
# පන්සියපනස් ජාතක පොත් වහන්සේ



# පන්සියපනස්

# ජාතක පොත්

# වහන්සේ

# සංඥාපනය

සොලී ජාතික පණ්ඩිත මහතෙරුන්වහන්සේ නමකගෙන් ඉගෙන කුරුණෑගල යුගයෙහි විසූ සතරවන පණ්ඩිත පරාක්‍රමබාහු මහරජාණන් විසින් පාලි ජාතකඨකථාව සිංහලට පරිවර්තනය කොට මෙම ජාතක පොත් වහන්සේ කල බව මහාවංශයෙහි එයි.

යතුරුලිවීම: ICTA

සෝධුපත් බැලීම: තුෂාර ද සිල්වා මහතා

# පටුන


සංඥාපනය ........................................................ i

001. අපණ්ණක ජාතකය ........................................ 5

002. වණ්ණුපථ ජාතකය ........................................ 21

003. සේරිවාණිජ ජාතකය ........................................ 29

004. චුල්ලසෙට්ඨි ජාතකය ........................................ 35

005. තණ්ඩුලනාළි ජාතකය ........................................ 56

006. දෙවධම්ම ජාතකය ........................................ 63

007. කට්ඨහාරී ජාතකය ........................................ 73

008. ගාමණී ජාතකය ........................................ 77

009. මඛාදෙව ජාතකය ........................................ 79

010. සුඛවිහාරි ජාතකය ........................................ 83

011. ලක්ඛණ මිග ජාතකය ........................................ 88

012. නිග්‍රෝධ මිග ජාතකය ........................................ 93

013. කණ්ඩින ජාතකය ........................................ 112

014. වාතමිග ජාතකය ........................................ 116

015. ඛරාදිය ජාතකය ........................................ 122

016. තිපල්ලත්ථමිග ජාතකය ........................................ 124

017. මාලුත ජාතකය................................................ 0

018. මතකභක්ත ජාතකය.......................................... 3

019. අයාචිතභක්ත ජාතකය....................................... 7

020. නළපාන ජාතකය............................................. 10

021. කුරුඞ්ගමෘග ජාතකය ...................................... 14

022. කුක්කුර ජාතකය ........................................... 17

023. භොජාජානීය ජාතකය........................................ 23

024. ආජඤ්ඤ ජාතකය .......................................... 29

025. තිත්ථ ජාතකය ............................................... 31

026. මහිලාමුඛ ජාතකය.......................................... 39

027. අභිණ්හ ජාතකය ............................................. 45

028. නන්දිවිසාල ජාතකය ....................................... 48

029. කණ්හ ජාතකය ............................................... 53

030. මුනික ජාතකය............................................... 58

031. කුලාවක ජාතකය............................................. 61

032. නච්ච ජාතකය................................................ 74

033. සම්මොදමාන ජාතකය....................................... 78

034. මත්ස්‍ය ජාතකය ............................................... 82

035. වට්ටක ජාතකය .................................................. 0

036. සකුණ ජාතකය.................................................. 6

037. තිත්තිර ජාතකය .................................................. 9

038. බක ජාතකය.................................................. 17

039. නන්ද ජාතකය .................................................. 24

040. ඛදිරඞ්ගාර ජාතකය.................................................. 29

041. ලොසක ජාතකය .................................................. 46

042. කපොත ජාතකය.................................................. 61

043. වෙළුක ජාතකය .................................................. 66

044. මකස ජාතකය .................................................. 70

045. රොහිණී ජාතකය .................................................. 73

046. ආරාමදූසක ජාතකය.................................................. 75

047. වාරුණී ජාතකය.................................................. 78

048. වෙදබ්බ ජාතකය.................................................. 81

049. නක්ඛත්ත ජාතකය.................................................. 88

050. දුම්මෙධ ජාතකය.................................................. 92

051. මහශීලව ජාතකය .................................................. 97

052. චුල්ලජනක ජාතකය .................................................. 109

053. පුණ්ණපාති ජාතකය ....................................... 110

054. ඵල ජාතකය ....................................................... 113

055. පඤ්චායුධ ජාතකය ................................................ 117

056. කාංචනක්ඛන්ධ ජාතකය ........................................ 123

057. වානරින්ද ජාතකය ............................................... 128

058. තයෝධම්ම ජාතකය ............................................... 133

059. භෙරිවාද ජාතකය ................................................. 137

060. සංඛධම්ම ජාතකය ................................................ 139

061. අසාතමන්ත්‍ර ජාතකය ............................................. 140

062. අණ්ඩභූත ජාතකය ................................................ 149

063. තක්ක ජාතකය ..................................................... 160

064. දුරාජාන ජාතකය ................................................. 167

065. අනභිරති ජාතකය ................................................ 171

066. මුදුලක්ඛණ ජාතකය .............................................. 174

067. උච්ඡඞ්ග ජාතකය ................................................. 183

068. සාකෙත ජාතකය .................................................. 186

069. විෂවන්ත ජාතකය ................................................ 189

070. කුද්දාල ජාතකය .................................................. 192

071. වරණ ජාතකය .................................... 200

072. සීලවනාගරාජ ජාතකය.................................... 207

073. සච්චංකිර ජාතකය.................................... 213

074. රුක්ඛධම්ම ජාතකය.................................... 222

075. මච්ඡ ජාතකය.................................... 226

076. අසංකිය ජාතකය.................................... 231

077. මහාසුපින ජාතකය.................................... 235

078. ඉල්ලීස ජාතකය .................................... 260

079. ඛරස්සර ජාතකය .................................... 279

080. භීමසෙන ජාතකය .................................... 281

081. සුරාපාන ජාතකය .................................... 289

082. කාලකණ්ණි ජාතකය .................................... 295

083. අත්ථස්සද්වාර ජාතකය .................................... 299

084. කිම්පක්ක ජාතකය .................................... 302

085. සීලවීමංස ජාතකය.................................... 305

086. මඞ්ගල ජාතකය .................................... 311

087. සාරම්භ ජාතකය .................................... 319

088. කුහක ජාතකය.................................... 321

089. අකතඤ්ඤු ජාතකය ........................................ 325

090. ලිත්ත ජාතකය ........................................ 329

091. මහාසාර ජාතකය ........................................ 332

092. විස්වාසභොජන ජාතකය ........................................ 351

093. ලොමහංස ජාතකය ........................................ 355

094. මහාසුදස්සන ජාතකය ........................................ 361

095. තෙලපත්ත ජාතකය ........................................ 364

096. නාමසිද්ධි ජාතකය ........................................ 377

097. කූටවාණිජ ජාතකය ........................................ 381

098. පරොසහස්ස ජාතකය ........................................ 385

099. අසාතරූප ජාතකය ........................................ 389

100. පරොසත ජාතකය ........................................ 395

101. පණ්ණික ජාතකය ........................................ 396

102. වෙරි ජාතකය ........................................ 399

103. විතීය මිත්තවින්දක ජාතකය ........................................ 401

104. දුර්වල කාෂ්ට ජාතකය ........................................ 402

105. උදංචනී ජාතකය ........................................ 405

106. සාලික ජාතකය ........................................ 408

107. බභ්‍ය (බාහිය) ජාතකය.................................. 413

108. කුඩ්ඩක පූව ජාතකය.................................... 419

109. සිඟාල ජාතකය ........................................ 422

110. සබ්බසංහාර ජාතකය.................................... 424

111. ගද්‍රභපඤ්හ ජාතකය.................................... 424

112. අමරාදේවි පඤ්හ ජාතකය.............................. 425

113. මිතචින්ති ජාතකය ...................................... 425

114. සකුණ ජාතකය ........................................ 427

115. දුබ්බච ජාතකය.......................................... 429

116. තිත්තිර ජාතකය ........................................ 430

117. වට්ටක ජාතකය ........................................ 432

118. අකාලරාවි ජාතකය .................................... 435

119. බන්ධන මොක්ඛ ජාතකය................................ 437

120. කුසනාලි ජාතකය........................................ 442

121. දුම්මේධ ජාතකය........................................ 444

122. නංගුලීස ජාතකය........................................ 447

123. අම්බ ජාතකය............................................ 450

124. කටාහක ජාතකය........................................ 452

125. අසිලක්ඛණ ජාතකය .................................... 456

126. කලණ්ඩුක (කලන්දුක) ජාතකය ........................ 460

127. බිළාර ජාතකය ............................................ 462

128. අග්ගිදත්ත (අග්ගික) ජාතකය ......................... 464

129. කෝසිය ජාතකය.......................................... 465

130. අසම්පදාන ජාතකය...................................... 468

131. පඤ්චගරු ජාතකය ....................................... 472

132. ඝසන (ඝතාසන) ජාතකය ............................... 475

133. ජාතසෝම (ඣානසෝධන) ජාතකය................... 476

134. චන්දාභාස (චන්දාභ) ජාතකය ......................... 478

135. ස්වර්ණහංස ජාතකය ..................................... 478

136. බබ්බු ජාතකය ............................................. 482

137. ගොධ ජාතකය ............................................ 487

138. උභතෝභට්ට ජාතකය.................................... 489

139. කාක ජාතකය .............................................. 491

140. රිතීය ගොධ ජාතකය.................................... 495

141. රිතීය සිගාල ජාතකය .................................. 497

142. විරොචන ජාතකය......................................... 499

143. නංගුට්ඨ ජාතකය ..................................... 503

144. රාධ ජාතකය ............................................. 505

145. කාක ජාතකය ............................................ 507

146. ද්විතීය පුෂ්පරත්ත ජාතකය ............................. 510

147. තෘතීය සිඟාල ජාතකය ................................. 512

148. විරොචන ජාතකය......................................... 516

149. සංජීවක ජාතකය ......................................... 522

150. රාජොවාද ජාතකය....................................... 526

151. චතුර්ථ සිඟාල ජාතකය.................................. 530

152. සූකර ජාතකය............................................. 533

153. උරග ජාතකය.............................................. 537

154. ගග්ග ජාතකය ............................................ 539

155. අලීන චිත්ත ජාතකය ................................... 543

156. ගුණ ජාතකය ............................................. 549

157. සුහනු ජාතකය............................................ 557

158. ස්වර්ණ මයුර (මෝර) ජාතකය ........................ 560

159. විනීල (ක) ජාතකය...................................... 567

160. ඉන්දගුත්ත (ඉන්දසමානගොත්ත) ජාතකය.......... 570

161. සණ්ඨව ජාතකය ........................................ 572
162. සුසීම ජාතකය ........................................ 574
164. නකුල ජාතකය ........................................ 579
165. උපසාල්හ (ක) ජාතකය ........................................ 581
166. සමිද්ධි ජාතකය ........................................ 583
167. සකුණග්ඝි ජාතකය ........................................ 585
168. අරක ජාතකය ........................................ 587
169. කකණ්ටක ජාතකය ........................................ 590
170. කල්‍යාණ (ධම්ම) ජාතකය ........................................ 590
171. දද්දර ජාතකය ........................................ 593
172. මක්ට ජාතකය ........................................ 596
173. දුතීය (දුබ්භි) මක්කට ජාතකය ........................................ 598
174. ආදිච්චුට්ඨාන ජාතකය ........................................ 600
175. කලහසමුට්ඨි (කලායමුට්ඨි) ජාතකය ........................................ 602
176. තින්දුක ජාතකය ........................................ 604
177. කච්ඡප ජාතකය ........................................ 607
178. සත්ත (සත) ධම් ජාතකය ........................................ 610
179. දුද්දද ජාතකය ........................................ 613

180. අසදෘශ (අසදිස) ජාතකය ............................ 614

181. සංගාමාවචර ජාතකය.................................... 620

182. වාලෝදක ජාතකය ....................................... 625

183. ගිරිදන්ත ජාතකය ......................................... 627

184. අනභිරත ජාතකය ......................................... 629

185. දධිවාහන ජාතකය ....................................... 631

186. චතුමට්ට ජාතකය.......................................... 638

187. සීහකොට්ඨුක ජාතකය .................................. 641

188. සීහ චම්ම ජාතකය........................................ 643

189. ශීලානිශංස ජාතකය ...................................... 644

190. රුහක ජාතකය.............................................. 647

191. සිරිකාලකණ්ණි ජාතකය.................................. 650

192. චුල්ල පදුම ජාතකය ...................................... 650

193. මණිචෝර ජාතකය ........................................ 657

194. පර්වතුනුව (පබ්බතූපත්ථර) ජාතකය.................... 661

195. වලාහක (වලාහස්ස) ජාතකය.......................... 664

196. මිත්තාමිත්ත ජාතකය....................................... 668

197. රාධ ජාතකය ............................................... 670

198. ගෘහපති (ගහපති) ජාතකය ........................ 672
199. සාධුසීල ජාතකය.................................. 674
200. බන්ධනාගාර ජාතකය............................ 676
201. කේලිසීල ජාතකය ................................ 679
202. බණ්ඩ (ක) වතී ජාතකය......................... 682
203. වීර (වීරක) ජාතකය............................. 687
204. ගංගානම් (ගංගෙයය) ජාතකය..................... 689
205. චිත්‍රීය කුරුංගමිග ජාතකය..................... 691
206. අස්සක ජාතකය .................................. 694
207. සුංසුමාර ජාතකය................................ 698
208. කක්කර ජාතකය ................................... 701
209. කන්දගලක ජාතකය................................ 703
210. සෝමදත්ත ජාතකය ................................ 705
211. උච්චිට්ඨ භත්ත (භක්ත) ජාතකය .................... 709
212. භරු ජාතකය ....................................... 711
213. පුණ්ණනදී ජාතකය................................ 715
214. කච්ඡප ජාතකය.................................... 718
215. මච්ඡ (ක) ජාතකය ................................. 721

216. සෙග්ගු ජාතකය ........................................ 722
217. ව්තීය කූටවාණිජ ජාතකය ................................ 724
218. ගරහිත ජාතකය ........................................ 727
219. ධම්මද්ධජ ජාතකය ...................................... 730
220. කාසාව ජාතකය ........................................ 746
221. චුල්ල නන්ද (චුල්ලනන්දිය) ජාතකය ....................... 749
222. පුටභත්ත ජාතකය ...................................... 754
223. කුම්භීල ජාතකය ....................................... 759
224. බත්ති(ය) වණ්ණන ජාතකය ................................ 760
225. කෝසිය ජාතකය ........................................ 761
226. ගුථපාණී (පානක) ජාතකය ............................... 762
227. කාමනීය (කාමනීත) ජාතකය .............................. 766
228. පලාස (පලායි) ජාතකය .................................. 770
229. ද්විතීය පලාස ජාතකය ................................... 772
230. උපාහන ජාතකය ....................................... 774
231. වෙණ්ණුථූන ජාතකය ..................................... 777
232. විකණ්ණක ජාතකය ..................................... 780
233. අහිතාබු (අසිතාබ) ජාතකය .............................. 782

234. වච්ඡනක(නඛ) ජාතකය .................................... 785
235. බක ජාතකය ............................................. 787
236. සාකේත ජාතකය .......................................... 788
237. ඒකපාද ජාතකය .......................................... 789
238. අරිතමෘත (හරිතමාතු) ජාතකය ......................... 791
239. මහපිංගල ජාතකය ....................................... 793
240. සබ්බදඨ ජාතකය ......................................... 795
241. සුන(ඛ) ජාතකය .......................................... 799
242. ගුත්තිල ජාතකය ......................................... 801
243. වීටිවච්ඡ (විතිච්ඡ) ජාතකය ............................. 811
244. මූලපරියාය ජාතකය ..................................... 813
245. තේලෝවාද ජාතකය ...................................... 816
246. පාදංජලි ජාතකය ........................................ 818
247. කිංසුගෝකාම (කිංසුකෝපම) ජාතකය ................. 819
248. සාල(ක) ජාතකය ......................................... 822
249. කපි ජාතකය ............................................. 825
250. සංකප්ප ජාතකය ......................................... 827
251. තිලමුට්ඨි ජාතකය ...................................... 834

252. මණිකණ්ඨ ජාතකය ........................................ 838
253. කුණ්ඩක කුච්ඡි සින්ධව ජාතකය ...................... 843
254. සුව (සුක) ජාතකය........................................ 848
255. ජරදපාන ජාතකය ........................................ 850
256. ආදසමුබ (ගාමණී චණ්ඩ) ජාතකය ................. 852
257. මහාමන්ධාතු ජාතකය...................................... 870
258. කිරීට (කිරීටවච්ඡ) ජාතකය ........................... 874
259. දූත ජාතකය................................................ 877
260. පදුම ජාතකය ............................................ 879
261. මුදුපාණි ජාතකය......................................... 881
262. චූලපලොභන (සංකප්ප) ජාතකය.................... 884
263. මහපනාද ජාතකය........................................ 889
264. කුරග්ග (කුරප්ප) ජාතකය............................. 893
265. වාත සෛන්ධව (වාතග්ග සින්ධව) ජාතකය........ 894
266. කක්ටක (කක්කට) ජාතකය............................ 898
267. ආරාම දූසක ජාතකය.................................... 903
268. සුජාත ජාතකය ........................................... 906
269. කාකෝලූක (උලූක) ජාතකය ........................ 911

270. උදපාන (දූසක) ජාතකය.............................. 913
271. ව්‍යාඝ්‍ර ජාතකය ........................................... 915
272. කච්ඡප ජාතකය .......................................... 918
273. ලෝල ජාතකය............................................. 920
274. දූලූසි (රුචිර) ජාතකය.................................. 923
275. කුරුධම්ම ජාතකය ........................................ 924
276. රෝම(ක) ජාතකය ....................................... 948
277. මහිස ජාතකය............................................. 950
278. ශතපත්‍ර (සත පත්ත) ජාතකය ....................... 953
279. කූටසාක (පුටදූසක) ජාතකය......................... 956
280. අභ්‍යන්තර ජාතකය...................................... 957
281. සෙය්‍යංස (සෙය්‍ය) ජාතකය............................ 966
282. වඩ්ඪ(කී) ජාතකය ...................................... 970
283. සිරි ජාතකය ............................................... 976
284. මණිසූකර ජාතකය ....................................... 984
285. සාලොහිත (සාලූක) ජාතකය ........................ 989
286. ලාභගරු ජාතකය........................................ 991
287. මච්ඡද්වාර (උදන) ජාතකය.......................... 992

288. නානච්ඡන්ද ජාතකය .................................... 995

289. සීලවීමංස ජාතකය....................................... 999

290. භද්දඝට ජාතකය ........................................ 1001

291. සුපත්ත ජාතකය ......................................... 1003

292. කායවිච්ඡන්ද ජාතකය .................................. 1007

293. ජම්බුඛාදක ජාතකය..................................... 1010

294. අන්ත ජාතකය .......................................... 1011

295. සමුද්‍ර ජාතකය.......................................... 1013

296. කාමවිලෝපන(විලාප) ජාතකය ..................... 1015

291. උදුම්බර ජාතකය........................................ 1016

292. කුමාරපත්ත ජාතකය.................................... 1019

293. තෘතිය බක ජාතකය.................................... 1021

294. චුල්ලකාලිංග ජාතකය ................................. 1023

295. මහාඅශ්වාරෝහක ජාතකය........................... 1036

296. සීලවීමංස ජාතකය..................................... 1043

297. සුජාත ජාතකය ......................................... 1047

298. පලාස ජාතකය ......................................... 1051

299. ජවනසකුණ ජාතකය.................................... 1055

300. ජව ජාතකය ............................................ 1057

302. සය්හ ජාතකය ........................................ 1062

302. පුචිමන්‍ද ජාතකය .................................... 1068

303. කස්සපමන්දිය ජාතකය.................................. 1072

304. ක්‍ෂාන්තිවාද ජාතකය.................................... 1077

305. ලොහකුම්භි ජාතකය .................................. 1082

306. මාංශ ජාතකය .......................................... 1090

307. සස ජාතකය............................................. 1094

308. ඒකරාජ ජාතකය........................................ 1101

309. දද්දර ජාතකය .......................................... 1103

310. මතරොදන ජාතකය .................................... 1106

311. කනවෙර ජාතකය........................................ 1110

312. තිත්තිර ජාතකය........................................ 1118

313. සුබ්බච ජාතකය ........................................ 1124

314. කුටි දූෂක ජාතකය.................................... 1130

315. දද්දභ ජාතකය ........................................ 1139

316. බ්‍රහ්මදත්ත ජාතකය.................................... 1143

317. චම්මසාටක ජාතකය.................................... 1147

318. ගොධ ජාතකය ............................................ 1149
319. කක්කාර ජාතකය........................................ 1151
320. කාක ජාතකය ............................................ 1155
321. අනනුසොචිය ජාතකය ................................ 1158
322. කාලබාහු ජාතකය ..................................... 1163
323. සීලවීමංශ ජාතකය ................................... 1168
324. චම්මසාටක ජාතකය ................................... 1170
325. ජම්බුක ජාතකය ........................................ 1173
326. බ්‍රහත්ඡත්ත ජාතකය................................... 1176
327. පීඨ ජාතකය ............................................. 1180
328. තුෂ ජාතකය.............................................. 1183
329. බාවේරු ජාතකය........................................ 1189
330. විසයිහ ජාතකය ....................................... 1192
331. තණ්ඩුලනාළි ජාතකය..................................... 1196
332. වානර ජාතකය ......................................... 1196
333. කුන්තානි ජාතකය ..................................... 1199
334. අම්බචෝර ජාතකය .................................... 1202
335. ගජකුම්භ ජාතකය ..................................... 1205

336. කෙසව ජාතකය........................................ 1207

337. අයකූට ජාතකය ........................................ 1213

338. අරඤ්ඤ ජාතකය ........................................ 1216

339. සන්ධිභෙද ජාතකය ........................................ 1218

340. මණිකුණ්ඩල ජාතකය........................................ 1221

341. සුජාත ජාතකය........................................ 1224

342. ජොත ජාතකය ........................................ 1227

343. උරග ජාතකය ........................................ 1231

344. ඝන ජාතකය........................................ 1238

345. කාරණ්ඩක ජාතකය ........................................ 1241

346. ලටුකික ජාතකය........................................ 1244

347. චුල්ල ධම්මපාල ජාතකය ........................................ 1248

348. ස්වර්ණමෘග ජාතකය........................................ 1252

349. සුස්සොන්දිය ජාතකය........................................ 1258

350. වර්ණාරොහ ජාතකය ........................................ 1261

351. ශීලපරික්ඛ ජාතකය........................................ 1264

352. හිරි ජාතකය........................................ 1267

353. අභිගුණ්ඨික ජාතකය ........................................ 1270

354. ගුම්බිය ජාතකය ........................................ 1272
355. සාලිය ජාතකය ........................................ 1274
356. නවසාර ජාතකය ........................................ 1276
357. මිත්තවින්දක ජාතකය........................................ 1278
358. පලාස ජාතකය ........................................ 1280
359. දීඝ කොසල ජාතකය........................................ 1282
360. මුවපෝතක ජාතකය ........................................ 1284
361. මූසික ජාතකය........................................ 1286
362. චුල්ලධනුද්ධර ජාතකය........................................ 1290
363. කපොත ජාතකය........................................ 1295
364. ආචාරි ජාතකය........................................ 1298
365. ස්වෙතකෙතු ජාතකය ........................................ 1302
366. දරීමුඛ ජාතකය........................................ 1307
367. නේරු ජාතකය........................................ 1315
368. ආසංඛවතී ජාතකය........................................ 1317
369. මිගාලොප ජාතකය........................................ 1323
370. ශ්‍රී කාලකන්නි ජාතකය ........................................ 1326
371. බිළාල ජාතකය........................................ 1332

372. ධම්මද්ධජ ජාතකය........................................ 1334
373. නන්දියමෘග ජාතකය.................................. 1336
374. කරපත්ත ජාතකය ...................................... 1341
375. සුචි ජාතකය .............................................. 1348
376. තුණ්ඩිල ජාතකය ........................................ 1352
377. ස්වර්ණකක්කටක ජාතකය.............................. 1356
378. මය්හ ජාතකය............................................ 1360
379. ධජවිහෙඨ ජාතකය .................................... 1363
380. පුෂ්පගන්ධ ජාතකය .................................... 1367
381. විඝාත ජාතකය............................................ 1370
382. වට්ටක ජාතකය .......................................... 1372
383. කාක ජාතකය ............................................ 1373
384. කුක්කු ජාතකය............................................ 1375
385. මනෝජ ජාතකය ........................................ 1378
386. දහම්සොඬ ජාතකය ...................................... 1383
387. සුතනු ජාතකය .......................................... 1387
388. ගිජ්ඣ ජාතකය.......................................... 1393
389. දබ්බපුෂ්ප ජාතකය .................................... 1395

390. දසන්නක ජාතකය ........................................ 1399
391. සත්තුභස්ත ජාතකය ........................................ 1405
392. අට්ඨිසේන ජාතකය ........................................ 1414
393. කපි ජාතකය ........................................ 1417
394. බකබ්‍රහ්ම ජාතකය ........................................ 1421
395. ගණ්ඩාර ජාතකය ........................................ 1425
396. මහා කපි ජාතකය ........................................ 1430
397. කුම්භකාර ජාතකය ........................................ 1435
398. දල්හධම්ම ජාතකය ........................................ 1444
399. සොමදත්ත ජාතකය ........................................ 1449
400. සුසීම ජාතකය ........................................ 1452
401. කොට්සිඹලි ජාතකය ........................................ 1456
402. ධූමකාරි ජාතකය ........................................ 1458
403. ජාගර ජාතකය ........................................ 1462
404. කුම්මාසපිණ්ඩි ජාතකය ........................................ 1465
405. පරන්තප ජාතකය ........................................ 1475
406. කච්චානි ජාතකය ........................................ 1484
407. අෂ්ටශබ්ද ජාතකය ........................................ 1490

408. සුලසා ජාතකය .......................................... 1496
409. සුමංගල ජාතකය.......................................... 1501
410. ගඩිගාමාල ජාතකය.......................................... 1505
411. වෙතිය ජාතකය .......................................... 1517
412. ඉන්ද්‍රිය ජාතකය.......................................... 1522
413. ආදිත්ත ජාතකය .......................................... 1534
414. දිව් ජාතකය.......................................... 1540
415. ගිජ්ඣ ජාතකය .......................................... 1542
416. කොසම්බ ජාතකය.......................................... 1546
417. මහ ගිරා ජාතකය .......................................... 1563
418. සුළුසුව ජාතකය.......................................... 1573
419. හාරිත ජාතකය .......................................... 1578
420. රාජෝවාද ජාතකය .......................................... 1586
421. පදමානවක ජාතකය.......................................... 1590
422. ලොමසකාශ්‍යප ජාතකය.......................................... 1604
423. සක්වාදූ ජාතකය .......................................... 1611
424. හලින්දිය ජාතකය.......................................... 1616
425. සමුග්ග ජාතකය.......................................... 1622

426. පූතිමාංශ ජාතකය ........................................ 1631

427. තිත්වටු ජාතකය ........................................... 1638

428. චතුඩාර ජාතකය .......................................... 1652

429. කෘෂ්ණ ජාතකය ........................................... 1658

430. චතුපොසථ ජාතකය ...................................... 1668

431. සංඛ ජාතකය ................................................ 1668

432. චුල්ලබෝධි ජාතකය ..................................... 1674

433. කණ්හදීප ජාතකය ........................................ 1679

439. නිග්‍රෝධ ජාතකය ......................................... 1687

440. තක්කාරි(තක්කළ) ජාතකය ........................... 1698

441. මහා ධර්‍මපාල ජාතකය.................................. 1705

442. කුක්කුහ(කුක්කුට) ජාතකය............................. 1711

443. මට්ටකුණ්ඩලී ජාතකය.................................... 1716

444. බිළාර(රි) කෝසිය ජාතකය ........................... 1719

445. කාක (චක්කවාක) ජාතකය............................ 1730

446. මහා මංගල ජාතකය..................................... 1732

447. ඝතපණ්ඩිත ජාතකය ..................................... 1738

448. මාතුපෝසක ජාතකය .................................... 1749

449. ජුණ්හ ජාතකය........................................... 1756

450. ධම්ම ජාතකය ............................................ 1763

451. උදයභද්ද (උදය) ජාතකය ........................... 1768

452. පානීය ජාතකය............................................ 1779

453. යුද්ධඤ්ජය (යුධඤ්ජය) ජාතකය .................... 1787

454. දසරථ ජාතකය............................................ 1792

455. සංවර ජාතකය ........................................... 1802

456. සුප්පාරක ජාතකය....................................... 1811

# “නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස”

ශාක්‍යකුලතිලකවූ (ශාක්‍ය වංශයට අලංකාරයක්වූ) පරදුක්ඛදුක්ඛිතවූ (අනුන්ගේ දුකෙහිදී දුක්වන්නාවූ) කරුණානිධානවූ (කරුණාව උපදනා තැනක් බඳුවූ) අසරණ සරණවූ (අසරණයන්ට පිහිටවූ) සමන්තභද්‍රවූ (හැම අතින් ම යහපත්වූ) තිලෝගුරු සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ මේ භද්‍ර කල්පයට සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයකින් යට සාරමණ්ඩ නම් කල්පයෙහි ‘තණ්හඞ්කරය, මෙධඞ්කරය, සරණඞ්කරය’යි තුන්බුදු කෙනෙකුන් වහන්සේට ඉක්බිතිව උපන් තුන්ලොවට ඛෙමඞ්කරවූ (නොබිය බව ගෙනදෙන්නාවූ) මොහඳුරට දිවාකරවූ (මුලාව නැමති අඳුර නැසීමට සූර්‍ය්‍යයා වැනිවූ) මුළුසත්නට ශාන්තිකරවූ (සෙත සලසන්නාවූ) පින්වත්නට සිවඞ්කරවූ (නිවන් ලබාදෙන්නාවූ) මරසෙනගට භයඞ්කරවූ දීපඞ්කර නම් සර්‍වඥයන් වහන්සේ බුදුව සියළු සත්වයන් අමාමහනිවන් දක්වමින් සුදසුන් විහාරයෙහි වාසය කරන සමයෙහි රම්‍මගම් නුවරවාසී මනුෂ්‍යයෝ සර්‍වඥයන් ප්‍රධානකොට භික්‍ෂුසංඝයා වහන්සේ පවරා (දනට ආරාධනාකොට) සර්‍වඥයන් වඩනා මාර්‍ගය සරසන්නට වන්හ.

එසමයෙහි අප මහාබොධිසත්වයෝ සුමේධ නම් තාපසව වාසය කරන්නාහු මං සකස්කොට තබන්නාවූ මනුෂ්‍යයන් දැක “මේ මාර්‍ගය කුමකට සරසවුද?”යි විචාරා එපවත් දැන එසේ වීනම් “මා සරහන නියායෙන් (මටත් සැරසීමට) භූමි ප්‍රදේශයක් දෙවු”යි කීහ. එවිට මනුෂ්‍යයෝ දෙන්නාහු දැදුරුව දියබොර ඇති භූමි ප්‍රදේශයක් (වගුරු බිම් කැබැල්ලක්) දීලූහ. ඒ භූමි ප්‍රදේශය සකස්කොට තනා නොනිමන තුරු සාර ලක්‍ෂයක් භික්‍ෂූන් වහන්සේ පිරිවරා ඒ දීපඞ්කර නම් සර්‍වඥයන් වහන්සේ වැඩිසේක.

ඒ සර්‍වඥයන් වහන්සේ දැක සුමේධ තාපසයෝ මඩ කලලෙහි (මඩ ගොහොරුවෙහි) අඳුන් දිවිසම් අතුට (කලු කොටිසම අතුරා) බුදුබව පතා වැදහොත්තාහ. සර්‍වඥයන් වහන්සේ ඒ තාපසයන්ගේ ඉස්දෙර (ඉහඉද්දර) සිට “මහා පුරුෂයා කුමක් සිතා වැදහොත්තේද්‍ හෝ”යි දිවසින් බලා සිතූ සිතුවිලි දැක “මහණෙනි, මේ පුරුෂයාණෝ මෙතනට සාරාසඞ්ඛ්‍ය කල්ප ලක්‍ෂයකින් මත්තෙහි මහබඳුරු නම් කපේදී ‘ගෞතම’ නම් බුදුවෙති යි විවරණ පතුල්”(පෙරුම්දම් පිරීමට පදනමක් බඳු විවරණ) දෙවා වදාළසේක.

ඒ සුමේධ තාපසයෝත් ගාථාමාත්‍රයක් (යම්තම් ගාථාවක්) ඇසූ පමණින් නිවන් දකින්නට හේතු සම්පත් ඇතිව තිබියදීත් ඒ හැර සංසාරයට වැද එතැන් පටන් දශ පාරමිතාය, දශ උප පාරමිතාය, දශ පරමාර්‍ථ පාරමිතාය යන සමත්‍රිංශත් (සියල්ල තිහක් වූ) පාරමිතා ධර්‍මයන් හා අඞ්ග පරිත්‍යාගය

(ශරීරාංග පරිත්‍යාග කිරීම) ජීවිත පරිත්‍යාගය යනාදිවූ පඤ්චමහා පරිත්‍යාගයන් හා ඉන් මෑත බුදුවූ කොණ්ඩඤ්ඤාදී වූ තෙවිසි බුදුකෙනෙකුන් වහන්සේ අතින් ලබන ලද විවරණශ්‍රීද ඇතිව වෙස්සන්තරාත්මභාවයෙහි සිට සත්වරක් මහ පොළව ගුගුරුවා මහදන්දී එයින් චුතව තුසිතභවනයෙහි ඉපිද බොහෝ කාලයක් එහි වැස දසදහසක් සක්වළ දිව්‍ය බ්‍රහ්මයන්ගේ ආරාධනාවෙන් පස්මහබැලුම් බලා ඇසළ පුරපසලොස්වක් ලත් උතුරුසළ නැකතින් මාතෘගර්භයෙහි (මවු කුස) ප්‍රතිසන්ධිග්‍රහණය කොට (පිළිසිඳගෙන) දසඑකඩමසක් (සම්පූර්ණ දසමාසයක්) ඇවෑමෙන් මතෘගර්භයෙන් ප්‍රසූතව එකුන්තිස් (විසිනව) අවුරුද්දක් රාජ්‍යය කොට තුන්පූර්ව නිමිත්ත දැක සසර කළකිරී සතර වැනිව දුටු මහණ වේශය දැක ප්‍රව්‍රජ්‍යාවෙහි (පැවිදිවීමෙහි) ආලය ඇතිව එදා රාත්‍රියෙහි කණ්ඨක නම් අශ්වයා පිට නැගී දසදහසක් සක්වළ දිව්‍යබ්‍රහ්මයන් පිරිවරා අනෝමා නම් ගංතෙර දී මුහුලස (කෙස්වැටිය) කපා ආකාශයට දමා මහාබ්‍රහ්මයා විසින් දෙන ලද අෂ්ටපරිෂ්කාර (අට පිරිකර) දරා පැවිදිව සාවුරුද්දක් දුෂ්කරක්‍රියා කොට අජපාල නිග්‍රොධමූලයෙහිදී සුජාතාවන් දුන් ක්ෂීරපායාසය (කිරිබත) වළඳා සල්වෙනෙහි දිවාවිහරණය කොට (දවල් කාලය ගෙවා) සවස්වේලෙහි ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ කරා එමින් සිට අතරමගදී සොත්ථිය නම් බමුණකු දුන් කුසතණ අටමිටක් ගෙන ඇසතු බෝමුල්හි සලා ඉන් පැනනැංගාවූ තුදුස්රියන් වජ්‍රාසනාරූඪව (රියන් දහසතරක් උස්වූ දියමන්ති ආසනයට නැගී) මාරපරාජය

කොට අළුයම් වේලෙහි සියළු කෙලෙසුන් නසා බුදුව සත්සතියක් බෝධිද්‍රැම (බෝරුක) සමීපයෙහි දවස් යවා අටවන සතියේදී මහාබ්‍රහ්මයාගේ ආරාධනාවෙන් බරණැස්නුවර ඉසිපතන නම් විහාරයෙහිදීපස්වග මහණුන් වහන්සේ ප්‍රධන කොට ඇති බොහෝ දිව්‍යබ්‍රහ්මයන්ට දම්සක්පැවතුම් සූත්‍ර දේශනාව කොට බොහෝ සත්වයන් අමාමහනිවන් දක්වා එතැන් පටන් වෛනෙය ජනයන් (හික්මවිය යුතු සත්වයන්) සංසාරසාගරයෙන් ගොඩනගා වාසයකරන සේක්, ඒ ඒ මනුෂ්‍යයන්ගේ හා ඒ ඒ භික්‍ෂු භික්‍ෂුණීන්ගේ නොයෙක් ආපත්ති හා (වැරදි ක්‍රියා) නොයෙක් දෘෂ්ටාන්තවලට හා නොයෙක් කථාන්තරවලට හා මෙකී දෙයෙහි සංකා (සැක) දුරුකරණු පිණිස ද දිව්‍යබ්‍රහ්ම මනුෂ්‍යාදීන්ට පින් පිණිස ද වදාරන ලද පන්සිය පනස් ජාතක ධර්‍මදේශනාව එළුවෙන් (සිංහල භාෂාවෙන්) දක්වන්නට වුව මැනවැයි කියා පරාක්‍රම නම් ඇමති සත්පුරුෂයාගේ ආරාධනාවෙන් හා වීරසිංහප්‍රතිරාජ නම් අමාත්‍යෝත්තමයාගේ (උතුම් ඇමතියාගේ) උත්සාහයෙන් ද අටුවාසාමින් ලී (අටුවාචාර්‍ය්‍යයන් වහන්සේ විසින් ලියන ලද) ජාතක නියාව (පිළිවෙල) නොවරදවා එළුවෙන් ලියූ ජාතක කථාව සත්පුරුෂවූ මනුෂ්‍යයන් විසින් කන් යොමා සිත් එලා (සිත යොමුකොට) ඇසිය යුතු:-

ඒ කෙසේද යත්?

# 001. අපණ්ණක ජාතකය

භාග්‍යවත්වූ තිලෝගුරු සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ ජේතවන මහ විහාරයෙහි දිව්‍යබ්‍රහ්ම ආර්‍ය්‍යෙර්‍ය්‍යාපථසංඛ්‍යාත විහරණයන් (දිව්‍ය, බ්‍රහ්ම, ආර්‍ය්‍ය විහරණය යන විවේක වේලාවන් ගෙවීමේ ක්‍රම) අතුරෙන් එක්තරා විහරණයකින් දවස් යවන සේක්, අනේපිඩු මහසිටාණන්ගේ යහළු වූ පන්සියයක් තීර්ත්‍ථක ශ්‍රාවකයන් අරභයා මේ අපණ්ණක ජාතක ධර්‍මදේශනාව කොට වදාළසේක.

එක් දවසක් අනේපිඩු මහසිටාණෝ තමන්ගේ යහළුවූ පන්සියයක් තීර්ත්‍ථක ශ්‍රාවකයන් කැඳවාගෙන බොහෝ ගඳදුම්මල් පහන් හා ගිතෙල් මී උක්සකුරු හා සිවුරුපිළි ආදිය ගෙන්වාගෙන ජේතවනයට ගොස් බුදුරජාණන් වහන්සේට නමස්කාර කොට මල්සුවඳ ආදියෙන් පූජා කොට ගිතෙල් ආදිවූ බෙහෙත් බඩු හා සිවුරුපිළිද භික්‍ෂු සංඝයා වහන්සේට පිළිගන්වා “න පච්ඡතො න පුරතො” (පිටිපසින්ම හෝ ඉදිරියෙන්ම වාඩිනොවී) යනාදී සයවැදෑරුම්වූ නිසද්‍යාදෝෂ (හිඳගැනීමේ වැරදි) දුරුකොට එකත්පස්ව හුන්නාහුය. ඒ අන්‍යතීර්ත්‍ථක ශ්‍රාවකයෝ බුදුන්ට නමස්කාර කොට බුදුන්ගේ පුන්සඳ මඬලක් බඳු වූ සශ්‍රීක මුඛය (ලක්ෂණ මුහුණ) හා දෙතිස් මහාපුරුෂ ලක්‍ෂණ (ලොවුතුරා බුදුබව ලබන මහාපුරුෂයෙකුගේ උප්පත්තියෙන් ම සිරුරෙහි පිහිටන්නාවූ උතුම් මංගල ලක්ෂණ දෙතිස) අශීත්‍යනුව්‍යඤ්ජන (උපමංගල ලක්ෂණ අසූව) ඛ්‍යාමප්‍රභා (බුදු සිරුර වටා

බඹයක් දුරට විහිදෙන රශ්මි මාලාව) කෙතුමාලාලංකාරයෙන් (බුදුරජුන්ගේ විහිදෙන රශ්මි මාලාව) විරාජමානවූ (බබළන්නාවූ) බ්‍රහ්මශරීර හා කරකැවි යුවල යුවල නික්මෙන්නා වූ ඝන බුද්ධරශ්මි බල බලා අනේපිඬු මහසිටාණන් සමීපයෙහි උන්නාහුය.

එකල්හි ඔවුන්ට බුදුහු රත්ගල් තලාවක හිඳ සිංහනාද කරන්නා වූ අභීත (නිර්භීත) කෙශරසිංහරාජයෙකු මෙන්ද, මෙඝකාලයෙහි (වැසිකාලයෙහි) මහාවර්‍ෂාවක් වස්නා කලක් මෙන්ද, ආකාශ ගංගාවක් (සුදු දියදහරින් යුත් අහස් ගඟක්) බානා කලක් මෙන්ද, රුවන් දමක් (මැණික් මාලාවක්) ගොතන්නකු මෙන්ද, අෂ්ටාඞ්ගයෙන් සමන්විතවූ (අංග අටකින් සමන්විතවූ) ශ්‍රවණීයවූ (ඇසීමට ප්‍රියවූ) මනොඥවූ බ්‍රහ්මස්වරයෙන් (ගැඹුරු කටහඬින්) නා නා නය නිපුණ විචිත්‍රවූ මධුරවූ ධර්‍මදෙශනාව කොට වදාළසේක.

ඒ තීර්ත්‍ථක ශ්‍රාවකයෝ බුදුන්ගේ ධර්‍මය අසා ප්‍රසන්නවූ සිත් ඇතිව නැගී සිට දසබලධාරීවූ (කායබල දහයක් හා ඥාණබල දහයක් දරන්නාවූ) බුදුන්ට නමස්කාර කොට තීර්ත්‍ථක ලබ්ධිය (තීර්ථක ආගමික විශ්වාසය) හැර බුදුන්ගේ සරණ ගියහ. ඔහු එතැන් පටන් ඇමකල ම අනේපිඬු මහසිටාණන් හා සමග සුවඳ මල් ආදිය ගෙන විහාරයට ගොස් බණ අසති, දන් දෙති, සිල් රක්‍ෂා කෙරෙති, පෙහෙවස් රකිති (පොහෝ දිනවල අටසිල් රකිති). ඉක්බිත්තෙන් බුදුහු සැවැත්නුවරින් රජගහනුවරට වැඩි සේක. එකල්හි ඒ තීර්ත්‍ථක

ශ්‍රාවකයෝ බුදුන් රජගහනුවරට වැඩි කල්හි බුදුන්ගේ සරණය හැර නැවත අන්‍ය තීර්ථකයන්ගේ සරණගෙන තමන්ගේ මුල සරණයෙහිම පිහිටියාහ. බුදුරජාණන් වහන්සේත් සත් අටමසක් කල් යවා නැවත ජේතවනයට වැඩිසේක.

අනේපිඩු මහසිටාණෝත් නැවත ඔවුන් කැඳවාගෙන බුදුන් සමීපයට ගොස් වැඳ සුවඳ මල් ආදීයෙන් පූජා කොට බුදුන්ට නමස්කාර කොට එකත් පස්ව උන්නාහුය. ඒ තීර්ථක ශ්‍රාවකයෝත් බුදුන් වැඳ එකත්පස්ව හුන්නාහුය. එකල්හි ඔවුන් බුදුරජාණන් වහන්සේ සැරිසරා වැඩිකල්හි ගන්නා ලද සරණ හැර නැවත අන්‍ය තීර්ථකයන්ගේ සරණගෙන මූලස්ථානයෙහි (මුලින් සිටි තත්වයෙහි) පිහිටි බව අනේපිඩු මහසිටාණෝ බුදුන්ට දැන්වූහ.

එකල්හි සර්වඥයන් වහන්සේ ප්‍රමාණාතික්‍රාන්තවූ (අසීමිත) කාලයෙහි අතරක් නැතිකොට පවත්වන ලද වාක්සුචරිතානුභාවයෙන් (යහපත් වචන භාවිතාකර තිබීමේ අනුහසින්) දිව සුවඳින් සුවඳ කැවූ, නොයෙක් සුවඳින් පිරුණු රුවන් කරඬුවක් හරණකලක් (විවෘත කරන අවස්ථාවක්) පරිද්දෙන් මුඛපද්මය (මුවපියුම) විවෘත කොට මධුරස්වර (මිහිරිනාදය) විහිදුවමින් "සැබෑද උපාසකවරුනි, තොපි රත්නත්‍රයෙහි සරණ හැර අන්‍ය තීර්ථකයන්ගේ සරණ ගියෝදැ?"යි විචාරා වදාළසේක.

එකල්හි තමන් කළ කාරිය සඟවන්නට අසමර්ථ වූ ඔවුන් විසින් "සැබැව ස්වාමීනි"යි කී කල්හි බුදුනු උපාසක වරුන්ට

ආමන්ත්‍රණය කොට "එම්බා උපාසකවරුනි, යටින් අවීචිය(අවීචි මහ නරකය) හා මත්තෙන් භවාග්‍රය (විශ්වයෙහි කෙළවර නම්වූ අකනිටා බඹලොව) කෙළවර කොට සරසින් අනන්තාපරිමාණ සක්වළෙහි (පමණ නොකළැකි ලෝකධාතුවල) සීලසමාධිප්‍රඥාදීවූ ගුණයෙන් බුදුන් හා සමකෙනෙක් නැත. බුදුන්ට වඩනා කෙණෙක්ම නැත. මෙසේ උත්තමගුණයෙන් සමන්විත වූ රත්නත්‍රය සරණ ගිය උපාසක කෙනෙක් වෙත්ව යි උපාසිකා කෙනෙක් වෙත්ව යි නරකාදීවූ සතර අපායෙහි උපදිනාහු නොවෙති. අපායොත්පත්තියෙන් (අපායෙහි ඉපදීමෙන්) මිදී දිව්‍යලෝකයෙහි ඉපිද මහා සම්පත් අනුභව කෙරෙති. එසේ හෙයින් තොප ඇමදෙනා මෙබඳු සරණ හැර අන්‍ය තීර්ත්‍ථකයන්ගේ සරණ යන්නවුන් විසින් කළ සේ නපුරැ"යි වදාළසේක. "තවද උපාසකවරිනි, බුද්ධානුස්මෘති, ධර්‍මානුස්මෘති, සංඝානුස්මෘති කර්මස්ථානය (භාවනා අරමුණු) නම් ශ්‍රොතාපත්ති මාර්‍ගය හා ශ්‍රොතාපත්ති ඵලය දෙන්නේය, සකෘදාගාමි මාර්ගය හා සකෘදාගාමි ඵලය දෙන්නේය, අනාගාමි මාර්ගය හා අනාගාමි ඵලය දෙන්නේය, අර්හත් මාර්ගය හා අර්හත් ඵලය දෙන්නේය"යි මේ ආදීවූ කාරණයෙනුත් ධර්‍මදෙශනා කොට "මෙබඳු රත්නත්‍රය සරණ බිඳපු තොප විසින් නොකළමනා දෙයක් කරණ ලදැ"යි වදාල සේක.

මෙසේ භාග්‍යවත් වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ අනේකප්‍රාකාරයෙන් උපාසකවරුන්ට අවවාද කොට "උපාසකවරුනි, පළමුත් මනුෂ්‍යයෝ 'අසරණය සරණය'යි

විරුඬග්‍රහණය ගෙන (වරදවා පිළිගෙන) අමනුෂ්‍යයෝ පරිගෘහිතවූ (අරක්ගත්) කාන්තාරයෙහි යක්‍ෂයන්ට ගොදුරුව මහා විනාශයට පැමිණියෝය. ‘සරණයම සරණය’යි ඒකාන්ත කොට අවිරුඬග්‍රහණය (නිවරදිව පිළිගත්) ගත්තාවූ මනුෂ්‍යයෝ ඒ කාන්තාරයෙහි ස්වාස්ථ්‍යයට (සුවපත් බවට) පැමිණියෝ වේදැ”යි වදරා මුවෙන් නොබැණ (නිශ්ශබ්දව) වැඩ උන් සේක. එකල්හි අනේපිඬු මහසිටාණෝ හුනස්නෙන් නැගී සිට බුදුන් වැඳ ස්තුති කොට දෙහොත් මුදුනෙහි තබා “ස්වාමීනි, දැන් වූ කලි මේ උපාසකවරුන්ගේ උතුම්වූ රත්නත්‍රය සරණ හැර විරුඬග්‍රහණය අපට ප්‍රකාශය, පූර්වයෙහි යක්‍ෂාධිගෘහිත වූ කාන්තාර මාර්ගයෙහි විරුඬග්‍රාහීන්ගේ විනාශය හා අවිරුඬගෘහිතවූ වූ මනුෂ්‍යයන් ස්වාස්ථ්‍යයට පැමිණිබව අපට සැඟවී තිබෙන්නේය, නුඹ වහන්සේටම ප්‍රකාශය, ස්වාමීනි, යාච්ඤා කරම්හ, පින්වත්වූ සර්වඥයන් වහන්ස ආකාශයෙහි පුන්සඳමඬල නගා පානා කලක් මෙන් (ඔසවා පෙන්වන්නාක් මෙන්) මේ කාරණය ප්‍රකාශ කොට වදාල මැනවැ”යි ආරාධනා කළාහුය.

ඉක්බිත්තෙන් බුදුහු “මා විසින් සිටාණෙනි, අප්‍රමාණ කාලයක් මුළුල්ලෙහි දස පාරමිතාවන් පුරා ලෝක වාසීන්ගේ සැක දුරු කරන පිණිසම සර්වඥතාඥනය ප්‍රතිවෙධ කරන ලද්දේය (සියල්ල දත් නුවණ හෙවත් බුදුනුවණ ලබන ලද්දේය). සිංහ තෛලයෙන් රන්නළක් (රත්රන් බටයක්) පුරවන්නාක් මෙන් සකස්කොට කන් නමා අසව”යි සිටාණන්ට සිහි උපදවා හිමගර්භයක් (වළාකුළක්) පලා පුන්සඳමඬල

පිටත්කොට පාන්නාක් මෙන් භවාන්තරයෙන් (වෙන ආත්මභාව වලින්) සැඟවුනාවූ කාරණය ප්‍රකාශ කොට වදාළසේක.

යටගිය දවස කසීරට බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් සතරසංග්‍රහ වස්තුවෙන් (දානය, ප්‍රියවචන, අර්ථචර්‍ය්‍යාව, සමානාත්මතා) ජනරඤ්ජනය කොට (මහජනයා සතුටු කොට) රාජ්‍යය කරන්නාහුය. එසමයෙහි පුරනලද බෝධිසම්භාර ඇති අප මහබෝසතාණෝ සාත්තුනායක කුලයක (ගැල්හිමි වෙළඳ පවුලක) පිළිසිඳගෙන ක්‍රමයෙන් වැඩිවිය පැමිණ පන්සියයක් ගැලින් වෙළඳාම් කොට ඇවිදිනාහුය. ඒ බෝධිසත්වයෝ කලෙක නැගෙනහිරින් බස්නාහිරට යෙති, කලෙක බස්නාහිරින් නැගෙනහිරට යෙති. එකල බරණැස් නුවර අනෙකුත් සාත්තුනායක පුත්‍රයෙක් විය. ඒතෙම අඥානය, අව්‍යක්තය (හුරුබුහුටි නැත), උපායෙහි දක්ෂ නොවෙයි.

එසමයෙහි බෝධිසත්වයෝ බරණැස් නුවරින් මාහැඟි වූ බඩු ගෙන පන්සියයක් ගැල් පුරා ගමන සරහා සිටුවූය. ඒ නුවණ නැති සාත්තුනායක පුත්‍රද එසේම පන්සියයක් ගැල් බඩු පුරා ගමනට සරහා සිටු වූයේය. බෝධිසත්වයෝ “ඉදින් මේ නුවණ නැති සාත්තුනායක පුත්‍ර තෙමෙ මා හා සමග යේනම් ගැල් දහසක් එක් මග යන්ට පටන්ගත් කළ මග නොසෑහෙන්නේය (මග ඉඩමදිවේ), මනුෂ්‍යයන්ට දර පැන් හා සරකට (හරකුන්ට) තණ නොලැබිබ හැක්කේය. මොහුවත් මාවත් පළමු කොට යාම කළ යුතුය”යි සිතා බෝධිසත්වයෝ ඒ

අඟදන වූ සාත්තුනායකයා කැඳවා මෙපවත් කියා “අප දෙදෙනා එක්ව යන්ට නොපිළිවෙන, කිමෙක්ද? තෙපි ඉදිරියෙහි යව්ද? නොහොත් පස්සෙයි යවුදැ”යි විචාළෝය. එවේලෙහිම හෙතම මෙසේ සිතී, “තමා ඉදිරියේ යන්ට වන් කල්හි බොහෝ අනුසස් වන්නේය. ගැල්සකින් නුබුන් (කරත්ත රෝදවලින් නොකැඩුනු) මගින් යෙමි, ගැල් අදින ගොන් පළමු සරක් නොකෑ තණ කති, මනුෂ්‍යයන්ට පළමු කිසිකෙනෙකුන් විසින් නොකැඩූ පලාකොල වන්නේය ප්‍රසන්න වූ පැන් වන්නේය. කැමති පරිද්දෙන් අගය තබා ගෙන බඩු විකුණමි”යි සිතා හෙතම “මම යහළුව, පළමු කොට යෙමි”යි කීහ. මහාබොධිසත්‍වයෝත් පස්සෙහි යාමෙහි බොහෝ අනුසස් දැක මෙසේ සිතූය “ඉදිරියෙහි යන්නාවූ සත්‍වයෝ මග විසම තැන සම කෙරෙති, මම ඔවුන් ගිය මගින් යෙමි, පෙරත්තුව (පළමුව) ගිය ගොන් මුහුකුරා (මොරා) තදව ගිය තණ කති, මාගේ ගොන් නැවත අටගත් මිහිරි වු ලාතණ අනුභව කෙරෙති. පළමු පලාකොළ කඩාගත් තැනින් නැගි දළු පලා මනුෂ්‍යයන්ට මිහිරි වන්නේය. පළමු පැන් නැති තැන වළ කැන පැන් උපදවති, මොවුන් කැනවූ වළවලින් අපි පැන් බොම්හ. පළමු කොට අගය තිබියේ නම් මනුෂ්‍යයන්ගේ දිවි ගැලවූවාක් (දිවි බේරාගත්තාක්) වැන්නේය, මම පස්සෙහි ගොස් මොවුන් විසින් තුබූ අගයෙන් බඩු විකුණමි”යි ඒ මහබෝසතාණෝ මෙතෙක් අනුසස් දැක “යහළුව තෙපි පළමු කොට යව්ව”යි කීවාහුය.

එකල්හි නුවණ නැති සාත්තුනායක "යහපත යහළුව"යි කියා ගැල්යොද ගෙන නික්ම ක්‍රමයෙන් මනුෂ්‍යවාසය ඉක්ම කාන්තාර මුඛයට (කාන්තාරය ඉදිරිපිටට) පැමිණියේය. එතෙම පළමුව හැම ගැල්ම මහසැළ (ලොකු හැළි) තබ්බවා පැන් පුරවා සැට යොදුන් කාන්තාර මාර්‍ගයෙහි ගමන් ගත්තේය. ඉක්බිත්තෙන් ඔහු කාන්තාර මධ්‍යයට පැමිණි කල්හි එහි අධිගෘහිත යක්‍ෂයෙක් "මේ මනුෂ්‍යන් ගෙනයන පැන් දම්මවා පියා දුර්වල කොට සියල්ලවුන් කමි"යි සිතා සර්‍වාංගයෙන් ධවලවූ (සුදේසුදු) ඇළි ගොන් දෙන්නෙකු යොදන ලද සිත්කළු යානාවක් මවාගෙන දුණුහියවුරු පළඟ ආයුධ (දුණු ර්තල දැමු කොපු පලිග යන ආයුධ) ගත් අත් ඇතිව අමුනුෂ්‍යයන් දස දොළොස් දෙනෙකු පිරිවරාගෙන ඇඹුල් උපුල් මල් පැළඳ තෙත් ඉසකේ හා තෙත් පිළි ඇතිව නායක පුරුෂයෙකු මෙන් ඒ රථයේ ඉඳ මඩ වැකී ගියාවූ රථයකින් යුක්තව පෙරමඟට ගියේය. ඔහුගේ පිරිවර අමනුශ්‍යයෝද ඉදිරියේ පස්සේ වන්නාහු තෙත් ඉසකේ හා තෙත් පිළි ඇතිව ඇඹුල උපුල් මල් පැළඳ රත්පියුම් හෙලපියුම් මිටි ගෙන නෙළුඹල සහ නෙළුඹුදැලි (නෙළුම් අල හා නෙළුම් දළු) කමින් පැන් බිඳු හා මඩ බිඳු වගුරමින් නික්මුණාහුය. යක්‍ෂයා ඉදිරියේ එන්නාවූ සාත්තුනායකයා දැක තමාගේ යනාව මගින් ඉවත්කොට "කොයි යවුදැ"යි යනාදීන් ඔහු හා සමග සුවදුක් කතා කළේය. සාත්තුනායකයාද තමාගේ යානාව මගින් ඉවත් කොට සෙසු ගැල් යන්ට මග අවසර හැර එකත්පස්ව සිට ඒ යක්‍ෂයාට මෙසේ කීය. "අපි වූ කලී

බරණැස් නුවර සිට ආම්හ, තෙපි හැම දෙන ඇඹුල උපුළ මල් පැලඳ රත්පියුම් හෙලපියුම් ගත් අත් ඇතිව නෙළුම්ල හා නෙළුඹුදැලි කමින් සකල ශරීරයෙහි මඩ වකාගෙන පිනි බිඳු වගුරවා කොයි සිට අවුද? තොපි එන මග වැසි වටද? ඇඹුල උපුල් මල් ආදියෙන් ගැවසී ගත් විල් ඇද්දැ”යි විචාළේය.

යක්‍ෂයා ඔහුගේ බස් අසා “යහළුව, තෝ කුමක් කියයිද? තෙල (අර) පෙනෙන්නේ නිල් වූ වන රේඛාවය (වනරොදය), එතැන් පටන් සියළු වනය පැනින් ගැවසී ගත්තේය, නිබඳ වැසි වස්නේය, කඳුරැලි පුරා දිය දුවන්නේය, ඒ ඒ තැන පියුමින් ගැවසී ගත් විල් හා පොකුණු වන්නේයැ”යි කියා පිළිවෙලින් යන්නාවූ ගැල්වල මනුෂ්‍යයන් අතින් “මේ ගැල කිනම් බඩුදැ?”යි විචාළේය. එකල්හි ඒ මනුෂ්‍යයෝ “අසවල් බඩු”යි කීහ. පස්සේ එන්නාවූ ගැල් ඉතා බරව එන්නේය. “ඒ ගැල්වල කුමන බඩුදැ?”යි විචාළේය. “පැන් පිරූ ගැල්” යයි කීහ. පළමු මෙතන දක්වා පැන් ගෙන ආ තොප විසින් කළසේ ඉතා යහපත් වන්නේය. මෙතැන් පටන් තොප ගෙන යන පැනින් ප්‍රයෝජන නැත. ඉදිරියේ බොහෝ පැන් ඇත, පැන් සැළවල් බිඳ පැන් දමා පියා සැපසේ යවු”යි කීයේය.

මෙසේ කියා “තෙපි යව අපට ලස් (ප්‍රමාද) වන්නේයැ”යි කියා මදතැනක් ගොස් අන්තර්ධානව (නොපෙනී ගොස්) තමාගේ යක්‍ෂ පුරයට ගියේය. ඒ අඥාන වූ සාත්තුනායකයාද තමා නුවණ නැති බැවින් යක්‍ෂයාගේ බස් ගෙන සැළවල්

බිඳුවා පැන් උලක්කුවක් විචරකුත් (බින්දුවක් පමණවත්) නොතිබා සියළු පැන් දම්මවා ගැල් පමණක් පදවාගෙන නික්මුනේය. ඉදිරියේ ස්වල්ප මාත්‍රයකුත් පැන් නොවිය. මනුෂ්‍යයෝ පැන් නොලැබ මිරිකී ගියාහු (විඩාවට පත්වූවාහු), සවස්වන තුරු ගොස් ගැල් වලල්ලෙහි සිටුවා (ගැල් රවුමට නවත්වා) ගොන් ගැල්සක (කරත්ත රෝදවල) බැඳ සිටවූය. සරකුන්ට බොන්නටවත් මනුෂ්‍යයන්ට බත් පිසන්නටවත් පැනක් නැති විය. පැන් නොළැබ මිරිකී ගියාහු මනුෂ්‍යයෝ ඒ ඒ තැන වැදහෙව නිදන්නට පටන්ගත්තාහුය. රාත්‍රි භාගයෙහි යක්‍ෂයෝ යක්‍ෂ පුරයෙන් අවුත් සරක් හා මනුෂ්‍යයන් මරා මස් අනුභව කොට ඇට පමණක් තබා ගියාහුය. මෙසේ ඒ නුවණ නැති සාත්තුනායකයා නිසා සියළු සත්වයෝ විනාශයට පැමිණියාහුය. අත් ඇට ආදිය ඒ ඒ අත විසිරී ගියේය. පන්සියයක් ගැල් බඩු පිරුවනින්ම (පිරුණු ගමන් ම) තිබුයේය.

මහාබෝධිසත්වයෝද නුවණ නැති සාත්තුනායකයා ගිය මසක් යෙළමසක් (මාසයක් හමාරක්) ඉක්මවා පන්සියක් ගැල්වල බඩු පටවාගෙන නුවරින් නික්ම ක්‍රමයෙන් පැන් නැති අමනුෂ්‍ය වාසවූ කාන්තාර මුඛයට පැමිණියෝය. මෙසේ පැමිණියාවූ මහාබෝධිසත්වයෝ එතැන්හිදි මහ සැළවල පැන් පුරවා බොහෝ පැන් ගෙන තමන් හා කැටිව යන මිනිසුන් කැඳවා කඳවුරු බැඳගෙන උන් තැන බෙරපියවි කරවා (අණබෙර ගස්වා) මනුෂයන් රැස් කොට මෙසේ කිවුය. “මා නොවිචාරා පැන් පතක් විචරකුත් ප්‍රයෝජන නොවිඳුව, මේ කතරමග විෂවෘක්‍ෂයෝ ඇත්තාහ. ඒහෙයින් පෙර නොකෑවිරූ

පළාකොලක් මලක් ඵලාඵලයක් මා නොවිචාරා නොකව”යි මෙසේ මනුෂ්‍යයන්ට අවවාද කොට බඩු පැටවූ පන්සියයක් ගැල් හා සමග අමුනුෂ්‍යාධිගෘහිතවූ නිරුදක (ජලය නැති) කාන්තාරයට පැමිණියෝය. ඒ මහබෝසතාණෝ කාන්තාර මධ්‍යයට පැමිණි කල්හි ඒ යක්‍ෂතෙම පළමු පරිද්දෙන්ම බෝධිසත්වයන් එන පෙරමග තමා දක්වා සිටියේය. බෝධිසත්වයෝ ඔහු දැකලාම දැනගත්තුය. “මේ කාන්තාරයෙහි පැන් නැති හෙයින් නිරුදක කාන්තාර යැයි මේ කාන්තාරයට නමක් වන්නේය, මේතෙම නිර්භීතය, රත්වූ ඇස් ඇත්තේය, මොහුගේ ඡායාවත් නොපෙනෙන්නේය, ඒකාන්තයෙන්ම මොහු විසින් පළමු කොට ගිය නුවණ නැති සාත්තුනායකයා ඔහුගේ පජීත් (පිරිස) හා සමග ගැල් වල පිරවූ පැන් දම්මවා ක්ලාන්ත කොට කන ලද්දේ වන්නේය. මාගේ වූ කලි නුවණැති බව හා උපායෙහි දක්‍ෂ බව මොහු නොදනිති යි සිතමි”යි සිතා ඉක්බිත්තෙන් ඕ හට මෙසේ කිවුය. “තෙපි හැමදෙන පලායවු, අපි හැම වෙළඳු නම් අනික් පැනක් නොදැක ඇරගත් පැන් නොදම්හ, පැන් දුටු තැනදී පැන් දමා පියා ගැල් සැහැල්ලු කොට ගෙන යම්හ”යි කිවුය. යක්‍ෂයා මඳ තැනක් ගොස් අන්තර්ධානව තමාගේ යක්‍ෂ පුරයටම ගියේය. යක්‍ෂයා ගිය කල්හි මනුෂ්‍යයෝ බෝධිසත්වයන්ට මෙසේ කිවුය.

“ස්වාමීනි, මේ මනුෂ්‍යයෝ මේ නිල් වූ වනරේඛාව පෙනෙන්නේය, එතැන් පටන් නිබඳ වැසි වස්නේයැ යි කියා ඇඹුල උපුලමල් පැළඳ රත්පියුම් හෙලපියුම් මිටිගෙන

නෙළුම්බල හා නෙළුම්දැලි කමින් නෙත් පිළි හැඳ නෙත් වූ හිසකේ හැරගෙන ආවාහුය. එසේ හෙයින් අප හැම ගෙනයන පැන් දමාපියා ගැල් සැහැල්ලු කොට ගෙන වහා පලායම්හ''යි කිවුය.

බෝධිසත්‍වයෝ ඒ මිනිස්සුන් කී බස් අසා ගැල් රඳවලා සියළු මනුෂ්‍යයන් රැස් කොට "තොප විසින් මේ කාන්තාර මාර්ගයෙහි විලෙක්වත් පොකුණෙක්වත් ඇතැයි කිසි කෙනෙකුගෙන් ඇසූවිරූ ඇද්දැ?''යි විචාලෝය. "ස්වාමීනි, ඇසූවිරූ නැත, මේ තෙම නිරුදක කාන්තාරය වේදැ''යි ඒ මනුෂ්‍යයෝ කිවුය. එකල්හි බෝධි සත්‍වයෝ කියන්නාහු, "මේ අප දුටු මනුෂ්‍යයන්ගෙන් සමහර කෙනෙක් නිල් වූ වනරොදින් එපිට වැසි වස්නේයයි කිවිය. වැසි සුළඟ නම් කෙතෙක් තැන් හමාදැ''යි විචාලෝය. "ස්වාමීනි, යොදුනක් පමණ තැන් හමන්නේ වේදැ''යි කිවුය. "කිමෙක්ද, තොප හැම දෙනා අතුරින් එක් කෙනෙකුගෙත් ඇඟ වැසි සුළඟෙක් වැදගත්දැ?''යි විචාළෝය. "නැත ස්වාමීනි'' කිහ. "මේඝශීර්ෂ (වැහිවළාකුල්) නම් කොපමණකදී පෙනේදැ?''යි විචාළෝය. "යොදුනක් පමණ තැන් පටන් පෙනෙන්නේ වේද ස්වාමීනි''යි කිවුය. "තොප ඇමගෙන් කිසි කෙනෙකුන් විසිනුත් එක වැසි වළාකුලකුත් දුටුවේ ඇද්දැ?''යි විචාළෝය. "නැත ස්වාමීනි''යි කීහ. "විදුලිය නම් කෙතැන් පටන් පෙනේදැ?''යි විචාළෝය. "සතර පස් යොදුනක් පටන් පෙනෙන්නේ වේද ස්වාමීනි''යි කිවුය. "තොප ඇමදෙනාගෙන් කිසි කෙනෙකුන් විසින් විදුලි ආලෝකයක් දක්නා ලද්දේදැ?''යි විචාළෝය. "නැත ස්වාමීනි,

විදුලි ආලෝකයක් නොදුටුම්හ”යි කීහ. “මේඝධ්වනිය (අහස ගොරවන හඬ) නම් කොතෙක් තැන් පටන් ඇසේදැ?”යි විචාළෝය. “එක් යොදුනක් මත්තේ පටන් ඇසෙන්නේ වේදැයි ස්වාමීනි” කිවුය. “කිමෙක්ද, තොප ඇමදෙනාගෙන් කිසි කෙනෙකුන් විසින් විදුලි ආලෝකයක්, වැසි ගර්ජ්ජනාවක් කරන්නා ඇසුවෝ ඇද්දැ?”යි විචාළෝය. “නැත ස්වාමීනි, අකුණු ගසන හඬක් නොඇසුම්හ”යි කීහ.

එකල්හි අප මහබෝසතාණෝ කියන්නාහු “එම්බා පින්වන්ති, මොහු මනුෂ්‍යයෝ නොවෙති යි යක්‍ෂයෝය, මොහු අප හැම ගෙන යන පැන් දම්මවා පියා දුර්වලකොට කම්හයි ආවාවූ යක්‍ෂකෙනෙක් වෙති. ඉදිරියේ ගිය නුවණ නැති සාත්තුනායක පුත්‍රයා උපාය දැක්මෙහි අදක්‍ෂය. ඒකාන්තයෙන්ම එතෙම මොහු විසින් පැන් දම්මවා මිරිකා දුර්වල කොට කන ලද්දේ වන්නේය, පන්සියයක් ගැල් බඩු පිරුවණින්ම තිබෙන්නේ වේදැ යි අපි එම බඩුපිරූ ගැල් දකුම්හ. එසේ හෙයින් පැන් උලක්කුවක් විචරකුත් නොදමා වහවහා ගැල් පදුව”යි කියා ගැල් පදවාගෙන නික්මුණාහුය.

මහාබෝධිසත්වයෝ යමින් සිට බඩු පිරුවණින්ම තිබූ ගැල් දැක පන්සියයක් ගැල් හා ගොන් හා මිනිසුන්ගේ අත් පා ඇට ආදිය ඒ ඒ තැන විසිර තිබුවා දැක ගැල් මුදවා ගැල් වලල්ලෙන් කඳවුරු බඳවා වේලාසනම මනුෂ්‍යයන් හා ගොන්ද බත් හා තණ කවා මනුෂ්‍යයන් මධ්‍යයේ ගෙරි කැටිකොට වැදහොවා තුමූ ශක්තිසම්පන්න ප්‍රධාන පුරුෂයන් ගෙන

කඩුගත් අත් ඇතිව තුන්යම් රාත්‍රියෙහි රැකවල් ගෙන සිටිසේ සිටම අරුණු නැගුය (සිටි පරිද්දෙන් එළිවෙතුරු සිටියේය). දෙවන දවස් උදෑසනම සියළු කටයුතු සපයාගෙන ගොන් තණ ආදිය කවා ගෙන මාළුගැල් (පරණ කරත්ත) දමා තරගැල් (සවිමත් කරත්ත) ගෙන මඳ මිළ ඇති බඩු දම්මවා බොහෝ මිල ඇති බඩු නංවාගෙන මහබෝසතානෝ තමන් වෙළඳම් කරන්නට යන්ට සිතූ නෙතටම ගොස් දියුණු තියුණු (දෙගුණ තෙගුණ) මිළයෙන් බඩු විකොට සියළු පඤ්ත් ගෙන නැවත තමන්ගේ නුවරටම ආවාහුය.

ශාස්තෘ වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මේ කතාව ගෙනහැර දක්වා වදාරා “මහසිටාණෙනි, මෙසේ පෙර විරුද්ධග්‍රාහය ගත්තෝ මහා විනාශයට පැමිණියෝය. අවිරුද්ධග්‍රාහය ගත්තාවූ නුවණැත්තෝ අමනුෂ්‍යයන් අතින් මිදී සැපසේ කැමති තැනට ගොස් අභිමතාර්ථය (බලාපොරොත්තුවූ කරුණ) සිද්ධකොට ගෙන පෙරලා තමන් වසන නෙතට සැපසේ පැමිණියෝ වේදැ”යි පූර්වාපරසන්ධි ගැලපීම් වශයෙන් අතීත කථාවත් වර්තමාන කථාවත් වදාරා මත්තෙහි ‘අපණ්ණක ජාතක’ ධර්මදේශනාව කොට වදාරණ සේක :-

“අපණ්ණකං ඨානමෙකෙ - දුතියං ආහු තක්කිකා”
“ඒතදඤ්ඤාය මෙධාවී - තං ගණ්හෙ යදපණ්ණකං”

(ඇතැම් පණ්ඩිත මිනිස්සු ඒකාන්තවූ අවිරුද්ධවූ නෛර්‍ය්‍යානික කාරණය මැනවැයි පිළිගත්තාහුය. තෙත් ඉසකේ හා පිළි ආදිය දැක වනරොදෙහි ජලය තිබිය යුතුය, තෙත් ඉසකේ හා පිළි ආදිය දක්නට ලැබුණු බැවිනියි තර්කය උසස් ලෙස පිළිගත් නුවණ නැත්තෝ දෙවැනිවූ සපණ්ණක ප්‍රතිපදාව මැනවයි කීහ. නුවණැතියා මේ බව දැන යමක් අපණ්ණක නම් එය නිවැරදියයි පිළිගත යුතුයි) මේ ගාථාව වදාළසේක.

මෙහි අපණ්ණක පටිපදාව නම් රත්නත්‍රය සරණයාම, පඤ්චශීලය හා දසශීලය රක්‍ෂා කිරීමය, ප්‍රාතිමෝක්ෂ සංවරශීලය (භික්ෂු භික්ෂුණීන් උදෙසා පණවන ලද විනයපිටකයෙහි සඳහන් චාරිත්‍රවාරිත්‍ර වශයෙන් භේදවූ ශික්ෂාපද පිරීමෙන් ඇතිකරගන්නා ශීලය), ඉන්ද්‍රිය සංවර ශීලය, ආජීවපාරිසුධ ශීලය (නිවැරදි ජීවිකාවෘත්තිය නිසා ඇති කරගන්නා ශීලය), ප්‍රත්‍යසන්නිශ්‍රිත ශීලය (සිවුපසය සිහි නුවණින් යුතුව පරිභෝග කිරීමෙන් ඇතිකරගන්නා ශීලය) යන සියළුම සිල් පිරිසිදුව සිල් නොකිලිටි කොට රැකීමය. චක්ෂුරාදි පඤ්චේන්ද්‍රියයන් වසඟ කොට වසන බවය, භෝජනයෙහි පමණ දක්නා බව, නිදි වර්ජිත කිරීමය (රාත්‍රිකලයේ තුන්යම අතුරින් පළමුවන තෙවන යාමදෙක්හිදී බවුන් වැඩීමාදියෙහි යෙදී දෙවනයාමයේදී නිදාගැනීම), පඤ්චවිධ ධ්‍යානය ඉපිදවීමය, විදර්ශනා (ත්‍රිලක්ෂණ) භාවනා කිරීමය, පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති ඉපිදවීමය, ශ්‍රොතාපත්‍යාදිවූ සතර ආර්‍ය්‍යමාර්ගය හා සතර ආර්‍ය්‍යඵලය ඉපදවීම යන මේ සියල්ල අපණ්ණක පටිපදා නම් වේ,

නිර්‍වාණගාමිනිවූ (නිවනට යත හැකි) ප්‍රතිපත්තිය නම් වෙයි, සර්‍වඥ ශාසනයට අවිරුධ ප්‍රතිපත්තිය නම් වෙයි.

මෙහි ‘සපණ්ණක පටිපදා’ යන අන්‍ය ලබ්ධි ගැන්මය, දස අකුසලකර්‍මයෙහි හැසිරීමය, නුසුදුසු වූ කායවාක්සමාචාරයෙහි (කායික හා වාචසික ක්‍රියාවල) යෙදීමය යන මේ සියල්ල වන්නේය. මේ විරුද්ධ ප්‍රතිපදාව සතර අපායෙහි හා පඤ්චවිධ නීචකුලයෙහි උපදවා මහා දුක් දෙන්නේය. තවද මේ අවිරුධ වූ ඒකාන්ත කාරණාවූ මේ අවිරුද්ධ ප්‍රතිපත්තියෙහිම සිට සර්‍වඥවරයෝ දෘඪ වීර්‍ය්‍යයෙන් පාරමිතාවන් පුරා බෝධිද්‍රැම සමීපයෙහි (බෝරුක්මුල) ඉඳ සම්‍යක් සම්බෝධිඥාණය සමධිගමය කරන්නාහුය (ලබා ගන්නාහුය). පසේබුදුවරයෝ ප්‍රත්‍යෙකබෝධිඥාණය සමධිගමය කෙරෙති. බුද්ධපුත්‍රවූ ශ්‍රාවකයෝ ශ්‍රාවක පාරමිතාඥාණය ප්‍රතිවෙධය කෙරෙති.

මෙසේ භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ ඒ උපාසකවරුන්ට ත්‍රිවිධකුශල සම්පත්තීන් හා දිව්‍යබ්‍රහ්ම සම්පත්තීන් දක්වා කෙලවර මේ ‘අපණ්ණක පටිපදාව’ අර්‍හත් මාර්‍ගයට පමුණුවා නිර්‍වාණසම්පත්තිය සාදාදී ලන්නේයැ යි කියා අනේපිඩු මහසිටාණන් ප්‍රධානකොට ඇති පන්සියයක් උපාසකවරුන්ට මේ ‘අපණ්ණක ධර්‍මදේශනාව’ දක්වා මත්තෙහි චතුරාර්‍ය්‍යසත්‍යය සොළොස් ආකාරයකින් ප්‍රකාශ කොට වදාළසේක.

මේ චතුස්සත්‍ය ධර්‍මදේශනාවගේ කෙළවර ඒ සියළු පන්සියයක් උපාසකවරු යෙළ දහසක් (එක්දහස් පන්සියයක්) කෙළසුන් නසා දහසක් නයින් ප්‍රතිමණ්ඩිතවූ (සැරසුණු) සෝවාන් ඵලයෙහි පිහිටියාහුය. බුදුරජාණන් වහන්සේ මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා වදාරා මේ ‘අපණ්ණක ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි අඥාන වූ සාත්තුනායක පුත්‍ර නම් දැන් මේ දේවදත්ත ස්ථවිරයෝය. ඔහුගේ පර්‍ෂද (පිරිස) නම් මේ දේවදත්ත පර්‍ෂද වන්නේය. එසමයෙහි නුවණැති සාත්තුනායකයාගේ පර්‍ෂද නම් දැන් බුදු පිරිස් වන්නාහුය. එසමයෙහි නුවණැති සාත්තුනායක පුත්‍ර නම් තිලෝගුරු සම්‍යක්සම්බුදු රජු වූ මම්ම වේදැ”යි තමන් වහන්සේ දක්වා වදාළසේකි.

## 002. වණ්ණුපථ ජාතකය

තවද එක් සමයෙක්හි බුදුහු දෙව්රම් වෙහෙරහි වැඩවසනසේක් භාවනා කිරීමෙහි හරනලද වීර්‍ය්‍ය ඇති භික්‍ෂුකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ කෙසේද යත්?

බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර වසන කල්හි එම නුවර වසන්නා වූ එක් කුලපුත්‍රයෙක් ජේතවනාරාමයට ගොස් බුදුන්රදුන්ගෙන් බණ අසා රත්නත්‍රයෙහි ප්‍රසන්න වූ සිත් ඇතිව කාමයෙහි ආදීනව (පස්කම් සැපතෙහි දෙස්) හා ප්‍රව්‍රජ්‍යාවෙහි

(මහණකමෙහි) අනුසස් අසා මහණව උපසම්පදා පස්වසක් ඇතුළත උභයමාතෘකාව වනපොත්කොට (භික්ෂු භික්ෂුණී දෙපක්ෂය සඳහා පණවන ලද ප්‍රතිමෝක්ෂ ශික්ෂාපද දෙකොටස කටපාඩම් කර) ශික්ෂාපද ඉගෙන භාවනා මාර්ගයත් ඉගෙන සර්වඥයන් සමීපයේදී තමන් වහන්සේට අභිප්‍රායවූ (රුචිවූ) කර්මස්ථානයක් (සමසතළිස් භාවනා අරමුණුවලින් එකක්) ගෙන උදකලාව වාසය කැමතිව වලට (වනයට) වැද වනයෙහි සැදැහැ ඇති උපාසකවරුන් විසින් කරවා පිළිගන්වන ලද පන්සලක වස් වැස, වස් තුන්මස මුළුල්ලෙහි මාර්ගඵල උපදවන්නට උත්සාහ කරණ සේක්, විදර්ශනාලොකයක් (විදර්ශනා භාවනාව කරගෙන යන විට සිතට දැනෙන ආලෝක ස්වභාවයක්) වේවයි ප්‍රතිභාග නිමිත්තක් (සමථ භාවනාවේදී භාවනා අරමුණ, වැහිවළාකුළක් ඉදිරියෙහි වූ කොකෙකු පැහැදිළිව පෙනෙන්නා සේ පැහැදිළිව සිතට වැටහීම) වේවයි උපදවගත නොහී මෙසේ සිතූසේක. "සර්වඥයන් වහන්සේ විසින් පුද්ගලයෝ සතර දෙනෙක් (උග්ඝටිතඥ්ඥ, විපච්තඥ්ඥ, නෙය්‍ය, පදපරම) වදාරණ ලද, මොවුන් සතර දෙන අතුරෙන් මා පදපරම වන්ට කාරණ වන්නේය. මට මේ ආත්ම භාවයෙහි මාර්ගයෙක්වත් ඵලයෙක්වත් නැතැයි සිතමි. එසේ හෙයින් මේ වනයෙහි වැස කුමක් කෙරෙම්ද? සර්වඥයන්වහන්සේ සමීපයට ගොස් රූපාග්‍රප්‍රාප්තවූ (රුවින් අගතැන්පත්වූ) බුදුන්ගේ ශරීරය බල බලා මිහිරිවූ බණ අසමින් විසුයෙම් වීම් නම් යහපත් වන්නේය"යි සිතා නැවත ජේතවනාරාමයට වැඩි සේක.

උන් වහන්සේ දැක සන්දෘෂ්ට සම්භක්ත (වරක් දැකීම් පමණින් හා කලක් ආශ්‍රය කිරීමෙන්) භික්ෂූහු මෙසේ කිවූහ. “ඇවැත්නි, තෙපි ලොව්තුරා බුදුන්ගෙන් කමටහන් ගෙන මහණදම් කෙරෙමි යි ගිවිස දැන් වූ කලී වලින් අවුත් ගණසඞගණිකායෙහි (සමූහ වාසයෙහි) ඇලී වාසය කරව. කිමෙක්ද? තොපගේ ප්‍රව්‍රජ්‍යාකෘත්‍යය (රහත්බව ලැබීම) මුදුන් පැමිණියේද? පුනරුත්පත්තියක් නැතුව අභීත් ඵලශ්‍ඥානය ප්‍රතිවේධ කළාදැ?”යි කීහ. “ඇවැත්නි, මම මාර්‍ගයක්වත් ඵලයක්වත් නොලැබ මා අභව්‍ය පුද්ගලයෙක් විය යුතුයැයි සිතා වීර්‍ය්‍යී හැර ආමි”යි කීසේක. එකල්හි භික්ෂූන් වහන්සේ කියන සේක් “ඇවැත්නි, දෘඪවීර්‍ය්‍යී ඇති සර්‍වඥයන් වහන්සේගේ සාසනයෙහි මහණව භාවනාකොට මාර්‍ගඵල ඉපදවීමෙහි වීර්‍ය්‍යී අළුවාවූ (අත්හළ), තොප විසින් අකාරියක්ම (නොකටයුත්තක්ම) කරන ලද, අප හා කැටිව එව, සර්‍වඥයන් වහන්සේ සමීපයට යම්හ”යි කියා ඒ භික්ෂුව කැඳවාගෙන බුදුන් සමීපයට ගිය සේක.

සර්‍වඥයන් වහන්සේ භික්ෂුහු දැක “මහණෙනි, තෙපි මේ භික්ෂුව නොකැමැති පරිද්දෙන් කැඳවා ගෙන කුමක් පිණිස අවුද? මොහු විසින් කවර අපරාධයක් කරන ලදදැ”යි විචාරා වදාළසේක. එකල්හි භික්ෂූන් වහන්සේ දක්වනසේක් “ස්වාමීනි, මේ මහණ මෙබඳු නෛර්‍ය්‍යාණික (නිවනට පමුණුවන) ශාසනයෙහි මහණව මහණධම් කරන්නේ වීර්‍ය්‍යී ඇර ආයේය”යි දැක්වූසේක. එකල්හි සර්වඥයන් වහන්සේ “සැබැ මහණ, තා වීර්‍ය්‍යී හළුයෙහිදැ?”යි වදාරා “සැබැව ස්වාමීනි”යි

දැන් වූ කල්හි "කිමෙක්ද මහණ තෝ මෙබඳු ශාසනයෙහි මහණව අල්පේච්ඡසේක (අවශ්‍යතා අඩු කෙනෙක් වනසේක), සනතුෂ්ටසේක (ලද පමණින් සතුටුවන්නෙක් වනසේක), කුලෙහි ගෙණෙහි නොඇලෙන සේක (සෙසු අය සමඟ ප්‍රමාණය ඉක්මවා සබඳකම් පවතන කෙනෙක් නොවනසේක), වඩන ලද වීර්‍ය්‍යී ඇති සේකැ"යි මෙසේ තමා ප්‍රසිද්ධ නොකොට (භික්ෂූන් අතර ප්‍රසිද්ධවීම අත්හැර දමා), මේ මහණ හරාන ලද වීර්‍ය්‍යී ඇත්තේයැ යි කුමක් පිණිස ප්‍රකාශ කරවූයෙහිද? මහණ තෝ පෙර වීර්‍ය්‍යීවත්වූයේ නොවේද? තා එකතැනැත්තවු කල වීර්‍ය්‍යී නිසා මරුකතර (වැලි කාන්තාරයෙහි) පන්සියයක් ගැල්වල ඒ මිනිසුන් හා ගොන් පැන් ලැබ ස්වාස්ථ්‍යයට (සුවපත් බවට) පැමිණියෝ නොවේද? දැන් තෝ කවර කාරණයෙකින් වීර්‍ය්‍යී ඇරපුයෙහි වේදැ?යි වදාළසේක. එකල්හි ඒ මහණ මෙපමණ බසකින් උපස්ථම්භ (පිටුබල) ලද්දේ විය. ඒ කථාව අසා භික්ෂූන් වහන්සේ බුදුන්ට යාඥාකරණ සේක් "ස්වමීනි, දැන් මේ භික්ෂුහු විසින් වීර්‍ය්‍යී හළ බව අප ඇමට ප්‍රකාශය (පැහැදිලිය), අතීතයෙහි මොහු තනි තැනැත්තවුන්ගේ වීර්‍ය්‍යී නිසා මරුකතර ගොන් හා මිනිසුන් පැන් ලැබ ස්වාස්ථ්‍යයට පැමිණි බව භවයෙන් පටිච්ඡින්න (වැසුනු) හෙයින් අපට අප්‍රකාශය, නුඹ වහන්සේගේ සර්‍වඥතා ඥාණයටම ප්‍රකාශය, අපටත් ඒ කාරණය ප්‍රකාශකොට වදාළ මැනවැ"යි ආරාධනා කළ සේක. එකල්හි සර්‍වඥයන් වහන්සේ "එසේ වීනම් මහණෙනි, අසව්ය"යි කියා ඒ භික්ෂූන්ට සිහි උපදවා භවාන්තරයෙන් සැඟවුනාවූ කාරණය ප්‍රකාශ කොට වදාළසේක.

යටගිය දවස කසීරට බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහබෝසතාණෝ සාත්තුනායක කුලයෙහි පිළිසිඳගෙන වැඩිවිය පැමිණ පන්සියයක් ගැලින් වෙළඳාම් කොට ඇවිදිනාහුය. මෙසේ වෙළඳාම් කොට ඇවිදිනාහු මහබෝධිසත්වයෝ එක් කලක මරුකතරට පැමිණියාහුය. ඒ වාලුකා කාන්තාරයෙහි වැලි ඉතා සියුම් වන්නේය. මිටින්ගත් වැලි මිට නොසිටින්නේය. හිරු නැඟි වේලෙහි පටන් කිහිරඟුරු රැසක් මෙන් (දැවූ කිහිරි දරවල අඟුරු ගොඩක් මෙන්) කකියන්නේය (දැඩි තාපයෙන් යුක්තය). පයින් වැලි මැඩගෙන (පාගාගෙන) යන්ට නොපිළිවන. එසේ හෙයින් ඒ වාලුකා කාන්තාරයෙහි යන්නා වූ සත්වයෝ දර පැන් තෙල් සහල් ආදිය ගැලින් අරගෙන රාත්‍රියෙහි ගොස් අරුණ නැගුණ වේලෙහි ගැල් මුදා ගැල් වටවලල්ලෙහි සිටුවා මුදුනෙහි කොළමඩු ඉදිකොට වේලාපසම කාබී ඇකිල (විවේක ගෙන) මණ්ඩපඡායාවෙහි (මඩු සෙවනෙහි) ඉඳ දවස් යවා (දවල් කාලය ගෙවා) ඉර බැස ගිය කල්හි රාත්‍රි භොජනය අනුභවකොට බිම සීතලව ගිය කල්හි ගැල් යොදාගෙන යන්නාහුය. සමුද්‍ර යාත්‍රාවක් (මූදු ගමනක්) හා සමාන වූ ගමන් වන්නේය. ගැල් පදවාගෙන යන ප්‍රධාන පුරුෂ තෙමේ ‘ගොඩ නියමුවාය’යි නම් ලබන්ට සුදුසු වන්නේය. එසේ හෙයින් තරු සලකුණින් ගැල්සාත්තු (ගැල් කණ්ඩායම) පදවාගෙන යන්නේය. අප මහබෝසතාණෝද එකල්හි මේ ක්‍රමයෙන් ඒ මරුකතර යන්නාහු, එකුන්සැට (පනස්නව) යොදුනක් ගොස් දැන් එක රාත්‍රියකින්ම මරුකතර

ගෙවා ක්ෂෙමභූමියට (නිර්භය ස්ථානයට) පැමිණීම වන්නේයයි කිය හැකි අවස්ථාවෙහි සවස බත් අනුභවකොට සියළු දර පැන් නිමවා ගැල් යොදාගෙන නික්මුනාහුය.

නියාමක (මග පෙන්වන) පුරුෂයාණෝ ඉදිරියේ යන ගැල දික්සගලා පුටුවක් (භාන්සි පුටුවක්) අතුරුවා ගෙන ආකාශයෙහි තරු සලකුණු බලමින් "ගැල් මෙසේ පදුව මෙසේ පදුව"යි කිය කියා වැදහොත් තැනැත්තෝ බොහෝ කලක් නොනිදූ බැවින් නින්දෙන් මිරිකී (නිදිබරව) නිඳන්ට පටන් ගත්තාහුය. එකල්හි ගොන් කරකැවී ආපස්සේ (ආපසු) නික්මුණු බව නොදත්තාහුය. ගැල් අදනා ගොන් සකල රාත්‍රියෙහි අවුත් පළමු දවස් ලැගිතැනටම පැමිණියාහුය. සාත්තුනායක තෙමේ අරුණු නැගෙන වේලෙහි පිබිද නැකත් තරු බලා "ගැල් රඳව, රඳව"යි කීයේය. මෙසේ කියා ගැල් කරකවා පිළිවෙළින් සිටුවමින් සිටියදීම අරුණු නැංගේය. මනුෂයෝ කියන්නාහු "මේ අපගේ කඳවුරු බැඳ උන් තැනය. අපගේ දර පැනුත් නිමවා ගියේය. දැන් නටුවමෝදැ"යි (නැසුනොවෙමු නේදැයි) කියා ගැල් මුදා ගැල් වටවළල්ලෙහි සිටුවා මුදුනේ මණ්ඩපයක් කොට තමතමන්ගේ ගැල්යට සෝක ගෙන උන්නාහුය.

එවෙලෙහි අප මහබෝසතාණෝ "මා වියඹී ඇරපුවොත් සියල්ලෝම නසිති"යි සිතා උදෑසන සිසිල් වේලේම ඇවිදිනා තැනැත්තෝ එක් ඊතණ පඳුරක් දැක "මේ තණ පඳුරට දිය උරමින් නැංගේවනැ"යි සිතා උදැල්ලක් ගෙන්වා ගෙන ඒ

ර්තණ පඳුර තිබු තැන කණින්ට පටන්ගෙන සැට රියනක් පමණ තැන කැණාපූය. මෙතෙක් තැන් කැණ නැවතත් පල්ලේ කණුම්හ යි උදුළු එළන්නාවු (උදළුවලින් කොටන්නාවූ) මනුෂ්‍යන්ගේ උදළු යට ගලතල මත්තේ වැදගන්නට පටන්ගත් කල්හි ඇමදෙන අවීරියව ගියහ. බෝධිසත්වයෝ වනාහී "මේ ගල තලින් යට පැන් විය යුතුය"යි සිතා ළිඳට බැස ගලතලමත්තෙහි සිට නැමී තුමූ දිය යන අඬ පරීක්‍ෂා කරන්නෝ ගලතල යටින් දිය යන අඬ අසා ළිදෙන් ගොඩ නැගී තමන්ගේ අතවැසි පුරුෂයාට මෙසේ කිවුය. "දරුව, තොප අවීරියව ගියෝත් අප සියල්ලෝම නසුම්හ, එසේ හෙයින් තොපි අවීරිය නොවී පසු නොබැස වීය්ඝී වඩා මේ යකුළ (කුළුගෙඩිය) ගෙන ළිඳට බැස මේ ගලතලමත්තෙහි කුළු ගණනක් (කුළු පහරවල් කීපයක්) එලාපියව"යි කිවුය.

ඒ අසා අතවැසි පුරුෂයා මහබෝසතාණන්ගේ වචනය පිළිගෙන ඇම දෙන වීය්ඝී තබා පියා සිටි කල්හි තෙමේ වීය්ඝී නොහැර ළිඳට බැස ගලතල මත්තෙහි යකුලු ගණනක් එලාපුයේය. එකල්හි ගලතල මධ්‍යයෙන් බිඳී යට* (*දියට) වැටී අවිච්ජින්නව (නොකඩවා) පවත්නා වූ ජල ප්‍රවාහය (දිය පහර) ඇස්වාගෙන සිටියේය (වළක්වාගෙන සිටියේය). නාඹතල්කඳක්සා (නාඹර තල් කඳක් පමණවූ) දිය කඳක් උඩ පැනනැංගේය. එකල්හි සියළු මනුෂ්‍යයෝ පැන් බී ජලස්නානය කොට ඉතිරිව තිබු ගැල්සක් (කරත්ත රෝද) ආදිය පලා කැඳ බත් ආදිය පිස අනුභවකොට ගොනුන් පැන් පොවා තණ ආදිය කවාගෙන ඉරබට වේලෙහි ළිඳ සමීපයෙහි

ධජයක් බැඳ මරුකතර ගෙවා තමන් විසින් කැමතිවන ලද්දවූ ස්ථානයටම ගියාහුය.

ඒ මනුෂ්‍යයෝ තමන් අභිප්‍රාය ස්ථානයෙහිදී බඩු විකොට එකට දෙක හා එකට සතර නියායෙන් දෙදියුණු සතර දියුණු ලාභ ලැබ තමන් පළමු වසන්නාවූ ස්ථානයටම පෙරලා ආවාහුය. ඒ හැම මනුෂ්‍යයෝ එහි වසන්නාවූ ආයුපමණින් සිට කම්වූ (කල කුසලාකුසල අනුව) පරිද්දෙන් මිය පරලොව ගියාහුය. මහබෝසතාණෝද දනාදී වූ පින්කම්කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහුය. තිලෝගුරු සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදරා තවද මත්තෙහි ඒ භික්ෂූන් වහන්සේට ධර්මදේශනා කරනසේක් “යම්සේ වෙළඳුන් නොකුසීතව මරුකතර ළින් බිඳ පැන් ලද්දාහුද, එපරිද්දෙන්ම මේ සර්වඥ ශාසනයෙහි මහණව නුකුසීතව වීර්‍ය්‍ය කරන්නාවූ නුවණැති මහණතෙමේ ධ්‍යාන විමොක්ෂ මාර්ගඵලාදිවූ ප්‍රභේද ඇති ළය සැනහීම ලබන්නේය (ධ්‍යානාදිය උපදවා ගැනීම නිසා සිත් සැනසීම ලබාගන්නේය). මහණ තෝ පෙර පැන් පමණක් නිසා වීර්‍ය්‍ය කොට දැන් මෙබඳුවූ නෛර්‍ය්‍යාණික ශාසනයෙහි මහණව මාර්ගඵලයට පැමිණීමෙහි කවර කාරණයකින් වීර්‍ය්‍ය ඇරපුයෙහිදැ?”යි මෙසේ නැවතත් ධර්මදේශනා කොට ‘දුක්ඛ, සමුදය, නිරොධ, මාර්ගය’යි කියන ලද චතුරාර්‍ය්‍ය සත්‍යය ප්‍රකාශ කොට වදාළසේක. චතුස්සත්‍ය ධර්මදේශනාවගේ කෙළවර පසුබට වීර්‍ය්‍ය ඇති භික්ෂූන් වහන්සේ අර්හත් ඵලයෙහි පිහිටි සේක. ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ අතීත කතාවත් වර්ත්තමාන කථාවත්

දෙක එක් කොට අනුසන්ධි ගලපා මේ ‘වන්ණුපථ ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි නුපසුබට වීය්‍යී ඇති ගලතල බිඳ මහජනයාට පැන් ලබාදුන් අතවැසි පුරුෂයා නම් දැන් මේ පසුබට වීය්‍යී ඇති මහණ වන්නේය. එසමයෙහි මරුකතර ගියා වූ සෙසු පෂීද් නම් දැන් මේ බුදුපිරිස් වන්නාහ. එසමයෙහි සාත්තුනායක පුත්‍ර නම් දැන් තිලෝගුරු සම්‍යයක් සම්බුදුරජ වූ මම ම වේදැ”යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 003. සේරිවාණිජ ජාතකය

තවද එක් සමයෙක් හි සකලගුණනිධානවූ (සියළු ගුණ නිධන්කළ තැනක් බඳුවූ) තිලෝගුරු බුදුරජාණන් වහනසේ සැවැත්නුවර නිසා ජේතවනාරාමයෙහි වැඩවසනසේක් පසුබට වීය්‍යී ඇති භික්‍ෂුකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

ඒ පසුබට වීය්‍යී ඇති භික්‍ෂූන් වහන්සේ පළමු පරිද්දෙන්ම අවශේෂ භික්‍ෂූන් වහන්සේ විසින් බුදුන් සමීපයට කැඳවාගෙන අවුත් පෑ කල්හි බුදුහු ඒ භික්‍ෂූන් වහන්සේට ආමන්ත්‍රණය කොට “එම්බල මහණ, තෝ මෙබඳු මාගීඵලදායක (සතර මගඵල ගෙනදෙන්නාවූ) ශාසනයෙහි මහණව වීය්‍යී හරණෙහිද? ලක්‍ෂයක් වටනා ඝනරන් තලියෙන් පිරිහුනාවූ සෙරිවාණිජ වෙළෙන්ද මෙන් බොහෝ කාලයක් ශෝක

කරන්නේ වේදැ?”යි වදරා තුෂ්ණීම්භූතව (නිශ්ශබ්දව) වැඩහුන්සේක.

එකල්හි එතැනට රැස්වූ භික්ෂූන්වහන්සේ සකසා හැඳ පෙරව ඵලභාරයෙන් (ගෙඩි බරින්) නැමුනාවූ කදලි වෘක්ෂයක් (කෙසෙල් ගසක්) මෙන් බුදුරජාණන් වහන්සේට අභිමුඛව නමිනව (නැමී) බද්ධාඤ්ජලීව (දෙහොත් එක්කොට) දෙහොත් මුදුනෙහි තබා භක්තිප්‍රේමාතිභාරාවනතොත්තමාඞ්ගයෙන් (භක්කතිය හා ආදරය නැමති මහබරින් නැමුනාවූ හිසින්) නමස්කාරකොට සිට ඒ අථිය (අතීත කථාව නැමති කරුණ) ප්‍රකාශ කරන පිණිස සර්‍වඥයන් වහන්සේට ආරාධනා කළසේක. එවෙලෙහි බුදුරජාණන් වහන්සේ අන්‍යභවයෙන් සැඟවුනාවූ කාරණය ප්‍රකාශකොට ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස මෙම කල්පයට පස්වෙනිවූ කප මහාබෝධිසත්‍වයෝ සෙරිව රාජ්‍යයෙහි රන්පසුම්බිපයිය (රන්කහවණු සහිත පසුම්බිය) කරලා කිසිල්ලෙහි ගන්වාගෙන වෙළඳම් කෙරෙන හෙයින් ‘කච්ඡපුට වාණිජය’ යන නම් ඇති වෙළඳව උපන්නාහුය. ඒ වෙළෙඳණෝ ‘සේරිවාණිජ’ නම් එක් ලෝභී වෙළඳකු හා සමග ‘නීලවාහිණී’ නම්වූ ගඟින් එතරව ‘අන්‍ධපුර’ නම්වූ නුවරකට වැද නුවර වීථි බෙදාගෙන තමන්ට පැමිණි වීථියෙහි බඩු විකුණමින් ඇවිදිති. අන්‍යවූ ලෝභී වෙළඳ තමාට පැමිණි වීදියෙහි බඩු විකොට ඇවදිනේය. එකල්හි එනුවර එක් සිටුකුලයක ඇත්තෝ දුප්පත් වූය. සියළු

මල්බෑයන් (බාලසොහොයුරන්) හා දරුවෝත් වස්තුවත් නැසී ගියෝය. එක් මිණීබිරි කුඩා කෙල්ලක් මුත්තණීයන් හා සමඟ නොනැසී රඳුගියාය. ඔවුන් දෙදෙනම අනුන්ට බැළ මෙහෙකොට ජීවත් වෙති. මොවුන් දෙනාගේ ගෙයි පළමු මහසිටාණන් බත් අනුභව කළ රන්තලියෙක් වළං අතුරෙහි තිබී බොහෝ දවසක් ප්‍රයෝජන නොවූ හෙයින් මලගැසී (මලකඩ) ගියේය. ඒ තාක් වන තුරු ඔහු දෙදන රන් තලිය බවක් නොදනිති. එකල ඒ ලෝභී වෙළඳ "කඳුවළලු (වීදුරු වළලු) ගනුව"යි කියමින් ඇවිදිනේ ඒ ගේදොරට පැමිණියේය. ඒ ගෙයි කුමාරිකාවෝ වෙළඳ දැක මුත්තණීයන්ට කියන්නී "මැනියෙනි, මට එක් පළඳනාවක් ගනුව"යි කිව. ඒ අසා මුත්තණීයෝ "අපි දුක්ඛිතයම්හ, කුමක් දී පළඳනා ගනුමෝදැ"යි කිවුය. ඒ වේලෙහි ඒ කුමාරිකා තොම කියන්නී "අපගේ තලියක් ඇත, ඒ තලියෙන් අපට කිසි ප්‍රයෝජනයකුත් නැත, මේ තලිය දීපියා වළලු ගතමැනවැ"යි කිව.

මුත්තණීයෝ ඒ කුමාරිකාවගේ ඇවිටිලි බලවත් හෙයින් වෙළඳ කැඳවා අස්නක හිඳුවා තලිය දී "ස්වාමීනි, මේ තලිය අරගෙන නුඹගේ නැගණීයන්ට කිසි පළඳනාවක් දුන මැනව"යි කිවුය. ඒ ලෝභී වෙළඳ තලිය අතින් ගෙන "රන්තලියක්වනැ"යි තලිය පිට ඉඳිකටුවෙන් හිරක් ඇඳ රන්බව දැන "මොවුන්ට කිසිවක් නොදීම මේ තලිය ගෙනයමි"යි සිතා "මේ තලිය කුමක් අගීද, අඩමඳටකුත් (මදටිය බාගයක් රත්රන්වල වටිනාකම) පමණ මේ තලියට මිළ නැත්තේයැ"යි කියා බිමට දමා හුනස්නෙන් නැගීසිට

ගියේය. "එක් කෙනෙකුන් වැද නික්මුනු වීථියට අනෙක් තැනැත්තේ වදින්ට නිසිවන්නේයැ"යි බෝධිසත්‍වයෝ ඒ වීථියට වැද "කඳුවළලු ගනුව"යි කියමින් එම ගේදොරට පැමිණියෝය.

නැවත ඒ කුමාරිකාතොම පළමු පරිද්දෙන්ම මුත්තණියන්ට කියන්නී "මෑනියෙනි, මට වලළු ඇරගෙන දුන මැනවැ"යි ඇවිටිලි කිව. එකල්හි මුත්තනණියෝ කුමාරිකාවන්ට කියන්නෝ "දුවණියනි, පළමුව ආ වෙළඳුණෝ තමාට දුන් තලිය බිමට දමා ගියෝය. දැන් කුමක් දී ගනුමෝදැ"යි කිවුය. ඒ අසා කුමාරිකා තොම කියන්නී "මෑණියනි, ඒ වෙළඳතෙම තදපරුෂ බස් ඇත්තේය. මේ වෙළඳුණෝ වූකලී ප්‍රිය වූ දැකුම් ඇත්තෝය. මොළොක්වූ කතා ඇත්තෝය. එසේ හෙයින් මේ තලිය අරගෙනදී මට පළඳනා ඇරගෙන දුන මැනවැ යි, වළලු නම් යහපත් වේදැ"යි කිව. ඒ කුමාරිකාවගේ බස් අසා මුත්තණියෝ කියන්නෝ "එසේ වීනම් කැඳව"යි කියා වෙළඳුණන් කැඳවූහ.

ඉක්බිත්තෙන් ගෙට වැදලා උන්නා වූ බෝධිසත්‍වයන්ට ඒ තලිය දුන්නාහ. බෝධිසත්‍වයෝ ඒ රන් තලියේ නියාව දැන කියන්නාහු "මෑණියනි, මේ තලිය අගනා බඩු මා අත නැතැ"යි කිවුය. ඒ අසා කුමාරිකාවගේ මුත්තණියෝ කියන්නෝ "පළමු ආ වෙළඳුණෝ මේ තලිය අඩමඳටකුත් නොපුස්නේය"යි (නොවටීයයි) කියා බිමට දමා ගියෝය. මේ තලිය වූකලි නුඹගේ කුසලයෙන් ස්වාමිනි රත්රන්ව ගියවනැ

යි අපි නුඹට මේ තලිය දෙම්හ, අපට යන්තම් දෙයක් දීපියා මේ තලිය ගෙනගිය මැනවැ''යි කිවුය.

බෝධිසත්වයෝ එකෙණෙහිම අතතිබූ පන්සියයක් කහවණු හා පන්සියයක් අගනා බඩු දී මිල ඇමම දී "මට මේ පලම් දණ්ඩ (තරාදිය) හා පසුම්බියත් කහවණු අටකුත් දුන මැනව''යි මෙපමණක් ඉල්වා අරගෙන පළා ගියාහුය. මහබෝසතාණෝ වහ වහා ගංතෙරට ගොස් ඔරු පදනා තොටියාට කහවණු අට දී ඔරුවට පැනනැංගාහුය.

ඉක්බිත්තෙන් ඒ ලෝභී වෙළඳ නැවතත් ඒ ගෙට ගොස් "පළමු මා බලාපියා ගිය තලිය ගෙනව, යන්තම් මිලයක් තොපට දෙමි''යි කියා ඉල්වීය. ඒ අසා කුමාරිකාවගේ මුත්තණියෝ ඕහට බැණදෙඩා (දෙස් පවරා) "අපගේ ලක්ෂයක් වටනා ඝනරන් තලිය අඩමඳටකුත් නොපුස්නා කෙළෙහිය. තට ස්වාමිදරුවකු වැනිවූ එක් ධර්මිෂ්ඨ වෙළඳණ කෙනෙක් අපට දසක් මිළ දී ඒ තලිය අරගෙන ගියෝවේදැ''යි කිවුය.

ඒ අසා "හෙතම ලක්ෂයක් වටනා ඝනරන් තලියෙන් පිරිහී ගියෙම්වේදැ යි මට වූයේ බලවත් හානියකැ''යි උපන්නා වූ බලවත් ශෝක ඇතිව සිහි එළවා ගන්නට අසමර්ථව විසංඥව (සිහි නැතිව) තමා අත තිබූ කහවණුත් බඩුත් ඒ ගෙදරම වගුරුවා හන් පෙරවි පිළි හෙලා (හැඳගත් පොරවාගත් වස්ත්‍ර බිමදමා) පලම්දඬු මුගුරක් මෙන් අල්ලාගෙන බෝධිසත්වයන් පසුපස්සෙහි ලුහුබඳවාගෙන යන්නේ ගංතෙරට පැමිණ යන්නා වූ බෝධිසත්වයන් දැක "එම්බල තොටිය,

ඔරුව රඳව, රඳව"යි කියා අඬගසාලිය. ඒ අසා බෝධිසත්ත්වයෝ තොටියාට කියන්නාහු "ඔරුව ආපස්සේ කරකවා නොපදුව"යි වැලකූය. තමා කීබස් නොගිවිස ඔරුව නොරඳා පදනා ඔරුවෙන් යන්නා වූ බෝධිසත්ත්වයන් බල බලා සිටියා වූ ඒ ලෝභී වෙළෙඳුට බලවත් වූ සෝක උපන්නේය. ළය (හදවත) උණුව ගියේය. මුඛයෙන් හුණුලේ නැගීය. වැවක පැළිවළල්ලක් (පැලී ගිය මඩතට්ටුවක්) මෙන් ළය පැළී ගියේය. ඒ ලෝභී වෙළෙඳු බෝධිසත්ත්වයන් කෙරෙහි ආඝාත (වෛර) බැඳ එතන්හිම ජීවිතක්ෂයට පැමිණියේය. මේ බොධිසත්ත්වයන් කෙරෙහි දෙවදත්ත ස්ථවිරයන්වහන්සේගේ පළමුවෙන් වෛර බැඳිම වන්නේය. බොධිසත්ත්වයෝ දානාදී වූ පින්කම්කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය.

තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මේ ධර්මදෙශනාව ගෙනහැර දක්වා වදාරා මත්තෙහි ධර්මදේශනාකොට වදාරණසේක් යම්සේ පෙර සෙරිවාණිජ නම් වෙළෙඳු ලක්‍ෂයක් වටනා ඝනරන් තලිය නොලැබ ඒ තලිය ගන්ට වීර්‍ය්‍යී නොකොට ඒ තලියෙන් පිරිහී ශොක කෙළේ ද, පශ්චාත්තාපයට (පසුතැවිල්ලට) පැමිණියේ ද, එපරිද්දෙන් මහණ තොපිත් මේ ශාසනයෙහි සරහා පිළියල කරනලද රන් තලියන් වැනි වු ආර්‍ය්‍යී මාර්‍ගයට පසු බට වීර්‍ය්‍යී ඇති බැවින් නොපැමිණ ඒ මාර්‍ගඵලයෙනුත් පිරිහී බොහෝ කලක් සෝක කරන්නාහුය. ඉදින් තෝ වීර්‍ය්‍යී නොහළුයෙහි වීනම් නුවණ ඇති වෙළෙඳාණන් රන්තලිය ගෙන ප්‍රයොජනය වින්ද කලක්මෙන් මාගේ ශාසනයෙහි නවවිධ ලොකොත්තර ධර්මය (සතර මග

නුවණ, සතර ඵල නුවණ, නිර්වාණය) ලබන්නේහි වේදැ''යි මෙසේ ඒ සර්වඥයන් වහන්සේ නැවතත් ඒ භික්ෂූන් වහන්සේට අර්හත්ඵලයෙන් කූළුගන්වමින් (මුදුන් පමුණුවමින්) ධර්මදේශනාව දක්වා චතුරාර්ය්‍ය සත්‍යය ප්‍රකාශකොට වදාළසේක. චතුස්සත්‍ය ධර්මදෙශනාවගේ කෙළවර පසුබට වීර්ය්‍ය ඇති භික්ෂූන් වහන්සේ අර්හත්ඵලයෙහි පිහිටි සේක. තවද බුදුහු පූර්වාපරසන්ධි ගළපා මේ 'සේරිවාණිජ ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි අඥාන වෙළඳ නම් දැන් දෙවදත්ත ස්ථවිරයෝය. එසමයෙහි නුවණ ඇති වෙළඳ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ''යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 004. චුල්ලසෙට්ඨි ජාතකය

තවද සූර්ය්‍යවංශාභිජාතවූ (සූර්ය්‍යවංශයෙහි උපන්) තිලෝගුරු බුදුරජාණන් වහන්සේ රජගහ නුවර නිසා ජීවකයන්ගේ අඹ උයනෙහි වසනසේක් 'චුල්ලපන්ථක' ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය ගෙණහැර දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

රජගහ නුවර වසන මහධන සිටාණන්ගේ දූ වූ එක් කුමාරිකාවක් තමාගේ දාසයකු හා සමග මිත්‍රසන්ථවය (හිතමිතුරුව) වාසය කොට වසන දවස් "මේ ක්‍රියාව අනික් කෙනකු දැකපු නම් කටයුතු නොවෙ''යි සිතා භයින් ත්‍රස්තව

(තැතිගෙන) ඒ පුරුෂයාට කියන්නනී "අප දෙදෙනා මෙතන වසන්නට නොපිළිවන් වන්නේය, ඉදින් මාගේ දෙමව්පියෝ මේ දෝෂය දැකපු නම් කටයුතු නොවෙයි (සුදුසු නොවේ), අප කඩකඩ කොට කපා පියති" සිතා "අන්‍යදේශයකට ගොස් වසම්හ"යි කියා හස්තසාර වස්තුව (තමන් සතු වැඩි අගය ඇති වස්තුව) හැරගෙණ පළමුකොට හළදෙරින් (විවෘත කරනලද දෙරෙන්) නික්ම "යම් තැනකට ගොස් අනුන් නොදන්නා තෙනකට යම්හ"යි කථාකොට දෙදෙනම ගියාහුය. මෙසේ ගොස් එක්තෙනක වසන්නාවූ ඔවුන්ගේ සංවාසය (එක්ව විසීම) නිසා කුමාරිකාවට බඩ දරු ගර්භයෙක් පිහිටියේය. ඕ තොමෝ දරුගැබ් මුහුකුරා ගිය කල්හි වල්ලභයා (සැමියා) සමග කථා කරන්නී "දරුගැබ මුහුකුරා ගියේය, ඤාතිබන්ධූන් (නෑදෑයින්) නැති තෙනදී දරු වැදීම නම් අප දෙදෙනාටම දුක් වන්නේය, එසේ හෙයින් දෙමව්පියන්ගේ ගමට යම්හ"යි කිව. ඒ පුරුෂයා "අද යම්හ, සෙට යම්හ"යි කියා බස් ඉකුත් කරන්නේය. එකල කුමාරිකාව සිතන්නී "මේ අඥාන පුරුෂයා තමාගේ දෝෂය මහත් බැවින් යන්ට උත්සාහ නොකරයි, දෙමව්පියෝ නම් දරුවන්ට වැඩ කැමැත්තෝය, එසේ හෙයින් මොහු යත් කිම? නොයත් කිම? මා යන්ට සුදුසු වන්නේය"යි ඒ පුරුෂයා ගෙයින් බැහැර ගිය කල්හි තමාගේ ගෙයි වලං ඇඳ පුටු ආදී සියල්ලම තැන්පත්කොට තබා තමාගේ දෙමව්පියන්ගේ ගමට යන නියාව අසළ ගෙවල ඇත්තන්ට කියා මංහි (මාර්ගයෙහි) නික්මුනාහ.

එකල්හි ස්වාමිපුත්‍රයා ගෙට අවුත් කුමාරිකාව නොදැක අසල ගෙවල මිනිසුන්ගෙන් විචාරා දෙමව්පියන්ගේ ගමට ගිය නියාව අසා වහවහා ලුහුබැඳවාගෙන ක්‍රමයෙන් ගොස් අතරමගදී දුටුයේය. ඒ දුටුවිට අතරමගදීම දරුවැදීම වූයේය. ඒ වල්ලභ පුරුෂයා "අහෝ සොඳුර කිමෙක්දැ?"යි විචාළේය. "ස්වාමීනි, පුතකු වදාපීමි" කීව. "දැන් කුමක් කරමෝදැ?"යි පුරුෂයා කී කල්හි "යම් දරුකෙනෙකුන් වැදීම් නිසා මා දෙමව්පියන් ගමට යමෝ නම් ඒ කාරිය අතරමගදී සිද්ධවිය, නෑයන්ගේ ගෙට ගොස් කුමක් කරමෝදැ?"යි කීය. මෙසේ කියා දෙදෙනම නැවත නික්මුණාහ. මෙසේ එක්සිත්ව පෙරලා තමන්ගේ ගෙට ආවාහුය. ඒ උපන්නාවූ කුමාරයාට නම් තබන්නාහු මගදී උපන් බැවින් 'පන්ථක කුමාරයෝ'යයි නම් තබාලූහ.

තවද ඒ සිටු කුමාරිකාවට නොබෝ දවසකින්ම දරුගැබියෙක් පිහිටියේය. ඒ සිටු දූ පළමු පරිද්දෙන්ම "දෙමව්පියන්ගේ ගමට යෙමි" කියා ගොස් අතරමගදීම දරුවන් වැදූය. ඒ කුමාරයන්ටත් මගදී උපන් බැවින් පළමු උපන් කුමාරයන්ට 'මහාපන්ථක' කුමාරයෝය, බාල පුතණුවන්ට 'චුල්ලපන්ථක' කුමාරයෝ යයි නම් තැබූහ. ඔහු දෙදෙනාම දරුවන් පෝෂ්‍යකොට ක්‍රමයෙන් වැඩෙන්නාවූ ඔවුන් දෙදෙනාගෙන් මහාපන්ථක නම් කුමාරතෙමෙ සෙසු කුමාරවරුන් හා කෙළනා කල සෙසු කුමාරයෝ "සුළු පියාණෝ ය, මුත්තණුවෝ ය, මුත්තණීයෝය"යි කියන්නන්ගේ බස් අසා මෑණියන් අතින් විචාරන්නාහු "මෑණියන් වහන්ස,

සෙසු දරුවෝ සුළු පියාණෝ ය, මුත්තණුවෝ ය, මුත්තණියෝ යයි කියති. කිමෙක්ද? අපට නෑයෝ නැද්දැ?"යි විචාළේය. එකල්හි මෑණියන් කියන්නෝ "එසේය පුත, තොපගේ නෑයෝ මෙතන නැත. රජගහනුවර මහධනසිටාණෝය යන කෙනෙක් තොපගේ මුත්තණුවෝය. ඒ නුවර තොපගේ නෑයෝ බොහෝ"යි කිවුය.

ඒ අසා කුමාරයෝ කියන්නෝ "කුමක් නිසා ඒ නෑයන් ගේ සමීපයට නොයමෝදැ"යි කිවුය. මෑණියෝද තමන් ඔබ (එහි) නොයන කාරණා කියා දරුවන් නැවතූය. ඒ කුමාරයෝ නැවතත් "මුතුන්මිත්තන් සමීපයට යම්හ"යි කියා ඇවිටිලිව කියන හෙයින් පුරුෂයාට මෙසේ කිවුය "මේ දරුවෝ හැමවේලේම මට පීඩා කෙරෙති. කිමෙක්ද? දෙමව්පියෝ අප දැක ඇඟමස් කපා කද්ද? කැටුව දරුවන් කැඳවාගෙන ගොස් මුතුන්මිත්තන් දකුම්හ"යි කිවුය. ඒ අසා වල්ලභපුරුෂයා "මම තොපගේ දෙමව්පියන්ගේ ඉදිරියෙහි සිටින්නට අසමර්ත්ථයෙමි" කියා "තොපි දෙදරුවන් කැඳවාගෙන ගොස් මුතුන්මිත්තන් දක්ව"යි කීය. "දැක්වීමෙනුත් ප්‍රයෝජන ඇතැ"යි කියා දෙදරුවන් කැඳවාගෙන රජගහ නුවරට ගොස් නුවරදොර එක් ශාලාවෙක නවාතැන් ගෙන දරුවන්ගේ මෑණියෝ ද දෙදරුවන් කැඳවාගෙන ආ නියාව දෙමාපියනට කියා යැවූය. ඒ අසා සිටුදුවගේ දෙමව්පියෝ සිතන්නාහු "සසර ඇවිදිනාවූ අපට පුත් නුවූ දූ නුවූ කෙනෙක් නැත, ඔහු දෙදෙනෙ අපගේ වංශයට හානි කළාහ, එසේ හෙයින් මහත් වූ අපරාධ කළාහ, එසේ හෙයින් ඔවුන් දෙදෙනා අප

ඇස්හමුයෙහි සිටින්නට නොපිළිවන්නෝය, මේ අප දීලු වස්තු හැරගෙන දෙදෙනාම තමන් කැමති සැප තෙනකට ගොස් ජීවත්වෙත්ව"යි කිවුය. ඒ අසා සිටු දූ දෙමව්පියන් එවු වස්තු හැරගෙන දරුවන් දෙන්නා තමන් සමීපයට ආ දූතයන් අතට පාවාදී (භාරදී) යවුය. දෙදරුවෝ ද මුතුන්මිත්තන් සමීපයේ වැඩී වර්ධනය වෙති. ඔවුන් දෙනො අතුරෙන් චුල්ලපන්ථක කුමාරයෝ ඉතා බාලයෝ ය. මහාපන්ථක කුමාරයෝ මුත්තණුවන් හා සමඟ බුදුන් සමීපයට බණ අසන්නට යෙති. නිරන්තරයෙන් බණ අසන්නාවූ කුමාරයන්ට මහණ වීමෙහි සිත් නැමුණේ ය. එකල්හි කුමාරයෝ මුත්තණුවන්ට කියන්නෝ "ඉදින් නුඹ වහන්සේ ගිවිස්නාසේක් වීනම් (අවසර දෙතොත්) මහණ වන්නෙම් වේදැ"යි කිවුය.

එබස් අසා මුත්තණුවෝ කියන්නාහු "පුත තෙපි කුමක් කියව්ද? සියලු ලෝවැස්සන්ගේ මහණවීමටත් වඩා තොපගේ මහණවීම යහපත් වන්නේය, ඉදින් තොපි මහණදම් පුරන්නට සමර්ත්‍ථයෝ නම් මහණුවම් (මහණකම) ගණුව"යි කියා කුමාරයන් කී බස ගිවිස සර්‍වඥයන් වහන්සේ සමීපයට ගොස් සර්‍වඥයන් වහන්සේ විසින් "මේ කිමෙක්ද? මහසිටාණෙනි තෙපි දරුකෙනෙකුන් ලදදැ"යි විචාළ කල්හි "එසේය ස්වාමීනි! කුමාරයෝ මාගේ මුනුබුරාණෝය, උෟ තුමූ නුඹ වහන්සේ සමීපයෙහි මහණවෙමි යි කියති"යි දැන්වූහ. ඒ බස් බුදුහු අසා එක්තරා තෙරකෙනෙකුන් වහන්සේට "මේ කුමාරයන් මහණ කරව"යි නියෝගකොට වදාළසේක. ඒ තෙරුන් වහන්සේ කුමාරයන්ට තචපඤ්චක කර්‍මස්ථාන දී මහණ කළසේක.

උන්වහන්සේත් බොහෝවූ බුද්ධ වචනයන් ඉගෙණ පිරුණාවූ විසිවයස් ඇතිසේක් උපසම්පදාව ලත්සේක. උපසම්පදාවූ තැන් පටන් නුවණින් සලකා භාවනා මනස්කාර (මෙනෙහි) කෙරෙමින් නොබෝ දවසකින් රහත් වූ සේක. මහාපන්ථක ස්ථවිරයන් වහන්සේ ධ්‍යාන සුවයෙන් (ධ්‍යාන ලබාගැනීම නිසා හටගත් මානසික සැපයෙන්) දවස් යවන සේක් "කිමෙක්ද? මේ සැපය චුල්ලපන්ථකයන්ට දෙන්ට පුළුවන් දේ හෝ"යි සිතූසේක. ඉක්බිත්තෙන් ඒ මහාපන්ථක ස්ථවිරයන් වහන්සේ මුතුන් සිටාණන්ගේ ගෙට ගොස් "මහසිටාණෙනි, ඉදින් තොපි ගිවිසූ නම් මම චුල්ලපන්ථකයන් මහණ කරවන්නෙම් වේදැ"යි වදාළසේක. ඒ අසා සිටාණෝ "යහපත ස්වාමීනි, චුල්ලපන්ථකයන් මහණ කළ මැනවැ"යි කිවුය. තෙරුන් වහන්සේ චුල්ලපන්ථකයන් මහණකොට දශසීලයෙහි පිහිටවූ සේක. චුල්ලපන්ථක සාමණේරයන් වහන්සේ මහණවෙලා මන්දප්‍රාඥ (නුවණ අඩු කෙනෙක්) වූහ.

"පදුමං යථා කොකනදං සුගන්ධං පාතො සියා
ඵුල්ලමවීතගන්ධං
අඞ්ගීරසං පස්ස විරොචමානං
තපන්තමාදිච්චමිවන්තළික්ඛෙ"

(අළුයම පිපී ගියාවූ සුවඳින් යුතු, පහනොවූ සුවඳ ඇති රත් පියුම යම්සේ ද, එසේම නුබ මැද දිලිහෙන හිරුමඬල යම්සේ ද, එසේ බබළන්නාවූ බුදුන් බලව)

යන මේ ගාථාව සාරමසකින් වනපොත් (කටපාඩම්) කරන්නට අසමර්ත්‍ථ වූයේය. ඒ චුල්ලපන්‍ථක සාමණේරයන් වහන්සේ කාශ්‍යප සර්‍වඥයන් වහන්සේගේ සමයෙහි මහණව නුවණැතිව එක්තරා නුවණ මද භික්‍ෂු කෙනෙකුන් වහන්සේගේ පාළි (බුදුන් වදාළ මුල් දේශනා) උගන්නා කල්හි සිනාසී නින්දාකොට කෙළිසේක (සෙල්ලම් කෙළේය). ඒ නුවණ මඳ භික්‍ෂූන් වහන්සේ ප්‍රඥාවන්ත භික්‍ෂූන් වහන්සේගේ නින්දායෙන් පාළිය නූගත්සේක. වනපොත් නොකළසේක. ඒ පූර්‍වජන්මයේ (පෙර භවයෙහි) කරණ ලද අකුශල කර්‍මානුභාවයෙන් මේ චුල්ලපන්‍ථක සාමණේරයන් වහන්සේ මහණ වූ ගමණේ නුවණින් මඳවූසේක. පළමු වනපොත් කළ පදය ඉදිරියේ වනපොත් කරණ කලට නස්නේය. මේ ගාථාව වනපොත් කරන්ට උත්සාහ කරන්නාවූ චුල්ලපන්ථක සාමණේරයන් වහන්සේට සාරමසක් ඉකුත්ව ගියේය.

එකල්හි මහාපන්ථක ස්ථවිරයන් වහන්සේ මෙසේ වදාළසේක "පන්ථකයෙනි, මේ ශාසනයට අයෝග්‍යව (නුසුදුස්සෙක් වන්නෙහිය), සාර මසකින් එක ගාථාවක් වනපොත් කොට ගන්ට අසමර්‍ථව, ප්‍රව්‍රජ්‍යාකෘත්‍යය (පැවිදිවීමේ ප්‍රයෝජනය) වූ කලි තෙපි කෙසේ මස්තකප්‍රාප්ත කරවූදැ"යි "මෙතෙනින් පලායව"යි කියා විහාරයෙන් නෙරපූසේක. එසමයෙහි මහාපන්ථක ස්ථවිරයන් වහන්සේ සියළු සංඝයා වහන්සේට බත් බෙදාදෙනසේක (දන් බෙදීමේ තනතුර උසුලන සේක). ජීවකයෝ බොහෝ ගඳ දුම්මල්, පහන් ආදිය ගෙන්වාගෙන තමන්ගේ අඹ උයනට ගොස් බුදුන්ට පූජාකොට

බණ අසා උනස්නෙන් නැගී බුදුන් වැඳ මහාපන්ථක ස්ථවිරයන් වහන්සේ කරා එළඹ "ස්වාමීනි, බුදුන් සමීපයෙහි කෙතෙක් භික්ෂුන් වහන්සේදැ?"යි විචාළෝය. තෙරුන්වහන්සේ "පන්සියයක් පමණ භික්ෂූන් වහන්සේය"යි වදාළසේක.

එකල්හි ජීවකයෝ කියන්නෝ "ස්වාමීනි සෙට බුදුන් ප්‍රධානකොට ඇති පන්සියයක් භික්ෂූන් වහන්සේ කැඳවාගෙන අවුත් මාගේ ගෙයිදී සිඟුව (දන් වළඳනු) මැනවැ"යි කිවුය. "උපාසකයිනි, චුල්ලපන්ථකයෝ ශාසනයෙහි පිහිටක් නොලද්දේය. උන් හැර සෙසු භික්ෂූන්වහන්සේට තොපගේ ආරාධනාව ඉවසන්ට (භාර ගැනීමට) කියන්නෙමි වේදැ"යි වදාළසේක. ඒ අසා චුල්ලපන්ථක සාමණේරයන් වහන්සේ සිතනසේක් "මහාපන්ථක ස්ථවිරයන් වහන්සේ මෙතෙක් භික්ෂූන් වහන්සේගේ ආරාධනාව ඉවසනසේක් මා පිටත්කොට (අත්හැර) ඉවසූසේක. ඒකාන්තයෙන් මාගේ බෑයන් (සහෝදරයන්) වහන්සේ මා කෙරේ බිඳී ගියෝය. එසේ කළ මට දැන් ශාසනයෙන් ප්‍රයෝජන කිම්ද? ගිහිවෙමි. ගිහිව සිට දනාදිවූ පින්කොට ජීවත්වෙමි"යි සිතා "දෙවෙනි දවස් උදෑසන ගිහිවෙමි"යි සිතා නික්මුණෝය.

සර්‍වඥයන් වහන්සේ අළුයම් වේලෙහි ලොවබලා වදාරණසේක් (මාර්‍ගඵලාදියක් ලැබීමට සුදුස්සෝ කවුරුදැයි මහාකරුණා සමාපත්තිඥනයෙන් ලෝකයා දෙස විමසා බලනසේක්) මේ කාරණය දැක පළමුකොට ගොස් චුල්ලපන්ථකයන් වහන්සේ යන මග දොරටුවේ සක්මන්

කරණසේක්. තමන්වහන්සේ වසන ගෙන් (කුටියෙන්) නික්මුණසේක් සර්‍වඥයන් වහන්සේ දැක “ස්වාමීනි”යි කියා එළඹ නමස්කාර කළසේක. ඉක්බිත්තනේ සර්‍වඥයන් වහන්සේ “චුල්ලපන්ථක, මේ වෙලේ කොයි යව්දැ?”යි වදාළසේක. “ස්වාමීනි, මාගේ බෑයන් වහන්සේ මා ශාසනයෙන් නෙරපූසේක. එසේ හෙයින් මම ගිහි වන්නෙමි”යි දැන්වූසේක. ඒ අසා සර්‍වඥයන් වහන්සේ “චුල්ලපන්ථකයෙනි, තොපගේ ප්‍රව්‍රජ්‍යාව නම් මා සන්තකය, බෑයන් විසින් නෙරපන (එලවා දමන) ලද්දවූ තොපි කවර කාරණයකින් මා සමීපයට නාවාහුද? මා කැටුව එව, ගිහිවීමෙන් ප්‍රයෝජන කිම්ද? මා සමීපයෙහි වාසය කරව”යි කියා වදාළසේක. ඉක්බිති චුල්ලපන්ථකයන් වහන්සේ කැඳවාගෙන ගොස් ගඳකිළි නිසමත්තෙහි (ගඳකිළිය ඉදිරිපිට) හිඳුවා “චුල්ලපන්ථකයනි, නැගෙනහිරට අභිමුව හිඳ මේ රෙද්ද, ‘රජෝහරණං රජෝහරණං’(කිලුටු පහකිරීම, කිලුටු පහකිරීම) යි කිය කියා පිරිමැදීමෙන් මෙතන හිඳුව”යි වදරා සෘධියෙන් මවන ලද පිරිසිදු රෙද්දක් දී වඩනට (දනය සඳහා වැඩීමට) වේලා දැන්වූ කල්හි භික්‍ෂුසංඝයා වහන්සේ පිරිවරා ජීවකයන්ගේ ගෙට ගොස් පනවන ලද බුද්ධාසනමස්ථකයෙහි (බුදුන් සඳහාම පිලියළ කළ ආසනය මත) වැඩහුන්සේක. චුල්ලපන්ථකයන් වහන්සේද සූර්‍ය්‍යරස්මි බල බලා ඒ රෙදි කඩ ‘රජෝහරණං රජෝහරණං’ යි කිය කියා පිරිමදිමින් උන්සේක. මෙසේ ඒ චුල්ලපන්ථකයන් වහන්සේ ඒ රෙදි කඩ පිරිමැද මැද සිටියදීම කිලුටුව ගියේය.

ඉක්බිති උන්වහන්සේ සිතන සේක් "මේ රෙදි කඩ ඉතා පිරිසිදුය, නිර්මලය, මේ ආත්මභාවය (ශරීරය) නිසා පූර්ව ප්‍රකෘති (මුල් ස්වභාවය) හැර මෙසේ කිලුටුව ගියේය, ඒකාන්තයෙන් ප්‍රත්‍ය සමුත්පන්න ධර්මයෝ (හේතූන්ගෙන් හටගත් දේ) ඉපිද නස්නාසුල්ලහ"යි (විනාශවී යන ස්වභාවය ඇත්තාහයි) කිය කියා ප්‍රත්‍යය සමුත්පන්න ධර්මයන්ගේ ක්ෂණක්ෂණයෙහි (මොහොතක් මොහොතක් පාසා) ඉපිද නස්නාබව සලකමින් විදර්ශනා (අනිත්‍ය, දුක්‍ය, අනාත්ම වශයෙන් විමසීම) වැඩූසේක. සර්වඥයන් වහන්සේද "චුල්ලපන්ථකයන්ගේ සිත විදර්ශනාවට නැගෙන්නේ යැයි චුල්ලපන්ථකය, රෙදි කැබැල්ල කිලුටුව රජසින් රැඳී ගියේද, (අපවිත්‍ර දෙයින් යුක්ත වීද) එමෙන්ම තාගේ අභ්‍යන්තරයෙහි ද (සිතතුළ ද) රාගරජාදීහු (ලෝභාදී කෙලෙස්) ඇත්තාහ, ඔවුන් දුරුකරව"යි කියා ආලෝකයක් හැර (ඍද්ධිබලයෙන් මැවූ ආලෝකධාරාවක් යවා) ඉදිරියේ උන්නාක් මෙන් පෙනෙන්නාවූ ස්වරූප (ස්වභාව) ඇතිව මේ ගාථාව වදාල සේක.

> "රාගො රාජො නච පන රෙණු වුච්චති - රාගස්සෙතං අධිවචනං රජොති,
> එතංරජං විප්පජහිත්වා භික්ඛවො - විහරන්ති තෙ විගතරජස්ස සාසනෙ"

> "දොසො රජො නච පන රෙණු වුච්චති - දොසස්සෙතං අධිවචනං රජොති,

එතං රජං විප්පජහිත්‍වා භික්ඛවො - විහරන්ති තෙ විගතරජස්ස සාසනෙ”

“මොහො රජො නච පන රේණු වුච්චති - මොහස්සෙතං අධිවචනං රජොති,
එතං රජං විප්පජහිත්‍වා භික්ඛවො - විහරන්ති තෙ විගතරජස්ස සාසනෙ”

(‘රජස්’ යනු රාගයට ද දූවිලිවලට ද නමකි, මෙහිදී ‘රජස්’ යනු ‘රාගය’යි, දූවිලි නොවේ. ‘රජස්’ යන්න ‘රාගයට’ විශේෂ නාමයකි. ඒ භික්‍ෂූහු මේ රාගය දුරුකොට වීතරාගී වූ බුදුරජුන්ගේ සසුනෙහි වාසය කරත්.)

(‘රජස්’ යනු ‘ද්වේෂයට’ ද දූවිලිවලට ද නමකි, මෙහිදී ‘රජස්’ යනු ‘ද්වේෂය’යි, දූවිලි නොවේ. ‘රජස්’ යන්න ‘ද්වේෂයට’ විශේෂ නාමයකි. ඒ භික්‍ෂූහු මේ ද්වේෂය දුරුකොට වීතද්වේෂී වූ බුදුරජුන්ගේ සසුනෙහි වාසය කරත්.)

(‘රජස්’ යනු ‘මෝහයට’ ද දූවිලිවලට ද නමකි, මෙහිදී ‘රජස්’ යනු ‘මෝහය’යි, දූවිලි නොවේ. ‘රජස්’ යන්න ‘මෝහයට’ විශේෂ නාමයකි. ඒ භික්‍ෂූහු මේ මෝහය දුරුකොට වීතමෝහී වූ බුදුරජුන්ගේ සසුනෙහි වාසය කරත්.)

යන මේ ගාථා වදාළ ඉක්බිති චුල්ලපන්ථක ස්ථවිරයන් වහන්සේ සිවුපිළිසිඹියා හා සමග රහත් වූසේක. චතුපටිසම්භිදාවට (සිවුපිළිසිඹියාවට) පැමිණීමෙන් ම ත්‍රිපිටකයද ප්‍රගුණ විය (තුන්පිටකයෙහි හැකියාව ද ලැබිණි). ඒ

චුල්ලපන්ථක ස්ථවිරයන් වහන්සේ පෙර රජව ඉපද නුවර පැදකුණු කරනසේක් (නුවර වටා යනසේක්) නළලින් ඩා (ඩාදිය) වැගිරෙන්නට පටන්ගත් කලිහි පිරිසිදු සළුපටින් නළල් කෙළවර පිසපුසේක. සළුව කිලිටුව ගියේය. ඒ රජ්ජුරුවෝ සිතන්නාහු "මේ ශරීරය නිසා මෙබඳු වූ පිරිසිදු සළුව තමාගේ (එහි) පිරිසිදු ධවල ගුණය (සුදු ගතිය) හැර කිලිටුව ගියේය, ඒකාන්තයෙන් ප්‍රත්‍යය සමුත්පන්න ධර්‍මයෝ අනිත්‍යයෝයැ"යි අනිත්‍යසංඥාව (අනිත්‍යය යන හැඟීම) සිහි කළේය. ඒ කාරණයෙන් ඒ තෙරුන් වහන්සේට රජෝහරණයම (කිලුටු පහකිරීම) ප්‍රත්‍ය (අවබෝධ) විය. ජීවකයෝ සර්‍වඥයන් වහන්සේට දක්ෂිණෝදකය (දන් වැළඳීම සඳහා පැන්) එලවුය (පිළිගැන්වීය). බුදුහු එවේලෙහි "ජීවකයිනි, විහාරයෙහි භික්ෂූහු ඇත්තෝ නොවේද?"යි කියා අතින් පාත්‍රය වැසූසේක. එවේලෙහි මහාපන්ථක ස්ථවිරයන් වහන්සේ "ස්වාමීනි, විහාරයෙහි භික්ෂූන් නැත්තේයි වෙත්දැ"යි කීසේක. සර්‍වඥයන් වහන්සේ "භික්ෂූන් ඇති නැති නියාව දැන එව"යි කියා පුරුෂයකු යැවූහ. එකෙණෙහි චුල්ලපන්ථක ස්ථවිරයන් වහන්සේ සිතනසේක් "මාගේ බෑයන් වහන්සේ විහාරයෙහි භික්ෂූහු නැතැයි සිතූහ. විහාරයෙහි භික්ෂූන් ඇති නිසා උන්වහන්සේට ප්‍රකාශ කළමැනව"යි සිතා සියළු අඹ උයන භික්ෂූන්ගෙන් ම පිරූසේක. සමහර භික්ෂූන් වහන්සේ සිවුරු ගෙත්තම් කරනසේක (මහනසේක), සමහර කෙණෙකුන් වහන්සේ සිවුරු රඳනසේක (පඬුපොවනසේක), සමහර කෙනෙකුන් වහන්සේ වනපොත් කරණසේකැ යි මෙසේ

ඔවුනොවුන් වෙනසක් නැතිව එකස්වරූප වූ භික්ෂූන් දහසක් මැවූසේක.

බලන්නට ගිය පුරුෂයා විහාරයේ බොහෝ භික්ෂූන් දැක නැවත අවුත් ජීවකයන්ට කියන්නේ “සියළු අඹ උයන භික්ෂූන්ගෙන් ගැවසී ගත්තේයැ”යි කීය. ඉක්බිති සර්‍වඥයන් වහන්සේ ඒ පුරුෂයාට වදාරණසේක් “බුදුහු චුල්ලපන්ථකයන් වහන්සේ කැඳවන සේකැ යි කියව”යි වදාළසේක. එබස් අසා පුරුෂයා ගොස් එපරිද්දෙන්ම කී කල්හි “මම චුල්ලපන්ථකයෙමි”යි, “මම චුල්ලපන්ථකයෙමි”යි මුඛ දහසක් නැංගේය. (දහසක් භික්ෂූහු කථාකළහ) එකල්හි පුරුෂයා නැවත බුදුන් කරා ගොස් “ස්වාමීනි, ඇමදෙනා වහන්සේ අපි චුල්ලපන්ථකයම්හ, අපි චුල්ලපන්ථකයම්හ යි කියනසේක් යැ”යි දැන්විය. ඒ බස් අසා බුදුහු “දැන් තෝ ගොස් පළමු කොට යමෙක් ‘මම චුල්ලපන්ථකයෙමි’ කිව් නම් ඔහු අත අල්වා ගනුව, අවශේෂයෝ අන්තර්ධාන වෙති”යි වදළාහ. එවේලෙහි ඒ පුරුෂයා එපරිද්දෙන්ම කළේය. දහසක් පමණ භික්ෂූන් වහන්සේ අන්තර්ධාන වූසේක. තෙරුන් වහන්සේ ද කැඳවාගිය පුරුෂයා හා කැටිව වැඩිසේක.

සර්‍වඥයන් වහන්සේ ජීවකයන් කැඳවා “ජීවකයෙනි, චුල්ලපන්ථකයන්ගේ පාත්‍රය ගනුව”යි “චුල්ලපන්ථකයෝ තොපට අනුමෙවෙනි (කළ කුශලය අනුව සතුටු විය හැකි) ධර්‍මදේශනා කෙරෙති”යි වදළහ. ජීවකයෝ එපරිද්දෙන්ම කළෝය. එවේලෙහි චුල්ලපන්ථක ස්ථවිරයන් වහන්සේ සිංහ

නාද කරන්නාහු අභීත කේසරසිංහරාජයකු පරිද්දෙන් තුන්පිටකය අළලා (ඇතුළත් කර) අනුමෙවෙනි ධර්‍මදේශනා කලසේක. සර්‍වඥයානන් වහන්සේ උනස්නෙන් පැනනැගී භික්‍ෂුසංඝයා පිරිවරා විහාරයට වැඩ භික්‍ෂූන් විසින් වත් දැක් වූ කල්හි (වතාවත් කිරීමෙන් පසු) හුනස්නෙන් නැගී ගඳකිළිනිස මත්තෙහි සිට භික්‍ෂුසංඝයා වහන්සේට සුගතොවාදය (බුදුන්ගේ අවවාදය) දී කමටහන් දී වදාරා (ඒ ඒ භික්‍ෂූන්ට සුදුසු භාවනා අරමුණු උගන්වා) භික්‍ෂුසංඝයා යවා සිව්දෑගඳින් (කොකුම්, යොන්පුප්, තුවරලා, තුරුක්තෙල්) සුවඳ කරනලද ගඳකිළියට වැද දකුණැලව සිංහසෙය්‍යාව (බුදුවරුන් සැතපෙන ක්‍රමය වූ දකුණැලයෙන් සැතපීම) කොට වදාළසේක.

ඉක්බිත්තෙන් සවස් වේලෙහි ධම්සභාමණ්ඩපයට භික්‍ෂූන් වහන්සේ නොයෙන් තැනින් රැස්ව රත්පලස් තිරයක් වට කරන කලක් මෙන් හිඳ බුදුන්ගේ ගුණකථාව පටන්ගත්සේක.

“ඇවැත්නි, මහාපන්ථක ස්ථවිරයෝ චුල්ලපන්ථක ස්ථවිරයන්ගේ අධ්‍යාසය (අදහස) නොදන්නාහු, එක ගාථාව සාරමසකින් වනපොත් කොටගත නුහුණුවෝය (අසමත් වූහ). නුවණ මදයෝය යි කියා විහාරයෙන් නෙරපූහ. සර්‍වඥයන් වහන්සේ තමන් වහන්සේ ධර්‍මමරාජ බැවින් එකම අන්තරාභක්තයෙහි (උදේ දනය දවල් දනය අතරතුර වූ වේලාව තුළදී) සිවුපිළිසිඹියා හා සමග අර්හත්ඵලය දුන්සේක, චතුපටිසම්භිදා ප්‍රාප්ත විය, එමෙන් තුන්පිටකය ප්‍රගුණ විය,

සර්‍වඥයන් වහන්සේගේ බලමහිමය නම් ඉතා ආශ්චර්‍ය්‍යී (පුදුම) වන්නේය”යි බුදුන්ගේ ගුණ කිය කියා උන්සේක.

එකල්හි සර්‍වඥයන් වහන්සේ දම්සභා මණ්ඩපයෙහි මේ කථාප්‍රවෘතිය දැන “අද මා විසින් එතනට යන්ට වටනේය”යි බුද්ධසෙය්‍යාවෙන් නැගී රත්වූ දෙපට අඳනා සිවුර ත්‍රිමණ්ඩල ප්‍රතිච්ඡාදනය කිරීම් වශයෙන් (නැබ හා දෙදණ යන තුන්තැන වැසෙන පරිදි) හැඳ, විජ්ජුල්ලතා සශ්‍රීකවූ (විදුලියක්සේ කහ පැහැයෙන් ශොභනවූ) පටිධාතුව (සිවුරු පටිය) ඊමත්තේ බැඳ, රත්පලසක් හා සමානවූ පාංශූකූල සුගතමහාචීවරය ඒකාංශ කොට (රත්පලසක් හා සමාන වූ බුදුන්ගේ උතුම් පාංශුකූල සිවුර එක් උරහිසක් පමණක් වැසෙන සේ කොට) ඊමත්තේ (ඒ අඳනයට උඩින්) පෙරෙව සුගන්ධ ගන්ධකුටියෙන් (සුවඳැති ගඳකිලියෙන්) නික්ම මත්තහස්තිරාජයක්හු (මත් ඇතකු) අල්වන්නට නික්මුණු කෙශරසිංහරාජයෙකුගේ විලාසයෙන් අප්‍රමාණ සර්‍වඥලීලාවෙන් දම්සභාමණ්ඩපයට වැඩ සරහනලද මණ්ඩපමධ්‍යයෙහි පණවනලද උතුම් වූ බුද්ධාසනමස්තකයට පැනනැගී (අසුන මත වැඩ හිඳ) ෂඩ්වර්‍ණ බුද්ධරශ්මිමාලාවෙන් (සවණක් බුදුරැස් සමූහය) විහිදුවමින් සාගරකුක්ෂිය (සයුරු ජලතලය) බබුළුවමින් යුගන්ධර මුදුනෙහි (මහමෙර පවු වටා සිටි යුගන්ධර නම් පර්‍වතය මුදුනෙහි) දිලිසෙන්නාවූ ළහිරුමඬලක් මෙන් (උදාවී එන හිරුමඬලක් සේ) දිලිහි දිලිහී ආසන මධ්‍යයෙහි වැඩ උන්සේක.

බුදුරජාණන් වහන්සේ එතැනට පැමිණි කෙණෙහිම භික්ෂුසංඝයා වහන්සේ කථා විච්ඡේදනයකොට (කථාව නවත්වා) මුවෙන් නොබැණ (නිශ්ශබ්දව) වැඩ උන්සේක. සර්‍වඥයන් වහන්සේ මොළොක්වූ මෙත් සිතින් භික්ෂු පෂ්ත් (භික්ෂු පිරිස) බලා "මේ පර්ෂද ඉතා බොහෝ වන්නේය, එකද භික්ෂුවක්හුගේ අත පය සෙලවීමක් වේවයි කැසපියන කිඹිසපියන (කහින - කිවිසන) ශබ්දයක් වේවායි නැත, මේ සියළු භික්ෂූහුම බුද්ධ ගෞරවයෙන් හා බුද්ධතේජසින් තැතිගත්හ, ආයුෂ්කල්පය (පරමායුෂ කාලය) මුළුල්ලෙහි මා බැණ නොනැගී (කථා නොකර) උන්කල්හිදු පළමුකොට කථාවක් නූපදවති, එහෙයින් මම පළමුකොට කථාවක් උපදවමි"යි සිතා මිහිරි වූ බ්‍රහ්මස්වරයෙන් (උතුම් කටහඬින්) භික්ෂූන්ට ආමන්ත්‍රණය කොට "මහණෙනි, දැන් කවර කථාවකින් යුක්තව උනුද? කවර නම් කථාවක් තොපට අඩාලවීදැ? යි විචාළසේක.

එකල්හි ඒ භික්ෂූන් වහන්සේ "අපි මෙතැන්හි උන්නමෝ අන්‍යවූ ස්වර්ගමොක්ෂද්වයට (සගමොක් දෙකට) බාධක වූ තිරශ්චීන කථාවක් (නොමනා කථාවක්) නොකීම්හ, නුඹවහන්සේගේ ගුණ වර්‍ණනා කොට කොට උනුම්හ"යි දැන් වූසේක. එකල්හි භික්ෂූන් වහන්සේගේ කථාව අසා "මහණෙනි, චුල්ලපන්ථකයෝ දැන් මා නිසා ධර්‍මමහත්වයට (ගුණදහමින් උසස් බවට) පැමිණියෝය, පෙරත්වූකලි මා නිසා භොගමහත්‍වයට පැමිණියෝය"යි වදාළසේක. එකල්හි එක් භික්ෂුකෙනෙකුන් වහන්සේ ඒ අර්ත්‍ථය ප්‍රකාශ කරනු පිණිස

භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේට ආරාධනා කළසේක. භාග්‍යවතුන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒකෙසේද යත්?

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි අප මහබෝසතාණෝ සිටුකුලයක ඉපද වැඩිවිය පැමිණ සිටුතනතුරු ලැබ 'චුල්ලසිටාණෝ' යන නමින් ප්‍රසිද්ධව වෙසෙති. ඒ සිටාණෝ නුවණැත්තෝය, ව්‍යක්තයෝය, සියළු නිමිති දනිති. එක් දවසක් ඒ සිටාණෝ රජ්‍යසේවයට යන තැනැත්තෝ වීථිමධ්‍යයයේ මළ මියෙකු දැක නක්‍ෂත්‍ර යොගය (නැකැත් වේලාව) පරීක්‍ෂාකොට මෙසේ කීවුය "නුවණැති කුලපුත්‍රයක්හු විසින් මේ මීයා අරගෙන පුත්‍රදාරාවන් (අඹුදරුවන්) පෝෂ්‍ය කරන්නටවත් වෙළඳාම් කරන්නටවත් පුළුවන් වන්නේ වේදැ"යි කීවුය.

එක්තරා දුගී පුරුෂයෙක් සිටාණන්ගේ ඒ වචනය අසා "සිටාණෝ නොදැන නොකියති"යි සිතා මීයා අරගෙන එක් සල්පිලක (කඩයක) බළලකු නිසා (සඳහා) දී දෙවියට සමාරක් (වී ඇට දෙකහමාරක් බර) රත්රන් ලද්දේය. ඒ කාකණික මාත්‍රාවෙන් (කහවණු ස්වල්පයෙන්) උක්සකරු ගෙන එක කළයකින් පැන් ගත්තේය. එතෙම වලින් (වනයෙන්) මල් කඩාගෙන ලන්නාවූ මාලාකාරීන් (මල්මාලා ගොතන්නවුන්) දැක උක්සකුරු සුඟක් (මදක්) දී පැන් වත් කලේය (පැන් දුන්නේය). ඒ මාලාකාරීහු එකි එකී මල්මිට දුන්නාහ. ඒතෙමේ මල් විකුට ඒ මල් මිළයෙන් දෙවැනි දවස් උක්සකුරු හා

පැන් කළයක් ගෙන මල්වත්තට ගියේය. එදවස් ඕහට මාලාකාරීන්හු මල් භාගයක් කඩාගෙන මල් ගස් දී ගියාහ. ඒතෙමේ නොබෝ දවසකින් මේ උපායෙන් අටකහවණුවක් ලද්දේය. නැවත එක් වැසිසුළං දවසක රාජෝද්‍යානයේ බොහෝ වියලි දඬු හා අතුපත් සුළඟින් වැගුරුණේය. උයන්ගොවුවාද දමන්නට උපාය නොදක්නේය. එකල්හි ඒ පුරුෂයා එතනට ගොස් “ඉදින් තොපි මේ දඬු හා අතුපත් මට දෙවුනම් මම සියළු දඬුපත් උයනින් පිටත් කරවාපියන්නෙමි වේදැ”යි උද්‍යානපාලකයාට කීහ. උද්‍යානපාලකයා “යහපත යහළුව, ඇරගනුව”යි ගිවිස්සේය.

චුල්ලන්තේවාසිකතෙම (චුල්ලසිටාණන්ගේ උපදෙස් අනුව කටයුතු කරන පුරුෂයා) කුඩා කොල්ලන්ගේ කෙළිමඩුල්ලට (ක්‍රීඩාපිටියට) ගොස් උක්සකුරු දී ඇසිල්ලකින් ඒ සියළු දඬුපත් කොල්ලන් ලවා උයනින් අද්ද පිටත්කරවා උයන් දොරකොඩ කැටිකරවූයේය (ගොඩ ගැස්වීය). එකල්හි රජගෙට වළං ලන (වළං සාදන) කුඹලා රජගෙට වළං පලහනු (පුළුස්සනු) සඳහා දර සොයා ඇවිදින්නේ උයන් දොරකඩ තුබූ ඒ දරගොඩ දැක ඔහු අතින් මිළදී විකිණී ගත්තේය (මිළට ගත්තේය). එදවස් චුල්ලන්තේවාසිකතෙම සොළොස් කහවණුවක් හා සැළ (ලොකු හැලි) ආදීවූ වළං පන්සියයකුත් ලද්දේය. ඒතෙමේ වෙළඳම් කිරීමෙන් කහවණු සූවිස්සක් වූ කල්හි “මට මේ උපාය ඇතැ”යි (මම මෙබඳු උපායක් කරමියි) නුවර දොරටුවට නොදුරු තැනක එක් පැන් සලක් (පැන් මඩුවක්) තබාගෙන පන්සියයක් තණ අදිනා පුරුෂයන්ට

පැන් වත්කලේය. ඔහු මෙසේ කිවුය "තොපි අපට බොහෝ උපකාර කෙළෙහිය. තොපට අපි කුමක් කරමෝදැ"යි කීය. එකල්ලහි චුල්ලන්තේවාසිකයා කියන්නේ "මාගේ කාරියක් පැමිණි කල්හි කියන්නෙමි වේදැ"යි කියා ඈත මෑත අවිදිනේ ගොඩ වෙළඳාම් කරන්නවුන් හා සමගත් මුහුදු වෙළඳාම් කරන්නවුන් සමගත් මිත්‍ර ගත්තේය.

එකල්හි ඕහට ගොඩ වෙළඳාම් කරන්නවුන්ගේ ප්‍රධාන පුරුෂතෙම "ඉදින් සෙට දවස් මේ නුවරට අස් වෙළෙඳෙක් පන්සියයක් අසුන් ගෙන එන්නේය"යි කීය. එතම ඔහුගේ වචනය අසා තණ ගෙනෙන්නා වූ පන්නයින්ට (තණකොළ කපන්නන්ට) "අද මට එකි එකී තණ මිටියක් දෙව, මා තණ විකුණන්නට පළමුකොට තොපි ඈම තණ නොවිකුණාව"යි කීහ. එකල ඔහු හැමදෙන "යහපතැ"යි ගිවිස පන්සියයක් තණමිටි ගෙනවුත් ඔහුගේ ගේදෙර එලුහ. අස් වෙළෙන්ද සියළු නුවර ඇවිද අසුන්ට තණ නොලැබ ඒ චුල්ලනේතවාසිකයා හට කහවණු දහසක් දී තණ අරගත්තේය.

ඉක්බිත්තෙන් කීප දවසක් ගියකලට සමුද්‍ර යාත්‍රාවෙන් වෙළඳාම් කරන්නාවූ යහළුවා ඕහට කියන්නේ "තොටට නැව් අවුත්වනැ"යි කීය. එකල චුල්ලනේතවාසික පුරුෂයා "මට මේ උපායෙන් ප්‍රයෝජන ඇතැ"යි සිතා කහවණු අටක් දී සියළු පිරිවරින් යුක්තව පිරුළු රථයක් (ඉල්වාගත් රථයක්) ගෙන මහත් වූ යසපිරිවරින් බටහිරතොට ගමට ගොස් පේරුස් මුද්දක් (තමාගේ නම කෙටූ මුද්දක්) නැවට අත්තිකාරම්

කොටද්ි නුදුරු තැනක වටකොට තිරයක් බඳවා සමීප වූ වරපුරුෂයන්ට මෙසේ විධාන කළේය "පිටතින් වෙළෙඳුන් අවූනම් රැකවල් තුනකින් මෙහෙවර කියා (මුරකපොලු තුනක් පසුකර යායුතු බව කියා) මා සමීපයට කැඳවාගෙන එවු"යි කීහ. එකල "පටුනුගමට නැව බට"යි අසා බරණැස්නුවරින් වෙළඳුන් සියයක් "බඩු ගනුම්හ"යි ආවාහුය. නැවත බඩු වෙළඳම් කරන්නාහු මනුෂ්‍යයෝ කියන්නාහු "අපගෙන් තොපට බඩු නොලැබෙයි. අසවල් තැන හිඳිනා මහවෙළඳුනන් විසින් අත්තිකාරම් දෙනලදැ"යි කීවුය. එබස් අසා බරණැස්නුවර වෙළෙඳුන් ඒ චුල්ලනේතවාසිකයා සමීපයට ආවාහුය. ඔහුගේ අතවැසි පුරුෂයෝ පළමුකොට ලූ විධාන නියාව රැකවල් තුනකින් තුන්විටක් ඔබිනොබ මෙහෙවර කියා අවුත් ඒ වෙළඳුන් ආබව කියා යැව්වාහුය. වෙළෙන්ඳු චුල්ලන්තේවාසිකයන්ට එකි එකී දහසක් (එක් එක්කෙනා දහස බැගින්) දී චුල්ලනේතවාසික පුරුෂයා හා සමග "නැව්බඩු ගණුම්හ"යි පත්තුව ගෙන (බඩු ගන්නා කොටස් කරුවන් වී) නැවත එකි එකී දහසක් දී නැව්බඩු අරවාගෙන (බඩු බාවාගෙන) බඩු තමන් සන්තක කළහ. චුල්ලන්තේවාසික දෙලක්‍ෂයක් වස්තු හැරගෙන බරණැස්නුවරට අවුත් "සත්පුරුෂයන්ට කෙළෙහිගුණ දැන්ම (දැනගැන්ම) සුදුසු වේදැ"යි ලක්‍ෂයක් වස්තු ගෙන්වාගෙන චුල්ලසිටාණන් සමීපයට ගියේය.

එකල්හි සිටාණෝ ඕහට "දරුව තොප විසින් කුමක් කොට මේ වස්තුව ලබන ලද්දේදැ"යි කීහ. මළ මීයාගේ

විකිණීම පටන් සියළු ප්‍රවෘත්තිය කීයේය. චුල්ලසිටාණෝ ඔහුගේ බස් අසා "මෙබඳු පුරුෂයකු අනුන්ට ඇරපියන්නට සුදුසු නොවන්නේය"යි කියා වැඩිවිය පැමිණ සිටි තමන්ගේ දියණියන් ඕහට පාවා දී සියළු තමන්ගේ වස්තුවට හිමි කළාහ. ඒ පුරුෂයා චුල්ලසිටාණන්ගේ ඇවෑමෙන් ඒ නුවර සිටුසේසත් (සිටුපදවිය) ලද්දේය. මහබෝසතාණෝ දනාදී පින්කම් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහ යි වදාළසේක.

තිලෝගුරු සම්‍යක් සම්බුද්ධරාජොත්තමයාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදාරා මත්තෙහි ධර්මදේශනාකොට "යම්සේ නුවණැති පුරුෂයෙක් මඳ ගින්නක් ක්‍රමයෙන් ගොම සුණු ආදිය ලා මුඛයෙන් පිඹ මහත් වූ වහ්නිස්කන්ධයක් (ගිනිකඳක්) කෙරේද, එපරිද්දෙන්ම නුවණැති සත්ත්වතෙම යම් සුවල්ප වූ බඩු මිළයක් ලැබ නොයෙක් උපායෙන් වෙළඳාම්කොට වස්තු යසස් වර්ධනය කරන්නේයැ"යි මෙසේ භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ "මහණෙනි, චුල්ලපන්ථක ස්ථවිරයෝ දැන් මා නිසා ධර්මයේ මහන්තත්වයට පැමිණියෝය, පූර්ව ජන්මයෙහි භෝග මහන්තත්වයට පැමිණියෝයැ"යි ධර්මදේශනාව වදාරා අතීත කතාවත් වර්තමාන කථාවත් දෙකම එක්කොට පූර්වාපර සන්ධි ගලපා මේ 'චුල්ලසෙට්ටි ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි චුල්ලන්තේවාසික පුරුෂතෙම දැන් මේ චුල්ලපන්ථක ස්ථිවිරයෝය. එසමයෙහි චුල්ලසිටුව උන්නෙම්

දැන් තිලෝගුරු සම්‍යයක්සම්බුදු රජවූ මම්ම වේදැ''යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

***************

# 005. තණ්ඩුලනාළි ජාතකය

තවද එක් සමයෙක්හි ශාක්‍යසිංහවූ(ශාක්‍යවංශයට අති උතුම්වූ) සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර නිසා ජේතවනාරාමයෙහි වාසය කරණසේක් ලාළුදායී නම් තෙරකෙනෙකුන් වහන්සේ උදෙසා මේ ජාතකය වදාළසේක.

එ කෙසේද? යත්,

එක් සමයෙක්හි දබ්බමලලපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සංඝයා වහන්සේට 'ලාබත්' ආදිවූ බත් පමුණුවන සේක(සලාක දනාදී වූ දන වෙන් වෙන් කර බෙදදෙනසේක). උන් වහන්සේ උදෑසන ලාබත් පමුණුවන්ට වන්කල්හි 'උදායි' ස්ථවිරයන් වහන්සේට කිසිකලෙක යහපත් බතෙක් පැමිණෙන්නේය (හොඳ දනයක් ලැබෙන්නේය), කිසිකලෙක නපුරු බතෙක්(අයහපත් දනයක්) පැමිණෙන්නේය. උදායි ස්ථවිරයන් වහන්සේ තමන් වහන්සේට නපුරු බත පැමිණ දවස් ලාබත් බෙදන්නාවූ ස්ථානයෙහි ආලොලන(කලබල) කරණසේක. "කිම? දබ්බමල්ලපුත්‍රයෝ ම ලාබත් බෙදන්ට දනිත්ද? අපි නොදනිමෝදැ?යි කියාත් කියනසේක. උන්වහන්සේ ලාබත් බෙදන තැන ආලොලන කරණ හෙයින් "එසේ වීනම් දැන් නුඹවහන්සේම ලාබත් බෙදදුන මැනවැ''යි කියා ලාබත්

පෙට්ටි(ඒ ඒ දන නියම කිරීම සඳහා පිළියෙළ කරගත් ඉරටුකෑලි දැමූ පෙට්ටිය) ඒ තෙරුන්වහන්සේට පාවාදුන්හ.

එතැන් පටන් සංඝයා වහන්සේට ඒ ලාළුදායි ස්ථවිරයන් වහන්සේ ම ලාබත් බෙදදෙන සේක. දෙන්නාවුන් ඒ තෙරුන්වහන්සේ යහපත් බත වේවායි(ප්‍රණීත දනයකි කියා හෝ) නපුරු බත වේවායි (ප්‍රණීත නොවූ දනයකි කියා හෝ) අසවලුන්ගේ කොටසේ(මෙනම් මෙනම් භික්ෂුපිරිසට) යහපත් බත සිටියේ යයි(මිහිරි දනයක් යෙදිණි යයි) කියාවත් අසවල් කොටසේ නපුරු බත සිටියේ යයි කියාවත් නොදන්නාසේක. ඨිතිකාව(සන්ධිය හෙවත් ඒ ඒ භික්ෂු සමූහයාට බෙදදෙනු ලබන දන මෙතැනින් අවසන් වෙයැයි නියම කළතැන) කරනසේකුත්(කරනවිට දී පවා) අසවල් කොටසේ ඨිථිකාව යැයිද සලකාගත නොහෙනසේක. භික්ෂූන් වහන්සේ පාළියේ සිටි වේලාවෙහි මෙතන අසවල් ඨිතිකාව සිටියාය, (මේ භික්ෂුව සිටින තැනින් එක් භික්ෂු පිරිසක් අවසානය) මෙතැන අසවල් ඨිතිකාව සිටියායයි බිමවත් බිත්තියේවත් ඉරක්(ඨිතිකාව අමතක නොවීම සඳහා ඉරක්) අඳිනාසේක. දෙවෙනි දවස් ලාබත්තැන භික්ෂූන් වහන්සේ මඳ හෝ වනසේක. බොහෝ හෝ වනසේක. භික්ෂූන් වහන්සේ මඳවූ කල ඇඳලු ඉර අගට පලායන්නේය(අගට වැටේ). බොහෝවූ කල්හි මුලට වන්නේය. ඒ උදායි ස්ථවිරයන් වහන්සේ ඨිතිකාව දැනගත නොහී රේඛා සංඥයෙන්(බිත්තියෙ හෝ බිම අඳින ලද ඉරි සලකුණින්) ලාබත් දෙනසේක.

එකල්හි අවශෙෂ භික්‍ෂූන් වහන්සේ කියනසේක් "ඇවැත්නි, උදායි ස්ථවිරයෙනි, රේඛාව නම් පසු හෝ පෙර හෝ වෙයි(අගට හෝ මුලට වැටේ). උතුම් බත අසවල් කොටසේ සිටියේය, නපුරු බත අසවල් කොටසේ සිටියේයැ"යි කීසේක. ඒ අසා උදායි ස්ථිවිරයන් වහන්සේ භික්‍ෂූන් වහන්සේ හා විවාද කරණසේක් "ඒසේ නම් මේ ඉර කවර කාරණයකින් මෙසේ සිටියේද? මම නුඹවහන්සේගේ බස් කුමක් පිණිස අදහම්ද? මේ රේඛාවෙන් අදහමි"යි කීසේක. එකල්හි බාල භික්‍ෂූන් වහන්සේත් සාමණේරයන් වහන්සේත් "ඇවැත්නි, ලාළුදායි ස්ථවියන් වහන්ස, නුඹවහන්සේ ලාබත් බෙද දෙතොත් භික්‍ෂූන් වහන්සේ ලාභයෙන් පිරිහෙනසේක. නුඹවහන්සේ බත් බෙද දෙන්නට සුදුසු නොවනසේක, මෙතැනින් නික්මුණ මැනවැ"යි කියා ලාබත් බෙදදෙන තැනින් නෙරපූසේක. එවේලෙහි ලාබත් බෙදදෙන තැන මහත් කෝලාහල විය. ඒ අසා සර්‍වඥයන් වහන්සේ අනඳ මහතෙරුන් වහන්සේ අතින් විචාරණසේක් "ආනන්දයෙනි, ලාබත් බෙදන තැන මහත් වූ කෝලාහල ඇසෙයි, මේ කවර කෝලහල ශබ්දයෙක්දැ"යි වදාළසේක. අනඳ මහතෙරුන් වහන්සේ සර්‍වඥයන් වහන්සේට එපවත් දැන්වූ සේක.

එකල්හි සර්‍වඥයන් වහන්සේ "එම්බා ආනන්දයෙනි, උදායි ස්ථවිරයා තමා අඥාන බැවින් අනුන්ට ලාභාහානි කෙළේ දැන්මතු නොවෙයි, පළමුත් කෙළේ වේදැ"යි වදාළසේක. අනඳ මහතෙරුන් වහන්සේ ඒ අර්ථය ප්‍රකාශ කරණ පිණිස සර්‍වඥයන් වහ්නේසට ආරාධනා කළසේක. බුදුරජාණන්

වහන්සේ භාවන්තරප්‍රච්ජන්න(අන්‍ය භවයන්ගෙන් වැසුනාවූ) කාරණය ප්‍රකාශ කොට වදාළසේක.

යටගිය දවස කසීරට බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙක් රාජ්‍යය කරන්නාහුය. එකල අප මහා බෝසතාණෝ ඒ රජ්ජුරුවන්ට වන්නකුකම්(භාණ්ඩ මිළ තක්සේරු කිරීම) කරන්නාහුය. ඇත් අස් ආදීන් හා රන්රුවන් ආදිය අගය කරවති. ඒ ඇත් අස් ආදියෙන් අගය කරවා වස්තු ස්වාමීන්ට වස්තුවට සුදුසුවූ වටනා මිළම දෙවති. රජ්ජුරුවෝ වූකලී ඉතා ලෝභියෝය. ඒ රජ්ජුරුවෝ තමන් ලෝභී ප්‍රවෘත්ති (පැවතුම්) ඇති බැවින් මෙසේ සිතූහ "මේ වන්නක්කා මෙසේ වන්නකුකම් කොට අය වැය කෙරේ නම් නොබෝ කලකින්ම මාගේ භාණ්ඩාගාරයේ වස්තු නිමා යන්නේය. එසේ හෙයින් අනිකකු වන්නකු තනතුරෙහි තබමි"යි සිතූය. මෙසේ සිතා ඒ රජ්ජුරුවෝ සිවුමැදුරු කවුළුව හැර රාජාඞ්ගනය(රජ ගේ මිදුල) බලන තැනැත්තෝ ලෝභී වූ නුවණ නැති එක් ගම්වැසි පුරුෂයකු රාජාඞ්ගනයෙන් යන්නා දැක "මේ තෙමේ මට සියළු වස්තුවේ අගය තබා අයවැය කරන්ට සමර්ථ වන්නේය"යි ඔහු සමීපයට කැඳවා ගෙන්වාගෙන "දරුව, තෝ අපට වස්තුවෙහි අගය තබා අයවැය කොට වන්නකුකම් කරන්නට සමර්ථයෙහිදැ"යි කිවුය. එබස් අසා ඒ පුරුෂයා "යහපත ස්වාමීනි"යි ගිවිස කල්හි රජ්ජුරුවන්ගේ වස්තුව රක්නා පිණිස ඒ අඥාන පුරුෂයා වන්නකුකමෙහි සැලසූහ.

එතැන්පටන් ඒ දන්ධයා(මෝඩයා) ඇත් අස් ආදීන් අගය කරන්නනේ අගය පිරිහෙළා(පහත දමා) මුඛවෙශාවූ(කටට ආ) යම් මිළයක් අභිප්‍රාය වූ(තමාට කැමති) පරිද්දෙන් කියයි. ඔහු වන්නකු තනතුරෙහි සිටි බැවින් එතෙම යම් මිළයක් කී නම් ඔහු කී මිළම ඒ වස්තුවට මිළ වන්නේය. රාජ නියෝගයෙන් සැලසූ (පත්කරනු ලැබූ) තැනැත්තවුන් හෙයින් ඊට විරුද්ධව උත්තර කියන කෙනෙක් මඳවුය. එකල්හි උත්තරාපථයෙහි(උතුරු දිග ප්‍රදේශයෙහි) වසන්නාවූ එක් අස් වෙළෙන්දෙක් පන්සියයක් අසුන් එනුවරට ගෙනායේය. රජ්ජුරුවෝ අසුන් ගෙනා නියාව අසා තමන්ගේ ඒ නුවණ නැති වන්නක්කා කැඳවා අසුන් මිළ කරවූයේය. එතෙම අසුන් මිළකරන්නේ පන්සියයක් අසුන්ට එකම සාල් නැළියක්(හාල් සේරුවක්) අගය කළේය. මෙසේ අගය කොට "අස් වෙළදුන්ට එකම සාල් නැළියක් දෙව"යි කියා සැල් නැළියක් මිලයට දී අසුන් පන්සියක් දෙනා රජ්ජුරුවන්ගේ අස්සල(ඉස්තාලයේ) බැන්දවූයේය. අස් වෙළෙඳ පළමු අගය කරවන වන්නක්කානන් සමීපයට ගොසින් එපවත් කියා "දැන් කුමක් කරමොදැ?"යි විචාළේය. ඒ අසා මහබෝසතාණෝ කියන්නාහු "ඒ පුරුෂයාට අත්ලස් දී මෙසේ විචාරව, අපගේ අස්සු වූකලී එකම සාල් නැළියක් වටිති යි අප විසින් දන්නා ලද්දේය, තොප නිසා සාල් නැළියෙහි අගය දන්නා කැමැත්තෙමිහ, එසේ හෙයින් රජ්ජුරුවන් වහන්සේ සමීපයේ සිට සාල් නැළිය මෙතෙක් මිල අගනේය යි කියන්නට නොපිළිවන්දැ යි විචාරව. ඉදින් සාල් නැළියේ මිල කියන්ට පිළිවනැයි කියේ වීනම් ඔහු කැඳවාගෙන

රජ්ජුරුවන් වහන්සේ සමීපයට යව. මමත් එතනට එන්නෙමි වේදැ''යි කිවුය.

එකල්හි අස් වෙළඳ බෝධිසත්ත්වයන් කී බස් ''යහපතැ''යි පිළිගෙණ ලෝභීවූ වන්නකූ පුරුෂයාට අත්ලස් දී ඒ කාරණය කියවූයේය. ඒ වන්නකූ පුරුෂයා අත්ලස් ලැබලාම ''සාල් නැළියට මිළ කියන්ට මට පිළිවන් වන්නේයය''යි කීය. එබස් අසා වෙළෙඳ ''එසේ වීනම් රජගෙට යම්හ''යි කියා ඔහු කැඳවාගෙන රජ්ජුරුවන් සමීපයට ගියේය. බෝධිසත්ත්වයෝත් අවශේෂ අමාත්‍යයෝත් ඒ වේලාවට එතනට ආවාහුය. එකල්හි අස් වෙළෙඳ රජ්ජුරුවන් වැඳලා කියන්නේ ''ස්වාමීනි, මම පන්සියයක් අසුන්ට එක සාල් නැළිය අගනා බව දනිමි, ඒ සාල් නැළිය කෙතෙක් අගීදැ?යි වන්නක්කාණන් අතින් විචාළ මැනව, රජ්ජුරුවන් වහන්සැ''යි කීය.

රජ්ජුරුවෝ එපවත් නොදැන කියන්නාහු ''එම්බල වන්නකූ පුරුෂය, පන්සියයක් අස්සු කෙතෙක් මිළ වටිද්දැ?''යි විචාළෝය. එබස් ඇසූ වන්නකූ පුරුෂයා ''ස්වාමීනි, සාල් නැළියක් වටනේ වේදැ''යි කීය. ''වන්නාට දරුව,(දරුව ඒ එසේ වේවා) පන්සියක් අස්සු වූකළී සාල් නැළියක් අගිත්වයි, ඒ සාල් නැළිය කෙතෙක් මිළ පුස්නේදැ?''යි(අගීදැයි) විචාළෝය. ඒ අඥාන පුරුෂයා ''ස්වාමීනි, අන්තඃපුරය පිටිපුර(ඇතුළුනුවර - පිටනුවර) සහිතවූ බරණැස් නුවර සාල් නැළිය අගනේ වේදැ''යි කීය. ඒ අඥාන පුරුෂයා පළමු ''රජ්ජුරුවන්ගේ සිත් ගනිමි''යි සිතා අනුවර්තනය

කරන්නේ(ලෝභී රජුගේ අදහස අනුව ක්‍රියාකරමින්) එකම සාල් නැළියක් අසුන්ට අගය කළේය. නැවත ඒ වෙළෙන්ඳ අතින් අත්ලස් ලැබ එම සාල් නැළියට අන්තඃපුරය පිටිනුවර සහිත වූ බරණැස් නුවර  අගය කෙළේය.

එසමයෙහි බරණැස් නුවර පවුරු වළ්ල්ල(වටා බැඳ තුබූ ප්‍රාකාරය) දෙළොස් යොදුනක් පමණ වන්නේය. මේ නුවර ඇතුළත වන්නේය. පිටත වානාහි තුන්සියයක් යොදුන් පමණ රාජ්‍යය වන්නේය. මෙසේ ඒ අඥාන පුරුෂයා දෙළොස් යොදුනක් වට ඇති නුවර හා තුන්සියයක් යොදුන් වට ඇති මේසා මහත් රාජ්‍යය එකම සාල් නැළියට අගය කළේය. ඒ අසා අමාත්‍යයෝ අත් පොළසන් දී සිනාසී කියන්නාහු "අපි පෙර පොළව හා රාජ්‍යය අනර්ඝ මිළ නැතැ යි(මිළ කළ නොහැකි දෙයකැයි) සිතා උනුම්හ, දැන් වූ කලී මේසා මහත් සරාජිකවූ බරණැස් නුවර හා රාජ්‍යය සාල් නැළියක් පමණ අගනේය. නුඹවහන්සේගේ වන්නකු පුරුෂයාගේ සමර්ථතාව ඉතා ආශ්චර්යය නියාය, මේතෙක් කල් මුළුල්ලෙහි මේ වන්නකු පුරුෂයා කොයි විසීද? අපගේ රජ්ජුරුවන් වහන්සේටම මෙතෙම සුදුසු වන්නේය"යි හාසකොට(සිනාසී) නින්ද කළාහුය. එකල්හි රජ්ජුරුවෝ ලජ්ජාවට පැමිණ ඒ නුවණ නැති පුරුෂයා නුවරින් පිටත් කරවා මහබෝසතාණන්ටම වන්නකු තනතුරු දුන්නාහුය. මහබෝධිසත්වයෝ එතැන්පටන් දනාදී වූ පින්කම් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය.

ශාස්තෘවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මේ ධර්‍ම දේශනාව ගෙනහැර දක්වා වදරා “ආනන්ද ස්ථවිරයෙනි, මේ අඥාන වූ උදායි ස්ථවිරයා මෙරමාහට ලාභහානි කෙළේ දැන් මතු නොවෙයි, පෙරත් තමා නුවණ නැති බැවින් කෙළේම වේදැ”යි අතීත කථාවත් වර්ථමාන කථාවත් දෙක එක්කොට සන්ධි ගලපා මේ ‘තණ්ඩුලනාළි ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි ගම්වැසි වූ අඥාන වන්නකු පුරුෂයා නම් දැන් මේ ලාළුදායි ස්ථවිරය. නුවණැති වන්නකු පුරුෂයා නම් ලොකස්වාමී වූ මම්ම වේදැ”යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 006. දෙවධර්‍ම ජාතකය

තවද එක් සමයෙක් හි ශාක්‍යකුල චින්තාමාණික්‍ය වූ(ශාක්‍ය වංශයට සිතූ පැතූ දේ දෙන මැණිකක් බඳු වූ) තිලෝගුරු බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර නිසා ජේතවන මහාවිහාරයෙහි වාසය කරණසේක්, එක්තරා බහුභාණ්ඩික(බොහෝ පිරිකර පරිහරණය කරන්නාවූ) භික්‍ෂූ කෙනෙකුන් වහන්සේ උදෙසා මේ ජාතකය වදාළ සේක.

සැවැත්නුවර වාසී වූ එක් කෙළෙඹි පුත්‍රයෙක් තමාගේ භාර්යාව මිය පරලොව ගිය කල්හි ශාසනයෙහි මහණ වූයේය. එතෙමේ මහණවන්නට පූර්‍වභාගයෙහිම(පෙරම) තමා වසනු පිණිස පන්සලකුත් ගිනිහල් ගෙයකුත්(කුස්සියක්) බඩුහල් ගෙයකුත්(ගබඩා ගෙයක්) කරවා බඩුහල් ගෙය ගිතෙල්

තලතෙල් ආදීයෙන් පුරා මහණ වූයේය. මහණ වූ පසු තමා සන්තක කෙල්ලන් කොල්ලන් කැඳවා ගෙන්වාගෙන රුචිවූ පරිද්දෙන් බත් මාළු පිසවාගෙන අනුභව කරන්නේය. සිවුරු ආදිවූ බොහෝ පිරිකර ඇත්තේය. රාත්‍රියෙහි එක් අඳනයක් හා පොරවණයක් පොරෝණේය. දිවා භාගයෙහි අනික් අඳනය හා අනික් පොරෝණයක් වළඳින්නේය. විහාර කෙළවර වාසය කරන්නේය. ඉක්බිත්තෙන් එක් දවසක් මේ භික්ෂූන් වහන්සේ සිවුරු හා ඇතිරි ආදිය ගෙන් පිටත්කොට මළුවේ වනා, අවු ගස්වන කලට බොහෝ දනව්වාසී වූ භික්ෂූන් වහන්සේ සෙනාසන චාරිකාවේහි ඇවිදිනාසේක්, ඒ බහුභාණ්ඩික භික්ෂූන්ගේ මළුවට ගොස් සිවුරු ආදිය දැක "මේ කාගේදැ?"යි විචාළසේක. ඒ බහුභාණ්ඩික මහණ "ඇවැත්නි, මාගේය"යි කීසේක. "ඇවැත්නි, මේ සිවුරත්, මේ සිවුරත්, මේ අඳනයත්, මේ අඳනයත්, මේ ඇතිරියත්, මේ ඇතිරියත් සියල්ලම තොපගේදැ?"යි විචාළසේක. "එසේය ඇවැත්නි" කී කල්හි භික්ෂූන් වහන්සේ කියනසේක් "ඇවැත්නි, බුදුරජාණන් වහන්සේ විසින් තුන් සිවුරු අනුදන්නා ලදී. මෙසේ අල්පේච්ඡ වූ(සීමාසහිත වූ අවශ්‍යතා ඇති) සර්‍වඥයන් වහන්සේගේ ශාසනයෙහි තොපි මහණ වී මෙසේ බොහෝ පිරිකර ඇතිකල වරෝ යම්හ, තොප සර්‍වඥයන් වහන්සේ සමීපයට ගෙනයම්හ"යි කියා ඒ භික්ෂූහු කැඳවාගෙන බුදුන් සමීපයට ගියසේක.

බුදුහු දැකලා ම "කිමෙක්ද? මහණෙනි, මේ භික්ෂූහු නොකමැති පරිද්දෙන්ම කැඳවාගෙන අවුදැ?"යි වදාළසේක.

එකල්හි භික්ෂූන් වහන්සේ කියනසේක් “ස්වාමීනි, මේ මහණ බහුභාණ්ඩිකය, බහුපරිෂ්කාර ඇත්තේය”යි දැන්වූසේක. එබස් අසා බුදුනු “මහණ, තා බහුභාණ්ඩික වූයේ සැබෑදැ?”යි විචාරා වදාළසේක. “ස්වාමීනි, සැබෑව”යි ඒ මහණ දැන්විය. එ බස් ඇසූ බුදුනු “මහණ, තෝ කවර කාරණයකින් බහුභාණ්ඩික වූවෙහිද? මම නොයෙක් කාරණයෙන් අල්පේච්ඡ බව හා සන්තුෂ්ට භාවයෙහිද(ලද දෙයින් සතුටුවන ස්වභාවයෙහිද), කායවිවේක, චිත්තවිවේක හා විදර්ශනා භාවනා කිරීමෙහි, වීර්ය වැඩීමෙහි ගුණ කීයෙම් නොවේදැ?”යි වදාළසේක. ඒ බහුභාණ්ඩික භික්ෂූන් වහන්සේ බුදුන් වදාල බස් අසා කිපී “එසේ කල මේ සැටියේ ඇවිදීම්දැ”යි පොරෝණය දමා පියා භය ලජ්ජා නැතිව පර්ෂද් මධ්‍යයෙහි තනි අඳනයෙන්ම සිටිසේක. එකල්හි සර්වඥයන් වහන්සේ ඒ භික්ෂුවට පිටිවහල් වනසේක් “මහණ, තෝ පෙර බලවත්වූ භය ලජ්ජා ඇත්තෙහි නොවේදැ?”යි “දියරකුස්ව උපන්නා වූ කාලයෙහිත් භය ලජ්ජා දෙක සොයමින් දෙළොස් අවුරුද්දක් විසුයෙහි නොවේද? එසේ වූ තෝ දැන් කවර කාරණයකින් මෙබඳු ගරුවූ සර්වඥශාසනයෙහි මහණව, සිව්වණක් පර්ෂද්(සිවුපිරිස) මධ්‍යයෙහි පොරෝණය දමා භය ලැජ්ජා හැර සිටියෙහිදැ”යි වදාළසේක.

එබස් ඇසූ මහණ භය ලජ්ජා දෙක එලවා(උපදවා ගෙන) දමාපූ සිවුර නැවත පොරවාගෙන බුදුන් වැඳ එකත්පස්ව උන්නේය. අවශේෂ භික්ෂූන් වහන්සේ ඒ අර්ථය ප්‍රකාශ කරන පිණිස සර්වඥයන් වහන්සේට ආරාධනා කළසේක. බුදුරජාණන්

වහන්සේ අන්‍යභවයෙන් පිළිසන්වූ කාරණය ප්‍රකාශකොට වදාළසේක.

යටගිය දවස කසීරට බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙක් ජනරඤ්ජනය කොට(මිනිසුන් සතුටුකොට) රාජ්‍යය කරන්නාහුය. එකල මහබෝසතාණෝ ඒ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ ගත්තාහුය. උපන්නාවූ කුමාරයන්ට නම් තබන දවස් ‘මහිංසාස’ කුමාරයෝ යයි නම් තැබූහ. ඒ කුමාරයන් ඇත මැත දිවපැන කෙළ ඇවිදිනා අවස්ථාවෙහි රජ්ජුරුරවන්ට අනික් පුතණු කෙනෙක් උපන්නාහුය. ඒ උපන් කුමාරයන්ට නම් තබන්නාහූ ‘චන්ද්‍ර’ කුමාරයෝ යයි නම් තැබූහ. ඒ දෙවෙනි කුමාරයන් ඇත මැත දිව පැන කෙළ ඇවිදිනා අවස්ථාවෙහි බෝධිසත්වයන්ගේ මෑණියෝ කාලක්‍රියා කළෝය. රජ්ජුරුවෝ අනික් බිසෝ කෙනෙකුන් අගමෙහෙසුන් තනතුරෙහි තැබූහ. ඒ බිසව රජ්ජුරුවන්ට ඉතා ප්‍රියය, මන වඩයි, සිත් කළුව වාසය කෙරෙයි. එකල ඔවුන් දෙදෙනාගේ ප්‍රිය සංවාසයෙන් ඒ බිසව් එක් පුතණු කෙනෙකුන් වැදූය. ඒ උපන් කුමාරයන්ට ‘සූර්ය’ කුමාරයෝ යයි නම් තැබූහ. රජ්ජුරුවෝ පුතණුවන් දැක සතුටු වූ සිත් ඇතිව “සොඳුර, තොපගේ පුතණුවන්ට වරයක් ගණුව”යි කිවුය. බිසව් “ඒ වරය මා කැමති විටෙක ඇර ගනිමි”යි පසුව ගතයුතු කොට තබා තිබූය.

ඒ බිසවූ පුතණුවන් වැඩිවියට පැමිණි කල්හි රජ්ජුරුවන්ට කියන්නේ “ස්වාමීනි, නුඹවහන්සේ විසින් මාගේ පුතණුවන්

උපන් දවස් වරයක් දෙනලදී. එසේ හෙයින් මාගේ පුතණුවන්ට රාජ්‍ය දුන මැනවැ''යි කිවුය. රජ්ජුරුවෝ ඒ අසා කියන්නෝ "මාගේ දරුවෝ දෙන්න මහත් වූ ගිනි කඳන් මෙන් බබලමින් ඇවිදිති. තොපගේ පුතණුවන්ට රාජ්‍යය දෙන්ට නොපිළිවනැ''යි ප්‍රතික්ෂේප කොට නැවත නැවතත් ඒ බිසවුන් තමන්ගේ පුතණුවන්ට රාජ්‍යය ඉල්වන්නා දැක "මෝ තොමෝ මාගේ දරුවන්ට අනර්ථයක්, අවැඩක්, උපක්‍රමයක් කොට පියාදේහෝ''යි සිතා පුතුන් දෙබෑයන්(සොහොයුරු දෙපුතුන්) සමීපයට කැඳවා මෙසේ කිවුය "එම්බා දරුවෙන,. මම සූර්ය කුමාරයන් උපන් ගමනේ උන්ට වරයක් දිනිමි. දැන් උන්ගේ මෑණියෝ රාජ්‍යය ඉල්වති, මම උන්ට රාජ්‍යය නොදෙනු කැමැත්තෙමි. ස්ත්‍රීහූ නම් පාපියෝය. එසේ හෙයින් තොපට නපුරක් සිතාපූ නම් නපුරු වන්නේය. තොපි දැන් වලට වැද(වනයට ගොස්) මා ඇවෑමෙන් අවුත් තොප සන්තක මෙනුවර රාජ්‍යය කරවු''යි කියා හඬා වැළප ඉස සිඹ සනසා යැවුය. ඔවුන් දෙදෙනා පිය රජ්ජුරුවන් වැඳ ප්‍රාසාදයෙන් බස්නාවුන් රාජංගනයේ(රජ මිදුලෙ) කෙළනා(සෙල්ලම් කරන) සූර්ය කුමාරයෝ දැක ඒ කාරණය දැන "මමත් දෙබෑයන් වහන්සේ හා සමග යෙමි''යි කියා කැටිවම නික්මුනාහුය. මෙසේ නික්ම ගොස් කුමාරවරු තුන්දෙනම හිමාලය වනයට යන්නාහුය. බෝධිසත්වයෝ මාර්ගයෙන් යන ගමණෝ මගින් ඉවත්ව රැකක් මුල ඉඳ සූර්ය කුමාරයන්ට මෙසේ කීහ.'' මල සූර්ය කුමාරයෙනි, තෙල පෙනෙන විලට ගොස් නාපියා

පැනුත් බී, පියුම් පතින්(නෙලුම් කොළයෙන්) අපට පැන් ගෙනෙව"යි කිවුය.

ඒ විල තෙමේ වෙසවුණු රජ්ජුරුවන්ගෙන් එක් දියරකුසකු විසින් වරම් ලබන ලද්දේය. වෙසමුණු රජ්ජුරුවෝත් ඕහට කියන්නෝ "දේවධර්මය දන්නා කෙනෙකුන් තබා(හැර) යම් අනික් කෙනෙක් මේ විලට බටුහු නම් ඔවුන් කන්න ලැබෙන්නේය. විලට නොබට කෙනෙකුන් කන්නට නොලැබෙන්නේය"යි කිවුය. එතැන් පටන් දියරකුසා යම් කෙනෙක් ඒ විලට බටුහු නම් ඔවුන් අතින් දේවධර්මය විචාරා යම් කෙනෙක් නොදිනිත් නම් ඔවුන් කන්නේය. ඉක්බිත්තෙන් සූර්ය කුමාරයෝ ඒ විලට ගොස් පරීක්ෂා නොකටම බටුවානු ය. එකල්හි උදක රාක්ෂයා ඒ කුමාරයන් අල්වාගෙන "දේවධර්මය දනුදැ?"යි විචාළේය.

එකල්හි සූර්ය කුමාරයෝ කියන්නෝ "දේවධර්මය නම් චන්ද්‍ර - සූර්ය දෙදෙනා වේදැ"යි කිවුය. ඉක්බිත්තෙන් දියරකුසු ඕහට "තෙපි දේවධර්මය නොදනුව"යි කියා දියයට ගිල්වා තමා වසන්නාවූ ස්ථානයෙහි සිටවිය. බෝධිසත්වයෝත් සූර්ය කුමාරයන් ලස්වන්නා(පමාවෙනු) දැක චන්ද්‍ර කුමාරයන් යවුය. දියරකුසු චන්ද්‍ර කුමාරයන් අල්වාගෙන "දේවධර්මය දනුදැ?"යි විචාළෝය. "දනිමි, දේවධර්මය නම් සතරදිග වේදැ"යි චන්ද්‍ර කුමාරයෝ කිවුය. දියරකුසු "තෙපිත් දේවධර්මය නොදනුව"යි කියා උනුන් අල්වාගෙන ඒසේම දියයට සඟවා සිටුවුයේය.

බෝධිසත්ත්වයෝ ඒ චන්ද්‍ර කුමාරයනුත් කල්යවා නොයන හෙයින් "එක්තරා අන්තරායෙක් විය යුතුය"යි තුමූ එතනට ගොස් දෙදෙනාම විලට බට පියවර සටහන් දැක "මේ විල රාකෂසයකු අධිගෘහිත විලක් උවමැනවැ"යි සිතා කඩුව උරයේ එල්වාගෙන, දුන්න නගා දුනුම්ට හීයලාගෙන(හීය යොදාගෙන) සිටියාහුය. දිය රකුසු බෝධිසත්ත්වයන් දියට නොබස්නා දැක වල දඬු කපා ඇවිදිනා පුරුෂයෙකු මෙන් තමාගේ ස්වරූපය පාලා බෝධිසත්ත්වයන්ට කියන්නේ "පින්වත් වූ පුරුෂය, තොපි මග ගමන් යාමෙන් මිරිකී ගියව, කුමක් හෙයින් මේ විලට බැස නාපියා පැන් බී නෙළුඹල හා නෙළුම්දැලි කා මල් පැළඳ සැපසේ නොයව්දැ"යි කිවුය.

බෝධිසත්ත්වයෝ ඔහු දැක සිතන්නාහු "මොහු යකෂයා විය යුතුය. මොහු විසින් මාගේ මල් දෙන්නා අල්ලා ගන්නා ලද්දේ වනැ"යි සිතා "තෝ මාගේ මලුන් අල්වාගත්තෙහිදැ?"යි කිවූය. "එසේය මම ඇල්වුයෙමි" කී කල්හි "කවර කාරණයකින්දැ"යි විචාරා "මම මේ විලට බට කෙනෙකුන් කන්ට ලබමි"යි කී කල්හි "කිමෙක්ද? තෝ සියල්ලවුන්ම කන්ට ලබන්නේහිදැ?"යි විචාරා "යමෙක් දේවධර්මය දනී නම් ඔහු හැර සෙස්සවුන් කන්ට ලබමි"යි කී කල්හි "තට දේවධර්මයෙන් ප්‍රයෝජන ඇද්දැ?"යි විචාළෝය. "එසේය, දේවධර්මයෙන් ප්‍රයෝජන ඇතැ"යි දියරකුසු කීය. "එසේ වීනම් මම තට දේවධර්මය කියමි" කිවූය. එබස් අසා දියරකුසු "එසේ වීනම් කිවමැනව මම දේවධර්මය අසමි"යි කීය. බෝධිසත්ත්වයෝ "මම තට දේවධර්මය කියමි, බල එකෙක් ඇත. කිලිටුව(අපිරිසිදුව) සිටි

හෙයින් මදක් මැලියෙමි''යි කිවූය. උදක රාක්ෂසයා බෝධිසත්වයන් නහවා පැන් පොවා මල් පලඳවා සුවඳ විලවුන් ගල්වා සරහන ලද මණ්ඩපයෙහි උතුම් වූ පය්‍යීඞකයක් අතුට දුනේනේය. මහබෝසතාණෝ ඒ පනවන ලද ආසන මස්තකයෙහි ඉඳ යක්ෂයා පාමුල සිටුවාගෙන "එසේ වීනම් තෝ කන් යොමා සකස්කොට අසව''යි කියා දේවධර්මය කියන්නාහු මෙසේ කිවූය.

"මේ ලෝකයෙහි යම් කෙනෙක් භයින් හා ලජ්ජාවෙන් අකුශල ධර්මනුත් නොකළමනා අවශේෂ ලෝක චාරිත්‍රයනුත් දැන හැකිලෙන හෙයින් භය ලජ්ජා දෙකින් යුක්තව වාසය කෙරෙද්ද, කුශල ධර්මයෙහි ඇමකල්හිම බලවත්වූ ඇලුම් ඇත්තෝද, උතුම්වූ සත්පුරුෂ ගුණ ඇත්තෝද, එසේ වූ සත්වයන්ගේ ප්‍රවෘත්තිය(මේ අයුරින් පැවැත්ම) මේ ලෝකයෙහි දේවධර්ම නම්වෙ''යි කියා ධර්මදේශනා කළෝය.

යක්ෂයා මේ ධර්මදේශනාව අසා ප්‍රසන්නවූ සිත් ඇතිව බෝධිසත්වයන්ට කියන්නේ "මම තොප කෙරෙහි පුසන්නයෙමි. ප්‍රසන්න වූ මම එක් මලණු කෙනෙකුන් තොපට දෙමි. කවුරුන් ගෙනෙම්දැ''යි කීය. ඒ අසා බෝධිසත්වයෝ "බාල මලණුවන් ගෙනෙව''යි කිවූය. දියරකුසු කියන්නේ "පණ්ඩිතයෙනි, තොපි උදක් දේවධර්මය දන්නා පමණෙක්මය, එපමණක් විනා ඒ ධර්මයෙහි තොප පවත්නේ නැතැ''යි කීය. "කවර කාරණයකින්දැ''යි කී කල්හි "වැඩිමහලු තැනැත්තන් තබා බාල තැනැත්තන් ගෙන්වන හෙයින්, තොප

ජෙට්ඨාපචායන(වැඩිහිටියන් පිදීමේ) කර්මය නොකරන හෙයිනැ''යි කීය. එබස් අසා මහබෝසතාණෝ කියන්නෝ ''එම්බල යක්‍ෂය, මම දේවධර්‍මයත් දනිමි, දේවධර්‍මයෙහිත් පවතිමි. අපි මේ වලට වදනමෝ මේ බාල මලණුවන් නිසා වනුම්හ. මුන් පිණිස අපගේ පියාණන් වහන්සේගේ අතින් මුන්ගේ මෑණියෝ රාජ්‍ය ඉල්වූය. අපගේ පියාණන් වහන්සේ ඒ වරය නොදී අප රකිනා නිසා වනයෙහි වසන්ට කීසේක. එබස් ඇසූ බාල මලණුවෝ නොරඳා අප හා සමග මේ වනයට අවූය. ඉඳින් අපි ඒ කුමාරයන් වනයෙහි එක් යක්‍ෂයෙක් අනුභවකොට පිය යි කීමෝ නම් අප කීබස් අදහාගන්නා කෙනෙකු නැත. එසේ හෙයින් මම නින්දාවට භයින් බාල මලණුවන් ගෙන්වමි''යි කිවූය. එබස් අසා දියරකුසු සමාධිව (සතුටුව) ''සාධු! සාධු! පණ්ඩිතයෙනි, තොපි දේවධර්‍මයත් දනුව, දේවධර්‍මයෙහිත් පවතුව''යි ප්‍රසන්නවූ සිත් ඇතිව බෝධිසත්‍වන්ට සාධුකාරදී දෙබෑයන්ව ගෙනවුත් පාවාදිණ.

එකල්හි බෝධිසත්‍වයෝ ඕහට අවවාද කරන්නෝ ''යක්‍ෂය, තෝ පෙර කළ අකුශල කර්මයෙන් අනුන්ගේ වෙර ලේ මස් කන්නාවූ යක්‍ෂව උපන්නෙහිය. දැන් නැවතත් අකුසල්ම කෙරෙහි. නම් තා විසින් කරනලද අකුශල කර්මය නරකාදී සතර අපායෙන් තා මුදාලිය නොහෙන්නේය. එසේ හෙයින් මෙතැන් පටන් අකුසල් හැර කුසල් කරව''යි අවවාද කොට යක්‍ෂයා දමනයෙහි ලන්ට සමර්ථ වූයේය. මහබෝසතාණෝ යක්‍ෂයා දමනයෙහි ලාගෙන ඕහු විසින් කරනලද ආරක්‍ෂා ඇතිව එතැන්හිම වසන්නාහු. එක් දවසක් නැකැත් තරු බලා

පියරජ්ජුරුවන් කාලක්‍රියා කළ නියාව දැන යක්‍ෂයා කැඳවාගෙන බරණැස්නුවරට ගොස් රාජ්‍යය ගෙන චන්ද්‍ර කුමාරයන්ට යුවරජ තනතුර හා සූර්ය කුමාරයන්ට සෙනෙවිරත් තනතුරදී යක්‍ෂයාට සිත්කළු තෙනක දේවාලයක් කරවා එතැන්හි ඔහු වස්වා නිරන්තරයෙන් බත් හා මල් පහන් සුවඳ විලවුන් ඕහට පළමුකොට පුදන පරිද්දෙන් සැලසූය. ඒ මහබෝසතාණෝ දැහැමෙන් රාජ්‍යය කොට කම්වූ පරිද්දෙන් මියපරලොව ගියෝය.

ශාස්තෲ වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදාරා චතුස්සත්‍යය ප්‍රකාශ කොට වදාළසේක. මේ චතුරාර්ය සත්‍යය ධර්මදේශනාවගේ කෙළවර ඒ බහුභාණ්ඩික භික්‍ෂූන් වහන්සේ සෝවාන් පෙලෙහි පිහිටිසේක. බුදුරජාණන් වහන්සේ අතීත කථාවත් වර්ථමාන කථාවත් දෙක එක්කොට සන්ධි ගළපා මේ ‘දේවධර්ම ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි උදක රාක්‍ෂසයා නම් දැන් මේ බහුභාණ්ඩික මහණාය. සූර්යය කුමාරයෝ නම් ආනන්ද ස්ථවිරයෝය. චන්ද්‍ර කුමාරයෝ නම් ශාරිපුත්‍ර ස්ථවිරයෝය, මහිංසාස කුමාරයෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම ම වේදැ”යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 007. කට්ඨහාරී ජාතකය

තවද එක් සමයෙක්හි සකල ලොකානන්දකරවූ(මුළු ලොවම සතුටු කරන්නා වූ) බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසනසේක්, වාසභ ක්‍ෂත්‍රියාවන්ගේ කථාව අරභයා මේ ජාතකය වදාළ සේක.

මෙම වර්ථමාන කථාව දෙළොස් වැනි නිපාතයෙහිවූ 'භද්‍රශාල ජාතකයෙ'හි මතු පහළවන්නේය. ඒ වාසභ ක්‍ෂත්‍රියාවෝ වනාහී මහානාම නම් ශාක්‍ය රජ්ජුරුවන්ගේ දුවණියෝය. නාගමුණ්ඩා නම් දාසියගේ කුස පිළිසිඳ ගත්තාය. කොසොල් රජ්ජුරුවන්ට අගමෙහෙසුන් වූවාය. ඕ තොමෝ රජ හට ප්‍රිය වූ පුත්‍රයෙක් වැදුවාය. කොසොල් රජ වනාහි වාසභ ක්ෂ්‍රියාවන්ගේ දාසිභාවය පසුව දැන ස්ථානාන්තරයෙන් (අගමෙහෙසුන් තනතුරෙන්) පිරිහෙලුවේය. විඩුඩභ නම් පුත්‍රයාගේ ද ස්ථානන්තරය පිරිහෙලුවේය. ඔහු දෙදෙනාම රජගෙය ඇතුළත ම වසන්නාහ.

බුදුරජාණන් වහන්සේ ඒ කාරණය දැන වදාරා පෙරවරු පන්සියයක් භික්‍ෂූන් පිරිවරා රජගෙට වැඩ පනවන ලද ආසනයෙහි වැඩහිඳ "මහරජ, වාසභ ක්‍ෂත්‍රියාවෝ කොයිදැ?"යි වදාළසේක. කොසොල් රජ්ජුරුවෝ ඒ කාරණය දැන්වූයේය. "මහරජ, වාසභ ක්‍ෂත්‍රියාවෝ කවරක්හුගේ දුවණියෝදැ?"යි විචාළ කල්හි "ස්වාමීන් වහන්ස, මහානාම නම් රජහුගේයැ"යි කීසේක. "කවරක්හු නිසා ආයේදැ?"යි වදාළ කල්හි "ස්වාමීන් වහන්ස, මා නිසාය"යි කීවෝය. "මහරජ, වාසභ ක්‍ෂත්‍රියාවෝ

රජහුගේ දුවණියෝය. රජහු නිසාම අවුය. රජහු නිසාම පුත්‍රයෙක් ලද්දිය. ඒ පුත්‍ර තෙම කවර කාරණයකින් පියාණන් අයිති රාජ්‍යයට හිමි නොවන්නේද? පූර්ව කාලයේදී රජදරුවෝ මොහොතක් කල් එක්ව වාසය කළාවූ දරුකැටියාගේ(දර කඩන ගැහැණියගේ) බඩෙහි උපන්නාහු පුත්‍රයෙකු ලැබ ඒ පුත්‍රයාට රාජ්‍ය දුන්නාහුය''යි වදාළ කල්හි කොසොල් රජ තෙම ඒ කාරණය පහල කරන පිණිස භාග්‍යවතුන් වහන්සේට යාච්ඤා කළේය. භාග්‍යවතුන් වහන්සේ භවයෙන් වැසි තිබූ කාරණය ප්‍රකාශ කොට වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර රාජ්‍යය කරන්නාහු බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් මහත් වූ පිරිවරින් උයනට ගොස් එහි පුෂ්ප ඵල ලෝභයෙන් හැසිරෙනසේක් උයන් වන ලැහැබෙහි ගායනා කොට දර නෙලන්නාවූ එක් ස්ත්‍රියක දැක පිළිබඳ සිත් ඇතිව තෘෂ්ණාසන්ථවය කළෝය.(කාමාසාවෙන් මෛවුන්දම් සේවනය කළේය) එකෙණෙහිම අප මහබෝධිසත්වයන් වහන්සේ ඒ ස්ත්‍රියගේ බඩෙහිම පිළිබඳගත්සේක. එකෙණෙහිම ඇගේ බඩ විදුරු(දියමන්ති) පුරනවන ලද්දක් මෙන් ගරුවූ කුක්ෂිය වූයේය(බඩ බරවූයේය). ඒ ස්ත්‍රිය ගැබ පිහිටි බව දැන "මහරජ මගේ ගර්භය පිහිටියේයැ''යි කීවාය. එකල්හි ඒ රජතෙම අංගුෂ්ඨ මුද්‍රිකාව(ඇඟිලි මුද්ද) දී "ඉදින් දුවණිකෙනෙක් වූ නම් මේ අංගුෂ්ඨ මුද්‍රිකාව විකුට පෝෂ්‍ය කරව, ඉදින් පුත්‍රයෙක් වීනම් මුද්‍රිකාව හා සමග මාගේ සමීපයට ගෙන එව''යි කියා වැඩි සේක. ඒ ස්ත්‍රිද ගර්භය මුහුකුරන ලද්දී බෝධිසත්වයන් වහන්සේ

වැදුවාය. ඒ අප මහබෝධිසත්ත්වයන් වහන්සේ ඔබ මොබ හැසිරෙන කල්හි කෙළිමඬුල්ලෙහි(සෙල්ලම් පිටියෙ) ළදරුවෝ උන්වහන්සේට මෙසේ කියන්නාහු "පියාණන් නැත්තාහු විසින් පහරණ ලදුම්හ"යි කියන්නාහුය. ඒ අසා බෝධිසත්ත්වයන් වහන්සේ මෑණියන් සමීපයට ගොස් "මෑණියනි, මාගේ පියාණෝ කවිදැ?"යි විචාළසේක. "පුත්‍රය, තෙපි බරණැස් රජහුගේ පුත්‍රයකැ"යි කීවාය. "මෑණියනි, කිසි සලකුණක් නැත්තේදැ?"යි විචාළසේක. "පුත්‍රය, රජ්ජුරුවෝ මේ මුද්‍රිකාව දී ඉඳින් දුවණී කෙනෙක් වීනම් මේ මුද්‍රිකාව විකුට පෝෂ්‍ය කරව, ඉඳින් පුත්‍රයෙක් වීනම් මේ මුද්‍රිකාව හා සමග ගෙනෙවයි කියා ගියසේක්යැ"යි කීවාය.

"මෑණියනි, එසේ කල්හි කවර කාරණයකින් මා පියාණන්ගේ සමීපයට කැඳවාගෙන නොයන්නෙදැ?"යි කීසේක. ඒ ස්ත්‍රී අප බෝසතාණන්ගේ අධ්‍යාශය(අදහස) දැන රාජවාස භවනද්වාරයට ගොස් රජහට කීවාය. රජහු විසින් කැඳවනු ලබන්නේ රජගෙට වැද රජහට වැඳ "මහරජ්ජුරුවන් වහන්සේ නුඹ වහන්සේගේ පුත්‍රයකැ"යි කීවාය. රජ්ජුරුවෝද දන්නා සේක්ම(දන්නා නමුදු) පර්ෂද්(පිරිස) මැද ලැජ්ජාවෙන් "මාගේ පුත්‍රයෙක් නොවෙයි" කීසේක. "මහරජ්ජුරුවන් වහන්ස, නුඹවහන්සේගේ මේ මුද්‍රිකාව මේ දැන ගණුව"යි කීවාය. "මේ ද මාගේ මුද්‍රිකාවක් නොවෙයි" කීසේක. "මහරජ්ජුරුවන් වහන්සේ, දැන් සත්‍ය හැර මට අනෙක් සාක්ෂ්‍යයෙක් නැත්තේය. මේ ළදරු තෙම නුඹවහන්සේ නිසා උපන්නේ වීනම් අහස්හි සිටවයි, ඉඳින් එලෙස නොවුයේ වීනම් බිම හී

මරණයට පැමිණෝව"යි කියා බෝධිසත්වයාණන් වහන්සේගේ පාදද්වන්දය(දෙපා) අල්වාගෙන අහස්හි දැමුවාය. අප මහබෝධිසතාණන් වහන්සේ අහස්හි පලක් බැඳ හුන්සේක්(අරමිනිය ගොතාගෙන වැඩහිඳ) මිහිරි වූ කට හඬින් පිය මහරජු හට බණ වදාරණ සේක් මෙසේ වදාළසේක "මහරජ, මම නුඹවහන්සේගේ ආත්මජ පුත්‍රයෙක්මි(අනුජාත පුතෙක් වෙමි). ජනප්‍රධාන වූ මහරජ, නුඹවහන්සේ මා ආරක්‍ෂා කොට වදාළමැනව. මහරජ්පුරුවන් වහන්ස, හස්ති බන්ධ, අස්ස බන්ධාදීවූ(ඇතුන් අසුන් ආදීන් බලන) මනුෂ්‍යයන්ද හසත්‍යශවාදී වූ තිරශ්චීන සත්වයන්ද(ඇත් අස් ආදී තිරිසන් සතුන්ද) රක්‍ෂා කරණසේක්, ස්වකීය පුත්‍රවූ මා රක්‍ෂා නොකරනසේක් දැ"යි නින්දා කිරීමෙන් හා අනුග්‍රහ කිරීමෙන් මෙසේ වදාළසේක.

අහස්හි හිඳ මෙසේ ධර්‍මදේශනා කරන්නා වූ බෝධිසත්වයන් වහන්සේගේ ධර්‍මය අසා "පුත්‍රය, මෙසේ වර(නරුණු මෙසේ හෙයින්) මම්ම පෝෂ්‍ය කරමි"යි කියා අත දිගුකළ සේක. අනෙකුත් සත්වයෝ දහස් ගණන් අත් දිගු කළාහුය. බෝධිසත්වයන් වහන්සේ අනෙක් කෙනෙකුගේ අතට නොබැස රජහුගේ අතටම බැස ඇකයෙහි උන්සේක. රජ්පුරුවෝ අප මහබෝධිසත්වයාණන් වහන්සේට යුව රාජ්‍යය දෙවුසේක. මෑණියන් වහන්සේ අගමෙහෙසි කළසේක. බෝධිසත්වයන් වහන්සේ රජහු ඇවෑමෙන් 'කාෂ්ටවාහන" නම් රජව, දැහමෙන් සෙමෙන් රාජ්‍ය කොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියසේක.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ කොසොල් රජහට මේ ජාතක ධර්‍මදේශනාව ගෙනහැර දක්වා වදාරා අතීත කථාව හා වර්ථමාන කථාව දක්වා පූර්‍වාපර සන්ධි ගලපා මේ 'කට්ඨහාරි ජාතකය' නිමවා වදාළසේක.

එසමයෙහි මෑණියෝ නම් දැන් මහාමයා දේවිය. පියාණෝ නම් සුදෙවුන් මහරජාණෝය. කාෂ්ටවාහන නම් රජව උපන්නෙම් තිලෝගුරු සම්‍යයක් සම්බුදුරජු වූ මම්ම වෙම්දැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 008. ගාමණී ජාතකය

තවද එක් සමයෙක්හි සනරාමර ලෝකගුරු වූ(දෙව් මිනිසුන් සහිත ලෝකයාට ගුරු වූ) බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සේක් පසුබට වීර්‍ය්‍යය ඇති භික්‍ෂූන් කෙනෙකුන් අරඹයා මේ ජාතකය වදාළසේක.

මේ ජාතකයේ වර්ථමාන කථාවත් අතීත කථාවත් එකොළොස් වැනි නිපාතයෙහි වූ 'සංවර' ජාතකයෙහි මතු පහල වන්නීය.

ගාමිණී කුමාරතෙම බෝධිසත්‍වයන් වහන්සේගේ අවවාදයෙහි පිහිටා ජ්‍යෙෂ්ඨභ්‍රාතෘවූ(වැඩි මහලු සොහොයුරන් වූ) කුමාරවරුන් සියයකට බාලව සියයක් පමණ භ්‍රාතෘන් පිරිවරා ධවලච්ඡත්‍රයාගේ(සුදු කුඩය) යට උතුම් ආසනයෙහි හුන්සේක් "තමාගේ ඓශ්වර්‍ය්‍ය සම්පත්තිය අපගේ අචාර්‍ය්‍යන් වහන්සේ සන්තකය"යි සතුටුව ප්‍රීතිවාක්‍ය පවත්වන සේක්

“නුවණැත්තවුන්ගේ අවවාදයෙහි සිට තුරිත(ඉක්මන්) නොව උපාය ක්‍රමයෙන් කර්මාන්තයෙහි ප්‍රයුක්තයනට(යෙදුනවුන්ට) ප්‍රාර්ථිත වූ(පතන ලද්දවූ) ප්‍රයොජනයෙහි ආසාව සමෘද්ධ වේමය. දනාර්ථ, ප්‍රියවචන, සමානාත්මතායයි(දීම, යහපත පිණිස ක්‍රියා කිරීම, යහපත් වචනය, අන්‍යයන්ද තමන් හා සමසේ සැලකීම) කියනලද බ්‍රහ්මචර්‍ය්‍යාව මූලික වූ සමාපත්තීන් ද මුහුකුරා සිටි බැවින් පරිපක්වූ(මුහුකුරා ගිය) බ්‍රහ්මචර්‍ය්‍යාව ඇතිවීමි. ගාමණී කුමාරය, මෙසේ දැන ගනුවයි කියා තමන් සර්‍වජන ජ්‍යෙෂ්ඨ බැවින් ආත්ම ද්විතීයකොට(සියලු දෙනාට නායක බැවින් තමා දෙවෙනියාකොට සිතා) තමන්ට ආමන්ත්‍රණයකොට ‘ආචාරීන්’ වහන්සේ නිසා බෑයන් සියයක් ඉක්මවා මේ මහා රාජ්‍යයට පැමිණීයෙමි”යි ප්‍රීති වාක්‍ය පැවැත්වූ සේක.

ගාමිණී කුමාරයන් රාජ්‍යයට පැමිණී සත් අට දවසක් ඇවෑමෙන් සියලු භ්‍රාතෘ වූ කුමාරවරහු තමන් වසන තැනට ගියාහුය. ගාමිණී මහරජතෙම දැහැමෙන් රාජ්‍යය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියේය. බෝධිසත්‍වයන් වහන්සේද දනාදී පින්කම්කොට කම්වූ පරිද්දෙන් මියපරලොව ගියසේක. ශාස්තෘ වූ බුදුරාජාණන් වහන්සේ මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා වදරා චතුස්සත්‍යය ප්‍රකාශකොට වදළසේක. චතුස්සත්‍යයාගේ අවසානයෙහි පසුබට වීර්‍ය්‍ය ඇති භික්‍ෂූන් වහන්සේ අරහත් ඵලයෙහි පිහිටිසේක.

බුදුරජාණන් වහන්සේ අතීත කථාව හා වර්ථමාන කථාව ගෙනහැර දක්වා වදරා පූර්වාපර සන්ධි ගලපා මේ ‘ගාමිණී ජාතකය’ නිමවා වදාළසේක.

## 009. මඛාදෙව ජාතකය

තවද එක් සමයෙක්හි සර්වලෝකෛකාදීපායමාන වූ(මුළු ලොවට එකම පහනක් වැනිවූ) තිලෝගුරු බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර නිසා ජේතවන මහාවිහාරයෙහි වාසය කරණසේක් මහබිනික්මන් (පැවිදිව නිවන්සුව සොයනු පිණිස ගිහිගෙය හැරයාම) අරභයා මේ ජාතකය වදාළසේක.

එක් සමයෙක්හි භික්‍ෂූන් වහන්සේ සර්වඥයන් වහන්සේ මහබිනික්මන් වර්ණනා කොට කොට උන්සේක. එකල්හි සර්වඥයන් වහන්සේ දම්සභා මණ්ඩපයට අවුත් බුද්ධාසන මස්තකයෙහි වැඩහුන්සේක් භික්‍ෂූන් වහන්සේට ආමන්ත්‍රණය කොට “මහාණෙනි, දැන් කිනම් කථාවකින් යුක්තව උනුද? කිනම් කථාවක් දැන් තොපට අඩාලවීදැ”යි(කොට නිමකළ නොහැකි වීදැයි” වදරා “ස්වාමීනි, අනික් කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ, නුඹවහන්සේගේ මහබිනික්මන් වර්ණනා කොට කොට උනුම්හ”යි කී කල්හි “මහණෙනි, සර්වඥයන් වහන්සේ නික්මුනේ දැන් මතු නොවෙයි, පළමුත් නික්මුනේවේදැ”යි වදාළසේක. භික්‍ෂූන් වහන්සේ ඒ අර්ථය ප්‍රකාශ කරනු සඳහා සර්වඥයන් වහන්සේට ආරාධනා කළසේක. භාග්‍යවත්වූ බුදුරජාණන් වහන්සේ

භාවාන්තරප්‍රච්ඡන්න වූ(අතුරු භවයෙන් වැසුණු) කාරණය ප්‍රකාශකොට වදාළසේක.

යටගිය දවස විදෙහ රාජ්‍යයෙහි මියුලුනුවර මඛාදේව නම් රජ්ජුරු කෙනෙක් දශරාජ ධර්‍මයෙන් අකොපප්‍යකොට(කඩ නොකට) සර්‍වධර්මිෂ්ඨව රාජ්‍යය කරන්නාහුය. ඒ රජ්ජුරුවෝ සුවාසුදහසක්(අසූහාර දහසක්) අවුරුදු කුමාර ක්‍රීඩා කොට, සුවාසුදහසක් අවුරුදු යුවරජකම් කොට, සුවාසුදහසක් අවුරුදු එකරාජ්‍ය කොට බොහෝකල් යවා එක් දවසක් කපුවාට බණවා(කරණවෑමියාට කථාකොට) කියන්නාහු "යහළු කපුව, යම් දවසක් මා ඉස නරකෙසක්(ඉදුනු කෙසක්) දුටුයේ වීනම් එදවස් මට කියව"යි කිවූය. කපුවාත් බොහෝ කලයක් යවා එක් දවසක් රජ්ජුරුවන්ගේ අඳුන්වන් කෙස් අතුරේ(කළු කෙස් අතර) තුබූ එකම නරකෙසක් දැක "රජ්ජුරුවන් වහන්ස, කෙස් අතුරේ නරකෙන්දක් පෙණෙන්නේය"යි කීය. "එසේ වීනම් සබඳ කපුව, නරකෙස උදුරා මා අත්ලෙහි තබව"යි කී කල්හි රන් අඬුවෙන් නරකෙස උදුරා රජ්ජුරුවන් අත්ලෙහි තැබීය. එසමයෙහි රජ්ජුරුවන්ට සූවාසුදහසක් අවුරුදු ඉතිරිව සිටියේය. එසේ වී නමුත් නරකෙස දැකලාම "මෘත්‍යු රාජයා ඇවිත්(මරණය පැමිණ) සමීපයෙහි සිටියාක් මෙන්ද තමන් ගිනිගත් පන්සලකට වන්නාක් මෙන්දැ"යි සිතමින් සංවේගයට පැමිණ තුමූ තමන්ට අවවාද කරන්නාහු "අඥානවූ මඛාදේවයෙනි, ඉස නර නැගෙන තුරුත් කෙලෙසුන් ඇරපිය නුහුණුවාහුද?(හිසකෙස් සුදුවන තුරුත් කෙලෙස් දුරුකරගත

නොහැකිවීද?) තොපසේ වූ අඥනයෝ නැතැ"යි තමන්ටම නින්ද කළාහුය.

මෙසේ රජ්ජුරුවන්ට නරකෙස් පහළ වූ නියාව කල්පනා කරත් කරත් අභ්‍යන්තරයෙහි දහ වැදගත. සකල ශරීරයෙන් ඩා වැගිරෙන්ට පටන් ගත්තේය. එවේලෙහි රජ්ජුරුවෝ "අදම නික්ම මහණදම් කරන්නට වටනේය"යි කපුවාට ලක්‍ෂයක් වස්තු උපදනා ගම්වරයක් දී ප්‍රධාන පුත්‍ර වූ රාජ්‍ය කුමාරයන් කැඳවා "පුත, මා ඉස නරකෙසක් පහළවිය. එසේ හෙයින් මම මහලුව ගියෙමි, මා විසින් මනුෂ්‍ය ලෝකයෙහි අනුභව කළමනා සම්පතුන් අනුභව කරන ලද්දේය, දැන් දිව්‍ය සම්පතුන් අනුභව කරන්නාව කැමැත්තෙමි, එසේ හෙයින් මහණ වන්නට දැන්ම මට කල් වන්නේය, තෙපි මේ රාජ්‍යය පාවා ගනුව, මම මහණව මඛාදේව නම් අඹ උයනේ වැස මහණදම් කෙරෙමි"යි කිවූය.

මෙසේ මහණ වනු කැමැත්තාවූ රජ්ජුරුවන් කරා අමාත්‍යයෝ එළඹ "ස්වාමීනි, නුඹවහන්සේ කවර කාරණයකින් මහණවන සේක්දැ"යි විචාළෝය. රජ්ජුරුවෝ නරකෙස අතින්ගෙන අමාත්‍යායන්ට තමන් මහණවන කාරණය කියන්නාහු "ප්‍රථම වයසය, මධ්‍යම වයසය, පශ්චිම වයසය යි කියනලද තුන් වයසම නසන හෙයින් වයස පැහැර ගන්නා වූ මේ නරකෙස මාගේ හිස අටගත්තේය. හිස නරකෙස් අටගත් විටම මරණය අවුත් නළල්තෙලෙහි සිටියා නම් වෙයි. නරකෙස් නම් යමරජ්ජුරුවන්ගෙන් එවූ දේවදූතයන්

වැන්නෝය. එසේ හෙයින් අදම මට මහණවන්නට කල් වන්නේය"යි අමාත්‍යයන්ට කියා එදවස්ම රාජ්‍ය හැර සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවැදිව මඛාදේව නම් අඹ උයනේ වෙසෙමින් සුවාසූදහසක් අවුරුදු මුළුල්ලේහි මෛත්‍රිය, කරුණා, මුදිතා, උපේක්ඛා යයි කියනලද චතුර්විධ බ්‍රහ්මවිහාර භාවනාකොට(සිවු වැදැරුම් උතුම් විහරණ වඩා) නොපිරිහුණාවූ ධ්‍යානයෙන් ගොස් බ්‍රහ්ම ලෝකයෙහි ඉපිද නැවත එයින් චුතව අවුත් මියළු නුවර ඉපිද පසුබස්නාවූ තමන්ගේ වංශය ගලපා(පිරිහෙන්නාවූ තමන්ගේ වංශය රැකදී) එම අඹ උයනෙහි මහණව බ්‍රහ්ම විහාර භාවනාකොට නැවත බ්‍රහ්ම ලෝකයෙහි උපන්නාහුය.

ශාසතෘ වූ බුදුරජාණන් වහන්සේ "මහණෙනි, සර්වඥයන් මහබිනික්මන් නික්මුණේ දැන්මතු නොවෙයි, පෙරත් නික්මුණේම වේදැ"යි මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදාරා චතුරාර්ය්‍ය සත්‍යය ප්‍රකාශ කළසේක. චතුස්සත්‍යය ධර්මදේශනාවගේ කෙළවර ඒ භික්ෂූන් වහන්සේ අතුරෙන් සමහර කෙනෙකුන් වහන්සේ සෝවාන් ඵලයෙහි පිහිටිසේක. සමහර කෙනෙකුන් වහන්සේ සකෘදාගාමී ඵලයෙහි පිහිටිසේක. සමහර කෙනෙකුන් වහන්සේ අනාගාමී ඵලයෙහි පිහිටිසේක. මෙසේ බුදුරජාණන් වහන්සේ අතීත කථාවත් වර්ථමාන කථාවත් දෙක එක්කොට සන්ධි ගලපා මේ 'මඛාදේව ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි කපුවා නම් දැන් මේ ආනන්ද ස්ථවිරයෝය. එසමයෙහි ප්‍රධාන පුත්‍ර නම් දැන් මේ රාහුල ස්ථිවිරයෝය. එසමයෙහි මඛාදේව රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යයක් සම්බුදු රජු වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 010. සුඛවිහාරි ජාතකය

තවද එක් සමයෙක්හි තුන්ලොවට නැගු ප්‍රදීපයක් වැන්නාවූ(දැල්වූ පහනක් වැනිවූ) සර්‍වඥයන් වහන්සේ අනුපිය නම් නුවර ආශ්‍රයකොට අනුපිය නම් අඹ වනයෙහි වැඩවසනසේක් සුඛවිහාරී වූ(පැවිදි සැපයෙන් කල් ගෙවන්නාවූ) භද්දිය ස්ථවිරයන් වහන්සේ අරඹයා මේ ජාතකය වදාළසේක.

සුඛවිහාරී වූ භද්දිය ස්ථිවිරයන් වහන්සේ ක්ෂත්‍රිය රාජකුමාරවරුන් සදෙනාගේ සමාගමයෙහි උපාලි ස්ථවිරයෙන් වහනසේ සත්වැනි කොට පැවිදි වූසේක. ඔහුන් අතුරින් භද්දිය ස්ථවිරයෙන් වහන්සේය, කිම්බිල ස්ථවිරයන් වහන්සේය, භගු ස්ථවිරයන් වහන්සේය, උපාලි ස්ථවිරයන් වහන්සේය, යන සතර දෙනා වහන්සේ රහත් වූසේක. ආනන්ද ස්ථවිරයන් වහන්සේ සෝවාන් වූසේක. අනුරුද්ධ ස්ථිවිරයන් වහන්සේ දිවැස් ලත්සේක. දෙව්දත් ස්ථවිරයන් වහන්සේ ධ්‍යානලාභී වූසේක. ක්ෂත්‍රිය රාජ කුමාරවරුන් සදෙනාගේ කථාව අනුපිය නුවර දක්වා ඛණ්ඩහාල ජාතකයෙහි මතු ප්‍රකශ වන්නේය.

ආයුෂ්මත් භද්දිය ස්ථවිරයන් වහන්සේ වනාහි රජවූ කල්හි තමන් රක්‍ෂා කරනසේක් රක්‍ෂාවට විධාන කිරීමද පළමුකොට බොහෝ ආරක්‍ෂාවෙන් රක්‍ෂා කරන ලදුව මතුමහල් තලයෙහි මහ යහන්හි ඔබිනොබ පෙරෙලෙමින් සයන කරන්නාවූ තමනට භය පැමිණීමද දැන් අරහත්ඵලයට පැමිණ අරණ්‍යාදී වූ යම් කිසි තැනෙක්හි හැසිරෙනසේක් තමාට පහ වූ බය ඇති බවද දක්නාසේක් “ඉතා සැපය”යි කිය කියා ප්‍රීති වාක්‍ය පවත්වන සේක. ඒ අසා භික්‍ෂූන් වහන්සේලා “ආයුෂ්මත් වූ භද්දිය ස්ථවිරියන් වහන්සේ අරහතත්‍වය ප්‍රකාශ කරනසේකැ”යි(තමා රහත්වූ බව ප්‍රකාශ කරතියි) කියා සර්‍වඥයන් වහන්සේට දැන්වූවාහුය. සර්‍වඥයන් වහන්සේ භික්‍ෂූන් වහන්සේලාට වදාරනසේක් “මහණෙනි, භද්දිය ස්ථිවිරයෝ සැපවිහාරිවූවෝ(සැපයේ වාසය කළෝ) දැන්මතු නොවෙති, පෙරත් සැපවිහාරිවූහ”යි වදාරා භික්ෂුන් විසින් ඒ කාරණය ප්‍රකාශ කරනු පිණිස යාඥා කල කල්හි සර්‍වඥයන් වහන්සේ භවයෙන් වැසී තුබුනු ප්‍රකාශකොට වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහා බෝධිසත්‍වයන් වහන්සේ ප්‍රසිද්ධවූ බ්‍රාහ්මණ මහාසාර කුලයෙක්හි ඉපද වැඩිවයසට පැමිණ වස්තුකාම, කෙලශකාමයෙහි(කාම වස්තුවල හා ඒවා නිසා උපදිනා කිළිටි අදහස්වල) ආදීනවද මහබිනික්මන් නික්මීමෙහි(කාම වස්තූන්ගෙන් ඈත්වීමෙහි) ආනිසංස ද දැක වස්තුකාම ක්ලේශකාම හැර හිමාල වනයට වැද ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන්(තවුස්

පැවිද්දෙන්) පැවිදිව අෂ්ටසමාපත්ති(රූපාවචර ධ්‍යාන සතර හා අරූපාවචර ධ්‍යාන සතර යන අට) උපදවා වාසය කරනසේක. උන්වහන්සේට මහත් පිරිවර වූයේය. පන්සියයක් පමණ තපස්වීහු වුවාහුය. අප මහබෝසත්ණන් වහන්සේ වර්ෂා කාලයෙහි හිමාලයෙන් නික්ම තපස්වී සමූහයා විසින් පිරිවරණ ලදුව ගම් නියම්ගම් ආදීයෙහි සැරිසරා වඩනාසේක් බරණැස් නුවරට පැමිණ රජුහු නිසා (රජුගේ ආරාධනාවෙන්) රාජොද්‍යානයෙහි වාසය කළසේක. එතැන්හි වැසි සාර මස වාසයකොට රජහට දැන් වූසේක. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ බෝධිසත්‍වයන් වහන්සේට කියනසේක් "ස්වාමීන්වහන්ස, නුඹවහන්සේ වෘද්ධසේක(මහළුය). හිමාලය වනයට යාමෙන් නුඹවහන්සේට කවර ප්‍රයෝජනයක්ද? අතවැස්සන් හිමාලය වනයට යවා මෙතැන්හිම වාසය කරව"යි කීයේය. බෝධිසත්‍වයන් වහන්සේ ප්‍රධාන අතවැසි තපස්වීන් වහන්සේට පන්සියයක් තපස්වීවරුන් භාරකොට "තෙපි යව, මේ තපස්වීවරුන් හා සමග හිමාලය වනයෙහි එතැන්හිම වාසය කරව, මම මෙතැනම වාසය කරමි"යි කිවූය.

බෝධිසත්‍වයන් වහන්සේගේ ප්‍රධාන අතවැසි තපස්වීන් වහන්සේ රාජ තපස්වීන් වහන්සේය. මහත් රාජ්‍යයක් හැර පැවැදිව කිසුණු පිරියම්(කසින අරමුණක් ගෙන කරන භාවනාව) කොට අෂ්ටසමාපත්තිලාභීව වසනසේක්, සෙසු තපස්වීන් හා සමග හිමාලය වනයෙහි වසනසේක්, එක් දවසක් ආචාරීන් වහන්සේ දක්නා කැමතිව ඒ තපස්වීවරුයන්ට ආමන්ත්‍රණය කොට "තෙපි උකටලී නොව

(කළකිරීමට නො පැමිණ) මෙතැන්හිම වාසය කරව, මම ආචාරීන් වහන්සේට නමස්කාරකොට එන්නෙමි"යි කියා ආචාරීන් වහන්සේගේ සමීපයට ගොස් නමස්කාරකොට පිළිසඳර කථාකොට එක් මැඩිලිපතක්(කොළ ඇතිරිල්ලක්) අතුට ආචාරීන් වහන්සේගේ සමීපයෙහිම උන්සේක. එවෙලෙහි බරණැස් රජ්ජුරුවෝ "තපස්වීන් වහන්සේ දකිමි"යි කියා උයනට ගොස් නමස්කාරකොට එකත්පසෙක්හි හුන්සේක. අතවැසි තපස්වීන් වහන්සේ රජ්ජුරුවන් දැකත් නොම නැගී සිටිසේක්ම හුන්සේක්ම(නොනැගිට හුන් අයුරින්ම ඉඳ) වනාහි "ඉතා සැපය ඉතා සැපය"යි කියා ප්‍රීති වාක්‍ය පැවැත්වූසේක.

රජතෙම සිතනුයේ "මේ තපස්වීන් වහන්සේ මා දැකත් නැගී නොසිටිසේකැ"යි අසන්තෝෂව බෝධිසත්‍වයන් වහන්සේට කියනසේක් "ස්වාමීන්වහන්ස, මේ තපස්වීන් වහන්සේ කැමති පරිද්දෙන් ආහාරය අනුභව කළසේක් ද? ප්‍රීති වාක්‍ය පවත්වනසේක් සැප සෙයයාව ම කරණසේකැ"යි කීයේය. "මහරජ, මේ තපස්වීන් වහන්සේ දැන් "මම පෙර ගිහි කල්හි රජ්‍යශ්‍රී අනුභව කරන්නෙමි ආයුධ ගත් අත් ඇති බොහෝ සේනාව විසින් රාක්‍ෂා කරණු ලබන්නේමි මෙබඳු සැපයක් නොලද්දෙමි" කියා තමාගේ ප්‍රව්‍රජ්‍යා සැපය, ධ්‍යාන සැපය අරභයා මේ ප්‍රීති වාක්‍ය පැවැත්වූයේය"යි වදාළසේක.

මෙසේද කියා බෝධිසත්‍වයන් වහන්සේ රජහට ධර්මදේශනා කොට වදාළසේක.

"යම් පුද්ගලයක්හු සෙසු බොහෝ පුද්ගලයෝ රක්‍ෂා නොකරෙද්ද? යමෙක් සෙසු බොහෝ සත්‍වයන් රක්‍ෂා නොකෙරේද? මහරජ, ඒ පුද්ගලයා වස්තුකාම, කේල්ශකාමයෙහි අපේක්‍ෂාවක් නැතිව හුදකලාව කායවිවේක, චිත්තවිවේක සැපයෙන් යුක්තව සයනය කරන්නේය. හුදෙක් සයනය කරන්නේම නොවෙයි, මෙබඳු පුද්ගලතෙම සැපසේ යන්නේය, සැපසේ සිටින්නේය, සැපසේ හිඳින්නේය, සැපසේ හෝනේය. සියලු ඊර්යයාපථයෙහි(ඉරියව්වල) සැපසේ කල්යවන්නේ. මහරජ, තෘෂ්ණාව නැත්තාවූ පුද්ගලතෙම සැපසේ වාසය කරන්නේය"යි වදාළසේක.

රජ්ජුරුවෝ බෝධිසත්‍වයන්ගේ ධර්‍මදේශනාව අසා තුටුපහටු සිත් ඇතිව නමස්කාරකොට වාසභවනයට ගියසේක. අතවැසි තපස්වීන් වහන්සේද ආචාරීන් වහන්සේට වැඳ හිමාලය වනයට වැඩිසේක. බෝධිසත්‍වයන් වහන්සේ වනාහි එතැන්හිම වාසය කරනසේක් නොපිරිපුන් ධ්‍යානයෙන් යුක්තව කාලක්‍රියා කොට බ්‍රහ්ම ලෝකයෙහි උපන්සේක. ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ මේ දම්දෙසුන් ගෙනහැර දක්වා අතීත කථාව හා වර්ථමාන කථාව වදුරා පූර්‍වාපර සන්ධි ගලපා මේ 'සුඛවිහාරී ජාතකය' නිමවා වදාළසේක.

එසමයෙහි අතවැසි තපස්වීන් වහන්සේ නම් දැන් භද්දිය ස්ථවිර වූසේක. ශාස්තෘන් උපන්නෙම් තිලෝගුරු සම්‍යයක් සම්බුදු රජුවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 011. ලක්ඛණ මිග ජාතකය

තවද එක් සමයෙක්හි පහකළා වූ කෙලෙස් මල ඇති සර්‍වඥයන් වහන්සේ රජගහනුවර නිසා වේළුවනාරාමයෙහි වැඩ වසනසේක් දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ අරභයා වදාළසේක.

දෙවදත්ත ස්ථවිරයන් වහන්සේගේ කථාව දුනුවායන් හැරීම දක්වා ‘ඛණ්ඩහාල’ ජාතකයෙහි විස්තර වශයෙන් පෙනෙන්නේය. ධනපාල නම් හස්ති රජයාගේ හැරීම දක්වා ‘චුල්ලහංස’ ජාතකයෙහි විස්තර වශයෙන් මතු පෙනෙන්නේය. දෙවදත්ත ස්ථවිරයන් පොළොව පලාගෙන ගියතැන් දක්වා සොළොස් වැනි නිපාතයෙහි ‘සමුද්දවාණිජ’ ජාතකයෙහි මතු පහළ වන්නේය.

එක් කලෙක්හි දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ පඤ්ච වස්තුවක් යච්ඤාකොට(වර පහක් ඉල්ලා) නොලත්සේක් සංඝයා බිඳුවා(සංඝභෙදය කොට) පන්සියයක් භික්‍ෂූන් කැඳවාගෙන ගයා නම් ගංහිස වාසය කරනසේක. එකල්හි ඒ භික්‍ෂූන් වහන්සේගේ ප්‍රඥාව මිහිකිරීමට ගියේය(මේරීමට පත් විය). සර්‍වඥයන් වහන්සේ ඒ භික්‍ෂූන්ගේ ප්‍රඥාව මුහුකළ බව දැන වදරා අග්‍රශ්‍රාවකයන් දෙදෙනා වහන්සේට ආමන්ත්‍රණය කොට “ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, තොප ආශ්‍රය කළාවූ පන්සියයක් භික්ෂූන් දෙවදත්ත ස්ථවිරයන්ගේ ලබ්ධිය රුස්වා(අදහස් පිළිගෙන) ඔහු හා සමග ගියාහුය. දැනුදු වනාහි ඒ භික්‍ෂූන්ගේ ප්‍රඥාව මිහිකිරීමට ගියේය. තෙපි

දෙදෙනා බොහෝ භික්ෂූන් හා සමග එතැනට ගොස් භික්ෂූන්ට ධර්මදේශනා කොට ඒ භික්ෂූන් මාර්ගඵලයෙන් ප්‍රබෝධ කරවා කැඳවාගෙන එව”යි වදාළසේක.

සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ එපරිද්දෙන් ගොස් ඒ භික්ෂූන්ට ධර්මදේශනා කොට මාර්ගඵලයෙන් පුබුදුවා දෙවැනි දිනයෙහි සූර්යෝද්ගමන වේලාවේ(හිරු උදාවෙද්දී) ඒ පන්සියයක් භික්ෂූන් කැඳවාගෙන වේළුවනාරාමයට වැඩියාහුය. ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ වේළුවනාරාමයට අවුත් සර්වඥයන් වහන්සේට නමස්කාරකොට සිටි කල්හි සෙසු භික්ෂූහු සැරියුත් මහතෙරුන් වහන්සේට ප්‍රශංසා කොට භාග්‍යවතුන් වහන්සේට මෙසේ දැන්වූවාහුය. “ස්වාමීන් වහන්ස, අපගේ ජ්‍යෙෂ්ඨ භ්‍රාතෘවූ(වැඩිමහලු සහෝදරයා වන) දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ පන්සියයක් භික්ෂූන් වහන්සේ විසින් පිරිවරණ ලදුව වඩනාසේක් ඉතා හොබනාසේක. දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ වනාහි පිරිහුණාවූ පිරිවර ඇතිසේකැ”යි කිවාහුය.

සර්වඥයන් වහන්සේ වදාරනසේක් “මහණෙනි, ශාරිපුත්‍ර ස්ථවිරයෝ නෑ සමූහයා විසින් පිරිවරන ලදුව එනසේක් හෙබියෝ දැන්මතු නොවෙති, පෙරත් ශෝභාවත් වූවාහුය. දෙවදත්ත ස්ථවිරයෝ ද පිරිවරින් පිරිහුණෝ දැන්මතු නොවෙයි පෙරත් පිරිහුණෝම”යි වදාළ කල්හි භික්ෂූන් ඒ කාරණය ප්‍රකාශ කරණු පිණිස භාග්‍යවතුන් වහන්සේට යාඥා

කළාහුය. භාග්‍යවතුන් වහන්සේ භවයෙන් වැසී තුබූ කාරණය ප්‍රකාශ කොට වදාළසේක.

යටගිය දවස මගධරට රජගහනුවර එක් මගධ රජෙක් රාජ්‍යය කරනසේක. එකල්හි බෝධිසත්ත්වයන් වහන්සේ මෘග ජන්මයෙහි(මුව යොනියෙහි) පිළිසිඳගෙන වැඩී, වයසට පැමිණ මුවන් දහසක් පිරිවරාගෙන වනයෙහි වසනසේක.

උන්වහන්සේට ලක්ෂණය, කාලයයි කියා පුත්‍රයෝ දෙදෙනෙක් වූවාහුය. අප මහබෝසතානන් වහන්සේ තමා මහළු වයසට පැමිණි කල්හි “පුත්‍රයෙනි, මම දැන් මහලුයෙමි, තෙපි මේ මෘග සමූහයා පරිහරණය කරවු”යි කියා පන්සියය පන්සියය බැගින් එක් එක් පුත්‍රයාට භාර කළසේක. එතැන් පටන් ඔහු දෙදෙන මෘග සමූහයා පරිහරණය කරන්නාහු ය. මගධරට ශස්‍ය සමීපයෙහි ගොයමින් අකපටු(ගැවසුණු) කල්හි වනන්තරයෙහි මෘගයන්ට උපද්‍රව වන්නේය. මනුෂ්‍යයෝ ශස්‍යයන් අනුභව කරන්නාවූ මෘගයන් මරණ පිණිස ඒ ඒ තන්හි වල් කණන්නාහුය(වළවල් සාරන්නාහුය). හුල් හිඳුවන්නාහුය. පාසාණ යන්ත්‍රයක් සදන්නාහුය(උගුල් අටවන්නාහුය). සොර මළ ආදිය අටවන්නාහුය(රහස් මළපුඩු තබන්නාහුය). බොහෝ මෘගයෝ විනාශයට පැමිණෙන්නාහුය. බෝධිසත්ත්වයන් වහන්සේ ශස්‍ය සම්බාධසමය(ශස්‍ය නිසා විපත් එළඹෙන කාලය) දැන පුත්‍රයන් කැඳවා ගෙන්වා අවවාද දෙනසේක් “පුත්‍රයෙනි, මේ තෙම ගොයමින් යුක්ත කල්වන්නේය. බොහෝ මෘගයෝ විනාශයට පැමිණෙන්නාහුය.

අපි වෘද්ධ වූම්හ. යම්කිසි උපායකින් එක්තැනෙක්හි කල්යවම්හ. තෙපි තොපගේ මෘග සමූහය ගෙන අරණ්‍යයෙහි පර්‍වත පාදයකට වැද ගොයම් ද මැඩි(කපා පාගාගත්) කල්හි එවු"යි කීසේක. ඔහු "යහපතැ"යි කියා පියාණන්ගේ වචනය අසා පිරිවර සහිතව නික්මුණාහුය.

ඔහුන් යන්නාවූ මර්ගයෙහි මනුෂ්‍යයෝ "මෙසමයෙහි මෘගයෝ පර්‍වතයට නැගෙන්නාහුය, මේ සමයෙහි බස්නාහුය"යි දන්නාහුය. ඔහු ඒ ඒ තැන සැඟවී හිඳ බොහෝ මෘගයන් විද මරන්නාහුය. කාල නම් මෘගරාජයා ද තමා අඥාන බැවින් "මෙනම් වේලෙහි යායුතුය, මෙනම් වේලෙහි නොයායුතුය"යි නොදන්නේ මෘගසමූහයා ගෙන පෙරවරුද පස්වරුද පෙරයම්හිද අළුයම්හිද ගම්දොරින්(ගම ඉදිරියෙන්) යන්නේය.

මනුශ්‍යයෝ ඒ ඒ තන්හි ස්වභාවයෙන් සිටියාහු ද සැඟවී සිටියාහු ද බොහෝ මෘගයන් විනාශයට පැමිණෙවුවාහුය. මෙසේ කාල නම් මෘගරාජ තෙමේ තමා නුවණ මද බැවින් බොහෝ මෘගයන් විනාශයට පමුණුවා ස්වල්ප වූ මෘගයන් පිරිවරණ ලදුව වනාන්තරයට වන්නේය. ලක්ෂණ නම් මෘගරාජ වනාහි පණ්ඩිතය, ව්‍යක්තය, උපායෙහි දක්ෂය, මේ වේලාවෙහි යා යුතුය, මේ වේලාවෙහි නො යායුතුයි දන්නේය. ඒ මෘගරාජ තෙමේ ගම්දොරින් ද නොයන්නේය, දවල් ද නොයන්නේය, පෙරයම්හිද නොයන්නේය, අලුයම්හිද නොයන්නේය. මෘගසමූහයා ගෙන මධ්‍යම රාත්‍රියෙහිම

යන්නේය. ඒ කාරණයෙන් එකම මෘගයෙකුදු නොනසා වනාන්තරයට වනි. ඒ මෘගයෝ එහි සාරමසක් වාසය කොට ගොයම් ද මිරිකූ කල්හි (කපා පාගාගත් පසු) පර්වතයෙන් බැස ආවාහුය.

කාල නම් මෘගරාජ තෙමේ පසුව එනුයේද පූර්වොක්ත ක්‍රමයෙන්(පෙර පරිදිම පැමිණ) අවශේෂ මෘගයන් විනාශයට පමුණුවමින් හුදකලාවම(තනිවම) අයේය. ලක්‍ෂණ නම් මෘගරාජ වනාහි එකම මෘගයකුදු නොනසා පන්සියයක් මුවන් විසින් පිරිවරණ ලදුව මව්පියන් දෙදෙනාගේ සමීපයට ආයේය. බෝධිසත්‍වයන් වහන්සේ මෙසේ එන්නාවු පුත්‍රයන් දැක මෘගසමූහයා සමග මන්ත්‍රණය කරනසේක් මෙසේ කථාවක් පහළ කළසේක. "ආචාර ශීලයෙන් සමන්විත වූ ධර්‍ම පටිසන්ථාරය(ධර්මය කියාදීමෙන් සත්කාර කීම) ආමිස සන්ථාරය(සිවුපසයෙන් සත්කාර කිරීමය) යන ද්විවිධ වූ පටිසන්ථාරය ප්‍රවෘත්ති(තම පැවත්ම) කොට ඇත්තවුන්ට අභිවෘද්ධි වන්නේය. ඥාති සමූහයා විසින් පිරිවරණ ලදුව එන්නාවු ලක්‍ෂණ නම් මෘගරාජයා බලව, ඉක්බිත්තෙන් නෑයන්ගෙන් විශේෂයෙන් පිරිහී එන්නාවූ මේ කාල නම් මෘගරාජයා බලව"යි කියා බෝධිසත්‍වයෝ මෘගධෙනුවට නියෝග කළසේක. මෙසේ ලක්‍ෂණ නම් පුත්‍රයාට වනාහි සන්තෝෂ වූ බෝධිසත්‍වයන් වහන්සේ ජීවිතාන්තය දක්වා සිට, කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියසේක.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ වදාරණසේක් “මහණෙනි, ශාරිපුත්‍ර ස්ථවිර ඥාති සමූහයා විසින් පිරිවරණ ලදුව ශෝභාවත් වූවෝ දැන්මතු නොවෙති, පෙරත් ශෝභාවත්වූ වූවාහුය. දෙවදත්ත ස්ථවිරයෝ පිරිවර සමූහයා කෙරෙන් පිරිහුණෝ දැන්මතු නොවෙති, පෙරත් පිරිහුණෝමය”යි වදාරා මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදාරා අතීත කථාව හා වර්ථමාන කථාව ගළපා පූර්වාපරසන්ධි යොදා මේ ‘ලක්‍ෂණමෘග ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි කාල නම් මෘගතෙම දැන් දේවදත්ත ස්ථවිර වූයේය. පර්ෂද්(පිරිස) තොම දෙවදත්ත ස්ථවිරයන්ගේ පර්ෂද් වූවාය. ලක්‍ෂණ නම් මෘගරාජතෙම දැන් ශාරීපුත්‍ර ස්ථවිරයන් වූයේය. ඔහුගේ පර්ෂද්තොම දැන් බුදුපිරිස් වූවාය. එකල්හි මාතෘ වූ මෘගධෙනුව දැන් රාහුල මවු වුවාය. පිතෘ වූ මෘගරජව උපන්නෙම් වනාහි දැන් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 012. නිග්‍රොධ මිග ජාතකය

තවද එක් සමයෙක්හි අසරණ සරණ වූ තිලෝගුරු සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර නිසා දෙව්රම් වෙහෙර වැඩ වසනසේක් කුමාර කාශ්‍යප ස්ථවිරයන් වහන්සේගේ මෑණියන් අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ තෙරුන් වහන්සේගේ මෑණියෝ නම් රජගහනුවර මහ සම්පත් ඇති සිටාණ කෙනෙකුගේ දියණි කෙනෙක පූර්

ජන්මයෙහි රැස් කරනලද බොහෝ කුසල් මුල් ඇත්තෝය. අනිත්‍යාදී වශයෙන් පරීක්‍ෂා කරනලද සංස්කාර ධර්‍මයන් ඇත්තෝය. පශ්චිමාත්මභාවයෙහි (අන්තිම ආත්මයෙහි) සිටියාහුය. කළ තුළෙහි දැල්වූ පහනක්මෙන් මුන්ගේ අර්හත් ඵලයට උපනිශ්‍රය(වාසනා මහිමය) බබලන්නේය. ඒ සිටුකුමාරිකා තමා නම දන්නා තැන් පටන් ගිහිගෙයි ඇල්මක් නැතිව මහණවනු කැමතිව දෙමව්පියන්ට කියන්නී "මෑණියනි, පියාණෙනි, මට ගිහිගෙයි විසීමෙහි සිත නෑලෙන්නේය. මම නෛර්‍ය්‍යාණික වූ සර්‍වඥශාසනයෙහි මහණවනු කැමැත්තෙමි, මා මහණ කරව"යි කිවූහ. එබස් ඇසූ දෙමව්පියෝ කියන්නෝ "දුවණියෙනි, කුමක් කියවුද? අපගේ ගෙයි බොහෝ වස්තු වන්නේය. තොපිත් අපගේ එකම දියණියෝය. එසේ හෙයින් තොප මහණවන්ට නොපිළිවන්ය"යි කිවූය. ඒ සිටු කුමාරිකාව නැවත නැවතත් යාච්ඤා කොට දෙමව්පියන්ගෙන් මහණ වීමට අවසරයක් නොලැබ සිතන්නී "වන්නාටය(එසේ වේවා) පුරුෂයකුට පාවා දුන්කල ඒ පුරුෂයා සිත්ගෙන මහණ වෙමි"යි සිතූය.

ඉක්බිත්තෙන් ඒ සිටුදුව වැඩිවිය පැමිණි තැනැත්තී දෙමව්පියන් පාවා දෙන ලද පුරුෂයාගේ ගෙට ගොස් පතිදෙවතාව(ඒ ස්වාමිපුරුෂයා දෙවියෙකු මෙන් සිතන්නී) පඤ්චසීලයෙන් හා ආචාරසීලයෙන් යුක්තව දනාදී වූ පින්කම් කෙරෙමින් ගිහිගෙයි විසූය. එකල ඔවුන් දෙදෙනාගේ සංවාසයෙන් සිටු කුමාරිකාව බඩ දරු ගර්භයෙක් පිහිටියේය. ඕ තොමෝ දරුගැබ පිහිටි බව නොදන්නීය.

ඉක්බිත්තෙන් එක් දවසක් එනුවර නක්‍ෂත්‍ර ඝෝෂණය(නකත් කෙළියට දිනය බව හඬගා කීම) කොට සියලු නුවරවාසීහු නකත් කෙළි කෙළින්ට පටන් ගත්තාහ. සැවැත් නුවර මුළුල්ල ශක්‍රපුරයක්මෙන් සරසා පිළියෙල කරන ලද්දේ විය. ඒ කුමාරිකාවද දැන් මහත්වූ නක්‍ෂත්‍ර ක්‍රීඩාව පවත්නා කල්හි තමාගේ ශරීරය සුවඳ ආදීය ගල් වන්නීත් නොවෙයි. වස්ත්‍රාභරණාදීන් සැරහෙන්නීත් නොවෙයි, තමාගේ පියවි ස්වභාවයෙන්ම ඇවිදින්නීය. ඇගේ වල්ලභයාණෝ ද මෙසේ කීවාහුය. "සොඳුර, මේ සියලුම නුවර නකත් කෙළි කෙළීම ඇසුරුකොට ඇත්තේය. තෙපි කුමක් නිසා ශරීරය පටිජග්ගනය(සැරසීම) නොකරව්දැ?"යි කීහ. "ස්වාමිපුත්‍රය, දෙතිස් කුණුප කොට්ඨාශයෙන් පිරුණා වූ මාගේ ශරීරය වස්ත්‍රාභරණාදීයෙන් සැරහීමෙන් ප්‍රයෝජන කිම්ද? මාගේ ශරීරය ද දෙවියන් විසින් නිර්මාණය කරන ලද්දේත් නොවෙයි. බ්‍රහ්මයන් විසින් නිර්මාණය කරන ලද්දේත් නොවෙයි. ස්වර්ණයෙන් නිර්මිතත්(රනින් සාදන ලද්දේත්) නොවොයි. මාණික්‍යයෙන් නිර්මිතත් නොවෙයි. හෙළ සඳුන් ආදී වූ චන්දනයෙන් නිර්මිතත් නොවෙයි. රත් පියුම්, හෙළ පියුම්, රක්තෝත්පල, ස්වේතෝත්පල ගර්භයෙන්(රතු නෙළුම්, සුදු නෙළුම්, රතු මානෙල්, සුදු මානෙල් මල් තුලින්) උපන්නේත් නොවෙයි. දිව්‍ය ඖෂධයකින් කරන ලද්දේත් නොවෙයි. වැලි කෙසේ උපන්නේද යත්: කුණපයෙහි අට ගත්තේය. මව්පිය දෙදෙනාගේ සම්භවයෙන්(එක්වීමෙන්) ජාතය, අනිත්‍යය, ඉලීම්, මැඩීම්, බිඳීම්, නැසීම් ස්වභාවකොට

ඇත්තේය. සෝනළු(සොහොන් අළු) ගොඩ වර්ධනය කරන්නේය. තෘෂ්ණා, උපාදන දෙකෙන් යුක්ත ශෝකයට මූලකාරණය, හැඬීමට වස්තුය(කරුණු වේ). සියළු රෝගයට වාසස්ථානය, දෙතස් කම් කටුල්(තිස් දෙකක් වූ වධ බන්ධන) කරන්න වුන්ට පරිග්‍රහ කරන ලද්දේය(අයිතිකර දෙන ලද්දේය). ඇතුළෙහි කුණුය, පිටද නිරන්තරයෙන් වෑහෙන්නා වූ කුණු ඇත්තේය, අසූ දහසක් කෘමිකුලයන්ට(පණුරැසසට) වාසස්ථානය, අමුසොහොනට ලංව සිටියේය. මරණයාගේ කෙළවර සියලු ලෝකවාසීන්ගේ චක්‍ෂුපථයෙහි(ඇස් ඉදිරිපිට) පවත්නා වූ මේ ශරීරය තුන්සීයක් පමණ ඇට සඟලින් ද, නවසියයක් නහරින් ද යෙදුනේය. සමින් ද, නවසියයක් මස් වැදැල්ලෙන් ද, දලබුයෙන්ද යුක්තය. මේ කීවා වූ සියල්ලම මේ සමින් වැසී සිටිය. එසේ හෙයින් තත්වූ පරිද්දෙන් පිටත සිටියවුන්ට නොපෙනෙන්නේය. ඇතුණෙන් ද(බඩවැල් වලින්) පිරී සිටියේය. උදරයෙන්ද පිරී සිටියේය. අක්මාවට ද, හෘදය මාංසයට ද, පපුකැත්තට ද, වකුගඩුවට ද, බඩදිවට ද, සොටුවට ද, කෙළට ද, සෝදියට ද (දඩියට), මේදතෙලට ද, සඳමිදුලට ද, පිත්තයට ද වාසස්ථානය(නිවෙස් වන්නේය). තවද ඒ සත්වයාගේ නවමහ දොරින් හැම වේලෙහිම අසූචි වහනය වන්නේය(වැගිරෙන්නේය). දෑසින් රිල් ව්‍යවහාරයෙන්(කබ යන නමින් හඳුන්වන) අක්ෂි ගූථය ද(ඇස් මලද), දෙකන් සිලෙන් කාරදු ව්‍යවහාරයෙන්(කරාදු නමින්) හඳුන්වන කර්ණගූථය ද(කන් මලද) දෙනාස්පුටයෙන් සොටු ද, පිත්තය ද, සෙලෙමාව ද වෑහෙන්නේය. සමහර වේලෙහි

මුඛයෙන්ද වමනය කරන්නේය. ශරීරයෙන් සෝදිය(ඩහදිය) වහනය කරන්නේය. යලිදු ඒ සත්‍වයාගේ සිදුරු ඉස ඉස් මුලින්ද(සිදුරු සහිත හිස් මොළයෙන්ද) පිරුණෝය. අවිද්‍යාව පෙරදැරි කොට ඇත්තාවූ අඥාන සත්‍වතෙමේ යථොක්ත කුණප කෝට්ඨාශයන්ගෙන් යුක්ත වූ ඒ සත්‍වයා යහපතැයි සිතන්නේය. මේ ශරීරය අපමණ වූ ආදීනවයෙන් ද යුක්තය. විෂවෘක්‍ෂයට බඳු වූ උපමාත් ඇත්තේය. සියළු ව්‍යාධීන්ට වාසස්ථාන ය. උදක්(ඒකාන්තයෙන්) සියළු දුක්ඛයාගේ මුල ය. ඉඳින් මේ කුණප ශරීරයාගේ ඇතුළත පිටත වූයේ නම් ඒ කාන්තයෙන් දණ්ඩක් ඇරගෙන කෑමට පැමිණි කවුඩු බලු ආදීන් වළකන්නේය. මේ ශරීරය දුර්ගන්ධ වහනය කරන්නේය. එසේ හෙයින් අපවිත්‍රය, කුණපයක් වැනිය. පටකඩකින්(පට වස්ත්‍රයකින්) වසා තැබූ කසළ කොඩකට බඳු උපමා ඇත්තේය. ඇතුළත අසූචි පුරා පිටත සිතුයම් කළ මැටි කළයකට බඳු උපමා ඇත්තේය. තවද මේ ශරීරය නුවණැස් ඇත්තවුන් විසින් නින්ද කරන ලද, අඥාන සත්‍වයන් විසින් සතුටුවන ලද්දේය. ස්වාමිපුත්‍රය, මේ කුණප ශරීරය සරහා කුමක් කෙරෙම්ද? මේ ශරීරයාගේ සැරහීම අසුචි පිරුණා වූ කළයෙහි පිටත සිතියම් කරන්නාක් වැන්නේය"යි කිව. සිටු පුත්‍රයාණෝ ඒ කුමාරිකාවන් මෙලෙසින් අනිත්‍ය ප්‍රතිසංයුක්තව(අනිත්‍ය බව පළ කරෙමින්) කියන්නා වූ බස අසා මෙසේ කීහ.

"සොඳුර, තෙපි මේ ශරීරයෙහි මෙලෙසින් දේෂ දක්නාහු කවර හෙයකින් මහණ නොවවුදැ?"යි කිවූය.

"ස්වාමිපුත්‍රයාණෙනි, මහණ වීමට තොප විසින් සම්මත ලදිම් නම්(අනුමත දෙන්නේ නම්) අදම මහණ වෙමි"යි කීව. සිටුපුත්‍රයාණොත් "යහපත, මම තොප මහණ කරවිමි"යි කියා මහදන් පවත්වා මහත්වූ සත්කාර සම්මාන කොට මහත් වූ පෙලහරින් භික්ෂුණීන් වසන ආරාමයට ගෙන ගොස් ඒ කුමාරිකාව මහණ කරවන්නාහු, දෙව්දත් මහතෙරුන් වහන්සේට පක්‍ෂව හිඳිනා වූ භික්ෂුණීන් සමීපයෙහි මහණ කරවූහ.

ඒ කුමාරිකාව ද ප්‍රව්‍රජ්‍යාව ලැබ සම්පූර්ණ වූ චිත්ත සංකල්පනා(ඉටුකරගත් අදහස්) ඇත්තී සතුටු වූ සිත් ඇතිවූය. ඉක්බිත්තෙන් ඒ කුමාරිකාවන්ගේ දරු ගර්භය මිහිකිරීමට(මේරීමට) පැමිණියේය. චක්ෂුරාදී ඉන්ද්‍රියයන්ගේ අන්‍යථාත්වය(වෙනස්වීම) ද හස්තපාද, පෘෂ්ට ඉල්පුණු(අත්, පා සහ පිට ඉදී ඇති) බව ද, උදර පටලයාගේ මහත් බවද දැක භික්ෂුණීහු "ආර්යාව, තෙපි දැරී ඇත්තාක්(ගැබ් ගත්තාක්) මෙන් පෙනෙයි. මේ කිමෙක්දැ?"යි විචාළාහ.

"ආර්‍ය්‍යාවෙනි, මෙනම් කාරණයකැයි නොදනිමි, මාගේ ශීලය සම්පූර්ණය"යි කීව. ඉක්බිත්තෙන් ඒ භික්ෂුනිය අවශේෂ භික්ෂුණීහු දෙව්දත් මහතෙරුන් සමීපයට කැඳවාගෙන ගොස් "ආර්‍ය්‍යයන් වහන්ස, මේ කුලස්ත්‍රිය දුකසේ වල්ලභයා සිත් ලබාගෙන(සැමියාගේ කැමැත්ත) ප්‍රව්‍රජ්‍යාව ලද්දේය. දැන් වනාහී මෑගේ දරු ගර්භයෙක් පෙනෙන්නේය. අපි හැම මේ

ගර්භය ගිහිකල ලත් බවුත් මහණකල ලත් බවුත් නොනුම්හ, දැන් මීට කුමක් කරමෝදැ?''යි විචාළාහ.

දෙව්දත් ස්ථවිරයෝ ද තමන් නුබුදු බැවින් ද අනුන් කෙරේ ක්ෂාන්තියක්, මෛත්‍රියක්, දයාවක් නැති හෙයින් ද මෙසේ සිතූහ. "දෙව්දත් ස්ථිවිරයන් වහන්සේගේ පක්‍ෂයෙහි භික්ෂුණියක් කුසින් දරු ගර්භයක් පරිහරණය කරන්නීල. දෙවදත්ත ස්ථවිරයෝය ඒ බල බලා ඉඳිති යි මට නින්ද උපදවන්නේය යි මා විසින් මේ මෙහෙණිය මෙතැනින් නෙරපාපියන්ට සුදුසුය''යි ඒ දෙවදත්ත ස්ථවිරයෝ පරීක්‍ෂා නොකොටම ගල්කැටක්(ගලක්) පෙරලන කලක් පරිද්දෙන් උඩට පැන නැඟී "යව(පලායව), මෑ මෙතැනින් නෙරපාපියවු''යි කීය. ඒ භික්ෂුණියද දෙවදත්ත ස්ථවිරයන් කී බස් අසා උන් තැනින් නැඟී සිට වැඳලා සර්‍වඥයන් වහන්සේගේ පක්‍ෂයෙහි භික්ෂුණීන් වසන්නා වූ ස්ථානයට ගියාය.

ඉක්බිත්තෙන් ඒ බාල වූ මෙහෙණින්න භික්ෂුණීන්ට කියන්නී "ආර්‍ය්‍යාවෙනි දේව්දත්ත ස්ථිවිරයෝ බුදු නොවෙති. මට උන් සමීපයෙහි මහණව ඉඳිමෙන් ප්‍රයෝජන නැත. මේ ලෝකයෙහි අග්‍ර පුද්ගල වූ සර්‍වඥයන් වහන්සේ සමීපයේ මහණ වීමට අභිප්‍රාය කොට(අදහස් කොට) මා විසින් දුකසේ ලද්ද වූ මේ ප්‍රව්‍රජ්‍යාවම අන්තර්ධාන නොකරව. මා කැඳවාගෙන සර්‍වඥයන් වහන්සේ කරා ජේතවනාරාමයට යව''යි කීව.

ඒ භික්ෂුණීහු ද අළුත ගියා වූ භික්ෂුණිය කැඳවාගෙන රජගහනුවරින් පන්සාළිස් යොත්නක් තැන් මග ගෙවා අනුක්‍රමයෙන් ජේතවනාරාමයට පැමිණ සර්‍වඥයන් වහන්සේ වැඳ මේ කරුණ දැන්වූවාහුය. සර්‍වඥයන් වහන්සේ "මෑගේ දරුගැබ ගිහිකලම පිහිටියේයැ"යි සිතූසේක. එසේ නියම කොට දැනත් "ශ්‍රමණභවත් ගෞතමයෝ දේවදත්ත ස්ථිවිරයන් විසින් හරණලද මෙහෙණියක අරගෙණ ඇවිදිනාහ"යි තිර්තකයන්ට කියන්ට අවසර පෙනෙන්නේය. එහෙයින් මේ උපත් කතාව විචාරා සනිටුහන්(විනිශ්චය) කරන්නට ද සරාජික පර්ෂත් මධ්‍යයෙහි(රජුන් සහිත මහ පිරිස මැද) විනිශ්චය කරන්නට සුදුසු වන්නේ යයි දෙවැනි දවස් පසේනදී කොසොල් රජ්ජුරුවන් ද අනේපිඩු මහසිටාණන් ද සුළු අනාථපිණ්ඩිකයන් ද විශාකා මහඋපාසිකාවන් ද අනිකුත් ප්‍රසිද්ධ මහ කුලයන් ද කැඳවාලා මේ අධිකරණය විචාරා සනිටුහන් කරන්නට පාවා දුන්සේක. සවස් වේලෙහි සිව්වනක් පර්ෂත්(සිවු පිරිස) රැස්වූ කල්හි විනයට අග්‍රකොට තබන ලද්දා වූ උපාලි ස්ථවිරයන් වහන්සේට "යව, සිව්වනක් පර්ෂත් මධ්‍යයෙහි මේ දහර භික්ෂුණියගේ අධිකරණය(තරුණ භික්ෂුණියගේ නඩුව) විචාරා ශුද්ධ කරව"යි වදාළසේක.

"යහපත ස්වාමීනි"යි තෙරුන් වහන්සේ පර්ෂත් මධ්‍යයට ගොස් තමන් වහන්සේට පැමිණියාවූ ආසනයේ වැඩහිඳ රජ්ජුරුවන්ගේ ඉදිරියෙහි දී විශාඛා උපාසිකාවන් කැඳවා "යව, මහ උපාසිකාවෙනි, මේ ළදරු භික්ෂුණී අසවල් මස අසවල් දවස් මහණ වූව"යි තතව හෙයින්(ඇති සැටියෙන්)

දැන මේ දරුගර්භය මහණවෙන්නට පෙරාතුදේ හෝ පසුව දේ හෝ යි නියම දැන කියව”යි විශාඛාවන් අතට පාවා දුන්සේක.

විශාඛා මහඋපාසිකාවද “යහපත ස්වාමීනි” පිළිගෙන වට කොට තිරයක් අද්ද තිරය ඇතුළේ දී බාල භික්ෂුණියගේ හස්ත පාදදිය බඩ කෙළවර කොට බලා මාස් දවස් එක්කොට ගණන් පරිඤා කරවා ගිහිකල දරුගැබ ලත් නියාව තත්‍වහෙයින් දැන උපාලි ස්ථවිරයන් වහන්සේ සමීපයට ගොස් මේ වූනියාව දැන්වුවාය. තෙරුන් වහන්සේද සිව්වනක් පර්ෂද් මධ්‍යයෙහි දී ඒ භික්ෂුණිය ශුද්ධ(නිදෙස්) කළසේක. ඒ භික්ෂුණිය ද උපන් කිළුටින් ශුද්ධව(පිරිසුදුව) භික්ෂු සංඝයා වහන්සේද සර්‍වඥයන් වහන්සේද වැඳ සෙසු භික්ෂුණීන් හා සමඟ මෙහෙණින්නන් වසන්නාවූ ස්ථානයටම ගියාය. ඕ තොමෝ දරු ගර්භය මිහි කිරීමට පැමිණි කල්හි පියුමතුරා(පදුමුත්තර) සර්‍වඥයන් සමයෙහි කරනලද ප්‍රාර්ථනා ඇති මහානුභාව සම්පන්න වූ පුත්‍රයාණ කෙනෙකු වැදූය.

ඉක්බිත්තෙන් එක් දවසක් පසේනදි කොසොල් රජ්ජුරුවෝ මෙහෙණවර සමීපයෙන් යන්නෝ දරුවන් අඬන අඬ අසා අමාත්‍යයන් අතින් “මේ කිමෙක්දැ?”යි විචාළාහ. අමාත්‍යයෝද ඒ කාරණය දැක “රජ්ජුරුවන් වහන්ස, ඒ දවස් සිව්වනක් පර්ෂද් මධ්‍යයේදී අධිකරණ විචාරා සනිටුවහන් කළ භික්ෂුණීන් වහන්සේ පුත්‍රයාණ කෙනෙකුන් වැදූසේක. ඔවුන්ගේ මේ ශබ්දය”යි කීවාහුය. “සගයෙනි භික්ෂුණීන්ට දරුවන්

පරිහරණය කිරීම නම් තපසට ඉතා පළිබෝධය(හිරිහැර සහිතය). අපි ඒ කුමාරයන් වඩම්හ''යි කියා ගෙන්වාගෙන නාටක ස්ත්‍රීන්ට පාවා දෙවා කුමාර පරිහරණයෙන්(රජ කුමාරෙකු හදා වඩා ගන්නාක් මෙන්) ඇති දැඩි කළහ.

ඒ කුමාරයන්ට නම් තබන දවස 'කාශ්‍යප'යයි නම් තුබූහ. ඉක්බිත්තෙන් ඒ කුමාර පරිහරණයෙන් වැඩුණු බව හේතුකොටගෙන 'කුමාර කාශ්‍යප' යයි කියා නම් තුබුවාහුය. ඒ කුමාරයෝද සත් හැවිරිදි අවස්ථාවෙහි සර්වඥයන් සමීපයෙහි මහණව සම්පූර්ණ වූ විසි වයස් ඇතිව උපසම්පදව ලැබ කල්ගිය පසු බණ කියන්නාවුන් අතුරෙහි විචිත්‍ර කථික වූවාහුය. ඉක්බිත්තෙන් ඔහු සර්වඥයන් වහන්සේද "මහණෙනි, මාගේ ශාසනයෙහි විසිතුරු කොට බණ කියන්නාවූ ශ්‍රාවකයන් අතුරෙන් යම්මේ කුමාර කාශ්‍යප ස්ථවිරයෙක් ඇද්ද, මේ තෙම අග්‍රය''යි(අග්‍ර තනතුරේ) පිහිටුවා වදාළසේක. උන්වහන්සේද පසුව කල්යාමෙකින් 'වම්මික' සූත්‍ර දේශනාවේ දී බණ අසා අරහත්වයට පැමිණි සේක. ඒ කුමාර කාශ්‍යප ස්ථවිරයන්ගේ මව් භික්ෂූණියද විදර්ශනා වඩා අරහත්ඵලයට පැමිණියාය. ඒ කුමාර කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ද සර්වඥ ශාසනයෙහි ආකාශයෙහි චන්ද්‍රයා පරිද්දෙන් ප්‍රකාශ වූසේක.

එක් දවසක් සර්වඥරාජෝත්තමයාණන් වහන්සේ පස් බත ආහාර පයෝීෂණයෙන් වැළකීසේක් (පස්වරුවෙහි පිඩුසිගා යාමෙන් වැළකුණු සේක්) වළඳා අන්තයෙහි භික්ෂූන් වහන්සේට අවවාද දී ගඳකිළියට වන්සේක. භික්ෂූන් වහන්සේ අවවාද

පිළිගෙන තම තමන් වහන්සේගේ රාත්‍රි ස්ථාන, දිවාස්ථානයෙහි(රෑ ගත කරන, දවල් ගත කරන තැනහි) දවල් දවස් යවා(දිවාකාලය ගෙවා) සවස් වේලෙහි දම්සභා මණ්ඩපයට රැස්ව “ඇවැත්නි, දෙවදත්ත ස්ථවිරයෝ තමන් නුබුදු බැවින් ද ක්‍ෂාන්ති මෛත්‍රියක් නැති බැවින් ද ඔහු විසින් කුමාර කාශ්‍යප ස්ථවිරයෝ ද උන්වහන්සේට මව් වූ ස්ථවිරීහු ද නෙරණනා ලදහ (නෙරපා හරින ලදහ). සර්‍වඥයන් වහන්සේ වනාහී තමන් වහන්සේ ධර්‍මරාජයන් බැවින්ද සියළු සත්‍වයන් කෙරෙහි පතලා වූ කරුණා මෛත්‍රි ආදිය ඇති බැවින්ද ඔවුන් දෙදෙනාට පිහිට වූසේකැ”යි සර්‍වඥයන් වහන්සේගේ ගුණ වර්‍ණනා කෙරෙමින් උන්සේක. බුදුරජාණන් වහන්සේද සර්‍වඥ ලීලාවෙන් දම්සභා මණ්ඩපයට වැඩ, පණවන ලද බුද්ධාසන මස්තකයෙහි වැඩහිඳ “මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි (පෙර) කවර කතාවකින් යුක්තව උනුදැ”යි විචාරා වදරා “නුඹවහන්සේ නොකියන්ට වදළා වූ රාජකථා, චෝරකථා ආදී වූ දෙතිස් කථාවෙන් යුක්තව උනුමෝ නොවම්හ. ද්වදත්ත ස්ථිවිරයන්ගේ පිහිට නොලැබ පලා ආ කුමාර කාශ්‍යප ස්ථවිරයන් හා මව් ස්ථවිරාවන් දෙදෙනාට පිහිට වූ නියාව කිය කියා උනුම්හ”යි ආදියෙහි පටන් සියළු ප්‍රවෘත්තිය දැන්වූහ. “මහණෙනි, සර්‍වඥයෝ මොහුන් දෙදෙනාට දැන්මතු පිහිටවූවෝ නොවෙති, පූර්‍වයෙහිත් ප්‍රත්‍යයත් පිහිටත් වූවාහු වේදැ”යි වදළසේක. භික්‍ෂූන් වහන්සේ ඒ අර්ථය ප්‍රකාශ කරන පිණිස භාග්‍යවත් වූ බුදුරජහට

යාච්ඤාකොට කීසේක. සර්වඥයන් වහන්සේ ද අන්‍ය භාවයෙන් සැඟවුනා වූ ඉකුත්වත් ප්‍රකාශකොට වදාළසේක.

ඒ කෙසේ ද යත්?

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජකෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි අප මහ බෝසතාණෝ මෘග(මුව) යෝනියෙහි පිළිසිඳ ගත්හ. බෝධිසත්වයෝද මව් කුසින් බිහි වූවාවූ රන්වන් වූ ශරීර වර්ණ ඇති වූහ. ඒ මෘග පෝතකයන්ගේ අක්ෂීහු දෙදෙන(දෙ ඇස) ඉන්ද්‍රනීල මාණික්‍යයකට බඳුවු සටහන් හා පෑ ඇත්තාහ. අංකුර දෙක(මෝදුවන අං දෙක) රජත වර්ණය(රිදීවන්ය). මුහුණ රත් පලස් හූවටක් බඳු වූ පැහැ(රතුපාට පට නූල් පන්දුවක පැහැය) ඇත්තේය. හස්ත පාදයන්ගේ(අත්පාවල) පර්යන්තයෝ(කෙළවරවල්) ලාක්ෂාරසයෙන් පිරියම් කරන ලද්දාහු(ලාකඩ දියර ගෑවාක්) වැනිය. වලාධිය චමර වලාධියක්(සෙමර මුවෙකුගේ වලිගයක්) වැනි වූයේය. එ මෘග පෝතකයන්ගේ ශරීරයද මහත් වූ අශ්වපෝතකයක්හුගේ (ලොකු අශ්වපැටවකුගේ ශරීරය තරම්) පමණ වූයේය. ඒ මුව රජ්ජුරුවෝ ද පන්සියයක් පමණ මුවන් විසින් පිරිවරන ලදුව වනයෙහි වාසය කරන්නාහ. නමින් නිග්‍රෝධ නම් මුව රජ්ජුරුවෝය. එ මුව රජ්ජුරුවන්ට නුදුරු වූ ස්ථානයෙහි පන්සියයක් මුවන් පිරිවරන ලදුව ‘ශාඛා මෘග’ නම් වූ අනිකුත් මුව රජ්ජුරුකෙනෙක් ඒ වනයෙහි වසන්නාහ. ඒ මුව රජ්ජුරුවෝ ද රන්වන් වූ ශරීර වර්ණ ඇත්තාහ.

එසමයෙහි බරණැස් රජ්ජුරුවෝද මුවන් මැරීමෙහි නියුක්තව වෙසෙති. මාංස නැතිව බත් අනුභව නොකෙරෙති. මනුෂ්‍යන්ගේ කර්මාන්ත(වැඩපල) නැතිකොට සියළු ගම් නියම්ගම් ජනපදවාසීන් රැස් කරවා දවස් පතා මුව දඩයමට යන්නාහ. මනුෂ්‍යයෝ මෙසේ සිතූහ. "රජ්ජුරුවන් වහන්සේ නිරන්තරයෙන් මුව දඩයමට යාමෙන් අප හැමගේ කර්මාන්ත පමා වන්නේය. අපි හැම රාජධානියෙහි මුවන්ට ගොදුරට නිසි තෘණ ආදිය රෝපණය කොට පැන් බොන්නා වූ ස්ථානයක් ද සමෘද්ධ කරවා(සකස් කොට) බොහෝ මුවන් වලින්(වනයෙන්) ගෙනවුත් උයනෙහි ලා දොර පැලලි(වැටකොටු) බැඳ රජ්ජුරුවන් වහන්සේට පාවා දුනුමෝ නම් යෙහෙකැ"යි සිතා ඒ සියළු මනුෂ්‍යයෝම එක්ව ගෙන උද්‍යානයෙහි තණ පැන් සමෘද්ධ කරවා මුගුරු ආදී වූ නොයෙන් ආයුධ ගත් අත් ඇතිව වලට වැද මුවන් සොයා ඇවිදිනා වූ වන මධ්‍යයෙහි සිටියා වූ මුවන් හා ශාඛ නම් මුව රජ්ජුරුවන් හා නිග්‍රෝධ නම් මුව රජ්ජුරුවන් වසන්නාවූ ස්ථානය මධ්‍ය කොට වටකළාහුය.

ඉක්බිති ඒ මෘග සමූහයා දැකලා ගස්වල ද වල්පිට ද බිමද මුගුරුවලින් ද දඬු ආදියෙන් ද ගසමින් මුවන් භය ගන්වා උගුළුවා(එළවා දමා) කඩු, අඩයටි, දුනු ආදී වූ ආයුධයන් ඔසවා පෑ(පෙන්වා) මහත්වූ ශබ්ද පවත්වමින් මෘග සමූහයා උයනට වද්දවා දොර පැලලි වසා රජ්ජුරුවන් කරා ගොස් "රජ්ජුරුවන් වහන්ස, දවසක් පාසා මුව දඩයමට ගොස් අප හැමගේ කර්මාන්ත නොනැසුව මැනව, අප හැම

විසින් වලින් මුවන් ගෙනවුත් නුඹවහන්සේගේ උයනෙහි ලන ලද. මෙතැන් පටන් ඔවුන්ගේ මස් අනුභව කළ මැනව"යි රජ්ජුරුවන්ට කියා තමන්ගේ ගම්වලට ගියාහුය. රජ්ජුරුවෝ උන් හැම කී බස් අසා උයනට ගොස් මුවන් බලන්නාහු, රන්වන් මුව රජ්ජුරුවන් දෙදෙනා දැක ඔවුන් දෙදෙනාට අභය දානය දුන්නාහ. එවක් පටන් කිසි දවසක රජ්ජුරුවෝ තුමූම ගොස් ඉන් එක මුවෙකු විද ගෙනෙන්නාහ. කිසි දවසක අරක්කැමියා ගොස් මුවකු විද ගෙනෙන්නේය. මුවෝ දුනු දැක මරණ භයින් තැති ගත්තාහු ඒ ඒ තැන සැඟ වී යන්නාහ. විත් (ඊපහර) දෙක තුන ලැබ බොහෝ දෙනා පීඩා විඳින්නාහ. තණින් පැනින් දුක් විඳ ලෙඩ වන්නාහු ද වෙති. මරණයට ද පැමිණෙති. මෘග සමූහයා මෙපවත් බෝධිසත්වයන්ට දැන්වූය. බොධිසත්වයෝ ද ශාඛ මෘග රජ්ජුරුවන් කැඳවාලා "යහළු, බොහෝ වූ මුවෝ වැළපෙති, නසති, ඒකාන්තයෙන් මැරිය යුතු බව නියම වූ පසු මෙතැන් පටන් ශරයෙන්(ඊයෙන්) මුවකු නොවිදිත්වයි, දන්ගෙඩිය තුබූ ස්ථානයට මුවන්ට වර(වාරය) පැමිණෝවයි, එක් දවසක් අපගේ පර්ෂදට(පිරිසට) වාරය පැමිණෝවයි, එක් දවසක් තොපගේ පර්ෂදට වාරය පැමිණෝවයි, වාරය පැමිණියා වූ මුවෝ ගොස් දම් ගෙඩියෙහි හිස තබලා වැද හොත්වයි, එසේ කල්හි මුවෝ ඒ වදයට නොපැමිණෙත්ව"යි සනිටුහන්(නියම) කළෝය. ඒ සියළු මෘගයෝම "යහපතැ"යි පිළිගත්හ.

එදවස පටන් වාරය පැමිණියාවූ මුවෝ ගොස් දන් ගෙඩිය මත්තෙහි හිස තබා වැද හොනේය. අරක්කැමියා අවුත් ඒ

දන්ගෙඩිය මත්තේහි වැද හොත්තාවූ මෘගයාම මරා ඇරගෙන යන්නේය. ඉක්බිත්තෙන් එක් දවසක් ශාඛ මෘගයාණන්ගේ පර්ෂත්හි දැරි ඇතිවූ(ගැබ්ගත්) මුව දෙනකට වාරය පැමිණියෝය. ඒ මුව දෙනද ශාඛ මුව රජ්ජුරුවන් සමීපයට එළඹ "ස්වාමීනි, මමත් ගර්භිනීමි. දරුකෙනෙකුන් වදා අපි දෙදෙනා දෙවාරයක් යම්හ යි මාගේ වාරය ඉක්මවාපුව මැනැව"යි කිව.

ඒ ශාඛ මුවාණෝ "තොපට පැමිණි වාරය අනෙක් කෙනෙකුන්ට පමුණුවන්නට මට නොපිළිවන. තෝම තීගේ පුත්‍රයා දන්නෙහිය. මෙතැනින් පලා යව"යි කීවාහුය. ඒ මුව දෙන ශාඛ මුවන්ගේ සමීපයෙන් අනුග්‍රහයක්(අනුකම්පාවක්) නොලබන්නී බෝධිසත්වයන් කරා එළඹ මේ කාරණය දැන්වුව. බෝධිසත්වයෝද ඒ මුව දෙනගේ බස් අසා "වන්නාටය(ඊට කම් නැත), තෙපි යව, මම තොපගේ වාරය ඉක්මවමි"යි තුමු ගොස් දන්ගෙඩිය මත්තෙහි(හිස ගසා දැමීමේදී හිස තබන ලී කොටය මත) ඉස තබා හොත්තෝය. අරක්කැමියාද ඒ බෝධිසත්වයන් දැක "ලබන ලද අභය ඇති මුව රජ්ජුරුවෝ දන් ගෙඩිය මත්තෙහි ඉස තබාගෙන වැදහොත්තාය. මීට කාරණය කිම් දෝහෝ"යි සිතා යුහුව ගොස් එපවත් රජ්ජුරුවන්ට කීයේය. රජ්ජුරුවෝද එකෙණෙහිම රථයකට පැන නැගී මහත් වූ පෙරහරින් උයනට ගොස් දම් ගෙඩිය මත්තෙහි හිස තබා වැදහොත් බෝධිසත්වයන් දැක "යහළු වූ මුව රජ්ජුරුවෙනි, මා විසින් තොපට අභය දයන දෙන ලද්දේ නොවේද? කවර කාරණයකින් තෙපි මෙතන

වැදහොත්තාහුදැ?"යි කීහ. "මහරජ්ජුරුවෙනි, දැරී ඇති මුව දෙනක් මා සමීපයට අවුත් 'මට පැමිණි වාරය අනිකකුහට පමුණුවනු මැනවැ'යි කිව. මා විසින් එකක් හහට පැමිණි මරණ දුක අනෙකක් හට පමුණුවන්නට නොපිළිවන, ඒ මම මාගේ ජීවිතය ඈට දී ඈට පැමිණි වාරය මම අරගෙන වැදහොත්තෙමි, අනෙක් සැකයක් නොකරව, රජ්ජුරුවනි"යි කීවාහුය.

"මාගේ ස්වාමිවූ මෘග රාජයාණනි, මා විසින් තොප බඳු වූ ක්‍ෂන්තිය මෛත්‍රිය හා අනුකම්පාව ඇති කෙනෙකුන් මනුෂ්‍යයන් කෙරෙහිදු නොදක්නා ලද, ඒ කාරණයෙන් තොප කෙරෙහි ප්‍රසන්න වෙමි, නැගී සිටුව, තොපටත් ඒ මුව දෙනටත් අභය දානය දිනිමි"යි කීහ. "අප දෙදෙනා විසින් අභය දානය ලත් කල්හි සෙසු මුවෝ කුමක් කෙරෙද්ද? රජ්ජුරුවෙනි" කීහ. "සෙසු මුවන්ටත් අභය දානය දිනිමි"යි කීහ. "මහරජ උයන වසන මුවන්ට අභය දුනුව, වල වසන සෙසු මුවෝ කුමක් කෙරෙද්දැ?"යි කීහ. "ඔවුන්ටත් අභය දිනිමි"යි කීහ. "මහරජ වල හා ගම වසන මුවෝ අභය දානය ලත්හ. අවශේෂ වූ චතුෂ්පදික සත්‍වයෝ(සෙසු සිව්පා සත්තු) කුමක් කෙරෙද්ද? රජ්ජුරුවනි" කීහ. "ඒ චතුෂ්පදික සත්‍වයන්ටත් අභය දානය දිනිමි"යි කීහ. "චතුෂ්පදිකාදීහු අභය දානය ලත්හ. දියෙහි වසන්නාහූ මත්ස්‍ය ජාතීහු කුමක් කෙරෙද්ද?" කීහ. "ඔවුන්ටත් අභය දානය දිනිමි"යි කීහ.

මෙපරිද්දෙන් මහබෝධිසත්වයෝ රජ්ජුරුවන් අතින් මුවන් ආදිවූ සියළු සත්වයන්ට අභය දානය ඉල්වාගෙන වැදහොත් තැනින් නැගී සිට රජ්ජුරුවන් පඤ්චශිලයෙහි පිහිටුවා "රජ්ජුරුවෙනි, දස කුසල ධර්මයෙහි හැසිරෙව. මව්පියන් කෙරෙහි ද, දූ දරුවන් කෙරෙහි ද, ශ්‍රමණ බ්‍රාහ්මණයන් කෙරෙහි ද, සියළු ජනපද වාසීන් කෙරෙහි ද ධර්මයෙන් හැසිරෙව"යි රජ්ජුරුවන්ට අවවාදකොට "මධ්‍යම ප්‍රතිපදාවෙහි හැසිරෙන්නා වූ සත්වතෙමේ කරජ කායයාගේ භේදයෙන්(ශුක ශ්‍රෝණිතවලින් උපන් සිරුර බිඳී යෑමෙන්) මරණින් මත්තෙහි සුගති සංඛ්‍යාතවූ(සුගතියයි කියනලද) ස්වර්ග ලෝකයෙට පැමිණේය"යි රජ්ජුරුවන්ට සර්වඥ ලීලාවෙන් ධර්මදේශනා කොට කීප දවසක් ඒ උයනේ වාසයකොට රජ්ජුරුවන්ට අවවාද දී මෘග සමූහයා විසින් පිරිවරණ ලදුව තමන් පෙර විසුවා වූ වනයට පැමිණියාහුය. ඒ මුව දෙන් ද පුෂ්ප කර්ණිකාවකට බඳු(මල් කෙමියක් වැනි) වූ පුතෙකු වැදූහ. ඒ මුව පැටියාණෝ ද කෙළනා තැනැත්තෝ ශාඛ මෘගරාජ සමීපයෙහි ගොස් කෙළනාහ. ඉක්බිත්තෙන් ඒ මෘග පෝතකයාණන්ගේ මෑණියෝ ඒ ශාඛ මෘග රාජයන් සමීපයෙහි යන්නාහු දැක "පුත මෙතැන් පටන් ඔහු සමීපයට නොයව. නිග්‍රොධ මෘග රාජයන් වහන්සේ සමීපයටම යව"යි පුතණුවන්ට අවවාද කරන්නාවූ මෘග ධෙනුව මෙසේ කිව "පුත්‍රය, තොප වේවායි අනෙක් කෙනෙක් වේවායි තමහට හිතයක් වැඩක් කැමැත්තේ විනම් නිග්‍රොධ මෘග රාජයාණන් වහන්සේම සේවනය කරන්නේය. ශාඛ මෘග රාජයාණන් කරා

නොවළඹෙන්නේය. සේවනයත් නොකරන්නේය. ඔහු නිසා ජීවිකාවත් නොකරන්නේය. ශාඛ මෘග රාජයාණන් සමීපයෙහි යම් ජීවිකාවක් ඇද්ද, ඒ ජීවිකාවටත් වඩා නිග්‍රෝධ මෘග රාජයාණන් වහන්සේගේ පාද මූලයෙහි වැදහෙව මියයාම උතුම් වන්නේයැ''යි ශාඛ මෘග රාජයාණන් සමීපයට නොයෙන ලෙස අවවාද කලාහ. රජ්ජුරුවන් විසින් අභය දානය දුන් තැන පටන් අභය ලද්දා වූ මුවෝ මනුෂ්‍යයන්ගේ ගොයම් කා නසන්නාහ. මනුෂ්‍යයෝ "අභය දානය ලත් මුවෝය''යි ගසන්නට ද පළවන්නට ද නොහැක්කාහ. ඒ මනුෂ්‍යයෝ රාජාංගනයේ රැස්ව රජ්ජුරුවන්ට මෙපවත් කීවාය. රජ්ජුරුවෝ "ප්‍රසන්න වූ සිත් ඇති මා විසින් නිග්‍රොධ මෘග නම් උත්තමයාණන්ට වරදෙන ලදැ, මම රාජ්‍යය හරින්නේ නමුත් එදවස් දුන් ප්‍රතිඥා නොහරිමි. පලා යවු, මාගේ ආඥාව පවත්නා ස්ථානයෙහි මුවන් මරන්නට කිසිත් සත්‍වයෙක් නොලබන්නේ ය''යි කීවාහුය.

නිග්‍රොධ මෘග රජ්ජුරුවෝද එපවත් අසා මෘග සමූහයා රැස් කරවා මෙතැන් පටන් අනුන්ගේ ගොයම් කන්නට නොපිළිවනැයි මුවන් වලකා "මෙතැන් පටන් ගොයම් රක්නා වූ මනුෂ්‍යයෝ ගොයම් රක්නා පිණිස වැටක් නොකරත්වයි, කුඹුරු වටකොට පත් අදිත්ව''යි මනුෂ්‍යයන්ට කියා යැව්වාහුය. එතැන් පටන්කොට ක්ෂෙත්‍රවල පත් ඇදීම් සංඥාව(කොළ එල්වීමෙන් කරන ඇඟවීම) පහළවිලු.

එවක් පටන් පත් ඇළිම් සලකුණ ඉක්මවන්නාවූ එකද මෘගයකුත් නැති. මේ වනාහි ඒ සත්වයන් මහබෝසතාණන්ගෙන් ලද අවවාදයි. මෙපරිද්දෙන්ම මෘග සමූහයාට අවවාදකොට නිග්‍රොධ බෝධිසත්වයෝ ආයුපමණින් සිට ඒ මුවන් හා සමග කම්වූ පරදිද්දෙන් මිය පරලොව ගියාහුය. ඒ රජ්ජුරුවෝ ද බෝධිසත්වයන්ගේ අවවාදයෙහි සිට දානමානාදි වූ කුසල්කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ.

ලොව්තුරා සර්‍වඥයන් වහන්සේ ද “මහණෙනි, මේ ස්ථවිරාවන්ට ද කුමාර කාශ්‍යප ස්ථවිරයන්ට ද මම පිහිට වූයෙම් දැන්මතු නොවෙමි, පළමුත් පිහිට වූයෙම් වේදැ”යි මේ ජාතක ධර්‍මදේශනාව ගෙනහැර දක්වා චතුස්සත්‍යය දේශනාව පෙරදැරිකොට අතීත කථාවත් වර්ථමාන කථාවත් වදරා දෙක එක්කොට සන්ධි ගලපා මේ ‘නිග්‍රොධ මිග ජාතකය’ නිමවා වදාළසේක.

“එකල්හි ශාඛ මෘග රාජයාණෝ නම් දැන් දේවදතත ස්ථවිරයෝය. ඔවුන්ගේ එදවස් මෘග පර්ෂද දැනුත් දේවදත්ත පර්ෂදය. ඒ මුව දෙන නම් දැන් මේ ස්ථවිරාවෝය. එදවස් මේ මුව පැටවාණෝ නම් දැන් බණ කියන්නවුන් කෙරෙහි අග්‍ර වූ මේ කුමාර කාශ්‍යප ස්ථවිරයෝය. එදවස් බරණැස් රජ්ජුරුවෝ නම් දැන් ධර්‍ම භාණ්ඩාගාරික වූ ආනන්ද ස්ථවිරයෝය. නිග්‍රොධ මුව රජ්ජුරුවෝ නම් ලෙව්තුරා බුදු වූ මම්ම වේදැ”යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 013. කණ්ඩින ජාතකය

තවද තිලෝගුරු සම්‍යයක් සම්බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර නිසා දෙව්රම් වෙහෙර වැඩ වසන සේක් පුරාණ දුතිකාව(පෙර ගිහිකල භාර්යාව) කෙරෙහි ලොල් වූ එක් භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

මෙහි වර්ථමාන කථාව අට්ඨක නිපාතයෙහි ‘ඉන්ද්‍රිය’ ජාතකයෙහි මතු ප්‍රකාශ වන්නේය. භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ ද ඒ භික්ෂු හට “මහණ, තෝ පුර්‍වයෙහිත් මේ මාතුගාමය(ස්ත්‍රිය) නිසා ජීවිත විනාශයට පැමිණ සහළගුරු රැසක්හි පැළැහුණෙහිය”(දිලිහෙන ගිනි අඟුරු රැසක් මත පිළිස්සීමට පත්වුයෙහිය) යැයි වදාළසේක. භික්ෂූන් වහන්සේ ඒ කාරණය ප්‍රකශ කරන පිණිස සර්‍වඥයන් වහ්නේසට යාච්ඤාකොට දැන්වූසේක. සර්‍වඥයන් වහන්සේ ද භාවාන්තරයෙන් පටිච්ඡන්න වූ(සෙසු භවයෙන් වැසුණු) ඒ කාරණය ප්‍රකාශ කොට වදාළසේක.

මෙයින් මත්තෙහි වනාහි භික්ෂුන් වහන්සේගේ යාච්ඤාවද භවාන්තරයෙන් සැඟවුනේය යන එපමණකුත් නොකියා “ඉකුත්වත් ගෙනහැර දැක්වූසේකැ”යි මෙපමණක්ම කියමු. මෙපමණක් කී කල්හිත් යාච්ඤාවද වළාගැබකින් නික්මුණා වූ චන්ද්‍රයා පරිද්දෙන් භවාන්තරයෙන් සැඟවුනා වූ කාරණය දැයි යන මේ සියල්ල යට කියන ලද ක්‍රමයෙන් යොදා දතයුතු.

යටගිය දවස මගධරට රජගහනුවර මගධ නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කෙරෙති. මගධරට වාසීන් ගොයම් කරන අවධියේහි මුවන්ට මහත් වූ උපද්‍රව වන්නේය. ඒ මෘගයෝ වනයෙහි පර්‍වත සමීපයෙහි වසන්නාහ. ඒ මුවන් අතුරෙහි එක් වලෙක(වනයක) පර්‍වතයක් සමීපයෙහි වසන්නා වූ මෘගයෙක් එක් ගමක් සමීපයෙහි වසන්නා වූ මෘගපෝතිකාවක් හා සමග මිත්‍රත්වය කොට ඒ මුවන් වසන්නාවූ පර්‍වත සමීපයෙන් බැස නැවත ගම් සමීපයට බස්නා කල්හි මෘගපෝතිකාව කෙරහි පිළිබඳ සිත් ඇති බැවින් ඈ හා එක්වම බස්නේ ය. ඉක්බිත්තෙන් ඒ මෘගපෝතිකාව මෙසේ කීවා ය. "ස්වාමිපුත්‍රය, තෙපි වනාහි පර්‍වතයෙහි වසව, ඉතා බාලයහ.(මොඩයහ) ගම් සමීපය නම් ශංකා ප්‍රතිභය සහිතය(බිය සැක රහිතය), අප හා සමග වනයෙන් නො බසුව, නො එව"යි වැළකූවා ය.

ඒ මුවාද ඒ මෘගපෝතිකාව කෙරෙහි පිළිබඳ සිත් ඇති බැවින් නොවැළක(නොනැවතී) ඈ හා සමග ගම් සමීපයට ගියේය. ඉක්බිත්තෙන් ඒ මගධරට වාසීහු "දැන් මුවන් පර්‍වත පාදයෙන් බස්නා වේලාය"යි දැන මග සමීපයෙහි මුවා වූ තැන්වල කොටුපත්(ආවරණ ස්ථාන) බැඳගෙන එහි සිටිනාහ. ඒ මුවාත් මුවදෙනත් එන්නාවු පෙරමග එක් මුව වැද්දෙක් කොටුපතක සැඟවී සිටියේය. ඒ මෘගපෝතිකාව ද මනුෂ්‍යගන්ධය ආඝ්‍රාණය කොට(මිනිස් ගඳ ඉව කොට) තමා හා කැටිව එන්නා වූ බාල මෘගයා ඉදිරි කොටලා තොමෝ පස්සේ එන්නීය. ඉක්බිත්තෙන් ඒ කොටුපත සිටියා වූ වැදි ද එක සැර පහරින් (ඊ පහරින්) මුවා එතනම විද හෙළීය.

මෘගපෝතිකා මුවා තමා කෙරෙහි පිළිබඳ සිත් ඇතිව එන බව දැන, පැන වාත වේගයෙන් පලා ගියාය. වැදි ද කොටුපතින් නික්ම, තමා විදි මුවා මස්කොට ගිනි මොළවා සාළාඟුරු මත්තෙහි යහපත් වූ මස් බහා පුළුස්සාගෙන යැපෙන පමණක් කා පැන් බී ඉතිරි මස් ලේ බිංදු වගුරව වගුරවා කඳෙක බැඳගෙන තමාගේ අඹුදරුවන් සතුටු කෙරෙමින් ගෙට ගියේය.

එකල්හි මහ බෝධිසත්‍වයෝ ඒ වන ලැහැබ වෘක්‍ෂ දේවතාව උපන්හ. ඉක්බිත්තෙන් බෝධිසත්‍වයෝ ඒ කාරණය දැක "මේ අඥාන වූ මෘගයාට පැමිණි මරණය මැණියන් නිසා පැමිණියේත් නොවෙයි, පියාණන් නිසා පැමිණියේත් නොවෙයි. වැලි කෙසේ පැමිණියේද? කාමය නිසා පැමිණෙයේය"යි කාමය නිමිත්ත කොට ගෙන සත්‍වයෝ සුගතියෙහි අත්පා කැපීම් ආදියටද, නරකයෙහි පස්කම් කටොල්(දෙඅත් දෙපා පපුව යන පස් තැන ගිනිගත් යහුල් ගැසීම නම් වූ පස් වැදෑරුම් වධ බන්ධන) ආදී වූ අනේක ප්‍රකාර දුඃක්ඛයටද පැමිණෙති. අනුන්ට මරණ දුක ඉපදවීම නමුදු මේ ලෝකයෙහි උත්තමයන් විසින් නින්ද කරන ලදමය. යම් ජනපදයක ස්ත්‍රියක් විධාන(පාලනය) කෙරේ ද, අනුශාසනා කෙරේ ද, ස්ත්‍රියක නායක කොට ඇති ඒ ජනපදය නින්දිතිය. සත්‍වයෝ ස්ත්‍රී වසඟත්‍වයට පැමිණෙත් ද ඒ සත්‍වයෝ ද නින්දිතයහ"යි මෙසේ නින්දිත වස්තු තුනක් දක්වා වන දේවතාවුන් සාධුකාර දී ගන්ධ පුෂ්පාදීන්(සුවඳමල් ආදියෙන්) පූජාකෙරෙමින් සිටිය දී මධුර ස්වරයෙන් ඒ වනලැහැබ ඒක කෝලාහල කෙරෙමින්(එක්වන් ඝෝෂාවකින් පුරවමින්) ධර්මදේශනා කරන්නා

වූ බෝධිසත්ත්වයෝ මෙසේ කිවූය. “තියුණු මුවහත් ඇති තරකොට දෙසිදුරුකොට විදින්නට සමර්ථ වූ ශරයන් ඇති පුරුෂයාට ද නින්ද වේව යි, යම් ජනපදයක ස්ත්‍රියක් නායකකම් කෙරේ ද ඒසේ වූ ජනපදයටත් නින්ද වේවා යි, යම් සත්ව කෙනෙක් ස්ත්‍රී වසඟත්වයට පැමිණියාහු ද ස්ත්‍රීන් කීවාම කෙරෙත් ද ඒ සත්වයන්ටත් නින්ද වේවා”යි යනාදීන් ධර්මදේශනා කළාහුය. මෙසේ එක ගාථාවෙන් නින්දිත වස්තූන් තුනක් දක්වා බෝධිසත්වයෝ ඒ වනය එක නින්නාද කෙරෙමින් සර්වඥ ලීලාවෙන් (බුදුවරයෙකු මෙන්) ධර්මදේශනා කළාහුය.

තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ද මේ ජාතක ධර්මදේශනාව ගෙනහැර දක්වා චතුස්සත්‍ය ප්‍රකාශ කොට වදාළසේක. චතුස්සත්‍යයාගේ කෙළවර උකටලී මහණ සෝවාන් ඵලයෙහි පිහිටියේය. සර්වඥයන් වහන්සේද වර්ථමාන කථාව හා අතීත කතාව වදාරා පූර්වාපර සන්ධි ගලපා මේ ‘කණ්ඩින ජාතකය’ නිමවා වදාළසේක.

“එකල්හි පර්වතස්ථ(පර්වතවාසී) මෘගයාණෝ නම් දැන් මේ සාසනයෙහි උකටලී වූ භික්ෂුහුය. එකල්හි මෘගයාණන් හැර දිවු මෘගපොතිකා නම් මේ පුරාණ දුතිකාය. කාමයෙහි දෝෂ කියා ධර්මදේශනා කල දේවතාණෝ නම් ලොව්තුරා බුදු වූ මම්මය”යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 014. වාතමිග ජාතකය

තවද එක් සමයෙක්හි සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් චුල්ලපිණ්ඩපාතිකතිස්ස ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

ශාස්තෘන් වහන්සේ වනාහි රජගහනුවර නිසා වේළුවනාරාමයෙහි වාසය කරන කල්හි තිස්ස කුමාර නම් වූ මහා සම්පත් ඇති සිටුකුලයක පුත්‍රයෙක් ඇත්තේය. ඒ සිටුපුත්‍ර තෙම එක් දවසක් වේළුවනාරාමයට ගොස් සර්‍වඥයන් වහන්සේගේ ධර්‍මදේශනාව අසා පැවිදිවනු කැමැතිව පැවිදිවීමට යාච්ඤාකොට දෙමාපියන් විසින් නොඅනුදන්නා ලද හෙයින්(අනුමත නොකළ බැවින්) ප්‍රතික්ෂේප කරන ලද්දේ සත්දවසක් නිරාහාරව ඉඳ රට්ඨපාල ස්ථවිරයන් මෙන්ම මව්පිය දෙන්නා අනුදන්වා සර්‍වඥයන් වහන්සේ සමීපයෙහි පැවිදි වූ සේක. සර්‍වඥයන් වහන්සේ ඔහු පැවිදි කරවා අඩ මසක් කල් වේළුවනාරාමයෙහි වාසයකොට ජේතවනාරාමයට වැඩිසේක. එතැන්හිදී මේ කුලපුත්‍රයන් වහන්සේ තෙළෙස් ධුතාංගයන්(කෙළෙස් මැඩ පැවැත්වීම සඳහ පුරනු ලබන ධුතංග නම් පිළිවෙත් දහතුන) සමාදන්ව සැවැත්නුවර ගෙපිළිවෙළින් පිඬු පිණිස හැසිරෙමින් කල්යවනසේක. චුල්ලපිණ්ඩපාතිකතිස්ස ස්ථවිරයන් වහන්සේ යයි කී කල්හි ආකාශයෙහි චන්ද්‍රයා මෙන් සර්‍වඥ ශාසනයෙහි ප්‍රකාශ(ප්‍රසිද්ධ) වූසේක.

එසමයෙහි රජගහනුවර නැකැත් කෙළි පවත්නා කල්හි ස්ථවිරයන් වහන්සේගේ මව්පිය දෙදෙන උන්වහන්සේ ගිහි කල්හි යම් ආභරණ භාණ්ඩයෙක් ඇද්ද ඒ ආභරණ බඩු රෙදි කරඬුවෙක්හි බහා අභිමුඛයෙහි තබාගෙන "අනිකුත් නැකත් කෙළිවල අපගේ පුත්‍රයා මෙනම් මෙනම් අලංකාරයෙන් සැරහී නැකත් කෙළි කෙළනේ ය. අපගේ ඒ එකම පුත්‍රයා ගෙන ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ සැවැත්නුවරට වැඩිසේක. අපගේ පුත්‍රයා දැන් කොතැන්හී උන්සේක්ද? කොතැන්හි සිටිසේක්දැ"යි කියා අඬන්නාහුය.

ඉක්බිත්තෙන් එක් වණ්‍ණ දාසියක්(වෙසඟනක්) ඒ සිටුකුලයට ගොස් හඬන්නාවූ සිටු භාර්යාව දැක "ආර්යාවෙනි, කවර හෙයකින් අඬන්නීදැ?"යි විචාළීය. සිටු භාර්යාවෝ ඒ කාරණාව දැන්වුවාහුය. "ආර්යාවෙනි, සිටුපුත්‍රයාණෝ කවර දෙයකට කැමති වන්නාහුදැ?"යි විචාළී ය. "අසවල් අසවල් දෙයට"යි කිවාය. "ඉදින් නුඹවහන්සේ මේ ගෙයි සියළු ඓශ්වර්යය(සම්පත්) මට දෙවුනම් මම තොපගේ පුත්‍රයා ගෙන එන්නෙමි"යි කීවාය. සිටු භාර්යාව ඒ වචනය "යහපතැ"යි පිළිගෙන වැටුප් දී පිරිවරින් ඒ වණ්‍ණදාසිය යැව්වාය. "යව තමාගේ බලයෙන් මාගේ පුත්‍රයා ගෙනෙව"යි කිවූය. ඒ වෙශ්‍යාඞගනාව පිළිසන්(ආවරණය කළ) යානාවෙක්හි ඉඳ සැවැත්නුවරට ගොස් තෙරුන් වහන්සේ භික්‍ෂාව(පිඬු) පිණිස හැසිරෙන විථියෙහි නවාතැන්ගෙන සිටුකුලයෙන් ආ මනුෂ්‍යයන් තෙරුන්වහන්සේට නොදක්වා තමාගේ පිරිවරින්ම පිරිවරන ලද්දී, පිඬු පිණිස හැසිරෙන්නා වූ තෙරුන්

වහන්සේට පළමුකොට බත් හැන්දක් පිළිගන්වා ක්‍රමයෙන් බත් මාළාවක්(තළියක්) පිළිගන්වා තෘෂ්ණාවෙහි බඳවා අනුක්‍රමයෙන් ගෙයි වැඩ හිඳිනට සලස්වා ආහාරය දෙන්නී තමාගේ වසඟයට පැමිණී බැව් දැන ගිලන් ආකාරය දක්වා ඇතුළු ගබඩාවෙහි සයනය කළාය.

තෙරුන් වහන්සේ ද භික්‍ෂාචාර(පිඬු පිණිස හැසිරෙන) වේලෙහි ගෙපිළිවෙලින් හැසිරෙන සේක් ගෙයි දොරට පැමිණිසේක. පිරිවර ජනයෝ තෙරුන් වහන්සේගේ පාත්‍රය ගෙන තෙරුන් වහන්සේ ගෙයි වැඩහිඳින්නට සැලැස්වූවාහුය. තෙරුන් වහන්සේ ඉඳගෙනම "උපාසිකාව කොයිදැ?"යි විචාළසේක. "ස්වාමින් වහන්ස, ගිලන් වූවාය. නුඹවහන්සේ දක්නට කැමතිය"යි කිවූය. උන්වහන්සේ රස තෘෂ්ණාවෙහි බැඳුණුසේක් තමාගේ ව්‍රත සමාදානය(සමාදන් වී ඇති ධුතාංග ව්‍රතය) බිඳ වෙශ්‍යාඞගනාව හොත් තැනට වන්සේක. ඒ ස්ත්‍රී තමා ආ කාරණාව කියා උන්වහන්සේ පොළඹවා රස තෘෂ්ණාවෙන් බැඳ සිවුරු හරවා තමාගේ වසඟයෙහි තබා යානාවේ හිඳිනට සලස්වා මහත් වූ පිරිවරින් රජගහනුවරටම ගියාය.

ඒ ප්‍රවෘත්තිය හැම තැන්හිම ප්‍රකාශ(ප්‍රකට) වුයේය. භික්ෂුන් වහන්සේලා දම්සභා මණ්ඩපයෙහි වටින් රැස්ව හුන්නාහු "ඇවැත්නි, චුල්ලපිණ්ඩපාතිකතිස්ස ස්ථවිරයන් වහන්සේ වනාහි එක් වණී දාසියක් රස තෘෂ්ණාවෙන් බැඳගෙන ගියාය"යි කියා කථාවක් පහළ කළාහුය. සර්‍වඥයන්

වහන්සේ දම්සභා මණ්ඩපයට එළඹ අලංකෘත වූ බුද්ධශාසනය මස්තකයෙහි වැඩහිඳ "මහණෙනි, මේ දම්සභා මණ්ඩපයෙහි මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උන්නාහුදැ?"යි වදාළ කල්හි ඒ භික්ෂූහු ඒ ප්‍රවෘත්තිය දැන්වූවාහුය.

සර්වඥයන් වහන්සේ වදාරණසේක් "මහණෙනි, මේ චුල්ලපිණ්ඩපාතිකතිස්ස ස්ථිවරයෝ රස තෘෂ්ණාවෙන් බැඳී මේ ස්ත්‍රියට වසඟ වුවෝ දැන්මතු නොවෙති, පෙරත් මේ ස්ථවිරයෝ මේ ස්ත්‍රිය වසඟ වූවාහුමය"යි වදාරා ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන්ගේ සංජය නම් උද්‍යාන පාලකයෙක් උයන රක්‍ෂා කරන්නේය. ඉක්බිත්තෙන් එක් වාත මෘගයෙක්(වාත වේගයෙන් දිවිය හැකි මුවෙක්) ඒ උයනට අවුත් සංජය නම් උද්‍යාන පාලයා දැක දිව යන්නේය. සංජය නම් උද්‍යාන පාලකයා ද ඔහු තැතිගන්වා නොඑලවන්නේය. ඒ මෘගයා නැවත නැවත අවුත් උයනෙහිම හැසිරෙන්නේය. උද්‍යානපාල තෙම උයනේ නොයෙක් මල්ඵල ආදීය ගෙන දවස්පතා රජහට දක්වන්නේය. ඉක්බිත්තෙන් එක් දවසක් රජ්ජුරුවෝ කියනසේක් "යහළු උද්‍යානපාලය, උයනේ කිසි ආශ්චර්යවත්(පුදුම) දෙයක් දුටුවා ඇත්තෙහි නම් කියව"යි කීසේක. "මහරජ්ජුරුවන් වහන්ස, අනිකක්නු නොදුටුයෙමි, එක් වාත මෘගයෙක් වනාහි අවුත් උයනෙහි හැසිරෙන්නේය. ඔහු දිටිමි"යි කියේය. "ඔහු අල්වා

ගන්නට හැකි වන්නෙහිදැ''යි විචාළසේක. ''මී පැණි මඳක් ලද්දේ නම් මෘගයා රජ ගේ ඇතුළටම පමුණුවන්නට හැකි වන්නෙමි''යි කීයේය.

රජ්ජුරුවෝ ඕ හට මී දෙවූසේක. උද්‍යාන පාලකයා මී ගෙණ උයනට ගොස් වාත මෘගයා ගොදුරු කා ඇවිදිනා තන්හි තණපත්වල මී පැණි ගල්වා සැඟවී සිටියේය. මෘගයා අවුත් මීයෙන් ගල්වන ලද තණ අනුභව කොට රස තෘෂ්ණාවෙහි බැඳුනේය. අන් තැනකට නොගොස් උයනටම එන්නේය. උද්‍යානපාල තෙමේ ඕහු මී ගල්වන ලද තෘණයෙහි ඇලුණු බැව් දැන ක්‍රමයෙන් තමා පෙනුනේය. මෘග තෙමේ උද්‍යාන පාලයා දැක කීප දවසක් දිවගොස් නැවත නැවත දක්නේ විශ්වාස බවට පැමිණ ක්‍රමයෙන් උද්‍යාන පාලයාගේ හස්තයෙහි තිබෙන තණ අනුභව කරන්නේය. සංජය නම් උද්‍යානපාල තෙමේ මෘගයා විස්වාස බවට පැමිණියා දැන රාජවාසභවන දක්වා විථිමාර්ගය හුණ පැදුරුවලින් වටකොට ඒ ඒ තන්හි කොල අතු කඩාහෙලා මී පුරව ලද ලබු එලය(ලබු ගෙඩිය) ඇකයෙහි එල්වාගෙන තණමිටිය කිසිල්ලේ තබාගෙන මී ගල්වන ලද තෘණයෙන් මෘගයාගේ අභිමුඛයෙහි විසුරුවමින් රජ ගේ ඇතුළම ගෙන ගියේය.

මෘගයා ඇතුළට වන්කල්හි දෙර වැසුවේය. මෘගයා මනුෂ්‍යයින් දැක කම්පාවෙමින් මරණ භයින් බියපත් වුයේ ඇතුළු රාජාංගනයෙහි(ඇතුල් රජ මිදුලේ) ඔබිනොබ ධාවනය කරන්නේය. රජ්ජුරුවෝ මතුමහල් තලයෙන් බැස කම්පා

වන්නාවූ මෘගයා දැක "වාත මෘගයා නම් මනුෂ්‍යයන් දුටු තැනට සත් දවසක් නොඑන්නේය, තැතිගත් තැනට ජීවිතාන්නතය දක්වා නොඑන්නේය, ඒ වාත මෘගයා සංජය තෙමේ රස තෘෂ්ණාවෙන් බැඳ යටත් කොට ගත්තේය. මෙබඳු ගහණ නිශ්‍රිතවූ(කැලෑව ඇසුරු කරන) වාත මෘග තෙමේ රස තෘෂ්ණාවෙහි බැඳී දැන් මෙබඳු තැනට ආයේය, ඒකාන්තයෙන් පින්වත්නි, මේ ලෝකයෙහි රස තෘෂ්ණාවට වැඩියෙන් ලාමක දෙයක් නැත්තේය"යි කියා ධර්මදේශනාවට පටන්ගත්සේක.

නිරන්තර වාසස්ථාන වූ ආවාසයෙහිද ඡන්දරාග(ඇල්ම කිරීම) ලාමකය, මිත්‍රසන්ථවයෙහිද(මිතුරන් ඇසුරු කිරීමෙහිද) ඡන්දරාගය ලාමකය. මේ දෙතැන්හි ඇල්මට වඩා මධුරාම්ලදීවු(මිහිරි ඇඹුල් ආදී) ජිව්හා විඥෙදය වූ(දිවෙන් රස විඳ දත යුතුවූ) රසයෙහි ඇලීම පවිටු වන්නේය. කුමක් හෙයින්ද? යත් අරණ්‍යායෙහි ගහණ නිශ්‍රිත වූ වාත මෘගයා සංජය නම් උද්‍යාන පාලයා මධුර රසයෙන් තමාගේ වසඟයට පැමිණි වූයේය"යි කියා රස තෘෂ්ණාවෙහි ආදීනව වදරා ඒ මෘගයා අරණ්‍යයටම යැවූසේක.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ "මහණෙනි, ඒ වණී දසිය මේ මහණ රස තෘෂ්ණාවෙන් බැඳ තමා වසඟ කෙළේ දැන්මතු නොවේ. පෙරත් වසඟ කළාය"යි වදරා මේ දම්දෙසුම ගෙනහැර දක්වා පූර්වාපර සන්ධි ගලපා මේ 'වාතමිග ජාතකය' නිමවා වදාළසේක.

“එසමයෙහි සංජය නම් උද්‍යාන පාලයා නම් මේ චණ්ඩ දසිය වූවාය. වාත මෘගයා නම් චුල්ලපිණ්ඩපාතිකතිස්ස ස්ථවිරයෝය. බරණැස් රජව උපන්නෙම් නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජුවූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 015. බරාදිය ජාතකය

තවද එක් සමයෙක් හි සර්‍වඥයන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසනසේක්, එක්තරා අකීකරු භික්‍ෂු කෙනෙකුන් අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ භික්ෂුන් වහන්සේ වනාහි අකීකරුය, අවවාදය නොගන්නා සේක. ඉක්බිත්තෙන් සර්‍වඥයන් වහන්සේ ඒ භික්ෂුන් වහන්සේට වදාරණසේක් “මහණ, තෙපි අකීකරුව අවවාද නොගන්නේ සැබෑ ද? කිම්දැ?”යි වදාළසේක. “භාග්‍යවතුන් වහන්ස, සැබැව”යි දැන්වූසේක. සර්‍වඥයන් වහන්සේ “මහණ, තෝ පූර්‍වයෙහිත් අකීකරු බැවින් ප්‍රඥාවන්තයන්ගේ අවවාද නොගෙන මලෙහි බැඳුනේම ජිවිතක්‍ෂයට පැමිණියෙහිය”යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහබෝසතාණන් වහන්සේ මෘග ජන්මයෙහි ඉපිද මෘග සමූහයා විසින් පිරිවරණ ලදුව අරණ්‍යයෙහි වසන සේක. ඉක්බිත්තෙන්

බෝධිසත්වයන් වහන්සේට නැගණී වූ මෘග ධේනුවක් පුත්‍රයකු දක්වා "බෑයන් වහන්ස, මේ තෙමේ නුඹවහන්සේගේ බෑනා වන්නේය. මොහුට මෘග මායම්(දඩයක්කාරයන් රැවටීමට මුවන් කරන උපාය ක්‍රම) උගන්වන සේක්ව"යි කියා භාරකළාය. බෝධිසත්වයන් වහන්සේ ඒ බෑණා වූ මෘගපෝතකයාට "අසවල් වේලාවෙහි අවුත් උගනුව"යි කීසේක. මෘගපෝතක තෙම කියන ලද වේලෙහි නොඑන්නේය. යම්සේ එක් දවසක්ද එසේම සත් දවසක් සත් අවවාදයක් ඉක්මවා ඒ මෘගපෝතකයා මෘග මායම් නොඉගෙන හැසිරෙනුයේ මළෙහි(මළ පුඩුවේ) බැඳුනේය.

ඒ මෘගපෝතකයාගේ මෑණීතොමෝ භ්‍රාතෘවූ(සොහොයුරු වූ) මෘගයා කරා එළඹ "භ්‍රාතෘන් වහන්ස, කිමෙක්ද? බෑණා වූ මෘගයාට මුව මායම් උගන්වන ලද්දේදැ?"යි විචාළීය. බෝධිසත්වයන් වහන්සේද "ඒ අනොවාදක(අවවාද නොපිළිගන්නා) මෘගපෝතකයාගේ කාරණය නොසිතව, තොපගේ පුත්‍රයා විසින් මුව මායම් නොඋගන්නා ලදැ"යි කියා දැනුදු ඕහට අවවද දෙන්නට නොකැමැතිව මෙසේ කීසේක. "බරාදිය නම් තැනැත්තීය, එකි එකී පාදයෙහි දෙකක් දෙකක් බැගින් අටකුරයක් ඇති මුලින් වක්ව අගින් ඉතා වක් වූ අං ඇති හෙයින් වංකාතිවංක නම් වූ සප්ත අවවාද කලායෙන් ඉක්මුණු(අවවාද කළ සත් වේලාවක් ඉක්ම වූ) ඒ මෘගයාට අවවාද කරන්නට උත්සහ සිතක් නැත්තේමි"යි කීසේක.

ඉක්බිත්තෙන් ඒ අකීකරු මෘගයා මළෙහි බැඳුණු කල්හි වැදිපුත්‍ර තෙමේ මරා මාංස ගෙන ගියේය. ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ වදාරණසේක් "මහණ, තෝ අකීකරු වූයේ දැන්මතු නොවෙයි, පූර්වයෙහිත් අකීකරු වූයෙහිය"යි වදරා මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා පූර්වාපර සන්ධි ගලපා මේ 'ඛරාදිය ජාතකය' සමාප්ත කොට වදාළසේක.

"එසමයෙහි බෑණා වූ මෘගයා නම් දැන් මේ අකීකරු මහණ වූයේය. නැගණී වූ මෘගධෙනුතොම උපුල්වන් මහාස්ථවිර වූවාය. අවවාද දුන් මෘගව උපන්නෙමි වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 016. තිපල්ලත්ථමිග ජාතකය

තවද තිලෝගුරු බුදුරජාණන් වහන්සේ කොසඹෑ නුවර නිසා බදරිකාරාමයෙහි වසන සේක් ශික්ෂාකාමී වු(හික්මීමේ දැඩි ආසා ඇති) රාහුල ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

එක් සමයෙක්හි සර්වඥයන් වහන්සේ අලව් නුවර නිසා අග්ගාලව නම් දේවාලයයෙහි වසන කල්හි බොහෝ උපාසිකාවරුද භික්ෂුණීහුද විහාරයට බණ අසනු පිණිස එලඹෙති, දවල් දවස බණ අසති, කල්ගිය ගියසේ(කල් යාමේදී) උපාසිකාවරුද භික්ෂුණීහුද බණ ඇසීමට නොගොස් උන්හ. භික්ෂූන් වහන්සේද උපාසිකාවරුද ඒ පර්ෂද්හි(පිරිසෙහි)

ඇතිවූහ. එතැන් පටන් රාත්‍රියෙහි බණ ඇසීම සැළසුනේය. බණ අසා අන්තයෙහි වැඩිමහලු භික්ෂූන් වහන්සේ තමන් වහන්සේ වසන්නා වූ ස්ථානවලට ගොස් සැතපෙනසේක. බාල භික්ෂූන් වහන්සේ උපාසකවරුන් හා සමග භෝජන ශාලාවෙහි සැතපෙනසේක. ඒ උපාසකවරුන් හා බාල වහන්දැ නිද්‍රාවට පැමිණි කල්හි ඉන් සමහර කෙනෙක් "ඝුරු ඝුරු" යන අනුකරණ ඇතිව(ගොරවමින්) ප්‍රශ්වාස කරන්නාහුය. දත් කමින් හොනාහ. සමහර කෙනෙක් මද ඇසිල්ලක් නිද්‍ර නැගී සිටිනාහ. මේ විප්‍රකාරය දැක භික්ෂූන් වහන්සේ සර්වඥයන් වහන්සේට දැන් වූසේක.

බුදුහු "යම්කිසි මහණෙක් අනුපසම්පන්නයන්(උපසම්පද නොවූ අය) හා එක සෙනස්නෙහි සහසෙයයාව(එක්ව නිදීම) කෙළේ නම් පාචිත්තියාපත්ති(පචිති නම්වූ වරද) වන්නේය"යි ශික්ෂාපද පණවා කොසඹෑ නුවරටම වැඩිසේක. ඒ විහාරයෙහි භික්ෂූන් වහන්සේ ආයුෂ්මත් වූ රාහුල ස්ථවිරයන් වහන්සේට "ඇවැත් වූ රාහුල ස්ථවිරයෙනි, සර්වඥයන් වහන්සේ විසින් අනුපසම්පන්නයන් හා එක සෙනස්නේ නොසැතපෙන්ට ශික්ෂාපද පනවන ලද, දැන් තොප වසන්නා වූ ස්ථානයක් දනුව"යි(සොයාගනුව) කීසේක. පළමුත් ඒ භික්ෂූන් වහන්සේ සර්වඥයන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන්ද ඒ ආයුෂ්මතුන් වහන්සේගේ ශික්ෂාකාමී බව නිසාද තමන්වහන්සේලා වසන්නා වූ ස්ථානයට පැමිණියා වූ ඒ රාහුල ස්ථවිරයන් වහන්සේට අතිශයින් සංග්‍රහ කරනසේක. මිටි ඇඳක් පනවා ඉස තබන්නට සිවුරක් දෙනසේක. එදවස් වනාහි ශික්ෂාපද භයින්

වසන්නාවූ ස්ථානයකුත් නුදුන් සේක. රාහුලෝත්තමයාණෝද "මාගේ පියාණන් වහන්සේය"යි "සර්වඥයන් වහන්සේගේද මාගේ උපාධ්‍යායන් වහන්සේය"යි සැරියුත් මහතෙරුන් වහන්සේද "මාගේ ආචාර්‍ය්‍යන් වහන්සේය"යි මුගලන් මහතෙරුන් වහන්සේගේද "මාගේ සුළුපියාණන්ය"යි අනඳ මහතෙරුන් වහන්සේද සමීපයට නොගොස් සර්වඥයන් වහන්සේ වලංජනය (පරිහරණය) කරන්නාවු වර්චස් කුටියට(වැසිකිළියට) බ්‍රහ්මවිමානයකට වදනක්හු(ඇතුල් වන්නාක්) මෙන් වැද රාත්‍රියෙහි වාසය කළසේක.

සර්වඥයන් වහන්සේ වලංජනය කරන්නා වූ කුටියෙහි දොරඅගුළු මොනවට වසන ලද්දේ වෙයි, බිම සුවඳින් පිරිබඩ ගන්නා ලද්දේය. ගඳදම පුෂ්පදමයෙන් එල්වන ලද්දේය. සකල රාත්‍රියෙහි පාන් ඇවිලෙන්නේය. රාහුලොත්තමයාණන් විසින් ඒ කුටියෙහි මේ යථොක්ත වූ සමෘද්ධි නියාව(පහසුකම් ඇති නිසාම) ඒ රාත්‍රී වාසය කළසේකුන් නොවෙයි, භික්ෂූන් වහන්සේ විසින් "තොප වසන්නාවූ ස්ථානයක් දනුව"යි කියන හෙයින් අවවාදයෙහි ගෞරවයෙන්ද ශික්ෂාකාමී බැවින්ද ඒ වර්චස් කුටියෙහි රාත්‍රි වාසය කළසේක. අතරතුරයෙහි භික්ෂූන් වහන්සේද ඒ රාහුල ස්ථවිරයන් වහන්සේ දුරදීම එන්නා දැක උන්වහන්සේ වත්සම්පන්න බව පරීක්ෂා කරන පිණිස මිටලු(මිටි හෝ අතට ගත්) මුස්න හෝ කසල පෙට්ටිය(කුණු කූඩය) හෝ පිටත දමා "ඇවැත්නි, මේ කවුරුන් විසින් දමන ලද්දේදැ"යි කියන්නාහ.

කිසි කෙනෙකුන් විසින් " රාහුල ස්ථවිරයෝ මේ මගින් ගියෝදැ"යි කී කල්හි "ස්වාමීනි, මේ මම නොදනිමි"යි නොකියා ඒ නොතැන්පත්ව තිබූ මුස්න හා කසල පෙට්ටිය තැන්පත් කොට තබා "මට ක්‍ෂමා කොට වදාළ මැනව ස්වාමීනි"යි භික්‍ෂූන් වහන්සේ ක්ෂමා කරවා යනසේක. එපරිද්දෙන් ශික්ෂාකාමී වූ රාහුල ස්ථවිරයන් වහන්සේ තමන්වහන්සේගේ ශික්‍ෂාකාමී බව නිසා ඒ වර්චස් කුටියෙහි රාත්‍රිය වාසය කළසේක. ඉක්බිත්තෙන් බුදුරජාණන් වහන්සේ අරුණු නැගෙන්නාට පෙරාතුව වර්චස් කුටිද්වාරයෙහි වැඩසිට කෑරූ(උගුරෙන් පිට කරන ශබ්දයක්) සේක. ඒ රාහුල ස්ථවිරයන් වහන්සේද ඇතුලේ ඉඳ කෑරූ සේක. "මේ කවරෙක්දැ?"යි බුදුහු විචාළසේක. "මම රාහුලය"යි ගෙන් මෑත්ව වැඩිසේක. "රාහුලය, කවර හෙයිකින් තෝ මෙතන වැදහොත්තේහිදැ?"යි විචාළසේක. "ලගිනා(නිදාගැනීමට) තෙනක් නැති හෙයින්නැ"යි කියා "ස්වාමීනි, භික්‍ෂූන් වහන්සේ පළමු මා ආ කල්හි සංග්‍රහ කරනසේක, දැන් තමන්වහන්සේට ආපත්ති වෙයි යන භයින් වසන තැන් නොදෙනසේක. ඒ මම මේ ස්ථානය අනික් කෙනෙකුන් විසින් ඝට්ටනය(කරදර) නොකරන්නා වූ ස්ථානයක් වේදැයි මේ කාරණයෙන් මෙතැන සැතපිමි"යි දැන් වූසේක.

ඉක්බිත්තෙන් "භික්ෂූහු දැම්ම රාහුලයා හරණාහු(අතහැර දමන්නාහු) සෙසු කුලදරුවන් මහණ කරවා කුමක් කෙරෙත්දැ"යි කියා සර්‍වඥයන් වහන්සේට ධර්‍මසංවේගය උපන්නේය. ඉක්බිත්තෙන් උදැසනක්සේම භික්‍ෂූන් වහන්සේ රැස්

කරවා දම්සෙනවි සැරියුත් මහතෙරුන් වහන්සේ අතින් "ශාරිපුත්‍ර ස්ථවිරයයෙනි, අද රාහුලයා කොතැනක ලැග්ගේද? තෙපි දනුදැ?"යි විචාරා වදාළසේක. "ස්වාමීනි, මම නොදනිමි"යි දැන් වූසේක. "ශාරිපුත්‍ර ස්ථවිරයෙනි, අද රාහුලයා වර්චස් කුටියෙහි ලැග්ගේය. මෙපරිද්දෙන් රාහුලයා හරණා වූ තෙපි හැම සෙසු කුලදරුවන් මහණ කරවා කුමක් කරව්ද? මෙසේ කළ කල්හි මේ බුද්ධශාසනයෙහි ප්‍රව්‍රජිතයෝ පිහිටක් නොලබන්නාවු වේත්දැ"යි ධර්මසංවේගයට පැමිණ "මෙතැන් පටන් කොට අනුසම්පන්නයක්හු එක්ව දෙදවසක් තමා සමීපයෙහි වස්වා තුන්වැනි දවස් ඔවුන් වසන තෙනක් දැන පිටත වස්ව"යි කියා මේ අනුප්‍රඥප්තිය(උප නීතිය) වදාරා නැවත ශික්ෂාපද පැනවූසේක.

එකල්හි දම්සභා මණ්ඩපයෙහි වැඩ උන් භික්ෂූන් වහන්සේ රාහුල ස්ථවිරයන් වහන්සේගේ ගුණ කථා කියනසේක් "ඇවැත්නි, බලව, රාහුල ස්ථවිරයෝ යම්තාක්(ඉතාම) ශික්ෂාකාමිහුය. ඒ භික්ෂූන් විසින් 'තොප වසන තෙනක් දනුව'යි කියන ලද්දහ. 'මම සර්වඥපුත්‍රයෙමි, තෙපි හැම මේ සස්නට කවුරුදැ?යි තෙපිම නික්මෙවු'යි කියා එකද සව්වක්හු හාත් පිළිසඳරයක් නොකොට වර්චස් කුටියෙහි වාසය කළෝදැ"යි කියා ඒ භික්ෂූන් වහන්සේ කථා කරන කල්හි සර්වඥයන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩ සරහනලද බුද්ධාසන මස්තකයෙහි වැඩහිඳ "මහණෙනි, දැන් මා එන්නට පූර්වභාගයෙහි කවර නම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාළසේක. "ස්වාමීනි, රාහුල ස්ථවිරයන්ගේ ශික්ෂාකාමී බව

කතාකොට කොට උනුම්හ''යි දැන්වූ කල්හි සර්‍වඥයන් වහන්සේද ''මහණෙනි, රාහුල ස්ථවිරයෝ දැන්මතු ශික්‍ෂාකාමී නොවෙති පූර්‍වයෙහිත් තිරශ්චීන (තිරිසන්) යෝනියෙහි උපන්නෝද ශික්‍ෂාකාමීව විසුවෝ වෙත්දැ''යි වදාරා ඉකුත්වත් ගෙනහැර දක්වා වදාළසේක.

යටගිය දවස රජගහ නුවර එක් මගධ රජ්ජුරුකෙනෙක් රාජ්‍යය කෙරෙති. එකල්හි මහබෝසතාණෝ මෘග(මුව) යෝනියෙක්හි ඉපිද මෘග සමූහයා විසින් පිරිවරණ ලදුව වනයෙහි වාසය කරන්නාහ. ඉක්බිත්තෙන් ඒ බෝධිසත්‍වයන්ගේ නැගණියෝ තමන්ගේ පුතණුවන් එතනට කැඳවාගෙන අවුත් ''බෑයන් වහන්ස, නුඹවහන්සේගේ බෑණනුවන්ට මෘග මායම්(ජීවිත ආරක්ෂක ක්‍රම) ඉගැන්නුව මැනවැ''යි කිවූය. මහබෝධිසත්‍වයෝ ''යහපතැ''යි නැගණියන්ට ප්‍රතිවචන දී ''යව දරුව, අසවල් වේලේ ඇවිත් උගනුව''යි කීහ.

ඒ මෘග පෝතයාද මයිලණුවන් විසින් නියමකොට කී වේලා නොඉක්මවා බෝධිසත්‍වයන් කරා එළඹ මෘග මායම් උගන්නේය. මෘග පෝතකයාද එක් දවසක් වනයෙහි ඇවිදිනේ මලෙක්හි(මලපුඩුවේ) බැඳුනේ තමා බැඳුනු නියාව කියා ඇඬුයේය. මෘග සමූහයාද පලාගොස් ''තොපගේ පුතණුවෝ මලෙක බැඳුනෝය''යි ඒ මුවපැටවාගේ මෑණියන්ට කීහ. ඒ මෘග ධෙනුවද බෑයන් සමීපයට ගොස් ''බෑයන් වහන්ස, නුඹ වහන්සේගේ බැනණුවෝ මෘග මායම් උගත්තුදැ?''යි විචාළිය. මහබෝසතාණෝද ''තොපගේ පුතණුවන්ට කිසි සැකයක්

තොපි නොකරවයි, ඔහු විසින් යහපත් කොට මෘග මායම් උගන්නාලදැයි කිසිත් පීඩාවක් නැත, තොප සතුටු කරමින් දැන් එති''යි කියන්නාවූ බෝධිසත්ත්වයෝ මෙසේ කීවාහුය.

"එම්බා පින්වත, තෘණ භක්ෂණයකොට සෙයයාව කරන්නාවු අට කුහරයකින් යුක්ත වූ මධ්‍යම රාත්‍රි වේලෙහි පැන් බොන සුලු වූ මට බෑණා වූ මෘග පෝතකයාණන්ට නොයෙක් මෘග මායම් ඉගැන්වීම්, එසේ හෙයින් නාසාවාතයකින් සුලං රඳවා භූමියෙහි වැදහෙව ආශ්වාසය කෙරෙමින් කලා සයකින් යුක්ත වූ මෘග මායමින් වැද්දනු වඤ්චාකොට(රවටා) තොපගේ පුත්‍රයාණෝ තොප සතුටු කෙරෙමින් නොබෝ කලකින් එන්නාහ''යි ඒ බෝධිසත්ත්වයෝ කීවාහුය.

මෙසේ මහබෝධිසත්ත්වයෝ තමන්ගේ බෑනණුවන්ට මෘග මායම් යහපත් කොට ඉගැන් වූ බව දක්වන්නාහු නැගණියන්ට "ශෝක නොකරව''යි අස්වැසූහ. ඒ මුව පැටවාද මල බැඳුණු තැනැත්තෝ නොසෙල්වීම භූමියෙහි හෙව ඉළ ඇට පෙණෙන නියායෙන් කකුල් දික්කොට එක ඇලයකින් වැදහොත් තෙනට ආසන්නයෙහි කුර අගින් ගසා පස්ද තණද උපුල්වා(උදුරා) මලමුත්‍ර පිටත්කොට ඉස එල්ලා දිව දික්කොට සකල ශරීරය කෙළින්(කෙළවලින්) කිළිටිකොට සුලන් ගැන්වීමෙන්(ආශ්වසකොට සුළං ගැනීමෙන්) බඩ උදුම්වාගෙන ඇස පෙරලාගෙන යටවූ නාසාපුටයෙන් වාතය සංවරණය කෙරෙමින් මතු නාසාපුටයෙන් පිටත නික්මෙන්නාවූ වාතය

රඳවා සියලු ශරීරයෙහි තදබව ගන්වා මළා වූ ආකාරය දැක්වූයේය. නිල මැස්සෝද ඔහු වටකොට ගත්හ. ඒ ඒ ස්ථානයෙහි කපුටෝත් සැඟවී උන්හ. මේ නියායෙන් වැදහොත් තෙනට මල ලූ(මලපුඩුව ඇටවූ) වැදි අවුත් මුවාගේ බඩ අත ගසා "උදැසනම බැඳුනේ වන, කුණුව ගියේය"යි උඟ බැඳුණු වරපට මුදා "මෙතනදී ම මොහු මස් කොට ගෙනයෙමි"යි සැකයක් නැතිව කොළ අතු කඩන්ට පටන් ගත. මුව පැටවාද වැදහොත් තැනින් නැගී සතර පයින් සිට ශරීරය කිළිපොළා කර දික්කොට මගවාතයෙන් සිඳුනා වූ වළාකඩක් මෙන් යුහුව දුවගෙන ගොස් මෑණියන් සමීපයට ගියේය. සර්වඥයන් වහන්සේද "මහණෙනි, රාහුලයා දැන් මතු ශික්ෂාකාමී නොවෙයි, පූර්වයෙහිත් ශික්ෂාකාමී ය"යි වදාරා මේ ජතක ධර්මදේශනාව ගෙනහැර දක්වා සන්ධි ගළපා 'තිපල්ලත්ථමිග ජාතකය' නිමවා වාදළසේක.

"එකල්හි බෑණාවු මුව පැටියාණෝ නම් දැන් රාහුල ස්ථවිරයෝය, ඒ මුව පැටියාණන්ගේ මෑණියෝ නම් උපුල්වන් මහස්ථවිරිය, මුව පැටියාණන්ට මයිල් වූ මුවාණෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 017. මාලුත ජාතකය

තවද එක් සමයෙක්හි සර්වඥ ගෙවා දත්(දතයුතු සියලු දේ සම්පූර්ණයෙන් අවබෝධ කළ) බුදුරජාණන් වහන්සේ දෙව්රම්වෙහෙර වසනසේක් වැද්ධ කල මහණ වූ භික්ෂූන් දෙනමක් අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ භික්ෂු දෙනම කොසොල් ජනපදයෙහි එක් ආරණ්‍ය විහාරයෙක්හි වසනසේක. එක් කෙනෙක් කාල ස්ථිවිර නම්, එක් කෙනෙක් ජුණ්හ ස්ථවිර නම්. ඉක්බිත්තෙන් එක් දවසක් ජුණ්හ ස්ථවිරයන් වහන්සේ  කාල ස්ථවිරයන් වහන්සේගෙන් විචාරණසේක් "ස්වාමීනි, කාල ස්ථවිරයන් වහන්ස, ශීත නම් කවර කලෙක්හි වන්නේදැ?"යි විචාළසේක. හෙතම "කාල පක්‍ෂයෙහි(අව පක්ෂයෙහි) වන්නේය"යි කීසේක.

ඉක්බිත්තෙන් එක් දවසක් කාල ස්ථවිරයන් වහන්සේ ජුණ්හ ස්ථවිරයන් වහන්සේ අතින් විචාරණසේක් "ස්වාමීනි, ජුණ්හ ස්ථවිරයන් වහන්ස, ශීත නම් කවර කාලෙක්හි වන්නේදැ?"යි විචාළසේක. හෙතම "ජුණ්හ පක්‍ෂයෙහි(පුර පක්ෂයෙහි) වන්නේය"යි කීසේක. ඔහු දෙදෙනාම තම තමාගේ ශංකා(සැක) සිඳින්නට නොහැකිව සර්‍වඥයන් වහන්සේ සමීපයට ගොස් සර්‍වඥයන් වහන්සේට නමස්කාර කොට "ස්වාමීනි, සර්‍වඥයන් වහන්ස, ශීත නම් කවර කලෙක්හි වන්නේදැ?"යි විචාළාහුය. සර්‍වඥයන් වහන්සේ ඒ භික්‍ෂූන්ගේ කථාව අසා වදා‍රා "මහණෙනි, මම පූර්‍වයෙහිත් තොපට මේ ප්‍රශ්නය දේශනා කෙළෙම්, භවයෙන් වැසී තුබුණු බැවින් නොසැලකුවාහුය"යි වදා‍රා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස එක් පර්‍වත ප්‍රාන්තයෙක්හි(පවු පාමුලක) සිංහයෙක්ද, ව්‍යාඝ්‍රයෙක් දැයි කියා යහළුවෝ දෙදෙනෙක් එකම ගුහායෙක්හි වසන්නාහුය. එකල්හි බෝධිසත්‍වයන්

වහන්සේද ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන්(තවුස් පැවිද්දෙන්) පැවිදිව ඒ පර්වත ප්‍රාන්තයෙහි වාසය කරනසේක.

ඉක්බිත්තෙන් එක් දවසක් ඒ යහළුවන් දෙදෙනාට 'ශීතය' නිසා විවාදයක් උපන. ව්‍යාඝ්‍රයා "කාල පක්‍ෂයෙහි වන්නේය"යි කීයේය. සිංහයා "ජුණ්හ පක්‍ෂයෙහි ශීත වන්නේය"යි කීයේය. ඔහු දෙදෙනාම තමාගේ ශංකා සිඳින්ට නොහැකිව බෝධිසත්වයන් වහන්සේ අතින් විචාළාහුය. බෝධිසත්වයන් වහන්සේ වදාරණසේක් "කෘෂ්ණ පක්‍ෂයෙහිද(අව පක්ෂයෙහිද) නොහොත් ශුක්ල පක්‍ෂයෙහිද(පුර පක්ෂයෙහිද) යන මේ දෙපක්‍ෂයෙන් යම් කලෙක්හි පූර්වාදී දිගින්(පෙරදිග ආදි දිසාවලින්) යුක්තව මාරුතය හමාද? එසමයෙහි ශීත වෙයි. ඊට කාරණා කවරේද? ශීතය වාතයෙන් හටගන්නේය. වායු හමන කල්හි ශීතය වන්නේය. කෘෂ්ණ පක්‍ෂය, ශුක්ල පක්‍ෂය ම ප්‍රමාණ නොවන්නේය. තොපි දෙදෙන මේ ප්‍රශ්නයෙහි නොපැරදුනාහුය. මෙසේ බෝධිසත්වයන් වහන්සේ ඒ යහළුවන් දෙදෙනාට අවබොධ කළසේක.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ ද "මහණෙනි, පෙරත් මා විසින් තොපට මේ ප්‍රශ්නය කියන ලද්දේය"යි මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදාරා දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග යන චතුරාර්ය සත්‍යයන් ප්‍රකාශකොට වදාළසේක. චතුස්සත්‍යයාගේ කෙළවර ඒ ස්ථවිරයන් දෙදෙනා වහන්සේම සෝවාන් ඵලයෙහි පිහිටියාහුය. ශාස්තෘන් වහන්සේ පූර්වාපර සන්ධි ගළපා මේ ජාතකය නිමවා වදාළසේක.

“එකල්හි ව්‍යාඝ්‍රතෙම කාල ස්ථවිර වූයේය. සිංහතෙම ජුණ්හ ස්ථවිර වූයේය. ප්‍රශ්නය විසර්ජනය කළාවූ තපස්විව උපන්නෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ”යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 018. මතකභක්ත ජාතකය

තවද එක් සමයෙක්හි බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර නිසා ජේතවනාරාමයෙහි වැඩ වසනසේක් මතකභක්තයක්(මළවුන් වෙනුවෙන් දෙන දානයක්) අරභයා මේ ජාතකය වදාළසේක.

එකල්හි මනුෂ්‍යයෝ එළුවන් ආදී වූ බොහෝ සත්‍වයන් මරා කාලක්‍රියා කළා වූ තමන්ගේ නෑයන් උදෙසා මතකභක්ත නම් වූ පරිත්‍යාගයක් කෙරෙති. භික්‍ෂූහු ඒ මනුෂ්‍යයන් මෙපරිද්දෙන් කරන්නාවුන් දැක සර්‍වඥයන් වහන්සේ අතින් “ස්වාමීනි, දැන් මනුෂ්‍යයෝ බොහෝ ප්‍රාණීන් ජීවිතක්‍ෂයට පමුණුවා මතකභක්ත නම් වූ දෙයක් දෙති, ස්වාමීනි, මෙහි වැඩෙක් ඇද්දැ?”යි විචාළසේක. සර්‍වඥයන් වහන්සේ “මහණෙනි, මතකභක්ත දෙම්හයි කියා කරනලද ප්‍රාණඝාතයෙහි කිසිත් වැඩෙක් නම් නැත. පෙරත් නුවණැත්තෝ ආකශයෙහි හිඳ ධර්‍මදේශනා කොට මේ මතකභක්තයෙහි ආදීනව කියා සියළු ජම්බුද්වීපවාසී සත්‍වයන් මේ ක්‍රියාවෙන් ඇරවූහ(මුදාගත්හ). දැන් වනාහී භවසංක්ෂේපගත හෙයින්(සසරින් වැසී ඇති නිසා) නැවත පහළවිය”යි වදාරා අතීත කථාව ගෙනහැර දැක් වූසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි වේදත්‍රයාගේ පාරප්‍රාප්ත වූ(ඍග් - යජුර් - සාමන් යන තුන්වේදය හොඳින් උගත්) දිසා ප්‍රධාන(දිසාපාමොක් නම් වූ) එක් ආචාර්ය බ්‍රාහ්මණයෙක් “මතකභක්තයක් දෙමැ”යි එක් එළුවකු අල්වාගෙන තමාගේ අතවැස්සන්ට “සගයෙනි, මේ එළුවා ගඟට ගෙනගොස් නාවා කර මල්වඩම් බැඳ පසගුල්දී(අතක ඇඟිලිපහ කෙළවර සුවඳ ආලේප තවරා එළුවාගේ සිරුරෙහි ඉන් සලකුණු තබා) සරහා ගෙනෙවු”යි විධාන කෙළේය. ඒ මනුෂ්‍යයෝද “යහපතැ”යි බමුණාට ප්‍රතිඥා දී එළුවා ඇරගෙන ගඟට ගොස් නාවා කීසැටියේ සරහා ගංතෙර සිටවූහ. ඒ එළු, තමා පූර්වයෙහි කරණ ලද අකුශල කර්මය ජාතිස්මරණඥානයෙන්(පෙර ආත්ම සිහිකර බැලීමට සමත් නුවණින්) දැක “මෙබඳු වූ දුක්ඛයෙන් අද දවස් මිදෙමි”යි සොම්නසට පැමිණියේ කළයක් බිඳින පරිද්දෙන් මහත්කොට සිනාසී නැවත “මේ බමුණා මා මරා මා විසින් මෙතෙක් කල් මුලුල්ලෙහි විඳි දුක් ලබන්නේය”යි බමුණා කෙරෙහි කරුණා උපදවා මහත් වූ ශබ්දයෙන් හැඬුයේය.

ඉක්බිත්තෙන් පුරුෂයෝ ඒ කරුණ ඔහු අතින් “සබඳ එළුවාණෙනි, තොපි මහත්කොට සිනාසී ඇඬුවාහුය. කවර කාරණයකින් සිනාසුනුද? කවර කාරණයකින් ඇඬුවාහුදැ?”යි විචාළාහුය. “තෙපි ඇම මේ කාරණය තොපගේ ආචාරීන් සමීපයෙහි දී මා අතින් විචාරවු”යි කියේය. මනුෂ්‍යයෝ ඒ එළුවා ඇරගෙන ගොස් මේ කාරණය ආචාර්යය

බ්‍රාහ්මණයාහට කීහ. ඒ ආචාර්යයාද මනුෂ්‍යයන් කී බස් අසා එළුවා අතින් "එළුවාණෙනි, තෙපි කවර කාරණයකින් සිනාසුනුද? කවර කාරණයකින් හැඬුයේදැ?"යි විචාළේය.

ඒ එළුවාද තමා පූර්වයෙහි කළ අකුශල කර්මය ජාතිස්මරණඥාණයෙන් සිහිකොට බමුණාට කීහ. "බ්‍රාහ්මණයාණෙනි, මම පූර්වයෙහි තොපසේම වේදත්‍රය හදාළ වූ(උගත්) බමුණුව ඉපිද 'මතකභක්තයක් දෙමි'යි එළුවකු මරා දිනිමි. හේ මම ඒ එළුවා මැරූ අකුශල කර්මයෙන් එකකින් උනු පන්සියයක් ජාතියෙහි(ආත්ම හාරසිය අනූ නවයක) ඉස්කැපීම් දුක්ඛයට පැමිණියෙමි. මේතෙම මට කොටිප්‍රාප්තිය වූ (අවසානයට පැමිණි) පිරුණු පන්සියයක් ජාති ඇති ආත්මභාවය ය. හේ මම 'අද දවස් මෙබඳු වූ දුක්ඛයෙන් මිදෙමි'යි සොම්නසට පැමිණියෙමි, මේ කාරණයෙන් සිනාසීමි. අඬන්නෙම් වනාහි 'මම එළුවකු මරා ජාති පන්සියයක් මුළුල්ලෙහි ඉස්කැපීම් දුක්ඛයට පැමිණ අද ඒ දුක්ඛයෙන් මිදෙමි. මේ බමුණා ද මා මරා මා සේම පන්සියයක් ජාතියෙහි ඉස්කැපීම දුක්ඛය ලබන්නේය'යි තොප කෙරෙහි කරුණාවෙන් ඇඬිමි"යි කීය. "එළුවාණෙනි, නොබව, මම තොප නොමරමි"යි කීය. "බමුණානෙනි, කුමක් කියවුද? තොප නොමැරුවත් මා විසින් අද මරණින් මිදෙන්ට නොපිළිවනැ"යි කීය. "එළුවාණෙනි, තෙපි නොබව, මම තොපට රැකවල් ගෙන තොප හා සමග ඇවිදිමි"යි කීය. "බමුණානෙනි, තොපගේ ආරක්ෂාව ඉතා ස්වල්පය, මා විසින් කරන ලද අකුශල කර්මය මහත බලවතැ"යි කීය. බමුණෝ එළුවාණන් මුදා "මේ

එළුවා කවර කෙනෙකුන් විසිනුත් මැරිය නොදෙම්හ”යි කියා තමාගේ අතවැස්සන් ඇරගෙන ගොස් බමුණාණෝ එළුවාණන් හා එක්වම ඇවිදිනාහ. එළුවා බැම්මෙන් හරණ ලද්දේ එක් ගලතලයක් පිට අටගත් තණ කැලයෙක්හි කර ඔසවා කොළ කන්ට පටන් ගත්තේය. එකෙනෙහිම ගලතල පිට සෙනක්(අකුණක්) ගැසීය. ඉන් ගල්ලැල්ලක් ඉපිරගෙන ගොස්(ගැලවී ගොස්) එළුවා දික්කළා වූ ග්‍රීවයෙහි හී(බෙල්ලේ වැදී) හිස කැපුනේය. ඉක්බිත්තෙන් මහජනයාද එතනට රැස්විය.

එකල්හි මහබෝධිසත්‍වයෝ ඒ ස්ථානයෙහි වෘක්‍ෂ දේවතාව උපන්හ. ඒ බෝධිසත්‍වයෝ ද මහජනයා බල බලා සිටියදීම දේවතානුභාවයෙන් නිරාලම්බ වූ(එල්ලී සිටීමට නොහැකි) ආකාශයෙහි ඌරුබද්ධාසනයෙන් උපලක්‍ෂිතව හිඳ(අරමිණිය බැඳ වාඩිවී) “මේ සත්‍වයෝ මෙපරිද්දෙන් අකුශලයෙහි විපාක දැන ප්‍රාණඝාත නොකොළෝ නම් යෙහෙකැ”යි මියුරු වූ කටහඬින් යුක්තව ධර්මදේශනා කරන්නාහු මෙසේ කියත් “ඒ ඒ භවයෙහි සත්‍වයාගේ උත්පත්තියත්, ජරා ව්‍යාධි මරණ පැමිණීමත් දුක් වන්නේ යයි මෙසේ ලෝකයෙහි සත්‍වයෝ දන්නාහු නම් සත්‍වයෙක් සත්‍වයෙකු නොමරන්නේය. ප්‍රාණඝාත කළා වූ පුද්ගලයා වනාහි අටමහනරකයෙහිත්(මහනිරය අටෙහිත්) සොළොස් ඔසුපත් නරකයෙහිත්(නරකයක වටේ ඇති කුඩා නරක දහසයෙහිත්) අනෙකප්‍රකාර වූ තිරිසන් යෝනියෙහිත් ඉපිද මහත් වූ දුක් අනුභව කෙරෙමින් බොහෝ කලක් ශෝක කරන්නේය. මොහයෙන් මුඩ වූ(මෝඩකමින් මුළා

වූ) සත්‍වයෝ අවිජ්ජාවෙන්(මෝඩකමින්) අන්ධව මේ ආදීනව(විපාක) නොදැක ප්‍රාණඝාත කරන්නාහුය”යි මෙසේ මහබෝසතාණෝ නරක භයින් තැතිගන්වා ධර්‍මදේශනා කළෝය. මනුෂ්‍යයෝ ධර්‍මදේශනාව අසා නරක භයින් භයපත්ව ප්‍රාණඝාතයෙන් වැළැක්කාහුය. බෝධිසත්‍වයෝත් ධර්‍මදේශනා කොට මහජනයා ශීලයෙහි පිහිටුවා කම්වූ පරිද්දෙන් මියපරලොව ගියෝය. මහජනයාත් බෝධිසත්‍වයන්ගේ අවවාදයෙහි පිහිටා දනාදී පින්කම් කොට දිව්‍යලෝකයෙහි උපන්නාහුය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා වදාරා පූර්‍වාපර සන්ධි ගළපා මේ ‘මතකභක්ත ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි වෘක්‍ෂ දේවතාව ඉපිද ධර්‍මදේශනා කෙළෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ”යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

## 019. අයාචිතභක්ත ජාතකය

තවද එක් සමයෙක්හි තුන්ලෝවාසීන්ට ගෞරවස්ථානීය වූ(ගරු කළයුතු තැන්හි සිටියාවූ) සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි සතර ඉරියව්වෙන් යුක්තව වැඩ වාසය කරනසේක් දේවතාවන්ට යාච්ඤා කොට බිලි පූජාව කිරීමක් අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ කාලයෙහි වනාහී මනුෂ්‍යයෝ වණික් කර්මාන්තය පිණිස(වෙළහෙළඳම් සඳහා) යන්නාහු මෘග සූකරාදී ප්‍රාණීන්(මුව ඌරු ආදී සතුන්) ඝාතනය කොට දේවතාවන්ට බිලිපූජා කොට "අපි අන්තරායක් නැතිව අර්ථසිද්ධියට(බලාපොරොත්තු ඉටු කර) පැමිණ අවුත් නැවත නුඹවහන්සේලාට බිලි පූජා කරම්හ"යි කියා ආරාධනාකොට යන්නාහුය.

එසේ ගිය තැන්හි අන්තරාවක් නැතිව අර්ථසිද්ධියට පැමිණ ආවාහූ "දෙවතානුභාවයෙන් මේ අර්ථසිද්ධිය වූයේය"යි සිතමින් ඌරන් මුවන් ආදීවූ බොහෝ ප්‍රාණීන් නසා යාඥවෙන් මිදෙන පිණිස බිලි පූජා කරන්නාහුය. එසේ කරන්නාවූ බිලිපූජා දැක භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේට දන්වන්නාහු "ස්වාමීන් වහන්ස, මේ ප්‍රාණඝාත කිරීමෙහි වැඩෙක් ඇද්දෙ හෝ නැද්දේ හෝ"යි විචාළාහුය. භාග්‍යවතුන් වහන්සේ භවයෙන් වැසී තුබුනු කාරණය ප්‍රකාශකොට වදාළසේක.

යටගිය දවස කසීරට එක් ගමෙක්හි කෙළෙඹි පුත්‍රයෙක් ගම්දෙරෙහි(ගමට ඇතුළුවන දොරටුවෙහි) පිහිටියා වූ නුග වෘක්ෂයෙක වාසය කරන්නා වූ දෙවතාවට "බිලිපූජා කෙරෙමි"යි ප්‍රතිඥකොට ගොස් අර්ථසිද්ධියට පැමිණ අන්තරායක් නැතිව අවුත් "එළුවන්, තිරෙළුවන්(බැටළුවන්) ආදී වූ බොහෝ ප්‍රාණීන් ඝාතනය කොට ඇයැද ගැනීමෙන්(දෙවියන් යැදීමෙන්) අන්තරායෙන් මිදෙමි"යි සිතා

නුග රුක්මුලට ගියේය. නුග වෘක්ෂයෙහි අධිගෘහිත දිව්‍යපුත්‍ර තෙම කඳ වෙළෙප්හි(ගස් දෙබලක) සිට මෙසේ කීයේය.

"පින්වත් පුරුෂය, තෝ ඉදින් මින් මිදෙනු කැමැත්තෙහි නම් පරලොව මිදෙනු පරිද්දෙන් මිදෙව, ප්‍රාණ වධාදී වූ දුශ්චරිත කොට දැන් මිදෙන්නේද, මතු පාප පාශයෙන්(පවු නැමති උගුළෙන්) බැඳෙන්නේය. ඒ කාරණය දැන මෙසේ නුවණැත්තාවූ පණ්ඩිත පුරුෂයෝ මතු පාප පාශයෙන් නොබැඳෙන පරිද්දෙන් මිදෙත්. ඊට කාරණා කවරේද? මෙබඳු මිදීම් අඥානයා හට බන්ධනයට කාරණාය(සසර බැඳීමට කරුණු වේ). මෙසේ ප්‍රාණඝාත කොට මිදීම නම් අඥානයා හට බැඳීමට කාරණා වන්නේය"යි කියා ධර්මදේශනා කළසේක.

එතැන් පටන් මනුෂ්‍යයෝ මෙබඳු වූ ප්‍රාණඝාත කිරීම යයි කියන ලද අකුශලකර්මයන් වැලක දානශීලාදී වූ සුචරිත ක්‍රියාවෙහි හැසිරී දිව්‍යලෝකයෙහි උපන්නාහුය.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ මේ ජාතක ධර්මදේශනාව ගෙනහැර දක්වා පූර්වාපර සන්ධි ගළපා මේ 'ආයාචිතභක්ත ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි වෘක්ෂ දේවතාව උපන්නෙම් දැන් තිලෝගුරු සම්‍යයක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන් වහන්සේ ගෙනහැර දක්වා වදාළසේක.

# 020. නළපාන ජාතකය

තවද එක් සමයෙක්හි දෙව්බඹුන් මුදුනෙහි කෙළනා(දෙව්බඹුන් සිරසින් පදුම්ලද) පා පියුම් ඇති ලෝකස්වාමී වූ සර්‍වඥයන් වහන්සේ කොසොල් දනව්වෙහි සැරිසරා ඇවිදිනා සේක් ‘නළපාන’ නම් ගමට පැමිණ ‘නළපාන’ නම් පොකුණ සමීපයෙහි වූ වැටකේ වනයෙහි වසනසේක් බටදඬු අරභයා මේ ජාතකය වදාළසේක.

එසමයෙහි භික්‍ෂූන් වහන්සේ නළපාන නම් පොකුණෙන් පැන් සනහා ඉදිකටු කුළා නිසා(ඉදිකටු කොපු සඳහා) සාමණේරයන් වහන්සේ ලවා බටදඬු කප්පවා ගෙන්වා ගෙන ඒ සියළු බටදඬු ගැට නැතිව එකච්ඡිද්‍රව(එකම සිදුරක් ලෙස) දිගටම සිදුරු නියාව දැක බුදුන් කරා ගොස් “ස්වාමීනි, අපි ඉදිකටු කුළා නිසා බටදඬු ගෙන්වුම්හ. ඒ බටදඬු මුල පටන් අග දක්වා සිදුරුය. මේ කිමෙක්දැ?”යි විචාළෝය. සර්‍වඥයන් වහන්සේ එබස් අසා “මහණෙනි, මේ මාගේ පුරාතනයෙහි අධිෂ්ඨානයෙකැ”යි වදරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස ඒ වන ලැහැබ වල් වූයේය(වල් බිහිවිය). ඒ පොකුණෙහි එක් දිය රකුසෙක් පොකුණට බට මිනිසුන් කන්නේය. එසමයෙහි බෝධිසත්‍වයෝත් තිත්මුවකු සා(පමණ) මහතැති වඳුරු රජව අසූදහසක් පමණ වඳුරන් විසින් පිරිවරණ ලදුව වඳුරුමුල පරිහරණය කෙරෙමින් ඒ වනයෙහි වසන්නාහුය. ඒ මහබෝසතාණෝ වානර සමූහයාට අවවාද දෙන්නාහු “දරුවෙනි, මේ වනයෙහි විෂ වෘක්‍ෂයෝත්

අමනුෂ්‍යාධිගෘහිත වූ පුෂ්කරණීහුත්(පොකුණුත්) වෙති. එසේ හෙයින් තොපි හැම නොකෑවිරූ ඵලාඵලයන් කතොත් වේවායි නුපූවිරූ(බී හුරු පුරුදු නැති) පැනක් බොතොත් වේවායි මා විචාරාම කවු බොවු"යි විධානය කළෝය. ඒ වානරයොත් එබස් "යහපතැ"යි පිළිගෙණ එක් දවසක් පෙර නොගියවිරූ තැනකට ගොස් එතැන්හි දහවල් දෙවරු(පෙරවරු පස්වරු) ඇවිද පැන් සොයන්නාහු එක් පොකුණක් දැක පැන් නොබීම බෝධිසත්‍වයන්ගේ ඊම බල බලා උන්නාහුය. එකල්හි බෝධිසත්‍වයෝ අවුත් "කිමෙක්ද? දරුවෙනි, පැන් නොබෙව්වදැ?"යි කිවූය. වානරයෝ කියන්නාහු "නුඹවහන්සේ එනතෙක් බලා උනුම්හ"යි කිවූය. බෝධිසත්වයෝ "දරුවනි, තොප කළ සේ යහපතැ"යි කියා පොකුණ සිසාරා ඇවිද පියවර පරීක්‍ෂා කරන්නාහු දියටබට පියවර ම දැක දියෙන් ගොඩනැගී පියවර නොදැක "ඒකාන්තයෙන් මේ අමුනුෂ්‍ය පරිගෘහිත වූ(අමුනුෂ්‍යයන් අරක්ගත්) පොකුණක් වුව මැනවැ"යි දැන "පැන් නොබී උන්නාවූ තොප විසින් කෙළදැ ඉතා යහපත් වන්නේය. මේ අමුනුෂ්‍යධිගෘහිත පොකුණෙකැ"යි කිවූය.

උදක රාක්‍ෂසයාද(දිය රකුසාද) ඒ වඳුරන් දියට නොබස්නවුන් දැක නිල් වූ බඩ හා ධවල වූ මුඛ(සුදුපාට මුහුණ) ඇතිව රත් වු අතුල්තල පතුල්තල ඇතිව භයංකර වේශයෙන් දිය දෙබෑකොට නික්ම "කුමක් නිසා උනුද? පොකුණට බැස පැන් බොවු"යි කීය. එකල මහබෝසතාණෝ ඔහට කියන්නෝ "මේ පොකුණෙහි උපන් උදක රාක්‍ෂයා

නම් තෝදැ"යි විචාළෝය. "එසේය මමය"යි කී කල්හි "පොකුණට බටවුන් කන්නට ලැබෙන්නේදැ?"යි කිවුය. "එසේය ලබමි, මම මීට බට යටත් පිරිසෙයින් පක්ෂීන් පටන් කිසිකෙනෙකුන් නොහරිමි. තොපි ඇමදෙනාත් කන්නෙමි වේදැ"යි දියරකුසු කීය. ඒ බස් ඇසූ බෝධිසත්වයෝ "අපි තොප විසින් අප හැම දෙනා කෑ නොදෙම්හ"යි කිවූය. "එසේ කළ පැනුත් බොන්නෙහුදැ?"යි දියරකුසු කීය. "එසේය පැනුත් බොම්හ, තොප වසඟයටත් නොපැමිණෙම්හ"යි කිවූය. "එසේ කළ කෙසේ පැන් බොවුදැ"යි උදක රාක්ෂයා කී කල්හි "කිමෙක්ද තෝ බැස පැන් බොතියි සිතන්නෙහිදැ?"යි බෝධිසත්වයෝ කියා "අපි අැම අසූදහසක් පමණ වඳුරෝ පොකුණට නොබැසම එකෙකෙක් බට දණ්ඩක් ගෙන ඇඹුල දණ්ඩෙන්(නෙලුම් දඬුයෙන්) පැන් බොන්නවුන් මෙන් තාගේ පොකුණෙන් පැන් බොම්හ. එසේ කල්හි තොපි අප ඇමදෙනා කන්ට අසමර්ථ වන්නෙහි වේදැ"යි කිවුය. මෙසේ කියා මහබෝසතාණෝ එක් බට දණ්ඩක් ගෙන්වා හැරගෙණ පාරමි ධර්මයෙන් ආවර්ජනා කෙරෙමින්(සිහි කරමින්) සත්‍යක්‍රියා කොට මුඛයෙන් පිඹපූහ. බට දණ්ඩ ඇතුළෙන් කිසිම ගැටයක් නැතිව මුල සිට අග දක්වා හැම තැනම සිදුරු විය. මෙම ක්‍රමයෙන් අනිකුත් අනිකුත් බට දඬු ගෙන්වා පිඹ දුන්නේය. තවද "මෙසේ කල්හි පිඹ නිමවන්නට නොපිළිවන්ය"යි කියා බෝධිසත්වයෝ "මේ පොකුණ වටකොට අටගත් සියලු බට දඬු එකච්ඡිද්‍ර වේවා"යි කියා අධිෂ්ඨාන කළෝය.

බෝධිසත්ත්වවරයන්ගේ කුසල් මහත් බැවින් සිතූ දෙය සමෘද්ධ(ඉෂ්ට) වන්නේය. එසේ හෙයින් එතැන් පටන් ඒ පොකුණ වටකොට සිටි සියළුම බටදඬු ඒකච්ඡිද්‍ර විය, ඒකරන්ධ්‍ර(ඇතුළත ගැට රහිතව එකදිගටම හිස්ව සිදුරුවිය) විය. මේ කාලපයෙහි කල්පස්ථායි වූ(කල්පයක කාලයක් තුළ පවත්නා) ප්‍රාතිහාර්යය සතරෙක් වන්නේය. ඒ සතර කවරේද? යත්, චන්ද්‍රයාගේ ශශ ලාඤ්ඡනය(හාවාගේ සළකුණ) මේ කල්පය මුලුල්ලෙහි සිටිනේය. වට්ටක ජාතකයෙහි ගිනි නිවී ගිය තැන් මේ කප මුලුල්ලෙහි ගින්නෙන් නොදවන්නේය. ඝටීකාර නම් කුම්භකාරයාගේ(වළං සාදන්නාගේ) ගෙය පිහිටි තැන් සියලු මේ කප නොතෙමී තිබෙන්නේය. මේ පොකුණ පිරිවරා සිටි සියලු බටදඬු මේ කප මුලුල්ලෙහි ඒකරන්ධ්‍රව තිබෙන්නේ යයි මෙසේ කල්පස්ථායී වූ ප්‍රාතිහාර්යය සතරක් වන්නේය. බෝධිසත්ත්වයෝ මෙසේ අධිෂ්ඨාන කොට එක බටදණ්ඩක් ගෙන උන්නාහුය. ඒ අසූදහසක් පමණ වානරයෝත් එකි එකී බටදණ්ඩක් ගෙන පොකුණ පිරිවරා උන්නාහුය. ඔහු ඇමදෙනද බෝධිසත්ත්වයන් බටදණ්ඩෙන් උරා පැන් බොන්ට ගත් කල්හි ගොඩ හිඳ බටදණ්ඩෙන් උරා පැන් පූවාහුය. මෙසේ ඔවුන් ඇමදෙනාම පැන් පු කල්හි උදක රාක්‍ෂසයා කිසිවක් නොලැබ නොසතුටුව සිත් ඇතිව තමා වසන්නාවූ ස්ථානයටම ගියේය. බෝධිසත්ත්වයෝත් සහපිරිවරින් වලටම(වනයට) වන්නාහුය. ශාස්තෘ වූ සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ "මහණෙනි, මේ බට දඬු සිදුරුවීම මාගේම පුරාතන අධිෂ්ඨානයෙකැ"යි මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදරා

පූර්වාපර සන්ධි ගළපා මේ ‘නළපාන ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි උදක රාක්ෂසයා නම් දැන් මේ දෙවදත්ත ස්ථවිරයෝය. අසූදහසක් වානරයෝ නම් දැන් මේ බුදු පිරිසය. උපායෙහි දක්ෂ වූ වානර රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ”යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 021. කුරුඞ්ගමෘග ජාතකය

තවද එක් සමයෙක්හි ලොවට හිත ඇති වූ තිලෝගුරු සම්‍යයක් සම්බුදුරජාණන් වහන්සේ වේළුවනාරාමයෙහි වසන සේක් දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

එක් සමයෙක්හි දම්සභා මණ්ඩපයෙක්හි රැස්ව උන්නාවු භික්ෂූන් වහන්සේ “ඇවැත්නි, මේ දේවදත්ත ස්ථවිරයෝ සර්වඥයන් වහන්සේ මරණ පිණිස දුනුවායන් මෙහෙයූහ, හිසට ගල් පෙරලූහ, නාලාගිරියා මෙහෙයූහ, සර්වප්‍රකාරයෙන්ම(හැම අතින්ම) බුදුන් වධයට උත්සහ කළහ”යි දේවදත්ත ස්ථවිරයන් වහන්සේගේ නුගුණ කියමින් උන්සේක. සර්වඥයන් වහන්සේ අවුත් පණවන ලද බුද්ධාසන මස්තකයෙහි වැඩහිඳ “මහණෙනි, දැන් කවර කථාවකින් යුක්තව උනුදැ”යි විචාරා වදාළසේක. “ස්වාමීනි, දෙවදත්ත ස්ථවිරයෝ නුඹවහන්සේට වධයට උත්සහ කෙරෙතියි උන්ගේ නුගුණ කිය කියා

උනුම්හ"යි කීසේක. "මහණෙනි, දෙවදත්ත ස්ථවිරයන් මා වධයට උත්සහ කෙළේ දැන්මතු නොවෙයි පෙරත් උත්සහ කළෝමය, එතකුදු වුවත් මරාගත නුහුනුවෝමය"යි වදුරා ඉකුත්වත් ගෙනහැර දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරන කල්හි බෝධිසත්වයෝ කුරුංගමෘග යෝනියෙහි(තිත්මුව ආත්මයන) ඉපිද එක් වනයක ඵලාඵල කමින් වාසය කෙරෙති. ඒ බෝධිසත්වයෝ එක් කාලයක ඵලසම්පන්න වූ(ගෙඩි පිරී ගියාවූ) ඇද්දේමට වනයක ඇද්දෙමට ගෙඩි කන්නාහුය. එකල්හි මැස්සේ සිට(ගස් උඩ අට්ටාල බැඳ ඒ මතට වී)  සතුන් මරන්නා වූ ගම්වැසි වැදිපුත්‍රයෙක් ඵලගත් ගස්මුල්වල(ගෙඩිවලින් පිරුණු ගස්යට) මුවන්ගේ පියවර සටහන් බලා ගස උඩ මැස්සක් බැඳ එහි ඵල අනුභව කරන්නට ආවාවූ මුවන් තෙප් දමාලා හැණ(හෙල්ලෙන් ඇණ) මරා ඒ මුවන්ගේ මස් විකුට ජීවත් වන්නේය.

එක් දවසක් ඒ ගසමුල බෝධිසත්වයන්ගේ පියවර සටහන් දැන් ඒ ඇද්දෙමට ගස උඩ අට්ටාලයක් බැඳ උදෑසනම බත් කා තෙප්ගෙන වනයට වැද ඒ වෘක්‍ෂය උඩට නැගී අට්ටාලය පිට උන්නේය.

බෝධිසත්වයෝ උදෑසනම වසන්නා වූ ස්ථානයෙන් නික්ම "ඇද්දෙමට කම්"යි අවුත් ඒ ගසමුලට වහා නොවැද කිසිකලෙක අට්ටාල වැද්දේ ගස්උඩ අට්ටාල බඳිති, එසේ

හෙයින් එබඳු උපද්‍රවයෙක් ඇද් දේ හෝ යි පරීක්‍ෂා කෙරෙමින් දුර සිටියාහුය. වැදි පුත්‍රයාත් බෝධිසත්‍වයන් ළගට නොඑන නියාව දැන අට්ටාලයෙහිම සිට ඇද්දෙමට ගෙඩි කඩ කඩා බෝධිසත්‍වයන් ඉදිරියට දමන්නේය. බෝධිසත්‍වයෝ "මේ එල අවුත් මාගේ ඉදිරියහිම වැටෙන්නේ මේ ගසඋඩ වැද්දෙක් ඇද්දේ"යි නැවත නැවත උඩ බලන්නාහුය. වැද්දහු දැක නොදුටුවාක් මෙන් "පින්වත් වූ වෘක්‍ෂය, පෙර තෝ ළඹ එල්වන කලක් මෙන් ඉඳුරාම එල එලන්නෙහිය(ලඹ කැටයක් පහතට එල්ලන්නාක් මෙන් කෙලින්ම ගෙඩි බිම දමන්නෙහිය). දැන්වූ කල්හි තා විසින් වෘක්‍ෂ ධර්‍මය හරන ලද්දේය(කෙලින්ම ගෙඩි බිමට දැමීමේ ගස්වල ස්වාභාවික චාරිත්‍රය අතහැර දමන ලදී) මෙසේ තා විසින් වෘක්‍ෂ ධර්‍මය හළ පසු මමත් අන්‍ය වෘක්‍ෂයක් කරා එළඹ මට ආහාරයක් සොයමි"යි නික්මුනහ.

එකල්හි වැදිපුත්‍රයා අට්ටාලයෙහිම හිඳ බෝධිසත්‍වයන්ට තෙප් දමා වැරද ගිය හෙයින් "තොප දැන් පලයව, වැරද ගියේ වේදැ"යි කීය. බෝධිසත්‍වයෝ කරකැවී සිට කියන්නෝ "එම්බල පුරුෂය, දැන් තා ඒකාන්තයෙන්ම මා වැරද වූ බවමුත් අට මහනරකයෙහිත් සොළොස් ඔසුපත් නරකයෙහිත්(මහා අපාය අටෙත් එක එකක් වටා ඇති ඔසුපත් අපාය දහසයෙහිත්) දෙතිස් කම්කටුල්(දෙතිස් වධ) නොවැරදවූයෙහිම වේදැ"යි කිවූය. මෙසේ කියා ඒ මහාබෝසතාණෝ කැමති පරිදි ගියෝය. වැදිපුත්‍රයා ගසින් බැස කැමති පරිද්දෙන් ගියේය.

බුදුරජාණන් වහන්සේ "මහණෙනි දේවදත්ත ස්ථවිරියන් මා වධයට උත්සහ කළේ දැන්මතු නොවෙයි පෙරත් උත්සහ කළෝමය එතකුදු වූවත් මරාගත නුහුණුවෝය"යි ධර්‍මදේශනා ගෙනහැර දක්වා වදරා මේ 'කුරඞගමෘග ජාතකය' නිමවා වදාළසෙක.

"එසමයෙහි අට්ටාල වැද්ද නම් දැන් මේ දෙවදත්ත ස්ථවිරයෝය. කුරුඞගමෘග වුයේම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජාණන් වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 022. කුක්කුර ජාතකය

තවද එක් සමයෙක්හි නිවනට දොරහළුවවූ(දොර විවෘත කළාවූ) තිලෝගුරු සම්‍යයක් සම්බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක් නෑයන්ට වැඩෙහි හැසිරීමක් අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ ඥාත්‍යර්ථචර්යාව(නෑයන්ට හිත වැඩ පිණිස හැසිරීම) ද්වාදස නිපාතයෙහි (දොළොස්වන පරිච්ජේදයෙහි) 'භද්‍රසාලා' ජාතකයෙහි මතු පහළ වෙන්නේය. වර්ථමාන කථාව පිහිටුවා ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි බෝධිසත්‍වයෝ එබඳු අකුශල කර්මයක් නිසා බලු යෝනියෙහි ඉපද නොයෙක් සිය දහස්ගණන් බල්ලන් විසින් පිරිවරණ ලදුව මහ සොහොනෙහි

වෙසෙති. ඉක්බිත්තෙන් එක් දවසක් රජ්ජුරුවෝ ඇළි(සුදු) අසුන් යෙදූ සියලු රථාලංකාරයෙන් සරහන ලද රථයකට පැනනැගී උයනට ගොස් එහි දිවාභාගය මුලුල්ලෙහි කෙළ(ක්‍රීඩාකොට) ඉරු අස්තයට ගිය කල්හි(ඉර බැසහිය පසු) නුවරට වන්නාහුය. රජ්ජුරුවන්ගේ රථය සැදුවනම(ගමනට සැරසූ අයුරින්ම) රාජංගණයෙහි තිබුණේය. රාත්‍රියෙහි වැසි වසින්ට පටන්ගත් කල්හි ඒ රථයේ හී සැදූ සම් හා වරපට තෙමී මොලොක්ව ගියේය. ප්‍රාසාදයේ මතුමහලින් කිණබල්ලෝ(දඩයම් බල්ලෝ) බැස ඒ රථයේ සම් හා වර පට කෑවාහුය. දෙවැනි දවස් රජ්ජුරුවන්ට කියන්නෝ "දේවයන් වහන්ස, සොරොව්වෙන් බල්ලෝ ඇතුළට වැද රථයෙහි සම් හා වරපට කෑවාහුය"යි කිවූය. එබස් ඇසූ රජ්ජුරුවෝ බල්ලන්ට කිපී "දුටු දුටු තැනදීම බල්ලන් මරව"යි විධාන කළෝය.

එතැන් පටන් බල්ලන්ට මහත්වූ ව්‍යසන උපන්නේය(විනාශයක් ඇතිවිය). ඔහු දුටු දුටු තැනම මරණ ලබන හෙයින් භයින් සොහොනට ගොස් බෝධිසත්ත්වයන් සමීපයට වන්නාහුය. බෝධිසත්ත්වයෝ ඔවුන් දැක "රැස්වූ නියාව බොහෝය, මීට කාරණා කිම්දැ?"යි විචාළෝය. ඔහු කියන්නෝ "අන්තඃපුරයෙහි රජ්ජුරුවන් වහන්සේගේ රථයේ සම් හා වරමඩු බල්ලන් විසින් කන ලදැයි කිපියාවූ රජ්ජුරුවන් වහන්සේ බල්ලන් මරන්නට විධාන කළසේක. බොහෝ බල්ලෝ නසිති. මහත් වූ භය උපනැ"යි කිවූය.

එබස් ඇසූ බෝධිසත්ත්වයෝ සිතන්නෝ "රැකවල් ඇතිව තිබෙන තැන හෙයින් පිටත බල්ලන්ට වදින්ට අවසර නැත්තේය. ඇතුළු රජුගේ කීණ බල්ලන්ගේම මේ ක්‍රියාවක් වන්නේය. දැන් වූකලී සොරුන්ට කිසි භයෙක් නැත්තේය. නොසොරුව සිටියෝ මරණයට පැමිණෙති, මම රජ්ජුරුවන් වහන්සේට සොරුන් දක්වා ඥාති සමූහයාට ජීවිතදානය දුන්නේ වීනම් යහපත් වන්නේය"යි ඒ මහබෝසතාණෝ නෑයන් අස්වසා "තෙපි හැම දෙන නොබවු, මම තොපට දිවි ඇරදෙමි, යම්තාක් රජ්ජුරුවන් දකින්නෙම්ද, ඒ තාක් තෙපි මෙහි වසව"යි කියා පාරමී ධර්මයන් ආවර්ජනා කොට(සිහිකොට) සලකා මෛත්‍රී භාවනා පෙරදැරි කොට "මා ඇඟට කැටයක්වත් මුගුරක්වත් ගසන්ට කිසිවෙකුත් උත්සාහ නොකෙරේත්වා"යි ඉටාගෙණ තනිවම ඇතුළුනුවරට වන්නාහුය. ඉක්බිත්තෙන් ඔවුන් දැක එක සත්ත්වයෙකුතක් කිපී බැලූ එකෙක් නම් නැත්තේය. රජ්ජුරුවෝ සුනඛවධය(බල්ලන් මැරීම) නියෝගකොට තුමූ විනිශ්චය මණ්ඩලයෙහි උන්නාහුය. බෝධිසත්ත්වයෝ රජ්ජුරුවන් උන්නාවූ ස්ථානයටම ගොස් වැද රජ්ජුරුවන්ගේ සිංහාසනය යටට වන්නාහුය. එකල්හි බෝධිසත්ත්වයන් රාජපුරුෂයෝ සිංහාසනය යටින් ඇද එළියේ ලන්ට පටන් ගත්තාහු. ඒ දැක රජ්ජුරුවෝ වැළකූහ.

මහබෝසතාණෝ මදක් සැතපී සිංහාසනය යටින් මෑත්ව රජ්ජුරුවන් වැඳ "නුඹවහන්සේ බල්ලන් මරණසේකැ"යි විචාළෝය. "එසේය මමය"යි කීකල්හි "බල්ලන්ගේ අපරාධය කවරේදැ?යි රජ්ජුරුවන් වහන්ස"යි කිවූය. "මාගේ රථයේ

සැදු සම් හා වරමදු කෑවාහුය"යි කීකල්හි "යම් කෙනෙක් කෑවු නම් ඔවුන් දන්නසේක්දැ"යි විචාළෝය. "නොදනුම්හ"යි කීකල්හි "සම් කෑ සොරු මොහුයයි තත්වූ හෙයින් නොදැනම දුටු දුටු තැන මේ මැරීම යහපත්ද? රජ්ජුරුවන් වහන්ස"යි කිවූය. "රථයෙහි සම් බල්ලන් කෑ හෙයින් දුටු දුටු තැනදී හැම බල්ලන්ම මරවු"යි "සුනඛවධය නියෝග කෙළෙමි"යි කිවූය.

එබස් ඇසූ බෝධිසත්වයෝ "කිමෙක්ද? නුඹවහන්සේගේ මනුෂ්‍යයෝ බල්ලන් හැමම මරද්ද? නොහොත් මරණු නොබලන්නෝත් ඇද්දැ"යි විචාළෝය. "මරණු නොලබන්නෝත් ඇත. අපගේ ගෙයි කීණ බල්ලෝ මරණු නොලබති"යි කිවූය.

එබස් ඇසු මහබෝසතාණෝ කියන්නෝ "මහරජ්ජුරුවන් වහන්ස, දැන්ම නුඹවහන්සේගේ රිය සම් බල්ලන් කෑ හෙයින් දුටු දුටුවන් ඇම ම මරවුයි සුනඛ වධය නියෝග කෙළෙමි කීසේක. නැවත දැන්ම අපගේ ගෙයි බල්ලෝ මරණු නොලබතියි කීසේක. එසේ කල්හි නුඹ වහන්සේ ඡන්දදී වශයෙන්(පක්ෂපාතකම් ආදිය නිසා) අගතියට යනසේක් වේදැ"යි කිවූය. මෙසේ කියා "අගතිගමනය නම් සුදුසු නොවන්නේය. රාජධර්‍මයකුත් නොවෙයි, රජ්ජුරුවන් නම් කාරණා කාරණා පරීක්ෂා කොට තරාදියක් මෙන් මධ්‍යස්ථවන්ට වටනේය. දැන් වනාහි කීණ බල්ලෝ මරණු නොලබති, දුර්‍වල වූ සුනඛයෝ මරණු ලබති, එසේ හෙයින් මේ

සියලු බල්ලන්ගේ මැරීමක් නොවෙයි, දුර්වල සුනඛ ඝාතනය''යි කිවූය.

මෙසේ කියා මහබෝසතාණෝ මධුරස්වර විහිදුවා "මහරජ්ජුරුවන් වහන්ස, යමක් නුඹ වහන්සේ කරනසේක් වීනම් ධර්මයෙක් නොවෙ''යි රජ්ජුරුවන්ට ධර්මදේශනා කළෝය. තවද "රජ්ජුරුවන් විසින් සොරුන්ට නිග්‍රහ කටයුත්තේය, නිසොරුන්ට නිග්‍රහ නොකටයුත්තේය, කිසිවකුත් නැති නිසොරු මරණට පැමිණෙති, අනේ! මේ ලෝකයෙහි අයුක්තියක් පවත්නේය''යි කිවූය. රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන්ගේ බස් අසා කියන්නේ "පණ්ඩිතයෙනි, අසවලුන් විසින් රිය සම් කන ලදැයි කීයේ තෙපි දනුදැ?''යි විචාළේය. "එසේය, දනිමි'' කී කල්හි "කවුරුන් විසින් කන ලද්දේදැ?''යි විචාළේය. "නුඹවහන්සේගේ ගෙයි කීණ බල්ලෝය''යි කී කල්හි "කීණ බල්ලන් විසින් කෑ නියාව දැන ගත්තේ කෙසේදැ?''යි විචාළේය. "මම ඔවුන් විසින් කෑ නියාව දක්වන්නේ නම් වේදැ''යි කී කල්හි "දක්වව, පණ්ඩිතයෙනි''යි කිවූය.

"එසේ වීනම් නුඹවහන්සේගේ ගෙයි කීණ බල්ලන් ගෙන්වා පැන් මොරු සුඟකුත් ඊතන සුඟකුත්(මෝරුවතුර ටිකකුත් ඊතණ ටිකකුත්) ගෙන්වුව මැනව''යි කිවුය. රජ්ජුරුවොත් එපරිද්දෙන්ම කළෝය. ඉක්බිත්තෙන් මහබෝධිසතාණෝ "මේ හීතණ මෝරෙහි මැඩ(හීතණ යුෂ මෝරු සමග මිශ්‍රකොට) බල්ලන්ට පෙව්ව මැනව''යි කිවුය. රජ්ජුරුවොත් එසේම කොට පෙවුහ. මෝරු පූ(පානය කළ) බල්ලෝ සම් හා වර සමග

වමනය කළාහුය. ඒ දැක රජ්ජුරුවෝ "සර්‍වඥකෙනෙකුන් වහන්සේගේ කීමක් මෙන් වන්නේය"යි සතුටුව ධවලච්ඡත්‍රයෙන්(සේසතින්) හා රාජ්‍යයෙන් පූජා කළාහුය.

මහබෝසතාණෝ "මහරජ්ජුරුවෙනි, දෙමව්පියන් කෙරේ ධර්‍මයෙන් හැසිරෙව" යනාදීන් 'තෙසකුණ' ජාතකයෙහි ආවාවූ දසරාජ ධර්‍මයෙන් රජ්ජුරුවන්ට ධර්‍මදේශනා කොට "රජ්ජුරුවෙනි, මෙතැන්පටන් ප්‍රමාද නොවව"යි රජ්ජුරුවන් පඤ්චශීලයෙහි පිහිටුවා තමන්ට දුන් ධවලඡත්‍රය හා රාජ්‍යය රජ්ජුරුවන්ටම පෙරලා දුන්නේය. රජ්ජුරුවෝ මහාබෝධිසත්‍වයන්ගේ ධර්ම කථා අසා සියලු සත්වයන්ට අභයදී බෝධිසත්වයන් ප්‍රධාන කොට බල්ලන් තමන් මේ නිමවන සැටියේම(ආහාර ගන්නා අයුරින්ම) නිරන්තරයෙන්ම බත් ලන ලෙස සලස්වා බෝධිසත්‍වයන්ගේ අවවාදයෙහි සිට ආයු පමණින් දනාදී වූ පින්කම් කොට මරණින් මත්තෙහි ගොස් දිව්‍ය ලෝකයෙහි උපන්නාහුය.

කුක්කුරොවාදය(බෝසත් සුනඛයා විසින් දුන් අවවාදය) දසවා දහසක් අවුරුදු(දස දහසක් අවුරුදු) මුළුල්ලෙහි පැවැත්තේය. බෝධිසත්‍වයෝත් ආයු පමණින් සිට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය.

ශාස්තෲවූ බුදුරජාණන් වහන්සේ "මහණෙනි, සර්‍වඥයෝ නෑයන්ට දැන්මතු වැඩෙහි හැසිරෙන්නෝ නෙවෙති, පෙරත් වැඩෙහි හැසිරෙන්නෝම වේදැ"යි මේ ධර්‍මදේශනාව ගෙනහැර

දක්වා වදරා පූර්වාපර සන්ධි ගලපා මේ ‘කුක්කුර ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් ආනන්ද ස්ථවිරියෝය. අවශේෂයෝ දැන් බුදු පිරිසය, එසමයෙහි අවවාද දුන් කුක්කුර නම් තිලෝගුරු සම්‍යයක් සම්බුදු රජවූ මම්ම වේදැ”යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 023. භොජාජානීය ජාතකය

තවද එක් සමයෙක්හි ජේතවනාරාමයෙහි වැඩවසන සර්වඥයන් වහන්සේ පසුබට වීර්යය ඇති එක් මහණෙකු අරභයා මේ ජාතකය වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි අප මහබෝධිසත්වයෝ භොජාජානීය නම් සෛන්ධවයන්ට (සින්ධු දේශයෙහි උපන් භොජාජානීය නම් කුලයෙහහි අශ්වයන්ට) නායකව අස්රජව උපන්නහ. භෝජාජානීය නම් කුලයෙහි සෙසු අසුන්ට වැඩි තරම් උතුම් වූ ඒ අස්රජනු බරණැස් නුවර රජහට මගුලස්ව වෙසෙති.

ඔවුන් සිටිනා අශ්වශාලාව උඩුවියන් බැඳ හිත්ති සිතුයම් කරවා බිම සුදුවැලි අතුරණ ලද්දේය. මහබෝසතාණෝ එහි හෙළ කුඩයක්(සුදු කුඩයක්) යටසිට මධුර වූ භෝජනය අනුභවකොට හැම අසුන්ට උතුම් ව වාසය කෙරෙති.

එසමයෙහි සත් රජ්ජුරු කෙනෙක් ඒ බරණැස් රජ්ජුරුවන් හා "යුද්ධකොට රාජ්‍යය ගණුම්හ"යි සටනට අවුත් බොහෝ සේනාව පිරිවරා පඤ්චායුධයෙන්, සන්නද්ධව ඇත්, අස්, රථ ආදී මහත් කායබල සේනාව ගෙන නුවර වටකොට සැරසී රැක සිටියාහුය. බරණැස් නුවර රජ්ජුරුවෝ තමන්ගේ අමාත්‍යයන් රැස්කොට එපවත් උන්ට කියා "කළමනා කිම්දැ"යි කිවූය.

එබස් අසා අමාත්‍යයෝ කියන්නාහු "දේවයිනි, නුඹවහන්සේ පළමුකොට නොවැඩිය මැනව, නුඹවහන්සේගේ මෙනම් රාවුතයාණ කෙනෙක් (අශ්වාරෝහකයෙක්) ඇත්තෝවේද? උන්ට පිරිස් පාවාදී(සේනාව බාරදී) ප්‍රසාදදී උන් යැව්ව මැනව, උන් නොපෝහොසත් නම් නුඹවහන්සේ පසුව වැඩිය මැනව"යි කිවුය.

රජ්ජුරුවෝ එපවත් අසා ඒ රාවුතයාණන් ගෙන්වා ගෙන කියන්නාහු "දරුව, අපගේ රාජ්‍යය ගණුම්හයි කියා අප හා සටන් කරන්නට රජදරුවෝ සත්දෙනෙක් මහබලසෙනග ගෙන රාජ්‍යය වටකොට රැකගත්හ. උන් සත්දෙනා හා කැටුව යුද්ධ කොට ගතහෙයිදැ?"යි විචාළෝය. එපවත් අසා රාවුතයාණෝ "ස්වාමීනි, මට පිළිවනි නුඹ වහන්සේගේ භොජාජානීය නම් මගුල් අසු ලදිම් නම් යුද්ධකොට ජයගෙන දෙම්"යි කිවුය.

රජ එපවත් අසා "මාගේ රාජ්‍යය නැසීයාම සුදුසු නොවෙ"යි සිතා "කැමති පිරිස් හා කැමති සෛන්ධවයකු ගෙන යවයි, සතුරනුත් සාදා දෙව"යි(සතුරු සේනාවද පරාජය

කරවයි) කිවුය. රාවුතයාණෝ සෙන්ධවයා හා සමග පිරිස් ගෙන නික්ම සතුරන් සිටිතෙනට ආසන්නව සිට භෝජාජානීය නම් සෙන්ධවයාණන් ඇළයට ගොස්(ළගට ගොස්) සනහාලා ඇග අතගාලා "තොපට ද මටද ස්වාමි වූ රජ්ජුරුවන්ට පක්‍ෂපාතව සටන්කොට සතුරන් සාහාදෙව"යි ඔවා තෙපුල් දී නොයෙක් රසයෙන් යුක්ත භෝජනය කවා මධුර පානය පොවා සුවඳ විලවුන් ගල්වා සන්නාහයක් ලා(යුද ඇඳුමක් අන්දවා) එහි රන්සැත්ලා(රන්වැඩ දැමූ ඇතිරියක් එලා) වසා දැඩිකොට සදලා තෙමේ සැරහීගෙන සන්නාහ සන්නද්ධව මගුල් කඩුව ගෙන අසුට නමස්කාර කොට ලා පිටට පැන නැගී යුද්ධයට වන්නාහ.

බෝධිසත්වයෝ සිතන්නාහු "මේ සත් රජ්ජුරු කෙනෙකුන් තබා මුළු දඹදිව සෙනඟ අවුත් කම් කිම් ද? උන් නොමරා ඇල්ලූ කල වේද සුරුකමෙ"යි සිතා "සබඳ ආශ්වාචාර්‍ය්‍යය, රජ දරුවන් නොමරා යුද්ධය මට බාරය"යි කිවුය. ඒ අශ්වචාරී තෙමේ සාහසිකව සතුරු සෙනඟ මධ්‍යයට වන්සඳ අශ්වයා පිනූ පිනූ තෙනට(පැන්න පැන්න තැනදී) විදුලියක් මෙන් කඩුව හිස සිසාරා නොබාහිඳ පළමු බලකොටුව බිඳපියා එක් රජ්ජුරුකෙනෙකුන් නොමරා අල්වා ගෙණවුත් නුවරට පාවාදී නැවතත් බිහිසුණු සතුරු සෙනඟ මැදට වැද සේනාව බිඳ පරාජය කොට ඒ රජුත් නොමරා ගෙන සේනාවට පාවාදී මෙසේ ම සදෙනෙකු ගෙන නැවත සත්වන රජහු අල්වන්ට බොහෝ සෙනඟ එක්ව සිටත් අසු මෙහෙයාලා යුද්ධයට වන්සඳ අස්හු සතුරන් අතින් කඩු පහරක් ලදින් කඩු

පහර කා ඇඟින් ලේ ධාරා ඉසින්නාහු අශ්වාචාර්යයා බලා මහත් වූ භය ශෝකයෙන් ආයේ ආපසු මෙහෙයාලා රජගෙයි මිදුලට ගෙනගොස් සන්නාහය ලිහිල්කොට නැවත අනික් අසකු සන්නාහය බඳින්නට වන. අස් තෙමේ කඩුපහර කෑ වේදනාවෙන් වැදහෙව සිතත්නේ “මේ අශ්වාචාර්යය තෙමේ මාගේ ගුණ නොදන්නේය. සත්වෙනි බලකොටුව බිඳින්ට හා සත්වන රජු ගන්ට නික්මෙයි, අනික් අසකු සදයි, ආශ්වාචාර්යයා සත්වන රජු ගන්ට නොපොහොසත. මේ තෙමේ ද මරණයට යයි. ආශ්වයාත් මරතන් රටත් නසන්නේය. රජුත් සතුරන්ට අසුවන්නේය. එසේ වත් මා සෙවුනා(මා සේවය කරණා) රජහට කළ විර්යය නොපෙණෙයි, දියෙහි ඉරක් ඇන්ද සේ වෙයි. මා ඇර අන් අයෙක් මෙ සකල දඹදිව සත්වන රජු ගන්ට ද බලකොටුව බිඳින්නට ද නොපොහොසතැ”යි සිතා කෙළෙහි ගුණ දන්නා වූ මහබෝසතාණන් වහන්සේ මෙසේ සිතුසේක.

“මේ රජ මා තිරිසන් නැනැත්තහුට බොහෝ උපකාර තබා දී මගුලස්ධනාන්තරයෙහි(මගුල් අස් තනතුරෙහි) තමා මට නොයෙක් පොෂ්‍යකොට මා රක්‍ෂා කෙළේ නම් මෙසේ වූ යුද්ධයක් දුටුකලට වේද? මා ඇඟින් වැගිරෙන ලේ රජු මට දුන් නොයෙක් රසයෙන් මධුර පානයෙන් අටගන්නතා වූ ලේ මුත් අනිකකින් ඇතිවූ දෙයක් නොවෙයි. එබැවින් මාගේ ශරීරයෙහි රජු නිසා අටගත් මාංශය ද ජීවිතය ද රජුට දී පක්‍ෂපාතව ම මළෙම් නම් පරලොව සුවයෙක් ම ලැබෙයි, තමන් පිණිස මාගේ ජීවිතය සතුරන්ට දී පක්‍ෂපාතව මළකල

'තිරිසන්ව සිට මට සතුරන් සාදා දී මා නිසා ජීවිතය දුන්හ'යි මාගේ රජු කී කල්හි මළත් නොමළා යයි සිතන සේක්, සබඳ අශ්වාචාර්යය, සත්වන බලකොටුව හා එහි බිහිසිණු සතුරන් මැදට වදින්ට අනිත් අසෙක් මා මුත් මුළු දඹදිව නැතැයි භෝජාජානීය නම් වූ සෛන්ධව කුලයෙහි උපන්නාවූ මා මුත් අනිත් අස් රජෙක් නැතැයි මා නගා සිටුවාගෙන සන්නාහ බැඳ සත්වන රජු ගන්ට යව"යි කීසේක.

බෝධිසත්වයන්ගේ බස් අසා ආශ්වාචාර්යය තෙමෙ බෝධිසත්වයන් සමීපයට ගොස් නගා සිටුවාගෙන වණය වසා බෙහෙත් බැඳ පෙරසේම සන්නාහය ලා අසුපිට පැනනැගී කඩුව ගෙන මහත් බලකාය ගෙන සතුරු සෙනඟ බිඳ සත්වන රජු අල්වාගෙන නොමරා ම ගෙනත් පිරිසට පාවාදීලූයේ ය.

සත්වන රජු හා සෙනඟ සාදා සතුරන් බිඳපියා පිරිස් ඇරගෙන බෝධිසත්වයන් හා සමඟ රජගෙදොරට අවුත් රජ්ජුරුවන් දුටුයේය. රජ්ජුරුවෝ බෝධිසත්වයන් කෙටුම් කෑ බව අසා මහත් වූ ශෝකයෙන් කම්පිතව සිටියාහ. බෝධිසත්වයෝ තමන්ගේ රජ්ජුරුවන්ට කියන්නාහු "දේවයෙනි, මේ රජ සත්දෙනා නොමරව, දිවිරවා පියා මිත්‍රව සිට උන් උන්ගේ රටට යව"යි කීහ.

"මහරජ, තොප මට කරණ උපකාර නම් තෙල අශ්වාචාර්යයට කළ මැනවැ"යි සත්කාර කරවා "තොපි ද නොපමාව දන්දෙව, පෙහෙවස් රකුව, බණ අසව, ප්‍රාණවධ

නොකරව, දශරාජ ධර්‍මයෙන් රාජ්‍යය කරව''යි අවවාදකොට බෝධිසත්‍වයෝ තුමූ සන්නාහය මුදපීකල පරලොව ගියහ.

රජ්ජුරුවෝ මහත් ශෝකයෙන් හඬා කම්පිතව බෝධිසත්‍වයන් මහත් වූ පෙරහරින් පූජාකොට ආදහණ කරවූහ. බෝධිසත්‍වයන් කී පරිද්දෙන් රජ්ජුරුවෝ සිත තබා ආශ්වාචාර්යයාහට බොහෝ වස්තු ද ගම්බිම් ද තනතුරු ද දී මිත්‍රද්‍රෝහී නොවී රක්‍ෂාස්ථානයෙහි(ආරක්ෂා සහිතව) තුබූ සේක. නැවත බෝධිසත්‍වයන් කී අවවාද සිත තබා තමන්ට ද්‍රෝහී වූ රජ සත්දෙනා ගෙන්වාගෙන නොමරා නාවා ආහාර අනුභව කරවා සත්දෙනා දිව්රවා උන් උන්ගේ රටට යවා තුමුද බෝධිසත්‍වයන් කී පරිද්දෙන්ම නිබඳව පන්සිල් රැක පොහොය අටසිල් රැක දශරාජ ධර්මයෙන් රාජ්‍යය කොට තමන් කළ කුශලමූලයෙන් දෙව්ලොව උපන්නාහුය.

ශාස්තෘන් වහන්සේ මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා වදාරා ''මහණෙනි, පෙර නුවණැත්තා වූ මහොත්තමයෝ විර්යය කරන්නට සුදුසු තන්හි වීර්යය කළාහු ය. මෙබඳු ප්‍රහාර ලැබගෙන ද විර්යය නොහැරියාහු ය. තෙපි වනාහී මෙබඳු නෛර්යාණික(නිවනට පමුණුවන) ශාසනයෙහි මහණව කවර කාරණයෙකින් විර්යය හැරියෙහිදැ''යි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට වදාළසේක. චතුස්සත්‍යයාගේ අවසානයෙහි පසුබට විර්යය ඇති මහණතෙම අර්හත්ඵලයෙහි පිහිටිසේක. බුදුරජාණන් වහන්සේ පූර්‍වාපර සන්ධි ගළපා මේ 'භෝජාජානීය ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් ආනන්ද ස්ථවිර වූසේක. අශ්වාචාර්යය තෙම ශාරීපුත්ත ස්ථවිර වුයේය. භොජජානීය සෛන්ධවාශව ව උපන්නෙම් තිලෝගුරු සම්‍යයක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 024. ආජඤ්ඤ ජාතකය

තවද එක් සමයෙක්හි සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවාසය කරණසේක් හරණාලද(පසුබට) විර්යය ඇති භික්ෂුවක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

සර්‍වඥයන් වහන්සේ ඒ භික්‍ෂූන් වහන්සේට ආමන්ත්‍රණය කොට "මහණෙනි පෙර නුවණැත්තෝ විර්යය කරන්නට සුදුසු තන්හි ශර ප්‍රහාර ලැබගෙන(හී පහර කාගෙන) විර්යය කලාහුය"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි පූර්‍වජාතකයෙහි(භොජාජානීය ජාතකයෙහි) කියනලද ක්‍රමයෙන් සත් රජ්ජුරු කෙනෙක් නුවර පිරිවැරුවාහුය.

ඉක්බිත්තෙන් එක් රථාචාර්යයෙක් භ්‍රාතෘ වූ(සහොදර වූ) අශ්වයන් දෙදෙනකු රථයෙක්හි යොදා නුවරින් නික්ම බලකොටු සයක් බිඳ රජදරුවන් සදෙනෙක් අල්වා ගත්තේය. එකෙණෙහි වැඩිමහළු අශ්වතෙම ශර ප්‍රහාරයක් ලද්දේය. රථාචාර්යය තෙමේ රථය ගෙන යනුයේ රජගෙයි දෙරට අවුත් වැඩිමහලු අශ්වයා රථයෙන් මුදා සන්නාහය ලිහිල්කොට

එක් පාර්ශවයකින් සයනය කරවා අන් අශ්වයකු සරහන්නට පටන් ගත්තේතය. බෝධිසත්වයන් වහන්සේ ඔහු දැක පූර්වයෙහි කියනලද ක්‍රමයෙන් සිතා රථාචාර්යය කැඳවා හොත්සේක්. මෙසේ අවවාද කළසේක.

“පූර්වාහ්නාදී වූ(පෙරයම් කාලය ආදී වූ) යම් යම් කලෙක්හි වේවයි, යම් යම් තැනෙක්හි වේවායි, යම් යම් ක්‍ෂණයෙක්හි වේවායි, යම් යම් යුද්ධමණ්ඩලයෙක්හි(යුද බිමෙක) වේවයි ද ප්‍රහාර ලත් හෝ නොලත් යම් යම් කල්හි වේවායි අභිප්‍රාය(රියදුරු අදහස) දන්නාසුළු උතුම් සෛන්ධවයා ම ව්‍යායාම කෙරෙයි(වෙහෙසෙයි). වීර්යය කිරීමට ප්‍රාරම්භ කෙරෙයි(පටන්ගනී). එහි බළුංකාශ්වයෝ(කුලහීන අශ්වයො) පිරි හෙන්නාහුය. ඒ කාරණයෙන් මේ රථයෙහි මම යොදව”යි කීසේක.

රථාචාර්යයා බෝධිසත්වයන් වහන්සේ නඟා සිටුවා රථයෙහි යොදා සත්වෙනි බලකොටුව බිඳ සත්වෙනි රජහු අල්වාගෙන රථය පදිනුයේ රාජවාසභවනද්වාරයට(රජමැදුරු දොරටුවට) අවුත් අශ්වයා මිදුයේය. බෝධිසත්වයන් වහන්සේ එක් ඇලයකින් හොත්සේක් යට කියනලද ක්‍රමයෙන් රජහට අවවාද දී නිරුද්ධක වූසේක(මිය ගියෝය). රජ්ජුරුවෝ බෝධිසත්වයන් වහන්සේගේ ශරීරය ආදාහන කරවා රථාචාර්යයාහට ආදර සත්කාරකොට දැහැමෙන් රාජ්‍යය කරවා කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදාරා චතුස්සත්‍ය ප්‍රකාශකොට මේ 'ආජඤ්ඤ ජාතකය' නිමවා වදාළසේක. චතුස්සත්‍ය දේශනාවන්ගේ කෙළවර පසුබට වීර්යය ඇති භික්ෂූන් වහන්සේ අරහත් ඵලයෙහි පිහිටිසේක.

"එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් ආනන්ද ස්ථවිර වූසේක. ප්‍රහාර ලදින් වීර්යය කොට සත් වැනි රජහු අල්වා දුන් අශ්වයා නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 025. තිත්ථ ජාතකය

තවද එක් සමයෙක්හි සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවාසය කරණසේක් දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේගේ සද්ධිවිහාරික වූ (ළඟින් ඇසුරු කරන) පූර්වයෙහි පරිචය කරනලද(පෙර අත්බව්හි දී පුරුදු කරනලද) ස්වර්ණකාර(රන්කරු) කුලයකින් මහණ වූ භික්ෂුවක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

ආසයානුසය ඥාණය(අනුන්ගේ යටිසිත තුළ ඇති කෙලෙස් දැනගන්නා නුවණ) වනාහි සර්වඥයන් වහන්සේලාට ම වන්නේය. අවශේෂ ශ්‍රාවකයන් වහන්සේලාට නැත්තේය. එහෙයින් දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ තමන් වහන්සේට ආසයානුසය ඥාණය නැති හෙයින් සද්ධිවිහාරික භික්ෂූන් වහන්සේගේ අභිප්‍රාය(අදහස) තමා නොදත්නාසේක්

අශුභ කර්මස්ථානය ම වදාළසේක. ඒ භික්ෂූන් වහන්සේට ඒ භාවනාව සත්ප්‍රාය නුවූයේය(නුසුදුසු විය). කවරහෙයින් ද? යත්, ඒ භික්ෂූන් වහන්සේ වනාහි පටිපාටියෙන්(පිළිවෙළින්) පන්සියයක් ජාතියෙහි ස්වර්ණකාර කුලයෙහි ම පිළිසිඳ ගත්සේක.

ඉක්බිත්තෙන් ඒ භික්ෂූන් වහන්සේට බොහෝ කලක් ඒ ස්වර්ණයාගේ දැක්ම පුරුදු කළ හෙයින් අශුභ කර්මස්ථාන භාවනාව සත්ප්‍රාය නුවූයේය. ඒ භික්ෂූන් වහන්සේ එහි උද්ග්‍රහ නිමිත්ත (භාවනාවේ දී කමටහන පියවි ඇසට නොව මනසට පෙනෙන අවස්ථාව) මාත්‍රයකුදු උපදවන්ට නොහැකිව සාරමසක් කල්යැවූසේක. දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ තමන්ගේ අතවැසි මහණාට අර්හත්ඵලය දෙන්නට නොහැකිව”ඒකාන්තයෙන් මේ තෙමේ බුදුන් විසින් විනයනය(හික්මවීම) කටයුතු වන්නේය”යි “සර්වඥයන් වහන්සේගේ සමීපයට කැඳවාගෙන යෙමි”යි සිතා අලුයම් වේලෙහිම ඕහු කැඳවාගෙන සර්වඥයන් වහන්සේගේ සමීපයට වැඩිසේක. එසේ ගියකල්හි සර්වඥයන් වහන්සේ වදාරණසේක් “ශාරිපුත්‍ර ස්ථවිරයෙනි, කවර හෙයකින් එක් මහණෙක්හු කැඳවාගෙන ආයේදැ?”යි විචාළසේක. “ස්වාමීන් වහන්ස, මම මේ මහණ හට කර්මස්ථාන භාවනාව දුන්නේමි. සාරමසක් මුලුල්ලෙහි උද්ග්‍රහ නිමිත්ත මාත්‍රයකුදු නොයිපද වූයේය, ඒ මේ මහණ තෙමේ බුදුන් විසින් විනයනය කටයුතුයි සිතා නුඹවහන්සේ සමීපයට කැඳවාගෙන ආයෙමි”යි කී කල්හි “ශාරීපුත්‍ර ස්ථවිරය, කවර නම් කමටහනක් අතවැසි මහණාහට

දුන්නෙහිදැ?''යි විචාළසේක. ''භාග්‍යවතුන් වහන්ස, අශුභ කමටහනැ''යි දැන්වූසේක. ''ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, තොපගේ චිත්තසන්තානයෙහි(සිතෙහි) ආසයානුසය ඥාණය නැත්තේය, තෙපි යව, සවස් වේලෙහි අවුත් තොපගේ අතවැසි මහණා කැඳවාගෙන යව''යි වදාලසේක.

මෙසේ සර්‍වඥයන් වහන්සේ සැරියුත් මහතෙරුන් වහන්සේ ගමන් කරවා (පිටත්කර යවා) ඒ භික්ෂූන් වහන්සේට මනොඥ වූ අඳනා සිවුරු දෙවා ඔහු කැඳවාගෙනම පිඩු පිණිස වැඩ ප්‍රණීත වූ ඛාද්‍ය - භොජ්‍ය විකෘතිය(කෑ යුතු රස විඳිය යුතු ආහාර වර්‍ග) දෙවා මහත් වූ භික්ෂු සංඝයා පිරිවරා නැවත විහාරයට අවුත් ගඳකෙළියෙහි දිවා භාගය ගෙවා සවස් වේලෙහි ඒ භික්ෂුව කැඳවාගෙන විහාරයෙහි සැරිසරා වඩනාසේක් අඹ උයනෙහි එක් පොකුණක් මවා ඒ පොකුණෙහි මහත් වූ පියුම් පඳුරක්(නෙලුම් ගස් පඳුරක්) මවා එහිද මහත් පියුමක් මවා ''මහණ, මේ පියුම් බලමින් හිඳුව''යි කිය හිඳුවා ගඳකෙළියට වන්සේක. ඒ මහණ ඒ පියුම නැවත නැවත බලන්නේය. භාග්‍යවතුන් වහන්සේ පියුම ජරාවට පැමිණි වූසේක. ඒ පියුම ඒ මහණ බල බලා සිටියදීම ජරාවට පැමිණ විවර්‍ණ(අවපාට) වූයේය. ඉක්බිත්තෙන් පියුම හාත්පසින් පෙති වැටෙමින් මොහොතකින් සියලු පියුම් පෙති වැටුණෝය. ඉක්බිත්තෙන් රේණු වැගුරුණෝය. පියුම් කෙමිය පමණක් අවශේෂ(ඉතුරු) වූයේය.

ඒ භික්ෂූන් වහන්සේ ඒ පියුම බලමින් සිතනසේක් "මේ පියුම දැන්ම පිපී අභිරූපව(ශොභමානව) දැකුම් කටයුතු වූයේය, ඉක්බිත්තෙන් වර්ණය මුහුකුරා පෙතිද රේණුද හුණුයේය(වැටුණෝය). කර්ණිකා මාත්‍රයක් පමණව(කෙමිය පමණක්) සිටියේය. මෙබඳු පියුම පවා ජරාවට පැමිණියේය. මාගේ මේ ශරීරයට කෙසේ ජරාව නොපැමිණෙන්නේදැ"යි සිතා "සියලු සංස්කාර ධර්‍මයෝ අනිත්‍යයහ"යි කියා විදර්ශනා වැඩූසේක. සර්‍වඥයන් වහන්සේ ඔහුගේ සිත විදර්ශනාවට ආරූඪ වූයේ(නැඹුරුවීයයි) දැන ගඳකෙළියෙහි වැඩහුන් සේක්ම ආලෝකයක් පතුරුවා වදාරණසේක් "සරත් කාලයෙහි ඇඹුල(කුමුදු) මලක් අතින් කඩාගන්නාක් මෙන් තමගේ සිත්සතන්හි ස්නෙහය(තෘෂ්ණාව) අභීත් මාර්‍ගඵලඥාණ නැමති ශාස්ත්‍රයෙන්(ආයුධයෙන්) සිඳ බුදුන් විසින් දේශනා කරනලද නිවණට පමුණුවන්නා වූ අෂ්ඨාංගික මර්‍ගය වඩව"යි වදාළසේක. ඒ භික්ෂූන් වහන්සේ මේ ධර්‍මයාගේ කෙළවර අර්හත් ඵලයට පැමිණ "ඒකාන්තයෙන් සියලු භවයෙන් මිදුනෙමි"යි සිතූහ.

සො වුත්ථවාසො පරිපුණ්ණමානසො - ඛීණාසවො අන්තිමදෙහධාරී,
විසුද්ධසීලො සුසමාහිතින්ද්‍රියො - චන්දෙ යථා රාහුමුඛා පමුත්තො.

තථා අහං මොහමහන්ධකාරං - විනොදයිං සබ්බමලං අසෙසං,

ආලොකමුජ්ජොතකාරො පභංකරො - සහස්සරංසි
විය භානුමා නභෙ.

(රාහුගේ ග්‍රහණයෙන් මිදුනා වූ චන්ද්‍රයා යම්සේද, එසේම මමද විසූ බඹසර ඇත්තෙම්, අන්තිම ආත්මභාවයෙහි සිටි රහතෙකු වූයෙම්, සුපිරිසුදු සිල් හා මනාව දමනය කළ ඉඳුරන් ඇත්තෙක් ද වෙමි)

(ආලෝකය චලිත කරන්නා වූ ප්‍රභාස්වර වූ දහසක් රැසින් සූර්‍ය්‍යයා අහස්කුස සිට අඳුර දුරලන්නාසේ මමද අවිද්‍යාව නම් ගනඳුරද, සෙසු සියලු කෙලෙස් මලද ඉතිරි නොකොට සංසිඳවීමි)

මේ ආදී ගාථාවලින් ප්‍රීතිවාක්‍ය පැවැත් වූසේක. ප්‍රීතිවාක්‍ය පවත්වා ගොස් භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කළසේක. සැරියුත් ස්ථවිරයන් වහන්සේද අවුත් ශාස්තෲන් වහන්සේට නමස්කාර කොට තමන්ගේ සද්ධිවිහාරික භික්ෂූන් වහන්සේද කැඳවාගෙන වැඩිසේක. මේ සිද්ධිය භික්ෂූන් වහන්සේ අතරෙහි ප්‍රකාශ විය. භික්ෂූන් වහන්සේද දම්සභාවෙහි හිඳ''ඇවැත්නි, ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ආසයානුසය ඥාණය නැති හෙයින් තමාගේ අතවැසි භික්ෂූන් වහන්සේගේ අභිප්‍රාය නොදත්සේක. සර්‍වඥයන් වහන්සේ වනාහි දැන එක දවසකින්ම ඕහට සිවුපිළිසිඹියා සමග අර්හත්ඵලය දෙවූසේක. සර්‍වඥවරයෝ නම් මහානුභාව ආශ්චර්‍ය්‍ය සේකැ''යි කියා සර්‍වඥයන් වහන්සේගේ ගුණ වර්ණනා කොට හුන්නාහුය.

සර්වඥයන් වහන්සේ දම්සභා මණ්ඩපයට එළඹ අලංකෘත වූ බුද්ධශාසනය මස්තකයෙහි වැඩහිඳ "මහණෙනි, මේ දම්සභා මණ්ඩපයෙහි මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුත්තව උන්නාහුදැ?"යි විචාළසේක. "භාග්‍යවතුන් වහන්ස, අන් කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ. නුඹවහන්සේ ම දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේගේ සද්ධිවිහාරික භික්ෂුන් වහන්සේගේ අභිප්‍රාය දැන වදාළ කථාවෙනැ"යි දැන්වූවාහුය.

සර්වඥයන් වහන්සේ වදාරන සේක් "මහණෙනි, ඒ මම දැන් බුදුව ඔහුගේ අභිප්‍රාය දැන ගත්තා ආශ්චර්‍ය්‍ය නොවෙයි, පෙරත් මම ඔහුගේ අභිප්‍රාය දැනගත්තෙම් වේදැ"යි වදාරා ඉකුත්වත් ගෙනහැර දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරනසේක. එකල්හි අප මහබෝසතාණන් වහන්සේ ඒ රජහට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නා වූ අමාත්‍යයෙක් වූසේක. එකල්හි රජහුගේ මඟුල් අශ්වයා නහන තොට එක්තරා බළුංකාශවයකු(පහත් කුලයක උපන් අශ්වයකු) නැහැවූවාහුය. මඟුල් අශ්වයා බළුංකාශවයා නහවනලද තොටට බස්වනු ලබන්නේ පිළිකුල් කොට බස්නට නොකැමති වූයේය. අස්ගොව්වා ගොස් රජහට "මහරජ්ජුරුවන් වහන්ස, මඟුල් අශ්වයා තොටට බසින්නට නොකැමති වූයේය"යි දැන්වූයේය.

රජ්ජුරුවෝ බෝධිසත්වයන් යවන සේක් “යව පණ්ඩිතයෙනි, කවර කාරණයකින් අශ්වයා තොටට බස්වනු ලබන්නේ නොබස්නේ දැයි දැනගනුව”යි කීසේක. බෝධිසත්වයන් වහන්සේ “යහපත මහරජ” කියා ගං තෙරට ගොස් අශ්වයා බලා ඔහු නිරෝගීබැව් දැන “කවර කාරණයකින් මේ අශ්වයා තොටට නොබස්නේදැ”යි පරීත්ෂාකරන සේක් “පළමුකොට මෙහි අශ්වයෙකු නහවන ලද්දේ වන, එහෙයින් පිළිකුල් කරනේය, තොටට නොබස්නේය”යි සිතා අස්ගොව්වාගෙන් “පින්වත, මේ තොටෙහි කවරක්හු පළමු නහවන ලද්දේදැ”යි විචාළසේක. “ස්වාමීන් වහන්ස, අන් බළුංකාශ්වයෙකැ”යි කීයේය.

බෝධිසත්වයන් වහන්සේ සිතනසේක් “ මේ අශ්වයා තමා සුචිකාම (පිරිසුදුකමට ප්‍රිය) බැවින් පිළිකුල් කෙරෙමින් මෙහි නහන්නට නොකැමැතිය, මොහු අන් තොටෙක්හි නහවන්නට වටනේය”යි ඔහුගේ අභිප්‍රාය දැන “පින්වත් අශ්වාචාර්‍ය්‍යය, ගිතෙල් මී සර්කාරයෙන්(සකුරුවලින්) අභිසංස්කෘත(සකස් කරනලද) ක්ෂීරපායාසය(කිරිබත) ද වනාහි නැවත නැවත අනුභව කරන්නහුට තෘප්තිය නොවන්නේය(කැමැත්තක් ඇති නොවේ). මේ අශ්වයා බොහෝ වර මේ තොටෙහි නහවන ලද්දේය. මොහු වනාහි වෙන තොටෙක බස්වා නහවා ජලය පොවාලව”යි කියා මෙසේ කීසේක. “රථාචාර්‍ය්‍යය, මේ අශ්වයා අන් තොටෙකින් නහවා පැන් පොවාලව, යම් සේ පුරුෂයෙක් සර්පි(ගිතෙල්) මධු සර්කාරයෙන් අභිසංස්කෘත පායාසය අධික කොට කෑමෙන් අතෘප්තියට පැමිණේද(සෑහීමට පත් නොවේද)

එපරිද්දෙන් අනික් අශ්වයකු නෑමෙන් අපවිත්‍ර වූ තොටෙහි තමාගේ ශෘංගාරත්වය(පිරිසිදුව සිටීමේ කැමැත්ත) හේතුකොට ගෙන ස්නානය නොකැමැත්තේය. අන් තොටකින් නහවව”යි කීසේක.

අශ්වාචාර්‍ය්‍යයා බෝධිසත්වයන් වහන්සේගේ වචනය අසා අශ්වයා වෙන තොටකට බස්වා පැන් පොවා නැහැවූයේය. බෝධිසත්වයන් වහන්සේ අශ්වයා නහවා පැන් පොවන කල්හි රජුගේ සමීපයට ගොස් සියලු ප්‍රවෘත්තිය දැන් වූසේක. රජ්ජුරුවෝ මෙබඳු තිරශ්චීනයාගේ අභිප්‍රාය දැනගත් සේකැ”යි කියා අප මහබෝසතාණන් වහන්සේට මහත් ඓශ්වර්‍ය්‍ය දී ජීවිතයාගේ කෙළවර කම්වූ පරිද්දේන් මිය පරලොව ගියසේක. බෝධිසත්වයන් වහන්සේ ද කම්වූ පරිද්දේන් මිය පරලොව වැඩිසේක.

ශාස්තෲ වූ බුදුරජාණන් වහන්සේ වදාරණසේක් “මහණෙනි, මම මොහුගේ අභිප්‍රාය දැන ගත්තෙම් දැන්මතු නොවෙයි, පෙරත් අභිප්‍රාය දැන ගත්තෙම් වේදැ”යි කියා මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා පූර්‍වාපර සන්ධි ගළපා මේ ‘තිර්ථ ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි මංගල අශ්වයා නම් දැන් මේ භික්ෂූන් වහන්සේ වූසේක. එකල්හි රජ්ජුරුවෝ නම් දැන් ශාරිපුත්‍ර ස්ථවිර වූසේක. පණ්ඩිත අමාත්‍යව උපන්නෙම් වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ”යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 026. මහිලාමුඛ ජාතකය

තවද එක් සමයෙක්හි බැලූබැලුවන් ඇස් නොනිමවන(සෑහීමකට පත් නොකරවන) මනහර රූ ඇති ලොකස්වාමී වූ බුදුරජාණන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වසනසේක් දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ අජාසත් කුමාරයන් පහදවා ලාභසත්කාර ඉපිද වූසේක. අජාසත් කුමාරයෝ දෙවදත්ත ස්ථවිරයන් වහන්සේට ගයා හිස (ගයා ශීර්ෂය නම් ස්ථානයෙහි) විහාරයෙක් කරවා නොහෙක් රස ඇති තුන් අවුරුදු ගිය සුවඳ ඇල්සාලෙ බත් දවසක් පාසා පන්සියයක් වසුන්වලින්(හැළි වලින්) එවති. ලාභසත්කාර නිසා දෙවදත්ත ස්ථවිරයන් වහන්සේට පිරිවර මහත් විය. දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ පිරිවරා හා සමග විහාරයෙහි ම වසන සේක.

එසමයෙහි රජගහනුවර වසන්නාවූ යහළුවෝ දෙදෙනෙක් වෙති. ඔවුන් අතුරෙන් එක් කෙනෙක් බුදුන් සමීපයෙහි මහණ වූය. එක් කෙනෙක් දෙවදත්ත ස්ථවිරයන් ලඟ මහණ වූය. ඔහු දෙදෙන ඔවුනොවුන් ඒ ඒ තෙනදීත් දකිති. විහාරයට ගොසිනුත් දකිති. ඉක්බිත්තෙන් එක් දවසක් දෙවදත්ත නිශ්‍රිත(දෙව්දත් ඇසුරේ වසන) මහණ අන් භික්ෂූහට කියන්නේ "කිමෙක්ද? තෝ දවසක් දවසක් පාසා ඩා(දහදිය) පෙර පෙරා සිඟන්නෙහිය. දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ ගයා හිස

විහාරයෙහිම හිඳ නොයෙක් අග්‍ර රසයෙන් යුක්තව භෝජනය වළඳන සේක. මෙබඳු උපායෙක් නැත. කුමක් පිණිස තෝ දුක් අනුභව කරන්නෙහිද? කිමෙක් ද තා විසින් උදෑසන ම ගයා හිස විහාරයට අවුත් අවුළු සහිත කැඳ වළඳ අටලොස් වැදෑරුම් වූ ඛාද්‍ය(කැවිලිවගී) අනුභවකොට නොයෙක් අග්‍ර රසයෙන් යුක්ත වූ භෝජනය වළඳන්නට නපුරුදැ"යි(නරකදැයි) කීය. ඒ මහණ නැවත නැවත කියන බස් අසා යනු කැමතිව එතැන් පටන් ගයා හිසට ගොස් වළඳ වේලාපස වෙළුවනයට එන්නේය. ඒ මහණ හැම කල සඟවාගත නොහුණුයේය. "ගයා හිසට ගොස් දෙවදත්ත ස්ථවිරයන්ට තබා දෙනලද බත වළඳන්නෙය"යි නොබෝ කලකින්ම ප්‍රසිද්ධ විය.

ඉක්බිත්තෙන් ඕහට සහාය භික්‍ෂූන් කියන්නාහු "සැබෑද? මහණ, තෝ දෙවදත්ත ස්ථවිරයන්ගේ බත වලඳන්නෙහිදැ"යි කී කල්හි "සැබෑව ඇවැත්නි, මම ගයා ශිර්ෂයට ගොස් වළඳිමි. මට වූ කලී දේවදත්තයෝ බත් නොදෙති, අන් මනුෂ්‍යයෝ දෙති"යි කීය. "ඇවැත්නි, දේවදත්තයෝ සර්‍වඥයන්ට ප්‍රතිපක්‍ෂයෝ (විරුද්ධ) ය. දුශ්ශීලයෝය. අජාසත් රජ්ජුරුවන් පහදවා අධර්‍මයෙන් තමන්ට ලාභසත්කාර ඉපදවූය. තෙපි මෙබඳු නෛර්‍යාණික(නිවනට පමුණුවන්නා වූ) ශාසනයෙහි මහණව දෙවදත්තයන්ට අධර්‍මයෙන් උපන්නා වූ භෝජනය වළඳව, වරෝ යම්හ, බුදුන් සමීපයට ගෙණයම්හ"යි කියා ඒ භික්ෂූව කැඳවාගෙන දම්සභා මණ්ඩපයට ආවාහුය. සර්‍වඥයන් වහන්සේ ඒ භික්‍ෂූන් කැඳවා "කිමෙක් ද?

මහාණෙනි, තොපි මොහු නොකැමැති පිරිද්දෙන්ම කැඳවාගෙන අවුදැ"යි වදාළසේක. "එසේය ස්වාමීනි, මේ මහණා නුඹවහන්සේ සමීපයෙහි මහණාව දෙවදත්තයන්ට අධර්මයෙන් උපන් භෝජනය වළඳන්නේය"යි දැන් වූසේක. එබස් අසා බුදුහු "සැබෑද? මහණා, තෝ දේවදත්තයන්ට අධර්මයෙන් උපන් භොජනය වළඳයිදැ"යි විචාළසේක. එබස් ඇසූ මහණා "දේවදත්තයෝ මට නොදෙති, මනුෂයෝ දෙති, ඒ බත මම වළඳමි"යි දැන්විය.

එබස් ඇසු සර්වඥයන් වහන්සේ වදාරණාසේක් "මහණා, තෝ මෙහි මහණාව මාගේ ශාසනය භජනය(ඇසුරු) කෙරෙමින් දේවදත්තයන්ගේ බත කෙසේ නම් අනුභව කෙළෙහිද? හැම කලම දුටු දුටුවන් භජනය කරණා සුලු වූයෙහිවේදැ"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි මහබෝසතාණෝ ඒ රජ්ජුරුවන්ට අමාත්‍ය වූහ. එකල රජ්ජුරුවන්ගේ 'මහිලාමුඛ' නම් මගුලැතෙක් විය. ඒ තෙම සිල්වත, ආචාර සම්පන්නය, කිසි කෙනෙකුන්ට හිංසාවක් පීඩාවක් නොකරන්නේය.

ඉක්බිත්තෙන් එක් දවසක් ඒ ඇතු සිටිනා ඇත්හල සමීපයෙහි රාත්‍රී භාගයෙහි සොරු අවුත් ඕහට නුදුරු තැන හිඳ සොරකම් මන්ත්‍රණාය(සාකච්ඡා) කළාහුය. "මෙසේ උමං බින්ද යුත්තේය, මෙසේ මං පැහැරිය යුත්තේය, උමං බිඳීම හා මං පැහැරීම මගක් තොටක් සේ නිරවුල්කොට

ඉගෙනගෙන බඩු සොරකම් කරන්ට වටනේය, සොරකම් කරන්නාහු විසින් වස්තු හිමියන් මරා සොරකම් කටයුත්තේය, එසේ කල්හි නැගී සිටින්නට(සොරාට එරෙහිව ක්‍රියා කිරීමට) ස්වර්ථයෙක් නම් නොවන්නේය, වස්තුව සොරකම් කරන්නාහු විසින් ශිලාචාර ගුණයෙන් යුක්ත නොවිය යුතුය, කර්කශව, පරුෂව, සාහසිකව පැවැත්ත යුත්තේය"යි මෙසේ කථාකොට ඔවුනොවුන් උගන්වා ගෙන ගියාහුය. මෙම ක්‍රමයෙන් දෙවැනි දවසය, තුන්වෙනි දවස යයි කියා බොහෝ දවසක් ම එතනට අවුත් මන්ත්‍රණය කලාහුය.

ඒ මහිලාමුඛ නම් හස්තියා ඒ සොරුන්ගේ බස් අසා "මා උගන්වති" යන සංඥායෙන්(හැඟීනේ) "දැන් මා විසින් චණ්ඩ පරුෂ රෞද්‍ර කියා ඇතිව පැවැත්ත යුත්තේය"යි සිතා එබඳු වූ චණ්ඩ ගුණ ඇත්තෙක් විය. ඉක්බිත්තෙන් උදෑසනම ආවා වූ ඇත්ගොව්වා සොඬින් බඳු අල්වාගෙන බිම ගසා මැරුයේය. එසේ ම අනිකකුත්, අනිකකුත් මැරුයේය. "මහිලාමුඛ නම් හස්තියාට මද නැංගේය(මද කිපුනේය). එසේ හෙයින් දුටු දුටුවන් මරන්නේය"යි රජ්ජුරුවන්ට කිවුය. එබස් ඇසූ රජ්ජුරුවෝ බෝධිසත්‍වයන්ට කියන්නෝ "පණ්ඩිතයෙනි, යව, කවර කාරණයකින් ඒ ඇතා දුෂ්ට විදේ‍ද හෝ යි දැනගෙන එව"යි කිවූය.

බෝධිසත්‍වයෝ ගොස් ඔහුගේ ශරීරයෙහි රෝග නැති නියාව දැන "කවර කාරණයකින් මේ තෙමේ දුෂ්ට විදේ‍ද හෝ"යි පරීක්‍ෂා කරන්නාහු ඒකාන්තයෙන් නුදුරු තෙනක කිසි

කෙනෙකුන්ගේ නපුරු වචනයක් අසා මොහු “මා බස්කම් උගන්වති(මට බස් වහර උගන්වතියි) යන සංඥාවෙන් දුෂ්ට වීය”යි සනිටුහන් කොට ඇත්ගොව්වන් අතින් විචාරන්නාවූ “ඇත්හල සමීපයේ රාත්‍රි භාගයෙහි කිසි කෙනෙකුන් විසින් කථාවක් කළ නියාවක් දනුදැ”යි විචාළෝය. “ස්වාමීනි, සොරු අවුත් කථා කළෝය”යි කිවුය. බෝධිසත්ත්වයෝ ගොස් රජ්ජුරුවන්ට කියන්නෝ “දේවයන් වහන්ස, ඇතුට කිසි රෝගපීඩාවක් නැත, සොරුන්ගේ බස් අසා දුෂ්ට වීය”යි කිවුය. “දැන් කුමක් කළ යුතුදැ?”යි කී කල්හි “සිල්වත් මහණ බමුණන් ඇත්හල සමීපයෙහි හිඳුවා ශිලාචාර කථා කියන්නට සුදුසු වන්නේය”යි කිවුය. රජ්ජුරුවන් විසින් “එසේ කරව”යි කී කල්හි බෝධිසත්ත්වයෝ සිල්වත් වූ මහණ බමුණන් ඇත්හළ සමීපයෙහි හිඳුවා “ස්වාමීනි, ශිලනිඃශ්‍රිත(ශීලය පිළිබඳවූ කථා) කථා කිව මැනැවැ”යි කිවුය.

එබස් අසා බමුණෝ ඇතුට නුදුරු තෙනක හිඳ කියන්නෝ “කිසිවක් නොඇල්ලවිය යුත්තේය. කිසිවෙකු නොමැරිය යුත්තේය. ශිලාචරයෙන්, ක්‍ෂාන්ති, මෛත්‍රී කරුණාවෙන් යුක්ත විය යුතුය”යි ශිලනිඃශ්‍රිත කථා කළාහුය. ඒ හස්තියා එබස් අසා “මොහු මා බස්කම් උගන්වති, එසේ හෙයින් දැන් මේතැන් පටන් සිල්විය යුතුය”යි සිතා සිල්වත්ව ක්‍ෂාන්ති කරුණාවෙන් යුක්ත විය. රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන් අතින් විචාරන්නෝ “කිමෙක්ද? දරුව, හස්තියා සිල්වත් වීදැ”යි විචාළෝය. බෝධිසත්ත්වයයෝ “එසේය, රජ්ජුරුවන් වහන්සැ”යි කීහ.

එබස් ඇසූ රජ්ජුරුවෝ කියන්නෝ "මෙබඳු දුෂ්ට වූ හස්තියා නුවණැත්තන් නියා පෞරාණික ධර්‍මයෙහි(සිල්වත් ආචාරශීලි පරහිංසා නොකළ ඒ පැරණි ස්වභාවයෙහිම) පිහිටියේ වේදැ"යි කියා බෝධිසත්ත්වයන්ට ප්‍රශංසා කළෝය. තවද රජ්ජුරුවෝ "තිරශ්චීන වූ හස්තියාගේ පවා අභිප්‍රාය(අදහස) දැනගත්තෝ වේදැ"යි කියා බෝධිසත්ත්වයන්ට මහත් වූ යශස්(සම්පත්) දුන්නාහුය. රජ්ජුරුවෝ ආයු පමණින් සිට මහබෝසතාණන් හා සමග කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ "මහණ, තෝ පෙරත් දුටු දුටුවන් භාජනය කළෙහිය. සොරුන්ගේ කථා අසා සොරුන් භජනය කෙළෙහිය. ධාර්මිකයන්ගේ බස් අසා ධාර්මිකයන් භජනය කෙළෙහිය"යි ධර්‍මදේශනාව ගෙනහැර දක්වා වදාරා පූර්‍වාපර සන්ධි ගළපා මේ 'මහිලාමුඛ ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි මහිලාමුඛ හස්තියා නම් දැන් මේ විපක්‍ෂසෙවී(විරුද්ධ වූ දේවදත්ත පක්‍ෂය ඇසුරු කළ) භික්ෂූය. රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. අමාත්‍ය වූයෙම් තිලොගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 027. අභිණ්හ ජාතකය

තවද එක් සමයෙක්හි බුදුරජාණන් වහන්සේ දෙව්රම්වෙහෙර වැඩ වසනසේක් එක් උපාසකයකු හා මහලු තෙරකෙනකුන් අරභයා මේ ජාතකය වදාළසේක.

සැවැත් නුවර වාසය කරන්නා වූ යහළුවෝ දෙදෙනෙක් වූවාහුය. ඔවුන් අතුරෙහි එක් කෙනෙක් පැවිදිව දවසක් දවසක් පාසා උපාසකයාගේ ගෙට වඩනාසේක. උපාසක තෙම තෙරුන් වහන්සේට ආහාර පිළිගන්වා තෙමේද ආහාර අනුභවකොට උන්වහන්සේ හා සමග විහාරයට අවුත් සූර්‍ය්‍යයා අස්තංගතවන තැන් දක්වා(හිරු බසින තුරු) ඔබිනොබ කථා කිරීමෙන් හිඳ නුවරට යන්නේය. තෙරුණ් වහන්සේද නුවර වාසල් දෙර දක්වා ඒ උපාසකයා එක්ව ගොස් නවත්නාසේක. ඒ දෙදෙනා විශ්වාස බව භික්‍ෂූන් වහන්සේ අතුරෙහි ප්‍රකාශ(ප්‍රසිද්ධ) වූයේය. ඉක්බිත්තෙන් එක් දවසක් භික්ෂූහු ඔවුන් දෙදෙනාගේ විශ්වාස කථාව කියමින් දම්සභා මණ්ඩපයෙහි උන්නාහුය. සර්‍වඥයන් වහන්සේ වැඩවදාරා "මහණෙනි, මේ දම්සභාවෙහි දැන් මා එන්නට පූර්‍වභාගයෙහි කවර නම් කථාවකින් යුක්තව උන්නාහුදැ"යි විචාරා "ස්වාමීන් වහන්ස, මේ නම් කථාවකිනැ"යි දැනු වූ කල්හි සර්‍වඥයන් වහන්සේ වදාරණසේක් "මහණෙනි, මොහු දෙදෙන විශ්වාස වූවෝ දැන්මතු නොවෙයි පෙරත් විශ්වාස වූවාහුය"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහබෝසතාණන් වහන්සේ ඒ රජහට අමාත්‍යයෙක් වූසේක. එකල්හි එක් සුනඛයෙක් මගුල් ඇත්හලට ගොස් මගුල් ඇතා අනුභව කරන තන්හි වැටුනා වූ බත්හුළු අනුභව කරන්නේය. ඒ සුනඛ තෙම ඒ ආහාරයෙන්ම වැඩෙනු ලබන්නේය. මගුලැතාට විශ්වාස වූයේය. සුනඛයා හස්තියාගේ සමීපයෙහිම අනුභව කරන්නේය. දෙදෙනාම වෙන්ව වසන්නට නොහැකි වෙති. සුනඛ තෙම හස්තියාගේ සොඬ ගෙන ඔබිනොබ කෙරෙමින් කෙළනේය(ක්‍රීඩා කරන්නේය). එසේ කල්හි එක් දවසක් පිටිසර වැසි එක් ග්‍රාමීය මනුෂ්‍යයෙක් ඇත්ගොව්වාට මිලදී ඒ සුනඛයා ගෙන තමාගේ ගමට ගියේය. එතැන් පටන් ඒ හස්තියා සුනඛයා නොදක්නේ ගොදුරු අනුභව නොකරන්නේය. පැන් නොබොන්නේය. නොම නහන්නේය. ඒ කාරණය රජහට දැන්වූවාහුය. රජ්ජුරුවෝ බෝධිසත්වයන් වහන්සේට වදාරණසේක් "පණ්ඩිතයෙනි, දැන ගනුව, කවර කාරණයකින් හස්තිරාජ තෙම මෙලෙස කරන්නේදැ"යි කියා යැවූසේක. බෝධිසත්වයන් වහන්සේ හස්තිශාලාවට ගොස් හස්තියාගේ දොම්නස් බැව් දැන "මොහුගේ ශරීරයෙහි රෝගයක් නොපෙණෙන්නේය. මොහුගේ වනාහී කිසි කෙනෙකුන් හා සමග විශ්වාස බවක් ඇද්දෝ හෝ"යි විචාළසේක. "ස්වාමීන් වහන්ස, එක් සුනඛයෙකු හා එක්ව බලවත් මිත්‍රකමක් ඇත්තේය"යි කීය. "දැන් ඒ සුනඛයා කොයිදැ"යි විචාළසේක. "එක් මනුශෂයෙකු විසින් ගෙන යන ලද්දේය". "ඔහු වාසය

කරන තැන් දන්නේදැ''යි කීසේක. ''ස්වාමීන් වහන්ස, නොදනිමි''යි කීය.

බෝධිසත්‍වයන් වහන්සේ රජුගේ සමීපයට ගොස් ''මහරජ්ජුරුවන් වහන්ස, හස්තියාට කිසි ආබාධයක් නැත්තේය. ඕහට වනාහී එක් සුනඛයෙකු හා සමග බලවත් විශ්වාසයක් වූයේය. ඒ සුනඛයා නොදක්නා වූ හස්තිරාජ තෙම භෝජනය අනුභව නොකෙරෙයි සිතමි''යි කියා මෙසේ කීසේක ''මහරජ, බතට පළමුකොට දෙන කටුක භෛසජ්‍යයෙන්(බෙහෙතින්) උක්ත පිඩු ගන්නට නොපොහොසත, පිඩු කොට දෙන භොජනය ගන්නට නොපොහොසත, කුශ තෘණ ද අනුභව කරන්නට නෝපොහොසත, නහන වේලෙහි ශරීරා වර්තනය (ඇඟ ඇතිල්ලීම) කරන්නටද නොපොහොසත, නිරන්තර දර්ශනය හේතුකොට ගෙන හස්තිරාජ තෙම සුනඛයා කෙරහි ස්නෙහ කෙළේයයි සිතමි''යි කීසේක.

මෙසේ යමක් යමක් ඒ හස්ති රාජයා කරන්නට නොහැකිද? ඒ සියල්ලම රජහට දැන් වූසේක. රජ්ජුරුවෝ බෝධිසත්‍වයන් වහන්සේගේ වචනය අසා ''පණ්ඩිතයන් වහන්ස, දැන් කවරක් කටයුතුදැ?''යි විචාළසේක. ''අපගේ මගුලැතාගේ යහළු සුනඛ තෙම එක් ගම්වැසි මනුෂ්‍යයෙක් ගෙන ගියේය. යමෙක්හුගේ ගෙයි ඒ සුනඛයා දුටුවොත් ඕහට මෙබඳු දඩයයි කියා බෙර ලව, මහරජ''යි කීසේක. රජතෙම එලෙස කරවූයේය. ඒ ප්‍රවෘත්තිය අසා ඒ පුරුෂතෙම සුනඛයා හැරියේය. සුනඛතෙම සීඝ්‍රයෙන් ගොස් හස්තියාගේ සමීපයටම

ගියේය. හස්ති තෙමෙ සුනඛයා සොඬින් ගෙණ කුම්භස්ථලයෙහි තබා හඬා වැලපපියා කුම්භස්ථලයෙන් බස්වා ඔහු විසින් ආහාරය අනුභව කළ කල්හි පසුව තෙමේ අනුභව කෙළේය. “තිරශ්චීනයාගේ අභිප්‍රාය(අදහස) දත්තේය”යි කියා රජ්ජුරුවෝ බෝධිසත්වයන් වහන්සේට මහත් ඓශ්වර්‍ය්‍යී(සම්පත්) දුන්සේක.

ශාස්තෲන් වහන්සේ වදාරණසේක් “මහණෙනි, මොහු දෙදෙන විශ්වාස වූවෝ දැන්මතු නොවෙයි, පෙරත් විශ්වාස වූවාහුය”යි කියා මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා චතුස්සත්‍ය දේශනාව වදාරා පූර්‍වාපර සන්ධි ගළපා මේ ‘අභිණ්හ ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි සුනඛ තෙම දැන් මේ උපාසක වූයේය. හස්ති තෙම දැන් මේ මහල්ලක ස්ථවිර වූයේය. පණ්ඩිත අමාත්‍යව උපන්නෙම් වනාහි තිලෝගුරු සම්‍යයක් සම්බුදුරජ වූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 028. නන්දිවිසාල ජාතකය

තවද එක් සමයෙක්හි අසමධුර වූ(අසම වූ බුදු පදවිය දරන) සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසනසේක් ෂඩ්වර්ගික භික්ෂූන්ගේ පරුෂ කෙප්ලක්(භික්ෂූන් සදෙනකුගේ කණ්ඩායමේ පරොස්බස් බැණීමක්) අරභයා මේ ජාතකය වදාළසේක.

එසමයෙහි වනාහි ෂඩ්වර්ගික භික්ෂූහු ඩබර කරන්නාහු ප්‍රියශීලි(ප්‍රිය මනාප ගති ඇති) භික්‍ෂූන්ට ගර්හා කෙරෙති. අතිවචනශරප්‍රහාර (දරුණු වචන නැමති ඊ පහර) දෙති. දශවිධ ආක්‍රොශ වස්තුවෙන්(අපහාසය ගෙනදෙන කීම් දසයකින්) ආක්‍රෝශ කෙරෙති. භික්‍ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේට දැන්වූවාහුය. භාග්‍යවතුන් වහන්සේ ෂඩ්වර්ගික භික්‍ෂූන් කැඳවා ගෙන්වා “මහාණෙනි, ඩබර කරන්නේ සැබෑවදැ?”යි විචාරා වදාරා “භාග්‍යවතුන් වහන්ස, සැබැව”යි දැන්වූ කල්හි ගර්හාකොට(දෙස් පවරා) “මහණෙනි, පරුෂවචනය නම් තිරශ්චීනගතයන්ට(තිරිසනුන්ට) ද අමනෝඥ වන්නේය. පූර්වයෙහි ද එක් තිරශ්චීනගත සත්‍වයෙක් තමාට පරුෂ වචනයෙන් කියන්නාහු දස දහසකින් පරාජය කෙළේය”යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස ගන්ධාර රට තක්සලා නුවර ගන්ධාර නම් රජෙක් රාජ්‍යය කෙරෙයි. එකල්හි අප මහබෝධිසත්‍වයන් වහන්සේ ගව ජන්මයෙහි උපන්සේක. ඉක්බිත්තෙන් බෝධිසත්‍වයන් වහන්සේ ළදරු වසුපැටවි කාලයෙහි එක් බ්‍රාහ්මණයෙක් ගවයන් දෙන්නාවූ දායකයන්ගේ සමීපයට ගොස් ගවයෙක් ලැබගෙන ‘නන්දිවිශාල’ යයි කියා නමක්කොට පුත්‍රස්ථානන්තරයෙහි(පුත් තනතුරෙහි) තබා බොහෝ ඕහට ප්‍රියවෙමින් කැඳ බත් ආදිය දී පොෂ්‍ය කරන්නේය. අප මහබෝධිසත්‍වයන් වහන්සේ වැඩි වයසට පැමිණිසේක් “මම මේ බ්‍රාහ්මණයා විසින් දුකසේ රක්‍ෂා කරන ලද්දේමි. මා හා සමග සියලු ජම්බුද්වීපයෙහි මා සදෘශවීම(සමාන) උසුලන අනික්

ගවයෙක් නම් නැත්තේය. එහෙයින් මම තමාගේ බලය දක්වා බ්‍රාහ්මණයාහට මා රක්‍ෂා කළාට මිල දුන්නෙම් වීනම් ඉතා යෙහෙකැ''යි සිතූසේක.

මෙසේ සිතා බෝධිසත්‍වයන් වහන්සේ එක් දවසක් බ්‍රාහ්මණයාට කියනසේක් ''බ්‍රාහ්මණය, යව, ගවයන් ධනකොට ඇති එක් සිටාණ කෙනෙකුන් කරා එළඹ 'මාගේ ගව තෙම එකට බැඳනාලද ගැල් සියයක් අදනේ'යයි කියා දහසකින් පරදු තබව''යි(ඔට්ටු අල්ලවයි) කීසේක. ඒ බ්‍රාහ්මණ තෙම සිටාණන්ගේ සමීපයට ගොස් කථාවක් පහළ කොළෝය. ''මේ නුවර කවරක්හුගේ ගවයෝ කාය ශක්තියෙන් යුක්ත දැ''යි කීයේය. ඉක්බිත්තෙන් ඕහට සිටුපුත්‍ර කියනුයේ ''අසවල්හුගේය, අසවල්හුගේය''යි කියා ''සියලු නුවර අපගේ ගොන් හා සදෘශ ගවයෝ නැත්තෝය''යි කීයේය. බ්‍රාහ්මණ තෙමේ කියනුයේ ''මාගේ ඒකාබද්ධ කොට බඳනාලද(එකට ඇඳන ලද) ගැල් සියයක් අදනට සමර්ථ එක් ගොණෙක් ඇත්තේය''යි කීයේය. සිටාණෝ කියන්නෝ ''බ්‍රාහ්මණය, එබඳු ගොණෙක් කොයින්දැ?''යි කීහ. බ්‍රාහ්මණතෙම ''මාගේ ගෙයි ඇත්තේය''යි කීයේය. ''එසේ වීනම් පරදුව තබව''යි කීහ. ''යහපත, කරන්නේමි'' කියා දහසකින් පරදු කළේය.

බ්‍රාහ්මණ තෙමේ ගැල් සියයක් වැලි කැට කැබලිති ගලින්ම පුරවා පිළිවෙලින් තබා සියල්ල අකුර බඳින යොතින්(ඇක්සලය බඳින ලණුවෙන්) එකට බැඳ නන්දිවිශාල නම් ගවයා නහවා සුවඳින් පසගුල්(සුවඳ කල්කය තැවැරූ

ඇඟිලි පසින් කළ ලකුණු) දී ග්‍රීවයෙහි(බෙල්ලේ) මල් පළඳවා පළමු ගැල් ධුරයෙහි(විය ගහේ) හුදකළාවම යොදා තෙමේ ගැල්හි හිඳ කැවිට ඔසවාගෙන “අදුව කූළ, උසුලව කූළ”යි කීයේය. බෝධිසත්වයන් වහන්සේ “මේ තෙමේ අකූළ වූ මට කූළු වචනයෙන්(පරුෂ වචනයෙන්) කියන්නේ ය”යි කියා සතර පය ටැඹක් (කණුවක්) මෙන් නිශ්චලකොට සිටිසේක. සිටාණෝ එකෙණෙහිම බ්‍රාහ්මණයාගෙන් වස්තු දහස ගෙන්වා ගත්තෝය.

බ්‍රහ්මණ තෙමේ දහසෙකින් පැරදුණේය. ගවයා මුදාහැර ගෙට ගොස් ශෝකයෙන් මඩනා ලදුව හොත්තේය. නන්දිවිශාල නම් ගොණා තණ කා ආයේ, ශෝකයෙන් මඩනා ලද බ්‍රාහ්මණයා දැක සමීපයට එළඹ “බ්‍රාහ්මණය, කවර හෙයකින් නිද්‍රාව කරන්නෙහිදැ?”යි කීයේය.

“දහසකින් පැරදුනා වූ මට නිදි කොයින්දැ”යි කීය. “බ්‍රාහ්මණය, මෙපමණ කලක් තොපගේ ගෙයි වසන්න වූ මා විසින් කිසි භාජනයක් බිඳපීමක් හෝ කිසිවක් මැඩ මීරිකීමක් හෝ නුසුදුසු තැනෙක්හි මළමුත්‍ර බැහීමක් හෝ කළවිරිදැ”යි කීයේය. “පුත්‍රය, එවැනි දෙයක් නැත්තේය”යි කීය. “එසේ කල්හි මට කවර කාරණයකින් කූළුවාදයෙන් කීයෙහිද? මේ තොපගේ ද්වේෂ වන්නේය. මාගේ ද්වේෂයෙක් නැත්තේය. යව, ඒ සිටාණන් හා සමග වස්තු දෙදහසකින් පරදුකොට තබව. හුදෙක් අකූළු වූ මට කූළවාදයෙන්(කපටියෙකු නොවූ මට කපටියා යන වචනයෙන්) කථා නොකරව”යි කීයේය.

බ්‍රහ්මණ තෙම මහබෝධිසත්‍වයන් වහන්සේගේ වචනය අසා ගොස් වස්තු දෙදහසකින් ඇපකොට තබා, යට කියනලද ක්‍රමයෙන්ම ගැල් සියය ඒකාබද්ධ කොට බැඳ නන්දිවිශාල නම් වෘෂභයා සරහා පළමු ගැල්වියෙහි(ඉදිරියෙන්ම ඇති කරත්තේ විය ගසේ) යෙදුයේය. කෙසේ යෙදුයේද යත්: විය ගැලෙහි නිශ්චල කොට බැඳ එක් කෙළවරක නන්දිවිශාල නම් වෘෂභයා යොදා එක් කෙළවරක් ගැල්යොතින් වෙළා විය කෙළවර අකුරක ඇණමුල නිසා මුඩුරුක් දණ්ඩක් දී(මුක්කුවක් ගසා) ඒ යොතින් නිශ්චලකොට බැඳ තැබූයේය. එසේ කළ කල්හි විය එයට හෝ මෙයට හෝ නොවන්නේය. එක ගොණෙකු විසින් ඇදගන්නට හැකි වන්නේය.

ඉක්බිත්තෙන් ඒ බ්‍රාහ්මණ තෙමේ ගැලෙහි හිඳ නන්දිවිශාල නම් වෘෂභයාගේ පිට පිරිමැද "මාගේ පුත්‍ර වූ යහපත් වෘෂභය, මේ ගැල් යෙහෙන් අදුව, උසුලුව යහපතැ"යි කීය. බෝධිසත්‍වයන් වහන්සේ ඒකාබද්ධව බඳනාලද ගැල් සියය එකවේගයෙන්ම ඇද පසුව සිටි ගැල, අභිමුඛයෙහි ගැල පිහිටි තැන තිබූය(කෙළවරෙහි වූ කරත්තය ඉදිරියෙන්ම වූ කරත්තය තුබු තැනට පත්විය). ගවධනය කොට ඇත සිටාණෝ පැරැද බ්‍රහ්මණයා හට වස්තු දෙදහසක් දුන්නෝය. අනිකුත් මනුෂ්‍යයෝද බෝධිසත්‍වයන් වහන්සේට බොහෝ වස්තු දුන්නාහුය. ඒ සියලු වස්තුව බ්‍රාහ්මණයාහටම වූයේය. මෙසේ බෝධිසත්‍වයන් වහන්සේ නිසා බොහෝ වස්තුව ලද්දේය.

සර්‍වඥයන් වහන්සේ වදාරණසේක් “මහණෙනි, පරුෂ වචනය නම් කිසිවක් හටත් මනාප නොවන්නේය”යි ෂඩ්වර්ගික භික්‍ෂූන්ට ගර්හාකොට ශික්‍ෂා පද පණවා මෙසේ වදාළසේක. “අන්‍යයා හා සමග කථා කරන්නේ චතුර්දෝෂ විරහිත වූ(බොරුව, කේලම්, රළු බස, හිස් බස යන දෝෂ හතරෙන් තොර වූ) මිහිරි වූ, මටසිළුටු වූ, මොළොක් වූ ප්‍රියවචනයෙන් ම බිණිය යුත්තේය. කිසි කලෙක්හිත් අමනෝඥ වචනය නොබිණිය යුත්තේය. කුමක් හෙයින්ද? යත් නන්දිවිශාල නම් වෘෂභ තෙම අමනාප වචන කියන්නහුගේ බර නොඇද පසුව මනාප වූ ප්‍රිය වචනය කියන්නාවූ බ්‍රාහමණයාගේ ගරුභාරය(අධික වූ බර) ඇද්දේය”යි මෙසේ සර්‍වඥයන් වහන්සේ “මනෝඥ වචනය බිණිය යුතුය”යි මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා වදාරා මේ ‘නන්දිවිශාල ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි බ්‍රාහ්මණ තෙමේ දැන් මේ කාලයෙහි ආනන්ද ස්ථවිරයන් වූයේය. නන්දිවිශාල නම් වෘශභව උපන්නෙම් වනාහි තිලෝගුර සම්‍යක් සම්බුදු රජ වූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 029. කණ්හ ජාතකය

තවද එක් සමයෙක්හි තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසනසේක් යමකප්‍රාතිහාර්‍ය්‍ය(යමාමහ පෙළහර) අරභයා මේ ජාතකය වදාළසේක.

සර්වඥයන් වහන්සේ යමකප්‍රාතිහාර්‍ය්‍ය කොට දිව්‍යලෝකයෙහි වැස මහපවුරුණු(වස් අවසාන කිරීම්, වස් පවාරණ නම් විනය කර්මය කරන) දිනයෙහි සකස්පුර(සංකස්ස පුර) දොරට බැස මහත් වූ පිරිවරින් ජේතවනයට වන්කල්හි භික්‍ෂූන් වහන්සේ දම්සභා මණ්ඩපයෙහි රැස්ව හිඳ "ඇවැත්නි, තථාගත නම් වූ සර්වඥයන් වහන්සේ නම් අසමධුර සේක(අසමාන පදවියක් ඇතිසේක) . සර්වඥයන් වහන්සේ විසින් උසුලන ලද්ද වූ ධුරය උසුලන්නට සමර්ථ වූ අන්කිසි සත්‍වයෙක් නම් නැත්තේය. මක්ඛලීගෝසාලාදී වූ ශාස්තෲහු සදෙන 'අපි යමකප්‍රාතිහාර්‍ය්‍ය කරම්හ. අපි යමකප්‍රාතිහාර්‍ය්‍ය කරම්හ'යි කියා එක ප්‍රාතිහාර්‍ය්‍යයකුත් නොකළෝය. සර්වඥයන් වහන්සේ වූකලි ඉතා ආශ්චර්‍ය්‍යවත්සේක"යි(පුදුම උපදවන සුලු යයි) බුදුන්ගේ ගුණ කිය කියා උන්සේක.

එකල්හි සර්වඥයන් වහන්සේ අවුත් "මහණෙනි, දැන් කවර නම් කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා වදාළසේක. "ස්වාමීනි, අන් කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ, නුඹවහන්සේගේ මෙබඳු ගුණ කථාව කිය කියා උනුම්හ"යි කී කල්හි "මහණෙනි, දැන් ඉසලූ ධුරයක් කවරෙක් උසුලා ද? පෙර තිරිසන් යොනියෙහි උපන්නාවූ මම මා හා සම ධුරය ඇති කිසිවක්හු නොලද්දේම් වේදැ"යි වදරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහා බෝසතාණෝ ගව යෝනියෙහි උපන්නාහුය. ඉක්බිත්තෙන් ඔහු බාල අවස්ථාවෙහිම ඔහුගේ ස්වාමිදරුවෝ එක් වෘද්ධ වූ ස්ත්‍රියකගේ ගෙයි වැස නවාතැන් කුලියට පිරිසිඳ(නවාතැන් ගාස්තුව ලෙස ගණන් බලා) දුන්නාහුය. ඒ වෘද්ධ ස්ත්‍රී මහබෝසතාණන් කැඳ බත් ආදීයෙන් පෝෂ්‍ය කරන්නී පුත් තනතුරෙහි තබා වැඩූය. ඒ තෙම ‘ආය්‍යී කාකාලක’යි මේ නමින් ප්‍රසිද්ධව වැඩිවිය පැමිණියේය. අඤ්ජන වණ්ණ ගම ගොන් හා කැටිව (කලු පාටින් යුතුව ගමේ සෙසු ගොනුන් සමග) ඇවිදින්නේය. ශිලාචාරයෙන් යුක්තය. ගම් දරුවෝ ඇඟත් කරත් එල්ලීගෙන ඇවිදිත්, වාලධියත්(වලිගයත්) අල්වාගෙන ඇවිදිති. පිටට නැගීත් ඇවිදිති. ඒ වෘෂභයා එක් දවසක් මෙසේ සිතුයේය. “මාගේ මෑණියෝ දුක්ඛිතයෝය, මා පුත් තනතුරෙහි තබා වඩා දුකසේ පොෂ්‍ය කළෝය. එසේ හෙයින් මම බැළ මෙහෙකොට මුන් දුප්පත් කමින් මිදුයේ වීනම් යහපත් වන්නේය”යි සිතා එතැන් පටන් බැළ මෙහෙයක්(කුලී වැඩක්) සොයමින් ඇවිදින්නේය.

ඉක්බිත්තෙතන් එක් දවසක් සාත්තුනායක පුත්‍රයෙක්(ගැල්නායකයෙක්) පන්සියයක් ගැල් හා සමග විසම වූ ගැඹුරු තොටකට බටයේය. ඔහුගේ ගොන් ගැල් ගොඩගන්න අසමර්ථයෝය. පන්සියයක් ගැල්ගොන් වියදඬු පරම්පරායෙන්(වියදඬුවෙන් වියදඬුව අමුනා) යොදන ලද්දහු එකගැලකුත් ගොඩ නගාගත නුහුනුවූහ. බෝධිසත්වයෝ ද

ගොන් හා සමග ඒ ඒ තැන්හි ඇවිදිති. සාත්තුනායක පුත්‍රයාද ගෙන් ලකුණු(ගොනුන්ගේ සුභ අසුභ ලක්‍ෂණ) දත්තේය. එතෙම "මේ ගෙරින් අතුරෙහි මේ ගැල් ගොඩගන්න සමර්ථ වූ වෘෂභ ජාතියෙක්(ගව වර්‍ගයෙක්) ඇද්දේ හෝ"යි පරීක්‍ෂා කරන්නේ බෝධිසත්‍වයන් දැක "මේ අජානීයයා(කුලවත් ශක්තිමත් ගවයා) මාගේ ගැල් ගොඩගන්ට සමර්ථ වන්නේය. මොහුගේ ස්වාමීදරුවෝ කවුරුදැ?"යි ගොපල්ලන් අතින් විචාළෝය. තවද "පින්වත්නි, මොහුගේ ස්වාමීදරුවෝ කවුරුහුද? මම මොහු ගැල යොදා ගැල් ගොඩනැගූ කල්හි මිළ දෙමි"යි කීය.

එකල්හි ගොපල්ලා කියනනෝ "අල්වාගෙන යොදගත මැන. මෙතැන මොහුගේ ස්වාමීදරු කෙනෙක් නැතැ"යි කීය. ඒ සාත්තුනායකයා එබස් අසා ඔහු ලගට නැහැ ලණුවක් බැඳ අදනේ සිටි තෙනින් සොළවන්නට අසමර්ථ විය. බෝධිසත්‍වයෝ වනාහි "ගැල් ඇදි කුලී කී කල්හි යෙමි"යි සිතා නොගියාහුය. සාත්තුනායක පුත්‍ර ඔහුගේ අභිප්‍රාය(අදහස) දැන යාච්ඤා කරන්නේ "පන්සියයක් ගැල් තොප විසින් ගොඩනැගූ කල්හි එකි එකි ගැලකට කහවණු දෙකක් කුළී කොට දහසක් දෙමි"යි කීය. එකල්හි බෝධිසත්‍වයෝ තුමූම ගියාහුය. ගැල් සමීපයට ගිය බෝධිසත්‍වයන් දැක මිනිස්සු වෘෂභයා ගැල්හි යෙදුවාහුය. එකල්හි බෝධිසත්‍වයෝ එක වේගයෙන්ම ඔසවා ගොඩ නැගුවාහුය. මෙම ක්‍රමයෙන් සියලු පන්සියයක් ගැල්ම ගොඩ නැගූය. සාත්තුනායක පුත්‍රතෙම එකි එකී ගැලකට එකි එකී කහවණුවක් බැගින් පන්සියයක්

කහවණු පොදිබැඳ ඒ මහබෝසතාණන් කර බැන්දේය. ඒ බලා බෝධිසත්ත්වයෝ “මේ තෙම මට දෙමි යි පළමු නියම කළ කුළී නොදෙන්නේය. එසේ හෙයින් දැන් මොහු යානොදෙමි”යි ගොස් ඇමට පෙරතුම ඉදිරියේ ගැල අසුරාගෙන සිටියෝය. ඉවත්කරන්නට උත්සහ කරන්නාහු ඉවත්කොට නුහුණුවාහුය.

එවෙලෙහි සාත්තුනායක පුත්‍ර සිතන්නේ “මේ තෙම තමාට කුළී මදි නියාව දතවනැ”යි සිතා එක් වස්ත්‍රයක දහසින් පොදියක් බැඳ “මේ තෙම තොප ගැල නැගූ කුළිය”යි කියා කරබැඳ එල්වූයේය. මහබෝසතාණෝ දහසින් බැඳි පියල්ල ගෙන මැණියන් සමීපයට ගියාහ. ගම්දරුවෝ ඒ දැක “ආර්‍ය්‍යකාකාළකයන්ගේ කර කිමෙක්දැ”යි බෝධිසත්ත්වයන් සමීපයට එන්නාහුය. බෝධිසත්ත්වයෝ ඒ කුඩා කොල්ලන් පසු පස්සෙහි දිව ලුහුබඳවා යවා මැණියන් සමීපයට ගියෝය. පන්සියයක් ගැල් ගොඩනැගූ බැවින් ඇස් රතුව මිරිකී ගියාවූ ස්වරූප(විඩාපත් වූ අයුරු) ඇතිවූය. වෘද්ධ උපාසිකාවෝ මහබෝසතාණන් කර දහසින් බැඳි පියල්ල දැක “මුන් විසින් කොයි දී ලබන ලදදැ”යි ගොපලු දරුවන් අතින් විචාරා එපවත් අසා “දරුව, කිමෙක්ද? මම තොප ලත් කුළියෙන් ජීවත්වනු කැමැත්තෙම්ද? කුමක් සිතා තොපි මෙබඳු වූ දුක් අනුභව කළාහුදැ”යි කියා මහබෝසතාණන් උණු පැනින් නාවා සියලඟ (මුළු සිරුරෙහි) තෙල් ගල්වා පැන් පොවා සප්පාය(සුදුසු) භෝජනය අනුභව කරවා සන්තර්පණය කොට(සතුටු කරවා) ජීවිතපර්යාවසානයෙහි (දිවි කෙළවර)

බෝධිසත්ත්වයන් හා සමඟ කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය.

බුදුරජාණන් වහන්සේ "මහණෙනි, සර්‍වඥයන් වහන්සේ අසමධුර වූසේක් දැන්මතු නොවෙයි, පෙරත් අසමධුර වූවෝම වේදැ"යි වදරා පූර්‍වාපර සන්ධි ගළපා මේ 'කණ්හ ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි වෘද්ධ ස්ත්‍රී නම් මේ උත්පලවර්‍ණා මහාස්ථවිරාය. ආර්‍ය්‍යකාකාළක වෘෂභයා නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 030. මුනික ජාතකය

තවද එක් සමයෙක්හි මෝහාන්‍ධකාර භග්න කළා වූ (මෝහය නැමති අඳුර නැසූ) තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසනසේක් ථුල්ලකුමාරිකාපලොභනයක් (විවාපත් නොවී ගෙදරටම වියපත් වූ ස්ත්‍රියකගේ පෙළඹවීමක්) අරභයා මේ ජාතකය වදාළසේක.

සර්‍වඥයන් වහන්සේ "සැබෑද? මහණ, තෝ සර්‍වඥ ශාසනයෙහි උකටලී වුයේහිදැ"යි භික්‍ෂුහු අතින් විචාරා වදාළසේක. "එසේය ස්වාමීනි"යි කී කල්හි "කුමක් නිසාදැ?"යි විචාරා "ථුල්ලකුමාරිකාපලොභනයක් නිසාය ස්වාමීනි" කී කල්හි බුදුරජාණන් වහන්සේ වදරණසේක් "මහණ, තට මෝතොමෝ අනර්ථකාරීය, පෙරත් මැගේ විවාහ මගුලේ දී

ජීවිත විනාශයට පැමිණ මහජනයාට මාළුවට (අහාරයට) පැමිණියෙහි වේදැ”යි ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි බෝධිසත්ත්වයෝ එක් ගමෙක එක් කෙළෙඹි පුත්‍රයෙකුගේ ගෙයි ගව යෝනියෙහි උපන්නාහුය. බෝධිසත්ත්වයන්ට ‘මහලෝහිතයෝය’යි නම් තුබුවාහුය. මළනුවන්ට ‘චුල්ලලෝහිතයෝය’යි නම් තුබූහ. ඔවුන් දෙබෑයන් නිසාම ගෙයි කර්මාන්ත සමෘද්ධව පිරිමැසෙන්නේය. ඒ කුලෙහි එක් කුමාරිකාවක් ඇත්තීය. ඒ කුමාරිකාව නුවර වැසි කුල පුත්‍රයෙක් තමාගේ පුත්‍රයාට විචාළේය. ඇගේ දෙමව්පියෝ “කුමාරිකාවගේ විවාහ කාලයෙහි ආවාවූ අමුත්තන්ට අවුළු (ආහාර) වන්නේය”යි සිතා කැඳබත් ලා ‘මුනික’ නම් ඌරෙකු පොෂ්‍ය කළාහුය. ඔහු දැක චුල්ලලෝහිතයෝ බෑණ ගොනාණන්ට කියන්නෝ “මේ කුලයෙහි කර්මාන්තධුරාභිවර්ධන (කර්මාන්ත කටයුතුවල දියුණුව) වන්නී අප දෙබෑයන් නිසාමය, මේ ගෙයි ඇත්තෝ වූකලී අප දෙදෙනාට තණ හා පිදුරු ලති. මේ සුකරයා කැඳ බතින් නිතිපතාම පොෂ්‍ය ලබයි. කවර කාරණයෙන් මේ ඌරා කැඳබත් ලබන්නේදැ?”යි විචාළෝය.

එකල්හි බෑණ කියන්නේ “මල, චුල්ලලෝහිතයෙනි, තෙපි මොහුගේ භොජනයට ආලය නොකරව. මේ ඌරා මරණ භෝජනය අනුභව කෙරෙයි. මේ කුමාරිකාවගේ විවාහ කාලයෙහි ආවාවූ අමුත්තන්ට අවුළු වන්නේ යයි මේ

මනුෂ්‍යයෝ මේ ඌරා පෝෂණය කෙරෙති. මෙයින් කීප දවසක් ගියකල ඒ මනුෂ්‍යයෝ එති. එකල්හි මේ ඌරා, දෙකකුල් අල්වාගෙන අදනාහු යට ඇඳින් මැත්කොට (ඇඳ යටින් එළියට ගෙන) මරා අමුත්තන්ට මාලු පිසීම දක්නා වේදැ''යි කිවුය.

ඉක්බිත්තෙන් නොබෝ දවසකින් ඒ මනුෂ්‍යයෝ ආවාහුය. ඔවුන් මුනික නම් ඌරා දැක මරා අනෙකප්‍රකාරයෙන් මාළු පිසුය. බෝධිසත්‍වයෝ චුල්ලලෝහිතයන්ට කියන්නෝ ''දරුව, තොප විසින් මුනිකයා දක්නා ලද්දේදැ?''යි විචාළෝය. ''දක්නාලද පින්වතුන් වහන්සැ''යි කී කල්හි ''ඌරාගේ භොජනයෙහි ඵල කවරේද? ඔහුගේ බතට සියක් ගුණයෙන් දහස් ගුණයෙන් අපට තණ හා පිදුරු අනුභව කිරීම උතුම් වන්නේය, නිරවද්‍යය, දීර්ඝායුෂ්ක ලක්‍ෂණයෙකැ''යි (දිගු කලක් ජීවත්වීමේ ලකුණකැයි) කිවූය.

බුදුරජාණන් වහන්සේ ''මහණ, තෝ පෙර මේ කුමාරිකාව නිසා ජීවිතක්ෂයට පැමිණ මහජනයාට අවුළු බවට පැමිණියෙහි වේදැ''යි මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා වදරා චතුස්සත්‍ය ප්‍රකාශ කළසේක. චතුස්සත්‍ය ධර්‍මදේශනාවගේ කෙළවර උකටලී මහණ සෝවාන් පෙලෙහි පිහිටයේය. සර්‍වඥයන් වහන්සේ පූර්‍වාපර සන්ධි ගළපා මේ 'මුනික ජාතකය' නිමවා වදාළසේක.

''එසමයෙහි මුනික සුකරයා නම් මේ උකටලී මහණය. එසමයෙහි කුමාරිකාව නම් මේ ථුල්ල කුමාරිකාය.

චුල්ලලෝහිත ගොනාණෝ නම් ආනන්ද ස්ථවිරයෝය. මහලෝහිත ගොනාණෝ නම් තිලෝගුරු සම්මාසම්බුදුරජ වූ මම්ම වේදැ''යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 031. කුලාවක ජාතකය

තවද එක් සමයෙක්හි ධර්මාධිපති වූ (ධර්‍මයට නායක වූ) තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වසනසේක් පැන් නොපෙරා වැළඳූ එක් භික්‍ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

සැවැත්නුවර වාසී වූ යහළු වූ භික්‍ෂූහු දෙදෙනෙක් දනව්වකට ගොස් එක් ඵාසුතෙනක (පහසු තැනක) අදහස් වූ පරිද්දෙන් වැස "සර්‍වඥයන් වහන්සේ දකුම්''යි නැවත එයින් නික්ම ජේතවනාරාමයට අභිමුඛව ගියසේක. ඒ දෙදෙනා වහන්සේ අතුරෙන් එක් කෙනෙකුන් වහන්සේගේ අත පෙරහංකඩකින් දිය පෙරා වළඳනසේක. ඒ දෙදෙනා වහන්සේම එක් දවසක් විවාදකොට  (වාද විවාද වී) පෙරහංකඩ ඇති භික්‍ෂූන් වහන්සේ අනික් තැනැත්තන් වහන්සේට පෙරහංකඩ නොදී තමන් වහන්සේ පැන් පෙරා වැළඳුසේක. අනික් භික්‍ෂූන් වහන්සේ පෙරහංකඩ නොලැබ පිපාසා ඉවසාගත නොහී නොපෙරා පැන් වැළඳූසේක. ඒ දෙදෙනා වහන්සේම ක්‍රමයෙන් ජේතවනාරාමයට ගොස් බුදුන් වැඳ එකත්පස්ව හුන්සේක. සර්‍වඥයන් වහන්සේ සුවදුක් කථා කොට "කොයි සිට අවුදැ?''යි විචාළසේක. "ස්වාමීනි, අපි කොසොල් දනව්වෙහි එක් ගමක වැසි එයින් නික්ම

නුඹවහන්සේ දක්නා පිණිස ආමිහ”යි කීවෝය. “තෙපි දෙදෙනා සමගියාදැ”යි විචාළ කල්හි පෙරහංකඩ නැති මහණ කියන්නේ “ස්වාමීනි, මේ මහණ අතරමගදී මා හා විවාදකොට පෙරහංකඩ නුදුන්නේය”යි කියේය. අනික් මහණ කියන්නේ “ස්වාමීනි, මේ මහණ නොපෙරාම දැන දැන ප්‍රාණීන් සහිත ජලය වැලඳූයේ වේදැ”යි කීය.

එවෙලෙහි බුදුහු “මහණ සැබෑද? තෝ දැන දැන පණුවන් ඇති දිය පරිභෝග කෙළේදැ?”යි විචාළසේක. “එසේය ස්වාමීනි, මා විසින් නොපෙරා දිය වළඳන ලද්දේය”යි කීය. එබස් ඇසූ සර්‍වඥයන් වහන්සේ “මහණ, පෙර නුවණැත්තෝ දෙදෙව්ලොවට (චාතුර්මහාරාජික හා තාවතිංස යන දිව්‍ය ලොක දෙක) අධිපතිව රාජ්‍යය කෙරෙමින් යුද්ධයෙන් පැරදී සමුද්‍රමස්තකයෙන් (මුහුද උඩින්) යන්නා වූ ඓශ්වර්‍ය්‍යයක් නිසා (සම්පත්තියක් වෙනුවෙන්) ප්‍රාණවධයක් නොකරම්හ”යි ඒ සා මහත් යසස් හැර ගරුඬ පෝතකයන්ට (ගුරුළු පැටවුන්ට) ජීවිතදානය දී රථය වැළකුවෝම වේදැ”යි වදාරා ඉකුත්වත් ගෙනහැර දක්වා වදාළසේක.

යටගිය දවස මගධරට රජගහනුවර මගධ රජ්ජුරුකෙනෙක් රාජ්‍යය කරන්නාහුය. එසමයෙහි පුරණලද බෝධිසම්භාර (පාරමිතා) ඇති අප මහබෝසතාණෝ යම්සේ දැන් ශක්‍රදේවේන්ද්‍රයෝ පූර්‍වාත්ම භාවයෙහි මගධරට මචල ග්‍රාමයෙහි උපන්නාහුද එපරිද්දෙන්ම ඒ මචල ග්‍රාමයෙහි මහා සම්පත් ඇති කුලයක පුත්‍රව උපන්නාහුය. ඔවුන්ට නම් තබන

දවස් 'මඝ කුමාරයෝ' යයි කියා නම් තුබූය. බෝධිසත්වයෝ වැඩිවිය පැමිණ 'මඝමානවකයෝ' යයි මෙනමින් ප්‍රසිද්ධ විය.

ඉක්බිත්තෙන් උන්ගේ දෙමව්පියයෝ සමජාති ඇති කුලයකින් කුමාරිකාවක් ගෙනවුත් පාවා දුන්නේය. ඒ බෝධිසත්වයෝ දුදරුවන් හා සමග වර්ධනය වෙමින් දනපති වූහ. නිරන්තරයෙන් පඤ්චශීලය රක්‍ෂා කෙරෙති. එකල ඒ ගම ගෙවල් තිසක් වන්නේය. ඒ තිසක් පමණ මනුෂ්‍යයෝ එක් දවසක් ගම මධ්‍යයෙහි සිට කර්මාන්ත කරන්නාහුය. බෝධිසත්වයෝ සිටි තැන පයින් වැලි පීරා කසල ඉවත් කොට ඒ ප්‍රදේශය සිත්කළු කොට සිටියාහුය. එකල අනිකෙක් අවුත් එතැන්හි සිටියේය. බෝධිසත්වයෝ අනික් තෙනක් කසල හැර සිත්කළු කොට සිටියාහුය. එතැන්හී අනිකෙක් අවුත් සිටියේය. බෝධිසත්වයෝ නැවත අන් තෙනක, නැවත අන් තෙනකයයි සියල්ලවුන්ම සිටිතැන් සිත්කළු කොට මෑතභාගයෙහි එතන මණ්ඩපයක් කරවූහ. පසුව මණ්ඩපයත් හැර ශාලාවක් කරවූහ. ඒ ශාලාවෙහි සැතපෙන්ට පෝරු අතුට (ලෑලි අතුරා) පින් පැන්සලක් තැබ්බවූය. මෑතභාගයෙහි ඒ ගම්වැසියෝ තිස් දෙනාත් බෝධිසත්වයන් හා එක්වූහ. බෝධිසත්වයෝ ඔවුන් තිස්දෙනා පඤ්චශීලයෙහි පිහිටුවා එතැන් පටන් ඔහුන් හා සමග කුසල් කෙරෙමින් ඇවිදිති. ඔවුන් හැමදෙනත් බෝධිසත්වයන් හා සමග කුසල් කරන්නාහු. උදැසනම නැගීසිට වෑ පොරෝ මොහොල් ගත් අත් ඇතිව සතරමංසන්ධි ආදියෙහි මෝලින් ගල් ඇන උදුර උදුරා පෙරලත්, රථඅකෝ ආදියේ වැදගන්නාවූ (කරත්තරෝද ඇක්සල ආදියෙහි

හැප්පෙන්නාවූ) ගස් කපා දමති, විසම තැන් සම කරති, ඒදඬු ලති, පොකුණු කණිති, ශාලාවල් කෙරෙති, දන්දෙති, සිල් රක්‍ෂා කෙරෙති. මෙසේ බොහෝ සේ බෝධිසත්‍වයන්ගේ අවවාදයෙහි පිහිටා ශීලසංරක්‍ෂණය (සිල් රැකීම) කළාහුය.

එකල්හි ඔවුන්ගේ ගම්මුදලි (ගම්මුලාදෑණියා) මෙසේ සිතීය. "මම පෙර මේ මනුෂ්‍යයන් රා බොන කල්හි, ප්‍රාණඝාතාදිය කරන කල්හි රා සැලකට කහවණුවක් නියායෙන් (බැගින්) දඩ මුඩු නොමද අයපඬුරු (දඩමුදල් හා බොහෝ තුටු පඬුරු) වශයෙන් වස්තු ලබමි, දැන් වූකලී මඝමානවකයෝ "සිල් රක්වමි" කියා ඔවුන් ප්‍රාණඝාතාදිය කළ නොදෙති. දැන් වනාහි උන් ලවා පන්සිල් රක්වන්නෙමි වේදැ"යි කියා කිපී රජ්ජුරුවන් කරා ගොස් කියන්නේ "ස්වාමීනි, බොහෝ හොරු එක්ව ගම් පැහැරීම් ආදිය කෙරෙමින් ඇවිදිති"යි කීය. රජ්ජුරුවෝ ඔහුගේ වචනය අසා "තෝ ගොස් ඔවුන් හැමදෙනා ගෙනව"යි කීවුය. එතෙම ගොස් සියල්ලවුන්ම බැඳ ගෙන අවුත් "රජ්ජුරුවන් වහන්ස, සොරුන් ඇමදෙනාම ගෙනෙන ලදැ"යි රජ්ජුරුවන්ට දැන්විය.

රජ්ජුරුවෝ ඔවුන් කළ කාරිය නොවිචාරා ශුද්ධ නොකට ම (වරද නිවරද බව තීරණය නොකරම) "මුන් ඇමදෙනාම ඇතුන් ලවා මඬව"යි කීවුය. ඉක්බිත්තෙන් ඒ සියල්ලවුන්ම රාජාංගනයෙහි වැදහොවා ඇතු ගෙණවාහුය. එකල්හි බෝධිසත්‍වයෝත් තමන්ගේ සියලු පර්ෂිදට (පිරිසට) අවවාද කරන්නෝ "තොපි සියල්ල ශීලය ආවර්ජනා කරවු (සිහිකරවු),

කේලාම් කී තැනැත්තහු කෙරෙහිත් රජ්ජුරුවන් කෙරෙහිත් ඇතුන් කෙරෙහිත් තොප තොපගේ ශරීරයෙහිත් (තම තමා කෙරෙහිත්) සමකොට මෛත්‍රී කරවු”යි කිවුය. ඔවුහුත් එපරිද්දෙන්ම කළාහුය. ඉක්බිත්තෙන් ඔවුන් හැමදෙනාම මඩන පිණිස ඇතුන් අකුස්සෙන් කොටලා (හෙණ්ඩුවෙන් ඇන) ළඟට මෙහෙයාලුය. ඒ ඇත් ළඟට නොවදනේය. මහහඬින් හඬ හඬා පලායන්නේය. ඒ දැක අනික් ඇතෙකු ගෙනාවාහුය. ඔහුත් එපරිද්දෙන්ම ගියේය. රජ්ජුරුවෝ ඒ අතුන් මිනිසුන් නොමඬනා බැව් දැක “මොහුන් අත කිසි ඖෂධයක් වන්ට උවමැනව, පරීක්‍ෂා කරවු”යි කිවුය. පරීක්‍ෂා කරන්නාහු නොදැක “නැත රජ්ජුරුවන් වහන්සැ”යි කිවුය. “එසේ වීනම් කිසි මන්ත්‍රයක් ඇත, පරීක්‍ෂා කරවු, ‘තොප පිරිවන (මතුරන) මන්ත්‍රයෙක් ඇද්දැ’යි ඔවුන් අතින් විචාරව”යි කිවුය. එබස් අසා රාජපුරුෂයෝ විචාළාහුය. බෝධිසත්‍වයෝ “ඇතැ”යි කිවුය. රාජපුරුෂයෝ “ඔවුන් පිරිවන මන්ත්‍ර ඇතැ”යි රජ්ජුරුවන්ට දැන්වුය.

රජ්ජුරුවෝ ඔවුන් හැමදෙනාම සමීපයට කැඳවා “තොප දන්නා මන්ත්‍රය කියව”යි කිවුය. බෝධිසත්‍වයෝ කියන්නෝ “රජ්ජුරුවන් වහන්ස, අනික් අපගේ මන්ත්‍රයෙක් නම් නැත්තේය. අපි තිසක් පමණ දෙනා ප්‍රාණවධ නොකරම්හ, සොරකම් නොකරම්හ, කාම මිත්‍යාචාර නොකරම්හ, බොරු නොකියම්හ, රා නොබොම්හ, මෛත්‍රී භාවනා කරම්හ, දන් දෙම්හ, මං සමකරම්හ, පොකුණු කරම්හ, ශාලා කරම්හ, මේ අපට මන්ත්‍ර වන්නේය, පිරිතුන් වන්නේය, වැඩත් වන්නේය”යි

කිවුය. එබස් ඇසූ රජ්ජුරුවෝ ඔවුන් කෙරහි පැහැද කේලාම් කී තැනැත්තහුගේ සියලු වස්තුවත් ඔහු තුමුත් ඔහුන්ටම පාවා දුන්නේයෙ. ඔහු ඇමදෙනාම එතැන් පටන් කැමති පරිද්දෙන් වඩ වඩා කුසල් කරන්නාහුය. "සතර මංසන්ධියෙහි මහත් වූ ශාලාවක් කරම්හ"යි වඩුවකු කැඳවා ශාලාවක් කරන්නට පටන්ගත්තුය. ස්ත්‍රීන් කෙරෙහි ආලය මඳ බැවින් ඒ ශාලාව කිරීමට ස්ත්‍රීන් සමාදන් නොකරවූහ. (සහභාගීකර නොගත්හ)

එසමයෙහි බෝධිසත්ත්වයන්ගේ ගෙයි 'සුධර්මා, චිත්‍රාය, නන්දාය, සුජාතා' යයි ස්ත්‍රීහු සතර දෙනෙක් වෙති. ඔවුන් අතුරෙන් සුධර්මාවෝ වඩුවා හා එක්ව "බෑණනි, මේ ශාලාවට මා නායක කරව"යි කියා අත්ලස් දුන්නුය. වඩුවා "යහපතැ"යි ගිවිස පළමුකොටම කැණිමඩලට (පරාල සියල්ල එකට ගළපන ප්‍රධාන කණුවට) දණ්ඩක් කපා වියලා සැස විත් විද (සිදුරු විද) කැණිමඩල කොට නිමවා කඩකින් (රෙදි කැබැල්ලකින්) වසා වෙලා තුබූයේය. ඉක්බිත්තෙන් ශාලාව කොට නිමවා කැණිමඩල උඩනගන අවස්ථාවෙහි "අනේ අපි එකක් සිහි නොකළම්හ"යි කීය. "පින්වත, කුමක්දැ?"යි කී කල්හි "කැණිමඩලක් උවමනා වේදැ"යි කීය. "වන්නාට (වේවා), අපි ගෙනඑම්හ"යි කී කල්හි "දැන් කැපූ දණ්ඩකින් කරන්ට නොපිළිවන් වන්නේ යයි පළමුකොට කපා සැස විඳ තුබූ කැණිමඩලක් ලදමැනවැ"යි කීය. "දැන් කුමක් කරමෝදැ?"යි කී කල්හි ඉඳින් කිසි කෙනෙකුන්ගේ ගෙයි කර්මාන්ත කොට (සාදා) නිමවා තුබූ කැණිමඩලක් ඇත්නම් එසේ වූ කැණිමඩලක් සොයව"යි කිවුය. ඔහු ඇමදෙන

සොයන්නාහු සුදර්මාවන්ගේ ගෙයි තුබූ කැණිමඬල දැක මිළයට ඉල්වා නොලද්දුහ.

එකල සුදර්මාවන් විසින් "ඉදින් මා ඒ ශාලාවට එක්කොට ගනු නම් (සහභාගී කරවා ගනී නම්) කැණිමඬල දෙන්නෙම්වේදැ"යි කී කල්හි "අපි ස්ත්‍රීන් සමාදන්කොට නොගනුම්හ"යි කිවුය. එබස් ඇසූ වඩුවා කියන්නෝ "ආර්යයාවෙනි තොපි ඇම කුමක් කියව්ද? බ්‍රහ්මලෝකය හැර සෙසු ස්ත්‍රීන් නැති තෙනක් නම් නැත, කැණිමඬල ඇරගනුව, එසේ කල්හි අපගේ කර්මාන්ත වහා සමෘද්ධ වන්නේය"යි කීය. ඔහු හැමදෙනා "යහපතැ"යි කියා කැණිමඬල ගෙන ශාලාව කොට නිමවා ඉන්නා පෝරු අතුට ඒ ඒ තැන පින් පැන්සල් තබ්බවා නිරන්තරයෙන් දුගී මගී යාචකයන්ට දෙන ලෙස කැඳ බත් තැබ්බවුය. තවද ඒ ශාලාව වටකොට පවුරක් බඳවා දොරක් ලවා පවුර ඇතුළත වැලි තබ්බවා (විසුරුවා) පවුරේ පිටත තල්පැල පන්තියක් රෝපනය කරවූය. චිත්‍රාවෝත් ඒ ශාලාව සමීපයෙහි උයනක් කරවූය. ඒ උයන 'මල්ඵල ගන්නාවූ අසවල් ගසෙක් නැතැ'යි නොකියහැකි සියලුම ගස් ඇත්තේය. නන්දාවෝත් එතනම පොකුණක් කරවූය. ඒ පොකුණ පස්වනක් (පාට පහකින් යුත්) පියුමෙන් සැදින, සිත්කළුය. සුජාතාවෝ වූ කලි කිසි පින්කමක් නොකරවූය.

ඉක්බිත්තෙන් මහබෝසතාණෝ මවුන්ට උපස්ථාන කිරීමය, පියන්ට උපස්ථාන කිරීමය, කුලදෙටුවන්ට (පවුලේ වැඩි

මහල්ලන්ට) උපස්ථාන කිරීමය, බොරු නොකීමය, පරුෂ වචන නොකීමය, කේලාම් නොකීමය, මසුරුමල (මසුරුකම) දුරුකිරීමය යයි යන සප්තවිධ වූ ව්‍රතසමාදනයන් පූරා (සමාදන් වූ ව්‍රත සත සපුරා)

"මාතාපෙත්තිභරං ජන්තුං - කුලෙජෙට්ඨාපචායිනං
සණ්හං සඛිලසම්භාසං - පෙසුණෙය්‍යප්පහායිනං

මච්ඡෙරවිනයෙ යුත්තං - සච්චං කොධාභිභුං නරං
තං වෙ දෙවා තාවතිංසා - ආහු සප්පුරිසො ඉති"

(මවුපිය පොෂණය, කුලදෙටුවන් පිදීම, ප්‍රිය වචන කථාකිරීම, කේලාම් නොකීම, මසුරුකම දුරලීම, ඇත්ත කථාකිරීම, වෛර නොකිරීම යන මේ ව්‍රත හෙවත් ගුණදහම් සතෙන් යුත් සත්ත්වයා සත්පුරුෂයෙකැයි දෙව්ලෝවැසි දෙවියෝ කියති.)

මෙසේ ප්‍රසංසා කටයුතු බවට පැමිණ ජීවිතාන්තයෙහි ගොස් තව්තිසා දිව්‍ය ලෝකයෙහි ශක්‍රදේවේන්ද්‍රව උපන්නාහුය. බෝධිසත්ත්වයනගේ සහාය මනුෂ්‍යයෝද ඒ දිව්‍ය ලොකයෙහි උපන්නාහුය.

එකල තව්තිසා භවනයෙහි අසුරයෝ වාසය කරති. ශක්‍ර දේවේන්ද්‍රයෝ "අපට සාධාරණ රාජ්‍යයෙන් ප්‍රයෝජන කිම්දැ?"යි අසුරයන් දිව්‍යසුරාව පොවා මත්වූවන් දෙකකුල ගන්වා (දෙපයින් ඔසවා) මහමෙර පත්ලේ එලූය (දැමීය). ඔහු ඇමදෙන අසුර භවනයටම පැමිණියෝය. අසුර භවනය නම්

මහමෙර යට තව්තිසා දිව්‍ය ලෝකයෙහි ශක්‍රපුරය මෙන් දසදහසක් යොදුන් පමණ තැන් ඇත්තේය. එහි දෙවියන්ගේ පරසතු රුක මෙන් චිත්‍රපාටලී නම් කල්පස්ථායි (කල්පයක කාලයක් පවත්නා) වෘක්ෂයෙක් ඇත. ඒ අසුරයෝ චිත්‍රපාටලී වෘක්ෂය මල් පිපී ගිය කල්හි "මේ අපගේ දිව්‍ය ලෝකය නොවෙයි, දිව්‍ය ලෝකයෙහි පරසතු මල් පිපෙන්නේය.එසේ හෙයින් මේ දිව්‍යලෝකය නොවෙ"යි දනිති. එකල්හි ඔහු "ජරා ශක්‍රයා අප සුරාවෙන් මත්කොට මහා සමුද්‍රයට දම්මා අපගේ දිව්‍ය ලෝකය ගත. එසේ හෙයින් අපි ඔහු හා සමග යුද්ධකොට අපගේ දිව්‍යපුරය ගනුම්හ"යි ටැඹක් ඔස්සේ නැගෙන්නා වූ කුහුඹුවන් මෙන් මහමෙර ඔස්සේ වටින් නැංගාහුය. එකල්හි ශක්‍රයෝ අසුරයන් විසින් පරදවන ලද්දාහු යෙල සියයක් යොදුන් (යොදුන් එකසිය පණහක්) පමණ ඇති වෛජයන්ත රථයට පැනනැගී දක්ෂිණ සමුද්‍රයාගේ (දකුණුදිග මුහුදෙහි) මතු මත්තෙන් යන්ට පටන් ගත්තාහුය. එකල්හී ඒ රථය මුහුදුපිටින් වේගයෙන් යන්නේ කොළඉඹුල් වනයට පැමිණියේය. ඒ ශක්‍රයන් යන්නා වූ මාර්ගයෙහි ඉඹුල් වනය තල් වනයක පතු (පත්‍ර) වැගිරෙන කලක් මෙන් කැඩී කැඩී මුහුදු පිට වැගිරෙන්නේය. ගරුඬපෝතකයෝ (ගුරුළු පැටවු) මුහුදු පිට පෙරළෙමින් මහහඬින් හැඬුවාහුය.

ඒ අසා ශක්‍රයෝ මාතලී නම් රථාචාර්‍ය්‍යයා අතින් විචාරන්නේ "සබඳ මාතලිය, ගරුඬ පැටවුන් අඬන අඬ ඇසෙන්නේය. මේ කුමන ශබ්දයක්දැ?"යි විචාළෝය. "ස්වාමීනි, නුඹවහන්සේගේ රථයේ වේගයෙන් ඉඹුල් වනය කැඩී වැගිරෙන

හෙයින් ගරුඬ පෝතකයෝ මරණ භයින් තැතිගෙන එකකොළාහල කොට හඬති''යි කීය. එබස් ඇසූ මහබෝසතාණෝ කියන්නෝ ''සබඳ මාතලිය, අප නිසා මොහු පීඩාවට නොපැමිණෙත්වයි, අපි ඓශ්වර්‍ය්‍යයක් නිසා ප්‍රාණ වධයක් නොකරම්හ, මොවුන් නිසා අපි ජීවිතය පරිත්‍යාග කොට අසුරයන්ට ජය දෙම්හ, මාතලිය, රථය නවත්වව''යි කිවුය. එබස් අසා මාතලී නම් දිව්‍ය රථාචාර්‍ය්‍යයා රථය වලකා අන්‍ය මාර්ගයකින් දිව්‍ය ලෝකයට අභිමුඛ කළේය. අසුරයෝ වනාහි ඒ රථය කරකැවුනා දැක ''ඒකාන්තයෙන් අන් සක්වළකින් ශක්‍රයෝ ආවාහුය. නැවත බලයක් ලදින් රථය වලක්කේවනර''යි මරණ භයින් භයපත්ව පලාගොස් අසුරභවනයට වන්නාහුය. ශක්‍රයෝත් දිව්‍ය ලෝකයට ගොස් දෙව්ලොව දෙවියන් පිරිවරණ ලදුව නුවර මධ්‍යයෙහි සිටියේය. එකෙණෙහි පොළොව පලාගෙන දහසක් යොදුන් උස ඇති වෛජයන්ත ප්‍රාසාදය පැනනැංගේය. ජයගෙන සිටි පසු පැනනැගී බැවින් 'වෛජයන්තය'යි කියා එම ප්‍රාසාදයට නම් විය. ඉක්බිත්තෙන් ශක්‍ර දේවේන්ද්‍රයෝ නැවත අසුරයන් නොඑන පිණිස පස් තෙනක රැකවල් ලැවුය. මහාමේරු පර්‍වතයාගේ ප්‍රථමාලින්දයෙහි (පළමුවන පිලෙහි) නාගයන් සිටුවූය. ද්විතීයාලින්දයෙහි ගරුඬන් සිටවූය. තෘතියාලින්දයෙහි දානව රාක්ෂයන් සිටවූය. චතුත්ථාලින්දයෙහි යක්‍ෂයන් සිටවුය. පංචමාලින්දයෙහි සතරවරම් මහරජදරුවන් සිටවූය. මෙසේ පඤ්චස්ථානයක ආරක්‍ෂාව තබා ශක්‍ර දේවේන්ද්‍රයෝ දිව්‍යසම්පත් අනුභව කරන්නාහුය.

එකල සුධර්මාවෝ මනුෂ්‍ය ලෝකයෙන් චුතව අවුත් ඒ ශක්‍ර දේවේන්ද්‍රයන්ටම පාදපරිචාරිකාව (භාර්‍ය්‍යාව වී) උපන්නාහුය. කැණිමඩල දුන් කුසලයෙන් ඒ සුධර්මාවන්ට පන්සියයක් යොදුන් උස ඇති සුධර්මා නම් මාණික්‍යසභාවක් (මැණික් වලින් නිමවූ රැස්වීම් ශාලාවක්) පහළ විය. ඒ දිව්‍ය සභාවෙහි ධවලච්ඡත්‍රය (සුදු කුඩය) යට යොදුනක් පමණ ස්වර්ණපර්‍ය්‍යංකයක (රන් පුටුවක) හිඳ ශක්‍ර දේවේන්ද්‍රයෝ දිව්‍ය මනුෂ්‍යායන්ගේ කාර්‍ය්‍යාකාර්‍ය්‍ය (කළයුතු නොකළයුතු) විචාරන්නාහුය. චිත්‍රාවෝත් චුතව ඒ ශක්‍ර දේවේන්ද්‍රයන්ටම පාදපරිචාරිකාව උපන්නාහුය. උයන කරවූ කුසලයෙන් ඔවුන්ට චිත්‍රා නම් උයනෙක් පහළ විය. නන්දාවෝත් චුතව අවුත් ඒ ශක්‍ර දේවේන්ද්‍රයන්ටම පාදපරිචාරිකාව උපන්නාහුය. පොකුණ කැණවූ කුසලයෙන් උන්ට නන්දා නම් පුෂ්පකරණියෙක් (පොකුණක්) පහළ විය. සුජාතාවෝ වූකලී කුසලයක් නොකළ බැවින් එක් වනයෙක කඳුරැළියෙක (ගලාබස්නා දියපාරක් අසල) කෙකිණියෙක්ව උපන්නාහුය. ශක්‍ර දේවේන්ද්‍රයෝ සුජාතාවන් නොදැක "කොතනැක උපන්නීදෝහෝ"යි පරීක්‍ෂා කරන්නෝ එහි උපන් නියාව දැන එතනට ගොස් ඒ කෙකිණ්න හැරගෙන දිව්‍ය ලෝකයට ගොස් සිත්කළු වූ දිව්‍යපුරයත් සුදර්මා නම් දිව්‍යසභාවත් චිත්‍රලතා වනයත් නන්දා නම් පුෂ්පකරණීයත් ඒ කෙකිණ්නට දක්වා මොහු හැම දෙනම කුසල්කොට මට පාදපරිචාරිකාව උපන්නාහුය. තෝ වූකලී කුසල් නොකොට තිරිසන් යෝනියෙහි උපන්නෙහිය, මෙතැන් පටන් ශීලසංරක්‍ෂණය කරව"යි අවවාදකොට පඤ්චශීලයෙහි

පිහිටුවා ඒ කඳුරැළියට ගෙනගොස් අළුවාහුය (හැරියෝය). ඒ කෙකිණිත් එතැන් පටන් පන්සිල් රක්නීය. ශක්‍ර දේවේන්ද්‍රයෝ කීපදවසක් ගියකල "මෝතොමෝ සිල් රක්නට සමර්ථ දේහෝ"යි විචසන පිණිස එතනට ගොස් මත්ස්‍යරූපයක් මවාගෙන බඩ පෑ (බඩ පැත්ත පෙන්වා) ඉදිරියෙහි වැදහොත්තාහුය. ඒ කෙකණී තොමෝ මළා වූ මත්ස්‍යයෙක් දේහෝයි සංඥායෙන් (හැඟීමෙන්) ඉගටිය ඩැහැගත මත්ස්‍යයා නගුට සෙලවි, එකල්හි ඒ කෙකිණී "මේ මත්ස්‍යයා ජීවත් වන්නේය"යි ඇරපුව. ශක්‍ර දේවේන්ද්‍රයෝ ඒ දැක "යහපත යහපත සිල් රක්නට තෝ සමර්ථයෙහිය"යි සාධුකාර දී ගියාහුය. ඒ කෙකණී එයින් චුතව බරණැස් නුවර කුඹල් කුලයක උපන. ශක්‍ර දේවේන්ද්‍රයෝ "කෙකිණී කොයි උපන්දේහෝ"යි පරීක්ෂා කරන්නාහු, කුඹල් කුලයෙහි උපන් නියාව දැන රන්කැකිරෙන් (රනින් කළ කැකිරි ගෙඩිවලින්) ගැලක් පුරාගෙන ගම් මධ්‍යයෙහි මහළු වේශයකින් ඉඳ "කැකිරි ගණුව"යි අඬගා කියති. මනුෂ්‍යයෝ අවුත් "ස්වාමීනි, දුන මැනව"යි කීහ.

ඒ අසා ශක්‍රයෝ කියන්නෝ "මම ශීලසංරක්ෂණය කරණ කෙනෙකුට දෙමි, තෙපි සිල් රකුදැ"යි විචාළෝය. එබස් ඇසූ මනුෂ්‍යයෝ "අපි සිල් රැකීම නම් කෙසේ වූ දෙයකැයි නොදනුම්හ, මිළයට දෙව"යි කිවාහුය. "මට මිළයෙන් ප්‍රයෝජනයක් නැත. සිල් රක්‍ෂා කරන කෙනෙකුන්ටම දෙමි"යි ශක්‍රයෝ කීවුය. මනුෂ්‍යයෝ "මේ තෙම යම්කිසි නළවන්නෙකැ"යි (වංචාකාරයෙකැයි) කියා ගියෝය.

සුජාතාවෝ එපවත් අසා “මට ගෙනඑන ලද්දේවනැ”යි ගොස් “ස්වාමීනි, දුනමැනව”යි කීය. “මැණියනි, සිල් රකුදැ”යි විචාළෝය. “එසේය රකිමි”යි කී කල්හි “මා විසින් මේ කැකිරි තොපට ම ගෙනඑන ලද්දේය”යි කියා ගැල හා සමග ඇගේ ගේදෙර තබා ගියෝය. ඒ ස්ත්‍රී ද දිවි පමණින් සිල් රක්‍ෂාකොට එයින් චුතව වෙපචිත්ති නම් අසුරේන්‍ද්‍රයාට දූව උපන. සිල් රැකි අනුසයින් විශිෂ්ට රූ ඇති වුව.

ඉක්බිත්තෙන් ඒ වෙපචිත්ති නම් අසුරෙන්ද්‍ර තෙමේ අසුරකන්‍යාව වැඩිවිය පැමිණි කල්හි “මාගේ දූ තමාට අභිප්‍රාය (රුචිවූ) පුරුෂයකු ගණුව”යි කියා අසුරයන් රැස් කරවීය. එකල්හි ශක්‍ර දේවේන්ද්‍රයෝ “ඒ සුජාතා දැන් කොයි උපන්නෝ දෝහෝ”යි පරීක්‍ෂා කරන්නෝ අසුරු භවනෙහි උපන් නියාව දැන “සුජාතාවන් අභිප්‍රාය වූ පුරුෂයකු ගනිමි”යි කියා “මා අල්වන්නීය”යි අසුරවේශයක් මවාගෙන ඒ අසුරයන් රැස්වූ තෙනට ගියෝය. එකල සුජාතාවන් සරහා අසුරයන් සමීපයට ගෙනවුත් “තොපට අභිප්‍රාය වූ වල්ලභයකු (සැමියෙකු) අල්වා ගනුව”යි කීහ. ඕ තොමෝ බලන්නී ශක්‍රයන් දැක පූර්ව ස්නෙහ වශයෙන් (පෙර කළ ආදරය වශයෙන්) “මේ මාගේ වල්ලභයාය”යි අත අල්වාගත. ශක්‍ර දේවේන්ද්‍රයෝ ඒ සුජාතාවන් ශක්‍රපුරයට ගෙනගොස් අඩතුන් කෙළක් නාටක ස්ත්‍රීන්ට (නිළියන් දෙකෝටි පනස් ලක්‍ෂයකට) ප්‍රධානකොට තබා සම්පත් අනුභව කරන්නාහු ආයු පමණින් සිට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය.

ශාස්තෘන් වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා “මහණෙනි, පෙර නුවණැත්තෝ දිව්‍යරාජ්‍යය කරන්නාහු තමන්ගේ ජීවිතය පරිත්‍යාගකොට ප්‍රාණඝාත නොකොළෝ වේද? තෝ වූකලී මෙබඳු වූ නෛර්‍ය්‍යාණික ශාසනයෙහි මහණව ප්‍රාණීන් සහිත නොපෙරූ පැන් අනුභව කෙළෙහි වේදැ”යි ඒ භික්ෂුහට නින්දාකොට පූර්‍වාපර සන්ධි ගළපා මේ ‘කුලාවක ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි මාතලී සංග්‍රාහක (මාතලී රියැදුරා) නම් මෙසමයෙහි ආනන්ද ස්ථවිරයෝය. එසමයෙහි ශක්‍ර දේවේන්ද්‍රව උපන්නෙම් නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 032. නච්ච ජාතකය

තවද එක් සමයෙක්හි සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසනසේක් බහුභාණ්ඩික (බොහෝ පිරිකර බඩු ළඟ තබාගෙන සිටි) එක් භික්ෂු කෙනෙකුන් අරභයා මේ ජාතකය වදාළසේක.

මෙහි වර්තමාන කථාව යට කියනලද ‘දේවධර්‍ම ජාතකයෙ’හි කියනලද්ද හා සදෘශය(සමානය). සර්‍වඥයන් වහන්සේ ඒ මහණහට වදාරණසේක් “මහණ, තෝ බහුභාණ්ඩික වූයේ සැබෑද? කිම්දැ”යි වදාළසේක. “ස්වාමීන් වහන්ස, එසේය”යි දැන්වූ කල්හි “කවර කාරණයෙකින් තෝ බහුභාණ්ඩික වූයෙහිදැ”යි වදාළසේක. ඒ මහණතෙම

මෙපමණක් අසාම කිපුනේ අඳනා පොරෝනා(අඳින පොරවන) සිවුරු දමා "දැන් මේ ආකාරයෙන් හැසිරෙමි"යි කියා සර්‍වඥයන් වහන්සේ අභිමුඛයෙහි නග්නව (නිර්වස්ත්‍රව) සිටියේය. මනුෂ්‍යයෝ ඕහට "නින්ද වේව"යි කීවාහුය. එතෙම එයින් දිවගොස් ගිහි වූයේය.

භික්ෂූහු දම්සභා මණ්ඩපයෙහි රැස්ව උන්නාහු "බුදුරජාණන් වහන්සේගේ ඉදිරියෙහි මෙබන්දක් කෙළේය"යි කියා ඔහුගේ නුගුණ කථාව කීවාහුය. බුදුරජාණන් වහන්සේ එතනට වැඩ වදරා "මහණෙනි, මේ දම්සභාවෙහි මා එන්නට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උන්නාහුදැ"යි භික්‍ෂූන්ගෙන් විචාරා වදාළසේක. "ස්වාමීන් වහන්ස, ඒ භික්‍ෂූන් වහන්සේ නම් නුඹවහන්සේගේ ඉදිරියෙහි සිවුවණක් පර්ෂත් මධ්‍යයෙහි(භික්‍ෂු, භික්‍ෂුණී, උපාසක, උපාසිකා යන සිවු පිරිස මැද) හිරිඔතප්(ලජ්ජා භය) දෙක හැර ගම් ළදරුවෙකු මෙන් නග්නව සිට මනුෂ්‍යයන් විසින් පිළිකුල් කරනු ලබන්නේ ගිහිව ශාසනයෙන් පිරිහුනේ යයි කියා ඔහුගේ නුගුණ කථාව කිය කියා උනුම්හ"යි දැන්වූහ. සර්‍වඥයන් වහන්සේ "මහණෙනි, ඒ මහණ හිරිඔතප් නැතිව සර්‍වඥ ශාසනයෙන් පිරිහුනේ දැන්මතු නොවෙයි, පූර්වෙහි ස්ත්‍රී රත්න ප්‍රතිලාභයෙන්ද (උතුම් කාන්තාවක් ලබාගැනීමෙන්ද) පිරිහුණේයැ"යි වදරා ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස ප්‍රථම කල්පයෙහි සිව්පාවෝ සිංහයකු රජ කළාහුය. මත්ස්‍යයෝ ආනන්ද නම් මත්ස්‍යයා රජ කළාහුය.

පක්ෂිහු ස්වර්ණ නම් හංසයා රජ කළාහුය. ඒ ස්වර්ණහංසයාගේ වනාහි ධීතෘවූ(දියණියවූ) හංස පොතිකාව විශිෂ්ට රූ ඇත්තීය. හංස රාජතෙම ඒ හංස ධෙනුවට වරයක්(රිසි දෙයක් ඉල්ලීමේ අවසරයක්) දුන්නේය. ඕ තොමෝ තමාගේ සිතට රුචි වූ ස්වාමියකු ප්‍රාර්ථනා කළාය. හංස රාජතෙම තමාගේ දුවණියනට වරයදී හිමාලය වනයෙහි සියලු පක්ෂීන් රැස්කර වූයේය. අනේකප්‍රකාරවූ හංස, මයුරාදී පක්ෂි සමූහයෝ රැස්ව එක් මහත් වූ පහණතෙලෙක්හි(ගල්තලාවෙක්හි) රැස්වූවාහුය. හංස රාජතෙම "තමහට සිත්කළු වූ ස්වාමියෙකු අවුත් ගන්ව"යි කියා දුවණියන් කැඳවූයේය. හංස ධේනුතොම පක්ෂි සමුහයා බලන්නී මැණික්වන් ග්‍රීවය ඇති විසිතුරු පත් ඇති මයුරයකු දැක "මේ තෙම මට ස්වාමි වේවා"යි කැමතිවුවාහුය. පක්ෂි සමූහයෝ මයුරයා කරා එළඹ මෙසේ කීවාහුය. "යහළු මයුරය, මේ හංස රාජයාගේ දුවණියෝ මෙපමණ පක්ෂීන්ගේ මධ්‍යයෙහි ස්වාමියෙකු කැමතිවන්නී තොප කැමතිවූවාය"යි කිවාහුය. එවේලෙහි මයුරතෙම "දැන්ම වනාහි මාගේ බලය නුදුටුයෙහිදැ"යි කියා ඉතා සතුටුව හිරිඔතප් දෙක බිඳ පළමුකොට මහත් වූ පක්ෂි සමූහයාගේ මැද පක්ෂ පත්‍රයන් දිගුකොට නටන්නට පටන් ගත්තේය. නෘත්‍ය කරණුයේ(නටමින්) නොසැඟවුනා වූ වර්චස් මාර්ගය (ගුද මාර්ගය) ඇති වූයේය.

ස්වර්ණහංස රාජතෙම ලජ්ජාවට පැමිණියේ "මොහුට අධ්‍යාත්මිකව(සිතතුලින්) පහළවන්නා වූ හිරිද නැත්තේය, බාහ්‍යව(බාහිර වශයෙන්) පවත්නා වූ භයද නැත්තේය.

හිරිඔතප් දෙක බිඳුනා වූ මොහුට මාගේ දුවණියන් නොදෙමි"යි කියා පක්ෂි සමූහයා මධ්‍යයෙහි මෙසේ කීසේක. "මයුරය, තාගේ ශබ්දය මනොඥය(සිත්කළුය), පිටත සිත්කළුය, ග්‍රීවයද වෛඩුර්‍ය්‍ය මාණික්‍යයෙහි(දියමන්ති මැණිකෙහි) වණී හා සදෘශය, තාගේ පිච්ඡභාරයෝද ව්‍යාමමාත්‍රයහ(බඹයක් පමණ දිගය), මෙසේ රූපී වූවද හිරිඔතප් දෙක බිඳ නෘත්‍ය කළ හෙයින් මෙබඳු ලජ්ජා නැත්තා වූ තොපට මාගේ දුව නෙදෙමි"යි කියා හංස රජ එම පර්ෂත් මධ්‍යයෙහිම තමාගේ බෑනා වූ හංස පොතකයාහට තමාගේ දුවණියන් වූ හංස ධේනුව දුන්සේක. මයුර තෙම හංස පෝතිකාව නොලැබ ලජ්ජාව එයින් පැන නැගී ගියේය. හංස රජ ද තමා වසන තැනටම ගියේය.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ "මහණෙනි, මේ මහණ හිරිඔතප් දෙක බිඳ රත්න ශාසනයෙන් (මාහැගගි බුදුසස්නෙන්) පිරිහුනේ දැන්මතු නොවෙයි පෙරත් ස්ත්‍රී රත්නය ලැබීමෙන්ද පිරිහුනේමය"යි වදාරා මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා පූර්වාපර සන්ධි ගලපා මේ 'නච්ච ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි මයුරතෙම දැන් මේ බහුභාණ්ඩික මහණ වූයේය. හංස රාජව උපන්නෙම් වනාහී තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වෙම්දැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 033. සම්මොදමාන ජාතකය

තවද එක් සමයෙක්හි ශාක්‍යකුලතිලක වූ(ශාක්‍ය වංශය අලංකාර කරන්නා වූ) බුදුරජාණන් වහන්සේ කිඹුල්වත්පුරය ආශ්‍රයකොට(සමීපයෙහි වූ) නිග්‍රෝධාරාමයෙහි වැඩවාසය කරණසේක් සුඹුළු ඩබරක් (ගැහැණුන් පිළිබඳ ආරාවුලක්) අරභයා මේ ජාතකය වදාළසේක. එය 'කුණාල' ජාතකයෙහි මතු ප්‍රකාශ වන්නේය.

ඒ කාලයෙහි වනාහි බුදුරජාණන් වහන්සේ නෑයන්ට ආමන්ත්‍රණය කොට "මහරජදරුවෙනි, නෑයන්ගේ ඔබ්මොබ විවාද කිරීම නම් නුසුදුසුය. තිරශ්චීනගතයෝද පූර්වභාගයෙහි සාමග්‍රිව(තිරිසන් සත්තුද පෙර සමගිව) වසන්නාහු පසමිතුරන් මැඩපැවත(විරුද්ධකාරයින් පරදවා) යම්දවසක විවාද කළාහුද, එකල්හි මහත් විනාශයට පැමිණියාහුය"යි වදරා නෑරජදරුවන් විසින් යාච්ඤා කරන ලදුව ඉකුත්වත් කථාව දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහබෝසතාණන් වහන්සේ වටුජන්මයෙහි ඉපිද(වටුවකුව ඉපිදා) නොයක් දහස් ගණන් වටුවන් පිරිවරකොට ඇතිව අරණ්‍යයෙහි (වනයෙහි) වසනසේක. එකල්හි එක් වටුවැද්දෙක් ඒ වටුවන් වසන තැනට ගොස් වටුවන්ගේ හැඬිම(ශබ්දය) කොට ඔවුන් රැස්වූ බැව්දැන ඔවුන්ගේ මත්තෙහි දැල් දමා කෙළවරෙහි පටන් මඩිමින් සියල්ලවුන් එක්තැන්කොට පැස (පෙට්ටිය) පුරවා

ගෙට ගොස් ඒ පැටවුන් විකොට(විකුණා) ඒ මිලයෙන් ජීවිකාව කරන්නේය. ඉක්බිත්තෙන් එක් දවසක් බෝධිසත්‍වයන් වහන්සේ ඒ වටුවන්ට කියනසේක් "මේ පක්‍ෂිවැද්දතෙම අපගේ නෑයන් විනාශයට පමුණුවන්නේය. මේතෙම යමක් විසින්(යම් උපායක් නිසා) අප අල්ලාගන්නට නොහැකි වන්නේද, මම එබඳු එක් උපායෙක් දනිමි. අද මෙතැන් පටන් මේ වැද්දා විසින් තොපගේ මත්තෙහි දැල් දැමූ කල්හි එකෙක් එකෙක් එකෙකි දැල්ඇසෙක්(එක් එක් දැල් සිදුරක) හිස තබා දැල ඔසවා කැමති තැනකට ගෙනගොස් එක් කටුලැහැබෙක්හි බහව(දමනු) එසේ දැමූ කල්හි යට ඒ ඒ තැනින් දිවම්හ"යි කීසේක. ඒ සියල්ලෝ "යහපතැ"යි කියා පිළිගත්තාහුය.

දෙවැනි දිනයෙහි මත්තෙහි දැල දැමූ කල්හි බෝධිසත්‍වයන් විසින් කියනලද ක්‍රමයෙන් ම දැල ඔසවා එක් කටුලැහැබෙක්හි බහා තුමු යටි දිසාවෙන් ඒ ඒ තැනින් දිව ගියාහුය. ලැහැබින් දැල මුදාගන්නා වූ වටුවැද්දාහට විකාලය (හවස්) වූයේය. ඒ තෙම හිස් අතින්ම ගියේය. දෙවැනි දිනයෙහි පටන් වටුවෝ එසේම කරන්නාහුය. ඒ වැදිද සූර්යාගේ අස්තංගමනය(ඉර බැසීම) දක්වා දැල මුදමින් කිසිවක් නොලැබ සිසතින්ම ගෙට යන්නේ. ඉක්බිත්තෙන් ඔහුගේ භාර්යාව කිපී "තොපි දවසක් පාසා සිසතින් එන්නෙහිය, අනිකුදු තොපගේ පිටත රක්‍ෂාකරන තැනෙක්(අන් බිරියක්) ඇතැයි සිතමි"යි කීවාය.

වැදිතෙම කියනුයේ "සුන්දරාංගනිය,(යහපත් අඟපසඟ ඇත්තිය) මට අන් රක්‍ෂාකරන තැනක් නැත්තේය, වැලිදු වනාහි ඒ වටුවෝ සමගිව හැසිරෙති. මා විසින් දැල දැමූ පමණකින්ම දැල ගෙන කටුලැහැබෙක්හි දමා යන්නාහුය. ඔහු හැම කල්හිම සමගිව වාසය නොකරති. තෙපි නහමක් සිතව(තෙපි ඒ ගැන නොසිතන්න), යම් දවසක ඔහු විවාදයට පැමිණියාහුද, එකල්හි ඒ සියල්ලවුන් ම මරා තිගේ මුහුණ සතුටු කරවමින් ගෙන එන්නෙමි"යි කියා "වටුපක්‍ෂීහු විවාද නොකරන්නාහු දැල ගෙනයති, ඒ පක්‍ෂිහු යම් කලෙක්හි විවාද කෙරෙද්ද එකල්හි මාගේ වසඟබවට පැමිණෙති. එකල්හි ඔවුන් ගෙන තිගේ මුහුණ සතුටු කරවමින් එමි"යි කියා භාර්යාව අස්වැසුයේය.

කීපදවසක් ඇවෑමෙන් එක් වටුවෙක් ගොදුරු බිමට බස්නේ නොසලකා(අත්වැරැද්දකින්) අනිකක්හුගේ ඉස ඇක්මවිය(පෑගුනේය). අනික් වටුවා "මාගේ හිස කවරෙක් ඇක්මීදැ"යි කියා කිපුනේය. "මම නොසලකා ඇක්මවීමි, නොකිපෙව"යි කී කල්හිද කිපුනේමය. ඔහු නැවත නැවත කියන්නාහු "තෙපිම දැල ඔසවන්නෙහි යයි සිතමි" කියා ඔවුනොවුන් විවාද කළාහුය. ඔවුනොවුන් විවාද කරන කල්හි බෝධිසත්‍වයන් වහන්සේ "විවාද කරන්නවුන් කෙරෙහි යහපතෙක් නම් නැත්තේය, දැන්ම ඔහු දැල නොඋසුලන්නාහු එයින් මහත් විනාශයට පැමිණෙති, වැදිතෙම අවසර(ඉඩ) ලබන්නේය, මා විසින් මෙතැනිහි වසන්ට නොහැකිය"යි

සිතූසේක. බෝධිසත්ත්වයන් වහන්සේ තමන් පර්ෂිත්(සිය පිරිස) ගෙන අන්තැනකට ගියසේක.

වටුවැද්ි වනාහි කීපදවසකින් අවුත් වටුහඬින් හඬා, රැස්වූ ඔහුන්ගේ මුදුනෙහි දැල බැහුයේය. ඉක්බිත්තෙන් එක් වටුවෙක් "දැල උසුලන්නා වූ තාගේ වනාහි මස්තකයෙහි රෝමයෝ පතිතවූහ(හිස කෙස් ගැළවී වැටුණේය), දැන් ඔසව"යි කීයේය. අනිකෙක් "දැල ඔසවන්නා වූ තාගේ වනාහි පක්‍ෂපත්‍ර දෙකෙහි පත්‍රයෝ පතිත වූවහුට(පියාපත් දෙකෙහි පිහාටු ගිලහී ගියේය), දැන් උසුලව"යි කීයේය. මෙසේ ඔවුනොවුන් "තෝ උසුලව, තෝ උසුලව"යි කියද්දීම වැදිතෙම දැල ඔසවා සියලු වටුවන් එක්කොට පැස පුරා භාර්යාව හාස්‍ය කරවමින් ගෙට ගියේය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ "මෙසේ මහරජ, නෑයන්ගේ ඩබර නම් නුසුදුසුය. ඩබර කිරීම් විනාශයට කාරණය"යි මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා පූර්‍වාපර සන්ධි ගළපා මේ 'සම්මොදමාන ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි නුවණ නැති වටුවා නම් දැන් මේ දෙවදත්ත ස්ථවිරයෝය. ප්‍රඥාවන්ත වටුව උපන්නෙම් වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක

# 034. මත්ස්‍ය ජාතකය

තවද එක් සමයෙක්හි ලොකාලොකදිවාකර වූ(ලෝකය ආලෝක කරන සූර්‍ය්‍යයා බඳුවූ) තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසනසේක් පුරාණ දුතියිකාපලෝභනයක්(පැරණි භාර්‍ය්‍යාව කෙරෙහි කළ ආලයක්) අරභයා මේ ජාතකය වදාළසේක.

එසමයෙහි සර්‍වඥයන් වහන්සේ ඒ භික්ෂූහට "සැබෑද? මහණ, තෝ උකටලී වීදැ"යි විචාළසේක. "සැබෑව ස්වාමීනි" දැන් වූ කල්හි "කවුරුන් විසින් උකටලී කරන ලද්දේදැ"යි විචාළසේක. "ස්වාමීනි, මාගේ පුරාණ භාර්‍ය්‍යාතොමෝ මා කෙරෙහි බලවත් වූ සෙන්හ ඇත්තීය, එසේ හෙයින් ඈ ඇරපියන්ට අසමර්ත්‍ථයෙමි"යි කීය. ඉක්බිත්තෙන් සර්‍වඥයන් වහන්සේ ඕහට වදාරණසේක් "මහණ, ඒ ස්ත්‍රී අනර්ත්‍ථකාරිණීය, පෙරත් තෝ ඈ නිසාම මරණයට පැමිණ මා නිසා මරණින් මිදුනෙහි වේදැ"යි වදරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහබෝසතාණෝ ඒ රජ්ජුරුවන්ට පුරෝහිතව උපන්නාහුය. එසමයෙහි කෙවුලෝ(ධීවරයෝ) ගඟට දැල් දැමුය. ඉක්බිත්තෙන් එක් මහා මත්ස්‍යයෙක් රතික්‍රීඩා වශයෙන් තමාගේ මත්ස්‍යධෙනුව හා සමග කෙළිමින් එන්නේය. ඔහුගේ ඒ මත්ස්‍යධෙනුතොමෝ පෙරත්තුව(ඉදිරියෙන්) යන්නී ජලගන්‍ධය(දැලෙහි ගඳ) ආඝ්‍රාණය කොට දැල වළහා ඉවතින් ගියාය. ඒ කාමයෙහි

ගිජු වූ ලොල් මත්ස්‍යයා දැල් කුසයටම (දැලතුළටම) වන්නේය. කෙවුලෝ ඔහු දැලටවන් නියාව දැන දැල ඔසවා මත්ස්‍යායා ගෙන නොමරා වැලිමත්තට දමා "මොහු අඟුරේම පලහා(ගිනි අඟුරුවලින් පුළුස්සා) කම්හ"යි ගිනිකොට අඟුරු බසිති (පිළියල කරති), උල් සසිති, මත්ස්‍යයා "ඒ අඟුරේ පැලහීමවත්, උලින් ඇනීමවත්, අනිත් දුකෙක්වත් මට පීඩා නොකරන්නේය. ඒ මත්ස්‍යධෙනුතොමෝ 'මාගේ ස්වාමි වූ මත්ස්‍යයා අන් මත්ස්‍යධේනුවක හා සමඟ ගියෝ දේ හෝ'යි යම් දෙම්නසකට පැමිනේ නම් ඒ මට පීඩා කරන්නේය"යි වැලි මත්තේ වැදහෙව අඬනේය.

එසමයෙහි පුරෝහිත බමුණානෝ තමන්ගේ පරිවාර සමූහයා විසින් පිරිවරණ ලදුව නහන පිණිස ගංතෙරට අවුය. ඒ මහබෝසතානෝ වූකලී සියලු සත්‍වයන්ගේ බස්(සියලු සත්‍ව භාෂාවන්) දනිති. එසේ හෙයින් ඒ මත්ස්‍යයා අඬන අඬ අසා සිතන්නෝ "මේ මත්ස්‍යයා කාමරතියෙන්(කාමාශාවෙන්) අඬන්නේය, මෙසේ ක්ලෙශාතුර වූ(කෙලෙස් ලෙඩ සැදුනු) සිත් ඇතිව මියන්නා වූ මේතෙම නරකයෙහි උපදින්නේය, එසේ හෙයින් මම ඕහට පිහිට වෙමි"යි කෙවුලන් සමීපයට ගොස් කියන්නෝ "එම්බා පින්වත්නි, තෙපි අපට එක දවසකුත් ව්‍යඤ්ජනයකට මත්ස්‍යයෙකු නොදෙව්දැ?"යි කිවුය. එබස් ඇසු කෙවුලෝ කියන්නෝ "ස්වාමීනි, කුමක් කියන සේක්ද? නුඹවහන්සේ කැමති මත්ස්‍යයෙකු ඇරගෙන ගිය මැනවැ"යි කිවුය. මහබෝසතාණෝ කියන්නෝ "අපට අන් මත්ස්‍යයෙකුගෙන් ප්‍රයෝජන නැත. මේ මත්ස්‍යයාම දෙව"යි

කිවුය. කෙවුලන් විසින් “ගතමැනව ස්වාමීනි” කී කල්හි මහබෝසතාණෝ ඒ මත්සයා දෑතින් ඔසවාගෙන ගංතෙර හිඳ “එම්බල මත්ස්‍යය, ඉදින් මම තා අද නුදුටුයෙම් වීම් නම් මරණයට පැමිණෙන්නෙහි වේදැ”යි “මෙතැන් පටන් ක්ලෙශවසඟ නොවෙව”යි අවවාදකොට ඒ මත්ස්‍යාය දියට හැර නුවරට වන්නාහුය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා වදරා චතුස්සත්‍යය ප්‍රකාශකොට වදාළසේක. චතුස්සත්‍යය ධර්‍මදේශනාවගේ කෙළවර උකටලී මහණ සෝවාන් පෙලෙහි පිහිටිසේක. සර්‍වඥයන් වහන්සේත් පූර්‍වාපර සන්ධි ගළපා මේ ‘මත්ස්‍ය ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි මත්ස්‍යධෙනුව නම් දැන් පුරාණ දුතියිකාය, මත්ස්‍ය නම් උකටලී මහණය, පුරෝහිත බ්‍රාහ්මණ නම් තිලෝගුරු සමයක් සම්බුදුරජ වූ මම්ම වේදැ”යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 035. වට්ටක ජාතකය

තවද එක් සමයෙක්හි සද්ධර්‍මකේතුක වූ(සද්ධර්මයට කොඩියක් වැනි වූ) තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මගධරට සැරිසරා ඇවිදිනාසේක් ලැවුගිනි නිවීමක් අරභයා මේ ජාතකය වදාළසේක.

එක් සමයෙක්හි සර්‍වඥයන් වහන්සේ මගධරට සැරිසරා ඇවිදිනාසේක් එක්තරා මගධ ග්‍රාමයක පිඬුසිඟා ඇවිද වළඳ

ඉක්බිති භික්ෂු සමූහයා පිරිවරා මගට පිළිපන්සේක. එසමයෙහි මහත් වූ ලැව්ගින්නෙක් නැංගේය. ඉදිරියෙහිත් පස්සෙහිත් බොහෝ භික්‍ෂූහුය. ඒ ලැව්ගිනි ඒකධූමව එකජ්වාලව (එකම දුම්කඳක් ගිනිකඳක් ලෙස) මැඩගෙණ එන්නේය. එතැන්හි සමහර පෘථජ්ජන භික්‍ෂු කෙනෙකුන් වහන්සේ මරණ භයින් භයපත්ව "මේ එන ගින්නට අපි ඉදිරියෙහි ගිනි ලම්හ, මේ ගින්නෙන් දගියතැන් ලැව්ගිනි නොදවන්නේය"යි කියා ගිනිදඬු මැත්කොට(ගිනි උපදවීමට ගන්නා ලී දඬු රැගෙන) ගිනි ගානසේක (ගිනි ඉපදවීමට අතුල්ලති).

ඒ දැක සමහර භික්ෂු කෙනෙකුන් වහන්සේ මෙසේ කීසේක "ඇවැත්නි, තෙපි කුමක් කරව්ද? ආකාශ මධ්‍යයෙහි සිට චන්ද්‍ර මණ්ඩලයත්, නැගෙනහිර සක්වලින් නැගෙන්නාවූ දහසක් රස්මීන් හෙබියා වූ සූය්‍ර්‍යමණ්ඩලයත්, වේලාන්තයෙහි(වෙරළෙහි) සිට සමුද්‍රයත් මහමෙර සමීපයෙහි සිට මහමෙරත් නොදත්තවුන් මෙන් දෙව්මිනිසුන් සහිත වූ ලොවට අග්‍ර පුද්ගල වූ තොප හා සමග යන්නා වූ සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ නොබලා 'පටග්ගි දනය (ප්‍රතිවිරුද්ධ ගින්නක්) දෙම්හ'යි කියව, බුදුබල නොදනුව, වර තොපි බුදුන් සමීපයට යම්හ"යි කියා ඉදිරියෙහිත් යන්නාවූ ඒ සියලු භික්‍ෂූන් වහන්සේම එක්ව දශබලධාරී වූ බුදුරජාණන් වහන්සේ සමීපයට ගියසේක. සර්‍වඥයන් වහන්සේ මහත් වූ භික්ෂූසංඝයා පිරිවරා එක්තරා ප්‍රදේශයක වැඩ සිටිසේක. එකල ලැව්ගිනි මඩනාක් මෙන් බුරමින් එන්නේය. මෙසේ එන්නා වූ ලැව්ගිනි බුදුන් සිටි තැනට පැමිණ ඒ ප්‍රදේශයට හාත්පසින් සොළොස්

කිරියක්(කිරි දහසයක් එනම් වී බුසල් තුන්සිය විස්සක ප්‍රමාණය ලබාදෙන වපසරිය ඇති ප්‍රදෙසක්) පමණ තැනට පැමිණ දියෙහි ගලා නිවාපු තණ සුලක් මෙන් නිවිගියේය. එකල්හි භික්‍ෂූන් වහන්සේ බුදුන්ගේ ගුණ කියන්නට පටන් ගත්සේක.

"සර්‍වඥයන් වහන්සේගේ ගුණ නම් ඉතා ආශ්වර්‍ය්‍යය, නොදත හැක්කේය. මේ සිත් පිත් නැති ගිනි පවා බුදුන් සිටි තැන් මැඩගෙණ එන්ට අසමර්ථ විය. දියෙහි ගලාපු තණ සුලක් මෙන් නිවී ගියේය. සර්‍වඥවරයන්ගේ ආනුභාව නම් ඉතා ආශ්වර්‍ය්‍යය"යි මෙසේ බුදුගුණ කියන්ට පටන් ගත්සේක. සර්‍වඥයන් වහන්සේ ඒ භික්‍ෂූන්ගේ කථාව අසා "මහණෙනි, මේ භූමි ප්‍රදේශයට පැමිණ මේ ගිනි නිවියේ නම්, මේ මාගේ දැන් බල නොවෙයි, මේ වූකලි මාගේ පුරාතනයෙහි සත්‍යක්‍රියා බල වන්නේය. මේ ප්‍රදේශය මේ කප මුළුල්ලෙහි ගින්නෙන් නොදැවෙන්නේ, මෙය කල්පස්ථායි(කල්පයක් මුළුල්ලෙහි පවත්නා) ප්‍රාතිහාර්‍ය්‍යයෙක් වන්නේය"යි වදාළසේක.

එකල්හි ආයුෂ්මත් වූ ආනන්ද මහා තෙරුන් වහන්සේ බුදුන් වැඩ හිඳිනා පිණිස සඟල සිවුර(දෙපට සිවුර) සතරපට කොට පැණවූසේක. එහි සර්‍වඥයන් වහන්සේ පළක් බැඳ වැඩහුන්සේක. භික්ෂුසංඝයා වහන්සේත් බුදුන් පිරිවරා වැඩහුන්සේක. එකල්හි භික්ෂූන් විසින් "ස්වාමීනි, මේ වූකලි අපට ප්‍රකාශය. අතීත කථාව භවයෙන් පටිච්ඡන්න(වැසී ඇති) හෙයින් අප්‍රකාශය. ඒ අතීත කථාව අපට ප්‍රකාශකොට වදාළ

මැනවැ"යි භික්ෂූන් විසින් ආරාධිත වූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස මගධරට එම ප්‍රදේශයෙහි බෝධිසත්ත්වයෝ වටු යෝනියෙහි පිළිසිඳගෙන මව්කුසින් බිහිව බිජුවට ගසාගෙන(බිත්තරය පලාගෙන) නික්මුණු කල්හි මහත් වූ පෙදවට සා(බොලයක් පමණ වූ) පමණ වටුපැටවෙක් වූයේය. ඉක්බිත්තෙන් ඔහු දෙමව්පියෝ කැදැල්ලේ වැදහොවා මුවතුඩින් ගොදුරු ගෙණවුත් පෝෂ්‍ය කෙරෙති.

ඒ බෝධිසත්ත්වයන්ට පක්ෂප්‍රහාර කොට(අත්තටු ගසා) ආකාශයෙන් යන්ට නිසි බලයෙක්වත් දෙපස ඔසවා ගොඩ ගමන් කරන්ට බලයෙක්වත් නැත. ඒ ප්‍රදේශය ද අවුරුද්දක් අවුරුද්දක් පාසා ලැව්ගිනි ගන්නේය. ඒ ලැව්ගිනි එසමයෙහිත් මහහඬින් බුරමින් ඒ ප්‍රදේශයෙහි ගිනි ගත්තේය. ඒ දැක පක්ෂි සමූහයා තම තමන්ගේ කැදැල්ලෙන් නික්ම මරණ භයින් භයපත්ව හඬමින් යන්නාහුය.

බෝධිසත්ත්වයන්ගේ දෙමව්පියෝ මරණ භයින් භයපත්ව බෝධිසත්ත්වයන් හැරපියා පලා ගියාහුය. බෝධිසත්ත්වයෝ කැදැල්ලේ වැදහෙවම කර ඔසවා මැඩගෙණ එන්නා වූ ලැව්ගිනි දැක මෙසේ සිතූය "ඉදින් මට පක්ෂප්‍රහාර කොට ආකාශයෙන් යන්ට කිසි බලයෙක් වේනම් ආකාශයට පැනනැගී අනික් තැනකට යෙමි, මාගේ දෙමව්පියෝත් මරණ භයින් භයපත්ව මා උදකලාකොට හැර තමන් රැකෙමින්

ගියෝය. දැන් මට අන් පිළිසරණෙක් නැත, සරණයක් පිහිටක් නැත්තේම් මා විසින් අද කුමක් කටයුතුදෝ”යි සිතූහ.

තවද බෝධිසත්‍වයන්ට එකල මෙසේ වූ සිතිවිල්ලක් වුයේය. “මේ ලෝකයෙහි ශීලගුණ නම් වූ දෙයක් ඇත. සත්‍යගුණ නම් වූ දෙයක් ඇත. යටගිය දවස පාරමීධර්‍මයන් පුරා බෝමැඩ හිඳ සම්‍යක් සම්බෝධිඥනසමධිගමනය (බුදුනුවණ ලබා ගැනීම) කළා වූ ශීල සමාධි ප්‍රඥ විමුක්ති විමුක්තිඥන දර්ශනයෙන් යුක්ත වූ සියල්ලන් කෙරෙහි පතළා වූ මෛත්‍රී කරුණා ක්‍ෂාන්තියෙන් යුක්ත වූ සියලු සත්‍වයන් කෙරෙහි සමව පැවැත්තා වූ මෛත්‍රී භාවනාව ඇති සර්‍වඥවරයෝ නම් ඇත. ඔවුන් විසින් ප්‍රතිවෙධ(අවබෝධ) කරනලද ගුණධර්ම නම් දෙයක් ඇත. මා කෙරෙහිත් එක් සත්‍යයක් ඇත. එසේ හෙයින් අතීතයෙහි උපන්නා වූ සර්‍වඥවරයන් හා ඔවුන් විසින් ප්‍රතිවේධ කරනලද ගුණධර්‍මය ආවර්ජනයකොට(සිහිකර බලා) මා කෙරෙහි විද්‍යාමාන වූ සත්‍යය සත්‍යක්‍රියා කොට ගිනි වළකා අද මා විසින් මටත් සෙසු පක්ෂීන්ටත් ස්වාස්ථයක්(යහපතක්) කිරීම වටනේය”යි සිතූය.

ඉක්බිත්තෙන් බෝධිසත්‍වයෝ අතීතයෙහි පිරිනිවියා වූ සර්‍වඥයන් වහන්සේගේ ගුණ සලකා තමන් කෙරෙහි විද්‍යමාන වූ සත්‍ය ස්වභාවය උදෙසා සත්‍යක්‍රියා කරන්නාහු මෙසේ කිවුය.

“ඉදින් මාගේ පක්ෂපාත්‍රයන් විද ආකාශයෙහි නොයාහැකි බවත්, හස්තපාදයන් ඇති බවත්, ඔසවා නොයාහැකි බවත්,

දෙමව්පියන් මා කැදැල්ලේම දමා ගිය බවත් සත්‍යයද ඒ සත්‍යයෙන් ජාතවේදය(ගින්න) ඉවත්ව යා”යි කියා කැදැල්ලෙහි වැදහෙව සත්‍යක්‍රියා කළෝය. ඒ බෝධිසත්ත්වයන්ගේ සත්‍යක්‍රියා හා සමග සොළොස් කිරියක් පමණ තැන් නිවී ගිනි ඉවත්ව ගියෝය. ගිනි පසු බස්නේ දවාගෙන වනයට නොගියේය. වැලි කුමක් කළෝද? යත්, දියෙහි ගලාපු තණ සුලක් මෙන් එතැන්හිම නිවී ගියේය. ඒ මහබෝධිසත්ත්වයන් විසු වාසස්ථානය මේ කප මුළුල්ලෙහි ගින්නක් වැද නොගන්නා බැවින් කල්පස්ථායි වූ ප්‍රාතිහාර්‍ය්‍ය නම් විය.

මෙසේ මහබෝසතාණෝ සත්‍යක්‍රියා කොට ජීවිතාන්තයෙහි කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය. ශාස්තෲ වූ බුදුරජාණන් වහන්සේ “මහණෙනි, මේ වනය ගින්නෙන් නොදැවීම දැන් මාගේ බලයෙක් නොවෙයි. පුරාතනයෙහි වටුව උපන්කල මාගේ සත්‍යක්‍රියා බලයෙකැ”යි මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා වදාරා චතුස්සත්‍ය ප්‍රකාශ කළසේක. චතුස්සත්‍යායාගේ කෙළවර සමහර කෙනෙකුන් වහන්සේ සෝවාන් වුසේක. සමහර කෙනෙකුන් වහන්සේ සකෘදාගාමී වූසේක. සමහර කෙනෙකුන් වහන්සේ අනාගාමී වූසේක. සමහර කෙනෙකුන් වහන්සේ රහත් වූසේක. බුදුරජාණන් වහන්සේ පූර්‍වාපර සන්ධි ගලපා මේ ‘වට්ටක ජාතකය’ නිමවා වදාළසේක.

"එසමයෙහි දෙමව්පියෝ නම් දැන් මේ දෙමව්පියෝමය. එසමයෙහි වටු රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 036. සකුණ ජාතකය

තවද එක් සමයෙක්හි ජගදානන්දකර වූ(ලෝකයාට සතුට ගෙන දෙන්නා වූ) බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසනසේක් දැහනය වූ(පිළිස්සී ගිය) පන්සලක් ඇති භික්ෂු කෙනෙකුන් අරභයා මේ ජාතකය වදාළසේක.

එක් භික්ෂු කෙනෙකුන් වහන්සේ වනාහි සව්ශාස්තෘයන් වහන්සේගේ සමීපයෙන් කමටහන් ගෙන දෙව්රම් වෙහෙරින් නික්ම කොසොල් දනව්වෙහි එක් පසල් ගමක් නිසා(පිටිසර ගමක් අසල පිහිටි) එක් අරණ්‍යයෙක්හි සෙනස්නෙක වසනසේක. ඉක්බිත්තෙන් පළමුවැනි මාසෙහිම උන්වහන්සේගේ පන්සල දැහනය වූයේය. ඒ භික්ෂූන් වහන්සේ "මාගේ පන්සල දැහනය වූයේය, දුකින්ම වසමි" කියා මනුෂ්‍යයන්ට කීසේක. මනුෂ්‍යයෝ "දැන් අපගේ කෙත වියළුනේය(කුඹුරු වේලි ගියේය), කෙතට දිය හෙලාකොට දෙම්හ(කුඹුරුවලට ජලය හරවා පන්සල සාදා දෙන්නෙමු). දිය හෙලූ කල්හි බිජු වපුටකොට(වී වපුරා) දෙම්හ. බිජු වපුල කල්හි වැටකොට(වැට බැඳ පසුව පන්සල සාදා දෙන්නෙමු). වැට කළ කල්හි නෙලායයි කියාද(ගොයම් නෙලා පසුව), දාස ද (ගොයම් කැපූ පසු) යයි කියාද, මැඩ(ගොයම් පැගූ පසු) යයි කියාද මෙසේ මේ ක්‍රියාව දක්වමින්ම තුන්මසක් කල්

යැවුවාහුය. ඒ භික්ෂූන් වහන්සේ තුන්මසක් අභ්‍යවකාශයෙහි (එළිමහනෙහි) දුකින් වසනසේක් කමටහන් වඩා විශේෂයක් (ධ්‍යානමාර්ගඵලාදියක්) උපදවාගන්ට නොහැකි වූසේක. පවුරුණුකොට(වස් නිමවා) වනාහි සර්වඥයන් වහන්සේගේ සමීපයට ගොස් නමස්කාර කොට එකත්පසෙක හුන්සේක. සර්වඥයන් වහන්සේ ඒ භික්ෂූන් හා පිළිසඳර කථාකොට "කිමෙක්ද? මහණ, සැපසේ වස් විසුයෙහිද? තොපගේ කමටහන් මස්තකප්‍රාප්ත වූයේදැ"යි(සාර්ථක විදැයි) විචාළෙසේක. ඒ භික්ෂූන් වහන්සේ ඒ ප්‍රවෘත්තිය කියා "මට සෙනසුන් සප්‍රාය(සේනාසන පසුකම්) නැති හෙයින් කමටහන් මස්තකප්‍රාප්ත නුවුයේය"යි දැන් වුසේක. සර්වඥයන් වහන්සේ වදරණසේක් "මහණෙනි, පෙර තිරශ්චිනගතයොත්(තිරිසන් සත්තු පවා) තමන්ට සප්‍රයා සප්‍රායා(සුදුසු නුසුදුසු දෙය) දැනගත්තාහුය. තොපි කවර කාරණයකින් නොදත්තාහුදැ"යි වදරා ඉකුත්වත් කථාව වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහබෝසතාණෝ තිරශ්චින පක්ෂි ජන්මයෙහි(තිරිසන් සතකු වූ කුරුල්ලකුව) ඉපද පක්ෂි සමූහයා විසින් පිරිවරන ලදුව අරණ්‍ය ප්‍රදේශයෙක්හි ශාඛාවෙලපන් සමෘද්ධ වූ(අතු හා දෙබල වලින් අඩුවක් නැත්තා වූ) මහත් වෘක්ෂයක් ආශ්‍රයකොට වාසය කරනසේක. ඉක්බිත්තෙන් එක් දවසක් ඒ වෘක්ෂයාගේ ශාඛාවෙන් ඔබිමොබ ගැටෙන කල්හි සුණු(ලීකුඩු) වැගිරෙන්නේය. දුම් නැගෙන්නේය. ඒ දැක බෝධිසත්වයන්

වහන්සේ සිතනසේක් “මේ ශාඛාවෝ දෙදෙන මෙසේ ඝර්ෂණයව ඝර්ෂණයව(ගැටි ගැටී) ගිනි පහළ වන්නේය, ගිනි පරඬුල්පත් ගන්නේය(පරඬැල්වලට පැතිරෙන්නේය), එතැන් පටන් මේ වෘක්‍ෂයද දවන්නේය. මෙතැන්හි අප විසින් වසන්නට නොහැකිය. මෙයින් දිවගොස් අන් තැනකට යන්ට වටනේය”යි සිතූසේක. මෙසේ සිතා බෝධිසත්‍වයන් වහන්සේ පක්‍ෂි සමූහයාට මෙසේ කීසේක් “යම් වෘක්‍ෂයක් පක්ෂීහු ආශ්‍රය කළෝද, ඒ වෘක්‍ෂය ගිනි හරගත්තේය(පිටකරන්නේය), වක්‍රවූ(ඇදවූ) ග්‍රීවය හා පක්‍ෂපත්‍ර(බෙල්ල හා අත්තටු) ඇති හෙයින් වක්කංග නම් වූ පක්ෂීහු ඒ ඒ දිගුන් සේවනය කරව(ඒ ඒ දිසාවලට පලායවු), අපට පිහිටවූ වෘක්‍ෂයෙන්ම ගිනිවැද භය උපන්නේය, එහෙයින් වරෙවු, අන් තැනකට යම්හ”යි තීසේක.

බෝධිසත්‍වයන් වහන්සේගේ වචනය කළා වූ(පිළිගත්තා වූ) නුවණැත්තා වූ පක්ෂීහු උන්වහන්සේ හා සමග එක්වරම අහසට පැනනැගී අන් තැනකට ගියාහුය. යම් කෙනෙක් නුවණ නැත්තෝද ඔවුහු “මේ පරිද්දෙන්ම බිඳුවක් පමණ දියෙහි මෙතෙම කිඹුලන් දක්නේය”යි කියා බෝධිසත්‍වයන් වහන්සේගේ වචනය නොගෙන එතැන්හිම විසුවාහුය. ඉක්බිත්තෙන් නොබෝ කලකින් බෝසතාණන් විසින් සිතූ ආකාරයෙන්ම ගිනි පහළව ඒ වෘක්‍ෂය ගිනිගත්තේය. දුම්ද ගිනිදැල්ද නැගී කල්හි දුමින් අන්ධ වූ පක්ෂීහු අන් තැනකට යන්ට නොහැකිවුවාහු ගින්නෙන් වැටිවැටීම විනාශයට පැමිණියාහුය.

බුදුරජාණන් වහන්සේ මෙසේ වදරා "මහණ, පෙර තිරශ්චීනයෝත් දහනවෘක්ෂාග්‍රවල(ගින්නෙන් දැවෙන ගස්මුදුන්වල) වස්නාහු තමන්ට සප්‍රයාසප්රාය දැන ගත්තාහුය. තෙපි කවර හෙයකින් නොදත්තෙහිදැ"යි කියා ධර්මදේශනාව ගෙනහැර දක්වා චතුස්සත්‍යය ප්‍රකාශකොට වදාළසේක. චතුස්සත්‍යය දෙශනාවගේ කෙළවර ඒ භික්ෂූන් වහන්සේ සෝවාන් ඵලයෙහි පිහිටිසේක. බුදුරජාණන් වහන්සේද පූර්වාපර සන්ධි ගළපා මේ 'සකුණ ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි බෝසතාණන්ගේ අවවාදය කළා වූ පක්ෂීහු දැන් බුදුපිරිස් වූවාහුය. නුවණැති පක්ෂීව උපන්නෙම් වනාහි තිලෝගුරු සම්‍යයක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 037. තිත්තිර ජාතකය

තවද එක් සමයෙක්හි සසර කතරින් එතර කරන හෙයින් ගැල්සාත්තුවාහකයක්හු (ගැල් කණ්ඩායමක නායකයෙකු) වැනි වූ සර්වඥයන් වහන්සේ සැවැත් නුවරට වඩනාසේක් සැරියුත් මහතෙරුන් වහන්සේට සෙනසුන් වැළැකීමක්(ලැගුම් තැනක් නොදී වැළක්වීමක්) අරභයා මේ ජතකය වදාළසේක.

අනේපිඬු මහසිටාණන් විසින් විහාරය(ජේතවනාරාමය) කරවා දූතයන් යැවූ කල්හි ශාස්තෘන් වහන්සේ රජගහ නුවරින් නික්ම විශාලා මහනුවරට පැමිණ එහි කැමති පරිද්දෙන් වාසයකොට "සැවැත් නුවරට එමි" කියා මඟට

පිළිපන්සේක. එසමයෙහි වනාහී ෂඩ්වර්ගික භික්‍ෂූන්ගේ(භික්‍ෂූන් සයනමක්ගේ කණ්ඩායමට අයත්) අතවැසි භික්‍ෂූන් අභිමුඛව(පළමු පළමුව) ගොස් ස්ථවිරයන් වහන්සේලා(වැඩිහිටි තෙරවරු) සෙනසුන් නොගත් කල්හිම(ලැගුම්තැන් පිළිගැනීමට පෙර) "මේ සෙනස්න අපගේ උපාධ්‍යයන් වහන්සේටය, මේ සෙනස්න ආචාරීන් වහන්සේටය, මේ සෙනස්න අපටම වන්නේය"යි කියා සෙනසුන් වලකාත්(සෙනසුන් දියයුත්තන්ට නොදී තම තමන්ට බෙදාගනිත්). පසුව ආවාවූ ස්ථවිරයන් වහ්නේසේලා සෙනසුන් නොලබන්නාහුය. සැරියුත් මහතෙරුන් වහන්සේගේ ද අතවැසි භික්ෂූහු ස්ථවිරයන් වහන්සේට සෙනස්නක් සොයන්නාහු නොලද්දාහුය. සැරියුත් මහතෙරුන් වහන්සේ සෙනස්නක් නොලබමින් සර්‍වඥයන් වහන්සේගේ සෙනස්නට නුදුරු තැනැක්හි එක් වෘක්‍ෂ මූලයෙක්හි හිඳිමෙන්ද සක්මන් කිරීමෙන්ද කල් යවුසේක.

සර්‍වඥයන් වහන්සේ අළුයම් වේලෙහි පිටතට නික්ම කැසපීසේක (කැස්සේය). තෙරුන්ව වහන්සේ ද කැසපි සේක. "මේ තෙම කවරෙක්ද?" "ස්වාමීන් වහන්ස, මම ශාරිපුත්‍රයෙමි"යි කීසේක. "ශාරිපුත්‍ර ස්ථවිරය මේ වෙලාවෙහි මෙතැන්දි කවරක් කරන්නෙහිදැ?"යි වදාළසේක. සැරියුත් මහතෙරුන් වහන්සේ මේ ප්‍රවෘත්තිය දැන් වූසේක. ශාස්තෘන් වහන්සේ ස්ථවිරයන් වහන්සේගේ බස් අසා "දැන් වනාහි මා ජිවත් ව ඉන්දදී භික්ෂූහු ඔවුනොවුන්ට ගෞරව නැත්තෝය. ආදර නැත්තෝය. පිරිනිවන් පෑ කල්හි කවරක් කරන්නාහු දෝ"යි ආවර්ජනා කරන්නාහට(අනාගත සඤ්ඥාණයෙන් මතුකාලය

බලන්නා වූ බුදුරජුන්ට) ධර්මසංවේගය(කෙලෙස් නැසූ උතුමන්ට සියළු සංස්කාර ධර්මයන්ගේ ස්වභාවය පිළිබඳ බියවීම් වශයෙන් උපදින සංවේගාත්මක ඥාණය) පහළවූයේය.

සර්වඥයන් වහන්සේ රාත්‍රිය පහන් වූ කල්හි භික්ෂු සංඝයා රැස්කරවා භික්ෂූන්ට වදාරණසේක් “මහණෙනි, ෂඩ්වර්ගික භික්ෂූහු පෙරටු පෙරටුව ගොස් ස්ථවිර භික්ෂූන් වහන්සේලාට සෙනසුන් වැළකුවෝ සැබෑද?”යි විචාරා වදාළසේක. “භාග්‍යවතුන් වහන්ස සැබෑව”යි කීවාහුය. ඉක්බිත්තෙන් ෂඩ්වර්ගික භික්ෂූන්ට ගර්හාකොට ධර්මකථාව වදාරා භික්ෂූන්ට ආමන්ත්‍රණය කොට “මහණෙනි, අග්‍ර ආසන, අග්‍ර උදෙක, අග්‍ර පිඩු(ආසන, පියයුතු සහ පරිභෝග කළයුතු ජලය, ආහාර යන මේවා අතර ප්‍රධාන කොටස) කවරක්හූ ලබන්නට සුදුසුදැ”යි විචාරා වදාළසේක. සමහර භික්ෂූහු “ක්‍ෂත්‍රිය කුලයෙන් පැවිදි වූවෝය” සමහර කෙනෙක් “බ්‍රහ්මණ කුලයෙන් මහණ වූවෝය, ගෘහපති කුලයෙන් මහණ වූවෝය, ඔවුන්ට සුදුසුය”යි කීවාහුය. සමහර කෙනෙක් “විනයධර භික්ෂූහුය, ධර්මකථික(ධර්ම කොටස් කියන කියවන භික්ෂුහුය) භික්ෂූහුය, ප්‍රථම ධ්‍යානලාභීය, ද්විතිය ධ්‍යානලාභීය, තෘතිය ධ්‍යානලාභීය, චතුර්ත ධ්‍යානලාභීය” කිවාහුය. සමහර කෙනෙක් “සෝවාන්ය, සකෘදාගාමීය, අනාගාමිය, අර්හත්ය, ත්‍රිවිද්‍යාවට පැමිණියාහ(පෙර අත්බැව් දන්නා නුවණ, චුති උපත්තිය දන්නා නුවණ, සියළු කෙලෙස් නැතිකිරීමේ නුවණ යන ත්‍රිවිද්‍යා ලත් භික්ෂුහුය) ෂඩ්අභිඥාවට පැමිණියාහුය”යි(ඍද්ධිවිධ, දිව්‍යකන, පරසිත් දැනීම, පෙර භවයන් ගැන දැනීම, චුති

ප්‍රතිසන්ධි දැනීම, සව්කෙලෙසුන් නැසීම යන කරුණු සය පිළිබඳ ඥාණය) කීවාහුය.

මෙසේ ඒ භික්ෂූන් විසින් තමතමාගේ අභිප්‍රාය(කැමැත්ත) වශයෙන් අග්‍ර ආසනාදියට සුදුසු භික්ෂූන් කී කල්හි සර්වඥයන් වහන්සේ වදාරණසේක් "මහණෙන, මාගේ සාසනයෙහි අග්‍ර ආසනාදියට පැමිණ (අග්‍රආසන ලැබීමාදිය පිළිබඳ) ක්‍ෂත්‍රිය කුලයෙන් පැවිදිවූයේ පමණ නොවෙයි(ප්‍රමාණවත් නොවෙයි), බ්‍රාහ්මණ කුලයෙන් පැවිදිවූයේ පමණ නොවෙයි, ගෘහපති කුලයෙන් පැවිදි වූයේ පමණ නොවෙයි, විනයධර තැනැත්තේ ද පමණ නොවෙයි, සුත්‍රාන්තික (සූත්‍රධර්ම කටපාඩම්) තැනැත්තේද පමණ නොවෙයි, අභිධර්ම දන්නා තැනැත්තේද පමණ නොවෙන්නෝය, ප්‍රථමධ්‍යානාදී වූ ධ්‍යානලාභීහුද පමණ නොවන්නේය, ශ්‍රෝතාපත්‍යාදී වූ මාර්ගඵල ලාභීහුද පමණ නොවන්නේය, වැලිදු වනාහි මහණෙනි, මේ ශාසනයෙහි පටිපාටිය වූ පරිද්දෙන්(වැඩිමහළු පිළිවෙල, සගමහළු පිළිවෙල වූ) වැඳිමද හුනස්නෙන් නැගීමද අඤජලී කර්මද(දෙහොත් මුදුන් දී වැඳිමද) ආදර ක්‍රියාද කටයුත්තේය. අග්‍ර ආසනය, අග්‍ර උදකය, අග්‍ර පිණ්ඩය ලැබිබ යුත්තේය. මේ මෙහි ප්‍රමාණය, ඒ කාරණයෙන් වැඩිමහළු භික්ෂූන් වහන්සේ මෙකී දෙය ලැබීමට සුදුසුය, දැනුදු වනාහී මහණෙනි, ශාරිපුත්‍ර ස්ථවිර තෙම මාගේ අග්‍රශ්‍රාවකය, මා අනුව ධර්මචක්‍රය පවත්නේය, මට අනතුරුව සෙනස්න ලබන්නට සුදුසුය, ඒ ශාරිපුත්‍ර ස්ථවිර තෙම මේ රාත්‍රියෙහි සෙනස්නක් නොලබනසේක් වෘක්‍ෂ මූලයෙක්හි කල් යවූසේක. තෙපි දැන්ම

මෙසේ ගෞරව නැතිව ආදර නැතිවූවාහුය. කල් යත් යත් කවරක් කොට වසන්නාහුදැ?''යි කියා ඉක්බිත්තෙන් ඒ භික්ෂූන්ට අවවාද දෙනු පිණිස "මහණෙනි, පෙර තිරශ්චීනගතයෝද(තිරිසන් සතුන් පවා) 'අපි ඔවුනොවුන් ගරු නොකොට ආදර නොකොට අසභායවෘත්තීව(මිත්‍රයන්සේ පැවැත්මක් නැතිව) විසීම අපට සුදුසු නොවන්නේය. අප අතුරෙන් මහළු යමක්හු දැනගෙන ඕහට අභිවාදනාදිය (වැඳිම් ආදිය) කරම්හයි කියා යහපත්සේ පරීක්ෂාකොට මේ තෙම අපට මහළු ය'යි දැන ඕහට අභිවාදනාදීය කොට දිව්‍යලොක මාර්ගය පුරමින් ගියාහුය''යි වදාරා ඉකුත්වත් කථාව වදාළසේක.

යටගිය දවස හිමාල වනයාගේ පාර්ෂවයෙක්හි(පැත්තක තුබූ) එක් මහා න්‍යග්‍රොධ වෘක්ෂයක්(නුග ගසක්) ආශ්‍රය කොට තිත්තිරය(තිත්වටු කුරුල්ලකු), වානරය, හස්තියය කියා යහළුවෝ තුන් දෙනෙක් වාසය කළාහුය. ඔහුන් තුන්දෙනා ඔවුනොවුන් ගරු නොකොට ආදර නොකොට අසභාගවෘත්තියෙන් (වෙන් වෙන් පැවතුම් වලින්) යුක්තවූවාහුය. ඉක්බිත්තෙන් ඔවුන්ට මෙබඳු වූ සිතෙක් වූයේය. කෙබඳු සිතෙක්ද? "අපට මෙසේ වාසය කරන්නට නුසුදුසුය, අපි අපගෙන් යමෙක් මහළුද, ඕහට වන්දනාමානනාදීය කෙරෙමින් වාසය කරමෝ නම් ඉතා යෙහෙකැ''යි සිතුවාහුය. "අපගෙන් කවරෙක් වෘද්ධතරදැ''යි සිතා එක් දවසක් "මෙයට උපායෙක් ඇතැ''යි සිතා තිත්තිරය, වානරය, හස්තිය යන තුන් දෙනාම නුගරුක මුල්හි හිඳ තිත්තරය වානරය යන

දෙදෙනා හස්තියා සමීපයෙන් විචාළාහුය. "යහළු හස්තිය, තෙපි මේ නුගරුක කවරක් ප්‍රමාණ කල් තැන්පටන් දන්නෙහිදැ"යි විචාළාහ. හස්තිතෙම කියනුයේ "සබඳිනි(මිත්‍රවරුනි), මම ලාපැල කල්හි(ළපැටි පැලයක් ලෙස තිබුනු කාලයෙහි) මේ නුග ගස බඩයට කොට ගියෙමි. යට කොට සිටි කල්හි වනාහි මේ වෘක්‍ෂයාගේ මුදුන් ශාඛාව මාගේ නාභිය ගැයෙන්නේය. මෙසේ මම මේ වෘක්‍ෂය පැලකල් පටන් දන්නෙමි"යි කීය. නැවතත් තිත්තිරය හස්තිය යන දෙදෙනා පූර්‍වයෙහි කියනලද ක්‍රමයෙන්ම වානරයාගෙන් විචාළාහුය. වානරතෙම කියනුයේ "යහළුවෙනි, මම වානර පැටවා වුයෙන් බිම හිඳ ග්‍රීවය(බෙල්ල) නොඔසවාම මේ නුග පැලැටියගේ අක්දළු(අගදළු) කෑයෙමි. මෙසේ මම මේ නුග වෘක්‍ෂය කුඩාකල් තැන් පටන් දන්නෙමි"යි කීයේය. ඉක්බිත්තෙන් වානරයාය හස්තියාය යන දෙදෙනා පූර්‍වයෙහි කියනලද ක්‍රමයෙන්ම තිත්තිර පණ්ඩිතයෙන්ගෙන් විචාළාහුය. තිත්තිර පණ්ඩිතයෝද "යහළුවෙනි, පූර්‍වයෙහි අසවල් නම් තැන මහත් නුග වෘක්‍ෂයෙක් වූයේය. මම ඒ වෘක්‍ෂයාගේ ඵලයක් අනුභවකොට මෙතැන්හි වර්චස් එලුයෙමි(මලපහ කෙළෙමි). එයින් මේ වෘක්‍ෂය හටගත්තේය. මෙසේ මම මේ වෘක්‍ෂය හටගත් කල් තැන් පටන් දන්නෙමි එසේ හෙයින් මම තොපට වැඩියෙන් ජාතියෙන්(උපතින්) වෘද්ධයෙමි"යි කීසේක.

මෙසේ කී කල්හි වානරයාද හස්තියාද තිත්තිර පණ්ඩිතයන්ට කියන්නාහු "නුඹවහන්සේ අපට වැඩියෙන් වෘද්ධතරය, අද මෙතැන් පටන් අපි නුඹවහන්සේට සත්කාර

ගරුකර වන්දනාමානාදී වූ පූජාවෙන්ද, වැඳීමය, හුනස්නෙන් නැගීමය, අඤ්ජලිකර්ම, සාමීචිකර්මයන්ද(සුවදුක් විචාරීම්ද) කරම්හ. නුඹවහන්සේගේ අවවාදයෙහි ද සිටුම්හ. නුඹවහන්සේ වනාහි මෙතැන් පටන් අපට අවවාද අනුශාසනා දෙව"යි කිවුය. එතැන් පටන් තිත්තිර පණ්ඩිතයන් වහන්සේ ඔහුන්ට අවවාද දුන්සේක. ශිලයෙහි පිහිට වූසේක. තෙමෙත් පඤ්චශීලය සමාදන්ව රක්‍ෂා කළසේක. ඔහු තුන්දෙනම පඤ්චශීලයෙහි පිහිටුවා ඔහුනොවුන් ගෞරව ඇති ව සදෘශ වූ ප්‍රවෘත්ති ඇතිව (එකසමාන පැවතුම් ඇතිව) ජීවිතයාගේ කෙළවර දිව්‍ය ලෝකයෙහි උපන්නාහුය. ඔහුන් තුන්දෙනාගේ සිල්සමාදන්වීම 'තිත්තර බ්‍රහ්මචය්‍යී' නම් වූයේය.

"මහණෙනි, තිරශ්චීනගත වූ ඔහු වනාහි ඔවුනොවුන් ගෞරව සහිතව සත්කාර සහිතව වාසය කළාහුය. තෙපි මෙසේ යහපත්කොට දෙසනලද ධර්‍මය ඇති මාගේ ශාසනයෙහි පැවිදිව කවර හෙයකින් ඔවුනොවුන් ගෞරව නැතිව ආදර නැතිව වාසය කරන්නාහුද? මහණෙනි, මෙතැන් පටන් සඟමහළු පිළිවෙළින් වැඳීමය, හුනස්නෙන් නැගීමය, අඤ්ජලී කර්මය, සාමීචි කර්මය, මහණ වූ පිළිවෙලින් අග්‍ර ආසනය, අග්‍ර උදකය, අග්‍ර පිණ්ඩය යන මේ සියල්ල මෙතැන් පටන් තොපට අනුදනිමි(නියම කරමි). අභිනව මහණවූවාහු විසින් වෘද්ධතරයනට නොවැළැක්විය යුත්තේය. යමෙක් වැළැක් වූයේ වීනම් දුක්කටාප්තතියැ"යි(දුක්කට නම් වරද සිදුවේයැයි) වදරා මෙසේ සර්‍වඥයන් වහන්සේ මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා මෙසේ වදාළසේක.

“වෘද්ධාපචායන ධර්‍මයෙහි(වැඩිහිටියන් පිදීමේ චාරිත්‍රධර්‍මයෙහි) දක්‍ෂ වූ යමෙක් කුලවෘද්ධ (කුලපරපුරෙන් උසස් වූ), ගුණවෘද්ධ(ගුණයහපත් කම්වලින් වැඩි තැම්පත් වූ), වයොවෘද්ධ(වයසින් වැඩි) තුන්දෙනා කෙරෙන් ගුණවෘද්ධ වයොවෘද්ධ යන දෙදෙනාහට පූජා කෙරේද, ඔහු ඉහතාත්ම භාවයෙහි ප්‍රශංසාර්ග වෙති(මෙලොවදීම පැසසීමට සුදුසු වෙත්). මෙලොව හැර යායුතු පරලොවෙයි සුගතියට යන්නාහු වෙති. මහණෙනි, ක්‍ෂත්‍රියයෝ වෙත්වයි, බ්‍රාහ්මණයෝ වෙත්වයි, වෛශ්‍යයෝ වෙත්වයි, ක්‍ෂුද්‍රයෝ වෙත්වයි, ගෘමස්තයෝ(ගිහියෝ) වෙත්වයි, ප්‍රව්‍රජිතයෝ(පැවැද්දෝ) වෙත්වයි, තිරශ්චීනගතයෝ වෙත්වයි යම් කිසි සත්ත්ව කෙනෙක් ජ්‍යෙෂ්ඨාපචායන(වැඩිහිටියන් පිදීමේ) කර්මයෙහි දක්‍ෂවූවාහු ගුණයෙන් යුක්ත වූ වයෝවෘද්ධයන්ට ආදර කෙරෙත්ද, ඔහු මේ ආත්මභාවයෙහිද ජ්‍යෙෂ්ඨාපචායන ක්‍රියාව කළාහු යයි ප්‍රශංසා ලබන්නාහුය. කරජකායයාගේ භෙදයෙන්(සිරුර බිඳී මියගිය පසු) ස්වර්‍ගලෝකයෙහිද උපදනාහුය”යි වදාළසේක.

මෙසේ ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ ජ්‍යෙෂ්ඨාපචායන කර්මයාගේ ගුණ වදාරා පූර්‍වාපර සන්ධි ගළපා මේ ‘තිත්තිර ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි හස්තියා නම් දැන් මහමෞද්ගල්‍යායන ස්ථවිර වූසේක. වඳුරා නම් ශාරිපුත්‍ර ස්ථවිර වූ සේක. තිත්තර පණ්ඩිතව උපන්නෙම් වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 038. බක ජාතකය

තවද ලෝකස්වාමී වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවන විහාරයෙහි වැඩවසන සමයෙහි චීවරවඩ්ඪකි(සිවුරු වඩුවා) නම් එක් භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාරණලදී.

ඒ කෙසේද යත්?

දෙව්රම් වෙහෙර වැඩවසන එක්කෙනෙකුන් වහන්සේ කඩ කැපීම ගෙත්තම් (රෙදි කැපීම් හා මැසීම්) කිරීම් ආදියෙහි දක්ෂසේක. එසේ හෙයින් උන්වහන්සේට ‘චීවරවඩ්ඪකිය’යි නම් විය. දිරාගිය රෙදි කැබලි ගෙන හස්ත කර්මාන්ත දක්වා(අතවැඩ පෙන්වා) සිවුරු ගෙත්තම් කොට රඳු(සායම් පොවා) සුරැකිව තබනසේක.

සිවුරු ගෙත්තම් කරන්ට නොදන්නා භික්ෂූන් වහන්සේ අලුත් අලුත් පිළි උන් වහනසේ සමීපයට ගෙනගොස් “මේ කඩ කපා දුන මැනව”යි කියනසේක. එකල ඒ මහණ “කඩ කපා ගෙත්තම් කරනසේක් කල් යන්නේය. මා පළමු තනාතුබූ(මසා ඇති) සිවුරු ඇතැ”යි කියා අලුත් පිළි ගෙන ජීර්ණ වූ(දිරාගිය) සිවුරු දෙනසේක. ඒ සිවුරු වැලඳ(පාච්චිකර) මදක් කිළුටු වූකල උනුපැනෙහි ලා සෝදනසේක. එසමයෙහි ඒ ඒ තැන දිරුණු තැන් පෙනෙන්නේය. උන්වහන්සේලා බොහෝසේ කලකිරෙනසේක. මෙසේ ආ ආ භික්ෂූන් වහන්සේගෙන් අලුත් පිළි ගෙන

දිරාගිය සිවුරු දී වංචා කරනසේක් බොහෝ තැන ප්‍රකාශ වූසේක. මුන්වහන්සේ පරිද්දෙන් පිටිසරත් එක මහණෙක් වූයේය. ඒ මහණ "දෙව්රම් වෙහෙර තමාගේ වංචා දන්නා එක් කෙනෙකුන් වහන්සේ ඇතැ"යි යනු අසා සිතනුයේ "නුවරවාසීහු ඒ භික්ෂූහු රවටන්ට වුවමැනැවැ"යි සිතා ඉතා නොරත රෙදි(වඩා ඝන නොවූ රෙද්දකින්) සිවුරක් කොට යහපත්කොට රඳා ඒ සිවුර වැළඳගෙන(පොරවාගෙන) දෙව්රම් වෙහෙරට ගියසේක. අනික් මහණ ඒ භික්ෂූහුගේ සිවුර දැක ලෝභ උපදවා තමන් රවටන්නට ආ බව නො දැන කියනසේක් "ස්වාමීනි, මේ සිවුර නුඹවහන්සේ විසින් කරන ලද්දේදැ"යි විචාළේය. "එසේය අප විසිනැ"යි කී කල්හි "එසේ වීනම් මේ සිවුර මට දුනමැනවැ"යි කීසේක. "කුමක් කියවුද? පැවිද්දෙනි, අප ඉන්නේ පිටිසර, චීවරාදී ප්‍රත්‍යය දුර්ලභය, තොපට මේ සිවුර දී කුමක් පොරවම්දැ?"යි කීසේක. "ස්වාමීනි, අපගේ අළුත් පිළි ඇත, ඒ ඇරගෙන සිවුරු කොටගෙන ගතමැනවයි, සිවුර මට දුන මැනවැ"යි කීසේක. "එසේ තොප ඉල්වන කල සිවුර ගනුව"යි කියා අළුත් පිළි ගෙන සිවුර දී වංචාකොට ගියාහ. උන්වහන්සේ සිවුර වැලඳ කීපදවසකින් උණුපැනෙහිලා සෝදනසේක් නොයෙක් තැන ඉරී ගිය රෙදි බව දැන "පිටිසර මහණ මා වංචා කෙළේය"යි ලජ්ජා වූ සේක.

ඉක්බිත්තෙන් පිටිසර වංචා දන්නා මහණෙකු දෙව්රම් වෙහෙර වංචා දන්නා මහණක් රවටන ලදැ"යි භික්ෂූන් මධ්‍යයෙහි ප්‍රකාශ විය. මේ කථාව එක් දවසක් දම්සභා

මණ්ඩපයේ වැඩහුන් භික්ෂූන් වහන්සේ කිය කියා උන් තැනට බුදුරජාණන් වහන්සේ තුන්තරා ගමනින්(පොළොව කිමිද යාම, අහසින් යාම සහ ප්‍රකෘති ගමන යන තුන්ගමන් අතරින්) එක්තරා ගමනකින් වැඩවදුරා පණාවන ලද බුද්ධාසනමස්තකයෙහි සවණක් ඝනරැසින් දිලිහි දිලිහී වැඩහිඳ මිහිරි වූ කටහඬින් බ්‍රහ්මඝෝෂා(උතුම් ශබ්ද) විහිදුවමින් "මහණෙනි, මා එන්නට පළමුවෙන් කවර කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා "ස්වාමීනි, මෙනම් කථාවකින් යුක්තව උනුම්හ"යි දැන්වූ කල්හි "මහණෙනි, දැන්මතු නොවෙයි, පිටිසර මහණ දෙව්රම් වෙහෙර මහණහු පෙරත් රැවටුයේ වේදැ"යි වදුරා ඒ භික්ෂූන් විසින් ආරාධිත වූසේක් අතීත කථාව දක්වා වදාළ සේක.

යටගිය දවස අප මහාබෝධිසත්ත්වයෝ එක්තරා වන ප්‍රදේශයක පියුම් විලක් ඇසුරුකොට සිටි ලුණුවරණ ගසෙක රුක්දෙවිව උපන්හ. එසමයෙහි එක්තරා කුඩා විලෙක නියං සමයෙහි දිය මඳවූයේය. එහි කුඩමස්සෝ බොහෝය. එක් කොකෙක් ඒ කුඩමස්සන් දැක "එක් උපායකින් මුන් රවටා ගෙනගොස් මස්කන්නට උවමැනවැ"යි සිතා ඒ විලට ගොස් දිය කෙළවර කරබාගෙන බක තපස් අඟවා සිතිවිල්ලක් සිතා උන්නේය. කුඩමස්සෝ ඔහු දැක ළඟට ගොස් "ස්වාමීනි, කුමක් සිතා ඉදින්නේදැ?"යි විචාළාහුය. කොකා කියනුයේ "තොපට වූ විපත සිතමින් ඉන්නෙමි"යි කීය. "ස්වාමීනි, අපට වූ විපත කුමක්දැ"යි කී කල්හි කොකා කියනුයේ "මේ විල දියත් මඳය? තොපට ගොදුරුත් මඳය, නියඟත් මහත් බැවින්

කුඩමස්සන්ට වූයේ මහත් දුකකැ''යි සිතා ඉඳිමි. "තොපි මා කීවා කරවු නම් තොප හැම එකින් එක තුඩින් ඩැහැගෙන ගොස් පස්පියුමින් සැදි මහවිලකට අරින්නෙම් වේදැ''යි කියේය.

එවිට කුඩමස්සෝ කියන්නෝ "ස්වාමීනි, කොකාණෙනි, කප අටගත් ද (කල්පය පටන්ගත් දින) පටන් කුඩ මස්සන්ට වැඩකට කාරියක්(යහපත සඳහ වන ක්‍රියාවක්) සිතූ කෙනෙක් නම් නැත, දැනුදු තොපි වනාහි කුඩමස්සන් වංචාකොට එකින් එකා කනු කැමතිව කළ උපායකැයි සිතම්හ''යි කීය. කොකා කියනුයේ "තොපි එසේ නොකියව, මාගේ බස නොඇදහමව් නම් එක කුඩමස්සෙකු එවා විල ඇති බව ඔහු අතින් විචාරා දැනගනුව''යි කීයේය. එවිට කුඩමස්සෝ ඔහුගේ වංචා නොදැන "මේ කොකා ධර්මිෂ්ට එකෙකැ''යි එක්සිත්ව විලබලා එන පිණිස එක් කනපද්දකු(ලොකු කණයකු) දුන්හ. කොකාද ඒ කනපද්ද තුඩින් ඩැහැගෙන ගොස් ඒ විලට හැර සියලු විල්වල ඉසුරු(ලස්සන) දක්වා නැවත ගෙන කුඩමස්සන් සමීපයට හැරියේය. ඒ කනපද්ද විලෙහි මහිම කුඩමස්සන්ට විස්තරකොට කියේය. ඒ සියලු මත්ස්‍යයෝම ඒ කොකාට කියන්නාහු "ස්වාමීනි, අප හැම ඒ විල ලුව මැනව''යි කීහ. කොකාද "යහපතැ''යි කියා පළමුකොට කනපද්ද ඩැහගෙන ගොස් විල දක්වා විල ඉවුර පිට සිටි ලුණුවරණ ගසෙහි සැගවි ඉඳ තුඩින් ඇන කනපද්ද මරා මස්කා ඇට ගස මුල එළා නැවත විලට ගොස් "ඔහු වන්නා(ඔහු නම්) විලට ඇරපිමි, වෙන එකෙක් එව''යි කියා ඔහුද ගෙනගොස් මස්

කා මෙම නියාවෙන් එකින් එක ගෙනගොස් මස් කා සියලු කුඩමස්සන් නිමාවට ගියසේ දැන නැවත විලට ආයේ එක් කකුළුවෙකු ඉතිරිවූයේ දැක ඔහුද කනු කැමතිව කකුළුවාට කියන්නේ "එම්බා පින්වත් වූ කකුළුව, මා විසින් සියලු මත්ස්‍යයෝම පස්පියුමින් සැදි මහවිලෙක්හි හරන ලද්දේය. තොපි මෙතන තනිව කුමකට ඉදුද? ඉදින් තෝ කැමැත්තෙහි නම් තාත් ගෙනගොස් විලට අරින්නෙම් වේදැ"යි කීය. එවිට කකුළුවා කියන්නේ "එම්බා කොකාණෙනි, ඒ විලට ගෙනයන්නේ කෙසේදැ?"යි විචාළේය. "තුඩින් ඩැහැගෙන යෙමි"යි කීයේය. "එසේ ගෙන යෙතොත් තොපි මා බිම එලව(හෙළන්නෙහිය), එබැවින් තොප ගෙනයන්ට (තාගේ ගෙනයාම ගැන) බමි"යි(බිය වෙමියි) කීය. කොකා එවිට කියන්නේ "තෙපි එසේ නොබව, යහපත්කොට අල්වාගෙන යෙමි"යි කිවුය.

එවිට කකුළුවා සිතන්නේ "මේ කොකා විසින් එක කුඩමස්සෙකුත් විලට හැරියේ නැත, හැම මස් කෑයේය, ඉදින් මාත් විලට ගෙනගොස් විල ලූවොත් පලු නියාමය(විලට දැමුවොත් දැමුවාවේ) විලට නොහැරියේ නම් මොහුගේ බොටුව කපා දිවි තොර කෙරෙමි"යි සිතා කොකාට කියන්නේ "යහළු කොකාණනි, තොප යහපත්කොට අල්වාගත නොහෙයි, අපගේ යහපත් ඇල්වීමක් ඇත, ඉදින් තාගේ බොටුව අපගේ නළින්(අඩුවෙන්) අල්වන්නට ලැබේ නම් තොප හා සමග යන්නෙම් වේදැ"යි කිවුය. එවිට කොකා තුමු රවටන්ට කී බව නොදැන "යහපතැ"යි පිළිගන. කකුළුවාද තමාගේ නළින්

අඬුවකින් ඇල්ලුවක් මෙන් ඒ කොකාගේ බොටුව තරව අල්වාගෙන "දැන් තොප යව"යි කීහ. කොකාද කකුළුවා ගෙනගොස් විල දක්වා ලුණුවරණ ගස දිසාවට යන්ට පටන්ගත.

එවිට කකුළුවා කියන්නේ "ඇයි මා විලට නොහැර කොයිගෙන යවුද?"යි කී කල්හි "කිමෙක්ද කකුළුව, තෝ මට මායම් කියයිද? තෝ මගේ නඟකගේ (නංගි කෙනෙකුගේ) බුහුණනියකගේ (සොහොරියකුගේ) පුතෙක්ද? තෝ මා තා උසුලා ඇවිදිනා කොල්ලකුයයි සිතයිද? තෙල(අර) ලුණුවරණ ගසමුල තිබෙන කටු ගොඩ බල, මත්ස්‍යයන් යම්සේ අනුභව කෙළෙම්ද, තාත් එසේම අනුභව කෙරෙමි"යි කිය. එවිට කකුළුවා කියන්නේ "එම්බා කොක, ඒ කුඩමස්සෝ තමන් නුවණ මඳ හෙයින් තට ගොදුරු වූහ. එසේ අප රවටන්නට නොපිළිවන, තාම විනාශයට පමුණුවම්, තෝ නුවණ නැති හෙයින් කැවිලි කෑ පමණක් මුත් තා රැවටුනු බව නොදන්නෙහිය, මියතොත් දෙන්නම මියම්හ, දැන් තාගේ බෙල්ල කපා බිම හෙලමි"යි කියා අඬුවකින් ඇල්ලුවක් මෙන් තමා නළින් තරව ඔහුගේ බොටුව ඇල්වීය.

එකල කොකා කරකැවි බෙල්ල නමා කට දල්වා ඇස් උඩ හිඳුවා කඳුළු වම්මා(වගුරුවා) මරණ භයින් තැතිගෙන "ස්වාමීනි, කකුළුවාණෙනි, නුඹට කිසි අවැඩක් නොසිතමි, නොකරමි, මට ජීවිතදානය දුනමැනවැ"යි කීය. "එසේ විනම් සෙමෙන් අහසෙන් බැස මා තෙල විලට ඇරපියව"යි කීය.

එවිට කොකාද නැවත කරකැවී ගොස් විලට බැස විල කෙළවර මඩපිට කකුළුවා තුබුයේය. කකුළුවා කතුරකින් පියම් දණ්ඩක් කපන්නාක් මෙන් කොකාගේ බොටුව දෙකට කපා දියට වන්නේය. ඒ ආශ්චර්ය්‍යය දුටු ලුනුවරණ ගසෙහි දේවතාවා සාධුකාර දී සියලු වනය උන්නාදකොට(දෝංකාර ගන්වා) මිහිරි කටහඬින් මෙසේ කීයේය.

මේ ලෝකයෙහි අතිශයින්ම වංචාබුද්ධි ඇති තැනැත්තේ හැමතැනම ඒ වංචාවෙන් සැපසේ පිහිටන්ට නොපිළිවන හෙවත් එක තැනකදී දෙතැනකදී වංචාවෙන් ජයගත හෙයි, ඇම කල්හි ම ජයගත නොහැක්කේය. ඒ සොරසිත් ඇති පාපී සත්‍වයා තමාට අවැඩක් ලබන්නේය.කැමති දෙය නොලබන්නේය. කුමක් මෙන්ද යතහොත් කකුළුවාගෙන් ග්‍රීවච්ඡේදයට(ගෙළ සිඳ ගැනීමට) පැමිණි කොකා මෙනි. හෙවත් යම්සේ කකුළුවා කොකාගේ බොටුව කැපීද එපරිද්දෙන්ම වන්නේය”යි මේ අර්ථය ප්‍රකාශකොට බෝධිසත්‍වයෝ වනය එකනින් නාදකොට ධර්මදේශනා කළසේක. සුරාසුරචක්‍රවාරු චූඩාමාණිමරීචිසඤ්චය පරිචුම්බිතචරණනඛ මයුඛජ්වාලා ඇති(උතුම් වූ සුර අසුර සමූහයාගේ මනොඥ වූ චූඩාමාණික්‍යවලින් විහිදුනු රැස් සමූහය වැදුනු ශ්‍රීපාදවල නියරැස් සමූහයෙන් යුත්) බුදුරජාණන් වහන්සේ වදාරණසේක් “එම්බා මහණෙනි, දැන්මතු නොවෙයි, පෙරත් වංචා දන්නවුන් වංචා කෙළෙම් වේදැ”යි වදාරා මේ ධර්මදේශනාව පූර්වාපර සන්ධි ගළපා මේ ජාතකය නිමවා වදාළසේක.

“එසමයෙහි කොකා නම් දැන් දෙව්රම් වෙහෙර වසන කෙරාටික ස්වභාව ඇති චීවරවඩ්ඪකි මහණ වන්නේය. එකල්හි කකුළුවා නම් දැන් මේ පිටිසර වසන වංචාබුද්ධි දන්නා මහණ වන්නේය. එකල ලුණුවරණ ගසෙහි අධිගෘහිත දිව්‍ය පුත්‍රයා නම් ලෝකදිවාකර වූ(ලොවට හිරු බඳුවූ) මම්ම වේදැ”යි තමන් වහන්සේ ගෙනහැර දක්වා වදාළසේක.

## 039. නන්ද ජාතකය

තවද එක් සමයෙක්හි බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසනසේක් සැරියුත් මහතෙරුන් වහන්සේගේ සෘද්ධිවිහාරික(අතවැසි) භික්ෂු කෙනෙකුන් අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ භික්ෂූන් වහන්සේ වනාහි කීකරුය, වචනයෙන් ඉවසනසේක, සැරියුත් මහතෙරුන් වහන්සේට මහත් ව්‍යායාමයෙන්(උනන්දුවෙන්) උපකාර කරනසේක. ඉක්බිත්තෙන් එක් සමයෙක්හි සැරියුත් මහතෙරුන් වහන්සේ බුදුරජාණන් වහන්සේට සැළකොට දනව් සැරිසරා වඩනාසේක් දක්ෂිණාගිරි ජනපනදයට වැඩිසේක. ඒ කීකරු භික්ෂූන් වහන්සේ ඒ ජනපදයට වැඩිකල්හි දැඩිමන් ඇතිව(තද මාන්නයෙන් යුතුව) තෙරුන් වහන්සේගේ වචනය නොකරනසේක. “ඇවැත්නි, මෙනම් දෙය කරව”යි කී කල්හි වනාහි තෙරුන් වහන්සේට ප්‍රතිපක්ෂ(විරුද්ධ) වූයේය. ස්ථවිරයන් වහන්සේ ඔහුගේ අදහස් නොදන්නාසේක. තෙරුන් වහන්සේ ඒ ජනපදයෙහි සැරිසරා නැවත ජේතවනාරාමයට වැඩිසේක. ඒ භික්ෂූන් වහන්සේ

තෙරුන් වහන්සේට ජේතවනා විහාරයට ආ කල් තැන් පටන් නැවත එබඳු ගුණයෙන් (පෙර පුරුදු කීකරු ගුණයෙන්) යුක්ත වූසේක. තෙරුන් වහන්සේ සර්‍වඥයන් වහන්සේට දැන් වූසේක. “ස්වාමීන් වහන්ස, මාගේ එක් සද්ධිවිහාරික භික්ෂු කෙනෙක් එක් තැනෙක්හි සියයක් දී ගත් දාසයෙකු මෙන් වන්නේය(මුදලට ගත් වහලෙකු මෙන් නිහතමානී වන්නේය) එක් තැනෙක්හි දැඩිමන් ඇතිව ‘මෙනම් දෙයක් කරව’යි කියනු ලබන්නේ ප්‍රතිපක්‍ෂ වන්නේය”යි දැන් වූසේක.

සර්‍වඥයන් වහන්සේ වදාරණසේක් “ශාරිපුත්‍ර ස්ථවිරයෙනි, මේ මහණතෙම මෙබඳු ශිලී වූයේ(ස්වභාව ඇත්තෙක් වූයේ) දැන්මතු නොවෙයි, පෙරත් මේ තෙම එක් තෙනකට ගියේ සියයක් දී ගත් දාසයකු මෙන් වන්නේය. එක් තෙනකට ගියේ ප්‍රතිපක්‍ෂව පිළිසතුරු වන්නේය”යි(විරුද්ධ වී සතුරෙකු මෙන් වන්නේය) වදාරා තෙරුන් වහන්සේ විසින් යාඥාකරන ලදුව ඉකුත්වත් ගෙනහැර දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහබෝධිසත්‍වයන් වහන්සේ එක් කෙළෙඹි කුලයෙක්හි පිළිසිඳ ගත්සේක. අප මහාබෝසතාණන් වහන්සේගේ යහළු වූ එක් කෙළෙඹි පුත්‍රයෙක් ඇත්තේය. හෙතම වෘද්ධය(මහළුය), ඔහුගේ භාර්යාව වනාහි ළදරුය (තරුණය). ඒ තරුණ ස්ත්‍රී තොමෝ වෘද්ධ පුරුෂයා නිසා පුත්‍රයකු ලද්දිය. ඒ පුරුෂතෙම සිතනුයේ “මේ ස්ත්‍රී තරුණ බැවින් මාගේ ඇවෑමෙන් කිසියම්

පුරුෂයකු ගෙන මේ වස්තුව නසන්නීය. මාගේ පුත්‍රයාහට නොදන්නීය. මම මේ ධනය පෘථිවිගත කෙළෙම් නම් යෙහකැ"යි සිතා ගෙයි නන්ද නම් දාසය කැඳවාගෙන වනයට ගොස් එක් තැනෙක්හි ඒ වස්තුව නිධානගත කොට ඕහට කියා "පින්වත් නන්ද නම් දාසය, මේ වස්තුව මාගේ ඇවෑමෙන් මාගේ පුත්‍රයාහට කියව, ඒ වස්තුව පරිත්‍යාග නොකරව"යි කියා ඕහට අවවාද දී කාලක්‍රියා කෙළේය.

ඔහුගේ පුත්‍රද අනුක්‍රමයෙන් වැඩිවිය පැමිණියේය. ඉක්බිත්තෙන් ඕහට මෑණියෝ මෙසේ කිවුය "පුත්‍රය, තොපගේ පියාණෝ නන්ද නම් දාසයා කැඳවාගෙන වස්තුව නිධාන කෙළේය, ඒ වස්තුව ගෙන්වාගෙන කුටුම්බසණ්ඨාපනය කරව"යි(පවුල නඩත්තු කරවයි) කිවුය. ඒ පුත්‍රතෙම එක් දවසක් නන්ද නම් දාසයහට කියනුයේ "මලණුවෙනි, මාගේ පියාණන් විසින් කිසි වස්තුවක් නිධාන කරන ලද්දේ ඇද්දැ"යි කීයේය. "එසේය ස්වාමිනි වහන්සේයැ"යි කීයේය. "ඒ වස්තුව කොතැන්හි නිධාන කරන ලද්දේදැ"යි විචාළේය. "ස්වාමීන් වහන්ස, වනයෙහිය"යි කීයේය. "එසේ විනම් යම්හ"යි කියා උදැල්ලක් හා කූඩයක් ගෙන නිධාන තිබෙන තැනට ගොස් "මල (මල්ලියේ), වස්තුව කොතැන්හිදැ"යි කීයේය.

නන්ද නම් දාසයා නැගී වස්තුව මත්තෙහි සිට වස්තු නිසා මානය උපදවා "කොල(බොල) දාසී පුත්‍රය, මෙහෙකරුව, තොපට මෙතැන්හි වස්තු කොයින්දැ"යි කුමාරයාහට ආක්‍රෝශ කෙළේය. කුමාරතෙම ඔහුගේ පරුෂවචන අසා නොඇසුනාක්

මෙන්ව "එසේ වීනම් යම්හ"යි කියා ඔහු කැඳවාගෙන ආපසු අවුත් නැවත දෙතුන් දවසක් ඉක්මවා ගියේය(නිධානය ඇති තැනට ගියේය). නන්ද නම් දාසතෙම එලෙසම ආක්‍රෝශ කරන්නේය. කුමාරයා ඔහු හා සමඟ පරුෂවචන නොකියාම ආපසු අවුත් "මේ දාසතෙම මෙතැන් පටන් 'වස්තුව කියන්නෙමි' කිය කියා යන්නේය. ගොස් වනාහි ආක්‍රොශ කරන්නේය. එහි කාරණා නොදන්නෙමි, මාගේ පියාණන්ගේ යහළු වූ කෙළෙඹි පුත්‍රයෙක් ඇත්තේය, ඔහු අතින් විචාරා දැන ගනිමි"යි කියා බෝධිසත්වයන් වහන්සේගේ සමීපයට ගොස් ඒ සියලු ප්‍රවෘත්තිය කියා "පියාණෙනි, කවර කාරණාවක්දැ"යි විචාලේය.

බෝධිසත්වයන් වහන්සේ කියනසේක් "පුත්‍රය, යම් තැනෙක්හි සිට නන්ද නම් දාසතෙම ආක්‍රොශ කරන්නේද, තොපගේ පියාණන් සන්තක වස්තුව එතැන්හිමය, ඒ කාරණයෙන් යම් තැනෙක්හිදී තොපට නන්ද නම් දාසතෙම ආක්‍රෝශ කරන්නේද එතැන්හිදී ම ඔහු 'කොල දාසය වරෙව'යි කියා ඇද දමා උදැල්ලක් ගෙන එතැන බිඳ කුලසන්තක(තම පවුලට අයත්) වස්තුව නිකුත්කොට(එළියට ගෙන) දාසයා ලවා ඔසවා වස්තුව ගණුව"යි කියා මෙසේ කීසේක.

"කුලජාත(ගෙදරම උපන්) දාසියගේ පුත්‍ර වූ නන්ද නම් දාසතෙම යම් තෙනෙක්හි සිටියේ පරුෂකොට ගර්හා(නින්දා) කෙරේද, බෙණෙ ද(කථා කරයිද), සොභන වර්ණ සාම්‍යයෙන්(ලක්‍ෂණ පාට අතින් ඇති සමානත්වය නිසා

'සොභනවර්‍ණ' නම්වූ) ස්වර්‍ණ රජතමණිමුක්තාප්‍රවාලාදීන් නිර්වෘත්ත වූ රාශියද ස්වර්‍ණමාලාද(රන් රිදී මැණික් මුතු පබළු ආදියෙන් යුතු වස්තු සමූහයද රන්මාලාද) යම් තැනෙක්හි ඔහු(නන්‍ද නම් දාසයා) සිටී ද, එතැන්හියයි සිතමි"යි කියා බෝධිසත්‍වයන් වහන්සේ කුමාරයාහට වස්තු ගන්නා උපාය වදාළසේක. කුමාරතෙම බෝධිසත්‍වයන් වහන්සේට වැඳ ගෙට ගොස් නන්ද නම් දාසයා කැඳවාගෙන නිධාන තිබෙන තැනට ගොස් අවවාද කී පරිද්දෙන් පිළිපැද ඒ වස්තුව ගෙන කුටුම්බසණ්ඨාපනය කොට බෝධිසත්‍වයන් වහන්සේගේ අවවාදයෙහි සිටියෙහි සිටියේ දානශීලාදී වූ පින්කම්කොට ජීවිතයාගේ කෙළවර කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියසේක.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ වදාරණසේක් "මේ මහණ පෙරත් මෙබඳු ශීලී වූයේය"යි වදාරා මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා පූර්‍වාපර සන්ධි ගළපා මේ 'නන්ද ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි නන්ද නම් දාසතෙම මේ සැරියුත් මහතෙරුන් වහන්සේගේ සද්ධිවිහාරික වූ භික්ෂූහුය. නුවණැත්තා වූ කෙළෙඹි පුත්‍රව උපන්නෙමි තිලෝගුරු සම්‍යයක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 040. ඛදිරඞ්ගාර ජාතකය

තවද එක් සමයෙක්හි මෛත්‍රී නැමැති ජලයෙන් නිමවනලද කොපාග්නි (කෝපය නැමති ගිනි) ඇති තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසනසේක් අනේපිඬු මහසිටාණන් අරභයා මේ ජාතකය වදාළසේක.

අනේපිඬු මහසිටාණෝ විහාරයම උදෙසා සුපණස්කෙළක්(පණස් හතර කෝටියක්) ධන සර්‍වඥ ශාසනයෙහි විසුරුවා රත්නත්‍රයෙහි සරණ හැර අන් තැනෙක්හි රත්නසංඥවක්(රත්නය යන හැඟීමක්) නූපදවා සර්‍වඥයන් වහන්සේ දෙව්රම් වෙහෙර වසන කල්හි දවසක් පාසා තුන්විටකම උපස්ථානයට යන්නාහුය. උදෑසනම එක්වරෙක යෙති, දවල් බත් අනුභවකොට ඉක්බිති එක්වරෙක යෙති. සවස් වේලෙහි එක්වරෙක යති, තවත් අතරතුරෙහි උපස්ථානයට යෙති.

මෙසේ යන්නාවූ අනේපිඬු මහසිටාණෝ “කුමක් ඇරගෙන අවුදෝහෝයි සාමණේරයන් වහන්සේ හා ළදරු භික්ෂූන් වහන්සේ මාගේ අත බලනසේක් වේදෑ”යි කියා සිස් වූ අතින් එක් දවසකුත් නොගිය විරූය. උදෑසන යෙත් නම් කැඳ අවුළු පත් ගෙන්වා ගෙන යෙති. වළඳා අන්තයෙහි යෙත් නම් ගිතෙල් මී උක්සකුරු ආදිය ගෙන්වා ගෙන යෙති. සවස් වේලෙහි යෙත් නම් සුවඳමල් හා සිවුරු පිළි ආදිය ගෙන්වා ගෙන යති. මෙසේ දවසක් දවසක් පාසා කරන්නාවූ වස්තු පරිත්‍යාගයෙහි ප්‍රමාණයෙක් නැත්තේය. වෙළඳාම් කරන්නා වූ

බොහෝ දෙනෙක් ඒ සිටාණන්ට පත්ලා(ගිවිසුම් පත්‍ර පිට) අටලොස් කෙළක් වස්තු ණයට ගත්තාහුය. ඒ වස්තු මහාසිටාණෝත් නොඑලවති(නොඉල්වති). අනික් මුතුන් මිත්තන් ආදීන් සන්තක අටලොස් කෙළක් වස්තු ගංතෙර නිධානකොට තබන ලද්දේය. ඒ වස්තු වරින්වර ගඟ මහවතුර ඊමෙන් ගංඉවුර බුන්කල්හි(බිඳිගිය කල්හි) මහා සමුද්‍රයට වැද ඇස් ඔබන ලද පරිද්දෙන්ම සැළවල්(මුදල් දමා සීල් තබනලද ලොකුහැලි ඒ සැටියෙන්ම) මහා සමුද්‍රය ඇතුලෙහි පෙරලි පෙරලී ඇවිදිනාහ.

සිටාණන්ගේ ගෙයි පන්සියයක් භික්‍ෂූන් වහන්සේට නිරන්තරයෙන් බත් තබා දෙන ලද්දේය. ඒ සිටාණන්ගේ ගෙය පන්සියයක් භික්ෂූසංඝයා වහන්සේට සතරමං සන්ධියක කරනලද පොකුණක් හා සමාන වන්නේය. සියළු භික්‍ෂූන් වහන්සේට මව්පිය තනතුරෙහි පිහිටියෝය. එසේ හෙයින් ඒ සිටාණන්ගේ ගෙට බුදුරජාණන් වහන්සේත් වඩනාසේක. අසූ මහසව්වන් වහන්සේත් වඩනාසේක. සෙසු යන එන භික්‍ෂූන් වහන්සේගේ පමණෙක් නම් නැත්තේය. ඒ සිටාණන්ගේ ගෙය සත්මහලක් ඇත්තේය, දොරටු සතකින් හෙබියේය.

ඒ සිටාණන්ගේ සතරවෙනි දොරටුවෙහි එක් මිත්‍යාදෘෂ්ටි දෙවිදුවක් වසන්නීය. සර්‍වඥයන් වහන්සේ සිටාණන්ගේ ගෙට වඩනා කල්හිත් පිටතට වඩනා කල්හිත් තමාගේ විමන සිටින්නට අසමර්ථව දරුවන් වඩාගෙන බැස බිම සිටිනීය. අසූ මහසව්වන් වහන්සේ හා අවශේෂ ස්ථවිරයන් වහන්සේ වදනා

කල්හිත් විමනින් බැස බිම සිටිනීය. ඕතොමෝ මෙසේ සිතුවාය "ශ්‍රමණ භවත් ගෞතමයාණන් වහන්සේත් ශ්‍රාවකයන් වහන්සේත් මේ ගෙට වදනා කල්හිත් නික්මෙන කල්හිත් මට සැපයක් නැත්තේය, හැම කල්ම බැස බිම සිටින්ට නොපිළිවන් වන්නේය. යම් සේ මොහු මේ ගෙට නොවදිත් නම් මා විසින් එපරිද්දෙන් කරන්ට වටනේය"යි සිතා ඉක්බිත්තෙන් එක් දවසක් සිටාණන්ගේ සියලු කාරියෙහි නියුක්ත පුරුෂයා (කාරිය කරවනරාළ අයකැමියා) වැදහොත් තැනට ගොස් ආලෝකයක් පතුරුවා සිටියාය. "මේ තෙම කවුරුදැ?"යි කී කල්හි "මම සතවන දොරටුවේ අධිගෘහිත දේවතාදූය"යි කිවුය. "කුමක් පිණිස අවුදැ?"යි විචාළ කල්හි "තොපගේ සිටාණන්ගේ ක්‍රියාවක් නුදුටුද? තමන්ගේ අන්තිම අවස්ථාව(අවසාන කාලය) නොබලා වස්තුව පිටත්කොට ශ්‍රමණ භවත් ගෞතමයන්ම පුදති, වෙළඳාමක් නොකරති, පොලියක් පිට නොලති, අවශේෂ වූ සීවප් ආදී(සෙසු සීසෑම් හා වැපරීමාදී) කිසි කර්මාන්තයකුත් නොකරවති. එසේ හෙයින් සිටාණෝ තමන්ගේ කාර්යය යම්සේ කරවත් නම් ශ්‍රමණ භවත් ගෞතමයෝ යම්සේ ශ්‍රාවකයන් හා සමඟ මේ ගෙට නොවදිත් නම් එපරිද්දෙන්ම තොප සිටාණන්ට අවවාද කරව"යි කිවුය.

ඉක්බිත්තෙන් ඒ දේවතා දුවට සිටාණන්ගේ කාරිය කරන්නා වූ පුරුෂයා කියන්නේ "නුවණ නැත්තා වූ දිව්‍ය ස්ත්‍රිය, සිටාණන් වහන්සේ වස්තු වියදම් කරණසේක් නෛර්යාණික වූ(නිවනට පැමිණ වන්නාවූ) සර්වඥ ශාසනයෙහි වියදම් කළසේක. ඉදින් ඒ සිටාණන් වහන්සේ මාගේ

කෙස්වැටිය අල්වා ඇදගෙන ගොස් විකුණන සේක් වීනම් මම ඊට උත්තරයක් නොකියමි. එසේ හෙයින් තෝ මෙතැන නොසිට පලායව''යි භය ගැන්විය. නැවත එක් දවසක් සිටාණන්ගේ වැඩිමහලු පුතණුවන් සමීපයට ගොස් එසේම අවවාද කළාය. ඒ ප්‍රධාන පුත්‍රතෙමේත් පළමු පරිද්දෙන්ම භය ගැන්වූයේය. සිටාණන් හා සමග කථා කරන්ට අසමර්ථ වන්නීය. සිටාණන්ට නිරන්තරයෙන් දන්දීමෙන් හා වෙළඳාම් නොකිරීමෙන් අය මඳ වූ කල්හි වස්තුව නිමා ගියේය.

ඉක්බිත්තෙන් ඒ සිටාණන් ක්‍රමයෙන් දිළිඳු බවට පැමිණි කල්හි අදිනා පිළිත් හෝනා හිඳිනා දැත් (නිදන වාඩිවන භාණ්ඩත්) භෝජනයත් පෙරසේ නොවන්නේය. මෙසේ දුක්පත් බවට පැමිණත් භික්ෂු සංඝයා වහන්සේට දන් දෙති. මධුරකොට දන්දෙන්නට අසමර්ථයෝය. ඉක්බිත්තෙන් එක් දවසක් නමස්කාරකොට උන්නා වූ සිටාණන්ට සර්වඥයන් වහන්සේ වදාරණසේක් ''සිටාණෙනි, තව දක්වා (තවමත්) තොපගේ ගෙයි දන් පවතීදැ''යි විචාළක. එබස් ඇසූ සිටාණෝ කියන්නෝ ''ස්වාමීනි, තව දක්වාත් දෙමින් සිටිමි, දෙන පමණක් විනා සකස්කොට දිය නොහෙමි, කාඩිදෙවනු කොට(ඇඹුල් හොද්දක් සමග) නිවුඩුසාලේ බත් දෙමින් සිටිමි''යි කිවුය. එකල්හි සර්වඥයන් වහන්සේ වදාරණසේක් ''සිටාණෙනි, තෙපි රූක්ෂ වූ(රළු) භෝජනය දෙමියි සිතා නාකුළුවව(අසතුටු කර නොගන්න) සිත ප්‍රසන්න කල්හි බුද්ධ ප්‍රත්‍යෙකබුද්ධ ආර්‍ය්‍යශ්‍රාවකයන්ට දුන්නා වූ දානය රූක්ෂ නම් නොවෙයි, කුමක් හෙයින්ද? යත් විපාක මහත් බැවිනැ''යි

වදාළසේක. සිත ප්‍රසන්න කරන්ට සමර්ථ තැනැත්තහුගේ දානය රූක්‍ෂ නම් නොවෙයි. ඒ මෙසේ දතයුත්තේය.

"නත්ථි චිත්තෙ පසන්නම්හි - අප්පිකා නාම දක්ඛිණා
තථාගතෙවා සම්බුද්ධො - අථවා තස්ස සාවකෙ

නකිර'ත්ථි අනෝමදස්සි - සුපාරිචරියා බුද්ධෙසු අප්පිකා
සුක්ඛාය අලොණකායව - පස්සඵලං කුම්මාස පිණ්ඩියා"

(සිත ප්‍රසන්න වුවහොත් සම්මා සම්බුදු වූ තථාගතයන් වහන්සේ විෂයෙහි හෝ නැතහොත් උන්වහන්සේගේ ශ්‍රාවකයන් වහන්සේ නමක් විෂයෙහි හෝ දෙනලද සුළු වූ හෝ දානයක් පවා මහත් බැවින් සුළු දානකැයි කිව නොහැක.

උසස් දර්ශනයෙන් යුත්ත වූ නිර්වාණදර්ශී වූ බුදුවරුන් විෂයෙහි කරනලද සත්කාර සම්මාන හෝ දාන අතර සුළුයයි කිව හැක්කක් නැත්තේමය. වියලී ගියා වූ ලුණු නැති කැවුමක් දන්දීමෙන් ලද විපාකය බලව.)

තවද සිටාණන්ට සර්වඥයන් වහන්සේ වදාරණසේක් "සිටාණෙනි, තොපි වූ කලී රූක්‍ෂ වූ දානය දෙන්නාහු ආචාර්‍ය්‍යසී පුද්ගලයන්ට දෙව(සතර මාර්ග සතර ඵලයට පැමිණි උතුම් පුද්ගලයන් අටදෙනාහට දෙන්නෙහිය) මම 'වේලාම'

නම් බ්‍රාහ්මණ කාලයෙහි සියලු දඹදිව නගුල් උඩ බැඳවා(ජීවනොපාය වූ සීසෑමාදී කෘෂිකාර්මික කටයුතු නවතා) සියලු යාචකයන්ට සත්රුවන් දෙන්නෙම් පසදාව මහා ගංගාවෙහි (ගංගා, යමුනා, අචරවතී, සරභූ, මහී යන ගංගා පහ) ජලය එක් ගංගාවකට වැද මහවතුරු මඬනා කලක් (උතුරා යන අවස්ථාවක්) මෙන් මහදන් පවත්වන්නෙම් සරණගත වූ(තෙරුවන් සරණ ගියා වූ) පන්සිල් රක්නා වූ කිසිවක්හූ නොලදිමි. දක්ඛිණෙය්‍ය(ලොකෝත්තර පාර්ථනාවක් ඉෂ්ට වේවායි පතා දෙන දන් පිළිගැනීමට සුදුසු) පුද්ගලයෝ නම් මෙසේ දුර්ලභ වන්නාහුය. එසේ හෙයින් තෙපි කවර කාරණයකින් මාගේ දානය රූක්‍ෂය, සකස් නොවෙයි කියා සිත අකුළු වව්දැ"යි වදාළසේක. මෙසේ ම කියා නැවත වේලාම සූත්‍රය වදාළසේක.

ඉක්බිත්තෙන් ඒ දෙවතා දූ ඉසුරුමත් කල ඒ සිටාණන් හා සමග කථා කරන්ට අසමර්ථ වූ තැනැත්තී දැන් දුක්පත්ව ගිය බැවින් "තමාගේ බස් ගන්නේ වේදැ"යි සිතමින් මධ්‍යම රාත්‍රී වේලෙහි ශ්‍රී යහන් ගබඩාවට වැද ආලෝක පතුරුවා ආකාශයෙහි සිටියාය. සිටාණෝ දැක "මේ කවරෙක්දැ?"යි විචාළෝය. "සිටාණන් වහන්ස, මම සතරවෙනි දොරටුවේ අධිගෘහිත දේවතාදූය"යි කිවුය. "කුමක් පිණිස අවුදැ?"යි විචාල කල්හි "නුඹවහන්සේට අවවාද කියනු කැමතිය"යි කිවුය. "එසේ වීනම් කියව"යි කී කල්හි "මහසිටාණන් වහන්ස, නුඹවහන්සේ අන්තිම අවස්ථාවත් නොසිතන සේක. දූ දරුවන් බුහුනන් (සොහොයුරියන්) නොබලනසේක. ශ්‍රමණ භවත්

ගෞතමයන්ගේ ශාසනයෙහි බොහෝ සම්පත් විසුරුවන ලද, නුඹවහන්සේ බොහෝ කලක් වස්තු වියදම් කිරීමෙනුත් කෘෂිවණික්(ගොවිතැන හා වෙළදාම) ආදී වූ කර්මාන්තයන් නොකිරීමෙනුත් ශ්‍රමණ භවත් ගෞතමයන් නිසා දුක්පත්ව ගියසේක. එසේ වුවත් නුඹවහන්සේ ශ්‍රමණ භවත් ගෞතමයන් හැරනොපියනසේක. අද දක්වාත් ශ්‍රමණයෝ නුඹවහන්සේගේ ගෙට වදිත්මය. ඒ ශ්‍රමණයන් විසින් යම් වස්තුවෙක් පළමු ගෙනයන ලද්දේ විනම් ඒ වස්තුව නැවත පෙරලා(ආපසු) ගෙන්වා ගන්ට නොපිළිවන් වන්නේය. ගත් දෙයක් ගත්තේමය. මෙතැන් පටන් නුඹවහන්සේත් ශ්‍රමණ භවත් ගෞතමයන් කරා නොගිය මැනව, ඒ ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ශ්‍රාවකයනුත් ගෙට වැද්ද නුදුන මැනව, ශ්‍රමණ භවත් ගෞතමයන් කරකැවී සිටත් නොබලා නුඹවහන්සේගේ ගොයිතැනුත් වෙළඳාමුත් කොට කුටුම්බසණ්ඨාපනය(පවුල් නඩත්තු කිරීම) කළ මැනවැ''යි කිවුය.

එකල්හි සිටාණෝ ඒ දෙව්දුවට කියන්නෝ "මේ තොප මට දෙන්නාවු අවවාදදැ''යි කිවුය. "එසේය, මේ මා දෙන අවවාදය''යි කී කල්හි "තොප බඳු වූ දෙව්දූන් සියයකිනුත් දහසකිනුත් ලක්‍ෂයකිනුත් සොළවාලිය නොහැකි කොට (වෙනස් කළ නොහැකිසේ කොට) දශබලධාරී වූ බුදුරජාණන් වහන්සේ විසින් නිශ්චය කරන ලද්දේම් වීම්(තීරණය කරන ලදුවෙම් හෙවත් සෝවාන් කරන ලද්දෙම්). මාගේ ශ්‍රද්ධාව වනාහි මෙර මෙන්(මහමේරු පර්වතයසේ) නිශ්චලව පිහිටියාය. මා විසින් නෛර්යානික වූ රත්නශාසනයෙහි නිර්මල වූ

ශාසනයෙහි වස්තුව වියදම් කරන ලදී. එසේ හෙයින් තී විසින් නොකිය යුත්තක් කියනලද. සර්‍වඥශාසනයට ප්‍රහාරයෙන්(පහරදීමෙන්) නින්දාවක් දෙනලද. මෙබඳු අනාචාර වූ දුස්සීල වූ කාලකන්නි වූ තී හා සමග මා එක ගෙයි වසන්ට සුදුසු නොවෙයි, වහා මාගේ ගෙයින් නික්ම අනික් තැනකට යව”යි කිවුය.

ඒ දේවතා දූ සෝවාන් ඵලයෙහි පිහිටි ආර්‍ය්‍යශ්‍රාවක වූ සිටාණන්ගේ වචනය අසා එතන සිටින්නට අසමර්ථව තමා වසන තැනට ගොස් දරුවන් අත අල්වාගෙන නික්ම අනික් තැනක වසන්ට අවසරයක් නොලැබ “සිටාණන් ක්‍ෂමා කරවා එහිම වෙසෙමි”යි නුවර රැකවල් ගත් දිව්‍යපුත්‍රයා සමීපයට ගොස් නමස්කාර කොට සිටායාය. “කවර කාරණයකින්දැ”යි කී කල්හි “ස්වාමීනි, මම නොසලකා අනේපිඬු මහසිටාණන් හා සමග කථාවක් කෙළෙමි. ඒ සිටාණෝ මට කිපී වසන තැනින් නෙරපූය. මා සිටාණන් සමීපයට ගෙනගොස් ක්‍ෂමා කරවා වසන තැනක් මට දෙව”යි කිව. “තී විසින් සිටාණන් හට කුමක් කරන ලදදැ”යි විචාළ කල්හි “මෙතැන් පටන් බුද්ධොපස්ථානය නොකරව, ශ්‍රමණ භවත් ගෞතමයන් මේ ගෙට වැද්ද නොදෙවයි කීමි ස්වාමීනි”යි කිවුය. එබස් ඇසූ දිව්‍යපුත්‍රයා කියන්නේ “තී විසින් නොකියයුත්තක් කියනලද, ශාසනයට නින්ද කරනලද දෝශාරෝපණය කරනලද, මම තී කැඳවාගෙන සිටාණන් සමීපයට යන්ට උත්සහ නොකරමි”යි කීය.

ඒ දෙව්දුව ඔහු සමීපයෙන් සංග්‍රහයක්(පිළිසරණක්) නොලැබ සතරවරම් රජදරුවන් සමීපයට ගියාය. ඔවුන් විසිනුත් එසේම ප්‍රතික්ෂේප කරන ලද්දී ශක්‍රදේවේන්ද්‍රයන් සමීපයට ගොස් එපවත් කියා "ස්වාමීනි, මම වසන තෙනක් නොලැබ දරුවන් අත අල්වාගෙන පිහිටක් නොලැබ ඇවිදිමි, නුඹවහන්සේගේ ශ්‍රී සමෘද්ධියෙන් මා වසන තැනක් දුන මැනව"යි තරකොට යාච්ඤා කළාය. එබස් අසා ශක්‍රදේවේන්ද්‍රයෝ කියන්නෝ "තී විසින් අයුක්තියක් කියනලද, සර්වඥශාසනයට පහර දෙනලද, මමත් තී නිසා සිටාණන් හා සමග කථා කරන්ට අසමර්ථයෙමි. බල එකෙක් කියමි. සිටාණන් වහන්සේ සමාකරවා ගන්ට එක් උපායක් කියමි"යි කිවුය. "යහපත ස්වාමීනි, කිවමැනව"යි කී කල්හි ශක්‍රදේවේන්ද්‍රයෝ කියන්නෝ "දිව්‍යස්ත්‍රිය, මේ මහසිටාණන් අතින් මනුෂ්‍යයෝ පත්ලා අටළොස් කෙළක් වස්තු ණය ඇරගත්තුය, ඒ වස්තුව තෝ සිටාණන්ගේ නියුක්ත පුරුෂයානන්ගේ(අයකැමියාගේ) වේසය ගෙන කිසි කෙනෙකුන් නොදන්වා ඒ පත් ඇරගෙන තරුණ යක්ෂයන් කීපදෙනෙකුන් විසින් පිරිවරණ ලදුව එක් අතකින් පත් හා එක් අතකින් පන්හිඳක් ගෙන ඒ ණයවැද්දන්ගේ (ණයකාරයන්ගේ) ගෙට ගොස් ගේ මධ්‍යයෙහි සිට තීගේ යක්ෂානුභාවයෙන් ඒ ණයවැද්දන් තැති ගන්වා 'මේ තොප ලු ණයපත,(තොප අත්සන් කළ ණය ගිවිසුම් පත්‍රයයි) අපගේ සිටාණන් වහන්සේ තමන්වහන්සේ ඉසුරුමත් කළ වස්තු ඇති හෙයින් තොප අතින් ණය නොඑල වූසේක(ආපසු නොගත්සේක), දැන්

දුක්පත්ව ගියසේක, එසේ හෙයින් තොප ගත් ණය දෙව'යි තොපගේ යක්ෂානුභාවයෙන් දක්වා ඒ අටළොස් කෙළක් වස්තු එලවාගෙන සිටාණන්ගේ සිස්වු භාණ්ඩාගාරයේ පුරා, අනිකුත් අචිරවතී නම් ගංතෙර නිධාන කළ වස්තුවකුත් ගඟ ඉවුර බිඳිගිය කල්හි සමුද්‍රයට වන්නා ඇත(වැටී ඇත), එයින් තොපගේ ආනුභාවයෙන් දක්වා ඒ ගෙනවුත් කොටුගුළු පුරා අනිකුත් අසවල් තැන අස්වාමික වූ(අයිතිකරුවකු නැති) අටළොස් කෙළක් වස්තු ඇත, ඒත් ගෙනවුත් සිස්වූ කොටගුළු පුරාලව. මේ සිවුපණස් කෙළක් පමණ වස්තුවෙන් සිස්වූ කොටුගුළු පුරාලීම තොපට දඬුවම, මෙසේ දඬුවම් කොට මහසිටාණන් ක්ෂමා කරගන්නැ''යි ශක්‍රදේවේන්ද්‍රයෝ කිවුය.

එබස් ඇසූ දේවතා දූ "යහපත, ස්වාමීනි" කියා ශක්‍රදේවේන්ද්‍රයන්ගේ වචනය පිළිගෙන කියනලද ක්‍රමයෙන්ම සියලු වස්තුව ගෙනවුත් කොටු ගෙවල් පුරාලා මධ්‍යම රාත්‍රි වේලෙහි සිටාණන්ගේ ශ්‍රී යහන් ගබඩාවට වැද ආලෝකය පතුරුවා ආකාශයෙහි සිටියාය. "තොප කවරෙක්දැ''යි කී කල්හි "ස්වාමීනි, මහසිටාණන් වහන්ස, මම නුඹවහනසේගේ සතරවෙනි දොරටුවේ වසන්නා වූ අඥාන වු දිව්‍යස්ත්‍රිය, මෝහයෙන් මුඪ වූ(මුළා වූ) මා විසින් බුදුන්ගේ ගුණ නොදැන පළමු දවසෙක නුඹවහන්සේ හා සමග කළ කථාවෙක් ඇත. ඒ දේෂයට මට ක්ෂමාකොට වදාළ මැනව, තවද ශක්‍රදේවේන්ද්‍රයන් වහන්සේගේ වචනයෙන් නුඹවහන්සේගේම ණය එලවා(ආපසු ගෙන) අටළොස් කෙළක් වස්තුත්, සමුද්‍රයට වන් අටලොස් කෙළක් වස්තූත්, ඒ ඒ තැන අස්වාමික වූ

අටලොස් කෙළක් වස්තූත් එක්කොට සූපණස් කෙළක් පමණ වස්තූ ගෙනවුත් නුඹවහන්සේගේ සිස්වූ කොටගුළු පිරීමෙන් දඬුවම් කරනලද, ජේතවන මහවිහාරය නිසා වියදම් කළ සියළු වස්තුව මා විසින් එක්කොට තබනලද, වසන තැනක් නොලැබ දුක්විඳ ඇවිදිමි, මා නුවණ නැතිව කළ දෙය සිත නොතබා සිටාණන් වහන්ස, මට ක්‍ෂමාකොට වදාළ මැනව”යි කිවුය.

එකල්හි අනේපිඬු මහසිටාණෝ ඇගේ වචනය අසා මෙසේ සිතූය “මේ දෙවිදු දඬුවම් කෙළෙම් කියාත් කියයි, තමාගේ ද්වේෂයත් ගිවිස සිටිනීය, සර්‍වඥයන් වහන්සේ මෑ විනයනය කොට(හික්මවා) තමන්වහන්සේගේ ගුණ දක්වනසේක. එසේ හෙයින් බුදුරජාණන් වහන්සේට දක්වමි”යි සිතා ඒ දිව්‍යස්ත්‍රියට මෙසේ කිවුය.

“දේවතාදුව, ඉදින් මා ක්‍ෂමා කරවනු කැමැත්තෙයි විනම් සර්‍වඥයන් වහන්සේ සමීපයෙහිදී මා ක්‍ෂමා කරව”යි කිවුය. එබස් ඇසූ දෙවිදු කියන්නී “යහපත එසේ කෙරෙමියි සර්‍වඥයන් වහන්සේ සමීපයෙහිදී මා කැඳවාගෙන ගොස් ක්‍ෂමා කළ මැනවැ”යි කිවුය. සිටාණෝ “යහපතැ”යි කියා පාන්ව ගිය ක්ලහි(රැය ගතවී එළිය වැටුනු පසු) උදෑසනම ඒ දිව්‍යස්ත්‍රී කැඳවාගෙන සර්‍වඥයන් වහන්සේ සමීපයට ගොස් ඈ කළ කාරිය සියල්ලම සර්‍වඥයන් වහන්සේට දැන්වූය. බුදුරජාණන් වහන්සේ එබස් අසා “සිටාණෙනි, මේ ලෝකයෙහි පාපී වූ පුද්ගලයාත් යම්තාක් පාපය විපාක නොදේ නම් ඒ

තාක්කල් යහපතක් දක්නේය, යම් කලෙක ඕහට අකුශල කර්මය විපාක දේ නම් එකල අකුශල කර්මයාගේ විපාකයම දක්නේය. කුසල් කළා වූ සත්වයාත් යම්තාක් කුශල කර්මය විපාක නොදේ නම් ඒ තාක් අකුශල කර්ම දක්නේය. යම් කලෙක ඕහට කුශල කර්මය විපාක දේ නම් එකල කුශලකර්ම විපාකයම දක්නේය''යි කියා මේ දම්පියාවෙහි ගාථා දෙක වදාළසේක.

> "පාපොපි පස්සතී භද්‍රං - යාව පාපං න පච්චති
> යදා ච පච්චති පාපං - අථපාපො පාපනී පස්සති"

> "භද්‍රොපි පස්සති පාපං - යාව භද්‍රං න පච්චති
> යදා ච පච්චති භද්‍රං - අථ භද්‍රො භද්‍රානි පස්සති"

(පව්ටා තමන් කළ පව්ටු ක්‍රියාවට විපාක ලැබෙන තුරු සිතන්නේ එම පව්ටු ක්‍රියාව යහපත් දෙයක් ලෙසය. අනිසි විපාක ලැබෙන්නට පටන් ගත් පසු එම ක්‍රියාව පව්ටු බව තේරුම් ගනී)

(දැහැමියා ද තමන් කළ යහපත් ක්‍රියාවට විපාක ලැබෙන තුරු සිතන්නේ එම දැහැමි ක්‍රියාව නිසරු අයහපත් දෙයක් ලෙසය. නමුත් එහි ඉෂ්ට විපාක ලැබෙන විට එය යහපත් ක්‍රියාවකැයි තේරුම් ගනී)

යන මේ ගාථාවෙන් දෙදෙනා වදාළහ. ඉක්බිති ඒ දිව්‍යස්ත්‍රී සෝවාන් ඵලයෙහි පිහිටා සර්වඥයන් වහන්සේගේ චක්‍ර ලක්‍ෂණයෙන් චිහ්නිත වූ (රෝද ලකුණෙන් සළකුණු වූ) ශ්‍රීපාදයෙහි වැටී “ස්වාමීනි, රාගයෙන් රත්වූ, ද්වේෂයෙන් දුෂ්ට වූ, මෝහයෙන් මුඪ වූ, අවිද්‍යාවෙන් අන්ධ වූ නුඹවහන්සේගේ ගුණ නොදන්නා වූ මා විසින් නොකිය යුත්තක් කියනලද, ඊට මට ක්‍ෂමා කොට වදාළමැනවැ”යි කියා සර්වඥයන් වහන්සේ ක්‍ෂමා කරවා අනේපිඬු මහසිටාණන් ක්‍ෂමා කරවූය.

එකල්හි අනේපිඬු මහසිටාණෝ සර්වඥයන් වහන්සේ ඉදිරියෙහි සිට තමන්ගේ ගුණ කියන්නෝ “ස්වාමීනි, දේවතාදූ ‘බුද්ධෝපස්ථානාදිය නොකරව’යි වලකන්නා වූ තැනැත්තී මා වලකාගත නුහුණුවාහුය, ‘දන් නොදෙව’යි මා වලකමින් සිටියදීත් මම දන් දනිම්මය, ස්වාමීනි, මේ මාගේ විශේෂ ගුණ නොවේදැ”යි දැන්වූ කල්හි එබස් ඇසූ සර්වඥයන් වහන්සේ සිටාණන්ට වදාරණසේක් “සිටාණෙනි, තොප වූකලී ශ්‍රොතාපන්න වූ ආර්‍ය්‍යශ්‍රාවකව, අචලශ්‍රද්ධාවෙහි(ස්ථිර ශ්‍රද්ධාවෙහි) පිහිටියව, නිර්මල වූ සම්‍යක් දෘෂ්ටි ඇත්තාහු, එසේ හෙයින් තොප මේ අල්පේශාක්‍ය වූ(ආනුභාවයෙන් හීන වූ) දිව්‍යස්ත්‍රිය වලකමින් සිටියදී නොවැලකී බව ආශ්චර්‍ය්‍ය නො වන්නේය. පෙර නුවණැත්තෝ අබුධොත්පාද කාලයෙහි (බුදුවරයෙකු ලොව නූපන් සමයෙහි) නුවණ නොලැබූ අවස්ථාවෙහි කාමාවචර ඓශ්වර්‍ය්‍යයව(කාමලොක සතෙහි යස ඉසුරට) අධිපති වූ වසවර්ති මාරයා විසින් ආකාශයෙහි සිට ‘ඉඳන් තෙපි දන් දෙවු නම් මේ නරකයෙහි පැසෙනවාදැ’යි

අසූරියනක් පමණ ගැඹුර ඇති කිහිරගුරු වලක්(කිහිරි අඟුරු පිරි වලක්) දක්වා 'දන් නොදෙව'යි වලකන ළද්දහු පොළව පලාගෙන පැනනැගී පියුම්කෙමිය මත්තෙහි සිට දන් දුන්නාහුය. මේ ආශ්චර්‍ය්‍යය"යි වදරා අනේපිඬු මහසිටාණන් විසින් ආරාධිත වූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි පුරනලද බෝධිසම්භාර(පාරමිතා) ඇති අප මහබෝසතාණෝ බරණැස් නුවර සිටුකුලයක ඉපිද අනේකප්‍රකාර වූ සැපයෙන් දිව්‍යකුමාරයකුමෙන් වැඩෙමින් ක්‍රමයෙන් විඥබවට(නුවණැති බවට) පැමිණ සොළොස් ඇවිරිදි කලම සියලු සිල්පයෙහි කෙළවර පැමිණියෝය. ඒ කුමාරයෝ පියාණන්ගේ ඇවෑමෙන් සිටු තනතුර ලැබ නුවර සතරවාසල් දොර දන්හල් සතරෙක, නුවරමැද එකෙක, තමාගේ ගෙදොර එකෙකැයි සදන්හල් කරවා මහදන් දෙති, පන්සිල් රකිති, පෙහෙවස් වෙසෙති. ඉක්බිත්තෙන් එක් දවසක් පෙරවරු වේලෙහි බෝධිසත්ත්වයන්ට නොයෙක් අග්‍රරසයෙන් යුක්ත වූ භොජනය එලවූ කල්හි එක් පසේබුදු කෙනෙකුන් වහන්සේ සතියක් ඇවෑමෙන් නිරෝධ සමාපත්තියෙන්(සිතේ ක්‍රියාකාරිත්වය නතර කිරීමේ සමාපත්තියෙන්) නැගී සිඟන වේලාව සලකා "අද මා විසින් බරණැස්නුවර සිටාණන්ගේ ගෙදෙරට යන්ට වටනේය"යි සිතා නාලිය දැවටු වළඳ(නාලිය නම් කෝටුවලින් සෑදු දැහැටිකූරුවලින් දත්මැද) අනවතප්පත විලින් මුව සෝද රත්ගල්තලා (රතුපාට ගල් තලයක්) මුදුනෙහි සිට අඳනය

ඇඳ ඊමත්තෙහි පටිය බැඳ සගල සිවුරෙන් ගැටවටු ගන්වා(දෙපට සිවුරෙහි පහත කොන්දෙක සුළඟට ඔබමොබ විහිදීම නතර කිරීම සඳහා එකට ගැටගසා) සෘද්ධියෙන් උපන්නාවූ මැටිපාත්‍රයක් ගෙන ආකාශයෙන් ගොස් බෝධිසත්‍වයන් අනුභව කරන්නට තලියේ බත්ලූ ඇසිල්ලෙහිම ගෙදොර වැඩසිටිසේක.

බෝධිසත්‍වයෝ ඒ පසේබුදුන් වහන්සේ දැකලාම අස්නෙන් නැගී සිට ආදර දක්වා අතවැස්සා මුණ බැලූය. ඔහු විසින් "කුමක් කෙරෙම්ද ස්වාමීනි" කී කල්හි "පසේබුදුන් වහන්සේගේ පාත්‍රය ගෙනවු"යි කිවුය. එකෙණෙහිම පාපී වූ වසවර්තීමාරයා කම්පිත වෙමින් නැගීසිට "මේ පසේබුදුන් වහන්සේ අදට සත්වෙනි දවස්(අද දිනට සත් දවසක්) බත් නොලත්සේක, එසේ හෙයින් අද බත් නොලත්සේක් විනම් නස්නා සේක, උන්වහන්සේ නසමි, සිටාණන්ගේ දනයටත් අන්තරායක් කෙරෙමි"යි සිතා එකෙනෙහිම අවුත් මිදුල් මධ්‍යයෙහි අසූරියනක් පමණ අඟුරු වලක් මැවීය. ඒ අඟුරුවල කිහිරඟුවෙන් පිරුණේය. හාත්පසින් දිළිහෙන්නාවූ ගිනිදැල් ඇත්තේය. එකජ්වාලව(එකම ගිනිදැල් ගොඩක්ව) ඇවිලෙන්නේය. අවීචිමහනරකය මෙන් බලන්නාවූ සත්‍වයන්ට වැටහෙන්නේය. ඒ කිහිරඟුරු වල මවා තෙමේ ආකාශයෙහි සිටයේය. පාත්‍රය ගන්නට ගියාවූ පුරුෂයා ඒ කිහිරඟුරු වල දැක මහත් වූ භයින් භවපත්ව වැලැක්කේය.

මහබෝසතාණෝ ඔහු දැක "දරුව තෝ කුමක් නිසා වැලැක්කෙහිදැ?"යි විචාළේය. ඒ පුරුෂයා කියන්නේ "ස්වාමීනි, මේ මිදුල මධ්‍යයේ මහත්වූ අඟුරු වළෙක් ගිනිගෙන දිලියෙන්නේය, ඒකජවාලව ඇවිලෙන්නේය"යි කීහ. තවද අනිකෙක් අනිකෙකැයි එන එන්නෝ සියල්ලෝම භයින් ත්‍රස්තව වේගයෙන් පලාගියාහ. එකල බෝධිසත්වයෝ මෙසේ සිතූහ "අද මාගේ දානයට අන්තරායක් කරණු කැමතිව වසවර්තිමාරයා ඉපිළ නැංගේ වන(පැනගෙන ආවා වියයුතුය), ඒ මාරයා තමාසේම වූ මාරයන් සියයකිනුත් මාරයන් දහසකිනුත් මා සොලවාලීය නොහැකිබව නොදත්වන. අද දැන් මාරයාගේවත් මාගේවත් බල මහත්බව හා ආනාභාව මහත්බව දනිමි"යි සිතා සැරසූ සැටියේම බත්තලිය තුමූම ඇරගෙන ගෙන් නික්ම අඟුරුවල මුවවිට සිට ආකාශය බලා මාරයා දැක "තෝ කවරෙක්හිදැ?"යි විචාළේය. "මම වසවර්තිමාරයාය"යි කී කල්හි "මේ අඟුරු වල තා විසින් මවන ලද්දේදැ?"යි කිවුය. "එසේය මා විසිනැ"යි කී කල්හි "කුමක් පිණිසදැ"යි විචාරා "තොපගේ දානයට අන්තරාය කරනු පිණිසත් පසේබුදුන් වහන්සේගේ ජීවිතාන්තරාය කරනු පිණිසත් කෙළෙමි"යි කීය.

ඒ අසා බෝධිසත්වයෝ කියන්නාහු "මාරය. තා විසින් මාගේ දානයට අන්තරාවක්වත් පසේබුදුන් වහන්සේගේ ජීවිතයට අන්තරාවක්වත් මම කොටලිය නොදෙමි, අද දැන් මාගේවත් තාගේවත් බල මහත් නියාව දනිමි"යි කියා මහබෝසතාණෝ දෘඪ වූ සමාදනයෙන්(දැඩි ආත්ම

විශ්වාසයෙන් යුතුව) බත්තලිය ගෙන අඟුරුවල මත්තට පැනපූය. එකෙණෙහිම අසූරියනක් පමණ ගැඹුරු ඇති අඟුරුවල පත්ලෙහි ඊ ඊ පිට අටගත්තාවූ සත්බුමු(තට්ටු හතකින් යුත්) මහපියුමෙක් උඩනැගී බෝධිසත්වයන්ගේ දෙපය පිළිගත්තේය. ඒ පියුමෙන් තඹක් පමණ රේණු ආකාශයට කරකැවි කැවී නැගී මහබෝසතාණන් වහන්සේගේ ඉස්මුදුනෙහි පටන් සකළ ශරීරය රන්සුන්නෙන්(රත්රන් කුඩුවලින්) නැවරුවාක් මෙන් කෙළේය. එකෙණෙහි මහබෝසතාණෝ පියුම් කෙමිය මත්තෙහි සිට නොයෙක් අග්‍රරසයෙන් යුක්ත වූ භෝජනය පසේබුදුන් වහන්සේගේ පාත්‍රයට පිළිගැන්වූය. පසේබුදුන් වහන්සේ ආහාරය පිළිගෙන අනුමෙවෙනි ධර්මදේශනා කොට පාත්‍රය ආකාශයට හැර මහ ජනයා බලබලා සිටියදීම ආකාශයට පැනනැගී පස්වණක් වලා(පස්පාටකින් යුත් වළාකුල්) මඩිමින් හිමාලය වනයට වැඩිසේක. වසවර්තිමාරයාත් පැරදී දෙමිනසට පැමිණ තමන් වහන්නාවූ ස්ථානයටම ගියේය. බෝධිසත්වයෝ පියුම් කෙමිය මත්තහි සිට මහජනයාට දන්දීම හා සිල්රක්‍ෂා කිරීමෙහි ගුණවර්ණනා කිරීමෙන් ධර්මදේශනා කොට මහජනයා විසින් පිරිවරණ ලදුව තමන්ගේ ගෙටම වැද දිවි පමණින් දානාදී වූ පින්කම් කොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියේය.

ශාස්තෲ වූ බුදුරජාණන් වහන්සේ "සිටාණෙනි, යම් බඳුවූ තෙපි ප්‍රථමමාර්ග (සෝවාන් මාර්ගය) ලැබ දෙව්දුව විසින් දැන් සොලවාලන්ට අසමර්ථවූවාහුය යන යමෙක් ඇත්නම් ඒ තෙමේ ආශ්චර්ය්‍ය නොවන්නේය. පෙර නුවණැතන් විසින් කළ දෙයම

ආශ්චය්‍ය්‍ය වන්නේය"යි මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා පූර්‍වාපර සන්ධි ගළපා මේ 'ඛදිරඞ්ගාර ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි පසේබුදුහු එහිම පරිනිර්‍වාණ කළෝය. වසවර්තිමාරයා පරදවා පියුම් කෙමිය මත්තහි සිට පසේබුදුන්ට බත්තලිය පිළිගැන්වූ බරණැස්නුවර සිටාණෝ නම් සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 041. ලොසක ජාතකය

තවද එක් සමයෙක්හි මොහොදුරට ශරත් සූය්‍ය්‍යයා(මෝහය නැමැති අඳුර දුරු කිරීමට සරත් කාලයෙහි පැයු හිරු) වැනි වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසනසේක් ලොසකතිස්ස ස්ථවිර නම් තෙරකෙනකුන් වහන්සේ අරභයා මේ ජතකය වදාළසේක.

මේ ලොසකතිස්ස ස්ථවිරයන් වහන්සේ නම් කවරේද? යත්, කොසොල්රට එක් තමාගේ කුලය නැසුවා වූ කෙවුල්(ධීවර) පුත්‍රයෙක, සිවුපසය නොලැබෙන භික්ෂූ කෙනෙක. උන්වහන්සේ වනාහී උන්තැනින් චුතව කොසොල්රට එක් කුල දහසක් දෙන වසන්නාවූ කෙවුල් ගමෙක්හි එක් කෙවුල් ස්ත්‍රියකුගේ කුස පිළිසිඳ ගත්තේය. උන් වහන්සේ පිළිසිඳ ගත් දිනයෙහි ඒ කුල දහසක් ගෙවල්වල ඇත්තෝ දැල් ගත අැත් ඇතිව ගංගාවේහිද තඩාගයෙහිද මත්ස්‍යයන්

සොයන්නාහු, එක් කුඩා මත්ස්‍යයකුදු නොලද්දාහුය. එතැන් පටන් ඒ කෙවුලෝ පිරිහෙන්නාහුය. ඔහු මව්කුස උපන් කල්හිම ඔවුන්ගේ ගම සත්වරක් ගින්නෙන් ද ගියේය. සත්වරක් රජුහු විසින් දඩ ගන්නා ලද්දේය. මෙසේ අනුක්‍රමයෙන් දුක්ඛිත වූ ඔහු මෙසේ සිතුවාහුය.

“පූර්වයෙහි අපට මෙබඳු වූ පිරිහීමෙක් නැත්තේය. දැන් වනාහී පිරිහෙම්හ. අපගේ අතරෙහි එක් කාලකන්නියෙක් විය යුතුය. දෙකොට්ඨාසයක් වම්හ”යි (දෙපිරිසක් වෙමුයි) කියා පන්සියය පන්සියය බැගින් එක්වූවාහුය. එයින් යම් කොටසෙක්හි ඔහුගේ මවුපියෝද, එක් කොටසක පිරිහෙන්නේය. අනික් කොටස වැඩෙන්නේය. ඒ කොටසද දෙකොටසක්ව බෙදී ඒ කොටසද දෙකොටසක්ව බෙදී මෙසේ යම්තාක් ඒ කුලය එක්වුයේද(ඒ ගෙය පමණක් තනිවීද) ඒතාක් විභාගකොට ඔහුන්ගේ කාලකන්නි බව දැන තලා නිකුත් කළාහුය(පළවා හැරීය).

ඉක්බිත්තෙන් ඔහුගේ මෑණියෝ දුකින් ජීවත්වන්නී ගර්ගය මුහුකළ(ගැබ මෝරා) කල්හි එක්තැනෙක්හි වැදුවාය. ඒ පශ්චිම භවික සත්‍වයා(නිවන් දක්නා ජාතියෙහි උපන් පුද්ගලයා) නසන්නට නොහැකිය. කළය ඇතුලත තිබෙන ප්‍රදීපයක් මෙන් හෘදයෙහි අර්හත් ඵලයට උපනිශ්‍රය(හේතු සම්පත්) දිලිහෙන්නේය. ඒ ස්ත්‍රිය ඒ ළදරුවා රක්‍ෂාකොට පියවර ඔසවා ඔබ්මොබ හැසිරෙන කල්හි ඒ ළදරුවාට එක්

කබලක්(බඳුනක්) අතට දී "පුත්‍රය, මේ ගෙට වදුව"යි(කෑම සොයා ගැනීමට මේ ගෙට යවයි) කියා පලා ගියාය.

ඒ ළදරු එතැන් පටන් හුදකලාව ඒ ඒ තන්හි භික්‍ෂා(කෑම) සොයා එක් තැනෙක්හි සයනය කරන්නේය, නොම නහන්නේය, ශරීරය නොසරසන්නේය, පාංශු පිශාචයකු(මළ ප්‍රේතයෙකු) මෙන් දුකින් ජීවත් වන්නේය. එතෙම අනුක්‍රමයෙන් සත්ඇවිරිදිව එක් ගෙදොරකඩෙක්හි බඳුන් දෝනා ජලය දැමූ තැන්හි කපුටුවෙකු මෙන් එකි එකී හුල අවුලමින් අනුභව කරන්නේය.

ඉක්බිත්තෙන් දම්සෙනවි සැරියුත් මහතෙරුන් වහන්සේ සැවැත්නුවර පිඩු පිණිස හැසිරෙනසේක් ඔහු දැක "මේ සත්වතෙම ඉතා බැගෑපත් වන්නේය. කවර ගමෙක්හි වසන්නේ දෝ හෝ"යි කියා ඔහු කෙරෙහි මෛත්‍රී සිත වඩා "කොල වරව්"යි වදාළසේක. ඒ ළදරුතෙම ගොස් තෙරුන්වහන්සේට වැඳ සිටියේය. ඉක්බිත්තෙන් ඔහුට තෙරුන් වහන්සේ "කවර ගමෙක්හි වසන්නෙහිද, තමාගේ මව්පිය දෙදෙන කොයිදැ?"යි විචාළසේක. "ස්වාමීන් වහන්ස, මම කිසි පිහිටක් නැත්තෙමි, මාගේ මව්පිය දෙදෙන මා නිසා ක්ලාන්ත වූම්හයි(හිරිහැරයට පත්වූහයි) කියා මා හැර ගියාහුය". වැලිදු වනාහි "පැවිදි වන්නෙහිදැ"යි විචාළසේක. "ස්වාමීන් වහන්ස, මම වනාහි පැවිදි වන්නෙමි. මා වැනි බැගෑපත්හු කවරෙක් පැවිදි කරවන්නේදැ?"යි කීය. "මම පැවිදි කරවන්නෙමි" වදාළසේක. "යහපත පැවිදි කළ මැනව"යි කීය. තෙරුන්වහන්සේ ඔහට

ඛාද්‍යභෝද්‍යාදිය(කෑ යුතු,රස විඳිය යුතු දෑ ආදිය) දී ඔහු ගෙනගොස් ස්වහත්යෙන්ම(සියතින්ම) නහවා පැවිදි කරවා විසිවස් පිරුණු කල්හි උපසම්පද කරවූසේක. එතෙම මහළු වයසට පැමිණි කල්හි ‘ලොසකතිස්ස’ ස්ථවිරයයි කියා ප්‍රසිද්ධ වූයේය. නුවණැත්තේය. ස්වල්ප ලාභ ඇත්තේය.

උන්වහන්සේ විසින් වනාහී අසදෘශ දනයෙහි දු(කොසොල් රජු විසින් දෙනලද අසාමාන දනයෙහිදීද) කුක්ෂිය(කුස) පුරා ආහාර නොලත්විරූසේක. ජීවිතය යැපෙන පමණක්ම ලබනසේක. උන්වහන්සේගේ පාත්‍රයෙහි වනාහි එක් වරක්ම කැඳ කෙණෙස්සක්(හැන්දක්) පිළිගැන්වූ කල්හි පාත්‍රය මුවවිට(කට) දක්වා පිරුණාක් මෙන් පෙනෙන්නේය. ඉක්බිත්තෙන් මනුෂයෝ “මුන්වහන්සේගේ පාත්‍රය පිරුණෝය”යි සිතා යටිදිසාවෙහි(උන්වහන්සේට අනතුරුව සිටි භික්ෂූන්) පාත්‍රවලට කැඳ පිළිගන්වති. ඔහුගේ පාත්‍රයට කැඳ පිළිගන්වන කල්හි මනුෂ්‍යයන්ගේ භාජනවල කැඳ අන්ත්‍රස්ධාන වෙයි (අතුරුදහන් වෙයි) කියාද කියත්, ඛාද්‍යභෝජ්‍යායෙහි දු මෙම ක්‍රමයයි. ඒ ලෝසකතිස්ස ස්ථවිරයන් වහන්සේ එයින් මෑතභාගයෙහි විදර්ශනා වඩා අග්‍ර වූ අර්හත්ඵලයෙහි පිහිටිසේක්ද ස්වල්පලාභී(මඳ ලැබීම් ඇත්තෙක්ම) වූසේක.

ඉක්බිත්තෙන් අනුක්‍රමයෙන් ආයුසංස්කාරය(ආයු කාලය) පිරිහිණු කල්හි උන්වහන්සේගේ පිරිනිවන් පානා දිනය පැමිණියේය. දම්සෙනවි සැරියුත් මහතෙරුන් වහන්සේ ආවර්ජනා කොට(සිහිකර බලා) වදාරණසේක් උන්වහන්සේ

පිරිනිවන් පානා බැව් දැන "ලොසකතිස්ස ස්ථවිරයන් වහන්සේ අද පිරිනිවන් පානාසේක. අද මා විසින් මෝහට යැපෙන පමණක්(කුසට සෑහෙන තරම්) ආහාර දෙන්නට වටනේය"යි සිතා ඕහු කැඳවාගෙන සැවැත් නුවරට පිඬු පිණිස වන්සේක. සැරියුත් මහතෙරුන් වහන්සේ ඒ මහණ නිසා පළමු බොහෝ මනුෂ්‍යයන් ඇති සැවැත් නුවරින් අත දිගුකොට වැඳිම් පමණක්ද නොලත්සේක. ඉක්බිත්තෙන් තෙරුන් වහන්සේ "ඇවැත්නි, යව ආසන ශාලාවෙහි හිඳුව"යි කියා ඕහු යවා "මේ ආහාර ලොසකතිස්ස ස්ථවිරයන් හට දෙව"යි කියා ලත් ආහාර යවූසේක. ඒ ආහාර ගෙන ගියාහු ලොසකතිස්ස ස්ථවිරයන් සිහිනොකොට තෙමේ ම අනුභව කළාහුය. ඉක්බිත්තෙන් තෙරුන් වහන්සේ නැගී සිට විහාරයට වඩනා කල්හි ලොසකතිස්ස ස්ථවිරයන් වහන්සේ ගොස් ස්ථවිරයන් වහනසේට නමස්කාර කළසේක. ස්ථවිරයන් වහන්සේ ආපසු බලා සිටිසේක් ම "ඇවැත්නි, තොප විසින් ආහාර ලද්දේදැ"යි විචාළසේක. "ස්වාමීන් වහන්ස, මම නොලබමි"යි කීසේක. තෙරුන් වහන්සේ සංවේගයට පැමිණ කල්වේලා බැලූසේක. "කල් ඉක්මුනේය"යි දැන තෙරුන්වහන්සේ "මෙහි එව ඇවැත්නි, මෙතැන්හිම හිඳුව"යි කියා ලොසකතිස්ස ස්ථවිරයන් ආසන ශාලාවේ හිඳුවා කොසොල් රජහුගේ මාලිගාවට වැඩිසේක. රජ්ජුරුවෝ තෙරුන් වහන්සේගේ පාත්‍රය ගෙන්වා "ආහාරය පිළිගන්වන්ට විකාලය"යි (නුසුදුසු වේලාව යයි) සිතා පාත්‍රය පුරා චතුමධුර පිළිගැන්වූසේක. තෙරුන්වහන්සේ ඒ චතුමධුර ගෙනගොස් "ඇවැත්නි, එව"යි

කියා ඕහට “මේ චතුමධුර වළඳව”යි කියා පාත්‍රය ගෙනම වැඩසිටිසේක. හෙතෙම තෙරුන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන් ලජ්ජාවෙන් නොවලඳනසේක.

ඉක්බිත්තෙන් තෙරුන්වහන්සේ ඕහට “ඇවැත්නි එව, මම පාත්‍රය ගෙනම සිටිනෙමි, තොපි හිඳ වළඳව, ඉදින් මේ පාත්‍රය අතින් මුක්ත කෙළේ නම් කිසිවකුත් නොවන්නේය”යි වදාළසේක. ඉක්බිත්තෙන් ආයුෂ්මත් වූ ලොසකතිස්ස ස්ථවිරයන් වහන්සේ අග්‍රෛශ්වර වූ(ප්‍රධානතම වූ) දම්සෙනවි සැරියුත් මහතෙරුන් වහන්සේ පාත්‍රය ගෙන සිටියදී ම චතුමධුර වැළඳූසේක. ඒ චතුමධුර තෙරුන්වහන්සේගේ ආයෘී ඍද්ධි බලයෙන් ක්ෂය බවට(නිමාවට) නොගියේයය. එකල්හි ලොසකතිස්ස ස්ථවිරයන් වහන්සේ කැමති පමණක් බඩපුරා වැළඳුසේක. එදිනයෙහි අනුපාදිශෙෂ නිර්‍වාණ ධාතුවෙන්(කෙලෙස් හා පංචස්කන්ධය යන දෙකම අවසන් කරමින්) පිරිනිවන් පෑසේක. සර්‍වඥයන් වහන්සේ සමීපයෙහි සිට ශරිරය ආදහණ කරවූසේක. ධාතූන් වහන්සේ ගෙන චෛත්‍යයක් කළාහුය. එකල්හි භික්ෂූහු දම්සභාවෙහි රැස්ව හිඳ “ඇවැත්නි, ලොසකතිස්ස ස්ථවිරයන් වහන්සේ පින් නැත්තේය, අල්පලාභිය, මෙබඳු පින් නැත්තාවූ අල්පලාභීහූ විසින් කෙසේ ආයෘී ධර්‍මය ලත් සේක්දැ”යි කියමින් හුන්නාහුය. සර්‍වඥයන් වහන්සේ දම්සභාවට වැඩ වදාරා “මහණෙනි, දැන් මේ දම්සභාවෙහි මා එන්නට පෙර කවර නම් කථාවකින් යුක්තව උනුදැ”යි විචාරා වදාළ කල්හි “ස්වාමීන් වහන්ස, මෙනම් කථාවකිනැ”යි දැන්වූවාහුය. සර්‍වඥයන් වහන්සේ

වදාරණසේක් "මහණෙනි, මේ මහණ තෙම තමහට ලාභ නොලබන බවද, ආර්‍ය්‍ය ධර්‍මය ලබන බවද තෙමේම කෙළේය(තමාම කරගතේත්ය). මේ මහණ වනාහි පෙර අන්‍යයනට ලාභාන්තරාය කොට (ලැබෙන ලාභයට බාධාකොට) ස්වල්පලාභී වුයේය. අනිත්‍ය, දුඃඛය, අනාත්ම යයි කියා විදර්‍ශනාවට සුදුසු භාවනාවගේ ඵලයෙන් ආර්‍ය්‍ය ධර්‍මලාභී වූයේය"යි වදාරා ඉකුත්වත් කථාව ගෙනහැර දක්වා වදාළසේක.

යටගිය දවස කාශ්‍යප සර්‍වඥයන් වහන්සේගේ කාලයෙහි එක්තරා භික්ෂු කෙනෙකුන් වහන්සේ එක් කෙළෙඹි පුත්‍රයෙකු නිසා ගමෙක්හි වූ සෙනස්නෙක්හි වසනසේක. පියවි ස්වභාවශීලයෙන්(ස්වාභාවික සිල්වත් ගතියෙන්) යුක්තව විදර්‍ශනාවෙහි යෙදී වසනසේක.

ඉක්බිත්තෙන් එක් ක්ෂීණාශ්‍රව තෙර කෙනෙකුන් වහන්සේ හැම වත් නොහැර වසනසේක්, අනුක්‍රමයෙන් ඒ භික්ෂූන් වහන්සේට උපස්ථාන කරන්නා වූ කෙළෙඹි පුත්‍රයාගේ වසන ගමට පැමිණිසේක. කෙළෙඹි පුත්‍රතෙම තෙරුන් වහන්සේගේ ඊර්‍ය්‍යාපථයෙහි ම(ඉරියවුවලින්ම) ප්‍රසන්නව පාත්‍රය ගෙන ගෙට වැඩම කරවා සකස්කොට වළඳවා මඳක් ධර්‍ම කථාව අසා තෙරුන් වහන්සේට වැඳ "ස්වාමීන් වහන්ස, අපගේ සමීප විහාරයටම වැඩිය මැනව, අපි සවස් වේලෙහි අවුත් දකුම්හ"යි කීයේය. තෙරුන් වහන්සේ විහාරයට ගොස් නේවාසික තෙරුන්වහන්සේට වැඳ ආපුච්ඡා කොට(සුව දුක්

කථාකොට) එකත් පසෙක්හි හුන්සේක. නේවාසික තෙරුන්වහන්සේ උන්වහන්සේ හා සමඟ පිළිසඳර කථාකොට "ඇවැත්නි, නුඹවහන්සේ විසින් භික්‍ෂාහාරය(ආහාරමය දානය) ලබන ලදදැ?"යි විචාළසේක. "එසේය ලදිමි"යි වදාළසේක. "කොතනින් ලත්සේක්දැ?"යි විචාළසේක. "නුඹ වහන්සේගේ ආසන්න ගම කෙළෙඹි පුත්‍රයාගේ ගෙයිනැ"යි කීසේක. මෙසේ ද කියා තමහට සෙනස්නක් විචාරා පටිජග්ගනය(සකස්) කොට පා සිවුරු තැන්පත්කොට තබා ධ්‍යාන සැපයෙන් ඵල සැපයෙන් කල්යවමින් වැඩහුන්සේක.

ඒ කෙළෙඹි පුත්‍රයාද සවස් වේලෙහි සුවඳමල් හා පහන් තෙල්ද ගෙන්වා ගෙන විහාරයට ගොස් නේවාසික තෙරුන්වහන්සේට වැඳ "ස්වාමින් වහන්ස, එක් ආගන්තුක තෙරකෙනෙකුන් වහන්සේ ඇත. වැඩිසේක් දෝ හෝ"යි විචාළේය. "එසේය වැඩිසේක". "දැන් කොතැන්හිදැ?"යි කීයේය. "අසවල් සෙනස්නෙහිය". කෙළෙඹි පුත්‍රතෙම උන් වහන්සේගේ සමීපයට ගොස් වැඳ එකත් පසෙක්හි හුන්නේ ධර්‍ම කථාව අසා ශිතල වේලෙහි චෛත්‍යයටද, බෝධීන් වහන්සේටද සුවඳමල් පුදා පහන් අවුළුවා දෙදෙනා වහන්සේට ආරාධනාකොට ගියේය. නේවාසික තෙරුන් වහන්සේ වනාහි "මේ කෙළෙඹි පුත්‍රතෙම බිඳින්නේය(ස්වභාවය වෙනස්කොට ඇත). ඉදින් මේ භික්‍ෂූන් වහන්සේ මේ විහාරයෙහි වසනසේක් වීනම් මා මේතෙම කිසිවකටත් නොගන්නේය"යි(නොසලකනු ඇතැයි) කියා තෙරුන්වහන්සේ කෙරෙහි අසන්තෝෂ බවට පැමිණ "මේ විහාරයෙහි මුන්වහන්සේ නොවසන ආකාර මා

විසින් කරන්ට වටනේය''යි සිතූසේක. ක්‍ෂීණාශ්‍රව තෙරුන් වහන්සේ ඒ භික්‍ෂුහුගේ අභිප්‍රාය දැන ''මේ ස්ථවිරයතෙම මාගේ කුලයෙහි හෝ ගණයා කෙරෙහි(දායක ගෙවල් සමග හෝ පිරිස සමග හෝ) හෝ නොඇළුනු බව නොදන්නේය''යි සිතා තමා වසන තැනට ගොස් ධ්‍යාන සැපයෙන් ඵල සැපයෙන් කල්යැවූසේක.

නේවාසික තෙරුන්වහන්සේද දෙවැනි දිනයෙහි නියපිටින් ගෙඩිය ගසා (ඝණ්ඨාවට තට්ටු කොට) නිය පිටින් දොරට ආකොටනය කොට(තට්ටු කොට) කෙළෙඹි පුත්‍රයාගේ ගෙට ගියසේක. කෙළෙඹි පුත්‍රතෙම උන්වහන්සේගේ පාත්‍රය ගෙන පනවන ලද ආසනයෙහි වැඩ හිඳිනට සලස්වා ''ස්වාමීන් වහන්ස, ආගන්තුක ස්ථවිරයන් වහන්සේ කොතැන්හිදැ?''යි විචාළේය. ''මම තොපගේ කුළුපග ස්ථවිරයන්ගේ ප්‍රවෘත්තිය නොදන්නෙමි, ගෙඩිය ගැසුයෙමි, දොරට ආකොටනය කරණුයෙමි පුබුදුවා ගන්නට නොහැකි වූයෙමි. ඊයේ දවස තොපගේ ගෙයදී ප්‍රණීත භෝජන වළඳා දිරවා ගන්නට නොහැකි වූයේ දැන් නිද්‍රාවට පැමිණියේ වන්නේය. තොපි පහදින්නාහු මෙබඳු තැන්හිම පහදනාහුය''යි කීසේක.

ක්‍ෂීණාශ්‍රව තෙරුන් වහන්සේ පිබිදැ තමාට භික්‍ෂාචාර වේලාව සලකා ශරීරය ප්‍රතිජග්ගහනය කොට(මල මුත්‍රාදිය කොට නිමවා) පාත්‍රා සිවුරු ගෙන අහසට පැනනැගී අන් තැනකට වැඩිසේක. ඒ කෙළෙඹි පුත්‍රතෙම නේවාසික තෙරුන්වහන්සේට ගිතෙල් මී සකීරායෙන් අභිසංස්කෘත

පායාසය(ගිතෙල් මීපැණි සකරු මිශ්‍රකොට පිළියෙල කළ කිරිබත) වළඳවා පාත්‍රය සුවඳ සුනුයෙන් උලා නැවත පුරවා "ස්වාමීන් වහන්ස, ඒ ආගන්තුක ස්ථවිරයන් වහන්සේ මාර්‍ගීකලාන්ත වූසේක් වන, උන්වහන්සේට මේ ආහාරය ගෙනයව"යි කියා පිළිගැන්වූයේය. නේවාසික ස්ථවිරයන් වහන්සේ ප්‍රතික්ෂේප නොකොටම ගෙනයනසේක් "ඉදින් ඒ භික්‍ෂූන් වහන්සේ මේ ක්‍ෂීරපායාසය වැළඳුසේක් වීනම් ශ්‍රීවය ගෙන නිකුත් කළේ නමුදු(බෙල්ලෙන් අල්ලා එළියට දැමූවත්) නොයනසේක. ඉදින් වනාහි මම මේ ක්‍ෂීරපායාසය මනුෂ්‍යයයන් හට දුන්නේ නම් මාගේ ක්‍රියාව ප්‍රකාශ(ප්‍රසිද්ධ) වන්නේය. ඉදින් දියෙහි දැමීම් නම් දියපිට ගිතෙල් පෙනෙන්නේය. ඉදින් භූමියෙහි දැමුයේ වීනම් කපුටුවන්ගේ රැස්වීමෙන් පෙනෙන්නේය. මේ ක්‍ෂීරපායාසය කොතැන්හි දමම් දේ හෝ"යි පරීක්‍ෂා කරනුයේ මැල(කුඹුරක ඉපනැලි) පුලුස්සන්නාවූ එක් කෙතක් දැක අඟුරු දෙබේකොට(දෙබෑ කර) එහි බහා මත්තෙහි අඟුරෙන් වසා විහාරයට ගියසේක් විහාරයෙහි ඒ භික්‍ෂූන් වහන්සේ නොදැක සිතනසේක් ඒකාන්තයෙන් ඒ භික්‍ෂූන් වහන්සේ ක්‍ෂීණාශ්‍රව කෙනෙක, මා අභිප්‍රාය දැන අන්තැනකට වැඩිසේක් වන, මා විසින් බඩ හේතුකොට ඉතා නුසුදුස්සක් කරන ලදැ"යි සිතූසේක. ඒ ක්‍ෂණයෙහිම ඒ භික්‍ෂූන් වහන්සේට මහත් දෙම්නසක් පහළ වූයේය. එතැන් පටන් කොටම මනුෂ්‍යප්‍රේතව නොබෝ කලකින්ම කාලක්‍රියාකොට නරකයෙහි උපන්නේය.

ඒතෙම බොහෝ වර්ෂ සතසහශ්‍රයක්(අවුරුදු ලක්‍ෂ ගණනක්) නරකයෙහි පැසීගියේය. නිරයෙහි පැසී අවශිෂ්ට(ඉතිරි) කර්මයෙන් පිළිවෙලින් පන්සියයක් ජාතියෙහි යක්‍ෂව ඉපද එක දවසකුදු බඩපුරා ආහාරයක් නොලද්දේය. එක් දවසක් වනාහී ගබමල බඩපුරා ලද්දේය. නැවත පන්සියයක් ජාතියෙහි සුනඛව උපන්නේය. එකල්හිද එක දවසක් උද්ගාරය(වමනය) කරනලද ආහාරයක් බඩපුරා ලද්දේය. සෙසු කල්හි ඔහු විසින් බඩපුරා ආහාරයක් නම් නොලත් විරිය. සුනඛ ජන්මයෙන් චුතව වනාහී කසීරට එක් ගමෙක දුක්පත් කුලයෙක්හි උපන්නේය. ඔහුගේ උත්පත්තියෙහි පටන් ඒ කුලය අතිශයින් දුක්පත් වූයේය. නාභියෙන් මත්තට දියකැඳ පමණකුදු නොලද්දේය. ඕහට වනාහි ‘මිත්තවින්දකය’යි කියා නමෙක් වූයේය. ඔහුගේ මවුපිය දෙදෙන ක්‍ෂුධා දුක්ඛය (බඩසාදුක) ඉවසන්නට නොහැකිව “කාලකන්නිය යව”යි තලා ඔහු නිකුත් කළාහුය(එළවා දැම්මාහුය). මිත්තවින්දක තම පිටිවහලක් නැතිව හැසිරෙනුයේ බරණැස් නුවරට ගියේය.

එසමයෙහි බෝධිසත්‍වයාණන් වහන්සේ බරණැස් නුවර දිසාපාමොක් ආචාර්ව පන්සියයක් මානවකයන්ට ශිල්ප උගන්වන සේක. එකල්හි බරණැස් නුවර වාසීහු දුක්ඛිතයන්ට වැටුප් දී ශිල්ප හික්මවන්නාහුය. මේ මිත්තවින්දකද බෝධිසත්‍වයාණන් වහන්සේ සමීපයෙහි කුශලව ශිල්පය පුරුදු කරන්නේය (ශාස්ත්‍ර ගෙවීමට බැරිව පිනට උගන්නේය). හෙතෙම පුරුෂ අවවාද(වැඩිහිටි අවවාද) නොගන්නේය.

ඔවුනොවුන්ට ප්‍රහාර දෙමින් හැසිරෙන්නේය. බෝධිසත්ත්වයාණන් වහන්සේ විසින් අවවාද දෙනු ලබන්නේද අවවාද නොගන්නේය. ඔහු නිසා උන්වහන්සේට අය මඳ වූයේය. ඉක්බිත්තෙන් මිත්තවින්දක තෙම මානවකයන් හා සමග දබරකොට අවවාද නොගනිමින් එතැනින් ගොස් ඒ ඒ තැන්හි ඇවිදින්නේ එක් පසල්(පිටිසර) ගමකට ගොස් බැලමෙහෙකොට ජීවත් වන්නේය. හෙතෙම එතැන්හි එක් දිළිඳු ස්ත්‍රියක හා සමග තෘෂ්ණාසන්ථවය(කාම සේවනය) කළේය. ඒ ස්ත්‍රී ඔහු නිසා ළදරුවන් දෙදෙනෙකු වැදූවාය. ගම්වැස්සෝ "අපට කටයුතු නොකටයුතු නොකියව"යි කියා මිත්තවින්දකයා හට බලය දී(බලයෙන්) ඔහු ගන්දොර කිළියක(කුටියක) විසීම කරවූවාය. ඒ මිත්තවින්දකයා නිසා ඒ පසල් ගම්වැසියෝ සත්වරක් රජ හට දඩ දුන්නාහුය. සත්වරක් ඔහුන්ගේ ගෙවල් දහන වූවාහුය. සත්වරක් තඩාගයෙහි (ජලාශයෙහි) දිය සිඳුනේය. ඔහු සිතන්නාහු "අපට පළමු මේ මිත්තවින්දකයා නොආ කල්හි මෙබන්ඳක් නැත්තේය. දැන් වනාහි මොහු ආ කල් තැන් පටන් පිරිහෙම්හ"යි කියා ඔහු තලා නිකුත් කළාහුය. හෙතෙම තමාගේ ළදරුවන් ගෙන අන් තැනකට යනුයේ අමුනුෂ්‍යයන් පරිගෘහිත(අරක්ගත්) එක් අරණ්‍යයකට (වනයකට) පැමිණියේය. එතැන්හි අමුනුෂ්‍යයන් ඔහුගේ දරුවන්ද භාර්‍ය්‍යාවද මරා මාංස අනුභව කළාහුය. මිත්තවින්දකයා එතැනින් දිවගොස් ඒ ඒ තැන්හි හැසිරෙමින් ගම්භීර නම් එක් පටුන් ගමකට නැව් හරණා(නැව් දියත් කරන) දිනයෙහිම පැමිණියේ කම්කරුවෙක් ව නැවට

නැගුනේය. ඔහු නැගුණු නැව මුහුදු පිටින් සත් දවස් ගොස් සත්වෙනි දිනයෙහි සමුද්‍ර මධ්‍යයෙහි ඇණ තිබුවාක් මෙන් සිටියේය. ඔහු පව්ටු කුසපත් ලුවාහුය(පව්කාරයා සෙවීමේ කුසපත් ඇද්දාහුය). සතවරක් ම මිත්තවින්දකයා හට පැමිණියේය. නැවෙහි මනුෂ්‍යයෝ ඕහට එක් උණ දඬු කලබක්(උණ දඬුමිටියක්) දී හස්තය අල්වාගෙන සමුද්‍රයෙහි බැහවූවාහුය(දැම්මාහුය). ඔහු දැමූ පමණකින්ම නැව ගියේය.

මිත්තවින්දකතෙම හුණ කලප්හි හෙව සමුද්‍ර පිටින් යන්නේ කාශ්‍යප සර්‍වඥයන් වහන්සේගේ කාලයෙහි මහණව රක්‍ෂාකළ ශීලඵලයෙන්(සීලයේ ආනිසංශයෙන්) මුහුදු පිට එක් ස්ඵටික(පළිඟු) විමානයක්හි දිව්‍ය ස්ත්‍රීන් සතර දෙනෙකු ලැබ ඔහුන්ගේ සමීපයෙහි දිවසැප විඳිමින් සත් දවසක් වාසය කළේය. ඒ විමාන ප්‍රේතයෝ වනාහි සත් දවසක් සැප අනුභව කෙරෙති. සත් දවසක් දුක් අනුභව කරන්නට යන්නාහුය. “යම්තාක් කලකින් අපි එමුද ඒ තාක් කල් මෙතැන්හි වසව”යි කියා ගියාහුය. මිත්තවින්දකයා ඔහුන් ගිය කල්හි හුණ කලප්හි හිඳ මත්තෙහි යනුයේ රිදී විමනෙක්හි දිව්‍ය ස්ත්‍රීන් අට දෙනෙකු ලද්දේය. එයින් මත්තෙහිලු යනුයේ මැණික්මය විමනෙක්හි දිව්‍ය ස්ත්‍රීන් සොලොස් දෙන ද ස්වර්‍ණමය විමනෙක්හි දිව්‍ය ස්ත්‍රීන් දෙතිස් දෙනෙකු ලද්දේය. ඔවුන්ගේද වචන නොකොට(නොඅසා) මත්තෙහි යන්නුයේ තුරු දිවයිනක(දූපතක් අතරේ) එක් යක්‍ෂ පුරයක් දුටුයේය. එහි එක් යක්‍ෂණියක් එළු රූපයෙන් හැසිරෙන්නීය. මිත්තවින්දකයා ඈ යක්‍ෂණී බව නොදන්නේ, “එළු මස් අනුභව කෙරෙමි”යි

සිතා ඇගේ පය අල්වා ගත්තේය. ඕ තොමෝ යක්‍ෂානුභාවයෙන් ඔහු ඔසවා දැමුවාහුය. මිත්තවින්දක තෙම යක්‍ෂණී විසින් දමන ලද්දේ මුහුදු පිටින් ගොස් බරණැස් නුවර පවුරපිට එක් කටුලැහැබක් මත්තේහි වැටි පෙරලෙමින් භූමියේ පිහිටියේය.

එසමයෙහි වනාහී ඒ පවුර පිට රජහුගේ එළුවන් තණ කා ඇවිදින්නවුන් සොරු ගෙන යන්නාහුය. එළුගොව්වෝත් "සොරු ගනුම්හ"යි කියා එකත්පසව සැඟවී සිටියාහුය. මිත්තවින්දකයා පෙරලී භූමියේහි සිටියේ ඒ එළු දෙනුන් දැක "මම සමුද්‍රයෙහි එක් දිවයිනක එළු දෙනක පය අල්වාගෙන ඇ විසින් දමන ලද්දෙමි මෙතැන්හි වැටුනෙමි ඉදින් වනාහි දැන් එක් එළු දෙනකගේ පය අල්වා ගතිම් නම් ඒ එළුදෙන මා මතු සමුද්‍ර මත්තෙහි විමාන දිව්‍ය ස්ත්‍රීන්ගේ සමීපයෙහි දමන්නේය"යි සිතුයේය. හෙතම මෙසේ වූ නුවණින් මෙනෙහිකොට එළුදෙනගේ පය අල්වා ගත්තේය. ඒ එළුදෙන ගත් පමණකින් ඇඬුවාය. එළුගොව්වෝ ඔබිනොබින් අවුත් ඔහු ගෙන "මෙපමණ කලක් රජහුගේ එළුවන් අනුභව කළා වූ මෙතෙම සොරෙකැ"යි කියා ඔහු බැඳ ඇන රජුගේ සමීපයට ගෙන යන්නාහුය. එකිනෙහි බෝධිසත්වයාණන් වහන්සේ පන්සියයක් මානවකයන් පිරිවරාගෙන නුවරින් නික්ම නහන්නට වඩනාසේක. මිත්තවින්දතකයා දැක හැඳින ඒ මනුෂ්‍යයන්ට කියනසේක් "සගයෙනි, මේ තෙම අපගේ අතවැස්සෙකි, කවර හෙයකින් මොහු ගත්තාහුදැ?"යි කීසේක. "ස්වාමීන් වහන්ස, මේ එළුවන් සොරක එක් එළියකගේ පය අල්වා ගත්තේය.

එහෙයින් ගන්නා ලද්දේය"යි කිවුය. "එසේ වීනම් මොහු අපට දස කොට දෙව, අප නිසා ජීවත් වන්නේය"යි කීසේක. ඕහු "යහපත ස්වාමීන් වහන්සේය"යි කියා ඔහු හැර ගියාහුය. ඉක්බිත්තෙන් ඕහට බෝධිසත්‍වයන් වහන්සේ "මිත්තවින්දකය, තෝ මෙතෙක් කල් කොතැන්හි විසීදැ?"යි විචාළසේක. එතෙම තමා විසින් කරනලද ක්‍රියා දැන්වූයේය. බෝධිසත්‍වයන් වහන්සේ "වැඩ කැමැත්තවුන්ගේ වචනය නොකරන තැනැත්තේ මෙබඳු දුකට පැමිණෙන්නේය"යි වදාරා "වැඩ කැමැතිව හිත චින්තනයෙන් අනුකම්පා කරන්නාහුගේ අනුශාසනාව අවවාදය යමෙක් නොකෙරේද, එසේ වූ පුරුෂ තෙම එළුවන්ගේ පය අල්වාගෙන ශෝක කරන්නා වූ මිත්තවින්දකයා මෙන් නිරන්තරයෙන් මිරිකෙන්නේය(පීඩාවට පත්වන්නේය), ශෝක කෙරෙන්නේය"යි කියා බණ වදාළසේක. මෙසේ ඒ තෙරුන් වහන්සේ විසින් මෙපමණ කලක් මුළුල්ලෙහි ත්‍රිවිධ ආත්මයෙක්හි(අත්මභාව තුනක) කුක්‍ෂිය (කුස) පුරා ආහාර නොලත් විරීසේක. යක්‍ෂව උපන් කල්හි එක් දවසක් ගබ්මල ලද්දේය. සුනඛව උපන් කල එක් දවසක් උද්ගාරය කල ආහාරයක් ලද්දේය.

පිරිනිවන් පානා දිනයෙහි දම්සෙනවි සැරියුත් මහතෙරුන් වහන්සේගේ ආනුභාවයෙන් චතුමධුරය(ගිතෙල්, මී පැණි, වෙඬරු,උක්සකුරු යන මිහිරි ආහාර සතර) ලත්සේක.

මෙසේ අන්‍යයන්හට ලාභාන්තරාය කිරීම මහා දෝෂය"යි දත යුත්තේය. ඒ කාලයෙහි ඒ ආචාරීන් වහන්සේද

මිත්තවින්දකයාද කම්වූ පරිද්දෙන් මියපරලොව ගියාහුය. සර්‍වඥයන් වහන්සේ “මහණෙනි, මෙසේ මේ මහණ තෙමේම ස්වල්පලාභී බවද තෙමේම ආයර්‍යධර්මය ලත් බවද කෙළේය”යි කියා මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා වදාරා පූර්‍වාපර සන්ධි ගළපා මේ ‘ලොසක ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි මිත්තවින්දකයා නම් දැන් ලොසකතිස්ස ස්ථවිර වූසේක. දිසාපාමොක් ආචාරිව උපන්නෙම් තිලෝගුරු සම්‍යයක් සම්බුදු රජවූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 042. කපොත ජාතකය

තවද එක් සමයෙක්හි අද්වයවාදී(පරස්පර විරෝධී වචන දෙකක් නොකියන්නා වූ) තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසනසේක්, එක්තරා ලොල්(ලෝභී) වූ භික්ෂූ කෙනෙකුන් වහන්සේ අරඹයා මේ ජාතකය වදාළසේක.උන් වහන්සේගේ ලොල් බව නම් නව වැනි නිපාතයෙහි ‘කාකි’ ජාතකයෙහි මතු පහළ වන්නේය.

එසමයෙහි භික්‍ෂූන් වහන්සේ “ස්වාමීනි, මේ මහණ ඉතා ලොල් මහණෙකැ”යි සර්‍වඥයන් වහන්සේට දැන් වූසේක. එකල සර්‍වඥයන් වහන්සේ “සැබෑද මහණ, තෝ ඉතා ලෝභීයෙහිදැ?”යි වදාළසේක. “එසේය ස්වාමීනි”යි කී කල්හි “මහණ, තෝ පෙරත් ලොභීයෙහිය, ලොභී බැවින් ජීවිතක්‍ෂයට

පැමිණියෙහිය. පණ්ඩිතයෝද තා නිසා තමන් වසන තැනින් පිරිහුනෝ වේදැ''යි වදරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහබෝසතාණෝ පාරාපත යෝනියෙහි(පරෙවියෙක්ව) උපන්නාහුය. එකල බරණැස් නුවර වැස්සෝ කුසල් කැමැති බැවින් ඒ ඒ තැන පක්ෂීන්ගේ සැපසේ විසීම නිසා(සඳහා) තොපෙට්ටි(දහයියා දැමූ පෙට්ටි) එල්වා තබති. බරණැස් නුවර සිටාණන්ගේ අරක්කැමියා තමන්ගේ මුළුතැන්ගේ තොපෙට්ටියක් එල්වා තැබූයේය. බෝධිසත්වයෝ එහි වාසය කෙරෙති. එකල්හි ඒ මහබෝසතාණෝ උදෑසනම නික්ම ගොදුරු සොයා අනුභවකොට සවස් වේලෙහි අවුත් වාසය කරමින් දවස් යවති.

ඉක්බිත්තෙන් එක් දවසක් එක් කපුටුවෙක් මුළුතැන්ගේ මත්තෙන් යන්නෙහි ඇඹුල් නියඹලා මත්ස්‍යමාංස දවා සුවඳ කැවූ ගන්ධය ආඝ්‍රාණයකොට එහි ලොබ උපදවා ''කවරක්හු නිසා මේ මත්ස්‍යමාංස ලබන්දේ හෝ''යි මුළුතැන්ගෙට නුදුරු තැනක හිඳ පරීක්ෂා කෙරෙන්නේ සවස බෝධිසත්වයන් අවුත් මුළුතැන්ගෙට වඩනා දැක ''මේ පරවියා නිසා මත්ස්‍යමාංස ලබම්''යි දෙවෙනි දවස් උදෑසනම අවුත් බෝධිසත්වයන් පෙට්ටියෙන් නික්ම ගොදුරු පිණිස යන වේලෙහි පසුපස්සේ නික්මුනේය. එකල මහබෝසතාණෝ ඕහට ''කවර කාරණයකින් අප හා සමග සබඳ තෝ ඇවිදිනෙහිදැ''යි කිවුය. ''ස්වාමීනි,

නුඹවහන්සේගේ ක්‍රියාවට මට ඉතා රිසියෙයි, එසේ හෙයින් මම මෙතැන් පටන් නුඹවහන්සේට උපස්ථාන කෙරෙමි''යි කිය. එබස් ඇසූ මහබෝසතාණෝ කියන්නේ ''යහළු තොපි අන් ගොචාරයක් අනුභව කරව, අපි අන් ගෝචරයක් අනුභව කරම්හ(ඔබ එක්තරා වර්ගයක ආහාර ගන්නෙහිය, අප ඊට වඩා වෙනස් වර්ගයක ආහාර ගන්නෙමු), තොප විසින් අපට උපස්ථාන කරන්නට නොපිළිවන් වන්නේ වේදැ''යි කිවුය. ''ස්වාමීනි, නුඹවහන්සේ ගොදුරු කන කල මමත් ගොදුරුකා නුඹවහන්සේ හා සමඟ යන්නෙමි වේදැ''යි කීය. ''යහපත උදක්(විශේෂයෙන්) තොප විසින් අප්‍රමාද විය යුතුය''යි මෙසේ මහබෝසතාණෝ කපුටුවාට අවවාදකොට ගොදුරු කන්නාහු තණ බිජු අනුභව කෙරෙති. බෝධිසත්වයන් ගොදුරු අනුභව කරන වේලෙහි කපුටුවා ගොස් ගොම පිඬක් පෙරළා පණුවන් අවුලා කා බඩ පුරාගෙන බෝධිසත්වයන් සමීපයට අවුත් ''ස්වාමීනි, නුඹවහන්සේ ඉතා බොහෝ වේලක්(වේලාවක්) ගොදුරු අනුභව කරනසේක. බොහෝකොට කෑම යහපත් නොවන්නේ වේදැ''යි කියා බෝධිසත්වයන් හා සමග ඇවිද ගොදුරු අනුභවකොට සවස් වේලේ අවුත් මුළුතැන්ගෙයි වෙසෙයි.

ඉත්බිත්තෙන් එක් දවසක් සිටාණන්ට බොහෝ මත්ස්‍යමාංස ගෙනාවාහුය. අරක්කැමියා ඒ මත්ස්‍යමාංස ඇරගෙන මුළුතැන්ගෙයි ඒ ඒ තැන එල්වා තිබුයේ කපුටුවා ඒ දැක ලොභ උපදවා ''සෙට ගොදුරු බිමට නොගොස් මා විසින්

මේ මත්ස්‍යමංස කෑ යුතුය"යි රාත්‍රියෙහි තනන තනනා(තටම තටමා) කෙඳිරි ගාමින් වැඳ හොත්තේය.

දෙවෙනි දවස් බෝධිසත්‍වයෝ ගොදුරු පිණිස යන තැනැත්තෝ "වර යහළු කපුටුව"යි කිවුය. "ස්වාමීනි, නුඹවහන්සේ ගිය මැනව,මට බඩ රුජාවෙක් විය"යි කීය. එබස් ඇසූ මහබෝධිසත්‍වයෝ කියන්නෝ "සබඳ, කපුටුවන්ට බඩ රුජාවෙක් නම් කිසිකලෙකත් නුවූ විරූය. රාත්‍රියෙහි තුන් යමින් එකි එකී යමෙක මුර්ජා(යාමයක් පාසා බඩ ගින්නෙන් ක්ලාන්ත) වෙති, ගිතෙල් ගැලූ පහන් කඩක් ගිලූ කල ඒ කපුටුවන්ට මඳ ඇසිල්ලක තෘප්ති නිවාරණය වෙයි (කෑදරකම සංසිඳේ) බඩ පිරෙයි, තෝ මත්ස්‍යමාංස කනු කැමැත්තෙහි වන, මනුෂ්‍යයන් විසින් අනුභව කටයුත්ත තොපට ගෝචර නොවෙයි. තොපට අනුභව කරන්නට නුසුදුසුය, මෙබන්දක් නොකර මා හා සමග ගොදුරු පිණිස වර"යි කිවූය. "යා නොහෙමි ස්වාමීනි"යි කී කල්හි "එසේ වීනම් තා කළ නොකටයුත්තෙන් තෝම ප්‍රකාශ වන්නෙහි වේද?(තොප කළ වැරැද්දට තොපම විපාක විඳින්නේ නොවේදයි) ලෝභ වසඟයට නොපැමිණ අප්‍රමාදව වාසය කරව"යි කපුටුවාට අවවාදකොට බොධිසත්වයෝ ගොදුරු කන්නට ගියෝය. එකල අරක්කැමියා අනෙකප්‍රකාර වූ මත්ස්‍යමාංස විකෘතිය(මස් මාළුවලින් සෑදු කෑමවර්ග) පිස තබා උණුසුම නික්මෙන පිණිස බඳුන් ඇර මස් රස වහන්නා වූ මුඩම බඳුන් මත්තේ තබා ගෙන් නික්ම ඇඟ ඩා(දඩිය) පිසිමින් සිටියේය.

එකණෙහි කපුටා පැසින්(පෙට්ටියෙන්) හිස ඔසවා මුළුතැන්ගෙයි ඈත මෑත බලන්නේ අරක්කැමියා ගෙන් නික්මුණු නියාව දැන "මේ වූකලී දැන් මාගේ මනදෙල පුරා මස් අනුභව කරන්ට කල, කිමෙක්ද මහත් මසක් අනුභව කරම්ද, නොහොත් සුනු වූ(අඹරන ලද) මසක් අනුභව කරම්ද"යි සිතා "සුනුටු මසකින් නම් වහා කුස පුරවාගත නොහැක්කේය, මහත් මස් කැටියක් නෙවුත් පැස තබාගෙන කකා වැදහෝම්"යි (වාඩිවී සිටිමියි) පැසින් උඩ නැගී මස් රස වහන මුඩම මත්තේම උන්නේය. ඔහුගේ හිඳිමෙන් ඒ මුඩම කිලි කිලි යන අනුකරණයෙන් ශබ්දය පැවැත්තේය.

අරක්කැමියා මුඩම අඬගිය අඬ(තලියෙන් නැගුණු හඬ) අසා "කිමෙක්දෝ හෝ"යි ගෙට වන් තැනැත්තේ කපුටුවා දැක "මේ දුෂ්ට කපුටුවා මා විසින් සිටාණන් වහන්සේට සකස්කොට පිස තුබූ මස් අනුභව කරණු කැමැත්තේය, මම වූකලී සිටාණන් වහන්සේ නිසා ජීවත්වෙමි, මේ අඥනයා නිසා ජීවත් නොවෙමි, එසේ හෙයින් මට මොහුගෙන් ප්‍රයෝජන කිම්ද"යි දෙර වසා කපුටුවා අල්වාගෙන සකල ශරීරය පත් උදුරා(පිහාටු උගුල්ලා) අලුත් ඉඟුරු, ලුණු, දුරු, මිරිස් ආදී වූ කුළුබඩු අඹරා ඇඹුල් මොරේ කලාන්දුකොට(ඇඹුල් මෝරු දියෙහි කලතා) ඔහුගේ සකල ශරීරයෙහි ගල්වා ඒ කපුටුවා පැසට දැමුයේය. කපුටුවා මහත් වූ දුක්ඛ වේදනාවෙන් මඬනා ලදුව තතනමින් කෙඳිරි ගගා වැද හොත්තේය.

බෝධිසත්වයෝ සවස් වේලේ අවුත් ඒ ව්‍යසනයට පැමිණි තැනැත්තවුන් දැක "ලොල් වූ කපුටුව, මා කීවා නොකොට තාගේ ලෝභය නිසා මහත් වූ දුකට පැමිණියෙහි වේදැ"යි කියා "දැන් මාත් මෙතැන වසන්ට නොපිළිවනැ"යි මහබෝසතාණෝ අනික් තැනකට ගියෝය. කපුටුවා එතැන්හිම ජීවිතක්‍ෂයට පැමිණියේය. එකල්හි අරක්කැමියා ඔහු පැසින් ගෙන කසල ගොඩට දැමීය.

ශාස්තෲ වූ බුදුරජාණන් වහන්සේ "මහණ, තෝ ලොල් වුයේ දැන්මතු නොවෙයි, පෙරත් ලොල් වූයෙහිය. තාගේ ලොල් බව නිසා නුවණැත්තෝ තමන් වසන තැනින් පිරිහී ගියෝ වේදැ"යි මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා වදරා චතුරාර්‍ය්‍ය සත්‍යය ප්‍රකාශ කොට වදාළසේක. චතුස්සත්‍යයාගේ කෙළවර ඒ ලොල් මහණ අනාගාමි පෙලෙහි පිහිටියේය. සර්‍වඥයන් වහන්සේ පූර්‍වාපර සන්ධි ගළපා මේ 'කපොත ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි කපුටුවා නම් දැන් මේ ලොල් වූ භික්ෂූහුය. එසමයෙහි පරෙවිව උපන්නෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 043. වෙළුක ජාතකය

තවද එක් සමයෙක්හි සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වාසය කරනසේක් එක්තරා දුර්‍වච(අකීකරු) භික්ෂුවක් අරභයා මේ ජාතකය වදාළසේක.

සර්වඥයන් වහන්සේ ඕහට වනාහි "මහණ, තෝ දුර්වච වූයේ සැබෑදැ?"යි විචාරා "ස්වාමීන් වහන්ස, සැබැව"යි දැන් වූ කල්හි "මහණ, තෝ දුර්වච වූයේ දැන්මතු නොවෙයි, පෙරත් දුර්වච වූයෙහිය. දුර්වච වූ බැවින්ම නුවණැත්තන්ගේ වචනය නොකොට සර්පමුඛයෙන් ජීවිතක්ෂයට(සර්පයෙකු දෂ්ට කිරීමෙන් මර්ණයට) පැමිණීයෙහිය"යි වදාරා ඉකුත්වත් කථාව වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි බෝධිසත්ත්වයන් වහන්සේ මහාභොග කුලයෙක්හි(මහ ධනවත් පවුලක) ඉපිද වැඩි වයසට පැමිණ පංචකාමයෙහි ආදීනව හා මහබිනික්මන් කිරීමෙහි ආනිශංස දැක වස්තුකාමයෙන්(කාම වස්තු) හැර හිමාල වනයට වැද ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන්(තවුස් පැවිද්දෙන්) පැවිදිව කිසුණු පිරියම්කොට(කසින භාවනා) පඤ්චාභිඥා අෂ්ට සමාපත්ති උපදවා ධ්‍යාන සැපයෙන් කල් යවනසේක්. මෑත භාගයෙහි මහත් පිරිවර ඇතිව පන්සියයක් තපස්වීවරයන් විසින් පිරිවරණ ලදුව ගණශාස්තෘව(පිරිසට අනුශාසකව) වාසය කරනසේක.

ඉක්බිත්තෙන් එක් සර්ප පෝතකයෙක් තමාගේ ස්වභාවයෙන් ගොදුරු කා ඇවිදිනේ එක්තරා තපස්වියක්හුගේ ආශ්‍රමයට පැමිණීයේය, තපස්වීන් වහන්සේ ඒ සර්පයා කෙරෙහි පුත්‍රස්නෙහ(දරු සෙනෙහස) උපදවා ඔහු එක් වෙළුපර්වතයෙක්හි(උණ පුරුකක් තුළ) හොවා රක්ෂා

කරන්නේය. ඕහට වෙළුපර්වතයෙහි හෝනා හෙයින් 'වෙළුක' යයි කියා නමක් කළාහුය. ඔහු පුත්‍රස්නෙහයෙන් රක්‍ෂා කරන්නාහු තපස්විය හට 'වෙළුක පියා' යයි කියාම නමක් කළාහුය. එකල්හි බෝධිසත්‍වයන් වහන්සේ "එක් තපස්වියෙක් වනාහී සර්පයෙකු රක්‍ෂා කරන්නේය"යි අසා ඔහු කැඳවා "තෙපි ආශිවිෂයකු(සර්පයෙකු) රක්‍ෂා කරන්නේ සබෑද? කිම්ද" විචාරා "සැබෑව"යි කී කල්හි "ආශිවිෂයා හා සමග විශ්වාසයෙක් නම් නැත්තේය. මෙසේ රක්‍ෂා නොකරව"යි කීසේක. තාපසතෙම කියනුයේ "ආචාරීන් වහන්ස, ආශිවිෂයා මාගේ පුත්‍ර වන්නේය. මම ඔහුගෙන් වෙන්ව වසන්ට නොහැකි වන්නෙමි"යි කීයේය. "එසේ වීනම් මොහුගේ සමීපයෙන් ජීවිතක්‍ෂයට(මරණයට) පැමිණෙන්නේහිය"යි කීසේක.

තපස්වීන් වහන්සේ බෝධිසත්‍වයන් වහන්සේගේ වචනය නොගත්තේය. ආශිවිෂයාද හරනට(ඉවත දමන්නට) නොහැකි වූයේය. ඉක්බිත්තෙන් කීප දවසක් ඇවෑමෙන් සියලු තපස්විවරයෝ ඵලාඵල පිණිස ගොස් ගිය තැන්හී ඵලාපලයාගේ සුලභ බැව් දැක දෙතුන් දවසක් එතැන්හිම වාසය කළාහුය. වේළුක පියාණෝද ඒ තපස්වීන් වහන්සේලා හා එක්ව යනුයේ ආශිවිෂයා හුණපුරුකෙහි හොවා පිධානකොට (පියනින් වසා) ගියේය. ඒ තාපසතෙමෙ නැවත සෙසු තපස්විවරයන් හා දෙතුන් දවසක් ඇවෑමෙන් අවුත් "වෙළුකයා හට ගොදුරු දෙමි"යි කියා හුණපුරුක පියන හැර "පුත්‍රය ක්‍ෂුධායෙහිය,(බඩගිනි ඇත්තේ නොවේද?) එව"යි කියා හස්තය දිගු කෙළේය. ආශිවිෂතෙම දෙතුන් දවසක්

නිරාහාර බැවින් කිපි දිගුකරන ලද හස්තය ඩැහැ(දෂ්ටකොට) තපස්වියා එතැන්හිම ජීවිතක්‍ෂයට පමුණුවා වනයට වන්නේය. තපස්විවරහු ඒ දැක බෝධිසත්‍වයන් වහන්සේට දැන් වූවාහුය. බෝධිසත්‍වයන් වහන්සේ ඔහුගේ ශරීරය ආදාහන කරවා සෘෂි සමූහයාගේ මැද ඉඳ සෘෂින්ට අවවාද වශයෙන් මෙසේ වදාළසේක.

“වැඩ කැමැත්තාවූ හිත චිත්තයෙන් අනුකම්පා කරන්නාහුගේ අනුශාසනාව අවවාදය යමෙක් නොහික්මිනිද(පිළිනොගනීද) එසේ වූ පුරුෂතෙම වෙළුක නම් සර්පයාගේ පියාණෝ යම්සේ හොත්තාහුද (මැරී වැතිර සිටීද) එපරිද්දෙන්ම නසන ලදුව හෝනේය”යි වදාළසේක. මෙසේ බෝධිසත්‍වයන් වහන්සේ සෘෂි සමූහයාට අවවාද දී සතරබ්‍රහ්ම විහරණයන්(මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යන උතුම් පැවතුම්) වඩා ආයුෂයාගේ කෙළවර බ්‍රහ්මලෝකයෙහි උපන්සේක.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ වදාරණසේක් “මහණ, තෝ දුර්වච වූයේ දැන්මතු නොවෙයි, පූර්වයෙහිද අකීකරු බැවින් සර්පමුඛයෙන් පූතිභාවයට (කුණුවීමට) පැමිණියෙහිය”යි කියා මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා පූර්වාපර සන්ධි ගළපා මේ ‘වෙළුක ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි වෙළුක සර්පයාගේ පියාණෝ නම් දැන් මේ දුර්වච මහණ වූයේය. අවශෙෂ පර්ෂද්(සෙසු පිරිස) දැන් බුදු

පිරිස් වූවාහුය. ගණ ශාස්තෘව උපන්නෙමි තිලෝගුරු සම්‍යයක් සම්බුදුරජ වූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 044. මකස ජාතකය

තවද එක් සමයෙක්හි ශාන්තිගුණ ඇති තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මගධරට සැරිසරා වඩනාසේක් එක්තරා ගමෙක නුවණ නැති ගම්වැසි මනුෂ්‍යයන් අරභයා මේ ජාතකය වදාළසේක.

එක් සමයෙක බුදුරජාණන් වහන්සේ සැවැත් නුවරින් නික්ම මගධ රාජ්‍යයට ගොස් එහි චාරිකාකොට ඇවිදිනාසේක් එක්තරා ගමකට පැමිණිසේක. ඒ ගමතෙමේත්(ඒ ගම වූකලී) බොහෝසේ අඥාන මනුෂ්‍යයන් විසින් ගැවසී ගත්තේය. එක් දවසක් ඒ ගම අඥාන මනුෂ්‍යයෝ රැස්ව කියන්නෝ “පින්වත්නි, අප වනයට වැද කර්මාන්ත කරන කල්හි මදුරුවෝ කති. උන්ගේ කෑම නිසා අපගේ කර්මාන්තයට බාධා වන්නේය. අපි ඇමදෙනම දුනු හා ආයුධ ඇරගෙන ගොස් මදුරුවෝ හා යුද්ධකොට සියලු මදුරුවන් විදකොට මරම්හ”යි මන්ත්‍රණය කොට “වනයට ගොස් මදුරුවන් මරම්හ”යි ඔවුනොවුන් විදකොට මහා දුකට පැමිණ අවුත් ඇතුළු ගමත් ගම් මධ්‍යයෙහිත් ගම්දොරත්(ගමට ඇතුළුවන තැනත්) වැද හොත්තාහුය. එකල සර්වඥයන් වහන්සේ භික්ෂු සංඝයා පිරිවරා ඒ ගමට පිඩුසිගා වන්සේක. අවශේෂ(සෙසු) මනුෂ්‍යයෝ බුදුන් දැක ගම්දොර මණ්ඩපයක් කොට බුදු

පාමොක් මහසඟ පිරිසට මහදන් දී බුදුන් වැඳ එකත්පස්ව උන්නාහුය.

සර්‍වඥයන් වහන්සේ ඒ ඒ තැන චිත් කෙටීමෙන් ව්‍රණවූ(තුවාළ වූ) ශරීර ඇති මනුෂ්‍යයන් දැක උපාසකවරුන් අතින් විචාළසේක් “බොහෝ මනුෂ්‍යයෝ ගිලන්ව වැද හොවිති. මොහුන් විසින් කුමක් කරන ලද්දේදැ”යි විචාළසේක. “ස්වාමීනි, මේ මනුෂ්‍යයෝ ‘මදුරුවන් හා යුධ කරම්හ’යි ගොස් ඔවුනොවුන් විද තුමු ගිලන් බවට පැමිණියෝය”යි දැන්වූය. සර්‍වඥයන් වහන්සේ “එම්බා නුවණැති මනුෂ්‍යයෙනි, මේ අඥාන මනුෂ්‍යයන් ‘මදුරුවන් මරම්හ’යි කියා තමන් මැරුවේ දැන්මතු නොවෙයි, පෙරත් ‘මදුරුවන් ගසම්හ’යි කියා අනුන් ගැසූ(අනුන්ට පහරදුන්) මනුෂ්‍ය කෙනෙක් වෙත්දැ”යි වදරා ඒ ප්‍රඥ(නුවණැති) මනුෂ්‍යයන් විසින් ආරාධිත වූ බුදුරජහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහබෝසතාණෝ වෙළඳාමෙන් ජීවත් වෙති. එසමයෙහි කසීරට එක් පසල්(පිටිසර) ගමෙක බොහෝ වඩුවෝ වෙසති. ඒ ගම එක් ඉසකේ වැගිරීගිය(හිසකෙස් වැටුණු) වඩුවෙක් දණ්ඩක් සස්නේය. එකල එක මදුරුවෙක් ඔහුගේ තඹතැටි පිටක්(තඹ තැටියක මතු පිටක්) වැනි වූ ඉසෙ හිඳ අඩයටියෙන් පහරනාක් මෙන් ඉස මුවතුඩින් විදිනේය. එතෙම තමා සමීපයෙහි සිටි පුතුට කියන්නේ “පුත, මා හිස එක්

මදුරුවෙක් තෙබකින්(උල් ආයුධයකින්) අනින්නාක් මෙන් විදිනේය. ඔහු නවතාපියව''යි කීය. එබස් ඇසූ පුත්‍රයා කියන්නේ "පියාණන් වහන්ස, ඉවසුව මැනවයි, එක පහරින් ඒ මදුරුවා මරාපියමි''යි කීය. එසමයෙහි බෝධිසත්ත්වයෝත් තමන්ට බඩු සොයමින් එගමට පැමිණි ඒ වඩුවන්ගේ දඬුහල සිටියාහ. ඒ වඩ්ඪකී පුත්‍රයා "මදුරුවා දුරු කෙරෙමි''යි සියුම් මුවහත් ඇති මහ පොරවක් ගෙණ පියාගේ පිටිපස්සේ සිට "මදුරුවා ගසමි''යි පියාගේ හිස දෙකක් කොට පැළුයේය. වඩුවා එතැන්හිම ජීවිතක්ෂයට පැමිණියේය. බෝධිසත්ත්වයෝ ඔහුගේ ක්‍රියාව දැක "සතුරා වුවත් නුවණැති තැනැත්තේ උත්තමය. ඒ නුවණැත්තාවූ සතුරා අනුන් තමා මරතත් දඩ ගනිතත්(දඬුවම් කරතත්) ඒ දණ්ඩනාදියෙහි භයින් මනුෂ්‍යයන් නොමරන්නේය''යි සිතා මෙසේ කිවුය. "නුවණින් යුක්ත වූ සතුරා උතුම, නුවණ නැත්තාවූ මිත්‍රයා උතුම් නොවෙයි, කුමක් හෙයින්ද යත්, මේ කෙළ තොළු වූ (පුරසාරම් දොඩන) නුවණ නැති පුත්‍රයා 'මදුරුවා මරමි'යි තමාගේ පියාගේ ඔළුව පලාපිය. එසේ හෙයින් අඥාන වූ මිත්‍රයාට වඩා ප්‍රාඥ වූ අමිත්‍රයාම උතුමැ''යි මෙසේ මහබෝසතාණෝ එතනට පැමිණ සත්ත්වයන්ට ධර්මදේශනා කොට හුනස්නෙන් නැගී ගොස් කම් වූ පරිද්දෙන් මියපරළොව ගියෝය. වඩුවාගේ නෑයොත් ඔහු දවාපූය(ආදාහන කළෝය).

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ "උපාසකවරුනි, පෙරත් 'මදුරුවා ගසමිහ'යි අනුන් ගසා මැරූ මනුෂ්‍යයෝ ඇත්තෝම

වේදැ"යි මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා වදරා පූර්‍වාපර සන්ධි ගළපා මේ 'මකස ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි එතනට පැමිණ සත්‍වයන්ට අවවාද කොට ගියා වූ නුවණැති වෙළඳනෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 045. රෝහිණී ජාතකය

තවද එක් සමයෙක්හි බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසනසේක් අනේපිඩු මහසිටාණන්ගේ දාසියක් අරභයා මේ ජාතකය වදාළසේක.

අනේපිඩු මහසිටාණන්ගේ වනාහි රෝහිණී නම් වූ දාසියක් වූවාය. ඒ දාසියගේ මැහැලි වූ මෑණියෝ වී පහරන(වී කොටන) තැනට අවුත් හොත්තීය. ඒ මැහැලි ස්ත්‍රිය මැස්සෝ පිරිවරා හිදියෙන්(ඉදිකටුවෙන්) විදිනාක් මෙන් කන්නාහුය. ඕ තොමෝ දුවණියන්ට කියන්නී "දියණියෙනි, මක්‍ෂිකාවෝ(මැස්සෝ) මා කති. මොවුන් වලක්ව"යි කීව. ඕතොමෝ "මෑණියෙනි, වලක්වමි"යි කියා මොහොල ඔසවා "මෑණියන්ගේ ශරීරයෙහි මක්‍ෂිකාවන් මරා විනාශයට පමුණුවන්නෙමි"යි සිතා මෑණියන්ට මොහොලින් ප්‍රහාර දී ජීවිතක්‍ෂයට පැමිණී වුව. ඒ දැක "මාගේ මෑණියෝ මළාය"යි කියා අඬන්ට පටන් ගත්තීය. ඒ ප්‍රවෘත්තිය අනේපිඩු මහසිටාණන්ට දැන් වූවාහුය. සිටාණෝ ඒ දාසියගේ ශරීරය

ආදාහන කරවා විහාරයට ගොස් සියලු ප්‍රවෘත්තිය සර්‍වඥයන් වහන්සේට දැන්නූහ.

සර්‍වඥයන් වහන්සේ "ගෘහපතිය, මේ දාසිය 'මෑණියන්ගේ ශරීරයෙහි මක්‍ෂිකාවන් මරමි' සිතා මොහොලින් ප්‍රහාර දී මෑණියන් මැරුවා දැන්මතු නොවෙයි, පූර්‍වයෙහිත් මැරුවාමය"යි වදාරා අනේපිඬු මහසිටාණන් විසින් ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි බෝධිසත්‍වයන් වහන්සේ සිටුකුලයෙක්හි ඉපිද පිය මහසිටුහුගේ ඇවෑමෙන් සිටුතනතුරට පැමිණිසේක. ඒ සිටාණන්ගේ ද රෝහිණී නම් දාසියක් වූවාය. ඒ දාසිද තමාගේ වී පහරන තැනට අවුත් හොත්තා වූ මෑණියන් විසින් "දුවණියෙනි, මාගේ හිස මක්‍ෂිකාවන් වලක්ව"යි කියනු ලබන්නී මෙම ක්‍රමයෙන් මොහොලින් ප්‍රහාර දී මෑණියන් ජීවිතක්‍ෂයට පමුණුවා හඬන්ට පටන් ගත්තේය. බෝධිසත්‍වයන් වහන්සේ ඒ ප්‍රවෘත්තිය අසා "අමිත්‍රද වනාහි(සතුරා වුවත්) මේ ලෝකයෙහි ප්‍රඥාවන්ත තැනැත්තෙම උතුමැ"යි සිතා මෙසේ කීසේක. "කරුණා ඇත්තා වූ යම් බඳු බාලයෙක් ඇද්ද, ඌට වඩා නුවණැත්තා වූ අමිත්‍රයාම උතුම් වන්නේය. කුමක් මෙන්ද යත්, රෝහිණී නම් වූ නුවණ නැත්තී 'මව මැස්සන් මරමි'යි මුසල ප්‍රහාරයෙන් (මොහොල් පහරින්) මරා ශෝක කෙරෙයි. මේ කාරණයෙන් මේ ලෝකයෙහි

අමිත්‍රද ප්‍රඥාවත් තැනැත්තේ උතුම් වන්නේය''යි බෝසතානන් වහන්සේ පණ්ඩිතයා හට ප්‍රසංසා කරමින් බණ වදාළසේක.

ශාස්තෲන් වහන්සේ "ගෘහපතිය, මෝ තොමෝ 'මැස්සන් මරාම්'යි සිතා මව නැසුවා දැන්මතු නොවයි, පෙරත් මැරුවාමය''යි වදරා මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා පූර්වාපර සන්ධි ගළපා 'රෝහිණී ජාතකය' නිමවා වදාළසේක.

"එකල්හි මෑණියන් දැනුත් මෑණියෝම වූහ. දුවණියෝ දැනුත් දුවණියෝය. මහසිටුව උපන්නෙම් වනාහී තිලෝගුරු සම්‍යක් සම්බුදුරජු වූ මම්ම වේදැ''යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 046. ආරාමදූසක ජාතකය

තවද එක් සමයෙක්හි ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ කොසොල් රට එක්තරා ගෙමෙක්හි වසනසේක්, උද්‍යානයක් දුෂ්‍ය(අපිරිසිදු) කිරීමක් අරභයා මේ ජාතකය වදාළසේක.

සර්වඥයන් වහන්සේ වනාහි කොසොල්රට සැරිසරා වඩනාසේක්, එක්තරා ගමකට පැමිණීසේක. ඒ ගමෙහි වසන එක් කෙළෙඹි පුත්‍රයෙක් සර්වඥයන් වහන්සේට ආරාධනා කොට තමාගේ උයනෙහි වැඩහිඳිනට සලස්වා බුදුපාමොක් මහසංඝයා වහන්සේට දන් දී "ස්වාමීන් වහන්සේලා කැමති පරිද්දෙන් මේ උයනෙහි හැසිරෙන සේක්ව''යි කීයේය.

භික්ෂූන් වහන්සේලා උන් තැනින් නැගී සිට උයන්ගොව්වා(උයන රැක බලාගන්නා) ගෙන උයනෙහි

හැසිරෙන්නාහු එක් එළිවූ තැනක ඝනවූ ජායාව ඇත්තේය. "මෙතැන්හි වෘක්ෂයක් හෝ ගසෙක් හෝ නැත්තේය. කවර කාරණයෙක්දැ?"යි විචාළාහ. "ස්වාමීන් වහන්ස, මේ උද්‍යානය ගස් රෝපනය කරණ කල්හි ගම්දරුවෙක් දිය ඉස්නේ මෙතැන්හි පැල මුල් උදුරා මුල් පමණින් (පැල මුලින් උදුරා මුල්වලට පමනක්) දිය ඉස්සේය. ඒ රුක්පැල මළානිකව මළේය. මේ කාරණයෙන් මේ ස්ථානය එළිවූයේය"යි කීය. භික්ෂූන් වහන්සේලා සර්‍වඥයන් වහන්සේ කරා එළඹ මේ කාරණාව දැන් වූවාහුය. සර්‍වඥයන් වහන්සේ "මහණෙනි, ඒ ග්‍රාම දාරකතෙමේ(ගම්දරු තෙම) ආරාමය දූෂ්‍ය කෙළේ දැන්මතු නොවෙයි, පූර්‍වයෙහිත් ආරාමය දූෂ්‍ය කෙළේමය"යි වදාරා ඉකුත්වත් කථාව වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි බරණැස් නුවර නකත් කෙළියට(නැකතට කරනු ලබන උත්සවයට) ඝෝෂා කළාහුය(අණබෙර ගැස්වූහ). නක්ෂත්‍ර භෙරි ශබ්දය ඇසූ තැන් පටන් සියලු නුවර වැස්සෝ නකත්කෙළි ආශ්‍රයකොට හැසිරෙන්නාහුය. එකල්හි රජුහුගේ උයනෙහි බොහෝ වානරයෝ වසන්නාහුය. උද්‍යානපාලක තෙම සිතනුයේ "නක්ෂත්‍ර ක්‍රීඩාවට බෙර ලැවූයේය. මේ වානරයන්ට දිය ඉසුවයි කියා නක්ෂත්‍ර ක්‍රීඩා කෙරෙමි"යි සිතා ජ්‍යෙෂ්ඨ වානරයා කරා එළඹ "යහළු වානර ජ්‍යෙෂ්ඨය, මේ උද්‍යානය නුඹවහන්සේලාටද බොහෝ උපකාරය, එහෙයින් නුඹවහන්සේලා මේ උයනෙහි පුෂ්පඵල ඵල්ලවයන්(මල්, ගෙඩි, දලු) අනුභව කරව, නක්ෂත්‍ර

ක්‍රීඩාවට ඝෝෂණය කෙළේය, මම නක්‍ෂත්‍ර ක්‍රීඩා කරන්නෙමි, යම් කලකින් මම එම්ද ඒතාක් කල් මේ උයනේ රුක්පැල ගස්වලට දිය වත්කරන්ට හැකිවන්නාහුදැ?"යි විචාළේය. "යහපත හැකිවන්නෙමි"යි කීයේය. "එසේ වීනම් අප්‍රමාදවවු"යි කියා දිය වත්කරනු පිණිස ඔවුන්ට සම්පයිද කාෂධමය කළද(හමින් කළ පසුම්බි ද ලීයෙන් කළ කළ ද) දී ගියේය. වානරයෝ සම්පයිද දඬු කළද ගෙන පැළ ගස්හි දිය වත්කරන්නාහුය. ඉක්බිත්තෙන් ඔවුනට වානර රජතෙම කියනුයේ "පින්වත් වූ වානරයෙනි, ජලය නම් රක්‍ෂා කටයුත්තේය. තෙපි පැළගස්හි ජලය වත්කරන්නාහු ගස් උපුට උපුටා මුල් බලා ගැඹුරුව ගිය මුල්හි බොහෝ ජලය වත්කරව, ගැඹුරුව නොගිය මුල්හි ස්වල්පයක් වත්කරව, පසුව අපට ජලය ලැබගත නොහැක්කේය"යි කීයේය. ඔහු වානර රජුහුගේ වචනය "යහපතැ"යි පිළිගෙන එලෙස කළාහුය.

එසමයෙහි පණ්ඩිත පුරුෂයෙක් රාජෝද්‍යානයෙහි එලෙස කරන්නාවූ ඒ වානරයන් දැක මෙසේ කීයේය. "පින්වත් වානරයෙනි, කවර කාරණයනින් තෙපි අළුත රොපනය කරනලද පැලගස් උපුට උපුටා මුල් පමණින් ජලය වත්කරන්නාහුදැ"යි කීයේය. ඒ වානරයෝ "අපගේ වානර රජතෙම මෙසේ අවවාද දුන්නේය"යි කීවාහුය. නුවණැත්තා වූ පුරුෂතෙම ඒ වචනය අසා "පින්වත්නි, ඒකාන්තයෙන් පිරිහීමක් වූයේය. අඥාණ වූ නුවණ නැත්තෝ වැඩක් කරම්හ"යි කියා අවැඩක් කරන්නාහුය"යි සිතා මෙසේ කීයේය.

"අනර්ථයෙහි දක්‍ෂයා විසින් අර්ථයෙහි හැසිරීම සුව එලන්නේ නොවෙයි. (අයහපතෙහි යෙදීමේ දක්‍ෂයාට යහපලතෙහිඅ හැසිරීම සැපදායක කරුණක් නොවේ) නුවණ නැති තැනැත්තේ වැඩ පිරිහෙලන්නේය. කවරෙක්හු මෙන්ද කීවොත් උද්‍යානයෙහි නියුක්ත වානරයා වැඩ කෙරෙමියි සිතා අවැඩ කෙළේය"යි කියා මෙසේ ඒ නුවණැති පුරුෂතෙම වානර රජ හට නින්දාකොට තමාගේ පර්ෂද්(පිරිස) ගෙන උයනින් නික්මුනේය.

සර්වඥයන් වහන්සේ "මහණෙනි, මේ ගම ළදරුවා උයන දූෂ්‍ය කෙළේ දැන්මතු නොවෙයි, පෙරත් උයන දූෂ්‍ය කෙළේමය"යි වදාරා මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ 'ආරාමදූසක ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි ප්‍රධාන වානරතෙම දැන් ආරාම දූෂ්‍ය කළ ගම්ළදරු වූයේය. පණ්ඩිත පුරුෂව උපන්නෙම් වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 047. වාරුණී ජාතකය

තවද එක් සමයෙක්හි බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසනසේක්, රා දූෂ්‍ය කිරීමක් අරභයා මේ ජාතකය වදාළසේක.

අනේපිඩු මහසාටාණන්ගේ වනාහි යහළු වූ එක්තරා වෙළෙන්දෙක් තියුණු වූ රා යොදා හිරණ්‍ය ස්වර්ණාදිය(රන් රිදී ආදිය) ගෙන විකූට(විකුණා) වසනුයේ මහජනයා රැස් වූ කල්හි “සගය තෙපි මිළගෙන රා දෙව”යි කියා අතවැස්සකුට ඇනවා(නියමකොට) තෙමේ නගනු පිණිස ගියේය. අතවැසි පුරුෂතෙම මහජනයා හට රා දෙනුයේ මනුෂ්‍යයන් අතරතුර ලුණුකැට ගෙන්වාගෙන අනුභව කරන්නවුන් දැක “රා, ලුණු නැත්තේ වන, ලුණු මෙහි බහන්නෙමි” සිතා රා සැළෙහි නැළියක්(සේරුවක්) පමණ ලුණු බහා ඔහුන්ට රා දෙන්නේය. ඔහු මුඛය පුරපුරා ගත් රා දමා(කට පුරාගත් රා වීසිකොට) “තොප විසින් කවරක් කරණ ලද්දේදැ?”යි විචාළහුය. “තෙපි රා බී ලුණු ගෙන්වන්නවුන් දැක ලුණුයෙන් යෙදුයෙමි”යි කීයේය. “මෙබඳු මනාප වූ රා නැසූයෙහිය, අඥානයෙහිය”යි ඕහට නින්දාකොට නැගීසිට ගියාහ. රා වෙළඳතෙම අවුත් එක් සත්වයෙකුන් නොදැක “රා පීවාහු කොතැන්හි ගියාහුදැ?”යි විචාළේය. අතවැස්සා තමා කළ කාරිය කීය. “අඥානය, මෙබඳු මනොඥ රා තා විසින් නසන ලද්දේදැ”යි නින්දාකොට මේ කාරණාව අනේපිඩු මහසිටාණන්ට දැන් වූ යේය. අනේපිඩු මහසිටාණෝ “අපට මේ තෙපුල් පඬුරක්(ප්‍රීතිදායක පුවතක්) ඇතැ”යි සිතා ජේතවනාරාමයට ගොස් බුදුරජාණන් වහන්සේට නමස්කාරකොට එකත්පසව ඉඳ මේ කාරණාව දැන් වූයේය. බුදුරජාණන් වහන්සේ වදාරණසේක් “ගෘහපතිය, මේ තෙම රා දූෂ්‍ය කෙළේ දැන්මතු නොවෙයි, පූර්වයෙහිත් රා

දුෂ්‍ය කෙළේමය''යි වදාරා අනේපිඬු මහසිටාණන් විසින් ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් කථාව දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහබෝධිසත්‍වයන් වහන්සේ බරණැස් නුවර සිටු කුලයක ඉපිද වැඩිවියට පැමිණ සිටු ස්ථානාන්තරයට (තනතුරට) පැමිණිසේක. ඒ බරණැස් සිටාණන් නිසා එක්තරා වෙළෙන්ඳෙක් ජීවත්වන්නේය. ඒ වෙළඳ පුත්‍රතෙම තියුණු වූ රා යොදා "මේ රා විකුට මිළ ගණුව''යි කියා අතවැස්සාට කියා නහනු පිණිස ගංගාවට ගියේය. අතවැසි පුරුෂතෙම අප මහබෝසතානන් වහන්සේ ආශ්‍රයකොට සිටි වෙළෙන්ඳා ගිය පමණකින්ම රා සැළවල්හි ලුණු බහා මෙම ක්‍රමයෙන් රා නැසුයේය. ඉක්බිත්තෙන් ඔහුගේ ආචාරීතෙම අවුත් ඒ කාරණාව දැන සිටාණන්ට දැන් වූයේය. සිටාණෝ "අනර්ථයෙහි දක්‍ෂ වූ අඥනයෝ වැඩ කරම්හයි කියා අවැඩ කරන්නාහුය''යි කීසේක. අනර්ථයෙහි දක්‍ෂා විසින් කරණලද අර්ථවර්‍යය(යහපතෙහි හැසිරීම්) තොමෝ සුව එලවන්නී නොවෙයි. නුවණ නැති තැනැත්තේ තමහට වැඩ පිරිහෙලන්නේය. කවරක්හූ මෙන්ද යත් රා සැළවල ලුණු ලා නැසූ කොණ්ඩඤ්ඤ නම් අතවැස්සා යම් සේ "සුරාව යහපත් කෙරෙමි''යි ලුණු ලා නැසීද එපරිද්දෙන් නුවණ නැති තැනැත්තේ "යහපත් කෙරෙමියි නපුරක්ම කරන්නේය''යි කියා බෝධිසත්‍වයන් වහන්සේ බණ වදාළසේක.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේද "ගෘහපතිය, මේ අතවැසි පුරුෂතෙම රා දුෂ්ය කෙළේ දැන්මතු නොවෙයි, පෙරත් සුරා දුෂ්‍ය කෙළේමය"යි වදරා පූර්වාපර සන්ධි ගළපා මේ "වාරුණී ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි රා දුෂ්‍ය කළ අතවැසි පුරුෂතෙම දැනුදු සුරා දුෂ්‍ය කළ අතවැසි පුරුෂ වූයේය. බරණැස් සිටුව උපන්නෙම් වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 048. වෙදබ්බ ජාතකය

තවද එක් සමයෙක්හි මහමෙර සේ නිශ්චල වූ(මහාමේරු පර්වතයසේ නොසෙල් වෙන) ගුණ ඇති බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වසනසේක් දුර්වච(අකීකරු) භික්ෂු කෙනෙකුන් වහන්සේ උදෙසා මේ ජාතකය වදාළසේක.

සර්වඥයන් වහන්සේ ඒ භික්ෂූහට "මහණ, තා දුර්වච වුයේ දැන්මතු නොවෙයි, පෙරත් දුර්වච වුයෙහිමය. ඒ දුර්වච වු කාරණයෙන්ම නුවණැත්තන්ගේ බස් නොගෙන සියුම් මුවහත් ඇති ඛඩ්ගයෙන්(කඩුවෙන්) දෙකඩකොට නසන ලදුව මගවැටි ඔත්තෙහිවේද? (වතිර සිටියේ නොවේද?) තා එක තැනැත්ත වූ නිසා දහසක් පුරුෂයෝ ජීවිතක්‍ෂයට පැමිණියෝ වේදැ"යි වදරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි එක් ගෙමෙක එක්තරා

බමුණෙක් වේදබ්භ නම් මන්ත්‍රයක් දන්නේය. ඒ මන්ත්‍රය වූකලී අනර්ඝය, මාහැගිය නැකැත් යොගයක් ලත් කල්හි ඒ මන්ත්‍රය පිරුවා(මතුරා) ආකාශය බැලු කල ආකාශයෙන් සත්රුවන් වර්ෂා වස්නේය. එකල පුරණලද බෝධිසම්භාර ඇති අප මහබෝසතාණෝ ඒ බ්‍රහ්මණයා සමීපයෙහි ශිල්ප උගන්නාහුය. ඉක්බිත්තෙන් එක් දවසක් බ්‍රාහ්මණයා බෝධිසත්‍වයන් කැඳවාගෙන කිසි කටයුත්තක් නිසා තමාගේ ගමින් නික්ම චේතිය රාජ්‍යයට ගියේය. අතරමග එක් වලෙක(වනයක) පන්සියයක් පමණ පෙසෙනක චොර නම් වූ සොර කෙනෙක්(පෙසෙනක චොර නම් වූ සොරු කණ්ඩායමක්) මං පහරණුවෝය. ඒ පෙසෙනක චෝරයෝ බෝධිසත්‍වයන් හා වේදබ්භ නම් බමුණ අල්වා ගත්තුය. ඔහු ඇම දෙනම කවර කාරණයකින් ‘පෙසෙනක චොරය’යි නම් ලද්දාහුද යත් ඔහු ඇම දෙනම දෙදෙනෙකු අල්වාගත් කල එකෙකු වස්තු ගෙන යන්ට යවා එකෙකු සමීපයෙහි රඳවා ගනිති. එසේ හෙයින් ඔහු ‘පෙසෙනක චොර’ නම් වෙති. ඔහු ඇම දෙනද දෙපුරා පිය කෙනෙකුන් අල්වාගෙන පියාණන්ට කියන කල “තෙපි අපට වස්තු ගෙනවුත් පුතණුවන් ගලවාගෙන යව”යි කියති මෙම ක්‍රමයෙන් දෙපුතු මෑණී කෙනෙකුන් අල්වාගෙන මෑණියන් වස්තු ගෙන එන්ට යවති. දෙටු කණිටු දෙබෑ කෙනෙකුන් අල්වාගෙන දෙටු බෑණන් වස්තු ගෙන එන්ට යවති. ආචාරීය, අන්තේවාසික දෙදෙනෙකු අල්වාගෙන අන්තේවාසිකයා වස්තු ගෙන එන්ට යවති.

ඒ සොරුන් පන්සියයක් දෙනා එකල වේදබ්භ නම් බමුණා අල්වාගෙන බෝධිසත්‍වයන් වස්තු ගෙනෙන්ට යැවුය. බෝධිසත්‍වයෝ ආචාරීන් වැඳ කියන්නෝ "මම දෙතුන් දවසක් ගියකල එමි, නුඹ වහන්සේ නොබා මැනව (බිය නොවනු මැනවි), තවද එකක් කියමි, මා කීවා කළ මැනව, අද සත්රුවන් වස්නා වූ නක්‍ෂත්‍ර යෝගය, වර්ෂා නොවැස්සුව මැනව, ඉදින් නුඹවහන්සේ වැස්සුවසේක් වීනම් නුඹවහන්සේත් විනාශයට පැමිණෙනසේක. මේ පන්සියයක් සොරුන් විනාශයට පැමිණෙති"යි මෙසේ ආචාරීන්ට අවවාදකොට වස්තු ගෙනෙන්ට ගියෝය. සොරු හිරු අස්තයට ගිය කල්හි බමුණා බැඳ හොවාලුය.

එකෙණෙහිම නැගෙණහිර සක්වලින් සම්පූර්ණව චන්ද්‍රමණ්ඩලය නැංගේය. එකල බමුණා නක්‍ෂත්‍ර යෝගය බලන්නේ "සම්පත් වර්ෂා වස්වන්නා වූ නක්‍ෂත්‍ර යෝගය ලබනලද, එසේ හෙයින් බන්ධනයෙහි වැදහෙව දුක් අනුභව කිරීමෙන් මට ප්‍රයෝජන කිම්ද? මන්ත්‍රය පිරුවා සත්රුවන් වර්ෂා වස්වා සොරුන්ට වස්තු දී සැපසේ යෙමි"යි සිතා සොරුන්ට බැණවුයේය(කථා කළේය). "පින්වත් වූ සොරුනි, තෙපි ඇම මා කුමක් නිසා ඇල්වූවහුදැ?"යි කීයේය. "ආචාරීනි, වස්තු පිණිසය"යි කී කල්හි "ඉදින් තොපට වස්තුවෙන් ප්‍රයෝජන ඇත්නම් මා බන්ධනයෙන් මුදවා වහා නහවා අලුත් පිළි අඳවා සුවඳ විලවුන් ගල්වා මල් පළඳවා සිටුවව"යි කීයේය. ඒ සොරු ඇමදෙන ඔහුගේ කථාව අසා එපරිද්දේන් කළේය.

එකල බමුණා නක්‍ෂත්‍ර යෝගය දැන මන්ත්‍රය පිරුවා ආකාශය උඩ බැලීය. එකෙණෙහිම ආකාශයෙන් සත්රුවන් වර්ෂා වූයේය. සොරු ඒ ධනය එකතැන්කොට උතුරුසළුවල පොදි බැඳගෙන නික්මුණාහුය. බමුණාත් ඔවුන් පසුපස්සේම ගියේය. ඉක්බිත්තෙන් ඒ සොරුන් පන්සියයක් දෙනා අන්‍ය වූ සොරුන් පන්සියයක් අල්වා ගත්තුය. "කුමක් පිණිස ඇල්වූදැ"යි කී කල්හි "වස්තුව පිණිස ඇල්වූම්හ"යි කිවුය. "ඉඳින් තොපට ධනයෙන් ප්‍රයෝජන ඇත්නම් මේ බමුණා අල්වා ගනුව, මේ බමුණා ආකාශය උඩ බලා ධන වර්ෂා වැස්වූයේය, අපට මේ වස්තුව මොහු විසින්ම දෙන ලද්දේය"යි කිවුය.

එකල්හි සොරු වස්තුව ඇති සොරුන් හැර "අපටත් වස්තු දෙව"යි කියා බමුණා අල්වාගත්තුය. බමුණ කියන්නේ "මම තොපට වස්තු දෙමියි, සත්රුවන් වැසි වස්වන්නා වූ නක්‍ෂත්‍ර යෝගය වූකලී මෙතනට අවුරුද්දකින්(අද සිට අවුරුද්දක් ගිය තැන) මත්තෙහි වන්නේය. ඉඳින් තොපට වස්තුවෙන් ප්‍රයෝජන ඇත්නම් කලක් ඉවසව ධන වර්ෂා වස්වන්නෙම් වේදැ"යි කිවුය. එබස් අසා සොරු කිපී "එම්බල දුෂ්ඨ වූ බමුණ, සෙස්සන්ට දැන්ම ධන වර්ෂා වස්වා අපට අනික් අවුරුද්දක් ඉවසන්නට කියන්නේහිදැ"යි කියා තියුණු වූ මුවහත් ඇති කඩුවකින් බමුණා දෙකඩකොට ගසා මග හෙළා වේගයෙන් පසුපස්සේ ලුහුබඳවාගෙන ගොස් ඒ සොරුන් හා සමඟ යුද්ධකොට පන්සියයක් පුරුෂයන් මරා වස්තුගෙන නැවත දෙකොටසක් ව ඔවුනොවුන් හා යුද්ධකොට

දෙසියපනසක් පුරුෂයන් මරා මෙම ක්‍රමයෙන් බෙදී ඔවුනොවුන් මැරීමෙන් දෙදෙනෙක් පමණක් ශේෂවූහ. ඒතාක් වනතුරු ඔවුනොවුන් මැරුවාහුය.

මෙසේ ඒ පුරුෂයෝ දහසක් දෙනා විනාශයට පැමිණියෝය. ඔහු දෙදෙනා උපායෙන් ඒ වස්තුව ගෙනගොස් එක් ගමක් සමීපයෙහි කැළයක වස්තුව සඟවා එකෙක් කඩුවක් ගෙන වස්තුව රැක උන්නේය. එකෙක් සාල් ගෙන බත් පිසන්ට ගමට වන්නේය. ලෝභය නම් මෙසේ විනාශය මුල්කොට ඇත්තෙමය. ඉක්බිත්තෙන් ඒ වස්තුව සමීපයෙහි උන් තැනැත්තේ මෙසේ සිතීය "ඒ පුරුෂයා ආකල්හි මේ වස්තුව දෙකොටසක් වන්නේය. එසේ හෙයින් මම ඔහු ආ ඇසිල්ලෙහි කඩුවෙන් ගසා මැරුයෙන් වීනම් යහපත් වන්නේය"යි ඒ තෙම කඩුව කොපුවෙන් හයා(ඇද) ඔසවාගෙන ඔහු එන පෙරමග බලබලා උන්නේය. අන්‍ය වූ බත් පිසන්ට ගිය පුරුෂයා සිතන්නේ "ඒ ධනය දෙකොටසක් වන්නේය. එසේ හෙයින් මම මේ බතෙහි විෂයක් ලා ඒ පුරුෂයා කවා මරා තනිවම වස්තුව ගන්නෙම් වීනම් යහපතැ"යි සිතීය. ඉක්බිත්තෙන් ඒ බත් පිසන්නාහූ පුරුෂයා බත්පිස අන්තයේ(අවසානයේ) තෙමේත් බස් අනුභවකොට ඉතිරි බතෙහි විෂ ලා ඒ බත් ගෙන වස්තු තුබූ තැනට ගියේය. ඔහු බත් බා තබාලා සිට මද ඇසිල්ලකින්ම වස්තුව රැකසිටි තැනැත්තේ කඩුවෙන් ඔහු දෙකඩකොට ගසා මුවා තැනකට(නොපෙණෙන තැනකට) දමා ඒ බත් අනුභවකොට තෙමේත් එතැන්හිම ජීවිතක්‍ෂයට

පැමිණියෝය. මෙසේ වස්තුව නිසා සොරුන් දහසක් දෙනා විනාශයට පැමිණියෝය.

බෝධිසත්වයෝත් එක් දෙදවසක් ගිය කල ආචාරීන් ගලවනු නිසා වස්තුව ඇරගෙන එන තැනැත්තෝ පළමු තමන් කථාකොට ගියතැන ආචාරීන් නොදැක විසිර තිබෙන්නාවුත් වස්තුවත් දැක "ආචාරීන් විසින් මා කිවා නොකොට ධන වර්ෂා වස්වන ලද්දේවනැයි, සියල්ලවුන් විනාශයට පැමිණී නියාවනැ"යි මහවනින් නික්මුණාහුය. යන්නාහූ මහබෝසතාණෝ ආචාරීන් මධ්‍යයෙන් දෙකැබිලිව වැදහොත්තා දැක "මා කීවා නොකොට මළෝය"යි දර ගෙනවුත් දරසෑයක් බැඳ ආචාරීන් දවා වනපස මලින්(කැලෑ මලින්) පූජාකොට ඉදිරියේ යන තැනැත්තෝ ජීවිතක්‍ෂයට පැමිණියා වූ පන්සියයක් දෙනා හා එයින් මත්තෙහි දෙසියපනස් දෙනෙකැයි මෙම ක්‍රමයෙන් කෙළවර දෙදෙනකු ජීවිතක්‍ෂයට පැමිණියවුන් දැක මෙසේ සිතූය "මේ දෙදෙනෙකුගෙන් උනු වූ පුරුෂයෝ දහසක් විනාශයට පැමිණියෝය. අනිකුත් සොරු දෙදෙනෙකු වියයුතුය(ඉතිරි සොරුන් දෙදෙනාත් සිටිය යුතුය). ඔහු දෙදෙනත් වස්තුවෙන් නැම්මීගත නොහෙති(රැකී සිටිය නොහැකි වෙති) දැන් උන් කොයි ගියෝ දෝ හෝ"යි කියා ඉදිරියේ යන්නාවූ මහබෝසතාණෝ ඔවුන් දෙදෙනා ධනය ඇරගෙන කැලේට වන් මග දැක පාදනුසාරයෙන්(පාසටහන් අනුව) ගිය තැනැත්තෝ පොදිබැඳ තිබූ වස්තු රාශිය දැක එකක්හු බත්තලිය මත්තෙ වැටි මළ තැනැත්තහු දැක ඉක්බිත්තෙන් "මොහුන් විසින් මෙනම් දෙයක් කරන ලදැ"යි

සියල්ල නුවණින් දැක "ඒ පුරුෂයෝ දැන් කොයි ගියේ දෝ හෝ"යි පරීක්ෂාකොට සොයන තැනැත්තෝ ඔවුන් මුවා තැනක දමන ලද්දනු දැක "අපගේ ආචාරීනු මා කීවා නොකොට තමන් නොකීකරු බැවින් තුමුත් විනාශයට පැමිණියෝය. උන් විසින් අන්‍ය වූ දහසක් පුරුෂයෝ විනාශයට පමුණුවන ලද්දනුය. එසේ හෙයින් ඒකාන්තයෙන් උපායක් නැතිව නිස්කාරණයෙහි තමන්ට අභිවෘද්ධියක් ප්‍රාර්ථනා කරන්නාවූ සත්වයෝ ආචාරීන් මෙන් මහත් වූ විනාශයට පැමිණෙති"යි සිතා තවද මෙසේ මහබෝසතාණෝ "යම් සේ අපගේ ආචාරීන් උපායක් නැතිවම අස්ථානයේ වීර්‍ය්‍යය කෙරෙමින් ධන වර්ෂා වස්වා තුමුත් ජීවිතක්ෂයට පැමිණියෝද අනුන්ටත් ජීවිත විනාශයට ප්‍රත්‍ය වූ ද(උපකාර වූයේද) ඒපරිද්දෙන්ම යම් අනිකුත් සත්වයෙක් උපායෙක් නැතිව තමාට වස්තු කැමතිව වීර්‍ය්‍යය කෙරෙත් නම් තෙමේත් නස්නේය. අනුන්ටත් විනාශයට ප්‍රත්‍ය(හේතු) වන්නේය"යි වනය එකනින් නාදකොට දෙවියන් සාධුකාර දෙමින් සිටියදී ධර්මදේශනාකොට උපායෙන් ඒ වස්තුව තමන්වහන්සේගේ ගෙට ගෙන්වාගෙන දනාදී වූ පින්කම් කෙරෙමින් ආයු පමණින් සිට ජීවිතාන්තයෙහි ස්වර්ගලෝකයට ගියාහුය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ "මහණ, තා දුරුවච වූයේ දැන්මතු නොවෙයි, පෙරත් දුර්වච වූ බැවින් මහත් විනාශයට පැමිණියෙහි වේදැ"යි වදරා මේ දේශනාව ගෙනහැර දක්වා වදරා මේ 'වේදබ්භ ජාතකය' නිමවා වදාළසේක.

“එසමයෙහි වේදබ්භ බ්‍රහ්මණයා නම් දැන් මේ නොකීකරු මහණය, අන්තේවාසික වූයෙම් තිලොගුරු සම්‍යයක් සම්බුදුරජ වූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 049. නක්ඛත්ත ජාතකය

තවද එක් සමයෙක්හි ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසනසේක් එක්තරා ආජීවකයෙකු(අජීවක ආගමට අයත් පැවිද්දෙකු) අරභයා මේ ජාතකය වදාළසේක.

සැවැත්නුවර වනාහි එක් කුලයෙක දුවණී කෙනෙකුන් ජනපදයෙහි වාසය කරන්නා වූ එක් කුලපුත්‍රයෙක් තමාගේ පුත්‍රයාහට වලක්වා(විවාහ කරීමට පොරොන්දු කරවාගෙන) “අසවල් දිනයෙහි කැඳවාගෙන යන්නෙමි” කියා දවස නියමකොට තබා ඒ දිනය පැමිණී කල්හි තමාගේ කුළුපග වූ ආජීවකයක්හුගෙන් විචාළේය. “ස්වාමීන් වහන්ස, අද අප එක් මඟුලක් කරම්හ. නක්‍ෂත්‍ර යහපත් දේ හෝ අයහපත් දේ හෝ”යි(නැකත හොඳද නරකද) විචාළේය. ඒ ආජීවකතෙම සිතනුයේ “මේ තෙම මා අතින් පළමුවෙන් නොවිචාරා දවස්තබා(දිනය නියම කොටගෙන) දැන් විචාරන්නේය. වන්නාට, මොහු හික්මවන්නෙමි”යි කිපී “අද නක්‍ෂත්‍ර යහපත් නොවන්නේය, දැන් මගුල් නොකරව, ඉදින් කළාහු නම් මහත් විනාශ වන්නේය”යි කීයේය. ඒ කුලයෙහි මනුෂ්‍යයෝ ඔහුගේ වචනය අදහාගෙන එදවස නොගියාහුය. නුවර වාසීහූ සියලු මංගල ක්‍රියාවකොට ඔහුන්ගේ නොඊම දැක “ජනපද වාසීන්

විසින් අද දවස තබන ලද්දේය, නොම ආවාහුය. අපගේ ද බොහෝ වස්තුව විනාශයට ගියේය. අපට ඔහුන්ගෙන් කවර ප්‍රයෝජනද? අපගේ දුවණියන් අනිකකත්හට දෙම්හ''යි කියා කරනලද මගුලෙන්ම(සූදානම් කරනලද මගුලෙන්ම) දුවණියන් අනිකකත්හට දුන්නාහුය. අනිකුත් ජනපද වැසි කුලයෙහි ඇත්තෝ දෙවැනි දිනයෙහි අවුත් "අපට කුමාරිකාව දෙව"යි කීවාහුය. ඉක්බිත්තෙන් ඔහුන්ට සැවැත්නුවර වාසීහු කියන්නාහු "ජනපද වාසී වූ තෙපි ගෘහපතියෝය, පව්ටු මනුෂ්‍යයෝය, දවස් තබා අනාදරයෙන් නො ආවාහුය. ආවාහු මගින්ම නැවත යවු(ආපාරෙන්ම ආපසු යව), අප විසින් අන්‍යයන්ට කුමාරිකාව දෙන ලද්දීය''යි කියා පරිභව බැන්නාහුය. ඔහු ඔවුන් හා සමඟ ඩබරකොට ආවාහු මගින්ම ගියාහුය. ඒ ආජීවකයා විසින් ඒ මනුෂ්‍යයන්ගේ මගුලට අන්තරාය කළ බව භික්‍ෂූන්ගේ අතුරෙහි ප්‍රකාශ(ප්‍රසිද්ධ) වූයේය.

ඒ භික්ෂූහු දම්සභා මණ්ඩපයෙහි රැස්ව උන්නාහු "ඇවැත්නි, ආජීවකයා විසින් කුලයාගේ මගුලට අන්තරාය කරනලදැ''යි කියමින් හුන්නාහුය. ශාස්තෘන් වහන්සේ අවුත් "මහණෙනි, මේ දම්සභා මණ්ඩපයෙහි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ''යි විචාරා වදාළ කල්හි "මෙනම් කථාවකිනැ''යි දැන් වුවාහුය. "මහණෙනි, ආජීවකයා විසින් කුලයාගේ මගුලට අන්තරාය කළේ දැන්මතු නොවෙයි, පූර්වයෙහිද මේ ආජීවකතෙම ඔවුන්ට කිපී මගුලට අන්තරාය කෙළේය''යි වදාරා ඉකුත්වත් කථාව ගෙනහැර දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි නුවර වාසීහු ජනපද වාසින්ගේ දුවණී කෙනෙකුන් රුස්වා(කැමති කරවා) දවස් නියමකොට තබා තමාගේ කුළුපග වූ ආජීවකයෙකුගෙන් විචාළාහුය. "ස්වාමීන් වහන්ස, අද අපගේ එක් මංගල ක්‍රියාවෙක් ඇත. නක්‍ෂත්‍රය යහපත් දේ හෝ අයහපත් දේ හෝ"යි විචාළාහුය. ඒ ආජීවකතෙම සිතනුයේ "මොහු තමාගේ අභිප්‍රාවෙන්(කැමැත්ත අනුව) දවස නියමකොට තබා දැන් මාගෙන් විචාරන්නාහුය"යි කියා කිපී "අද මොහුන්ගේ මගුලට අන්තරාය කෙරෙමි"යි සිතා "අද නක්‍ෂත්‍රය යහපත් නොවන්නේය. ඉදින් මගුල් කළෝ නම් මහත් විනාශයට පැමිනෙන්නාහුය"යි කීයේය. ඒ නුවර වාසීහු ඔහුගේ වචනය අදහාගෙන නොආවාහුය. ජනපද වාසීහු ඔවුන්ගේ නොර්ම දැන "නුවර වාසීහු අද දවස තබා(දවස නියමකොට) නොආවාහුය. අපට ඔවුන්ගේ ප්‍රයෝජන කවරේදැ"යි කියා අන්‍යයන්හට දුවණීයන් දුන්නාහුය. නුවර වාසීහු දෙවැනි දිනයෙහි අවුත් කුමාරිකාව ඉල්වූවාහුය. ජනපද වාසීහු කියන්නෝ "තෙපි නුවර වාසීහු නම් නසනලද ලජ්ජා ඇති ගැහැවියහ(ගෘහපතියෝ වන්නාහුය), දවස තබා කුමාරිකාව නොගත්තාහ, අප තොපගේ ගමන් නැති බැවින් අන්‍යයන්ට දුනුම්හ"යි කිවාහුය. "අපි ආජීවකයක්හුගෙන් විචාරා නක්‍ෂත්‍රය යහපත් නොවන බැවින් නොආම්හ. අපට කුමාරිකාව දෙව"යි කීවාහුය. "අප විසින් තොප නොඑන බැවින් අන්‍යයන්ට දෙන ලද්දේය, දැන් දෙනලද කුමාරිකාව කෙසේ නැවත ගෙන

එමෝදැ''යි කියා මෙසේ ඔවුන් ඔබිනොබ(ඔවුනොවුන්) ඩබර කරන කල්හි එක් නුවර වැසි ප්‍රඥාවත් පුරුෂයෙක් එක් කර්මාන්තයක් නිසා ජනපදයට ගියේය. “අපි ආජීවකයාගෙන් විචාරා නක්‍ෂත්‍රය යහපත් නොවන බැවින් නොආම්හ''යි කියන්නාවූ ඒ නුවර වාසීන්ගේ වචනය අසා “නක්‍ෂත්‍රයෙන් කවර ප්‍රයෝජනද? කුමාරිකාවගේ ලැබීම් නක්‍ෂත්‍රය නොවේදැ''යි කියා මෙසේ කීසේක. “නක්‍ෂත්‍රය බලන්නාවු අඥානයාගේ අර්ථය ඉක්මෙන්නේය (නැකත් බලන්නා වූ මෝඩයාගේ බලාපොරොත්තුව ඉටු නොවේ). අර්ථයට අභිෂ්ටාර්ථ ප්‍රතිලාභය ම නක්‍ෂත්‍ර නම (බලාපොරොත්තුවන කරුණට නැකත නම් බලාපොරොත්තු දේ ඉටුවීමයි) තාරකා රූපයෝ කවර නම් අර්ථයක් සාදද්දැ''යි(නැකත් වලින් ඇති ඵලය කුමක්දැයි) කීසේක. නුවර වාසීහු ඩබරකොට කුමාරිකාව නොලැබ ගියාහුය.

ශාස්තෲන් වහන්සේ ද “මහණෙනි, මේ ආජීවකතෙම මේ කුලයාගේ මඟුලට අන්තරාය කෙළේ දැන්මතු නොවෙයි, පූර්වයෙහිත් අන්තරාය කෙළේම''යයි කියා මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ ‘නක්‍ෂත්‍ර ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි ආජීවකතෙම දැනුදු ආජීවක වූයේය. එසමයෙහි ඒ කුලයෝ දැනුදු මේ කුලයෝ වූවාහුය. ඔවුන්ට අවවාද කියා සිටියා වූ පණ්ඩිත පුරුෂයන් වූයෙම් වනාහී

තිලෝගුරු සමයයක් සම්බුදුරජ වූ මම්ම වේදැ''යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 050. දුම්මෙධ ජාතකය

තවද එක් සමයෙක්හි දිව්‍ය බ්‍රහ්මයන්ගේ මස්තකයෙහි කෙළනා ශ්‍රී පාද ඇති (දෙව් බඹුන්ගේ හිසින් පිදුම් ලබනා සිරිපතුල් ඇති) බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවාසය කරණසේක් ලෝකාර්ථ චර්යාවක්(ලෝකයාට සෙත සැලසීමක්) අරභයා මේ ජාතකය වදාළසේක.

මෙහි වර්ථමාන කථාව දෙළොස් වැනි නිපාතයෙහි වූ 'මහා කණහ' ජාතකයයෙහි මතු ප්‍රකාශ වන්නේය.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහබෝධිසත්වයන් වහන්සේ ඒ රජ්ජුරුහුගේ අග්‍රමෙහෙෂිකාවන්ගේ කුක්ෂියෙහි පිළිසිඳ ගත්සේක. මව් කුසින් නික්මුණ වූ අප මහබෝධිසත්වයන් වහන්සේට නම් තබන්නා වූ දිනයෙහි 'බ්‍රහ්මදත්ත කුමාරය'යි කියා නම් කළානුය. ඒ බ්‍රහ්මදත්ත නම් කුමාරතෙම සොළොස් ඇවිරිදි වයසට පැමිණ තක්ෂලා නුවරට ගොස් ශිල්පය ඉගෙණ වෙදත්‍රයාගේ (ඍග්, යජුර්, සාමන් යන වේද තුනෙහි) පරතෙර පැමිණ අටළොස් විද්‍යාස්ථානයන්ගේත්(විද්‍යාවිෂය දහඅටෙහිත්) නිෂ්පත්තියට(පරතෙරට) පැමිණිසේක.

ඉක්බිත්තෙන් අප මහබෝසතානන් වහන්සේට පිය මහරජ්ජුරුවෝ යුවරජ තනතුරු දුන්සේක. එසමයෙහි බරණැස් නුවරවාසිහු දේවතාවන් මඟුල්කොට පවත්නාහ(උතුම්කොට සළකන්නාහ). දෙවියන්ට නමස්කාර කරන්නාහු බොහෝ තිරෙළු පලෙලුවන්(එළුවන් බැටළුවන්) කුකුළන්, ඌරන්, ආදී වූ ප්‍රාණීන් ඝාතනය කොට අනේකප්‍රකාර වූ පුෂ්පයෙන්(නන්වැදැරුම් මලින්) හා සුගන්ධයෙන්ද මාංශයෙන් හා රුධිරයෙන්ද(මසින් හා ලෙයින්ද) බිලිපූජා කරන්නාහුය. බෝධිසත්වයන් වහන්සේ සිතනසේක් "දැන් සත්වයෝ දෙවියන් මඟුල්කොට පවත්නාහුය. බොහෝ ප්‍රාණවධ කෙරෙති(සතුන් මරති), මහජනතෙම බොහෝසේ අධර්මයෙහි පිහිටියේය. මම පිය රජහුගේ ඇවෑමෙන් රාජ්‍යය ලැබ එකකුදු කලාන්ත(කිසිවකු පීඩා) නොකොට උපායෙන්ම ප්‍රාණවධ කරන්ට නොදෙන්නෙමි" සිතූසේක.

මෙසේ සිතා අප මහබෝසතාණන් වහන්සේ එක් දවසක් රථයට නැගී නුවරින් නික්මුණුසේක් මහත් නුග වෘක්ෂ මූලයෙක්හි මහජනයා රැස්ව නුග වෘක්ෂයෙහි අධිගෘහිත වූ(නුග ගසෙහි අරක්ගෙන සිටිනා) දිව්‍ය පුත්‍රයාගේ සමීපයෙන් පුත්‍රයන් හා දුහිතෘ යසස් ධනාදීන් යමක් යමක් කැමතිද(දූ පුතුන් කීර්තිය ධනය ආදී යම් කිසිවක් බලාපොරොත්තු වේද) ඒ ඒ කැමති දෙය ප්‍රාර්ථනා කරන්නාවුන් දුටුසේක. ඒ අප මහබෝසතාණන් වහන්සේ රථයෙන් බැස ඒ නුග වෘක්ෂය කරා එළඹ සුගන්ධ පුෂ්පයෙන් පූජාකොට ජලයෙන් අභිෂේකකොට(සුවඳ මලින් පුද දියෙන් නහවා) වෘක්ෂය

ප්‍රදක්ෂිණාකොට(ගස වටා ඇවිද) දෙවතාමංගලිකයක්හුමෙන්(දෙවියන් පුදන්නෙකු මෙන්) දෙවතාවට නමක්කාරකොට රථයට නැගී නුවරට ම වැඩිසේක. එතැන් පටන් මෙම ක්‍රමයෙන් අතරතුරෙහි(වරින්වර) එතනට ගොස් දෙවතාමංගලියක්හු මෙන් පූජා කරනසේක.

ඒ අප මහබෝසතාණන් වහන්සේ විසින් මෑත භාගයෙහි පිය රජ්ජුරුහුගේ ඇවෑමෙන් රාජ්‍යයෙහි පිහිටා සතරඅගති(ඡන්ද, ද්වේෂ, මොහ, බය) දුරුකොට දශරාජ ධර්‍මයන් කොපය නොකෙරමින්(දාන - සීල - පරිත්‍යාග - ඍජුබව - මෘදුබව - තපස් ගුණය - අවෛරය - අවිහිංසාව - ඉවසීම - නීතිගරුක බව යන දශරාජ ධර්ම නොකෙළසා) දැහැමෙන් රාජ්‍ය කෙරෙමින් මෙසේ සිතූසේක. “මාගේ මනෝරථය මස්තකප්‍රාප්ත වූයේය(සිතේ අදහස ඉටුවූයේය), රාජ්‍යයෙහි පිහිටියෙමි, එබඳු වූ මම පූර්‍වයෙහි යම් එක් කාරණයක් සිතූයෙමි ද දැන් ඒ කාරණාව මස්තකප්‍රාප්ත කරන්නෙමි”(ඒ කරුණ මුදුන් පත්කරන්නෙමි) සිතා අමාත්‍යයන්ද බ්‍රහ්මණ ගෘහපති ආදීන්ද රැස්කරවා මෙසේ ආමන්ත්‍රණය කළසේක. “පින්වත්නි, මා විසින් කවර කාරණයකින් රාජ්‍යයට පැමිණෙන ලදදැයි දන්නාහුදැ”යි විචාළසේක. “මහරජ්ජුරුවන් වහන්ස නොදනුම්හ”යි කීවාහුය. වැලිදු වනාහි “මා අසවල් නම් නුගවෘක්ෂයට සුගන්ධාදීන් පූජාකොට බද්ධාඤ්ජලිව(දෑත් එක්කොට) සිට නමස්කාර කිරීම දුටුවිරිදැ”යි(දුටුවාදැයි) වදාළසේක. “එසේය මහරජ”යි කීවාහුය. එකල්හි “මම ප්‍රාර්ථනාවක් කෙළෙමි, ඉදින් මම

රාජ්‍යයට පැමිණීයෙම් නම් නුඹවහන්සේට බිලිපූජා කරන්නෙමියි කීයෙමි, එසේ හෙයින් මා විසින් ඒ දෙවතාවාගේ ආනුභාවයෙන් මේ රාජ්‍යය ලබන ලද්දේය, දැන් ඒ දේවතාවාට බිලි පූජා කරන්නෙමි, තෙපි ප්‍රමාද නොකොට සීඝ්‍රව දේවතාවාට බිලිපූජා සදව”යි කීසේක. “මහරජ කවර කවර දෙයක් ගණුමෝද්‍ද”යි කීවාහුය. “පින්වත්නි, මම දේවතාවාට යාච්ඤා කරන්නේ යමෙක් මාගේ රාජ්‍යයෙහි ප්‍රාණඝාතාදී පඤ්ච දුස්සීල කර්මයන්ද, දශ අකුශල කර්මපථයන්ද සමාදන්ව පවතිද්ද, ඔවුන් ඝාතනයකොට අතුණු බහන් මාංශ රුධිරාදීයෙන් (බඩවැල් මස් ලේ ආදියෙන්) බිලිපූජා කෙරෙමැයි කියා ආරාධනා කෙළෙමි. තෙපි මෙසේ බෙර හසුරුවව, ‘අපගේ රජ්ජුරුවෝ යුවරජ කල්හි මෙසේ යාඥාවක් කළසේක. ඉදින් මම රාජ්‍යයට පැමිණීයෙන් වීනම් යමෙක් මාගේ රාජ්‍යයෙහි දුස්සීලව වෙසේද ඒ සියල්ලවුන් ඝාතනයකොට බිලිපූජා කරන්නෙමි’ කියාය, දැන් ඒ රජතෙම පඤ්ච පාපයද, දශ අකුශල් දැයි කියනලද දුස්සීල කර්මය සමාදන්ව පවත්නා වූ දුස්සීලයන් දහසක් නසා ඔවුන්ගේ හෘදයමාංශාදිය(හද මස්) ගෙන දේවතාවට බිලිපූජා කරනු කැමතිසේක. මෙලෙස නුවරවාසීහු දැනගනිත්ව”යි කීසේක. මෙසේ ද කියා “යමෙක් දැන් මෙතැන් පටන් දුස්සීල ක්‍රියාවෙහි පවතිද්ද, ඔවුන් දහසක් නසා යාගකොට ආරාධනාවෙන්(බාරයෙන්) මිදෙමි”යි කියා මේ කාරණය ප්‍රකාශ කරනු පිණිස මෙසේ කීසේක. “මේ ක්‍රියාව කරන්නට සුදුසුයයි, මෙය නොකරන්නට සුදුසුයයි කියා නොදන්නා වූ

දුර්මෙධයන්(මෝඩයන්) ප්‍රාණඝාතාදී කරන්නා වූ අඟදන පුද්ගලයන් දහසකින් යාගකරන්නට යාඥා කරන ලද්දේය. ඒ මම දැන් ඒ ආරාධනාවෙන් රාජ්‍යය ලදිමි. දැන් යාගකරන්නෙමි, කාරණා කවරේද? දැන් අධාර්මික ජනයෝ බොහෝය. ඔවුන් ගෙන බිලිපූජා කරන්නෙමි" කීසේක.

අමාත්‍යයෝ බෝධිසත්ත්වයන් වහන්සේගේ වචනය අසා "මහරජ යහපතැ"යි කියා දොළොස් යොදුන් බරණැස් නුවර බෙර ලැවුවාහුය. ආඥා භෙරිය(අණ බෙරය අසා) අසා එකද දුස්සීල ක්‍රියාවක් සමාදන්ව සිටියා වූ එක පුරුෂයෙකුදු නුවූයේය. මෙසේ බෝධිසත්ත්වයන් වහන්සේ යම්තාක් කල් රාජ්‍යය කළසේක් ද එතාක් කල් එක පුද්ගලයකුදු පඤ්ච පාප, දශ අකුශලය යන කර්මයන් කෙරෙන් එකදු අකුශල ක්‍රියාවක් කරන්නෙකු නොපෙනුනේය. මෙසේ බෝධිසත්ත්වයන් වහන්සේ එක පුද්ගලයකු කලාන්ත නොකරවා (පීඩාවට පත් නොකොට) සියලු රටවැස්සන් ලවා සිල් රක්‍ෂා කරවා තමන්වහන්සේද දනාදී වූ පින්කම්කොට ජීවිතයාගේ කෙළවර තමාගේ පර්ෂද්(පිරිස) ගෙන දිව්‍ය ලෝකය පුරමින් වැඩිසේක.

ශාස්තෲන් වහන්සේද "මහණෙනි, තථාගතත්වාදී(පෙර බුදුවරුන් ආ පිළිවෙළින් පැමිණ හෙයින් 'තථාගත' නම් වූ ආදී) කාරණයෙන් යුක්ත සර්‍වඥයන් වහන්සේ ලෝකයාට වැඩෙහි හැසුරුනේ දැන්මතු නොවෙයි, පෙරත් හැසුරුණුසේක්මය"යි කියා මේ දම් දෙසුම ගෙනහැර දක්වා

පූර්වාපර සන්ධි ගළපා මේ ‘දුම්මෙධ ජාතකය’ නිමවා වදාළසේක.

“එකල්හි පර්ෂද් තොම දැන් බුදු පිරිස් වූවාහුය. බරණැස් රජුව උපන්නෙම් දැන් තිලෝගුරු සම්‍යයක් සම්බුදුරජ වූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 051. මහශීලව ජාතකය

තවද එක් සමයෙක්හි මහපොළොව සේ විපුල වූ ගුණ ඇති(මහා පොළොව සේ මහත් ගුණ ඇති) තිලෝගුරු(තුන් ලොවට ගුරු වූ) බුදුරජාණන් වහන්සේ දෙව්රම්වෙහෙර වසනසේක් පසුබට වීර්‍ය්‍ය ඇති එක් භික්ෂු කෙනෙකුන් වහන්සේ උදෙසා මේ ජාතකය වදාළසේක.

සර්වඥයන් වහන්සේ ඕහට “සැබෑද? මහණ තෝ පසුබට වීර්‍ය්‍ය ඇත්තෙහිදැ?”යි විචාරා “එසේය ස්වාමීනි” කී කල්හි “මහණ තෝ කවර කාරණයකින් මෙබඳු නෛර්‍ය්‍යාණික(නිවනට පමුණුවන්නා වූ) ශාසනයෙහි මහණව වීර්‍ය්‍ය හැරපුයෙහිද?(අත්හලෙහිද?) පෙර නුවණැත්තෝ රාජ්‍යයෙන් පිරිහීත් තමන්ගේ වීර්‍ය්‍යයෙහි සිට නටුවාවුත් යසස(විනාශ වූ කීර්තිය) ඉපද වූවෝමවේදැ”යි වදරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි පුරණලද බෝධිසම්භාර ඇති අප මහබෝසතාණෝ ඒ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන්

කුස පිළිසිඳ ගත්තුය. ඒ බෝධිසත්ත්වයන්ට නම් තබන දවසේ 'ශීලව කුමාරයෝය'යි නම් තුබූහ. සොළොස් ඇවිරිදි වයසෙහි දීම සියලු ශිල්පයෙහි කෙළ පැමිණ මෑත භාගයෙහි පියාණන්ගේ ඇවෑමෙන් රාජ්‍යයෙහි පිහිටා 'මහශීලව රජ්ජුරුවෝය'යි මෙනමින් ප්‍රසිද්ධ වූය. ධර්මිෂ්ඨයෝය. ධර්මයෙන් රාජ්‍යය කෙරෙති. ඒ රජ්ජුරුවෝ නුවර සතර වාසල් දොරය, නුවර මධ්‍යයෙහිය, තමන්ගේ මාලිගාව සමීපයෙහිය යි දන්හල් කරවා දුගී මගී යාචකයන්ට දන්දෙති. නිරන්තරයෙන් පන්සිල් රකිති. පොහොය පෙහෙවස් වෙසෙති(අටසිල් රකිති). ක්ෂාන්ති, මෛත්‍රී, කරුණාවෙන් යුක්තව ඇකයෙහි උන් දරු කෙනෙකුන් නලවා සතුටු කරන්නාක් මෙන් සියලු සත්ත්වයන් සතුටු කරවමින් දැහැමෙන් රාජ්‍යය කෙරෙති.

එකල රජ්ජුරුවන්ගේ එක් අමාත්‍යයෙක් අන්තඃපුරයට වැද මෑත භාගයෙහි තමා කළ කාර්යයන් ප්‍රසිද්ධ විය. අමාත්‍යයෝ රජ්ජුරුවන්ට එපවත් දැන්වූය. රජ්ජුරුවෝ පරීක්ෂා කරන්නාහු තුමූම ප්‍රත්‍යක්ෂකොට ගෙන ඒ අමාත්‍යයා කැඳවා කියන්නේ "නුවණ නැති තා විසින් නොකළමනා දෙයක් කරනලද, තෝ මාගේ විජිතයෙහි වසන්නට නුසුදුසුයෙහිය. තාගේ වස්තුවත් පුත්‍රදාරාවනුත් හැරගෙන අනික් තැනකට පළායව"යි කියා රටින් නෙරපූය. ඒ අමාත්‍යයා කසී රටින් නික්ම ගොස් කොසොල් රජ්ජුරුවන්ට සේවය කරන්නේ ක්‍රමයෙන් රජ්ජුරුවන්ට අභ්‍යන්තරව විස්වාස විය(සමීප විශ්වාස වන්තයෙක් විය).

එතෙම එක් දවසක් කොසොල් රජ්ජුරුවන්ට කියන්නේ "රජ්ජුරුවන් වහන්ස, බරණැස් නුවර රාජ්‍යය නම් නිමලසි(මී මැස්සන් නොමැති) මී වදයක් හා සමානය. රජ්ජුරුවන් වහන්සේ ඉතා මොලොක්සේක. ස්වල්ප වූ සේනාවකින් බරණැස් නුවර රාජ්‍යය හැරගන්නට පිළිවන් වන්නේය"යි කීය. රජ්ජුරුවෝ ඔහුගේ බස් අසා "බරණැස් නුවර රාජ්‍යය නම් මහත් වන්නේය. මේ තෙමෙත් ස්වල්ප වූ බලවාහනයකින්ම රාජ්‍යය ගන්ට පිළිවනැයි කීය කිමෙක්ද? මේ රජ්ජුරුවන්ගෙන් එවූ චරපුරුෂයෙක් දෝ හෝ"යි සිතා "තෝ චරපුරුෂයෙක්දැ?"යි කිවුය. "රජ්ජුරුවන් වහන්සෙ, මම චර පුරුෂයෙක් නොවෙමි, ඇත්තම කියමි, ඉදින් මාගේ බස් නොඇදහනසේක් වීනම් මනුෂ්‍යයන් යවා පසල් දනව්වෙන්(පිටිසර ජනපදයක) ගමක් නසාපුව මැනව. ඒ ගම් පහරණ මනුෂ්‍යයන් අල්වාගෙන තමන්වහන්සේ සමීපයට ගෙනගිය කල්හි වස්තු දීලා හැරපියන සේකැ"යි කීය. එබස් ඇසූ රජ්ජුරුවෝ "මේ තෙම ඉතා නිර්භීතව කියන්නේ වන්නාට(එසේ වුවත්) පරීක්‍ෂා කෙරෙමිය"යි සිතා තමන් පුරුෂයන් යවා පසල් දනව්වෙන් ගමෙක මිනී මරවා කොල්ල කැවූය. ඒ පසල් දනව්වේ මනුෂ්‍යයෝ මිනීමරූ සොරුන් අලවා බඹදත් රජුවෙත ගෙනාවාහුය. රජු ඔවුන් දැක "දරුවෙනි, කවර කාරණයකින් ගම් පැහැරූදැ?"යි විචාළෝය. "ස්වාමීනි, ජීවත්ව ගතනොහි ගම් පැහැරුම්හ"යි කී කල්හි "එසේ කල කුමක් නිසා මෙතෙක් කල් මා සමීපයට නො ආවුද? දැන් මෙවක් පටන් මෙබන්දක් නොකරව"යි කියා ඔවුන්ට සම්පත් දී

අළුවාහුය(පිටත් කළහ). ඒ මනුෂ්‍යයෝ ගොස් කොසොල් රජ්ජුරුවන්ට ඵපවත් දැන්වූහ. ඒ රජ්ජුරුවෝ මෙපමණකිනුත් යා නොහි(යාමට නොකැමතිව) නැවත මධ්‍යයේ ජනපදයක් පැහැරවූය. ඒ සොරුන්ටත් බරණැස් රජ්ජුරුවෝ පළමු පරිද්දෙන්ම සම්පත් යැවූය. කොසොල් රජ්ජුරුවෝ මෙපණකිනුත් නොගොස් නැවත පුරුෂයන් යවා විථිමධ්‍යයෙහි මිනී මරවා කොල්ල කැවූය. රජ්ජුරුවෝ ඒ සොරුන්ටත් සම්පත් දී යව්වාහුය. එකල්හි කොසොල් රජ්ජුරුවෝ “ඉතා ධර්මිෂ්ඨ රජ්ජුරු කෙනෙකැ”යි දැන “බරණැස් රාජ්‍යය ගනිමි”යි සේවා වාහන ගෙන නික්මුනාහුය.

එසමයෙහි වනාහී බරණැස් රජ්ජුරුවන්ගේ මත්ත හස්තිරාජයානුදු(මද කිපුණු ඇත් රජුන් පවා) අභිමුඛව එන කල්හි(ඉදිරියට එන කල) පිටි පෑ පලා නොයන්නා වූ(ආපසු හැරී පැන නොදුවන්නා වූ) ස්වභාව ඇති සිය දහස් ගනන් අකුණු ගසන කල්හිත් තැති නොගන්නා වූ ස්වභාව ඇති ශීලව මහරජ්ජුරුවන්ගේ අභිප්‍රායක් ඇති කල්හි සියළු දඹදිව රාජ්‍යය ඇරගන්ට සමර්ථ වූ දහසක් පමණ ඔවුනොවුන් හැර වෙන්ව පළා නොයන්නා වූ උත්තම මහයෝධයෝ ඇත. ඔහු හැම දෙනම “කොසොල් රජ්ජුරුවෝ යුද්ධයට එති” අසා තමන්ගේ රජ්ජුරුවන් සමීපයට ගොස් කියන්නෝ “කොසොල් රජ්ජුරුවන් වහන්සේ බරණැස් නුවර රාජ්‍යය ගනිමියි එනසේක. ස්වාමීනි, යම්හ, උන්වහන්සේ අපගේ රාජ්‍යය සීමාවට බැස්ස නොදීම තලාපියා අල්වාගනුම්හ”යි කීය. ඒ අසා රජ්ජුරුවෝ “මා නිසා දරුවෙනි, අනුන්ට පීඩා කිරීමෙන්

ප්‍රයෝජන නැත. රාජ්‍යය කැමති කෙනෙක් ගනිත්වයි, එසේ හෙයින් තොපි ඇම නොයව”යි වැළකූය. කොසොල් රජ්ජුරුවෝ සීමාව ඉක්ම දනවු මධ්‍යයට වන්නාහුය. අමාත්‍යයෝ නැවතත් රජ්ජුරුවන් කරා ගොස් එසේම කීවාහුය. රජ්ජුරුවන් පළමු පරිද්දේන්ම වැළකූය. කොසොල් රජ්ජුරුවෝ පිටිනුවර සිට “රාජ්‍යය හෝ දෙත්වයි හෝ යුද්ධ කෙරෙත්ව”යි කියා ශීලව මහරජ්ජුරුවන්ට අසුන් යවුය. රජ්ජුරුවෝ ඒ අසා “මා හා සමග කරන්නා වූ යුද්ධයක් නැත. රාජ්‍යය ගන්නාසේක්ව”යි කියා පෙරලා අසුන් යැවුය. නැවතත් අමාත්‍යයෝ රජ්ජුරුවන් කරා ගොස් කියන්නෝ “රජ්ජුරුවන් වහන්ස, අපි කොසොල් රජ්ජුරුවන් නුවරට වැද්ද නොදෙම්හයි පිටි නුවරදී තලාපියා අල්වාගනුම්හ”යි කිවුය. රජ්ජුරුවන් පළමු පරිද්දෙන්ම වලකා නුවර වාසල් දොර හරවා අමාත්‍යයන් දහසක් දෙනා සමග ප්‍රාසාදයේ මතු මහල්තලයෙහි සිංහාසන මස්තකයෙහි උන්නාහුය.

කොසොල් රජ්ජුරුවෝ මහත් වූ සේනා වාහන හා සමග බරණැස් නුවරට වන්නාහු. ඒ කොසොල් රජ්ජුරුවන්ගේ මාලිගා දොර සමීපයට ගොස් අමාත්‍ය සමූහයා විසින් පිරිවරණ ලදුව නොවසනලද දොර ඇති මාලිගාවෙහි සරහා පිළියෙළ කරනලද මතු මහල්තලයට නැගී උන්නා වූ නිරපරාධ වූ ශීලව මහරජ්ජුරුවන් අමාත්‍යයන් දහසක් දෙනා හා සමග අල්වා යවා “මේ රජ්ජුරුවන් අමාත්‍යයන් දහසක් දෙනා හා සමග පිටිතල හයා බැඳ(අත් පිටිපසට තබා බැඳ) අමු සොහොනට ගෙනගොස් කරවටක් පමණ වල කැන(වවල්

කප්පවා) යම් සේ එකෙකුත් අතක් ඔසවන්නටත් අසමර්ථ නම්(නොහැකිවේද) ඒපරිද්දෙන් පස්ලා වලලා ලව(පස් දමා වලලා දමවයි), රාත්‍රියෙහි සිවල්ලු අවුත් මොවුන්ට කලමනා දෙය කරන්නෝවේදැ”යි කිවුය.

මනුෂ්‍යයෝ සතුරු රජ්ජුරුවන්ගේ බස් අසා රජ්ජුරුවන් හා සමග අමාත්‍යයයන් දහසක් දෙනා පිටිතල හයා බැඳ පිටත් කළාහ. එකල්හි ශීලව මහරජ්ජුරුවෝ සතුරු රජ්ජුරුවන් කෙරෙහි ආඝාත පමණකුත් (වෛර මාත්‍රයක් වත්) නොකළෝය. ඒ අමාත්‍යයන් දහසක් දෙනා මෙසේ බැඳලා ගෙන යන කල්හි රජ්ජුරුවන්ගේ වචනය ඉක්ම පවත්වන්නට අසමර්ථ කෙනෙක් නම් නුවූයේය. මෙසේ ඒ මහබෝසතාණන්ගේ පර්ෂද් ඉතා විනීත වන්නේය.(පිරිස ඉතා හික්මුණු පිරිසක් වන්නේය).

ඉක්බිත්තෙන් ඒ සතුරු රජ්ජුරුවන්ගේ රාජපුරුෂයෝ අමාත්‍යයන් සහිත වූ ශීලව රජ්ජුරුවන් අමු සොහොනට ගෙනගොස් කරවටක් පමණ වලකැණ ශීලව රජ්ජුරුවන් මධ්‍යයෙහි(මැද) අවශේෂ අමාත්‍යයන් දෑලයෙහියි(දෙපසෙහිදැයි) දහසක් දෙනාම වලට බා(වල දමා) පස්ලා ඝනකොට(තදකොට) පස් තලා ගියාහුය. එකල්හි ශීලව රජ්ජුරුවෝ අමාත්‍යයන් බණවා කියන්නෝ “සතුරු රජ්ජුරුවන් කෙරෙහි කෝපයක් නොකොට මෛත්‍රී කරව”යි අවවාද කළෝය. ඒකල මධ්‍යම රාත්‍රි වේලේ “මනුශ්‍ය මාංස කම්හ”යි කැනහිල්ලු ආවාහුය. ඔවුන් දැක රජ්ජුරුවන් හා

අමාත්‍යයෝ එක පැහැරම හඬ ගැසුය(එක්වරම ශබ්ද කළාහුය). කැනහිල්ලු භයින් ත්‍රස්තව(තැතිගෙන) පලා ගියාහුය. නැවත ඔහු පෙරලා සිට බලන්නාහු පස්සෙහි එන කෙනෙකුන් නැති නියාව දැන නැවත ආපසු ගියෝය. වල තුල මනුෂ්‍යයෝ පළමු පරිද්දෙන්ම අඬ ඇසූය. මෙසේ තුන් වාරයක් පළාගොස් නැවත පෙරලා සිට බලන්නාහු ඔවුන් අතුරෙන් එකෙකුවත් නොඑන නියාව දැන "මොහු වධයට පැමිණියෝ වනැ"යි(මරණ දඬුවම ලත් අය විය යුතුයි) බුහුටිව පෙරළා(නිර්භව ආපසු) අවුත් නැවත දහසක් දෙනා අඬගසමින් සිටියදීත් පළා නොගියාහුය.

ප්‍රධාන කැනහිලා රජ්ජුරුවන් කරා ගියේය. අවශේෂයෝ සෙසු අමාත්‍යයන් සමීපයට ගියෝය. උපායෙහි දක්ෂ වූ රජ්ජුරුවෝ ඔහු තමන් සමීපයට එන නියාව දැන ඩහන්ට(සපා කෑමට) අවසර දෙන්නාක් මෙන් කර ඔසවා ඔහු යට උගුර ඩැහැගත්තාහ. නිකටින් ඇද යන කල මිරිකා ගන්නාක් මෙන් තරකොට මිරිකා ගත්තුය. ඇත්බල ඇති රජ්ජුරුවන් විසින් නිකටින් ඇද ග්‍රීවයෙන් තරකොට මිරිකා ගන්නාලද කැනහිලා තමා ගලවා ගන්ට අසමර්ථව මරණ භයින් භයපත්ව මහ හඬින් හැඬුයේය. සෙසු කැනහිල්ලු ඔහුගේ බැගෑ අඬ අසා "එක් පුරුෂයක්හු විසින් අල්වා ගන්නා ලද්දේ වන"යි අමාත්‍යයන් සමීපයට වදනට අසමර්ථව මරණ භයින් භයපත්ව ඇම දෙනාම පළා ගියාහ. රජ්ජුරුවන්ගේ නිකටින් තරකොට ගන්නාලද කැනහිලා ඇත මැත ගැසෙන්ට වන්කල්හි පස් සිථිලව(පස් බුරුල්ව) ගියේය.

ඒ කැනහිලාත් මරණ භයින් භයපත්ව සතර කකුලෙන් රජ්ජුරුවන්ගේ ළය ශරීරයේ පස් පසුරු ගා ඉවත් කෙළේය(පපු ප්‍රදේශයෙහි පස් පහුරු ගා ඉවත් කළේය). රජ්ජුරුවෝ සිථිල වූ නියාව(බුරුල් වූ බව) දැන කැනහිලා හැර ඇත්බල ඇති ශක්ති සම්පන්න(ඇතකුට සමාන ශක්තිය ඇති) තැනැත්තෝ ඔබ්මොබ කැරකැවී දෙපිටට නැමී දෑත ඔසවා මුවවිට එල්බ(වලකටෙහි එල්ලී) සුලගින් කඩා දැමූ වලාකුළක් මෙන් වලින් ගොඩනැගී සිට අමාත්‍යයන් අස්වසා පස් පීරා(පස් ඉවත්කොට) සියල්ලවුන් ගොඩනගා අමාත්‍යයන් විසින් පිරිවරණ ලදුව අමු සොහොනෙහි සිටියාහුය.

එසමයෙහි මනුෂ්‍යයෝ මළ මිනියක් අමු සොහොනට ගෙනගොස් දමන්නාහු, යක්‍ෂයන් දෙදෙනෙකුගේ සීමා මධ්‍යයට දැමූය. ඒ යක්‍ෂයෝ දෙදෙන මිනිය බෙදාගත නොහී "අපි මේ මිනිය බෙදාගත නොහෙම්හ. මේ ශීලවී රජ්ජුරුවන් වහන්සේ ධර්මිෂ්ඨ සේක. උන්වහන්සේ අපට බෙදා දෙනසේක. ඒ රජ්ජුරුවන් වහන්සේ සමීපයට යම්හ"යි ඒ මළ මිනිය දෙකකුල අල්වාගෙන රජ්ජුරුවන් සමීපයට ගොස් "රජ්ජුරුවන් වහන්ස, අපට මේ මිනිය බෙදාදුන මැනව"යි කීය. එකල බෝධිසත්වයෝ කියන්නෝ "පින්වත් වූ යක්‍ෂයනි, මම තොපට මේ මිනිය බෙදා දෙමි. මම වූ කලී පිරිසිදු නොවෙමි. එසේ හෙයින් පළමුකොට නාමි"යි කිවුය. යක්‍ෂයෝ සතුරු රජ්ජුරුවන්ට තිබූ සුවඳ කැවූ පැන් තමන්ගේ ආනුභාවයෙන් ගෙනවුත් රජ්ජුරුවන් නාන පිණිස දුන්නාහුය. ඉස්නානයකොට සිට රජ්ජුරුවන්ට සතුරු රජ්ජුරුවන්ගේ පත්කොට තුබූ

(රැස්කොට තිබූ) සළු ගෙනවුත් දුන්හ. ඒ සළු ඇඳගෙන සිටියාවූ රජ්ජුරුවන්ට සිව්දෑගඳ(සඳුන්, කපුරු, කොකුම්, තුවරලා යන සුවඳ පිරූ) කරඬුවක් ගෙන දුන්හ. සුවඳ විලවුන් ගල්වා සිටි රජ්ජුරුවන්ට රන්කරඬුවේ ලා මැණික් තල්වැට මත්තේ තුබූ නොයෙක් මල් ගෙනවුත් දුන්හ. මල් පැලඳ සිටි රජ්ජුරුවන්ට "අනික් කුමක් කරමෝදැ"යි විචාළෝය.

රජ්ජුරුවෝ තමන්ට සය ඇති නියාව(බඩගිනි ඇති බව) ඇඟවූය. යක්‍ෂයෝ ගොස් සතුරු රජ්ජුරුවන්ට පිස තබනලද නොයෙක් අග්‍රරසයෙන් යුක්ත වූ භෝජන ගෙනවුත් දුන්හ. රජ්ජුරුවෝ නාහා සුවඳ විලවුන් ගල්වා සැරහී සැදී පැහැදී සිටි තැනැත්තෝ අනෙකප්‍රකාර වූ අග්‍රරසයෙන් යුක්ත වූ භෝජනය අනුභව කළෝය. යක්‍ෂයෝ සතුරු රජ්ජුරුවන්ට තුබූ සුවඳ කැවු පැන් ස්වර්ණ භිංකාරයෙන්(රන් කෙණ්ඩියෙන්) රන්තැටිය හා සමග ගෙනාවාහුය.

ඉක්බිත්තෙන් බෝධිසත්ත්වයෝ පැන් බී මුඛය සෝදා අත සේදූ කල්හි සතුරු රජ්ජුරුවන්ට සපයනලද පස්පල වතින්(බුලත් විටට ගන්නා කපුරු,තකුල්, නරං පොතු, කරබු, ඉගුරු යන පහ) යුක්ත වූ බුලත් ගෙනවුත් දුන්හ. බුලත් කා සිටි කල්හි "අනෙක් කුමක් කරමෝදැ?"යි විචාළෝය. "නැවත ගොස් සතුරු රජ්ජුරුවන්ගේ ඉස්දෙර තුබූ මඟුල් කඩුව ගෙනෙව"යි කිවුය. ඒ මඟුල් කඩුවත් ගෙනාවාහුය. රජ්ජුරුවෝ කඩුවගෙන එම මිනිය කෙළින් සිටුවා ඉස් මුදුනෙහි කඩුවෙන්

ගසා දෙකක් කොට පලා යක්ෂයන් දෙදෙනාට සමබෙත් බෙදා දුන්. (සමසේ බෙදා දුන්හ) ඒ කඩුව සෝදා කොපුවේ ලා උරයේ බැඳ එල්වාගෙන සිටියාහුය.

ඉක්බිත්තෙන් ඒ යක්ෂයෝ මනුෂ්‍ය මාංස අනුභවකොට බඩ පුරාගෙන සතුටු වූ සිත් ඇතිව සිටියාහු "රජ්ජුරුවන් වහන්ස, නුඹවහන්සේ ට අනික් කුමක් කරමෝදැ?"යි විචාළෝය. "ඒසේ වීනම් තෙපි තොපගේ ආනුභාවයෙන් මා ගෙනගොස් සතුරු රජ්ජුරුවන්ගේ ශ්‍රී යහන් ගබඩාවේ බා සිටුවාලවයි, මේ අමාත්‍යයන් ගෙනගොස් තම තමන්ගේ ගෙයි සිටුවාලව"යි කිවුය. ඒ යක්ෂයෝ දෙදෙන "යහපත, ස්වාමීනි" කියා ගිවිස එපරිද්දෙන්ම කළාහුය.

එසමයෙහි රජ්ජුරුවෝ සරහනලද ශ්‍රී යහන් ගබඩාවේ ශ්‍රී යහන් මස්තකයෙහි වැදහෙව නිදන්නාහුය. රජ්ජුරුවෝ සතුරු රජ්ජුරුවන් නිදිමතව නිදන තැනැත්තන්ගේ බඩට කඩුපතින් ගැසූය(කඩුවෙන් තට්ටු කළේය). ඒ රජ්ජුරුවෝ හයින් ත්‍රස්තව පිබිද ප්‍රදීපාලෝකයෙන් ශීලව මහරජ්ජුරුවන් හැඳින යහනින් නැගී ධෛර්‍ය්‍යය උපදවාගෙන සිට රජ්ජුරුවන්ට මෙසේ කිවුය.

"මහරජ්ජුරුවෙනි, මෙබඳු වූ රාත්‍රියෙහි ගනනාලද රැකවල් ඇතිව වසනලද දොර ඇති මේ ප්‍රාසාදයේ රැකවල් මනුෂ්‍යයන්ගෙන් අවසරයක් නැත්තාවූ ස්ථානයෙහි කඩුව අල්වාගෙන ස්වර්ණාභරණයෙන් සැරහී කෙසේ නම් තෙපි මේ යහන් මත්තට අවුදැ"යි කීය.

එබස් ඇසූ ශීලව මහරජ්ජුරුවෝ තමන් ආ සැටිය විස්තරකොට කීවාහුය. එබස් ඇසූ සතුරු රජ්ජුරුවෝ "කලකිරුණා වූ සිත් ඇති මහරජ්ජුරුවෙනි, මම මනුෂ්‍යාව සිටත් තොපගේ ගුණය නොදත්මි, අනුන් ඇඟ වෙර ලේ මස් කන්නා වූ(අනුන්ගේ ඇඟ ලේ මස් කන්නා වූ) චණ්ඩ පරුෂ වූ යක්‍ෂයන් විසින් තොපගේ ගුණ දන්නාලද. රජ්ජුරුවෙනි, දැන් මම මෙබඳු වූ ශීල ගුණයෙන් යුක්ත වූ තොප කෙරෙහි ද්‍රෝහයක් නොකරමි"යි කඩුවගෙන සපථකොට රජ්ජුරුවන් ක්‍ෂමා කරවා(සමාව ගෙන) මහයානේ සතපවා(මහ ඇඳෙහි නිදිකරවා) තුමූ කුරු යහනෙක(මිටි ඇඳෙක) වැදහෙව පාන්ව ගිය කල හිරු නැගි කල්හි බෙරලවා සියලු සේනාව හා අමත්‍ය, බ්‍රාහ්මණ, ගෘහපතීන් රැස් කරවා ඉදිරියේ ආකාශයෙහි පුන්සඳ මඬල ඔසවා(සඳ මඬල උඩට නගා) පාන්නාක් මෙන් ශීලව රජ්ජුරුවන්ගේ ගුණ කියා පර්ෂද් මධ්‍යයෙහි(පිරිස මැදදීම) නැවත රජ්ජුරුවන් ක්‍ෂමා කරවා රාජ්‍යය පාවාදී "මෙතැන් පටන් නුඹවහන්සේට උපන්නා වූ සතුරන්ගෙන් උපද්‍රවයෙක් ඇත්නම් මට භාරවන්නේය. මා ගත් රැකවලින් නුඹවහන්සේගේ රාජ්‍ය ශ්‍රී අනුභවකොට වදාළ මැනවැ"යි කියා කේලාම් කී තැනැන්තවුන් රාජාඥා කොට(දඬුවම් කොට) තමන්ගේ සේනා වාහන ගෙන ස්වකීය වූ රාජ්‍යයටම ගියෝය.

ශීලව රජ්ජුරුවෝත් ස්වර්ණාභරණයෙන් සැරහී ධවලච්ඡත්‍රය යට(සුදු කුඩය යට) සරහන සරභ මෘගයන්ගේ(සරභ නම් මුවන්ගේ) කකුල් බඳු වූ පා ඇති

ස්වර්ණ පර්යංකයේ(රන් පිටුවෙහි) හිඳ තමන්ගේ සම්පත්තිය බලා "මෙබඳු සම්පත්තියත් අමාත්‍යයන් දහසක් දෙනාගේ ජීවිත ප්‍රතිලාභයත් මා වීර්‍ය්‍ය නොකළ කල්හි කිසිවෙක් සිද්ධ නොවන්නේ වේදැයි වීර්‍ය්‍ය බලයෙන්ම මම නටුවාවූ යසසත් ලදිමි. අමාත්‍යයන් දහසක් දෙනාට ජීවිත දානය දිනිමි. ඒකාන්තයෙන්ම ප්‍රාර්ථනා කළ වස්තුවෙහි ආලය නොහැර වීර්‍ය්‍ය කටයුත්තේය. කළා වූ වීර්‍ය්‍ය ඇති සත්වයාහට විපාක නම් මෙසේ සමෘද්ධ වන්නේය"යි සිතා තවද ඒ මහබෝසතාණෝ "පින්වත්නි, සිල්වතුන්ගේ වීර්‍ය්‍යයෙහි ඵල නම් මෙසේ සමෘද්ධ වන්නේය"යි උදන් අනා දිවි පමණින් කුසල්කොට කම්වූ පරිද්දෙන් මියපරලොව ගියෝය.

ශාස්තෲවූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදාරා චතුස්සත්‍ය ප්‍රකාශ කළසේක. චතුස්සත්‍යයාගේ කෙළවර පසුබට වීර්‍ය්‍ය ඇති භික්ෂූන් වහන්සේ අර්හත් ඵලයෙහි පිහිටිසේක. සර්වඥයන් වහන්සේ පූර්වාපර සන්ධි ගළපා මේ 'මහා ශීලව ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි දුෂ්ට වූ අමාත්‍යයා නම් දැන් මේ දෙවදත්ත ස්ථවිරයෝය. දහසක් අමාත්‍යයෝ නම් දැන් බුදු පිරිස්ය. මහා ශීලව රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 052. චුල්ලජනක ජාතකය

තවද එක් සමයෙක්හි තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයේ වැඩවාසය කරණසේක් පසුබට වීර්‍ය්‍ය ඇති භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

එහි වර්ථමාන කථාව හා අතීත කථාව ‘මහා ජනක’ ජාතකයෙහි(525) විස්තර වශයෙන් මතු ප්‍රකාශ වන්නේය. මේ ජාතකයෙහි චුල්ලජනක රජ්ජුරුවෝ වනාහී ධවලචඡත්‍රයාගේ(සුදු සේසත) යට පණවනලද සිංහාසන මස්තකයෙහි හුන්සේක් මෙසේ පර්ෂද්ට(පිරිසට) කීසේක.

“පුරුෂතෙම ‘නිෂ්ඨාවට පැමිණෙමි’යි ආසාව කරන්නේය. ප්‍රාඥ පුරුෂතෙම මේ නම් සදගත හැකිදැ”යි උකටලී(කලකිරීමක්) නොවන්නේය. ඒ එසේමැයි, දියෙන් ගොඩට නැංගාවූ මම මාගේ ඓශ්වර්‍ය්‍යය(සම්පත්) බලමි. යම් පුරුෂයෙක් වීර්‍ය්‍ය කළේ නම් ඒ වීර්‍ය්‍යයෙන් ඵලය සිද්ධ වන්නේය. සාගරයෙන් පීනා වීර්‍ය්‍යයෙන් ගොඩ දුටුවා මෙනැ”යි දැක්වූසේක.

මේ ජාතකයෙහිද පසුබට වීර්‍ය්‍ය ඇති භික්ෂූන් වහන්සේ අර්හත් ඵලයට පැමිණීසේක. “ජනක නම් රජව උපන්නෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 053. පුණ්ණපාති ජාතකය

තවද එක් සමයෙක්හි අෂ්ටපර්ෂිත්හි(අට පිරිසෙහි, එනම් රජ, බමුණු, ගෘහපති, ශ්‍රමණ, චාතුර් මහා රජික, තාවතිංස, මාර, බ්‍රහ්ම යන අට පිරිසෙහි) අකම්පයවූ(කම්පා නොවන සුලු වූ) ඥාන ඇති සර්වඥයන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසනසේක් විෂ යොදනලද සුරාවක් අරභයා මේ ජාතකය වදාළසේක.

එක් සමයෙක්හි සැවැත් නුවර වාසය කරන්නා වූ සුරා ධූර්තයෝ(බේබද්දෝ) එක තැනකට රැස්ව කියන්නාහු "අපගේ සුරා මිල ක්‍ෂය වූයේය.(අපට රා ගැනීමට තිබූ මුදල් අවසන් විය.) කෙසේ මිළ ලබමුදෝ"යි කියා මන්ත්‍රණය (සාකච්ඡා) කළාහුය. ඉක්බිත්තෙන් එක් කර්කශ ධූර්තයෙක්(සුරා ලැදි නපුරු මිනිසෙක්) කියන්නේ "තෙපි නහමක් නොසිතව(ඒ ගැන නොසිතන්න) එක් උපායෙක් ඇත්තේය"යි කීය. "කවර නම් උපයෙක්දැ"යි කී කල්හි අනේපිඬු මහසිටාණෝ අංගුෂ්ට මුද්‍රිකාව(ඇඟිලි මුදුව) පැළඳ මටසිලිටු වස්ත්‍ර හැඳ පෙරවරු රජහට උපස්ථානයට පිණිස යනසේක. අපි සුරා පාත්‍රවල්හි විසංඥ(සිහි නැති) කරණු පිණිස බෙහෙත් බහා සුරාපාන ශාලාව සදා හිඳ අනේපිඬු මහසිටාණන් එන කල "මහසිටාණෙනි, මෙසේ එව"යි කියා කැඳවා ගෙන්වා ඔහු සුරාපානය කරවා විසංඥවුවහුගේ(සිහි නැති අනේපිඬු සිටුහුගේ) අංගුෂ්ට මුද්‍රිකාව ද වස්ත්‍රයන් ද ගෙන රා මිළ කරම්හ"යි කියේය. ඒ අසා සූරා ධූර්තයෝ ඔහුගේ වදනය

"යහපතැ"යි පිළිගෙන එලෙසකොට සිටාණන් එන කල්හි පෙරමගට ගොස් "ස්වාමීන් වහන්ස, මෙතනට ආවමැනව, මෙතන අපගේ සමීපයෙහි ඉතා මනෝඥ වූ සුරා තිබෙන්නේය. ඉන් මදක් පානයකොට යව"යි කීවාහුය.

සෝවාන් ඵලයට පැමිණීයා වූ ආර්යශ්‍රාවක වූ අනේපිඬු මහසිටාණෝ "කවර හෙයකින් සුරා පානය අනුභව කරනසේක්ද? නොකමැතිවූ සේක් වනාහි මේ ධූර්තයන් පරීක්ෂා කරන්නේමි" සිතා ඔහුන්ගේ සුරාපාන භූමියට ගොස් ඔහුන්ගේ ක්‍රියාව බලා "මේ රහ මොවුන් විසින් මෙනම් කාරණයකින් යොදන ලදැ"යි දැන "අද මෙතැන් පටන් මේ ධූර්තයන් මෙතනින් එලවන්නෙමි"යි සිතා කියනසේක් "කොල දුෂ්ට වූ ධූර්තයෙනි, තෙපි සුරාපාත්‍රවල්හි බෙහෙත් බහා ආ ආවවුන් පානය කරවා විසංඥ කරවා කොල්ල කම්හයි සිතා සුරාපාන මණ්ඩලය සරහා හුන්නාහුද? උදක්(හුදෙක්) මේ සුරා වර්ණනා කරවුද? තොප අතුරෙන් එකෙක්ද ඔසවා පානය කරන්නට උත්සහ නොකරන්නේය, ඉදින් මේ සුරා විෂ නොයොදන ලද්දේ වීනම් තොපි පානය කරව"යි කියා ඒ ධූර්තයන් භයගන්වා එතනින් එලවා තමාගේ ගෙට ගොස් ධූර්තියන් විසින් කරනලද කාරණාව සර්වඥයන් වහන්සේට දන්වමි සිතා ජේතවනාරාමයට ගොස් දැන් වූසේක.

සර්වඥයන් වහනසේ වදාරණසේක් "ගෘහපතිය, දැන් වනාහි ඒ ධූර්තයෝ තොප වංචා කරණු කැමති නුවූවාහුය. පෙරත් නුවණැත්තවුන් වංචා කරණු කැමති වූවාහුමය"යි වදාරා

අනේපිඬු මහසිටාණන් විසින් යාච්ඤා කරන ලද්දාහු ඉකුත්වත් කථාව දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහබෝසතාණන් වහන්සේ බරණැස සිටාණ කෙනෙක් වූසේක. එකල්හිද මේ ධූර්තයෝ මෙම ක්‍රමයෙන් මන්ත්‍රණය කොට සුරාවෙහි විෂ යොදා බරණැස් සිටාණන් එන කල්හි පෙරමගට ගොස් මෙපරිද්දෙන්ම කිවාහුය. බරණැස් සිටාණෝ නොකමැතිව ඒ ධූර්තයන් පරීක්ෂා කරණු කැමතිව ගොස් ඔවුන්ගේ ක්‍රියාව බලා "මෙනම් දෙයක් කරණු කැමැත්තාහ, ඔවුන් මෙතනින් එලවන්නෙමි"යි සිතා කියනසේක් "පින්වත් ධූර්තයෙනි, සුරාපානය කොට රාජ වාසභවනයට(රජවාසලට) යන්ට නුසුදුසුය, රජ්ජුරුවන් දැක නැවත එන කල්හි දැන ගනිමි, තෙපි මෙතැන්හිම හිඳුව"යි කියා රාජසේවයට ගොස් නැවත ආසේක.

ධූර්තයෝ එන්නාවු සිටාණන් දැක "ස්වාමින් වහන්ස, මෙතනට එව"යි කීවාහුය. ඔහුන්ගේ වචනය අසා එතනට ගොස් විෂ යොදා තිබෙන රා පාත්‍රයන් බලා මෙසේ කීසේක. "පින්වත් ධූර්තයෙනි, තොපගේ ක්‍රියාව මට නොරුච් වන්නේය(ප්‍රිය නොවන්නේය). තොපගේ සුරා භාජනවල් පිරූ පරිද්දෙන්ම තිබෙන්නේය, තෙපි හුදෙක් සුරා වර්ණනා කරහු, නොම පානය කරන්නාහුය. ඉදින් මේ සුරා මනාප වුයේ වීනම් තෙපිත් පානය කරන්නාහුය. මේ සුරාව වනාහි විෂ

යොදා වන ලද්දේ වනැ''යි කියා ඔහුන්ගේ මනොරථය(අදහස) බිඳවනසේක් මෙසේ වදාළසේක. ''සුරා පාත්‍රවල් මා යනකල් මෙන් පිරී තිබෙන්නේය. යම් මේ සුරා වර්‍ණනා කථාවක් පවතීද, හෙද අතික්කමය, ඉදින් මේ සුරා මනාප වීනම් තෙපි පානය කරන්නාහුය. පානය කළොත් අඩු පාත්‍ර තිබෙන්නේය. තොපගෙන් එක් කෙනෙකුන් විසිනුදු සුරාපානය නොකරන ලද්දේය. එසේ හෙයින් මේ සුරාපානය යහපත් නොවන්නේය. විෂ යොදවන ලද්දේ වනැ''යි කියා ධූර්තයන් භයගන්වා ''නැවත මෙබන්දක් නොකරව''යි කියා තැති ගන්වා එතැනින් එළවූසේක.

අප මහබෝසතාණන් වහන්සේ ජිවිතාන්නය දක්වා දානාදී පින්කම්කොට කම්වූ පරිද්දෙන් මියපරලොව ගියසේක. ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා වදාරා ජාතක ධර්‍මය නිමවා වදාළසේක.

''එසමයෙහි ධූර්තයෝ දැනුදු ධූර්තයෝ වූවාහුය. බරණැස් සිටුව උපන්නෙම් වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ''යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 054. ඵල ජාතකය

තවද එක් සමයෙක්හි සර්‍ව ධර්‍මයන්(සියලු ධර්මයන්) සර්‍වාකාරයෙන් (සියලු අයුරින්) කරතලා මලක ක්‍රමයෙන්(අත්ලට ගත් විනිවිද පෙණෙන ආමලක නම් වූ මැණිකක් මෙන්) අවබෝධ කළාවූ සර්‍වඥයන් වහන්සේ

ජේතවනාරාමයෙහි වැඩවාසය කරණසේක් ඵලයෙහි දක්‍ෂ වූ(ගෙඩි පැසුණු නොපැසුණු බව කීමට සමත්) එක් උපාසකයක්හු අරඹයා මේ ජාතකය වදාළසේක.

සැවැත් නුවර වාසය කරන්නාවූ එක් කෙළඹි පුත්‍රයෙක්(ගෘහපතියෙක්) වනාහි බුදු පාමොක් භික්ෂු සංඝයා වහන්සේට ආරාධනාකොට තමාගේ උයනෙහි වැඩ හිඳිනට සලස්වා කැඳ අවුළුපත් වළඳවා උයන්ගොව්වාට ආමන්ත්‍රණයකොට "භික්ෂු සංඝයා වහන්සේ හා සමග උයනෙහි හැසිර ආයසී වූ භික්ෂු සංඝයා වහන්සේට අඹ දඹ ආදී වූ නොයෙක් ඵලාඵල ජාති පිළිගන්ව"යි කීයේය. උද්‍යානපාල තෙම ඔහුගේ වචනය පිළිගෙණ භික්ෂු සංඝයා කැඳවාගෙන උද්‍යානයෙහි හැසිරෙන්නේ වෘක්‍ෂය දිසාව බැලූ පමණකින්ම "මේ ඵලය අමුය. මේ ඵලය යහපත්ව නොපැසුනේය. මේ ඵලය යහපත්ව පැසුනේය"යි දැන ගන්නේය. "හෙතම යමෙක් කීයේද ඔහුගේ වචනය එලෙසම වන්නේය"යි කියා භික්ෂු සංඝයා ගොස් සර්‍වඥයන් වහන්සේට දැන් වුවාහුය. "ස්වාමීන් වහන්ස, මේ උද්‍යානපාල තෙම ඵලයෙහි දක්‍ෂය, භූමියෙහි සිටම වෘක්‍ෂය බලා මේ ඵලය අමුය, මේ ඵලය යහපත්ව නොපැසනේය, මේ ඵලය යහපත්ව පැසුනේයයි දන්නේය. මෙතෙම යමක් කීයේද ඒ එලෙසම වන්නේය"යි දැන් වුවාහුය. සර්‍වඥයන් වහන්සේ වදාරණසේක් "මහණෙනි, මේ උද්‍යානපාලයාම ඵලයෙහි දක්‍ෂ වූයේ දැන්මතු නොවෙයි, පෙරත් නුවණැත්තෝ ඵලයෙහි දක්‍ෂ වූවාහුමය"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කරන කල්හි අප මහබෝධිසත්ත්වයන් වහනසේ සිටු කුලයෙක්හි ඉපිද වැඩි වයසට පැමිණ පන්සියයක් ගැල් කරණකොට ගෙන වණික්කර්මාන්ත (වෙළදම) කරනසේක් එක් දවසෙක මහමග ආරණ්‍යයකට(වනයකට) පැමිණ අභිමුඛයෙහි(ඉදිරිපිට) සිට සියළු මනුෂ්‍යයන් රැස්කරවා “මේ වනයෙහි විෂ වෘක්ෂයෝ නම් වන්නාහුය. එහි විෂ පත්‍රයෝය, විෂ පුෂ්පයෝය, විෂ ඵලය, විෂ මධුය යන මොහු වන්නාහුමය.පෙර තොප විසින් පරිභෝග (අනුභව) නොකරණ ලද යම් කිසි පත්‍රයක්වත්, පුෂ්පයක්වත්, ඵලයක්වත් මා අතින් නොවිචාරා අනුභව නොකරව”යි කීසේක.

ඔහුන් උන්වහන්සේගේ වචනය පිළිගෙන වනයට වන්නාහුය. වන අභිමුකයෙහි එක් ගම්දොරක කිංඵල වෘක්ෂයෙක් ඇත්තේය. ඒ වෘක්ෂයාගේ ස්කන්ධ, ශාඛා, පුෂ්ප, ඵල(කඳ, අතු, මල්, ගෙඩි) යන සියල්ලද අඹ හා සදෘශ (සමාන) වන්නාහුය. හුදක් එම නොවෙසි(වෙනසක් නැති) වණී සටහනකින්ද (පාටින්ද) සුගන්ධයෙන්ද(සුවඳින්ද) රසයෙන්ද ආමපක්ව ඵලයෝද(අමු ගෙඩිද ඉදුණු ගෙඩිද) අඹඵල හා සදෘශය. අනුභව කළ කල්හි හලාහල(නපුරු) විෂයක් මෙන් ජීවිතක්‍ෂයට පමුණුවන්නේය. පළමුවෙන් ගිය සමහර ලොල් වූ පුරුෂයෝ “මේ අඹ වෘක්ෂයකැ”යි යන සංඥායෙන් ඵලයක් අනුභව කළාහුය. සමහර කෙනෙක් “ගැල්සාත්තුවාහයන්(ගැල් සමූහයේ නායකයාගෙන්) අතින් විචාරා අනුභව කරම්හ”යි

කියා අතින් ගෙන සිටියාහුය. ඔහු ගැල්සාත්තුවාහයන් ආ කල්හි "ස්වාමීන් වහන්ස, මේ ඵල අනුභව කරමෝදැ"යි විචාළාහුය.

බෝධිසත්වයන් වහන්සේ මේ අඹ වෘක්ෂයෙක් නොවෙයි දැන "මේ වෘක්ෂය කිංඵල වෘක්ෂයක්ය, අනුභව නොකරව"යි වලක්වා යමෙක් අනුභව කළාහුද උත්ගාරය(වමනය) කරවා චතුමධුරය(වෙඬරු, ගිතෙල්, හකුරු, මී පැණි) පානය කරවා නීරෝගි කළසේක.

පූර්වයෙහි මේ වෘක්ෂ මූලයෙහි මනුෂ්‍යයෝ නවාතැන් ගෙන 'අඹඵල' යයි සිතා මේ විෂ ඵලයන් අනුභවකොට ජීවිතක්ෂයට පැමුණුයාහුය. දෙවැනි දින මෙහි ගම්වැසියෝ ඇවිත් මළ මනුෂ්‍යයන් දැක පාදයෙන් අල්වාගෙන ප්‍රතිච්ඡන්න ස්ථානයෙහි(රහස් තැනක) දමා ගැල් හා සමග ඔහුන් අයිති සියළු බඩු ගෙනයන්නාහුය. ඔහුන් ඒ දිනයෙහිද අරුණෝද්ගමන(අරුණ උදාවන) වේලාවෙහිම "මට ගවයෝය, මට ගැල්ය, මට බඩුය"යි කියා සීඝ්‍රව ඒ වෘක්ෂ මූලයට ගොස් නිරෝගීව සිටි මනුෂ්‍යයන් දැක "කෙසේ තොප මේ වෘක්ෂය අඹ වෘක්ෂයක් නොවන්නේ යයි දැන ගත්තාහුදැ"යි විචාළාහුය. "අප නොදනුම්හ, ගැල් සාත්තුවාහ ශ්‍රේෂ්ඨයාණන් වහන්සේ දත් සේකැ"යි කිවුය.

එවිට මනුෂ්‍යයෝ බෝධිසත්වයන් අතින් විචාරන්නාහු "පණ්ඩිතයානන් වහන්ස, නුඹවහන්සේ මේ වෘක්ෂය අඹ වෘක්ෂය නොවන බව කෙසේ දත් සේක්දැ"යි විචාළාහුය. අප

මහබෝධිසත්ත්වයාණන් වහන්සේ "කාරණා දෙකකින් දැන ගතිමි" වදාළසේක. මේ වෘක්ෂය දුකින් නැගෙන පරිද්දෙන් වැඩි නොවෙයි (ගහට නැගීමට පහසු පරිදි වැඩුනේය), ඔසවා තබනලද හිනි පෙළක් (හිනිමඟක්) සෙයින් සුවසේ නැගෙන පරිද්දෙන් වැඩියේය, ගමින් දුර සිටියේද නොවෙයි, ගම් දොර සිටියේය. ඉදින් මේ තෙම මධුර ඵල ඇති වෘක්ෂයෙක් වීනම් මෙහි එකදු ඵලයකුදු නොතිබෙන්නේය. මනුෂ්‍යයන් විසින් නිරන්තරයෙන් පිරිවරණ ලද්දේ වෙයි. එහෙයින් මේ වෘක්ෂය විෂ වෘක්ෂය බව දැන ගතිමි"යි කියා මහජනයාට ධර්මදේශනා කොට යහපත් ගමනක් වැඩිසේක.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ "මහණෙනි, පෙරත් නුවණැත්තෝ ඵලයෙහි දක්ෂ වූවාහුම"යි කියා මේ දම්දෙසුම ගෙනහැර දක්වා වදරා පූර්වාපර සන්ධි ගළපා මේ ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි ගැල්සාත්තුවාහයන්ගේ පර්ෂත්තොම දැන් බුදු පිරිස් වූවාහුය. ගැල්සාත්තුවාහ ජ්‍යෙෂ්ඨව උපන්නේ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 055. පඤ්චායුධ ජාතකය

තවද එක් සමයෙක්හි ජාම්බෝනද ස්වර්ණයට බඳු වූ(දඹරන් හා සමාන) ශරීර ප්‍රභා ඇති(කාන්තිමත් සිරුරක් ඇති) සර්වඥයන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන

සමයෙහි පසුභට වීර්‍ය්‍යී ඇති භික්‍ෂූන් කෙනෙකු අභඹයා මේ ජාතකය දක්වන ලදී.

සර්‍වඥයන් වහන්සේ මේ භික්‍ෂූහට ආමන්ත්‍රණයකොට "සැබෑද මහණ, තෝ පසුබට වීර්‍ය්‍යී ඇත්තේදැ?"යි වදාළසේක. "සැබෑව ස්වාමිනි" කී කල්හි "මහණ, පෙර නුවණැත්තා වූ මහෝත්තමයෝ වීර්‍ය්‍යී කරන්න සුදුසු තැන්හි වීර්‍ය්‍යී කළෝදැ"යි වදරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකු රාජ්‍යය කරන සමයෙහි අප මහබෝසතාණෝ රජ්ජුරුවන්ගේ අග්‍රමෙහෙසිකා බිසවුන් කුස පිළිසිඳ ගත්තුය. ඒ බෝධිසත්‍වයන්ට නම් තබන දවස අටෝරාසියක් (එකසිය අටක්) බමුණන් ගෙන්වා සියළු සත්‍වයන් වස්තුවෙන් පිණවා ලක්‍ෂණ විචාළෝය. එකල ලක්‍ෂණ කීමෙහි දක්‍ෂ වූ බමුණෝ ලක්‍ෂණ සම්පත්තිය බලා "මහ පිනැති රාජකුමාර කෙනෙකුන් වහන්සේය. නුඹවහන්සේගේ ඇවෑමෙන් රාජ්‍යයට පැමිණ දස රාජධර්‍මයෙන් රාජ්‍යය කරන සේකැ"යි කීය. පඤ්චායුධ (කඩුව, දුන්න,තෝමරය, අඩයටිය,පාරාවලල්ල) සිල්පයෙහි දක්‍ෂව ජම්බුද්වීපයෙහි සත්‍වයන්ට අග්‍ර පුරුෂ වනසේකැ"යි කිවුය. බමුණන්ගේ බස් අසා කුමාරයන්ට නම් තබන්නාහු 'පඤ්චායුධ කුමාරයෝ' යයි නම් තුබූහ.

ඉක්බිත්තෙන් ඒ කුමාරයන් වැඩිවිය පැමිණි කල්හි රජ්ජුරුවෝ සමීපයට කැඳවා "ශිල්පයක් ශාස්ත්‍රයක් නිමවා නොගෙණ රාජ්‍යය කළ නොහැක්කේය. එසේ හෙයින් ශිල්ප

උගනුව”යි කීහ. “ස්වාමීනි, කවුරුන් සමීපයෙහි උගනිම්දැ?”යි කී කල්හි “පුත ගන්ධාර දේශයෙහි තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් සමීපයෙහිය”යි කී කල්හි එහි ගොස් ශාස්ත්‍රය ඉගෙණ නිමාවට පැමිණ ඉක්බිති ආචාරීන් වැඳ තක්සලා නුවරින් නික්ම පඤ්චායුධ සන්නද්ධව(පස් වැදෑරුම් අවි දරා) බරණැස් නුවරට යන්නාහු වනාන්තරගතව මාර්ගයට අභිමුඛ වූ කල්හි(හැරුණු පසු) එසේ පැමිණෙන්නා වූ කුමාරයෝ අතරමග සිලෙසලෝම නම් යක්‍ෂයකු වසන්නා වූ එක් වනයකට පැමිණියෝය.

එකල කුමාරයන් වනයට අභිමුඛ වූ කල්හි මනුෂ්‍යයෝ දැක “පින්වත් වූ පුරුෂය, තෙපි මේ වනාන්තරයට නොවදුවයි(නොපිවිසෙන්න). මේ වනාත්තරයෙහි සිලෙසලෝම නම් යක්‍ෂයෙක් ඉඳ දුටු දුටුවන් අල්වා අනුභව කරන්නේය. එසේ හෙයින් තෙපි නොයව”යි වැලකූය.

බෝධිසත්‍වයන් තමන්ගේ සමර්ථකම තුමූම වළකා(සිතාගෙන) නිර්භීතව කෙශර සිංහරාජයකුසේ වනයට සාහසිකව(නිර්භයව) පැමිණි කල්හි කැනහිල්මල් කැකුළු සා(ළපටි කෙසෙල් මුව තරම් වූ) දළ ඇතිව කබරපත් වූ (කබර වැටුණු) මුඛ(මුහුණ) හා බඩ ඇතිව නිල් වූ හස්තපාද ඇතිවූ ආකල ඕ හට බෝධිසත්‍වයෝ කියන්නාහු “එම්බල යක්‍ෂය, මම මාගේ සමර්ත්‍ථකම් සළකා මෙතැනට වන්නෙමි, තෝ අප්‍රමාදව මා සමීපයට වර, විෂ පොවනලද ශරයකින් (ඊතලයකින්) විද මෙතනම හෙළමි”යි ඔහු තැතිගන්වා දරුණු

වූ විෂ පොවන ලද ශරය දුණු පිට ලාගෙන ඇඳ අතහලවාහුය. ඒ ශරය ගොස් යක්‍ෂයාගේ රෝමයෙහි ඇලි ගියේය.

ඉක්බිත්තෙන් අනික් ශරය කැයි මෙසේ හීදඬු පනසක් විද්දේය. ඒ සියළුම හීදඬු යක්‍ෂයාගේ රෝමයෙහිම ඇලී ගියේය. තවද යක්‍ෂයා ඒ සියළු හීදඬුම කිලිපොලා තමාගේ පාමුල වගුරවා බෝධිසත්‍වයන් සමීපයට ගියේය. එකල බෝධිසත්‍වයෝ නැවතත් තැතිගන්වා කඩුව කොපුවෙන් හයාගෙන(එළියට ඇද) ගැසුයේය. දෙතිස් අඟලක් දිග ඇති කඩුව රෝමයෙහි ඇලි ගියේය. එවිට මුගුරෙන් ගැසුසේක. එයත් රෝමයෙහි ඇලි ගියේය. ඒ මුගුරු ඇලී ගියා දැක බෝසතාණෝ කියන්නාහු "පින්වත් වූ යක්‍ෂය, මම පඤ්චායුධ කුමාරයෝය. මාගේ නම නොඇසූ කෙනෙක් නැත, මම තා විසින් අධිගෘහිත වූ වනාන්තරයට වදනෙම් දුණු ආදී වු ආයුධයක් සලකා වන්නේම් නොවෙමි. මාගේ සමර්ත්‍ථකම සලකා වන්නේමි, එසේ හෙයින් තා සුණු විසුණු කරමි"යි අධිෂ්ඨාන දක්වා ගර්ජනාකොට දකුණතින් යක්‍ෂයාට පැහැරීසේක(ගැසුවේය). එයිදු රෝමයෙහි ඇලී ගියේය. වමතින් පහළසේක. එයිදු රෝමයෙහි ඇලී ගියේය. දකුණු පයින් පහළසේක. එයත් රෝමයෙහි ඇලි ගියේය. වම් පයින් පහළසේක. එයත් රෝමයෙහි ඇලි ගියේය. "ඇන සුණු විසුණු කරමි" ඉසින්ද පහළහ. මහබෝසතාණෝ පස් තෙනකින්ද බැඳී එල්ලෙමින් සිටිත් නිර්භීතව කථා කෙරෙති.

එකල යක්‍ෂයා මෙසේ සිතීය "පුරුෂ සිංහයෙක, පුරුෂ ශ්‍රේෂ්ඨයෙක, මේ කෙසේ වූ පුරුෂයෙක් දෝ හෝ"යි කියා සිතන්නේ "එම්බල පුරුෂය, තෝ මට ගොදුරුව සිට මෙසේ වූ බුහුටි(ආඩම්බර) කථා කරන්නට කාරණා කවරෙක්ද?" විචාළේය.

එකල්හි බෝධිසත්‍වයන් වහන්සේ "තෝ මා කෑයෙහි වීනම් මාගේ කුක්ෂියෙහි(බඩ තුල) වජ්‍රායුධයක් ඇත්තේය. ලයෙන් ඇනී පිටින් නැගෙන්නේය. තාගේ අතුනු බහන්(බඩවැල්) කඩ කඩ කොට සිඳ ජීවිතක්‍ෂයට පමුණුවන්නේය. එසේ කල්හි අප දෙදෙනාම නැසෙම්හ. මේ කාරණයෙන් මම නොබාමි"යි (බිය නොවෙමි) කීවාහුය. මේ වචනය වූ කලි බෝධිසත්‍වයන් තමන්ගේ අභ්‍යන්තරයෙහි ඥානායුධය(නුවණ නැමති ආයුධය) සඳහා කීහ.

ඒ බස් අසා යක්‍ෂයා මෙසේ සිතීය "මේ මානවකයා සත්‍යයෙක්ම කියන්නේය. පුරුෂ සිංහයාගේ ශරීරයේත් මුං ඇටයක් පමණ අනුභව කළෙම් වීම් නම් මාගේ බඩ දිරවාගත නොහෙමි. එසේ හෙයින් මොහු ඇරපියෙමි"යි සිතා මරණ භයින් ත්‍රස්තව බෝධිසත්‍වයන් ඇරපියන්නේ "මානවකය, තෝ සිංහ පුරුෂයෙකි(උතුම් පුරුෂයෙකි), තාගේ මස් නොකමි, තෝ රාහු මුඛයෙන් මිදුනා වූ චන්ද්‍රයා පරිද්දෙන් මා අතින් මිදී මිත්‍ර සමූහයා සතුටු කරවමින් පලායව"යි කීය. එකල්හි බෝධිසත්‍වයන් වහන්සේ ඕ හට මෙසේ කීය. "යක්‍ෂය, මම වූ කලීයෙමි, තෝ වනාහි පෙර අකුසල් කොට රෞද්‍ර වූ

කර්මයෙන් ලේ රැඳිගියා වූ අත් ඇතිව අනුන්ගේ ශරීරමාංශය භක්‍ෂණය කරන්නා වූ යක්‍ෂව උපන්නෙහිය. ඉදින් මේ යක්‍ෂාත්ම භවයෙහි සිට අකුස්ල් කරන්නේ වීනම් අඳුරෙන් අඳුරටය යන්නෙහිය. මා දුටු තැන් පටන් තා විසින් අකුසල් කරන්නට නොපිළිවන. ප්‍රාණඝාත නම් නරක, තිරිසන්, ප්‍රේත, අසුරකාය යන සතර අපායෙහි උපදවන්නේය. නැවත මනුෂ්‍ය ලෝකයෙහි උපනුපන් තෙන මන්දායුෂ්ක බව (ආයුෂ අඩු බව) ලබන්නේය. මේ ආදී වූ නොයෙක් කාරණයෙන් පඤ්ච දුසසීලයෙහි ආදීනව හා පඤ්ච සීලයෙහි අනුහස් හා අනේකප්‍රකාරයෙන් යක්‍ෂයා තැතිගන්වා ධර්මදේශනාකොට ඔහු දමනයේ ලා ඔහුගේ සන්තානයෙහි(සිතෙහි) කෙලෙස් නැමති සතුරන් නසා පඤ්ච සීලයෙහි පිහිටවා වනාන්තරයෙහි සත්‍වයන් විසින් දෙනලද භෝජනය බිලියම් පිණිස(බිලි පූජා වශයෙන්) ලැබ අප්‍රමාදව වාසය කරව”යි අවවාදකොට වනයෙන් නික්ම මහවන සමීපයෙහි මනුෂ්‍යන්ට කියා පඤ්චායුධ සන්නද්ධව බරණැස් නුවරට ගොස් දෙමව්පියන් දැක මෑත භාගයෙහි රාජ්‍යයෙහි පිහිටා දැහැමෙන් රාජ්‍ය කරමින් දානාදී වූ කුසල්කොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ.

මෙසේ ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදරා තවද භික්ෂුන්ට මත්තෙහි අවවාද කරණසේක් “නොපසුබට වූවා වූ වීය්‍යී ඇති සිතින් නිරවද්‍ය වූ අර්ත්‍ථයෙන්(නිවැරදිය යන තේරුම අනුව) කුසලයයි කියනලද සප්ත ත්‍රිංශත් බෝධිපක්‍ෂික ධර්මයෙන්(සිව්මග නුවණ

ලැබීමට හේතුවන දහම් තිස්හත) වඩාද සියළු සංස්කාර ධර්‍මයන් අනිත්‍යය, දුක්ඛය, අනාත්මයි මෙසේ ත්‍රිලක්‍ෂණ මෙනෙහිකොට විදර්ශනාවෙහි පටන් බෝධිපාක්‍ෂික ධර්‍මයන් වඩන්නා වූ යෝගාවචර තෙම සියළු සංයෝජන (සංස්කාර බන්ධන) ක්‍ෂය කරන්නා වූ සතරවැනි ආර්‍ය්‍යමාර්ගයාගේ(රහත් මගෙහි) කෙළවර උපන් බැවින් රහත් බවට පැමිණියේය"යි ධර්‍මදේශනාවෙහි කුළුගන්වා(මුදුන් පමුණුවා) මත්තෙහි චතුරාර්‍ය්‍ය සත්‍යය ධර්මයන් ප්‍රකාශකොට වදාළසේක.

චතුරාර්‍ය්‍ය සත්‍යයන්ගේ අවසානයෙහි පසුබට වීර්‍ය්‍ය ඇති භික්‍ෂූහු අරහත් ඵලයෙහි පිහිටිසේක. සර්‍වඥයන් වහන්සේ පූර්‍වාපර සන්ධි ගළපා මේ 'පඤ්චායුධ ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි යක්‍ෂයා නම් අංගුලිමාල ස්ථිවිරයෝය. පඤ්චායුධ කුමාරයෝ නම් බුදු වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 056. කාඤචනස්ඛන්ධ ජාතකය

තවද එක් සමයෙක්හි අසරණයන්ට සරණ වූ සර්‍වඥයන් වහන්සේ සැවැත් නුවර වැඩ වසනසේක් එක් තරා භික්‍ෂූන් කෙනෙකුන් අරභයා මේ ජාතකය වදාළසේක.

සැවැත් නුවර වාසය කරන්නා වූ එක් කුල පුත්‍රයෙක් සර්‍වඥයන් වහන්සේගේ ධර්‍මදේශනාව අසා සර්‍වඥයාසනයෙහි(බුදු සසුනේ) පැහැද පැවිදි වූයේය.

ඉක්බිත්තෙන් ආචාර්‍ය්‍ය උපාධ්‍යායන් වහන්සේලා ඒ භික්‍ෂූන් වහන්සේට අවවාද දෙන්නාහු "ඇවැත්නි, සීලය එකවිධ වන්නේය, ද්විවිධ වන්නේය යනාදී බහුප්‍රකාර වන්නේය(නොයෙක් ආකාර වන්නේය). මේ චූල්ලසීල නම, මේ මධ්‍යමසීල නම, මේ මහාසීල නම, මේ ප්‍රාතිමොක්‍ෂ සංවරසීල නම, මේ ඉන්ද්‍රිය සංවරසීල නම, මේ ආජීව පාරිශුද්ධිසීල නම, මේ ප්‍රත්‍යය සන්නිශ්‍රිතසීල නමැයි කියා සීලය ප්‍රභේද වන්නාහු වෙති"යි කීය. එකල ඒ භික්‍ෂූන් වහන්සේ මෙසේ සිතූ සේක. "මේ සීලය නම් ඉතා බොහෝය. මම මෙපමණක් සමාදන්ව පවත්වන්නට නොහැකි වන්නේය. සිල් පුරන්නට නොහැකි වන්නා හට ප්‍රව්‍රජ්‍යාවෙන්(පැවදිකමෙන්) කවර ප්‍රයෝජනද? මම ගිහිව දානාදී වූ කුසල් කරන්නෙමි, පුත්‍රදාරාවන්ද(අඹුදරුවන්) රක්‍ෂා කරන්නෙමි" සිතූසේක.

මෙසේ ද සිතා "ස්වාමීන් වහන්ස, මම සිල් රක්‍ෂා කරන්ට නොහැකි වන්නෙමි, සිල් රකින්ට නොහැක්කා හට ප්‍රව්‍රජ්‍යාවෙන් කවර ප්‍රයෝජනද? මම සිවුරු හරින්නෙමි, නුඹවහන්සේලාගේ පාසිවුරු (පාත්‍රය හා සිවුරු) ගනුව"යි කීයේය. එසේ කී මහණාහට ආචාර්‍ය්‍ය උපාධ්‍යයන් වහන්සේ වදාරණසේක් "ඇවැත්නි, එසේ කල්හි බුදුන් වැඳ යව"යි කියා උන්වහන්සේලා ඒ මහණ කැඳවාගෙන සර්‍වඥයන් වහන්සේගේ සමීපයට ධම්සභා මණ්ඩපයට ගියාහුය. සර්‍වඥයන් වහන්සේ දැක "මහණෙනි, කවර කාරණයකින් නොකැමති කරවා මහණාක්හු කැඳවාගෙන ආවාහුදැ?"යි වදාළසේක. "ස්වාමීන් වහන්ස, මේ භික්‍ෂූන් වහන්සේ 'මට සිල් රකින්නට නොහැකි

වන්නෙමි' කියා පාත්‍රා සිවුරු භාරකොට දුන්නේය. ඉක්බිත්තෙන් ඒ මහණ අප කැඳවාගෙන ආම්හ''යි දැන්වූවාහුය.

''මහණෙනි, තෙපි වනාහි මේ මහණහට කවර කාරණයකින් සීලය බොහෝ කොට කීවාහුද? යම් පමණක් තෙමේම රක්නට හැකිවේද, එපමණක්ම රක්‍ෂා කෙරේවා, මෙතැන් පටන් තෙපි එසේ කිසිවක් නොකියව, මීට කටයුතු මම දනිමි'' කියා ''මහණෙනි, තෙපි මෙසේ එව. තොපට බොහෝ සීලයෙන් කවර ප්‍රයෝජනද? ත්‍රිවිධ සීලයම(සිත, කය, වචනය යන තුන්දොර සීලය) රක්‍ෂා කරන්නට හැකි වන්නේදැ?යි විචාරා වදාළසේක. ''ස්වාමීන් වහන්ස, හැකිවන්නෙමි'' කීය. ''එසේ වීනම් තෙපි මෙතැන් පටන් කායද්වාරය, වාග්ද්වාරය, මනොද්වාරය යන ත්‍රිවිධ ද්වාරයන්ම රක්‍ෂා කරව. කාය ද්වාරයෙන් අකුසල කර්මය නොකරව. වාග් ද්වාරයෙන් අකුසල් නොකරව. මනෝ ද්වාරයෙන් අකුසල් නොකරව. ගිහි නොව මේ ත්‍රිවිධ සීලයම රක්‍ෂා කරව''යි වදාළසේක.

මෙපමණකින් ඒ භික්‍ෂූන් වහන්සේ තුටු පහටු සිත්(සතුටු වූ සිත්) ඇතිව ''යහපත, ස්වාමීන් වහන්ස, මේ ත්‍රිවිධ සීලය රක්‍ෂා කෙරෙමි''යි කියා සර්වඥයන් වහන්සේට නමස්කාරකොට ආචාර්‍ය්‍ය උපාධ්‍යායන් වහන්සේ හා කැටිව ගියසේක. ඒ භික්‍ෂූන් වහන්සේ ඒ ත්‍රිවිධ සීලය පුරමින්ම දැනගත්සේක. ''ආචාර්‍ය්‍ය උපාධ්‍යායන් විසින් මට කියනලද සීලයද

මෙපමණෝක්මය. උන්වහන්සේලා වනාහි තමුන් සවුනේගෙවා (දතයුතු සියල්ලම අවසානයට) නොදත් බැවින් මට අවබෝධ කරන්නට නොහැකි වූවාහුය. බුදුරජාණන් වහන්සේ වනාහි තමන් සවුනේගෙවා දත් බැවින් නිරුත්තර වූ(තමන්ට වඩා උසස් කෙනෙක් නැති) ධර්මරාජත් වූ බැවින් මෙපමණ සීලය ද්වාරත්‍රයෙහිම බහා මට දැන් වූසේක. ඒකාන්තයෙන්ම සර්වඥයන් වහන්සේ මට පිහිට වූසේකැ"යි කියා විදර්ශනා වඩා කීප දවසකින් ම අර්හත් ඵලයෙහි පිහිටිසේක.

ඒ ප්‍රවෘත්තිය දැන දම්සභා මණ්ඩපයෙහි රැස්ව හුන්නාහු භික්ෂූන් වහන්සේලා කියන්නාහු "ඇවැත්නි, අසවල් මහණ සිල් රක්ෂා කරන්නට නොහැකි වන්නෙමි කියා ගිහි බවට පැමිණෙන්නාහු සියළු සීලයන් තුන් කොටසෙක්හි පිහිටුවා ග්‍රහණය කරවා(ආරක්ෂා කරවා) ශාස්තෘන් වහන්සේ අරහත් ඵලයට පැමිණ වූසේක. සර්වඥයෝ නම් ඉතා ආශ්චර්යයීමත් සේකැ"යි බුදුගුණ කියමින් හුන්නාහුය.

සර්වඥයන් වහන්සේ එතනට වැඩවදාරා "මහණෙනි, ධම්සභාවෙහි කවර නම් කතාවකින් යුක්තව හුන්නුදැ"යි වදාරා "මේ නම් කතාවකින්ය"යි දැන් වූ කල්හි "මහණෙනි, ඉතා බරැරුම් බර කොට්ඨාශ වශයෙන් බෙදන ලද්දේ සැහැල්ලුවූවාක් මෙන් වන්නේය, පෙර නුවණැති මහොත්තමයෝ මහත් රත්රන් කඳක් ලැබ ඔසවා ගන්ට නොහැකිව විභාගකොට ඔසවාගෙන ගියාහුය"යි වදාරා අතීත කථාව ගෙනහැර දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍ය කරන කල්හි අප මහබෝසතාණෝ එක් ගමක කර්ෂිකව(ගොවියෙක්ව) උපන්සේක. බෝධිසත්ත්වයන් වහන්සේ එක් දවසක් එක්තරා හරනලද(පාළු) ගමෙක්හි කෙතක් කර්ෂිණය කරනසේක(සීසාන සේක). පූර්වයෙහි ඒ ගම සම්පත්තියෙන් යුක්ත වූ එක් සිටාණ කෙනෙක් කලවයක් හා පමණ වටඇති සතර රියන් දිග ඇති රන්කඳක් නිධානකොට කළුරිය කළේය.

ඒ රන් කඳෙහි බෝධිසත්ත්වයන් වහන්සේගේ නගුල ලග්නව සිටියේය (හැපුනේය). බෝධිසත්ත්වයන් වහන්සේ මුල් සමූහයෙක් වනැයි සිතා පස් පීරමින් ඒ මුල දැක පාංශුවෙන්(පසින්) වසා දවල් කර්ෂිණකොට සූර්‍ය්‍යයා අසතංගත වූ (ඉර බැස ගිය) කල්හි වියදඬු නගුල් ආදීය එක් පසෙක්හි බහා තබා ස්වර්ණස්කන්ධය ගෙන යන්නෙමි” සිතා ඒ රන්කඳ ඔසවා ගන්නට නොහැකි වූසේක් හිඳ “මෙපමණ කුක්ෂි රක්‍ෂා පිණිස(ජීවන වියදම සඳහා) වන්නේය. මෙපමණෙක් නිධාන කොට තබන්නෙමි. මෙපමණකින් කෘෂිවර්‍ණික් (ගොවිතැන් වෙළඳාම්) කර්මාන්තාදියෙහි යොදන්නෙමි. මෙපමණ දානාදී කුසල් කිරීමට වන්නේය”යි කිය සතර කොට්ඨාශයක් කළසේක.

මෙසේ කොට්ඨාශ කළ කල්හි අප මහබෝසතාණන් වහන්සේට ඒ ස්වර්ණස්කන්ධය සැහැල්ලුවූවාක් මෙන් වුයේය. අප මහබෝසතාණන් වහන්සේ ඒ ස්වර්ණස්කන්ධය ඔසවා ගෙට

ගොස් සතර කොට්ඨාශයකට බෙද "දානාදී වූ පින්කම් කොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියසේකැ"යි වදාරා සර්වඥයන් වහන්සේ බුදුව වැඩ ඉඳ මෙසේ වදාළසේක.

"භෝගයන්ගේ ක්ෂෙමයට(සසර බැම්වලින් නිදහස් වීමට) හෙවත් නිර්වාණයට පැමිණෙන පිණිස දුරුකළ නීවරණයන්(නිවන් මග අවුරණ කාමච්ඡන්දාදී අකුසල් පහ) ඇති චිත්තයෙන් එසේ විගත නීවරණ වශයෙන් දවා සොභාකළ ස්වර්ණයක් සේ නිර්මල වූ සිත් ඇති යම් සත්වයෙක් නිරාමයාර්ත්ථයෙන් (නොඇලීම් අර්ථයෙන්) කුසල් නම් වූ බෝධිපාක්ෂික ධර්මයන් වඩාද, ඒ තෙම සියළු සංයෝජනයන්ගේ විනාශයට පිළිවෙලින් පැමිණෙන්නේය"යි මෙසේ සර්වඥයන් වහන්සේ අරහත් ඵලයට කුළුගන්වා දේශනාව නිෂ්ඨිකොට පූර්වාපර සන්ධි ගලපා මේ 'කාඤ්චනස්ඛන්ධ ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි ස්වර්ණස්කන්ධය ලද්ද වූ කර්ෂ පුරුෂ වුයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 057. වානරින්ද ජාතකය

තවද එක්සමයෙක්හි චතුවෛසාරද්‍ය(කරුණු සතරක් පිළිබඳ විශාරද) ඥානයෙන් යුක්ත වූ බුදුරජාණන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසනසේක් දෙවදත්ත ස්ථවිරයන්ගේ

වධය(බුදුන් මැරීමට) පිණිස උත්සාහයක් අරභයා මේ ජාතකය වදාළසේක.

එසමයෙහි බුදුරජාණන් වහන්සේ දේවදත්ත ස්ථවිරයන් වහන්සේ "වධය පිණිස උත්සාහ කෙරෙති" අසා "මහණෙනි, දේවදත්ත ස්ථිවිර තෙම වධය පිණිස උත්සාහ කරන්නේ දැන්මතු නොවෙයි, පෙරත් උත්සාහ කෙළේමය, එලෙස උත්සාහකොට තැතිගැන්වීම් පමණකුදු කරන්නට නොහැකි වූයේය"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහබෝධිසත්‍වයන් වහන්සේ වඳුරු ජන්මයෙහි ඉපිද වැඩි වයසට පැමිණ අස් පැටවකු පමණ කාය ශක්තියෙන් යුක්තව එකවරම (තනිව හැසිරෙමින්) ගංගා තීරයෙක්හි වාසය කරනසේක. ඒ ගංගාවගේ මැද අනේකප්‍රකාර වූ ආම්‍ර පානාදී ඵල වෘක්ෂයෙන්(අඹ කොස් ආදී පලබර ගසින්) යුක්ත වූ එක් දිවයිනක් වන්නේය. හස්තිබල හා සමාන කාය ශක්තියක් ඇති බෝධිසත්‍වයන් වහන්සේ ගංගාවගේ මෙතෙරින් පැන නැගී දිවයින මෙතර ගඟ මැද(දූපතත් මෙතරත් අතර ගඟ මැද) එක් අතලගලෙක්(ගල් තලාවක්) ඇත්තේය. එහි හෙන සේක. එතැනින් පැන නැගී ඒ දිවයිනෙහි හෙන සේක. එතැන්හි දී අනේකප්‍රාකාර ඵලාඵලයන් අනුභවකොට සවස ඒ උපායෙන්ම නැවත අවුත් තමා වසන තැන්හි විසීම කොට දෙවැනි

දිනයෙහිද එලෙසම කරනසේක. මෙම ක්‍රමයෙන් එතැන්හි වාසය කරනසේක.

එසමයෙහි වනාහී ප්‍රජාපතින්(භායර්‍යාව) සහිත වූ එක් කුම්භීලයෙක් (කිඹුලෙක්) ඒ ගංගාවෙහි විසීම කරන්නේය. ඔහුගේ භාර්යාව වූ කිඹුල් ධේනුව තොමෝ ඔබිනොබ වඩනා වූ බෝධිසත්ත්වයන් වහන්සේ දැක බෝධිසත්ත්වයන් වහන්සේගේ හෘදය මාංශයෙහි දෙළ(ආශාව) උපදවා කිඹුලාට කියනුයේ "ස්වාමීන් වහන්ස, මට වනාහි මේ වානරෙන්ද්‍රයාගේ හෘදය මාංශයෙහි දෙළෙක් උපන්නේය"යි කීවාය. කුම්භීලතෙම "යහපත පින්වන්ති, ලබන්නෙහිය"යි කියා "අද දවස දිවයිනෙන් එන්නා වූ වානරෙන්ද්‍රයා අල්වා ගනිමි"යි කියා ගොස් ගල් අතලෙහි හොත්තේය.

බෝධිසත්ත්වයන් වහන්සේ දහවල් ගොදුරු කා සවස් වේලෙහි දිවයිනෙහි සිටිසේක්ම පහණ(ගල) බලා "මේ පහණ දැන් උස්ව පෙනෙන්නේය. ඊට කාරණා කවරේදැ?"යි සිතූසේක. උන්වහන්සේට වනාහි ජල ප්‍රමාණයද පාෂාණ ප්‍රමාණයද(ජලය ඇති ප්‍රමාණයත් ගල ඉන් මතුවී ඇති ප්‍රමණයත්) යහපත්ව වැටහී තිබෙන්නේය. ඒ කාරණයෙන් ඕහට මෙබඳු සිතෙක් වූයේය. "අද මේ ගංගාවගේ ජලය අඩු වූයේත් නොවෙයි, වැඩි වූයේත් නැත. එසේ වුයේද(එසේ වුවත්) මේ පහණ මහත්ව පෙනෙන්නේය. කිමෙක්ද? මෙතැන්හි මා ගන්නා පිණිස කුම්භීලතෙම හුන්නේදැ"යි බෝධිසත්ත්වයන් වහන්සේ "පළමුකොට ඔහු පරීක්‍ෂා කරන්නෙම"යි සිතා

එතැන්හිම සිට පහණ හා සමග කථා කරන්නාක් මෙන් "පින්වත් පහණැ"යි කියා ප්‍රතිවචනයක්(පිළිතුරක්) නොලබනසේක්, තුන්වෙනිවර දක්වා "පින්වත් පහණැ"යි කීසේක. එකල්හි වානරතෙම "කවර හෙයකින් ප්‍රතිවචනයක් නොදන්නේය"යි කියා නැවත ඕහට කියන්නා වූ වානරතෙම "කිමෙක්ද? පින්වත් පහණ, අද මට ප්‍රතිවදන නොදෙන්නේදැ"යි කීසේක.

එකල්හි කුම්භිලතෙම සිතනුයේ "ඒකාන්තයෙන් සෙසු දිනවල්හි මේ පහණ වානරෙන්ද්‍රයාහට ප්‍රතිවචන දෙන්නෝය. මෝහට දැන් ප්‍රතිවචන දෙන්නෙමි"යි සිතා "කිමෙක්ද? පින්වත් වානරෙන්ද්‍රය"යි කීයේය. එවිට බෝධිසත්‍වයෝ "තෝ කවරෙහිදැ"යි විචාළසේක. "මම කුම්භීලයෙකි"යි කීයේය. "කුමක් පිණිස මෙතැන්හි හොත්තෙහිදැ"යි විචාළසේක.

එවිට කිඹුල්වතෙම "නුඹවහන්සේගේ හෘදය මාංශය පතාය"යි කියේය. බෝධිසත්‍වයන් වහන්සේ සිතනසේක් "මට යායුතු මගක් නැත්තේය. අද මා විසින් මේ කුම්භීලයා වඤ්චා කටයුතුය"යි සිතා ඉක්බිත්තෙන් ඕහට මෙසේ කීසේක. "යහළු කුම්භීලය, මම ආත්මභාවය තොපට පරිත්‍යාග කරන්නෙමි, තෝ මුඛය හයා මා තාගේ සමීපයට ආ කල්හි ගණුව"යි කීසේක. කිඹුලුන්ගේ වනාහි මුඛය විවෘත වූ කල්හි ඇස් දෙක පියෙන්නේය. හෙතෙම ඒ කාරණය නොසලකා මුඛය විවෘත කෙළේය. ඉක්බිත්තෙන් ඔහුගේ ඇස්දෙක පිහිත

වූයේය(වැසුණේය). හෙතම මුඛය විවෘතකොට ඇස්දෙක නිබ්ලනයකොට (වසාගෙන) හොත්තේය.

බෝධිසත්වයන් වහන්සේ එලෙස වූ බව දැන දිවයිනෙන් අහසට පැන නැගී ගොස් කිඹුලාගේ මස්තකය ආක්‍රාන්තකොට(පාගා) එතැනින් පැන නැගී විප්ජුල්ලතාවක්(විදුලියක්) මෙන් බබලමින් එතෙර සිටිසේක. කිඹුලා ඒ ආශ්චර්යයී දැක "පින්වත් වානරේන්ද්‍රය, මේ ලොකයෙහි චතුර්විධ කාරණයකින් සමන්විත වූ පුද්ගලතෙම පසමිතුරන් මැඩපවත්නේය. ඒ සියළු කාරණාවෝම තොපගේ අභ්‍යන්තරයෙහි ඇතැයි සිතමි"යි කියා මෙසේ කීයේය "වානරෙන්ද්‍රය, වාක් සත්‍යයද(ඇත්ත කථා කිරීමද) පරීක්ෂා ඥානයද (විමසා කටයුතු කිරීමේ නුවණද) අනෂ්ට ධෛර්යයද(නොනැසුණු ධෛර්යයද) නිස්සංග ත්‍යාගයද(ආත්ම පරිත්‍යාගයද) යන මේ සතර ගුණයෝ නුඹවහන්සේට මෙන් යමක්හට ඇද්ද, ඒතෙම පසමිතුරා මැඩපවත්නේය". මෙසේ කුම්භීලතෙම බෝධිසත්වයන් වහන්සේට ප්‍රශංසාකොට තමා වසන තැනට ගියේය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ වදාරණසේක් "මහණෙනි. දේවදත්ත ස්ථවිර තෙම මට වධය පිණිස උත්සාහ කළේ දැන්මතු නොවෙයි, පෙරත් උත්සාහ කෙළේමය"යි මේ දම්දෙසුන් ගෙනහැර දක්වා පූර්වාපර සන්ධි ගළපා මේ 'වානරින්ද ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි කිඹුලා නම් දැන් දේවදත්ත ස්ථවිරයෝය. ඔහුගේ භාර්යාව වූ කිඹුල් ධේනුව නම් දැන් චිඤ්චිමානවිකාවෝය. වානරේන්ද්‍රව උපන්නෙම් වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 058. තයොධම්ම ජාතකය

තවද එක් සමයෙක්හි රාගාදිසංග රහිත වූ(රාගාදී ඇලීම් බැඳීම් නැති) තිලෝගුරු බුදුරජාණන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසනසේක් දෙවදත්ත ස්ථවිරයන් වහන්සේගේ වධයට උත්සහ කිරීමක් අරභයා මේ ජාතකය වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කරන කල්හි දෙවදත්ත ස්ථවිරයෝ වානර යෝනියෙහි ඉපිද හිමාල වන ප්‍රදේශයෙහි වානර සමූහයා පරිහරණය(පාලනය) කරන්නාහු තමන් නිසා උපන්නා වූ වානර පෝතකයන් "මොහු වැඩී ගිය කල වානර සමූහයා පරිහරණය කෙරෙති" යන භයින් දතින් ඩෑ(දත්වලින් හපා) ඔවුන්ගේ බීජොත්පාටනය(අණ්ඩ උපුටා දැමීම) කරන්නාහුය.

එසමයෙහි බෝධිසත්ත්වයෝත් එම වානරයා නිසා එක් වැඳිරියක කුස පිළිසිඳ ගත්තාහුය. එකල වැඳිරිතොමෝ දරුගැබ පිහිටි නියාව දැන තමාගේ දරුගැබ රකිමින් අනික්

පර්වත ප්‍රාන්තයකට ගියාය. ඕතොමෝ ගැබ මුහුකුරා ගිය කල්හි බෝධිසත්ත්වයන් වැදූහ.

බෝධිසත්ත්වයෝ වැඩී විඥබවට(නුවණැති බවට) පැමිණ ශක්ති සම්පන්නවූය. ඒ බෝධිසත්ත්වයෝ එක් දවසක් මෑණියන් අතින් "මෑණියනි, මාගේ පියාණන් වහන්සේ කොයිදැ?"යි විචාළෝය. "පුත, අසවල් පර්වත ප්‍රාන්තයෙහි වඳුරුමුල රකිමින් වෙසෙති"යි කිව. "මෑණියෙනි, ඒ වානර රජ්ජුරුවන් සමීපයට මා ගෙන යව"යි කිවුය. "පුත, තොප විසින් පියාණන් සමීපයට යන්ට නොපිළිවන, තොපගේ පියාණෝ තමන් නිසා උපන්නා වූ වානර පෝතකයන් 'වඳුරුමුල පරිහරණය කෙරෙත්' යන භයින් දතින් ඩෑ බීජොත්පාටනය කෙරෙති"යි කිවුය. "මෑණියෙනි, මා එතනට ගෙන යව, මම ඊට කටයුතු දන්නෙම් වේදැ"යි කී කල්හි ඒ වැඳිරිතොමෝ පුත්‍රයා වඩාගෙන ඒ වානරයා සමීපයට ගියාය.

එකල වානරයා තමාගේ පුත්‍රය දැකලාම "මෙතෙම වැඩී ගියේ වීනම් වඳුරුමුල පරිහරණය කළ නොදෙති, එසේ හෙයින් දැන්ම මොහු දුරුකොට පිය යුතු"යි ඔහු වැළඳ ගන්නාක් මෙන් තරකොට මැඩලුයේය(මිරිකුවේය). බෝධිසත්ත්වයෝ වූකලී ඇත්බල හා සමාන වූ බල ඇත්තෝය. එසේ හෙයින් බෝධිසත්ත්වයෝත් පිය වඳුරු අල්වා තරකොට මැඩලූය. ඔහුගේ ඇඟ ඇට බිඳී යන්නාක් මෙන් විය. ඉක්බිත්තෙන් ඒ වානරයාට මෙසේ සිතිවිල්ලෙක් විය. "මේතෙම වැඩී ගියේ වීනම් මා මරන්නේය, කවර උපායකින් පළමුකොට

මොහු මරාපියම් දේ හෝ”යි සිතීය. තවද මෙසේ සිතීය. “මීට නුදුරු තෙන රාක්‍ෂසාධිගෘහිත(රකුසන් අරක්ගත්) විලෙක් ඇත. ඒ විල රාක්‍ෂසයා ලවා මොහු කවමි”යි සිතා ඉක්බිත්තෙන් ඕහට කියන්නෝ “මම මහළු වයසට යෙමි, මේ වඳුරුමුල තොපට පාවාදෙමි. අදම තොප රජ කෙරෙමි, අසවල් තැන විලෙක් ඇත, ඒ විල ඇඹුල(කුමුදු) වන දෙකෙකුත් උපුල(මානෙල්) වන තුනකුත් නෙළුම් වන පසකුත් පිපෙන්නේය, එයින් මල් ගෙනෙව”යි කීය.

මහබෝසතාණෝ “යහපත, පියාණන් වහන්ස, ගෙනෙමි”යි කියා ගොස් විලට නොබැස හාත්පසින් පියවර සටහන් පරීක්‍ෂා කරන්නෝ බට පියවරම දුටුය. විලින් ගොඩනැගී පියවර නොදුටුය. බෝධිසත්‍වයෝ “මේ විල රාක්‍ෂසාධිගෘහිත විය යුතුය. මාගේ පියාණන් වහන්සේ මා මරවනු කැමතිව තමන්වහන්සේ මරාගත නොහී රාක්‍ෂසයා ලවා මරවනු කැමැති සේ වනැ”යි සිතා “මේ විලට නොබස්මි. මලුත් කඩා ගනිමි”යි පැන් නැති තෙනට ගොස් වේග දක්වා(වේගයෙන්) උඩ පැන එපිට යන තැනැත්තෝ පැන් නැති ආකාශයෙහිම සිටියා වූ(අහසෙහිම රැඳෙමින්) මල් දෙකක් කඩාගෙන එපිට වැටී ගියෝය. නැවත එතරින් මෙතර පැන එන තැනැත්තෝ ඒ උපායෙන්ම මල් දෙකක් කඩා ගත්තූය. මෙසේ විල් දෙතෙර රැස්කරන්නා වූ බෝධිසත්‍වයෝ මලුත් කඩාගත්තූය. රාක්‍ෂසයාගේ ආඥාව පවත්නා තැනටත් නොබටුය.

ඉක්බිත්තෙන් "මෙතැකින් වඩා(මීට වඩා) ඔසවාගත නොහැක්කේය"යි සිතා ඒ කැඩූ මල් එක් තෙනක රැස් කරමින් සිටි කලට ඒ රාක්‍ෂසයා සිතන්නේ "මා විසින් මෙතෙක් කල් මුළුල්ලෙහි මෙබඳු වූ නුවණැති ආශ්වර්යමත් පුරුෂයෙක් දුටුවිරූ නැත, මලුත් කඩා කැමති පමණක් කඩාගෙන මාගේ ආඥාව පවත්නා තෙනටත් නොබටුයේය"යි දිය දෙබෑකොට දියෙන් ගොඩනැගී බෝධිසත්වයන් සමීපයට ගොස් කියන්නේ "වානරේන්ද්‍රය, මේ ලෝකයෙහි සම්ප්‍රාප්ත වූ(පැමිණි) භය දුරු කිරීම දන්නා වූ, ප්‍රඥා සම්ප්‍රයුක්ත වූ උත්තම වූ වීර්‍ය්‍යය නිර්භීත බවය, උපාය ප්‍රඥාය යන මේ ධර්‍මයෝ තුන්දෙන යමහක්හට ඇත්තාහු වීනම් ඒ සත්වතෙමේ පසමිතුරන් මැඩ පවත්වන්නේය. ඒ ධර්‍මයෝ තුන්දෙනම තොපගේ අභ්‍යන්තරයෙහි විද්‍යාමානයෝයයි සිතමි"යි මෙසේ උදක රක්‍ෂසයා බෝධිසත්වයන්ට ස්තූතිකොට "මේ මල් කුමක් පිණිස ගෙන යවුදැ?"යි විචාළේය. "මපියාණන් වහන්සේ මා රජ කරනු කැමති සේක. ඒ කාරණයෙන් ගෙනයෙමි"යි කී කල්හි රාක්‍ෂසයා "මෙබඳු උත්තම පුරුෂයෙක්හූ විසින් මල් ඔසොවාගෙන යන්ට නොපිළිවන, මම ගෙනයෙමි" තෙමේ මේ මල් මිටිය ඔසොවාගෙන බෝධිසත්වයන් පසුපස්සෙහි ගියේය.

ඉක්බිත්තෙන් බෝධිසත්වයන්ගේ පිය වඳුරා එන්නා වූ බෝධිසත්වයන් දුරදීම දැක "මම මොහු රකුසුවත් කන්නේයයි යැවිමි. ඒතෙමේ දැන් රාක්‍ෂසයා ලවා මල් ගෙන්වාගෙන එන්නේය. දැන් වූකලී නටුයෙමි වේදැ"යි(විනාශ වූයෙමි නොවේදැයි) සිතමින් සත්කඩක්කොට ළය පලාගෙන

එතැන්හිම ජීවිතක්ෂයට පැමිණියෝය. එකල්හි අවශේෂ වානරයෝ එක්ව බෝධිසත්ත්වයන් රජ කළාහුය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ 'තයොධර්ම ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි යූථපති(වඳුරු රැළේ නායකයා) නම් දැන් දේවදත්ත ස්ථවිරය. එසමයෙහි යූථපති පුත්‍ර වූයේම් තිලෝගුරු සම්‍යයක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 059. භෙරිවාද ජාතකය

තවද එක් සමයෙක්හි සනරාමරලෝකගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසනසේක් එක්තරා දුර්වච(අකීකරු) භික්ෂුවක් අරභයා මේ ජාතකය වදාළසේක.

සර්වඥයන් වහන්සේ ඒ මහණාහට වනාහි වදාරණසේක් "මහණ, තෝ අකීකරු වුයේ සැබෑදැ?"යි විචාරා වදාළ කල්හි "භාග්‍යවතුන් වහන්ස, සැබැව"යි දැන් වූකල්හි "මහණ, තෝ අකීකරු වූයේ දැන්මතු නොවෙයි, පෙරත් අකීකරු වූයේහිය"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි අප මහබෝසතාණන් වහන්සේ භේරිවාදක(බෙර වයන්නන්ගේ) කුලයෙක්හි ඉපිද වැඩිවිය පැමිණ එක් ගමෙක්හි වාසය කරනසේක. ඒ අප

මහබෝසතාණන් වහන්සේ බරණැස් නුවර නැකත් කෙළියට බෙර ලැවූ(අණ බෙර ගැසූ) ශබ්දය අසා "නෘත්‍ය මණ්ඩලයෙහි භෙරිවාද්‍යකොට(රඟමඬලෙහි බෙර වයා) වස්තුව ගෙන එන්නෙමි"යි සිතා පුත්‍රයාද කැඳවාගෙන නෘත්‍ය මණ්ඩලයට ගොස් භෙරිවාදකොට බොහෝ වස්තුව ලැබ ඒ වස්තුව ඇරගෙන තමාගේ ගමට එනසේක්, අතරමග සොරුන් විසින් අධිගෘහිත වූ අරණ්‍යයකට (වනයකට) පැමිණ නිරන්තරයෙන් භෙරිවාදය කරන්නා වූ පුත්‍රයා වැලැක්වූසේක් "පින්වත් වූ පුත්‍රය, නිරන්නරයෙන් භෙරිවාද්‍ය නොකොට මගට පිළිපන්නාහු විසින් ප්‍රධානීන්ට වයන්නා වූ භෙරි ශබ්දය මෙන් අතරතුරෙහි වයව"යි කී සේක. පියාණන් විසින් වළක්වන්නා වූ ඒ පුත්‍රතෙම භෙරි ශබ්දයෙන්ම සොරුන් ලුහුබඳවමි"යි සිතා අතුරු නැතිවම බෙර වැයුයේය.

සොරුහු පළමුවෙන්ම භෙරි ශබ්දය අසා "ඊශ්වර භෙරි ශබ්දයකැ"යි (ප්‍රභූවරුන් සඳහා කැරෙන බෙර වැයීමක් යයි) දිවගොස් අතිශයින් ඒකාබද්ධව (එක දිගට පවත්නා) ශබ්දය අසා "මේ ඊශ්වර භෙරි ශබ්දයෙක් නොවන්නේය"යි සිතා අවුත් පරීක්ෂාකොට දෙදෙනාම දැක තළා වස්තු පැහැර ගත්තාහුය. අප මහබෝසතාණන් වහන්සේ "ඒකාන්තයෙන් දුකසේ ලබනලද වස්තුව ඒකාබද්ධකොට භෙරිවාද්‍ය කරන්නා වූ පුත්‍රයා විසින් නසන ලද්දේය"යි පුත්‍රයාට මෙසේ කීසේක.

"භෙරිවාද්‍ය කරන්නේය, භෙරිවාද්‍ය ප්‍රමාණය ඉක්මවා නොම කරන්නේය. නිරතුරු වාද්‍ය නොකරන්නේය.

ප්‍රමාණාතික්‍රමණයකොට(පමණ ඉක්මවා) නිරතුරුවම භෙරිවාද්‍ය කිරීම වනාහි පවිටු වන්නේය. හේ කුමක් හෙයින්ද යත්?... භෙරිප්‍රහරණය කරන්නාහු(බෙර වයන්නා) විසින් කර්ෂිපාන (කහවණු) සියයක් ලබන ලද්දේය. ඒ ලබනලද දෙය නිරන්තරයෙන් නොකීකරුව වාද්‍ය කරන්නාහු විසින් නසන ලද්දේය"යි කීසේක.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ජාතක ධර්මදේශනාව ගෙනහැර දක්වා වදරා පූර්වාපර සන්ධි ගළපා නිමවා වදාළසේක.

"එසමයෙහි පුත්‍රතෙම අකීකරු මහණ වූයේය. පියාණෝ නම් තිලෝගුරු සම්‍යයක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 060. සංඛධම්ම ජාතකය

තවද එක් සමයෙක්හි තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසනසේක් දුර්වච (අකීකරු) භික්ෂුවක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහබෝසතාණන් වහන්සේ සක් පිඹිනා කුලයෙක්හි ඉපිද වැඩිවයසට පැමිණ වසන කල්හි බරණැස් නුවර නැකැත් කෙළියට බෙර ලැවිණ.

එකල්හි බෝසතාණෝ තම පියාණන් කැඳවාගෙන "සක් පිඹීමෙන් වස්තුව ලබමි"යි සිතා ගොස් සක් පිඹීමෙන් වස්තුව

ලැබ ගමට එන කල්හි සොරුන් වසන අරණ්‍යයකට පැමිණ සක් පිඹිනා වූ පියාණන් වැලකූසේක. ඒ පියතෙම "සක් හඬින් සොරුන් ලුහුබඳවමි"යි කියා අතුරු නැතුවම සක් පිම්බේය. ඒ සොරුහු පෙර කියනලද ක්‍රමයෙන්ම අවුත් වස්තුව පැහැර ගත්තාහුය. බෝධිසත්ත්වයන් වහන්සේත් පූර්වයෙහි කියනලද ක්‍රමයෙන් මෙසේ කීසේක. "සක් පිඹිනේය, නොම සක් නොපිඹිනේය. අධිකකොට ප්‍රමාණ ඉක්මවා නොපිඹින්නේය. ප්‍රමාණය ඉක්මවා අධිකකොට පිඹීම වනාහි ඉතා ලාමක වන්නේය. කුමක් හෙයින්ද? යත්, සක් පිඹීමෙන් ලබනලද වස්තුව නැවත නැවත සක් පිඹිනා වූ අපගේ පියාණන් විසින් නසන ලද්දේය"යි කීසේක. ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මෙසේ මේ දම් දෙසුම් ගෙනහැර දක්වා වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි පියාණෝ නම් දැන් අකීකරු මහණ වූයේය, පුත්‍රව උපන්නෙමි තිලෝගුරු සම්‍යයක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 061. අසාතමන්ත්‍ර ජාතකය

තවද එක් සමයෙක්හි සර්ව ධර්මයෙහි අප්‍රතිහත වූ ඥානාචාර(සියලු ධර්මයෙහි නොපැකිලි පවත්නා ඥාණගති) ඇති තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වසනසේක් උකටලී වූ භික්ෂුවක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

මෙහි වර්ථමාන කථාව උම්මදන්ති ජාතකයෙහි මතු පහළ වන්නේය. සර්‍වඥයන් වහන්සේ ඒ භික්ෂූහට "මහණ, මේ ලෝකයෙහි ස්ත්‍රීහු නම් දුක්ඛයට වස්තූහුය(හේතු කාරණා වෙති). අසත්පුරුෂයෝය, ලාමකයෝය, අන්තිමයෝය, තෝ එබඳු ලාමක ස්ත්‍රියක නිසා කවර කාරණයකින් උකටලී වූයෙහිදැ"යි වදුරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහබෝසතාණෝ ගන්ධාර රට තක්සලා නුවර බ්‍රාහ්මණ වංශයෙහි ඉපිද නුවණැති බවට පැමිණ වේදත්‍රයෙහි (ඍග්, යජුර්, සාමන් යන වේද තුනෙහි) සියළු ශිල්පයෙහිත් නිමාවට පැමිණ දිසාපාමොක් ආචාරී වූය.

එසමයෙහි බරණැස් නුවර බ්‍රහ්මණ කුලකයක පුත්‍රයෙකු උපන් දවස්ම ගිනිගෙන(ගිනි පිදීමට අවශ්‍ය ගින්න මොළවා) නොනිවා තිබූය. ඉක්බිත්තෙන් ඒ බ්‍රාහ්මණ කුමාරයා සොළොස් ඇවිරිදි වයසට පැමිණි කල්හි දෙමව්පියයෝ මෙසේ කිවුය "පුත, අපි තොප උපන් දවස්ම ගිනි ගෙන තිබුම්හ, ඉදින් තෙපි බ්‍රහ්මලෝකයෙහි උපදනා කැමැත්තාහු වීනම් ගිනි ගෙන වලට වැද(ඒ ගින්න රැගෙන වනයට ගොස්) ගිනිදෙවියාට නමස්කාර කෙරෙමින් බ්‍රහ්ම ලෝකපරායන වව(බඹලොව ඉපිදෙව), ඉදින් ගිහිව වසනු කැමැත්තාහු වීනම් තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරීන් සමීපයෙහි ශිල්ප ඉගෙණ කුටුම්බ සණ්ඨාපනය(පවුල් ජීවිතයක්) කරව"යි කිවුය.

මානවකයා කියන්නේ “මම වල ගිනි පරිහරණය කරන්නට අසමර්ථයෙමි, කුටුම්බ සණ්ඨාපනය කෙරෙමි”යි කියා දෙමාපියන් වැඳ ආචාර්යය කොට්ඨාශ(ගුරුපඬුරු) යයි කියනලද මස්සෙන් දහසක් ගෙන තක්සලා නුවරට ගොස් ශිල්ප ඉගෙණ පෙරලා ආයේය.

ඔහුගේ දෙමාපියෝ ගිහි ගෙයි විසීමට නොකැමැත්තාහුය. වනයේ හිඳ ගිනිදෙවියාට පුජා කරනු කැමැත්තාහුය. එසේ හෙයින් එකල මානවකයාගේ මව්තොමෝ ස්ත්‍රීන්ගේ දේෂ දක්වා වලට යවනු කැමැත්තී “දිසාපාමොක් ආචාරීන් වහන්සේ නුවණැතිසේක, ව්‍යක්තසේක(උගත්කම ඇතිසේක), මාගේ පුතණුවන්ට ස්ත්‍රීන්ගේ දේෂ කියන්ට සමර්ථසේකැ”යි සිතා “පුත, තොප විසින් ශිල්ප උගන්නා ලදදැ”යි කිවුය. “එසේය මෑණියන් වහන්සැ”යි කී කල්හි “තොප විසින් අසාත මන්ත්‍රයෝත් උගන්නා ලද්දහුදැ”යි කිවුය. “නැත මෑණියන් වහන්සැ”යි කී කල්හි “ඉදින් තොප විසින් අසාතමන්ත්‍ර නොඋගන්නා ලද්දේ වීනම් තොප විසින් කවර නම් ශිල්පයෙක් උගන්නා ලද්දේද? යව, යව, අසාතමන්ත්‍රයත් ඉගෙණ එව”යි කිවුය. ඒ මානවකයා මෑණියන් කී බස් “යහපතැ”යි පිළිගෙන නැවත තක්සලා නුවරට අභිමුඛව ගියේය.

ඒ ආචාරීන්ගේත් මෑණියෝ ඉතා වෘද්ධයෝය. අවුරුදු එක්සිය විස්සක් වයස් ඇත්තාහුය. දිසාපාමොක් ආචාරීහු තමන්ගේ මෑණියන් සිය අතින් නහවා, කවා පොවා පෝෂ්‍ය

කෙරෙති. අවශේෂ මනුෂ්‍යයෝ බෝධිසත්ත්වයන් මෙසේ කරන්නා දැක පිළිකුල් වන්නාහුය.

එකල මහබෝසතාණෝ මෙසේ සිතූහ. “මම වලට වැද ඒ වනයෙහිදී මෑණියන් වහන්සේ පෝෂ්‍ය කෙරෙමින් විසුයේ වීනම් යහපතැ”යි සිතූය. ඉක්බිත්තෙන් මහබෝසතාණෝ මෙසේ සිතා එක් විවේක වූ වනයෙක්හි පැන් පාසු තැනක පන්සලක් කොට ගිතෙල්, මී, උක්සකුරු, උඳු, මුන්, සාල් ආදීවූ දෙය ගෙන්වා ගෙන මෑණියන් උසුගවාගෙන ඒ වනයට ගොස් මෑණියන් පෝෂ්‍ය කෙරෙමින් වාසය කළෝය.

ඒ අසාතමන්ත්‍රය උගන්නා කැමති මානවකයාත් තක්සලා නුවරට ගොස් ආචාරීන් නොදක්නේ “ආචාරීන් වහන්සේ කොයිදැ”යි විචාරා එපවත් අසා වනයට ගොස් නමස්කාර කොට සිටියේය. එකල ඕහට ආචාරීහු කියන්නෝ “කිමෙක්ද? දරුව, ඉතා වහා අවුනැ”යි(ඉත් ඉක්මනින් යළි ආවේ) කිවුය. එබස් ඇසූ මානවකයා කියන්නේ “නුඹ වහන්සේ මා අසාතමන්ත්‍රය නොඉගැන්වූ සේක් නොවේදැ”යි කීය. මහබෝසතාණෝ “තොපට ආසතමන්ත්‍රය උගන්නට කීවෝ කවුරුදැ”යි විචාළෝය. “ආචාරීන් වහන්ස, මාගේ මෑණියන් වහන්සේ කීසේකැ”යි කීය. එකල බෝධිසත්ත්වයෝ සිතන්නෝ “මේ ලොකයෙහි අසාතමන්ත්‍ර නම් දෙයක් නැත, මේ මානවකයාගේ මෑණියෝ මෝහට ස්ත්‍රීන්ගේ දෝෂ දක්වනු කැමැත්තෝවනැ”යි සිතූය.

ඉකිබිති ඕහට මහබෝසතාණෝ කියන්නෝ "දරුව, යහපත තොපට අසාතමන්ත්‍රය දෙමි, අද පටන්කොට මාගේ තනතුරෙහි සිට මාගේ මෑණියන් වහන්සේ සිය අතින් නහවා, කවා පොවා පොෂ්‍ය කරව, අතපය හිස පිරිමැදීම්, පිට මැඩීම් ආදිය කරන්නාවූ තෙපි 'ආය්‍යීයන් වහන්ස, නුඹවහන්සේ ජරාවට පැමිණි කල්හිත් නුඹවහන්සේගේ මෙබඳු යහපත් වූ ශරීරය වන්නේය, ළදරු අවස්ථාවෙහි වීනම් කෙබඳු වේදැ'යි කියව, අතපය මඩනා අවස්ථාවෙහිත් හස්තපාදද්දීන්ගේ ගුණ කියව, තොපට මාගේ මෑණියන් වහන්සේ යමක් කීයේ විනම් එකී දෙය තෙපි ලජ්ජා නොව මට කියව, එසේ කළා නම් අසාතමන්ත්‍රය ලබව, නොකළා නම් නොලබන්නේ වේදැ"යි කිවුය. ඒ මානවකයා "යහපත, ආචාරීන් වහන්සැ"යි කියා මහබෝසතාණන්ගේ වචනය පිළිගෙන එතැන් පටන් කියන ලද්දා වූ සියලු කාරිය කෙළේය.

ඉක්බිත්තෙන් ඒ බෝධිසත්‍වයන්ගේ මෑණියන්ට ඒ මානවකයා නැවත නැවත ශරීර වර්‍ණනා කරත් කරත් "මේ තෙම මා හා සමග අභිරමණය(සංවාසය) කරනු කැමැත්තේ වනැ"යි සිතා අන්ධ වූ ජරාවෙන් ජීර්ණ වූ බෝධිසතත්ව මාතාවන්ගේ අභ්‍යන්තරයෙහි ක්ලේශයෝ උපන්හ. ඒ බෝධිසත්‍ව මාතාවෝ එක් දවසක් තමන්ගේ ශරීර වර්‍ණනාව කරනු කල්හි ඒ මාණවකයාට කියන්නෝ "මා හා සමග අභිරමණය කරනු කැමැත්තෙහිදැ"යි කිවුය. "ආය්‍යීයන් වහන්ස, මම වූ කලී කැමැත්තෙමි, ආචාරීන් වහන්සේ ගුරුසේක් වී දැ"යි(ගුරුවරයා නොවේදැයි) කීය. "ඉදින් තෝ

මා කැමැත්තෙහි වීනම් මාගේ පුතණුවන් මරාපිය''යි කිවුය. මෙසේ කී කල්හි මානවකයා කියන්නේ "මම ආචාරීන් වහන්සේ සමීපයෙහි මෙතෙක් ශිල්ප ඉගෙණ ක්ලේශමාත්‍රයක්(සිතේ හටගත් අපිරිසිදු අදහස් ටිකක්) නිසා කුමකැයි කියා ආචාරීන් වහන්සේ මරම්දැ''යි කීය. "එසේ වීනම් ඉදින් තෙපි මා නොහැරනම්(මා අත නොහරින්නේ නම්) මම්ම ඒ දරුවන් මරම්''යි කිවුය.

මේ ලෝකයෙහි ස්ත්‍රීහු නම් අසත්පුරුෂයෝය, දුක්ඛයට වස්තූහුය, ලාමක යෝය, පශ්චිමයෝය. එබඳු වූ වයසෙහි සිට පවා රාග සිත් උපදවා කෙල්ශ වසග වන්නී, මෙසේ උපකාරී වූ පුත්‍රයා මරණු කැමැති වුව. එසේ හෙයින් ස්ත්‍රීහූ නම් අසත්පුරුෂයෝමය.

ඉක්බිත්තෙන් මානවකයා ඒ සියලු කථා බෝධිසත්වයන්ට කීයේය. එබස් ඇසූ මහබෝසතාණෝ "මානවකය, ඒ සියළු ප්‍රවෘත්තිය මට කියන්නා වූ තා විසින් කළ දැ ඉතා යහපත් වන්නේය''යි කියා මෑණියන්ගේ ආයුසංස්කාරය(ආයුෂ කාලය) බලන තැනැත්තෝ "අදම මියෙති''යි දැන "මානවකය, මෙසේ උන්වහන්සේගේ අභිප්‍රාය(අදහස) පරීක්ෂා කරම්හ''යි එක් දිඹුල් දණ්ඩක්(අත්තික්කා ලීයක්) ගෙන්වාගෙන සැස මහබෝසතාණෝ තමන්ගේ ප්‍රමාණයෙන් කාෂ්ටරූපයක්(ලී රූපයක්) කොට ඉස හා සමග පොරොවා තමන් වැදහොත් තැන උත්තැනි කොට(උඩුකුරු කොට) හොවා රැණක් බැඳ අතවැස්සාට කියන්නාහු "දරුව, පොරවක් ගෙනගොස් මාගේ මෑණියන්

වහන්සේට මා මෙතන වැදහොත් නියාව හඟවා ලව"යි කිවුය. එබස් ඇසූ මානවකයා ගොස් "ආය්‍යීයන් වහන්ස, ආචාරීන් වහන්සේ පන්සල තමන්වහන්සේ වැදහොනා තැන වැදහොත්සේක. මා විසින් වැදහොත් තැන දැනගන්නා සඳහා රැණක් බැඳ තබනලද, මේ පොරව ඇරගෙන රැණ සනින් ගොස් ඉදින් පිළිවන් වීනම් පුතණුවන් වහන්සේ මරාපුව මැනැව"යි කීය. එබස් ඇසූ බෝධිසත්‍ව මාතාවෝ "මා නොහරණාවදැ"යි කිවුය. "කවර කාරණයකින් මම නුඹවහන්සේ හැරපියම්දැ"යි කීය.

එකල බෝධිසත්‍ව මාතාවෝ පොරව ඇරගෙන වෙවුල වෙවුලා නැඟීසිට රැණ සංඥාවෙන් ගොස් අතින් අල්වා බලා "මේ තෙම මාගේ පුතණුවෝය"යි යන සංඥාවෙන් කාෂ්ට රූපයෙහි මුහුණින් වස්ත්‍රය ඉවත්කොට පොරොව ඇරගෙන "එක පහරින්ම මරමි"යි සිතා බොටුවෙහිම පොරොව හෙලා "ටැකැ"යි යන අනුකරන ශබ්දය උපන් කල්හි "දඬුරුවකැ"යි දත්තුය.

ඉක්බිත්තෙන් මහබෝසතාණන් විසින් ඉවත සිට "මෑණියන් වහන්ස, කුමක් කරනසේක්දැ"යි කී කල්හි "වඤ්චා කරන ලද්දෙම් වෙමි"යි සිතා එතැන්හිම වැටී මිය ගියේය. තමන්ගේ පන්සල වැදහොත් නමුත් ඒ වේලාවට උන් විසින් මළ යුතුමය, එසේ හෙයින් මහබෝසතාණෝ මෑණියන් මළ නියාව දැන ආදහන කොට සොහොනෙහි ගිනි නිවා වනපස මලින් පුජාකොට මානවකයා කැඳවාගෙන පන්සල් දෙර හිඳ

කියන්නෝ "දරුව, වෙන අසාතමන්ත්‍ර නම් දෙයක් නැත. ස්ත්‍රීහු නම් අසත්පුරුෂයෝය, අසාතයෝය (වංක අදහස් ඇත්තෝය). තොපගේ මෑණියෝ 'අසාතමන්ත්‍රය ඉගෙණගෙන එව'යි මා සමීපයට එවන තැනැත්තෝ ස්ත්‍රීන්ගේ දෝෂ දැනගන්නා පිණිස එවුය. දැන් වූකලී තොප විසින් ප්‍රත්‍යක්‍ෂයෙන්ම මාගේ මෑණියන් වහන්සේගේම දෝෂ දක්නා ලද්දේ වේද, මේ කාරණයෙන් ස්ත්‍රීහු නම් සැප දුරුකොට දුක් එළවන හෙයින් අසාතයෝය, දුක්ඛ වස්තූහුය, අසත්පුරුෂයෝය, ලාමකයෝය, අන්තිමයෝය දැනගනුව"යි ඒ මානවකයාට අවවාදකොට යැවුය.

ඒ මානවකයාත් ආචාරීන් වැඳ දෙමාපියන් සමීපයට ගියේය. එකල්හි මෑණියෝ කියන්නෝ "පුත, තෙපි අසාතමන්ත්‍රය ඉගෙණ ගතුදැ"යි ඔහු අතින් විචාළෝය. "එසේය, මෑණියන් වහන්සැ"යි කී කල්හි "දැන් කුමක් කරව්දැ"යි "මහණව ගිනිදෙවියාට පුදපුජා කරව්ද, නොහොත් ගිහි ගෙයි වසව්දැ?"යි කීවුය. එබස් ඇසූ මාණවකයා කියන්නේ "මෑණියන් වහන්ස, මා විසින් ප්‍රත්‍යක්‍ෂකොට ස්ත්‍රීන්ගේ දෝෂ දක්නාලද, එසේ හෙයින් මට ගිහි ගෙයින් ප්‍රයෝජන නැත, මම තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවෙමි"යි තමන්ගේ අභිප්‍රාය ප්‍රකාශ කෙරෙමින් මෙසේ කිවුය. "මේ ලොකයෙහි ස්ත්‍රීහු නම් දුක්ඛයට වස්තු හෙයින් අසාත නම් වෙති, අසත්පුරුෂ නම් වෙති. ඔවුන් ක්ලේශ වසගවීමට හිමෙක් නම් මරියාදාවෙක්(සීමාවක්) නම් නැත්තේය. යම් සේ වහ්නිය තමා කෙරෙහි ලූ යම් යම් කාෂ්ටයෙක් ඇත්නම් ඒ

මුළුල්ලම දවා හසම කරත් මුත් මෙතෙක් සෑහෙයි යන තෘප්ති වාරණයෙක්(සෑහීමට පත්වීමක්) නැත්තේද එපරිද්දෙන්ම ස්ත්‍රීහු නම් කෙතෙක් දවස් කෙලෙස් වසඟ වූ නමුත් මෙතෙක් සෑහෙයි යන තෘප්තියක් ඔවුන්ට නැත්තේය. එසේ හෙයින් ගර්හිත වූ කෙලෙස් වසඟ වන්නා වූ ස්ත්‍රීන් හැර කාය විවේක, චිත්ත විවේක වර්ධනය කෙරෙමින් මහණ වෙමි, පැවිදිව කිසුණු පිරියම්(කසින භාවනාව) කොට බ්‍රහ්මලෝක පරායන වෙමි"යි කීය.

තවද මෙසේ කියා තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව කිසුණු පිරියම්කොට පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා, ගණයා කෙරෙන් කාය හා කෙලෙසුන් කෙරෙන් චිත්ත විවේකකොට මේ ද්විවිධ විවේකය වඩමින් බ්‍රහ්මලෝකොත්පත්තිය කෙරෙමි, මට ගිහි ගෙයින් ප්‍රයෝජන නැතැ"යි මෙසේ ස්ත්‍රීන්ට නින්දාකොට දෙමාපියන් වැඳ පැවිදිව කියනලද ප්‍රකාර ඇති විවේකය වඩමින් බ්‍රහ්මලෝකයෙහි උපන්නාහුය.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ "මහණෙනි, ස්ත්‍රීහූ නම් දුකට වස්තූහුය, අසත්පුරුෂයෝය, ලාමකයෝය, දුක් දෙන්නාහුය"යි කියා මෙසේ ස්ත්‍රීන්ගේ නුගුණ කියා චතුස්සත්‍යය ප්‍රකාශකොට වදාළසේක. චතුස්සත්‍ය ධර්මදේශනාවගේ කෙළවර ඒ ශාසනයෙහි උකටලීව ඇලුම් නැති වූ භික්ෂූන් වහන්සේ සෝවාන් පෙලෙහි පිහිටිසේක. ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ පූර්වාපර සන්ධි ගලපා මේ 'අසාතමන්ත්‍ර ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි මෑණියෝ නම් දැන් භද්‍රකාපිලානිය, පියාණෝ නම් මහකාශ්‍යපස්ථවිරයෝය, අන්තෙවාසික නම් දැන් ආනන්ද ස්ථවරයෝය. එසමයෙහි දිසාපාමොක් ආචාරී වූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 062. අණ්ඩභූත ජාතකය

තවද එක් සමයෙක්හි සර්‍වසත්වොත්තම වූ(සියළු සතත්වයන්ට උත්තම වූ) තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම්වෙහෙර වැඩ වසනසේක් උකටලී වූ භික්ෂුවක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

සර්‍වඥයන් වහන්සේ ඒ භික්ෂුහට "සැබෑද? මහණ තෝ උකටලී වුයෙහිදැ"යි වදරා "සැබෑව, ස්වාමීනි"යි කී කල්හි "මහණ, ස්ත්‍රීහු නම් රැක්ක නොහැක්කාහුය, පෙර නුවණැත්තෝ ස්ත්‍රියක ගර්භයෙහි (මවුකුසෙහි) පටන් රක්නාහු රැකගත නුහුනුවෝම වේදැ"යි වදරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි පුරණලද බෝධිසම්භාර ඇති අප මහබෝසතාණෝ ඒ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ වැඩිවිය පැමිණ සියළු ශිල්පයෙහි නිෂ්පත්තියට(නිමාවට) පැමිණ පියරජ්ජුරුවන්ගේ ඇවෑමෙන් රාජ්‍යයෙහි පිහිටා දැහැමෙන් රාජ්‍යය කරන්නාහුය. ඒ

බෝධිසත්වයෝ පුරෝහිත බ්‍රහ්මණයා හා සමග දු කෙළනාහුය. කෙළෙමින් හිඳ,

"සබ්බානදී වංකගතා සබ්බේ කට්ඨමයා වනා
සබ්බිත්ථියෝ කරෙ පාපං ලභමානා නිවාතකෙ"

(හැම ගංගාවක්ම ඇදය, හැම වනයක්ම සෑදී ඇත්තේ දැවවලිනි, එසේම රහස් තැන් ලද මොහොතෙහි හැම ස්ත්‍රියක්ම පවුකරයි)

යන මේ දූතගීතිකාව(සුදු සින්දුව) කියමින් රිදිපෝරුවෙහි(රිදියෙන් කළ ලෑල්ලෙහි) රන්පස ඇට (රනින් කළ දාදු කැට) දමන්නාහුය. මෙසේ කෙළනා වූ ඒ රජ්ජුරුවෝ නිරන්තරයෙන් දිනති. පුරෝහිතයා පරදනේය. ඒ පුරෝහිත බ්‍රාහ්මණයා ක්‍රමයෙන් තමාගේ ගෙයි සම්පත් නිමවන්ට පටන්ගත් කල්හි මෙසේ සිතුයේය. "මෙසේ නිරතුරුව පැරදීම ඇති කල්හි මාගේ මේ ගෙයි සියළු ධනය ක්‍ෂය වන්නේය, පුරුෂාන්තරයට(පිරිමියෙකු හා සංවාසයට) නොගියා වූ එක් ස්ත්‍රියෙක සොයා ගෙයි වාසය කරවන්නෙමි"යි සිතීය. තවද ඕහට මෙසේ වූ සිතිවිල්ලෙක් විය. "අන් පුරුෂයෙකු දුටුවා වූ ස්ත්‍රියෙක රක්නට නොපිළිවන, ගර්භයෙහි පටන් එක් ස්ත්‍රියෙක රැක ඈ වැඩිවිය පැමිණි කල්හි මාගේ වසඟයෙහි තබා එක් පුරුෂයකුහටම නියතකොට තරකොට රැකවල් ලවා රජ්ජුරුවන් වහන්සේගෙන් වස්තු ගෙන ගියේම් වීනම් යහපතැ"යි සිතීය.

ඒ බ්‍රාහ්මණ තෙමේත් අඟපසඟ ලකුණු දැන්මෙහි(අංග විද්‍යාවෙහි) සමර්ථය. ඉක්බිත්තෙන් ඒ තෙමේ දුක්පත් වූ ස්ත්‍රියක ගර්භනී නියාව දැක "දුවක වන්නීය"යි දැන ඈ කැඳවා සමීපයට ගෙන්වා ගෙන වැටුප් වියදම් දී ගෙහිම වස්වා වැදූ කල්හි ඈට වස්තු දී යවා ඒ කුමාරිකාව අන් පුරුෂයකු දැක්ක නොදී ස්ත්‍රීන් අතටම දී පෝෂ්‍ය කරවා වැඩිවිය පැමිණි කල්හි ඒ කුමාරිකාව තම වසඟයෙහි තුබුයේය. යම් පමණ කලෙකින් ඒ කුමාරිකාව වැඩේ නම් ඒ තාක් කල් මුලුල්ලෙහි රජ්ජුරුවන් හා සමග දූ නොකෙළියේය. ඒ ස්ත්‍රිය තමා වසඟයෙහි තබා පසුව "මහරජ්ජුරුවන් වහන්ස, දූ කෙළුම්හ"යි කියේය. රජ්ජුරුවෝ "යහපතැ"යි කියා පළමු පරිද්දෙන්ම දූ කෙළියාහුය.

පුරෝහිත බ්‍රාහ්මණයා රජ්ජුරුවන් ගායනාකොට පස ඈට දමන කල්හි "මාගේ ස්ත්‍රිය ඈර ගායනා කළ මැනව"යි කීය එතැන් පටන් පුරෝහිත බ්‍රාහ්මණයා දිනන්නේය. රජ්ජුරුවෝ පරදිති. බෝධිසත්වයෝ "මොහුගේ ගෙයි පතිව්‍රතාධර්මය(එකම පුරුෂයෙකු පමණක් තම සැමියා ලෙස සැලකීමේ චාරිත්‍ර ධර්මය) රක්‍ෂා කරන්නාවූ එක් ස්ත්‍රියක් වියයුතු"යි පරීක්‍ෂා කරන තැනැත්තෝ ඇති නියාව දැන් "ඈගේ පතිව්‍රතාධර්ම සංඛ්‍යාත වූ(නම් වූ) සීලය බිඳුවම්"යි සිතා එක් ධූර්තියෙකු(සල්ලාලයකු) කැඳවා ගෙන්වාගෙන "පුරෝහිතයන්ගේ ස්ත්‍රියගේ පතිව්‍රතාධර්මය බිඳපියන්ට පිළිවන්දැ"යි කිවූය. "පිළිවන ස්වාමීනි" කී කල්හි ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ ඕහට වස්තු දී "එසේ වීනම් වහා ඒ කාර්යය

නිෂ්ටා කරව"යි කියා ඒ ධූර්තියා යැවුය. ඒ ධූර්තිතෙම රජ්ජුරුවන් සමීපයෙන් වස්තු ඇරගෙන සුවඳසුණු කපුරු තකුල් ආදී වූ සුවඳ බඩුගෙන ඒ පුරෝහිත බ්‍රාහ්මණයාගේ ගෙට නුදුරු තැන සියළු සුවඳ බඩුයෙන් සල්පිලක්(කඩයක්) සැදුයේය. පුරෝහිත බ්‍රාහ්මණයාගේත් ගෙය සත්මාලක් සත් දොරටුවක් ඇත්තේය. හැම දොරටුවලම ස්ත්‍රීන්ගෙන් රැකවල් වන්නේය. පුරෝහිත බ්‍රහ්මණයා හැර අන් පුරුෂයෙක් ගෙට වදනට අසමර්ථ වන්නේය. කසල දමන්නා වූ පෙට්ටියත් බලා පරීක්ෂාකොටම ඇතුල් ගෙට ගන්නාහුය. ඒ මානවිකාව(තරුණිය) පුරෝහිතයාම දක්නීය. අන් පුරුෂයෙක් නොදක්නීය. එකල ඒ ස්ත්‍රියගේ එක් පරිචාරිකා(අතවැසි) ස්ත්‍රියක් සුවඳ මල් ආදියට මිළ ඇරගෙන යන්නී එම ධූර්තියාගේ සල්පිල සමීපයෙන් යන්නීය.

එකල ඒ ධූර්තියා "මෝතොමෝ පතිව්‍රතා ධර්‍මය රක්ෂා කරන්නා වූ ස්ත්‍රියගේ පරිචාරිකා ස්ත්‍රියෙකැ"යි නියමයෙන් දැන එක් දවසක් ඒ පරිචාරිකා ස්ත්‍රිය එන්නවුන් දැකලාම සල් පිළින් නැගීසිට ගොස් ඈ පාමුල වැටීහි දෑතින් දෙපය තරකොට අල්වාගෙන "මෑණියෙනි, මෙතෙක් ද මුළුල්ලෙහි කොයි ගියෝදැ"යි කියා ඇඬුයේය. එකල අවශේෂ වූ ඕහට සහාය වූ අවශෙෂ ධූර්තියෝත් එක් පසෙක සිට "අතපය මුව සටහණිනුත් ගමනාගමන ආදී වූ ආකල්පයෙනුත් (ඉරියව්වලිනුත්) මෑණියන් හා පුතණුවෝ එකසැටියෝමය"යි කිවාහුය. ඒ ස්ත්‍රී ඒ ඒ බොහෝ දෙනා මෙසේ කියන්ට වන් කල්හි තොමෝද අදහාගෙන(විශ්වස කරගෙන) "මේ මාගේ

පුත්‍රයෙක් වනැ''යි තොමෝත් අඬන්ට පටන්ගත. ඔහු දෙදෙනාම අඬාවැලපප ඔවුනොවුන් වැළඳ සිටියාහුය.

ඉක්බිත්තෙන් ඒ ධූර්තිතෙම "මෑණියෙනි, දැන් තොප කොයි යවුදැ''යි කීයේය. පරිචාරිකා ස්ත්‍රී කියන්නී "කින්නරාංනාවකගේ(කිඳුරියකගේ) විලාස බඳු වූ විලස් ඇති රූපයෙන් අග්‍රප්‍රාප්ත වූ පුරෝහිත බ්‍රාහ්මණයාණන්ගේ ළදරු (තරුණ) ස්ත්‍රියට උපස්ථාන කෙරෙමින් වෙසෙමි''යි කිවුය. "දැන් මෑණියෙනි කොයි යවුදැ?''යි ධූර්තියා විචාළේය. "ඒ කුමාරිකාවන්ට සුවඳ මල් ආදිය ගන්නා පිණිස යෙමි''යි කී කල්හි "මෑණියෙනි, අනික් තැනකට යාමෙන් ප්‍රයෝජන කිම්ද? මෙතැන් මා සමීපයෙන්ම සුවඳ මල් ගෙනව''යි කියා මිළ නොගෙන බොහෝ බුලත් තකුල් කපුරු ආදිය හා නොයෙක් සුවඳ මල් ආදිය දුන්නේය. ඒ සුවඳ මල් ආදිය ඇරගෙන පරිචාරිකා ස්ත්‍රිය ගෙට ආ කල්හි මානවිකාතොමෝ බොහෝ සුවඳ මල් ආදිය දැක "කිමෙක්ද? මෑණියෙනි, අද අපගේ බමුණානෝ අප කෙරෙහි ප්‍රසන්න වුදැ''යි කිව. "කවර කාරණයකින් මෙසේ කියන සේක්දැ''යි පරිචාරිකා ස්ත්‍රිය කී කල්හි "මේ සුවඳ මල් ආදිය බොහෝ නියාව දැකය''යි කිවුය. එකල පරිචාරිකා ස්ත්‍රිය කියන්නී "පුරෝහිතයාණන් වහන්සේ සුවඳ මල් ආදියට බොහෝ මිළ නුදුන්සේක, මා විසින් වනාහි මේ සුවඳ මල් ආදිය මාගේ පුතණුවන් සමීපයෙන් ගෙනන ලදැ''යි කිව.

මෙසේ කියා එතැන් පටන් බමුණානන් දුන් මිළ තොමෝ ඇරගෙන ඒ ධූර්තියාගෙන්ම සුවඳ මල් ආදිය ගෙනෙන්නීය. ඒ ධූර්තියා කීපදවසක් ගියකල ගිලන් ආකාරයක් දක්වා වැදහොත්තේය. ඒ පරිචාරිකා ස්ත්‍රීතොමෝ ඔහුගේ සල්පිලට ගොස් ඒ ධූර්තියා නොදැක "මාගේ පුතණුවෝ කොයිදැ"යි විචාළේය. ගෙයි සිටි මනුෂයෝ කියන්නෝ "තොපගේ පුතණාඅවන් ඇඟට ආපාසුවෙක් බලවතැ"යි කිවුය. එබස් ඇසූ පරිචාරිකා ස්ත්‍රී ඔහු වැදහොත්තෙනට ගොස් හිඳ පිට පිරිමදින්නී "පුත, තොපට ආපාසු කවරේදැ?"යි විචාළිය. හෙතම මුවෙන් නොබැණ වැදහොත්තේය. "පුත, බැණ නොනැගෙන්ට කාරනා කිම්දැ"යි විචාළ කල්හි "මෑණියනි, මියෙතත් තොපට කියන්ට නොපිළිවනැ"යි කීය. "මට නොකියා පුත, කවුරුන්ට කියව්දැ"යි කී කල්හි "මෑණියෙනි, මට අනික් අපාසුවෙක් නැත, ඒ තරුණ මානවිකාවගේ වර්ණ සෞන්දර්‍ය්‍ය අසා පිළිබඳ සිත් ඇතිවිම්, ඒ මානවිකාව ලද්දෙම් වීනම් ජීවිතය තිබෙයි, නොලද්දේ වීනම් මෙතැන්හිම මියන්නෙම් වේදැ"යි කීහ. පරිචාරිකා ස්ත්‍රී කියන්නී "පුත, මට ඒ භාරය, තෙපි ඒ මානවිකාව නිසා සිතිවිලි නොකරව"යි කියා ඔහු අස්වසා බොහෝ සුවඳ ආදිය ගෙන මානවිකාව සමීපයට ගොස් කියන්නී "මෑණියෙනි, මාගේ පුත්‍රයා මාගෙන් තොපගේ ගුණ අසා පිළිබඳ වූ සිත් ඇතිවිය, කුමක් කටයුතුදැ"යි කිව. "ඉදින් කැඳවාගෙන එන්ට සමර්ථයෝ වීනම් අපගෙන් අමුතු කවරේදැ"යි කිය.

පරිවාරිකා ස්ත්‍රී මානවිකාවගේ බස් අසා එතැන් පටන් ඒ ගෙයි කොන් කොන් වලින් බොහෝ කස එක්කොට මල් ගෙනෙන පෙට්ටියෙ ලාගෙන යන්නී පෙට්ටිය පරීක්‍ෂා කරන වේලෙහි රැකවල් සිට ස්ත්‍රියගේ ඉසට දමන්නීය. ඒ රැකවල් සිටි ස්ත්‍රී ඇඟට කසළ දැමීමෙන් පිළිකුල්ව ඉවත් වන්නීය. ඒ පරිවාරිකා ස්ත්‍රීතොමෝ මෙම ක්‍රමයෙන් යමක් යමක්(යම් යම් තැනැත්තියක්) කිසිවක් කියා නම් ඒ ඒ ස්ත්‍රිය ඉසමත්තට කසළ දමන්නිය එතැන් පටන් පරිවාරිකා ස්ත්‍රිය යමක් ඇතුලෙන් ගෙනෙතත් පිටතින් ඇතුලට ගෙනෙතත් කිසි ස්ත්‍රියක් ඒ ගෙනෙන දෙය පරීක්‍ෂා කරන්නට උත්සාහ නොකරන්නීය.

එකල්හි ඒ ස්ත්‍රී, ධූර්තියා මල් ගෙනෙන පැස ඇතුලේ ලාගෙන මානවිකාවගේ සම්පයට ගෙන ගියාය. ධූර්තියා මානවිකාවගේ ශිල භේදයකොට එක් දවසක් ප්‍රාසාදයෙහි විසුයේය. පුරෝහිත බ්‍රාහ්මණයාගෙන් බැහැර ගිය කල්හි දෙදෙනාම අභිරමණය(සංවාසයෙහි) කෙරෙති. ඔහු ආ කල්හි ධූර්තියා සැඟවෙන්නේය. ඉක්බිත්තෙන් ඒ මානවිකාතොමෝ එක් දෙදවසක් ගියකල්හි "පුරුෂය, තොප දැන් යන්ට වටනේය"යි කිව. එබස් ඇසූ ධූර්තියා කියන්නේ "මම බමුණාන්ට පහරක් ගසා යනු කැමැත්තෙමි"යි කීය. මානවිකාතොමෝ "එසේ වීනම් වන්නාටය"යි ධූර්තියා සඟවා හිඳුවා බමුණා ගෙට ආ කල්හි මෙසේ කිව, "ස්වාමීනි, මම නුඹවහන්සේ වීණා ගායනා කරන කල්හි නටනු කැමැත්තෙමි"යි කීව, "යහපත සොඳුර නටව"යි කියා බමුණා

වීණා ගායනා කරන්ට පටන් ගත්තේය. එකල මානවිකා කියන්නී "නුඹවහන්සේ බලාහිදිද්දී නටන්නට ලජ්ජා ඇත්තේමි, එසේ හෙයින් නුඹවහන්සේගේ මූණ කඩකින්(රෙද්දකින්) වසා බැඳ නටමි"යි කිව. එබස් ඇසූ බමුණා "ඉදින් තෙපි ලජ්ජාව වීනම් එසේ කරව"යි කීය. එකෙණෙහි මානවිකා ඝන වූ වස්ත්‍රයක් ගෙන ඒ බමුණාගේ ඇස්දෙක වසා මුහුණ බැන්දීය. බමුණා මුහුණු කඩින් මුහුණ බඳවාගෙන වීණා ගායනා කරන්නට පටන්ගත. ඒ මානවිකාතොමෝ මද ඇසිල්ලකින් නටාපියා කියන්නී "ස්වාමීනි, මම නුඹවහන්සේගේ හිසට එක් විටක් ඇනපියන්නා කැමැත්තෙමි"යි කිව. ස්ත්‍රිය කෙරෙහි ලොල් වූ බමුණා කිසි කාරණයක් නොදැන "පැහැරපිය"යි කීය. එකෙණෙහි මානවිකා ධූර්තියාට ඉඟි කළාහුය. ධූර්තිතෙමේ සෙමෙන් සෙමෙන් අවුත් බමුණාගේ පිටිපස්සෙහි සිට ඉස වැලමිටෙන් ඇන්නේය. එකෙණෙහි ඇස් පිට පලා යන්නාක් මෙන් විය. හිස ගැටක් පැන නැංගේය. ඒ බමුණා වේදනාවෙන් පිඩීතව "තිගේ අත මෙසේ ගෙනෙව"යි කීය. මානවිකා තමාගේ අත ඔසවා බමුණාගේ අත මත්තෙහි තිබූය. බමුණා කියන්නේ "තීගේ අත මෙළෙක, පහර වූකලි ඉතාම තදය"යි කීය. ධූර්තියා බමුණාට ඇනපියා සැගවුණේය. මානවිකා ඔහු සැගවී ගිය කල්හි බමුණා මුහුණින් වස්ත්‍රය මුදාහෙලා තෙල් ගෙනවුත් හිස ගැට නැගිතෙන ගා මැඩ(අතුල්ලා) සන්තර්පණය(වෙදනාව සහනය) කළාය. බමුණා ගෙන් බැහැර ගිය කල්හි නැවත ඒ පරිචාරිකා ස්ත්‍රී ධූර්තියා පැස ලාගෙන පිටත් කළාය.

ඉක්බිත්තෙන් ඒ ධූර්තියා රජ්ජුරුවන් සමීපයට ගොස් ඒ සියළු පවත් කීයේය. රජ්ජුරුවෝ තමන්ට සේවයට ආවා වූ පුරෝහිත බ්‍රාහමණයා දැක "බමුණානෙනි, දු කෙළිමෝදැ"යි කිවුය. "යහපත, රජ්ජුරුවන් වහන්සැ"යි කී කල්හි රජ්ජුරුවෝ දූතශාලාව සරහා පළමු පරිද්දෙන්ම දූතගීතිකාවන් කියා පස ඇට දැමූය. බමුණා මාණවිකාවගේ තපස් බිඳී ගිය බව නොදැන "මාගේ මාණවිකාව හැර ගායනා කළ මැනවැ"යි කීය. මෙසේ කියන්නාවූන් බමුණා පරැද්දේය. එකල්හි රජ්ජුරුවෝ ධූර්තියාගෙන් තමා මාණවිකාව පවත් අසා දත්හෙයින් කියන්නෝ "බමුණ, මාණවිකාව තබන්නට(අත්හැර ගායනා කරන්ටයයි) කුමට කියයිද? තාගේ මාණවිකාවගේ තපස් බිඳී ගියේය. තෝ මාගම ගර්භයෙහි පටන් රැකගත්, තැනක රැකවල්ලා රැකගත්තෙමියි සිතුයෙහිය. ස්ත්‍රීන් නම් බඩ ඇතුලේ ලාගෙන ඇවිද්දත් රක්නට නොපිළිවන මේ ලෝකයෙහි එක් පුරුෂයෙකුම පතා පතිව්‍රතාධර්මය රක්‍ෂා කරන්නා වූ ස්ත්‍රියක් නැත. තාගේ මාණවිකාව 'නටනු කැමැත්තෙමි' කියා වීණා ගායනා කරන්නා වූ තාගේ මුහුණ වස්ත්‍රයකින් වසා බැඳ තමාගේ චෞර පුරුෂයා ලවා තාගේ හිස වැලමිටින් අන්නවා යවුය, දැන් තෝ දු කෙළිමින් හිඳ 'මාගේ ස්ත්‍රිය තබා දූතගීතිකාව ගායනා කළ මැනව'යි කුමක් පිණිස කියන්නෙහිදැ"යි මෙසේ මහබෝසතාණෝ බමුණාට ධර්මදේශනා කළෝය.

එකල්හි බමුණා බෝධිසත්වයන්ගේ ධර්මදේශනාව අසා ගෙට ගොස් ඒ මාණවිකාවට කියන්නේ "තී විසින් මෙබඳු පාප

කර්මයක් කරන ලද්දැ”යි කීය. “ස්වාමිනි, ඒ කීවෝ කවුරුද? නොකෙළම්, මම මා අතින් ඇන්නෙමි, අනික් නුඹවහන්සේගේ හිසට ඇනි කෙනෙක් නැත, ඉදින් නුඹවහන්සේ මා කීවා නොඅදහන සේක් වීනම් මම නුඹවහන්සේ ඇර අන් පුරුෂයෙකුගේ මා අත ඇල්ලීම් පමණකුත් නොදනිමියි සත්‍යක්‍රියාකොට ගිනිවැද නුඹ වහන්සේ අදහවමි”යි(විශ්වාස කරවමියි) කිව.

බමුණා එබස් අසා “එසේ වීනම් වන්නාටය”යි මහත් වූ දරගොඩක් කරවා ගිනි දල්වා ඒ ස්ත්‍රිය කැඳවා කියන්නේ “ඉදින් තමා අදහනු කැමැත්තේ වීනම් මේ ගින්නට පැනපියව”යි කීය. මානවිකාව තමාගේ පරිචාරිකා ස්ත්‍රියට උගන්වන්නී “මැණියෙනි, තොපගේ පුතණුවන් එතනට ගොස් මා ගිනි වදනා වේලෙහි අත අල්වාගන්ට කියව”යි පළමුකොට ම උගන්වා තුබූය. ඒ පරිචාරිකා ස්ත්‍රී ගොස් ධූර්තියාට එපවත් එපරිද්දෙන්ම කිව. එබස් ඇසූ ධූර්තියා අවුත් පර්ෂිත්(පිරිස) මධ්‍යයෙහි සිටියෙහිය. ඒ මානවිකා බමුණා වඤ්චා කරනු කැමතිව මහජනයා මධ්‍යයෙහි සිට කියන්නේ “බමුණානෙනි, තොප හැර අන් පුරුෂයෙකුගේ මා අත ඇල්ලීම් පමණකුත් නොදනිමියි මේ සත්‍යක්‍රියාවෙන් මේ ගිනි මා නොදව”යි කියා ගිනිවදින්ට ගත. එකෙනෙහි ධූර්තියා කියන්නේ “පින්වත්නි, පුරෝහිත බ්‍රාහමණයානන්ගේ කටයුතු දැන් බලව, මෙබඳු වූ ස්ත්‍රියක් ගිනිවැද මරවති” කියා ගොස් මානවිකාව අත අල්වා ගත්තෝය. ඕතොමෝ ධූර්තියාගේ අත අරවා පියා පුරෝහිතයාට කියන්නී “ස්වාමීනි, මා සත්‍යක්‍රියාව

බිඳිගියේය, එසේ හෙයින් මා ගිනිවදින්ට නිර්භීතව නොපිළිවනැ"යි කීව. "කවර කාරනයකින්දැ?"යි බමුණා කී කල්හි "අද මා විසින් අන් පුරුෂයකු මා අත ඇල්වීම් පමණකුත් නොදනිමියි මෙසේ සත්‍යක්‍රියා කරනලද, දැන් වූකලී මේ පුරුෂයා අවුත් මාගේ අත අල්වාගත. එසේ හෙයින් මා ගිනිවදින්ට නොපිළිවනැ"යි කීව. මෙබස් ඇසූ බමුණා "මෑ විසින් මම වඤ්චා කරන ලද්දෙමි"යි දැන ගෙන් නෙරපුයේය. එසේ හෙයින් මේ ලෝකයෙහි ස්ත්‍රීහු නම් මෙසේ වූ අධර්මයෙන් සමන්විතයෝය. කොමණ වූ පාපයක් කොටත් තමන්ගේ පුරුෂයන්ට වඤ්චා කරනු කැමතිව "මම මෙබන්දක් නොකළෙමි"යි කියා දවස මුළුල්ලෙහිත් සපථකොට ගිවිස්වන්නාහුය.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ මෙසේ "ස්ත්‍රීහු නම් රැකලිය නොහැකි සත්ව කෙනෙකැ"යි ධර්මදේශනාව ගෙනහැර දක්වා වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට වදාළසේක. චතුස්සත්‍ය ධර්මදේශනාවගේ කෙළවර උකටලී වූ භික්ෂූන් වහන්සේ සෝවාන් පෙලෙහි පිහිටිසේක. ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ පූර්වාපර සන්ධි ගලපා මේ 'අණ්ඩභූත ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 063. තක්ක ජාතකය

තවද එක් සමයෙක්හි කරුණාවට පිහිට වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසනසේක් ශාසනයෙහි උකටලී භික්ෂුවක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

සර්‍වඥයන් වහන්සේ ඒ මහණාහට වනාහී වදාරණසේක් “මහණ, තෝ උකටලී වුයෙහි සැබෑද? කිම්දැ”යි විචාරා වදාරා “ස්වාමීන් වහන්ස, සැබැව”යි දැන් වූකල්හි “ස්ත්‍රීහු නම් කළ උපකාර නොදන්නාහුය, මිත්‍රද්‍රෝහිය, කවර කාරණයකින් ඔවුන් නිසා උකටලී වූයෙහිදැ”යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහම්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහබෝසතාණන් වහන්සේ සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ගංගාතීරයෙහක්හි අසපුවක් කොටගෙන අෂ්ටසමාපත්තීන්ද පඤ්චාභිඥාවන්ද උපදවා ධ්‍යාන ක්‍රීඩා සැපයෙන්(ලබනලද ධ්‍යාන නිසා හටගත් මානසික සතුටින්) යුක්තව වාසය කරනසේක. එසමයෙහි බරණැස් සිටාණන්ගේ දූ වූ දුෂ්ට කුමාරිකාවක් ඇත්තීය. ඕතොමෝ චණ්ඩය, පරුෂය, දැසිදස් කම්කරුවන්ට අක්‍රොශ කරන්නීය, ප්‍රහාර දෙන්නීය. ඉක්බිත්තෙන් එක් දවසක් ඒ කුමාරිකාවෝ කැඳවාගෙන “ගංගාවෙහි දිය කෙළුම්හ”යි කියා ගියාහුය. ඔහුන් ජලක්‍රීඩා කරද්දීම සවස් වූයේය. වර්ෂාව පටන් ගත. මනුෂ්‍යයෝ වර්ෂාව දැක ඔබිනොබ සීඝ්‍රව දිව ගියාහුය. සිටු දුවගේ දැසිදස් කම්කරුවෝ “අද අප විසින්

මේ කුමාරිකාව පිටිදකින්ට වටනේය''යි සිතා ඒ කුමාරිකාව ජලභ්‍යන්තරයෙහිම (දියතුළම) දමා ගොඩ නැංගාහුය. වර්ෂාව වර්ෂණය කලේය.(වැසි වැස්සේය) සූර්යාද අස්තංගත වූයේය.(බැස ගියේය) අන්ධකාර වූයේය. ඔව්හු ඒ කුමාරිකාවගෙන් වෙන්ව ගෙට ගොස් ''කුමාරිකාව කොයිදැ''යි කී කල්හි ''ගංගාවෙන් පළමුව ගොඩ නැංගාය, ඉක්බිත්තෙන් ඒ කුමාරිකාව කොතැන්හි ගිය බවක් නොදනුම්හ''යි කිවාහුය. නෑයෝද පරීක්ෂාකොට නොදැක්කාහුය. මහත් වූ බැගෑපත් ශබ්දයෙන් හඬන්නා වූ ඒ කුමාරිකාතෝමෝ ජලශ්‍රොතයෙන් (සැඩදිය පහරින්) ගෙනයනු ලබන්නී මධ්‍යම රාත්‍රියෙහි බෝධිසත්‍වයන් පන්සල සමීපයට පැමිණියාය.

අප මහබෝසතාණන් වහන්සේ ඒ ස්ත්‍රියගේ ශබ්දය අසා ''මාගමකගේ ශබ්දයක් වන්නේය, මෑට පිහිට ආරක්ෂාවක් කරන්නෙමි''යි සිතා තණසුලක් ගෙන ගංතෙරට ගොස් ඒ ස්ත්‍රිය දැක ''තෝ භය නොගනුව, තෝ භය නොගනුව''යි කියා අස්වසා හස්තිබල(ඇතකුගේ ශක්තියක්) දරන්නා වූ කාය ශක්තියක් ඇති බෝසතාණන් වහන්සේ ගඟින් පීනමින් ගොස් ඒ ස්ත්‍රිය ඔසවාගෙන අසපුවට ගෙනගොස් ගිනි දල්වා දුන්සේක. සීත පහ වූ කල්හි මිහිරි වූ ඵලාඵලයෙන් ඵලවූසේක.(පිළිගැන්විය) ඒ ඵලාඵල අනුභවකොට සිටියා වූ ඒ ස්ත්‍රිය අතින් ''කොතැන්හි වාසය කරන්නීද? කෙසේ ගංගාවෙහි හුණුවාහුදැ''යි විචාළසේක. ඒ ස්ත්‍රීතොමෝ ඒ ප්‍රවෘත්තියවූ පරිද්දෙන් දැන් වූවාය. ඉක්බිත්තෙන් බෝධිසත්‍වයන් වහන්සේ ඒ ස්ත්‍රියට ''මෙතැන්හි වාසය කරව''යි

කියා පන්සලෙහි වාසය කරවා දෙතුන් දවසක් බෝධිසත්වයන් වහන්සේ අභ්‍යවකාශයෙහි(එළිමහනෙහි) වාසයකොට “දැන් තෙපි යවු”යි වදාළසේක. ඒ ස්ත්‍රීතොම සිතන්නී “මේ තපස්වීන් වහන්සේ ශීලභේදයට පමුණුවාගෙන යන්නෙමි”යි සිතා නොයන්නීය. ඉක්බිත්තෙන් කල්යත් යත් ස්ත්‍රී ගුත්තය(ගැහැණුන්ගේ මායාකාරී ක්‍රියා) ස්ත්‍රී ලීලාව(ඇස්කොණින් බැලීමාදී ස්ත්‍රී විලාස) දක්වා බෝධිසත්වයන් වහන්සේගේ ශීලභේද කරවා ධ්‍යනය අන්තර්ධාන කළාය. අප මහබෝසතාණන් වහන්සේ ඒ ස්ත්‍රිය කැඳවාගෙන ආරණ්‍යයෙහිම වාසය කළසේක. ඉක්බිත්තෙන් ඒ ස්ත්‍රීතොම අප මහබෝසතාණන් වහන්සේට කියන්නී “ස්වාමීන් වහන්ස, අපට ආරණ්‍යවාසයෙන් කාරිය කිම්ද? මනුෂ්‍ය පථයට(මිනිස් පියසට) යම්හ”යි කීවාය.

බෝධිසත්වයන් වහන්සේ ඒ ස්ත්‍රිය කැඳවාගෙන එක් පසල්ගමකට ගොස් මෝරුබැල මෙහෙයක් (අනුන්ගේ මෝරු විකුණාදී ලබාගත් කුලියක්) ලබා ජීවිකාවකොට ඒ ස්ත්‍රිය රක්‍ෂා කරනසේක. අප මහබෝසතාණන් වහන්සේ මොරු විකුණා ජීවත්වන හෙයින් ‘තක්‍ර පණ්ඩිතයෝය’යි කියා නමක් කළාහුය. එසේ වාසය කරන්නා වූ අප මහබෝසතාණන් වහන්සේට ඒ ගම් වැස්සෝ වැටුප් දී “අපට කටයුතු නොකොටයුතු කියමින් මෙහි වාසය කරව”යි කියා ගම්දෙරෙහි කුටියෙක වාසය කරවූවාහුය. එසමයෙහි චෞරයෝ(හොරු) පර්වතයෙන් බැස පසල්දනව්ව පහරන්නාහුය. ඒ සොරහු එක් දවසක් ඒ ගම පැහැර ගම්වැස්සන් ලවා බඩු

පොදි ඔසවාගෙන යන්නාහු. ඒ සිටු දුවද අල්වාගෙන තමන් වසන තෙනට ගොස් සෙසු ජනයා හැරියාහුය. සොරදෙටු (සොර නායකයා) වනාහී සිටු දියණියගේ රූපයෙහි ඇලී ඔවුන් තමහට භාර්යාව කොට ගත්තේය.

බෝධිසත්වයන් වහන්සේ "මෙ නම් ස්ත්‍රිය කොයිදැ"යි විචාළසේක. "සොරදෙටුවා විසින් අල්වාගෙන ගොස් තමාට භාර්යාව කරන ලදැ"යි අසාත් "ඒ ස්ත්‍රීතොම මාගෙන් වෙන්ව නොවසන්නීය, දිව අවුත් මා සමීපයට එන්නීය"යි සිතා ඈගේ ඊම බලමින් ගම්හි වාසය කළසේක. සිටු දූද සිතන්නේ "මෙතැන්හි සැපසේ වසන්නෙමි, කලෙක තක්‍ර පණ්ඩිතයන් වහන්සේ කිසි දෙයක් නිසා අවුත් මෙයින් කැඳවාගෙන වඩනාසේක. එසේ කල්හි මම මේ සැපයෙන් පිරියෙන්නෙමි, එසේ හෙයින් මම ඕහට ප්‍රිය කෙනෙකුමෙන් තක්‍ර පණ්ඩිතයන් කැඳවා ගෙන්වා නැසුවූයේ විනම් ඉතා යෙහැකැ"යි සිතුවාය. ඒ ස්ත්‍රීතොම එක් මනුෂ්‍යයෙකු කැඳවා "මම මෙතන දුකින් ජීවත් වන්නෙමි, තක්‍ර පණ්ඩිතයන් වහන්සේ අවුත් මා ගෙනයනසේක්ව"යි කියා හස්නක් යවුවාය.

අප මහබෝසතාණන් වහන්සේ ඒ හස්න අසා අදහා(විශ්වාසකොට) එතැන්හි ගොස් ගම්දොර සිට අස්නක් යවූසේක. ඒ ස්ත්‍රීතොම ගෙන් නික්ම අවුත් උන්වහන්සේ දැක "ස්වාමීන් වහන්ස, ඉදින් අප දෙදෙනා දැන් ගිය මෝ නම් සොරදෙටුතෙම ලුහුබැඳ එලවා අපි දෙදෙනාම නසන්නේය. රාත්‍රී භාගයෙහි යම්හ"යි කියා තක්‍ර පණ්ඩිතයාණන් වහන්සේ

කැඳවාගෙන අවුත් ආහාර අනුභව කරවා කොටුයෙහි (කාමරයෙක) හිඳුවා සවස් වේලෙහි සොරදෙටුවා අවුත් සුරා පානයකොට මත් වූ කල්හි "ස්වාමීපුරුෂය, ඉදින් මේ වේලාවෙහි තොපගේ සතුරා දුටුයේ වීනම් ඕහට කවරක් කරන්නෙහිදැ?"යි කීවාය. එතෙම "මෙනම් මෙනම් දෙයක් කරන්නෙමි"යි කීයේය. "කිමෙක්ද? ඒතෙම දුරස්ථානයෙහි (සිටින්නේ ඈත තැනක) නොවේදැ"යි කීයේය. "ඔහු කොටුයෙහි උන්නේය"යි කීවාය. ඒ වෙලෙහි සොරදෙටුතෙම හුළක්(හුළු එළියක්) ගෙන එතැන්හි ගොස් අප මහබෝසතාණන් වහන්සේ දැක අල්වාගෙන ගේ මැද හෙළා වැළමිටි ආදියෙන් අභිප්‍රාය වූ පරිද්දෙන්(කැමති පරිදි) තැළුයේය.

අප මහබෝසතාණන් වහන්සේ තැළුන් ලබනසේක් අන් කිසිවක් නොකියා "කොධනො අකතඤ්ඤුව පිසුණා මිත්ත දුභිකා"යි(ක්‍රොධ බහුල වූ, කෙළෙහි ගුණ නොදත්, කේලාම් කියන, මිතුරන් භේද කරවන) කියා මෙපමණක් වදාරණසේක. සොරදෙටුතෙම උන්වහන්සේට තළා පිටිතොලහයා බැඳ(දෑත් පසුපසට බැඳ) සයනය කරවා සවස් වේලෙහි ආහාරය අනුභවකොට සයනයකොට පිබිදුනේ රා මද සුන් කල්හි නැවතත් තලන්ට පටන් ගත්තේය. බෝධිසත්ත්වයන් වහන්සේ එම "කෝධනො අකතඤ්ඤුව" යනාදී පද සතර වදාළසේක. සොරදෙටුතෙම සිතන්නේ "මේ පුරුෂතෙම මෙසේ තලනු ලබන්නේද අන්කිසිවක් නොකියා මේ සතරපදයම කියන්නේය. මොහු අතින් විචාරන්නෙමි"යි සිතා ඒ ස්ත්‍රිය නිදිවන් බව

දැන තක්‍ර පණ්ඩිතයන් අතින් "පින්වත් පුරුෂය, තෙපි මෙසේ තාඩනය(තැලීම) ලබන්නේද කවර කාරණයකින් මේ සතරපදයම කියව්දැ"යි විචාළේය.

ඉක්බිත්තෙන් තක්‍ර පණ්ඩිතයන් වහන්සේ "එසේ වීනම් අසව"යි කියා ඒ කාරණය ආදීයෙහි පටන් (මුල පටන්) වදාළසේක. "මම පෙර වනාන්තරයෙහි වාසය කරන්නාවූ එක් තපස්වීයෙක්ව ධ්‍යානලාභීයෙක් වුයෙමි. ඒ මම මේ ස්ත්‍රිය ගංගාවෙහි ජලශ්‍රොතසින් ගෙන යනවා දැක ගොඩනගා ප්‍රතිජග්ගනය(ආවතේව) කෙළෙමි. එසේ ප්‍රතිජග්ගනය කළා වූ මා මේ ස්ත්‍රී පොළඹා ධ්‍යානයෙන් පිරිහෙළුවාය. ඒ මම ආරණ්‍යය හැර මේ ස්ත්‍රිය පෝෂ්‍ය කෙරෙමින් පසල්ගමෙක වාසය කෙළෙමි. ඉක්බිත්තෙන් මේ ස්ත්‍රිය සොරුන් විසින් මෙතැන්හි ගෙන එන ලද්දී 'මම දුකින් වාසය කරන්නෙමි, අවුත් මා කැඳවාගෙන යව'යි කියා මට හසුන් යවා දැන් තොපගේ අතට පැමිණ වුවාය, මේ කාරණයෙන් මම මෙසේ කීවෙමි"යි වදාළසේක.

චෞරතෙම සිතනුයේ "යම් බඳු වූ මේ ස්ත්‍රීතොම මෙබඳු ගුණයෙන් යුක්තව උපකාර කළවුන් කෙරෙහි මෙසේ විපිලිපන් බවට(සතුරු බවට) පැමිණීයාය. මෝතොම මට කවර නම් උපද්‍රවයක් නොකරන්නීද? මෝතොමෝ හැරිය යුතුය"යි කියා සිතූයේය. සොරදෙටුතෙම තක්‍ර පණ්ඩිතයන් අස්වසා ඒ ස්ත්‍රිය ප්‍රබෝධ කරවා(නින්දෙන් පුබුදුවා) කඩුව ගෙන නික්ම "මේ පුරුෂයා ගම්දෙරහිදී ඝාතනය කරන්නෙමි"යි කියා ඒ ස්ත්‍රිය

හා සමග ගමින් පිටතට ගොස් "මොහුගේ අත අල්වාගනුව"යි කියා බෝධිසත්‍වයන් වහන්සේ අල්වා ග්‍රහණය කරවා කඩුව ගෙන තක්‍ර පණ්ඩිතයන්ට ප්‍රහාර දෙන්නාක් මෙන්ම ඒ ස්ත්‍රිය දෙකඩක්කොට සිඳ දමා ශීර්ෂස්නායකොට(හිසේ දිය නා) තර්ක පණ්ඩිතයන් කීපදවසක් ප්‍රණීතාහාරයෙන් සන්තර්පණය කරවා(සංග්‍රහ කරවා) "දැන් කොතැන්හි වඩනාසේක්දැ"යි කීයේය. තර්ක පණ්ඩිතයන් වහන්සේ "ගිහිගෙන් මට ප්‍රයෝජනයක් නැත, ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ඒ ආරණ්‍යයෙහිම වසන්නෙමි"යි කීසේක. එසේ වීනම් "මමත් පැවිදි වන්නෙමි"යි කියා දෙදෙනම පැවිදිව ආරණ්‍ය ප්‍රදේශයට ගොස් පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා ජීවිතාවසානයෙහි බ්‍රහ්මලෝකයෙහි උපන්නාහුය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ අතීත වර්තමාන කථාවස්තු දෙක වදාරා පූර්වාපරසන්ධි ගළපා වදාළසේක. "මහණ, මේ ස්ත්‍රීහු නම් ක්‍රොධියහ, උපන් ක්‍රොධ වළකාගන්නට නොපොහොසත්ය, කෘතඥයෝද නොවෙති, කරනලද ඉතා මහත් උපකාරයකුදු නොදනිති, ප්‍රියසුන්‍ය(අප්‍රිය) කථා කෙරෙති, මිත්‍රයන් බිඳුවන්ට සුදුසු කථා කිරීම ස්වභාවකොට ඇත්තාහ. එසේ හෙයින් මෛථුනවිරති සංඛ්‍යාත බ්‍රහ්ම චරියාවෙහි(මෙවුන්දම් සෙවීමෙන් වෙන්වීම නම් වූ උතුම් හැසිරීමෙහි) හැසිරෙව, එසේ හැසිරෙන්නා වූ තොපි ධ්‍යාන සැපය, මාර්ග සැපය, ඵල සැපය යන ත්‍රිවිධ සැපයෙන් නොපිරිහෙන්නාහුය"යි වදාරා ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ දම්දෙසුම ගෙනහැර දක්වා වදාරා චතුස්සත්‍යය

ප්‍රකාශකොට වදාළසේක. චතුස්සත්‍යය දේශනාවගේ අවසානයෙහි උකටලී වූ මහණතෙම සෝවාන් ඵලයෙහි පිහිටියේය. ශාස්තෘ වූ බුදුරජාණන්වහන්සේ මේ ‘තර්ක ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි සොරදෙටුතෙම දැන් ආනන්ද ස්ථවිර වූසේක. තර්ක පණ්ඩිතව උපන්නෙම් වනාහී තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 064. දුරාජාන ජාතකය

තවද එක් සමයෙක්හි තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසනසේක් උපාසකයක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

සැවැත්නුවර වාසය කරන්නා වූ එක් උපාසකයෙක් වනාහී තිසරණයෙහි හා පඤ්ච ශීලයෙහිද පිහිටියේය. බුදුන් කෙරෙහි මමත්වය(මගේමය යන හැඟීම) කරන්නේ. ධර්මය කෙරෙහි මමත්වය කරන්නේය. සංඝයා කෙරෙහි මමත්වය කරන්නේය. ඔහුගේ භාර්යාව වනාහී දුස්සීලය, පාපකර්මයෙහි හැසිරෙන්නීය. යම් දවසෙක මිථ්‍යාචාරයෙහි(අනාචාරයෙහි) හැසුරුනාද, එදවස් සියයක් වස්තු දී ගත් දාසියක මෙන්(යටහත් පහත් ගති ඇති දිසියක් මෙන්) වන්නීය. මිථ්‍යාචාරය නොකළාවූ දිනයෙහි වනාහී ස්වාමිදුවක් මෙන් වන්නීය. චණ්ඩය, පරුෂය, ඒ උපාසකතෙම ඒ ස්ත්‍රියගේ ස්වභාව දැනගන්ට නොහැකි වන්නේය. ඉක්බිත්තෙන් ඒ ස්ත්‍රී

විසින් පෙළන ලද්දේ(හිරිහැර කරන ලදුව) බුදුන්ට උපස්ථානයට නොයන්නේය. ඉක්බිත්තෙන් එක් දවසක් සුවඳමල් ආදිය ගෙනවුත් නමස්කාරකොට එකත්පසව උන්නා වූ උපාසකයාහට සර්වඥයන් වහන්සේ වදාරණසේක් "උපාසකය, තෙපි කවර කාරණයකින් සත්අට දවසක් බුද්ධ උපස්ථානයට නොආවාහුදැ"යි වදාළසේක.

"ස්වාමීන් වහන්ස, මාගේ ස්ත්‍රීතොමෝ එක් දවසක සියයක් වස්තු දී ගත් දාසියක් මෙන් වන්නීය. එක් දිනයක ස්වාමිදුවක් මෙන් වන්නීය. චණ්ඩය, පරුෂය, මම ස්ත්‍රියගේ ස්වභාවය දැනගන්ට නොහැකි වන්නෙමි. මම ඒ ස්ත්‍රිය විසින් පීඩාවට පැමිණියෙමි සර්වඥයන් උපස්ථානයට නොආයෙමි"යි දැන්වූයේය. ඉක්බිත්තෙන් ඒ උපාසකයාගේ වචනය අසා සර්වඥයන් වහන්සේ වදාරණසේක් "උපාසකය, මාගමුන්ගේ (සත්‍රීන්ගේ) ස්වභාවය නම් දැනගත නොහැක්කේය"යි වදාරා "පූර්වකාලයෙහිද නුවණැත්තෝ තොපට ස්ත්‍රීන්ගේ ස්වභාවය ප්‍රකාශ කළාහුය. තෙපි වනාහී ඒ කාරණාව භවයෙන් වැසී තිබෙන හෙයින් සලකා ගන්ට නොහැකිවූවාහුය"යි වදාරා ඒ උපාසකයා විසින් ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහබෝසතාණන් වහන්සේ දිසාපාමොක් ආචාර්ය පන්සියයක් පමණ මානවකයන්ට ශිල්ප උගන්වන්නාහුය. එකල අන්‍ය රාජ්‍යවාසී

වූ එක් බ්‍රාහ්මණ මානවකයෙක් අවුත් බෝධිසත්ත්වයන් ස්වමීපයෙහි ශිල්ප උගන්නේය. එක් ස්ත්‍රියක් කෙරේ පිළිබඳ සිත් ඇතිව(ආදර හැඟීම් ඇතිව) ඈ භාර්යාවකොට එම බරණැස් නුවර වසන්නේ දෙතුන් වේලක් ආචාරීන්ට උපස්ථානයට නොගියෝය. ඔහුගේ භාර්යාතොමෝ දුස්සීලය, පවිටු වූ ස්වභාව ඇත්තේය, මිථ්‍යාචාර කළා වූ දිනයෙහි දැසියක් මෙන් වන්නීය, නොකළ දිනයෙහි ස්වාමිදුවක් මෙන් වන්නීය. චණ්ඩය, පරුෂය, ඒ බ්‍රහ්මණ මානවකයා ඇගේ අභිප්‍රාය(ස්වභාවය) දැනගත නොහෙනා තැනැත්තේ ඈ විසින් පීඩිත වූ වියවුල් සිත් ඇත්තේ ආචාරීන්ට උපස්ථානයට නොයන්නේය.

ඉක්බිත්තෙන් සත්අට දවසක් ඉකුත්කොට ආවා හූ මානවකයා දැක "මානවකය, මෙතෙක් දවස් තොප නුදුටුයේ කුමක් නිසාදැ"යි ආචාර්යතෙම විචාළේය. එබස් ඇසූ මානවකයා කියන්නේ "ආචාරීන් වහන්ස, මාගේ භාර්යාතොමෝ මාම කැමති වන්නීය, එක් දවසක් දැසියක් මෙන් නිහතමානී වන්නීය, එක් දවසක් ස්වාමිදුවක් මෙන් තදය, රුක්‍ෂය(පරුෂය), මම ඇගේ අභිප්‍රාය දැනගත නොහෙමි, ඈ විසින් පීඩිතව වියවුල් සිත් ඇත්තෙමි නුඹවහන්සේට උපස්ථානයට නොආයෙමි"යි කීය.

එකල ආචාරීහු කියන්නේ "මානවකය, එසේමය, ස්ත්‍රීහූ නම් අනාචාරයෙහි හැසිරුනු දවස් පුරුෂයා අනුව පවතිත්, දැසියක් මෙන් නිහතමානී වෙති, අනාචාරයෙහි නොහැසිරුනු දවස්

මෙන් ඇතිව (මාන්නයෙන් යුක්තව) වල්ලභයා(සැමියා) කිසිවෙකු කොටත් නොසිතති. මෙසේ මේ ස්ත්‍රීහු නම් පරුෂයහ, දුස්සීලයහ, ඔවුන්ගේ ස්වභාව දැනගත නොහැක්කේය, උන් කැමති කල්හිත් මධ්‍යස්ථව විසිය යුතුය''යි කියා ඒ මානවකයාට මෙසේ අවවාද කළාහුය.

"එම්බල මානවකය, මේ ස්ත්‍රී මා කැමති වන්නීය, පතන්නීය, මා කෙරෙහි සෙනහ කරන්නීයයි සතුටු නොව, මෝතොමෝ මා නොකැමති වන්නීයයි සෙනෙහ නොකරන්නීයයි කියා ශෝක නොකරව, කැමති කල්හි සතුටක්වත් නොකමැති කල්හි ශෝකයක්වත් නොකොට මධ්‍යස්තවම වාසය කරව. ස්ත්‍රීන්ගේ අභිප්‍රාය නම් ස්ත්‍රී මායාවෙන් සැඟවුනු හෙයින් නොදත හැක්කේය. ඊට කාරණා කවරේද? යත්, යම් සේ මත්ස්‍යයා ගමනාදියෙන් සැඟවුනු බැවින් (දියයට ඔබ මොබ සැඟවී පිහිනායාමාදිය නිසා) නොදත හැක්කේ වේද, එසේ හෙයින්ම ඒ මතස්‍යයා කෙවුලන්(ධීවරයන්) තමා අම්මනට(අල්වාගන්ට) ආ කල්හි දියෙන් තමාගේ ගමන සඟවාලා යේද, තමා අල්වාගත නොදේද, එපරිද්දෙන් ස්ත්‍රීහු නම් මහත් වූ දුස්සීල කර්මකොට "අපි මෙබන්දක් නොකළම්හ''යි තමන් කළා වූ කාරිය ස්ත්‍රී මායාවෙන් සඟවා පුරුෂයන් වඤ්චා කෙරෙති. එසේ හෙයින් මේ ස්ත්‍රීහු නම් පාපකර්මයහ, දුරාචාරයහ. එසේ වූ ස්ත්‍රීන් කෙරෙහි මධ්‍යස්තව වසන්නා වූ සත්වතෙමේ සුවපත් වන්නේය''යි මෙසේ මහබෝසතාණෝ අන්තේවාසිකයාට(අතවැසියාට) අවවාද කළාහුය.

එතැන් පටන් අන්තේවාසිකයා ඒ ස්ත්‍රිය ද කෙරෙහි මධ්‍යස්ථ විය. ඔහුගේ භාර්යාවත් “ආචාරීන් විසින් මාගේ දුස්සීලභාවයද දන්නා ලද්දේය”යි එතැන් පටන් අනාචාරයක් නොකළාහ. ඒ උපසාකයාගේ ස්ත්‍රීන් “බුදුරජාණන් වහන්සේ විසින් මාගේ දුරාචාර බව දැනගන්නා ලද්දේය”යි එතැන් පටන් පාපකර්ම නොකළාය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා චතුරාර්‍ය්‍යසත්‍යය ප්‍රකාශකොට වදාළසේක. චතුස්සත්‍ය ධර්මදේශනාවගේ කෙළවර උපාසකයා සෝවාන් පෙළෙහි පිහිටියේය. සර්‍වඥයන් වහන්සේ පූර්‍වාපරසන්ධි ගළපා මේ ‘දුරාජාන ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි ස්ත්‍රී පුරුෂයෝ දෙදෙනා නම් දැන් ස්ත්‍රී පුරුෂයෝ දෙදෙනාය. දිසාපාමොක් ආචාරී වූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 065. අනභිරති ජාතකය

තවද එක් සමයෙක්හි අප්‍රතිපුද්ගල වූ(අසමසම වූ) තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසනසේක් එබඳු වූ ම එක් උපාසකයෙක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ උපාසකයා වනාහී පරීක්‍ෂා කරන්නේ ඒ තමාගේ ස්ත්‍රිය දුස්සීල නියාව දැන කලහ කරන ලද්දේ වියවුල් සිත් ඇති

බැවින් සත්අට දවසක් සර්‍වඥයන් වහන්සේට උපස්ථානයට නොගියේය. ඒ තෙම එක් දවසක් විහාරයට ගොස් සර්‍වඥයන් වහන්සේට නමස්කාරකොට උන්නේය. "උපාසකය සත්අට දවසක් මුළුල්ලෙහි කුමක් නිසා නොආයෙහිදැ"යි විචාළ කල්හි "ස්වාමීනි, මාගේ භාර්යාතොමෝ දුස්සීලය, පාපධර්‍මීය, එසේ හෙයින් මම ඈ හා කලහකොට වියවුල් සිත් ඇති බැවින් නොආයෙමි"යි කීය.

එබස් අසා සර්‍වඥයන් වහන්සේ ඕහට වදාරණසේක් "උපාසකය, ස්ත්‍රීන් අනාචාර කළකල්හි ඔවුන් කෙරෙහි කෝපයක් නොකොට මධ්‍යස්ථ විය යුත්තේ යයි පෙරත් තට නුවණැත්තෝ කීවාහුය. තෝ වූකලි භවයෙන් සැඟවුනු බැවින් ඒ කාරණය සලකාගත නුහුනුයෙහි වේදැ"යි වදරා උපාසකයා විසින් ආරාධිත වූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහබෝසතාණන් වහන්සේ පළමු පරිද්දෙන් දිසාපාමොක් ආචාර්‍ය වූවාහුය. ඉක්බිත්තෙන් ඒ දිසාපාමොක් ආර්‍යගේ අන්තේවාසිකයා භාර්‍ය්‍යාවගේ දෝෂයක් දැක ව්‍යාකූල වූ සිත් ඇති බැවින් කීපදවසක් නොඅවුත් එක් දවසක් ආචාර්‍යන් විසින් විචාරණ ලද්දේ ඒ කාරණය කීයේය. එකල ආචාර්‍ය ඕහට කියන්නේ "දරුව, ස්ත්‍රීහු නම් සර්‍වසාධාරණයෝය(සියල්ලන්ටම පොදුය), දුස්සීලයෝය, එසේ වූ සත්‍රීන් කෙරෙහි නුවණැත්තෝ කෝප නොකරන්නාහුය"යි කියා මහබෝසතාණෝ අවවාද කරන්නාහු

මෙසේ කිවුය. “එම්බල මානවකය, යම් සේ නොයෙක් තොට ඇති ගංගාව ජලස්නානය කරන පිණිස පැමිණියා වූ චණ්ඩාලාදීන්ටත් ක්‍ෂත්‍රියාදීන්ටත්(රජවරුන්ටත්) සාධාරණම වේද, එහි නොනාන කෙනෙක් නැද්ද, යම් සේ මහවත(මහපාර) යන එන්නා වූ හීනොත්කෘෂ්ට වූ(උසස් පහත්) සියළු සත්වයන්ට සාධාරණ වේද, ඒ මගින් නොයන කෙනෙක් නැද්ද, යම් සේ සුරාපාන මණ්ඩලය(රා බොන තැන) සියල්ලවුන්ට සාධාරණ වේද, යමෙක් යමෙක් සුරාපානා මණ්ඩලයට වදනා කැමැත්තේ වීනම් ඒ ඒ සියළු සත්වතෙමේ වදනේම වේද, එතැන්හිම මනුෂ්‍යයන්ගේ විසීම කරනලද සභාශාලාදියත් සියළු සත්වයන්ට සාධාරණම වේද, ඒ ශාලා ආදියට නොවදින්ට නිසි එකෙක් නම් නැද්ද, මහමාවත පින්පැන්සලවල් තබා කරනලද පින්පැන් මඩුවත් සියල්ලවුන්ට සාධාරණ වේද, එහි පැන් නොබොන එකෙක් නැද්ද, එපරිද්දෙන්ම දරුව මානවකය, මේ ලෝකයෙහි ස්ත්‍රීහුත් සියළු හීනොත්කෘෂ්ට සත්වයන්ට සාධාරණයෝය. එසේ හෙයින් නුවණැත්තෝ ‘මේ ස්ත්‍රීහු නම් ලාමකයෝය, අනාචාරයෝය, දුස්සීලයෝය, සර්‍වසාධාරණයෝය’යි සිතා තමන් බලවත් වූ බුද්ධිසම්පන්න බැවින් නොකිපෙන්නාහුය”යි මෙසේ මහබෝසතාණෝ අන්තේවාසිකයාට අවවාද කළාහුය.

අන්තේවාසිකයා බෝධිසත්වයන් කී අවවාද අසා මධ්‍යස්ථ පැවැත්තේය. ඔහුගේ භාර්යාවත් “ආචාරීන් විසින් මාගේ නුගුණ දැනපියනලදැ”යි එතැන් පටන් පාපකර්‍මයක් නොකළාය. වර්තමාන කාලයෙහි උපසාකයාගේ භාර්‍ය්‍යාතොමෝ

"බුදුරජාණන් වහන්සේ විසින් මාගේ කාරිය දැනපියන ලද්දේය"යි එතැන් පටන් පාපකර්ම නොකළාය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා චතුරාර්ය්‍යසත්‍යය ප්‍රකාශකොට වදාළසේක. චතුස්සත්‍ය ධර්මදේශනාවගේ කෙළවර උපාසකයා සෝවාන් පෙළෙහි පිහිටියේය. සර්වඥයන් වහන්සේ පූර්වාපරසන්ධි ගළපා මේ 'අනභිරති ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි ස්ත්‍රී පුරුෂයෝ දෙදෙන නම් දැන් ස්ත්‍රී පුරුෂයෝ දෙදෙනමය. දිසාපාමොක් ආචාර්ය වූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 066. මුදුලක්ඛණ ජාතකය

තවද එක් සමයෙක්හි ලෝකොත්තම වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසනසේක් සංක්ලෙශයක්(සිතේ කිලුටක්) අරභයා මේ ජාතකය වදාළසේක.

සැවැත් නුවරවාසී වූ එක් කුලපුත්‍රයෙක් සර්වඥයන් වහන්සේගෙන් ධර්මදේශනාව අසා පැහැද ශාසනයෙහි මහණව සියළු ප්‍රතිපත්තියෙහි පිළිපදින්නේය(පිළිවෙත් පුරන්නේය). ඒ යෝගාවචරයන් (භාවනාවෙහි යෙදී සිටින) වහන්සේ ඇම වේලෙහි සිතින් නොහරිනලද කමටහන් ඇතිව(භාවනා අරමුණෙන් යුක්තව) එක් දවසක් සැවැත් නුවර පිඬුසිගා ඇවිදනසේක් සර්වාභරණයෙන් සැරහුනා වූ ස්ත්‍රියක් දැක සුභ

වශයෙන්(ඉතා යහපත් ලෙස) ඉන්ද්‍රියයන් බිඳ(ඇස අසංවරකොට) බැලූ සේක. ඒ භික්ෂූන් වහන්සේගේ අභ්‍යන්තරයෙහි(සිතෙහි) ක්ලේශයෝ චලිතවූහ(රාග නැමති කෙලෙස් උපන්නේය). වෑයෙන් කොටනලද කිරි ගසක් මෙන් විය(තුවාල වූ කිරි ගසෙන් කිරි නොනවත්වා ගලනා මෙන් නොනැවතීම රාගය උපන්නේය). භික්ෂූන් වහන්සේ එතැන් පටන් කෙලෙස් වසඟව(කෙලෙසුන්ට යටත්වී) කායාසවාදයක් වත් චිත්තාස්වාදයක් වත්(කයේ හෝ සිතේ සැනසීමක්) නොලබනසේක් භයපත්ව වෙවුලන්නා වූ මුවෙකු හා සමානසේක. ශාසනෙහි ඇළුම් නැති බැවින් දික්ව ගියා වූ කෙසේ ලොම් නිය හා කිලිටු වූ සිවුරු ඇතිසේක.

ඉක්බිත්තෙන් ඒ භික්ෂූන් වහන්සේගේ ඉන්ද්‍රිය විකාර(ඉඳුරන් වෙනස්වීම) දැක සහාය භික්ෂූන් වහන්සේ කියනසේක් "ඇවැත්නි, තොපගේ චක්‍ෂුරාදී ඉන්ද්‍රියෝ පෙර සේ නොවෙති. ඊට කාරණා කවරේදැ?"යි විචාළසේක. "ඇවැත්නි, ශාසනයෙහි ඇලුම් නැතිවීමි"යි කීසේක. එබස් ඇසූ සහය භික්ෂූන් වහන්සේ බුදුන් සමීපයට කැඳවාගෙන ගියසේක. සර්‍වඥයන් වහන්සේ "මහණෙනි, මේ භික්ෂූහු නොකමැති පරිද්දෙන් කුමක් පිණිස කැඳවාගෙන අවුදැ"යි විචාළසේක. "ස්වාමීනි, මේ මහණ ශාසනයෙහි ඇලුම් නැත්තේය"යි දැන් වූසේක. "සැබෑද? මහණ"යි විචාළ කල්හි "සැබව ස්වාමීනි"යි දැන් වූසේක. " තා උකටලී කරවූවෝ කවුරුදැ"යි විචාළ කල්හි "ස්වාමීනි, මම පිඬුසිඟා ඇවිදින්නේනම් එක් ස්ත්‍රියක ඉඳුරන් බිඳ බැලීමි. එකල මට ක්ලේශයෝ චලිතවූහ. ඒ

ක්ලේශයන්ගෙන් චලිතවීමෙන් ශාසනයෙහි ඇළුම් නැතිවීමි''යි දැන් වූසේක.

ඉක්බිත්තෙන් සර්වඥයන් වහන්සේ ඒ භික්ෂූහට වදාරණසේක් "මහණ, තෝ ඉන්ද්‍රියන් විෂභාගාලම්බනය(රාගය ඉපදීමට හේතුවන අශුභ අරමුණ) ශුභ වශයෙන් ලබන්නෙහි ක්ලේශයන් විසින් කම්පා කරන ලද්දෙහිය යන යමෙක් ඇත්නම් ඒ තෙමේ ආශ්චර්ය නොවන්නේය. පෙර පඤ්චාභිඥා අෂ්ටසමාපත්තිලාභීව ධ්‍යාන බලයෙන් ක්ලේශයන් විෂ්කම්භණනයකොට (ධ්‍යාන බලයෙන් කෙලෙස් ඔබා තද කිරීමෙන් යටපත්කොට) පිරිසිදු වූ නිර්මල වූ සිත් ඇතිව ආකාශයෙන් යන්නා වූ බෝධිසත්වයෝ පවා ඉන්ද්‍රියයන් බිඳ විෂභාගාලම්බන බැල්මෙන් ධ්‍යනයෙන් පිරිහී ක්ලේශයෙන් කම්පිතව මහදුක් අනුභව කළාහුය, මහමෙර උපුටා එලන්ට නිසි වූ මාරුතය(සුළඟ) ඇතෙකු සා ඇති ක්ෂුද්‍ර(කුඩා) පර්වතයෙක්හි පැකිළි යේද?(හැප්පී නතර වේද?) සියයක් යොදුන් උස ඇති මහදඹ ගස මුලින් උදුරන්ට නිසි වූ මාරුතය ඉවුරු බුන් ගංතෙර(කැඩිබිඳී ගිය ගං ඉවුර අසල) හටගත් ක්ෂුද්‍ර වෘක්ෂයෙක පැකිළී යේද? මහසමුද්‍රය වියලා පියන්ට(වේලා දැමීමට) සමර්ථ වූ මාරුතයකුදු වැගොන්නක (කුඩා ජලාශයක) දිය වියලා නොපියාද? එසේ හෙයින් මෙසේ වූ බුද්ධි ඇති පිරිසිදු චිත්තසන්තාන ඇති(අදහස් ඇති) බෝධිසත්වයන් අඥාන(මුළා) කරවන්නා වූ ක්ලේශයෝ තා කෙරෙහි කුමක් පිණිස ලජ්ජා වෙද්ද? පිරිසිදු සත්වයොත් ක්ලේශයන් නිසා කිලුටුව යෙති. උත්තම වූ යසසින් යුක්ත වූ

සත්ත්වයෝ අයසෙට පැමිණෙතී"යි වදරා ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි අප මහබෝසතාණෝ කසීරට එක් මහසම්පත් ඇති බ්‍රහමණ කුලයක ඉපිද විඤ්ඤුබවට(නුවණැති බවට) පැමිණි තැනැත්තෝ සියළු සිල්පයෙහි පරතෙරට පැමිණ පඤ්චකාමය හැර ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන්(තවුස් පැවිදි ක්‍රමයට) පැවිදිව කිසුණු පිරියම්කොට(කිසිණ භාවනාකොට) පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා ධ්‍යාන සැපයෙන් දවස් යවමින් හිමාලය වන ප්‍රදේශයෙහි වාසය කරන්නාහුය. ඒ බෝධිසත්වයෝ එක් කලෙක ලුනු ඇඹුල් සෙවුනා සඳහා හිමාලය වනයෙන් බැස බරණැස් නුවරට පැමිණ රාජෝද්‍යානයෙහි වැස දෙවැනි දවස් සිරුරු පිළිදැග(වැසිකිළි කෙසකිළියාම මුවසේදීමාදී කටයුතු නිමවා) රත් වූ වැහැරි සිවුරුමය වූ අඳනය, පොරෝනය දෙක(ගස්පට්ටා ආදියෙන් වියනලද අතු පැහැයෙන් යුත් සිවුරු දෙකක් වූ අඳනය හා පොරවන සිවුර) මානකොට හැඳපෙරව අඳුන් දිවිසම් ඒකාංශකොට බහා (කලු දිවි හමක් එක් උරයක් වැසෙන සේ ලාගෙන) දළ මඩුලු බැඳ(හිසකෙස් රවුම්කර තලප්පාවක් බැඳ) කෙණ්ඩියක් ගෙන බරණැස් නුවර පිඬුසිගමින් රජ්පුරුවන්ගේ මාලිගා දෙරකඩට පැමිණියෝය. රජ්පුරුවෝ ඒ තපස්වීන්ගේ ඊර්‍යාපථයෙහි(ඉරියව් පැවැත්වීමෙහි) පැහැද සමීපයට ගෙන්වාගෙන මහානර්ඝ වූ ඛද්‍යභෝජ්‍යයෙන්(මිහිරි ආහාරපානවලින්) පිණවා කරනලද

අනුමෝදනා ඇති (අනුමෝදනා බණ දෙසූ) බෝධිසත්ත්වයන් රාජෝද්‍යානයෙහි වසනු පිණිස ආරාධනා කළෝය. ඒ බෝධිසත්ත්වයෝ ආරාධනා පිළිගෙන රජගෙයිදී වළඳ රාජකුලයට ආවවාද කෙරෙමින් උද්‍යානයෙහි සොළොස් හවුරුද්දක් විසුවාය.

ඉක්බිත්තෙන් එක් දවසක් රජ්ජුරුවෝ ක්ෂොභ වූ ප්‍රත්‍යන්ත ජනපදයක් (පිටිසර ප්‍රාන්ත රාජ්‍යයක වූ කැරැල්ලක්) සන්හිඳුවනු පිණිස යන තැනැත්තෝ මුදුලක්ඛණ නම් වූ අගමෙහෙසිකාවන්ට “මාගේ තපස්වීන් වහන්සේට අප්‍රමාදව උපස්ථාන කරව”යි කියා ගියෝය. මහබෝසතාණෝ රජ්ජුරුවන් ගියතැන් පටන් තමන් කැමති විටක රජගෙට යෙති. ඉක්බිත්තෙන් එක් දවසක් මුදුලක්ඛණාවෝ බෝධිසත්ත්වයන්ට ආහාර පිස සමුර්ධකොට ලා(පිළියෙළ කර) “අද තපස්වියන් වහන්සේ කල් යවා(පමාවී) එන සේකැ”යි සුවඳ පැනින් නහා සියළු බිසෝ පළඳනාවෙන් සැරහී මතුමහල්තලයෙහි කුරුයහනක් පණවා(මිටි ඇඳක් පිළියෙළකොට) බෝධිසත්ත්වයන්ගේ ඊම බල බලා වැදහොත්තාහුය.

බෝධිසත්ත්වයෝත් එතනට වළඳන්නට වේලාව සලකා ධ්‍යානයෙන් නැගී ආකාශයෙන්ම රජගෙට ගියෝය. මුදුලක්ඛණාවෝ බෝධිසත්ත්වයන්ගේ වැහැරි සිවුරේ පවන් ගන්නා අඬ(සුළඟ වැදෙන ශබ්දය) අසාම “තපස්වීන් වහන්සේ වැඩිසේක් වනැ”යි වැදහොත් තැනින් වහා නැගී සිටියාහුය.

වේගයෙන් නැගිසිටියා වූ ඒ බිසවුන්ගේ මටසිළුටු වූ සළුව වැටී ගියේය. තාපසයෝ සිව්මැදුරු කවුළුවෙන් වදනා තැනැත්තෝ බිසවුන්ගේ විෂභාග රූපාලම්බනය (රාගය ඉපදීමට හේතු වූ රූපය) ඉඳුරන් බිඳ සුභවශයෙන් බැලූය. එකල බෝධිසත්ත්වයන්ගේ අභ්‍යන්තරයෙහි ක්ලේශයෝ චලිතවූහ. කිරි ඇති ගසකට කෙටුවාක් මෙන් විය. එකෙණෙහිම බෝධිසත්ත්වයන්ගේ ධ්‍යානය අන්තර්ධාන විය. පියාබුන්(තටු කැඩුණු) කපුටුවෙකු මෙන් විය. බෝධිසත්ත්වයෝ සිටම ආහාර පිළිගෙන නොවළඳම් ක්ලේශයෙන් කම්පිතව ප්‍රාසාදයෙන් බැස උයනට ගොස් පන්සලට වැද පෝරුමැස්ස(ලෑලි අතිරූ ඇඳ) යට ආහාරය තබා විෂභාගාලම්බනයෙහි බැඳී කෙලෙස් ගින්නෙන් දැවෙමින් නිරාහාර බැවින් වියලෙන්නාහු සත්දවසක් මුළුල්ලෙහි පොරුමැස්සෙහි වැදහොත්තාහුය. සත්වෙනි දවස රජ්ජුරුවෝ පසල්දනව්ව ජයගෙන අවුත් නුවර පැදකුණුකොට මාලිගාවට නොගොස්ම "තපස්වීන් වහන්සේ දකිම්හ"යි උයනට ගොස් පන්සලට වැද තපස්වින් වැදහොත් තැන් දැක "එක් අපාසුවෙක් වනැ"යි පන්සල කසළ හරවා(පන්සල පිරිසිදු කර) පය මඬිමින්(තවුසානන්ගේ පය මිරිකමින්) හිඳ "ස්වාමීනි, අපාසුව කිමෙක්දැ"යි විචාළෝය.

එබස් ඇසූ බෝධිසත්ත්වයන් වහන්සේ කියනසේක් "මහරජ්ජුරුවෙනි, මට අනික් ආඵාසුවෙක් නැත, ක්ලේශ වසඟයෙන් පිළිබඳ සිත් ඇතිව්මි"යි කිවුය. "ආර්‍යයන් වහන්ස, නුඹවහන්සේගේ සිත කවුරුන් කෙරෙහි පිළිබඳ වීදැ"යි විචාළෝය. "මහරජ්ජුරුවෙනි, මුදුලක්ඛණාවන් කෙරෙහි පිළිබඳ

වීය''යි කිවුය. රජ්ජුරුවෝ "යහපත, ස්වාමීනි, මම මුදුලක්ඛණාවෙන් නුඹවහන්සේට දෙමි''යි කියා තාපසයන් කැඳවාගෙන මාලිගාවට වැද බිසවුන් සර්වාභාරණයෙන් සරහා තපස්වීන්ට පාවාදුන්නුය. දෙමින් සිට රජ්ජුරුවෝ මුදුලක්ඛණාවන්ට කියන්නෝ "තොප විසින් තොපගේ බලයෙන් මේ තපස්වීන් රැකපිය යුතුය''යි කිවුය. "යහපත, ස්වාමීනි, තපස්වීන් රැකපියම්හ''යි ගිවිස්සෝය. තාපසයෝ බිසවුන් ඇරගෙන මාලිගාවෙන් බටුවාහුය. ඉක්බිත්තෙන් මුදුලක්ඛණාවෝ මහවාසල් දොරින් නික්මුණු වේලෙහිම තපස්වීන්ට කියන්නෝ "ස්වාමීනි, අපට එක් ගෙයක් ලද මැනව, එසේ හෙයින් නුඹවහන්සේ ගොස් රජ්ජුරුවන් වහන්සේගෙන් ගෙයක් ඉල්වාගත මැනවැ''යි කිවුය. තාපසයෝ එබස් අසා ගොස් රජ්ජුරුවන් අතින් ගෙයක් ඉල්លූය. රජ්ජුරුවෝ මනුෂ්‍යයන් ශාරීරකෘත්‍යය සපයන(මලමුත්‍රා කරන) වැසිකිළියක් හා සමාන වූ එක් ගෙයක් දෙවුය. තාපසයෝ බිසවුන් කැඳවාගෙන ගෙට ගියෝය. බිසව ගෙට වදින්ට මැලිව සිටියාහුය. "කවර කාරණයකින් ගෙට වදින්නට මැලිදැ?''යි කී කල්හි "අපවිත්‍ර බැවින් වදිනට මැලියෙමි''යි කිවුය. "දැන් කුමක් කෙරෙමිදැ?''යි කී කල්හි "ඒ ගෙය කසළ හැර පිරිසිදු කරව''යි කියා රජ්ජුරුවන් සමීපයට යවා "උදැල්ලක් ගෙනව, පෙට්ටියක් ගෙනව''යි ගෙන්වාගෙන අපවිත්‍රය හා කසළ දම්මවා "ගොම ගෑව මැනව, නැවතත් යව, ඇඳක් ගෙනව, පුටුවක් ගෙනව, පහණක් ගෙනව, ඇතිරියක් ගෙනව, සැලක්(හැළියක්) ගෙනව, කළයක්

ගෙනව”යි කියා එකී එකී විටෙක ගෙන්වා නැවත පැන් ආදිය ගෙනෙන පිණිස විධාන කළාය. එවේලෙහි බෝධිසත්‍වයෝ කළයක් හැරගෙන පැන් ගෙනවුත් සැළ පුරා නහන පැන් සරහා තබා යහනක් ඇතුළේය. එකල යහනේ එක්ව ලගින්නට පටන්ගත් බෝධිසත්‍වයන් දැතින් රවුළුපත් දෙක(මුහුණේ දෙපසින් වැඩී තුබූ රැවුල් දෙකොට) මිරිකා අල්වාගෙන “තොප මේ ශ්‍රමණ බවත් බ්‍රාහ්මණ බවත් නොදනුදැ”යි කියා තමා තමන්ගේ අභිමුඛයට ගසලා ඇදලූය. මහබෝසතාණෝ ඒ වේලෙහි සිහි ලද්දාහු මෙතෙක් කල් මුළුල්ලෙහි කාමච්ඡන්දයෙන්(පස්කම් සැපෙහි කළ ආලයෙන්) අඥාන වූය. මෙසේ ක්ලේශයෝ නම් අඥානයාට මුල් කාරණායෝ යයි මහබෝසතාණෝ සිහි ලැබගෙන සිතන්නාහු “මේ තෘෂ්ණාව මතු මත්තෙහි වඩාගෙන යේ නම් සතර අපායෙන්ම ඉස ඔසවාලිය(හිස ඔසවන්නට) නොදෙන්නේය. එසේ හෙයින් අදම මා විසින් මේ මුදුලක්ඛණාවන් රජ්ජුරුවන්ට පාවාදී හිමාලය වනයට වදින්ට වටනේය”යි බෝධිසත්‍වයෝ මුදුලක්ඛණාවන් කැඳවාගෙන රජ්ජුරුවන් කරා ගොස් “මහරජ්ජුරුවෙනි, තොපගේ බිසව් තොපටම සුදුස්සෝය. මට උන්ගෙන් ප්‍රයෝජන නැත. උදක්(හුදෙක්) මුන් නිසා මාගේ තෘෂ්ණාව වැඩුණු පමණකැ”යි කියා බිසවුන් රජ්ජුරුවන්ටම පාවාදුන්නුය. “තවද මහරජාණෙනි, තොපගේ මුදුලක්ඛණා නම් බිසවුන් නොලැබ, පෙර මට මුන් ලද්දේ විනම් යහපතැයි එකම තෘෂ්ණාවක් උපන, යම් වේලෙක මා විසින් මේ දිගුපුළුල් වූ නුවන් ඇති මුදුලක්ඛණාව ලබන ලද්දීද, ඒ වේලෙහි

පටන්ගෙන ගෘහතෘෂ්ණාවය(ගෙට ඇති ඇල්ම), උපකරණ තෘෂ්ණාවය, උපභෝග තෂ්ණාව යයි(එම ගෙය හා උපකරණ පරිභෝග කිරීමේ ඇල්ම) මෙසේ අනෙකප්‍රකාර වූ තෘෂ්ණාව මතු මත්තෙහිම වඩාගෙන ගියේය. ඒ තෘෂ්ණාව මතු මත්තෙහිත් මෙසේම වැඩිගෙන යේ නම් සතර අපායෙන් මා ඉස ඔසවාලිය නොහෙන්නේය. එසේ හෙයින් මට මේ බිසවුන්ගෙන් ප්‍රයෝජන නැත, තොපගේ බිසවුන් තෙපිම පාවාගණුව”යි, “මම් වූ කලි හිමාලය වනයට වදිමි”යි කියා එකෙණෙහිම නටුවා වූ(නැසුනු) ධ්‍යානය උපදවාගෙන ආකාශයෙහි හිඳ ධර්මදෙශනා කොට රජ්ජුරුවන්ට අවවාද දී ආකාශයෙන්ම හිමාලය වනයට ගොස් නැවත මනුෂ්‍ය පථයක්(මිනිස් පියසක්) දිශාවට නොආවාහුය. මතු මත්තෙහිත් ‘මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්‍ෂා’ යන සතරබ්‍රහ්මවිහාර භාවනාකොට බ්‍රහ්මලෝකයෙහි උපන්නාහුය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදෙශනාව ගෙනහැර දක්වා වදාරා චතුරාර්‍ය්‍ය සත්‍යය ප්‍රකාශකොට වදාළසේක. චතුස්සත්‍ය ධර්මදේශනාවගේ කෙළවර උකටලී මහණ සෝවාන් පෙලෙහි පිහිටියේය. සර්වඥයන් වහන්සේ පූර්වාපරසන්ධි ගළපා මේ ‘මුදුලක්ඛණ ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් ආනන්ද ස්ථවිරයෝය. මුදුලක්ඛණාවෝ නම් උත්පලවර්ණ මහස්ථවිරියෝය. එසමයෙහි

තවුස් වූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 067. උච්ඡඞ්ග ජාතකය

තවද එක් සමයෙක්හි සංසාරචක්‍ර මථනය කළාවූ(සංසාරය නැමති රෝදයේ ගමන නතර කළාවූ හෙවත් සසර ඉපදීම නැවත්වවූ) තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වසනසේක් එක්තරා දනවුවාසී ස්ත්‍රියක් අරභයා මේ ජාතකය වදාළසේක.

එක් සමයෙක්හි කොසොල් රට තුන්දෙනෙක් එක්තරා වනයක් සමීපයෙහි සීසානාහුය. එකල ඒ වන ඇතුළේ වසන්නා වූ සොරු මන්ෂ්‍යන් අල්වා කොල්ලකාගෙන ගියෝය. රාජපුරුෂයෝ ඒ සොරුන් සොයා නොදැක ඒ තුන්දෙනා සීසානා තැනට අවුත් "තෙපි වනයෙහි හිඳ කොල්ලකාපියා දැන් සී සා ඇවිදුදැ"යි කියා "ගම කොල්ලකෑ සොරුන් නම් මොහුය"යි බැඳගෙන අවුත් කොසොල් රජ්පුරුවන්ට පාවාදුන්නුය. එකල්හි එක් ස්ත්‍රීයක් අවුත් "මට වස්ත්‍රයක් දෙව"යි කියා හඬමින් නැවත නැවත මාළිගාව වට ඇවිදින්නීය. රජ්ජුරුවෝ ඒ ස්ත්‍රියගේ ශබ්දය අසා "මැට වස්ත්‍රයක් දෙව"යි කිවුය. එබස් අසා රාජපුරුෂයෝ වස්ත්‍රයක් ගෙන ඒ ස්ත්‍රී සමීපයට ගියෝය. ඒ ස්ත්‍රිය වස්ත්‍රය දැක "මම මේ වස්ත්‍රය නොඉල්වම. ඒ පුරුෂවස්ත්‍රය (ස්වාමිපුරුෂය නැමති වස්ත්‍රය) ඉල්වීමි"යි කිව. මනුෂ්‍යයෝ ගොස් රජ්ජුරුවන්ට කියන්නෝ "ස්වාමීනි, මේ ස්ත්‍රී වස්ත්‍රයක්

වුවමැනවැයි නොකියයි, පුරුෂවස්ත්‍රයක් වුවමැනවැයි කියව''යි කියා රජ්ජුරුවන්ට දැන්වූහ.

එකල්හි රජ්ජුරුවෝ ස්ත්‍රී සමීපයට කැඳවාගෙන "තෝ පුරුෂවස්ත්‍රය වුවමැනවයි කියා යාඥා කරන්නෙහිදැ''යි විචාළෝය. "එසේය ස්වාමීනි, ස්ත්‍රියට වල්ලභයා නම් වස්ත්‍රයක් හා සමානය, පුරුෂයා නැති කල්හි දහසක් මිළ වටිනාවත් වස්ත්‍රයක් හැඳගෙන සිටින්නා වූ ස්ත්‍රීතොමෝ නග්නවූවාහු නම් වෙයි'' කිව. රජ්ජුරුවෝ ස්ත්‍රියගේ බස් අසා ප්‍රසන්න වූ සිත් ඇතිව "මොහු තුන්දෙන තිට කවුරුවෙද්දැ''යි විචාළෝය. "ස්වාමීනි, මුන් තුන්දෙනාගෙන් එක් කෙනෙක් මාගේ වල්ලභයාය(ස්වාමිපුරුෂයාය), එක් කෙනෙක් මාගේ මළණුවෝය, එක් කෙනෙක් මාගේ පුතණුවෝය''යි කීය. රජ්ජුරුවෝ එබස් අසා "මම තිට සතුටුවීමි, සතුටු වූ මම මුන් තුන්දෙනාගෙන් එක් කෙනෙකුන් දෙමි, කවුරුන් කැමැත්තෙහිදැ''යි විචාළෝය. ස්ත්‍රී කියන්නී "ස්වාමීනි, මම ජීවත්ව වුන්නෙම් වීම් නම් එක් වල්ලභයෙකු ලබෙමි. පුතණුවන් කෙනෙකුන් ලබම්මය. මාගේ දෙමාපියන් මළ බැවින් මලණු කෙනෙක් දුල්ලභයෝය. එසේ හෙයින් ස්වාමීනි, මට මලණුවන් දුන මැනව''යි කියෝය. රජ්ජුරුවෝ සතුටුව තුන්දෙනාම ස්ත්‍රියට පාවා දුන්නේය. මේ ස්ත්‍රිය නිසා තුන්දෙනෙක් දුකින් මිදුනාහ. මේ කාරණය භික්ෂු සංඝයා කෙරෙහි ප්‍රකාශ විය.

ඉක්බිත්තෙන් එක් දවසක් භික්ෂු සංඝයා වහන්සේ දම්සභා මණ්ඩලයෙහි රැස්ව හිඳ "ඇවැත්නි, එක් ස්ත්‍රියක නිසා

තුන්දෙනෙක් මිදුනෝවේදැ''යි ඒ ස්ත්‍රියගේ ගුණ කිය කියා උන්සේක. ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ දම්සභා මණ්ඩපයට අවුත් පණවනලද බුද්ධාසන මස්ථකයෙහි වැඩහිඳ "මහණෙනි, මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ''යි විචාරා "මේ නම් කථාවකින් යුක්තව උනුම්හ''යි කී කල්හි "මහණෙනි, මේ ස්ත්‍රී මුන් තුන්දෙනා ගැසවූවාක් දැන්මතු නොවෙයි, පෙරත් ගැළවූව''යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි තුන්දෙනෙක් මහා වන සමීපයෙහි සිසාති'' යන සියල්ලම යට කියනලද එද හා සමාන වන්නේය. එසමයෙහි වනාහි රජ්ජුරුවන් විසින් "තුන්දෙනාගෙන් කවුරුන් කැමැත්තෙහිදැ''යි විචාර කල්හි ස්ත්‍රිය කියන්නී "ස්වාමිනි, තුන්දෙනාම දෙන්ට නොපිළිවන්දැ''යි කිවුය. "එසේය, තුන්දෙනාම දෙන්ට නොපිළිවනැ''යි කී කල්හි "ඉදින් තුන්දෙනාම දෙන්ට නුඹවහන්සේට නොපිළිවන් වීනම් මාගේ මලණුවන් මට දුනමැනවැ''යි කිවුය. රජ්ජුරුවන් විසින් "පුත්‍රයාවත් වල්ලභයාවත් හැරගනුව, තිට මලණුන්ගෙන් ප්‍රයෝජන කිම්දැ''යි කී කල්හි "ස්වාමිනි, වල්ලභයන් හා පුත්තු නම් සුලභයෝය. මල් වූකලී ලැබගත නොහැක්කාහුය''යි කියන්නී මෙසේ කිවුය "රජ්ජුරුවන් වහන්ස, යම් සේ වලට වැද(වනයට ගොස්) ඉනවටකොට(ඉනවටේට ඔඩොක්කුවක් බැඳගෙන) පලා නෙලාගත්ම ඉන පලා සුලභ වන්නා සේ ස්ත්‍රීන්ට පුත්‍රයෝ නම් සුලභ වන්නාහුය. ඉන තුබූ පලා හා

සමාණයෝය මඟට බසැ උදකලාව (තනිවම) යන්නා වූ ස්ත්‍රියට වල්ලභයෝ නම් සුලභයෝය. දුටු කෙනෙක්ම වල්ලභ වෙති. යම් හෙයකින් මට දෙමව්පියයෝ නැද්ද, එසේ හෙයින් මම දැන් එකකුසින් ඕත්(එක්කුස උපන්) මලණු කෙනෙකුන් යම් තෙනකින් ගෙනෙම් නම් ඒ මාතෘකුක්ෂි සංඛ්‍යාත වූ අන්‍ය දෙශයක්(මවුකුස නැමති වෙනත් තැනක්) නොදකිමි. එසේ හෙයින් මා මලණුවන්ම දුනමැනවැ''යි කිවුය. රජ්ජුරුවෝ ''මේ ස්ත්‍රිය සැබැවක්ම කියන්නීය''යි සතුටු වූ සිත් ඇතිව තුන්දෙනාම සිරගෙන් ගෙන්වා පාවාදුන්නුය. ඒ ස්ත්‍රී තුන්දෙනාම කැඳවාගෙන තමා වසන්නා වූ ස්ථානයටම ගියාය.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ ''මහණෙනි, මේ ස්ත්‍රිය මුන් තුන්දෙනා දුකින් ගැළවූවා දැන්මතු නොවෙයි, පෙරත් ගැළවූමය''යි මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා වදාරා පූර්‍වාපරසන්ධි ගළපා මේ 'උච්ඡංග ජාතකය' නිමවා වදාළසේක.

''අතීතයෙහි සතරදෙනාම දැන් මේ සතරදෙනාමය. එසමයෙහි රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ''යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 068. සාකෙත ජාතකය

තවද එක් සමයෙක්හි උපමාවිෂයාතික්‍රාන්ත වූ(උපමාවක් දැක්විය නොහැකි) රූපකාය(රූපශ්‍රීයාව) ඇති තිලෝගුරු බුදුරජාණන් වහන්සේ සාකෙත නුවර නිසා අඤ්ජන වනයෙහි

වසනසේක් එක් බ්‍රාහ්මණයෙකු අරභයා මේ ජාතකය වදාළසේක.

භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ භික්ෂූසංඝයා පිරිවරා සාකෙත නුවරට පිඬුසිඟා වඩනා කල්හි සාකෙත නුවර වසන්නා වූ එක් මහළු බමුණෙක් නුවරින් පිටත්ව යන්නේ වාසල් අතුරෙහිදී සර්වඥයන් වහන්සේ දැක දෙපය වැටී ගොප්මස තරයේ අල්වාගෙන "පුත, දරුවන් විසින් වෘද්ධ අවස්ථාවෙහි දෙමවුපියෝ නම් රැක්කයුත්තෝ නොවෙතවත්ද? කවර කාරණයකින් මෙතෙක් කල් මුළුල්ලෙහි මට නොදැක්වූද? මම වූකලී තොප දිටිමි. තොපගේ මෑණියන් දක්නා පිණිස එව"යි කියා සර්වඥයන් වහන්සේ කැඳවාගෙන තමාගේ ගෙට ගියේය.

සර්වඥයවන් වහන්සේ ඔහුගේ ගෙට ගොස් භික්ෂූසංඝයා වහන්සේ හා සමග පනවනලද ආසන මස්තකයෙහි වැඩහුන්සේක. බැමිණී අවුත් සර්වඥයන්ව වහන්සේගේ ශ්‍රීපාදමූලයෙහි වැටී "පුත, මෙතෙක් කල් මුළුල්ලෙහි කොයි ගියාද? දෙමව්පියෝ වෘද්ධ අවස්ථාවෙහි උපස්ථාන කටයුත්තෝ නොවෙත්දැ"යි කියා ඇඬුය. දූ දරුවනුත් කැඳවාගෙන අවුත් "තොපගේ බෑණන් වහන්සේ (සොහොයුරුතුමන්) වඳුව"යි කියා වැඳවූය. ඔහු දෙදෙනා සතුටු සිත් ඇතිව බුදුන් ප්‍රධානකොට ඇති භික්ෂූසංඝයා වහන්සේට මහදන් දුන්නාහුය.

සර්වඥයන් වහන්සේ වළඳා ඉක්බිති ඔවුන් දෙදෙනාටම 'ජරාධර්ම සූත්‍රය' වදාළසේක. සූත්‍ර දේශනාවගේ කෙළවර දෙදෙනාම අනාගාමී ඵලයෙහි පිහිටියාහුය. සර්වඥයන් වහන්සේ හුනස්නෙන් නැගී අඤ්ජන වනයට වැඩිසේක. භික්ෂූන් වහන්සේ දම්සභා මණ්ඩපයෙහි වැඩහිඳ "ඇවැත්නි, මේ බ්‍රාහ්මණයා සර්වඥයන් වහන්සේගේ පියාණෝ සුද්ධෝදන රජ්ජුරුවෝය, මෑණියෝ මහමායා දේවියයි දන්නේය. එසේ දැන දැනත් බැමිණිය හා සමඟ සර්වඥයන් වහන්සේ 'මාගේ පුතණුවෝ යයි කියයි. සර්වඥයන් වහන්සේත් බමුණා කියන දෙය ඉවසූසේක. මීට කාරණා කවරේදැ?"යි මෙසේ වූ කථාවක් උපදවා උන්සේක. සර්වඥයන් වහන්සේ ඒ භික්ෂූන්ගේ කථාව අසා "මහණෙනි, ඔහු දෙදෙන තමන්ගේ පුතණුවන්ට පුතණුවෝය"යි කියති වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

"මහණෙනි, මේ බමුණා යටගිය දවස අතුරක් නැතිව(අඛණ්ඩව) පටිපාටියෙන් (පිළිවෙළින්) පන්සියයක් ජාති මුළුල්ලෙහි මට පිය විය, පන්සියයක් ජාති මුළුල්ලෙහි මට සුළුපිය විය, පන්සියයක් ජාති මුළුල්ලෙහි මට මහළුපිය(සීයා) විය. මේ බැමිණිත් අතුරක් නැතිව පිළිවෙළින්ම පන්සියයක් ජාති මුළුල්ලෙහි මට මව් විය, පන්සියයක් ජාති මුළුල්ලෙහි කුඩාමව් විය, පන්සියයක් ජාති මුළුල්ලෙහි මැහැලිමව්(ආච්චි) විය. මෙසේ යෙළදහසක් ජාති (ජාති එකදහස් පන්සියයක්) මුළුල්ලෙහි බමුණා අත වැඩිනම්, යෙළෙදහසක් ජාති මුළුල්ලෙහි බැමිණිය අත වැඩිනම්, මෙසේ යෙළදහසක් ජාති මුළුල්ලෙහි මොහු දෙනෙ මව්පිය වුහ"යි වදාරා ධර්මදේශනාකොට

වදාළසේක. "යම් පුද්ගලයෙක්හු දුටු පමණකින්ම ඔහු කෙරෙහි සිත පහදීද, මොලොක් වේද, ස්වභාවයෙන් ඒ උපන් ජන්මයෙහි පෙර නුදුටුව්රුත් ඒ පුද්ගලයා කෙරෙහි අනුභූත පූර්වස්නෙහ වශයෙන්ම(පෙර භවයන්හි පුරුදුව තුබූ ආදරය වශයෙන්ම) ඒකාන්තයෙන්ම සත්වතෙමේ විශ්වාසයට පැමිණෙන්නේය"යි මෙසේ ධර්මදේශනාකොට වදාළසේක.

මෙසේ ශාස්තෲ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා පූර්වාපරසන්ධි ගළපා මේ 'සාකෙත ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි බමුණා හා බැමිණී නම් දැන් මේ බමුණා හා බැමිණියය, එසමයෙහි පුත්‍ර වූයෙම් තිලෝගුරු සම්‍යයක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 069. විෂවන්ත ජාතකය

තවද එක් සමයෙක්හි නිර්මල වූ පස් පැ දිස්නා(නිල්, රන්වන්, රතු, කළු, සුදු යන පස් පැහැයකින්) නේත්‍ර යුගලයක් ඇති තිලෝගුරු බුදුරාජණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසනසේක් දම්සෙනවි සැරියුත් මහතෙරුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

තෙරුන් වහන්සේ පිටකන දෙයක්(පිටිවලින් සෑදූ ආහාර වර්ගයක්) වළඳන වේලෙහි මනුෂ්‍යයෝ කියන්නාහු "ස්වාමීනි, ඇතුළු ගමට වන්(ගම ඇතුළට පැමිණ) භික්ෂූන් වහන්සේටත් අවුළුපත් පිළිගත මැනවැ"යි කීහ. එකෙණෙහි තෙරුන්

වහන්සේගේ සද්ධිවිහාරික(එකට වාසය කරන) භික්ෂූන් වහන්සේ ඇතුළුගම වූසේක. උන්වහන්සේ කොටස ගෙන ඒ භික්ෂූන් වහන්සේ නොආ හෙයින් "ඉතා දහවල් වන්නේය"යි සැරියුත් මහතෙරුන් වහන්සේට පිළිගැන්වූය. ඒ තෙරුන් වහන්සේ අවුළුපත් වැළඳූ නොබෝකලකින්ම සද්ධිවිහාරික භික්ෂූන් වහන්සේ ගමින් විහාරයට වැඩිසේක. එකල තෙරුන් වහන්සේ වදාරණසේක් "ඇවැත්නි, අපි තොපට තුබූ පිටිකන දැ වළඳපුමොදැ"යි වදාළසේක. එබස් ඇසූ සද්ධිවිහාරිකයන් වහන්සේ කියනසේක් "ස්වාමීනි, මිහිරෙක් නම් කවුරුන්ට අප්‍රියදැ"යි කීසේක. එකෙණෙහි සැරියුත් මහතෙරුන් වහන්සේට සංවේග උපන. උන්වහන්සේ "මම මෙතැන් පටන් පිටිකන දෙයක් නොවළඳිමි"යි ඉටාගත්සේක.

එතැන් පටන් සැරියුත් මහතෙරුන් වහන්සේ පිටකන දෙයක් නොවැළඳූ විරූ සේක. උන්වහන්සේ පිටකන දෑ නොවළඳන නියාව භික්ෂුසංඝයා කෙරෙහි ප්‍රසිද්ධ විය. භික්ෂුසංඝයා වහන්සේ ඒ කථාව කියමින් දම්සභා මණ්ඩපයෙහි වැඩ උන්සේක. එකල ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ "මහණෙනි, දැන් මා එන්නට පූර්වභාගයෙහි කවර නම් කථාවකින් යුක්තව හුනුදැ"යි විචාරා "මෙනම් කථාවකින් යුක්තව උනුම්හ"යි දැන්වූ කල්හි "මහණෙනි, ශාරිපුත්‍ර ස්ථවිරයෝ එක්වරෙක හැරපු දෙය ජීවිත පරිත්‍යාග කෙරෙත් නමුත් දෙවනුව නොගනිත්ය"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහබෝසතාණෝ විෂවිද්‍යා කුලෙයක ඉපිද වෙදකමින් ජීවත් වන්නාහුය. එකල එක් ජනපදවාසී මනුෂ්‍යයෙක් සර්පයෙක් දෂ්ටකොට පුයේය. ඔහුගේ නෑයෝ ප්‍රමාද නොකොට වහා වෛද්‍යයා කැඳවාගෙන ආවාහුය. එකල වෛද්‍යා කියන්නේ "කිමෙක්ද? ඖෂධ ගල්වා විෂ දවා ගනිම්ද? දෂ්ට කළ සර්පයා ගෙන්වාගෙන දෂ්ට කළ තෙනින් ඔහු ලවාම විෂය අද්දවා ගනිම්දැ"යි කීයේය. "සර්පයා ගෙන්වා විෂය ඇදදගත යුතුය"යි මනුෂ්‍යයෝ කීවාහුය. ඒ විෂවිද්‍යාචාර්‍ය්‍යයා මන්ත්‍රෞෂධයෙන්(මන්ත්‍ර නැමති බෙහෙතින්) සර්පයා ගෙන්වාගෙන "තා විසින් මේ පුරුෂයා දෂ්ට කරන ලද්දේදැ?"යි කීය. "එසේය, මා විසිනැ"යි කී කල්හි "තා දෂ්ට කළ තැනින් තෝ විෂ මුඛයෙන් ඇද ගණුව"යි කීයේය. සර්පයා කියන්නේ "එක් වාරයෙක ඇරපු දෙය නැවත ගත්විරූ නැත, මම මා විසින් හරනලද විෂය නැවත ඇදනොගනිමි"යි කීය. සර්පයාගේ බස් අසා විෂවිද්‍යාචාර්‍ය්‍යයතෙම දර ගෙන්වාගෙන ගිනි මොළවා "ඉඳින් තාගේ විෂ තෝ නොඅදනෙහි වීනම් මේ ගින්නට වැදීයා"යි(පනින්නැයි) කීය. සර්පයා "ඉඳින් මම ගිනිවදිමි. නමුත් මා විසින් හරනලද විෂයක් මාගේ ජීවිත්වීම කරනකොට ගෙන පෙරලා උරා ඇද ගන්නේම් වීනම් ඒ විෂයට නින්දවේයයි, ඒ විෂය නැවත උරා ඇදගැන්ම නිසා ගිනිවැද යම් මරණෙක් වේනම් ජීවත්වීමටත් වඩා ඒ මරණය

උතුමැ''යි කියේය. මෙසේද කියා ගිනිවළින්ට නික්මුනේය. එකල වෙදුණෝ ඒ සර්පයා වළකා ගිනිවැද්ද නොදී ඒ සර්පයා දෂ්ට කළා වූ පුරුෂයා ඖෂධයෙන් හා මන්ත්‍රයෙන් විෂ නැතිකොට නිරෝගකොට සර්පයාට පන්සිල් දී ''මෙතැන් පටන් දෂ්ට කොනොකට කිසි කෙනෙකුන්ට පීඩාවක් නොකරව''යි කියා අවවාදකොට ඇරපුවාහුය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ ''මහණෙනි, ශාරිපුත්‍ර ස්ථවිරයෝ එකවරකෙ හැරපු දෙය ජීවිත පරිත්‍යාග කරතත් නැවත නොගනී''යි මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදරා පූර්වාපරසන්ධි ගළපා මේ 'විෂවන්ත ජාතකය' නිමවා වදාළසේක.

''එසමයෙහි සර්පයා නම් දැන් ශාරිපුත්‍ර ස්ථවිරයෝය. එසමයෙහි විෂවිද්‍යාචාරී වූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ''යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 070. කුද්දල ජාතකය

තවද එක් සමයෙක්හි ප්‍රඥාවිෂයාතික්‍රාන්ත වූ ධර්මකාය(නුවණ මෙහෙයා බැලිය හැකි සීමාවද ඉක්ම වූ ධර්ම සමූහයක්) ඇති තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසනසේක් චිත්තහස්ති ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ තෙරුන් වහන්සේ නම් සැවැත් නුවර එක් කුලපුත්‍රයාණ කෙනෙක ඉක්බිත්තෙන් එක් දවසක් ඒ කුලපුත්‍රතෙම සීසා

පියා(සීසෑමකොට) එන තැනැත්තේ විහාරයට වැද එක් තෙර කෙනෙකුන් වහන්සේගේ පාත්‍රයෙන් සිනිදු වූ මිහිරි වූ ප්‍රණීත භොජනයක් ලැබ මෙසේ සිතුයේය "අපි රෑ දවල් මුළුල්ලෙහි සිය අතින් නොයෙක් කර්මාන්ත කොටත් මෙබඳු වූ මධුරාහාරයක් නොලබම්හ. මාත් මහණවූවොත් යහපතැ"යි සිතීය.

මෙසේ සිතා ඒ කුලපුත්‍ර මහණව මසක්, යෙළමසක්(මාසයක්, මාස එකහමාරක්) ඇවෑමෙන් නුවණින් සිහිනොකොට ක්ලෙශ වසඟව ගිහිව නැවත බත්(ආහාර) නොලැබ මිරිකී අවුත් මහණව අභිධර්මය උගත්සේක. මෙම ක්‍රමයෙන් සවාරයෙක ගිහිව සත්වෙනි වාරයෙහි මහණව සප්තප්‍රකරණය (අභිධර්ම පිටකයට අයත් ධම්මසංගනිප්‍රකරණය ආදී ග්‍රන්ථ හත) හදුරා බොහෝ භික්ෂූන් වහන්සේට අභිධර්මය උගන්වා විදර්ශනා වඩා රහත් වූසේක.

එකල උන්වහන්සේගේ සහාය භික්ෂූහු "ඇවැත්වූ චිත්තයෙනි, කිමෙක්ද? තොපට පෙර පරිද්දෙන් දැන් ක්ලේශයෝ නොවැඩෙත්දැ"යි නින්ද කළසේක. එකල උන්වහන්සේ වදාරණසේක් "ඇවැත්නි, මම දැන් මෙතැන් පටන් ගිහිවන්ට අයොගය වෙමි"යි කීසේක. මෙසේ උන්වහන්සේ අර්හත්ඵලයට පැමිණි කල්හි ධම්සභා මණ්ඩපයෙහි මෙසේ වූ කථාවෙක් පහළ වූයේය. "ඇවැත්නි, මෙබඳු වූ අර්හත්ඵලයට උපනිශ්‍රය(හේතුවාසනා) ඇතුව තිබියදී ආයුෂ්මත් වූ චිත්තහස්ති ශාරිපුත්‍ර ස්ථිවිරයෝ සවාරයෙක ගිහිවූය, එසේ

හෙයින් පෘථග්ජන බව නම් ඉතා මහත් වූ දෝෂ ඇති දෙයකැ''යි මෙසේ වූ කථාවක් උපදවා උන්සේක.

එකල සර්‍වඥයන් වහන්සේ අවුත් ''මහණෙනි, දැන් කවර කථාවකින් යුක්තව උනුදැ''යි විචාරා ''මෙනම් කථාවකින් යුක්තව උනුම්හ''යි දැන් වූ කල්හි ''මහණෙනි, පෘථග්ජන චිත්තය නම් ලඝුය (සැහැල්ලුය) නිග්‍රහ නොකට හැක්කේය(සංවර කිරීම අපහසුය). ආලම්බන වශයෙන්(ඒ ඒ අරමුණු කරා දිවීම් වශයෙන්) ගොස් ඇලී යන්නේය. එක් වරෙක ඇලීගිය සිත වහා මුදලන්ට නොපිළිවන, එබඳු වූ චිත්තයාගේ දමනය යහපත් වන්නේය. දමනයෙහි ලන ලද්දවූම චිත්තය සැප එලවන්නේ. මෙමබඳු වූ චිත්තයකට නිග්‍රහකොට ගත නුහුනු බැවින් පෙර නුවණැත්තෝ එක් උදලු කෙටියක් නිසාම ඒ උදලු හැරපිය නොහී ලෝභ වශයෙන් සවාරයෙක ගිහිව සත්වෙනි වාරයෙහි පැවිදිව ධ්‍යාන උපදවා ලොභයට නිග්‍රහ කළෝම වේදැ''යි වදරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි පුරනලද බෝධිසම්භාර ඇති අප මහබෝසතාණෝ පලාදිය විකුණන්නා වූ කුලයක ඉපිද විඥ්ඥු බවට(නුවණැති බවට) පැමිණියෝය. ''කුද්දල පණ්ඩිතයෝය''යි ඔවුන්ට නම් තුබූයේය. ඒ බෝධිසත්‍වයෝ උදැල්ලෙන් බිම කොටා පලා හා ලබු කොමඩු කැකිරි ආදිය රෝපණයකොට ඒ පලාදිය විකුණමින් දුක්ඛ ජීවිකාවෙන්

ජීවත් වෙති. ඒ බෝධිසත්වයන්ට උදළු කෙටිය හැර අනික් වස්තුවක් නැත්තේය. ඒ කුද්දාල පණ්ඩිතයෝ එක් දවසක් මෙසේ සිතූහ "මට ගිහිගෙයි විසීමෙන් ප්‍රයෝජන කිම්ද? මේ ගිහිගෙන් නික්ම මහණ වෙමි"යයි සිතූහ. ඉක්බිත්තෙන් එක් දවසක් උදළු කෙටිය සඟවා තබා සෘෂිධි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවැද්ව උදළු කෙටිය සිහිකොට ලොභය සිඳගත නොහී කෙටි උදැල්ල නිසා නැවත නැවත ගිහි වූයේය. මෙසේ දෙවෙනි වාරය තුන්වෙනි වාරයයි මෙසේ සවාරයෙක උදළු කෙටිය සඟවා තබා මහණත් වූහ. ගිහිත් වූහ. සත්වෙනි වාරයෙහි මහබෝධිසත්වයෝ සිතන්නාහු "මම මේ කෙටි උදැල්ල නිසා නැවත නැවත ගිහිවීමි, දැන් ඒ උදළු කෙටිය මහගංගාවට දමාපියා මහණ වෙමි"යි ගංතෙරට ගොස් "ඉදින් උදළු කෙටිය හුණු තැන් දුටුයේ වීනම් නැවත අවුත් ගොඩනගාගන්ට සිතිවිලි උපදනේය"යි උදළු කෙටිය මිට අල්වාගෙන ඇත්බල හා සමාන බල ඇති බෝධිසත්වයෝ ඉස වටා තුන්විටක් සිසාරා(කරකවා) ඇස පියාගෙන ගංගාව මධ්‍යයට දමා "ජයගතිමි, ජයගතිමි" කියා තුන්වරක් සිංහනාද කළෝය.

එකෙණෙහි බරණැස් රජ්ජුරුවෝ පසල් දනව්වට සෙමෙහි තබා(සාමය ඇතිකොට) එන තැනැත්තෝ ගංගාවෙහිදි ඉස හා මග ජලස්නානයකොට සර්වාභාරණයෙන් සැරහී ඇත්කඳක් මත්තෙහි(ඇතෙකු පිට) යමින් හිඳ බෝධිසත්වයන්ගේ ජයශබ්දය අසා "මේ පුරුෂයා 'ජයගතිමි' කියන්නේ මොහු විසින් කවරෙක් ජයගන්නා ලද්දේ දැයි ඔහු කැඳවා

විචාරව''යි බෝධිසත්ත්වයන් කැඳවා ගෙන්වාගෙන ''පින්වත් වූ පුරුෂය, මම වූකලී විජිත සංග්‍රාම(යුද ජයලැබූ) ඇත්තෙමි, දැන් ජයගෙන එමි, තා විසින් ජයගන්නා ලද්දේ කවරෙක් දැ''යි විචාළෝය.

එසේ ඇසූ බෝධිසත්ත්වයෝ කියන්නාහු ''මහරජ්ජුරුවෙනි, යුද්ධ දහසකුත් යුද්ධ ලක්‍ෂයකුත් ජයගත්තා වූ තොප විසින් කෙලෙසුන් ජය නොගත් බැවින් ජය නොගන්නා ලද්දේය, මම වූ කලී මාගේ අභ්‍යන්තරයෙහි(සිතතුළ) ලෝභයට නිග්‍රහකොට කෙලෙසුන් ජයගතිමි''යි කියමින් සිටම මහත් වූ ගංගාව බලා ආපො කසිණය(කසිණ භාවනාව අරමුණ ලෙස ජලය) අරමුණුකොට ඇති ධ්‍යානය උපදවා පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා ආකාශයෙහි හිඳ රජ්ජුරුවන්ට ධර්‍මදේශනා කරන්නාහු මෙසේ කිවුය ''පසමිතුරන් පරාජයකොට රාජ්‍යය ලැබ නැවත ඒ සතුරන් විසින් ජය ගතයුතු හෙයින් ඒ යුද්ධයෙන් ලබන්නා වූ ජය අගපත් වූ(උතුම්) ජයක් නම් නොවෙයි. කුමක් හෙයින්ද? යත්, නැවත සතුරන් විසින් ජය ගතයුතු හෙයිනි. කෙලෙස් නැමති පසමිතුරන් පරාජයකොට මැඩ ජය ගන්නා වූ ජය යහපත් වන්නේය. කුමක් හෙයින්ද? යත්, නැවත ජය ගැන්මක් නැති හෙයිනැයි, එසේ හෙයින් මහරජ්ජුරුවෙනි, තොප දහසක්වර ලක්‍ෂයක්වර යුද්ධ ජයගෙන තොපි සංග්‍රාම යෝධයෝ නම් නොවව්, කුමක් හෙයින්ද? තොපගේ ක්ලේශයන් ජය නොගත් හෙයින්, යමෙක් වනාහි තමාගේ අභ්‍යන්තරයෙහි ක්ලේශයන් ජයගනී නම් ඒ තෙමේ උත්තම වූ

සංග්‍රාමශීර්ෂයෙහි(යුද්ධභූමියෙහි) යෝධ නම් වන්නේය”යි ආකාශයෙහි හිඳ මෙසේ සවිලාසාගෙන්(බුදුවරයකු මෙන්) ධර්මදේශනා කළෝය. මෙසේ රජ්ජුරුවන් ධර්මය අසමින් සිටියදීම තදංගප්‍රහාණ වශයෙන්(ඒ අවස්ථාවට පමණක් තාවකාලිකව යටපත්වීම් වශයෙන්) ක්ලේශයෝ ප්‍රහීණවූහ(දුරුවූහ). ප්‍රව්‍රජ්‍යාවට සිත නැමුණෝය. රජ සෙනඟටත් එසේම ක්ලේශයෝ ප්‍රහීණවූහ. මහරජ්ජුරුවෝ “දැන් නුඹවහන්සේ කොයි යන්සේක්දැ”යි බෝධිසත්වයන් විචාළෝය. හිමාලය වනයට වැඳ සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවෙමි මහරජ්ජුරුවෙනි” කිවුය. “එසේ වීනම් මමත් මහණ වෙමි”යි කියා බෝධිසත්වයන් සමඟ නික්මුණාහ.

සේනාව බ්‍රහ්මණ, ගෘහපතිහුය, ඇත්නායකවරුය යන සියල්ලෝම ඒ ස්ථානයෙහි රැස්වූය. ජන සමූහයෝ රජ්ජුරුවන් සමඟ නික්මුණාහුය. බරණැස් නුවරවාසී මනුෂ්‍යයෝ “අපගේ රජ්ජුරුවන් වහන්සේ කුද්දල පණ්ඩිතයන්ගේ ධර්මදේශනාව අසා මහණවනු කැමතිව සේනාව හා සමග නික්මුනසේක. එසේ හෙයින් අපි මෙතන කුමක් කරමෝදැ”යි දේළොස් යොදුනක් පමණ ඇති බරණැස් නුවර සියළු නුවරවාසි සත්වයෝ නික්මුණාහුය. දෙළොස් යොදුනක් පමණ පර්ෂිද(පිරිස) වුයේය. ඒ පර්ෂිත්ගෙන බෝධිසත්වයෝ හිමාලය වනයට වන්නාහුය.

ශක්‍ර දේවේන්ද්‍රයන්ගේ පාණ්ඩුකම්බල ශෛලාසනය(බඳුවදමල්සේ රත් පැහැඇති ගල් ආසනය) බෝධිසත්වයන්ගේ ආනුභාවයෙන් උෂ්ණාකාර(රත්ව) දැක්

වූයේය. ඒ ශක්‍ර දේවේන්‍ද්‍රයෝ "කිමෙක් දෝ හො"යි පරීක්‍ෂා කරන්නාහු කුද්දල පණ්ඩිතයෝ මහබිනික්මන් නික්මුණාහුයයි දැක "මහත් ජය සමාගමක් වන්නේය. එසේ හෙයින් උන්ට වසන තැනක් උවමැනවැ"යි සිතා විශ්වකර්මයා කැඳවා "දරුව, කුද්දල පණ්ඩිතයෝ මහබිනික්මන් නික්මුණාහුය, වසන තැනක් ලබන්ට වටනේ, තෙපි හිමාල වනයට ගොස් සම වූ භූමිප්‍රදේශයක දිගින් තිස් යොදුනක් හා පුළුලින් පසළොස් යොදුනක් හා පමණ ඇති ආශ්‍රම ප්‍රදේශයක් මව"යි කිවාහුය. ඒ ඇසූ විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා "යහපත, ස්වාමීනි"යි ගිවිස එහි ගොස් එපරිද්දෙන්ම කෙළේය. තවද විශ්වකර්ම දිව්‍යපුත්‍රයාත් ආශ්‍රම ප්‍රදේශයේ පන්සල් මවා භයජනක ශබ්ද පවත්වන්නාවූ දුෂ්ට මෘගයන්, පක්‍ෂීන්, අමනුෂ්‍යයන් දුරුකොට ඒ දිසා භාගයෙන් එක් පියවරක් ඇති(එක් අයෙකු බැගින් යාහැකි ඉතා පටු) මාර්ගයක් දක්වා තමන් වසන්නා වූ ස්ථානයටම ගියේය.

කුද්දල පණ්ඩිතයෝ ඒ පර්ෂිත් ඇරගෙන හිමාල වනයට වැද ශක්‍ර දේවේන්ද්‍රයන් විසින් දෙනලද ආශ්‍රම ප්‍රදේශයට ගොස් විශ්වකර්ම දිව්‍යපුත්‍රයා විසින් මවනලද තවුස් පිරිකර ගෙන පළමු තුමූ පැවිදිව පසුව පර්ෂිත් පැවැදිකොට ආශ්‍රම ප්‍රදේශය බෙදා දුන්නාහුය.

සත්රාජ්‍යයක රජදරුවෝ තමන්ගේ රාජ්‍යය හැර බෝධිසත්වයන් සමීපයට අවුත් තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි වූහ. තිස් යොදුනක් පමණ අසපු පිරීගියේය. කුද්දල පණ්ඩිතයෝ

අවශේෂ කසිණයෙහිත්(ආපො කසිණය හැර සෙසු කසිණ අරමුණු නවයෙත්) පරිකර්ම(මූලික) භාවනාකොට බ්‍රහ්මවිහාරයන්(මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා) වඩා පර්ෂිද හැමටම කමටහන් කීවාහුය. ඇම දෙනාම පඤ්චාභිඥ අෂ්ටසමාපත්තිලාභිව බ්‍රහ්මවිහාරයන් වඩා බ්‍රහ්මලෝකයෙහි උපන්නාහුය. යම් සත්ව කෙනෙක් ඒ තපස්විවරයන්ට අත්පා මෙහෙවර උපස්ථාන කළාහු නම් ඔහු හැමදෙනම දිව්‍යලෝකයෙහි උපන්නාහුය.

ශාස්තෲ වූ බුදුරජාණන් වහන්සේ "මහණෙනි, මෙසේ මා චිත්තය ක්ලෙශ වශයෙන් ඇලී ගියේ නම් මුදලිය නොහැක්කේය. උපන්නා වූ ලෝභධර්මයෝ දුරුකොට ලිය නොහැක්කාහුය. මෙබඳු නුවණැත්තන් පවා ඒ ලෝභධර්මයෝ අඥානකොට පුවෝවවුදැ"යි(ඒ ලොභධර්මයෝ නුවණැත්තන් පවා මුළාවට පත්කළාහු නොවේදැයි) මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදාරා චතුරාර්‍ය්‍ය සත්‍යය ප්‍රකාශ කළසේක. චතුරාර්‍ය්‍ය සත්‍යයාගේ කෙළවර සමහර කෙනෙකුන් වහන්සේ සෝවාන් පෙලෙහි පිහිටිසේක. සමහර කෙනෙකුන් වහන්සේ සකෘදාගාමී පෙලෙහි පිහිටිසේක. සමහර කෙනෙකුන් වහන්සේ අනාගාමී පෙලෙහි පිහිටිසේක. සර්වඥයන් වහන්සේත් පූර්වාපරසන්ධි ගළපා මේ කුද්දල ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි රජ්පුරුවෝ නම් දැන් ආනන්ද ස්ථවිරයෝය. එසමයෙහි පර්ෂිත් නම් දැන් බුදුපිරිසය. එසමයෙහි කුද්දල

පණ්ඩිතයෝ නම් දැන් තිලොගුරු සම්‍යයක් සම්බුදුරජ වූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 071. වරණ ජාතකය

තවද එක් සමයෙක්හි චක්‍ර ලක්‍ෂණයෙන් විහ්නිත වූ(රෝද ලකුණෙන් ලකුණු කරනලද) ශ්‍රීපාද පත්ම ඇති තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වසනසේක් කුටුම්බියපුත්තතිස්ස ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

එක් දවසක් සැවැත් නුවරවාසීහු අන්‍යොන්‍ය සහාය වූ තිසක් පමණ කුලපුත්‍රයෝ සුවද මල් හා සුවඳ දිය ගෙන “සර්‍වඥයන් වහන්සේගෙන් ධර්මදේශනා අසම්හ”යි මහජනයා විසින් පිරිවරන ලදුව ජේතවනයට ගොස් නාගමාලක(නා ගසින් යුත් මළුව) සාලමාලකා දියෙහි(සල් ගසින් යුත් මළුව ආදියෙහි) මදක් හිඳ සවස්වේලෙහි සර්‍වඥයන් වහන්සේ සුගන්ධගන්ධවාසිත වූ (සුවඳ ද්‍රව්‍යවලින් සුවඳවත් කරනලද) ගන්ධකුටියෙන් නික්ම දම්සභා මණ්ඩපයට ගොස් අලංකෘත වූ බුද්ධාසන මස්තකයෙහි වැඩහුන් කල්හි කුලපුත්‍රයෝ සහපිරිවරින් දම්සභා මණ්ඩපයට ගොස් සර්‍වඥයන් වහන්සේට සුවඳ මල් ආදියෙන් පූජාකොට චක්‍ර ලක්‍ෂණයෙන් විහ්නිත වූ පතුල්තල ඇති සුපුෂ්පිත පද්මයක්(මනාව පිපුනු නෙළුම් මලක්) මෙන් ශ්‍රී සහිත වූ(සිරියාවත්) ශ්‍රීපාද වන්දයෙහි(දෙපතුලෙහි) වැඳ එකත්පස්ව හිඳ ධර්‍මය ඇසුවාහුය.

එකල ඒ කුලපුත්‍රයන්ට මෙසේ වූ සිතිවිල්ලක් වුයේය “අපි බුදුරජාණන් වහන්සේ විසින් දෙසනලද ධර්‍මය යම් පරිද්දෙන් දනුමෝ නම් එපරිද්දෙන්ම මහණවම්හ”යි කියා ඔහු හැමදෙනම සර්‍වඥයන් වහන්සේ දම්සභා මණ්ඩපයෙන් නික්මුනු කල්හි බුදුන් කරා එළඹ නමස්කාරකොට මහණවීමට යාඥා කළාහුය. ඔවුන්ට සර්‍වඥයන් වහන්සේ ප්‍රව්‍රජ්‍යාව දුන්සේක. ඔහු හැමදෙනාම ආචාර්‍ය්‍ය (පැවිදිකළ ගුරුවරයන් වහන්සේලා) උපාධ්‍යායයන් වහන්සේ(ශික්‍ෂාගරුක ජීවිතයක් සඳහා මෙහෙයවන ගුරුවරයන් වහන්සේලා) සිත්ගෙන උපසම්පදා ලැබ පස් අවුරුද්දක් ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන් වහන්සේ සමීපයෙහි වැස උභයමාතෘකාවන්(භික්‍ෂු භික්‍ෂුණී ප්‍රාතිමොක්‍ෂ ශික්‍ෂාපද දෙකොටස) ප්‍රගුණකොට කැප අකැප(සුදුසු නුසුදුසු දේ) දැන ත්‍රිවිධ වූ අනුමෝදනාවෙන්(මංගල, අවමංගල, දානශාලාව යන තුන්තැනදී කළයුතු සුදුසු බණ) ඉගෙණ සිවුරු ගෙත්තම්කොට රඳා(පඬුපොවා) “මහණදම් කරම්හ”යි ආචාර්‍ය්‍ය උපාධ්‍යායන් වහන්සේ පිළිවිස සර්‍වඥයන් වහන්සේ කරා එළඹ නමස්කාරකොට එකත් පස්ව හිඳ “ස්වාමීනි, අපි භවයෙන් කළකිරී ගියම්හ, ජාති ජරා ව්‍යාධි මරණ භයින් භයපත් වුම්හ. අපට සංසාරයෙන් මිදීම පිණිස කමටහන් වදාළ මැනවැ”යි ආරාධනා කළසේක. සර්‍වඥයන් වහන්සේ ඒ භික්‍ෂූන්ට කර්‍මස්ථාන අටතිස් දෙනා අතුරෙන් සැප වූ(යොග්‍ය) කර්මස්ථාන තෝරා පරීක්‍ෂාකොට කමටහන් වදාළසේක. ඒ භික්‍ෂූන් වහන්සේ සර්‍වඥයන් වහන්සේ සමීපයෙන් කමටහන් ගෙන බුදුන් වැඳ පැදකුණුකොට විහාරයට ගොස්

ආචාර්යඋපාධ්‍යායන් වහන්සේ දැක පාසිවුරු ගෙන "මහණදම් කරම්හ"යි නික්මුණාසේක.

ඉක්බිත්තෙන් ඒ හැමදෙනා වහන්සේ අතුරෙන් කුටුම්බියපුත්තතිස්ස ස්ථවිර නම් වූ භික්‍ෂු කෙනෙකුන් වහන්සේ කුසීතසේක, හීනවීර්‍ය්‍යසේක, රසයෙහි ගිජුසේක. උන්වහන්සේ මෙසේ සිතුසේක "මම වල්හි (වනයෙහි) වසන්ටවත්, වීර්‍ය්‍ය කරන්ටවත්, පිඬුසිඟා යන්ටවත් අසමර්ත්‍ථ යෙමි. එසේ හෙයින් මට ගමනින් කවර ප්‍රයෝජනයෙක්ද? නොගොස් රඳමි"යි පසුබට වීර්‍ය්‍ය ඇති භික්‍ෂූන් වහන්සේ පසුපස්සේ මඳ තැනක් ගොස් රැඳුනුසේක. අවශේෂ වූ භික්‍ෂූන් වහන්සේත් කොසොල් දනව්වෙහි චාරිකා කෙරෙමින් පසල් (පිටිසර) දනව්වෙහි එක්තරා ගමකට ගොස් ඒ ගම් නිසා එක් වනයක වස්වැස වස්තුන් මස ඇතුළත වීර්‍ය්‍ය කෙරෙමින් විදර්‍ශනා වඩා ගැබ්ගන්වා(මගපල ලැබීමට ආසන්න වන තරමට දියුණුකොට) මහීකම්පා කෙරෙමින්(පොළව ගුගුරුවා) අරහත්ඵලයට පැමිණ වස් අන්තයෙහි පවරා(පවාරණයකොට) වඩනා ලද ගුණධර්‍මය සර්‍වඥයන් වහන්සේට කියම්හ"යි ඒ වනයෙන් නික්ම අවුත් ක්‍රමයෙන් ජේතවනයට පැමිණිසේක. පාසිවුරු තැන්පත්කොට තබා ආචාර්‍ය්‍ය උපාධ්‍යායන් වහන්සේ දැක නැවත සර්‍වඥයන් වහන්සේ දක්නා කැමතිව බුදුරජාණන් වහන්සේ සමීපයට ගොස් නමස්කාරකොට උන්සේක.

සර්‍වඥයන් වහන්සේ ඒ භික්‍ෂූන් වහන්සේ හා සමග මිහිරි වූ පිළිසඳර කථා කළසේක. ඒ භික්‍ෂූන් වහන්සේ කරනලද

සුවදුක් කථා ඇතිසේක් තමන්වහන්සේ විසින් ලබනලද ගුණධර්‍මයන් සර්‍වඥයන් වහන්සේට දැන් වූසේක. බුදුරජාණන් වහන්සේත් ඒ භික්‍ෂූන් වහන්සේට ප්‍රශංසා කළසේක. එකල ඒ කුටුම්බියපුත්තතිස්ස ස්ථවිරයන් වහන්සේ සර්‍වඥයන් වහන්සේට ඒ භික්‍ෂූන් වහන්සේගේ ගුණකථාව කියන්නා අසා තමන්වහන්සේත් මහණදම් කරනු කැමතිසේක. ඒ අවශේෂ භික්‍ෂූන් වහන්සේ "ස්වාමීනි, අපි අඹ වනයට ගොස් වසමෝදැ"යි සර්‍වඥයන් වහන්සේ අතින් විචාළසේක. සර්‍වඥයන් වහන්සේ "යහපතැ"යි අනුදත් කල්හි ඒ භික්‍ෂූන් වහන්සේ බුදුරජාණන් වහන්සේට නමස්කාරකොට තමන්වහන්සේගේ පිරිවෙන්වලට(ලැගුම් ගන්නා තැන්වලට) ගියසේක.

ඉක්බිත්තෙන් ඒ කුටුම්බියපුත්තතිස්ස ස්ථවිරයන් වහන්සේ රාත්‍රි භාගයෙහි අධිකකොට වඩනාලද වීර්‍ය්‍ය ඇතිව මහත් වූ වේගයෙන් මහණදම් කරණසේක් මධ්‍යමයාමයෙහි ආලම්බන ඵලකයෙහි(සක්මන් මළු කෙළවරක පනවා ඇති ලෑල්ලෙහි) වැතිර සිටම නිදමින් පෙරළී වැටී කලවේ ඇට බිඳගත් වේදනා බලවත් විය. අවශේෂ භික්‍ෂූන් වහන්සේ උන්වහන්සේට බෙහෙත් ආදිය බැඳ පරිහරණය කිරීමෙන් (රැකබලා ගැනීම නිසා) යා නුහුනුසේක.

ඉක්බිත්තෙන් උපස්ථාන වේලාවට ඒ භික්‍ෂූන් වහන්සේත් ආ කල්හි සර්‍වඥයන් වහන්සේ "මහණෙනි, තෙපි සෙට යම්හයි කියා ඊයේ අපට කීවා නොවේදැ"යි විචාළසේක. "එසේය

ස්වාමීනි, යම්හයි කීම්හ, එතකුදුවුවත් අපට සහාය වූ කුටුම්බියපුත්තතිස්ස ස්ථවිරයෝ නොවේලේ අධික වේගයෙන් මහණාදම් කෙරෙමින් නිද්‍රාවෙන් මඩනා ලදුව(නිදිබරින් මිරිකී) පෙරළී වැටී හුන්හ. උන්ගේ කලවේ ඇට බිඳුනේය. උන් නිසා අපගේ ගමන් බාධාවීය"යි දැන් වුසේක. එකල්හි සර්‍වඥයන් වහන්සේ "මහණෙනි, මොහු තමන්ගේ හීනවීර්‍ය්‍යකමින් නොකල්හි අධික වේගයෙන් වීර්‍ය්‍යකොට තොපගේ ගමනට අන්තරාය කෙළේ දැන්මතු නොවෙයි, පෙරත් මෙතෙම තොපගේ ගමනට අන්තරාය කෙළේ වේදැ"යි වදාරා ඒ භික්‍ෂූන් විසින් ආරාධිත වූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස ගන්‍ධාර රට තක්සලා නුවර බෝධිසත්‍වයෝ දිසාපාමොක් ආචාර්‍ය්‍ය පන්සියයක් මානවකයන්ට ශිල්ප උගන්නාහුය. ඉක්බිත්තෙන් එක් දවසක් මානවකයෝ දර ගෙනෙන පිණිස වලට (වනයට) ගොස් දර කඩන්නාහුය. ඔවුන් අතුරෙන් කුසීත මානවකයෙක් මහත් වූ ලුණුවරණ ගසක් දැන "මේ මළ ගසෙකැ"යි යන සංඥාවෙන් "මද ඇසිල්ලක් වැදහෙව පසුව ගසට නැගී දර කඩාලා ඇරගෙන යෙමි"යි උතුරුසළුව අතුට වැදහෙව, නසා හඬවමින් (ගොරවමින්) නිදන්නේය. සෙසු මානවකයෝ දරමිටි බැඳ ඇරගෙන යන්නාහු ඒ නිදන්නා වූ මානවකයාට පිටිපල්ලෙන් ගසා පොබයා(පිටිපතුලෙන් ඇන අවදිකරවා) ගියාහුය. ඒ කුසීත මානවකයා නැගීසිට ඇස නිදි පිස පිස නිදි පලායා නොදීම(නිදිබර ගතියෙන්ම) ලුණුවරණ ගසට නැගී අත්තක් අල්වාගෙන තමා දිසාවට ඇද බිඳිනේ බිඳි නැගී(කැඩී විසි

වූ) අතු කෙළෙවරින් තමාගේ ඇස සිල්කොටගන එක් අතකින් ඇස වසා අනික් අතින් නොමළදර(අමුදර) කඩා ගසින් බැස දරමිටියක් බැඳ ඔසවාගෙන වහාගොස් ඒ මානවකයන් විසින් එලනලද දරමිටි මත්තේ එලූයේය.

එදවස්ම දනව්ගමෙක එක් කුලයක මනුෂ්‍යයෝ "බමුණන් ලවා ශාන්ති කරවා(සෙත් කරවා) දනුත් දී දක්ෂිණාවත්(තුටුපඬුරුත්) දෙම්හ"යි ආචාරීන් පැවරූය(ආචාරීන්ට ආරාධනා කළෝය). එකල්හි ආචාරීහු මානවකයන්ට කියන්නාහු "දරුවෙනි, සෙට එක් ගමකට යා යුතුය, එසේ හෙයින් තෙපි හැම නිරාහාරව යන්ට අසමර්ථව වේදැයි උදෑසනම කැඳ පිසවා අනුභවකොට ගොස් තොප ලබන කොටසුත් අපට පැමිණි කොටසුත් එක්කොට ඇරගෙන එව"යි කීවාහුය. එබස් ඇසූ මානවකයෝ කැඳ පිසනු පිණිස කෙල්ල (දාසිය) පුබුදුවා නගාසිටුවා "වහා අපට කැඳ පිසව"යි කිවාහුය. ඒ කෙළි කැඳ පිසනු පිණිස දර ගනිමින් මත්තේ තුබූ අමු ලුණුවරණ දඬු ගින්නේ ලා නැවත නැවත පිඹත් ගිනි දල්වාගත නොහී ඉරුනැංවූවාය. මානවකයෝ "ඉතා දහවල්ව ගියේය, දැන් යන්ට නොපිළිවනැ"යි කියා ආචාරීන් සමීපයට ගියෝය.

ආචාරීන් වහන්සේ කියනසේක් "දරුවෙනි, කුමක් පිණිස නොගියාදැ"යි විචාළෝය. "එසේය, ආචාරීන් වහන්ස නොගියම්හ"යි කී කල්හි "කවර කාරණයකින් නොගියාහුදැ"යි කිවුය. "ස්වාමීනි, අසවල් කුසීත මානවකයා අප හා සමග

දරට ගොස් ලුණුවරණ ගසක් මුල වැදහෙව, නිදාපියා පසුව වහ වහා ගසට නැගී ඇසත් සිල්කොටගෙන අමු ලුණුවරණ දර ඇරගෙන අප විසින් පළමුකොට ගෙනවිත් එලනලද දර මත්තෙහි එලීය. කැඳ පිසන තැනැත්තී ඒ වියළි දරයයි යන සංඥාවෙන් ගින්නේ ලා පිඹින්නී හිරු නැගෙනතුරු ගිනි මොළවා ගත නුහුණුව, මේ කාරණයෙන් අපගේ ගමනට බාධා වීය"යි කීහ. ආචාරී මානවකයා කළ කාර්යය අසා "අඥාන සත්ත්වයන්ගේ කාරිය නිසා මෙබඳු ලාභ හානියෙක් වීය"යි කියා මානවකයන්ට "මෙසේ යම් කිසි පුද්ගලයෙක් මේ පළමුකොට කළමනාදෙය, මේ පසුව කළමනාදෙයයි මෙසේ පරීක්ෂා නොකොට පළමුකොට කළමනා කටයුතු පසුව කෙරේද? ඒ අඥාන පුද්ගලතෙමේ අමු ලුණුවරණ දර කඩා ගෙනාවා වූ අපගේ මානවකයා මෙන් පශ්චාත්තාපයට (පසුතැවිලි වීමට) පැමිණ සෝකකොට හඬන්නේය"යි මෙසේ මහබෝසතාණෝ අතවැස්සනට මේ කාරණය කියා දානාදී වූ පින්කම්කොට ජීවිතාන්තයෙහි කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ "මහණෙනි, මොහු තොපගේ ගමනට අන්තරාය කෙළේ දැන්මතු නොවෙයි, පෙරත් කෙළේමය"යි මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදාරා පූර්වාපරසන්ධි ගළපා මේ 'වරණ ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි අක්ෂිභෙදයට(අස බිඳ ගැනීමට) පැමිණි මානවකයා නම් දැන් මේ උරුභේදයට(කලවා ඇට බිඳ

ගැනීමට) පැමිණියා වූ මහණය. සෙසු මානවකයෝ නම් දැන් මේ බුදුපිරිසය. ආචාර්ය්‍ය බ්‍රාහ්මණ වූයේ තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 072. සීලවනාගරාජ ජාතකය

තවද ශාන්ත වූ වෘත්ති(පැවතුම්) ඇති තිලෝගුරු බුදුරජාණන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසනසේක් දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

දම්සභා මණ්ඩපයට රැස් වූ භික්‍ෂූන් වහන්සේලා “ඇවැත්නි, දෙවදත්ත ස්ථවිරයෝ අකෘතඥයෝය, සර්‍වඥයන් වහන්සේගේ ගුණ නොදනිති”යි කියමින් උන්සේක. ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩ “මහණෙනි, මා එන්නට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව හුනුදැ”යි විචාරා “මෙනම් කථාවකින් යුක්තව උනුම්හ”යි කී කල්හි “මහණෙනි, දෙවදත්ත ස්ථවිරයෝ අකෘතඥවූවෝ දැන්මතු නොවෙයි, පෙරත් අකෘතඥයෝ යයි, කිසි කලෙකත් මාගේ ගුණ නොදන්නෝමය”යි වදරා ඒ භික්‍ෂුන් වහන්සේ විසින් ආරාධිත වු බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහබෝසතාණෝ හිමාලය වනයෙහි ඇත් යොනියෙහි උපන්නාහුය. ඒ බෝධිසත්වයෝ මව්කුසින් බිහිවන තැනැත්තෝ සර්වාංගයෙන්

ධවල වූය(මුළු ශරීරයෙන්ම සුදු පැහැ අත්තෙක් විය). රිදී පිඩැල්ලෙක්(රිදී කුට්ටියක්) හා සමානයෝය. ඒ බෝධිසත්වයන්ගේ ඇස් ඉඳුනිල්මිණිවට දෙකක් (ඉන්ද්‍රනීල මාණික්‍ය බෝල දෙකක්) මෙන් ප්‍රකාශව(පැහැදිලිව) පෙනෙන්නා වූ පඤ්ච ප්‍රාසාදයෙන්(පස් පැහැයකින්) හොබනේය, මුඛය රත්පලසක් හා සමාන වන්නේය(කට රතු පලසක් සේ රතුපාටින් යුක්තය), සොඬ ස්වර්ණබින්දුයෙන් (කහපාට පුල්ලිවලින්) හෙබියා වූ රජතදමයක් හා සමාන වන්නේය(රිදියෙන් කළ මල්මාලාවක් සේ සුදු පැහැයෙන් යුක්තය). සතරපය ලාක්‍ෂාරසයෙන් පිරියම් කරන ලද්දක් වැන්නේය(පාද හතර ලාකඩවතු ගෑවාක් මෙන් රත් පැහැ ඇත්තේය), මෙසේ ඒ මහබෝසතාණන්ගේ දසපාරමිතාවෙන් අලංකෘත වූ(දශ පාරමිතානු භාවයෙන් ශොභමාන වූ) රූපාග්‍රප්‍රාප්ත වූ(රුවින් අගතැන්පත්) ආත්මභාවය විය.

ඉක්බිත්තෙන් විඤ්ඤූබවට(නුවණැතිබවට) පැමිණියා වූ ඒ බෝධිසත්වයන්ට ඒ සියලු හිමාලය වනයෙහි හස්තීහු රැස්ව උපස්ථාන කෙරෙමින් ඇවිදිනාහුය. මෙසේ ඒ මහබෝසතාණෝ අසූදහසක් ඇතුන් පිරිවරා හිමාලය වන ප්‍රදේශයෙහි වසන්නාහුය. මෑතභාගයෙහි ගෙණහි(සෙසු ඇත්රැළ හා එක්ව වසීමෙහි) දෝෂ දැක ගණයා කෙරෙන් කාය විවේකකොට(සමූහවාසයෙන් ඉවත්වීම නිසා කායික සන්හිඳියාව ලැබ) උදකලාව වල්හි(වනයෙහි) වාසය කළාහුය. ඒ බෝධිසත්වයන් වහන්සේ සිල්වත් බැවින් 'සීලවනාගරාජය'යි කියා මේ නමින් ප්‍රසිද්ධ විය. එකල බරණැස් නුවර වැසි එක්

වනචරයෙක් (වනයෙහි හැසිරෙන්නෙක්) හිමාලය වනයට වැද තමා ජීවිකාවෘත්තිය කරන්ට නිසි භාණ්ඩයන් සොයන්නේ දික් නියම කොටගත නොහි(දිසාව හඳුනා ගැනීමට අසමත්ව) මංමුළාව වල්මත්ව හයින් භයපත්ව දෝත හිස තබා අඬමින් ඇවිදිනේය. මහබෝසතාණෝ ඔහුගේ ඒ බලවත් වූ බැගෑහඬ අසා මේ පුරුෂයා සමීපයට එළඹිකල් ඒ පුරුෂතෙම බෝධිසත්වයන් දැකලා හයින් පලා ගියේය. බෝධිසත්වයෝ ඔහු යන්නා දැක සිටතෙනම සිටපුව(නතර විය). ඒ පුරුෂයා බෝධිසත්වයන් සිටියා දැක තෙමේත් සිටියේය. බෝධිසත්වයෝ නැවත නික්මුනාහුය. ඒ පුරුෂයා නැවත පලාගොස් බෝධිසත්වයන් සිටිවේලේම සිට මෙසේ සිතුයේය. "මේ හස්තිරාජයා මට අවැඩක් කැමති එකෙක් නොවෙයි, මේ දුකින් මුදනු කැමැත්තේවනැ"යි නිර්භීතව සැකයක් නැතිව සිටියේය. බෝධිසත්වයෝ ඔහු කරා ගොස් "පින්වත් පුරුෂය, තෝ කවර කාරණයකින් හඬමින් ඇවිදිනේදැ"යි විචාළෝය. "ස්වාමීනි, දික් නියම කොටගත නොහී මංමුළාව මරණ හයින් භයපත්ව ඇවිදිමි"යි කීය.

ඉක්බිත්තෙන් ඕහට බෝධිසත්වයෝ තමන් වසන තැනට ගොස් කීපදවසක් එලාඵලයෙන් සතපා "පින්වත් වූ පුරුෂය, තෝ නොබව මම තා මනුෂ්‍යපථයට (මිනිසුන් වසන පෙදෙසට) ගෙනයෙමි"යි කියා තමන් පිට හිඳුවාගෙන මනුෂ්‍යපථයට නික්මුනාහුය. ඉක්බිත්තෙන් ඒ මිත්‍රද්‍රෝහී පුරුෂයා "කිසිවෙක් විචාළේ නම් කියයුතු වන්නේය"යි බෝධිසත්වයන් පිට ඉඳුවා යන වේලෙහි වෘක්ෂ නිමිත්ත පර්වත

නිමිත්ත සලකමින්(ගස් ගල් තිබෙන තැන් සිහියේ තබාගනිමින්) යන්නේය. ඉක්බිත්තෙන් බෝධිසත්වයෝ අසත්පුරුෂයා වනයෙන් පිටත්කොට බරණැස් නුවරට යන්නා වූ මහමාවත සිටුවා "පින්වත් පුරුෂය, මෙ මගින් යව, මා විචාළ කෙනෙකුන්ට නොකියව"යි ඔහු යවා මහබෝසතාණෝ පෙරලා තමන්වහන්සේ වසන්නාවූ ස්ථානයට ගියේය.

ඉක්බිත්තෙන් ඒ පුරුෂයා බරණැස් නුවරට ගොස් ඒ නුවරවට ඇවිදිනේ දන්තකාර වීථියට(ඇත්දත් කර්මාන්තය කරන්නවුන් සිටි වීථියට) පැමිණ දන්තවිකෘති කරන්නා(ඇත් දළවලින් විවිධ භාණ්ඩ සාදන්නා) දැක "කිමෙක්ද? පින්වත්නි, ජීවදන්ත(පණපිටින් සිටින ඇතුන්ගේ දළ) ලද්දේත් ගනුදැ"යි විචාළේය. එබස් ඇසූ දළවඩුවෝ කියන්නෝ "පින්වත, තෝ කුමක් කියම්ද? ජීවදන්ත නම් මළ ඇතුන්ගේ දළට වඩා ඉතා මාහැඟිවේදැ"යි කිවුය. "එසේ නම් මම තොපට ජීවදන්ත ගෙනෙමි"යි කියා මාර්ගෝපකරණ ගෙන කර්කශ වූ (මොට්ට, රළු) කියතක් ගෙන බෝධිසත්වයන් වසන්නා වූ ස්ථානයට ගියේය. බෝධිසත්වයෝ ඔහු දැක "කුමක් නිසා අවුදැ?"යි විචාළෝය. "ස්වාමිනි, මම දුක්ඛිතයෙමි, කෘපණයෙමි(දිළිඳු වෙමි), ජීවත්ව ගත නොහෙමි, නුඹවහන්සේගෙන් දළ කැබෙල්ලක් ඉදින් දුන්සේක් වීනම් දළ කැබැල්ල ඇරගෙන ගොස් විකොට ඒ මිලයෙන් ජීවත්වෙමි සිතා ආමි"යි කීය.

එබස් ඇසූ මහබෝසතාණෝ "පින්වත, වන්නාටය(ඊට කම් කිම්ද?) තට දළ දෙමි, දළ කපන්ට කියතෙක් ඇද්දැ"යි

විචාළෝය. "කියත ඇරගෙන ආමි"යි කීය. "එසේ වීනම් කියතින් දළ කපා ගනුව"යි කියා බෝධිසත්ත්වයෝ පා හකුළුවා උරවිලා(ගොණෙකු වැදහොවින ලෙස) වැදහුන්නාය. ඒ අසත්පුරුෂයා බෝධිසත්ත්වයන්ගේ දළ අක් දෙකම(දළ කෙළවරවල් දෙකම) කපා ගත්තේය. බෝධිසත්ත්වයෝ ඒ දළ කැබලි දෙක සොඬින් ගෙන "පින්වත් වූ පුරුෂය, මට මේ දළ දෙක අප්‍රියයි, අමනාපයයි නොදෙමි, මාගේ මේ දළ දෙක මීට වඩා දහසක් ගුණයෙන් ලක්ෂයක් ගුණයෙන් සර්වධර්මයන් සර්වාකාරයෙන් ප්‍රතිවේධ කරන්ට (සියළු දහම් සියළු අයුරෙන් දැනගැනීමට) සමර්ත්ථ වූ සර්වඥතාඥාණය නැමති දත්තයෝ අතිශයින් මට ප්‍රිය වන්නාහුය. මේ මාගේ දන්තදානය සර්වඥතාඥාණ ප්‍රතිවේධයට ප්‍රත්‍යය වේවා"යි කියා සර්වඥතාඥාණය ඇපකොට දළ සගල දුන්නාහුය.

ඒ අසත්පුරුෂ වූ පාපියා දළ සගල ගෙනගොස් විකුට ඒ මිල නිමාගිය කල්හි (ඒ මුදල අවසන් වූ පසු) නැවතත් බෝධිසත්ත්වයන් සමීපයට අවුත් "ස්වාමීනි, නුඹවහන්සේගේ දළ විකොට ලබනලද මිළ මාගේ ණය ගෙවාලන්ට පමණක් සෑහින, එසේ හෙයින් ඉතිරි දළ දුනමැනවැ"යි කීය. බෝධිසත්ත්වයෝ "යහපතැ"යි ගිවිස පළමු පරිද්දෙන් කප්පවා ඉතිරි දළ දුන්නාහුය. ඒ පුරුෂයා ඒ දළත් විකොට නැවත අවුත් "ස්වාමීනි, ජීවත්ව ගත නොහෙමි, මුල් දළ(දෙදළ මුල් කොටස්) දුනමැනවැ"යි කීය. බෝධිසත්ත්වයෝ "යහපතැ"යි ගිවිස පළමු පරිද්දෙන්ම දුන්නාහුය. ඒ පාපී පුරුෂයා මහබෝසතාණන්ගේ රිදීදමක් හා සමාන වූ සොඬ මඩිමින්

කෛලාසකූටය(සුදුපාටින් බබළන කෛලාශ නම් පර්වත මුදුන) හා සදෘශ වූ(සමාන වූ) කුඹමත්තට නැගී දෙදළ විලුඹින් ඇන මස් පීරා රළු කියතින් මුල්දළ කපාගත නොහී වෙහෙසෙන රශ බලා සොඬගින් කියත කොණ අල්වා දළ කපා මුල් සිඳුවා ගෙන ගියෝය.

ඒ පාපී වූ පුරුෂයා මහබෝසතාණන්ගේ දෘෂ්ටිපථයෙන්(ඇසට පෙනෙන මානයෙන්) ඉවත්ව ගියෙන් මඳකින්ම දෙලක්‍ෂ සතළිස්දහසක් ඝනකඩ මහබොල්පොළව(මහා ඝනකමින් යුත් පොළව) සිනේරු යුගන්ධාරාදී වූ භාරයන්ද(මහාමෙර, යුගන්ධර පර්වත ආදී මහා වස්තූද) හා දුර්ගන්ධ පිළිකුල් මලමුත්‍රා දියද ධරන්ට සමර්ථ වන්නේ වී නමුත් මහබෝසතාණන්ගේ ගුණ රාශිය ධරාගත නොහෙන්නීය මෙන් පැළී විවර වුව. එකෙණෙහිම අවීචි මහනරකයෙන් වහ්නිජ්වාලා(ගිනිදැල්) නික්ම ඒ මිත්‍රද්‍රෝහී පුරුෂයා කුලසන්තක වූ රතු පලසකින්(තම පරපුරට උරුම වූ රත් පැහැති කම්බිලියකින්) පොරවන්නාක් මෙන් වසාගෙන අවීචි මහානරකයට ගෙන ගියේය. මෙසේ පාපී වූ පුද්ගලයා පොළවට වන්කල්හි ඒ වන ලැහැබ වසන්නා වූ වෘක්‍ෂ දේවතාවා "අකෘතඥ මිත්‍රද්‍රෝහී පුද්ගලයාට චක්‍රවර්ති රාජ්‍යශ්‍රීය දීත් සතුටු කරවන්ට නොපිළිවනැ"යි වන ලැහැබ එක නින්නාදකොට මෙසේ ධර්මදේශනා කෙළේය. බෝධිසත්වයෝ ආයු පමණින් සිට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ “මහණෙනි, දෙවදත්ත ස්ථවිරයෝ අකෘතඥ වූවෝ දැන්මතු නොවෙති, පෙරත් ආකෘතඥ වූවෝම වේදැ”යි මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදරා මේ ‘සීලවනාගරාජ ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි මිත්‍රද්‍රෝහී පුරුෂයා නම් දැන් දෙවදත්ත ස්ථවිරයෝය. වෘක්ෂ දේවතාවා නම් ශාරිපුත්‍ර ස්ථවිරයෝය, එසමයෙහි සීලවනාගරාජ වූයෙම් දැන් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 073. සච්චංකිර ජාතකය

තවද එක් සමයෙක්හි ශාක්‍යකුල ප්‍රදීප වූ(ශාක්‍යවංශයට පහනක් බඳු වූ) තිලෝගුරු බුදුරජාණන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසනසේක් වධයට (හිංසා කිරීම සඳහා) උත්සාහ කිරීමක් අරභයා මේ ජාතකය වදාළසේක.

භික්ෂුසංඝයා වහන්සේ දම්සභා මණ්ඩපයෙහි රැස්ව හිඳ “ඇවැත්නි, දේවදත්ත ස්ථවිරයෝ සර්වඥයන් වහන්සේගේ ගුණ නොදනිති. වධයට උත්සහ කෙරෙති”යි දේවදත්ත ස්ථවිරයන්ගේ නුගුණ කියමින් උන් කල්හි ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩ “මහණෙනි, මා එන්නට පූර්වභාගයෙහි කවර නම් කථාවකින් යුක්තව උනුදැ?”යි විචාරා “මෙනම් කථාවකින් යුක්තව උනුම්හ”යි කී කල්හි “මහණෙනි, දෙවදත්ත ස්ථවිරයෝ දැන්මතු නොවෙති

මට වදයට උත්සාහ කළෝ, පෙරත් උත්සාහ කළෝම වේදැ''යි වදරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි ඒ රජ්පුරුවන්ගේ දුෂ්ටකුමාර නම් පුත්‍රයෙක් විය. ඔහු කර්කෂය, ඵරුෂය, ප්‍රහටාශි විෂයක්හු(දණ්ඩෙන් පහර කෑ සර්පයෙකු) සමානය, නොබැන නොගසා කිසි කෙනෙකුන් හා කථා නොකරන්නේය. ඒ කුමාරතෙම ඇතුළෙහි ජනයාටත් පිටත ජනයාටත් ඇස හුණු රජසක්(ඇසේ වැටුණු කුණක්) මෙන්ද කන්නට ආ යකෙකු මෙන්ද අප්‍රිය වන්නේය. උද්වේග(භය) උපදවන්නේය. ඒ කුමාරතෙම එක් දවසක් ගංගාවෙහි ජලක්‍රීඩා කරනු පිණිස මහපිරිවරින් ගංතෙරට ගියේය. එකෙණෙහි මහත් වූ මේඝයක්(වැහි වළාකුළක්) නැංගේය. සියළු දිග්(දිසා) අන්ධකාර විය. ඒ කුමාරතෙමේ දාස කර්මකාරාදීන්ට(දාස කම්කරු ආදීන්ට) කියන්නේ ''සගයෙනි, මෙසේ එව, මා කැඳවාගෙන ගංගා මාධ්‍යට ගෙනගොස් නහවා ගෙනව''යි කීයේය.

එබස් ඇසූ දාස කම්කාරදීහූ ඒ කුමාරයා ගංගා මධ්‍යයට ගෙනගොස් ''රජ්පුරුවන් වහන්සේ අපට කුමක් කරනසේක්ද? මේ පාපී වූ පුරුෂයා මෙතැන්හිම මරම්හ''යි මන්ත්‍රණයකොට ''කාලකන්නිය, මෙසේ එව''යි කියා ඔහු දියේ ලා ගොඩ නැගී ගංතෙර සිටියාහුය. ''කුමාරයෝ කොයිදැ?''යි විචාළ කල්හි ''අපි කුමාරයන් නුදුටුම්හ. වැසි නැගුවා(වැසි වසිනු) දැක දිය

කිම්ද ඉදිරයෙහි ආයේ වනැ''යි කියා අමාත්‍යයෝ රජ්ජුරුවන් සමීපයට ගියාහුය. ''රජ්ජුරුවෝ කුමාරයා කොයිදැ?''යි විචාළෝය. ''ස්වාමීනි, නොදනුම්හ. වැසි නැගූ කල්හි ඉදිරියේ ආසේක්වනැයි(පළමුව එන්නට ඇතැයි) සිතා ආම්හ''යි කීහ. එබස් ඇසූ රජ්ජුරුවෝ ''වාසල්දොර හරවා ගංතෙරට ගොස් පරීක්‍ෂා කරව''යි ඒ ඒ තැන බැලූය. මෙසේ බලා කිසිවෙක් කුමාරයා නුදුටුයේය.

ඒ කුමාරයෝ මේඝයෙන් අන්ධකාරව වැසි වසින්ට පටන්ගත් කල්හි දියෙන් යන්නා වූ එක් දඬුකඩක් දැක එහි හිඳ මරණ භයින් තැතිගෙන අඬ අඬා යෙති. එකල බරණැස් නුවරවාසී වූ එක් සිටුපුත්‍රයෙක් ගංතෙර සතළිස් කෙළක් ධන නිධානකොට වස්තු ලෝභයෙන් ඒ නිධානය සමීපයෙහි සර්පව උපන්නේය. අනික් සිටුපුත්‍රයෙක් ඒ මහගංගා ප්‍රවාහ දේශයෙහි(මහා ගං සැඩ දියපහර ඇති පෙදෙසෙහි) තිස් කෙළක් ධන නිධානකොට ධන තෘෂ්ණාවෙන් එහිම මුසිකව (මීයෙක් ව්) උපන්නේය. ඔවුන් දෙදෙනා වසන්නා වූ ස්ථානයට වතුරුවන්නේය(ජලය ගලා ආයේය). ඔහු දෙදෙනා දියවන් මගින් නික්ම(ජලය ගලා ආ පාරෙන් නික්ම) ගඟ සරස(හරහා) පීනා ගෙනගොස් ඒ රාජකුමාරයන් එල්බගෙන යන්නා වූ දඬුකඩ සමීපයට පැමිණ දෙන්නාම දෙකෙළවරට නැඟී කඳපිට හොත්තාහුය. තවද එම ගංතෙර එක් දිඹුල් රුකෙක් ඇත. එහි ගිරාපෝතකයෙක්(ගිරා පැටවෙක්) වසන්නේය. ඒ වෘක්‍ෂයත් දියෙන් මුල් සේදී ගඟ මත්තෙහි හිණ. ගිරාපෝතකයා වැසි වසින්ට පටන්ගත් කල්හි නැඟී පලා යා

නොහී(යාමට නොහැකිව) එම දඬුකඩෙහි එක් පසෙක උන්නේය.

මෙසේ සතරදෙනා එක්ව ගඟ වතුරෙන් යන්නාහුය. එකල්හි අප මහබෝසතාණෝ කසීරට ප්‍රසිද්ධ වූ බ්‍රාහ්මණ වංශයෙහි ඉපිද වැඩිවිය පැමිණ සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ඒ ගඟ වක්කලමක(වංගුවක් වූ බොක්කක් මත) පන්සලක් කොටගෙන වාසය කරන්නාහුය. ඒ මහබෝසතාණෝ මධ්‍යම රත්‍රී වේලෙහි සක්මන් කරන්නාහු ඒ රාජ කුමාරයන්ගේ බලවත් වූ බැගෑපත් අඬ අසා මෙසේ සිතූය. “මෙබඳු වූ මෛත්‍රී කරුණාවෙන් යුක්ත වූ තාපසයකු බලා සිටියදී මේ පුරුෂයාගේ මරණය සුදුසු නොවෙයි. දියෙන් ගොඩනගා ඔහුට ජීවිත දානය දෙමි”යි සිතා මහබෝසතාණෝ “ඕහට නොබව”යි කියා අස්වසා ගඟට බැස දිය සරස පීනා ගෙනගොස් ඒ දඬුකඩ එක් කෙළවරක් අල්වාගෙන අදිනාහූ නාගබල(ඇතෙකුගේ ශක්තිය) ඇති ශක්ති සම්පන්න වූ මහබෝසතාණෝ එක වේගයෙන්ම ගංතෙරට පැමිණ කුමාරයන් ඔසවා ගෙනගොස් ගොඩ සිටුවා ඒ නාග සර්පාදිනුත් ගොඩනංවා පන්සලට ගෙනගොස් ගිනි මොලවා “මේ සර්පාදීහු තිරිසන් හෙයින් දුර්වල වෙද්දැ”යි පළමුකොට ගිනි තප්පවා සීත සන්සිඳුවා ආහාර දෙන්නා වූ පළමුකොට සර්පාදීන්ටම දී පසුව රාජකුමාරයන්ට එලාඑල දුන්නාහුය. එකල රාජකුමාරයෝ “මේ කූට තාපසයා මා රජකුමාරයයි නොසිතා තිරිසනුන්ට සත්කාර සම්මානකොට සම්භාවනා

කරන්නේය''යි බෝධිසත්ත්වයන් කෙරෙහි ආඝාත(වෛර) බැන්දේය.

ඉක්බිත්තෙන් කීපදවසක් ගිය කල්හි ඈම දෙනම ඇගබල ඉදී(සිරුරට ශක්තිය ලැබී) ඝණ වතුරත් බට කල්හි(මහා දියකඳ බැස ගිය කල්හි) සර්පයා තාපසයන් වැඳ කියන්නේ ''ස්වාමීනි, නුඹවහන්සේ විසින් මට බොහෝ උපකාර කරනලද, මම වූකලී දිළිඳු වූ එකෙකිමුත් නොවෙමි, අසවල් තැන මාගේ සතළිස් කෙළක් ධන නිධානකොට තිබෙන්නේය, නුඹවහන්සේට වස්තුවෙන් ප්‍රයෝජනයක් ඇති කල්හි ඒ සියළු ධනය නුඹවහන්සේට දෙන්ට සමර්ථයෙමි, ඒ ස්ථානයට නුඹවහන්සේ අවුත් 'දීර්ඝය'යි කියා හඬගාලුව මැනවැ''යි කියා ගියෝය.

මීයාත් එසේම තාපසයන්ට වස්තුවෙන් පවරා ''අසවල් තැන සිට 'මූසිකය'යි කියා කැඳවුව මැනවැ''යි කියා ගියේය. ගිරවා වූකලී තාපසයන්ට වැඳ කියන්නේ ''ස්වාමීනි, නුඹවහන්සේ විසින් බොහෝ උපකාර කරන ලද්දේය, මට වස්තු නැත, නුඹවහන්සේට රත් ඇල් සාලෙන් ප්‍රයෝජනයක් ඇති කල්හි අසවල් තැන මා වසන්නා වූ තැනට අවුත් 'සුවපෝතකය'යි කියා අඬගාලුව මැනව, එකල මම මගේ නෑයන්ට කියා නොයෙක් සිය ගණන් ගැල් පුරණ පමණ රත්හැල් ගෙන දෙන්ට සමර්ථයෙමි''යි කියා ගියේය. රාජකුමාරයෝ වනාහී මිත්‍රද්‍රෝහී බැවින් කිසිවක් නොකියාම ඒ බෝධිසත්ත්වයන් ''තමන් සමීපයට ආකල මරමි''යි සිතාගෙන ''ස්වාමීනි, මා රාජ්‍යයෙහි පිහිටි කල්හි වැඩිය මැනව, මම

නුඹවහන්සේට සිව්පසයෙන් උපස්ථාන කෙරෙමි"යි කියා ගියෝය.

ඒ රජකුමාරයෝත් නුවරට ගොස් නොබෝ කලකින්ම රාජ්‍යයෙහි පිහිටියේය. බෝධිසත්ත්වයෝ "රාජකුමාරාදීන්ගේ සිත් පරීක්ෂා කෙරෙමි"යි සිතා පළමුකොට සර්පයා සමීපයට ගොස් නුදුරු තැනක සිට "දීර්ඝය"යි කියා බැනවූ (අඬගැසූ) සේක. දීර්ඝයා එක වචනයෙන්ම නික්ම අවුත් බෝධිසත්ත්වයන්ට වැඳ "කිමෙක්ද? ස්වාමීනි, මෙතන සතළිස් කෙළක් ධන ඇත. ඒ සියළු වස්තුවම මැත්(ඉවත්) කරවාගෙන ගිය මැනවැ"යි කීය.. බෝධිසත්ත්වයෝ "එසේ වීනම් වන්නාටය, මට කාරියක් පැමිණිකල ගන්නෙම්වේදැ"යි වදරා සර්පයා රඳවාපියා මීයා සමීපයට ගොස් අඬගෑවාහුය. ඒ මුසිකයාත් එපරිද්දෙන්ම පිළිගන්නේය. බෝධිසත්ත්වයෝ ඔවුන් නවතා ගිරාපෝතකයා සමීපයට ගොස් "සුවපෝතකය"යි බැණාවූය. ඒ ගිරවාත් එක වචනයෙන්ම ගස අතුරින් බැස බෝධිසත්ත්වයන් වැඳ "ස්වාමීනි, කිමෙක්ද? මාගේ නෑයන්ට කියා හිමාලය වන ප්‍රදේශයෙන් නුඹවහන්සේට සයංජාත හැල්(ඉබේ හටගත් ඇල් වී) හැරගෙන්වම්දැ?"යි විචාළෝය. බෝධිසත්ත්වයෝ "ප්‍රයොජනයක් ඇති කල්හි දන්නෙම්වෙදැ"යි ඔහුද වලකා "දැන් රජ්ජුරුවන් පරීක්ෂා කෙරෙමි"යි ගොස් රාජොද්‍යානයෙහි වැස දෙවැනි දවස් ආකල්හි සමුර්ධි(සන්සුන් ඉරියවු) ඇතිව පිඬු සිගන්නා වූ වතින්(ව්‍රතය අනුව) නුවරට වන්නාහුය.

එකෙණෙහි ඒ මිත්‍රද්‍රෝහී රජ්ජුරුවන් සරහා පිළියෙල කරනලද ඇත්කඳ මත්තට(ඇතු පිටට) නැගී මහත් වූ පෙළහරින් නුවර පැදුකුණු කෙරෙමින් රජ්ජුරුවෝ ඇත්කඳ මත්තේ හිඳ බෝධිසත්ත්වයන් දුරදීම දැක "මේ කූට තාපසයා මා සමීපයේ වළඳ වළඳා වසනු කැමතිව ආයේය. ඒ කාලකන්ණි යම්තාක් පර්ෂිත්(පිරිස) මධ්‍යයෙහි තමා මට කළගුණ ප්‍රකාශ කෙරේ නම් නපුර, ඊට පළමුකොටම ඔහුගේ හිස කප්පවම්"යි සිතා රාජපුරුෂයන් මුන බැලුවෝය. රාජපුරුෂයෝ "ස්වාමීනි, කුමක් කරමෝදැ?"යි කී කල්හි "මේ කූට තාපසයා මාගෙන් කිසිවක් ඉල්ලවනු කැමතිව ආයේයයි සිතමි, ඒ කාලකන්නි තාපසයා මා දැක්ක නොදී ඔහු අල්වාගෙන පිටතල හයා බැඳ(දෙඅත් පසුපසට කර බැඳ) සතර මංසන්නධියක් පාසා මරා මරා(ගස ගසා) නුවරින් පිටත්කොට දන්ගෙඩියෙහිදී ඔහුගේ හිස කපා මිණිය ගෙනගොස් ඇනපියව"යි(උල හිඳුවයි) විධාන කළෝය.

ඒ රාජපුරුෂයෝ රජ්ජුරුවන් කී බස් "යහපතැ"යි පිළිගෙන ගොස් නිරපරාධ වූ මහබෝසතාණන් බැඳගෙන සතර මංසන්ධියෙදී මරමින් දන්ගෙඩියට ගෙනයන්ට පටන් ගත්තාහුය. බෝධිසත්ත්වයෝ මැරූ මැරූ තැන්හිදී "මෑණියනි, පියාණනි" නොකියාම නොහඬා නිර්භීතකාරීව මෙසේ කියන්නාහුය. "මේ ලෝකයෙහි සමහර නුවණැති සත්ත්ව කෙනෙක් දියෙන් යන්නා වූ වියළි දණ්ඩක් දියෙන් ගොඩ නගාලීම යහපතැයි උතුමැයි කියන්නා හූ විනම් ඒ උත්තම ප්‍රාඥ පුරුෂයෝ සැබැවක්ම කියති. කවර කාරණයකින්ද? ඒ

දියෙන් නැගූ දඬුකඩ බත් ආදිය පිසීමටත්, සීතයෙන් පීඩිත වූ සත්‍වයන්ට සීත දුරු කරන්නටත් අන්‍ය වූ සර්පාදීන්ගෙන් වන්නා වූ උපද්‍රව දුරු කරන්නටත් උපකාර වන්නේය. සමහර මිත්‍රද්‍රෝහී වූ අකෘතඥ වූ පාපී වූ පුරුෂයා දියෙන් යන කල්හි අත අල්වා දියෙන් ගොඩ නගාලීම යහපත් නොවන්නේය. ඒ එසේ වේදැ, මේ පාපී වූ පුරුෂයා දියෙන් ගොඩනගා ගොඩලා මම්ම මට දුක් පමුණුවා ගත්තෙමි වේදැ”යි මෙසේ ගැසූ ගැසූ තැනදී මේ කාරණය කියන්නාවුය. එබස් අසා එතැනට රැස් වූ මනුෂ්‍යයන්ගෙන් යම් කෙනෙක් නුවණැත්තෝ වූනම් ඔහු මෙසේ කීවාවුහ.

“කිමෙක්ද? පින්වත් වූ තාපසයෙනි, තොප විසින් අපගේ රජ්ජුරුවන් වහන්සේට කළ කිසි ගුණයෙක් ඇද්දෝ”යි විචාළෝය. බෝධිසත්‍වයෝ එපවත් අසා කියන්නාහු “මම මොහු මහ වතුරෙන් යන්නාහු ගොඩනගා මම්ම මට දුක් කළෙමි. ඒකාන්තයෙන් පුරාතණයේ නුවණැත්තන් කීවා නොකෙළෙමි සිතා මෙසේ කියමි” කීවාහුය.

එබස් අසා ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණාදීන් හා නුවරවාසීහූ “මේ මිත්‍රද්‍රෝහී වූ රජ්ජුරුවෝ එබඳු ගුණ සම්පන්න වූ තමන්ට ජීවිත ධානය දුන්නා වූ තපස්වීන්ගේ ගුණ පමණකුත් නොදනිති. මොහුන් නිසා අපට වෙන වැඩෙක් නම් කොයින්ද. එසේ හෙයින් මොහු ගනුව”යි කිපී වටින් එක්ව කැට මුගුරු අඩයටි ආදී පහරින් ඇත් කඳ මස්තකයෙහිම රජ්ජුරුවන් මරා ජීවිතක්‍ෂයට පමුණුවා දෙකකුල් අල්වා ඇදගෙන ගොස්

අගලපිට(අගලට) දමා මහබෝසතාණන් අභිෂේකකොට රාජ්‍යයෙහි පිහිට වූහ.

ඒ මහබෝසතාණෝ දැහැමෙන් රාජ්‍යය කරන්නාහු එක් දවසක් සර්පාදීන් පරීක්‍ෂා කරනු කැමතිව මහ පිරිවරින් සර්පයා වසන තැනට ගොස් "දීර්ඝය"යි කියා බැණවූය. එවිට සර්පයා අවුත් වැඳ "ස්වාමීනි, නුඹවහන්සේ මේ වස්තුව ගත මැනවැ"යි කීය. රජ්ජුරුවෝ හතළිස් කෙළක් වස්තුව අමාත්‍යයන්ට පාවාදී මීයා සමීපයට ගොස් "මූසිකය"යි කියා බැණ වූසේක. ඒ මීයාත් එබස් අසා අවුත් තිස් කෙළක් වස්තුව පාවා දුන්නේය. රජ්ජුරුවෝ ඒ වස්තුව අමාත්‍යයන්ට පාවාදී ගිරවා වසන තැනට ගොස් "සුවපෝතකයැ"යි අඬගෑය. ගිරවාත් ඒ අසා අවුත් දෙපය වැඳ "කිමෙක්ද? ස්වාමීනි, රත්හැල් ගෙනෙම්දැ"යි කීය. රජ්ජුරුවෝ "ඇල්සාලෙන් ප්‍රයෝජනයක් ඇති කල්හි ගෙන්වා ගනිමි"යි "වරෝ යම්හ"යි කියා සැත්තෑ කෙළක් වස්තුව හා සමඟ තුන් දෙනාම කැඳවාගෙන නුවරට ගොස් ප්‍රාසාදයෙහි මතුමහල්තලයට නැගී වස්තු සංග්‍රහකොට (ගබඩාකොට) තබා සර්පයාට වසනු පිණිස රන් නලයක් කරවා, මීයාට වසනු පිණිස ස්ඵටික මාණික්‍යයමය වූ(පළිඟුවලින් සාදනලද) ගුහාවක් කරවා, ගිරවාට වසනු පිණිස රන් මැදිරියක්(කූඩුවක්) කරවා, සර්පයාට හා ගිරවාට ගොදුරු පිණිස දවසක් පාසා රන් තට්ටුවේ(තැටියක) මී හා විළඳ ලවා, මීයාට ගොදුරු පිණිස සුවඳ ඇල් සහල් රන් තට්ටුවේ මී ලවා දී ඔවුන් තුන් දෙනාට සංග්‍රහකොට දනාදී වූ පින්කම් කළාහුය. මෙසේ

සතරදෙනම දිවි පමණින් සමගි සතුටුව වැස ජීවිතාන්තයෙහි කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියාහුය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ "මහණෙනි, දේවදත්ත ස්ථවිරයෝ දැන් මතු මට වධ කළෝ නොවෙත්, පෙරත් වධයට උත්සහ කළෝම වේදැ"යි මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා වදරා පූර්‍වාපරසන්ධි ගළපා මේ 'සච්චංකිර ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි දුෂ්ට වූ රජ්ජුරුවෝ නම් දැන් දේවදත්ත ස්ථවිරයෝය. සර්පයා නම් ශාරිපුත්‍ර ස්ථවිරයෝය. මීයා නම් මෞද්ගල්‍යාන ස්ථවිරයෝය. ගිරවා නම් ආනන්ද ස්ථවිරයෝය. පසුව රාජ්‍යය කළ ධාර්මික රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 074. රුක්ඛධම්ම ජාතකය

තවද අසරණසරණ වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසනසේක්, දියදබරය නිසා තමන්ගේ නෑයන් මහත් වූ විනාසයට පැමිණෙන නියාව දැන ආකාශයෙන් ගොස් රෝහිණී නම් වූ ගංගාමස්තකයෙහි ආකාශයෙහි පළක් බැඳ වැඩහිඳ නිල් රැස් විහිදුවා ඒකාන්ධකාරකොට නෑයන් භයගන්වා ආකාශයෙන් බැස ගංතෙර වැඩහිඳ ඒ කලහය අරභයා මේ ජාතකය වදාළසේක.

මේ මෙහි සංක්ෂෙපයයි.(කෙටි විස්තරයයි) විස්තරය වූ කලී ‘කුණාල ජාතකයෙ’හි මතු පහල වන්නේය.

එසමයෙහි සර්‍වඥයන් වහන්සේ නෑයන්ට ආමන්ත්‍රණයකොට “මහරජ්ජුරුවනි, තොපි ඔවුනොවුන්ගේ නෑයොය, නෑයන් විසින් සමඟ සතුටුව වසන්ට වටනේයයි, නෑයන්ගේ සමගි බවක් ඇති කල්හි පසමිතුරෝ (සතුරෝ) අවකාශ නොලබති, මනුෂ්‍යයින්ට තබා සිත්පිත් නැත්තා වූ වෘක්‍ෂයන්ගේ සමගි බව වන්නේය”.

“අතීතයෙහි හිමාලය වන ප්‍රදේශයෙහි මහපවනෙක් සල්වනයෙක තරකොට හැමීය. ඒ සල්වනය ඔවුනොවුන් හා මහරුක් පැළෑටි ගස් කැලෑ ලතා ආදියෙන් වැළඳගත් එක රුකකුත් එළවන්ට(උදුරා බිම හෙළීමට) අසමර්‍ථව මුදුනෙන් මුදුනෙන් ම මහත් පවන් හමා ගියේය. ලතා ආදියෙන් වැළඳ ගැන්මක් නැතිව එලියෙහි සිටියා වූ අතුපතර වෙළෙප්(අතු සමූහය සහ දෙබල්) ආදියෙන් විශාල වූ ඒක් මහරුකක් සෙසු රුක්සේ ඒකාබද්ධ නොවූ බැවින් ඒ රුක් මුලිනුදුරා එලාපූයේය. මේ කාරණයෙන් තොප හැමදෙනා විසිනුත් සමඟිව සතුටුව වසන්ට වටනේය”යි වදාරා ඒ නෑයන් විසින් ආරාධිත වූ බුදුන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි පළමුකොට උපන්නා වූ වෙසමුණු රජ්ජුරුවෝ(වෛශ්‍රවණ නම් යක්කුනට අධිපති දිව්‍ය රජතුමා) චුත වූහ. ශක්‍ර දේවේන්ද්‍රයෝ අන් වෙසමුණු රජ කෙනෙකුන් නායකත්වයේ තිබූහ. ඒ වෙසමුණු රජ්ජුරුවන් ඉකුත්

චූ(චුත වූ පසු) කල්හි පසුව උපන් වෙසමුණු රජ්ජුරුවෝ "මහරුක්ගස් කැලෑ ලිය ආදීන් අතුරෙන් තමන් කැමති කැමති තෙනක විමන් ගනිත්ව"යි කියා අසුන් යැවූය. එසමයෙහි අප මහබෝසතාණෝ හිමාලය වන ප්‍රදේශයෙහි එක් සල්වනයෙක රුක්‍ෂ දේවතාව උපන්නාහුය. ඒ බෝධිසත්‍වයෝ නෑයන්ට කියන්නාහු "තෙපි හැම විමන් ගන්නාහු(විමාන සාදගන්නාහු) එළියේ සිටි වෘක්‍ෂවල විමන් නොගනුව, තෙපි මේ සල්වනයෙහි මා විසින් ගන්නාලද විමානය පිරිවරා විමන් ගණුව"යි කිවූය. ඒ බෝධිසත්‍වයන් කීවා කරන්නා වූ නුවණැති දේවතාවෝ බෝධිසත්‍වයන්ගේ විමානය පිරිවරා වට සිටි සල්ගස්වල විමන් ගත්තාහුය. නුවණ නැති දේවතාවෝ "අපට වනයෙහි විමානයෙන් ප්‍රයෝජන කිම්දැ?යි මනුෂ්‍යයපථයෙහි ගම් නියම්ගම් රාජධානිවල විමන් ගනුම්හ, ගම් ආදිය නිසා (ආශ්‍රයකොට) වසන්නා වූ දේවතාවෝ ලාභයෙන් හා යසසින් අග්‍ර බවට පැමිණෙති"යි කියා මනුෂ්‍යපථයෙහිම මගඑළිවල(එලිමහන් තැන්වල) අටගත්තා වූ මහරුක්වල විමන් ගත්තාහුය.

ඉක්බිත්තෙන් එක් දවසක් මහත් වූ වැසි සුළඟෙක් උපන්නේය. පවන් ඉතා තද බැවින් ගැඹුර බට(ගැඹුරට ගිය) මහමුල් ඇති වනස්පතිවෘක්‍ෂයෝ(වනයට අධිපති වැනි මහගස්) බිඳී සිඳී ගිය අතු හා වෙළෙප් ඇතිව මුලි'නුපුටා වැටී ගියාහුය. ඒ මාරුතය ඉතා චණ්ඩ වූයේය. එසේ හෙයින් ඔවුන් හා එක්ව බැඳී සිටියා වූ සල්වනයට පැමිණ ඈතමෑත බලා පහරමින් එක රුකකුත් එලන්නට අසමර්ථ විය.

භග්න විමානයන්(බිඳිගිය විමන්) ඇති දෙවියෝ අන් පිළිසරණක් නැතිව දරුවන් ගෙන හිමාලය වනයට ගොස් තමන්ගේ පවත් සල්වනයේ දෙවියන්ට කීවාහුය. ඒ සල්වනයෙහි දෙවියෝ මනුෂ්‍යපථයෙහි දෙවියන් ආ නියාව බෝධිසත්‍වයන්ට කීවාහුය. එබස් ඇසූ මහබෝසතාණෝ "නුවණැත්තන්ගේ බස් නොගෙන පිහිටක් නැති තෙනට ගියා වූ සත්‍වයෝ නම් මෙබඳුම වන්නෝ වේදැ"යි කියා ධර්‍මදේශනා කළාහුය. "පින්වත් වූ දේවතාවෙනි, ඔවුනොවුන් හා එක්ව බැඳි නොසිටි, වනයෙහි අටගත්තා වූ වෘක්ෂයා මහපවනින් මුලිනුපුටා හෙළන්නේය. එසේ හෙයින් අචේතස්කවූද සචේතස්කවූද (පණ නැති ඇති) සියල්ලටම සමගි බව උතුම් වන්නේය"යි මෙසේ මහබෝසතාණෝ මේ කාරණය කියා වෘක්ෂ දේවතාවන්ට අවවාදකොට යවා ආයුෂයාගේ කෙළවර කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියායෝය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මෙසේ "මහරජ දරුවෙනි, නෑයන්ට සමගිවීම යහපත් වන්නේය. එසේ හෙයින් සමගි සතුටුව ප්‍රිය සංවාසයෙන් වසව"යි මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා වදාරා මේ 'රුක්ඛධම්ම ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි දේවතාවෝ නම් දැන් බුදුපිරිසය. නුවණැති වෘක්ෂ දේවතාවෝ වූයෙම් තිලෝගුරු සම්‍යයක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 075. මච්ඡ ජාතකය

තවද එක් සමයෙක්හි සශ්‍රීක වූ මුඛපද්මයක්(ශොභමත් පියුමක් වැනි මුහුණක්) ඇති තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසනසේක් තමන්වහන්සේ විසින් වස්වනලද වර්ෂාවක් අරභයා මේ ජාතකය වදාළසේක.

එසමයෙහි කොසොල් රට වැසි නොවැසීමෙන් ගොයම් ආදීය මියයන්නේය. ඒ ඒ තැන වැව් පොකුණු ආදිය වියලී ගියේය. ජේතවන දොරටුව සමීපයෙහි වු ජේතවන පොකුණෙහිත් පැන් සිඳී ගියේය. කලල්යට (මඩ යට) වැදහොත්තා වූ මස්කැස්බන් කපුටුවන් හා උකුස්සන් ආදී වූ පක්ෂීහු හුල් හා සමාන වූ තුඩින් ඇන මැත් මැත්කොට(එලියට ගෙන) සල්ව සල්වා(සොලව සොලවා) අනුභව කරන්නාහුය.

සර්‍වඥයන් වහන්සේ මස්කැස්බන්ට පැමිණියා වූ ව්‍යසනය දැක මහා කරුණාවෙන් මෙහෙයනලද සිත් ඇතිව “අද මා විසින් වැසි වස්සන්නට වටනේය”යි පාන් වූ කල්හි(එළිය වැටුනු පසු) සිවුරුපිළිදැග(සිවුරු හැද පෙරව) පිඩු සිඟන වේලාව සලකා මහත් වූ භික්ෂුසංඝයා වහන්සේ විසින් පිරිවරන ලදුව මහත් වූ බුද්ධ විලාශයෙන් සැවැත් නුවරට පිඩුසිඟාවැඩ වළදා අන්තයෙහි සැවැත් නුවරින් විහාරයට වඩනාසේක් ජෙතවන පොකුණෙහි පියගැටමත්තෙහි (පඩිපේළිය මත) වැඩ සිට ආනන්ද මහතෙරුන් වහන්සේට වදාරණසේක් “ආනන්ද ස්ථවිරයනි, ජලසාටිකාව(නානකඩය) ගෙනව,

ජේතවන පොකුණෙන් පැන් සනහමි''යි(දිය නාමි) වදාළසේක. ''ස්වාමීනි, ජෙතවන පොකුණෙහි පැන් සිඳි ගියේය. කලල් මඩ පමණක්ම තිබුයේ නොවෙ''යි දැන් වූසේක. ''ආනන්ද ස්ථවිරයනි, සර්වඥයන්ගේ ආනුභාව නම් ඉතා මහත, එසේ හෙයින් තෙපි ජලසාටිකාව ගෙනව''යි වදාළසේක. එබස් ඇසු අනඳ මහතෙරුන් වහන්සේ ''යහපත, ස්වාමීනි'' කියා ජලසාටිකාව ගෙනවුත් දුන්සේක. සර්වඥයන් වහන්සේ ජලසාටිකාව එක් කෙළවරක් ඇඳ එක් කෙළවරකින් ශරීරය වසා ''ජේතවන පොකුණෙන් ජල ස්නානය කරමි''යි පියගැට මත්තෙහි වැඩ සිටිසේක.

එකෙනෙහි ශක්‍ර දේවේන්ද්‍රයාගේ පාණ්ඩුකම්බල ශෛලාසනය උණුවිය. ඒ ශක්‍ර දේවේන්ද්‍රයෝ ''කිමෙක් දෝ හෝ''යි පරීක්‍ෂා කරන්නාහු ඒ කාරණාව දැන් වසසවළාහක දිව්‍යපුත්‍රයා කැඳවා ''දරුව, සර්වඥයන් වහන්සේ ජේතවන පොකුණෙන් පැන් සනහමියි පියගැටමත්තේ වැඩහිඳසේක. වහා සියළු කොසොල් රට එක මේඝයකොට වර්ෂාව වස්ව''යි විධාන කළෝය.

ඒ වසසවළාහක දිව්‍යපුත්‍රයා ''යහපතැ''යි ගිවිස එක් වළාවක් ඇඳ එක් වළාවක් පෙරව මේඝගීතිකා (වැහිගී) ගායනා කරමින් නැගෙනහිර සක්වළට (දිසාවට) අභිමුඛව නික්මුනේය. එකෙණෙහි නැගෙනහිර දිසාභාගයෙහි කලවිටිමඩලක්(රවුම් කමතක්) පමණ එක් මේඝමණ්ඩලයක්(වැහිවළාකුලක්) නැගී ක්‍රමයෙන් ශතපටල

සහසුපටල(සිය දහස් ගණන් වළාකුළු වශයෙන් වැඩී ගොස්) ගර්ජනා කෙරෙමින් විදුලිය ගස්වමින් කිබිසිනිකොට(යටිකුරුකොට) තබනලද පැන් කළයක් මෙන් වසිමින් සියළු කොසොල් රට මහවතුරෙන් සලා (යටකරගෙන) දිවන්නාක් මෙන් වැටුනේය. වර්ෂා ධාරානිපාතයෙන්(වැසි දියදහර වැටීමෙන්) වස්නට පටන්ගත් කල්හි මද ඇසිල්ලකින්ම ජේතවන පොකුණ පිරී ගියේය. මුදුන්පියගැට වසා පොකුණේ පැන් පිරී ගියේය. එකෙණෙහිම සර්වඥයන් වහන්සේ ජලස්නානය කොට රත් වූ දෙපට අඳනසිවුරු ඇඳ ඊ මත්තේ පටිධාතුව(පටිය) බැඳ සුගත මහචීවරය(සර්වඥයන් වහන්සේලා පොරවන මහසිවුර) ඒකාංශකොට ගෙන භික්ෂුසංඝයා වහන්සේ පිරිවරා ගොස් ගඳකිළිමළුයේ පණවනලද බුද්ධාසන මස්ථකයෙහි වැඩහිඳ භික්ෂුසංඝයා වහන්සේ විසින් වත් දැක් වූ කල්හි(වතාවක්කොට නිමා වූ පසු) නැගීසිට මැණික්මය වූ සඳකඩපාණ මත්තෙහි වැඩහිඳ භික්ෂුසංඝයා වහන්සේට අවවාද දී යවා සුගන්ධගන්ධ කුටියට වැද දකුණැලයෙන් සිංහසෙය්‍යාවෙන් සැතපී වදාළසේක.

සවස්වේලෙහි දම්සභා මණ්ඩපයෙහි රැස්ව උන්නා වූ භික්ෂූන් වහන්සේ “ඇවැත්නි, දසබලධාරී වූ බුදුරජාණන් වහන්සේගේ ක්ෂාන්තිකරුණා සමාපත්තියක්(ඉවසීම හා කරුණා ගුණයක්) බලව, නොයෙක් සත්‍වයන් මියන්නට පටන්ගත් කල්හි නොයෙක් විල් පොකුණු ආදිය වියලෙන්නට පටන්ගත් කල්හි මස්කැස්බන් මහදුකට පැමිණෙන්නට පටන්ගත් කල්හි

කරුණාව නිසා 'මහජනයා දුකින් මුදමි' ජලසාටිකාව හැඳ ජේතවන පොකුණෙහි පියගැටමත්තේ සිට මද ඇසිල්ලකින් සියළු කොසොල් රට මහවතුරෙන් උල්පවා පියන්නාක් මෙන් වැසි වස්වා මහජනයා කායික චෛතසික දුක්ඛයෙන්(කයේ සිතේ දුකින්) මුදා විහාරයට වන්සේක් වේදැ"යි කථා කරමින් සිටි කල්හි ගඳකිළියෙන් නික්ම දම්සභා මණ්ඩපයට වැඩ "මහණෙනි, මා එන්නට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා වදාරා "මේ නම් කථාවකින් යුක්තව උනුම්හ"යි කී කල්හි "මහණෙනි, සර්වඥවරයෝ මහජනයා දුකින් පීඩිත වන්නට පටන්ගත් කල්හි දැන්මතු නොවෙයි, පෙරත් තිරිසන් යෝනියෙහි ඉපිද මත්ස්‍යරාජ කාලයෙහිත් වැසි වස්සුවෝම වේදැ"යි ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස මෙම කොසොල් රට මෙම සැවැත් නුවර මෙම ජේතවන පොකුණ පිහිටි තැන වැල්කැලයෙන් ගැවසීගත්තා වූ එක් කඳුරැළියක් විය. එසමයෙහි මහබෝසතාණෝ මත්ස්‍ය යෝනියෙහි ඉපිද මත්ස්‍යය සමූහයා විසින් පිරිවරන ලදුව ඒ කඳුරැළියෙහි වසන්නාහුය. දැන් යම්සේ ද එපරිද්දෙන්ම එසමයෙහිත් ඒ රට වැසි නොවටුයේය. මනුෂ්‍යන්ගේ ගොයම් මිය ගියේය. වැව් ආදිය සිඳී ගියේය. මස්කැස්බෝ(මස්සු හා කැස්බෑවෝ) කලල්යට වන්නහුය. මේ කඳුරැළියෙහිත් මත්සයෝ කලල්යට වැද ඒ ඒ තැන සැඟවුනාහුය. කපුටු ආදී හූ තුඩින් ඇන මැත්කොට කන්නාහුය. මහබෝසතාණෝ ඥාති සමූහයාට පැමිණියා වූ ඒ ව්‍යසනය දැක "මොවුන්ට උපන්නා වූ මේ දුක්ඛය මා හැර

අනික් මුදන්ට සමර්ථ එකෙක් නැතැ"යි සත්‍යක්‍රියාකොට වැසි වස්වා මරණ දුකින් මුදනු පිණිස කලු වූ මඩ දෙබෑකොට පීරා නික්ම අඟුරු කැටයක් වැනි වූ මහමත්ස්‍යයාණෝ මනාකොට ගානලද(කපා ඔප දමනලද) ලෝහිතංක මාණික්‍යයක් සමාන වූ ඇස්දෙක දල්වා අකාශය බලා වස්සවළාහක දිව්‍යය පුත්‍රයාට අඬගා කියන්නාහු "පින්වත් වු වස්සවළාහක, මම නෑයන් නිසා දුකට පැමිණියෙමි, සිල්වත් වූ මා දුක් විඳිමින් සිටියදී තෝ කවර කාරණයකින් වැසි නොවස්වන්නෙහිද? මා විසින් ස්වජාති මාංසය(තම වර්ගයාගේම මස්) කන්නා වූ මත්ස්‍ය යෝනියෙහි ඉපිද සාලාටක් සා පමණවූත්(හාල් ඇටයක් තරම් වූ හෝ) මත්සයෙක් කෑ විරූ නැත්තේය, මා විසින් අන් ප්‍රාණියෙකුත් ජිවිතයෙන් තොරකළවිරූත්(මරාදැමූ බවක්) නැත්තේය, මේ සත්‍යයෙන් වැසි වස්වා මාගේ ඥාති සමූහයා දුකින් මුදව"යි කියා පරිචාරක කොල්ලෙකුට(මෙහෙකාර කොලුවකුට) විධාන කරන්නාහු මෙන් වස්සවළාහක දිව්‍යපුත්‍රයාට විධාන කරන්නා වූ මහබෝසතාණෝ මෙසේ කිවුය. "පිනවත් වූ වස්සවළාහක දිව්‍යපුත්‍රය, තෝ ගර්ජනාකොට විදුලිය ගසා වර්ෂාව වස්වා කපුටු සමුහයා කලල්යට වැද සිටියා වූ මත්සයන් තුඩින් හැන මැත්කොට කන්නා වූ දියෙන් සඟවා ඒ කපුටුවන්ගේ මත්ස්‍යය නිධානය(මසුන් නැමති නිධානය) නසාපියව, තවද කපුටු සමූහයා මේ කඳුරුළිය දියෙන් පිරීගිය කල්හි මත්සයන් නොලැබ සෝක කරන්නනේය, ඒ කපුටු සමූහයා තෝ මේ කඳුරුළිය පුරමින් ශෝකාග්නියෙන්(ශෝකය නැමති ගින්නෙන්)

ද්වාපියව, මාත් මාගේ නෑයනුත් සියල්ලවුන්ම මේ මරණ ශෝකයෙන් ගලවාපිය''යි මෙසේ මහබෝසතාණෝ පරිවාරක සේවකයන් හට ආඥා කරන්නාක් මෙන් වස්සවලාහක දිව්‍යපුත්‍රයාට විධානකොට මහවැසි වස්වා මහජනයා මරණ දුකින් මුදා ජීවිතාන්තයෙහි කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ ''මහණෙනි, සර්වඥයන් වහන්සේ දැන්මතු වැසි වැස්වූවෝ නොවෙති, පෙරත් මත්ස්‍ය යෝනියෙහි ඉපිදත් වැසි වැස්වූවෝ වේ''දැයි වදාරා මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදාරා පූර්වාපරසන්ධි ගළපා මේ 'මත්ස්‍ය ජාතකය' නිමවා වදාළසේක.

''එසමයෙහි මත්ස්‍ය සමූහයා නම් දැන් බුදුපිරිසය. වස්සවලාහක දිව්‍යපුත්‍රයා නම් ආනන්ද ස්ථවිරයෝය. එසමයෙහි මත්ස්‍ය රජ්ජුරුවෝ නම් දැන් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ''යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 076. අසංකිය ජාතකය

තවද එක් සමයෙක්හි අෂ්ටෝත්තරශතමංගල්‍ය ලක්ෂණයෙන් විරාජමාණ වූ (එකසිය අටක් මඟුල් ලකුණුවලින් බබළන්නා වූ) ශ්‍රී පාද ඇති තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසනසේක් සැවැත් නුවරවාසී වූ එක් උපාසකයෙක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ උපාසකයාණෝ ශ්‍රොතාපන්න වූ(සෝවාන් වූ) ආර්‍යශ්‍රාවකය. ඒතෙම කිසි කටයුත්තක් නිසා ගැල්සාත්තුනායකයකු(ගැල්කණ්ඩායමක නායකයකු) හා සමග මාර්‍ගයෙහි යන්නේ එක් වල්කඩෙක (කැලෑ පෙදෙසක) ගැල්මුදා කඳවුරු බැඳි කල්හි සාත්තුනායකයාට නුදුරුතෙනක එක් කරගසක් මුල සක්මන් කරන්නෝය. එකල්හි පන්සියයක් සොරුන් තමන් සොරකම්කරන්නට කල් පරික්‍ෂාකොට "ඒ කඳවුර කොල්ලකම්හ"යි දුඩුමුගුරු ආදිය ගෙන ඒ ස්ථානය පිරිවරා ගත්තාහුය.

එකල්හි උපාසකයෝ සක්මන් කෙරෙත්මය. සොරහු ඒ උපාසකයා දැක "ඒකාන්තයෙන් මෙතෙමේ මේ ස්කන්ධාවාරය(කඳවුර) රක්‍ෂා කරන්නා වූ පුරුෂයෙක් වන. එසේ හෙයින් මොහු නිදන්නට වන් කල්හි පැහැරපියා යම්හ"යි සිතා බලහත්කාරයෙන්ම මැඩගෙන වැදගත නොහි ඒ ඒ තැනම සිටියාහුය. ඒ උපාසකයෝත් ප්‍රථමයාමයෙහිත්, මධ්‍යමයාමයෙහිත්, පශ්චිමයාමයෙහිත් සක්මන් කරමින්ම සිටියාහුය. අළුයම් වේලාව වූ කල්හි සොරු අවසරයක් නොලැබ ගන්නාලද කැටමුගුරු ආදිය දමා ගියාහුය. උපාසකයෝ තමන් ගිය කළමණාකාරිය නිෂ්ටාකොටගෙන(නිමවාගෙන) අවුත් බුදුරජාණන් වහන්සේ නමස්කාරකොට "ස්වාමීනි, තමා රක්නා කෙනෙක් අනුන් රක්නාහු නම් වේද්දැ"යි විචාළෝය. "එසේය, උපාසකය, තමන් රක්නා එකෙක් අනුන් රක්නේය, අනුන් රක්නා එකෙක් තමා රක්නේය"යි වදාළසේක.

එබස් ඇසු උපාසකයෝ "ස්වාමීනි, භගවත් බුදුරජාණන් වහන්සේ විසින් ඒ කාරණය වදාල නියාව ඉතා යහපත්ව වන්නේය. මම එසේ එක සාත්තුනායකයෙකු හා සමග ගමට පිළිපැද රුකක් මුල සක්මන් කරන්නෙමි මා රකිමියි සියළු සාත්තුවන් රැක්කෙමි"යි කීය. සර්‍වඥයන් වහන්සේ "උපාසකය, පෙර නුවණැත්තෝ තමා රක්නෝ අනුන් රැක්කෝම වේදැ"යි වදරා ඒ උපාසකයා විසින් ආරාධිත වූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයේදී අප මහබෝසතාණෝ බ්‍රහ්මණ කුලයෙහි ඉපිද වැඩිවිය පැමිණ කාමයෙහි ආදීනව දැක ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව හිමාලය වනයෙහි වසන්නාහු ලුණුඇඹුල් සෙවුනා පිණිස ජනපදයට අවුත් ජනපද චාරිකා කරමින් එක් සාන්තුනායකයෙකු හා සමඟ ගමට පිළිපැද එක් වන ප්‍රදේශයක සාත්තුව විසූ කල්හි(ගැල් කණ්ඩායම නතර වූ පසු) සාත්තුවට නුදුරුතැන ධන්‍ය සැපයෙන් දවස් යවමින් එක්තරා රුකක් මුල සක්මන් කරමින් සිටියාහුය. එකල්හි පන්සියයක් සොරුන් සවස බත් අනුභව කල කල්හි "ඒ ගැල් සාත්තුනායකයා පැහැරපියා උදුරා ගනුම්හ"යි අවුත් වටලා ගත්තාහුය. ඒ සොරු සැමදෙන තාපසයන් දැක "ඉදින් මේ තාපසයෝ අප දුටුහු නම් සාත්තුවාසින්ට කියති. එසේ හෙයින් මුන් නිදන්නට වන් කල්හි පැහැරපියම්හ"යි කියා එතැනහිම සිටියාහුය. මහබෝසතාණෝ එවේලෙහි පටන් සකල රාත්‍රියෙහි සක්මන් කලාහුය. සොරුන් අවසර නොලැබ ගත්තාහු

කැටමුගුරු ආදිය දමා ගැල්සාත්තුවෙහි වසන්නා වූ සත්‍වයන්ට කටහඬපෑ(කථාකොට) "පින්වත් සාත්තුවාසීනි, ඉදින් මේ ගස මුල සක්මන් කරන්නා වු තාපසයෝ අද නොවුවෝ නම් තෙපි හැමදෙනම මහත් විනාශයට පැමිණෙන්නාහුමය. එසේ හෙයින් සෙට මේ තාපසයන් මහත් වූ සත්කාර සම්මාන කරවු"යි කියා ගියාහ.

ඒ සාත්තුවාහක සත්‍වයෝ පාන්ව ගිය කල්හි(එළිය වැටුනු පසු) සොරුන් දැමු කැටමුගුරු දැක භයපත්ව බෝධිසත්‍වයන් සමීපයට ගොස් වැඳ "ස්වාමීනි, නුඹවහන්සේ සොරු දක්නා ලද්දුහුදැ"යි විචාළෝය. "එසේය පින්වත්නි, දක්නා ලද්දුහ"යි කී කල්හි "ස්වාමීනි, මෙතෙක් සොරුන් දැක භයෙක්වත් තැතිගැන්මෙක් නූපදිනිදැ"යි විචාලෝය.

මහබෝසතාණෝ කියන්නෝ "පින්වත්නි, සොරුන් දැක භය නම් වස්තු ඇති කෙනෙකු වන්නේය. මම වූ කලී නිර්ධනයෙක්මි. එසේ වූ මම කුමක් පිණිස බම්දැ"යි කිවුය. තවද "ගමත් වලත්(වනයේ) වසන්නා වූ මම භයෙක්වත් තැතිගැන්මෙක්වත් නැතැ"යි කියා ධර්‍මදේශනා කරන්නාහු මහබෝසතාණෝ මෙසේ කිවුය. "පින්වත්නි, මම ගම්හි වසන්නේ මුත් ග්‍රාමොපචාරයෙන් විනිර්මුක්තව(ගම අසලින් ඉවතට නොගොස්) වසන්නේ මුත් සංකාවෙක නොසිටි බැවිනි සංකාවෙක් භයෙක් නැත්තෙමි, පිරිසිදු සිල් ඇති බැවින් කායවාචීමනොවංක(කය වචනය හා සිතෙහි ඇදබවක් හෙවත් දුරාචාරක්‍රියා) විරහිත වූයෙමි සෘජුව දිව්‍යලෝක මාර්ගයටත්

නැගෙමි, එයින් මත්තේ මෛත්‍රා කරුණා දෙක්හි පිහිටි බැවින් සෘජුව බ්‍රහ්මලෝක මාර්ගයටත් නැගෙමි”යි මෙසේ මහබෝසතාණෝ ධර්‍මදේශනාකොට සතුටු වූ සිත් ඇති මනුෂ්‍යයෝ විසින් කරනලද පූජා සත්කාර ඇත්තාහු දිවිපමණින් සතර බ්‍රහ්මවිහාර භාවනාකොට(මෛත්‍රා, කරුණා, මුදිතා, උපෙක්ඛා යන බ්‍රහ්මවිහාර භාවනා කර) බ්‍රහ්ම ලෝකයෙහි උපන්නාහුය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා වදරා පූර්‍වාපරසන්ධි ගළපා මේ ‘අසංකිය ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි සාන්තුවාසී මනුෂ්‍යයෝ නම් දැන් බුදුපිරිසය. එසමයෙහි තපස්වි වූයෙමි තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 077. මහාසුපින ජාතකය

තවද එක් සමයෙක්හි දිගුපුළුල් නිල්නුවන් ඇති තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසනසේක් සොළොස් මහස්වප්නයක්(මහා සිහින දහසයක්) අරභයා මේ ජාතකය වදාළසේක.

එක් දවසක් කොසොල් රජ්ජුරුවෝ රාත්‍රියෙහි නිද්‍රාවට(නින්දට) පැමිණි පශ්චිමයාමයෙහි(අළුයම) සොළොස් ස්වප්නයක් දැක භයින් ත්‍රසතව පිබිද “මේ ස්වප්නයන් දුටු

බැවින් මට කුමක් වේදෝ හෝ''යි මරණභයින් බියපත්ව යහන්පිට හිඳම පාන්කොටපූය.

ඉක්බිත්තෙන් පාන් වූ කල්හි ශාන්ති බ්‍රාහ්මණයෝ(රජුට සෙත් පතන බමුණෝ) හා පුරෝහිත බ්‍රාහමණයෝ රජ්පුරුවන් කරා පැමිණ ''ස්වාමීනි, රජ්පුරුවන් වහන්ස, රාත්‍රියෙහි සැපසේ විසූසේක්දැ''යි විචාළෝය. ''ආචාර්ීවරයෙනි, මට සැපයෙක් නම් කොයින්ද? අද මම අළුයම් වේලෙහි සොළොස් ස්වප්නයක් දුටිමි, මම ඒ ස්වප්නයන් දුටු වේලේ පටන් භයපත් වීමි, ආචාර්ීවරයෙනි, එහි දෝෂය කියවු''යි කිවූය. ''ස්වප්නයන් අසා දන්නමෝ වේදැ''යි කී කල්හි බමුණන්ට රජ්පුරුවෝ දුටුවා වූ ස්වප්න කියා ''කිමෙක්ද? මට මේ සවප්න දුටු කාරණයෙන් කුමක් වේදැ''යි විචාළෝය. එබස් ඇසූ බමුණෝ අත් සැලූහ. රජ්පුරුවන් විසින් ''කවර කාරණයකින් තොපි අත් සලව්දැ?''යි විචාළ කල්හි ''මහරජ්පුරුවන් වහන්ස, ඒ ස්වප්න ඉතා කර්කශ වූ ස්වප්නයකැ''යි කීහ. ''ඒ ස්වප්නයෙහි විපාක කවරේදැ?''යි විචාළ කල්හි ''රාජන්තරාය ය, භොගන්තරාය ය, ජීවිතන්තරාය ය යන මේ ත්‍රිවිධ වූ අන්තරායන් අතුරෙන් එක්තරා අන්තරායෙක් වන්නේය''යි කිවූය. ''ඒ ස්වප්නයට ප්‍රතික්‍රියා(පිළියම්) කළ හැකිදැ?''යි විචාළේය. ''ඒකාන්තයෙන් මේ ස්වප්නය ඉතා තද බැවින් ප්‍රතික්‍රියා කළ නොහැක්කේය, අපි වූකලී ඒ ස්වප්නයට පිළියම් කරම්හයි, ඒ ස්වප්නයෙහි දෝෂ පහකොටපියන්ට අසමර්ථ වූ අපගේ ශාසත්‍රය ඉගැන්මෙන් ප්‍රයෝජන කිම්දැ?''යි කිවූය. ''කුමක්කොට ඒ දෝෂ

දුරුකරව්ද්‍ද?''යි විචාළේය. ''මහරජ්ජුරුවන් වහන්ස, සියල්ලෙන් සතරක් සතරක් නියායෙන් 'සර්‍වචතුස්ක' නම් වූ යාගයක් කරම්හ''යි කිවූය. රජ්ජුරුවෝ භයින් ත්‍රස්තව ''එසේ වීනම් ආචාර්‍ය්‍යවරයෙනි, මාගේ ජීවිතය තොප ඇම අතය, මට වහා ස්වස්ථයක් (යහපතක්) කරව''යි කිවූය.

එබස් ඇසූ බමුණෝ ''බොහෝ වස්තුන් ලබම්හ, බොහෝ කන බොන දෑත් ගෙන්වා ගණුම්හ''යි බලවත් සන්තෝෂයෙන් යුක්තව ''මහරජ්ජුරුවන් වහන්ස අස්වසා මාලිගාවෙන් නික්ම නුවරින් පිටවට යාගාවාටයක්කොට(යාගවළක්) බොහෝ චතුස්පදජාතීන්(විවිධ සිවුපාවුන්) යාගස්ථම්භයේ බැඳ(යාගවල අසල සිටවනලද කණුවෙහි බැඳ) බොහෝ පක්ෂි සමූහයාත් ගෙනවුත් ''මේ මේ දෑ ලද මැනවැ''යි නැවත ඔබිනොබ ඇවිදිනාහුය.

එකල්හි මල්ලිකාදේවී ඒ කාරණය දැන රජ්ජුරුවන් කරාගොස් ''මහරජ්ජුරුවන් වහන්ස, බමුණෝ නැවත නැවත ඈතමෑත ඇවිදිති, කිමෙක්දැ?''යි විචාළීය. එබස් අසා රජ්ජුරුවෝ කියන්නෝ ''පෝසත්ව ඇවිදිනා තෙපි අපගේ කම්මුල සර්‍පයන් ඇවිදිනා නියාව නොදන්නවාදැ''යි කිවූය. ''මහරජ්ජුරුවන් වහන්ස, මේ කුමක් කී නියාදැ?''යි විචාළ කල්හි ''මා විසින් මෙබඳු ස්වප්නයක් දක්නාලද, ස්වප්නයෙහි විපාක බමුණන් අතින් විචාළ කල්හි බමුණෝ 'ත්‍රිවිධ අන්තරායන් අතුරෙන් එක්තරා අන්තරායෙක් පෙණෙයි' කියා ඒ අන්තරාය වලකන පිණිස යාගකරම්හයි කියා නැවත

නැවත ඇවිදිති''යි කිවූය. ''කිමෙක්ද? මහරජ්ජුරුවන් වහන්ස, දිව්‍යමනුෂ්‍යයන් සහිත වූ ලෝකයෙහි අග්‍රබ්‍රාහ්මණයානන් අතින් නුඹවහන්සේ විසින් දක්නා ලද්ද වූ ස්වප්නයට ප්‍රතික්‍රියා විචාරණ ලදද''යි කිවූය. ''සොඳුර, ඒ දිව්‍යමනුෂ්‍යයන් සහිත වූ ලෝකයෙහි අග්‍රබ්‍රාහ්මණවූවෝ කවුරුදැ?''යි විචාළෝය. ''ස්වාමීනි, දිව්‍යමනුෂ්‍යයන් සහිත වූ ලෝකයෙහි අග්‍රපුද්ගල වූ සර්‍වධර්‍මයන් සර්‍වාකාරයෙන් විශේෂයෙන් දන්නා වූ පිරිසිදු චිත්තසන්තාන(සිත් සතන්) ඇති නික්ලේශී වූ (කෙලෙස් රහිත වූ) මහබ්‍රාහ්මණයාණන් වහන්සේ නාඳුනනසේක්ද? ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වනාහි සවප්නයෙහි තොරතුරු දන්නාසේක, වැඩිය මැනව, මහරජ්ජුරුවන් වහන්ස, ඒ සර්‍වඥයන් වහන්සේ අතින් විචාළ මැනවැ''යි කිවූය. රජ්ජුරුවෝ ''යහපත, දේවීනි''යි කියා විහාරයට ගොස් බුදුරජාණන් වහන්සේට නමස්කාරකොට උන්නාහුය.

සර්‍වඥයන් වහන්සේ මධුරස්වර විහිදුවා ''කිමෙක්ද? මහරජ්ජුරුවෙනි, ඉතා උදෑසනම අවුදැ''යි වදළසේක. ''ස්වාමීනි, මම අළුයම් වේලෙහි සොළොස් සවප්නයක් දැක භයින් ත්‍රසතව බමුණන්ට කීමි, බමුණෝ ඒ අසා 'මහරජ්ජුරුවන් වහන්ස, ඒ ස්වප්නය නම් ඉතාතද රෞද්‍ර වූ ස්වප්නයක, ඒ දුටු සවප්නය විනාශ කරුණු පිණිස චතුෂ්කයෙන් යාගයක් කරම්හයි' කියා යාගය සරහති(පිළියෙල කරති), එසේ හෙයින් බොහෝ ප්‍රාණීහු මරණභයින් භයපත්ව සිටියාහ, නුඹවහන්සේ වූකලී දිව්‍යමනුෂ්‍යයන් සහිතව ලෝකයෙහි අග්‍රපුද්ගලසේක, යමක්

නුඹවහන්සේගේ ඥානමුඛයට හමු නොවේ නම් එසේ වූ අතීතානාගත වර්තමානයෙහි උපන්නා වූ කිසිම පදාර්ථයෙක්(කරුණක්) නම් නැත්තේය, එසේ හෙයින් සවාමීනි, බුදුරජාණන් වහන්ස, මේ ස්වප්නයෙහි විපාක වදාළ මැනවැ"යි කීවිය. "මහරජ්ජුරුවෙනි, ඒ එසේමය දිව්‍යමනුෂ්‍යයන් සහිත වූ ලෝකයෙහි මේ ස්වප්නයන්ගේ තොරතුරු විපාක දක්නට මා හැර අන් සමර්ථ කෙනෙක් නම් නැත්තාහුය, එසේ හෙයින් මම තොපට කියමි, එතකුදු වුවත් තොප දුටුසැටියේම ස්වප්නය කියව"යි වදාළසේක. "යහපත, ස්වාමීනි"යි කියා රජ්ජුරුවෝ දුටුසැටියේම ස්වප්නය කියන්නාහු!

උසභා රුක්ඛා ගාවියො ගවා ච
අසෙසා කංසො සිගාලී ච කුමෙභා
පොකඛරණී ච අපාක චන්‍දනං
ලාපුනි සීදන්ති සීලා පලවන්ති
මණ්ඩුකියො කණ්හසපෙප ගිලන්ති
කාකාං සුවණ්ණා පරිවාරයන්ති
තසාවකා එළකානං භයා හී'ති

යන මේ මාතෘකාව සිතතබා ස්වප්නය කීවාහුය. කෙසේ කිවුද? යත්:

"ස්වාමීනි, මම එක් ස්වප්නයක් මෙසේ දිටිමි. අඤ්ජනවර්ණ වූ(කළු පැහැති) කාලවෘෂභයෝ(කළු ගොන්නු) සතරදෙනෙක් 'යුද්ධ කරම්හ'යි සතරදිගින් රාජාඞ්ගනයට අවුත් 'වෘසභ යුද්ධය බලම්හයි' මහජනයා රැස් වූ කල්හි යුද්ධ කරන්නා වූ

ආකාර දක්වා ගජ්නාකොට ඒ ඒ අත පලා යන්නාහ. මේ පළමුවන ස්වප්නය දිටිමි, මේ සවප්නයට විපාක කවරේදැ?''යි විචාළෝය. ''මහරජ්ජුරුවෙනි, මීට විපාක තොප සමයෙත් අප සමයේත් නොවන්නේය, අනාගතයෙහි අධර්මිෂ්ඨ වූ කෘෂ්ණ(දිළිඳු) රජදරුවන් හා අධර්මිෂ්ඨ මනුෂ්‍යයන් සමයෙහි ලොව යහපත පෙරලෙන්ට(වෙනස්වන්ට) පටන්ගත් කල්හි කුසලය පසුබැස අකුසලය උත්සනනව(වැඩිදියුණු වී) කුසලයට අකුසලය මතුව ලොව පිරිහෙන්නා වූ කාලයෙහි වෂ්ාව යහපත්ව ඉඳුරා(නියම ලෙස) නොවස්නේය, මෙඝපාදයෝ(වැහිවළා හෝ වර්ෂාකාරක හේතු) සිඳෙන්නාහුය, ශස්‍යයෝ මලානික වන්නාහුය, එසේ හෙයින් දුර්භික්ෂ වන්නේය, මෙඝයෝ වස්නාක්මෙන් සතරදිගින් නගා(මතුවී) ස්ත්‍රීන් 'අව්වෙහි වැනූ වී ආදිය තෙමෙයි' යන භයින් අතුළුකොට ගත් කල්හි(ගේ තුළට ගත්විට) පුරුෂයන් උදළු හා පෙට්ටි ගෙන ඇලඅමුණු නියර බඳින්ට නික්මුණු කල්හි වස්නා ආකාර දක්වා ගර්ජනාකොට විදුලිය අඳුන්වන් කළුගොන් සතරදෙනා රාජාඞගනයට අවුත් පොර අරභයා බොහොදෙනා 'ගොන්පොර දකුම්හයි' රැස් වූ කල්හි පොර අන්නා වූ ආකාර දක්වා තප්ලා ගර්ජනාකොට පොර නෑනම(පොර ඇනීමක් නොකරම) ඒ ඒ අත පලායාමෙන් මෙඝයෝ නොවැසම පලා යන්නාහුය. මේ තෙමේම මේ ස්වප්නයෙහි විපාක වන්නේය, තොපට වූකලී මේ ස්වප්නය දුටු කාරණයෙන් කිසි අනතරායෙක් නැත. අනාගතය අරභයා දක්නා ලද්ද වූ මේ ස්වප්නය වන්නේය, බමුණෝ වනාහි

තමන්ගේ ජීවිකා වෘත්තිය නිසා යාග කිරීමෙන් සන්හිඳෙයි කිවුය"යි මෙසේ සර්වඥයන් වහන්සේ ස්වප්නයට නිෂ්පත්ති(සිහින විපාක) වදාරා "මහරජ්ජුරුවෙනි, දෙවෙනි වූ ස්වප්නය කියව"යි වදාළසේක.

"ස්වාමීනි, දෙවෙනි ස්වප්නය මෙසේ දිටිමි, කුඩා රුක් හා ගස් පොළොව පලා වියතක් පමණත් රියනක් පමණත් උඩ නොනැගීම මල් පිපෙන්නේත් ඵල ගන්නේත් වෙයි. මේ දෙවෙනි ස්වප්නය දිටිමි, මීට විපාක කවරේදැ?"යි විචාළෝය. "මහරජ්ජුරුවෙනි, මීටත් විපාක ලොව පිරිහෙන්නට වන්කල්හි මනුෂ්‍යයන් මන්‍දායුෂ්ක වූ(අඩු ආයුෂ ඇති) කල්හි වන්නේය. අනාගතයෙහි සත්‍වයෝ අධික වූ රාග ඇතිවන්නාහු වෙත්, වයසට නොපැමිණියාවූ කුමාරිකාවෝ පුරුෂාන්තරයට(පිරිමින් හා සංවාසයට) ගොස් ඍතුමතිව ගර්භනීව දූ දරුවන් හා සමඟ වෙසෙති. පැළ ගස්වල මල්මෙන් ඔවු'නොවුන්ගේ ඍතුමතිබව හා ඵලමෙන් දූදරුවෝ වන්නාහුය. මේ කාරණයෙනුත් තොපට භයෙක් නැත, තුන්වැනි ස්වප්නය කියව, මහරජ්ජුරුවෙනි"යි වදාළසේක.

එකල රජ්ජුරුවෝ තුන්වෙනි ස්වප්නය කින්නාහු මෙසේ කිවුය. "ස්වාමීනි, එදවස්ම උපන්නා වූ වස්සන්ගෙන් දෙනුන් කිරි බොන්නා දිටිමි, මේ තුන්වෙනි ස්වප්නය, මීට විපාක කවරේදැ?"යි විචාළෝය. "මීටත් විපාක මතු එන්නා වූ කාලයෙහිම මනුෂ්‍යයන්ගේ ජ්‍යෙෂ්ඨාපචායික කර්මය(වැඩිහිටියන් සැලකීමේ සිරිත) නටකල්හි(නැති වූ විට) වන්නේය,

අනාගතයෙහි සත්ත්වයෝ මවුපියන් කෙරෙහිවත් නැදිමයිලන් කෙරෙහිවත් ලජ්ජාවක් නූපදවා තුමූ ම කුටුම්බය (විවාහය) විචාරා තුමූ ම තමන්ට සලසා ගනිති. බත්පිළියකුත්(ආහාර හා වස්ත්‍ර) වෘද්ධයන්ට(දෙමව්පියන් අතුළු වැඩිහිටියෝ) දෙනු කැමති කෙනෙක් දෙති, නොදෙනු කැමති කෙනෙක් නොදෙති, ඒ වෘද්ධයෝ අනාථ අසරණව තුමූ තමන් නිසා ජීවත්වගත නොහී එදවස උපන්නා වූ වසසන්ගෙන් කිරි බොන්නා වූ මහදෙනුන් මෙන් දරුවන් සිත්ගෙන උන් නිසා ජීවත් වෙති. මේ කාරණයෙනුත් තොපට භයෙක් නැත, සතරවෙනි ස්වප්නය කියවයි මහරජ්ජුරුනි”යි කීසේක.

“ස්වාමීනි, ආරොහ පරිනාහ සම්පනන වූ(උස මහතින් යුත්) මහගොන් යුගපරම්පරා අග(වියගස් තබා පිළිවලින් ගොන් රැනෙහි කෙළවරට) යොද තරුණ වූ ගොන්නාඹුන් රථසකාටාදී භාරයන්(ගැල්බර) අදනා සඳහා මුල්ගැල් හිස(මුලින්ම ඇති ගැල ඉදිරියෙහි) යොදන්නවුන් දිටිමි. ඒ නාඹුගොන් මුල යොදන ලද්දහු භාරය ඇදගත නොහී කරින් විය දමා(වියගස කරින් ඉවතට දමා) සිටියාහුය. එසේ හෙයින් ගැල් කැමති තැනකට ගොස් වෙළඳම් ආදී කාරිය සමෘර්ධකොට(සාර්ථක) ගන්ට නුවූයේය. මේ මාගේ සතරවැනි වූ ස්වප්නය, මීට විපාක කවරේදැ?”යි විචාළෝය.
“මහරජ්ජුරුවෙනි, මීට විපාක අනාගත කාලයෙහි අධර්මිෂ්ඨ වූ රජදරුවන් සමයෙහි වන්නේය. අනාගතයෙහි අධර්මිෂ්ඨ වූ කෘපණ වූ රජදරුවෝ නුවණැත්තා වූ, පරම්පරාව දැන්මෙහි සමර්ථ වූ, ඒ ඒ කාය්‍යී සමෘර්ධකොට දීලන්ට නිසි වූ,

මහඅමාත්‍යයන්ට යස පිරිවර නොදෙති, ධර්‍මාධිකරණයෙහිත්(ධර්‍මසභාවෙහි සහ විනිශ්චය ශාලාවෙහිද) රාජකාය්‍ර්‍ය විචාරන්නා වූ, ස්ථානයෙහිත් නුවණැත්තා වූ, විනිශ්චයෙහි දක්‍ෂ වූ, පරම්පරාවන් පැවත ආවා වූ වයොවෘද්ධ අමාත්‍යයන් නොසලස්වති. ඔවුන්ට විරුද්ධ වූ තරුණ වූ බාල අමාත්‍යයන්ට යස පිරිවර දෙති. එබඳුවූවන්ම විනිශ්චයෙහි සලසති, ඒ තරුණ අමාත්‍යයෝ රාජ කටයුතු හා යුක්තයායුක්ති (යුතු අයුතුකම්) නොදන්නාහු, ඒ තමන්ට දුන් යසසත් ධරාගත නොහෙති, මහළු වූ නුවණැති අමාත්‍යයෝද යසස් නොලබන්නාහු රාජ කටයුතු සමෘද්ධකොට දීලන්ට සමර්‍ථයෝ වූ නමුත් අපට ‘මේ රාජ කටයුත්තෙන් ප්‍රයෝජන කිම්ද? අපි දැන් පිටතට ගියමෝ වේද? අභ්‍යන්තර වූ බාල අමාත්‍යයෝම ඒ රාජකාරිය දන්නෝ වේදැ’යි, උපන්නා වූ රාජකාරියක් නොකෙරෙති, එසේ කල්හි සර්‍වප්‍රකාරයෙන්ම ගැල්හිස උසුලන්ට අසමර්‍ථ වූ නාඹුගොන් ගැල්හිස වියෙහි යෙදූ කලක් මෙන්ද, ගැල්හිස උසුලන්ට අදින්ට අසමර්‍ථ වූ මහගොන් වියදඬු පරම්පරාවෙන් අග යෙදූ කලක් මෙන්ද ඒ රජදරුවන්ට මහත් වූ පරිහානියම වන්නේය, මහරජ, මේ කාරණයෙනුත් තොපට භයෙක් නැත, පස්වෙනි ස්වප්නය කියව”යි වදාළසේක.

“ස්වාමීනි, දෙදිසාවෙන් මුඛ දෙකක් ඇති අශ්වයෙකු දිටිමි. ඔහුට දෙපිටින්ම කෑ හැකිය, ඒතෙමේ දෙපිටින්ම කන්නේය. මේ මා විසින් දක්නාලද පස්වැනි ස්වප්නය ය, මීට විපාක කවරේදැ?”යි විචාළේය. “මහරජ, මේ ස්වප්නයටත්

අනාගතයෙහි අධර්මිෂ්ඨ වූ රජදරුවන් සමයෙහි විපාක වන්නේය. අනාගතයෙහි අධර්මිෂ්ඨ වූ අඥාන රජදරුවෝ අධර්මිෂ්ඨ වූකල අධර්මිෂ්ඨ මනුෂ්‍යයෝත් විනිශ්චයෙහි සලසති. කුසලාකුසලයෙහි ආදරයක් නැත්තා වූ ඒ අඥාන මනුෂ්‍යයෝ සභායෙහි හිඳ විනිශ්චය කරන්නාහු හිමි නොහිමි දෙදෙනා අතින්ම අල්ලස් ගෙන මුඛ දෙකින් කානම් කන්නා වූ අශ්වයා මෙන් අත්ලස් ගන්නාහුය. මේ ස්වප්නය නිසාත් තොපට භයෙක් නැත, සවෙනි ස්වප්නය කියව”යි වදාළසේක.

“ස්වාමීනි, මහජනයෝ ලක්‍ෂයක් වටනා රන්තාලියක් මැද(ඔපවෙන ලෙස මැද) ‘මෙහි මුත්‍ර කරව’යි එක් ජරාසිගාලයෙක්(මහළු සිවලෙකුට) හට එලවා තුබූය(පිළිගැන්වූහ). ඒ මහළු කැණහිලා ඝනරන් තලියෙහි මුත්‍රකෘත්‍යය කරන්නා දිටිමි. මේ මා විසින් දක්නාලද සවෙනි ස්වප්නය, මීට කවර විපාකයෙක්දැ?”යි විචාළෝය. “මීට විපාක අනාගතයෙහිම වන්නේය. මහරජ, අනාගතයෙහි ජාතිසම්පන්න නොවන්නා වූ අධර්මිෂ්ඨ රජදරුවෝ ජාතිසම්පන්න කුලපුත්‍රයන්ට ‘මොහු අපට කිසි අනතරායක්කොට පියද්දේ හෝ’යි සංකාවෙන්(සැකෙන්) යසස් නොදෙති, අකුලීනයන්(කුලහීනයන්) ඇතිකොට වඩනය කරති, එසේ කල්හි මහසම්පත් ඇති ජාතිසම්පන්න මනුෂ්‍යයෝ ජීවත්වගත නොහී ‘මොවුන් නිසා ජීවත්වම්හ’යි අකුලීනයන්ට දූදරුවන් දෙති, මෙසේ ඒ කුලදූන්ගේ අකුලීනයන් සමඟ සංවාසය මහළු කැණහිලාගේ රන්තලියෙහි මුත්‍රකෘත්‍යය

කිරීමක් හා සමාන වන්නේය. මේ ස්වප්නයෙනුත් තොපට භයෙක් නැත, සත්වැනි වූ ස්වප්නය කියව"යි වදාළසේක.

"ස්වාමීනි, එක් පුරුෂයෙක් ලණුවක් අඹර අඹරා පාමුල තබන්නේය. ඒ පුරුෂයා උන් පුටුව යට හොත්තා වූ සාකුස් ඇති(බඩගිනි ඇති) එක් කැණහිල් ධෙනුවක් ඒ පුරුෂයා නොදන්නා පරිද්දෙන් ඒ වරමඬ(ලණුව) කන්නීය. මම මෙසේ දිටිමි, මේ මාගේ සත්වැනි වූ ස්වප්නය, මීට විපාක කවරේදැ?"යි විචාළෝය. "මීට විපාක අනාගතයෙහිම වන්නේය. තවද අනාගතයෙහි ස්ත්‍රීහු පුරුෂයන් කෙරෙහි ලොල් වෙති, අලංකාරයෙහි ලොල් වෙති, වීථිවල ඇවිදීමෙහි ලොල් වෙති, ආමිසයෙහි(කෑම්බීම්වල) ලොල් වෙති, දුශ්ශීල වෙති, දුරාචාර වෙති. එසේ වූ ස්ත්‍රීහු තමන්ගේ පුරුෂයන් කෘෂිවණික්(ගොවිතැන් වෙළදාම්) ආදිවූ කර්මාන්තකොට දුකින් ආයාසයෙන් රැස් කරන ලද්ද වූ සම්පත් චෞරපුරුෂයන්(සොර සැමියන්) හා එක්ව රා බී මල් පැළඳිම් සුවඳ විලවුන් ගැල්වීම් ආදියකොට තමන්ගේ ගෙයි අත්‍යායික වූ කාර්‍ය්‍යීන් (අවශ්‍යම කටයුතු) නොබලා ගෙයි බළල්ලාව සිදුරෙනුත්(ගෙදර බිත්තියට උඩින් ඇති සිදුරෙන් පවා) චෞරපුරුෂයන්ගේ ඊම පරීක්‍ෂා කෙරෙමින් සෙටැදවස් වැපිරිය යුතු බිජුවට වුවත් පැර(කොටා) කැඳබත් අවුළුපත් ආදිය සපයා, අඹර අඹරා පාමුල තබනලද වරමඬ කන්නා වූ පුටුව යට වැදහොත් කැණහිල් ධෙනුව මෙන් ඒ චෞරපුරුෂයා හා එක්ව වස්තුව කා නසන්නාහුය. මේ

කාරණයෙනුත් තොපට භයෙක් නැත, අටවැනි ස්වප්නය කියව”යි වදාළසේක.

“ස්වමීනි, මාලිගා දොරකඩ බොහෝ හිස් වූකල පිරිවරා තබනලද එක් මහත පැන් පිරුණු කළයක් දිටිමි. ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍රය යන සතර පක්ෂයෙහි සත්‍වයෝ සතරදිගින් හා සතර අනුදිගින් කළවලින් පැන් ගෙනවුත් පැන් පිරී තිබෙන්නා වූ පූර්ණකුම්භයම(පිරුණු කළගෙඩියම) පුරවති. පුර පුරා වත්කළ පැන් ඉතිරි ඉතිරී ගලායන්නේය. එසේද වී නමුත් නැවත නැවතත් පිරුණු කළයෙහිම පැන් වත් කරන්නාහුය. හිස් කළ බලන්නා වූ කෙනෙකුත් නැත. මේ මාගේ අටවැනි ස්වප්නය ය, මීට කවර විපාකයෙක්දැ?”යි විචාළෝය.

“මහරජ්ජුරුවෙනි, මීටත් අනාගතයෙහිම විපාක වන්නේය. අනාගතයෙහි වනාහි ලොව පිරිහෙන්නේය. රට නිරොජජක(නිස්සාර) වන්නේය. රජදරුවෝ දුක්පත්ව කෘපණ(දිළිඳු) වෙති. යම් රජ්ජුරු කෙනෙක් ඉසුරුමත්ව වෙසෙත් නම් උන් භාණ්ඩාගාරගෙයි ලක්ෂයක් පමණ කහවණු වන්නේය. ඒ රජ්ජුරුවෝ මෙසේ දුක්පත්වූවාහු සියළු දනව්වාසී සත්‍වයන් ලවා තමන්ගේම කර්මාන්ත කරවති. රාජකාරියෙන් පීඩිත වූ මනුෂ්‍යයෝ තමන්ගේ කර්මාන්ත හැර රජදරුවන් පිණිසම ඇල් වී මහ වී ආදී වූ පුබ්බණ්ණ(පෙරවරු වේලාවෙහි වැපිරිය යුතු ධාන්‍ය වර්ග) හා උඳු මුං තල කලත් ආදී වූ අපරණ්ණ(පස්වරු වේලාවෙහි

වැපිරිය යුතු ධාන්‍ය වර්‍ග) වපුරති, රක්‍ෂා කෙරෙති, කපති, මඩති (පාගති), ගෙට ගෙනෙති, උක්යතින්(උක්දඬු මිරිකන යන්ත්‍රයෙන්) පැණිමැඩ උක්පැණි කකාරති, පුෂ්පාරාම ඵලාරාම(මල්වතු පළතුරුවතු) කෙරෙති, ඒ ඒ තැන ද මැඩ(කපා පාගා) තබනලද වී, සාල්, උඳු, මුං, තල, කලත් ආදිය ගෙනවුත් රජ්ජුරුවන්ගේ කොටුගුළුම(අටුකොටුම) පුරවති. තමන්ගේ ගෙයි සිස් වූ කොටුගුළු බලන්නෝත් නැත. මෙසේ කිරීම සිස් වූකල නොබලා පැන් පිරූ කළයම පුරන්නා හා සමාන වන්නේය. මේ ස්වප්නයෙනුත් තොපට භයෙක් නැත, නවවෙනි ස්වප්නය කියව"යි වදාළසේක.

"ස්වාමීනි, පස්පියුමෙන් ගැවැසීගත්තා වූ වටින්ම තොට ඇත්තා වූ එක් පොකුණක් දිටිමි. හාත්පසින් ද්විපාද චතුෂ්පාදදීහු(දෙපා සිවුපාදී සත්තු) බැස එහි පැන් බොති. ඒ පොකුණ මධ්‍යයේ ගැඹුරු තැන පැන් කැළඹී තිබෙන්නේය. පොකුණ අස(ලඟ) ද්විපාද චතුෂ්පාදදීන් මිරිකන (පාගන) තැන පැන් ප්‍රසන්නව තිබෙයි. මේ මාගේ නවවැනි ස්වප්නය ය, මීට කවර විපාකයෙක්දැ?"යි විචාළෝය.

"මහරජ්ජුරුවෙනි, මීටත් අනාගතයෙහිම විපාක වන්නේය. අනාගතයෙ කාලයෙහි රජදරුවෝ අධාර්මික වන්නාහුය. ඡන්දයෙන්, ද්වේශයෙන්, මෝහයෙන්, භයින් අගතියට යෙමින්(නීතියෙන් පිට පැන) රාජ්‍යය කරන්නාහුය. ධාර්මිෂ්ඨ විනිශ්චය නොකෙරෙති, අත්ලස්ම(අල්ලස්) වස්තුකොට ඇත්තාහු වෙති, සම්පත්තියෙහි ලොල් වෙති, රටවැසියන්

කෙරෙහි ඒ රජදරුවන්ට ක්‍ෂාන්ති මෛත්‍රී කරුණාවෙක් නම් නැත්තේය. චණ්ඩයහ, පරුෂයහ, උක්තයෙහි ලූ උක්ගැටයක් මෙන් පෙළ පෙළා අනේකප්‍රකාර වූ අය පඬුරු(අයබදු) උපදවා වස්තු ගන්නාහුය, මනුෂ්‍යයෝ අයපඬුරින් පීඩිතව කිසිවක් දීගත නොහී ගම් නියම්ගම් ආදිය හැර ප්‍රත්‍යන්ත ජනපදයට(අත පිටිසර පළාත්වලට) ගොස් වාසය කෙරෙති, මධ්‍යම ජනපදය සූන්‍ය(හිස්) වන්නේය, ප්‍රත්යන්තය මනුෂ්‍යන්ගෙන් ගහන වන්නේය. යම් සේ පොකුණ මධ්‍යයේ පැන් කැළඹී තිබේද, පොකුණ කෙළවර පැන් විශේෂයෙන් ප්‍රසන්නව තිබේද, එපරිද්දෙන්ම වන්නේය. මේ කාරණයෙනුත් තොපට භයෙක් නැත, දසවැනි වූ ස්වප්නය කියව"යි වදාළසේක.

"ස්වමිනි, එකම සැළ පැසෙන්නා වූ(හැළියෙහි ඉදෙන) බත් අපාක වන්නා (බත එක සමානව හැමතැන නොඉදෙන බව) දිටිමි. 'අපාක' නම් පළා බෙදූ (පළා වෙන්කර) තැබුවාක් මෙන් තුන් ආකාරයකින්ම පැසීමය. එක් භාගයෙක බත් ඉතා කොමුය(ඉතා බෙරිවී ඉදී ඇත). එක් භාගයක බත් සාල්ය(තවම සහල්ය). එක් භාගයක මදකොට පැසුනේය. මේ මාගේ දසවැනි වූ ස්වප්නය, මීට විපාක කවරේදැ?"යි විචාළෝය. "මහරජ්පුරුවෙනි, මීටත් අනාගතයෙහි විපාක වන්නේය. තවද අනාගතයෙහි රජදරුවෝ අධර්මිෂ්ඨ වෙති. ඒ රජදරුවන් අධර්මිෂ්ඨ වූ කල්හි රාජපුරුෂයෝය, බ්‍රාහමණ ගෘහපතීහුය, නියම්ගම්වාසීහු හා දනව්වාසී සත්‍වයෝයයි මෙසේ ශ්‍රමණබ්‍රාහ්මණයන් පටන් සියළු සත්‍වයෝම අධර්මිෂ්ඨ

වන්නාහුය. ඉක්බිත්තෙන් ඔවුන්ට අරක්ගත් දෙවියෝය, වෘක්ෂදේවතාවෝය, ආකාශස්ථ දේවතාවෝ යයි මෙසේ සියළු දේවතාවෝම අධර්මිෂ්ඨ වන්නාහුය. අධර්මිෂ්ඨ රජදරුවන්ගේ රාජ්‍යයෙහි මහපවන් තදව හමනේය. එසේ තදව හමන්නා වූ පවන් ආකාශස්ථ විමන් කම්පා කරන්නේය. ඒ විමන් කම්පිත වූ කල්හි දේවතාවෝ කිපී වැසි වැස්විය නොදෙති. වස්නාවූත් වැසි සියළු රට එකපැහැර නොවස්නේය. තවද වස්නා වූ වර්ෂාව සී සෑමටවත් වැපිරීමටවත් උපකාරීව නොවස්නේය. රාජ්‍යයෙහි යම්සේද, එපරිද්දෙන්ම දනව්වෙහිත් වැව් පොකුණු විල් ආදියෙහිත් එකපැහැර නොවස්නේය, වැව් උඩත්තට(උඩු පැත්තට) වසී නම් වැව යටි මියරට(යටි පැත්තට) නොවස්නේය, යටි මියර වසීනම් උඩත්තට නොවස්නේය, එක් භාගයක ගොයම් අධික වර්ෂාවෙන් නස්නේය, එක් භාගයක ගොයම් වැසි නොවැසීමෙන් මැරෙන්නේය, එක් භාගයක ගොයම් සම වර්ෂාව වස්වා මනාව පැසවන්නේය. මේ එකම රජ්ජුරුවන්ගේ රාජ්‍යයෙහි වපුරනලද ගොයම් එක් සැළ පැසෙන්නා වූ බත් තුන්කොටසක් වූවාක් මෙන් තුන් පරිද්දකින් පැසෙන්නේය. මේ කාරණයෙනුත් තොපට භයෙක් නැත, එකොළොස්වන ස්වප්නය කියව”යි වදාළසේක.

“ස්වාමීනි, ලක්ෂයක් වටිනා සඳුන් හරයක්(රත්හඳුන් ගැටයක්) කුණු මොරට (කුණු වූ මෝරු වතුර වෙනුවට) විකුණන්නා දිටිමි. කවර විපාකදැ?”යි විචාළෝය. “මීටත් අනාගතයෙහිම මාගේ ශාසනය පිරිහෙන්ට වන් කල්හි විපාක වන්නේය. තවද අනාගතයෙහි ප්‍රත්‍යයෙහි(සිවුපසයෙහි) ලොල්

වූ භික්ෂූහු බොහෝ වන්නාහ. ඔවුන් මා විසින් බොහෝ ප්‍රත්‍යයෙහි ලොල් බව මැඩ කියනලද ධර්මදෙශනාව චීවරාදී චතුර්විධ ප්‍රත්‍යය නිසා(උදෙසා) අනුන්ට දේශනා කෙරෙති. ප්‍රත්‍යය ලොභයෙන් මිදී නිසසරණ පක්‍ෂයෙහි සිට(සසරින් නිදහස් වීමේ අදහසේ පිහිටා) නිර්වාණාභිමුඛව(නිවනට තුඩුදී) දෙසන්ට අසමර්ථ වෙති. හුදක් ‘මාගේ ව්‍යඤ්ජන සම්පත්තිය(ශරීරශොභාව හෝ වාක්චාතුර්ය්‍යය) හා මධුර සවරය(මිහිරි කටහඬ) අසා මාහැගි වූ සිවුරු ආදිය දෙති(දායකයෝ දෙති), දෙනු කැමැතතාහුද වෙති’යි කියාම දේශනා කරති. සමහර කෙනෙක් වීථිමධ්‍යයය, සතරමංසන්ධියය, මාලිගාවේ වාසල්දොරකඩය යනාදී වූ සථානවල හිඳ මදටත් කහවණුවක්(සුළු ගාස්තුවක්) නිසාත් දේශනා කෙරෙති. මෙසේ මා විසින් නිර්වාණය අගයකොට දෙසනලද ධර්මය චීවර, පිණ්ඩපාත, සෙනාසන, ගිලානප්‍රත්‍යය යන චතුර්විධ ප්‍රත්‍යය හා මදටත් කහවණුවක් නිසා විකිණීකොට දෙන්නාහුය(විකුණන්නාහුය). ලක්‍ෂයක් අගනා හඳුන්හරක් කුණුමොරට විකුණන්නාවුන් වැන්නෝය. මේ කාරණයෙනුත් තොපට භයෙක් නැත්තේය, දොළොස්වෙනි ස්වප්නය කියව”යි වදාළසේක.

“ස්වාමීනි, සිස් වූ වියළි ලබු දියෙහි ගිලෙන්නා දිටිමි. මීට විපාක කවරේදැ?”යි විචාළෝය. “මහරජ්ජුරුවෙනි, මීටත් අනාගතයෙහි යහපත පෙරලෙන්ට වන් කල්හිම විපාක වන්නේය. එසමයෙහි රජදරුවෝ ජාතිසම්පන්න කුලපුත්‍රයන්ට යසස් නොදෙති, කුලගැත්තන්ටම යසස් දෙති. ඒ කුලහීනයෝ

ඉසුරුමත් වෙති, කුලපුත්‍රයෝ දිළිඳුවෙති. රජදරුවන් සම්මුඛයෙහිත්, රාජද්වරයෙහිත්(රජගෙදරදීත්), අමාත්‍යයන් සම්මුඛයෙහිත්, විනිශ්චය මණ්ඩලයෙහිත් සිස් ලබු හා සමාන වූ අකුලීනයන්ගේම කථාවල ගැලීසිටියා මෙන් නිශ්චලව සුප්‍රතිෂ්ඨිත වන්නාහුය, සංඝකර්ම ගණකර්මයෙහිත් (භික්ෂූන් සාමූහිකව කරනු ලබන විනයකර්මාදියෙදීද) පාත්‍ර චීවරාදිය හා විහාරාදීන්ගේ විනිශ්චය ස්ථානයෙහිත් දුශ්ශීල වූ පාපී පුද්ගලයන්ගේම කථාව නෛර්‍ය්‍යාණික(ඇදහියයුතු) වන්නේය, ඔවුන්ගේ බස් ග්‍රාහ්‍ය(පිළිගැනීමට සුදුසු) වන්නේය, ලජ්ජී භික්ෂූන්ගේ(ශික්ෂාගරු භික්ෂූන්ගේ) එබස් අග්‍රාහ්‍ය වන්නේයයි, මෙසේ සර්වප්‍රකාරයෙන්ම සිස් ලබු ගිලෙන කලක් මෙන් වන්නේය. මේ කාරණයෙනුත් තොපට භයෙක් නැත, තෙළෙස්වැනි වූ ස්වප්නය කියව"යි වදාළසේක.

"ස්වාමීනි, මහත් වූ කුළුගෙවල් පමණ වූ ඝණ ශෛල(ගල්කුට්ටි) නැව් මෙන් දියෙහි හිල්පෙන්නා (පාවෙන්නා) දිටිමි. මීට විපාක කවරේදැ?"යි විචාළෝය. "මහරජ්ජුරුවෙනි, මීටත් එබඳු වූ කාලයෙහිම විපාක වන්නේය. එසමයෙහි අධර්මිෂ්ඨ රජදරුවෝ අකුලීනයන්ට යසස් දෙති. ඔවුහු සම්පත් ලැබ ඉසුරුමත් වෙති. කුලීනයෝ දුක්පත් වෙති. ඔවුන් කෙරෙහි කිසිවකුත් ආදරගෞරව නොකෙරෙති. අන්‍ය වූ අකුලීනයන් කෙරෙහිම ආදරගෞරව කෙරෙති. රජ්ජුරුවන් සම්මුඛයෙහිත්, අමාත්‍යයන් සම්මුඛයෙහිත්, විනිශ්චය මණ්ඩලයෙහි දක්ෂ වූ බරගල් හා සමාන වූ කුලපුත්‍රයන් බස් පිහිටා නොසිටිනේය. ඒ කුලපුත්‍රයන් කථාකරන්ට වන් කල්හි

'මුන් කියන්නේ කිම්දැ'යි අන්‍ය වූ අකුලීනයෝ අපහාසකොට නින්‍දා කෙරෙති, භික්‍ෂූන් වහන්සේගේ සන්නිපාතයෙහිත්(රැස්වූ තැන්වලදීත්) උක්තප්‍රකාර වූ සථානවල්හි ලජ්ජිපෙසල (ශික්‍ෂාකාමී සිල්වත්) භික්‍ෂූන් වහන්සේ ගරුකොට නොසිතති. ඒ ලජ්ජි භික්‍ෂූන්ගේ කථාවන් සංඝ සන්නිපාතාදියෙහි(සංඝ රැස්වීම් ආදියේදී) නිශ්චලව(ඒකමතිකව පිළිගත හැකි පරිදි) නොසිටින්නේය. ගල් හිල්පෙන කලක් මෙන් හිල්පෙන්නේය. ග්‍රාහ්‍ය නොවන්නේය. මේ කාරණයෙනුත් තොපට භයෙක් නැත, තුදුස්වැනි වු ස්වප්නය කියව''යි වදාළසේක.

"ස්වාමීනි, මීපුප්සා(මී මල් තරමට කුඩා වූ) මැඩියන් මහත් වූ කෘෂණ(කළු) සර්පයන් පසුපස්සෙහි වේගයෙන් ලුහුබැඳවා ගෙනගොස් ඇඹුලදඬුමෙන් (නෙළුම්බට මෙන්) කඩ කඩා 'මුරු' 'මුරු' යන අනුකරණ ශබ්ද පවත්වමින් මස් කා ගලන්නවුන්(ගිල දමන්නන්) දිටිමි. මීට විපාක කවරේදැ?''යි විචාළෝය. "මීටත් ලොව පිරිහෙන්ට වන්කල්හි අනාගතයෙහි විපාක වන්නේය. එසමයෙහි මනුෂ්‍යයෝ අධික රාගීව ක්ලේශවසඟව ළදරු ළදරු වූ(තරුණ තරුණ වූ) තම තමන්ගේ භාය්‍ය්‍යාවන්ගේ වසඟයෙහි පවතී. ඔවුන්ගේ ගෙයි දාසකර්‍මකාරාදීන් (දාසකම්කරු ආදීන්) හා ගවමහිසාදීන්ද(එළහරක් මීහරක් ආදීන්) රන්රුවන් ආදියත් ඒ ස්ත්‍රීන් සනතක වන්නේය. 'අසවල් රන්රුවන් මුතුමැණික් ආදිය හා වසත්‍රාභරණ ආදී සියළු වසතූන් කොයිදැ?'යි විචාළ කල්හි 'ඒ වස්තුව කොයි තිබෙයි නමුත් තට මේ විචාරා ආයාස ගැන්ම ප්‍රයෝජන කිම්ද? තෝ මා ගෙයි ඇත්ත

නැත්ත(ඇති නැති දේ) විචාරන්නා කැමැත්තෙහිදැ?'යි කියා අනේකප්‍රකාරයෙන් ආක්‍රොශපරිභව බැණ මුඛ නැමැති අඩයටියෙන්(උලෙන්) ඇණ දසයකුමෙන් තමා වසඟයෙහි පවත්වා තුමූ ඉසුරුමත්කම් පවත්වන්නාහුය. එසේ කල්හි මීපුප් පමණ මැඩියන් කෘෂණ සර්පයන් ගලනා කලක් මෙන් වන්නේය. මේ කාරණයෙනුත් තොපට භයෙක් නැත, පසළොස්වැනිවූ ස්වප්නය කියව"යි වදාළසේක.

"ස්වාමීනි, දශවිධ වූ අධර්මයෙන්(අප්‍රිය ජනක ගතිගුණ දහයකින්) යුකත වූ ගම් පහරන්නා වූ(ගම් තම ගොදුරු බිම් කරගත්තා වූ) කපුටුවන් රන්වන් වූ පැහැ ඇති බැවින් 'ස්වර්ණ' යයි ලබනලද නම් ඇති සවර්ණහංසරාජයන් පිරිවරා ඇවිදිනාවුන් දිටිමි. මීට විපාක කවරේදැ?"යි විචාළෝය.

"මහරජ්ජුරුවෙනි, මීටත් අනාගතයෙහි දුර්වල රජදරුවන් සමීපයෙහිම විපාක වන්නේය. මහරජ්ජුරුවෙනි, අනාගතයෙහි රජදරුවෝ හසතිශිල්පාදීයෙහිත්, යුද්ධයෙහිත් බුහුටි නොවෙති, සමර්ථ නොවෙති. ඒ රජදරුවෝ තමන්ම රාජවිපත්තියෙහි සංකා කෙරෙමින් සමානජාති ඇත්තා වූ කුලපුත්‍රයන්ට ඓශ්වර්ය්‍ය නොදී තමන්ට මෙහෙකරන කරනැවෑමියන්(හිසරැවුල් කපන්නන්) ආදී වූ සත්වයන්ට ඓශ්වර්ය්‍ය දෙති. ජාතිගොත්‍රයෙන් යුක්ත වූ කුලපුත්‍රයෝ රජදරුවන් පිහිටක් ලැබගත නොහී ජීවත්වන්ට අසමර්ථව ඓශ්වර්ය්‍යයෙහි පිහිටියා වූ ජාතිගොත්‍රයෙන් හීන වූ අකුලීනයන්ට සේවය කෙරෙති, ඇවිදිති. මෙසේ කල්හි

ස්වර්ණහංසරාජයෝ කපුවූවන් පිරිවරා ඇවිදිනා කලක්මෙන් වන්නේය. මේ කාරණයෙනුත් තොපට භයෙක් නැත, සොළොස්වැනි වූ ස්වප්නය කියව"යි වදාළසේක.

"ස්වාමීනි, පෙර දිවියෝ එළුවන් කති, මම වූකලී දැන් එළුවන් දිවියන් පසුපස්සෙහි ලුහුබැඳ ගෙනගොස් 'මුරු මුරු' යන අනුකරණකොට කන්නා දිටිමි. එකල්හි අන්‍ය වූ දිවියෝ එළුවන් දුරින් එනනා දැක භයින් ත්‍රසතව පලාගොස් කැලයට වැද සැඟවෙන්නාහුය. මම මෙසේ දිටිමි, මීට විපාක කවරේදැ?"යි විචාළෝය.

"මහරජ්ජුරුවෙනි, මීටත් අනාගතයෙහි අධර්මිෂ්ඨ රජදරුවන් සමයෙහි විපාක වන්නේය. එසමයෙහි අකුලීනයෝ රාජවල්ලභ(රජවරුන්ට පක්ෂපාත) වෙති, ඉසුරුමත් වෙති. කුලපුත්‍රයෝ අප්‍රසිද්ධ වෙති. ඒ රාජවලලභ වූ කුලහීනයෝ තමන්ගේ බස් රජදරුවන්ට කියා නම්මා(තම වචනයට නම්මවාගෙන) විනිශ්චයශාලාදියෙහි බලවත්ව හිඳ ජාතිසම්පන්න වූ ප්‍රවෙණියෙන්(පරපුරෙන්) ආවා වූ සත්‍වයන්ගේ කෙත්වත් ආරාමාදියට 'මේ අප සන්තක වූ කෙත්වත් ආදිය'යි යුක්ති බැණ ඒ ඒ කුලයන් විසින් 'තොපගේද? අපගේදැ?'යි කියා විනිශ්චයස්ථානාදියෙහි විවාද කරන කල්හි වේවැල් ආදියෙන් ගස්වා බොටුව අල්වා ඉවත දැම්මවා 'තොපගේ පමණ නොදනුද? අප හා සමඟ විවාද කරව්ද? දැන් රජ්ජුරුවන් වහන්සේට දන්වලා(පවසා) හස්තපාදදිය(අතපය) කප්පවාපියවු'යි ඒ කුලපුත්‍රයන් භය

ගන්වති. ඒ කුලපුත්‍රයෝ රාජවල්ලභ වූ කුලහීනයන්ට භයින් තමන් සන්තක වූ ක්‍ෂෙත්‍රවස්තු ආරාමාදිය(කෙත්වතු උයන් ආදිය) 'තොපිම ඇරගනිව්, තොපටමය'යි පාවාදී තමන් ගෙට යහපත්ව(තමන්ගේ ගෙවල්වලට ගොස්) වැදහෝනාහුය. පාපී වූ භික්‍ෂූහු ලජ්ජී වූ භික්‍ෂූන්ට කැමති පරිද්දෙන් පීඩා කරන්නාහු. ඒ ලජ්ජී ප්‍රියසීලී වූ භික්‍ෂූන් වහන්සේ කිසි පිහිටක් නොලැබ වනයට වැද කැලෑදියෙහි සැඟවී හිඳිනාසේක. මෙසේ කල්හි හීනජාතීන් හා පාපී භික්‍ෂූන් විසින් පීඩිත වූ ජාතිමත් කුලපුත්‍රයන් හා ලජ්ජී භික්‍ෂූන් එළුවන්ට භයින් දිවියන් සැඟවී භයගෙන පලායන කලක්මෙන් වන්නේය. මේ කාරණයෙනුත් තොපට භයෙක්නැත, මේ ස්වප්නය අනාගතයම උදෙසා තොප විසින් දක්නා ලද්දේය. බමුණෝ වනාහි තමන් අධර්මිෂ්ඨවන බැවිනුත් ධර්‍මයෙහි තත්ත්වය නොදන්නා බැවිනුත් තොප කෙරෙහි ස්නෙහයෙනුත් කීහ. 'බොහෝ වස්තු ලබම්හ'යි තමන් වස්තුවෙහි ලොභොබී බැවිනුත්, ජීවත්වනු නිසා නුඹවහන්සේ දුටු මේ ස්වප්න විනාශය පිණිස 'සර්‍වචතුෂ්ක යාගය කරම්හ'යි කීවෝ වේදැ''යි මෙසේ සර්‍වඥයන් වහන්සේ සොළොස් ස්වප්නයෙහි විපාක වදාරා "මහරජ්ජුරුවෙනි, දැන් මේ ස්වප්නය දුටුවෝ තොපි මතු නොවෙයි, පුරාතනයෙහි රජදරුවෝත් දුටුවාහුමය. බ්‍රාහ්මණයෝ ඒ රජදරුවන්ටත් මෙපරිද්දෙන්ම කියා මේ ස්වප්නය යාගමත්තට දැමූය. ඉක්බිති නුවණැත්තන් විසින් දෙසනලද න්‍යායෙහි(ක්‍රමයෙහි) සිට බොධිසත්වයන් අතින් විචාළෝය. පුරාතනයෙහි නුවණැත්තෝ ඔවුන්ට මේ ස්වප්නය

කියන්නෝ මෙම ක්‍රමයෙන්ම කීවෝ වේදැ''යි වදරා ඒ කොසොල් රජ්ජුරුවන් විසින් ආරාධිත වූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කරන සමයෙහි පුරණලද බෝධිසම්භාර ඇති අප මහබෝසතාණෝ ප්‍රසිද්ධ වූ බ්‍රාහ්මණ වංශයෙහි ඉපිද වැඩිවිය පැමිණ ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා හිමාලය වන ප්‍රදේශයෙහි ධ්‍යානක්‍රීඩාවෙන් යුක්තව වාසය කරන්නාහුය. එසමයෙහි බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ මෙම ක්‍රමයෙන් ස්වප්නය දැක බමුණන් අතින් විචාළෝය. බමුණෝ මෙපරිද්දෙන් යාග කරන්නට ගත්හ. බමුණන් අතුරෙන් පුරෝහිත බ්‍රාහ්මණයාගේ අතවැසි මාණවකයා ප්‍රඥාසම්පන්නය, ව්‍යක්තය. ඒ තෙමේ ආචාරීන්ට කියන්නේ "ආචාරීන් වහන්ස, නුඹවහන්සේ විසින් අපි වෙදත්‍රය උගන්වන ලදුම්හයි, ඒ වෙදත්‍රයෙහි එකකු මරා එකක්හට ස්වස්ථයක්(යහපතක්) කිරීමක් නැත්තේ වේදැ''යි කීය. එබස් ඇසූ ආචාරී කියන්නෝ "දරුව, මේ උපායෙන් අපට බොහෝ වස්තු උපදවන්නේය, තෝ වූකලී රජ්ජුරුවන්ගේ වස්තු රකනා කැමැත්තේ වෙනැ''යි කිවූය.

එබස් ඇසූ මානවකයා "එසේ වීනම් ආචාරීන් වහන්ස, නුඹ වහන්සේගේ යාග කාරිය කළමැනවයි, මම නුඹ වහන්සේ සමීපයෙහි කුමක් කරම්දැ''යි කියා ගොස් ඉවත ඇවිදිනේ

රජ්ජුරුවන්ගේ උයනට ගියේය. එදවස් මහබෝසතාණෝත් ඒ කාරණය දැන "අද මා විසින් මනුෂ්‍යපථයට(මිනිසුන් වසන තැනට) ගිය කල්හි මහජනයා මගේ බන්ධනයෙන් මිදීම වන්නේයැ"යි ආකාශයෙන් ගොස් උයනේ බැස රන්පිළිමයක් මෙන් මගුල් සලවට මත්තේ උන්නාහුය. ඒ මානවකයාද බෝධිසත්වයන් කරාගොස් එකත්පසව හිඳ සුවදුක් කථා කළේය. මහබෝසතාණෝ ඒ මානවකයා හා සමග මිහිරි වූ පිළිසඳර කථාකොට "කිමෙක්ද? මානවකය, රජ්ජුරුවෝ දැහැමින් රාජ්‍යය කෙරෙත්දැ"යි විචාළෝය. "ස්වාමීනි, රජ්ජුරුවන් වහන්සේ වූකලී ධර්මිෂ්ඨසේක. එතකුදු වුවත් බමුණෝ උන්වහන්සේ අපායමාර්ගයෙහි පවත්වති, රජ්ජුරුවන් වහන්සේ සොළොස් ස්වප්නයක් දැක බමුණන්ට කී සේක. බමුණෝ 'යාග කරම්හ'යි පටන්ගත්හ. කිමෙක්ද? ස්වාමීනි, මේ ස්වප්නයන්ගේ විපාක මේ යයි රජ්ජුරුවන් වහන්සේ ගිවිස්වා මහජනයා භයින් මුදන්ට නුඹවහන්සේට නොවටීදැ"යි කීහ. "මානවකය, අපි වූකලී රජ්ජුරුවන් නාඳුනම්හ, රජ්ජුරුවන් වහන්සේ අප නාඳුනති, ඉදින් මෙතනට අවුත් විචාළෝ නම් අපි ඔහුන්ට කියනමෝ වේදැ"යි කිවුය. මානවකයා "ස්වාමීනි, මම රජ්ජුරුවන් වහන්සේ කැඳවාගෙන එමි. නුඹවහන්සේ මාගේ ඊම බලමින් ඇසිල්ලක් පමාවුව මැනවැ"යි කියා බෝධිසත්වයන්ට ප්‍රතිඥා දී රජ්ජුරුවන් සමීපයට ගොස් "මහරජ්ජුරුවන් වහන්ස, එක් ආචාරී තාපස කෙනෙකුන් වහන්සේ නුඹවහන්සේගේ උයනෙහි බැස 'නුඹවහන්සේ විසින් දුටු ස්වප්නයෙහි විපාක කියමි'යි කැඳවනසේකැ"යි කීය.

රජ්ජුරුවෝ ඔහුගේ කථා අසා මහජනයා පිරිවරා එකෙනෙහිම උයනට ගොස් තාපසයන් වැඳ එකත්පස්ව හිඳ "ස්වමීනි, නුඹවහන්සේ මා දුටු ස්වප්නයෙහි විපාක දන්නාසේක්දැ"යි විචාළෝය. "එසේය, මහරජ්ජුරුවනි"යි කී කල්හි "එසේ වීනම් කිව මැනවැ"යි කිවුය. "මහරජ්ජුරුවනි, කියම්, තොප දුටු සැටියේ ස්වප්නය මට කියව"යි කිවූය. "යහපත, ස්වාමීනි" කියා රජ්ජුරුවෝ!

උසභාරුක්ඛා ගාවියෝ ගාවා ච
අසෙසා කංසො සිඟාලී ච කුමෙභා
පොක්ඛරණී අපාකචන්දනං
ලාපූනි සීදන්ති සිලා පල්වන්ති
මණ්ඩුකියො කණ්හසපෙප ගිලන්ති
කාකං සුවණ්ණා පරිවාරයන්ති
තසාවකා එළකානං භයා හී'ති

යන මේ ගාථාව කියා පසේනදි කොසොල් රජ්ජුරුවන් විසින් කියනලද ක්‍රමයෙන්ම සොළොස් ස්වප්නය කිවූය. මහබෝධිසත්වයෝත් ඒ සොළොස් ස්වප්නය දැන් සර්වඥයන් වහන්සේ වදාළ සැටියේම විස්තර හෙයින් විපාකයන් කියා කෙළවර මෙසේ කිවුය. "මහරජ්ජුරුවෙනි, මෙතෙම ස්වප්නයෙහි නිෂ්පත්තිය(විපාකය) වන්නේය. ඒ ස්වප්නයෙහි දෙෂ නසන පිණිස යම් යාගක්‍රියාවක් පවතී නම් ඒ යාග විපරීත හෙයින් පවත්නේය. කවර කාරණයකින්ද? යත්,

මේ සොළොස් ස්වප්නයෙහි විපාක නම් ලෝකයෙහි සත්‍වයන්ගේ ගුණ පෙරලෙන්ට වන් කල්හි, අකාරණය කාරණයයි කියා ගන්නා කල්හි, කාරණය අකාරණයයි ගන්නා කල්හි, අභූත භූතයයි(නොවූ දේ වූයේයයි) කියා ගන්නා කල්හි, භූතය අභූතයයි කියා ගන්නා කල්හි, අලජ්ජීන් උත්සන්න වන කල්හි, ලජ්ජීන් පිරිහෙන කල්හි වන්නේය. දැන් තොපගේවත් මාගේවත් යන මේ පුරුෂයුග්මය(පුරුෂයන් දෙදෙනා) පවත්නා කල්හි(ජීවත්වන කාලය ඇතුළතදී) මේ සොළොස් ස්වප්නයෙන් වන විපාකයෙක් නැත. එසේ හෙයින් මේ ඒ ස්වප්නවිපාක විනාශය පිණිස පවත්නාහු යාගක්‍රියා විපරියාස හෙයින් පවත්නේය. ඒ යාගයෙන් ප්‍රයෝජන නැත. තොපට මේ සොළොස් ස්වප්නය දුටු කාරණයෙන් භයෙක්වත්, තැති ගැන්මෙක්වත්, නැතැ''යි මහාබෝසතාණෝ රජ්ජුරුවන් අස්වසාලා මහජනයා බන්ධනයෙන් මුදා නැවත ආකාශයේ සිට රජ්ජුරුවන්ට අවවාද කියා පඤ්චශීලයෙහි පිහිටුවා ''මෙතැන් පටන් මහරජ්ජුරුවෙනි, බමුණන් හා එක්ව කරන්නා වු පශුඝාත(සත්ව ඝාතන) නම් යාගය ඇරපියව''යි ධර්‍මදේශනාකොට ආකාශයෙන්ම තමන් වසන්නා වූ ස්ථානයටම ගියෝය. රජ්ජුරුවොත් මහබෝසතාණන්ගේ අවවාදයෙහි පිහිටා දනාදි වූ පින්කම්කොට කම් වූ පරිද්දෙන් මියපරලොව ගියෝය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා වදාරා ''මහරජ්ජුරුවෙනි, ස්වප්න දුටු කාරණයෙන් තොපට භයෙක් නැත, මේ යාගය හැරපියව''යි

යාග හරවා මහජනයාට ජීවිත දානය දී පුර්වාපරසන්ධි ගළපා මේ 'මහසපින ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. මානවකයා නම් ශාරිපුත්‍ර ස්ථවිරයෝය. එසමයෙහි තපස්වී වුයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 078. ඉල්ලීස ජාතකය

තවද එක් සමයෙක්හි ලොකොත්‍රයට ප්‍රදීපයක්(තුන් ලොවට පහනක්) බඳු වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වසනසේක් මච්ඡරිය කොසිය සිටාණන් අරභයා මේ ජාතකය වදාළසේක.

රජගහ නුවරට නුදුරු තෙනක සකඛරා නම් වූ ගමෙක් වූයේය. එහි අසූකෙළක් පමණ ධනසම්පත් ඇති මච්ඡරිය කොසිය නම් සිටුපුත්‍රයෙක් වසන්නේය. ඒ සිටුපුත්‍රතෙම තණ කෙන්දක්(තණකොළ අගක්) තෙල් ගාලා එයින් තෙල් බින්දුවකුත් අනුන්ට නොදෙන්නේය. තෙමේත් අනුභව නොකරන්නේය. මෙසේ ඔහුගේ වස්තු සමූහය පුත්‍රදාරාදීන්ටවත් ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්ටවත් ප්‍රයෝජනයකට නොපැමිණෙන්නේය. රාක්ෂසාධිගෘහිත වූ පුෂ්කරණීයක්(රකුසන් අරක්ගත් පොකුණක්) මෙන් අපරිභොගව(පරිභෝග කිරීමෙන් තොරව) සිටිනේය.

එක් දවසක් සර්‍වඥයන් වහන්සේ අලුයම් වේලේ මහා කරුණා සමාපතතියෙන් නැගී සියලු සක්වළ චතුසසත්‍යාවබොධයට(සිවුසස් තේරුම් ගැනීමට) සුදුසු බන්ධූන්(හේතු සම්පත් ඇත්තවුන්) බලා වදාරණසේක් පන්සාළිස් යොදුනකින් මත්තේ වසන්නා වූ භාය්‍ර්‍යාව සහිත වූ සිටාණන්ගේ ශ්‍රොතාපත්තිඵලයට උපනිශ්‍රය(සොවාන්වීමේ භාග්‍යය) දුටුසේක. සර්‍වඥයන් වහන්සේ මහා කරුණා සමාපතතියෙන් නැගී බලන්නෝ, පළමු දවසෙක රාජ සේවයට රජගෙට ගොස් රජ්ජුරුවන්ට සේවයකොට එන්නා වූ සිටාණෝ සාකුස්(බඩගිනි) ඇතිව දනවුවැසි මනුෂ්‍යයකු කොමුයෙන්(පැණියෙන්) පිරුණා වූ කබල්ලක් (කැවුමක්, රොටියක්) කන්නා දැක එහි තෘෂ්ණාව උපදවා තමන්ගේ ගෙට ගොස් මෙසේ සිතූය "ඉදින් කබල්ලක් කනු කැමැත්තෙමි' කියෙම් නම් මා සමග බොහෝ දෙන කනු කැමති වෙති, එසේ කල්හි මාගේ බොහෝ සාල්, ගිතෙල්, මී, උක්සකුරු ආදිය නිමවන්නේය. එසේ හෙයින් කිසිවක්හට නොකියමි"යි තෘෂණාව ඉවසාගෙන ඇවිදිනාහුය. ඒ සිටාණෝ කල් යත් යත් සුදුමැළිව ගිය ශරීර ඇතිව ඉපිල තිබෙන්නා වූ නහර බහනින් වළඳිනාලද(නහර නැමති ලණුවලින් යුත්) ශරීර ඇතිවූය. ඉක්බිත්තෙන් තෘෂ්ණාව ඉවසාගත නොහී ගබඩාවට වැද ඇඳ වැලඳගෙන වැදහොත්තාහුය. මෙසේ දුර්‍වල බවට පැමිණෙත් වසතු විනාශ වෙයි යන භයින් කවුරුන්ටත් කිසිවක් නොකීවාහුය. එකල්හි සිටාණන්ගේ භාය්‍ර්‍යාව සමීපයට ගොස් පිට පිරිමැද "ස්වාමීනි,

නුඹවහන්සේට අපාසු කුමක්දැ?''යි විචාළීය. "මට කිසි අපාසුවෙක් නැතැ''යි කී කල්හි "කිමෙක්ද? සිටාණන් වහන්ස, රජ්ජුරුවන් වහන්සේ කිපිසේක්දැ''යි විචාළීය.

"රජ්ජුරුවන් වහන්සේ මට කළ කෝපයෙක් නැතැ''යි කී කල්හි "එසේ කල නුඹවහන්සේගේ දූදරුවන් විසින්වත් ද්‍රස කර්මකාරාදීන් විසින්වත් කරනලද කිසි අමනාපයෙක් ඇද්දැ?''යි විචාළීය. "එබන්දකුත් නැතැ''යි කී කල්හි "නුඹවහන්සේට කිසි තෘෂණාවෙක් ඇද්දැ?''යි විචාළීය. එසේ කල්හි වස්තු විනාශ භයින් කිසිවක් නොකියා නිශ්ශබ්දවම වැදහොත්තාහුය.

ඉක්බිත්තෙන් සිටාණන්ගේ භාර්‍ය්‍යාතොමෝ "ස්වාමීනි, කිව මැනව, කිසිවක් ගැන නුඹවහන්සේට තෘෂණාව ඇද්දැ?''යි විචාළීය. එබස් ඇසූ සිටාණෝ බස ගැළපියන්නාක්මෙන්(වචන ගිලින්නාක් මෙන් ඉතා සෙමින්) "එක් තෘෂ්ණාවක් ඇතැ''යි කිවූය. "ස්වාමීනි, කවර තෘෂ්ණාවෙක්දැ?''යි විචාළ කල්හි "කබල්ලක් කනු කැමැත්තෙමි''යි කිවූය. "එසේ කල නුඹවහන්සේ මෙතෙක් දවස් කුමක් පිණිස නොකීසේක්ද? නුඹවහන්සේ දිළිඳුසේක්ද? සක්ඛර නම් නියම්ගම් වැස්සන්ට සෑහෙන පරිද්දෙන් කබළු පිසම්දැ?''යි කිවූය. "තීට ඔවුන්ගෙන් ප්‍රයෝජන කීම්ද? උං තුමූ තමන්ට උපයාගෙන කති''යි කිවූය. "එසේ වීනම් එක වීථියෙක වසන්නවුන්ට සෑහෙන පරිද්දෙන් පිසම්දැ?''යි කිවූය. "තොපි මහසම්පත් ඇති නියාව දන්නමෝ වේදැ''යි කීවූය. "එසේ වීනම් මේ ගෙයි පමණක් සියල්ලවුන්ට සෑහෙනුකොට පිසම්දැ?''යි කිවූය. "මම තොප මහත් වූ

අදහස් ඇති නියාව දන්නේවේදැ''යි කිවූය. ''එසේ වීනම් නුඹවහන්සේගේ දූදරුවන් පමණට සෑහෙන නියායෙන් පිසම්දැ?''යි විචාළීය. ''ඔවුන්ගෙන් තිට ප්‍රයෝජන කීම්දැ''යි කී කල්හි ''එසේ වීනම් නුඹවහන්සේටත් මටත් සෑහෙන පරිද්දෙන් පිසම්දැ?''යි කිවූය. ''තෝ මට කුමක් කරන්නෙහිදැ''යි කී කල්හි ''එසේ වීනම් තනිව නුඹවහන්සේටම සෑහෙන නියාවෙන් පිසම්දැ?''යි විචාළීය. එකල සිටාණෝ කියන්නෝ ''මෙතනදී පිසන කල බෝහෝදෙනා කනු කැමති වෙති, නොකඩසාල් හැර කඩසාලත්(සුන් සහල්) උදුන හා කබල් ආදියත් ගෙන යන්නෙමි, යම්තම් කිරිතෙල් වී උක්සකුරු ආදියත් ගෙන සත්මාලක් ඇති ප්‍රාසාදයාගේ මතුමහල් තලයට නැගී පිසවා එතැන්හිම උදකලාව හිඳ කම්''යි කිවූය. ඒ සිටු දූ සිටාණන් කී බස් ''යහපතැ''යි පිළිගෙන ගතයුක්ත ගෙන්වාගෙන ප්‍රාසාදයට නැගී කෙල්ලන් යවා සිටාණන් කැඳවූය. ඒ සිටාණෝ ආදී පටන්(මුල පටන්) දොරවල් පියමින් හැරම දොරවල්වලම අගුල් ලා සත්වෙනි මාලට නැගී ඒ සත්වෙනි මාලයෙහි දොර පියා(ඇර) උන්නාහුය. සිටාණන්ගේ භාර්‍ය්‍යාවන් උදුනෙහි ගිනිමොලවා කබල ලිපතබා කබළු පිසන්ට පටන් ගත්තීය.

එකල සර්‍වඥයන් වහන්සේ මුගලන් මහතෙරුන් වහන්සේට උදෑසනම මෙසේ වදාළසේක. ''මහමොග්ගල්ලාන සථවිරයෙනි, රජගහ නුවර සකඛර නම් නියම්ගම මචඡරිය කොසිය නම් සිටුපුත්‍රයෙක් 'කබළු කම්' සිතා අනුන්ගේ දැක්මට භයින් සත්මාලක් ඇති ප්‍රාසාදයෙ මතුමහල් තලයෙහි කබළු

පිසන්නේය. තෙපි එතනට ගොස් ඒ සිටුපුත්‍රයා දමනෙහිලා ඔහුගේ සන්තානගත වූ කෙලෙස් නමැති විෂ විනාසකොට සිටුපුත්‍රයා හා සිටුදුව ලවා කබළු කිරිතෙල් මී සකුරු ආදී වූ දෙය ගෙන්වා තොපගේ බලයෙන් ජෙතවනයට එව. මම අද පන්සියයක් භික්‍ෂූන් හා සමඟ විහාරයෙහිම හිඳිමි. ඒ කබල්ලක පූපයෙන් ආහාර කෘත්‍යය කෙරෙමි”යි වදාළසේක. තෙරුන් වහන්සේ “යහපත, ස්වාමීනි” කියා සර්‍වඥයන් වහන්සේගේ වචනය පිළිගෙන එකෙණෙහි ඍද්ධිබලයෙන් ඒ නියම්ගමට ගොස් ඔහුගේ ප්‍රාසාදයෙහි සිවුමැදුරු කවුළුව සමීපයෙහි මනාකොට හැඳපෙරවා ආකාශයෙහි ඉඳුනිල්මිණි රුවනක් මෙන් සිටිසේක.

මහසිටාණන්ට තෙරුන් වහන්සේ දැකලාම ළය කම්පිතව ගියේය. ඒ සිටාණෝ “මම මෙබඳු වූ ශ්‍රමණයන්ට භයින්ම මේ ස්ථානයට ආමි, මේ ශ්‍රමණයෝ වනාහි අවුත් කවුළුදෙර සමීපයෙහි සිටියේය”යි අනිකක් කියාගත හැකි දෙයක් නොදැක ගින්නට දැමූ ලුණු කැටියක් මෙන් රොෂයෙන්(කෝපයෙන්) ‘තට තට’ යන අවුකරණ ශබ්ද පවත්වමින් මෙසේ කීහ.

“ශ්‍රමණයෙනි, තෙපි ආකාශයෙහි සිට කුමක් ලබවුද? ආකාශයෙහි අපදයෙහි පද දක්වා(පියවර තබාගත නොහැකි අහසෙහි පිය සටහන් පෙන්වා) සක්මන් කළමුත් කිසිවක් නොලබන්නාවේදැ”යි කිවුය. තෙරුන් වහන්සේ එම තෙන ආකාශයෙහි සිට ඈත මෑත සක්මන් කළසේක. සිටාණෝ ඒ

දැක "ශ්‍රමණයෙනි, සක්මන්කොට කුමක් ලබවුද? ආකාශයෙහි පලක් බැඳගෙන උන්නේ වී නමුත් කිසිවක් නොලබන්නාවේදැ"යි කිවූය. තෙරුන් වහන්සේ ආකාශයෙහි පලක් බැඳ හුන්සේක.

ඉක්බිත්තෙන් සිටාණෝ ඒ දැක "ආකාශයෙහි හිඳ කුමක් ලබවුද? කවුළුදෙර එළිපත්තෙ සිටියේ වී නමුත් කිසිවක් නොලබන්නාවේදැ"යි කිවුය. තෙරුන් වහන්සේ එළිපත මත්තේ අවුත් සිටිසේක. ඉක්බිත්තෙන් ඒ දැක "එළිපත මත්තේ සිට කුමක් ලබනසේක්ද? දුමා ගියා නමුත්(දුම් පැතිරවූවත්) කිසිවක් නොලබන්නාවේදැ"යි කිවුය. තෙරුන් වහන්සේ එබස් අසා දුමා ගියසේක. සියළු ප්‍රාසාදය ධූමයෙන් ඒකාන්ධකාර විය. සිටාණන්ගේ ඇස් ඉඳිකටුවෙන් විදිනා කලක් මෙන් විය. "ගෙය ද දේ හෝ"යි යන හයින් "ඉදින් දිලිහී ගියා නමුත් කිසිවක් නොලබන්නාවේදැ"යි නොකියා මෙසේ සිතුයේය. "මේ මහණ ඉතා ලග්නය(කබළු පූ කෑමෙහි ලොල්ය), ඒකාන්තයෙන් නොලැබ නොයන්නේය. එසේ හෙයින් මෝ හට එක් පූපයක් දෙවමි"යි භාර්‍ය්‍යාවට කියන්නෝ "සොඳුර, මෝ හට කුඩා පූපයක් පිසදී යවා පියව"යි කීහ.

ඕතොමෝ සැළි අගින්ම පිටි සුගක් කබලේ වත් කොටපූය. එකෙණෙහි මහත් වූ පූපයක්ව සියළු කබලපුරා ගෙනවිත් නැගී සිටියේය. සිටාණෝ ඒ දැක "තී විසින් බොහෝකොට පිටි උකාගන්නා ලදැ"යි කියා තුමූම සැළි අගින් පිටි පොඩියක් උකාගෙන කබලේ වත්කොටපූය. පළමු

වත්කොට පිසූ පූපයට වඩා මහත් විය. මෙසේ යම් යම් පූපයක් පිසන්නේනම් ඒ පූපය මහත්ව ගෙණයන්නේය. සිටාණෝ ඒ දැක කලකිරී භාය්‍ය්‍යාවට කියන්නේ "සොඳුර, මෝ හට එක් පූපයක් දී යවා පියව"යි කිවූය.

එබස් අසා ඒ සිටුදු පෙට්ටියෙන් එක් පූපයක් ගන්ට වන් කල්හි සියල්ලම ඒකාබද්ධව ඇලී ගියේය. ඒ සිටුදූ සිටාණන්ට කියන්නී "ස්වාමීනි, සියළු පූපයන් ඒකාබද්ධව ඇලී ගියේය. වෙන්කොට ගත නොහෙමි"යි කිව. "මම වෙන් කෙරෙමි"යි කියා සිටාණෝත් වෙන් කොටගත නුහුවෝය. දෙදෙනම දෙකෙළවර අල්වා ඇද වෙන් කොටගත නුහුනුවාහුය.

ඉක්බිත්තෙන් ඒ සිටාණන් පූපයක් හා වෑයම් කරන්නවු තැනැත්තහුගේ සකල ශරීරයෙන් ඩා බිඳගත්තේය. කබල්ලෙහි තෘෂණාව සිඳී ගියේය. එකල්හි සිටාණෝ භාය්‍ය්‍යාවට කියන්නෝ "සොඳුර. මට පූපයෙන් කම් නැත, පෙට්ටිය පිටින්ම මේ භික්‍ෂුවට දීපියව"යි කිවූය. ඒ සිටුදූ පෙට්ටිය පිටින්ම ඇරගෙන තෙරුන් වහන්සේ සමීපයට ගියාය. එකල තෙරුන් වහන්සේ දෙදෙනාටම ධර්‍මදෙශනාකොට රත්නත්‍රයෙහි ගුණ වදාළසේක. "දෙනලද දානයෙහි විපාක ඇත. අමුතු පඬුරු වශයෙන් දෙනලද දක්‍ෂිණායෙහිත් විපාක ඇතැ"යි දානාදීන්ගේ විපාක ආකාශයෙහි පුන්සඳමඬලක් මෙන් ප්‍රකාශකොට දැක් වූසේක.

ඒ අසා ප්‍රසන්න වූ සිත් ඇතිව "ස්වාමීනි, අවුත් මේ පය්‍ය්‍යඞ්කයෙහි වැඩහිඳ මේ පූපයන් වැළඳුව මැනවැ"යි

ආරාධනා කළෝය. තෙරුන් වහන්සේ වදාරණ සේක් "සිටාණෙනි, සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ 'පූපයන් වළඳිමි'යි පන්සියයක් භික්ෂූන් වහන්සේ හා සමඟ විහාරයෙහි වැඩහුන්සේක. තොපගේ අභිප්‍රාය ඇත්නම් සිටුදුව ලවා පූපයන් හා ක්ෂීරාදිය ගෙන්වාගෙන සර්වඥයන් වහන්සේ සමීපයට යව"යි වදාළසේක.

සිටාණෝ කියන්නෝ "ස්වාමීනි, සර්වඥයන් වහන්සේ කොයි වසනසේක්දැ?"යි විචාළෝය. "සිටාණෙනි, මීට පන්සාළිස් යොදුනකින් මත්තෙහි ජේතවන විහාරයෙහියයි වදාළසේක. "ස්වාමීනි, වේලා නුගුළුවා මෙතෙක් දුර කෙසේ යමෝදැ?"යි කීවූය. "පින්වත් වූ සිටාණෙනි, තොපගේ යන්ට අභිප්‍රායෙන් ඇත්නම් මම තොප ඍද්ධිබලයෙන් ගෙනයමි. තොපගේ ප්‍රාසාදයෙහි ඉණිහිස තිබූ තැනම තිබෙන්නේය, ඉණි පාමුල වනාහී ජේතවන දොරටුවෙහිම වන්නේය, උඩුමාලෙන් යටිමාලට බස්නා දැතුරෙහිම තොප දෙදෙනා ජේතවනයට ගෙනයමි"යි වදාළසේක. සිටාණෝ "යහපත ස්වාමීනි"යි පිළිගත්තුය.

එකල තෙරුන් වහන්සේ "හිණිහිස ඒ ප්‍රාසාදයේහිම කොට ඒ හිණිපාමුල ඒ ජේතවන දොරටුව වේව"යි ඉටුසේක. එසේ වූයේය. තෙරුන් වහන්සේ සිටාණනුත් සිටුදුවත් උඩුමාලෙන් යටිමාලට බස්නාට පළමුකොට ජේතවනයට පැමිණ වූසේක.

ඔහු සර්වඥයන් වහන්සේ කරා එළඹ "වළඳින්ට වේලාය"යි දැන්වූය. සර්වඥයන් වහන්සේ එබස් අසා භොජන ශාලාවට වැද භික්ෂුසංඝයා වහන්සේ හා සමඟ පනවනලද බුද්ධාසන

මස්තකයෙහි වැඩ හුන්සේක. මහසිටාණෝ බුදුන් ප්‍රධානකොට ඇති පන්සියයක් භික්ෂුසංඝයා වහන්සේට දක්ෂිණෝදකය දුන්නාහුය. සිටුදූ සර්‍වඥයන් වහන්සේගේ පාත්‍රයට පූප පිළිගැන්වූය. සර්‍වඥයන් වහන්සේ තමන්වහන්සේට යපෙන පමණක් පිළිගත්සේක. පන්සියයක් භික්ෂූන් වහන්සේත් එසේම පිළිගත්සේක. සිටාණෝ දිගටම කිරි තෙල් මී සකුරු පිළිගන්වාගෙන ගියෝය. සර්‍වඥයන් වහන්සේ පන්සියයක් භික්ෂූන් වහන්සේ හා සමඟ පූපයෙන්ම ආහාර කෘත්‍යය සැපවූසේක.

මහසිටාණෝත් භාර්‍ය්‍යාව හා සමඟ සෑහෙන පමණ පූප අනුභව කළාහුමය. එතෙකුදුවත් පූපයෙහි කෙළවර නොපෙණුනේය. සියළු විහාරයෙහි භික්ෂූන් වහන්සේටත් සිඟන්නන් හා යාචකයන්ටත් දුන් කල්හිත් පූපයෙන් කෙළවරක් නොපෙණුනේය. එසේ කල සිටාණෝ "ස්වාමීනි, පූපයෝ නොනිමන්නෝය"යි බුදුරජාණන් වහන්සේට දැන්වූවෝය. "එසේ විනම් සිටාණෙනි, ජේතවන දොරටුව සමීපයෙහි ලා පියව"යි වදාළසේක.

ඉක්බිත්තෙන් ඔහු දෙදෙන දොරටුව නුදුරුතෙන ප්‍රාග්භාරයක් (වළක් වැනි පහත් තැනක) සමීපයෙහි පෙට්ටියෙන්ම සලාපූය. අද දක්වාත් ඒ ස්ථානය කබල්ලක පූව ප්‍රාග්භාරයයි කියා ප්‍රසිද්ධ විය. මහසිටාණෝ භාර්‍ය්‍යාව සමඟ සර්‍වඥයන් වහන්සේ සමීපයට ගොස් එකත්පස්ව සිටියාහුය. බුදුරජාණන් වහන්සේ අනුමෙවෙනි ධර්‍මදෙශනා

කළසේක. අනුමෝදනාවගේ කෙළවර මේ දෙදෙනම සෝවාන් ඵලයෙහි පිහිටා බුදුරජාණන් වහන්සේට නමස්කාරකොට ජේතවන දොරටුවෙහිදී හිණට නැගී තමන් ප්‍රසාදයෙහිම ගොස් පිහිටියාහුය. එතැන් පටන් මහසිටාණෝ අසූකෙළක් ධන බුද්ධශාසනයෙහි දන පරිත්‍යාග වසයෙන් විසුරුවූය.

දෙවෙනි දවස් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර පිඬුසිඟා ජේතවනයට අවුත් භික්ෂූන් වහන්සේට සුගතොවාද දී ගඳකිළියට වැද සැතපුණු කල්හි සවස්වේලේ දම්සභා මණ්ඩපයෙහි රැස්ව උන්නා වූ භික්ෂූන් වහන්සේ "ඇවැත්නි, මහාමෞද්ගල්‍යාන ස්ථවිරයන් වහන්සේගේ ආනුභාවයක් බලව, මසුරු සිටාණන් ඇසිල්ලකින්ම දමනයෙහි ලා සන්තානගතවූ කෙලශ නමැති විෂ විනාශකොට පූපය ගෙන්වාගෙන ජේතවනයට අවුත් සර්වඥයන් වහන්සේට සම්මුඛකොට සෝවාන්පෙළෙහි පිහිටවූය. ඒ මහමෞද්ගල්‍යාන ස්ථවිරයෝ ඉතා මහත් වූ ආනුභාව ඇත්තෝය"යි තෙරුන් වහන්සේගේ ගුණ කියා උන්සේක. ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩ "මහණෙනි, දැන් මා එන්නාට පූර්වභාගයෙහි කවර කථාවකින් යුකතව උනුදැ?"යි විචාරා "මේ නම් කථාවකින් යුක්තව උනුම්හ"යි කී කල්හි "මහණෙනි, කුලයන් (දායකභවතුන්) දමනයෙහි ලන්නා වූ භික්ෂූන් විසින් කුලයන්ට පීඩා නොකොට නොමිරිකා නොතලා මලින් රොන් ගන්නා වූ බඹරක්හු මෙන් කුලයන් කරා එළඹ බුදුගුණ දැන්විය යුත්තේය"යි වදරා තෙරුන් වහන්සේට ප්‍රශංසා කරනසේක.

"යථාපි භමරො පුප්ඵං - වණ්ණගන්ධං අහෙඨයං
පලෙති රසමාදාය - එවංගාමෙ මුනී චරෙ ති"

(මී මැස්සා වර්ණගන්ධ සම්පන්න වූ මල නොතලා රොන් ගෙන යන්නාක් මෙන් භික්ෂුවද දායකයන්ට පීඩා සේ ගම්වල හැසිරිය යුතුයි.)

යන මේ දම්පියාවෙහි ගාථාව වදාරා මත්තෙහිත් තෙරුන් වහන්සේගේ ගුණ ප්‍රකාශ කරනු පිණිස "මහණෙනි, මෞද්ගල්‍යාන ස්ථවිරයන් විසින් මසුරු සිටාණන් දමනෙහි ලැවේ දැන්මතු නොවෙයි, පෙරත් ඔහු දමනෙහි ලා කර්‍මඵල සම්බන්ධය දැන්වූවෝම වේදැ"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි බරණැස් නුවර 'ඉල්ලීස' නම් සිටාණෙක් විය. ඒ සිටාණෝ අසූකෙළක් සම්පත් ඇත්තෝය, පුරුෂ දෝෂයෙන් සමන්විතයෝය(අංගවිකල බවින් යුක්තය), බුන් සිහින් කකුල් ඇත්තෝය. වක් හස්තපාදාදිය ඇත්තෝය, වපරැස්(වපර ඇස්) ඇත්තෝය, රත්නත්‍රයෙහි අප්‍රසන්නයෝය, සැදැහැ නැත්තෝය, මසුරු ගුණ ඇත්තෝය, තමන් සන්තක වස්තුව අනික් කෙනෙකුට නොදෙති, තුමූත් අනුභව නොකරති, උන්ගේ සම්පත රාක්ෂාධිගෘහිත වූ පොකුණක් මෙන් වූය. ඒ සිටාණන්ගේ දෙමව්පියෝ වූකලී සත්වැනි කුලපරම්පරාව දක්වා දායකයහ, දානපතියහ. මූ තුමූ

සිටු තනතුරු ලැබලාම වංශය නසා, දන්හල් දවා, යාචකයන් තලා පිටත්කොට වස්තුවම රැස්කරවූය.

ඒ සිටාණෝ එක් දවසක් රජ්ජුරුවන්ට රාජ සේවයට ගොස් තමන් ගෙට එන තැනැත්තෝ ගමන් ආයාසයෙන් මිරිකුණා වූ එක් දනව්වැසි මනුෂ්‍යයෙක් එක රා කළයක් ගෙන පුටුවක් මත්තෙහි හිඳ ඇඹුලා රා යෙන් ඔඩමක් (කෝප්පයක්) පුර පුරා කුණු මස් අවුළු හා සමඟ බොන්නාවුන් දැක රා බොනු කැමතිව මෙසේ සිතූය "ඉදින් මම රා බොත් නම් මා බොන්නට වන් කල්හි බොහෝදෙන බොනු කැමැති වෙති, එසේ කල්හි මාගේ වස්තුව නැසී යන්නේය"යි ඒ සිටාණෝ තෘෂ්ණාව ඉවසමින් ඇවිද කල්යාමෙන් ගිය කල්හි තෘෂ්ණාව ඉවසාගත නොහී පොළානැගූ පුළුණක්(පොළන ලද පුළුන්) මෙන් සුදුමැළි වූ ශරීර ඇතිවූය. ඉල්පව තිබෙන්නා වූ නහර බහනින් වෙළඳනාලද ශරීර ඇත්තේය.

ඉක්බිත්තෙන් එක් දවසක් ඒ සිටාණෝ ගබඩාවට වැද ඇඳ වැළඳගෙන හොත්තාහුය. සිටාණන්ගේ භාර්‍ය්‍යාතොමෝ සමීපයට පැමිණ පිට පිරිමැද "ස්වාමීනි නුඹවහන්සේට අපාසු කිම්දැ?"යි විචාළීය. මෙතැන්හි කියයුතු සියල්ල යට කියනලද ක්‍රමයෙන්ම දත යුත්තේය. "එසේ වීනම් තනි වූ නුඹවහන්සේටම සෑහෙන නියායෙන් ඉදිකෙරෙම්දැ?"යි විචාළ කල්හි "ගෙයිදී සුරාව ඉදිකළ කල බොහෝ දෙන ඒ සුරාව බොන්ට ප්‍රාර්ථනා කෙරෙති, අන්ගානියෙන්(තැබෑරුමෙන්)

ගෙන්වාත් මෙතන හිඳ බොන්ට නොපිළිවන්නේය”යි මදටක් පමණ රන් දී අන්ගානියෙන් රා කළයක් කුඩා කොල්ලකු ලවා ගෙන්වාගෙන නුවරින් නික්ම ගංතෙරට ගොස් මහවන සමීපයේ එක් කැලයකට වැද රා කළය තබ්බවාගෙන “තෝ පළාය”යි කියා කොල්ලා දුර යවා ‘ඔඩමක්’ පුරාගෙන රා බොන්නට පටන් ගත්තාහුය.

ඒ සිටාණන්ගේ පියාණෝ වනාහී දනාදී පින්කම් කළ බැවින් දිව්‍යලෝකයෙහි ශක්‍රව උපන්නාහුය. ඒ ශක්‍රදේවේන්ද්‍රයා එකෙණෙහිම “මාගේ දන් වැට පවතී දෝහෝයි නොපවතී දෝ හෝ”යි පරීක්‍ෂා කරන්නාහුය. ඒ දන් වැට නොපවත්නා බවත්, පුත්‍රයා කුලවංශය නසා, දන්හල් දවා, යාචකයන් මරා නෙරපා මසුරු බව පිහිටා අනික් කෙනෙකුන්ට දියයුතු වන්නේය යන භයින් වන ලැහැබකට වැද උදකලාව රා බොන නියාව දැක “දැන් යෙමි, ඔහු අල්ලා දමනයෙහි ලා කර්මඵල සම්බන්ධයන් දක්වා දන්දෙවා දිව්‍යලෝකයෙහි උපදනා ලෙසත් කෙරෙමි”යි මනුෂ්‍යපථයට බැස ඉල්ලීස සිටාණන් හා නොවෙනස් වූ (වපරැස්) (කොරබව) සේ වූ වෙනින් ආත්මභාවයක් මවාගෙන රජගහ නුවරට වැද රජ්ජුරුවන්ගේ මාළිගා දොරකඩ සිට තමන් ආ නියාව කියා යවා “අවුත් වදිත්ව”යි කී කල්හි මාළිගාවට වැද රජ්ජුරුවන් වැඳ එකත් පසෙක සිටියාහුය. රජ්ජුරුවෝ “කිමෙක්ද? මහසිටාණෙනි, නොවේලේ අවුනැ”යි කිවූය. “ආම් ස්වාමීනි, මාගේ ගෙයි අසූකෙළක් පමණ වස්තු ඇත. ඒ වස්තුව නුඹවහන්සේ ගෙන්වා භාණ්ඩාරගේ පුරවාගත මැනවැ”යි කිවූය. “මහසිටාණෙනි,

තොපගේ වස්තුව අපට ප්‍රයෝජන නැත. තොපගේ වස්තුවට වඩා අපගේ වස්තුව ඉතා බොහෝය''යි කිවූය.

එබස් ඇසූ සිටාණෝ කියන්නෝ "ඉදින් රජ්ජුරුවන් වහන්ස, නුඹවහන්සේට ප්‍රයෝජනයක් නැත්නම් කැමති පරිද්දෙන් ගෙන දන් දෙමි''යි කිවූය. "දෙව, මහසිටාණෙනි'' කී කල්හි "යහපත, මහරජ්ජුරුවන් වහන්සැ''යි කියා ඒ සිටාණෝ රජ්ජුරුවන් වැඳ නික්ම ඉල්ලීස සිටාණන්ගේ ගෙට ගියෝය. එකල්හි සියළු පරිවාර මනුෂ්‍යයෝ අවුත් පිරිවරා ගත්තුය. කිසි එකකුත් "ඉල්ලීස සිටාණෝ නොවෙති''යි කියා දැන ගන්ට සමර්ථ වූ කෙනෙක් නම් නැත. එකල්හී සිටාණෝ ගෙටවැද එළිපත ඇතුළේ සිට දොරටුපාලයා කැඳවා "එම්බල කොල, මා හා සමාන ස්වරූප ඇති යම් අනිකෙක් අවුත් 'මාගේ ගෙයය''යි වදින්ට ආ නම් ඔහු පිටිකරගසා පිටත් කරව''යි කියා දොරටුපාලනයාට විධානකොට තුමූ ප්‍රාසාදයේ මතුමහල් තලයට නැගී මහානඝී වූ අස්නක හිඳ සිටුදූ සමීපයට කැඳවා සතුටු ආකාර දක්වා "සොඳුර දන්දෙමෝදැ?''යි කිවූය. ඒ වචනය අසාලාම සිටුදූත්, දූදරුවෝත්, දාසකම්කාරාදීහුත් මෙතෙක්කල් මුළුල්ලෙහිත් මුන්වහන්සේට දන් දෙන්ට සිතුවිල්ලකුත් නූපන්නේය, අද වූකලී රා බී මොළොක් වූ සිත් ඇතිව දෙනු කැමතිසේක් වනැ''යි කීහ.

ඉක්බිත්තෙන් සිටුදූ ඒ සිටාණන්ට "ස්වාමීනි, කැමති පරිද්දකින් දන් දුන මැනවැ''යි කීව. "එසේ වීනම් නුවර

බෙරලවනු තැනැත්තහු (අණබෙරකරු) කැඳවා ගෙන්වාගෙන, ‘රන් රිදී මුතු මැණික් ආදියෙන් ප්‍රයෝජන ඇති කෙනෙක් ඉල්ලීස සිටාණන්ගේ ගෙට එව’යි කියා සියළු නුවර බෙරලව”යි කිවූය. ඒ සිටුදූත් එපරිද්දෙන් කළාය. මහජනයෝ පැස්,පෙට්ටි, පයි(පසුම්බි) ආදිය ගෙන දොරකඩට රැස්වූවාහුය. එකෙණෙහි ශක්‍රයෝ සත්රුවණ් පිරුණ ගබඩාවල දොර හරවා “මේ සියළු වස්තු තොප හැමට දෙමි, සෑහෙන පමණක් ගෙන යව”යි කීවාහුය. එකල මහජනයෝ ගබඩාවලින් වස්තු මෑත්කොට (එළියටගෙන) රාජාඞගනයෙහි රැස්කොට තම තමන් ගෙනා භාජන පුරාගෙන යන්නාහුය.

එක්තරා දනවුවැසි මනුෂ්‍යයෙක් ඉල්ලීස සිටාණන්ගේ ගොන් උන්ගේම රථයෙහි යොදාගෙන සත්රුවණින් පුරා නුවරින් නික්ම මාවත පැමිණ ඉල්ලීස සිටාණන් වැද ඉඳ රා බොන්නා වූ කැලයට වැද නුදුරු තැනකින් රථය පදනේ “ස්වාමීනි, ඉල්ලීස සිටාණන් වහන්ස අවුරුදු සියයක් ජීවත්වුව මැනව. නුඹවහන්සේ නිසා දැන් මා විසින් සිය අතින් කර්මාන්ත නොකොට දිවි පමණින් රැකෙන පමණ සම්පත් ලබන ලද්දේය. නුඹවහන්සේගේම රථය, නුඹවහන්සේගේම ගොන්ය, නුඹවහන්සේගේම ගෙයි සත්රුවණය. දැන් මේ වස්තු මෑණියන් විසින් දුන් දෙයකුත් නොවෙයි, පියාණන් වහන්සේ විසින් දුන් දෙයකුත් නොවෙයි, ස්වාමීනි, නුඹවහන්සේම නිසා ලත් සම්පත්ය”යි සිටාණන්ගේ ගුණ කිය කියා යන්නේය.

සිටාණෝ එබස් අසා භයින් ත්‍රස්තව මෙසේ සිතූය "මේ තෙම මාගේ නම කියා යෙයි, කිමෙක්ද? රජ්ජුරුවන් වහන්සේ විසින් මාගේ ධනය ලෝවැස්සන්ට දෙන ලද්දේවනැ"යි කැලයෙන් නික්ම ගොන්ගෙය(ගොන් බාන) හා රථය ඇඳින ගෙන "එම්බල දුෂ්ට වූ කොල්ල. මාගේ ගොනා, මාගේ රථයය"යි කියා ගොස් ගොන්ගේ ලනුව අල්වා ගත්තේය. එකල්හි ඒ දනවුවැසි පුරුෂයා රථයෙන් බැස "එම්බා දුෂ්ට කොල්ල, ඉල්ලීස සිටාණෝ සියළු නුවරවාසීන්ට දන්දෙති, තෝ උන්ට කුමක් වන්නෙහිදැ"යි ඇන සෙණ ගසන්නාක් මෙන් පිටිකරගසා ඒ රථය ඇරගෙන ගියේය. මේ ඉල්ලීස සිටාණෝ තමන් වෙව්ලමින් නැගීසිට ඇඟ වැලි පිස පිස වහ වහා ගොස් රථයේ එල්ලී ගත්තූය. එකල්හි ඒ දනවුවැසි පුරුෂයා රථයෙන් බැස ඉසකේ අල්වා නමාගෙන වැලිමිටි දෙකින් ඇන තලා බොටුව අල්වා මාගීයටම අභිමුඛකොට දමා ගියේය. මෙපමණකින් ඒ සිටාණන්ගේ රා මද සිඳී ගියේය. ඒ සිටාණෝ වෙව්ල වෙව්ලා වේගයෙන් තමන්ගේ ගේ දොරට ගොස් සම්පත් ඇරගෙන යන්නාවුන්ට "එම්බා පින්වත්නි, මේ කිමෙක්ද? රජ්ජුරුවන් වහන්සේ මාගේ සම්පත් කොල්ලකන සේක්දැ"යි කියා ගොස් ඒ ඒ වස්තු අල්වා ගනිති. ඇල්වූ ඇල්වූ මනුෂ්‍යයෝ ගස ගා පාමුල එලති. ඒ සිටාණෝ වේදනාවෙන් පීඩිතව ගෙට වදින්නට පටන් ගත්තූය. එකල්හි දොරටුපාලයා "එම්බල දුෂ්ට වූ ගෘහපතිය, කොයි වදනෙහිදැ"යි උන පත්තෙන් දෙපත්ත හසුකොට මත්තෙ පොත්ත පත්තට යන්නාක්මෙන් තළා බොටුව අල්වාගෙන

පිටත් කළාහුය. එවේලෙහි සිටාණෝ “දැන් මට රජ්ජුරුවන් වහන්සේ හැර අන්කිසි පිළිසරණෙක් නැතැ”යි රජ්ජුරුවන් වහන්සේ සමීපයට ගොස් “දේවයන් වහන්ස, මාගේ ගෙය නුඹවහන්සේ කොල්ලකන සේක්දැ?”යි කිවුය. එබස් ඇසූ රජ්ජුරුවෝ “සිටාණෙනි, මම කොල්ලනොකම්, තොපම අවුදින් නුඹවහන්සේ නොගන්නාසේක් වීනම් මන්ම මාගේ වස්තුව දන් දෙමි, නුවර බෙරලවා දන් දුන්නෝවේදැ”යි කිවුය. එකල්හි සිටාණෝ කියන්නෝ “දේවයන් වහන්ස, මම නුඹවහන්සේ සමීපයට නාමි, කිමෙක්ද? නුඹවහන්සේ මා මසුරු නියාව නොදන්නාසේක්ද? මම තණ කොන්දක් ගලා තෙල් බිඳුවකුත් කිසි කෙනෙකුට නුදුන් විරීමි, යම් සිටාණ කෙනෙක් දන් දෙන්නේද උන් කැඳවා ගෙන්වාගෙන පරීක්‍ෂා කරවුව මැනව රජ්ජුරුවන් වහන්සැ”යි කිවුය.

එබස් ඇසූ රජ්ජුරුවෝ ශක්‍රදේවේන්‍ද්‍රයන් කැඳවා ගෙන්වාගෙන දෙදෙනාගේ වෙනස රජ්ජුරුවෝ නොදනිත්, අමාත්‍යයෝත් නොදනිති, මසුරු සිටාණෝ “කිමෙක්ද? රජ්ජුරුවන් වහන්ස, මූ සිටාණෝද මම සිටාණෝදැ?”යි කිවූය. “අප නාදුනම්හ. එසේ දෙදෙනා අඳුනන්නා වූ කිසි කෙනෙක් ඇද්දැ?”යි විචාළෝය. “ස්වාමීනි, මාගේ භාර්‍ය්‍යාව අඳුනන්නී වේදැ”යි මසුරු සිටාණෝ කීහ. එකල්හි ඒ සිටාණන්ගේ භාර්‍ය්‍යාව කැඳවා “තොපගේ ස්වාමිපුත්‍රයාණෝ කවුරුදැ?”යි විචාළසේක.

ඒ සිටුදූතොමෝ "මූ වේදැ"යි කියා ශක්‍රයන් සමීපයෙහි සිටියාය. දූදරුවනුත් දාසකර්මකාරාදීනුත් කැඳවා විචාළාහුය. හැම දෙනම ගොස් ශක්‍රයන් සමීපයෙහි සිටියාහුය. නැවත සිටාණෝ මෙසේ කීය "මාගේ හිස පිළිකාවෙක් ඇත, කෙසින් වැසී තිබෙන බැවින් ඒ පිළිකාව කපුවාම(කරණවෑමියා) දන්නේය, අනික් කෙනෙක් නොදනිති, ඔහු කැඳවුව මැනවැ"යි කිවූය. එසමයෙහි වනාහි බොධිසත්වයෝ ඉල්ලීස සිටාණන්ට කපුව උපන්නාහුය. රජ්ජුරුවෝ ඒ කපුවා කැඳවා "ඉල්ලීස සිටාණන් අඳුනන්නෙහිදැ?"යි විචාළෝය. "ඉස බලා ඇඳින ගනිමි ස්වාමීනි" කීය. "එසේ වීනම් දෙදෙනාගේම ඉස බලව"යි කිවූය.

එකෙණෙහි ශක්‍රයෝ ඉස පිළිකාවක් මවා ගත්තුය. බොධිසත්වයෝ දෙදෙනාගේම ඉස පිළිකා බලා පිළිකා දැක "මහරජ්ජුරුවන් වහන්ස, දෙදෙනා ඉසම පිළිකා ඇත්තේය. මම ඔවුන් දෙදෙනාගෙන් එක් කෙනෙකුත් ඉල්ලීස බව දැනගත නොහෙමි"යි කියා මෙසේ කිවූය. "දෙදෙනම කොරවූය, දෙදෙනම පිලිවූය, දෙදෙනම වපරැස් ඇත්තෝය, දෙදෙනම පිළිකා ඇත්තෝය. එසේ හෙයින් ඉල්ලීසයන් අසවල්ලුයයි මම නොදනිමි"යි කිවූය. බොධිසත්වයන්ගේ වචනය අසා මසුරු සිටාණෝ කම්පිත වූ සිත්ඇතිව ශොකයෙන් සිහි එලවාගත නොහී එතනම වැටීහුන්නාහුය.

එකෙණෙහි ශක්‍රදේවේන්ද්‍රයෝ "මහරජ්ජුරුවන් වහන්ස, මම ඉල්ලීසයෙක් නොවෙමි, ශක්‍රදේවේන්ද්‍රයෙමි"යි කියා මහත් වූ

ශක්‍රදේවේන්ද්‍ර ලීලාවෙන් ආකාශයෙහි සිටියාහුය. ඉල්ලීසයන් මූණ ඩා පැන්ඉස සනතපීනය කළෝය. ඒ සිටාණෝ නැගීසිට ශක්‍රදේවේන්ද්‍රයන්ට නමස්කාරකොට සිටියාහුය. එකල ශක්‍රදේවේන්ද්‍රයෝ සිටාණන්ට කියන්නෝ "ඉල්ලීසයෙනි, මේ වස්තුව මා සතුය, තා සන්තක නොවෙති, මම තොපගේ පියාණෝය, තෙපි මාගේ පුතණුවෝය, මම දානාදී වූ පින්කම්කොට ශක්‍රාත්මභාවයට පැමිණයෙමි, තොප වනාහී මාගේ වංශයෙහි අදානසිලිව මසුරුබවෙහි පිහිටා දන්හල් දවා යාචකයන් පිටත්කොට වස්තුව රැස් කෙළෙහිය. ඒ වස්තුව තොපිත් අනුභව නොකරන්නෙහුය, අනික් කෙනෙකුන්ටත් ප්‍රයෝජන නැත්තේය, රාක්‍ෂසාධිගෘහිත වූ පොකුණක් මෙන් සිටිනේය. ඉදින් මාගේ දන්හල් කරවා පෙර පරිද්දෙන්ම දන් දුන්නෙහි විනම් යහපත, ඉදින් නොදෙන්නෙහි විනම් තාගේ සියළු ධනධාන්‍යයන් අන්තර්ධානකොට මේ වජ්‍රායුධයෙන් තාගේ ඔළුවත් පලා ජීවිතක්‍ෂයට පමුණුවමි"යි කිවූය.

එබස් අසා ඉල්ලීස සිටාණෝ මරණ භයින් තැතිගෙන "මෙතැන් පටන් දන් දෙමි"යි ප්‍රතිඥා දුන්නුය. ශක්‍රයෝ සිටාණන්ගේ ප්‍රතිඥා ලැබ ආකාශයෙහි හිඳ ධර්මදෙශනාකොට පඤ්චශීලයෙහි පිහිටුවා ශක්‍රභවනයට ගියෝය. ඉල්ලීස සිටාණෝත් දානාදී පින්කම්කොට සවර්ගලෝකයෙහි උපන්නාහුය.

ශාසතෘ වූ බුදුරජාණන් වහන්සේ "මහණෙනි, මහමෞද්ගල්‍යාන ස්ථවිරයෝ මසුරු සිටාණන් දමනයෙහි ලූවෝ දැන්මතු නොවෙයි, පෙරත් දමනයෙහි ලූවෝ වේදැ"යි

මේ ධර්‍මදෙශනාව ගෙනහැර දක්වා වදරා පූර්‍වාපරසන්‍ධි ගළපා මේ ‘ඉල්ලීස ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි සිටාණෝ නම් දැන් මසුරු සිටාණෝය, ශක්‍රදේවේන්‍ද්‍රයෝ නම් මහමොග්ගල්‍යාන ස්ථවිරයෝය, රජ්ජුරුවෝ නම් ආනන්‍ද ස්ථවිරයෝය. එසමයෙහි කපුව උපන්නෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 079. ඛරස්සර ජාතකය

තවද එක් සමයෙක්හි ශාක්‍යකුල විනතාමාණික්‍ය වූ(ශාක්‍ය වංශයට සිතූ පැතූ සම්පත් දෙන මැණිකක් බඳු වූ) තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වසනසේක් එක්තරා අමාත්‍යයෙකු අරභයා මේ ජාතකය වදාළසේක.

කෝසල රජ්ජුරුවන්ගේ එක්තරා අමාත්‍යයෙක් රජ්ජුරුවන් සිත්ගෙන පාසල්දනව්වේ ගමෙක අයපඬුරු(අයබදු) ලැබගෙන සොරුන් හා එක්වගෙන ඒ සොරුන්ට කියන්නේ “මම මනුෂ්‍යයෙක් ඇරගෙන වනයට වදිමි. තොපි ගම කොල්ල කා එයින් ලබනලද වස්තුවෙන් මටත් භාගයක් දෙව”යි කියා පළමුකොට මිනිස්සුන් රැස්කරවා තෙමේ වනයට ගොස් එහි ඉඳ සොරුන් අවුත් සරක් මරා මස් කා ගම පැහැර ගිය කල්හි සවස්වේලේ මහජනයා විසින් පිරිවරන ලදුව ගමට එන්නේය.

ඔහුගේ ඒ ක්‍රියාව නොබෝ දවසකින්ම ප්‍රසිද්ධ විය. මනුෂ්‍යයෝ එපවත් රජ්ජුරුවන්ට දැන්නුය. රජ්ජුරුවෝ ඒ අමාත්‍යයා කැඳවා ගෙන්වාගෙන දෙර හිඳුවා තරයේ නිග්‍රහකොට අනික් ගම්මුදලියෙකු (ගම්මුලාදෑනියකු) ඒ පසල්දනව්වට යවා ජේතවනයට ගොස් සර්‍වඥයන් වහන්සේට නමස්කාරකොට එකත්පස්ව හිඳ එපවත් දැන්විය.

බුදුරජාණන් වහන්සේ “මහරජ්ජුරුවෙනි, මොහු මෙසේ කෙළේ දැන්මතු නොවෙයි, පෙරත් මෙසේම කළසුලුය”යි වදරා ඒ රජ්ජුරුවන් විසින් ආරාධිත වූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කරන කල්හි ඒ බරණැස් රජ්ජුරුවෝ එක් අමාත්‍යයක්හට ප්‍රත්‍යන්ත(පිටිසර) ජනපදයෙහි ගමක් දුන්නුය. මෙතැන්හි කියයුතු වූ සියල්ල පළමු කියන ලද්ද හා සමාන වන්නේය.

එසමයෙහි බොධිසත්‍වයෝ වෙළඳම්කොට ප්‍රත්‍යන්ත දනව්වෙහි වාසය කරන්නාහු ඒ අමාත්‍යයා ලත් ගම වාසය කරන්නාහුය. ඒ මහබෝසතාණෝ ඒ ග්‍රාමභොජකයා සවස්වේලෙහි මහජනයා පිරිවරා තද ශබ්ද වූ ඇති පටාභෙරියක්(පණාබෙරය නම් වූ බෙරයක්) ගස්වාගෙන එන කල්හි මේ දුෂ්ට වූ ග්‍රාමභොජකයා සොරුන් හා එක්වගෙන ගම් පහරවා කොල්ලකවා සොරුන් පලාගොස් වනයට වන් කල්හි දැන් තෙමේ ශාන්තදාන්ත එක්කහු මෙන් නිවී සැනහී

බෙර ගස්වාගෙන එන්නේයයි නින්‍දා කළාහුය. නොබෝ කලකින් ඔහුගේ ඒ ක්‍රියාව ප්‍රකාශ විය. රජ්ජුරුවෝ දෙසානුරූපව නිග්‍රහ කළාහුය.

ශාසතෘ වූ බුදුරජාණන් වහන්සේ “මහරජ්ජුරුවෙනි, මොහු මෙබඳු වූ ස්වභාව ඇත්තේ දැන්මතු නොවෙයි, පෙරත් මෙබඳු ස්වභාව ඇත්තේ වේදැ”යි මේ ධර්මදෙශනාව ගෙනහැර දක්වා පූර්වාපරසන්ධි ගළපා මේ ‘ඛරස්සර ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි අමාත්‍යයා නම් දැන් මේ අමාත්‍යයාමය, එසමයෙහි අමාත්‍යයාට නින්‍දා කළා වූ ප්‍රාඥ පුරුෂ වූයෙම් සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 080. භීමසෙන ජාතකය

තවද එක් සමයෙක්හි ලෝකත්‍රයෙහි(කාම, රූප, අරූප යන තුන්ලොව) පතල වූ කීර්තිඝොෂා ඇති තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වසනසේක් තමහට ස්තුති කරන්නා වු(තමා විසින්ම තමාගේ ගුණ කීමෙහි නිරත වූ) එක්තරා භික්ෂුවක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

එක් භික්ෂු කෙනෙකුන් වහන්සේ “ඇවැත්නි, අපගේ ජාතිය හා සමාන වූ ජාතියෙක් නම් නැත, අපගේ ගොත්‍රය හා සමාන වූ ගොත්‍රයෙක් නම් නැත, අපගේ දසකර්මකාරාදීහුත් ඇල්සාලේ බත් හා මත්ස්‍යමාංස අනුභව

කෙරෙති, කසීරට සුවඳවිලවුන් ගල්වති, අපි මහණ වූ බැවින් දැන් මෙබඳු වූ රූක්‍ෂභොජනය(කටුක ආහාරපාන) අනුභව කරම්හ. රූක්‍ෂවූ සිවුරු වලදිම්හ”යි(ගොරෝසු සිවුරු පොරවමු’යි) ස්ථවිර නවක මධ්‍යම(උපසම්පාදවෙන් දසවස් පිරීම නිසා ස්ථවිර නම්වූද, අලුත උපසපන් වීම නිසා නවක නම්වූද, මේ දෙදෙන වහන්සේලා අතර වයසෙහි සිටීම නිසා මධ්‍යම නම්වූද) භික්‍ෂූන් සමීපයෙහිදී තමන්වහන්සේගේ මහන්තත්‍වය කියමින් ජාත්‍යාදී (ජාතිකුලගොත්‍රාදිය හා සබැඳි පහත් වචන වලින්) වශයෙන් මෙරමාහට නින්ද කෙරෙමින් ඇවිදිනාසේක.

ඉක්බිත්තෙන් එක් භික්‍ෂු කෙනෙකුන් වහන්සේ මේ භික්‍ෂූහුගේ කුලප්‍රදේශය හා ජාතිගොත්‍රය පරීක්‍ෂාකොට මොහු තමාගේ ප්‍රතාප(මහන්තත්වය) කියන බව භික්‍ෂූන් වහන්සේට දැන්වූසේක. භික්‍ෂූහු ධර්‍මසභා මණ්ඩපයෙහි රැස්වහිඳ “ඇවැත්නි, අසවල් මහණ මෙබඳුවූ නෛර්‍ය්‍යාණික(නිවනට පමුණුවන) ශාසනයෙහි මහණව තෙමේ තමහට ස්තූතිකොට මෙරමාහට නින්ද කෙරෙමින් ඇවිදිනේය”යි ඒ භික්‍ෂුවගේ නුගුණ කිය කියා උන්සේක. එකල්හි ශාසතෘ වූ බුදුරජාණන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩ “මහණෙනි, දැන් මා එන්නාට පළමුව කවර කථාවකින් යුතුව උනුදැ?”යි විචාරා “මෙනම් කථාවෙකින් යුකතව උනුම්හ”යි කී කල්හි “මහණෙනි, ඒ මහණ දැන් තමාට ස්තූතිකොට ඇවිදින්නේ වෙයි, පෙරත් තමාට ස්තූතිකොට අනුන්ට නින්ද කෙරෙමින් ඇවිද්දේම වේදැ”යි වදරා ඉකුත්වත් දක්වා වදළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කරන සමයෙහි අප මහබෝසතාණෝ එක් නියම්ගමෙක ප්‍රසිද්ධ වූ බ්‍රාහමණ වංශයෙහි ඉපිද වැඩිවිය පැමිණ තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් සමීපයෙහි හිඳ වේදත්‍රය(ඍග්, යජුර්, සාමන් යන තුන් වේදය) හා අෂ්ටාදශ විද්‍යාසථානය(ගණිත, මිණිතාදී විද්‍යා විෂයන් දහඅට) ඉගෙණ සියලු ශිල්පයෙහි මුදුන් පැමිණ ‘චුල්ලධනුග්ගහ පණ්ඩිතයෝය’යි මේ නමින් ප්‍රසිද්ධ වූය. ඒ අප මහබෝසතාණෝ තක්සලා නුවරින් නික්ම සියළු සමයාන්තර ශිල්ප(වෙනත් ආගම් හා ශිල්ප) පරීක්‍ෂා කෙරෙමින් මහිංසක රාජ්‍යයට ගියෝය. මේ ජාතකයෙහි වූ කලී අප මහබෝසතාණෝ මදක් මිටියෝය, නැමුනා වූ ආකාර ඇත්තෝය, එසේ හෙයින් ඒ බොධිසත්‍වයෝ මෙසේ සිතූය “ඉදින් මම කිසි රජ්ජුරු කෙනෙකුත් කරා ගියෙම් නම් ඒ රජ්ජුරුවන් වහන්සේ ‘මෙසේ ලකුණ්ඨ වූ(මිටි වූ) ශරීර ඇත්තෝ අපට කුමක් කරන්නෝදැ’යි කියනසේක, එසේ හෙයින් මම ආරොහපරිනාහයෙන් යුක්ත වූ(හොඳට උස මහත ඇති) එක් පුරුෂයෙකු ඉදිරිකොට ගෙන(මුල්තැන තබාගෙන) ඔහු නිසා ජීවත්වීම් නම් යහපත් වන්නේය”යි සිතා බෝධිසත්‍වයෝ එබඳු වූ පුරුෂයෙකු සොයන්නාහු භීමසේන නම් වූ එක් වියනක්හුගේ(රෙදි වියන්නෙකුගේ) පිළි වියන තැනට ගොස් ඔහු හා සමඟ පිළිසඳර කථාකොට වෙම් “සබඳ, තෝ කිනම්හුදැ?”යි විචාළෝය. “මම භීමසේන නම් වෙමි”යි කී කල්හි “කිමෙක්ද? තෝ මෙසේ විශිෂ්ට වූ

රූපයෙන් හා ආරොහපරනාහයෙන් යුක්තව මේ හීන ක්‍රියාව කුමක් පිණිස කරන්නෙහිදැ”යි විචාළෝය. “ජීවත්ව ගතනොහී කෙරෙමි”යි කී කල්හි “සබඳ තෝ මෙසේ ක්‍රියා නොකරව, සියළු දඹදිව මා හා සමාන වූ දුනුවායෙක් නැත, ඉදින් මම කිසි රජ්ජුරු කෙනෙකුන් වහන්සේ දුටුයෙම් වීනම් උන්වහන්සේ ‘මේ ලකුණ්ඨකයා අපට කුමක් කෙරේදැ’යි මට කිපෙනසේක, එසේ හෙයින් තෝ රජ්ජුරුවන් වහන්සේ දැක ‘මම දුනුවායෙමි’ කීයෙහි වීනම් රජ්ජුරුවන් වහන්සේ තට වියදම් දී නිරන්තරයෙන් වෘත්ති(රැකියාව) තබා දෙනසේක. මම තට උපන්නා වූ කාය්‍ය්‍යයෙක් ඇත්නම් කෙරෙමින් තාගේ සෙවණෙහි(සමීපයෙහි) ජීවත්වෙමි, එසේ කල්හි අපි දෙදෙනම සුඛිතවම්හ, මා කීවා කරව”යි බෝධිසත්‍වයෝ කිවුය. ඒ පුරුෂයාත් මහබෝසතාණන්ගේ බස “යහපතැ”යි පිළිගත්තේය.

ඉක්බිත්තෙන් බෝධිසත්‍වයෝ ඒ භීමසේන නම් පුරුෂයා කැඳවාගෙන බරණැස් නුවරට ගොස් තුමූ ඕහට උපස්ථායකව ඒ පුරුෂයා ඉදිරිකොට ගොස් මාළිගා දොරකඩ සිට රජ්ජුරුවන්ට දන්වා යැවූය. රජ්ජුරුවන් වහන්සේ විසින් “එත්ව”යි කී කල්හි දෙදෙනාම මාළිගාවට වැද රජ්ජුරුවන් වැඳ සිටියාහුය. “කවර කාරණයක් නිසා තෙපි මෙහි අවුදැ?”යි කී කල්හි භීමසේනයා “මම දුනුවායෙක්මි, මා හා සමාන වූ දුනුවායෙක් මේ සියළු දඹදිව නැත්තේය”යි කීය. “කුමක් ලදින් නම් මට උපස්ථාන(සේවය) කරන්නෙහිදැ”යි කී කල්හි “දෙපෝයක් පාසා(පෝය දෙකකට වරක් හෙවත් අඩමසක් අඩමසක් පාසා) දහසක් ලබන්නේ වීම් නම්

උපස්ථාන කරන්නේම්වේද රජ්ජුරුවන් වහන්සැ”යි කිවූය. “මේ පුරුෂයා තට කවුරු වේදැ”යි කී කල්හි “රජ්ජුරුවන් වහන්ස, මාගේ අතවැසි පුරුෂයායැ”යි කීය. “යහපත මට උපස්ථාන කරව”යි කී කල්හි එතැන් පටන් භීමසේන නම් පුරුෂයා රජ්ජුරුවන්ට සේවය කරන්නේය. ඕ හට පැමිණ කාර්‍යයක් බෝධිසත්‍වයෝම සමෘද්ධ කරති.

එසමයෙහි කසීරට එක් වනයක බොහෝ මනුෂ්‍යයන් යන එන්නා වූ මාර්‍ගයක ව්‍යාඝ්‍රයෙක් සඤ්චාරය කරමින් බොහෝ මනුෂ්‍යයන් අල්ව අල්වා කන්නේය. එපවත් රජ්ජුරුවන්ට දැන් වූවාහුය. රජ්ජුරුවෝ භීමසේනයා කැඳවාගෙන “දරුව, ඒ ව්‍යාඝ්‍රයා අල්වන්ට පිළිවන්දැ?”යි විචාළෝය. “රජ්ජුරුවන් වහන්ස, මම දුනුවාය, කුමක් නිසා බම්ද?(බිය වෙම්ද?) ව්‍යාඝ්‍රයා අල්වන්ට අසමර්ථ වෙම්දැ”යි කීය. එබස් ඇසූ රජ්ජුරුවෝ ඕ හට වැටුප් වියදන් දී යවූය. ඒ භීමසේනයා ගෙට ගොස් බෝධිසත්‍වයන්ට එපවත් කීයේය. බොධිසත්‍වයෝ “යහපත, යාලුව යව”යි කිවූය. “තොප නොයව්දැ”යි කී කල්හි “එසේය, මම නොයමි, තොපට උපාය වූ කලි කියමි”යි කිවූය. “සබඳ, උපාය කියව”යි කී කල්හි “තොපි වහාම ව්‍යාඝ්‍රයා වසන තැනට උදකලාව නොයව, දනවුවැස්සන් රැස්කොට දුනු දහසක් හෝ දෙදහසක් ගෙන්වගෙන එහි යව, තෙපි ව්‍යාඝ්‍රයාව ඉගිලගිය නියාව(නින්දෙන් පිබිදී සිටින බව) දැන පලාගොස් එක් කැලයකට වැද බඩින් තලව්ව වැද හෙව(බඩ පොළවට තදකර හෙවත් මුණින් අතට නිදාගනුව), දනවුවැසි මනුෂ්‍යයෝ ඒ ව්‍යාඝ්‍රයා තළා මරා ගනිති, ඔවුන්

විසින් ව්‍යාඝ්‍රයා අල්වාගත් කල්හි තෙපි දතින් වැලක් කපා වැල් කෙළවර අල්වාගෙන මළා වූ ව්‍යාඝ්‍රයා සමීපයට ගොස් ‘පින්වත්නි, මේ ව්‍යාඝ්‍රයා මැරුවෝ කවුරුදැ?’යි කියා ‘මම මේ ව්‍යාඝ්‍රයා ගොණකු මෙන් බැඳ රජ්ජුරුවන් සමීපයට ගෙනයෙමි’යි වැල් නිසා(සඳහ) කැලයට ගොස් ‘මා වැල් කඩාගෙන එන්නාට පළමුකොටම මේ ව්‍යාඝ්‍රයා මැරුවෝ කවුරුදැ?’යි කීව(ඇසුවේය), එකල්හි දනවුවැසි මනුෂ්‍යයෝ භයින් ත්‍රස්තව ‘ස්වාමීනි, රජ්ජුරුවන් වහන්සේට නො කියව’යි කියා තොපට බොහෝ වස්තු දෙති. ‘ව්‍යාඝ්‍රයා තොප විසින් අල්වා ගන්නා ලද්දේය’යි රජ්ජුරුවන් සමීපයෙන් බොහෝ වස්තු ලබන්නා වේදැ”යි කිවූය. ඒ භීමසේන නම් පුරුෂයා “යහපතැ”යි ගොස් බෝධිසත්වයන් කී පරිද්දෙන්ම ව්‍යාඝ්‍රයා අල්වාගෙන වනය නිර්භයකොට මහජනයා විසින් පිරිවරන ලදුව බරණැස් නුවරට වැද රජ්ජුරුවන් දැක “මා විසින් ව්‍යාඝ්‍රයා අල්වා ගන්නාලද, වනයත් නිභීය කරනලදැ”යි කීය. රජ්ජුරුවෝ සතුටුව බොහෝ වස්තු දුන්නාහුය.

නැවත එක් දවසක් මාගීයෙක “මීමෙක් මිනිසුන්ට ඇන මග යා නොදෙන්නේය”යි රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝ පළමු පරිද්දෙන්ම භීමසේනයා යවූය. ඒ භීමසේනයාත් බෝධිසත්වයන් කී උපායෙන් ව්‍යාඝ්‍රයා මෙන් ඒ මීමත් අල්වාගෙන අවුය. රජ්ජුරුවෝ නැවතත් ඔහට සතුටුව වසතු බොහෝ සේ දුන්නුය. ඔහු මහත් වූ ඓශ්වර්‍ය්‍යමදයෙන් (ධනවත්කම නිසා ඇති වූ මානයෙන්) මත්ව බෝධිසත්වයන් කෙරෙහි අවඥකොට(අපහාසකොට) උන්ගේ බස් නොගෙන

“තොප නිසා ජීවත් නොවෙමි, කිමෙක්ද? පුරුෂයෝ නම් තෙපිමදැ”යි ආදි වූ පරුෂ වචනයන් කියන්නේය.

ඉක්බිත්තෙන් කීප දවසක් ගියකල්හි සතුරු රජ්ජුරු කෙනෙක් අවුත් බරණැස් නුවර වටලාගෙන “රාජ්‍යය හෝ දෙව, යුද්ධ හෝ කරව්”යි රජහට හසුන් යවූය. රජ්ජුරුවෝත් අසුන් අසා “යුද්ධ කරව”යි භීමසේනයා යවූය. ඒ තෙමේ සියළු සන්නාහයෙන් සන්නද්ධව(යුද ඇඳුම් ආදියෙන් සැරහී) යුද්ධ වෙසක් ගෙන හසති සන්නාහයෙන් සන්නද්ධ වූ හස්තියෙකු පිටට පැනනැගී උන්නේය. බෝධිසත්‍වයෝත් ඔවුන්ගේ මරණභයින්(ඒ භීමසේන මැරෙතැයි බියෙන්) සියළු සන්නාහයෙන් සන්නද්ධව භීමසේනයාගේ පශ්චිමාසනයෙහි (භීමසේනට පිටුපස ආසනයේ) උන්නාහුය. හස්තියා මහජනයා විසින් පිරිවරන ලදුව නුවර දෙරින් නික්ම යුද්ධභූමියට පැමිණියේය. එකල්හි භීමසේනයා සටන් බෙරහඬ අසාලාම වෙව්ලන්ට පටන් ගත. බෝධිසත්වයෝ “දැන් මූ වැටීම මියන්නේය”යි සිතා ඇතු පිටින් නොවැටෙන පිණිස භීමසේනයාගේ ඇඟ වරපටකින් වටකර බැඳ අල්වා ගත්තේය. භීමසේනයා යුද්ධභූමිය දැක මරණභයින් තැතිගෙන මලමුත්‍රයෙන් ඇතුපිට කෙළසුයේය(අපවිත්‍ර කෙළේය). එකල බෝධිසත්‍වයෝ කියන්නෝ “භීමසේනය, පළමු කී කාරිය නියාවට පසුව කළ කාරිය සම නොවන්නේ වේද?(පළමුව පුරුෂයෝ නම් තා පමණක්ද? මම පුරුෂ නොවෙම්ද?යි කියා අවුත් දැන් මරබියෙන් වෙව්ලමින් ඇතුපිට කෙළෙසූ බව යන මේ පසුව කළ කටයුත්ත සහ පළමුව කී කාරිය අතර

සමානත්වයක් නැනේද?) තෝ පළමු යුද්ධභටයෙක් මෙන් වූයේය, දැන් ඇතුපිට කෙළසන්නෙහිය''යි කියා බොධිසත්වයෝ ඕහට නින්දා කළෝය.

තවද "භීමසේනය, තා විසින් පළමු කියන ලද්දේ කිමෙක්ද? 'පුරුෂයෝ නම් තෝමද? මම පුරුෂ නොවෙම්ද? මමත් යෝධභටය'යි නින්දා වචනයක් කීය. මේ වූකලි එකෙක, ඉක්බිත්තෙන් පළමු තා කී නින්දා වචනයෙන් මැතභාගයෙන්(පසුව) දැන් මේ යුද්ධ භූමියෙහිදී සන්නාහයෙන් සන්නද්ධ වූ ඇතුගේ පිට කෙළසා තාගෙන්ම මලමුත්‍රධාරාවෝ වැහෙති, මේ එකෙක, එසේ හෙයින් භීමසේනය, පළමු කී යුද්ධකථාවය. ඇතුපිට කෙළසා විඳින්නා වූ ආයාසය(වෙහෙස) යන මේ දෙක සමාන නොවන්නේ වේදැ''යි මෙසේ මහබෝසතාණෝ ඕහට නින්දාකොට "සබඳ, තෝ නොබව, මා සිටියදී කුමක් නිසා තෝ ආයාස විඳිද්දැ'' යි භීමසේනයා ඇතුපිටින් බාවාගෙන "පලා යව''යි කියා යවා "අද මා විසින් ප්‍රසිද්ධ වන්ට වටනේය''යි යුද්ධයට වැද සිංහනාදකොට බළකොටුව බිඳ සතුරු රජ්ජුරුවන් ජීවග්‍රාහයෙන්(පණ පිටින්) අල්වාගෙන බරණැස්රජු සමීපයට ගියෝය. රජ්ජුරුවෝ සතුටුව බෝධිසත්වයන්ට මහත් වූ යසපිරිවර දුන්නාහුය. එතැන් පටන් බෝධිසත්වයෝ 'චුල්ලධනුග්ගහ පණ්ඩිතයෝය'යි සියළු දඹදිව ප්‍රසිද්ධ විය. ඒ මහබෝසතාණෝ භීමසේනයාට වැටුප් වියදම් දී ඔහු පළමුව විසුවා වූ ස්ථානයට යවා දනාදී පින්කම්කොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය.

ශාස්තෲ වූ බුදුරජාණන් වහන්සේ "මහණෙනි, මේ භික්ෂූහු තමාට ස්තූතිකොට අනුනට නින්දා කළේ දැන්මතු නොවෙයි, පෙරත් නින්දා කළෝම වේදැ"යි මේ ධර්මදෙශනාව ගෙනහැර දක්වා පූර්වාපරසන්ධි ගළපා මේ 'භීමසේන ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි භීමසේන නම් දැන් අනුන්ට නින්දාකොට තමාට ස්තූති කරන්නා වූ මහණය, එසමයෙහි චුල්ලධනුග්ගහ පණ්ඩිතයෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 081. සුරාපාන ජාතකය

තවද එක් සමයෙක්හි පංචමාරයන්(පඤ්චස්කන්ධ මාර, කෙලෙස් මාර, සාමාන්‍ය මරණය නැමති මාර, කුශලාකුශලකර්ම නැමති මාර, වසවර්ති නම් දෙවපුත්‍රමාර යන පස් මරුන්) ජයගත්තා වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ කොසඹෑ නුවර නිසා(අසල වූ) ඝොෂාකාරාමයයෙහි වැඩවසනසේක 'සාගත' ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර වස්වැස චාරිකා ගමනින් භද්දවතිකා නම් නියම්ගමට පැමිණි කල්හි ගොපල්ලන් අජපාලයන්(එළුවන් බලන්නන්) ගොවින් මගීන් ආදී සත්වයෝ සර්වඥයන් වහන්සේ දැක වැඳ "ස්වාමිනි බුදුරජාණන් වහන්ස, අඹතිර්ථයට(අඹතොට නැමති තැනට)

නොවැඩිය මැනව, අඹතිර්ථයෙහි ජටිලයාගේ ආශ්‍රමයෙහි අඹතිර්ථ නම් නාග රාජයෙක් ආශීර්විෂය(උග්‍ර විෂ ඇත්තේය), ඝොරවිෂය(දරුණු විෂ ඇත්තේය), ඒ නාග රාජයා සර්‍වඥයන් වහන්සේට පීඩා කරන්නේය''යි කියා වැළකූය. සර්‍වඥයන් වහන්සේද ඔවුන්ගේ කථාව නොඇසූවාක්හු මෙන් ඔවුන් තුන්යලක් දක්වා වලකමින් සිටියදීම වැඩිසේක.

බුදුරජාණන් වහන්සේ භද්දවතිකාවට නොදුරෙහි වූ එක්තරා වන ලැහැබෙක වැඩවසන සමයෙහි බුද්ධොපස්ථායක වූ සාගත ස්ථවිරයන් වහන්සේ ඒ අඹතොටට වැඩ නාගරාජයා දමනයකොට ඔහු සරණශීලයන්හි පිහිටුවා බුදුන් සමීපයට ආවාහුය.

සාගත ස්ථවිරයන් වහන්සේ විසින් නාගරාජයා දමනයෙහි ලූනියාව සියළු ජනපදයෙහි පතළේය. කොසඹෑ නුවරවාසී වූ සත්‍වයෝ සර්‍වඥයන් වහන්සේට පෙරගමන්කොට නමස්කාරකොට සාගත ස්ථවිරයන් වහන්සේ සමීපයට ගොස් වැඳ එකත්පස්ව සිට මෙසේ කීවාහුය "ස්වාමීනි, යමෙක් නුඹ වහන්සේට දුලභ වීනම් ඒ වදාළ මැනව, අපි එය සමූර්ධ(ඉටු) කරම්හ''යි කිවූය. එබස් ඇසූ තෙරුන් වහන්සේ මුවෙන් නොබිණුසේක. සමහර භික්ෂූන් වහන්සේ වනාහී (දුසිල් භික්ෂූන් වහන්සේලා) "උපාසකවරුනි, ප්‍රව්‍රජිතයන් වහන්සේට 'කාපෝතිකා' නම් සුරාව දුලීභද වෙයි, සිත්කළු ද වෙයි. ඉදින් තෙපි තෙරුන් වහන්සේට ප්‍රසන්නවූවාහු නම් කාපෝතිකා සුරාව පිළියෙළ කරව''යි කීසේක. ඒ උපාසකවරු

"ස්වාමීන් වහන්ස, යහපතැ"යි පිළිගෙන සර්‍වඥයන් වහන්සේට සෙට දවසට ආරාධනාකොට නුවරට වැද තමතමන්ගේ ගෙයිදී "තෙරුන් වහන්සේට දෙම්හ"යි කාපෝතිකා නම් සුරාව පිළියෙල කර තෙරුන් වහන්සේට පවරා තමන්ගේ ගෙයිදී සුරාව පිළිගැන්වූය. තෙරුන් වහන්සේ ඒ සුරාව වළඳ මදයෙන් මත්ව නුවරින් නික්මෙනසේක් වාසල්දෙර වැටී නන්දෙඩමින් වැදහොත්සේක.

සර්‍වඥයන් වහන්සේ වළඳ ඉක්බිති නුවරින් නික්මෙනසේක් ඒ තෙරුන් වහන්සේ ඒ ආකාරයෙන් වැදහොත්තා දැක "මහණෙනි, සාගත ස්ථවිරයන් ඇරගනුව"යි කියා ගෙන්වාගෙන විහාරයට වැඩිසේක. ඒ භික්ෂූන් වහන්සේ තෙරුන් වහන්සේගේ හිස සර්‍වඥයන් වහන්සේගේ ශ්‍රීපාද මූලයට කොට(සිරිපතුල් මුල තබා) වැදහොවාලූසේක. තෙරුන් වහන්සේ පෙරලී තමන් වහන්සේ දෙපය ශ්‍රීපාද මූලයට කොට වැදහොත්සේක. සර්‍වඥයන් වහන්සේ භික්ෂූන් වහන්සේ අතින් විචාරණසේක් "කිමෙක්ද? මහණෙනි, පෙර සාගත සථවිරයන් වහන්සේ මා කෙරෙහි යම් ගෞරවයක් ඇත්නම් ඒ ගෞරවය දැන් ඇද්දැ" යි විචාළසේක. "නැතැ ස්වාමීනි" කී කල්හි "මහණෙනි, අඹතිර්ථ නම් නාගරාජයා දමනය කළෝ කවිරුදැ?"යි විචාළසේක. "ස්වාමීනි, සාගත ස්ථවිරයන් වහන්සේය"යි කී කල්හි "කිමෙක්ද? මහණෙනි, දැන් සාගත ස්ථවිරයෝ දියබරණයකුත් (දිය නයෙකුවත්) දමනයෙහි ලන්ට සමර්ථයෝදැ?"යි වදාළසේක. "ස්වාමීනි, ඒ නැතැ"යි කී කල්හි "කිමෙක්ද? මහණෙනි, යමක් මෙසේ විසංඥව (සිහි නැතිව)

වැදහොවිත් නම් එසේ වූ සුරාව බොන්නට සුදුසුදැ?"යි විචාළසේක. "ස්වාමීනි, සුදුසු නොවේය"යි දැන් වූසේක.

ඉක්බිත්තෙන් භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ සාගත ස්ථවිරයන් වහන්සේට නින්‍දාකොට භික්ෂූන් වහන්සේට ආමන්ත්‍රණයකොට "රාමෙර බීම නිමිතතකොට පාචිත්තියාපතති වේය"යි(පාචිත්තිය නම් වූ වරදවේ) කියා ශික්ෂාපද පනවා හුනස්නෙන් නැගීසිට ගඳකිළියට වන්සේක. දම්සභා මණ්ඩපයට රැස් වූ භික්ෂූන් වහන්සේ සුරාපානයෙහි නුගුණ කීසේක. "ඇවැත්නි, මේ සුරාපානය නම් මහත් වූ දෙෂ ඇත්තේය, මහත් වූ ඍද්ධිමත් වූ සාගත ස්ථවිරයෝ යම්සේ බුදුන්ගේ ගුණ නොදනිත් නම් එපරිද්දෙන් කළෝය"යි සුරාවෙහි නුගුණ කීසේක. ශාසතා වූ බුදුරජාණන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩ "මහණෙනි, කවර කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා වදාරා "මෙනම් කථාවකින් යුක්තව උනුම්හ"යි කී කල්හි "ප්‍රව්‍රජිතයන් රා බී මත්ව විසංඥවූයේ දැන්මතු නොවෙයි, පෙරත් විසංඥවූවෝම වේදැ"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහබෝසතාණෝ කසීරට ප්‍රසිද්ධ වූ බ්‍රාහමණ වංශයක ඉපිද වැඩිවිය පැමිණ ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා ධ්‍යාන ක්‍රීඩා කෙරෙමින්(ධ්‍යාන ලැබීම නිසා හටගත් ප්‍රීතියෙන් යුක්තව) හිමාලය වන ප්‍රදේශයෙහි වාසය කරන්නාහුය.

පන්සියයක් අන්තේවාසික(අතවැසි) තාපසයෝ මහබෝසතාණන් නිරන්තරයෙන් පිරිවරා ඇවිදින්නාහුය.

ඉක්බිත්තෙන් ඒ මහබොධිසත්‍වයන්ට වස්සාන කාලය(වැසි කාලය) පැමිණි කල්හි අන්තේවාසිකයෝ කියන්නෝ "ආචාරීන් වහන්ස, මනුෂ්‍යපථයට(මිනිසුන් වසන පෙදෙසට) ගොස් ලුණුඇඹුල් සෙවෙනියකොට(පරිභොගකොට) එම්හ"යි කීහ. ඒ ඇසූ මහබෝසතාණෝ "අන්තේවාසිකයෙනි, මම මෙහිම වෙසෙමි, තෙපි හැම ගොස් ශරීර සතප්පාගෙන වර්‍ෂා කාලය ඉකුත්කොට එව"යි කිවූය. ඔහු හැමදෙන "යහපතැ"යි ආචාරීන් වැඳ බරණැස් නුවරට ගොස් රාජොද්‍යානයෙහි වැස දෙවෙනි දවස් පිටත වාසල්දොර සමීපයෙහි ගම සිඟා වළඳා සම්පූර්ණව දෙවෙනි දවස් නුවරට වන්නාහුය. මනුෂ්‍යයෝ දැක ප්‍රසන්නව භික්‍ෂාව(පිණ්ඩපාතය) දුන්නාහුය. කීප දවසකින් රජ්ජුරුවන්ටත් දැන්වූය. "දේවයන් වහන්ස, හිමාලය වනයෙන් පන්සියයක් ඍෂිවරයෝ අවුත් උයනේ වෙසෙති. ඔහු හැමදෙන ඝොර වූ(උග්‍ර) තපස් ඇත්තෝය, දමනයෙහි ලූ පඤ්චෙන්ද්‍රියන් ඇත්තාහ, උතුම්වූ සීලසංරක්‍ෂණය ඇත්තාහ"යි දැන්වූය.

රජ්ජුරුවෝ ඔවුන්ගේ ගුණ අසා උයනට ගොස් වැඳ සුවදුක් කථාකොට වස් සාරමස එහිම වසන පිණිස ප්‍රතිඥාගෙන(පොරොන්දු කරවාගෙන) ආරාධනා කළෝය. ඍෂිවරයෝ එතැන් පටන් රජගෙයිදී වළඳා උයන වෙසෙති. ඉක්බිත්තෙන් එක් දවසක් නුවර මහත් වූ සුරා පානයෙක් විය. රජ්ජුරුවෝ "තපස්විවරයන්ට සුරාපාන නම් දුර්ලභ වෙයි"

සිතා උතුම් වූ බොහෝ සුරා යැවූය. සෘෂිවරයෝ රා බී උයනට ගොස් රා මදයෙන් මත්ව සමහර කෙනෙක් පැන පැන නටති. සමහර කෙනෙක් ගී කියති. නටා ගී කියා කෙණ්ඩිය හා එක්ව බිම ගසාගෙන වැටී හී(දිය කෙණ්ඩිය සමඟ බිම ඇදවැටී) නිද රාමද සුන්කල්හි පිබිද තමන්ගේ විප්‍රකාරය දැක "අප විසින් ප්‍රව්‍රජිතයන්ට නොසරුප්(නුසුදුසු) දෙයක් කරන ලදැ"යි හඬා වැලප "අප ආචාරීන් වහන්සේ සමීපයෙන් වෙන් වූ බැවින් මෙබඳු වූ ලාමක ක්‍රියාව කළෝවම්හ"යි එකෙණෙහිම උයන හැර හිමාලය වනයට ගොස් තවුස්පිරිකර තැන්පත්කොට තබා ආචාරීන් වැඳ එකත්පස්ව හිඳ "කිමෙක්ද? තපස්විවරයිනි, මනුෂ්‍යපථයේ ආහාරයෙන් නොමිරිකී(අගහිගයක් නොමැතිව) සැපසේ විසූද? සමගිවත් වාසය කළාදැ?"යි බොධිසත්‍වයන් විසින් විචාරන ලද්දනු. "ආචාරීන් වහන්ස, සැපසේ විසුම්හ, එතකුදුවුවත් අපි හැමදෙන නොපිය යුත්තක් බී විසංඥව සිහි එලවාගත නොහී නැටුම්හ, ගී කීම්හ, නැවත සිහි එලවාගෙන අප කළසේ නපුරුයි ඇඬුම්හ"යි කියා "මෙබඳු සිහිපත් නැති කරන්නා වූ සුරා පානයටත් වඩා මා වානරවූවෝ නම් යහපත් වන්නේය"යි මෙසේ තපස්විවරයෝ තමන්ගේ නුගුණ බොධිසත්‍වයන්ට කීවාහුය. එපවත් ඇසූ මහබෝසතාණෝ "ගුරුවරයන් හා එක්ව නොවසන්න වූ තපස්විවරයන්ට මෙබන්ඳක් වන්නේම වේදැ"යි ඒ තාපසවරුන්ට නින්දකොට "මෙබන්ඳක් මතු නොකරව"යි ඔවුන්ට අවවාදදී නොපිරිහුනු ධ්‍යානයෙන් බ්‍රහ්මලෝකයෙහි උපන්නාහුය.

ශාසතෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදෙශනාව ගෙනහැර දක්වා වදාරා මේ 'සුරාපාන ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි සෘෂිසමූහයා නම් දැන් බුදුපිරිසය, ගණශාසතෘවූයේ(පිරිසට අනුශාසකයා වූයේ) නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

# 082. කාලකණ්ණි ජාතකය

තවද එක් සමයෙක්හි සංසාර සාගරයට නැවක් බඳු වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසනසේක් අනේපිඬු මහසිටාණන්ගේ මිත්‍රයෙකු අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ මිත්‍රයා වනාහී අනේපිඬු මහසිටාණන් හා එක්ව වැලි කෙළියේය, එක් කලෙක ආචාරීන් සමීපයෙහි ශිල්ප උගත්තේය, නමින් 'කාලකණ්නි'ය. ඒ තෙමේ කල්යාමකින් දුක්පත්ව ජීවත්ව ගතනොහී අනේපිඬු මහසිටාණන් සමීපයට ගියේය. එකල සිටාණෝ ඔහු අස්වසාලා වැටුප් වියදම් දී තමන් සන්තක සියල්ල ඕහට පාවාදුන්නාහුය(භාර කෙළේය). එතෙමේ සිටාණන්ට උපකාරීව සියළු කටයුතු කරන්නේය. එකල එක් යාළුවෙක් සිටාණන් සමීපයට ගොස් මෙසේ කිවූය. "මහසිටාණෙනි, මොහු තොප සමීපයෙහි විසිය නොදෙව, සිටු කාලකණ්නිය, හිඳු කාලකණ්නිය, අනුභව කරව කාලකණ්නිය

යන මේ ශබ්දයෙන් යකෙක් වුවත් පලා යන්නේය. ඒ එසේ නම් මෙබඳු ශබ්දය නිසා තොපගේ ශ්‍රීතොමෝ(යසඉසුරුමත් බව) පලායාම ගැන කියනුම කවරේද? මොහු වූ කලී තොප හා සමාන කෙනෙක් නොවෙයි, දුකබිතය, විරූපීය, තොපට මූගෙන් ප්‍රයෝජන කිම්දැ?"යි කිවූය.

එබස් අසා අනේපිඩු මහසිටාණෝ කියන්නෝ "නාමය නම් ව්‍යවහාර මාත්‍රයක, නුවණැත්තෝ ඒ නාමමාත්‍රය ප්‍රමාණ නොකරති(හොඳ නරක මැනීමේ මිනුම් දණ්ඩක් ලෙස නොගනිති), සුතමංගලිකවන්ට (අසන්නට ලැබෙන යම් යම් ශබ්දවලින් මේවා සුබ ඵලදායකය, මේවා අසුභ ඵලදායකයැයි විශ්වාස කරන්නෙකු වීම) සුදුසු නොවන්නේය. මා විසින් නාමමාත්‍රයක් හේතුකොටගෙන එක්ව වැලිකෙළි තැනැත්තනු හැරපියන්ට නොපිළිවනැ"යි ඒ යාළු විශ්වාසයන්ගේ බස් නොගෙන එක් දවසක් තමන්ගේ භොගග්‍රාමයට (ආදායම් ලැබෙන ගමට) යන තැනැත්තෝ ඒ කාලකණ්නි නම් පුරුෂයා රැකවලට රඳවා ගියේය. එකල සොරු "සිටාණන් ගමට ගියෝය, එසේ හෙයින් උන්ගේ ගෙය පැහැර පියම්හ"යි (කොල්ලකන්නෙමු) නොයෙක් ආයුධ හැරගෙන රාත්‍රි භාගයෙහි අවුත් ගේ වටලා ගත්තුය. ඒ කාලකණ්නි නම් පුරුෂයාත් 'සොරු එති' යන සැකයෙන් නොනිදම උන්නේය.

එතෙමේ සොරුන් ආ නියාව දැන මනුෂ්‍යයන් පුබුදුවා "තෝ සක් පුඹුව, තෝ බෙර ගසව"යි කියා මහත් වූ රඟමණ්ඩලක් සරහන්නාසේ (නාට්‍යයක් දක්වන්නාක් මෙන්)

මෙන් සියලු ප්‍රාසාදිය එකඝොෂා කෙළේය. එකල සොරු "ගෙය සිස්වා තිබුයේයයි අප විසින් වරදවා අසනලද, මහසිටාණෝ මෙගෙයිමැ"යි කැටමුගුරු ආදිය දමාපිය ගියාහුය. දෙවෙනි දවස් එතන දමනලද කැටමුගුරු ආදිය දැක භයපත්ව "ඉදින් අද මෙබඳු වූ බුද්ධිසම්පන්න වූ ගේ බලන්නෙක් නුවූයේ වීනම් කැමැති පරිද්දෙන් වැද සියළු ගෙය පැහැර පියන්නාහුය. මිත්‍රයා නිසා සිටාණන් වහන්සේට වැඩක්ම වීය"යි ප්‍රශංසාකොට අනේපිඬු සිටාණන් භොගග්‍රාමයෙන් ආ කල්හි ඒ සියළු ප්‍රවෘත්තිය කීවාහුය. එකල්හි සිටාණෝ ඒ මනුෂ්‍යයන්ට මෙසේ කිවූය "තොපි හැම මාගේ මෙබඳු ගේ බලන්නා වූ මිත්‍රයා මෙතනින් නෙරපියන්ට(එළවා දැමීමට) උත්සාහ කළෝවේදැයි ඉදින් මම තොප හැමගේ බසින් මොහු නෙරපුයේ වීම්නම් අද මාගේ වස්තුවෙන් කිසිවකුත් නොතිබෙන්නේ වේද? නාමය නම් අප්‍රමාණය, හිතමිත්‍රයාම ප්‍රමාණය"යි කියා ඕහට වඩාලා(වැඩිපුර) වැටුප් දී සංග්‍රහ කළෝය.

ඉක්බිත්තෙන් ඒ සිටාණෝ "දැන් මම සර්‍වඥයන් වහන්සේට දන්වමි මේ කථා නැමැති පඬුරෙක් ඇත්තේය"යි සර්‍වඥයන් වහන්සේ සමීපයට ගොස් ආදියෙහි පටන්(මුල පටන්) සියළු පවත් දැන්වූය. සර්‍වඥයන් වහන්සේ "සිටාණෙනි, කාලකණ්නි මිත්‍රයා තමාගේ ගෘහවස්තුව රැක්කේ දැන්මතු නොවෙයි, පෙරත් රැක්කෝ වේදැ"යි වදරා සිටාණන් විසින් ආරාධිත වූ බුදුනු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කරන කල්හි අප මහබෝසතාණෝ මහත් වූ යසපිරිවර ඇති මහතාණ කෙනෙක් වූය. ඒ සිටාණන්ගේ 'කාලකණ්නි' නම් මිත්‍රයෙක් විය යනාදී සියල්ල වර්තමාන කථාව හා සදෘශ(සමාන) වන්නේය. බොධිසත්‍වයෝ තමන්ගේ භොගග්‍රාමයෙන් ආ තැනැත්තෝ එපවත් අසා "ඉදින් මම තොප ඇමගේ බසින් මෙබඳු වූ මිත්‍රයා නෙරපියෙම් නම් අද මාගේ ගෙයි කිසි වස්තුවක් නොතිබෙන්නේ වේදැ"යි කියා මිත්‍රයාගේ ගුණ කීවාහුය.

"තවද සත්පියවරක් එක්ව යැමෙන් 'මිත්‍ර' නම් වන්නේය. දෙළොස් දවසක් එක්ව විසීමෙන් 'සහාය' නම් වන්නේය. මසකින් යෙළමසකින් (මාස භාගයකින්) 'ඥාති' සමාන වන්නේය. එයින් මත්තේ එක්ව විසීමෙන් ආත්ම සමාන(තමා හා සමානම වූවෙක්) වන්නේය. එසේ හෙයින් සත්පුරුෂ ගුණ ඇත්තා වූ මම ආත්ම සැපය නිසා බොහෝ දවසක් විශ්වාස වූ මේ 'කාලකණ්නි' නම් වූ පුරුෂයා කෙසේ නම් හැරපියම්දැ"යි මිත්‍රරසයෙහි ගුණ කීවාහුය. එතැන් පටන් නැවත කිසිවෙක් මේ කාලකණ්නි නම් පුරුෂයා පිළිබඳ බසක් නොකීයේය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදෙශනාව ගෙනහැර දක්වා වදරා මේ 'කාලකණ්නි ජාතකය' නිමවා වදළසේක.

“එසමයෙහි කාලකණ්නි පුරුෂයා නම් දැන් ආනන්ද ස්ථවිරයෝය, එසමයෙහි බරණැස් නුවර සිටාණෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 083. අත්ථස්සද්වාර ජාතකය

තවද එක් සමයෙක්හි සංසාර සාගරයට පසුරක්(පාරුවක්) බඳු වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසනසේක් කාරණා දැනීමෙහි සමර්ත්ථ වූ එක් කුලපුත්‍රයක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

සැවැත් නුවර එක් මහසම්පත් ඇති සිටාණ කෙනෙකුන්ගේ පුත්‍රයෙක් සත් ඇවිරිද්දෙහිම නුවණැත්තේය, කාරණා’කාරණ දැන්මෙහි සමර්ත්ථය. එක් දවසක් ඒ කුලපුත්‍රයා පියාණන් සමීපයට ගොස් අභිවෘද්ධියට උපාය වූ(දියුණුවට හේතු වූ) ප්‍රශ්නය විචාළේය. ඒ සිටාණෝ ඒ ප්‍රශ්න දැනගත නුහුනුවාහුය. ඉක්බිත්තෙන් ඒ සිටාණන්ට මෙසේ වූ සිතිවිල්ලෙක් විය. මේ ප්‍රශ්නය ඉතා සූක්‍ෂමය, සර්‍වඥයන් වහන්සේ හැර අනික් කෙනෙක් උඩින් භවාග්‍රය(අකනිටා බඹලොව) හා යටින් අවීචියෙන්(අවීචි මහනරකයෙන්) පිරිසිඳුනා වූ(සීමා වූ) මේ ලෝකයෙහි මේ ප්‍රශ්නය කියන්නට සමර්ත්ථ කෙනෙක් නැතැ”යි සිටාණෝ පුත්‍රයා කැඳවාගෙන බොහෝ සුවඳමල් ආදිය ගෙන්වාගෙන ජේතවනයට ගොස් සර්‍වඥයන් වහන්සේට පූජාකොට වැඳ එකත්පස්ව හිඳ බුදුරජාණන් වහන්සේට මෙසේ දැන්වූය “ස්වාමීනී, මේ

කුමාරයා නුවණැත්තේය, කාරණා'කාරණ දැන්මෙහි සමර්ත්‍ථය, මේ තෙමේ මා අතින් අභිවෘද්ධියට කාරණා වූ ප්‍රශ්නයක් විචාළේය, මම ඒ ප්‍රශ්නය දැනගත නොහී බුදුරජාණන් වහන්සේ සමීපයට ආමි, ස්වාමීනි, බුදුරජාණන් වහන්ස මට ඒ ප්‍රශ්නය වදාළසේක් වීනම් යහපත් වන්නේය''යි කීයේය.

එකල්හි සර්‍වඥයන් වහන්සේ වදාරනසේක් "උපාසකය, පෙරත් මේ කුමාරයා මා අතින් මේ ප්‍රශ්නය විචාළේය, මමත් ඕහට කීමි. එසමයෙහි මේ තෙමේ ඒ ප්‍රශ්නය දන්නේය, දැන් වූකලී අන්‍යභවයෙනුත් සැගවුනු බැවින් නොසලකන්නේය''යි වදුරා ඔහු විසින් ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි පුරනලද බෝධිසම්භාර ඇති අප මහබෝසතාණෝ මහසම්පත් ඇති සිටාණ කෙනෙක් වූය. එකල ඒ සිටාණන්ගේ පුත්‍රයෙක් සත්හැවිරිදි වයසේදීම ප්‍රඥාවෙන් වැඩ අවැඩ දැන්මෙහි සමර්ත්‍ථය, ඒ කුමාර තෙමේ එක් දවසක් පියාණන් සමීපයට ගොස් "පියාණන් වහන්ස, වැඩ අවැඩ උපාය නම් කවරේදැ?''යි විචාළේය. එකල ඕහට පියාණෝ ප්‍රශ්නයක් කියන්නාහු මෙසේ කිවුය "ශරීරව්‍යාධියෙන් පීඩිත කල්හි නොලද්ද වූ ලාභයක් උපදවනටත් ලද්ද වූ ලාභයක් ප්‍රයෝජන විඳින්නටත් අසමර්ත්‍ථ වන්නේය. නිරෝගී තැනැත්තේම නූපන්නා වූ ලාභ උපදවන්නටත් උපන්නා වූ ලාභයක් ප්රයෝජනය විඳින්නටත් සමර්ත්‍ථ වන්නේය.

චිත්තක්ලේශයෙන්(සිත කෙලෙස්වලින්) පීඩිත වූ කල්හි නූපන්නා වූ ධ්‍යානාදී ලාභයක් උපදවන්ටත්, උපන්නා වූ ධ්‍යානාදි ලාභ නැවත නැවත සමාපත්ති වශයෙන් ප්‍රයෝජන විඳින්ටත් අසමර්ත්‍ථ වන්නේය. ඒ අනාරොගයය (රෝගීබව) ඇති කල්හි නොලබන ලද්ද වූ ලාභය නොලබන්නේය, ලබන ලද්ද වූ ලාභය නිරර්ත්‍ථක වන්නේය. නිරෝගී බව ඇති කල්හි නොලබන ලද්ද වූ ලාභය ලැබෙන්නේය, ලබන ලද්ද වූ ලාභය සාර්ත්‍ථක වන්නේයයි නිරෝගී බවම උත්තෘෂ්ට වූ(අතිශයින්ම උසස්) ලාභයෙක් නම් වන්නේය. එසේ හෙයින් පළමුකොට නිරෝගීබව අභිවෘද්ධියට උපායක මහා ආචාරශීලයෙන් යුක්තව ලෝක චාරිත්‍ර දැන්මද දෙවෙනි වූ අභිවෘද්ධියට කාරණය, ඥාණවෘද්ධ, වයෝවෘද්ධ, තපෝවෘද්ධ(නුවණ, වයස, සිල්වත්බව යන මෙයින් වැඩිහිටිබවට ගියා වූ) ගුරුවරුන්ගෙන් අවවාද ඇසීම තුන්වෙනි වූ අභිවෘද්ධියට කාරණයක. මේ ලෝකයෙහි කාරණා නිශ්‍රිත වූ(තමාටත් අනුන්ටත් හිතසුව ගෙන දීමට සමත්) බහුශ්‍රැත වූ බව(උගත්කම) සතරවෙනි වූ ලෝවැඩ උපායක, ත්‍රිවිධ දුශ්චරිත ධර්‍මය(තිදොරින් සිදුවන අකුසල්) දුරුකොට ත්‍රිවිධ වූ සුචරිත ධර්‍මයන්ට අනුව පැවැත්ම පස්වැනි වූ අභිවෘද්ධියට මූලය. චිත්තයාගේ ලීන නොවන බව(උත්සහයත් බව) සවැනි වූ අභිවෘද්ධියට කාරණයක. එසේ හෙයින් මොහු සදෙන ලෞකික ලෝකෝත්තර සංඛ්‍යාත(නම් වූ) අභිවෘද්ධියම සාදදීලන්ට සමර්ත්‍ථ හෙයින් උතුම් වූ අභිවෘද්ධි කාරණාවෝය''යි මෙසේ මහබෝසතාණෝ පුත්‍රයාට

අභිවෘද්ධියට උපාය වූ ප්‍රශ්නයයි කීවාහුය. ඒ කුමාරතෙම එතැන් පටන් ඒ සවැදෑරුම් වූ අභිවෘද්ධිකර ධර්මයෙහි පැවැත්තේය. බොධිසත්ත්වයෝ දනාදී පින්කම්කොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය.

ශාසතෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදෙශනාව ගෙනහැර දක්වා වදාරා මේ ‘අත්ථස්සද්වාර ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි පුත්‍රයා නම් දැන් මේ පුත්‍රයාය, එසමයෙහි ප්‍රශ්න විස්සර්ජනය කළාවූ(පැණ විසඳූ) මහසිටාණෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 084. කිම්පක්ක ජාතකය

තවද එක් සමයෙක්හි සියළු ලෝවැඩ කිරීමෙහි සමර්ත්ථ වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වසනසේක් උකටලී වූ(සසුනේහි ඇලුම් නොමැති වූ) භික්‍ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

එක්තරා කුලපුත්‍රයෙක් බුද්ධශාසනයෙහි ළැදිව මහණව එක් දවසක් සැවැත් නුවර පිඩුසිඟා ඇවිදිනේ සර්වාභරණයෙන්(සියළු ආභරණවලින්) සැරහුණා වූ එක් ස්ත්‍රියක් දැක ක්ලෙශවසඟව(කෙලෙස් බලපෑමට යටවී) ශාසනයෙහි ඇළුම් නැති වූයේය. ඉක්බිත්තෙන් ඒ භික්‍ෂුව ආචාර්‍ය්‍ය උපාධ්‍යායන් වහන්සේලා බුදුරජාණන් වහන්සේ සමීපයට කැඳවාගෙන

ගියේය. සර්‍වඥයන් වහන්සේ “සැබෑද? මහණ, තෝ ශාසනයෙහි උකටලී වූයෙහිදැ”යි විචාරා “සැබැව ස්වාමීනි” කී කල්හි “මහණ, මේ පඤ්චකාම ගුණයෙන් නම් පරිභොග කාලයෙහි සිත්කළු වන්නාහ. ඒ පඤ්චකාම කොට්ඨාශයන්ගේ අනුභව කිරීම(විඳීම) නරකාදී සතර අපායෙහි ඉපිද මහදුක් දෙන බැවින් කිම්ඵල නම් විෂඵල අනුභව කිරීම හා සමාන වන්නේය. කිම්ඵල නම් වර්‍ණයෙන්, ගන්‍ධයෙන්, රසයෙන් සමුර්ධය(නොඅඩුය). අනුභව කළ කල්හි වනාහී අතුනුබහන් සිඳ(බඩවැල් කැපීගොස්) ජීවිතක්‍ෂයට පමුණුවන්නේය. පෙරත් බොහෝදෙන ඒ ඵලයෙහි ස්වභාවය නොදැන වර්‍ණ, ගන්‍ධ, රසයෙහි බැඳී ඒ ඵලය අනුභවකොට ජීවිතක්‍ෂයට පැමිණියෝ වේදැ”යි වදුරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහබෝසතාණෝ සාත්තුනායකව පන්සියයක් ගැලින් බඩු ගෙන්වාගෙන නැගෙනහිරින් බස්නාහිරට යන්නාහු මහවන සමීපයට පැමිණ මනුෂ්‍යයන් රැස්කරවා “මේ වනයෙහි විෂ වෘක්‍ෂයෝ ඇත, එසේ හෙයින් මා නොවිචාරා තොපි හැම පෙර නොකෑවිරූ ඵලයක් නොකව”යි අවවාද කළාහුය. මනුෂ්‍යයෝ වනය ඉක්ම(පසුකොට) ආරණ්‍යමුඛයෙහි(කැලෑවේ අනික් පැත්තේ ඉදිරියෙහි) එක් කිම්පක්ක නම් එක් විෂ වෘක්‍ෂයෙක් ඵලභාරයෙන්(ගෙඩිබරින්) නැමී තිබෙන්නා දුටුය. වෘක්‍ෂයාගේ කඳ අතුපත් ඵල සටහනින්(හැඩ රුව අතින්) හා වර්‍ණ, ගන්‍ධ, රසයෙන් අඹ ඵල හා සමාන වන්නේය. ඒ යන්නා වූ සත්‍වයන්

අතුරෙන් සමහර කෙනෙක් වර්‍ණ, ගන්‍ධ, රසයෙහි බැඳී අඹඵලය යන සංඥාවෙන්(හැඟීමෙන්) අනුභව කළාහුය. සමහර කෙනෙක් “සාත්තුනායකයා විචාරා කම්හ”යි අතින් අල්වාගෙන සිටියාහුය. මහබෝසතාණෝ ඒ ස්ථානයට පැමිණ අල්වාගෙන සිටි ඵල දම්මවා (ඉවත ලා) යම් කෙනෙක් කමින් සිටියෝ නම් ඔවුන් වමනය කරවා බෙහෙත් දුන්නාහුය. ඒ සත්‍වයන්ගෙන් සමහර කෙනෙක් නිරෝගී වූහ, පළමුකොට අනුභවකොට සිටියා වූ සත්‍වයෝ ජීවිතක්‍ෂයට පැමිණියාහුය.

බොධිසත්‍වයෝ තමන් කැමති තැනට සැපසේ ගොස් වෙළඳාම් කිරීමෙන් ලාභ ලැබගෙන නැවත තමන් වසන්නා වූ ස්ථානයට අවුත් දානාදී පින්කම්කොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ “මහණෙනි, යම් සත්‍වයෙක් මත්තෙහි වනාහී දොෂ නොදැන පඤ්චකාමය අනුභව කෙරේද? ඒ සත්‍වයා කිම්පක්ක නම් විෂඵලය අනුභව කළා වූ සත්‍වයන් මරණට පැමිණියාක් මෙන් නරකාදී සතර අපායෙහි(නරකය, තිරිසන්ව ඉපදීම, ප්‍රෙතව ඉපදීම, අසුරකාය අපායන් සතරෙහි) ඉපිද මහදුක් අනුභව කරන්නේය”යි වදාරා චතුරාර්‍ය්‍යසත්‍යය ප්‍රකාශ කළසේක.

උකටලී වූ මහණ සෝවාන්ඵලයට පැමිණියේය. අවශෙෂ පර්ෂිදින්(සෙසු පිරිසෙහි) සමහර කෙනෙක් සෝවාන්ඵලයෙහි පිහිටියහ. සමහර කෙනෙක් සකෘදාගාමිඵලයෙහි පිහිටියහ.

සමහර කෙනෙක් අනාගාමීඵලයෙහි පිහිටියහ. සමහර කෙනෙක් රහත් වූහ.

ශාසතෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්‍මදෙශනාව ගෙනහැර දක්වා වදරා මේ 'කිම්පක්ක ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි පර්ෂිත් නම් දැන් බුදුපිරිසය, එසමයෙහි සාත්තුනායක වූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 085. සීලවිමංස ජාතකය

තවද එක් සමයෙක්හි සීලසමාධිප්‍රඥාවෙන් යුකත වූ තිලෝගුරු සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසනසේක් සිල් පරීක්ෂා කරන්නා වූ බ්‍රාහ්මණයෙකු අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ බ්‍රාහමණතෙමේ කොසොල් රජ්ජුරුවන් නිසා ජීවත් වන්නේය. තිසරණගතය, අඛණ්ඩ පඤ්චසීලය රක්ෂා කරන්නේය. වෙදත්‍රයෙහි පරතෙරට පැමිණියේය. රජ්ජුරුවෝ "මේ තෙමේ සිල්වතැ"යි ඕහට අධික වූ සත්කාර සම්මාන කෙරෙති, ඉතා ගරුකොට සලකති. එකල බ්‍රාහ්මණයා මෙසේ සිතීය "කිමෙක්ද? මේ රජ්ජුරුවෝ මාගේ ජාතිකුලප්‍රදෙශ සමෘද්ධිය(ජාතිය කුලය උපන්රට ආදියෙන් උසස්බව) නිසා මට සත්කාර සම්මාන කරණසේක් දෝහෝයි නොහොත් සීලසමෘද්ධිය(උසස් සිල්වත්බව) නිසා සම්භාවනා

(ගරුසැලකිලි) කරනසේක් දෝහෝයි එසේ හෙයින් මා පළමුකොට පරීක්‍ෂා කොටපුවම නොවේදැ''යි සිතා ඒ බ්‍රාහ්මණයා එක් දවසක් රජ්ජුරුවන්ට සේවයට ගෙට(රජගෙට) යන්නේ එක් වන්නකු පුරුෂයෙකුගේ පෝරුවෙන්(භාණ්ඩ තක්සේරු කරන්නෙකුගේ මේසයෙන්) නොකියා එක් කහවණුවක් ඇරගෙන ගියේය. ඒ දැක වන්නක්කා බ්‍රාහ්මණයා කෙරෙහි ගරුත්‍වයෙන් කිසිවක් නොකියා උන්නේය. නැවත එක් දවසක් කහවණු දෙකක් ගත්තේය. ඒ වන්නකු පුරුෂයා ඒ දවසුත් එසේම ඉවසුයේය. බමුණා තුන්වෙනි දවස් කහවණු මිටක් හැරගත්තේය. ඉක්බිත්තෙන් වන්නකු පුරුෂයා ඕහට කියන්නේ ''එම්බල බ්‍රාහ්මණය, රජ්ජුරුවන් වහන්සේගේ රාජභාණ්ඩාගාරය සොරකම් කරන්නේ අදට තුන්දවසක් නොවේදැ''යි කීය. මෙසේ කියා තමා විසින් ''රාජභාණ්ඩාරය සොරකම් කරන්නා වූ සොරා අල්වා ගන්නාලද''යි තුන්විටෙක අඬගැසූයේය.

එකල ඔහු සමීපයට මනුෂ්‍යයෝ ඇතින් මෑතින් අවුත් ''බොහෝ දවසක් සිල්වත් එකකුමෙන් ඇවිදිනෝ නොවේද? දැන් තා කළේ කිම්දැ?''යි පහර කීපයක් ගසාපියා බැඳගෙන රජ්ජුරුවන්ට දැක්වූහ. රජ්ජුරුවෝ ඔහු දැක කලකිරී ''බමුණ කවර කාරණයකින් මෙබඳු වූ දුස්සීල ක්‍රියාවන් කෙළෙහිදැ''යි කියා ''ඇරගෙන යව, මෝහට රාජාඥා කරව''යි(දඬුවම් කරවයි) කිවූය. බමුණා ''රජ්ජුරුවන් වහන්ස, මා රාජභාණ්ඩාගාර සොරකම් කළේ නැතැ''යි කීය. ''එසේකල කුමක් නිසා වන්නක්කාගේ සල්පිල පෝරුවෙන් කහවණු

ගතීදැ?''යි ඇසූය. ''රජ්ජුරුවන් වහන්ස, එසේ කළේ නුඹවහන්සේ මට අධිකකොට සත්කාර සම්මානකොට සම්භාවනා කරන හෙයින් කිමෙක්ද? මේ රජ්ජුරුවන් වහන්සේ මාගේ ජාත්‍යාදිය නිසා මට අධිකකොට සම්භාවනා කරනසේක් දෝහෝයි නොහොත් සීලය නිසා සම්භාවනා කරනසේක් දෝහෝයි පරීක්ෂා කරන පිණිස කෙළෙමි, දැන් වූ කලී මා විසින් ඒකානතයෙන් රජ්ජුරුවන් වහන්සේ මට සම්භාවනා කෙළේ සීලය නිසාමය, ජාත්‍යාදියක් නිසා නෙවෙයි දන්නාලද, එතකුදු වුවත් දැන් නුඹවහන්සේ මට රාජාඥා කරමින් සිටිසේක. එහෙයින් මම එකාන්තයෙන් මේ ලෝකයෙහි සීලයම උතතමය, සීලයම ප්‍රධානයයි නිෂ්ඨාවට ගියෙමි(නිගමනය කළෙමි), මම මේ සීලයට සුදුසු කාරියක් කෙරෙමි නම් ගිහිගෙයි සිට පඤ්චකාමය අනුභව කෙරෙමින් කොටගත නොහෙමි, අදම ජෙතවනයට ගොස් සර්‍වඥයන් වහන්සේ සමීපයෙහි මහණ වෙමි, ස්වාමීනි, මට මහණවීමට අවසර දුනමැනවැ''යි කියා රජ්ජුරුවන් අනුදන්වා ජෙතවනයට අභිමුඛව(දිසාවට) ගියේය.

ඉක්බිත්තෙන් ඔහුගේ ඥාතිමිත්‍රයන් හා බන්ධූහූ රැස්ව මහණවීමට යාම වළකා ගතනොහී නැවතුනෝය. ඒ බමුණා බුදුරජාණන් වහන්සේ සමීපයට ගොස් ප්‍රව්‍රජ්‍යාව ඉල්ලා ප්‍රව්‍රජ්‍යාවත් උපසම්පදාවත් ලැබ කමටහන් මෙනෙහිකොට විදර්‍ශනා වඩා රහත්ව සර්‍වඥයන් වහන්සේ කරාගොස් ''ස්වාමීනි, මාගේ ප්‍රව්‍රජ්‍යාව මස්තකප්‍රාප්තවිය''යි(සඵලවියයි) තමන්වහන්සේ අර්හත්ඵලය ලත් නියාව ප්‍රකාශ කළසේක.

උන්වහන්සේගේ අර්හත්වය ප්‍රකාශ කිරීම භික්ෂුසංඝයා කෙරෙහි ප්‍රසිද්ධ විය. ඉක්බිත්තෙන් එක් දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස් වූ භික්ෂූන් වහන්සේ "ඇවැත්නි, අසවල් කොසොල් රජ්ජුරුවන්ගේ උපස්ථායක වූ බමුණා තමාගේ සීලය පරීක්ෂාකොට රජ්ජුරුවන් අනුදන්වා මහණව අර්හත්ඵලයෙන් පිහිටියේය"යි ඒ භික්ෂූන් වහන්සේගේ ගුණ කියමින් උන්සේක.

සර්වඥයන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩවදාරා "මහණෙනි, දැන් කවර කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා "මෙනම් කථාවකින් යුකතව උනුම්හ"යි කී කල්හි "මහණෙනි, මේ බමුණාම පමණක් දැන් තමාගේ සීලය පරීක්ෂාකොට පැවිද්ව තමන්ට පිහිටක් කළේ නොවේ, පෙරත් පණ්ඩිතයෝ තමාගේ සීලය පරීක්ෂාකොට පැවිද්ව තමන්ට පිහිටක් කළෝම වේදැ"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහබෝසතාණෝ ඒ රජ්ජුරුවන්ට පුරෝහිත වූහ. දන් දීමෙහි බලවත් වූ ඇළුම් ඇත්තෝය, සිල් රක්ෂා කිරීමෙහිද බලවත් වූ ඇලුම් ඇත්තෝම අඛණ්ඩව(කඩ නොකොට) පඤ්චසීලය රක්ෂා කෙරෙති. රජ්ජුරුවෝ සෙසු බමුණන්ට වඩා උත්තරීතර කෙරෙති(ගරු බුහුමන් අතින් වඩා උසස් තැනක් දෙති) යන සියල්ලම පළමු කියනලද්ද හා සදෘශවන්නේය(සමාන වේ). මහබෝසතාණෝ "සොරකම් කළෝය"යි බැඳගෙන රජ්ජුරුවන් සමීපයට ගෙනයන කල්හි අහිගුණ්ඨිකයෝ වීථිමධ්‍යයෙහි

සර්පයින් කෙලවන්නාහුය (නටවන්නාහ). නගුට අල්වති, බොටුව අල්වති, සර්පයා අල්වාගෙන තමන්ගේ කරවට වෙළති.

එකල බොධිසත්වයෝ ඔවුන් දැක "දරුවෙනි, මේ සර්පයාගේ නගුට නාල්ලව, බොටුවෙහි නොවෙළව, මේ සර්පයා දෂ්ට කළේ වීනම් තොප ජීවිතක්‍ෂයට පමුණුවන්නේය"යි කීවූය. අහිගුණ්ඨිකයෝ කියන්නෝ "බමුණ, මේ සර්පයා සිල්වත, ආචාර සම්පන්නය, තා සේ දුශ්ශීල නොවෙයි, තෝ වූකලී තාගේ දුශ්ශීල බැවින් අනාචාරයෙන් රාජභාණ්ඩාගාර සොරකම්කොට 'සොරා' යයි දැන් බැඳගෙන යන ලද්දැය"යි කීවූය.

එකෙණෙහි බොධිසත්‍වයෝ මෙසේ සිතූහ "සර්පයෝ පවා දෂ්ට නොකිරීමෙන් අනුන්ට හිංසා පීඩා නොකිරීමෙන් සිල්වත්හයි නම් ලබති, මනුෂ්‍යයන් කෙරෙහි එවැනි ගුණ විශේෂයක් පිහිටියේ වීනම් කියනු කීමෙක්ද? මේ ලෝකයෙහි සත්පුරුෂයන් විසින් රක්‍ෂා කරනලද දසශීල, අෂ්ටාඞගශීල ආදී සියල්ලම උතුම් වන්නේය. ඒ ශීලයට වඩා ශ්‍රෙෂ්ඨතර වස්තුවෙක් ලෝකයෙහි නැත්තේය"යි සිතූහ. එකෙණෙහි ඒ රාජපුරුෂයෝ ඒ බ්‍රාහ්මණයා ගෙනගොස් රජ්ජුරුවන්ට දැක්වූහ.

ඉක්බිත්තෙන් රජ්ජුරුවන් විසින් "කොල මේ කීමෙක්දැ?"යි විචාරනලද රාජපුරුෂයෝ මෙසේ දැන්වූහ. "දෙවයන් වහන්ස, මේ බ්‍රාහ්මණතෙමේ රාජභාණ්ඩාගාර සොරකම් කරනලද සොරෙකැ"යි කියා දැන් වූ කල්හි රජ්ජුරුවෝ අමාත්‍යයන්ට නියෝග කරන්නාහු "කොල, මේ බ්‍රාහ්මණයා විසින් රෑ දවල්

මෙසේම සොරකමෙහි ලා යෙදී වාසය කරන්නේ වීනම් ඕහට රාජාඥා කරව”යි නියෝග කළ කල්හි බ්‍රාහ්මණතෙමේ රජ්ජුරුවන්ට කියන්නේ “රජ්ජුරුවන් වහන්ස, මා කළ සොරකමෙක් නැතැ”යි කියා දැන්වීය. “එසේකල කුමක් හෙයින් වස්තු හැරගත්තෙහිදැ?”යි විචාළ කල්හි බ්‍රාහ්මණතෙම පළමු කී පරිද්දෙන්ම තමා සොරකම් කළ කාරණා රජ්ජුරුවන්ට දන්වන්නේ “ඒ කාරණයෙන් මම මේ ලෝකයෙහිලා සීලය ශ්‍රෙෂ්ඨ යයි නියමය”යි යනාදීන් සීලගුණයම ප්‍රශංසා කරන්නේ “දේවයන් වහන්ස, ලෝකයෙහි මෙවැනි ලාමක ආශිවිෂයෝ(සර්පයෝ) පවා අනුන් දෂ්ට නොකිරීමෙන් සිල්වත්යයි බොහෝදෙනා විසින් ප්‍රශංසා කටයුතු වන්නාහුය. මේ කාරණයෙනුත් සීලයම උතුම් වන්නේය, සීලයම ශ්‍රෙෂ්ඨ වන්නේය”යි ශීලාදී ගුණයට ප්‍රශංසා කරන්නේ මෙසේ කීය

“මහරජ මේ ලෝකයෙහි කයින්, වචනින්, මනසින් අව්‍යතික්‍රම සංඛ්‍යාත වූ(සමාදන් වූ ශික්‍ෂාපද නොකැඩීම නම් වූ) ආචාර සීලයම ශ්‍රෙෂ්ඨ වන්නේය, තවද මහරජ අඛණ්ඩාදී භාවයෙන්(නොබිඳුනුබව ආදියෙන්) රක්‍ෂා කරන ලද්දා වූ පඤ්චශීල, අෂ්ඨාඞගශීල, දසශීලාදී වූ සීලයම නිරුත්තර(අති උතුම්) වන්නේය, ශ්‍රෙෂ්ඨ වන්නේය. ඝොරවිෂ තේජස් ඇත්තා වූ ආශිවිෂයෝ පවා ‘දෂ්ට නොකිරීමෙන් හා අනුන්ට හිංසා නොකිරීමෙන් සිල්වතතුය’යි සත්පුරුෂයන් විසින් ප්‍රශංසාවට පැමිණියෝය”යි අතරමගදී තමා දුටු කාරණා අභිමුඛකොට දක්වා රජ්ජුරුවන්ට මෙසේ ධර්මදෙශනාකොට

වස්තුකාම(කම්සැප විඳිමට උපකාරීවන උපභොග වස්තු) ක්ලේශකාමයන්(එම වස්තු පරිහරණය කිරීම නිසා සිතේ පහලවන කෙලෙස් සිතුවිලි) හැර සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් (තවුස් පැවිදි ක්‍රමයෙන්) මහණව හිමාලය වනයට වැද පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා, චුති - ප්‍රතිසන්ධි වශයෙන්(මරණය හා යලි හටගැනීම වශයෙන්) බ්‍රහ්මලෝකය පරමප්‍රතිෂ්ඨා කළේයයි(බඹලොව ඉපදීම එකම අධිෂ්ඨානය කළේයයි) ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදෙශනාව ගෙනහැර දක්වා වදාරා පූර්වාපරසන්ධි ගළපා මේ 'සීලවිමංස ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි රජපිරිස් නම් දැන් බුදුපිරිස් වූවාය. එසමයෙහි පුරෝහිත බ්‍රාහ්මණයා නම් දැන් බුදු වූ මම්ම යැ"යි දක්වා වදාළසේක.

## 086. මඞගල ජාතකය

තවද එක් සමයෙක්හි සද්ධර්ම චක්‍රවර්ති වූ(මුළු සද්ධර්මයට ආධිපත්‍යය දරන්නා වූ) තිලෝගුරු බුදුරජාණන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසනසේක් එක් වස්ත්‍ර ලක්‍ෂණ දන්නා බ්‍රාහ්මණයෙකු අරභයා මේ ජාතකය වදාළසේක.

හේ කෙසේද? යත්,

රජගහ නුවර වසන්නා වූ එක්තරා බමුණෙක් දුටුදෙය ඇසූදෙය මගුලැයි ගන්නාලද ලබ්ධි ඇත්තේ බුද්ධාදී රත්නත්‍රයෙහි ලා අප්‍රසනනය, දෘඪමිථ්‍යාලබ්ධි(දැඩි වැරදි

ඇඳහීම්) ඇත්තේය. ඒතෙම රාජපාක්ෂිකය, බොහෝ සම්පත් ඇත්තේය, බොහෝසේ උපභොග පරිභොග ඇත්තේය(පරිහරණය කිරීම් සේවනය කිරීම් ඇත්තේය). තවද ඒ බ්‍රාහ්මණයාගේ සුමුගක්(පෙට්ටියක) තිබුණු අනඝී වූ පිළිසඟලක්(වටිනා ඇඳුම් කට්ටලයක්) මීයන් විසින් කන ලද්දේ විය. නැවත එක් දවසක් ඒ බ්‍රාහ්මණයා ඉස්සෝද නහා "අඳින පිළි ගෙණව"යි කී කල්හි ඔහුගේ අතවැසියෝ අඳිනා පිළිසඟල මීයන් කෑ නියාව ඕහට කීහ. බ්‍රාහ්මණතෙම එකල මෙසේ සිතුයේය "මීයන් කාපු මේ පිළිසඟලක් ගෙයි තිබුයේ වීනම් මහත් වූ විනාශයට පැමිණෙන්නේය, මේ පිළිසඟල ගෙයි තිබීම අවලක්ෂණය, අශ්‍රීකය, තවද මේ පිළිසඟල මාගේ ගෑණු පිරිමි දරු කෙනෙකුන්ට යොග්‍ය නොවන්නේය. දැසිදස් මෙහෙකරුවන්ට දෙන්ටත් නොනිසි වන්නේය. කුමක් නිසාද? යත්, යම්කිසි කෙනෙකුන්ට මේ පිළීසඟල දුනහොත් උන්ට මහවිනාශ වන්නේය. එවැනි පිළිසඟල අමුසොහොනෙක ලවාපියවම්"යි(දම්වමයි) සිතා නැවත මෙසේ සිතීය "දැසිදස් මෙහෙකරු කෙනෙකුන් අත යැවූයේ වීනම් ඔහු මේ වස්ත්‍රයෙහි ලා ලොභ උපදවාගෙන හැරගත්තෝවූ නම් මහත් වූ විනාශයට පැමිණෙන්නාහුය. එබැවින් පුතු අත යවා මේ වස්ත්‍රය දමවාපියම්"යි පුතු කැඳවා "තෝ මේ වස්ත්‍රය අතින් නොඅල්වා දණ්ඩකින් ඇරගෙන අමුසොහොනට ගෙනගොස් දමාපියා ඉස්සෝද නහා පිරිසිදුව එව"යි කියා යවුයේය.

තුන්ලොවට සිත ඇති වූ කරුණා නිධාන වූ(කරුණාව උපදින තැනක් බඳු වූ) සරණාගත වජ්‍රපඤ්ජර වූ(පිහිට

සොයා ආවුනට දියමන්තියෙන් සැදූ කූඩුවක් බඳු වූ) තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ අළුයම් වේලෙහි මහාකරුණා සමාපත්තියට සමවැද "අද දවස්හි කවර කෙනෙකුන් ස්වර්ගමොක්ෂ සම්පතෙහි පිහිටුවා පියම්දෝ"යි පූර්ව සර්වඥයන් වහන්සේ විෂයෙහි කෘතාධිකාර වූ(කරනලද ප්‍රාර්ථනා ඇති) මහපින් ඇතිවන්නා වූ බන්ධූන් බලා වදාරණසේක් මේ බමුණා හා දෙපුතුපියන් තමන් වහන්සේගේ අනාවරණඥාන ජාලයට (යමක් දැන ගැනීමේදි බාධක රහිතව එය දත හැකි නුවණ) ඇතුළත් වූ නියාව දැක "මේ දෙදෙනාට අද කවර අභිවෘද්ධියෙක්(යහපතක්) වේදෝ"යි බලා වදාරණසෙක් ශ්‍රොතාපත්ති මාර්ගයට පැමිණීමට හේතුසම්පත් ඇති නියාව දැක වදාරා මුවන් යන්නා වූ හසර නොහැර සිටිනා වූ මුව වැද්දෙකු පරිද්දෙන් අමුසොහොන් දොරට(ඉදිරියට) ගොසින් සවණක්ඝන රැස් විහිදුවමින් එක්තරා ස්ථානයෙක්හි වැඩහුන්සේක. ඉක්බිති මාණවකතෙමේ පියාගේ බස් මුදුනෙන් පිළිගෙන ගරවිල්කුණක්(ගැරඬිකුණක්) දණ්ඩකින් ඔසවාගෙන යන පරිද්දෙන් ඒ පිළිසඟල දඬු කෙළවරින් ඔසවාගෙන අමුසොහොන් දොරට ගෙනගොස් දමන්ට සිටියේය.

ඉක්බිති සර්වඥ රාජොත්තමයාණන් වහන්සේ ඔහුගේ ඒ ක්‍රියාව දැක වදාරා "මානවකය, තෝ කුමක් කරන්නෙහිදැ?"යි විචාරා වදාළසේක. ඒවේලෙහි මානවකයා බුදුන්ට දන්වන්නේ "භවත් ගෞතමයෙනි, මේ පිළිසඟල මීයන් විසින් කනලද, එසේ හෙයින් නිශ්‍රීකය(අසුභය), හලාහල විෂයක්(දරුණු විෂක්)

හා සමානය, එසේ හෙයින් මපියාණෝ මේ වස්ත්‍රයන් අමුසොහොනට දමන්නෝ අනිකක්හු අත යව්වෝතින් ඔහු මෙහි ලොභ උපදවාගෙන ඇර ගනිතියි සිතා මා අත එව්වෝය"යි කියා දැන්වීය. "එබැවින් මේ වස්ත්‍රය දමා ඉස්සෝද නහා ගෙටයෙමි"යි කීයේය.

ඔහු කී බස් අසා බුදුහු වදරණසේක් "එසේ වීනම් බ්‍රාහ්මණ මානවකය, තෙල පිළිසඟල දමා පියව"යි වදාළසේක. මානවකද ඒ පිළිසඟල අමුසොහොනෙහි දැමුයේය. එකල්හි ශාසතෲ වූ බුදුරජාණන් වහන්සේ "මෙබඳු දෙය අපට වටනේය"යි ඔහු බල බලා සිටියදීම ගෙන වදාළසේක. මානවකතෙම යුහුව(වහා) ගොසින් "භවත් ගෞතමයෙනි, මේ පිළිසඟල තොපට සුදුසු නොවෙයි, බොහෝ දෙනා විසින් අවලක්‍ෂණයයි කියනලද ඒ අශ්‍රීකය නොගනුව"යි වලක්ව වලක්වාම සිටියදී පිළි හැරගෙන වේළුවන මහවිහාරයට වැඩ වදාළසේක.

මානවක තෙම යුහුව ගොසින් තමාගේ පියාහට එපවත් කීයේය. එකල්හි බ්‍රාහ්මණතෙම මෙසේ සිතීය "ඒ වස්ත්‍රය වනාහි අවමංගල සම්මතය(අසුභ සම්මතය), අශ්‍රීකය, ඉදින් ශ්‍රමණ භවත් ගෞතමයෝ ඒ පිළියෙන් සිවුරුකොට ගෙන පෙරව්යෝ නම් මහත් වූ විනාශයට පැමිණෙන්නාහුය. උන් උන්නා වූ වේළුවනාරාමයත් නසින්නේය. එබැවින් අපට බොහෝ අයස්(අපකීර්තිය) උපදින්නාහයි, ශ්‍රමණ භවත් ගෞතමයන්ට අනිකුත් බොහෝ පිළි ගෙන්වාගෙන ගොසින්

සිවුරු පිණිස පිළිගන්වා උන් ඇරගත් අවලක්‍ෂණ වස්ත්‍රය උන්ලවා දම්මවා පියත් නම් යහපතැ"යි බොහෝ සිවුරු පිළි ගෙන්වාගෙන පුතා හා සමග වේළුවනාරාමයට ගොස් ශාසතෘ වූ බුදුරජාණන් වහන්සේ දැක නමස්කාර මාත්‍රයකුත් නොකොට එකත්පස්ව සිට මෙසේ විචාළේය.

"සැබෑද භවත් ගෞතමයෙනි, අමුසොහොනට දමා පියනලද අශ්‍රික වූ පිළිසඟලෙක් තොප විසින් ගෙනෙන ලද්දැ?"යි විචාළේය. "සැබෑය, බමුණැ"යි වදාළසේක. බමුණු කියන්නේ "භවත් ගෞතමයිනි, ඒ පිළිසඟල අවමඟුලැයි බොහෝ දෙනා විසින් දන්නා ලදී, ඉදින් තොපට ප්‍රයෝජනයක් වුණු නම් තොපට මහත් වූ විනාශ පැමිණෙයි සිතමි. තොප උන් වේළුවනාරාමයත් නස්නේය. ඉදින් තොපට අඳනා පොරෝනා සිවුරු මාත්‍රාවකුදු නොසෑහෙන්නේ වීනම් මා විසින් මේ දෙනලද බොහෝ වස්ත්‍රයන් ඇරගෙන නපුරු වස්ත්‍රයන් දමාපුව මැනවැ"යි කීයේය. එසේ කී බමුණාට බුදුහු වදාරණසේක් "බමුණු, අපවැනි තපස්විවරයන්ට අමුසොහොනකටවත්, ඇතුළු වීථියටවත්, කසළ ගොඩටවත්, නහන තොටටවත්, මහමඟටවත් මෙසේ වූ ස්ථානයෙහි හුණු දෙයක්වත් දමාපු දෙයක්වත්(දමන ලද්දක් වුවත්) ජීර්ණ(දිරූ) වස්ත්‍රයක්වත් වටනේය"යි වදාළසේක.

"එම්බල බ්‍රාහ්මණය, තා මෙබඳු මිථ්‍යාදෘෂ්ටියෙහි(වැරදි විශ්වාසයෙහි) පිහිටියේ දැන්මතු නොවෙයි, යටගිය දවසත් තෝ මෙබඳු ලබ්ධි ඇත්තේමය"යි වදරා ජාතක දේශනාවට

මුඛමාත්‍රයක්(ආරම්භ මාත්‍රයක්) දක්වා නිශ්ශබ්දව වැඩඋන්සේක. එකල්හි ඒ බ්‍රාහ්මණයා විසින් ආරාධිත වූ බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් ගෙනහැර දක්වා වදාළසේක.

ඒ කෙසේදැ? යත්,

යටගිය දවස මගධරට රජගහ නුවර ධාර්මික නම් මහරජජුරු කෙනෙක් දාන, ප්‍රියවචන, අර්ථචර්‍ය්‍යා, සමානාත්මතා යන සතර සංග්‍රහ වස්තුවෙන් ජනරංජනය කෙරෙමින්(ජනයා සතුටු කෙරෙමින්) රාජ්‍යය පරිපාලනය කරන්නාහුය. එසමයෙහි පුරණලද පාරමිතා ධර්‍මයන් ඇත්තා වූ අප මහබෝසතාණෝ එක්තරා ප්‍රසිද්ධ වූ බ්‍රාහ්මණ මහාසාර කුලයක ඉපිද වැඩිවිය පැමිණ පඤ්චකාමයෙහිලා(රූප ශබ්දාදී පස්කම් සැපයෙහි) ආදීනව දැක තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා හිමාලය වනයෙහි වාසය කරන්නෝ එක් සමයෙක්හි හිමාලය වනයෙන් නික්ම රජගහ නුවර රජ්ජුරුවන්ගේ මගුල් උයනට පැමිණ එහි වාසයකොට දෙවෙනි දවස් භික්ෂාචෘත්තිය (පිඬු සිඟීම) සඳහා ශාන්තර්‍ය්‍යා ප්‍රවෘත්තියෙන්(සන්සුන් පැවැත්මෙන්) ඇතුළු නුවරට සිඟා වන්හ.

මතුමහල් තලයෙහි සිටියා වූ රජ්ජුරුවෝ තාපසයන් දැක ප්‍රසන්නව මතුමහල් තලයට ගෙන්වාගෙන මාහැඟි අස්නෙක්හි වඩාහිඳුවා චතුමධුරයෙන්(ගිතෙල්, වෙඬරු, මී පැණි, උක් හකුරු යන සිවු මිහිරි රසයෙන්) වළඳවා තාපසයන්ගෙන් මධුර වූ බණ අසා සතුටු වූ සිත් ඇත්තා වූ රජ්ජුරුවෝ

මඟුල්උයන තාපසයන් වසන නියායෙන් ප්‍රතිඥා ඇරගෙන මහත් වූ උපස්ථාන කරන්නාහුය.

තාපසයෝද දවස දවස රජගෙයිදී වළඳා රජ්ජුරුවන්ගේ මඟුල් උයනෙහි ලා වාසය කෙරෙති. එසමයෙහි රජ්ජුරුවන්ගේ රජගහ නුවර 'දූෂ්‍යලක්‍ෂණ' නම් බ්‍රාහ්මණයෙක් විය. ඔහු සුමුගෙක තැබූ පිළිසඟලක් "මීයන් විසින් කපන ලද්දේදැ"යි යනාදීන් සියල්ලම පළමු දක්වනලද කථාන්තරය හා සමාන වන්නේය.

එකල මහබෝසතාණෝ පළමුව ගොස් සොහොන්දෙර එක්තරා ස්ථානයෙක්හිලා හිඳ ඒ බ්‍රාහ්මණයා විසින් දමනලද පිළිසඟල ඇරගෙන තමන් වසන්නා වූ උද්‍යාන භූමියට නැගී ගියහ. බ්‍රාහ්මණ මානවකයාද ගොසින් එපවත් පියාහට කීයේය. ඔවුන්ගේ පිය වූ මහබමුණු මෙසේ සිතූයේය "මේ රාජ කුළුපග වූ තාපසයෝ මෙබඳු කාරණයකින් නැසී ගියෝනම් නපුරැ"යි සිතා මහබෝසතාණන් කරා එළඹ "තාපසයෙනි, තොප ඇරගත්තා වූ තෙල අශ්‍රීක වූ පිළිසඟලක් ඇද්ද? ඒ දමා පියව"යි කීහ.

එකල්හි ඒ තාපසයෝ කියන්නාහු "එම්බල බමුණ, සුසාන භූමියෙක්හි දමන ලද්දා වූ ද මෙයින් අන්‍යස්ථානයෙක්හි(මෙබඳු වෙනත් තැනක) දමාපු දෙයෙක් ද අප වැනි තාපසයන්හට චීවරයන්ට යොග්‍යය"යි කීහ. "එම්බල බ්‍රාහ්මණය, දුටු දෙය ඇසූ දෙයම ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය වශයෙන් දන්නේය. අපි මඟුලැයි ගන්නමෝ නොවම්හ. මෙබඳු ලබ්ධිය බුඩ

ප්‍රත්‍යෙකබුද්ධාදී(බුදු පසේබුදු ආදී) උත්තමයන් විසින් ප්‍රශංසා කරන ලද්දේ නොවෙයි, එබැවින් නුවණැත්තවුන් විසින් මෙබඳු ලබ්ධි ගතයුතු නොවන්නේය"යි බමුණාට මිහිරි වූ ධර්‍මදෙශනාකොට අවවාද කළාහ.

බ්‍රාහ්මණතෙම තාපසයන් විසින් කියනලද ධර්‍මය අසා සතුටු සිත් ඇත්තේ තමාගේ මිථ්‍යාදෘෂ්ටිය හැර මහබෝසතාණන්ගේ සරණයෙහිලා පිහිටියේය. මහබෝසතාණෝද නොපිරිහුණා වූ ධ්‍යාන ඇතිව චූතිප්‍රතිසන්ධි(මැරී ඉපදීම්) වශයෙන් බ්‍රහ්මලෝකයෙහි පිළිසරණකොට උපන්නාහුය. දෙවාතිදෙව වූ ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ඉකුත්වත් කථා ගෙනහැර දක්වා වදරා බුදුව වැඩහිඳ බමුණාට "යස්ස මංගලා සමුහතො" යන ගාථාවකින් වදරණසේක් "එම්බල බ්‍රාහ්මණය, ක්‍ෂීණාශ්‍රවයෝ දෘෂ්ටි මංගලය, ශ්‍රැත මංගලය (දකිනදේ යහපත්ය අසනදේ යහපත්ය) යනාදී වූ චන්ද්‍රග්‍රහණ, සූර්‍ය්‍යග්‍රහණ, අසනිපාත, උල්කාපාත, වස්ත්‍රලක්‍ෂණ(අකුණු ගැසීම, තරු ගිලිහී වැටීම, වස්ත්‍රවල ස්වරූපය) ආයුධ ලක්‍ෂණ යනාදිවූ ඉෂ්ටානිෂ්ට (සුභ අසුභ) දෙක්හි මධ්‍යස්ථාකාරයෙන් පවත්නාහ"යි යනාදීන් මෙසේ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ නැවත චතුස්සත්‍යය ප්‍රකාශකොට ධර්‍මදේශනා පවත්වා වදාළසේක.

ධර්‍මදෙශනාවගේ කෙළවර මහබමුණු තමාගේ පුත්‍රයා හා සමග දහසක් නයින් ප්‍රතිමණ්ඩිත වූ(යුක්ත වූ) ශ්‍රොතපත්ති මාර්‍ගයට පැමිණ නිවන් දුටුසේක. ශාස්තෘ වූ බුදුරජාණන්

වහන්සේ මේ ජාතකය පූර්වකථාව හා අපරකථාව හා එක්ව සන්ධි ගළපා නිමවා වදාළසේක.

"එසමයෙහි ඒ බ්‍රාහ්මණයා හා දෙපුතුපියෝ දැන් මෙකලත් මේ බ්‍රාහ්මණයා හා දෙපුතුපියෝය, එසමයෙහි ඔවුන් සම්‍යක්දෘෂ්ටියෙහි පිහිටෙව්වා වූ තාපසෝ නම් දැන් සර්වඥපදප්‍රාප්ත වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 087. සාරම්භ ජාතකය

තවද එක් සමයෙක්හි ත්‍රෛලොක්‍ය ප්‍රදීපායමාන වූ(තුන්ලොවට පහනක් බඳු වූ) ගෝතම ගොත්‍රයෙහි උපන්නා වූ තිලෝගුරු සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ එක් සමයෙක්හි සැවැත් නුවර නිසා ජෙතවන මහවිහාරයෙහි වැඩවසනසේක් මුසාවාද ශික්ෂාපදය අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ කෙසේද? යතහොත්,

නාම ගොත්‍රයෙන් අප්‍රසිද්ධ වූ එක්තරා භික්ෂු කෙනෙකුන් වහන්සේ ලජ්ජා ප්‍රියශීලී වූ සෙසු භික්ෂුන් වහන්සේට ජාතිකුල ප්‍රදේශාදීන් ඝටා (ජාතිය, කුලය හා උපන් දේශය ආදියෙන් ගරහා) ආක්‍රොශ දෙඩවනසේක, බණිනසේක. එසේ උන්වහන්සේ කියන්නා වූ වචනය සෙසු සබ්‍රම්සරුන් වහන්සේ අසා එපවත් බුදුන්ට දැන් වූසේක. බුදුහු ඒ භික්ෂූන් වහන්සේ ගෙන්වා "සැබෑද? මහණ ලජ්ජා ප්‍රියශීලි භික්ෂූන්ට අක්‍රොෂ

පරිභව බණනෙහිදැ''යි විචාරා වදාළසේක. ඉක්බිති භික්ෂූන් වහන්සේ විසින්ම ''සැබැව ස්වාමීනි''යි දැන් වූ කල්හි ''එම්බල මහණ, පරුෂ වචනය නම් මනුෂ්‍යයන්ට තබා තිරිසනුන්ටත් අප්‍රිය දෙයකැ''යි වදාරා මේ ජාතක ධර්‍මදේශනාව දක්වා වදාළසේක.

මෙහි පූර්‍ව කථාව හා අපර කථාව 'නන්දිවිශාල ජාතකයෙහි' කී පරිද්දෙන් දන්නේය. මේ ජාතකයයෙහි වනාහී අප මහබෝසතාණෝ ගන්ධාර දේශයෙහි තක්සලා නුවර එක්තරා බමුණෙකුගේ නමින් 'සාරම්භ' නම් වෘෂභ රාජයෙක්ව උපන්නහයි සර්‍වඥයන් වහන්සේ මෙසේ ඉකුත්වත් ගෙනහැර දක්වා වදාරා ඒ භික්ෂූන් වහන්සේට ධර්‍මදේශනාකොට වදාරණසේක් ''එම්බල මහණ, ප්‍රිය වචනයන් සියල්ලන්ටම කියයුතුය. මුසාවාද, පිසුනාවාචා, ඵරුෂාවාචා, සම්ඵප්‍රලාපාදි වූ දුර්භාෂිත තෙපුල්(නරක වචන) කියන්නා වූ සත්‍වයෝ ඉහලෝකයෙහිත් පරලෝකයෙහිත් දෙකින්ම පශ්චාත්තාපයට(පසුතැවිලි වීමට) පැමිණ බොහෝ අනභිවෘද්ධියට පැමිණෙන්නාහුය''යි වදාරා අනේකාකාරයෙන් දුර්භාෂිත වචනයෙහි ආදීනව දක්වා ධර්‍මදේශනාකොට වදාළසේක.

''එසමයෙහි බ්‍රාහ්මණයා නම් දැන් මේ ධර්‍ම භාණ්ඩාගාරික ආනන්ද ස්ථවිරයෝය, එසමයෙහි බැමිණී නම් දැන් මෙකල්හි උපුල්වන් මෙහෙණීය, නමින් 'සාරම්භ' නම් වූ වෘෂභරාජ නම් දැන් බුදු වූ මම්ම වේදැ''යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 088. කුහක ජාතකය

තවද එක් සමයෙක්හි තුන්ලොවට චිතතාමාණික්‍යයක්(සිතූ පැතූ සම්පත් ලබාදෙන මැණිකක්) බඳු වූ අප තිලෝගුරු බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර නිසා ජෙතවන මහවිහාරයෙහි වැඩවසනසේක් කොහොන්(කුහක) තපස් රක්නා වූ එක්තරා භික්‍ෂුන් වහන්සේ කෙනෙක් අරභයා මේ ජාතකය වදාළසේක. මෙහිලා කුහක වස්තුව ‘උද්දාල’ ජාතකයෙහි කියන ලද්ද හා සමාන වන්නේය.

හේ කෙසේදැ? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි එක්තරා කුඩා ගමක් නිසා(කුඩා ගමක වාසය කරමින්) කොහොන් තපස් රකිනා එක්තරා ජටාධර තාපසයෙක් වසන්නේය. එක්තරා කෙළෙඹි පුත්‍රයෙක්ද ඔහු කෙරේ ප්‍රසන්නව වනයෙහි ඕහට පන්සලක් කරවාදී මධුර වූ අන්නපානාදියෙන්(ආහාර පානාදියෙන්) නිරන්තරයෙන් උපසඨාන කරන්නේය.

එකල්හි ඒ කෙළෙඹි පුත්‍රයා ඔහු “සිල් වතැ”යි සිතා සොරුන් කෙරෙහි භයින් රත්රන් නික් සියයක් (මසුරන් කලං 1500ක්) ඔහු වසන පන්සලට ගෙනගොස් එක් තැනක නිධානකොට “ස්වාමීනි, මේ බැලුව මැනවැ”යි කියා තාපසයන්ට භාරකොට ගියේය. එකල්හි තාපසයෝ තුමු “උපාසකයෙනි, භණ්ඩපටිසාම නම්(බඩු තැම්පත්කොට රැකීම

නම්) තපස්වීවරයන්ට කැප සරුප් නොවන්නේය. අනුන් සන්තක වසතුවෙහි අපට ලෝභය නූපදින්නේය''යි කීහ. කෙළෙඹි පුත්‍රයාද ''යහපත ස්වාමීනි''යි තාපසයන්ගේ ගුණයට ප්‍රශංසාකොට ඔහුගේ බස් අදහාගෙන නැගී ගියේය.

දුෂ්ට තාපසයෝද ''මෙපමණ වසතුවක් ලදහොත් රැකීම් ගතහෙමැ''යි(දිවිරැකගත හැකියයි) සිතා කීප දවසක් ඉක්මවාලා ඒ නිධානකොට තුබූ වසතු අරගෙන අතරමග එක්තරා ස්ථානයෙක්හි තබා නැවත අවුත් තමා වසන්නා වූ පන්සලම වාසයකොට දෙවෙන දවස් කෙළෙඹි පුත්‍රයගේ ගෙයි ආහාර කෘත්‍යය සපයා මෙසේ කීහ. ''උපාසකයෙනි, තොප නිසා අපි බොහෝ දවසක් මෙහි වාසය කළෝ වම්හ, එසේ හෙයින් බොහෝ දවසක් නික්මුණෝය, එකතැන බොහෝ කලක් වසන්නා වූ තපස්වීවරයන්ට මනුෂ්‍යයන් හා සංසගී(ඇසුරු කිරීම) දේෂ වන්නේය, ඒ සංසගීය වූකලී තපස්වීවරයන්ට කිලුටක් හා සමානය, එබැවින් උපාසකයෙනි, අපි අන්‍ය ස්ථානයකට යම්හ''යි කීයේය.

එකල්හි කෙළෙඹි පුත්‍රයා විසින් ''ස්වාමීනි, කිසිවකින් ප්‍රයෝජනයෙක් ඇත්නම් මට වදාළ මැනව, නොවැඩිය මැනවැ''යි කියා වලකන ලද්දු වූ තාපසතෙම උපාසකයන්ගේ බස් නොපිළිගත්තේය. කෙළෙඹි පුත්‍රයාද ''ස්වාමීනි, නොනවත්ව(නොනැවතී) වඩනා බැවින් ගොසින් වහ වහා වැඩිය මැනවැ''යි කියා ගම්දෙර දක්වා පසුගමන්කොට ගොසින් වැළැක්කේය.(නතර විය)

ජටාධර තාපසයෝද "මේ කෙළෙඹි පුත්‍රයාට වංචාවක් කෙළෙම් නම් යහපතයැ"යි සිතා ජටාඅතුරෙහි තණපතක් තබාගෙන ගොසින්ලා නැවත වැළැක්කාහුය(ආපසු ආවේය). ඉක්බිති කෙළෙඹි පුත්‍රයාද ජටාධරයන් දැක "කිමෙක්ද? ස්වාමීනි, ගිය ඇසිල්ලෙහිම වැඩිසේක්මැ"යි විචාළේය. "උපාසකයෙනි, තොපගේ ගෙන් පිටත්වෙන වේලෙහි අපගේ මේ ජටාවෙහි තණපතක් වැදගන රැඳිගියේය, එසේ හෙයින් අදත්තාදානය(සොරකම) නම් තපස්විවරයන්ට නොවටනේය. ඒ තණපත ඇරගෙන තොපගේ ගෙයි ලාපියන පිණිස ආමි"යි කියා කීයේය.

කෙළෙඹි පුත්‍රයාද "ස්වාමීනි, මෙච්තරකින් නුඹවහන්සේට කවර දෝෂයෙක්ද? ඒ ඇරදමාපියා වැඩිය මැනවැ"යි කියා "අනේ මාගේ තාපසයෝ ඉතා කුකුස්පර(සැකයෙන් යුතු) කෙනෙක, අනුන් සන්තක වස්තුවකිනුත් තණපතක් විතරකුත් ඇරගන්ට සිත කෙනෙක් නොවෙති"යි කියා තාපසයන්ගේ ගුණෙහි අතිශයින් ප්‍රසන්නව වැඳලා "වැඩිය මැනවැයි ස්වාමීනි"යි කීයේය. එකල්හි බඩු නිසා පසල්දනව්වට(පිටිසර ගමකට) යන්නා වූ බොධිසත්ත්වයන් විසින් එම ගෙයි නවාතැන් ගන්නා ලද්දේ විය. කෙළෙඹි පුත්‍රයා අතින් තාපසයන්ගේ බස් බොධිසත්ත්වයෝ අසාලාම "ඒකාන්තයෙන්ම මේ දුෂ්ට තාපසයන් විසින් මේ අඥාන කෙළෙඹි පුත්‍රයාගේ යම්කිසි ධනයෙක් වංචාවෙන් හැරගත්තේ වනැ"යි අනුමානයෙන් සිතා කෙළෙඹි පුත්‍රයා අතින් බොධිසත්ත්වයෝ විචාරන්නෝ "සැබෑද? මේ තාපසයන් කෙරෙහි තොප තුබූ වස්තුවෙක් ඇද්දැ"යි

විචාළෝය. “සැබෑව, යන්තම් වසතුවක්(සුළු වස්තුවක්) තිබීමි”යි කීහ. “කොපමණ ධනයෙක්දැ”යි විචාළ කල්හි “සබඳ, රත්රනින් නික් සියයක් පමණාය”යි කීය. “එසේ වීනම් ගොසින් පන්සල තුබූ වස්තුව ඇත්ද නැත්ද බලව”යි කියා කීයේය. කෙළෙඹි පුත්‍රයා ගොසින් තමා තුබූ ධනය පරීක්‍ෂාකොට “සබඳ, මා තුබූ තැන්හි නුදුටිමි”යි කීහ. බොධිසත්‍වයෝ කියන්නෝ “යහළු, තා තබාලූ වස්තුව ඇරගත් කෙනෙක් නැත, ඒ සොර තවුසා විසින් ඇර ගන්නාලද වන්නේය, අප දෙදෙනාම ගොසින් ඕහු අල්වාගෙන උග අත තුබූ වසතුව ඇර ගනුම්හ”යි කියා කීහ. “යහපතැ”යි දෙදෙනම එක්ව ඕහු කරා දිවගෙන ගොස් සොරකම් කළ තාපසයන් අල්වාගෙන අතින් පයින් තලා මරා ගහටකොට(පීඩා හා කරදරකොට) ජටාධරයා අතතුබූ වස්තුව ඇර ගත්තාහුය.

බොධිසත්‍වයෝද ඒ නික් සියයක රත්රන් දැක “මෙතෙක් වස්තුවෙහි කුකුස් නොකළ තොපි ජටාවෙහි වැදගත් තණපතෙහි කෙසේ කුකුස්දැ”යි නින්දාකොට “එම්බල අඥානය, මෙතැන් පටන්ගෙන එබන්දක් නොකරව”යි අවවාදකොට දිවිපමණින් දානාදී පින්කම් කෙරෙමින් තමන් කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ.

ශාසතෲ වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා වදාරා මේ ජාතකය පූර්‍වාපරසන්ධි ගළපා නිමවා වදාළසේක.

"එසමයෙහි කූට ජටාධරයා නම් මේ කොහොන් තපස් රකිනා භික්‍ෂුහුය. එසමයෙහි ප්‍රඥා සම්පන්න වූ සිටුපුත්‍රයා නම් දැන් සර්‍වඥපදප්‍රාප්ත වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 089. අකතපප්ඤ්ඤු ජාතකය

තවද ශාක්‍යකුලකල්පද්‍රැම වූ(ශක්‍යවංශයට කප්රුකක් බඳු) තිලෝගුරු සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර නිසා ජේතවනාරාමයෙහි වැඩවසනසේක් මේජාතකය අනේපිඬු මහසිටාණන් අරභයා වදාළසේක.

හේ කෙසේද? යත්,

අනේපිඬු මහාසිටාණන්ට පසල්දනවුවැසි එක්තරා සිටාණ කෙනෙක් අදෘෂ්ටමිත්‍රව(දැකීමක්වත් නොමැතිව මිත්‍රව්) වාසය කරන්නාහුය. එකල්හි ඒ පසල්දනව්වෙහි උපදනා බඩුයෙන් ගැල් පන්සියයක් බඩු පුරා තමන්ගේ කාරියෙහි නියුකත පුරුෂයන් කැඳවා "දරුවනි, තොපි හැමදෙන මේ ගැල් පන්සියයෙහි බඩු ගෙන්වාගෙන ගොස් සැවැත් නුවර අපගේ යාළු වූ අනේපිඬු මහසිටාණන් සම්මුඛයෙහි ගෙන ගියා වූ බඩු විකුට ඒ රටින් අපට උවමනා බඩුවක් ගෙන එව"යි විධාන කළාහ. ඒ පුරුෂයෝ සිටාණන්ගේ බස් ගිවිසගෙන බඩු ගෙන්වාගෙන සැවැත් නුවර අනේපිඬු මහසිටාණන් දැක ඒ බඩු හා පඬුරුත් දක්වා දී තමන් ආ පවතුත් සිටාණන්ට කීවාහුය.

මහසිටාණෝද ඔවුන් දැක "අප ලගට තොප හැම ආයේ ඉතා යහපතැ"යි කියා හිඳිනා නවාතැන් බත් වැටුප් ආදියද දෙව්වාහුය. "අපගේ මිත්‍ර වූ මහසිටාණන්ට සුවදුක් කිමදැ?"යි විචාරා සමීපයට එවූ බඩු පඬුරු විකුණවා මිළ පුරුෂයන්ට දෙව්වාහුය. පුරුෂයෝ තමන්ගේ පසල්දනව්වට ගොසින් ඒ කාරණය තමන්ගේ සිටාණන්ට කීවාහුය.

තවද මෑතභාගයෙහි එක් සමයෙක්හි අනේපිඬු මහසිටාණෝ බඩු පිරූ පන්සියයක් ගැල් පසල්දනව්වට යව්වාහුය. සිටාණන්ගේ මිනිස්සු පසල්දනව්වට ගොසින් තමන් ගෙනගිය පඬුරු පසල්දනව් වැසි සිටාණන්ට පෑ දූටහ. සිටාණෝද "තොපි හැම කොයි සිට අව්දැ?"යි විචාරා "සැවැත් නුවර නුඹවහන්සේගේ යහළු වූ අනේපිඬු සිටාණන් වහන්සේ ළඟ සිට ආම්හ"යි කීකල්හි "අනේපිඬු මහසිටාණෝයයි යන නමකුත් මිනිසුන්ට ඇද්දැ"යි අප හා සරිකොට කියා "තමන් යව් පඬුරුත් ඇරගෙන යහපත, තොපි නික්මෙවු"යි කීහ. ගිය පුරුෂයන්ට හිඳිනා තැනක්වත් බත් වැටුප් ආදියක්වත් විචාරා නුදුන්හ. එකල්හි ගිය පුරුෂයෝ තමන් ගෙනගිය පඬුරු තුමූම විකුට ඒ රටින් උවමනා පඬුරු ඇරගෙන සැවැත් නුවරට ගොසින් අනේපිඬු මහසිටාණන්ට එපවත් කීවාහුය. නැවත කලාතුරකින් පසල්දනව්වාසී සිටාණෝ ගැල් පන්සියයක් බඩු පුරවා සැවැත් නුවරට යව්වාහුය. ඒ පුරුෂයෝ තමන් ගෙනගිය පඬුරු ඇරගෙන අනේපිඬු මහසිටාණන්ට දුටහ. එකල්හි අනේපිඬු මහසිටාණන්ගේ මිනිස්සු මෙසේ කීහ "ස්වාමීනි, මේ ආ

සියල්ලවුන්ට හිඳිනා ගෙවල් බත් වැටුප් දීමත් අපට භාරය''යි කියා ඔවුන්ගේ ගැල් පිටිනුවර එක්තරා ස්ථානයක මුදවා ''තොපි හැමදෙනම මෙතැන්හි ඉඳුවයි, තොපි හැමදෙනම බත් බුලත් ආදී වූ සියල්ලම අපගෙන් ලැබෙන්නේය''යි කියා ඔවුන් විවරක් නොහැර(උන්සතු කිසිවකුත්) උදුරගෙන රථ අදිනා ගොන් ඒ ඒ තැන ලුහුබඳවා ගැලින් රථසක් ගලවා ගැල්පිට තබා ගැලසක් හැරගෙන ගියාහුය. ඒ පසල්දනව් වැස්සෝ තමතමන් හැඳිපෙරව් පිළි විවරක්(වස්ත්‍රවලට හෝ) අහිමිව මහත් වූ භයින් තැතිගෙන නොරඳා යුහුව නික්මුනාහුය.

අනේපිඬු මහසිටාණන්ගේ මිනිස්සු තමන් ඒ කළා වූ පවත් සිටාණන්ට කීවාහුය. සිටාණෝද එපවත් අසා ''සර්‍වඥයන් වහන්සේට දන්වන්ට සුදුසු වූ බස්පඬුරෙකැ''යි(කථා නැමති තෑග්ගක් යයි) සිතාගෙන සර්‍වඥයන් වහන්සේ සමීපයට ගොසින් ආදියෙහි(මුල) පටන්ගෙන තමන් කළ කටයුතු සහ පසල්දනව්වැසි සිටාණන් කළ දෙයත් සර්‍වඥයන් වහන්සේට දැන් වූවාහුය. එවේලෙහි බුදුහු වදාරණසේක් ''එම්බල ගෘහපතිය, පසල්දනව්වැසි සිටාණන් කෙළෙහිගුණ උපකාර නොදත්තේ දැන්මතු නොවෙයි, යටගිය දවසත් කෙළෙහිගුණ උපකාර නොදත්තෝමය''යි වදාරා සිටාණන් විසින් ආරාධිත වූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යතහොත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි පුරනලද බොධිසම්භාර

ඇති අප මහබෝසතාණන් වහන්සේ බරණැස මහා සම්පත් ඇත්තා වූ සිටුකුලයක උපන්නාහ. ඒ බොධිසත්‍වයන්ට අදෘෂ්ටමිත්‍රව වාසය කරන්නා වූ පසල්දනව්වැසි අනික් සිටාණකෙනෙක්ද වූවාහ''යි කියා ඒ සියළු ඉකුත්වත් කථාව වර්තමාන කථාව හා සදෘශ(සමාන) වන්නේය.

බොධිසත්‍වයෝ වනාහි තමාගේ මිනිසුන් ''අද මේ කටයුත්තක් අප විසින් කරනලදැ''යි කියා අවුත් තමන්ට කී කල්හි ''පළමුව අනුන් විසින් තමාට කළා වූ උපකාරයක් නොදන්නා වූ යම් සත්‍ව කෙනෙක් ඇත්නම් මෙබඳු විකාරයට පැමිණෙන්නාහුය''යි කියා සම්ප්‍රාප්ත වූ පර්ෂිදට ධර්‍මදේශනා කරන්නා වූ බොධිසත්‍වයෝ ''මේ ලෝකයෙහි ක්‍ෂත්‍රිය, බ්‍රාහ්මණාදී වූ යම්කිසි පුරුෂයෙක් අනුන් විසින් පළමුකොට තමා කරන ලද්ද වූ උපකාරයක් නොදන්නා වූ අඥාන පුරුෂතෙම කුදු මහත් යම්කිසි කටයුත්තක් තමාට පැමිණ ගියා වූ යම්කාලයෙක් ඇද්ද, එබඳු කාලයෙහි ඊට ප්‍රතිබලව සිටියා වූ අනික් සහායක්වත් නොලබන්නේය''යි යනාදී ධර්‍මදේශනාකොට තුමූ දිවිපමණින් දානාදී පින්කම්කොට තමාගේ කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ.

ශාසතෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ජාතක ධර්‍මදේශනාව ගෙනහැර දක්වා වදරා ජාතකය පූර්‍වාපරසන්‍ධි ගළපා නිමවා වදාළසේක.

''එකල්හි පසල්දනව්වැසි සිටාණෝ නම් දැන් මේ පසල්දනව්වැසි සිටාණෝය, බරණැස් නුවර සිටාණෝ නම් මේ

සර්වඥපදප්‍රාප්ත වූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 090. ලිත්ත ජාතකය

තවද එක් සමයෙක්හි ගෞතම ගොත්‍රයෙහි උපන්නා වූ අපගේ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර නිසා දෙව්රම් වෙහෙර වැඩවසනසේක් මේ ජාතකය චීවරාදී වූ චතුර්විධ ප්‍රත්‍යය(සිවුරු ආදී සිවුපසය) ලදින් නොපස්විකා(දායකයන්ගෙන් ලැබුණු සිවුපසය මා ප්‍රයොජන ගන්නේ හුදෙක් දිවි රැකගෙන මහණදම් පිරීමටම පමණකැයි මෙනෙහි නොකොට) වළඳන්නා වූ පෘථග්ජන භික්ෂූන් වහන්සේ අරභයා වදාළසේක.

ඒ කෙසේදැ? යතහොත්,

එක් සමයෙක්හි බොහෝ භික්ෂූන් වහන්සේ බොහෝ චීවරාදී චතුර්විධ ප්‍රත්‍යය ලදින් බොහෝසේම නොපස්විකා වළඳනසේක. එසේ නොපස්විකා චීවරාදී ප්‍රත්‍යය ප්‍රයෝජන විඳිනා බොහෝ භික්ෂූන් වහන්සේ බොහෝ නිරා(අපා) දුකින් හෝ තිරිසන් අපායෙහි හෝ ප්‍රෙතාත්මභාවයෙහි හෝ ඉපිද නොමිදෙනසේක.

ශාසතෘ වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ මේ කාරණාව දිවසින් දැක වදාරා භික්ෂූන් වහන්සේට අනේකාකාරයෙන් නොපස්විකා වැළඳිමෙහි ආදීනව(දොස්) දක්වා වදාරා බණ වදාරණසේක් “මහණෙනි, මේ ප්‍රියශීලි(සසුන් ළැදි) භික්ෂූන්

විසින් චතුර්විධ ප්‍රත්‍යය ලදින් නොපස්විකා වැළඳිම නොකටුයුතු වන්නේය, එසේ හෙයින් මෙතැන් පටන්ගෙන මහණෙනි, පස්විකා වළඳව”යි වදරා ප්‍රත්‍යවේක්ෂා කරන්නා වූ ක්‍රම දක්වනසේක් “මහණෙනි, මාගේ ශාසනයෙහි යම් භික්‍ෂු කෙනෙක් තෙම ‘සීතස්ස පටිඝාතාය’ (සීතලෙන් වැළකීම සඳහා සිවුරු පොරවම්)”යි යනාදීන් ඒ ඒ ප්‍රත්‍යයට සුදුසු පරිද්දෙන් ප්‍රත්‍යවේක්ෂා පාලිය(පාඨය) වදරා “මහණෙනි, මෙපරිද්දෙන් චීවරාදී චතුර්විධ ප්‍රත්‍යය ලදින් පස්විකා වැළඳිම සුදුසු වන්නේය”යි වදරා “එම්බා මහණෙනි, මේ නොපස්විකා වැළඳිම නම් උග්‍රවිෂයක් අනුභව කරන්නා හා සමාන වන්නේය. අනුභව කිරීමෙහි ආදීනව නොදන්නා වූ පුරාතනයෙහි කිසි සත්ව කෙනෙක් විෂ අනුභවකොට අවසන්හි බොහෝ දුකට පැමිණියාහ”යි වදරා අරාධිත වූ බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

හේ කෙසේද? යතහොත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි පුරනලද පාරමිතා ඇති අප මහබෝසතාණෝ එක්තරා මහාසම්පත් ඇති කුලයක ඉපද වැඩිවිය පැමිණ දූකෙළියෙහි ලොභ ඇතිව අක්‍ෂධූර්තව(සූදු කෙළියෙහි යෙදී) වසන්නාහුය.

තවද එසමයෙහි වංචාවෙන් දූ කෙළ අනුන් පරදවන්නා වූ අක්‍ෂධූර්තයෙක්ද(සූදු කෙළින්නෙක්ද) විය. එකල්හි සොරනු අක්‍ෂධූර්ත නොව බොධිසත්වයන් හා සමඟ දූ කෙළිනේ තමා

දිනන කල්හි කෙළිමඩුල්ල නොබිඳිනේය(ක්‍රීඩක පිරිස විසුරුවා නොදමයි). තමා පරදිනා කල්හි පසඇට(දාදු කැට) මුඛයට දමා "පසඇට අපවත්ව ගියේය"යි(නැතිවීයයි) කෙළිමඩුල්ල බිඳ නැගී යන්නේය. බොධිසත්‍වයෝ ඔහුගේ කාරණය දැන "යහපත ඊට සුදුස්සක් කෙරෙමි" සිතාගෙන පසඇට ඇරගෙන තමන්ගේ ගෙයිදී විෂයෙන් පසඇට දෙතුන්වැනිව රඳවාගෙන(දෙතුන් විටක් පොගවාගෙන) නැවත නැවත විෂ පෙවූ පසඇට ගෙන ධූර්තයා සමීපයට ගොසින් "සබඳ දූ කෙළිම්හ"යි කියා කීහ. ධූර්තයා "යහපතැ"යි කියා කෙළිමඩුල්ල සරහා ඔහු හා සමග කෙළිනේ තමා පරදින අවසථාවෙහි එයින් එක් පසඇටක් ඇරගෙන මුඛයට දමන නියාව දැක "යහපත යහළු තෙපි ගැළපියව(ගිලින්න) මතු මින් මෙසේ වූ දෙයක් වෙයි කියා දැනගනුව"යි මතුවන ආදීනව දක්වන්නේය. "යහළු, තෙපි දැන් වංචාවෙන් පසඇට ගළතත්(ගිල්ලත්) උග්‍ර විෂයෙන් රැඳුබව (පෙඟවූ බව) හේතුකොටගෙන අවසන්හි බලවත් වූ දුක් වේදනාවට පැමිණෙන්නෙහිය"යි බොධිසත්‍වයන් මෙසේ කියා උන්කලට ධූර්තයා තම විෂයෙන් මූර්ජාවෙමින්(සිහිමුළා වෙමින්) ඇස්දෙක පෙරළා කරටිය(බෙල්ල) නමාගෙන වැටී හුණුයේය.

බොධිසත්‍වයෝ වනාහි "මා නිදුක්නු නිසා(මා නිදුකින් ජීවත්වන නිසා) මෙවැනි අඥානයෙකු නැසයාම(මියයාම) සුදුසු නොවන්නේය. මෝහට මා ජීවිතදානය දීම වටනේය"යි සිතා ඖෂධයෙන් පරිභාවිතා කරනලද(ඖෂධ වර්ග යොදා පිළියෙල කරනලද) බෙහෙත් යොගයෙන් ඔහු අනුභව කරවා විෂය

වමනය කරවා නිරෝගිකොට "මතු මෙබන්දක් නොකරව"යි අවවාද කියා දිවි පමණින් දන්දී පින්කම් කෙරෙමින් තමන්ගේ කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ.

ශාසතෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා වදරා "එම්බා මහණෙනි, නොපස්විකා වළඳන චතුර්විධ ප්‍රත්‍යය නම් විෂ අනුභව කිරීමක් හා සදෘශය"යි වදරා මේ ජාතකය පූර්‍වාපරසන්ධි ගළපා වදාළසේක.

"එකල්හි ප්‍රඥාසම්පන්න අඤ්ඤාතියානෝ නම් දැන් බුදු වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 091. මහාසාර ජාතකය

තවද එක් සමයෙක්හි මුළු ලොවට උතුම් වූ රූපකායසම්පත්තියෙන් හා ධර්‍මකාය සම්පත්තියෙන් යුක්තව දසබල(කායබල ආදී වූ දසවැදෑරුම් බල) චතුර් වෛශාරද්‍යාදී වූ(සියල්ල දත් බව, කෙළෙසුන් දුරුකළ බව, පිරිසිදු දහම් දත් බව, අනතුරු සිදුකරන දහම් දත් බව ආදී වූ) ගුණයෙන් විරාජමාන වූ (බබලන්නා වූ) අප තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර නිසා(සමීපයෙහි වූ) දෙව්රම් වෙහෙර වැඩවසනසේක් මේ 'මහාසාර ජාතකය' ආයුෂ්මත් වූ අනඳ මහතෙරුන් වහන්සේ අරභයා වදාළසේක.

ඒ කෙසේද? යතහොත්,

එක් සමයෙක්හි කොසොල් රජ්ජුරුවන්ගේ පුරසත්‍රීහු මෙසේ සිතුවාහ. "බුද්ධොත්පාද කාලය (බුදුවරයකු ලොව පහළවන

කාලය) නම් ඉතා නොලද හැක්කේය(ලැබීම අසීරුය). මනුෂ්‍යාත්මභාවයද එසේ ලද නොහැක්කේය. චක්ෂුරාදී පඤ්චේන්ද්‍රියන්ගේ සම්පූර්ණතාවය ලැබගැන්මත් එසේම දුර්ලභ වන්නේය. අපිද මෙබඳු වූ බුද්ධොත්පාදය හා ක්ෂණසම්පත්තියත්(බුදුවරයකු ලොව පහළවන කාලයෙහි ඉන්ද්‍රියන්ගේ සම්පූර්ණව මිනිසකුව ඉපදීමත් ලැබගෙන අපගේ අභිප්‍රායෙන්(කැමැත්තෙන්) දෙව්රම් වෙහෙරට ගොස් බුදුන්ගේ මධුර වූ ධර්ම දේශනා අසන්ට හෝ වේවයි දන්දෙන්ට හෝ වේවයි නොලබම්හ, මැදිරියෙක(කුඩුවක) ලූවන් මෙන් වාසය කරම්හ, මහරජ්ජුරුවන් වහන්සේට දක්වා අපට බණ කියන්ට සුදුසු භික්ෂු කෙනෙකුන් වහන්සේ ගෙන්වාගෙන උන්වහන්සේ සමීපයෙහි ධර්මය අසාම ඒ පාලි ධර්මයෙන් යම් යම් විවරක් ඉගෙණගතමෝ නම් එබඳු ධර්මයකුත් ඉගෙණ ගනුම්හ, දනාදී වූ පින්කමුත් කොට ගණුම්හ. එසේ කල්හි මේ ක්ෂණසම්පත්තිය අපට ඵල වන්නේය”යි ඔහු හැමදෙනම රජ්ජුරුවන් සමීපයට ගොසින් තමන් හැම සිතූ කාරණය රජ්ජුරුවන්ට දැන්නුවාහුය. රජ්ජුරුවෝ එබස් අසා “යහපතැ”යි ගිවිස්වාහුය.

නැවත එක් දවසක් රජ්ජුරුවෝ උයන් කෙළිනා කැමැත්තෝ උයන්පාලකයා ගෙන්වා “උයනෙහි මිනිස් කෙනෙකුන් ඇත්ද නැත්ද පරීක්ෂාකොට එව”යි නියෝග කළ කල්හි උද්‍යානපාලකතෙමේ උයනේ මිනිසුන් ඇත්ද නැත්ද පරීක්ෂාකොට ඇවිදිනේ එක්තරා රුකක් මුල සර්වඥයන් වහන්සේ වැඩඋන් නියාව දැක රජ්ජුරුවන් සමීපයට උද්‍යානපාලතෙමේ ගොස් “දේවයන්වහන්ස, උයනේ අන්

කිසිවෙකුත් නැත. තවද සම්මා සම්බුදුරජාණන් වහන්සේ එක්තරා රුකක් මුල වැඩඋන්සෙක්යැ”යි කීයේය. “යහපතැ”යි කෝසල රජ්ජුරුවෝ “සර්‍වඥයන් වහන්සේ සමීපයෙහිදී බණත් අසා ගණුම්හ”යි සරහා පිළියෙල කරනලද උතුම් වූ රථවාහනයකට නැගී සර්‍වඥයන් වහන්සේ සමීපයට ගියාහ.

එසමයෙහි ‘ඡත්තපාණී’ නම් අනාගාමී උපාසකයෙක් සර්‍වඥයන් වහන්සේ සමීපයෙහි බණ අසමින් උන්නාහුය. එසේ බණ අසමින් උන් උපාසකයන් රජ්ජුරුවෝ දැක “කිමෙක් දෝ හෝ”යි සංකාවෙන් මඳ වේලාවක් බලා සිට නැවත මෙසේ සිතූහ. ඉදින් මේ ලාමක(නින්දිත) පුරුෂයෙක් වීනම් සර්‍වඥයන් සමීපයෙහි ඉඳ බණ නොඅසන්නේය. මොහු අලාමක පුරුෂයෙක්හුම විය යුතුය”යි සිතින් සිතා සර්‍වඥයන් වහන්සේ කරා එළඹ පසග පිහිටුවා වැඳ එකත්පස්ව හුන්හ.

උපාසකයෝද බුද්ධ ගෞරවයෙන් රජ්ජුරුවන් දැක නැගී සිටීමක්වත් වැඳීමක්වත් නොකළාහ. ඒ කාරණයෙන් රජ්ජුරුවෝ ඔහු කෙරෙහි නොසතුටු සිත් ඇතිවූහ. ශාසතෘ වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ රජ්ජුරුවන්ගේ සිත අසන්තුෂ්ට නියාව(නොසතුටු බව) දැන වදරා උපාසකයන්ගේ ගුණ රජ්ජුරුවන්ට වදාළසේක. “මේ උපාසකයෝ බොහෝ ඇසූපිරූතැන් ඇත්තෝය, අනාගාමී මාර්‍ගඵලයෙහි පිහිටි කෙනෙක, වස්තුකාම ක්ලෙශකාමයෙහි අලග්න(වස්තු ආසාව නිසා සිතේ ඇතිවන කෙලෙස් සිතුවිලිවල නොඇලුණු) සිත් ඇති වූ බලවත් වූ උපාසක කෙනෙකැ”යි වදාළසේක.

රජ්ජුරුවෝ සිතන්නෝ "මේ පුරුෂතෙම ලාමක එකෙක් නොවන්නේය, මොහුගේ ගුණ බුදුහු පවා වර්ණනා කළසේකැ"යි සිතින් සිතා උපාසකයන්ට මෙසේ කීහ. "උපාසකයෙනි, තොපට යම්කිසි වස්තුවකින් ප්‍රයෝජනයක් ඇත්තේ වීනම් ඒ අපට කියව"යි කියා කීහ. උපාසකයෝද "යහපත ස්වාමීනි" පිළිගත්තාහුය. රජ්ජුරුවෝ ද සර්වඥයන් වහන්සේගෙන් මධුර වූ ධර්මදෙශනාව අසා වැඳ තුන්යලක්(තුන් විටක්) පැදකුණුකොට රජගෙට නැගී ගියහ.

තවද එක් දවසක් කොසොල් රජ්ජුරුවෝ තමන් වසන මතුමහල් තලයෙහි සිවුමැදුරු කවුළුව හැර ඇතුළුවීථිය බලා සිටියෝ පෙරවරු බත් අනුභවකොට පත් කුඩයක්(තල් අතු කුඩයක්) ඉසට කොටගෙන රජ්ජුරුවන්ගේ මාලිගාව සමීපයෙන් දෙව්රම් වෙහෙරට යන්නා වූ ඡත්තපාණි නම් උපාසකයා දැක රාජපුරුෂයන් යවා ගෙන්වාගෙන මෙසේ කීහ. "උපාසකයෙනි, තෙපි බොහෝ ඇසූපිරූතැන් ඇති හෙයින්(බොහෝ කරුණු කාරණා අසා දැන පුරුදු හෙයින්) බහුශ්‍රැතය, අපගේ පුරස්ත්‍රීහු බණ අසන්නා කැමැත්තෝය. පාලි ධර්මයෙන් කිසිවක් ප්‍රගුණකොට ගන්නා කැමැත්තාහු වෙති. ඉදින් තෙපි පුරස්ත්‍රීන්ට බණ කියා පාලි ධර්මයන් ප්‍රගුණ කරවා ලියහෙවු නම් යහපතැ"යි කීහ. උපාසකයෝ කියන්නාහු "මහරජ, ගිහිගෙයි සිටි කෙනෙකුන් විසින් පුරගෙවල බණ කියන්ට හෝ වේවයි බණ උගන්වන්ට හෝ වේවයි සුදුසු නොවන්නේය. භික්ෂූන් වහන්සේටම ඒ කටයුත්ත සුදුසුය"යි කීහ. එකල්හි රජ්ජුරුවෝද උපාසකයන් කී බස් ගිවිස

"යහපත, තෙපි යව"යි උපාසකයන් නික්මවා පුරස්ත්‍රීන් ගෙන්වාගෙන "භද්‍රාවෙනි, තොපි හැමදෙනාටම බණ කියනු පිණිස, ධර්‍මය උගන්වනු පිණිස සර්‍වඥයන් වහන්සේ සමීපයට ගොසින් එක් භික්ෂු කෙනෙකුන් වහන්සේ ඉල්ලම්, අසූ මහසව්වන් වහන්සේගෙන් කවර කෙනෙකුන් වහන්සේට ආරාධනා කෙරෙම්දැ"යි කියා විචාළහ.

ඔහු හැමදෙන එක්ව කථාකොට "ධර්‍ම භාණ්ඩාරික අනඳ මහතෙරුන් වහන්සේම කැමතිය"යි කීහ. රජ්ජුරුවෝ සර්‍වඥයන් වහන්සේ සමීපයට ගොස් වැඳ එකත්පස්ව උන්නා වූ බුදුන්ට මෙසේ දැන්වූහ "ස්වාමීනි, අපගේ පුරස්ත්‍රීහු අනඳ මහතෙරුන් වහන්සේ සමීපයෙහි ධර්‍මය අසන්ටද ඉගණීමයද කැමති වන්නාහුය, ඉදින් අනඳ මහතෙරුන් වහන්සේ දවස දවස රජගෙට වැඩ අපගේ අනතඃපුර වාසීන්ට බණ වදරා උන්ගේ ශක්ති පමණින් පාලි ධර්‍මයන් වනපොත්(කටපාඩම්) කරවා වඩිනාසේක් වීනම් යහපතැ"යි කියා දැන්වූහ.

බුදුහු "යහපත මහරජ"යි රජ්ජුරුවන් කී බස් පිළිගෙන එපරිද්දෙන්ම අනඳ මහතෙරුන් වහන්සේට නියෝගකොට වදාළසේක. එතැන් පටන්ගෙන රජ්ජුරුවන්ගේ පුරස්ත්‍රීහු අනඳ මහතෙරුන් වහන්සේ සමීපයෙහි බණ අසන්නාහුද, වනපොත් කරන්නාහුද වෙත්.

එසමයෙහි එක් දවසක් රජ්ජුරුවන් පලඳනා වූ චූඩාමාණික්‍යය(හිසෙහි පළඳනා මැණික) සොරුන් විසින් ගන්නා ලද්දේ වන්නේය. රජ්ජුරුවෝ ඒ මැණික සොරුන්

විසින් ගත්බව අසා අමාත්‍යයන්ට මෙසේ නියෝග කළහ. “රජගෙයි සියළු අභ්‍යන්තර ජනයාම අල්වාගෙන තොප දන්නා නියායකින් මැණික පවත් කරවා දෙව”යි(සොයා දෙවයි) විධාන කළහ.

එබස් ඇසූ අමාත්‍යයෝ රාජභවනයෙහි අභ්‍යන්තර ස්ත්‍රීන් ආදිකොට ඇති සියල්ලන් අතින් “මැණික තොප ගතුදැ”යි විචාරා බොහෝ ජනයාහට පීඩා කරන්නාහුය. එදවස් අනඳ මහතෙරුන් වහන්සේ යම් මේ ස්ත්‍රීහු පළමු, තෙරුන්වහන්සේ දැක තුටු පහටුව(ඉතා සතුටුව) බණ අසන්නාහු වෙත්ද, පාලි ධර්මය පුහුණු කරන්නාහු වෙත්ද, එලෙස නොව වික්‍ෂෙපයට පැමිණියා වූ සියල්ලවුන්ම දැක මෙසේ විචාරා වදාළසේක “අද කවර කාරණයකින් තෙපි හැමදෙනාම මෙබඳු වික්‍ෂෙපයට පැමිණියාදැ”යි විචාරා වදාළසේක.

එකල්හි ස්ත්‍රීහු මහතෙරුන් වහන්සේට මෙසේ කීහ “ස්වාමීනි, රජ්ජුරුවන් වහන්සේගේ චූඩාමාණික්‍යය අපවත්ව(නැතිව්) ගිය හෙයින් පවත් කරම්හයි කියා අමාත්‍යයෝ වල්ලභ ස්ත්‍රීන් පටන් ඇතුළුගෙයි බොහෝ ජනයාට පීඩා කරන්නාහුය. කාට කුමක් වේද යන බවක් නොදන්නා හෙයින් විකෂෙපව සිටිම්හ”යි කීහ. මහතෙරුන් වහන්සේද “තෙපි හැම ඊට සෝක නොකරව”යි ඒ පුරස්ත්‍රීන් හැමදෙනම අස්වසා රජ්ජුරුවන් සමීපයට වැඩ පණවනලද ආසනයෙහිලා වැඩඋන්සේක. “මහරජ, තොපගේ

චූඩාමාණික්‍යය සොරුන් විසින් ගන්නාලද්දැ''යි විචාළසේක. ''එසේය ස්වාමීනි'' කියා කීය.

ඉක්බිත්තෙන් තෙරුන්වහන්සේ වදාරණසේක් ''මහරජ, මැණික පවත් කරවාගන්ට(සොයා ගන්නට) නොපොහොසත්තුදැ''යි වදාළසේක. ''ස්වාමීනි, රජගෙයි අභ්‍යන්තරව හිඳිනා ස්ත්‍රීන් පටන් සියල්ලවුන්ම අල්වාගෙන ගහටකොට විචාරත් මැණික පවත් කරවාගන්ට නොපිළිවන් වීය''යි කීහ. තෙරුන්වහන්සේ වදාරණසේක් ''මහරජ, බොහෝ දෙනාට පීඩා නොකොට මැණික ඇරගන්ට උපායෙක් ඇතැ''යි වදාළසේක. ''ස්වාමීනි, කවර උපායෙක්දැ''යි විචාළහ. ''පිදුරු ඇදීමෙන් මහරජ''යි වදාළසේක. ''ස්වාමීනි, කවර පිදුරු ඇදීමෙක්දැ''යි විචාළහ. ''මහරජ, යම්පමණ ජනයා කෙරේ සැක ඇත්නම් ඒ ඇමදෙනම ගණන්කොට එකී එකී කෙනෙකුන් අතට එකී එකී පිදුරු කැටියක් හෝ මැටි පිඩක් දී මේ උදසන්හිම අසෝතැන(අසවල් තැන) ලා පියවයි කියයුතු වන්නේය, යමක්හු විසින් මැණික ගන්නා ලද්දේ වීනම් ඒ තමා ඇරගත් මැණික පිදුරු, මැටි ආදියෙහි නොපෙණෙන පරිද්දෙන් වසාගෙන අවුත් දමා පියන්නේය, මහරජ, මෙසේ කළ කල්හි ඉදින් පළමු දවස්ම මැණික ලාපු නම්(ගෙනවිත් දැමුවොත්) යහපත්මය, ඉදින් නුළුවෝ නම්(නොදැමුවහොත්) දෙවෙනි දවසුත් තුන්වෙනි දවසුත් එසේම කරවිය යුතු වන්නේය, එසේ කල්හි බොහෝ දෙනාට පීඩා නොවන්නේය. මැණිකද පවත්නේය''යි වදාළසේක.

තෙරුන්වහන්සේ රජ්ජුරුවන්ට මෙසේ කියා විහාරයට වැඩිසේක. රජ්ජුරුවෝද තෙරුන්වහන්සේ වදාළ පරිද්දෙන්ම තුන්දවසක් මෙම ක්‍රමයෙන්ම කරවූවාහුය. රජ්ජුරුවන් මෙසේ නොයෙක් සැටියෙන් උත්සාහ කළ නමුත් සොරු තමන් ඇරගත් මැණික නුදුන්නාහුය.

තෙරුන්වහන්සේ තුන්වෙනි දවස් රජගෙට වැඩ "කිමෙක්ද? මහරජ, මැණික ලදුදැ"යි විචාළසේක. "ස්වාමීනි, සොරු මැණික අපට නුළුහ"යි කීහ. "එසේ වීනම් මහරජ, මතුමහල් තලයෙහි පිළිසන්තන්හි (රහසිගත තැනක) දියසැළක් තබ්බවා වට තිරයක් මුවා කරවා රජගෙහි අභ්‍යන්තරයෙහි සියළු ස්ත්‍රීන්ටද කුදුන් කුරීන්(කොරුන්) රැකවලුන්ද(ආරක්‍ෂකයින්ද) ආදී වූ සියළු පුරුෂයන් උතුරු සළුවකින් පොරවාගෙන අවුත් ඒ දියසැළ බලා එන්ට නියෝග කරව"යි කීයේය. ඒ භාණ්ඩාගාරික අනඳ මහතෙරුන් වහන්සේම මේ අධිකරණය තමන්වහන්සේට භාරකොට ගත්සේක. ඒකාන්තයෙන් මැණික පවත් කරවා විනා නොවළකිනාසේක. ඒ තමා ගෙන හිඳිම කාරණා(සුදුසු) නොවන්නේය. මෙවිට "මේ මැණික ගෙනගොස් රජගෙයි ලා පියව"යි සිතා සොරු දියසැළෙහි මැණික ලූයේය. "මැණික ලබන ලදැ"යි සතුටු වූ රජගෙයි සියළු ස්ත්‍රී පුරුෂයෝද "තෙරුන්වහන්සේ නිසා මෙවැනි මහදුකින් මිදී ගියෙම්හ"යි කියා සතුටු වූහ. "තෙරුන්වහන්සේගේ ආනුභාවයෙන් රජ්ජුරුවන් වහන්සේගේ චූඩාමාණික්‍යය පැවැත් වූයේය"යි කියා තෙරුන්වහන්සේගේ ප්‍රඥානුභාවය සියලු නුවරද භික්‍ෂුසංඝයා වහන්සේ කෙරෙහිද ප්‍රසිද්ධ වූයේය.

එකල්හි දම්සභා මණ්ඩපයෙහි රැස්ව උන්නා වූ සීල, සමාධි, ප්‍රඥා, විමුක්තිඥාන දර්‍ශනාදියෙන් යුක්ත වූ මහකාශ්‍යප ස්ථවිරයන් ප්‍රධාන වූ භික්‍ෂුසංඝයා වහන්සේ තෙරුන්වහන්සේගේ ගුණකථනය කෙරෙමින් වැඩඋන්සේක. "ඇවැත්නි, අනඳ මහතෙරහු තමන්ගේ බහුශ්‍රැතභාවය හේතුකොටගෙන පණ්ඩිත ස්වභාවයෙන් උපායෙහි තමන් දක්‍ෂ හෙයින් බොහෝ දෙනාට පීඩානොකොටම උපාය ශක්තියෙන් රජ්ජුරුවන්ට මැණික ඇරගෙන දෙව්හ"යි කියා මෙවෙනි කථාවෙන් උපලක්‍ෂිතව(යුතුව) වැඩ උන් කල්හි සුරාසුර වර චක්‍රවාරු චූඩාමාණික්‍ය මරීචිසඤ්චය පරිචුම්බිත චරණ නඛ මයූඛ ඇති(දිව්‍ය අසුර සමූහයාගේ හිසෙහි වූ ඔටුනුවල මුදුන් මැණික් රශ්මි සමූහය වැලඳගත් පාදයන්හි නියරැස් ඇති, දිව්‍ය අසුර සමූහයාගේ ඔටුනු සහිත හිසින් පිදුම්ලද දෙපා ඇති) ත්‍රිලෝක ස්වාමී වූ(තුන්ලොවටම නායක වූ) ත්‍රිලෝගුරු (තුන්ලොවටම ගුරු වූ) බුදුරජාණන් වහන්සේ ශ්‍රී ගන්ධකුටියෙහි වැඩහිඳ දිව්‍යශ්‍රොත ධාතුවෙන්(දිව්‍ය කනින්) ඒ භික්‍ෂූන් වහන්සේ කියමින් උන් කථා ප්‍රබන්ධය(කථා ප්‍රවෘත්තිය) අසා වදරා "මේ භික්‍ෂූහු අනඳ ස්ථවිරයන්ගේ ගුණ කථනය කෙරෙමින් උන්නාහ. එතනට ගිය කල්හි තමන් කියමින් උන් කථා මට කියන්නාහුය. මෙය අර්ථොත්පත්තිකොට(නිදානයකොට) ගෙන සම්ප්‍රාප්ත(පැමිණි) පිරිසටද ධර්‍මදෙශනා කෙරෙමින් ඒ මාගේ දෙශනාව ඇසූ සත්ත්වයන්ට ස්වර්‍ගමොක්‍ෂ(දිව්‍ය - නිර්වාණ සැප) දෙකට කාරණා වන්නේය"යි සිතා වදරා තුන්තරා ගමනින්(පයින් යෑම, අහසින් යෑම, පොළව කිමිද

යෑම යන තෙවදෑරුම් ගමන් ක්‍රමයෙන්) එක්තරා ගමනකින් දම්සභා මණ්ඩපයට වැඩ පනවනලද බුද්ධාසන මස්තකයෙහි වැඩහිඳ සශ්‍රීක වූ(ශෝභාවත්) ශ්‍රී මුඛපත්මය(උතුම් මුව පියුම) විවෘතකොට සියළු දම්සභා මණ්ඩපය එකපැහැර සුවඳ කරමින් අෂ්ටාංගයෙන්(දුර විහිදෙන බව, මිහිරිබව ආදී අංග අටෙන් යුක්ත වූ) මධුරඝොෂා(මිහිරි නාද) පවත්වා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කවර නම් කථාවකින් උපලක්ෂිතව උනුදැ"යි විචාරා වදාළසේක. එකල්හි අසූ මහසව්වන් වහන්සේගෙන් එක් කෙනෙකුන් වහන්සේ නැගීසිට සකස්කොට හැඳ පොරවාගෙන බද්ධාංජලීව(දෑතේ ඇඟලි එකට එක්කොට වැඳගෙන) දෙහොත් මුදුනෙහි තබාගෙන එලගත් රුකක් මෙන් නැමීසිට මෙසේ දැන් වූසේක.

"ස්වාමීන් වහන්සේ නොකියන්ට වදාළ රාජකථා(රජුන් පිළිබඳ කථා) චොරකථා(සොරුන් පිළිබඳ කථා) ඉත්ථිකථා(ස්ත්‍රීන් පිළිබඳ කථා) ධූර්තකථා(සල්ලාලයන් පිළිබඳ කථා) පානකථා(මත්පැන් පානය පිළිබඳ කථා) යනාදී වූ දෙතිස් කථාවෙන් උපලක්ෂිතව(යුක්තව) උනුමෝ නොවම්හ, ආනන්ද ස්ථවිරයන්ගේ ගුණ කථනය කෙරෙමින් මෙතෙකින් උපලක්ෂිතව උනුම්හ"යි කියා දැන් වූ කල්හි "එම්බා මහණෙනි, අනුන් හැරගත් වස්තුව ආනන්ද ස්ථවිරයෝම දැන් ඇරදුන්නාහු නොවෙති, පුරාතනයෙහි නුවණැත්තෝද බොහෝ ජනයාට පීඩා නොකොට තමන්ගේ ප්‍රඥානුභාවයෙන් තිරිසනුන් අතට පැමිණියා වූ වස්තුව පවා ගෙනහැර දෙව්වෝවේදැ"යි

වදාරා ඒ භික්ෂූන් වහන්සේ විසින් ආරාධිත වූ බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් කථාව ගෙනහැර දක්වා වදාළසේක.

ඒ කෙසේද? යතහොත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි පුරනලද පාරමිතා ඇති අප මහබෝසතාණෝ සියළු අෂ්ටාදස විද්‍යා ඉගෙණ කෙළ පැමිණියා වූ අමාත්‍යයෙක්ව රජ්ජුරුවන්ට අර්ථයෙන් අනුශාසනා කරන්නාහු වෙති.

එසමයෙහි එක් දවසක් බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවෝ මහත් වූ පෙරහැරින් උයන් කෙළියට ගොසින් වනක්‍රීඩාකොට දිය කෙළිනා කැමතිව මහරජ්ජුරුවෝ මගුල් පොකුණට බැස අනතඃපුරවාසී සියළු ස්ත්‍රී සමූහයාද දිය කෙළියට ගෙන් වූවාහුය.

ඉක්බිති පුරස්ත්‍රීහු ඉස පළඳනා වූද කර පළඳනා වූද පාදංගුලි පළඳනා(පා ඇඟිලිවල පළඳනා ආභරණ) පා සලඹ(නූපුර, සිලම්බු) කිංකිණික ජාලා(ගෙජ්ජිවැල්) ජංඝාපත්‍ර(කොණ්ඩ පළඳනා) ඌරුජාලා(කලවෙහි පළඳින මේස්) කටිසූත්‍ර(හවඩිය) උදරබන්ධන(බඩ බඳනා ආභරණ) අවුල්හර, මුත්හර(මුතුමාල) තෝඩු සිරෝජාලා(නළල් පට) මේ ආදී වූ ආභරණ විශේෂයෙන් ගලවා උතුරුසළු පොටෙක්හි බහා උතුරුසළුව සුමුගෙක(කරඬුවක) බහා වස්තු රකිනා පරිද්දෙන් දාසීන් අතට පාවාදී ජලක්‍රීඩාවට බටුවාහුය.

එසමයෙහි එක් වැඳිරියෙක් උයනෙ එක්තරා ගසෙක සාඛාවෙහි බලාගෙන උන්නීය. එකල්හි බිසවූ සියළු පළඳනා ගළවා උතුරුසළුවෙක්හි බහා ඇතුළෙහි තබන්නාවුන් දැක ඒ මුත්හර ගෙන තොමෝද පළඳනා කැමැත්තී රැකවල උන්නා වූ දසියගේ ප්‍රමාදභාවයක් බල බලා උන්නීද, එකල්හි ඒ දසියද පළඳනා සුමූගෙක තබාගෙණ ඇත්මෑත් බල බලා උන් තැනැත්තීද නිද උන්නීවුව. එකල්හි වැඳිරිතොමෝ දසියගේ ප්‍රමාදභාවය දැක පවනට බඳු වූ වේගයෙන් යුහුව දිවගෙන ගොස් මහමුත්හර(මහමුතුමාලය) තමා කර පළඳගෙන පවනට බඳු වූ වේගයෙන්ම යුහුව දිවගෙන ගොස් රුකට නැගී කොල අතුරෙහි ලා සැඟවී හිඳ "සෙසු වැඳිරියෝ දකිති" යන භයෙන් එක්තරා ගස් සිදුරෙක්හි සඟවා අතිශයින්ම සන්හුන් කෙනෙක් මෙන් ඒ මුත්හර රකිමින් උන්නාවූව(හුන්හ). ඒ බිසෝ පළඳනා රැක උන්නා වූ දසිය මුත්හර නොදක්නා තැනැත්තී භයින් වෙවුලන ස්වරූප ඇති තැනැත්ති තමා ගැලවී ගන්නා අනික් උපායක් සොයන තැනැත්තී "පුරුෂයෙක් බිසවුන් වහන්සේගේ මුත්හර හැරගෙන දිවපීහ"යි මහත්කොට අඬලූය. ආරක්ෂාවෙහි සිටි පුරුෂයෝ ඒ ස්ථානයෙන් රැස්ව ඒ දසියගේ බස් අසා රජ්ජුරුවන්ට දැන් වූවාහුය. එකෙණෙහි රජ්ජුරුවෝ "සොරුන් වහා අල්ව"යි කියමින් අමාත්‍යයන් ගෙන්වාගෙන සොරුන් අල්වන පරිද්දෙන් වෙන වෙන(එකිනෙකාට) නියෝග කළහ.

රාජපුරුෂයෝද උයනින් පිටත්ව "සොරුන් අල්ව"යි කියමින් ඈතමෑත සොරුන් පරීක්ෂා කරමින් ඇවිදිනාහුය.

එකල්හි දනවුවැසි අයපඬුරු පසිඳ(අයබදු ගෙවා) යන දුක්පත් මිනිසෙක් බොහෝ දෙනාගෙන් 'සොරුන් අල්ලව' යන ඝෝෂාව අසා තමා කෙරෙහිලා හයින භයපත්ව යුහුව දිවන්ට වන. එසේ දිවන්නා වූ පුරුෂයා දැක "සොරකම් කළ මේ පුරුෂයාවනැ"යි සිතා ඔහු ලුහුබඳවා ගෙනගොස් අල්වාගෙන අතින් මරා තලා(තලා පෙලා) "එම්බල දුෂ්ට වූ සොර, මහාසාර නම් පළඳනාව හැරගත්තෙහිදැ"යි විචාළහ.

එකල්හි ඒ පුරුෂයා මෙසේ සිතීය. "ඉදින් මම නොගතිමි කීම් නම් අද මාගේ ජීවිතය නැත. මෙතනදීම තලා මරා ජීවිතය හැරගන්නාහුය. නැතැයි නොකියා උන් කී දෙයම ගිවිසීම්"යි සිතා "ස්වාමීනි, මම හැරගතිමි"යි කීහ.

ඉක්බිත්තෙන් රාජපුරුෂයෝ ඔහු පිටිතල(අත් පිටිපසට තබා) බැඳ රජ්ජුරුවන් සමීපයට ගෙනගියාහ. රජ්ජුරුවෝද ඔහු අතින් මෙසේ විචාළහ. "කොළ තා විසින් මහාසාර නම් වූ පළඳනාව ගන්නා ලද්දැ"යි විචාළහ. "එසේය දේවයන් වහන්ස, මා විසින් මහාසාර නම් ඇඳෙක් පුටුවකුත් නොදක්නාලද විය, සිටාණන්ගේ කීමෙන් පළඳනාව ඇරගෙන උන්ට දුනිමි"යි කීය. රජ්ජුරුවෝ ඒ සිටාණන් ගෙන්වා ඔහු අතින් "මහාසාර නම් පළඳනාවෙක් සිටාණෙනි, තොප විසින් ගන්නා ලද්දැ"යි විචාළහ. සිටාණෝ නොදනිති නොකියා "දේවයිනි, මහාසාර නම් පළඳනාව මොහු අතින්ම මම ඇරගෙන පුරෝහිතයන්ට දුනිමි"යි කීය. රජ්ජුරුවෝ පුරෝහිත බමුණා ගෙන්වා "කීමෙක්ද? පුරෝහිතයෙනි, තොප විසින්

මහාසාර නම් පළඳනාව ගන්නා ලද්දැ”යි විචාළ කල්හි “එසේය දේවයෙනි, මම හැරගෙන ගාන්ධර්වයා (සංගීතඥයාට) හට දිනිමි”යි කීය. ඒ ගාන්ධර්වයා ගෙන්වා “කොල ගාන්ධර්වයෙනි, පුරෝහිතයන් අතින් මහාසාර නම් පළඳනාව ගන්නා ලද්දේදැ?”යි විචාළහ. ගාන්ධර්වයා නැතැයි නොකියා “එසේය දේවයනි, මම ඇරගෙන ඒ පළඳනාව ක්ලෙශ වසඟයෙන් මේ නුවර වෛශ්‍යාවට(ගණිකාවට) දිනිමි”යි කීහ. රජ්ජුරුවෝ ඒ වෛශ්‍යාවද ගෙන්වා “තී විසින් මහාසාර නම් පළඳනාව ගන්නා ලද්දැ?”යි විචාළ කල්හි ඒ වේලෙහි වෛශ්‍යාදුව කියන්නී “දේවයිනි, මහාසාර නම් පළඳනාවක් මා පැළැන්දේ නැත, ඔබ්බකින් ලද්දේත් නැතැ”යි කියා කිව. මෙසේ පස්දෙනා අතින් විචාරණ කල්හි හිරු අස්තයට ගියේය. එකෙණෙහි රජ්ජුරුවෝද “දැන් වේලා නොවෙයි, සෙට විචාරා ගණුම්හ”යි ඒ පස්දෙනාම අමාත්‍යයන් අතට පාවාදී (බාරකොට) ඇතුළු නුවරට වදනාහ.

එකල්හි බෝධිසත්වයෝ මෙසේ සිතූහ “මේ මහාසාර නම් පළඳනාව අභ්‍යන්තරයෙහි අපවත් වූයේය (නැති විය). මේ පළඳනාව ඇරගතැයි යන පුරුෂතෙමේ පිටත සඤ්චාරණය කරන එකෙක, උයන් දෙරකඩ ආරක්‍ෂාවෙහි පුරුෂයෝ සිටියහ. එහෙයින් පිටත එකෙක් තබා අභ්‍යන්තර එකෙකුත් වස්තුව හැරගෙන පලායන්ට අවකාශයෙක් නම් නැත්තේය. එසේ හෙයින් පිටතින් ආ කෙනෙකුන්ටවත් ඇතුළේ සිටි කෙනෙකුන්ටවත් ඇරගන්ටවත් කාරණයෙක්(හැකිබවක්) නොපෙණෙන්නේය. මේ දුක්පත් මිනිසා විසින් “සිටාණන්ට

දෙනලද්දැ''යි කියා කියත් නම් තමා ගැලවෙනු පිණිස කිවයුතු වන්නේය. ''පුරෝහිතයන්ට මා විසින් දෙනලද්දැ''යි කියන්නා වූ සිටාණන් විසිනුත් පුරුෂයෝ රාජධ්‍යාසයෝය(උසස් පන්තියට අයත් ජනයා රජුගේ අදහස් දන්නෝය), ''උග ගැලවෙත් නම් මමත් ගැලවෙමි'' සිතා කිවාහු වන. ''ගාන්ධර්වියාට මා විසින් දෙන ලද්දැ''යි කියන පුරෝහිතයන් විසිනුත් ''ගාන්ධර්වියා නිසා සැපසේ සිරගෙදරදී ඔවුන් හා කථා කොට ඉඳුම්හ''යි කියා කීයේ වන. ''වෛශ්‍යාවට මා විසිනුත් දෙන ලද්දැ''යි යන ගාන්ධර්වියන් විසිනුත් ''සිරගෙදරදී උකටලියක්(මැලිකමක්) නැතිව වෛශ්‍යව හා කථාකරමින් ඉඳුම්හ''යි සිතා කීයේ වන මුන් පස්දෙනාම නොසොර විය යුතුය. මඟුල් උයනෙහි වඳුරෝ බොහෝකොට ඇත්තාහුය. ''මේ පළඳනාව එක්තරා වැදිරියකගේ අතට පැමිණෙන්ට කාරණය''යි(ඇතැයි) සිතා එකල්හි බෝධිසත්වයෝ රජ්ජුරුවන් කරා එළඹ ''මහරජ, තෙල සොරුන් අපට භාරකළ මැනව, අපි ඒ විචාර සුද්ධකොට (නිරවුල්කොට) දෙම්හ''යි කීහ. රජ්ජුරුවෝද ''යහපත පණ්ඩිතයෙනි, ඒ තොපට භාරය, විචාරා පවත් කරවා දෙව''යි(තොරතුරු දැනගෙන මට කියන්නැයි) කියා පස්දෙනාම පණ්ඩිතයන්ට පාවාදුන්හ.

එකල්හි බෝධිසත්වයෝ තමන්ගේ අතවැසි පුරුෂයන් ගෙන්වා පස්දෙනම එක සිරයක(එක් සිර මැදිරියක) ලවා වටකොට රැකවල් ලවා ''මොහු පස්දෙන ඔවුනොවුන් හා යම් යම් කථාවෙක් කෙරෙත් නම් කන්දී අසාගෙන සිට ඇසූ දෙය

මට අවුත් කියව"යි කියා කීහ. පණ්ඩිතයන්ගේ පුරුෂයෝද එපරිද්දෙන්ම කළාහුය.

ඉක්බිති මනුෂ්‍යයන් කා බී ඇකුළුන වේලෙහි(නිදගත් විට) සිටාණෝ ගොවියාට මෙසේ කීහ "එම්බල දුෂ්ට වූ කොල ගැහැවිය, තෝ කවර දවසෙක්හි මා දුටු විරුද? මම කවර දවසක දිටිමිද? කවර දවසෙක්හි තෝ මට දිනීදැ"යි විචාළහ.

එකල්හි ගැහැවිතෙමේ කියන්නේ "ස්වාමීනි, මහසිටාණෙනි, මට නොකිපෙව මැනව, මහාසාර නම් පළඳනාවක් තබා මහාසාර යයි යන නම් ඇති ඇඳක් පුටුවකුත් මා දුටුවිරූ නැත, සිටාණන් වහන්සේ රාජවල්ලභසේක(රජුට හිතවත්සේක), ගැලවීමක් වේනම් දෙන්නම එක්ව ගැලවී යම්හයි කියා ජීවිත ආසාවෙන් කීමි"යි කීහ.

එකල්හි බමුණානෝද සිටාණන්ට මෙසේ කීහ "මහසිටාණෙනි, තොපට තුලුනුදුන්(ඒ මිනිසා නොදුන්) පළඳනාව තෙපි මට දිනිමියි කුමක් නිසා කිව්දැ?"යි විචාළහ. එකල්හි සිටාණෝ කියන්නාහු "අපි දෙදෙනෙම ඉසුරුමත්ව(සම්පත් ඇතිව) ප්‍රධානව සිටියම්හ, එසේ වූ අප දෙදෙනා එක්ව සිටි කල්හි කාරිය සිද්ධිය වහා පැමිණෙන්නේ යයි සිතා කීමි"යි කීය.

එකල්හි ගාන්ධර්වයා ද පුරෝහිතයාට මෙසේ කීහ "බමුණ, තොප විසින් කවර දවසෙක පළඳනාව මට දෙන ලද්දේදැ?"යි විචාළහ. එකල්හි පුරෝහිත බ්‍රාහ්මණතෙම කියන්නේ "එම්බල ගාන්ධර්වය, තට දුන් හෙයින් කීයෙමි

නොවෙමි, අපි හැම තා නිසා සැපසේ ඉදුම්හයි සිතා කීමි''යි කීය.

එකල්හි වෛශ්‍යාතොමෝ ගාන්ධර්වීයන් අතින් මෙසේ විචාළීය "කොල දුෂ්ට වූ ගාන්ධර්වීය, මම කවර දවසෙක තා ලගට ගියෙම්ද? තෝ මා ලගට කවර දවසෙක්හි ආ විරූ එකෙක්දැ?''යි විචාළීය. "නග (නැගණියෙනි), තෙපි මට නොකිපෙව, අපි පස්දෙන එක්ව වසන කල්හි ගෘහවාසයක් හා සමාන වන්නේය, කිසි උකටලියක්(අසහනයක්) නැතිව සැපසේ වැද හිඳුම්හ''යි කියා කීය.

බොධිසත්වයෝ තමන්ගේ චරපුරුෂයන් අතින් මුන් පස්දෙනා කී කථාව අසා නියම දැන මුන් පස්දෙනා නොසොර නියාව තත්ව හෙයින්(තත් වූ පරිදි) දැන "වැඳිරිය අතින් ඇරගත් පළඳනාව ඇරගණිමි'' සිතා රත්පලස් හුයෙන්(රතු පට නූල් වලින්) බොහෝ පළඳනා කරවා උයනේ වැඳිරියන් අල්වාගෙන අතපයද, කරද පළස් හුයෙන් කළ බොහෝ පළඳනා පළඳවා උයනේම අළුවාහුය(මුදාහළය). දලහර පළඳනාව (මහමුතු පළඳනාව) ගත් වැඳිරිතොමෝ තමා ඇරගත් පළඳනාව රකිමින් උයනෙහි උන්නීය. බෝධිසත්වයෝ මනුෂ්‍යයන්ට මෙසේ විධාන කළහ "තෙපි හැම ගොසින් උයන වැඳිරියන් හැමදෙනාම පරීක්ෂා කරව, යම් වැඳිරියක අත මුත්හර දුටු නම් ඈ භය ගන්වා පළඳනාව හැරගණුව''යි කීහ.

එකල්හි වැඳිරියෝ "අප විසින් පළඳනා ලබන ලදැ"යි තුටුපහටු සිත් ඇතියාහු උයනෙහි ඇවිදිනාහුය. කිසි කෙනෙක් පලස්හු පළඳනා ලදින් පළඳනා නොලත් වැඳිරියන් ලඟට ගොසින් "අපගේ අතකර පළඳනා බලව, තොපි නොලද්දේ වව්දැ"යි කියා කීහ. එකල්හි පලස් පළඳනාව නොලත් වැඳිරිතොමෝ එක් සෙර වැඳිරියක කියන්නා වූ බස් සහනය කොටගත නොහී(ඉවසාගත නොහැකිව) ගුණාමකුව සෙසු වැඳිරියන්ට මෙලෙස කිව "තෙල සෙවූ(ඔය වැනි) පලස්හු පළඳනාවෙන් මට ප්‍රයෝජන කිම්දැ?"යි තමා සඟවාගෙන උන් මහාසාර නම් පළඳනාව තමාගේ කරේ ලාගෙන නික්මුණාය. එසේ ඈ මුත්හර කර ලාගෙන නික්මුණු කල්හි පණ්ඩිතයන්ගේ චරපුරුෂයෝ දැක වැඳිරිය භය ගන්වා පළඳනාව එලවාගෙන අවුත්(උදුරාගෙන අවුත්) බෝධිසත්‍වයන්ට දුන්හ.

එකල්හි බෝධිසත්‍වයෝද මුත්හර ගෙන්වා ගෙනගොස් රජ්ජුරුවන්ට පෑහ. "මහරජ්ජුරුවෙනි, මේ නුඹවහන්සේගේ මුත්හරය, නුඹවහන්සේ සිරගෙයි ලැවූ පස්දෙනම සොරකම් නොකළාහුය, මඟුල් උයනේ වැඳිරියක විසින් මේ මුත්හරය ගෙනයන ලදැ"යි කී කල්හි "පණ්ඩිතයෙනි, ඒ මුත්හරය වැඳිරි ඇරගත්තා කෙසේ දතුද? ඇරගත් දෙය කෙසේ ගෙන්වා ගතුදැ?"යි විචාළහ. ආදියෙහි පටන් සියළු ප්‍රවෘත්තිය මහරජ්ජුරුවන්ට බෝධිසත්‍වයෝ විස්තර වශයෙන් කීවාහුය.

රජ්ජුරුවෝ සතුටු සිත් ඇතියාහු මෙසේ සිතුවාහුය "සටනක් පැමිණි අවස්ථාවෙහි සටන ජය ගන්ට නිසි සූරවීර

යෝධභටයෝ විය යුත්තාහුය. කාරිය චින්තාවක්(කළයුතු නොකළයුතු දෙයක්) පැමිණි කල්හි ‘එබඳු කාරිය මෙම කටයුතු කළ මැනවැ’යි නියම කරන්ට නිසි අමාත්‍යයෝද සෙවිය යුතු වන්නාහ, මධුර වූ අන්න පානාදියක් ලත් කල්හි ප්‍රිය වූ බන්ධු මිත්‍රාදීහු සිහිකටයුතු වන්නේය, අර්ථ ගාම්භීර(අර්ථයෙන් ගැඹුරු) ධර්‍මගාම්භීරයෙන්(ධර්ම අතින් ගැඹුරු බවෙන්) යුක්ත වූ ප්‍රතිභාගයක්(ප්‍රශ්නයක්) දුටු කල්හි නුවණැති පණ්ඩිතවරහු සෙවිය යුත්තාහුය”යි මෙසේ රජ්ජුරුවෝ බෝධිසත්‍වයන්ට ස්තුතිකොට ඝන වර්ෂාවක් වස්වන්නා වූ මහමේඝයක් පරිද්දෙන් සත්රුවන් පූජාකොට ඒ බෝධිසත්‍වයන්ගේ අවවාදයෙහි සිට දිවි පමණින් දනාදී පින්කම්කොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ. මහබෝසතාණෝද දිවි පමණින් දනාදී පින්කම්කොට තමන්ගේ කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ජාතක ධර්‍මදේශනාව ගෙනහැර දක්වා වදාරා අනඳ මහතෙරුන් වහන්සේගේ ගුණ වර්‍ණනාකොට වදාරා ජාතකය පූර්‍වාපරසන්ධි ගළපා නිමවා වදාළසේක.

“එසමයෙහි බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ නම් දැන් මේ භාණ්ඩාගාරික අනඳ මහතෙරහුය, ප්‍රඥාසම්පන්න වූ අමාත්‍යයෝ නම් දෙවාතිදෙව වූ සර්‍වඥපදප්‍රාප්ත වූ දැන් බුදුවූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 092. විස්වාසභොජන ජාතකය

තවද එක් සමයෙක්හි ෂට් අසාධාරණ ප්‍රඥායෙන්(සත්ත්වයන්ගේ ශ්‍රද්ධාදි ඉන්ද්‍රියන් මේරූ නොමේරූ බව දැනීම ආදිකොට ඇති අන්‍යයන්හට නොමැති අසහාය ඥාන සයෙන්) යුක්ත වූ තිලෝගුරු(කාම, රූප, අරූප යන තිලොවට ගුරු වූ) සම්මා සම්බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර නිසා දෙව්රම් වෙහෙර වැඩවසනසේක් විශ්වාස භොජනයක්(නිසැක ආහාරයක්) අරභයා මේ ජාතකය වදාළසේක.

හේ කෙසේද? යතහොත්,

එසමයෙහි වනාහි බොහෝ භික්ෂූන් වහන්සේ "අපගේ දෙමවුපියන්ගෙන් එවාලූ(ලැබුණා වූ) භෝජනයයි කියාද, අපගේ නගුන් බුහුනන්ගෙන්(බාල වැඩිමල් සොහොයුරියන්ගෙන්) එවාලූ භෝජනයයි කියාද, අපගේ මයිලනුවන්ගෙන්(මාමාගෙන්) නැන්දනියන්ගෙන් එවාලූ භෝජනයයි කියාද අපමණ වුවත් (සීමාවක් නොමැති වුවද) මේ කියන බන්දුහු අපට භෝජනය දෙන්ට නිස්සහ. අපි ඔවුන්ගෙන් ලැබගෙන වළඳන්ට නිස්සම්හ"යි නෑයන් විසින් දෙනලද චීවරාදී චතුර්විධ ප්‍රත්‍යය(සිවුපසය) දුන් කල්හි සැක නැතිව නොපස්විකා(සිල් රකිනුවස් ජීවත්වීමට ආහාර ගන්නා බව සිහි නොකොට) වළඳන්නාහුය.

ශාසතෘ වූ බුදුරජාණන් වහන්සේ ඒ කාරණය දිවසින් දැක වදරා “නොපස්විකා වැළඳීමෙහි ආදීනව දක්වා භික්ෂූන්ට මා විසින් ධර්‍මදේශනා කෙළෙම් නම් යහපතැ”යි සිතා භික්ෂූන් වහන්සේ රැස් කරවා “මහණෙනි, භික්ෂූන් විසින් නෑයන් විසින් දෙනලද චීවරාදී චතුර්විධ ප්‍රත්‍යය පස්විකා අනුභව කටයුත්තේය. එසේ නොපස්විකා සතරපසය(සිවුපසය) අනුභවකොට කළුරිය කරන්නා වූ භික්ෂූහු යක්‍ෂාත්මභාවයෙන්, ප්‍රේතාත්මභාවයෙන් නොමිදෙන්නාහුය. මහණෙනි, මෙසේ නොපස්විකා වළඳනාලද චීවරාදී චතුර්විධ ප්‍රත්‍යය නම් විෂ අනුභව කිරීමක් හා සදෘශ(සමාන) වන්නේය. මහණෙනි, මේ විෂ නම් වූ දෙය විශ්වාස ඇත්තවුන් දුන්දෙයක් විශ්වාස නැත්තවුන් දුන් දෙයක් අනුභව කළ කල්හි ප්‍රාණහානි කරන්නේමය. පුරාතනයෙහි විශ්වාසයෙන් විෂ අනුභව කළෝ ජීවිත විනාශයට පැමිණියාහ”යි වදරා නිශ්චලව වැඩ උන්සේක. එකල්හි භික්ෂූන් වහන්සේ විසින් ආරාධනා කරනලද සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යතහොත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි පුරණලද බෝධිසම්භාර ඇති අප මහබෝසතාණෝ මහාවිභව(මහධනවත්) සිටුකුලයක උපන්නාහුය. මහබෝසතාණන්ගේ ගෙරි රකිනා(ගවයන් බලාගන්නා වූ) එක් ගොපල්ලෙක් වෙල ගොයම්කොට වැට බැඳි සමයෙක්හි ගෙරින් හැරගෙන ගොසින් වලට(කැලයට)

වැද එහි ගැලක් ගසා ගෙරි රකිමින් ඒ වල වසන්නේය. සිටාණන්ට කලින් කලට තෙල් දී කිරි ගෙනැවිත් දෙන්නාහුය. එකල්හි ගෙරි සිටිනා ගාලට නුදුරු තැන්හි වසන්නා වූ සිංහයෙකුට භයින් ගෙරි දුර්වලවීමෙන් කිරි මඳ වූයේය.

එක් දවසක් ගොපල්ලා කිරි තෙල් හැරගෙන සිටාණන් දකින්ට ආ කල්හි සිටාණෝ ඔහු අතින් මෙසේ විචාළහ "කිමෙක්ද? ගොපල්ල, කිරි තෙල් ඉතා මදව ගියේවනැයි විචාළහ. එකල්හි ගොපළුතෙමේ කිරි තෙල් මඳවගිය කාරණාව සිටාණන්ට කීහ. "සබඳ ගොපල්ල, සිංහයා හා සමඟ සම්බන්ධව ඇතිව වසන අන් සත්ව කෙනෙක් ඇද්ද? නැද්දැ?"යි විචාළහ. "ස්වාමීනි සිටාණන් වහන්ස, එක්තරා මිහිවින්නක්(මුව දෙනක්) සිංහයා හා සංවාසයකොට(ඇසුරුකොට) වෙසෙයි" කීහ. "කොල, ඒ මිහිවින්නා තා විසින් අල්ලන්ට පුළුවන්දැ"යි විචාළහ. "ස්වාමීනි, මිහිවින්නා විචරක් අල්වා ගැන්ම පිළිවනැ"යි කීයේය. 'එසේ වීනම් තා ඒ මිහිවින්නා අල්වාගෙන නලළ පටන්ගෙන සියළු ශරීරය ලොම්හි විෂ ගල්වා නැවත කීප වාරයක විෂ ඇග ගා වියලා දෙතුන් දවසක් ඉකුත්කොට ඒ මිහිවින්නා ඇල්ලූ තෙනටම හැරපියව"යි විධාන කෙළේය. "එකල්හි සිංහයාද මිහිවින්නා කෙරෙහි සෙනෙහසින් සියළු ශරීරය දිවෙන් ලෙව ජීවිත විනාශයට පැමිණෙන්නේය, එසේ සිංහයා මළ කල්හි ඔහුගේ සමද නියපඳුරුද, දළද, සිංහතෙල්ද හැරගෙන අප ලඟට එව"යි කියා විධානකොට ගොපල්ලා යැවූහ.

එසේ යුන්නා වූ ගොපළු ඊට නිසි විෂයකුත් සිටාණන්ට කියා හැරගෙන ගොසින් මිහිවින්නා වසන තෙන ගොපළු දැළක් බැඳ උපායෙන් ඒ මිහිවින්නා අල්වාගෙන සිටාණන් කී පරිද්දෙන් විෂය මිහිවින්නා ඇග ගල්වා හැරියේය. සිංහතෙම මිහිවින්නා දැක බලවත් වූ සෙනෙහසින් ඇගේ සියළු ශරීරය දිවින් ලෙව තෙමේ ජීවිත විනාශයට පැමිණියේය. ගොපළුද නියසම් වසාතෙල් ආදිය හැරගෙන මහබෝසතාණන් සමීපයට ගියේය.

බෝධිසත්ත්වයෝ ඒ කාරණය දැන "මෙරමා කෙරෙහි ස්නේහ කිරීම නොකටයුතු වන්නේය, මෙසේ බලපරාක්‍රමයෙන් යුක්ත ශක්තිසම්පන්න වූ සිංහරාජයා පවා ක්ලෙශ සංසර්ග(කෙලෙස් වසගව) මිහිවින්නා ඇග ලෙවීමෙන් විෂය අනුභවකොට ජීවිතක්ෂයට පැමිණියේය"යි කියා එතනට සම්ප්‍රාප්ත පර්ෂදට(පිරිසට) බණ දෙසන්නා වූ බෝධිසත්ත්වයෝ "විශ්වාස ඇත්තවුන් කෙරෙහිද, නැත්තවුන් කෙරෙහිද විශ්වාසය නම් නොකටයුතු වන්නේය. කුමක් මෙන්ද? යත්, ඒ ස්නේහ කිරීම හේතුකොටගෙන භය කාරණා උපදා වන්නේය. මිහිවින්නාගේ මිත්‍රසංවාසයෙන් සිංහතෙම ජීවිත විනාශයට යම්සේ පැමිණියේද, එසේ හෙයින් කිසි කෙනෙකුන් කෙරෙහි විශ්වාස නොකටයුතුය"යි මෙසේ මහබෝසතාණෝ සම්ප්‍රාප්ත වූ පර්ෂදට ධර්මදේශනාකොට දිවි පමණින් දනදී පින්කම්කොට තමන්ගේ කුසල් වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ.

ශාසතෘ වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ මේ ජාතක ධර්මදේශනාව නිමවා වදාළ සේක. "එකල්හි මහසිටාණෝ නම් දැන් බුදු වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 093. ලොමහංස ජාතකය

තවද එක් සමයෙක්හි ත්‍රෛලෝක්‍ය(තිලොවට) නායක වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ විසාලා මහනුවර නිසා පාටිකාරාම නම් වූ වෙහෙරෙහි වැඩවසනසේක් සුනක්ඛත්ත නම්වූ නිගණ්ඨ පරිබ්‍රාජකයක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ කෙසේද? යතහොත්,

එක් සමයෙක්හි සුනක්ඛත්ත නම් නිගණ්ඨ පරිබ්‍රාජකතෙමේ (කෙලෙස් ගැට නැතැයි සලකන, බුදු සසුනෙන් පිටස්තර සසුනක පැවිදි වූ තවුස්) සර්වඥයන් වහන්සේට උපස්ථායකව බුදුන්ගේ පාසිවුරු ගෙන බුදුන් හා සමඟ ඇවිදිනේය. කොරක්‍ෂත්‍රිය නම් නිගණ්ඨයාගේ බණ අසනු කැමති වූයේ දශබලධාරී වූ සර්වඥයන් වහන්සේ පාසිවුරු ඔබට පාවාදී කොරක්‍ෂත්‍රිය නම් නිවටයා නිසා(ඇසුරුකොට) වාසය කරන්නේ, ඔහු මියගොස් කාලකංජා නම් වූ අසුර යෝනියෙහි උපන් කල්හි තමාගේ තපස් ඇර ගිහිභාවයට ගොසින් මෙසේ කියා ඇවිදිනේය. "ශ්‍රමණ භවත් ගෞතමයන් කෙරෙහි ධ්‍යාන විමොක්‍ෂාදී වූ (ධ්‍යාන අවබෝධය රහත්වීම ආදී වූ) උත්තරි මනුෂ්‍ය ධර්මයෙක්(උතුම් මිනිස් දහමක්) නම් නැත, ක්ලේශ

ප්‍රහාණය කරන්නා වූ(කෙලෙස් දුරු කරන්නා වූ) ඥානදර්ශන විශේෂයකුත්(විශේෂ නුවණින් දැකීමකුත්, විදර්ශනාවකුත්) නැත, විරක්තයෙන්(නො ඇලීමෙන්) මඩනා ලදුව ශ්‍රමණ භවත් ගෞතමයෝ ධර්‍මය කියන්නාහ, විමසීම අනුව ධර්‍මදේශනාව කරන්නාහුය, ආචාරී කෙනෙකුන් නැතිව ස්වබුද්ධියෙන්ම(තමාට වැටහෙන පරිදිම) සිතාගෙන කියන්නාහුය. යමෙකුහට ධර්‍මදේශනා කෙරෙත් නම් ඒ ධර්‍මය වූ පරිද්දෙන් පිළිපදිනා වූ සත්‍වයන්ට නරකාදී සතර අපාය දුක්ඛයෙන් ගැළවීම පිණිස නොවන්නේ”යි විශාලා මහනුවර තුන්පවුර ඇතුලෙහි සර්‍වඥයන් වහන්සේගේ නුගුණ බොහෝ දෙනාට කියා ඇවිදිනේය.

එකල ආයුෂ්මත් වූ සැරියුත් මහතෙරුන් වහන්සේ පිඬුසිඟා වඩනාසේක් බුදුන්ගේ අගුණ කියන්නා වූ සුනක්ඛත්ත නම් නිගණ්ඨ පරිබ්‍රාජකයන්ගේ බස් අසා පසු බත ආහාර කෘත්‍යයෙන්(ඉර හැරුණු පසු ආහාර ගැනීමෙන්) වැළකීසේක. ඒ කාරණය භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේට දැන් වූසේක. සැරියුත් මහතෙරුන් වහන්සේද වදාළ බස් අසා බුදුනු වදාරණසේක් “එම්බල ශාරිපුත්‍ර ස්ථවිරය, සුනක්ඛත්ත නම් වූ ඒ තුච්ඡ පුරුෂතෙමේ ක්‍රොධ බහුල වූ ස්වරූප ඇත්තේය, මාගේ ධර්‍මය නෛර්‍ය්‍යානික(නිවනට පමුණුවන) නොවන්නේයයි තමන්ගේ ක්‍රොධ බහුල භාවයෙන්ම කියන්නේය, ඒ සුනක්ඛත්තතෙමේ නොදැන එලෙස කියන නමුත් මාගේ ගුණ කීවාම වන්නේය, තවද ඒ තුච්ඡ වූ පුරුෂතෙමේ මේ මාගේ ගුණ නොදන්නෝ නොවෙයි, එම්බල ශාරිපුත්‍ර ස්ථවිරය,

ෂට්අභිඥාවෝද(සෘද්ධිවිධ ආදී වූ උතුම් නුවණ සයද) මා කෙරෙහි ලා පිහිටියාහ, එසේ හෙයින් මේ මාගේ උත්තරී මනුෂ්‍යධර්‍මය වන්නේය. තවද ශාරිපුත්‍ර ස්ථවිරය, දසබල චතුර්වෛශාරද්‍ය විශාරද ඥානයද(කායබල, ඥානබල ආදී දසවදෑරුම් බල හා සියල්ලදත් බව, කෙලෙස් රහිත බව ආදී කරුණු සතර මනාව දන්නා නුවණද) මා කෙරෙහි ඇත, එසේ හෙයින් මේ මාගේ උත්තරී මනුෂ්‍යධර්‍මය නම් වන්නේය. අණ්ඩජ, ජලාබුජ, සංසෙදජ, ඕපපාතික(බිත්තරයෙන් උපන්, වැදෑමසින් උපන්, තෙත් පෙදෙසෙහි උපන්, ක්‍ෂණිකව පහළවීම් වශයෙන් උපන්) යන පරිච්ඡේද(පිරිසිඳ දන්නා) ඥානයද මා කෙරෙහි ඇත. දිව්‍යගති, මනුෂ්‍යගති, ප්‍රේතගති, අසුරගති, තිරිසන්ගති සංඛ්‍යාත වූ පඤ්චගතියම (පස් වදෑරුම් වූ උප්පත්ති ස්ථානම) පිරිසිඳ දන්නා නුවණද මා කෙරෙහි ඇත. එසේ හෙයින් මේද මාගේ උත්තරී මනුෂ්‍යධර්‍මය නම් වන්නේය. මෙසේ යථොක්ත වූ උත්තරීතර මනුෂ්‍යධර්‍ම ගුණයෙන් යුක්ත වූ මට යම් පුද්ගලයෙක් දනාදී වූ උතුරු මිනිස්දම් මා කෙරෙහි නැතැයි කියන්නේ වීනම් එසේ තමා ගත්තා වූ දුර්ලබ්ධි(වැරදි දෘෂ්ටිය) නොහැර සිටින්නේ වීනම් තමන් විසින් වරදවා ගත්තා වූ දුර්ලබ්ධිය හේතුකොටගෙන අත අල්වාගෙන නරකයෙහි ඇර සිටුවූවාක්(ඇරලන්නාක්) මෙන් වන්නේය”යි එසේ තමන්වහන්සේ කෙරෙහි විද්‍යාමාන වූ උත්තරී මනුෂ්‍යධර්‍මයෙහි ගුණ වදරා “එම්බල ශාරීපුත්‍ර ස්ථවිරය, ඒ සුනක්ඛත්ත නම් පරිබ්‍රාජකතෙමේ කොරක්‍ෂත්‍රිය නම් නිවටාගේ ධර්‍මය අසා ඔහුගේ දුෂ්කර ක්‍රියායෙන් ප්‍රසන්න

වූයේ ඔහුගේ කොහොන්(කුහක) තපස්හි විශ්වාසී වූයේ මාගේ ගුණ ගන්ට ඒ තෙමේ අයොගය්‍යය"යි වදරා "එම්බල ශාරිපුත්‍ර ස්ථවිරය, මම මේ භද්‍රකල්පයට ඒකානූවන කපින් මත්තෙහි (අනූඑක් කල්පයකට පෙර) සසරෙහි සැරිසරන්නෙම් 'මේ අචේලක වූ ව්‍රතයෙහි(නිර්වස්ත්‍ර පිළිවෙතෙහි) හරයෙක් ඇද්දෝ හෝ'යි බාහිරයන්ගේ මිථ්‍යා තපස් විමසන්නෙම් චතුරඞගයෙන් යුක්ත වූ(අංග සතරකින් යුක්ත වූ) බඹසර වස් රකින්නෙම් අචේලක ව්‍රත සමාදන කෙරෙමින් වාසය කරන්නෙම් අචේලක ව්‍රතයට සුදුසු වූ සීල සංරක්‍ෂණය කරන්නෙම් වේදැයි සියළු තපස්විවරයන්ට අග්‍ර වූ පරම තපස්විව වාසය කෙරෙමි රූක්‍ෂප්‍රතිපත්තිය(කටුක පිළිවෙත්) පුරන්නෙම්ද අතිශයින් විශිෂ්ඨ වූ රූක්‍ෂප්‍රතිපත්ති පුරන්නෙම් වීමි, පාපයෙහි ලජ්ජා ඇතිව වසන්නේ මුත් උත්කෘෂ්ට පාපභීරුක(මහත්සේ පවට බිය) වූයෙමි, ජනවෘත(ජනයා ගැවසෙන) ස්ථානයෙහිලා වාසය කරන්නේ මුත් උත්කෘෂ්ට ජනවිවික්ත(ජනයාගෙන් තොර) වාසයෙන් වසන්නේ නම් වීමි"යි වදරා නිශ්ශබ්දව වැඩඋන්සේක.

එකල්හි අනඳ මහතෙරුන් වහන්සේ විසින් ආරාධිත වූ බුදුහු ඉකුත්වත් ගෙනහැර දක්වා වදාළසේක.

ඒ කෙසේද? යතහොත්,

යටගිය දවස මේ භද්‍රකල්පයට ඒකානූවන කපින් මත්තෙහි එක්තරා කපෙක්හි පුරණලද පාරමිතා ධර්‍මයන් ඇති මහබෝසතාණෝ බුදුසස්නෙන් පිටත් බායත්(බාහිර)

ශාසනයෙහි 'තපස් රක්‍ෂා කෙරෙමි'යි ආජීවක ප්‍රව්‍රජ්‍යාවෙන්(නිර්වස්ත්‍ර පැවිද්දෙන්) පැවිදිගෙන අචේලක පරිබ්‍රාජකව ගෙන තපස් රක්‍ෂා කරන්නාහුය. සියලඟින් රජස් දැලි(මුළු සිරුරින් දූවිලි කුණු) උසුලන්නාහ, හුදකලාව වාසය කරන්නාහ, මිනිසුන් දැක භයපත් වූ මුවන් පරිද්දෙන් වනයට වදිනාහ, මහා විකෘත භොජනයෙන්(මල, මුත්‍ර, පස්, අළු යන සිවු වැදෑරැම් අස්වාභාවික ආහාරයෙන්) සන්තුෂ්ට(සතුටු) වන්නාහ, වසුන්ලාපු(වසා බැඳ තබනලද ආහාර) ආදිය අනුභව කරන්නාහ, නොපමාව තපස් රක්‍ෂාකරනු පිණිස මහ වනයෙහි හුදකලාව වාසය කරන්නාහ. බොල් පිණිබාන සමයෙහි බොල්පිණිද අධික වූ සුලඟම පවත්නා සමයෙහිද මෙබඳු අන්තරාෂ්ටක අකාල වනප්‍රදේශයෙන්(උවදුරු සහිත වූ නොකල්හි වනයෙන්) නික්ම අබවස්හි (එළිමහනෙහි) වාසයකොට ඉරු නැගි කල්හි මහ වනයට වදිනාහුය.

ඒ බොධිසත්වයෝ යම්සේ රාත්‍රියෙහි අබවස් ඉඳ බොල් පින්නෙහි තෙමුණා වෙද්ද දිවා භාගයෙහිත් වලට වැද වන ලැහැබින් වෑහෙන පිනි බින්ඳුයෙන් තෙමෙනලද ශරීර ඇතිව දහවල් ශරීර පීඩාවෙන් දුක්විඳිනා වූ ග්‍රීෂ්ම සෘතුවෙහිද දවල් අබවස්හි වාසය කෙරෙමින් වන ප්‍රදේශයෙන් නික්ම අබවස්හි වාසයකොට ඉර නැගි කල මහවනයට වදිනාහුය. ඒ බෝධිසත්වයෝ යම්සේ රාත්‍රියෙහි අබවස ඉඳ බොල් පින්නෙහි තෙමුනාහු වේද දිවා භාගයෙහිත් වලට වැද වන ලැහැබෙන් වෑහෙන පිනි බින්ඳුයෙන් තෙමෙනලද ශරීර ඇතිව රෑ දවල් සීත පීඩාවෙන් දුක් විඳිනාහු ග්‍රීෂ්ම සෘතුවෙහි දවල අබවස

වාසය කෙරෙමින් රාත්‍රියෙහි වන ලැහැබටම වදිනාහුය. ඒ බෝධිසත්ත්වයෝ යම්සේ දිවා භාගයෙහි අබවසෙහි අව්වෙහි වාසය කළාහු රාත්‍රියෙහි එපරිද්දෙන් පවන් නැති වන ලැහැබ පීඩාවට පැමිණෙන්නාහුය.

එකල්හි බෝධිසත්ත්වයන්ගේ ශරීරයෙන් ග්‍රීෂ්ම කාලයෙහි නිවාසස්ථානයෙහිලා(නිවසන තන්හි) ඉඳිම හේතුකොටගෙන සියළු ශරීරයෙන් සෙවදජල ධාරාව(දහඩිය) වෑහෙන්නේයයි මෙබඳු දුෂ්ප්‍රතිපත්තීන් බඹලොව පිළිවෙතට සිතා පිළිවෙත් පුරන්නෝ බොහෝ කලක් මා විසින් මෙසේ අචේල ව්‍රත සමාදනකොට වාසය කරනලද, එසේ වාසය කරන්නා වූ බෝධිසත්ත්වයන්ට ආයු කෙළවර නරකයෙහි උපදින්ට සුදුසු ගති නිමිත්ත(මරණින් මතු උපදින තැන ලක්‍ෂණ) දැක “මෙතෙක් කල් මුළුල්ලෙහි මා කරනලද ව්‍රතසමාදනය ව්‍යර්ථව ගියේවනැ”යි සිතා එකෙණෙහිම තමන්ගේ ගත් සම්‍යක්දෘෂ්ටියෙහි පිහිටා(නිවරදි විශ්වාසයෙහි පිහිටා) ගෙන චූති ප්‍රතිසන්ධි(මැරී ඉපිද) වශයෙන් තව්තිසා භවනෙහි උපන්නාහුයයි ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ජාතක ධර්මදේශනාව මෙපරිද්දෙන් ගෙනහැර දක්වා වදාරා පූර්වාපරසන්ධි ගළපා වදාළසේක.

“එසමයෙහි අචේල ව්‍රතසමාදනයකොට එහි දෝෂ දැක සම්‍යක් ප්‍රතිපත්තියෙහි පිහිටා ස්වර්ගයෙහි උපන්නෙම් දැන් සර්වඥපදප්‍රාප්ත වූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 094. මහාසුදස්සන ජාතකය

තවද මුළු ලොවට පතළා වූ ආඥා(අණසක) ඇති තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ කුසිනාරා නුවර මලල රාජේන්ද්‍රයන්ගේ(මල්ල රජුන්ගේ) ශාලවනොද්‍යානයෙහි යුග්ම ශාලාභ්‍යන්තරයෙහි(සල්ගස් දෙකක් අතර) පරිනිර්වාණමංචකයෙහි සැතපුණුසේක් අනඳ මහතෙරුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

ශාසතෲ වූ බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වසනසේක් සැරියුත් මහතෙරුන් වහන්සේ ඉල්මස මැදි පොහොයෙහි නාලක නම් ගම තමන්වහන්සේ උපන් ගර්භයෙහිම(ගෙහිදීම) පිරිනිවන් පෑ වදාළසේක. මුගලන් මහතෙරුන් වහන්සේද ඉල්මස කළුවර පොහොයෙහි පිරිනිවන් පෑසේක. බුදුනු කුසිනාරා නුවරට ගොස් “මම පිරිනිවන් පාමි”යි අනුක්‍රමයෙන් දනව් සැරිසරා වඩනාසේක් කුසිනාරා නුවරට වැඩ මල්ල රජ්පුරුවන්ගේ මඟුල් උයනෙහි උයන මැද යුග්ම ශාලාන්තරයෙහි උතුරු දිගට ඉසලා ඇතුළු යහනෙහි නැගී නොසිටිනා සෙයියාවෙන් සැතපුණුසේක. ඉක්බිති ඒ සැතපුණු සර්වඥයන් වහන්සේට අනඳ මහතෙරුන් වහන්සේ දන්වනසේක් “භාග්‍යවතුන් වහන්ස, මේ නුවර පිරිනිවන් පෑ නොවදාළ මැනව, ජලාශ්‍රයක් නැති හෙයින් නිරුදක වූ රළු නුවර පිරිනිවන් නොපෑව මැනව, රජගහ නුවර, සැවැත් නුවර ආදි වූ එක්තරා මහනුවරක පිරිනිවන් පෑව මැනවැ”යි ආරාධනා කළසේක.

සර්වඥයන් වහන්සේද අනඳ මහතෙරුන් වහන්සේට වදාරණසේක් "ආනන්ද ස්ථවිරයිනි, එසේ නොකියව, කුඩා නුවරෙහි කියාද අතුනුවරයයි කියාද මේ කුසිනාරා නුවරට කියන්ට සුදුසු නොවන්නේය. ආනන්ද ස්ථවිරය, යටගිය දවස මහසුදර්ශන නම් සක්විති රජව උපන් සමයෙහි මෙම නුවර මම වාසය කෙළෙමි. එම්බා ආනන්ද ස්ථවිරයෙනි, පෙර මෙම නුවර දෙළොස් යොදුන් රුවන් පවුරෙන් පිරිකෙව් කරනලද වීය"යි වදාරා නිශ්ශබ්ද වූසේක.

එකල්හි ආනන්ද මහතෙරුන් වහන්සේ විසින් ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් ගෙනහැර දක්වා වදාරණසේක් 'මහසුදර්ශන සූත්‍රදේශනාව' ගෙනහැර දක්වා වදාළසේක.

හේ කෙසේද යතහොත්?

එහි විස්තර මහසුදර්ශන සූත්‍රයෙන් දතයුතු වන්නේය. එකල්හි මහසුදර්ශන නම් සක්විතිරජව තමන් වසන ධර්ම නම් ප්‍රාසාදයෙන් පාත බැස ප්‍රාසාදයට නුදුරුව සත්රුවන්මය වූ තල්වනයෙහි පණවනලද කැප අස්නෙක්හි ඉඳ දකුණැලයෙන් නැඟී නොසිටිනා සෙයනාවෙන් මරණ මඤ්චකයෙහි වැදහොත්තා වූ සක්විති රජ්ජුරුවන්ට අගමෙහෙසුන් වූ සුභද්‍රා නම් බිසව කියන්නී "දේවයිනි, සුවාසුදහසක් නුවරින් පිරිවරන මේ කුසාවතී නම් රාජධානියෙහි ඇලුම්කොට වදාළ මැනව"යි ඒ සුභද්‍රා නම් බිසවුන් කී කල්හි මහසුදසුන් සක්විති රජතෙමේ බිසවුන්ට මෙසේ කීය "දේවීනි, එසේ නොකියව, තවද මේ

සියළු රජ ඉසුරෙහි අපේක්‍ෂාවක් නොකළ මැනව, ඇල්මක් නොකළ මැනවැයි මෙසේ අනුශාසනා කරව"යි කියා කීහ.

"දේවයිනි, කවර කාරණාවක් නිසාද? එසේ වදාළේය"යි කී කල්හි මහරජ්ජුරුවෝ කියන්නාහු "එම්බා සුභද්‍රා දේවීනි, අද දවස්ම කාලක්‍රියා කරමි. එසේ හෙයින් කිසිවෙක අපේක්‍ෂාවක් කරන්ට නොකිය"යි කීහ. එබස් අසා බිසව්ද සුවාසූදහසක් පමණ ස්ත්‍රීහුද හඬා වැළපූහ. එබස් ඇසූ අමාත්‍යයෝද සියළු නුවර වැස්සෝද රජ්ජුරුවන් කී බස් අසා සහනයකොටගත නොහී(ඉවසාගත නොහැකිව) අඬා වැළපුණාහ. සුදසුන් නම් මහරජ්ජුරුවෝද බොහෝ දෙනාගේ අරගල අසා(කලකෝලාහල අසා) "කිසි කෙනෙක් හඬා අරගල නොකරවයි සියල්ලවුන් නවතා සුභද්‍රා නම් බිසවුන් කැඳවා "එම්බා දේවීනි, නොහඬව, නොහඬව නල බීජ මාත්‍රාවකුත් සියළු සංස්කාර ධර්මයන්ගේ එකාකාර පැවැත්මක් නැති හෙයින් නිත්‍ය දෙයක් නැතැ"යි කියා "අනිච්චාවත සංඛාරා" යනාදී ගාථාවෙන් බිසවුන්ට බණ කියා ඒ මහසුදසුන් රජ්ජුරුවන් අමෘත මහනිර්වාණය දැක්වීමෙන් දේශනාව කුළුගන්වා සෙසු බොහෝ ජනයාටද "දන් දෙවයි, සිල් රක්‍ෂා කරවයි, පෙහෙවස්(අටසිල්) රක්‍ෂා කරව"යි අවවාදකොට චුතිප්‍රතිසන්ධි වශයෙන් දිව්‍යලෝකයෙහි උපන්නාහ.

ශාස්තෘ වූ සම්මා සම්බුදුරජාණ වහන්සේ මේ ජාතක ධර්මදේශනාව ගෙනහැර දක්වා වදාරා ජාතකය පූර්වාපරසන්ධි ගළපා වදාළසේක.

“එසමයෙහි සුවාසූදහසක් ස්ත්‍රීන්ට නායක වූ සුභද්‍රා දේවීහු නම් දැන් මෙකල්හි රාහුල මාතාවෝය, එකල්හි පරිනායක රත්නය නම් මෙකල්හි රාහුල ස්ථවිරයෝය, සෙසු පිරිස් නම් මෙකල්හි බුදුපිරිස් වන්නාහ. එසමයෙහි මහසුදසුන් සක්විතිරජ නම් බුදු වූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 095. තෙලපත්ත ජාතකය

තවද එක් සමයෙක්හි කරුණාවට වාසස්ථාන වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ‘සුම්භ’ නම් රට දෙසක නම් නියම්ගමක් නිසා එක්තරා වන ප්‍රදේශයෙක්හි වාසය කරණ සේක් මේ ජාතකය ජනපදකල්‍යාණී සූත්‍ර දේශනා අරභයා වදාළසේක.

ඒ කෙසේද යතහොත්?

එක් සමයෙක්හි භික්‍ෂූන් වහන්සේට කර්‍මස්ථාන දෙවා වදාරා උපමාවක් දක්වා භික්‍ෂූන් වහන්සේට “අප්‍රමාදව මහණ දම් පුරව”යි අවවාද කරන බුදුහු මෙසේ වදාරනසේක.

“මහණෙනි, ජනපදකල්‍යාණී නම් උතුම් වූ රූ දරන්නා වූ තමා උපන් දනව්වට කල්‍යාණ වූ එක් ස්ත්‍රියෙක කේශ කල්‍යාණය(මනා කෙස් කලඹය), මාංස කල්‍යාණය(මනාව වැඩුන මස් ඇති බව), අස්ථි කල්‍යාණය(සිරුරෙහි ඇට මනාව වැසී ඇති බව), ඡවි කල්‍යාණය(මනා පැහැයෙන් යුතු බව), වයඃ කල්‍යාණය(වියපත් වුවද වයස නොපෙණෙන බව) යන පංච කල්‍යාණයෙන් යුක්තය. තවද ඒ නාටක ස්ත්‍රීතොමෝ

උතුම් වූ රූපයෙන්ද, උතුම් වූ නෘත්‍යයෙන්ද, උතුම් වූ ගීතයෙන්ද, උතුම් වූ වැයීමෙන්ද බොහෝ ජනයාට සිත්කළු වන්නීය. එබඳු වූ නාටක ස්ත්‍රිය ඒ නෘත්‍ය මණ්ඩලයට බැස නෘත්‍ය ගීත, වාදිතාදිය පවත්වන්ට පටන්ගත් කල්හි බොහෝ ගම් නියම්ගම් රාජධානියෙහි මනුෂ්‍යයෝ 'ඇගේ රූපය දකුම්හ, මධුර ශබ්දය අසම්හ, නෘත්‍ය ගීත වාද්‍යාදිය දකුම්හ'යි බොහෝ සේ රැස් වන්නාහු වෙද්ද? මහණෙනි, යම්සේ රජ්ජුරු කෙනෙක් සිරගෙයි උන් පුරුෂයෙකු ගෙන්වාගෙන මෝවිටිගසා(ගැට්ටතෙක්) පිරුණු තෙල් පාත්‍රයක් ඔහු අතටදී 'එම්බල පුරුෂය, තාගේ ජීවිතයෙහි ලා අපේක්ෂා(පණට ආදරය) ඇත්තෙහි වීනම් මේ තෙල් පිරුණා වූ තෙල් පාත්‍රය දෑතින් ඔසවාගෙන තෙල් බින්දුවක් විවරක්(පමණකුත්) බිම නොවගුරුවා ඇලි නොගස්වා(ඇල නොකොට) බිම නොහෙලා ජනපදකල්‍යාණී නම් වූ තෙල නාටකස්ත්රිය නටන්නා වූ රඟමඬල මධ්‍යයෙන් නෘත්‍ය ගීතාදීන් නොබලා, නොඅසා බොහෝ ජනයාගේ ඇඟත් නොපැහැර පලා ගියේ වීනම් තාගේ ජීවිතය ලබන්නේය'යි නියෝගකොට රජ්ජුරුවන් නැවත අනික් පුරුෂයෙකු ගෙන්වා තියුණු මුවහත් ඇති කඩුවක් ඔහු අතටදී 'තෙල් පාත්‍රය ගෙනයන පුරුෂතෙමේ තෙලෙන් බින්දුවක් වගුරුවා හෝ නම් එතැන්හිදීම ඔහුගේ ගෙළ සිඳුව'යි නියෝග කළේ වීනම්, නියෝග ඇසූ පුරුෂතෙමේ තෙල් පාත්‍රය ගෙනයන පුරුෂයා පෙරටුකොට ඔහු භය ගන්වමින් තැති ගන්වමින් පසුපස්සෙහිලා යන්නේද, තෙල් පාත්‍රය ගෙන යන්නා වූ

පුරුෂයාද තමගේ ජීවිත ආසාවෙන් පිරූ තෙල් පාත්‍රයෙන් තෙල් පොදකුත් බිම නොවගුරුවා, ඇලිත් නොගස්වා බිම නොහෙලා ජනපදකල්‍යාණී නම් වූ නාටකස්ත්‍රිය නටන්නා වූ බොහෝ දෙනා රැස්ව රඟ මඩුල්ල මධ්‍යයෙන් ගැලවී පලා ගියේ නම් ඒ බැරි දෙයක් නොවේ. කුමක් නිසාද යතහොත්? කඩුගත් අත් ඇති පුරුෂයෙකු ඔහු පසුපස්සෙහි භය ගන්වමින් ගිය හෙයිනි. එම්බා මහණෙනි, මාගේ ශාසනයෙහි කමටහන් ඇරගෙන මහණදම් පුරන්නා වූ යොගාවචරයා විසින් ජීවිත ආසාවෙන් තෙල් පාත්‍රය නොවගුරුවා ගෙනයන පුරුෂයා පරිද්දෙන් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්ප්‍රෂ්ටව්‍යයෙහි අලග්නව(නොඇලී) මහණදම් පිරිය යුතුය”යි.

“මෙසේ ජනපදකල්‍යාණී නම් එබඳු නාටකස්ත්‍රිය නටන රඟමඩුල්ල මධ්‍යයෙන් යම් පුරුෂයෙක් පිරුණු තෙල් පාත්‍රයක් නෙහෙලා, නොවගුරුවා ඉඳින් ගෙන ගියේ වීනම් ස්වාමීනි, ඉතා ආශ්චර්‍ය්‍යයී වන්නේය”යි වදාළසේක.

එසේ වදාළ භික්ෂූන් වහන්සේට සර්‍වඥයන් වහන්සේ වදාරනසේක් “එම්බා මහණෙනි, ඒ ආශ්චර්‍ය්‍යයී නොවෙයි, පුරාතනයෙහි නුවණැත්තෝ තමන්ගේ අප්‍රමාද සිහිය හේතුකොටගෙන අමනුෂ්‍යයන් විසින් නිර්මිත කරනලද දිව්‍යරූපයෙහිද ඉඳුරන් බිඳ ඇස් දල්වා බැලීම මාත්‍රාවකුත් නොකොට අමනුෂ්‍ය පරිගෘහිත වූ(අරක්ගත්) ස්ථානයෙන් ගැලවීගෙන ගොසින් රාජශ්‍රියට පැමිණියාහුය. එම්බා මහණෙනි, ඒ ආශ්චර්‍ය්‍යයීය”යි ජාතක දේශනාවට

මුඛමාත්‍රයක්(පටන් ගැනීම පමණක්) දක්වා නිශ්ශබ්දව වැඩහුන්සේක. එකල්හි ඒ භික්ෂූන් වහන්සේ විසින් ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි පුරණලද පාරමිතා ඇති අප මහබෝසතාණෝ ඒ බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන්ගේ පුත්‍රයන් සියයක් දෙනා අතුරෙන් හැමටම බාලව ඉපිද අනුක්‍රමයෙන් විඥබවට(බුද්ධිමත් බවට) පැමිණියේය.

එකල්හි රජ්ජුරුවන්ගේ රජගෙයි පසේබුදුවරයන් වහන්සේ නිබඳ වළඳනසේක. බෝධිසත්ත්වයෝ පසේබුදුවරයන් වහන්සේට වතාවත් කරන්නාහ.

එක් දවසක් බෝධිසත්ත්වයෝ "මාගේ මල්බෑයෝ බොහෝය. මේ නුවර කුලසන්තක වූ රාජ්‍යය ලබම් දෝ හෝයි නොලබම් දෝ හෝ"යි සිතූහ. ඉක්බිත්තෙන් ඔහුට "පසේබුදුවරයන් වහන්සේ අතින් විචාරා නියම දනිමි"යි මෙසේ සිතිවිල්ලෙක් විය. ඒ මහබෝසතාණෝ දෙවෙනි දවස් පසේබුදුවරයන් වහන්සේ වැඩි කල්හි ධබරාව(පැන් පෙරන භාජනය) හැරගෙන පැන් පෙරා ගෙනවුත් පය සෝදා තෙල් ගල්වා ඉක්බිත්තෙන් පසේබුදුරජාණන් වහන්සේ අන්තරබජ්ජකය(අතුරුපස) වළඳා වැඩහුන් කල්හි වැඳ එකත්පස්ව උන්නාහුය. "ස්වාමීනි, මාගේ බොහෝ මල්බෑයෝ ඇත්තාහ, කුලසන්තක වූ රාජ්‍යයට මම පැමිණෙම් දෝ හෝ"යි කියා විචාළාහුය. ඉක්බිත්තෙන් පසේබුදුරජාණන්

වහන්සේ වදාරනසේක් "කුමාරයෙනි, තෙපි මෙනුවර ඉඳ රාජ්‍යය ලබන්නාහු නොවෙත්. මීට එක්සිය විසියොත්නකින් මත්තෙහි ගන්ධාර රට තක්සලා නුවරෙක් ඇත්තේය, ඒ නුවරට යන්ට සමර්ථ වූ තෙපි මෙයින් සත්වන දවස් රාජ්‍යය ලබනු, අතරමග වූ මහමාවතක් ඇත. වනයෙහි උපද්‍රවයෙක් ඇත. ඒ වනය ඉකුත්කොට යන්නා හට යොදුන් සියයක් පමණ මාර්ගය වන්නේය. එල්ලයට යතොත් පණස් යොදුනක ඒ මාර්ගය වනාහි අමනුෂ්‍ය කාන්තාර නම්. එහි යක්‍ෂනීහු අතරමග ගම්නියම්ගම් ශාලාවන් මත්තෙහි එල්වන ලද රන්තරු රිදීතරුයෙන් විසිතුරු වියන් ඇති මහයහන් පණවා රන් නිල් ඇගෑයෙන්(තීරුවලින්) නොයෙක් පැහැ ඇති පට කඩතිර වටකොට ඇඳ දිව්‍යාභරණයෙන් ආත්මභාවය සරසා ශාලාවෙහි හිඳ යන එන්නා වූ පුරුෂයන් මිහිරි වූ වචනයෙන් පොළඹවාගෙන මිහිරි ගී කියා ස්වරූප(ස්වභාව) ඇත්තා වූ "මෙතන ඇවිත් හිඳ පැන් බී පියව"යි කැඳවා සමීපයට පැමිණියා වූ පුරුෂයන්ට අසුන් පණවාදී තමන්ගේ රූපශෝභාවෙන් හා භාවභාවලීලා (අඟර දඟර විලාස) කටාක්‍ෂමන්දස්මිතයෙන්(නෙතගින් බැලීමෙන් හා මඳ සිනාවෙන්) පොළඹවා ක්ලේශ වසඟකොට තණ්හා ව්‍යතික්‍රම(ආසාවෙන් කාමසේවනය) කළ කල්හි එතනදීම ලේ වගුරුව වගුරුවා කා ජීවිතක්‍ෂයට පමුණුවන්නාහ. රූපයෙහි ඇළුම් ඇති සත්ත්වයා රූපයේ සිත් ගන්නාහ. ශබ්දයෙහි ඇළුම් ඇති සත්ත්වයා මිහිරි වූ ශබ්දයෙන් සිත් ගන්නාහ. ගන්ධයෙහි ඇළුම් ඇති සත්ත්වයා දිව්‍යගන්ධයෙහි පොළඹ වන්නාහ. රස විෂයකොට

ඇති සත්ත්වයා දිව්‍යමය වූ නොයෙක් අග්‍රරස භොජනයෙන් පොළඹ වන්නාහ. ස්පර්ශයෙහි ඇළුම් ඇති සත්ත්වයා ඉස්දෙර පාමුල ලනලද රත්කන්වයින්(රන්පැහැති කොට්ට) ඇති මනා වූ ඇතිරිළි අතුරනලද දිව්‍යහනින් පොළඹ වන්නාහ. ඉන්ද්‍රියයන් බිඳ ඒ යක්‍ෂනීන් නොබලා සිහි එළවාගෙන ගියේ වීනම් ඒ තක්සලා නුවර රජ්‍යය ලබනවාය”යි පසේබුදුරජාණන් වහන්සේ වදාළසේක.

බෝධිසත්ත්වයෝ “ස්වාමීනි, වන්නාටය, නුඹවහන්සේගේ අවවාද ගෙන යන්නා වූ මම යක්‍ෂනීන් කුමක් නිසා ඉන්ද්‍රියයන් බිඳ(අසංවරකොට) බලම්දැ”යි කියා ප්‍රතිඥා දී පසේබුදුවරයන් වහන්සේ ලවා පිරිත් කරවා පිරිත් වැලි හා පිරිත් හුය(නූල්) ගෙන පසේබුදුවරයන් වහන්සේ හා දෙමාපියන් වැඳ තමන්ගේ මාලිගාවට ගොස් තමන්ගේ සේවකයන්ට කියන්නාහු “මම තක්සලා නුවර රාජ්‍යය ගන්ට යමි, තෙපි සිටුව”යි කීහ. එසඳ පස්දෙනෙක් “අපිත් නුඹවහන්සේ හා සමග එම්හ”යි කීහ. බෝධිසත්ත්වයෝ “තොප විසින් එබඳුව යන්ට නොපිළිවන, අතරමග යක්‍ෂනීහු රූපාදියෙහි ඇළුම් ඇතිවම මනුෂ්‍යයින් එබඳු රූප ශබ්දදියෙන් පොළඹවා ගණිති, මහත් වූ උපද්‍රව ඇත. මම වූ කලී මාගේ සමර්ථත්ත්වය සිතාලා යෙමි”යි කිවූය. “කිමෙක්ද දේවයන් වහන්ස, අප නුඹවහන්සේ හා සමඟ යන්නමෝ අපට ප්‍රිය රූපයක් බලමෝද? අපි නුඹවහන්සේ මෙන් ධෛය්‍ය්‍යීවත්ව යම්හ”යි කිවූය. බෝධිසත්ත්වයෝ “එසේ වීනම් අප්‍රමාදව”යි කියා ඒ පස්දෙනා ගෙන මාර්ගයට පිළිපන්හ.

ඒ යක්ෂනීහු ග්‍රාමාදීන් මවා හුන්හ. ඒ පුරුෂයන් පස්දෙනා අතුරෙන් රූපයෙහි ඇලුම් ඇති පුරුෂයා ඒ යක්ෂනී බලා රූපාලම්බණ ප්‍රීතිබද්ධව(රූපාරම්මණය කෙරෙහි ආසාවෙන් බැඳී) මඳක් පසු බසින්ට වන. බෝධිසත්ත්වයෝ "කිමෙක්ද පින්වත, මදක් පසුබැසුනේ ඇයිදැ?"යි කීහ. එසඳ ඒ පුරුෂයා කියන්නේ "දේවයන් වහන්ස, මාගේ පා රිදෙයි මදක් ශාලාවේ හිඳ එමි"යි කීය. බෝධිසත්ත්වයෝ "එම්බල පුරුෂය, මොහු යක්ෂනීහුය, මොවුන් ප්‍රාර්ථනා නොකරව"යි කිවූය. ඒ පුරුෂයා "වන්නාටය, කුමක් වේවයි දුටු දෙයක් දකිමි දේවයන් වහන්ස, නොයෙමි" කීය(කමක් නෑ, මොනවා වුවත් හමුවන දෙයට මුහුණ දෙමි). බෝධිසත්වයෝ "එසේ වීනම් තාගේ නොකීකරු කමින් වනදෙය තෝ මා දක්නේ වේදැ"යි කියා අන් පුරුෂයන් සතරදෙනා ගෙන ගියාහ.

ඒ රූපයෙහි ඇළුම් ඇති පුරුෂයාත් යක්ෂනීන් සමීපයට ගියේය. ඔහු තමන් හා සමග ව්‍යතික්‍රමණය (කාම සේවනය) කළ කල්හි ඒ පුරුෂයා එතනදීම ජීවිතක්ෂයට පමුණුවා ඉදිරි ඉදිරියෙහි ගොස් අනික් ශාලාවක් මවා ආතත විතතාදී වූ නොයෙක් තූර්‍ය්‍යභාණ්ඩයන් ගෙන ගී කියා උන්හ. එතැන්හිදී ශබ්දයෙහි ඇළුම් ඇති පුරුෂයා රඳු ගියේය. ඔහුත් අනුභවකොට ඉදිරියේ අනේකප්‍රකාර සුවඳ කරඬු පුරා සල්පිල් හඳගෙන සිටියාහුය. එතැන්හි ගන්ධයෙහි ඇළුම් ඇති පුරුෂයා රැඳුනේය. ඔහුත් අනුභවකොට ඉදිරියේ ගොස් නොයෙක් අග්‍ර රස ඇති දිව්‍යභෝජනය පුරාගෙණ බතිනි අඟානිය(බත් කඩයක්) සදගෙන උන්හ. එතැන්හි රසයෙහි ගිජු වූ පුරුෂයා

රැඳුනේය. ඔහු අනුභවකොට ඉදිරියෙහි ගොස් අනේකප්‍රකාර දිව්‍යහන් පනවා උන්හ. එතැන්හි ස්ප්‍රෂ්ටව්‍යයෙහි(ස්පර්ශයෙහි) ලොල් වූ පුරුෂයා රැඳුනේය. ඔහුත් අනුභව කළාහ. බෝධිසත්ත්වයේ උදකළා වූය.

ඉක්බිත්තෙන් ඒ යක්‍ෂනී සිතන්නී "ඒකාන්තයෙන් මේ පුරුෂයා ඉතාම මෘදුය, මම මොහු කාමුත් නොරඳිමි"යි බෝධිසත්ත්වයන් පසුපස්සෙහි ගියාය. වන කර්මාන්ත නිසා දඬුපත් කපන්ට ගිය සත්ත්වයෝ යක්‍ෂනිය දැක "තී ඉදිරියෙහි යන්නා වූ මේ පුරුෂයා තිට කවරෙක් වේදැ?"යි විචාළාහ. "ස්වාමිදරුවෙනි, මා බාල අවස්ථාවෙහි පටන් වල්ලභ වූ පුරුෂයාණෝය"යි කීවාය. එසඳ පුරුෂයෝ "පින්වත, මෙබඳු වූ සිවුමැලි මල්දමක් සේ රන්වන් කුමාරිකාව තමාගේ දෙමව්පියන්වත් වූ පසුපස්සෙහි නික්මයෙහි කුමක් නිසා තොපි මෑ නොමිරිකා(පීඩාවට පත් නොකොට) ඇරගෙන නොයව්දැ"යි කීහ. එසඳ බෝධිසත්ත්වයෝ "එම්බා පින්වත්නි, මෝතොමෝ මාගේ ස්ත්‍රියක් නොවෙයි, යක්‍ෂනීය. මෝ මාගේ මනුෂ්‍යයන් පස්දෙනෙකු අනුභවකොටපුව"යි කිවූය. බෝධිසත්ත්වයෝ මෙසේ කියතුදු යක්‍ෂනී කියන්නී "පින්වත්නි, පුරුෂයෝ නම් කිසි කල තමන්ගේ ස්ත්‍රීන් යක්‍ෂණීන් හා ප්‍රේතදූන් හා සදෘශ(සමාන) කෙරෙති"යි කියා යමින් සිටම ගර්භණී ස්වරූපයක් දක්වා නැවත එක්දරු කෙනෙකුන් ලත් රූපයක් දක්වා පුතකු ඇකයෙන් වඩාගෙන බෝධිසත්‍වයන් පසුපස්සෙහි නික්මුණා දුටු මනුෂ්‍යයෝ පළමු සේ විචාරති.

බෝධිසත්ත්වයෝත් ඈ යකින්නී නියාව කිය කියා ගොස් තක්සලා නුවරට පැමිණියාහ.

ඒ යක්ෂනී පුතු අන්තර්ධානකොට තනියම පසුපස්සෙහි ගියාහ. බෝධිසත්ත්වයෝ මෙනුවර වාසල් දොරට පැමිණ එක් ශාලාවක උන්නාහ. යක්ෂනී බෝධිසත්ත්වයන්ගේ තේජසින් ඇතුළට වදින්ට අසමත්ව දිව්‍යරූප මවාගෙන ශාලාවාරයෙහි සිටියාහ.

එකෙණෙහි තක්සලා නුවරින් කොසොල් රජ්ජුරුවෝ උයනට යන තැනැත්තෝ ඈ දැක පිළිබඳ සිත් ඇතිව "දරුව, මෑ අස්වාමික නියාව දැනගෙන එව"යි කියා පුරුෂයෙකු යවූහ. ඒ පුරුෂයා ඈ කරා පැමිණ "සස්වාමිකදැ"යි විචාළේය. යකින්නී කියන්නී "එසේය පුරුෂයාණෙනි, මේ ශාලාවේ ඉන්නා පුරුෂයාණෝ නම් මට බාල අවස්ථාවෙහි පටන් බත් පිළි දී ස්වාමීව සිටි තැනැත්තෝය"යි කීය. බෝධිසත්ත්වයෝ එසඳ කියන්නාහු "මෝතොමෝ මාගේ ස්ත්‍රියක් නොවෙයි, මෑ යක්ෂනිය. මෑ විසින් මාගේ මනුෂ්‍යයෝ පස්දෙනෙක් අනුභවකොට පියනලදහ"යි කිවූය. යක්ෂනී කියන්නී "ස්වාමිපුරුෂයෝ නම් පින්වත, කිපි කල(තරහ ගියවිට) යමක් මුඛාවේස වීනම්(කටට ආවේ නම්) එයම කියති"යි කිව. මෙහෙවර ගිය පුරුෂයා දෙදෙනාගේ බස් අසා රජ්ජුරුවන්ට ගොස් කීය. රජ්ජුරුවෝ "අස්වාමික භාණ්ඩය නම් රජ්ජුරුවන් සන්තකය"යි කියා යක්ෂනිය කැඳවා ගෙන්වාගෙන ඇතුපිට තබා නුවර

පැදකුණුකොට ප්‍රසාදයට නැගී ඈ අගමෙහෙසුන් තනතුරෙහි තිබූහ.

ඒ රජ්ජුරුවෝ ඉස් සෝදා නහා සුවඳ විලවුන් ගන්වා සවස මෙහෙ නිමවා ශ්‍රීයහන් මසතකයට නැගී සැතපුනේය. ඒ යක්‍ෂනී තමන්ට සුදුසු ආහාරයක් අනුභවකොට සර්වාණාභරණයෙන් සැරහී සුවඳ විලවුන් ගන්වා ශ්‍රීයහන් මසතකයෙහි රජ්ජුරුවන් හා සමඟ වැදහෙව. රජ්ජුරුවන් රතිසුවයෙන් සැපවිඳ සැතපුණු කල්හි එක් ඇලයකට පෙරලී ඇඬූය.

එසඳ රජ්ජුරුවෝ ඈට "සොඳුර, තෝ කුමක් පිණිස අඬන්නෙහිදැ"යි විචාළහ. "දේවයන් වහන්ස, මම නුඹවහන්සේ විසින් මගදී දැකගෙන එන ලද්දෙමි. නුඹවහන්සේගේ අනතඃපුරයෙහි බොහෝ ස්ත්‍රීහු ඇත. මා වූකලී සම්පත්තීන් අතුරේ වසන්නෙමි බසක් උපන්විට "තීගේ මවුපිය ජාතිගෝත්‍ර දන්නෝ කව්රුද? අතරමඟදී ගෙනෙනලද්දී නොවේදැ"යි කියා ඉස බොල් කෙළ හෙව පීඩා කරන්නික් මෙන්(ඔලුවෙන් අල්ලා සොලවමින් පීඩා කරන්නාසේ) මතු කරබා ගනී(ඉදිරි කල නිහඬ වෙමි). ඉදින් නුඹවහන්සේ සියලු රාජඓශ්වර්‍ය්‍යයීත් ආඥාවත් මට දුන්සේක් වීනම් මාගේ සිත අලලා(සිත පාරවා) බසක් කියන්ට කවර නම් සත්ත්වයෙක් සමර්ථ වේදැ"යි කීව.

එසඳ රජ්ජුරුවෝ කියන්නාහ "සොඳුර මට සියළු රාජ්‍ය වාසීහු නොනැමෙති. මම උන්ට නායක නොවෙමි. යම් කෙනෙකු රාජාඥාව මරුත්තුකොට(කඩකොට) නොකළමනා

දෙයක් කෙරෙද්ද, ඔවුන්ටම නායක වෙමි. මේ කාරණායෙන් තොපට සියළු රාජ්‍ය ඓශ්වර්‍ය්‍යයත් ආඥාවත් දෙන්ට නොපිළිවනැ''යි කීහ.

එබැවින් "දේවයන් වහන්ස, රට නුවර ආඥාව නුපුළුවන් වීනම් මේ ඇතුළු මාලිගාවෙහිත් අන්තඃපුරයෙහිත් වසන්නා වූ සත්ත්වයන් කෙරෙහිත් මගේ ඉසුරු(අධිපතිබවත්) පවත්නා ලෙස ආඥාව දුන මැනවැ''යි කිව.

රජ්ජුරුවෝ දිවපහස් බැඳී ඇගේ බස මිරිකාගත නොහී(ඉවතලිය නොහැකිව) "යහපත සොඳුර, මේ අන්තඃපුරයෙහි වසන්නා වූ සත්ත්වයන් කෙරෙහි තිගේ ඉසුරු පවත්නා ලෙස අඥා දෙමි. තෝ ඔවුන් තිගේ වසඟයෙහි පවත්වා ගනුව''යි කීහ. යක්‍ෂනිය "යහපත ස්වාමීනි''යි පිළිගෙන රජ්ජුරුවන් නිදිපරමත්ව (නින්දට වැටී) නිදන කල්හි යක්‍ෂපුරයට ගොස් යක්‍ෂනියන් කැඳවාගෙන අවුත් තොමෝ රජ්ජුරුවන් ජීවිතක්‍ෂයට පමුණුවා ඇට පමණක් ශේෂකොට සියළු සම්, මස්, නහර, ලේ අනුභවකොට අවශේෂ යක්‍ෂයෝ අන්තඃපුරය ඇතුලේ මහවාසල් දොර පටන් අංගානියේ කුකුළන් බල්ලන් ආදිකොට සියල්ලවුන් නොහැර කා ඇට පමණක් ශේෂ කළාහ.

දෙවනි දවස් දොර පියූවනම(දොර වසනලද අයුරින්ම) තිබෙනු දැක මනුෂ්‍යයෝ පොරවෙන් දොර පළා ඇතුලට වැද සියළු මාලිගාව ඇටින් පිරූ තිබුවා දැක "ඒකාන්තයෙන් ශාලාවේ හොත් පුරුෂයා 'මේ මාගේ ස්ත්‍රිය නොවෙයි,

යක්‍ෂනීය'යි කී බස් සැබෑමයයි රජ්ජුරුවෝ වූ කලි තමන් කිසිවක් නොදන්නා හෙයින් තමන්ට බිසෝ තනතුරෙහි තිබූහ. ඕතොමෝ යක්‍ෂයන් කැඳවා ගෙන අවුත් සියළු ජනයා කා ගියාය''යි කීහ.

බෝධිසත්ත්වයෝත් එදවස් ශාලාවෙහිත් පිරිත් වැලි ඉසලාගෙන පිරිත් හූ වටකොට කඩුව අතින්ගෙන සිටම අරුණු නැග්හ. මනුෂ්‍යයෝ සියළු රාජාංගනයේ හා මාලිගාවේ ඇට අද්දවා දම්මවා කසල හැර ශුද්ධකොට ගොම ගාවා, ඊ මතුපිට සිවු දෑ ගඳින් පිරිබඩ කොටගෙන සුවඳමල් විසුරුවා සුවඳමල් තැන තැන එල්වා, සුවඳ දුම් දී පුන්කලස් තනා ධජපතාකයෙන් හා කෙසෙල් ගස් ආදියෙන් බැඳ දිව්‍ය විමානයක් මෙන් සරහා කථා කරන්නාහු “පින්වත්නි, යම් පුරුෂයෙක් දිව්‍ය රූපය මවාගෙන පසුපස්සේ යන්නා වූ යක්‍ෂනී ඇඳින ඉන්ද්‍රියන් බිඳ(අසංවරව) බැලීම් පමණකුත් නොකළේද? ඒතෙම උදාර මනුෂ්‍යයෙකි. ධෛර්‍ය්‍යසම්පන්නය, මහනුවණැත්තේය, එබඳු පුරුෂයෙකු අනුශාසනා කරන කල්හි සියළු රාජ්‍යය සුඛිත වන්නේය, ඔහු රජකරවමිහ''යි කීහ.

ඉක්බිත්තෙන් සියළු අමාත්‍යයන් හා නුවරවාසීන්ද ඒකච්ඡන්දව බෝධිසත්ත්වයන් කරා පැමිණ “දේවයන් වහන්ස, නුඹවහන්සේ මේ රාජ්‍යයෙහි රාජශ්‍රී අනුභවකොට වදාළ මැනවැ''යි කියා නුවරට කැඳවාගෙන ගොස් රුවන් රැසක් මත්තෙහි සිටුවා අභිෂේකකොට(ඔටුනු පළඳා) තක්සලා නුවර රජ කළාහුය.

ඒ රජ්ජුරුවෝ ඡන්දයෙන්ද, ද්වේශයෙන්ද, මෝහයෙන්ද, භයින්ද, නොකළමනා කාය්‍ර්‍යයන් නොකරන හෙයින් සතර වැදෑරුම් අගති ගමනය දුරුකොට දශරාජ ධර්‍මයෙන් අකොපය්‍යවකොට(උල්ලංඝනය නොකට) දැහැමෙන් රාජ්‍යය කෙරෙමින් දනාදී වූ පින්කම්කොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ.

ශාසතෘ වූ බුදුරජාණන් වහන්සේ මේ අතීත කථාව ගෙනහැර දක්වා වදාරා භික්ෂූන් වහන්සේට අවවාද වදාරනසේක් මෙසේ වදාළසේක. “මහණෙනි, ඇතුළු මුවවිට(ගැටිටේ) රේඛාව සමව පිරුණා වූ තෙල් බින්දුවකුත් නොවගුරුවා යම්සේ පුරුෂයෙක් ගෙන ගියේද? එපරිද්දෙන්ම තමාගේ සිත කායගතාසතියෙහි (කය පිළිබඳව විමසා බැලීමෙහි) ඇසිල්ලකුත් බහිරාලම්බනයෙහි වික්‍ෂෙපයට(බාහිර අරමුණු දැක සිත චංචලබවට) නොපැමිණේ් නම් එපරිද්දෙන්ම නුවණැත්තා වූ යෝගාවචරතෙමේ(භාවනාවෙහි යෙදෙන පුද්ගලතෙම) ස්වකීය වූ චිතතය රක්නේය. කුමක් පිණිසද යත්, අනවරාග්‍ර(අගමුල නොදත්) සංසාරයෙහි කිසි බාල පෘථජ්ජන කෙනෙකුන් විසින් ස්වප්නයෙනුත්(සිහිනෙනුදු) නොගිය විරූ නිර්‍වාණ නැමැති දසාව(දිසාව) ප්‍රාර්ථනා කරන්නාහු විසින් කර්මස්ථානයෙහි ඇමවේලෙහිම අභ්‍යාස කටයුතුද, එසේ හෙයින් යම් පුද්ගලයෙක් නිවන් දකිනා කැමැත්තේ වීනම් ඒ සත්ත්වයා විසින් තෙල් පාත්‍රය ගෙන යන්නා වූ සත්ත්වයා හැම වේලෙහිම සිහි ඇතිව තෙල් බින්දුවකුත් නොවගුරුවා ගෙන යන්නාක් මෙන් හැමවේලෙහිම

කායගතාසති කර්මස්ථානයෙන් යුක්තව නානාලම්බනයෙහි(නොයෙක් අරමුණු වෙත) සිත යා නොදී චිත්තෙකාග්‍රතාකොට(සිත එකඟකොට) තමාගේ සිත රැක අමෘතමහා නිර්වාණය සාක්ෂාත් කටයුත්තේය"යි මෙසේ ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ නිර්වාණධර්මයෙන් දේශනාව කූළුගන්වා (සම්පූර්ණකොට) මේ 'තෙලපත්ත ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි රජපිරිස නම් දැන් බුදුපිරිසය, එසමයෙහි රාජ්‍යයට පැමිණියා වූ කුමාරයෝ නම් තිලෝගුරු සම්මා සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 096. නාමසිද්ධි ජාතකය

තවද එක් සමයෙක්හි අසමසම වූ(සෙසු බුදුවරුන් සමගම සමාන වූ) තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසනසේක් නාමසිද්ධික(නමින් යහපත සැළසේයයි සැළකූ) භික්ෂූන් වහනසේ අරභයා මේ ජාතකය වදාළසේක.

එක් කුලපුත්‍රයෙක් නමින් පාපක නම, ඒ තෙම ශාසනයෙහි ලැදිව මහණව භික්ෂූන් වහන්සේ විසින් "ඇවැත්වූ පාපකයෙනි,(එම්බා පව්කාරයාණෙනි) මෙසේ එව, මෙසේ සිටුව"යි කියනු ලබන්නේ එබස් අසා මෙසේ සිතූසේක. "ලෝකයෙහි පාපක නම් ලාමකය(පහත්ය), කාලකන්ණියක හා සමානය, අන්‍ය වූ මංගල ප්‍රතිසංයුක්ත වූ(යහපත් බැවින් යුතු) නමක් කියවා ගනිම්"යි ඒ මහණ ආචාර්ය උපාධ්‍යායන්

වහන්සේ කරාගොස් “ස්වාමීනි, මාගේ නම අවමංගල්‍යය, අනිත් නමක් මට කළ මැනවැ”යි කීසේක.

ඉක්බිත්තෙන් භික්‍ෂූන් වහන්සේ කියනසේක් “ඇවැත්නි, නාමය නම් ප්‍රඥප්ති මාත්‍රයකි, නමින් කිසි අර්ථ සිද්ධියක් නම් නැත. තොපගේ නමින්ම සතුටුව”යි කීසේක. ඒ මහණ නැවත නැවත යාච්ඤා කෙළේමය, තවද භික්‍ෂූන් වහන්සේ නාමසිද්ධික බව සංඝයා වහන්සේ කෙරෙහි ප්‍රසිද්ධ විය.

ඉක්බිත්තෙන් එක් දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස්ව උන්නා වූ භික්‍ෂූන් වහන්සේ “ඇවැත්නි, අසවල් මහණ නම් සිද්ධ කරන්නේය(නම් සාදන්නේය). අභිවෘද්ධිකරන(යහපත සිදු කරන්නා වූ) නාමයක් ඉල්වන්නේය”යි මෙසේ වූ කථාවක් උපදවා හුන්සේක. සර්වඥයන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩ “මහණෙනි, දැන් කවර කථාවකින් යුක්තව හුනුදැ”යි විචාරා “මේනම් කථාවකින් යුක්තව හුනුම්හ”යි කී කල්හි “මහණෙනි, ඒ භික්ෂුහු නාමසිද්ධික වූයේ දැන්මතු නොවෙයි, පෙරත් නාමසිද්ධිකමය”යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස තක්සලා නුවර මහබෝසතාණෝ දිසාපාමොක් ආචාර්ව පන්සියයක් මානවකයන්ට මන්ත්‍ර හදාරන්නාහුය. ඒ බෝධිසත්වයන්ගේ එක් මානවකයෙක් නමින් පාපක නම, ඒ තෙමේ සෙසු මානවකයන් විසින් ඒ පාපකයාට “මෙසේ සිටු පාපකය, මෙසේ යව පාපකය”යි කියන්නා වූ බස් අසා සිතන්නේ “මාගේ නාමය අවමංගය්‍යය, අන්‍ය නාමයක් ඉල්වා ගනිමි”යි සිතා ආචාරීන් කරා ගොස් “ආචාරීන්

වහන්ස, මාගේ නම අවමංගල්‍යය, එසේ හෙයින් මට අනික් නමක් තබව"යි කිවූය.

එකල්හි ආචාර්‍ය ඕහට කියන්නෝ "දරුව, ජනපද චාරිකාකොට තොප සිතට අභිප්‍රාය වූ එක් අභිවෘද්ධි නාමයක් ගෙන එව. ඒ නාමය හැරගෙන ආ කල්හි ඒ නම් පෙරළා(ඒ නම වෙනස්කොට) අනික් නමක් තොපට තබමි"යි කිවුය. එබස් ඇසූ මාණවකයා "යහපත ආචාර්‍යන් වහන්ස"යි කියා මාර්ගෝපකරණ ගෙන නික්ම ගමින් ගමට ඇවිදිනේ එක් නුවරකට පැමිණියේය.

එනුවර ජීවක නම් එක් පුරුෂයෙක් බන්ධු වර්ගයා(නෑදෑයින්) විසින් දවන්ට(මල ජීවකව ආදාහනයට) ගෙන යන්නා දැක "මේ කිනම් පුරුෂයෙක්දැ"යි විචාළේය. "ජීවක නමැ"යි(ජීවත් වන්නා නමියයි) කීවාහුය. "ජීවකයාත් මියේදැ"යි විචාළ කල්හි "ජීවකයාත් අජීවකයාත් මියන්නෙ වේද? නාමය වූකලී ප්‍රඥප්තිමාත්‍රයක, තා අඥාන එකෙකැයි සිතම්හ"යි කිවූය.

එකල්හි ඒ පාපක නම් පුරුෂයා ඒ කථාව අසා නාමයෙහි මධ්‍යස්ථව ඇතුළුනුවරට වන්නේය. එකල්හි දාසියක බැලමෙහෙ නොකරන්නා දැක ස්වාමි දරුවෝ බැඳ හිඳුවා වැලක් ගෙන ගසන්නාහුය. ඇගේ නම ධනපාලි නම් වන්නේය. ඒ පාපකයා නම් පුරුෂයා වීථි මධ්‍යයෙන් යන්නේ ඈට තලන්නා දැක "කුමක් නිසා මෑට තළවිදැ?"යි විචාළේය. "බැලමෙහෙ නොකරන හෙයින් තලම්හ"යි කී කල්හි "මැගේ නම

කිම්දැ?"යි විචාළේය. "ධනපාල නමැ"යි කී කල්හි "ධනපාල නම් ඇත්තෝ බැලමෙහෙ පමණක් දීගත නොහෙද්දැ?"යි විචාළේය. "ධනපාලනුත් අධනපාලනුත් දුක්පත් වෙති, නාමය වූ කලී ප්‍රඥප්තිමාත්‍රයක, එසේ හෙයින් තෝ අඥනව විචාරෙහි සිතමි"යි කීය.

එබස් ඇසූ පාපක නම් මානවකයා නාමයෙන් අතිශයින් මධ්‍යස්ථව නුවරින් පිටත්ව මඟට පිළිපන්නේ අතරමඟ මංමුලා වූ පුරුෂයෙක් දැක "දරුව කුමක්කොට ඇවිදිදැ?"යි විචාළේය. "ස්වාමීනි, මංමුලා වීමි"යි කී කල්හි "තාගේ නම කුමක්දැ?"යි විචාළේය. "පන්ථක(මඟ යන්නා) නම් ඇත්තෙමි"යි කීයේය. "පන්ථකයෝත් මංමුලා වෙද්දැ?"යි විචාළේය. "පන්ථකයෝත් අපන්ථකයෝත් මංමුලා වෙති, නාමය වූකලී ප්‍රඥප්තිමාත්‍රයක, තෝ අඥනව විචාරෙති සිතමි"යි කීහ.

එබස් ඇසූ පාපක නම් මානවකයා නාමයෙහි අතිශයින් මධ්‍යස්ථව බෝධිසත්ත්වයන් සමීපයට ගොස් "කීමෙක්ද? දරුව නමක් අභිප්‍රායකොට ගෙන ආයිදැ"යි විචළේය. එකල්හි "ආචාර්ීන් වහන්ස, ආජීවකයෝත් ජීවකයෝත් මියති, ධනපාලිත් අධනපාලිත් දුක්පත් වෙති, පන්ථකයෝත් අපන්ථකයෝත් මංමුලා වෙති එසේ හෙයින් නාමය නම් ප්‍රඥප්තිමාත්‍රයක, නාමයෙන් අර්ථසිද්ධියක් නැත, මේ කර්මයෙන්ම අර්ථසිද්ධිය වන්නේය. එසේ හෙයින් මට අනික් නමකින් කම් නැත, පළමු මාගේ නමම මට නම් වෙයි"යි කීය.

එබස් ඇසූ මහබෝසතාණෝ "ඔහු විසින් දුටු දෙයක්, කළ දෙයක් එක්කොට ගළපා කියන්නාහ. ජීවකයා මළා දැක ධනපාලයා දුක්පත් නියාව දැක පන්ථකයෝ මංමුළා වූ නියාව දැක පාපක නම් මානවකයා අභිවෘද්ධි නාමයෙන් ප්‍රයෝජනයක් නැත කියා නැවත තමා වසන්නා වූ ස්ථානයට ආයේ වේදැ"යි කිවූය.

ශාස්තෘ වූ බුදුරජණන් වහන්සේ මේ අතීත කථාව ගෙනහැර දක්වා වදාරා "මහණෙනි, මේ පාපක නම් පුරුෂයා අභිවෘද්ධිකරන නාමයක් උවමනවැයි නම් සිද්ධකොට ඇවිද්දේම වේදැ"යි වදාරා මේ 'නාමසිද්ධි ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි නාමසිද්ධි මානවකයා නම් දැන් මේ නාමසිද්ධි මහණය, එසමයෙහි ආචාරීන්ගේ පෂීත් නම් දැන් බුදුපිරිසය, දිසාපාමොක් ආචාරී වූයෙම් නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 097. කූටවාණිජ ජාතකය

තවද එක් සමයෙක්හි අප්‍රතිවාද වූ(තමන්වහන්සේට එරෙහිව කථා කළහැක්කෙක් නැත්තා වූ) තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වසනසේක් එක් සොර වෙළෙඳක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

සැවැත් නුවර වෙළෙන්දෝ දෙදෙනෙක් එක්ව වෙළොම් කරන්නාහු ගැලින් බඩුගෙන ජනපද චාරිකාවට ගොස්

වෙළඳම්කොට ලාභ ලැබගෙන පෙරලා ආවාහුය. ඔවුන් දෙදෙනා අතරෙන් සොර වෙළෙඳ මෙසේ සිතූහ. "මේ වෙළෙඳ බොහෝ දවසක් දුර්භෝජනයෙන් හා දුක්ඛසෙය්‍යාවෙන් මිරිකුණෝය(යහපත් ආහාර හා නවාතැන් පහසු නැතිවීමෙන් පීඩාවට පත්විය), දැන් තාමාගේ ගෙයි අනේකප්‍රකාර වූ අග්‍රරසයෙන් යුක්ත වූ භෝජනය අනුභවකොට දිරවාගත නොහී අජීර්ණව මිය යන්නේය. එකල්හි මම මේ භාණ්ඩ තුන් කොටසක්කොට එක් කොටසක් ඔහුගේ දරුවන්ට දෙමි. දෙකොටසක් මම ගනිමි"යි සිතා ඒ සොර වෙළෙඳ "අද බෙදමි, සෙට බෙදමි"යි කියා බෙදන්ට මැලිව හිඳිනේය.

ඉක්බිත්තෙන් නුවණැති වෙළෙඳ ඔහු නොකැමැති වුවත් බලාත්කාරයෙන් බඩු බෙදවා විහාරයට ගොස් බුදුරජාණන් වහන්සේට නමස්කාරකොට සුවදුක් කථාකොට උන් කල්හි සර්වඥයන් වහන්සේ විසින් "උපාසකය, මෙසේ දවස් ලස්වගියේ(පමාවූයේ) කුමක් නිසාදැ?යි නුවරට අවුදිනුත් කල්යවා බුද්ධෝපස්ථානයට නොආයේය. කවර කාරණයකින්දැ?"යි විචාළ කල්හි එපවත් බුදුරජාණන් වහන්සේට දැන්වීය.

සර්වඥයන් වහන්සේ "උපාසකය, මොහු සොර වෙළෙඳ වූයේ දැන්මතු නොවෙයි, පෙරත් සොර වෙළෙඳමය. දැන් වූකලි තොප වඤ්චා කරණු කැමතිය. පෙරද නුවණැත්තන්

වඤ්චා කරන්ට උත්සාහ කළේ වේදැ"යි වදරා ඒ උපාසකයා විසින් ආරාධිත වූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහබෝසතාණෝ බරණැස් නුවර වෙළඳ කුලයක උපන්නාහුය. ඒ බෝධිසත්ත්වයින්ට නම් තබන දවස් 'පණ්ඩිතයෝ'යයි නම් තැබූහ. ඒ මහබෝසතාණෝ වැඩිවිය පැමිණ අන් වෙළෙඳකු හා සමග එක්වගෙන වෙළඳාම් කෙරෙති. ඔහුට 'අතිපණ්ඩිත'යයි නමෙක් විය. ඔහු දෙදෙන බරණැස් නුවරින් පන්සියයක් ගැලින් බඩු පටවාගෙන ජනපදයට ගොස් වෙළඳාම්කොට ලාභ ලැබගෙන නැවත බරණැස් නුවරටම අවාහුය.

ඉක්බිත්තෙන් ඔහු දෙදෙන බඩු බෙදන කල්හි අතිපණ්ඩිතයෝ "මා විසින් දෙකොටසක් ලැබිය යුතුය"යි කිවූය. "කුමක් නිසාදැ?"යි කී කල්හි "තෙපි පණ්ඩිතයෝය, මම අතිපණ්ඩිතයෙමි. එසේ හෙයින් පණ්ඩිතයෝ එක් කොටසක් ලබන්ට නිස්සෝය, මම අතිපණ්ඩිත හෙයින් දෙකොටසක් ලබන්ට නිස්සෙමි"යි කීය.

එබස් අසා මහබෝසතාණෝ කියන්නෝ "අප දෙදෙනාගේ බඩු මිලත් ගොනුත් සරිතරම් (ප්‍රමාණයෙන් සමානය) නොවේදැයි, එසේ කල දෙකොටසක් ලබන්නට කාරණ කවරේදැ?"යි විචාළෝය. "මා අතිපණ්ඩිත බැවිනැ"යි කීය. මෙසේ ඔහු දෙදෙන බසින් බසට කලහ කළාහුය.

ඉක්බිත්තෙන් අතිපණ්ඩිතයෝ "එක් උපායෙක් ඇත" සිතා තමන්ගේ පියාණන් ගස් සිදුරෙක්හි(බෙනයක) හිඳුවා කියන්නේ "තොපි අප හැමදෙනම මෙතනට ආ කල අතිපණ්ඩිතයෝ දෙකොටසක් ලබන්නට නිස්සෝයයි කියාලව"යි කියා බොධිසත්ත්වයන් සමීපයට ගොස් "සබඳ මට දෙකොටසක් ලබන්නට නිසි නියාවත් මේ වෘක්ෂ දේවතාවා දන්නේය, වරෝ යම්හ, ඔහු අතින් විචාරම්හ"යි කියා මහබෝසතාණුත් එතනට කැඳවාගෙන ගොස් "ස්වාමීනී, වෘක්ෂ දේවතාවන් වහන්ස අපගේ යුක්ති පසිඳින මැනව"යි(නඩුව විසඳනු මැනවයි) කිවුය.

ඉක්බිත්තෙන් ඕහට අතිපණ්ඩිතයෝ කියන්නාහු "මූ පණ්ඩිතයෝය, මම අතිපණ්ඩිතයෝය, අප දෙදෙනා විසින් එක්ව වෙළඳම් කරනලද, අප දෙදෙනාගෙන් කවුරුන් විසින් දෙකොටසක් ලැබිබ යුතුදැ"යි විචාළ කල්හි "පණ්ඩිතයන් විසින් එක් කොටසක් ලැබිබ යුතුය. අතිපණ්ඩිතයන් විසින් දෙකොටසක් ලැබිබ යුතුය"යි කීය. එකල්හි මහබෝසතාණෝ මෙසේ විනිශ්වය කරනලද යුක්තිය අසා "දැන් තා දේවතා නියාවත්, දේවතාවා නොවන නියාවත් දන්නෙම් වේදැ"යි කියා පිදුරු ගෙන ගස් සිදුර පුරවා ගිනි මෙළවූය.

එකල්හි අතිපණ්ඩිතයන්ගේ පියා ගිනි දැල් ඇඟ ගැසෙන්ට පටන්ගත් කල්හි ශරීරයෙන් අඩියක් දක්වාගෙන උඩට පැන නැඟී අත්තක් අල්වාගෙන එල්ලමින් ධරාගත නොහී(වාවාගත නොහැකිව) බිමට වැටී අඬමින් කියන්නේ "මේ ලෝකයෙහි කාරණා දන්නා වූ පණ්ඩිත භාග්‍යයෙන් යුක්ත වූ උත්තම

පුද්ගලයාම යහපත් වන්නේය, අතිපණ්ඩිතයා යන නාම මාත්‍රයකින් වඤ්චා ස්වභාව ඇති කූට පුරුෂයා යහපත් නොවන්නේය, කුමක් නිසාද? යත්, වඤ්චා ස්වභාව ඇති පණ්ඩිතයන්ට පියව(පියා වී) මදක් ද ගියමෝ(පිලිස්සී ගියා) නොවේදැ"යි මෙසේ බැගෑපත්ව හැඬුයේය. ඉක්බිත්තෙන් ඊ පණ්ඩිත අතිපණ්ඩිත දෙදෙන මධ්‍යයෙන් දෙකක්කොට වස්තු සරිකොටස් ගසා(මුදල්ගොඩ සමව බෙදා) ඇරගෙන කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ "පෙරත් මේ සොර වෙළෙඳමය"යි මේ අතීත කථාව ගෙනහැර දක්වා වදරා මේ 'කූටවාණිජ ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි සොර වෙළෙඳ නම් දැනුත් සොර වෙළෙඳමය, නුවණැති වෙළෙඳ වූ යෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

# 098. පරොසහස්ස ජාතකය

තවද එක් සමයෙක්හි වීතරාගී වූ(රාගය ප්‍රහීණ කළා වූ) තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වසනසේක් පෘථජ්ජනක(පුහුදුන් අය පිළිබඳ වූ) ප්‍රශ්නයක් අරභයා මේ ජාතකය වදාළසේක.

මෙහි වර්තමාන කථාව 'සරභඞ්ග' ජාතකයෙහි විස්තර වශයෙන් වන්නේය. එක් සමයෙක්හි භික්ෂූන් වහන්සේ දම්සභා

මණ්ඩපයෙහි රැස්ව "ඇවැත්නි, දස බලධාරී වූ(සඥණ බලය ආදී බල දසයක් දරන්නා වූ) බුදුරජාණන් වහන්සේ විසින් සංක්‍ෂෙපයෙන්(කෙටියෙන්) විචාරණ ලද්ද වූ ප්‍රශ්නය සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ විස්තර හෙයින් විස්සර්ජනය(විස්තර වශයෙන් විසඳීම) කළසේක් වේදැ"යි තෙරුන්වහන්සේගේ ගුණ කථාව කිය කියා උන්සේක.

සර්වඥයන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩ "මහණෙනි, දැන් කවර කථාවකින යුක්තව උනුදැ"යි විචාරා "මෙනම් කථාවකින් යුක්තව උනුම්හ"යි කී කල්හි "මහණෙනි, ශාරිපුත්‍ර ස්ථවිරයෝ මා විසින් සංක්‍ෂෙපයෙන් කියනලද ප්‍රශ්න විස්තර හෙයින් දැන්මතු විස්සර්ජනා කළෝ නොවෙති, පෙරත් මෙසේ විස්සර්ජනා කළෝම වේදැ"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහබෝසතාණෝ ප්‍රසිද්ධ වූ බ්‍රාහ්මණ වංශයෙක ඉපිද තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් සමීපයට ගොස් සියළු ශිල්ප ඉගෙණ පඤ්චකාමය හැර ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා හිමාලය වනයෙහි විසුවාහුය.

ඒ මහබෝසතාණන්ට පන්සියයක් අතවැසි වූවාහුය. ඉක්බිත්තෙන් බෝධිසත්ත්‍වයන්ගේ ප්‍රධාන ශිෂ්‍යය වූ තාපසයෝ වර්ෂා කාලයෙහි දෙසියපණසක් තපස්වීවරයන් ගෙන ලුණු ඇඹුල් සෙවුනා සඳහා මනුෂ්‍යපථයට(මිනිසුන් වෙසෙන

පෙදෙසට) ගියෝය. එසමයෙහි බෝධිසත්ත්වයන්ට කාලක්‍රියාවට කල් පැමිණියේය. සමීපයෙහි සිටි අන්තේවාසිකයා "ආචාරීන් වහන්ස, නුඹවහන්සේ විසින් කවර ගුණ ධර්මයක් ලබන ලදදැ"යි අධිගමය(අවබෝධ කළ උතුම් ගුණය) විචාළේය. මහබෝසතාණෝ ඔවුන්ට "නත්‍ථි කිඤ්චි"යි කියා මිය ගොස් ආභස්සර බ්‍රහ්ම ලෝකයෙහි උපන්නාහුය. බෝධිසත්ත්වයෝ වූ කලී අරූප සම්පත්ති(අරූපාවචර සමාපත්තිය) ලාභීව සිටත් අරූපී බ්‍රහ්ම ලෝකයෙහි නූපදනාහුය.

ඉක්බිත්තෙන් අන්තේවාසිකයෝ "ආචාරීන් වහන්සේට අධිගමයෙක් නැතැ"යි ශ්මසාන භූමියෙහි (සොහොන් බිමේදී) සත්කාර නොකළාහුය. එකල්හි ප්‍රධාන ශිෂ්‍යයාණෝ ඇවිත් "ආචාරීන් වහන්සේ කොයිදැ"යි විචාරා "කාලක්‍රියා කළාය"යි යනු අසා "කිමෙක්ද ආචාරීන් වහන්සේ අධිගමයක් විචාළහුදැ?"යි කිවූය. "එසේය, විචාළම්හ"යි කී කල්හි "කුමක් කීසේක්දැ?"යි විචාළෝය. "උන්වහන්සේ විසින් 'නත්‍ථි කිඤ්චි'යි කියා මියගොස් මෙපණක් කියනලද, එසේ හෙයින් අපි උන්වහන්සේට කිසි සත්කාරයක් නොකළම්හ"යි කීහ.

එබස් ඇසූ ප්‍රධාන ශිෂ්‍යයාණෝ "තෙපි ආචාරීන්ගේ වචනාර්ථය නොදන්නෝය, ආචාරීන් වහන්සේ ආකිඤ්චඤ්ඤායතන ලාභි(ආකිඤ්චඤ්ඤායතන නම් වූ තුන්වන අරූපාවචර සමාපත්ති ලබා ඇති බව) සේකැ"යි කිවූය. අන්තේවාසිකයෝ ප්‍රධාන ශිෂ්‍යයන් නැවත නැවත කියමින් සිටියදීත් අදහා නොගත්තෝය. මහබෝසතාණෝ ඒ කාරණය

දැන "නුවණ නැත්තා වූ අතවැස්සෝ මාගේ ප්‍රධාන ශිෂ්‍යයාගේ බස් අදහා නොගණිති. ඒ අතවැස්සන්ට මේ කාරණය ප්‍රකාශ කෙරෙමි"යි සිතා බ්‍රහ්ම ලෝකයෙන් අවුත් ආශ්‍රම ප්‍රදේශ මස්තකයෙහි මහත් වූ ආනුභාවයෙන් ආකාශයෙහි සිට ප්‍රධාන ශිෂ්‍යයන්ගේ ප්‍රඥානුභාව වර්ණනා කරන්නාහු මෙසේ කිවූය.

"කියනලද වචනයෙහි අර්ථ දැනගත නොහෙන්නා වූ අඥාන වූ දහසක් දෙන රැස්ව මේ නුවණ නැති මේ තාපසවරුන් මෙන් අවුරුදු සියයකුත් අඬා වලප්නාහුය. කිසිම අර්ථයක්වත් කාරණයක්වත් දැනගත නොහෙති. මෙබඳු වූ දහසක් දෙනාට වඩා ප්‍රධාන ශිෂ්‍යයා මෙන් කියනලද වචනයෙහි අර්ථය දැනගන්නේ වීනම් එබඳු වූ එකම නුවණැති පුරුෂයාම උතුම් වන්නේය"යි මෙසේ මහබෝසතාණෝ ආකාශයෙහි සිටම ධර්ම දේශනාකොට තපස්වී සමූහයාට තමන් ආකිඤ්චඤ්ඤායතන සමාපත්ති ලාභී නියාව ප්‍රකාශකොට බ්‍රහ්ම ලෝකයට ගියාහුය. ඒ තාපසයෝත් කිසුණු පිරියම්කොට(කසින භාවනා වඩා) ධ්‍යානලාභීව බ්‍රහ්මලෝකයෙහි උපන්නාහුය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා වදාරා මේ 'පරොසහස්ස ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි ප්‍රධාන ශිෂ්‍යායා නම් දැන් ශාරිපුත්‍ර ස්ථවිරයෝය, මහාබ්‍රහ්මව උපන්නෙම් තිලෝගුරු බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 099. අසාතරූප ජාතකය

තවද එක් සමයෙක්හි වීතදෙවෂී වූ(ක්‍රෝධය පහකළා වූ) තිලෝගුරු බුදුරජාණන් වහන්සේ කොධන නම් නුවර නිසා කුණ්ඩධාන වනයෙහි වසනසේක් කෝලිය රජ්පුරුවන්ගේ දූ වූ සුප්පවාසා නම් උපාසිකාව අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ සුප්පවාසා නම් උපාසිකාවට එසමයෙහි සත් අවුරුද්දක් මුළුල්ලෙහි කුසින් දරුගැබ පරිහරණයකොට(දරාගෙන) සතියක් මුළුල්ලෙහි ගර්භයෙන් මූඪව(දරුගැබ හරස්වීම නිසා) ඉතා මහත් වූ වේදනා උපන්නේය. ඒ උපාසිකාව මෙසේ අධික ප්‍රමාණ වූ වේදනාවෙන් පීඩිතවත් බුදුගුණ කියන්නී "යම් සර්වඥ කෙනෙකුන් වහන්සේ මෙබඳු වූ දුක් තරණය පිණිස(දුක් නිවා ගැනීම සඳහා) ධර්මදේශනා කරනසේක් වීනම් ඒ භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සධර්මයන්(දතයුතු සියළු ධර්ම) සර්වාකාරයෙන්(හැම අයුරින්ම) පරොපදෙශ රහිතව(අනුන්ගේ උපදේශ නොමැතිව) දත්සේක. යම් අෂ්ටාර්‍ය්‍ය පුද්ගල භික්ෂු(සතරමග සතරඵලයට පැමිණි භිකෂූන්) සමූහයෙක් මෙබඳු වූ දුක් දුරු කරණු පිණිස පිළිපන්නේ වීනම්(යෙදී සිටි නම්) භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකසංඝයා ඒකාන්තයෙන් මොනවට

පිළිපන්නේය. යම් නිර්වාණ ධර්මයෙක්හි මෙබඳු වූ දුක්ඛයෙක් නැත්තේ වීනම් ඒකාන්තයෙන් ඒ නිර්වාණ ධර්මය සැප වන්නේය”යි යන මේ ත්‍රිවිධානුස්මෘතියෙන්(තෙරුවන් සිහි කිරීමෙන්) යුක්තව ඉවසූය.

ඒ සූප්පවාසා නම් උපාසිකාතොමෝ තමාගේ ස්වාමිපුරුෂයා ලඟට කැඳවා තමාගේ පවතුන් මේ නමස්කාර අස්නත් කියනු පිණිස සර්වඥයන් වහන්සේ සමීපයට යවූහ. සර්වඥයන් වහන්සේ නමස්කාර අසුන් අසා “සුප්පවාසා නම් කෝලිය රජ දූ සුවපත් වේවයි, නීරෝග වේවයි, පුතකු වදුව”යි කීසේක. සර්වඥයන් වහන්සේගේ ඒ වචනය හා සමගම සුප්පවාසා නම් වූ කෝලිය රජ දූ සුවපත්ව නීරෝගව පුතෙකු වැදූහ. ඉක්බිත්තෙන් ඒ උපාසිකාවගේ වල්ලභයා(ස්වාමිපුරුෂයා) ගෙට ගොස් ඒ උපාසිකාව වැදූ නියාව දැක “පින්වත්නි, ඒකාන්තයෙන් ආශ්චර්යයෙකැ”යි අතිශයින් බුද්ධානුභාවයෙන් ආශ්චර්ය අද්භූත වූ සිත් ඇත්තේ විය. සුප්පවාසා නම් උපාසිකාවත් පුතකු වදා සතියක් මුළුල්ලෙහි බුදුන් ප්‍රධානකොට ඇති භික්ෂුසංඝයා වහන්සේට දන්දෙනු කැමතිව නැවත ආරාධනා කරුනු සඳහා තමාගේ ස්වාමිපුරුෂයා යවූහ.

එසමයෙහි මුගලන් මහතෙරුන් වහන්සෙගේ උපාසකයක්හු විසින් බුදුන් ප්‍රධානකොට ඇති භික්ෂුසංඝයා වහන්සේ පවරනලද සේක(දනට ආරාධනා කරනලද සේක). සර්වඥයන් වහන්සේ සුප්පවාසාවන්ගේ දනට අවසර(ඉඩ) දෙන පිණිස

මුගලන් මහතෙරුන් වහන්සේ ඒ උපාසකයා සමීපයට යවා ඔහු ගිවිස්වා(නියමකර ගත් දිනයට පසුව දනට වඩිනබවට පොරොන්දු කරවාගෙන) සතියක් මුළුල්ලෙහි භික්‍ෂූන් වහන්සේ හා සමඟ ඒ සුප්පවාසාවන්ගේ දන් පිළිගත්සේක.

සත්වෙනි දවස් සුප්පවාසාවෝ පුතණුවන් ‘සීවලී’ කුමාරයන් සරහා භික්ෂුසංඝයා වහන්සේ වැන්දවූය. ඒ කුමාරයන් පිළිවෙලින් සැරියුත් මහතෙරුන් වහන්සේ සමීපයට ගෙනගිය කල්හි තෙරුන්වහන්සේ ඒ කුමාරයන් සමග “කිමෙක්ද සීවලීනි, තොපට සැපදැ?”යි සුවදුක් කථා කළසේක. එවිට කුමාරයෝ කියන්නෝ “ස්වාමීනි, මට සැපයෙක් නම් කොයින්ද? මම සත් අවුරුද්දක් මුළුල්ලෙහි ලොහෝකුඹු නිරයක් වැනි වූ මව්කුස විසූයෙම් වේදැ”යි තෙරුන්වහන්සේ හා සමඟ මෙබඳු කථාවක් කළෝය. සුප්පවාසාවෝ ඒ කුමාරයන්ගේ බස් අසා “උපන් සතියෙන්ම මාගේ පුතණුවෝ අනුබුද්ධ වූ දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ හා සමග කථා කෙරෙති”යි සොම්නසට පැමිණියෝය.

සර්‍වඥයන් වහන්සේ සුප්පවාසාව අතින් “මෙබඳු වූ දරුවන් කැමැත්තේදැ?”යි විචාළසේක. “ස්වාමීනි, ඉදින් මෙබඳු වූ සෙසුත් දරුවන් සත්දෙනෙකු ලද්දේ වීනම් මම කැමැත්තෙම් වේදැ”යි කීවාය. සර්‍වඥයන් වහන්සේ උදම් අනා(සතුටු බස් කියා) අනුමෙවෙනි(කළ පින්කම අනුව සතුටු විය හැකි) ධර්‍මදේශනාකොට වැඩිසේක. සීවලී කුමරුවෝත්

සත් ඇවිරිදි කලම ශාසනයෙහි ලැදිව මහණව විසි වයස පිරුණු කල්හි උපසම්පදාව ලැබ පිනැතිව ලාභයෙන් අග්‍රප්‍රාප්තව(මුදුන් පැමිණ) මහී කම්පා කරවා(මහපොළොව දෙදරවා) අර්හත්ඵලයට පැමිණ පිනැත්තවුන් අතුරෙන් ඒතදගග තනතුරට(ප්‍රධාන තනතුරට) පැමිණිසේක.

ඉක්බිත්තෙන් එක් දවසක් භික්‍ෂූන් වහන්සේ දම්සභා මණ්ඩපයට රැස්ව "ඇවැත්නි, සීවලී ස්ථවිරයන් වහන්සේ සත් අවුරුද්දක් මුලුල්ලෙහි මව්කුසෙහි වැස සත් දවසක් ගර්භමූඪ බවට පැමිණිසේක. අනේ දෙපුතුමව් මහා දුක් අනුභව කළාහුය. කෙබඳු කර්මයක් කළෝදැ"යි කථාවක් උපදවා උන්සේක. ශාස්තෘ වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ එතනටම වැඩ වදාරා "මහණෙනි, දැන් කවරනම් කථාවකින් යුක්තව හුනුදැ"යි විචාරා "මෙනම් කථාවකින් යුක්තව උනුම්හ"යි කී කල්හි "මහණෙනි, මහපිණැත්තා වූ සීවලී ස්ථවිරයන්ට සත් අවුරුද්දක් මුළුල්ලෙහි ලොහොකුඹු නරකාදිය හා සමාන මව්කුස වාසයද සතියක් මුළුල්ලෙහි ගර්භමූඪ බවට පැමිණීමද ඔවුන් විසින් ම කළ කර්මය මුල්කොට ඇත්තේය. සුප්පවාසාවන්ට සත් අවුරුද්දක් මුළුල්ලෙහි කුසින් දරුගැබ පරිහරනය කරන්නා වූ දුකුත් සතියක් මුළුල්ලෙහි ගර්භමූඪ වූ දුකුත් තමන් කළ කර්මය මුල්කොට ඇත්තේය"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහබෝසතාණෝ

රජ්ජුරුවන්ගේ අග්‍රමහේසිකාවන්ගේ කුස පිළිසිඳගෙන වැඩිවිය පැමිණ තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් සමීපයෙන් ශිල්ප ඉගෙන පියාණන් ඇවෑමෙන් දැහැමෙන් රාජ්‍යය කළේය.

එසමයෙහි කොසොල් රජ්ජුරුවෝ මහසෙනග පිරිවරා බරණැස් නුවර ගෙන රජ්ජුරුවන් ජීවිතක්‍ෂයට පමුණුවා රජ්ජුරුවන්ගේම අගමෙහෙසුන් තමන්ට අගමෙහෙසුන් කළෝය. බරණැස් නුවර රජ්ජුරුවන්ගේ පුතණුවෝ පියාණන් මළ කල්හි වාරිමාර්ගයෙන්(නගරය තුළ සිට පිටතට ජලය බැසයන කාණුවකින්) පලාගොස් සේනාව රැස් කරවා බරණැස් නුවරට අවුත් නුදුරු තෙනක හිඳ රජ්ජුරුවන්ට “රාජ්‍යය හෝ දුන මැනව, යුද්ධය හෝ කළ මැනව”යි පත්(හසුන්) යවූහ.

එකල කෝසල රජ්ජුරුවෝ “යුද්ධ කෙරෙමි” පෙරලා පත් යවූහ. රාජ කුමාරයන්ගේ මෑණියෝ ඒ අසුන්(ලිපිය) අසා “යුද්ධයන් කම් නැත, හැමදිගම සංචාරය සිඳ(හැමතැනම හැසිරීම් නවත්වා) බරණැස් රජ වටලා ගණුව, ඉක්බිත්තෙන් දරපැන්බත් ආදිය නිමා ගිය කල්හි ආහාරයෙන් පීඩිත වූ මනුෂ්‍යයන් ඇති නුවර යුද්ධයක් නැතිවම ගන්නාමෝද්‍රැ”යි පතක් යවූහ. ඒ රාජකුමාරයෝ මෑණියන්ගෙන් එවූ අසුන් අසා සත් දවසක් මුළුල්ලෙහි සංචාරය සිඳ නුවර වටලා ගත්තුය. නුවර ඇතුළට පැමිණියා වූ සත්ත්වයෝ මැදිරිය පසි වූ(කූඩුවට හිර වූ) පක්ෂීන් පරිද්දෙන් විය. සත්වෙනි දවස් ඒ කොසොල් රජ්ජුරුවන්ගේ හිස ගෙනවුත් කුමාරයන්ට දුන්නාහුය. කුමාරයෝ නුවරට වැද රාජ්‍යය ගෙන රාජ්‍යශ්‍රී

අනුභවකොට කෙළවර කම් වූ(කළ පින් පවු අනුව) පරිද්දෙන් මිය පරලොව ගියාහ.

ඒ කුමාරයෝ සතුරු රජ්ජුරුවන්ගේ සේනාවට පීඩා කළා වූ අකුසල කර්ම විපාකයෙන් සත් අවුරුද්දක් මුළුල්ලෙහි මවුකුස වැස සතියක් මුළුල්ලෙහි ගර්භමූඪ බවට පැමිණියෝය. තවද ඒ කුමාරයෝ 'පියුමතුරා' (පදුමුත්තර) නම් සර්වඥයන් වහන්සේගේ ශ්‍රීපාද මූලයෙහිදී "ලාභීන් අතුරෙහි අග්‍ර වෙම්ව"යි කියා මහදන් දී යම් ප්‍රාර්ථනාවක් කළෝද 'විපස්සි' සර්වඥයන් සමයෙහි නුවර වාසීන් සමග දහසක් වස්තු අගනා වූ දී උක් සකුරු දන් දී යම් ප්‍රාර්ථනාවක් කළෝද එහි ආනුභාවයෙන් ලාභීන් කෙරෙහි අග්‍ර වූහ. සුප්පවාසාවෝත් "නුවර වටලාගෙන නිස්සඤ්චාරයකොට(ඔබමොබ හැසිරීම නවත්වා) බත්පැන් වැද්ද නොදී නුවර අරගනුව"යි පුතණුවන්ට කියා යවූ බැවින් සත්අවුරුද්දක් මුළුල්ලෙහි කුසින් දරුගැබ පරිහරණකොට සතියක් මුළුල්ලෙහි ගර්භමූඪ වූය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ "මහණෙනි ඒ දෙපුතු මවුන් මේ ගර්භපරිහරණය ගර්භවාස සංඛ්‍යාත වූ(මව සත් අවුරුද්දක් දරු ගැබ උසුලා සිටීම හා පුතු සත් අවුරුද්දක් මවුකුස විසීම නම් වූ) දුක්ඛයෙන් පීඩිතවූවන් පෙර තමන් විසින් නුවර වටලා නිස්සඤ්චාරකොට මහජනයාට දුක් දීමෙන් කළ අකුසල කර්මයෙනැ"යි මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදරා 'අසාතරූප ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි නුවර වටලා රාජ්‍යයට පැමිණි කුමාරයෝ නම් සීවලී ස්ථවිරයෝය, මෑණියෝ නම සුප්පවාසාවෝය, පිය වූ බරණැස් නුවර රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 100. පරොසත ජාතකය

තවද එක් සමයෙක්හි වීතමෝහී වූ(මොහය පහකළා වූ) තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසනසේක් පෘථග්ජන ප්‍රශ්නයක්(ලාමක අය පිළිබඳ ප්‍රශ්නයක්) අරභයා මේ ජාතකය වදාළසේක

මෙහි වර්තමාන කථාවත් අතීත කථාවත් ප්‍රශ්නව්‍යාකරණයෙන් (ප්‍රශ්න හා විසඳීම් අනුව) යට කියනලද 'පරොසහස්ස' ජාතකය හා සමාන වන්නේය. හුදක් මෙහි නුවණැත්තා වූ සත්ත්වයෝ අවුරුදු සියයක් කියනලද වචනයෙහි අර්ථ පරීක්ෂා කරන්නාහු වීනම් එසේ බලා පරීක්ෂා කරන්නාවුත් සත්ත්වයෝ අර්ථයක්වත් දැනගත නොහෙන්නාහුය. එසේ හෙයින් යම් සත්ත්වයෙක් කියනලද වචනයෙහි අර්ථය දන්නේ වීනම් ඒ එකම නුවණැති පුද්ගලයා උතුම් වන්නේය. මෙසේ මහබෝසතාණෝ ආකාශයෙහිම සිට ධර්මදේශනාකොට තපස්වී සමූහයාට ප්‍රශ්නය අවබෝධකොට බ්‍රහ්ම ලෝකයටම ගියෝය. ඒ තපස්වීවරයෝත් කිසුණු පිරියම්කොට(කසිණ භාවනා වඩා) ධ්‍යානලාභීව(ධ්‍යාන උපදවාගෙන) ජීවිතපර්‍යන්තාවසානයෙහි(දිවි කෙළවර) මියගොස් බ්‍රහ්ම ලෝකයෙහි උපන්සේක.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා මේ ‘පරොසත ජාතකය’ නිමවා වදාළසේක.

# 101. පණ්ණික ජාතකය

තවද එක් සමයෙක්හි අසිත්‍යනුව්‍යංජනයෙන් යුක්ත වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වසනසේක්. එක් පණ්ණික උපාසකයක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ පණ්ණික නම් උපාසකයා සැවැත් නුවර වැසි සැදෑ ඇති රත්නත්‍රයෙහි ප්‍රසන්න වූ එක් උපාසකයෙක. ඒ තෙම අනේකප්‍රකාරයෙන් ඉගුරු කසා ආදියද තම්පලා ආදී වූ පලාකොල හා ලබු පුසුල් ආදිය විකොට(විකුණා) ජීවත් වන්නේය. ඒ උපාසකයාගේ එක් දුවක් ඉතා විශේෂ රූ ඇත්තීය, බැලූබැලූවන්ට ප්‍රසාද එලවන්නීය, ආචාරශීලයෙන් යුක්තය, භය ලජ්ජා දෙකින් සමන්විතය, හුදක් සැමවේලෙහි සිනාමුසු මුහුණු ඇත්තීය. ඒ කුමාරිකා සමානජාති ඇත්තා වූ කුලයකින් පුරුෂයන් අවුත් විවාහ නිසා විචාළ කල්හි කුමාරිකාවන්ගේ පියාණෝ මෙසේ සිතූහ “මේ කුමාරිකාව ඔබ්බෙත් පුරුෂයෝ ඇවිත් විචාර ගියෝය, මෝතොමෝත් හැමවේලෙහිම සතුටුවූ මුහුණු ඇත්තීය, කුමාරිකා ධර්‍මය නැති බැවින් කුමාරිකාවන් අන් කුලයට ගිය කල්හි දෙමව්පියන්ට නින්දා වන්නේය, එසේ හෙයින් මේ කුමාරිකාවට කුමාරිකා ධර්‍මය ඇද්දෝ හෝයි නැද්දෝ හෝයි පරීක්ෂා කෙරෙමි”යි සිතා ඒ උපාසකයා එක් දවසක් දුව ලවා පෙට්ටියක් ගෙන්වා ගෙන වලින්(කැලයෙන්) පලා කඩනු සඳහා වලට ගොස්

පරීක්‍ෂා කිරීම් වශයෙන් කලේශනිශ්‍රිත වූවාක්හු මෙන් රහස් කියා ඒ කුමාරිකාවගේ අත අල්වා ගත්තුය. ඒ කුමාරිකාව අත අල්වාගත් පමණකින් අඬමින් වලපමින් කියන්නී "පියාණන් වහන්ස, මේ නුඹවහන්සේට සුදුසු නොවෙයි, දියෙන් ගිනි නැන්ගා හා සමානය, එසේ හෙයින් නුඹවහන්සේ මෙබන්දක් නොකළ මැනවැ"යි කිව. එබස් ඇසූ පියාණෝ "මැණීයෙනි, මා විසින් තොප පරීක්‍ෂා කරණු පිණීස තොප අල්වා ගන්නාලද, දැන් වූකලී යවයි කිමෙක්ද? තොපට කුමාරිකා ධර්‍මය ඇද්ද? නැද්දැ?"යි විචාළේය.

එසේ හෙයින් "පියාණන් වහන්ස, මට කුමාරිකා ධර්‍මය ඇත, මම ලෝභ වශයෙන් පුරුෂයෙකුගේ මුහුණ පමණකුත් නොබැළු විරුමැ"යි කිවූය. එබස් ඇසූ පියාණෝ දුවණියන් අස්වසාලා ගෙටගොස් මගුල්කොට අන් පුරුෂයෙකුට පාවාදී "සර්‍වඥයන් වහන්සේට නමස්කාර කරමි"යි කියා ගඳදුම් මල්පහන් ආදිය ගත් අත් ඇතිව ජේතවනයට ගොස් බුදුරජාණන් වහන්සේට වැඳපුද එකත්පස්ව උන්නාහුය. එකල්හි සර්‍වඥයන් වහන්සේ විසින් "උපාසකයෙනි, තොප කල්යවා ආයේ කුමක් නිසාදැ?"යි කී කල්හි එපවත් සර්‍වඥයන් වහන්සේට දැන්වීය. සර්‍වඥයන් වහන්සේ "උපාසකය, මේ කුමාරිකාව බොහෝ කලක පටන් ආචාර ශීලයෙන් යුක්තය, තෝ වූකලී කුමාරිකාව දැන්මතු පරීක්‍ෂා කළෝ නොවෙයි, පෙරත් පරීක්‍ෂා කෙළෙහිම් වේදැ"යි වදාරා ඒ උපාසකයා විසින් ආරාධිත වූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි අප මහබෝසතාණෝ වනයෙහි වෘක්ෂ දේවතාව උපන්සේක. එකල්හි බරණැස් නුවර පණ්ණික නම් උපාසකයෝය යනාදි වූ සියල්ල වර්තමාන කථාව හා සමාන වන්නේය. ඒ උපාසකයා විසින් පරීක්ෂා කරන පිණිස අත අල්වා ගන්නා ලදුව අඬමින් වලපමින් කියන්නී "යම් පියාණ කෙනෙක් කායික චෛතසික දුක්ඛයෙන් පීඩිත වූ තැනැත්තිට පිහිට වෙද්ද එසේ වූ මාගේ පියාණන් වහන්සේ දැන් මේ වන මධ්‍යයෙහිදී මෙබඳු මිත්‍රද්‍රෝහි වූ කර්මයක් කරනසේක. එසේ හෙයින් මේ වන මධ්‍යයෙහිදීම කවුරුන්ට අඬම්ද? යම් පියාණ කෙනෙකුන් වහන්සේ මට පිහිට වන්ට රක්ෂා ස්ථාන වන්ට සුදුසුසේක් වීනම් එසේ වූ පියාණන් වහන්සේද දැන් සාහසික වූ රෞද්‍ර ක්‍රියාවක් කරනසේක. එසේ හෙයින් මම දැන් කව්රුන්ගේ නම කියා අඬම්දැ"යි දෙවතොපජක්ඛායනයක් කරන්නාක් මෙන් මුරගා ඇඬූය.

එකල්හි ඒ කුමාරිකාවගේ පියාණෝ කුමාරිකාව අස්වසාලා "මෑණියෙනි, තොපි කුමාරිකා ධර්‍මය රැක්කෝවේදැ?"යි විචාළේය. "එසේය පියාණන් වහන්ස, මම රැක්කෙමි"යි කී කල්හි ඒ කුමාරිකාව ගෙට කැඳවාගෙන ගොස් මඟුල්කොට අන් කුලයක පුරුෂයෙකුට පාවා දුන්නුය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා වදරා චතුරාර්‍ය්‍ය සත්‍යය ප්‍රකාශකොට වදරා

මේ 'පණ්ණික ජාතකය' නිමවා වදාළසේක. චතුස්සත්‍ය ධර්‍ම දේශනාවගේ කෙළවර උපාසකයා සෝවාන් පෙළෙහි පිහිටියේය.

"එසමයෙහි දූ නම් දැන් දූ මය, ඒ කාරණය ප්‍රත්‍යක්‍ෂකොට දුටුවා වූ වෘක්‍ෂ දේවතා වුයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 102. වෙරි ජාතකය

තවද එක් සමයෙක්හි ශාක්‍යකුල සිබාමාණික්‍ය වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වසනසේක් අනේපිඩු සිටාණන් අරභයා මේ ජාතකය වදාළසේක.

අනේපිඩු මහසිටාණෝ තමන්ගේ ගොවිතැන් කරන්නා වූ ගමට ගොස් එන තැනැත්තෝ අතරමඟදී "අතරමග වසන්නට සුදුසු නොවෙයි, සැවැත් නුවරටම යෙමි"යි සිතා වහ වහා ගැල් පදවාගෙන සැවැත් නුවරටම අවුත් දෙවෙනි දවස් විහාරයට ගොස් බුදුරජාණන් වහන්සේට එපවත් දැන්වූය. සර්‍වඥයන් වහන්සේ "සිටාණෙනි පෙරත් නුවණැත්තෝ අතරමග සොරුන් දැක අතරමග ළස්නොවී(ප්‍රමාද නොවී) තමන් වසන්නා වූ ස්ථානයටම වහ වහාම ගියෝවේදැ"යි වදරා සිටාණන් විසින් ආරාධිත වූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි පුරණලද බොධිසම්භාර ඇති අප මහබෝසතාණෝ මහා සම්පත් ඇති සිටුපුත්‍රව ඉපිද එකගමක ඇත්තන් කළ යාඥවක් නිසා අමුතු බත් අනුභව කරන්නට ගොස් පෙරළා ගමට එන්නාහු අතරමගදී සොරුන්දැක අතර නොවැස වහ වහා ගැල් පදවාගෙන තමන්ගේ ගෙටම අවුත් අනේකප්‍රකාර වූ අග්‍රරසයෙන් යුක්ත වූ භෝජනය අනුභවකොට මහා අනඝී වූ ශ්‍රීයහන් මස්තකයේ හිඳ "සොරුන් අතින් මිදී නිර්භයස්ථාන වූ මාගේ ගෙටම ආයෙමි වේදැ"යි ප්‍රීතිවාක්‍ය වශයෙන් උදන් අනන්නාහු මෙසේ කිවුය "යම් බඳු වූ ස්ථානයෙක්හි වෛර සිත් ඇති පුද්ගලයෙක් වසන්නේ වීනම් එබඳු ස්ථානයෙක්හි කාරණා දන්නා වූ පුද්ගලයෝ කිසියම් කාරියක් නිසා එක දවසක් වසන්නේ වී නමුත් සිතට සැපයකින් වැසපිය නොදෙන්නේය, හැම වේලෙහිම බලවත් වූ චිත්තඛෙදයක් හා දෙම්නසින් යුක්තව වසන්නේය"යි මෙසේ මහබෝසතාණෝ උදන් අනා දනාදී වූ පින්කම්කොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය. ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මෙසේ මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදාරා මේ 'වෛරි ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි බරණැස් නුවර සිටාණෝ නම් තිලෝගුරු සම්‍යයක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 103. විතීය මිත්තවින්දක ජාතකය

තවද එක් සමයෙක්හි පරහිත නිරත වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වසනසේක් එක් දුර්වච භික්‍ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

මෙහි වර්තමාන කථාව මිත්තවින්දක ජාතකයෙහි විස්තර වශයෙන් කියන ලද්දේය.

මේ ජාතකය වූකලි කාශ්‍යප සර්වඥයන් වහන්සේ සමයෙහි වන්නේය. එසමයෙහි උරචක්‍රමාලාව උසුලා නරකයෙහි පැසෙන්නා වූ එක් නාරකික සත්වයෙක් “ස්වාමීනි, කෙබඳු වූ අකුසල කර්මයෙක් කෙළෙහිදැ?”යි බෝසතාණන් අතින් විචාළේය. බෝධිසත්වයෝ “තා විසින් මේ අකුසල කර්මය කරන ලදැ”යි මෙසේ කිවූය. “සමුද්‍ර මධ්‍යයෙහි දිවයිනක වෛමාණික ප්‍රේතී වූ(මාසයෙන් අඩක් දිව්‍ය සම්පත් විඳිමින්ද අනිත් අඩ ප්‍රේතව දුක් විඳිමින්ද වූ) දිව්‍යාඞගනාවන් සතර දෙනෙකු දැක එපමණකින් සතුටු නොව ‘මේ යහපත් දේ හෝයි අයහපත් දේ හෝ’යි කියා ඒ ඒ තැන අධික තෘෂ්ණාවෙන් මතුමත්තේ ගොස් දිව්‍යාඞගනාවන් අට දෙනෙකු ලද්දෙහිය, එපමණකිනුත් සතුටු නොව ඉදිරියෙහි යන්නා වූ තෝ දිව්‍යාඞගනාවන් සොළොස් දෙනෙකුත් ලද්දෙහිය, තවද එපමණකිනුත් සතුටු නොවන්නා වූ තෝ දිව්‍යාඞගනාවන් දෙතිස් දෙනෙකුන් ලද්දෙහිය, ඉනුත් සතුටු නොව අත්‍රිච්ඡතායෙන් යන්නේ උරචක්‍රමාලාවට පැමිණියේ වෙහිය, මෙසේ ස්වකීය වූ ලාභයෙන් සතුටු නොව ඒ ඒ තැන්හි ඉච්ඡායෙන් ලාභය

ප්‍රාර්ථනා කරන්නා වූ තෝ දැන් මේ උරචක්‍රමාලාවට පැමිණියේ වෙහිය. මෙසේ තෘෂ්ණා වසඟ වූ තාගේ මස්තකයෙහි නැවත නැවත මේ උරචක්‍රමාලාව වැටී හිස කපමින් මහා දුක් දෙන්නේය”යි ඔහුගේ කර්ම විපාකය ප්‍රකාශකොට කිවූය.

“මෙසේ කියා මහබෝසතාණෝ තමන් වසන්නා වූ දිව්‍ය ලෝකයටම ගියෝ”යි නාරකීක සත්‍වයා තමා කළ අකුසල් ගෙවීගිය කල්හි කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියේය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා වදාරා ‘මිත්තවින්දක ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි මිත්තවින්දක නම් දුර්වච මහණාය, එසමයෙහි දිව්‍යපුත්‍ර වූයේ තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 104. දුර්වල කාෂ්ට ජාතකය

තවද එක් සමයෙක්හි මහත් වූ ධෛර්‍ය්‍ය ඇති තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසනසේක් මරණභීරුක(මරණයට බිය) වූ එක් භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

සැවැත් නුවරවාසී වූ එක් කුලපුත්‍රයෙක් බුදුරජාණන් වහන්සේ වදාරන්නා වූ ධර්ම දේශනාව අසා ශාසනයෙහි මහණව මරණභීරුක විය. රාත්‍රිස්ථාන දිවාස්ථානයෙහි පටන්

අමනාප ශබ්දයක් වේවයි පක්ෂීන් හා චතුෂ්පද ජාතීන්ගේ ශබ්දයක් වේවයි අසා මරණ භයින් තැතිගෙන මහ හඬින් හඬමින් පළා ගියේය. ඒ භික්ෂුන් වහන්සේට මියමි යන සිතිවිලි පමණකුත් නැත්තේය, ඉදින් ඒ මහණ මම මියමි දන්නේ වීනම් මරණට නොබන්නේය. මරණානුස්මෘති කම්මස්ථානය නොවැඩූ බැවින් මරණට භය වන්නේය.

ඒ භික්ෂූන්ගේ මරණභීරුක බව භික්ෂුසංඝයා වහන්සේ කෙරෙහි ප්‍රකාශ(ප්‍රසිද්ධ) විය. ඉක්බිත්තෙන් දම්සභා මණ්ඩපයෙහි රැස්ව උන්නා වූ භික්ෂූන් වහන්සේ මෙසේ වූ කථාවක් ඉපද වූසේක. ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩ "මහණෙනි, මා එන්නාට පළමු කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා "මෙනම් කථාවකින් යුක්තව උන්මිහ"යි කී කල්හි ඒ භික්ෂූහු කැඳවා "මහණ, තා මරණභීරුක වූයේ සැබෑදැ?"යි විචාරා "සැබව, ස්වාමීනි" දැන් වූ කල්හි "මහණෙනි, මේ භික්ෂූහට නොසතුටවව්, මේ මහණ දැන්මතු මරණභීරුක වූයේ නොවෙයි, පෙරත් මරණභීරුකය"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි පුරණලද බෝධිසම්භාර ඇති අප මහබෝසතාණෝ හිමාලය වනයෙහි වෘක්ෂ දේවතාව උපන්හ. එසමයෙහි බරණැස් නුවර රජ්පුරුවෝ තමන්ගේ මඟුලැතු යුඩක්ෂමකොට හස්තිශික්ෂාව කරණු නිසා හස්ත්‍යාචාරීන්ට ඇතු පාවා දුන්නුය. එකල්හි හස්තියාට

ඉවසාගත නොහී තමා බැඳි කඹය බිඳගෙන මනුෂ්‍යයන් ලුහුබඳවා දිවගෙන ගොස් හිමාලය වනයට වන්නේය. මනුෂ්‍යයෝ ඔහු අල්වාගත නොහී පසුපස්සෙහි ගොස් නැවත ආපසු ගියාහුය. ඒ හස්ති රාජයා එතැන් පටන් මරණභීරුක විය. පවන් හැඬූ හඬ අසා වෙව්ලමින් මරණ භයින් භයපත්ව සොඬ කෙළව කෙළවා මහත් වූ වේගයෙන් දිවන්නේය. අත්කඹුයෙන් බැඳ කොළින් දුක්කම්කටුල් කරන කලක් මෙන් ඕහට මහත් භය උපන්නේය. කායාස්වාදයෙක් වේවයි චිතතාස්වදයෙක් නොලැබ වෙව්ල වෙව්ලා ඇවිදිනේය.

වෘක්ෂ දේවතාවානෝ ඔහු දැක වෙලෙප් අතුරෙහි සිට මෙසේ කිවූය "යම් දුර්‍වල වූ කාෂ්ටය, පූර්‍වදික් ආදියෙන්ම හමන්නා වූ මහපවනින් බිඳ හෙලාද එසේ කාෂ්ටය, මේ වනයෙහි බොහෝය, සුලභය, ඒ ඒ තැන ඇත, ඉදින් තෝ ඒ පවනින් බිඳි වැටෙන දරදඬු ආදියට භය වන්නේ වීනම් එසේ කල්හි නිරන්තරයෙහි තණ පැන් අනුභවකොට සැපසේ ජීවත්ව"යි කියා මෙසේ වෘක්ෂ දේවතාවෝ හස්තියට අවවාද දුන්නාහුය. ඒ හස්තියාත් එතැන් පටන් නිර්භීත විය.

ශාස්තෘ වූ සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ මේ ධර්‍ම දේශනාව ගෙනහැර දක්වා වදාරා චතුරාර්‍ය්‍ය සත්‍යය ප්‍රකාශකොට මේ 'දුර්‍වල කාෂ්ට ජාතකය' නිමවා වදාළසේක. චතුස්සත්‍ය ධර්‍ම දේශනාවගේ කෙළවර මරණභීරුක මහණ සෝවාන් පෙලෙහි පිහිටියේය.

“එසමයෙහි හස්තියා නම් දැන් මේ මරණාහීරුක මහණය, එසමයෙහි වෘක්ෂදේවතා වූයෙමි තිලෝගුරු සම්‍යක් සම්බුදු වූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 105. උදංචනී ජාතකය

තවද එක් සමයෙක්හි කරුණාස්පද වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම්වෙහෙර වසනසේක් චුල්ලකුමාරිකා පලෝභනයක් අරභයා මේ ජාතකය වදාළසේක.

මෙහි වර්තමාන කථාව තෙරස නිපාතයෙහි චුල්ලනාරද කාශ්‍යප ජාතකයෙහි විස්තර වශයෙන් එන්නේය. සර්වඥයන් වහන්සේ භික්ෂුවහට “මහණ තා උකටලී වූයේ සැබෑදැ?”යි විචාරා “සැබව ස්වාමීනි” කී කල්හි “මහණ තාගේ සිත කා කෙරෙහි පිළිබඳ වීදැ?”යි විචාළසේක. “ස්වාමීනි, පුරුෂ සමාගමකට නොපැමිණියා වූ බාල වයස ඉක්මව සිටි ඒ කුමාරිකාව කෙරෙහි සිත් පිළිබඳ විය”යි දැන් වූසේක.

එකල්හි සර්වඥයන් වහන්සේ ඒ භික්ෂුහට වදාරනසේක් “මහණ තට මේ ස්ත්‍රිය අනර්ථකාරිය. පෙරත් තෝ මේ ස්ත්‍රිය නිසා ශීලවිපත්තියට පැමිණ වෙව්ලමින් ඇවිදිනේ නුවණැත්තන් නිසා සැප ලද්දේ වේදැ”යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන යනාදී වූ අතීත කථාවත් චුල්ලනාරද කාශ්‍යප ජාතකයෙහි විස්තර වශයෙන් එන්නේය.

එසමයෙහි වනාහී අප මහබෝසතාණෝ සවස් වේලෙහි ඵලාඵල ඇරගෙන අවුත් පන්සලට වැද දොර හැර පුතණුවන් චුල්ලතාපසයන්ට කියන්නේ "පුත, තෙපි මෙතෙක් දවස් දර ගෙනෙව, නහන බොන පැන් ගෙනෙව, ගිණි දල්වව, අද වූ කලි කිසිවකුත් නොකොටම කුමක් නිසා දුර්මුඛව සිතිවිලි ගෙන හුන්නාදැ?"යි විචාළේය. එබස් ඇසූ චුල්ලතාපසයෝ කියන්නෝ "පියාණන් වහන්ස, නුඹවහන්සේ ඵලාඵල ගෙනෙන්ට ගිය කල්හි එක් ස්ත්‍රියක් ඇවිත් පොළඹවා හැරගෙන යන්ට පටන්ගත. මම නුඹවහන්සේගෙන් අවසරගෙන යෙමි සිතා නොගියෙමි. අසවල් තැන ඒ ස්ත්‍රී හිඳුවා ආමි. පියාණන් වහන්ස මම දැන් යමි"යි කිවූය. එබස් අසා මහබෝසතාණෝ "මොහු නවතන්ට නොපිළිවනැ"යි සිතා "එසේ වීනම් දරුව යව, මේ ස්ත්‍රිය තොප ගෙන ගොස් යම් දවසෙක මත්ස්‍යමාංශ කනු කැමති හෝ වේදැයි තෙල්, තලතෙල්, ඵනු, සාල් ආදියෙන් හෝ ඈට ප්‍රයෝජනයක් වේද එදවස් 'මේ මේ දෙය ගෙනෙව'යි කියා තොපට පීඩා කෙරේද? එකල මාගේ ගුණ සිහිකොට ලා අවුත් මෙතනම වාසය කරව"යි කියා අවසරදී යවූහ. චුල්ලතාපසයෝ ඈ හා සමග මනුෂ්‍යපථයට ගියෝය.

එකල ඒ ස්ත්‍රී ඒ තාපසයන් තමා වසගයට පමුණුවා "මස් ගෙනෙව"යි කියා යමකින් යමක් ප්‍රයෝජන ඇත්නම් ඒ මත්ස්‍යමාංශාදිය ගෙන්වන්නීය. එකල්හි චුල්ලතාපසයෝ "මෝතොමෝ තමාගේ කොල්ලකු ලවා බැලමෙහෙ කරවන්නාක් මෙන් නොයෙක් දෙය ගෙන්වා පීඩා කරන්නීය"යි

එතනින් නික්ම පියාණන් සමීපයට ගොස් නමස්කාරකොට සිටිපලම සිට මෙසේ කිවූය. “පියාණන් වහන්ස, නුඹවහන්සේ සමීපයෙහි හිඳ සැපසේ ජීවත් වන්නා වූ මා වසඟයෙහි පමුණුවා සිතට තැවුල් කරමින් තමා හා කැටිව කැඳවාගෙන ගොස් නැවත මට පීඩා කරන්නියක් මෙන් යමක් යමක් කැමති වීනම් ඒ මත්ස්‍ය-මාංශාදිය මා ලවා ගෙන්වමින් ලිඳෙන් පැන් උකාගන්නනා වූ තුලාවක් මෙන් ද, සැලින් පැන් උකාගන්නා වූ දලුවක් මෙන් ද, කැමති කැමති ඒ වස්තු මා ලවා අද්දන්නීය. තවද මෙසේ වූ ස්ත්‍රී මා කෙරෙහි ස්නෙහ ඇත්තීය. කාමයෙන් මියුරු වූ වචනයෙන් පොළඹවාගෙන තමා වසන තෙනට ගොස් තෙල් හා ලුනු ඇඹුල්, සහල් ආදී වූ සෙසු යමක් යමක් කැමති වීනම් ඒ සියල්ලම මා අතින් ඉල්ලා කොල්ලෙකු මෙන්, බාලයෙකු මෙන් කොට මා ලවා ඒ සියල්ලම ගෙන්වන්නීය”යි ඒ ස්ත්‍රියගේ නුගුණ කීවාහුය.

එකල්හි මහබෝසතාණෝ චුල්ලතාපසයන් අස්වසාලා “වන්නාට පුත, මෙසේ එව, තෙපි මෙතැන් පටන් මෛත්‍රී වඩව, කරුණා වඩව”යි සතර විහාර භාවනාවන් කීවාහුය.

චුල්ලතාපසයෝ නොබෝ දවසකින්ම පඤ්චාභිඥා, අෂ්ටසමාපත්ති උපදවා චතුර්විධ බ්‍රහ්මවිහාර භාවනාවන්කොට පියාණන් හා සමඟ ගොස් බ්‍රහ්ම ලෝකයෙහි උපන්නාහුය.

ශාස්තෲ වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදාරා දුඃඛසත්‍යය, සමුදයසත්‍යය,

නිරෝධසත්‍යය, මාර්ගසත්‍යයයි කියනලද චතුරාර්‍ය සත්‍යය ප්‍රකාශකොට මේ ‘උද්දංචනී ජාතකය’ නිමවා වදාළ සේක.

චතුස්සත්‍ය ධර්‍මදේශනාවගේ කෙළවර ඒ මහණ සෝවාන් පෙලෙහි පිහිටියේය.

“එසමයෙහි චුල්ලකුමාරිකා නම් දැන් චුල්ලකුමාරිකාය, චුල්ලතාපසයෝ නම් උකටලී මහණාය, එසමයෙහි චුල්ලතාපසයන්ගේ පිය වූ තාපසයෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 106. සාලික ජාතකය

තවද එක් සමයෙක්හි සුබාස්පද වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම්වෙහෙර වසනසේක් අතකුරු ගැසීමෙහි දක්‍ෂ එක් භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

සැවැත් නුවරවාසී එක් කුලපුත්‍රයෙක් අතකුරු ගැසීමෙහි දක්‍ෂ විය. ඒ තෙම එක් දවසක් බුදුරජාණන් වහන්සේ වදාරන්නා වූ ධර්‍මදේශනාව අසා ශාසනයෙහි ලැදිව මහණව උපසම්පදාව ලද්දේය. උපසම්පදාව ලත් බව විනා ශික්‍ෂාකාමී නොවනසේක් ප්‍රතිපත්ති සාරයක් නොවනසේක.

ඒ භික්‍ෂූන් වහන්සේ එක් දවසක් ළදරු භික්‍ෂූන් වහන්සේ කැඳවාගෙන අචිරවතී නම් ගඞගාවට ගොස් පැන් සනහා ගංතෙර සිටිසේක.

එසමයෙහි සෙවතහංසයෝ දෙදෙනෙක් ආකාශයෙන් යන්නාහුය. ආකාශයෙන් යන්නා වූ හංසරාජයන් දෙදෙනා දැක වැඩිමහළු භික්ෂූන් වහන්සේ බාල භික්ෂූන්ට කියනසේක් "මේ පස්සෙහි යන්නා වූ හංසයා අතකුරකින් ඇස ගසා පාමුල එලම්දැ"යි කීසේක. අන්‍යවූ බාල මහණ කියනසේක් "කෙසේ ගසා එලනසේක්ද? ගසා එලන්ට නුඹවහන්සේට නොපිළිවනැ"යි කීසේක. අන්‍යවූ වැඩිමහළු භික්ෂූන් වහන්සේ එබස් අසා කියනසේක් "ඇවැත්නි, ඒ හංසයාගේ මෙපිට ඇස තට තිබියදී දෙවෙනි එපිට ඇසින් ගසා මෙපිට ඇසින් පලවම්"යී කීසේක. බාල භික්ෂූන්වහන්සේද "මේ කියන්නේ නැත්තය"යි කී කල්හි "එසේ වීනම් පරීක්ෂාකොට බලා වදාළ මැනවැ"යි කියා එක් තුනස් අකුරක් ගෙන අතකුරෙන් පැහැර හංසයාගේ පෙඳගොල්ල දිශාවට ගැසූසේක. ඒ ගැසූ අකුර රෑං රෑං යන අනුකාරණධවනි පවත්වමින් බුරාගෙන අවුත් පෙඳගොල්ල සමීප වූයේය. එකල්හි හංසයා "උපද්‍රවයක් විය යුතුය"යි සිතා කරකැවී අතකුරු ගලේ ශබ්දය අසන්ට පටන්ගත, එකෙනෙහි ඒ භික්ෂූන් වහන්සේ එක් වට අකුරක්ගෙන හංසයා කරකැවී බලන තැනැත්තහුගේ ඒ පිට ඇසට ගැසූයේය. ගසනලද අකුර පිට ඇසින් වැදගෙන මෙපිට ඇසින් බඳ පලා ගියේය. හංසයා අඬමින් පාමුල වැටී ගියේය.

එකල්හී ඒ ඒ තැනින් භික්ෂූන් වහන්සේ අවුත් නින්දකොට "තොප විසින් කළ සේ නපුරැ"යි කිය කියා සර්වඥයන් වහන්සේ සමීපයට කැඳවාගෙන ගොස් "ස්වාමීනි, මේ භික්ෂූහු

විසින් මෙනම් දෙයක් කරන ලදැ''යි එපවත් දැන් වූසේක. එකල්හි සර්‍වඥයන් වහන්සේ ඒ භික්ෂූන්ට නින්දාකොට "මහණෙනි, මොහු අතකුරු ගැසීම් ශිල්පයෙහි දක්‍ෂ වූයේ දැන්මතු නොවෙයි, පෙරත් දක්‍ෂ වීය''යි වදරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහබෝසතාණෝ ඒ රජ්ජුරුවන්ට අමාත්‍ය වූහ. එසමයෙහි රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රාහ්මණයා ඉතා මුඛරිය, බහුභාණීය. ඔහු කථා කරන්ට පටන්ගත් කල්හි අවශේෂයන්ට කථාවට අවසරයක් නොලැබේ. එකල රජ්ජුරුවෝ සිතන්නෝ "මොහුගේ කථාවිච්ඡේදය කරන්ට නිසි වූ කවරක්හු කවර දවසක ලබම්දෝ හෝ''යි සිතා එතැන් පටන් එබඳු එකක්හු පරීක්ෂා කරමින් ඇවිදිති.

එසමයෙහි බරණැස් නුවර එක් පිළු වූ පුරුෂයෙක් අකුරු ගැසීමෙහි දක්‍ෂ විය. එනුවර කුඩා කොල්ලෝ ඒ පිළුමිනිසා රථයක ලාගෙන ඇවිදිමින් බරණැස් නුවර වාසල්දොර සමීපයෙහි වූ සාඛාවිටප සම්පන්න වූ මහත් නිග්‍රෝධ වෘක්‍ෂයක් ඇත, එතනට ගෙනවුත් ඔහු පිරිවරා සිටිති. දෙවියට ස්මාරක අඩමදට යනාදී රන් මිලදී "ඇත් රුවක් කර, අස් රුවක් කරව''යි කියති. ඒ පිළා අතකුරු ගස ගසා නුගපත් වලට ගසති. සිංහ ස්වරූප, මෘග ස්වරූප, පක්‍ෂි ස්වරූපාදී වූ අනේකප්‍රකාර රූපයන් දක්වන්නේය. ඒ නිග්‍රෝධ

වෘක්ෂයෙහි සියලු පත්‍රයෝ ඡිද්‍රව පෙනෙන්නාහුය. එකල්හි රජ්ජුරුවෝ උද්‍යාන ක්‍රීඩාවට යන්නාහු ඒ ස්ථානයට පැමිණියෝය. ඒ පිළු පුරුෂයා වටලාගෙන සිටි කුඩා කොල්ලෝ රැකවුලුන් ගසා ඉවත් කරන්නාහු භයින් හැමදෙනම ඒ ඒ තැන පලා ගියෝය. පිළු පුරුෂයා නුග ගස මුල වැද හොත්තේය. රජ්ජුරුවෝ නුග ගස මුලට ගොස් රථයේ හිඳම පත් සිදුරු බැවින් ඡායාව විරලව තිබෙන්නා දැක උඩ බැලු තැනැත්තෝ සියලු පත්ම සිදුරු සිදුරුව තිබෙන්නා දැක "මෙසේ කළෝ කවුරුදැ?"යි විචාළෝය. ඒක පරීක්ෂා කරන්නා වූ රාජපුරුෂයෝ "දේවයන්වහන්ස, පිළකු විසිනැ"යි කී කල්හි "මේ පිළා නිසා පුරෝහිත බ්‍රාහ්මණයාගේ මුඛරි බව හා බහුභාණික බව ඔබවා පියන්ට පිළිවන් වන්නේය"යි සිතා "පිළා කොයිදැ"යි විචාළෝය. එකල පරීක්ෂා කරන්නා වූ රාජපුරුෂයෝ මුල් හස්සේ වැදහොත් තැනැත්තහු දැක "දේවයන් වහන්ස, පිළා මේ වේදැ"යි කිවූය. රජ්ජුරුවෝ ඔහු සමීපයට ගෙන්වා පෂීත්(පිරිස) ඉවත් කරවා විචාරන්නෝ "අප සමීපයෙහි මුඛරි බමුණෙක් ඇත. ඔහු නිශ්ශබ්ද කරන්ට පිළිවන්දැ"යි විචාළෝය. "ස්වාමීනි, එළුබෙටි නැලියක් ලද්දෙම් වීනම් නිශ්ශබ්ද කරන්ට පිළිවන, දේවයන් වහන්සැ"යි කිවූය.

රජ්ජුරුවෝ පිළා මාලිගාවට කැඳවාගෙන ගොස් තිරයක් ඇතුලෙහි හිඳුවා තිරය සිදුරුකොට බමුණා තිරය අභිමුඛකොට හස්නක් පණවා නැලියක් පමණ වියලි එළුබෙටි

පිළා සමීපයේ තබ්බවා පුරෝහිත බ්‍රාහ්මණයා රාජසේවයට ආ තැනැත්තාහු ඒ අස්නේ හිඳුවා කථා ඉපදවූය.

බමුණු අනික් කෙනෙකුන්ට අවසරයෙක් නොදී රජ්ජුරුවන් සමග කථා කරන්ට පටන් ගත්තේය. එකල්හි පිළා තිරය සිදුරෙන් එකී එකී එළුබෙටි ගසා ඇම නිම ගියේය. බමුණුගේ බඩට වන්නා වූ නැලියක් පමණ එළුබෙටි ගලන තුරුත් කිසිවකුත් නොදැනම දැන් මෙයින් මත්තෙහි එළුබෙටි ගැල දිරවාගන්ට අසමත් වේය. "එසේ හෙයින් ගෙට පලා ගොස් පුවඟු ගෙන්වා ගෙන කොටා යුෂ මැඩ පැන් හා කලන්දු කොට බී වමණයකොට තොපගේ ශරීරය නිරෝගකොට ස්වස්ථ කොට ගණුව"යි කිවූය. බමුණු එතැන් පටන් මුඛය වසා ගත්තාක් මෙන්ම කථා කරන්නාවුන් සමගත් කථා කරනුයේය. රජ්ජුරුවෝ "මොහු විසින් මට කණී සැපය කරන ලදැ"යි පිළාට අවුරුද්දකට ලක්‍ෂයක් නිමන්නා වූ සතර දිගින් ගම් සතරක් දුන්නාහුය.

එකල්හි මහ බෝසතාණෝ රජ්ජුරුවන් කරා එළඹ " දේවයන් වහන්ස, ශිල්ප නම් ලෝකයෙහි නුවණැත්තන් විසින් උගත යුත්තේය. පිළු විසින් අතකුරු ගැසීමෙහි දක්‍ෂ වීමෙනුත් මෙතෙක් සම්පත් ලබන ලද්දේය"යි කියා "මේ ලෝකයෙහි කවරක් වී නමුත් යම් යම් ශිල්පයක් ඉගැන්ම යහපත් වන්නේය. මහරජ්ජුරුවන් වහන්ස, බලා වදාළ මැනව, මේ කොර පිළු වූ පුරුෂයා විසින් එළුබෙටි අතකුරෙන් ගැසීමෙන් සතර දිගින් ගම්වර සතරක් ලබන ලද්දේ වේද? එසේ

හෙයින් සෙසු ශිල්පයෙහි අනුසස් කෙළවරක් ඇද්දැ?”යි කියා ශිල්පයෙහි ගුණ කීවාහුය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා වදරා මේ ‘සාලික ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි පිළා නම් දැන් මේ හංසඝාතක මහණය, රජ්ජුරුවෝ නම් ආනන්‍ද ස්ථවිරයෝය, නුවණැති අමාත්‍ය වූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 107. බහ්‍ය (බාහිය) ජාතකය

තවද එක් සමයෙක්හි සුරාසුරවරචක්‍රවාරුචුඩාමාණිමරිචි සංචය පරිචුම්බිත චරණ නඛ මයුඛ ඇති ලෝකස්වාමී වූ තිලෝගුරු සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ විසාලා මහනුවර නිසා මහාවනයේ කූටාගාර ශාලාවෙහි වැඩවසනසේක් එක් ලිච්ඡවිරජ්ජුරු කෙනෙකුන් අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ ලිච්ඡවි රජ්ජුරුවෝ ශ්‍රද්ධාසම්පන්නයෝය, රත්නත්‍රයෙහි ප්‍රසන්නයෝය, බුද්ධමාමකය, ධම්මමාමකය, සංඝමාමකය නිරන්තරයෙන් අඛණ්ඩ වූ පඤ්චශීලය රක්‍ෂා කෙරෙති. පොහොය නොවරදවා පෙහෙවස් රක්‍ෂා කෙරෙති. ඒ රජ්ජුරුවෝ එක් දවසක් බුදුන් ප්‍රධානකොට ඇති භික්‍ෂුසංඝයා වහන්සේට ආරාධනාකොට මහදන් සරහා තමන්ගේ මාලිගාවත් විශේෂකොට සරහා මාලිගාවේදී බුදුපාමොක්

මහසග පිරිසට මහදන් දුන්නාහුය. ඒ රජ්ජුරුවන්ගේ බිසව් ස්ථූල අඞ්ගප්‍රත්‍යඞ්ග ඇත්තෝය. උද්ධුමාතක අසුභ නිමිත්තක්මෙන් ආකල්ප සමෘධියක් නැත්තෝය. ස්ථූල ශරීර හා මහත් වූ උස මහත ඇත්තෝය. බුදුරජාණන් වහන්සේ අනුමෙවෙනි ධර්‍මදේශනාකොට විහාරයට ගොස් භික්‍ෂුසංඝයා වහන්සේට අවවාද දී ගඳකිළියට වන්සේක.

දම්සභා මණ්ඩපයෙහි රැස්ව උන්නා වූ භික්‍ෂූන් වහන්සේ කථාවක් උපදවන සේක් “ඇවැත්නි, එබඳු සැදැහැ ඇති විශිෂ්ට රූ ඇති රජ්ජුරුවන්ගේ බිසව් බැලූ බැලුවන්ට ප්‍රසාද වන්නා වූ රූපශ්‍රීයක් නැත්තෝය. ස්ථූල වූ ශරීර ඇත්තෝය. රුවක් පිනක් නැත්තෝය. එසේ වූ බිසවුන් හා සමග කෙසේ නම් මේ රජ්ජුරුවෝ අභිරමණය කෙරෙද්දැ”යි මෙසේ වූ කථාවක් ඉපදවලා උන්සේක.

එකල්හි ශාස්තෲ වූ බුදුරජාණන් වහන්සේ තුන්තරා ගමනින් එක්තරා ගමනකින් දම්සභා මණ්ඩපයට වැඩවදාරා පණවනලද බුද්ධාසන මස්තකයෙහි යුගඳුරු මුදුනෙහි දිළිහෙන්නා වූ ළහිරු මඩලක් මෙන් දිළිහි දිළිහී වැඩහිඳ “මහණෙනි, දැන් මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව හුනුදැ?යි කවර නම් කථාවක් තොපට අඩාලදැ”යි විචාරා “ස්වාමීනි, නුඹවහන්සේ විසින් නොකියන්ට වදාළා වූ රාජ කථා, චෝර කථා යනාදී දෙතිස් කථා අතුරෙන් එක්තරා කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ. ශ්‍රද්ධා සම්පන්න වූ බුදුහු මාගේමය, ධර්‍මය මාගේමය, සංඝයා

මාගේම යයි කියා රත්නත්‍රයෙහි මමත්‍වයකොට වසන්නා වූ ඉතා රූපත් වූ මේ ලිච්ඡවි රජ්ජුරුවෝ රූපශ්‍රීයක් තැනැත්තා වූ ආකල්ප සමෘධියක් නැති මේ ස්ථූල වූ ශරීර ඇති බිසවුන් හා සමග කෙසේ නම් සංවාසයක් කෙරෙද්දැයි මෙසේ වූ කථාවකින් යුක්තව උනුම්හ"යි කී කල්හි "මහණෙනි, දැන්මතු නොවෙයි, පෙරත් මේ ලිච්ඡවි රජ්ජුරුවෝ ස්ථූල වූ ශරීර ඇති ස්ත්‍රියක් හා සමග අභිරමණය කළෝ නාවේදැ"යි වදාරා මුවෙන් නොබැණ වැඩ උන් කල්හි ඉක්බිත්තෙන් එතනට රැස් වූ ඇමදෙනා වහන්සේ අතුරෙන් එක් කෙනෙකුන් වහන්සේ නැගී සිට සුපිළිසන්ව මනාකොට දසනඛ සමෝධානයෙන් බද්ධාඤ්ජලිය දෙහොත් මුදුනේ තබාගෙන ඵලභාරයෙන් නැමුනා වූ කදලි වෘක්‍ෂයක් මෙන් නමිනව බුදුරජාණන් වහන්සේ අෂ්ටෝත්තර ශතමඞ්ගල්‍යයෙන් සල්ලක්‍ෂණව විරාජමාන වූ ශ්‍රීපාද වන්දය වැඳ එකත්පස්ව සිට දන්වනසේක් "ස්වාමීනි, දැන් මෙසේ සැදැහැ ඇති රූපත් වූ ලිච්ඡවි රජාකුමාරයන් ස්ථූල වූ ශරීර ඇති ප්‍රසාද වූ මේ බිසවුන් හා සමග සංවාසය කරන නියාව සියල්ලන්ට ප්‍රකාශය. අතීතයෙහි විරූප වූ ස්ථූල ශරීර ඇති ස්ත්‍රීන් හා සමග අභිරමණය කළ නියාව භස්මයෙන් ප්‍රච්ඡනන් වූ ජාතවේදයක් මෙන් වළාකුළෙන් සැඟවී තුබූ පුන්සඳ මඬලක් මෙන්ද පාංසුවෙන් ප්‍රච්ඡන්නා වූ ජාතිරඟ මාණික්‍යයක් මෙන්ද භවයෙන් ප්‍රච්ඡන්න හෙයින් අප ඇමදෙනා වහන්සේට අප්‍රකාශය. එසේ හෙයින් ඒ කථා ස්වරූපය හිමගර්භයක් පළා පුන්සඳ මඬලක් ගෙනහැර පානා කලක් මෙන් ඒ අතීත

කථාව ගෙනහැර දක්වා වදාළොත් යහපතැ"යි ඒ භික්ෂූන් වහන්සේ විසින් ආරාධිත වූ බුදුන් ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි පුරණලද බෝධිසම්භාර ඇති අප මහබෝසතාණෝ බරණැස් රජ්ජුරුවන්ට අමාත්‍ය වූය. එකල්හි ජනපදවාසී වූ එක් ස්ත්‍රියක් ස්ථූල වූ ශරීර ඇත්තීය, ආකල්ප සමෘධියෙක් නැත්තීය, අනුන්ට බැල මෙහෙකොට ඇවිදිනීය, රාජාඞගනය සමීපයෙන් යමින් සිට ශරීරවලංජනයෙන් පීඩිතව අත්කඩින් ශරීරය වසාගෙන මලමූත්‍ර බාහ්‍යකොට නැගී සිටියාය. එකෙනෙහි බරණැස් රජ්ජුරුවෝ සිව්මැදුරු කවුළුව හැර රාජාඞගනය බලන තැනැත්තෝ ඒ ස්ත්‍රිය කළා වූ ක්‍රියා දැක මෙසේ සිතූහ. "මේ ස්ත්‍රී මෙබඳු වූ එලිපිට අඞගනස්ථානයෙහි ශරීරවලංජනය කරන්නී භය ලජ්ජා දෙක නොහැර අත්කඩින් ශරීරය වසාගෙන හිඳ මලමුත්‍ර බාහ්‍යකොට වහා නැගී සිටියාය. එසේ හෙයින් මෑ නිරෝග විය යුතුය. මෑගේ වස්තු විසද බව වන්නේය. විසද වූ වස්තුවෙහි වූකලී එක් පුත්‍රයෙක් උපන්නේ විනම් විසදව පිනැති වන්නේය. එසේ හෙයින් මේ ස්ත්‍රිය මා විසින් අගමෙහෙසුන් තනතුරෙහි තබන්නට වටනේය"යි සිතා ඒ රජ්ජුරුවෝ ඈ අස්වාමික නියාව දැන සමීපයට කැඳවා ගෙන්වාගෙන රුවන් රැසක් මත්තේ සිටුවා මස්තකයෙහි අභිෂේක ජලය වත්කොට අගමෙහෙසුන් තනතුරෙහි තිබුවාහුය. ඒ බිසව රජ්ජුරුවන්ට අතිශයින් ප්‍රියව සිත්කළුව මනවඩමින්

නොබෝ කලකින්ම එක් කුමාර කෙනෙකුන් වැදූය. ඒ බිසවුන් වැදූ ඒ රාජ කුමාරයෝ පියරජ්ජුරුවන්ගේ ඇවෑමෙන් චක්‍රරත්නාදී වූ සප්තරත්නයෙන් සමන්විත වූ මුලු සක්වළ ඒකාතපත්‍රකොට චක්‍රවර්ති රාජ්‍යශ්‍රී අනුභව කළාහුය.

එකල්හි මහබෝසතාණෝ ඒ බරණැස් රජ්ජුරුවන්ගේ බාහිය නම් වූ දනව්වැසි බිසවුන්ගේ යශසමෘද්ධිය දැක එබඳු වූ කථාවක් කරන්ට සුදුසු අවසරයක් ලදින් රජ්ජුරුවන් දැක වැඳ එකත්පස්ව සිට “දේවයන් වහන්ස, උගතමනා ශිල්පය නම් කුමක් නිසා නූගත යුතුද? මම් මේ පිටත දනව්වැසි බිසවුන්ගේ මහත් කුසල් ඇත්තා වූ භය ලජ්ජා සහිතව අත්කඩින් සකල ශරීරය වසාගෙන පිළිසන් ආකාරයෙන් ශරීර කෘත්‍යයකොට මෙබඳු කුසල් ඇත්තා වූ දෙවඟනන් බඳු වරඟනන් සොළොස් දහසකට නායකව චක්‍රවර්ති රාජ්‍යශ්‍රී අනුභව කරන්ට පුතණු කෙනෙකුන් වහන්සේත් ලැබ ප්‍රමාණාතික්‍රාන්ත වූ යසපිරිවරින් හා ශ්‍රී සමුර්ධියෙන් යුක්තව අග්‍ර මෙහෙසිකා ස්ථානයට පැමිණිසේක. උන්වහන්සේ මේ සා මහත් වූ ඓශ්වර්‍ය්‍යීකට පැමිණිසේක් වේද, එසේ හෙයින් ලෝකයෙහි උගතමනා ශිල්පයෙක් ඇත්නම් උගතමනා යුතුමය”යි ශිල්ප ශාස්ත්‍ර උගන්නා වූ සත්ත්වයන්ට වර්‍ණනා කරන්නාහු මෙසේ කිවූය “රජ්ජුරුවන් වහන්ස, මේ ලෝකයෙහි අක්‍ෂර ලිඛිත ගණිත ගාන්ධර්‍ව නක්‍ෂත්‍ර ඡන්දස්නිඝණ්ඩු අලංකාර යනාදී වූ ඒ ඒ ශිල්පයෙහි විපාකය හා සවච්ඡන්දික වූ ශිල්ප ඉගැන්මෙහි බලවත් වූ අභිප්‍රාය ඇති මනුෂ්‍යයෝ බොහෝ ඇත්තාහුමය. එතකුදු වුවත් මා තමාට සුදුසු ස්පවල්ප මාත්‍ර

වුවත් ආචාර ශීලය විවරකුත් ඉගෙණීම් කළමනා දෙයයි. එහි ඇදහිල්ලක් ඇතුව නොපිරිහෙළා කරන්නා වූ සත්ත්ව කෙනෙක් ඇත්නම් එසේ වූ සත්ත්වයන්ට ඉහාත්ම භාවයෙන්ම ඉෂ්ටවිපාක වන්නේය. ඒ එසේම වේදැයි පිටත දනව්වෙහි වැඩි වර්ධන වූ බිසවුන් වහන්සේ භය ලජ්ජා සහිතව ආචාර ශීලය නොපිරිහෙළා කරන්නා වූ ක්‍රියාවෙන් නුඹවහන්සේගේ සිත් මෙසේ මහත් වූ සමෘද්ධියකට පැමිණීසේක් වේදැ"යි කියා මහබෝසතාණෝ උගතමනා ශිල්පයෙහි ඉෂ්ටවිපාක හා ගුණ විශේෂයෙන් ප්‍රකාශකොට කීවාහුය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදාරා දුඃඛසත්‍යය, සමුදය සත්‍යය, නිරෝධ සත්‍යය, මාර්ග සත්‍යයයි කියනලද චතුරාර්‍ය්‍ය සත්‍යය ප්‍රකාශකොට පූර්වාපරසන්ධි ගළපා මේ බාහ්‍ය ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි රජ්ජුරුවන් හා බිසවුන් මෙසමයෙහි රජ්ජුරුවන් හා බිසව් ය. එසමයෙහි රජ්ජුරුවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනාකොට සියලු ලෝකවාසීන්ට කර්තව්‍යාකර්තව්‍ය කුසල් අකුසල් ප්‍රකාශකොට ලෝවැඩසාද දී නුවණින් යෙදී වාසය කළා වූ නුවණැති අමාත්‍ය වූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 108. කුඩ්ඩක පූව ජාතකය

තවද එක් සමයෙක්හි භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි සැවැත් නුවරවාසීන් එක්ව බුදුපාමොක් මහසංඝයා වහන්සේ පවරා දනක් දෙන ගමනේ නුවර වසන මහාදුගී නම් එකෙක් තමා ඒ දනයෙහි මුසුවන(එක්වන) පිණිස තමාට සැපවුනු කුඩු - පූවක් සකසා ඉදිකොට "බුදුන්ටම පිළිගන්වමි"යි සිතා සිටිකලට උපාසකවරුන් කැඳ පිළිගන්වා "අවුළුපත් පිළිගන්ව"යි කී බස හා සමඟ පෙරාතුයෙන් තමා ගෙනගිය කුඩුපූව බුදුන්ට පිළිගැන්වීය.

බුදුහුත් සෙසු මිහිරි අවුළුපත් පිළිගැන්වූවත් නොපිළිගෙන දුගියා කෙරේ කරුණාවෙන් එම වළඳා වදාරා ජේතවනාරාමයට වැඩ වදාළසේක.

එපවත් රජ, යුවරජ, සෙනෙවිරත් ආදී වූ ප්‍රජාව අසා මහදුගියා කරා ගොස් "මිළ අරගෙන පින්දෙව"යි පින් ඉල්වූහ. එවිට මහදුගියා සිතන්නේ "මා දුකින් කොටගත් කුසලය බුදුන් විචාරා දෙමි"යි සිතා බුදුන් කරා එළඹ "මිළ ගෙනවත් නොගෙන වත් පින්දීම යහපතැ"යි වදාළ බස් අසා එනුවර වාසීන්ට මිළ ගෙන පින් දීමෙන් නවකෙළක් වස්තුව ලද. ඒ නියාව අසා කොසොල් රජ්ජුරුවෝ ඕහට සිටුසේසත් නැංගවූය.

එදවස් දම්සභා මණ්ඩපයෙහි වැඩඋන් සංඝයා වහන්සේ දුගියා කුඩුපූ පිළිගන්වා සිටු සේසත් ලත් නියාව කිය කියා උන්සේක. එතනට තුන්තරා ගමනින් එක්තරා ගමනකින් සර්‍වඥන් වහන්සේ වැඩ වදාරා පනවනලද බුද්ධාසනයේ වැඩහිඳ "මහණෙනි, මා එන්නාට පූර්‍ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාළ කල්හි "නොකියන්ට වදාළ දෙතිස් කථාවෙන් එක්තරා කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ, නුඹවහන්සේට දන් දී මහදුගියා මහා සම්පත් ලත් නියාව කිය කියා උනුම්හ"යි දැන් වූ කල්හි "මහණෙනි, දැන්මතු නොවෙයි, පෙරත් කුඩුපූවක් දී මහා සම්පත් ලද්දේවේදැ"යි වදාරා ජාතකයට මුඛමාත්‍රයක් දක්වා තුෂ්ණිම්භූතව වැඩ උන්කල්හි හැමදෙනා වහන්සේගේ අනුමැතියෙන් එක් නමක් නැගී සිට සුපිළිසන්ව හැඳපෙරව භක්ති ප්‍රේමයෙන් බුදුන්ට බද්ධාඤ්ජලීව දෙහොත් මුදුනේ තබා වැඳ සිට "ස්වාමීනි, දැන් වනාහී මොහු සම්පත් ලත් නියාව අප හැමදෙනාට ප්‍රකාශව දැනෙයි, පළමු කුඩුපූවක් දී මහා සම්පත් ලත් නියාව තෙකල් දත් බුදුන්ට මිසක් අපට නොදැනෙයි, දක්වා වදාළොත් යහපතැ"යි ආරාධිත වූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් දැහැමෙන් රාජ්‍යය කරන සමයෙහි බරණැස් නුවරවාසීන් ඒ ඒ වෘක්‍ෂ දේවතාවන්ට පූජාකොට දවස් හරණා කල්හි එනුවර දුක්පත් පුරුෂයෙක් එඬරු ගසක් වට කසල හැර ඒ රුක් දෙවියන්ට ගඳදුම් මල් පහන්

ඛාද්‍යාභොජ්‍යාදි වූ දෙය හැරගෙන යන්නවුන් දැක තමාගේ එඬරු ගස දෙවියාට අනික් පුදන්ට නිසි උපකරණයක් නැති හෙයින් තමාට සැපවුනු කුඩුපූවක් දෙවියාට පුදම් ගෙනගොස් ගස මුලදී සිතන්නේ "දෙවියෝ නම් දිව්‍යහාරය අනුභව කෙරෙති. එසේ හෙයින් මෙසේ වූ කුඩුපූ මාගේ දේවතාවා අනුභව නොකරන්නේය"යි සිතා "කවර කාරණාවකින් ගෙනයෙම්දැ"යි සිතා "මම් ම ප්‍රයෝජන විඳිම්"යි සිතා ආපස්සේ නික්මුණු කල්හි ඒ ගස වසන දේවතාවා තමාගේ අර්ධ ශරීරයක් දක්වා සිට කියන්නේ "පුරුෂය, තා ලබන්නේ යම් දෙයක් වේද, තාගේ දෙවියාත් ලබන්නේය"යි කීය. දෙවෙනිව ඒ කුඩුපූව දේවතාවාටම පිදීය. එවිට දේවතාවා කියන්නේ "තොප මා ආශ්‍රය කෙළේ කුමක් නිසා දැ"යි කී කල්හි "ස්වාමීනි, මා දුප්පත් විසිනැ"යි කී කල්හි "එසේ වීනම් මේ එඬරු ගස වටකොට කරින් කර ගසා නිධාන සැලවල් තිබෙන්නේය. ඒ නිධාන සැලවල් භාරාගෙන රජ්ජුරුවන්ට පාව. අද තට සිටුසේසත් ලැබේ"යි කියා අන්තර්ධාන විය.

ඒ පුරුෂයා දේවතාවා කී ලෙස සම්පත් උල්පවාගෙන රජ්ජුරුවන්ට පෑ කල්හි "මෙතෙක් සම්පත් ඇති තැනැත්තෙකුට සේසත් දිය යුතුය"යි කියා සිටුසේසත් දුන්හ. එසඳ මහා සම්පත් ලදින් දනාදි වූ කුසල්කොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය. සර්වඥයන් වහන්සේ දෙකල් ගළපා මේ 'කුඩ්ඩපූව ජාතකය' නිමවා වදාළසේක.

“එසමයෙහි දුඃඛිත පුරුෂයා නම් මෙසමයෙහි දුඃඛිත පුරුෂයාමය, එඬරු ගස දේවතාව උපන්නෙමි ලොව්තුරා බුදු වූ මම්ම ය”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 109. සිඟාල ජාතකය

තවද එක් සමයෙක්හි සර්‍වඥයන් වහන්සේ රජගහ නුවර නිසා වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ විසින් අළුත මහණ වූ පන්සියයක් භික්‍ෂූන් වහන්සේ ඇරගෙන ගයා නම් ගඬිගාවෙහි විහාරයක් කොටගෙන “සර්‍වඥයන් වහන්සේ කරන්නේ ප්‍රතිපත්ති නොවෙයි, මා කරන්නේ ප්‍රතිපත්තියමැ”යි කියා සංඝයා වහන්සේ හැරගෙන වෙනම පොහොයකොට වසන සමයෙහි එක් දවසක් සංඝයා වහන්සේ රාත්‍රී මුඛයෙහි දම්සභා මණ්ඩපයෙහි වැඩහිඳ “ඇවැත්නි, දෙවදත්ත ස්ථවිරයෝ නැත්තෙන් බොරුගුණ අඟවා වාසය කෙරෙති”යි මේ කථාව කිය කියා උන්කල්හි බුදුරජාණන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩ වදාරා පණවනලද බුද්ධාසන මස්තකයෙහි වැඩහිඳ “මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?”යි විචාරා වදාළ කල්හි “දෙවදත්ත ස්ථවිරයන් සංඝභෙද කළ නියාව කිය කියා උනුම්හ”යි සැළකළ කල්හි “මහණෙනි, දැන්මතු නොවෙයි, පළමුත් මුසාවාද කීවෝවේදැ”යි වදාරා භික්‍ෂූන් වහන්සේ විසින් ආරාධිත වූ බුදුනු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි "බරණැස් නුවර නැකත්කෙළි කෙළිනේය"යි විධාන ඇසූ නුවරවාසීන් විසින් දේවතාවන්ට බලි පිණිස රා මස් ආදී වූ දෙය වීථියේ කෝවකොට තිබූ කල්හි එදවස් රෑ මත්ස්‍ය මාංස ගන්ධයෙන් කැණහිල් බල්ලෙක් නුවරට වැද රා මස් කා මත්ව රෑ යා නොහී පාන් වූ කල්හි "මේ වේලෙහි පිටත් වීනම් බොහෝදෙන කැටමුගුරු ගෙන මරති"යි සිතා ඝන කැලයක සැඟවී මග බල බලා ඉඳ බොහෝ මොත්තන් යන්නවුන් හා කථාකොට තනිව යන බමුණකු දැක "බමුණෝ නම් ඉතා ලොභොබි අයෙකැ"යි සිතා බමුණා ළඟට අවුත් "තොප මා නුවරින් පිටත ගෙන ගියේ නම් මසුරන් දෙසියයක් තිබූ තැන් පාමි"යි කියන්නාහු බමුණු "සැබව"යි සිතා තමාගේ උතුරු සළුවෙන් වසා කිසිල්ල අස්සේ සඟවාගෙන නුවරින් පිටත ගොස් "සම්පත් පාව"යි කියන්නා කැණහිල් කියන්නේ "ඈත යන්නා පාමි"යි කියා හැරගෙන ගොස් සුසාන භූමියට ගොස් "මෙතන නිධානය"යි කිය කියා බිමට බැස "සම්පත් ලබන්ට තාගේ උතුරු සළුව පාත්කොට ලව"යි තබ්බවා "තෙල ගස මුල නිධානය ගණුව"යි කියා උන් බිම කණද්දී තෙමේ කඩට නැගී සතරකොණ හා මධ්‍යය හා වර්චස්කොට නැගී ගියේය.

එතන වෘක්ෂ දේවතාවා කියන්නේ "බමුණ, බෙල්ලන් සියයකටවත් මන්නැති කැණහිලා අතින් සම්පත් ගන්ට අවුත් ඉනකඩ වර්චස් කරවාගත් විවරක්වේද? එසේ හෙයින් අඥාන බ්‍රාහ්මණය, තොපගේ කඩත් සෝද ඉස්සෝද නා තා කළමනා

බමුණු කෘත්‍යය කරව”යි කී කල්හි එලෙසමකොට නුවරට ගියේයයි වදාරා දෙකල් ගළපා මේ ජාතකය නිමවා වදාළසේක.

“එසමයෙහි කැණහිල් බල්ලා නම් දෙවදත්ත ස්ථවිරයෝය, එසමයෙහි මේ යුක්තිය බලා සිටි වෘක්‍ෂ දේවතාවා නම් බුදු වූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 110. සබ්බසංහාර ජාතකය

තවද සර්‍වසංහාර ජාතකය වනාහි සර්‍වසංහාර ප්‍රශ්නයයි ජාතක අටුවාවෙහි කියන ලදී. එසේවී නමුදු අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් වදාළ ජාතක දේශනා ගාථාවන්ට අර්‍ථව්‍යාඛ්‍යානය කළා වූ පොළොන්නරු කාලයෙහි විසූ ත්‍රිපිටක වාගීශ්වරාචාර්‍ය්‍ය රජමුරාරී පණ්ඩිතෝත්තමයා විසින් මෙයට සර්‍වසංහාර ජාතකයයි නම් කරන ලදී. මේ සර්‍වසංහාර ජාතකය සියළු ආකාරයෙන් උම්මග්ග ජාතකයෙහි විස්තර වන්නේ යයි දත යුතු.

# 111. ගද්‍රභපඤ්හ ජාතකය

තවද ගද්‍රභ පඤ්හ ජාතකය වනාහි ගද්‍රභ ප්‍රශ්නයයි ජාතක අටුවාවෙහි කියන ලදී. එසේවී නමුදු සනනාමර ලොකගුරු වූ අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් වදාළ ජාතක දේශනා පාලියෙහි ගාථාවන්ට අර්‍ථව්‍යාඛ්‍යානය කළා වූ ත්‍රිපිටක වාගීශ්වරාචාර්‍ය්‍ය රජමුරාරී පණ්ඩිතෝත්තමයා විසින් මෙයට ගද්‍රභපඤ්හ ජාතකයයි නම් කරන ලදී. මේ

ගද්‍රභ පඤ්හ ජාතකය සියළු ආකාරයෙන් උම්මග්ග ජාතකයෙහි විස්තර වන්නේ යයි ජාතක අටුවාවෙහි කියන ලදි.

# 112. අමරාදේවි පඤ්හ ජාතකය

තවද අමරාදේවි පඤ්හ ජාතකය වනාහි අමරාදේවි ප්‍රශ්නයයි ජතක අටුවාවෙහි කියනලද නමුදු ත්‍රෛලොක තිලක තිලෝගුරු වූ සර්‍වඥරාජෝත්තමයාණන් වහන්සේ විසින් ජාතක දේශනා පාලියට ඇතුළත්කොට වදාළ බැවින් ජාතකයක් වශයෙන් සලකනු ලැබේ. මේ අමරාදේවිපඤ්හ ජාතකය ද උම්මග්ග ජාතකයෙහි විස්තර වශයෙන් කියන ලද්දේයයි ජාතක අටුවාවෙහි කියන ලදි. එයින් විස්තර බලා දත යුතු.

# 113. මිතවින්ති ජාතකය

තවද එක් සමයෙක්හි සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි වයෝවෘද්ධ තෙර දෙදෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ තෙර දෙදෙනා වහන්සේ පිටිසර ජනපදයෙහි ගමක වස් වසන්ට වැඩ උපාසකවරුන් විසින් එල වූ සිව්පසය පිළිගෙන වස් තුන්මස රැඳ ඒ ගම සැප බැවින් දෙවන අවුරුදු වසුත් ඒ විහාරයේ වැස අන්තයේ සැවැත් නුවරට වැඩිසේක. ඒ දෙදෙනා වහන්සේ දුටු සංඝයා වහන්සේ “ඇවැත්නි, බුද්ධොපස්ථානයට පමා වූයේ ඇයිදැ?”යි කියන්නා “ගිය තැන පාසු විසින් රැඳුනම්හ”යි වදාළසේක.

එදවස් සවස දම්සභා මණ්ඩපයට වැඩ වැඩිමහලුවරුන් වහන්සේ විසින් මේ කථාව කියමින් උන්සේක. එතැනට බුදුහු වැඩ පණවන ලද බුද්ධාසන මස්තකයෙහි වැඩහිඳ "මහණෙනි, මා එන්නාට පළමු කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි වදරා භික්ෂූන් වහන්සේ විසින් "අසවල් මහළුතෙර දෙදෙනෙකු වහන්සේගේ කුසීතභාවය කියමින් උනුම්හ"යි කී කල්හි "මහණෙනි, දැන්මතු නොවෙයි, පළමුත් ඔහු දෙදෙන කුසිත වූවෝම වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බාරාණසී ගං ඉස්වන ප්‍රදේශ ස්ථානයෙහි වසන බහුචින්තිය, අල්පචින්තිය, මිතචින්තිය යන මත්ස්‍යයන් තුන් දෙනෙක් මනුෂ්‍යපථ ආසන්නව ගඟ වසන කල්හි ඉන් මිතචින්ති නම් මත්ස්‍යා කියන්නේ "මනුෂ්‍යයන්ට ආසන්නව විසීම නම් උපද්‍රවයට කාරණාය"යි කියන්නා අනික් මත්‍යසයෝ දෙදෙන තෘෂ්ණාවෙන් ලෝභීව "අද යම්හ, සෙට යම්හ"යි කිය කියා තුන් මසක් දවස් යව් කල්හි එක් දවසක කෙවුලෝ(ධීවරයෝ) ගඟ අහුරා දැල් එලූහ.

බහුචින්ති, අල්පචින්ති යයි කියන මත්ස්‍යයෝ දෙදෙන ඉදිරිව යන්නාහු දැල ආඝ්‍රාණය නොකොට ගොසින් දැලෙහි බැඳුනුවුය. පස්සේ යන මිතචින්ති නම් වූ මත්ස්‍යයා දැල ආඝ්‍රාණයකොට දැල ඇතුළට නොවැද දැල ඇසින් අනික්

පිටට ගොස් සිතන්නේ “මා කියමන් නොගෙන මත්ස්‍යයෝ දෙදෙන අසු වූය. උන් ගලවන්ට උවමැනවැ”යි සිතා ඇතුලේ සිට පිටට පැන්නා සේ අඟවා පැන පිටත සිට ඇතුළටත් මේ සැටියෙම්ම පැන දිය පළාගෙන කවා ගිය කල්හි “මහ මසුන් බැඳුනු හෙයින් දැල ඉරුනේවනැ”යි සිතා දැල එකපිටකින් එසෙව් කල්හි “මත්ස්‍යයෝ දෙදෙන දැලින් ගැළවුනාහ”යි වදාරා දෙකල් ගළපා මේ ‘මිතචින්ති ජාතකය’ නිමවා වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට බණ වදාළ කල්හි මහතෙර දෙදෙනාම දහසක්නයින් ප්‍රතිමණ්ඩිත වූ සෝවාන් පෙළෙහි පිහිටිසේක.

“එසමයෙහි බහුචින්තිය, අල්පචින්තිය යන මත්ස්‍යයෝ නම් මේ තෙර දෙදෙනාය, මිතචින්ති නම් මත්ස්‍යව උපන්නේම් බුදු වූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 114. සකුණ ජාතකය

තවද සැවැත් නුවර සර්‍වඥයන් වහන්සේ වැඩවසන සමයෙහි එක්තරා කුලස්ත්‍රියක් භික්ෂුණී ශාසනයෙහි මෙහෙණිව තෘෂ්ණාවෙහි ගිජුව වසනසේක් මෙහෙණි තැන් නොකැඩී වීථියක සිඟා වැඩ එහි උපාසකවරුන් විසින් දුන් මිහිරි ආහාර වළඳා දවස් හරණාසේක් “මේ වීථියට අනික් මෙහෙණි කෙනෙකුන් වහන්සේ වැඩිසේක් නම් මට ආහාරය මෙබඳු නොලැබෙයි, එසේ හෙයින් ඊට මහාකුලක් කෙරෙමි”යි සිතා මෙහෙණවරට ගොස් “අසවල් තැන වීථියේ චණ්ඩ වූ ඇතුන්, අසුන්, කඩාකන බල්ලන් ආදී වූවන්ගෙන් උපද්‍රව ඇත, ඒ

වීථියේ කවුරුන් වහන්සේත් නොයන බව ය"යි කියන්නා එබස් ඇසූ මෙහෙණින් වහන්සේලා "කීවේ ඇත්තෙකැ"යි සිතා වීථියෙන් යන්නා තබා කරකැවී බලන්නකුත් නොකළසේක.

එසමයෙහි ඒ කියන මෙහෙණින් වහන්සේ තනිව සිඟා වළඳා ඇවිදිනා කල්හි එක් දවසක් එක් ගෙයකට සිඟා වඩනා ගමනේ බැටළුවෙක් දිව අවුත් ඇන කළවය ඇට බිඳ එළු කල්හි එතන සිටි උපාසකවරු අල්වා කැඩීගිය ඇට සන්ධි ගන්වා බැඳගෙන ඇඳක ලා ගෙනගොස් මෙහෙණිවර ලූහ.

මේ කථාව භික්ෂූන් වහන්සේ කෙරෙහි ප්‍රකාශ විය. එදවස් දම්සභා මණ්ඩපයෙහි වැඩිඋන් සංඝයා වහන්සේ "'අසවල් මෙහෙණි අනුන්ට අවවාද කියා තමන්ගේ පය බිඳවා ගතැ"යි කිය කියා උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩමවා "මා එන්නාට පළමු කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා "මෙහෙණින්නගේ කථාව කිය කියා උනුම්හ"යි දැන් වූ කල්හි "දැන්මතු නොවෙයි, පෙරත් අනුන්ට අවවාද කිය කියා තුමූ මළහ"යි වදාරා ආරාධිත වූ බුදුනු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ පක්ෂීන්ට රජව උපන්සේක. ඉන් එක්තරා පක්ෂි ධේනුවක් "ගොදුරු බොහෝව ලැබේ"යි මාවතක ගොදුරු කා ඇවිදිනී එක් දවසක් "මේ මගට අන්‍ය පක්ෂි කෙනෙකුන් වැද්ද නොදෙමි"යි සිතා පක්ෂීන්ට පලාගොස් "අසවල් මාවත

ඇතුන්, අසුන්, රථ අදින ගොන් ආදීන්ගෙන් උපද්‍රව බොහෝය"යි කියන්නීය. ඒ ඇසූ පක්ෂීහු ඒ දිසාවට නොගිය විරූහ. තමා ඉච්ඡාපරාව ඇවිදිනී එක් දවසක් පවනට බඳු වේගයෙන් රථයක් පදිනවා දැක කරකැවී බලා "තව දුරය"යි සිතා කරබාගෙන ගොදුරු කමින් සිටි කලට වහා අවුත් රථය පැමිණී කල පියාසර කරන්ට අසමත්වී දෙකක්ව තෙරපී මළහ. බෝධිසත්ත්වයෝ පක්ෂි ගණයා පිරිවරා ආකාශයෙන් යන්නාහු පක්ෂීන් සමන්වා මෙකියන පක්ෂි ධේනුව නොදැක අසවල් අවවාද කියන පක්ෂි ධේනුව බලා මහ මාවත මිය පියා වැදහොත්තී දැක "අනුන්ට අවවාද කියා තෘෂ්ණාවට වසඟව මළාය"යි වදරා වනයට වැඩිසේක.

"එසමයෙහි අවවාද දෙන පක්ෂිණී නම් මේ කියන මෙහෙණිය, එසමයෙහි පක්ෂිව උපන්නෙම් වනාහී බුදුහු මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 115. දුබ්බච ජාතකය

තව ද එක් සමයෙක්හි සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් නොකීකරු භික්ෂුවක්හු අරභයා මේ ජාතකය වදාළසේක. මේ ජාතකය නවවැනි නිපාතයෙහි ගිජ්ක්ධ ජාතකයෙහි විස්තර වශයෙන් එන්නේය. සර්වඥයන් වහන්සේ ඒ භික්ෂූන්ට ආමන්ත්‍රණයකොට "මේ මහණ දැන්මතු නොවෙයි, නොකීකරු වූයේ පෙරත් නොකීකරුමය"යි වදරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ කරණම්පනන විජ්ජත් කුලයක ඉපිද වැඩිවිය පැමිණ කරණම් නිමවා ඉගෙණ ගුරුන් හා සමග ඒ ඒ තැන ඇවිදිනාසේක් එක්තරා ගමකට පැමිණ ආචාරීන් විසින් ශිල්ප දක්වන්ට ආයුධ පසක් බිම හිඳුවා පනින්ට සරා "මෙතෙක් දවස් අභ්‍යාසය පනින්නේ ආයුධ සතර ය, පසක් කෙළේ ඇයිදැ"යි "එකක් හල මැනවැ"යි කියන්නා රා මදයෙන් මත්ව ඒ ආචාරී "තෙපි මාගේ පමණ නොදන්නවාදැ"යි කියා ආයුධ සතර පැන පස්වන ආයුධය ඇනී මළාහ.

ඒ දුටු ශිෂ්‍යයා "මා කියමන් නොගෙන ආචාරීහු මළහ"යි ආයුධයෙන් ගළවා ආදාහන කරවූහයි දෙකල් ගළපා මේ 'දුබ්බච ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි ආචාරී නම් නොකීකරු මහණාය, ශිෂ්‍යව උපන්නෙම් ලොව්තුරා බුදු වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 116. තිත්තිර ජාතකය

තවද ජේතවනාරාමයෙහි සර්වඥයන් වහන්සේ වැඩවසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන්ගේ දක්‍ෂිණ ශ්‍රාවක වූ කෝකාලික ස්ථවිරයන් නිසා මේ ජාතකය දක්වන ලදී.

එහි වර්තමාන කථාව තේරස නිපාතයෙහි විස්තර වශයෙන් එයි. සර්වඥයන් වහන්සේ "මහා කෝකාලික

ස්ථවිරයෝ බොහෝකොට බස් කීමෙන් පෙරත් ජීවිතක්‍ෂයට පැමිණියෝම වේදැ”යි වදරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ ප්‍රසිද්ධ බ්‍රාහ්මණ කුලයක ඉපිද වැඩිවිය පැමිණ ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව බොහෝ තාපසවරුන්ට ගණනාසකව හිමාලය වනයෙහි වසනසේක.

එසමයෙහි පාණ්ඩු රෝග ඇති තාපස කෙනෙක් ගිනි තපින පිණිස පොරවක් ඇරගෙන වලට(වනයට) ගොස් දර පලන්නාහ. එතනට තාපස කෙනෙක් ගොසින් “මෙතන පලව, මෙතන පලව”යි යනාදීන් නොයෙක් පරිද්දෙන් කියන්නා කිපී “දර පැලුම් උගන්වන්ට ආචාරී කෙනෙක්දැ”යි තියුණු මුවහත් ඇති පොරවින් පළා එක පහරිම්ම ජීවිතක්‍ෂයට පැමිණ වූහ.

බෝධිසත්ත්‍වයෝ ඒ තාපසයන් කළ පවත් අසා මළ තාපසයන්ට කළමනා කෘත්‍යය කර වූහ. තවද බෝධිසත්ත්‍වයන් වසන පන්සල කෙරේ ආසන්න වූ තුඹගස තිත්වටුවෙක් දවස් පතා මහත්කොට අඬයි. ලිහිණි වැද්දෙක් උගේ අඬ අසා අල්වා මරා හැරගෙන ගියේය. බෝධිසත්ත්‍වයන් වහන්සේ උගේ හඬ නාසා “මෙතෙක් දා අඬන තිත්වටුවා කොයිදැ?”යි විචාරා එපවත් අසා තිත්වටුවාගේ කථාව හා තාපසයන්ගේ කථාව එක්කොට ගාථාව ගළපා ඒ ගාථාවෙන් ඒ තාපසයන්ට අවවාදකොට සතර බ්‍රහ්මවිහාර භාවනාකොට තාපසවරුන් හා සමග

නොපිරිහුණු ධ්‍යානයෙන් බ්‍රහ්මලෝකප්‍රාප්ත වූහයි ‘තිත්තර ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි බොහෝකොට බස් කීමෙන් හිස පලවා ගත් තාපසය නම් කෝකාලික ස්ථවිරයෝය, ගණශ්‍රේෂ්ඨව උපන්නෙම් බුදු වූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 117. වට්ටක ජාතකය

තවද සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි උත්තර සෙට්ඨිපුත්‍රයන් අරභයා මේ ජාතකය වදාළසේක.

සැවැත් නුවර වසන මහා සම්පත් ඇති උත්තර සිටාණන්ගේ ගෙයි මහා පින් ඇති බ්‍රාහ්මණ කුමාරයෙක් ඇවිත් උන්ගේ භාර්‍ය්‍යාවන්ගේ කුස පිළිසිඳ දසඑකඩමසක් ඇවෑමෙන් බිහිව වැඩිවිය පැමිණියේය.

එසමයෙහි එනුවර කාර්තික උත්සවය බොහෝ සිටුකුමාරවරු තමන්ගේ ගෙයි භාර්‍ය්‍යාවන් හා සමඟ උත්සව සත්දවසක් කෙළනාහු උත්තර කුමාරයෝත් “ස්ත්‍රීන් හා සමඟ උත්සව කෙළින්ට උවමැනවැ”යි සිතා උන්කරා ගොස් එපවත් කීහ.

උත්තර කුමාරයන් බ්‍රහ්ම ලෝකයෙන් ආ නියායෙන් එබස් නොගිවිස්සෝය. එසේ නොගිවිස්සත් සිටුකුමාරවරු එක්ව ඒ ගම වෛශ්‍ය ස්ත්‍රියක්ගෙන අවුත් සර්‍වාභරණ පළඳවා සරසා

ගෙයි ලූහ. උන් දැක කරනඟා බලන්නක් වත් බසක් කියන්නක් වත් නොකියා ඉන්නා විසින් “භාව භාවයක් දක්වා වුවත් ලබවා ගතහැකි දේ හෝ”යි සිතා මන්දස්මිත වූ දෙයක් දැක්වූහ.

එසඳ සිටුකුමාරයෝ අසුභ වශයෙන් බලා ඇගේ ශරීරය ඇට කෑල්ලක් කොට සිතා පිළිකුල්ව “ආ ගමන් සිස්ව යන්නේ ඇයිදැ”යි සිතා ඈට උවමනා සම්පත් දී යවූහ. එසේ ගෙයින් පිටත්ව වීථියෙන් යන්නීය. පොහොසත් අමාත්‍යයෙක් දැක තමාගේ ගෙට කැඳවාගෙන ගියෝය. උත්සව කෙළි ඉක්බිති වූ පසු වෛශ්‍ය ස්ත්‍රියගේ මවු තමාගේ දූ නොදක්නී සිටුකුමාරවරුන් කරාගොස් “තොපි හැම මාගේ දුව ගෙන ගියාහුය, පාව”යි කියන්නා “උත්තර කුමාරයන්ට එදම පාවාදීපුම්හයි උන්කරා යව”යි කියන්නා උන්කරා ගොස් “මාගේ දුව පාවා දුන මැනව”යි කියන්නා “එදම් උන් යවපීම්, කොයිගිය බවත් නොදනිමි”යි කියන්නා උත්තර කුමාරයනුත් හැරගෙන රජ්ජුරුවන් කරාගොස් එපවත් කියා මුරගාන්නා රජ්ජුරුවන් විසින් ආද්‍යානත විචාරණාකොට “තොපගේ ගෙට වන්පසු පාවා දුන මනාමය”යි කියන්නා “කොයි වන් බව නොදනිමි”යි කියන්නා “එසේ වීනම් ආඥා කරව”යි විධාන කළාහ.

විධාන ඇසූ අමාත්‍යයන් විසින් පිටිතලහයා බැඳගෙන වදබෙර ගස්වාගෙන වීථියෙන් පිටත් වූහ. ඒ ඇසූ බොහෝ මනුෂ්‍යයෝ අඬමින් වැලපෙමින් එතනට අවුත් “නුඹ වහන්සේ

වන් ව්‍යවස්ථයන්ටත් මෙසේ වූ දෙය පැමිණියේය''යි වැලපෙමින් යන්නවුන් දැක ඒ සිටුකුමාරයා සිතන්නේ ''මේ දුකින් යම්සේ ගැලවීයෙන් නම් ගෞතම බුදුන්ගේ ශාසනයෙහි මහණ වෙමි''යි සිත සිතා යමින් සිටිකල වෛශ්‍ය ස්ත්‍රිය තමා නිසා සිටුපුත්‍රයා මරණ නියාව අසා මහා ප්‍රාසාදයෙන් බැස වධකරන පුරුෂයා කරා ගොස් තමා දැක්කවිය. ඈ දුටු පුරුෂයෝ ඈටම පාවාදී සිටුපුත්‍රයා ගැලවූහ.

මරණින් මිදුනා වූ සිටුපුත්‍රයා වැවට ගොස් ඉස් සෝද නහා බත් කා දෙමවුපියන් වැඳ අවසර ඉල්ලාගෙන මහත් වූ පෙළහරින් වනයට ගොස් මහණව උපසම්පද ලදින් නොබෝ දවසකින් විදර්ශනා වඩා රහත් වූසේක.

එදවස් දම්සභා මණ්ඩපයට රැස් වූ මහළුවරුන් වහන්සේ මේ කථාව කිය කියා උන්තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදරා ''මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව හුණුදැ?''යි විචාරා වදරා ''අසවල් සිටුකුමාරයෝ මරණ දුකින් ගැලවී රහත් වූ නියාව කිය කියා උනුම්හ''යි දැන් වූ කල්හි ''මහණෙනි, නුවණැත්තෝ පළමුත් මරණ පැමිණි කල උපායෙන් ගැලවුණෝ වේදැ''යි වදරා ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ වටු ජාතියෙහි උපන්සේක. එසමයෙහි බරණැස් නුවර ලිහිණි

වැද්දෙක් වලට ගොස් වටුවන් බඳගෙන ගෙයි තිබා ගොදුරු ලා අනුන්ට මිලයට දෙන්නේය.

එක් දවසක් බෝධිසත්ත්‍වයන් වහන්සේ වැද්දහු දැමූ දැලට අසුව උගේ ගෙට අවුත් උගෙන් ලූ ගොදුරු දැක "ඇඟ මහත් වීනම් නපුරැ"යි සිතා ගොදුරු නොකා ඇඟ දුර්‍වලකොට, ඒ වැදිත් බෝධිසත්ත්‍වයන් "ගොදුරු නොකන්නේ කුමක් නිසා දෝ හෝ"යි සිතා අල්ලෙහි තබාගෙන බලමින් සිටි කලට උගේ ප්‍රමාදයක් බලා පවනට බඳු වූ වේගයෙන් වනයට පලා ගියාහ.

බන්ධු වටුවන් විසින් "මෙතෙක්ද පමාවූයේ ඇයිදැ?"යි විචාරන්නා "වැද්දෙකුට අසුව ගැළවුණු මාන කීවාහුය"යි වදරා දෙකල් ගළපා මේ 'වට්ටක ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි වටුව උපන්නෙම් තිලෝගුරු බුදු වූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 118. අකාලරාවි ජාතකය

තවද සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා වහන්දෑ දෙනමක් කළමනා වත්පිළිවෙත් කළමනා වේලාවට නොකොට රාත්‍රියෙහි නිදි වූ කලත් යෙහෙන් පිබිදීමක් නැතිව පිබිදිනා කල මහත්කොට ඝෝෂාව පවත්වා පුබුදිනා හෙයින් සමීපයෙහි වැදහොත් වහන්දෑ රාත්‍රියෙහි නිදි නැතිව හිඳිනාසේක.

මේ කථාව දම්සභා මණ්ඩපයෙහි රැස් වූ මහළුවරුන් වහන්සේ විසින් කියමින් උන් කල්හි සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා “මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?”යි විචාරා වදාල කල්හි “අසවල් නම අකාලරාවි වූ නියාව කිය කියා උනුම්හ”යි දැන් වූ කල්හි “මහණෙනි, මොහු දැන්මතු නොවෙයි, පළමුත් අකාලරාවි වූවෝ වේදැ”යි වදාරා ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ ප්‍රසිද්ධ වූ බ්‍රාහ්මණ කුලයක ඉපද උගතමනා ශිල්ප ශාස්ත්‍ර නිමවා දිසාපාමොක් ආචාර්‍ය්‍ය පන්සියයක් අතවැස්සන්ට ආචාර්‍ය්‍ය වසන්නාහ.

එසමයෙහි අතවැස්සන් ගේ කල් නොවරදවා හඬන කුකුළෙක් ඇති වූ නිසා ශිල්ප ශාස්ත්‍ර වේලාවට පිරුවති. ශාස්ත්‍ර නොපිරිහෙලා ඉන්නා අවදියෙහි ඒ කුකුළා කල් යාමකින් නැසී ගියහ. එක් ශිෂ්‍යයෙක් සුසානභූමිය කෙරේ බැද්දක දර කඩා ගියේ එක් කුකුළකු අල්වා ගෙනවුත් මැදිරියක ලා පෝෂ්‍යය කෙරෙති. එසමයෙහි ඒ කුකුළා අඬන කල මධ්‍යම රාත්‍රියෙහි ඇඬූ කල්හි ශිෂ්‍යයෝ පිබිද ශිල්ප ශාස්ත්‍ර පිරිවහන්නට නැගීසිටි කලට වේලා බෝ විසින් නිද නිද පිරිවීමෙන් වනපොත් කළ දෙයත් පිරිහෙයි. අළුයම් වේලේ හැඬූ කල වේලාව මඳ විසින් තිබෙයි. මේ

දෙකාරණයෙන්ම ශිල්පය පසුබසිනා බව දැක සිතන්නාහු "මේ කුකුළා ඇඬීමෙන් අමුතු ශිල්ප උගන්නා තබා පළමු කළ දෙයත් අපවත් වෙ"යි සිතා උෟ මරා එපවත් ආචාරීන්ට කීහ.

"ආචාර්‍ය්‍ය මවුපියන් නැතිව ආචාර්‍ය්‍ය ගුරු කෙනෙක් නැතිව ව්‍යවස්ථිත වෙන කෙනෙකුන් ගේ පණිත මේ කුකුළාසේමය"යි කියා ශිෂ්‍යයන්ට අවවාද දී කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදාරා දෙකල් ගළපා මේ 'අකාලරාවි ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි කල්වරත් නොදැන අඬන කුකුළා නම් පිබිදීම ව්‍යවස්ථිත නොවන මහණාය, ශිෂ්‍යයෝ නම් දැන් මේ බුදුපිරිසය, ආචාරීව උපන්නෙම් බුදු වූ මම්ම වේදැ"යි වදාරා මේ ජාතකය නිමවා වදාළසේක.

# 119. බන්ධන මොක්ඛ ජාතකය

තවද සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි විඤ්චාමානවිකාව නිසා මේ ජාතකය වදාරන ලදී. එහි වර්තමාන කථාව වාදශ නිපාතයෙහි 'මහපදුම' ජාතකයෙහි විස්තර වශයෙන් එන්නේය.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි ඒ රජ්ජුරුවන්ට ප්‍රිය වූ බෝධිසත්ත්වයන් වහන්සේ පුරෝහිතව උපන්සේක. ඒ රජහට පියව අගමෙහෙසුන් බිසෝ කෙනෙක් ඇත්තාහ. රජ්ජුරුවෝ ඒ බිසවුන් කෙරෙහි අධික වූ ප්‍රේම ඇති හෙයින් "තොප කැමති

වරයක් ගණුව"යි කියන්නා එවිට බිසව් කියන්නේ "තෙල, කුමක් අඩු හෙයින් ඉල්වම්ද? අන්‍ය ස්ත්‍රියක රාග චිත්තයෙන් නොබැලුවහොත් ඒ මට වරය"යි කියන්නා රජ්ජුරුවන් වහන්සේ විසින් "සොළොස් දහසක් පුරඞ්ගනාවන්ද ඉන්දදී එබඳු වරයක් දෙන්ට බැරිය"යි කීව. බිසවුන් තත්පරව නැවතත් ඉල්වන හෙයින් බිසවුන් බස ඉක්මවා යා නොහෙන රජ්ජුරුවන් වහන්සේ විසින් වර දී එතැන් පටන් අන්‍ය ස්ත්‍රියක රාග මිශ්‍රව නොබලා දවස් යවන කල්හි පසල් ගමක සතුරන්ගෙන් භයක් පැමිණ ඒ රට උන් අමාත්‍යයා විසින් කීප වරෙක සටන්කොටත් ජය ගතනොහී එපවත් රජ්ජුරුවන්ට කියා යවීය. රජ්ජුරුවෝ ඒ අසා සිව්රඟ සෙනග රැස් කරවා සටනට නික්මෙමින් සිට අග්‍රමහේසිකා බිසවුන් ගෙන්වා "සටන් නම් චපල භයක් පැමිණියක් ස්ත්‍රීන් ජාතිය හැරගෙන වහා ගැළ වී ගත නොහැක්ක. එසේ හෙයින් තෙපි රඳව"යි කියන්නා "නොපිළිවන එම්"යි කීය. තත්පරවත් රජ්ජුරුවන් විසින් "රැඳුනු මනාමය"යි කියන විසින් "එසේ වීනම් යොත්තෙන් යොත්ත මා විචාරා එවන්ට උවමැනව"යි කියන්නා "යහපතැ"යි කියා බිසවුන් රඳවා නුවර රැකවල් ලවා පුරෝහිත බමුණන්ට පාවා දී නික්ම යොත්තෙන් යොත්ත එකෙක නියායෙන් මෙහෙවර කරන්නන් ආ කළ "තොපි ආවෝ ඇයිදැ?"යි බිසව් විචාරා "සුවදුක් විචාරන්ට ආම්හ"යි කියන්නා "එසේ වීනම් මෙසේ එව"යි කියා උන් හා සමග ලෝකස්වාදරතියෙන් යෙදී යවන්නාහ. මෙම නියායෙන් දෙතිස් යොදුන් මාර්ගයට රජ්ජුරුවන් විසින් එවනලද දෙතිස් දෙනා

ද, යුද්ධයෙහි ජයගෙන එන ගමනේ එවන ලද දෙතිස් දෙනාදැයි කියා මෙසේවූ සැටසතරදෙනා හා සමග සංවාසය කළහ.

එකල්හි රජ්ජුරුවෝ නුවර සමීපයට අවුත් ජය කඳවුරු ස්ථානයෙහි හිඳ තමන් ආ පවත් බෝධිසත්ත්වයන් වහන්සේට කියා යවූ කල්හි පිටිනුවර සරහා අනතඃපුරයට ගොස් එපවත් බිසවුන්ට කියන්ට බිසෝ ගෙට ගියාහ. බිසව් බෝධිසත්ත්වයන්ගේ යහපත් රූපශ්‍රීය දැක පිළිබඳ සිතින් "මෙසේ අවුත් යහන පිට ඉඳුව"යි කීහ. එබසට බෝධිසත්ත්වයන් වහන්සේ විසින් "ඇයි දේවීන් වහන්ස, රජ්ජුරුවන් වහන්සේ ඉතා රූපත්සේක. පරලොවටත් බයිමි"යි කියන්නා "රජ්ජුරුවන් විසින් එවනලද සූසැට දෙනා නියාවට තොපම රජ්ජුරුවන්ටත් පරලොවටත් බා ගියාදැ?"යි කියන්නා "මේ සා මහත් වනතුරු පරස්ත්‍රියක මුහුණත් රාග වශයෙන් නොබැලීමි. මෙබස් මා කණ එලවන්ට එපා"යි බොධිසත්ත්වයෝ කීහ. "එසේ වීනම් රජ්ජුරුවන්ට කියා තාගේ හිස කප්පමි"යි ඕ කීවාය. "එක ජාතියක තබා දහසක් ජාතියේ හිස් කප්පතත් එසේ වූ දෙයක් නොකරමි"යි නික්මුණුසේක.

බිසවු ඇඟ නබගෙන තෙල් වැකුණු ශරීරයෙන් කිළුටුව වස්ත්‍රයක් ඇඳ ලෙඩ වේසයක් මවාගෙණ ශ්‍රී යහන් ගබඩාවෙහි වැද හොත්තීය. ස්ත්‍රීන්ට කියන්නාහු "රජ්ජුරුවන් වහන්සේ, ඇවිත් මා විචාළොත් ලෙඩ නිසා කියව"යි කියා වැදහොත්තාහ.

බෝධිසත්ත්වයන් වහන්සේ රජ්ජුරුවන්ට පෙර ගමන්කොට රජ්ජුරුවන් දුටුසේක. රජ්ජුරුවෝ මහා පෙළහරින් නුවර පැදකුණුකොට රජගෙට අවුත් බිසවුන් නොදැක "කොයිදැ?"යි විචාරා ලෙඩ නියාව අසා ශ්‍රී යහන් ගබඩාවට ගොස් බිසවුන්ගේ පිට පිරිමැද "සුවදුක් කීම්දැ?"යි දෙතුන්වැනිව විචාරන්නා කරකැවී බලා "නොනැසී නුඹවහන්සේත් ආ නියාවේද? අපිත් සස්වාමික නියාවේදැ"යි කියන්නා රජ්ජුරුවනුත් "ඒ කීම්දැ?"යි විචාරන ලදුව "පුරෝහිත බමුණන් විසින් තමා කීවා නොකළ විසින් මට කළ දැය"යි කියන්නා රජ්ජුරුවෝ වහා උදහස්ව මාලිගාවෙන් පාතට බැස එතන සිටි සේවකයන්ට "පුරෝහිත බමුණා පිටිතලගයා බැඳගෙන ගොස් මරාපියව"යි මෙවර කීහ.

එපවත් ඇසූ රාජපුරුෂයෝ බෝධිසත්ත්වයන් පිටිතලහයා බැඳගෙන වදබෙර ගස්වාගෙන මරන්ට නික්මුණාහ. එවිට බෝධිසත්ත්වයෝ සිතන්නාහු "බිසවුන් විසින් වූ දෙයක, ප්‍රඥව නම් මෙසේ වූ දුකක් පැමිණි වේලේ ගැලවෙන්ටය"යි සිතා "රජ්ජුරුවන්ට පාවා මිසක් නොමරව"යි කියන්නා "මරන්ට ගෙනයන තොප කීම්ද? පානෙය"යි කියන්නා "රජ්ජුරුවන් වහන්සේ ගෙන් මා නිසා නිධාන කරනලද බොහෝ සම්පත් ඇත, එසේ විසින් මා මැරුවොත් රජ්ජුරුවන් වහන්සේට බොහෝ අලාභ වන්නාහ" ගෙනගොස් රජ්ජුරුවන්ට පෑහ.

රජ්ජුරුවෝ දැක "බමුණ භය ලජ්ජා නැතිව තා කළේ කුමක්දැ?"යි කියන්නා "දේවයන් වහන්ස, එසේ වූ දෙයක් මම

නොකළෙමි. තවද නම දන්නා තැන් පටන් ඉකිනියක සා ප්‍රාණඝාතයකුත් නොකෙළෙමි. අනුන්ගේ වස්තුවකින් තණකෙන්ද්‍රක සාත් අදත්තා දානයක් නොගත්තෙමි. පරස්ත්‍රීන් රාග චිත්තයෙන් කර ඔසවාත් නොබැලි විරීමි, කෙළි පිණිසත් බොරුවක් නොකී විරීමි, තණ කෙන්ද්‍රකින් ගලලාත් රා පෙනක් නොබී විරීමි, ද්‍රෝහී කළෝ මෙහෙවර එවි සූසැට දෙනාමය, මාත් එතනට අල්ලන්නාම එලෙස නොකළෙමියි කී විසින් මේ මට කර වූ දෙය”යි දැන්වූහ.

එපවත් අසා රජ්ජුරුවෝ සූසැට දෙනා ගෙන්වා බිසවුනුත් ගෙන්වා බිසවුන් අතින් “සැබෑද?”යි විචාරා “සැබව”යි කී විසින් “හැමදෙනාම මරව”යි කියන්නා බෝධිසත්ත්වයන් වහන්සේ කියනසේක් “බිසවුන් කී විසින් කළෝය”යි කියා උනුත් ගලවා උන් උන්ගේ ස්ථානාන්තරවල සලස්වා “ස්ත්‍රීන්ට නම් තිබීම ආදෙයකැ”යි බිසවුනුත් ගළවා “ගිහිගෙයි සිටියෙන් වේද මේසා අවුලත් වූයේය”යි සිතා නෑයන් විසින් හැඬියදී බොහෝ සම්පත් හැර හිමාල වනයෙහි මහණව පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා බඹලොව ගියාහයි වදාළසේක.

“එසමයෙහි බිසවු නම් චිඤ්චාමාණවිකාවය, එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය, පුරෝහිත බ්‍රාහ්මණ උපන්නේ නම් ලොව්තුරා බුදු වූ මම්ම වේදැ”යි වදාරා මේ ‘බන්ධන මොක්ඛ ජාතකය’ නිමවා වදාළසේක.

# 120. කුසනාලි ජාතකය

තවද එක් සමයෙක්හි සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි අනේපිඬු මහසිටාණන්ගේ මිත්‍රයෙකු නිසා මේ ජාතකය වදාරන ලදී. යට කියනලද කාලකණ්ණි ජාතකයෙහි කියනලද ක්‍රමයෙන් මයයි දත යුතුයි.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ වනදේවතාවකුව ඉපිද මගුල් උයන සල්ගස වනදේවතාවා හා සමග විශ්වාසව වැලුප් පඳුරෙක වාසය කරනසේක.

එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ එකස්තම්භ මහා මාලිගාවෙක වාසය කරනසේක. එසමයෙහි ටැඹ සෙලවින. ඒ රජ්ජුරුවෝ වඩු ආචාරීන් ගෙන්වා "එකස්තම්භ මාලිගාවෙහි පළමු කප උදුරවා ඇර කපක් අමුතුව ඉඳුවව"යි කී විසින් ආචාරීවරු ගසක් බලා නොදැක උයනට ගොස් උයන මඟුල් සල්ගස මිසක් අනික් ගසක් නොදැක ඒ ගොසින් රජ්ජුරුවන් වහන්සේට කීහ.

රජ්ජුරුවෝ "එසේ උවත් කපා එය ඉඳුවව"යි කී විසින් වඩු ආචාරීවරු ගස ළඟට ගොස් බලි පූජාකොට "සෙට ගස කපම්හ"යි කියා දේවතාවන් අනික් ගසකට පලායන්ට ආරාධනා කළහ.

දේවතාවානෝත් තමන් ඉන්ට අනික් ගසක් නොදැක තමන්ගේ දරුමල්ලන් වැලඳ හඬන්ට වන්නාහ. එසමයෙහි දුක් සුව විචාරන්නට ආවා වූ වනදේවතාවෝත් අඬන්ට වන්හ. එසමයෙහි වැළුප් පඳුරෙහි වසන දේවතාවත් එතනට අවුත් අඬන කාරණා විචාරා "ගසට සෝක නොකොට වදාළ මැනව. නුඹවහන්සේගේ වෘක්‍ෂය මම ගලවමි"යි කියා අස්වසා දෙවෙනි දවස් ගස කපන්ට වඩුවන් ආවේලා කටුසු වෙසක් මවාගෙන බල බලා සිටියදී ගස මුල් අස්සට වැදී අස්සෙන් යන්නාක් බඳුව ශාඛාග්‍රයෙන් පෙනුනාහ. එසේ වූ අතරත වූ ගස බෝධිසත්ත්වයන්ගේ උපායෙන් නිස්සාරත්වයට පැමිණියෝය, වඩුවෝත් ඒ දැක "අරය ඇති ගසෙකැයි උනුම්හ. මෙසේ නිස්සාර වූ ගසින් කම් කිම්දැ?"යි පළා ගියාහ. ඒ ගස වසන වනස්පති වූ දේවතාවා තමාගේ උපවෙනෙහි දේවතාවන්ට කියන්නේ "මම මාහේශාක්‍යව සිටත් මගේ ගස ගලවා ගන්නා උපාය නොදන්නෙමි. වැළුප් වනයේ වසන දේවතාවා විසින් වෘක්‍ෂය රකිනා නුවණ දන්නවන. එසේ හෙයින් ප්‍රඥාවන්තයන් විනා නීච උත්තමයන්ගෙන් කම් කිම්දැ"යි බණ කියා තමන් හා වැළුප් වනයේ දේවතාවාණන් හා විශ්වාස හිඳ කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ.

"එසමයෙහි වනදේවතා නම් ආනන්ද ස්ථවිරයෝය. වැළුප් වනයේ දේවතාව උපන්නෙම් බුදු වූ මම්ම වේදැ"යි වදාරා මේ 'කුසනාලි ජාතකය' නිමවා වදාළසේක.

# 121. දුම්මේධ ජාතකය

තවද රජගහ නුවර නිසා වේළුවනාරාමයෙහි සර්‍වඥයන් වහන්සේ වැඩවසන සමයෙහි එක් දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස්ව වැඩ උන්නා වූ මහළුවරුන් වහන්සේ “ඇවැත්නි, දේවදත්ත ස්ථවිරයෝ බුදුන්ගේ දෙතිස් මහපුරුෂ ලක්‍ෂණ අසූ අනුව්‍යංජන බ්‍යාමප්‍රභා ආදි වූ රූප ශ්‍රී දැකත් බුදුන් කෙරෙහි මෛත්‍රියක් නැතිව ‘මෙබඳු වූ රූප ශ්‍රීයක් මට ඇති නූයේය’යි සිතා බුදුන් කෙරෙහි ඊර්‍ෂ්‍යාවෙන් බුදුන් නසන්ට සිතති”යි කිය කියා කථාකොට උන්සේක.

එතනට සර්‍වඥයන් වහන්සේ වැඩ බුද්ධාසන මස්තකයෙහි වැඩහිඳ “මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?”යි විචාරා වදාරා “දේවදත්ත ස්ථවිරයෝ බුදුන් කෙරේ ඊර්‍ෂ්‍යා නියාව කිය කියා උනුම්හ”යි දැන් වූ කල්හි “මහණෙනි, දැන්මතු නොවෙයි, පළමුත් මා කෙරෙහි ඊර්‍ෂ්‍යාව ඇත්තේමවේදැ”යි වදාරා ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස රජගහ නුවර මගධ නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ ඇත් කුලයක ඉපිද ස්වර්ග ධවලව විසිතුරු වූ රූප ශ්‍රීයෙන් අලඞ්කෘතව මගධ නම් රජ්ජුරු කෙනෙකුන් වහන්සේට වාහනව සිටිනාසේක.

එසමයෙහි එක් දවසක් මගධ රජ්ජුරුවෝ සර්‍වාලඞ්කාරයෙන් සරහනලද මඟුලැතාට ආරූඪව මහත් පෙළහරින් නික්මුණාහ. එවිට රාජ්‍යවාසීන් මඟුලැතු දැක "ඇතුගේ ආරෝහ පරිනාහ රූප ශ්‍රීයක් හා මෙසේ වූ ඇතෙකු චක්‍රවර්ති රජ්ජුරු කෙනෙකුන්ටවිනා මෙවැනි රජ්ජුරු කෙනෙකුන්ට ඇතෙක් නොවේ"යි කියා ඇතුම වර්‍ණනා කළාහ. ඒ වර්‍ණනාව රජ්ජුරුවන් විසින් අසා "තිරිසන් ඇතු වර්‍ණනා කළෝය, මා වර්‍ණනා නොකළෝය"යි ඇතු කෙරෙහි ඊර්ෂ්‍යාකොට ඇතු නසන්ට සිතා රජගෙට ගොස් ඇත්තලයා ගෙන්වා "තොප විසින් මඟුලැතු ඉඳින් කම්බස් ඇතිව ව්‍යවසර්‍ථිත කරන ලදදැ"යි විචාරා හස්ත්‍යාචාරියා විසින්ම "ඇතු නාවා කම්බස් කරන ලදැ"යි කී කල්හි එසේ වීනම් "වේපුල්ල පර්‍වතයට ඇතු නඟව"යි කී කල්හි හස්ත්‍යාචාරියා විසින් "යහපතැ"යි ගිවිස ඇතු ඇරගෙන පර්‍වතයට නැඟී කල්හි රජ්ජුරුවෝත් අමාත්‍ය මණ්ඩලයා පිරිවරා පර්‍වත මුදුනට නැංගාහ. "ප්‍රපාත ආසන්නව ඇතු සිටුවා බල"යි කීහ. ඒ මානට ඇත්තලයා සන්කොට තුන්පයින් සිටිවිය. එවිට රජ්ජුරුවෝ "පෙරවා අත්දෙක ඔසවා පස්සා පාදෙක ඔසව"යි කියන්නා එලෙස ඇතු නොවැටෙන්නා, නැවත රජ්ජුරුවන් විසින් "පෙරවා අත්දෙක ඔසවා සිටුව"යි කියන්නා එලෙසත් සිටිවිය. පසුව "එක පයකින් සිටුවා බලව"යි කියන්නා එලෙසටත් සිටිවිය. මෙලෙස කොටත් ඇතු නොවැටෙන්නා එවිට රජ්ජුරුවෝ කියන්නෝ "ඇතුන්ගේ සතර කකුලම ඔසවා ප්‍රපාත දිසාවට මෙහෙයාලව"යි කීහ.

එවිට ඇත්තලයා සිතන්නේ “රජ්ජුරුවන් වහන්සේ විසින් ඇතු නසන්ට ප්‍රයෝගයක් වනැ”යි සිතා ඇතු කන්තල දිසාවට කරනමා කියන්නේ “පින්වත් ඇත් රජ්ජුරුවෙනි, තොප නසන්ට උත්සාහ කරනසේක. එසේ හෙයින් තට පිළිවන් වීනම් ආකාශයට නැගී බරණැස් නුවරට පළා යව”යි කීහ. ඒ ක්‍ෂණයෙහිම පෙර කරනලද පින්බලයෙන් පහළවන ලද සෘද්ධියෙන් පුළුන් පෙළක් ආකාශයට පැන නැංගාක් මෙන් පැන නැංගේය. එවිට ඇත්තලයා ඇතු පිටට පැන හිඳ කියන්නේ “නුඹ වහන්සේ වැනි පින්මද රජ්ජුරු කෙනෙකුන්ට පහළවන ඇතෙක් නොවෙයි, එසේ හෙයින් නුඹ වහන්සේ වැනි නිවට රජ්ජුරු කෙනෙකුන්ට වාහනයට නොනිසිය, නුඹ වහන්සේම සිටිනේය”යි කියා බරණැස් නුවරට නැගීගොස් රජ්ජුරුවන්ගේ රාජාඞගණ සමීපයෙහි සිටියේය. ඒ දුටු නගරවාසීහු මහත් සන්තෝෂයට පැමිණ ඔබගොස් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝත් වහා එතනට ගොස් ඇතු දැක මහත් සන්තෝෂයෙන්ම “මා නිසා මට පිට දෙන්ට ආ ඇතෙක් වීනම් බිමට බසීව”යි ආරාධනා කළාහ. එවිට ඇතු බිමට බටුයේය.

ඒ වේලෙහි ඇත්තලයා ඇතු පිටින් බැස රජ්ජුරුවන් විසින් “දරුව, ඇතු ඇරගෙන කුමක් නිසා අවුදැ?”යි විචාරන්නා තමා ආ ගිය ලෙස තත් වූ පරිද්දෙන් කී කල්හි “තා කළ සේ යහපතැ”යි කියා සමාධිව නුවර සරහා ඇතු මහත් වූ පෙළහරින් මඞගල හස්ති වාහනයට පමුණුවා බරණැස් නුවර රාජ්‍යය තුන් කොට්ඨාසකොට ඇතුට එක්

කොට්ඨාසයක්, ඇත්තලයාට එක් කොට්ඨාසයක්, රජ්ජුරුවන්ටත් එක් කොට්ඨාසයක් සලස්වා දැහැමෙන් සෙමෙන් රාජ්‍යයකොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදරා "එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් සාරිපුත්‍ර ස්ථවිරයෝය, ඇත්තලයා නම් ආනන්ද ස්ථවිරයෝය. එසමයෙහි මගධ රජ්ජුරුවෝ නම් දේවදත්ත ස්ථවිරයෝය, එසමයෙහි ඇතුව උපන්නෙම් බුදු වූ මම්ම වේදැ"යි වදරා මේ 'දුම්මේධ ජාතකය' නිමවා වදාළසේක.

# 122. නංගුලීස ජාතකය

තවද සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කාළුදායි තෙරුන්වහන්සේ උපාසකවරුන්ට බණ වදරා ප්‍රස්තාව බලා වදරන්ට නොදන්නා විසින් මගුල් පැමිණි තැනදී බණ වදරන්ට ආරාධනා කළ කල අවමගුලට සුදුසු බණ වදරනසේක. අවමංගල්‍ය ස්ථානයකදී බණ වදරන්ට ආරාධනා කළ කල්හි මංගල සූත්‍රාදී බණ වදරනසේක. මේ වූ නියාවෙන් ප්‍රස්ථාවට නොනිසිකොට කාළුදායි තෙරුන්වහන්සේ බණ වදරන නියාව දම්සභා මණ්ඩපයෙහි රැස්ව උන්නා වූ සංඝයා වහන්සේ කිය කියා උන්සේක.

එතනට බුදුරජාණන් වහන්සේ වැඩ වදරා "මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුම්දැ?"යි විචාරා වදාළ කල්හි "කාළුදායි තෙරුන්වහන්සේගේ නුවණ මද නියාව කිය කියා උනුමහ"යි දැන් වූහ. "මහණෙනි, දැනමතු

නොවෙයි, පළමුත් නුවණ නැත්තෝම වේදැ''යි වදාරා ආරාධිත වූ බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ දිසාපාමොක් ආචාරීව සියළු මනුෂ්‍යයන්ට ශිල්ප දෙමින් වාසය කරන්නාහ.

එසමයෙහි පොහොසත් කෙනෙක් ශාස්ත්‍ර උගන්නාහ. දුඃඛිත කෙනෙක් බැලමෙහෙකොට ශාස්ත්‍ර උගන්නාහ. එසමයෙහි නුවණ නැති දුඃඛිත පුරුෂයෙක් දිසාපාමොක් ආචාරීනට බැලමෙහෙකොට ශාස්ත්‍ර උගන්නේය. ඒ තෙම එක් දවසක් ආචාරීන්ගේ පය මැඩ මැඩ උන්කල්හි "ආචාරීන්, පා මුල් කකුල් දෙක රුකුල්ලව''යි කියන්නා "යහපතැ''යි කියා එක පයකට පත්ලා අනික් පයට රුකුල් නැත්තෙන් තමාගේ කලවය මත්තේ ඇඳකකුල තබා තුන්යම් රාත්‍රියෙහි ඉඳ පාන් කෙළේය. උදසනක් සේ ආචාරීන් නැගීසිට උන්ලෙස බලා කම්පාවූවාහු "වාලක් පරිද්දෙන් මෙබඳු දුක් ගෙනෙත් ශාස්ත්‍රයක් ඉගෙන ගත නොහෙයි, එසේ හෙයින් පණ්ඩිත කරවා ගන්ට උවමැනවැ''යි සිතා මූ අතින් දවස්පතා දුටු දුටු දෙය තමන්වහන්සේට සලස්වා එකී කල "මීට උපමා කෙසේදැ?''යි විචාරා කාරණා නොවරදවා උපමා කීපයක් නොවරදවා කී නම් "නුවණැති කර ගනිමි''යි සිතා ඔහු ලගට

කැඳවා "තොප විසින් දර පළා ගෙනෙන්ට ගිය තැන දුටු දෙයක් ඇත්නම් කියව"යි කීහ.

එසඳ "යහපතැ"යි කියා එක් දවසක් බැද්දට ගියේය. එක්තරා සර්පයෙකු දැක එපවත් ආචාරීන්ට කීහ. ආචාරී ඒ අසා "සර්පයා කුමක් වැන්නදැ?"යි විචාළහ. එවිට කියන්නේ "නඟුලිසක් වැන්නේය"යි කීය. ඒ අසා ආචාරී "සර්පයාත් දිගය, නඟුලිසත් දිගය, එසේ හෙයින් ඒ කාරණය සරිය"යි සතුටු වූහ. පසු දවසක් බැද්දට ගියේය. ඇතෙකු දැක අවුත් ආචාරීන්ට කීහ. "ඒ ඇතුට උපමා කියව"යි කියන්නා "නඟුලිසක් වැන්නැ"යි කීහ. ඒ අසා ආචාරී "සොඩ උපමාකොට කීවනැ"යි සතුටු වූහ. පසු දවසක් උක් දණ්ඩක් ලදින් ඒ නියාව ආචාරීන්ට කීහ. "ඊට උපමා කියව"යි කියන්නා "නඟුලිසක් වැන්නැ"යි කීහ. එවිට ආචාරී "උක් දණ්ඩත් දිගය, නගුලිසත් දිගය ඒ කාරණය"යි සිතූහ. පසු දවස් දන්දෙන ස්ථානයකට ගිය ගමනේදී කිරි හා සමග බත්ළැහ. ඒ බත් කා ඇවිත් ඒ සැටිය කීහ. එවිට ආචාරී "තා කෑ කිරි හා බත් කුමක් වැන්නදැ"යි විචාළාහ. "නඟුලිසක් වැන්නය"යි කීහ. ආචාරීන් විසින් "පළමු කාරණා තුන වන්නා සරිවේයයි මෙසේ සරි වේවයි සිතා කෙසේ උත්සාහ කළත් නුවණැත්තාහු ඇති කරවා ගන්ට බැරිය"යි කියා හළහයි වදාරා "එසමයෙහි නුවණ නැති අතවැස්සා නම් කාළුදායි ස්ථවිරයෝය, දිසාපාමොක් ආචාරීව උපන්නෙම් ලොව්තුරා බුදු වූ මම්ම වේදැ"යි වදාරා 'නංගුලීස ජාතකය' නිමවා වදාළ සේක.

# 123. අම්බ ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා කුලපුත්‍රයෙක් ලැදිව මහණ වූ කළමනා වත් පිළිවෙත් මහත් පිළිවෙත් සතළිසක් හා සූක්‍ෂම පිළිවෙත් අසූවක් පුරාගෙන හැමදීම්, මළුහැමදීම්, පෙත්මන් හැමදීම්, ධර්මශාලා හැමදීම්, සඞඝාරාම හැමදීම් හා පින්පැන් තැබීම් යනාදීන් නොකුසීතව කරනසේක. උන්වහන්සේගේ වත්පිළිවෙත් කිරීමෙහි ප්‍රසන්නව උපාසකවරුන් විසින් පන්සියයක් පමණ පාත්‍ර දවස්පතා උන්වහන්සේට තිබූහ. ඒ පාත්‍ර පන්සියයක් බොහෝ දෙනා වහන්සේට ලාභ විය. මේ කථාව දම්සභා මණ්ඩපයෙහි රැස්ව වැඩඋන් මහළුවරුන් වහන්සේ කිය කියා උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා වදාරා "අසවල් නම නිසා ලාභ සත්කාර පැමිණි නියාව කිය කියා උනුම්හ"යි දැන් වූ කල "මහණෙනි, දැන්මතු නොවෙයි, පළමුත් මුන් පිළිපන් වතාවත් නිසා බොහෝ ලාභ සත්කාර පැමිණියේ වේදැ"යි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ ප්‍රසිද්ධ බ්‍රාහ්මණ කුලයක ඉපද පඤ්චකාමයෙහි ආදීනව දැක

පන්සියයක් තාපසවරුන් ඇතිව හිමාලය වනයෙහි ගණජ්‍යෙෂඨව වාසය කරනසේක.

එසමයෙහි හිමාලය වනයෙහි වැසි නොවැස ලිං පොකුණුවල පැන් සිඳී සිව්පාවෝත් පැන් නොලැබ විඩාපත්ව දුක් විඳිනාහ. එසමයෙහි පන්සියයක් තාපසවරුන් අතුරෙන් එක් තාපස කෙනෙක් ගසක් කපා ඔරුවක් කැණ සිව්පාවුන්ට පැන් ඇද වත් කරන්නාහ. සිව්පාවුන් ආ ආ සේ පැන් ඇද වත් කරනා විසින් එලාඵල කඩා යන්ට කල් නැතිව විඳිනා ආයාස සිව්පාවෝ දැන උනුනුන් හා කථා කරන්නෝ "තාපසයන්ගෙන් පැන් ගන්ට යම්හයි සිව්පා කෙනෙක් තමතමන්ට පිළිවන් යම් යම් විවර අඹ, කොස් ආදී වූ දෙය ගෙන එව"යි උනුන්ට විධානකොට ඒ නියාවට ගෙන දසඅටක් ගැල් පුරායන විවර දවස්පතා රැස් කරන්නාහ. ඒ රැස්කළ දෙය පන්සියයක් තාපසවරුන් බෙදා වළඳන්නාහ. ඉතුරු වූ දෙය වල දමන්නාහ. මෙපමණාත් දැන බෝධිසත්ත්වයෝ තාපසවරුන්ට අවවාද කියන්නාහු "අසවල් තාපසයන්ගේ වියඤීයෙන් අපි පන්සියයක් දෙනම එලාඵල පිණිස වනයට නොගොස් උන් පළම ඉඳම මිහිරි එලාඵල ප්‍රයෝජන විඳිම්හයි, එසේ හෙයින් ගෘහස්ථව වූවත් ප්‍රව්‍රජ්ජිත වූවත් වියඤී කළයුතුය"යි වදාරා "එසමයෙහි පැන් ඇද වත්කළ තාපසයෝ නම් මෙසමයෙහි වතාවත් ව්‍යස්ථිතව කරන ලද්ද වූ භික්ෂුහුය. ගණජ්‍යෙෂ්ඨ වූ තාපසයෝ නම් බුදු වූ මම්ම වෙිදැ"යි වදාරා මේ 'අම්බ ජාතකය' නිමවා වදාළසේක.

# 124. කටාහක ජාතකය

තවද සර්‍වඥයන වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ‘පිත්තු’ කියන නමක් නිසා මේ ජාතකය දක්වන ලදී. එහි වර්තමාන කථාව යටකියන ලද විකත්ථන ජාතකයෙන් දැක්ක යුතුය

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ එනුවර මහා සම්පත් ඇති සිටුව උපන්සේක. එසමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේගේ ගෙයි පුතණු කෙනෙක් උපන්නාහුය. ඕහු උපන් දවස්ම ගෙයි කෙල්ලකගේ පුතෙක් උපන. සිටුකුමාරයෝත් කෙල්ලකගේ පුතාත් එක්ව වැඩිවිය පැමිණියාහ. සිටුකුමාරයන් අකුරු කරන්ට යන කළ තමුන් කැටුවම ගොස් ලිවීම, ගිණීම් ආදී වූ නොයෙක් ශාස්ත්‍ර ඉගෙණ ගත. තෙමේ නමින් කටාහක නම් විය. වෙළඳම් ආදී වූ දෙයෙහි දක්ෂය. කීමෙහි බිණීමෙහි සපන. එසේ හෙයින් උන් භාණ්ඩාගාර ගේ බැලීමෙහි සිටාණෝ සලස්වා ගත්හ.

එක් දවසක් කටාහක නම් කොලු සිතන්නේ “ඇමදුම මට ගේ බැලීමෙහි තිර නොවන්නේය. යම් සේ මාගේ වැරැද්දක් දැක ස්වාමිදරුවෝ ලෙහිසන් ගසා වහල් මෙහෙවරට ඇරගත්තු නම් මට බොහෝ දුකැ”යි සිතා “ඊට උපායක් කරන්ට උවමැනවැ”යි සිතන්නේ “අපගේ සිටාණන් වහන්සේට යහළුව හිඳිනා පිටිසර සිටාණ කෙනෙක් ඇත, උන් කරා ගොස් සිටාණන්ගේ පුතණුවෝ යයි කියා උන්ගේ දුවණියන්

ලවා පිසවා කෑත් නම් යහපතැ''යි සිතා සිටාණන්ගෙන් ලී පතක්කොට පතක් ලියන්නේ - මාගේ කටාහක නම් පුත්‍රයා තමන්දෑ කරා යවමි, තමන්දෑ අප හා සමාන කුල විසින් අපගේ පුතණුවන්ට තමන්ගේ දුවණියන් පාවා දෙන්ට අමුතු නැති නියාවත්, ඒ නියාව දැන තමන්දෑ දුවණියන් පාවාදී බොහෝ සම්පත් රැක්ක යුතු නියාවත්, මමත් මෙතන කටයුතු බොහෝ විසින් නොගිය නියාවත්, පසුව මා එන නියාවත් කියා සිටාණන් ලියා යවූ බඳුව බොරු පතක් ලියාගෙන සිටාණන්ගේ අස් මුද්දෙන් අසුන් ඔබාගෙන සිටාණන්ගේ ගේ බලන විසින් සාඳු සුවඳ ආදී වූ දෙයත් සිහින් පිළිත් ඇරගෙන පසල් සිටාණන්ගේ ගමට ගොස් සිටාණන් වැඳලා සිටියේය.

සිටාණන් විසින් "කොයි සිට අවිදැ?"යි විචාළ කල්හි "බරණැස් නුවර සිට ආමි"යි කී විසින් "කාගෙ දරු කෙනෙක්දැ?"යි විචාරන්නා "බරණැස් සිටාණන්ගේ පුතණු වෙමි"යි කී විසින් "කුමක් නිසා අවුදැ?"යි විචාරන්නා "මා ආ කටයුතු පතින් දැක්ක හැකැ"යි කියා පත අතට දුන්නාහ. සිටාණෝ පත කියවා පතෙහි අසුන් අසා සතුටුව තමන්ගේ දුවණියන් පාවා දී බොහෝ සම්පත් දුන්නාහ. එදා සිට සිටු දූ විසින් තමාට එවි ඛාද්‍යාභෙද්‍යා, මල්, සුවඳ ආදී වූ දෙය එලවූ කල්හි ඒ දැක "මෙසේ වූ බත් කම්ද? මෙසේ වූ පිළි අඳින්ද? මෙසේ වූ මල්සුවඳ පලඳිම් දැයි පිටිසර ඇත්තන්ගේ කොලකම මෙසේ වනැ"යි කියා වෙහෙසෙයි.

එසමයෙහි බරණැස් නුවර සිටාණෝ තමන්ගේ කටාහක නම් කොල්ලා නොදැක ඒ තැන මිනිසුන් යවා පිටිසර සිටාණන්ගේ ගම උන් නියාව අසා රජ්ජුරුවන් වහන්සේට දන්වා අවසර ඇරගෙන පිටිසරට නික්මුණාහ. සිටාණන් පිටිසර යන නියාව ඒ ඒ තැන ප්‍රසිද්ධ විය. කටාහක නම් කොලුත් එපවත් අසා "සිටාණන් එන්නේ අනික් දෙයක් නිසා නොවෙයි, මා ලඟටය"යි සිතා "සැඟවී ගියේ නම් ඒ කටයුතු නොවෙ"යි සිතා "මෙතැන්හිම ඉඳ සිටාණන් වහන්සේ ආ කල උන්වහන්සේට මෙහෙවරකොට සිත ලබා ගණිමි"යි සිතා එතැන් පටන් තමාගේ ගෙයි මිනිසුන් ආදී වූ ඇම දෙනාට කියන කල "සෙස්සන් සේ නොවෙයි, අපි අපගේ දෙමව්පියන් දුටු කළ භය ලජ්ජා ඇත්තම්හ, එක සරියේ හිඳන් බත් නොකම්හ, මඩ සෝධා තිබීම්, පැන් පෙරා තිබීම්, වීල් තිබීම්, පළට පැන් තිබීම් පටන් වාල් කළමනාදෙය අපි කරන්නේමය"යි කිය කියා ඉන්නා කලට ඒ සිටාණෝ අවුත් ලඟ ගමෙක උන්නාහ.

එවිට තෙමේ මයිලනුවන් ලඟට ගොස් "අපගේ පියාණන් වහන්සේ මේ ගමට වඩිනාසේක. නුඹවහන්සේ විසින් ආගන්තුක සත්කාර කළ මැනවැ"යි සිටාණන් විසින් කරනලද සුවදුක් කථා ඇතිව සිටාණන් බත් කා ඉක්බිති පළට පැන් ඇරගෙන ගොස් තිබා ඉක්බිතිව සිටාණන්ට බිම බැස වැඳ "ස්වාමීනි, කළමනා යම් මෙහෙයක් කෙරෙමි, මාගේ සම්පත්තීන් පිරිනොහෙළුව මැනවැ"යි යාච්ඤා කෙළේය. එවිට සිටාණෝත් උන්ගේ උගත්කම් නැති නියාව දැන "මා නිසා තොපගේ

සම්පත් පිරි නොහෙළම්"යි කියා උන් හා සමඟ ගමට අවුත් පිටිසර සිටාණන් විසින් කරනලද ආගන්තුක සත්කාර විඳ කා, බී අන්තයෙහි ප්‍රිය වූ කථාකොට උන්නාහ.

එවිට ආගන්තුක සිටාණෝ කියන්නෝ "නුඹවහන්සේගේ පුතණුවන් අත පත එව් වේලේම ඒ නියාවට මම් මාගේ දුවණියන් පාවා දී කළමනා කටයුත්තෙන් අඩුවක් නොකෙළෙම්"යි කීහ. එපවත් සිටාණෝ අසා "යහපතැ"යි කියා "එක් දවසක් තමන්ගේ යෙහෙළනියන්ගෙන් "ඉස උකුණන් හරුව"යි කියා උකුණන් හරවා හිඳ කියන්නානු "කුමක්ද? තොපගේ ස්වාමිපුත්‍රයා ප්‍රිය වාසය කෙරේදැ"යි කියා විචාළහ. එවිට ඕතොමෝ කියන්නී "කිසිවකුටත් අමුත්තන් නැත. කළ මෙහෙයකුත් ඇත්නම් කසලි යයි කියා නින්ද කියන පමණක් විනා සෙසු අමුත්තෙක් නැතැ"යි කියන්නා වූ ආදීත් එසේමය. "මෙයින් මතු බසක් කීවොත් මේ මන්ත්‍රය උගන්නා උන්ගේ මුඛය මැඩියේය"යි කියා මේ මන්ත්‍රය උගන්වා කීප දවසක් ඇතුළත එම ගම රඳ නික්මුණාහ. ඒ කොලුත් ඊ ඉන්නා දම තෙක් අනික් කෙනෙකුන්ට අවකාශයක් නොදී මෙහෙකොට නික්මුණු ගමනේත් පසු ගමන්කොට නැවත ගමට අවුත් පළමු කී නියාවටම වඩා උද්ධතව වාසය කරන්නාහ. එක් දවසක් සිටුදුව විසින් එලවනලද බත් දැක "මෙසේ වූ බත් ද ලබන්නේය"යි කියන්නා එවිට සිටු දූ ඉදිරියේ සිට සිටාණන් කී මේ ගාථාව කීහ.

ඒ කෙසේද? යත්

"බහුම්පි සො විකත්ථෙය්‍ය - අඤ්ඤං ජනපදං ගතො

අන්වාගන්ත්වා න දූසෙය්‍ය - භුඤ්ජ භොගෙ කටාහක"

මේ ගාථාවෙහි අභිප්‍රාය සිටු දූ නොදන්නීය. කටාහකයා ගාථාවෙහි අභිප්‍රාය දැන එතැන් පටන් බැණ නොනැගී ඉඳින්නේය. ගාථාවෙහි අභිප්‍රාය නම් කෙසේද? යතහොත්,

"තෝ අනික් දේශයක සිට මීට ආවයි කියා තෝ තාගේ තරම් නොදනීද, මේ මුරයට සිටාණන් වහන්සේ නිකම් පළා ගියසේකැයි කියා පසුව මුරයේ ආ සේක් වීනම් තා ලෙහි සං ගසා ඇරගෙන යනසේක්දැ"යි කියවයි වදාරා "එසමයෙහි කටාහකයා නම් මේ පිත්තු කියන භික්ෂුහුය, එසමයෙහි බරණැස් නුවර සිටු වූයෙම් මම්ම ය"යි වදාරා 'කටාහක ජාතකය' නිමවා වදාළසේක.

# 125. අසිලක්ඛණ ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කොසොල් රජ්ජුරුවන්ගේ මඟුල් කඩුව සිඹිමින් ලක්‍ෂණ කියන බමුණෙක් ඇත. අත්ලස් දුන්න වැමියන්ගේ කඩු ගෙනවිත් පෑ කල "යහපතැ"යි කියයි. අත්ල්ස නුදුන්න වැමියන්ගේ කඩු පෑ කල "නපුරැ"යි කියයි. අත්ලස් කා ලක්‍ෂණ කියන නියාව එක් වැමියෙක් දැන ඒ නියාවට යහපත් කඩුවක් ලක්‍ෂණ යුක්තකොට තුන්සන ගභා කොපුවක් ඉදිකොට කොපුව ඇතුළත මිරිස් සුනුකොට පුරා කඩුව ඊ ලා ගොසින් රජ්ජුරුවන්ට පෑහ. රජ්ජුරුවන් විසින් බමුණා

ගෙන්වා කඩුව පෑ ලක්‍ෂණ කියයි කී විසින් “යහපතැ”යි කඩුව කොපුවෙන් ඇද නාසය කෙරේ තිබා කඩුව ඉඹලිය. ඒ ක්‍ෂණයෙහි කඩුව ඇලි තුබූ මිරිස් සුනු නාසයට වැද කිඹිසීය. කඩුව නාසයෙන් ඈත්කොට කිඹිසින්ට පමා සෙයින් කඩුව පිටම කිඹිස කප්පවාගත.

ඒ කථාව භික්‍ෂුසංඝයා වහන්සේ කෙරෙහි සැලවිය. ඒ කථාව දම්සභා මණ්ඩපයෙහි රැස් වූ මහළුවරුන් වහන්සේ කිය කියා වැඩ උන්තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදරා “මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?”යි විචාරා වදරා “කඩුවේ ලකුණු කියන බමුණාගේ නාසය කැපුණු නියාව කිය කියා උනුම්හ”යි දැන් වූ කල්හි “මහණෙනි, දැන්මතු නොවෙයි, පළමුත් නාසය කප්පවා ගතැ”යි වදරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි රජ්ජුරුවන්ගේ කඩුවේ ලක්‍ෂණ කියන බමුණෙකු ඇති වීමද, කඩුව ඉඹ ලක්‍ෂණ කීම්ද, කිඹිස නාසය කපා ගැනීමද, මෙකී සියල්ලම වර්තමාන කථාව කී පරිද්දෙන්මයයි දතයුතු.

ඒ නියායෙන් නාසා කප්පවා ගත් බමුණන් දැක රජ්ජුරුවන් විසින් ඉටියෙන් නාසයක් ලවා පළමුසේම උන්ගේ

ස්ථානානතරයේ සිටුව තමන්ට සේවය කරන පිණිස සලස්වා ගත්හ.

එසමයෙහි රජ්ජුරුවන්ගේ බෑණා රාජ කුමාරයෙක්ද රජ්ජුරුවන්ගේ දූ වන රාජකුමාරිකා කෙනෙක්ද බාල දා පටන් එක්ව කෙළ එක්ව වැඩි උනුන් කෙරෙහි පිළිබඳ සිත් ඇතිව වසන සමයෙහි බරණැස් රජ්ජුරුවන් විසින් අමාත්‍ය මණ්ඩලයා එක්ව හිඳ කථා කරන්නාහු "මාගේ දුවණියන් ඔබ්බේ රජ්ජුරු කෙනෙකුන්ට පාවා දෙන්නායින් මට භාරය. එසේ හෙයින් රජ්ජුරුවන් දෙන්නෙකු මට සහය වන්නේය"යි සිතා රාජකුමාරිකාවන් රාජකුමාරයන්ට නොපෑ වාසය කරන්නාහ. දෙන්නාම උනුන් කෙරෙහි පිළිබඳසිත් ඇති විසිනුත් වයසුත් මුහුකුරා සිටි විසිනුත් එක් දවසක් රාජකුමාරයෝ රාජකුමාරිකාවගේ කිරිමව් දැක මසුරන් දහසක් දී රාජකුමාරයෝ කියන්නෝ "තොප විසින් රාජකුමාරිකාවන් රජ ගෙන් මෑත් කරන උපායක් කරව"යි කී විසින් "ඒ මට බාරය"යි කියා රජ්ජුරුවන් කරා ගොස් "දේවයන් වහන්ස, නුඹවහන්සේගේ දුවණියන් වහන්සේගේ ශරීරයෙහි කාලකණ්නියක් වෙසෙයි. එසේ හෙයින් ඒ කාලකණ්නි ප්‍රවාහ කරන්ට උවමැනවැයි, එසේ හෙයින් අසවල් තෙන ශ්වසාන භූමියෙහිදී පිළක් බැඳ පිළපිට මිනියක් තබා මිනිය පිට ඇඳක් තබා ඇඳපිට රාජකුමාරිකාවන් ඉඳුවා ඉස්සෝද නහවාගෙන ආ යුතුය"යි කීහ.

රජ්ජුරුවෝත් ඒ අසා "එසේම කරව"යි උන්ටම භාර කළහ. එම විට ගොස් ශ්වසාන භූමියට මිරිස් සුනු පොට්ටනියක් ඇරගෙන ගොස් එක්ව ගිය මිනිසුන් ඒ ඒ තැන සඟවාපියා මියගිය මිනියක් සේ මුනින් වැදහෙව මා විසිනුත් නුඹලාට අඬක් ගසාපියා මා කැටිව රැකවලට ගිය සේවායනුත් ඇරගෙන දුවපියන්නා එවිට නුඹවහන්සේ රාජකුමාරිකාව ඇරගෙන ඉස්සෝද නහා ගෙටම පලා ගිය මැනව"යි කියා එපවත් ගොස් රාජකුමාරිකාවන්ටත් කියා රාජකුමාරයන් විසින් එකී දවසට එකී සැටියේ ගොසින් ශ්වසානා භූමියෙහි වැදහොත් කලට රාජකුමාරිකාවන් හැරගෙන සේනාව විසින් රැකවල් ලවාගෙන නික්ම පෙරමඟ දී සේනාව ඇත්තන්ටත් කියන්නී "ශ්වසාන භූමියෙහි වැදහොත් පුරුෂයා කීපවාරයක් කිඹියපියා නැගීසිට පළමුව දුටු කෙනෙකුන් අල්වාගෙන මරාපියයි, එසේ හෙයින් තොප හැමදෙන බියපත්ව"යි මඟදීම කියා සෝන්පලයට ගොස් කී ලෙසම රාජකුමාරයන් කිඹිස පියන්නා තෙමේ හයින් මහඬින් හඬාගෙන ඇමටම පළමුව දිවපුව, ඒ දුටු පිරිස් ආවුද එලා මහහඬින් හඬා දිවාපුවාහ.

එවිට රාජකුමාරයෝ රාජකුමාරිකාවන් ඇරගෙන ඉස්සෝද නහා තමාගේ ගෙට ගියහ. එපවත් රජ්ජුරුවෝ අසා සතුටුව "සිතා උන්නා පැමිණියා"යි වහා මඟුල්කොට සරණ පාවා දී රාජ්‍යයත් පාවාදුන්හ.

එසමයෙහි කඩු ලක්‍ෂණ කියන බමුණා රජ්ජුරුවන් නැගෙනහිරට පිට ලා උන් විසින් නැගෙනහිරට මූණ ලා සිටි බමුණාගේ මුහුණ අව්ව ගැසෙත් ගැසෙත් ඉටිවිරී නාසය වැටී ගියවිට බමුණා ලජ්ජාවෙන් කරබාගත. එවිට රාජකුමාරයෝ කියන්නෝ “ආචාරීනී, ලජ්ජා නොවෙව, කිඹිසීම නිසා තොපට මේසා අලාභයක් විය. ඒ කිඹිසීම් නිසා මට මෙසේ වූ ලාභයක් විය”යි කියවයි වදාරා “එසමයෙහි කඩු ලක්‍ෂණ කියන මෙසමයෙහි කඩු ලක්‍ෂණ කියන බමුණාමය, බරණැස් රජ්ජුරුවන්ට බෑණා වූ රාජ්‍යය ලත් රාජකුමාරයෝ නම් බුදු වූ මම්ම වේදැ”යි වදාරා ‘අසිලක්ඛණ ජාතකය’ නිමවා වදාළසේක.

# 126. කලණ්ඩුක (කලන්දුක) ජාතකය

තවද සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කලණ්ඩුක ජාතකය දක්වන ලදි. එහි වර්තමාන කථාවද බරණැස් සිටාණන්ගේ පුතණුවන් හා කෙල්ලකගේ පුතා එක්ව අකුරු කළ නියාවද, සිටාණනගේ ගේ බැලූ නියාවද, සිටාණන් ලිව්වා බඳු බොරු පතක් ලියූ නියාවද, ඒ පත ගෙනගොස් පසල් සිටාණන්ගේ දුවට දුන් නියාවද යන සියල්ල පළමු කියනලද ‘කටාහක’ ජාතකයෙහි පණිතමය දත යුතු.

මේ ජාතකයෙහි වෙනස නම් කටාහක නම් කොළු සිටුදුව පාවාගෙන වාසය කරන සමයෙහි බරණැස් නුවර සිටාණෝ තමන්ගේ කොල්ලා අපවත්ව ගිය හෙයින් තමන් ගේ වසන

ගිරවාට කියන්නාහු "ගිරාපෝතකයෙනි, තොප විසින් කලණ්ඩුකයා උන් තෙනින් බලා ඇවිත් කියව"යි කියන්නා "යහපතැ"යි නික්ම ඒ ඒ තැන්හි බලාගෙන යන්නේ කලණ්ඩුකයා වසන ගමට අවුත් පැමිණියේය.

ගිරාපෝතකයා පැමිණි දවසම කලණ්ඩුකයා "ස්නානය කරන්ට"යි ගඟට ගියේය. ගිරාපෝතකයාත් ගඟ සමීපයෙහි දිඹුල් ගසක කොලතුරේ සැඟවීගෙන උන්නේය. කලණ්ඩුකයන් ජල ක්‍රීඩාව කරන හෙයින් සීත නොවදින්ට සිටුදුව විසින් කැළුබඩු කකාරණලද කිරි අතට දුන් කල්හි කලණ්ඩුක කිරි කටක් ඇරගෙන කට සෝදා සිටුදුවගේ ඉස වත්කරන්නා දුටු ගිරාපෝතකයා කියන්නේ "ඇයි? කලණ්ඩුකයෙනි, අප බැද්දේ වසන පක්ෂීන් පමණ මිසක් තොප අප හා එකගෙයි වාසය කළෝය, තොපි තොපගේ තරම් නොදනුද? එසේ විසින් මෙසේ වූ ජාතිසම්පන්න සිටුදුවගේ ඉසට කිරි වත්කරන්නේය, කටට ඇරගත් කිරි බී පියන පමණක් විනා නොදනිමි"යි කීහ.

එබස් ඇසූ කලණ්ඩුක සිතන්නේ "ගිරවානන් දැන් මාගේ තත්‍වය එළියේ කිව්වොත් නපුරැ"යි සිතා "ගිරවානෙනි, මෙසේ ඇවිත් සාමිචිකොට හිඳුව"යි කීහ. එබස් ඇසූ ගිරවා "තමාගේ තත්‍වය කී හෙයින් මාගේ බොටුව මඩින්ට මූ කැන්දන්නේය"යි සිතා ආකාශයට නැගී බරණැස් නුවරටම ගොසින් සිටාණන්ට මේ තත්‍වය කීයේය. ඒ ඇසූ සිටාණෝද "එකියන කලණ්ඩුකයා ගෙන්වාගෙන ආවොත් මෙසේ සලසාගත හැකිය"යි වදරා "එසමයෙහි කලණ්ඩුක නම් මේ

පිත්තු කියන භික්ෂූහුය, බරණැස් සිටාණෝ නම් බුදු වූ මම්ම වේදැ''යි වදරා 'කලණ්ඩුක ජාතකය' නිමවා වදාළ සේක.

# 127. බිළාර ජාතකය

තවද සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි වඤ්චා ප්‍රයෝග දන්නා භික්ෂු කෙනෙකුන් වහන්සේ ගෙනවුත් පෑ කල්හි "මහණෙනි, දැන් මතු නොවෙයි, පෙරත් වඤ්චා ප්‍රයෝගයෙන්ම දන්නෝ වේදැ''යි වදරා ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ විසින් ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ මූසිකව(මීයෙකුව) උපන්සේක. මහතින් ඌරු පැටියෙකුගේ ප්‍රමාණය. සියදහස් ගණන් මීයන්ට නායකව තුඹසක වසනසේක. එසමයෙහි එක කැනහිලෙක් ගොදුරු සොයා ඒ ඒ තැන ඇවිදිනේ මීයන් සමූහයා දැක "යම් උපායකින් මේ මීයන් කන්ට උවමැනවැ''යි සිතා බෝධිසත්ත්වයන් ගොදුරු කන්ට යන මග නැගෙනහිරට මුහුණ ලා කට දල්වාගෙන තුන් පයක් ඔසවාගෙන කකුලක් බිම ගසාගෙන කැණහිලා සිටියේය. බෝධිසත්ත්වයෝ ගොදුරු සොයා යන තැනැත්තවුන් වහන්සේ ඔහු දැක "තොපි කව්රුදැ?''යි විචාරා උන් විසින් "මා ධාර්මිකයෝය''යි කී කල්හි "එක පයින් සිටිනේ ඇයිදැ?''යි කී විසින් "තුන් පයින් සිටියෙම් නම් පොළොව ධාරාලිය

නොහෙ''යි කීය. ''කට දල්වාගෙන සිටිනේ ඇයිදැ?''යි කී විසින් ''සුලන් අනුභව කරන්ටය''යි කීහ. ''නැගෙනහිරට මුහුණලා සිටිනේ ඇයිදැ?''යි කී විසින් ''සූර්‍ය්‍යදිව්‍යපුත්‍රයාට සේවය කරමි''යි කී විසින් බෝධිසත්ත්වයෝ ''මූ කියන්නේ ඇත්තෙකැ''යි සිතා ''මුන් ළෙහි යහපත් ගුණයක් ඇතැ''යි සිතා දවසට දෙවිටක් ඇවිත් සේවය කරන්නාහ.

එසමයෙහි කැණහිල් මීයන් තමාට සේවයකොට යන්නවුන් බලා හැමට පස්සේ යන මීයෙකු අල්වාගෙන කා කට ලේ පිස පළමු සිටි නියාවටම සිටියේය. මෙම නියායෙන් දවස්පතා මීයන් කන විසින් කල් යාමෙන් මීයෝ අඩු වී ගියාහ. එවිට මීයෝ ගොස් බෝධිසත්ත්වයන්ට කියන්නාහු ''පෙර අපි මේ තුඹස ඉඳිනේ ගැටි ගැටිය, දැන් ඉතා තුනීව ගියම්හ, ඒ කුමන කාරණාවක් බවත් නොදනුම්හ, ඒ බව දතොත් යහපතැ''යි කීහ.

ඒ බව බෝධිසත්ත්වයෝ අසා ''එසේ වීනම් කැණහිලාගෙන් වන උපද්‍රවයෙක් නිසාය''යි සිතා එදවස් කැණහිලාට සේවයට ගොස් එන ගමනේ ''පරීක්‍ෂා කරන්ට උවමැනවැ''යි සිතා මීයන් ඇමෝම යවා පසුව බෝධිසත්ත්වයෝ නික්මුණාහ. බෝධිසත්ත්වයන් නික්මෙන්නා දැක මෙතෙක් ද මීයන්ට පනින්නා සේම පැන්නේය. බෝධිසත්ත්වයෝ ඔහු අතින් ගැලවී ඉවත පැකිල යන්නාහු ''බළලුන් කරන තපස් වැන්නේය''යි සිතා ''කරන තපසැ''යි කියා ''තපස් කරම්හයි මෙසේ වූ

වඤ්චා කෙරෙද්දැ?"යි කියා බොටුවට පැන කුලළ කඩා කා මරාපුවාහ.

ඒ දුටුවා වූ මීයෝ එතනට අවුත් කැණහිල් බල්ලාගේ මාංස එකසීම ලියා කාපුවාහ. පසුව ආ මීයෝ මොත්තමට මාංස සම්හනුයේය. ඔහු මරා සැපසේ වාසයකොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදරා "එසමයෙහි මීයන්ට නායකව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදරා 'බිළාර ජාතකය' නිමවා වදාළසේක.

## 128. අග්ගිදත්ත (අග්ගික) ජාතකය

තවද සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි වඤ්චා ප්‍රයෝග දන්නා භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදරන ලදී.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ මූසික ව උපන්සේක. එසමයෙහි එක් කැණහිලෙක් ගින්නෙන් දු ඉස ලොම් පමණක් තිබියදී සර්වංගයෙහි ලොම් දු ගියේය. එවිට හිස පමණක් රැකගත්තා වූ කැණහිල් ජායාවෙන් තමා හිස් කුඩිඹිය පමණක් දැක "කුඩිඹිය ඇති පසු ජීවත් විය හැක්කැ"යි සිතා බෝධිසත්ත්වයන් ඇතුළු වූ බොහෝ මීයන් වසන තැනට ගොස් පළමු කී ජාතකය පරිද්දෙන් වැද සිටි ව්‍යවස්ථාවට බෝධිසත්ත්වයෝ එතනට අවුත් "තොපි කවුරුදැ?යි වදරන්නාහු "අග්ගික භාරවාජයෝය"යි කියන්නා

"කුමක් නිසා අව්දැ?"යි විචාරා "තොප හැම රකින්ට ආමි"යි කී විසින් "අප රකිනේ කෙසේදැ?"යි විචාරන්නා "උදෑසන සවස ගොදුරට යන්නවුන් හා දෙවනුව බිලයට වදිනවුන් ගැන නියමය දනිමි"යි කී විසින් "යහපත මයිලනුවනි, එලෙස කරව"යි කී විසින් එතැන් පටන් යන එන මීයන්ගේ ගණන පසාරයෙන් කන විසින් මීයෝ තමන්ගේ මීයන් අඩු නියාව බෝධිසත්ත්වයන්ට කීහ.

බෝධිසත්ත්වයෝ එපවත් අසා එදවස් හැමට පස්සේ නික්මුණාහ. මෙතෙක් ද සේම කැණහිල් බළු බෝධිසත්ත්වයන් වහන්සේට පැන්නේය. බෝධිසත්ත්වයෝ වළහා ඉවත පැන "තොප විසින් මීයන් රකිමි කියා මීයන් නැසූ පමණක්මය"යි බොටුවට පැන කුලළ සපා කා මැරූහයි වදාරා "එසමයෙහි කැණහිලා නම් දැන් මේ කුහක භික්ෂූහුය, මීයන්ට රජව උපන්නෙමි බුදුවූ මම්ම වේදැ"යි මේ 'අග්ගිදතත ජාතකය' නිමවා වදාළසේක.

# 129. කෝසිය ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා බ්‍රාහ්මණයෙක් උපාසකව තුණුරුවන් මමායන ඇතිව වාසය කෙරෙයි.

එසමයෙහි ඔහුගේ ගෙයි වසන බැමිණී දුරාචාරව වාසය කරන විසින් රාත්‍රී මානයෙහි නිදි නොලැබ දහවල් ගෙයි කළමනා කිසි කර්මාන්තයක් නොකොට වැදහෙව නිදන්නීය.

බමුණා අවුත් "ඇයි තොප වැදහෙව නිදන්නේ කුමක් නිසාදැ?"යි විචාළේය. එවිට "ලෙඩ වීමි"යි කියන්නා "කුමන ලෙඩදැ"යි විචාරන්නා "රුජාවෙක"යි කී විසින් "කළමනා කවරේදැ?"යි බමුණා විචාරන්නා "ප්‍රණීත ආහාරය ලබන්නා යහපතැ"යි කී විසින් දවස්පතා සිඟා සොයා ගෙනෙන්නේය. මේ නියායෙන් තමාගේ දවස්පතා ලත් රුජාව සන්සිඳිමක් නැති විසින් ඒ බව බුදුන්ට දන්වන නියාත් කීප දවසක් නොගිය විසින් ගඳ දුම්, මල්, පහන් ගත් අත් ඇතිව බුදුන් කරා ගොස් බුදුන් වැඳ පුදා එකත්පස්ව උන්නේය.

බුදුහු බමුණා දැක "මෙතෙක් දවස් නොආයේ ඇයිදැ?"යි විචාළසේක. බමුණු එවිට කියන්නේ තමාගේ ගෙයි බිරින්ද රුජාවක් විසින් "බෙහෙත් සපයන නිසා පමාවීමි"යි කියා නැවත කියන්නේ "රුජාව පමණක් මිසක් සර්‍වාඩගයෙන් වැහැර ගිය කෙනෙක්වත් ශරීර වර්‍ණයෙන් අඩුවත් වූයේත් නැත, එසේ පමණක් මිසක් කෙතෙක් ප්‍රණීත ආහාර දුන්නත් රුජාවෙන් අඩුවක් නැත. ඊට කළමනා කුමක්දැ?"යි සර්‍වඥයන් වහන්සේගෙන් විචාළෝය.

සර්‍වඥයන් වහන්සේ වදාරනසේක් "භවයෙන් ප්‍රතිච්ඡන්නව තිබෙන හෙයින් තට නොදැනෙන්නේ පමණක් මිසක් පළමුත් ඊට බෙහෙත් කීවෝ වේදැ"යි වදාරා බමුණා විසින් ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ

දිසාපාමොක් ආචාරීව එසියයක් නුවර කුමාරවරුන්ට හා බ්‍රාහ්මණ කුමාරවරුන් ආදී වූ බොහෝ දෙනාට ශිල්ප දී වාසය කරනසේක. එක් බමුණෙක් දිසාපාමොක් ආචාරීන් අතින් ත්‍රිවේදය හා අක්‍ෂර, ලිඛිත ගණිත, තර්ක ව්‍යාකරණාදී වූ අෂ්ටාදශ ශිල්පයෙහි පාරප්‍රාප්ත විය.

ඒ බමුණාද දවස තුන්විටක් ආචාරීන්ට සේවයකොට ශිල්ප ශාස්ත්‍රයෙහි අඩුවැඩිය අරවාගෙන යෙයි. එසමයෙහි ඒ බමුණාගේ බිරින්ද දුශ්ශීල නියාව පළමුව වර්තමාන කථාවෙහි පණත සේම බමුණා අවුත් ආචාරීන්ට කී කල්හි, ආචාරී එපවත් අසා "ප්‍රණීත ආහාර කැවීමෙහි කම්නැත. ගොමුදියෙහි පස්පළා කකාරා ඇරගත් පැන් හා තිකුළු තිපල් කකාළ කෂාය ඉදිකොට තඹ භාජනයෙහි වත්කොට කීප දවසක් තිබා තඹ ගඳ වෙඬරුවු කල්හි ඒ කෂාය ගෙනගොස් වැලක්වත් ලනුවක්වත් ඉපලක්වත් ඇරගෙන සිට 'මේ බේත් බී රුජාව සංහිඳුවා ගනුව. එසේ නැත්නම් මාගෙන් දෙන ප්‍රණීත ආහාරය කණ බොන නියාවට ගෙයි මේවර හෝ කරව'යි කියව. මෙකී දෙයකට කැම්මැලි වූනම් ඉසකේ පත අල්වාගෙන අත තුබූ ඉපල වුවත්, වේවැල වූවත්, ලනුව වූවත් තුනින් එකකින් යහපත්කොට ඇන මේ නියායෙන් කරන්නා ලෙඩ සුවවෙ"යි කියා ආචාරී කීහ.

බමුණා ගෙට ගොසින් එලෙස කරන්ට වූ දින "උපාය කීවේ කවුරුදැ?"යි විචාරන්නා "ආචාරීන් වහන්සේ කීසේකැ"යි බමුණා කී විසින් "ආචාරීන් මාගේ තත්ත්වය දත් නියාව

වේදැ''යි සිතා එවිට "මේ වධ මා විඳින්නේ ඇයිදැ''යි සිතා ඇඳින් නැඟිසිට කළමනා මෙහෙවර කළහ. එතැන් පටන් කරන දුස්සීලය හැර පතිව්‍රතා ධර්මය රැක්කාහ. වර්තමාන කථාවෙහිත් බුදුන් ඇසූ නියාව දැන මේ කියන බැමිණිත් තමා කරණ ලද දුස්සීලය හරන ලද්දීය.

"එසමයෙහි දෙමහල්ලෝ නම් මෙසමයෙහිත් දෙමහල්ලෝමය, දිසාපාමොක් ආචාර්ව උපන්නෙම් බුදුවූ මම්මය''යි වදාරා දෙකල් ගළපා මේ 'කොසිය ජාතකය' නිමවා වදාළසේක.

# 130. අසම්පදාන ජාතකය

තවද සර්වඥයන් වහන්සේ රජගහ නුවර නිසා වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස්ව වැඩ උන්නා වූ මහළුවරුන් වහන්සේ "ඇවැත්නි, දෙවදත්ත ස්ථවිරයෝ කෙළෙහි ගුණ නොදනිති''යි කිය කියා වැඩ උන්සේක.

එතනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?''යි විචාරා වදාළ කල්හි "දෙවදත්ත ස්ථවිරයන් කෙළෙහි ගුණ නොදන්නා නියාව කිය කියා උනුම්හ''යි දැන් වූ කල්හි "මහණෙනි, දැන්මතු නොවෙයි, පෙරත් කෙළෙහි ගුණ නොදන්නෝම වේදැ''යි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස මගධ රට රජගහ නුවර මගධ නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ එනුවර අසූකෙළක් සම්පත් ඇති සංඛ සිටුව උපන්සේක.

එසමයෙහි බරණැස් නුවර මහ සම්පත් ඇති පිළිය නම් සිටාණන් කෙනෙක් ඇත්තාහ. එනුවර සිටුවරු දෙදෙන උනුන් කෙරේ විශ්වාසය දවසරනාහ.

එසමයෙහි බරණැස් නුවර පිළිය සිටාණන්ගේ ගෙයි සම්පත් පිරිහී ගොස් දුක්ඛිතව සිතන්නාහු “මාගේ යහළු සංඛ සිටාණන් කරා ගොස් සම්පත් ඇරගෙන වුත් රැකෙමි”යි සිතා තමන් හා සිටු දුවණියන් පමණක් බරණැස් නුවරින් නික්ම නැගීයන්ට වාහනයක් පමණ නැතිව පයින්ම රජගහ නුවරට අවුත් සංඛ සිටාණන්ගේ ගෙට වැද දුටු කල්හි සිටාණෝ “කුමක් නිසා අවුදැ?”යි විචාරන්නා “දුක්ඛිතව රැකෙන මානක් නැතිව නුඹ කරා ආමි”යි කී විසින් එවිට සංඛ සිටාණන් විසින් “ආයේ යහපතැ”යි කියා තමන්ගෙන් සතළිස් කෙළක් සම්පත් දී දැසිදස් පරිවාර සම්පත් සියල්ලත් දෙකොටසක් කොට බෙදා කොටසක් දී සත්කාර සම්මාන කොට යවූහ.

කල්යාමකින් සංඛ සිටාණෝත් දුක්ඛිතව සිතන්නාහු “මෙසේ දුක් විඳිනා බලත් මාගේ බොහෝ සම්පතුත් ඇරගෙන ගිය පිළිය සිටාණන් කරා යන්නා මටත් ප්‍රත්‍යුපකාර කරන්නෝ වේදැ”යි සිතා සිටු දුවණියන් හා සමග බරණැස් නුවරට

ගොස් සිට දුව ශාලාවක රඳවා තුමූ පිළිය සිටාණන්ගේ ගෙදරට ගියාහ. එවිට පිළිය සිටාණෝ "සංඛ සිටාණන් ආහ"යි අසා ගෙට කැඳවා යවූහ. සංඛ සිටාණෝ ගෙට අවුත් දැක උනස්නෙන් නැගී සිටින්නක්වත් ඉන්නා අසුන් පැනවීම් සාමීචිකමක්වත් නොකොට "කුමක් නිසා අවුදැ?"යි විචාළහ.

එවිට සංඛ සිටාණෝ කියන්නෝ "නුඹ දකිනා පිණිස ආමි"යි කියන්නා "නවාතැන් අළේ කොයිදැ?"යි කියන්නා "නවතැන් අළ තැනක් නැත"යි කියන්නා එදවස් තමන්ගේ ගෙදරට දසක් යාල රත්හැල් වැද තිබෙද්දී කෙළෙහි ගුණ නොදන්නා හෙයින් තමන්ගේ ගෙයි කොල්ලෙකු කැන්දලා කියන්නෝ "මුන් ආ ගමන සිස් නොකොට බොල් තිඹක් මුන්ගේ එකතුරු පටට මැනලව"යි කියා සම්මතකොට සිටාණන්ට කියන්නාහු "තෙපිත් තෙල ඇරගෙන ගොස් නවාතැනකදී පිස කාපියා මා කරා නොඅවුත් තොපගේ රටටම පළා යව"යි කීහ.

එබස් අසා සංඛ සිටාණෝ සිතන්නාහු "මේ බොල්තිඹ ඇරනොගනිම් දෝ හෝ"යි සිතා නැවත සිතන්නාහු "මා විසින් මිත්‍ර ධර්මය නොබිඳිනා ඒ කුමක් වේව"යි සිතා බොල්තිඹ හින ලවාගෙන ශාලාවට ගොස් එපවත් සිටුදුවට කීහ. ඒ සිටුදුව කියන්නී "නුඹවහන්සේ විකේෂ්පව සතළිස් සම්පතුත් පරිවාරත් දී බොල්තිඹ ලවාගෙන ආයේ කිම්දැ?"යි කී විසින් "උන් විසින් ඵැ බොල්තිඹ ඇර නොගනිම් නම් මාගේ මිත්‍රකම් බිඳිනා හා සරිය, එසේ විසින් ගෙනාමි, ඊට තොපි කනස්සළු

නොව"යි කීවත් සිටුදූ හඬන්නීමය. පළමු සංඛ සිටාණන් විසින් පිළිය සිටාණන්ට පාවාදුන් ගම් ධූරයෙක් ශාලාව සමීපයෙන් යන්නේ ශාලාව ඇතුළට වැද සිටාණන් හා සිටු දුවණියන් දැක දෙන්නා පයගෙන හඬා "සාමි දුවණියෙනි, කුමකට හඬව්දැ?"යි විචාරන්නා "සතළිස් කෙළක් සම්පත් දී බොල්තිඹක් දුන් විසිනැ"යි කිවූය. එවිට කියන්නා "නුඹවහන්සේ විකෂ්ප නුවුව මැනවැ"යි කියා තමන්ගේ ගෙට දෙන්නාම කැඳවාගෙන ගොස් ඉස් සෝධා නහවා බත් කවා තමාගෙනුත් බොහෝ සත්කාරකොට තමා හා එක්ව ආ පරිවාරයන්ටත් කියා උන් ලවාත් බොහෝ සත්කාර කරවා ඒ කියන කොලු තමාගේ රැස පරිවාරත් හැරගෙන වාසල සිට මොරගෑය. එවිට රජ්ජුරුවෝ තමන්ගේ සිටාණන් හා රජගහ නුවර සිට ආ සංඛ සිටාණන් දෙන්නා ගෙන්වා බරණැස් නුවර රජ්ජුරුවෝ සංඛ සිටාණන් අතින් විචාරන්නා "තොපගේ ලඟට මුන් ගිය ගමනේ මුන්ට කුමක් දුනුදැ?"යි විචාරන්නා "සතළිස් කෙළක් සම්පත් හා බොහෝ පරිවාර දුනිමි" කී විසින් පිළිය සිටාණන් අතින් "සැබෑදැ"යි විචාරන්නා "සැබව"යි කී විසින් "තොප කරා මුන් ආ ගමනේ තොප දුන්නේ කුමක්දැ?"යි පිළිය සිටාණන් අතින් විචාරන්නා කරබා ගත්හ.

එවිට රජ්ජුරුවන් විසින් "බොල්තිඹක් දුන්නෙයි කියන්නා ඇසුම්හ"යි කී විසින් කරබා ගත්තාහ.

එසමයෙහි රජ්ජුරුවන් හා අමාත්‍ය මණ්ඩලයා හා බොහෝ නින්දා කළාහ. එවිට රජ්ජුරුවෝ සංඛ සිටාණන්ට කියන්නෝ "මුන්ගේ ගෙයි සම්පත් එකහීම ඇරගෙන යව"යි කියන්නා "දේවයන් වහන්ස, අනුන්ගේ සම්පතතින් මට කාරිය කිම්ද? මා දුන් සතළිස් කෙළක් සම්පත් හා මාගේ පරිවාර ඇම් මේ"යි කියා ඇම ම ඇරගෙන රජගහ නුවරට ගොස් දානාදී පින්කම් කොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදාරා "එසමයෙහි පිළිය සිටාණෝ නම් දේවදත්ත ස්ථවිරයෝය, එසමයෙහි සංඛ සිටාණෝ නම් බුදුවූ මම්ම වේදැ"යි දෙකල් ගළපා 'අසම්පදාන ජාතකය' නිමවා වදාළසේක.

## 131. පඤ්චගරු ජාතකය

තවද සර්වඥයන් වහන්සෙ ජේතවනාරාමයේදී අජපාල න්‍යග්‍රෝධ සූත්‍රය වදාළසේක. එදවස් සංඝයා වහන්සේ දම්සභා මණ්ඩපයෙහි රැස්ව වැඩහිඳ කථා කරනසේක් "ඇවැත්නි, සර්වඥයන් වහන්සේ විසින් අජපාල න්‍යග්‍රෝධ මූලයෙහිදී තණ්හාය, අරතීය, රගාය යන මාර ස්ත්‍රීන් තුන්දෙනා විශිෂ්ඨ රූ මවාගෙන බුදුන් පොළඹවන්ට ආ ගමනේ බුදුන් විසින් කර ඔසවාත් නොබලන ලද. එසේ විසින් මේ නියා රූපශ්‍රීයක් දැක වැඩහුන් නියාව යහපතැ"යි කියා කථාකොට වැඩහුන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා එපවත් අසා "දැන් මහණෙනි, මා විසින් සියලු

ක්ලේශයන් නසා ලොව්තුරා බුදුවූ ජාතියෙහි ස්ත්‍රී වසඟ නොවූවා කුමක්ද, අබුද්දෙත්පාදයෙහි බෝධිසත්ත්වයන් නුමු කළ නුවණින් දවස අරණ සමයෙහි පවා ස්ත්‍රී වසඟ නුවමෝද්‍රා''යි වදුරා ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි ඒ රජ්ජුරුවන්ට රාජකුමාරවරුන් පන්සියයක් ඇති වූ නියාවද, බෝධිසත්ත්වයන් ඇමට බාලව ඉපද පසේබුදුන් අතින් ''කවරද මට රාජ්‍යය ලැබේද්‍ර?''යි විචාළ නියාවද, පසේබුදුන් විසින් ''සත් දවසකින් තක්සලා නුවරට ගියා නම් රාජ්‍යය ලබ''යි කී නියාවද, අමාත්‍යයන් පස් දෙනෙකු එක්ව ගොස් පඤ්චකාම තෘෂ්ණාවෙන් යකින්නට ගොදුරු වූ නියාවද, බෝධිසත්ත්වයන් පස්සේ යකින්න එලවාගෙන ඊම ආදී ගන්ධාර නුවර ශාලාවක වන් නියාවද, ගන්ධාර නුවර රජ්ජුරුවන් නුවරට ඇතු පිටින් වඩිමින් සිට බෝධිස,ත්‍වයන් එපයි කියව කියවා යකින්න ඇරගෙන රජගෙට ගිය නියාවද, එදවස් රෑ තමාගේ යක්‍ෂ විමානයට ගොස් යකින්නන් ඇරගෙන රජ්ජුරුවන් හා සියලු වාසල පටන් ඇතුළු අය ජීවිතක්‍ෂයට පමුණුවා ඇට තිබියදී භක්ෂණය කළ නියාවද, යන සියල්ලම පළමු කියනලද 'ගන්ධාර ජාතකය' සේම යයි දත යුතුය.

යකුන් පළා ගිය කල පසු දවස් ගම්මුදලිවරුන් විසින් දෙරවල් බිඳ ඇතුලට අවුත් රජගෙයි තුබූ කසල දමා ශුද්ධකොට නුවර දිව්‍යපුරයක් මෙන් සරහා රජගෙය සුධර්මා නම් දිව්‍යසභාවක් මෙන් සරහා අමාත්‍ය මණ්ඩලයා රැස් කරවන්නාහු "අසවල් ශාලාවේ උන් පුරුෂයා රාජ්‍යය කරන්ට නිස්සෝ ය"යි කියා ඔබ කරා ගොස් එපවත් කීහ.

එවිට බෝධිසත්ත්වයෝ කියන්නෝ "රජ්ජුරුවන්ගේ පුතණු කෙනෙකුන් නැද්දැ?"යි විචාරන්නා "නැත"යි කී හෙයින් ඔටුණු පැළඳ මහත් වූ පෙළහරින් නුවරට වැද දළපුඩු සේසත් නැගූ සිංහාසනාරූඪව යුවරජ සෙනෙවිරත් ඇතුළු වූ අමාත්‍ය මණ්ඩලයා පිරිවරා බ්‍රාහ්මණ පක්‍ෂීත්, ගෘහපති පක්‍ෂීත් සමන්විත වූ සොළොස් දහසක් නාටක ස්ත්‍රී නැටීම්, ගී කීම්, බෙර ගැසීම් ආදී වූ දෙයින් මේඝ ගර්පනාවක් කරන්නට වන්නාහ. පඤ්චාංගික තූර්‍ය්‍යනාදයෙන් එක නින්නාද කෙරෙමින් ඒ ඒ තැන ඝෝෂා කරවන්ට වන්නාහ. මේ නියායෙන් බොහෝ රාජානුභාවයෙන් ඉඳ සිතන්නාහු "පසේබුදුන් වහන්සේ කී පණතට හා වීර්‍ය්‍ය ධෛර්‍ය්‍යයෙන් මෙසේ ප්‍රතාපයක් ලද්දේය"යි සිතා එතැන් පටන් දනාදී වූ කුසල්කොට දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදාරා "එසමයෙහි ගන්ධාර දේශයෙහි රාජ්‍යය කළ රාජකුමාරයෝ නම් බුදුවූ මම්ම ය"යි වදාරා මේ 'පඤ්චගරු ජාතකය' නිමවා වදාළසේක.

# 132. ඝසන (ඝතාසන) ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද. එක්තරා භික්ෂු කෙනෙකුන් වහන්සේ පිටිසර ගමක වස් වසන්ට පළමු තුන් මස පන්සල ගිනි වැද ද ගිය විසින් උපාසකවරුන්ට එපවත් කියා උපාසකවරුන් විසින් සී සාම්හ, වැට බඳිම්හ යනාදී කී කී දවස්ම අවුත් කිය කියා තුන් මසම ගණය නොනැගූහ. විහාර එාසු මඳ හෙයින් අධිගමයක් වන්නා තබා ආලෝකයක් පමණකුත් උපදවාගත නුහුණුවාහුය. මේ නියායෙන් දවස් ඇර වස් ඉක්බිති බුදුන් කරා අවුත් වැඳ එකත්පස්ව වැඩ උන්සේක.

සර්වඥයන් වහන්සේ සුවදුක් විචාරා "ඇයි මහණෙනි, ගිය කාරිය මුදුන් පැමිණියේ දැ?"යි විචාරන්නෝ "විහාර අඵාසු හෙයින් භාවනා කරන්ට නුවූයේය"යි දන්වන්නා "එාසු තෙනකට ගොසින් උවත් භාවනා කරන්ට එපාදැ"යි "පෙර පක්ෂිහු පවා තමන් උන්තෙන අඵාසු හෙයින් ඔබ්බට ගොසින් වාසය කළෝවේදැ"යි වදරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ පක්ෂිව බොහෝ පක්ෂීන්ට රජව ඉපද ගඟක් සමීපයෙහි වාසය කරනසේක. එසමයෙහි බොහෝ පක්ෂීන් ගඟට නැමී තිබෙන අත්තෙක ඉඳ වර්චස් කරන්නාහ. එසමයෙහි ගඟ

වසන්නා වූ නාග රාජයෙක් තමා වසන දියෙහි පක්ෂීන් වර්චස් කරන්නා දැන "උන් වසන ගස ගින්නෙන් දවන්ට උවමැනවැ"යි සිතා රාත්‍රියෙහි පක්ෂීන් එකම ගසට රැස්ව උන් වේලාවට පළමුකොට විෂ ධූමයක් අළේය. ඉන් ඒ ගඟ පැන් උනු කරවා පීය. දෙවෙනිව ගිනිකඳ අළේය. ඉන් දුම්කඳ පැන නැංගේය. තුන්වෙනිව අල ගිණිකඳින් නාඹ තල්කඳ සා ගිනිකඳ පැන නැංගේය. ඒ දුටු බෝධිසත්ත්වයෝ "ගින්නට විරුද්ධ වූ දියෙන් ගිනිකඳ පැන නැගී අවස්ථාවෙහි අපි මෙතන ඉඳිම කාරණා නොවෙ"යි කීවා කරන පක්ෂීන් ගණනක් ඇරගෙන ඔබ්බට ගියේ වේදැයි වදරා "එසමයෙහි නායක පක්ෂීව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදරා 'ඝසන ජාතකය' නිමවා වදාළසේක.

# 133. ජාතසෝම (ඝධානසෝධන) ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි සකස්පුර දොරට බට දවස් සැරියුත් ස්වාමීන් වහන්සේ ප්‍රශ්න විසර්ජනය කළ නියාව යහපතැයි යන මේ කථාව නිසා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ හිමාලය වනයෙහි බොහෝ තාපසවරුන්ට නායකව වසන්නාහුය.

එසමයෙහි බෝධිසත්වයන්ගේ ප්‍රධාන අතවැස්සා නම් ඔබ්බේ ගමකට වස් වසන්නට යාමේදී බෝධිසත්ත්වයන් වහන්සේගේ මරණ කාලය පැමිණියේය. එවිට අතවැසි තාපසවරු විසින් ලඟට අවුත් "කුමක්ද, ධ්‍යානයක් උපදවාගත් සේක්දැ?"යි විචාරන්නා "ආකිංචනං නත්‍ථි කිංචි"යි වදාරා ප්‍රාණය නිරුද්ධව ගොස් බඹලොව ගොසින් පෙනුනුසේක.

එවිට තාපසවරුන් විසින් "ආකිංචනං නත්‍ථි කිංචි" යන බසෙහි අර්ථය දැනගත නොහී "මිත්‍යදෘෂ්ටින් උපදනා බඹලොව උපන් නියාව නොවේදැ"යි සිතා ආදාහන පූජාව මාහැඟිකොට නොකළාය.

එවිට ප්‍රධාන අතවැසි තාපසයෝ එතනට අවුත් තාපසවරුන් අතින් "අචාරීන් වහන්සේගේ ප්‍රාණය නිරුද්ධව යන ගමනේ කීයේ කිම්දැ?"යි විචාරා එපවත් අසා "එසේ විනම් අභස්සර නම් බඹලොව උපන්නේය"යි කීහ. බොහෝ තාපසවරුන් "ඒ කීයේ බොරු ය"යි යන විසින් මහබ්‍රහ්ම තෙමේම එතනට අවුත් "මාගේ ප්‍රධාන තාපසයා කීයේ ඇත්තම ය"යි කියා පෙරලා බඹලොව ගියා යයි වදාරා "එසමයෙහි ප්‍රධාන තාපසයෝ නම් සැරියුත් ස්ථවිරයෝය. මහබ්‍රහ්මව උපන්නේ නම් බුදුවූ මම්ම ය"යි මේ 'ඣානසොධන ජාතකය' නිමවා වදාල සේක.

# 134. චන්‍ද්‍රභාස (චන්‍ද්‍රභ) ජාතකය

තවද සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි සකස්පුර නුවර සැරියුත් සාමීන්ගේ ප්‍රශ්න නිසා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ හිමාල වනයෙහි බොහෝ තාපසවරුන්ට නායකව ඉඳ පරලොව යන දවස් තාපසවරුන් විසින් ළඟට අවුත් "කුමණ සෘඬියෙක් පැමිණියේදැ?"යි විචාරන්නා "චන්ද්‍රාභාසං සුරියාභාසං" කියා පරලොව ගියාහ. එවිට ජ්‍යෙෂ්ඨ තාපසයන් විසින් "අපගේ තාපසයන් වහන්සේ ආභස්සර නම් බඹලොව උපන්සේකැ"යි කී විසින් තාපසවරුන් නොගිවිස්නා හෙයින් මහබ්‍රහ්මයා එතනට අවුත් "ජ්‍යෙෂ්ඨ තාපසයන් කීයේ සැබෑමය"යි කියා බඹලොව ගියාහයි වදරා "එසමයෙහි ජ්‍යෙෂ්ඨ තාපසයෝ නම් සැරියුත් මහස්ථවිරයෝය. මහබ්‍රහ්මව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැ"යි 'චන්ද්‍රභය ජාතකය' නිමවා වදාළසේක.

# 135. ස්වර්ණහංස ජාතකය

තවද සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා උපාසකයෙක් ඌනු වත්තක් කොට භික්ෂූන් වහන්සේ බොහෝ දෙනාට ඌනු කඩා දෙන්නේය.

"මේච්චරටත් කඩා ගණුව"යි කියා උන් ලවාම කඩවාත් යවන්නේය. භික්ෂුණීන් වහන්සේත් ඔහුට කියා ඔහු කීව් ව්වරක් කපාකොටා තමන් වහන්සේ හෝ කඩාගෙන යනසේක. උපාසකයා හෝ කඩා දෙන්නේය.

මේ නියායෙන් දවස් හරණා සමයෙහි එක් දවසක් උත්සවයක් නිසා බොහෝ දෙනා ගෙට අවුත් ළූනු කඩාගෙන ගියාහ. ඒ වේලාවට නන්දන නම් භික්ෂුණී කෙනෙකුන් වහන්සේ ඔහුගේ ගෙට එදවස් අවුත් "උපාසකයෙනි, ළූනු දෙව"යි කී සෙයින් උපාසක තැනත් ළූනු දීපියා සිටි ප්‍රස්තාවට ඉල්වූ හෙයින් "නුඹ වහන්සේ මේ ළූනු වත්තට ගොසින් ළූනු තුනක් කඩා ගත මැනවැ"යි කීය.

එබස් අසා තමන් වහන්සේගේ මෙහෙණින්නන් හා සමග වත්තට ගොස් ළූනු එකසීම කඩාගෙන ගියසේක. එවිට උයන්ගොව්වාත් "නොකියන් ඉන්ද දී මෙසේ වූ අන්‍ය කෙරෙද්දැ?"යි කියා මුරගෑය. උපාසකයාගේ සිතිවිල්ලට කළකිරුණ ඒ ඇසූ බොහෝ මෙහෙණින්නන් වහන්සේත් උස්කොටනා කොට එපවත් සර්‍වඥයන් වහන්සේට දැන් වූසේක.

සර්‍වඥයන් වහන්සේත් එපවත් අසා "මහණුන් විසින් නම් දුන් දෙයක් විනා නුදුන් දෙයක් ඇරගත යුතුදැ?යි බොහෝ තෘෂ්ණාවෙන් අත සිටි දෙයක් නැසී යන්නේ ඔබ්බෙන් ලබන ලද දෙයක් නැත. ලත් දෙයෙහි සතුටු වීමෙන් ඔබ්බෙනුත් සම්භවෙයි. අත සිටි දෙයත් තාවුරුවේ"යි කියා බොහෝකොට

භික්ෂූන් වහන්සේ මෙහෙණින්නන්ට නින්දාකොට "මහණෙනි, පෙරත් මේ මෙහෙණින්න බහුවිත්ත ඇත්තී වේදැ"යි වදාර ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේදැයි යතහොත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ බමුණු කුලයක ඉපද දූන් තුන්දෙනා ගෙන එකෙක් නන්දාය, එකෙක් නන්දවතීය, එකෙක් සුන්දරීනන්දනී යයි. දූන් තුනදෙනෙකු ලදින් ඔබ්බෙ පරකුලයෙක ලන්ට විවාහ කරන්නාට පළමු ම පිය වූ බෝධිසත්ත්වයන් වහන්සේ මියගොස් ස්වර්ණහංසව ඉපද ජාති සමරණ ඥාණයෙන් මේ හංස ජාතියට පළමුවෙනි ජාතියෙහි බ්‍රාහ්මණ කුලයෙහි උපන් නියාවත් බැමිණිය හා දූන් තුන්දෙනා අනුන්ට බැලමෙහෙකොට රැකෙන නියාව දැක "මාගේ පියාපත් රන්පියාපත් විසින් කැපීම් තැලීම් ආදී වූ කර්මාන්තයට නිසිව තිබෙයි. එසේ හෙයින් මාගේ අඹුදරුවන්ට සංග්‍රහ පිණිස ම විසින් දෙමසින් අතනට ගොස් පියාපත් එල එලා ආම් නම් යහපතැ"යි සිතා දවසක් තමන්ගේ ගෙට අවුත් පළය පිට උන් කල්හි දූන් තුන්දෙන විසින් "තොපි කවුරුදැ?"යි විචාරන්නා "තොප ඇමට පිය වූ බ්‍රාහ්මණයානෝ නම් මමය, තොපට හා තොපගේ මැණියන්ටත් සංග්‍රහ පිණිස ආමි" කියා රන්පතක එලා ගියහ. මෙම නියායෙන් කීප වාරයෙක රන්පත් එලා සිටි කල්හි එක් දවසක් බැමිණි සිතන්නී "තිරිසනා නම් එක් සිතක්

නොවන්නාහ. ඉදිරියේ මෙතනට නොයෙමි සිතුවොත් අපට බොහෝ අලාභය"යි සිතා දූන් කැඳවා කියන්නී "තොපගේ පියාණන් දවසෙක අල්වාගෙන ඇඟ පියාපත් උදුරා ගනුව"යි කීහ.

එපවත් උන්ගේ දූන් තුන්දෙන කියන්නාහු "අපගේ පියාණන් වහන්සේගේ සර්වාංගය රිදෙයි, අපි එලෙස නුදුරම්හ"යි කීහ. මෙසේ නියායෙන් කිය කියා උන් කලට හංසයා ඒ ගෙට ආවේය. එකල්හි බැමිණී කියන්නී "ස්වාමි පුත්‍රයා මා කරා එව"යි කියා කැඳ වූ කල්හි එවිට බෝධිසත්‍වයන් වහා උන් කරා එන්නාම අල්වාගෙන සර්වාංගයේ රෝමයන් උදුරා ගත්තාහ.

බෝධිසත්‍වයන් නොමනා අභිප්‍රායෙන් උදුරා ගත් හෙයින් සියළු රන්පත් නිස්ප්‍රභාව ගියේය. බෝධිසත්ත්‍වයෝ පියාපත් නැති හෙයින් යානොහී එම ගෙයිම උන්නාහ. දෙවෙනිව ඇවිත් වන ලොම් සුදු පැහැ ඇතිවන්නා බෝධිසත්ත්‍වයන් ඇරපුවාහ. එතැන් පටන් බෝධිසත්ත්‍වයෝ ගෙට නොආවිරූහයි වදාරා "මහණෙනි, තෘෂ්ණාවගේ අධිකත්‍වය නිසා යෙහෙන් සෙමෙන් ලැබ ගන්නා රන්පත් ලැබ ගන්ට නුවූයේ වේදැ"යි වදාරා "එසමයෙහි බැමිණී නම් මේ නන්ද නම් මෙහෙණින්නය. ස්වර්ණහංසව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම ය"යි වදාරා 'ස්වර්ණහංස ජාතකය' නිමවා වදාළසේක.

# 136. බබ්බු ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන කාණමාතාව ආර්‍යශ්‍රාවක නම් වූ උපාසිකාවක් ඇත්තීය. එකියන උපාසිකාවට කාණමාතාව යයි කියන්ට කාරණා කින්දැ?යි යතහොත්, කාණ නම් දුවක් ඇත්තීය. ඈට මව් විසින් කාණ යයි නම් කළේ ඇස කණ හෙයින් නොවෙයි, විශේෂව රූ ඇති හෙයින් ඈ දුටු පුරුෂයෙක් ඇගේ රුවෙහිම තෘෂ්ණාව බැඳී අනික් ස්ත්‍රියක කෙරේ දෘෂ්ටියක් නොහෙලන විසින් කාණවූවා හා සමානයෝ යයි කියා කාණාවෝ යයි නම් තිබූහ.

කාණ නම් දුව ඔබ්බට ඇගේ මැණියෝ පාවා දුන්හ. ඔබ්බෙ කුලයක වැද ඉඳ බොහෝ දවසකින් මැණියන් දකින්ට මැණියන් කරා අවුත් දැක උන් ලඟ වැද ඉඳ නොඑන විසින් උන්ගේ ස්වාමි පුත්‍රයා කියා යවන්නේ “කාණාවන් දකිනා බොහෝ අභිප්‍රාය ඇත්තෙමි, වහා එන්නේය”යි කියා යවූහ. එපවත් අසා කාණාවෝ තමන්ගේ මැණියන්ට එපවත් කීවාහ. එපවත් කාණමාතාවෝ අසා “ස්වාමිපුත්‍රයා දකින්ට යන ගමන සිසතින් යාම නපුරු යයි කැවුම් ආදී වූ දෙය පිසවාගෙන යා යුතුය”යි පණත් කළාහ.

ඒ අවස්ථාවට වහන්දෑ නමක් සිඟා වැඩිසේක. සෝවාන් උපාසිකාවන් විසින් ගෙයි කැවුම් තිබෙද්දී “නැතැ”යි කියන්ට කාරණා නොවන හෙයින් පාත්‍රය පුරා කැවුම් පිළිගැන්වූහ. ඒ භික්‍ෂූන් වහන්සේත් අනික් සිඟායෙන භික්ෂු කෙනෙකුන්

වහන්සේ දැක උන්වහන්සේට කියනසේක් “කාණමාතාවන්ගේ ගෙයි කැවුම් ඇත, ඔබ්බට යව”යි කීසේක.

එපවත් අසා ඒ ගෙට ගොස් පාත්‍රය පුරා කැවුම් ලබාගෙන අනික් නමකට කීසේක. ඒ නම අනික් නමකට කීසේකැයි කියා මේ නියායෙන් සතර නමකට පාත්‍රා පුරා දීමෙන් කැවුම් නිමා ගියේය.

එසේ හෙයින් කාණාව ඒ මුරයේ යන ගමන් තබා දෙවෙනි වලියේත් ස්වාමිපුත්‍රයා “අව මැනවැ”යි කියා යවන්නා මුරයේත් ගමනට පිසූ කැවුම් එම භික්ෂූන් වහන්සේම පිළිගත් හෙයින් ගමනට බාධා වූ හෙයින් ඔබ්බෙන් කුලස්ත්‍රියක් ගෙනාහ. එපවත් කාණාවෝ අසා බොහෝ විකේෂ්පව අඬන්ට වන්නාහ. කාණමාතාවෝත් විකේෂ්ප වූහ.

එපවත් සර්‍වඥයන් වහන්සේ දැක කාණමාතාවන්ගේ ගෙට අවුත් උන් විසින් පනවනලද බුධාසනමස්තකයෙහි වැඩහිඳ “උපාසිකාවෙනි, තොපගේ දුව අඬන්නේ ඇයිදැ?”යි විචාරා එපවත් අසා ඊට සුදුසු බණ වදාරා උන්ගේ සෝක නිවා ජේතවනාරාමයට වැඩිසේක.

එදවස් සවස දම්සභා මණ්ඩපයෙහි රැස් වූ මහළුවරුන් වහන්සේ “අසවල් භික්ෂූන් සතර දෙනා නිසා කාණාවන්ගේ ගමණටත් බාධා වියයි ආර්‍ය්‍යී උපාසිකාවන්ටත් බොහෝ විකේෂ්පය”යි කිය කියා උන් තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා “මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?”යි විචාරා එපවත් අසා “මහණෙනි, දැන්මතු

නොවෙයි, පෙරත් මෙකියන භික්ෂූහු සතරදෙනා විසින් කාණමාතාවන්ගේ ලාභය උදුරා ගෙනෙන ලදැ''යි වදරා ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ ගල්වඩු කුලයක ඉපිද ගල් වඩුවන්ට ආචාර්‍ය්‍ව දවසරිනාසේක.

එසමයෙහි සතළිස් කෙළක් සම්පත් නිධානගතව තිබෙන්නා වූ පිටිසර සිටාණ කෙනෙක් නැසී ගියාහ. උන්ගේ බැදෑනියෝ මියගොස් සම්පතෙහි ගත්තා වූ ආසාවෙන් නිධාන භූමියෙහි තුඹසෙක මූසිකා ධෙනුව උපන්නාහ.

ඒ අවස්ථාවට බෝධිසත්ත්‍වයෝ ඒ පාළු ගමට අවුත් ගල් පළා ඉන් කර්මාන්තකොට ජීවත් වන්නාහ. දවසට විටක් බෝධිසත්ත්‍වයන් ඒ ගමට එන හෙයින් මූසිකා ධෙනුව බෝධිසත්ත්‍වයන් කෙරෙහි ස්නෙහ උපදවාගෙන ''මාගේ සතළිස් කෙළක් සම්පත් ඇත, ඒ සම්පත් ඒ සත්පුරුෂයාට දී මමත් ප්‍රයෝජන විඳිමි''යි සිතා එක් දවසක් කහාපණයක් කටින් ඩැහැගෙන අවුත් බෝධිසත්ත්‍වයන්ගේ පා මුල එලා ළුව. බෝධිසත්ත්‍වයෝ ''මේ කිමෙක්දැ?''යි කීහ. මූසිකාව විසින් ''මේ රත්තරන් නුඹවහන්සේ විසින් ඇරගෙන මට රත්තරන් සතර වියටෙක දඩමස් ඇරගෙන ඉතිරිවා ප්‍රයෝජන ගත මැනවැ''යි කීහ.

ඒ නියාවට දවස්පතා කෂීාපණායක් මී දෙන්නීය. බෝධිසත්ත්වයෝ රත්තරන් සතර වියටෙක දඩමස් ඇරගෙන ලා මේ නියායෙන් දවස් අරණා සමයෙහි එක් බළලෙක් ගොදුරු සොයා ඇවිදිනේ මූසිකා ධෙනුව දැක අල්වාගත. එවිට මූසිකාව කියන්නී “මා ඇර පියව”යි කීය. ඊට බළල් කියන්නේ “ගොදුරු සොයන්නෙමි”යි කී විසින් “මා ඇල්ලූයේ කුමටදැ?”යි විචාරා “මාංස කන්ටය”යි කී විසින් “එකදු කන මාංසය යහපත්ද? ඇමදු කන මාංසය යහපත්දැ?”යි විචාරන්නා “හැමදු කන මාංසය ලැබේ නම් යහපත්වෙ”යි බළලා කියන්නා “එසේ වීනම් මා ඇර පියන්න, දවස්පතා මාංස ලබමි”යි මූසිකාව කී විසින් අසා බළලා කියන්නේ “යහපත, ඒ නියාවට මස් දෙව”යි “පමා වූ දවසෙක දන්නෙමි වේදැ”යි භය ගන්වා අලහ.

එතැන් පටන් මූසිකා ධෙනුව තමා ලත් මාංස දෙකොටසක් කොට බළලාට කොටසක් දී කන්නීය. මේ නියායෙන් අනික් බළලෙක් ඇල්වීය. උන්ටත් මාංස කොට්ඨාසයක් දෙන නියායෙන් කියා ගැලවුනාහ. මේ නියායෙන් බළලුන් සතර දෙනෙකු ඇල් වූ ගමනේ සතරදෙනාම මේ නියායෙන් ගිවිස තමා එක තැනැත්තිය, බඩ පුරා මාංස පස් කොටසක් කොට සතර කොටසක් බළලුන්ට දී තමා කොටසක් කන හෙයින් බඩපුරා කන්ට නොලත්තීය. දවසින් දවස දුර්වලභාවයට පැමිණීයාහ.

එපවත් බෝධිසත්ත්වයෝ දැන "මෙසේ වන්ට හේතු කවරේදැ?"යි විචාරා එපවත් අසා "මෙතෙක් දවස් මට නොකීවේ ඇයිදැ?"යි කියා විචාරා ඒ නියාවට දැවාන ගුහාවක් ඉදිකොට ඉන්ට සලස්වා "තී විසින් මස් ඉල්ලා ආ බළලුන්ට පරිභව බණව"යි සලස්වා ලූහ. ඒ නියාවට මූසිකාව දැවාන කරඬුවේ උන් කලට පළමුකොට බළලෙක් ඇවිත් "තී විසින් මට දෙන මස් කොයිදැ?"යි විචාරන්නා "ඇයි, තොපට මස් දෙන්ට උන් එකෙක්ද, තොපට මස් උවමනා වීනම් තොපගේ දරුවන්ගේ මාංස කව"යි කියා කිපෙන ලෙස බස් කීව. එවිට බළල් කෝපව "තොපිත් මෙසේවූදැ?"යි දැවාන කරඬුවට පැන ලය තලාගෙන ඉවත ගොස් බැද්දේ ලැග මිය ගියේය.

මෙම නියායෙන් අනික් බළලුන් තුන්දෙනත් මූසිකාවගේ බසට කෝපයෙන් දැවාන කරඬුව පැන ලය පලාගෙන මළාහ. එතැන් පටන් මූසිකාව බෝධිසත්ත්වයන් කෙරේ සමාධියෙන් පැහැද කෂීාපණ දෙකක් දවසකට දෙන්නීය. මේ නියායෙන් තමාගේ සතළිස් කෙළක් සම්පත් දුන්නීයයි වදරා බළලුන් සතරදෙන මස් කෑමෙන් මූසිකාවට වූ අලාභය සේම උපාසිකාවන්ටත් වූ අලාභ යයි වදර "අදවක් පටන් පවරා දුන් දනක් විනා නොපවරා දුන් දනක් ගෙට ගොස් ඇර ගනීම අකැපය"යි ශික්ෂාපද පණවා වදළසේක.

"එසමයෙහි බළලුන් සතරදෙනා නම් මේ භික්ෂුහු සතරදෙනය, මූසිකා ධෙනුව නම් කාණමාතා වූ

උපාසිකාවෝය. එසමයෙහි ගල්වඩුව උපන්නෙමි ලොව්තුරා බුදුවූ මම්ම ය''යි දෙකල් ගළපා මේ 'බබ්බු ජාතකය' නිමවා වදාළසේක.

# 137. ගොධ ජාතකය

තවද සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි වඤ්චා ප්‍රයොග දන්නා භික්‍ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී. එහි වර්‍තමාන කථාව යටකියනලද කුහක ජාතකයයෙහි සැලැස්ම සේම යයි දතයුතු.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයෝ ගොයි යෝනියක ඉපිද පිටිසර ගමක බැද්දේ තුඹසෙක වාසය කරන්නාහ.

එසමයෙහි සිල්වත් ගුණවත් තාපස කෙනෙක් එකියන පිටිසර ගම මනුෂ්‍යයන්ගෙන් සිව්පසය අනුභව කරන්නාහ. බෝධිසත්ත්‍වයෝ ඒ තාපසයන්ගේ මියුරු ධර්‍මදේශනාව අසන නිසා දවසක දෙවිටක් අවුත් තාපසයන් දැක වැඳ යන්නාහ. කල්යාමකින් උපාසකවරුන්ට කියාගෙන ඒ තාපසයන් වහන්සේ හිමාලය වනයට වැඩිසේක. පසුව කූට තපස් කරන්නා වූ තාපස කෙනෙක් එම ගමට අවුත් උහුත් උපාසකවරුන් විසින් දෙන දන් ලබන්නාහු එම පන්සල වසන්නාහ.

එසමයෙහි ගොයාණෝ "පළමු තාපසයන්සේම මුයිත් යහපත් කෙනෙකැ"යි සිතා දවසකට දෙවිටක් අවුත් දකිනාහ. එසමයෙහි එක් දවසක් නොකල් වැස්සෙක් වට විසින් මෙරු පැන නැංගාහ. මෙරුන් කන නිසා බොහෝ ගොයි ඒ ඒ තුඹස්වලින් එලිබටහ. ඒ දැන මනුෂ්‍යයෝ බැද්දට අවුත් බොහෝ ගොයින් මරාගෙන යන්නාහු ගොයි මාලු යහපත්කොට පිසගෙන ගියාහ. තාපසයෝත් ගෝයි මාලු කා "කුමන මාංසදැ?"යි විචාරා ගෝයි මස නියාව කියන්නා එහි තෘෂ්ණාව බැඳ "මා කරා එන මහගොයෙක් ඇත, ඔහු මරා මස් කමි"යි සිතා උපාසකවරුන්ට කියා ලුනු මිරිස් ආදී වූ දෙයත්, අත්පල්ලයකුත් ගෙන්වා පන්සල ඇතුලේ සඟවා තබා යහපත් පොල්ලකුත් ඉදිකොට ඒ පොල්ල වැහැරි සිවුරෙන් සඟවාගෙන සක්මන් කෙළවර ගල අස්න පිටකර නමාගෙන ගොස් ගොයාණන් එනමග යටැසින් බල බලා අපිස් භාවයක් අඟවා උන්නාහ. ගොයාණෝත් තුඹසින් පිටත්ව එන්නාහුමය. මෙතෙක් ද සේ ළඟට නොඅවුත් කොව කොවා තාපසයන් ඉන්නා සැලැස්මෙන් සැකව උඩුසුලඟට ගොස් තාපසයන් ගොයි මස් කෑ නියාව නාසයෙන් ආඝ්‍රාණකොට දැන දැන ළන් නොවී දුරුව දුරුව ඇවිදිනාහ.

ඒ තාපසයෝ "තමන් කරා ගොයාණන් නොඑන විසින් කොවපුව"යි සිතා "පොල්ල බලා දමාලා ගසා මරමි" සිතා දැමුවාහ. දැමූ පොල්ල වල්ගය අගට වැදගත. දෙවෙනිව ලුනු බඳු පොල්ල ඇරගෙන ගසනතුරු බෝධිසත්ත්වයෝ වහා ගොසින් තුඹසට වැද අනික් තෙනකින් මූන එලියට ලා "තා

යහපත් තාපස කෙනෙකැයි සිතා උනිමි, තා සේ වූවන්ට කාෂාය වස්ත්‍ර, දිවිසම්, ජටා ආදී වූ දෙය තරම් නොවේ"යි කියා බැන තුඹසට වැදගියාහ.

ඒ තාපසයෝ "මෙවක් පටන් මෙතන උනිනම් ගොයාණෝ මාගේ තතු උපාසකවරුන්ට කිය"යි සිතා එදවස්ම හිමාලය වනයට නික්මුණාහයි වදරා "එසමයෙහි කූට තාපසයෝ නම් වඤ්චා ප්‍රයෝග දන්නා භික්ෂූහුය, යහපත් තාපසයෝ නම් ශාරිපුත්‍ර ස්ථවිරයෝය, ගෝව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදරා 'ගොධ ජාතකය' නිමවා වදළසේක.

## 138. උභතෝභට්ට ජාතකය

තවද සර්‍වඥයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස්ව මහළුවරුන් වහන්සේලා කථාවක් උපදවනාසේක් "දේවදත්ත ස්ථවිරයෝ බුදුන් වදළ ප්‍රතිපත්ති නුපුරා ඉන්න විසින් භික්ෂූහු නොවන්නාහ. ගිහිව සිට ලබනලද ලාභයෙනුත් පිරිහුනාහ. මහණව සිට ලබන්නා වූ අධිගම ආදී වූ ලාභයෙනුත් පිරිහුනාහ. එසේ හෙයින් දෙකෙළවර ගිනි වැදගෙන මධ්‍යයේ අසූචි ගැවුණු දණ්ඩක් සෙයින් අභව්‍යය. දේවදත්ත ස්ථවිරයෝ උභයභ්‍රෂ්ට වූව"යි මේ කථාව කිය කියා වැඩ උන් තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදරා "මහණෙනි, මා එන්නාට පූර්‍ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව හුනුදැ?"යි විචාරා වදරා එපවත් අසා "මහණෙනි, දැන්මතු නොවෙයි, දේවදත්ත

ස්ථවිරයෝ පළමුත් උභයභ්‍රෂ්ටයෝ වේදැ”යි වදරා ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයෝ පිටිසර ගමක බැද්දේ විලක් ගාව ගසක වෘක්‍ෂ දේවතාව උපන්සේක.

එසමයෙහි එක්තරා බිළිවැද්දෙක් තමාගේ පුතු කැඳවාගෙන ඒ විල සමීපයට අවුත් ඒ විල බොහෝ මසුන් ඇති හෙයින් බිළිය දමාලීය. ඒ බිළිය ගොස් මහා කණුවක ඇවිලිණ. ඇදගත නොහැකි විසින් කෙවුළු සිතන්නේ “මහා කුඩමස්සෙකැ”යි සිතා පුතා අත ගෙට කියා යවන්නේ “තොපගේ මෑණියන් අසල ගෙයි ඇත්තන්ලා ඩබර කරන්ට කියාලව”යි කියා යවා තෙමේ බිලිකටු ඇදගත නොහැකි විසින් කැඩෙයි යන භයින් ඉනකඩ ගොඩ තිබා “මසු අල්වමි”යි දියට බැස දියෙහි අතපත ගා ඇවිදිනා කල දියෙහි තිබූ කණු දෙකක් දැස ඇනී ඇස් දෙක නැසින. ගොඩ තිබූ ඉනකඩ මග යන හොරෙක් ඇරගත. පුතාගේ බස් අසා මව් දබර උපදවා ගන්නා උපායක් උවමනා විසින් එක් කණෙක තල්පතක් තබාගෙන, එක් ඇසෙක බඳුන් කබල්ලේ දැලිගෙන පිරිමැද ගා ගෙන පිරිය ඇති පුතෙකුසේ බලුකුක්කෙකු වඩාගෙන වියරු උණු කෙනෙකු මෙන් අවුනැයි කියන්නා වියරු උණෙන් “තොප විනා මා වියරු උණෝ නැතැ”යි බසින් බසට දබර බෝ වනමෝ ගම්මුදලියාට කී දබර එලවමි කියා ඇරගෙන ගොස් ගම්මුදලින්ට පැමිණියාය.

ගම්මුදලි යුක්ති විචාරා "ඇටම වරදය"යි කියා දඩ සලස්වා මරා තළා දඩ ඇරගත්තාහ.

එවිට කෙවුල් දියෙන් ගොඩට නැගී අතින් ඇස වසාගෙන කඩ සොයා ගොඩ නොදැක සිටියේය. ඒ වේලාවට බෝධිසත්ත්වයෝ වෘක්ෂයෙන් පිටත්ව කියන්නාහු "කෙවුල, තාගේ අඥාන කමින් දිය කළමනා කටයුතතෙනුත් දියට බැස ඇස් දෙකත් නසාගෙන, ගොඩ තිබුන ඉනකඩත් නුවූයේ යයි අවවාද කී යුක්තියෙන් දබරකොට තොපගේ බිරින්ද මරා ගෙයි තිබූ සම්පත්තියෙනුත් ප්‍රයෝජන නුවූයේය. එසේ හෙයින් දියෙන් කළමනා කටයුත්තෙනුත් ප්‍රයෝජන නුවූයේය" අවවාද කියා අන්තර්ධාන වූහයි වදාරා "එසමයෙහි ඇස නසාගත් කෙවුලා නම් දේවදත්ත ස්ථවිරයෝය, වෘක්ෂ දේවතාව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම ය"යි වදාරා 'උභතෝභ්‍රෂ්ට ජාතකය' නිමවා වදාළසේක.

## 139. කාක ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි බන්ධු සංග්‍රහයක් නිසා මේ ජාතකය දක්වන ලදි. එහි වර්තමාන කථාව දසවැනි නිපාතයෙහි 'භද්‍රසාල' ජාතකයෙහි විස්තර වශයෙන් එන්නේය.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රාහ්මණයෙක් වීථියේ යමින් සිටියේය. එවේලාවට කවුඩෝ

දෙන්නෙක් තොරණයක් පිට උන්නාහ. ඉන් එක් කවුඩෙක් කියන්නේ "මේ බමුණාගේ ඉස වර්චස් කරන්ට මට අභිප්‍රාය"යි කියන්නා එවිට අනික් කවුඩු කියන්නේ "මහා සම්පත් ඇති උවමනා බමුණාය. එසේ වූ බමුණා හා කැටිව වෛර වීමෙන් කවුඩු රැස එකසීම නසාලන්ටත් සපන. එසේ වූ දෙයක් නොකරව"යි කීහ. ඊට කවුඩු කියන්නේ බමුණා ඉස වර්චස් නොකොට ඉන්ට බැරිය, කුමක් වේවයි වර්චස් කරමි" කී විසින් අනික් කවුඩු "තා කළ දෑ තොම දකුව"යි කියා ඔබ්බකට ගියේය.

එවිට බමුණාත් තොරණ කෙළවරට ලන් වන්නාම කවුඩු ඉස වර්චස් කොටපිය. එවිට බමුණුත් කවුඩුත් කෙරේ වෛර බැන්දේය. ඒ අවධියට අනුන්ට බැලමෙහෙකොට ජීවත් වන ගැහැණියක් වී සිගිත්තක් අව්වේ වනාලුය. පීඩම්ලොම් ඇති එළුවෙක් ඒ වී කන්ට වන. එවිට ඒ ස්ත්‍රිය විසින් පොල්ලක් ලා මරා ලුහුබැඳවා පුව, තවත් ඇගේ ප්‍රමාදයක් බලා වී කන්ට ආය. දෙවෙනිවත් එසේම ගැසූය. එවිටත් පලා ගියේය. පසුව මැහැලි සිතන්නී "තවත් මූ විටින් විටම වී කත් නම් මාගේ බැලමෙහෙය පහරින්ට ගෙනා වි නිමායෙ"යි සිතා ගිනි පෙණොල්ලක් අතින් ඇරගෙන නිදා වැටී වැටී වැදහොත්තීය. එවේලාවට ඒ එළුවා වී කන්ට ආ විසින් ගිනි පෙණොල්ලෙන් බල පහරක් ගැසුව. සැඩ ඇතිව එළුවා විසින් ඇඟ ගිනි වැදගත. ඒ ගිනි නිවන්ට එළුවා වහා ගොසින් ඇත්හළ තුබූ ඉලුප් ගොඩක වැටී වැදහොත්තේය. ඒ ඉලුප් ගේත් ගිනි ගත්හ. ඇත්හළ ද ඇතුන් පිට වැටී ඇතුන්ගේ පිට බොහෝ

වණාව ගියේය. ඇත්හළ වෙදවරුන් පිළියම්කොට බැරි සෙයින් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝ එපවත් අසා පුරෝහිත බමුණා ගෙන්වා "ඇතුන්ට පිළියම් කරන්ට බැරි යයි වෙදවරු කීහ, ඊට ආචාරීනි කළමනා කින්දැ?"යි විචාළහ.

එපවත් බමුණු අසා "කවුඩන්ගේ තෙල් ලදෙත් පිළියම් කරන්ට හාරය"යි කීහ. එපවත් රජ්ජුරුවෝ අසා "කවුඩන් මරව"යි කීහ. ඒ නියාවට මෙහෙවර අසා ගත් නුවරවාසී කවුඩන් සිය දහස් ගණන් මරා ගොඩකොට පුවාහ.

එසමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ සුසානයක් සමීපයෙහි සුවාසූදහසක් කවුඩන් පිරිවරා කවුඩන්ට නායක රජව ඉන්නාහ. කවුඩු රජ්ජුරුවෝ කවුඩන්ට වූ විපත්තිය කවුඩකු අතින් අසා "මාගේ බන්ධූන්ට වූ ආපදය මාම ගොසින් ගළවතොත් විනා අනික් කෙනෙකුන්ට බැරිය"යි සිතා දශපාරමිතාව පෙරදැරිකොට සියලු සත්ත්වයන් කෙරේ මෛත්‍රී පතුරුවා "මා විසින් මාගේ බන්ධූන් වු කවුඩු සමූහයා ගලවන නියායෙන් මැ යන්නේය, ඒ ගැළවීම සත්‍යය නම් මට කිසි අන්තරාවක් නොවේව"යි කියා අධිෂ්ඨානකොට පවනට බඳු වූ වේගයෙන් අවුත් ඇරලා තිබූ කවුළු දෙරින් රජගෙට වැද රජ්ජුරුවන්ගේ සිංහාසනයට වන්හ.

එවිට එතන සිටි මිනිසුන්ගෙන් එකෙක් කවුඩා අල්ලන්ට ලගට ආයේය. එවිට රජ්ජුරුවන්ට කියන්නාහු "රජ්ජුරුවෙනි, පරීක්ෂා කරවිනා කීවන්ගේ බසට මෙසේ අනර්ථයක් කෙරෙද්දැ?"යි කීහ. "රජ්ජුරුවන් විසින් නම් පරීක්ෂාකාරීව

මිසක් වෛරයෙන් කී කී බස් පස්සේ ගොසින් මෙසේ කෙරෙද්දැ''යි අවවාද කීහ.

එවිට රජ්ජුරුවෝ සතුටුව සතපාක සහශ්‍රපාක තෙලින් දෙපිය එව මැඩ තමන්ට ඉදිකළ අන්නපාන ආදී දෙය බඩ පුරා කවා රන්බිස්සක් පිට ඉඳුවා "කවුඩන්ට තෙල් නැත්තේ කුමක් හෙයින්දැ?''යි විචාළහ.

එවිට රජගෙය මුළුල්ලේ එකනාදකොට මිණියක නාදයක් සේ මිහිරි කටහඬින් කියන්නාහු "දේවයෙනි, කවුඩෝ යටත් පිරිසෙයින් කුඩා කොල්ලකුත් පමණ මනුෂ්‍යයෙකුත් දකිනා කලත් මහා භය චකිත ඇත්තාහ. එසේ හෙයින් උන්ගේ ලෙහි දැන්වත්, ගියදවසත්, අනාගතයෙහිවත් ඇඟ තෙල් නැත්තේමය''යි කියා බමුණා විසින් කවුඩන් නසන නිසා කියයි කියා මිහිරි කටහඬින් කියත් කියත් රජ්ජුරුවන්ගේ ළය මොලොක්ව කියන්නාහු "මාගේ රාජ්‍යයෙන් තොපට පූජා කෙරෙමි, රාජ්‍යය පිළිගනුව''යි කියන්නා "ඉන් මට ප්‍රයෝජන කිම්ද? මාගේ බන්ධූන් ගැලවෙන්නා පමණය''යි කීහ.

රජ්ජුරුවෝ සතුටුව සියලු ප්‍රාණීන්ටම අභය දී "කවුඩන් මරන්ට එපාය''යි කියා එතැන් පටන් සාල් අමුණක බත් පිසවා, ඊට නිසි මාළු ආදී වූ දෙය ඇතිව දවස්පතා කාවනුවේ බත් ලන්නාහ. බෝධිසත්ත්වයෝ දවස්පතා තමන් මේ නිමවන බත් ලබන්නාහ. මේ නියායෙන් දවස් ඇර කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදාරා "එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය, කවුඩන්ට රජව

උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්මය''යි වදාරා 'කාක ජාතකය' නිමවා වදාළසේක.

# 140. ඊතීය ගොධ ජාතකය

තවද සර්‍වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි නොකීකරු භික්ෂු කෙනෙකුන් වහන්සේ නිසා මේ ජාතකය දක්වන ලදි. මෙහි වර්තමාන කථාව 'මහිලාමුඛ' ජාතකයෙහි විස්තර වශයෙන් පෙනෙන්නේය.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ ගෝධ යෝනියක ඉපිද ගොයින් දහස්ගණන් පිරිවරා මහත් වූ තුඹසක වාසය කරන්නාහ.

එසමයෙහි බෝධිසත්ත්වයන්ගේ ගෝ පැටියෙක් කටුස්සකු හා විශ්වාසව ගෙන වසන්නේය. එසමයෙහි බොහෝ ගොයි එපවත් ගොසින් බෝධිසත්ත්වයන්ට කීහ. බෝධිසත්ත්වයෝ තමන්ගේ ගෝ පැටවා ගෙන්වාගෙන "අද පටන් තෝ නීච වූ ජාති ඇති කටුස්සා හා විශ්වාසය නිසා මතු ගෝ රැසට අනර්ථ වෙයි'' තමන්ගේ ස්ථානෝචිත ප්‍රඥාවෙන් දැන කීවාහ. එසේ කීවත් ඒ ගෝධ පැටවා කීවා නොකොට කටුස්සාගේ ඇඟ වැතිර කෙළිනේය.

මේ නියායෙන් කල් යත් යත් ගොයා ඉතා මහත් විය. ඒ මහත් වූ කය ඇරගෙනත් කටුස්සා ඇඟ වැතිර කෙළිනේය. මේ නියායෙන් ඒ වේලාවට කටුසු තමා කය කුඩා හෙයින්

මහත් වූ ශරීර ඇඟ වැතිර ගන්නා මහත් පර්වතයක් ඇඟ වතුරුවා ලූවාසේ තමාට දැනෙන විසින් ගොයින් කෙරේ වෛර බැන්දේය.

ගෝධ රජ්ජුරුවෝත් "කටුස්සා නිසා යම් දවසෙක භය පැමිණෝ"යි නියම දැන ඒ නියාවට සොර උමගක් කැණ තිබුවාහ. ඒ අවදියට නොකල් වැස්සෙක් වට බොහෝ මෙරු පැන නැංගාහ. ඒ දැක එක් වැද්දෙක් "මෙරු කන්ට ගොයින් බස්නා කලැ"යි සිතා ගොයින් මරණ්නට බැද්දට ගියේය. ඔහු බැද්දේ ඇවිදිනා කලට ගොයින් කෙරේ වෛර බැඳි කටුසු ඒ කියන වැද්දහු දැක "කුමක් නිසා බැද්දේ ඇවිදිදැ?"යි විචාරා "ගොයින් සොයා ඇවිදිමි" කී විසින් "ගොයින් සොයා තා දුක් ගන්ට එපයි, පිදුරු හා ගිනි ගෙන ගොසින් මම වේද පාමි" කියන්නා ඒ නියාවට වැදි ගොසින් පිදුරු හා ගිනි ගෙනාය.

එවිට කටුසු කියන්නේ "මේ කියන තුඹස් කටැයි, පිදුරු ගන්වාලා ගිනි ඇන පියව, එවිට දුම් කැලැ ගොයින් තුමූම පිටත් වන්නාහ, පිටත් වූ වේලාවට තොප අත තුබූ පොල්ල බලාවත්, බල්ලන් පැලවාත් කැමති ගොයි මරා ගනුව"යි කීය. එසේම වැදි කෙළේය.

බෝධිසත්ත්වයෝ "මෙතෙක් අපේ බන්ධූන්ට භය වූයේ අසත්පුරුෂ වූ කටුස්සා නිසාය"යි සිතා සාරා තුබූ සොර උමගින් පලා ගියාහයි වදරා "එසමයෙහි කටුස්සා නම් දේවදත්ත ස්ථවිරයෝය. නොකීකරු ගෝ පැටියා නම්

නොකීකරු භික්ෂූහුය. එසමයෙහි ගෝ රජව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැ''යි වදාරා 'ගොධ ජාතකය' නිමවා වදාළසේක.

# 141. රිතීය සිගාල ජාතකය

තවද සර්වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් දවසක් මහළු තෙරුන් වහන්සේ දම්සභා මණ්ඩපයට රැස්ව දේවදත්ත ස්ථවිරයෝ "සර්වඥයන් වහන්සේ නසන්ට නාලාගිරියා මෙහෙයා ගිජ්ඣකූට පර්වතයෙහි සිට ගල් පෙරලා විදින්ට දුනුවායන් යවාත් නසන්ට නොයෙක් ප්‍රයෝගකොටත් නසාගත නුහුනුවෝ වේදැ''යි කිය කියා උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?''යි විචාරා වදාළ කල්හි එපවත් අසා "දැන්මතු නොවෙයි මහණෙනි, පෙරත් දේවදත්ත ස්ථවිරයෝ මා නසන්ට සිතා නසාගත නුහුනුවෝ වේදැ''යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ කැණහිල් යෝනියෙහි ඉපිද දහස් ගණන් කැණහිලුන් පිරිවරා අමු සොහොනක වාසය කරන්නාහ.

එසමයෙහි බරණැස් නුවර උත්සව කෙළියක් නිසා රා මස් ඒ ඒ තැන බොහෝකොට තිබා දවළුත් කෙළ රැ වූ දවස

පසළොස් පැයකුත් කෙළි විසින් මස් නිමා ගොසින් රා පමණක් තිබුයේය. එවිට එක් පුරුෂයෙක් "රා මස් දෙව"යි කීය. එවිට බොහෝ මනුෂ්‍යයෝ "මස් නැතැ"යි කීහ. එවිට එක්තරා මිනිහෙක් කියන්නේ "මා ඉන්දදී මස් අමාරුදැ"යි කියා පොල්ලක් ඇරගෙන වාසල් අගුළු ලූ විසින් දිය යන සොරොව්ව අස්සෙන් පිටත්ව සොහොන් පලකට ගොස් උඩුබැල්ලෙන් මළමිනියක් සේ වැදහොත්තේය.

ඒ වේලාවට බෝධිසත්ත්වයෝ මිනී කන්ට ගොස් මිනිසා වැදහොත් නියාව දැක "මේ තෙමේ නොමළ එකෙකැ"යි සිතා "එසේ වූවත් පරීක්ෂා කරන්ට උවමැනවැ"යි යටි සුළඟට ගොස් ඉව කොට නොමළ නියාව දැන "මූ රවටා පලායන්ට උවමැනවැ"යි සිතා ලඟට අවුත් පොල්ල ඩෑ ලඟට ඇද්දහ. මිනිසත් පොල්ල ලඟට ඇද්දේය. එවිට කැණහිල් ඈත ගොසින් කියන්නේ "වැදහොත් පමණකින් මළ නොමළ නියාව දැනගත නොහැක්ක. නමුත් පොල්ල ඩෑ ලඟට ඇද්දහාම නොමළ නියාව දැන කුමන නින්දක්දැ"යි කීවාහ.

එවිට ඒ පුරුෂයා නැගීසිට පොල්ල බලා ගසා නොවැදහොත් බැවින් "තෝ මා විසින් ගැලවී ගියාවේදැ?"යි කියා කැණහිල් කියන්නේ "තා අතින් මම ගැලවී ගියෙමි. තොප සතර අපායෙහි නොගැළවනෝදැ"යි කීහ.

එවිට ඒ පුරුෂයා කරබාගෙන තමා ආ ලෙස ඇතුළු නුවරට අවුත් අගලින් ඉස්සෝදා නහා තමාගේ ගෙටම ගියේයයි වදාරා "එසමයෙහි කැණහිළුව මරන්ට ගිය පුරුෂයා

නම් දේවදත්ත ස්ථවිරයෝය, එසමයෙහි කැණහිලුන්ට රජව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම ය''යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 142. විරොචන ජාතකය

තවද එක් සමයෙක්හි සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන් විසින් බුදුන් අතින් "සියලු භික්‍ෂූන් වහන්සේ පාංශුකූල චීවර පොරවනා නියායෙන් සොසානිකාඞගය පුරන ලෙසද, වෘක්‍ෂ මූලයෙහි හිඳ භාවනා කරන ලෙසද, මච්ඡමාංස නොකන ලෙසද, වල වාසයෙහි විනා ගම් වාසයේ සඞඝයා වහන්සේ නොවසන ලෙසද කියා මේ ප්‍රශ්නයද බුදුන් අතින් ඉල්වා බුදුහු "මාගේ ශාසනයෙහි සුඛිත මුදිතයෝ බොහෝ දෙන මහණ වෙති. එසේ හෙයින් කී දෙය පිළිවන් කෙනෙක් පුරති, බැරි කෙනෙක් නුපුරති. මා විසින් එසේ එක සී පුරන්ට උවමැනවැයි ආපාතති නොපණවමි'' වදාරන්නා ඊට දේවදත්ත ස්ථවිරයෝ "බුදුහු මා කීවා නොකළසේකැ''යි කිපී සැරියුත් සාමීන්ගේ ගණයෙන් අලුත සිවුරු පෙර වූ විනය නොදන්නා භික්‍ෂූන් පන්සියයක් ඇරගෙන "බුදුන්ගෙන් ලබනලද උපසම්පදා සෘඬි ආදී වූ දෙය ඇතිව තිබියදීත් බුදුන් කෙරෙන් තණ අගක් ගලා ඇරගන්නා විචරක් මා ඔවුන් ප්‍රයෝජනයක් නැතැ''යි කියා එක සී මසින් මස පොහො දෙකක් කොට සඞඝ භේද කරවාගෙන ගයා නම් ගඟඉස පන්සලක "මමත් බුදුය''යි කියා බුඩකෘත්‍යය කරමින් දවස් අරණසේක.

එසමයෙහි සර්‍වඥයන් වහන්සේ එක් දවසක් දේවදත්ත ස්ථවිරයන් වහන්සේගේ භික්‍ෂූන් පන්සියක් දෙනාට අධිගමය හේතු නියා දැන සැරියුත් මුගලන් දැගසව්වන් ලඟට කැඳවා "තෙපි දෙන්න දේවදත්ත ස්ථවිරයන් සමීපයට ගොස් උන්ගේ පරිවාර භික්‍ෂූන් පන්සියයක් දෙනාට බණ කියා කැඳවාගෙන එව"යි වදාළසේක.

එපවත් අසා දැගසව්වන් වහන්සේ දේවදත්ත ස්ථවිරයන්ගේ ගණයට වැඩිසේක. දේවදත්ත ස්ථවිරයෝත් දැගසව්වන් වහන්සේ දැක "තමන් කරා පලා ආහ"යි සිතා ඒ වේලාවට තමන් බණ කිය කියා උන් විසින් බුදුරජාණන් වහන්සේ වදාරන ලෙස දේවදත්ත ස්ථවිරයන් වහන්සේ වදාරනසේක් "ශාරිපුත්‍ර ස්ථවිරයෙනි, මාගේ වසට රිදෙයි. තෙපි බණ කියව"යි කියා තමන්වහන්සේ බණ අස්න ගාවා බිම සැතපුනුසේක. ඒ වේලාවට සැරියුත් සාමි බණ කියා පන්සියක් දෙනාම රහත් කොටගෙන වේළුවනාරාමයට වැඩිසේක.

එවිට කෝකාලික ස්ථවිරයෝ දේවදත්තයන්ගේ ගණයට අවුත් ගණය සූන්‍යව තිබුනු නියාව දැක දේවදත්ත ස්ථවිරයන්ට කියන්නාහු "තොපගේ වහන්දෑ එකසීම දෑගසව්වන් ඇරගෙන යා දී කුමන මරනිදි නිදන්නේය"යි කියා විලුඹ බලා යකුලකින් ගැසූවාසේ විලුඹෙන් ළමැද්දට ඇන ලේ තුන්කටක් නන්වාපීය. සැරියුත් සාමිත් රහතුන් පන්සියයක් ඇරගෙන බුදුන් දුටුසේක.

එවිට සර්‍වඥයන් වහන්සේ “ශාරිපුත්‍ර ස්ථවිරයෙනි, දේවදත්ත ස්ථවිරයෝ තොප යන කලට කෙසේ උනුදැ?”යි විචාරා වදාරන්නා සැරියුත් සාමි කියනසේක් “ස්වාමීනි, දේවදත්ත ස්ථවිරයෝ සර්‍වඥයන් වහන්සේගේ විලාසයෙන් උන්නේය”යි වදාරා කෝකාලික ස්ථවිරන් කළදෑත් දැන් වූසේක. එපවත් සර්‍වඥයන් වහන්සේ අසා වදාරා “ශාරිපුත්‍ර ස්ථවිරයෙනි, දැන්මතු නොවෙයි, පළමුත් දේවදත්ත ස්ථවිරයෝ මා සේ ක්‍රියා කරන්ට වැද බොහෝ විනාශයට පැමිණියෝ වේදැ”යි වදාරා ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ සිව්පාවුන්ට උතුම් වූ කේසර සිංහව ඉපිද පර්‍වතයක් මුදුනේ ස්වර්‍ණමය ගල්ගුහාවක වාසය කරනසේක.

එසමයෙහි එක් දවසක් කේසර සිංහරාජතෙම පර්‍වතයෙන් පැන මීමෙකු අල්වාගෙන මාංස අනුභවකොට වැවට ගොසින් පැන් බී පෙරලා පර්‍වතයට එන ප්‍රස්ථාවට එක් කැණහිලෙක් සිංහයාට ලන්ව ගිය හෙයින් තමා ගැලවී යන උපායක් නැති හෙයින් සිංහයාගේ පය වැඳලා සිටියේය. එවිට සිංහයා කියන්නේ “ඇයි ජම්බුකය, කුමකට සිටියේදැ?”යි විචාරා “නුඹවහන්සේට සේවාකම් කරන්ට සිටියෙමි” කී විසින් බෝධිසත්ත්වයෝත් ඒ කැණහිලා කැන්දාගෙන පර්‍වතයට නැගී

උන් ඉන්ට එක් තැනක් සලස්වා "තොප විසින් පර්‍වත මුදුනේ සිට සිව්පාවුන් බලා මා කරා අවුත් අසවල් සිව්පාවා ඇල්ලුව මැනවැ"යි කියාද පැලඹී වදාළ මැනවැ"යි කියන්නා "තොපට කැමති මාංස මරා තොපටත් ලා මමත් කා ජීවත්වෙමිහ"යි කීසේක.

එතැන් පටන් කැණහිල් එලෙසම පෑ මස් ගෙන තෙමේත් කා කැණහිලාටත් ලන්නේය. මේ නියායෙන් සිංහයා මරාලූ මස් කන හෙයින් දවසින් දවස ඇඟ පුෂ්ටිමත්ව මහත් වූ හෙයින් උද්ධතව සිතන්නේ "සිංහයෝත් සිව්පාගතයෝය, මමත් සිව්පාගතයෙමි, එසේ විසින් එකෙකු මරාලන මස් කන්නේ කිම්ද? මට මස් මම්ම මරා ගණිමි"යි සිතා සිංහය කරා ගොසින් කියන්නේ "නුඹවහන්සේ මරාලන මස් මම මෙතෙක් ද කෑමි, ඉනිබ්බේ මරාලන මස් නුඹවහන්සේම කැව මැනව"යි කියන්නා සිංහයා කියන්නේ "හසතිවිදුරණායට අපට විනා තොපට බැරිය"යි කීප වාරයක කියද්දීත් උවමැනවැයි සිතත් මෙපමණක් ඇතිවන්නාහ. "හසතිවිදුරණාය මට පිළිවනැ"යි කියන්නා "යහපතැයි එසේ වීනම් අද රෑට නුඹවහන්සේ වැදහෝනා ස්ථානයෙහිම වැදහෝනට උවමැනව උදෑසනක්සේම මා නික්මෙන වේලාවට පැළඹ කැණහිලාය"යි කියන්න උවමැනව මෙපමණක් ඇතිවන්නා "හස්තිවිදුරණාය මට පිළිවනැ"යි කියන්නා "යහපතැ"යි එලෙස සිංහයා කෙළේය.

කැණහිල් රන් ගල්ගුහාවෙන් නික්ම පර්‍වත මුදුනට නැගී ඇඟ තුන් ඇවරක් කිළිපොළා තුන් විටෙක කැණහිල් අඬ

අඬා සතරදිසා බලා මහත් වූ ඇතු දැක ඇතු පිටට පැනපීය. ඇතු පිටට පිණු ගමනේ කැණහිල් ඇතු පාමුල වැටී ඇතු විසින් පයින් මැඩ සුනුවිසුන්කොට පෙරලා සුනුකළ ඇට එක්තැන්කොට ඊපිට වර්චස්කොට හා මූත්‍රකොට කුඤ්චනාදද කොට ගියේය.

ඒ දුටු සිංහයා "කැණහිලා පැලඹුනු නියාව සොඳය ඉස ළය තළාගත් දෙයත් සොඳසැටිය, පැලඹුනු නියාවත් ඔබීමය"යි කියා ගල්ගුහාවටම ගියෝයයි වදාරා "එසමයෙහි සිංහයා කරන ක්‍රියාවම කෙරෙමියි කියා ළය තලාගත් කැණහිලා නම් බුදුන් කරන ක්‍රියා කෙරෙම් ළය තළාගත් දේවදත්ත ස්ථවිරයෝය, එසමයෙහි කේසර සිංහව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාරා 'විරොචන ජාතකය' නිමවා වදාළසේක.

## 143. නංගුට්ඨ ජාතකය

තවද සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ජේතවනාරාමය පිටිපස්සේ නිගණ්ඨ තාපසයෝ මොත්තමෙක් හිඳ "තපස් කරන්ට දුක් දී කළමැනව"යි කියා සමහරු එක්පයක් බිම ඔසවාගෙන අනික් පය ඇඟිලි අගින් සිට මෙසේ වූ තපස් කරන්නා සමහරු ඉර මුදුන් වේලේ සතරකොණ ගිනිමැල සතරක් බැඳ ඊ මද්ධ්‍යයේ පඤ්චතාප නම් ව්‍රතයක් කරන්නාහ.

බොහෝ මහළුවරුන් වහන්සේ බුදුන් කරා අවුත් "ස්වාමීනි, නිගණ්ඨයන් විසින් මෙසේ ව්‍රතයක් කරන්නාහ. ඒ නිසා උන්ට ඉදිරියේ පැමිණෙන ලාභ ඇද්දැ?"යි විචාරා සර්‍වඥයන් වහන්සේ විසින් "මහණෙනි, ඉන් කුමන ලාභයද? පළමු උත්තමයෝ පවා මෙයින් යහපත් දෙයෙකැයි සිතා ජාතාග්නි ඇරගෙන වලට(වනයට) ගොස් ගිනිදෙවියාට පූජාකොට ඉන් පැමිණෙන්නා වූ ලාභයක් නැති හෙයින් පෙරලා ඒ ගිනි නිව කිසුණු(කසින) පිරියම් භාවනාකොට බඹලොව ගියෝ වේදැ"යි වදාරා ඒ කෙසේදැ?යි යතහොත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ ප්‍රසිද්ධ වූ බ්‍රාහ්මණ කුලයක උපන්හ. එදවස් පටන් දෙමව්පියන් විසින් ගිනි නොනිවා තිබා දෙළොස් ඇවිරිදි වයස් පැමිණි අවස්ථාවේ දෙමවුපියෝ කියන්නාහු "පුත තොපි උපන් දවස් පටන් ජාතාග්නිය තබාගෙන උනුම්හයි, ඒ අග්නිය ඇරගෙන වලට ගොස් ගිනිදෙවියාට පූජාකොට බඹලොව යව් නම් එසේවන, එසේ නැත්නම් කුටුම්බසණ්ඨාපනය කොට ගිහිගෙයි වාසය කරව"යි කියා කීහ.

එපවත් බෝධිසත්ත්වයෝ අසා "ගිහි ගෙයින් මට ප්‍රයෝජන කිම්ද?" ජාතාග්නිය ඇරගෙන වලට ගොස් ගිනිදෙවියාට පූජා කරන්නාහ.

එසමයෙහි එක් දවසක් පිටිසර ගමකට සිඟා ගියකල ගෝ දනයෙන් ගොනෙකු ලැබ "ඒ ගෝන ඇරගෙන අවුත්

ගිනිදෙවියාට පුදමි" සිතා ඒ කියන ගෝනා අත්තේ බැඳ ලුනු ඇඹුල් සොයා යාමට ගියාහ. ඒ යා දී වල් වැද්දෝ ගෝන මරාගෙන ගෝ කකුල් සතර හා සම හා වල්ගය එතනට දමා සෙසු මස් කන්නක් කා ඉතිරි දෙය ඇරගෙන ගියාහ.

බෝධිසත්ත්වයෝත් ලුනු ඇඹුල් ඇරගෙන එතනට අවුත් සම හා කකුල් හා වල්ගය තිබුවා දැක "තමා කන්ට තුබූ දෙය රැකගත නුහුනු දේවතාවා රැක්කේ කුමක්දැ"යි සිතා එකී ගොනාගේ කකුල් හා සම හා වල්ගය ගින්නට දමමින් සිට කියන්නාහු "තොපසේ වූ අසත්පුරුෂයන්ට මෙපමණක් මහාදෙයකැයි සිතාද, සී සී බලව, තොප නිසා මටවත් ලාභයෙක් නැතෙ"යි කියා පැන් වක්කොට ගිනි නිවා ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව කිසුණු පිරියම් භාවනාකොට පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවාගෙන නොපිරිහුනු ධ්‍යානයෙන් බඹලොව ගියාහයි වදාරා "එසමයෙහි තාපසව උපන්නෙමි ලොවුතුරා බුදුවූ මම්ම ය"යි වදාරා 'නංගුට්ඨ ජාතකය' නිමවා වදාළසේක.

# 144. රාධ ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පුරාණ දූතිකාවක් කෙරෙහි ලෝභ කළා වූ භික්ෂු කෙනෙකුන් වහන්සේ නිසා මේ ජාතකය දක්වන ලදි. මෙහි වර්තමාන කථාව මතු කියනලද 'ඉන්ද්‍රිය' ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය. මෙහි උකටලී වූ භික්ෂූන් වහන්සේ පෑ ගමනේ සර්වඥයන් වහන්සේ විසින් "පළමුත් තොපි මුන්ගේ

අනාචාර වලකාගත නුහුනු කල දැන්නම් පිළිවන්දැ?යි තමාගේ ඉචඡාවේ ලාගත නොහෙන ස්ත්‍රීන්ට තා උකටලීවනු කරණා නොවෙ''යි කියා ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්ත්‍වයෝ ගිරා යෝනියෙක උපන්නාහුය.

එසමයෙහි එක්තරා බමුණෙක් බෝධිසත්ත්‍වයන්ගේ මල් වූ ගිරා පැටියෙකුත් බෝධිසත්ත්‍වයනුත් වඩාගෙන ගමට අවුත් බෝධිසත්ත්‍වයන් වහන්සේට ''පොටඨපාදය''යි කියාත් මළණුවන්ට ''රාධය''යි කියාත් නම් තබා දරුකොට වඩන්නාහ.

එසමයෙහි බමුණා වෙළඳමක් නිසා ඔබ්බට යන්නේ තමාගේ ගිරා දරුවන් දෙන්නා ලඟ ඉඳුවා කියන්නාහු ''තොප මව් බැමිණිය විසින් නොකටයුත්තක් කරතොත් තොපි අවවාද කරව''යි කියන්නා ''අවවාද කියා නවත්වනු හැක්කේ වීනම් කියමි, බැරියේ වීනම් බැන නොනැග ඉඳිමි'' කියා කීහ.

බමුණාත් තමා යන වෙළඳමට ගියේය. එවක් පටන් බැමිණියගේ ගෙට එන්නන් යන්නන්ගේ අවසරයක් නැති විය. එවිට බෝධිසත්ත්‍වයන්ගේ මළණුවෝ බෝධිසත්ත්‍වයන් ලගට අවුත් කියන්නාහු ''පියාණන් වහන්සේ යන ගමනේ අවවාද කියන්නට වේදැයි කියාලා ගියේය. අවවාද කියා බලම්හ''යි

කියන්නා එවිට බෝධිසත්ත්වයෝ කියන්නෝ "මලණ්ඩ, තොපි බාල විසින් නොදැන කියන බස්ට, දස පැයට මේ ගෙට වන්නා වූ ගණන් නැත. අනික් විසි පැයේ ගෙට වදනවුත් ගණන් නොදැනෙයි. එසේ වූ ස්ථානයෙහි කුමන අවවාද කියන්නේද? බැණ නොනැගී ඉඳුව"යි මළණුවන්ට අවවාද කියා උන්නාහ. එසේ සිටි නොබෝ දවසකින් බමුණු ආයේය.

බමුණු ඇවිත් බෝධිසත්ත්වයන් අතින් "බැමිණිගේ දුරාචාර කුමක්දැ?"යි විචාරන්නා ගිරවාණෝ කියන්නා "දුරාචාර අප්‍රමාණය, මෙසේ වූ දුරාචාර කරන්නේ නුඹවහන්සේ කෙරේ අභිප්‍රාව නැත්තෙන් නොවේද? එසේ වූ තැනැත්තිය ගෙයි තිබාගෙන ඉන්නේ කිම්දැ?"යි කියා නැවත කියන්නාහු "මේ දෝෂය කී වේලේ පටන් අප මෙතන ඉඳීම කාරණා නොවේ"යි සිතා මළණුවනුත් ඇරගෙන පිය බ්‍රාහ්මණයාගේ දෙපතුල් වැඳ ආකාශයට වැද වනයට ගියෝයයි වදාරා "එසමයෙහි බැමිණී නම් පුරාණ දුතිකාය, බමුණා නම් මේ කියන භික්ෂුය, රාධ ගිරවාණෝ නම් ආනන්ද ස්ථවිරයෝය, පොට්ඨපාද ගිරවාණෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම ය"යි වදාරා 'රාධ ජාතකය' නිමවා වදාළසේක.

# 145. කාක ජාතකය

තවද එක් සමයෙක්හි සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි මහළු උපසකවරු මොත්තමක්ව පින්කොට ඇවිදිනාහු. එක් දවසක් සමඟව හිඳ සිතන්නාහු "මහළුව ගිහිගෙහි සිටිනා බලාත් තපස්කොට

මහණව රහත්ව කෙළෙසුන් නසාපුවොත් යහපතැ''යි සිතා බුදුන් කරා අවුත් ''ස්වාමීනි, මහණ කරවා වදාරන්නේ යහපතැ''යි කියා මහණ කරවා මහණ වූ ගමනෙත් ජේතවනාරාමයෙහි කෙළවර එක් තැනක පන්සල් ඉදිකොටගෙන වාසය කරන්නාහ.

මහළුව මහණ වූ විසින් අකුරක් කොටගතත් නොහෙනසේක. බුදුන් වදාළ බණ භාවනා කොටත් රහත්ව ගත නොහෙනසේක. වීථියේ සිඟා වඩනා කලත් තමන්වහන්සේ අඹුදරුවන්ගේ ගෙටම සිඟා වඩනාසේක. මෙසේ ඉන්නා අවදියට ඒ උපාසිකාවෝ එක්තරා ව්‍යාධියකින් නැසී ගියහ. එපවත් ඒ මහළුවරුන් වහන්සේත් අසා ''හස්ත කර්මාන්තයෙහි සපන් ස්ත්‍රී නැසී ගියාහ''යි උනුන් කරා අත්වැල බැඳ අඬන්ට වන්නාහ.

එපවත් සංඝයා වහන්සේ අසා එතනට අවුත් අඬන කාරණා විචාරා ''යහපත් කොට බත් මාළු පිසන ස්ත්‍රිය මළ හෙයින් අඬම්හ''යි කී විසින් එපවත් ඇසූ මහළුවරුන් වහන්සේ දම්සභා මණ්ඩපයෙහි රැස්ව හිඳ මේ කථාව කිය කියා උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩවදාරා ''මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථවකින් යුක්තව උනුදැ?''යි වදාරා එපවත් අසා ''පළමුත් මූ අඹුවන් මළ ගමනේ අඬා මහ මුහුද පැන් ඉසීන්ට බැරි හෙයින් අඬා මියන්ට වන් ගමනේ උත්තමයන්ගේ සහයෙන් ගැළවුනේ වේදැ''යි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ සමුද්‍රයෙහි දේවතාව ඉපද වාසය කරනසේක. එසමයෙහි බොහෝ මනුෂ්‍යයෝ රැස්ව සමුද්‍රයේ වසන දේවතාවන්ට හා නයින්ට බලි පිණිස බොහෝ රා මස් බත් මුදුවැල්ලේ තිබුවාහ. ඒ අවස්ථාවෙහි කැවිඩියක් හා කපුටුවෙක් වැල්ලේ ඇවිදිනාහු ඒ බත් හා රා මස් කා රා මතින් මත්ව "මුහුද නාම්හ"යි කියා රළ ගසන සමීපයෙහි නාමින් සිටිකල මහත් වූ රළ ඇවිත් කැවිඩිය රළෙන් අරගෙන ගිය කලට වහා මත්සයයෙක් කාපිය. ඒ දැක කපුටුවා තමාගේ බිරින්ද රැළින් අරගෙන ගිය හෙයින් ඇඬීය. ඒ අඬ අසා එතනට රැස් වූ කපුටුවෝ "දුක්මුසුව කිම්දැ?"යි විචාරා "තොප ඇමගේ යෙහෙළිය මහ මුහුද ඇරගෙණ ගියේය"යි කී කලට බොහෝ කපුටුවෝ ඒ අසා විකෙෂපව "අප මෙතෙක් දෙනා එක් වූ කළ මහමුහුද පැන් ඉසපිය නොහැක්කදැ?"යි සිතා මහ මුහුද පැන් කටින් උක උකාකොට දමන්ට වන්නාහ. මේ නියායෙන් බොහෝ වේලාවක් උත්සාහකොට සැතපී ඉන්නාහු යම්තම් අඩුවකුත් නුදුටු හෙයිනුත් ලුණුදිය කටින් හයන විසින් උගුර වියලින.

හුඹුක්ක පුප්පා පැන් ගෙනෙන හෙයින් හනුවත් ඉගිලින. බොහෝ විට පැන් ගැළෙන හෙයින් දෑසුත් රතුව බොහෝ ආයාසයට පැමිණ "පැන් ඇදීම් තිබා රැකීය"යි කියා

අඬන්නාහු "ගිරා කටක් සේ කටක් ඇති මොණර පිටක් සේ පෑය ඇති පුරවි කෙවිල්ලක හඬ බඳු කටහඬ ඇති අපගේ යෙහෙළිවන කැවිඩි ධේනුව සොරහු මුහුදු ඇරගෙන ගියේ වේදැ"යි කිය කියා එක රාවයෙන් බොහෝ කපුටුවෝ අඬන්ට වන්නාහ. එවිට බෝධිසත්ත්වයෝ එපවත් දැන භයන්කාර වේෂයක් පෑ උන්ගේ සෝක නිවිහයි වදරා "එසමයෙහි කැවිඩි නම් මෙසමයෙහි යහපත් මාළු පිසූ උපාසිකාය. ඒ ඇඬූ කපුටුවෝ මොත්තම නම් මේ මහළු භික්ෂු මොත්තමය, උන් ඇමට භය ගන්වා සෝක සන්සිඳ වූ සමුද්‍ර දේවතාවා නම් ලොව්තුරා බුදුවූ මම්ම ය"යි වදරා 'කාක ජාතකය' නිමවා වදාළසේක.

# 146. ථිතීය පුෂ්පරත්න ජාතකය

තවද සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි උකටලී වූ වහන්දෑ නමක් දැක වදරා "මහණ, කුමක් නිසා උකටලීදැ?"යි විචාරා "පිසමින් ආදියෙහි දක්‍ෂ වූ මාගේ පුරාණ දුතිකාව නිසා උකටලී වීමි"යි කීය. "පළමුත් මහණ ඈ නිසා උල ඉඳුවා අවීචි මහනරකයට ගියෝවේදැ"යි වදරා ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ ආකාශස්ථ ද්‍රේවතාව උපන්සේක.

එසමයෙහි කාර්තික උත්සව දවසෙක දුක්ඛිත පුරුෂයෙක් තමාගේ ඇති රෙදි කඩරොළු දෙකක් යහපත්කොට අපුල්ලා සියයක් දෙසියයක් විවරපට බැඳ, ගෙයි තබා උත්සව දවස් අඹුවන් විසින් ළගට අවුත් "වනුක්මලෙහි පැය ඇති කඩක් ඇඳගෙන තොප හා මා හා සිපගෙන වීථියේ කෙළින්ට උවමැනවැ"යි කීහ. එවිට පුරුෂයා කියන්නේ "මා දුක්ඛිත වුව, මට වනුක්මලේ පැය ඇති පිළි කොයින්දැයි, මාගේ අපුල්ලා තිබූ සුදුකඩ ඇත. ඒ ඉනකඩ ඇඳගෙන කෙළුව"යි කීහ. එසේ කීවත් ඕතොමෝ කියන්නී "වනුක්මලේ පැය ඇති ඉන කඩක් ලදෙත් විනා මා කෙළිනා කෙළි නැත, සුදුකඩ ඇඳගෙන කෙළින්ට අභිප්‍රාය ඇත්නම් අනික් බිරින්දක් ඇරගෙන කෙළව"යි කීහ.

එපවත් පුරුෂයා අසා නැවත යාච්ඤාකොටත් ස්ත්‍රිය විසින් කියන්නී "පිරිමින් විසින් සිතූ කල කුමක් බැරිද? රජ්ජුරුවන්ගේ වනුක්මල් වත්තට ගොසින් මල් කඩාගෙන එව"යි කියන්නා ඊට පුරුෂයා කියන්නේ "රජ්ජුරුවන්ගේ වනුක්මල් වත්තට ගොසින් මල් කඩාගෙන එන්නා තිබා කර ඔසවා බලන්ටත් මට බැරිය"යි කියන්නා "රාත්‍රියෙහි ගොසින් කරන සොරකම් බැරිදැ?"යි කියා තත්පර විසින් ස්ත්‍රියගේ

අභිප්‍රාය මැඩගත නොහෙන පුරුෂයා විසින් “යහපතැ”යි ගිව්ස නුවරින් පිටත ගොස් වැට පැන වත්තට වන්නාහ.

වත්ත බලන මනුෂ්‍යයෝ ඔහු වැට පැනි නියාව අසා ගොස් “සොරෙක් වනැ”යි යුහුව එතනට ගොස් ඔහු අල්වා පිටිතලහයා බැඳ රෑ උයනේ රඳවා පාන් වූ ගමනේ රජ්ජුරුවන්ට පෑ කල්හි රජ්ජුරුවෝ “උයනේදී අල්වාගත් කල මට පානේ කිම්දැයි දිවස් උල ඉඳුව”යි කී හෙයින් වද බෙරගස්වා ගෙනගොසින් දිවස් උල ඉඳවූහ. දිවස් උල ඉඳ වූ වේදනාද කඩවුන් විසින් තියුනු මුවහත් ඇති තුඩින් ඇස සාරණ වේදනා හා මේ එකක්කොට නොසිතා “මාගේ සොඳ බිරින්ද වනුක්මලින් රැඳුනු කඩක් ඇඳගෙන කාර්තික උත්සව කෙළියට සිතුවා නුවූයේ වේදැ”යි වික්‍ෂෙපය උපන් අවස්ථාවට ප්‍රාණය නිරුඬව අවීචි මහනරකාදියෙහි උපන්හයි වදරා “එසමයෙහි දෙමහල්ලෝ නම් මෙසමයෙහි දෙමහල්ලෝමය, ඒ කාරණය ප්‍රත්‍යක්‍ෂව දුටු ආකාශස්ථ දේවතාව නම් ලොව්තුරා බුදුවූ මම්ම ය”යි වදරා මේ ‘පුෂ්පරත්න ජාතකය’ නිමවා වදාළසේක.

# 147. තෘතීය සිගාල ජාතකය

තවද සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි අළුත මහණ වූ පන්සියයක් දෙනාවහන්සේ මධ්‍යම රාත්‍රියෙහි කාම රාගයක් ඉපද වූසේක.

ඒ වේලාවේ සර්වඥයන් වහන්සේ "මේ වේලාවට මාගේ භික්ෂූහු කුමන සිතිවිලි සිතත් දේ හෝ"යි මහාකරුණා සමාපත්තියෙන් බලා වදාරණසේක් ඒ පන්සියයක් භික්ෂූන්ට රාග විතර්කයක් උපන් නියාව දැක "චක්‍රවර්ති රජ්ජුරු කෙනෙකුන්ගේ නුවරට සතුරු කෙනෙකුන් වන්නාසේ මා ඉන්නා ජේතවනාරාමයෙහි ඉන්නා වහන්දෑට උපන් විතර්කය මා විසින් බණ කියා රාගචිත්තය දුරුකොට පියන්ට උවමැනවැ"යි සිතා "ආනන්දය"යි වදාළසේක. ආනන්දසාමි බුදුන්ට අත්පා මෙහෙවර කරන පස්විසි අවුරුද්ද මුළුල්ලෙහි බුදුන් කෙරේ මෛත්‍රී රැකවල් පිණිස අහෝ රාත්‍රියෙහි අත්වැට පහන්ගත් අත් ඇතිව ඇවිදිනාසේක.

එසේ හෙයින් බුදුන් අඬගෑ අඬ අසා "ඇයිද? සාමිනි" කියා ලඟට ආසේක. සර්වඥයන් වහන්සේ සිතා වදාරණසේක් "රාගචිත්තය උපන් පන්සියයක් දෙනා වහන්සේ ගෙන්වාගෙන බණ කීම් නම් 'අපට උපන් සිතිවිල්ල සර්වඥයන් වහන්සේට දැනීනැ'යි සිතා භයපත් වන්නාහ. භයපත් වූකල සිතහෙලා බණ නොඅසන්නාහ. සිතහෙලා බණ නොඇසීමෙන් අධිගමයට නොපැමිණෙ"යි සිතා වදාරා "සාමාන්‍යයෙන් ඇමට බණ කියමි" සිතා "ජේතවනාරාමයෙහි වසන භික්ෂූන් එක්කරව"යි කියා වදාළසේක.

එපවත් ඇසූ ආනන්ද ස්වාමීන් වහන්සේ යතුරු කෙසි මුදු ඇරගෙන ගෙයක් ගෙයක් පාසා ගොස් දොර දොර ඇර එපවත් කීසේක. එපවත් ඇසූ මහළුවරුන් වහන්සේ

ජේතවනාරාමයට වැඩිසේක. භික්ෂූන් වහන්සේ රන් පර්වතයක් රත්පලසකින් වසන කලක් පරිද්දෙන් වත්පිළිවෙත් දක්වා වැඩඋන්සේක.

සර්වඥයෝත් නීල පීත ලෝහිත අවදාත මාංජෙෂ්ඨ ප්‍රභාසවර යයි යන සවනක් ඝණ බුදුරැස් ආකාශයෙහි විහිදුවා හිරු දහස් සඳ දහස් නැන්ගාසේ ඒකාලෝකකොට වැඩහිඳ බණ වදාරණසේක්.

"මහණෙනි, භික්ෂූන් විසින් කාම විතර්ක, ව්‍යාපාදවිතර්ක, විහිංසා විතර්ක නොසිතිය යුතුය, ස්ත්‍රීන් විෂයෙන් සිතිවිලි යම්තමක් සිතුවත් බොහෝ අකුසල් පිරෙයි. කාරණා කිම්ද? සර්පයෙක් කඩා කෑ මුඛය යම්තම් වනයක් වුවත් සියළු සර්වාංගයම විෂ මූර්ජාවෙන් නසා පියන්නේය. ගින්නක් යම්තම් උවත් බොහෝ දෙය දවා භෂ්මකොට පියන්නේය. එක සෙනක් ගැසූ තෙනක බොහෝ ගස්කොලන් දවා භෂ්මකොට පියන්නේය. පඤ්චකාමයෙහි සිතිවිල්ලත් එවැන්න. මෙහි ඇල්මක් කිරීම ඇත් මසෙහි ඇල්මකොට කැණහිළාට වූ දුක් වැන්නේය"යි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ සිගාල යෝනියෙහි උපන්සේක. එසමයෙහි එක් ඇත්මිණියක් බෝධිසත්ත්වයෝ දැක "මාගේ දිවි හිමියෙන් කන්ට ඇතැ"යි

සිතා කැණහිල් ගොස් ඇතු සොඬ ඩෑලිය. “නගුපිමන් ඩෑ කලක් මෙන් වූයේය. දල ඩෑලිය හරයක් ඩෑවාසේ තුබුයේය. බඩ ඩෑලිය අටු පලළක් ඩෑවාසේ තුබූයේය. ගුදය ඩෑයේය. තෙල් කැවුමක්සේ තුබූයේය. එසේ තිබෙන්නා වූ තැනින් මොලොක් මසක් ලදිමි සතුටුව කකා බඩට වැද සැපසේ මාංසත් කෑ හැක්ක, පැනට මාරුව ලෙත් පියහැක්ක, අක්මා පපු ඉසට ලාගෙන ඇත් සමපිට වැද හෝනටත් හැකිය. එසේ හෙයින් ඔබ්බට ගොසින් ජීවත් වීමෙන් ප්‍රයෝජනය කිම්ද? මෙතෙන ඉඳ ජීවත් වෙමි” සිතා එලෙසම කා බි දවස් හරින්ට වන.

ඒ අවදියට නියඟයකකොට ඇත්සම වියලෙත් වියලෙත් වලිමග ඇසිර ගියේය. ඇත්සම වියලෙන්න මාංසත් තදව ගියේය. ලෙත් සිඳි ගිය ලෝකාන්තරික නරකය මෙන් මහා අන්ධකාර විය. මහත් වූ උෂ්ණ පවතින්ට වන. කැණහිල් මහත් වූ භයට පැමිණ “ගැලවී යන උපායක් ඇද්දේ හෝ”යි වටම දිව ඒ ඒ තැන හිස ඇන ගැලවී යන මගක් නොදැක මහත් වූ භයින් තැවි තැවී ඉදිය. එක්තරා වැස්සෙක් වැස වලිමග තෙමී තරුවක්සේ එලිය පෙණින. ඒ වේලාවෙහි කුම්භස්ථලය දක්වා පසුබැස මහත් වේගයෙන් “පිටතට දීවෙමි”යි පීනාහු.

එකල්හි කැණහිලුගේ සර්වාංගය ඉදී තිබූ හෙයින් සියළු ලොම්ම වලිමග ඇලින. කැණහිලා ලොම් ඇරී තල්කඳක් මෙන් මැත්ව බිය නැත්තේ සිතන්නේ “මාගේ තෘෂ්ණාවේ

අධිකයෙන් මෙසේ විනාසයට පැමිණියෙමි, මෙයින් මතු ඇත් කුණු නොකමි”යි අධිෂ්ඨානකොට එතැන් පටන්කොට ඇත්කුණක් නොකෑයේයයි වදාරා චතුස්සත්‍යය වදාළසේක.

ජාතකය අවසානයෙහිදී පන්සියයක් භික්ෂූන් වහන්සේ සියළු කෙලෙසුන් නසා අහීත් මාර්ගයට පැමිණිසේක. සෙසු බොහෝ භික්ෂූන් වහන්සේ සෝවාන්, සකෘදාගාමී, අනාගාමී තුන්මග තුන්ඵලයට පැමිණිසේක. බොහෝ දෙනාට ධර්‍මය අභිවෘද්ධි විය.

“එසමයෙහි කැණෑහිල්ව උපන්නේ ලොව්තුරා බුදුවූ මම්ම ය”යි වදාරා මේ ‘සිගාල ජාතකය’ නිමවා වදාළසේක.

# 148. විරොචන ජාතකය

තවද සර්‍වඥයන් වහන්සේ විශාලා මහනුවර මහවනයේ කූටාගාර ශාලාවෙහි වැඩවසන සමයෙහි විශාලා මහනුවර ගව්වෙන් ගව්ව නියාවට පවුරු තුනක් හා අට්ටාල ගෝපුරයෙන් සමලංකෘතව තිබෙන්නේය.

තවද ඒ නුවර සත්දහස් සත්සිය සත්දෙනෙක් රජදරුවෝ ඔටුනු පැලඳ රජ කෙරෙති. එපමණම යුවරජ දරුවෝත් ඇත්තාහ. එපමණ සෙනෙවිරත් වරුත් ඇත්තාහ. එපමණ භාණ්ඩාර නායකවරුන් ඇත්තාහ. මේ නියායෙන් අමාත්‍ය මණ්ඩලයා හා සෙනා සමුර්ධිය ඇතිව ඉන්නා අවදියේ සත්දහස් සත්සිය සත්දෙනෙකු රාජකුමාරවරුන් අතුරෙන් දුට්ඨ නම් ලිච්ඡවි කුමාර කෙනෙක් ඇත්තාහ. චණ්ඩය, පරුෂය,

බසක් කියා නම් ගසාලා බැනලා විනා නොකියන්නේය. ඇමදම දණ්ඩෙන් ගසා කුප්පවන ලද සර්පයෙකු වැන්නේය. කෝපයෙන් දිලිහි කොපාග්නියෙන්ම දිලිහී ඇවිදිනේය. ඒ රාජකුමාරයන් දැක්කදී බස් එකක් දෙකක් කියා ගන්ටත් නොපිළිවන් වන්නේය. දෙමව්පියන් පටන් තුන්මල් බෑවුන් ආදී වූ එක් කුසෙහි බන්ධුහුද, සුත ප්‍රේමයෙන් වදගත් දරුවෝද, ඉවජාපරව ඉඳිනාහ. බිරින්දද, යාළු විශ්වාසයෝද යන සියල්ලෝම තද පරුෂ කෝපී මනුෂ්‍යයන් දුටු කල කඩා කන්ට ආ සර්පයෙකු මෙන්ද, සොරුන් ඇති වනයකට වන්නාක් මෙන්ද, මස් කන්ට ආ යකෙකු දුටුවාක් මෙන්ද, ඔහු කෙරේ භය ඇතිව දවස් හරණාහ.

මේ නියායෙන් ඉහලෝකයෙහි දවස් ඇර පරලෝ සතර අපායෙහි වැටී බොහෝ දුක් විඳිනාහ. කෝපී මනුෂ්‍යයෝ කෝපී විසින් පූර්ව චන්ද්‍රයා සේ මුහුණක් උවත් ගිනදුම් වැදගත් පියුමක් සේ අශෝභමත් වන්නේය. මල ගැසුනු රන් කැඩපතක් සේ වන්නේය. කෝපයාගේ අධිකත්වය ඉවසාගත නොහී තමා තමාට ඇන ගන්නේය. ඒ නැත්නම් හලාහල විෂයෝ අනුභව කරන්නේය. කරවැල් ලා ගෙන මීයන්නේය. මහත් වූ ප්‍රපාතයෙන් වැටී මීයන්නේය. මෙසේ එක් උපායෙකින් මළ කල දෙවෙනි ජාතියෙහි නරකයට වැටී බොහෝ දුක් විඳ මනුෂ්‍යාත්මභාවයක් ලත් කල්හි උපන්දා පටන් චක්ෂු රොග, ශ්‍රොත රොගාදී වූ රොගයෙන් එක්තරා ව්‍යාධියකින් මෙසේ අපරිමිත ව්‍යාධි ඇතිව බොහෝ දුක් විඳිනේය.

සියලු සත්ත්වයන් කෙරේ මෛත්‍රී, මුදිතා, දයා, කරුණා ඇති වීමෙන් මෙකී දුක් ඕහට නොවී සියලු සම්පත් විඳින්නේයයි වදාළසේක.

මේ එකවාරේ වදාළ අවවාදයෙන්ම ඒ කුමාරයා තමාගේ මානය හැර එතැන් පටන් දළ උදුරාපු නයින් සේද, නල උදුරාපු කකුළුවන් සේද, අඟ කපාපු ගෝනුන් සේද ශාන්තදාන්තව දවසරිනෝය. යම් කෙනෙක් මැරූ තැළුද නමුත් බැන්නෝ නමුත් "මට බැන්නෝ මැරූ තැළුවෝ කව්රුදැ?"යි කියා ආපස්සා පමණකුත් නොබලන්නේය. මේ නියායෙන් දවස් අරනේය.

එක් දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස් වූ මහළුවරුන් වහන්සේ "ඇවැත්නි, සර්වඥයන් වහන්සේ විසින් දෙමව්පියන්ට පවා අවවාද කියා හික්මවා ගත නුහුනු රාජ කුමාරයන් ඇතෙකු හස්ත්‍යාචාරියෙක් දමනය වෑවා සේ එක අවවාදයෙන්ම දමනේ ලවනලදැ"යි කියන්නා ඊට අනික් නමෙක් "එසේමය, ඇවැත්නි, නැගෙණහිර බස්නාහිර උතුරු දකුණු දිගය යන සතර අනුදිගට තමා සිතූ තෙනට අසුන්, ගොන් දමනයේලාද එසේම පුරිසධම්ම සාරථී වූ තිලෝගුරු සර්වඥයන් වහන්සේ පුරුෂයනුත් රූපාරූපාදි වසයෙන් සිතූ දිසාවට මනුෂ්‍යයනුත් හික්මවීම සර්වඥයන් වහන්සේට මිසක් අනික්කාට පුළුවන්දැ"යි කියා මේ කථාව කිය කියා උන් තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි

වදුරා එපවත් අසා "මහණෙනි, දැන්මතු නොවෙයි, පළමුත් ඒ රාජකුමාරයන් දමනේ ලනලදැ"යි වදුරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ ප්‍රසිද්ධ වූ බ්‍රාහ්මණ කුලයක ඉපිද දෙමව්පියන්ගේ ඇවෑමෙන් පිරුණු සම්පත් හැර හිමාලය වනයට ගොස් මහණව ලුණු ඇඹුල් සොයා බරණැස් නුවරට අවුත් පිඩු පිණිස වීථියේ වඩිනාසේක.

එකල්හි රජ්ජුරුවෝ තාපසයන් වහන්සේ දැක එක්තරා අමාත්‍යයෙක් කැඳවා "අර වඩිනා තාපසයන් වහන්සේ කැඳවාගෙන එව"යි කීසේක. අමාත්‍ය තෙම එහි ගොස් ඒ බව දැන් වූ කල්හි තාපසයන් වහන්සේ ඕහට මෙසේ කීසේක. "පින්වත, රජ්ජුරුවන් හා පළමු පුරුදුකමෙකුත් නැත, අපි හිමාලය වැසි තාපසවරු වම්හ, මම රජ්ජුරුවන්ගේ කුළුපග තාපස කෙනෙකුත් නොවෙමි, එහෙයින් අප රජ්ජුරුවෝ කුමට කැඳවද්දැ?"යි කීසේක.

එපවත් අසා අමාත්‍යයා ගොස් "උන්වහන්සේ නොවඩිනාසේකැ"යි රජ්ජුරුවන්ට දැන්විය. රජ්ජුරුවෝ එපවත් අසා "අපගේ කුළුපග වූ තාපස කෙනෙකුන් නැත, තමන්වහන්සේ විනා අනික් තාපස කෙනෙකුන් අපි දුටුයේ

නැත, එසේ හෙයින් වඩිනට උවමැනවැ''යි දෙවෙනිවත් ආරාධනා කළාහුය.

එපවත් තාපසයන් වහන්සේ අසා රජගෙට වැඩිසේක. රජ්ජුරුවෝ තාපසයන් වැඳ "වැඩහිඳිනේ වඩිනේ කොයිදැ?''යි විචාළහ. එවිට තාපසයෝ කියන්නාහු "මහරජ හිමාලය වනයෙහි වාසයකොට වර්ෂා කාලය පැමිණි කල්හි වස් වසන තැනක් සොයා ඇවිදිම්හ''යි කීහ. එපවත් රජ්ජුරුවෝ අසා "මාගේ මඟුල් උයනෙ වස් වසන්නේ යහපතැ''යි කියා තුමූ බත් කා ඉක්බිති තාපසයන් වහන්සේ කැඳවාගෙන උයනට ගොස් උයනේ වැඩ ඉන්ට සලස්වා උයන්ගොව්වා කැඳවා "මුන්වහන්සේ අතපා මෙහෙවර කරන්ට තොපට භාරය''යි භාරකොට රජගෙට අවුත් එතැන් පටන් දවසකට කීපවිටක් තාපසයන් දකින්ට යන්නාහ.

මේ නියායෙන් දවසරින සමයෙහි රජ්ජුරුවන්ගේ දුෂ්ඨ කුමාරයෝ යයි කුමාර කෙනෙක් ඇත්තාහ. ඒ තෙම චණ්ඩය, පරුෂය, දණ්ඩෙන් ගසනලද සර්පයෙකු මෙන් කෝපයෙන් දවසරිනේය. ඒ අවදියේ දෙමව්පියන්, බන්ධු, සාහාය ආදී වූවන් කීදෙයක් නොඅසන්නේය. එපවත් රජ්ජුරුවෝ දැන කුමාරයන් ඇරගෙන තාපසයන් වහන්සේ ලඟට ගොස් "ස්වාමීනි, මේ කුමාරයා චණ්ඩය, පරුෂය. ඔහු හික්මවා වදාළ මැනවැ''යි කියා තාපසයන් වහන්සේට පාවාදී රජ්ජුරුවෝ ගියාහ.

තාපසයෝත් කුමාරයන් අත අල්වාගෙන උයනේ ඇවිදිනාහු දෙපෙති කොහොඹ ගසක් පැ "කුමාරයෙනි, මින් එක පතක් සපා කා පියව"යි කීහ. "යහපතැ"යි කියා කුමාරයෝ ඉන් එක පතක් සපා කා තිත්ත හෙයින් කෙළ හා සමඟ බිමට දමා "දෙපෙති අවස්ථාවේ මෙසේ මහත් වීනම් බොහෝ නසාපිය"යි කියා ඒ ගස උදුරා අතින් ඹටා දමාපුවාහ.

එවිට තාපසයෝ කියන්නාහු "දුටුවාද, කොහොඹ ගස තිත්ත විසින් කඩා දමනලද, ඒ නියායෙන් මේ අමාත්‍යයෝ මේ කුමාරයෝත් දැන්ම මෙසේ වූ චණ්ඩය, පරුෂය රාජ්‍යයට පැමිණියහොත් බොහෝ අනර්ථ කරන්නේය"යි කියා තොපත් නසන්නාහ. එසේ හෙයින් තොප විසින් චණ්ඩ, පරුෂ නොව දැහැමෙන් දවස් හරුව"යි අවවාද කීසේක.

අවවාද ඇසූ කුමාරයෝ එතැන් පටන් චණ්ඩ, පරුෂ නොවී දවස් ඇරියාහ. රජ්ජුරුවන්ගේ ඇවෑමෙන් දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කොට කම් වූ පරිද්දෙන් මියපරලොව ගියාහයි වදාරා "එසමයෙහි දුෂ්ට රාජ කුමාරයෝ නම් මෙසමයෙහි දුෂ්ට රාජ කුමාරයාය, එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් ආනන්ද ස්ථවිරයෝය, එසමයෙහි තාපසයෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 149. සංජීවක ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි අජාසත් රජ්ජුරුවෝ දුස්සීල පාපී වූ දේවදත්ත ස්ථවිරයන් කෙරෙහි පැහැද ගයා නම් ගඟ හිස පන්සලක් කරවා උපස්ථාන කරන්නා වූ උන්ගේ බසින් බුදුන්ට නාලාගිරියා මෙහෙයිමෙන්, විදින්ට දුනුවායන් යවීම් ආදී වූ බුදුන්ට බොහෝ අනර්ථ කරවා සෝවාන් වූ ධර්මිෂ්ඨ වූ පිය රජ්ජුරුවනුත් දේවදත්ත ස්ථවිරයන්ගේ බසට මරවා දේවදත්ත ස්ථවිරයන් පොළොව පලා ගිලුම්හයි ඇසූ දවස් පටන් දේවදත්ත ස්ථවිරයන් පොළොව ගිළුකල් "උන්ගේ බස් නියාවට පිළිපන් මටත් එසේ පැමිණේය"යි සිතා රෑ දවල් භයට පැමිණ දිවාමානයේ සැපසේ දවසැර රාත්‍රීමානයේ සැපවේදේ හෝ යි සිතා වැදහොත් කලක් පොළොව පළාගෙන යන්නාසේ නරකයෙහි ගිනිදැල් ඇඟට වැද ගන්නාසේ ස්වප්නයෙන් දක්නා විසින් බොහෝ භයට පැමිණ බෙල්ල කරකවා අව්වට දැමූ කුකුළෙකුසේ රෑ දවල් භයට පැමිණ රාජ ඓශ්වර්‍ය්‍ය කෙතෙක් ඇතත් සැපයක්කොට නොවිඳ දුක්ම විඳින්නාහු.

සර්වඥයන් වහන්සේගෙන් දුටු ස්වප්න විචාරන්ට තද සිතිවිලි ඇතිව "බුදුන් දකින්ට යෙමි"යි එදවස් ජීවකයන්ට ලැජ්ජා ඇතිව ව්‍යාජයෙන් කියන්නාහු "අමාත්‍යයෙනි, සඳපහණ දවාලක් සේ දුනු පන්සාළිසෙක එපිට තුබූ කල විද්දහැකි, මේ සඳපහණ ඉතා ප්‍රසන්නයහ, ඉතා නිස්කලංකයහ, ඉතා

මනෝඥයයහ, ඉතා රම්‍යයහ, මෙසේ වූ වේලෙහි නිකම් මෙතන ඉඳ කරන්නේ කිම්ද? යහපත් වූ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙකුන් කරා ගොස් බණ දහම් අසන්ට යන්ට අභිප්‍රා ඇත. කවුරුන් කරා යමෝදැ?යි විචාළහ.

ඒ ඇසූ අමාත්‍යයෝත් තමන් භක්ති ගත් සැලැස්ම කියන්නාහු නිවටුන්ගේ ගුණ කියන්ට වන්නාහ. ඉන් එකෙක් කියන්නේ "පුරාණ කාශ්‍යප නම් මක්ඛලිගෝසාල නම් බුදුන් කරා ගියොත් යහපතැ"යි කීහ. අනිකෙක් කියන්නේ "උන් නියාවට අජිතකෙසකම්බලි නම් බුදුන් කරා ගියොත් යහපතැ"යි කිව. අනිකෙක් කියන්නේ "කකුධකාත්‍යයන බුදුන් කරා ගියොත් යහපතැ"යි කීය. අනිකෙක් කියන්නේ "සඤ්ජයබෙල්ලට්ඨිපුත්‍ර නම් බුදුන් කරා ගියොත් යහපතැ"යි කීහ. අනිකෙක් කියන්නේ "මෙකී බුදුන් ඇමදෙනා නියාවට නිඝණ්ඨනාථ පුත්‍ර නම් බුදුන් කරා අපගේ යාම යහපතැ"යි කීහ.

මේ නියායෙන් නිවටුන් වැනි කොල්ලන් ඇරගෙන තම තමන්ට කටට ආවාක්ම කීවාහ. රජ්ජුරුවෝ උන් කියන බස් නොඅසා ඉඳ ජීවකයන් විසිනුත් "මා නිසා යම් කථාවක් උපන්නේය"යි දැන ගණත් බැණ නොනැගී උන්නාහ. එපවත් රජ්ජුරුවෝ දැන "ඇයි කුමාර භාණ්ඩක වූ ජීවකයෙනි, මෙතෙක් දෙන තම තමන්ගේ භක්තිගත් බුදුවරුන් කීයේය, තොප බැණ නොනැගී ඉඳිනේ, තොප භක්තිගත් බුදු කෙනෙක් නැද්දැ?"යි කීය.

එවිට ජීවකයෝ ඒ අසා උනස්නෙන් නැගිට බුදුන් වසන දිසාවට වැඳ බුදුන්ගේ නවඅහරහා දී ගුණ කියා "මෙසේ ගුණ ඇති සර්‍වඥයන් වහන්සේ මාගේ අඹ උයනේ එක් දහස් අටසියයක් භික්‍ෂූන් වහන්සේ පිරිවරාගෙන වැඩ හිඳිනාසේක් දකින්ට වැඩියොත් යහපතැ"යි කීය.

එපවත් රජ්ජුරුවෝ අසා "ඉතාම හොඳය. ඒ නියාවට ඇත්වාහන හා සේනා සමුර්ධිය කරව"යි කියා ඒ නියාවට සේනා සමුර්ධිය කරවාගෙන මහත්වූ රාජ ඓශ්වර්‍ය්‍යයෙන් බුදුන් කරා ගොස් ඇතු පිටින් බැස ගණයට අවුත් සකස්ව හැඳ පෙරව මනා ඉඳුරන් ඇතිව අතක් පයක් සැලීමක්වත් මෙතෙක් දෙනා වහන්සේ ඉඳිනා තෙන කැසපියන, කිඹිසපියන පමණක්වත් නැතිව මනාව වැඩ උන්නා දැක සතුටුව සංඝයා වහන්සේ පළමුව වැඳ පසුව බුදුන් වැඳ එකත්පස්ව හිඳ "ප්‍රශ්න විචාරන්නා කැමැත්තෙමි"යි දැන් වීය. "යහපත මහරජ, ප්‍රශ්න විචාරව"යි වදාළ කල්හි රජ්ජුරුවන් විසින් කියන්නාහු "ස්වාමීනි, මහණදම් පිරීමෙන් ලැබෙන ආනිසංස කුමක්දැ?"යි විචාරන්නා දෙබණාවරකින් හා පන්සියයක් ග්‍රන්ථසංඛ්‍යාවෙන් යුත් 'සාමාන්‍යඵල සූත්‍රය' වදරා රජ්ජුරුවන් විසින් බුදුන් වැඳ "ස්වාමීනි, මා නොදැන කළ ද්‍රොහ ඉවසා වදරන්නේ යහපතැ"යි ක්‍ෂමා කරවාගෙන ගියාහ. සර්‍වඥයන් වහන්සේත් භික්‍ෂූන් වහන්සේට "මහණෙනි, අජාසත් රජ පිතෘඝාත කර්මයකොට අසත්පුරුෂයා හා එක්වීමෙන් තමන් තමාම නසාගත් හෙයින් මිස නැත්නම් අදම සෝවාන් වන්නේය"යි වදාළසේක.

දෙවෙනි දවස් දම්සභා මණ්ඩපයෙහි රැස් වූ මහළුවරුන් වහන්සේ “අජාසත් රජ අසත්පුරුෂයා නිසා ලාභයකින් පිරිහීගියේ වේදැ”යි වදරා වැඩ උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩවදරා “මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?”යි විචාරා වදරා එපවත් අසා “මහණෙනි, දැන්මතු නොවෙයි, පළමුත් අසත්පුරුෂයන්ට සහායව අනර්ථය සලස්වා ගත්තේ වේදැ”යි වදරා ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ බරණැස් නුවර බ්‍රාහ්මණ කුලයක ඉපිද වැඩිවිය පැමිණ දිසාපාමොක් ආචාරීන් ගාවාට ඇවිත් ශිල්ප ශාස්ත්‍ර ඉගෙනගෙන අවුත් බරණැස් නුවර දිසාපාමොක් ආචාරීන්ව පන්සියයක් අතවැස්සන්ට අකුරු කරවා වාසය කරන්නාහු. ඉන් එක් සංජීවක නම් මානවකයකුට මළමිණී මන්ත්‍රය පිරුවා දේවතානුභාවයෙන් උපද්දා කීප අඩියක් ඇවිදිනා පමණට මන්ත්‍රය ඉගැන්වූහ. ලඟට ආ කළ නවතන මන්ත්‍රය නීගැන්වූහ.

එසමයෙහි ඒ ශිෂ්‍යයා ඇතුළු වූ පන්සියයක් ශිෂ්‍යයෝ වලට දරකඩා ගියාහ. එවිට “ව්‍යාඝ්‍රයෙකු උපද්දා දෙම්හ”යි කීහ. අතවැස්සන් “එනම් දෙයක් කවර කලකත් බැරිය”යි කියන්නා “එසේ වීනම් බලව”යි කීය. මන්ත්‍ර පිරුවන්ට පටන් ගත්හ. සෙසු අතවැස්සෝ “කවුරු දනිද්දැ”යි කියා ගස් උඩට

පැන නැන්ගාහ. ඒ තෙමේ මන්ත්‍රය පිරුව පිරුවා ගල් දැම්හ. එවිට ව්‍යාඝ්‍රයා නැගීසිට මන්ත්‍රය පිරූ තෙනැත්තහුගේම බෙල්ල කඩා මරා තෙමේත් එතනම වැටී ගියේය. සෙසු අතවැස්සෝ දරකඩා ගෙනවුත් ආචාරීන්ට කීහ. එපවත ඇසූ ආචාරීන් ශිෂ්‍යයන් ලඟට කැඳවා “අසත්පුරුෂයාට සංග්‍රහ කිරීමෙහි විපාක ලද්දේ වේදැ”යි දැහැමෙන් සෙමෙන් සුචරිත පින්කම්කොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියෝ වේදැයි වදරා “එසමයෙහි සංජීවක මානවකයා නම් අජාසත්ත රජය, එසමයෙහි බරණැස් නුවර දිසාපාමොක් ආචාරීව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම ය”යි වදරා ‘සංජීවක ජාතකය’ නිමවා වදාළසේක.

# 150. රාජෝවාද ජාතකය

තවද දුකනිපාතයෙහි ජාතකය දක්වම්හ. කෙසේද? යත්, සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි රජ්ජුරු කෙනෙකුන්ට කී අවවාදයක් නිසා මේ ජාතකය දක්වන ලදී. මෙහි වර්තමාන කථාව ‘තෙසකුණ’ ජාතකයෙහි විස්තර වශයෙන් බස්නේය.

මෙහි කොසොල් රජ්ජුරුවෝ එක් දවසක බරණැස් නුවර යුක්තියක් විචාරණ නිසා බුදුන් දකින්ට උදය යා නුහුනු හෙයින් දවල් බත් කා ඉක්බිති අතපැන් නොසිඳෙන තුරුම වහා රථයකින් ගොස් බුදුන් වැඳ එකත්පස්ව හුන්නාහ.

සර්‍වඥයන් වහන්සේ "මහරජ, අද වූකලි මැදයම්හි කුමක් නිසා අවුදැ?"යි විචාරන්නා "දැහැමෙන් සෙමෙන් විචාරා පසිඳුවන නිසා නො ආයෙමි". "දැන් වනාහි රජ දරුවන් දැහැහෙන් සෙමෙන් යුක්ති විචාරීම් යහපත් වෙයි, මා සේ වූ සම්මාසම්බුදුරජ කෙනෙකුන් ගේ අවවාද වූ නියාවෙන් වේද යුක්ති විචාරන්නේය. පළමු උත්තමයෝ කිසි කෙනෙකුන්ගේ අවවාදයක් නැතිව ඡන්‍ද්‍රාගිතිය, ද්වේෂාගතිය, භයාගතිය, මෝහාගතිය යන සතර අගතියට නොගොස් දැහැමෙන් රාජ්‍යය කළෝ වේදැ"යි වදුරා රජ්ජුරුවන් විසින් ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ දස එකඩමසකින් බිහි වූසේක.

ඒ කුමාරයන්ට නම් තබන්නාහු "බ්‍රහ්මදත්ත කුමාරයෝය"යි නම් තුබූහ. ඒ කුමාරයානන් වැඩිවිය පැමිණ දිසාපාමොක් ආචාරීන් කරා ගොස් ශිල්ප ඉගෙන නිමවා බරණැස් නුවරට අවුත් පියාණන්ගේ ඇවෑමෙන් රාජ්‍යයට පැමිණ සතර අගතියට නොගොස් දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කරන්නාහ. උන්ගේ ධර්මිෂ්ඨකමින් අන්‍යායවෙකැයි යන දෙයක් නැතිවිය. අධිකරණ ශාලා හිස්විය. අමාත්‍යයෝ සවස් වනතුරුත්

අධිකරණ ශාලාවේ හිඳ යුක්ති විචාරන්නට එන්නන් නැති හෙයින් ගෙවලට පලා යන්නාහ.

මේ නියායෙන් කිසි අයුක්තියක් නැතිව දවස් අරණා හෙයින් රජ්ජුරුවෝ සිතන්නාහු "යම්සේ මාගේ නුගුණයක් කියන්නෝ ඇද්දේ හෝ"යි සිතා රැ නිවාසයේ පරීක්ෂාකොටත් තමන්ගේ නුගුණයක් කියන කෙනෙක් නැතිව "අපගේ රජ්ජුරුවන් වහන්සේ සුඛි සුවපත් වෙනසේක්වායි, දීඝායුෂ්කව ඉඳිනාසේක්ව"යි යන බස විනා "අන්‍යයක් අයුක්තියක් කළසේකැ"යි යන බසක් නොඅසා දෙවැනිව සිතනසේක් "මොහු මා සමීපයෙහි වාසය කරන හෙයින් නුගුණ නොකියන්නෝය"යි සිතා ඇතුළු නුවර පිටි නුවර අප්‍රසිද්ධ වේෂයෙන් ගෙයක් ගෙයක් පාසා පරීක්ෂාකොටත් තමන්ගේ නුගුණයක් කියන කෙනෙකේ නොඅසා "මා කෙරේ භයින් උනුන් නොකියන්නෝමය"යි සිතා "මාගේ අඟද්‍ව වැටෙන පිටිසර ගම්නියම්ගම් බලන්ට යෙමි" සිතා රාජ්‍යය අමාත්‍යයන්ට පාවාදී රථයට පැනනැගී නික්ම ඒ ගම්වල තමන් වහන්සේගේ යාපත්කම් විනා නපුරක් කියන කෙනෙකුන් නොඅසා දෙවැනිව නුවරට එනසඳ "සැවැත් නුවර මල්ලිකා නම් රජ්ජුරුවෝත් තමන්ගේ නුගුණ කියන්නෝ ඇද්දේ හෝ"යි පරීක්ෂා කරන්නට පිටත්ව ආ තැනැත්තෝ සැවැත් නුවර රජ්ජුරුවන් ගේ රථාචාරී කියන්නේ "අපගේ රජ්ජුරුවන්ගේ ගුණ කියමි"යි සිතා නුගුණම කියන්නේ "එම්බල රථාචාර්‍යය, අපගේ රජ්ජුරුවෝ දුෂ්ටයාට දුෂ්ට කමින්ම ජය ගන්නාහ, සත්පුරුෂයාට සත්පුරුෂකමින්ම ජය ගන්නාහ, බොරු කියන

තැනැත්තහුට බොරුවෙන් ජය ගන්නාහ, සැබෑව කියන්න වුන්ට සැබෑව කියා ජය ගන්නාහ, ලෝභී තැනැත්තවුට ලෝභයෙන් ජය ගන්නාහ, තෑගි තැනැත්තවුට ත්‍යාගයෙන්ම ජය ගන්නාහ. මේ අපගේ රජ්ජුරුවන් වහන්සේග් ගුණය. එසේ හෙයින් මග අරුව"යි කීහ.

ඒ බරණැස් නුවර රථාචාරියා අසා "තොපගේ රජ්ජුරුවන්ගේ ගුණ කියමි කියා තොප කීවා ගුණ වුව, නුගුණයට ගිය කල ගුණ කොයිද්‍ැ"යි කියා "අපගේ රජ්ජුරුවන් ගේ ගුණ අසව"යි කියන්නෝ "කෝපි මනුෂ්‍යයාට කෝප නොකිරීමෙන් ජය ගන්නාසේක. ලෝභී තැනැත්තවුට ත්‍යගයෙන් ජය ගන්නාසේක. බොරු කියන තැනැත්තවුට සැබෑ කීමෙන් ජය ගන්නාසේකැ"යි කියා "මේ අපගේ රජ්ජුරුවන් වහන්සේගේ ගුණය රථාචාරිය මග අරුව"යි කීහ.

එබස් අසා මල්ලිකා රජ්ජුරුවෝ බිමට බැස ගොන් මුදා රථය ඉවත්කොට "රජ්ජුරුවන් වහන්සේගේ රථය පදුව"යි කීය. එවිට බරණැස් රජ්ජුරුවෝ සැවැත් නුවර රජ්ජුරුවන්ට කියන්නාහූ "තොපි මා සේ දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කරව"යි අවවාද කියා තමන්ගේ නුවරටම ගොස් දැහැමෙන් සෙමෙන් රාජ්‍යයකොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියායයි වදාරා "එසමයෙහි මල්ලිකා රජ්ජුරුවන්ගේ රථාචාර්‍යයා නම් දැන් මේ මෞද්ගල්‍යයාන ස්ථවිරය. මල්ලිකා රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. බරණැස් රජ්ජුරුවන්ගේ රථාචාර්‍යයා නම් ශාරීපුත්‍ර ස්ථවිරයෝය.

බරණැස් රජුව උපන්නෙමි ලෙව්තුරා බුදුවූ මම්ම වේදැ"යි 'රාජොවාද ජාතකය' නිමවා වදාළසේක.

# 151. චතුර්ත්‍ථ සිගාල ජාතකය

තවද සර්‍වඥයන් වහන්සේ විශාලා මහනුවර කූටාගාර ශාලාවෙහි වැඩවසන සමයෙහි එනුවර එක්තරා කරනවෑමියෙක් රාජවල්ලභව රජ්පුරුවන් බිසෝවරුන් ආදීන්ගේ ඉසකේ වැඩීම්, දැළි වැඩීම්, අන්දන් තිබුම් ආදී වූ කර්මාන්තකොට රාජවල්ලභව ඉඳින්නේය. මෙතෙක් දෑ නොව උපාසකව තිසරණයෙහි පිහිටා පන්සිල් දවස්පතා රැක බුද්ධ වල්ලභව ඉඳිනේය.

එසමයෙහි එක් දවසක් කරනවෑමියා තමගේ පුතෙක් ඇරගෙන රජගෙට මෙවර කරන්නට ගියේය. ඒ වේලාවට ලිච්ජවී කුමාරියක් එතනට ඇවිත් සිටියාය. ඒ කුමාරිකාවන්ගේ විශිෂ්ඨ වූ රූ දැක කරනැවෑමියාගේ පුතා ඈ පිළිබඳ වූ සිත් ඇතිව ගෙට ගොසින් ඇඳවැලඳගෙන නොකා නොබී වැදහොත්තේය. එවෙලෙහි කරනැවෑමියා කියන්නේ "තා කරනැවෑමිව හීන කුලයෙහි උපන් නියාව තෝ නොදනීද? උභයකුල පාරිශුද්ධ වූ රාජවංසයෙහි උපන් රාජ කන්‍යායන් තොපට ලැබේද? එසේ හෙයින් තොපි ඒ අසා සෝක නොකරව, ඔබ්බේ කරනැවෑමි කුලයකින් යහපත් ස්ත්‍රියක් පාවාදිය හැක්ක, සෝක නොකරව"යි කීහ.

එකී අවවාදත් නොඅසා දෙමව්පියන්, නගුන්, බුහුන්, යාළු විශ්වාසයන් ආදී වූවන්ගේ අවවාදත් නොගිවිස ශෝකයෙන්ම නොකා නොබී සුෂ්කව වියලී නැසී ගියේය. පියාත් ඌට කළමනා ආදාහන කෘත්‍යයකොට පින් පෙත්දී සෝකයෙන් බුදුන් දකින්ට නොගොස් සෝක සන්හිඳුනු පසු ගඳමල් පාහන් ගත්අත් ඇතිව බුදුන් දකින්නට ගොස් සර්‍වඥයන් වහන්සේ "ඇයි උපාසකය, මෙතෙක් දා නොආයේ ඇයිදැ?"යි විචාරාන්නා එවිට කරනැවෑමියා කියන්නේ "මාගේ පුතා මෙසේ වූ සිතක් සිතා මළ හෙයින් නොආයෙමි" දැක්විය. එපවත් සර්‍වඥයන් වහන්සේ අසා "පළමුත් මේ තෙමේ නිවච සිට උත්තම ජාතියට සිතිවිලි සිතා මළේ වේදැ"යි වදාරා ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ සිංහරාජව උපන්සේක. බෝධිසත්ත්වයන්ට සහෝදර මල් සිංහහෝ සදෙනෙක් ඇත්තාහ. ඇමට බාල වූ නඟ වූ සිංහ ධේනුවක් ඇත්තීය. මේ කියන සිංහයෝ ඇම රන් පර්‍වතයෙහි රන්ගල් ගුහායෙක වාසය කරන්නාහ. එතනට නුදුරු වූ රිදී පර්‍වතයේ දැවාන ගුහායෙක කැණහිලෙක් වසන්නේය. එවකට බෝධිසත්ත්වයන්ගේ දෙමව්පියෝ දෙන්න නැසී ගියහ. එවක් පටන් බෝධිසත්ත්වයන් වහන්සේ ඇතුළු වූ සත්බෑයෝ

නැගණියන් ගල්ගුහාවේ ඉඳුවාලා සත්බෑයෝ මාංස මරා තමුන් කා නැගණියන්ට දී මේ නියායෙන් දවසරිනාහ.

එකල රිදී පර්වතයේ වසන කැණහිල් සිතන්නේ "දෙමව්පියෝත් නැත, බෑයෝත් ගොදුරු සොයා යන්නාහ, මම් මේ අවසරයේ ගොස් සිංහධේනුව හා කැටුව සංවාසය යෙදුනේ වීනම් යහපතැ"යි සිතා රිදී පර්වතයෙන් බැස රන් පර්වතයට සිංහ ධේනුව යන ගුහාව සමීපයට අවුත් සිංහ ධේනුවට කියන්නේ "තොපිත් සතරපයක්ව මමත් සතරපයක්ව ඇත්තෙමි. එසේ හෙයින් තොප හා මා හා සමාන වම්හ. තොපි මට ප්‍රජාපති වව්, මම තොපට ස්වාමී වෙමි" කියා රාගනිශ්‍රිත බස් කීය. එබස් සිංහ ධේනුව අසා "මේ තෙමේ සිව්පාවුන්ට අධම ජාතියෙහි උපන, මම් සිව්පාවන්ට උතුම් ජාතියෙහි උපනිමි, මු හා කුමන විශ්වාසයෙක්දැ"යි සිතා නැවත සිතන්නාහු "කැණහිල් අතින් රාගනිශ්‍රිත බස් ඇසු කල මා ඉඳන් කින්ද ස්වාසය අල්වා ජිවිතය අරිමි" සිතා "සොරා අරනේ ඇයිදැයි සත් බෑයන් ආකල උන්ටත් කියා අරිමි" සිතා උන්නීය.

ඒ වේලාවට සත් බෑයන්ගෙන් එක් සිංහයෙක් මස් මරාගෙන සිංහ ධේනුව ලගට අවුත් "නඟ, මේ මස් කව"යි කීහ. සිංහ ධේනුව නොසතුටුවිය. එවිට සිංහයා "ඇයිදැ"යි විචාරා එපවත් අසා "කැණහිලා කොයිදැ"යි කියා කීහ. "අරවේද රිදී පර්වතය මුදුනේ ආසනයේ ඉදිනේය"යි කිව. එබස් සිංහයා අසා මහත් වූ කෝපයෙන් දැවාන ගුහාවට

පැන ළය තලාගෙන පර්‍වත පාර්ශවයෙහි වැටී මළේය. මෙම නියායෙන් සදෙනෙක් "කැණහිලා ගණුම්හ"යි පැනලා ළය තලාගෙන මිය වැටී උන්නාහ. සත්වෙනිව ආ බෝධිසත්ත්‍වයෝ එපවත් අසා "කැණහිළුන් ගේ ආකාශයෙහි ඉඳිමෙක් නැත. මේ පෙණෙන්නේ දෑවාන ගුහාව"යි සිතා කැණහිලා ගොදුරු කන්ට බස්නා මග පරීක්‍ෂාකොට පොළොව පැළෙන කලක්මෙන් ආකාශ ගර්ජනාවක් මෙන්යි සිංහනාද කෙළේය. සිංහනාද ඇසූ කැණහිල් භයින් තැතිගෙන ළය පැලී මළේය.

ඒ කාරණය දක්වන සර්‍වඥයන් වහන්සේ "මහණෙනි, සිංහ ධේනුවක පතා ආ කැණහිලා සිංහනාදයෙන්ම භයවී මළෝය"යි වදාළසේක. සිංහයාත් කැණහිලා මරා පෙරලා ගල් ගුහාවට අවුත් බෑයන් මළ නියාවත් අසා සෝකපත් වූ නැගණියන්ගේ සෝකත් අරවා දැහැමෙන් සෙමෙන් වාසයකොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදාරා "එසමයෙහි කැණහිලා නම් මේ කරනැවෑමියාගේ පුතාය. සිංහ ධේනුව නම් ලිච්ඡවී කුමාරිකාය, මල් වූ සිංහයෝ සදෙන නම් මහතෙරුන් වහන්සේය. එසමයෙහි කේසර සිංහව උපන්නෙම් ලොවුතුරා බුදුවූ මම්ම ය"යි වදාරා 'සිගාල ජාතකය' නිමවා වදාළසේක.

## 152. සූකර ජාතකය

තවද සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් දවසක් සවස ගඳකිළියෙහි දෙර වැඩසිට මහළුවරුන් වහන්සේට අවවාදකොට සමුදී වදාළසේක.

සැරියුත් මහසාමීන්, මුගලන් මහසාමීන් බුදුන් වැඳ තම තමන්වහන්සේගේ විහාරවලට වැඩිසේක. ඉන් මුගලන් සාමීන් වහන්සේගේ ගණයේ යම්තමක් සැතපී "සැරියුත් සාමීන්ගේ ගණයට ගොස් ප්‍රශ්න විචාරමි" සිතා සැරියුත් සාමීන් කරා අවුත් ප්‍රශ්න විචාළසේක. උන්වහන්සේත් බණ පලඟ නැඟී විජිනී පත්‍රයක් ගත් අත් ඇතිව වැඩ හුන්සේක්. මුගලන් සාමීන් විචාළ ප්‍රශ්නය ආකාශයේ පුන්සඳ මඬල ඔසවා පාන්නාක් මෙන් විස්තරකොට වදාරනසේක. උන්වහන්සේගේ ප්‍රශ්න විචාරීම් හා උන්වහන්සේගේ ප්‍රශ්න කීම් ඇසීම් බොහෝ භික්ෂූ, භික්ෂූණීන්, උපාසක, උපාසිකා යන සිව්වනක් පර්ෂිත් දෙදෙනා වහන්සේම වදාරන බණ කථා අසා උන්නාහ.

ඒ වේලාවට මාළුතෙරුන් වහන්සේ නමක් සිතනසේක් "මෙසේ වූ වේලේ මමත් කටට ආවක් කියා ප්‍රශ්ණයක් කොට විචාරා උන්වහන්සේට කියාගත නුහුනු කල මෙතන සිටිනා බොහෝ මනුෂ්‍යයෝත් මුන්වහන්සේ විනය දන්නා නුවණැති නමෙකැයි සිතා මට සත්කාර කරන්නාහ"යි සිතා සැරියුත් සාමීන් ලඟට ගොස් "ඇවැත්නි, ශාරිපුත්‍ර ස්ථවිරයෙනි, අපිත් ප්‍රශ්ණයක් විචාරන්ට අවසරදැ?"යි කියනසේක් "ආවෙධි කායවා නිබ්බෙධි කායවා නිග්ගහෙත්වා විසෙසෙත්වා පටිසෙසෙත්වා ආහ"යි කියා මේ කාරණය කීසේක.

එබස් සැරියුත් සාමීන් අසා "මේ මාළු භික්ෂූහු තමන් කටට ආ දෙයක් කිවුය. මුන් සේ වූවන් ප්‍රශ්න විචාරන්නේ

අප ඉදිනේ ඇයිදැ"යි සිතා විජිනිපත්‍රය දණ්ඩාසනයෙහි තිබා වැඩහිඳිනා ගණය ඇතුලට වැඩපූසේක.

මුගලන් සාමීන් තමන්වහන්සේගේ වැඩහිඳිනා ගණයට වැඩපුසේක. එවිට එතනට එක් වූ බොහෝ උපාසකවරුන් "ඒ දෙදෙනා වහන්සේගේ මිහිරි බණ මුන් වහන්සේ නිසා බණ්ඩ විය""යි පොළු මුගුරුගෙන ලුහුබඳවා ගත්හ. උන්වහන්සේත් හයින් දිවනසේක් පෝරු දිරාගිය පරණ නානා ගෙයක වැටී අසූචි වැකුණු ශරීර ඇතිව පිළිකුල් බවට පැමිණිසේක. එපවත් දැක උපාසකවරු මධ්‍යම රාත්‍රී කාලයෙහි බුදුන් කාරා ගියාහ.

සර්වඥයන් වහන්සේ "උපාසකරුන් නොවේලේ ආයේදැ?"යි විචාරා එපවත් අසා "පළමුත් උත්තමයන් හා සරිවන නියා අසූචි ගැවසුනු ශරීර ඇති වුයේවේදැ"යි වදරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ සිංහව ඉපිද වනයේ වාසය කරන්නාහ.

එසමයෙහි ඌරු සමූහයක් විලක් සමීපයෙහි ගොදුරු කා වසන්නාහ. එතනම තාපසවරුන් වහන්සේ වාසය කරනසේක. එසමයෙහි සිංහයෝ ගොදුරු කා පැන් බොන නිසා ඌරන් වසන විලට බට ඒ වෙලාවට මහත් ඌරෙකු ගොදුරු කා

විල සමීපයෙන් යන්නාවූ දැක "සුවසේ මූ කමි" සිතා "අද මූට නොපෙණී යන්නට මැනව, මා අද දුටු නම් පසුව දවසෙක නොපැමිණෙන්නේය"යි සිතා ඌරාට නොපෙණී අනික් තොටකින් ගෙඩනැගී සිටිකල ඒ ඌරා සිංහයා දැක "තමාට භයින් යෙති" සිතා කියන්නේ "යාළුව, මමත් සතර පයක් ඇත්තෙක් වෙමි. තොපටත් සතර පයක් ඇත්තෙහිය. එසේ හෙයින් තොප මා දැක නොගොසින් මා කරා එව"යි වාසි කියා පරදවා බස් කීය.

එබස් සිංහයා අසා "අද මට බැරිය, අදට සත්වෙනිදා තොප හා මා හා යුද්ධයක් කරමිහ"යි කියා ගියේය. එවිට ඌරු තමාගේ ඌරු රැසට කීය. ඌරෝ එවිට කියන්නෝ "තාගේ බල නොදැන සිංහයන් හා කැටුව යුද්ධ කෙරෙමියි කියා තා සලසාගත් හෙයින් ඉදිරියේ මේ ඌරන්ට විනාසය තා නිසාය"යි ඌරෝ අසා භයින් තැතිගෙන "මේ ඇමදෙනාම එක්ව මට උපායක් කියව"යි කීය. එවිට එසේ වීනම් "මේ සත්ද මුළුල්ලේම තාපසවරුන්ගේ නාන ගෙවල්වලට ගොසින් අසූචි ශරීරය මුල්ලේ තවර තවරා වියලාගෙන ඇමදෙනා එක්ව උඩුසුළඟේ සිටිනා අසූචි ගඳය අසා සිංහයෝ පැරැද පලායෙ"යි කියා ඌරෝ එක්ව මේ උපාය කිවුය. ඌරාත් එලෙසම කොට සත්වෙනි දවස් ඇවිත් උඩුසුළඟේ සිටියේය.

සිංහයා එතනට අවුත් ඌරු සිටිනා නියාව දැක "තා විසින් සිතූ උපාය යහපත, නැත්නම් තා මරා පියන්නෙමි වේද, මෙවිට තා අතින් අල්ලන්ට හා පයින් අල්ලන්ට හා

කටින් අල්ලන්ට හා කැතවුව, එසේ හෙයින් ජය තොපටමය''යි කියා සිංහයා පලා ගියේය. ඌරුත් තමා ජයගත් නියාව තමාගේ රැලට කියා ඊට සතුටුව "සිංහයන් අප කෙරේ කිපුනේය. අපට මෙතන ඉන්ට නපුරැ''යි කියා ඔබ්බට ගියාහයි වදාරා "එසමයෙහි ඌරා නම් මේ භික්ෂුය. සිංහව උපන්නෙම් බුදුවූ මම්ම ය''යි වදාරා මේ 'සුකර ජාතකය' නිමවා වදාළසේක.

## 153. උරග ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කොසොල් රජ්ජුරුවන්ගේ අමාත්‍යයෝ දෙන්නෙක් උනුනුන් කෙරෙහි වෛරව වාසය කරන්නාහ. එපවත් රජ්ජුරුවෝ දැන නොයෙක් අවවාද කියාත් උනුන් කෙරෙහි වෛර හරවාගත නුහුණුවාහ. උන්ගේ බන්ධුනුත් අවවාද කියා අරවාගත නුහුණුවාහ.

එපවත් සර්වඥයන් වහන්සේ අසා එක් දවසක් අළුයම් වේලෙහි මහාකරුණා සමාපත්තියට සමවැද බලා වදාරනසේක් ඒ කියන අමාත්‍යයන් දෙන්නා සෝවාන් වන්ට හේතු ඇති නියාව වදාරා ඉන් එකකුගේ ගෙට උදාසනක්සේ වැඩ වදාරා ඔහු විසින් පාත්‍රයගෙන සර්වඥයන් වහන්සේ ඇතුළු ගෙට වඩා කැඳ අවුළුපත් ආදී වූ දෙය වළඳවා අන්තයෙහි ඕහට මෛත්‍රියෙහි අනුසස් වදාරා ඔහු සෝවාන් කොට දවල් බත් වළඳන වෙලාවට ඔහු ලවා පාත්‍රය ගෙන්වාගෙන අනිත් අමාත්‍යයාගේ ගෙට ගොස් ඔහු විසින් සර්වඥයන් වහන්සේ

වඩා ගෙට ගෙන්වා මධුර වූ ආහාරපානයෙන් සව්ඟදයන් වහන්සේට වැලඳවිය.

සව්ඟදයොත් වළඳා අන්තයෙහි ඕහටත් මෛත්‍රියෙහි අනුසස් වදරා ඔහුත් සෝවාන් කරවිය. කා විසිනුත් එක් කරවාගත නුහුණුවා සව්ඟදයන් වහන්සේ එක් කරවා වෛර අරවා වදාළසේක. එදවස් දම්සභා මණ්ඩපයට රැස් වූ මාළුවරුන් වහන්සේ "ඇවැත්නි, උනුන් කෙරේ වෛර වූ අමාත්‍යයන් දෙන්නා කා විසිනුත් එක් කරවාගත නුහුණුය. සව්ඟදයන් වහන්සේ එක් කරවා වෛර අරවා වදාළසේක. ඉතා අපූර්වය"යි වදාළසේක. එතනට සව්ඟදයන් වහන්සේ වැඩ වදරා ආරාධිත වූ සව්ඟදයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ තාපසව ගංගාවක් සමීපයෙහි පන්සලක වාසය කරනසේක.

එසමයෙහි බරණැස් නුවර මහත් වූ උත්සවයෙක් විය. ඒ උත්සවය බලන්ට දිව්‍ය නයෙකු හා ගරුඬයකුත් ඇවිත් මනුෂ්‍ය වේෂයෙන් කෙළි බලා අන්තයේ ගරුඬයා නයා දැක ලුහුබඳවාගත. එවිට නයාත් නාග වේශය ගෙන වහා වහා දුවන්නේය.

ඒ වේලාවට තාපසයෝ කාෂාය වස්ත්‍රය ගොඩ තබා නානකඩක් ඇඳගෙන දිය නාන්ට බටහ. ඒ වේලාවට නයා

එමින් සිට සිතන්නේ "තාපසයන්ගේ වැහැරීමය වූ සිවුර යට වනින් නම් මා ගැල විය හැක්කේය"යි සිතා ඉන්ද්‍රනීල මාණික්‍යයක් ලෙසට රූපය මවාගෙන වල්කලා සිවුරට වැද ගියේය. ඒ වේලාවට ගුරුළුත් පසුපස්සේ ආයේ තාපසයන්ගේ වල්කලා සිවුරු වන් නියාව දැක තාපසයන් කෙරේගත් ආදරයෙන් සිවුරු ඔසවා නයා ඩැහැ නොගෙන තාපසයන් කරාගොස් කියන්නේ "ස්වාමීනි, ක්‍ෂුධාවෙන් පීඩිතව නයා ලුහුබඳවගන ආ මම නුඹවහන්සේ කෙරෙහිගත් ආදරයෙන් සිවුරු ඇතුලට වැදගිය නයා නොඇල්වීමි, එසේ හෙයින් සිවුරු ඇරගෙන නයා මට දුන මැනවැ"යි කීය. එපවත් බෝධිසත්වයෝ අසා "ගුරුළ තා කළ දෑ ඉතා යහපත, තොපට දෙවියෝ ආයුබෝ කෙරෙත්වයි, දෙවියන්ගේ භෝජනය තොපට ලැබේව"යි යනාදී ආශිර්වාදකොට ගොඩට අවුත් නයා එක් අතකින් ඇරගෙන සිවුරු ඇඳ පෙරවගෙන නයා හා ගුරුළු ඇරගෙන පන්සලට ගොස් දෙන්නාට බණ කියා ජාති වෛරී ගුරුළා හා නයා සමගි කරවා ඒ උපන් ආත්මභාවයට ඔහුනොවුන් කෙරේ වෛර නොවන පණතට සලස්වා යවුහයි වදරා "එසමයෙහි ගුරුළා හා නයා නම් මේ අමාත්‍යයෝ දෙන්නාය. තාපසව උපන්නෙමි ලොවුතුරා බුදුවූ මම්ම ය"යි වදරා 'උරග ජාතකය' නිමවා වදාළසේක.

# 154. ගග්ග ජාතකය

තවද සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පසේනදී කොසොල් රජ්ජුරුවන් විසින් කරවා

පිළිගන්වනලද රාජකාරාමයෙහි වැඩවසන සමයෙහි එක් දවසක් සිව්වනක් පර්ෂිද් මධ්‍යයෙහි වැඩහිඳ බණ වදාරන සර්වඥයන් වහන්සේ කිඹිස වදාළසේක. එවේලෙහි බොහෝ භික්ෂූන් වහන්සේ "භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ බොහෝ කලක් ජීවත් වනසේක්වා"යි "සුන්දර වූ බුදුරජාණන් වහන්සේ බොහෝ කලක් ජීවත් වනසේක්වා"යි යනාදින් ආ වැඩූහ. මේ නියායෙන් බොහෝ දෙනා වහන්සේ ආ වැඩීමෙන් අරගල මහත්ව බණ එදවස් කඩ විය.

එපවත් අසා සර්වඥයන් වහන්සේ "මහණෙනි, ආ වැඩීම පමණකින් ආයුෂ බොහෝ වේද? නොවැඩුවෝ ආයුෂ මද වේදැ?"යි වදාරා "ස්වාමීනි, එසේ වූ දෙයක් ඇත්දැ?"යි දන්වන්නා "මහණෙනි, එසේ වීනම් අද වක් පටන් අනුන්ට ආ වැඩුවාට පෙරලා ආ වඩීමක් වත් කළෝද ආපත්ති වන්නේය"යි ශික්ෂා පද පණවා වදාළසේක.

එතැන් පටන් මහළුවරුන් වහන්සේ කිඹිසි කල උපාසකවරුන් ආ වඩන්නාහ. තමන් අතින් ආ වැඩුන් අසාගෙන මහළුවරුන් වහන්සේ ආ නොවඩන සෙයින් "ශාක්‍යපුත්‍ර වූ සර්වඥයන් විහන්සේ ගේ ශ්‍රාවකයෝ අප ආ වැඩු කල අපට ආ නොවඩන්නාහ"යි උක්තා කළාහ. එපවත් සංඝයා වහන්සේ දැන සර්වඥයන් වහන්සේට දැන් වූසේක. සර්වඥයෝ "ආ වඩන්නා අභිප්‍රාය ඇත්තේ වේදැ"යි වදාරා ශික්ෂා පද අරවා වදාළසේක. එවිට භික්ෂූන් වහන්සේ දන්වනසේක් "ආ වැඩීමත් පෙරලා ඒ වැඩීමත් කොතැන්

පටන් සිට ස්වාමීනි, ඇතිවීදැ?''යි විචාරන්නා "මහණෙනි, පූර්‍වයෙහිදී ඇතිවීය''යි වදරා ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයෝ එක්තරා සෙට්ඨියෙකුට පුත්‍ව උපන්නාහ. ඒ වෙළඳ තමාගේ පුතා අත කඳුවළලු ආදී වූ බඩු පොදියක් දී ඒ ඒ තෙන වෙළඳම් කොටගෙන එන්නේය.

එක් දවසෙක සවස් වේලෙහි බරණැස් නුවරට අවුත් තමන් රෑ ලගින තැනක් නැති හෙයින් ඒ නුවර මනුෂ්‍යයන් අතින් "ආගන්තුග මනුෂ්‍යයන් ලගින්නේ කොතනදැ?'' විචාළ කල්හි මනුෂ්‍යයෝ කියන්නෝ "නුවරින් පිටත සාලාවෙක් ඇත. ඊ යක්‍ෂයෙක් වාසය කෙරෙයි. ඊ ලගිතොත් යව''යි කිවුය. එවිට සෙට්ඨියාගේ පුත්‍රයා කියන්නේ "පියණන් වහන්ස, ඔබම ලගුම්හ. යක්‍ෂයා දමනේ ලන්ට මටම භාරය''යි කීහ. "යහපතැ''යි ගිවිස දෙන්නාම ගොස් සාලාවේ ලැග්ගාහ.

එවේලෙහි බෝධිසත්ත්‍වයෝ පියාණන් වහන්ස් වැදහොත්තද පය මැඩ මැඩ උන්සේක. ඒ වේලාවට ඒ සාලාවෙ වසන යක්‍ෂයාත් දෙළොස් අවුරුද්දක් වෙසමුනි රජ්ජුරුවන්ට පැන් ඇද ඔවුන් විසින් "අසවල් සාලාව වැදහොත්තවුන්ගේ කිඹිසි කල ආ වැඩුවන් පෙරලා ආ වැඩුවන් හැර සෙස්සන් කව''යි වරලැබ ඊ ඉඳ ආ

නොවැඩුවන් කන්නේය. එදවස් රෑ දෙපුතු පියන් කන නිසාත් වස්කප උපන් යක්‍ෂයා සියුම් ධූලි සිඟිත්තක් වැදහෝනා සෙට්ඨියාගේ නාසේ එලාලීය. එවිට වැදහොත් සෙට්ඨියා කිඹිස පියාපය. පය මැඩ මැඩ සෙට්ඨියා ආ නොවැඩීය. එවිට යක්‍ෂයා වස්කපින් බැස ඔහු කරා ගියේය. එවිට බෝධිසත්ත්වයෝ එසේ වීනම් "මේ යක්‍ෂයා කිඹිසපු කල ආ නොවැඩූවන් කන්ට එන යක්‍ෂයෙකැ"යි සිතා ආ වඩන බෝධිසත්ත්වයෝත් "අවුරුදු විස්සක් ඉතිරි සියක් අවුරුද්දක් ඉඳිනාසේක්ව"යි "මෙසේ ආ වැඩීමෙන් ප්‍රේතයෝ මා ලඟට නොඑවත්ව"යි කියා කීහ. මේ නියායෙන් පුතණුවන්ගේ ආ වැඩීම අසා පියාණන් කරා ගියේය. එවිට පියාණෝත් "ආ වැඩුවන්ට පෙරලා ආ නොවැඩුවන් කන්නා වූ යක්‍ෂයෙක් වනැ"යි සිතා "පුත තෙපිත් අවුරුදු විස්සක් ඉතුරු සියක් අවුරුදු ආයු බොහෝ වේවයි, තොපට මා ආ වැඩීමෙන් ප්‍රෙතයෝ මා කරා නොඑත්ව"යි කියා කීය. එවිට යක්‍ෂයා දෙන්නාම ආ වැඩු හෙයින් බැනනොනැගී සිටියේය.

බෝධිසත්ත්වයෝ කියන්නාහු "යක්‍ෂය තෝ ආදිත් බොහෝ පව්කොට යක්‍ෂව උපන, දැනුත් ප්‍රාණඝාතකොට පෙරලාත් දුක් විඳින්නෙහිය, එසේ හෙයින් තෝ අඳුරෙන් අඳුරට ගියා සරිය"යි කියා ඕ හට බොහෝ අවවාද කියා පන්සිල් දී යක්‍ෂයා දමනේලුහ.

එපවත් බොහෝ දෙනාට කීය. එවිට රජ්ජුරුවෝත් එපවත් අසා සතුටුව "මෙසේ වූ පුරුෂයෝ සියලු

කටයුත්තෙහි සපන්නුය''යි සිතා සෙනෙවිරත් ධුරයට තබා ගත්හ. බෝධිසත්ත්වයන්ගේ පියාණුන්ටත් බොහෝ සම්මාන දුන්නාහ. යක්ෂයාටත් දේවාලයක් සලස්වා බලිපිදේනි දෙන නියායෙන් පණත්කොට බෝධිසත්ත්වයන්ගේ අවවාදයෙන් දැහැමෙන් සෙමෙන් රාජ්‍යයකොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියායයි වදාරා “එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් ධර්‍ම භාණ්ඩාගාරික වූ ආනන්ද ස්ථවිරයයෝය. බෝධිසත්ත්වයන්ට පියව උපන් සෙට්ඨියාණෝ නම් ධුතාංගධරයන් කෙරෙහි අගතැන්පත් වූ මහාකාශ්‍යප ස්ථවිරයෝය. එසමයෙහි යක්ෂයා දමනය කළා වූ සෙට්ඨියාණෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැ''යි වදාරා ‘ගග්ග ජාතකය’ නිමවා වදාළසේක.

# 155. අලීන චිත්ත ජාතකය

තවද සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි වීර්‍ය්‍ය අඩු කළ භික්ෂූන් කෙනෙකුන් නිසා මේ ජාතකය දක්වන ලදි. මෙහි වර්තමාන කථාව එකාදශ නිපාතයෙහි සීවලී ජාතකයෙහි විස්තර වශයෙන් බස්නේය. මෙහි සර්‍වඥයන් වහන්සේ “මහණ, දැන් තොපගේ වීර්‍ය්‍ය අඩු පමණක් විනා ආදි තොපගේ වීර්‍ය්‍ය බලයෙන් දෙළොස් යොදුන් බරණැස් නුවර වටලාගත් සේනාව බිඳුවා රාජ්‍යය ගෙන දුන්නේ වේදැ''යි වදාරා “ඒ කෙසේදැ?''යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි වඩුවෝ පන්සියයක් ඒ නුවර මණ්ඩපාදි දේශවලට ගොස් දඬුපත් කපා ගෙනවුත් කර්මාන්ත කරන්නාහ. එසමයෙහි වඩුවෝ සිතන්නාහු "දඬුපත් කපා දගන මෙතනට එන්නා බලාත් එතනම ඉඳ කර්මාන්ත කරම්හ"යි සිතා උඩුගම් බලා ගොස් දඬුපත් සුලභව ලබන තෙන ගෙවල් කොටාගෙන වසන්නාහ.

එසමයෙහි එක් මහා ඇතෙක් ගොදුරු සොයා ඒ ඒ තැන ඇවිදිනේ දිරාගිය කිහිරි ගසෙක පය උල ඇනී මහත් වූ වේදනාවෙන් තුන් පයක් ඇන වඩුවන් උන්තෙනට අවුත් වැටීපියා වැදහොත්තේය. ඒ වේලාවට වඩුවෝ එතනට අවුත් ඇතු පය ඇණුනු උල දැක වටින් අවුළුවා උල ඇද බෙහෙත්කොට වණය සුව කළාහ. එවිට ඇතු තමාට කළ උපකාරය දැක "ප්‍රත්‍යුපකාර කරන්ට උවමැනවැ"යි සිතා ඇතා එතැන් පටන් මෙහෙකරන්ට පටන්ගත. මේ නියායෙන් දවස්පතා දඬු ඇදීම්, දඬු පෙරලීම් ආදී මෙහෙවරකොට වඩුවන් විසින් දවස්පතා ලබන බත්පිඩ් පන්සියය කා දවස් ඇර තමා දුර්වලවන්නා සිතන්නේ "මෙහෙකොට ගන්ට ශක්ති මදව, එසේ හෙයින් තමන්ගේ පුත්වන අජානීය ඇත්පැටවා මෙහෙයට ලායෙමි" සිතා ඇත්පැටවා වඩුවන් ලඟට ගෙනවුත් "පුත මා කළ මෙහෙ ලෙස වඩුවන් සිත්ගෙන මෙහෙ කරව"යි කියා වඩුවන්ට පාවාදී ගියේය.

ඒ ඇත්පැටවාත් වඩුවන් සිත්ගෙන මෙහෙකොට වඩු කුඩා කොල්ලන් හා සමග දියකෙළි ආදී වූ කෙළිත් කෙළිනේය. අජානීය ඇත් ගොඩ මිස දියෙහි මලමුත්‍ර නොකරන්නේය. එක් දවසක් වට වැස්සකින් ඉලත්තියෙක් දියේ වැටී ගස්බිලක අස්සේ වැටී ගියේය. බරණැස් නුවර ඇත්තලයෝ ඇතුන් නාවන්ට ගොස් ගඟට බැස ඇත් ඉලත්තිය ආඝ්‍රාණයකොට දියට නොබසිනාහ. එවිට ඇත්තලයෝ "කුමන කාරණයක් දෝ හෝ"යි පරීක්ෂාකොට ඒ ඉල්ලත්තිය කලඳුකොට, ඇතුන්ගේ ඇඟ ඉස්සාහ. සුවඳ ඇති ඉලත්තිය ඇඟ වැදගත්තා හා සමානකොට සිතා සතුටුව දියට බැස දිය කෙළියාහ.

ඇත්තලයෝ වඩුගම අජානීය හස්තියා ඇති නියාව දැන රජ්ජුරුවන්ට එපවත් කියා "මගුලැත්කමට නිසි ඒ ඇතා ගෙන්වා ගතහොත් යහපතැ"යි දැන්වූහ. රජ්ජුරුවෝ එපවත් අසා සතුටුව ඔරු පාරු පණත්කොට වඩුවන් ඉන්නා උඩුගං බලා ගියාහ.

ඒ වේලාවට දිය කෙළිමින් සිටි ඇත්පැටවාත් පඤ්චාඞගික තූර්යනාද අසා ගොඩ අවුත් වඩුවන් ළඟ සිටියෝය. ඒ වේලාවට රජ්ජුරුවන්ට වඩුවෝ පෙර ගමන්කොට රජ්ජුරුවන් වහන්සේ දැක වැඳ බලා "ගැත්තවුන්ගෙන් දඬුපතින් ප්‍රයොජන ඇත්නම් මිනිස් කෙනෙකුන් අත කියා එවන්නමෝ වේදැ"යි "වැඩියේ ඇයිදැ?"යි විචාළහ. එවිට රජ්ජුරුවෝ "තොප ඇමගෙන් දඬුපත් ඉල්ලවා නොආම්හ"යි කීහ. එවිට වඩුවෝ කියන්නෝ "යහපත ඇරගෙන වඩිනා බව යහපතැ"යි

කීහ. රජ්ජුරුවෝ ඒ ඇතා ගෙන යන්ට යොමු කළහ. ඒ ඇත් යන්ට මැලි විය. එවිට රජ්ජුරුවන් විසින් "මේ කුමන නිසාදැ?"යි විචාරන්නා එවිට වඩුවෝ කියන්නෝ "තමා රැකී මිලදී යන අභිප්‍රාය ඇතිවය"යි කියන්නා රජ්ජුරුවෝ ඇතු මිලකොට සොඬ ලක්ෂයක් අගනාකොට සතරපය සාරලක්ෂයක් වටිනාකොට වල්ගය ලක්ෂයක් වටිනාකොටත් මේ නියායෙන් ඇතුට සලක්ෂයක් මිළකොට වඩුවන්ට එපමණ මිලදී ඇතා ගෙනයන්ට උත්සහ කළත් ඇතා යන්ට මැලි විය.

එවිට රජ්ජුරුවන් විසින් "මැලි වන්ට කාරණා කිම්දැ?"යි විචාරන්නා "වඩුවන් පන්සියයට පිළි දෙන නිසාය"යි කියන්නාහ. එවිට රජ්ජුරුවෝ වඩුවන්ට පිළි දී එසේත් මැලිවන සෙයින් වඩුවන් පන්සියයගේ බිරින්දන් පන්සියයටත් පිළි දීත් එසේත් පමාවන හෙයින් වඩුවන්ගේ දරුවන් ආදීන්ටත් වැල්වලළු ආදී කර්මාන්ත දී ඉක්බිති කිසි කෙනෙකු හන් නොකොට ඉන්දදීම තෙමේම නික්මිනි.

එවිට බරණැස් රජ්ජුරුවෝ ඇතා ඇරගෙන නුවර ඇත්තල දිව්‍යපුරයක් මෙන් සරහා නුවරට ගෙන්වුත් තමන්ට මඟුල් යහනකොට සලස්වා තමන්ට ඇති යම්ම පෙරහරක් ඇත් රජ්ජුරුවන්ටත් සලස්වාලා වශ්වාසව දවස්රිනා සමයෙහි ඇත් රජ්ජුරුවන්ගේ ආනුභාවයෙන් ඒ රජ්ජුරුවෝ සිත්ගෙන වාසය කරන්නාහ.

එසමයෙහි බෝධිසත්ත්වයෝ ඒ රජ්ජුරුවන්ගේ අග්‍රමහේසිකා බිසවුන් කුස පිළිසිඳ දසඑකඩ මසක් පුරා වදන

අවස්ථාවට එක්තරා ව්‍යාධියකින් බරණැස් රජ්ජුරුවෝ නැසී ගියේය. එවිට අමාත්‍යයෝ "රජ්ජුරුවන් මළ පවත් ඇත්රජ්ජුරුවන්ට කීවොත් ඇත්රජ්ජුරුවෝ නැසියෙති" සිතා නොකිවාහ. ඒ අවස්ථාවට කෝසල රජ්ජුරුවෝ "කාත් නැති රාජ්‍යය හෙයින් මා සන්තකය"යි කියා ඇවිත් නුවර වටකොටගෙන "රාජ්‍යය හෝ දෙව, යුද්ධ හෝ කරව"යි කියා පත් යව්වාහ.

එබස් ඇසූ බරණැස් නුවර අමාත්‍යයෝ කියා යවන්නාහු "සමුද්‍රික දන්නා බමුණෝ බිසවුන් වහන්සේගේ බඩ පිරිමි කුමාරයෙක් සත් දවසකින් බිහිවෙති කීහ. එබස් නියම දත් කල රාජ්‍යය දෙතත් යුද්ධ කරතත් එවිටය"යි කියා කැඩපත් යවූහ. එබස් ඇසූ කෝසල රජ්ජුරුවෝ "යහපතැ"යි කියා ගිව්ස්සාය. මේ නියායෙන් සත්දා ගිය පසු බෝධිසත්ත්වයෝ උපන්නාහ. උපන් පසු සේනාව තල්ලු පසු යුද්ධ කරවන්ට වැද පිටබල නැති හෙයින් සේනාව බිඳ බිඳ අනිලන්නාහ. එපවත් අමාත්‍යයෝ බිසවුන්ට පලාගොස් කියන්නාහු "පිටබල නැති හෙයින් යුද්ධ කල නොහැක්ක, එසේ හෙයින් රජ්ජුරුවන් වහන්සේ මළ නියාවත් රාජකුමාරයන් වහන්සේ උපන් නිසා ඇත් රජ්ජුරුවන්ට කියා ඇත්රජ්ජුරුවන් පිටබල කොටගෙන යුද්ධ කරම්හ"යි කීහ. එබස් බිසව අසා "යහපතැ"යි බෝධිසත්ත්වයන් දුහුලක වැදහොවාගෙන ඇතා කරාගොස් කියන්නාහු "නුඹවහන්සේගේ යාළු වූ රජ්ජුරුවන් වහන්සේ නැසුනු නියාව නුඹවහන්සේ ශෝකයෙන් පැළෙතියි සිතා නොකිම්හ. ඒ අවසරයෙන් කෝසල රජ්ජුරුවෝ අවුත් නුවර

වටකොට ගත්තාහ. එසේ හෙයින් නුඹවහන්සේගේ යාළු රජ්ජුරුවන්ගේ පුතණුවන් මරතත් නුඹවහන්සේම මැරුව මැනව, නැවත රාජ්‍යය ගෙන දෙතත් දුනමැනව"යි කියා ඇතා පාමුල රාජකුමාරයන් ඉඳුවූහ.

එවිට ඇත්රාජයන් කුමාරයන් වඩා, ඉස තිබාගෙන අඬා, මෑණියන් වහන්සේට පාවාදී සේවාකමට නික්මුනේය. එවිට අමාත්‍යයෝ ඇත්රජ්ජුරුවන් සන්නාහයෙන් සන්නද්ධ කරවා සරහා සතර වාසල් දොර අලහ. එවිට ඇත් සේනාව සමුර්ධියෙන් නුවරින් පිටත්ව කූඤ්චනාදකොට ඒ ඒ සත්වයන් නොයෙක් තැන ලුහුබඳවා පළමුව රජ්ජුරුවන්ගේ බලකොටුව බිඳ රජ්ජුරුවන් ජීවග්‍රාහයෙන් ඉසකේ පත්ගසා අල්වාගෙන අවුත් රාජ කුමාරයන් දක්වා බොහෝ දෙනම මරන්ට කී ගමනේ මැරිය නොදී "ඉනිබ්බේ මෙසේ වූ දෙයක් නොකරව"යි අවවාද කියා උන්ගේ රටට යවුහ.

බෝධිසත්ත්වයන්ටත් සියල්ලන්ගේ සිත් සන්තෝෂ කරවා උන් විසින් "අලීනචිත්ත"යි නම් තැබූ කල්හි සත් ඇවිරිදි අවස්ථාවේ අභිෂේකකොට එක්සියයක් රාජධානිවල රජදරුවන්ට නායකව දැහැමෙන් රාජ්‍යයකොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදරා "මහණෙනි, ඒ ඇතුන්ගේ වීර්‍ය්‍ය බලයෙන් බිලිඳු කුමාරයන්ට පවා රාජ්‍යය දුන්නුය. එසේ හෙයින් මහණෙනි, වීර්‍ය්‍යම කළමනාය"යි වදාළසේක.

මේ දේශනාවගේ අවසානයෙහිදි වියැඝී අඩු වූ භික්ෂූන් වහන්සේ සියලු කෙලෙසුන් නසා අර්හත්භාවයට පැමිණිසේක. “එසමයෙහි ඒ රාජකුමාරයන්ගේ මෑණියෝ නම් මහාමායා දේවීයන් වහන්සේය. පියරජ්ජුරුවෝ නම් සුද්ධෝදන රජුය. ඒ අජානීය හස්තියා නම් මේ වියැඝී අඩු වූ භික්ෂූන්ය. ඒ ඇතුට පිය වූ මහඇත් නම් සාරිපුත්‍ර ස්ථවිරිය, අලීනචිත්ත කුමාරව උපන්නෙම් දැන් බුදුවූ මම්ම ය”යි වදරා ‘අලීනචින්ත ජාතකය’ නිමවා වදාළසේක.

# 156. ගුණ ජාතකය

තවද සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ආනන්ද සාමීන් විසින් එක් දවසක් ලබන පිළිසගල දහසක් නිසා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

ආනන්ද සාමීන් කෝසල රජ්ජුරුවන්ගේ අන්තඃපුර ස්ත්‍රීන්ට බණ කියන සමයෙහි එක් දවසක් කෝසල රජ්ජුරුවන්ට දස් දස් මිළ වටිනා පිළිසගල දසක් පාක්කුඩම් පිණිස පෑහ. ඉන් රජ්ජුරුවෝ පිළි පන්සියයක් අනඳ සාමීන්ගෙන් බණ අසන බිසෝවරුන්ට දුන්හ. ඒ බිසෝවරු පන්සියය නොඇඳ තිබාගෙන ඉඳ සාමීන් බණ කියන්ට ආ වේලේ පන්සියයක් දෙනම තම තමන් ලත් පිළි පන්සියයම පිළිගැන්වූහ.

අනඳ සාමීන් ඒ පිළි ගෙන ගණයට වැඩිසේක. පසුව දවස් මේ නිමවන වේලාවට බිසෝවරු පන්සියයක් දෙනම

පරණ පිළි ඇඳගෙන රජ්ජුරුවන් කරා එන්නාහ. එවිට රජ්ජුරුවෝ "ඊයේ මා දුන් පිළි කොයිදැ?"යි විචාරන්නාහ. "ස්වාමිනි, ඒ පිළිසඟල පන්සියයම අනඳ සාමීන්ට පිළිගැන්වූහ"යි කියන්නාහ. එවිට රජ්ජුරුවෝ "අනඳ සාමීන්ම පිළිගත්සේක්දැ?"යි විචාරා බිසෝවරුන් "එසේය, පිළිගත්සේකැ"යි කියන්නා "සර්‍වඥයන් වහන්සේ වදාළේ තුන්සිවුරක් වුව, මෙතෙක් පිළි ගත්තේ පිළි වෙළඳම් කරනසේක්දැ"යි සිතා රජ්ජුරුවෝ කිපී අනඳ සාමීන්ගේ ගණයට ගොස් "ස්වාමීනි, අන්තඃපුර වාසීන්ට බණ කියා වදාරන්නේ ඇද්දැ?"යි විචාරන්නා "එසේය මහරජ, කියම්හ"යි වදාරන්නා "කියන පමණක්ද? උයිත් බණ අසා උගනිද්දැ?"යි විචරන්නා "එසේය මහරජ, අසති. පිළිවන් පිළිවන් දෙයක් වණපොත් කෙරෙති" කියන්නා "නුඹවහන්සේ අතින් අසන පමණක් වීනා යම් සත්කාරත් කෙරෙද්දැ?"යි විචාරන්නා "එසේය මහරජ, ඊයේ බණ අසා පිළිසඟල පන්සියයක් දුන්නුහ"යි වදාරන්නා "ඇයි? සර්‍වඥයන් වහන්සේ තුන්සිවුරක් අනුදත්සේක. මෙතෙක් පිළි ගත්තේ ඇයිදැ?"යි විචාරන්නා "මහරජ, සර්‍වඥයන් වහන්සේ විසින් ප්‍රයෝජන විඳීමට තුන්සිවුරක් මිස පිළිගැන්වීමට මෙතෙක් දේෂ නැතැයි සර්‍වඥයන් වහන්සේ වදාළසේක. එසේ හෙයින් මා ලත් පිළි දුර්‍වල සිවුරු ඇති තෙනට දෙමි" කියන්නා "පළමු සඟල සිවුරු කරන්නේ කිම්දැ?"යි කියන්නා "ඒ සිවුරු පොරෝනා සිවුරට අරගන්නාසේකැ"යි වදාළසේක.

එවිට රජ්ජුරුවෝ කියන්නේ "පොරොනා සිවුරු කුමක් කෙරෙද්දැ?"යි විචාරන්නා "මළු තැනක් කපා හැර අඳනා සිවුරට අරගන්නාසේකැ"යි වදාළසේක. "පළමු අඳනා කුමක් කෙරේදැ?"යි විචාරන්නා "ඒ සිවුරු සැතපෙන ඇඳ අතුරණ ලෙස ඇරගන්නාසේකැ"යි වදරන්නා "පළමු ඇඳ ඇතිරිලි කුමක් කරනසේක්දැ?"යි විචාරන්නා "යහපත් ඔප ලූ බුමුතුරුණුකොට අතුරණසේකැ"යි වදාළසේක. "පළමු බුමුතුරුණු කුමක් කරනසේක්දැ?"යි විචාරන්නා "බිස්සකෙට අකුලා පය පිසින්ට ගන්නාසේකැ"යි කීසේක. "පළමු තුබූ බිසි කුමක් කරනසේක්දැ?"යි රජ්ජුරුවෝ විචාළහ. "මහරජ, සැදෑ ඇත්තන් දුන් දෙයම අපවත් නොකරන හෙයින් සියුම් මුවහත් ඇති කරයෙන් රල සීන්කොට කපා මැටි හා හික්තියෙහි අනා ගානාසේකැ"යි "එසේ වූ අවස්ථාවේ සැදෑ ඇත්තන් දුන් දෙය මහරජ, අපවත් නොකරනසේකැ"යි වදාළසේක. එබස් ඇසූ රජ්ජුරුවෝ සතුටුව තමන් ළඟ තිබූ පිළිසඟල පන්සියයත් අනඳ සාමීන්ට දී ගියාහ.

අනඳ සාමී පළමුත් පන්සියයක් පිළිසඟල දුවීල සිවුරු ඇති තැනට දී රජ්ජුරුවන්ගෙන් ලත් පන්සියයක් සඟලට සිතනසේක් "මාගේ භික්ෂූ පන්සියයක් ඇත. ඉන් ඇමටම බාල භික්ෂූන් කෙනෙකුන් මට අත පය මැඩීම්, මළු ඇමදීම් ආදී වූ නානා ගෙවල් ගොම ගැම් ආදී වූ වත්පිළිවෙත් සුවච කීකරුව කෙරෙත්. එසේ හෙයින් මුන්ට සංග්‍රහ කළමනාවේදැ"යි සිතා අනඳ සාමී ඒ නම කෙරේ පැහැද පිළි පන්සියයක් දුන්සේක.

ඒ බාල භික්‍ෂූන් වහන්සේ තමන්වහන්සේ ලත් පිළි අනඳ සාමීන්ගේ ගණෝ පන්සියයක් භික්ෂුන් වහන්සේට පිළිගැන් වූසේක. ඒ පන්සියයක් දෙනාවහන්සේත් සිවුරුකොට කිනිහිරි මලෙහි පැහැය හා සමානකොට පෑය ලා ඒ අලුත් සිවුරු පොරවාගෙ සර්‍වඥයන් වහන්සේදකින්නට වැඩිසේක. දැක වැඳ මෙසේ විචාළසේක. "සෝවාන් වූ ආර්‍ය්‍යශ්‍රාවකයන් වහන්සේත් මුන බැලිම් ඇද්දැ?"යි විචාළසේක. එවිට සර්‍වඥයන් වහන්සේ "ආර්‍ය්‍යශ්‍රාවකයන් වහන්සේගේ එසේ වූ දෙයක් නැතැ"යි වදාරන්නා "එසේ කල අපගේ උපාද්ධ්‍යායන් වහන්සේ විසින් බාල භික්ෂූ නමට පිළි පන්සියයක් දෙනලද්දේ නොවේදැ"ය කීය. "ආනන්දයින් විසින් මූන බලා දුන් දෙයක් නොවෙයි. තමන්ට බොහෝ උපකාරීව සිටි භික්‍ෂූන් හෙයින් ප්‍රත්‍යුපකාරී නිසා දුන්නුය. උන් තබා පළමු උත්තමයෝත් උපකාර කලා වූන්ට ප්‍රත්‍යුපකාර කළෝවේදැ"යි යතහොත් ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ සිංහව ඉපිද පර්‍වතයක වාසය කරනසේක. ඒ කියන පර්‍වතයට නුදුරු තෙන විලක් සමීපයෙහි මඩව ඉවුරු බිඳි ඊ පිට මොලොක් තණ ඇතිව තිබෙන පලෙක් ඇත. ඊට ලඝු සැහැල්ලු සාවුන් මුවන් යා හැක. මහත් සත්‍වයා යා

නොහැක්කේය. එක් දවසක් එක් මුවෙක් ඒ පල සමීපයෙහි තණ කමින් සිටියේය.

බෝධිසත්ත්වයෝත් ගොදුරු නිසා පර්‍වතය මුදුනට නැඟී ගියේ ඒ දෙස බලා පලෙයි තණ කන මුවා දැක "මුවාට පනිමි" සිතා සිංහ නාදකොට පැන්නේය. මුවාත් සිංහ නාද අසා භයපත්ව වහා ගැලවී පලා ගියේය. සිංහයාත් පැමිණි වේග රඳවාගත නොහී පලට පැන තණ කැඩී පා සතර මඩෙහි ගැලී ටැම් සරතක්සේ නිශ්චලව ඇනී ගියේය. මඩින් ගැලවිගත නොහී සිංහයාත් සත් දවසකින් නිරාහාරව සිටියේය. එකල්හි කැණහිලෙක් එන්නට අවුත් සිංහයා දැක භයින් දුවන්ට වන.

එවිට සිංහයා කියන්නේ "පා සතර මඩෙහි එරී පියා සිටියෙමි, මා කෙරේ තෝ නොබා මා කරා අවුත් මාගේ ජීවිතය ගලවා දෙව"යි කීහ. එවිට කැණහිල් නොබා අවුත් "සිංහ රජ්ජුරුවෙනි, නුඹවහන්සේ මා දක්නා උපායෙකින් ගලවමි. ගලවාපු වේලේ පෙරලාම මා මරතියි භය ඇත්තෙමි. ජීවිතදානය දුන්නොත් යහපතැ"යි කීය.

එබස් සිංහයා අසා "කැණහිල්, තෝ භය නොගෙන මට උපකාර සිටුව, තොපට විනාශයක් නොකෙරෙමි. තොපගේ ජීවිතය ඇතිතෙක් මානයේ රකිමි. දන්නා යම් උපායකින් ගලව"යි කීහ.

එබස් අසා කැණහිල් සිංහයාගේ පය කෙරෙන් පසුරු ගාමින් ඇලක් කැන්නේ විල දක්වා කැන, ඒ කැන්නා වූ

ඇලින් පැන් ගෙනවුත් සතර පයට ඇරීය, වියලී තුබූ මඩ සිහිල් විය. එවිට කැණහිල් සිංහයාගේ බඩ කෙළවරට ගොස් තමාගේ ඉසින් සිංහයාගේ යටිබට ඔසවා "ස්වාමීනි, වීර්‍ය්‍ය කළ මැනව"යි කියා සිංහයා එවිට ආරාලා පීනුයේය. ගොඩපැන සිට යන්තන් වේලාවක් සැතපී එතන ලග යෙමින් සිටි මීමෙකු මරා පළමුකොට කැණහිලාට මස් ලා පසුව තුමු මස් කෑහ.

කැණහිල් තමාට ඵෑ මස් කොට්ඨාශයෙන් සමහරක් කා සමහරක් ඩෑගෙන යන්ට වන. "මේ මස් ගෙන යන්නේ කාටදැ?"යි විචාරන්නාහු "නුඹවහන්සේගේ බැලිම්ඩියටය"යි කියන්නා එවිට සිංහයා "යහපත" ඈ සමීපයට ගොස් ඈට බස් දී, එකියන කැණහිල්දෙන හා කැණනහිලා ඇතුළුව ඇරගෙන ගුහාව සමීපයෙහි ගුහාවක වාසය කරවා, දවස්පතා සිංහරජ්ජුරුවන් හා කැණහිල් ගොදුරට යන්නාහු සිංහධේනුව හා කැණහිල්ධේනුව ගුහාවේ හිඳිනීය.

සිංහරජ්ජුරුවෝ මස් මරා කැණහිලාට දී සිංහධේනුවට හා කැණහිල්ධේනුවට මස්කැටි දෙකක් ඩෑගෙන විත් දෙන්නාහ. මේ නියායෙන් දවස් අරණ සමයෙහි සිංහධේනුව පුතුන් දෙදෙනකු වැදුහ. මේ නියායෙන් සිංහපැටවුන් කැණහිල්පැටවුන් එක්ව දවස් හරණාහ. සිංහයාත් කැණහිලාගේ දරුවන්ට ස්නේහ ඇත්තේය. එවිට සිංහධේනුව සිතන්නී "සිංහයා කැණහිල්ධේනුවගේ දරුවන්ට ස්නේහ ඇත්තේය. කැණහිල්ධේනුව හා කැටිව සංවාසය ඇත්තේය"යි සිතා සිංහයා කැණහිල් ගොදුරට ගිය තැන සිංහධේනුව

කැණහිල්ධේනුවට භය ගන්වන්නී "මෙතන ඉඳිනේ ඇයිද? පලාය"යි කියන්නීය. සිංහපැටවුත් කැණහිල්පැටවුන්ට භය ගන්වන්නාහ.

මේ නියායෙන් ඉඳිනා කල්හි කැණහිල්ධේනුව කැණහිලාට කියන්නී "සිංහධේනුන් වහන්සේ මෙසේ භය ගන්වනසේකැයි සිංහරජ්ජුරුවන් වහන්සේගේ සම්මත බවත් නොදැනෙයි. එසේ හෙයින් අපි මෙතන ඉන්ට නොපිළිවනැ"යි කීහ. එපවත් කැණහිල් අසා සිංහරජ්ජුරුවන් කරාගොස් කියන්නේ "ස්වාමීනි, නැතැක් දවස් එකතැන වාසය කරන්නේය. එසේ හෙයින් අප්‍රිය වන්නේය. නුඹවහන්සේගේ සිංහධේනුන් වහන්සේ අපගේ අඹුදරුවන් භය ගන්වන සේක. අප සේ වූ දුර්වලයන්ට පලා යන්ට කියන්නා පලා යන පමණක් විනා භය ගන්වන්ට උවමනාද? එසේම පෝසතුන් ලඟ දුප්පතුන් උන්කල පහකිරීම කාරණා නොවන්නේය. එසේ හෙයින් අපට අවකාශ දුනමැනවයි, ඔබ්බකට ගොහින් වාසය කරම්හ"යි කැණහිල් කීහ.

එබස් සිංහයා අසා තමාගේ සිංහධේනුවට කියන්නේ "එම්බල සිංහධේනුව, මේ කැණහිලා මා විස්වාස වූ කාරණය දනිදැ?"යි විචාරා "විශ්වාස වූ කාරණය නොදනිමි" කී විසින් "එසේ නම් එක් සමයෙක ගොදුරු සොයා ගොස් සත් දවසක් මා මෙතනට නොආ කාරණා දනිදැ?"යි විචාරා "නොදනිමි" කී විසින් "එම්බල, මම මුවෙකුට පැන මුවා වැරදා ගොස් මඩ කලලෙක එරී සත් දවසක් නිරාහාරව උන්ගමනේ මූ නිසා

ප්‍රාණය ලද්දේය. එසේ හෙයින් මාගේ ඉෂ්ටමිත්‍ර යාළුවා බන්ධු වූයයි කියාත් ඇත. ඉෂ්ටමිත්‍රයයි කියාත් ඇත. එසේ වූ කැණහිලාට තොප විසින් වෛරවීම කාරණා නොවෙයි. අදවක් පටන් මම යම්ම සැටියෙක සිතනවා නම් ඒ සැටිම මේ කැණහිලාට සිතව"යි කියා එතැන් පටන් සිංහධේනුවත් කැණුහිල්ධේනුවත් විශ්වාසව දවස් අරණාහ. සිංහපැටවුන් කැණහිල්පැටවුත් විශ්වාසව එක්ව කෙළනාහ. මේ නියායෙන් දවස් අරණා කල්හි සිංහපැටවුන්ගේ දෙමව්පියනුත් කැණහිල්පැටවුන්ගේ දෙමව්පියනුත් මළ පසුත් උනුනුන් කෙරෙහි විස්වාසව දවස් කළාහ. මේ නියායෙන් සත් පරම්පරාවෙක දවස් කළහයි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට වදාළසේක.

චතුස්සත්‍යය ධර්‍ම දේශනාවගේ අවසානයෙහි එමතෙක් දෙනාවහන්සේ සෝවාන් වූසේක. එමතෙක් දෙනාවහන්සේ සකෘදාගාමී වූසේක. එමතෙක් දෙනාවහන්සේ අනාගාමී වූසේක. එමතෙක් දෙනාවහන්සේ සියළු කෙලෙසුන් නසා රහත් වූසේක. එසේ හෙයින් මේ ධර්‍මය බොහො දෙනාට වැඩ පිණිස වදාරා මේ 'ගුණ ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි කැණහිලා නම් ආනන්ද ස්ථවිරයෝය. සිංහව උපන්නේ නම් ලොවුතුරා බුදුවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 157. සුහනු ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කෝපී භික්ෂු දෙදෙනෙකුන් වහන්සේ නිසා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද? යත්,

සැවැත් නුවර වාසය කරන භික්ෂු කෙනෙකුන් වහන්සේ කෝපව චණ්ඩපරුෂව වාසය කරනසේක. පිටිසර එසේම එක් නමෙක් චණ්ඩපරුෂව වාසය කෙරෙති. මෙකියන දෙනම චණ්ඩපරුෂ නියාව ප්‍රකාශව(ප්‍රසිද්ධව) තිබෙයි. එසමයෙහි පිටිසර නම සැවැත් නුවරට වැඩිසේක. සාමණෝර දහර භික්‍ෂූන් වහන්සේ සිතනසේක් "තොපි දෙනම එකතැනට සැලසුනු කල කුමක් කරද්දෝ හෝ"යි සිතා "ඇවැත්නි, නුවර කෝපී නම වසන ගෙයි පිටිසර කෝපී නම ලුසේක. කෝපී දෙනම ඔවුනොවුන් වහන්සේ දැක ආචාර සමාචාරකොට උනුන් වහන්සේගේ අත් පා මැඩ මේ නියායෙන් විශ්වාසව උන්සේකැ"යි මේ කාරණාව ධම්සභා මණ්ඩපයෙහි රැස්ව හුන් මාළුවරුන් වහන්සේ කිය කියා වැඩ උන්සේක.

එතනට සර්වඥයන් වහන්සේ වැඩවදරා "මහණෙනි, මා එන්නට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි වදරා එපවත් අසා "මහණෙනි, දැන්මතු නොවෙයි, යටගිය දවසත් මේ භික්ෂූහු දෙනම ඔවුනොවුන් වහන්සේ දැකපු

වෙලෙහි සමගිවුයෝ වේදැ"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ ඒ රජ්ජුරුවන් වහන්සේට කළමනා සියළු කටයුත්තෙහි තමන් යුක්තව රජ්ජුරුවන්ගේ භාණ්ඩාගාරයට වදිනා අය වියදම් ආදි වූ දෙයත් අසුන් විකිණීමෙන් දක්‍ෂව මැදහත්ව වෙළඳම් කරන අමාත්‍යව උපන්සේක.

ඒ අවධියට අසුන් ගෙන වෙළඳම් කරන ලෙස අසුන් පන්සියයක් ඒ නුවරට ගෙණාවුය. බරණැස් රජ්ජුරුවෝ ලෝභීව එසේ හෙයින් බෝධිසත්ත්‍වයන් දැහැමින් සෙමින් කරන වෙළඳම්වලට මැලිව අනිත් අමාත්‍යයෙකුට අසුන් වෙළඳම් කරන ලෙස සලස්වා ඒ අමාත්‍යයාට කියන්නාහු "අපගේ සොන නම් චණ්ඩ වු අසෙක් ඇත. ඒ අසු වෙළඳමට ගෙනා අසුන් මධ්‍යයේ ලා පියව, ඒ අසුන් මේ අශ්වයා කඩා කා වනයකොට පියයි, වනය කොටපු කල මිළ අඩු වෙයි, මිළ අඩු වුකල සම්පත් දී අරගතැ"යි කියා මේවර කීහ.

අමාත්‍යයෝත් එලෙස කෙළෝය. ඒ අක්යුති විඳගත් අස් වෙළඳ බෝධිසත්ත්‍වයන් වහන්සේ කරා ගොස් එපවත් කීහ. එවිට බෝධිසත්ත්‍වයෝ කියන්නාහු "ඇයි, තොප ඇම ලඟ චණ්ඩපරුෂ අශ්වයෙක් නැද්දැ?"යි විචාළාහ. එබස් ඇසු අස් වෙළෙඳේ කියන්නෝ "අප ලඟත් සුහ නම් චණ්ඩපරුෂ අශ්වයෙක් ඇතැ"යි කීහ. එපවත් බෝධිසත්ත්‍වයෝ අසා "එසේ

වීනම් දෙවැනිව එනකල ඒ අශ්වයාත් ඇරගෙන එව”යි කීහ. එපවත් අස් වෙළෙඳේ “යහපතැ”යි ගිවිස පසුව වලියේ එන්නා වූ ඒ අසුත් ඇරගෙන ආවාහුය.

එවිට රජ්ජුරුවෝ අසුන් ඒ නුවරට ආ නියාව අසා රජ්ජුරුවෝ සිව්මැදුරු කවුළුවේ මතුමාලේ බලා සිටියාහු. සෝන නම් අසුත් අසුන් මධ්‍යයට මුදපූහ. එවිට අස් වෙළඳුන් තමන්ගේ සුහ නම් අසා උනාපුහ. එවිට චණ්ඩපරුෂ අසුන් දෙන්නා උනුන් කරාගොස් උනුන් පිටිතොල තබාගෙන කම්පස් අසුන් මෙන් සිටියාහ. එවිට රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන්ගේ මූන බලා “මේ කිමෙක්ද? කම්පස් අසුන් දෙන්නෙකු මෙන් උනුන් මූන බලා සිටියාහ”යි බෝධිසත්ත්වයන් අතින් විචාළාහ. බෝධිසත්ත්වයෝ ඊට කියන්නාහු “කෙතෙක් දුර වුවත් අසත්පුරුෂයෝ අසත්පුරුෂයන් දුටුකල එක් වන්නේය, සත්පුරුෂයා සත්පුරුෂයෝ දුටුකල එක් වන්නේමය, එසේ හෙයින් නීච වූ අසා නීච වූ අසා හා එක් වූය”යි කියා නැවත කියන්නාහු “රජ්ජුරුවන් විසින් අධික ලොභ නුව මැනව, මනුෂ්‍යයන්ගෙන් අයුක්ති සම්පත්ති ගැනීම දෝෂය”යි කීහ. එබස් රජ්ජුරුවෝ අසා ඔවුන්ගේ වෙළඳම් කිරීම බෝධිසත්ත්වයන්ටම භාර කළාහ.

බෝධිසත්ත්වයොත් අගය වූ නියාවට ඒ වෙළඳම්කොට අස් වෙළඳුන්ට සම්පත් දුන්නාය. අස් වෙළඳුන් සම්පත් ලැබ සන්තෝෂයෙන් ගියාහ. රජ්ජුරුවොත් බෝධිසත්ත්වයන්ගේ අවවාද වූ නියාවට දැහැමින් සෙමින් රාජ්‍යයකොට කම් වූ

පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදාරා "මහණෙනි, එසමයෙහි චණ්ඩපරුෂ අසුන් දෙන්නා නම් මෙසමයෙහි කෝපී වූ භික්‍ෂූන් දෙදෙනය. රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. පණ්ඩිත අමාත්‍ය නම් බුදුවූ මම්ම ය"යි වදාරා 'සුහනු ජාතකය' නිමවා වදාළසේක.

# 158. ස්වර්ණ මයුර (මෝර) ජාතකය

තවද කරුණානිධාන වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ශාසනයෙහි උකටලී වූ භික්ෂු කෙනෙකුන් වහන්සේ සර්වඥයන් වහන්සේට පානාහ. සර්වඥයෝ "සැබෑද මහණ, උකටලී වුයෙහිදැ?"යි වදාරා "සැබෑව, ස්වාමීනි" කියන්නා "කුමක් නිසාදැ?"යි විචාරා වදාරන්නා "සරහන ලද ස්ත්‍රියක දැක ඈ කෙරෙහි පිළිබඳ සිතින් ශාසනයෙහි උකටලී වූයෙහි ය"යි කියන්නා එවිට සර්වඥයෝ "මහණෙනි, මුන් සේවූ අහේතුක ප්‍රඥා ඇති සත්වයා තබා මහොත්තමයෝ ස්ත්‍රී වසඟයට පැමිණියෝ වේදැ"යි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ මයුරව උපන්සේක. උපදිනා බිජු වටින්ම රන්වන් පෑ ඇතිව ඉපිද බිජුවට ගසාපූ කල රන්වන් පෑයව ඉපිද වැඩිවිය පැමිණ

පියාපත් අතුරෙහි මනොඥ වූ සවර්‍ණවර්‍ණ රේඛාවලින් සමලඬකෘතව බැළුවන්ට ප්‍රසාද එලවන තරම් විශේෂ වූ රූපශ්‍රියෙන් යුක්තව ඉන්නාසේක් මෙසේ වූ සිතක් සිතූසේක "මාගේ රූපශ්‍රිය අනර්ඝ හෙයින් මනුෂ්‍යයන් ලග දවස් හැරීමෙන් යම්සේ උපද්‍රවයෙක් වෙ"යි සිතා හිමාලය වනයට ගොස් පර්‍වත වළළු තුනක් ඉක්ම ගොස් සතරවන පර්‍වත වළල්ලෙහි වූ දණ්ඩකාරඤ්ඤ නම් පර්‍වත වළල්ලෙහි වාසය කරන්නෙහිය. ඒ මයුර රජ දවස්පතා ගොදුරු භූමියට බස්නා කල තමාට ආරක්‍ෂාව පිණිස නැගෙන්නා වූ සූර්‍ය්‍ය දිව්‍යපුත්‍රයන් බලා මෙසේ වූ බ්‍රහ්ම මන්ත්‍රයක් කියයි, ඒ කෙසේද?

**"උදෙතයං චක්ඛුමා එකරාජා, හරිස්සවණ්ණො පඨවිප්පභාසො, තංතං නමස්සාමි හරිස්සවණ්ණං පඨවිප්පභාසං, තයජ්ජගුත්තා විහරෙමු දිවසං"**

යන මේ මන්ත්‍රය කියා පර්‍වතයෙන් බිමට බස්නේය.

එහි අභිප්‍රාය(අදහස) කෙසේද? යත්,

සකල චක්‍රාවාල ගර්භවාසී වූ සියලු සත්‍වයාහට රාත්‍රිභාගයෙහි වූ අන්ධකාරය විධ්වංශනය කොට රූප දර්ශනයට හේතු වූ ආලෝක පතුරවන හෙයින් ඇස් ඇත්තා වූ වොරජිම් අර්ථයෙන් සියළු සක්වළගැබ ආලෝක පතුරවන්නා වූ ඒ සූර්‍ය්‍යපුත්‍රයා හට නමස්කාර කෙරෙමි, අද දවස් ඒ සූර්‍ය්‍ය දේවතාවා විසින් රකිනා ලදුව නිර්භයව වාසය කෙළෙමි" කියා සූර්‍ය්‍යාට නමස්කාරකොට දෙවනුව අතීත වූ සර්‍වඥයන් වහන්සේට නමස්කාර කරන මයුරයා මෙලෙස කියා

**"යේ බ්‍රාහ්මණාවෙදගු සබ්බධම්මෙ, තෙ මෙ නමො තෙ ච මං පාලයන්තු, නමත්ථු බුද්ධානං නමත්ථු බෝධියා, නමො විමුත්තානං නමො විමුත්තියා, ඉමං සො පරිත්තං කත්වා මොරො චරති එසනා."**

මෙහි අභිප්‍රාය කෙසේද? යත්,

තවද දුරු කරනලද පාපයන්ඇති ස්කන්ධ ධාතු ආයතනාදී සියළු පදර්ථයන් සර්වප්‍රකාරයෙන් පිරිසිඳ දත්තා වූ යම් සර්වඥයවන් වහන්සේ කෙනෙක් ඇද්ද, මාගේ නමස්කාරය උන්වහන්සේට වේවයි, ඒ අතීත කාලයෙහි අපමණ වූ අචින්ත්‍ය වූ ආබද්ධ ගුණාගණාඩගයෙන් යුක්ත වූ සර්වඥයන්ට නමස්කාර වේවායි, ඒ සර්වඥයන් විසින් ප්‍රතිවෙධ කරනලද සම්‍යයක් සම්බුද්ධ ඥණායටද නමස්කාර වේවායි, ඒ සර්වඥයන් විසින් වදරනලද සද්ධර්ම වූ පරිද්දෙන් පිළිපදිනා වූ සංසාර සාගරයෙන් ගොඩනැගී අමා මහනිවන් දුටුවා වූ සංඝරත්නයටද නමස්කාර වේවායි, ඒ සර්වඥයන් විසින්ද ඒ ආර්‍ය්‍ය සංඝයා වහන්සේ විසින් ප්‍රතිවෙධ කරනලද සතරමග සතරඵල සංඛ්‍යාත වූ විමුක්තියටද නමස්කාර වේවායි කියා ඒ මයුර රජ්ජුරුවෝ මේ පිරිත් ආරක්‍ෂාකොට ගොදුරු පිණිස හැසිරෙන්නාහයි වදාළසේක.

ඒ මයුරතෙම මේ පිරිත් ආනුභාවයෙන් දවල් දවස් සැපසේ කිසි අන්තරාවක් නැතිව සැපසේ ඇවිද රාත්‍රිභාගයෙහි පර්වතයට නැගී, බස්නාහු සූර්‍ය්‍යයා දැක ඒ පරිත්තය පිරිත් වන්නාහු

**"අපෙතයං චක්ඛුමා ඒකරාජා හරිස්සවණ්ණො පඨවිප්පභාසො, තංතං නමස්සාමි හරිස්සවණ්ණං පඨවිප්පභාසං, තයජ්ජගුත්තා විහරෙමු රත්තිං. යෙ බ්‍රහ්මණාවෙදගු සබ්බධම්මෙ, තෙ මෙ නමො තෙ ච මං පාලයන්තු, නමත්ථු බුද්ධානං නමත්ථු බෝධියා, නමො විමුත්තානං නමෝ විමුත්තියා. ඉමං සො පරිත්තං කත්වා මොරො වාසම කප්පයි".**

කියන මේ පරිත්තානුභාවයෙන් රාත්‍රියෙහිත් සැපසේ වාසය කරන්නාහ.

මේ නියායෙන් පරිත්‍යානුභාවයෙන් දවස්පතා වාසය කරන කල්හි එසමයෙහි එක් වැද්දෙක් වනචරකව හිමාල වනයෙහි ඒ ඒ තැන ඇවිදින්නේ ය. බෝධිසත්ත්වයන් වාසය කරන පර්වත සමීපයට ගොස් බෝධිසත්ත්වයන් දැක දෙවෙනිව තමාගේ ගමට අවුත් තමාගේ පුතාට තමා මියන අවස්ථාවේ "එම්බල, අසවල් දණ්ඩකාරඤ්ඤ පර්වත මුදුනේ රන්වන් මයුරයෙක් ඉදිනේය. යම් දවසක රජ්ජුරුවන් වහන්සේ රන්වන් මොනරෙකුගෙන් ප්‍රයෝජන ඇතැයි කීසේක් නම් තෝ ඒ මොනරා අල්වා දෙව"යි කීය.

එසමයෙහි බරණැස් රජ්ජුරුවන්ගේ අග්‍රමෙහේෂිකාව වූ ඛේමා නම් බිසව රාත්‍රියෙහි ස්වප්නයෙන් රන්වන් මොනරකු අතින් බණ අසන්නා දැක පිබිද උදැසන රජ්ජුරුවන්ට කියන්නී "රන්වන් මොනරකු මට අවශ්‍යයෙන් දුටොත් විනා මගේ ජීවිතය නැතැ"යි කියා දෙළ ගත්තාහ. එබව

රජ්ජුරුවෝ දැක අමාත්‍යයන් ගෙන්වා “රන්වන් මොනරකු ඇද්දැ?”යි විචාළාහ. අමාත්‍යයෝ “රන්වන් මොනරෙකු ඇති නියාව, නැති නියාව දන්නෝ බමුණෝ”යි කීවාහ. රජ්ජුරුවෝ “යහපතැ”යි බමුණන් අතින් විචාළහ. බමුණෝ ශාස්ත්‍ර බලා “රන්වන් මොනරු ඇත. ඒ දන්නෝ වැද්දෝය”යි කීහ. එවිට රජ්ජුරුවෝ වැද්දන් ගෙන්වා “රන්වන් මොනරුන් ඇති තැන් දන්නෝ ඇද්ද?”යි විචාළහ.

ඉන් එක් වැද්දෙක් කියන්නේ “ස්වාමීනි, හිමාල වනයෙහි පර්වත වළලු තුනකින් එපිට දණ්ඩකාරණ්‍යද්ඍද නම් පර්වතයෙහි ඇතැ”යි කීහ. එවිට රජ්ජුරුවෝ “එසේ වීනම් තොප ගොසින් ගෙනව”යි කීහ. එවිට වැදි තෙමේ “යහපතැ”යි ගිවිස තමාගේ පුතාට එපවත් කියා තෙමේ වලට(වනයට) ගොස් පියා කී සලකුණු නියාවට දණ්ඩකාරණ්‍යද්ඍද නම් පර්වතයේ මොනරා වාසය කරන නියාව දැක, මොනරා ගොදුරු සොයා බස්නා මාවත දැක, එම මාවත මළ ඉඳුවා බෝධිසත්ත්වයන් බඳින්ට බොහෝ උත්සාහ කළේය. බොධිසත්ත්වයන්ගේ මන්ත්‍රානුභාවයෙන් මළ ඇතුලේ පය ලුවත් මළ නොහැහිරෙන්නේය. මේ නියායෙන් ඒ වැදි තමාගේ දිවිහිමියෙන් උත්සහකොටත් බැරි හෙයින් ඒ හිමාල වනයෙහිම හිඳ මළේය.

ඛේමා නම් බිසවුන් “මොනරා ලබමි” දෙළ නොලත් හෙයින් මළාහ. රජ්ජුරුවෝත් “මොනරා නිසා බිසවුනුත් මළේය”යි සිතා මොනරා කෙරෙහි වෛර බැඳ රන් පොතක

ලියවන්නාහු 'අසවල් හිමාල වන පර්වතයෙහි පර්වත වළලු තුනකින් ඇතුළේ දණ්ඩකාරකද්ඝද නම් පර්වතයෙහි ස්වර්ණ මයුරයෙක් වෙසෙයි. ඒ මයුරයාගේ මස් කෑ කෙනෙක් අජරාමර වෙති' රන්පත ලියාවා භාණ්ඩාගාරයේ රක්‍ෂාකොට තබා මළාහ.

උන්ට ඉක්බිති රාජ්‍යයට පැමිණි රජ්ජුරුවෝත් ඒ රන්පත දැක "එසේ වීනම් මොනරා මරා මස් කා අජරාමර වෙන්ට උවමැනවැ"යි සිතා වැද්දෙකු යවූහ. ඒ වැදිත් බොහෝ උත්සාහකොට මන්ත්‍රානුභාවයෙන් බැරි හෙයින් ඒ වනයේම මළේය. මේ නියායෙන් රජදරුවෝ සදෙනෙක් යැවූ වැද්දෝ සදෙනම බැද්දේ මළ පමණ විනා මොනරා අල්වාගත නොහුනුවාහුය. සත්වැනි රාජ්‍යයට පැමිණි රජ්ජුරුවෝත් රන්පත බලා එලෙසම වැද්දෙකු යවූහ. ඒ වැදිත් වලට ගොස් බෝධිසත්ත්වයන්ට මළ ඉඳුවා බොහෝ උත්සාහකොට බැරි හෙයින් සිතන්නේ "මේ මොනරා මළෙයි පයලාත් නොබැඳෙන්නේය. කුමණ කාරණයකින් දේ හෝ"යි සිතා පරීක්‍ෂා කරනනේ බෝධිසත්ත්වයන් උදෑසනක්සේ සූර්‍ය්‍යයාට නමස්කාරය හා බ්‍රහ්මමන්ත්‍රය පිරවීම් ආදිය වූ කාරණා දැක "එසේ වීනම් මන්ත්‍රය ආකුල කෙරෙමි" සිතා පිටිසර ගමකට පෙරලා අවුත් මොනර සෙබඩක අල්වාගෙන ඒ මොනර සෙබඩ සිටි තැනට අසුරුසන් ගැසූ වේලේ නටා හා රාව ප්‍රතිරාව කරන්නට හා මෙකී දෙය මොනර සෙබඩ කරන ලෙස සලස්වාගෙන මොනර සෙබඩ ඇරගෙන පෙරලා හිමාල වනයට ගොස් බෝධිසත්ත්වයන් ගොදුරු භූමියට බස්නා තෙන

මළ ඉඳුවා එතැන සෙබඩ සිටුවා බෝධිසත්ත්වයන් ඉරු බලා මන්ත්‍රය පිරුවන්ට පළමුකොට මොනර සෙබඩ ලවා රාගනිශ්‍රිතකොට ඇඬවිය.

බෝධිසත්ත්වයෝත් නැතක් දවස නොඇසූ රාගනිශ්‍රිත අඬ සෙයින් ඊ බැඳි යක්‍ෂයන් ආවේශ වූකල කිසිවක් නොදන්නාමෙන් රාගයෙහි බැඳී පිරිවහන මන්ත්‍රය සඳහන් නැතිව සෙබඩ සිටි තෙනට මොනරා බට තෙනත්තෝ මල බැඳින. එවිට වැදි මොනරා අල්වාගෙන ගොස් රජ්ජුරුවන්ට පෑහ. රජ්ජුරුවෝත් මොනරා දැක සතුටු වුහ.

එවිට මයුර රජ්ජුරුවෝ රජගෙන් විචාරන්නේ "මා ගෙන්වූයේ කුමකටදැ?"යි විචාළහ. රජ්ජුරුවෝ කියන්නෝ "තොපගේ මස් කෑවන් අජරාමර වෙති අසා තොප මරා මස් කන්ට ගෙනවමි" කීසේක.

එවිට මයුර රජ්ජුරුවෝ කියන්නාහු "මාගේ මස් කා අජරාමර වෙතොත් යහපතැයි. මා මියන කල මාගේ මස් කෑවුන් අජරාමර වෙන්නේ කෙසේදැ?"යි කිහ. එබස් රජ්ජුරුවෝ අසා "එසේ නොකියව, රන්වන් මොනරා වේදැ"යි කීහ. එබස් මයුර රජ්ජුරුවෝ අසා "එසේ වීනම් රන්වන් වූ කාරණාව අසව, මම යටගිය දවස බරණැස් නුවර චක්‍රවර්ති රජව ඉපිද පන්සිල් රැක දැහැමෙන් සෙමින් රාජ්‍යයකොට ඉන් මියගොස් දිව්‍ය ලෝකයෙහි ඉපිද එයින් චුත වූකල අකුසල් බලයෙන් මේ තිරිසන් යෝනියෙහි උපනිමි. මා රැක්කා වූ පඤ්ච ශීලයෙහි බලයෙන් මෙසේ වූ රූපශ්‍රීයකට පැමිණී

යෙමි" කීහ. ඒ නොඅදහන රජ හට මයුර රජ්ජුරුවෝ කියන්නාහු "මම යටගිය දවස චක්‍රවර්ති රාජ්‍යය කරන සමයෙහි මට ද ආකාශචාරීව ඒ ඒ තැන ඇවිද්ද වූ රන්රුවන් රථයක් ඇත. ඒ රථය තොපගේ මගුල් පොකුණේ දිය ඉස්සා රථය ඇරගෙන මාගේ බස් සැක අරව"යි කීහ.

එබස් අසා රජ්ජුරුවෝ එලෙස පැන් ඉස්සවා රථය ගොඩ ලා ගත්තාහ. රජ්ජුරුවෝ සතුටුව බෝධිසත්ත්වයන් මුද අලහ. බෝධිසත්ත්වයෝත් එවිට රජ්ජුරුවන්ට පන්සිල් දී අවවාදකොට පක්ෂප්‍රහාර කෙරෙමින් දණ්ඩකාරණ්‍යක නම් පර්වතයටම ගියායයි වදරා ශාස්තෘ වු බුදුරජාණන් වහන්සේ චතුස්සත්‍යය ප්‍රකාශකොට මේ 'ස්වර්ණමයුර ජාතකය' නිමවා වදාළසේක. ජාතකාවසානයේදී ඒ භික්ෂූන් වහන්සේත් සියළු කෙලෙසුන් නසා රහත් වූසේක.

"එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. මයුර රජ්ජුරුවෝ නම් ලොවුතුරා බුදුවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 159. විනීල (ක) ජාතකය

තවද ශාස්තෘ වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ රජගහනුවර වෙළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන්ගේ සර්වඥ විලාශය දැක්වීමක් නිසා මේ ජාතකය දක්වන ලදී.

හේ කෙසේද? යත්,

සර්‍වඥයන් වහන්සේ දෑගසව්වන් වහන්සේට වදාරනසේක් "දේවදත්ත ස්ථවිරයන්ගේ පන්සියයක් දෙනාවහන්සේ රහත් කරවාගෙන එනසේක්දැ"යි කියා ඒ දෙදෙනා වහන්සේ ගයාශීර්ෂ නම් දේවදත්ත ස්ථවිරයන් හිඳිනා විහාරයට ගියසේක. එවිට දේවදත්ත ස්ථිවිරයෝ සර්‍වඥ විලාසයක් දක්වන්නෝ "ශාරිපුත්‍ර ස්ථවිරයෙනි, මාගේ වසට රිදෙයි, තොපි බණ කියව"යි කියා ධර්‍මාසනය පිටිපස්සේ වැදහොත්තාහ. සැරියුත් සාමීන් බණ කියා පන්සියයක් දෙනාවහන්සේ රහත් කරවා අරගෙන පලා ගියසේක. එවිට දේවදත්ත ස්ථවිරයන්ගේ ලගට කොකාලික ස්ථවිරයෝ පැමිණ පයින් ලයට ඇණ ලේ තුන් කටක් ගන්වාපුහ.

සැරියුත් මුගලන් දෑගසව්වන් දෙදෙනාවහන්සේත් සර්‍වඥයන් කරා වැඩිසේක. සර්‍වඥයෝද එවිට "දෑගසව්වෙනි, තොප දැක දේවදත්ත ස්ථවිරයෝ කුමන කෘත්‍යයක් කළ සේක්දැ?"යි විචාළසේක. දෑගසව්වන් වහන්සේ වදාරනසේක් "ස්වාමීනි, දේවදත්ත ස්ථවිරයෝ සර්‍වඥ කෘත්‍යයකොට ළය තලාගෙන ලේ තුන්කටත් නගාපුවෝ වේදැ"යි වදාළසේක. එවිට සර්‍වඥයන් වහන්සේ "දැන්මතු නොවෙයි, පළමුත් දේවදත්ත ස්ථවිරයෝ, මාගේ කෘත්‍යකොට හීනවූවෝ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස විදේහරට මියුළු නුවර විදේහ නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි හංසයෙක් කැව්ඩියක හා සමග සංවාස විය. ඒ සංවාසයෙන් කැව්ඩි ධේනුව පුතකු වැදූහ. එකියන පුත්‍රයා මවසේ කළු පැහැයත් නොවෙයි, පිය වූ හංසයාගේ රන්වන් පැහැයත් නොවෙයි, දෙපැයටම නොව නීලවන් පැහැයම විය. ඒ උන්ගේ දෙමව්පියෝ උන්ට නම් තබන්නාවූ 'විනීලයෝය'යි නම් තැබූහ.

හංසයාණන්ගේ හිමාලයෙහි හංස පැටවුන් දෙන්නෙක් ඇත්තාහ. එසේ හෙයින් හංසයා අතරතුරේ මියුළු නුවරට ඇවිත් යන්නේය. ඒ දැක හංස පැටව් දෙන්න කියන්නෝ "පියාණන් වහන්ස, නුඹවහන්සේ මනුෂ්‍ය පථයට නිතර යාමෙන් උපද්‍රව වන්නේය. අපි ගොසින් ඒ පැටවුන් ගෙනෙම්හ"යි කීහ. "එසේ වීනම් මියළු නුවර වාසය කෙරේ තල්ගසෙක් කවුඩු කැදැල්ලක වෙසෙති. තොපි දෙන්න ගොසින් හැරගෙනව"යි යැව්හ.

එවිට හංස පෝතකයෝ දෙන්න විනීල නම් කපුටුවා ලගට අවුත් ඔහු ලීයක හිඳුවා හංසයෝ දෙන්න ලීය දෙපිටින් ඩැගෙන විනීලයා මැද්දෙහි හිඳුවාගෙන මියුළු නුවර මධ්‍යයෙන් නික්මුනාහ. ඒ වේලාවට වෛදෙහ රජුපුරුවෝ යහපත්කොට සැරහී ඇලි අසුන් සතරදෙනෙකු යෙදූ රථයකට නැගී නුවර මහත් ප්‍රදක්ෂිණාවෙන් නික්මුනාහ. ඒ වේලාවට විනීලකයාත් ආකාශයෙන් යමින් සිටියේ රථයෙන් යමින් සිටි රජ්ජුරුවන් දැක කියන්නේ "මියුළු නුවර ගෙයක්කොට ඇති

වේදෙහ රජ්ජුරුවෝත් අසුන් සතරදෙනෙකු යොදනලද රථයකින් නික්මුනාහුය. මමත් ස්වර්ණහංසයෝ දෙන්නෙකු යොදනලද රථයෙන් ආකාශයෙන් නික්මුනෙමි"යි කීය.

එබස් අසා හංසයෝ කෝපව "මූ මෙතනදී මරා පියාම්හ"යි සිතා නැවත සිතන්නාහු "එසේ කළමෝ නම් පියාණන් වහන්සේ 'ඊෂ්‍යාවෙන් මරාපියා ගියහ'යි සිතනාසේකැ"යි සිතා එසේ නොකොට හැරගෙන ගියා වූ හංසයාන්ට එපවත් කීයේය. හංසයා කිපී "තෝ තාගේ තරම නොදනීද? තොප සේ වුවන්ට නිසි මළමුත්‍ර ඇති ස්ථානයෙක විනා මෙසේ වූ තෙන තොපට අස්ථානය"යි කියා හංස පැටවුන්ට කියන්නාහු "මොහු ඇරගෙන මූගේ මවලග ලාපියා එව"යි කීහ. හංසයොත් එලෙසම කළෝදැයි වදරා දෙකල් ගලපා මේ 'විනීල ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි විනීල නම් දේවදත්ත ස්ථවිරයන්ය. හංස පැටවි නම් දෑගසව්වෝය. පියාණෝ නම් ආනන්ද ස්ථවිරයයෝය. වේදෙහ රජව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 160. ඉන්දගුත්ත (ඉන්ද්‍රසමානගොත්ත) ජාතකය

තවද ශාක්‍යසිංහ වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි නොකීකරු භික්ෂූන් කෙනෙකුන් වහන්සේ අරඹයා මේ ජාතකය දක්වනලදී.

ඒ කෙසේද? යත්,

එක් නොකීකරු භික්ෂූන් කෙනෙකුන් වහන්සේ සර්‍වඥයන් වහන්සේට දක්වන්නා "මහණ, නොකීකරු වූයේ සැබෑදැ?"යි විචාරා "සැබැව"යි දන්වන්නා "මහණ, තාගේ නොකීකරුකම් පිණිස පළමුත් ඇතු පයින් මැඩුම් කෑයෙහි වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ පන්සියයක් තපස්වරුන් පිරිවරාගෙන ගණ නායකව හිමාල වනයෙහි වසන්නාහ.

එසමයෙහි ඉන්ද්‍රගුත්ත නම් තාපස කෙනෙක් ඇත් පැටවකු වඩාගත්තාහ. බෝධිසත්ත්වයෝත් "මේ ඇතා වැඩිමෙන් ඇතා නිසා උපද්‍රව පැමිණෙයි. ඒ නොවඩව"යි කීහ. ඒ තාපසයෝ කීවා නොකොට ඇතා මුහුකුරුවා වැඩී එයින් වැඩිවිය පැමිණ මද සෙල්වී ගිය අවස්ථාවට තාපසයෝ තාපසවරුන් හා සමග ඔබ්බෙ ගමකට ගොස් එන කල ඇත් මදයෙන් සිටි හෙයින් ඒ තාපසයන්ගේ පන්සල විදු පැන් සලවල් ආදී වූ දෙයත් බිඳ තාපසයන් ඉඳිනා ගල් පුවරුවත් උදුරා දමා සක්මන් කෙළවර වැතිර සිටිනා පුවරුවත් උදුරා දමා "තාපසයන් මරා යෙමි"යි සිතා වන සමීපයෙහි සිටියේය.

එවේලාවට තාපසයෝ එතනට අවුත් සැක නැතිව ළඟට ගියාහ. එවිට ඇත් තමා ළඟට ආ තාපසයන් දැක තමාගේ දළින් ඇන මරා වලට ගියේය. ඒ දුටු තාපසවරු එපවත්

බෝධිසත්ත්වයන් කීවාහුය. බෝධිසත්ත්වයෝත් එවිට තාපසයන්ට කළමනා ආදාහණ කෘත්‍යයකොට තාපසවරුන් සමීපයට කැඳවා කියන්නාහු "අසත්පුරුෂ නීච වූ සත්ත්වයා ලං කිරීමෙන් දෝෂ නියාව මේ ඉන්ද්‍රගුත්ත තාපසයන් කීවා නොකිරීමෙන් අසත්පුරුෂ ඇතා වඩා මරවා ගත්තා වැන්නේය. එසේ හෙයින් සත්පුරුෂ සත්ත්වයා ලං කිරීමෙන් හා උන් කී අවවාද ලෙසට පිළිපැදීමෙන් බොහෝ ඉෂ්ටාත්ථියට පැමිණෙන්නේය"යි යනාදීන් තාපසවරුන්ට අවවාද කියා කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදාරා මේ 'ඉන්ද්‍රගුත්ත ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි ඉන්ද්‍රගුත්ත තාපසයෝ නම් මේ නොකීකරු භික්ෂූහුය. එසමයෙහි කීකරු තාපසයෝ නම් බුදු පිරිසය. එසමයෙහි තාපසයන්ට අවවාද කළා වූ නායක තාපසයෝ නම් මම්ම වේදැ"යි සම්මා සම්බුදුරජාණන් වහන්සේ දක්වා වදාළසේක.

# 161. සන්ථව ජාතකය

අසරණසරණ වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ගිනිදෙවියාට පූජා කරන නිගණ්ඨයන් අරභයා මේ ජාතකය දක්වනලදි.

ඒ කෙසේද යත්?

මෙහි වර්තමාන කථාව 'නංගුට්ඨ' ජාතකයෙහි විස්තර වශයෙන් දක්වනලදි. භික්ෂූන් වහන්සේ "ස්වාමීනි, මුන්පුද

ගිනිදෙවියාගෙන් මතුවන වැඩෙක් ඇද්දැ?''යි විචාළසේක. ඊට සර්‍වඥයන් වහන්සේ "මහණෙනි, පෙර උත්තමයෝත් මෙහි වැඩෙක් ඇද්දේ හොයි බලා වැඩක් නැති හෙයින් ඇරපුවෝ වේදැ''යි වදරා "ඒ කෙසේදැ?''යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ බමුණු කුලයක ඉපිද දෙමව්පියන් විසින් උපන් දවස් තිබූ ගිනි නොනිවා තිබා බෝධිසත්ත්‍වයන්ගේ වයස් සොළොස් ඇවිරිද්දට පැමිණි කල්හි බෝධිසත්ත්‍වයන්ට කියන්නාහු "පුත, මේ ගිනි ඇරගෙන ගොස් වහ්නි දේවතාවාට පූජාකොට වනයේ තපස් කරවු නම් ඒසේ කරව නැත්නම් ශාස්ත්‍රය ඉගෙණ කුටුම්ඹසණ්ඨාපනයකොට(විවාහවී) වාසය කරව''යි කීහ.

එවිට බෝධිසත්ත්‍වයෝ "මට ගිහිගෙයින් කම් නැතැ''යි කියා ගිනිදෙවියා ඇරගෙන ගොස් වහ්නි දෙවතාවාට පූජාකොට වලට(වනයට) ගොස් පන්සලක් ඉදිකොට ගිනිදෙවියාට පූජා කරන්නාහ.

එසමයෙහි එක් දවසක් දන්දෙන ගෙයකින් එළගිතෙල් මුසු කිරිබතක් ලැබ "මාගේ ගිනිදෙවියාට පූජා කෙරෙමි''යි සිතා ගෙනවුත් ගිනි මොළවා තෙල් මුසු කිරිබත් ගින්නට දැමූහ. එවිට තෙල් අධික හෙයින් ගිනි මහත්ව ඇවිල පන්සල දවන්ට වන.

ඒ වේලාවට බ්‍රාහ්මණ පන්සලින් පිටත්ව තමාගේ පන්සල දැවෙනු බලා කියන්නේ "අසත්පුරුෂ වූ නිවයා හා එක්වීමෙන් මා බොහෝ දුක්විඳ ඉදිකොට ගත් පන්සල දවන පමණකැ"යි කියා ගිනි නිවා හිමාලය වනයට නික්මිනි.

එවිට අතරමග සිංහයකු හා ව්‍යාඝ්‍රයෙකු හා දිවියෙකු හා තුන් දෙනාගේ මූන ලෙව ලෙව සිටි රිලවකු දැක "සිංහ ව්‍යාඝ්‍ර දෙදෙනා හා දිවියා ඇතුළු වූ තුන්දෙනා විශ්වාස නිසාත් අසත්පුරුෂයා විසිනුත් මුන්ට අනර්ථ නොකරති" කියා හිමාලය වනයට ගොස් ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා ආයු කෙළවර බ්‍රහ්මලෝකයෙහි උපන්හයි වදරා 'සන්ථව ජාතකය' නිමවා වදාළසේක. "එසමයෙහි තාපසව උපන්නෙම් බුදුවූ මම්ම වේදැ"යි වදාළසේක.

# 162. සුසීම ජාතකය

තවද සරණාගත වජ්‍රපඤ්ජර වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ජන්ද දානයක් අරභයා මේ ජතකය දක්වනලදි.

හේ කෙසේද යත්?

සැවැත් නුවරවාසීහු එක් සමයෙක තනි තනිව සර්‍වඥයන්ට දන් දෙන්නාහ. සමහර ද පස්දෙනා එක්ව දන් දෙන්නාහ. සමහර දවස් වීථියක මනුෂ්‍යයෝ එක්ව දන් දෙන්නාහ. සමහර දවස් නුවරවාසීහු එක්ව දන් දෙන්නාහ. මේ නියායෙන්

දන් දෙන සමයෙහි එක් දවසක් නුවරවාසීහු එක්ව දනක් සරහා ගත්තාහ. එවිට තීර්ථක භක්තික ඇත්තෝ "නිගණ්ඨනාථපුත්‍ර, මක්ඛලිගෝසාලාදී වූ අසත්සමයේ ඇත්තන්ට දන් දෙමිහ"යි එක භක්තිගත් උපාසකවරු කියති. සම්‍යයක් භක්ති ගත්තෝ "සර්‍වඥයන් වහන්සේ ප්‍රධාන භික්ෂු සංඝයා වහන්සේට දන් දෙමිහ"යි කියති. මේ නියායෙන් උනුන් ගිවිස්වාගත නොහී දවස් අරණ සමයෙහි එක් නුවණැති මනුෂ්‍යයෙක් කියන්නේ "මේ දෙපක්‍ෂයෙන් බොහෝ මිනිසුන් ඇති පක්‍ෂයේ කෙනෙකුන්ට දන් දෙමිහ"යි කියා කීහ. ඒ වේලේ බොහෝ මිනිසුන් ඇත්තේ බුද්ධශාසනයේ හෙයින් "බුද්ධශානයටම දන් දෙමිහ"යි කියා ඒ නියාවට දන් සපයා දුන්නාහ.

එසමයෙහි සර්‍වඥයන්ගේ දන් කඩ කරන්නට සිතූවන් කඩ නොකොට දන් දීපුවාහ. සර්‍වඥයෝත් අනුමෙවැනි බණ වදරා ජේතවනාරාමයට වැඩිසේක. භික්‍ෂූන් වහන්සේත් තමන් වහන්සේගේ ගණවලට වැඩි රාත්‍රි මානයෙහි දම්සභා මණ්ඩපයට රැස්ව "ඇවැත්නි, තීර්ථකයන් විසින් සර්‍වඥයන් ලබන්නා වූ ලාභ සත්කාරයට අන්තරායෙක් කරන්ට උත්සහකොටත් අන්තරායෙක් කොටගත නුහුනුවෝ වේදැ"යි මේ කථාව කිය කියා වැඩඋන් තැනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදරා "මහණෙනි, මා එන්නට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා එපවත් අසා "මහණෙනි, දැන්මතු නොවෙයි, පළමුත් මාගේ ලාභ සත්කාරයට අන්තරාය කරන්නට වැදත් අන්තරාය කොටගත නුහුනුවෝ

වේදැ''යි වදාරා ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර සුසීම නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ පුරෝහිත බමුණාන කෙනෙක් ඇත්තාහ. ත්‍රිවේදයෙහි පාරප්‍රාප්තව ඇත් වේද හා ඇත් ලක්‍ෂණ දැන අවුරුදු පතා හස්ති යාගකොට කෙළ ගණන් සම්පත් ලබන්නාහ. ඒ අවදියේ බෝධිසත්ත්‍වයෝ ඒ බමුණාගේ ගෙයි බැමිණිය බඩ පිළිසිඳ ඉපිද සත්අට අවුරුදු පැමිණි කල බෝධිසත්ත්‍වයන් වහන්සේ ගේ පියාණෝ නැසී ගියාහ.

එසමයෙහි හස්ති යාගය පැමිණියේය. එවිට බමුණෝ එක්ව ''හස්ති යාගය කරන කල් පැමිණියේය. ස්වාමීනි, මෙතෙක් දවස් හස්ති යාගකොට සිටි පුරෝහිත බමුණා වැටිහුණු හෙයිනුත් උන්ගේ පුතාණෝ කිසිම ශාස්ත්‍රයක් නොදනිති, එසේ හෙයින් අපි හස්ති යාග කරම්හ''යි කීවාහුය. එවිට රජ්ජුරුවෝත් ''යහපතැ''යි ගිවිස්සොය. ''අදින් බමුණෝ සතරවෙනිදා හස්ති යාගය කරම්හ, එසේ හෙයින් බොහෝ ලාබ ලබම්හ''යි ඇවිදිනාහ.

ඒ දුටු බෝධිසත්ත්‍වයන්ගේ මෑණියෝ ''සත්මුත්තක ප්‍රවේණිව පැවත ආ හස්ති යාගත් ඔබ්බකට සැලසී ගියේය. අප බොහෝ ලබන සම්පතුත් හානි විය''යි කියා හඬන්ට වන්හ. එසේ අඬ අඬා උන්නා වූ මෑණියන් උන්තෙනට බෝධිසත්ත්‍වයොත් ඇවිත් ''මෑණියන් වහන්ස, අඬන්නේ

ඇයිදැ?"යි විචාරා එපවත් අසා "අදට යාග කරන්නේ කී දවසකැදැ?"යි විචාරා "සතර දවසෙකැ"යි අසා "මේ හස්ති යාගය හා ත්‍රිවෙදය දන්නෝ කවුරුදැ?"යි විචාරා "මෙතනට එකසියවිසි යොදුන් ඇති තක්සලා නුවර දිසාපාමොක් ශිල්ප දනිති" කී විසින් "එසේ වීනම් සෙට දවල් තක්සලා නුවරට යෙමියි, රෑ දෙවරු ශාස්ත්‍ර උගෙන පසු දවස් අවුත් සතරවෙනි දිනයෙහි යාගය කෙරෙමි. එසේ හෙයින් නුඹ වහන්සේ වික්‍ෂෙප නුවූව මැනව"යි මෑණියන් අස්වසා මෑණියන් උදසනක්සේ ලූ බත් කා අචාරිභාගය(ගුරු පඬුරු) හැරගෙන උදෑසනක්සේ නික්ම සනධ්‍යා වේලාවට එකසියවිසි යොදුන් මගගෙවා තක්සලා නුවරට පැමිණ දිසාපාමොක් ආචාරීන් දුටුහ. ඒ ආචාරීන් "කුමක් නිසා අවුදැ?"යි විචාරා "ත්‍රිවෙදය හා හස්ති ශාස්ත්‍රය උගන්ට ආමි. මට වහා උගන්නට උවමැනවැ"යි කී විසින් "මෙතෙක් ශාස්ත්‍ර කෙසේ උගන්වන්නෙහිදැ?"යි කියන්නා "එසේ නොවෙයි, අදින් තුන්වෙනි දවස් හස්ති යාග වෙයි. එසේ හෙයින් එකසියවිසි යොදුන් කතර ගෙවා මමත් ආයේ වෙමියි, එසේ හෙයින් අදට පරක්කුවක් නොවී නුඹවහන්සේ විසින් පාලිය පමණක් පිරිවණ මම අද්‍යාතන වශයෙන් අර්ථ විදහා දැන ගනිමි" කියා ඒ නියාවට ආචාරීන් ගිවිස රෑ බත් කා ඉක්බිති බෝධිසත්ත්වයෝත් බත් කා ආචාරීන් පය සෝද ආචාරීන් වැඳ ආචාරිභාගයේ මසුරන් දහස පාමුල තිබා උන්නාහ.

ආචාරීන්ද තමන් දන්නා ශාස්ත්‍රය පිරිවා පාන්කොට පුවාහ. බෝධිසත්ත්වයෝත් ආචාරීන් විසින් වහා වහා සඟවා

කියාපුවා ඒකශෘති හෙයින් ධරා "ආචාරීන් වහන්ස, තව ඇද්ද?"යි විචාළසේක. ආචාරී "ඒතෙකැ"යි කී විසින් "එසේ වීනම් අසවල් තැන අසවල් වැරදිය, අසවල් තෙන මෙසේ හරිය, එසේ හෙයින් මෙවක් පටන් ශිල්ප උගන්වන කල මෙසේ උගන්විය මැනවැ"යි යනාදීන් අචාරීන්ට කියා උදුසනක්සේ පිටත්ව බරණැස් නුවරට අවුත් මෑණියන්ට ශාස්ත්‍ර උගත් පුවත කියා උන්නාහ.

පසු දවස් රජ්පුරුවන්ගේ සියයක් ඇතුන් රන් සන්නාහයෙන් සරහා රන් ධජ, රිදී ධජ ආදී වූ දෙය නන්වා මහත් වූ අලංකාරකොට "අපි යාග කරම්හ"යි සැරහී බමුණෝ සිටියාහ. ඒ වේලාවට රජ්පුරුවොත් මහත් වූ අලංකාරයෙන් සැරහී යාගයට උවමනා පිළි පළඳනාව දෙයත් ගෙන්වාගෙන යාග ශාලාවට ආහ. ඒ වේලාවට බෝධිසත්ත්වයෝත් කුමාර අලංකාරයෙන් සැරහී මහත් පිරිවර පිරිවරන ලදුව එතනට අවුත් රජ්පුරුවන් දැක කියන්නාහු "කළුපැහැ ඇති සුදුදළ ඇති රන් සන්නාහයෙන් සරහනලද සියයක් ඇතුන්ගේ යාගය අපට පැවත ආ යාගය ඔබ්බකට සලස්වා වදාළයි කියන්නා ඇසිමි. ඒ සැබෑදැ?"යි කීහ.

එවිට රජ්පුරුවවෝ කියන්නාහු "කළුපැහැ ඇති සුදුදළ ඇති රන් සන්නාහයෙන් සරහනලද සියයක් ඇතුන්ගේ යාගය, තෝ ශාස්ත්‍ර නොදනීව කී විසින් ඔබ්බකට සැලසුවා සැබැව"යි කීහ. එවිට බෝධිසත්ත්වයෝ කියන්නාහු "නුඹවහන්සේගේ සත්මුත්තන් පරම්පරා හා මාගේ සත්මුත්තන් පරම්පරාවේ

අපිම යාගකොට ආ පමණක් විනා කළ කෙනෙක් නැත්තාහ. එසේ හෙයින් මේ බමුණන් තිබා දඹදිව බමුණන් එක එක සී එකවත් මා කී බසට උත්තරයක් කියන්නට සපන් එකද බමුණෙක් නැත. ත්‍රිවේදය හා හස්ති ශිල්පය මට වඩා දන්නෝ නැතැ”යි කීහ. එතන සිටි බමුණෝ බෝධිසත්ත්වයන් කළ සිංහනාදය අසා උත්තරයක් කියන්නට අසමර්ත්‍ථ වූහ. එවිට බෝධිසත්ත්වයෝ යාගකොට ලදමනා සම්පත් ලබාගෙන ගෙට ගියෝ වේදැයි වදාරා ‘සුසීම ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි බැමිණියෝ නම් මහාමායාදේවිය. පියාණෝ නම් සුද්ධෝදන රජ්ජුරුවෝය. බරණැස් රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. දිසාපාමොක් ආචාරී නම් ශාරිපුත්‍ර ස්ථවිරය. බ්‍රාහ්මණ කුමාරව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම ය”යි වදාළසේක.

මේ ජාතකය අවසානයෙහි බොහෝ දෙනා සෝවාන් වුහ. එමතෙක් දෙනා අනාගාමී වුහ. එමතෙක් දෙනා සකෘදාගාමී වුහ. එමතෙක් දෙනා සියළු කෙලෙසුන් නසා රහත් වුහ. එසේ හෙයින් මේ ධර්‍මය බොහෝ දෙනාට සාර්ත්‍ථක විය.

## 164. නකුල ජාතකය

තවද පරදුක්ඛ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කෝසල රජ්ජුරුවන්ගේ සේනා නායක මහඅමාත්‍යයන් දෙන්නෙකුගේ කෝපයක් නිසා මේ ජාතකය

දක්වනලදී. මෙහි වර්ථමාන කථාව යටකියනලද ‘උරග’ ජාතකයෙහි විස්තර වශයෙන් බස්නේය. “මහණෙනි, මේ මහඅමාත්‍යයන් දෙන්නාගේ කෝප වෛරය පළමුත් ඇරවූවෙම් වේදැ”යි වදරා ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ බ්‍රාහ්මණ කුලයක උපන්සේක. පඤ්චකාමයෙහි ආදීනව දැක ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පන්සලක වාසය කරනසේක.

එසමයෙ පන්සල සමීපයෙහි සක්මන් කෙළවර තුඹසක මුගටියෙක් වාසය කෙරෙති. එතනට සමීපයෙහි ගස් බිලක(බෙනයක) සර්පයෙක් වාසය කෙරෙයි. එසමයෙහි ඒ කියන නාගයා හා මුගටියා දවස්පතා උනුන් කඩා කා උනුන් කන්නාහ. එසමයෙහි තාපසයෝ සිතනුයේ “මා සේ වූ තාපස කෙනෙකුන් සමීපයෙහි ඉන්නා මුන් දෙන්නා උනුන් කෙරේ වෛරව ඉඳින්ට සුදුසු නොවෙ”යි සිතා අවවාද කියා සමගි කළහ. එසමයෙහි එක් දවසක් සර්පයා ගොදුරට යා දී මුගටියා තුඹසින් කර මෑත්කොට දත් පෙණනතුරු කට දල්වාගෙන වැදහෙව නිදමින් සිටියේය. ඒ වේලාවට තාපසයෝ එතනට අවුත් ඌ දැක “ඇයි තා ඉතා භයංකාර කොටපියා ඉන්ට තාගේ අසත්පුරෂ වූ සර්පයාත් සත්පුරුෂව ගියා වුව, කුමක් නිසාදැ?”යි විචාළහ. එවිට මුගටියා

කියන්නේ "අමිත්‍රයා කෙරෙහිත් සංකා කළ යුතුමය, මිත්‍රයා කෙරෙහිත් සංකා කළ යුතුමය, එසේ හෙයින් පසමිතුරා කෙසේ විශ්වාස වුවත් සංකා කළ යුතුය"යි කීහ.

එබස් අසා බෝධිසත්ත්වයෝ "තොප සේ වූ සිතක් සර්පයා කෙරේ නොසිතව"යි කියා භාවනාකොට නොපිරිහුනු ධ්‍යානයෙන් ගොස් බ්‍රහ්මලොකයෙහි උපන්නාහ. මුගටියා හා නාගයත් කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදාරා මේ 'නකුල ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි මුගටියා හා නාගයා නම් මේ සමයෙහි වෛරී වූ අමාත්‍යයෝ දෙන්නාය. තාපසව උපන්නෙම් ලොවුතුරා බුදුවූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 165. උපසාල්හ (ක) ජාතකය

තවද කරුණානිධාන වූ සර්‍වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි උපසාල්හක නම් බ්‍රාහ්මණයෙක් ඇත.

දිනක් ඒ බ්‍රාහ්මණයා තම පුතණුවන් කැඳවා කියන්නේ "පුතණුවනි, දවසෙක මා මළහොත් චණ්ඩාලාදීන් නොදවපු සුචිපවිත්‍ර ස්ථානයක දවව"යි කීහ. එබස් අසා බමුණාගේ පුතා කියන්නේ "මම එසේ වූ ස්ථානයක් නොදනිමි. නුඹවහන්සේම එසේ වූ ස්ථානයක් පෑවොත් යහපතැ"යි කීහ. එබස් අසා බමුණා "කීයේ කාරණය"යි කියා පුතා හා සමග ගිජ්ජකූට පර්‍වතයට ගොස් ගල්කුළු තුනක් මධ්‍යයේ "මෙතන යහපතැ"යි

පුතාට කියා පුතා හා තමා දෙන්නා පාතට බස්නා අවස්ථාවට එදවස් සර්වඥයන් වහන්සේ මහකරුණා සමාපත්තීන් ලොව බලා වදාරනසේක, බමුණා හා පුතාගේ හේතු සම්පත් දැක ගිජ්ජකූට පර්වතයට නැගී වදාළසේක.

එවේලාවට බමුණා හා පුතා බස්නාවුන් දැක "ඇයි කොතනට ගොසින් බසුදැ?"යි විචාරා වදාළසේක. එවිට පිය බමුණා නොබැන නොනැගී සිටියේය. පුතා කියන්නේ "ස්වාමීනි, මේ අපගේ පියාණන් වහන්සේ හානි වූ දවසෙක යහපත් තෙනක තමන්වහන්සේ දවන්ට කියා පර්වත මුදුනේ කුළු තැනක් මධ්‍යයේ දවන්ට කීසේක. ඒ බලන්ට ගියම්හ"යි කීහ.

එවිට සර්වඥයෝ "ඒ ස්ථානය බලන්ට අපිත් යම්හ"යි බමුණා සමග පර්වතයට නැගී ස්ථානය දැක "තාගේ පියා හා තෙපි නොඉඳුල් තෙනක් සොයා ඇවිද්දේවේදැ"යි වදාරා බමුණා විසින් ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස රජගහ නුවර උපසාල්හක නම් බමුණෙක් ඇත. ඒ තමාත් තමාගේ පුතා හා සමඟ "කාත් නොදැවූ ස්ථානයක දවන්ට උවමැනවැ"යි කියා ගිජ්ජකූට පර්වතයට නැන්ගේය. බෝධිසත්ත්වයෝ මගධරට බමුණු කුලයක ඉපිද දිසාපාමොක් ආචාරීන් අතුරෙන් ශිල්ප නිමවා ඉගෙණ සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවදිව වාසය කරන්නේ, බමුණා හා පුතා ගිජ්ජකූට පර්වතයට අවුත් බස්නා වේලාවට උන් හා සමග

පර්වතයට නැගී “මේ තොප කරන්නේ කිම්දැ?”යි විචාරා එපවත් අසා තාපසයෝ පරසිත් දන්නා විසින් “එම්බල බ්‍රාහ්මණය, සුචි පවිත්‍රයට අටගත්තා වූ ස්ථානයේ ඒ ඒ ජාතියේ සත්ත්වයන් මෙතන දැවූ ජාති හා තාත් ඒ ඒ කුලයෙහි ඉපිද වූ ජාති හැර මෙම නුවර උපසාල්හක නම් බ්‍රාහ්මණව ඉපිද මේ තමාගේ පුතා හා සමඟ එතනට අවුත් දැවූ ජාති තුදුස්දහසයක් වෙයි, එසේ හෙයින් මිනියක් නොදැවූ ස්ථානයක්, මිනියක් නොතිබුණු ස්ථානයක් එක තැනකත් නැත්තේ වේදැ”යි කියා සතර විහාර භාවනාකොට බඹලොව ගියහයි වදරා ‘උපසාල්හක ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි දෙපුතුපියෝ නම් දැන් මේ දෙපුතුපියෝමය. තාපසව උපන්නෙමි ශාස්තෘ වූ බුදුවූ මම්ම ය”යි වදාළසේක. මේ ජාතකාවසානයේදී ඒ බ්‍රහ්මණ දෙපුතුපියෝ දහසක් නයින් ප්‍රතිපණ්ඩිත වූ සෝවාන් ඵලයෙහි පිහිටියාහ.

# 166. සමිද්ධි ජාතකය

තවද ලෝකදිවාකර වූ සර්වඥයන් වහන්සේ රජගහ නුවර තපෝදාරම විහාරයෙහි වැඩවසන සමයෙහි සමිද්ධි තෙරුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

“සමිද්ධි තෙරුන් වහන්සේ යයි යන නම කුමක් නිසාදැ?”යි යතහොත් එක් දවසක් ජලස්නානය කොට අඳනය ඇඳගෙන සිවුර අත ලාගෙන ඇඟ පැන් වියලෙන තුරු සිටසේක. එවිට බොහෝ භික්ෂූන් වහන්සේ උන්වහන්සේගේ

රූපශ්‍රීය දැක රූපශ්‍රීයෙන් අඩුවක් නැති හෙයින් ‘සමිද්ධි තෙරුන් වහන්සේ ය’යි නම් ලත්සේක.

එක්තරා දිව්‍යස්ත්‍රියක් උන්වහන්සේගේ රූපශ්‍රීය දැක පිළිබඳ සිත් ඇතිව, එක් දවසක් උන්වහන්සේ කරා ගොස් කියන්නී “මේ නිසා රූපශ්‍රීයාවක් ඇතුව පඤ්චකාම සැපය අනුභව නොකොට මහණව ඉඳිමෙන් කාරණය කිම්ද? වෘද්ධි අවස්ථාවට පැමිණි කල තපස් රැක්ක මැනව”යි කිව. “මේ අවස්ථාවෙහි ගිහිගෙයි උන්න මැනවැ”යි කී එබස් අසා තෙරුන් වහන්සේ කියනසේක් “එම්බල, මරණ නම් කවර අවස්ථාවෙහි පැමිණෙන බවත් නොදැනෙයි. එසේ හෙයින් සිවුරු නොහරිමි”යි කීසේක. එවිට දේව දූ තමා අභිප්‍රාවට බස් නොකී හෙයින් අන්තර්ධානව ගියාහ. තෙරුන් වහන්සේ එපවත් ගොසින් සර්‍වඥයන් වහන්සේට කීසේක. සර්‍වඥයෝත් “පළමුත් දේවතා දූ තොප තබා උත්තමයන්ටත් මේ බස් කීවාවේදැ”යි වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ හිමාලය වනයෙහි වාසය කරන සේක. එක් දවසක් ජලස්නානයකොට රිටිසුඹුලක් අත ලාගෙන ශරීරයේ පැන් වියලෙන තුරු වැඩ සිටිසේක. එක්තරා දිව්‍යස්ත්‍රියක් උන්වහන්සේගේ රූපශ්‍රීය දැක පිළිබඳ සිත් ඇතුව “යෞවන අවස්ථාවේ පඤ්චකාම සැප අනුභව නොකොට මහණව

ඉඳිමෙන් කාරිය කිම්ද? වෘද්ධ අවස්ථාවට පැමිණි කල තපස් රැක්ක මැනව, මේ අවස්ථාවෙහි ගිහිගෙයි උවමැනව''යි කීව.

එබස් අසා තාපසයෝ කියන්නෝ ''එම්බල, මරණ නම් කවර අවස්ථාවේ පැමිණෙන බවත් නොදැනෙයි. එසේ හෙයින් තාපස ප්‍රව්‍රජ්‍යා නොහරිමි''යි කීසේක. එවිට දිව්‍යස්ත්‍රී අන්තර්ධාන වීයයි කියා 'සමිද්ධි ජාතකය' නිමවා වදාළසේක.

''එසමයෙහි තාපසව උපන්නේ බුදුවූ මම්ම ය''යි වදාළසේක.

# 167. සකුණග්ඝි ජාතකය

තවද ත්‍රෛලෝක්‍ය චූඩාමාණික්‍ය වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් දවසක් භික්ෂූන් වහන්සේට අවවාද කරනසේක් ''මහණෙනි, භික්ෂූන් විසින් දෙමව්පියන් ගොදුරුසොයා ගිය මග යා යුතුය. අස්ථානයෙහි ගොදුරු සොයා යාම විනාසයට කාරණය''යි යනාදී 'සකුණ සූත්‍රය' වදාළසේක.

ඒ විස්තර වශයෙන් මහවග්ගෙහි බස්නේය. ''මහණෙනි, පක්ෂි පවා අස්ථානයේ ගොදුරු සොයා යාමෙන් විනාශයට පැමිණියෝ වේදැ''යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ

කැටකිරිලිව උපන්සේක. කැටකිරිලිව ඉපිද සීකැට අස්සේ ගොදුරු කා නෑයන් හා සමග වසන්නා වූ කැටකිරිලි තොමෝ එක් සමයෙක "අන්‍යභූමියෙක ගොදුරු සොයා කමි" සිතා ඔබ්බකට ගොස් තැනි බිමක ගොදුරු සොයා කමින් සිටියේය. ඒ වේලාවට එක් උකුස්සෙක් කැටකිරිල්ලට නොඅඟවා අවුත් ගසාගත. කැටකිරිලි උකුස්සා ගසාගෙන යමින් සිටියෙදී හඬ හඬා කියන්නී "මාගේ විෂය නොවූ පරවිෂයට අවුත් මේ සා දුක් පැමිණියේය. මාගේ විෂය වීනම් මට කුමක් කොට පියන්නෝ ඇද්දැ?"යි කීය.

එබස් ඇසූ උකුස්සා "එසේ වීනම් තාගේ විෂයට ගොස් හිඳූ, තාගේ විෂය මම ගසාගත නොහෙම්දැ"යි කියා කැටකිරිල්ල අත අළහ. එවිට කැටකිරිල්ල ඇවිත් සී කැට මධ්‍යයේ හිඳ "මෙවිට මා ගසාගතැ"යි කීය. එබස් උකුසු අසා මහා වේගයෙන් ගසන්ට අවුත් ළගට "දැන් දැන් ගසමි" කී අවස්ථාවට සී කැටයෙන් බිමට බැස සැඟවින, උකුසුත් ආ වේගය රඳවාගත නොහී සී කැටෙහි ලය තලාගෙන දැස් උඩ හිඳුවා මළේය.

ඒ දක්වන්නා වූ සර්‍වඥයන් වහන්සේ "මහණෙනි, යම් සේ දෙමව්පියන් ඉන්නා වූ ස්ථානයෙන් ඔබ්බට ගියා වූ කැටකිරිල්ලී යම් සේ දුකට පැමිණායේද? පියාණන් නැවිඳුනා වූ මග ඇවිඳුනා වූ භික්‍ෂූන්ට එසේම වන්නේය. භික්ෂුන්ට පියාණෝ කවුරුදැයි යතහොත්? සර්‍වඥයන් වහන්සේය. උන්වහන්සේ වදාළ මර්ගය නියාවට පිළිපැදීම උතුම, යම් සේ

කැටකිරිලි සී කැට ඇති තැන ගොදුරු නොකා තැනි බිම ගොදුරු කන්ට ගොස් උකුස්සාට අසුවිද? එම නියායෙන්ම මහණෙනි, රූපශ්‍රීයක් දැක ඊටම චක්‍ෂුරින්ද්‍රිය එලීමෙන්ද, යමෙක් තෘෂ්ණාවට වාල්විමෙන්ම ඉන්ද්‍රිය එලීමය යනාදී රූපාලම්බනයෙහි ඇල්මකොට මෘත්‍යුමාරයාට අසුවන නියාව යහපත් තෙනට ගොදුරට නොගොසින් උකුස්සාට අසුවූවාක් මෙන් එසේ වූ රූපාලම්බනයෙහි සිත නොඑලවා සර්‍වඥයන් වදාළ ප්‍රතිපත්ති නියාවට දවස් හැර සංසාරසාගරයෙන් ගැලවී යාම නම් තමාගේ ස්වකීය ස්ථානයට ඇවිත් ගැළවී ගියා වූ කැටකිරිල්ල වැන්නේය. මහණෙනි, ඒ කැටකිරිල්ලිත් මළා වූ උකුස්සා පිටට පැන නැගී මාගේ ස්ථානයට පැමිණි හෙයින් පසමිතුරා පිටු දක්වන ලදැ"යි වදරා 'සකුණග්ඝි ජාතකය' නිමවා වදාළසේක. ජාතකාවසානයෙහි බොහෝ සත්ත්වයෝ සෝවාන් වූහ.

"එසමයෙහි උකුස්සා නම් දේවදත්ත ස්ථවිරයයෝය. කැටකිරිල්ලිව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 168. අරක ජාතකය

තවද ශාක්‍යසිංහ වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි 'මෙත්තසුත්‍රය' නිසා මේ ජාතකය දක්වන ලදී.

ඒ කේසේද යත්?

"මහණෙනි, පුරුදු කරන ලද්දා වූ, වඩන ලද්දා වූ, මෙනෙහි කරන ලද්දා වූ මෛත්‍රී සිතින් උපලක්ෂිත වූ සත්ත්වයන් හට එකොළොස් වැදෑරුම් වූ ඉෂ්ට විපාක ඇත්තේය. ඒ කවරේද? යත්, ඒ සත්ත්වතෙමේ යෙහෙන් නිදන්නේය. යෙහෙන් පුබුදින්නේය. භයංකර ස්වප්නාදියක් නොදක්නේය. සියලු සත්ත්වයන්ට ප්‍රියකරු වන්නේය. යක්ෂ රාක්ෂාදින්ටත් ප්‍රියකරු වන්නේය. දෙවියන් විසින් රක්නා ලබන්නේය. ඕහට ගින්නෙන් හෝ විෂයෙන් හෝ ආයුධයෙන් හෝ උපද්‍රවයක් නැත්තේය. ප්‍රසන්න ජව්වණී ඇත්තේය. සිහිමුළාව නොමියන්නේය. මරණින් මත්තෙහිත් නොපිරහුණු මෛත්‍රී ඇත්තේය.බ්‍රහ්මලෝකයෙහි උපදින්නේය"යි මෙත්තානිශංස ගෙනහැර දක්වා වදාරා "මහණෙනි, භික්ෂූන් විසින් තමා සියළු සත්ත්වයා කෙරෙහි පිරිසිඳ හෝ සාමාන්‍යයයෙන් හෝ සියළු සත්‍වයෝ නිදුක්, නිරෝගී, සුවපත් වෙත්වයි කියා මෛත්‍රී භාවනාවද, දුක්ඛිත සත්ත්වයෝ දුකින් මිදෙත්වයි කියා කරුණා භාවනාවද, සුවපත් සත්ත්වයන් දැක සත්ත්වයෝ සුඛිතමුදිත වෙත්වයි කියා මුදිතා භවනාවද, සියළු සත්ත්වයන් කෙරෙහි උත්කර්ෂවක් නෙකොට සම සිතින් දැකීමෙන් උපේක්ෂා භාවනාවදැයි චතුර්විධ බ්‍රහ්මවිහාර භාවනායෙහි යෙදී වාසය කළ යුත්තේය"යි සම්ප්‍රාප්ත පර්ෂදට ධර්මදේශනාකොට වදාරා "මහණෙනි, පෙරත් උත්තමයෝ මෛත්‍රී භාවනාවකොට සංවර්තවිවර්ස්ථායි කප් සතක් වනතුරු බ්‍රහ්ම සම්පත්තියෙන් නොපිරිහුණෝ වේදැ"යි

වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස එක්තරා කපෙක අප මහබෝධිසත්ත්වයන් වහන්සේ බ්‍රාහ්මණ කුලයෙක ඉපිද පඤ්චකාමයෙහි ආදීනව දැක ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව බොහෝ තාපසවරුන්ට නායකව 'අරක' මහශාස්තෘව වාසය කරනසේක. තුමුත් මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්‍ෂා යන සතර බ්‍රහ්මවිහාර භාවනාකොට තමන්ගේ තාපසවරුන්ටත් අවවාද කරන්නෝ මෙසේ කියාත්.

"තාපසවරු නම් යම් සේ සත්ත්වයෙක් සතර දිගය, සතර අනුදිගය, උඩය, යටය යන දශ දිශාවෙහි ඇත්තා වූ සත්ත්වයා කෙරෙහි මෙත් සිත් පතුරුවාද, ඒ සත්ත්වයාගේ සන්තානයෙහි අටගත් අකුශල ධර්‍ම කෙනෙක් ඇත්නම් අධික වූ මෛත්‍රී ආනුභාවයෙන් යුක්ත වූ හෙයින් විපාක දයක නොවී ඒ අකුශලයෝ කුශලයෝ වන්නාහුය"යි බෝධිසත්ත්වයෝ ඒ ඍෂිගණයාට ධර්‍මදේශනාකොට සතර බ්‍රහ්මවිහාර භාවනකොට එයින් චුතව බ්‍රහ්මලෝකයෙහි ඉපිද සංවර්තවිවර්තස්ථායි කප් සතක් බ්‍රහ්මසම්පත් වින්දහයි  වදාරා "එසමයෙහි අරක නම් ශාස්තෘ වූයෙම් ලොව්තුරා බුදුවූ මම්ම ය"යි වදාරා 'අරක ජාතකය' නිමවා වදාළසේක.

# 169. කකණ්ටක ජාතකය

කකණ්ටක ජාතකය වනාහි සර්‍වධර්‍මයන් සර්‍වාකාරයෙන් අවබෝධකොට දේශනාකර වදාළ සර්‍වඥ රාජෝත්තමයාණන් වහන්සේ විසින් වදාළ දේශනා පාළියෙහි පෙනෙන හෙයින් අටුවාචාරීන් වහන්සේ විසින්ද ජාතකයක් වශයෙන් කියන ලදි. එසේ වී නමුදු එහි විස්තර කථාව ‘උම්මග්ග’ ජාතකයෙහිම විස්තර වශයෙන් පෙනෙන්නේ යයි දත යුතු.

# 170. කලයාණ (ධම්ම) ජාතකය

තවද ශාක්‍යකුල නායක වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ශාසනයෙහි ප්‍රසන්න වූ එක් උපාසකයෙක් සර්‍වඥයන් වහන්සේ ගෙන් බණ අසන්ට ගඳදුන්, මල්, පහන් ගත් අත් ඇතිව සර්‍වඥයන් කරා දකින්ට ගියේය.

උන් යා දී උන්ගේ නැන්දා ගෙටවුත් තමාගේ දුව අතින් විචාරන්නී “තොපගේ ස්වාමිපුත්‍රයා තොපට ප්‍රියකරුව වාසය කෙරේදැ?”යි විචාළාය. එපවත් අසා කියන්නී “අපගේ ස්වාමිපුත්‍රයා දවස් අරන මනා භික්ෂු කෙනෙකුන් දවස අරන වැන්නැ”යි කිව. මවගේ කණ මහළු සෙයින් ඇට ඇසෙන්නේ “ස්වාමිපුත්‍රයා ගියා”යි කීවා සේ ඇසින. “එසේද තොපගේ ස්වාමිපුත්‍රයා මහණ වෙන්ට ගියා”යි කියා අඬන්නට වන. ඇගේ අඬ අසා ගෙයි දැසීදස් සියල්ලෝ අඬන්නට වන්හ.

බොහෝ ස්ත්‍රී පුරුෂයෝ ඒ ගෙට එන්නෝ “කිමෙක්දැ?”යි විචාරා එපවත් ඇසූහ.

ඒ වේලාවට උපාසක පෙරලා ගෙට එන්ට විදියට බැසපීය. ඒ වේලාවට එක් මිනිසෙක් ගොසින් එපවත් මගදී දැක කෙළඹිපුත්‍රයාට කියන්නේ “තොපගේ ගෙයි තොප මහණ වූවයි කියා එහි අඬති” කීහ. එපවත් කෙළඹිපුත්‍රයා අසා “මට උපන්නා වූ කීර්ති ඝෝෂාව නොනසමි” සිතා ගණයට ගොස් සවීඟදයන් වහන්සේ ගේ සමීපයට ගියේය. සවීඟදයෝත් “ඇයි උපාසකය දැන් නොවේද, තෝ බුද්ධුපස්ථානයකොට ගියෝ, පෙරළා කුමක් නිසා අවුදැ?”යි විචාරා “ස්වාමීනි, මහණ නොවී ඉන්දදී මහණ වුවයි ඇසින. ඇසුනු කීර්ති ඝෝෂාව නොනසමි සිතා මහණ වන්නට ආමි. එසේ හෙයින් මා මහණ කර වදාළොත් යහපතැ”යි කීය.

එබස් අසා සවීඟදයෝත් “යහපැතැ”යි කියා මහණ කර වදරා උපසම්පදව දෙවා වදාළසේක. ඒ භික්ෂූන් වහන්සේත් නොබෝ දවසකින් විදර්ශනා වඩා රහත් වූසේක.

එක් දවසක් භික්ෂූන් වහන්සේ ධම්සභා මණ්ඩපයේ රැස්ව කථා කරනසේක් “ඇවැත්නි, අසවල් කෙළඹිපුත්‍රයා තමාට උපන් කීර්ති ඝෝෂාව නොනසා මහණව සියළු කෙළෙසුන් නසා රහත් වූවෝ වේදැ”යි කිය කියා වැඩහුන් තැනට සවීඟදයන් වහන්සේ වැඩවදරා “මහණෙනි, මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?”යි විචාරා වදරා එපවත් අසා “මහණෙනි, පෙර උත්තමයෝත් උපන්නා

වූ කීර්ති ඝෝෂාව නොනැසුවෝ වේදැ''යි වදාරා ''ඒ කෙසේදැ?''යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ගේ නුවර සිටාණ කෙනෙකුගේ ගෙයි ඉපිද වැඩිවිය පැමිණ ඒ සිටාණන්ගේ ඇවෑමෙන් සිටුසේසත් ලැබ රාජසේවය කරන සමයෙක්හි එක් දවසක් රාජසේවය කරන්ට යා දී වර්ත්තමාන කථාව සේම ''සිටාණන් මහණ වූහ''යි හඬන්නට වන්නාහ.

ඒ වේලාවට බෝධිසත්ත්වයන් වහන්සේත් රාජසේවයකොට පෙරලා ගෙට යන්නා වූ මග යන මිනිසෙකුගෙන් එපවත් අසා ''කීර්ති ඝෝෂා නොනසමි'' සිතා පෙරළා රජගෙට අවුත් රජ්ජුරුවන් දුටුහ. රජ්ජුරුවෝත් ''සිටාණනි, ගියවර නොමකා ආයේ කුමකටදැ?''යි විචාරන්නා ''දේවයන් වහන්ස, මා මහණ නොවී ඉන්ද දී මහණ වුහයි කීර්ති ඝෝෂා පැතිරින. ඒ උපන්නා වූ කීර්ති ඝෝෂා නොනසා මහණ වන්නා කැමැත්තෙමි''.

එසේ හෙයින් ඒ අර්ත්‍ථය ප්‍රකාශකොට දක්වන පිණිස මහසිටාණෝ මෙසේ කියත් ''ජනප්‍රධාන වූ දේවයන් වහන්ස, යම් සේ කල්‍යාණ වූ කීර්ති ඝෝෂාවක් ප්‍රකාශ වූකල කීර්ති ඝෝෂාව නසාපීම කාරණා නොවෙයි, හිරිඔතප් ඇති

සත්ත්වයන් තමාට පැමිණි ධූරය හැරපීම කාරණා නොවෙ”යි කියා තවද කියන්නා හු “ජනප්‍රධාන වූ දේවයන් වහන්ස, එසේ හෙයින් මට පැමිණියා වූ කල්‍යාණ ගුණය අරනේ යුතු නැත. එසේ හෙයින් ස්වාමීනි, මම මහණ දම් පුරමි. පඤ්චකාමයෙහි තෘෂ්ණාව නැතැ”යි කියා රජ්ජුරුවන් අතින් අවකාශ ඉල්වාගෙන හිමාල වනයට ගොස් තාපසව පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවාගෙන නොපිරිහුනු ධ්‍යානයෙන් ගොස් බඹලොව උපන්නාහයි වදරා ‘කල්‍යාණ ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් දැන් ආනන්ද ස්ථවිරයෝය. තාපසව උපන්නෙම් දැන් බුදුවූ මම්ම ය”යි වදාළසේක.

# 171. දද්දර ජාතකය

තවද ශාක්‍යකුල තිලක වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කොකාලික ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්?

සැවැත් නුවර බොහෝ භික්ෂූන් වහන්සේ ඒ ඒ තැන බුදුන්ගේ පාළි ධර්‍මය පිරිවහනසේක. ඒ කෝකාලික තෙරුන්නාස්සේ බණ කියන්නා අසා තමන්වහන්සේ බණ කියාගත නොහෙතත් බණ කියන නියාවට “අපි බණ

නොකියමෝද? එසේ කල අපගේ බණ අසන්නෝ ඇත්නම් කියන්නමෝ වේදැ''යි කියාගෙන ඇවිදිනාසේක.

එපවත් සංඝයා වහන්සේ අසා "ඒසේ වීනම් කොකාලිකයෙනි, අද දවස් තෙපි බණ කියව''යි කීසේක. එබස් අසා "යහපත බණ කියමි'' ගිවිස යහපත්කොට කැඳ අවුළුපත් ආදී දෙය වළඳා කටුකරඬු මලේ පැහැය ඇති සිවුරකුත් යහපත් තැඹිලිවන් සිවුරකුත් ඇඳ පෙරව බණ කියන්ට උන්සේක. "ධම්මස්සවන කාලෝ අයං භදන්තා'' කියා බණට අඬ ගා ඒ අඬ අසා බොහෝ භික්ෂූන් වහන්සේ ධම්සභා මණ්ඩපයට රැස් වූසේක.

එතනට තමන්වහන්සේත් වැඩ වෘද්ධ භික්ෂුන් වහන්සේට නමස්කාරකොට විසිතුරු කර්මාන්ත කළ විජිනිපත්‍රයක් අතට ගෙන ධර්මාසනාරූඪව බණ කියන්ට වැද පළමුකොට කියන ගාථාවෙන් පදයක් කියා අනිකුත් පදය දැකගත නොහී තුෂ්ණීම්භූතව, සර්වාංගය මුළුල්ල ඩාදිය සෙල්වී තමන්වහන්සේ කී වාසයට බණ කියාගත නුහුණු හෙයින් භය ලජ්ජාවට පැමිණ ධර්මාසනයෙන් බැස කරබාගෙන පලා ගියසේක. ඒ වේලේ අනිකුත් භික්ෂූ කෙනෙකුන් වහන්සේ පළඟ නැගී බණ කීසේක.

එක් දවසක් ධම්සභා මණ්ඩපයෙහි රැස් වූ මාළුවරුන් වහන්සේ "කොකාලික ස්ථවිරයන් බණ කියන්ට සපනායයි උනුම්භ. දැන් උන් බණ නොදන්න නියාවත්, අනුවණ නියාවත් දතුම්භ''යි කිය කියා මේ කථාවෙන් යුක්තව උනුසේක. එතනට

සර්‍වඥයන් වහන්සේ වැඩවදාරා එපවත් අසා ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයෝ සිංහයන් ට රජව ඉපිද ගල්ගුහාවක වාසය කරන්නාහ. එතන සමීපයෙහි ගල්ගුහාවෙක කැණහිලෙක් වාසය කරන්නේය. එසමයෙහි එක් දවසක් මහවැස්සෙක් වට. එවිට බොහෝ සිංහයෝ බෝධිසත්ත්‍වයන් ලඟට අවුත් බෝධිසත්ත්‍වයන් හා සිංහනාදකොට කෙළනට වන්හ.

ඒ වේලාවට කැණහිලාත් තමාගේ ගල්ගුහාවෙන් එලියට අවුත් අඬ ගසා කෙළිනට වන. කැණහිලාගේ හඬ ඇසූ සිංහයෝ ලජ්ජාව මුවෙන් නොබැන සිටියාහ. ඒ වේලාවට බෝධිසත්ත්‍වයන්ගේ පුත් වන සිංහ පැටවෙක් බෝධිසත්ත්‍වයන්ට කියන්නේ “පියාණන් වහන්ස, මේ සිංහ සමූහයා අඬ ගසා කෙළිමින් සිටියව තිබුයේ ඇයිදැ?”යි විචාළේය.

එපවත් සිංහ රජ්ජරුවෝ අසා “එම්බල පුත, අපි නම් සිව්පාවුන්ට රජකුලේ උපනුමහ, එසේ වූ අපි හැම කෙළිනා වේලාවට සිව්පාවුන්ට නීච වූ සිගාලයා අප මෙන්ම අඬ ගසා අප හා සමානව ම කෙළන්ට වන්හ. සිගාලයෝ අප හා සමඟ අඩු හෙයින් ලජ්ජාවෙන් සිංහයෝ බැන නොනැගී උනුම්හ”යි වදාරා මේ ‘දද්දර ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි සිගාලයෝ නම් කෝකාලික ස්ථවිරයෝය. සිංහ පෝතකයෝ නම් රාහුල ස්ථවිරයෝය. සිංහ රාජව

උපන්නෙම් ලොවුතුරා බුදුවූ මම්ම ය''යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 172. මක්කට ජාතකය

තවද ශාක්‍යසිංහ වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි වඤ්චාප්‍රයෝග දන්නා භික්ෂු කෙනෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

මෙහි වර්තමාන කථාව 'පකිණ්ණක' නිපාතයෙහි 'උද්දල' ජාතකයෙහි විස්තර වශයෙන් එන්නේය. මෙහි "මහණෙනි, පළමුත් මේ භික්ෂූහු වඤ්චාවෙන් ගිනි තපින්ට වන්නේ වේදැ''යි වදාරා "ඒ කෙසේදැ?''යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ එක්තරා කෙළඹි පුත්‍රයෙක්ව උපන්නාහ. එසමයෙහි බෝධිසත්ත්වයන්ගේ බිරින්දෑ පුතෙකු වැදූහ. ඒ පුතා වැඩිවිය පැමිණෙන අවස්ථාවට බෝධිසත්ත්වයන්ගේ බිරින්ද නැසී ගියහ. එවිට බෝධිසත්ත්වයන්ගේ පුතණුවන් කැන්දගෙන බොහෝ නෑයන් අඬමින් සිටියදී ගේ පිරුණු සම්පත් හැර හිමාල වනයට ගොස් පන්සලක්කොට වාසය කරන්නාහ.

එසමයෙහි එක් දවසක් මහා වැස්සෙක් වසින්ට වන. ඒ වේලාවට බෝධිසත්ත්වයෝ පන්සල මැස්සෙක වැදහොත්තාහ. බෝධිසත්ත්වයන්ගේ පුතණුවෝ බෝධිසත්ත්වයන්ගේ පය මැඩ

මැඩ උන්නාහ. ඒ වේලාවට එක් වඳුරෙක් සීතයෙන් පිඩිතව පියා සිතන්නේ "මම තාපසයන්ගේ පන්සලට ගියේ නම් වැදද නොදෙති. තාපස වේසයක් ලාගෙන යෙමි" සිතා මළා වූ තාපස කෙනෙකුන්ගේ වල්කලා ඇඳගෙන තාපසයන් පන්සල ගාවා තල්ගස මුල කරබාගෙන සිටියේය.

ඒ වේලාවට බෝධිසත්ත්වයන්ගේ පුතණුවෝ ගෙයි සිට දොරට ගිය තැනැත්තේ වඳුරු දැක "තාපස කෙනෙකුන් වහන්සේ ඇවිත් සිටින සේකැ"යි සිතා ගෙට අවුත් "පියාණන් වහන්ස, තාපස කෙනෙකුන් වහන්සේ අවිත් දොර සිටිනසේක. උන් ගෙට ගෙන්වා ගිනිතප්ප වන්නට උවමැනව"යි කියා එබස් අසා මැස්සෙන් බැස දොරට අවුත් වඳුරා දැක "එම්බල පුත, තාපස කෙනෙකුන්ට මෙසේ වූ මුහුණක් නැත. එසේ හෙයින් මේ වඳූරාය. මුන්සේ වුවන් ගිනි තපින්ට ගෙන් වූකල තැප යන කල පන්සල ගිනි ලා පියා යන්ට හපන්නුය. එසේ හෙයින් තා මෙතන සිටින්නේ ඇයිදැ"යි කියා ගිනි පෙල්ලක් බලා ගැසූහ. එවිට තමාගේ මල්කලා දමා ගසට පැන නැන්ගේය.

බෝධිසත්ත්වයෝත් සතර බ්‍රහ්මවිහාර භාවනාකොට නොපිරිහුනු ධ්‍යනයෙන් ගොස් බ්‍රහ්මලෝකප්‍රාප්ත වූහයි වදාරා 'මර්කට ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි වඳූරා නම් වඤ්චාප්‍රයෝග දන්නා භික්ෂූහුය. එසමයෙහි තාපස කුමාරයෝ නම් රාහුල ස්ථවිරයෝය.

තාපසව උපන්නෙමි ලොව්තුරා බුදුවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 173. දුතිය (දුබ්භි) මක්කට ජාතකය

තවද ශාක්‍යකුල චූඩාමාණික්‍ය වූ සර්වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි දේවදත්ත මහතෙරුන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

එක් දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස් වූ භික්ෂූන් වහන්සේ "දේවදත්ත ස්ථවිරයෝ අකෘතඥයෝය. කෙළෙහි ගුණ නොදනිති" යනාදීන් මේ කථාව කොට උන් කල්හි සර්වඥයන් වහන්සේ එතනට වැඩවදාරා "මා එන්නට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා "අනික් කථාවකින් යුක්තව නුම්හ. දේවදත්ත ස්ථවිරයන් වහන්සේගේ කෙළහි ගුණ නොදන්න බව කිය කියා උනුම්හ"යි කී කල්හි "මහණෙනි, දැන්මතු නොවයි, දේවදත්ත ස්ථවිරයෝ කෙළෙහි ගුණ නොදන්නෝය"යි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ කසීරට බමුණු කුලයක ඉපිද පඤ්චකාමය හැර තාපසව වසන්නාහ.

එසමයෙහි එක්තරා අවදියක නියඟෙක් කළේය. බොහෝ පක්ෂීහු පැන් නොලබන්නාහ. මඟ යන මනුෂ්‍යයන් ඇති කාලයෙහි පැන් ලබන්නාහ, නැති කලෙහි නොලබන්නාහ. එසමයෙහි මනුෂ්‍යයන්ගේ සංචාරය නැතක් කාලයක් ඒ මඟ නුවුයේය. එසමයෙහි බෝහෝ පක්ෂීහු පැන් නොලබන්නාහ. එක් වඳුරෙකුත් පැන් වළක් සමීපයෙහි පැන් වත්කරන කෙනෙකුන් නැත්තෙන් බල බලා ඉඳීය.

එසමයෙහි බෝධිසත්ත්වයෝ කිසියම් කටයුත්තක් නිසා ඒ මඟ යන්නාහු ඒ විල සමීපයට ආවාහු පැන් උකා බී නහා වඳුරාත් එතන සිටි විසින් උන්ට පැන් වත් කළාහ. ඒ පැන් බී බඩ පුරවාගෙන ගසට නැගී බෝධිසත්ත්වයන්ට උසුළු පාන්නට වන. එවිට බෝධිසත්ත්වයෝ “යහපත, තොප සේ වූවන්ට පැන් වත්කළ හෙයින් උසුළු පානෙ වේදැයි, නීචයාට කළ දෙයෙහි ප්‍රත්‍යුපකාර නැත්තේ වේදැ”යි කීහ. එපවත් වඳුරා අසා “අපගේ ජාතියෙහි සත්ත්වයන් උපකාර කළ වුන්ට ප්‍රත්‍යුපකාර කළ කෙනෙක් කොයි ඇද්ද? තව මා කරන්නේ මෙතෙක්ද? තොපගේ හිස වර්චස් කොටද මා යන්නේය”යි කීහ. එබස් අසා බෝධිසත්ත්වයෝ “මෙසේ නීචයා එසේ කරන්නේ සැබැවැ”යි කියා නික්මුණාහ. වඳුරා තමා කරා එන්නා අත්ත උඩ ඉඳ බෝධිසත්ත්වයන් හිස් මුදනේ වර්චස් එළා ගියෝය. බෝධිසත්ත්වයෝ වඳුරා කෙරේ අමෛත්‍රියක් නොසිතා ගොස් ඉස සෝද නහා ගියෝ වේදැයි වදරා මේ ‘චිතීය මක්කට ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි වඳුරා නම් දේවදත්ත ස්ථවිරයෝය. තාපසව උපන්නෙම් බුදුවූ මම්ම ය”යි වදාළසේක.

# 174. ආදිච්චුට්ඨාන ජාතකය

තවද ශාක්‍යකුල ප්‍රසාද වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි වඤ්චාප්‍රයෝග දන්නා භික්‍ෂු කෙනෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්?

වඤ්චාප්‍රයෝග දන්නා භික්ෂු කෙනෙකුන් වහන්සේ සර්‍වඥයන් වහන්සේට දක්වන්නා “මහණෙනි, දැන්මතු නොවෙයි, පළමුත් වඤ්චාප්‍රයෝග දන්නේ වේදැ”යි වදරා “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙණෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ කසීගම් බ්‍රාහ්මණ කුලයක ඉපිද පඤ්චකාමයෙහි ඇලුම් හැර ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් මහණව හිමාලය වනයෙහි බොහෝ තාපසවරුන්ට නායකව වාසය කරන්නාහ.

එසමයෙහි වස් සාරමස ලුණු ඇඹුල් සපයන නිසා හිමාලය වනයෙන් බරණැස් නුවරට අවුත් ඒ ගම උපාසකවරුන්ගේ ආරාධනාවෙන් නන්වා දුන්නා වූ පන්සල වාසය කරන්නාහ. එසමයෙහි එක්තරා වඳුරෙක් තාපසවරුන් වීථියෙහි සිඟා යා දී මේ තාපසවරුන්ගේ පන්සල විද පැන් වලන් ආදී වූ

දෙයත් බිඳ, ඩබරාවල පැනුත් නමා, පන්සලෙත් වර්චස් කර මේ නියායෙන් කරන්නේය. එසමයෙහිත් තාපසවරුන් වස් තුන්මස වස් වැස අන්තයේ "උපාසකරුනි, අපි යම්හ"යි කීහ.

එවිට උපාසකවරුත් "සෙට දවස අපගෙන් දෙන දන් වළඳා යන්නේය"යි කීහ. තාපසවරුන් "යහපතැ"යි ගිවිස්සාහ. උපාසකවරුත් ඛාද්‍යභෝජ්‍ය ඇතිව බත් මාළු තාපසවරුන් ඉන්නා තැනට ගෙන ගියහ. ඒ වේලාවට වඳුරුත් සිතන්නේ "මම ශාන්තදාන්ත වේෂයක් දක්වාගෙන මේ ගෙනා මධුර කැවිල්ලෙන් මාත් කන්ට උවමැනවැ"යි සිතා මෙතෙක් ශාන්තදාන්ත වේෂයක්ව ඉර බලාගෙන සිටියේය. ඒ වේලාවට තාපසවරුන්ට දන් ගෙනා උපාසකවරු වඳුරා සිටි මානේ දැක "යහපතුන් ළඟ විසිගත් ගුණයෙන් මෙසේ වනැ"යි කියා ස්තූති කරන්ට වන්නාහ. එවිට තාපසයෝත් "මේ වඳුරාගේ යහපත් ගුණයක් නැත. මූට කුමට ස්තූති කරන්නෙහිදැ"යි කීහ. මුන් විසින් අපගේ පන්සල විදා ගිනි හල්වා ගෙයි වර්චස්කොට කළ ඩබරා ආදී වූ දේත් බිඳ බොහෝ අනර්ථ කරන ලදැ"යි කීහ. එපවත් අසා උපාසකවරු කැටමුගුරුත් අත් ඇතිව වඳුරා එහුබඳවා ගත්හ. තාපසවරුන් හිමාලය වනයට සැපසේ ගොස් තපස් රැක බඹලොව ගියාහයි වදාරා මේ 'ආදිච්චුපට්ඨාන ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි වඳුරා නම් දැන් වඤ්චාප්‍රයෝග දන්නා භික්ෂූහුය. තාපසවරුන් නම් බුදු පිරිසය. ගණශාස්තෘව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම ය"යි දක්වා වදාළසේක.

# 175. කලහසමුට්ඨි (කලායමුට්ඨි) ජාතකය

තවද ශාක්‍යකුල ප්‍රසාද වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කෝසල රජ්ජුරුවන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඡේ කෙසේද යත්?

එක් සමයෙක්හි කෝසල රජ්ජුරුවන්ගේ පසල් දනව්වේ එක් ගමකට සතුරන්ගෙන් භයක් පැමිණියේය. එබස් අසා රජ්ජුරුවෝ වර්ෂා කාලය තිබිය දී යුද්ධ පිළිබඳ වූ කටයුතු හෙයින් අකාලයව තිබියදී නික්ම චතුරංගිනි සේනාව ඇරගෙන ජේතවනාරාමය සමීපයේ දවස් ගතව කඳවුරු බැඳ උන්නාහ. ඒ ඉඳ සිතන්නාහු "මම අකාලයෙහි නික්මිණිමි. එසේ හෙයින් සර්‍වඥයන් වහන්සේ දකිමි. සර්‍වඥයෝ මා අතින් 'මහරජ, කොයි යව්දැ'යි විචාරනසේක. එවිට මම මේ බව කියමි. මට මෙලොවිනුත් පරලොවිනුත් සංග්‍රහ කරනසේක. එසේ හෙයින් නොයායුතු වීනම් 'මහරජ, කොයි යව්ද? අකාලය'යි කියා වදරනසේක. යා යුතු වීනම් මුවෙන් නොබැන වැඩහිඳිනා සේකැ"යි සිතා බුදුන් දකින්ට ගියහ.

සර්‍වඥයෝ "මහරජ, මධ්‍යහ්න වේලේ කුමකට අවුදැ?"යි විචාරා "ස්වාමිනි, පසල්රට සතුරන් විසින් සේවාකමට යන ගමනේ ස්වාමීන් දැක වැඳ යන නිසා ආමි"යි කීහ. එබස් සර්‍වඥයෝ අසා "මහරජ, අකාලයෙහි යාම යහපත් නොවෙ"යි වදරා "පළමුත් අකාලයෙන් නික්මුනා වූ රජදරුවෝ

උත්තමයන්ගේ කාරණා අසා නැවත්තෝ වේදැ''යි වදරා ''ඒ කෙසේදැ?''යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් ඒ රජ්ජුරුවන්ට සියළු කටයුතු රාජකාරීයට ප්‍රධාන වූ අමාත්‍යව උපන්සේක.

එසමයෙහි ''පසල්රට සතුරන්ගෙන් භයක් උපනැ''යි කියා අසා රජ්ජුරුවෝ සේවාකමට යන ලෙස මඟුල් උයනට දවස් ගතුවූහ. බෝධිසත්ත්‍වයන් රජ්ජුරුවන් හා මඟුල් උයනේ කථා කොට කොට උන්කල අසුන්ට කානම් ගෙනවුත් නිවන නිසා කානම් ඔරුවෙක ලැවුහ. ඒ වේලාවට එක් වඳුරෙක් එතනට අවුත් කටිනුත් අතිනුත් උකාගෙන ගසට නැගී කමින් සිටියේය. කමින් සිටියා වූ මුවින්ම ඇටෙක් බිම හින. ඒ කන්ට සිතා අත කට තිබූ කානම් දමාපියා බිමට බැස වැටුනු මුන් ඇටය ඇත මෑත සොයා ඇවිද නොදැක ගසට නැගී සෝකයෙන් දහසකට ගැතිසිඟිති නියා පැරද ගිය එකෙකු සේ උන්නේය. ඒ වේලාවට රජ්ජුරුවෝ බෝධිසත්ත්‍වයන් අතින් ''මේ වඳුරා කළ දෑ දුටුදැ?''යි කියන්නා වූ ''වානරතෙම අල්ප වූ මුගටක් නිසා බොහෝකොට කන කැවිල්ල අපවත් කළේය. ඒසේ වූ අල්ප කටයුත්තක් නිසා මහත් කටයුත්තක් යම් පුරුෂයෙක් නසාපියාද? එසේමය අප හැම ඇතුළු වූ ඇමදෙනාගේ

කටයුත්තේ සැලැස්මය මුගට සඳහා බොහෝ මුගට දමාපු වඳුරා වැන්නේය''යි කියා යන ගමන වැලකූහ.

සර්වඥයන් වහන්සේගේ බස් අසා කෝසල රජ්ජුරුවෝ තමන්ගේ නුවරටම ගියාහයි වදරා 'කලාභමුට්ඨි ජාතකය' නිමවා වදාළසේක.

''එසමයෙහි බඹදත් රජ්ජුරුවෝ නම් අනාන්ද ස්ථවිරයයෝ. අමාත්‍යව උපන්නෙමි ලොව්තුරා බුදුවූ මම්ම ය''යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 176. තින්දුක ජාතකය

තවද ශාක්‍යකුල ලෝචන වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ප්‍රඥා පාරමිතාව අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්?

බෝධි ජාතකය, උම්මග්ග ජාතකය ආදී වූ දෙයෙහි ප්‍රඥා පාරමිතාව වර්ණනා කරන්නාක් මෙන් මේ ජාතකයෙහිත් සර්වඥයන් වහන්සේගේ ප්‍රඥා පාරමිතා වර්ණනාව කිය කියා වැඩඋන් තැනට සර්වඥයන් වහන්සේ වැඩවදරා ''මහණෙනි, මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?''යි විචාරා වදරා එපවත් අසා ''මහණෙනි, දැන් තබා තිරිසන්ව උපන් සමයෙහිත්, තමන්ගේ ප්‍රඥා බලයෙන් බොහෝ දෙනා ගොඩලෑවෝ වේදැ''යි වදරා ''ඒ කෙසේදැ?''යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ අසූ හාරදහසක් පමණ වඳුරන්ට නායකව හිමාල වනයෙහි වසන්නාහ. සමහර කලෙක මනුෂ්‍යපථයට අවුත් වන සමීපයෙහි පිටිසර ගමෙක වසන්නාහ. යහපත් ඵල පල්ලවයෙන් සම්පූර්ණ වූ තිඹිරි ගසෙක් ඇත. මනුෂ්‍යයෝත් ඒ වන සමීපයෙහි ගමින් පලා යන්නාහ. ඒ අවස්ථාවට වඳුරෝ ගමට අවුත් තිඹිරි කා ඒ ගම වාසයකොට මනුෂ්‍යයන් එන අවස්ථාවට පෙරලා හිමාලය වනයට පලා යන්නාහ.

එක් සමයෙක මනුෂයෝත් ඒ ගමට බැස උණ පත්තෙන් ගෙවල් සොයා, උණ පත්තෙන් ගෙවල් බිත්ති බැඳ, දොර ලී දොර බාලා ඒ ගම වාසය කරන්නාහ. එසමයෙහි ගම මධ්‍යයේ තිඹිරි ගසක් ඵල පල්ලවයෙන් අතු කැඩී යන්නාසේ එලගෙන සිටිනේය. එසමයෙහි වඳුරෝ සිතන්නාහු “තිඹිරි ගසෙහි ඵල පල්ලවයෝ කිමෙක්දෝ? මනුෂ්‍යයෝ ඇද්ද නැද්දෝ? හො”යි සිතා පරීක්ෂා කරන පිණිස තමන් ඇම දෙන එක වඳුරෙකු යවූහ. ඒ වඳුරා ගොස් බලා එපවත් වඳුරන්ට කීහ. වඳුරෝ එපවත් අසා නායක වඳුරු රජ්ජුරුවන් කරා ගොස් “දේවයන් වහන්ස, අපගේ තිඹිරි ගස ඵල පල්ලවයෙන් සම්පූර්ණය. එසේ හෙයින් එතනට යා යුතුය”යි කීහ.

වානර රජ්ජුරුවෝ එබස් අසා “ඒ ගම මිනිස්සු ඇද්ද? නැද්ද?” විචාරා “මිනිස්සු ඇතැ”යි කියන්නා “එසේ නම් තිඹිරි ගස නිසා යන ගමන නොයම්හ”යි කීහ.

එසේ තමන් කීවත් වඳුරෝ එකසීම එක්ව “දේවයන් වහන්ස, ගම සමීපයෙහි බැද්දේවල ඉඳ රෑ මධ්‍යම වේලාවට අපි ගොස් තිඹිරි කා එම්හ”යි කීහ. බොහෝ සේ කාරණා කියා වානර රජ්ජුරුවන් කැඳවාගෙන හිමාලය වනයෙන් නික්ම ඒ ගම සමීපයෙහි ගල් පොත්තෙක රෑ පසළොස් පැය වනතුරු වැදහොත්තාහු නිදා මධ්‍යම රාත්‍රී වේලේ ගසට නැංගාහ.

ඒ වේලාවට එක් මිනිසෙක් ශරීරකෘත්‍ය කරනු සඳහා පිටත්ව යමින් සිටියේ තිඹිරි ගස බොහෝ වඳුරන් උන් නියාව දැක ගම මධ්‍යයෙහි සිට ගම ඇත්තන්ට ඇසෙන නියාවෙන් අඬ ගැසීය. ඒ අඬ අසා බොහෝ දෙන ආයුධ හා කැටමුගුරු ගත් අත් ඇතිව අවුත් ගස මුල වටකොටගෙන “පාන් වූවිට වඳුරන් මරම්හ”යි සන්නද්ධව ගෙන සිටියාහ.

ඒ වේලාවට වඳුරෝ මනුෂ්‍යයන් දැක භයින් ත්‍රස්ථව “අපට පැමිණියා වූ භය වානර රජ්ජුරුවන්ට කියම්හ”යි කියා “රජ්ජුරුවන්ගේ ප්‍රතිෂ්ඨා විනා අනික් ප්‍රතිෂ්ඨාවෙක් නැතැ”යි සිතා වානර රජ්ජුරුවන් ලඟට ගොස් “දේවයන් වහන්ස, බොහෝ මනුෂ්‍යයෝ ආයුධ හා කැටමුගුරු ගත් අත් ඇතිව අප මරන්ට වටකොට ගත්තාහ. අප ගැලවී ගන්ට නුඹ වහන්සේගේ ප්‍රතිෂ්ඨාවක් කිවමැනවැ”යි වඳුරෝ එක්ව කීහ. එබස් බෝධිසත්ත්වයෝ අසා “තෙපි හැම නොබව. මනුෂ්‍යයෝ ඔබ්බේ භයක් පැමිණි තැනකට පලායෙති. තොප හැම නොබව”යි කියා මිනිසුන් ඉඳිනා විදියේ ගිනි මොලවා කපු

කටිනා මැහැල්ලක සමීපයට එකියන වඳුරා කුඩා කොල්ලකු සේ අවුත් ගිනි පෙනෙල්ලක් ඇරගෙන ගොසින් විටී ගිනි ලා පීය.

ඒ වේලාවට ගිනි නිවන්ට මනුෂ්‍යයන් යා දී වඳුරෝ ගසින් බස්නාහු සේනක නම් වඳුරා එක තිඹිරි ගෙඩියක් කඩාගෙන බටහයි වදාරා මේ 'තින්දුක ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි වානර රජ්ජුරුවන්ට බෑනව උපන් සේනක නම් වඳුරා නම් මෙසමයෙහි මහානාම ශාක්‍ය රජ්ජුරුවෝය. වානර සමූහයා නම් බුදු පිරිසයයි. වානර රජව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 177. කච්ඡප ජාතකය

තවද ශාක්‍යකුල තිලක වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි අහිවාතක රෝගය නිසා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්?

සැවැත් නුවර සිටුකුලයක අහිවාතක රෝගය උපන. ඒ රෝගය උපන් කල ගෙයි කුකුලන් බල්ලන් ආදී වුවන් පටන් නසිති. ඒ අවස්ථාවෙහි සිටාණෝ තමන්ගේ පුතණුවන්ට කියන්නාහු "තොප විසින් භික්ති බිඳගෙන ගියොත් ව්‍යාධිය සන්හිඳෙයි, ඒ නිසා වලට(වනයට) පලා ගොස් ව්‍යාධිය සන්හිඳුනු කල මෙතනට අවුත් අසවල් තැන තිබූ සම්පත් ඇරගෙන කුටුම්බ සණ්ඨාපනයකොට ජීවත්වව්" කීහ.

"යහපතැ"යි කියා ඒ සිටුකුමාරයා ගිව්ස හික්තිය බිඳගන ගිය තැනැත්තේ සර්‍වඥයන් වහන්සේ දිට.

සර්‍වඥයෝත් "කොයි සිට ආවාදැ?"යි විචාරන්නාහු "අසවල් ගෙයි අභිවාතක රෝගය උපන් හෙයින් මාගේ ප්‍රාණය ගලවාගෙන බන්ධූන්(ඥාතීන්) ඇරපියා ආමි"යි කීහ. සර්‍වඥයෝත් එබස් අසා "තා කළ දේම සොඳය, පළමුත් තමන්ගේ වාසස්ථානයෙහි නොසිට විපත්ති දැක ගැලවී ගියෝ සුව වුවෝ වේදැ"යි "තමා වාසස්ථානයෙහි සිතා උන්නෝ දුක්වූනෝ වේදැ"යි වදාරා "තා ගැලවී ගියේ යහපතැ"යි වදාළසේක. එබස් අසා සිටුකුමාර "ඒ කෙසේදැ?"යි ආරාධනා කළේය. එකල්හි සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ කුම්භකාර ව ඉපිද කුඹල්කමින් අඹුදරුවන් පොෂ්‍යය කරනසේක.

එසමයෙහි බරණැස ගංගා සමීපයෙහි එක් විලක් ඇත. ඒ විල වතුර ආ කලට විල හා ගංගා හා එක් වන්නේය. එසමයෙහි මත්ස්‍යයෝ "මේ අවුරුද්දේ නියන් කෙරෙයි, මේ අවුරුද්දේ වැසි වතුර ඇතැ"යි දන්නා වූ "එන අවුරුද්දේ නියන් කෙරෙති" දැන "විල හා ගඟ එක්වනතුරු ගලාපු ගමනේ පසුවට නියන් කෙරෙයි. මේ අවස්ථාවේ පලා ගියොත් යහපතැ"යි සිතා බොහෝ මස්කැස්බෝ දියෙන් ගඟට පලා

ගියහ. එසමයෙහි එක් ඉබ්බෙක් "මාගේ දෙමාපියන් පටන් උන්නෙන් මෙතන, මාත් වැඩිවිය පැමිණයේත් මෙතනය"යි සිතා "නොයමි"යි ඒ විලම උන්නේය. ඒ ප්‍රස්ථාවට වතුර බැස නියන් කොට දිය සිඳී මඩ හා කළල් අවස්ථාවට තුබුයේය. ඒ අවස්ථාවට බෝධිසත්ත්වයෝ වලන් උකන්ට පස් අරගන්න නිසා ඒ විල සමීපයේ පස් කොටන්ට වන්නාහ. ඒ වෙලාවට ඉඳුබු පස් පිරාගෙන යන්නේ පස් කොටන වළට පැමිණියේය. බෝධිසත්ත්වයන් එලාඋ උදැල්ලෙන් කැපින. බෝධිසත්ත්වයෝත් පස් පිඩැල්ලකැයි සිතා උදැල්ලෙන් ගොඩලූහ.

එවිට මහත් වූ වේදනාපත්ව කියන්නේ "බොහෝ බන්ධූන් යා දී මා ඉපිද වැඩිගත ස්ථානයයි ඉඳ උන්නායේ එල ලදිමි. එසේ හෙයින් භාර්ගව කුලයෙහි උපන් කුඹලාණෙනි තමා උපන් වැඩි තෙන යයි කියාම ඇලීම කරන්ට දෝෂය"යි කියා කුඹලාණන්ට අවවාද කිය කියා ජීවිතක්‍ෂයට පැමිණියේය.

කුඹලාණෝත් ඉදුබුවා අතටගෙන ඒ ගම්වැසි මනුෂ්‍යයන් මධ්‍යකොට කියන්නේ "යම් සේ මේ ඉඳිබුවා 'තමන්ගේ බන්ධූන් යාදීත් තමා ස්ථානයයි කියා උන්නා සේ එල ලදිමි' කියා මට ගාථා දෙකකින් කීය. එසේ හෙයින් කවුරුත් 'මේ මාගේ ප්‍රිය වූ රසයය, මේ මාගේ ප්‍රෂටව්‍යය, මේ මාගේ දරුවෝය, මේ මාගේ භාර්යාවෝය, මේ මාගේ බන්ධූය, මේ මාගේ ධන ධාන්‍යය, මේ මාගේ ගේදෙරය'යි තෘෂ්ණා කළෝ නම් වන්නා වූ දෝෂය ඉඳිබුවාට වූ හානිය හා සමානය"යි බුද්ධ ලීලාවෙන් අවවාද කීවාහ. දස දහසක් යොදුන් දඹදිව ප්‍රකාශ

විය. ඒ කුම්භාකාර කී අවවාදය සද්දහසක් අවුරුදු අවවාද නියාවට පැවැත්තේයයි වදරා 'කච්ඡප ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි ඉඳිබුවා නම් ආනන්ද ස්ථවිරයෝය. කුම්භාකාරව උපන්නෙමි ලොව්තුරා බුදුවූ මම්ම ය"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 178. සත්ත (සත) ධර්ම ජාතකය

තවද ශාක්‍යකුල භද්‍රඝට වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් විස්සක් අන්වේසනයන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්?

එක අවධියෙක භික්ෂූන් වහන්සේ බුදුන් නොකරන්ට කී පිළියම්කොට ජීවත්වීම, භානා වපුරණා තැනට ගොස් උපසාසකවරුන් කී මෙහෙවර කිරීමෙන් උනුන්ගේ ගෙට ගොස් උන් කීවා කිරීම් යනාදීන් බුදුන් නොකරන්ට කී කාරණා එක්විස්සක් කොට චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලානප්‍රත්‍යය ආදි වූ සතරපසය උපදවාගෙන වාසය කරනසේක.

එසමයෙහි සර්වඥයන් වහන්සේ එපවත් අසා ඉදිරියේ පැමිණෙන නරක, තිරිසන්, ප්‍රේත, අසුරකාය යන සතරඅපාය දැක බොහෝ භික්ෂූන් වහන්සේ රැස් කරවා වදාරනසේක් "මහණෙනි, මා නොකරන්නට කී එක්විසි අන්වේසන කිරීමෙන් පසය උපදවාගෙන කෑ නම් ගිනිවට හා විෂ හා

කුලහීනයන්ගේ ඉඳුල් කෑවා හා සමානය''යි ආරාධනා නැතිවම ජාතකය දක්වන සර්වඥයන් වහන්සේ "මහණෙනි, යම්සේ සත්තධම්ම නම් මානවකයා චණ්ඩාලායාගේ ඉඳුල් බත් කා ප්‍රාණය නසා ගද්ද? එසේමය''යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ චණ්ඩාල කුලයෙක ඉපිද ඔබ්බේ ගමකට යන ගමනේ බත් ගැටයක් හා සාල් නැලියක් ඇරගෙන නික්මුනාහ.

ප්‍රසිද්ධ බ්‍රාහ්මණ කුලයක උපන් සත්තධම්ම නම් බ්‍රාහ්මණ මානවකයෙකුත් මගට උපකරණයක් සපයා නොගෙන චණ්ඩාලයා නික්මුනා වූ මාවතින් නික්මින. බමුණු චණ්ඩාලයා අතින් "තෝ කවරේදැ?''යි විචාළේය. බෝධිසත්ත්වයෝ එක් ජාතියකුත් බොරු නොකී හෙයින් තමන් චණ්ඩාල නියාව නොහඟවා කීහ. සැඩොලාත් එවිට "නුඹ කවුරුදැ?''යි විචාරන්නා "මම අසම්භින්න නම් බ්‍රාහ්මණයෙමි'' කීහ.

එවිට චණ්ඩාලයා "එසේ නම් නුඹවහන්සේලා කැටිව යෙමි'' සිතා නික්ම අතරමඟ පැන් පාසු තැනකදී බමුණා හා චණ්ඩාලයා වැවට බැස නා ඉක්බිත්තෙන් චණ්ඩාලයාත් ගෙනා බත්මුලින් "බමුණානන් වහන්ස, නුඹවහන්සේ පළමුවෙන් බත් කෑවොත් වේද? මා කන්නේය''යි කීය. එබස් ඇසූ බමුණා "චණ්ඩාලය, තාගේ ගෙන් ගෙනා බත්ද මා කන්නේය''යි කියාද, එවිට චණ්ඩාල තමා ගෙනා බතින් එක් කොටසක්

සවස කන්ට තිබා අනික් කොටස කා නික්මිණ. බමුණාත් නික්මිණ. සවස් වනතුරු ගමනේ ගොසින් සවස් වේලේ ගඟකදී දෙන්නම නා බමුණා බල බලා සිටියදී "දවල් කන්නට කී ගමනේ නොකෑ හෙයින් දැනුත් නොකති" සිතා චණ්ඩාලයා කන්නට වන.

ඒ වේලාවට බමුණු බඩ සා ඉවසාගත නොහී "චණ්ඩාලයා මට බත් නොදීම කන්නට වන. එසේ හෙයින් මුගේ ඉඳුල්උවත් උදුරාගෙණ කන්ට උවමැනවැ"යි සිතා චණ්ඩාලයා ලඟට ගොසින් ඉඳුල්පත උදුරාගෙන ඊ තුබූ බත් කා අත කට සෝධා නැවත සිතන්නේ "මා කළේ කිම්දැ?"යි "උතුම් බ්‍රාහ්මණ කුලයෙහි ඉපිද බඩ සායක් නිසා චණ්ඩාලයාගේ ඉඳුල්පත් නොකන්නට නුවූයේය. ඉඳුල්බත් කන දෙයත් චණ්ඩාලයා ගිවිස්වා ගන්ට නුවූයේය. උදුරාගෙන කන දෙයත් බඩ පුරා කන්ටත් නුවූයේය. කෑ දෙයත් බඩ රඳගත නුවූයේය"යි සිතා බොහෝ විකෂේපයට පැමණ "මෙසේම ඉඳමා ගේ ප්‍රාණය තිබාගෙන ඉඳිමෙන් ප්‍රයෝජන නැතැ"යි වලට වැද අභ්‍යවකාශයෙහි නැසී ගියේයයි වදරා "මහණෙනි, භිකිෂූහු නම් අනුන්ගෙන් බත් නොකෑ සැටියේ කෑයින් නම් බුදුන් කීවා නොකළම්හයි තමා සිතට විකෂේපව පසුව නරකාදී සතර අපායෙන් නොගැලවෙන්නාහ. එසේ හෙයින් සත්තධම් බ්‍රාහ්මණයාට වුවා සේ වන්නේය"යි වදරා මේ 'සන්තධම් ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි චණ්ඩාලව උපන්නෙමි බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 179. දුද්දද ජාතකය

තවද ශාක්‍යකුල කිරීට වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි උපාසකවරු කීපදෙනෙකු සමග ව දුන් දානයක් අරභයා මේ ජාතකය දක්වන ලදි. "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ බ්‍රාහ්මණ කුලයක ඉපිද වැඩිවිය පැමිණ පඤ්චකාමයෙහි ආදීනව දැක ප්‍රව්‍රජ්‍යායෙහි අනුසස් දැන පැවිදිව බොහෝ තාපසවරු පිරිවරා හිමාලය වනයෙහි වාසය කරනසේක. වස් වසන අවධියට ලුණු ඇඹුල් නිසා බරණැස් නුවරට තාපසවරුන් පිරිවරා වැඩිසේක.

ඒ අවධියට බරණැස් නුවර එක් උපාසකයෙක් බොහෝ දෙනා ලබාගෙන සත් දවසක් බොහෝ තාපසවරුන්ට දන් දින. දන් දී අවසානයෙහිදී නායක ව දන් දෙන උපාසක කියන්නේ "ස්වාමීනි, යන්තමක දන් දුන්නොත් ඇත. බොහෝ ව දන් දුන්නොත් ඇත. පින් එක සරිසේ වේදැ?"යි කීය. තාපසයෝ කියන්නේ "ඒ එසේමය, ස්වල්ප වුවත් බොහෝ වුවත් දුන්නා වූ දානයෙහි විපාක බුදු, පසේබුදු, මහරහතුන්

විසින් ප්‍රශංසා කරන ලද. එසේ විසින් දනයෙහි විපාක කියාගත නොහැක්කේය. දන විෂයෙහි මඳ දෙයක් දුන්නත් දිව්‍යලෝක සම්පත් විඳිනාහ. ‘මේ මනා වූ දනය දීමෙන් කිම්දැ?’ සිතා දන් නුදුන්නොත් නරකාදි වූ දුක් විඳින්නාහ”යි වස් සාරමස ඒ ගම රැඳ වස් අන්තයෙහි හිමාලය වනයට වැඩ සතර බ්‍රහ්මවිහාරයෙන් දවස් යවා නොපිරිහුනා වූ ධ්‍යානයෙන් බ්‍රහ්මලෝකප්‍රාප්ත වූහයි වදරා ‘දුද්දද ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි තාපසවරු නම් දැන් බුදුපිරිසය, ගණජ්‍යෙෂ්ඨ ව උපන්නෙමි බුදුවූ මම්ම ය”යි වදාළසේක.

# 180. අසදෲශ (අසදිස) ජාතකය

තවද ශාක්‍යකුල මහනිධාන වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද? යත්,

එක් දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස් වූ මාළුවරුන් වහන්සේ “ඇවැත්නි, සර්වඥයන් වහන්සේ මේ නියා රාජ්‍යයක් හැර මහබිනික්මන් කළෝ වේදැ”යි කියා වැඩ උන්තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදරා “මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?”යි විචාරා වදරා එපවත් අසා “දැන් සර්වඥ කාලය පැමිණි කාලයෙහි තිබා, නුමුහු කළ නුවණ ඇති අවස්ථාවෙහි තමන්ට පැමිණෙන

රාජ්‍යය ශ්‍රී හැර මහබිනික්මන් කළෝ වේදැ''යි වදාරා ''ඒ කෙසේදැ?''යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඡේ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ගේ අග්‍ර මහේසිකා බිසවුන් බඩ පිළිසිඳ දසවුකඩ මසකින් බිහි වුහ. ඒ කුමාරයන් බිහි වූ ගමනේ නම් තබන්නාහු ''අසදෘශ කුමාරයෝය''යි නම් තැබූහ.

ඒ කුමාරයන් වැඩිවිය පැමිණෙන අවස්ථාවට අනිකුත් පින්වත් කුමාරයෙක් බඩ පිළිසිඳ දසවුකඩ මසකින් බිහිව ඒ කුමාරයන්ට නම් තබන්නාහු ''බ්‍රහ්මදත්ත කුමාරයෝය''යි නම් තැබූහ.

අසදෘශ කුමාරයෝත් වැඩී දිසාපාමොක් ආචාර්‍යීන් කරාගොස් උගතමනා ශිල්ප ඉගෙන රජ්ජුරුවන් කරා අවුත් උන් කලට පිය රජ්ජුරුවන්ට මරණ කාලය පැමිණියෙහින් රජ්ජුරුවෝ කියන්නාහු ''අමාත්‍යයෙනි, අසදෘශ කුමාරයන්ට රාජ්‍යය දෙව. බ්‍රහ්මදත්ත කුමාරයන්ට යුවරජ තනතුරු දෙව''යි කියා ස්වර්ගස්ථ වූහ.

එවිට අමාත්‍යයෝත් අසදෘශ කුමාරයන්ට රාජ්‍යය පමුණුවන්ට උත්සහ කළාහ. ඒ අසා අසදෘශ කුමාරයෝ රාජ්‍යය නොගිවිස්සාහ. අමාත්‍යයෝ බ්‍රහ්මදත්ත කුමාරයන්ට

රාජ්‍යය පමුණුවා බෝධිසත්ත්වයන්ට යුවරජ තනතුරු දුන්නාහ. එවිටත් නොගිවිස නිකම්ම කුමාර සැලැස්මේම උන් අවස්ථාවට එක්තරා අමාත්‍යයෙක් රජ්ජුරුවන් කරාගොස් “නුඹවහන්සේගේ බෑයන්වහන්සේ නුඹවහන්සේ නසා රාජ්‍යය ගන්ට උත්සහා කරනසේකැ”යි කියා බිඳවූය. රජ්ජුරුවෝත් එබස් අසා බිඳී “බෑයන්වහන්සේ අල්ව”යි කීහ.

එවිට බෝධිසත්ත්වයෝ වැඩපසස්නා අමාත්‍යයෙකු අතින් අසා බරණැස් නුවරින් පිටත්ව සාමන්ත කෙනෙකුන්ගේ නුවරට ගියාහ. ඒ නුවරට ගොස් වාසල්දොර සිට “ධනුද්ධරයෙක් ආය”යි කියා රජ්ජුරුවන්ට දන්වා යවන්නාහු. රජ්ජුරුවන් විසින් “එන්නේය”යි කියා යවන්නා රජ්ජුරුවන් විසින් “කෙතෙක් පඩි තොපට උවමනාදැ?”යි විචාරන්නා “මසුරන් ලක්‍ෂයක් පඩි උවමැනවැ”යි කියන්නා රජ්ජුරුවෝත් පිරිස් අඩු කරන්ට උවමනා හෙයින් “යහපත ලක්‍ෂයක් නියායෙන් පඩි දෙව”යි කියා සැලැසුවූය. මෙසේ පඩි කන අවස්ථානෙහි දුනුවායෝ එකසීම “අපට වඩා මූ පඩි කන්නේය”යි කියා ඊර්ෂ්‍යයාවෙන් ඉඳිනාහ.

එසමයෙහි එක් දවසක් රජ්ජුරුවෝ මඟුල් උයනට ගොස් අඹ ගස්මුල යානක් ලවාගෙන වටතිරයක් අද්ද උත්තානිව වැදහොත් රජ්ජුරුවෝ අඹ ගස අත්තේ තුබූ අඹ කැන දැක “මිනිස් කෙනෙකුන් නැගී කඩා කන්ට බැරි සෙයින් දුනුවායන් ලවා විද්දවා ගනිමි” සිතා දුනුවායන් රැස්කොට අඹ කැන විදින්ට කීහ. “ස්වාමීනි, අපගේ විදමන් දැක වදාළේ ඇත,

ලක්‍ෂයක් පඩි කන අළුත් ධනුද්ධරයානන් ලවා වද්දවන බවය”යි කීහ. එවිට රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන් ගෙන්වා “අඹ කැනට විදුව”යි කීය. බෝධිසත්ත්වයෝත් “නුඹවහන්සේ වැදහොත් තැනට ආරින්ට උවමැනව”යි එතන යාන ඉවත් කරවා එතන සිටියාහ. සෙසු දුනුවායන් අත දුනුර්තල නැති හෙයින් දුනුවායෝ කථා කරන්නාහු “අප අත දුනුර්තල ඉල්වුවත් කවුරුවත් දුනුර්තල නොදෙව”යි කථා කළාහ.

බෝධිසත්ත්වයෝත් වටකොට තිරයක් බන්ද ඇතුළේ වැඩ සිට ඉන තුබූ සුදුකඩ ඉවත තිබා රන්සේලයක් ඇඳ බුලත් පයිය ඇතුලේ තිබූ කඩුව උරේ එල්ලවාගෙන බඩ අවුරා රන් ඕලිය යලක් බැඳ හිරවුර පිට බැඳ රන් සන්නාවකුත් ලාගෙන, රන් පටක් නලළ බැඳ සන්ධි වක්කළ හගු දුන්න අතින්ගෙන පබළුවැලක් හා සමාන දුනුදියක් ලාගෙන, ර්දණ්ඩක් අතින්ගෙන පොළොව පලාගෙන නැංගා වූ නාග මානවකයෙකු සේ තිරයෙන් මෑත්ව, විදිනා වූ ස්ථානයෙහි සිට රජ්ජුරුවන්ට කියන්නාහූ “දේවයන් වහන්ස, අඹ කැන යන හීයෙන් විදිම්ද? එන හීයෙන් විදිම්ද?”යි විචාළාහ. රජ්ජුරුවෝ කියන්නාහු යන හීයෙන් විදිනවා දුටුවිරූ ඇත. එන හීයෙන් විදිම අපූර්වය”යි කියන්නා “එසේ විදුය”යි කීහ.

බෝධිසත්ත්වයෝ නැවත කියන්නාහූ “මගේ හීය චාතුර්මහාරාජිකය දක්වා යෙයි, එසේ හෙයින් මදක් වේලා වැඩ සිටිනේ යාපත බලා වදාළ මැනව”යි කියා වේග දක්වා ර්දඬු විද පුහ. ඒ හීය අඹ කැනින් කැබැල්ලක් කපාගෙන

චාතුර්මහාරාජිකයට පැන නැංගේය. බෝධිසත්ත්වයෝත් ඒ හීය චාතුර්මහාරාජිකයාට පැනනැගී බව දැන අනික් හීයක් වේග දක්වා විද්දාහ. ඒ හීය පළමු විදි හීයේ පගිලියේ වැදගෙන උඩ ගියේය. ඉන් එක හීයක් දෙවතාවෝ ඇරගත්හ. අනික් හීය පවනින් ගුගුර ගුගුරා බසින්නට වන. එවිට බොහෝ දෙනා "මේ කිමෙක්දැ?"යි බලන්නට වන්නාහ.

බෝධිසත්ත්වයෝ "ඊදණ්ඩෙන් පවන්ගෙන බස්නා බවය"යි කියන්නා බොහෝ දෙන "තමන්ගේ ශරීරයෙහි වැටෙති" සැක වන්ට වන්නාහ. එවිට හීය ඇවිත් අඹ කැන කැපුනු ස්ථානයෙන්ම කැපී වැටෙන්නට වන. බෝධිසත්ත්වයෝ එක අතකින් අඹ කැන හා එක් අතකින් ඊදඬු අල්වා ගත්තාහ.

මේ දුටු සමාධියෙන් (සතුටින්) දහස්ගණන් ඔල්වර හඬ හා දහස්ගණන් අසුරුසන් හා දහස්ගණන් පිළි හිස සිසාරමින් නැටූහ. රජ්ජුරුවෝත් කෙළගණන් සම්පත් දුන්නාහ.

එසමයෙහි බරණැස් නුවර අසදෘශ කුමාරයෝ නැති නියාව අසා සත් රජ්ජුරු කෙනෙකුන් හා සේනාව අවුත් නුවර වටකොටගෙන "රාජ්‍යය හෝ දෙන්නේය. යුද්ධ හෝ කරන්නේය"යි කියා යවුහ. එබස් බරණැස් රජ්ජුරුවෝ අසා භයින් ත්‍රස්තව "බෑයන්වහන්සේ කොයිද්දේ හෝ"යි සිතා සාමන්ත රජ්ජුරුවන් ලඟ සිටිනා නියාව අසා එක් අමාත්‍යයෙකු කැඳවා "තොප මා වැන්දකොට වැඳ, මාගේ බෑයන්වහන්සේ කැඳවාගෙන එව"යි කියා යවුහ.

ඒ අමාත්‍යයෝ ගොසින්, ඒ සැටියේ කීයේය. බෝධිසත්ත්වයෝ තමන්ගේ රජ්ජුරුවන්ට කියා අවසර ඉල්වාගෙන බරණැස් නුවරට අවුත් අට්ටාලය පිට සිට ඊදණ්ඩක පත් ලියා බඳනාහු "අසදෘශ කුමාරයෝ මේ ගමය, පළමුකොට මා විදි හීයෙන්ම පලා යව, දෙවැනි හීයට සිටියා නම් තොප ඇම ජීවිතක්ෂයට පමුණුවමි" කියා පත්කඩවල් ලියා ඊදණ්ඩක් විද්දාහ. ඒ ඊදණ්ඩ ගොසින් සත් රජ්ජුරුවන් බත්කන තලිය පිට වැටී හින. එවිට රජ්ජුරුවෝත් "දෙවෙනි හීය විද්දෙත් ඒ නියාව වන්නේ නියමය"යි කියා බිඳී තමන්ගේ නුවරවලට පළා ගියාහ.

බෝධිසත්ත්වයෝ පිනිබිඳක් සා ලේ පෙතක් නොසොල්වා සත්රජ්ජුරු කෙනෙකුන් ජය ගත්තාහ. එවිට බ්‍රහ්මදත්ත කුමාරයෝ "බෑයන්වහන්ස, පළමුත් නුඹවහන්සේ සන්තක රාජ්‍යය නුඹවහන්සේ එපයි කී නිසා මම රාජ්‍යය කෙළමි. දැනුත් නුඹවහන්සේ රාජ්‍යය කල මැනව"යි කීසේක.

එබස් අසදෘශ කුමාරයාණන් වහන්සේ අසා "මාගෙන් තොපට දුන් රාජ්‍යය දැහැමින් සෙමෙන් කරව"යි කියා පාවා දී හිමාලය වනයට ගොස් ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා බඹලොව ගියාහ. ඒ අර්ථය ප්‍රකාශ කරන්නා වූ සර්වඥයාන් වහන්සේ "මහණෙනි, ඒ ධනුද්ධර වූ අක්ෂරවේධි, වාලවේධි, ශරවේධි, ශබ්දවේධි යනාදී වූ විදමන්ද වැලිබිසි, පිදුරුබිසි, ගැල් තඹපත් යපත් ආදී වූ දෙයෙහි විදමන්ද යනාදීන් සූසැට කලාවේ දක්ෂ වූ ඒ

අසදෘශ කුමාරයන්ගේ මළණුවන්ට පැමිණි භය එලවා ඉක්බිති මහබිනික්මන් කළෝ වේදැයි වදරා 'අසදෘශ ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවෝ ආනන්ද ස්ථවිරයෝය. අසදෘශ රජව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 181. සංගාමාවචර ජාතකය

තවද ශාක්‍යකුල කල්පද්‍රැම වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි නන්ද ස්වාමීන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්?

නන්ද සාමීන්වහන්සේ මහණවන දවස් ජනපදකල්‍යාණිය විසින් "වහා එව, නන්දය"යි කවුළුදොර සිට කී බස් සිතන්නාහු නන්ද සාමීන් මහණදමෙහි උකටලීව පඬුවන් වූ පැහැයෙන් හා නිය කෙස් වැඩී ශාසනයෙහි උකටලීව වාසය කරනසේක.

එපවත් සර්වඥයෝ දැන නන්ද සාමීන් ඉන්නා තැනට ගියසේක. උන්වහන්සේ සර්වඥයන් වහන්සේට අසුන් පනවා වදාළසේක. සර්වඥයන් වහන්සේ පැන වූ අසුන් පිට වැඩ උන්සේක. වැඩහිඳ "නන්දයෙනි, ශාසනයට ඇළුම් ඇද්දැ?"යි විචාරන්නා "ස්වාමීනි, ජනපදකල්‍යාණිය කෙරේ තෘෂ්ණාව ඇති හෙයින් ශාසනයෙහි ඇළුම් මදව වාසය කෙරෙමි"යි කීහ.

එවිට සර්‍වඥයන් වහන්සේ “නන්දයෙනි, හිමාලය වනය අදුනනවාදැ?”යි විචාරන්නා “ස්වාමීනි, නාඳුනමි” කී හෙයින් “එසේ වීනම් හිමාලය වනය දකින්ට යම්හ”යි වදාළසේක. එවිට නන්ද සාමීන් කියනසේක් “මාගේ ඍද්ධියක් නැතිව කෙසේ යම්දැ”යි කීසේක. එබස් අසා සර්‍වඥයෝ “තොපි මාගේ ඍද්ධියෙන් එව”යි කියා අත අල්වාගෙන ආකාශයට පැනනැගී වැඩිසේක් අතරමග දඩු ගිය සේනක් මවා ඒ සේන දඩු ගිය කණුවක් මවා එහි කන්, නාසා, වල්ගය දඩු ගිය වැඳිරියෙක මවා “නන්දය, තෙල දඩු ගිය වැඳිරිය දුටුදැ?”යි විචාරන්නා “දිටිමි” කී විසින් “මේ වැඳිරිය සිත තබා ගණුව”යි හිමාලය වනයට ගොස් හිමාලය වනයේ අනෝතත්ත විල ආදී මහවිල් සතරක් හා පඤ්ච මහගංගාව හා දහස්ගණන් පර්‍වත හා හිමාලය වනයෙහි නොයෙක් අපූර්‍ව දක්වා “චාතුර්මහාරාජිකය අඳුනනවාදැ”යි විචාරා “නාදුනමි” කී විසින් “එසේ වීනම් දකින්ට එව”යි කියා නන්ද සාමීන් ඇරගෙන චාතුර්මහාරාජික දිව්‍යලෝකයට ගොස් පඬුපුල්සලස්නේ වැඩහුන් සේක.

එවේලෙහි ශක්‍රදේවේන්ද්‍රයෝ තමන්ගේ දෙදෙව්ලොව දේවතාවන් පිරිවරා බුදුන් දැක එකත්පස්ව සිටියාහ. එවේලාවට ශක්‍රයාගේ දෙකෙළ පනස්ලක්‍ෂයක් දිව්‍යස්ත්‍රීහු දකින්ට ගියාහ. පන්සියයක් කකුටපාදිනි වූ දිව්‍යස්ත්‍රීයෝ සර්‍වඥයන් දකින්ට ගියාහ. එවිට සර්‍වඥයෝත් කියන්නාහු “නන්දයෙනි, ජනපදකල්‍යාණී නියාවට මුන් වටිද්දැ?”යි විචාළහ. එපවත් අසා නන්ද කුමාරයෝ කියන්නාහු “ස්වාමීනි,

ජනපදකල්‍යාණී නම් අතරමග දුටු වැඳිරිය වැන්නීහ. එසේ හෙයින් ජනපදකල්‍යාණීය කෙරේ ඇති සිතුවිලි ඇරිණ. මේ දිව්‍යාංගනාවන් මා ලබන්නේ කෙසේදැ?"යි විචාළහ. එවිට සර්‍වඥයෝ "ඉඳුරා මහණදම් පිරුවොත් දිව්‍යාංගනාවන් දැක්ක හැක්කැ"යි වදාළසේක.

එබස් අසා "එසේ වීනම් මහණ දම් පුරම් ස්වාමිනි, මට දිව්‍යස්ත්‍රීන් ලබන නියාවට ඇපවන්ට උවමැනවැ"යි කීහ. සර්‍වඥයෝත් "යහපත නන්දයෙනි, මම ඇපවෙමි" වදාළසේක.

එවිට නන්ද සාමීන් "මහණදම් වහා පුරන්ට උවමැනවැ"යි කියා දිව්‍යලෝකයෙන් සර්‍වඥයන් හා සමග ජේතවනාරාමයට වැඩ එතැන්පටන් දිව්‍යස්ත්‍රීන් පතා මහණදම් පුරන්නාහ.

සර්‍වඥයන් වහන්සේ සැරියුත් සාමින්ට වදාරණසේක් "ශාරිපුත්‍ර ස්ථවිරයෙනි, නන්දයෝ 'දිව්‍යස්ත්‍රීන් ලබතොත් මහණදම් පුරමි' මා අතින් ඇප ලවාගත්තෝ වේදැ"යි වදාළසේක. එවිට මුගලන් සාමීන්ටත් එලෙස වදාළසේක. කාශ්‍යප සාමීන්ටත් එලෙස වදාළසේක. අනුරුද්ධ ස්වාමීන් වහන්සේටත් එලෙස වදාළසේක. ආනන්ද සාමීන්ටත් එලෙස වදාරා අසූ මහසව්වන් වහන්සේ ඇතුළු බුද්ධවල්ලභ බොහෝ භික්‍ෂූන් වහන්සේට එපවත් වදාළසේක. සැරියුත් සාමීන් නන්ද සාමීන් කරාගොස් "නන්දයනි, දිව්‍යලෝකයෙහි දෙවියන් මධ්‍යයේ බුදුන් ඇප ලවාගෙන ස්ත්‍රීන් තකා මහණදම් පුරවාද? තොපගේ මහණදම් පිරීම නම් කුලියට බැලමෙහෙ කරන්නා වැන්නැ"යි වදාළසේක. මේ නියායෙන් නන්ද සාමීන්

දුටු යම් තැනකදීම "කුලියට බැලමෙහෙ කරන්නා වැන්නේය"යි කියා බොහෝ මාළුවරුන් වහන්සේ ලජ්ජා කරනසේක. බොහෝ දෙනාවහන්සේ කියන බසට ලජ්ජාව නන්ද සාමීන් එකගව ස්ත්‍රීන් කෙරෙහි සිතිවිල්ල ඇර විදර්ශනා වඩා රහත් වුසේක.

රහත්ව බුදුන් කරා ගොස් "ස්වාමීන් වහන්ස, මට ඇප වූ ඇපය ඉනී ගියේ වේදැ"යි කීසේක. සර්‍වඥයෝත් "නන්දයෙනි, තොප රහත් වූ ගමනේ ඇපයෙන් ඉදි ගියය, ගමනයෙමි"යි වදාළසේක.

එදවස් වැස රැස්ව මාළුවරුන් වහනසේ "නන්දයෝ අවවාදක්‍ෂමයෝය" යන කථාව කිය කියා වැඩහුන් තැනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදරා "මහණෙනි, මා එන්නාට පුර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදරා එපවත් අසා "නන්දයෝ පෙරත් අවවාදක්‍ෂමයෝ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ ඒ රජ්ජුරුවන්ට පසමිතුරු වූ රජ්ජුරුව කෙනෙකුන්ට හස්ත්‍යචාරීව දවස් හරණාහ. බෝධිසත්ත්වයන් විසින් කම්පස් කරනලද මගුලැතාත් යුද්ධයෝග්‍යව සිටිනේය. එකියන පසල් රජ්ජුරුවෝත් සේනාවන් පිරිවරා බරණැස් නුවරට අවුත් නුවර

වටකොටගෙන "රට හෝ දෙන්නේය. යුද්ධ හෝ කරන්නේය"යි පත් යවූහ.

එබස් බරණැස් නුවර රජ්ජුරුවෝ අසා "රාජ්‍යය කුමට දෙම්ද? යුද්ධ කෙරෙමි"යි කියා අට්ටාල වෙට්ටම ආදී වූ දෙයෙහි සේනාව සලස්වා යුද්ධ කරන්ට වන්නාහ. ඒ වේලාවට අට්ටාලවල සිට දමන්නා වූ බොහෝ ශරවර්ෂා දැක ඉවසාගත නොහී ඇත් පසුබැස ගියේය. එවිට බෝධිසත්ත්වයෝ කියන්නාහු "යුද්ධයට යෝග්‍යයයි කියා ඉන්නා වූ හස්තිරජය, ශරවර්ෂාව නැත්තා වූ යුද්ධයෙක් නම් යුද්ධ නොවෙයි, එසේ හෙයින් 'ශරවර්ෂාව ඇඟට වැදගතැ'යි පසුබසිනේ ඇයිදැ?යි, නාගේන්ද්‍රය වහාගොස් කණයම් බිඳ, ඉන්ද්‍රඛීලය උපුටා දමා, පවුරු වාටලා එලා නුවරට වැද බරණැස් රජ්ජුරුවන් අල්වාගෙන අපගේ රජ්ජුරුවන්ට පාවා දෙව"යි කීහ.

එබස් අසා පෙරලා කරකැවී දිවගෙන ගොස්, සකු උදුරා දමන්නාක් මෙන් ඉන්ද්‍රඛීලය උදුරා දමා පවුරු පදනම් ඇන බිඳ, නුවරට වැද බරණැස් රජ්ජුරුවන් අල්වා දුන්නායි වදාරා 'සංගාමාවචර ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි ඇතා නම් නන්ද ස්ථවිරය. හස්ත්‍යචාරීව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 182. වාලෝදක ජාතකය

තවද ශාක්‍යකුලතිලක වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි විඝාසාදයන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්?

පන්සියයක් උපාසකවරුන් තමන් ගේ ඇති ගම්බිම්වල සරකා තමතමන් අඹුදරුවන්ට පාවාදී බුදුන්ගෙන් බණ අසා එක්කම හිඳිනාහ. එකී පන්සියයක් දෙනාගෙන් සමහරු සෝවාන් වූහ. සමහරු සකෘදාගාමී වූහ. සමහරු අනාගාමී වූහ. මෙසේ තුන්මග තුන්ඵලයට පැමිණි උපාසකවරුන් සසර සිටි එක් උපාසක කෙනෙක් නැත.

එසමයෙහි දන් දෙන යම් කෙනෙක් ඇත්නම් උපාසකවරුන්ටත් සමග දන් දෙන්නාහ. ඒ උපාසකවරුන්ගේ දැහැටිදඬු ආදී වූ දෙය පණත්කොට දෙන්නා වූ පන්සියයක් අතවැස්සෝ ඇත්තාහ. ඔවුහු උපාසකවරුන්ගේ ඉඳුල්පත් කන හෙයින් “විඝාසාදය”යි යන නම් ලද්දාහ.

එක් දවසක් එකියන විඝාසාදනයෝ පන්සියයක් දෙන දනට ගොස් උනුන් කැටිව මල්ලව යුද්ධයක් සලසාගෙන, ඒ ඒ තැන පැන බැසගෙන බොහෝ අරගල කරන්ට වන්නාහ. පන්සියයක් උපාසකරුන් බැණ නොනැඟී තමන් ගෙවල්වලම උන්නාහ.

සර්වඥයෝ අනඳ සාමීන් ගෙන්වා "ආනන්දය, මේ කුමන අරගලදැයි බලාපියා එව"යි කියා යවූසේක. ආනන්ද සාමීන් ඒ බලා එපවත් සර්වඥයන්ට දැන් වූසේක. සර්වඥයෝ එපවත් අසා "ආනන්දයෙනි, පෙරත් මේ කියන උපාසකවරු බැණ නොනැඟී ඉන්දදීම මේ කියන කොල්ලෝ දිව පැන ඇවිද්දේ වේදැ"යි වදරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ ඒ ඒ රජ්ජුරුවන්ට වැඩ පසස්නා අමාත්‍යව උපන්සේක.

එසමයෙහි පසල්රට "සතුරන්ගෙන් භයක් පැමිණිය"යි අසා පසල්රට ගොසින් යුද්ධකොට උන් හැමදෙනම පරදවා නුවරට අවුත් රජගෙට වදිනා රජ්ජුරුවෝ අමාත්‍යයන්ට කියන්නාහු "මේ එක්ව දුක් ගෙන ආ පන්සියයක් අසුන්ට මුද්දිරප්පලන් පැන් නුමුසුකොට මිරිකා ඒ රස පොවව"යි කීහ. "යහපතැ"යි ඒ නියාවට මුද්දිරප්පලන් පැන් අසුන් පොවා, ඉතිරි පැන් මිරිකා කසට පිපීගිය වසල බොහෝව තුබූ විසින් අමාත්‍යයෝ රජ්ජුරුවන් අතින් "මීට කුමක් කරමෝදැ?"යි විචාරා අසුන් පන්සියයකට කානම් ඇදගෙන ඒ ආ කොටළුවන්ට ඒ කසට පිපීගිය වසළු බොහෝව තිබූ හෙයින් පැනෙහි ලා මිරිකී පොව"යි කීහ. ඒ මානයට පෙවු යාපත් රසය බීපූ අස් පන්සියය කිසිම අරගලයක් නැතිව තමන්ගේ අස්සල බැන

නොනැඟී සිටියාහ. කසට පැන් බීපුවා වූ කොටළුවෝ රජගෙයි ඒ ඒ තැන පැන නටන්නට වන්හ.

රජ්ජුරුවෝ ඒ දැක ලඟ සිටි බෝධිසත්ත්වයන් විචාරන්නාහු "එම්බල, යහපත් රසය බීපු අශ්වයෝ උඩත් කමක් නැතිව වාසය කරන්නාහ. අසුන් බී ඉතිරි වූ කසට පිපී දමාපු මුද්දිරප්පලන් පැන් බී උඩත්ව ඇවිදිනාහ. මෙයට කාරණය කිම්දැ?"යි විචාළහ. එවිට බෝධිසත්ත්වයෝ කියන්නාහු "ජනප්‍රධාන වූ දේවයන් වහන්ස, අශ්වයෝ උත්තම් ජාති හෙයින් ඒ පැන් බීත් උන් මන්ත නොව දවසරිනාහ. නීචයන් විසින් තමන් ලත් යම් යම් තාක් දෙයකට උමතු වන්නාහ. එසේ හෙයින් මේ කොටළුවෝත් තමන් නුපුවිරූ මුද්දිරප්පලන් රසය බීපු හෙයින් උඩත්ව දවසනාහ"යි කීහ. රජ්ජුරුවෝත් ඒ කොටළුවන් මරා වාසලින් පිටත ලුහයි වදරා මේ 'වාලෝදක ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි කොටළුවෝ නම් දැන් මේ විඝාසාදයෝය. අශ්වයෝ පන්සියය නම් උපාසකවරු පන්සියය. එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයයෝය. එසමයෙහි අමාත්‍යව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 183. ගිරිදන්ත ජාතකය

තවද ශාක්‍යකුල ප්‍රදීප වූ සර්වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි සර්වඥයන්ට විපක්ෂ වූ

දෙවදත්ත ස්ථවිරයන්ට පක්‍ෂ වූ භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි. හේ කෙසේද? යත්, වර්තමාන කථාව ‘මහිලාමුඛ’ ජාතකයෙහි විස්තර වශයෙන් බස්නේය.

යටගිය දවස බරණැස් නුවර සාම නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් අමාත්‍ය කුලයක ඉපිද වැඩිවිය පැමිණ රජ්ජුරුවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනාකොට ඉදිනාසේක.

එසමයෙහි පාණ්ඩව නම් අශ්වයෙක් ඇත. ඒ අශ්වයා බලන්නා වූ ගිරිදත්ත නම් අස්සලයෙක් ඇත. ඒ අස්සලයාගේ පය සිගිතතකට කොරය. ඒ කොර වූ අස්සලයා අසු ගෙන කඩියාලම අල්වාගෙන කොර පය ඇන ඇන ඉදිරියේ යන්නේ, අසාත් “මා උගන්වන දෙයක” සිතා ඒ මානයට ගොසින් පය කොරකොටම ඔබ ඔබා යන්නේය.

එපවත් රජ්ජුරුවෝ අසා බෝධිසත්ත්වයන්ට කියන්නේ “මඟුලසා පය කොරකොට ඔබත්, කියන්නා ඇසීමි. උගට කවර ව්‍යාධියෙක් දෝ හෝයි ගොසින් බලා එව”යි රජ්ජුරුවෝ කීහ.

බෝධිසත්ත්වයෝ ගොසින් අසා බලා ව්‍යාධියක් නොදැක සිතන්නාහු “අස්සලායාගේ පය කොරකොට ඔබන නිසා මුත් පය කොරකොට ඔබන පමණක් විනා, ව්‍යාධියක් නැතැ”යි රජ්ජුරුවන්ට කියන්නාහු “සාම නම් රජ්ජුරුවන් වහන්ස, නුඹවහන්සේගේ පාණ්ඩව නම් අස්වයා ගිරිදත්ත නම්

අස්සලයාගේ ද්වේෂයෙන් පය කොරකොට ඔබන පමණක් මිසක්, අසාගේ ව්‍යාධියක් නැත. එසේ හෙයින් යහපත් නිර්ව්‍යාධි අස්සලයෙකු අසු බලන්ට සලස්සන්නා අසුගේ පය කොර ඇරෙ”යි කියන්නා ඒ නියාවට නිර්ව්‍යාධි අස්සලයෙකු සැලැස්සූ ගමනේ අසාගේ පය කොර පලා ගියේයයි වදාරා මේ ‘ගිරිදත්ත ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි ගිරිදත්ත අස්සලයා නම් දේවදත්ත ස්ථවිරයෝය. පාණ්ඩව නම් අශ්වයා මා කෙරේ වෛරී පක්ෂයේ අත්ගත් භික්ෂූහුය. රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. අමාත්‍යයව උපන්නෙම් බුදුවූ මමම ය”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 184. අනභිරත ජාතකය

තවද ත්‍රිභුවන තිලක වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා බ්‍රාහ්මණයෙකු අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්?

සැවැත් නුවර එක් බ්‍රාහ්මණ මානවකයෙක් ත්‍රිවේදය පාරප්‍රාප්තව බොහෝ රාජකුමාරවරුන් නම් මන්ත්‍ර හදරත්වයි. ඒ තෙමේ කල්යාමෙකින් අඹුදරුවන් වහල් සරක් ආදී වූ බොහෝ ගිහිකම්ටුල්ලේ යෙදී, තෙමේ තමාගේ මන්ත්‍ර මධ්‍යයෙහිත් අන්තයෙහිත් ආදීයෙහිත් සිත කැළඹී සිහි නැති වන්ටවන.

එසමයෙහි එක් දවසක් ඒ බ්‍රාහ්මණ ගඳදුම් මල් පහන් ගත් අත් ඇතිව බුදුන් දකින්ට ගොසින් බුදුන් දිට. සර්‍වඥයෝ "ඇයි බ්‍රාහ්මණය, බොහෝ දෙනාට මන්ත්‍ර උගන්වයි, දැනට ම වනපොත් ඇද්දැ?"යි විචාරා වදාළසේක.

එද කියන්නේ "ස්වාමිනි, පඤ්චකාම විසයෙහි හා ගිහි කම්කටුලේ සිත වැටී ආදී යහපත්ව දන්නා දෙය දැන් සඳහන් නැති වෙන්නට වනැ"යි කීය. එබස් සර්‍වඥයෝ අසා "පළමුත් තට එසේම වූයේ වේදැ"යි වදරා ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ බරණැස් නුවර දිසාපාමොක් ආචාර්ය්‍ව ඉපිද බොහෝ ශිෂ්‍යයන් අකුරු කියවා වාසය කරනසේක. එසමයෙහි අතවැස්සන්ට ප්‍රධාන බෝධිසත්ත්‍වයන්ට ඉක්බිතිව ඉන්නා බ්‍රාහ්මණයෙක් ඇත. ඒ බ්‍රාහ්මණයා පඤ්චකාමයෙහි හා ගිහිකම්කටුල්ලෙහි වන. එවක් පටන් ශිල්ප වනපොත් නැති වන්නට වන. බෝධිසත්ත්‍වයෝ "ඇයි මාණවකය, තාගේ ශිල්ප වනපොත් නැද්දැ?"යි විචාළහ. "එසේය, පඤ්චකාමයෙහි හා ගිහිකම්කටුලුවලට සැලවුනු ගමනේ වනපොත් නැති වන්ට වන්නාහ"යි කීහ.

එබස් අසා "එම්බල, කැළඹුනා වූ ජලයෙහි සිප්පි මස්කැස්බෝ නොපෙණෙන්ද? එමෙන් කැළඹුනා වූ සිත්විල්ලෙන්

ශාස්ත්‍රය නොපෙණෙන්නේය. ප්‍රසන්න වූ ජලයෙහි සිප්පි මස්කැස්බන් පෙණෙන්නාසේ ප්‍රසන්න වූ සිතිවිල්ලේ බොහෝ ශාස්ත්‍ර සිත තිබෙ"යි වදාරා 'අනභිරත ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි බ්‍රාහ්මණ මාණවකයා නම් මෙසමයෙහිත් බ්‍රාහ්මණ මාණවකයාමය, දිසාපාමොක් ආචාරී නම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 185. දධිවාහන ජාතකය

තවද ත්‍රිභූවනාධිපති වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන් වහන්සේ භජනය කරන භික්ෂු කෙනෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

මෙහි වර්ථමාන කථාව යට කී ජාතකය හා සමානය. මෙහි සර්‍වඥයන් වහන්සේ "මහණෙනි, අසත්පුරුෂයන් භජනය කිරීමෙන් සත්පුරුෂයෝත් නපුරු වන්නාහ. කාරණා කිම්ද? යත්, කොසඹ ගස හා අගුල්වැල් එක්වීමෙන් තික්ත වූ අඹගස වැන්නේය"යි වදාරා ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බමුණෝ සතර දෙනෙක් ගිහිගෙය හැර හිමාලය වනයට වැඩ සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන්

පැවිදිව පෙළපාළියෙන් පන්සල් ඉදිකොටගෙන වාසය කරන්නාහ.

එසමයෙහි හැමට වැඩිමාළු තාපසයෝ කළුරියකොට දෙදෙව්ලොව දෙවියන්ට නායක වූ ශක්‍රදේවේන්ද්‍රව උපන්නාහ. ඉපිදි තාපසකම්කොට ශක්‍රභවනයට ආ නියාවත් තමන් මලණු තුන්බෑයන් තාපසකම් කරන නියාවත් දැක, ඒ තුන්බෑයන් කරා ශක්‍රයෝ අවුත් දැක යන්නාහ.

එක් දවසක් වැඩිමාළු තාපසයා කරා අවුත් "ස්වාමීනි, ඵාසු අඵාසු කිම්දැ?යි උවමනා කිම්දැ?"යි විචාළහ. එවිට තාපසයෝ කියන්නාහු "පාණ්ඩු රෝගය ඇති හෙයින් ගින්නෙන් ප්‍රයෝජන ඇත. ඊට උපකාර වච්" කීහ. එබස් ශක්‍රයෝ අසා "වාසිඑරසුවය"යි යන දෙයක් දී "එක් පිටකින් පෙරලා ගන්නා පොරව ය"යි කියා "තෙලෙන් කැමති ප්‍රයෝජනයක් විදුව"යි කියා ශක්‍රයෝ තාපසයන්ට දුන්නාහ. තාපසයෝ කියන්නාහු "ශක්‍රයෙනි. මේ වෑපොරව ඇරගෙන මට දර ගෙනෙන්නෝ කවුරුදැ?"යි කීහ. එවිට ශක්‍රයෝ කියන්නාහු "නුඹවහන්සේ අත පිස හින්දදීම දර පලාගෙන එව"යි කියන්නා තෙමේම ගොස් පෙරලා දර පලාගෙන විත් "ගිනි මොලවන්නේ ය"යි කියා වාසිඑරසුව දී අනික් මැදි බෑ තාපස කරා ගියේය.

ඒ තාපයන් සමීපයට ගොසින් ශක්‍රයෝ කියන්නාහු "තාපසයන් වහන්ස, නුඹවහන්සේට ඵාසු අඵාසු කිම්දැ?"යි විචාළාහ. ඒ තාපසයෝ කියන්නාහු "ඇතුන්ගෙන් පන්සල

ඇලගෑමෙන් බොහෝ අවුසුය. එසේ හෙයින් ඇතුන් පහ කරන උපායක් කියව"යි කීහ. ශක්‍රයෝ එබස් අසා බෙරයක් දී "මේ බෙරය එක් ඇසක් ගසාලන්නා චතුරංගිනී සේනාව වුවත් බිඳෙන්නාහ. එක් ඇසක් ගසාලන්නා එකෙනෙහිම මිතුරුව සිටිනාහ"යි කියා බෙරය දී බාල තාපසයන් කරා ශක්‍රයා ගොස් ඵාසු අඵාසු විචාරා ඒ තාපසයෝත් තමන්ට පාණ්ඩු රෝගයක් ඇති නියාව කියා දී "ඊට සෑහෙන යමක් ඇතොත් යහපතැ"යි කීහ. එවිට ශක්‍රයෝ දී කළයක් දී "මේ එක් තෙනක නමාපියන්නා මහත් වූ ගංගාවක් වෙ"යි කියා දී ශක්‍රයෝ ගියාහ.

එසමයෙහි එක්තරා හූරෙක් පාළුව ගිය ගමක සාරා කා ඇවිදිනේ අනර්ඝ මැණිකක් දැක, ඒ මැණික කටින් ඩැහැගෙන ඒ මැණිකේ ආනුභාවයෙන් ආකාශයෙන් නික්ම, සමුද්‍ර මධ්‍යයෙන් දිවයිනකට බැස සිතන්නේ "ඒ ඒ තැන ගොදුරු සොයා ඇවිදින්නට කාරණා කිම්ද? මෙතැනම ඉඳිමි" සිතා දිඹුල් ගසක් සමීපයට ගොසින් දිඹුල් ගහ මුල මැණික තිබා එහි වැදහොත්තේය.

එකලට එක් ගමක දෙමව්පියන් විසින් හරණලද එක්තරා පුරුෂයෙක් පටුන් ගමකට ගොස් කුලියට පඩව්වකට නැගී යාත්‍රා කරන්නේය. මුහුදු මධ්‍යයේදී පඩව්ව නැසින, එවිට පුරුෂයා ලෑල්ලක් බඩ තබාගෙන පීනන්නාහු ඌරා වැදහොත් දිවයිනට පාව ගියේය. එතැනට පාව ඌරා වැදහොත් නියාවත් මැණික තිබූ නියාවත් දැක "ඌරා මෙතනට ආවේ

මැණිකේ ආණුභාවයෙන්මැ''යි සිතා උගරා කරා යෙමින් සිට සොල්මන් නොකොට අවුත් මැණික අරගෙන ආකාශයෙන් දිඹුල් ගසට නැගී සිතන්නේ "උගරා මරා මස් කා පියා ඔබ්බකට යෙමි'' සිතා දිඹුල් දණ්ඩක් කඩා උගරා ඇඟට දැමී. එවිට උගරා පිබිද මැණික ඇසින් නොදැක ඒ ඒ තැන ඇවිද වියරු වැටුනා සේ සොයන්ට වන. ඒ වේලාවට ගස උඩ උන් පුරුෂයා සිනා සී පීය. එවිට උගරු උඩ බලා මිනිසා දැක "දිඹුල් ගස එලාපියා මිනිසා එලාගෙන නසමි'' සිතා දිඹුල් ගසට වේගවත්ව ඉසින් අන්නට වන. ඒ නියාවෙන් දිඹුල් ගසට ඇන තමන්ගේ ඔලුව පලාගෙන තෙමේම මළේය.

පුරුෂයා උගරා මළ බව දැන, ගසින් බැස ගිනි ගා උගරා පුලුස්සා කා එතැන සිට මැණිකෙහි ආනුභාවයෙන් හිමාල වනය බලා ආකාශයෙන් යන්ට වැද, අතරමග උන් තාපසවරුන් තුන්දෙනා දැක ඉන් පළමු තාපසයන්ගේ පන්සල කෙරේ බැස, ඒ තාපසයන් දැක එතැන කීපදවසක් රඳා තාපසයන්ගේ 'වාසිඑරසුවේ' ආනුභාවය දැක "මේ වාසිඑරසුව ඇරගන්ට උවමැනවැ''යි කියා තමන්ගේ මැණිකේ ආනුභාවය කියා තාපසයෝ එපත් අසා "ආකාශයෙන් මාත් ඒ ඒ තැන යන්ට උවමැනවැ''යි සිතා වාසිපරසුව දී මැණික ඇරගත්තාහ. ඒ 'වාසිපරසුව' ගත්තා වූ පුරුෂයා 'වාසිඑරසුව' අත පා යවා "තාපසයන්ගේ හිස කපාගෙන එව''යි යැවීය. වාසිඑරසුව එලෙසම ගොස් තාපසයන්ගේ ඉස කපාගෙන ආය.

මැණිකත් ඇරගෙන එවිට ඒ පුරුෂයා 'වාසිචීරසුව' එක් තැනක සඟවා තිබා අනික් තාපසයන් කරා ගොස් මැණික ඇරගෙන උන් හා කීපදවසක් රඳා, බෙරෙහි ආනුභාව දැක "මේ බෙරය මා ඇරගන්නට උවමැනවැ"යි සිතා තමන්ගේ මැණිකේ ආනුභාවය කියා තාපසයන් විසින් මැණික ඇරගෙන බෙරය දුන් පසු ඒ තාපසයන්ටත් ඒ නියායෙන් 'වාසිපරසුව' අත පා යවා තාපසයන්ගේ හිස කප්පා ගෙන්වාගෙන මැණිකත් අරගෙන අනෙක් තාපසයන් කරා ගොස් උන්ගේ දී කළයෙහි ආනුභාව දැක දී කළය ගන්නා පිණිස මැණිකේ ආනුභාවය කියා මැණික දී කළය අරගෙන වාසිචීරසුව අත පා යවා තාපසයන්ගේ හිස කප්පා ගෙන්වාගෙන මැණිකත් අරගෙන ආකාශයෙන් බරණැස් නුවර කරාගොස් බරණැස් නුවර සමීපයෙහි සිට රජ්ජුරුවන්ට කියා යවන්නේ "මට රාජ්‍යය හෝ දෙව, යුද හෝ කරව"යි කියා මිනිසෙකු අත කියා යැවුය.

එබස් රජ්ජුරුවෝ අසා චතුරංගනී සේනාව අරගෙන "මොහු අල්වම්"යි නික්මුනාහ. නික්ම පුරුෂයා කරා අවුත් යුදයට වන්නාහ. එවිට පුරුෂ සියල්ලවුන්ම තමාට මිතුරු වන්නා වූ බෙර ඇස ගසාලීය. එවේලේ බොහෝ සේනාව අවුත් ඒ පුරුෂයා වටකොට ගත්තාහ.

එවිට රජ්ජුරුවෝ එසේ වූවත් රාජධෛර්‍යයීයෙන් කීපදෙනෙකු ඇරගෙන බැණගෙන නික්මුණාහ. ඒ වේලාවට තමාගේ දී කළය නමාපීය. එවිට ගංගාවක් සේ දී වතුර

ඇරගෙන නික්මුණෝය. එවිට සතුරුව ඉන්නා බොහෝ දෙනා ඉගුලුනාහ. එවිට අනික් බෙර ඇස ගසා සතුරන් ඒ ඒ තැන යවා වාසිඑරසුව අත පැසවා රජ්ජුරුවන්ගේ හිස ගෙන්වා ගත්තාහ. “මෙතෙක් සේනාවෙන් එකකුත් ආයුධයක් සලස්කොට ලම්හයි නොසිතූහ. එවිට බොහෝ දෙන එක්ව ඒ පුරුෂයාට “දධිවාහන රජ්ජුරුවෝය”යි නම් තබා මහත්කොට පෙරහරින් නුවර ගෙනවුන් ඔටුනු පලන්දා රාජ්‍යයට සලස්ව ගත්හ. ඒ දධිවාහන රජ්ජුරුවෝ දැහැමෙන් රාජ්‍යය කරන්නාහ.

එසමයෙහි දධිවාහන රජ්ජුරුවන් එක් ගඟක ලෝදැල් එලා නාමින් සිටිසේක. හිමාල වනයෙන් කර්ණමුන්ඩ නම් විලින් දේවතාවන් ආනුභව කරන්න වූ අඹ ගසින් අඹයෙක් අවුත් ඒ ලෝදැල් වල බැඳිනි. ඒ දුටු කෙවුලෝ රජ්ජුරුවන්ට ගෙනගොස් පෑහ. රජ්ජුරුවෝත් වැද්දන් අතින් විචාරා අඹ රසය අනුභවකොට ඒ කියන අඹ ඇටය උයනේ රෝපනය කරවා, ඒ ගස වට බොහෝ සුවඳ ගස් ඇති කරවා දවස් පතා සුවඳ පැන්, කිරි පැන්, සඳුන් පැන් වත්කරවා ගස නොයෙක් මල්දම් එල්වා සුවඳ දුම් හා සුවඳ පැන් හා ලවා වටකොට පට කඩතිර ජවනිකා බන්දවා මේ නියායෙන් බොහෝ පෙරහර අඹ කසට කරවූහ.

අඹ ගස තුන් අවුරුද්දකින් රන්වන්ව මී අඹ එලගෙන මී හා සමාන රස ඇති විය. රජ්ජුරුවෝ ඒ ගස එල අනුභවකොට “මේ එල ඒ ඒ රජදරුවන්ට පඬුරුකොට

යවමි"යි සිතා නැවතත් සිතන්නාහ "මේ ඵල රජදරුවෝ කා ඒ ඇට ඉඳුවා ඇති කළෝ නම් මේ ගස නිස්සාර වෙ"යි සිතා අඹ ගෙඩියේ පැලවෙන ස්ථානයෙහි මඩු කටු ගසා යවූහ. ඒ ඒ රජ දරුවෝත් අඹ කා අඹ ඇට ඉඳුවා නැස්පෙන හෙයින් "මීට කාරණා කිම්දෝ හො?"යි සිතා පරීක්ෂාකොට මඩු කටු ගසා යවනලද නියාව දැන ඉන් එක් රජ්ජුරු කෙනෙකුන්ගේ උයන්ගොව්වාත් බරණැස් නුවරට ගොස් දධිවාහන රජ්ජුරුවන්ට තමන් ආ පවත් කියා යවා රජ්ජුරුවන් විසින් ගෙන්වා "තෝ උයන්ගොව්වෙක් දැ?"යි විචාරන්නා සේ "එසේය රජ්ජුරුවන් වහන්ස, අකාලයට ඵල ඇති මල් ඇති කිරීම ආදි වු දෙය දනිමි"යි කියා එබස් රජ්ජුරුවෝ අසා තමන් උයන්ගොව්වා හා කැටිව උයන් බලන ලෙස සැලසූහ. ඒ කියන උයන්ගොව්වා අකලට මල් හා ඵල ද ඇතිකොට රජ්ජුරුවන්ට පෑය. රජ්ජුරුවෝ සතුටුව පළමුව සිටි උයන්ගොව්වා හැර අමුතුව ආ උයන්ගොව්වාට උයන භාරකොට දුන්නාහ.

එවිට උයන්ගොව්වා උයන තමා නතු වූ පසු "අඹගස තිත්ත කෙරෙමි" සිතා අඹ ගසට කොසඹ ගසක් හා අගුල් වැල් වට ඉඳුවිය. ඒ වැඩී අඹ ගස මුල් බැඳී අඹ ගස ශාඛා හා එක්ව බැඳී අගුල් වැල් ගස වැළඳ කල්යාමකින් අඹ ගස කොසඹ ගස මෙන් තිත්තව ගියේය. තමා ආ කාරිය සිද්ධව ගිය හෙයින් උයන්ගොව්වා තමා නුවරට පළා ගියේය.

එවිට රජ්ජුරුවෝ එක් දවසක් මගුල් උයනට ගොස් "අඹ කමි"යි සිතා අඹ කා කොසඹ කොල සැපුවා සේ තිත්ත විසින් රජ්ජුරුවෝ කාරා බිමට දැමූහ. බොධිසත්ත්වයෝ ඒ රජ්ජරුවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නා වූ අමාත්‍යයව ඉපිද රජ්ජුරුවන් ලග සිටියාහ. රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන්ට කියන්නාහු "අමෘත්ත වූ අඹ ගසට කළමනා ප්‍රතිකාරයෙන් අඩුවක් නැතිව තිබියදී තිත්ත වන්ට කාරණා කිම්දැ?"යි විචාළීය.

එවිට බෝධිසත්ත්වයෝ කියන්නාහු "දධිවාහන රජ්ජුරුවන් වහන්ස, කොසඹ ගස්, අගුල් වැල් නිසා වනැ"යි කීහ. එවිට රජ්ජුරුවෝ කොසඹ ගස්, අගුල් වැල් කප්පවා දම්මවා තිත්ත වූ පස්ද අද්දවා දම්මවා මිහිරි පස් ලවා කිරිපැන්, සඳුන් පැන් වත්කොට පෙරසේ පනත් කළාහ. පළමු උයන් ගොව්වාට උයන පාවා දුන්නාහ. අඹ ගස පෙරසේම මිහිරි රස ඇතිවීයයි වදාරා 'දධිවාහන ජාතකය' නිමවා වදාළසෙක.

"එසමයෙහි අමාත්‍යයව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම ය"යි දක්වා වදාළසේක.

# 186. චතුමට්ට ජාතකය

තවද ත්‍රිභුවන ඊස්වර වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි මාළු භික්ෂු කෙනෙකුන් වහන්සේ අරඹයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්?

එක් දවසක් සැරියුත් මුගලන් දෑගසව්වන් වහන්සේ උන්වහන්සේ කැටුව ප්‍රශ්ණ විසඳීම ආදී වූ ධර්‍ම කථාවෙන් යුක්තව සිව්වනක් පර්ෂිත් මධ්‍යයෙහි වැඩවූන්සේක.

එතනට මාළුතෙර කෙනෙකුන් වහන්සේ අවුත් තුන්වෙනිව ඉඳ "සැරියුත් සාමීනි, නුඹවහන්සේට නොදැනෙන දෙයක් ඇත්නම් මට වදාළ මැනව්යි මම කියමි. මට නොදැනන දෙයක් ඇත්නම් නුඹවහන්සේට කිව මැනවැ"යි කී සේක. එබස් දෑගසව්වන් වහන්සේ අසා "මේ නිකම්ම තුච්ඡ පුරුෂයා අප හා සමඟ ඉඳ කථා කෙරෙ"යි කියා ලජ්ජාව එතැනින් පළා ගියසේක. එවිට බොහෝ උපාසකවරු ඒ නම එතැනින් පහකොට එපවත් සර්‍වඥයන් ට සැල කළාහ.

සර්‍වඥයෝ "උපාසකවරුනි, දැන්මතු නොවෙයි, පෙරත් දෑගසව්වන් කථාකොට උන් කලට මේ කියන භික්ෂූහු නිසා කතාව ඉගුළුනේ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය පාලනය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ හිමාල වනයෙහි ගසක වෘක්ෂ දේවතාව ඉපිද වාසය කරනසේක.

එසමයෙහි චිත්‍රකූට පර්‍වතයෙහි වසන්නා වූ ස්වර්‍ණ හංසයෝ දෙන්නෙක් ගෝචර භූමියට යන එන කල බෝධිසත්ත්වයන්

වාසය කරන්නා වූ වෘක්ෂයේ සැතපී යන්නාහ. මෙසේ යාමෙන් බෝධිසත්ත්වයන් හා හංසයෝ දෙන්නා විශ්වාසව මෙලොවින් පරලොවින් යුක්ත කථා කිය කියා යන්නාහ.

එසමයෙහි එක් දවසක් බෝධිසත්ත්වයන් වහන්සෙ හා ස්වර්ණ හංසයෝ දෙන්නා හා කථාකොට උන් තැනට කැනහිලෙක් ඇවිත් ගසමුල ඉඳ "හංසයනි, උඩම හිඳ රහස් කථා කරවුදැයි, සිවිපාවුන්ට නායක වූ මා හා සමඟ කතා නොකොට උඩ ඉදිනේ ඇයි?" කීහ. එබස් හංසයෝ අසා "මේ නිවයා අප හා කැටිව කථා කරයි" කියා ලජ්ජා ව චිත්‍රකූට පර්වතයට නැඟී ගියහ.

බෝධිසත්ත්වයෝ එවිට කැනහිලාට පෙනී "හංසයන් හා හංසයොන් කතා කෙරෙති. හංසයන් හා දෙවියෝ කථා කෙරෙති. තෝ වනාහි ජාතියෙන්, වර්ණයෙන්, රූපයෙන්, ශබ්දයෙන් යන සතර කාරණයෙන් අඩු වූ තා හා සමඟ කුමන කථාදැ?"යි කියා අහංකාර වේග පෑ කැනහිලා ලුහුබන්දපුවයි වදරා මේ 'චතුමට්ට ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි කැනහිලා නම් මේ මාළු භික්ෂූහු ය. හංසයෝ දෙදෙනා සැරියුත් මුගලන් වහන්සේය. වෘක්ෂ දේවතාව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 187. සීහකොට්ඨුක ජාතකය

තවද ත්‍රිභූවන තිලක වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කොකාලික ස්ථවිරයන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්?

කෝකාලික ස්ථවිරයන් වහන්සේ බොහෝ ත්‍රිපිටකය හදාරන මාළුවරුන් වහන්ස් දැක "අපිත් මධුර ස්වරයෙන් කියමෝදැ"යි කියා එක් දවසක් බණ කියන්නට වැද බණ කියාගත නුහුණුවෝ ශරීරයෙන් ඩාදිය සෙලවී බිමට බැසපූය. බොහෝ භික්ෂූන් වහන්සේත් බුදුන් කරාගොස් ආදි "මුන් බණදහම් දනිතියි උනුම්හ. තමන් කිසිවකුත් නොදන්නා නියාව බණ කියන්ට යයි ගොස් තමාම ප්‍රකාශ කළේය"යි වදාළසේක.

එබස් අසා සර්‍වඥයෝ "පළමුත් තමන් සිංහනාද කරමැයි සිතා සිවල්නාද කළෝ වේදැ"යි වදරා ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි අප මහබෝධිසත්ත්වයෝ හිමාලය වන ප්‍රදේශයෙහි සිංහරාජයන්ව ඉපිද එක් සිවල්දෙනක් සමඟ සංවාසකොට පුත්‍රයෙක් ලද්දේය.

ඒ සිවල් පැටවාගේ ඇඟිලි හා නියද ශරීරයාගේ කේසරයෝද වර්ණයෙන් හා සටහනින්ද පිය වූ සිංහරාජයාට

සමාන වූයේය. නාදය තෙමේ මැණී වූ සිවල් දෙනගේ නාදයට සරි වූයේය.

එසමයෙහි එක් දවසක් වැසි වසින්ට වන. ඒ වැසි වැස නිමි කල්හි සිංහයෝ සිංහ නාදකොට කෙළිනාහු. ඒ නාදය ඇසූ සිවල් පැටවාණෝ ද "මමත් සිංහනාද කරමැ"යි සිතා සිවල්නාදය ම කළාහුය. ඒ සිවල්නාදය අසූ අනිකුත් සිංහයෝ "මේ කිමෙක්දැ?"යි නිශ්ශබ්ද ව උන්නෝය. මහබෝසතාණන් වහන්සේගේ භාය්‍යාව වූ සිංහ ධේනුවගේ පුත්‍ර වූ සිංහපෝතක තෙමේ "මපියාණන් වහන්ස, මේ සිංහ තෙමේ වර්‍ණයෙන් අප හා සමානය, ශබ්දය වනාහී අන් පරිද්දකින් වන්ට කාරණා කවරේදැ?"යි ඇසීය.

ඒ ඇසූ මහබෝසතාණෝ "දරුව, තොපගේ සහෝදර වූ මේ තෙමේ මාගේ වර්‍ණ සටහන් ඇත්තේ නමුදු මට දාව උපන් සිවල්දෙනකුගේ පුත්‍රයා ය"යි ඔහු අස්වසා ඒ සිවල්දෙනගේ පුත්‍රයාට ආමන්ත්‍රණයකොට කියන්නේ "දරුව, මෙයින් පසුව මෙහි වසන්නෙහි නම් සිංහනාද කිරීමට නොගොස් සිටුව"යි අවවාදකොට වදරා මේ 'සීහකොට්ඨුක ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි සිගාලපුත්‍ර නම් දැන් මේ කෝකාලික ස්ථවිරයෝය. අතිජාත පුත්‍ර නම් දැන් මේ රාහුල ස්ථවිරයෝය. එසමයෙහි සිංහරාජන් ව උපන්නෙම් බුදුවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 188. සීහ චම්ම ජාතකය

තවද ත්‍රිභුවන නායක වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කොකාලික ස්ථවිරයන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්?

කෝකාලික ස්ථවිරයන් වහන්සේ බොහෝ ත්‍රිපිටකය හදාරන මාළුවරුන් වහන්ස් දැක "අපිත් මධුර ස්වරයෙන් කියමෝදැ"යි කියා එක් දවසක් බණ කියන්නට වැද බණ කියාගත නුහුණුවෝ ශරීරයෙන් ඩාදිය සෙලවී බිමට බැසපූය. බොහෝ භික්ෂූන් වහන්සේත් බුදුන් කරාගොස් "ආදි මුන් බණදහම් දනිතියි උනුම්භ. තමන් කිසිවකුත් නොදන්නා නියාව බණ කියන්ට යයි ගොස් තමාම ප්‍රකාශ කළේය"යි වදාළසේක.

එබස් අසා සර්වඥයෝ "පළමුත් තමන් කිසිවකුත් නොදන්නා නියාව තමන්ම ප්‍රකාශ කළෝ වේදැ"යි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ ගොවි කුලයක ඉපිද සී සා ජීවත් වන්නාහ.

එසමයෙහි එක්තරා වෙළෙඳෙක් කොටළුවෙකු පිටින් ඒ ඒ තැන බඩු අරගෙන ගොසින් විකොට ජීවත් වන්නේය. කොටළුවා තෘණ භූමියට අරණ කල සිංහ සමක් පොරවා යවන්නේය. මේ නියායෙන් කොටළුවා තණ කවා

බෝධිසත්ත්වයන් වසන්නා වූ ගමට පැමිණියා වූ වෙළෙඳ පළමු පරිද්දෙන් සිංහ සමක් පොරවා යවූවාහු. වපුළ කුඹුර කන්ට හළ, එකියන කොටළුවාත් තණ කන්ට වන. එවිට කුඹුර රකිනා මනුෂ්‍යයෝ “සිංහයෙක් අවුත් තණ කති” සිතා මරන්ට භයින් ගමට ගොස් බොහෝදෙනා එක්කොට ගෙන ආයුධ හා ගැස්විම් පිඹීම් ඇතිකොට කුඹුර වටකොට ගෙන අඬගසා භයගන් වන්නාහ.

එවිට කොටළුවා භයින් තමාගේ රාවයන් ඇඬූ හෙයින් ගද්‍රභයා මරා තළා ඇට සුනුවිසුනුකොට පුවාහ. ඒ වේලේ වෙළෙඳු එතනට අවුත් “තාගේ ව්‍යවස්ථාව සේ බැණ නොනැගී හිඳ ඇඬීමෙන් මරණයට පත් වූයේ වේදැ”යි කීය. සර්‍වඥයන් වහන්සේ මේ ඉකුත්වත් වදරා මේ ‘සීහ චම්ම ජාතකය’ නිමවා වදාළ සේක.

“එසමයෙහි ගද්‍රභයා නම් කොකාලික ස්ථවිරය. එසමයෙහි ගොවියාව උපන්නෙම් බුදුවූ මම්ම ය”යි වදාළසේක.

## 189. ශීලානිශංස ජාතකය

තවද ත්‍රිභූවන චූඩාමාණික්‍ය වූ සර්‍වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි උපාසක කෙනෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්?

එක්තරා උපාසකයෙක් බුදුන් දක්නා පිණිස ජේතවනාරාමයට එමින් සිට අතරමග අචිරවතී නම් ගංගාවක්

දැක ගංගාවේ ඔරු පාරු පදින තොටියා නොදැක එවිට සිතන්නාහු "ඔරු පාරු නැතැයි කිම්ද? බුද්ධාලම්බන ප්‍රීතියෙමි"යි සිතා දියට බැස ගල්පොත්තක යන්නාසේ නික්මුණාහ. ගංගාව මධ්‍යයට ගිය කල ගඟ දැලයෙන් බිඳිනා රළ දැක බුද්ධාලම්බන ප්‍රීතිය යම්තෙමෙක් අඩුවිය. ඒ වේලාවට පැනෙයි පය ගැලෙන්ට වන. නැවත බුද්ධාලම්බන ප්‍රීතිය උපදවා දියපිටින් ගොසින් බුදුන් දකින්නට ගියාහ.

එවිට සර්‍වඥයෝ "උපාසකය, යෙහෙන් සෙමෙන් අවිදැ?"යි විචාරන්නා "එසේය ස්වාමින් වහන්ස, බුද්ධාලම්බන ප්‍රීතියෙන් අචිරවතී නම් ගංගාවෙන් ගල්තලක් පිට එන්නාසේ ආමි, ස්වාමීනි" කීය.

එබස් සර්‍වඥයෝ අසා "උපාසකය, පළමුත් උපාසකවරු බුද්ධාලම්බන ප්‍රීතියෙන් ජීවිතය රැකගත්තෝ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කරන සමයෙහි කාශ්‍යප බුදුන්ගේ අනාගාමී උපාසකයෙකු පඩවි නැගෙන්නට යන අවස්ථාවට එක්තරා කරනැවෑමියෙකුත් පඩවි නැන්ගේය. ඒ කරනැවෑමියාගේ භාර්යාවද උපාසකයන්ට කරනැවෑමියා පාවා දී "පැමිණි දුකක් සුවයෙක බැලෙව"යි කියා කිව. "යහපතැ"යි ගිවිස දෙන්නම පඩවි නැගී සත්දවසක් සමුද්‍ර යාත්‍රාකොට සත්වෙනි

දවසේ පඩව් බුන් කල්හි ලෑල්ලක් පිට උපාසකයන් හා කරනැවෑමියන් හා දෙන්න ලෑල්ල බඩ තියාගෙන පීනාගෙන ගොස් දිවයිනකට පාව ගියහ.

එවිට කරනැවෑමියා දිවයිනක බොහෝ පක්ෂීන් මරා කා උපාසකයාටත් දෙයි. උපාසකයා සිතන්නාහු "මෙතන අපට සරණයෙක් නම් බුද්ධ, ධම්මය, සංඝය, යන ත්‍රිරත්නය විනා අනික් සරණයෙක් නැතැ"යි කියා සිතා ඉන්නාහ.

ඒ වේලාවට මහාසමුද්‍රයෙහි වසන්නා වූ නාගරාජයෙක් තමා කය සත්රුවන් පිරූ නැවක් මෙන් මවාගෙන ඒ සමුද්‍රයේ වසන්නා වූ දේවතාවා මාලිනි වෙසක් මවාගෙන උපාසකයන් වසන ස්ථානයට ගොස් "බරණැස් නුවරට යන්නෝ ඇද්ද?"යි අඬ ගැසීය. එවිට උපාසක "අපි බරණැස් නුවරට යම්මැ"යි කීය. එවිට "යහපත, තොප නිසා ගෙනා නැවය. තොප නැගෙව"යි කීහ.

උපාසකයා කරනැවෑමියාට නැගෙන්ට අඬ ගැසීය. එවිට දේවතාවා කියන්නේ "තොප විනා උන් නැගෙන්ට අවසර නැතැ"යි කීය. "ඇයි, උන් නැගෙන්නට බැරි කවර කාරණයක් නිසාදැ?"යි විචාරන්නා "තිසරණ පිහිටි කෙනෙක් විනා තිසරණ නොපිහිටියන් නැංග නැතැ"යි කීහ.

එවිට උපාසකයෝ "මා ගත්තා වූ යම් සීලයෙක් ඇත්නම් තොපිත් අනුමෝදම් වේව"යි කීහ. එවිට කරනැවෑමියාත් "ස්වාමීනි, මාගේ අතින් පිනක් කොටගත නුහුනු වත්

නුඹවහන්සේ දුන් පින් අනුමෝදන් වෙමි'' කියා සිත සුද්ධකොට පින් අනුමෝව ගත.

එවිට කරනැවැමියාත් නැවට නන්වාගෙන දෙන්නා මූදින් ගඟට බාගෙන ගඟ ඔස්සේ ගොසින් බරණැස් නුවරට බා දෙන්නාගේ ගෙවලට වෙන වෙනම සම්පත් සලස්වා ආකාශයේ සිට කියන දිව්‍යපුත්‍ර බරණැස් නුවරට සත්ත්වයන්ට ඇසෙන සැටියේ ''යම් කෙනෙක් සත්පුරුෂ වූ වාසයෙන් හා තුනුරුවන් කෙරෙහිම මාන ඇතිව වෙසෙත් නම් ඒසේ වූ සත්ත්වයාට සමුද්‍ර මධ්‍යයේදී ප්‍රතිෂ්ඨාව පෙනෙන්නේ වේදැ''යි කියා නැවත කියන්නාහූ ''යම් සේ සත්පුරුෂයන් හා සමාගම් වීමෙහි ආනුභාවයෙන් කිසි ගුණයක් නැති කරනැවැමියාත් ප්‍රතිෂ්ඨාවක් ලද්දේ වේදැ''යි කීහයි වදාරා 'ශීලානිශංස ජාතකය' නිමවා වදාළසේක.

''එසමයෙහි උපාසකයෝ නිවන් දැක පූහ. එසමයෙහි නාගරාජයා නම් ශාරිපුත්‍ර මහස්ථවිරය, දේවතාව උපන්නෙමි බුදුවූ මම්ම වේදැ''යි තමන්වහන්සේ දක්වා වදාළසේක. මේ ධර්‍ම දේශනාවසානයේහි දී මේ උපාසක සකෘදාගාමී මාර්ගයට පැමිණියා.

## 190. රුහක ජාතකය

තවද ත්‍රිභුවන චිත්තාමාණික්‍ය වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා පුරාණ

දූතිකා කෙරේ පිළිබඳ සිත්ඇති භික්‍ෂූන් වහන්සේ කෙනෙකුන් නිසා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්?

මෙහි වර්ථමාන කථාව අට්ඨක නිපාතයෙහි 'ඉන්ද්‍රිය' ජාතකයෙහි විස්තර වශයෙන් එන්නේය. මෙහි "මහණ, තෝ වනාහී පුරාණ දූතිකාව නිසා සිව්වනක් පර්ෂිත් මධයෙහි ලජ්ජාභාවයට පැමිණියේ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයෝ රජ්ජුරුවන්ගේ ආග්‍රමෙහෙසිකා බිසවුන් කුස පිළිසිඳ ඉපිද වැඩිවිය පැමිණ පිය රජ්ජුරුවන්ගේ ඇවෑමෙන් රාජ්‍යය කරන්නාහ.

ඒ රජ්ජුරුවන්ගේ රුහක නම් පුරෝහිත බ්‍රාහ්මණයෙක් ඇත. ඒ රජ්ජුරුවෝ සන්නාහ සන්නද්ධයෙන් සරහණ ලද අශ්වයෙකු බමුණන්ට දී "බමුණානන් මා දකින්ට එනකල මේ අසා නැගී එව"යි කියා සැලැස්සූහ. ඒ නියාවට පුරෝහිතයාත් අසා නැගී එන්නේය. බොහෝ දෙනා අශ්වයාට ස්තූති කරන්නාහ. ඊට බ්‍රාහ්මණ තමාගේ පුරාණ ස්ත්‍රියට කියන්නේ "එම්බල සොඳුර, අපගේ අශ්වයාට බොහෝ සේ ස්තූති කරන්නාහයි කීහ. එවිට ස්ත්‍රිය කියන්නී "මාගේ බමුණු වෙහෙසාපියන්ට උවමැනවැ"යි සිතා කියන්නී "බමුණානන් වහන්ස, අසුට කවුරුත් ස්තූති කරන්නේ සන්නාහය ලාගෙන

යන නිසාය, එසේ හෙයින් නුඹ වහන්සේ සන්නාහය ලාගෙන සතර කකුලයෙන් ගියමැනවැ''යි කිව. එබස් බ්‍රාහ්මණයා අසා ''මුන් කීවේ ඇත්තකැ''යි සිතා මොහයෙන් අන්ධ වූ බ්‍රාහ්මණයා පසු දවස සන්නාහය ලාගෙන විථියේ නික්මින. එවිට බොහෝ දෙන සිනාසී ''බමුණානන් වහන්ස, ඉතාම රිසියෙමි'' කීහ. රජ්ජුරුවෝ දැක ''ඇයි බ්‍රාහ්මණය, තට පිත් කිපිනිදැයි, නැතහොත් උම්මාදයක් සැලසුනු වේදැ?''යි කීහ.

එවිට බ්‍රාහ්මණයා ලජ්ජාවට පැමිණ සිතන්නේ ''බොහෝ දෙනාගෙන් ලැජ්ජාවට හා නින්දවට පැමිණියා වේදැ''යි කෝපයෙන් ''බැමිණියට කියමි'' කියා ගෙට නික්මින. බැමිණියත් බමුණා කෝපව ගෙට එන නියාව දැන පැලදෙරින් පලාගොස් රජගෙට වන. රජ්ජුරුවෝත් කීපදවසක් පලායන්නා බමුණාට කියන්නාහ ''බ්‍රාහ්මණය, දුනුදිය කැඩිගිය කල පෙරලා ගැටගසා දුන්නේ ලා ගනිද්ද? එමෙන් තොපගේ බ්‍රාහ්මණිය ක්‍ෂමාකොට පාවා ගණුව''යි කීහ.

එවිට බ්‍රාහ්මණයා කියන්නේ ''දේවයන් වහන්ස, දුනුදිය කැඩිගිය කල ඔබ්බෙන් නියද සලස්වා දුනුදිය සලස්වා ගනිද්ද? එමෙන් ස්ත්‍රියක් සලස්වා ගනිතොත් විනා මෙතෙක් ලජ්ජාවට පමුණුවාපු තැනැත්තිය එපාය''යි කියා හැර ඔබ්බෙන් ස්ත්‍රියක් ගෙනාහයි වදරා මේ 'රුහක ජාතකය' නිමවා වදාළසේක.

''එසමයෙහි පුරාණ ස්ත්‍රිය නම් මෙසමයෙහිත් පුරාණ දුතිකාය. පුරෝහිත බමුණා නම් ශාසනයෙහි ඇළුම් මද

භික්ෂුහුය. බරණැස් රජ්ජුරුවෝ නම් බුදුවූ මම්ම ය”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 191. සිරිකාලකණ්ණි ජාතකය

තවද සිරිකාලකණ්ණි ජාතකය වනාහි ලෝක දිවාකර වූ තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ වදාළ දේශනා පාලියෙහි දක්නා ලැබේ. එයම අර්ථකථාචාරීන් වහන්සේ විසිනුදු මහා උම්මග්ග ජතකයෙහි එන්නේ යයි කියනලද හෙයින් සවිස්තරය එයින් බලා දැන ගතයුතු.

# 192. චුල්ල පදුම ජාතකය

තවද ත්‍රිභුවන ප්‍රදීප වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ස්ත්‍රීන් කෙරේ පිළිබඳ සිත් ඇති භික්ෂූන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි. මෙහි වර්ථමාන කථාව ‘උම්මදන්ත’ ජාතකයෙහි විස්තර වශයෙන් බස්නේය. මෙහි වනාහි සර්‍වඥයන් වහන්සේ භික්ෂූන්ට “ස්ත්‍රීන් කෙරෙහි පිළිබඳ සිත් ඇතිව උරය පලා ලේ බොන්ට දුන්නේ වේදැ”යි වදරා “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ගේ අග්‍රමහේසිකා බිසවුන් බඩ පිළිසිඳ දසවකඩ

මසකින් උපන් කුමාරයාට නම් තබන්නාහු “පදුම කුමාරයෝය”යි නම් තුබූහ.

ඒ කුමාරයන්ට ඉක්බිති රාජ කුමාරයෝ සදෙනෙක් උපන්නාහු. මේ නියායෙන් රාජකුමාරවරුන් සත්දෙන වැඩිවිය පැමිණ ගේ දෙර රැක පියාණන් වහන්සේට ඉතා ලෙන්ගතුව වාසයකොට රාජසේවය කරන්නාහ.

එක් දවසක් රජ්ජුරුවෝ සිව්මැදුරු කවුළුවෙන් වීථිය බලන්නාහු, පුතුන් සත්බෑයන් මහත් වූ සේනා සමෘද්ධියෙන් රාජසේවයට එන්නාවුන් දැක රජ්ජුරුවෝ සිතන්නාහු “මේ දරුවෝ සත්දෙන මාගේ රාජ්‍යය උදුරා ගනිති”යි සිතා පුතුන් සත්බෑයන් තමන් කැඳවා කියන්නාහු “දරුවෙනි, තොප කෙරේ සැක ඇත්තෙමි. එසේ හෙයින් මගේ නුවර නොයිද ඉසළු යම් අතෙක පලාගොස් මාගේ ඇවෑමෙන් අවුත් තොපගේ කුලසන්තක වස්තුව හා රාජ්‍යය හිමිකර ගනුව”යි කීහ.

එවිට සත්බෑයයෝ පියාණන් වහන්සේගෙන් වියෝවන සෝකයෙන් අඬා වැලප රජ්ජුරුවන්ගේ ආඥාව ඉක්මගත නොහෙන්නා වූ තමන්ගේ භාර්යාවන් වූ බිසෝවරු සත්දෙනාම අත අල්වා නික්මුනාහ. නික්ම ක්‍රමයෙන් ගොස් මහත් වූ වාළුකා කාන්තාරයකට පැමිණ ඒ කාන්තාරයේ ඇවිදින්නාහු කන බොන දෙයක් නැතිව සා පිපාසයෙන් පීඩිත වූවාහු. අඹුවන් කෙරේ තෘෂ්ණාව හැර පළමු දවස් බල මලණුවන්ගේ අඹුව මරා මස් බෙදා කෑහ. බෝධිසත්ත්වයෝ තමන් ලත් දෙකොටසින් කොටසක් දෙන්නා බෙදා කා මේ

නියායෙන් මළුන් සයදෙනාගේ බිරිඳන්ගේ මස් කා සත්වෙනි දවස් බෝධිසත්ත්වයන්ගේ භාර්යාවන් මරන්නට වන්නාහ.

එවිට බෝධිසත්ත්වයෝ "මරන්නනේ ඇයිද? අද දවස කන්ට මස් දෙමි" කියා පළමු තිබූ මස් කොටස් දී "මේ මස් කොටස් අදට කව, සෙට දවසට පුළුවන් වේදැ"යි අස්වසා රෑ මළුන් සදෙනා නිදන්නට වන් වෙලේ "මේවිට මාගේ භාර්යයාව ගලවා ගනිමි" සිතා භාර්යයාව අත අල්වාගෙන නික්මුණාහ. ඒ කියන ස්ත්‍රියත් "යා නොහෙමි" කී හෙයින් කර ඉඳුවාගෙන නික්මුණාහ. මේ නියායෙන් රාත්‍රිය මුළුල්ලේ ගමන්කොට උදෑසන නික්මෙන්ට වන් වේලාවට ඉරු රස්මී ශරීරයේ වැදගෙන පැන් පිපාස අධිකව "පැන් බොමි" කියන්නා "මෙතන පැන් කොයින්දැ?"යි කීවත් "පැන් බොමි" කියා තත්පරහෙයින් දකුණු උරය පලා "ඉන් වෑහෙන්නා වූ ලේ ධාරා බොව"යි සලස්වා ඒ නියායෙන් ලේ බී සන්තර්පිත වූ බිසවුන් ඇරගෙන ගඟක් සමීපයට පැමිණ ඒ ගඟින් පැන් බී නා සන්තර්පිතව වනයට වැද පන්සලක් කොටගෙන පලාඵල කා පැවිදිව දවස් අරණාහ.

එසමයෙහි ඒ ගංතෙර ඉස නුවරෙක රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කරන්නාහ. ඒ රජ්ජුරුවන්ට රාජද්‍රෝහ කළ එක් සොරකු අත පය කන් නාසා කපා ඔරුවක් පිට ලා යටි ගං බලා අලහ. ඒ කොටා දියේ මුරගාගන යන්නේ බෝධිසත්ත්වයන් වසන්නා වූ පන්සල සමීපයට පැමිණියේය. බෝධිසත්ත්වයෝත් මොරගාගෙන දියෙහි යන්නාවූන් දැක ඔහු

කෙරේ කරුණාවෙන් ඔහු කරා අවුත් දියෙන් ගොඩ ලා පන්සලට ගෙනගොස් මැස්සක් බැඳ එහි ඔහු ලා, අත පය ආදී වූ දෙය කසට පැනින් සෝධා බෙහෙත් කරන්නාහ.

බෝධිසත්ත්වයන්ගේ බිසව් "මේ කොටා ගෙනායේ කුමටදැ?"යි බෝධිසත්ත්වයන්ට දෙඩා කොටා කරේ පිළිකුල්ව දශවිටම කෙළගසා දමා ඉඳිනාහ. එසේ දමාහිඳත් බෝධිසත්ත්වයෝ කළමනා පිළියමින් අඩුවක් නොකොට නොබෝ දවසකින්ම වනය සුව කළහ. වන ගුණකොට ඒ කොටා හා බිසවුන් පන්සල සතප්පවා බෝධිසත්ත්වයෝ පලාඵල කඩා ගෙනවිත් දෙන්නාම රක්නාහ. මේ නියායෙන් කල් යාමක් යත්, කොටා කෙරේ බිසවුන් පිළිබඳ සිත් ඇතිව ලෝකාස්වාදරතියෙන් යෙදී දවස් අරන්නාහු. බෝධිසත්ත්වයන් කෙරේ පිළිබඳ සිත් මදව බෝධිසත්ත්වයන් මරන්ට උත්සාහ සිතා එක් දවසක් බෝධිසත්ත්වයන් ආ වේලාවට සොර ලෙඩක්ගෙන වකුටු ගසාගෙන නිදා කියන්නාහු "ස්වාමිනි, නුඹවහන්සේ හා වැලිකතර එමින් සිට මේ පර්වතය දැක 'සැපසේ අපි වාසය කරමෝ නම් පිදේනියක් පුදමි' කියා ආරාධනා කෙළෙමි. ඒ දේවතාවා රෑ සීනෙන් පෙනී බොහෝ භය ගන්වයි. එසේ හෙයින් ඒ දේවතාවාට බළි පූජාවක් කළොත් යහපතැ"යි කීහ.

එබස් බෝධිසත්ත්වයෝ අසා "සැබෑ දෙයෙකැ"යි සිතා ඒ නියාවට පිදේනි සපයාගෙන බිසවුන් සමඟ පර්වතයට නැංගාහ. එවිට බිසවුන් කියන්නාහු "ස්වාමීනි, මේ දේවතාවන් වහන්සේ

එසේ මෙසේ දේවතාන කෙනෙකුන් වහන්සේ නෙවෙයි. එසේ හෙයින් නුඹවහන්සේ පළමුකොට වනමලින් පූජාකොට තුන්විටක් ප්‍රදක්‍ෂිණාකොට වැඳ සිට ආරාධනාකොට ඉක්බිති බළිපූජා කෙරම්හ"යි කියා ඒ නියාවට බෝධිසත්ත්වයෝ "යහපතැ"යි ගිවිස වනමල් පුදා තුන්විටෙක ප්‍රදක්‍ෂිණාකොට සෙල සමීපයට ආකල ඕ තොමෝ බෝධිසත්ත්වයන් පස්සෙහි සිට බෝධිසත්ත්වයන්ගේ අවසර බලා පිටිකරගසා බෝධිසත්ත්වයන් සෙලින් පහත හෙළුය.

බෝධිසත්ත්වයෝ වැයෙන්නහුම කටු නැත්තා වූ කැලයෙන් ගැවසී ගත්තා වූ මහදිඹුල් ගසෙක වැටුනාහ. බෝධිසත්ත්වයෝ දිඹුල් ගස මහත් හෙයින් බසින්ට බැරිව දිඹුල් කා ඒ ගසේම උන්නාහ. එසමයෙහි මහත් වූ ශරීරයක් ඇති ගොයෙක් බෝධිසත්ත්වයන් උන් ගස සමීපයට අවුත් දිඹුල් කන්නේය. බෝධිසත්ත්වයන් දැක භයින් පලා ගොසින් දෙවැනි දවස සැකවී ගොදුරු කා පසුව සැක ඇරී බෝධිසත්ත්වයන් හා පුරුදුව කියන්නෝ "සත්දවස එකතැන කොයිත් නොගොසින් ගසම ඉන්නේ කුමක් නිසාදැ?"යි විචාරන්නා තමන් ප්‍රවෘත්ති කියා ගොයාණන් විසින් "තොපි නොබව"යි අස්වසා ගසට නැගී "මා පිට හිඳුව"යි සලස්වා ගසින් බිමට බස්වා බිම සිටුවා වලට යන්නාහ.

බෝධිසත්ත්වයොත් මග ඔස්සේ ගොසින් එක් පියවර ගමකට පැමිණ ඒ ගම වාසය කරන්නාහු පියාණන් වහන්සේ මළ පවත් අසා රාජ්‍යයට අවුත් රාජ්‍යයට පැමිණ දවස

සලක්‍ෂයක් වස්තු වියදන්කොට දන්හල් කරවා දන් දී දැහැමින් සෙමින් රාජ්‍යය කරන්නාහ.

එසමයෙහි බිසව් හා කොටාත් පිටිසර අවුත් කොටුත් ඉස තබාගෙන සිඟා කන්නාහ. බොහෝ දෙනා බිසවුන් දැක "මූ නුඹට කුමක් වේදැ?"යි විචාළ කල "මාගේ නැදිමයිල් සරණයෙන් පාවා දී බාල ද පටන් ප්‍රියකරු ස්වාමිපුත්‍රයාය. එසේ හෙයින් මුන් දුකට පැමිණයත් අත් හරින්නේ කෙසේදැ?යි අත් නොහැර ඇවිදිමි" කියන්නාහු.

එබස් ඇසූ බොහෝ දෙනා "මුන් කියන්නේ ඇත්තකයැ"යි සිතා උන්ට කැඳබත් ආදී වූ දෙය බොහො කොට දුන්නාහ. එකියන බිසව් දුටු බොහෝ මනුෂ්‍යයෝ "තොප මෙසේ දුක් විඳින්නේ ඇයිද? මහපදුම රජ්ජුරුවන් වහන්සේ දන්හල් කරවා බොහෝ යාචකයන්ට දන් දෙන්නාහ. උන්වහන්සේගේ දන්හලට ගොස් දන් කා දවසරුව"යි කීහ. එබස් අසා "යහපතැ"යි ගිවිස බරණැස් නුවරට අවුත් දන්හල් දක්නට වන්නාහ.

බෝධිසත්ත්වයෝත් එක් දවසක් දන්හල් බලා ගොස් කීප දෙනකුට තමන් අතින් දන් දී සෙස්සන්ට "මෙලෙසම දන් දෙව"යි කියා ඇතු පිට නැගී නික්මුණාහ. බිසව් කොටා ඉස තබාගෙන දන් කා යන්නාවුන් හා කැටිව නික්මුණාහ. රජ්ජුරුවෝ බිසවුන් හා කොටු දැක ඇඳිනගෙන ලඟට ගෙන්වා කොටු බිම බා තබා "තොප කවුරුන්දැ?"යි විචාළහ.

බිසෝ සැක නැතිව කියන්නාහු “මාගේ නැදිමයිල් සරණ සමනය”යි කීහ.

එබස් රජ්ජුරුවෝ අසා “ඇත්තමදැ?”යි විචාරන්නා “එසේය” නිර්භීතව කී හෙයින් බොහො දෙනා ඊට සතුටු වූහ. රජ්ජුරුවෝ කියන්නාහු “තොපගේ පියාණන් අසවල් රජ්ජුරුවන් වුව, තොපගේ මෑණියන් අසවල් වුව, තෙපි අසවල් රාජකුමාරිකා වුව, තොපි පිස කැවූ මහපදුම කුමාරයාණන් මම වුව. මෙසේ වූ කොටා තොපට කෙසේ වූ නැදිමයිල් සරණ සමනෝද? ඇයි තෙපි ‘මා මැළැ’යි සිතා කොටා හිස තිබාගෙන අවුදැ?”යි කියා අමාත්‍යයන්ට කියන්නාහු “අමාත්‍යයෙනි, මා විසින් තොප ඇමට කියන ලද්දේ පළමුවෙන් නෙවේද? අප සත්බෑයන් වැලිකතර පැමිණ නියාවත්, සත්බෑයන් උනුන්ගේ අඹුදරුවන් මරා මස් කෑදීම මුන් ගලවාගෙන උරය පලා ලේ දී පැන් පිපාස නිවා මුන් සතප්ප වූ නියාවත්, කොටා දියෙහි අත් පා කපා දමාපු ගමනේ මුරගාගෙන යන තැනැත්තහු මා විසින් ගොඩ ලාගෙන දැක බේත්කොට රැකී නියාවත්, මේ බිසවුන් කොටා කෙරේ සිත් බැඳි පව්තයෙන් මා එළු නියාවත්, මා දිඹුල් ගසට වැටී ගොයාණන් විසින් බිමට බා අවුත් රාජ්‍යයට පැමිණ නියාවත් යන සියල්ලම තොපි ඇමට මා විසින් පළමු කියන ලද්දේ වේද? ඒ කියන බිසව නම් මේ බිසවය. එකියන කොටා නම් මේ කොටාය. ඒ ගලින් එළු පදුම කුමාරයයෝ නම් මම්මය. එසේ හෙයින් මළ මිනියක් හා සමාන කොටාත් පොළු මුගුරු බා තලා සුනුවිසුනුකොට පියව, මෑත් කන්

නාසා කපා පියව"යි කෝපයෙන් කියා, නැවත කෝප සන්හිඳී යාපත් පැසක කොට ලා බිසවුන්ගේ ඉස හා එක්ව අයා බන්ද "මේ නුවර ඉන්ද නොදී පිටිනුවර ලවව"යි යවුහයි වදුරා මේ 'චුල්ල පදුම ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි මල්ලු සත්දෙන නම් බුද්ධවල්ලභ වූ මහතෙරවරුය. බිසව් නම් චිංචා මානවිකාය, කොටා නම් දේවදත්ත ස්ථවිරයෝය. ගොයා නම් ආනන්ද ස්ථවිරයෝය. පදුම කුමාරව උපන්නෙමි බුදුවූ මම්ම ය"යි වදාළසේක.

## 193. මණිචෝර ජාතකය

තවද ත්‍රිභුවන තිලකාකාර වූ සර්වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන් වහන්සේ බුදුන්ට පැමිණ වූ වධයක් අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්?

එක් දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස් වූ මාළුවරුන් වහන්සේ විසින් "දේවදත්ත ස්ථවිරයෝ වධ යොදා උත්සාහ කළ පමණක් මිසක් කිංචි මාත්‍රාවකුත් කොටගත නුහුනුවාහ"යි යන මේ කථාව කිය කියා උන්තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදුරා "මහණෙනි, මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදුරා එපවත් අසා "මහණෙනි, දැන්මතු නොවෙයි පෙරත් දේවදත්ත ස්ථවිරයෝ මට වධ යොදා කිංචි මාත්‍රාවකුත් කොටගත නොහැක්කෝ

වේදැ''යි වදරා ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ පිටිසර ගමක ඉපිද බරණැස් නුවරින් කුලස්ත්‍රියක පාදපරිචාරිකා පිණිස සලස්වා ගත්සේක. එකියන ස්ත්‍රී විශිෂ්ඨ වූ රූ ඇත්තීය. පඤ්ච කල්‍යාණයෙන් යුක්තය. දිව්‍ය ස්ත්‍රියක් හා සමානය. කින්නරාංගනාවන්ගේ සොභා ධරන්නීය. බැලුවන් ප්‍රසාද වන්නීය. ස්වාමිපුත්‍රයාට පතිව්‍රතා ධර්‍මය රකින්නේය. ස්වාමිපුත්‍රයාගේ දෙමව්පියන්ට වත්පිළිවෙත් කරන්නීය. එසේ හෙයින් ස්වාමිපුත්‍රයාත් ප්‍රියව දවස් අරනේය. එකියන ස්ත්‍රී සුජාතා නම් වන්නීය.

එකියන සුජාතා නම් ස්ත්‍රී තමාගේ ස්වාමිපුත්‍රයාට කියන්නී "මාගේ දෙමව්පියන් දක්නා නියායෙන් බරණැස් නුවරට යන්ට උවමැනවැ''යි කිවුය. බෝධිසත්ත්‍වයෝත් "යහපතැ''යි කියා ගිවිස දෙමව්පියන් දකින්ට නිසි කැවුම් ආදී දෙය පිසවාගෙන බෝධිසත්ත්‍වයෝ රථය ඉදිරියේ පදිනාහුය. බෝධිසත්ත්‍වයන්ගේ භාර්‍ය්‍යාව වූ සුජාතාවෝ විසිතුරුව සැරහී යහපත් මනා වූ වස්ත්‍රයක් හැඳ රථයේ උන්නාහ.

මේ නියායෙන් නුවරට වැද නුවර මධ්‍යයෙන් රථය පැද යන්නාහ. ඒ වේලාවට බරණැස් රජ්ජුරුවෝ මහත් වූ පෙළහරින් ඇත්කඳට පැන නැගී නුවර ප්‍රදක්ෂිණාකොට

යන්නාහුය. ඒ වේලාවට බෝධිසත්ත්වයන්ගේ බිසවුන් රථයෙන් බැස හංස ලීලායෙන් රථය පසුපස්සේ ගමන් කරන්නට වන්නාහ. රජ්ජුරුවෝ ඒ විසිතුරු රූපශ්‍රීය දැක පිළිබඳ සිත් ඇතිව අමාත්‍යයෙකු ලඟට කැඳවා කියන්නාහු “තෙල යන්නා වූ ස්ත්‍රිය අස්සවාමිකද? සස්සාමිකදැ?යි විචරා එව”යි කියා අමාත්‍යයා යවූහ.

ඒ අමාත්‍යයා ඒ ස්ත්‍රිය අතින් විචාරාගෙන ගොස් රජ්ජුරුවන්ට කියන්නනේ “දේවයෙනි, රථයේ ඉන්නා පුරුෂයා තෙල ස්ත්‍රියගේ පුරුෂයාය”යි කීහ. එබස් රජ්ජුරුවවෝ අසා පිළිබඳ සිත් ඇරගත නොයෙන්නාහු “යම් සේ මේ පුරුෂයා උපායකින් නසා මෑ ඇරගත මැනවැ”යි සිතා එතන සිටි අමාත්‍යයකුට කියන්නාහු “තෝ චූඩාමාණික්‍යය ඇරගෙන ගොස් අර පදිනා රථයෙහි ලා එව”යි කියා යවූහ.

පුරුෂයාත් එලෙසම කොට රජ්ජුරුවන්ට එපවත් කියා රජ්ජුරුවෝත් එපවත් අසා “මාගේ චුඩාමාණික්‍යය අපවත්ව ගියේයය”යි අමාත්‍යයන් ට ඇසෙන සැටියේ කීහ. අමාත්‍යයෝ ඒ අසා ඒ ඒ වාසල් රැකවල් ලවා නුවර මුළුල්ල ඇළලී ඒ ඒ තැන දිව පනින්ට වන්නාහ. ඒ වේලාවට මැණික රථයේ ලු පුරුෂ තෙමෙත් මිනිස් මොත්තමක් ඇරගෙන “පුරුෂයාගේ රථය බලන්ට උවමැනැවැ”යි කියා රථයේ තුබූ මැණික ඇරගෙන “මේ පුරුෂයා සොරාය”යි කියා මරා තලා පිටිතොලහයා බැඳ ගෙනගොස් “ස්වාමීනි, මේ වේද? මැණික් සොරාය”යි කීහ.

එවිට රජ්ජුරුවෝත් නොවිචාරාම "ඉස කපා පියව"යි කීහ. එපවත් ඇසූ රාජපුරුෂයෝ බෝධිසත්ත්වයන් කෝපයෙන් කෝපයට ගෙනගොස් දහස් ගණන් ගෙඩිගසා දකුණු වාසල්දෙරකඩින් ඇරගෙන ගොස් බෝධිසත්ත්වයන් උඩුබල්ව වැදහොවා ඉස කපන්ට වන්නාහ. ඒ දුටු බෝධිසත්ත්වයන්ගේ භාර්යයාවෝ පසු පස්සේ අඬාගෙන ගොස් බෝධිසත්ත්වයන්ගේ ඉස කපන්ට ඔසවාගත් පොරව වැලක කියන්නාහු "අනේ ස්වාමීනි, මා නිසා නුඹවහන්සේට මෙබඳු දුකෙක් පැමිණියේ වේද? නුඹවහන්සේ වැනි වූ නිරපරාධීන්ටත් මෙවැනි පාටෝව සැලසෙන්නටත්, මම ඒකාන්තයෙන් නුඹවහන්සේට පතිව්‍රතා ධර්‍මීය රැක්කේ නම්, යම් සේ මෙලෝ රක්නා දේවතා කෙනෙක් ඇත්නම් ලෝක නිර්මාණ කළා වූ බ්‍රහ්මයා මේ සක්වල ඇත්නම්, රජ්ජුරුවන් කරන්නා වූ නොකටයුත්ත වලක්වා ගණුවයි දේවතා කෙනෙකුන් නැති හෙයින් වෙද නොවැලකුනේ වේදැ"යි සිතූහ.

එවිට පතිව්‍රත වූ සුජාතාවන් සිතූ සිතිවිල්ලෙන් ශක්‍රයාගේ පාන්ඩුකම්බල ශෛලාසනය හුණු විය. එවිට ශක්‍රයෝ දහසක් නුවණැසින් "මාගේ ශක්‍ර සම්පත් උදුරා ගන්නා කෙනෙක් ඇද්දෝ හෝ"යි සිතා බැලූහ. ශක්‍රදේවේන්ද්‍රයෝ මේ කාරණය දැක "මා එතනට යා යුතුය"යි සිතා අප්‍රසිද්ධ වේශයෙන් එතනට අවුත් දන්ගෙඩියට පැමිණි බෝධිසත්ත්වයන් සර්‍වාලංකාරයෙන් සරහා, ඇතු පිට වඩා හිඳුවා, ඇතු පිටි උන් රජ්ජුරුවන් ක්‍ෂණයකින් දන්ගෙඩියේ වැදහොවා

බෝධිසත්ත්වයන්ට ඔසවා ගත්තා වූ පොරව රජ්ජුරුවන්ගේ ඉස කපා වෙන්කල පසු "බරණැස් රජ්ජුරුවනැ"යි දත්හ.

ශක්‍රයෝ තමන්ගේ ශක්‍රානුභාවයෙන් ආකාශයෙහි සිටියාහ. බ්‍රහ්මණ, ගෘහපති ආදී වූ බොහෝ මනුෂ්‍යයෝ "ශක්‍රයන් විසින් අසත්පුරුෂ රජ්ජුරුවන් මරා ධර්මිෂ්ඨ රජ්ජුරු කෙනෙකුන් අපට සලස්වන ලදැ"යි සතුටු වූහ. ශක්‍රයෝ අකාශයෙහි සිට ඒ පුරුෂයාට ඔටුනු පලඳවා සුජාතාවන්ට අග්‍රමහෙසිකා පට බන්ද ශක්‍රයෝ කියන්නාහූ "අසත්පුරුෂ රජ්ජුරුවන් රාජ්‍යය කරන සමයෙහි නොකල වැසි වසින්නේය, කලට වැසි නොවසින්නේය, දුර්භික්ෂ භය, චෝර භය ආදී වූ භය උපදින්නේය, එසේ වූ රජ දරුවෝ ඉන්න ද අයස හා අපකීර්ති අසන්නාහ, මළ කලත් සතර අපායේ දුක් විඳිනාහ"යි කියා ශක්‍රදේවේන්ද්‍රයෝ දිව්‍යලෝකයට ගියෝය. බෝධිසත්ත්වයෝ දැහැමෙන් සෙමෙන් රාජ්‍යයකොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදරා මේ 'මණිචෝර ජාතකය' නිමවා වදාළසේක.

## 194. පර්වතන්තර (පබ්බතන්තර) ජාතකය

තවද කරුණානිධාන වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කොසොල් රජ්ජුරුවන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්?

කොසොල් රජ්ජුරුවන්ගේ අන්තඃපුරයට "අමාත්‍යයන් ද්‍රෝහ කළේය"යි රජ්ජුරුවෝ අසා තුමුත් ඒ නියාවට පරීක්‍ෂාකොට ඇත්ත බව නියමකොටත් "බුදුන් විචාරා මුන්ට ආඥා කෙරෙමි" සිතා බුදුන් කරා ගොස් කියන්නාහු "ස්වාමීනි, අන්තඃපුරයට එක්තරා අමාත්‍යයෙක් ද්‍රෝහ කෙළේය. උහට කළමනා කිම්දැ?"යි බුදුන් විචාළාහ.

සර්‍වඥයෝත් "ඒ අමාත්‍යයෝ තොපට වැඩ පසස්නා අමාත්‍යයෙක්ද? ස්ත්‍රියත් තොපට ප්‍රිය වූ ස්ත්‍රියක්දැ?"යි විචාරා රජ්ජුරුවන් විසින් "ස්වාමීනි, අමාත්‍යයෝ මාගේ සියළු කළමනා කටයුත්තට මට පක්‍ෂපාතව දුක්ගන්නා අමාත්‍යයෝය. එකියන ස්ත්‍රීන් මට ප්‍රියකරු ස්ත්‍රීය"යි කීහ. එබස් සර්‍වඥයෝ අසා "අමාත්‍යයාත් වැඩ පස්නා කල, ස්ත්‍රියත් ප්‍රියකරු ස්ත්‍රිය කළ වරද ක්‍ෂමා කිරීම යහපතැ"යි කියා වදාරා "පෙරත් මෙසේම පුරද්‍රෝහ කළවුන්ගේ සැලැස්ම නුවණැත්තන් විසින් විචාරන්නා ඊට කාරණා කීවෝ වේදැ"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ට අර්ථයෙන් ධර්‍මයෙන් අනුශාසනා කරනලද අමාත්‍යව උපන්සේක. බරණැස් රජ්ජුරුවන්ගේ එක්තරා අමාත්‍යයෙක් "අන්තඃපුරයට ද්‍රෝහ කළේය"යි අසා තුමුත් ප්‍රත්‍යක්ෂව දැක "අමාත්‍යයන් මට වල්ලභයයි, සියළු

කටයුත්තෙහි නියුක්ත වූ අමාත්‍යයාය, ස්ත්‍රීන් මා පියකරු ස්ත්‍රිය, එසේ හෙයින් මේ කටයුත්ත මාගේ පණ්ඩිත අමාත්‍යයා අතින් ප්‍රශ්නයක්කොට විචාරා අඟ කරමි'' සිතා අමාත්‍යයන් ගෙන්වා ආසනේක හිඳුවා කියන්නාහු "ප්‍රශ්ණයක් කියමි. විසඳව''යි කීහ. "යහපත දේවයන් වහන්සය''යි කියන්නා "විසඳමි'' කීහ.

එවිට රජ්ජුරුවෝ කියන්නාහු "යම් පර්වත පාර්ශවයෙක පස් පියුමින් සැදුනු විලක් සමීපයෙහි සිංහයෙක් වාසය කෙරෙයි. සිංහයාගෙන් ආරක්‍ෂාව තිබූ විල පැන් කැනහිලෙක් ඉඳුල් කෙළේය. එපැන් දමාපිය යුතුද? නොදමාපිය යුතුදැ?''යි කීහ. එබස් බෝධිසත්ත්වයෝ ඇසූ ගමනේම බෝධිසත්ත්වයෝ "අන්තඃපුරයට වැදුනැ''යි සිතා කියන්නාහු "මහරජ්ජුරුවන් වහන්ස, නොයෙක් සිව්පාවන් ගංගාවට බැස පැන් බොති. ඒ පැන් ඉඳුලක් නැත්තේය. එමෙන් රජ්ජුරුවන් වහන්ස, බිසවුන් වහන්සේ හළ නොහැක්ක. එසේ හෙයින් අමාත්‍යයා හා බිසවුන් වහන්සේට ප්‍රිය වී නම් ආඥ නොකළ මැනවැ''යි කීහ. රජ්ජුරුවෝත් කෝප සංසිඳී අමාත්‍යයා හා බිසවුන්ට "ඉනිබ්බේ මෙසේ නොකටයුත්තක් කළා නම් දන්නමෝ වේදැ''යි භය ගන්වා කීහ. එතැන් පටන් එසේ වූ නොකටයුත්තක් නොකළාහයි වදරා 'පබ්බතූන්තර ජාතකය' නිමවා වදළසේක. කොසොල් රජ්ජුරුවන්ගේ අමාත්‍යයන් හා බිසවුන් හා දෙදෙනා සර්වඥයන් වහන්සේ ඇසූ තැන් පටන් එසේ වූ නොකටයුත්තක් නොකළාහ.

"එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරියෝය. පණ්ඩිත අමාත්‍යයෝ නම් බුදුවූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 195. වලාහක (වලාහස්ස) ජාතකය

තවද කරුණානිධාන වූ සර්‍වඥයන් වහන්සේ ජේතවානාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා ස්ත්‍රියක් කෙරෙහි පිළිබඳ සිත් ඇති භික්‍ෂූන් කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්?

එක් භික්ෂූ කෙනෙකුන් වහන්සේ ස්ත්‍රියක් කෙරෙහි පිළිබඳ සිත් ඇතිව වාසය කෙරෙති. සර්‍වඥයන් වහන්සේ ඒ අසා "සැබෑද? මහණ, ස්ත්‍රියක් කෙරෙහි තා පිළිබඳ සිත් ඇත්තේදැ"යි විචාළසේක. "සැබැවයි ස්වාමීනි" කියන්නා "මහණ, ස්ත්‍රීන් කෙරේ පිළිබඳ සිත් ඇති වීමෙන් යකින්නන් අතට පැමිණ වෙළඳුන් පන්සියය මෙන් දුකට පැමිණෙන්නේ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස තාම්බ්‍රපර්ණී දීපයෙහි තම්මැන්නා නුවර යක්‍ෂ පුරයක් මවාගෙන බොහෝ යකින්නෝ වාසය කරන්නාහ. ඒසමයෙහි ඒ යකින්නෝ තමන්ගේ තම්මැන්නාවට පඩවි පාරු නැගී මනුෂ්‍යයන් ආ කල උන් හා සමග වාසයකොට අනික්

වෙළඳ කෙනෙකුන් නැව් නැගී ආ කලට පළමු සිටියවුන් ඇසිල්ලෙකින්ම නාසා සිරගෙයි ලා උන් කන්නාහ. තම්මැන්නා ඉද්දට නැවෙක් නොආ නම් නාග දිවයින පටන් කැළණිය දක්වා මේ අන්තරා කඩයේ කඩක්කරේ ඇවිද දුටු නැවෙක් ඇත්නම් අල්වා කන්නාහ. මේ නියායෙන් දවස් හරනා සමයෙහි වෙළෙන්දේ පන්සියයෙක් නැව් නැගී යන්නාහු තාම්බ්‍රපර්ණී දිවයිනට පාව ගියහ. එවිට යකින්නෝ තම තමන්ගේ වාසස්ථානයට මනුෂ්‍යයන් ඇති ස්ථානයක් මෙන් වප් වැපිරීම් සීසෑම් හා බල්ලන් කුකුලන් ආදී වූවන්ගේ නොයෙක් වෙස් මවා පෑහ. “මනුෂ්‍යයන් ඇති ගමෙකැ”යි සිතා ගොඩ බැසපු කල්හි ඒ යකින්නෝ එතැනට අවුත් ඒ වෙළඳුන්ට කන බොන කැවිලි සලස්වා කා බී අන්තයෙහි කියන්නාහු “තොප හැම කොයි සිට අවුදැ?”යි විචාරා ඉක්බිති “ස්වාමිපුත්‍රයෝ වෙළඳමට ගියාහ. දැන් තුන් අවුරුද්දක් නොආහ. එසේ හෙයින් තොප ඇමත් වෙළඳුන් හෙයින් අප ඇමට ස්වාමිපුත්‍රව ඉඳුව”යි කීහ. ඒ නියාවටම ඒ යකින්නෝ තමන් භාවභාව දක්වා තමන් හැමට ලබාගෙන පන්සියයක් වෙළඳුන් තමන් ඇමට සලස්වා ගත්තාහ.

නායක වෙළෙඳුගේ භාර්යාවද රෑ පළා ගොස් මිනී කා ඇවිදින් ස්වාමිපුත්‍රයා ළඟම හොත් වේලාවට යකින්න ඇඟ සිසිලස තිබූ හෙයින් වෙළෙන්ද “මේ කිමෙක්දෝ හෝ”යි පරීක්ෂාකොට මිනී කන නියාව දැන පසුව දවස් උදෑසන වෙළෙඳුන් පන්සියය හා සමග ශරීර කෘත්‍ය කරන්නට ගොසින් නායක වෙළඳෙන්ද කියන්නේ “එම්බල, මුන් ඇම නම්

යකින්නෝය. පළමු උන් පුරුෂයන් අප දැක කාපුහ. ඉනිබ්බේ ආ කෙනෙක් ඇත්නම් අප සේ තිබාගෙන අප කති. එහෙයින් අප පලා යා යුතුය"යි කීහ.

එවිට ඉන් දෙසියපනසෙක් "මේ කුමණ බසෙක්ද? මෙසේ වූ දිව්‍යාංගනාවන් හා සමාන ස්ත්‍රීයන් ඇරපියා අපි යා නොහෙමැ"යි කියා රැඳුනාහ. දෙසියපනසෙක් "අපි ගැලවී යන්නේ කෙසේදැ?"යි සිත සිතා මුදු වැල්ලේ ඇවිදිනාහ. එකලට බෝධිසත්ත්වයන් වහන්සේ හිමාලය වනයෙහි අජානීය සෛන්ධව ඉපිද කවුඩුවන්ගේ පැහැය හා සමාන වූ මුහුණක් හා ඉන්ද්‍රනීල මාණික්‍යයමය වූ කෙස්වැටියක් හා පෙළාපු පුළුන් හා සමාන ධවල වූ පෑයක් ඇතිව ආකාශයෙන් යන්නා වූ සෘද්ධි ඇතිව දවස් පතා තම්මැන්නාව සමීපයෙහි විලෙක සයංජාත ඇල් කා යන විටෙක "මා හා දඹදිවට යන්නෝ ඇද්දැ?"යි අඬගා යන්නාහ.

එසේ අඬගෑ කලට ඒ මිනිස් දෙසියපනස එතැනට අවුත් "අපි යම්හ"යි දෙහොත් මුදුනේ තබාගෙන කීවාහ. එවිට බෝධිසත්ත්වයෝ බිමට බැස පිට හිඳුවාගෙන, වල්ගසේ එල්ලනුන් වල්ගයේ එල්වාගෙන, සෙස්සන් ඔහුගේ ආනුභාවයෙන් ඇරගෙන ආකාශයට නැගී දඹදිවට ගොස් උන් උන්ගේ වාසස්ථානයට සලස්වා බෝධිසත්ත්වයෝ තමන්ගේ හිමාලය වනයට ගියාහ.

සර්වඥයන් වහන්සේත් "මහණෙනි, යම් භික්ෂුනී කෙනෙක්, උපාසක උපාසිකා කෙනෙක්, සිව්වනක් පර්ෂිදෙන් යම්

කෙනෙක් ස්ත්‍රී විෂයෙහි ලෝභ වූනම් පඤ්චවිධ වූ වද විඳිනාහ. පඤ්චවිධ වූ වධය නම් කවරේද? යත්, අත් කැපීම එකෙක, කන් නාසා කැපීම එකෙක, මාපට ඇඟිල්ල කැපීම එකෙක, උරය කැපීම එකෙක, ඉස කැපීම එකෙක යන පඤ්චවිධ වූ වධ විඳිනාහුය. නරකාදී වූ සතර අපායෙත් බොහෝ දුක් විඳිනාහ”යි වදාරා නැවත වදාරන සර්වඥයන් වහන්සේ “මහණෙනි, යම් කෙනෙක් සර්වඥයන් වහන්සේගේ බස් නොඅසා ස්ත්‍රී විෂයෙහි තමන් සිතූ සැටියේ වාසය කෙරෙත් නම් නායක වෙළෙන්දාගේ බස් නොඅසා යකින්නන්ට ගොදුරු වූ වෙළඳුන් දෙසියපනස හා සම වන්නාහ. යම් කෙනෙක් සර්වඥයන් වහන්සේගේ බස් ගිවිස එසේ වූ කටයුත්ත ඇරපූ නම් අස්වසා නායක වෙළෙඳුන්ගේ බස් ගිවිස ගැලවී ගිය වෙළඳුන් දෙසියපනස හා සම වන්නාහ. දිව්‍යලෝකයෙහි හා සොලොස් බඹලොවින් වින්ද මනා සම්පත් විඳිනාහ”යි කියා අමාමහ නිවන් දැක් වීමෙන් මේ ධර්මදේශනාව කුළුගන්වා මේ ජාතකය චතුස්සත්‍යය ප්‍රකාශ කිරීමෙන් මේ මේ ‘වලාහක ජාතකය’ ධර්මදේශනාව නිමවා වදාළසේක.

මේ ජාතකාවසානයෙහි ඒ භික්ෂූන් වහන්සේ දාහසක් නයින් ප්‍රතිමණ්ඩිත වූ සෝවාන් ඵලයෙහි පිහිටිසේක.

“එසමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේගේ අවවාද ගිවිස වෙළඳ පුත්‍රයෝ දෙසියපනස නම් බුදු පිරිසය, අශ්වව උපන්නේ නම් ලොව්තුරා බුදුවූ මම්ම ය”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 196. මිත්තාමිත්ත ජාතකය

තවද කරුණාප්‍රවාහ වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවාසය කරන සමයෙහි උපාධ්‍යයන් වහන්සේ කෙනෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්?

එක් බාල නමෙක් තමන්වහන්සේගේ උපාධ්‍යයන් වහන්සේ කෙරේ විශ්වාසී සේක. "මා කළ දෙයට උරණ නොවනසේකැ"යි වාන් ලන ලෙස පයියක් විදිනට රෙද්දක් ඇරගත් පසු එපවත් උපාධ්‍යායන් වහන්සේට කීසේක. උපාධ්‍යයායන් වහන්සේ "මාගේ කඩ කුමකට ඇරගත්තුදැ?"යි විචාරන්නා "නුඹවහන්සේ මා හා විශ්වාසය තකා ඇරගතිමි" කියන්නා "තොප හා මා හා කුමන විශ්වාසදැ"යි කියා අත්ලෙන් පාර කීපයක් ගැසුසේක.

මේ කථාව ධම්සභා මණ්ඩපයෙහි ප්‍රකාශ විය. එබස් සර්‍වඥයන් වහන්සේ අසා "මහණෙනි, පළමුත් ඒ භික්ෂූනු කෝපි වූවෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ කසීරට බ්‍රාහ්මණ කුලයක ඉපිද වැඩිවිය පැමිණ ගිහිගෙයි

ආලය හැර හිමාලය වනයට වැද ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව බොහෝ තාපසවරුන්ට ගණශාස්තෘව වාසය කරන්නාහ.

එසමයෙහි එක්තරා තාපස කෙනෙක් ඇත. ඒ තාපසයෝ කුඩා ඇතෙක් වඩති. බෝධිසත්‍වයෝ "ඒ ඇතා වැඩීමෙන් බොහෝ උපද්‍රව සැලසෙයි ඇරපියව"යි කීවත් ඇරපියා නොහී පුත්‍ර ප්‍රේමයෙන් වඩා මුහු කෙරෙව්වාහ. එකියන ඇත් ත්‍රිමද ගලිත වූ තැනැත්තේ තාපසයන් ඵලාපල ගෙණෙන්නට ගිය කීප දවසකින් ආ තැනැත්තන් දැක අල්වාගෙන මරා තළාපියා පලා ගියෝය. බොහෝ තාපසවරු ඒ තාපසයන්ට කළමනා ආදාහනකොට එපවත් බෝධිසත්ත්‍වයන්ට කීහ. නැවත කියන්නාහු "ස්වාමීනි, වෛර මිත්‍රයන් දැන ගන්නේ කෙසේදැ?"යි කීහ.

එවිට බෝධිසත්ත්‍වයෝ කියන්නාහු "යම් අහිත මනුෂ්‍ය කෙනෙකුන් දුටු වේලේ පිළිසඳර කථා නොකෙරේද? සිනාවක් නොයේද? ඇස් දල්වා ප්‍රියව නොබලාද? දැක සතුටු නොවේද? යන මෙකී කාරණාවෙන් යුක්ත වූ තැනැත්තේ වෛරීය. මෙකී කාරණා නොව ඉන්නා තැනැත්තේ ප්‍රියකරුය"යි බොහෝ තාපසවරුන්ට අවවාද කියා සතර බ්‍රහ්මවිහරණයෙන් බඹලොව ගියාහයි වදරා මේ 'මිත්තාමිත්ත ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි ඇතා වැඩූ තාපසයෝ නම් අතවැසි භික්ෂූහුය, ඇතා නම් උපාධ්‍යායෝය, ගණශාස්තෘව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 197. රාධ ජාතකය

තවද කරුණාගංගා වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ස්ත්‍රියක් කෙරෙහි පිළිබඳ සිත් ඇති භික්ෂූන් කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

හේ කෙසේද යත්?

එක්තරා භික්ෂු කෙනෙකුන් වහන්සේ ස්ත්‍රියක් කෙරෙහි පිළිබඳ සිත් ඇතිව වාසය කරනසේක. භික්ෂූන් වහන්සේ සර්වඥයන් වහන්සේට දැන් වූ කල්හි "මහණ, තොප විසින් ස්ත්‍රීන් පිළිබඳ වූවයි කියා ලැබගත හැකිද? පළමු රැකවල් සලස්වාත් රැකගත නුහුණුවෝ වේදැ?"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

හේ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ ගිරා ව උපන්සේක. උපන්නා වූ බෝධිසත්ත්වයන්ට රාධ යයි නම් වූහ. බෝධිසත්ත්වයන්ට මල් වූ පොට්ඨපාද නම් ගිරවාන කෙනෙකුන් ඇත්තාහ. මෙකියන ගිරවුන් දෙන්නා වැද්දෙක් අල්වාගෙන බ්‍රාහ්මණයෙකුට දින. ඒ බ්‍රාහ්මණ දරුකොට වඩා, බ්‍රාහ්මණ ඔබ්බකට යන්නේ තමන්ගේ දරුවන් දෙදෙනාට කියන්නේ "යම්සේ තොපගේ මව් බැමිණී වැරැද්දක් කෙරේ නම්

වැරැද්ද වලකා ලව,උන්ගේ දුක් සුවයෙක් බැලෙව"යි කියා ගියහ. බමුණු ගියවක් පටන් බැමිණි අනාචාරයේ යෙදෙන්ට වන. දවසකට ගෙට එන යන මනුෂ්‍යයන්ගේ ගණනෙක් නැත. එවිට පොට්ඨපාද නම් බෝධිසත්ත්වයන්ගේ මලණුවෝ බෝධිසත්ත්වයන්ට කියන්නාහු "බෑණන්වහන්ස, අපගේ පියාණන් වහන්සේ කියා ගියේ මෑණියන් වහන්සෙගේ වැරැද්දක් ඇති නම් වලක්වන්ට කියා ගියාවේද? එසේ හෙයින් මෙසේ වූ වැරදි බලා නොකියන්නේ කෙසේද? ඊට අවවාද කියව"යි කීය.

එවිට බෝධිසත්ත්වයෝ "ඒ තොපට ඇයිදැ?"යි කීවත් පොට්ඨපාද නම් ගිරවා බැමිණිය කරා ගොස් "මෑණියන් වහන්ස, මෙසේ නොකටයුතු කරන්නේ කෙසේද? ඉනිබ්බේ මෙසේ නොකටයුතු නොකළ මැනව"යි කීය. එබස් මෑණියෝ අසා "යහපත පුත, ඉනිබ්බේ මෙසේ කටයුතු නොකරමි" කියා සතුටු සිත් ඇති කෙනෙකුන් මෙන් ලඟට ගොස් කැඳවාගෙන බොටුව කරකවා ගින්නේ ලා පුළුස්සා කාපුවාහ.

කල් යාමකින් බමුණා අවුත් ගෙයි ඉඳ රාධ නම් පුතණුවන් අතින් විචාරන්නාහු "තොපගේ මෑණියන්ගේ දෝෂයෙක් ඇද්ද?"යි විචාළහ. එවිට රාධ නම් ගිරවානෝ කියන්නෝ "පියාණන් වහන්ස, නුවණැත්තෝ යම් කෙනෙකුන්ගේ වැරදි දුටත් නොකටයුතු අවස්ථාවේ නොකියන්නාහ. එසේ වූ අවස්ථාවේ කීමෙන් පොට්ඨපාදයාට වූ වධ පැමිණෝන්නේ වේදැ"යි කියා "මෙවේලේ පටන් මා මෙතෙන ඉඳිමෙන්

මැණියන් වහන්සේ මා කෙරෙහි උරණසේකැ''යි කියා බමුණා අතින් අවසර ඉල්වාගෙන වනාන්තරයට ගියාහයි වදාරා 'රාධ ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි පොට්ඨපාද ව උපන් ගිරවානෝ නම් ආනන්ද ස්ථවිරයෝය. එසමයෙහි රාධ ගිරවානෝ බුදුවූ මම්ම වේදැ''යි වදාළසේක.

# 198. ගෘහපති (ගහපති) ජාතකය

තවද කරුණාවට වාසස්ථාන වූ සර්‍වඥයන් වහන්සේ උකටලී වූ භික්ෂුවක් දැක් වූ කල්හි "මහණ, ස්ත්‍රීන් කෙරේ පිළිබඳ වීම යහපත් නොවෙයි, පෙරත් ස්ත්‍රීන් කෙරේ පිළිබඳව දුක් වූයේ නොවේදැ''යි වදාරා ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

හේ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ පිටිසර ගමෙක ගොවි ව උපන්සේක.

එකල්හි ඒ ගමේ ගම්මුදලියා බෝධිසත්ත්‍වයන්ගේ භාර්යාව කෙරේ පිළිබඳව දවස් අරණෝය. බෝධිසත්ත්‍වයෝ ඒ සංකාව දැන අල්වන්ට උත්සහ කරන්නාහ. එසමයෙහි සී සානා කාලය පැමිණ බොහෝ ගොවි තමන් බිජුවට වපුළාහ. වපුට බත් සායව කටුසර කා දවසරිනාහු. ගොයම්බඩ අවදියෙහි ගොවින් එක්ව ගම්මුදලින් කරා ගොස් කියන්නාහු "ගම්මුදලිනි,

දෙමසක් විතර ගිය කල ගොයම් ද මඩුම්හ, ඒ ද මැඩිකල නුඹවහන්සේට වී දෙම්හ. දැන් අපට කන්ට මාළු ගොනෙකු දෙන්ට උවමැනව"යි කියා ඇරගෙන මරා කාපුහ. එවිට කීප දවසක් ගම්මුදියා බෝධිසත්ත්වයන් ගෙයින් ගිය නියාව දැන ගෙට අවුත් වැද ඉන්නා වේලාවට බෝධිසත්ත්වයෝත් පෙරලා ගෙට එන්නට වන්නාහ.

බෝධිසත්ත්වයන්ගේ භාර්යයාවත් ඒ දැක ගැලවී යන උපායක් නොදැක ගම්මුදලියාට කියන්නාහු "නුඹවහන්සේ ගේ මධ්‍යයේ සිට වී දෙවයි කිය මැනව, මම අටුයේ සිට වී නැතැයි කියම්" කියා සිටි වේලාවට බෝධිසත්ත්වයෝ ගෙට අවුත් දෙන්නාගේ කාරණා දැක කියන්නාහු "මේ මා වඤ්චා කරන ප්‍රයෝගයකැ"යි සිතා බෝධිසත්ත්වයෝ "ඇයි ගම්මුදලිය, තොප විසින් ගොනා දුන්නේ දෙමසකින් වී දෙන්ට වුව, දෙපෝයකුත් නොගිසින් ඉන්දදී දැන් කුමන විද ඉල්ලන්නේය"යි කිය කියා "තීත් කෙටුවේ වී නැති නියාව දැන දැන තොප කියන්නේ කුමන වීයක්දැ"යි කියා "ඇයි? ගම්මුදලිනි, තොප ගම්මුදලිකම් කරමැයි කියා අනුන්ගේ භාර්යයාව හා කථා කරන්නට කාරණා කිම්දැ?"යි ඉස කේපත අල්වා හෙළා යහපත්කොට ඇන පිටිකර තලා බොටුව අල්වා දමාපීහ.

ඒ ස්ත්‍රියද කොටුවෙන් බාගෙන ඇගේ ඉස කේපත අල්වා බිම හෙළාගෙන ඇණ මරා තලා "ඉනිබ්බේ මෙසේ වූ වැරැද්දක් නොකරව"යි කියා භය ගැන්වූහ. එවක් පටන්

ගම්මුදලියා ඒ ගේ දිසාව බලන්නාක් නොකළේය. ස්ත්‍රීත් එසේ වූ අභිරහස චිත්තයෙක් නොසිතූහයි වදාරා මේ ‘ගෘහපති ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි ගොවි ව උපන්නෙම් බුදුවූ මම්ම ය”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 199. සාධුසීල ජාතකය

තවද කරුණාසමුද්‍ර වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා බ්‍රාහ්මණයෙකු අරභයා මේ ජාතකය දක්වන ලදි.

ජේ කෙසේද යත්?

එක්තරා බ්‍රාහ්මණයෙකුගේ දූන් සතරදෙනෙක් ඇත්තාහ. දූන් සතරදෙනා ප්‍රාර්ථනා කරන්නා වූ පුරුෂයෝ සතරදෙනෙක් ඇත්තාහ. ඒ පුරුෂයන් සතරදෙනාගෙන් එකෙක් රූපත් ව ඉඳිය. එකෙක් වයෝවෘද්ධ ව ඉඳිය. එකෙක් ජාතිසම්පන්න ව ඉඳිය. එකෙක් සිල්වත් ගුණවත් ව ඉඳිය. බ්‍රාහ්මණයාත් මේ කියන සතරදෙනාගෙන් “කාට මාගේ දූන් දෙන්දැ?”යි සිතා බුදුරජාණන් වහන්සේ සමීපයට පැමිණ මේ කාරණය බුදුරජාණන් වහන්සේගෙන් ඇසුයේය. බුදුරජාණන් වහන්සේ වදාරනසේක් “බ්‍රාහ්මණය, තමන්ට නොදැනෙන පමණක් විනා පෙර නුවණැත්තෝ ඒ කාරණය තට කීවෝ වේදැ”යි වදාරා බ්‍රාහ්මණයා විසින් ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ එම නුවර බ්‍රාහ්මණ කුලයක ඉපිද දිසාපාමොක් ආචාරීන් ව දවස් අරණාසේක.

එසමයෙහි එක්තරා බ්‍රාහ්මණයකුගේ දූන් සතරදෙනෙක් ඇත්තාහ. ඒ දූන් සතරදෙනා ප්‍රාර්ථනා කරන්නා වූ පුරුෂයෝ සතරදෙනෙක් ඇත්තාහ. ඒ පුරුෂයන් සතරදෙනාගෙන් එකෙක් රූපත් ව හිඳිනේය. එකෙක් වයෝවෘද්ධ ව හිඳිනේය. එකෙක් ජාතිසම්පන්න ව ඉඳිනේය. එකෙක් සිල්වත් ගුණවත් වන්නේය. මේ කියන සතරදෙනා බ්‍රාහ්මණයා විසින් ගෙන්වා “කාට දෙන්දේ හෝ”යි සිතා තමන් නොදන්නා හෙයින් බ්‍රාහ්මණයා දිසාපාමොක් ආචාරීන් ලඟට ගොස් එපවත් කීය.

එවිට දිසාපාමොක් ආචාරීන් කියන්නාහු “බ්‍රාහ්මණය, රූ ඇත්තාවුන්ට දීම යහපත, වයෝවෘද්ධයන්ට දීමත් යහපත, වංශවතුන්ට දීමත් යහපත, එසේ වූවත් සිල්වතුන්ට දීම උත්තමය”යි කීහ. “බ්‍රාහ්මණය, සිල්වත් පුරුෂයාට තමන් දූන් සතරදෙනාම දුන්න මැනව”යි වදාරා ‘සාධුසීල ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි බ්‍රාහ්මණයා නම් මෙසමයෙහිත් බ්‍රාහ්මණයාය. දිසාපාමොක් ආචාරී නම් බුදුවූ මම්ම ය”යි වදාළසේක. ඒ බණ අවසානයෙහි බ්‍රාහ්මණයා දහසක් නයින් ප්‍රතිමණ්ඩිත වූ සෝවාන් මර්ගයට පැමිණියේය.

# 200. බන්‍ධනාගාර ජාතකය

තවද කරුණාපූජාහී වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි බන්‍ධනයක් අරභයා මේ ජාතකය දක්වන ලදි.

හේ කෙසේද යත්?

එක් සමයෙක්හි උමන් පැහැර මංපහරණ සොරුන්ද, මිනී මරණ සොරුන්ද, මේ කියන සොරුන් අල්වා රජ්ජුරුවන්ට පෑහ. රජ්ජුරුවෝත් ඒ සොරුන් දඬුකන්තලයෙ ලීම්, පිටිතොල හයා බැඳීම්, දම් ලා මැසීම් ආදී වූ බොහෝ බන්‍ධනයට පමුණුවා හිරගෙයි ලැව්වාහ.

එකල පිටිසර සිට වහන්දෑ නමක් සැවැත් නුවරට වැඩිසේක් මේ බන්ධනාගාරයට පැමිණියා වූ මනුෂ්‍යයන් දැක එපවත් සර්‍වඥයන් වහන්සේට වැඳ සැලකොට ඉක්බිති “ස්වාමීනි, බන්‍ධනයට පැමිණි මනුෂ්‍යයන් දුටුම්හ. උන් ඒ බන්‍ධනයෙන් ගැළවීගෙන නොඑන්නා සේ තිබෙයි. මෙසේ වූ බන්‍ධනයට වඩා අනික් බන්‍ධනයෙක් පවා ඇද්දැ?”යි විචාළසේක. “මහණෙනි, මේ කුමන බන්‍ධනයක්ද? පඤ්චකාම විෂ නැමැත්තා වූ බන්ධන වේද, බන්‍ධන නම් එසේ වූ බන්‍ධනයෙන් ගැළවී යන්ට වේද බැරිය, එසේ වූ බන්‍ධනයෙන් පවා උත්තමයෝ ගැලවී ගියෝ වේදැ”යි වදරා “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

හේ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ දුක්පත් කුලයක ගොවි ව ඉපිද වැඩිවිය පැමිණ කනවැන්දුම් මෑණියන්ට අත් පා මැඩීම, උනුපැන් සිහිල්පැන් තිබීම ආදී වතාවත් තමන්වහන්සේ තනිවම කරනසේක.

බෝධිසත්ත්වයන්ගේ මෑණියෝත් තමන් පුතණුවන් තනිවම දුක් ගන්නා හෙයින් බෝධිසත්ත්වයන්ට නොකියා ඔබ්බෙන් කුලස්ත්‍රියෙකු ගෙන්වා සරණපාවා දුන්හ.

මේ නියායෙන් දවස් අරණ සමයෙහි බෝධිසත්ත්වයන්ගේ මෑණියෝ එක්තරා ව්‍යාධියකින් නටහ. එසමයට බෝධිසත්ත්වයන්ගේ භාර්යයාවන් බඩ දරුගැබක් පිහිටියේය. ඒ දරුගැබ පිහිටි නියාව බෝධිසත්ත්වයෝ නොදැන "භද්‍රාව, ගිහිගෙන් මට කම් නැත. තපසට යෙමි. අවසර දෙව"යි කීහ.

එවිට බෝධිසත්ත්වයන්ගේ ස්ත්‍රී "ස්වාමීනි, මා බඩ ගර්භයෙක. ඒ ගර්භය ප්‍රසූත කළ කල වඩිනේ යහපතැ"යි කීහ. "යහපතැ"යි රඳා කිරි වපුරා පසු තපසට යන්ට සිතන අවස්ථාවට අනික් දරුගැබෙක් බඩ පිළිසිඳ ගත. එවිට බෝධිසත්ත්වයෝ සිතන්නාහු "මුන්ට කියා අවකාශ ඉල්වාගෙන යෙම් නම් මූ යා නොදෙති. මුන්ට මා නොකියා යා යුතුය"යි සිතා මධ්‍යමරාත්‍රී වේලේ හෙයින් නික්ම වීථියට බටහ. ඒ වේලාවට ගම් රැකවල්ලු දැක අල්වා ගත්හ. එවිට බෝධිසත්ත්වයෝ කියන්නාහු "මවුන්ට උපස්ථාන කරන්නා වූ

මම අනික් නොකටයුත්තක් නිසා පිටත් වූයෙම් නොවෙයි, හිමාලය වනයට ගොස් තපස් කරන්නට යෙම් යි සිතා ආමි'' කියන්නාහු එවිට ගම රැකවල්ලු ඇරපුවාහ.

එවිට බෝධිසත්ත්‍වයෝ එතැනින් ගැළවී සිතන්නාහු "මේ වේලේ නික්මුනොතින් අනික් තෙනකදීත් ඇල්ලූ නම් නපුරැ''යි සිතා ඔබ්බේ ගෙයක රෑ ලැග පාන් වූ ගමනේ නික්මූනාහු, හිමාලය වනයට වැද සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවැදිව "ගිහි බන්‍ධනයෙන් ගැලවී ගියෙමි''යි උපන්නා වූ ප්‍රීති වේගයෙන් උදන් අනන්නා වූ "යම් සේ සිර දඬුකම් ලැබ මැසීම්, බැදීම් ආදී වූ බන්‍ධනයෙන් ගැලවීගත, හැකත් මතු පුත්‍රදාරාදීන් පඤ්චකාම විෂබන්‍ධනයෙන් ධෛර්‍ය්‍යවන්ත කෙනෙකුන් මිසක් ගලවීගත නොහැක්කා වූ ගිහිබන්‍ධනයෙන් මිදී මෙසේ වූ සැපයක් ලදිමි'' උදන්අනා පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා නොපිරිහුනු ධ්‍යානයෙන් බ්‍රහ්මලෝකයෙහි උපන්නාහයි වදාරා 'බන්ධනාගාර ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි පියාණෝ නම් සුද්ධෝදන රජ්ජුරුවෝය, එසමයෙහි මෑණියෝ නම් මහාමායා දේවිය, එසමයෙහි බෝධිසත්ත්‍වයන්ගේ භාර්‍ය්‍යාවෝ නම් යශෝදරා දේවිය, ගිහිබන්‍ධනයෙන් මිදුනු ගොවියෝ නම් බුදුවූ මම්ම ය''යි වදාළසේක.

මේ බණ අවසානයෙහිදි බොහෝ දෙනා සෝවන්, සෙදැගැමි, අනාගිමි, අර්හත් යන සතරඵලයට පැමිණියාහ.

# 201. කේලිසීල ජාතකය

තවද කරුණාස්වාමි වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ලකුණ්ටක භද්දිය තෙරුන්වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ කෙසේද යත්?

ලකුණ්ටක භද්දිය ස්වාමීන් වහන්සේ මහා සෘද්ධිවන්ත සේක. මධුර වූ ධර්‍මකථික සේක. අවශේෂ රහත්භාවයක් නොව් සිව්පිළිසිඹියාපත් රහත්සේක. ලකුණ්ටක භද්දිය මහතෙර ස්වාමීන් මිටිව සාමණේර නමක් සේ සිටිනා හෙයින් තිස්ස නම උන්වහන්සේට "ඇයි සාමණේරයෙනි, කොයි ගියාදැ?"යි සිවුරු ඇඳ ඉස අත ගා මේ නියායෙන් උන්වහන්සේ ඇරගෙන කෙළ ජේතවනාරාමයට වැද සිවුරු ඒ ඒ තැන තැන්පත්කොට තබා සර්‍වඥයන් විසින් සුවදුක් විචාරා අන්තයෙහි "ස්වාමීනි, මිහිරිකොට බණ කියන්නා වූ ලකුණ්ටක භද්දිය තෙරුන්වහන්සේ කොයිදැ?"යි විචාළසේක.

"ඇයි? මහණෙනි, තොපි කන් පොත්ත අල්වාගෙන කෙළපියා ආයේ ලකුණ්ටක භද්දිය තෙරුන්වහන්සේ වේදැ"යි වදාළසේක. එබස් අසා භික්ෂූන් වහන්සේ "ඇයි ඊනියා ආනුභාව ඇති මුන්වහන්සේ ලකුණ්ටක කෙළිනා රුවක් සේ වන්ට කාරණා කිම්දැ?"යි විචාළසේක. සර්‍වඥයන් වහන්සේ "මහණෙනි, තුමූ තමන්ට කොටගත් දෙයකැ"යි වදාරා "ඒ

කෙසේදැ?”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ ශක්‍රදේවේන්‍ද්‍රව උපන්සේක. එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ ක්‍රීඩාපරව දවස් අරණාහු මාළු අසුන්, මාළු රථ ඈත මෑත ලී බන්දා කඩ වඩා සිනා සී කෙළිනාහ. මෑලි ගැනුන් ගෙන්වා බඩපිට ගසා යථා එලිමාහ මාළු මිනිසුන් හා ඈතයවාජිය. මේ නියායෙන් රජ්ජුරුවන් ගහට කරන්නා දැක බොහෝ මනුෂ්‍යයෝ තමතමන්ගේ දෙමව්පියන්ට කරන්නා වූ මාතෘ උපස්ථානය, පිතෘ උපස්ථානය හැර දෙමව්පියන් ඒ ඒ තැන යවාජිය.

මේ නියායෙන් ඒ රජ්ජුරුවන් වෘද්ධයන් හැරගෙන කෙළිනා හෙයින් අමාත්‍යයෝත් එලෙසම කෙළේය. ඒ නියායෙන් බොහෝ පව් පිරී මනුෂ්‍යයෝ දිව්‍යලෝකයට නොගොස් නරකයෙහිම උපන්නාහ. එවකට ශක්‍රදේවේන්‍ද්‍රයෝත් තමන්ගේ දිව්‍යභවනයෙහි අමුතුව උපදිනා දිව්‍යපුත්‍රයන් නොදැක “කුමන කාරණයෙක්දැ?”යි මනුෂ්‍යලෝකය බලන්නාහු “බරණැස් රජ්ජුරුවන් කරන්නා වූ අසද්ධර්‍මය නිසා නුවරවාසීනුත් එලෙසකොට නරකයෙහි උපදිති” කියා දැක “මා ගොසින් රජ්ජුරුවන්ට අවවාද කිව මැනවැ”යි සිතා මාළු වේසයක් මවාගෙන මාළු රථය ට නැගී මාළු ගොන් දෙන්නෙකු අදිනා ලෙස සලසාගෙන කිලාන් දෙසැලක් රථයේ

තිබාගෙන "මා රජ්ජුරුවන්ට විනා කාටත් නොපෙනේව"යි සිතා අධිෂ්ඨානකොට ලා වීථියට බටහ.

ඒ වේලාවට රජ්ජුරුවෝත් මහත් වූ අලංකාරයෙන් සැරහී ඇතු පිටට පැන නැගී වීථියෙහි නික්ම තමන් ඉදිරියට එන්නා වූ මාළු රථයේ ශක්‍රයන් දැක "මේ මාල්ලා ඉවත ලව"යි අමාත්‍යයන්ට කීහ. අමාත්‍යයෝත් තමන්ට නොපෙණෙන හෙයින් "කොයිද සාමිනි" කියා විචාරන්නාහ. ඒ වේලාවට ශක්‍රයෝ තමන් පදිනා රථය ඇතු පිට උන් රජ්ජුරුවන්ගේ ඉස මුදුනෙන් රථය පැද ඉස සමීපයට ආ කල්හි කිලාන් සැලක් ඉස ගසා බිඳපුවාහ. නැවතත් එන අත අනිත් කිලාන් සැල ඉස ගසා බිඳපුවාහ. එවිට රජ්ජුරුවෝ විපිළිසර ලෙසට පැමිණියාහ.

ඒ වේලෙහි ශක්‍රයෝ ශක්‍රාත්මභාවය මවාගෙන වජ්‍රායුධය ගත් අත් ඇතිව අවකාශයෙහි සිට "ඇයි රජ්ජුරුවෙනි, තොපට මාළු වේෂය නොපෙණෙන්නා සේ සිතාගෙන බොහෝ මාළු මිනිසුන් ගහටකොට කෙළින්ට කාරණා කිම්දැ?යි තොප එක තැනැත්තන් නිසා බොහෝ දෙන මාතෘ උපස්ථාන, පිතෘ උපස්ථාන හැර තොපම වැඩිමහල්ලන්ට කරන ගහටයෙන් බොහෝ දෙනා නරකාදි සතරඅපායෙහි දුක් විඳින්නාහ. මෙවක් පටන් එසේ මෙසේ අනාචාර කළානම් මේ මාගේ වජ්‍රායුධයෙන් තොපගේ ඉස සත්කඩක්කොට ගසමි"යි භය ගන්වා ගියහ.

රජ්ජුරුවෝ එවක් පටන් ශක්‍රයන් කී පරිද්දෙන්ම තමන් මාළු මිනිසුන් හා කැටිව කෙළනා වූ කෙළි නොකෙළිහයි වදරා "මහණෙනි, යම් සේ හංසයන්, කොස්ලිහිණියන් ආදි වූ පක්‍ෂින්ද, ඇතුන් අසුන් ආදි වූ සිව්පාවුන් ඇතුළු වූ සියල්ලෝම සිංහයා කෙරෙහි භය ඇතිව වාසය කෙරෙද්ද? එපරිද්දෙන්ම මහණෙනි, ලකුණ්ටක භද්දිය මහතෙරුන් වහන්සේ කුඩා උවත් උන්ගේ ගුණ මහිමවේද? බැළුව මැනවැ"යි වදරා 'කෙළිසීල ජාතකය' නිමවා වදාළසේක්.

"එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් ලකුණ්ටක භද්දිය හ. ශක්‍රදේවේන්‍ද්‍රව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැ"යි වදාළසේක.

# 202. ඛණ්ඩ (ක) වත්ත ජාතකය

තවද කරුණානාථ වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි සර්ප දෂ්ට භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

එක් භික්ෂු කෙනෙකුන් වහන්සේ විහාර සමීපයෙහි දර පලමින් සිටි කල එක් වෘක්‍ෂයෙක වසන්නා වූ සර්පයෙක් අවුත් ඒ භික්‍ෂූන් වහන්සේ දෂ්ට කෙළේය. එකල ඒ භික්ෂුන් වහන්සේ විෂ මූර්ජාවෙන් මළසේක.

ඒ කථාව භික්ෂූන් වහන්සේ දම්සභා මණ්ඩපයෙහි කිය කියා උන්තැනට සර්‍වඥයන් වහන්සේ වැඩවදරා "මහාණෙනි, මා එන්නට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි

විචාරා එපවත් අසා "අහිරාජ කුලයට මෛත්‍රී කළොත් මෙසේ නොවන්නේ වේදැ?යි පළමු අහිරාජ කුලයට මෛත්‍රීකොට කිසිම අන්තරාවකට නොපැමිණියේය වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ බ්‍රාහ්මණ ව ඉපිද පඤ්චකාමය හැර හිමාලය වනයෙහි ඍෂිප්‍රව්‍රජ්‍යයාවෙන් පැවිදිව බොහෝ තාපසවරුන්ට ගණ ශාස්තෘ ව වාසය කරනසේක.

එසමයෙහි බොහෝ සර්පයන්ගෙන් තාපසවරුන් වහන්සේට භය පැමිණෙයි. එපවත් බොහෝ තාපසවරුන් ගණ ශාස්තෘ වහන්සේට කීසේක. උන්වහන්සේ එපවත් අසා "සතර කුලෙහි සර්පයන්ට මෛත්‍රී කරව"යි කියන බෝධිසත්ත්‍වයෝ මේ ජාතකයේ පළමුවෙනි ගාථාව කියනසේක්

**"විරූපක්ඛෙහි මෙ මෙත්තං - මෙත්තං එරාපථෙහිමෙ**
**ඡබ්‍යාපුත්තෙහි මෙ මෙත්තං - මෙත්තං**
**කණ්හාගොතමකෙහිච"**

යන මේ ගාථාව කීහ. මෙහි අර්ථ මෙ මෙත්තං - මාගේ මෛත්‍රිය, විරූපක්ඛෙහි - විරූපාක්‍ෂක නම් නාග කුලයන් හාය, මෙ මෙත්තං - මාගේ මෛත්‍රිය, එරාපථෙහිමෙ -

ඓරාපථ නම් නාග කුලයන් හාය, මෙ මෙත්තං - මාගේ මෛත්‍රිය, ඡබ්‍යාපුත්තෙහි - ඡබ්‍යපුත්ත නම් නාග කුලයන් හාය, මෙ මෙත්තං - මාගේ මෛත්‍රිය, කණ්හාගෝතමකෙහිච, කණ්හාගොතමක නම් අහිරාජ කුලයන් හායි. "මෙසේ සතර කුලයන්ය. ඉදින් තෙපි මොවුන් කෙරෙහි මෛත්‍රී කළාහු නම් සර්ව සර්පොපද්‍රව නොවන්නේය"යි වදාරා දැන් සාමාන්‍යයෙන් මෛත්‍රී භාවනා දක්වන්නාහු

**"අපාදකෙහි මෙ මෙත්තං - මෙත්තං දිපාදකෙහි මෙ**
**චතුප්පදෙහි මෙ මෙත්තං - මෙත්තං බහුප්පදෙහිමෙ"**

යන මේ ගාථාව කීහ. මෙ මෙත්තං - මාගේ මෛත්‍රිය, අපාදකෙහි - අපාදක දීර්ඝ ජාතීන් කෙරෙහිය, මෙ මෙත්තං - මාගේ මෛත්‍රිය, දිපාදකෙහි - දිපාදක වූ මනුෂ්‍යයන් හා පක්ෂීන් හාය, මෙ මෙත්තං - මාගේ මෛත්‍රිය, චතුප්පදෙහි - චතුෂ්පාද වූ හස්ත්‍යශ්වාදීන් හාය, මෙ මෙත්තං - මාගේ මෛත්‍රිය, බහුප්පාදෙහි - ගොනුසු ආදී වූ බොහෝ පා ඇත්තවුන් කෙරෙහිය. මෙසේ මෛත්‍රී භාවනාවෙහි ස්වරූප දක්වා දැන් යාඥා වශයෙන් ආරක්ෂා දක්වන්නාහු,

**"මා මං අපාදකො හිංසි - මා මං හිංසි දිපාදකො**
**මා මං චතුප්පදො හිංසි - මා මං හිංසි බහුප්පදො"**

යන මේ ගාථාව කීහ. අපාදකො - අපාද සතෙක්, මා මං හිංසි - මා නහමක් පෙළාවා(නොපෙළාවා), දිපාදකො - දිපාද සත්ත්වයෙක්, මා මං හිංසි - මා නහමක් පෙළාවා, චතුප්පදො - සිව්පා සතෙක්, මං මං හිංසි - මා නහමක්

පෙළාවා, බහුප්පදෙ - බොහෝ පා ඇති සතෙක්, මා මං හිංසි - මා නහමක් පෙළවා, දැන් අනොදිස්සක හෙයින් මෛත්‍රීය දක්වන්නාහු,

**"සබ්බෙ සත්තා සබ්බෙ පාණා - සබ්බෙ භූතාච කෙවලා**
**සබ්බෙ භද්‍රානි පස්සන්තු - මා කංචි පාපමාගමා"**

යන මේ ගාථාව කීහු. සබ්බෙ සත්තා - ඇම සත්හුද, සබ්බෙ පාණා - හැම ප්‍රාණීහුද, සබ්බෙ භූතාච කෙවලා - හැම භූතකයෝද, සබ්බෙ - හැමදෙනාම, භද්‍රානි - කල්‍යණයන්, පස්සන්තු - දකිත්වා, කිඤචි - මොවුන් කෙරහි කිසි සතක්හු කරා, පාපං - පාප දුකක්, මා ආගමි - නහමක් නොපැමිණෙවා, මෙසේ හැම සතුන් කෙරෙහි අනෝදිස්සක හෙයින් මෛත්‍රී දක්වා දැන් තුනුරුවන් ගුණ සිහි කරන පිණිස

**"අප්පමාණො බුද්ධො අප්පමාණො ධම්මො අප්පමාණො සංඝො"**

යනු කීහු. බුදුධො - බුද්ධරත්නයද, අප්පමාණො - අප්‍රමාණය කරන්නා වූ ක්ලේශයන් නැති හෙයින් ගුණයන්ගේ ප්‍රමාණ නැති හෙයින්ද අප්‍රමාණයි, ධම්මො - ධම්මරත්නයද උක්තප්‍රකාර හෙයින් ප්‍රමාණ නොකොටහැකි හෙයින්, අප්පමාණො - ප්‍රමාණයක් නැත්තේය, සංඝො - සංඝරත්නය, අප්පමාණො - අප්‍රමාණ ධර්මය සමානයෝගයෙන් අප්පමාණයයි

මෙසේ රත්නත්‍රයෙහි ගුණ සිහි කරව"යි වදාරා ප්‍රමාණ සත්ත්වයන් දක්වන්ට

**"පමාණවන්තානි සිරිංසපානී අහි විච්ඡිකා සතපාදී උන්නානාභි සරබූ මූසිකා"**

යනු සිරිංසපානී - දීර්ඝ ජාතීහු, පමාණවන්තානි - ප්‍රමාණකර ක්ලේශ සංයෝගයෙන්ද අප්‍රමාණකර ගුණයන් නැති හෙයින්ද ප්‍රමාණවත්හුයි, දැන් අහිංසා යනාදීන්ට උන් ස්වරූපයෙන් දක්වත්. අහි - සර්පය, විච්ඡිකා - ගොනුසුය, සතපාදී - පත්තෑයහ, උන්නානාභි - මකුළුවහ, සරබූ - සිකනැලහ, මූසිකා - මීයහ යන මොහුයි. දැන් මත්තෙහි කටයුතු දක්වන්නාහු,.

**"කතා මෙ රක්ඛා කතා මෙ පරිත්තා - පටික්කමනතු භූතානි**
**සොහං නමො භගවතො - නමො සත්තනනං සම්මාසම්බුද්ධනනති"**

යන මේ ගාථාව කියත්. රත්නත්‍රයෙහි ගුණානුස්මරණය කරන්නා වූ, කතා - කරනලද, මෙ - මා විසින්, රක්ඛා - රක්‍ෂා තොමෝ, කතා - කරනලද, මෙ - මා විසින්, පරිත්තා - පරිත්තානයෝ, භූතානි - මේ මා කෙරෙහි අහිත අදහස් ඇති සත්ත්වයෝ, පටික්කමන්තු - පහවෙත්වා, සොහං - ඒ මම, භගවතො - අතීත වූ භාග්‍යවත් බුදුන්ට, නමො - නමස්කාර කෙරමි, සත්තනතං සම්මාසම්බුද්ධානං - අතීත වූ විපස්සී ආදී වූ සත් බුදුන්ට, නමො - නමස්කාර කෙරෙමි

යනාදීන් බන්ධ පරිත්තය තපස්වරුන්ට ඉගැන්වූහ. එතැන් පටන් තාපසවරුන්ට සර්පයන්ගෙන් කිසි භයෙක් නුවුයේයයි වදරා 'ඛන්ධකවර්ති ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි තාපසවරු නම් බුදු පිරිසය. ගණ නායකව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 203. වීර (වීරක) ජාතකය

තවද ස්වයම්බුද්ධ වූ සර්වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි සර්වඥ කෘත්‍යයක් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

දේවදත්ත ස්ථවිරයන් වහන්සේගේ පන්සියයක් භික්ෂූන් වහන්සේ දැගසව්වන් වහන්සේ ගොසින් බණ කියා ඇරගෙන බුදුන් කරා වැඩිසේක.

සර්වඥයෝ දැගසව්වන් වහන්සේ දැක "තොප ඇම එන වේලාවට දේවදත්ත ස්ථවිරයෝ කෙසේ උනුදැ?"යි විචාරා "සර්වඥ විලාසයෙන් ඉඳ බොහෝ විනාසයට පැමිණියෝය"යි වදාළසේක.

එබස් සර්වඥයෝ අසා "පළමුත් දේවදත්ත ස්ථවිරයෝ මාගේ ක්‍රියාව කරන්ට වැද බොහෝ විනාසයට පැමිණියෝ වේදැ"යි වදරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ එක් විලක දියකා ව උපන්සේක. නමින් 'වීරක' නම් ව වසන සමයෙහි බරණැස් නුවර සාය ගසා බොහෝ දෙනාද ආහාර නැති හෙයින් කවුඩුවන්ට තබා දෙන කාවනු සේ බත් නොලබන්ට වන්නාහ.

සවිට්ඨක නම් එක් කපුටුවෙක් තමාගේ කවුඩු දේනුව හා සමග බෝධිසත්ත්වයන් වසන්නා වූ විලට ගොස් බෝධිසත්ත්වයන්ට ආදර දක්වා සිටියේය. බෝධිසත්ත්වයෝත් "ඇයි සබඳ කුමක් නිසා අවුදැ?"යි විචාරා "නුඹවහන්සේට සේවය කරන්නට ආමි" කියන්නා "යහපතැ"යි කියා එතැන් පටන් තුමු ගොදුරු කා කවුඩාට දෙන්නාහ. කවුඩුත් බඩ පුරා ගොදුරු කා තමාගේ කැවිඩි ධේනුවටත් දෙන්නේය. මේ නියායෙන් දවස් හරණා සමයෙහි එක් දවසක් කවුඩා කියන්නේ "මුයිත් කළුපැහැය, මුයිත් දෙපා ඇත්තාහ, මමත් දෙපා ඇත්තෙමි. මුන් මැරූ ගොදුරු කන්නේ කවුද? මම ගොදුරු මරා කමි" සිතා දවසක් දියකාවා ළඟට ගොස් කියන්නේ "සබඳ තොප මරාළු ගොදුරු කන්නේ කවුද? මම ගොදුරු මරා කමි" කීහ.

එබස් අසා දියකාවා කියන්නේ "දියෙහි කිමිද කන මසුන් හෙයින් අපට මිසක් තොපට බැරිය"යි කීවත් ඒ කපුටු ගොසින් "මසුන් මරා කමි"යි දියට බැස සෙවෙල් අස්සේ බැඳි

පැන් බී මළාහ. ඒ කියන කවුඩාගේ කැව්ඩිදෙන් කවුඩා නා හෙයින් බොධිසත්ත්වයන් කරා ගොස් කියන්නී "මිහිරි කට හඬක් ඇති මොනරුන්ගේ කරට බදු වූ නිල් වූ ග්‍රීවයක් ඇති සවිට්ඨක නම් කවුඩා දැන් කොයිද?" වීරක නම් පක්ෂියාණන් වහන්සේ කියන්නේ "මා කීවා නොඅසා මානය උපදවා ගොදුරු කන්ට දියට බැස සෙවෙල් පය බැඳී මළේය"යි කීහ. එබස් කැව්ඩි අසා අඬා වැලප පෙරලා බරණැස් නුවරට ගියාහයි වදාරා 'වීර ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි 'මාගේ ක්‍රියාව කෙරෙමි' කියා ගිය මළ කවුඩා නම් දේවදත්ත ස්ථවිරය, දියකාව උපන්නෙමි ලොව්තුරා බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 204. ගංගානම් (ගංගෙය්‍ය) ජාතකය

තවද දශබලධාරී වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි බාල භික්ෂු දෙදෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්?

සැවැත් නුවරවාසීහු කුලපුත්‍රයෝ දෙදෙනෙක් බුද්ධශාසනයෙහි මහණව අසුභ භාවනාදිය කොට රුවට බැඳී "මමද රූ ඇත්තෙමි. තොපි රූ ඇත්තේ නොවේ"යි උනුන් හා වාදකොට එක් මාළු භික්ෂූ කෙනෙකුන් වහන්සේ ලඟට ගොස් "ස්වාමීනි, අප දෙන්නාගෙන් රූ ඇත්තේ කාටදැ?"යි විචාළසේක.

ඒ භික්ෂූන් වහන්සේ කියනසේක් "තොප දෙන්නා නියාවට මගේ රුව යහපතැ"යි කීසේක. එබස් අසා භික්ෂූන් වහන්සේ "අප විචාළේ එකෙක මුන්වහන්සේ කීයේ එකෙකැ"යි රොස් ගසාගෙන නික්මුණාසේක.

මේ කථාව ධම්සභා මණ්ඩපයේ රැස්ව උන් භික්ෂූන් වහන්සේ කිය කියා උන්තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩවදරා "මහණෙනි, මා එන්නට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදරා එපවත් අසා සර්‍වඥයන් වහන්සේ "දැන්මතු නොවෙයි, පළමුත් මේ භික්ෂූන් දෙන්නා රුවට බැඳි ඇවිද්දේ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ ගංගා නම් ගංගාව සමීපයෙහි වෘක්ෂයක දේවතා ව උපන්සේක.

එසමයෙහි එක් ගංගා නම් මත්ස්‍යයෙකු හා යමුනා නම් මත්‍යයෙකු හා මත්ස්‍යයෝ දෙන්නෙක් උනුන් දැක "මාගේ රූ ඇත. තොපගේ රූ නැතැ"යි යනාදීන් තර්කකොට ගොඩ සමීපයේ උන්නාවූ ඉදිබුවෙකු සමීපයට අවුත් කියන්නෝ "ගංගා නම් මත්ස්‍යයාගේ රුව වැඩිද? යමුනා නම් මත්ස්‍යයාගේ රුව වැඩිදැ?යි විචාළහ.

එවිට ඉදිබුවා කියන්නේ “ගංගා නම් මත්සයයාගේත් රුව වැඩිය, යමුනා නම් මත්සයයගේත් රුව වැඩිය, උන් දෙන්නා නියාවට රුවින් නිග්‍රෝධ වෘක්‍ෂයයේ වට වූ කබලක් ඇති රිය ඉසක් සේ ඉස ඇති සතර ගාතයක් ඇති මාගේ රුවම වැඩිය”යි කිය.

එබස් අසා ඒ මත්සයයෝ දෙන්නා “තට එක් කාරණයක් කියන්ට කී කල නොයෙක් කාරණා කියයි” කිපී වරල් පතින් පැන් ඉස ගියාහයි වදාරා ‘ගඩගෙයය ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි මත්සයයෝ දෙන්නා නම් මේ ළදරු භික්ෂූහුය. එසමයෙහි වෘක්‍ෂ දේවතාව උපන්නෙම් බුදුවූ මම්ම ය”යි වදාළසේක.

## 205. විතීය කුරුංගමිග ජාතකය

තවද ශාස්තෘ වූ සර්‍වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන් සර්‍වඥයන් වහන්සේ නසන්ට කළ උත්සායක් නිසා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්?

එක් දවසක් ධම්සභා මණ්ඩපයෙහි රැස් වූ මාළුවරුන් වහන්සේ දේවදත්ත ස්ථවිරයන් බුදුන් නසන්ට කළ උත්සාහය කිය කියා වැඩ උන්සේක. එතනට සර්‍වඥයන් වහන්සේ වැඩ “මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?”යි විචාරා වදාරා එපවත් අසා “පළමුත්

දේවදත්ත ස්ථවිරයෝ මහත් වූ උත්සාහ කළෝ වේදැ''යි වදරා "ඒ කෙසේදැ?''යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ කුරුංගමෘග ජාතියෙහි ඉපිද විලක් සමීපයෙහි ගසක් මුල වාසය කරනසේක.

ඒ විල වසන්නා වූ ඉදිබුවකු හා ගසෙක වාසය කරන්නා වූ කෑරලයකු හා බෝධිසත්ත්‍වයෝ මිත්‍රව වසන්නා වූ එසමයෙහි එක් වැද්දෙක් බෝධිසත්ත්‍වයන් වසන්නා වූ ගස සමීපයෙහි වරමන්දෙන් ඉදි කරනලද උගුලක් සලස්වාලීය. බෝධිසත්ත්‍වයෝ උගුලෙහි පෙරයම බැඳුනාහ. වරපටින් ඒ මළ වරපට කඩාගත නොහී මරණප්‍රාප්තරාග(මරණ බියෙන්) වශයෙන් ඇඬූහ. ඒ අඬ අසා කෑරලා හා ඉදිබුවා එතනට අවුත් "යහළුවාට දුක්බය පැමිණි කල ගලවා ගන්ට උවමනා වේදැ''යි සිතා කෑරලා ඉදිබුවාට කියන්නේ "සබඳ ඉදිබුවානෙනි, නුඹගේ කට දත් ඇත. එසේ හෙයින් නුඹ වරමන්ද කපන්න. මම වැද්දාගේ ගෙට ගොස් මෙතනට ආ නොදෙමි'' කියා ඉදිබුවා වරමන්ද කපන්නට සලස්වා තෙමේ වැද්දාගේ ගෙට ගොස් වැද්දාගේ ඉදිරියේ දොරපලය පිට උන්නේය.

වැදි ඉර පාන් වන්නට නැකැත් වේලා තබා නැගිට තෙබගත් අත් ඇතිව යන්ට වන. ඒ වේලාවට කෑරලා කෑරල් ශබ්දය අඬා පියාපත් තබා මූනට ගැසීය. එවිට වැදි "කාලකන්ණි පක්‍ෂියා ඇග ගැසිනැ"යි කියා පෙරලා ගෙට වැදි ගියේය. එවිට කෑරලා සිතන්නේ "දෙවැනි ආ වර නික්මෙන්නේ පැල දෙරනැ"යි සිතා පැලදෙර පලය පිට උන්නේය.

ඒ වේලාවට වැදිත් "ඉදිරියේ දෙරින් නික්මුණු හෙයින් කෑරලා ඇග ගැසින. පැල දෙරින් යෙමි" සිතා පැල දෙර බලා නික්මිණ. එවිටත් කෑරලා ඇග ගැසිනි. ඒ වේලාවටත් "කාලකන්ණි පක්‍ෂියා ඇග ගැසිනැ"යි කියාත් "වැලක මා නික්මුණු වේලේ පක්‍ෂියා ඇග ගැසිනැ"යි කියා "රෑ නොගොස් උදෑසනක් සේ යෙමි" සිතා රෑ වැද නිදා පාන් වූ දෙරින් පැයක් ගිය වේලේ නික්මිණ. උෟ නික්මුණු පවත් කෑරලා වහා ගොසින් මුවාට කීය. ඒ වේලාවට ඉදිබුත් තමාගේ කුඩා දත් වලින් වරපට කඩාගෙන තුන්පටකින් දෙපටක් කපා හළ, දත් ටැම්මෙන්නා සේ මහත් වේදනාවට පැමිණ කටින් ලේ ගොසින් අසේනිව වැද හොත්තේය.

ඒ මුවා එවිට වැද්දා තෙබ ඇතිව එන්නාවුන් දැක අරාපීනූයේය. වරපට කඩාගෙන වහා බැද්දට වන. කැරලා ගසට නැංගේය. ඉදිබුවා දියට යා නොහී එතනම වැද හොත්තේය.

ඉදිබුවා රැගෙන පසුම්බියේ ලාලා කනුවක් පිට එල්වාලීය. එවිට බෝධිසත්ත්වයෝ ඉදිබුවාට වූ වද දැක වැද්දාට ලං නොව නුදුරුව පෙණුනාවූය. වැදි මුවා පසුපස්සේ නික්මිණ. මුවා අතට අසුවන්නා සේ ගැවී ගැවී නික්ම වැද්ද වූ මහවනයේ ලා මුවා ලංවූ මගින් ඉදිබුවා උන්තැනට වහා අවුත් අඟ බාලා පසුම්බිය ඉරා ඉදිබු බා මැත්කොට කියන්නේ “ඉදුබ, තොයි දියට වැද යව. කෑරලා තොයිත් වෘක්ෂයට පැන නැගේව”යි කියා ඒ අර්ථය ප්‍රකාශකොට දක්වන සර්වඥයන් වහන්සේ “මහණෙනි, ඒ මුවා කී නියායෙන්ම ඉදුබුත් දියට බට, කෑරලා ඔබ්බකට ගියේය. මූවාත් වනයට වන. වැදි දෙවැනිව එතන්ට අවුත් ඉදුබා නොදැක සිස් වූ පසුම්බිය හැරගෙන තමා ගෙටම ගියේය”යි වදරා ‘කුරුංගමිග ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි වැදිතෙම දේවදත්ත ස්ථවිරය. ඉදිබුවා නම් මෞද්ගල්‍යයාන ස්ථවිරිය. කෑරලා නම් ශාරිපුත්‍ර ස්ථවිරය. කුරුංග මිග ව උපන්නෙමි බුදුවූ මම්ම ය”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 206. අස්සක ජාතකය

තවද දිපදෙත්තම වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පුරාණ දුතිකාවක් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්?

එක් ස්ත්‍රියක් නිසා උකටලී වූ භික්ෂු කෙනෙකුන් වහන්සේ දක්වන්නා "මහණ, තාගේ අභිප්‍රාය(කැමැත්ත) මිසක්, තා කෙරේ ඇගේ අභිප්‍රායක් නැත. එසේ වුවත් තෝ ඈ කෙරේ ආලයෙන් පළමුත් බොහෝ දුක් වූයේ නොවේදැ"යි වදුරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස පොතලී නුවර අස්සක නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි උන්ගේ උබ්බරී නම් බිසෝ කෙනෙකුන් ඇත්තාහ. පංච කල්‍යාණයෙන් යුක්ත වූ විශිෂ්ඨවූ රූ ඇත්තීය. මනුෂ්‍ය රූපය ඉක්ම සිටියාහ. දිව්‍යාංගනාවකගේ රූපයට ආසන්නව සිටියහ.

මේ රූ ඇත්තා වූ ආග්‍රමහේසිකා බිසව එක්තරා ව්‍යාධියකින් මළහ. රජ්ජුරුවෝ ඒ බිසව් කෙරේ බොහෝ සෝකයෙන් බිසවුන් දෙනක ලා කුණු නොවන්ට තෙල් පුරා වත්කොට තමන් වැදහෝනා යානයට ලා නොකා නොබී උන්හ. අමාත්‍යයන් ආදී අය "ස්වාමීනි, සර්‍ව සංස්කාරයම අනිත්‍යයහ. එසේ හෙයින් විකෂෙප නොවුව මැනවැ"යි කීවත් රජ්ජුරුවෝ තමන්ගේ විකෂෙපය ඇරගත නොහී සත්දවසක් නොකා නොබී දවස් අරින්නට වන්නාහ.

එසමයෙහි පුරණලද බෝධිසම්භාර ඇති අප මහබෝසතාණෝ හිමාලය වනයෙහි පැවිදිව ධ්‍යාන ක්‍රීඩාවෙන් දවස් අරණසේක් එක් දවසක් ලෝකය දිවසින් බලා

වදාරණසේක් “අස්සක නම් රජ්ජුරුවන්ගේ දුක්ඛය බලා, මම ගොසින් උන්ගේ දුක්ඛය හරින්ට උවමැනව”යි සිතා ආකාශයෙන් ඒ නුවරට අවුත් ඒ රජ්ජුරුවන්ගේ මඟුල් උයනේ සල්වට මත්තේ රන් පිලිමයක් සේ වැඩ උන්සේක. එතනට එක් බ්‍රාහ්මණ මානවකයෙක් ආය. එවිට තාපසයෝ කියන්නෝ “තොපගේ රජ්ජුරුවෝ දශරාජ ධර්මයෙන් රාජ්‍යය කෙරෙද්දැ?”යි විචාළහ. එවිට බ්‍රාහ්මණ මානවකයා කියන්නේ “ස්වාමිනි, ඉන් අඩුවෙක් නැත. උන්වහන්සේගේ අග්‍රමහේසිකා බිසවුන් වහන්සේ නැසී ගියසේක. එසේ හෙයින් සෝකාතුරසේක. නුඹවහන්සේ වැනි ස්වාමීන් විසින් ඒ සෝකය හළ මැනව”යි කීය. එබස් තාපසයෝ අසා “ඒ කියන රජ්ජුරුවන් අපි නාඳුනම්හ. අඳුනමෝ නම් එකියන බිසවුන්ගේ උත්පත්තියත් කියා බිසවුනුත් පා සෝක තුනී කරන්නෝමෝ වේදැ”යි කීහ.

එබස් බ්‍රාහ්මණ මානවකයා අසා “රජ්ජුරුවන් වහන්සේ කැන්දාගෙන එමි. නුඹවහන්සේ මෙතන වැඩ උනමැනව”යි කියා රජ්ජුරුවන් කරා ගොස් එපවත් කීහ. රජ්ජුරුවෝ දිවැස් ඇති තාපස කෙනෙකුන් ආ නියාව අසා “ඒ තාපසයෝ මාගේ බිසවුන්ගේ උත්පත්තිය දනිති. එසේ හෙයින් උන් කරා යෙමි”යි සිතා අමාත්‍යය මණ්ඩලය පිරිවරා උයනට ගොස් තාපසයන් දැක “තාපසයන් වහන්ස, මාගේ බිසවුන්ගේ උත්පත්තිය දන්නාසේක්දැ?”යි විචාළය. “එසේය මහරජ, දනිමි” කියන්නා “එසේ වීනම් උපන් ස්ථානය කිය මැනව”යි කියන්නා “මහරජ, ගොමපැණි ව උපන්නාහ”යි කීහ. එවිට

රජ්ජුරුවෝ "මේ කියා රූපශ්‍රීයක් ඇති තැනැත්තෝ ගොමපැණී ව උපද්දිද? ඒ අදහාගත නොගනිමි"යි කීහ. "එසේ වීනම් රජ්ජුරුවෙනි, උන් මෙතනට ගෙන්වා පාමිදැ?"යි කීහ. "යහපත ස්වාමීනි" කීහ.

එවිට තාපසයෝ "ගොමපැණියා හා උන්ගේ වල්ලභ ගොම පණුවා හා දෙදෙනා ගොම උන්ඩි දෙකත් පෙරල පෙරලා එත්ව"යි අධිෂ්ඨාන කළහ. එම නියායෙන් ගොමපණුවා ඉදිරිකොට ලා ගොමපැණී ගොම උණ්ඩයත් පෙරල පෙරලා එතනට ආවාය. එවිට තාපසයෝ "එන්නා වූ ගොමපැණී නම් උබ්බරී නම් බිසව්ය"යි කීහ. නැවත තාපසයෝ කියන්නාහු "මහරජ්ජුරුවෙනි, මුන් විසින් පූර්වජාතියෙහි තමන්ගේ රූප මදයෙන් මත්ව කිසි පිනක් කරන්ට නුවූය. එසේ හෙයින් මෙසේ උපන්නාහ. මුන් ලවා කථා කරන්මිදැ"යි කීහ. එබස් අසා "යහපතැ"යි කී විසින් උබ්බරී නම් බිසවුන් ලවා "උබ්බරිනි, තොපගේ ජාති ගෝත්‍ර කියව, තොපගේ රජ්ජුරුවන්ට ප්‍රිය ඇද්දැ"යි විචාළහ.

එවිට ගොමපැණියා "තාපසයන් වහන්ස, රජ්ජුරුවන් වහන්සේ හා මා හා ආදී මේ උද්‍යානයෙහි බොහෝ කෙළි කෙළපියා වාසය කරනලදි. දැන් ජාතියෙන් වෙන් වූ හෙයින් රජ්ජුරුවන් හා මා හා කුමන විශ්වාසදැ"යි කිව. එබස් අසා රජ්ජුරුවෝ බිසවුන් කෙරේ තෘෂ්ණාව ඇර රජ්ජුරුවෝ මිනිය ගෙන් පිටත් කරවා ඉස් සෝධා නාහා සෝක තුනීකොට තාපසයන් කී අවවාද නියාවට දැහැමෙන් සෙමෙන් රාජ්‍යය

කොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදාරා 'අස්සක ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි අස්සක රජ්ජුරුවෝ නම් මේ කියන ශාසනයෙහි උකටලී වූ භික්ෂූහුය, උබ්බරී බිසව නම් මේ උකටලී කළා වූ ස්ත්‍රීහුය. එසමයෙහි මේ කාරණය තපසයන්ට කී බ්‍රාහ්මණ මානවකයා නම් ශාරිපුත්‍ර ස්ථවිරය, තාපසව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 207. සුංසුමාර ජාතකය

තවද මුනීන්ද්‍ර වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන්ගේ වධයට උත්සාහ කිරීමක් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්?

එක් දවසක් සංඝයා වහන්සේ ධර්‍මසභා මණ්ඩපයෙහි රැස්ව "දේවදත්ත ස්ථවිරයෝ සර්‍වඥයන් වහන්සේට වධයට උත්සාහ කෙරෙති" කිය කියා උන් තැනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්ත උනුදැ?"යි වදාරා එපවත් අසා "පළමුත් දේවදත්ත ස්ථවිරයෝ මා නසන්නට උත්සාහකොට භයක් විචරත් උපදවාගත නුහුනුවෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ ගංගාවක් සමීපයෙහි බැද්දක වානරව ඉපිද දවස් හරණසේක.

එසමයෙහි එක් කිඹුල් දෙනක් බෝධිසත්ත්වයන් දැක බෝධිසත්ත්වයන්ගේ හෘදය මාංශය කන්ට දොළෙක් ඇතිව එපවත් තමාගේ කිඹුලාට කියන්නී "ස්වාමිපුත්‍රයාණෙනි, ඇත් සමාන බල ඇති වානර රජ්ජුරුවන්ගේ හෘදමාංශ කන්නට මට දොළක් උපනැ"යි කියන්නා ඊට කිඹුලා කියන්නේ "අපි ජලයෙහි වාසය කරන්නෝය, ඔහු වනාහි ගොඩ වාසය කරන්නේය, එසේ හෙයින් උන්ගේ හෘදය මාංශය ගෙණෙන්ට මට පිළිවන්දැ?"යි කීහ.

එබස් අසා කිඹුල්දෙන කියන්නී "ස්වාමීනි, නුඹ දන්නා යම් උපායකින් හෘදමාංශය ගෙනෙන්න, නොගෙනාවොත් මාගේ ජීවිතය නොතිබෙ"යි කිව. එබස් අසා කිඹුලා "යහපතැ"යි කියා වදුරා වානර රජ්ජුරුවන් වසන ගස සමීපයට ගොස් "වානර රජ්ජුරුවෙනි, ඇයි තොප කසට එලාපල කා මෙතන ඉන්නේ බලාත් එගොඩ අඹ, දෙඹ, දෙල්, බෙලි, කිතුල්, තල් ආදී වූ මිහිරි එලාපල ඇති වනයේ වාසය කළොත් නපුරුදැ?"යි විචාළාහ.

එබස් අසා වානර රජ්ජුරුවෝ කියන්නාහු "කිඹුලානෙනි, දෙබිත්තියේ ගසා වතුර යෙමින් සිටියදී ගඟ මෙගොඩ සිට එගොඩට පැනපිය නොහැක්ක, කුමක් කෙරෙමිදැ?"යි කීහ.

එවිට කිඹුල් කියන්නේ "තොපගේ අභිප්‍රාය(කැමැත්ත) ඇත්නම් මාගේ පිට ඉඳවාගෙන ගොඩ ලා ගනිමි" කීය.

එබස් වානර රජ්ජුරුවෝ අසා "යහපත පිට පැලව"යි කීය. කිඹුලා පිටට පැන නැංගාහ. එවිට කිඹුල් වඳුරාණන් පිට හිඳුවා ගඟ මධ්‍යයට ගොස් දියෙහි ගිලෙන්නට වන. එවිට බෝධිසත්ත්වයෝ "මේ කිමිද? සබඳ, මා ඇරගෙන දියෙහි ගිලෙව්නැ"යි කීහ. එබස් අසා කිඹුලා කියන්නේ "තොපට එලාපල දෙන්ට උන් එකෙක්ද? මාගේ කිඹුල්දෙන් තොපගේ හෘදමාංශ උවමැනවැයි මා හට කී සෙයින් තොප මරා හෘදමාංශ ගන්ට ගෙනාවෙමි" කීහ.

එබස් අසා වානර රජ්ජුරුවෝ කියන්නාහු "එසේ සිතන්නේ යහපත වඳුරාන්ගේ හෘදය මාංශය ළෙයි තිබේ නම් ඒ ඒ තෙන පිණීමෙන් සුනුවිසුනු නොවේදැ?"යි කීය. එබස් අසා කිඹුල් "තොපගේ හෘදය මාංශය කොයි තිබේදැ?"යි කීය. බෝධිසත්ත්වයෝ එතනට ලං වූ විලිකිණි වූ දිඹුල් ගෙඩි ඇති ගසක් දැක "තෙල දිඹුල් ගසෙහි එල්ලෙන්නේ මාගේ හෘදය මාංශය"යි කීහ.

එවිට කිඹුලා "එසේ වීනම් තොප නොමරමියි හෘදය මාංශය මට දෙව"යි කියා වඳුරා ගොඩලීය. වඳුරු ගසට නැගී "තාගේ ගොඩ තිබූ අඹ දඹයෙන් මට කිසි ප්‍රයෝජනයක් නැත, එම්බල අඥාන වූ කිඹුල, වඳුරන්ගේ අක්මාව ඔබ්බේ තිබේද? තා මහත් පමණ මිසක් තාගේ ළෙයි කිසිම නුවණෙක් නැත්තේ වේද? තා වඤ්චා කළ නියාව තෝ

නොදන්නේය. එසේ හෙයින් තෝ තාගේ විමානයට පලා යව''යි කීහ.

කිඹුල් දසින් පැරදගිය එකෙකු සේ විකෂේපයට පැමිණ තමා ඉන්න වාසස්ථානයට ම ගියේයයි වදරා 'සුංසුමාර ජාතකය' නිමවා වදාළසේක.

''එසමයෙහි කිඹුල්දෙන නම් චිඤ්චිමානවිකාය, කිඹුලා නම් දේවදත්ත ස්ථවිරයෝය. වඳුරු ව උපන්නෙම් බුදුවූ මම්ම ය''යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 208. කක්කර ජාතකය

තවද භාග්‍යවත් වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි සැරියුත් සාමීන්ගේ විහාරයෙහි බාල භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්?

සැරියුත් සාමීන්ගේ අතවැසි භික්ෂු කෙනෙකුන් වහන්සේ කය ආරක්‍ෂා පිණිස ''උෂ්ණ බත් කෑවොත් පත්තය කුපිත වෙ''යි කියා උෂ්ණ වේලාවෙහි තමන්වහන්සේ කයට කිසි දුකක් වැද්ද නොදී රකිනාසේක.

මේ නියාව ධර්‍මසභා මණ්ඩපයෙහි රැස් වූ මාළුවරුන් වහන්සේ කිය කියා උන් තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩවදරා ''මහණෙනි, මා එන්නට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?''යි විචාරා වදරා එපවත් අසා ''දැන්මතු නොවෙයි, පෙරත් මූ තමන් ශරීරයට කිසි දුකක්

වැද්ද නොදුන්නේ වේදැ''යි වදාරා ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වනයෙහි වෘක්‍ෂ දේවතාව උපන්සේක.

එසමයෙහි ලිහිණි වැද්දෙක් පක්‍ෂි ධේනුවක් ඇරගෙන කොරවකුන් බඳන්නේය. පළමුත් මැදිරියෙක අසුව ගැලවී ගිය කොරවකු ඒ වැදි බඳන්ට උත්සහ කෙළේය. පළමුත් තමා අසු වූ හෙයින් ඒ වැද්දහුට අසු නොවී වැද්දහු ලාලු මළවල පය නොතබන්නේය. වැදිත් ''අවශ්‍යයෙන් උවමැනවැ''යි සිතා උත්සහකොට ඇවිදින්නේ පළමුත් තමා බැඳුනු හෙයින් මළට අසු නොවී ගැලවී දවස් අරනේය.

එවිට වැදි සිතන්නේ ''මළ ඉඳුවා බැරිමය''යි සිතා තමා උස නියාවට කූඩුවක් ඉදිකොට ඊ අතු බේරා තුමූ ගසක් හැටියට නික්මුනාහ. එවිට කොරවකා වැද්ද වූ නියාව දැන සිතන්නේ ''මූ සීහි කරන්ට උවමැනවැයි මෙකල වනාන්තරයෙහි ඇවිදින්නෙමි බොහෝ අඹ, දඹ, දෙල්, බෙලි, කිතුල් දුටු විරිමි, මෙසේ ඇවිදිනා ගසක් දුටු විරුද? තාගේ වඤ්චාවට මා අසුවන්නේ නැතැ''යි කියා පියා අඬාගෙන පලා ගියහ.

වැදිත් පක්‍ෂියා පලාගිය පසු කියන්නෝ “එසේ වීනම් පක්‍ෂියා මන්දිරය කඩාගෙන ගිය වනැයි එසේ හෙයින් මූ සොරකම් දන්නේ ය”යි ඔබ්බට ගොසින් පක්‍ෂීන් බඳගෙන තමාගේ වාසස්ථානයට ගියේයයි වදරා මේ ‘කක්කර ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි ලිහිණී වැදි නම් දේවදත්ත ස්ථවිරය, කොරවකා නම් ශරීරය රක්‍ෂා කරන්නා වූ භික්ෂූහුය, මේ කාරණය ප්‍රත්‍යක්‍ෂකොට දුටුවා වූ වෘක්‍ෂදේවතාවා නම් බුදුවූ මම්ම ය”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 209. කන්දගළක ජාතකය

තවද ලෝකනායක වූ සර්වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි සුගතාලය අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්?

එක් දවසක් ධර්මසභා මණ්ඩපයෙහි රැස් වූ මාළුවරුන් වහන්සේ දේවදත්ත ස්ථවිරයන් වහන්සේ සර්වඥ විලාසය කළ නියාව කිය කියා වැඩඋන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදරා “මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?”යි විචාරා එපවත් අසා “මහණෙනි, දැන්මතු නොවෙයි,
පෙරත් මූ මාගේ විලාසය ධරා බොහෝ දුක්ඛයට පැමිණියෝ

වේදැ''යි වදරා ''ඒ කෙසේදැ?''යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ නමින් බද්දිරව නම් කෑරලව ඉපිද කිහිරි වනයෙහි දවස් අරණාසේක.

එසමයෙහි බෝධිසත්ත්වයන්ට යාළු ව එරබදු ඉඹුල් ආදී වූ ස්ථානයෙහි වාසය කරන්නා වූ කන්දගලක නම් කෑරලෙක් බෝධිසත්ත්වයන් කරා ආය. බෝධිසත්ත්වයෝ තමන්ගේ කිහිරි වනයෙහි කිහිරි ගස් විද පණුවන් කෑරලාට ලූහ.

කෑරලා බෝධිසත්ත්වයන් ලූ පණුවන් කැවුම් කන්නා සේ කා කීප දවසකින් මොහු සිතන්නේ ''මොයිත් ගස් විද කන්නෝය. මුන් විදිනා ගස් මම් ම විද නොහෙන්දැ''යි සිතා එක් දවසක් කියන්නේ ''යහළු, තොප විදිනා ගස් මම විද පණුවන් කමි. තොප ගස් විද ආයාස නොගනුව''යි කීය.

බෝධිසත්ත්වයෝ කියන්නාහු ''තොපට පිළිවන් එරබදු, ඉඹුල් ආදී ගස් විද පණුවන් කතොත් විනා මේ හර ඇති කිහිරි ගස් විදින්නට බැරිය''යි කියන්නා ''ඒ කිම්දැ?''යි මහා වේගයෙන් ගොස් කිහිරි ගසෙහි හොට ඇන හොට කඩාගෙන, ඔළුවත් පළාගෙන දැස් උඩඉඳුවා මහත් වූ වේදනාවට පැමිණ ගස එලීගෙන ඉන්ද නොහී මුර්ජාව බිම

වැටී කුමක් බවත් නොදැන නන්දෙඩන්නේ "සිහින් වූ පත් ඇති යකඩ සේ තද වූ ගස කුමන ගසෙක්දැ"යි විචාළෝය.

බෝධිසත්ත්වයෝ කියන්නාහු "තොප විද අභ්‍යාස ගස් නොවිද මා කියමන් නොගෙන බොහෝ ආයාසයට පැමිණියාව, මේ ගස් නම් කිහිරි ගසැ"යි කීහ. එකියන පක්ෂියා එතනම මළහයි වදාරා 'කන්දගළක ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි කන්දගලක කෑරලා නම් දේවදත්ත ස්ථවිරය. ඛදිරව නම් කෑරලා ව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 210. සෝමදත්ත ජාතකය

තවද විනායක වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ලාලුදායි ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

ලාලුදායි ස්ථවිරයන් වහන්සේ සභයක ඉද බස්පස් කියන්ට වන්සේක් නම් කියන බස තබා නොකියන බසම කියනසේක. මුන්වහන්සේගේ අඥාන කම ධර්‍මසභා මණ්ඩපයෙහි රැස් වූ මාළුවරුන් වහන්සේ කිය කියා වැඩඋන් තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා එපවත් අසා "පළමුත් ලාලුදායියෝ එසේමය"යි වදාරා "ඒ

කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ කසීරට බමුණු ගමක ඉපිද වැඩිවිය පැමිණ සෝමදත්ත නම් බ්‍රාහ්මණ ව තක්සළා නුවරට ගොස් දියපාමොක් ආචාරීන් ලග ශාස්ත්‍ර ඉගෙන පෙරලා දෙමව්පියන් කරා අවුත් දුක්පත් හෙයින් "රජ්ජුරුවන් වහන්සේට සේවයකොට දෙමව්පියන් රකිමි" සිතා බරණැස් නුවරට ගොස් රජ්ජුරුවන්ට රාජවල්ලභව දවස් අරණා සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේගේ පිය වූ බ්‍රාහ්මණයන්ගේ සානා ගොන් ගෙයක් ඇත. ඒ ගොන් ගෙයෙන් එක් ගොනෙක් නැසින. "එපවත් පුතණුවන්ට කියමි" සිතා බරණැස් නුවරට ගොස් "සෝමදත්ත නම් පුතණුවෙනි, මාගේ ගොන් ගෙයෙන් ගොනෙක් නැසින, ඊට ගොනෙකු රජ්ජුරුවන්ට කියා මට ඉල්වා දෙව"යි කීය.

එබස් බෝධිසත්ත්‍වයෝ අසා "පියණන් වහන්ස, රජ්ජුරුවන් වහන්සේට වල්ලභ වූ ගමනේදී 'ගොනෙකු දුන මැනව'යි කියන්ට මට යොග්‍ය නොවෙයි. නුඹවහන්සේම රජ්ජුරුවන් වහන්සේට කියා ඉල්වාගත මැනවැ"යි කීහ. එවිට පියාණන් වහන්සේ කියනසේක් "පුත දෙන්නෙකු සිටියදී යම්ම දෙයක් මට කියන්ට බැරිය, මම කන්නලව් කියන්නෙම් සිටින ගොනතා ඇරගන්ට කියතොත් විනා කන්නලව් කියාගෙන ගොනෙකු

ඇරගත නොහෙමි" කීහ. "එසේ ගොනා දෙතත් ගොනෙකු ඇරගතත් නුඹවහන්සේ ම කිව මැනව, මම ඊට උපායෙක් කියාලමි" කියන්නාහු "රජ්ජුරුවන් වහන්සේ දුටුවිට '**ජයතු භවං මහාරාජ**' කියා ආශිර්වාදකොට ගාථාවක් කිය මැනවැ"යි කියන්නාහු

**"වෙ මෙ ගොණා මහරාජ - යෙහි ඛෙත්තං කසාමසෙ**
**තෙසූ එකො මතො දෙව - දුතියං දෙහි ඛත්තිය"**

යන මේ ගාථාව කිව මැනවැ"යි කියා. මෙහි අභිප්‍රාය(අදහස) "මහරජ්ජුරුවන් වහන්ස, මාගේ සීසාන ගොන්නු දෙන්නෙක් ඇත්තාහ. ඉන් එක් ගොනෙක් මළ, ක්ෂත්‍රියෙශ්වර රජ්ජුරුවන් වහන්ස, අනික් ගොනෙකු දෙවා වදාළ මැනවැ"යි කියා මේ ගාථාව අවුරුද්දකින් උගන්වා අවුරුද්ද මුළුල්ලේ සුවඳ ගස් ඇත්තා වූ සුසානයෙක පිදුරු කැරලි රැසක් සේ සිටුවා "මූ රජ්ජුරුවෝය, මූ සෙනවිරද්දු ය"යි කියා මේ නියායෙන් අස්ථාන කෝල අරවා ඉක්බිති බෝධිසත්ත්වයන්ගේ පියාණෝ "පුත ගාථාව වනපොත් ව ගියේය"යි කියන්නා "යහපතැ"යි පඬුරක් ගෙන්වාගෙන පියණනුත් කැඳවාගෙන රජ්ජුරුවන් දැක සිටියාහ.

එවිට බෝධිසත්ත්වයන්ගේ පියාණෝ රජ්ජුරුවන් දැක "ජයතු භවං මහාරාජ" කියා තමන් ගෙනගිය පඬුරුත් දී රජ්ජුරුවන් දැක සිටියාහ. එවිට රජ්ජුරුවන් විසින් "සෝමදත්තයෙනි, මූ තොපගේ පියාණෝදැ"යි විචාරන්නා

"එසේය ස්වාමීනි" කී අවස්ථාවෙහි බෝධිසත්ත්වයන්ගේ පියාණෝ කියන්නාහු

**"වෙ මෙ ගොණා මහරාජ - යෙහි ඛෙත්තං කාසමසෙ**
**තෙසූ එකො මතො දෙව - දුතියං ගණ්හ ඛත්තිය"**

කී හෙයින් බෝධිසත්ත්වයන් "දෙහි" කියා උගන්වා තිබියදී "ගණ්හ" යි කියා කී හෙයින් රජ්ජුරුවෝ ගාථාව වරද්දවා කී නියාව දැන්ම සිනාසී "ඇයි සෝමදත්තයෙනි, තොපගේ ගෙයි මෙසේ ම ගොන් බොහෝදැ?"යි කියා බෝධිසත්ත්වයන් විසින් "ගොන් දුනොත් ඇත්තේ වේදැ"යි කී බසට තමන් වල්ලභව සිට තුමූ කන්නලව් නොකියා තමන්ගේ පියාණන් හා කන්නලව් කියෙව්වාට සතුටුව ගොන් දස දෙනෙකු දී බ්‍රාහ්මණයා උන් ගමත් පටුනුකොට ලියා දී යවුහ.

එවිට බෝධිසත්ත්වයන් හා පියාණෝ රථයකට නැගී යමින් සිටි බෝධිසත්ත්වයෝ කියන්නාහු "මේ කිම්ද? මුළුල්ලේ සුවඳ ගස් ඇත්තා වූ ශ්මසානයෙහිදී ගාථා වනපොත් කරවා වරදවා කියේ ඇයිදැ?"යි කීහ.

"පුත සභායෙහිදී බස් කියා යහපත අසන්නොත් ඇත. නපුරු අසන්නොත් ඇත. මා විසින් වරද්ද කියාත් මෙතෙක් දේ ලද්දෙම් වේදැ"යි කීහයි වදරා මේ 'සෝමදත්ත ජාතකය' නිමවා වදාළසේක්.

"එසමයෙහි සෝමදත්තයන්ගේ පියාණෝ නම් ලාලුදායි ස්ථවිරයෝය. පුතණුවෝ නම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 211. උච්චිට්ඨ භත්ත (භක්ත) ජාතකය

තවද සුගතේන්ද්‍ර වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ස්ත්‍රියක් නිසා උකටලී වූ භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ දුක්පත් වූ කිසිවක් නැත්තා වූ විජ්ජත් කුලයක ඉපිද සිඟා කා ජීවත් වන සමයෙහි එක්තරා බ්‍රාහ්මණයකුගේ භාර්යාව දුරාචාරව දවස් අරිනීය.

බෝධිසත්ත්වයෝත් ඒ බ්‍රාහ්මණයාගේ ගෙට සිඟා ගියහ. ඒ බ්‍රාහ්මණයා ඔබ්බේ ගමකට ගියේය. උන් යා දී ඒ බැමිණිද තමාගේ අන්‍ය වූ චෞර පුරුෂයෙකු ගෙන්වාගෙන ලෝකාස්වාදරතියෙහි යෙදී ඉක්බිති “බත් කා යව”යි බ්‍රාහ්මණයා හට කීය. ඉක්මන්ව බත් පිස චෞර පුරුෂයාට බත් ලා ඕතොමෝ මඟ බලා සිටියාහ. බෝධිසත්ත්වයෝත් “යම්තම් දෙයක් ලැබේදැ?”යි සිතා දොරකඩ සිටියාහ.

ඒ වේලාවට ගෙය ඇති බ්‍රාහ්මණයා ගෙට එන්ට වන. එවිට බැමිණී ගෙට එන්නාවුන් දැක සොර සැමියා බත් කමින් උන් තැනැත්තහු කොටුව ඇතුලේ ලුව. ගෙට ආ සැමියා බත් කන පෝරුව ඇදලා අතට පැන් දී සොර සැමියා බත්

කමින් සිටි මණ්ඩයේ ගෙයි සැමියාට උනු බත් ලා ලා අතට දී ලුව. එවිට බ්‍රාහ්මණ බතෙහි අත ඔබා "උඩ බත් උනුය, යට බත් සීතලය, බත් නිවේනම් උඩ බත් විනා යට බත් නිවෙන්ට කාරණා කිම්දැ?යි ඒ කවර කාරණ නිසාද? ඒ කාරණය මට කියව"යි කීහ. බ්‍රාහ්මණ කීපවරක් විචාරත් බ්‍රාහ්මණී "තමා කළ සොරකම සැලවෙ"යි සිතා බැණ නොනැගී සිටියාහ.

එවිට බෝධිසත්ත්වයෝ සිතන්නාහු "පළමු ආයේ සොර සැමියාය"යි සිතා "සොර සැමියා කොටුවේ උන් නියාව මා කියන්ට උවමැනවැ"යි සිතා කියන්නේ "බ්‍රාහ්මණයන් වහන්ස, නුඹවහන්සේගේ බැමිණියගේ චෞර පුරුෂයා බත් කවා කොටුවේ ඉඳුවා උන් කෑ මණ්ඩලයේ ඉඳුල් බත් නුඹවහන්සේට තිබූයේය, අපි නම් විජ්ජත් කුලයෙහි උපන් හෙයින් ඇසින් දුටු දෙයක් යාපත්වත් නපුරවත් කියම්ම. එසේ හෙයින් ඉනිබ්බෙ නපුරු නොකරණ නියායෙන් හික්මවාගත මැනවැ"යි කියා ගියහ. බමුණාත් දෙන්නාම අල්වාගෙන පාටවකොට "ඉනිබ්බෙ මෙසේ වූ දෙයක් නොකරව"යි කීවයි වදාරා මේ 'උච්චිට්ඨ භත්ත ජාතකය' නිමවා වදාළසේක. ජාතකාවසානයේදී ඒ භික්ෂූන් වහන්සේ දහසක් නයින් ප්‍රතිමණ්ඩිත වූ සෝවාන් ඵලයෙහි පිහිටිසේක.

"එසමයෙහි බ්‍රාහ්මණයා නම් මේ කියන භික්ෂූහුය. එසමයෙහි බ්‍රාහ්මණී නම් මෙසමයෙහි ස්ත්‍රීය. දුක්පත් විජ්ජත්

ව උපන්නෙමි බුදුවූ මම්ම ය''යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 212. හරු ජාතකය

තවද කරුණානිධාන වූ මාගේ ස්වාමිදරු වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කෝසල රජ්ජුරුවන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්?

සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ලාභයෙන්, යසසින් වැඩී දවසරිනසේක.

එසමයෙහි තීර්ථකයෝ ලාභසත්කාරයෙන් පිරිහී සිතන්නාහු ''ශ්‍රමණ භවත් ගෞතමයන් හා ශ්‍රාවකයන්ගේ ලාභසත්කාර මහත, අපට නැත. ලාභසත්කාර මහත් වන්නේ ජේතවනාරාමයෙහි භූමි විශේෂයනැ''යි කියා සිතාගෙන ''අපටත් එතන තීර්ථකාරාමයක් ඉදිකොටගෙන වාසය කරන්නට උවමැනවැ''යි සිතා ''රජ්ජුරුවන්ට නොකියා කළමෝ නම් භික්ෂූහු කළ නොදෙති'' සිතා ''රජ්ජුරුවන්ට අත්ලසක් දී ලබ්බවාගත තනම්හ''යි සිතා තීර්ථකයෝ එක්ව මසුරන් ලක්‍ෂයක් දී කියන්නාහු ''මහරජ්ජුරුවෙනි, ජේතවනාරාමය කෙරේ තීර්ථකාරාමයක් කරවන්නා අභිප්‍රාය ඇත්තම්හ, භික්ෂූ ඇවිත් රජ්ජුරුවන්ට කීකල රජ්ජුරුවන් ඊට අවුලක් නොකියන්නේ යහපතැ''යි කියන්නා ගිවිස්සාහ.

තීර්ථකයෝ බොහෝ වඩුවන් ඇරගෙන ජේතවනාරාමයට පිටිපස්සේ කරන බොහෝ අරගල අසා "ආනන්දය, මේ කුමන අරගලයක්දැ?"යි විචාරා එපවත් අසා "ආනන්දය, භික්ෂුසංඝයා රැස් කරව"යි කියා සංඝයා වහන්සේ රැස් කරවා "භික්ෂූනි, තොප ගොස් රජ්ජුරුවන්ට කියව"යි කියන්නා "යහපතැ"යි කියා භික්ෂූන් වහන්සේ රැස්ව රජ්ජුරුවන් කරා ගොස් රජ්ජුරුවන්ගේ වාසල සිට එපවත් කියා යවූසේක.

රජ්ජුරුවෝ තමන් කියන්ට උත්තරයක් නැති හෙයින් "ගෙයි නැතැ"යි කිවූය. භික්ෂූන් වහන්සේ විහාරයට ගොස් එපවත් සර්වඥයන් වහන්සේට සැල කළසේක. සර්වඥයන් වහන්සේ "රජ්ජුරුවෝ අත්ලස් කා මෙසේ කරති" සිතා "පසුව දවස් දෑගසව්වන් යව"යි වදාළසේක.

දෑගසව්වන් වහන්සේ දොරකඩ සිට රජ්ජුරුවන්ට කියා යවන්නා එවිට රජ්ජුරුවෝ "ගෙයි නැතැ"යි කියා යවූය.

පසුව දවස් සර්වඥයන් වහන්සේ පන්සියයක් රහතුන් වහන්සේ පිරිවරා රජගෙට වැඩිසේක. එවිට රජ්ජුරුවෝ උඩුමාලෙන් බැස සර්වඥයන් වැඳ පාත්‍රය අතටගෙන බුදුන් රජගෙට වඩාගෙන ගොස් වළඳවා අන්තයෙහි එකත්පස්ව උන්නාහ.

එවිට සර්වඥයන් වහන්සේ වදාරනසේක් "මහරජ, අත්ලස් බලයෙන් තාපසවරුන් දෙපසක් ගස්වා පෙරත් රජදරුවෝ

බොහෝ විනාසයට පැමිණියෝ වේදැ”යි වදරා ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ හිමාලය වනයෙහි තාපසව පන්සියයක් තාපසවරුන්ට නායකව වාසය කරනසේක්, වාස් කාලයෙහි ඒ ඒ තැන සැරිසරා වඩිනාසේක්, බරණැස් නුවරට වැඩ නුවර සිඟා උතුරුදිග වාසලින් පිටත්ව ඒ වාසල සමීපයෙහි නුග ගසක් මුල වාසය කරන්නාහ.

එසමයෙහි අනිකුත් පන්සියයක් තාපසවරුන් ලුණු ඇඹුල් සොයනා පිණිස බරණැස් නුවර අවුත් ඒ තාපසවරු මොත්තමක් නුවර සිඟා දකුණු වාසල සමීපයේ නුග ගසක් මුල වාසය කරන්නාහ.

මේ නියායෙන් තාපසවරු වස්සාන කාලයෙහි එහි වැස හිමාලය වනයට ගියාය. දෙවනු අවුරුදුත් එම නුවරට එන අවස්ථාවට දකුණු දෙර වාසල සිටි නුග ගස වැටින. දකුණු දෙර වාසල පළමු අවුරුද්දේ උන්නා වූ තාපසවරු තමන් උන් නුග ගස වැටුනු හෙයින් උතුරු දිග වාසල නුග ගස මුල ඉන්ට වන්නාහ.

එසමයට උතුරු වාසල නුග ගස මුල උන්නා වූ තාපසවරු ඒ නුවරට අවුත් තමන් පළමු උන් නුග ගස

කෙරේ ගියහ. මේ කියන තාපසවරුන් යන්නාට පළමු අනිත් තාපසවරු මොත්තමක් උන්නු හෙයින් “අප පළමු මුරයේ උන් නුග ගස මුල උන්නේ කවර නිසාදැ?”යි කියා උන් හා දබර කළාහ. මේ කියන තාපසවරුන් “අපි පළමුකොට උන්නමෝ, එසේ හෙයින් අපි නුග ගස මුල නාරිම්හ”යි කියා දබර කරන්ට වන්නාහ. මේ නියායෙන් දෙපක්ෂ ඇත්තෝම දබරකොට එපවත් රජ්ජුරුවන්ට කීහ.

රජ්ජුරුවෝ එපවත් අසා “පළමුකොට උන් තාපසවරුන්ටමය”යි කීහ. එබස් අසා අනික් තාපසවරු මොත්තම ඉර්ඬියෙන් පළමු චක්‍රවර්ති රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කළා වූ රණ මැදිරියෙක් රජ්ජුරුවන්ට අත්ලස්කොට දී “රජ්ජුරුවෙනි, අපගේ වාසස්ථානය අපට සලස්ව”යි කීහ. ඊටත් රජ්ජුරුවෝ ගිවිස්සාහ. එවිට තාපසවරු උනුන් ලා බොහෝ අඬදබරකොට අන්තයෙහි සිතන්නාහු “අපි ගිහිගෙය හැර මහණ වූවන් විසින් කළ සේ නපුරැ”යි සිතා එතනින් වහා හිමාලය වනයට ගියහ.

දේවතාවෝ “මෙතෙක් තාපසවරුන්ට උක්කොටනා කළෝ මේ රජ්ජුරුවෝ වේදැ? මේ රජ්ජුරුවන්ගේ නුවර නසම්ව”යි සිතා මහමුහුද අල්ලා මහත් වූ වතුරක් එවා ඒ තුන්සියයක් යොදුන් නුවර ගසා නැසුහයි වදුරා “රජ්ජුරුවෙනි, එක රජ්ජුරුවන් කළා වූ අධර්ම නිසා නැතක් මනුෂ්‍යයෝ නසින ලද්දැහුය. එසේ හෙයින් ඡන්දදී වශයෙන් අගතියට යාම යහපත් නොවෙ”යි කියා රජ්ජුරුවන්ට සර්වඥයන් වහන්සේ

අවවාද වදරා 'හරු ජාතකය' නිමවා වදාළසේක. කෝසල රජ්ජුරුවෝ මේ ධර්මදේශනාව අසා තීර්ථකයන්ගේ ආරාම බිඳුවා අලන.

"එසමයෙහි ගණශාස්තෘව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

## 213. පුණ්ණනදී ජාතකය

තවද මාගේ චිත්තමාණික්‍ය වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ප්‍රඥාපාරමිතාව අරභයා මේ ජාතකය දක්වන ලදි.

එක් දවසක් ධර්මසභා මණ්ඩපයෙහි රැස් වූ මාළුවරුන් වහන්සේ "ඇවැත්නි, සර්වඥයන් වහන්සේ මහපඤ්ඤෙ, මහත් වූ අර්ථ, ධර්ම, නිරුක්ති, ප්‍රතිභානාදි මහත් වූ ප්‍රඥාවෙන් යුක්තසේක. පුථුපඤ්ඤෙ ආකාශය සේ පෘථුල වූ ප්‍රඥාවෙන් යුක්තසේක. හාසුපඤ්ඤෙ, හාසු බහුල වූ, තුෂ්ටි බහුල වූ, ප්‍රමොද්‍ය ප්‍රඥා බහුල වූ ප්‍රඥාවෙන් යුක්තසේක. ජවනපඤ්ඤෙ, ජවන හංසගතියක් පරිද්දෙන් ශීඝ්‍ර වූ පරිද්දෙන් පවත්නා ප්‍රඥාවෙන් යුක්තසේක. තික්ඛපඤ්ඤෙ, සියුම් වූ ප්‍රඥාවෙන් යුක්තසේක. නිබ්බෙධික පඤ්ඤෙ, විනිවිද පවත්නා වූ ප්‍රඥාවෙන් යුක්තසේක. උපාය කුසලො, ඒ ඒ කටයුත්තෙහි උපාය කෞශල්‍ය ඥානයන් ඇති සේකැ"යි යනාදීන් ප්‍රඥා පාරමිතාව වර්ණනාකොට වැඩ උන්තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම්

කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා එපවත් අසා "දැන් සර්‍වඥපදප්‍රාප්ත ව ඉන්දදී නුවණ විශේෂ වර්‍ණනා කරන්නේ කිම්ද? පෙරත් බෝධිසත්ත්‍වයෝ නුවණින් අග්‍රප්‍රාප්තයෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රාහ්මණයාට පුත්‍ව ඉපිද වැඩිවිය පැමිණ දිසාපාමොක් ආචාර්‍ය්‍ය සමීපයට ගොස් සියළු ශාස්ත්‍ර ඉගෙණගෙන අවුත් පියාණන්ගේ ඇවෑමෙන් පුරෝහිත ධුරයට පැමිණ රජ්ජුරුවන්ට සේවය කරන්නාහ.

රජ්ජුරුවෝ දුර්ජනයන්ගේ බසින් බෝධිසත්ත්‍වයන් තමන් ඉන්නා නුවරින් නෙරපුවාහ. බෝධිසත්ත්‍වයෝ තමන්ගේ අඹුදරුවන් ඇරගෙන ගොසින් පිටිසර කසීගමෙක වාසය කරන්නාහ. රජ්ජුරුවෝත් කල්යාමකින් බෝධිසත්ත්‍වයන්ගේ ගුණ සිහිකොට "දුර්ජනයන්ගේ බස් නිසා නුවරින් නෙරපීමි, උන් මා ගෙන්වා ගන්ට උවමැනවැ"යි සිතා "මිනිසෙකු අත කැන්ද යවීම් නම් ඒ තරම් නොවෙයි, එසේ හෙයින් ප්‍රශ්නක් යවා ඒ ප්‍රශ්නයෙන්ම ගෙන්වා ගනිමි" සිතා මේ ජාතකයෙහි පළමුවෙනි ගාථාව බැඳ යවූහ.

ඒ කෙසේද යත්?

**පුණ්ණං නදිං යෙනච පෙය්‍යමාහු - ජාතා යවං යෙනච ගුය්හමාහු**

**දූරං ගතං යෙනච අව්හයන්ති - සොත්‍යාගතො හන්දච භුඤ්ජ බ්‍රාහ්මණා.**

කියන ගාථාව යවූහ. මේ කියන ගාථාව හා කවිඩුමස් තමන්ගේ අත පේරැස් මුද්දෙන් අස් ඔබ්බවා රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන්ට යවූහ. මෙහි අභිප්‍රාය නම් “එක පැතිර යන්නා වූ මහවතුරෙහි පැන් බොන්නෝ කවුරුද? ගොයම් කුඹුරු ආදී වූ දෙයෙහි සැඟවී ඉන්නෝ කවුරුද? දුර ගියා වූ මනුෂ්‍යයන් එන නියාව කියන්නෝ කවුරුද? බ්‍රාහ්මණයා මේ අභිප්‍රාය හා මේ කියන මස් දනුව”යි කීහ.

බෝධිසත්ත්වයෝ කියා යවූ ප්‍රශ්නය විසඳා වැසිවතුර දියෙහි පැන් බොන්නාහුත් කව්ඩෝය. ගොයම් ආදී දෙයෙහිත් ඉන්නෝත් කව්ඩුවෝය. දුර ගියා වූ මනුෂ්‍යයන් එන නියාව කියන්නෝත් කව්ඩෝය. එසේ හෙයින් මේ කවුඩුමස් නියාය, නැවත ඒ ප්‍රශ්නය විසඳා බලන්නාහු “රජ්ජුරුවන් වහන්සේ විසින් වැසි වතුර හා ගොයම් කුඹුරු ආදී වූ දෙයෙහිත් සමුර්ධව ඒ ඒ තෙනට ගියා වූ මනුෂ්‍යයෝ නුවරට රැස් වුව, එසේ හෙයින් බ්‍රාහ්මණය, තොසින් නුවරට එව”යි කියා සිතා කවුඩුමස් එව්වාට සතුටුව “ස්වාමීනි මා කෙරේ කරුණා ඇති සේකැ”යි සිතා ගාථාව කියන්නාහු,

**යතො මං සංරතී රාජා - වායසම්පි පහෙතවෙ**

**හංසං කොඤ්චා මයූරාච - අසතියෙව පාපියා යි.**

කියා ගාථාව යවූහ. එහි අභිප්‍රාය "දේවයන් වහන්ස, මා කෙරේ කරුණාව ඇති නියාව දනිමි. කවුඩුමස් එවූ ගමනින්ම අනික් හංස, කොස්ලිහිණි, මයුරයන් ආදී වූ පක්ෂීන්ගේ මිහිරි මාංශය ලත් කලක් මා සිතා වදරන්නේ ඇත්තේ වේදැ"යි කියා මනා වූ රථයට නැගී නුවරට වන්නාහ. රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන් දැක සතුටුව පෙර පරිද්දෙන්ම පුරෝහිත ස්ථානාන්තර දී රක්නාහයි වදරා මේ 'පුණ්ණනදී ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි බ්‍රාහ්මණ ව උපන්නෙමි බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 214. කච්ඡප ජාතකය

තවද මාගේ කල්පද්‍රැම වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කෝකාලික ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

මෙහි වර්ථමාන කථාව තක්කරි ජාතකයෙහි විස්තර වශයෙන් පෙනෙන්නේය. මෙහි "මහණෙනි, කෝකාලික ස්ථවිරයෝ වස්තු රැක්ක නොහී බොහෝ විනාශයට පැමිණියෝ වේදැ"යි වදරා ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ ඒ රජ්ජුරුවන්ට අමාත්‍යව දවස් අරිනාහ.

එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ බහුභාණීව ඉන්නාහ. බෝධිසත්ත්වයෝ "මේ රජ්ජුරුවන්ගේ බොහෝකොට දෙඩීම කවර ද අරවා පියම්දෝ හෝ"යි සිත සිතා ඉඳිනාහ.

ඒ අවධියට එක් හංසයෝ දෙන්නෙක් ඉදිබුවෙකු හා හාදව ඉඳිනාහු "ඉදුබාණෙනි, අප හිමාලය වනයෙහි රන් ගුහායෙහි වාසය කරම්හ, එතන ඉතා සිත්කළුය, එතන දකින්ට එව්දැ?"යි කීහ. එවිට ඉදුබා කියන්නේ "තොපි නම් පියඅඹා යයි, මා කෙසේ යෙම්දැ?"යි කිව. එපවත් අසා හංසයෝ කියන්නාහු "තොපගේ කට රැකගත එවූ නම් ගෙන යෙම්මය"යි කියා ලීයක් කඩාගෙන දෙන්න දෙකෙළවර ඩැගෙන ඉදුබුවා ලීය මැද්දෙන් ඩැගන්නා ලෙස සලස්වා පියඅඹා ගෙන නික්මෙන්නට වන්නාහ.

ඒ වේලාවට කුඩා කොල්ලෝ මොත්තමෙක් ඒ හංසයන් දෙන්නා අල්වාගෙන යන ඉදුබා දැක "එම්බල, හංසයෝ දෙන්නෙක් ඉදුබුවෙකු ඩැගෙන ආකාශයෙන් යන්නාහ"යි අඬගා කීහ. ඒ ඉදිබු ඒ අසා "අපගේ යාළුවෝ අප කෙසේ ගෙනයෙත්වයි, තොපට මේ දෙකම ඇයිදැ"යි සිතා කියන්ට කට දල්වන දැතුරේ බරණැස් නුවර වීථිය සමීපයට ආ අවස්ථාවට ඉදිබු කට දල්වා බිම වැටී දෙකැබැල්ලක්ට පැලී

මළහ. නුවරවාසී "ඉබ්බෙක් ආකාශයෙන් වැටී මළෝය"යි එකකෝලාහල කොළෝය.

රජ්ජුරුවෝ එපවත් අසා බෝධිසත්ත්වයන් ඇතුළු වූ අමාත්‍ය මණ්ඩලයා පිරිවරා එතනට ගොස් බෝධිසත්ත්වයන් අතින් "හංසයන් දෙන්නෙකු ඩැගෙන යමින් සිටියදී හුනුයේ කුමන කාරණයකින්දැ?"යි විචාළහ.

බෝධිසත්ත්වයෝ එවිට සිතන්නාහු "හංසයන් දෙන්න ඩැගෙන යමින් සිටියදී යම් කෙනෙකුන් කී බසක් නිසා උන්ට ප්‍රතිවචන කියන්ට සිතා කට දල්වා උනුව"යි සිතා "රජ්ජුරුවන්ගේ බොහෝකොට බස් කීම් අරවන්ට මට උපායෙක් සම්භවිය"යි සිතා කියන්නාහු "දේවයන් වහන්ස, මේ ඉදිබු තමාගේ වචනය රැකගත නෙහී බස් කියා මේ අස්ථානයේ වැටින. එසේම ජනෝත්තම වූ රජ්ජුරුවන් වහන්ස, යම් කෙනෙක් වාචාල බස් බිනූ නම් උන්ටත් මෙසේම විනාශයට පැමිණෙන්නේ වේදැ"යි කීහ.

එබස් රජ්ජුරුවෝ "මේ කීයේ මටදැ?"යි කීහ. "දේවයන් වහන්ස, නුඹවහන්සේටත් සරිය"යි කීහ. එතැන් පටන් රජ්ජුරුවෝ වාචාලකම් හළහයි වදරා මේ 'කච්ඡප ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි හංසයෝ දෙන්න නම් දැගසව්වෝය. ඉදුබා නම් කෝකාලික ස්ථවිරයෝය. රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. අමාත්‍යයව උපන්නෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 215. මච්ඡ (ක) ජාතකය

තවද කරුණානාථ වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි උකටලී වූ භික්ෂූන් කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්?

එක් උකටලී භික්ෂු කෙනෙකුන් වහන්සේ දැක "මහණ, තා ශාසනයෙහි උකටලී වූයේ සැබෑදැ?"යි විචාරා "එසේය ස්වාමීනි" කී කල්හි පළමුත් "මහණ, තෝ මේ ස්ත්‍රිය නිසා තොපට පැමිණි වධ නොදැන අසුවූයේ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ට පුරෝහිත තනතුරෙහි සිටිනාසේක.

එසමයෙහි එක් දවසක් කෙවුලෝ(ධීවරයෝ) දැල් දමා මත්ස්‍යයෙකු බඳගෙන "හුනුවැල්ලේ ලා මේ කියන මත්ස්‍යයා පුළුස්සා කම්මැ"යි ගිනි මොලවා උල් සසිමින් සිටියාහ. එවිට මත්ස්‍යයාගේ මත්ස්‍ය ධේනුව කුමක් සිතාදෝ අඬන්නෝ "මා මේ උනුවැල්ලේ ලාපු දුක්ඛයට සසිනා උල් ආදී වූ ගිනි මොලවා කරන දුක්ඛය සියල්ලම මට දුක් නොවෙයි සිතන්නේය. මාගේ මත්ස්‍ය ධේනුව 'අනික් මසින්නකලා කැටිව

එක්ව ගිය'යි සිතා විකෙෂ්ප වේදෝ?යි සිතා කියන සෝකය මට සෝක යයි සිතා එසේ විසින් මැරිය නොදි යම් පුරුෂයෙක් ඇත්නම් මා දුකින් ගලව''යි කියා මහහඬින් හැඬූය.

ඒ වේලාවට බෝධිසත්ත්වයෝ "නාන්නට ය''යි කියා ගඟ අසලට ගියාහු මත්ස්‍යයාගේ අඬ අසා කෙවුලන්ට කියා ඇරගෙන මත්ස්‍යය ගඟට හලහයි වදාරා මේ 'මත්ස්‍ය ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි ඒ මසින්න හා මත්ස්‍යයා නම් උකටලී වූ භික්ෂූ හා පුරාණ දුතියිකාය. බ්‍රහ්මණව උපන්නෙම් බුදුවූ මම්ම ය''යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 216. සෙග්ගු ජාතකය

තවද මාගේ ස්වාමිදරු වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පණ්ණක නම් උපාසකයකු අරහයා මේ ජාතකය දක්වන ලදි.

මෙහි වර්ථතමාන කථාව එකාදස නිපාතයෙහි වූ පණ්ඩිත ජාතකයෙහි විස්තර වශයෙන් බස්නේය. මෙහි පණ්ණක නම් උපාසකයෝ කීප දවසක් බුදුන් කරා ගොස් ටික දිනක් නැවතී හිඳ බුදුන් දකින්ට ගියහ.

ස්වාමීන් "ඇයි තා මෙතෙක් ද පමා වූයේ ඇයිදැ?''යි විචාළසේක. "ස්වාමීනි, මාගේ දුව විමසා නිදෙස් නියාව දැන ඔබ්බකට විවාහ මඟුල් කරවා මඟුල් කෙරෙමි. ඒ නිසා පමා

වීමි” කීහ. සර්වඥයෝත් “තොප පළමුත් නිද්දේෂ තැනැත්තිය විමසුයේ වේදැ”යි වදරා “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ වෘක්ෂදේවතා ව ඉපිද වනයේ වාසය කරනසේක.

එක්තරා කෙළඹිපුත්‍රයෙක් තමාගේ දුව විශිෂ්ට වූ රූ ඇති සඳහාත්, හාව භාව ලීලා කටාක්ෂයෙන් තමාට සැක උපන් හෙයින් “මේ කන්‍යා ස්ත්‍රිය නොවේදෝ හෝයි පරීක්ෂා කරන්නට උවමැනව”යි සිතා දුව අත අල්වාගෙන වනාන්තරයට ගොස් කෙලෙස් වසඟව අත ඇල්ලුවා සේ ඇඟවීය. එවිට දූ හයින්ම අඬන්නට වන. එවිට පියා “මේ වඤ්චාවෙන් අඬති” සිතා “කුමක්ද? පඤ්චකාම විෂය නම් කාටත් සරිය, එසේ හෙයින් තොපි කන්‍යා ස්ත්‍රිය නොවූ නම් අඬන්නේ ඇයිදැ?”යි කීහ.

එබස් අසා “පියාණන් වහන්ස, මම එසේ වූ පඤ්චකාම රස විඳිනා සැටියක අනභ්‍යාසයෙමි. අඬන්නී මම දුක්බයක් පැමිණි වේලේ ප්‍රතිෂ්ඨාව සිටිනා වූ දෙමව්පියන් විසින් පැමිණි දුක්බය කාට කියම්ද?” කියා ඇඬුහ. එවිට පියාත් තමාගේ දුව නිද්දේෂ නියාව දැන, ඒ නියාවට සුදුසු මඟුල්කොට ඔබ්බේ සරණපාවා දුන්නාහයි වදරා මේ ‘සෙග්ගු ජාතකය’ නිමවා වදාළසේක.

"එසමයෙහි ඒ දූ නම් මේ දූමය. කෙළෙඹිපුත්‍රයා නම් පණ්ණක නම් උපාසකය. වෘක්‍ෂදේවතාව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 217. ව්තීය කූටවාණිජ ජාතකය

තවද මුළුලොවට ගුරු වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි සොර වෙළඳම් දන්නා උපාසකයෙකු අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්?

සැවැත් නුවර වාසය කරන්නා වූ පණ්ඩිත වෙළඳය, සොර වෙළඳයයි ව්‍යාපාරයෝ දෙදෙනෙක් පන්සියයක් ගැල් වලින් බඩු පුරෝගෙන නැගෙන ඉරට, බස්නා ඉරට වෙළඳමට ගොස් වෙළඳම්කොට දෙවැනිව සැවැත් නුවරට අවුත් වෙළඳම්කොට ගෙන ආ බඩු සරියේ බෙදා ගණිම්හයි කියා එවිට සොර වෙළඳ සිතන්නේ "මෙතෙක් ද කටුක ආහාර කෑමෙන් දුක්බ වූ සයන ආදී වූ දෙයෙහි සැතපී රෑපාන නිදිමරා බොහෝ දුක් විඳිනා ලද, එසේ හෙයින් මිහිරි වූ භෝජනය කා යහපත් වූ යහන්වල සැතපුනු කලට අජීර්ණ වූ ආහාරය හෙයින් දිරවාගත නොහී මියන්නේය. මූ මළ කල මුගේ සම්පත් ඇර ගනිමි" සිතා දවස් පසු කරන්නට වන. එපවත් පණ්ඩිත වෙළඳ දැන දසවිටක සංකොට බඩු සරියේ බෙදගත. පසුව දවස් ගඳදුම් මල් පහන් ගත් අත් ඇතිව බුදුන් දකින්ට ගියේය.

එවිට සර්‍වඥයෝ "ඇයිද උපාසකය, කවරද ඇයිදැ?"යි විචාරා "ස්වාමීනි, මා ආයේ පසළොස් දවසකට අදතැ"යි කියන්නා "උපාසකය, මෙතෙක් දවස් කල බුද්ධොපස්ථානයට නායේ ඇයිදැ?"යි විචාරා එපවත් අසා "එකියන ව්‍යාපාර පළමුත් වඤ්චාප්‍රයෝගය දන්නෝ වේදැ"යි වදාරා ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ රජ්පුරුවන්ගේ අධිකරණ නායක අමාත්‍ය ව උපන්සේක.

එසමයෙහි පිටිසර ගමක වාසය කරන්නා වූ එක් ව්‍යාපාරයෙක් බරණැස් නුවර වසන්නා වූ සොර වෙළඳාම් කරන ව්‍යාපාරයෙක් ඇත. උග ලගට අවුත් යපළු පන්සියයක් තිබෙන ලෙස කියා පාවාදී ගියේය. ඒ ව්‍යාපාරයත් තමා අභිප්‍රාය නියාවට වියදම්කොට මීයන්ගේ මී බෙටි යපළු තිබූ ගෙයි විසුරුවාලීය.

කල්යාමකින් පිටිසර වෙළඳ බරණැස් නුවර වෙළඳ සමීපයට අවුත් "මා තොපට තබන්ට දුන් යපළු පන්සියය දෙව"යි කීහ. එකියන වෙළඳ කියන්නේ "යපළු පන්සියය මීයෝ කාපුය"යි කියා මී බෙටි ගෙනුවත් පෑය.

එවිට පිටිසර වෙළඳ අසා "එසේද, මීයෝ යපළු කැවුදැ?"යි කියා කිසි දෙයකුත් නොකියා බරණැස් නුවර

වෙළඳ හා කැටිව ප්‍රිය කථාකොට ඌගේ පුතා කැඳවාගෙන "ජලස්නානයට යෙමි" ඇරගෙන ගොස් අනික් ගෙයක සඟවා තබා තුමූ ඉස සෝධා නහා ගෙට ගියේය.

එවිට බරණැස් නුවර ව්‍යාපාරිකයා පිටිසර වෙළඳ අතින් "තොප හා කැටිව නාන්නට ගිය මාගේ පුතා කොයිදැ?"යි විචාළේය. එවිට කියන්නේ "තොපගේ පුතා ගොඩ සිටුවා ලා මා නාන්ට බට දී උන් උකුස්සෙක් ගසාගෙන ගියේය. මමත් අත්පිඩි ගා බොහෝ උත්සහාකොට එලවාගත නුහුනුයෙමි" කීහ.

එවිට බරණැස් නුවර වෙළඳු කියන්නේ "උකුස්සෝ කුඩා කොල්ලන් ගසාගෙන යෙද්දැ?"යි කීහ. එවිට පිටිසර වෙළඳ කියන්නේ "ඒ කීයෙත් කාරණමය. මම කුමක් කෙරෙම්දැ?"යි කීහ. එවිට බරණැස් නුවර වෙළඳ කියන්නේ "තෝ මාගේ දරුවන් කොයිබ දේ සඟවාපිය අවුත් උකුස්සා ගසාගෙන කීයේ යයි බොරු කියාදැ?"යි කියා "අධිකරණ නායකන්ට කියම්හ"යි කියා වෙළඳ බෝධිසත්ත්වයන්ට කියන්නේ "ස්වාමීනි, මේ කියන ව්‍යාපාර, මාගේ පුතා නාන්නටයි තමා කැටිව කැන්දගෙන ගොස් මේ කොයිබ දේ සඟවාපියා උකුස්සා ගෙන ගියයි කියයි, මේ යුක්තිය නුඹවහන්සේ මැදහත්ව විචාළ මැනව"යි කීහ.

එබස් අසා බෝධිසත්ත්වයෝ පිටිසර වෙළඳ අතින් "මූ කියන්නේ ඇත්තදැ?"යි විචාළාහ. "එකියන ව්‍යාපාර කියන්නේ ඇත්තමය, මා කියන්නකුත් අසන්නේ යහපතැ"යි කියා

"ස්වාමීනි, මා ගෙන තිබූ යපළු පන්සියය මීයන් කෑ කල කුඩා කොල්ලා උකුස්සා ගසාගෙන යෑම අරුමකින්ද? මාගේ යපළු පන්සියය මියන් කෑ කල නියාව සැබෑව, බොරුව මටත් විචාර කිව මැනව"යි කීය. එබස් අසා බෝධිසත්ත්වයෝ "එසේ විනම් මූ කළා වූ වඤ්චාවට ප්‍රතිවඤ්චාවක් කළ නියාව යහපතැ"යි කියා උදන් අනන්නා වූ "ඒ එසේමය. මීයන් යපළු කෑ කල උකුස්සා කුඩා කොල්ලා ගසාගෙන යාම අපූර්‍ව කිම්දැ?"යි "එසේ හෙයින් තා කළ වඤ්චාවට ප්‍රතිවඤ්චා කළ නියාව යහපතැ"යි කියා නැවත කියන්නාහු "තොප මුන් ගෙන තිබූ යපළු පන්සියය දී පියන්නා තොපගේ පුතා මූ පාවා දෙති" කියන්නා එවිට "යහපතැ"යි කියා "මම යපළු පනසියය දෙමි. මාගේ පුතා පාවා දෙව"යි කියා ඒ නියාවට උන්ගේ යපළු පන්සියය උන්ට පාවා දී උන්ගේ පුතා උන්ට පාවා දුන්නැයි වදරා මේ 'කූටවාණිජ ජාතකය' නිවමා වදාළසේක.

"එසමයෙහි සොර වෙළඳ නම් දැන් සොර වෙළඳමය. එසමයෙහි පණ්ඩිත වෙළඳ නම් දැන් පණ්ඩිත වෙළඳමය. එසමයෙහි අධිකරණ නායකව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 218. ගරහිත ජාතකය

තවද මුළු ලොවට මව් වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පඤ්ච කාමයෙහි

ඇලීමෙන් උකටලී භික්ෂු කෙනෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්?

එසමයෙහි එක්තරා භික්ෂු කෙනෙකුන් වහන්සේ පංචස්කන්ධව කාමයෙහි ඇල්ම ඇතිව වාසය කරනසේක. එපවත් භික්ෂූන් වහන්සේ දැන සර්වඥයන් වහන්සේට ගොසින් දැන්වූසේක. සර්වඥයන් වහන්සේ "සැබෑද? මහණ, තා ශාසනයෙහි උකටලී වූය"යි විචාරා වදාරන්නා "සැබැව ස්වාමීනි" කියන්නා "කුමක් නිසාදැ?"යි විචාරා "ස්වාමීනි, පඤ්චස්කන්ධ කාමයෙහි ඇල්ම ඇත්තෙමි" ඒ නිසා කියන්නා "මහණ, පළමුත් තිරිසන්නු පවා පඤ්චස්කන්ධ කාමයට නින්දා කළෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ වඳුරු ව උපන්සේක.

වඳුරු ව උපන් ගමනේ බෝධිසත්ත්වයන් වහන්සේ එක් වැද්දෙක් වඩාගෙන ගොස් බරණැස් නුවර රජ්ජුරුවන් වහන්සේට දින. රජ්ජුරුවෝත් බෝධිසත්ත්වයන් වහන්සේ ක්‍රීඩාචාරකොට සලස්වා ගත්තාහ. බෝධිසත්ත්වයන් වහන්සේ

මනුෂ්‍යයන්ගේ සත්ගුණය ඉගෙනගෙන ව්‍යවස්ථිතව වාසය කරන්නාහ.

රජ්ජුරුවෝත් වානරයාගේ ව්‍යාවස්ථිත කම් දැන බෝධිසත්ත්වයන් අල්වා ගෙනා වැද්දාවූට කියන්නා "වඳුරා ගෙනගොස් මේ වඳුරා ඇල්ලූ වනයෙහිම ලා පියව"යි කියා යවූහ. එකියන වැදිත් කී ලෙසම හිමාලය වනයට ගෙනගොස් අළහ.

බොහෝ වඳුරෝ බෝධිසත්ත්වයන් අළ පවත් අසා ගලතලයක් පිටට එක්ව බෝධිසත්ත්වයන් හා කථා කරන්නාහු "ඇයි කිමෙක්ද? මෙතෙක් දවස් කොයි ගියේදැ?යි විචාළහ.

බෝධිසත්වයෝ කියන්නාහු "එක් වැද්දෙක් මා අල්වා ගෙනගොස් බරණැස් රජ්ජුරුවන්ට පෑය. රජ්ජුරුවෝත් මාගේ ගුණ ක්‍රියාව දැක මා මෙතනට අරවාපූව"යි කීහ. වානරයෝ එපවත් අසා විචාරන්නාහු "මනුෂ්‍යයන්ගේ ක්‍රියාව කිමෙක්දැ?"යි විචාළාහ.

බෝධිසත්ත්වයෝ කියන්නාහු "මා කියන්නේ කිම්දැ?"යි කීප වරක් කීවත් දෙවෙනිව තුන්වෙනිවත් විචාරන්නා බෝධිසත්ත්වයෝ කියන්නාහු "මනුෂ්‍යයන්ගේ අනිත්‍යය, දුක්ඛය, අනාත්ම යයි කියන තිලකුණු නොදැන මමය යන ග්‍රහණින් දවස් අරනාහු, මේ මාගේ රත්රන්, අමුරන්, මේ මාගේ අඹුදරුවෝ ආදී දෙයයි කියා ඇල්මකොට දවසරිනාහ. දැළිරැවුළු ඇති සත්ත්වයන් පුරුෂයනැයි කියාත්, තන හා කන් විදීම් හා මේවර ආදී වූ දෙය ලා ඉන්නාවුන් ස්ත්‍රියනැයි

කියාත්, මෙසේ දෙපක්‍ෂයක් ඇතිව උනුන්ට විවාහ මගුල් ආදී වූ දෙයකොට ස්ත්‍රී පුරුෂයන් එක ගෙයි වාසයකොට ස්ත්‍රියගේ ආධිපත්‍යය ඇතිව දවස් අරනාහ"යි සත් වූ පරිද්දෙන් බෝධිසත්ත්‍වයෝ කීහ.

එබස් අසා වානරයෝ අසා "නෑසිය යුත්තක් ඇසුම්හ. නොකියව මැනව, නොකියව මැනව"යි කියා දෙකන කන අත් වසාගෙන නෑසිය යුතු බස් ඇසූ ගල්පොත්ත ස්ථානයට ගර්හිත ශෛලයයි නම් තබා ඒ වනයේ නොසිඳ අනික් වනයකට ගියහයි වදාරා මේ 'ගරහිත ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි වානරාධිපති ව වඳුරු ව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 219. ධර්‍මධ්වජ ජාතකය

තවද මුළු ලොවට ප්‍රිය වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි "දේවදත්ත ස්ථවිරයන් සර්‍වඥයන් වහන්සේට වධයට උත්සාහ කෙරෙති" යන මේ කථාව කිය කියා උන්කලට සර්‍වඥයන් වහන්සේ එතනට වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා එපවත් අසා "මහණෙනි, දැන්මතු නොවෙයි, දේවදත්ත ස්ථවිරයෝ පළමුත් මට වධයට උත්සාහකොටත් භයක් චකිතයක් පමණකුත් උගුළුවාගත

නුහුණුවෝ වේදැ”යි වදරා “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි ඒ රජ්පුරුවන්ගේ කාල නම් සෙනවිරත් කෙනෙක් ඇත්තාහ. ඡත්තපාණී නම් මගුල් කපුවෙකුත් ඇත්තාහ. පුරනලද පාරමිතා ඇති බෝධිසත්ත්‍වයෝ ඒ රජ්පුරුවන්ට පුරෝහිත තනතුරෙහි සිටිනාහ, නමින් ධර්‍මධ්වජ පණ්ඩිතයහ.

එසමයෙහි කාල නම් සෙනවිරද්දු අධිකරණ විචාරන්නහු අත්ලස් කා හිමියන් අහිමියන්කොට අයුක්ති කරන්නාහ.

එසමයෙහි එක් බලි අයුක්තියක් විඳගත්තා වූ පුරුෂයෝ අධිකරණයෙන් පැරද ඉස තිබූ අතින් මොර ගහගෙන යන්නාහු රාජසේවයට එන්නා වූ බෝධිසත්ත්‍වයන් පස කඩාගනහී අඬාගෙන “ඇයි ස්වාමීනි, කාල නම් සෙනවිරදුන් වහන්සේ යුක්ති අයුක්තිකොට අත්ලස් කා බොහෝ අනර්ථ කරනසේක. නුඹවහන්සේ වැනි ධර්මිෂ්ඨ අමාත්‍යයෙක් ඇතිව ඉන්දදී අපගේ අන්‍යය විභාග කල නපුරුදැ?”යි කීහ.

බෝධිසත්ත්‍වයෝ එපවත් අසා කරුණා පුරස්සරව සිතින් “යාපත විචාරමි” කියා “මා හා කැටිව එව”යි කියා කැඳවාගෙන අධිකරණ ශාලාවට ගොස් යුක්තිය වූ පරිද්දෙන්ම විචාරා හිමියන්ට හිමි කළහ. ඒ යුක්තිය

දැහැමෙන් සෙමෙන් විචාළ නියාව දැනගත් මනුෂ්‍යයෝ බොහෝ සාධුකාර දී "යහපත යුක්තිය විචාළ නියාව"යි ඝෝෂා කළාහ.

රජ්ජුරුවෝ එපවත් අසා "කුමන ඝෝෂායෙක්දැ?"යි විචාළාහ. සිටි අමාත්‍යයන් විසින් කාල නම් සෙනවිරදුන් විසින් වරද්ද කී යුක්තියක් ධර්මධ්වජ පණ්ඩිතයෝ මැදහත්ව විචාළාහ. ඊට බොහෝ දෙනා විසින් කරනලද සාධුකාර ශබ්දය"යි කීහ.

එපවත් රජ්ජුරුවෝ අසා බෝධිසත්ත්වයන් ලඟට කැඳවා "ආචාර්යනි, යුක්තියක් යහපත්ව ඇසුනැයි යන්නා ඇසුම්හයි, සැබෑදැ?"යි විචාරා "එසේය ස්වාමීනි" කී කල්හි එවිට රජ්ජුරුවෝ කියන්නාහු "ආචාර්යනි, අදවක් පටන් තෙපිම අධිකරණයේ ඉඳ යුක්ති විචාරව"යි කීහ. බෝධිසත්ත්වයෝත් නොගිවිස්සාහ. රජ්ජුරුවෝ ඊ ඊ පිටම "අධිකරණ විචාරව"යි කී විසින් "යහපතැ"යි ගිවිස එතැන් පටන් හිමියන් හිමිකොට අහිමියන් අහිමිකොට මැදහත්ව යුක්ති විචාරන්නාහ. බෝධිසත්ත්වයෝත් යුක්ති විචාරන්නාට වන් පසු කාල නම් සෙනවිරදුන් කන අත්ලස් නැතිව ගියේය. ඊට කාංසිව සිතන්නාහු "යම් සේ මුන් රජ්ජුරුවන් කෙරේ බිඳුවා මරවා පියන්ට උවමැනවැ"යි සිතා රජ්ජුරුවන් කරා ගොස් කියන්නාහු "රජ්ජුරුවන් වහන්ස, ධර්මධ්වජ පණ්ඩිතයෝ නුඹවහන්සේගේ රාජ්‍යය ප්‍රාර්ථනා කෙරෙති" කීහ. "ආචාර්යනි, මට එසේ නොසිතෙ"යි නොගිවිස්සාහ. "ඉදින් දේවයන් වහන්ස, මා කීවා නොගිවිස්නා සේක් වීනම් සෙට රාජසේවයට

එන වේලාවට සිව්මුදුරු කවුළුවෙන් බලා වැඩ සිටිනා උන් එන්නා වූ ප්‍රතාප දැක මා කී බස් අදහාගත මැනවැ"යි කීහ.

රජ්ජුරුවෝත් දෙවැනි දවස් කී ලෙසම සිව්මැදුරු කවුළුවෙන් බලා සිටියාහ. බෝධිසත්ත්වයන් එන වේලාවට බොහෝ දෙන තමන්ගේ යුක්තිය අයුක්තිය කියන නිසා බොහෝ දෙනා වටකොට ගත්හ. රජ්ජුරුවෝත් මහත් වූ පිරිවර ඇතිව එන්නා වූ බෝධිසත්ත්වයන් දැක "කාල නම් සෙනවිරදුන් කීවේ ඇත්තය"යි අදහාගෙන කාල නම් සෙනවිරදුන්ට කියන්නාහු "මෙවිට කුමක් කරමෝදැ?"යි කීහ. එවිට කාල නම් සෙනවිරද්දු කියන්නේ "මරවා දම්මවාපිය මෝය"යි කීහ.

රජ්ජුරුවෝත් කියන්නාහු "වැරැද්දක් පමුණුවා මිස මරන්ට බැරිය"යි කීහ. එබස් අසා සෙනවිරද්දු කියන්නාහු "ඊට උපායෙක් ඇත. උන් විසින් කොටගත නොහැක්කා වූ මෙහෙයක් කියා, ඒ මෙහෙය කොටගත නුහුනු කල මරවා පියම්හ"යි කීහ. එවිට රජ්ජුරුවන් "කුමක් සෙවූ මෙහෙයක් කියමෝදැ?"යි විචාරන්නා "දේවයන් වහන්ස, උයනක් කරන කල තුන් සතර අවුරුද්දකින් මිසක් මවාගත නොහැක්කය. එසේ වූවා මරවා දමන්නේ යහපතැ"යි කීහ.

එබස් රජ්ජුරුවෝ අසා බෝධිසත්ත්වයන් කැඳවා කියන්නාහු "ධම්මධ්වජ පණ්ඩිතය, සෙට උයන් කෙළියක් කෙළනා කැමැත්තම්හ. පළමු උයන පරණව ගියේය. අපට

අළුත් උයනක් කරවා පාවා දෙව. සෙට අප එන වේලාවට කරවාගත නුහුනුවෝ තොපගේ ජීවිතය හානිවෙ"යි කීහ.

බෝධිසත්ත්වයෝත් "කාල නම් සෙනවිරදුන් කීනියා දෙයෙක් වනැ"යි සිතා "යහපත, දේවයන් වහන්ස, පිළිවන් වීනම් කරන්නෙමි වේදැ"යි කියා ගෙටගොස් ඉස් සෝධා නහා බත් කා ඉක්බිත්තෙහි යාන පිට විකෙෂ්පයෙන් උන්නාහ.

එවිට බෝධිසත්ත්වයන් වහන්සේගේ ගුණානුභාවයෙන් ශක්‍රයාගේ පාණ්ඩුකම්බල ශෛලාසනය හුණු විය. ශක්‍රයෝ "මාගේ සම්පත් උදුරා ගන්නෝ කවුරුදෝ හෝ"යි දහසක් නුවණැසින් මිනිස් ලොව බලන්නාහු බෝධිසත්ත්වයන් වහන්සේ විකෙෂ්පව උන් නියාව දැක "එසේ වීනම් මා එතනට ගොස් උන්ගේ විකෙෂ්පය අරවන්ට උවමැනව"යි සිතා බෝධිසත්ත්වයන් වහන්සේගේ ගෙය සමීපයෙහි ආකාශයෙහි සිටියාහ.

බෝධිසත්ත්වයෝ "තොපි කවුරුදැ?"යි විචාරා "මම දෙදෙව්ලොව දෙවියන්ට නායක වූ ශක්‍රදේවේන්ද්‍රයාය"යි කියා "ඹබගේ ගුණානුභාවයෙන් ආමි. තොපි විසින් විකෙෂ්පව ඉඳිනා කාරණා කියව"යි කීහ.

බෝධිසත්ත්වයෝ කියන්නාහු "සෙට දවස ස්වාමීන් උයන් කෙළියට වඩිනා වේලාවට උයනක් කරවන්නට කීසේක. උයන් නම් තුන්හතර අවුරුද්දකින් මිස කරවාගත නොහැකි කල එක දවසකින් කෙසේ කරවම්දැ?යි විකෙෂ්පව උනුමි" කීහ. එවිට ශක්‍රයෝ කියන්නාහු "මහාපුරුෂය, විකෙෂ්ප නොව.

නන්දු නම් චිත්‍රලතා නම් උයන් සේ උදුසනම නිර්මිත කොට ලමි. කොතන උයනක් කරවන්දැ?"යි කීහ.

බෝධිසත්ත්වයෝ "අසවල් තෙන අපගේ රජ්ජුරුවන් වහන්සේට වාස පහසුය, එතන උයන ඉදිකරව"යි ලකුණු කීහ. ශක්‍රයෝත් එම නියායෙන් අටලොස් රියන් උස ඇති මහා සීමාපවුරක් වට සලස්වා ඊ ඇතුළේ අඹ, දඹ ආදී වූ ඵලපල්ලවයෙන් යුක්ත වූ උයනක් මවා ගියේය.

බෝධිසත්ත්වයෝත් පෙරවරු බත් කා ඉක්බිත්තෙන් ශක්‍රයා නිර්මිත කළා වූ උයන් බලා රජ්ජුරුවන් කරා ගොස් "දේවයන් වහන්ස, උයන්කොට නිමියේය. උයන් කෙළියට වැඩිය මැනව"යි කීහ. රජ්ජුරුවෝත් උයනට ගොස් උයන දැක සතුටු ව කාල නම් සෙනවිරදුන් අතින් විචාරන්නාහු "අභිප්‍රාය නියාවට උයන කොට නිමියේය. කුමක් කරමෝදැ?"යි කීහ. එවිට සෙනවිරද්දු කියන්නාහු "ධර්මධ්වජ පණ්ඩිතයන් සිතූ ඇසිල්ලෙහිම උයන කොට නිමවන ලද, පතසක් මවා ලන්ට බැරිදැ?"යි කියා "සෙට දවස් වඩිනා වේලාවට පස් පියුමෙන් සැදූ සත්රුවන්මය වූ පොකුණක් මවන්නව මෙහෙවර වදාළ මැනවැ"යි කීහ.

රජ්ජුරුවෝත් "යහපතැ"යි බෝධිසත්ත්වයන් කැඳවා "පණ්ඩිතයෙනි, උයන වනාහී අභිප්‍රාය නියාවට කොට නිමියේය. ඒ නියාවට පස් පියුමෙන් සැදුනු සත්රුවන් පොකුණක් සවසට නිමවාලව නොකර වූ නම් තොපගේ ජීවිතය නැත්තේ වේදැ"යි කීහ.

බෝධිසත්ත්වයෝත් “යහපත, දේවයන් වහන්ස, පිළිවන් වීනම් කරවන්නෙම් වේදැ”යි කීහ. එයිත් පළමු පරිද්දෙන්ම දසක් වක් ඇති සියයක් තොට ඇති සත්රුවන්මය වූ රළපාන ඇති පස් පියුමෙන් සැදුනු පොකුණක් මැවීය.

බෝධිසත්ත්වයෝ උදෑසනක් සේ ශක්‍රයන් මැවූ පොකුණ බලා රජ්ජුරුවන් ලඟට ගොස් “දේවයන් වහන්ස, පොකුණ කොට නිමියේය. බලා වදාරන්නේ යහපතැ”යි කීසේක. රජ්ජුරුවෝ “යහපතැ”යි පොකුණට ගොස් පොකුණ බලා සතුටුව කාල නම් සෙනවිරදු අතින් විචාරන්නාහු “සෙනවිරදුනි, පතසත් අභිප්‍රාය නියාවට නිමවන ලද, මෙවිට කුමක් කරන්නමෝදැ?”යි විචාළහ. එවිට සෙනෙවිරද්දු කියන්නාහු “උයන්ටත්, පතසටත් සුදුසු නියායෙන් සවීදන්තමය වූ මාලිගාවක් කරවන්ට කියන්නේ යහපතැ”යි කීහ. රජ්ජුරුවෝත් බෝධිසත්ත්වයන් කැඳවා “පණ්ඩිතයෙනි, පතසට සුදුසුකොට සවීදන්තමය ප්‍රාසාදයක් කරව්, ඒ නොකළා නම් තොපගේ ජීවිතය නැතැ”යි කීහ.

බෝධිසත්ත්වයෝ “යහපත, පිළිවන් වීනම් කරවන්නෙම් වේදැ”යි කීහ. එයිත් ශක්‍රදේවේන්ද්‍රයෝ සවීදන්තමයින් විසිතුරු කොට මාලිගාවක් ඉදි කළාහ. බෝධිසත්ත්වයෝත් ශක්‍රයන් මැවූ මාලිගාව බලා රජ්ජුරුවන් ලඟට ගොස් “දේවයන් වහන්ස, මාලිගාවක් කොට නිමවන ලද, බලන්ට වඩින්නේ යහපැතැ”යි කීහ. රජ්ජුරුවෝත් ගොසින් මාලිගාව බලා සතුටුව කාල නම් සෙනවිරදු අතින් විචාරන්නාහු “ඇයි?

ඉතින් කුමක් කරමෝදැයි සෙනෙවිරදුනි” කීහ. එවිට සෙනවිරද්දු කියන්නාහු “මාලිගාවේ පාන් නොලා මාණික්‍යාලෝකයෙන් බබලන නියායෙන් යාපත් මැණික් මවන්ට කියන නියා යහපතැ”යි කීහ. රජ්ජුරුවෝත් බෝධිසත්ත්වයන් කැඳවා කියන්නාහු “මාලිගාවට සුදුසුකොට ප්‍රදීපාලෝකයක් නැතිව මාණික්‍යාලෝකයෙන්ම ඉදිනා නියායෙන් මැණිකක් මව”යි කීහ. එයිත් ශක්‍රයෝ නිර්මිත කළාහ.

බෝධිසත්ත්වයෝ එයිත් දැක රජ්ජුරුවන්ට “දේවයන් වහන්ස, මැණික නිර්මිත කරන ලදැ”යි කීහ. රජ්ජුරුවෝත් ඇවිත් බලා සතුටුව “මෙවිට කුමක් කරමෝදැ?”යි කාල නම් සෙනවිරදුන් විචාළහ. කාල නම් සෙනවිරද්දු “දේවයන් වහන්ස, මුන් සිතූ දෙයක්ම මෙසේ නිර්මිත වන්නේ දේවානුභාවයෙන, එසේ හෙයින් දේවයන් වහන්ස, දෙවියන්ටත් බැරි දෙයක්ම කියම්මය”යි කියා කියන්නාහු “චතුරාංගයෙන් යුක්ත වූ උද්‍යාන පාලකයෙකු මවන්නේ යහපතැ”යි කීහ. රජ්ජුරුවෝත් එපවත් අසා “යහපතැ”යි කියා බෝධිසත්ත්වයන් කැඳවා “උයන හා පතැස හා මාලිගාව හා මැණික මැව්ව නියාව යහපත, ඒ ඇමට රක්‍ෂාවට චතුරාංගයෙන් යුක්ත වූ උද්‍යාන පාලකයකු සලස්වාලව”යි කීහ.

බෝධිසත්ත්වයන් වහන්සේ “යහපත ස්වාමීනි, පිළිවන් විනම් කරවන්නෙමි වේදැ”යි කියා ඉස සෝධා නහා බත් කා ඉක්බිති සිතන්නාහු “සෙස්ස නම් ශක්‍රයෝ තමන්ට පිළිවන් හෙයින් නිර්මිත කළාහ. චතුරාංගයෙන් යුක්ත වූ පුරුෂයෙකු

නිර්මිත කරන්ට දෙවියන්ටත් බැරිය. එසේ හෙයින් අනාථයේ අනුන් අත මියෙන්නා බලා වලට ගොස් අසරණව මිය යන්නේ යහපතැ''යි සිතා කාටවත් නාහවා ප්‍රාසාදයෙන් බිමට බැස අල දෙරින් නික්ම වලට ගොස් ගසක් මුල වැඩ හිඳ,

"ලාභො අලාභො අයසො යසොච
නින්‍දා පසංසාච සුඛංච දුක්ඛං''

යන මේ අෂ්ටලෝක ධර්මය සිහි කෙරෙමින් උන්නාහ. ඒ වේලාවට ශක්‍රදේවෙන්ද්‍රයෝත් එපවත් දැන වැදි පුත්‍රයෙකුගේ වේශයක් ගෙන බෝධිසත්ත්වයන් ලගට අවුත් කියන්නේ "බ්‍රාහ්මණයාණන් වහන්ස, සැපසේ ගේදොරව උන්සේක් වේද? දැන් මෙසේ උදුකලාව උන්නේවේදැ''යි විචාළහ.

බෝධිසත්ත්වයෝ කියන්නාහු "සැබෑය වැදිපුත්‍රය, ගෙදොරව උන්නෙත් සැබව, උදුකලාව වනාන්තරයේ උන්නොමෝ වේදැ''යි කියන්නා "ඊට කාරණා කිම්දැ?''යි ශක්‍රයෝ විචාළහ. බෝධිසත්ත්වයෝ "රජ්ජුරුවන් තමන්ට කී දෙයත් තමන් කළ දෙයත් ඇමම කියා දැන් රජ්ජුරුවන් වහන්සේ චතුරාංගයෙන් යුක්ත වූ මිනිසෙකු මවන්ට කියා කියනසේක. ඒක මා තබා දෙවියන්ටත් බැරිය එසේ හෙයින් අනර්ථයෙ මියන්නා බලාත් මෙසේ ඉද මියන්නේ යහපතැයි උන්නෙමි'' කීහ.

එපවත් ශක්‍රයෝ අසා "ඇයි බෝධිසත්ත්වයන් වහන්ස, මා වැද්දෙකැයි කියා උන්සේක්ද? නුඹවහන්සේ සිතූ සිතූ යම්ම දෙයක් නිර්මිත කළා වූ ශක්‍රදේවේන්ද්‍රයෝ නම් මම ය. එසේ වූ නුඹවහන්සේ කීවා කරන්නා වූ මා සේ එකකු ඉන්දදී

නුඹවහන්සේ විසේප්පව ඉන්නා කාරණා කිම්දැ?යි චතුරාංගයෙන් යුක්ත වූ මිනිසෙකු මවන්ටත් බැරි බවක් සැබැව, ඊට මම උපායෙක් කියමි, ඒ රජ්ජුරුවන්ගේ ඡත්තපානි නම් මගුල් කපුවා චතුරාංගයෙන් යුක්තය. ඔහු රජ්ජුරුවන්ට පා උයන්ගොව් කමට සලාසා පියව''යි කීහ.

බෝධිසත්ත්වයෝත් ''යහපතැ''යි පෙරලා ගෙට අවුත් ගෙයි සැතපී පසුව දවස් රජගෙට එන්නාහු අතර මගදී ඡත්තපානි නම් කපුවා දැක කියන්නාහු ''එම්බල ඡත්තපානිය, තොප චතුරාංගයෙන් යුක්තදැ?''යි ඇසීය. එවිට කියන්නාහු ''මා චතුරාංගයෙන් යුක්ත නියාව තොපට කීවේ කව්රුදැ?''යි කීහ. ''මට කීවේ ශක්‍රදේවේන්ද්‍රයෝය''යි'' කීහ. ''ශක්‍රදේවේන්ද්‍රයෝත් කොයි දී දුටුදැ?''යි කියන්නා තමන්වහන්සේ වනයට ගිය නියාව හා සියල්ලම තත් වූ පරිද්දෙන් කීහ. එවිට ඡත්තපානින් ''එසේමය, මම චතුරාංගයෙන් යුක්ත යෙමි'' කීය.

එවිට බෝධිසත්ත්වයෝත් ඡත්තපානිගේ අත අල්වාගෙන රජගෙට ගෙනගොස් ''දේවයන් වහන්ස, මූ චතුරාංගයෙන් යුක්තයහ, මුන් උයන්ගොව්කමට සලස්වා වදාරන්නේ යහපතැ''යි කීහ. රජ්ජුරුවෝත් ''සැබෑද? ඡත්තපානිය, තෝ චතුරාංගයෙන් යුක්තදැ?''යි විචාළහ. ''එසේය, දේවයන් වහන්ස, මම චතුරාංගයෙන් යුක්තයෙමි'' කීහ. ''තොපගේ චතුරාංගයෙන් යුක්ත පරිදි කියව''යි කියන්නාහු ඡත්තපානි කියන්නාහු ''දේවයන් වහන්ස, අන් කෙරේ වෛරයක් ද්වේෂයක් නොකිරීමය. මද්‍යපාන නොකිරීමය. අවිසද්සඳුණක

සච්ඡන්දක සියල්ලන් කෙරෙහි ඇල්ම නොකිරීමය. මෛත්‍රී භාවනා කිරීමයයි යන මාගේ චතුරගාංය"යි කීහ.

එවිට රජ්ජුරුවෝ කියන්නාහු "සියල්ලෝම යම් යම් දේකට උනුන් කෙරේ වෛර වන්නාහ, තොප එසේ වෛර නොකරන්නට කවර අරමුණක් නිසාදැ?"යි විචාළාහ. ඡත්තපානි නම් මගුල්කපුවා කියන්නේ "මම පෙර රජව ඉපිද බිසවුන්ගේ බස් අසා පුරෝහිත බමුණා බන්ධනයට පැමිණි වීමි, එතැන් පටන් මා ද්වේෂය හළේය"යි කීහ.

ඒ කෙසේද? යත්,

"එක් සමයක මම මෙරට බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුව ඉපිද එක් ගමනක් යන්නෙමි බිසවුන් සැප පහසු විචාරා සූසැටවරක් මෙහෙකරන්නන් යවීමි. උන් ඇමලා කැටුවම බිසවුන් අනාචාරයේ යෙදී අන්තයෙහි පුරෝහිත බමුණා අත අල්ලාපු විසින් 'මම එසේ වූ දෙයක් නොකරමි' කියා පළා ගියහ. බිසව් ඔහු කෙරේ වෛර බැඳගෙන 'මට බමුණා වරදින්ට උන'යි කීහ. රජ්ජුරුවෝත් 'ඒ ඇත්තය'යි කියා අදහාගෙන බ්‍රාහ්මණයා පිටිතල හයා බැඳගෙන ලගට ගෙන්වා ගත්තාහ. එවිට බ්‍රාහ්මණ 'දේවයන් වහන්ස, මම එසේ වූ නොකට යුත්තක් නොකෙළමි. මේ නොකටයුතු කළෝ මේවර ඇසූ මනුෂ්‍යයෝ සැමදෙනාය'යි කීහ. රජ්ජුරුවෝත් නන්වූ පරිද්දෙන් නියම දැන බිසවුන් කෙරේ කිපුණාහ. පුරෝහිත බමුණාත් 'දේවයන් වහන්ස, දේවීන්වහන්සේට නොකිපුන මැනව, ස්ත්‍රීන්ට තිබී ආ ස්වාභාවයෙක, යම් සේ තමාගේ

ඇඟින් වැගිරෙන්නා වූ පිළිකුල් ආදී වූ දෙයට යම් සේ කැත නොවෙත් නම් තමාගේ මලමුත්‍ර ආදී වූ දෙයට 'ඇයි මා විසින් යහපත් වූ අන්නපානය කන බොන ලද්දැයි මේ අසූචි භාවයට පැමිණියේ ඇයිදැ?'යි නොකිපෙත් නම් එම ස්ත්‍රීන් විෂයෙහි එමෙන් තොප නොකිපුන මැනව'යි කීහ. එබස් ඇසූ මමත් ඒ ජාතියෙහි බමුණානන් කී බස් අදහාගෙන මේ ජාතියේ පටන් නිවන් දකින ජාති දක්වා කවුරුන් කෙරේත් කෝපයක් නොකරමි, අධිෂ්ඨාන කෙළෙමියි ඒ නිසා මම මේ ජාතියෙහි කා කෙරේවත් ද්වේෂයක් නැත්තෙමි" කීහ.

එබස් රජ්ජුරුවෝ අසා "ඒ වන්නා ඒ සඳහාය, මද්‍යපාන නොකරන්නේ කුමණ කාරණාවක් නිසාදැ?"යි විචාළහ. එවිට ඡත්තපානි නම් කපුවා කියන්නේ "පෙර මම රජ ව ඉපිද ප්‍රියපුත්‍ර මාංශය රා මදයෙන් කෑමි. එවක් පටන් මා රා පෙවිලි අළේය"යි කීහ.

ඒ කෙසේද? යත්,

"පෙර මම මේ රටම ඡත්තපානි නම් රජ ව ඉපිද මච්ඡමාංස ඇතිව මිසක් බත් නොකන්නා ඒ රජ්ජුරුවන්ට එක් දවසක් අරක්කැමියා 'සෙට දවස් පෝද්‍ර පනිවාකම් කරන්ට බැරිය'යි කියා පළමුවෙනිද්‍ර ම මස් ඇර තබාගත්, එම මස් බල්ලා කාපුවාහ. එවිට අරක්කැමියා රජ්ජුරුවන්ට බත් වඩන්ට භයින් බිසවුන් වහන්සේට කියන්නේ 'දේවීන් වහන්ස, රජ්ජුරුවන් වහන්සේට මේ නිමවන්ට තැබූ මස් බල්ලා කාපුව,

රජ්ජුරුවන් වහන්සේ මස් ඇතිව මිසක් මේ නො නිමවනසේක. එසේ විසින් නිකම් බත් අත ලන්ට බම්' කීහ.

එවිට බිසව කියන්නාහු 'තොපි ඊට නොබව, ඊට උපායක් ඇත. රජ්ජුරුවෝ මාගේ පුතණුවන් කෙරේ බලවත්වූ ස්නෙහ ඇත්තාහ. එසේ හෙයින් මම බත් කන වේලාව බලා මගේ පුතණුවන් සරහාලා ඔක්කෝ තබාලමි. රජ්ජුරුවෝ පුතණුවන් සනස සනසා උන්නාහු දඩමස් ලූවෝ නුලූවෝ නොදැන බත් කන්නාහ'යි කීහ.

අරක්කැමියා 'යහපතැ'යි කියා ගියේය. රජ්ජුරුවෝත් රා බී මත්වීපියා බත් කන්ට උන්නාහ. බිසවුන් රාජ කුමාරයන් ඔක්කෝ ඉන්දවූහ. එවිට රජ්ජුරුවෝත් බත් කමින් සිට දඩමස් නොදැක "ඇයි කොල, දඩමස් නැත්තේ ඇයිදැ?"යි විචාරා 'ස්වාමීනි, අද දවස් පෝය නිසා ඊයේ මස් අරන් තිබීමි. ඒ මස් බල්ලෝ කෑවාහ. අද පෝය බැවින් විදියේ මස් නොලද්දෙමි" කීහ. රජ්ජුරුවෝ තොපට 'මස් සාය පමණක් මිසක් මටත් මස් සායදැ?"යි ඔක්කෝ උන් රාජකුමාරයන්ගේ බොටුව මිරිකා 'මේ මස්ගෙන පිසපියා ගෙනව'යි කීහ.

අරක්කැමියාත් ඊට උත්තර නොකියා 'යහපතැයි, රජ්ජුරුවන් වහන්සැ'යි කියා ගොස් මාළු පිස මේ වැඩිය. රජ්ජුරුවෝ ප්‍රියපුත්‍ර මාංශය කෑවාහ. එතන සිටියා වූ බොහෝ දෙනා රජ්ජුරුවන් කෙරේ භයින් අඬන්නක්වත් නොකට යුතුයයි යන බසක් වත් කියන්ට අසමර්ථ වූහ. රජ්ජුරුවෝත් බත් කා අත කට සෝධා වැදහෙව, නිද

පිබිදුනාහ. එවේලාවට රා මදය සිඳින. එවිට රජ්ජුරුවෝ 'මාගේ පුතණුවන් මෙසේ ගෙනව'යි කීහ.

එවිට බිසව් රජ්ජුරුවන්ගේ පාමුල අඬාහුන. එවිට රජ්ජුරුවෝ 'මේ කිමෙක්දැ?'යි විචාරා "ඇයි ස්වාමීනි, නුඹවහන්සේ දවල් මේ නිමවූයේ පුත්‍ර මාංශය නොවේදැ?'යි කීහ. එවිට 'රා පෙවිල්ලේ දේෂයෙන් වේද? ප්‍රියපුත්‍ර මාංශ කෑයේය"යි කියා බොහෝ විකෂේපයට පැමිණ 'මේ ජාතියෙහි පටන් නිවන් දක්නා ජාති දක්වා රා නොබොමි' කළ අධිෂ්ඨාන බලයෙන් දැනුත් මා රා බොන්නේ නැතැ"යි කීහ.

ඒ අසා රජ්ජුරුවෝ "ඒ වන්නාට ඒ සඳහාහ, කා කෙරෙත් තොප ඇල්මක් නැත්තේ කවර කාරණයක් නිසාදැ?"යි විචාළාහ.

එවිට ඡත්තපානි නම් කපුවා කියන්නේ "පසේ බුදුන්ගේ පාත්‍රය බිඳ අවීචි මහනරකාදියෙහි වැටුනා වූ කෙනෙකුන්ට පියරජ ව සිට මම බොහෝ දුක් වුනෙමි. එසේ විසින් එවක් පටන් මේ දක්වා එක් කෙනෙකුන් කෙරෙහි ඇල්මක් නොකරන්නේ ඒ කාරණයෙනැ"යි කීහ.

ඒ කෙසේද? යත්,

"යටගිය දවස මෙම නුවර කිතවාස නම් රජව උපන්මි. ඒ රජ්ජුරුවන්ට එක් පුත්‍රයෙක් උපන. නිමිති දන්නා බ්‍රාහ්මණයෝ 'දේවයන් වහන්ස, මේ රාජ කුමාරයෝ යම් දවසක මියන්නේ පැන් නොලැබය'යි කීහ. රජ්ජුරුවෝ ඒ අසා සතරවාසල

මහා වැව් සතරක් බන්ද, ඇතුළුනුවර ඒ ඒ තැන බොහෝ පතැස් පොකුණු බිඳවා, අම්බලන් නන්වා, ඒ ඒ තැන පැන් තබ්බවා මේ නියායෙන් දවස් අරනාහ.

රාජකුමාරයෝත් වැඩී යුවරජ තනතුරු ලැබ 'දුෂ්ට රාජකුමාරයෝ ය'යි යන නමින් ප්‍රසිද්ධ වූවාහ. රජ්ජුරුවෝත් තමන්ගේ අඹුදරුවන් ජායාව මෙන් කැටුවම යන යම් තැනකට කැඳවාගෙන යන්නාහ. එක් දවසක දුෂ්ට රාජකුමාරයෝ තනිව පියාණන් කැටිව එක් නොව් ඇත්කඳ පිටට නැගී චතුරාංගිනී සේනාව පිරිවරා නුවර ඇවිදින්ට වන්නාහ. ඒ වේලාවට සිල්වත් ගුණවත් දැමුනා වූ ඉඳුරන් ඇති එක් පසේබුදු කෙනෙකුන් වහන්සේ බත් පාත්‍රයක් සිගාගෙන වීථියේ වඩිමින් සිටිසේක. ඒ වේලේ රජ්ජුරුවන් ලා කැටිව එන්නා වූ බොහෝ පර්ෂිත් පසේබුදුන් වඳින්ට හා ගුණ කියන්ට වන්නාහ. එවිට යුවරජ්ජුරුවෝ 'මා වැනි රාජකුමාරයෙක් දැක්කදී මේ හිසමුඩු භික්ෂූන් දකින්ට වන්නාහ'යි පසේබුදුන්ට කිපී ඇතු පිටින් බැස පසේබුදුන් කරාගොස් 'පාත්‍රයට බත් ලද්දේ ඇද්දැ'යි විචාරා 'එසේය කුමාරයෙනි' වදරන්නා එවිට 'යාපත, පාත්‍රය බලම්ම'යි පාත්‍රය අතටගෙන බිම ඵලා පයින් මිරිකා සුනුවිසුණු කළාහ.

පසේබුදුහු 'නිකන් නිස්කාරණයේ මේ මාගේ පාත්‍රය බිඳ බොහෝ අකුසල් පුරාගතැ'යි මූණ බැළුහ. ඒ කුමාර තමන් කෙරේ උරණින් මූණ බැළුවයි සිතා 'කිතවාස නම් රජ්ජුරුවන්ගේ පුත් වූ දුෂ්ට කුමාරයෝ නම් මම, නුඹවහන්සේ

මට උරණව කරන්නේ කිමිදැ'යි කීහ. පසේබුදුරජාණන් වහන්සේ සුන්බත්ව උත්තරපථ වූ නන්දමූල පබ්භාරයට වැඩිසේක.

ඒ වේලාවට අවීචි මහනරකයෙන් ගිනිදැල් ඇවිත් රාජකුමාරයන්ගේ ඇඟ වැදගත, රාජකුමාරයෝත් බොහෝ දුහයට පැමිණ පැන් පිපාසයෙන් 'පැන් ගෙණව'යි කීහ. ඒ වේලාවට ඒ ඒ තැන තිබූ වැව්, පොකුණු, පතැස් ආදී වූ තැන තිබූ පැන් එකෙණෙහිම හිඳී ගියේය. පොලොව පලාගෙන රාජකුමාරයන් අවීචි මහනරකයට අරගන ගියේය. කිතවාස නම් රජව උපන්නා වූ මම බොහෝ වික්ෂේපවට පැමිණ සිතන්නේ 'යමකට ඇල්ම කිරීමෙන් පව්ද, වික්ෂේපයද උපදනේය. එසේ විසින් මේ ජාතියෙහි පටන් නිවන් දකිනා ජාති දක්වා කිසිම වස්තුවක ඇල්ම නොකෙරෙමි' කියා අධිෂ්ඨාන කෙළෙමි. එසේ නිසා මේ ජාතියෙහි කිසි දෙයකත් ඇල්ම නොකෙරෙමි'' කීහ.

එබස් රජ්ජුරුවෝ අසා ''ඒ වන්නා එසේය. සියලු සත්ත්වයන් කෙරේ මෛත්‍රී කරන්නේ කවර කාරණයකින්දැ?''යි කීහ. ඒ කාරණය කියන්නා වූ ජන්නපානි නම් කපුවා ''පෙර තාපසව ඉපිද කළා වූ මෛත්‍රී භාවනායෙක අභ්‍යසයෙන් මේ ජාතියේ මෛත්‍රිය ඇත්තේ ය''යි කීහ.

ඒ කෙසේද? යත්,

''පෙර මේ නුවර අරක නම් තාපසව ඉපිද මෛත්‍රී භාවනාකොට බඹලොව ඉපද සංවර්ත විවර්ත ආදී වූ

සත්කපක් මෛත්‍රී භාවනාකොට බඹලොව ඉපද ඒ අභ්‍යාසයෙන් දැනුත් මා මෛත්‍රී ආනුභා ඇත්තේය”යි කීහ.

එබස් රජ්ජුරුවෝ අසා “කිසිම අපරාධයක් නැති ධර්‍මධ්වජ පණ්ඩිතයන් කෙරේ මේ කාල නම් සෙනවිරද්දු අන්‍යයෙන් කන අත්ලස් නිසා උන් මා කෙරේ කනස්සළුය”යි සිතා සෙනවිරදුන් කෙරේ කෝපව අමාත්‍යයන් මූණ බැලූහ. අමාත්‍යයෝ රජ්ජුරුවන් අභිප්‍රාය දැන “දුෂ්ට වූ අත්ලස් සොර, තා කන අත්ලස් තිබී ගියේයයි කියා නිරපරාධ ධර්‍මධ්වජ පණ්ඩිතයන් නසන්ට උත්සාහ කළ නියාවදැ”යි ඇම දෙනාම උනස්නෙන් නැගී සිට කාල නම් සෙනවිරදුන් ඇද බිම හෙලාගෙන බොහෝ දෙන තමා අතට සම්භ වූ කැටමුගුරු ආදී වූ දෙයින් තළා අල්වාගෙන නුවරින් පිටත කසල ගොඩට ඇදපුවයි වදරා මේ ‘ධර්‍මධ්වජ ජාතකය’ නිමවා වදළසේක.

“එසමයෙහි කාල නම් සෙනවිරද්දු නම් දේවදත්ත ස්ථවිරයෝය, ධර්‍මධ්වජ පණ්ඩිත ව උපන්නෙම් බුදුවූ මම්ම ය”යි වදළසේක.

# 220. කාසාව ජාතකය

තවද මුළුලොවට පිහිට වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි. මේ කථා උත්පත්තිය වේළුවනාරාමයෙහිදීය.

ඒ කෙසේද? යත්,

එක් සමයෙක්හි සැරියුත් සාමීන් වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි ඒ ගම උපාසකවරු සැරියුත් සාමීන්ටත් දේවදත්ත ස්ථවිරයන්ටත් එක් දනයක් දෙන්නට යන්නාහ.

එසමයෙහි එක් ව්‍යාපාරයෙක් ලක්‍ෂයක් වටිනා සළුවක් උපාසකවරුන්ට දී "මාත් මේ දනයට මුසුවන්ට උවමැනවැ"යි සිතා මුසු විය. එකියන උපාසකවරු දන් දී අන්තයෙහි "මේ ලක්‍ෂයක් වටිනා සළුව සැරියුත් සාමීන්ට දෙමෝද? දේවදත්ත ස්ථවිරයන් වහන්සේට දෙමෝ හෝදැ?"යි කියා කථා කළාහ.

ඉන් සමහරු "සැරියුත් සාමීන්ට දෙම්හ"යි කීහ. සමහරු "සැරියුත් සාමීන් නම් දවසක් දෙදවසක් රඳා ලා වැඩ පියනසේක. අපගේ දුකෙහි සුවෙහි නොබැඳෙනසේක. දේවදත්ත ස්ථවිරයන් වහන්සේ වන්නා මේ ගමේම නිධානයක් සේ වැඩහිඳ අපගේ දුකෙහි සුවෙහි බඳෙනාසේක. එසේ හෙයින් ඔබවහන්සේට දෙම්මැ"යි කියා උන්වහන්සේට පිළිගැන්වූහ. දේවදත්ත ස්ථවිරයන් වහන්සේ දවළු ඉරා යහපත්ව ගෙත්තම්කොට කිනිහිර මල් පෙත්තක් මෙන් යහපත්කොට රඳා සිවුර පෙරවා ගත්සේක.

වේළුවනාරාමයෙහි සිට වහන්දෑ තිස්දෙනෙකුන් වහන්සේ ජේතවනාරාමයට වැඩ සර්වඥයන් දැක "ස්වාමීනි, දේවදත්ත ස්ථවිරයෝ තමන්ට නුසුදුසු වූ රහතුන්ට සුදුසු වූ සුවුරක් පෙරවියෝ වේදැ"යි කීසේක. සර්වඥයෝ එපවත් අසා "මහණෙනි, දැන්මතු නොවෙයි, දේවදත්ත ස්ථවිරයෝ තමන්ට නුසුදුසු වූ අර්හත්ධ්වජය පෙරවියෝ වේදැ"යි වදාරා "ඒ

කෙසේදැ?''යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයෝ අසූදහසක් ඇතුන්ට නායක ව ඇත්රජ ව ඉපද ඇත් සමූහයා පිරිවරා ඒ ඒ තැන ඇවිදිනාහ.

ඒ සමයෙහි එක්තරා දුක්ඛිත මනුෂ්‍යයෙක් දළකඩ ලියා ජීවත් වන්නා වූ මනුෂ්‍යයන් ඉන්නා වීථියට ගොස් කියන්නේ "තොප ඇමට දළකඩ සම්භ වීනම් යහපතැ"යි විචාළේය. එවිට දළකඩ කර්‍මාන්ත කරන්නා වූ මනුෂ්‍යයෝ කියන්නාහු "දළකඩ සම්භ වීනම් ඉතා යහපතැ"යි කීහ. එවිට ඒ පුරුෂයාත් "නිකන් ගියෙම් නම් ඇත්තු මා මරති. පසේබුදු විලාසයෙන් යෙමි" සිතා මනා වූ කාසවස්ත්‍රයක් ඇඳ පෙරව තෙබක් කාසාය වස්ත්‍රය යට සඟවාගෙන බෝධිසත්ත්වයන් ආදී වූ ඇතුන් වසන්නා වූ වනාන්තරයට ගොස් ඇතුන් යන්නා වූ මාවත වැඳ සිටියේය.

ඇත්තු මොහු දැක "පසේබුදු කෙනෙකුය"යි සිතා ආදරකොට ගියහ. ඒ වැදි ඇමට පස්සෙන් යන්නා වූ ඇත් බලා තෙබ දමා ලා ඇතු මරා දළ ගෙනගොස් විකුණයි. මේ නියායෙන් දවස්පතා ඇතුන් මැරීමෙන් බෝධිසත්ත්‍වයන්ගේ ඇත්තු කල්යාමකින් අඩු වූවාහ. එපවත් දත්තා වූ ඇත්තු බෝධිසත්ත්‍වයන් ලඟට ගොස් එපවත් කීහ. බෝධිසත්ත්‍වයෝ "එසේ වීනම් පසේබුදු විලාසය ඇරගෙන සිටිනා

තැනැත්තාවුන් ඇතුන් මරණ වැද්දෙකු නියාවේදැ''යි සිතා ''ඒ මා පරීක්ෂා කරන්ට උවමැනවැ''යි සිතා පසුව දවස් ඇතුන් සැමටම පස්සේ එන්ට වන්නාහ.

එදවසුත් ඒකියන පසේබුදු විලාසය ගත්තා වූ වැදි බෝධිසත්ත්වයන් දැක තමාගේ තෙබ දැමීය. උඟ තුමූ තෙබ බලා ''වැද්දා මරමි'' අත බිමගසා දිවගෙන අවුත් සිතන්නාහු ''මූ කුමක් වේවා කාසායවස්ත්‍රය ඇඳගෙන සිටියේය. එසේ හෙයින් මූ මරන්ට නොයෙදෙව''යි සිතා කියන්නාහු ''තොප සේවූ පාපිෂ්ටයන්ට මෙබඳු අර්හත්ධ්වජය වූ කාසායවස්ත්‍රය නොහොබීය. තා විසින් මෙතන වැද හිඳ මාගේ ඇතුන් නසන්ට කාරණා නොවෙයි, ඉදින් බොහෝ දවසක් තා දිටින්නම් දන්නෙමි වේදැ''යි කියා භය ගන්වා යවිහයි වදාරා මේ 'කාසාව ජාතකය' නිමවා වදාළසේක.

''එසමයෙහි වැදි නම් මේ දේවදත්ත ස්ථවිරයෝය. ඇත් සමූහයාට නායක ව උපන්නා වූ ඇත්රජ නම් බුදුවූ මම්ම ය''යි වදාළසේක.

# 221. චුල්ල නන්‍ද (චුල්ලනන්දිය) ජාතකය

තවද මුළුලොවට ආධාර වූ සර්‍වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

එක් දවසක් ධම්සභා මණ්ඩපයෙහි රැස් වූ මාළුවරුන් වහන්සේ "දේවදත්ත ස්ථවිරයෝ සර්‍වඥයන් වහන්සේට දුනුවායන් මෙහෙයීම් ආදී වූ බුදුන් නසන්ට බොහෝ උත්සාහ කළහ, සර්‍වඥයන්ගේ සීල, සමාධි, කරුණා බොහෝ වූ ගුණ දැක දැකත් බුදුන් කෙරේ දයාවක් කරුණාවක් නූපන. එසේ වීනම් දේවදත්ත ස්ථවිරයෝ මහතද්‍රයෝය"යි යන කථාව කිය කියා උන් තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා එපවත් අසා "මහණෙනි, දැන්මතු නොවෙයි, පෙරත් දේවදත්ත ස්ථවිරයෝ තද්‍රයෝම වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් හිමාලය වනයෙහි අසූදහසක් වානරයින්ට නායක ව නන්ද නම් වානරාධිපති ව දවස් අරණාහ.

බෝධිසත්ත්‍වයන්ගේ මල් වූ චුල්ල නන්ද නම් වානරයෙකුත් ඇත්තාහ. මේ කියන දෙබෑයෝ අන්ධ වූ මෑණියන් රකිනාහ. බෝධිසත්ත්‍වයෝත් වානරයන් සමඟ පලාඵල සොයා කන්නාහු පලාඵල තමනුත් කා වඳුරන් අත පලාඵල "මාගේ මෑණියන් වහන්සේට දෙව"යි කියා එවන්නාහ.

ඒ ගෙන ගියා වූ වඳුරෝ තමනුත් කා බෝධිසත්ත්වයන් වහන්සේගේ මෑණියන්ට නොදෙන්නාහ. බෝධිසත්ත්වයන් වහන්සේගේ මෑණියෝත් පලාඵල නොලැබ ඉතා දුර්වලභාවයට පැමිණියාහ. බෝධිසත්ත්වයෝ දවසක් මෑණියන්ට කියන්නාහු "ඇයි මාගෙන් යවන්නාවූ පලාඵල ඇත්ත වුව දුර්වල වන්ට කාරණා කිම්දැ?යි කීහ. බෝධිසත්ත්වයන්ගේ මෑණියෝ කියන්නාහු "පුත, තොප එවන පමණක් මිසක් මට නොදෙන්නාහ"යි කීහ. එබස් බෝධිසත්ත්වයෝ අසා "මම මේ වඳුරන්ට රාජ්‍යය කරන්නේන් මාගේ මෑණියන් වහන්සේ රැක ගන්ට නොපිළිවනැ"යි සිතා තමාගේ බාලමලණුවන්ට කියන්නාහු "මල, තොප විසින් වඳුරු මුලට රාජ්‍යයකොට වාසය කරව, මම මාගේ මෑණියන් වහන්සේ රකිමි" කීහ. ඒ අසා බෝධිසත්ත්වයන්ගේ මලණුවෝ කියන්නාහු "මටත් වානරයන්ට රාජ්‍යය කරන්ට බැරිය, මමත් මාගේ මෑණියන් වහන්සේ රකිමි" කියා බෝධිසත්ත්වයන් හා දෙන්නම මෑණියන්ද අරගෙන බරණැස් නුවරට අවුත් බරණැස් නුවර කෙළවර මහත් වූ නුග ගසක වාසය කරන්නාහ.

එසමයෙහි එක්තරා මනුෂ්‍යයෙක් තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරීන් ලඟ අකුරු කරන්නට වන. දිසාපාමොක් ආචාරී "මේ ඒ කාල පුරුෂයාය, මූට ශාස්ත්‍ර උගන්නා කිම්දැ?"යි සිතා නැවතත් "මුගේ උත්සාහ බලවත, කුමක් වේවා අකුරු කරවමි" සිතා ඔහුට බොහෝ ශාස්ත්‍ර උගන්වා යවන්නාහු යම් සේ "තොපි සාහසික ක්‍රියාවක්වත්, කෙනෙකුන්ට හිංසාවක්වත් නොකරව"යි කියා අවවාද කියා

යවූහ. එකී පුරුෂයාත් "යහපතැ"යි ගිවිස බරණැස් නුවර කරාගොස් දුනු ගත් අත ඇතිව දඩයම්කොට මස් මරා විකුට ජීවත් වන්නේ.

එක් දවසක් කිසිම දඩයමක් සම්භ නොවී ගෙට යන තැනැත්තේ නුවර කෙළවර මහත් නුග ගසක් දැක "මේ ගස යම් ඇත්තෙක් ඇද්දේ හෝ"යි ගස මුලට ගොස් උඩ බැලීය. ඒ වේලාවට බෝධිසත්ත්වයන් මෑණියන් ඉදිරියේ ඉදුවාගෙන බෝධිසත්ත්වයන් හා බෝධිසත්ත්වයන්ගේ මලණුවෝ පස්සේ උන්නාහු, දුනු ගත් අත් ඇති වැද්දහු දැක බෝධිසත්ත්වයෝ සිතන්නාහු "මාගේ මෑණියන් වහන්සේ මැළි විසින් හා කය දුර්වල විසින් හා නොමරන්නාහ"යි සිතූහ.

වැදිත් එකියන මැහැළි වැඳිරිය දැක සිතන්නේ "මාගේ ගෙයි කොල්ලෝවත් කාපියව"යි සිතා විදින්ට දුන්න නගාගත. ඒ දැක බෝධිසත්ත්වයෝ සිතන්නාහු "මේ වැදි මාගේ මෑණියන් විදින්ට උත්සහ කෙරෙති. එසේ හෙයින් මාගේ මෑණියන් වහන්සේට මාගේ ජිවිතය දෙන්ට උවමැනවැ"යි සිතා මලණුවන්ට කියන්නාහු "මම මාගේ මෑණියන් වහන්සේට ජිවිතය පරිත්‍යාගය දෙමි. තොපි මාගේ මෑණියන් වහනසේ රකුව"යි කියා වැද්දහුගේ දුනුපසට අවුත් කියන්නාහු "මාගේ මෑණියන් වහන්සේට ජීවිතදානය දී මා මරා මස් කව"යි කීහ. "යහපත තොපගේ මෑණියන් වහන්සේට ජීවිතදානය දෙමි" කියා බෝධිසත්ත්වයන් විද මරා එලාගත. තවත් මෑණියන්ට මරන්ට දුන්න ඇදගත. එවට බෝධිසත්ත්වයන්ගේ මලණුවෝ

"මේ වැදි මාගේ මැණියන් මරන්ට උත්සාහ කෙරෙයි, එසේ හෙයින් පළමුකොට මම මැණියන් වහන්සේට ජීවිතදානය දෙමි. එක දවසක් වී නමුත් රැකෙනසේක් වේදැ"යි සිතා වැද්දහුගේ දුනුපසට අවුත් කියන්නාහු "මාගේ බෑයන් වහන්සේත් මරාපුව, මාත් මරා ගනුව, අප දෙන්නාගේ මස් අදට තොපට ජීවිත් වෙන්ට ඇත. මැණියන් වහන්සේට ජීවිතදානය දෙව"යි කීහ.

වැදිත් "යහපතැ"යි කියා බෝධිසත්ත්වයන්ගේ මලණුවන් විද මරා ඉක්බිත්තෙහි "මාගේ ගෙයි කොල්ලෝවත් කාපියති" සිතා බෝධිසත්ත්වයන්ගේ මවු වැදිරිත් විද මරා එලාගෙන තුන්දෙනම කද බැඳගෙන නික්මින.

ඒ වේලාවට උගේ ගෙට හෙණක් ගසා දරුවන් දෙන්නත් මැණියනුත් මැරිනි. තමන් ඒ අසා අත තුබූ දුනුදඬු දමා දඩමස් කදත් දමා කඩ ඉරා කරලාගෙන ගෙට ගොස් ගෙයි තුබූ දැ ගිය කණුවක් ඉස වැටින. ඒ වේලාවට පොලවත් විවර වී අවීචි මහනරකයෙන් ගිනිදැල් ඇවිත් ඇඟ ඉස වසාගත.

එවිට නරකයට යමින් සිට කියන්නේ "යම් සේ මාගේ දිසාපාමොක් ආචාරීන් වහන්සේ විසින් 'කා කෙරේවත් ද්වේෂයක් නොකරව'යි කියනලද අවවාදයේ විපාක අදම ලදිමි. ඒ එසේමය, යම් සේ කල්‍යාණ ධර්මයක් කළ කෙනෙක් ඇත්නම් කල්‍යාණ ධර්මය දකිති. යම් අකුශලයක් කළ කෙනෙක් ඇත්නම් අකුශලයක්ම දකිති. ඒ එසේමය, තමා වපුළා වූ බිජුවටින් නැගෙන්නා වූ ඵලයත් එසේම වේදැ"යි යනාදීන්

කියා ගොසින් අවීචි මහනරකාදියෙහි වැටුනාහයි වදාරා මේ 'චුල්ලනන්ද ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි එකියන වැදි නම් දේවදත්ත ස්ථවිරයෝය. දිසාපාමොක් ආචාරී නම් ශාරිපුත්ත ස්ථවිරය. එසමයෙහි බෝධිසත්ත්වයන්ගේ මව් වැඳිරි නම් ප්‍රජාපතී ගෝතමි ස්ථවිරියන් වහන්සේය. බෝධිසත්ත්වයන්ගේ මල් වූ චුල්ලනන්ද වඳුරු නම් ආනන්ද ස්ථවිරයෝය. එසමයෙහි වඳුරන්ට රජ ව උපන්නා වූ වානරරජ නම් බුදු වූ මම්ම ය"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

## 222. පුටභත්ත ජාතකය

තවද මුළුලොවට කල්‍යාණමිත්‍ර වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් කෙළෙඹි පුත්‍රයෙකු නිසා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

එක්තරා කෙළෙඹි පුත්‍රයෙක් පසල්ගම්වාසී එක්තරා මනුෂ්‍යයෙකුට ණයක් දී පෙරලා ඒ ණය එලවන්ටයයි සැවැත් නුවර සිට පසල්ගමට ගොස් තමන්ගේ ණය නොදෙන හෙයින් ඒ ණය ඉල්වා ආ කෙළෙඹි පුත්‍රයා හා ඔහුගේ බිරින්ද ණය දරන්නන් හා කැටිව දබරකොට ගෙන දෙමහල්ලන් බත් කන්ට කියද්දී බතුත් නොකා නික්මුනාහ.

අතරමඟ යන කලට එක්තරා මනුෂ්‍යයෙක් දෙමහල්ලන්ගේ මුහුණ වැහැරී තිබූ හෙයින් බත්මුල පුරුෂයා අතට දුන්නාහ.

ඒ පුරුෂයාත් ඒ බත් ස්ත්‍රීට නොදී කනු කැමැතිව භාර්යාවට කියන්නේ "මේ වල සොරු ඇත, එසේ හෙයින් තොපි ඉදිරියේ යව"යි කියන්නා ඒ ස්ත්‍රීන් "ඇත්තකැ"යි සිතා ඉදිරියෙන් නික්මුනාහ.

එවිට ඒ පුරුෂයා බත්මුල උනා බත් කාපියා ස්ත්‍රියට කියන්නේ "එම්බල, තුමූ ඇම බත් කාපියා තුබූ සිස් මුලය අපට දුන්නේය"යි කිවුය. ඒ අසා ස්ත්‍රිය "මා දැක්කදී දුන් බත්මුල මට නොදී තෙමේම කා දැන් මට සිස් බත්මුල පෑය"යි විකේෂ්පව දෙන්නම එක්ව සැවැත් නුවරට එන්නා වූ ජේතවනාරාමයෙහි පොකුණෝන් නා "බුදුන් දැක යම්මැ"යි සිතා සැප සේ පොකුණෝන් නා සර්‍වඥයන් වහන්සෙ දකින්ට ගියහ.

සර්‍වඥයෝත් ඒ දෙමහල්ලන් දැක "ඇයි උපාසිකාවෙනි, උපාසකයන් කෙරේ ස්නේහ ඇත්තේදැ?"යි විචාළාහ. එවිට උපාසිකා කියන්නී "ස්වාමීනි, මා මුන්ට ස්නේහ ඇති පමණක් මිසක්, මූ මා කෙරෙහි සෙනෙහස නැත්තාහ. අද අතරමග දී එමින් සිටියදී දුන් බත්මුල මා සිටියදී තෙමේ කාපීය. මේ මා කෙරේ ඇති සෙනෙහස දැ?"යි කියා සර්‍වඥයන්ට දැන්වූහ. සර්‍වඥයෝත් "උපාසිකායෙනි, දැන්මතු නොවෙයි, පෙරත් තොපි මුන් කෙරෙහි සෙනෙහස ඇත්තෝමය. මූ තොපි කෙරෙහි සෙනෙහස නැත්තෝමය. මම නුවණැත්තන්ගේ බසින් පෙරලා උනුන් කෙරේ සෙනෙහස වූවෝ වේදැ"යි වදාර "ඒ

කෙසේද?”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ පුතණු කෙනෙකුන් ඇත්තාහ. ඒ පුතණුවෝ වැඩිවිය පැමිණ රජ්ජුරුවන්ට යුවරජ තනතුරෙහි සිටියාහ. එකියන බාරාණසී කුමාරයන් කෙරෙහි සැකව කියන්නාහු “තොපි පලා ගොසින් පාසල් නුවරක ඉඳ ඉක්බිති රාජ්‍යය කරන්නට එව”යි කීහ. “යහපතැ”යි කියා ඒ රාජකුමාරයෝ තමන්ගේ අගමෙහෙසුන් බිසවු අත අල්වාගෙන පසල් රටකට පලා ගොස් වාසයකොට උන් කලට පියරජ්ජුරුවන් මළ පවත් අසා රාජ්‍යයට නික්මුනාහ.

අතරමඟ යන කලට එක්තරා මනුෂ්‍යයෙක් දෙමහල්ලන්ගේ මුහුණු වැහැර තිබූ හෙයින් බත්මුලක් කුමාරයන් අතට දුන්නාහ. ඒ රාජකුමාරයෝත් තමන්ගේ බිසවුන්ට නොදී කනු කැමැත්තේ බිසවුන්ට කියන්නේ “මේ වල සොරු ඇත. එසේ හෙයින් තෙපි ඉදිරියේ යව”යි කියන්නා ඒ බිසවුනුත් “ඇත්තකැ”යි සිතා ඉදිරියෙන් නික්මුනාහ.

එවිට රාජකුමාරයෝ බත්මුල උනා බත් කාපියා බිසවුන්ට කියන්නේ “එම්බල, හැම බත් කාපීය. බත් නොතිබූ සිස් මුල අපට දුන්නේය”යි කීය. ඒ අසා බිසව “මා දැක්කදී දුන් බත්මුල මට නොදී තෙමේ කා සිස් බත්මුලක් පෑයේය”යි

විසෙක්පව දෙන්නම සමඟව බරණැස් නුවරට අවුත් රාජකුමාරයෝත් රාජ්‍යයට පැමිණ බිසවුන්ට අගමෙහෙසුන් තනතුරු දුන්නාහ. ඒ දුන් පමණක් මිසක් කරුණාවක් බිසවුන්ගේ දුක්සුව විචාරන්නක් නැත්තාහ.

එසමයෙහි බෝධිසත්ත්වයෝ ඒ රජ්ජුරුවන්ට අමාත්‍යව උපන්නාහ. එක් දවසක් බිසවු ලඟට ගොස් කියන්නාහු "ඇයි දේවීන් වහන්ස, අප සේ වූ වයෝවෘද්ධයන්ට බත්කඩ ආදී වූ දෙය දී සාදුක් විචාරන්ට එපාදැ?"යි කීහ.

එබස් බිසව් අසා "පියාණනි, මාගේ පොහොසත්කම් විවර කට වේද? මාත් සංග්‍රහ කරන්නේය"යි කියන්නා "ඇයිද? නුඹවහන්සේ අගමෙහෙසුන් බිසවුන් වහන්සේ නොවේදැ?"යි කියන්නාම "අගමෙහෙසුන් බිසවු මිසක් මා ඇති නියාවත් සාමින් නොදන්නාසේක. දැන් රාජ්‍යය පුරුදුවපියා සිතත්නේ කෙසේද? පෙර දුප්පත් ගමනේ රාජ්‍යය ලබන්ට එන ගමනේ පවා අතරමඟ දී බත්මුලක් ලත් ගමනේ මට නොදී කාපුසේක. එසේ වූ ද එසේ කල දැන් තමාම වේදැ"යි කීහ.

එවිට බෝධිසත්ත්වයෝ කියන්නාහු "රජ්ජුරුවන් දැක්කදීත් මා විචාළ කල එවිටත් මේ මානේ කියනසේක්දැ?"යි විචාළසේක. "යහපතැ"යි කියමි කීහ.

එවිට බෝධිසත්ත්වයෝ කියන්නාහු "එසේ වීනම් දැන්ම ගොසින් රජ්ජුරුවන් ලඟ සිටිමි. නුඹවහන්සේ එතනට අව මැනවැ"යි කියා බෝධිසත්ත්වයෝ රජ්ජුරුවන් ලඟ කථාකොට සිටියාහ. ඒ වේලාවට බිසවුන් රජ්ජුරුවන් ලඟට ගොස්

රජ්ජුරුවන් වැඩ සිටියාහ. එවිට බෝධිසත්ත්වයෝ බිසවුන් අතින් විචාරන්නාහු "ඇයි දේවීන් වහන්ස, නුඹවහන්සේ අප සේ වූ වයෝවෘද්ධයන්ට බත්කඩ ආදී වූ දේය දී දුක්සැප විචාරන්නට එපාදැ?"යි කීහ. එබස් බිසව් අසා "පියාණෙනි, මාගේ පෝසත්කම් විවරට වේද? මාත් සංග්‍රහ කරන්නේය"යි කියන්නා "එසේ කියන්නේ ඇයිද? නුඹවහන්සේ අගමෙහෙසුන් බිසවුන් වහන්සේ නොවේදැ?"යි කියන්නා "මා අගමෙහෙසුන් පමණක් මිසක් සාමින් මා ඇති නියාවත් නොදන්නාසේක. දැන් රාජ්‍යය පුරුදුවපියා සිතන්නේ කෙසේද? පෙර දුප්පත් සමයේ රාජ්‍යය ලබන්ට එන ගමනේ පවා අතමඟදී බත් මුලක් ලත් ගමනේ මට නොදී කාපුසේක. එසේ කළ දැන් තමාම වේදැ"යි කීහ.

එබස් අසා බෝධිසත්ත්වයෝ කියන්නාහු "දේවයන් වහන්ස. කීවේ ඇත්තදැ"යි විචාළාහ. එවිට රජ්ජුරුවෝ මුවෙන් නොබැන ඉවසූහ. ඒ පවත් දැක බෝධිසත්ත්වයන් වහන්සේ බිසවුන්ට කියනසේක් "දේවීන් වහන්ස, නුඹවහන්සේ කෙසේ කරුණාව ඇතත් රජ්ජුරුවන් වහන්සේ නුඹවහන්සේ කෙරේ ඇල්ම නැතුව වාසය කරමින් සිටියදී ළඟ විසීම රජ්ජුරුවන් වහන්සේ ගේ සිතට සැපයෙක් නැත. එසේ හෙයින් නුඹවහන්සේට මෙතනම යයි කියා ඇද්ද? සෙසු අනික් ස්ථානයකට ගොසින් ජීවත් වන්නාසේක්දැ"යි කීහ. එබස් රජ්ජුරුවෝ අසා තමන්ගේ රාජ්‍යශ්‍රී බිසවුන්ට දී එතැන් පටන් ප්‍රියවාසය කළාහයි වදරා 'පුටභත්ත ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි ඒ දෙමහල්ලෝ නම් තොපි දෙමහල්ලෝමය, ඒ අමාත්‍යව උන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 223. කුම්භීල ජාතකය

තවද තුන්ලොවට නායක වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි දෙව්දත් තෙරුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

එක් දවසක් ධර්‍මසභා මණ්ඩපයෙහි රැස් වූ බොහෝ භික්‍ෂූන් වහන්සේ "දේවදත්ත ස්ථවිරයෝ බුදුන් නසන්ට මහත් උත්සාහවීර්‍ය්‍යී කොටත් කරගත නුහුණුවෝය"යි කිය කියා උන් තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි අසා වදාරා "මහණෙනි, දෙව්දත් තෙරණුවෝ පෙරත් තථාගතයන් වහන්සේ නසන්ට උත්සහ කොටත් කරගත නුහුණුවෝම වේදැ"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුැ කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි අප මහබෝසතාණෝ හිමාලය වනය සමීපයෙහි වඳුරු යෝනියෙහි ඉපිද ඇත් හා සමාන බල ඇති ඒ වානර තෙමේ ගඟකින් එතෙර මෙතෙර යන්නේ ඒ ගඟෙහි වාසය කරන කිඹුල් ධේනුවක් තොමෝ මහබෝසතාණන් දැක හදවත කන්ට දොළෙක් උපන. ඒ බව

තම ස්වාමිපුරුෂයා වූ කිඹුලාණන්ට කීය. ඒ කාරණය ඇසූ කිඹුලාණෝ මහබෝසතාණන් අල්වන්ට බොහෝ උත්සහ කොටත් නොහැකිව ඒක් දවසක් මහබෝසතාණන්ට මෙසේ ස්තූති කෙළේය. "වානරෙන්ද්‍රයන් වහන්ස, නුඹවහන්සේගේ සත්‍යයද, ප්‍රඥාව හා ධෛර්‍ය්‍යයද, ත්‍යාගයද යන මේ විශේෂයෙන් යහපත් වූ ගුණයන් කරණ කොටගෙන සතුරන් ජයගන්නේය"යි කියා ලජ්ජාවට පත්ව යන්න ගියේය.

"එසමයෙහි කිඹුල්ධේනුව නම් දැන් චිඤ්චි මානවිකාය. කිඹුලාණෝ නම් දේවදත්ත ස්ථවිරයෝය. වානර ව උපන්නෙමි බුදුවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 224. බත්ති(ය) වණ්ණන ජාතකය

තවද 'කුම්භීල ජාතකය' පළමු කියන ජාතක වලින්ම විස්තර වශයෙන් පෙණෙන්නේය.

තවද මුළුලොවට එකබන්ධු වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කෝසල රජ්ජුරුවන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

කෝසල රජ්ජුරුවන්ට වැඩ පසස්නා එක් අමාත්‍යයෙක් අන්තඃපුරයට එක් ද්‍රෝහයක් කළේය. රජ්ජුරුවෝ උන් කෙරේ ක්‍ෂමාකොට එපවත් සර්‍වඥයන් වහන්සේට සැළ කළාහ. සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි උන්ගේ එක්තරා වැඩ පසස්නා අමාත්‍යයෙක් අන්තඃපුරයට ද්‍රෝහයක් කෙළේය. ඒ අමාත්‍යයාගේ ගෙට උගේ ගෙයි එක් මිනිසෙක් ගෙට වැද ද්‍රෝහ කෙළේය. එකියන අමාත්‍යයා තමාගේ ගෙයි ද්‍රෝහ කළ තැනැත්තහු අල්ලාගෙන රජ්ජුරුවන්ට පෑ කියන්නේ "දේවයන් වහන්ස, මට වැඩ පසස්නා මාගේ ගෙයි එක් මිනිසෙක් මා ගෙට වැරදින. උඟට කුමක් කරම්දැ?"යි විචාළහ.

එවිට රජ්ජුරුවෝ කියන්නාහු "එම්බල, මාගේ ගෙයිත් එක් වැඩ පසස්නා අමාත්‍යයෙක් ද්‍රෝහ කළේය. එසේ හෙයින් උන් කෙරේ තොප විසින් මෛත්‍රී කරව"යි කීහ. එබස් අමාත්‍යයෝ "සාමීනි, මාත් සිතාය මේ කිවේය"යි සිතා එවක් පටන් අන්තඃපුරයට ද්‍රෝහ කරන්නට නොසිතීයයි වදරා 'බත්තිවණ්ණ ජාතයය' නිමවා වදාළසේක.

"එසමයෙහි රජව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 225. කෝසිය ජාතකය

තවද මුළුලොවට තිලක වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කෝසල රජ්ජුරුවන් අරභයා මේ ජාතකය දක්වන ලදි. මෙහි වර්ථමාන කථාව ඉකුත්වත සේමයයි දතයුතු.

ඒ කෙසේද? යත්,

එක් රජ්ජුරු කෙනෙක් නොකාලයෙහි යුද්ධයට නික්ම මඟුල් උයන කඳවුරු බැඳගෙන උන්නාහ. ඒ වේලාවට එක් බකමූහුණෙක් උණ පඳුරක් මධ්‍යයෙහි සැතපුනේය. කවුඩෝ උණ පඳුර වටකොට ගෙන උන්නාහ. බකමුහුණු තමාට බල ඇතිව රූපිවත් නොවී දහවල්ම පිටත් විය. එවිට වටකොට ගෙන උන් කවුඩෝ ඔළුවේ ඇන එතන එලාපූවාහ. රජ්ජුරුවෝත් ඒ දැක තමන්ට අමාත්‍යකම් කරමින් සිටියා වූ බෝධිසත්ත්වයන් අතින් "මේ කිමෙක්දැ?"යි විචාළහ.

බෝධිසත්ත්වයෝ කියන්නාහු "රජ්ජුරුවන් වහන්ස, මේ බකමූහුණා තමාට නොකාලයෙහි පිටත් වූ හෙයින් බොහෝ විනාශයට පැමිණියේය. ඉදින් දේවයන් වහන්ස, බකමූහුණා සෙසු බකමුහුණන් පිටත්වන රෑට මෙයින් පිටත් වීනම් අන්තරායක් නොවී සැපසේම පලා යන්නේය"යි යනාදීන් වදාළසේක.

රජ්ජුරුවෝ ඒ අසා "යහපතැ"යි සිතා පෙරලා රජගෙට ගියහයි වදාරා 'කෝසිය ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. එසමයෙහි අමාත්‍යයව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 226. ගුථපාණී (පානක) ජාතකය

තවද මුළුලොවට අමා වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා භික්ෂූන් කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

සැවැත් නුවර ගව්වක් දෙගව්වක් ව්වරක දී උපාසකරුන් දන්නා ගමක් ඇත්තේය. එසේ වූ උපාසකවරු බොහෝ භික්‍ෂූන් වහන්සේලාට ලා බත් පොහෝ බත් ආදී වූ බොහෝ බත් දනය දෙන්නාහ.

එසමයෙහි ඒ ගම ඉන්නා ප්‍රශ්න ගුණ්ඨිකයෙක් ඇත. ඒ තෙම සාමණේර, මාළු භික්‍ෂූන් වහන්සේ ආ කල ප්‍රශ්න ගුණ්ඨිකයා විසින් දක්නාලද සේ "දන් කාපුවායේ විපාක කිම්දැ?"යි යනාදීන් ප්‍රශ්න විචාරයි. එවිට භික්‍ෂූන් වහන්සේ කියාගත නුහුනු වේලේ තෙමේ බණ කියන්නේය. එසේ හෙයින් මූ කරන අලෝහල නිසා බොහෝ මාළුවරුන් වහන්සේ ලා බත් පොහෝ බත් නිසා යන්ට මැලි වූහ.

එසමයෙහි පිටිසර සිට භික්‍ෂූන් කෙනෙකුන් වහන්සේ ජේතවනාරාමයට වැඩිසේක. ජේතවනාරාමයෙහි භික්‍ෂූන් වහන්සේ අතින් "ලා බත් පොහෝ බත් කොයි දී දෙන්නේදැ?"යි විචාරා "අසවල් ගමදීය, ඒ ගමට ප්‍රශ්න ගුණ්ඨිකයෙක් බොහෝ භික්‍ෂූන් වහන්සේ ගිය වේලේ නොයෙක් ප්‍රශ්න විචාරා ගැහැට කරන්නේය. එසේ හෙයින් ඔබ්බට යන්නේ කුමටදැ?"යි කීහ.

එවිට භික්‍ෂූන් වහන්සේ "අද දවස ලා බත් මට පමුණුවන්නාහ. මම ඉනිබ්බේ තර්කයක්, වාදයක් නොකරන ලෙස සලස්වාලමි" කීහ. "යහපතැ"යි කියා එදවස් උන්වහන්සේට පොහෝ බත් සැලැස් වූසේක. උන් වහන්සේත්

"යහපතැ"යි ගමට ගොස් ගම කෙළවර සිට සිවුර ගැට ගන්වන්ට වන්සේක. ඒ වේලාවට එකියන ප්‍රශ්න ගුණ්ඩිකයා අනින්ට දිවන්නා වූ බැටළුවෙකු මෙන් එතනට අවුත් "කුමක්ද දන් වළඳන්ට අවුද? මේ ගමට වන්නේ, එසේ හෙයින් දන් කෑ විපාක කිම්දැ?"යි විචාළේය. "යහපත දන් වළඳ ඉක්බිති ප්‍රශ්න කියම්මය"යි කීසේක. "යහපත" කියා ගමට ගොස් කැඳ වැළඳූසේක. ඒ වේලේ "බත් වළඳ ඉක්බිත්තෙන් කියම්මය"යි කියා ඉක්බිති බත් වළඳ අන්තයෙහි ඌ විසින් ප්‍රශ්න විචාරන්නා "යහපත මෙතන දී බැරිය, ගමින් කෙළවරවල දී කියමි" කියා ඌ හා සමග ගමින් කෙළවරට ගොස් පාසිවුරු එක් තැනක තබා යාපත්කොට අතින් බැට කැඩෙන සැටියේ ඇන "මේ මාගේ ඇන්න බැන්දයින් කුමන විපාකයෙක් ඇද්දැ?"යි කියා "අදවක් පටන් මේ ගමට ආ මාළුවරුන් වහන්සේ කෙරේ ඉනිබ්බේ ප්‍රශ්න විචාළා නම් දන්නමෝද්දැ"යි කියා භය ගන්වාලා ගියසේක. එතැන් පටන් ඒ භික්‍ෂූන් වහන්සේලාට ඒ චරපුරුෂයාගෙන් භය නුවුයේය.

මේ කථාව එක් දවසක් ධම්සභා මණ්ඩපයෙහි රැස් වූ මාළුවරුන් වහන්සේ කිය කියා වැඩඋන් තැනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා එපවත් අසා "මහණෙනි, දැන්මතු නොවෙයි, පෙරත් ඒ භික්‍ෂූන් විසින් උන්ට නිග්‍රහ කරන ලද්දේ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස අඟුරට හා මගධරට වාසී සත්ත්වයෝ උනුන් හා සමග වෙළඳම් ආදී වූ දෙය කරන පිණිස උනුන්ගේ රටට යන්නා වූ එක් දවසක් දෙරටවාසී මනුෂ්‍යයෝ මගධරට සීමාව කෙරේ ගඟක් සමීපයට අවුත් එහි ඉඳ නොයෙක් රා මස් කා බී උන්නාහ.

ඒ වේලාවට එක් ගූ කුරුමිණියෙක් එතනට අවුත් මනුෂ්‍යයන් බී ඉතිරිව දමා ලූ ගොටුවල තිබූ රා බී මත්ව අසූචි ගොඩක් පිට ඉඳ "යන්තමක් අසූචි මුගේ බරින් සැලියන්නා පොළොවට බරින් ධරාගත නොහෙ"යි කියා මහත් වූ අහංකාරයෙන් උන් වේලාවට ත්‍රිමදගලිත හස්ති රාජයෙක් එතනට අවුත් අසූචි දුර්ගන්‍ධය අසා පෙරලා කරකැවී නික්මෙන්ට වන් වේලාවට ගූ කුරුමිණියා කියන්නේ "ඇයි හස්ති රාජය, සපන් වූ සේවායෝ උනුන් දුටුකල බිඳී යෙද්ද? එසේ කල හස්ති රාජයා මා හා යුද්ධකොට යෙද්ද?" කියා කීය.

එබස් ඇත් අසා කරකැවී සිට කියන්නේ "තා හා මා හා කුමන යුද්ධ කරන්නේද? මාගේ පිරිසිදු වූ පයින් තා නොමඩිත් වුව, දලින් නොහනුත් වුව, මාගේ සොඬින් තා නොගසත් වුව, තා උන්ගේ අසූචි පිටය, එසේ හෙයින් තට අසූචියෙන් නිග්‍රහ කෙරෙමි" කියා කුරුමිණියා ලඟට අවුත් වර්චස් පිඩක් උඃ පිට හෙළා මුත්‍රකොට කුඤ්චනාද කොට

නික්මිණ. ඒ කුරුමිණියාත් එතනම ජීවිතක්‍ෂයට පැමිණියේ යයි වදරා “ගුථපාණි ජාතකය’ නිමවා වදාළසේක.

එසමයෙහි කුරුමිණියා නම් ප්‍රශ්නගුණ්ඨික නම් පුරුෂයායාය, එසමයෙහි හස්ති රාජයා නම් නිග්‍රහ කළ භික්‍ෂූහුය, මේ කාරණය ප්‍රත්‍යක්‍ෂව දුටු වන දේවතාවා නම් බුදුවූ මම්ම ය”යි වදාළසේක.

## 227. කාමනීය (කාමනීත) ජාතකය

තවද මුළුලොවට රසායන වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසනසේක් කාමනීය නම් බ්‍රාහ්මණයා අරභයා මේ ජාතකය දක්වන ලදි. මෙහි වර්ථමාන කථාවත් දසවෙනි නිපාතයෙහි විස්තර වශයෙන් දක්නේය.

මෙහි බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ බෑණා වන බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ “එපා”යි කියා ඇරපු රාජ්‍යය පෙරලා අවුත් ඇරගෙන ලොභ, ද්වේෂ, මෝහ ඇතිව රාජ්‍යය කරන්නාහ.

ලෝභයෙන් රාජ්‍යය කරන නිසා ශක්‍ර දේවේන්ද්‍රයා දැන “මම ගොසින් මේ රජ්ජුරුවන් රවටා පියා අයින් නම් යහපතැ”යි සිතා බ්‍රාහ්මණ වේශයෙන් අවුත් කියන්නා “දේවයන් වහන්ස, බොහෝ ඇත්, අස්, රථ, පාබල සෙනඟින් සමුර්ධ වූ මුතු, මැණික්, සංඛ, ශිලා, ප්‍රවාලා දී අනන්ත රත්නයෙන් සමුර්ධ වූ මද සේනාවකින් ජයගත හැක්කා වූ

උත්තර පඤ්චාල නුවරය, ඉඳිපත් නුවරය, කෙක නම් රාජධානිය යන තුන්රටක් දැක නුඹවහන්සේට කියන්ට සිතා ආමි. එසේ හෙයින් ප්‍රපඤ්ච නොකොට සෙට උදෑසනක් සේ චතුරාංගිනි සේනා සමුර්ධකොට නික්මෙන්ට උවමැනව"යි කීහ.

රජ්ජුරුවෝත් ඒ අසා සතුටුව "උදෑසනක් සේ මා කරා එව"යි කියා යැවූහ. ශක්‍ර දේවේන්ද්‍රයෝත් තමන්ගේ ශක්‍ර භවනයට නැඟී ගියාහ. රජ්ජුරුවෝත් පසු දවස් චතුරාංගිනි සේනාව සමුර්ධකොට "ඊයේ අපට රාජ්‍යය තුනක් දෙම්මැයි කී බ්‍රාහ්මණ මානවකයා කොයිදැ?"යි කියා අමාත්‍යයන් අතින් විචාළාහ. අමාත්‍යයෝ කියන්නාහු "අප විසින් උන්ට බත බුලතක් දෙන්ට සැලැස්සුවේ නැත. ස්වාමීන් විසින් සලස්වා වදාළේදැ?"යි වාචාළහ. රජ්ජුරුවෝ "මා එසේ කළා දෙයත් නැත. එසේ වුවත් එක් තෙනක ඉඳිය, ගොසින් බලව"යි කීහ. "යහපතැ"යි අමාත්‍යයෝත් ඒ ඒ තැන බලා නුදුටුවාහ. රජ්ජුරුවෝත් "එසේ වීනම් අපගේ කිසි සංග්‍රහයක් නොකළ විසින් ඉනිබ්බේ රටකට ගියාවනැ"යි සිතා බොහෝ විඝේෂපයට පැමිණ "මා විසින් බොහෝ ලාභයෙන් පිරිහෙන ලදැ"යි කළකිරී ඒ නිසාම ළය හුණුව රක්තපිත්ත අතීසාරයට පැමිණියාහ. බොහෝ වෙදවරුන් විසින් පිලියම් කරන ලදුවත් සහනයක් නුදුටුවාහුය.

එපවත් ශක්‍රයෝ දැන "මා විසින් එතනට ගොසින් රජ්ජුරුවන්ගේ සෝකයත් අරවලා ලෙඩෙත් සුවකොට රජ්ජුරුවන්ගේ ලෝභි සිතත් අරවා එමි" සිතා බ්‍රාහ්මණ

වේශයක් ඇරගෙන රජ්ජුරුවන්ගේ මාලිගාව දොරකඩ සමීපයෙහි සිට "වෙදකම් දන්නා වෙදෙක් රජ්ජුරුවන්ගේ රක්තාසීසාරය සුව කරන්නට ආමි" කීහ. රජ්ජුරුවෝ එපවත් අසා "මහවෙදවරුන් පිළියම් කරන ලදුව සුවකොටගත නුහුණු ව්‍යාධිය සුව කරන්නට මුන්ට පිළිවන්ද? යම් ලාභයක් කොටපියා යවාපියව"යි කීහ.

එපවත් ශක්‍රයෝ අසා "මම ලාභයක් තකා ආවෙම් නොවෙමි. රජ්ජුරුවන් වහන්සේගේ ලෙඩ සුව කරන පිණිස ආමි" කීහ. එබස් රජ්ජුරුවෝ අසා "එසේ වීනම් කැඳව"යි කියා තමන් ලඟට ගෙන්වා ගත්තාහ. ශක්‍රයෝත් රජ්ජුරුවන් ලගට අවුත් රජ්ජුරුවන්ට කියන්නාහු "දේවයන් වහන්ස, රක්තපිත්ත අතීසාරය ඇතිවන කල භයින් ශෝකයෙන් හා ආදී වූ දෙයින් ඇති වන්නේය. නුඹවහන්සේට ඇති වූයේ කුමන කාරණයක් මුල්වද? ඒ කීවොත් වේද නිදන් දැන පිළියම් කරන්නේය"යි කීහ.

එබස් රජ්ජුරුවෝ අසා "එම්බල බ්‍රාහ්මණය, එක්තරා බ්‍රාහ්මණ මානවකයෙක් මා කරා එලඹ පඤ්චාලරට හා ඉඳිපත් නුවර හා කෙකයා නම් රට හා යන රට තුනක් මට සාදා දෙමි කියා කීය. මමත් ඔහුට කිසි සංග්‍රහයක් නොකෙළමි. ඒ තෙම ඒ නිසා 'කටයුත්තක් කීමට සංග්‍රහයක් නොකළසේකැ'යි සිතා 'ඔබ්බේ රටකට ගියේ වනැ'යි සිතා 'මා විසින් අපරීක්ෂාකාරී වීමෙන් මේ නියා ලාභයකින් පිරිහි

ගියෙමි' සිතා උපන්නා වූ සෝකය මුල්කොටගෙන මේ ව්‍යාධිය ඇති වීය"යි කීහ.

එබස් ශුක්‍රයෝ අසා "රජ්ජුරුනි, බරණැස් නුවරට හා ප්‍රාර්ථනා කරන්නා වූ නුවර තුන ඇතුළුව රාජ්‍ය සතරකට තොපි රාජ්‍යය කරවා නමුත් සතර නුවරින් පිළි සතරක් අඳුද? සතර නුවරක රාජ්‍යය කරමියි කියා මණ්ඩා සතරකින් බත කවුද? යාන් සතරක සැතපෙව්ද? වාහන සතරකට නැගී යව්ද? එසේ නොයන විසින් තමා කෙරේ පැමිණි රාජ්‍යයට ලෝභ කිරීමෙන් පැමිණියා වූ ආයාස දුටුසේක් වේද? එසේ විසින් නුඹවහන්සේගේ ව්‍යාධියට මා හැර දඹදිව අනික් වෛද්‍යයෙක් පිළියම් කළ නොහෙමි"යි කීහ.

එවිට රජ්ජුරුවෝ "යහපතැයි වෛද්‍යයාණෙනි, තොප විසින් දන්නා යම් උපායකින් මාගේ සෝක සන්හිඳුවා ව්‍යාධි සුව කරව"යි කීහ. එවිට ශක්‍රයෝ "යහපතැ"යි කියා රජ්ජුරුවන්ට අවවාද කියන්නාහු "මහරජ්ජුරුවෙනි, යම් සේ ලොභ, ද්වේෂ, මෝහා දී වූ දෙය නුවණැත්තන් විසින් ප්‍රසංසා කරනු නොලැබෙයි. ඉඳුරාම එයත් අකුසලට භාජනව තිබෙයි කියා නරකා දී වූ දුකට පමුණුවා ලව"යි කියා නරක දක්වා රජ්ජුරුවන් භයගැන් වූහ. ඉක්බිති "රජ්ජුරුවෙනි, ඉනිබ්බේ තොප විසින් රාග, ද්වේෂ, මෝහා දී පාපයන් දුරුකොට දශරාජ ධර්මයෙන් අකොප්‍යව රාජ්‍යයකොට ශක්‍ර සම්පත් අත්පත් කරව"යි කීහ. රජ්ජුරුවොත් ශක්‍රයන්ගේ බස් අසා තමන් සිත ලෝභය අළහ. ඒ ක්‍ෂණයෙහි ව්‍යාධියත්

සන්සිඳෙන, ශක්‍රයෝත් තමන්ගේ දිව්‍ය භවනයටම ගියහ. රජ්ජුරුවෝත් දැහැමෙන් සෙමෙන් රාජ්‍යයකොට මිය පරලොව ගියාහයි වදරා 'කාමනීය ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් මෙසමයෙහි කාමනීය බ්‍රාහ්මණයාය. ශක්‍රදේවේන්ද්‍රව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 228. පලාස (පලායි) ජාතකය

තවද මුළුලොවට නිවන්සුව දෙන්නා වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පලාස පරිබ්‍රාජකයන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

පලාස නම් එක් පරිබ්‍රාජක කෙනෙක් මුළු දඹදිව තමන් හා සරිව වාද කරන කෙනෙක් නැතිව සැවැත් නුවරට අවුත් "මා හා සමඟ තර්ක කරන්නේදැ?"යි කීහ.

එවිට නුවරවාසීහු "පරවාද මර්දන කරන සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි තා සේ වූ පරිබ්‍රාජකයෝ සියෙක් දහසකුත් ඔබවහන්සේ දැක්ක දී එක බසකුත් කියාගත නොහෙන්නාහ"යි කීහ. එබස් පරිබ්‍රාජකයෝ අසා "එසේ නම් මාත් ශ්‍රමණ භවත් ගෞතමයන් ලා කැටිව කථා බිඳක්කොට පියන්ට උවමැනවැ"යි සිතා බොහෝ දෙනා පිරිවරා ගොස් ජේතවනාරාමයෙහි සත්වන දොරටුව දැක "මේ

සර්‍වඥයන් වසන්නා වූ ශ්‍රී ගන්‍ධකුටියදැ?”යි විචාළේය. එපවත් අසා මනුෂ්‍යයෝ කියන්නාහු “පරිබ්‍රාජකය, සර්‍වඥයන් වසන්නා වූ ගඳකිළි වෛජයන්ත ප්‍රාසාදය මෙන් තුබුයේය. මේ වනාහී සත්වන දොරටුවය”යි කීහ. එබස් පරිබ්‍රාජකයා අසා “සත්වන දොරටුව මෙසේ වන්කල ඉන්නා ගණය කෙසේ තිබේද? එසේ වූ තෙන ඉන්නා සර්‍වඥයන්ගේ නුවණ කෙබඳුදැ?”යි තර්ක කරන්ට හයින්ම බිඳී පලා ගියේය.

බොහෝ උපාසකවරුත් ඔල්වර හඬ ගසා සර්‍වඥයන් සමීපයට ආහ. සර්‍වඥයෝත් “ඇයි උපාසකවරුනි, නොකල් වේලේ ආ වනැ?”යි විචාරා එපවත් අසා “මේ පරිබ්‍රාජක දැන්මතු නොවෙයි, පළමුත් මා කරා අවුත් සත්වන දොරටුව දැක බිඳී පලා ගියේ වේදැ”යි වදරා “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස ගන්‍ධාර රට තක්සලා නුවර බෝධිසත්ත්වයන් රාජ්‍යය කරන සමයෙහි බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුත් “තක්සලා නුවර ගනුම්හ”යි චතුරාංගිනී සේනාව පිරිවරා නුවරට අවුත් “මාගේ ත්‍රිමදගලිත යුද්ධ යොග්‍ය හස්ති සේනාව මෙලෙස මෙහෙයත්වායි ඒ නියායෙන් සන්නාහ සන්නද්ධ වූ අශ්ව සේනාව මෙලෙස මෙහෙවත්වායි රථාලංකාරයෙන් සරහනලද රථ සමූහය මෙලෙස මෙහෙත්වයි පබලසෙන් මෙසේ දිවෙත්වයි ශර වර්ෂාවක් මෙන් ශර වර්ෂයාවත්වයි කඩුගත්තා වූ යෝධයෝ ඒ ඒ තැනින්

පැනනැගී මනුෂ්‍යන් පොළු ගසත්ව"යි යනාදී වූ සේනාවට විධාන කෙරෙමින් නුවරට අවුත් සත්වන දොරටුව දැක "මේ රජ්ජුරුවන් ඉන්නා මාලිගාවදැ?"යි විචාරා මනුෂ්‍යයන් විසින් "මේ මාලිගාව නොවෙයි, සත්වන දොරටුවය"යි අසා "දොරටුව මෙසේ කල රජ්ජුරුවන් ඉන්නා මාලිගාව කෙසේදැ?"යි සිතා බිඳී ගියහයි වදරා මේ 'පලාස ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් පලාස පරිබ්‍රාජකය. තක්සලා නුවර රජ ව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

## 229. ද්විතීය පලාස ජාතකය

තවද මාගේ ස්වාමිදරු වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පලාස පරිබ්‍රාජක නම් එකෙකු අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද? යත්,

පලාස නම් පරිබ්‍රාජකයෙක් බොහෝ මනුෂ්‍යයන් පිරිවරා ජේතවනාරාමයට සර්‍වඥයන් හා තර්කයට ගොස් සර්‍වඥයන්ගේ චන්ද්‍රමණ්ඩලයමෙන් සශ්‍රීක වූ මුඛශ්‍රීය දැක "මා මුන් ලා කැටිව තර්ක කරන්නට බැරිය"යි සිතා පිරිස් මධ්‍යයේ සිට බිඳී පලා ගියේය. බොහෝ උපාසකවරු ඔල්වර හඬ පවත්වා සිටියාහ.

සර්‍වඥයෝත් "උපාසකවරුනි, දැන්මතු නොවෙයි, පෙරත් මාගේ මුඛමණ්ඩලය දැක බිඳුනේ වේදැ"යි වදරා "ඒ

කෙසේදැ?”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද, යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නමින් බෝධිසත්ත්වයන් වහන්සේ රාජ්‍යය කරන සමයෙහි තක්සලා නුවර රාජ්‍යය කරන්නා වූ රජ්ජුරු කෙනෙක් චතුරාංගිනී සේනාව පිරිවරා බරණැස් නුවර වටකොට ගත්හ.

එවිට ගන්ධාර නම් රජ්ජුරුවෝ තමන්ගේ සේනාවෙ බලය කියන්නාහු “රථවල නගන්නා වූ බොහෝ ධජ වලින් සම්පන්න වූ මාගේ චතුරාංගිනී සේනාව ඉක්මවා බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ කෙසේ පලා යෙද්ද? මහසමුද්‍රයෙහි යම් සේ පක්ෂියෙක් පිය අඹා තීරණයක් දැක්ක නොහෙද්ද? යම් සේ මහත් වූ පර්‍වතයක් පුළුන් රළකින් සොලවාලිය නොහෙද්ද? එමෙන් මාගේ චතුරාංගිනී සේනාව තොප විසින් බිඳුවාපිය නොහැකැ”යි කියා කීය.

එබස් අසා බරණැස් රජ්ජුරුවෝ අට්ටාලයෙහි සිටි තැනැත්තෝ ගන්ධාර රජ්ජුරුවන්ට කියන්නාහු “එම්බල, තොප විසින් නිකම් ප්‍රලාප කීමෙන් කම් කිම්ද? තොපගේ සේනාව විසින් මාගේ සේනාව මැඩපියන්ට බැරිය” කියා කීය. එබස් අසා ගන්ධාර රජ්ජුරුවෝ “බරණැස් රජ්ජුරුවන්ගේ පුන්සඳක් සමාන වූ මුඛ ශ්‍රීයක් ඇති රජ්ජුරුවන්ට මා විසින් යුද්ධ කරන්ට බැරිය”යි සිතා තමන්ගේ රටට ගියාහ යි වදරා මේ ‘ද්විතීය පලාස ජාතකය’ නිමවා වදාළසේක.

"එසමයෙහි ගන්ධාර රජ්ජුරුවෝ නම් පලාස පරිබ්‍රාජකය. බරණැස් රජ්ජුරුවෝ නම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 230. උපාහන ජාතකය

තවද සද්ධර්මවර චක්‍රවර්ති වූ සර්වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

එක් දවසක් ධර්මසභා මණ්ඩපයෙහි රැස් වූ මාළුවරුන් වහන්සේ "දේවදත්ත ස්ථවිරයෝ ගුරුව සිටිය සර්වඥයන් වහන්සේ කෙරෙහි වැරදකොට බොහෝ විනාශයට පැමිණියෝ වේදැ"යි යන කථාව කිය කියා උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා එපවත් අසා "පළමුත් දේවදත්ත ස්ථවිරයෝ මා හා කැටිව සරිගස්වා බොහෝ විනාශයට පැමිණියෝ වේදැ"යි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ හස්ත්‍යාචාරී කුලයෙක උපන්සේක.

එසමයෙහි කසී රටින් එක්තරා මානවකයෙක් බරණැස් නුවරට අවුත් බෝධිසත්ත්වයන් අතින් හස්ති ශිල්පය උගත. බෝධිසත්ත්වයෝත් හස්ති ශිල්පය තමන් දන්නා පරිද්දෙන්

ආචාර භාගයක් නොතබා නිමවාම ශිල්ප දුන්නාහ. එකියන මානවක තම විසින් ශිල්ප නිමවා උගත් නියාව දැන අචාරීන්ට කියන්නේ "අචාරීන් වහන්ස, මා රජ්ජුරුවන්ට පෑමට තරමක් තිබා වදාළ මැනවැ"යි කීහ. "යහපතැ"යි කියා බෝධිසත්ත්වයෝත් රජ්ජුරුවන් කරාගොස් "දේවයන් වසන්ස, මාගේ එක් අන්තේවාසිකයෙක් නුඹවහන්සේට සේවය කරන්නෝ කැමතිය. එසේ විසින් ඔහුට තරමක් පදමක් සලස්වා සේවය ගන්නේ යහපතැ"යි කීහ. රජ්ජුරුවෝත් එපවත් අසා "එසේ වීනම් තොපගේ තරමින් භාගයක් උන්ට සලස්වා ලමි. ඒ මානවකයාට සේවය කරන්ට කියව"යි කීහ. "යහපතැ"යි බෝධිසත්ත්වයෝ එපවත් තමන්ගේ අතවැසියාට කීහ.

එබස් අසා අතවැසි කියන්නේ "ඇයි මාත් ශාස්ත්‍ර නිමවා උගත් වුව, නුඹවහන්සේගේ තරම් නොබලා භාග ලබන්ට කාරණා කිම්දැ?"යි කීහ. එපවත් බෝධිසත්ත්වයෝ රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝත් "එසේ කල තොප සරියේ ශිල්පශාස්ත්‍ර ධානාන්තර සරියේ ලැබ ගණිති" කීහ. බෝධිසත්ත්වයෝත් එපවත් තමන්ගේ අතවැසියන්ට කීහ. අතවැසි "යහපතැයි තර්ක කෙරෙමි" කීහ.

එබස් රජ්ජුරුවෝ අසා "හසත්‍යාචාරීන් හා උන්ගේ ශිෂ්‍යයාගේ තර්කය වෙයි" නුවර මුළුල්ලට සැල කළාහ. බෝධිසත්ත්වයෝත් "මුන් හා තර්ක කරන්නට උවමැනැ"යි සිතා උපායෙක් සලසන්නාහු ඇතා යන්ට කී වේලේ සිටින්නට හා සිටින්ට කී වේලේ යන්ට හා වඳෙන්ට කී වේලේ නැගී

සිටින්ට හා නැගී සිටින්ට කී වේලේ වදෙන්ට හා යමක් දෙන්ට කී වේලේ නොදෙන්ට හා නොදෙන්නට කී වේලේ දෙන්ට හා යනා දී විපරීත ග්‍රහකොට එක රැයින්ම ඇතකු කම්පස් කළහ. බෝධිසත්ත්වයෝත් ඇතකු පිට නැගී රාජාඞ්ගනයට ගියාහ. ශිෂ්‍යයෝත් ඇතකු පිට නැගී රාජාඞ්ගනයට ගියේය. බොහෝ දෙනා දෙන්නාගේ වාද බලන්නට එක්වූහ. ඒ හස්ත්‍යචාරීහු දෙන්නාත් සම සමව ශිල්ප දක්වන්නට වන්නාහ.

එවිට බෝධිසත්ත්වයෝ විපරීත ශිල්ප දක්වන්නට වන්නාහ. එවිට ඒ අතවැස්සවුට ඒ බැරි විය. එවිට බොහෝ මනුෂ්‍යයෝ “මේ තෙමේ මේ ආචාරින් වහන්සේ හා සමඟ තර්ක කරන ලද්දැ”යි කියා බොහෝ දෙන කැටමුගුරු දමා ඔහු එතනම ජීවිතක්‍ෂයට පැමිණ වූහ. බෝධිසත්ත්වයෝත් ඇතු පිටින් බැස රාජ්පුරුවන් දැක කියන්නාහු “දේවයන් වහන්ස, යම් සේ සුව පිණිස විදියන් වහන් ඇර ගන්නාහ. ඒ වනාහි නොවිතර සෙයින්වත් අසමජය වීමෙන් පය සෙල්ලී බොහෝ විනාසයට පැමිණෙන්නේ යයි එමෙන් ශාස්ත්‍රයක් සැප පිණිස ඉගෙණ තමා නීච හෙයින් අසැපයටත් පැමිණෙන්නාහ. සත්පුරුෂයෙකු උගත් ශාස්ත්‍රයක් විනම් යහපතටත් වන්නේ වේදැ”යි කීහ. එබස් රජ්පුරුවෝ අසා බෝධිසත්ත්වයන්ට බොහෝ තරම් පදම් දුන්නාහයි වදරා මේ ‘උපාහන ජාතකය’ නිමවා වදළසේක.

"එසමයෙහි අතවැසි නම් දේවදත්ත ස්ථවිරයෝය. හස්ත්‍යචාරී නම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

## 231. වෙණ්ණුපූන ජාතකය

තවද සද්ධර්‍මය මඟ වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් කුමාරිකාවක් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද, යත්,

බරණැස් නුවර සිටාණ කෙනෙකුන්ගේ දුවක් ඇත. ඒ සිටාණන්ගේ ගෙයි වෘෂභ රාජයෙක් ඇත. උගට එගෙයි ඇත්තෝ දේවතා ස්ථානයෙහි තිබා රකිනාහ. ඒ දුටු කුමාරිකා තමාගේ කෙල්ලක අතින් "ඇයි මෙහෙසු ගොන් නියාවට මුන්ට ආදර සත්කාර කරන්ට බලි ඇයිදැ?"යි විචාළාහ. එවිට ඒ කෙළි කියන්නී "සෙසු ගොන් නියාවට මේ ගොනාගේ පිට මොල්ලිය මහත්ව තිබෙන හෙයින් මේ වෘෂභ රාජයාය. එසේ හෙයින් පුජා සත්කාර කෙරෙති" කීහ.

එබස් ඇසූ සිටු කුමාරිකා එක් දවසක් මතුමාල් තලයේ සිට වීථියෙහි යන පිට ගැටයක් ඇති මිනිසකු දැක "එසේ නම් මේ පුරුෂ මනුෂ්‍යයන්ගේන් උතුම් එකෙක් වනැ"යි සිතා "එසේ හෙයින් මම උතුම් කුලයක උපනිම්, මම මුන් ලඟ උනින්නම් යහපතැ"යි සිතා තමන්ගේ ගෙයි කෙල්ලක් ඇරගෙන අළදෙරින් නික්ම එකියන කුදු හා සමඟ නික්මුනාහ.

මේ කථාව සංඝයා වහන්සේ අතර ප්‍රසිද්ධ විය. සංඝයා වහන්සේ ධම්සභා මණ්ඩපයෙහි මේ කථාව කිය කියා වැඩ උන්සේක. සර්‍වඥයන් වහන්සේ එතනට වැඩ "මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා එපවත් අසා "දැන්මතු නොවෙයි, පෙරත් මේ කුමාරිකා මේ කුද්‍ර කෙරේ ඇල්ම වුවෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයෝ පසල් ගමෙක සිටු කුලයෙක ඉපිද දූ පුත් දරුවන්ගේන් වර්ධනයට පැමිණියාය.

බරණැස් නුවර සිටාණ කෙනෙක් ඇත්තාහ. ඒ සිටාණන්ගෙ දුවණියන් තමන්වහන්සේගේ පුතණුවන්ට පාවා දෙන්ට කතාකොට උන් අවස්ථාවට බරණැස් නුවර සිටාණන්ගේ වෘෂභ රාජයෙක් ඇත. උඹට ඒ ගෙයි ඇත්තෝ දේවස්ථානයෙහි තබා රකිනාහ.

ඒ දුටු සිටු කුමාරිකා තමන්ගේ කෙල්ලක අතින් "ඇයි මෙසේ සෙසු ගොන් නියාවට මුන්ට ආදර සත්කාර බලි ඇයිදැ?"යි විචාළාහ. එවිට ඒ කෙළී කියන්නී "සෙසු ගොන් නියාවට මේ ගොන්ගේ පිට මොල්ලිය මහත්ව තිබෙන හෙයින්

මේ වෘෂභ රාජයාය. එසේ හෙයින් ආදර සත්කාර කෙරෙති" කීහ.

එබස් ඇසූ සිටු කුමාරිකා එක් දවසක් මතුමාල් තලයෙහි සිට වීථියෙහි යන පිට ගැටයක් ඇති මිනිසකු දැක "එසේ වීනම් මේ පුරුෂ මනුෂ්‍යයන්ගෙන් උතුම් එකෙක් වනැ"යි සිතා "එසේ හෙයින් මම උතුම් කුලයෙහි උපනිමි. මමත් මුන් ලඟ උනිම් නම් යහපතැ"යි සිතා තමන්ගේ ගෙයි කෙල්ලට කියන්නාහු "අසවල් පුරුෂයා අසවල් තෙන සිටින්නට කියව"යි කියා යවූහ. ඒ පුරුෂයාත් එලෙසම සිටියේය. එකියන සිටු කුමාරිකාත් උදෑසනක් සේ අප්‍රසිද්ධ වේශයෙන් අනර්ඝ සම්පතුන් ඇරගෙන ඇළ දෙරින් ම එකියන කුදු හා සමඟ නික්මුනාහ.

නික්ම අතරමඟට ගොස් එකියන කුදු අතරමඟ දී රැජාවක් අල්වාගෙන වක ගසාගෙන හොත්තේය. ඒ වේලාවට කියන්නා වූ සිටු දූ පාමුල උන්නීය. ඒ වේලාවට බෝධිසත්ත්වයෝ තමන්ගේ පුතණුවන්ට මඟුල් නිසා බරණැස් නුවරට යන්නාහු අතරමඟ සිටියා වූ සිටු දූ දැක ඇඳිනාගෙන "එසේ වීනම් මුන් විසින් තමන්ම සිතාගෙන මුන් පස්සේ ආවනැ"යි සිතා එවිට සිටු දුවට කියන්නාහු "ඇයි තොපි උතුම් වංශයෙහි ඉපිද මේ කුදු පස්සේ ආයේ ඇද්දැ?"යි විචාළාහ.

එවිට සිටු දූ කියන්නී "වෘෂභ රාජයා මොල්ලිය නිසා දේවතා තනතුරෙහි තබා ආදරය කරන හෙයින් මමත් මේ

කුදු මනුෂ්‍යයන්ගෙන් උතුම් එකෙකැයි සිතා මූ පස්සේ ආමි” කීය. එබස් අසා බෝධිසත්ත්වයෝ තමන්ගේ රථයට ඒ සිටු දුව ඉස් සෝදා නහවා, නංවාගෙන තමන්ගේ ගමට ගොස් පුතණුවන්ට පාවා දුන්නහයි වදාරා මේ “වීණාථූන ජතාකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි එකියන සිටු දූ නම් මේ සිටු දුවය. පසල්ගම සිටුව උපන්නෙම් බුදුවූ මම්ම ය”යි වදාළසේක.

## 232. විකණ්ණක ජාතකය

තවද සද්ධර්‍ම මහප්‍රදීපායමාන වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ශාසනයෙහි උකටලී වූ භික්ෂූ කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

භික්ෂූ කෙනෙකුන් වහන්සේ ස්ත්‍රියක් නිසා ශාසනයෙහි උකටලී ව උන් කෙනෙකුන් වහන්සේ සර්‍වඥයන් වහන්සේ දක්වන්නා “මහණ, පළමුත් තෘෂ්ණා වසඟ වීම නිසා මුන ඇත්තා වූ ඊ දණ්ඩෙන් යම් සේ කිඹුලා මළේද එමෙන් විනාශයට පැමිණිය”යි වදාරා “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නමින් බෝධිසත්ත්වයන් වහන්සේ රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ එක් දවසක් මඟුල් පතසට ගොස්

මහත් වූ නැව් නැගී බොහෝ නෘත්‍ය, ගීත, වාද්‍ය කෙරෙමින් නැවින් ඒ ඒ තැන සෙව්විජා පරව ඇව්දිනාහ. මත්ස්‍යයෝත් රජ්ජුරුවන්ට නෘත්‍යගීත වාදිත අසා තමුන් රජ්ජුරුවන්ගේ නැව පසුපස්සේ තාලස් බන්ධ ප්‍රමාණ මස් කැලය පසුපස්සේ නික්මුනාහ.

රජ්ජුරුවෝත් පසුපස්සෙහි නික්මුනු මත්ස්‍යයන් දැක "මෙතෙක් මත්ස්‍යයෝ පසුපස්සේ එන්නේ කිම්දැ?"යි විචාරා අමාත්‍යයන් විසින් "සේවය කරන්ට පසුපස්සේ එන නියාවය"යි කියන්නාහ. "එසේ කළ අපට කරන සේවය තරමක් පදමක් උවමැනවැ"යි සිතා "අදවක් පටන් මේ මත්ස්‍යයන්ට සාල් අමුණක බත් ලව"යි එක්තරා අමාත්‍යයෙකුට භාර කළාය. ඒ අමාත්‍යයාත් එලෙසම බත් ලන්නේය. ඒ බත් කන වේලාවට එක් කිඹුලෙක් නිසා මත්ස්‍යයෝ පමා වන්නාහ. බත් ඉතිරි වන්නාහ. එපවත් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝත් කියන්නාහු "ඔරුවක් පිට නැගී ගොසින් කිඹුලා මත්ස්‍යයන් කන වේලාවට උල් හීයකින් විද මරා පියව"යි කීසේක.

ඒ අමාත්‍යයෝත් ඒ නියායෙන් කිඹුලාත් මත්ස්‍යයන් කන වේලාවට ඔරුවක නැගී ගොස් බඩින් පිටවන ලෙස අන්නාපුවාහ. කිඹුලාත් බොහෝ වේදනාවට පැමිණ තමා වාසස්ථානයට යන්ට නික්මින. එවිට අමාත්‍යයා කිඹුලා නොරැකෙන නියාව දැන කියන්නේ "එම්බල කිඹුල, තාගේ තෘෂ්ණාව නිසා ප්‍රාණය තොරවන්නේය"යි කීහ. කිඹුලාත් තමා වසන ලෙනටම ගොසින් ජීවිතක්‍ෂයට පැමිණියේයයි සර්‍වඥයන්

වහන්සේ "මහණෙනි, යම් සේ තෘෂ්ණා වසග ව විනාශයට පැමිණි කිඹුලා හා සමානය"යි වදරා 'විකිණ්ණ ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 233. අභිතාබු (අසිතාබ) ජාතකය

තවද සද්ධර්ම මහගංගා වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් කුලස්ත්‍රියක් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

එක්තරා කුලස්ත්‍රියක් ඔබ්බේකට පාවා දුන්නාහ. පාවා ගත්තා වූ කෙළෙඹිපුත්‍ර එකියන කුමාරිකාව කෙරේ ආදර නැතිව ඉච්ඡාපරව ඇවිදිනේය. ඒ ස්ත්‍රීන් දෑගසව්වන් වහන්සේගේ උපාසිකා කුලයෙහි උපන් හෙයින් ඊට තමුන් අපේක්ෂාව තමා දෙන්නා වූ දන් ආදිය දි දී දවසරිති. ඔයිත් දෙදෙනා වහන්සේගේ අවවාදයෙන් සෝවාන් පෙළෙහි පිහිටා මහණ වන්ට අභිප්‍රාය ඇතිව දෙමව්පියන්ගෙන් අවකාශ ඉල්වාගෙන ගොසින් මෙහෙණි සස්නෙහි මහණව විදර්ශනා වඩා රහත් වූසේක.

මේ කථාව ධර්මසභා මණ්ඩපයෙහි රැස් වූ මාළුවරුන් වහන්සේ "අසවල් කුලස්ත්‍රිය තමා ගලවාගෙන නිවන් දක්වා පුවාදැ"යි යන මේ කථාව කිය කියා උන්සේක. සර්වඥයන්

වහන්සේත් එතනට වැඩ වදරා "මහණෙනි, මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදරා එපවත් අසා "මහණෙනි, පෙරත් මූ තමන් ගලවාගෙන ගියෝ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ බ්‍රාහ්මණ කුලයක ඉපිද හිමාලය වනයට ගොස් ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ධ්‍යාන ලාභිව වාසය කරනසේක.

එසමයෙහි බරණැස් රජ්ජුරුවන්ගේ වැඩිවියට පැමිණියා වූ රාජකුමාර කෙනෙක් ඇත්තාහ. ඒ රාජකුමාරයාත් තමන්ගේ අභිතාප නම් බිසවුන් ඇරගෙන හිමාලය වනයට ගොස් බෝධිසත්ත්‍වයන් වසන්නා වූ පන්සල සමීපයෙහි ගොස් ඉන්නාහ. එසමයෙහි එක්තරා ලිය කින්නරාවක් රජ්ජුරුවන් ඉදිරියෙහි නික්මෙන්ට වන. රජ්ජුරුවෝ ඈ කෙරේ පිළිබඳ සිත් ඇති බිසවුන් කෙරේ අපේක්ෂාව හැර "ලිය කින්නරාව අල්වමි" සිතා පසුපස්සේ නික්මුනාහ.

එවිට බිසව් සිතන්නාහු "මේ රජ්ජුරුවන් කැටිව එක්ව දුක්ගෙන ආ මා කෙරේ අපේක්ෂාව හැරපියා මේ පක්ෂියකු පස්සේ නික්මුනාහ. රජ්ජුරුවන් ගෙන් මට කාරණා කිම්දැ?"යි තාපසයන් කරා ගොස් "ස්වාමීනි, මා තාපස කරන්නේ යහපතැ"යි කීහ. "යහපතැ"යි කියා තාපස කළාහ. ඒ කියන

බිසවුන් වහන්සේ කිසුණුපිරියම් භාවනාකොට පඤ්ච ඉර්ධි අෂ්ටසමාපත්ති උපදවාගෙන තාපසයන් ලග සිටියහ. ඒ වේලාවට ඒ බාරාණසී කුමාරයෝත් කිඳුරු පක්ෂියා සොයා ගොස් නොදැක තාපසයන් උන් තෙනට අවුත් සිටියාහ.

එවිට බිසව් කියන්නාහු "රජ්ජුරුවෙනි, තොප මා ඇර පක්ෂි ධේනුව බලා ගිය විසින් මම් ම ධ්‍යානලාභිව ගියෙමි. එසේ හෙයින් නුඹවහන්සේ නිසා මට බොහෝ ලාභ වූයේය. ඉනිබ්බෙ මේ ජාතියේ නුඹවහන්සේ හා මා හා සංවාසයෙක් නැතැ"යි කියා ආකාශයට නැගී ඉර්ධියෙන් ඔබ්බට ගියහ. රජ්ජුරුවෝත් බොහෝ වික්‍ෂේපයට පැමිණ කියන්නාහු "යම් පුරුෂ කෙනෙක් බොහෝ තෘෂ්ණාවට පැමිණ බොහෝ දුකට පැමිණෙද්ද? ඒ කාරණය මාගෙන්ම දිටිමි. යම් සේ මම අභිතාප නම් බිසවුන්ගේ වියෝ වූ මා වැන්නැ"යි කීහ. එකියා ඒ රාජකුමාරයෝ තමන්ගේ පියාණන් මළ පවත් අසා බරණැස් නුවරට ගොස් රාජ්‍යය කළහයි වදරා 'අභිතාබු ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි බිසවු නම් මෙසමයෙහි මේ භික්ෂුණීහුය. එසමයෙහි රාජකුමාරයෝ නම් මෙසමයෙහි කෙළෙඹිපුත්‍රායය. තාපසව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 234. වච්ඡනක(නඛ) ජාතකය

තවද සද්ධර්මවර චක්‍රවර්ති වූ සර්වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි ආනන්ද සාමීන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

ආනන්ද සාමීන්ගේ යාළු ජුජමල්ල නම් යාළුවෙක් ඇත. ඒ තෙම ආනන්ද සාමීන් දකිනා අභිප්‍රාය ඇතිව කියා යවිය. අනන්ද සාමීන් සර්වඥයන් වහන්සේට දක්වා ඒ ජුජමල්ල නම් යාළුවාගේ ගෙට වැඩිසේක.

ඒ කියන යාළුවා ආනන්ද සාමීන් බත් මිහිරිකොට වළඳවා අන්තයෙහි කියන්නේ "ස්වාමීනි, මහණව සිටිනා බලාත් සිවුරු ඇරපියා ආවොත් මා හා සමව බොහෝ මුතු මැණික් ආදී වූ සම්පත් විඳිනාසේක් වේදැ"යි කියා ගිහිගෙයි සම්පත් වණිනා කළහ. ආනන්ද සාමීත් ගිහිගෙයි ආදීනව හා මහණ වීමේ විපාක හා කියා ජේතවනාරාමයට වැඩිසේක.

සර්වඥයෝත් ඒ පවත් අසා "ජුජමල්ලයෝ පළමුත් එලෙසම කීවෝ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ එක්තරා බ්‍රාහ්මණ කුලයක ඉපිද හිමාලය වනයට ගොස්

තාපසව වාසය කරනසේක් ලුණු ඇඹුල් සෙවුනා පිණිස බරණැස් නුවරට ආසේක. බරණැස් නුවර සිටාණෝ බෝධිසත්ත්වයන්ගේ ඉරියාපථයෙහි පැහැද සතුටු ව බෝධිසත්ත්වයන්ට දන් දෙන්නාහ. මේ නියායෙන් දවස් යාමෙන් බෝධිසත්ත්වයන් හා සිටාණෝ උනුන් කෙරෙහි විශ්වාස වූහ.

එවිට සිටාණෝ සිතන්නාහු "මේ වච්ඡනක තාපසයන් ගිහි කරවාගෙන පඤ්චකාම සැප අනුභව කරම්හ"යි සිතා බෝධිසත්ත්වයන්ට දවසක් දන් දී අන්තයේ කියන්නාහු "වච්ඡනක තාපසයන් වහන්ස, මේ තාපස් ක්‍රියාවෙන් බොහෝ දුක, එබැවින් එපමණ එසේ වූ තාපස ක්‍රියාව ඇර සැප වූ පඤ්චකාම සැපය මා හා කැටිව අනුභව කරන්නේ යහපතැ"යි කීහ. ඒ අසා බෝධිසත්ත්වයෝ කියන්නාහු "පඤ්චකාම සැපය නම් ආශ්‍රෑනයන්ට සැපයෙක් සේ සිතන පමණක් මිස බන්ධනයක් හා සමානය, එසේ හෙයින් මේ දුක්ඛය මේ ඇර සැප සේ තාපස ක්‍රියාවෙන් වනමුල් පලාඵල කා සැපසේ දවසරනේම යාපතැ"යි කියා තමන් වසන්නා වූ හිමාලය වනයට ගියහයි වදාරා මේ 'වච්ඡනක ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි සිටාණෝ නම් මේ කියන ජුජමල්ලවයෝය. එසමයෙහි තාපසව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 235. බක ජාතකය

තවද සද්ධර්‍ම මහසමුද්‍ර වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි වඤ්චා ප්‍රයෝග දන්නා භික්‍ෂු කෙනෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

එක් වඤ්චා ප්‍රයෝග දන්නා භික්‍ෂුන් කෙනෙකුන් වහන්සේ මාළු සිවුරක් සකස්කොට ගෙත්තම් කොටගෙන ජේතවනාරාමයට ආසේක. ජේතවනාරාමයෙහි වහන්දෑ සිවුර දැක "මේ සිවුර අපට දුන මැනව"යි කියන්නාහු "අප දුක සේ ලබාගත් සිවුර දෙන්නේ කෙසේදැ?"යි කියන්නා "එසේ වීනම් අපගේ අළුත් පිළි ඇරගෙන සිවුර අපට දුන මැනව"යි කියා පිළි ඇරගෙන සිවුර දුන්නාහ. ඒ කිලිටි සිවුර සෝදපු ගමනේ මාළු සිවුර නියාව දැන ඒ වඤ්චා කළ භික්‍ෂුන් වහන්සේ ඇරගෙන බුදුරජාණන් වහන්සේ කරා ගොස් සර්‍වඥයන්ට පෑහ. සර්‍වඥයෝ "පළමුත් මේ භික්ෂූහු වඤ්චා ප්‍රයෝග දනිති" වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ මත්ස්‍යව ඉපිද බොහෝ මත්ස්‍යයන්ට රජකම් කරන්නාහ.

එසමයෙහි කොකෙක් ඒ වැව සමීපයෙහි පියාපත් දෙක විදා කරනමාගෙන බකතපස් කෙරෙමින් සිටියේය. ඒ වේලාවට බෝධිසත්ත්වයෝ බොහෝ මත්ස්‍යයන් පිරිවරා කොකා උන් ස්ථානයට ආහ. ඒ වේලාවට මත්ස්‍යයෝ කොකා දැක "එළ නෙළුම් මලෙක පැහැ සමාන වූ යහපත් තාපස කෙනෙකැ"යි සිතා කියන්නාහු "මූ වනාහී පියාපත් විදාගෙන කරබාගෙන සිටිනාහ. එසේ හෙයින් මූ මහසිල්වත් කෙනෙකැ"යි කීහ.

එබස් බෝධිසත්ත්වයෝ අසා කරකැවී බලා කොකා නියාව දැන කියන්නාහු "එම්බල මත්ස්‍යයෙනි, මුන් මෙසේ ඉන්නේ තාපසයන් නිසා නොවෙයි, අපගේ අවකාශයක් බලාය. මුගේ කුමන සීලයෙක්දැ"යි කීහ. එවිට මත්ස්‍යයෝ දිය කළඹා උඟ එතනින් යවා පුවාහයි වදාරා 'බක ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි කොකා නම් වඤ්චා ප්‍රයෝග දන්නා භික්ෂූහුය. මත්ස්‍ය ව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

## 236. සාකේත ජාතකය

තවද සද්ධර්‍ම චූඩාමාණික්‍ය වූ සර්‍වඥයන් වහන්සේ සාකේත නුවර වැඩවසන සමයෙහි සාකේත නම් බ්‍රාහ්මණයා සර්‍වඥයන්ට ප්‍රිය නෑකම් කී හෙයින් මේ ජාතකය දක්වන ලදි. මෙහි ඉකුත් වර්ථමාන කථාවක් ඒක නිපාතයෙහි බස්නේය.

මෙහි "පළමුත් තමන්ටම පුත් ව උපන් හෙයින් ජාති වාසනා හේතුකොට කියන්නාහ"යි වදාළ කල්හි එවිට භික්ෂූන්

වහන්සේ දක්වනසේක් "ස්වාමීනි පූර්‍ව වාසනා ඇතැ"යි කියා පසුව "ජාතියේ විශ්වාසය වේදැ"යි වදාළසේක.

සර්‍වඥයන් වහන්සේ වදාරනසේක් "මහණෙනි, යම් සේ දියෙහි අටගන්නා නෙළුම් අල කෙතෙක් දවසින් වුවත් දිය හා මඩ එක්වූ ද එදවස් ඇති වේද, එමෙන් කොතෙක් දවසින් උවත් අනුන් දුටු වේලේ පූර්‍ව වාසනා බලයෙන් වුව, ඒ නැත්නම් උන් නිසා තමාට පැමිණි ලාභයක් නිසා වුවත් නවත්නාහ"යි වදාරා "මට මවුපිය ව උපන්නෝ මේ බමුණා හා බැමිණිමය, උන්ට පුත්‍ව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 237. ඒකපාද ජාතකය

තවද සද්ධර්‍ම කිරීට වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කෙළෙඹි පුත්‍රයෙකු අරභයා මේ ජාතකය වදාරන ලදි.

ඒ කෙසේද? යත්,

එක්තරා කෙළෙඹි පුත්‍රයෙක් තමාගේ පුත්‍රයෙකු ඇකයේ ඉඳුවාගෙන උන්නේය. ඒ පුත්‍රයා පියාට කියන්නේ "එක පාදයකින් යුක්ත වූ බොහෝ වුතය ඇති එකද්වාර ප්‍රාසාදය මට කියව"යි කීය.

එවිට ඒ පුරුෂයාත් "මේ ප්‍රශ්නය සර්‍වඥයන් වහන්සේට මිසක් අපට නොදැනෙ"යි සිතා සර්‍වඥයන් කරා තමාගේ පුතත් ඇරගෙන ගොස් කියන්නේ "ස්වාමීනි, මේ පුත්‍ර තෙම

එකද්වාර නම් ප්‍රශ්නයක් මා අතින් විචාරයි, ඒ මට නොදැනෙයි, වදාළොත් යහපතැ''යි කීහ.

සර්‍වඥයෝත් ''උපාසකයෙනි, මේ කුමර තෙම මේ ප්‍රශ්නය පළමුත් විචාළේය. නුවැණැත්තෝ මූට ප්‍රශ්නය විසඳූය. මේ වනාහී භවයෙන් සැඟවුනු විසින් නොදැනෙ''යි වදාරා ''ඒ කෙසේදැ?''යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුැ කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ සිටුකුලයක උපන්සේක.

එක් දවසක් බෝධිසත්ත්‍වයෝ තමන්ගේ පුත්‍ර කෙනෙකුන් ඔක්කේ වඩාගෙන උන්නාහ. එවිට කුමාර කියන්නේ ''එක පාදයෙන් යුක්ත බොහෝ අර්ථ ඇත්තා වූ එකද්වාර ප්‍රශ්නය කිව මැනව''යි කීහ. එවිට බෝධිසත්ත්‍වයන් කියන්නාහු ''එම්බල දරුව, බොහෝ කොට කීමෙන් කාර්‍ය්‍යය කිමද, ඒකසීල රකිනාම බොහෝ කෙලෙසුන් නැසීමට කාරණා වෙ''යි කීහයි වදාරා මේ 'ඒකපාද ජාතකය' නිමවා වදාළසේක.

''එසමයෙහි පුත්‍රයා නම් මෙසමයෙහි මේ කුමාරයයි. බරණැස් සිටුව උපන්නෙම් බුදුවූ මම්ම ය''යි වදාළසේක. මේ බණ අවසානයෙහිදි දෙපුතුපියෝ දසක් නයින් ප්‍රතිමණ්ඩිත වූ සෝවාන් පෙලෙහි පිහිටියාය.

# 238. අරිතමෘත (හරිතමාතු) ජාතකය

තවද සද්ධර්‍ම මහතිලක වූ සර්‍වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි අජාසත් රජ්ජුරුවන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

කෝසල රජ්ජුරුවන්ගේ නැගණියෝ බිම්බිසාර රජ්ජුරුවන්ට පාවා දෙන්නාහ. ඒ පාවා දෙන ගමනේ "තමන්ගේ නැගණියන් නානා පිණිසය"යි ලක්‍ෂයක් වටිනා කසීගමක් දුන්නාහ. පසුව අජාසත් රජ්ජුරුවන් විසින් පියාණන් මැරූ පසු මැණියෝත් රජ්ජුරුවන් කෙරේ සෝකයෙන්ම මළාහ.

එවිට කෝසල රජ්ජුරුවෝත් "පියා මරාපු සොරාට මාගේ නැගණියන්ට දයාද දුන් ගම නොදෙමි" කියා උන්නාහ. මේ ගම නිසා දෙමයිලෝ උනුත් හා දවස් පතා සටන් කරන්නාහ. සමහර දවස් කෝසල රජ්ජුරුවෝ බිඳී පලා යන්නාහ. සමහර දවස් අජාසත් රජ්ජුරුවෝ බිඳී පලා යන්නාහ. අජාසත් රජ්ජුරුවෝ දිනාපියා නුවරට එන කල බොහෝ ගැස්සුම් පිම්බුම් ඇතිව එන්නාහ. පැරද එනවිට ඒ අප්‍රසිද්ධ කාටවත් නාහවා එන්නාහ.

මේ පනත සංඝයා වහන්සේ එදවස් කථා කොට කොට උන් කලට සර්‍වඥයන් වහන්සේ එතනට වැඩ වදාරා "මහණෙනි, මා එන්නට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා එපවත් අසා "මහණෙනි, දැන්මතු නොවෙයි, පෙරත් තමන්ට පරාජයක් වූ වේලේ

විකේෂ්පව වූවෝ වේදැ”යි වදාරා “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ එක් වැවෙක නීලමණ්ඩුකව උපන්නාහ.

එසමයෙහි එක් කෙවුලෙක්(ධීවරයෙක්) වැවට කෙමනක් එබිය. ඒ කෙමනට බොහෝ මත්ස්‍යයෝ වන්නාහ. එක් උදක සර්පයෙක් “මසුන් කන්ටය”යි මසුන් ලා කැටිව කෙමනට වන. එවිට බොහෝ මත්ස්‍යයෝ ඒ සර්පයා කඩා කා ලේ මුසුකොට පුවාහ. ඒ සර්පයාත් කෙමනින් මෑත් විය.

ඒ වේලාවට නීලමණ්ඩුකයාත් එතන සිටියෝය. නීලමණ්ඩුකයා දැක සර්පයා කියන්නේ “එම්බල නීලමණ්ඩුකය, මත්ස්‍යයන් විසින් අන්‍යාය කරන නියාව තොපටත් හැගිදැ?”යි කීහ. එවිට මණ්ඩුකයා කියන්නේ “ඇයි, තොප විසින් මත්ස්‍යයන්ට අන්‍යාය කරන කළ මුයිත් තමුන්ට විෂය වූ වේලේ අන්‍යාය කරන්නේ වේදැ”යි කීහ. මත්ස්‍යයෝ ඇවිත් සර්පයා කා මරා පුවාහයි වදාරා ‘අරිතමාතෘ ජාතකය’ නිමවා වදාළසේක.

එසමයෙහි ජල සර්පයා නම් අජාසත් රජ්පුරුවෝය. නීලමණ්ඩුක ව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම ය”යි වදාළසේක.

# 239. මහපිංගල ජාතකය

තවද සද්ධර්ම මහකේතුවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

දේවදත්ත ස්ථවිරයෝ නවමසක් ව්‍යාධියට පැමිණ බුදුන් දකින්ට ජේතවනාරාමයෙහි වාසල සමීපයට ආ ගමනේ පොළොව පැලී නරකයට වන්නාහ. ඒ දුටු ඇසූ බොහෝ දිව්‍ය, බ්‍රහ්ම, මනුෂ්‍යාදී වූ අය මහා සතුටු වූහ.

සංඝයා වහන්සේත් මේ කථාව කිය කියා වැඩ උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා එපවත් අසා "දැන්මතු නොවෙයි, පෙරත් දේවදත්ත ස්ථවිරයන් මළ පවත් අසා බොහෝ මනුෂ්‍යයෝ සතුටු වූවෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර පිංගල නම් රජෙක් රාජ්‍යය කරන සමයෙහි ඒ රජ්ජුරුවෝ අසද්ධර්මයෙහි පිහිටා බොහෝ මනුෂ්‍යයන්ට වධ බන්ධනාදී වූ නිග්‍රහ කරන්නේය. බොහෝ මනුෂ්‍යයන් මැඩ අයුක්තියෙන් රාජ්‍යය කරන්නේය. තමාගේ පුත්‍ර, මිත්‍ර, බන්ධු වර්ගයා, අමාත්‍ය, ගෘහපති, සේනා ආදී වූ

බොහෝ සත්ත්වයන් කෙරෙහි කිසි දයාවක් නැත්තේය. බොහෝ මනුෂ්‍යයෝත් රජ්ජුරුවන් කෙරෙහි කිසි දයාවක් නැතිව තම තමන්ගේ ඇඟ ගැසූ කටුවක් සේ රජ්ජුරුවන් කෙරෙහි වෛරීව ඉන්නාහ.

බෝධිසත්ත්වයෝත් රජ්ජුරුවන්ට පුත් ව උපන්නාහ. පිංගල රජ්ජුරුවෝත් බොහෝ දවසකින් මළහ. එවිට බොහෝ මනුෂ්‍යයෝ සතුටු ව සියගණන් ගැල්වලින් දර පටවා ආදාහන භූමියෙහි ලා ආදාහනය කළාහ. සියගණන් පැන් කළ ගෙන්වාගෙය සුසාන භූමියෙහි වත්කොට ආදාහනය නිවා බෝධිසත්ත්වයන්ට ඔටුනු පළඳවා බොහෝ ශ්‍රමණ, ගෘහපති ආදී වූ සත්ත්වයෝ "අධර්මිෂ්ඨ වූ රජ්ජුරුවන් නැසී ගොස් ධර්මිෂ්ඨ රජ්ජුරුවන් ලදුම්හ"යි සතුටුව රජ්ජුරුවන් වටකොට සිටිනා වේලාවට එක්තරා දොරටුපාලයෙක් ඒ වේලාවට ආස්වාස ප්‍රාස්වාය ප්‍රාස්වාස නැතිව අඬන්නට වන.

එවිට ඒ දුටු බෝධිසත්ත්වයෝ කියන්නාහු "මපියාණන් වහන්සේ බොහෝ දෙනාට උක් දණ්ඩක් මිරිකා වසල්ලක් ඇරගන්නා සේ බොහෝ දෙනාට අන්‍යාය කළ විසින් පිඟුවන් ඇස් ඇත්තා වූ රජ්ජුරුවන් මළා යහපතැයි බොහෝ දෙනා සතුටු ව ඉන්ද දී තා ආස්වාස ප්‍රාස්වාසය නැතිව අඬන්ට තොපට රජ්ජුරුවන් වහන්සේ කුමන යහපතැක් කළ හෙයින්දැ?"යි විචාළාහ.

ඒ අසා දොරටුපාලයා කියන්නේ "උන්වහන්සේ මට කළා වූ යහපත සිතා අඬන්නේ නොවෙයි, පිඟුවන් ඇස් ඇති ඒ

පිංගල රජ්ජුරුවන් වහන්සේ උඩුමාලයට යන වේලෙත් බස්නා වේලෙත් කම්රයින්ගේ යකුලක් ඇරගෙන බානාක් මෙන් ටොකු අටක් බැගින් ඇන්නාහ. ඒ ඇන ඇන ආ අභ්‍යාසයටම යමයන්ගේ ඔලුවේ ඇනිසේක් නම් උයිත් ටොකු කාපියා පෙරලාත් මෙතනට එවපු නම් තවත් මට ටොකු ඇත්තේම වේදැයි සිතා අඬමි'' කීහ.

එබස් රජ්ජුරුවෝ අසා ''මූ අස්වසන්නට උවමැනවැ''යි සිතා කියන්නාහු ''ඒ කිම්දැයි සියගණන් ගැල් වලින් දර පටවා දවනලද, සියදහස් ගණන් පැන් කළ වත්කොට සුසාන භූමියේ ගිණි නිවා පියනලද වටකොට පවුර බඳනාලද, එසේ හෙයින් මළා වූ සත්ත්ව කෙනෙක් අනික් ජාතියක උපදිතොත් මිස මෙම සැටියේ එම කයින් නූපදනාහ''යි වදරා දෙරටුපාලයා අස්වැසූහ.

''එසමයෙහි පිංගල රජ්ජුරුවෝ නම් දේවදත්ත ස්ථවිරයෝය. පිංගල රජ්ජුරුවන්ට පුත් ව උපන් ධර්මිෂ්ඨ රජ්ජුරුවෝ නම් බුදුවූ මම්ම ය''යි වදාළසේක.

# 240. සබ්බදාඨ ජාතකය

තවද සද්ධර්ම මහනිධාන වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ කෙසේද? යත්,

එක් දවසක් ධම්සභා මණ්ඩපයෙහි රැස් වූ මාළුවරුන් වහන්සේ "දේවදත්ත ස්ථවිරයෝ තමන්ට තිබි ලාභ සත්කාර නාලාගිරියා මෙහෙයිමෙන් පිරහෙළා ගත්තාහ"යි යන කථාව කිය කියා උන් තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදරා "මහණෙනි, මා එන්නට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදරා එපවත් අසා "මහණෙනි, දැන්මතු නොවෙයි, පෙරත් දේවදත්ත ස්ථවිරයෝ තමන්ට පැමිණ ලාභ සත්කාරය පිරිහෙළා ගත්තෝ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ පුරෝහිත බ්‍රාහ්මණ ව උපන්නාහ.

බෝධිසත්ත්වයෝ පෘථිවි මන්ත්‍රයක් දන්නාහ. ඒ මන්ත්‍රය නම් සියල්ලවුන්ම ලබ්බා ගන්නා වූ ආඥවක් ඇත්තේය. ඒසේ විසින් බෝධිසත්ත්වයෝ ඒ මන්ත්‍රය කාත් දැක්ක දී නොපිරිවන්නාහ. එක් දවසක් සිස් වූ එලියක හිඳගෙන මන්ත්‍රය පිරිවන්නාහ.

ඒ වේලාවට එක් කැණහිලෙක් මන්ත්‍රය පිරිවනු අසාගෙන උන් තැනැත්තේ මන්ත්‍රය ඉගෙණ ගත. එක ජවනේම ඉගෙණ ගන්ට කාරණා කිම්දැයි යතහොත් පෙර ඔහු බ්‍රාහ්මණ ව ඉපිද මේ මන්ත්‍රය දන්නේය. ඒ අභ්‍යාසය ඇති හෙයින්

මන්ත්‍රය එක්වරින්ම ඉගෙණ ගත. එවිට බ්‍රාහ්මණ “මට ඒ මන්ත්‍රය නිපුනැ”යි කියා කින්මින. එවිට සිගාලයාත් “මටත් මන්ත්‍රය නිපුනැ”යි කියා නික්මින. “මේ කැණහිලා නිසා බොහෝ විනාස වෙ”යි සිතා “කැණහිලා අල්ව”යි කීහ.

ඒ කැණහිලාත් වහා දිවගෙන ගොස් වනයට වැද එක්තරා කැණහිල් දෙනක ඩැලීය. එවිට කැණහිල් දෙන් “ඇයිද ස්වාමීනි?” කිව. එවිට කැණහිල් “ඇයි තෝ නාඳුනෙයිද? මම සිව්පාවුන්ට රජවීමි” කියා ඒ මන්ත්‍රය කීය. ඒ වේලේත් බොහෝ කැණහිලුන් පළමුකොට එක් වූවාහ.

ඉක්බිති සිංහ, ව්‍යාඝ්‍ර, ඇත්, අස්, දිවි, වලස්, මුවන්, ගෝණුන්, ඌරන්, සාවුන් ආදී වූ බොහෝ සිව්පාවෝ පිරිවරා ගත්තාහ. ඒ සිගාලත් එක්තරා සිගාල ධේනුවක් අගමෙහෙසුන් කොට සව්‍යද්ධව නම් රජව “මා විසින් මනුෂ්‍යයන්ට රාජ්‍යය කරන්ට උවමැනව”යි සිතා ඇතුන් දෙන්නෙකු පිට සිංහයෙකු සිටුවා සිංහයා පිට තමන් හා තමන්ගේ අග්‍රමෙහෙසිකා සිගාල ධේනුව හා දෙන්න සිංහයා පිටට නැගී දොළොස් යොත්තක් ගැවසී සිටි සිව්පා සේනාව පිරිවරා බැණෑස් නුවර වටකොට ගෙන සිට බරණැස් රජ්ජුරුවන්ට කියා යවන්නාහු “රාජ්‍යය හෝ දෙන්නේය. යුද්ධ හෝ කරන්නේය”යි කියා යවූහ.

බොහෝ නුවරවාසී සිංහයන් ආදී වුවන් දැක භයින් ත්‍රස්තව වාසල් අගුළුලූහ. එවිට බෝධිසත්ත්වයෝ රජ්ජුරුවන්ට කියන්නාහු “දේවයනි, නොබව මැනව, මේ සබ්බදාඨක නම් කැණහිලා කැටිව කරන යුද්ධය මට භාරය”යි කියා

අට්ටාලයට නැගී සබ්බදාඨක නම් කැණහිලා දැක කියන්නාහු "එම්බල සබ්බදාඨක නම් කැණහිල, තා නුවර ගන්නේ කා කා ඇරගෙනදැ?"යි විචාළහ. එවිට කැණහිල් කියන්නේ "මාගේ සිගාලයන් ඇරගෙන ඔවුන් ලවා නාද කරවා ඒ නාදයෙන් බිය ගත්තා වූ නුවර හඬින් හය ගන්වා නුවර ගණිමි" කීහ.

එබස් අසා බෝධිසත්ත්වයෝ කියන්නාහු "එම්බල සිගාලය, තා මෙනුවර ගන්නේ කවුරුන් ලවාදැ?"යි විචාළහ. එවිට කැණහිල් කියන්නේ "මාගේ කේසර සිංහයන් ලවා නාද කරවා ඒ නාදයෙන් බිය ගත්තා වූ නුවර සිංහ හඬින් හය ගන්වා නුවර ගණිමි"යි කීහ. එබස් බෝධිසත්ත්වයෝ අසා අට්ටාලයෙන් බිමට බැස මුළු නුවර බෙර ලවා නුවරවාසීන් කණ උඳු පිටි බහාගෙන ඉදිරියේ බෙර ලවා නුවරවාසී ඒ නියායෙන්ම යටත් පිරිසෙයින් ගෙයි වඩනා පක්ෂීන් කණත් උඳු පිටි ලූවාහ. ඒ නියාවට උඳු පිටි ලූ පසු බෝධිසත්ත්වයෝ අට්ටාලයට නැගී කැණහිලාට කියන්නාහු "තා සේ වූ නීච කැණහිලෙකු කීවා අසා උත්තම ජාති ඇති කේසර සිංහයෝ නාද කෙරෙද්දැ?"යි කීහ.

එබස් අසා කැණහිල් කියන්නේ "බ්‍රාහ්මණය මාගේ සෙසු සිංහයන් තබා මේ සිංහයා අඬ ගසන්දැ?"යි කීය. එබස් අසා "යහපතැයි අඬ ගස්ස"යි කීහ. එවිට කැණහිලා නැගීවුන් සිංහයාට අඬ ගසන ලෙස සන් කළේය. එවිට සිංහයා ඇතාගේ කුම්බස්ථලයට පැන මහත්කොට සිංහනාද කළේය. එවිට ඇතු හයින් දිවන්නාහු කැණහිලා පයින් ගසා සුනුවිසුනු

කළාහ. ඇත්තු උනුන් ඇණ බිඳගෙණ එතනම මළහ. දෙලොස් යොදුන් සිටියා වූ සිව්පා සේනාව සිංහයන් ඇර සෙස්සෝ මළහ. එවිට බොහෝ මනුෂ්‍යයෝ කණ තුබූ උදු පිටි ඇර නුවරින් පිටත තුබූ බොහෝ සිව්පා සත්ත්ව සමූහයා දැක කන්න කා බොහෝ විසින් කපා වියලා ගත්තාහ. එතැන් පටන් වැලඉරා ඇති වියයි දතයුතු.

'සබ්බදාඨක ජාතකය' නිමවා වදාරා බුදුව වැඩහිඳ වදාරනසේක් "මහණෙනි, යම් සේ සබ්බදාඨක නම් සිගාලයා තමා ලද්දා වූ රාජ්‍ය සම්පත් ස්ථාවරකොට ගතනොහී යම් සේ විනාශයට පැමිණියේද? එමෙන්ම යම් සම්පතක් ලද්දා වූ පුරුෂයෙක් උඩඟුව වාසය කෙරේ නම් මෙසේ විනාශයට පැමිණෙන්නේ වේදැ"යි වදාරා "මේ සබ්බදාඨක කැණහිලා නම් දේවදත්ත ස්ථවිරය. බරණැස් රජ්ජුරුවෝ නම් ශාරිපුත්‍ර ස්ථවිරයෝය. බ්‍රාහ්මණව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාරා 'සබ්බදාඨ ජාතකය' නිමවා වදාළසේක.

## 241. සුන(ඛ) ජාතකය

තවද සංසාරසේතු වූ සර්වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි අම්බ නම් ස්ථානයෙහි පිහිටියා වූ භෝජන ශාලාවෙක් ඇත. ඊට හෙන්නා වූ පැන්තානයන් විසින් ගෙනවුත් "මෙතන බත් කා වැඩෙති" කියා එක්තරා බළු කුකුරුවකු එත. එද භික්ෂූන් වහන්සේ විසින් ලබනලද බත් කා වැඩී සථූල කය ඇතිවිය. එක්තරා පිටිසරවාසී මනුෂ්‍යයෙක් ඒ ශාලාවට අවුත් එතන සිට

පැන්තානයන්ට යම්තම් රණක් කඩක් දී බල්ලා වරපටකින් බැඳලා ඇරගෙන නික්මින. එවිට බළුත් බුරන්නවත් ඇවිටි කමක් කරන්නවත් උන් දුන් ගොදුරු කා උන්ද කම්පස් එකකුමෙන් උන. ඒ පුරුෂයාත් “බළු මා කෙරේ පුරුදු වීය”යි සිතා බැම්ම මිදීය. එවිට ඒ සුනඛ වහා අවුත් පළමු තමා සිටි තැනටම ගියේය.

මේ කථාව ධම්සභා මණ්ඩපයෙහි භික්‍ෂූන් වහන්සේ කිය කියා වැඩඋන් තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා “මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?”යි විචාරා වදාරා එපවත් අසා “මහණෙනි, දැන්මතු නොවෙයි, පෙරත් සුනඛ සොරකම් දන්නේ වේදැ”යි වදාරා “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි එක්තරා කෙළෙඹිපුත්‍රයෙක් වඩන්නා වූ බළු කුක්කෙක් ඇත. ඒ බළු කුකු ඔහු විසින් ලබන ලද්ද වූ බත් කා ස්ථූල වූ කය ඇති විය. එක්තරා පිටිසර වැසි මනුෂ්‍යයෙක් බල්ලා දැක ඒ කෙළෙඹිපුත්‍රයාට මසුරන් දහසක් හා කඩක් දී ඒ බල්ලා බැඳගෙන ගියේය. එවිට ඒ බළුත් බුරන්නක්වත් නොකොට උන් දුන් ගොදුරු කා උන් කම්පස් එකකු මෙන් උන්නේය. ඒ පුරුෂයාත් බල්ලා

ඇරගෙන ගොස් වනාන්තරයෙහි බල්ලා කරපටින් බැඳ ඒ පුරුෂ වැද හෝ නිදනට වන.

එවිට බෝධිසත්ත්වයෝත් එතනට කටයුත්තක් නිසා ආවාහු බල්ලා දැක කියන්නාහු “වරපට සපා කා කඩාපියන්ට පුළුවන්වත් බැමි කඩගෙන නොගොස් ඉඳිය. මෙසේ වූ අන්දමන්දෙයෝ ඇද්දැ”යි කීහ. එබස් ඇසූ සුනඛ කියන්නේ “පණ්ඩිතයෙනි, තොප කීවාම මාගේ සිතට නගා ගතිමි. නැත්නම් බැඳගන්නේ වේද, එසේ හෙයින් අවසරයක් බලා යෙමි” කියා ඒ පුරුෂයා නිදාපු කල්හි තෙමේ බැඳුම් කඩාගෙන තමා වසන තෙනට ගියේයයි වදරා මේ ‘සුනඛ ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි ඒ සුනඛයා නම් මෙසමයෙහි සුනඛය. ඒ පණ්ඩිතයෝ නම් බුදුවූ මම්ම ය”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 242. ගුත්තිල ජාතකය

තවද සංසාරනෞකා වූ සර්‍වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

එක් දවසක් සංඝයා වහන්සේ දේවදත්ත ස්ථවිරයන්ට කියනසේක් “ඇවැත්නි, සර්‍වඥයන් වහන්සේගෙන් තොපි ත්‍රිපිටකයක් දරණලද, සර්‍වඥයන් වහන්සේ නිසා

චතුර්ධ්‍යානයත් ලබනලද, එසේ වූ බොහෝ උපකාරව තොපට ආචාරී පදවියේ සිටි සර්‍වඥයන් වහන්සේට තොපි සමව සිතා විපරීතව කුමට ඉඳුදැ"යි කියා කීසේක. ඒ අසා දේවදත්ත ස්ථවිරයන් වහන්සේ කියනසේක් "ඇවැත්නි, සර්‍වඥයන් වහන්සේ මට කුමන ලාභ සත්කාර කලෝද? මම් ම ත්‍රිපිටකය දැරිමි. මම් ම ධ්‍යානය උපදවා ගතිමි. සර්‍වඥයන් වහන්සේ මට කුමක් කලෝදැ?"යි කීහ.

මේ කථාව ධර්‍මසභා මණ්ඩපයෙහි රැස් වූ මාළුවරුන් වහන්සේ කිය කියා වැඩඋන් තැනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදරා "මහණෙනි, මා එන්ට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදරා එපවත් අසා "දැන්මතු නොවෙයි, පෙරත් දේවදත්ත ස්ථවිරයෝ ගුරුන්ට අපක්ඛ්‍යාත කම් කළෝ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුරව බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ ගාන්ධර්‍ව නම් විද්වත් කුලයක ඉපිද වැඩිවිය පැමිණ ගාන්ධර්‍ව නම් ශිල්පය නිමවා ඉගෙනගෙන ගුත්තිල නම් ගාන්ධර්‍ව යන නමින් දඹදිව ප්‍රසිද්ධ වූහ. අන්ධ වූ දෙමාපියන් රක්නාහ.

එසමයෙහි බරණැස් නුවර සිට වෙළෙන්දු උදේනි රටට ආවාහු. එක් දවසක් ඉස් සෝද නාහා කා බී සැපසේ උන්නාහු. "අපට ගී කියන්නට වීණා ගයනා දන්නා විද්වතකු

ගෙනව''යි කීහ. ''යහපතැ''යි කියා එගම ගාන්ධර්වයන්ට නායක වූ මූසිල නම් ගාන්ධර්වයෙක් එතනට අවුත් එකියන වෙළෙඳුන්ට නටා ගී කීය. ඒ අසා ව්‍යාපාරයෝ සතුටු වන්නා නුවූහ. එවිට මූසිලයෝත් මද්දම කොට වීණා ගාන්ට වන . එවිටත් මඳකුත් සතුටු නුවූය. උත්තම කොට වීණා ගාන්ට වන. එවිටත් කිසි කෙනෙක් සතුටු නුවූහ.

එවිට මූසිල නම් ගාන්ධර්වී සිතන්නේ ''එසේ වීනම් මුන් හැම විශේෂයෙක් නොදන්නා කෙනෙකුන් වනැ''යි සිතා ''එසේ නම් මමත් මුන් හැම නොදන්නා මිනිසුන්ට නපුරු කොට ගායනා කෙරෙමි''යි ගායනා කරන්නට වන. එවේලේත් කිසි කෙනෙකුන් සතුටු නුවූය.

එවිට මූසිල නම් ගාන්ධර්වීයා කියන්නේ ''ඇයි තෙපි හැම මා මෙසේ ගායනා කරද්දී බැන නොනැගී ඉන්නේ, කිසි විශේෂයක් නොදන්නා හෙයින්ද?. නැත්නම් මට වඩා ගාන්ධර්වී කරන්නා ගාන්ධර්වීයෙකු දුටු විරූ ඇද්දැ?''යි විචාළේය. එබස් අසා මනුෂ්‍යයෝ කියන්නාහු ''එම්බල මූසිල නම් ගාන්ධර්වීය, ගුත්තිල නම් ගාන්ධර්වීයාගේ වීණා නාදය ඇසුවා වූ අපට තොපගේ විණා නාදය උණ පත්තෙක ගාන්නක් මෙන් අපට සිතෙ''යි කීහ. එබස් ඇසූ මූසිල ගාන්ධර්වී කියන්නේ ''එසේ වීනම් තොපි හැම බරණැස් නුවරට යන කල මාත් කැන්දගෙන යව''යි කීහ. ''යහපතැ''යි කී එකියන ව්‍යාපාරයෝත් තමන් බරණැස් නුවරට යන ගමනේ එකියන මූසිල නම් ගාන්ධර්වීයාත් කැඳවාගෙන ගොස් බරණැස් ගුත්තිල

ගාන්ධර්වීයාගේ ගෙය පෑහ. තම තමන්ගේ වාසස්ථානයට ගියාහ.

එකියන මූසිල නම් ගාන්ධර්වීයා ගෙට වන. ඒ වේලාවට බෝධිසත්ත්වයෝ ගෙයි නැත්තාහ. එවිට මූසිල නම් ගාන්ධර්වී බෝධිසත්ත්වයන්ගේ ඉද්දෙර තිබූ ජාති වීණාව ගාන්ට වන. අන්ධ වූ බෝධිසත්ත්වයන්ගේ දෙමාපියෝ කියන්නාහු "අපගේ දරුවන්ගේ වීණාවක් මීයෝ එක්ව පියා කපන සැටිය"යි කීහ. මූසිල ගාන්ධර්වීයෝ බෝධිසත්ත්වයන්ගේ දෙමාපියන් වැඳලා "නුඹවහන්සේගේ පුතණුවන් කොහිදැ?"යි විචාළේය. එවිට බෝධිසත්ත්වයන්ගේ දෙමාපියන් කියන්නාහු "දැන් දරුවෝ එති. මෙතන ඉඳුව"යි කියා උන් අවස්ථාවට බෝධිසත්ත්වයෝ එතනට ආහ.

එවිට මූසිල නම් ගාන්ධර්වී බෝධිසත්ත්වයන් වැඳ තමාට ශිල්ප උගන්වන්නට කීහ. එවිට බෝධිසත්ත්වයෝ සාමුද්‍රිකා ලක්ෂණ දන්නා හෙයින් "මේ අසත්පුරුෂයා ය"යි කියා දැන "තොපට මා දෙන විද්‍යා නැත. පලා යව"යි කීහ. එකියන මූසිලයාත් බෝධිසත්ත්වයන් නොකැමැති වුවත් බෝධිසත්ත්වයන්ගේ දෙමව්පියන්ගේ සිත් ගෙන "නුඹවහන්සේගේ පුතණුවන් වහන්සේට කියා මට ශිල්ප දෙන්ට කිව මැනවැ"යි කියා යාඥා කළේය. බෝධිසත්ත්වයන්ගේ දෙමාපියෝත් බෝධිසත්ත්වයන්ට කියන්නාහු "මොහුට ශිල්ප උගන්වන්ට"යි කීහ. බෝධිසත්ත්වයෝත් දෙමාපියන් කීවා

අපත්වන්ට බැරි හෙයින් "යාපතැ"යි කියා අචාරී භාග නොතිබාම ශිල්ප නිමාවට විද්‍යාව ඉගැන්වූහ.

බෝධිසත්ත්වයෝත් රජ්ජුරුවන් දකින්ට යන විටෙක අතවැස්සනුත් ඇරගෙන යන්නාහ. රජ්ජුරුවෝ "මූ කවුරුදැ?"යි විචාරන්නා "දේවයන් වහන්ස, මාගේ අන්තේවාසිකයෙක්ය"යි කීසේක. රජ්ජුරුවෝත් උහු හා සමාන කල්‍යාමෙන් විශ්වාස වූහ. බෝධිසත්ත්වයෝත් "දරුව, තොපට වඩා මම විද්‍යාව නිමවා දනිමි" කීහ. එක් දවසක් මූසිල ගාන්ධර්වියා සිතන්නේ "මම ඔබ්බේ නුවරකට ගොස් ජීවත් වන්නා බලා ඇමටම ප්‍රධාන වූ බරණැස් නුවර ඉඳිමි"යි සිතා බෝධිසත්ත්වයන්ට කියන්නේ "ආචාරීන් වහන්ස, රජ්ජුරුවන් වහන්සේට සේවය කරන්නා කැමැත්තෙමි" කීහ. බෝධිසත්ත්වයෝත් "රජ්ජුරුවන්ට ගොසින් කියමි" කියා රජ්ජුරුවන් සමීපයට ගොස් කියන්නාහු "දේවයන් වහන්ස, මාගේ අන්තේවාසිකයා නුඹ වහන්සේට සේවය කරන්නා කැමැත්තේය. උහුට පඩියක් සලස්වන්නට උවමැනවැ"යි කිහ. රජ්ජුරුවෝත් "එසේ වීනම් තොපගේ පඩි නියාව භාගයක් සලස්වාලමි" කීහ. එපවත් ගොස් ශිෂ්‍යයන්ට කීහ. ශිෂ්‍යයෝ කියන්නාහු "ඇයි මාත් ශස්ත්‍ර සරියේ දනිත් වුව, මට පඩි අඩුවන්ට කාරණා කවරේදැ?"යි කීහ. එපවත් බෝධිසත්ත්වයෝ ගොස් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝත් "තොප සරියට විද්‍යා පෑ නම් එතරම් නියාවට පඩිත් වෙ"යි කීහ.

බෝධිසත්ත්වයෝ එපවත් ශිෂ්‍යයන්ට කීහ. ශිෂ්‍යයෝ "යහපතැයි, විද්‍යා නියාවට පාමි" කීහ. රජ්ජුරුවෝ බෝධිසත්ත්වයෝත් ශිෂ්‍යයාත් ලඟට ගෙන්වා ශිෂ්‍යයාට කියන්නාහු "එම්බල, තොප විසින් ගුත්තිල නම් ගාන්ධර්වයන් හා කැටිව වාද කරන්ට පිළිවන්දැ?"යි විචාළාහ. එවිට මූසිල කියන්නේ "ශාස්ත්‍ර මාත් විශේෂකොට දැනුත් උව, අදට සත්වෙනිද උඹ හා මා හා වාද කරම්හ"යි කීහ. රජ්ජුරුවෝත් "ගුත්තිල ගාන්ධර්වයා හා ශිෂ්‍යයා හා දෙන්නා අදට සත්වෙනිද වාද කෙරෙති" නුවර සැල කළහ. බෝධිසත්ත්වයෝත් සිතන්නාහු "මේ කාරණය එසේ හෙයින් මොහුගේ විද්‍යාව සභයට යෙදෙයි. මා වයොවෘද්ධ හෙයින් සභයට නොයෙදෙයි. එසේ හෙයින් මා සරි වුවත් පැරැද්දත් පැරදි නියාමය"යි සිතා "එසේ හෙයින් පැරදීමට වඩා ප්‍රාණය නසා ගන්ට යහපතැ"යි සිතා "වලට වදිමි" සිතා ලජ්ජාවෙන් නික්මෙන්නාහ. මරණ භයින් ගෙට එන්නාහ. මේ නියායෙන් සත් දවසක් අවිච්ඡින්නව යාමෙන් ඒ මෙන්ම තනනලද මාවත්ව ගියේය.

මේ නියායෙන් බෝධිසත්ත්වයන් සත්වන දවස් වනාන්තරයට ප්‍රාණය නසා ගන්ට ගිය කල්හි ශක්‍රයන්ගේ පාංඩුකම්බලශෛලාසනය උනු විය. ශක්‍රයෝ "මාගේ සම්පත් උදුරා ගන්නේ කවුරුදැ?"යි සිතා දිවසින් බැළුගමනේ බෝධිසත්ත්වයන්ගේ වික්ෂේපය දැක එතනට අවුත් "ඇයි? ආචාරීනි මෙතන අවුත් සිටියා වනැ"යි විචාළාහ. එවිට බෝධිසත්ත්වයෝ "තොපි කවුරුදැ?"යි විචාරා "මම දෙදෙව්

ලොවට අධිපති වූ ශක්‍රයෝය”යි කීහ. එවිට බෝධිසත්ත්වයෝ කියන්නාහු “සත් සත් කඩක් ඇති වීණාවාද නමැත්තා වූ විද්‍යාව සෙට මා හා මාගේ ශිෂ්‍යයා හා දෙන්නා රජ්ජුරුවන්ට පාම්හ. කෝසිය ගෝත්‍රයෙහි උපන්නා වූ ශක්‍රදේවේන්ද්‍රය මට පිටිවහල් වෙව”යි කීහ.

එවිට ශක්‍රයෝ කියන්නාහු “යහපත ආචාරීනි, තොපට මම පිටිවහල් වෙමි. තොප හා උන් හා සරියේ විද්‍යාව පාන්න. එකල්හි මා සංඥා කළ වේලෙහි සත් තත කඩා පියව, තොප විසින් වීණා දණ්ඩෙ අත ගසන්ට වන් වේලාව පළමු නියාවට නාද වඩිනේය. උගේ තත් සතෙහි නාද අඩු වෙයි. ඒ අවස්ථාවට තොප විසින් මේ පස ඇට තුන ආකාශයට දමන්නාම නවසියයක් දිව්‍ය ස්ත්‍රීන් නටන්නාහ, මමත් එතනට එන්නෙමි වේදැ”යි කියා ගියාහ. මනුෂ්‍යයෝත් “සෙට දවස් ගුත්තිල ගාන්ධර්වයා හා මූසිල නම් අතවැස්සා හා දෙන්නාගේ සෙට තර්ක වන්නේය”යි කියා මැසි පිට මැසි බැඳ රථ පිට රථ තිබාගෙන හිව් ගැවසී සිටගත්හ.

බෝධිසත්ත්වයෝත් තමන්ගේ ජාති වීණාව ඇරගෙන අවුත් තමන්ට පැන වූ අස්න පිට උන්නාහ. මූසිල නම් අතවැසිත් තමාට පැන වූ අස්න පිට උන්නේය. බොහෝ මනුෂ්‍යයෝත් බලා සිටියාහ. රජ්ජුරුවෝත් රාජාසනයෙහි උන්නාහ. ශක්‍රදේවේන්ද්‍රයෝත් ආකාශයෙහි අදෘශ්‍යමානව සිටියාහ. ශක්‍රයන් ආ නියාව බෝධිසත්ත්වයෝ පමණක් දන්නාහ. එවිට බෝධිසත්ත්වයන් හා අතවැසි විද්‍යාව සමව පෑහ. බොහෝ

දෙනා "විද්‍යාව පෑ නියාව යහපතැ"යි බොහෝ දෙනා සතුටු වූහ. එවිට ශක්‍රයන්ගේ සංඥාවෙන් බෝධිසත්ත්වයෝත් පළමුවන තත කඩා පුවාහ. එවිට ඒ තත් සිදුරෙන් පළමු නාද නියාවට මහත් ව නාද පවතින්ට වන. ඒ දැක මූසිල ගාන්ධර්වයාත් තත් කැඩීය. ඒ අඬ ආදී නියාවට අඩු විය. මේ නියායෙන් බෝධිසත්ත්වයෝ දෙවන තතය, තුන්වන තතය, සතරවෙනි තතය, පස්වෙනි තතය, සවන තතය, සත්වන තත යයි මේ නියායෙන් තත් සතම කඩා වීණා දණ්ඩෙ වීණා ගාන්ට වන්නාහ. බරණැස් නුවර එක නින්නාදව ඇසෙන්ට වන. මූසිලයාත් මේ නියාවට තත් සතම කඩා නාද කරන්ටවන් වේලාවට උන පත්තක අතගාන කලක් මෙන් නිශ්ශබ්ද විය.

ඒ වේලාවට බෝධිසත්ත්වයෝ ශක්‍රයන් දුන් පස ඇට තුනින් එකක් ආකාශයට දැමූහ. තුන්සියක් දිව්‍ය ස්ත්‍රීන් නටන්ට වන්නාහ. දෙවැනි පස ඇට දැමූහ. එවිට තුන්සියයක් දිව්‍ය ස්ත්‍රීන් නටන්ට වන්නාහ. තුන්වෙනි පස ඇට දැමූ කල්හි තුන්සියයක් දිව්‍ය ස්ත්‍රීන් නටන්ට වන්නාහ. බෝධිසත්ත්වයෝ මියුරු වූ ගීතිකා කිය කියා වීණා නාද කරන්නාහ. ඒ දුටු රජ්ජුරුවන් හා නුවරවාසී බොහෝ සතුටු වූහ. රජ්ජුරුවෝත් මූසිලයා කෙරේ කිපී අමාත්‍යයන්ගේ මූණ බැලූහ. අමාත්‍යයෝ රජ්ජුරුවන්ගේ අභිප්‍රාය දත්තාහු විසින් "ආචාරීන් කැටිව ගුරුද්‍රෝහ කරන ලදැ"යි තමතමන්ගේ අත තිබූ කැට මුගුරු බාලා මරා තලා පය අල්වා ඉවත දැමූහ.

රජ්ජුරුවෝත් බෝධිසත්ත්වයන් කෙරෙහි සතුටු වූහ. එක පැතිර වස්නා මහවර්ෂාවක් මෙන් බොහෝ සත්රුවන් ආදී වූ ප්‍රාසාද දුන්නාහ. නුවරවාසී බොහෝ සම්පත් දුන්නාහ. ශක්‍රයෝත් “මා විසින් තොපගේ ගෙට වෛජයන්ත රථය එවමි. තොපි ඒ රථයට නැගී මා කරා එව”යි කියා දිව්‍යලෝකයට ගියහ. දිව්‍යස්ත්‍රීන් “ඇයි දේවයන් වහන්ස? යම්තම් වේලක් පමා වූයේදැ?”යි විචාරා “ගුත්තිල ගාන්ධර්වයන්ගේ වීණා නාදය අසන්ට ගියෙමි” කී කල්හි එවිට දිව්‍ය ස්ත්‍රීන් “අපිත් වීණා නාදය අසන්නා කැමැත්තෙම්හ”යි කියන්නා ශක්‍රයන් විසින් මාතලී නම් දිව්‍ය පුත්‍රයා අත වෛජයන්ත නම් රථය යවුහ.

බෝධිසත්ත්වයෝත් ඒ රථයට නැගී ශක්‍රයන් ලගට අවුත් සිටියාහ. ශක්‍රයෝ “ආචාර්යිනි, වීණා ගායනා කරව”යි කීහ. බෝධිසත්ත්වයෝ කියන්නාහු “විජ්ජත්තු නම් මිළයක් ඇතිව මිසක් විද්‍යා නොපානාහ. එසේ වීනම් මා විද්‍යා පෑ කල දෙන්නේ කිමිදැ?”යි කීහ. ශක්‍රයෝ “විද්‍යා පෑ කල බොහෝ සම්පත් දෙම්මැ”යි කියන්නා “සම්පත්තීන් මට කාර්ය නැත, මම නුඹ වහන්සේගේ දෙතිස් දිව්‍ය ස්ත්‍රීන්ගේ පින් අසන්නා පමණකැ”යි කීහ. එවිට දිව්‍ය ස්ත්‍රීන් “වීණා නාද කරන්නා ආචාර්යිනි, අප කළ පින් කියම්හ”යි කීහ. එවිට බෝධිසත්ත්වයෝත් “යහපතැ”යි කියා දිව්‍ය ගාන්ධර්වයන් මෙන් ගායනාකොට පෑ පළමුවන දිව්‍ය ස්ත්‍රිය අතින් විචාරන්නාවූ “තොපි ඔසධි තාරකාවන් මෙන් විශිෂ්ට වූ රුවින් දසදිග බබුළුවා දහස් ගණන් දිව්‍ය ස්ත්‍රීන් විසින් පිරවරණ ලදුව

සිටිනීය, එසේ හෙයින් තොප දැක මට සන්තෝෂ කරවයි මනුෂ්‍යාත්භාවයෙහිදී කෙසේ වූ පින්කොට මේ දිව්‍ය භවනයෙහි උපන්දැයි ඒ මට කියව"යි කීහ. ඔයිත් කියන්නී "ගාන්ධර්වයාණෙනි, මනුෂ්‍යාත්මභාවයෙහි සිටි මා විසින් කාශ්‍යප සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහි රහත් නමකට පිළිසගලක් දිනිමි. ඒ විපාකයෙන් මේ නියා ආනුභාවයක් ඇතිව උපනිමි" කීහ. බෝධිසත්ත්වයෝ සෙස්සන් අනිනුත් විචාළාහ. සෙස්සෝත් තමන් කළ කුසල් කීහ.

ඒ කෙසේද? යත්,

එකෙක් කියන්නී "මල් කළඹක් පුද දිව්‍යලෝකයෙහි උපනිමි" කීහ. එකෙක් "එක දාගැබකට සුවඳ පසගුල් දී ඒ පින්කමින් දිව්‍යලෝකයෙහි උපනිමි" කීහ. එකෙක "සුවඳ බඩුවක් දන් දී උපනිමි" කීහ. එකෙක් "මිහිරි පලාවල දන් දී දිව්‍යලෝකයෙහි උපනිමි" කීහ. එකෙක් "මිහිරි රස භික්‍ෂූන් වහන්සේට දන් දී උපනිමි" කීහ. එකෙක් "කාශ්‍යප බුදුන්ගේ දාගැබකට සිය අතින් පසගුල් දී උපනිමි" කිව. එකෙක් "මන්මුළායෙන් ආ භික්‍ෂූන් වහන්සේට දන් දී බණ අසා දිව්‍යලෝකයෙහි උපනිමි" කිව. එකෙක් "නැවින් යන වහන්දෑ කෙනෙකුන්ට පැන් පිළිගන්වා උපනිමි" කිව. එකෙක් "නැදිමයිලන් ආක්‍රොස බිණිය දී බැන නොනැගී මෛත්‍රීකොට උපනිමි" කිව. එකෙක් "තමා ලත් බත් කොටස බෙද දන් දී උපනිමි" කිව. එකෙක් "අනුන්ට වාල්ව ඉපිද තමා ලද දෙය

දන් දී උපනිමි" කිව. මේ නියායෙන් දෙතිස් දිව්‍ය ස්ත්‍රීන් තමන් කළ පින් බෝධිසත්ත්‍වයන්ට කීහ.

බෝධිසත්ත්‍වයෝත් "තමන්ගේ ජීවිතය ලද්ද වූ ඵල ලදිමි" කියා සතුටුව මනුෂ්‍යලෝකයට අවුත් ඵපවත් බොහෝ දෙනාහට කියා බොහෝ දෙනා පින්කමෙහි ඇසුරුවා වදරා මේ 'ගුත්තිල ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි මූසිල ගාන්ධර්‍වයා නම් දේවදත්ත ස්ථවිරය. බරණැස් රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරය. ශක්‍රයෝ නම් අනුරුද්ධ ස්ථවිරය. ගුත්තිල ගාන්ධර්‍වී උපන්නෙම් බුදුවූ මමම ය"යි වදාළසේක.

## 243. විටීවච්ඡ (විතිච්ඡ) ජාතකය

තවද සංසාරසාගර පරගත වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පලාස පරිබ්‍රාජකයන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

පලාස පරිබ්‍රාජක කෙනෙක් මුළු රට තමන්ට වඩිනා කෙනෙකුන් නොදැක සැවැත් නුවරට අවුත් "මා හා සමග තර්ක කරන්නට සමර්ථයෝ ඇද්දැ?"යි විචාරා මනුෂ්‍යයන් විසින් "සර්‍වඥයෝ තොප සේ වූ පරවාදීන් හා වාද කරන්ඩ සමර්ථයෝය. එසේ හෙයින් සර්‍වඥයන් කරා යව"යි කීහ. "යහපතැ"යි කියා ඒ කියන පරිබ්‍රාජකයා බුදුන් හා සමග

තර්ක කරන්නට සිතා ජේතවනාරාමයට ගියෝය. සර්‍වඥයන් හා තර්ක කළේය.

සර්‍වඥයෝත් උන් කී ප්‍රශ්න විසඳ "තොපි කී ප්‍රශ්න අපි විසඳුම්හ. අප කී ප්‍රශ්න විසඳව"යි වදරා "එකෙක් නම් කිම්දැ?"යි විචාළසේක. ඒ තෙම කුමක් බවත් නොදන්නේය. පැරද පලා ගියේය. බෙහෝ භික්‍ෂූන් වහන්සේ මේ කථාව කිය කියා උන් තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදරා "මහණෙනි, මා එන්නට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදරා එපවත් අසා "දැන්මතු නොවෙයි, පෙරත් මා එක බසින් පැරද පලා ගියෝ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ බ්‍රාහ්මණ ව ඉපිද පඤ්චකාමයෙහි ආදීනව දැක වනයට වැද ඍෂිප්‍රව්‍රජ්‍යවෙන් පැවිදිව වාසය කරනසේක.

එසමයෙහි තර්ක කරන්නා වූ එක්තරා පරිබ්‍රාජකයෙක් බෝධිසත්ත්‍වයන් වසන්නා වූ වනය සමීපයෙහි ගමකට ගියේය. ඒ ගම්වාසීන් ලඟට ගොසින් "මා හා සමඟ තර්ක කරන්නට සමර්ථයෝ ඇද්දැ?"යි විචාරා මනුෂ්‍යයන් විසින් "තෙල, වනයේ ඉඳිනා තාපසයෝ තොප සේ වූ වාදීන් හා වාද කරන්නට සමර්ථයෝය. එසේ හෙයින් තාපසයන් කරා යව"යි

කියා ඇරගෙන බොහෝ මනුෂ්‍යයෝ බෝධිසත්ත්වයන් වසන පන්සල සමීපයට ගියාහ.

බෝධිසත්ත්වයෝ "පරිබ්‍රාජකය, මේ ගාංගාවෙන් ගෙනා සිහිල් පැන් බී ඉඳුව"යි කීහ. එවිට පරිබ්‍රාජිකයෝ "පළමුකොට කී බස්ම අල්වාගෙන තර්ක කෙරෙමි" සිතා කියන්නේ "ගංගාව නම් එගොඩද? මෙගොඩද? මැද්දේද? දියෙන් යන්නා වූ තුන් ස්ථානයෙන් ගංගාව කියන්නේ කොතැනටදැ?"යි විචාළේය. ඒ අසා බෝධිසත්ත්වයෝ කියන්නාහු "එතරත් ගංගාව නොවන කල, මෙතරත් ගංගාව නොවන කල, දිය යන්නා වූ ස්ථානයත් ගංගාව නොවන කල ගංගාව නම් කොයිදැ?"යි විචාළාහ. එකියන පරිබ්‍රාජකයෝ "මා කී බස්ම දෙවනිව මටම කියා මා පැරදුව"යි ඉතා ලජ්ජා ව පලා ගියෝ යයි වදරා 'වීථිවච්ඡ ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි පරිබ්‍රාජකයෝ නම් මෙසමයෙහි පලාස පරිබ්‍රාජකයෝ ය. එසමයෙහි තාපසයෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 244. මූලපරියාය ජාතකය

තවද සංසාර ප්‍රතිෂ්ඨාධාර වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පන්සියයක් බ්‍රාහ්මණ භික්‍ෂූන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

ත්‍රිවේදයෙන් පාරප්‍රාප්ත වූ බ්‍රාහ්මණයෝ පන්සියයක් බුද්ධශාසනයෙහි මහණ ව බුදුන්ගේ ත්‍රිපිටකය හදරා ඒ බ්‍රාහ්මණ භික්‍ෂූන් වහන්සේ විසින් “සර්‍වඥයන් දන්නා ත්‍රිපිටකය අප විසිනුත් දන්නා ලදැයි, ඉතිකින් සර්‍වඥයන් වහන්සේට උපස්ථාන කිරීමෙන් කිම්දැ”යි සිතා මානයක් උපදවා ආලිස්සම් වූසේක. සර්‍වඥයෝත් ඒ දැන බ්‍රාහ්මණ භික්‍ෂූන් පන්සියයක් දෙනා වහන්සේට මූලපරියාය සූත්‍රයෙන් බණ වදරා පන්සියයක් දෙනා වහන්සේගේ මාන ගර්භය අරවා වදාළසේක.

මේ කථාව ධම්සභා මණ්ඩපයෙහි රැස් වූ භික්‍ෂූන් වහන්සේ කථාකොට කොට උන් තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදරා “මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?”යි විචාරා වදරා එපවත් අසා “දැන්මතු නොවෙයි, පෙරත් මේ පන්සියයක් දෙනාගේ මානය බින්දෙම් වේදැ”යි වදරා ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ දිසාපාමොක් ආචාර්ව පන්සියයක් බ්‍රාහ්මණ මානවකයන් ඇරගෙන අකුරු කරවා ත්‍රිවේදයෙහි පාරප්‍රාප්ත කළහ. තමන් දන්නා ශාස්ත්‍ර ඇම ම නිපුණ කෙරෙව්වාහ.

එකියන බ්‍රාහ්මණ මානවකයෝ “ඉතිකින් දිසාපාමොක් ආචාරීන්ට උපස්ථාන කිරීමෙන් කම් කිම්දැ”යි සිතා මානයක් උපදවාගෙන ආලිස්සම් ව ඉන්නා සමයට දිසාපාමොක් ආචාරී දෙබර ගසක් සමීපයේ වැතිරගෙන උන්නාහ. අතවැස්සෝත් ඇවිත් දෙබර ගස නියෙන් ගසා “මේ කිහිරි ගසසේ අරය නැතැ”යි කියා කීහ. දිසාපාමොක් ආචාරී “මේ කීයේ මටය”යි දැන කියන්නාහු “ප්‍රශ්නයක් කොට කියමි”සිතා ගාථාවක් කීහ.

ගාථාවේ අර්ථ, **කාලො** - අතීතානාගත වර්ථමාන සංඛ්‍යාත වූ කාලය, **අත්තනා** - තමා හා සමඟ, **සබ්බානි ඵවභූතානි** - සියළුම සත්ත්වයන්, **ඝසති** - අනුභව කරන්නේය, **කාලඝසො** - කාලය අනුභව කළා වූ, **යො භූතො** - යම් සත්ත්වයෙක් ඇද්ද?, **සෝ** - ඒ, **ඛීණා** - ශ්‍රව තෙමේ, **භූත පචනිං** - සත්ත්වයා පචනය කරන්නා වූ හෙවත් සියළු සත්ත්වයන් නසන්නා වූ කාලය, පච්පාක කළෙයි හෙවත් නැසුයේය. යම් කාලයෙක් සියළු සත්ත්වයන් තමා හා සමඟ නසා නම් ඒ කාලය ඛීණාශ්‍රවයන් වහන්සේම මත්තෙහි නැවත උත්පත්තියක් නැති හෙයින් නැසුවා නම් වනසේක. රහතන් වහන්සේ සකල ක්ලේශයන් නසා රහත් වූ හෙයින් සත්ත්වයන් විනාශ කළා වූ කාලය ඤය කළා නම් වනසේකැ”යි කියා “මේ ගාථාවේ අර්ථ මට සත්වෙනි දවසකින් කියව”යි කීහ.

එකියන ශිෂ්‍යයෝ “යහපතැයි ආචාරීනි” කියා වැඳ තමන්ගේ ගෙදරට ගොස් සත් දවසක් මුළුල්ලෙහි

උත්සහකොට එහි අර්ථ නොදැක ආචාරීන් කරා අවුත් “අපට ඒ අර්ථය නොයෙදෙ”යි කීහ. එවිට දිසාපාමොක් ආචාරීන් “තොප හැම තල් ගෙඩි සේ ඉස් තබාගෙන ‘මා කිසිවකුත් නොදනිති’ කියා තොප කියන පමණක් විනා මෙපමණකුත් නොදනිති” කියා නින්ද කළාහ. එකියන ශිෂ්‍යයෝ ආචාරීන් සමා කරවා ගතැයි වදරා ‘මුලපරියාය ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි එකියන අතවැස්සෝ නම් මේ බ්‍රාහ්මණ භික්ෂූහුය. එසමයෙහි දිසාපාමොක් ආචාරී නම් බුදුවූ මම්ම ය”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 245. තේලෝවාද ජාතකය

තවද සංසාර පාරගත වූ සර්‍වඥයන් වහන්සේ විසාලා මහනුවර කූටාගාර ශාලාවෙහි වැඩවසන සමයෙහි සිංහ නම් සෙනෙවිරදුන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

සර්‍වඥයන් වහන්සේ සිංහ නම් සෙනවිරදුන්ට බණ කියා උන් සෝවාන් කළ දවස් උන් විසින් බොහෝ මත්ස්‍ය මාංස ඇතිව රසමසවුලෙන් යුක්ත ව ආහාර සර්‍වඥයන් වහන්සේ ඇතුළුව සංඝයා වහන්සේට දන් දුන්නාහ. ඒ දුටු නිඝණ්ඨනාථපුත්‍ර බුදුන් කෙරේ කාංසිව උක්කෝටනාකොට කියන්නේ “ශ්‍රමණ භවත් ගෞතමයන් තමන් නිසා මැරූ මස් තමන් විසින් වලඳණ ලදැ”යි උක්කෝටනා කළහ. සර්‍වඥයෝ

එපවත් භික්ෂු සංඝයා වහන්සේ අතින් අසා "පෙරත් නිගණ්ඨනාථපුත්‍රයෝ උච්චිධීමාංශය කෑවයි පෙරත් උක්කෝටනා කළෝ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ බ්‍රාහ්මණ කුලයෙහි ඉපිද සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව බරණැස් නුවරට ලුණු ඇඹුල් සෙවුනා පිණිස ආහ.

එසමයෙහි බරණැස් නුවර කෙළෙඹි පුත්‍රයෙක් බෝධිසත්ත්වයන් දැක බෝධිසත්ත්වයන් වෙහෙසන පිණිස තමා ගෙට පවරා ගෙන්වාගෙන රසමසවුලෙන් යුක්ත ආහාරය දන් දී අන්තයෙහි කියන්නේ "නුඹවහන්සේ නිසා මම වධකොට මස් මරා දන් දිනිමි. එසේ හෙයින් ඒ පව් නුඹවහන්සේට හා මට හා සරිය"යි කීය. බෝධිසත්ත්වයෝත් "තොප විසින් තොපගේ අඹුදරුවන් මරා මස් මට එැවත්, මා විසින් මෛත්‍රී පුරස්සර විසින් වලඳන්නමෝය"යි කියා බෝධිසත්ත්වයෝ හිමාල වනයට ගියාහයි වදරා 'තේලෝවාද ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි කෙළෙඹි පුත්‍රයා නම් මෙසමයෙහි නිගණ්ඨනාථපුත්‍ර ය, එසමයෙහි තාපසව උපන්නෙමි බුදුවූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 246. පාදංජලි ජාතකය

තවද සංසාරවහ වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ලාලුදායි ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

එක් දවසක් සැරියුත් මුගලන් දෑගසව්වන් වහන්සේ බොහෝ සංඝයා වහන්සේ විසින් විචාළ ප්‍රශ්න විසඳ විසඳා උන්සේක. ඒ වේලාවට භික්‍ෂූන් වහන්සේ සතුටුව අස අසා වැඩඋන් කලට ලාලුදායි ස්ථවිරයන් වහන්සේ "ඇයි දෑගසව්වන් වහන්සේ කියෙත් අප දන්නා දෙයෙකැ"යි කීසේක. එබස් අසා දෑගසව්වන් වහන්සේ එතනින් වැඩපූසේක. සර්‍වඥයෝ එබස් අසා "දැන්මතු නොවෙයි, පෙරත් තොල පෙරලා කටට ආ දෙයක් කියන පමණක් විනා කුමකුත් නොදෙන්නේ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයෝ ඒ රජ්ජුරුවන්ට වැඩ පසස්නා අමාත්‍යව උපන්සේක.

රජ්ජුරුවන්ගේ පාදංජලී නම් රාජ කුමාර කෙනෙක් ඇත්තාහ. රජ්ජුරුවෝ කාලක්‍රියා කළහ. අමාත්‍යයෝ ඒ රජ්ජුරුවන්ට ආදාහණ කෘත්‍යකොට ඒ පාදංජලී නම් රාජ

කුමාරයානන් රාජ්‍යයට පමුණුවන්ට සිතා "නුවණ පරීක්‍ෂා කරම්හ"යි සිතා එක් දවසක් ඒ කුමාරයන් සභායේ ඉඳුවා යුක්තියක් අයුක්තියක්කොට විචාරා ඒ කුමාරයන් අතින් විචාළ යුක්තියද අයුක්තියදැයි විචාළාහ.

එවිට කුමාර තොල පමණක් පෙරලාලීය. එවිට අමාත්‍යයෝ "අප විචාළ යුක්තිය අයුක්තිය නියාව දැන තොල පෙරළා පුවමැනැ"යි සිතා අමාත්‍යයෝ එදවස් "රාජකුමාරයෝ නුවණැත්තෝවනැ"යි සිතූහ. දෙවන දවසුත් ඒ කුමාරයන් සභායේ ඉඳුවා යුක්තිය ඇති සැටියේම විචාරා "මේ යුක්තිය යහපත්ද නපුරුදැ?"යි විචාළහ. එදවසුත් ඒ කුමාර තොල පෙරලලීය. එවිට අමාත්‍යයෝ "පළමු යුක්තිය අයුක්තිය නිසා තොල පෙරළාවත් මේ යුක්තිය නියාවට කියාදීත් තොළ පෙරළන්නේ යුක්තියක් නොදන්නා හෙයිනැ"යි කියා ඒ කුමාරයා බැහැර කර බෝධිසත්ත්වයන් රාජ්‍යයට තබා ගත්හයි වදරා 'පාදංජලි ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි රාජකුමාරයෝ නම් ලාළුදායි ස්ථවිරයෝය. එසමයෙහි අමාත්‍යව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 247. කිංසුගෝකාම (කිංසුකෝපම) ජාතකය

තවද සංසාර පාරගත වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කිංසුකෝපම සූත්‍රය අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ කෙසේද? යත්,

භික්ෂූන් සතර දෙනෙකුන් වහන්සේ සර්වඥයන් වහන්සේගෙන් කමටහන් ඉගෙණගෙන ඒ සතර දෙනා වහන්සේගෙන් එක් කෙනෙකුන් වහන්සේ ෂඩ්ව ස්ථානයෙන් භාවනාකොට රහත් වූසේක. එක් භික්ෂු කෙනෙකුන් වහන්සේ පඤ්චස්කන්ධ භාවනාකොට රහත් වූසේක. එක් භික්ෂූන් කෙනෙකුන් වහන්සේ මහභූත භාවනාකොට රහත් වූසේක. එක් කෙනෙකුන් වහන්සේ අසුභ භාවනාකොට රහත් වූසේක. සතර දෙනා වහන්සේ සර්වඥයන් වහන්සේ දකිනට ගොස් කියනසේක් “අපි සතර දෙනම රහත් වූම්හ. රහත් වීම් එක් කලෙක භාවනා සතරක් වන්ට කාරණා කවරේදැ?”යි විචාළ සේක. සර්වඥයෝත් “කැළමල් විචාළ සතර බෑයන් වැන්නැ”යි වදුරා “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි ඒ රජ්පුරුවන්ගේ රාජකුමාරවරු සතර දෙනෙක් ඇත්තාහ. ඒ සතර දෙනා “කැළමල් කෙසේදැ?”යි විචාරා රථාචාරියා ගෙන්වා “කැළමල් ගෙන්වා අපට පාව”යි කීහ. රථාචාරියා සතර දෙනාට එකවිට නොපෑ පළමුකොට එක් රාජකුමාර කෙනෙකුන්ට වේළී ගිය අරටු කැළගසක් දක්වාලීය. අනිත් රාජකුමාර කෙනෙකුන්ට පත්‍රාංකුරයෙන් යුක්ත ගසක් දක්වාලීය. අනික්

කුමාර කෙනෙකුන්ට මල් පිපුනු ගසක් දක්වාලීය. අනික් කුමාර කෙනෙකුන්ට විලිසුනු ගසක් පෑලීය.

ඒ කුමාරවරුන් සතර දෙනා එක් දවසක් ඉඳ කථා කරන්නාහු "කැළගස් නම් ද ගිය කනුවක්මය"යි කීහ. එක් කෙනෙක් කියන්නාහු "නුග ගසක් සේමය"යි කීහ. එක් කෙනෙක් "මස් කැටි එල්වුවා සේමය"යි කීහ. එක් කෙනෙක් "විලිස්සපියා තිබෙන පත් ඇති රුක් මෙනැ"යි කීහ. මෙසේ කියා සතර දෙන උනුන්ගේ කථා නොගිවිස පිය රජුනු සමීපයට ගොස් "දේවයන් වහන්ස, කැළගස් නම් කෙසේ තිබේදැ?"යි කීහ. රජහු විසින් "තොප කීයේ කෙසේදැ?"යි කී කල්හි ඒ කුමාරවරු සතර දෙන තමන් කීවා වූ ක්‍රම පළමු පරිද්දෙන්ම කීවාහුය. එබසට රජපුරුවෝ කියන්නාහු "දරුවෙනි, තොප සතර දෙනා විසින්ම කැළගසක් දක්නා ලද්දේය. එතකුදු වූවත් රථාචාරියා විසින් තොපට කැළගසක් දක්වන කලට මේ ගස ඇම කල්ම මෙලෙස තිබේද? නොහොත් කලින් කලට වෙන වෙන ආකාරයෙන් පවතීදැ?යි විභාගකොට නොවිචාළ හෙයින් සැක උපන්නේය. ඒ වෘක්ෂයේ කොළ ගිය කාලයෙහි කනුවක් මෙන් තිබෙන්නේය. පත්‍රාංකුරයෙන් යුක්ත වූ කල ගසක් මෙන් තිබෙන්නේය. මල් ගත් කල මස් කැටි එල්ලුවාක් මෙන් තිබෙන්නේය. කොළ විලිස්සුනු කල්හි රන්වන් මහරිගසක් මෙන් තිබෙන්නේය. ඒ අවස්ථාවෙහි කාල විශේෂයෙන් ආකාර භේද වූ පමණක් මුත් එක කැළගස වන්නේය"යි කියා සැක දුරු කළාහුය.

සර්වඥයන් වහන්සේද මේ කථාව දෘෂ්ටාන්තය ගෙනහැර දක්වා වදාරා "මහණෙනි, ඒ සතර බෑයෝ විස්තර විභාගකොට නොවිචාළයෙන් යම් සේ සැක උපදවාපුහු ද, එපරිද්දෙන් සියළු විදර්ශනා ඥානයන් සකන්ධායතනභූත ධාතු ප්‍රභේද වූ ධර්මයන්ගේ විභාග දැන සෝතාපත්ති මාර්ගයට නොපැමිණී හෙයින් එක් රහත් වීමට භාවනා සතරක් වීමට කාරණා කිම්දැයි තොපට සැක උපන් පමණක් මුත් ඒ භාවනා සතරින්ම පැමිණෙන්නේ එක් නිර්වාණය"යි වදාරා මේ 'කිංසුකොපම ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් දැන් බුදුවූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 248. සාල(ක) ජාතකය

තවද ශාක්‍යකුල කල්පද්‍රම වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා මහතෙර කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

එක් මහතෙර කෙනෙකුන් වහන්සේ සමීපයෙහි සිටි ළදරු භික්ෂුවක් තමන් සතු තුන් සිවුරු පාත්‍ර ආදිය උපාධ්‍යායන් වහන්සේට භාර දී සිවුරු හැර උපාධ්‍යායයන් වෙතින් පහ වූයේය. එතල්හි ඒ මහතෙරුණ් වහන්සේ ඔහු සමීපයට ගොස් "තොපගේ පාසිවුරු තොප සන්තකය, මාගේ තුන්සිවුරු පාත්‍රය ආදී වූ පිරිකරත් තොප සන්තක වන්නේය"යි

පොළඹාගෙන නැවතත් මහණ කරවූසේක. ඒ මහණ කර වූ තැන් පටන් පළමු සේම තදවන්නට පටන් ගත්සේක. ඒ තෙම නැවතත් සිවුරු ඇර මහතෙරුණ් වහන්සේ යාඥා කළත් නැවත සිවුරු නොපෙරවියේය.

එක් දවසක් භික්ෂූන් වහන්සේ ධම්සභා මණ්ඩපයෙහි රැස්ව හිඳ "ඇවැත්නි, සාමණේර තෙම මොළොක් වූ සිත් ඇත්තේමය. මහතෙරුණ් වහන්සේගේ කෝපී කමින් පහ වූයේය"යි කිය කියා වැඩ උන්සේක. සර්වඥයන් වහන්සේ ධම්සභා මණ්ඩපයට වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පෙර පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා මේ ප්‍රවෘත්තිය දැන් වූ කල්හි "මහණෙනි, මේ ළදරුවෝ දැන්මතු මොළොක් සිත් ඇත්තෝ නෙවෙයි, පළමුත් එක් වරෙක මොහුගේ රොස දැක නැවත නොආයේය"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක .

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ කෙළෙඹි කුළයක ඉපිද වැඩි වියට පැමිණ වී වෙළඳාම් කිරීමෙන් ජීවිකාව කරන්නේය.

එකල එක්තරා අහිගුණ්ඨිකයෙක් වඳුරකු ඇතිකොට හික්මවා ඔහු අතට බෙහෙත් දී ඔහු ලවා නයින් කෙළවමින් රැකී ඇවිදිනේ බරණැස් නුවර උත්සව කෙළි කෙළනා පිණිස

ඒ වඳුරා ඒ වෙළඳුණන් අතට භාරකොට දී උත්සව කෙළ ඉක්බිත්තෙහි ඒ වෙළඳුණන් සමීපයට ගොස් "මාගේ වානරයා කොයිදැ?"යි විචාළේය. එවිට එකියන වානරත් තමාගේ ස්වාමිපුත්‍රයා ආ හෙයින් සන්තෝෂයෙන් ලගට ආහ. එවිට අහිගුණ්ඨිකයා තමාගේ අත තුබූ උණ පත්තක් බලා වානරයාට පහරක් ගසා බැඳගෙන ගොස් එක් අඹගසක් මුල වැදහොත්තේය. එකියන වානරත් බැඳුන් කඩාගෙන අඹගසට නැගී අඹ කා අහිගුණ්ඨකයා ඇගට අඹගැට ගැසීය. එවිට අහිගුණ්ඨකයාත් පිබිද වානරයාත් නොදැක ගස උඩ බලා වානරයා දැක "නලවා බා ගන්ට උවමැනවැ"යි සිතා "මට ඇත්තා නම් තොප එක පුතාම වුව, එසේ හෙයින් මාගේ ඇති යම් සම්පතෙක් ඇත්නම් තොපගේ ම වුව, පුත මෙසේ එව"යි කීහ. එවිට වානර කියන්නේ "මා තොප කෙරේ මෛත්‍රියෙන් ආවෙමි. තොප විසින් කිපී උණ පත්තෙන් ගැසූ හෙයින් තොප කෙරේ මම කිපිනිමි. එසේ හෙයින් මා එන්නේ නැතැ"යි කියා වානර ඔබ්බකට පලා ගියේය. ඒ පුරාෂයාත් විකෙෂප ව ගොට ගියේය යයි වදාරා 'සාල ජතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි වානර නම් මෙකියන සාමණේරය, එසමයෙහි අහිගුණ්ඨිකයා නම් මෙකියන මහතෙරය. එසමයෙහි ඒ විකුණන වෙළඳව උපන්නෙමි බුදුවූ මම්ම යැ"යි වදාළසේක.

# 249. කපි ජාතකය

තවද සංසාර ඵලක වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි වඤ්චා ප්‍රයෝග දෙන්නා භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

වඤ්චා ප්‍රයෝග දන්නා භික්ෂු කෙනෙකුන් වහන්සේ සර්‍වඥයන් වහන්සේට දක්වන්නා "මහණෙනි, දැන්මතු නොවෙයි, පෙරත් මූ වඤ්චා ප්‍රයෝගකොට ගිණි තපින්ට උත්සාහ කළෝ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ එක්තරා කෙළෙඹි පුත්‍රව ඉපිද තමන්ගේ බිරිඳ මළ පසු දරුවන් වඩාගෙන වනාන්තරයට ගොස් ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව තමන්ගේ පුතණුවන් මහණ කොටගෙන වාසය කරන්නාහ. එසමයෙහි වැස්සක් වසින්ට වන. එවිට එක්තරා වානරයෙක් වැස්සේ තෙමී තමාට සීත පිඩාව බලවත් හෙයින් "තාපසයන්ගේ පන්සලට ගොස් ගිණි තැප ගණිමි"යි සිතා "මා නික්ම ගියොත් වැද්ද නොදෙති" සිතා "තාපස වේශයක් හැරගෙන යෙමි" සිතා පුරාතන මළ තාපසා කෙනෙකුන්ගේ

අඳුන් දිවිසම ජටා ආදී වූ දෙය ඇඳ පෙරව දඬු ගත් අත් ඇතිව පන්සල සමීපයෙහි සිටියේය.

ඒ වේලාවට බෝධිසත්ත්වයෝ මැස්ස පිට වැදහොත්තාහ. බෝධිසත්ත්වයන්ගේ පය මැඩ මැඩ උන්නා වූ පුත්‍රයා තාපසවේශයෙන් සිටි වඳුරා දැක "මූ තාපස කෙනෙකැ"යි සිතා පියාණන්ට කියන්නාහු "පියාණන් වහන්ස, ඉඳුරන් දැමුණු තාපස කෙනෙක් වැස්සේ තෙමි තෙමි සීත පිඩා ඇතිව සිටිනාහ. එසේ වූ තාපසයන් වහන්සේ පන්සලට ගෙන ගිණි තප්ප වූකල නපුරුදැ?"යි කීහ.

බෝධිසත්ත්වයෝ "තාපස කෙනෙකුන් වහන්සේ වැඩි නියාවනැ"යි බිමට බැස බලා වඳුරා නියාව දැන පුතණුවන්ට කියන්නාහු "මූ තුමූ ඉඳුරන් දැමූ තාපස කෙනෙක් නොවේය. මේ තෙම වඳුරාය. එසේ හෙයින් මූ කෙරේ කරුණායෙන් මෙතනට ගෙන්වා ගිණි තැප්ප වූවෝ නම් මේ තෙමේ පන්සල ගිණි ලා යන්ටත් සපනැ"යි සිතා එතන තිබූ ගිණි පෙණල්ලක් බාලා උඟ හය ගන්වා එතනින් පහකොට පූවාහ. එකියන වානරයාත් එතැන් පටන් නොආයේය.

බෝධිසත්ත්වයෝත් පඤ්චඅභිඥා අෂ්ටසමාපත්ති උපදවාගෙන තමන් වහන්සේගේ පුතණුවන්දෑටත් කිසුනු පිරියම් භාවනා උගන්වා නොපිරිහුනු ධ්‍යානයෙන් බඹලොව ගියාහයි වදාරා 'කපි ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි එකියන වඳුරා නම් මේ වඤ්චා ප්‍රයෝග දන්නා භික්ෂූහුය. තාපස කුමාරයෝ නම් රාහුල කුමාරයෝය.

තාපස ව උපන්නෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ''යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 250. සංකප්ප ජාතකය

තවද තික නිපාතයෙහි ජාතකවලින් සංකප්ප ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

සංසාරදීප වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ස්ත්‍රියක නිසා ශාසනයෙහි උකටලී වූ භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

එක්තරා භික්‍ෂු කෙනෙකුන් වහන්සේ ස්ත්‍රියක නිසා උකටලී වූ නියාව සංඝයා වහන්සේ දැන "මහණ, සර්‍වඥයන් වහන්සේ විසින් ස්ත්‍රීන්කෙරේ පිළිබඳ සිතීම දෝෂ යයි කියා වදාළ නියාව දැන එසේ වූ පව් පිරෙන්නා වූ ස්ත්‍රීන් කෙරේ ශෝකව තොප සිවුරු අරින්ට කාරණා කිම්දැ?''යි කියා මහණ නොකමැති පරිද්දෙන් බුදුන් කරා ගෙනගොස් බුදුන්ට පෑහ.

සර්‍වඥයෝත් ඒ නම දැක ඇයි "මහණෙනි, මේ නම නොකැමැති පරිද්දෙන් ගෙනායේ කුමක් පිණිසදැ?''යි විචාරා වදරා එපවත් අසා "සැබෑද? මහණ, තා ස්ත්‍රියක් නිසා උකටලී වූයේය''යි විචාරන්නා "සැබෑය ස්වාමීනි'' කී කල්හි "මහණෙනි, මේ භික්‍ෂූන්ට වරදකොට ගෙනා පමණක් විනා මුන් තිබා පෙර උත්තමයන්ගේ පවා සිතිවිල්ල කළඹාපු ස්ත්‍රීහු

මුන් සේ වූවන් බලද්දැ''යි වදරා "ඒ කෙසේදැ?''යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයෝ බ්‍රාහ්මණ කුලයක ඉපිද දෙමවුපියන්ගේ ඇවෑමෙන් බොහෝ සම්පත් දැක සිතන්නාහු "මාගේ දෙමවුපියෝ මේ සම්පත් තිබා තුමූ පරලොව ගියාහ. එසේ හෙයින් මට සම්පත්තියෙන් කාර්‍ය කිම්දැ?''යි සිතා ගේ පිරුණු සම්පත් දන මුඛයෙහි විසුරුවා බොහෝ බන්ධූන් කඳුළුගත් මුහුණු ඇතිව සිටිය දී ගිහිගෙය හැර හිමාලය වනයට ගොස් ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවාගෙන වාසය කරන්නාහු, ලුණු ඇඹුල් නිසා බරණැස් නුවරට ආහ. රජ්ජුරුවෝත් මතුමාලෙහි සිටියාහු බෝධිසත්ත්‍වයන්ගේ ඊර්‍ය්‍යාපථයෙහි පැහැද තමන් ලඟ සිටි අමාත්‍යවරයෙකුට කියන්නාහු "අර වඩනා සිල්වත් තාපසයන් වහන්සේගේ භික්‍ෂා පාත්‍රය ඇරගෙන එව''යි කියා යවූහ.

එකියන අමාත්‍යයාත් ගොසින් බෝධිසත්ත්‍වයන්ගේ භික්‍ෂා පාත්‍රය ඉල්විය. බෝධිසත්ත්‍වයෝත් "රජ්ජුරුවන් අප හා පුරුදුකම්, විශ්වාසකම් නැති වුව. රජ්ජුරුවෝ අප කුමට කැඳවද්දැ?''යි කියා යවූහ. ඒ අමාත්‍යයෝ "එපවත් රජ්ජුරුවන් වහන්සේට කියා මා එනතුරු සිටිය මැනවැ''යි කියා රජ්ජුරුවන් කරා ගොස් එපවත් කියා රජ්ජුරුවෝ

එපවත් අසා ඒ අමාත්‍යයා අත කියා එවන්නාහු "මාගේ කුළුපග තාපස කෙනෙක් නැත්තාහ, එසේ හෙයින් වඩිනේ යහපතැ"යි කියා යවා රජ්ජුරුවෝ තුමූත් මතුමාලේ සිට සිව්මැදුරු කවුළුවෙන් අතපොවා තාපසයන් වැඳ "වඩිනේ යහපතැ"යි ආරාධනා කළහ.

බෝධිසත්ත්‍වයෝත් රජ්ජුරුවන් කළ ආරාධනාව ඉවසා රාජපුරුෂයා අතට භික්‍ෂා පාත්‍රය දී අමාත්‍යයා හා සමග රජගෙට වන්හ. රජ්ජුරුවෝත් බෝධිසත්ත්‍වයන්ට අසුන් පනවා වඩා හිඳුවා මිහිරි ආහාරපාන වළඳවා බණ අසා බෝධිසත්ත්‍වයන් තමන්ගේ මංගලෝද්‍යානයෙහි වසන නියායෙන් ප්‍රතිඥා ඇරගෙන බෝධිසත්ත්‍වයන් හා සමග උයනට ගොස් බෝධිසත්ත්‍වයන්ට රාත්‍රී ස්ථාන, දිවා ස්ථාන, චංක්‍රමණ ආදී වූ දෙය කරවා තාපසවරුන්ට කැප වූ ශ්‍රමණ පරිස්කාර සලස්වා උද්‍යානපාලකයට තාපසයන් වහන්සේගේ දුකෙහි සැපෙහි බැඳෙන නියාවෙන් ඕහට භාරකොට රජගෙට ගියාහ.

එවක් පටන් දොළොස් අවුරුද්දක් තාපසයන්ට සිවුපසයෙන් නිරන්තරයෙන් පෝෂ්‍ය කරන්නාහ.

එසමයෙහි බරණැස් රජ්ජුරුවන්ගේ පසල් දනව්වට සතුරන්ගෙන් භයෙක් විය. එපවත් දත් රජ්ජුරුවෝ අග්‍රමහේසිකාවන්ට කියන්නාහු "ප්‍රත්‍යන්තයේ සතුරන්ගෙන් භයෙක් විය, එය සන්සිඳවන්ට යන්නා කැමැත්තෙමි. මෙනුවරත් තොප හෝ මා හෝ දෙන්නාගෙන් එක් කෙනෙකුන්

ඉන්ද්‍රමනාය”යි කීහ. අග්‍රමහේසිකාවොත් එපවත් අසා “ඇයි කාරණා කිම්දැ?”යි විචාරා “සිල්වත් තාපසයන් වහන්සේට දන් දෙන පිණිස ය”යි කීහ. අග්‍රමහේසිකාවෝත් “යහපතැයි, දේවයන් වහන්ස, නුඹවහන්සේ වඩිනා තුරු තාපසයන් වහන්සේගේ කාර්යය මට භාරයි. නුඹවහන්සේ කිසි සැකයක් නොසිතා වැඩිය මැනවැ”යි කීහ. රජ්ජුරුවෝ “යහපතැ”යි චතුරංගිනි සේනාව ඇරගෙන යුද්ධයට ගියාහ.

එතැන් පටන් බෝධිසත්ත්වයෝ ආකාශයෙන්ම රජ්ජුරුවන්ගේ මාලිගාවට වැඩ බිසවුන් පණවාදෙන අස්න පිට හිඳ බිසවුන් දෙනලද ආහාරපාන වළඳා ආකාශයෙන් නැවත උයනට යන්න හ. මේ නියායෙන් දවස්පතා රජ ගෙයින් වළඳා එන්නාහ. එක් දවසක් බිසවුන් දන් සපයා බෝධිසත්ත්වයන් එන පෙරමඟ බල බලා උන්නාහු සිගිත්තක් ප්‍රමාදව හෙයින් නහා සිහින් කසාවන් වස්ත්‍රයක් ඇඳ සර්වාලංකාරයෙන් සැරහී කුරු යාහනකට වැදහෙව නිදන්නාහ. බෝධිසත්ත්වයෝ වේලා බලා භික්ෂා පාත්‍රය ඇරගෙන පස්වණක් වළා මඩිමින් රජ්ජුරුවන්ගේ මතුමාලට වැඩිසේක.

එවිට බිසවු වල්කලා සිවුරෙන් සුළන් වැදගත් අඬ අසා “තාපසයන් වහන්සේ වැඩිවනැ”යි සිතා වහා නැගී සිටිනාහු ලිහිල් ව තුබූ සළුව කටියෙන් ගැලවී වැටින. බෝධිසත්ත්වයෝත් ඒ දැක සුභ නිමිත්ත වශයෙන් බලන්නාහු දෘෂ්ටි ජාලයෙන් බිඳ බැළුහ. එවේලෙහි බෝධිසත්ත්වයන්ගේ ධ්‍යානය පිරිහිණ. පියසුනු කවුඩකු මෙන් සැදැල්ලේ පයින් බැස

සිටියාහ. බිසවුන්ගේ රූපශ්‍රීය යහපත් නිසාය. අතුල්, පතුල්, කලවා, කොණ්ඩ ආදී වූ අවයව වෙන වෙනම බලන බෝධිසත්ත්වයන්ට බලවත් වූ සෝක උපන. එවිට අමාත්‍යයෝ අසුන් පණවා ඉන්ට කීවත් නොයින්නාහ. බිසවුන් තමන් නිසා බෝධිසත්ත්වයන්ට සෝක උපන් බව දැන තමන් අන්නපානය බෝධිසත්ත්වයන්ගේ භික්‍ෂා පාත්‍රයෙහි ලූහ.

බෝධිසත්ත්වයෝ ආකාශයෙන් යා නොහී ඉනිමගින් බිමට බැස තමන් වසන්නා වූ පන්සලටම ගොස් බත් පාත්‍රයත් නොවලඳා තිබා මැස්සට නැගී සද් දවසක් නිරාහාරව වැදහොත්තාහ.

රජ්ජුරුවෝත් සතුරන් සන්සිඳුවා නුවරට අවුත් ප්‍රදක්‍ෂිණාකොට බැස තමන් වසන්නා වූ රජගෙට වැද "තාපසයන් වහන්සේ දකින්ට ය"යි කියා උයනට ගියාහ. තාපසයන් වහන්සේගේ මළුව කසලව තිබූ නියාව දැක "එසේ වීනම් තාපසයන් වහන්සේ හිමාලය වනයට වැඩපු නියා වේදැ"යි සිතා දොර අඩවල්කොට තිබූ හෙයින් ගෙට වැද තාපසයන් වහන්සේ දැක "එසේ නම් තාපසයන් වහන්සේ ලෙඩ නියාය"යි සිතා මළුවෙ කසළක් හරවා පිළිනිව නිලමැස්සන් ඇසිරෙමින් සිටි පාත්‍රයේ බතුත් දම්මවා තාපයන් වහන්සේ කරා ගොස් "ස්වාමීනි, ඇති පාසුඅපාසු කිම්දැ?"යි විචාරා එවිට තාපසයෝ කියන්නාහු "රජ්ජුරුවෙනි, ඊ පාරක් ලදුම්හ"යි කීහ.

රජ්ජුරුවෝ සිතන්නාහු "සතුරෝ මට කුමකුත් කොටගත නොහී තාපසයන් වහන්සේට දුක්ඛයක් කළ නියාවනැ"යි සිතා "ස්වාමීන් වහන්සේගේ ඊ පාර වැදගත්තේ කොතනදේ?" කියා ශරීරයේ වට බලා නොදැක තාපසයන් අතින් විචාරන්නාහු "කොතනක ඊය වැද ගත්තේදැ?"යි විචාළාහ.

එවිට බෝධිසත්ත්වයෝ කියන්නාහු "සතුරන්ගෙන් වැදගත් ඊයෙක් නොවෙ"යි කියා තමන් වැදගත් ඊය කියන්නාහු "මහරජ්ජුරුවෙනි, මම අන්‍ය වූ පසමිතුරන් විසින් විදින ලද්දෙම් නොවෙමි. වැලි කවුරුන් විසින් විදිනා ලද්දේද? යත්, මම් මාගේ හෘදයෙහි ඊය විදිනා ලද්දෙමි. කුමක් විදිනා ලද්දෙම්ද? යත්, **සංකප්පරාගධොතෙන** (සංකප්පරාග දෙ‍්‍රහනයෙන්), **විතක්කනිස්සිතෙනව** (විතර්කයෙන් යුක්ත වූ රාගයෙන්), **කොරොස්සනක** (ගන ලද්දා වූ චිත්තයෙන්, හස්තයෝ ශෝභනය, පාදයෝ ශෝභනය, මුඛය ශෝභනය යනාදී වූ හස්ත පාද දී අවයවයන් යහපතැයි ගන්නාලද විතර්ක නැමැති සිළු වූ සනාගන්නා ලද්දා වූ), **නාලං කටක හද්දෙන** (ඉඟුලින් ලා බැඳ සරහා යහපත්කොට නොකරන ලද්දා වූ, ඇස් කෙළවරින් බලා ඇද, මැඩ නොසිටුවන ලද්දා වූ), **නඋසකාරෙනෙව** (සවීාකාරයෙන්ම ඊ වඩුවකු විසින් නොකරන ලද්දා වූ බව දැන), **නකන්නායකමුත්තෙන** (දකුණු කන්මුල දක්වා උරපුරා ඇද අසුර නොගලවන ලද්දා වූ), **නපිමොරුපසෙවිනා** (මොනරුන්ගේ තඹවන් වූ, ගිජුලිහිණියන්ගේ ලොහො තුඩුවන් පතින් නොසදන ලද්දා වූ), **සබ්බංගපරිදෘහිනො** (සර්වාංග පරිදෘහ විනාශ කළ සකල

ශරීරයෙහි ගිණිසුළු ගසන්නාක් මෙන් දාහ උපදවන්ට සමර්ථ වූ), **තෙන** (ඒ කාමරාග නැමති ක්ලේශ සැරයෙන්), **විද්ධො අමහි** (විදින ලද්දෙම් වීමි).

මහරජ්ජුරුවෙනි, ඒ කාමරාග නැමති ඊයෙන් විදි වේලෙහි පටන් මාගේ සකල ශරීරය ගින්නෙන් තැවෙන කලක් මෙන් දාහ වැදගෙන දන්නේය. **රුධිර මස්සවෝ** (මාගේ ලෙහි වැදගෙණ යම් ශර ප්‍රහාර මුඛයකින් ලේ වැගිරේ නම්), **අවෙධඤ්ච නපස්සාමි** (එබඳු ලේ වැගිරෙන මුඛයකුත් නොදකිමි), **යාව අයොනිසොචිත්තා** (මාගේ සිත ඉතා සරකොට නුනුවණින් වඩනා ලද්දේය), එසේ හෙයින් මා විසින් **මෙ** (මට), **දුක්ඛසමාගතං** (අසුභාලම්බන වශයෙන් ගැණීමෙන්) රාග චිත්තය උපදවා දුක් එලවන ලදැ"යි ධර්‍ම දේශනාකොට රජ්ජුරුවන් "ඈත පලා යව"යි කියා පන්සල ඉඳ පඤ්චසෘද්ධි අෂ්ටසමාපත්ති උපදවාගෙන රජ්ජුරුවන් උන් තෙනට ගොස් ආකාශයෙහි පලක් බැඳ වැඩ හිඳ බණ කියා "රජ්ජුරුවෙනි, මම හිමාලය වනයට යම්හ"යි වදාළසේක. රජ්ජුරුවෝ "මාගේ දිවිහිමින් නුඹවහන්සේව ආරක්‍ෂා කෙරෙමි. නොගිය මැනවැ"යි කියද්දීත් "රජ්ජුරුවෙනි, මනුෂ්‍ය භවනයෙහි ඉඳිමෙහි බොහෝ ආදීනව ඇතැ"යි කියා හිමාලය වනයට ගියහයි වදාරා 'සංකප්ප ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි තාපස ව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 251. තිලමුට්ඨි ජාතකය

තවද මාගේ ශිරෝමාණික්‍ය වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් කෝපී වූ භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

එක්තරා භික්ෂු කෙනෙකුන් වහන්සේ යම්තම් බසකටම කෝප වනසේක. සෙසු භික්‍ෂූන් වහන්සේ එ නම දැක "කෝපී නොවන්නා වූ බුද්ධශාසනයෙහි මහාණුව තොප කෝප වීමෙන් දවස් යවන්නේ කටයුතු නොවන්නේ වේදැ"යි කියා ඒ භික්‍ෂූන් වහන්සේ සර්‍වඥයන් වහන්සේ කරා ගෙනගොස් දැක් වූසේක.

සර්‍වඥයන් වහන්සේත් "සැබෑද? තා කෝප වීමෙන් දවස් යවන්නේදැ"යි විචාළ කල්හි "සැබෑව ස්වාමීනි" දැන් වූ කල්හි සර්‍වඥයන් වහන්සේ "මහණෙනි, දැන්මතු නොවෙයි, පෙරත් මේ භික්ෂුහු කෝප වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ බ්‍රහ්මදත්ත නම් රාජ කුමාර කෙනෙක් ඇත්තාහ. ඒ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝත් තමන්ගේ පුතණුවන්ට මස්සෙන් දහසක් හා පිළිසඟලක් හා පත්කුඩයක් හා වහන්සඟලක් හා බත්මුලක් ආදී වූ දෙය දී "දිසාපාමොක් ආචාරීන් කරාගොස් ශිල්ප ශාස්ත්‍ර ඉගෙණගෙන එව"යි යවූහ.

එකියන කුමාරයාත් තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරී දකින්ට ගිය වේලාවට දිසාපාමොක් ආචාරීන් ශිෂ්‍යයන් ශිල්ප ශාස්ත්‍ර උගන්නා මිදුලෙහි සක්මන් කොට කොට සිටියහ. ඒ වේලාවට රාජකුමාරයන් ලඟ එන්නා දැක "ඇයි තොපි කුමට අවුදැ?"යි විචාරා "ශිල්ප උගන්ට ආමී" කී කල්හි ආචාරීන්ට වස්තු දී "ශිල්ප දැක උගනුද? කුලියට ශිල්ප උගනුදැ?"යි විචාළ කල්හි එවිට රාජකුමාරයාත් ආචාරී භාගයක් පළමුකොට තබා වැදහොත්තාහ. එවිට දිසාපාමොක් ආචාරීන් "රාජකුමාරවරුන් නම් කල්යවා ශිල්ප උගන්ට බැරිය, වහා ශිල්ප උගත මැනවැ"යි කියා සාමාන්‍ය නකත් සලස්වා ශිල්ප උගන්ට පටන් ගැන්වූහ.

එක් දවසක් රාජකුමාරයන් පිටිපස්සේ ලාගෙන නාන්ට වැවට යමින් සිටියාහ. ඒ වේලාවට එක්තරා මැලි ස්ත්‍රියක් එල කරපු තල අව්වේ වනා වියලමින් සිටියාහ. ඒ වේලාවට දිසාපාමොක් ආචාරී පස්සේ යමින් සිටි රාජකුමාරයෝත් එකියන එල තල දැක කන්නා අභිප්‍රාය ඇතිව ගාණක් අතටගෙන කාපූහ. එකියන මැලි ස්ත්‍රීන් ඒ දැක "කුඩාකොල්ලා හෙයින් බඩසයින් කාපුව මැනවැ"යි සිතා බැණ නොනැගී සිටියාහ. දෙවන දවසුත් එපරිද්දෙන්ම රාජකුමාරයෝත් එල තල ගාණක් අරගෙන ගියාහ. තුන්වන දවසුත් එපරිද්දෙන්ම ඇර ගත්තාහ.

එවිට ස්ත්‍රී සිතන්නී "මේ නියායෙන් දවස් පතා කත් නම් මාගේ තල නිමායෙ"යි සිතා කියන්නී "දිසාපාමොක් ආචාරීන්

වහන්ස, තමන්වහන්සේගේ අතවැස්සන් ලවා මාගේ තල ගන්නා සේකැ''යි මොර ගෑව. එවිට දිසාපාමොක් ආචාරී "ඇයි මැණියනි, මම කුමන අන්‍යායක් කෙළෙම්දැ?''යි කීහ. එවිට ස්ත්‍රී කියන්නී "නුඹවහන්සේ පස්සේ යන අතවැසි තුන් වාරයක් මාගේ තල ඇරගෙන ඉනිබ්බේත් තල ගනිත්නම් මාගේ තල නිමන්නේය''යි කියා මොර ගා කීය. එවිට දිසාපාමොක් ආචාරී කියන්නාහු "ඊට තොප වික්ෂේප නොව, තොපගෙන් කෑ තලවලට මම මිළ දෙමි'' කීහ. එවිට ස්ත්‍රී කියන්නී "කෑ තලයට මිළ එපයි, ඉනිබ්බේ මාගේ තල නොකන ලෙස අවවාද කියව''යි කීහ. එවිට දිසාපාමොක් ආචාරී කියන්නාහු "ඉදිරියේදී පාටව කෙරෙමි'' කියා අතවැස්සන් දෙන්නකු ලවා දෑත්කර අල්වා උණ පත්තෙන් පාර ගණනක් ගස්වා පාට ව කරවූහ.

එවිට රාජකුමාරාත් දෑස් රත්කොට උරණ ව මුහුණ බලා වෛර බැන්දේය. දිසාපාමොක් ආචාරීන් තමන් කෙරේ වෛර බැඳි නියා දත්හ. දැන දැනත් සියළු ශාස්ත්‍ර උගන්වා නිපුන කරවූහ. ඒ රාජකුමාරයාත් දිසාපාමොක් ආචාරීන් වැඳ නුවරට යන්නාහු "ආචාරීන් වහන්ස, මම සැප සේ රාජ්‍යයට පැමිණියෙම් වීනම් නුඹවහන්සේ කැඳවා එවමි. එවිට අව මැනවැ''යි කියා තමන්ගේ රටට ගොස් තමන්ගේ පියරජ්ජුරුවන්ට ශිල්ප දැක්වූහ.

එවිට රජ්ජුරුවෝ සමාධිව "මා ඇස් සමුයේ මොහුගේ රාජ්‍යශ්‍රී දකිමි'' සිතා රාජශ්‍රීය දුන්නාහ. එකියන

රාජකුමාරයාත් රාජ්‍යයට පැමිණ දිසාපාමොක් ආචාරීන්ට පාටව කරන්නා කැමතිව "ආචාරීන් වහන්සේ මා කෙරේ සැක නොසිතා වහා එන්නේ යහපතැ"යි කියා යවූහ. එපවත් දිසාපාමොක් ආචාරීන් වහන්සේ අසා "රජ්ජුරුවන් වහන්සේ මා කැඳවා එන්නේ මට සෙනෙහයෙන් නොවෙයි, මා ගැසූ පාරට නිග්‍රහ කරන්නටය"යි සිතා දැන "කුමාරයෝ බාලයෝය, එසේ හෙයින් මා කියන අවවාද දැන් අසන්නේ නොවෙති. පසුව වැඩිමාළු වයසට පැමිණි කල යෙමි" සිතා නොගොස් කල්‍යාමක් කොට රජ්ජුරුවන් වැඩිමාළු ව ගියපසු දිසාපාමොක් ආචාරීන් නොකැඳවාම තුමූ ගියහ.

ගොස් වාසල සිට තමන් ආ පවත් කියා යවූහ. එපවත් අසා රජ්ජුරුවෝ "යහපත, ආචාරීන් වහන්සේ කැඳවම්" කියා කැඳවා කියන්නාහු "ඇයි ආචාරීනි, තොපි මරණ නළලේ තබා අවුද? එදවස් තොප විසින් මා තල කෑවයි කියා දෙන්නකු ලවා අත් දෙක දල්වා උණ පත්තෙන් තැළ වූ පාර තව දක්වා මාගේ පිටේ රිදෙන්නේය"යි කියා "අමාත්‍යයෙනි, මේ දිසාපාමොක් මරව"යි කීහ. එවිට දිසාපාමොක් ආචාරී කියන්නාහු "රජ්ජුරුවෙනි, එදවස් තොප කෑ තලවට පාරක් නොගැසී නම් දෙවෙනි දවස් අනික් සොර කමක් කරනසේක. එවිට යම් කෙනෙක් මරා දමාපු නම් දැන් මේ රාජශ්‍රීය බලන්ට නැත්තේ වේද? එසේ හෙයින් හික්මවීම පිණිස කළ පාටවයට උත්තමයෝ වෛර නොබඳිති" කියා කීහ.

එපවත් අසා බොහෝ අමාත්‍යයෝත් “එසේමය, දේවයන් වහන්සැයි, දිසාපාමොක් ආචාරීන් වහන්සේ පිණිස රාජ්‍යශ්‍රීය නුඹවහන්සේ ලද්දේය”යි අමාත්‍යයෝ කීහ. රජ්ජුරුවෝ ඒ කාරණය සිතාගෙන ආචාරීන්ගේ බොහෝ ගුණ සඳහන්කොට කියන්නාහු “දිසාපාමොක් ආචාරීනි, රාජ්‍යයට පැමිණියේ තොප පිණිසයයි, එසේ හෙයින් රාජ්‍යය පිළිගනුව”යි කීහ. එපවත් අසා දිසාපාමොක් ආචාරීන් රාජ්‍යය නොගිවිස්සාහ. රජ්ජුරුවෝත් තමන්ගේ මිනිසුන් යවා ආචාරීන්ගේ අඹුදරුවන් ගෙන්වාගෙන තමන්ගේ නුවර ලා ආචාරීන්ට බොහෝ තරම් පදම් සලස්වා තමන්ට පුරෝහිත තනතුරෙහි තිබුවේදැයි වදරා මේ ‘තිලමුට්ඨි ජාතකය’ නිමවා වදාළසේක. මේ ජාතකය අවසානයෙහි එකියන භික්ෂූන් වහන්සේ අනාගාමී ඵලයෙහි පිහිටිසේක.

“එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් මේ කෝපී භික්ෂූහුය. දිසාපාමොක් ආචාරී ව උපන්නෙම් බුදුවූ මම්ම ය”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 252. මණිකණ්ඨ ජාතකය

තවද මාගේ ස්වාමිදරුවාණන් වහනසේ අලව් නුවර නිසා අග්ගාලා චෛත්‍ය භූමියෙහි වැඩවසන සමයෙහි කුටිකාර ශික්ෂා පදයන් දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

අලව් නුවරවාසී භික්‍ෂූන් වහන්සේ බොහෝ මනුෂ්‍යයන්ට "අපට ගෙවල් ඉදි කරන්ට කැති දෙව, පොරෝ දෙව"යි කියා නොයෙක් දේ ඉල්වා ආයාස කරනසේක. එසේ හෙයින් මනුෂ්‍යයෝ සංඝයා වහන්සේ දකිනා අභිප්‍රාය(කැමැත්ත) මදව වාසය කරන්නාහ.

එසමයෙහි කාශ්‍යප ස්වාමීන් අලව් නුවර සිඟා වැඩිසේක්, තමන්වහන්සේගේ මනුෂ්‍යයන් සැගවුනු හෙයින් උන්වහන්සේ දුක සේ සිඟා වළඳා සර්වඥයන් වහන්සේ වසන්නා වූ අග්ගාලක නම් චෛත්‍ය භූමියට ගොස් සර්වඥයන් වහන්සේට දන්වනසේක් "ස්වාමීනි, ආදි අලව් නුවර සිඟා ගිය කල සතරපහස සැප සේ ලැබෙයි. දැන් අප දැක මනුෂ්‍යයෝ සැඟ වෙති" කීසේක.

සර්වඥයෝත් ඒ සැඟ වෙන්නා වූ කාරණය දැන අලව් නුවරවාසී භික්‍ෂූන් වහන්සේ කැන්දා "තොප හැම විසින් අලව් නුවර මනුෂ්‍යයන්ට බොහෝ ගැන සිගිනිකොට නොයෙක් දෙය ඉල්වති යන්නක් ඇසිමි. ඒ සැබෑදැ?"යි විචාළසේක. ඒ භික්‍ෂූන් වහන්සේ "සැබැව ස්වාමීනි" දන්වන්නා "මහණෙනි, ඉල්වීම් නම් කවුරුන්ටත් නොකන්කලු දෙයක, යටත් පිරිසෙයින් බොහෝ සම්පත් ඇත්තා වුන්ට පවා ඉල්වීම් විකෂේප වේදැ"යි කියා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ එක්තරා බ්‍රහ්මණ කුලයක ඉපිද වාසය කරනසේක.

බෝධිසත්ත්වයන් වහන්සේගේ මෑණියන් වහන්සේ පසුවත් එක් බ්‍රාහ්මණ කෙනෙකුන් වැදූහ. ඉක්බිත්තෙන් බෝධිසත්ත්වයන් වහන්සේගේ මෑණියන් වහන්සේ පසුව කාලක්‍රියා කළහ. බෝධිසත්ත්වයන් හා මළණුවෝ ගිහිගෙයි සම්පත් හැර හිමාලය වනයට ගොස් ගඟක් සමීපයෙහි දෙබෑයෝ ගඟ දෙහික්තියෙහි පන්සල කොටගෙන වාසය කරන්නාහ.

බෝධිසත්ත්වයන්ගේ මළණුවෝ වසන්නා වූ පන්සල සමීපයෙහි ගඟ වසන්නා වූ මණිකණ්ඨ නම් නාගරාජයෙක් ඇත. ඒ තාපසයන්ගේ පන්සල සමීපයේ මනුෂ්‍ය වේශයෙන් සක්මන්කොට ඇවිදින්නේය. තාපසයන් දැක තාපසයන් හා පිළිබඳ සිත් ඇතිව කථාකොට යන වේලේ තාපසයන් නාග වේශයෙන් සිපගෙන තාපසයන් ඉස් මත්තේ පෙණය තිබා යම්තම් වේලාවක් සන්තෝෂ ව නිවාගෙන පෙරලා දරණවැලය ඇර තාපසයන් වැඳ නාග භවනයට යන්නේය. මෙම නියායෙන් දවස් පතා ඇවිත් යාමෙන් තාපසයන් ඇඟ ගෑවෙත් ගෑවෙත් භයින් තාපසයෝ වෑරිනාහ. මේ නියායෙන් ඉතා දුර්වලව පඬු වූ ශරීර ඇති වූහ.

එක් දවසක් තාපසයෝ තමන්ගේ බෑයන් වහන්සේ දකින්ට පන්සලට ගියාහ. බෝධිසත්ත්වයෝ මල් තාපසයන් දැක "ඇයි තොපගේ ශරීරය මෙලෙස දුර්වල වන්ට කාරණා කිම්දැ?"යි

විචාළාහ. එවිට බෝධිසත්ත්වයන්ගේ මළණුවෝ කියන්නාහු "මණිකණ්ඨ නම් නාගරාජයෙක් දවස් පතා අවුත් මා සිප ගන්නේය. එසේ හෙයින් මා වැරිනේය"යි කීහ. එවිට බෝධිසත්ත්වයෝ කියන්නාහු "ඒ නයා තොප සමීපයට නො ඒ නම් සමාධිදැ?"යි විචාළාහ. එවිට බෝධිසත්ත්වයන්ගේ මළණුවෝ "එසේ වීනම් යහපතැ"යි කීහ. "ඒ නාගරජ්ජුරුවන් පැලඳගෙන එන්නේ කුමණ ආභරණදැ?"යි විචාළාහ. තාපසයෝ කියන්නෝ "කර පළඳිනා කණ්ඨ මාණික්‍යය"යි කීහ. "එසේ වීනම් ඒ නාගරාජයා තොප සමීපයට ආ කල උන් පැලඳගෙන ආවා වූ කණ්ඨ මාණික්‍යය ඉල්වව, එදා පලා ගොස් පසුව දවස් ඒ මඩුව සමීපයට ආ කල මාණික්‍යය ඉල්වව, පසුව දවස් දියෙන් ගොඩ නැගෙන කලට මාණික්‍යය ඉල්වව, මේ නියායෙන් ඉල්වන්ට වදිනා කල තෙමේම නොයෙ"යි කීහ.

මේ නියාවට එකියන තාපසයෝත් පළමු දවස් නාගරාජයා ගෙට වදින වේලාවටම "තොපගේ ග්‍රීවයේ තිබූ කණ්ඨ මාණික්‍යය මට දෙව"යි කීහ. එවිට නයා ගෙට නොවැදම පලා ගියේය. දෙවැනි දවස් මඩුවේ කෙළවර සිට ආ වේලාවටම මැණික ඉල්වන්නා එතන සිට පලා ගියේය. තුන්වෙනි දවස් නයා දියෙන් ගොඩ නැගෙන වේලාවටම තාපසයෝ මැණික ඉල්වූහ. එවිට නයා දියෙන් කිමිද දිය මධ්‍යයෙන් ඉස ඔසවා කියන්නෝ "මට අන්නපානාදී වූ බොහෝ ලාභසත්කාර උපදවන්නා වූ කණ්ඨ මාණික්‍ය තොපට මම කෙසේ දෙම්ද? එසේ හෙයින් තොපගේ පන්සලට නේනා

පමණක් වේදැ''යි කියා නැවත කියන්නාහු ''මාගේ බොහෝ සම්පත් ඇති දෙය නොඉල්වා කණ්ඨ මාණිකාය ඉල් වූ හෙයින් තොප ලඟට නොඑන පමණෙක් වේදැ''යි කියා නාගරාජයා දියේ කිමිද නාගලොවට ගියේය.

එතැන් පටන් තාපසයන් සමීපයට නොආ විරූයේය. තාපසයෝත් නයා නොඑන දවස් පටන් පළමු නියාවටත් වඩා සෝකීපත් ව දුර්වල ව ගියෝය. බෝධිසත්ත්වයෝ මළණුවන් විචාරණ පිණිස ආවාහු මළණුවන් ඉතා දුර්වල හෙයින් ''දුර්වල වූයේ කුමක් නිසාදැ?යි විචාළහ.

එවිට තාපසයෝ කියන්නාහු ''නයා නොදැකීමෙන් දුර්වල ව ගියෙමි'' කීහ. බෝධිසත්ත්වයෝත් ''මූ නයා කෙරෙහි මහත් ස්නේහ ඇත්තාහ. එසේ හෙයින් නයා කෙරේ සෝකයෙන් මළෝ නම් නපුරු''යි සිතා ''සෝක අරවන්ට උවමැනවැ''යි සිතා කියන්නාහු ''මළ නොඉල් වියයුතු දෙය ඉල්වීමෙන් ඊට සෝක උපදව''යි කීහ. ''ඉතිකින් සෝක අරව''යි කියා තමන් පළමු වසන්නා වූ පන්සලට ම ගියාහ. එකියන තාපසයා සෝක අළුයේය. බෝධිසත්ත්වයන්ගේ මළණුවන් හා දෙන්නා පඤ්චසෘර්ධි අෂ්ටසමාපත්ති උපදවා නොපිරිහුනා වූ ධ්‍යානයෙන් බඹලොව ගියාහයි වදරා 'මණිකණ්ඨ ජාතකය' නිමවා වදාළසේක.

''එසමයෙහි බෝධිසත්ත්වයන්ගේ මළණුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. එසමයෙහි අවවාද කී තාපසයෝ නම් බුදුවූ මම්ම ය''යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 253. කුණ්ඩක කුච්ඡි සින්ධව ජාතකය

තවද මාගේ ශිරෝමාණික්‍ය වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි සැරියුත් ස්වාමීන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

සර්‍වඥයෝ සැවැත් නුවර ඉඳ ජනපද චාරිකාවේ සැරිසරා වැඩ පෙරලා සැවැත් නුවරට වැඩිසේක. සැවැත් නුවරවාසී බොහෝ මනුෂ්‍යයෝ "සර්‍වඥයන්ට ආගන්තුක සත්කාර කරම්හ"යි සිතා උපාසකවරු ධර්‍මශෝක නම් භික්ෂු කෙනෙකුන් වහන්සේ අතින් තමතමන්ට උවමනා විචාර පන්සියය සසියය දුන යයි මේ නියායෙන් පාත්‍ර ඇරගත්තාහ. එක්තරා දුක්පත් මැහැළි උපාසිකාවක් එකම එක නමකට දන් සපයා විධාන කරවන වහන්දෑ සමීපයට ගොස් "මටත් දන් දෙන නියායෙන් එක නමක් සලස්වන්ට උවමැනවැ"යි කියන්නා "එසේ වීනම් සැරියුත් ස්වාමීන්ගේ පාත්‍රය ගනුව"යි කීහ. "යහපතැ"යි කියා එකියන මැළි උපාසිකා සැරියුත් ස්වාමීන් වඩා ගෙනවුත් යහපත්කොට වැලඳ වූහ.

ඒ ගම අනේපිඬු මහසිටාණන්, විශාඛා මහඋපාසිකාවන්, කොසොල රජ්ජුරුවන් ඇතුළු වූ බොහෝ උපාසකවරුන් එකී උපාසිකාවට බොහෝ රත්රන් මුතුමැණික් දුන්නාහ. එකියන උපාසිකාවත් බලීව පොහොසත් වූව.

මේ කථාව ධම්සභා මණ්ඩපයෙහි රැස් වූ මාළුවරුන් වහන්සේ කිය කියා වැඩ උන් තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදරා "මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදරා එපවත් අසා මෙසේ වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ උත්තරාපථයෙහි අස් වෙළඳ ව උපන්නාහ.

එසමයෙහි බරණැස් නුවරටත් උත්තරාපථයටත් අතුරේ එක්තරා නියම් ගමෙක් ඇත. ඒ ගම ඉන්නා මැළි ස්ත්‍රියක් ඇත්තාහ. එසමයෙහි අස් වෙළෙඳුන් අසුන් පන්සියයක් ඇරගෙන බරණැස් නුවරට යන්නාහු මැළි ස්ත්‍රියකගේ ගෙයි කීප දවසක් රැඳුනාහ. එතන රැඳුනු ගමනේ වෙළඹක් ආජානීය සෛන්ධවයකු වැදුව. එකියන සෛන්ධවයා එකියන මැළි තමාට දරුකොට වඩ වන්ට වන. එකියන අස් වෙළඳුන් කීප දවසක් සැතපී ලා බරණැස් නුවරට අසුන් ඇරගෙන යන්ට වන්නාහ. එවිට එකියන ස්ත්‍රී කියන්නී "මෙතෙක් දවස් මාගේ ගෙයි දී කා බී යන කලට මට කුලියක් නොදී යන්නේය"යි කීය. එවිට අස් වෙළෙඳු "යහපත මැණියෙනි, කුලියක් දෙම්මැ"යි කිවූය. එවිට ස්ත්‍රී කියන්නී "කුලියෙන් මට කාරිය නැත. මාගේ ගෙයි දී උපන්නා වූ අස්පැටවා මට දෙන්නා පමණැ"යි කීහ. "යහපතැ"යි කියා එකියන අස් වෙළෙඳු අස්පැටවා දී ගියාහ.

ඒ කියන මැළි ඒ අස්පැටවා කුඩු හා තණ හා බත් පෙරු කැඳ ආදී වූ දෙය කවා වඩන්නීය. මේ නියායෙන් කවා මුකුරු වූ අවස්ථාවට, බෝධිසත්ත්වයෝත් උත්තරාපථයේ සිට අසුන් පන්සියයක් ඇරගෙන බරණැස් නුවරට එන්නාහු ඒ වේලාවට අජානීය අශ්වයා වඩන මැහැල්ලගේ ගෙට නවාතැනට ආවාහ. ඒ වේලාවට අජානීය අශ්වයා තණ කන්ට ගියේය. බෝධිසත්ත්වයන් ගෙනා අසුන් පන්සියයක් එකියන අජානීය අශ්වයාගේ ඉලත්තියේ සුවඳ අසමින් භයින් ගෙට නොවැද දොරම සිටියාහ. බෝධිසත්ත්වයෝ ගෙට වැද "අම්ම මේ ගෙයි අස්සු ඇද්ද?"යි විචාළාහ.

එවිට මැළි කියන්නී "පුත මා දරුකොට වැඩූ අසකු විනා වඩා අස්සු නැතැ"යි කීහ. බෝධිසත්ත්වයෝ "අශ්වයා කොයිදැ?"යි විචාළාහ. මැළි කියන්නී "තණ කන්ට ගියේය. දැන් දැක්ක හැකි"යි කීහ. ඒ කියන අශ්වයාත් තණ කා ගෙට අවුත් තමා සිටින ස්ථානයට ගියේය. එවිට සෙසු අස්සු ගෙට වන්නාහ. බෝධිසත්ත්වයෝත් එකියන අශ්වයා දැක "මේ අශ්වයා අජානීය අශ්වය"යි කියා දත්හ. බෝධිසත්ත්වයෝත් ඒ ගෙයි කීප දවසක් වාසයකොට බරණැස් නුවරට යනු කැමතිව මැහැල්ලට කියන්නාහු "අම්ම, බරණැස් නුවරට යෙමි. මේ කියන අශ්වපොතකයා මාගෙන් මිළ ඇරගෙන මට දෙව"යි කීහ. "කුමක් කියන්නේද පුත, දරුවනුත් මිළ ඇරගෙන විකුණද්දැ?"යි කීහ.

එවිට බෝධිසත්ත්වයෝ කියන්නාහු "අම්ම, මෙතන ඉඳ දුක් විඳිනා බලාත්, මා ළඟ වීනම් බොහෝ සුව විඳිනේ වේද? එසේ හෙයින් මට දෙන්නේය"යි කීහ. ඒ ස්ත්‍රී "මාගේ දරුවන් සුව විඳිනා වේද, යහපතැ"යි කියා අජානීය අශ්වයා බෝධිසත්ත්වයන්ට දුන. බෝධිසත්ත්වයෝත් ඒ අශ්වයා මිළකොට සතර පයට සාරදහසක් හා මුඛයට දහසක් වලිගයට දහසක් ඇතුළුව සදහසක් වස්තුව හා ඒ ස්ත්‍රී සර්වාභරණයෙන් සරහා යහපත් වස්ත්‍රයක් ඇන්දූහ. එවිට ඒ අජානීය අශ්වයාත් තමා වස්තුවට විකුටපු හෙයින් "මාගේ මෑණියෝ මා මෙතෙක් දවස් වඩා, වස්තු නිසා මා විකුට පුව"යි අශ්වයා ඇඬූහ. එවිට මෑළි ස්ත්‍රීන් "පුත වික්‍ෂෙප නොවන්න, තොප නිසා බොහෝ වස්තු ලදිමි. එසේ හෙයින් මේ කියන වෙළඳුණන් කැටිව යව"යි කීයා යවූහ.

බෝධිසත්ත්වයෝත් එකියන අශ්වයා ඇරගෙන සිතන්නාහු "මේ අශ්වයා තමා අජානීය නියාව දනීද්දෝ? නොදනීද්දෝ? හෝයි සිතා එම ස්ත්‍රිය ලන්නා වූ තණ හා කුඩු හා බතින් පෙරෑ උළුකැන්ම ලූහ. එවිට අශ්වයා නොකෑයේය. "ඇයි, තොප පළමු කණ දෙය දැන් නොකෑයේ ඇයිදැ?"යි කියන්නා එවිට අශ්වයා කියන්නේ "තමාගේ තරම් පදම් නොදන්නා කෙනෙකුන් සමීපයේදී උන් කුමක් කලත් ඉවසෙයි තමාගේ තරම් පදම් දන්නා වූ බ්‍රාහ්මණය, තොප දැක්කදීත් මා කුඩු කන්ට යෝග්‍යදැ?"යි කීහ. එවිට බෝධිසත්ත්වයෝ "තොප පරීක්‍ෂා කරන්ට කෙළෙමි" කියා ඒ අශ්වයාට මිහිරි අන්නපාන ලා එකියන අශ්වයා ඇතුළු වූ පන්සියයක් අසුන් ඇරගෙන

බරණැස් නුවරට වැදී අවශේෂ අසුන් පන්සියය එක් ඇලයෙක සිටුවා අජානීය අශ්වයාට බුමුතුරුණු ලා වියම් බැඳ, එක් ඇලයෙක සිටු වූවාහ. එවිට රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන් අතින් විචාරන්නාහු "ඇයි? මේ අසුන් පන්සියය එක් ඇලයක සිටියදී මූ එක් තෙනක සිටී. තෙමේ අසුන් පන්සියය නියාවට මේ වඩිදැ?"යි කීහ. "එසේය, දේවයන් වහන්ස, මේ අසුන් පන්සියය නියාවට මේ වැඩිය මේ අශ්වයාගේ ජව වේග බලා වදාළ මැනවැ"යි කියා මිනිසුන් පහකොට අශ්වයා පිට නැගී පාරේ අළහ. අසාගේ වේගයෙන් අසුන් කරින් කර ගසා සිටෙව්වා සේ එක අස්වලල්ලක් මෙන් විය. නැවත "බලා වදාළ මැනවැ"යි කියා දුවන වේග දන්වා අසා දිවන්ට වන. එවිට පිට උන් බෝධිසත්ත්වයනුත් අසාත් නොපෙණිනට වන. එවිට බෝධිසත්ත්වයො "අසා ඇරගෙන සෘර්ධි වුවාක් මෙන් වැටහේ දේ හෝ"යි සිතා බඩු අවුරා රතු කඩක් බැඳ ගත්තාහ.

ඒ වේලේ අශ්වයා පාරේ අරින්ට වන් වේලාවට රතු කඩක් වට ඇද්දක් මෙන් විය. නැවත බෝධිසත්ත්වයෝ "බලා වදාරන්නේ යහපතැ"යි කියා මගුල් පතසට ගොස් දියපිට නෙළුම් පතෙහි පාරේ අරින්ට වන්නාහ. එවිට අශ්වයාගේ කුරය තෙමෙන්නේත් නොවී නෙළුම්පත ඉරන්නේත් නොවී පාරේ අළ. නැවත බෝධිසත්ත්වයෝ අශ්වයාගේ ලඝුත්වය පානහු අසා පිටින් බැස අතින් අත ගසා අල්ල පෑහ. එවිට අශ්වයා තමාගේ සතර කුරයම අල්ල පිට තිබිය. එවිට බෝධිසත්ත්වයෝ කියන්නාහු "ස්වාමීනි, මේ අශ්වයාගේ වේගය

සමුද්‍රය කෙළවරකොට තිබෙන මුත් මුගේ වේගයෙහි අන්ත්‍රායක් නොපෙණෝ"යි කීහ.

එවිට රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන් කෙරේ සතුටු ව "මේ නියා අශ්වයෙකු දුන් තැනැත්තවුට රාජ්‍යයෙන් කැබැල්ලක් දෙමි" කළුහු ගසා දී අශ්වයා සිටිනා තැන තමන්ගේ රාජමැදිරිය මෙන් සරහා තමන්ට ඇති යම්ම පෙරහරක දී රැක්කැයි වදාරා 'කුණ්ඩක කුච්ඡිසින්ධව' ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි මැහැළි නම් මෙසමයෙහි මැහැළි මය, එසමයෙහි අජානිය අශ්වයා නම් ශාරීපුත්ත ස්ථවිරය, එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරය, එසමයෙහි අස්වෙළඳ ව උපන්නෙමි බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 254. සුව (සුක) ජාතකය

තවද මාගේ මුදුන්මල්කඩ වූ සර්ව්‍ඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කෑවා වූ අන්නපානාදිය දිරවාගත නොහි මළා වූ භික්ෂු කෙනෙකුන් වහනසේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

එක්තරා භික්ෂු කෙනෙකුන් වහන්සේ සය දැන නොවළඳ අජීර්ණකොට වළඳා මළසේක. මේ කථාව ධම්සභා මණ්ඩපයෙහි රැස් වූ මාළුවරුන් වහන්සේ කිය කියා වැඩ උන් තෙනට සර්ව්‍ඥයන් වහනසේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට

පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?”යි විචාරා වදාරා එපවත් අසා “මහණෙනි, දැන්මතු නොවෙයි, පෙරත් තෘෂ්ණා වසඟව මළෝ වේදැ”යි වදාරා “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ හිමාලය වනයෙහි ගිරා ව ඉපද වයෝවෘද්ධව දැස් නැතිව වාසය කරන්නාහ.

බෝධිසත්ත්වයන්ගේ පුතණු කෙනෙක් ඇත්තාහ. ඒ පුතණුවෝ දෙමාපියන්ට පලාඵල ගෙනවිත් ලා රකින්නාහ. එසමයෙහි ඒ ගිරා පෝතකයෝ සමුද්‍ර මධ්‍යයෙහි මී අඹ ඇති නියාව දැන පසු දවස් සමුද්‍ර මධ්‍යයෙහි දිවයිනට ගොස් අඹ කා දෙමාපියන්ට අඹ ගෙනවුත් දුන්නුය. බෝධිසත්ත්වයොත් එකියන අඹ කා “මේ අඹ අසවල් දිවයිනේ අඹ ගසේමය”යි කිවූය.

එවිට බෝධිසත්ත්වයන්ගේ පුතණුවෝත් “ඒ අඹය”යි කිවූය. ඊට බෝධිසත්ත්වයෝ කියන්නෝ “පුත, ඒ දිවයිනෙන් අඹ ගෙනීමෙන් ඉදිරියේ බොහෝ උපද්‍රව පැමිණෙයි.එසේ හෙයින් එතනට නොයව”යි කීහ.

එසේ කීවත් එකියන ගිරා පෝතකයා එකියන දිවයිනට ගොස් අඹ කන්නේමය. එක් දවසක් අඹ කා මත්ව පියා නිදි කන ඇතිව පියා අඹන්නේ මං හසර දැනගත නොහී

මහමුහුද මැද පියාසරකොට දියේ වැටී මළහ. ඒ මළා වූ ගිරා පෝතකයා මත්‍ස්‍යයෝ ගසා කෑවාහ.

බෝධිසත්ත්වයෝ තමන්ගේ පුතණුවන් නොආ හෙයින් "මා කීවා නොඅසා මළ වනැ"යි සිතා තමන්ට ගොදුරු ලන කෙනෙකුන් නැති හෙයින් තල්ල වියළී මළාහ යි වදාරා බුදු ව වැඩහිඳ වදාරනසේක් "යම් සේ කීවා නොඅසා තෘෂ්ණා වසඟව ඒ ගිරවා මළද එමෙන් යම් කෙනෙක් තෘෂ්ණා වසඟව අන්නපාන බොහෝකොට කත් නම් උන්ටත් එසේම වන්නේයයි, තමන්ගේ අග්නි විවරට අන්නපාන කත් නම් දෙලොවින් සුව එලව"යි වදාරා මේ 'සුව ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි එකියන ගිරා පෝතකයා නම් මෙකියන භික්‍ෂූහුය. ගිරවාට පිය ව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 255. ජරුදපාන ජාතකය

තවද සංසාරවාහ වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පන්සියයක් වෙළඳුන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

පන්සියයක් උපාසක වෙළෙන්දෝ වෙළදම් පිණිස යන්නාහු "සර්වඥයන් වහන්සේ දැක පන්සිල් ඇරගෙන යම්හ"යි සිතා

"ආමින"යි කියා සර්වඥයන් වහන්සේ අතින් පන්සිල් ඇරගෙන නික්මුණාහ.

නික්ම අතරමග දී පුරාතන ළිඳක් දැක "ඒ ළිඳ පැන් ඇද්දේ හෝ"යි සිතා බලා පැන් නොදැක "පැන් උනන තුරු කනුම්හ"යි සිතා කැනින්නාහු පළමුකොට යකඩ, ලෝකඩ, තඹ, රත්රන්, මුතු, මැණික් ආදී වූ බොහෝ සම්පත් දැක තමන්ගේ පන්සියයක් ගැල් පුරාගෙන සැවැත් නුවරට ආවාහුය.

ඇවිත් "සර්වඥයන් නිසාය අප සැප සේ යාත්‍රාකොට ගත්තේය"යි කියා සර්වඥයන් වහන්සේට දන් දී තමන් ළිඳින් සම්පත් ලත් නියාව කීය. සර්වඥයන් වහන්සේ එපවත් අසා "පෙරත් ඒ ළිඳින් වෙළෙඳුන් සම්පත් ඇරගන්ට සිතා බොහෝ විනාශයට පැමිණියෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ වෙළඳ කුලයෙහි සාත්තුනායක ව උපන්නාහ.

පන්සියයක් වෙළෙඳුන් ඇරගෙන වෙළඳාම් පිණිස නික්ම මෙම ළිඳ සමීපයට අවුත් කැන බොහෝ සම්පත් ගොඩ නැගූහ. බෝධිසත්ත්වයන් "ඉතකින් පමණ නොකරනුව, නොකැණනුව"යි කියද්දීත් කනින්ට වන්හ. එකියන ළිඳ පාත වසන්නා වූ දිය නයෙක් ඇත. ඒ නයාගේ ඉස උළු පස් වැටෙන්න වන. එවිට නයා කිපී "පණ්ඩිත වෙළඳ එපයි කියව කියවා වෙළෙන්ඳු මේ මාගේ විමානය බිඳිති. එසේ හෙයින්

පණ්ඩිත වෙළඳු හැර සෙසු වෙළෙන්දු මියෙත්ව”යි සිතා නාසා පුටයෙන් විෂ ධුමයක් ඇර පන්සියයක් වෙළඳුන් ජීවිතක්‍ෂයට පමුණුවා පන්සියයක් ගැල්ම බෝධිසත්ත්වයන්ට පාවා දී තමන්ගේ නාග මෙණෙවියන් ලවා ගැල් පද්දවා බෝධිසත්ත්වයන්ගේ ගෙයි ලැවූහ.

බෝධිසත්ත්වයෝත් බොහෝ යාචකයන්ට දන් දී කුසල්කොට පඤ්චසීලය රැක පෙහෙවස් රැක කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ. ඒ අර්ථය දක්වන සර්‍වඥයන් වහන්සේ “මහණෙනි, යම් සේ ඒ වෙළෙන්දු යකඩ, තඹ, ලෝකඩ, රත්රන්, මුතු, මැණික් ආදී වූ සම්පත් දැක පණ්ඩිත වෙළඳු “ඇඹෙයි” කියදී තෘෂ්ණා වසඟ ව විනාශයට පැමිණියාහ. තොප ඇම වනාහි තොප ඇමට විවර සම්පත් ගෙනා හෙයින් විනාශයට නොපැමිණිය”යි වදාරා ‘ජරදපාන ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි පණ්ඩිත වෙළඳු නම් බුදුවූ මම්ම ය”යි වදාළසේක.

# 256. ආදාසමුඛ (ගාමණී චණ්ඩ) ජාතකය

තවද ලෝකාචාරී වූ සර්‍වඥයන් වහන්සේ සැවැත් නුවර වාසය කරන සමයෙහි ප්‍රඥා පාරමිතාව අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

සර්වඥයන් වහන්සේ ප්‍රඥා විශේෂයක් යහපත් නියාව කියනසේක් "ඇවැත්නි, **මහාපඤ්ඤො** - මහත් වූ අර්ථ, ධර්ම, නිරුක්ති, ප්‍රතිභානා දී ගුණයෙන් යුක්ත වූ හෙයින් මහත් වූ පෂරඥා ඇතිසේක. **පුථුපඤ්ඤො** - දෙලක්ෂ සතළිස් දහසක් යොදුන් ඝණකඩ බොල් මහපොළව සේ පැතිර පවත්නා වූ පෘථුල වූ ප්‍රඥාවෙන් යුක්තසේක. **හාසුපඤ්ඤො** - හාසු බහුල වූ, තුෂ්ටි බහුල වූ, ප්‍රමෝද්‍ය බහුල වූ ප්‍රඥාවෙන් යුක්ත වූසේක. **ජවනපඤ්ඤො** - ජවන හංසගතියක් පරිද්දෙන් සීඝ්‍රව පවත්නා වූ ප්‍රඥාවෙන් යුක්තසේක. **තික්ඛපඤ්ඤො** - ජීර්ණපූට පත්‍රයෙක්හි දිවයින සයංතප්ත අස්ඛලිත අයස්සූලයක් පරිද්දෙන් සංස්කාර, විකාර, ලක්ෂණ, නිර්වාණ, ප්‍රඥප්තිය යන පඤ්චවිධ ප්‍රකාර වූ ශෛදය මණ්ඩලයෙහි අස්ඛලිතව විනිවිද පවත්නා වූ ප්‍රඥාවෙන් යුක්තසේකැ"යි ප්‍රඥා විශේෂය වර්ණනාකොට හුන්නාහුය.

සර්වඥයන් වහන්සේ එතනට වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා එපවත් අසා "මහණෙනි, දැන්මතු නොවෙයි, පෙරත් සර්වඥයෝ නුවණ ඇත්තෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර ජනසන්ධව නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ ඒ

රජ්ජුරුවන්ගේ අග්‍රමහෙසිකා බිසවුන් කුස පිළිසිඳ දසඑකඩ මසකින් බිහි වූහ.

ඒ රාජකුමාරයන්ගේ මැදපු කැඩපතක් මෙන් යහපත් වූ මුඛ ශ්‍රීයක් ඇති හෙයින් “ආදාසමුඛ කුමාරයෝ ය”යි නම් තුබූහ. ඒ කුමාරයන් සත් ඇවිරිදි අවස්ථාවෙහි ම ඉගැන් වූවමනා සියළු ශාස්ත්‍රම උගන්වා නිපුණ කරවා යුවරජ තනතුරු සලස්වා ජනසන්ධව නම් රජ්ජුරුවෝ සවර්ගස්ත වූහ.

ඉක්බිති අමාත්‍යයෝ සිතන්නාහු “මේ ආදාසමුඛ නම් රාජකුමාරයා බාලය, මුන්වහන්සේගේ නුවණ පරීක්‍ෂා කරන්ට වුවමැනවැ”යි කියා එක් දවසක් සභායෙහි ඉඳුවා දෙපයින් ගමන් කරන්ට දන්නා කම්පස් වඳුරෙකු පිළි අන්දා ඉස තලකඩුප්පුවක් බැඳ රියන් දණ්ඩක් අතට දී වානරයා රජ්ජුරුවන් වහන්සේ දක්වා “දේවයන් වහන්ස, මේ නුඹවහන්සේගේ පියාණන් වහන්සේට ආචාරිධුරයෙහි සිට වස්තු විද්‍යා ආදී කටයුතු කාරියෙහි පටන් නුවණින් ඉතා වැඩිතරම් එකෙකැ”යි කීහ. “එසේ හෙයින් මූ රකිණා බව යහපතැ”යි කීහ.

රජ්ජුරුවෝ එකියන වානරයා බලා “මූ වනාහි මනුෂ්‍යයෙක් නොවෙයි, මේ වනාහි වඳුරා ය”යි සිතා අමාත්‍යයන්ට කියන්නහු “මුන් සේ වූ වඳුරෝ තමන්ගේ නකුට සඟවා ඉන්ද නොහී ඉන්නෝ වස්තු විද්‍යා කෙසේ දනිද්දැ?යි මේකා වඳුරාය, මූ ඇරපියව”යි කීහ. අමාත්‍යයෝත් “සැබැව දේවයන් වහන්ස, නුඹවහන්සේ පරීක්‍ෂා කරන නිසා කළම්හ”යි

කියා ඒ වානරයා ඇරගෙන පලාගොස් කීප දවසක් අපොකොට ලා දෙවෙනිව එම වානරයා පිළි අන්දා සැට්ට මෙලක්කට්ටු ලා පොතක් අතට දී ඕහු ඇරගෙන ගොස් රජ්ජුරුවන්ට දක්වා "දේවයනි, නුඹවහන්සේගේ පියාණන් වහන්සේගේ අවධියේ අධිකරණ නායක කමට නියුක්තව සිටි අමාත්‍යයාය. මොහු රැක්ක මැනව"යි කීහ. එවිට රජ්ජුරුවෝ ඕහු වඳුරා නියාව දැන අමාත්‍යයන්ට කියන්නාහු "සත්පුරුෂයන් සේ නොවෙයි, ලොම් දික්ව ලොම් තදව තිබෙන මූගේ ළෙයි කුමන ගුණයෙක් ඇද්ද? මුන් සේ වූවන් ජනසන්ධව රජ්ජුරුවන් වහන්සේ අධිකරණ නායක කමට නොසලස් වනසේක. එසේ හෙයින් මේ වඳුරාය, මූ එපිට ලව"යි කීහ. එවිට අමාත්‍යයෝ කියන්නාහු "සැබෑව දේවයන් වහන්ස, නුඹවහන්සේ විමසන පිණිස කළම්හ"යි කියා ඕහු එපිට ලා පෙරලා කීප දවසකින් ඕහු අනික් වෙසක් ගන්වා රජ්ජුරුවන් වහන්සේ කරා ගෙනගොස් "නුඹවහන්සේගේ පියාණන් වහන්සේ සමීපයෙහි දෙමාපියන්ට උපස්ථාන කරන්නට සපන් ධර්මිෂ්ඨ වූ පුරුෂයෙකැ"යි කියා "මූ රැක්ක මැනව"යි කීහ.

එවිටත් රජ්ජුරුවෝ උඟ වඳුරා නියාව දැන නියන්නාහු "මුන් සේ වූවන් තමන්ගේ දෙමාපියන් මල් බෑ ආදී වූවන් රකින්ට අසමර්ථය, මේ වනාහි වඳුරාය, මූ අරව"යි කීහ. එවිට අමාත්‍යයෝ වඳුරා ඇර "රජ්ජුරුවන් වහන්සේ මහා නුවණැතිසේකැ"යි කියා රාජ්‍යයට තිබා ඔටුනු පළන්දා "ආදාසමුඛ රජ්ජුරුවන් වහන්සේගේ ආඥාව"යි කියා නුවර

බෙර ලැවූය. එකියන රජ්ජුරුවෝත් දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කොට දසරාජ ධර්මයට අකෝප්‍ය නොව රාජ්‍යය කරන්නාහ. ඒ රජ්ජුරුවන්ගේ යසස් හා කීර්තිය දශ දිසාවෙහි පැතිරිනි.

ඒ රජ්ජුරුවන් මත්තෙහි විමසූ ප්‍රශ්න මෙසේ දත යුතු. ඒ කෙසේද? යත්,

"ගොණො පුත්තහයො චෙව නලකාරෙ
ගාම භොජකො ගණිකාතරණී සප්පො
මිගො තිත්තිර දෙවතා නාගො තපස්සිනා
චෙව අචො බ්‍රාහ්මණ මාණාචො"යි

යනාදීන් ප්‍රශ්න දස සතරක් විසඳූසේක. ඒ කෙසේද? යත්,

එකියන ආදාසමුඛ නම් රජ්ජුරුවන් වහන්සේගේ පියාණන් වහන්සේට දුක් ගත් ගාමණිචණ්ඩ නම් එක් පුරුෂයෙක් සිතන්නේ "මුන්වහන්සේ බාල සේක. මම් වනාහී වයොවෘද්ධ යෙමි. එසේ හෙයින් බාල රජ්ජුරුවන්ට දුක්ගැණී යහපත් නොවෙ"යි සිතා එතනින් පලා ගොස් දෙයොත්නක් විවරකින් ඔබ්බෙ එක් ගමෙක වාසය කරන්නේය. වැසි වට කල්හි "සී සාන්ටය"යි කියා වෙන අයකුගෙන් ගොන්ගෙයක් ඇරගෙන ගොසින් සී සා අන්තයෙහි ඒ ගොන්ගේ පාවා දෙන්ට සිතා ඔහුගේ ගෙට ගියේය.

ඒ වේලාවට ඒ ගෙයි දෙමහල්ලන් බත් කන හෙයින් තෙමේ "මම් ගෙට ගියේ නම් මා බත් කන්ට කියති" සිතා

ගොන්ගෙයි ගෙටම දක්වාලීය. ඒ වේලාවට ස්ත්‍රී සහ පුරුෂයා බත් කමින් සිට මණ්ඩය අතට ඇරගෙන නැගී සිට ගොන්ගෙය දුටුහ. එකියන පුරුෂයාත් ගොන්ගෙය දුටු නියාව දැන ගොන්ගෙය පාවා නොදීම පලා ගියේය. එකියන ගොන්ගෙය තමන් සිටිනා පට්ටියෙහිම සිටියාහ.

එදා රෑ සොරු ඇවිත් ඒ කියන ගොන්ගෙය ඇරගෙන ගියාහ. ඒ පුරුෂයෝත් තමන්ගේ ගොන්ගෙය නොදැක ගාමණීචණ්ඩයන් කරා අවුත් "ඇයි, තොප සාන්ට අපගෙන් ගෙන ගිය ගොන්ගෙය දෙව"යි කීහ. ගාමිණීචණ්ඩයෝ කියන්නෝ "තොප බත් කමින් සිටියදී නොවේද? මා ගොන්ගෙය ගෙට බාණා ලා ආයේය"යි කීවත් "ඒ ගොන්ගෙය දෙන්ට අවමැනවැ"යි කියා නොයන හෙයින් රජ්ජුරුවන් කරා යන්ට නික්මිණ. දෙන්නා රජ්ජුරුවන් දකින්ට යන කලට ගාමණීචණ්ඩයෝ අතරමඟ තමන් අඳුනන ගෙයක් දැක "මේ ගෙට ගොස් බත් කාපියා යෙමි" සිතා ගෙට වන්හ. ඒ වේලාවට ඒ ගෙයි පුරුෂ නැත. එවිට ඒ ගෙයි ඉන්නා ස්ත්‍රී ගාමණීචණ්ඩයන් දැක "මුන්ට බත් උයන්ට අටුවට නැගෙමි"යි සිතා සත්මැසි බඩින් ඉඳ හිණක් වතුරුව, නැගෙන්ට වන් වේලාවට ඒ හිණ පෙරලී වැටීමෙන් සත්මැසි බඩ දරුවා මළේය. ඒ වේලාවට ඒ ගෙයි පුරුෂයා ගෙට අවුත් "ඇයි? ගාමණීචණ්ඩයෙනි, මාගේ බිරින්ද මරා දරුගැබ කුමක් නිසා එලාපුදැ"යි කියා කැටක් නගා "මොහු රාජදුතය"යි කියා ඇරගෙන ගාමණීචණ්ඩයන් මධ්‍යයේ ලා ගෙන දෙන්න දැලයෙන් නික්මුණාහ.

ඒ වේලාවට එක් අස්ගොව්වෙක් තමාගේ අසා බැඳුන් කඩාගෙන ගාමණීචණ්ඩයන් කරා දිවන හෙයින් "මයිලණුවෙනි, ගාමිණීචණ්ඩයෙනි, අසුට කැටක් ගසාලා රඳවා ලව"යි කීහ. "යහපතැ"යි ගාමණීචණ්ඩයොත් අසා රඳවන පිණිස කැටක් ගැසූහ. ඒ ගැසූ කැටින් අසාගේ කකුල උන කිලිල්ලක් සේ බිඳින. එකියන අස්ගොව්වාත් "අසා ඉක්ම වන්ට කී පමණක් විනා, මාගේ අසාගේ කකුල ගසා කඩන්ට කීම්දැ?"යි කියා කැටක් නගාලා පා "මොහු රාජදූතයෝය"යි කියා ගාමණීචන්ඩයන් මධ්‍යකොට තුන්දෙනා නික්මුණාහ.

එවිට ගාමණීචණ්ඩයෝ කියන්නේ "මම ශරීර කෘත්‍යයට යෙමි, තෙපි සැම මෙසේ සිටුව"යි කියා වලට වැද ගලකට නැගී "මියන්ටය"යි කියා ගලින් පාත පැනපීහ. එකියන ගලපාත කුළුපොතු දෙපුතුපිය කෙනෙක් උණ දඬු කපමින් සිටියාහ. එකියන ගාමණීචණ්ඩයෝ පනින්නාහු මාළු කුළුපොත්තා පිටට පැණපූහ. ඒ කුළුපොත්තා එකපිම්මෙන් ම මළේය. ගාමණීචණ්ඩයෝ නොමැරුනු හෙයින් එකියන කුළුපොත්තාගේ පුතා "මාගේ පියා මරාපූ පිතෘඝාතක සොරාය"යි කියා කැටක් නගා "මොහු රාජදූතයෝය"යි කියා ගාමණීචණ්ඩයන් ඇරගෙන තුන්දෙනා සිටි තැනට ආය. එකියන තුන්දෙනා "මේ කිම්දැ?"යි විචාළාහ. කුළුපොත්තා විසින් "මාගේ පියා මැරූ සොරායයි, එසේ හෙයින් ගෙණාමි" කීහ. සතරදෙන වට කොටගෙන නික්මුණාහ.

ඒ වේලාවට එක් ගම්මුදලියෙක් ගාමණීචණ්ඩයන් දැක "එම්බල, රජ්ජුරුවන් වහන්සේ මහා නුවණැති සේක, එහෙයින් මා කී අස්න ගොසින් කියව"යි කියන්නේ "ආදී මම මහත් වූ උපභොග පරිභොග ලැබුයෙමි. මමත් නිරෝගී වීමි. දැන් වනාහී මම ඔබ්බෙන් සම්භාවන්නා වූ සම්පතුත් නැත, පාණ්ඩු රෝගත් මට ඇතිව දුක් විඳිමි. මීට කාරණා කිම්දැ?යි රජ්ජුරුවන් වහන්සේ අතින් විචාරව"යි කීහ.

දෙවෙනිව එක් වෛශ්‍යා ස්ත්‍රියක් ගාමණීචණ්ඩයන් දැක කියන්නී "රජ්ජුරුවන් වහන්සේ මහා නුවණැති සේක, මා කී අස්නක් කියාලව"යි කියන්නී "ආදී මම බොහෝ ලාබ ලැබිමි. පුරුෂයෝ මා කරා එළඹෙන්නාහ. දැන් වනාහී බුලත් පතක් විවරවත් නොලබමි. ඊට කාරණා කිම්දැ?යි විචාරව"යි කීහ.

ඉක්බිති "යහපතැ"යි කියා ඔබ්බට යන කලට එක්තරා ස්ත්‍රියක් ගාමණීචණ්ඩවයන් දැක කියන්නී "රජ්ජුරුවන් වහන්සේ මහා නුවණැති සේක. එසේ හෙයින් මා කී අස්නක් රජ්ජුරුවන් වහන්සේට කියව"යි කීයන්නී "මම ස්වාමිපුත්‍රයා ලගත් ඉන්ද නොයෙමි, දෙමාපියන් ලගත් ඉන්ද නොහෙමි, මීට කාරණා කිම්දැ?යි රජ්ජුරුවන් අතින් විචාරව"යි කීහ.

ඉක්බිති "යහපතැ"යි කියා නික්මුණු වේලාවට එක් සර්පරාජයෙක් ගාමණීචණ්ඩයන් දැක කියන්නෝ "තොපගේ රජ්ජුරුවෝ මහා නුවණැත්තෝය, මා කියන යුක්තියක් කියව"යි කියා කියන්නේ "මම තුඹසින් නික්මෙණ වේලේ ගැහැටි ගැහැටී කින්මෙමි, ගොදුරු කා තුඹසට වහා

වැදයෙමි, මේ කාරණාව රජ්ජුරුවන් වහන්සේගෙන් විචාරව"යි කීහ.

"යහපතැ"යි කියා ගිවිස ඔබ්බට නික්මුණා කලට එක් මුවෙක් ගාමණීචණ්ඩයන් දැක කියන්නේ "රජ්ජුරුවන් වහන්සේ මහත් වූ නුවණැති සේක්ල, එසේ හෙයින් මා කී අස්නක් කියව"යි කියා කියන්නේ "මා සිටිනා ගස සමීපයේ තණ කන්ටත් මට අභිප්‍රාය, ඔබ්බෙ තණ කන්ට මට අභිප්‍රාය නැත, ඊට කාරණා කිම්දැ?යි රජ්ජුරුවන් වහන්සේගෙන් විචාරව"යි කීහ.

"යහපතැ"යි කියා නික්මුණ කලට ඔබ්බෙ තිත්වටුවෙක් ගාමණීචණ්ඩයන් දැක කියන්නේ "රජ්ජුරුවන් වහන්සේ මහා නුවණැති සේක්ල, එසේ හෙයින් මා කී අස්න කියව"යි කියා කියන්නේ "මම තුඹස පිට හිඳ නාද කරන වේලේ යහපත්කොට නාද කරමි, අනිත් තෙනක ඉඳ නාද කරන වේලේ යහපත් ව නාද නොවෙයි, මේ කවර කාරණයක් නිසාදැ?යි විචාරව"යි කීහ.

"යහපත" කියා නික්මුණ වේලාවට එක් වෘක්‍ෂදේවතාවෙක් ගාමණීචණ්ඩයන් දැක කියන්නේ "තොපගේ රජ්ජුරුවෝ මහා නුවණැති සේක්ල, මා කී විත්තියක් රජ්ජුරුවන්ට කියව"යි කියා කියන්නේ "මාගේ වෘක්‍ෂයට පළමු බොහෝ බලිපූජා ඇත, දැන් බලිපුජා නැත, ඊට කාරණා කිම්දැ?යි රජනු අතින් විචාරව"යි කීය.

“යහපතැ”යි නික්මුණු වේලාවට දියෙහි වසන නයෙක් කියන්නේ “මාගේ විල පැන් පළමු ප්‍රසන්න තිබෙයි, දැන් කැළඹී තිබෙයි, ඒ කවර කාරණාවක් නිසාදැ?යි විචාරව”යි කීහ.

“යහපතැ”යි කියා ඔබ්බට නික්මුණු කලට තාපසවරු කියන්නාහු “රජ්ජුරුවෝ මහා නුවණැත්තෝල, පළමු අප වසන්නා වූ පන්සල අඹ කොස් ආදී වූ වෘක්ෂවල පලාඵල ඉතා මධුරය, දැන් එම පලාඵල තික්ත රසය, ඒ කවර කාරණයක් නිසාදැ?යි විචාරව”යි කීහ.

මේ නියායෙන් ගාමණීචණ්ඩයෝ එකී ප්‍රශ්න දසය සිත තබාගෙන ඒ යුක්ති කියන සතර දෙනා ඇරගෙන රජ්ජුරුවන් අධිකරණයෙහි උන් වේලාවට අවුත් රජ්ජුරුවන් දුටුහ.

රජ්ජුරුවෝත් “ඇයි ගාමණීචණ්ඩයෙනි, මෙතෙක් දවස් කොයි උන්නාද? නැතැක් දවස් තොපගේ උකුලේ උනුම්හ, මෙතෙක් දවස් නුදුටුම්හ, කුමක් නිසා ආවාදැ?”යි විචාළාහ. එවිට ගාමණීචණ්ඩයෝ කියන්නාහු “මේ සතර යුක්තියක් කියන නිසා මා ඇරගෙන ආහ”යි කීහ.

එබස් අසා රජ්ජුරුවෝ කියන්නාහු “යුක්තියක් නිසා වුවත් තොප අප දුටු සේ යහපතැ”යි සතුටුව යුක්ති කියන්ට ආ අය අතින් රජ්ජුරුවන් විචාරන්නාහු “මුන් තොප ඇමට කී ලූ අන්‍යය අයුක්තිය කියව”යි කීහ.

පළමුකොට ගොන් යුක්ති එකා කියන්නේ “දේවයන් වහන්ස, සී සාන්ට උවමැනවැයි කියන්නා ගොන්ගෙයක් දී ලිමි, මොහු වනාහී පසුව ගොන්ඉල්ලූ කල නුදුන්නේය. ඒ ගොන් මට දෙව වදුරන්නේ යහපතැ”යි කීහ.

එවිට රජ්ජුරුවෝ “සැබෑද? ගාමණීචණ්ඩයෙනි” විචාරා “සැබැව දේවයන් වහන්ස, සී සාන්ටයයි කියා ගොන්ගෙයක් ඇරගෙන සී සා අන්තයෙහි මුන් බත් කමින් සිටියදී ගෙට වනි නම් මාත් බත් කන්ට කියත්දෝ හෝයි සිතා ගොන් ගෙටම දක්කා ලීමි. ඒ වේලාවට මුන් ගොන්ගෙය දුටුහ. ගොනුත් පට්ටියෙම සිටියදී සොරුන් ඇරගත්තාට මූ මට ණය කියයි” කීහ. එබස් රජ්ජුරුවෝ අසා එකියන පුරුෂයා අතින් විචාරන්නාහු “තා විසින් ගොන්ගෙය දක්නා ලදැ?”යි විචාළාහ. එවිට පුරුෂයා කියන්නේ “මම ගොන්ගෙය නුදුටුම්හ”යි කීහ. රජ්ජුරුවෝ “ඇයි? තොප මා ආදුසමුබ රජ්ජුරුවන් නියාව නොදනීද? මා දැක්කදී ඇත්ත විනා බොරු නොකියව”යි කීහ. එවිට ඒ පුරුෂයා කියන්නේ “සැබැව දේවයන් වහන්ස, ගොන්ගෙය දිටිමි” කීහ.

එවිට රජ්ජුරුවෝ ගාමණීචණ්ඩයන්ට කියන්නාහු “ගාමණීචණ්ඩය, මාගෙන් මසුරන් සොළොස් කළඳක් හැරගෙන ගොන්ගෙයක් දී පියා මූ මා ද දැක්ක දී බොරු කීවාට ඇස්දෙක උදුරා පියව”යි කීහ. එවිට ගොන් යුක්තිය කියන්ට ආ පුරුෂයා එබස් අසා කියන්නේ “ගාමණීචණ්ඩයෙනි, මට ගොන්ගෙයි මිළත් එපයි, මාගේ ඇස්දෙක උදුරන්ටත් එපායි,

මා ගලවා පුවමැනවැ"යි කිහ. "යහපතැ"යි කියා ගාමණීචණ්ඩයෝ උන් ගළවා යවාපූහ.

ඉක්බිති දරු යුක්ති කියන එකා රජ්ජුරුවන් ලඟට අවුත් "දේවයන් වහන්ස, මූ වනාහී මාගේ අඹුවත් මරා දරුගර්භය එළීය. එසේ හෙයින් මට දරුවන් දුනමැනවැ"යි කීහ. එවිට රජ්ජුරුවෝ "සැබෑද? ගාමණීචණ්ඩය"යි විචාරා "එසේය දේවයන් වහන්ස, මම බත් කන්ට මූගේ ගෙට වනිමි. ඒ වේලාවට මූගේ බිරින්ද මට බත් පිසන්ට සාල් බාන්ට යයි අටුවට හිණ ලා ගෙන පැන නැගී කලට පයපලා කඩාගෙන වැටුනු ගමනේ දරුගර්භය වැටිනැ"යි කීය.

එවිට රජ්ජුරුවෝ එකියන පුරුෂයා අතින් "මෙවිට කරන්නේ කිම්දැ?"යි විචාළාහ. "දේවයන් වහන්ස, කෙසේ වුවත් දරුවන් ලබන්ට උවමැනවැ"යි කියන්නා එවිට රජ්ජුරුවෝ කියන්නාහු "ගාමණීචණ්ඩයෙනි, මුන් දරුවන් උවමැනවැයි කියන පසු මළ දරුවන් උපද්දවා දෙන්ට බැරි වුවත්, එසේ හෙයින් මුන්ගේ බිරින්ද තොපගේ ගෙයි තිබාගෙන දරු කෙනෙකුන් ලත්කල අඹුවනුත් දරුවනුත් පාවා දෙවාලව"යි කීහ. එවිට ඒ පුරුෂයා "මා සත් ඇවිරිදි කාලයෙහි පටන් පිසවා කෑ බිරින්ද දැන් මා වියෝ නොකළ මැනව, මට දරුවනුත් එප"යි කියා ගාමණීචණ්ඩයන්ගේ පය ගෙන අඬා කන්නලව් කීහ. "යහපතැ"යි කියා ගාමණීචණ්ඩයෝ ඔහු අලහ.

එවිට අස්සලයා රජ්ජුරුවන් කරා ගොස් කියන්නේ “මොහු විසින් මාගේ අනර්ඝ වූ අශ්වයාගේ පය බිඳනා ලදහ. මට අස් මිළ දුන මැනවැ”යි කීහ. එවිට රජ්ජුරුවන් විසින් “සැබෑද? ගාමණීචණ්ඩය තා විසින් අශ්වයාගේ පය බිඳිනා ලදදැ?”යි විචාළාහ. “එසේය, දේවයන් වහන්ස, මොහු විසින් මට ‘මයිලණුවෙනි, කැටක් ගසා අසා රඳවා ලව’යි කී විසින් කැටක් ගැසීමි, එවිට අසාගේ පය බිඳුනේ සැබව’යි කීහ.

එවිට රජ්ජුරුවෝ “අස්සලස, තා විසින් එසේ කියන ලදදැ?”යි විචාළාහ. අස්සලයා “ස්වාමීනි, නොකීමි” කියන්නා “ඇයි මා ආදසමුඛ රජ්ජුරුවන් නියාව නොදනීද? මා දැක්ක දී ඇත්තක් විනා බොරු නොකියව”යි කීහ. එවිට අස්සලයා කියන්නේ “සැබෑව දේවයන් වහන්ස? කැටක් ගසා රඳව”යි කීහ. රජ්ජුරුවෝ ගාමණීචණ්ඩයාට කියන්නාහු “අසාගේ පය බිඳුනාට මිළ දිය යුතුය. මාගෙන් මසුරන් දහසක් ඇරගෙන මුන්ට දී පියව. අසා කැටක් ගසා රඳවන්ට කියලා මා මැද නොකීමි කියා බොරු කී හෙයින් මුගේ දිව කපව”යි කීහ. එවිට අස්සලයා “මට දිය යුතු මසුරන් දහස නුඹවහන්සේ ඇරගෙන මාගේ අසාගේ පය බිඳුනාටත් මට පලි නැත, මාගේ දිව ගලවාපුව මැනවැ”යි ගාමණීචණ්ඩයන්ට මුරගා කියා ගැලවී ගියේය.

ඉක්බිති කුළුපොත්තා ඇවිත් කියන්නේ “මූ විසින් මාගේ පියා මරණ ලද, ඒ මට විචාරන්නේ යහපතැ”යි කියා එවිට රජ්ජුරුවෝ “සැබෑද? ගාමණීචණ්ඩය”යි කියා විචාරා “එසේය

දේවයන් වහන්ස, මුන් තුන්දෙනා විසින් මා වටකොට ගෙනා හෙයින් මම සිතන්නේ ම 'ගොන්ගෙය ණය ගෙවාගත නොහෙන දරුවන්ගේ ණය හා අසාගේ ණය කෙසේ දී ගැලවෙම්දැ'යි සිතා 'මාගේ ප්‍රාණය නසා ගනිමි' සිතා 'පර්වතයට නැගී පනින්නෙමි' මූගේ පිය ගේ ඇගට පැනපිමි. මාගේ පිනූ වේගයෙන් උඟ මිය ගියේය''යි කීහ.

එවිට රජ්ජුරුවෝ කුළුපොත්තාට කියන්නාහු ''අන්‍යායෙන් මැරෑ ගමනක් නොවෙත්, නොදැන කළ වරදට කරන්නේ කිම්දැ?''යි කීහ. ''ඒ කෙසේ වුවත් දේවයන් වහන්ස, මාගේ පියාණන් ලද මැනවැ''යි කීහ. එවිට රජ්ජුරුවෝ ගාමණීචණ්ඩයන්ට කියන්නාහු ''මළා වූ පියා උපද්ද ගන්ට බැරි වුව, එසේ හෙයින් මූගේ මව ගෙන තොප පිසවා කන්නා තොප පියා ය''යි කීහ. එවිට කළුපොතු කියන්නේ ''මාගේ මව නුඹවහන්සේට කෙසේ දෙම්ද? මාගේ පියාත් මට එපයි, මාගේ මවත් දෙන්නේ නැතැ''යි කන්නලව් කියා ගැලවී ගියේය.

ගාමණීචණ්ඩයෝ යුක්තියෙන් දිනා සිටිනාහු ''අතරමග දී රජ්ජුරුවන් වහන්සේට කියන්ට කී ස්වරූප කියමි'' සිතා කියන්නාහු අගසිට මුලට විචාළාහ.

ඒ කෙසේද? යත්,

''දේවයන් වහන්ස, බ්‍රාහ්මණ මානවක මොත්තමක් මට කියන්නාහු ''ආදී අපි ශිල්ප වණපොත් කළ දේ යහපත්කොට සිත තිබෙයි, දැන් සිත නොතිබෙන්නේ කුමන කාරණයක්

නිසාදැ?"යි විචාරන්ට කිවුය. "කුමක් නිසාදැ?යි වදාළ මැනවැ"යි කීහ.

එවිට රජ්ජුරුවෝ කියන්නාහු "ආදී වුවන්ගේ ගෙදරවල නොවරද්ද අඬන කුකුලෙක් ඇත, එසේ හෙයින් ශිල්ප ශාස්ත්‍රය සිත තිබෙයි, දැන් වනාහී මධ්‍යම රාත්‍රී වේලේ හෝ පාන් වන්ට සිටියදී හෝ අඬන කුකුලෙක් ඇත, එසේ හෙයින් ශිල්ප ශාස්ත්‍ර නිදිමත හෙයින් සිත නොතිබෙයි, අනික් කුකුලෙකු වේලා දැන අඬන ලෙස සලස්ව"යි වදාළසේක.

"දේවයන් වහන්ස, තාපසවරු මොතත්මෙක් මට කියන්නාහු "ආදී අප වසන පන්සල අඹ කොස් ආදී පලාඵල මධුරය, දැන් එම පලාඵල තික්ත රසය, ඊට කාරණය විචාරාගෙන එව"යි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු "ආදී ඒ තාපසවරුන් යහපත්කොට තපස් රකිනා හෙයින් පලාඵල මිහිරිය, දැන් තපස් නපුරුකොට රකිනා හෙයින් තික්ත රසය, ඉනිබ්බේ මාගේ ආඥ කියා ඉඳුරා තපස් රකින්ට කියව"යි කීය.

නැවත තුන්වෙනි පැනය කියන්නේ "පළමු මාගේ විල පැන් ප්‍රසන්නව තිබෙයි, දැන් කැළඹී තිබෙයි, ඒ කාරණය විචාරාගෙන එව"යි කීහ. "ඊට කාරණා කවරේදැ?"යි කීහ.

එවිට රජ්ජුරුවෝ කියන්නාහු "ආදී ඒ නයා මෛත්‍රී කෙරේ, දැන් නොයෙක් අඬදබර කරන හෙයින් පැන් කැලඹී තිබෙයි, පළමු සේ මෛත්‍රීකොට වාසය කරන්නා පැන් නොකැළඹී තිබෙයි, ඒ නියාවට වාසය කරන්ට කියව"යි කීහ.

සතරවෙනි පැනය කියන්නේ “වෘක්ෂදේවතාවෙක් කියන්නේ තමා පළමු නොයෙක් බලිබිලි පටන් සියල්ල ඇත, දැන් නොලැබෙයි, ඒ කුමක් නිසාදැ?”යි විචාරන්ට කීය. “ඊට කාරණා කියව”යි කීහ.

ඊට රජ්ජුරුවෝ කියන්නාහු “වෘක්ෂදේවතාවා විසින් පළමු මනුෂ්‍යයන් සිතූ දෙය සිද්ධ කරන හෙයින් බලිපූජා කරන්නාහ, දැන් සිතූ දෙය සිද්ධ නොකරන හෙයින් බලිපූජා සිද්ධ නොකරන්නාහ, ඉනිබ්බේ මාගේ ආඥා කියා මනුෂ්‍යයන්ගේ සිද්ධාර්ථය සිද්ධ කරන්ට කියව”යි කීහ.

එවිට පස්වෙනි ප්‍රශ්නය කියන්නේ “තිත්වටුවෙකු තුඹසක් පිට ඉඳ නාද කරන්නා වූ වේලෙහි යහපත්ව නාද කෙරෙමි, අනික් තැනක ඉඳ නාද කරන වේලේ නාදය යහපත් නොවෙයි, ඒ කාරණය විචාරාගෙන යන්ට” කීය. එවිට රජ්ජුරුවෝ කියන්නාහු “ඒ තුඹස යට යහපත් නිධානයෙක් ඇත, එසේ හෙයින් නාදය යහපත් වෙයි, ඒ තුඹස බිඳපියා නිධානය තොප ඇරගණුව”යි කීහ.

සවන ප්‍රශ්ණය කියන්නේ “එක් මුවෙක් තමා වාසය කරන්නා වූ ගසමුල තණ කන්නා මිහිරිය, අනික් තෙනක තණ කන්ට නොමිහිරිය, මේ කාරණය විචාරාගෙන එව”යි කීය. එවිට රජ්ජුරුවෝ කියන්නාහු “ඒ මුවා වසනනා වූ ගස අග මහත්වූ බඹර මීයෙක් ඇත, ඒ මී බින්දු වට වැගිරීමෙන් තණ මිහිරි වන්නේය, ඒ ගස මීය සලාගෙන තොපිත් ඇරගෙන අපටත් මී එවාලව”යි කීහ.

“යහපතැ”යි කියා සත්වන ප්‍රශ්නය කියන්නේ “එක් නයෙක් තමා වසන්නා වූ තුඹසින් පිටවන වේලේ ගැටි ගැටී පිටත් වෙමි, ගොදුරු කා තුඹසට වදිනා වේලේ යුහුව වැද යෙමි, මේ කාරණය විචාරගෙන යන්ට කියව”යි කීහ. එබස් අසා රජ්ජුරුවෝ කියන්නාහු “ඒ නයා වසන තුඹස මහත් වූ නිධානයෙක් ඇත, ඒ නිධානයෙහි ගත් ආසාවෙන් නික්මෙණ වේලාවේ ගැහැටි ගැහැටී නික්මෙයි, තුඹසට වදිනා වේලේ එහි ගත් ලෝභයෙන් වහා වැදයෙහි, එසේ හෙයින් ඒ තුඹස බිඳපියා නිධානය ඇරගණුව”යි කීහ.

“යහපතැ”යි කියා අටවෙනි පැනය කියන්නාහු “එක් ස්ත්‍රියක් දෙමාපියන්ගේ ගෙයිත් ඉන්ද නොහෙමි, ස්වාමිපුත්‍රයාගේ ගෙයිත් ඉන්ද නොහෙමි, මීට කාරණ කිම්දැ?යි විචාරන්ට කියව”යි කියන්නා රජ්ජුරුවෝ කියන්නාහු “එසේ වීනම් ඒ ස්ත්‍රියගේ අතරමඟ ඉන්නා වරපුරුෂයෙකු ඇත, තොපි ගොසින් ඉනිබ්බේ ඒ ස්ත්‍රියට හා පුරුෂයාට මාගේ ආඥ කියා එසේ වූ නොකටයුත්තක් නොකරන්ට කියව”යි කීහ.

“යහපතැ”යි කියා නැවත ප්‍රශ්නයක් කියන්නේ “දේවයන් වහන්ස, එක්තරා වෛශ්‍යා ස්ත්‍රියක් කියන්නී ‘පළමු මට බොහෝ සම්පත් ලැබෙයි, දැන් වනාහී මට මස්සක් විවරක් දෙනෙ කෙනෙක් නැත, ඒ කුමක් නිසාදැ?’යි විචාරන්ට කිවුය. ඊට කාරණා කිම්දැ?”යි විචාළාහ. රජ්ජුරුවෝ කියන්නාහු “ආදී තමාගේ වෛශ්‍යධර්මය නොවරදවා රකින හෙයින්

කවුරුත් සම්පත් දෙන්නාහ, දැන් වෛශ්‍යධර්මය නොරකිනා හෙයින් කවුරුත් වුවමැනවයි නොසිතති, ඉනිබ්බේ වෛශ්‍යධර්මය රකින්නා කවුරුත් වුවමැනවැයි නොසිතති” කීහ.

නැවත දසවෙනි ප්‍රශ්නය කියන්නේ “ගම්මුදලියා පළමු තමාට බොහෝ සම්පත් ලැබෙයි, දැන් කිසිවකුත් නොලැබෙයි, පාණ්ඩ රෝගයක් ඇත, මීට කාරණා කිම්දැ?යි විචාරන්ට කීය. ඊට කාරණා වදාරන්නේ යහපතැ”යි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු “පළමු මොහු විසින් අන්‍යාය නොවී යුක්තායුක්ති විචාරන හෙයින් කවුරුත් බොහෝ සම්පත් දෙන්නාහ, දැන් වනාහී අයුක්ති කාරණා විසින් කවුරුත් සම්පත් නොදෙන්නාහ, තෙමේත් රෝගිය, එසේ හෙයින් ඉනිබ්බේ තමාගේ අඬදු කියා යුක්ති ඉඳුරා විචාරන්ට කියව”යි කීහ.

මේ නියායෙන් ගාමණීචණ්ඩයන් කී ප්‍රශ්න දසයම බුදුකෙනෙකුන් වහන්සේගේ ප්‍රශ්ණා විසඳා වදාරා ගාමණීචණ්ඩයන්ට කිසි කෙනෙකුගෙනු අවුලක් නොවන නියාවට ගමකුත් සලස්වා යවුහ.

ගාමිණීචණ්ඩයොත් රජ්ජුරුවන්ට කී මෙහෙවර බමුණාන්ට හා තපස්වරුන්ට හා නයාට හා වෘක්ෂදේවතාවාට හා ස්ත්‍රියට හා ගම්මුදලියාට කියා නයාගේ හා තිත්වටුවාගේ හා නිධාන දෙකත් උදුරා ඇරගෙන මුවා වසන්නා වූ ගල උඩ තුබූ බඹර මීයත් සලාගෙන ඉන් අග්‍ර මී රජ්ජුරුවන් කරා

යවා තමන්ගේ ගමට ගොස් දැහැමෙන් සෙමෙන් දවස් යවා කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ.

එකියන ආදසමුඛ රජ්ජුරුවන් වහන්සේ දැහැමෙන් සෙමෙන් රාජ්‍යයකොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදරා මේ ‘ගාමණීචණ්ඩ ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි ගාමණීචණ්ඩයෝ නම් මෙසමයෙහි ආනන්ද ස්ථවිරය, ආදසමුඛ රජව උපන්නෙම් බුදුවූ මම්ම ය”යි වදාළසේක.

## 257. මහාමන්ධාතු ජාතකය

තවද කරුණා නිදාන වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි උකටලී වූ භික්ෂු කෙනෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද? යත්,

එක්තරා භික්ෂු කෙනෙකුන් වහන්සේ තෘෂ්ණා වසගව සිවුරු හරිනට උත්සාහ කරන නමක් දැක ඒ නම ඇරගෙන ගොස් සර්වඥයන් වහන්සේට දන්වන්නා “ඇයි මේ මහණ නොකමැති පරිද්දෙන් ගෙනායේ කුමකටදැ?”යි විචාරා එපවත් අසා “මහණ, තා විසින් සිවුරු හැර ගිහිගෙයි සිටත් තාගේ තෘෂ්ණාව පුරාගත එයිද? රහත්ව තෘෂ්ණාව ක්‍ෂය කරතොත් මිසක් ගිහිගෙයි සිට තෘෂ්ණාව පුරාගත එයිද? තා තිබා සතිස්ලක්‍ෂ දසදහස් තුන්සියපණස් යොදුන් චක්‍රවාට ගර්භයට ඒකාධිපත්‍ය රාජ්‍යය හා තාරකා දිව්‍යලෝකයේ රාජ්‍යය හා

තව්තිසා භවනයෙහි අර්ධ රාජ්‍යයත් ඇතුළු වූ රාජ්‍ය තුනක් සතිස් ශක්‍ර කෙනෙකුන්ගේ ආයුෂය නිමා වනතුරු රාජ්‍යයකොට තමන්ගේ තෘෂ්ණාව පුරාගත නුහුනුවෝ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස ප්‍රථම කල්පයෙහි සූර්‍ය්‍යපුත්‍ර වූ මහාසම්මත නම් රජ්ජුරු කෙනෙකුන් ඇති වූහ. ඔහුගේ පුත් වරරෝජ නම් රජ්ජුරු කෙනෙකුන් ඇති වූහ. ඔවුන් පුත් කල්‍යාණ නම් රජ්ජුරු කෙනෙක් ඇති වූහ. ඔවුන් පුත් වරකල්‍යාණ නම් රජ්ජුරු කෙනෙක් ඇති වූහ. ඔවුන් පුත් උපොස්ථ නම් රජ්ජුරු කෙනෙක් ඇති වූහ. ඒ රජ්ජුරුවන්ට පුත්ව මහමන්ධාතු නම් රජ්ජුරු කෙනෙක් ඇති වූහ.

ඒ රජ්ජුරුවන්ට ආඥාවෙන් චක්‍රරත්නය, හස්තිරත්නය, අශ්වරත්නය, ගෘහපතිරත්නය, පරිනායකරත්නය, මාණික්‍යරත්නය, පුත්‍රරත්නය ආදි වූ සප්ත රත්නයන් පහළ විය. සතිස්ලක්‍ෂ දසදහස් තුන්සියපණස් යොදුන් චක්‍රවාට ගර්භයට ඒකාධිපත්‍යව රාජ්‍ය කරන්නා වූ මහත් වූ ආඥා තේජස් ඇත්තාහ. වමත හකුළුවා දකුණතින් අත්පොලොසන් කරන්නා සත්රුවන් වැසි වස්නේය.

මෙසේ වූ ආඥාසම්පන්න රජ්ජුරුවෝ ආයුස බොහෝ හෙයින් සුවාසූ දහසක් අවුරුදු කුමාර කෙළි කෙළියාහ, සුවාසූ දහසක් අවුරුදු යුවරජ තනතුරෙහි සිටියාහ, සුවාසූ දහසක් අවුරුදු රාජ්‍යයකොට, චක්‍රවර්ති රාජ්‍යයෙහි කනස්සළුව

උන්නාහ. එපවත් අමාත්‍යයෝ දැන "රජ්ජුරුවන් වහන්සේ විකේෂ්ප ව උන්නේ ඇයිදැ?"යි විචාරන්නා "කුමක්ද? මේ නියාවට සම්පත් හා ආශ්වර්‍ය්‍ය ඇති තෙනකට ගොස් රාජ්‍යය කරන්නා කැමැත්තෙමි, එසේ වූ ස්ථානයක් මට කියව"යි. කීහ. "යහපතැ"යි කියා අමාත්‍යයෝ කියන්නාහු "මේ නියාවට සම්පත්ති හා පඤ්චකාමයෙන් තාරකා දිව්‍යලෝකයෙහි වඩනේය"යි කීහ.

එවිට රජ්ජුරුවෝ "යහපතැ"යි කියා චක්‍රරත්නයට පැන් ඉස නැගී අමාත්‍ය මණ්ඩලයා පිරිවරා චාතුර්මහාරාජිකයට ගියාහ. ඊ වසන්නා වූ සතරවරන් දෙවියෝත් රජ්ජුරුවන්ගේ ආඥාවෙන් ඉදිරියට අවුත් රජ්ජුරුවන් වහන්සේ කැන්දාගෙන තමන් වාසස්ථානයට ඇරගෙන ගියහ. එවිට රජ්ජුරුවෝ චාතුර්මහාරාජික දිව්‍යලෝකයෙහි නැතක් කාලයක් වාසයකොට එහි මදක් කල් විකේෂ්පව සතරවරන් දෙවියන් අතින් විචාරන්නාහු "මේ නියාවට සම්පත්තියෙන් හා පඤ්චකාම සැපයෙන් කොයි වැඩිදැ?"යි විචාරන්නා සතරවරන් දෙවියෝ කියන්නාහු "අපි නම් ශක්‍රදේවේන්ද්‍රයන්ගේ සේවකයෝය. ශක්‍රදේවේන්ද්‍රයන් වසන තව්තිසා දිව්‍යලෝකයෙහි සම්පත්තින් හා පඤ්චකාමයෙන් වැඩිය"යි කීහ.

මහමන්ධාතු රජ්ජුරුවෝ ඒ අසා චක්‍රරත්නයයෙහි පැන් ඉස සප්තරත්නය හා සමඟ තව්තිසා දිව්‍යලෝකයට ගියාහ. එවිට ශක්‍රයෝත් තමන්ගේ දිව්‍යසේනාව ඇරගෙන රජ්ජුරුවන් කරා අවුත් රජ්ජුරුවන් ඇරගෙන තමන්ගේ ශක්‍රභවනයට

ගියාහ. ශක්‍රයෝත් තමන්ගේ තව්තිසා දිව්‍යලෝකය සරියේ බෙදූ අර්ධ රාජ්‍යයක් දුන්හ. ඒ දෙවියන්ගේ ආනුභාවයෙන් ඔහුගේ උස මහත හා දෙවියන්ගේ උස මහත හා දෙවියන්ගේ ආත්මභාව නියාවට නිරිමිත විය. ශක්‍රයන් හා මහමන්ධාතු රජ්ජුරුවන් එක්තැන උන් කලට වෙනස නම් ඇසපිය එලීම විනා සෙස්ස එකසරිය. මේ නියායෙන් සතිස් ශක්‍ර කෙනෙකුන්ගේ ආයුෂය යනතුරු රාජ්‍යකොට තම තෘෂ්ණාව අධික සෙයින් විතර්ක සිතක් සිතන්නාහු “කිමෙක්ද? අර්ධ රාජ්‍යය කිම්ද? ශක්‍රයන් මරා රාජ්‍යය කෙරෙමි”යි සිතා එම ක්‍ෂණයෙහිම කයත් වයෝවෘද්ධව දිව්‍යාත්මභාවය නැතිවී මනුෂ්‍යාත්මභවය පහළ විය.

එවිට මහමන්ධාතු රජ්ජුරුවෝ දිව්‍යලෝකයෙන් බැස තමන්ගේ මඟුල් උයනට බටහ. ඒ වේලේ එකියන මඟුල් උයනේ උයන්ගොව්වාත් මහමන්ධාතු රජ්ජුරුවන් වහන්සේ නියාව දැන ආසනයක් පනවා නුවරට පලාගොස් නුවර රජකම් කරන රජ්ජුරුවන් හා අමාත්‍යයෝ එතනට අවුත් රජ්ජුරුවන් වහන්සේ දැක “නුඹවහන්සේ සවර්ගස්ථ වූ කල කුමක් කියමෝදැ?”යි කියන්නා එවිට කියනසේක් “සතිස් ශක්‍ර කෙනෙකුන්ගේ ආයුෂ වළදූ මනුෂ්‍යභවනයට අවුත් මළ මහමන්ධාතු රජ්ජුරුවෝ තෘෂ්ණා වසඟ වීම නිසා ආයුෂය පිරිහී මළහ”යි වදූරා ‘මහමන්ධාතු ජාතකය’ නිමවා වදාළසේක. මේ බණ අවසානයෙහි එකියන භික්‍ෂූන් වහන්සේ දහසක් නයින් ප්‍රතිමණ්ඩිත වූ සෝවාන් ඵලයෙහි පිහිටිසේක.

"එසමයෙහි මහමන්ධාතු ව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 258. කිරීට (කිරීටවච්ඡ) ජාතකය

තවද අසරණ සරණ වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි අනඳ සාමීන් කෝසල රජ්ජුරුවන්ගෙන් පිළි දහසක් ලත් කථාව අරභයා මේ ජාතකය දක්වන ලදී.

මෙහි වර්ථමාන කථාව ඒක නිපාතයෙහි සිගාල ජාතකයෙහි විස්තර වශයෙන් බස්නේය.

මෙය බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ බ්‍රාහ්මණ ගමෙක කිරීටවච්ඡ නම් බමුණු ව උපන්නාහ.

එවිට පඤ්චකාමයෙහි ආදීනව දැක තාපස ව වනයෙහි වාසය කරන්නාහ. එසමයෙහි "කෝසල රජ්ජුරුවන් හා කැටිව සේවා කම් කරන්ට ය"යි කියා බරණැස් රජ්ජුරුවෝ නික්ම සේවා කර්මයෙහි බිඳී ඉස් ලූ ලූ අත සේනාව බිඳී වල් වන්හ.

රජ්ජුරුවෝ එකලාව ඇතු පිටින් වල් වන්නාහු කිරීටවච්ඡ නම් තාපසයන් වසන්නා වූ පන්සලට වන්හ. ඒ තාපසයෝත් ඒ වේලාවටම පලාඵල සොයා ගියහ. රජ්ජුරුවෝත් පන්සලට වැද පැන් පිපාස ඉවසාගත නොහී පැනක් බලන්නාහු තාපසයන් බොන පැන් ළිඳ දුටහ. ඒ ළිඳ පැන් උකාගන්ට රැනක් කලයක් නොදැක ඇතා බැඳි පොරොද්ද උනාලා

ඇතා පය බැඳ ලිඳට බැස ලිඳ ගැඹුරු හෙයින් පෙරලා ගොඩට අවුත් තමන්ගේ උතුරුසළුව ගැට ගසා බැස තව ගැඹුරු හෙයින් සිතන්නාහු "පැන් තත්තයෙන් මියන්නා බලාත් පැන් බී මියයාම යහපතැ"යි සිතා අතහැර ලිඳට පැන පැන් බී පිපාස නිවාගෙන උඩට ගොඩ නැග නොහී ලිඳම සිටියාහ.

ඒ වේලාවට තාපසයෝ එතනට අවුත් සන්නාහ සන්නද්ධව සිටිනා ඇතා දැක "රජ්ජුරුවන් වහන්සේ මෙතන ආ නියා වේදැ"යි සිතා නැවත සිතන්නාහු "ඇතා සිටියේ රජ්ජුරුවන් වහන්සේ කොයිද්දේ හෝ"යි සිතා බලන්නාහු ඇතා සමීපයට අවුත් ඇතා කම්පස් හෙයින් රජ්ජුරුවන් වහන්සේ බල බලා ලිඳ ගාවාම සිටියෝය. තාපසයෝ රජ්ජුරුවන් නොදක්නාහු ලිඳ සමීපයට අවුත් ලිඳ ඇතුලෙහි සිටි රජ්ජුරුවන් දැක "නොබව මැනව රජ්ජුරුවන් වහන්සැ"යි කියා ඉණක් වතුරුවා රජ්ජුරුවන් ගොඩ නැගූහ. ගොඩ නගා රජ්ජුරුවන්ට පලාවැල දී ඇතා සන්නාහ මුදා රජ්ජුරුවන් ඇඟ තෙල් කිරි ගා දෙතුන් දවසක් රජ්ජුරුවන් සතපා යවූහ.

නුවරවාසීන් රජ්ජුරුවන් වහන්සේ මළ බවත් නොදනුම්හ. "නියමයක් දැක විනා නුවරට නොදුම්හ"යි කඳවුරු බැඳ නුවරින් පිටත උන්නාහු රජ්ජුරුවෝ තාපසයන් වැඳ "මාගේ නුවරට වැඩිය මැනවැ"යි කියා තමන්ගේ නුවරට ගියාහ. ඒ තාපසයෝත් මසක් පෝයකින් බරණැස් නුවරට ගොස් රජ්ජුරුවන්ගේ මඟුල් උයනේ සැතපී දෙවැනි දවස් වීථියේ ගෙපිළිවෙළින් සිඟා රාජාංගනයට පැමිණිය ද රජ්ජුරුවෝ

තාපසයන් වැඩ ඇඳිනගෙන සතරපසයෙන් සංග්‍රහ කරන්ට වන්හ. ඒ දැක බොහෝ අමාත්‍යයෝත් "රජ්ජුරුවන් වහන්සේ විසින් මේ තාපසයන්ට කරන සංග්‍රහ සේවකයකුට කරනසේක් වීනම් කෙතෙක් රාජ්‍යය කටයුතුකොට නොකියද්දැ"යි කියා එක් දවසක් යුවරජ්ජුරුවන් හා මුදලිවරුන් රජ්ජුරුවන් වහන්සේට අවුත් කියන්නාහු "මේ කිරීටවච්ඡ නම් තාපසයන් වහන්සේ මෙලෙස උපස්ථාන කරන්ට ගුරුකමක් නැත, යහළුකමක් නැත, මිත්‍රකමක් නැත, බන්‍දුකමක් නැත, උන්වහන්සේ අතින් උගත් ශාස්ත්‍රයෙකුත් නැත, කුමක් නිසා උපස්ථාන කරන සේක්දැ?"යි කීහ.

එවිට රජ්ජුරුවෝ "පුත, යුවරජ්ජුරුවෙනි, මා බිඳී වල් වැද ගිය දා මේ තාපසයන්ගේ ලිඳ හුණුගමනේ මේ තාපසයන් නිසා මාගේ ජීවිතය රැකුනේය. මා මේ රාජ්‍යයට පැමිණියේත් ඒ නිසාමය. එසේ හෙයින් මේ තාපසයෝ මට මහා උපකාරීය. මුන් මට කළ උපකාරයට රාජ්‍යය දුන්නත් ඒ උපකාරයට සමාන නොවෙයි. ඒසේ වීනම් තොප ඇමත් මා ලද්දේ මේ තාපසයන් නිසාය. තොප ඇම විසිනුත් තාපසයන්ට සංග්‍රහ කරන්ට උවමැනව"යි කියා කීහ.

එකියන අමාත්‍යයෝත් එවක් පටන් තාපසයන්ට බොහෝ සංග්‍රහ කළහ. ඒ තාපසයෝත් රජ්ජුරුවන්ගෙන් සිව්පස ලැබ එහිම වාසයකොට පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා උපන්නා වු ධ්‍යයනයෙන් බඹලොව ගියාහ. එකියන

රජ්ජුරුවෝත් දනා දී කුසල්කොට දෙව්ලොව ගියාහයි වදරා මේ 'කිරීටවච්ඡ ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරය. කිරීටවච්ඡ තාපස ව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි දක්වා වදාළසේක.

## 259. දූත ජාතකය

තවද අසාධාරණ වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි තෘෂ්ණා වසඟ වූ භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි. මෙහි වර්ථමාන කථාව නවවෙනි නිපාතයෙහි කාක ජාතකයෙන් විස්තර වශයෙන් බස්නේය.

මෙහි වනාහි සර්‍වඥයන් විසින් "මහණෙනි, මේ භික්ෂූහු තෘෂ්ණාවෙහි අධිකත්‍වයෙන් ඉස් කැපීමට පැමිණියෝ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයෝ ඒ රජ්ජුරුවන්ට පුත්ව උපන්නාහ.

අන්නපාන යහපත්කොට අනුභව කරන හෙයින් "පාජිනසුද්ධ රජ්ජුරුවෝය"යි කියා නම් තුබූහ. ඒ රජ්ජුරුවෝ අන්නපාන කන විට බොහෝ මනුෂ්‍යයන් මධ්‍යයේ දළපුඩු සේසත් යට සිංහාසනයෙහි ඉඳ රන්තලියෙහි ලා ලූ

රසමසවුලෙන් යුක්ත වූ ආහාර බොහෝ දෙනා මධ්‍යයෙහි අනුභව කරන්නාහ.

එවිට එක්තරා පිටිසර මනුෂ්‍යයෙක් රජ්ජුරුවන් බත් මේ නිමන තෙනට ආයේ රජ්ජුරුවන් මේ නිමවන්නා වූ බොහෝ ඛාද්‍ය භොද්‍ය දැක තෘෂ්ණා ඉවසාගත නොහෙන්නේ අතක් උඩ නගා "මම දූතය"යි කියා අඬගැසීය. ඒ අවධියේ යම් කෙනෙක් "මම දූතය"යි කියා අඬගැසී නම් උන්ට අවකාස ඇර රජ්ජුරුවන් කරා ගෙන යන්නාහ. එසේ හෙයින් ඔහු දූතයයි කියා කී හෙයින් මනුෂ්‍යයන් දෙපලට බෙදී උඟට අවකාස අළහ.

ඔහු වහා අවුත් රජ්ජුරුවන් මේ නිමවන්නා වූ රන්තලියෙන් බත් පිඩක් උකාගෙන කා පීය. එතන සිටි පුරුෂයෙක් තමා අත තුබූ කඩුව කොපුවෙන් ඇද අයා ඉස කපන්ට වන. රජ්ජුරුවෝ "උගේ ඉස නොකපව"යි රජ්ජුරුවෝ තලියෙන් අත අයා ඕහට බත් කන්ට හැර කා ඉක්බිති මිහිරි පැනුත් පොවා අත කට සෝධවා කපුරු හා බුලතුත් කවා අන්තයෙහි "ඇයි තෝ කවර රජ්ජුරු කෙනෙකුන් ලඟ සිට අවිදැ?"යි විචාරන්නා කියන්නේ "දේවයෙනි, මම තෘෂ්ණාවගේ දූතයාය. මාගේ තෘෂ්ණාවෙන් තෘෂ්ණාවගේ කීමෙන් මම ඇවිත් නුඹවහන්සේගේ තලියෙන් බත් කැම්මය, එසේ හෙයින් යථොක්ත වූ රජ්ජුරුවන් වහන්ස, තෘෂ්ණා වසඟ වූ ආවා වූ මට කෝප නොකළ මැනවැ"යි කීහ.

රජ්ජුරුවෝත් ඌ කී බසට සතුටු ව "එම්බල, ඒ එසේම ය යම් මනුෂ්‍ය කෙනෙක් දුක් ගන්නේ තෘෂ්ණාව මූලිකවමය. එසේ හෙයින් මමත් තෘෂ්ණා වසඟව ඉන්නා එකෙකිමි. එසේ හෙයින් තොයිත් තෘෂ්ණා වසඟව ආ හෙයින් දූතයන්ට සංග්‍රහ කළමනා නොවේදැ?"යි එළ ගෙරින් සියයක්ද ගම්වර පසක්ද ආදී වූ බොහෝ සංග්‍රහ කළහයි වදාරා මේ 'දූත ජාතකය' නිමවා වදාළසේක.

මේ බණ අවසානයෙහි භික්‍ෂූන් වහන්ස් අනාගාමී ඵලයෙහි පිහිටි සේකැයි වදාරා මේ ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි තෘෂ්ණා වසඟ වූ පුරුෂයා නම් මෙසමයෙහි මේ භික්ෂුහුය. එසමයෙහි පාජිනසුද්ධ රජ්ජුරුවෝ නම් දැන් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 260. පදුම ජාතකය

තවද ලොකේශ්වර වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ආනන්ද බෝධීන් වහන්සේට පූජාකළ භික්ෂූ කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

ආනන්ද බෝධි කථාව කාලිංගබෝධි ජාතකයෙහි පෙනෙන්නේමය. මේ වනාහි ආනන්ද බෝධීන් වහන්සේට පූජා කරන පිණිස පිටිසර සිට එක් නමක් සැවැත් නුවරට වැඩිසේක. මාලාකාර වීථියේ මල් සොයා ගියසේක් වීථි මුලුල්ලේ ඇවිදත් මල් නොලැබ පෙරලා ආනඤ ස්වාමීන් කරා

අවුත් "මල් නොලදුම්හ"යි කීසේක. ආනන්ද සාමීන් "යහපත, දැන් මල් ගෙනෙන නිසා බැළුව මැනවැ"යි කියා වීථියට ගොස් බොහෝ ඇරගෙන ගොස් ඒ පිටිසර සිට ආ නමට දුන්සේක. ඒ නමත් ආනන්ද බෝධීන් පූජා කළසේක.

ආනන්ද සාමීන් මල් ලත් කථාව ධම්සභා මණ්ඩපයෙහි රැස් වූ මාළුවරුන් වහන්සේ කිය කියා උන් තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදරා "මහණෙනි, මා එන්නට පූර්‍වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදරා එපවත් අසා "මහණෙනි, දැන්මතු නොවෙයි, පෙරත් නුවණැත්තෝ මල් ලද්දෝ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්ස් ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයෝ සිටු කුලයක සිටුකුමාරයෙක්ව උපන්සේක.

ඒ නුවර මල්වතු බලන්නා වූ පුරුෂයෙක් නාසා හිනය. එක් දවසක් මානෙල් මලින් ප්‍රයෝජනයක් ඇත්තා වූ සිටුකුමාරවරු තුන්දෙනෙක් එකියන නාසා හීන මල්කරුවා කරා ගොස් මල් ඉල්ලන්නා ඉන් එක සිටුපුත්‍රයෙක් "අර උයන්ගොව්වා සිත්ගෙන කියමි"යි මෙසේ කීය. "දැලි අන්දන් කපාපුවා දෙවනුව අට ගණීද? එමෙන් තාගේ නාසය අටගන්නා නියායෙන් අපට මල් දෙව"යි කීහ. උඟ ඊට කාන්සිව මල් නොදී ඉන්නා අනික් සිටු කුමාර කියන්නේය

“මාසේ කපාගත් ගොයම් අට ගණීද? එසේම තාගේ නාසය අටගන්නා නියායෙන් අපට මල් දෙව”යි කීහ. ඊට උං විසින් විකෂේපව මල් නොදෙන විසින් අනික් සිටුකුමාර කියන්නේ “මුන් දෙන්නාම කීයේ බොරුය. කපාපු නාසය නම් ඇති නොවෙයි. මේ මා කීයේ සත්‍යය. යාළු මට මල් දෙව”යි කීහ. එවිට ඒ පුරුෂ “මුන් කීයේ ඇත්තැ”යි සිතා ඔහු මල් මිටියක් ඇරගෙන ගොස් ඒ සිටුකුමාරයන්ට දිනැයි වදාරා මේ ‘පදුම ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි මල් ලත් සිටුකුමාර නම් බුදුවූ මම්ම වේදැ”යි වදාළසේක.

# 261. මුදුපාණි ජාතකය

තවද අනේකේශ්වර වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ස්ත්‍රියක් කෙරේ පිළිබඳ සිත් ඇති භික්‍ෂූන් කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

එක් ස්ත්‍රියක් කෙරේ පිළිබඳ සිත් ඇති භික්‍ෂූන් කෙනෙකුන් වහන්සේට සර්වඥයන් වහන්සේ දක්වන්නා “මහණ, තා ස්ත්‍රීන් කෙරේ පිළිබඳව ස්ත්‍රීන් රැකගත එද්ද? පෙර දෙමාපියන් විසින් රැක්ක ගත නුහුනු ස්ත්‍රීහුය”යි වදාරා “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ ඒ රජ්ජුරුවන්ට පුත්ව ඉපිද වැඩිවිය පැමිණ යුවරජ තනතුරෙහි සිට රජ්ජුරුවන් ඇවෑමෙන් රාජ්‍යයට පැමිණ දුවණී කෙනෙකුන් හා බෑණනු කෙනෙක් ඇත්තාහ.

ඒ රාජකුමාරවරු දෙන්නම රජගෙයි වැඩෙන්නාහ. උන් දෙන්නම උනුන් කෙරේ පිළිබඳ සිත් ඇත්තාහ. රජ්ජුරුවෝ එක් දවසක් අමාත්‍යයන් කැඳවා කියන්නාහු "මාගේ බෑණන්ට මාගේ දුවණියන් පාවා දී රාජ්‍යය දෙම්මැ"යි කියා නැවත කියන්නාහු "එසේ නොවෙයි, මාගේ බෑණනුවන්ට අනික් රාජකුමාරිකාවක් පාවා දෙමි. මාගේ දුවණියනුත් වෙන රාජකුමාරයෙකුට පාවා දෙමි. එසේ කළ මට බොහෝ සහාය වන්නේ ය"යි කියා තමන්ගේ බෑණ රාජකුමාරයන්ට වෙන රජගෙවල් නන්වා රාජාංගනයෙන් වෙන් කළහ.

ඒ කුමාරයෝත් එකියන කුමාරිකාව කෙරේ පිළිබඳ සිත් ඇතිව ඒ කුමාරිකාවගේ කිරි මව දැක කියන්නාහු "කුමාරිකාව රජගෙන් පිටත් කොටගන්ට උවමැනවැ, ඊට මට උපායෙක් කිය මැනවැ"යි කීහ. එවිට කිරිමව් කියන්නී "මාගේ කුමාරිකාවන් වහන්සේ විචාරා අභිප්‍රාය දැන වදාළ දෙයක් කියමි" කියා රජකුමාරියන් සමීපයට ගොස් "දුවණියෙනි, ඉස උකුණන් අරිමි" කියා තුමූ උස් පුටුවේ හිඳ කුමාරිකාවන් මිටි අස්නෙක හිඳුවා තමා දෙකලවයෙන් හිස මැඩගෙන හිඳ උකුණන් අරිනා ආකාරයෙන් ඉස නියක් ඇනලූව. එවිට

මෙකියන කුමාරිකා "රාජකුමාරයන් වහන්සේ මා එපිට කොට ගන්නා නියා මෑ අත කියා එවූ නියාවේදැ"යි සිතා ගාථාවක් සඟවා කියා යව්ව. ඒ රාජ කුමාරයන් එපවත් දැන ඒ නියාවට ඝනාන්ධකාර වූ මහත් වර්ෂා කාලයක අත මොළක ඇති එක් පුරුෂයෙකුත් ඇරගෙන කම්පස් ඇතෙකුත් ඇරගෙන රජ්ජුරුවන්ගේ පාතමාල සමීපයෙහි ඇතා සිටුවා වැස්සේ තෙමි තෙමි සිටියාහ.

ඒ වේලාවට රජ්ජුරුවන් වහන්සේත් තමන්වහන්සේගේ රාජකුමාරිකාවට රැකවල් පිණිස තමන්වහන්සේගේ යහන ගාවා කුරු ඇඳක් ලා වැදහෝනා හැටියේ සලස්වා රකිනාසේක. එකියන කුමාරිකා එදවස් එකියන රාජකුමාරයෝත් "අද එති" සිතා පියාණන් වහන්සේට කියන්නාහු "පියාණන් වහන්ස, මා අද නාන්ට උවමැනවැ"යි කීහ. එවිට රජ්ජුරුවෝ "යහපත දුවණියෙනි, නාව"යි කිය දුවණියන් වඩාගෙන ගොස් සිව්මැදුරු කවුළුවෙන් පිටත සිටුවා එක් අතක් අල්වාගෙන "නාව"යි කීහ.

ඒ වේලෙහි එකියන කුමාරිකාත් රාජකුමාරයන්ගේ ඇඟ අල්වා රාජකුමාරයන් විසින් ඒ අත තිබූ ආභරණ එකියන ලද්ද වූ අතවැස්සා අත ලා ඒ අත රාජකුමාරිකාවෝ පියාණන් අතට දී තමන්ගේ අත් දෙකම ගලවාගෙන අනික් අත තුබූ ආභරණ ඔහු අනික් අත ලා තුමූ ගොසින් ඇතු පිටට නැගී ගියාහ.

රජ්ජුරුවෝත් අතවැස්සා වඩාගෙන "තමන් දුවනැ"යි සිතා වඩාගෙන ගොස් "ගෙයි ලා සැතපෙව"යි කියා තුමූ වැදහෙව නිදූහ. රජ්ජුරුවෝත් උදෑසන නැගී සිට එකියන පුරුෂයා දැක "මේ කිම්දැ?"යි විචාරා උඹ විසින් ඒ තත්වය කියන්නා රජ්ජුරුවෝ විස්ම ව කියන්නාහු "මුන් සේ වූ බාලදරුවන් පවා මා වැනි පියෙකු අත අල්වා සිටිය දී මාගේ අත උපායෙන් ගලවාගෙන ඇතු පිටට නැගී ගියාය. මූත් මෙසේ කල සෙස්සන් තමා කියනුම කිම්දැ"යි කියා "එසේ හෙයින් ස්ත්‍රීන් නම් රැකගත නොහැක්කේම"යි කියා තමන්ගේ දුවණියන්ට බොහෝ මගුල්කොට බෑණනුවන්ට සරණපාවා දී තමන් යුවරජ තනතුරෙහි පිහිටු වූහ. එකියන යුවරජ්ජුරුවෝත් රජ්ජුරුවන්ගේ අයාමෙන් රාජ්‍යයට පැමිණ දැහැමින් සෙමෙන් රාජ්‍ය පාලනයකොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදාරා මේ 'මුදුපානි ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි රජ ව උපන්නෙම් බුදු මම්ම ය"යි වදාළසේක.

## 262. චූලපලොභන (සංකප්ප) ජාතකය

තවද ලෝකනාථ වූ සර්වඥයන් වහනසේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ස්ත්‍රීන් කෙරේ පිළිබඳ සිත් ඇති භික්ෂූ කෙනෙකුන් වහනසේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

එක්තරා භික්ෂු කෙනෙකුන් වහන්සේ ස්ත්‍රියක් කෙරේ පිළිබඳව හිඳිනා දැක සර්‍වඥයන් වහන්සේට දක්වන්නා "එම්බල මහණ, උත්තමයෝ පවා මේ පඤ්චකාමය නිසා මිනී මරා පෙරලා තපස් රැක්කෝ වේදැ"යි වදරා ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජයය කරන සමයෙහි රජ්ජුරුවන්ට දරු කෙනෙක් නැත්තාහ. ඒ රජ්ජුරුවෝ තමන්ගේ අන්තඃපුරවාසීන්ට කියන්නාහු "දරුවන් ප්‍රාර්ථනා කරව"යි කීහ. එකියන අන්තඃපුරවාසී ඒ නියාවට දරුවන් පතා නැතක් කල් ගිය බෝධිසත්ත්‍වයෝ බඹලොවින් චුතව අවුත් රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ ගත්හ.

දස එකඩමසකින් උපන්නාහ. උපන් දවස් නාවා පියා එක් කිරි මවක් අතට දුන්හ. ඒ කිරි මව අතට යන්නා වූ බෝධිසත්ත්‍වයෝ අඬන්ට වන්නාහ. එවිට අනිත් ගැහැණියක් අතට වැඩූහ. එවිට කුමාරයෝ අඬන්නට වන්හ. මේ නියායෙන් ගැහැණුන් අත වැඩූ වැඩූ සේ අඬන හෙයින් පිරිමින් අතට වැඩූහ. එවිට නාඬන්නාහ. එතැන් පටන් පිරිමින් විනා ගැහැණුන් වැඩූ කලම අඬනාහ. එසේ හෙයින් පිරිමි වඩනාහ. කිරි පොවන තැටියේ වත්කොට පොවන්නාහ. නැත්නම් මැණියන් වහන්සේ තිරයෙන් පිට සිට තණපුඩුව මැත්කොට කිරි පොවන්නාහ. මේ නියායෙන් වැඩිවිය පැමිණී පසුත් ස්ත්‍රීන්

නොදක්නාහ. එබැවින් රජ්ජුරුවෝත් වෙන මාලිගාවක් කරවා වෙනම සයනය කරන නියායෙන් සැලැස්සූහ.

ඒ කුමාරයන්ට වයස සොළොස් ඇවිරිදි පිරුණු කල රජ්ජුරුවෝ සිතන්නාහු "මාගේ ඇත්තේ එකම පුතණුවෝය. ඔහු වනාහී මා ඉක්බිති රාජ්‍යය කරන්ට උවමැනව, රාජ්‍යය කළ නම් ස්ත්‍රීන් සමග පඤ්චකාම විෂය අනුභව කරන්ට උවමැනව, එසේ හෙයින් මාගේ පුතණුවන් ස්ත්‍රීන් නොදකිනා හෙයින් රාජ්‍යය කරන්ට බැරිය. කරන්නේ කිම්දැ?"යි කියා විසෙඤ්පව උන්සේක.

ඒ වේලාවට එක් ගී කීමෙහි දක්‍ෂ වූ ස්ත්‍රියක් රජ්ජුරුවන් කරා අවුත් කියන්නී "දේවයන් වහන්ස, විසෙඤ්පව උන්නේ ඇයිදැ?"යි විචාරා "එම්බල, මාගේ පුතණුවන් අසනීඝාත කුමාරයන් ස්ත්‍රීන් වසඟ නොවන හෙයින් විසෙඤ්පව ඉදිමි"යි කීහ. එවිට ස්ත්‍රී "දේවයන් වහන්ස, මේ නිසා නුඹවහන්සේ විසෙඤ්ප වන්ට එපා"යි "මම ගී කියා වීණා ගා ලබ්බවා ගණිමි" සිතා ඒ ස්ත්‍රී කුමාරයන් ලඟ සිටි පුරුෂයන්ට කියන්නී "මා සෙට ගී කියා වීණා ගායනා කෙරෙමි, එවිට කුමාරයන් වහන්සේ කී දෙයක් ඇත්නම් මට කියව"යි කියන්නා "යහපතැ"යි ඒ පුරුෂයෝ ගිවිස්සාහ.

එකියන ස්ත්‍රීත් පසුව දවස් දුර සිට ගී කී නියාවට වීණා නාද කරන්ට වන. එක්‍ෂණයෙහි රාජකුමාරයාත් කන් දී අසාගෙන වැද හොත්තේය. කන් දී අසාගෙන වැදහොත් පවත් ඒ ස්ත්‍රී අසා දෙවන දවස් ලග සිට ගායනා කළේය.

එවිට බෝධිසත්ත්වයෝ “එකියන ස්ත්‍රිය මාගේ ගෙට කැන්ද ගෙයි ඇතුලේ සිට ගී කියා වීණා නාද කරන්ට කියව”යි කීහ.

“යහපතැ”යි කියා ලඟට කැඳවා ඈ කී ගී අස අසා ඈ හා සමඟ ලෝකාස්වාද රතියෙහි යෙදී පඤ්චකාමයෙහි තත්පරව “පඤ්චකාම විෂය මා මිසක් අනික් කෙනෙකුන් අනුභව කරන්නෙ නම් කිම්දැ?”යි කඩුව කොපුවෙන් අයාගෙන වීථියට බැස මිනිසුන් පොළු ගසන්ට වන්හ. මේ නියායෙන් මිනිසුන් පොළු ගසාගෙන වීථියේ නික්මුණු නියාව රජ්ජුරුවන් අසා තමන්ගේ මිනිසුන් යවා ඒ කුමාරයන් අල්වා එකියන ස්ත්‍රීත් ඒ කුමාරයත් දෙන්නාම නුවරින් නෙරපූහ.

එකියන ස්ත්‍රීත් කුමාරයෝත් දෙන්නම හිමාලය වනයට ගොස් ඒකන්නකිම් සමුද්‍රය හා ඒකන්නකිම් ගඟක් ඇති එක් ස්ථානයක පන්සලක් කොට වාසය කරන්නාහ. එකියන ස්ත්‍රිය පන්සල ඉඳුවා බෝධිසත්ත්වයෝ පලාඵල ගෙනවුත් දෙන්නාහ. ඒ ස්ත්‍රීන් පිසලාලා ඉන්නීය. මේ නියා දවස් අරන කල්හි මූද මැද්දේ දිවයිනක වසන්නා වූ තාපස කෙනෙක් පලාඵල නිසා ආකාශයෙන් වනාන්තරයට යන්නා වූ බෝධිසත්ත්වයන්ගේ ගෙයි දුම් පෙණෙන්නා දැක ඒ ගෙය කරා බටහ.

ඒ වේලාවට බෝධිසත්ත්වයෝ පලාඵල කඩා වනාන්තරයට ගියහ. ඒ වේලාවට ඒ තාපසයෝ ඒ පන්සලට බටහ. ඒ ස්ත්‍රී ඒ තාපසයන් පන්සලට වඩා වළඳවා ඉක්බිති “වඩිනේ යහපතැ”යි කියාත් රඳවා තමාගේ භාවනාව දක්වා

තාපසයන් ලබ්බාගන උන් හා කැටිව ලොකාස්වාද රතියෙහි යෙදුනාහ. ඒ වේලාවට බෝධිසත්ත්වයෝ පලාඵල කඩාගෙන පන්සලට වන්නාහ. ඒ තාපසයෝ බෝධිසත්ත්වන් දැක පන්සලින් නික්ම සමුද්‍රය ලඟට ගොස් "ධ්‍යාන ඇතැයි ආකාශයට නැගෙමි"යි උත්සාහකොට සමුද්‍රයෙහි වැටී නුන. බෝධිසත්ත්වයෝත් මරන්ට කඩුව ඇරගෙන පස්සේ ඵහුබන්ද ගොස් තාපසයන් දැක "මේ තාපසයන් පළමු ඍෘර්ධි ඇති කෙනෙක් නියාවේද? දැන් මුන්ගේ ඍෘර්ධි පිරිහුන, මුන්ට ඍෘර්ධි උපද වන්ට උවමැනවැ"යි සිතා කියන්නාහු "තාපසයෙනි, ස්ත්‍රීන් කෙරේ පිළිබඳ වීමෙන් ධ්‍යානයෙන් පිරිහුන, ස්ත්‍රීහු නම් සියල්ල දවන්නා වූ ලැව් ගින්නක් මෙන් අවැඩ කරන සුල්ලහ, ආශිවිෂයෙකු මෙන් දෂ්ට කරන සුල්ලහ, යම්සේ කඩුව ගෙන මරණට සිටි පුරුෂයෙකු හා සමඟ කරන්නා වූ කථාව යහපතට යෙයි, ස්ත්‍රීන් හා කරන කථාව වැඩකට නොසැලසෙ"යි කියා බෝධිසත්ත්වයන් කියන්නාහු බණ අසා තාපසයෝ සමුද්‍රයෙහි සිටම ධ්‍යාන උපදවා තමන් වසන්නා වූ දිවයිනට ගියාහ. එවිට බෝධිසත්ත්වයෝත් "මෙසේ වූ භාරයන් හැර ධ්‍යාන උපදවා ආකාශයෙන් යෙමි" සිතා එකියන ස්ත්‍රීය ගෙන ගොස් මග සිටුවා "කැමති තෙනකට යව"යි කියා බෝධිසත්ත්වයෝ පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා මිය පරලොව ගියාහයි වදරා මේ 'චුල්ල පලොභන ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි අසනීඝාත කුමාරයෝ නම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 263. මහපනාද ජාතකය

තවද අප්‍රතිනාථ වූ සර්‍වඥයන් වහන්සේ කෝටි ග්‍රමයෙහි වැඩවසන සමයෙහි භද්දිය මහතෙර සාමීන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

එකියන කෝටි ග්‍රාමයෙහි භද්දිය සිටාණන්ගේ භද්දිය නම් සිටුකුමාර කෙනෙක් ඇත්තාහ. උන් වාසය කරන්නා වූ තුන් ඍතුවට තුන් ප්‍රාසාදයෙක් ඇත. ඉන් එකී එකී ප්‍රාසාදයෙහි සාර සාරමස වාසය කරන්නාහ. උෟත් එක් ප්‍රාසාදයෙක වාසයකොට එක් ප්‍රසාදයකට නික්මෙණ වේලේ උන්ගේ ආශ්වර්‍ය්‍ය බලන්ට බොහෝ මනුෂ්‍යයෝ මැසි පිට මැසි බැඳ සිට ආශචර්‍ය්‍ය බලන්නාහ.

මේ නියායෙන් වාසය කරන කල්හි එක් දවසක් කෝටි ග්රාමයෙහි මනුෂ්‍යයෝ “දනක් දෙන්ටය”යි බුදුන් ප්‍රධාන මහාසංඝයා පවරාගෙන මහත් වූ ශාලාවෙක වඩා හිඳුවා දන් දෙන්නාහ. ඒ වේලාවට එකියන භද්දිය කුමාර තමා ලත් ප්‍රාසාදය ඇර අනික් ප්‍රාසාදයකට යමින් සිටි කලට සර්‍වඥයන් වහන්සේ බොහෝ මනුෂ්‍යයන් පිරිවරා ධර්‍ම දේශනා කරමින් වැඩඋන් තෙනට තමාගේ පිරිවර හා සමඟ සර්‍වාලංකාරයෙන් සැරහී ගොස් සිටි පල සිට ම සියලු කෙලෙසුන් නසා රහත් වූහ.

සර්‍වඥයෝ භද්දිය සිටාණන්ට කියන්නාහු "තොපගේ පුතණුවෝ භද්දිය කුමාරයෝ රහත් වූහ. එසේ හෙයින් අද උන් පිරිනිවන් පාන්නක් හෝ මහණ වන්නක් හෝ උවමැනවැ"යි වදාළසේක. එවිට භද්දිය සිටාණෝ කියන්නෝ "මාගේ පුතණුවෝ මියන්නේ ඇයිද? මහණ වෙති"යි කීහ. "යහපතැ"යි කියා සර්‍වඥයෝ ඒ කුමාරයන් මහණ කරවා ගත්තාහ. එකියන භද්දිය ස්ථවිරයෝත් තමන්වහන්සේට පැමිණියා වූ නිවන් සැපත අනුභව කරනසේක් ධ්‍යාන භවනාදී වූ දෙය කොට සැප වූ ස්ථානයක උන්සේක.

ඒ වේලාවට බොහෝ භික්ෂූහු උන්වහන්සේ කරා ආසේක. උන්වහන්සේත් තමන්වහන්සේගේ ධ්‍යාන භාවනායෙන් උන් හෙයින් කවුරුන් වහන්සේ ආවත් නැගී නොසිට උන්සේක.

එවිට බොහෝ පෘථග්ජන භික්ෂූන් වහන්සේ "ඇයි? භද්දිය ස්ථවිරයන් මහණ වූයේ නොබෝ දවසෙක, වැඩිමහළු වහන්දෑ දැක මහතෙර කෙනෙකුන් මෙන් ඉන්ට කාරණා කිම්දැ?"යි උද්ඝෝෂණය කළසේක.

සර්‍වඥයෝ එපවත් දැන ඒ වහන්දෑගේ සිතිවිල්ල සුද්ධ කරන පිණිස උපාසකවරුන්ට කියා "අපි මේ ගංගාවෙන් එගෙඩ යන්නා කැමැත්තෙමිහ"යි වදාළසේක. "යහපතැ"යි කියා නැව්, ඔරු, පාරු ඉදිකොට සර්‍වඥයන් වහන්සේ හා සංඝයා වහන්සේ වඩිනා නියායෙන් සැලැස්සූහ.

සර්‍වඥයන් වහන්සේ භද්දිය තෙරුන් ළඟට කැඳවා "භද්දිය ස්ථවිරයෙනි, තොප මහාපනාද කාලයෙහි තොප විසූ

පස්විසි යොදුන් දිග හා සත් යොදුන් පුළුල හා සත්රුවන් ප්‍රාසාදය කොයිදැ?"යි විචාළසේක. එවිට භද්දිය තෙරුන් වහන්සේ කියනසේක් "ස්වාමීනි, ඒ ප්‍රාසාදය මේ ගංගායෙහිය"යි වදාළසේක. ඒ අසා බොහෝ භික්ෂූන් වහන්සේ සිතනසේක් "මේ භද්දිය තෙරුන් කියන්නේ කිම්දැ?"යි සිතූසේක.

එපවත් සර්‍වඥයෝ දැන "භද්දිය ස්ථවිරයෙනි, තොපගේ සබ්‍රම්සරුන්ගේ සාංකාවන් දුරු කරව"යි වදාළසේක. එවිට භද්දිය තෙරුන්වහන්සේ "යහපතැ"යි කියා තමන්වහන්සේ පළමු සිටි ප්‍රාසාදයෙහි කෙවින්න මාපටඟිල්ලෙන් ඔසවාගෙන ප්‍රාසාදය උඩ ඔසවා ගත්සේක. ඒ වේලේ බොහෝ මනුෂ්‍යයෝ "ප්‍රාසාදය ගව්වක් එස වන, දෙගව්වක් එස විනැ"යි යනාදීන් කියා බල බලා සිටියාහ.

එවිට මහාපනාද කාලයෙහි නෑයෝ එකියන මාලිගාව කෙරේ ගත් ලෝභයෙන් එහිම මස්කැසුප් ව උපන්නාහ. ඒ උපන්නා වූ බන්ධූහු ප්‍රාසාදය උඩට ඔසවත් ම පෙරලි පෙරලී දියෙහි ම වැටෙන්නාවුන් බලා සර්‍වඥයන් වහන්සේ "භද්දිය ස්ථවිරයෙනි, තොපගේ පූර්‍වයෙහි නෑයෝ බොහෝ ව්‍යසනයනට පැමිණෙති"යි වදාරා "ප්‍රාසාදය හරුව"යි වදාළසේක. "යහපතැ"යි කියා භද්දිය තෙරුන්වහන්සේ මාලිගාව අළසේක. මාලිගාව පළමු තුබූ ස්ථානයෙහිම පිහිටුවාහ. සර්‍වඥයෝත් එකියන ගංගාවෙන් එගොඩව පණවනලද බුද්ධාසනයෙහි වැඩ උන්සේක.

එවිට බොහෝ භික්‍ෂූන් වහන්සේ "මේ භද්දිය තෙරුන්වහන්සේ මහාපනාද කාලයෙහි මෙහි විසූ කාරණය ශ්‍රී බුද්ධියට මිසක් අපට නොදැනෙයි, එහි පිළිවෙළ කථාව දක්වා වදාළොත් යහපතැ"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

මෙහි ජාතක කථාව පකිණ්ණක නිපාතයෙහි සුරුචි ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය. මෙහි වනාහි යටගිය දවස වෛදේහ රට මියළු නුවර සුරුචි නම් රජ්ජුරු කෙනෙක් වූහ. ඒ රජ්ජුරුවන්ගේ සුරුචි කුමාරයෙක් වූය. සුරුචි නම් රජ්ජුරුවන්ට මහාපනාද නම් රාජකුමාරයෙක් ඇති වූය.

ඒ කුමාරයන්ට ශක්‍රයන් විසින් මවනලද පස්විසි යොදුන් මාලිගාවෙහි වාසයකොට දෙව්ලොව ගියෝය. "ඔහුගේ ආයාමෙන් මාලිගාව දියෙහි තිබූයේය"යි වදරා බුදුව වැඩ හිඳ වදාරනසේක් "මහාපනාද නම් රජ්ජුරුවන්ගේ පස්විසි යොදුන් සියක් මාල් ඇති නගනලද ධජයෙන් අලංකෘත වූ ඉන්ද්‍රනීල මාණික්‍යමය වූ දෙර ලී දෙරබායෙන් යුක්තව සැටදහසක් නාටකයන් විසින් දක්වනලද ආතත, විතත, විතතාතය, ඝනය, සුසිරය යන පඤ්චාංගික තූර්‍ය්‍ය නාදයෙන් ඒකානාද වූ අලංකෘත වූ මාලිගාවෙහි චක්‍රවර්ති රජ කෙනෙකුමෙන් රාජ්‍යයකොට පරලොව ගියහ"යි වදරා මේ ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි මහාපනාද රජ්ජුරුවෝ නම් භද්දිය ස්ථවිරයෝය. එසමයෙහි ශක්‍රව උපන්නේ නම් බුදුවූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 264. කුරඟ්ග (කුරප්ප) ජාතකය

තවද ලෝකස්වාමී වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි වීර්‍ය්‍යී අඩු භික්‍ෂූන් කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද? යත්,

එක්තරා වීර්‍ය්‍යී අඩු නමක් සර්‍වඥයන් වහන්සේට දක්වන්නා "මහණ, මේ නියා සැපතෙහි සිට වීර්‍ය්‍යී වඩතොත් විනා අඩු වෙන්ට කාරණා කිම්ද? පෙර උත්තමයෝ පවා තනිව සිටත් වීර්‍ය්‍යී කළෝ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසෙක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයෝ වනයක් සමීපයෙහි ගමෙක සේවායන් පන්සියයක් ඇරගෙන යන එන්නා වූ මනුෂ්‍යයන් ඒ වනයෙන් ඈත ලා ඉන් ලත් දෙයක් ඇරගෙන ජීවත් වන්නාහ.

එසමයෙහි පන්සියයක් ගැල් ඇරගෙන සාත්තුනායක ව්‍යාපාරයෙක් එකියන බෝධිසත්ත්‍වයන් වසන්නා වූ ස්ථානයට ආය. බෝධිසත්ත්‍වයෝත් ඔහු දුන් කුලී ඇරගෙන "මොවුන් මා විසින් ගලවා හරින්ට උවමැනවැ"යි සිතා තමන්ගේ සේවා

පන්සියයක් ඇරගෙන ඒ ගැළුත් පදවාගෙන වනාන්තරයට නික්මුණාහ.

ඒ වනාන්තරය මධ්‍යයෙහි සොරුන් පන්සියයක් ඒ ගැල් කොල්ල කන්ට ආහ. ඒ වේලාවට බෝධිසත්ත්වයන් හා කැටිව ආ සේවායන් පන්සියය භයින් සැඟවී ගියාහ. එවිට බෝධිසත්ත්වයෝ තනිව සිට ඈත මෑත පැන භය ගන්වා සතුරන් එලවා ගැල් පන්සියය ගලවා වනාන්තරයෙන් එතර කළහ. එවිට ගැල් සාත්තුනායකයා බෝධිසත්ත්වයන් රසමසවුළෙන් යුක්ත වූ ආහාරය කවා කියන්නේ "ආයුධ සන්නද්ධ සොරුන් දැක තොපට භයෙක් වත් තැතිගැන්මක් වත් නූවෙව් වේදැ?"යි කියා විචාළාහ.

"එසේය, පඤ්චායුධ සන්නද්ධව ආ සොරුන් දැක භයක් වත් තැතිගැන්මක් වත් නැත, උන් දැක මට මහා සන්තෝෂ උපන, තොප හැම කළා වූ උපකාරය සිතා සතුරන් බිඳීම යන සිතින් නිර්භීතව සිට සතුරන් සැඳීමි" වදුරා 'කුරඟ්ග ජාතකය' නිමවා වදාළසේක. බණ අවසානයෙහිදී වීර්‍ය්‍යයී අඩු භිඤු වීර්‍ය්‍යයී වඩා රහත් වූහයි වදුරා "එසමයෙහි එකියන වෙළඳුන් ගැළ වූ පුරුෂයා නම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 265. වාත සෛන්ධව (වාතග්ග සින්ධව) ජාතකය

තවද ඒකස්වාමි වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් කෙළෙඹි පුත්‍රයෙකු අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

එක්තරා රූපශ්‍රීයෙන් යුක්ත වූ ස්ත්‍රියක් තමන්ගේ රූපශ්‍රීයෙන් පුරුෂයෙකු දැක පිළිබඳ සිත් ඇතිව ඒ නිසා සෝකාග්නියෙන් තැවි තැවී තමාගේ ඇඳ වැලඳ සිපගෙන නොකා නොබී වැදහොත්තීය. ඒ දැන උන්ගේ යෙහෙළියෝද පරිවාර ස්ත්‍රීහුද ලගට අවුත් "ඇයි තොපට කුමන ආයාසයෙක්දැ?"යි දෙතුන් ඇවරක් විචාරන්නා එපවත් කී කල්හි එවිට එකියන ගැහැණු "අපට ඒ භාරය, තොපි සෝක නොගනුව"යි කියා එකියන පුරුෂයා සමීපයට ගොස් එපවත් කිවූය.

ඒ පුරුෂයාත් කීප වරක් කියන තුරු නොගිවිස පසුව "යහපතැ"යි "අසවල් දා එමි" කියා යවූහ.

ඒ ගැහැණුන් ගොසින් එපවත් සෝකයෙන් උන් ස්ත්‍රියට කියා "තෝ විකෂේප නොව, අසවල් දා එති" කීහ. "යහපතැ"යි කියා ඒ ස්ත්‍රීත් ඒ නියාවට තමාගේ ගෙයත් සරහා තොමෝත් සැරහීගන යහනාවේ වැදහොත්තීය. ඒ වේලාවට එ පුරුෂයාත් ඒ ගෙට අවුත් ඇඳ පාර්ශවයක ඉඳ ස්ත්‍රියගේ අත අල්වන්ට වන. ස්ත්‍රී සිතන්නී "ස්ත්‍රීන් නම් පළමුකොට පුරුෂයා අත ඇල්එැවිට ලැගී නම් නිස්සාර යයි සිතති. එසේ හෙයින් පළමුකොට මා නොකමැත්තාමෙන් අඟවා දෙවනු ආ දවසක අවකාස දෙමි" සිතා අත ගසා දමාපුවාහ. ඒ පුරුෂයාත් ලජ්ජාව, එතනින් පලා ගියේය. ඒ ස්ත්‍රිය ලගට ගැහැණු අවුත් "ඇයි, තී ලගට ආ පුරුෂයාට

තොපි කෙළේ කිම්දැ?''යි විචාරන්නා "ස්ත්‍රීන් නම් පළමුකොට ලැගී නම් නපුරැයි සිතා නොලැගුනෙමි'' කීහ.

ඒ අසා ගැහැණු කියන්නාහු "අප බොහෝ උත්සාහයයෙන් ඒ පුරුෂයා මෙතනට ගෙනායේය. තොපි උන්ට ප්‍රිය වූ බසක් විවරකුත් නොකියා යවූහ. උන් යවාපුයේ විපාක දන්නවාදැ?''යි කියා කීහ. එකියන පුරුෂයාත් ලජ්ජාවෙන් එකියන ස්ත්‍රියගේ මුහුණත් නොබැළූයේය. ඒ ස්ත්‍රීත් නිසායයි සෝකයෙන් වියලි වියලී මළේය. එකියන පුරුෂයාත් "ඒ ස්ත්‍රිය මළේ මා නිසාය''යි දන්නේය. ස්ත්‍රිය මළ පසු මල් සුවඳ ආදී වූ දෙය ඇරගෙන සර්‍වඥයන් කරා ගොස් පූජාකොට සිටියේය.

සර්‍වඥයෝත් "ඇයි උපාසකය, මෙතෙක් දවස් නොආයේ කිම්දැ?''යි විචාරන්නා උපාසකයා විසින් එපවත් නොවළහා දැන්විය. සර්‍වඥයෝ ඒ අසා "පළමුත් ස්ත්‍රී උත්තමයන් පවා තොමෝ ම කැඳවා රවටා යවූවාය''යි වදරා "කෙසේදැ?''යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයෝ වාත සෛන්ධව නම් අශ්ව ව ඉපද බරණැස් රජ්ජුරුවන්ට මඟුල් අශ්ව වාහන ව සිටිනාහ.

එක් දවසක් බෝධිසත්ත්වයන් ඇරගෙන නාවන්ට ගොස් නාවාපියා ඇරගෙන එන්නා වූ බෝධිසත්ත්වයන් දුටු කුන්තාලි නම් කොටළු ධේනුවක් තෘෂ්ණාව වැටී සෝකයෙන් තණ පැන් නොකා නොබී වාසය කරන්නීය.

ඒකියන කොටළු ධේනුවගේ පුතෙක් තමාගේ මව අතින් "ඇයි, ශෝකව තණ පැන් නොකා නොබී ඉන්ට කාරණා කිම්දැ?"යි විචාරන්නා එපවත් කීප විටක් විචාරන්නා ඒ කාරණා පුතාට කිව. ඒ පුත් "යහපත අශ්වයාට කියාලා ලබ්බන්ට මට භාරය"යි කියා අශ්වයා නාවන්ට වැවට ගෙනා වේලේ ඒ කොටළුවා අශ්වයා ලගට අවුත් "පියාණන් වහන්ස, මාගේ මව් වූ කොටළු දෙන් නුඹවහන්සේ කෙරෙහි තෘෂ්ණාව වැටී මියන්ට ඉදිති. එසේ හෙයින් උන්ගේ ජීවිත දානය දුන මැනවැ"යි කීහ.

එවිට එකියන අශ්වයාත් "මාගේ අස්සලයා මෙතන සිටිනා හෙයින් බැරිය, අස්සලයා මා නාවාපියා පිටියේ තණ කන්ට හරනේය. ඒ වේලාවට තොපගේ මව කැඳවාගෙන එව"යි කීහ.

එකියන කොටළුවාත් ඒ නියාවට තමාගේ මව කැන්දාගෙන අවුත් එලියේ සිටුවා තෙමේ බැද්දේ සැගවී සිටියේය.

අස්සලයා බෝධිසත්ත්වයන් නාවා පිටියට අළහ. බෝධිසත්ත්වයෝත් ඒ කියන කොටළු දෙන් සමීපයට අවුත් පිට මූණ තිබා චුම්බනයකොට සිටියේය.

ඒ වේලාවට කොටළු දෙන් සිතන්නී “ස්ත්‍රීහු නම් පුරුෂයන් ආ වේලේ පළමුකොට ලැගී නම් යහපත් නොවෙයි, එසේ කල නොතකති” සිතා “තමා නොකමැති සැටියේ අඟවන්ට උවමැනව”යි සිතා පලා ගියහ. ඒ කියන කොටළු ධේනුවගේ පුතාත් තමාගේ මව් ලඟට අවුත් කියන්නේ “මෙතෙක් දෘ විඝේෂ්පව උන් නිසා මාගේ පියාණන් නුඹවහන්සේ සමීපයට ලන් වූ කල්හි ඇයි නොලැග්ගෙන්ට කාරණා කුමක් නිසාදැ?”යි විචාළේය. එවිට කොටළු ධේනුව කියන්නී “පුත, ස්ත්‍රීහු නම් පළමුකොට නොලැගෙති. පසුව ලැග්ග යුතුය. ඒ නිසා පලා ආමි” කීහ.

ඒ අර්ථය දක්වන සර්‍වඥයන් වහන්සේ “යම් ස්ත්‍රියක් ලඟට ප්‍රාප්ත වූ පුරුෂයාට අවකාශ නොදෙත් නම් වාත සෛන්ධව නම් අශ්වයාට ආලය ඇතිව පළමුකොට තදකම් පෑ එකියන අශ්වයා විඝේෂ්පකර වූ කුත්තාලි නම් කොටළු ධේනුව වැනිය”යි වදරා මේ වාත සෛන්ධව ජාතකය නිමවා වදාළසේක.

“එසමයෙහි කොටළු දෙන් නම් මේ ස්ත්‍රියය. අශ්ව ව උපන්නෙම් බුදුවූ මම්ම ය”යි වදාළසේක.

## 266. කර්‍කටක (කක්කට) ජාතකය

තවද මාගේ ස්වාමිදරු වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා ස්ත්‍රියක් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

එක් කෙළෙඹි පුත්‍රයෙකු හා උන්ගේ භාර්‍ය්‍යාවන් හා දෙන්නා සැවැත් නුවරට එන්නාහු අතරමඟ සොරුන් ඇති ස්ථානයට පැමිණියාහු ඒ වනාන්තරයේ වසන්නා වූ සොරදෙටුවා එකියන ස්ත්‍රියගේ විශිෂ්ඨ වූ රූපය දැක ඈ කෙරෙහි පිළිබඳ සිතින් “මෙකියන පුරුෂයා මරා මෙකියන ස්ත්‍රිය ඇරගණිමි”යි සිතා පුරුෂයා මරන්ට කොපුවෙන් කඩුව අයාගත. එවිට ස්ත්‍රිය පතිව්‍රතා ධර්මය රැක තමාගේ ස්වාමිපුත්‍රයා දේවතාස්ථානයෙහි තබා වාසය කරන හෙයින් සොරදෙටුවා පය ගෙන අඬා “මා නිසා වේද? මාගේ ස්වාමිපුත්‍රයා මරන්ට සිතන්නේ, මාගේ ස්වාමිපුත්‍රයා රැකගත නුහුනුවත් මාගේ ප්‍රාණය සිරිගි කා වුවත්, ස්වාසය රඳවා වුවත් නසා ගණිමි” කීහ.

එවිට එකියන සොරා ඒ දෙමහල්ලන් නොමරා අළහ. ඒ දෙමහල්ලොත් සැවැත් නුවරට එන්නාහු “ජේතවනාරාමයට අවුත් සර්‍වඥයන් දැක යමිහ”යි සිතා ජේතවනාරාමයට අවුත් සර්‍වඥයන් දැක සිටියාහ.

සර්‍වඥයෝත් “කෙළෙඹි පුත්‍රය, මඟ සැපසේ පලා ආවාදැ?”යි විචාරා වදාරන්නා “ස්වාමීනි, අපට කුමන සැපයෙක් ඇද්ද? අතරමඟ දී සොරුන් අප අල්වාගත් ගමනේ මාගේ ස්ත්‍රිය නිසා ජීවිතය ලදුයේය”යි දැන්විය.

සර්‍වඥයෝ වදාරනසේක් “පෙරත් මේ ස්ත්‍රී නුවණැත්තන්ගේ ජීවිතය රැක දුන්නේය”යි වදරා “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි එක් විලෙක මහත් වූ කලවිටක් සා මහත ඇති රන්වන් කකුළුවෙක් ඇත. එකියන කකුළුවා වසන්නා වූ විලද එකියන කකුළුවාගේ නමින් නම් විය. එකියන කකුළුවාගේ විල සමීපයෙහි ඇත් රජ්ජුරු කෙනෙක් නිබඳව ඇත්මුලක් ගෙන වාසය කරන්නාහ.

ඒ ඇත්මුල විලට බැස පොකුරු මී, නෙලුම්දැලි කන්ට බට වේලාවට ඒ විල වසන්නා වූ කකුළුවා එක් ඇතෙකුගේ කකුල ඩැගෙන ගොස් කන්නේය. මේ නියායෙන් ඇතුන්ට බොහෝ ගැහැට කරන හෙයින් ඇත්තූ ඒ විලට නොබසිනාහ.

එසමයෙහි ඒ විල සමීපයෙහි වාසය කරන්නා වූ ඇත් රජ්ජුරුවන්ගේ ඇතිනීගේ බඩ බෝධිසත්ත්‍වයෝ පිළිසිඳ ගත්හ. එකියන ඇතින්නීත් තමාගේ දරු ගර්භය රකිනා නිසා ඔබ්බකට ගොස් බෝධිසත්ත්‍වයන් වැදූහ.

බෝධිසත්ත්‍වයෝ වැඩිවිය පැමිණ අඤ්ජන කූටයක් සේ මහත් වූ ශරීරයක් ඇතිව ඇතින්නක් තමන්ට පාදපරිචාරිකා කොට සලස්වාගෙන බෝධිසත්ත්‍වයෝ තමන්ගේ මෑණියනුත් ඇතින්නත් ඇරගෙන පියාණන් දකින්ට ඒ විල සමීපයට අවුත්

පියාණන් දැක ඒ විලට බට ඇතුන් කකුළුවෙකු විසින් අල්වා කන නියාව අසා බෝධිසත්ත්වයෝ තමන්ගේ පියාණන්ට කියන්නාහු "පියාණන් වහන්ස, මේ කකුළුවා මරන්ට මට භාරය"යි කියන්නා බෝධිසත්ත්වයන්ගේ පියාණෝත් කියන්නාහු "පුත, ඒ කකුළුවා බොහෝ ඇතුන් කා මරා පීය. එසේ හෙයින් තොපි ඒ විලට නොයව"යි කීහ.

ඒ මාන කියව කියවාත් "මා විලට යන්ට උවමැනවැ"යි කියා බොහෝ ඇතුන් පිරිවරා එකියන විල සමීපයට ගොස් ඇතුන්ගෙන් විචාරන්නේ "මේ විල වසන කකුළුවා ඇතුන් අල්වන්නේ විලට බසිනා වේලේද? ගොදුරු කන වේලේද? විලින් ගොඩ නගින වේලේදැ?"යි විචාළෝය. එකියන ඇත්තු කියන්නෝ "දියට බැස ගොදුරු කා ගොඩ නගින වේලේ ඇමට පස්සේ එන ඇතා පය අල්වන්නේය"යි කීහ.

එබස් අසා බෝධිසත්ත්වයෝ "යහපතැ"යි කියා ඇතුමුල හා ඇතින්න පිරිවරා දියට බැස ගොදුරු කා ගොඩ නගින වේලේ බෝධිසත්ත්වයෝ හැම ඇතුන් පළමුකොට එවා තමන්වහන්සේ පස්සේ එමින් සිටි කලට එකියන කකුළුවත් ලෝකරුවකු අඬුවකින් දිලිහී ගිය යවටක් අල්වන්නාක් මෙන් ඇතුගේ පය අඬුවෙන් අල්වාගෙන තමාගේ වාසස්ථානයට අදින්ට වන් කල්හි බෝධිසත්ත්වයෝත් තමන් සිටි තැනින් පා ඇද යා නොහී මරණ භයින් භයපත් ව මහත්කොට මරණ ප්‍රතිරාවයෙන් ඇඬූහ. ඒ අඬ ඇසූ බොහෝ ඇත්තු තමන්

කෙරේ හයින් කුඤ්ච නාදකොට ඉල්ලති මුත්‍ර වත්කොට ඒ ඒ අත දිවූහ.

බෝධිසත්ත්වයන්ට බිරින්ද වන ඇතින්නීත් කාට වූ භයක්වත් නොදැන දිවන්ට වන. බෝධිසත්ත්වයෝ තමන් ඇර නික්මුණු ඇතින්නට කියන්නාහු "පින්වත් වූ මා කෙරෙහි ප්‍රිය වූ ඇතින්න, අඩු ඇත්තා වූ උස්ව විසාරදව තිබෙන්නා වූ ඇස් ඇති මේ විල වසන්නා වූ කකුළුවෙක් මාගේ පස්ස පය ඩැගත. එසේ හෙයින් තී විසින් මා ඇරපියා යන්නේ ඇයිදැ?"යි කීහ.

එබස් අසා එකියන ඇතින්නියෝ "නොබව මැනව, නුඹවහන්සේ ඇර මම කොයි යෙම්ද? ඉදින් මේ දසදහසක් යොදුන් දඹදිව මට ලැබෙන මුත් නුඹවහන්සේ ඇර කොයි යෙම්දැ?යි කියා ලගට අවුත් සිතන්නී "කකුළුවාට යාඥකොට ගලවා ගන්ට උවමැනවැ"යි සිතා කියන්නාහු "රන්වන් පෑයක් ඇති ඉතා මහත් වූ කකුළුවන්ට නායක වූ කර්කටක රාජය, නුඹට අයදිමි. මාගේ ස්වාමිපුත්‍ර වූ හස්තිරාජයා ඇරව"යි කියා යාඥ කළහ.

එකියන කකුළුවා ස්ත්‍රීයගේ යාඥ අසා "නාරින්ට කාරණා නොවෙයි" සිතා තමන්ට වන්නා වූ හානිය නොදැන අළුයේය. බෝධිසත්ත්වයෝත් තමන්ගේ පය ගෙන කකුළුවාගේ පිට පය තබා මැණ්ඩහ. ඒ වේලෙහිම කකළුවාගේ ප්‍රාණය පලා ගියේය. බෝධිසත්ත්වයෝත් සතුටු ව කුඤ්ච නාද කළහ. ඒ

කුඩක්ව නාදය ඇසූ ඇත්තු පෙරලා දියට අවුත් කකුළුවා ඇඳ ගොඩ ලාගෙන සුණුවිසුණුකොට මඩවාපූහ.

ඒ කකුළුවාගේ නළ දෙක වනාහි දියෙහි තිබුවාහ. ගංගා නම් ගඟත් එකියන කකුළුවා වසන්නා වූ විලත් සමීපහෙයින් වතුර ආ කල ගඟින් ඒ විලට හා විලින් ගඟට හා පැන් වදිනා හෙයින් වතුරෙන් ගොසින් ඒ නළ දෙක දියෙහි වැටී ගංගා නම් ගඟට වැටී ඉන් එක් නළයෙක් දියෙන් ගොසින් මූදට වැටින. ඒ වනාහි අසුරයෝ දැක තමන්ට උත්සවයට මිහිඟු බෙරයක් කොට සලස්වා ගත්තාහ. ශක්‍රයෝත් අසුරයන් පැරද යන ගමනේ දමාපුවා වූ මිහිඟු බෙරය දැක ශක්‍රයෝත් තමන්ගේ උත්සවයට ගසන්ට සලසා ගත්හ.

එක් නළයෙක් වනාහි දසබෑ රජ්ජුරුවන් ලෝ දැල් එලනා ගංගාවේ ආ කල ලෝ දැලේ බඳුනා ඇරගෙන තමන්ගේ උත්සවයට ගසන්ට මිහිඟු බෙරයක් කොට සලස්වා ගත්තාහයි වදරා මේ 'කර්කටක ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි එකියන ඇතිනී නම් මේ කියන ස්ත්‍රීයය. එසමයෙහි ඇත් රජ ව උපන්නෙමි බුදුවූ මම්ම ය"යි දක්වා වදාළසේක.

## 267. ආරාම දූසක ජාතකය

තවද මාගේ ගුරු වූ සර්වඥයන් වහන්සේ දක්‍ෂිණාපථයෙහි උයන්ගොව්වෙකු අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවාසය කොට වස් අන්තයේ දක්‍ෂිණ ජනපදයට වැඩිසේක.

දක්‍ෂිණා ජනපදයෙහි එක්තරා උපාසකයෙක් සතරපසයෙන් සර්‍වඥයන් පවරා දන් දී උයන පිළිගැන්විය. පිළිගන්වා “මේ උයනේ ඒ ඒ තැන වඩිනේ යහපතැ”යි කීය. එවිට භික්‍ෂූන් වහන්සේ උයන්ගොව්වා අත අල්වාගෙන ඒ ඒ තැන ඇවිදිනාසේක. එක් සිස් වූ ප්‍රදේශයක් දැක “මේ ස්ථානයේ මෙසේ වූයේ ඇයිදැ?”යි විචාරා “බලා උයන්ගොව්වෙකු විසින් මුල් බට නියාවට බල බලා පැන් වත්කරන්ට උවමැනවයි ගස්පැල උදුර උදුරා පැන් වත් කළේය. එසේ හෙයින් මේ ප්‍රදේශය මේ නියාවට විය”යි කීහ. ඒ කථාව සංඝයා වහනසේ සර්‍වඥයන්ට දැන් වූසේක. සර්‍වඥයෝ “එකියන උද්‍යානපාලයා පෙරත් උයන් නැසුවෝ වේදැ”යි වදරා “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි ඒ රජ්පුරුවන්ගේ උයන රකිනා උයන්ගොව්වා එතනට අවුත් නුවර උත්සවයක් විසින් තෙමේත් උත්සවයට යනු කැමතිව උයන ඉඳිනා වඳුරන්ට කියන්නේ “තොප ඇමටත් මේ උයන නිසා බොහෝ ලාභය, එසේ විසින් මම නුවර උත්සව කෙළපියා එනදැතුරෙන් උයනේ පැලෑටිගස් වලට පැන් වත්කරව”යි කීහ. එකියන වඳුරෝ “යහපතැ”යි ගිවිස උයන්ගොව් විසින් දෙනලද රැන්

හා දඬුකල ඇරගෙන ලිඳින් පැන් උකා පැලෑටිගස් වලට පැන් වත්කරන්නාහ. මේ නියායෙන් පැන් වත්කරන කලට එකියන වඳුරන්ට නායක වූ වඳුරා එතනට අවුත් “මේ නියායෙන් පැන් වත්කරන කලට පැනට හානි වෙයි, ඒ නියායෙන් මුල් බොහෝකොට බට ගසට බොහෝකොට පැන් වත්කරන්ට උවමැනවයි, මඳකොට බට ගසට මඳකොට පැන් උවමැනවයි ගස් උදුරා බල බලා පැන් වත්කරන්නා පැනට හානි නොවෙයි, මේ නියාවට බල බලා පැන් වත්කරන්නා යහපතැ”යි කීය. එකියන වඳුරෝත් “මුන් කීයේ ඇත්තම”යි ගිව්ස සමහර පැල උදුරා බලා සමහර පැල ඉඳුවා සමහරට පැන් වත්කොට යන්නාහ.

මේ නියායෙන් දවස් අරණ කලට නුවණැති බ්‍රාහ්මණයෙක් එතනට අවුත් වඳුරන් කරන්නා වූ ක්‍රියාව දැක කියන්නේ “තොපි ඇම මේ නියායෙන් පැල උදුරා පැන් වත්කරන කල ගස් නොමියේද? මේ උපාය තොපි ඇමට කිවෝ කවුරුදැ?”යි කීහ. එවිට වඳුරෝ කියන්නාහු “අපගේ අධිපති වානරයන් කීවාට කරම්හ”යි කිවූහ. බෝධිසත්ත්වයෝ “තොපගේ යූථපතියාණන්ගේ නුවණ මෙසේ කල තොප ඇමගේ නුවණ තමාම කියනුම කිම්දැ”යි කියා කීහ. ඒ අසා එකියන වඳුරෝ කියන්නාහු “බමුණානන් වහන්සේ කියන්නේ කිම්ද? අප කළේ නුවණ නැතිව කළ දෙයක් නොවෙයි. ගස්කොල නම් ප්‍රමාණය දැන පැන් වත් කළමනා වේදැයි සිතා ඒ නියාවට පැන් වත්කළම්මැ”යි කීහ. “බමුණානන් වහන්ස, අපට නින්ද කරන්නේ ඇයිදැ?”යි කියා කීහ.

එවිට බෝධිසත්ත්වයෝ කියන්නාහු “තොප හා තොපගේ වඳුරු මුලට මා කියන්නේ කිම්දැ?යි තොප ලවා පැන් වත්කර වන්නා වූ උන්ම නායක වූ රජ්ජුරුවන් වහන්සේටය, මා නින්දා කරන්නේය”යි කීහයි වදාරා මේ ‘ආරාම දූසක ජාතකය’ නිමවා වදාළසේක.

එකියන උයන් නැසූ වඳුරා නම් මෙකියන උයන්ගොව්වාය, ඒ කාරණය ප්‍රත්‍යක්‍ෂව කීවා වූ බ්‍රාහ්මණයා නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 268. සුජාත ජාතකය

තවද මාගේ මව් වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි සුමනා නම් සිටුදුවණියන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

ධනංජය සිටාණන්ගේ දූ වූ විශාඛා මහ උපාසිකාවන්ගේ නන් වූ සුජාතා නම් සිටුදියණියන් අනේපිඬු මහසිටාණන්ගේ පුතණුවන්ට විවාහ මඟුල්කොට ගෙනාහ. එකියන සුජාතාවෝත් ගෙට ආවක් පටන් ගෙයි වහල් හා කැටිවත් ස්වාමිපුත්‍රයා කැටිවත් අඬදබර කරන්නාහ. මේ නියායෙන් දවස් අරණා සමයෙහි සර්‍වඥයෝත් එක් දවසක් අනේපිඬු මහසිටාණන්ගේ ගෙට වළඳන්ට වැඩිසේක. අනේපිඬු මහසිටාණෝත් සර්‍වඥයන්

දන් වළඳමින් සිටි කලට එකියන සුජාතාවෝ ගෙයි වහල් හා කැටිව දබර කරන්ට වන්හ.

සර්‍වඥයෝ දබර කරන අඬ අසා "මේ කිමෙක්දැ?යි සිටාණෙනි" වදාළසේක. "ස්වාමීනි, මාගේ ගෙයි කළහකාරීය දන්නා ලෙහෙළියක් ඇත. ඕ තොමෝ තමාගේ ස්වාමිපුත්‍රයා කැටිවත් ගෙයි වහල් හා කැටිවත් කළහා කෙරෙයි, ඈ දබර කරන අඬය ස්වාමීන" කීහ. එබස් අසා සර්‍වඥහන් වහන්සේ සුජාතාවන් ලගට කැඳවා "සුජාතාවනි, තී විසින් තොපගේ ස්වාමිපුත්‍රයාට වධ කරන්නා මෙනි. පින්වත් සුජාතාවනි, ස්වාමිපුත්‍රයෙකුට අඹුවෝ සත් දෙනෙක් ඇත්තාහ. ඉන් තෝ කුමන අඹුදැ?"යි විචාරා වදාළහ.

එවිට සුජාතාවෝ කියන්නෝ "ස්වාමීනි, මම නොදනිමි" කීහ. එවිට සර්‍වඥයෝ කියන්නාහු "යම් ස්ත්‍රියක් තමාගේ ස්වාමිපුත්‍රයාට නැදි මයිලන්ට හා ගෙයි දසි දසයන්ට දස විට බැණ දෙඩා වාසය කෙරේ නම් ඒ ස්ත්‍රිය **වධක භාර්‍ය්‍යා** නම් වෙයි.

යම් ස්ත්‍රියක් ස්වාමිපුත්‍රයා ඉපද වූ සම්පත් අනියමින් තම සිත් සැටියේ වියදම් කෙරේ නම් ඒ ස්ත්‍රී **චෞර භාර්‍ය්‍යා** නම් වෙයි.

යම් ස්ත්‍රියක් ස්වාමිපුත්‍රයා නියාවට තොමෝ වැඩිතරම් සිට ස්වාමිපුත්‍රයා කීවා නොඅසා තොමෝ වාසය කෙරේ නම් ඒ ස්ත්‍රිය **අරිය භාර්‍ය්‍යා** නම් වෙයි.

යම් ස්ත්‍රියක් තමාගේ ස්වාමිපුත්‍රයාගේ අන්නපානාදී වූ දෙය දැන වැදූ මවක් යම්සේ තමාගේ පුත්‍රයකුට කැව්ලි පෙව්ලි ආදියෙන් ඉදුරා පිරිමසාද? ඒ නියාවට වාසය කරන ස්ත්‍රී **මාතු භාය්‍ර්‍යා** නම් වෙයි.

යම් ස්ත්‍රියක් තමාගේ ස්වාමිපුත්‍රයාට යම්සේ භය ලජ්ජා ඇතිව, නැගණී බුණණී කෙනෙකුන් මෙන් වාසය කෙරේ නම් ඒ ස්ත්‍රි **භගිනි භාය්‍ර්‍යා** නම් වේ.

යම් ස්ත්‍රියක් තම ස්වාමිපුත්‍රයාගේ ධන ධාන්‍ය රකිමින්, වර්ධනය කෙරෙමින්, නැදි මයිලන් උවටැන් කරමින්, ස්වාමියාගේ කර්මාන්ත වෘද්ධි කෙරෙමින් වාසය කෙරේ නම් ඒ ස්ත්‍රි **සඛී භාය්‍ර්‍යා** නම් වේ.

යම් ස්ත්‍රියක් තමාගේ ස්වාමිපුත්‍රයා තමා මරතත්, බණීතත්, දොඩතත් ඒ ඉවසා වාසය කෙරේද? ඒ ස්ත්‍රිය **දාසි භාය්‍ර්‍යා** නම් වෙයි” යනාදීන් අඹුවන් සත්දෙනාගේ කථාව සර්‍වඥයන් වහන්සේ වදාරන්නා එකියන ගාථා සත අවසානයෙහි දී එකියන සුජාතාවෝ දසක් නයින් ප්‍රතිමණ්ඩිත වූ සෝවාන් ඵලයෙහි පිහිටියාය.

එවිට සර්‍වඥයෝ වදාරනසේක් “එම්බල සුජාතාව, පුරුෂයන්ට යම් ස්ත්‍රියක් **වධක භාය්‍ර්‍යාව, චෞර භාය්‍ර්‍යාව, ආරිය භාය්‍ර්‍යාව** වාසය කළා නම් නරකාදිවල ඉපිද බොහෝ දුක් විඳිනාහ.

යම් ස්ත්‍රියක් **මාතෘ භාර්‍ය්‍යාව, භගිනී භාර්‍ය්‍යාව, සඛී භාර්‍ය්‍යාව, දාසි භාර්‍ය්‍යාව** වාසය කෙරේ නම් ඕහු වනාහී දිව්‍යලෝකයෙහි සම්පත් විඳිනාහ. තෙපි වනාහි මෙකියන උතුම් භාර්‍ය්‍යාවන් සතරදෙනාගෙන් කොයි භාර්‍ය්‍යාවන්ගේ ගුණයෙන් වාසය කරව්දැ?"යි විචාරා වදාළසේක.

එවිට සුජාතාවෝ කියන්නාහු "මාගේ ස්වාමිපුත්‍රයාට දාසි භාර්‍ය්‍යාව සිට වාසය කෙරෙමි" කීහ. එවිට සර්‍වඥයන් වහන්සේ "යහපතැ"යි කියා ජේතවනාරාමයට වැඩිසේක.

එක් දවසක් සංඝයා වහන්සේ දම්සභා මණ්ඩපයෙහි රැස්ව කථා කරනසේක් "යම්සේ සුජාතාවෝ සර්‍වඥයන් වහන්සේ වදාළ එක බසින්ම අවගුණයෙන් හැර නැමුනාහ. සර්‍වඥයනුත් එක බසින්ම සුජාතාවන් වූ නියාව යහපතැ"යි කියා මේ කථාව කිය කියා උන් තැනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා එපවත් අසා "පෙරත් එක බසින්ම තිබුයෙම් වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ ඒ රජ්ජුරුවන්ට පුත්ව ඉපිද ඒ රජ්ජුරුවන්ගේ අයාමෙන් රාජ්‍යයට පැමිණියාහ.

බෝධිසත්ත්වයන්ගේ මෑණියෝ කෝපීව වාසය කරන්නාහ. රජ්ජුරුවෝ "මාගේ මෑණියන්ගේ කෝපය කෙසේ සන්සිඳුවා

ගනිම් දේ හෝ''යි සිත සිතා හිඳිනාහු "යම් කාරණයක් දැක විනා නිකම් කාරණා කියන්ට බැරිය''යි සිතා කාරණයක් පරීක්‍ෂා කෙරෙමින් උන්නාහ. එක් දවසක් රජ්ජුරුවෝ තමන්ගේ මෑණියන් ඇරගෙන උයන් කෙළියට නික්මුණාහ.

ඒ වේලාවට එක් කෑරලෙක් උයනේ හිඳ ඇඬීය. ඒ අඬ අසා බොහෝ මනුෂ්‍යයෝ "අවලක්‍ෂණ පක්‍ෂියා ඇඬීය''යි කියා දෙකන වසා ගත්තාහ. ඉන් ඔබ්බට ගිය කලට කෙවිල්ලක ඇඬූ ශබ්දය අසා "යහපත් නියා ශබ්දයකැ''යි කියා සතුටු වූහ.

මේ අර්ථය දැන රජ්ජුරුවෝ "මෑණියන්ට කියන්ට කාරණයක් දිටිමි'' කියා කියන්නාහු "මෑණියන් වහන්ස, නපුරු ශබ්දය අසා සියල්ලවුන්ටම අප්‍රිය විය. යහපත් පක්‍ෂියාගේ ශබ්දය අසා සියල්ලවුන්ටම සන්තෝෂ විය. එසේ හෙයින් මෑණියන් වහන්ස, තද පරුෂ වූ බස් ඇර මධුර වූ බස් කිව මැනවැ''යි කියා ඒ බරණැස් රජ්ජුරුවෝ මෑණියන්ට අවවාද කීහ. එකියන මව් බිසවුන් පුතණුවන් කී එකී අවවාදය අසා තමන්ගේ තද පරුෂකම් අළහයි වදරා මේ 'සුජාතා ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි ඒ රජ්ජුරුවන්ගේ මව්බිසවු නම් මෙසමයෙහි මෙකියන සුජාතා නම් සිටුකුමාරිකාය, එසමයෙහි බරණැස් රජ ව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම ය''යි වදාළසේක.

# 269. කාකෝලූක (උලූක) ජාතකය

තවද මාගේ දෙව් වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කව්ඩන්ගේ හා බකමූණන්ගේ කථාව අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද? යත්,

ජේතවනාරාමයෙහි පිටිපස්සේ හිඳිනා භික්ෂු කෙනෙකුන් වහන්සේ දවස් පතා උදෑසන මළුව අමදිනා කල කව්ඩන්ගේ ඉස් නැලිය දෙනැලිය ඇමද දමනසේක. මේ නියායෙන් දවස්පතා කව්ඩන් උකා දමන හෙයින් එක් දවසක් ඒ භික්‍ෂූන් වහන්සේ දම්සභා මණ්ඩපයේ දී අනිත් භික්‍ෂූන් වහන්සේට එපවත් කීසේක. ඒ කථාව කිය කියා වැඩ උන් තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා ඒ භික්‍ෂූන් වහන්සේ "ස්වාමීනි, කව්ඩන් හා බකමූණන් කවර කලක පටන් උනුන් හා වෛර වූයේදැ?"යි කියා විචාළසේක. "මහණෙනි, ප්‍රථම කල්පයෙහිය"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස ප්‍රථම කල්පයෙහි මනුෂ්‍යයෝ තමන්ට රූපත් වූ පුරුෂයන් රජකමට තකා ගත්තාහ. සිව්පාවෝ සිංහයන් රජකමට තකා ගත්තාහ. මත්ස්‍යයෝ ආනන්ද නම් මත්ස්‍යයා

රජකමට තකා ගත්තාහ. පක්ෂී එකණෝහිම ගල තලක් මත්තේ රැස්වගෙන කියන්නාහු "මනුෂ්‍යයෝ තමන්ට රජකමට තකා ගත්තාහ. සිව්පාවෝ සිංහයන් රජකමට තකා ගත්තාහ. මත්ස්‍යයෝ ආනන්ද නම් මත්ස්‍යයා රජකමට තකා ගත්තාහ. ඒසේ විසින් අපටත් රජ්ජුරු කෙනෙකුන් උවමැනව"යි සිතා සෑම පක්ෂීන් එක්ව බකමූණෝකු රජකමට තකා ගත්තාහ. තකාගෙන "එකණෝහිම ගිවිස්සන්ට උවමැනව"යි උවමනා නිසා එක් පක්ෂියෙක් නැගීසිට "බකමූණාට රාජ්‍යය පැමිණීම එකෙණෝහිම ගිවිස්සේ ඇද්දැ?යි ගිවිස්සේ ඇද්දැ?"යි තුන්විටක් විචාළේය. දෙවිටක් විචාරාණ තුරු එකෙකුත් මුවෙන් නොබැණ උන්හ. එවිට එක් කවිඩෙක් සිතන්නේ "මුන් රාජ්‍යශ්‍රී ලත් සන්තෝෂයෙන් ඉඳිනා වූ මූගේ මූණ මෙසේ කල ඉදින් කෝපයක් වූ වේලේ මූණ මෙසේ බැලිය ඇද්දැ?"යි කියා සිතා පක්ෂීන්ට කියන්නේ "සිය ගෝත්‍රයෙහි උපන් පක්ෂීනි, මා කියන්නාක් ඇමදෙනම නොකිපී අසතොත් කියමි" කීහ එබස් අසා පක්ෂී කියන්නාහු "ඉඳින් බාල පක්ෂියෙක් වී නමුත් කටයුත්ත කියයි නම් එම වේද? කටයුතු, තොප දත් දෙයක් ඇත්නම් කියව"යි කීහ.

එවිට කවිඩූ කියන්නේ "මේ බකමූණා රාජ්‍යය ලද්ද වූ සන්තෝෂයෙන් ඉඳිනා වූ මුන්ගේ මූණ මෙසේ කල ඉඳින් කෝපයක් වූ නම් කකියා ගිය කබලේ ලූ තල සේ පක්ෂී ඒ ඒ තෙන ඉසිර පලා යන්නාහ"යි කියා "මුන් කෙරේ ඇලෙන්නේ නැත. එසේ හෙයින් බකමූණන් රාජ්‍යයට තැකීමට මා ගිවිස්සේ නැතැ"යි කියා ආකාශයට නැගී පලා ගියෝය.

එකියන බකමූණන් කවුඩු පස්සේම දිවගත. මේ නියායෙන් උන් දෙන්න පලා ගිය පසු සෙසු පක්ෂී එක්ව "කවුඩා කීයේ ඇත්තම"යි කියා බකමූණන් ඇර ස්වර්ණහංස පෝතකයෙකු රාජ්‍යයට තකා ගත්තාහයි වදරා මේ 'කාකොලූක ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි හංසපොතකව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 270. උදපාන (දූසක) ජාතකය

තවද මාගේම කරුණානිධාන වූ සර්වඥයන් වහන්සේ බරණැස් නුවර ඉසිපතනාරාමයෙහි වැඩවසන සේක් බොන භික්ෂූන් පරිහරණය කරන්නා වූ බොන පැන් ළිඳක් කසල කරන කැණහිලෙකු අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

එක්තරා කැණහිලෙක් බොහෝ භික්ෂූන් වහන්සේ බොන පැන් වළඳන්නා වූ ළිඳක් දැක ඒ ළිඳින් දවස්පතා ම පැන් බී ඒ ළිඳ කසල කරන්නේය. එක් දවසක් එකියන කැණහිල් බල්ලා දැක සාමණේර මහළුවරුන් වහන්සේ කැට කැබිලිති දමා ගසා එතනින් පහ කළසේක. උයිත් එවක් පටන් එතනට නොආවිරිය.

එපවත් දම්සභා මණ්ඩපයෙහි රැස් වූ මාළුවරුන් වහන්සේ කථාකොට කොට උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින්

යුක්තව උනුදැ?"යි විචාරා එපවත් අසා "මහණෙනි, දැන්මතු නොවෙයි, පෙරත් මෙකියන කැණහිල් මේ බොන පැන් ලිඳම කසල කළේ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බෝධිසත්ත්වයෝ එක්තරා කුලයක ඉපිද තාපස ව එම බරණැස් නුවර ඉසිපතනාරාමයේ බොහෝ තාපසවරුන් පිරිවරා වාසය කරන්නාහ.

එසමයෙහි මෙම කියන ලිඳ මෙම කියන කැණහිල් පැනුත් බී කසලත් කරන්නේය. එවිට තාපසවරුන් මළ බාන් ලා කැණහිලා අල්වාගෙන ගොස් බෝධිසත්ත්වයන්ට පෑහ. බෝධිසත්ත්වයෝත් එකියන කැණහිලා දැක කියන්නාහු "ඇයි, තා විසින් තාපසවරුන් පැන් බොන්නා වූ ලිඳ කසල කරන්නේ ඇයිදැ?"යි කීහ. එබස් අසා කැණහිල් කියන්නේ "තාපසයන් වහන්ස, මට කෝප නොකළ මැනව, අපගේ සත්මුත්තන් පරම්පරාවේ යම් තෙනකින් යමක් අනුභව කළමෝ නම් එතන කසල කිරීම අපට තිබී ආ ජාතිධර්‍මයහ. එසේ හෙයින් කෙළෙමි. මට කෝප නොකළ මැනව"යි කීහ.

එවිට බෝධිසත්ත්වයෝ "තොප ඇමගේ යාපතට ඇරගත් දේ මෙසේ කල නපුර තමාම වේදැ"යි කියා "අද පටන් තොපි මේ ලිඳ කසල කළා නම් දන්නවාදැ"යි කියා අළහ. එකියන කැණහිලා එතනට එන්නාක් නොකෙළේ යයි වදරා මේ 'උදපාන ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි තාපස ව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

## 271. ව්‍යාඝ්‍ර ජාතකය

තවද මාගේ මව් වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කෝකාලික ස්ථවිරයන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

මෙහි වර්ථමාන කථාව තෙළෙස් වෙනි නිපාතයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේයි, මෙහි වනාහි කෝකාලික ස්ථවිරයන් වහන්සේ වාසය කරන්නා වූ කෝකාලික ගම දෑගසව්වන් වහන්සේ කාටත් නොකියා වස් වැස සැවැත් නුවරට වැඩපූසේක. ඒ කෝකාලික ගම වසන්නා වූ මනුෂ්‍යයෝ කෝකාලික තෙරුන්වහන්සේට කියන්නාහු "දෑගසව්වන් වහන්සේ මේ ගම වස් වැස වැඩි නියාව අපට නොකීයේ ඇයිද? එසේ හෙයින් නුඹවහන්සේ ගොසින් දෑගසව්වන් වහන්සේ කැඳවාගෙන වඩිනේ යහපතැ"යි කීහ.

"යහපතැ"යි කියා කෝකාලික ස්ථවිරයන් වහන්සේ සැවැත් නුවරට ගොස් දෑගසව්වන් වහන්සේ කෝකාලික ගමට වඩිනා නියාවට ආරාධනා කළසේක. දෑගසව්වන් වහන්සේ "අප එන්නේ නැත, තොපි යව"යි නොගිව්සිසේක.

මේ කථාව දම්සභාවට රැස් වූ මාළුවරුන් වහන්සේ "කෝකාලික ස්ථවිරයෝ දෑගසව්වන් වහන්සේ එක් වත් ඉන්ද

නොදෙති. ඇරපියාත් ඉන්ද නොදෙති" කිය කියා උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා එපවත් අසා "දැන්මතු නොවෙයි, මහණෙනි, පෙරත් ඔහු එසේම වේදැ"යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ වෘක්ෂ දේවතාව උපන්නාහ.

ඒ අසල එක් වනයෙක සිංහයෙක් හා ව්‍යාඝ්‍රයෙක් වාසය කරන්නේය. ඔවුන් දෙදෙනා නිසා මනුෂ්‍යයෝ ඒ වනය නොකපා ඉන්නාහ. සිංහයා හා ව්‍යාඝ්‍රයාත් ඒ වනයෙහි ඉදිනා සිව්පාවුන් කා ඒ ඒ තැන කැබලි එලා තබන්නාහ. එසේ හෙයින් ඒ වනය කුණු මසින් ගඳව වනය මුලුල්ලම දුර්ගන්ධ විය. ඒ වනය වසන්නා වූ වෘක්ෂ දේවතාවා බෝධිසත්ත්වයන් කරා ගොස් එපවත් කියා "සිංහයා හා ව්‍යාඝ්‍රයා මෙතනින් පහකොට පුවෝත් යහපත, ඒ නියාවට පහ කරන්ටදැ?"යි විචාළේය.

එවිට බෝධිසත්ත්වයෝ කියන්නාහු "සිංහයා හා ව්‍යාඝ්‍රයන් වනාන්තරයේ ඉඳිනා නිසා මනුෂ්‍යයන් මෙකියන වනාන්තරය නොකපන්නේය. එසේ නැත්නම් සිංහයන් හා ව්‍යාඝ්‍රයන් මෙකියන වනාන්තරයෙහි නැති නියාව දත්තු නම් මෙකියන

වනාන්තරය කොටා පියා සේන්කොට ගන්නාහ. එසේ විසින් සිංහයා හා ව්‍යාඝ්‍රයාත් පහ නොකරව"යි කීහ. එසේ කීවත් ඒ දිව්‍යපුත්‍රයා බෝධිසත්ත්වයන් කීවා නොඅසා භයංකාර ශබ්ද පවත්වා සිංහයා හා ව්‍යාඝ්‍රයාත් පහකොට පීහ. මනුෂ්‍යයෝ සිංහ ව්‍යාඝ්‍රයන්ගේ පියවර නොදැක "සිංහ ව්‍යාඝ්‍රයන් ඔබ්බේ වනාන්තරයකට ගිය නියාවේදැ"යි සිතා ඒ වනාන්තරය එක් භාගයකින් කපා හෙළි කරන්නට වන්හ.

එවිට එකියන දිව්‍යපුත්‍රයා බෝධිසත්ත්වයන් කරා ගොස් "සබඳ, තොප කීවා නොඅසා මම සිංහ ව්‍යාඝ්‍රයන් පහ කෙළෙමි. සිංහ ව්‍යාඝ්‍රයන් වනාන්තරයේ නැති නියාව දත්තා වූ මනුෂ්‍යයෝ වනාන්තරය එළි කරන්ට වන්නාහ. මෙවිට කුමක් කරම්දැ?"යි කියා කීහ.

එවිට බෝධිසත්ත්වයෝ කියන්නාහු "සිංහ ව්‍යාඝ්‍රයන් ගියා වූ වනාන්තරයට තොපි ගොසින් පිළිවන් වීනම් ඔවුන් දෙදෙනාට ආරාධනාකොට කැන්දගෙන එව"යි කීය. දිව්‍යපුත්‍රයාත් ඔවුන් ගියා වූ වනාන්තරයට ගොස් දෙහොත් මුදුනේ තබා ඔවුන් දෙදෙනාට ආරාධනාකොට "මේ මම නොදැන තොපි හැම භය ගන්වා එළවා පීමි. ඒ මම නොදැන කළෙමි. මට ක්‍ෂමාකොට මා වසන්නා වූ වනයට එව"යි කීහ.

එවිට ඔවුහුත් එබස් අසා "තොප වසන්නා වූ වන්නරයට අපි නේම්මැ"යි කියා නාවාහුය. එකියන මනුෂ්‍යයෝත් ඒ

බැද්ද කොටා එලිකොට සේන් කොටා ගත්හයි වදරා මේ 'ව්‍යාඝ්‍ර ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි සිංහයා නම් සැරියුත් මහස්ථවිරයන්ය. ව්‍යාඝ්‍රයා නම් මුගලන් මහස්ථවිරයන්ය. එකියන වනස්පති දේවතා නම් කෝකාලික ස්ථවිරය. වෘක්‍ෂ දේවතා ව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

## 272. කච්ඡප ජාතකය

තවද මාගේ බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසනා සමයෙහි කොසොල් රජ්ජුරුවන්ගේ අමාත්‍යයන් දෙන්නෙකු අරභයා මේ ජාතකය දක්වන ලදි.

මෙහි වර්ථමාන කථාව ඒකක නිපාතයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ කසී ගමක බමුණු ව ඉපිද පඤ්චකාමයෙහි ආදීනව දැක හිමාලය වනයට වැද ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා ගඟක් සමීපයෙහි ධ්‍යානලාභී ව උපේක්‍ෂා පාරමිතාව පුරන්නාහ.

එවිට එක් දුශ්ශීල වානරයෙක් බෝධිසත්ත්වයන්ගෙ උරය පිට ඉඳ ශ්‍රොතයට දුශ්චරිත ක්‍රියා කරන්නේය. මේ නියායෙන් දවස අරනේය. බෝධිසත්ත්වයෝ උපේක්‍ෂා පාරමිතාව පුරණ හෙයින් එහි උපේක්‍ෂාව ඉඳිනාහ. ඒ අභ්‍යාසයට එක් දවසක්

දියෙන් ගොඩ නැගී අව්ව තැප තැප කට දල්වාගෙන වැදහෝනා ඉබ්බෙකු දැක "තාපසයන්ට කළා වූ ක්‍රියාව සේ කෙරෙමි" කියා ඉබ්බාගේ කටට දුශ්චරිත ක්‍රියා කළේය. එකල්හි ඉදිබුවා යහපත්කොට ඩෑගත. එවිට වඳුරු තමා බලවත් වේදනා වැදගත් හෙයින් ඉදුබා දෑතින් අල්වාගෙන "මේ මාගේ දුක්ඛය කවුරුන් ලඟට ගොස් අරවා ගනිම්දැ"යි සිතා "අනික් කාටත් බැරිය, උපේක්‍ෂා පාරමිතාව පුරන්නා වූ තාපසයන් කරා යෙමි" සිතා ඉඳුබුවා වඩාගෙන බෝධිසත්ත්වයන් කරා ගියේය.

බෝධිසත්ත්වයන් ඒ වඳුරා දැක "මේ කිම්ද? භික්‍ෂා පාත්‍රයක් වඩාගෙන එන්නා වූ තාපස කෙනෙකුන් මෙන් කිම්දැ?"යි විචාළාහ. එවිට එකියන වානරයා කියන්නේ "තාපසයන් වහන්ස, මා විසින් යහපත් දෙයක් දේ හෝයි සිතා මේ ඉබ්බාගේ කටට දුශ්චරිත කෙරෙමි සිතා මෙහෙයීමි. ඔහු වනාහී ඩෑ ගත. මම් වනාහී බලවත් වේදනා පත් වී ඒ වේදනාවෙන් මා මිදුවොත් යහපතැ"යි කීය.

එවිට තාපසයෝ ඉදුබාට කියන්නේ "මේ කියන වඳුරු මෛථුන ක්‍රියාවෙහි තෘෂ්ණාව බලවත් හෙයින් මොහු සිත සිතා දුෂ්‍යකම් කළේය. තොයිත් ඌ සේම අඥාණයෙක්ද? ඇරපියව"යි කීහ. එවිට ඉදුබාත් බෝධිසත්ත්වයන් කී නියායෙන්ම ඇරපියා එකියන වඳුරුත් තමාට පැමිණි දුක්ඛය තාපසයන් නිසා මිදුනු හෙයින් එවක් පටන් එසේ වූ අධර්මයක් නොකළේයයි වදාරා මේ 'කච්ඡප ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි ඉදුබා හා වඳුරා නම් මේකියන අමාත්‍ය දෙදෙනාය. උපේක්‍ෂා පාරමිතාව පිරූ තාපසයෝ නම් බුදුවූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 273. ලෝල ජාතකය

තවද මහපොළොව සේ විසාරද වූ ගුණ ඇති සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ලෝභී භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

සිව්පසයෙහි ලෝභී වූ භික්ෂු කෙනෙකුන් වහන්සේ සර්‍වඥයන් වහන්සේ කරා ගෙනගොස් දැක් වූසේක.

එවිට සර්‍වඥයෝ "සැබෑද? මහණ, තා සිව්පස ලෝභීය"යි විචාරා වදාරා "සැබැව, ස්වාමීනි" දන්වන්නා "මහණෙනි, මෙකියන භික්ෂූහු පළමුත් ලෝභිකම නිසා උත්තම ව තමන් වසන්නා වූ ස්ථානයෙත් ඉන්ද නුහුනුවෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර සිටාණන්ගේ ගෙයි අරක්කැමියා පින් පිණිස පක්ෂීන්ට ඇවිත් ඉදිනා නියායෙන් පෙට්ටි වියා එල්වන්නේය. බෝධිසත්ත්‍වයෝත් පරවිය ඉපිද එකියන අරක්කැමියා විසින් එල්වනලද පෙට්ටියක වාසය කරනසේක.

එක් දවසක් කපුටුවෙක් මුළුතැන්ගෙයි උඩින් පියඹා යන්නේය. මච්ඡමාංශ ගන්ධය ඉවසාගත නොහී "මුළුතැන්ගෙට කෙසේ වැදහෙම් දෝ හෝ"යි සිතා උන. බෝධිසත්ත්වයෝත් "ගොදුරු කන්ටය"යි පිටත් උනාහ.

එකියන කපුටුවා බෝධිසත්ත්වයන් පස්සේ පියඅඹා යන්ට වන. බෝධිසත්ත්වයෝත් "ඇයි? සබඳ කපුටුවාණෙනි, තොප හා එක්ව අප ගොදුරු කන්නේ නැත. තොපි මා හා කැටිව ගොදුරු බිමට එන්නේ ඇයිදැ?"යි විචාළසේක. එවිට කපුටු කියන්නේ "පරවියාණන් වහන්ස, නුඹවහන්සේගේ ගොදුරු කැවිලි හා වාසය මටත් අභිප්‍රාය, එසේ හෙයින් නුඹවහන්සේට සේවාකම් කරන්ට ආමි" කීහ.

එබස් අසා පරවියාණෝ "යහපතැ"යි කියා උං සමග ගොදුරු කන්ට ගියාහ. පරවියාණන් ගොදුරු කා දී තෙමේ ගොසින් ගොම ටිම්බක් තුඩින් ඉරා පණුවන් කා බඩ පුරාගෙන පරවියාණන් ලඟට අවුත් යහපත්ව තව දක්වා ගොදුරු කන නියාවද "තමාගේ සය ඇදින කන්ට අවුදැ"යි කියා පරවියාණන් කැටිව ගොදුරු කා කැටිවම වාසස්ථානයට ගියේය. එවිට අරක්කැමියාත් "අපගේ පරිවියාණෝ තමන් සහය වූ කව්ඩෙකු ඇරගෙන ආව"යි කියා එකියන කව්ඩාට ඉන්ටත් එක් පෙට්ටියක් වියලා බැඳලීය. ඒ පෙට්ටියේ කව්ඩා වාසය කෙරෙයි. මේ නියායෙන් කීප දවසක් වාසය කළ කල එක් දවසක් එකියන සිටාණන්ගේ ගෙට බොහෝ දඩමස් ගෙනාවාහුය.

එදවස් එකියන කව්ඩාත් "මාත් එමින් යම්සේ මාංශයක් කන්ට උවමැනවැ"යි සිතා උන්හ. පරවියාණෝ ගොදුරට යෙමින් සිට "ඇයි? කව්ඩාණෙනි ගොදුරු කන්ට එව"යි කියන්නා "ස්වාමීනි, ඊයේ මා කෑවා වූ ගොදුරු නොදිරුණ අජීර්ණව බඩරුජා ගන්ට වන, මම අද නේමි" කීහ. එවිට පරවියාණෝ කියන්නෝ "තොපි කුමක් කියව්ද? කව්ඩන් නම් එළඟි තෙලින් ඇඹරූ පාන්කඩක් කැවීමට බඩ සුඟක් තිබී දිරණ පමණක්, සෙසු යම් ගොදුරක් උගුරෙන්පාත ගිය විටම නොදිරා තිබේද? කව්ඩන්ටත් අජීර්ණයෙක් ඇතිව බඩරුජා ගණීදැ?"යි කීහ. "ඒ එසේමය, එසේද වුවත් මට රුජා දැඩිය. මම අද නේමි" කීය.

එවිට පරවියාණෝ "තා මේ මච්ඡමාංශ නිසාය කියන්නේ, සිටාණන් වහන්සේගේ මච්ඡමාංශ ඉඳුල් නොකරව, ඉඳුල් කෙළෙහි නම් තට බොහෝ විනාශ පැමිනෙන්නේය"යි කීහ. මෙසේ අවවාද කියා පරවියාණෝ ගොදුරු කන්ට ගියහ. එවිට අරක්කැමියාත් මච්ඡමාංශ පිස පණත්කොට තිබා ඇඟ ඩා නිවන්ට පිසන ගෙන් පිටතට ගොස් සිටියේය. ඒ වේලාවට කව්ඩා "මේ මච්ඡමාංශ කන්ට අවකාශය"යි මාළු පිස වසා තුබූ බඳුනක් මත්තේ උන්නේය. උෟ ඉඳිනා වස්න 'ක්‍රිං' යන ශබ්ද විය. එවිගස අරක්කැමියා අසා ගෙට අවුත් කව්ඩා අල්වාගෙන ඇඟ පියාපත් සිඳ කුඩිඹියක් තබා ලුණු මිරිස් අඹරා කාඩිගා ඇඹුල් දියෙන් අනා ඇඟ ගල්වා කපුටුවා ඉඳිනා පෙට්ටියට දැමූහ. පරවියාණෝ ගොදුරු කා එතනට අවුත් කව්ඩා දැක වෙහෙසා කියන්නාහු "කෙකින්න, අපගේ

සබඳ කව්ඩා ඉන්නා මැදිරියේ තොප උන්කල තොපට නොදෙඩා උඟු එන්නාට පළමුකොට වහා පලා යව''යි කීහ. එබස් අසා කව්ඩා කියන්නේ ''ස්වාමීනි, මම කෙකින්නක් නොවෙමි. නුඹවහන්සේ වදාළ අවවාද නොගිව්ස මච්ඡමාංශයෙහි තෘෂ්ණාව උපදවා ලෝභයෙන් මච්ඡමාංශ කන්ට ගොසින් අරක්කැමියා මා අල්වාගෙන මට කළ ගැහටය''යි කීහ.

එවිට පරවියාණෝ ''මා කීවා නොගිව්ස මේසා දුක්ඛයට පැමිණියේය. ඉනිබ්බේ මින් මිය පරලොව ගිය කලත් නරකාදී දුක්ඛයට පැමිණෙන්නේ වේදැ''යි කියා ''මමත් මෙතන උන් කල අරක්කැමියා මා කෙරෙහි සැක උපදව''යි කියා එතනින් පියාසරකොට ඔබ්බකට නැගී ගියහයි වදාළසේක.

මේ බණ අවසානයෙහි භික්ෂූන් වහන්සේ අනාගාමී ඵලයෙහි පිහිටිසේක. පූර්වාපර සන්ධි ගළපා මේ 'ලෝල ජාතකය' නිමවා වදාළසේක.

''එසමයෙහි ලෝභි කව්ඩා නම් මේ ලෝභී භික්ෂූහුය. පරවි ව උපන්නේම් බුදුවූ මම්ම ය''යි වදාළසේක.

# 274. දූලූසි (රුචිර) ජාතකය

තවද මහමුහුද වූ ගුණ ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් ලෝභී භික්ෂු කෙනෙකුන් වහනසේ අරභයා මේ ජාතකය දක්වන ලදි. මෙහි

වර්ථමාන කථාවත් අතීත කථාවත් දෙකම පළමු කී ජාතකය මෙනි.

# 275. කුරුධම් ජාතකය

තවද මහමෙර සේ ස්ථිර වූ සාරගුණ ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් අකුරක් ගසා හංසයෙකු මැරූ භික්ෂුවක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ කෙසේද? යත්,

එම සැවැත් නුවර යාළුවෝ දෙදෙනෙක් ශාසනයෙහි මහණ ව උපසම්පදාව ලදින් බොහෝ සේ උනුන් නොහැර එක්ව ම ඇවිදිනාහු අචිරවතී නම් ගංගාවට ගියාහු නාපියා අව්ව තැප තැප පුරාතන කථාවන් කිය කියා වැල්ලේ සිටියාහ. ඒ ඇසිල්ලෙහි ආකාශයෙන් යන්නා වූ හංසයන් දෙන්නෙකු දැක දෙන්නාගෙන් කුඩා මහණ කියන්නේ "තෙළ හංසයන් දෙන්නාගෙන් එකෙකු ඇසකට අකුරකින් ගසමි" කීහ. අනික් මහණ කියන්නේ "තොපට බැරිය"යි කීහ. "එසේ වීනම් බැළුව මැන, මා දසාවේ ඇසට ගහන්ට ආශ්චර්‍ය්‍යය කිම්ද? අෑ ඇලයේ ඇසට ගසමි" කීහ. අනික් මහණ "තොපට බැරිය"යි කීය. නැවතත් "එසේ වීනම් බැලුව මැනවැ"යි කියලා තුනැස් අකුරක් අල්වාගෙන හංසයාගේ පශ්චාද් භාගයට ගසාලීය. යන්නා වූ හංසයා අකුර බුරාගෙන යන අඬ අසා නැවත පෙරලා බැලීය. ඒක්ෂණයෙහි වට අකුරක්

ගසාලීය. ඒ අකුර ගොස් ඇලයේ ඇසින් වැද තමා දසාවේ ඇසින් නාගාපීය.

හංසයාද අඬාගෙන පා පිට වැටී ගියේය. ඒ ස්ථානයෙහි සිටි භික්ෂූහු දැක ඔහු සමීපයට අවුත් "කිමෙක්ද? ඇවත මේ නියා වූ බුදුසන්නෙහි මාහණ ව නොකළමනා ප්‍රාණවධ කෙළේ යුත්තෙක් නොවේ"යි කියා ඔහු නොකමැති කරවාගෙන ගොස් බුදුන්ට දැන් වූහ. ඒ අසා බුදුහු වදාරනසේක් "මහණ, තා ප්‍රාණඝාත කළේ සැබෑදැ?"යි විචාරා වදාළසේක.

ඒ භික්ෂූන් විසින් "සැබැව, ස්වාමීනි" කී කල්හි "මේ නියා නෛර්යාණික බුද්ධශාසනයෙහි මහණ ව සිට කිසි භයක් නැතිව මෙබඳු ප්‍රාණවධ කළේ සුදුසු නොවේ"යි වදාරන බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළසේක. "පුරාතනයෙහි නුවණැත්තාහු අබුද්ධොත්පාද කාලයෙහි පවා ගිහිගෙයි වසන්නාහු ඉතා ස්වල්ප වූ නොකළමනා සැප නූපදවා විසුවෝ වේදැ"යි වදාරා "දැන් තෝ වූකලී කිසි භයක් නොකළේ වේදැ"යි වදාරා "එම්බල මහණ, පැවිදි වූවහු විසින් කාය, වාක්, මනඃ යන වාරත්‍රයෙන්ම සිහි ඇතිව විසුවෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ භවයෙන් ප්‍රතිච්ඡන්න වූ ඉකුත්වත් කථාව ගෙනහැර දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස කුරු රට ඉඳිපත් නුවර ධනංජය නම් රජ්ජුරුවන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ ගත්සේක.

දසමස් පිරී මව් කුසින් බිහිව සඳමඩල සේ වැඩී සත්ඇවිරිදි වයසට පැමිණ තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරීන් කෙරෙහි නුවණැතිව සියළු ශිල්ප ඉගෙන නිමවා අවුත් පියරජහු විසින් යුවරජ තනතුරෙහි සිටුවනසේක් කල්යාමකින් පියරජහුගේ ආයාමෙන් රාජ්‍යයට පැමිණසේක් දශ රාජධර්මයෙන් යුත්තව (කුරුධර්ම ජාතකයෙහිදී) වාසය කරනසේක.

එසේ වසන්නා වූ බෝධිසත්ත්වයන් වහන්සේ අඛණ්ඩකොට පඤ්චසීලය රක්නාහු බෝධිසත්ත්වයෝ මතු නොවන්නාහුය. “ඔවුහු කවුරුදැ”යි යත් රජ්ජුරුවෝය, රජ්ජුරුවන්ගේ මෑණියෝය, අගමෙහෙසුන් බිසවිය, යුවරජ්ජුරුවෝය, පුරෝහිත බමුණාය, යටුවම් කරන අමාත්‍යයාය, රථාචාරියාය, සිටාණෝය, බඩසැලමනන අමාත්‍යයයා, දෙරටුපාලයාය, ඒ නුවර රූපශ්‍රීන් හොබවා ඇවිදිනා වෛශ්‍යයා මෙසේ කියන එකොළොස් දෙන කුරුධර්ම යයි කියන ලද පඤ්චශීලය අඛණ්ඩකොට රක්නාහ. රජ්ජුරුවෝද නුවර වාසල්දෙර, නුවර මධ්‍යයෙහිය, රජගෙය දෙරකඩය යන මේ ස්ථානයෙහි සතර දන්හල් කරවා දවස සලක්ෂයක් බැගින් ධන වියදම්කොට දඹදිව සියළු සත්ත්වයන්ගේ නගුල් උඩ බඳවා සියළු යාචකයන්ට දන් දෙන්නාහුය. මෙසේ දන්දෙන ඒ

රජ්ජුරුවන්ගේ දානාධ්‍යාශයත් දන් දෙන නියාත් අඛණ්ඩකොට සිල් රක්නා නියාත් සියළු දඹදිව පැතිර ගියේය.

එසමයෙහි කලිගු රට දන්තපුර නුවර කලිගු රජ්ජුරුවන් රාජ්‍යය කරන සමයෙහි උන්ගේ රට බදමානයෙහි වැසි නොවැස, දුර්භික්‍ෂා භය උපන. නුවර විපත්තිය නිසා මනුෂ්‍යයන්ට රෝග භය උපන. දුර්භික්‍ෂ භයින් මළා වූ සත්ත්වයන් නිසා අමුනුෂ්‍ය භය උපන. මේ තුන් භය නිසා මනුෂ්‍යයෝ දුක්ඛිතව ගොසේ රැකී ගන්නා කිසිම උපායක් නොලදීන් දරුබිළිඳුන් අත් අල්වාගෙන ප්‍රේතයන් සේ ඇත මෑත ඇවිදිනාහ.

මෙසේ සියළු නුවරවාසීහුද එක්ව සඳවක් රාජාංගනයෙහි රැස්ව ශබ්ද පවත්වා කොලාහළ කළාහ. සිව්මැදුරු කවුළුව සමීපයෙහි සිටියා වූ රජ්ජුරුවෝ ඒ කෝලාහළ අසා "කුමන කෝළාහලයෙක්දැ?"යි විචාළාහ. ඒ අසා සිටිය වූ අමාත්‍යයෝ කියන්නාහු "මහරජ්ජුරුවෙනි, මේ ජනපදයෙහි තුන් භයෙක් උපනැ"යි රටට වූ විපත්තිය තත් වූ පරිද්දෙන් කීවාහ.

රජ්ජුරුවෝ එපවත් අසා "ඊට මා විසින් කුමක් කටයුතුදැ?"යි අමාත්‍යයන් අතින් විචාළාහ. "මහරජ, වැසි වස්වා දුර්භික්‍ෂ භය සන්සිඳුව මැනවැ"යි කීහ. "මෙසේ භය පැමිණි කල පුරාතනයෙහි රජදරුවෝ කෙසේ වැසි වස්වද්දැ?"යි කීහ. "මහරජ, දන් දී සිල් රැක ගර්භ ගෙවල හී තන ඇතිරියෙහි සත් දවසක් සැතපී වැසි වස්වති" කීහ.

රජ්ජුරුවෝ 'යහපතැ'යි ගිවිස කී ලෙසම පේවස් වසැත් වැසි වස්වාගත නුහුනුවාහ. රජ්ජුරුවෝද දෙවෙනිවත් අමාත්‍යයන්ට කියන්නාහු "මම කළ මනායක් පරිත්‍යාගකොට සිල් සමාදන්ව පේවස වැසත් වැසි වස්වාගත නුහුණු යෙමි. නැවත කුමක් කෙරෙම්දැ?"යි කීහ.

අමාත්‍යයෝ කියන්නාහු "මහරජ්ජුරුවෙනි, ඉඳිපත් නුවරට යවා ධනංජය කොරව්‍ය රජ්ජුරුවන්ගේ අංජනොපම වූ මංගල්‍ය හස්තියෙක් ඇත. ඒ ඇතුන් ගෙන්වා ගන්නාහා ම වැසි වසිති" කීහ. රජ්ජුරුවෝ චතුරංගිනි සේනාවෙන් හා පඤ්ච ප්‍රකාර බලයෙන් යුක්ත මහබල ඇති රජ්ජුරුවෝය. උන්ගේ ඇතු කෙසේ ගෙන්වමෝදැ?"යි කීහ. "ඒ මහරජ්ජුරුවන් හා යුද්ධ කළ මැනවැයි නැත ඒ රජ්ජුරුවෝ දන් දීමෙහි ඇළුම් ඇති කෙනෙක, ඉඳින් යමක් ඉල්ලු කෙනෙක් ඇත්නම් තමන්ගේ හිස ව් නමුත් කපා දෙන්නාහ. මෙසේ තමන්ගේ පස් පෑ දිස්නා ඇස් උපුටා දන් දෙන්නාහ. තමන්ගේ රාජ්‍යය ඉල්ලුවත් දෙන්නාහ. ඒ ඇතුගේ දෑ කියනු කිම්දැ?"යි කීහ. "එසේ කල ඇතු ඉල්වා ගෙනෙන්ට සමර්ථයෝ කවුරුදැ?"යි කීහ. "ඉල්වන්ට සුරුවුවෝ නම් බමුණෝය. බමුණන් යවා ගෙන්වාගත මැනවැ"යි කීහ.

එසේ වීනම් "යහපතැ"යි කියා රජ්ජුරුවෝ බමුණන් අටදෙනෙකු ගෙන්වා ගෙන උන්ට නොයෙක් සම්පත් දී සිත් ප්‍රීති කරවා "ඇතු ඉල්වා ගෙන එව"යි කියා බමුණන් යවූහ. ඔහු අටදෙන සියළු ප්‍රසාද ලදින් තුටුපහටු සිත් ඇත්තාහු

බැගෑපත් බමුණන්ගේ දුගී වෙස් මවාගෙන දෙපැයක් තෙනක නොලැග ඉඳිපත් නුවරට පැමිණ වාසල්දෙර දන්සැලින් කීප දවසක් දන් කා සැතපී මාර්ග පීඩාව සන්සිඳුවාගෙන "රජ්ජුරුවන් දන්හලට එන්නේ කවරදදැ?"යි විචාළාහ. මනුෂ්‍යයෝ කියන්නාහු "මසකට තුන් වාරයෙක වඩනාසේක. පුරපසළොස්වකය, තුදුස්වකය, අටවකය ඉනුත් සෙට පුරපසළොස්වකය, දන්හල බලන්ට වඩනාසේකැ"යි කීහ. බමුණෝ දෙවැනි ද උදෑසන ගොසින් නැගෙණහිර වාසල්දෙර සිටියාහ.

බෝධිසත්ත්වයන් වහන්සේ උදෑසනම සුවඳ පැන් සොළොස් කළයකින් ඉස් සෝධා නහා නොයෙක් රසයෙන් අග්‍ර වූ භෝජන අනුභවකොට සඳුන් සුවඳ ආදී වූ නොයෙක් ආභරණයෙන් හා ඔටුනු සහිත සූසැට ආභරණයෙන් ශක්‍රදේවේන්ද්‍ර විලාශයෙන් සැරහී රන්සැත් පොරෝදු ආදී වූ සියලු හස්ත්‍යාලංකාරයෙන් සරහන ලද සර්වාලක්‍ෂණ සම්පන්න වූ හස්තිරාජයා පිටට පැන නැගී චතුරංගිනි සේනාවෙන් හා ආතත, විතතාදී වූ නොයෙක් ඝෝෂාවෙන් නුවර එක නින්නාද කරමින් නැගෙණහිර වාසල්දෙරට වැඩ ඇතු පිටින් බැස දන්හල් වැද නායක බමුණන් කීප දෙනෙකුට තමන්වහන්සේ අතින් දන් දී ලා "මේ මා දුන් ලෙසට දන් දෙව"යි කියාලා ඇතු පිටට නැගී දකුණු වාසල්දෙරට වැඩිසේක. බමුණෝ නැගෙණහිර වාසල්දෙර රැකවල් බලවත් හෙයින් රජ්ජුරුවන් දැක ගත නොහී දකුණු වාසල්දෙරට ගියාහු. එන්නා වූ රජ්ජුරුවන් බල බලා නුදුරු තෙනක සිටියාහු ආසන්න වූ

මහතාණන්ට බමුණෝ අටදෙන අත් ඔසවාලා "ආයුරස්තු, බලමස්තු, සමාධිරස්තු, නිර්ව්‍යාධිරස්තු, භගවාන් ප්‍රියදර්ශනමස්තු" යනාදීන් ආශිර්වාද කොට සිටියාහ.

රජ්ජුරුවන් වහන්සේත් ඔවුන් දැක වජ්‍රාංකුශයෙන් ඇතු නවතා උන් සමීපයට ගොසින් "පින්වත් වූ බමුණානනි, කුමක් නිසා කුමක් සොයා අවිදැ?"යි විචාරා වදාළසේක.

බ්‍රාහ්මණයෝ බෝධිසත්ත්වයන්ගේ ගුණ වර්ණනා කරන්නාහු මේ කුරුධර්ම ජාතකයෙහි පළමුවන ගාථාවෙන් මෙසේ කියතළුඃ "මහරජ්ජුරුවෙනි, නුඹවහන්සේ අඛණ්ඩකොට රක්‍ෂා කරන කුරුධර්ම නමැති පඤ්චසීලය දහම් දුක්පත් යාචකයකු ඉල්වත් නොදෙන්සේක් දේ හෝයි සැකකොට ඉල් වූ යම් සම්පතක් නැත. නොදෙමි කියා කියන කීමෙක් නැත. දෙතියි කියන කීර්ති ඝෝෂාවද දස දහසක් යොදුන් දඹදිව මුදුපිට ඉසළුඃ තෙලිත්තක් සේ සියළු දිග පැතිර ගියා සේ ප්‍රසිද්ධ ව ගියේය. එහෙයින් නුඹවහන්සේගේ ඇතු ඉල්වාගෙන ආම්හ"යි කීහ. "අපගේ කලිගු රජ්ජුරුවන්ගෙන් බොහෝ වස්තු ලදුම්හ. එබැවින් අප ලත් සම්පත අපට තාවුරු වන ලෙස තෙළ ඇතු අපට දේවා වදාළ මැනවැ"යි කීහ.

ඒ අසා බෝධිසතාණෝ වදාරණසේක් "තෙපි ඉඳින් මේ ඇතු නිසාම වස්තු ලදු නම් ඒ ලත් දෙයම යහපත, මා විසින් පෙර පටන් ආ කෙනෙකුන්ට නැතැයි කියා නැති, අතැයි කියා නොදෙන ලදද නොවෙති. නොසිතුව මැනැව, මේ සත්රුවනින් විසිතුරුකොට සරහන ලද සියළු

හස්ත්‍යාලංකාරයෙන් සැරහුවන් ම දෙමි” කියා බමුණාන් අස්වසාලා වදාරණසේක් “රාජ වාහනයට යෝග්‍ය වූ මේ මාගේ හස්තිරාජයා තනිකොට මා දෙතියි නොසිතුව. මේ ඇතු පළමු පිරිමසා සිටි ඇත්වෙදුන්, ඇත්ගොව්වන්, පන්නයන් ආලත්ති බාන්නාවුන්, මුල්වේරියන් මේ ආදී සියලු කර්මකාරයන්ද ඕහට පළමුකොට තබා දුන් වුත්ති යන සියළු සනුමානයෙන් කිසිවකුත් අඩු නොකොට නොයෙක් කුලයෙන් සියගණන් මිනිසුන් සමුල්ල පාවා දෙමි. ඒ සියල්ලනුත් හස්තිරාජයාත් ඇරගෙන තොපට කැමති තෙනකට යව”යි ඇතු පිටම ඉඳ කියාලා ඇතු පිටින් බැස පියා “ඇතුගේ නොසැරුනු තෙනක් ඇත්නම් සරහාලා දෙමැ”යි සිතා ඇතු වට තුන් විටක් පැදකුණු කොට බලනසේක් නොසැරුහු තෙනක් නොදැක ඇතු සොඬ ගෙන බමුණාන් අත පිට තබා සුවඳ පැන් පිරුණු සවර්ණාභිංකාරය ගෙන්වාගෙන බමුණාන් අත පැන් වත්කොට ඇතු දන් දී වදාළසේක.

ඒ ඇතු දන් දුන් නියාවට උපමා කියත් මතු වෙස්සන්තර කල පුලස්ති නම් හස්තිරාජයා මෙසේම ආ බමුණාන්ට දන් දීමට පූර්ව නිමිත්ත පානාක් වැන්නැයි සිතමි. බමුණෝ පිරිවර හා සමග ඇතු දන් ලදින් ඇතු පිට හිඳ දන්තපුරයට ගොසින් තමන්ගේ රජ්ජුරුවන්ට ඇතු පාවා දුන්නහ. ඇතු නුවරට ගෙන ගියත් වැසි නොවටුයේමය. ඒ වේලෙහි රජ්ජුරුවෝ “ඊට කාරණා කිමිදැ?”යි විචාළාහ. අමාත්‍යයෝ කියන්නාහු “ධනංජය කොරව්‍ය රජ්ජුරුවෝ කුරුධර්ම කියති. එසේ හෙයින් උන්ගේ රටට වැසි වස්නේය. වැලිත් සෙස්සකින්

නොවෙයි, රජ්ජුරුවන් රකිනා කුරුධර්මයෙහි ආනුභාවයෙන්, ඇතුගේ බල මතු නොවේ''යි කීහ.

එවේලෙහි රජ්ජුරුවෝ එබස් අසා "එසේ වීනම් තෙල ඇතු සැරහුන්ම උගේ පිරිවර සමග වහා ගෙනගොස් රජ්ජුරුවන්ට ඇතු පාවාදීලා ඒ රජ්ජුරුවන් රක්‍ෂා කරන කුරුධර්මය තෙල රන්පත ලියවාගෙන එව''යි බමුණන් හා අමාත්‍යයන් යැවූහ.

ඔහු ගොස් රජ්ජුරුවන්ට ඇතු පාවා දෙවාලා නැවත කියන්නාහු "දේවයන් වහන්ස, මේ ඇතු ගෙන ගොසිනුත් අපගේ රටට වැසි නොවටුවේමය. නුඹවහන්සේ කුරුධර්මය රක්නාසේක්ල, ඒ නිසාම ඉඳිපත් නුවරට වැසි වස්නේ වේද? අපගේ රජ්ජුරුවන් වහන්සේටද ඒ කුරුධර්මය ලියා දෙනු මැනවැ''යි අයැදියේය. එවිට ධනංජය කෞරව්‍ය රජු කියන්නේ "දරුවන්, කුරුධර්මය රකින්නේ සැබෑය, එහෙත් දැන් මට ඒ සැක කෙරේ''යි කීහ. "එසේ හෙයින් ලියා දෙන්ට නොපිළිවනැ''යි කීහ.

රජ්ජුරුවන් එහි සැක උපදවන්ට කාරණ කිම්ද? යත්, එසමයෙහි රජ්ජුරුවෝ අවුරුද්දක් අවුරුද්දක් පාසා කාර්තික නැකත යයි යන මහසැණකෙළියක් ඇත. එදවස් රජ්ජුරුවෝ සියළු අලංකාරයෙන් සැරහී දිව්‍යරාජ වේශයෙන් චිත්‍රරාජයා යයි යන නමැති යක්‍ෂයෙකු සමීපයෙහි සිට සුවඳ මලින් විසිතුරුකොට සරහන ලද මල් හී සතරක් සතරදිග විදිනාහ. මේ වූ කලී බොහෝ කලක් රජදරුවන් විසින් කොට එන

චාරිත්‍රයෙකි. මේ රජ්ජුරුවන් වහන්සේත් එසේම සැණකෙළි කෙළිනා දවසෙක පොකුණු තෙරක චිත්‍රරාජයා සමීපයෙහි සිට සතරදිග මල් හී සතරක් විදපිසේක.

ඒ සතර හීයෙන් තුන් හීයෙක් දුටුහ. දියපිට විදපි හීය නොදැක සිතනසේක් "කිම්දෝ මා විසින් විදිනා හීය දියෙහි විදුනා මසකු ඇඟ වැදගත් දෝ හො"යි සැක උපදවා ගත්සේක. "එසේ හෙයින් ප්‍රාණවධය නිසා සීලය භේද වී නමුත් මට සැක කෙරෙයි. එබැවින් මාගේ සිත ගැටුනේ"යි කියා "දරුවෙනි, පළමු අඛණ්ඩකොට මා කුරුධර්ම රක්නේ සැබැව, දැන් මට මේසා සැකයෙක් ඇතැ"යි පිළිවෙළ වූ පරිද්දෙන් දූතයන්ට කියලා "අපගේ මෑණියන් වහන්සේ කුරුධර්මය මනාකොට රක්‍ෂා කරනසේක. ඔබ සමීපයෙන් ලියවාගෙන යව"යි වදාළසේක.

එබසට දූතයෝ කියන්නාහු "මහරජ, නුඹවහන්සේ සතෙකු මැරුව මැනවැයි යන සිතක් නැතිව එසේ කල නුඹවහන්සේට ප්‍රාණාතිපාතය සිද්ධ නොවෙයි. අපට කුරුධර්ම ලියා දුන මැනවැ"යි රන්පත ලියවා ගත්හ.

කුමක් සේ ලියවා ගත්තුදැ?යි යත්, **පාණො න හන්තබ්බො, අදින්නං නාදාතබ්බං, කාමෙසු මිච්ඡා න චරිතබ්බා, මුසා න භනිතබ්බා, මජ්ජං න පාතබ්බන්ති** මෙසේ ලියවාලා සිට වදාරනසේක් "තව ද මා පිට සැක මහත, අපගේ මෑණියන් වහන්සේ අතිනුත් ලියවා ගණුව"යි කියා යවුසේක.

නැවත බෝධිසත්ත්වයන් වහන්සේ වැඳ බිසවුන් වහන්සේ සමීපයට ගොසින් "දේවියන් වහන්ස, නුඹවහන්සේ කුරුධර්මය රක්‍ෂා කරනසේක්ල, අපට දුන මැනවැ"යි කීහ. "දරුවනි, මා කුරුධර්මය රක්නේ සැබෑව, දැන් මට එහි සැකයක් උපන, එබැවින් මට ඒ දෙන්ට නොපිළිවනැ"යි කීහ. කුමක් පිණිසද? යත්,

බිසවුන්ගේ පුත්තු දෙන්නෙක් ඇත්තාහ. ඉදින් වැඩිමහළු පුතණුවෝ නායක රජ්ජුරුවෝය. කුඩා පුතණුවෝ යුව රජ්ජුරුවෝය. අනික් රටකින් රජ්ජුරු කෙනෙක් බෝධිසත්ත්වයන්ට ලක්‍ෂයක් වටනා හඳුන් හරකුත් දහසක් වටනා රන්මාලාවකුත් පාක්කුඩම් පිණිස එවූහ. බෝධිසත්ත්වයන් වහන්සේ "ඒ වසතු දෙක තමන්වහන්සේගේ මෑණියන් වහන්සේට පූජා කරමි"යි කියා ඔහුට දෙවාපිසේක. එද බිසවුන් වහන්සේ මෙසේ සිතූසේක. "මම සඳුනුත් නොගාමි, මාලාවත් නොපළඳිමි, මාගේ යෙහෙළින් දෙන්නාට දෙමි" සිතාලා නැවත මට මෙසේවූ අදහසක් වුයේය. "මාගේ වැඩිමහල් යෙහෙළනියෝ සොළොස් දහසක් බිසෝවරුන්ට නායක ව රජ්ජ්රුවන්ට අගමෙහෙසුන්ව මා ඓශ්වර්‍ය්‍යයෙහි පිහිටා සිටියාහ. උන්ට දහසක් වටිනා මාලාව දී පියමි. කුඩා යෙහෙළනියෝ වනාහි අරුන් සේ උඟ සුවපත් නොවෙයි, උන්ට ලක්‍ෂයක් වටිනා සඳුන් හරය දී පියමි" සිතා දී පියා සිට නැවත සිතන්නාහු "මම කුරුධර්මය රක්‍ෂා කෙරෙමි. උන් දෙන්නා දුක්පත් කීම්, සුවපත් කීම්, වයසින් උන් උන්ගේ තරම් ලෙස වේද? සංග්‍රහ මැනවැ"යි සිතා වැඩිමහළු

යෙහෙළනියන්ට දහසක් වටිනා රන්මාලාව දී කුඩා යෙහෙළනියන්ට ලක්‍ෂයක් වටනා සඳුන් හරය දුන්නේය. "අයුක්තිය කුමක් දේ හෝ මාගේ කුරුධර්‍මයට අන්තරායක් වී දේ හෝ යි සැක උපදවා ගත්සේක. එසේ හෙයින් කුරුධර්‍මය දරුවෙනි, ලියා දෙන්ට සැක කෙරෙමි" කීහ.

ඒ අසා දූතයෝ කියන්නාහු "තමා සන්තක වස්තු තමා කැමති තෙනකට දෙති, එපමණකින් සීලය භේද නොවෙයි, නුඹවහන්සේ මෙපමණක පවා සැක ඇතිසේක. අනික් කුමක් නම් කරනසේක්ද? නුඹවහන්සේගේ සීලය ඉතා පිරිසිදුය, ඉතා නිර්මලය. එබැවින් අපට නුඹවහන්සේත් කුරුධර්‍මය ලියා දුන මැනවැ"යි කීහ. ඔබගෙනුත් ලියවා ගත්හ.

ඉක්බිති බිසවුන් වහන්සේ කියනසේක් "දරුවෙනි, මා සිත සැක ඇත. මාගේ යෙහෙළනියෝ යහපත්කොට කරුධර්‍මය රකිති. ඔබ ගොසින් ලියවා ගණුව"යි කීහ.

දූතයෝ බිසව සමීපයට ගොසින් පළමු පරිද්දෙන්ම ඉල්ලුවා සේ කුරුධර්‍මය ඉල්ලුවාහ. ඒ අසා බිසව් කියන්නාහු "මා පළමුකොට කුරුධර්‍මය රක්නේ සැබෑය. දැන් මට එහි සැකයෙක් ඇත. එසේ හෙයින් දෙන්ට නොපිළිවනැ"යි කීහ. ඒ කවරේදැ?යි යතහොත්,

එක් දවසක් බිසව් සිව්මැදුරු කවුළුව සමීපයෙහි සිටියාහු ඒ නුවර පැදකුණුකොට යන රජ්ජුරුවන් පසුකුඹයේ උන් යුවරජ්ජුරුවන් දැක පිළිබඳ සිත් ඇතිව සිතන්නාහු "මම ඉදින් සහවාසයෙන් එක් සිත්ව විසීමි නම් මතු රජ්ජුරුවන්ගේ

ආයාමෙන් රාජ්‍යයෙහි පිහිටියේ වීනම් මා අගමෙහෙසුන් තනතුරේ තබා රකියි" සිතූහ. "එසේ හෙයින් මම කුරුධර්‍මය රකිමින් සිට සස්වාමික ව කෙලෙසුන් වසඟ ව අනුන් සන්තක පුරුෂයා මූණ බැලීමි. එසේ හෙයින් මාගේ සීලයට අන්තරාය වී දේ හෝයි සැක කෙරෙමි"යි "එබැවින් ලියා දෙන්ට නොපිළිවනැ"යි කීහ.

ඒ අසා දූතයෝ කියන්නාහු "ස්වාමි දියණියෙනි, අනාචාර නම් සිතින් සිතූ පමණකින් සිද්ධ නොවෙයි, නුඹවහන්සේ මෙපමණක පවා සැක උපදවන දැද? මෙපමණකින් සීල භේදය නොවෙයි, ලියා දුන මැනවැ"යි උන්දැගෙනුත් කුරුධර්‍මය රන්පත ලියවා ගත්හ. ලියා දී සිට කියන්නාහු "කුඩාවරුනි, මා සිත සැක ඇත. යුවරජ්ජුරුවෝ යහපත්කොට කුරුධර්‍මය රක්‍ෂා කෙරෙති. උන්දෑ සමීපයට ගොස් කුරුධර්‍මය ලියවා ගණුව"යි කීහ.

දූතයෝ උන් සමීපයට ගොස් "කුරුධර්‍මය අපට ලියවා දුන මැනවැ"යි කීහ. යුවරජ්ජුරුවෝ කියන්නාහු එක් දවසක් පෙරවරු රාජසේවයට යන්නාහු රථයකින් ගොසින් රාජාංගනයට පැමිණ රජගෙයි දී කා රජගෙයි ලගිත් නම් රථයට දෙන බාන් ආදී වූ රථෝපකරණ රථය ඇතුලේ ලවාපියා රජගෙට වදනාහ. ඒ සලකුණෙන් සේනාව සිතන්නෝ "යුවරජ්ජුරුවෝ අද රජගෙයින් කා බී එහිම ලගිනාහ"යි කියා සියළු සේනාව තම තමන්ගේ ගෙවල් ලැග පාන් වූ කල

අවුත් රජගෙයින් ඒ රජ්ජුරුවන් පිටත් වන්ට කවරවිට දෝ හෝයි පෙරමඟ බල බලා සිටිනාහ.

රථාචාරියා දෙවන දවස් රථය සරහාගෙන පෙරමග බල බලා සිටිනේය. ඉදින් රජ්ජුරුවන් වහන්සේ දැන් දැකපියා එම් සිතා රජගෙට වදිනාසේක් වීනම් ඒ කැට බාන් ආදී වූ රථොපකරණා පිටත තබා වඩනාසේක. ඒ සලකුණෙන් සියළු සේනාව "දැන් දැන් වඩිනාසේකැ"යි රථය සරහා රාජාංගනයෙහි එකසීම සිටිනාහ. එක් දවසක් රථයෙන් මෙම ලෙස ගොසින් රාජාංගනයට බැස දැන්ම එම් යන සිතින් මෙතෙක් දවස් කර සංඥාව සේනාවට නොහඟවා රජගෙට වැඩියාහ. ඒ ඇසිල්ලෙහි මහා මේඝයක් නාගා වසින්ට පටන් ගත. රජ්ජුරුවෝ වැසි වස්නා දැක "නොයව"යි කියා යුවරජ්ජුරුවන්ට සමු දුන්හ. ඒ වේලෙහි රජ්ජුරුවෝ රජගෙයි දී ම කා බී රජගෙයිම සැතපුනාහ. කැටිව ගිය සේනාව "දැන් එනසේකැ"යි පෙරමඟ බල බලා සිටියාහු තුන් යම් රාත්‍රියෙහි සිටිවනම සිට පහන් කළහ. ඒ රජ්ජුරුවෝ දෙවැනි දවස් පාන් වූ කල රජගෙන් පිටත් වූවාහු සේනාව තෙම් තෙම් සිටියා දැක "සීලයට අන්තරාය වූ සැටිය"යි සිතින් සැක උපදවා ගත්හ. එසේ හෙයින් දුතයන්ට කියන්නාහු "මා පළමු කුරුධර්‍මය රක්නේ සැබෑව, දැන් එය වනාහි සැකයෙක් ඇත තොපට ලියා දෙන්ට නොපිළිවනැ"යි මේ කාරණාය වූ පරිද්දෙන්ම කීහ.

ඒ අසා දූතයෝ කියන්නාහු "දේවයන් වහන්ස, නුඹවහන්සේ මේ සේනාව මෙසේ වූ පීඩාවකට පැමිණෞවයි සිතා කළ දෙයක් නොවන පසු නුඹවහනසේගේ සීලයට අන්තරාය නොවෙයි, මෙපමණක පවා සැක උපදවන ලද සීලය ඉතා පිරිසිදුය, අපට කුරුධර්‍මය ලියා දුන මැනැවැ"යි කියා උන්ගෙනුත් කුරුධර්‍මය රන්පත ලියවා ගත්තාහ. ලියා දී කියන්නාහු "මා සිත සැකයෙක් ඇත්මය. පුරෝහිත බමුණානෝ යහපත්කොට කුරුධර්‍මය රක්‍ෂා කෙරෙති. උන්ගෙන් ලියවා ගනුව"යි කීහ.

දූතයෝ උන් සමීපයට ගොසින් කුරුධර්‍මය උන්ගෙනුත් ඉල්වූහ. උයිත් තමන්ටම උපන් සැකය කියන්නාහු එක් දවසක් රාජසේවයට යන්නේම අනික් රටකින් අපගේ රජ්ජුරුවන් වහන්සේට පාක්කුඩම් පිණිස එවන ලද ළහිරු මඬලක් සේ ඉතා සෝභමාන වූ රථවාහනයක් අතරමග දී දැක "මේ රථය කාගේදැ?"යි විචාරා "රජ්ජුරුවන් වහන්සේට ගෙනා රථයකැ"යි අසා සිතන්නාහු "මම වයෝවෘද්ධයෙමි. අපගේ රජ්ජුරුවෝ රථය මට දීපු නම් සුව සේ රථයට නැගීගණ ඇවිදිනෙම් වේදැ"යි සිත සිතා ගොසින් රජ්ජුරුවන් වහන්සේ ලග සිටියාහ. එපමණකින් රථය එවිටම ගෙනවුත් රජ්ජුරුවන්ට දැක් වූහ. රජ්ජුරුවෝත් "රථය ආචාරීන්ට දෙව"යි කියා කීහ. පුරෝහිතයාණෝ නොයිවසූහ. නැවතත් "අරගණුව"යි කීවත් නොගිවිස්සේමය. කුමක් හෙයින්ද? යත්,

"මා කුරුධර්මය රක්නා තැනැත්තාහු අනුන් සන්තක වස්තුවෙහි ලෝභය ඉපදවූයේ ඉතා නපුර, මාගේ සීලය බිඳුනු සැටිය"යි මෙපමණක් සඳහන්කොට පියා "කුඩාවරිනි, මාගේ සීලයෙහි මෙබඳු සැකයෙක් ඇත, එබැවින් දෙන්ට නුපුළුවනැ"යි කීහ. එබසට දූතයෝ කියන්නාහු "යමකට ලොභ කළ පමණකින් සිල් බිඳෙන්නේ නොවෙයි, නුඹවහන්සේ මෙපමණක් පවා සැක කරනසේක් අනික් පවක් කරනසේක්දැ"යි කියා උන්ගෙනුත් කුරුධර්මය රන්පත ලියවා ගත්හ. "තවද මට එකී සැක ඇත්තාවූ යටුවම් කරන අමාත්‍යාත් යහපත්කොට කුරුධර්මය රක්‍ෂා කරන්නේය. ඔහුගෙනුත් කුරුධර්මය ලියා ගනුව" කියා යවූහ.

උයිත් තම සිත උපන් සැකයක් කියන්නාහු එක් දවසක් තමන්ගේ ජනපදයේ කෙත් යටුවම් කරන්නාහ. කෙත මනන්නා වූ රැන කෙළවර කුඹුර ඇති තැනැත්තවුට දීලා අනික් කෙළවර තුමූ අල්වාගෙන තමන් දිසාවේ රැන කෙළවර බැඳළූ දඬ එක් කකුළුවෙකුගේ බිල මධ්‍යයට පැමිණ සිටියේය. ඒ වේලෙහි තුමූ සිතන්නාහු "ඉදින් මේ දඬ කෙළවර කකුළුවාගේ බිලයට බහාලීම් නම් ඒ බිලයේ කකුළුවා මියන්නේය. මේ රැනෙන් කෙළවර මඳක් ඉවත්කොට එලාලම් නම් රජ්ජුරුවන් සන්තක බිම අඩු වන්නේය. නැවත ඇතුළුවිට එලාලිම් නම් කුඹුරු හිමි තැනැත්තහුට අඩු වන්නේය. කුමක් කෙරෙම්දෝ හෝ"යි සිත සිතා "මේ බිලයේ කකුළුවා ඇත්නම් නියම දැනපුව මනාවේදැ"යි සිතා දඬු කෙළවර බිලයට බහාළුහ. ඒ වේලේ කකුළුවා 'ක්‍රිං' යන

ශබ්ද පවත්වා අඬාලිය. එවේලෙහි තමන්ට මෙසේ වූ අදහසක් වූයේය. "දණ්ඩ කෙළවර කකුළුවා ඇඟ ඇනී මිය ගියේ වීනම් මා රක්නා වූ කුරුධර්මයෙහි සැක ඉපද වීමි. එබැවින් දෙන්ට නොපිළිවනැ"යි කීහ.

ඒ අසා දූතයෝ කියන්නාහු "තොපගේ සිත කකුළුවා මරමි සිතා කළ දෙයක් නොවෙන බැවින් එපමණකින් ප්‍රාණවධය සිද්ධ නොවෙයි. මෙපමණක් පවා සැක කරන්නා තෙපි අනික් පවක් නම් කවර කලෙක කරවුද? තොපගේ සීලය ඉතා පිරිසිදුය. තොපගේ කුරුධර්මය අපට දෙව"යි කියා උන්ගෙනුත් කුරුධර්මය රන්පතක ලියවා ගත්හ. "තවද මට එහි සැක කෙරෙති යි එම්බල රථාචාරියාණෝත් කුරුධර්මය රක්‍ෂා කරන්නේ යයි උන් ලඟට ගොසිනුත් ලියවා ගනුත් යහපතැ"යි කීහ.

ඒ දූතයෝ ගොසින් ඔහු අතින් "කුරුධර්මය අපට ලියවා දුන මැනවැ"යි ඉල්වූහ. උයිත් කියන්නාහු "කුරුධර්මය මා රක්‍ෂා කරන්නේ සැබෑව, මෙයිදු සැකයෙක් ඇතැ"යි කියා ඒ සැකය කියන්නාහු එක් දවසක් පෙරවරු රජ්ජුරුවන් රථයෙන් උයනට වඩාගෙන ගියෙමි. රජ්ජුරුවොත් දවල් දවස උයන් කෙළි කෙළපියා සවස නික්ම රථයට නැගුනාහ. රථයෙන් අවුත් නුවරට නොවදනා තුරු හිරු හස්තයට ගියේය. ඒ ඇසිල්ලෙහි වැස්සෙක් නැගීය "රජ්ජුරුවන් වහන්සේ තෙමෙනසේක් දෝ හෝ"යි භයින් රථය අදනා හසුන්ට තරව කැවුටු සන් දී භය ගන්වා ලුහුබඳවා ලීමි. රථාශ්වයෝ කුමක්

බවත් නොදන්නාහු වහ වහා දිවයත්හ. එතැන් පටන් උයනට යන කලත් එතනට පැමිණි කලත් කැවුටු සන් දුන්නත් නුදුන්නත් වහ වහා දිවන්නාහ. ඒ තිරිසන් සත්ත්වයෝ කුමක් නිසා මෙලෙස දිවන්නේදැ?යි යතහොත්, “ඒකාන්තයෙන් එතන භය කටයුතු නිසි කාරණයක් ඇතැ”යි සිතා අසු දිවන්නාහ. මම හසුන් භය ගන්වන පිණිස කල දෙයක් නොවෙයි, එදවස් රජ්ජුරුවන් තෙමුනැයි මට වරදක් නැත, මම අස්ථානයෙහි දී ඉතා සුසික්ෂිත අසුන්ට තරව කැවිටි සන් දී භය ගන්වා කොටළු නොදැන්ම නිසා එතනට ආ යම් විටකම ඒ ස්ථානයහිම කුමක් නිසා වූ භයෙක් දේ හෝ වහවහා දිවෙමින් පීඩාවට පැමිණෙති. “මම කුරුධර්මය රක්නා තැනැත්තෙමි. මේ කාරණය නිසා මාගේ කුරුධර්මය නැමති සීලය දෙන්ට බැරිය”යි කීහ.

ඕහට දූතයෝ කියන්නාහු “මෙපමණකට පවා මෙසේ සැක කරන්නාහු අනික් පවක් කෙසේ කරව්දැ?”යි උන්ගෙනුත් කුරුධර්මය රන්පතක ලියවා ගත්හ. “එසේ වී නමුත් තව සැක ඇත. මෙනුවර සිටාණෝ අඛණ්ඩකොට කුරුධර්මය රකිති. උන්ගෙනුත් ලියවා ගණුව”යි කීහ.

දූතයෝ සිටාණන් ලගට ගොස් “නුඹ රක්නා කුරුධර්මය අපට දුන මැනවැ”යි ඉල්වූහ. සිටාණෝ කියන්නාහු එක් දවසක් මම ඇල්කෙත උඩුදරා බිම් යන්නේ මාගේ කෙත්වත් බලාපියා නැවත ගෙට එන්නෙමි “මේ ඇල් කරලින් මාලාවක් සේ ගොතා බඳවා ගණිමැ”යි සිතා එකම කරල් මිටියක්

ගන්වා ගතිමි. ඒ දවස් පටන් මෙසේ වූ අදහසක් මට වූයේය. “ඒ ඇල්කෙත රජ්ජුරුවන්ටත් මටත් අඳයට කළ දෙය. එසේ වූ තැනින් අනුන් සන්තක කරල් මිටක් මා ගෙන්වාගන ලදින් එය මා විසින් රක්‍ෂා කරන්නා වූ කුරුධර්‍මය නැමති සීලයට අන්තරායව් දේ හෝයි කියා මා සිත සැක උපන. එබැවින් මාගේ කුරුධර්‍මය මට දෙන්ට නොපිළිවනැ”යි කීහ.

දූතයෝ කියන්නාහු “සිටාණෙනි, නුඹ සොර සිතින් කල දෙයක් නොවන හෙයින් මෙපමණක් නිසා අදින්නාදානය සිද්ධ නොවන්නේය. මෙපමණක සැක උපදා වන්නාවූ නුඹවහන්සේ අනික් පවක් නම් කෙසේ කරනසේක්ද? නුඹවහන්සේගේ සීලය ඉතා පිරිසිදුය”යි කියා උන්ගෙනුත් කරුධර්‍මය රන්පතක ලියවා ගත්හ. “එසේ වී නමුත් මට සැක ඇත, බඩසල් මනන්නා වූ අමාත්‍යයෝ යහපත්කොට කරුධර්‍මය රක්‍ෂා කෙරෙයි. ඔහු ලගට ගොස් කරුධර්‍මය ලියවා ගනුව”යි කීහ.

දූතයෝ ඔහු සමීපයට ගොස් “නුඹ රක්නා කුරුධර්‍මය අපට දුන මැනවැ”යි කීහ. ඒ මනන්නෝද තමන් සිතට උපන් සැක කියන්නාහු එක් දවසක් කොටු ගෙයි දෙර ඉඳ රජ්ජුරුවන්ගේ භාණ්ඩාගාරයට වී මනන්නාහු නොමිනි වීත් ගෙන සන්ලුවාහ. වී මැන නොනිමෙන තුරු වැස්සෙක් වසින්ට පටන් ගත. අමාත්‍යයා මිනු වීයෙහි සන් ගැන “මෙතැකැ”යි කියා මා සන්ලු වී අසවල් වීයයි සලකුණක් නොකොට වීයෙහි එක්කොට සිහිනැතිව වෙරයතුරාලා පිය වහා දිවගෙන ගොසින් හිඳ සිතන්නාහු “සන් ළූ මිනු වීයෙහි එක් කෙළෙම්

නම් නොමිනු වීයෙහි එක් කෙළෙම් දෙ හෝ”යි සිතා “මිනු වීයෙහි එක් කෙළෙම් නම් රජ්ජුරුවන් වහන්සේගේ වී වඩනේය. සිටාණන්ගේ වී නස්නේය. වැලිත් මම කුරුධර්මය රකිමි. මාගේ ගුණ ධර්මය බිඳිනී දේ හෝයි සිතා මෙපමණක් නිසා මම කුරුධර්මය දෙන්ට බැරියයි කියෙමි”යි කීහ.

ඕහට දූතයෝ කියන්නාහු “තොපගේ සොර සිතක් නැත. මේ පමණකින් අදින්නාදානය සිද්ධ නොවෙයි, මෙපමණකට මෙසේ සිතන නුඹට අනික් කවර දවසෙක පාපයක් සිදුවී”දැයි කියා උන්ගෙනුත් කුරුධර්මය ලියවා ගත්හ. “එසේ වී නමුත් මට සැක ඇත. මේ නුවර වාසල බලන දොරටුපාලයා යහපත්කොට කුරුධර්මය රක්‍ෂා කෙරෙයි. ඔහු ගෙනුත් ලියවා ගණුව”යි කීහ.

අමාත්‍යයෝ ගොසින් ඔහු ගෙනුත් “කුරුධර්මය දුන මැනවැ”යි ඉල්ලූහ. ඒ තෙමේ එක් දවසක් වාසල්දොර වසන්නේ මෙතෙක් දවස් සේම තුන්විටක් අඬගා කියා දොර වසන්ට සිටි කලට ඒ නුවර එක් දිළිඳු මිනිසෙක් තමාගේ බාල නගක් කැඳවාගෙන වල දර පළා සොයා ගියාහු. නැවත අවුත් හඬ ගෑ ශබ්දය අසා නැගණියන් කැඳවාගෙන වහා අවුත් වාසල් දොරට පැමිණ “දොර ඇරපියව”යි කීව. උන්ට දොරටුපාලයා කියන්නේ “තෝ තමා මේ නුවර රජ්ජුරු කෙනෙකුන් ඇති නියා නොදනුද? කල් තබා වාසල අගුල ලන නියාව දැන දැන තාගේ අඹුව ඇරගෙන වල කෙළ ඇවිද පියා දැන් ඉඳ කුමකටද ඇයිදැ”යි කීය. ඒ දුගියා කියන්නේ

"ස්වාමීනි, එසේ නොකිව මැනව, මාගේ බිරින්දයෙක් නොවෙයි, මාගේ නැගණියෝය"යි කීහ. දොරටුපාලයාද එවේලෙහි සිතන්නේ "තමා අකාරණයෙක මෙලෙස කීව"යි සිතා "මා විසින් නොකිවමනා බසක් කියා පීමි. ඔහුගේ නගා ඔහුගේ අඹුව යයි නො දැන කීමි. මම වූ කලී කුරුධර්‍මය රකිමි. මේ කාරණය නිසා මාගේ කුරුධර්‍මය බිඳිනැයි මට සැක ඇත. ලියා දෙන්ට නොපිළිවනැ"යි කීහ.

දූතයෝ කියන්නාහු "තොපි උන්ගේ නගා නියාව දැන දැන කී දෙයෙක් නොවන හෙයින් තොපගේ සීලය භේද නොවෙයි, මෙපමණක පවා සැක කරන්නාහු අනික් වරදක් කෙසේ නම් කරවුද? ඉන් අපට දැනුනු වරදෙක් නැතැ"යි කියා උන්ගෙනුත් කුරුධර්‍මය රන්පතක ලියවා ගත්හ. "එසේ වී නමුත් මාගේ සිත සැක ඇත. මෙනුවර වසන්නා වූ වෛශ්‍යා දූ යහපත්කොට කුරුධර්‍මය රකිනීය, ඔබ ගොසින් උන්ගෙනුත් ලියවා ගනුව"යි කීහ.

උන් ලඟට ගොසින් "කුරුධර්‍මය අපට දුන මැනවැ"යි කියා ඉල්වූහ. ඒ වෛශ්‍යා දූත් තමා සිතට උපන් සැකයක් කියන්නී "මටත් සැකයෙක් ඇත. දෙන්ට නොපිළිවනැ"යි කීහ. ඒ කවරේදැ?යි යතහොත්, මේ වෛශ්‍ය දුව යහපත්කොට කුරුධර්‍මය රක්නා නියාව ශක්‍රයෝ දැන තමන් ඉඳුරා පරීක්‍ෂාකොට පියන පිණිස ඈ සමීපයට ළදරු වූ පුරුෂ වේසයක් මවාගෙන මසුරන් දහසක් දීලා තමාගේ දිව්‍යලෝකයටම පලා ගියේය. උඟ ගිය තැනැත්තෝ තුන්

අවුරුද්දක්ම නොඅවාහූය. ඒ වෛශ්‍යා දූ තමාගේ සීලයට අන්තරාය වේදෝ යන භයින් තුන් අවුරුද්දක් මුලුල්ලෙහි අනික් පුරුෂයකු අතින් මස්සක්, අකක්, තබා බුලත් පතක් පමණකුත් නොගත්තීය. ඕ තොමෝ දවසින් දවස අය මුඛයෙන් නැතිව ඇති දෙය වියදම් වීමෙන් තමාගේ ඇති සම්පත්තිය වියදම් වීමෙන් පිරිහී දුක්පත් ව ගොස් සිතන්නී "මට දහස දීලා ගිය පුරුෂයා දැන් තුන් අවුරුද්දක්ම නොආයේය. එසේ හෙයින් මම ඉතා දුක්පත්ව දැන් මාගේ බඩ පමණකුත් පැදගත නොහෙමි. මෙසේ ඉඳ නස්නට නොපිළිවන. අධිකරණ නායකයන් ලගට ගොස් මේ බව කියා දවස් හැර ගැන්ම යහපතැ"යි සිතා අධිකරණයට ගොස් "මුදලිවරිණි, මට මසුරන් දහසක් දීලා පුරුෂයෙක් ගියේය. මෙවකට තුන් අවුරුද්දක් උන් මළ බවත්, උන් බවත් නොදනිමි. එබැවින් බැහැරින් මා ලැබ ගන්නා දෙයක් නැති බැවින් දැන් බඩ පමණකුත් පැදගත නොහෙමි. කුමක් කෙරෙම්දැ?යි කීහ. "උන් තුන් අවුරුද්දක් නොආ කල කුමක් කරවුද? මෙතැන් පටන් ලත් දෙයක් ඇරගෙන රැකෙව"යි කීහ.

අධිකරණයෙන් වර ලදින් නික්ම යන තැනැත්තියට එක් පුරුෂයෙක් දහසින් බැඳි පියල්ලක් දික් කොටලීහ. ඒ ඇරගන්ට යයි අත දික්කරන්නා ම ශක්‍රයෝ අවුත් ඉදිරියෙහි සිටියාහ. එවේලෙහි වෛශ්‍යා දූ කියන්නී "මෙතනට යටගිය දවස තුන් අවුරුද්දකින් ඔබ්බෙ මට දහසක් දීලා ගිය පුරුෂයා අවුත් සිටිනේය. තාගේ රණින් මට ප්‍රයෝජන

කිම්දැ?''යි කියා දික්කල අත අයා ගත්තහ. එවේලෙහි ශක්‍රයෝ තමන්ගේ දිව්‍යාත්ම භාවයෙන් සර්‍වාභරණයෙන් සැදි පැහැදී ළහිරු රැස්ව ගියාහ. එවේලෙහි නුවරවාසීහු රැස්ව ගියාහ. ශක්‍රයෝ ජන සමාගමෙහි කියන්නාහු "මම මෑ විමසන පිණිස තුන් අවුරුද්දකින් ඔබ්බේ මැට මසුරන් දසක් දීලා ගියෙමි. මේ දෑතුරෙහි මෑ රක්නා කුරුධර්‍මයෙහි මා දුටු කිසි අඩුවෙක් නැත. එබැවින් සිල් රක්නවුන් විසින් මෙලෙස රැක්ක යුතුය''යි කියා සියල්ලවුන්ට අවවාද දීලා ඇගේ ගෙය සත්රුවනින් පුරා "මෙවක් පටන් නොපමාව සීලය රක්‍ෂා කරව''යි උන්ට අවවාද කියා තමන්ගේ දිව්‍යලෝකයට ගියාහ. ඕ තොමෝ මේ කාරණය නිසා "එකකුගෙන් ගත් අල්ලස් නොවරදවා අනිකකු දික්කල වස්තුවට අත දික් කෙළෙමි. මේ කාරණය නිසා මා රක්නා සීලය නැසී ගියා දෝ හෝයි සිතා නොදෙමි'' කීහ. එවේලෙහි ඈට දූතයෝ කියන්නාහු "අත දික්කළ පමණින් සිල් බිඳී නොයෙයි, තොපගේ සීලය ඉතා පිරිසිදුය''යි ඔවුන් ගෙනුත් කුරුධර්‍මය රන්පතක ලියවා ගත්හ.

මෙසේ එකොළොස් දෙනා රක්නා වූ සීලය රන්පතක ලියවාගෙන දන්තපුරයට ගොසින් කලිඟු රජහට ඒ රන්පත දීලා එපවත් වූ පරිද්දෙන් කීහ. එතැන් පටන් රජ්ජුරුවෝත් ඒ කුරුධර්‍මයෙහි ඇදහිලි ඇතිව අඛණ්ඩකොට පඤ්චසීලය රක්නාහ. ඒ සීලයෙහි ආනුභාවයෙන් කලිඟු රට දනව් බිඳ මානයෙහි වැසි වැසිපීය. ඒ රට උපන්නා වූ තුන් භයක් සන්සිඳී සියලු රට කිසි භයක් නැතිව ඉතා නිරාකූලව බත් බුලත් ආදී වූ සියළු සම්පත්තීන් සමුර්ධි විය. බෝධිසත්ත්‍වයන්

වහන්සේ දිවි පවත්නා කල් මුළුල්ලෙහි දන් පින් සිල් රක්‍ෂා කිරීම් ආදි වූ සියළු සුචරිතයෙහි යෙදී ජීවිතාවසානයෙහි දෙව්ලොව ගියහ යි වදරා චතුස්සත්‍යය ප්‍රකාශකොට කුරුධර්‍මී දේශනාව නිමවා වදාළසේක. ඒ බණ අවසානයෙහි බොහෝ දෙනා සතරමඟ සතරඵලයට පැමිණියාහ. එසමයෙහි කුරුධර්‍මීය රැකී එකොළොස් දෙනා මූ මූ යයි වදරණ සර්‍වඥයෝ

"ගණිකා උප්පලවණ්ණා ච - පුණෙණා
දෙවාරිකො තදා
රජ්ජුගාහො ච කච්චානො - දොණමාතාච
කොළිතො
සාරිපුත්තො තදාසෙට්ඨි - අනුරුධො ච සාරථි
බ්‍රාහ්මණ කස්සපො ථෙරෝ - උපරාජා නන්ද
පණ්ඩිතො
මහෙසි රාහුලමාතා - මායාදෙවි ජනෙත්තියා
කුරුරාජා බෝධිසත්තො - එවං ධාරෙථ
ජාතකං"

"එම්බා මහණෙනි, එසමයෙහි ගණිකා නම් වෛශ්‍යා දූ මෙසමයෙහි වමත් සව් වූ උපුල්වන් මහස්ථවිරීය, එසමයෙහි දෙරටුපාලයා නම් දැන් පූර්‍ණභද්‍ර නම් මහස්ථවිරයෝය. එසමයෙහි යටුවම් කළ අමාත්‍යයා නම් දැන් කසයින් මහස්ථවිරයෝය. බඩසැල අමාත්‍යයා නම් දැන් මුගලන් මහස්ථවිරයෝය. එසමයෙහි සිටාණෝ නම් දැන් ශාරිපුත්‍ර

මහස්ථවිරය, එසමයෙහි රථාචාර්‍ය්‍යයා නම් දැන් අනුරුද්ධ මහස්ථවිරය, එසමයෙහි පුරොහිත බ්‍රාහමණයා නම් දැන් මහකාශ්‍යප ස්ථවිරය, එසමයෙහි යුවරජ්ජුරුවෝ නම් දැන් නන්ද මහස්ථවිරය. එසමයෙහි අගමෙහෙසුන් නම් දැන් රාහුලමාතා වූ යසෝධරා මහස්ථවිරය, එසමයෙහි රජ්ජුරුවන් වහන්සේගේ මෑණියන් වහන්සේ නම් දැන් මහාමායා දේවිය. එසමයෙහි කුරු රජ්ජුරුවෝ නම් ලොව්තුරා බුදු වූ මම්ම වේදැ''යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 276. රෝම(ක) ජාතකය

තවද ආකාශය සේ අප්‍රමාණ ගුණ ඇති සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වා වදාළසේක. මෙහි වර්ථමාන කථාව බොහෝ ජාතකවල පෙණෙන්නේය.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ බොහෝ පරවියන්ට නායක ව පරවි ව උපන්සේක.

ඒ පරවියන් වසන්නා වූ වන සමීපයෙහි තාපස කෙනෙක් වාසය කරන්නාහ. ඒ තාපසයන් කරා බෝධිසත්ත්‍වයෝ පරවියන් පිරිවරා ගොසින් තාපසයන් දැක වැඳ පුදා යන්නාහ. ඉක්බිති තාපසයෝ ඔබ්බකට ගියාහ. ඒ පන්සල අනික් කූට තාපස කෙනෙක් වාසය කරන්නාහ. බෝධිසත්ත්‍වයෝත් ඒ තාපසයන් කරා ගොස් තාපසයන් වැඳ

පුදු බණ අසා ඒ පන්සල් මලුයෙහි ගොදුරු කා යන්නාහ. මේ නියායෙන් පනස් අවුරුද්දක් ගියේය.

එක් දවසක් උපාසකවරු පරවි මස් රසයක් තාපසයන්ට පිළිගැන් වූහ. තාපසයෝ පරවි මසෙහි තෘෂ්ණාව ඇතිව "මේ කුමන මස්දැ?"යි විචාරා "පරෙවි මසැ"යි කී පසු "එසේ වීනම් තොප ඇම විසින් මට සාල්, ලුණු, මිරිස් ආදී වූ දෙය ගෙන්වා දෙව"යි කියා ගෙන්වාගෙන පොල්ලකුත් සැස වල්කලා අස්සේ තබාගෙන පරවියන් එන පෙරමඟ බල බලා උන්නාහ. ඒ වේලාවට බෝධිසත්ත්වයෝ බෙහෝ පරවියන් පිරවරා තාපසයන් කරා ආහ.

තාපසයන් උන්නා වූ විලාසයෙන්ම බෝධිසත්ත්වයෝ "අද තාපසයන් ඉඳිනා නියාව අමුත්තක් ඇත මැනව, කුමක් දෝ හෝ"යි සිතා යටිසුලඟට ගොස් අඝ්‍රානයකොට තාපසයන් පරවිමස් කෑ නියාව දැන "තාපසෝ පරවි මස් කා අප මරන්ට උත්සාහකොට ඉඳිති" සිතා පන්සලට දුරුව දුරුව ගොදුරු කන්ට වන්නාහ. තාපසයෝ ඒ දැක "මේ පරවියෝ මා කරා නොඑති. කටයුතු කාරිය කියා ළන්කොට ගෙන මරමි" සිතා කියන්නාහු "ඇයි? තොප ඇම මෙතෙක් දවස් මා කරා අවුත් ළඟම ගොදුරු කන්නාහ. දැන් පනස් අවුරුද්දක් වාසය කරනුවෝද? අද කවර සැකයක් තොප ඇමට දැනුනු සඳහා මා ළඟට නොඑව්ද? නැතහොත් මා අනික් තාපස කෙනෙකැයි සිතා නොඑව්ද? නැත තොපි අනික් පරෙවි මොත්තමෙක්දැ?යි කීහ.

එබස් අසා බෝධිසත්ත්වයෝ කියන්නාහු "තොප අනික් තාපස කෙනෙකුන් සන්දත් නොවෙයි, අනික් පරවි මොත්තමෙක් නිසාත් නොවෙයි, තා ඉඳිනා ආකෘතිය අපට සැක කෙරෙයි, එසේ හෙයින් ලඟට නේන්නේය"යි කියන්නෝ "මා ඉදිරි සැලැස්ම මුන් ඇම දැනගත් නියා වේදැ"යි සිත දුර තබා පොල්ල දමාලා ගැසීය. ඒ දමා ලූ පොල්ල වැරද ගිය. එවිට තාපස කියන්නේ "තෙපි මාගෙන් වැරදුනවාදැ"යි කීහ. එවිට බෝධිසත්ත්වයෝ කියන්නාහු "තමා ගසාම වැරුද ගියාහු පමණක් විනා තාපසයෙනි, තෙපි සතර අපායෙන් නොවැරදුන වාදැ"යි කියා "එම්බල තාපසය, ඉනිබ්බේ තෝ මෙතන උන්නෙහි නම් උපාසකවරුන්ටත් තාගේ නුගුණ බොහෝකොට කියමි. තෝ මෙතනින් පලා යව"යි කියන්නාහු ඒ තාපසයා එවිට එතනින් පලා ගියේ යයි වදුරා මේ 'රෝම ජාතකය' නිමවා වදාළසේක.

එසමයෙහි එකියන තාපසෝ නම් දේවදත්ත ස්ථවිරයෝය. පළමු විසූ සිල්වත් තාපසයෝ නම් සාරිපුත්‍ර ස්ථවිරය, පරෙවි ව උපන්නෙම් බුදුවූ මම්ම වේදැ"යි වදාළසේක.

# 277. මහිස ජාතකය

තවද අකනිටා බඹලොව සේ උස් වූ ගුණ ඇති සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ක්‍රීඩා වඳුරෙකු අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

එක් ක්‍රීඩා වඳුරෙක් එක් කම්පස් ඇතෙකුගේ කුම්භස්තලයට නැගී කෙළනේය. එකියන ඇතාත් එකියන වඳුරු කෙරේ නොකිපී ඒ කෙළි ඉවසා ඉඳිනේය. පසුව එක් දවසෙක ඒ ඇතා ඔබ්බෙක බැඳ අනික් තෙනකින් අකම්පස් ඇතකු පළමු ඇතා සිටියා වූ නිලයේ බැන්දාහ. එකියන වඳුරාත් "පළමු ඇතා මෙනැ"යි සිතා "මේ ඇතා පිටට නැගෙමි" සිතා ඇතු පිටට නැගී කුම්භස්ථලය මත්තේ උන්නේය. එකියන ඇතා තමාගේ කුම්භස්ථලයෙන් වඳුරා අල්වාගෙන දළින් ඇන පයින් මිරිකා මරා දමාපිය.

මේ කථාව දම්සභාවෙහි රැස් වූ මාළුවරුන් වහන්සේ කිය කියා වැඩඋන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා එපවත් අසා "දැන්මතු නොවෙයි, පෙරත් එකියන වඳුරා එලෙසම කෙළේ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ වනාන්තරයට නුදුරු තෙනක මීගොන් ව උපන්නාහු ඇලි දුර්ග බොහෝ වූ ස්ථානයක ගසක් මුල වාසය කරන්නාහ.

ඒ ගස වසන්නා වූ එක් වඳුරෙක් ඒ කියන බෝධිසත්ත්වයන්ගේ පිට වර්චස් කරන්නේය. අඟ අල්වා කෙළිනේය. වල්පත් අල්වාගෙන ඔන්සිල්ලා කෙළිනේය.

බෝධිසත්ත්වයෝත් ඊට නොකිපීම වාසය කරන්නාහ. ඒ අවස්ථාවේ ඒ ගස වසන්නා වූ දේවතාවා බෝධිසත්ත්වයන්ට කියන්නේ "මීමාණෙනි, තොප ඇඟපත දුෂ්‍යකොට කෙළිනා වූ වඳුරාට තොප බැණ නොනැගී ඉඳිනේ ඇයිද? අඟවාලා ඇනපියා පයින් මිරිකා දමව"යි කීහ.

එවිට බෝධිසත්ත්වයෝ කියන්නාහු "ඒ කියන වඳුරා මාගේ ඇඟපත එලිගෙන කුමක් කරතත් මා මුන්ට කරන දෙයක් නැත. උෟ මැරීම නම් මට ප්‍රාණඝාතය සිද්ධ වන්නේ වේදැ"යි කියා "මා එසේ කරන්නේ නැත, අනික් මීමෙක් මෙතනට ආ නම් එහි හඬ කියා ගනුව"යි කියා "මා මූට කරන දෙයක් නැතැ"යි කියා බෝධිසත්ත්වයෝ කීප දවසකින්ම ඔබ්බකට ගියාහ. අනික් මීමෙක් ඒ ගස මුල වාසය කරන්ට ආහ. ඒ කියන වඳුරුත් "පළමු මීමා සේම ය"යි සිතා පිටට පැන කෙළිනට වන. එවිට ඒ කියන මීමා වඳුරා බිම හෙලාගෙන අඟින් ඇන ළය පළා මැරී යයි වදාරා මේ 'මහිස ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි ඒ කියන වඳුරා නම් මේ කියන වඳුරා මය. මීමා නම් මේ කියන ඇතා මය. ඒ වඳුරාගේ ක්‍රීඩාව ඉවසූ මීමා නම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 278. ශතපත්‍ර (සත පත්ත) ජාතකය

තවද සක්වළ අනන්ත වූවා සේ අපරියන්ත ගුණ ඇති සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි වහන්දෑ දෙනමක් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

පණ්ඩුකය, ලෝහිතකය යන සවග වහන්දෑගෙන් දෙනමක් බොහෝ භික්‍ෂූන් වහන්සේට "නුඹවහන්සේ අසවලුන් වහන්සේ නියාවට ගුණ නුවණ නැද්ද? නුඹවහන්සේ අඩුව ඉදිනේ ඇයිද?" යනාදීන් ද්වේෂ උපදින්ට නිසි බස් කියා කුප්පවා තමන්වහන්සේගේ ලාපන්ත ක්‍රියාවට කරවනසේක.

මෙපවත් දම්සභා මණ්ඩපයේ රැස් වූ මාළුවරුන් වහන්සේ කිය කියා වැඩඋන් තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නට පූර්‍වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා එපවත් අසා "මා කීවා නොගිවිස සවග වහන්දෑගේ බස් අසන වහන්දෑ නම් සතපත්‍ර පක්‍ෂියාගේ බස් අසා සන්තෝෂ වූ මානවකයා මෙනැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ එක්

වනාන්තරයක පන්සියයක් සොරුන්ට නායක ව සොරදෙටුව වාසය කරන්නාහ.

එසමයෙහි එක් පුරුෂයෙක් දහසක් ඔබ්බකට ණය දී ඒ ණය එළවාගත නොහී මළ. ඔහුගේ බිරින්දද ණය එළවාගත නොහී මිය යන අවස්ථාවෙහි තමාගේ වැඩී සිටියා වූ පුතා කැන්ද කියන්නී "පුත දසක් ඔබ්බෙන් ණය ඇරගත් කෙනෙක් ඇත. මා මළ කළ ඒ ණය තොපට නොදෙති. මා ඉන්දදී ඒ ණය එළවාගෙන එව"යි පුතා ණය එළවා යවිය. උං ණයගැත්තා අතින් ණය එළවාගෙන එන කලට මෑණියෝ මිය ගොසින් පුතා කෙරේ ස්නෙහයෙන් පුතා එන ඉදිරියේ ඕපාතික වූ කැණහිල් බැලිව ඉපද ගියාය. පුතාත් මස්සෙන් දස ඇරගෙන සොරුන් ඉඳිනා වනාන්තරය සමීපයට පැමිණියේය.

එවිට ඒ කියන කැණහිල් දෙන් තමාගේ පුතු සොරුන් මරණ හෙයින් මඟ අවුරා යා නොදී වැදහොත්තීය. ඒ කියන පුරුෂයා "අවලක්‍ෂණ සීපාවා දැකපීමි" කියා කැට මුගුරු ආදියෙන් ගසා වනාන්තරයට ගියේය. ඒ වේලාවට එක්තරා කෑරලෙක් සොරුන්ට "අසවල් පුරුෂයෙක් දසක් ඇරගෙන එයි" කියා කෑරුල් ශබ්දයෙන් ඇඞීය. එවිට එකියන පුරුෂයා "තමාට යහපත්කොට ඇඬූ අඬෙකැ"යි සිතා කෑරලා වැඳ "තවත් අඬව, තවත් අඬව"යි කීහ.

බෝධිසත්ත්වයෝ මේ කැණහිල් ධේනුව කළ දෙයත්, කෑරලා කළ දෙයත් දෙකම බලා සිටියාහ. බලා සිට

"මෙකියන කැණහිල් ධේනුව පූර්ව ජාතියෙහි මූට මව් ව උපන් කෙනෙකුන් උවමැනව, එසේ නිසා තමන්ගේ පුතා කෙරේ ස්නෙහයෙන් 'අප ලඟට ආ කලට මරා පියති' සිතා මඟ අවුරා වැද හොත්තීය. මේ කියන පුරුෂයා තමා වැඩ සිතා කැණහිල් ධේනුව කළ දෙය නොදැන උන් මරා පහකොට පියව යි අපට හිතව තමාට විපක්‍ෂව ඇඩූ කෑරලාට සමාධිව වැන්දේය"යි සිත සිතා උන් කලට සොරුන් මධ්‍යයට එකියන පුරුෂයා ඇවිත් වැද ගියේය.

බෝධිසත්ත්වයෝ "තුළු අල්ලව"යි කියා අල්වා ගත්තාහ. අල්වාගෙන බෝධිසත්ත්වයෝ විචාරන්නාහු "තොප මෙතනට ආයේ කුමක් සන්දදැ?"යි විචාළාහ. එවිට ඒ කියන්නේ තමා මවගේ ණය දුන් තැන් එළවාගෙන එන්ට කී නිසා "ණය එළවාගෙන යෙමි" කියන්නා "ඇයි, මසුරන් දස තොප අතදැ?"යි විචාරන්නා "ගෙනාමි" කීහ.

එවිට බෝධිසත්ත්වයෝ "තොපගේ මෑණියන්ගේ තත්ත්වය දනුදැ?"යි විචාරන්නා "මම නොදනිමි" කීහ. "තොපගේ මෑණියෝ මිය ගොසින් කැණහිල් ව ඉපද අතරමඟ දී තොප වැලකුවෝ උඉ ය"යි කියා "ඒ තොපි නොදැන 'අවැඩට කළ දෙයෙකැ'යි සිතා උන්ව පහ කොටපුව. තොපට අවැඩ ව අපට පක්‍ෂව ඇඩූ කෑරලාගේ ශබ්දය අසා තොපි සතුටු වුව, එසේ හෙයින් තොප සේ වූ අඥනයෝ නැත. එසේ වූ තොප මා නසන්නේ කිම්දැ?"යි කියා "තොපට ජීවිත හානිත්, අර්ථ හානිත් නොකෙරෙමි"යි අළහයි වදරා බුදුව වැඩ ඉඳ

වදාරණසේක් “යම් සේ ඒ පුරුෂයාට වැඩ කී කැණහිල් ධේනුව අවැඩකොට අවැඩ කී කෑරල ශබ්දය වැඩකොට සිතා විනාශයට පැමිණෙන්ට ගියේද? එලෙස යම් කෙනෙක් මා කීවා නොගිවිස මේ අඥාන භික්ෂූන් කීවා ගිවිසි කෙනෙක් ඇත්නම් මේ කෑරලා කීවා කොට විනාශයට පැමිණි පුරුෂයා මෙනැ”යි වදාරා මේ ‘සතපත්‍ර ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි සොරුන් පන්සියයට නායක ව උපන්නෙම් බුදුවූ මම්ම ය”යි වදාළසේක.

# 279. කුටසාක (පුටදූසක) ජාතකය

තවද සත්‍ව ලෝකය සේ අචින්ත්‍ය වූ ගුණ ඇති සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා උපාසකයෙක් තමාගේ වාසස්ථානයට සර්‍වඥයන් වහන්සේ හා සංඝයා වහන්සේ වඩාගෙන ගොස් දන් දී තමාගේ උයනේ දවල් භික්ෂූන් වහන්සේ “ස්වේච්ඡාපරයේ ඇවිදිනා සේක්ව”යි කියා “යහපතැ”යි කියා භික්ෂූන් වහන්සේ ඒ ඒ තෙන ඇවිදිනා කලට එක්තරා උයන්ගොව්වෙක් “මල් පලාවල කඩාගෙන එන්ටය”යි පත් කොල කඩා ගොටු විද බිම එලන්නේය. ඌගේ පිත් එලා ලූ ගොටු බිම ඉඳ ඉරා දමන්නේය. ඒ දැක සර්‍වඥයන් වහන්සේ “දැන්මතු නොවෙයි, මහණෙනි, පෙරත් ඒ එසේම ගොටු ඉරා දැමූයේ වේදැ”යි වදාරා “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි එක්තරා උයන්ගොව්වෙක් ගසකට නැගී උඩ ඉඳ ගොටු විද ඵලන්නේය. ඒ ඵලූ ඵලුවා එක්තරා වඳුරෙක් ඉරා අරිනේය. ඒ වේලාවට එක්තරා පුරුෂයෙකු එතනට ආයේය. ඒ දැක වඳුරා අතින් විචාරන්නේ "ඇයි, ඵලූ ගොටු තා විසින් ඉරා අරිනේ, යහපත්කොට ඉදිකරන්ටදැ?"යි විචාළේය. ඒ අසා වානර කියන්නේ "මුතුන් මී මුතුන් සමයේ පටන් අවැඩට නිසි දෙයක් විනා වැඩකට නිස්සක් නොකරන ලද. එසේ හෙයින් මම කුමකට ගොටු විදවාදැයි, මාගේ ස්වභාව ධර්‍ම හෙයින් විද දමමි" කීය. එවිට ඒ පුරුෂයා කියන්නේ "තොප ඇමගේ ධර්‍මය මෙසේ කල අධර්‍මය තමා කියනුම කිම්දැ?"යි කියා වානරයාට නින්දාකොට ඔබ්බකට ගියේයයි වදාරා "වඳුරා ලඟට ගිය පුරුෂයා නම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

## 280. අභ්‍යන්තර ජාතකය

තවද සංස්කාර ලෝකය සේ කල්පනාවට අවිෂය වූ ගුණ ඇති සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි යසෝධරා ස්ථවිරයන් වහන්සේට අඹ දුන් සැරියුත් ස්වාමීන් අරභයා මේ ජාතකය දක්වා ලදි.

ඒ කෙසේද? යත්,

සර්වඥයන් වහන්සේ විසාලා මහනුවර කූටාගාර ශාලාවෙහි වැඩවසන සමයෙහි ප්‍රජාපති ගෝතමීන් වහන්සේ ගැණුන් පන්සියයක් පිරිවරා කූටාගාර ශාලාවට අවුත් බුදුන් අතින් භික්ෂුණී ශාසනයට අනුදැන භික්ෂුණී කරවා ගත් පසු උන්වහන්සේ උපසම්පදාව ලදින් සෝවාන් ව භාවනා උපදවා රහත් වූ පසු යශෝධරා ස්ථවිරියන් වහන්සේ සිතනසේක් "රාහුල ස්වාමීන් වහන්සේත් මහණ වූ පසු සුද්ධෝදන රජ්ජුරුවන් වහන්සේත් අතීත වූ පසු ඉතකින් මා ඉඳිනේ කිම්දැ?"යි සිතා සැවැත් නුවරට අවුත් ජේතවනාරාමයේ වැඩඋන් සර්වඥයන් වහන්සේ අතින් පැවිදි ඉල්වාගෙන මහණ ව උපසම්පදාව ලදින් "යසෝධරා ස්ථවිරින් වහන්සේ ය"යි ප්‍රසිද්ධ ව ඉන්නා සමයේ දවස විටක් යසෝධරා ස්ථවිරින් වහන්සේ තමන්වහන්සේගේ පුත් වූ රාහුල ස්වාමීන් දකින්ට රාහුල ස්වාමීන් වසන්නා වූ විහාරයට වඩනාසේක.

එක් දවසක් යසෝධරා ස්ථවිරින් වහන්සේට බඩරුජාවක් ඇතිව රාහුල ස්වාමීන් දකින්ට නොආසේක. උන්වහනසේගේ අතවැසි භික්ෂුණී කෙනෙකුන් වහන්සේ එපවත් රාහුල ස්වාමීන්ට කීසේක. රාහුල ස්වාමීන් තමන්වහන්සේගේ මෑණියන් වහන්සේ යසෝධරා ස්ථවිරියන් දකින්ට යයි ගණයට ගියසේක. ගණයට ගොස් යසෝධරා ස්ථවිරියන් ගෙන් "ආථාසු කිම්දැ?"යි විචාරා "පුතණුවන් වහන්ස, බඩරුජාවක් ඇත. එසේ හෙයින් මට බොහො ආයසය"යි වදාළසේක. "ආදිත් ළමින්දුනි, මෙසේ වූ අවස්ථාවක කරන්නේ කිම්දැ?"යි විචාළසේක. "පැනි අඹ හා සකීරා කෑ කල පළමුත් මේ

රුජාව සමනය වෙ”යි කීහ. රාහුල ස්වාමීත් “යහපතැ”යි කියා තමන්වහන්සේට පියවූ සර්‍වඥයන් වහන්සේ කරා නොගොසින් සුලු පිය වූ ආනන්ද ස්වාමීන් කරාත් නොගොසින් උපාධ්‍යාය වූ මුගලන් ස්වාමීත් කරාත් නොගොසින් ගුරු වූ සැරියුත් සාමීන් ලඟට ගොසින් “ස්වාමීනි, යසෝධරා ස්ථවිරියන්ට බඩරුජාවක් ඇත. පෙරත් සකීරා හා අඹ කෑ කල බඩරුජා සන්හිඳෙයි. එය ලබන්නේ කෙසේදැ?”යි විචාළසේක.

සැරියුත් ස්වාමීන් “යහපත, ලද්දමෝ නම් දෙන්නමෝ වේදැ”යි වදරා රාහුල ස්වාමීනුත් පස්සේ ලා පසේනදි කෝසල රජ්ජුරුවන්ගේ රජගෙට ගොස් රාහුල සාමණේරයන් වහන්සේ රාජාගනයෙහි සිටුවා තමන්වහන්සේ රජගෙට ගොස් රජ්ජුරුවන් ලඟ සිඟා සිටියේය. එවේලාවට ම එක්තරා උයන්ගොව්වෙක් විලිස්ස ගිය අඹ කැනක් ගෙණවිත් රජ්ජුරුවන් අතට දීන. රජ්ජුරුවෝ තමන්ගේ ස්වහස්තයෙන් අඹ ලොලා සකීරා හා අඹ පාත්‍රය පුරා දුන්හ. සැරියුත් ස්වාමීන් අඹ පාත්‍රය ගෙන “මෙය තොපගේ මැණියන්ට දෙව”යි කියා රාහුල ස්වාමීන් අතට දුන්සේක. රාහුල ස්වාමීන් වහන්සේත් ඒ අඹ ගෙන ගොස් යසෝධරා ස්ථවිරියන් වහන්සේ අතට දුන්සේක. යසෝධරා ස්ථවිරින් වහන්සේත් අඹ වැළඳුසේක. අඹ වැළඳූ ගමනේ බඩරුජාව ගුණය විය.

කෝසල රජ්ජුරුවෝත් “සැරියුත් ස්වාමීන් අඹ මා ලඟදී නොවළඳ ගෙන ගියසේක. කාට දෙන්න ගෙන ගියසේක් දෙ

හෝයි බලව”යි පස්සේ මිනිසුන් යවා රාහුල ස්වාමීන්ට දුන් නියාව හා රාහුල ස්වාමීන් තමන්වහන්සේගේ මෑණියන් වහන්සේට දුන් පවත් අසා කෝසල රජ්ජුරුවෝ සිතන්නාහු “ඉදින් සර්‍වඥයන් වහන්සේ බුදු වූ හෙයින් අපගෙන් සිගා වළඳ ඉන්නා පමණක් මිසක්, නැත් නම් චක්‍රවර්ති රාජ්‍යය කරනසේක් නම් අපි ඇමම උන්වහන්සේගේ පරිවාර වේද? චක්‍රවර්ති රාජ්‍යය කරන දවසට පරිනායක රත්නව රාහුල ස්වාමීන් වහන්සේ තමන්වහන්සේගේ මෑණියන් වහන්සේට බඩ රුජාව නිසා අඹ සිගා වැඩිසේක. අපි ඇම උපාසකව ඉඳ යසෝධරා ස්ථවිරින් වහනසේට උගේ ඇඟි නොදත්තම්හ. එසේ හෙයින් අප කළ සේ නොයෙද”යි කියා යසෝධරා ස්ථවිරින් වහන්සේට අඹ හා සකීරා ඇම දවස්ම යවූහ.

සැරියුත් ස්වාමීන් නිසා යසෝධරා ස්ථවිරියන් වහන්සේට අඹ රසය නිසා බඩජාරු පහ වූ බව දම්සභා මණ්ඩපයට රැස් වූ මාළුවරුන් වහන්සේ කිය කියා උන් තැනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා “මහණෙනි, මා එන්නට පූර්‍වභාගයෙහි කවර නම් කථාවකින් යුක්තව උනුදැ?”යි විචාරා වදාරා එපවත් අසා “දැන්මතු නොවෙයි, පෙරත් ශාරිපුත්‍ර ස්ථවිරයෝ රාහුල මාතාවන්ට අඹ දුන්නේ වේදැ”යි වදාරා “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ එක්තරා

බමුණු ගමෙක බමුණු ව ඉපිද වැඩිවිය පැමිණ පඤ්චකාමයෙහි ආදීනව දැක ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි ව බොහෝ තාපසවරුන් පිරිවරා බරණැස් රජ්ජුරුවන්ගේ මඟුල් උයනෙහි වාසය කරන්නාහ.

එසමයෙහි එකියන තාපසවරුන්ගේ ගුණ තේජසින් ශක්‍රයන්ගේ පාඬුකම්බල ශෛලාසනය හුනු විය. ශක්‍රයෝ "මා නොකැමති පරිද්දෙන් උනු වන්ට කාරණා කිම්දැ?"යි තමන්ගේ දිවසින් බලා එපවත් දැක "ඒ තාපසවරුන් මෙකියන උයනේ නොයිඳිනා මානයක් කෙරෙමියි ඉඳිනා තැනින් උගුළුවාපු කල එක තැන ඉඳ එකඟව භාවනා කිරීම් නැතිව, ඒ නියාවට අද මම ගොසින් රජ්ජුරුවන්ගේ අග්‍රමෙහෙසිකාවන්ට අභ්‍යන්තර නම් අඹ කැවාහු වූ නම් චක්‍රවර්ති රාජ්‍යය කරන්ට පින් ඇත්ත වූ පුතණු කෙනෙකුන් උපදියි කියමි. ඒ බිසවු 'යහපතැ'යි කියා රජ්ජුරුවන්ට කියති. රජ්ජුරුවෝ 'යහපතැ'යි උයන අඹගස්වල අඹ බලවති. ඒ වේලාවට මම උයනේ අඹ ගස්වල අඹ අන්තර්ධාන කරවා පියමි. රජ්ජුරුවෝ එවිට මෙකියන උයනේ අඹ කැවෝ කවුරුන්දැ?යි උයන්ගොව්වා විචාරති. එවිට උයන්ගොව්වා 'තාපසවරු අඹ කැවෝය'යි කියා රජ්ජුරුවන්ට කියන්නාහ. රජ්ජුරුවෝ එවිට 'එසේ වීනම් තාපසවරු මෙතනින් පහ කරව'යි පහ කරන්නාහු වෙති. එවිට තාපසරුන් එකතැන විසීම නොලබන්නාහු, සිල් රක්‍ෂා කිරීමෙහි පමා වන්නාහ. තාපසවරුන් සිල භේද කරන්ට මේ කාරණා වන්නේය"යි සිතා එදවස් මධ්‍යම රාත්‍රී වේලාවේ රජ්ජුරුවන්ගේ බිසවුන්ගේ

ශ්‍රී යහන් ගබඩාවට ගොසින් කියන්නාහු "අභ්‍යන්තර නම් අඹ ගසක අඹ තොපගේ රජ්ජුරුවන්ට කිය ගෙන් වූ නම් චක්‍රවර්ති රාජ්‍යය කරන්ට පින් ඇති පුතණු කෙනෙක් උපදිති" කියා දෙව්ලොවට ගියහ.

බිසවුන් එදවස් පසුව බොරු ලෙඩක් ගෙන තමන්ගේ පරිවාර ස්ත්‍රීන්ට "රජ්ජුරුවෝ මා කොයිදැයි විචාළෝ නම් මා ලෙඩ නියාව කියව"යි කියා වැදහොත්තාහ. රජ්ජුරුවෝ සිංහාසනාරූඪ ව සොළොස් දහසක් බිසෝවරුන් පිරිවරා උන්නාහු "අග්‍රමෙහෙසිකාවන් වහන්සේ ලෙඩට වැදහොත්සේකැ"යි කියන්නා "ලෙඩ කිම්දැ?"යි විචාරන්ට රජ්ජුරුවෝ ගෙට ගියාහ. ගෙට ගොසින් බිසවුන්ගේ යහනේ එක් පාර්ශවයෙක ඉඳගෙන බිසවුන්ගේ පිට පිරිමැද "බිසවුනි, ඇති අපාසු කිම්දැ?"යි විචාළාහ. බිසවු කියන්නාහු "දේවයන් වහන්ස, මට වෙන අපාසු නැත, අභ්‍යන්තර නම් අඹ කන්ට දෙළොක් උපන. මේ අඹ ලදිම් නම් විනා මාගේ ප්‍රාණය නැතැ"යි කීහ.

එවිට රජ්ජුරුවෝ "අමාත්‍යයන් අතින් විචාරා ලදිම් නම් ගෙනෙන්නෙම් වේදැ"යි කියා අමාත්‍යයන් ලඟට ගොසින් අමාත්‍යයන් කැඳවා කියන්නාහු "අභ්‍යන්තර අඹ නම් කිම්ද? තොපි ඇම දැනුදැ?"යි විචාළාහ. එවිට අමාත්‍යයෝ කියන්නාහු "අභ්‍යන්තර අඹ නම් අඹ ගස් දෙකට මධ්‍යයේ සිටිනා අඹ ගස් වන්නේය. නුඹවහන්සේගේ උයනට මිනිසුන් යවා ගස් දෙකට මධ්‍යයෙහි සිටියා වූ අඹගස එල කඩා

ගෙන්වාගත මැනවැ"යි කීහ. රජ්ජුරුවෝ එවිට උයන බලන්ට මිනිසුන් යව්වාහ. මිනිසුන් යන කලට ශක්‍රයන්ගේ ආනුභාවයෙන් එක ගසකත් අඹ නැත්තාහ. එපවත් රජ්ජුරුවෝ අසා "ඇයි, මේ කාලයට අඹ නැති වෙන්ට කාරණා කිම්දැ?"යි උයන්ගොව්වා විචාරා උයන්ගොව්වා විසින් "තාපසවරුන් කෑවාය"යි කියන්නා රජ්ජුරුවෝ තාපසවරුන් එතනින් පහකර වූහ.

රජ්ජුරුවෝ අභ්‍යන්තර නම් අඹ නොලැබ අමාත්‍යයන් අතින් පෙරලා "අභ්‍යන්තර අඹ කොයිදැ?"යි විචාළේය. එවිට බමුණෝ කියන්නාහු "හිමාලය වනයෙහි පර්වත වළලු සතකින් ඇතුළත සවර්ණ පර්වතයක් සමීපයෙහි ලෝදැල් සතකින් වසා තබනලද වෙසවුණු රජ්ජුරුවන්ගේ අභ්‍යන්තර නම් අඹ ගසක් ඇතැයි අසා දැනුම්හ. දුටු දෑ නැතැ"යි කීහ. රජ්ජුරුවෝ එවිට "මිනිසුන් විසින් එතනට යන්ට නොපිළිවනැ"යි කියා තමන් වඩවන්නා වූ මහත් වූ ශරීරයක් ඇත්තා වූ ගිරාපෝතකයා රන් මැදිරියෙන් මෑත්කොට ළඟ තබා ඉඳ කියන්නාහු "සබඳ, තොපට අප විසින් බොහෝ උපකාර කරන ලද, ඊටත් උපකාරයට අප කී කටයුත්තක් සාදා දීලූවොත් යහපතැ"යි කීහ.

එවිට ගිරවා "යහපත, දේවයන් වහන්ස, කීවක් කරමි" කියන්නා රජ්ජුරුවෝ ගිරවාට "යහපතැ"යි කියා මී හා විළඳ කවා මී පැන් පොවා ශතපාක සහශ්‍රපාක තෛලයෙන් දෙපියා මැද "සබඳ, හිමාලය වනයෙහි සත්වන පව්වක

වළල්ලෙන් ඇතුලෙහි ස්වර්ණ පර්වතයක් ලග අභ්‍යන්තර නම් අඹ ගසෙක් ඇත් ල, ඒ අඹ ගසින් අඹ ගෙනවුත් දී බිසවුන්ගේ දෙල සන්සිඳව"යි කියා ගිරා පෝතකයාණන් දෑතින් අල්වාගෙන සිවුමැදුරු කවුළුව සමීපයෙහි සිට අළහ.

ඒ කියන ගිරවාත් රජ්ජුරුවන්ට ආදර දක්වා පියා අඹාගෙන රාජ්‍ය සීමා ගෙවාගෙන වනාන්තරයට වැද හිමාලය වනයෙහි පළමුවන පර්වත වළල්ලට ගොසින් එහි වසන්නා වූ ගිරවුන් අතින් "අභ්‍යන්තර නම් අඹ ගස දනුදැ?"යි "අපි නොදනුම්හ". දෙවන වළල්ලෙහි ගිරවුන් අතින් විචාරන්නේ "යහපතැ"යි කියන්නා වූ ඔවුනුත් විචාරා මෙම නියායෙන් දෙවන වළල්ලය, තුන්වන වළල්ලය, සතරවන වළල්ලය, පස්වන වළල්ලය, සවෙනි වළල්ලය යයි කියා සත්වන වළල්ලට ගොස් එහි උන් ගිරවුන් අතින් විචාළාහ.

ගිරව් කියන්නෝ "සැබැව, සවර්ණ පර්වත සමීපයෙහි අභ්‍යන්තර නම් අඹ ගසෙක් ඇතැ"යි කීහ. එවිට ගිරවා කියන්නේ "ඒ අඹ ගසෙන් මට ප්‍රයෝජන ඇත. ඉන් මට අඹ ගෙඩි කීපයක් ගෙනවිත් දීලව"යි කීය. එවිට කියන්නාහු "අඹ ගස නම් වෙසවුණු රජ්ජුරුවන් වහන්සේ ප්‍රයෝජන විඳිනා අඹ ගසය. ලෝ දැලින් වසා තිබෙයි. කුම්භාණ්ඩයන්ගෙන් රැකවල් ලද. ඒ අඹ කඩා ගන්නා තබා ඒ අඹ ගස ලඟටත් යන්ට නොපිළිවනැ"යි කීහ. එවිට ගිරවා කියන්නේ "කෙසේ වුවත් මම අඹ කඩා ගණිමි. මට සලකුණු කියව"යි සලකුණු විචාරාගෙන රෑ කුම්භාණ්ඩයන් නිදපු වේලෙහි එකියන අඹ

ගස මුල සමීපයෙන් ලෝ දැල යටින් ගස සමීපයට ගොස් ගසට වන. ඒ වේලාවට ලෝ දැල් 'ක්‍රිං' යන ශබ්දය පවත්වා ලෝ දැල් ඇඬුහ. එවිට කුම්භාණ්ඩයෝ පිබිද ගිරවා අල්වාගෙන "මේ ගිරවා ගැලපීයම්හ"යි කියාද "කඩකොට පලා කා පියම්හ"යි කියාද "පුලුස්සා කා පියම්හ"යි කියාද යනාදීන් ගිරවා භය ගන්වා බස් කීහ.

එකියන ගිරවාත් එවිට නිර්භීත ව කියන්නේ "දෙමව්පියන් කී මේවර වත්, බත් ලත් සාමීන් කී මේවර වත් කොට ප්‍රාණය ගියේ නම් දිව්‍යලෝකය ලැබෙන්නේ වේදැයි, එසේ හෙයින් මාගේ රජ්ජුරුවන් වහන්සේ කී මේවර නිසා බිසවුන් වහන්සේගේ දොළ සන්සිඳුවනු නිසා අඹ ගෙන යන්ට මේවර මා ආයේය. ඒ නිසා මාගේ ප්‍රාණය ගියෙහි වී නමුත් යහපතැ"යි කියා කීහ. එබස් අසා කුම්භාණ්ඩයෝ සතුටුව "යහපත, තොප කී බස් අප සිත්ගත, තොප නොමරා අරුම්හ"යි කීවාහ. එවිට ගිරවා කියන්නේ "මා ආ කාරිය මුදුන් පත් නුවූ කල මා ගොසින් කම් කිම්දැ?"යි කියන්නාහු "තොපට මේ ගසින් අඹ ගෙඩියකුත් දෙන්ට බැරි නොවෙයි. රජ්ජුරුවන් වහන්සේගෙන් ඇතිව තිබෙන අඹය. ඒ නිසා දෙන්ට බැරිය. දුන්නොත් අපට බොහෝ නිග්‍රහ පැමිණෙයි. තොපට උපායක් කියම්හයි අඤ්ජන ගුහාවෙයි වසන ජෝතිය තාපසයන්ට දවස දවස අඹ ගෙඩි සතරක් දෙති. උන් අතින් අඹ ගෙඩියෙක් ඉල්වා ගණුව"යි ඒ තාපසවන් කරා යවනු.

ඒ ගිරවාත් තාපසයන්ට එපවත් කියා තාපසයෝත් "යහපතැ"යි කියා දෙකක් තුමූ කා එකක් ගිරවා කවා එක අඹ ගෙඩියක් ඉල්වා සාල්ලෙක ලා ගිරවා කර බැඳ රජ්ජුරුවන් කරා යවූහ. ඒ ගිරවා අඹ ගෙඩිය රජ්ජුරුවන් අතට දීන. රජ්ජුරුවෝ බිසවුන්ට දුන්හ. ඒ අඹ කාත් දරුවෝ ඇති නුවූහයි වදරා මේ 'අභන්තර ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි බරණැස් රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසව් නම් යසෝධරා ස්ථවිරිය, ගිරාපෝතකයා නම් ආනන්ද ස්ථවිරයෝය. හිමාලය වනයෙහි තාපසයෝ නම් ශාරිපුත්‍ර ස්ථවිරය, බරණැස් නුවර උයනේ විසූ තාපසයෝ නම් බුදුවූ මම්ම ය"යි දක්වා වදාළසේක.

## 281. සෙය්‍යංස (සෙය්‍ය) ජාතකය

තවද සෘද්ධි විෂයෙහි සුක්ෂම වූ ගුණ ඇති සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා අමාත්‍යයෙකු අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

කෝසල රජ්ජුරුවන්ගේ අමාත්‍යයෙක් ඇත. ඒ අමාත්‍යයා කෙරෙහි සෙසු අමාත්‍යයෝ ද්වේෂ කියා රජ්ජුරුවන් බිඳවූහ. රජ්ජුරුවෝත් "ඇත්තෙකැ"යි කියා අමාත්‍යයා තමන්ගේ රාජ්‍ය ආසාවෙන් සිරගෙයි වැස්සූහ. ඒ අමාත්‍යයා සිරගෙයි ඉඳම බුද්ධාලම්බන ප්‍රීතියෙන් භාවනාකොට සෝවාන් වූහ.

රජ්ජුරුවෝත් ඔහු නිවැරදි නියාවත්, දුර්ජනයන්ගේ බස් නිසා ගැහැට පැමිණි නියාවත් දැන දම් කපා පළමු සිටියා වූ ස්ථානාන්තරයෙහි පිහිටුවා බොහෝ තරම් පදම් දී රැක්කාහ.

ඒකියන අමාත්‍යයා සර්වඥයන් වහන්සේ දකින්ට ගියේය. සර්වඥයන් වහන්සේ ඒකියන අමාත්‍යයා දැක "උපාසකයෙනි, තොපට දුඃඛයක් පැමිණියයි කියන්නා ඇසුම්හ"යි වදාළසේක. "සැබැව, ස්වාමිනි දුඃඛයක් පැමිණියේය. පැමිණි දුඃඛයෙන් වැඩකට පැමිණියෙමි" කියන්නා "සර්වඥයන් වහන්සේ වදාරනසේක් "කුමන සැපයෙක් ලද්දේදැ?"යි විචාරන්නා බුද්ධාලම්භන ප්‍රීතියෙන් සෝවාන් වීමි" කියන්නා "පළමුත් උත්තමයෝ දුඃඛයට පැමිණ සැපයකට පැමිණියෝ වේදැ"යි වදාරන්නා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි දශධර්මය කොපය්‍යය නොකොට රාජ්‍යය කරන්නාහ. දවස් පතා පඤ්චශීලය රකින්නාහ. පොහොයෙන් පොහොය අටසිල් රකින්නාහ. මේ නියායෙන් ධර්මිෂ්ඨව රාජ්‍යය කරන සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ අභ්‍යන්තර අමාත්‍යයෙක් රජ්ජුරුවන්ගේ අන්තඃපුරයට වැදින. රජ්ජුරුවෝ එපවත් අසා තුමූම පරීක්ෂාකොට නියම දැන "තෝ මාගේ විජිතයෙන් එපිට නොරඳා පලා යව"යි අළහ. මේ කථාව යට කියන ලද 'සීලව' ජාතකයෙහි පෙණෙන්නේය. මෙය වනාහී ඒකියන ලද

අමාත්‍යයා කොසොල් රජ්ජුරුවන් කරා ගොස් "දේවයන් වහන්ස, යම්තම් සේනාවක් ලබන්නා බරණැස් නුවර රාජ්‍යය සාදගත හැකැ"යි කීහ. රජ්ජුරුවෝත් "මූ කියන්නේ කිම්දැ?"යි කියා මිනිසුන් යවා එක් ගමක් කොල්ල කැවූහ. ඒ කොල්ලකෑ ගම මිනිසුන් අල්වා ගෙන රජ්ජුරුවන්ට පානා රජ්ජුරුවෝ "ඇයි? තොප ඇම මාගේ රාජ්‍යය කොල්ලකෑයේ" විචාරන්නා "සම්පත් නැත්තෙම් කොල්ලකෑම්හ"යි කී කල්හි එසේ උන්ට බොහෝ සම්පත් දී යැවූහ.

එපවත් කෝසල රජ්ජුරුවෝ අසා "එසේ වීනම් බරණැස් නුවර ගත හැකැ"යි කියා මහත් වූ සේනාව ඇරගෙන බරණැස් නුවරට ආහ. බරණැස් නුවර යෝධයෝ රජ්ජුරුවන් කරා ගොස් කියන්නාහු "කෝසල රජ්ජුරුවෝ උන් හා කැටිව යුද්ධයට යන නියායෙන් අවසර දුන මැනවැ"යි කීහ.

ඒ අසා බරණැස් රජ්ජුරුවෝ "යුද්ධ කරන්ට කාරණා කිම්ද? යුද්ධයට නොයව"යි කියා අමාත්‍යයන් පිරිවරා මතුමාලේ ඉඳ "වාසල් දොර අරුව"යි කියා දොර ඇරවූහ. කෝසල රජ්ජුරුවවෝ සේනාව ඇරගෙන කිසි සැකයක් නැතිව තමන්ගේ රාජ්‍යයට වදිනා සේ වැද මතුමාලට නැගී රජ්ජුරුවනුත් බිසවනුත් අල්වා සිරගෙයි වැස්සූහ.

බෝධිසත්ත්වයෝ සිරගෙයි හිඳ මෛත්‍රී භාවනාකොට ධ්‍යාන උපදවා ගත්තාහ. එකියන රජ්ජුරුවන්ගෙත්, බිසවුන්ගේත් මෛත්‍රී භාවන්යේ ආනුභාවයෙන් රජ්ජුරුවන්ගේ

ශරීරය දහ වැදගත. කෝසල රජ්ජුරුවෝ "මේ කිමෙක්දැ?"යි විචාරන්නා අමාත්‍යයෝ කියන්නාහු "මෛත්‍රී කරන රජ්ජුරුවන් වහන්සේගේ රාජ්‍යය ඇරගත් හෙයින් උන්වහන්සේ කරන මෛත්‍රී ආනුභාවයෙන් ශරීරයේ දහ වැදගතැ"යි කියන්නා රජ්ජුරුවෝ සිරගෙයි උන් රජහුගේ දම් කප්පවා "නුඹවහන්සේගේ රාජ්‍යය නුඹවහන්සේම පිළිපැද්ද මැනවැ"යි කියා පාවා දී ඒ කියන කේලාම් කී අමාත්‍යයා මරවා තමන්ගේ නුවරටම නැගී ගියහ.

බෝධිසත්ත්වයෝත් පණවන ලද සිංහාසනාරූඪ ව අමාත්‍ය මණ්ඩලය පිරිවරා උන්නාහු "අමාත්‍යයෙනි, මා විසින් එක රජ්ජුරුවන්ට කළා වූ මෛත්‍රී ආනුභාවයෙන් මමත් ගැලවී තොප ඇමත් ගලවා ගතිමි. එසේ හෙයින් මට රාජ්‍යයෙන් කම් නැතැ"යි කියා මහණ වූහයි වදාරා බුදු ව වැඩ හිඳ වදාරනසේක් "එකියන රජ්ජුරුවෝ මෛත්‍රී ආනුභාවයෙන් ගැලවී ගියෝ වේදැ"යි වදාරා 'සෙය්‍යංස ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි කෝසල රජ්ජුරුවෝ නම් දැන් ආනන්ද ස්ථවිරයෝය. නොකටයුතු කියා බිඳු වූ අමාත්‍යයා නම් දේවදත්ත ස්ථවිරය. බරණැස් රජ්ජුරුවෝ නම් බුදුවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 282. වඩ්ඪ(කී) ජාතකය

තවද බුද්ධවිෂයයේ අනුන් විසින් නොසිතිය හැක්කා වූ ගුණ ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ධනුග්ගහතිස්ස තෙරුන්වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

බිම්බිසාර රජ්ජුරුවන්ට කෝසල රජ්ජුරුවන් විසින් තමන්ගේ නැගණියනුත් පාවා දී නැගණියන් නානු මුරයටය කියා ලක්‍ෂයක් වටිනා කසීගමක් දුන්හ. ඉක්බිති අජාසත් රජ්ජුරුවන් විසින් පියාණන් මරාපු හෙයින් කෝසල රජ්ජුරුවෝ තමන්ගේ නැගණියන්ට දුන් කසීගම උදුරා ගත්තාහ. ඒ නිසා දස විටම උනුන් හා කැටිව සටන් ඇතිව තිබෙන්නේය.

එක් දවසක් කෝසල රජ්ජුරුවෝ සිතන්නාහු “සංඝයා වහන්සේ නම් බොහෝ නුවණැතිසේක. එසේ හෙයින් විහාරයක් පාසා ඇවිද කියන බස් අසව”යි කියා චරපුරුෂයන් සැලැස් වූහ. එකියන චරපුරුෂයෝ ගණයක් පාසා පරීක්‍ෂාකොට ඇවිද්දුහ. තෙරුන්වහන්සේ යයි දෙදෙනා වහන්සේ වාසය කරනසේක් මධ්‍යම රාත්‍රියෙහි පිබිද ධනුග්ගහතිස්ස තෙරුන්වහන්සේ උපතිස්ස තෙරුන්වහන්සේට කියනසේක් “කෝසල රජ්ජුරුවෝ බත් බොහෝ කන්ට සුරු පමණක් විනා තමාගේ බෑ වූ අජාසත් රජ්ජුරුවන් අල්වාගත නොඑන්නාහ”යි

කියන්නාහු උන්වහන්සේ කියනසේක් "ඇවැත්නි, සේවාකම් නම් පදුමබ්‍රැහය, චක්‍රබ්‍රැහය, සටකබ්‍රැහ යයි යන තුන් උපායක් ඇත. සකටබ්‍රැහ නම් දැලයෙන් පිරිස් සලසා සේවාකම් කොට පසුබැස මරුබට සේ පිරිස් මධ්‍යයේ සටන් වන්කල අල්වා ගැන්ම එක් උපායෙක. ඒ නියායෙන් අසවල් පර්‍වත සමීපයෙහි දී යුද්ධ කරන්නා අල්වා ගත හැක".

ඒ ඇසූ චරපුරුෂයෝ මේ උපාය රජ්ජුරුවන්ට කිවුය. ඒ ඇසු රජ්ජුරුවෝ සේනා වාහන සන්නද්ධව නික්ම කී නියාවට පිරිස් සලසා යුද්ධකොට අජාසත් රජ්ජුරුවන් අල්වාගෙන තමන්ගේ නුවරටම ගෙනවුත් තමන්ගේ දුවණියන් වූ රාජකුමාරිකාවන් පාවා දී පළමු දුන් ගම්වරත් දී උන්ගේ නුවරටම යවූහ.

මේ කථාව ධම්සභාවේ රැස් වූ මාළුවරුන් වහන්සේ කියනසේක් "මේ යුද්ධ ප්‍රයෝගය කර වූසේක් ධනුග්ගහතිස්ස තෙරුන්වහන්සේම"යි කියා වැඩඋන් තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා එපවත් අසා "දැන්මතු නොවෙයි, පෙරත් ධනුග්ගහතිස්සයෝ යුද්ධ ප්‍රයෝගයෙහි දක්‍ෂයෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි වඩු ගමෙක උපන්නා වූ

වඩුවෙක් දඬු සොයා වලට(වනයට) ගියේය. එක් ඌරු පැටවෙකු දැක අල්වාගෙන "වඩන්ටය"යි කියා ගෙට ගෙනගොස් වැඩීය. එකියන ඌරුත් වැඩී දළ වළල්ල වැටී මහත් වූ කය ඇති විය. එකියන ඌරා වඩුවන් වැඩූ හෙයින් "වඩ්ඪසූකර ය"යි කියා නම් තැබීය. එකියන ඌරාත් වඩුවාට වෑ නියන් දීලයි, කපන ලද දඬු පෙරලා පෑලයි, කළු හූය කටින් ඩෑගෙන කළු හූය ගසා මේ නියායෙන් කීකරුව වසන්නේය.

වඩුවා දවසක් සිතන්නේ "මාගේ ඌරා වැඩිවිය පැමිණියේය. එසේ හෙයින් යම් කෙනෙක් මරාපු නම් නපුරැ"යි සිතා එකියන ඌරා වඩාගෙන වලට ගොස් ඌරා වලට අළහ. ඒ ඌරාත් වලට වැද තමාගේ රැස ඌරන් හා එක් වුයේය. පැන් හා කැවිලි පෙවිලි පාසු තෙනක බොහෝ ඌරන් දැක එතනට ගියේය. ඒ වල ඌරෝත් මේ ඌරා කරා අවුත් සිටියාහ. එවිට වල වසන ඌරන්ට කියන්නේ කුමක්ද? "පලාඵල සමුර්ධ වූ පසු ඌරනුත් බොහෝ වූ තෙනකට පැමිණිය"යි කියන්නා එවිට ඌරෝ කියන්නාහු "ඉන් අඩුවෙක් නැත, එසේ වුවත් අපට මහත් වූ භයෙක් ඇතැ"යි කීහ. වඩ්ඪසුකර කියන්නේ "තොප දුටු ගමනේ මේ නියා කැවිලි ඇතිතෙන දුර්වලව ඉඳිනේ භයෙක් ඇති නියා යයි දනිමි"යි කියා "තොප ඇමට ඇති භය කිම්දැ"යි විචාළාහ. එවිට එකියන ඌරෝ කියන්නාහු "එක ව්‍යාඝ්‍රයෙක් අප කරා ඇවිත් දුටු දුටුවන් කයි" කීය. "එසේ හෙයින් අප ඌ කෙරේ භයින් වැරද ගියම්හ"යි ඌරෝ කිවුය.

වඩ්ඪසූකර එවිට කියන්නේ “එකියන ව්‍යාඝ්‍රයා දවස් පතා ඒද? අතරතුරෙක එද්දැ?”යි විචාරන්නා ඌරෝ කියන්නාහු “දවස්පතා නොඑයි. අතරතුරක එන්නේය”යි කියන්නා “එසේ වීනම් මා කීවක් කරවු නම් ව්‍යාඝ්‍රයා මම අල්වා දෙමි” කීහ. ඌරෝ “යහපතැ”යි ගිවිස්සාහ. එවිට එකියන වඩ්ඪසූකර ඌරුත් යුද්ධයට සලස් වන්නේ කුඩා ඌරන් වටකොට සලස්වා, ඊට ඇතුළුපිට දළ වළල්ල වැටුනු ඌරන් සලස්වා, ඊට ඇතුළුපිට යුද්ධයෝග්‍ය ඌරන් සලස්වා, සතර දිසාවේ ඌරන් දසය, විස්සය නියායෙන් ඇනි සලස්වා, මධ්‍යයේ ගොඩක්කොට තිබා ඔරුවක් සේ වළක් ඉදිකොට, ඒ වළ නමිනව තිබෙන නියායෙන් සලස්වාගෙන වට රැකවල් ලා සිටි ඌරන්ට “තෙපි ඇම නොබව”යි කියා විධානකොට ඇවිදිනා කලට ඉරු උදාව පාන් වන්නට වන.

ඒ වේලාවට ව්‍යාඝ්‍රයා පර්‍වත මුදුනෙන් පෙණින. එවිට ඌරෝ “ස්වාමීනි, පසමිතුරා ආය”යි කීහ. එවිට ඌරු කියන්නේ “ව්‍යාඝ්‍රයාද කළ යම් ක්‍රියාවක් තෙපි ඇමත් කරව”යි කීහ. එවිට ව්‍යාඝ්‍රයා කිළි පොලන්නා ඌරෝ කිළි පෙලුහ. ව්‍යාඝ්‍රයා ගර්ජනා කරන්නා ඌරොත් ගර්ජනා කළහ. ව්‍යාඝ්‍රයා මලමුත්‍ර කරන්නා ඌරෝ මලමුත්‍ර කළහ. එවිට ව්‍යාඝ්‍රයා සිතන්නේ “මෙතෙක් දවස් සේ නොවෙයි, අද යම් අමුත්තෙක් ඇතැ”යි සිතා තමා මස් මරාලන තාපසයන් කරා ව්‍යාඝ්‍රයා ගියේය. එවිට තාපසයෝ කියන්නෝ “ඇයි? මෙතෙක්ද ඌරු මස් ගෙනෙන තැනැත්තවු අද ඌරු මස් නොගෙනායේ

ඇයිද? තාගේ ඇඟ ශක්ති නැද්ද? ඌරෝ නිමා ගියෝ දැ?''යි විචාළෝය.

එවිට ව්‍යාඝ්‍රයා කියන්නේ ''තාපසයන් වහන්ස, මා ඇඟ ශක්ති ඇත. ඌරොත් ඇත. මෙතෙක් ද සේ නොවෙයි, අද අහංකාරව සිටියේය. එහෙයින් නොගියෙමි'' කියන්නා තාපසයෝ කියන්නාහු ''ඌරන් කෙසේ ශක්ති ඇතත් තොප ඇමටම භය ඇත්තෝය. එසේ හෙයින් නොබා වහා ඌරන් ගෙනව''යි කීහ. එබසට ''යහපතැ''යි කියා ව්‍යාඝ්‍රයා අවුත් තමා පළමුත් ඌරන්ට පණින්නා වූ පර්‍වත මුදුනට පැන නැගී සිටියාවුන් ඌරන් දැක තෙමෙත් වළ මධ්‍යයෙහි සිටියේය. එවිට ව්‍යාඝ්‍රයා ඌරන් සිටියා වූ දැක වේගයෙන් පීනු කලට ඌරු තමා ගැලවියන්ට සාරා තුබූ උමගින් පලා ගියේය. ව්‍යාඝ්‍ර පීනු වේගය රඳවාගත නොහී ඒ වළට පැන ඔරුවෙක ලූවා සේ සිටියේය. එවිට වඩ්ඪසූකර තමා සිටි තෙනින් ගොඩ නැගී ව්‍යාඝ්‍රයා දුටුයේය. මහත් වේගයෙන් දිවගෙන ගොස් ව්‍යාඝ්‍රයා මරා උගේ පඤ්චමධුර මාංශය අනුභවකොට ගොඩ නැගී ඌරන්ට කියන්නාහු ''තොපගේ සතුරා මරා පීමි'' කියන්නා පළමුවෙන් දිවගෙන ආ ඌරෝ උගේ මාංශය අනුභව කළහ. පස්සේ ආ ඌරෝ මස් කෑ ඌරන්ගේ හොට ඉඹ සිටියාහ.

වඩ්ඪසූකර කියන්නේ ''තොපගේ සතුරා මළේය. ඉදිරියේ කිසි භයෙක් නොවී වාසය කරව්'' කීහ. එසේ කීවත් ඌරෝ දුර්මුඛව සිටියාහ. එවිට ''තොපි දුර්මුඛව ඇයිදැ?''යි කියන්නා

"ස්වාමීනි, ව්‍යාඝ්‍රයා මැරීමෙන් කම් කිම්ද? තව මුන් සේ ව්‍යාඝ්‍රයන් දස දෙනෙකු උගන්වා එවන්ට නිසි තාපස කෙනෙක් ඇත. ඌ මැරුවොත් විනා අපට භය සන්නොසිඳේ"යි කියන්නා "තාපසයෝ කොයිදැ?"යි විචාරන්නා "අසවල් තෙන වාසය කෙරෙති" කියන්නා "යහපතැ"යි කියා ඌරන් ඇරගෙන තාපසයන් උන් තැනට දිවූහ.

එවිට තාපසයෝ "ව්‍යාඝ්‍රයා තව දක්වා නොඑන්නේ ඇයිදැ"යි සිතා "බලන්ටය"යි එන කලට ඌරෝ තාපසයන් දැක ලුහුබඳවා ගත්හ. එවිට තාපසයෝ තමාගේ පරිෂ්කාර දමා වහා දිවගෙන ගොස් දිඹුල් ගසකට පැන නැංගේය. එවිට ඌරෝ "අප නටුවෝද තාපසයා ගැලවී ගියේය"යි කියන්නා "ඊට මම උපායක් දනිමි" කියා ඊරියන්ට කියා පැන් අද්දවා ගස මුල වත් කරවා, පැටිති ඌරන් සිගින් මුල් කඩන්ට හා මහ ඌරන් මහ මුල් කඩන්ට සලස්වා මේ නියායෙන් දිඹුල් ගස වට මුල් කප්පවා මැද්දේ තුබූ මහ මුල තුමූ පොරවක් බාලා කපන්නාක්මෙන් කපා හළහ. එවිට දිඹුල් ගස වැටින. ඌරෝ තාපසයන් යා නොදී ඇට පමණක් තිබා මස් ලියා කෑවාහ. එකියන දිඹුල් ගස පිට වඩ්ඪසූකරයනුත් යහපත් ඊරියකුත් ඉඳුවා තාපසයන්ගේ සකින් අභිෂේක ජලය වත්කොට තමන් ඇමටම රජකොට ගත්තාහ. එතැන් පටන් රජදරුවන්ට දිඹුල් ගස භද්‍ර පීඨයට ගත්තාහ. එතන වනයේ වෘක්ෂයක වාසය කරන්නා වූ වෘක්ෂදේවතාවා මේ කාරණය දුටුහයි වදරා 'වඩ්ඪසූකර ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි වඩ්ඪසූකරයා නම් ධනුග්ගහ ස්ථවිරය. එසමයෙහි වෘක්‍ෂදේවතාව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 283. සිරි ජාතකය

තවද යුගන්ධර සාගරය සේ අනන්ත වූ ගුණ මුහුදට ගලා යන්නා වූ සියුම් නුවණ ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ශ්‍රී දන්නා වූ බ්‍රාහ්මණයෙකු අරභයා මේ ජාතකය දක්වන ලදි.

මෙහි වර්ථමාන කථාව දුක නිපාතයෙහි 'ඛදිරංගාර' ජාතකයෙහි විස්තර වසයෙන් පෙණෙන්නේය.

අනේපිඩු මහසිටාණන්ගේ සතරවන දොරටුවේ වාසය කරන මිත්‍යාදෘෂ්ටි ගත් දේවතාදුවෙක් ඇවිත් අනේපිඩු මහසිටාණන්ට කියන්නේ "තොපි පොහොසත් ද සිව්පනස් කෙළක් ධන වියදම්කොට බොහෝ දන් පින් කළහ. දැන් සම්පත් වියදම් ව ගියහ. එහෙයින් දැන් පින් කරන්ට දුක්පත් ව ගියාහ. එසේ හෙයින් දන් පින් නොකරව"යි දේවතා දූ කියන්නී. අනේපිඩු මහසිටාණෝ "තී මාගේ දොරටුවේ වාසය කරන්ට බැරිය"යි නෙරපූවාහ. එවිට දේවතා දූ නුවර අරක්ගත් දේවතාවාට සහ සතරවරම් දෙවියන්ට හා ශක්‍රයන්ට කිව. එකියන දේවියෝ "අපට බැරිය"යි කියන්නා තොමෝ අනේපිඩු මහසිටාණන්ට සිව්පනස් කෙළක් සම්පත් දී

බුදුන් මැදයේ අනේපිඬු මහසිටාණන් සමා කරවාගෙන සෝවාන් ඵලයට පැමිණියාහ.

ඉක්බිති අනේපිඬු මහසිටාණන් පොහොසත්ව මහසම්පත් ඇතිව ඉන්නා අවස්ථාවට ශ්‍රී දන්නා බමුණෙක් "අනේපිඬු මහසිටාණන් ශ්‍රී ඇරගන්ට උවමැනව"යි සිතා ගෙට ගියේය. එවිට අනේපිඬු මහසිටාණෝ ඒ බමුණා දැක දන් දී ඉඳ "ඇයි? බමුණා ආයේය"යි විචාරන්නා බමුණා කථා කරමින් සිතන්නේ "මේ සිටාණන්ගේ ශ්‍රී කොයිදැ?"යි පරීක්ෂා කරන්නේ සිටාණන්ගේ ගෙයි ඇලි කුකුළෙකු දැක සිතන්නේ "සිටාණන්ගේ ශ්‍රී මේ ඇලි කුකුළාගේ කරමලේය"යි සිතා "සිටාණෙනි මා ලඟ අකුරු කරන අතවැස්සෝ පන්සියයක් ඇත. ඒ අතවැස්සන් ශාස්ත්‍ර පිරුවන්ට වේලා වරද්ද අඬන යම් කුකුළෙක් ඇත. එසේ හෙයින් ශාස්ත්‍ර පිරිහෙයි. වේලා නොවරද්ද අඬනඟන නියායෙන් තෙල ඇලි කුකුළා මට දෙව"යි කියා ඉල්වූහ. "යහපතැ"යි කියා ඇලි කුකුළා දුන්නාහ.

ඒ වේලෙහි ශ්‍රී ගොසින් සිටාණන්ගේ සිරෝමාණික්‍යයෙහි පිහිටියේය. එවිට බමුණා සිරෝමාණික්‍යය ඉල්විය. සිටාණෝ සිරෝමාණික්‍යය දුන්නාහ. එවිට ශ්‍රී ගොසින් අන්තරයෂටියෙහි පිහිටියේය. එයිත් අන්තරයෂටිය ඇරගත. එවිට ශ්‍රී ගොසින් සිටාණන්ගේ අග්‍රමහේසිකා සිටුදියණියන්ගේ ශරීරයෙහි පිහිටියාහ.

එවිට බමුණෝ කියන්නේ "සිටාණන් වහන්ස, නුඹවහන්සේගේ ශ්‍රීය ඇරගන්ට යයි කියා ඇවිත් කුකුළා ඉල්විමි, ඇලි කුකුළා ගන්නා සිරෝමාණික්‍යයෙහි පිහිටියාහ, එසේ හෙයින් සිරෝමාණික්‍යයත් ඇරගතිමි. සිරෝමාණික්‍යයෙන් ගොස් අන්තරයෂ්ටියෙහි පිහිටියාය. එවිට අන්තරයෂ්ටියත් ඇර ගතිමි. අන්තරයෂ්ටියෙන් ගොස් තොපගේ අග්‍රමෙහෙසිකා සිටුදුවගේ ශරීරයෙහි පිහිටියාය". එවිට බමුණා සිටාණන්ට කියන්නේ "සිටාණෙනි, තොපගේ ශ්‍රී ඇරගන්ට යයි කියා ආමි. තොපගේ ශ්‍රී මා තිබා කවුරුන් විසිනුත් ඇරගත නොහැක්ක. එසේ හෙයින් එකියන ශ්‍රීත් සියළු සම්පතුත් නුඹ වහන්සේම වින්ද මැනවැ"යි කියා ගියේය.

එවිට සිටාණෝ "මේ බමුණා කී නියාව සර්වඥයන් වහන්සේට කියන්ට උවමැනවැ"යි සිතා සර්වඥයන් වහන්සේට ගොසින් මේ නියාව සිටාණෝ දැන් වූහ. සර්වඥයන් වහන්සේ වදාරනසේක් "තමාගේ පිණින් සම්භව වූ සම්පත් කවුරුන් විසිනුත් හැරගත නොහැක්ක. පෙරත් උත්තමයන්ගේ පිණින් සම්භව වූ සම්පත් උත්තමයන් නිසා තාවුරු වුයේ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ තාපස ව ඉපිද බරණැස් නුවර වාසය කරන්නාහු එනුවර වාසය

කරන්නා වූ හස්තයාචාර්‍ය්‍යයෙක් බෝධිසත්ත්වයන්ට සතරපසයෙන් සංග්‍රහ කරන්නේය.

එසමයට එනුවර දරකැටියෙක් වලට(වනයට) ගොස් දර පළාගෙන එන්නේ නුවරට වදින්නට රෑව ගිය හෙයින් එක් දේවාලයක සැතපුනේය. ඒ දේවාලය සමීපයෙහි ගසෙක කුකුළෝ දෙන්නෙක් උඩ නැගී වැදහොත්තාහ. අළුයම් වේලේ අග අත්තේ වැදහොත් කුකුළු අඬ නගා වර්චස් කරන්නේය. පාත අත්තේ වැදහොත් කුකුළාගේ ඉස වර්චස් කෙළේයි. එවිට පාත අත්තේ වැදහොත් කුකුළු කියන්නේ "කවුරුද? මාගේ ඉස වර්චස් කළෝය"යි කියන්නා අග අත්තේ වැදහොත් කුකුළු කියන්නේ "මම නොදැන වර්චස් කෙළෙමි"යි කියා දෙවැනිව එකියන කුකුළුගේ ඉස වර්චස් කෙළේය. එවිට පාත වැදහොත් කුකුළා කියන්නේ "පළමු නොදැන වර්චස් කෙළෙහිය. දෙවනුව වර්චස් කළේ අයිදැ?"යි කියා උනුන් හා කලහ කළහ. "ඇයි, මාගේ තත්ත්වය නොදැනුද? යම් කෙනෙක් මා කවූ නම් මසුරන් දහසක් ලබති" කීය. උඩ අත්තේ වැදහොත් කුකුළු කියන්නේ "තාගේ මාංශ විපාක මෙතෙක් වේද? යම් කෙනෙක් මාගේ මාංශ කැවූ නම් රජ වෙති, ලගු මාංශය කැවූ නම් සෙනෙවිරත් වෙති, ඇටමුසු මාංශය තාපස කෙනෙක් කැවූ නම් රාජ කුලුපග වෙති, යම් ස්ත්‍රියක් කැවූ නම් අග්‍රමෙහෙසිකා වෙති" කීය.

එබස් දරකැටියා අසා ගසට නැගී ඒ කුකුළා අල්වාගෙන තමාගේ ගෙට ගෙන ගොස් කුකුළා මරා මස්කොට අඹුවට දී

තෙල කුකුළා මාලු පිස, බතුත් පිසවා "මේ කුකුළු නම් අලිස්සම් දෙයක් නොවෙයි. මේ කුකුළු මස් කෑ කෙනෙක් රාජ්‍යයට පැමිණෙති. එසේ වූ මාංශය ඉස සෝධා නහා කන්ට උවමැනවැ"යි අඹුවත් කැන්දාගෙන බත් හා කුකුළු මසුත් ඇරගෙන ගඟට ගොස් බත් මාලු වැල්ලේ තබා ගඟට බටහ.

ඒ වේලාවට උඩුගඟින් වතුර ඇවිත් බත් සැළ හා මාළු ගඟ වතුරේ ගෙ යන්නේ, ගඟ පාත ඇත්හලට නායක වූ අමාත්‍යයා හා ඇත්හල ඇතුන් නාවන තැනට පැමිණියේය. එය දැක ඇත්හලයෙක් අමාත්‍යයාට ගෙන ගොස් දින. අමාත්‍යයොත් ඒ කුකුළු මාලු හා බත් දැක "තෙල අලවි නොකොට තබන්ට කියව"යි කියා ගෙට යවුහ.

ඒ දරකැටියා වැලි මිටක් හා මාලුවට පැන් කටක් බී ගොඩ නැන්ගේය. ඒ අමාත්‍යයාගේ කුළුපග තාපස කෙනෙක් ඇත්තාහ. ඒ තාපසයන්ට දිවස් ඇත්තේය. ඒ කුකුළු මස් දිවසින් දැක "මා එතනට ගොස් මාගේ මේ අමාත්‍යයා කුකුළු මස් කෑවා රාජ්‍යයට පමුණුවා මා ඔවුන්ට කුළුපග තාපස උවමැනවැ"යි අමාත්‍යයා එන්නට පළමු තාපසයා ගොස් ඇත්හලට නායක අමාත්‍යයාගේ ගෙයි ගොසින් උන්නාහ. ඒ වේලාවට අමාත්‍යයා ගොට අවුත් තාපසයන්ට බත් පිළිගන්වා කුකුළු මාලු පිලිගන් වන්ට වන. එවිට තාපසයෝ කියන්නාහු "මා විධාන කළ කල මාලු පිළිගන් වන්නේය"යි කියා උත්තම මාංසය ඇත්හල නායකයන්ට කන්ට සලස්වා, මධ්‍යම මාංසය උන්ගේ ඇඹෙනියන්ට අනුභව කරන නියායෙන් සලස්වා තුමූ

ඇට මාංසය අනුභවකොට "උපාසකය, අදට තුන්වෙනි දා තොපට රාජ්‍යය පැමිණෙයි, සුවපත්ව"යි කියා ගියහ.

ඉක්බිති කෝසල රජ්ජුරුවෝ "බරණැස් නුවර ගන්නා පිණිසය"යි සටනට අවුත් නුවර වටකොට ගත්හ. එවිට බරණැස් රජ්ජුරුවෝ "තුමූ සේනාවට විධානකොට සේවාකම් කරන්ට උවමැනවැ"යි කියා ඇත්හල නායකයන්ට සේසත් නන්වා ඇතු පිට ඉඳුවා තුමූ සේනාව මධ්‍යයෙහි සිටියාහ. ඒ වේලාවට පරසතුරන් ගෙන් එකෙකු විදි ඊ දණ්ඩකින් රජ්ජුරුවෝ විත් කා ජීවිත විනාසයට පැමිණියාහ. එවිට සේනාව රජ්ජුරුවන් නැසුණු නියාව දැන පසු බසින්ට වන්හ.

එවිට ඇත්හල නායකයා "මම වසතු දෙමි. තොප සටන් කරව"යි කීහ. එවිට සේනාව සටන්කොට පරසතුරන් සිඳුවා තමන්ගේ මළා වූ රජ්ජුරුවන් ආදහනය කරවා "රාජ්‍යයට කවුරුන් තබමෝදැ?"යි කථාකොට "රජ්ජුරුවන් වහන්සේ ජීවත්ව ඉඳම ඇත්හල නායකයන්ට රාජ්‍යය පමුණුවන ලදහ. උන්වහන්සේ මළ පසුත් සේනාව හා සටන්කොට සතුරන් පරාජයට පමුණුවා අපට වැඩ කරනලද. එසේ හෙයින් මෝහටම රාජ්‍යය පමුණුවම්හ"යි රාජ්‍යයට තබා උන්ගේ බිරිඳ අග්‍රමෙහෙසිකා කොට සලස්වා, තාපසයෝ රාජ කුලුපගව තාපසකමට සැරසුනාහ"යි වදාරා බුදුව වැඩ ඉඳ වදාරනසේක් "ගෘහපති පුත්‍රය, මේ ලෝකයෙහි සත්ත්වයන්ට කුසලය හා සදෘශ වූ ආකාරයෙක් නම් නැත. පිනැත්තවුන්ට අන්‍යාකරයේ රත්නයන් උපදිති. එසේ හෙයින් මේ කුසලය නම්

**දේවමනුස්සානං** - දිව්‍ය මනුෂ්‍යයන්ට, **සබ්බ කාම දදේ ඉෂ්ටාර්ථය** - ඉෂ්ට කරන්නා වූ නිධි නිධානයක් හා සමාන වන්නේය. **යං යං එව** - යමක් යමක්ම, **අභිපත්‍ථෙනති** - සිතින් පාර්ථනා කළාහු වීනම්, **සබ්බං** - ඒ සියල්ල, **එතෙන** - මේ කුසලය කරණ කොටගෙන, **ලබ්භති** - ලැබෙන්නේය. **සුවණ්ණතා** - මනා වූ ශරීර ඇති බවද, **සුස්සරතා** - මනා වූ මධුර ස්වර ඇති බවද, **සුසණ්ඨාණතා** - මනා වූ වර්ණ සංස්ථාන ඇති බවද, **සුරූපතා** - මනා වූ රූපසම්පත්ති ඇති බවද, **අධිපච්ච පරිවාරො** - සියල්ලන් මැඩ පවත්නා ආකාරයෙන් පවත්නා වූ අධිපතිභාවය හා පිරිවර, **ලබ්භති** - ලැබෙන්නේය. **මානුසිකාච සම්පත්ති** - මනුෂ්‍ය ලෝකයේ ඉපද අනුභව කටයුතු වූ සම්පත්තියක් ඇද්ද, **දෙවලොකෙච යාරති** - දිව්‍යලෝකයෙහි ඉපිද සම්පත් අනුභවකරන්නට හේතු යම් ඇල්මෙක් ඇද්ද, **යාව නිබ්බාන පත්ති** - කෙළවර අර්හත් ඵලාවසානයෙහි වින්ද යුතු වූ යම් නිර්වාණ සම්පත්තියක් ඇද්ද, **සබ්බං** - ඒ සියල්ල, **එතෙන** - මේ කුසල බලය හේතු කොටගෙන, **ලබ්භති** - ලැබෙන්නේය".

"**මිත්තසම්පදමාගම්ම** - කල්‍යාණ මිත්‍රයන්ගේ සම්පත්තියට පැමිණ හෙවත් සත්පුරුෂ සමාගමයට පැමිණ, **වෙ** - ඒකාන්තයෙන්, **යොනිසො පයුජ්ජතො** - නුවණින් යෙදී වාසය කරන්නා වූ පුද්ගලයා හට, **පුබ්බ** - පූර්ව, **නිවාසානුස්මෘති, දිව්‍යචක්‍ෂුරඥාණ, ආශ්‍රවක්‍ෂයකරඥාණය** - සංඛ්‍යාත වූ ත්‍රිවිද්‍යාවන් හා විමුක්ති අර්හත්ඵල විමුක්තිහුගේ බසින් හා වොවසිතා, ප්‍රාප්තබවය යන, **සබ්බං** - සියල්ල, **එතෙන** - මේ

කුසලය හේතු කොටගෙන, **ලබ්භති** - ලැබෙන්නේය. **පටිසම්භිදාය** - නම් අර්ථපටිසම්භිදාය, ධර්මපටිසම්භිදාය, නිරුක්ති පටිසම්භිදාය, පටිභාණ පටිසම්භිදාන කියන ලද චතුපටිසම්භිදා, **විමොක්ඛාච** - සුඤ්ඤත විමෝක්ෂ, අනිමිත්ත විමොක්ෂය, අප්‍රනිහිත විමොක්ෂයයි කියන ලද ත්‍රිවිධ විමොක්ෂයන්ද, **යාව සාවක පාරමී** - යම් සාවක පාරමිතා ඥාණයෙක් ඇද්ද, **පච්චෙකබෝධි** - පසේබුදු බෝධි ඥාණයෙක් ඇද්ද. **බුද්ධභූමි** - සම්‍යක් සම්බෝධි ඥාණයෙක් ඇද්ද, **සබ්බං** - ඒ සියල්ල මේ කුසලය කරණ කොටගෙන, **ලබ්භති** - ලැබෙන්නේය".

"**යදිදං පුඤ්ඤ සම්පදා** - යම් මේ කුසල සමුර්ධියෙක් ඇද්ද, **එසා** - මේ කුසල සම්පත්තිය, **එවං** - මෙසේ යථොක්ත වූ කාරණයෙන්, **මහිද්ධිමා** - මහත් සෘද්ධි ඇත්තේය, **තස්මා** - එසේ හෙයින්, **ධීරා** - අෂ්ටලෝක ධර්මයෙහි අකම්පස් ස්වරූප ඇත්තා වූ, **පණ්ඩිතා** - නුවණැත්තා වූ, **සුකතපුඤ්ඤතං** - සීලා දී වශයෙන් බොහෝකොට කරනලද කුසල් ඇති බව, **පසංසන්ති** - ප්‍රසංසා කෙරෙති" වදාරා මේ 'සිරි ජාතකය' නිමවා වදාළසේක. "ඇත්හලට නායක අමාත්‍යයා රාජ්‍යයට පැමිණියේය. රජ්ජුරුවන්ට කුලුපග තාපසව උපන්නෙම් බුදුවූ මම්ම වේදැ"යි වදාළසේක.

# 284. මණිසූකර ජාතකය

තවද ඉරුට වඩා තේජෝ ගුණ ඇති සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි සුන්දරී පරිබ්‍රාජිකාව අරභයා මේ ජාතකය දක්වන ලදි.

සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි සර්‍වඥයන් වහන්සේට ලාභ සත්කාර මහත, තීර්ථකයන්ට ලාභ සත්කාර මඳ, එසේ හෙයින් තීර්ථකයෝ එක්ව "ශ්‍රමණ භවත් ගෞතමයන්ට කිළුටක් උපද්දවා ලාභයෙන් පිරිහෙලම්හ"යි සිතා "අනික් කෙනෙකුන්ට බැරිය, සුන්දරී පරිබ්‍රාජිකාව රූපයෙන් යෞවනයෙන් යහපත්ව ඉඳිනීය, ඈ විෂයෙහි ශ්‍රමණ භවත් ගෞතමයන්ට කිළුටක් උපද්දවම්හ"යි සිතා උන් කලට සුන්දරී පරිබ්‍රාජිකාවෝ නිගණ්ඨනාථ පුත්‍රයන් දිකින්ට ගොසින් වැඳලා සිටියහ. නිගණ්ඨයෝ උන්ට බසකුත් බැණ නොනැගී උන්නාහ. එවිට සුන්දරී පරිබ්‍රාජිකා කියන්නී "ඇයි ස්වාමීනි, බැණ නොනැගී වැඩ ඉඳිනේ, සිතට කුමන විකෙෂ්පයෙක්දැ?"යි විචාළීය.

එවිට නිගණ්ඨයෝ කියන්නෝ "ඇයි, තොපට නොදැනේද? ශ්‍රමණ භවත් ගෞතමයන් අපට වන ලාභ සත්කාරත් විය නොදී අප මූණ දැලි ගා අපට කරන නිසරු තොපි නොදනුදැ?"යි කියා "ඒ ශ්‍රමණ භවත් ගෞතමයන්ට කිළුටක් උපදවා පියාතොත් තොප විනා අනික් කෙනෙකුන්ට බැරියයි, ඒ නියාවට තොපි යහපත් රූපශ්‍රී ඇත්තී දන්නා යම් උපායක් කොට උන්ට කිළුටක් උපදව"යි කියන්නා "ඔයිත් යහපත

ස්වාමීනි" කියා එදවස් පටන් උපාසකවරුන් ජේතවනාරාමයට ගොස් බණ අසා රෑ එන කලට තොමෝත් ගඳදුම්, මල්, පහන් ගෙන බුලත්, පුවක් ගෙන කඩක් ගෙන ඇතිරි, කොට්ටත් ඇරගෙන ජේතවනාරාමයට යන්නාක් මෙන් අඟවා යන්නීය. ඈ දැක උපසකවරු "ඇයි, තෝ මේ වේලේ කොයියෙහිදැ?"යි විචාරති. ඕද "ජේතවනාරාමයේ ගඳකිළියේ මාත් වාසය කරන්නේය"යි කියයි. නිදා නැගිත් උපාසකරු එන්නාට පළමු ඉවත නිගණ්ඨයන් වාසය කරන තෙනක ලැග ගමට බැස "කොයි සිට එව්දැ?"යි විචාළ කලට "ජේතවනාරාමයේ ගඳකිළියෙහි ලැග එමි"යි කියයි.

මේ නියායෙන් බොහෝ දෙනා දකිනා නියායෙන් ඇවිද කල් යවා බොහෝ දෙනා සැක උපන් පසු නිගණ්ඨයෝත් සොරුන්ට අත්ලස් දී ඒ සුන්දරී පරිබ්‍රාජිකාව අල්වා මරා සර්‍වඥයන්, ශ්‍රාවකයන් මැරුවා කොට අඟවා ජේතවනාරාමයේ ගඳකිළියේ මල් දමන කසල ගොඩ පීරා ලවා නිගණ්ඨයෝ රජ්ජුරුවන්ට කියන්නාහු "සුන්දරී පරිබ්‍රාජිකාව දැන් දකින්නේ නැත. යම් යම් කෙනෙකුන් මරාපු බවත් නොදැනෙ"යි, රජ්ජුරුවන්ට කියා අමාත්‍යයන් ගෙන නුවර මුළුල්ල බලා ජේතවනාරාමයට ගොස් පරීක්ෂාකොට මල්කසල යට තිබුනු මිණිය ඇද එලියේ ලා ඇඳල ලාගෙන රජ්ජුරුවන්ට ගොසින් පෑහ.

රජ්ජුරුවෝත් "ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ශ්‍රාවකයන් කළ නොකටයුත්ත බොහෝදෙන දකිනා නියායෙන් සුසාන

භූමියේ තබව''යි කියා මුලුනුවර ආරියශ්‍රාවකයන් හැර සෙසු බොහෝදෙන එතනට රැස්ව ''ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ශ්‍රාවකයන් කළද බලව''යි ඒ ඒ තැන සිට බණන්නාහ. එපවත් භික්ෂූන් වහන්සේ සර්වඥයන් වහන්සේට දැන් වූවාහ.

සර්වඥයන් වහන්සේ වදාරනසේක් ''වැරැද්ද කළ කෙනෙකුන්ට ආක්‍රෝශය කියන පමණක් විනා නිවරදි සත්ත්වයන්ට කවරෙක් කීවත් තමාට ප්‍රයෝජන කිම්දැ?යි කියව''යි වදාළසේක.

කෝසල රජ්ජුරුවෝ කියන්නාහු ''සර්වඥයන් වහන්සේගේ ශාසනයෙහි ශ්‍රාවකයන් වහන්සේ මිණියක් නොමරණ සේක. මිණිය මැරූවන් විචාරා නියම් කරන්ට උවමැනව''යි වදාළ කල්හි අමාත්‍යයෝ මිණිය මැරූවන් පරීක්ෂා කරන්ට නියෝග කළ කල්හි නිගණ්ඨයන්ගෙන් මසුරන් පන්සියයක් අත්ලස් ඇරගෙණ මිණිය මැරූ සොරුන්ගෙන් සමහර කෙනෙකුන් එකියන රන් දීලා රා මස් ආදිය ගන්නාහ. රන් නොලත් සොරු කියන්නාහු ''එක් මිනියක් මරා ලත් රනින් අපටත් සරි සේ නොදී තුමූම ප්‍රයෝජන ගන්නාහ''යි සියල්ලවුන්ට ඇසෙන නියායෙන් කී බස් අමාත්‍යයෝ ද අසා මෙකියන සොරුන් ගෙන ගොස් රජ්ජුරුවන් වහන්සේට පෑ කල්හි ''මෙකියන මිණිය කවුරුන් කියමනකින් මැරූදැ''යි විචාළ කල්හි ''නිගණ්ඨයන්ගෙන් අත්ලස් ඇරගෙන මිණිය මැරූම්හ''යි කී කල්හි එකියන නිගණ්ඨයන් ගෙන්වා විචාරා ''සැබැව''යි නිගණ්ඨයන් කී කල්හි එබස් අසා රජ්ජුරුවන් වහන්සේ

එකියන මිණිය ගෙන්වාගෙන මිණිය නිගණ්ඨයන්ගෙන් ඉස තබා එනුවර වීථියක් පාසා කියා ඇවිදින්නාහු "මේ මිණිය සර්‍වඥ ශාසනයේ ශ්‍රාවකයන් වහන්සේ නොමැරූසේක. ඔබ වහස්සේගේ සර්‍වඥයන් වහන්සේ නිෂ්ප්‍රභා කරන පිණිස අපිම මැරුමෝයයි කියව"යි කියා "වීථියක් පාසා ඇවිදුව"යි කියා යවු නියාව සියලු සත්ත්‍වයෝ අසා "සර්‍වඥ ශාසනයට බොහෝ ශ්‍රාවකයන් වහන්සේ නිෂ්ප්‍රභා කරන්ට සිතා නිගණ්ඨයෝ තුමූම නිෂ්ප්‍රභා වුවෝ වේදැ"යි ශ්‍රාවකයන් වහන්සේ කිය කියා වැඩඋන් තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තවය උනුදැ?"යි විචාරා වදාරා එපවත් අසා "මහණෙනි, යම් සේ සිංහයාගේ ඡායාව නොපෙණන පරිද්දෙන් උන් ගුහාව කිළුටු කරන්නට වැද කිළුටු කොටගත නුහුනුවාක් මෙන් සර්‍වඥයන් කිළුටු කොටගත නුහුනුවෝ වේදැ"යි වදාරා ඒ භික්‍ෂූන් විසින් ආරාධිත වූ බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයෝ එක්තරා බමුණු කුලයක ඉපිද පඤ්චකාමයෙහි ආදීනව දැක ගිහිභාවය හැර හිමාලය වනයට වැද සත්පර්‍වත වලල්ලක් ඇතුළුව තාපස ව වාසය කරන්නාහ.

බෝධිසත්ත්‍වයන් වසන්නා වූ ස්ථානයට නුදුරු තැනක වෛඩූර්‍ය්‍ය මාණික්‍යයමය ගුහායෙහි උපන්නා වූ ඌරෝ තිස්

දෙනෙක් වාසය කරන්නාහ. ඊට ඔබ්බෙ ගුහායෙක සිංහයෙක් වාසය කෙරෙයි. ඒ සිංහයාගේ ඡායාව වෛඩූර්‍ය්‍ය ගුහායෙන් පෙනෙන්නේය. ඌරෝ සිංහයාගේ ඡායාව දකිමින් දවස්පතා භයට පැමිණෙන්නාහ. එවිට ඌරෝ සිතන්නාහු “මේ ඡායාව මකන්ට උවමැනව”යි සිතා මඩෙහි ගැලී ඇවිත් ඒ ගුහායේ ඇග උලන්නාහ. මේ නියායෙන් මඩ හා ඌරන්ගේ ලොම් වැද ගැණීමෙන් මැණිකේ ඡායාව ආදි නියාවටත් දියුණුව බබලන්ට වන.

ඌරෝ මේ නියායෙන් උත්සහකොට ඒ පර්‍වත කිළුටු කොටගත නොහී එන්නාහු “තාපසයන් කරා ගොස් මීට උපායක් විචාරම්හ”යි සිතා “තාපසයන් වහන්සේ අපි මේ වෛඩූර්‍ය්‍ය ගුහායේ සත් අවුරුද්දක් විතර වාසය කළම්හ. අපි වසන්නා වූ ගුහාවට නුදුරු තැනක සිංහයෙකු වාසය කරන්නේය. සිංහයාගේ ඡායාව පර්‍වතයේ වැටී අපට දවස් පතා භය උපදවයි. එසේ බැවින් පර්‍වතය කිළුටු කරන්නට යයි කියා මඩ ගා උලාත් පර්‍වතය කිළුටු කොටගත නුහුනුවම්හ. ඊට අපට උපායක් කියන්නේ යහපතැ”යි සිතා තාපසයන් වහන්සේ අතින් උපායක් විචාළාහ.

තාපසයෝ කියන්නාහු “ඌරු ලොම් හා මඩ වැද ගැණීමෙන් පර්‍වත ඔපය පවත්වන පමණක් විනා කිළුටු කොටගත නොහැක. මේ උපායෙක් නොවෙයි, තොපි ඇම මේ ගුහාව ඇරපියා භය ඇත්නම් ඔබ්බකට පලා යව””යි කීහ. “යහපතැ”යි ඌරෝ ඔබ්බට ගියහ. බෝධිසත්ත්‍වයෝත්

නොපිරිහුනු ධ්‍යානයයෙන් පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා බඹලොව ගියහයි වදාරා මේ ‘මණිසූකර ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි තාපස ව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 285. සාලොහිත (සාලූක) ජාතකය

තවද සඳුට වඩා සෞම්‍ය වූ ගුණ ඇති සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි චුල්ලකුමාරිකා පලෝභනය අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

එක් භික්ෂු කෙනෙකුන් වහන්සේ චුල්ලකුමාරිකා යන ස්ත්‍රියකට ආලය ඇති නියාව භික්‍ෂූන් වහන්සේ සර්‍වඥයන් වහන්සේට දැන් වූසේක් සර්‍වඥයන් වහන්සේ “සැබෑද? මහණැ”යි විචාරා වදාරන්නා “සැබැව, ස්වාමීනි” කී කල්හි “පෙරත් තොපි මුන් නිසා අමුත්තන්ට බල්ලන්ට මස් වුයේ වේදැ”යි වදාරා “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයෝ එක්තරා ගෙයක ගොන් ව උපන්නාහ.

බෝධිසත්ත්‍වයන්ට ‘මහලෝහිත’ යයි නම් තුබූහ. බෝධිසත්ත්‍වයන්ගේ මලණුවන්ට ‘චුල්ලලෝහිත’ යයි නම්

තුබූහ. එකියන ගොන් දෙන්නා ඒ ගෙයි කළමනා යම්තාක් මෙහෙවරක් කොට සිටිනාහ. ‘සාලක’ නම් එක් ඌරෙකු ඒ ගෙයි ඇත්තෝ වඩා තමන් කන්නා සේ බොන්නා සේ කවා පොවා වර්ධනය කරන්නාහ. එවිට චුල්ලලෝහිතයෝ කියන්නාහු “මේ ගෙයි කළමනා යම් ම දෙයක් කරන්නාහු අපය, අපට තණ හා කුඩු ලති. නිකම් ඉඳිනා වූ ඌරාට නිරන්තරයෙන් සියලු කන දෑ කවා ඌව පෝෂ්‍ය කරන්නාහ. අපට එලෙස නොකරන්ට කාරණා කිම්දැ?”යි කීහ. එවිට මහලෝහිතයෝ කියන්නාහු “එම්බා මලන්ඩ, ඌට සියළු කන බොන දෑ ලන්නේ ඌගේ මාංශ වර්ධන වන නිසාය. මේ ගෙයි වැඩෙන කුමාරිකාව දුටුවාද? ඈ සරණ පාවා දෙන මඟුලේ බත් කන්ට ආ අමුත්තන්ට මාළු පිණිස කීප දවසකින් මූ මරන්නාහ. අපට ඒ කැවිල්ලෙන් කම් නැත. අපට දීර්ඝායුවට තණ හා කුඩු පමණැ”යි කීහ.

ඊට කීප දවසකින් ඒ කුමාරිකාව සරණ පාවා ගන්නා පිණිස ආවා වූ මනුෂ්‍යයන්ට ඒ කියන ඌරා කඩ කඩ කොට කපා මාළුකොට ආ අමුත්තන්ට අමුතු බතට දුන්නාහ. ඒ දැක ගොන් දෙන්නා “දුටුවාද? සැප සේ කවා පොවා ඌරාට වූ දැය? අපට අපගේ තණ හා කුඩුම යහපත් වීය”යි උන්ට කීහයි වදරා බුදුව වැඩහිඳ වදරණසේක් “එකියන ගොන් දෙන්නා ඒ ඌරාගේ කැවිල්ලට පළමුකොට නොසතුටු වූවෝ පසුව සමාධි වූවෝ වේදැ”යි වදරා ‘සාලෝහිත ජාතකය’ නිමවා වදාළසේක.

"එසමයෙහි කුමාරිකාව නම් මේ කුමාරිකාවය. එසමයෙහි උගරා නම් මේ භික්ෂූහුය. චුල්ලලෝහිතයෝ නම් ධර්‍මභාණ්ඩාගාරික වූ ආනන්ද ස්ථවිරය. මහලෝහිත නම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 286. ලාභගරු ජාතකය

තවද මාගේ ම දෙවි වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි සැරියුත් ස්වාමීන් ගණයේ ලාභගරු වූ භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද්දේය.

ඒ කෙසේද? යත්,

සැරියුත් සාමීන්ගේ ගණයේ එක්තරා භික්ෂු කෙනෙකුන් වහන්සේ "කුමන කාරණයකින් ලාභ උපදවා ගත හැකිදැ?"යි විචාළසේක. සැරියුත් ස්වාමීන් කියනසේක් "යම් කෙනෙක් උමතුව වාසය කෙරෙද්ද? යම් කෙනෙක් කේලාම් කියා වාසය කෙරෙද්ද? යම් කෙනෙක් නටා ගී කියා වාසය කෙරෙද්ද? යම් කෙනෙක් කටට ආවක් කියා දවස අරිද්ද? එසේ වූ මේ සතර පක්‍ෂයේ ඇත්තෝ ලාභය ලබති" කීහ. එබස් අසා "මෙසේ ලබන්නා වූ ලාභයෙන් මට ප්‍රයෝජන කිම්දැ?"යි නින්දාකොට කියා ගියහ.

මේ කථාව සර්‍වඥයන් වහනසේට සැරියුත් ස්වාමීන් දැන් වූසේක. මේ බස් අසා සර්‍වඥයන් වහන්සේ "පළමුත් මේ ලාභයට නින්දා කොමටම ගියෝ වේදැ"යි වදාරා "ඒ

කෙසේදැ?”යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුැ කෙනෙකුන් රාජ්‍යය පාලනය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ දිසාපාමොක් ආචාරී ව ඉපිද පන්සියයක් අතවැස්සන්ට ශිල්ප උගන්වා ඉන්නා අවස්ථාවෙහි ඉන් එක් අතවැස්සෙක් දිසාපාමොක් ආචාරීන් අතින් විචාරන්නේ “ස්වාමීනි, ලාභය උපදවා ගන්නේ කෙසේදැ?”යි විචාළේය.

ආචාරීහු කියන්නේ “යම් කෙනෙක් උමතුව වාසය කෙරෙද්ද? (පළමු කී නයින් දත යුතුය) එසේ වූ මේ සතරපක්ෂයේ ඇත්තෝ ලාභය ලබති” කීහ. අතවැසි කියන්නේ “ජනාපවාදය නිසා ලබන්නා වූ ලාභය නින්ද වෙයි. එසේ වූ ලාභය අපට එපයි, මෙසේ වූ බස් අපට නොකියව මැනව”යි කියා කිවයි වදරා ‘ලාභගරු ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි ඒ ලාභයට නින්ද කළ අතවැස්සා නම් මේ භික්ෂුහුය. එසමයෙහි දිසාපාමොක් ආචාරී ව උපන්නේ නම් බුදුවූ මම්ම ය”යි වදාළසේක.

# 287. මච්ඡද්වාර (උදන) ජාතකය

තවද මාගේ කල්‍යාණ මිත්‍ර වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් සොර වෙළඳම දන්නා ව්‍යාපාරිකයෙකු අරභයා මේ ජාතකය වදරන ලදි.

මෙහි වර්තමාන කථාව යටගිය ජාතකවල පෙණෙන්නේ යයි. මෙහි වනාහි බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ කෙළෙඹි කුලයෙක ඉපිද තමන්ගේ මලණුවන් හා සමග වෙළඳම්කොට මස්සෙන් දහසක් උපදවාගෙන දෙබෑයෝ ගමට එන්නාහු සැඩ ගඟක් සමීපයෙහි වැල්ලේ ඉඳ බෝධිසත්ත්වයෝ බත් කා මසුන්ට බත් ලා දෙවියන්ට පින් දුන්නාහ. ඒ ගංගාවේ වාසය කරන්නා වූ දේවතාවා පින් අනුමෝදන් විය. ඒ විපාකයෙන් එම විටම බොහෝ සම්පත් ලැබ බෝධිසත්ත්වයන් කෙරේ සතුටු විය. ඒ අවස්ථාවට බෝධිසත්ත්වයෝත් බත් කා වැල්ලේ නිදන්ට වන්නාහ.

ඒ වේලේ බෝධිසත්ත්වයන්ගේ මලණුවෝ වඤ්චා ප්‍රයෝග දන්නාහ. එසේ හෙයින් “මාගේ බෑනණුවන් වඤ්චාකොට මසුරන් දස ඇරගන්ට උවමැනවැ”යි සිතා බොරළු පය්‍යක් මසුරන් දස නියාවට බැඳ බෝධිසත්ත්වයන් ළඟ තබා බෝධිසත්ත්වයන් පිබිද යන්නාවුන් හා සමග ඔරුවට නැගෙන ගමනේ රන් පයියත් බොරළු පයියත් ඇරගෙන නික්මුනාහ. බෝධිසත්ත්වයන්ගේ මලණුවෝ බොරළු පයියත් ඇරගෙණ නික්මුනාහ. බෝධිසත්ත්වයන්ගේ මලණුවෝ “බොරළු පයිය දමා රන් පයිය ගනිමි”යි සිතා දමන තැනැත්තෝ බොරළු පයිය තබාගෙන රන් පයිය දැමූහ. බොරළු පයිය දමමි සිතා “රන් පයිය වැටිනැ”යි කීහ.

එවිට බෝධිසත්ත්වයෝ “යහපතැ”යි කියන්නාට යයි කියා උන්නාහ. ගඟ වසන්නා වූ දේවතාවා “ලාභයක් කළ තෙනැත්තවුට මා උපකාර කරන්ට උවමැනවැ”යි සිතා වැටුනු මසුරන් දහස මත්ස්‍යයෙකු ගිලින්ට සලස්වා තෙමේත් ඒ මත්ස්‍යයාට ආරක්ෂා ගත්තේය. එකියන දෙබෑයෝ ඔරුවෙන් ගොඩ නැගී තමන්ගේ ගමට ගියාහ. බෝධිසත්ත්වයන්ගේ මලණුවෝ රන් පයිය යයි සිතා බොරළු පයිය මුද බලා සිතන්නේ “රන් මටත් නුවුයේය. මාගේ බෑණන්ටත් නුවුයේය” බොහෝ වික්‍ෂේපව වැදහොත්තාහ.

එවේලාවට කෙවුලෝ මා දැල් එලා කුඩමැස්සන් අල්ලන්ට ගියාහ. දේවතාවගේ ආනුභාවයෙන් මසුරන් දහස ගිලුනු මත්සයා මා දැලට අසුව ගියේය. එවිට කෙවුලෝ කුඩමැස්සන් මරාගෙන අවුත් සෙසු මත්ස්‍යයන් විකොට රන් දස ගිලූ මත්ස්‍යයා ගෙයක් පාසා ඇරගෙන මසුරන් එක්දස් සත් කලඳකට ඇරගණුවයි කියා ඇවිද ඇරගන්නන් නැති හෙයින් බෝධිසත්ත්වයන්ගේ ගෙදරට ගෙන ගියාහ. බෝධිසත්ත්වයෝ “කොතනට විකුනන්නේය”යි විචාරන්නා “එක්දහස් සත් කලඳකට ය”යි කියන්නා “සත් කලඳකට දෙව”යි කියා ඉල්ලූ ගමනේ “යහපත, නුඹවහන්සේ ඇරගණිතොත් ඒ නියාවට දෙම්හ”යි කියා රන් සත් කලඳක් ඇරගෙන මත්ස්‍යයා දුන්නාහ.

ඈ මත්ස්‍යා ගෙන ගොසින් මාලු කරන කලට මත්ස්‍යයා බඩ තුබූ මසුරන් දහස දැක බෝධිසත්ත්වයන්ට ගෙන ගොසින්

දුන්හ. බෝධිසත්ත්වයෝ දසින් බඳ පියල්ල දැක තමන්ගේ අස් නියාව දැන "කවුරුදේ මාගේ මේ ලාභය මට පවත්කොට දුන්නේය"යි සිතා උන් කලට දේවතාවා ආකාශයෙහි සිට "මමය, මේ මත්ස්‍යයා අනික් කෙනෙකුන් ඇරගත නොදී තොපට ගෙනැවිත් දුන්නේම් මමය"යි කියාත් "තොපගේ මලණුවන් කෙළේ මෙලෙසය"යි කියාත් "උන්ට මින් මස්සකුත් නොදෙව"යි කියාත් දේවතාවනුත් "යම් කෙනෙකුන්ට ප්‍රසංසා වන්නේ යහපත් කෙනෙකුන්ට විනා මුන් සේ වූ ලෝභීන්ට ප්‍රසංසා නොවේ"යි කියා "මස්සකුත් නොදෙව"යි කීහ. එසේ වුවත් බෝධිසත්ත්වයෝ මසුරන් පන්සියයක් දුන්නාහයි වදාරා 'මච්ඡද්වාර ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි කූටවාණිජ වෙළඳු නම් මෙසමයෙහි සොර වෙළඳුය. එසමයෙහි කෙළෙඹි පුත්‍රව උපන්නේ නම් බුදුවූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 288. නානච්ඡන්ද ජාතකය

තවද මට ම සරණ වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ආනන්ද සවාමීන් ලත් වර අටක් අරභයා මේ ජාතකය දක්වන ලදි. මෙහි වර්තමාන කථාව එකක නිපාතයේ 'ජුණ්හ' ජාතකයෙහි බස්නේය.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝත් ඒ රජ්ජුරුවන්ට පුත්‍ව ඉපද පියාණන්ගේ ඇවෑමෙන් රාජ්‍යයට පැමිණ පියාණන් සමයේ පුරෝහිතව සිටි බමුණා හැර අනික් බමුණකු පුරෝහිත ස්ථානාන්තරයට ගත්හ.

ඒ බමුණුත් එක් මාර්ගයෙක වාසය කරන්නේය. එක් දවසක් බරණැස් රජ්ජුරුවෝත් නගර සෝධන දිනයේ තනිව ඇවිදිනාහ. එකල පන්සියයක් රා බී මත්ව යන්නා වූ සොරු රජ්ජුරුවන් දැක කවුරුන් බවත් නොදැන තළා උතුරු සළුවත් උදුරාගෙන රා කළයක් ඉස තබාගෙන යන්නාහු රජ්ජුරුවෝත් තනි විසින් කුමකුත් කියාගත නොහී සොරුන් පස්සේම නික්මුණාහ.

එවේලාවට දුක්පත් පුරෝහිතයා තමාගේ මිදුලේ සිට ආකාශය බලන්නේ ආකාශයේ තාරකා විශේෂයක් දැක තමාගේ බැමිණිය කැන්ද "එම්බල බැමිණිය, අපගේ රජ්ජුරුවන් වහන්සේ පසමිතුරන්ට අසුව ගියසේකැ"යි කීහ. බැමිණිත් "නුඹ කෙසේ දතුසේක්දැ?"යි කියන්නා "තාරකා විශේෂයකින් දනිමි" කීහ. රජ්ජුරුවෝ බමුණා කී බස් කථාව ඇසුවාහ. රජ්ජුරුවෝත් සොරුන්ට කියන්නාහු "සාමිවරුනි, මම නිකම් දුක්ඛිතයෙක්මි. මා නිකම් ගෙනගොස් තොපට ප්‍රයෝජන කිමිද? මාගේ උතුරු සළුව පමණක් ඇරගෙන මා ඇරපියව"යි දුප්පත් නියා කී කල්හි සෙරුන් "සැබැව, මේ නිකම් දුක්ඛිතයාගෙන් කම් කිම්දැ?"යි කියා දයාවෙන් ඇරපීහ.

එවිට බමුණා "එම්බල පින්වත, අපගේ රජ්ජුරුවන් වහන්සේ දැන් ගැලවී ගියසේකැ"යි කීහ.

ඒත් රජ්ජුරුවෝ අසා රජගෙට ගොස් උදෑසනක්සේ ම පුරෝහිත බ්‍රාහ්මණයා ඇතුලු වූ බොහෝ බමුණන් රැස් කරවා විචාරන්නාහු "කුමක් ඊයේ රෑ අපට වූ ලාභ අලාභයක්වත්, අපට වූ දුකක්වත් ඇද්දැ?"යි විචාළාහ. බමුණෝ කියන්නෝ "ස්වාමීන්ට වූ අලාභයකුත් නැත, අන්තරායකුත් නැත, ග්‍රහයෝත් සිටිහයි කිසිම අමුත්තක් නැතැ"යි කීහ. එවිට රජ්ජුරුවෝ "අසවල් මාළු ගෙයි පුරාතන පුරෝහිත බමුණා ගෙන්ව"යි කියා ගෙන්වා "තමා විසින් දුටු කාරණයකින් මට වූ අන්තරායක් ඇත්නම් කියව" කියා කීහ.

"එසේය දේවයන් වහන්ස, තාරකා විශේෂයකින් නුඹවහන්සේ සොරුන්ට අසුව, එවිට ගැලවී ගිය නියාව දිටිමි" කීහ. එවිට රජ්ජුරුවෝ "මෙකියන කොල්ලෝ මෙපමණෝක් නුදුටුවෝය. ශාස්ත්‍ර උගනිතොත් මෙසේ උගන්ට එපාද? තෙල කොල්ලන් පිටත ලව"යි පුරෝහිත බමුණා ඇතුළුව බමුණන් පිටත් කරවා පරණ පුරෝහිත බමුණා පුරෝහිත ධුරයෙහි සලස්වා "තොපි කී ශාස්ත්‍රයෙහි ඉතා සතුටු වුම්හ. තොප කැමති වරයක් ගණුව"යි කීහ. එවිට බමුණු කියන්නෝ "මා කැමති වරයක් මා ගත් කල මාගේ බිරින්ද, දරුවන්, යෙහෙළියන්, කොල්ලන්, කෙල්ලන්ගේ අභිප්‍රාව නොදැනෙයි. ගෙට ගොස් විචාරා ඇවිත් කියමි" කීහ. එවිට රජ්ජුරුවෝත් "යහපතැයි, විචාරා එව"යි කී කල්හි බමුණු ගෙට ගොස්

අඹුදරුවන්, යෙහෙළියන්, කෙල්ලන්, කොල්ලන් එක් කරවා විචාරන්නේ "රජ්ජුරුවන් වහන්සේ මට කැමති වරයක් ගණුවයි වදාළසේක. මම තොප ඇම විචාරමියි, තොපට කැමැත්තක් කියව"යි කී කල්හි ඔහුගේ අඹුව කියන්නී "මට කිරි දෙනුන් සියයක් දෙව"යි කීහ. ඡත්තපාණී නම් පුත්‍ර කියන්නේ "යහපත් සවිඣවයන් යෙදූ රථයක් ඉල්වා දෙව"යි කීය. යෙහෙළි කියන්නේ "මට යහපත් මැණික් කුණ්ඩලාභරණ දෙකක් ඉල්ලා දෙව"යි කීය. කෙළි කියන්නී "මට යහපත් වනක් මෝලක් කුල්ලක් ඉල්වා දෙව"යි කීය. එකියන බ්‍රාහමණ තෙම සිතන්නේ "මට ගමක් උවමැනවැ"යි සිතා රජ්ජුරුවන් කරා ගොස් කියන්නේ "අප ඇමගේ සිතිවිල්ලම එකඟ නොවෙයි, නානච්ඡන්ද යයි කියන්නේ මම ගමක් ලබන්නා කැමැත්තෙමි. මාගේ ගෙයි බිරින්ද කිරි දෙනුන් සියයක් කැමැත්තීය. මාගේ ඡත්තපාණී නම් පුත් අසුන් දෙදෙනකු යොදනලද රථයක් ලබන්නා කැමැත්තේය. මාගේ යෙහෙළි මැණික්මය කුණ්ඩලාභරණ දෙකක් කැමැත්තීය. මාගේ පුණ්‍යා නම් දැසී වනක් මෝලක් ලබන්ට කැමැත්තීය" කීය.

එවිට රජ්ජුරුවෝ "පුරෝහිත බමුණාට ගමක් දෙවා, උඹගේ අඹුවට කිරි දෙනුන් සියයක් දෙවා උඹගේ පුතාට අසුන් දෙන්නෙකු යොදනලද රථයක් දෙවා, යෙහෙළියට කුණ්ඩලාභරණ දෙවා, පුණ්‍යා නම් දැසියට වනක් මෝලක් කුල්ලක් දෙව"යි යන මේ සියල්ලම දී බොහෝ සම්පත් රජ්ජුරුවෝ දුන්හයි වදාරා මේ 'නානච්ඡන්ද ජාතකය' නිමවා වදාළ සේක.

"එසමයෙහි පුරෝහිත බ්‍රාහ්මණයා නම් ආනන්ද ස්ථවිරය. රජ ව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 289. සීලවීමංස ජාතකය

තවද මට ම පිහිට වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි බ්‍රාහ්මණයෙකු අරභයා මේ ජාතකය දක්වන ලද්. මෙහි වර්ථමාන කථාවත් එකක නිපාතයෙහි සීලවිමංස ජාතකයෙහි දක්වන ලද.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයෝ බ්‍රාහ්මණ ව ඉපද "සීලය වැඩි දේ හෝයි, ජාතිය වැඩි දේ හෝ"යි විමසන පිණිස වීථියේ පිළින් රන් තුන් මස්සක් සොරකම්කොට ඇරගත්තාහ. වීථියේ වෙළෙඳුන් "බමුණා රන් සොරා අරගතැ"යි අල්ලාගෙන "රජ්ජුරුවන්ට පාන්ට ය"යි ගෙනෙන කලට අතරමඟ පාඹට්ටියෙක් නයෙකු ඇරගෙන කෙළවන්ට වන. ඒ වේලාවට බෝධිසත්ත්‍වයෝත් "සර්පයා නම් විෂඝෝරය. එසේ වූ සර්පයා අල්වාගෙන කෙළින්ට යහපත් නොවෙයි, ඇරපියව"යි කීහ. එකියන පාඹට්ටියා කියන්නේ "මේ සර්පයා සිල්වත, කඩා නොකති" කීහ.

එවිට බෝධිසත්ත්‍වයෝ සිතන්නාහු "සර්පයා පවා කඩා නොකන්නේ සිල්වතැයි අසා ගතැ"යි සිත සිතා රජගෙට ගියාහ. රජ්ජුරුවෝත් "ආචාරීනි, මේ කෙළේ කිම්දැ?"යි කියන්නා "දේවයන් වහන්ස, මා සොරකමට කළ දෙයක්

නොවෙයි, සීලය වැඩිදේ, ජාතිය වැඩි දේ හෝයි සිතා පරීක්ෂා කරන්ට කෙළෙමි"යි කියන්නාහු "**සීලං** - ආචාරසීලය, **කල්‍යාණංකිරෙව** - යහපත් වන්නේය. **ලොකෙ** - ලොකයෙහි, **සීලං** - සීලය, **අනුත්තරං** - නිරුත්තරය, **පස්ස** - බලව, **ඝොරවිසොනාගො** - ඝොර වූ දරුණු විෂ ඇති සර්පයා, **සීල්වා ඉති** - සිල්වතැයි කියා, **නහඤ්ඤති** - හිංසනය නොකෙරෙයි, **සීලවා ඉති** - සිල්වත් වූ පුරුෂ තෙම, **යෙන** - යම් සීලාභරණයක් හේතු කොටගෙන, **සීලවා** - සිල්වත් වූයේ, **අරියවුත්ති සමාචාරො** - බුද්ධාදී වූ ආය්‍ර්‍යයන්ගේ ප්‍රතිපත්තිය හැසිරෙන්නේයයි, **වුච්චති** - කියනු ලැබේ. **ලොකො** - ලොකයෙහි, **සිවං** - නිරුපද්‍රයයි, **අනුමතං** - දන්නා ලද බවද එසේ වූ, **සීලං** - සීලය, **සෝ අහං** - ඒ මම , **සමාදිස්සං** - සමාදන් වෙමි, **සීලවා අඛංඩාදින්** - යුක්තකොට රක්ෂා කරන සීලය ගුණයෙන් යුක්ත වූයේ, **ඤාතිනට** - නෑයන්ටද, **පියෝ** - ප්‍රිය වුයේ, **හෝති** - වන්නේය. **මිත්තෙසුච** - මිත්‍රයන් කෙරෙහිද, **විරොචති** - බබලන්නේය, **කායස්සභෙදා** - ශරීරයාගේ භේදයෙන්, **චුති** - චුති චිත්තයෙන් මත්තෙහි, **සුගතිං** - සුගතියෙහි, **උප්පජ්ජති** - උපදනේය"යි කියා "දේවයන් වහන්ස, මට ගිහි ගෙයින් ප්‍රයෝජන නැතැ"යි කියා අවසරගෙන හිමාලය වනයට වැද ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා බ්‍රහ්ම ලෝකයෙහි උපන්නේ යයි වදරා 'සීලවිමංස ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි බ්‍රාහ්මණ ව උපන්නෙමි බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 290. හද්දඝට ජාතකය

තවද මා නිසා බුදු වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි අනේපිඩු මහසිටාණන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

අනේපිඩු මහසිටාණන්ගේ එක් පිතෙක් අක්‍ෂ ධූර්‍තී, සුරා ධූර්‍තී, ස්ත්‍රී ධූර්‍තී නොයෙක් දෙයෙහි වාසයකොට ඇති සම්පත් නසා දුක්පත් ව තමන්ගේ පියාණන් කරා අවුත් "දුක්ඛිතයෙමි" කියන්නා පියාණෝ මසුරන් පන්සියයක් දුන්නාහ. ඒ මසුරන් පන්සියයත් වෙළඳාම් ආදි වූ දෙයකොට සම්පත් උපදවා නොගෙන එයිත් ධූර්‍තී කමින් නසා පෙරලා අවුත් පියාණන් අතින් සම්පත් ඉල්වූහ. පියාණෝ පෙරළා සම්පත් දී ඒ බව සර්‍වඥයන් වහන්සේට දැන් වූහ.

සර්‍වඥයන් වහන්සේ "පළමුත් මුන්ට උත්තමයෝ සම්පත් දීම ගියාහ. මේ සම්පත් නසාම ගියෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ එනුවර සිටු ව ඉපිද සදන්හල් කරවා මහත් වූ දන් දී මිය ගොස් දෙදෙව් ලොවට නායක වූ ශක්‍රදේවේන්ද්‍ර ව "තෙමේ තමාගේ පුත්‍රයා කුමක්කොට වාසය කෙරේ දෝ හෝ"යි බලා දුක්ඛිත

ව සිඟා කා වාසය කරන නියාව දැක දයාවෙන් මොහුට "මා විසින් සම්පතක් දෙන්ට උවමැනවැ"යි සිතා භද්‍රඝටයක් දී කියන්නාහු "මේ පූර්‍ණඝටය ඉඳුරා තිබාගෙන උන්නු නම් තොපට කිසි සම්පතකිනුත් අඩුවෙක් නැතැ"යි කියා පූර්‍ණඝටය දී දෙව්ලොවටම ගියේය.

ඒ තෙම පූර්‍ණඝටයෙන් උපන් සම්පත් ඇරගෙන සුරාව අනුභවකොට උන් කලට එක් දවසක් තෙමේ පූර්‍ණඝටය රා බී මත්ව ආකාශයට දම දමා උන් කලට පූර්‍ණඝටය බිම වැටී බිඳුනි. එතැන් පටන් තමන් දුක්ඛිත විය.

ඒ අර්ථය දක්වන සර්‍වඥයෝ "**සබ්බකාමදදං** - සියලු කැමැති දෙයක් දෙන්ට සමර්ථ වූ, **කුම්භ** - සංඛ්‍යාත වූ කුම්භඝටය, **ධුත්තකො** - ඒ ධූර්‍තයා යම් පමණ කාලයක් රක්‍ෂා කෙරේද?, **තාව** - ඒ තාක්, **සුඛං** - සුව, **වඩ්ඪති** - වඩවයි, **යදා** - යම් කලෙක්හි, **මත්තො** - සුරා මදයෙන් මත්ව, **දදිත්තොව** - දර්පිතද, **තදා** - එකල්හි, **පමාදං** - ප්‍රමාදයෙන්, **නග්ගොව** - නග්න වුයේද, **පොතොව** - කැතිරිකඩ අඳනා ලද්දා වූද, **බාලො** - අඥානයා, **පච්ඡා** - පසුව, **විහඤ්ඤති** - පශ්චාත්තාපයෙන් තැවෙන්නේයි. **යෝ** - යමෙක් තෙම, **ඉමං** - මේ, **ධනං** - ධනය, **එවමෙවං** - එපරිද්දෙන්ම, **අමත්තා** - පමණ නොදැන, **පප්පොති** - ප්‍රයෝජන විඳිද, **සො දුම්මෙධො** - ඒ අඥාන සත්ත්ව තෙමේ, **කුම්භංභිත්වා ධුත්තකෙ** - භද්‍රඝටය බිඳ විශේෂපයට පැමිණියා වූ ධූර්තයා පරිද්දෙන්,

**පච්ජාතපති** - පසුතැවිලි බවට පැමිණෙන්නේය"යි වදාරා 'භද්‍රඝට ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි පූර්‍ණඝටය බිඳි සිටුපුත්‍රයා නම් මේ කියන සිටුපුත්‍රයාය. එසමයෙහි ශක්‍ර ව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 291. සුපත්ත ජාතකය

තවද මාම නිසා මේ සද්ධර්‍මය දේශනාකොට තබාලූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි සැරියුත් සාමීන් යශෝධරා ස්ථවිරීන් වහන්සේට දුන් රේමස් මුසු ඇල් සාලේ බතක් අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද? යත්,

අභ්‍යන්තර ජාතකයෙහි අඹ ලද්දා මෙන් රාහුල ස්ථවිරයන් වහන්සේ සැරියුත් සාමීන්ට කියා කොසොල් රජ්ජුරුවන්ගෙන් රේමස් මුසු ඇල් සාලේ බතක් ගෙන ගොසින් "යශෝධරා ස්ථවිරීන්ට දෙව"යි කියා රාහුල ස්ථවිරන්ට දුන්සේක. එපවත් රජ්ජුරුවෝ අසා එවක් පටන් රේමස් මුසු ඇල් සාලේ බත් යශෝධරා ස්ථවිරීන්ට දුන්නාහ.

මේ කථාව ධම්සභාවේ රැස් වූ මාළුවරුන් වහන්සේ කිය කියා වැඩඋන් තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා එපවත් අසා "දැන්මතු නොවෙයි, පෙරත් ශාරිපුත්‍ර ස්ථවිරයෝ රාහුල මාතාවන්ට

ආහාර දුන්නේ වේදැ''යි වදරා "ඒ කෙසේදැ?''යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ අසූ දහසක් කවුඩන්ට නායක වූ සුපත්ත නම් රජ්ජුරුවෝය. සුමුඛ නම් සෙනෙවිරද්දුය. සුඵස්සා නම් බිසවය යනාදීන් තුන්දෙන බරණැස් නුවර වාසය කරන්නාහුය. එක් දවසක් බෝධිසත්ත්‍වයන් හා අග්‍රමෙහේසිකාවන් හා දෙන්න මුළුතැන් ගෙය මුදුනෙන් ආකාශයෙන් යන්නාහුය. එකල අරක්කැමියා "මාළු උෂ්ණ නිවන්ට ය''යි කියා අත් පතලාවල මලා ඇර තිබූහ. ඒ වේලාවට බෝධිසත්ත්‍වයන්ගේ බිරින්ද මත්ස්‍ය මාංශයෙහි ගන්ධය අසා ඒ නිසා දොළ ගත්හ. පසුව දවස් බෝධිසත්ත්‍වයෝ ගොදුරට යන්නාහු භාර්‍ය්‍යාවන් කැඳවූහ. එවිට සුඵස්සාවෝ කියන්නාහු "ස්වාමීනි, මට දොළෙක් උපන, එසේ හෙයින් නුඹවහන්සේ ගොදුරට ගිය මැනව, මම යා නොහෙමි'' කීහ. බෝධිසත්ත්‍වයෝ "කෙබඳු දොළෙක්දැ?''යි විචාරන්නා "රජ්ජුරුවන්ගේ අග්‍රභෝජනය ලබන්නා කැමැත්තෙමි. එය මට ලැබෙන්නේ නැත. එසේ හෙයින් මාගේ ප්‍රාණය යන පමණෙකැ''යි කියා වැදහොත්තාහ.

බෝධිසත්ත්‍වයෝත් වික්‍ෂේපව උන් කලට සුමුඛ නම් සෙනෙවිරද්දු බෝධිසත්ත්‍වයන් ලඟට අවුත් "ඇයි, මූණ මලානිකව මුසුප්පුව ඉන්නේ කිම්දැ?''යි විචාරා එපවත් අසා "යහපත, ස්වමිනි, මට භාරය. නුඹවහන්සේලා දෙදෙනා

වහන්සේ ගොදුරට නොවඩින්නමෝ ය"යි කියා කවුඩන් එකෙණෙහිම එක් කරවාගෙන බරණැස් නුවරට ගොස් කවුඩන් මොත්තන් නියායෙන් රැකවල් සලස්වා ශක්ති සම්පන්න කවුඩන් අට දෙනෙකු ඇරගෙන රජ්ජුරුවන්ගේ මුළුතැන් ගෙයි පලය පිට ඉඳ කියන්නාහු "රජ්ජුරුවන් වහන්සේට මේ වඩන්ට ගෙන යන වේලාවට මම ගොසින් වස්න එලාපියමි, තොපි සතර දෙනෙක් ගොසින් බත් උකා ගණුව, මම අසූවයෙමි. මා අසුවූ නියාව නොකියව, මා අසුවූ නියාව ඇසුවොත් බත් මේ නොනිමනසේක. පසු පස්සේ එන නියාව කියව. ස්වාමීනුත් අග්‍රමහේසිකාවන් වහන්සේත් බත් කව"යි කියා උන් කලට අරක්කැමියත් වසුන්කඳ කර තබාගෙන මේ වඩා ගෙනෙන කලට කවුඩු සෙනෙවිරද ගොසින් ලැමද්දේ ඉඳ නාසය ඩෑගෙන පියාපත් දෙකින් දෑස වසාගත.

ඒ වේලාවට රජ්ජුරුවෝ මතුමාලේ සිටියාහු මේ ක්‍රියාව දැක "අරක්කැමිය, වස්නේන් අපට කම් නැත. ඒ දමාපියා කවුඩා නොහැර අල්ව"යි කීය. "යහපතැ"යි කියා වස්න දමා කවුඩා නොහැර අල්වාගත. එවිට කවුඩෝ අට දෙන තමන්ගේ බඩ පුරා කන්නක් කා තමන්ගේ රජ්ජුරුවන්ට හා බිසවුන්ටත් බත් හැරගෙන ගියහ. බිරින්දත් කවුඩු රජ්ජුරුවෝත් බඩ පුරා කෑහ.

අරක්කැමියාත් රජ්ජුරුවන්ට ඒ සුමුඛ නම් සෙනෙවිරදුන් පෑහ. "ඇයි තොපගේ ප්‍රාණයටත් නොසිතා රජ්ජුරුවන් වහන්සේට ගෙනන වසුනැයි කියාත් නොසිතා අරක්කැමියාගේ

නාහයත් ඩෑ වණකලේ කුමක් නිසාදැ?"යි විචාළාහ. "දේවයන් වහන්ස, නුඹවහන්සේගේ මේ නුවරම අපගේ අසූ දහසක් කවුඩන්ට රජ ව ඉන්නා වූ සුපත්ත නම් කවුඩු රජ්ජුරු කෙනෙක් ඇත. ඒ රජ්ජුරුවන්ගේ සුඵස්සා නම් බිසෝ කෙනෙකුන් වහන්සේ නුඹවහන්සේගේ භොජනයට දොළ ඇතිව ආයාසය විඳිති. මාගේ රජ්ජුරුවන් වහන්සේට ජීවිතය පුදා වුවත් උන්වහන්සේට බත් දී දොළ සංසිඳවනු සඳහා මාගේ ප්‍රාණය ගැන නොසිතා කෙළෙමි" කීහ. "එසේ හෙයින් යම් කෙනෙක් තමන්ගේද, දෙමව්පියන්ගේද, ස්වාමිපුත්‍රයාගේද යම් මනෝරථයක් නිසා ප්‍රාණය දුන්නත් මෙලොවත් පරලොවත් යහපතක් විනා නපුරෙක් නැත. නුඹවහන්සේගේ වස්නත් බිඳ මෙසේ වූ ද්‍රෝහයක් කෙළෙමි කැමති යම් ආඥාවක් කරවා වදාරණ බවය"යි කීහ.

එවිට රජ්ජුරුවෝ කියන්නාහු "එම්බල, මාගේ බොහෝ සත්කාර සම්මාන විඳ ඉඳිනා අමාත්‍ය ආදී වූ අය අපට මෙසේ වූ පක්‍ෂපාත කමක් කරන කෙනෙක් නැත. තොප මේ කළ පක්‍ෂපාත කම ඒ කවුඩු රජ්ජුරුවන්ට කළ දෙයෙක් නොවෙයි, මට කල පක්‍ෂපාත කමය, එසේ හෙයින් තොපට ආඥාවක් නොකරවමි. තොපට මාගේ රාජ්‍යයෙන් පූජා කෙරෙමි" කියා රාජ්‍යය පූජා කළහ. එවිට සුමුඛ නම් සෙනෙවිරද්දු කියන්නාහු "දේවයන් වහන්ස, අපි තිරිසන්නුය, අපට සේසතින් ප්‍රයොජන නැතැ"යි කියා තමන්ගේ සුපත්ත නම් කවුඩු රජ්ජුරුවන්ගේ ගුණ විස්තර වශයෙන් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝ කියන්නාහු "තොපගේ කවුඩු රජ්ජුරුවනුත්

උන්ගේ බිරින්දත් අප දකින්ට උවමැනවැ"යි කියන්නා සුමුඛ නම් සෙනෙවිරද්දු තමන්ගේ රජ්ජුරුවනුත් බිසවුනුත් රජ්ජුරුවන්ට පෑහ. එවිට රජ්ජුරුවෝ බෝධිසත්ත්වයනුත් බිසවුනුත් දැක මහසමාධි ව තමන්ගේ මේ නිමන බතින් සුපත්ත නම් කවුඩු රජ්ජුරුවන්ට හා සුඵස්සා නම් බිසවුන්ට හා සුමුඛ නම් සෙනවිරදුන්ට හා තුන් දෙනාට බත්දෙවා සෙසු කවුඩන්ට සාල් තුනමුනෙක බත් දෙන්ට සලස්වාලුහ. රජ්ජුරුවන්ට කවුඩු ව කී බණ සත්සියයක් අවුරුදු නොනැසී පැවැත්තෙයයි වදරා 'සුපත්ත ජාතකය' නිමවා වදාළසේක.

එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරය. සුමුඛ නම් සෙනෙවිරද්දු නම් ශාරීපුත්‍ර ස්ථවිරය. සුඵස්සා නම් බිසව් නම් යශෝධරා ස්ථවිරීය සුපත්ත නම් කවුඩු රජ්ජුරුවෝ නම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 292. කායවිච්ඡන්ද ජාතකය

තවද මාගේ ස්වාමී වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පාඬුරෝග ඇති පුරුෂයකු අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

පාඬුරෝග ඇති මනුෂ්‍යයෙකුට වෙදවරු බෙත්කොට "අසාධ්‍යය"යි කියා අළහ. නෑසියෝත් "ලෙඩ අසාධ්‍යය"යි ආලිස්සන් වූහ. ඒ පුරුෂයා සිතන්නේ "ඉදින් මේ ලෙඩින් සමනයෙක් වීනම් බුද්ධ ශාසනයෙහි මහණ වෙමි" සිතිය. ඒ

සිතූ ආනුභාවයෙන්ම ඒ ව්‍යාධිය නොබෝ දවසකින් සමන විය. එ කියන පුරුෂයා මහණ ව උපසම්පදාව භාවනාකොට රහත්ව පිරිනිවන් පෑසේක.

එක් දවසක් භික්ෂූන් වහන්සේ ධම්සභා මණ්ඩපයෙහි රැස්ව හිඳ "අසවල් නම් පාන්ඩුරෝග ඇතිව මියන්ට උන් තැනැත්තේ 'බුද්ධ ශාසනයෙහි මහණ වෙමි'යි යන සිතුවිල්ලෙන් මහණ ව භාවනාකොට රහත්ව නිවන් දුටුවෝදැ"යි කිය කියා වැඩඋන් තැනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා එපවත් අසා "දැන්මතු නොවෙයි, පළමුත් නුවණැත්තෝ බුද්ධ ශාසනයේ මහණ වෙමි යන සිතිවිල්ලෙනේ රෝගය සන්සිඳුවා මහණ වුවෝ වේදැ"යි එපවත් අසා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ බ්‍රාහ්මණ ව ඉපිද වාසය කරන කල්හි පාණ්ඩු රෝගයක් ඇතිව උපන් අවස්ථාවෙහි ගෙයි අඹුදරුවෝ නෑසියෝ වෙදවරු "අසාධ්‍ය ව්‍යාධිය"යි කියා අළහ.

බෝධිසත්ත්වයෝ සිතන්නාහු "මේ රෝගයෙන් මිදෙම් නම් මහණ වෙමි"යි යන සිතිවිල්ලක් සිතුනු නොබෝ දවසකින් ව්‍යාධිය සන්සිඳින. හිමාලය වනයට වැද ඍෂිප්‍රව්‍රජායෙන්

පැවිදිව පඤ්චසෘධි අෂ්ටසමාපත්ති උපදවාගෙන උදන් අනන්නාහු **අඤ්ඤතරෙන** - අට අනූවක් රෝගයන් අතුරෙන් එක්තරා, **රොගෙන බ්‍යඤ්ජන** - ස්වරූපයෙන් අතරෙන් රෝග නම් වූ, **ව්‍යාධිනා** - පාණ්ඩුරෝග ස්වරූප සංඛ්‍යාත රෝගයෙන්, **බාහං** - දැඩිකොට, **ඵුට්ඨස්ස** - පහකරනලද, **දුක්ඛ** - දුක්ඛිත වූ, **රුප්පතො** - ව්‍යධියෙන් පිඩිත වූ, **මෙ** - මාගේ, **ඉදං කලේබරං** - මේකලේබරය, **ආතපෙ** - ආතප ඇති හෙවත් අව් පහරණ, **සංසුනි** - පාංසුවෙයි, **කතං** - කරනලද, **පදුමං යථා** - පද්මයෙක් මෙන් වුයේ යි, **අජඤ්ඤං** - අපවිත්‍ර වූ නොදත හැකි වූ මේ ආත්මය, **ජඤ්ඤසංඛාතං** - අඥාන සත්ත්වයන් විසින් පවිත්‍රය යි, **අසූචිං** - අපවිත්‍ර වූ මේ ශරීරය, **සුචිසම්මතං** - සුචියයි දන්නා ලදද, **නාන කුණප පරිපූරං** - නොයෙක් කුණපයෙන් පරිපූර්ණ වූ මේ ශරීරය, **පස්සතො ඤාණ චක්ඛුසින්** - බලන්නා හට, **ජඤ්ඤරූපං** - දතහැකි වූ ස්වරූප ඇත්තෙයි, **යත්ථ** - යම් ශරීරයෙක්හි, **අධිමුච්ඡතා** - ක්ලේශමූර්ජාවෙන් අතිශයින් මුර්ජා වූ, **පජා** - සත්ත්වයෝ, **සුගතුප්පත්තියා** - සප්තකාම ස්වර්ගයෙහි, **මග්ගං** - මාර්ගය, **හාපෙන්ති** - පිරිහෙද්ද, (එසේ වූ සත්ත්වයන් ඇතුළු වූ) **ජෙගුච්ජියං** - ප්‍රතිකූල වූ, **අසූචිං** - සුචි නුවූ, **ව්‍යාධිධම්මං** - ව්‍යාධිප්‍රකෘති ඇති, **ඉමං පූතිකායං** - මේ කුණුප ශරීරයට, **ධිරත්ථූ** - නින්ද වෙයි කියා වදරා 'කායවිච්ඡන්ද ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි බ්‍රාහ්මණ තාපස ව උපන්නෙමි බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 293. ජම්බුඛාදක ජාතකය

තවද හුදු කරුණාවෙන් මවා ලූ රුවක් වැනි සර්‍වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන් වහන්සේ හා කෝකාලික ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

කෝකාලික ස්ථවිරයෝ තැනින් තැන ගොස් උපාසකවරුන්ට දේවදත්ත ස්ථවිරයන්ගේ ගුණ කියන්නාහු "දේවදත්ත ස්ථවිරයෝ නම් කෝලිය වංශයේ උපන්නාහ, ධූතඞගධරයහ, ධ්‍යානලාභි ව ධම්මකථිකයහ"යි කියා නොයෙක් ලාභ සත්කාර උපද වන්නාහ. දේවදත්ත ස්ථවිරයන් වහන්සේත් කෝකාලික ස්ථවිරයන්ගේ ගුණ කියන්නාහු "කෝකාලික ස්ථවිරයෝ නම් බ්‍රාහමණ කුලයෙහි උපන්නාහ, ත්‍රිපිටකධරයහ, ධුතඞගධරයහ, ධ්‍යාලාභිහ"යි යනාදීන් ඔවුන්ගේ ගුණ කියා උපාසකවරුන්ගෙන් ලාබ උපදවා ගන්නාහයි කීහ. මේ කථාව කිය කියා භික්ෂූන් වහන්සේ ධම්සභාවේ රැස්ව උන් තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා එපවත් අසා "දැන්මතු නොවෙයි, පෙරත් කෝකාලික ස්ථවිරයන් හා දේවදත්ත ස්ථවිරයෝ උනුනුන්ගේ ගුණ කියා උන්නෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි දඹ ගසක් උඩ ඉඳ කවුඩෙක් දඹ කකා උන්නේය. එතනට කැණහිලෙක් ඇවිත් ගස උඩ උන් කපුටුවා දැක "මේ කපුටුවාගේ නැති ගුණ කියා මොහු සිත්ගෙන දඹ කමි" සිතා මොහුගේ ගුණ කියන්නේ "මිහිරි කටහඬක් ඇති මොනරෙකුගේ පැහැයට බඳුවූ නිල් වූ යහපත් පැහැයක් ඇති පක්ෂීන්ට උතුම් වූ කපුටුවාණෙනි, දඹ අත්ත උඩ ඉඳ කුමක් කරනසේක්දැ?"යි විචාළේය. එවිට කපුටුවා කියන්නේ ව්‍යාඝ්‍ර පොතකයෙකු හා සමාන කැණහිලාණෙනි, උත්තමයන්ගේ ගුණ දන්නෝ උත්තමයෝය"යි කියා "තට දඹ දෙමි. දඹ අනුභව කරව"යි කියා දඹ සලා එළිය. ඒ දඹ වනයෙහි වසන්නා වූ වෘක්ෂ දේවතාවෙක් "බොරු කියාන්නා වූ නීච ක්‍රියා ඇති දෙන්නෙකු දුටු නියාය"යි කියා භයංකාර වේශයක් පා භය ගන්වා උන් දෙන්නා එතනින් පහ කළෙමියි කියා වදාරා මේ 'ජම්බුඛාද ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි කවුඩා නම් දේවදත්ත ස්ථවිරයන්ය. කැණහිලා නම් කෝකාලික ස්ථවිරය. වෘක්ෂ දේවතා ව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 294. අන්ත ජාතකය

තවද මුදිතාවෙන් මවාලූ රුවක් වැනි වූ සර්වඥයන් වහනසේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි කෝකාලික ස්ථවිරයන් වහන්සේ හා දේවදත්ත ස්ථවිරයන් වහන්සේ

අරහයා මේ ජාතකය දක්වන ලදි. මෙහි වර්තමාන කථාව පළමු කී ජාතකයෙහි පෙනෙන්නේය.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයෝ එඬරු වනයක දේවතා ව උපන්නාහ.

එනුවර මීමෙකු මළ ගමනේ නුවරින් පිටතට එඬරු වනය ගාවා ඇදපූහ. ඒ කුණු කන්ට කැණහිලෙකු ඇවිත් කමින් සිටි තැනට කපුටෙක් ඇවිත් සිතන්නේ "මේ කැණහිලාට ප්‍රශංසාකොට ම මුන් අතින් මස් ඉල්ලා ගන්ට උවමනාය"යි සිතා ප්‍රශංසා කරන්නේ "වෘෂභ රාජයෙකු බඳු වූ කණක් ඇති සිංහ රාජයෙකුට බඳු වූ ගාත්‍රයක් ඇති කැණහිලාණෙනි, කිසිවක් දෙව්දැ?"යි කීයේය. එවිට කැණහිලා කියන්නේ "මිහිරි කට හඬක් ඇති කපුටුවාණෙනි, උත්තමයන්ගේ ගුණ දනනෝ උත්තමයෝය"යි කියා තමා කන කුණින් කැබැල්ලක් දුන්නේය. ඒ වනයේ වසන්නා වූ දේවතාවා "කැණහිලා සිවුපාවුන්ට අධමය, කපුටුවා පක්ෂීන්ට අධමය, එඬරු ගස් වෘක්ෂ ජාතියට අධමය, මේ තුන්දෙනා එක්තැන් වූ නියාය යහපතැ"යි වදරා මේ 'අන්ත ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි කැණහිලා නම් දේවදත්ත ස්ථවිරයෝය. කපුටා නම් කෝකාලික ස්ථවිරයන් වහන්සේය. වෘක්ෂ දේවතාව උපනනෙම් බුදුවූ මම්ම ය"යි වදරා මේ 'අන්ත ජාතකය' නිමවා වදාළසේක.

# 295. සමුද්‍ර ජාතකය

තවද මෛත්‍රීයෙන් මවාලූ රුවක් වැනි වූ සර්‍වඥයන් වහනසේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි උපනන්ද නම් ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

ඒ උපනන්ද නම් ස්ථවිරයන් වහන්සේ ඉතා ලෝභීසේක. එක් ගෙයක සිවුරු හා එක් ගෙයක සැරයටිය හා එක් ගෙයක පාත්‍රය තබා "ඒ ගෙවල් තුන මොගේ ය"යි කියා ලාභ ගන්නාසේක. මහා ලෝභීසේක. අනුන්ට "ලොභ නොකරව"යි බණ කියනසේක. තමන්වහන්සේ ගරු භාණ්ඩ ආදිය පිළිගන්නාසේක. යම් තෙනකට යනසේක් නම් ගැල් පටවාගෙන යන්නා සේ නොයෙක් ගරු භාණ්ඩ පටවාගෙන යනසේක.

"අනුන්ට 'ගරු භාන්ඩ නොගනුව'යි බණ කියනසේකැ"යි යන කථාව භික්ෂූන් වහන්සේලා ධර්මසභා මණ්ඩපයෙහි රැස් ව කිය කියා වැඩඋන් තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ?"යි වදාරා මෙපවත් අසා "මහණෙනි, තමන් මෙසේකොට අනුන්ට අවවාද කීම යහපත් නොවෙන්නේ වේදැ"යි නින්දාකොට වදාරා "දැන්මතු නොවෙයි, මහණෙනි, පෙරත් මූ මහලෝභී ව සමුද්‍රයේ පැන් බොහෝ ව අනුන්ට බොන්නට නුපුරැයි අවවාද කළ කෙනෙක් වේදැ"යි වදාරා "ඒ

කෙසේදැ?''යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි ආකාශයෙන් යන දියකාවෙක් කියන්නේ "දැතිමෝරුන්, කුඩ මස්සන් ආදී වූ මත්ස්‍යයෙනි, මූද්‍ර පැන් විතරක් සේ බොව, පැන් බොහෝකොට බීවොත් තෝ නසී ය''යි කියා ඇවිදිනේය. සමුද්‍රයේ වසන දේවතාවා කියන්නේ "මේ කොයි පක්ෂියෙක්ද? සමුද්‍රයේ වසන මත්ස්‍යයන්ට පැන් නොබොන්නට කියාගෙන යන්නේය''යි විචාළේය. දියකාවා කියන්නේ "මම දියෙහි වසන්නා වූ දියකාවෙකි. සමුද්‍රයේ පැන් නැසෙතියි සිතා කීමි''යි කීහ. එවිට දේවතාවා කියන්නේ "නීච වූ සමුද්‍රකාකය, මේ සමුද්‍රයේ දිය එක් කෙනෙකුන් විසින් බී අඩුකොට ගත හැකිදැ''යි කියා ඌට භයංකාර වේශයක් දක්වා එතනින් පහකොට පුවයි වදරා මේ 'සමුද්‍ර ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි සමුද්‍රකපුටා නම් උපනන්ද භික්ෂූහුය, සමුද්‍ර දේවතා ව උපන්නෙම් බුදුවූ මම්ම වේදැ''යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 296. කාමවිලෝපන(විලාප) ජාතකය

තවද හුදු සීලයෙන් මවාලූ රුවක් වැනි සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පුරාන දුතිකාව අරභයා මේ ජතකය දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

මෙහි වර්ථමාන කථාව යටකී 'පුෂ්ප' ජාතකයෙහි පෙණෙන්නේය. මෙහි වණුක් මල් කඩා ගිය පුරුෂයා උල පිට උන්නේය. "තමා විඳිනා දුක්ඛ වේදනාවට වඩා මා මෙසේ වූ නියා නොදැන කොයි ගියේ දේ හෝයි සිතා මාගේ ස්ත්‍රී වික්‍ෂේප දේ හෝයි යන දුක්ඛය මට වේදනාය"යි සිත සිතා උන් තැනට එක් කවුඩුවෙක් ආකාශයෙන් යන්නාහු දැක කියන්නේ "සබඳ පක්‍ෂිය, මා වාහනයක් කොට ඇත්තා වූ කවුඩුව, මාගේ භාර්යාව වනාහී මා විඳිනා දුක් වේදනා නොදැන ඔබ්බට ගියයි මා කෙරේ වික්‍ෂේපව සිටියි යන සෝකය මට මේ වේදනාවටත් වඩා වේදනාය. එසේ හෙයින් තොපි ගොස් මා දුක්ඛයට පැමිණ නියාවත් කියලා මා ගෙයි ඇඳ ඉස්දෙර උපුල් මලට බඳු පැහැ ඇති සන්නාහයකුත් රන් පසළෝස් කළඳකින් කරනලද පේරුස් මුද්දකුත් ශුභ්‍ර වූ කසී සළුවකුත් තැබූයේ, මේ වස්තු තුන ඇරගෙන මා දුටුවා සේ ශෝක නොගෙන ප්‍රයෝජන විඳින්ට කියව"යි කියා යවා එම උල පිට ඉඳම කාලක්‍රියාකොට නරකයෙයි උපනැයි වදරා මේ 'කාමවිලෝපන ජාතකය' නිමවා වදාළසේක.

“එසමයෙහි මේ කාරණය ප්‍රත්‍යක්‍ෂකොට දුටු නාගරාජ දේවතාවා නම් බුදුවූ මම්ම ය”යි වදාළසේක.

# 291. උදුම්බර ජාතකය

තවද හුදු ක්‍ෂාන්තියෙන් (ඉවසීම) මවාලූ රුවක් වැනි සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා භික්‍ෂු කෙණෙකුන් වහන්සේ පසල්ගමක (පිටිසර) විහාරයක් කරවා එහි වාසය කරණසේක. උන් වහන්සේ වාසයකරන්නාවූ විහාරය සිත්කලුය, ඡායාසම්පන්නය (සෙවනින් යුත්), පැන් ඵාසුය (පහසු), උපාසකවරුත් ආවේනිකව (නියම ලෙස) පස දෙන්නාහ. මෙසේ බොහෝ දවසක් ඒ විහාරයේ වාසයකරණ කල්හි එක් ආගන්තුක භික්‍ෂුන්කෙනෙකුන් වහන්සේ විහාරයට වැඩිසේක. උන්වහන්සේට ආගන්තුක සාදකම්කොට උපාසකවරුන් ලවා පසයත් (සිව්පසය) දෙවා කීපදවසක් විහාරයෙහි වාසයකොට ආගන්තුක නම සිතනසේක් “මේ විහාරය ඵාසුය, මේ භික්‍ෂූහු පහකොට මා මෙතන වාසය කරන්ට උවමැනැව”යි සිතා “ඇයි ඇවැත්නි, බුද්ධෝපස්ථානයට නොයෙද්ද? බුදුන් නොදැක වාසය කරන්ට සුදුසුද?”යි වදාළසේක. උන්වහන්සේ වදරණ සේක් “බුදුන් දකින්ට අභිප්‍රාය ඇත්තෙමි, මාගේ විහාරය පාළුවේ දෝ හෝ යි සිතා විහාරය බලන කෙනෙකුන් නැති හෙයින් නොයන්නෙමි”යි වදාළසේක. එවිට ආගන්තුක භික්‍ෂූන්වහන්සේ වදරණසේක් “තමන් වහන්සේ එනතෙක් විහාරය බලමි. තොපි ගොසින් බුදුන් දැක එන්නේ යහපතැ”යි කීසේක.

උන්වහන්සේත් ආගන්තුක භික්‍ෂූන්වහන්සේට විහාරය පාවාදී උපාසක වරුන්ට උපස්ථාන කරන්ට සලස්වා බුදුන් දකිනා නියා ජේතවනාරාමයට වැඩිසේක. උන් වහන්සේ ජේතවනාරාමයට ගොස් එනකලට ආගන්තුක භික්‍ෂුතෙම විහාරයත් ගම උන් උපාසක වරුනුත් අත්ගෙණ උන්වහන්සේට වැඩඉඳිනා තෙනක් විවරකුත් අවසරයක් නුදුන්සේක. උන්වහන්සේ වෙන විහාරයක සැතපී "මුන් වහන්සේ කුමක් උවත් මා බොහෝ දවසක් වාසයකළ ගම උපාසකරු මට ආවේනිකව නොසිතද්දැ"යි උදෑසනක්සේම උන්වහන්සේ ගමට සිඟාවැඩිසේක. උපාසකවරුත් දන් දෙන්නා තබා සාමීචිකථා (තොරතුරු) පමණකුත් නොකළෝය. උන්වහන්සේ උන් ඇම කෙරේ විපරීත නොව "මෙතන වාසය කරන්නේ කිම්දැ"යි නැවතත් ජේතවනාරාමයට වැඩිසේත.

මේ කථාව දම්සභාවේ රැස්වූ මාළුවරුන් වහන්සේ (වැඩිහිටි හිමිවරු) කිය කියා වැඩ උන් තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි මා එන්නාට පූර්‍වභාගයෙහි (පළමුව) කිනම් කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා වදාරා එපවත් අසා "මහණෙනි, දැන්මතු නොවෙයි පෙරත් මුන්ගේ වාසස්ථානය උදුරාගත්තේ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ වනාන්තරයෙහි වෘක්‍ෂදේවතාව උපන්සේක. එතනට නුදුරු

ගල්ගුහායෙක රත්වූ මුඛ ඇති කුඩා වඳුරෙක් වාසය කරන්නේය. සත් රැ සත්දවලක් නොහැර ඝණවර්ෂාවක් වසින්ට වන. එවිට එක් කෘෂ්ණ මුඛ (කටකලු) නම් මහත් වානරයෙක් වැස්සේ තෙමී ඒ ගල්ගුහාව සමීපයට අවුත් සිතන්නේ "බොරුවක් කියා මේ වඳුරා මෙතනින් පහකොට මේ ගුහාව ගණිමි" සිතා ඒ ඵලාඵල කෑ එකෙකුමෙන් බඩපුප්පා කියන්නේ "වඳුර, මේ වනයේ අඹ දඹ නුග ආදීවූ යහපත් ඵලාඵල ඇති ඒ අනුභවකොට පියා එව"යි කියා ඒ වඳුරා එතනින් පහකොට තෙමේ ගල් ගුහාවට වැද උන්නේය. ඒ කුඩා වඳුරාද ඒ වනය මුළුල්ල ඇවිද නුග ගෙඩියක් විවරකුත් නොදැක ගල් ගුහාව සමීපයට අවුත් මේ වඳුරා මා වංචාකොට මෙතනින් පහකොට පියමි සිතන්නේ "තොප කී සැටියේ වනාන්තරයට වැද අඹ දඹ ආදීවූ ඵලාඵල අනුභවකොට ආමි. තොපිත් ගොසින් ඵලාඵල අනුභව කොට එව"යි කීහ. එවිට ඒ මහවඳුරා කියන්නේ "මේ වනයේ ඵලාඵලයෙක් කොතනක ඇද්ද? යටත් පිරිසෙයින් අඹ දඹ තබා කුඹුක්ගෙඩියක් පමණකුත් මේ වනයේ ඇද්දැ"යි කියා ඒ ගුහායෙන් නොගියෝ වේදැ?"යි වදරා මේ 'උදුම්බර ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි කුඩා වානරයා නම් නේවාසික භික්ෂූහුය. මහා වානරයා නම් විහාරය නෑර උන් ආගන්තුක භික්ෂූහුය. වෘක්ෂදේවතාව උපන්නෙම් බුදුවූ මම්මය"යි වදාළසේක.

# 292. කුමාරපත්ත ජාතකය

තවද හුදු ප්‍රඥාවෙන් මවාලු රුවක් වැනි වූ සර්‍වඥයන් වහන්සේ සැවැත්නුවර පූර්‍වාරාමයේ වැඩවසන සමයෙහි ක්‍රීඩාශීලීවූ (කෙලිලොල්) සාමණෙර වහන්දෑ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

සර්‍වඥයන් වහන්සේ උඩුමාලේ ඉන්දද්දී යටමාලේ ඉඳිනා සාමරනේරයන් වහන්දෑ බොහෝසේ අරගලකොට උනුන් හා මහත්කොට දොඩා කෝලාහල කළසේක. සර්‍වඥයෝ එපවත් අසා සැරියුත් සාමින්ට "ශාරීපුත්ත ස්ථවිරය, මේ යට මාලේ හිඳිනා භික්‍ෂූහු බොහෝ කොට අරගළ කරන්නාහ. උන් භයගන්වා මතු අරගල නොකරණ ලෙස හික්මව"යි වදාළසේක. එවිට ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ එගෙයි කොත්කැරැල්ල (වහල මුදුනෙහි කොත) පයින් අල්වාගෙණ සොලවාලුසේක. එවිට යටමාලේ උන් සාමනේරයන් වහන්දෑ උනුන් ඇඟගැසී භයින් තැතිගෙණ දොරට ගොස් මළුවේ සිටිසේක. එතනට ශාරිපුත්ත ස්ථවිරියන් වහන්සේ වැඩ "අරහල නොකරව"යි භයගැන්වූ සේක. මේ කථාව දම්සභාවේ රැස්වූ මාළුවරුන් වහන්සේ කිය කියා උන්තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි (පළමුව) කවර කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා එපවත් අසා "මහණෙනි, මේ සාමණෙරයෝ දැන් මතු නොවෙයි පෙරත් ක්‍රීඩාවෙහි

තත්පරයෝ (ඇලුනු) වේදැ”යි “ඒ කෙසේදැ”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්ත්‍වයන් වහන්සේ කුමාරපත්ත නමින් යුක්තව බ්‍රාහ්මණ කුලයක ඉපිද පඤ්චකාමයෙහි ආදීනව දැක ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ඒ වනාන්තරයට වන්නාහ. ඒ වනාන්තරයෙහි පන්සියයක් තාපසවරු එක් පන්සලක වාසය කරන්නාහ. උන් හැම කෙළිනා ක්‍රීඩා වානරයකුත් ඇත. ඒ තාපසවරු ලුනු ඇඹුල් නිසා මනුෂ්‍යපථයට (මිනිස් පියසට) ගියාහු එකල බෝධිසත්ත්‍වයෝ ගොස් ඒ පන්සල උන්නාහ. ක්‍රීඩා වානරයා පළමු තාපසවරු සේම වනැයි සිතා ඒ තාපසයන්ට මුඛවිකාර දැක්විය. එවිට බෝධිසත්ත්‍වයෝ “එඹල වානරය, තාපසරුන් ලඟ වසන්නාහූ සුශික්‍ෂිත (සංවර) උවමැනවයි ආචාරශීලයෙන් යුක්ත උවමැනවැ”යි වානරයා හික්මවූසේක. එතැන් පටන් වානරයා හික්ම ආචාරසීලයෙන් දවස් අරිනේය. ඒ තාපසයෝත් පන්සලින් ඔබ්බකට ගියසේක. එතන වාසය කළ තාපසවරු ලුනු ඇඹුල් සපයාගෙණ තමන් වාසය කළාවූ පන්සලට ආවාහ. එවිට ඒ වානරයා පළමු පරිද්දෙන් නොකර බැනනොනැගී (කතානැතිව) උන්නේය. එවිට තාපසවරු කියන්නාහූ “ඇයි? වානරය, තෝ පළමු අප හා හස්තවිකාර මුඛවිකාර පෑ කෙළෙනෙහි වේද්ද? දැන් නොකෙළින්නේ ඇයිදැ”යි විචාළාහ. එවිට වානරයා කියන්නේ “එඹා තාපසවරුනි, කුමාරපත්ත නම් තාපසයන් වහන්සේ මට

අවවාද කළසේක. එසේහෙයින් උන්වහන්සේ කී අවවාද මා සිත ඇත. පෙරසේ නොකෙළෙමි"යි කීය. "එසේනම් අපට අවවාද කියාගියා නියාවේදැ"යි වදුරා මේ කුමාරපත්ත ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි ඒ කුමාරපත්ත තාපසයෝ නම් බුදුවූ මම්මයයි වදාළසේක.

# 293. තෘතිය බක ජාතකය

තවද හුදු සද්ධර්මයෙන් මවාලු රුවක් වැනිවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි උපසේන නම් මහතෙර කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

මෙහි වර්තමාන කථාව සූත්‍රපිටකයෙහි විස්තර වශයෙන් පෙනෙන්නේය. උපසේන ස්ථවිරයන් වහන්සේ බාලවහන්දෑ එක්කොටගෙණ දුස්සීලව වාසයකරණසේක. සර්වඥයන් වහන්සේ එපවත් දැන කෝපකොට (නොසතුටුව) වදාළසේක. උපසේන මහතෙරුන් වහන්සේ භාවනාකොට ධ්‍යාන උපදවා රහත්ව තෙළෙස් ධුතාඟධරව (දහතුන් විශේෂ ගුණ) වාසය කරණ කල්හි එක් දෙදෙනෙකුන් වහන්සේගේ විවාදය නිසා බුදුහු පාටලීවනයට වැඩ වාසය කරණ සේක්, එසමයෙහි උපසේන නම් මහතෙරුන්වහන්සේ ධුතාඟධරව වහන්දෑ ඇරගෙණ සර්වඥයන් වහන්සේ කරා පාටලීවනයට වැඩිසේක.

සර්වඥයන් වහන්සේ "ධුතාඟධර වහන්දෑ විනා, නොවන වහන්දෑ මා දකින්නට නොඑත්ව"යි වදාළසේක. එවිට

ධුතාඞ්ගධර නොවන වහන්දෑ පාංශුකූලචීවරය (සොහොනෙන් ලබාගන්නා වස්ත්‍රයෙන් කළ සිවුර) පෙරවා ධුතාඞ්ගධරව සවීඥයන් වහන්සේ දුටුසේක. භික්ෂූන්වහන්සේ බුදුන් ජේතවනාරාමයට වැඩිය පසු ඒ පාංශුකූල චීවරයත් හැරතෙළෙස් ධුතාඞ්ගයත් හළසේක. එවිට බුදුහු වදාරණසේක් "මුන් හැමගේ සිල්රක්ෂා කිරීම බක නම් සිව්පාවා රැක්කාවූ සීලය මෙනැ"යි වදාළසේක. "ඒ කෙසේදැ"යි ආරාධිතවූ සවීඥයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ ශක්‍රදේවේන්ද්‍රව උපන්නාහ. එසමයෙහි බකනම් සිව්පාවෙක් ගඟක් අසලක පිටුපහණෙක (ගල් තලාවක) වාසය කරන්නේය. ඒ ගඟ වතුර ඇවිත් ගල්පොත්ත වටකොට මහවතුර ගලාගෙන එනවිට බක නම් සිව්පාවා සිතන්නේ "මෙතනින් මා ඔබ්බකට යා නොහැක්ක. පෙහෙවස් රක්ෂාකෙරෙමි"යි කරබාගෙණ (බෙල්ල පහත්කොට) බැනනොනැගී (කතා නැතිව) උන්නේය. එවිට ශක්‍රයෝ "මුගේ සීලය පරීක්ෂා කරන්ට උවමැනව"යි සිතා එළුවෙසක් මවාගෙණ ලඟට ආවාහ. එවිට බක නම් සිව්පාවා "එළුවා කමි" සිතා පිටට පැනපීය. ශක්‍රයෝ අන්තර්ධාන වූ සේක. දෙවනුවත් ගල්ලෑල්ලට නැගී "මට ප්‍රාණඝාතය සිද්ධ නුවූහෙයින් මාගේ සීලය බණ්ඩ නුවූයේය (කඩ නොවුයේ)"යි

සිතා උන්නේය. එවිට ශක්‍රයෝ දිව්‍යාත්මභාවයෙන් සිට "මේ තෝ සිල්රක්‍ෂාකරණ මනාදැ"යි කියා දෙව්ලොව ගියහ.

ඒ අර්ත්‍ථය (කාරණාව) දක්වන සර්‍වඥයන් වහන්සේ වදාරණසේක් "භික්‍ෂූහු මා එළඹ සිටිනාතුරු ධූතරාඞ්ගධරයම්හයි කියා අඟවා මා ජේතවනාරාමයට වැදුනාම පාංශුකූල චීවරය හැර ධූතාඞ්ගත් අළහ. මුන් රැකී සීලය නම් බක නම් සිව්පාවා එළුවා පිටට පැන වැරදගිය කල්හි මට ප්‍රාණඝාතය සිද්ධනොවුයේය. මාගේ සීලය ඛණ්ඩනුවුයේයයි සිතා උන් බක නම් සිව්පාවා මෙනැ"යි බොහෝ භික්‍ෂූන්වහන්සේට බණ වදරා "සීලය රක්‍ෂා කරණ කල නම් සිල්රක්නා පරිද්දෙන් සුසික්‍ෂිතව (හික්මීමෙන්) සීලය රක්‍ෂා කල මැනවැ"යි අවවාද වදරා මේ බකජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි ශක්‍රදේවේන්‍ද්‍රව උපන්නෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේකි.

**තිකනිපාත වර්‍ණනාව නිමි.**

# 294. චුල්ලකාලිංග ජාතකය

තවද එක් සමයෙක්හි පරහිත නිරතවූ (අනුන්ගේ යහපතෙහි ඇලුනු) සකල ජනමන නයනානන්ද කරවූ (ඇසට ප්‍රියවූ) ශාස්තෘ වූ අප තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සේක් සතර පරිබ්‍රාජිකා කෙනෙකුන්ගේ පැවිදිවීමක් අරභයා මේ ධර්‍ම දේශනාව ප්‍රකාශ කොට වදාළසේක.

ඒ කෙසේ ද යත්:-

විශාලා මහනුවරෙහි වනාහි සත්දහස් සත්සිය සත් දෙනෙක් ලිච්ඡවී රජහු වෙසෙති. ඒ සියළු රජ දරුවෝ ඔවුනොවුන් හා සාකච්ඡා කිරීමෙන් කල්පනාවක් කරන්නාහු ඊට ඉක්බිතිව පන්සියයක් වාද බිනීමෙහි නිපුණවූ (දක්‍ෂවූ) එක් නිගණ්ඨ පුත්‍රයෙක් මෙම විශාලා මහනුවරට පැමිණියේය. ඒ රජදරුවෝ ඔහුට සුදුසු සංග්‍රහ කළාහුය. අනිකුදු පන්සියයක් වාද බිනීමෙහි නිපුණවූ නිගණ්ඨ පරිබ්‍රාජිකාවක් එම නුවරට පැමිණියාය. ලිච්ඡවී රජදරුවෝ ඔවුන් දෙදෙනා වාද කරවූවාහුය. ඒ කිරීමෙන් ඔවුන් දෙදෙනා සදෘශ (සමාන) වූවාහුය. ඉක්බිති ලිච්ඡවී රජ දරුවන්ට මෙබඳුවූ සිතිවිල්ලෙක් වූයේය. “මොවුන් නිසා උපන් පුත්‍රයෙක් ව්‍යක්ත (දක්‍ෂ) වන්නේය”යි සිතා ඔවුන් දෙදෙනා විවාහ කරවා සමග වාසය කෙරෙව්වාහුය. ඔවුන්ගේ සංවාසය නිසා පිළිවෙලින් දූන් සතර දෙනෙකු හා එකම පුත්‍රයෙක් වැදුවාය. ඒ දූන් සතරදෙනාට ක්‍රමයෙන් සච්චය, ලෝලාය, අවවාදකය, පටාචාරා යයි නම් කළහ. පුත්‍රයාට සච්චක යයි නම් කළාහුය. ඔවුන් පස්දෙන විඥ්ඥදෘ (නුවණැති) බවට පැමිණි කල මෑණියන්ගෙන් පන්සියයෙක පියානන්ගෙන් පන්සියයෙකැයි වාද දහසක් උගත්තාහුය. මව්පිය දෙදෙන දූන් සතරදෙනාහට මෙසේ අවවාද කළාහුය. “ඉදින් ගෘහස්ථ (ගිහි) පුරුෂයෙක් තොපගේ වාදය බින්දේනම් ඕහට පාදපරිචාරිකා (බිරිඳ) වවු, පැවිදි කෙනෙක් තොපගේ වාද බින්දේනම් ඔහුගේ සමීපයෙහි පැවිදිවවු”යි කීවාහුය.

එයින් මෑතභාගයෙහි මව් පිය දෙදෙන කාල ක්‍රියා කළෝය. ඔවුන් කාල ක්‍රියා කළ කල්හි සච්චක නම් නිගණ්ඨ පුත්‍රයා ඒ විශාලා නුවරෙහි ලිච්ඡවී රජදරුවන් අක්‍ෂර ලිඛිතාදී (අකුරු ලිවීම) ශිල්ප උගන්වමින් වාසය කෙරෙයි, දූන් සතරදෙන දඹ අත්තක් ගෙණ වාදය පිණිස නුවරින් නුවර ඇවිදිනාහු ක්‍රමයෙන් සැවැත්නුවර වාසල්දොර සමීපයෙහි දඹ අත්ත හිටුවා "යම්කිසි ගෘහස්ථයෙක් හෝ පැවිද්දෙක් හෝ අපට වාදාරොපණය කරන්ට හැකිවී නම් ඒ පුරුෂතෙම මේ පාංශුරාසිය (පස් ගොඩ) පයින් විසුරුවා පයින් දඹ අත්ත මිරිකාපියත්ව"යි කියා ගම් දරුවන්ට කියා පිඩු පිණිස නුවරට වන්නාහුය.

ඉක්බිති ආයුෂ්මත්වූ දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ නොහැමදිතැන් (පිරිසිදු නොකළ) හැමද සිස්භාජනය දිය පුරවා ගිලන් භික්‍ෂූන්ට පිළිදැගුම් (උවැටැන්) කරවා ඉතා දහවල්හි සැවැත් නුවරට වඩනාසේක්. ඒ පස්රැස පිහිටවූ දඹ අත්ත දැක විචාරා ගම්දරුවන් ලවා හොලවා මිරිකවා "යම් කෙනෙකුන් විසින් මේ ශාඛාව පිහිටුවන ලද්දීද, ඔහු ආහාර කෘත්‍යය කොට අවුත් දෙව්රම් වෙහෙර දොරටුවෙහිදී මා දකිත්ව"යි ගම් දරුවන්ට කියා නුවරට වැද කරණලද ආහාරකෘත්‍ය ඇති සේක් දෙව්රම් වෙහෙර දොරටුවෙහි වැඩිසේක.

ඒ පරිබ්‍රාජිකාවෝ සතරදෙන පිඩුපිණිස හැසිර ආහාර කිස සපයා ආවාහු මිරිකා හෙළූ ශාඛාව දැක "කවරක්නු

විසින් මේ ශාඛාව මර්දනය කරණ ලද්දහු වේදැ''යි විචාළෝය. ''ශාරිපුත්‍ර ස්ථවිරයන් විසිනැ''යි අසා ''ඉදින් තොපි වාදය කරණු කැමැත්තාහු වී නම් දෙව්රම් වෙහෙර වාසල් දොරටුවට ගියමැනව''යි කියනලද්දහු. නැවත නුවරට ගොස් මහජනයා රැස් කරවා වෙහෙර වාසල් දොරටුවට ගොස් තෙරුන් වහන්සේ අතින් වාද දහසක් විචාළාහුය. තෙරුන්වහන්සේ ඒ සියළු වාදයන් විසඳූ ''අන්කිසි වාදයක් දනුදැ''යි විචාළසේක. ''ස්වාමීනි, අපි නොදනුම්හ''යි කීවාහුය. ''මම වනාහි අන්කිසි ප්‍රශ්ණයක් විචාරම්දැ''යි කීසේක. ''ස්වාමීනි, විචාළ මැනවැයි දනිතොත් කියන්නමෝ වේදැ''යි කිවූය. තෙරුන් වහන්සේ ''එකෙක් නම් කිම්දැ''යි විචාළසේක. ඒ පරිබාජිකාවෝ ස්වභාව වූ පරිද්දෙන් (ඇති සැටියෙන්) නොදන්නාහුය. එවිට තෙරුන් වහන්සේ විසඳූ වදාළසේක. ඔවූහු ''ස්වාමීන් වහන්ස, අපට පරාජයය, නුඹ වහන්සේට ජයවීය''යි කීවාහුය. ''දැන් තොප කුමක් කරව්දැ''යි විචාළසේක. ''අපගේ දෙමව්පියන් විසින් මෙබඳු අවවාදයක් දෙනලද, ඉදින් තොපගේ වාදය ගෘහස්ථයෙක් බින්දේ වීනම් ඕහට පාද පරිචාරිකවවු ඉදින් පැවිදිකෙනෙක් බින්දේ නම් ඔවුන්ගේ සස්නේ පැවිදිවවු යයි කීවාහුය. එබැවින් අපට පැවිදි වීම දුන මැනවැ''යි කිවූය. තෙරුන් වහන්සේ ''යහපතැ''යි වදාරා ඒ පරිබ්‍රාජිකාවන් සතරදෙනා උත්පලවණ්ණ මහා ස්ථවිරීන් වහන්සේගේ සමීපයෙහි පැවිදි කරවූසේක. ඒ සියළු මෙහෙනින්නෝ පැවිදි කරවූ නොබෝ කලකින් රහත් බවට පැමිණියාහුය.

ඉක්බිති එක් දවසක මේ ආශ්චර්යමත් (පුදුම) කථාශ්‍රවණයෙහි (කතා ඇසීමෙහි) කෝතුහල (උනන්දු) භික්ෂූන්වහන්සේ ධම්සභා මණ්ඩපයෙහි රැස්ව ඉඳ “ඇවැත්නි, ශාරිපුත්‍ර ස්ථවිරයෝ පරිබ්‍රාජිකාවන් සතර දෙනාට මාර්ග ඵල ප්‍රදානය කිරීමෙන් ඇස්වැස්සවූ සේක් වේදැ”යි උන් වහන්සේගේ ප්‍රඥා විශේෂ ගුණය ප්‍රකාශ කොට කීමෙන් වැඩ උන් සේක්. එකල්හි ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ එතැන්හි වැඩ වදරා “මහණෙනි, දැන් මා එන්නාට පූර්ව භාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ”යි විචාරා වදාළසේක. “ස්වාමීනි, බුදුරජාණන් වහන්ස, රාජකථා ආදිවූ අන් කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ. ශාරිපුත්‍ර ස්ථවිරයන් කරණ ලද ආශ්චර්යමත්වූ මෙනම් කථාවකින් කිය කියා උනුම්හ”යි දැන්වූ කල්හි “මහණෙනි, ශාරිපුත්‍ර ස්ථවිරයෝ මේ පරිබ්‍රාජිකාවන්ට අවශ්‍ය වූයේ දැන් මතු නොවෙයි පෙරත් වැඩෙහි යෙදීමෙන් අවශ්‍යවූය, දැන් ප්‍රව්‍රජ්‍යාභිසේක දීමෙන් අවශ්‍යවුසේක. පෙරත් රාජ මහේසිකාභිසේක ස්ථානයෙහි පිහිටවීමෙන් අවශ්‍යවූය”යි වදරා ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක.

යටගිය දවස කලිඟුරට දන්තපුර නුවර කලිඟු නම් රජක්හු රජ කරණ සමයෙහි අස්සක නම් රටක පොතලීනුවර අස්සක නම් රජෙක් රාජ්‍යය කෙරෙයි. ඔවුන් දෙදෙනා අතුරෙන් කලිඟු රජ සමෘද්ධ වූ හස්ත්‍යශ්වවාහනාදි බල සෙනග ඇතිව තෙමේද ඇත් බල ඇත්තේ තමා හා යුද්ධ කරන්නක්හු නොදැක යුද්ධ කරණු කැමතිව ඒ රජ “මා හා යුද්ධ කරණ කෙනෙකුන් නොදක්නෙමි. කවර ප්‍රයෝගයකින්

යුද්ධයක් යොදම්දැ''යි කියා අමාත්‍යයන් අතින් විචාළේය. එවිට අමාත්‍යයෝ කියන්නාහු "මහ රජ්ජුරුවන් වහන්ස, එක් උපායෙක් ඇත, නුඹවහන්සේගේ දූවු කුමාරිකාවෝ සතරදෙන උත්තම රූපශ්‍රී දරන්නාහ, ඔවුන් සියළු ස්ත්‍රී ආභරණයෙන් සරහා පිළිසන්වූ (වැසුනු) ආසනයෙහි වඩා හිඳුවා බළ සෙනඟ පිරිවරණ ලද්දවූ ඔවුන් ගම් නියම් ගම් රාජධානියෙහි ඇවිදුවා යම්කිසි රජෙක් ඔවුන් තමාගේ ගෙයි ඇතුලත් කොට වාසය කරණු කැමැත්තේ විනම් ඔහු හා සමග යුද්ධ කරම්හ''යි කීවාහුය.

ඒ කලිඟුරාජ අමාත්‍යයන් කී පරිද්දෙන්ම කෙළේය. ඔවුන් ගිය ගිය තැන්හි රජදරුවෝද කලිගුරජහට භයින් තමන් නුවරවලට වදින්ට අවසර නොදී අන්නපානාදිවූ පඬුරු යවා පිටිනුවර දීම යපීම කොට වාසය කරත්. මෙපරිද්දෙන්ම සියළු දඹදිව මුළුල්ලෙහි ඇවිද අස්සක පොතලී නුවරට පැමිණියාහුය. එනුවරෙහි අස්සක රජ නුවර වාසල්දොර (ප්‍රධාන දොරටුව) වස්වා පඬුරු ගමන් කරවූයේය. ඒ රජහුගේ නුවණැති කාර්යයාකාර්ය්‍ය පරිඥානයෙහි ව්‍යක්තවූ (කළ නොකළ යුතුදේ දක්ෂ) උපාය ඥානයෙහි දක්ෂවූ නන්දිසේන නම් අමාත්‍යයෙක් ඇත. ඒ තෙමේ මෙබඳු සිතිවිල්ලක් සිතීය. "මේ රාජකුමාරිකාවෝ වනාහි සියළු දඹදිවිතෙලෙහි සැරිසරා ඇවිද ප්‍රතියුද්ධ (එරෙහිව එන) කරණ කෙණෙකුන් නොලද්දාහුය. එසේ කල්හි සියළු ජම්බුද්වීපය හිස්වූයේ නම් වන්නේය. මම කලිඟුරජ හා සමග යුද්ධ කෙරෙමි''යි කියා නුවර වාසල් දොරට ගොස් දොරටුපාලයා කැඳවා ඒ රාජ

කන්‍යාවන් නුවරට වදනා පිණිස කියනුයේ "කලිඟුරටට ප්‍රධානවූ රජහට කලිඟුරජයයි කියා යම්සේ ව්‍යවහාර වීද, ඒ පරිද්දෙන්ම අරුණ කුමාරයන් වහන්සේ අපගේ මේ අස්සක නුවරට අධිපතිවූ හෙයින් අස්සකයයි නම් ලත් රජහු පුරුෂශ්‍රේෂ්ඨවූ (උතුම් මිනිසකු) ගුරුවරයන් විසින් මොනවට අනුශාසනා කරණ ලද්දවූ නන්දිසේන නම්වූ මා විසින් සුරක්‍ෂිතවූ වාසල්දොර මේ රාජ කන්‍යාවන්ගෙන් ඝර ප්‍රවේශය (ගෙට පිවිසීම) පිණිස කරණලදැ"යි අමාත්‍යයන් විසින් මෙසේ කියා දොර හරවා ඔවුන් ගෙණ ගොස් අස්සක රජහට දක්වා "රජ්ජුරුවන් වහන්ස, භය නොගත මැනව, යුද්ධ ඇති කල්හි ඊට සුදුසු කාරිය මම දනිමි"යි "මේ උත්තම රූපශ්‍රීධරවූ (මනා රූ සපුවෙන්) රාජ කන්‍යාවන් අගමෙහෙසුන් කරව"යි කියා ඔවුන්ට අභිශේකදී (මෙහෙසි තනතුරු) ඔවුන් සමඟ ආවාවූ රාජපුරුෂයන්ට "සගයෙනි තොප තොපගේ නුවරට පලායව"යි "රාජ කන්‍යාවන් අස්සක රජහු විසින් අගමෙහෙසුන් තනතුරෙහි තුබූබව තොපගේ රජහට කියව"යි කියා ගමන් කරවූයේය.

ඒ රාජ පුරුෂයෝ ගොස් එපවත් කලිඟු රජහට කීවාහුය. එබස් ඇසූ කලිඟුරජ "අස්සක මාගේ බලපරාක්‍රම (බල මහිමය) නොදන්නේදැ"යි කියා එකෙනෙහිම මහත් සිව්රඟ (ඇත්, අස්, රිය, පාබල) සෙනග හා සමග යුද්ධයට සැරසී නික්මුනේය. එපවත් ඇසූ නන්දිසේන නම් අමාත්‍යයා කලිඟුරජහු යුද්ධයට සැරසී එන බව දැක "තමන්ගේ රාජ්‍ය සීමාවෙහි වෙසෙත්වයි අපගේ රාජ සීමාවට නොබසිත්වයි

දෙරට සීමා මධ්‍යයෙහි වන්නේය''යි කියා අසුන් (ලියුම්) ලියා ගමන් කරවූයේය. ඒ රජ අස්න අසා තමාගේ රාජ්‍ය සීමාවෙහි සිටියේය. අස්සක රජ බල සෙනග පිරිවරා තමාගේ රාජ්‍ය සීමාවෙහි සිටියේය. එකල්හි පුරණ ලද බෝධි සමාභාර ඇති අප මහබෝසතානන් වහන්සේ ඍෂිප්‍රව්‍රජාවෙන් පැවිදිව දෙරට අතුරෙහි වූ එක් පන්සලෙක වාසය කරණ සේක.

කලිඟුරජතෙම "ශ්‍රමණයෝ නම් යම් කිසිවක් දනිති, යුද්ධයෙහි ජය පරාජය නම් කවරක් විසිනුදු නොදත හැක්කේය. එසේ හෙයින් එපවත් තාපසයන් වහන්සේ අතින් විචාරමි'' සිතා අප්‍රසිද්ධ වේශයකින් මහබෝසතානන් කරා ගොස් නමස්කාර කොට එකත්පස්ව හිඳ පිළිසඳර කථාකොට "ස්වාමීනි, කලිඟුරජද අස්සක රජද ඔවුනොවුන් හා යුද්ධ කරුණු කැමැත්තාහු. තම තමන්ගේ රාජ්‍ය සීමාවෙහිම සිටියාවූ මොවුන් දෙදෙනා අතුරෙහි කවරක් හට ජය පරාජය වන්නේ දැ''යි විචාළේය. "මහ පින්වත්වූ පුරුෂය, මම අසවල් රජහට ජයය අසවල් රජහට පරාජය වන්නේයයි නොදනිමි, ශක්‍රදේවේන්ද්‍රයෝ වනාහි මෙතනට එන්නෝය. මම් ඔහුගෙන් විචාරා කියමි, සෙට දවස මෙතනට එව''යි කීසේක. ශක්‍රදේවේන්ද්‍රයෝ මහබෝසතානන් වහන්සේට උපස්ථානයට අවුත් උන්නේය. ඉක්බිති මහබෝසතානන් වහන්සේ ඔහු අතින් එම කාරණාව විචාළසේක.

"ස්වාමීනි, තාපසයන් වහන්ස කලිඟුරජහට ජය වන්නේය. අස්සක රජහට පරාජය වන්නේය. මෙබඳුවූ පූර්වනිමිතිද

පෙනෙන්නේය''යි කීයේය. කලිඟුරජ දෙවෙනි දවස් ඇවිත් විචාළේය. මහබෝසතානන් වහන්සේද ඕහට ඒ කාරණය කීසේක. ඒ රජ ''කවර පූර්වනිමිතෙකක් (පෙර නිමිත්තක්) වන්නේදැ''යි නොවිචාරා ''මම වනාහි දනිමි'' යන සන්තෝෂ චිත්තයෙන් ගියේය. ඒ කථා ප්‍රවෘත්තිය දෙසෙනගට පැතිර ගියේය. එබස් ඇසූ අස්සක රජ නන්දිසේන නම් අමාත්‍යයා කැඳවා ''කලිඟුරජහට වනාහි ජයවන්නේය. අපි පැරදුනම්හ. මෙයට කටයුතු කිම්දැ''යි කීයේය.

එබස් ඇසූ අමාත්‍යයා ''මහරජාණන් වහන්ස, මේ යුද්ධ කිරීමෙන් කවර රජක්හටම ජය පරාජය වේදැයි කවරෙක් දනීද? නුඹ වහන්සේ එස් නොසිතව මැනව''යි රජහු අස්වසාලා බෝසතානන් කරා එළඹ නමස්කාර කොට එකත් පස්ව හිඳ ''ස්වාමීනි, මේ යුධයෙහි කවර රජෙක් ජයපරාජය වේදැ''යි විචාළේය. ''නන්දිසේනය, කලිඟුරජ දිනන්නේය. අස්සක රජ පරදින්නේය''යි කීයේය. ''ස්වාමීනි, දිනන්නාහට කවර පූර්වනිමිත්තක් පෙනෙන්නේද? පරදින්නා කවර පූර්වනිමිත්තක් පෙනෙන්නේදැ''යි විචාළේය. ''මහපිනැති නන්දිසේනය, දින්නනාහුගේ ආරක්‍ෂා දිව්‍ය පුත්‍රයා සර්වාංග ධවලවූ වෘෂභ වේසයෙන් (මුළු සිරුර සුදු ගොණෙකු සේ) පෙනෙන්නේය. පරදින්නාහුගේ ආරක්‍ෂා දිව්‍ය පුත්‍රයා සියලඟ කෘෂ්ණවර්ණවූ (කළුපැහැ) වෘෂභයක් මෙන් පෙනෙන්නේය. ඔවුන් දෙදෙනාගේ ආරක්‍ෂා කොට දෙන දිව්‍යපුත්‍රයෝම යුද්ධ කොට ජයපරාජය කෙරෙති'' කීයේය. එබස් ඇසූ නන්දිසේන නම් අමාත්‍යයා නැගීසිට ගොස් රජුගේ සහාය වූ දහසක්

පමණ මහ යෝධයෝ ඇත, ඔවුන්ගෙන එතනට නුදුරුතන්හි එක් පර්‍වතයක නැගී “පින්වත්නි, අපගේ රජ්ජුරුවන් වහන්සේගේ ජීවිතය රක්‍ෂාකොට දෙන්ට හැකිදැ”යි විචාළේය. ඒ තෙපුල් ඇසූ යෝධයෝ “එසේය ජීවිතය රක්‍ෂා කරන්ට හැකිවම්හ”යි කීවාහුය. “එසේ වීනම් ප්‍රපාත ස්ථානයෙහි වැටෙවුදැ”යි විචාළේය. එබස් ඇසූ දහසක් පමණ යෝධයෝ ප්‍රපාත ස්ථානයෙහි (බෑවුම) වැටෙන්ට පටන් ගත්තාහුය. ඒ වේලෙහි ඔවුන් වලක්වා “ප්‍රපාත ස්ථානයෙහි වැටී මිය ගියායින් ප්‍රයෝජන කිම්ද? අපගේ රජ්ජුරුවන් වහන්සේට සහායව නොපසු බැස යුද්ධ කරව”යි කීයේය. ඔහු එබස් පිළිගත්තාහුය. ඉක්බිති යුද්ධය පැමිණි කල්හි කලිඟුරජ “මම දිනමි” හීන වීර්යයට (උත්සාහය හැර) පැමිණ සන්නාහ සන්නද්ධව (යුධ ඇඳුමෙන් සැරසී) ගොළු ගොළු වූවාහු තම තමන්ගේ අභිප්‍රාය ස්ථානවලට (කැමති තැන්වලට) ගියාහුය. යුද්ධ කිරීමට සුදුසු කල්හි වීරිය නොකළාහුය. රජ දරුවෝ දෙදෙනාද අශ්ව යානාවට පැන නැගී යුද්ධ කරමි කියා ඔවුනොවුන් කරා එළඹියාහුය.

එකල්හි රජ දරුවන් දෙදෙනාගේ ආරක්‍ෂා දිව්‍යපුත්‍රයෝ පෙරටුව ගොස් කලිඟු රජහුගේ ආරක්‍ෂා දිව්‍යපුත්‍රයාට සර්‍වාඟධවලවූ වෘෂභ වේශයක් වූයේය. අස්සක රජහුගේ ආරක්‍ෂා දිව්‍යපුත්‍රයා සියලඟ කෘෂ්ණවර්‍ණ වෘෂභවේශයක් වූයේය. ඔහු දෙදෙනද ඔවුනොවුන් හා යුද්ධාකාර දක්වා එළඹියාහුය. වෘෂභයෝ වනාහි ඒ රජදරුවන් දෙන්නාටම පෙනෙති, අන් සත්‍වයන්ට නොපෙනෙති, නන්දිසේන නම්

අමාත්‍යතෙම "මහරජ්ජුරුවන් වහන්ස, නුඹ වහන්සේට ආරක්‍ෂා දිව්‍ය පුත්‍රයෝ පෙනෙන්නේදැ"යි කියා අස්සක රජගෙන් විචාළේය. "එසේය මට පෙනෙන්නෙය"යි කියේය. "කවර රූපයක් පෙනේදැ"යි විචාළේය. කලිඟුරජහුගේ ආරක්‍ෂා දිව්‍යපුත්‍රයා සර්වාංගධවලව වෘෂභයක්ව පෙණෙන්නේය. අපගේ ආරක්‍ෂා දිව්‍යපුත්‍ර තෙම සියලඟ කෘෂ්ණවර්ණව මිරිකුණු ශරීරව (විඩාපත්ව) පෙණෙන්නේය. "මහරජ්ජුරුවන් වහන්ස, නුඹ වහන්සේ නොබව මැනව, අපි ජය ගණුම්හ, කලිඟුරජ පරදනේය. එසේ හෙයින් නුඹ වහන්සේ අසු පිටින් බිමට බැස මෙතෙප් ගෙණ මොනවට හික්මුනු සෛන්ධවයා උදර පාර්ශවයෙහි වම් අතින් උන් මීලනය කොට (තදකොට) මේ දහසක් පමණ යෝධයන් හා සමඟ වේගයෙන් ගොස් කලිඟුරජහුගේ ආරක්‍ෂක දිව්‍යපුත්‍රයාහට තෙප්පහරින් (ආයුධයෙන්) පහරව"යි කීයේය.

"ඉක්බිති අපි දහසක් පමණ ඇත්තෝ දහසක් තෙප්වලින් පහරුම්හ. එසේකල්හි කලිඟුරජගේ ආරක්‍ෂා දිව්‍යපුත්‍ර නැසෙන්නේය. ඉක්බිති කලිඟුරජ පරදිනේය. අපි දිනම්හ"යි කියා අස්සක රජ "එසේවීනම් යහපතැ"යි ගිවිස නන්දිසේනයා විසින් දුන් සලකුණෙන් ගොස් තෙබින් (ආයුධයෙන්) පහරක් දුන්නේය. දහසක් පමණ යෝධයෝ තෙප්දහසක් පහළාහුය. ආරක්‍ෂා දිව්‍යපුත්‍රයා එතැන්හිම ජීවිතක්‍ෂයට පැමිණියේය. එකෙණෙහි කලිඟුරජ පැරද ගියේය. පැරද යන කලිඟුරජහු දැක දහසක් පමණ යෝධයෝ "කලිඟුරජ පැරදෙයන්නේය"යි මහ ශබ්ද පැවැත්වූවාහුය. මරණ භයින් භයගෙණ යන

කලිඟුරජ තාපසයන් වහන්සේට ආක්‍රෝශ කියා බණන්නේය. “එඹල කොල කූට (කපටි) තාපසය, අන් සත්‍වයන් විසින් සහනය (ඉටුකළ නොහැකි) කළ නොහැකි යුද්ධ ප්‍රයෝගාදිය සහනය කරන්නාවූ කලිඟු රජහට ජයයි කියාද අස්සක රජහට අවැඩව පරාජය වෙයි කියාද කියන ලද්දවූ තොප විසින් අත්ලස් ගෙණ පරදින රජහු දිනති, දිනන රජහු පරදිති තොප විසින් කියන ලද විරුද්ධවචනය, කායද්වාරාදීන් (කායාදී තිදොරින් නිවැරදි) ඍජුවූ උත්තම සත්‍වයෝ මෙබඳු මුසා නොකියති”යි කියා කලිඟුරජ තාපසයන්ට වෙහෙසා ආක්‍රෝශ පරිභව බෙනෙමින් ගොස් තමාගේ නුවරටම ගියේය. නැවත පසු බලන්ටද අසමර්ත්‍ථවිය.

ඉක්බිත්තෙන් කීප දවසක්හුගේ ඇවෑමෙන් සක්දෙව්රජ තාපසයන් වහන්සේට උපස්ථානයට ආයේය. උන් වහන්සේ ඒ සක්දෙව් මහරජහු හා සමග කථා කරණසේක්. “දෙදෙව්ලෝ වැසි දෙවියන්ට රජවූ පෘථිවීනිශ්‍රිත (පොළොව ඇසුරු කරණ) දෙවියන්ට ප්‍රධානවූ මඝමානවක යන පූර්‍වනාමයෙක් ඇති ශක්‍රදේවේන්‍ද්‍රයානනි, තොප වැනි මහේශාක්‍ය දෙවියෝ මුසාවාදයෙන් වැලැක්කාහ. සබවයයි (සත්‍ය වචනය) කියනලද උතුම් දනය ඒ දෙවියන් කෙරෙහි පිහිටියේය. තොප විසින් යම් වචනයක් මට කියන ලදද ඒ අනර්ත්‍ථවිනාසකරවූ මුසාවාදයයි කියන්නාවූ එබඳුවූ අවිද්‍යාමාන (නොපවතින) වචනයක් කවර කාරණයක් පිණිස කියනලදදැ”යි කීයේය.

එබස් ඇසූ ශක්‍රදේවේන්‍ද්‍රයෝ කියනුයේ “රාගාදී කෙලශයන් තමාගේ චිත්තසන්තානයෙන් බැහැරකරණ ලද හෙයින් බ්‍රාහ්මණ නම්වූ තාපසයානන් වහන්ස, දෙවියෝ පුරුෂයන්ගේ බල පරාක්‍රමයට ඊර්ෂ්‍යා නොකෙරෙති. එතැන්හි ආගම ශාස්ත්‍ර වල කියන බස් නුඹ වහන්සේ විසින් අසන ලද්දේ නොවේද? ආත්ම දමනයට පැමිණි සියලු සෙනග සමගි වීමෙන් නොපසුබැස යුද්ධයට එන කල්හි දඬුවීය්‍යී බලපරාක්‍රම ඇති අස්සක රජහට ජයවීය”යි කියා ශක්‍රදේවේන්‍ද්‍රයා තාපසයන් වහන්සේට කීයේය. ඉක්බිති කලිඟු රජ්ජුරුවන් පැරද ගිය කල්හි අස්සක රජ්ජුරුවෝ පර සෙනග දමා ගිය වස්තු ගෙණ තමාගේ නුවරටම ගියේය. ඉක්බිති නන්දිසේන නම් අමාත්‍යයා කලිඟු රජහට අසුන් ලියවා ගමන් කරවන්නේ “ඉදින් මේ රාජ කන්‍යාවන් සතරදෙනාට දයාද කොටස් එව්ව මැනව, නොඑව්වහොත් මේ තැන්හි කටයුතු කාරියාකාරිය දනිමි” ලියා ගමන් කරවූයේය. එබස් ඇසූ කලිඟුරජ භයින් තැතිගෙණ ඒ රාජ කන්‍යාවන් විසින් ලැබිය යුතු දයාද ගමන් කරවූයේය. එතැන් පටන් සමගිව වාසය කළාහුය.

ශාස්තෘ වූ බුදුරජානන්වහන්සේ මේ ධර්‍ම දේශනාව ගෙණ හැර දක්වා වදාරා මේ චුල්ලකාලිඟ ජාතකය නිමවා වදාළසේක.

“එසමයෙහි කලිඟුරජ දූ සතර භික්ෂුනියෝ වන්නාහුය, එකල්හි නන්දිසේන අමාත්‍යයා නම් දැන් ශාරිපුත්‍රස්ථවිරයෝය.

එසමයෙහි තාපසයෝ නම් බුදුවූ මම්මවේදැ”යි තමන් වහන්සේ දක්වා වදාළ සේකි.

# 295. මහාඅශ්වාරොහක ජාතකය

තවද එක් සමයෙක්හි ධර්මස්වාමිවූ බුදුරජානන්වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසනසේක්. අනඳ මහතෙරුන්වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද? යත්

වර්තමාන කථාව යට කියන ලද ජාතකය හා සදෘශමය (සමානය), “පෙර නුවනැත්තෝ තමාට කළ උපකාර වශයෙන් අනුන්ටත් ප්‍රත්‍යුපකාර (කළ ගුණ සැලකීම) කළාහුමවේදැ”යි වදරා මෙතැන්හි ඉකුත්වත් ගෙණ හැර දක්වා වදාළසේක.

යටගිය දවස පුරණ ලද බෝධි සමාභාර ඇති අප මහ බෝසතානන් වහන්සේ බරණැස් රජව දැහැමෙන් සෙමෙන් රාජ්ජය කරණ සමයෙහි දන්දෙන සේක. සිල් රක්‍ෂා කරණසේක. ඒ රජාණෝ පසල් දනව්වක් (පිටිසර ගමක්) කිපුනු බව අසා “ඒ පසල් දනව්ව සන්සිඳවමි”යි බල සෙනඟ පිරිවරා ගොස් යුද්ධයෙහි පැරදුනු ඒ රජ්ජුරුවෝ අසුපිටට පැන නැගී යුද්ධයටම සැරහුනු ඇමතියන් සිටි ගම් දෙරින් ඇතුළු පසල් ගමකට වන්නේය. එගම රාජ සේවකයෝ තිසක් වසති. ඔවුන් තිස්දෙන මේ කිමෙක්දැයි භයින් තැති ගෙණ ගොස් තම තමන්ගේ ගෙවලට වන්හ. එයින් එක් පුරුෂයෙක් තමාගේ ගෙට නොගොස් රජහට පසු ගමන් කොට “අපගේ

රජ්ජුරුවන් වහන්සේ යුද්ධයක් පිණිස ප්‍රත්‍යන්ත ජනපදයකට වැඩිසේක්වේද? තෙපි කවුරුද? රාජ පුරුෂයෙක්ද? චොර පුරුෂයෙක්දැ''යි විචාළේය.

"යහළු මම රාජපුරුෂයෙක්මි" කීයේය. "එසේවීනම් මා හා සමග ආව මැනවැ''යි කියා රජහු ගෙට කැඳවා ගෙණ ගොස් තමා හිඳිනා අස්නේ හිඳුවා "සොඳුර මෙසේ එව, මිත්‍රයානන්ගේ පය සෝදව''යි භාර්‍ය්‍යාවන් ලවා පය සෝධවා තමන්ගේ ශක්ති පමණින් ආහාර දී "මොහොතක් කල් සැතපුන මැනවැ''යි කියා සැතපෙන අසුනක් පැනවීය. එහි රජ සැතපුනේය.

ඉක්බිති ගම්වැස්සෝ අශ්වයාගේ සන්නාහ (යුධ ඇඳුම්) මුදා සක්මන් කරවා දිය පොවා පිට තෙල් ගල්වා ඔහු කෑයුතු තණ දුන්නේය. මෙසේ තුන් සතර දවසක් රජ්ජුරුවන් රක්‍ෂා කොට "යහළු, මම නුවරට යෙමි" කී කල්හි නැවත රජ්ජුරුවන් වහන්සේටද අසුටද කළ මනා සියළු වතාවත් කෙළේය. ඔහු විසින් කළ සත්කාර විඳ යන ඒ රජ කියනුයේ "යහළු, මම අශ්වාරෝහකයෙමි. අපගේ නුවර මැද වන්නේය. ඉදින් යම්කිසි කාරියක් කරණ කොට ගෙණ නුවරට එන්නෙහි වී නම් දකුණු දෙස මහ වාසල් දොර සිට දොරටුපාලයාගෙන් මහා අශ්වාරෝහකයා කවර ගෙයක වාසය කෙරේදැයි විචාරා දොරටු පාලයාද කැඳවා ගෙණ අපගේ ගෙට එව''යි කියා තමාගේ නුවරටම ගියේය. බල සෙනඟද රජ්ජුරුවන් නොදැක පිටිනුවර කඳවුරු බැඳ සිටියාහු. රජහු දැක පෙර

ගමන් කොට පිරිවැරූවාහුය. නුවරට වදනා රජ්ජුරුවෝ දෙරකඩ ඇතුලෙහි සිටිනා දෙරටුපාලයා ලඟට කැඳවා මහ ජනයා එතනින් පහ කරවා "කොල එක් පිටිසර ගම් වැසි පුරුෂයෙක් මා දක්නා කැමතිව ඇවිත් මහ අශ්වාරෝහකයාගේ ගෙය කොතැන්හි දැයි විචාළේ නම් තොපි ඔහුගේ අත අල්වාගෙණ ආයෙහි වී නම් එකල්හි තෙපි දහසක් ලබන්නෙහිය"යි කියා ගියේය. ඒ ගම් වැසි පුරුෂයා කලක් නුවරට නො ආයේය. ඔහු නොආ කල්හි රජ්ජුරුවෝ ඔහු වසන ගම කරවූවර (අයබදු) වැඩූහ. කරවුවර වැඩි කල්හිත් නොඑන්නේය. මෙලෙස දෙතුන් වරෙක කරවුවර වැඩිවිය. එසේද නොඑන්නේය.

ඉක්බිති ගම් වැසි මනුෂ්‍යයෝ රැස්ව ඕහට කියන්නාහු "අය්යියන් වහන්ස, නුඹ වහන්සේ මහා අශ්වාරෝහකයන් ගෙට ආකල් තැන් පටන් වැඩි කරවූවර දීමෙන් පීඩා විඳමෝ ඉවසාගත නොඑම්හ. එසේහෙයින් නුඹ වහන්සේ නුවරට ගියමැනවැයි මහා අශ්වාරෝහකයාට අපගේ වැඩි කරවූවර හැර වුවමැනව"යි කීවාහුය. "යහපත එසේවී නම් යෙමි" කියා "මාගේ මිත්‍රයා ලඟට සිස් අතින් යාම සුදුසු නොවන්නේය, උන්ගේ දරුවෝ දෙදෙනෙක් ඇත, ඒ දෙදෙනාටද මාගේ මිත්‍රයානන්ටද ඔවුන්ගේ භාය්‍යියාවුන්ටද හිඳිනා පොරොනා දෑ හා ආභරණද මාගේ ගමනට පිළියෙළ කරව"යි කීයේය.

"යහපත, පිළියෙල කරම්හ"යි කියා ඒ ගම්වැසි පුරුෂයෝ ඒ සියළු උපකරණ සැරහුය. එකියන උපකරණ හා තමාගේ

ගෙයි පිසූ අසුරුලහළු (කැවුම්) ගෙණ ගොස් දකුණු දෙස මහවාසල් දොරට පැමිණ “යහළුව, මේ නුවර මහා අශ්වාරෝහකයන්ගේ ගෙය කොතැන්හිදැ”යි දොරටු පාලයා අතින් විචාළේය. ඒ තෙම “මා හා සමග එව, තොපට මහා අශ්වාරෝහකයන් දක්වමි” කියා ඔහු අත අල්වාගෙණ රාජ භවනයෙහි දොරකඩට ගොස් දොරටු පාලකයා “පසල් ගම්වැසි පුරුෂයා කැඳවාගෙණ ආයෙමි”යි කියා යැවීය.

රජ එපවත් අසා උන්තෙනින් නැගීසිට “මාගේ මිත්‍රයානන් ඔහු හා සමග ආකෙණෙකුන් එතව”යි කියා යැවීය. රජ පෙර ගමන් කොට ඔහු දැකම ඔවුනොවුන් වැලඳ “මට උපස්ථාන කළ යෙහෙලි ස්ත්‍රීද ඕ දරුවෝද නිරෝගීදැ”යි විචාරා අත අල්වාගෙන මතු මහල්තලයට ගෙණ ගොසින් ඒ ගම්වැසි පුරුෂයා දළපුඩුසේසත්යට (ඇත් දළයෙන් කැටයම් කළ සුදු කුඩය යට) රාජාසන මස්තකයෙහි ඉඳුවා අග්‍ර මෙහෙසිකා බිසවුන් කැඳවා “සොඳුර, අපගේ මිත්‍රයානන් පය සෝදව”යි කීහ. එ බිසවද ඔහුගේ පය සේදුවාය. රජ ස්වර්ණභිංකාරයෙන් (රන් කෙන්ඩියෙන්) දිය වත් කෙළේය. බිසවු පය සෝදවා සුවඳ තෙල් ගැල්වුවාහුය. රජද “යහළු, අප කෑයුතු කිසි දෙයක් ඇද්දැ”යි විචාළේය. ඒ ගම් වැසි පුරුෂ තෙම “කෑ යුතු දෑ ඇතැ”යි කියා පසුබියෙන් අසුරුලහළු නිකුත් කෙළේය.

රජ රන්තලියෙන් ගෙන ඔහුට සංග්‍රහ කරන්නේ “මාගේ මිත්රයා විසින් ගෙණ ආ දෑ අනුභව කරව”යි කියා බිසවුන්ට

ද අමාත්‍යයන්ටද දෙවා තෙමේත් අනුභව කෙළේය. නැවත අන් පඬුරු දැක්වූයේය. නැවත රජ ඔහු සිත් ගන්නා පිණිස හන්පෙරව් (හැඳ පොරවාගගත්) කසී සළුව හැර ඔහු ගෙනා වස්ත්‍රයක්ම හැන්දේය. බිසවුද අමුතුව ගෙණා වස්ත්‍රාභරණයන් හැඳ පැලඳ ඉක්බිති ඔහු රාජ භෝජනය අනුභව කරවා "මොහු කැඳවා ගෙණ ගොස් මට මෙහෙකරණ පරිද්දෙන්ම කරකම් කරවා සුවඳ දියෙන් නාවා ලක්‍ෂයක් අගනා කසී සළුවක් හඳවා රාජාභරණයෙන් සරහා ගෙණව"යි කියා එක්තරා අමාත්‍යයෙකුට නියෝග කෙළේය. ඒ අමාත්‍යයාද එපරිද්දෙන්ම සරහා ගෙණ ආයේය.

ඉක්බිති රජ්ජුරුවෝ නුවර බෙර හසුරවා ඇමතිගණයා රැස් කරවා ධවලාතපත්‍රයාගේ (සුදු කුඩය) මැද්දෙහි හිඳ හිගුල්මය (රතු නූලක්) සූත්‍රයක් හෙලා අර්ධරාජ්ජය දුන්නේය. ඔහු දෙදෙන එතැන් පටන් අන්නපානාදිය අනුභව කිරීම් වශයෙන් යන එන ක්‍රියාවන් එක්පවත්වන්නාහ. කවරක්හු විසින් භෙද කොටගත නොහැක්කාවු විශ්වාසය ස්ථිර විය. ඉක්බිති ඔහුගේ අඹු දරුවන්ද නුවරට ගෙන්වා ඇතුළු නුවරෙහි ගෙවල් තනවා දුන්නේය. ඔහු දෙදෙන සමගි සතුටුව රාජ්ජය කෙරෙති. ඉක්බිති අමාත්‍යයෝ කිපී රාජ කුමාරයන්ට කියන්නාහු "කුමාරයන් වහන්ස, අපගේ රජ්ජුරුවන් වහන්සේ එක් පිටිසර වැසි ගොවියෙකුට රාජ්ජයෙන් අඩක් දී ඔහු හා සමග අන්නපානාදිය එක්ව පවත්වන සේක. රජ කුමරුවන් ලවා නමස්කාර කරවනසේක. මේ ගොවියානන් විසින් රජ්ජුරුවන් වහන්සේට ගියදවස කළ කෙළෙහි ගුණයක් අපි

නොදනුම්හ"යි රජ්ජුරුවන් වහන්සේ කුමකින් කුමක් කරන බවත් නොදැන ඉදිරියේ සිට කිවූය. එබස් රාජ කුමාරයෝ "යහපතැ"යි කියා පිළිගෙණ ඒ සියළු කථා ප්‍රවෘත්ති රජ්ජුරුවන්ට දක්වා "මහරජ්ජුරුවන් වහන්ස, මතු මෙබඳු දෙයක් නොකළ මැනවැ"යි කීයේය.

එබස් ඇසූ රජ "පුතනුවෙනි, මම යුද්ධයෙහි පැරදුනේ නම් කොතැන්හි වාසය කෙරෙම්ද? ඒ විසූ තැන් තෙපි දනුදැ?"යි විචාළේය. "දේවයන්වහන්ස, අපි නොදනුම්හ"යි කී බස් අසා කියනුයේ "මම මොහුගේ ගෙයි වාසය කරන්නෙම් නිරෝගිව අවුත් දැන් මේ බරණැසෙහි රාජ්ජය කෙළෙම්. මෙසේ මට උපකාර වූවක්හට ප්‍රත්‍යුපකාර වශයෙන් කවර සැපතෙක් නොදෙම්ද?" මෙසේද කියා වනාහි මහ බෝසතානන් වහන්සේ යම් කිසි සත්‍ව කෙනෙක් පෙර තමාට අනුපකාරී සත්‍වයන් කෙරෙහි දියයුතු වස්තුව දේද කෘතොපකාරි සත්වයන් කෙරෙහිත් දියයුතු වස්තුව නොදේද එබඳුවූ සත්‍ව තෙම ආපදර්ත්‍ථ (විපතකට) දුකට පැමිණියේ නමුදු මිත්‍රයන් විසින් කළයුතු සහායකට නොපැමිනෙන්නේ මෙයින් නොදිය යුතු සත්‍වයන්ගේ ගුණ ප්‍රකාශ කොට කියනසේක්. "යම් සත්‍වයෙක් පළමු තමාට උපකාර නොකළ සත්‍වයන් කෙරෙහි දියයුතු වස්තුව නොදේද කෘතොපකාරී සත්‍වයන් කෙරෙහි දියයුතු වස්තුව දේද එතෙම ආපදර්ත්‍ථයෙහි දුකට පැමිණියේ මිත්‍රයන් විසින් කළ යුතුවූ සහායකට පැමිණෙන්නේය. නොපිරිසිදු කාය වාක් සමාචාර (හැසිරීම්) ඇති ශඨප්‍රයෝග (කපටිකම්) දන්නා මනුෂ්‍යයන්

කෙරෙහි දියයුතු දානසීලාදී සුචරිත ධර්‍මයෙහි එක්ව යෙදීමද පංචකාම සම්පත්තිය සමඟ අනුභෝග කිරීම් මොහු විසින් මට විශේෂයෙන් උපකාර කෙළේය යන මේ සියල්ල නසින්නේයයි පිරිසිදු කායවාක් සමාචාර ඇති ඍජුවූ සිත් ඇති සත්‍වයන් කෙරෙහි කරණ දෙය ස්වල්ප වූ උපකාරයන් නමුදු මහත් ඵල මහානිසංස වන්නේය"යි දක්වන ආචාර්‍ය්‍යවරයෝ.

"යථාබීජං අග්ගිස්මිං ඩය්හති න විරූහති
එවං කතං අසප්පුරිසෙ ඩය්හති න විරූය්හති.

කතඤ්ඤුම්හිච පොසම්හි සීලවන්තෙ
අරියවුත්තිකෙ
සුඛෙත්තෙ විය බීජානි කතං තම්හි න නස්සති"

යම් සත්‍වයෙක් මේ ලෝකයෙහි පළමු කල්‍යාණ සුචරිත ධර්‍මයක් කෙළේද එබඳු සත්‍වයන්ගේ ලැබීම අතිශයින් දුෂ්කරය. පසුව අන්කිසි උපකාරයක් කෙළේ හෝ වෙයි පළමු කළ ගුණයෙන්ම අතිශයින් සියළු සත්කාර සම්මානාදී පූජාවට සුදුසු වන්නේයයි කියා රාජකුමාරයාහට කීහ. මෙබස් කාරණයෙන් ඇසූ රාජ පුත්‍රයා වනාහි අමාත්‍ය ජනයාහට කිසි බසක් නොකීයේය. ශාස්තෲවූ බුදුරජානන්වහන්සේ මේ ධර්‍ම දේශනාව ගෙණ හැර දක්වා වදාරා මේ මහා අශ්වාරෝහක ජාතකය නිමවා වදාළසේක.

"එකල්හි පසල් දනව්වැයි පුරුෂයා නම් ආනන්දස්ථවිරයෝය, එසමයෙහි බරණැස් රජ නම් දැන් තිලෝගුරු බුදුවූ මම්මය"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 296. සීලවීමංස ජාතකය

තවද එක්සමයෙක්හි ශාක්‍යකුලතිලකවූ සර්‍වඥයන්වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසනසේක් ක්ලෙශ නිග්‍රහයක් අරභයා මේ ජාතක ධර්‍ම දේශනාව ගෙණ හැර දක්වා වදාළසේක.

මෙහි වර්තමාන කථාවස්තුව යට ප්‍රඥා ජාතකයෙහි ප්‍රකාශ වූයේය. මේ කථාවෙහි මතු දක්වන්නේ සංක්‍ෂෙපමාත්‍රයෙක (ලුහුඬු සටහන). පන්සියයක් පමණ භික්‍ෂූහු දෙව්රම් වෙහෙර අබතුරෙහි (ඇතුලත) වාසය කරන්නාහු මධ්‍යම යාමයට අනතුරු කොට කාමවිතර්‍කයක් (කාමුක සිතුවිල්ලක්) කල්පනා කළාහුය. සර්‍වඥයන්වහන්සේ රෑ දවල් දශ දශ බැගින් සකොටසෙක්හි දිව්‍යසින් බලනසේක් ඇසක් ඇති පුරුෂයා යම්සේ එක ඇස රක්‍ෂා කෙරේද? එක පුත්‍රයෙක් ඇති පුරුෂයෙක් යම්සේ ඒ පුත්‍රයා රක්ෂා කෙරේද? වාලධිය (වලිගය) රක්‍ෂා කරන්නාවූ සෙමර ධෙනුවක් යම්සේ අප්‍රමාදව රක්‍ෂා කෙරේද? එපරිද්දෙන්ම හැම කල්හි බුදුහු භික්‍ෂූන් බලා වදාරණසේක. මුනීන්ද්‍රවූ අප බුදුරජානන්වහන්සේ රාත්‍රී භාගයෙහි දිව්‍යසින් සියළු දෙව්රම් වෙහෙර වැසි භික්‍ෂූන් බලා පරීක්‍ෂා කරණසේක් සක්විති රජක්හුගේ රාජභවනය ඇතුලෙහි පහළවූ සොරුන් මෙන් ඒ පන්සියයක් පමණ භික්‍ෂූන් දැක ශ්‍රී ගන්‍ධකුටිද්වාරය (ගඳකිළි දොරටුව) විවර කොට ආනන්ද ස්ථවිරයන් කැඳවා “ආනන්දය, තෙපි ඇතුළු විහාර කෙළවර සන්නිපාත ශාලාවෙහි (සංඝයා රැස්වන තැන)

භික්‍ෂූන් රැස් කරවා ගඳකිළි දොර සමීපයෙහි අස්නක් පණාව"යි වදාළසේක.

එබස් ඇසූ ආනන්ද ස්ථවිරයන් වහන්සේ එලෙස කොට දැන්වූසේක. ශාසතෲවූ බුදුරජානන්වහන්සේ පණාවන ලද බුද්ධාසන මස්තකයෙහි වැඩහිඳ සර්‍වසංග්‍රහ (පොදු වශයෙන්) වශයෙන් ආමන්ත්‍රණය කොට වදරා "මහණෙනි, පුරාතනයෙහි නුවනැත්තෝ පව් කිරීමෙහි රහසෙක් නම් නැත්තේයි කියා පව් නොකළාහුම"යි වදරා ඉකුත්වත් ගෙණ හැර දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි මහා බෝසතානන් වහන්සේ බමුණු කුලයෙහි ඉපිද උවමනා වයසට පැමිණ ඒ බරණැස්හි දිසාපාමොක් ආචාරීන්ගේ සමීපයෙහි පන්සියයක් පමණ මානවකයන්ට ප්‍රධානව ශිල්ප උගන්නේය. දිසාපාමොක් ආචාරීන්ගේ දියනි කෙනෙක් උවමනා (විවාහයට නිසි) වයසට පැමිණියේය. ඒ ආචාරීතෙම මෙසේ සිතුයේය "මානවකයන්ගේ සිල් රක්‍ෂා කොට ගුණයෙන් සමෘද්ධවූවාක්හට මාගේ දියනියන් විවාහකොට දෙමි" සිතා ඒ ආචාරීතෙමේ එක් දිනයෙක්හි අතවැසි මානවකයන් කැඳවා "සගයෙනි, මාගේ දියනියෝ උවමනා වයසට පැමිණියෝය. මැට විවාහයක් කරුණු කැමැත්තෙමි. එසේ හෙයින් වස්ත්‍රාභරණ ලැබියයුතු වන්නේය. තොප තොපගේ නෑයන් නොදක්වා සොරා ගෙණවුත්

වස්ත්‍රාභරණ ගෙන්වා, කිසිවක්හු විසින් නුදුටුදේම හැර ගනිමි, පෙනී ගෙනා දෙය ඇර නොගනිමි" කීය. ඒ මානවකයෝ ඔහු කී බස් "යහපතැ"යි පිළිගෙණ එතැන් පටන් නෑයන්ට නොදන්වා සොරාගෙණ වස්ත්‍රාභරණාදිය ගෙණහැර දෙන්නාහ. ආචාරිතෙම ඔවුන් විසින් ගෙන ගෙනා දෙය වෙන්ව තිබුයේ මහාබෝසතාණෝ කිසිදෙයක් නොගෙනා සේක.

ඉක්බිති ආචාරී කියන්නෝ "සගයෙනි, තොපි කිසිවක් නොගෙනාහු වේදැ"යි කීයේය. "එසේය ආචාරීන් වහන්ස, නොගෙනාමි"යි කීයේය. "සගයෙනි, තොපි කවර කාරණයකින් නොගෙනාහුදැ"යි විචාළේය. "නුඹවහන්සේ වනාහී පෙනී ගෙනා දෙය ඇරනොගන්නාක් සේක් වේද? මම වනාහි පව්කිරීමෙහි රහසෙක් නොදන්නෙමි" ප්‍රකාශකොට කියන සේක් "ආචාරීන් වහන්ස, මේ ලෝකයෙහි ප්‍රාණඝාතාදී පාපකර්‍මයන් කරන්නාවූ සත්‍වයන්ට රහසක් නම් නැත, වනදෙවියෝද ඒ පාපකර්‍මයන් දකිති, ඒ පාප කර්‍මය අඥාන සත්‍වයෝ රහසෙකැයි සිතති මම ඒ පාපකර්‍මයට රහස් ස්ථානයක් නොදන්නෙමි. ජන ශූන්‍යස්ථානයකුදු නැත්තේය. යම් තෙනක්හි ජන ශූන්‍යස්ථානයක් නොදක්නෙමි" කීවේය. "මාගේ දියනියන් නුඹවහන්සේටම සුදුසුය"යි වස්ත්රාභරණයෙන් සරහා බෝධිසත්‍වයන් වහන්සේට පාවා දුන්නේය. සෙසු මානවකයන්ට ආචාරී කියන්නෝ "තොප විසින් ගෙන ගෙනා වස්ත්‍රාභරණාදිය තොප තොපගේ ගෙවලටම ගෙනව"යි කීයේය.

ශාස්තෲවූ බුදුරජානන්වහන්සේ “මහණෙනි, අඥාන දුශ්ශීල මානවකයා තමා දුශ්ශීල බැවින් ඒ කුමාරිකාවන් නොලද්දනුය. නුවනැති අන් මානවකයානෝ තමා සිල්වත් බැවින් විවාහයෙන් ඒ ස්ත්‍රිය ලද්දේය”යි වදාරා සම්‍යක් සම්බෝධිඥානය (බුදුබව) ප්‍රතිවෙධ (අවබෝධ) කළාවූ බුදුහු වදාරණ සේක්.

“දුජ්ජච්චය, අජච්චය, නන්‍දය, සුඛවර්ජ්ජනය, වෙජ්ජය. අද්ධවලිය යන නම්ලත් සදෙනා ප්‍රධාන කොට ඇති සියළු මානවකයෝ ස්ත්‍රී ප්‍රතිලාභය කැමැත්තානුද? තමන්ගේ දුශ්ශීල භාවය හේතු කොට ගෙණ ඒ ස්ත්‍රී ප්‍රතිලාභයෙන් පිරිහුනානුය. පඤ්චසීලය, දසසීලය, ත්‍රිවිධ සුචරිතයයි යන ගුණ ධර්‍මයන් පිරීමෙන් පරතෙරට පැමිණියාවූ නුවනැත්තාවූ ස්වභාවවූ යථොක්ත වූ ගුණ ධර්‍මයන් රක්‍ෂා කිරීමෙහි වීර්‍ය්‍ය ඇත්තාවූ මම පාප කර්මයට ප්‍රතිච්ඡන්න (වැසු) ස්ථානයක් නොදකිමි. යම් තැනක් මහජනයන් විසින් ශූන්‍යද එබඳු ස්ථානයක්ද නැත්තේය. යම් තෙනක්හි ජනයන් විසින් අශූන්‍යවූ අන්කිසි තෙනක් ඇද්ද? එබඳු ස්ථානයක්ද නොදක්නා ලද යමෙක් පඤ්චසීලය, දශසීලය, ත්‍රිවිධ සුචරිතය යන ගුණ ධර්‍මයන් පිරීමෙන් පරතෙරට පැමිණියාවූ සීලසංරක්‍ෂණය ඥාණයෙන් සමුර්ද්ධවූ (නුවණින් පිරිපුන්) යථෝක්ත ගුණ ධර්‍මයන් රක්‍ෂා කිරීමෙහි වීර්‍ය්‍ය ඇත්තා වූ යම් බ්‍රාහ්මණයෙක් සීලාදී ගුණ ධර්‍මයන් රක්‍ෂා කෙරේද එබඳුවූ බ්‍රාහ්මණයාම කවර කාරණයකින් ස්ත්‍රී ප්‍රතිලාභය හරණේය”යි වදාළසේක. ශාස්තෲවූ බුදුරජානන්වහන්සේ මේ ධර්‍ම දේශනාව ගෙණහැර දක්වා වදාරා චතුරාර්‍ය්‍ය සත්‍යයන් ප්‍රකාශ කොට සීල විමංස

ජාතකය නිමවා වදාළසේක. චතුස්සත්‍ය ධර්ම දේශනාවගේ කෙළවර ඒ පන්සියයක් පමණ භික්ෂූහු රහත් ඵලයෙහි පිහිටියාහුය.

"එකල්හි දිසාපාමොක් ආචාර්‍ය නම් දැන් ශාරිපුත්‍ර ස්ථවිරය, එකල්හි නුවණැති බ්‍රාහ්මණ කුමාරයෝ නම් දැන් බුදුවූ මම්ම වේදැ"යි වදරා තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 297. සුජාත ජාතකය

තවද එක් සමයෙක්හි ශාක්‍යකුල තිලකවූ බුදුරජානන්වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසනසේක් මල්ලිකා දේවීන් අරභයා මේ ධර්ම දේශනාව දෙසා වදාළසේක.

එක් දවසක් කොසොල් රජ තමාගේ මල්ලිකා දේවීන් සමඟ සයනය කලහයෙක් (මත ගැටුමක්) වූයේය. ඒ රජ කිපී ඒ බිසව ඇති බව නොදන්නේය. මල්ලිකා දේවී තොමෝ කොසොල් රජ "තමා කෙරේ කිපුනු බව සර්වඥයන් වහන්සේ නොදනිති" සිතුවාය. බුදුරජානන් වහන්සේද එපවත් දැන වදරා "මොවුන් දෙදෙනාගේ සමගිභාවය කෙරෙමි"යි සිතා වදරා පෙරවරු එක්ක්ෂණයක් (ඇසිල්ලකින්) මුළුල්ලෙහි හඳනා සිවුරු හැඳ කයින් සිවුර හා අතින් පාත්‍රය ගෙණ පන්සියයක් භික්ෂූන් පිරිවරණ ලද සේක් සැවැත්නුවරට ප්‍රවිශ්ඨව රාජද්වාරයට වැඩිසේක. කොසොල් රජ තථාගතයානන් වහන්සේගේ පාත්‍රය ගෙණ තමාගේ වාස භවනයට වැඩම කරවා ගෙණ පනවන ලද බුද්ධාසනමස්තකයෙහි වඩා හිඳුවා

බුදුපාමොක් මහ සඟනට දක්‍ෂිණොදකය (දනයට පෙර පිරිනමන පැන්) දී කැඳ අවුලු (කැවිලි) ගෙන්වූයේය. බුදුහු පාත්‍රය ශ්‍රී හස්තයෙන් වසා "මහරජානෙනි, මල්ලිකා දේවීන් කොතැන්හිදැ"යි විචාළසේක. "ස්වාමීනි, බුදුරජානන් වහන්ස, ඇගෙන් ප්‍රයෝජන කවරේදැ"යි "ඕ තොමෝ තමාගේ යසසින් මහත්වූය (සැපතිි උඩගුව)"යි දැන්විය. "මහරජානෙනි, තොපම යසපිරිවර සම්පත් දී මාතුගාමයන් (ගැහැණුන්) උසස් කොට උන් විසින් කරණ ලද අපරාධ සහනය (ඉවසීම) නොකිරීම නම් සුදුසු නොවන්නේය"යි වදාළසේක.

ඒ කොසොල් රජ බුදුරජානන් වහන්සේගේ වචනය අසා බිසවුන් ගෙන්වූයේය. ඒ බිසව අවුත් බුදුරජහු වැලැඳවූවාය. සර්‍වඥයන් වහන්සේද ඔවුනොවුන් සමගිවන්නට සුදුසුයයි සාමග්ගිකෘත්‍යයාගේ (සමාදනයෙහි) ගුණවර්‍ණනා කොට වැඩිසේක. එතැන් පටන් ඔවුන් දෙදෙන සමගිව විසීමෙන් වාසය කළාහුය. ඊට අනතුරු කොට භික්‍ෂූන්වහන්සේ දම් සභා මණ්ඩපයෙහි රැස්ව වැඩ හිඳ "ඇවැත්නි, ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ එක වචනයෙන්ම ඔවුන් දෙදෙනා සමගි කොට වදාළසේකැ"යි කිය කියා කථාවක් පහළ කළාහුය. ශාස්තෘවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ එතැන්හි වැඩ වදරා "මහණෙනි, දැන් මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදරා "මෙනම් කථාවකින් යුක්තව උනුම්හ"යි දැන් වූ කල්හි "මහණෙනි, දැන් මතු නොවෙයි, පූර්‍වයෙහිද මම මොවුන් දෙදෙන එකම අවවාද වචනයකින්

සමගි කෙළම්වේදැ"යි වදරා ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්ජය කරණ කල්හි මහා බෝසතානන් වහන්සේ ඒ රජහට අර්ථයෙන් ධර්‍මයෙන් අනුශාසනාකරණ අමාත්‍යවූ සේක.

ඉක්බිති එක් දිනයෙක්හි බ්‍රහ්මදත්ත නම් රජ මහසිව්මැදුරු (සඳලුතලය) කවුළුව හැර රාජාංගනය (රජමිදුල) බලමින් සිටියේය. එකෙණෙහි විසිතුරුවූ රූ ඇතිව ප්‍රථම වයසෙහි සිටියාවූ ඩෙබරඵල වෙළඳක්හුගේ එක් දුවක් ඩෙබර පැසක් හිස තබා ගෙණ "ඩෙබරඵල ගනුව"යි කිය කියා රාජභවනයෙන් යන්නීය. ඒ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ ඇගේ ශබ්දය අසා ඈ කෙරෙහි පිළිබඳ සිත් ඇතිව හිමියන් නැති බව දැන කැඳවමින් රාජාංගනයට ගෙන්නා ඒ ස්ත්‍රිය අගමෙහෙසුන් තනතුරෙහි තබා මහත් යසපිරිවර සැපත් දුන්නේය. ඕ තොමෝ රජහට ප්‍රිය වන්නීය, මනවඩන්නීය.

ඉක්බිති එක් දිනයෙක්හි රන්තලියෙහි බහන ලද ඩෙබරඵල අනුභව කරමින් හුන්නේය. සුජාතා දෙවිතොම ඩෙබරඵල අනුභව කරන්නාහු දැක "මහ රජ්ජුරුවන් වහන්ස, නුඹවහන්සේ කවර නම් ඵලයක් අනුභව කරණසේක්දැ"යි කියන්නී "දේවයන් වහන්ස, රන් තලියෙහි බහන ලද්දවූ ලෙහෙවන් පැහැ ඇති නිර්මමලවූ කවර ඵලයෙක් වන්නේදැයි

විචාළාවූ මට එපරිදි නොවළහා කියව''යි කීවාය. එබස් ඇසූ බරණැස් රජ කිපී කියන්නේ ''පැසුණු ඩෙබර එල වෙළඳම් කරන ග්‍රහපතියන්හු දූවූ කෙල්ල තිගේ වංශයට අයිතිවූ ඩෙබරඵලයන් නොදනීදැ?''යි නින්ද බස් කියන්නෝ ''දෙවීනි, තෙපි හිස පැස තිබීමෙන් මොටවූ හිසක් ඇතිව දිරුනු රෙදි ඇඳ වලට (කැලයට) වැද දෙහෙටිල්ලෙන් (කෙකි බරුවෙන්) අතු නමා කැඩු කැඩූ ඵල අතින් එකතුරුපටට (ඔඩොක්කුව) අවුලා වෙළඳම් කරන්නීය, එසේ හෙයින් මා අනුභව කරන්නාවූ මේ ඩෙබරඵල තිගේ අයිතිවන්නේය. මේ කාලකන්නි ස්ත්‍රිය ලෝකුඹුනිරයෙහි වෙසෙන්නියක මෙන් අපගේ මේ රාජභවනයෙහි සිත් අලවා වාසය කරන්නීය. අශ්‍රික (පින් නැති) වූ මේ ස්ත්‍රිය මේ රාජසම්පත හැරියාහුය''යි කියා ඒ රජ ''යම් තෙනෙක්හි ඩෙබරඵල රැස් කිරීමෙන් විකිණී ගෙන ජීවත්වන්නීද? එතැන්හිම ගෙණ ගොස් හැරලව''යි කීයේය.

එබස් ඇසූ මහබෝසතාණන් වහන්සේ ''මා හැර අන් සත්‍වකෙනෙක් ඔවුන් සමගි කරවන්ට නොහැකි වන්නාහුය''යි සිතා රජහු අනුදන්වා ''මේ බිසවුන් පිටත ලීමට අවසර නොදෙමි'' සිතා රජ හට කියනසේක් ''මහරජ්ජුරුවන් වහන්ස, උසස්වූ බිසෝ තනතුරට පැමිණි ස්ත්‍රීන්ගේ මෙබඳුවූ ප්‍රමාද දෝෂ නොවන්නේ නොවෙයි. එසේ හෙයින් නරශ්‍රේෂ්ඨ වූ දේවයන් වහන්ස, මේ සුජාතාවන්ගේ ස්වල්ප වූ මෙබඳුවූ අපරාධයට නොකිපී සමාකළ මැනව''යි කීසේක. ඒ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ අමාත්‍යයාගේ වචනයෙන් සුජාතා නම් බිසවගේ ඒ අපරාධය ක්‍ෂමා කොට ඈ බිසෝ තනතුරෙහි පිහිට වූයේය.

එතැන් පටන් ඔහු දෙදෙන සමගිව වාසය කොට විසූහ. ශාස්තෘවූ සර්වඥයන්වහන්සේ මේ ජාතක ධර්ම දේශනාව ගෙණහැර දක්වා වදරා මේ සුජාතා ජාතකය නිමවා වදාළසේක.

"එකල්හි බරණැස් රජ නම් දැන් කෝසළ මහ රජය, එකල්හි සුජාතාවෝ නම් දැන් මල්ලිකාදේවිය, එකල්හි අමාත්‍ය වූයේ නම් දැන් බුදුවූ මම්ම වේදැ"යි තමන් වහන්සේම දක්වා වදාළසේක.

## 298. පලාස ජාතකය

තවද එක් සමයෙක්හි විජිත පඤ්චමාරවූ (පස්මරුන් දිනු) සර්වඥයන් වහන්සේ පරිනිර්වාණ සයනයෙහි සැතපුනුසේක් ආනන්ද ස්ථවිරයන් අරභයා මේ ධර්ම දේශනාව වදාළසේක.

ආයුෂ්මත් වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේ "අද රෑ අළුයම වේලෙහි ශාස්තෘවූ තථාගතයානන් වහන්සේ පිරිනිවන් පානාසේකැයි දැන මාගේ ශාස්තෘන් වහන්සේට කළ උපස්ථානය නිෂ්ඵල වන්නේය"යි කියා සෝකයෙන් පීඩිත වූසේක්. උද්‍යානයෙහි වූ නිවාස ගෘහභ්‍යන්තරවූ (ගෙය තුළ) අගුළුබාවෙහි (දොර බාවෙහි) එල්බ සිට හැඬූසේක. සර්වඥයන් වහන්සේ අනඳ මහතෙරුන්නාන්සේ නොදක්නා සේක් "මහණෙනි, ආනන්දයෝ කොතැන්හි දැ"යි විචාරා වදරා ඒ වූ කරුණු අසා කැඳවා "කරණ ලද පින් ඇත්තෙහිය, සපධන් වීර්ය්‍යයෙහි යෙදෙව, එසේවූ තෙපි චතුරාශ්‍රවයන් (කාම භව

දිට්ඨි අවිජ්ජා යන කෙලෙස්) දුරුකොට රහත්වන්නෝ වේද? මට කළ උපස්ථාන නිෂ්ඵලයයි නොසිතව, දැන් තෙපි විසින් මට කළ උපස්ථාන කවර කාරණයකින් නිෂ්ඵල වන්නේද? පෙර යමක්හට රෝග දේශාදී කාලයෙහි කළ උපස්ථාන නිෂ්ඵල නුවූයේය”යි වදාරා ඉකුත් වත් කථා වස්තුව ගෙණ හැර දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි මහ බෝසතානන් වහන්සේ බරණැසට නුදුරු තැන්හි කැල ගසෙක්හි දේවපුත්‍රයෙක්ව උපන්සේක.

එකල්හි බරණැස් නුවර වාසීහු දෙවියන්ට කළ යුතු මගුල් නිරන්තරයෙන් බිලියම් (පුද පූජා) කිරීම් ආදියෙහි යෙදුනාහුය. ඉක්බිති දුගී එක් බමුණෙක් “මමද එක් දේව පුත්‍රයෙකු පිළිදගිම් (ඇදහීම)” කියා උසස්වු භූමි ප්‍රදේශයෙක්හි පිහිටියාවූ මහත්වූ එක් කැලරුකක් මුල බිම සමතලා කොට තණ දුරු කොට වට පරික්‍ෂෙපකොට (හාත්පස වටකොට) සුදුවැලි විසුරුවා හැමද ඒ වෘක්‍ෂයෙහි සුවඳ සඳුනෙන් පසඟුල්දී (ඇගිලි පසින් කරන උපහාර) ගඳදුම් මල් පහන් ආදියෙන් පූජා කොට පහන් දල්වා “සැපසේ සැතපෙව”යි කියා වෘක්‍ෂය පැද කුණු කොට යන්නේය. දෙවෙනි දිනයෙහි උදෑසන් හිම අවුත් සැපයන් විචාරන්නේය.

ඉක්බිති එක් දිනයෙක්හි වෘක්‍ෂ දේවතාවා මෙසේ සිතුයේය. "මේ බමුණු අතිශයින් මා පිළිදගිනේය. මේ බ්‍රාහ්මණයා යම් කාරණයකින් මා පිළිදගීද ඕහට තමා දක්වමි" සිතා ඒ බ්‍රාහ්මණයා එතැන්හි අවුත් රුක් මුල හමදිනා කල්හි මහළු බමුණු වේසයකින් ඔහුගේ සමීපයෙහි සිට කියන්නේ "එම්බා බ්‍රාහ්මණයාණෙනි, තෝ පරචෙතනා (අන් සිත්) රහිත වූ නොආසන්නවූ කිසිවක් දැනගන නොහෙන්නාවූ මේ කැලෑ ගස යයි දැන පටන් ගන්නා ලද වීය්‍යී ඇතිව නිරන්තරයෙන් ප්‍රමාද නොවීම කවර කාරණයක් හේතුකොටගෙණ සැප සයනය විචාරන්නෙහිදැ"යි විචාළේය. එබස් ඇසූ බ්‍රාහ්මණ තෙම කියන්නේ "බ්‍රාහ්මණයානෙනි, මේ වෘක්‍ෂය දුර සිටියවුන්ට පැහැදී පෙනෙන්නේය. ආසන්නේහි වූ අයට අප්‍රකාශය, මහත් ද වෙයි. ඒකාන්තයෙන් මහේශාක්‍ය දෙවියන්ගේ විසීමට සුදුසු වෘක්‍ෂයෙක් වන්නේය. එසේ හෙයින් මේ කැලෑ වෘක්‍ෂයට නමස්කාර කෙරෙමි. මේ වෘක්‍ෂයෙහි යම් දෙවි කෙණෙක් වාසය කෙරෙද්ද ඔවුන්ට නිස්කාරණ නොවී ධන ප්‍රතිලාභය කරණ කොට ගෙණ නමස්කාර කෙරෙමි" කීයේය.

එබස් ඇසූ දේවපුත්‍රයානෝ ඒ දුගී බ්‍රාහ්මණයාට ප්‍රසන්න වූයේ තමාගේ විමානද්වාරයෙහි මහත් දිව්‍යානුභාවයෙන් උපලක්‍ෂිතව (පෙනෙන ලෙස) අහසෙහි සිට "එඹා බ්‍රාහ්මණයානෙනි, මම මේ වෘක්‍ෂයෙහි නිපන් දේවපුත්‍රයෙකි. භය නොගනුව තොපට ධනයක් දෙමි" කියා ඔහු අස්වසා කියන්නේ "එඹා බ්‍රාහ්මණයානෙනි, මා වැනි සත් පුරුෂයන්ගේ

සමීපයෙහි අවුත් සැප සයනය විචාරීම ආදී වූ වාක්ද්වාරයෙන් කළ ව්‍යායාමද, හැමදීම් සුවඳ මල් පහන් පූජා කිරීම් ආදීවූ කාය ඪාරයෙන් කළ ව්‍යායාමද, මෙසේ නිෂ්ඵල වේද? එසේ හෙයින් තොප විසින් කරණ ලද කෙළෙහි ගුණ දන්නාවූ මම මාගේ දිව්‍යානුභාව වූ පරිද්දෙන් තොපට උපකාරයක් කෙරෙමි” සිතා කියා විමානද්වාරයෙහි සිටියාවූ දිව්‍ය පුත්‍රතෙම අත දිගු කොට කියන්නේ “මේ තිඹිරි රුක ඈත පෙණෙන ලද පුලිල (එනම් ගස) වෘක්ෂය පිරිවරා ග්‍රීවයෙන් ග්‍රීවය හැර මහත් රැසක්ව සිටියාවූ පූර්‍ව වස්තු ස්වාමීහු විසින් යාගකොට තබන ලද දැන් මේ අසවාමිකවූ ඒ නිදනයන් ගොස් උගුළුවා ගණුව”යි මෙසේද කියා නැවත ඒ දේව පුත්‍රයා කියන්නේ “බ්‍රාහ්මණයාණෙනි, තෙපි මේ නිදනයන් උගුළුවා ගන්නේ ක්ලාන්ත වෙයි තෙපි නික්මව, මම තොපගේ වාසස්ථානයට ගෙණ ගොස් අසවල් තෙන නිධාන කෙරෙමි, තොපි ජීවිතාන්තය දක්වා පරිභෝග කරමින් දන් දෙව, සිල් රකුව”යි කියා ඒ බ්‍රාහ්මණයාට අවවාද දී ධනයන් තමාගේ දිව්‍යානුභාවයෙන් ඒ බමුණානන්ගේ ගෙයි පිරවූයේය. ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ ධර්‍ම දේශනාව ගෙණ හැර දක්වා වදරා මේ පලාස ජාතකය නිමවා වදාළ සේක.

“එකල්හි බ්‍රාහ්මණයා නම් දැන් ආනන්ද ස්ථවිරය එකල්හි වෘක්ෂ දේවතාවා නම් බුදුවූ මම්ම වේදැ”යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 299. ජවනසකුණ ජාතකය

තවද එක් සමයෙක්හි ෂට්අසාධාරණ (බුදුරදුන්ට ආවේනික නැණ සය) ඥානාදියෙන් උපලක්‍ෂිතවූ (යුක්ත) ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ දෙව්රම්වෙහෙර වැඩ වසනසේක් "දෙව්දත් තෙරුන් වහන්සේ කෙළෙහිගුණ නොදන්නාහුමය"යි වදරා ඉකුත්වත් ගෙණ හැර දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි අප මහ බෝසතානන් වහන්සේ නානාවිධ කුසුමභාරවන්ත (මල් බරින් නැමුනු) වෘක්‍ෂමණ්ඩිත (ගස්වලින් මනහරවූ) හිමාලය වන ප්‍රදේශයෙක්හි කෑරල පක්‍ෂියාව උපන්සේක.

ඉක්බිති මාංශ අනුභව කරන්නාවූ එක් සිංහයක්හුගේ ග්‍රීවයෙහි ඇටයක් ලග්නව (ඇනුනු) ඉදිමි ගොස් ගොදුරු අනුභව කිරීම නොහැකි වූයේය. කර්කෂවූ (අමිහිරි) වේදනාවෝ පවත්නාහ. නැවත ගොදුරු සොයා ඇවිදිනා ඒ කෑරලපක්‍ෂියා දුක්ඛයෙන් පෙලෙන්නාවූ ඒ සිංහයා දැක එක් අතුපතුරක් අතුරෙහි සැගවී උන්නේය. "යහළු සිංහය, තොපගේ දුකෙක් ඇද්දැ"යි විචාළේය. එබස් ඇසූ සිංහයා ඒ වූ කාරණය කීයේය. "යහළුව, මට තොපගේ මේ ග්‍රීවයෙහි ලග්නවූ ඇටය පහකරන්ට හැකි වෙමි, එසේද වූවත් මා

අනුභ කෙරෙති යන සිත ගත් භයින් වනාහි තොපගේ මුඛයට වදින්නට නොහැකි වෙමි'' කීයේය.

"යහළුව, තොප මම අනුභව නොකරමි. එබැවින් මාගේ ජීවිතය රක්‍ෂා කොට දෙව''යි කීයේය. ඒ කෑරල් පක්‍ෂියා "යහපතැ''යි ගිවිස සිංහයා ඇලයකින් සතප්පවා සිංහයා කවර ඉෂ්ටානිෂ්ට ක්‍රියාවක් මට කරණ බව කවරෙකුටත් දැනගත නොහෙයි සිතා යම්සේ මුඛය වහන්ට නොහැකිවේද? එපරිද්දෙන් ඔහු දෙතල්ලෙහි දඬුකෝටුවක් තබා මුවට වැද ගෙලෙහි ලැගුනු ඇට කෙළවර තුඩින් පහ කෙළේය. ඇටය ගිලිහී වැටී ගියේය. ඒ පක්‍ෂියා ඇටය හෙලා සිංහයාගේ මුඛයෙන් නික්මෙන්නේ දඬුකඩ තුඩින් පැහැර හෙලන්නේම නික්ම ගියේ ශාඛාග්‍රයෙහි (අතු අග) සැගවුනේය.

නැවත එක් දිනයෙක්හි එක් වන මහිසයෙකුගේ (වල් මීමෙකු) ජීවිතය නසා අනුභව කරන්නේය. ඒ කෑරල් පක්‍ෂියා "ඔහු පරීක්‍ෂා කෙරෙමි'' සිතා ඔහුගේ හිස උඩ සාඛාවක සැගවී ඉඳ සිංහයා හා සමග කථාකරන්නේ "පින්වත්වූ සිංහයානෙනි, තොපට නමස්කාර වේවයි මා විසින් කළයුතුවූ තොපගේ යම් කෘත්‍යයක් ඇද්ද? ඒ කෘත්‍යය මාගේ ඥාන ශක්තියෙන් කිසිවක් නොනසා කෙළෙමි. එසේ කළාවූ මම මෙයින් මාංශ කොටසක් ලබම්ද කින්දැ''යි විචාළේය. එබස් ඇසූ සිංහයා කියන්නේ "ලේ මිශ්‍ර මාංශ අනුභව කරන්නාවූ නිරන්තරයෙන් දරුනුකම් කරන්නාවූ මාගේ දත් අතුරට පැමිණියාවූ තොපගේ බහුල වූ යම් ජීවිකාවෙක් ඇත්නම් ඉන්

ජීවත්ව''යි කී කල්හි ඒ ඇසූ පක්‍ෂියා කියන්නේ ''යම් සත්‍වයක්හු කෙරෙහි කෙළෙහි ගුණ දැන්මෙක් නැද්ද තමා විසින් අන් සත්‍වයන්ට කරන්නාවූ කිසි ගුණයක් ඇද්ද කළාවූ ගුණයට නැවත ගුණ කිරීමෙක් නැද්ද එබඳු සත්‍වයන් සේවනය කිරීම නිෂ්ප්‍රයෝජන වන්නේයි. තවද යම් සත්‍වයක්හුගේ අභිමුඛයෙහි කරණලද ගුණය කරණකොට ගෙණ මිත්‍රධර්‍මය නොලැබේද? ඕහට රැහැනි (විරුද්ධ) නොවී ආක්‍රොශපරිභව (නින්ද අපහාස) නොබැන යුහුසුලු නොවීමෙන් ඕහු කෙරෙන් පහවිය යුත්තේය''යි මෙසේද කියා ඒ කෑරල පක්‍ෂියා ගියේය. ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේ ධර්‍ම දේශනාව ගෙණ හැර දක්වා වදුරා මේ 'ජවනසකුන ජාතකය' නිමවා වදාළසේක.

''එකල්හි සිංහයා නම් දැන් දේවදත්ත ස්ථවිරය, එකල්හි කෑරල පක්‍ෂියා වනාහි දැන් බුදුවූ මම්ම වේ''දැයි තමන් වහන්සේ දක්වා වදාළසේකි.

# 300. ජව ජාතකය

තවද එක්සමයෙක්හි ෂට්අසාධාරණ (බුදුරදුන්ට ආවේනික ඥණ සය) ඥනාදියෙන් උපලක්‍ෂිත වූ ශාස්තෘවූ සර්‍වඥයන් වහන්සේ දෙව්රම්වෙහෙර වැඩ වසන සේක් සවගයෙහි (ඡබ්බග්ගිය නම් භික්ෂු පිරිස) භික්‍ෂූන් අරභයා මේ ජාතකය වදාළ සේක.

මෙහි වර්තමාන කථා වස්තුව විනය පිටකයෙහි විස්තර වශයෙන් ආයේය. මෙතැන්දී මතු කියන්නේ සංක්‍ෂෙපප කථාවය.

ශාස්තෘවූ තථාගතයන් වහන්සේ සවගෙහි භික්ෂූන් කැඳවා "මහණෙනි, තෙපි මිටි අස්නෙහි හිඳ උස් අස්නෙහි උන්නක් හට ධර්‍ම දේශනා කරන්නේ සැබෑදැ?"යි විචාරා වදාළසේක. "ස්වාමීනි, භාග්‍යවත්වූ බුදුරජානන් වහන්ස, අප දේශනා කරන්නේ සැබෑය"යි දැන්වූ කල්හි ඒ භික්ෂූන් වහන්සේට නින්දා කොට වදරා "මහණෙනි, මාගේ ධර්‍මයෙහි තොපගේ ගරු නොකිරීම යුතු නොවන්නේය"යි වදරා "පුරාතන නුවනැත්තෝ වනාහි මිටි අස්නේ හිඳ මේ දේශනාවෙන් පිටත් මන්ත්‍ර යන්ත්‍රයක් හදරන්නවුන්ට නින්දා කළාහුය"යි වදරා ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි පුරණ ලද බෝධි සමභාර ඇති අප මහබෝසතානන් වහන්සේ සැඩොල් කුලයෙක්හි ඉපිද උවමනා (සුදුසු) වයසට පැමිණිසේක් උන්වහන්සේගේ භාර්යයාවෝ අඹ අනුභව කරන්ට දොළෙක් (ආශාවක්) ඇතිව "හිමියාණන් වහන්ස, මම අඹ අනුභව කරන්ට කැමැත්තෙමි"යි උන් වහන්සේට කීවාය. "සොඳුර, මෙකල්හි අඹඵල නැත්තේය. අනික් කිසි ඵලයක් ගෙණ දෙම්දැ?"යි විචාළේය. "හිමියාණෙනි, මම අඹඵල ලබන්නේ ජීවත්වෙමි. නොබලන්නාවූ මාගේ ජීවිතය නැතැ"යි කීවාය. ඈ කෙරෙහි පිළිබඳ සිත් ඇත්තාවූ ඒ පුරුෂයා කවර තැනෙක්හි අඹඵල ලබම්දෝහෝයි සිතීය.

එසමයෙහි බරණැස් රජුගේ උයනෙහි අඹ වෘක්ෂයෙක්හි නිරන්තරයෙන් ඵලගෙණ සිටින්නේ ඒ සැඩොල් පුරුෂයානෝ "ඒ වෘක්ෂයෙන් විලිකුන් (ඉදුනු) අඹ ඵලයක් ගෙණවුත් මැගේ දෙළ සන්සිඳුවමි" සිතා රාත්‍රී භාගයෙහි බරණැස් රජුගේ උයනට ගොස් අඹ ගසට නැගී ශාඛාවෙන් ශාඛාවට සැඟවී අඹඵල බලමින් ඇවිදිනසේක. එසේ අඹ සොයන උන් වහන්සේට රාත්‍රිය පහන් වූයේය. ඒ පුරුෂයානෝ මෙසේ සිතූහ. "දැන් මේ වෘක්ෂයෙන් බැස ගියේ වීනම් මා සොරාහුයයි අල්වා ගනිති"යි සිතා "රාත්‍රී භාගයෙහි ගසින් බැසයෙමි" සිතා එක් ශාඛාවකට නැගී සැඟවී හුන්සේක.

එකල්හි බරණැස් රජ පුරෝහිත බ්‍රාහ්මණයාගේ සමීපයෙහි මන්ත්‍රයන්ත්‍ර උගන්නේය. ඒ බරණැස් රජ උයනට ගොස් අඹ රුකමුල උස් ආසනයෙක්හි ඉඳ ආචාරීවූ පුරෝහිත බ්‍රාහ්මණයා මිටි අස්නක හිඳුවා මන්ත්‍රයක් උගන්නේය. වෘක්ෂ මස්තකයෙහි උන් පුරුෂයා සිතන්නේ "මේ රජ උසස්නෙහි හිඳ යම්තාක් කල් මන්ත්‍රයක් උගනීද ඒතාක්කල් මේ රජ්ජුරුවෝ අධාර්මිකය. යම් බ්‍රාහ්මණයෙක් තෙමේ නිචාසනයේ හිඳ යම්තාක් කල් මන්ත්‍රයන් හදාරවාද ඒතාක්කල් ඔහුද අධාර්මිකය, යම් බඳුවූ මාගේ භාර්‍ය්‍යාව කරණ කොටගෙණ ජීවිතය ගරු නොකොට සොරකමින් අඹ ඵලගෙණ හැරයෙමිද ඒ මමද අධාර්මිකයෙමි" කියා ගසින් බසිනා වූ පුරුෂයා එල්ලන්නාවූ එක් සාඛාවක් අල්වා ගෙණ ඔවුන්ගේ දෑතුරෙහි සිට කියනසේක්. "මහරජ්ජුරුවන් වහන්ස මම නෂ්ටවීමි (පිරිහුනු), නුඹ වහන්සේ ස්ථූලවූ (මුළාවූයේ)

ක්‍රියා ඇතිසේක. පුරෝහිත බමුණානෝ පූර්ව ක්‍රියා (පෙර සිරිත්) නැසූ හෙයින් මෙළේ නම් වෙයි" කියේය. "කවර කාරණය කින්දැ"යි විචාණ ලද්දවූ ඒ පුරුෂතෙම රජහට කියන්නේ "මහරජ්ජුරුවන් වහන්ස, අප තුන්දෙනා විසින් කරණ ලද්දවූ ක්‍රියාවෝ සත් පුරුෂයන්ගේ ආචාර සීමාව ඉක්මුණු හෙයින් අධාර්මිකය. යමෙක් නිවාසනයෙහි (මිටි ආසනයේ) හිඳ මන්ත්‍රය උගන්වාද යමෙක් උසස්නේ හිඳ මන්ත්‍රයක් උගනීද මොහු දෙදෙන පෙර පියවිදහමින්ම චුත වූවාහ. එසේ හෙයින් නුඹ දෙදෙනා වහන්සේ ගරු කළ යුතු පූර්ව ධර්මයන් නුදුටුසේක් ය"යි කීයේය.

එබස් ඇසූ පුරෝහිත බ්‍රාහ්මණයා කියන්නේ "පින්වත් වූ පුරුෂයාණෙනි, නොයෙක් මාංශ ව්‍යඤ්ජන කිරියෙන් වහන ලද සුදුවූ පැහැ ඇත්තාවූ හැල්සාලෙන් නිපන්නාවූ ආහාරය අනුභව කිරීමෙන් උදර පෝෂ්‍යයෙහි ගිජුවූ මම ඍෂීන් විසින් සෙවුනා ලද මේ පුරාතන ධර්මය සේවනය කෙරෙමි" කීයේය. එබස් ඇසූ සැඩොල් පුරුෂයානෝ කියන්නේ "මේ රජ හැර මේ දඹදිව්තලෙහි අන් සත්‍වයෝත් මෙපරිද්දෙන් ආහාරය පිසති, එසේ හෙයින් මේ සත්‍ව ලෝකය මහත, මෙතැන් හැර අන් තැනකට පලායව, තොපි අධර්මයෙහි නොහැසිරෙව්, යම් බඳුවූ තෙපි අන් තැනෙක්හි නොගොස් මෙතැන්හි වෙසෙත් නම් අධර්මයෙහි නොහැසිරපියා පාසාන කුම්භයක (ගල් කළයක) මෙන් පුරාතන වෘත්තිය නොබිඳවන්ටය. බ්‍රාහ්මණයානෙනි, තොපගේ පුරෝහිත තනතුරට පැමිණීමෙන් ලබන ලද යස පිරිවර සැපයට හා ධනයට නින්දා කරමිහ.

අපායේ ඉපදීමට හේතුවූ තොපගේ ජීවිකා වෘත්තියෙක් ඇද්ද අධර්මයෙහි හැසිරෙමින් ප්‍රතිලබ්ධ (ලබාගත්) යම් වෘත්තියෙන් ඇද්ද ඊට නින්‍දා කෙරෙමි'' කීයේය.

ඉක්බිති ධාර්මික බැවින් ඒ සැඩොල් පුරුෂයා හට පැහැදී ''පින්වත්වූ පුරුෂය, තෝ කවර ජාති ඇත්තෙක්දැ''යි විචාළේය. ''රජ්ජුරුවන් වහන්ස, මම චණ්ඩාලයෙක්මි'' කීයේය. ''පින්වත, ඉදින් තොපි ජාති සම්පන්න වූයේ වීනම් තොපට රාජ්ජය දෙමි. මෙතැන් පටන් වනාහි මම දහවල් රජ කෙරෙමි තොපි රාත්‍රියෙහි රජ කරව''යි කියා තමාගේ ග්‍රීවයෙහි (ගෙලෙහි) පැළඳි මල්දම් ඒ සැඩොල් පුරුෂයාණන්ගේ ගෙලෙහි පලඳවා ඔහු නුවරට ගෙණ රැකවල්හි නියුක්ත කෙළේය. නුවර රැකවල්ලුගේ ග්‍රීවයෙහි රක්තපුෂ්ප මාලාවන් (රත් මල් මාලාව) ලබන මේ වංශ විය. එතැන් පටන් වනාහි ඒ බරණැස් රජ්ජුරුවෝ ඒ පුරුෂයානන්ගේ අවවාදයෙහි පිහිටා ආචාරී පුරෝහිත බ්‍රාහ්මණයන් කෙරෙහි ගෞරව උපදවා මිටි අස්නෙහි හිඳිනේය. මන්ත්‍රයන් උගන්නේය. ශාස්තෲවූ සර්වඥයන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙණහැර දක්වා වදාරා මේ 'ජව ජාතකය' නිමවා වදාළ සේක.

''එකල්හි බරණැස් රජ නම් දැන් ආනන්දස්ථවිරයෝය, එකල්හි චණ්ඩාල පුත්‍රයා වනාහි දැන් බුදුවූ මම්මය''යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 302. සය්හ ජාතකය

තවද එක් සමයෙක්හි සංසාරවෘත්තියෙහි (පවතින සසර) අවිද්‍යාදී (නොදැනීම) කෙලශයන් විසින් භ්‍රමණයවන (සැරිසරන) සත්‍වයන් සද්ධර්මාමෘත (සදහම් අමා) පානය කරවා ස්වර්ගාපවර්ග (සුගති හා නිවන) සම්පත්ති ප්‍රතිලාභය කළාවූ සර්‍වඥරාජෝත්තමයානන් වහන්සේ (සියල්ල දත් බුදුරජුන්) ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ශාසනයෙහි උකටලිවූ (කළකිරුනු) භික්‍ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වා වදාළසේක.

එක් භික්‍ෂූන්වහන්සේ කෙනෙක් වනාහි සැවැත් නුවරෙහි පිඬුසිගා වඩනා සේක්. විශිෂ්ටවූ (ඉතාමත්) රූපශ්‍රී සම්පත් ඇති එක් ස්ත්‍රියක් දැක උකටලිවූ සේක් ශාසනයෙහි සිත් නොඇලෙනසේක.

ඉක්බිති භික්‍ෂූන්වහන්සේ නොකැමති කරවා (අකමැත්තෙන්ම) ගෙනගොස් සර්‍වඥයන්වහන්සේට දැක්වූසේක. ඒ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ "මහණ, තෝ උකටලී වූයේ සැබෑදැ"යි විචාරණ ලද, "සැබව, ස්වාමීනියි" කීසේක. එතෙපුල් (බස්) ඇසූ සර්‍වඥයන් වහන්සේ විසින් "මහණ, තොප කවරෙක් උකටලී කරවූයේද"යි විචාරා වදාළ කල්හි එපරිදි දැන්වූ සේක. එපවත් ඇසූ බුදුරජානන්වහන්සේ වදරණසේක් "මහණෙනි, තෙපි මෙබඳුවූ නෛර්‍ය්‍යාණික (නිවනට පමුණුවන) ශාසනයෙහි පැවිදිව කවර කාරණයකින් උකටලී වූයෙහිද? පෙර නුවනැත්තෝ පුරෝහිත තනතුරු (රජුට

අනුශාසනා කරන්නා) ලබන්නා ඒ සම්පත්තිය නිරපෙක්‍ෂව (බලාපොරොත්තු රහිතව) හැර පැවිදිවූවාහු වේදැ''යි කාලත්‍රයවර්තීවූ (තුන් කාලයෙහිම පවත්නා) සකල (සියළු) නාමරූප ධර්‍මයන්ගේ පරම්පරානුස්සරිය ක්‍ෂණයෙහි (පෙර කළ පිළිවෙල සිහිකරන මොහොතෙහි) අවිපරීතයෙන් (නොවෙනස්ව) දක්නාවූ සද්ධර්ම චක්‍රවර්තීවූ (සදහමට සක්විති වැනි) සර්‍වඥරාජෝත්තමයානන් වහන්සේ ඉකුත්වත් ගෙනහැර දක්වා වදාළසේක.

ඒ කෙසේ ද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි පුරණලද බෝධිසම්භාර ඇති (පෙරුම්දම් ඇති) අප මහා බෝසතානන් වහන්සේ පුරෝහිත බ්‍රාහ්මණයාණන්ගේ භාර්‍ය්‍යාවූ බැමිණිය කුස පිළිසිඳ රජ්ජුරුවන්ගේ පුත්‍රයා බිහිවන දවස්හිම ජාත වූසේක (උපන්නේය).

එකල්හි පුරෝහිතයෝ "මාගේ පුත්‍රයෙක් ඇතැ''යි කීවාහුය. ඒ තෙපුල් ඇසූ රජ්ජුරුවෝ ඒ බ්‍රාහ්මණ කුමාරයා ගෙන්වා කිරිමව්න්ට භාරකොටදී රජකුමරුවා හා කැටුවම පිළිදැගුම් (පෝෂණය) කරවූයේය. එතැන් පටන් කුමරුන් දෙදෙනාම පළඳනා ආභරණ හා ඛාද්‍යභොජ්‍යාදී (කනබොනදෑ) සියල්ලම එකසදෘශ (එක හා සමාන) වන්නේය. ඔහු දෙදෙනා වැඩිවිය පැමිණි එක්වම තක්සලා නුවරට ගොස්

අක්‍ෂර ලිඛිතාදී (අකුරු හා ලිවීම) සියළු උගත්මතා සිල්ප නොවළහා (පැහැර නොහැර) ඉගෙන ආචාහුය.

එකල්හි රජ්ජුරුවෝ තමාගේ පුත්‍රයාට යුවරජ තනතුර (උපරාජ්‍යය) දුන්නේය. රාජකුමාරයා මහත් යසපිරිවර සම්පත් ඇතියේය. එතැන් පටන් බෝධිසත්‍වයන් වහන්සේ යුවරජ්ජුරුවන් හා එක්වම ආහාර අනුභව කරන්නේය. පානීය යනාදියත් මෙම ක්‍රමයෙන් වන්නේය. මෙසේ ඔවුනොවුන්ගේ විශ්වාස ධර්‍මය (යහළුකම) ස්ථිර වූයේය. එයින් මෑත භාගයෙහි යුවරජ්ජුරුවෝ පියරජහුගේ අයාමෙන් (අභාවයෙන්) රාජ්‍ය සම්පත්තියෙහි පිහිටා මහත්වූ රාජ්‍ය ශ්‍රී සම්පත්තිය අනුභවය කරන්නේය.

ඉක්බිති ඒ විසුද්ධශීලසමාධ්‍යාදී ගුණයන්ට (පිරිසිදු සීල සමාධි ගුණයන්ට) වාසස්ථාන වූ අප මහා බෝසතානන් වහන්සේ සිතනසේක් "මාගේ මිත්‍රයා රාජ්‍ආනුශාසනා කරන්නේය. සිතුනු ඇසිල්ලෙහි මට වනාහි පුරෝහිත තනතුරු දෙන්නේය. පඤ්චකාම සම්පත්තියෙන් යුක්තවූ ගෘහවාසයෙන් (ගිහිකොට) මට ප්‍රයෝජන කිම්දැ"යි ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් (තාපස පැවිද්දෙන්) පැවිදිව කායචිත්තෛකග්ගතා (කාය චිත්ත විවේකය) දෙක වර්ධනය කෙරෙමි" සිතා බෝධිසත්‍වයන් වහන්සේ දෙමව්පියන් වැඳ පැවිදිවීමට අනුදන්වා (අවසර ගෙන) මහත්වූ භවභෝග සම්පත්තිය නිරපෙක්‍ෂව දමා අසහාය චාරීවූ (තනිව හැසිරෙන) මෘගේන්ද්‍රයෙකු (සිංහයෙකු) පරිද්දෙන් උදකළාවූ (තනිව) ස්වකීය වූ වාසභවනයෙන් නික්ම

ප්‍රසිද්ධ සිංහ ව්‍යාඝ්‍රාදීන් විසින් භයානක වූ හිමාලය වනයට වැද සිත්කළු වූ එක්භූමි ප්‍රදේශයෙක්හි පන්සලක් මවා ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥා (විශේෂ නුවණ පහක්) අෂ්ඨ සමාපත්ති (ප්‍රථමාදී ධ්‍යාන අට) උපදවා චිත්තානුකූලව (සිතිවූ පරිදි) ධ්‍යාන ක්‍රීඩා කෙළිමින් (භාවනා කරමින්) වාසය කරණසේක.

එකල්හි රජ්ජුරුවෝ තම හට මිත්‍රවූ බෝධිසත්ත්වයන් සිහිකොට "මාගේ මිත්‍රයානන් මේ ස්ථානයෙහි දකින්ට නැත්තේය. ඔහු කවර තෙනෙක්හි දැන් වාසය කරන්නේ දැ"යි විචාළේය. එතෙපුල් ඇසූ අමාත්‍යයෝ බෝධිසත්ත්වයන් වහන්සේ පැවිදිවූ බව කීයේය. "එයට ගොස් මාගේ මිත්‍රයානන් කැඳවාගෙණ එව"යි "ඔහුට පුරෝහිත තනතුර දෙනු කැමතිවෙමි" කීහ.

එබසට සය්හ නම් වූ අමාත්‍යයා, "යහපත, ගොස් කැඳවා ගෙන එමි"යි ගිවිස බරණැස් නුවරින් නික්ම අනුපිළිවෙළින් එක් ප්‍රත්‍යන්ත ගමකට පැමිණ එගම්හි උන්වහන්සේ එනකල ලැගුම් පිණිස කඳවුරක් කරවා වැදිපුරුෂයන් හා කැටිව බෝධිසත්ත්වයන් වහන්සේ වාසය කරන්නාවූ පන්සල සමීපයට ගොස් පන්සල් දොරකඩෙහි සකල කමලාසනානිම්සයුර ගරුඬ මනුෂ්‍ය විෂධරීන්ද්‍රයන්ගේ (සියලු බ්‍රහ්ම දිව්‍ය ගුරුළු මිනිස් නාරජුන්ගේ) හෘදය නේත්‍රානන්ද කරවූ (සිත් නෙත් සතුටු කරවන) සවර්ණ ප්‍රතිබිම්භයක්සේ (රන් පිළිමයක්) වැඩඋන් බුද්ධාංකුරයන් වහන්සේ (බෝසතුන්) දැක දෙහොත් මුදුනෙහි

තබා වැද එකත්පස්ව (පැත්තක) හිඳ පිළිසඳර කථා කෙරෙමින් ඉක්බිති "ස්වාමීන් වහන්ස, අපගේ රජ්ජුරුවෝ නුඹවහන්සේට පුරෝහිත තනතුරු දෙනු කැමතියෙන් නුවරට එනු කැමති සේක්දැ"යි කීහ.

එබසට බෝසතානන් වහන්සේ කියනසේක් "මම පුරෝහිත තනතුරු තබා සියළු කාසි කෝසලාදි සියලු ජම්බුද්වීප රාජ්‍යය හෝ චක්‍රවර්ති රාජ්‍ය ශ්‍රී සම්පත්තිය ලබතෝතිනුත් (ලැබුනත්) නොයෙමි. නුවණැත්තෝ වරක් දමන ලද ක්ලේශයක් නැවත ග්‍රහණය නොකරති. වරක් හරන ලද දෙය (අත්හල) වනාහි උත්ගාරකොට දැමූ කෙළපිඬක් (වමාරා දැමු කෙළ) හා සමාන වන්නේය"යි කියා ප්‍රකාශ කරණ සේක්. "එම්බා සය්හ නම්වූ අමාත්‍යය, මම වනාහි චක්‍රවාට පර්වතය (සක්වල ගල) විසින් පිරිවැරූ සාගරයට කර්ණාවතංසයක් (කන් අබරණයක්) වැනිවූ මේ පෘථිවි සංඛ්‍යාත (පොළොව වැනි) චක්‍රවර්ති රාජ්‍ය  සම්පත්තිය ධ්‍යාන සැපයෙන් (මානසික සුවයෙන්) යුක්ත වූ ප්‍රව්‍රජ්‍යාව (පැවිද්ද) හැර පංචකාම සම්පත්තියෙන් යුක්තවූ ඓශ්වර්යය (සැප සම්පත්) ඇරගතියි යන මේ ලෝක නින්දායෙන් යුක්තව නොකමැතියෙමි. මෙබඳු වූ නින්දා ස්වාභාවයෙන් දනුව"යි කියා "ශ්‍රේෂ්ඨ අමාත්‍ය, ධ්‍යානයෙන් ආත්මය පිරිහෙලා හෝ අධර්මයෙහි හැසිරීමෙන් හෝ යම් යසලාභ වෘත්තියෙක් (කීර්තිය හා ධනය ලබාදෙන සේවයක්) ඇත්නම් ඒ සියලු සම්පත්තිය නින්දිත වන්නේය" කියාද "යම් අධර්මයකින් වස්තු රැස් කිරීමෙක් ඇත්නම් එයින් ජීවත් වීමට වඩා ඉඳින්

ගෘහවාසය හැර (ගිහිව විසීම අත්හැර) භික්ෂාභාජනය (පාත්‍රය) අතින් ගෙන අන් කුලයෙක්හි (ගෙයක් පාසා) පිඬු පිණිස හැසිරෙමි. එම ජීවත් වීම මට උත්කෘෂ්ට (උතුම්) වන්නේය"යි කියා "මම වනාහි ඉදින් ගෘහ වාසය හැර සත්ව ලෝකයෙහි සත්වයන්ට හිංසා පීඩා නොකොට භික්ෂා භාජනය අතින් ගෙන අන් කුලයෙක්හි පිඬු පිණිස හැසිරෙමි. එබඳු ජීවිකාව රාජ්‍ය ශ්‍රී සම්පත්තියටත් වඩා උත්කෘෂ්ට ය"යි කීසේක.

බෝධි සත්වයන් වහන්සේ අමාත්‍යයා විසින් නැවත යාඥා කරද්දීත් පුරෝහිත තනතුරු මේ ආකාරයෙන් ප්‍රතික්ෂෙප කළසේක. එවිට සය්හ නම්වූ අමාත්‍යයා බෝධි සත්වයන් වහන්සේගේ සිත් ලැබ ගත නොහී වැඳ අවසර ඉල්වා ගෙන නුවරට ගොස් බෝධිසත්වයන් වහන්සේ නොඑන බව රජ්ජුරුවන්ට දැන්වූයේය. අජරාමර සංඛ්‍යාත (දිරීම, මැරීම නැති) නිර්වාණ ක්ෂෙමභූමිය ප්‍රණිධානය (ප්‍රාර්ථනා) කළාවූ සත්වයන්ගේ අභිමතාර්ථය (කැමති යහපත) සිද්ධකර අප තිලෝගුරු බුදුරජානන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙන හැර දක්වා චතුරාර්ය සත්‍යය ප්‍රකාශ කොට වදාරා මේ 'සය්හ ජාතකය' නිමවා වදාළසේක.

චතුරාය්‍ර්‍යසත්‍යය ධර්මදේශනාවගේ කෙළවර උකටලී භික්ෂූන්වහන්සේද දහසක් නයින් ප්‍රතිමණ්ඩිතවූ (යුක්තවූ) ශ්‍රොතාපතති ඵලයෙහි පිහිටිසේක. අවශේෂ පිරිසත් මෙවැනි ශ්‍රොතාපත්ති ඵලාදිය සාක්ෂාත් කළාහුය.

"එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් බුද්ධෝපස්ථායක වූ ආනන්දස්ථවිරයෝය. එසමයෙහි සය්හ අමාත්‍යයා නම් දැන් ඥනාග්‍රප්‍රාප්ත වූ ශාරිපුත්‍රස්ථවිරයෝය. එසමයෙහි පුරෝහිතයා නම් සමස්ථ සත්‍වයන් කෙරෙහි පතළ කරුණාවෙන් සමත්‍රිංසත් පාරමිතා ධර්‍මයන් පූරණය කොට අසවර්ත්‍ථ මූලයෙහිදී (ඇසතු රුක් මුලදී) ප්‍රාදූර්භූතවූ (පහළවූ) වජ්‍රාසනාරූඪව (විදුරසුන්හිඳ) සකලඥෙයය (සියලු දත යුතුදේ) ධර්‍මයන් කරතලාමලක (අතැඹුලක්සේ, එනම් අතෙහිවූ නෙල්ලි ගෙඩියක්සේ) ප්‍රතිවෙධ කළාවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේකි.

**වීරවග්ගො පඨමො**

# 302. පුච්මන්ද ජාතකය

තවද එක් සමයෙක්හි සුරාසුර බ්‍රහ්ම මනුජවන්දනීය (මිනිසුන් විසින් වැඳිය යුතු) ශාස්තෲ වූ අප තිලෝගුරු බුදුරජාණන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සේක්, ආයුෂ්මත්වූ මහමුගලන් තෙරුන් වහන්සේ අරභයා මේ දේශනාව වදාළ සේක. මුගලන් මහතෙරුන් වහන්සේ වනාහි රජගහ නුවර නිසා වන කැලයෙක්හි වසන කල එක් සොරෙක් නගරද්වාර නම් ගම්හි උමන් බිඳගෙන හස්තසාර (අතට අසුවූ) බඩු ගෙන ගොස් තෙරුන් වහන්සේ කළ ආකාරයෙන් කළ පිරිවෙණට වැද මට ආරක්‍ෂා වන්නේ යයි සිතා තෙරුන්වහන්සේගේ පන්සල නිසමත්තෙහි (අගුවෙහි) සැතපුනේය. තෙරුන් වහන්සේ ඔහු නිසමත්තෙහි සැතපුන බව

දැන ඒ පුරුෂයා කෙරෙහි සැක කොට සොරුන් හා එක්ව විසීම නම් සුදුසු නොවන්නේයයි සිතා පන්සලින් නික්ම ගොසින් "මෙතැන්හි තොප නොසැතපේව"යි නිකුත් කළ සේක.

ඒ සොරා එතැනින් නික්ම නොපෙනෙන ලෙස පියවලහා (පියවර අනුව) ගියේය. එගම්වැසි මනුෂ්‍යයෝ ගිනිසිළු ඇරගෙන සොරහුගේ පියවර සටහන් ඒ ඒ තැන්හි පරීක්‍ෂා කොට ගොස් ඒ සොරහු ආවාවූ තැන්ද සැතපුන තැන්ද යන මෙකී තැන් දැක සොරුන් මෙතැන්හි ආයේය, මෙතැන්හි සිටියේය, මෙතැන්හි හුන්නේය, මේ ස්ථානයෙන් නික්ම ගියේය, "අප විසින් සොරහු නොදක්නා ලද්දේය"යි ඔබිනොබ ඇවිද නොදැක ගියාහුය.

දෙවෙනි දවස්හි මුගලන් මහතෙරුන් වහන්සේ පෙරවරු වේලෙහි රජගහ නුවර පිඬු පිණිස හැසිර ආහාර කෘත්‍යයෙන් වැලකුන සේක් වේළුවනාරාමයට ගොස් එපවත් බුදුන්ට දැන්වූ සේක. "මොග්ගල්ලානයෙනි, සැක කළ යුතු තැන් සැක කෙළේ තොපි දැන්මතු නොවෙයි. පුරාතන නුවනැත්තෝද සැක කළ යුතු දෙයෙහි සැක කළාහුවේදැ"යි වදාරා ස්ථවිරයන් විසින් ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් ගෙනහැර දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජකු රජ කරන සමයෙහි අප මහ බෝසතානන් වහන්සේ බරණැස්

නුවර සුසාන වනයෙහි කොසඹ ගසෙක්හි වෘක්‍ෂ දේවතාව උපන්සේක.

ඉක්බිති එක් දිනයෙක නුවර දොර සමීප ගමෙක්හි කරන ලද සොරකම් ඇති පුරුෂයෙක් ඒ සුසාන වනයට ප්‍රවිෂ්ට විය. එකල්හි වනාහි ඒ සුසාන වනයෙහි කොසඹය, ඇසතුය යන වනස්පතී (විශාල ගස්) වෘක්‍ෂයෝ දෙදෙනෙක් වූහ. කරණ ලද සොරකම් ඇති පුරුෂයා කොසඹ ගස මුල බඩු පොදිය තබා සැතපුණේය. එකල්හි වනාහි මනුෂ්‍යයෝ සොරුන් ගෙන කොසඹ හුල්හි (උල තබත්) අමුණති. ඉක්බිති ඒ දේවපුත්‍රයා සිතනුයේ "ඉදින් මනුෂ්‍යයෝ අවුත් මේ සොරහු අල්වාගෙන මේ කොසඹ ගසෙහි ශඛාවන් ඡේදනය (සිඳ) කොට හුලක් තනා මොහු කොසඹ හුල්හි අමුනුවන්නාහුය. එකල්හි අපගේ මේ විමාන වෘක්‍ෂයත් නසන්නේය. එබැවින් ඔහු මෙතනින් නිකුත් කෙරෙමි"යි ඔහු හා සමග කථා කරන්නේ "කොල සොරු නැගී සිටුව, කවර කාරණයකින් සිතා සයනය කරන්නෙහි දැයි මෙතැන්හි තාගේ සයනය කිරීමෙන් කවර අර්ථයෙක් සිද්ධවේද? ගම්හි දරුණු සහාසික චොරක්‍රියා කළාවූ සොරා යම්සේ රාජ පුරුෂයෝ අල්වා නොගනිද්ද එපරිද්දෙන් නැගී සිට නික්මෙව"යි කීයේය. ඒ දේවපුත්‍රයා ඔහුට මේ උක්ත ප්‍රකාර වචනයෙහි භය ගන්වා ගමන් කර වූයේය.

ඒ සොරහු එතනින් ගිය කල්හි ඇසතුරුක්හි වසන දේවපුත්‍රයා කියනුයේ "ගමට ප්‍රවිෂ්ටකළ (පිවිස) යම් සොරකු

රාජ පුරුෂයෝ අල්වා ගෙන වනයෙහි ගෙන ගියා වූ කොසඹ වෘක්‍ෂයෙන් ශාඛාවක් කපා උල් හිඳුවති. එකල්හි පුචිමන්ද (පතගි) දේවපුත්‍රයාට කවර හානියෙක් වේදැ?"යි කී කල්හි එබස් ඇසූ කොසඹ රුක්හි වසන දේවපුත්‍රයා කියන්නේ "අශ්වර්ත්‍ථ (ඇසතු) දේවපුත්‍රය, තෙපි මාගේ ද සොරහුගේ ද එක්ව නොවසන බව නොදනුව ගම්හි සොරකම් කළ පුරුෂයා කොසඹ හුල්හි අමුනති. එසේ කල්හි මාගේ විමාන වෘක්‍ෂය නස්නේය. නොහොත් ශාඛායෙහික්හි බැඳ එල්වූ නම් මාගේ විමානය කුණප (මල කුණු) ගන්‍ධයෙන් හමන්නේය. එහි මාගේ සිත සැක කරව"යි කීයේය.

එපරිද්දෙන් ඒ දේවපුත්‍රයන්ට ඔවුන් කථා කරමින් සිටියදී වස්තු ස්වාමීහු සියළු කොලගත් අත් ඇතිව පියවර අනුසාරයෙන් අවුත් සොරහු සැතපුනු තැන් දැක "පින්වත්නි, දැන් මේ සොරු නැගී සිට ගියේය. ඉදින් සොරුන් ලද මෝ නම් ඔහු මේ කොසඹ හුල්හි හෝ අමුනා ශාඛාවෙක්හි හෝ බැඳ එල්වා යන්නමෝ වේදැ"යි කියා ඔබ්මොබ දිව ඇවිද සොරුන් නොදැකම ගියාහුය. ඔවුන්ගේ බස් ඇසූ අශ්වර්ත්‍ථ දේවපුත්‍ර කියන්නේ "එම්බා නිම්බවෘක්‍ෂ දේවපුත්‍රය, සැක කළයුතු දෙයෙහි සැක කල යුත්තේය. පාපමිත්‍ර සංසර්ගය දුරු කිරීමෙන් මෙලෙව්හි තමා රක්‍ෂා කෙරෙති. ත්‍රිවිධ දුශ්චරිතය දුරු කිරීමෙන් පරලොවින් වන අපායාදිවූ භයින් තමා රක්‍ෂා කෙරෙයි. එසේ හෙයින් අනාගත භය කරණ කොටගෙන නුවණැති සත්‍වයෝ මෙලොව පරලොව දෙකින් වන වැඩ දක්නහුය"යි කීයේය. ශාස්තෘ වූ

බුදුරජානන්වහන්සේ මේ ධර්‍ම දේශනාව ගෙනහැර දක්වා වදරා මේ ‘පුචිමන්ද ජාතකය’ නිමවා වදාළ සේක.

“එකල්හි අශ්වර්ත්‍ථ වෘක්‍ෂයෙහි නිපන් දේවපුත්‍රයා නම් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේය. එකල්හි නිම්බවෘක්‍ෂයෙහි නිපන් දේවපුත්‍රයා නම් දැන් බුදුවූ මම්ම වේදැ”යි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

# 303. කස්සපමන්‍දිය ජාතකය

තවද එක්සමයෙහි ෂඩ්භිඥාද්‍යනෙකගුණරත්නාලංකෘත (අභිඥා නම් විශේෂ ගුණ නැමති රුවනින් සැරසුනු) ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ ජේතවනාරමයෙහි වාසය කරන සේක් එක් මහළු භික්‍ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දේශනා කළසේක.

සැවැත් නුවර වැසි එක් කුල පුත්‍රයෙක් වස්තුකාම ක්ලෙශකාමයෙහි ආදීනව දැක සර්‍වඥයන් වහන්සේ සමීපයෙහි පැවිදිව කමටහන්හි යෙදී වාසය කරන්නේය. නොබෝ කලකින්ම රහත් බවට පැමිණියේය. ඊට මෑත භාගයෙහි උන් වහන්සේගේ මෑණියෝ කළුරිය කළහ. ඒ රහතන් වහන්සේ මෑනියන්ගේ ඇවෑමෙන් දෙපුතුපියන් (පුත් දෙදෙනා සහ පියා) පැවිදි කරවා දෙව්රම් වෙහෙරෙහි වැසි වස් එළඹෙන කල්හි චීවර ප්‍රත්‍යයන්ගේ (සිව්පසය) සුලභ බව අසා එක් ගමක විසීමට ගොස් එතැන්හි තුන්දෙනා වහන්සේම වස් එළඹ නිමවන ලද වස් ඇති සේක් ජේතවනාරාමයට ආ සේක.

රහත් වූ දහර (ළා බාල) භික්‍ෂූන්වහන්සේ කියන සේක් "ජේතවන විහාරස්ථානාසන්නයෙහි සිට සාමණේර තෙපි, මහළු තෙරුන් වහන්සේ සතප්පා කැන්දාගෙණ එව, මම පෙරටුව ගොස් පිරිවෙණ පිළදගිම් (සැකසීම)"යි කියා ජේතවනාරාමයට ගිය සේක.

මහළු තෙරුන් වහන්සේ සෙමින් සෙමින් සිට යන සේක. සාමණේරයෝ නැවත නැවත හිසින් පීඩා කරන්නාහුමෙන් "සාමිනි, ගිය මැනවැ"යි කියා ඒ මහළු තෙරුන් බලාත්කාරයෙන් ගෙණ එන්නේය. මහළු තෙරුන්වහන්සේ කියන සේක් "තොපි අප හා ගමන නොකැමැති කරවා ගෙණ යව්දැ"යි කියා නැවත වැලකී ආපස්සෙහි යන සේක. ඔවුනොවුන් හා විවාද කරන්නාවුම ඔවුන්ට හිරු හස්තංග ගතවිය (බැසගිය කල්හි). අන් වීතරාගී (ආශා නැති) භික්‍ෂූන්වහන්සේ පිරිවෙන හැමද දිය සපයා තබා ඔවුන් දෙදෙනාගේ ඊම නොදන්නා සේක් ගිනිසිළු ගෙණ පෙර ගමන් කොට එන්නා වූ ඔවුන් දැක "කල්ගියේ කිම්දැ"යි විචාළසේක.

මහළු භික්ෂූතෙම ඒ වූ කාරණය කී සේක්. ඒ රහත් භික්‍ෂූන්වහන්සේ ඒ දෙදෙනා සතප්පවා සෙමින් කැඳවා ආ සේක. එදවස්හි බුදුන්ට කළ යුතු උපස්ථානාදියට අවසර නොලත්සේක. නැවත බුදුරජානන් වහන්සේ දෙවැනි දවස්හි බුද්ධොපස්ථානයට අවුත් නමස්කාර කොට අන් භික්‍ෂූන් වහන්සේට බුදුහු "තෙපි කවර කල්හි අවුදැ"යි විචාළසේක. "ස්වාමීනි, ඊයේ ආයෙමි" දැන්වූ සේක. "තොපි ඊයේ වැනි

දවස අවුත් අද බුද්ධොපස්ථාන කරව්දැ''යි වදාළ සේක. ''ස්වාමීනි, බුදුරජානන්වහන්ස එසේය''යි කියා ඒ වූ කාරණය දැන්වූසේක.

ශාස්තෲ වූ බුදුරජානන් වහන්සේ මහළු තෙරුන් වහන්සේට නින්දා කොට වදාරා ''මෙතෙම මෙබඳු ක්‍රියා කෙළේ දැන්මතු නොවෙයි, පෙරත් නින්දා කෙළේම වේදැ''යි වදාරා ''දැන් මතු වනාහි ඒ මහළු භික්ෂූන් ක්ලාන්ත කරවන ලද්දේ නොවෙයි, පෙර නුවනැත්තන් ක්ලාන්ත කරවීය''යි වදාරා ඒ රහත් භික්ෂූන් විසින් ආරාධිත වූසේක්. ඉකුත්වත් ගෙණහැර දක්වා වදාල සේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරන කල පුරණ ලද බෝධිසමභාර ඇති අප මහබෝසතානන් වහන්සේ කසී නම් නියම්ගම්හි බ්‍රාහ්මණ කුලයෙක්හි උපන්සේක. උවමනා වයසට පැමිණි බ්‍රාහ්මණ කුමාරයන්ගේ මෑණියෝ කළුරිය කළේය. ඒ බ්‍රාහ්මණ කුමාරයා මෑණියන්ගේ අවමඟුල් කෘත්‍යකොට මසක් අඩමසක් ඇවෑමෙන් ගෙයි විද්‍යාමාන වස්තූන් දන් දීපියා පියානන්ද මලනුවන්ද ගෙණ හිමාල වන ප්‍රදේශයෙහි දෙවියන් දුන් රිටිසුඹුළුගෙණ (ගස් පට්ටා) ඍෂිප්‍රවෘජ්‍යාවෙන් පැවිදිව අල මුල්, වනමුල්, පලාහාරයෙන් යැපෙන සේක් සිත්කළුවූ වනලැහැබෙක වාසය කළසේක.

හිමාලය වනයෙහි වර්ෂා කාලයෙහි නොසිඳෙන ලද ජලධාරාවන් ඇතිව වැසි වස්නා කල්හි අලමුල් සාරන්ටද නොහැකිවන්නේය. ඵලාපල පණීයෝ (කොල) පතිත නොවෙති. එසේ හෙයින් තාපසවරයෝ බොහෝ සේ හිමවතින් බැස මනුෂ්‍යපථයෙහි (මිනිස් පියසෙහි) වෙසෙති.

එකල්හි මහ බෝසතානන් වහන්සේද පියානන් හා සමඟ මලනුවනුත් ගෙණ මනුෂ්‍යපථයෙහි වැස නැවත හිමාලය වනය මල් පිපී ඵලගත් කල්හි ඔවුන් දෙදෙනාගෙන හිමාලය වන ප්‍රදේශයෙහි පෙර විසූ තමාගේ ආශ්‍රමපදයට එන සේක්, පන්සලට නුදුරු තැන්හිදී හිරු හස්තයට ගතවූ කල්හි “තොපි ලසි ගමනින් එව. මම පෙරටුව ගොස් පන්සල පිළිදගිමි” කියා ඔවුන් දෙදෙනා හැර ගිය සේක. බාල තාපසයෝ පිය මහළු තාපසයන් හා සමඟ ලැසි ගමනින් යන්නේ ඒ මහළු තාපසයන්ගේ කටිප්‍රදේශයෙහිත් පීඩා කෙරෙමින් යන්නේය. මහළු තාපසයෝ “තොපි මාගේ අභිප්‍රායෙන් ගෙන යන්නේ ය”යි කියා නැවත වැලකී ආපස්සෙහි එන්නේය. මෙපරිද්දෙන්ම කලහ කරන්නාවූ ඔවුන්ට අන්ධකාර විය.

මහබෝසතානන් වහන්සේද පන්සල හැමද දිය පෙරා තබා ගිනිසුළු ගෙන පෙර මගට එන සේක් ඔවුන් දෙදෙනා දැක “මෙතෙක් කල් කුමක් කළ යුතුදැ”යි කීසේක. බාල තාපසයෝ පිය තාපසයන් විසින් කළමනා කාරණා කීයේය. මහබෝසතානන් වහන්සේ ඔවුන් දෙදෙනා ලැසි ගමනින් ගෙන ගොස් තාපස පරිෂ්කාරයන් තැන්පත් කොට තබා පියා

තාපසයන් ජලස්නානය කරවා පය මැදීම් තෙල් ගෑවීම් පිට මිරිකීම් මෙකී වත් කොට එක් ගිණී කබලක් සමීපයෙහි තබා සන්සිඳුවන ලද සිත ඇති "පිය තාපසයානන් වහන්ස, ලදරුවෝ නම් මැටි බඳුනක් හා සම සදෘශය (සමාන) යන මදකින්ම බිඳෙති. වරෙක බිඳුනු කල් තැන් පටන් නැවත ගලපන්ට නොහැකිවන්නේය. ඔවුන් ආක්‍රොශකරණ (බැන වදින) කල්හිද මහළු සත්‍වතෙම ඉවසිය යුත්තේය" කියා පියතාපසයන්ට අවවාද කරන සේක්. "අඥාන භාවයෙන් තරනුවූ කාශ්‍යප නම් පිය තාපසයන් වහන්ස, නුවනැති සත්‍වතෙම බාල දරුවෝ ආක්‍රොශ වචන හා පීඩා කෙරෙත්මුත් සියළු නොකමැති ක්‍රීඩාවන් ක්‍ෂමා කෙරෙති. ඉඳින් අනුවන සත්‍වයෝ ආක්‍රොශ පරිභව බෙනෙති නමුදු පහරින් නමුදු බාලදරකයන් විසින් කලාවූ සියළු අපරාධයන් සත්පුරුෂවූ වැඩි මහළු නුවනැති සත්‍වයෝ යුහුව මිත්‍රභාවයෙන් සමඟි වෙති. වැලිඳු අඥාන සත්‍වයෝ මැටි භාජනයක් මෙන් බිඳෙති. ඒ නුවනැති සත්‍වතෙම ස්වල්පමාත්‍රවූ විවාදයක් කෙළේද වෛරයන් සන්සිඳීම් වශයෙන් සමඟි භාවයට නොපැමිණෙන්නේය. මෙලෙව්හි යම් සත්‍වයෙක් තමා විසින් ඉක්මවා පැවති දෝෂ දනී නම්, යම් සත්‍වයෙක් තමා කල දෝෂ වරද නියායෙන් පිළිගන්ට දනීද, ඔහු දෙදෙන මිත්‍රභාවයෙන් සමඟි වෙති. එසේ හෙයින් ඔවුන් දෙදෙනාගේ මිත්‍රසම්බන්ධය නොනස්නේය. තවද මේ වේලෙහි යම් සත්‍වයෙක් ද්වේෂයෙන් මැඩ පවත්නා වූ අපරාධකාරී වූ අන්‍ය සත්‍වයන්ගේ ව්‍යතික්‍රමණයෙන් (ඉක්මවීමෙන්) ඔවුන් ක්‍ෂමා

නොකළ කල්හිද තමා විසින් "භද්‍රමුඛයානෙනි, (සොඳුරු මුහුණක් ඇති) තොපි මෙසේ එව, පාලි වචනයක් උගනුව, අර්ත්‍ථ කථාවන් අසව, භාවනායෙහි යෙදී වාසය කරව, කවර කාරණයක් නිසා බැහැර වාසය කරව් දැ"යි කියා තෙමේ අන්සත්‍වයන්ගේ අපරාධ දරා මෛත්‍රී භාවනාවට ප්‍රයත්න කෙරේද මිත්‍රයන්ගේ අක්‍රියාභාරය (නොකටයුතු) උසුලාද මිත්‍රයා විසින් කළ යුතු ධූරාව උසුලාද එහෙයින් මෙබඳු වූ සත්‍වතෙම විශේෂයෙන් උතුම් වන්නේය"යි මෙසේ කියා මහ බෝසතානන් වහන්සේ පිය තාපසයන්ට අවවාද කළ සේක. ඒ මහළු තාපසයානෝද එතැන් පටන් මොනවට දැපුනේය.

ශාස්තෘ වූ තථාගතයන් වහන්සේ මේ ධර්‍ම දේශනාව ගෙණ හැර දක්වා වදාරා මේ 'කස්සපමන්දිය' ජාතක ධර්‍ම දේශනාව නිමවා වදාල සේක.

"එකල්හි පිය තාපස නම් දැන් මහල්ලක ස්ථවිරය, එකල්හි සිළු තාපසයෝ නම් දැන් සාමණේරයෝය, එකල්හි පිය තාපසයන්ට අවවාද කළ තාපසයෝ නම් දැන් බුදුවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

# 304. ක්‍ෂාන්තිවාද ජාතකය

තවද මෙරසේ මුළු ලොවට අසාධාරණවූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝපී භික්‍ෂුකෙනෙකුන් වහන්සේ සර්‍වඥයන් වහන්සේ කරා කැඳවා ගෙනවුත් දැන්වූ කල්හි "මහණ, පෙර උත්තමයෝ නම්

කටුසැමිටියෙන් (කටු සහිත කසයෙන්) පහර දහසක් කාත් නොකිපුනෝ වේදැයි තොප වනාහි මේ නිසා බුද්ධ ශාසනයෙහි මහණව කෝපව වාසය කරන්නේ ඉතා අයුක්තිය”යි වදුරා “අත් පා කන් නසා කැපූවන්ටත් උත්තමයෝ කෝප නොකළෝ වේදැ”යි වදුරා ඉකුත් වත් ගෙණ හැර දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස කසීරට කලාබු නම් රජ කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්‍වයෝ බමුණු කුලයක උපන්නාහ. බෝධි සත්‍වයන්ට නම් තබන්නාහු කුරුඩක කුමාරයෝ යයි නමක් ඇතිව වැඩිවිය පැමිණ දෙමව්පියන් ඇවෑමෙන් ඒ සම්පත් හිමිව ඒ සම්පත් දනවිෂයෙහි විසුරුවා පංචකාමයෙහි ආදීනව දැක සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව හිමාලය වනයෙහි වාසය කොට ලුණු ඇඹුල් නිසා බරණැස්නුවරට අවුත් රජ්ජුරුවන්ගේ උයනට වැද වාසය කොට භික්‍ෂාව (ආහාර) පිණිස වීථියෙහි සිඟා ඇවිදිනාහු සෙනෙවිරදුන්ගේ ගෙදරට පැමිණි සේක. සෙනෙවිරද්දූ මුන් වහන්සේගේ ඊර්ය්‍යාපථයෙහි (ඉරියව්) පැහැද එවක් පටන් තමන්ගේ ගෙයින් දන් දී උපස්ථාන කරන්නාහ.

එසමයෙහි එක් දවසෙක කලාබු රජ්ජුරුවෝ රා බී මත්‍ව සත් දවසක් බිසෝවරුන් පිරිවරා උයන් කෙළියට ගොසින් මඟුල්සලවට (ගල් අසුනෙහි) මස්තකයෙහි කරුණාව ඇති ස්ත්‍රියක සමීපයෙහි කලවයෙහි හිස තබාලා වැදහොත්තාහුය.

සොළොස් දහසක් නාටක ස්ත්‍රීන් "අපගේ ස්වාමීන් නිදන කල අපි නෘත්‍ය කරන්නේ කාටදැ"යි කියාලා ගත්තාවූ පඤ්චාංගික තූර්යනාටක( ආතත ආදී සංගීත භාණ්ඩ) තබාලා ගොස් තාපසයන් ලඟ ගසමුල වටලා ගෙණ බණ අස අසා උන්නාහ. එකියන ස්ත්‍රී තමා කළවය සොල්වා රජ්ජුරුවන් පුබුද්දපූහ. පිබිද මඟුල්සල්වට මත්තෙහි හිඳ "මෙතන සිටියා වූ චණ්ඩාල ස්ත්‍රීහු කොයි ගියේ දැ"යි විචාළහ. එවිට බිසව් කියන්නාහු "තාපස කෙනෙක් ලඟ හිඳ බණ අසති" කීහ. "යහපත, කූට (කපටි) තාපසයන්ට නිහඬක් කියමි" නැගී සිට කඩුව අයාපියා (අමෝරා) ඇරගෙණ මරන්ට දිවූහ. රජ්ජුරුවන් වහන්සේගේ වල්ලභ ස්ත්‍රී රජ්ජුරුවෝ ඉදිරියට ගොස් කඩුව ඇර ගත්තාහ. රජ්ජුරුවෝ ගොසින් "තොපි කුමනවාදි දැ"යි විචාළාහ. එවිට "මහරජ, මම ක්‍ෂාන්තිවාදී (ඉවසන සුලු) නමය"යි කීහ. "ඒ කුමක්ද? ක්‍ෂාන්තිවාදී නමැ"යි විචාළ තෙන "මා කෙරේ මෛත්‍රීන් කෙරෙහිත් අමෛත්‍රීන් කෙරෙහිත් මම එක කරුණාවමැ"යි කීහෙයින් "මම ක්‍ෂාන්තිවාදීමැ"යි කීහ.

"මුන්ගේ ක්‍ෂාන්තිය බලන්නට උවමැනවැ"යි වධකයා ගෙන්වූහ. වධකයාත් රත්කඩක් හැඳ රතක් කරලා රත්මල් පැලඳ පොරවක් අතින් ගෙන "කවරක් හට කවර වධයක් කෙරෙම්ද වදාල මැනවැ"යි කීහ. "අනික් කාට වද කරන්ටද තෙල කූට තාපසයා ඉස බිමලා එලාගෙන පිට පාර පන්සියයක් ද, බඩපාර පන්සියයක්ද, දැලයෙහි දෙසිය දෙසියක් ද ගසාල"යි කීහ. එවිට වධකයාත් කී ලෙස ගෙඩි

ගසා සිටියාහ. එවිට කියන්නාහු, "තවද තොපගේ ක්‍ෂාන්තිවාදී නොගියේදැ"යි විචාළාහ. "ඇයි මහරජ මාගේ ක්‍ෂාන්තිය පයෙයි" කීහ. "පයක් කපාහරුව"යි කී හෙයින් වධකයාත් කී ලෙසම කළාහ. එවිටත් "තෝ කුමනවාදීදැ"යි විචාළෙන් "ඇයි මහරජ, මාගේ අත් පා කැපුවයි කිම් ද මාගේ ක්‍ෂාන්තිය මාගේ හෘදයෙහි වේදැ"යි කීහ. "තිළුගේ කන් නාසා කපා තෝ ක්‍ෂාන්තිවාදිදැ"යි විචාළෙන් "ඇයි මහරජ, මාගේ ක්‍ෂාන්තිය  මාගේ ලෙයි නොවේදැ"යි කියා වැදහොත් බෝධිසත්‍වයන් කැපූ අත් පා කන් නාසායෙන් හිය ලෙයෙන් රැළි ඔත්තාහ.

එවිට රජ්ජුරුවෝ කියන්නාහු "ඇයි තාපසයානෙනි, තව දක්වා තොපගේ ක්‍ෂාන්තිය නොගියේදැ"යි කීහ. එවිට බෝධිසත්‍වයෝ කියන්නාහු "මහරජ, ක්‍ෂාන්ති නම් අත් පා කන් නාසායෙහි තිබූ දෙයෙක්ද? මාගේ ගම්භීර වූ හෘදයෙහි පිහිටියේය. තොප කුමක් කළත් මාගේ ක්‍ෂාන්තියට කුමක් වේදැ"යි කීහ. එවිට රජ්ජුරුවෝ "තොපගේ ක්‍ෂාන්තිය තොපගේ ලෙයිහිම තිබේ"යි කියා විළුඹෙන් ළයට ඇන්මක් ඇන පිටත්වලා ගියාහ. එවිට තාපසයන්ට උපස්ථාන කරන්නාවූ සෙනෙවිරද්දූ තාපසයන් කරා අවුත් තාපසයන්ගේ කපාපු අත් පා කන් නාසා ඇරගෙන කඩ කඩ බැඳ තාපසයන් ඇඟ ලේ පිය තාපසයන් එක්තෙනක සතප්පවා වැඳ එකත්පස්ව හිඳ කියන්නාහු "උත්තමයානන් වහන්ස, වධ කළ සේක් රජ්ජුරුවන් වහන්සේය. රාජ්ජවාසීන්ගෙන් වධයක් කරන්නක්වත් කළ කෙනෙක්වත් නැත. රාජ්ජවාසීන්ට

කෝපයක්වත් අමෛත්‍රියක්වත් නොකළ මැනව, කෝප කරතත් මෛත්‍රී කරතත් රජ්ජුරුවන් වහන්සේටම කළ මැනවැ"යි කීහ. එවිට තාපසයෝ කියන්නාහු "රජ්ජුරුවන් විසින් මාගේ කන් නාසා අත්පා කප්පවා වද කරන ලද. එසේ කළත් මම රජ්ජුරුවන් කෙරෙහි නිෂ්කරුණාවක් (අකරුණාවක්) නැත. එසේ හෙයින් රජ්ජුරුවෝ චිරාත් කාලයක් ජීවත් වෙත්ව"යි "සුඛී සුවපත් වෙත්ව"යි කියා මෛත්‍රී කළහ. එකියන කලාබු රජ්ජුරුවෝ තාපසයන්ගේ දෘශ්‍යමානයක් ඉක්ම උයන් කෙළවරට ගිය කල්හි දෙලක්‍ෂ සතලිස් දහසක් ඝනකඩ බොල් මහ පොළොව පලාගෙන අවීචි මහනරකයෙන් ගිනි කඳෙක් අවුත් රජ්ජුරුවන් පලසකින් වට කරන්නා සේ වටලා අවීචි මහානරකයට ඇරගෙන ගියේය. ඒ අර්ථය දක්වන්නාවූ සර්‍වඥයන් වහන්සේ වදාරණ සේක් "මහණෙනි, මෙකින ක්‍ෂාන්තිවාද තාපසයෝ තමන්ගේ අත් පා කන් නාසා කපා දැලයේ පාර දහසක් ගසා වධකරන්නාහු කලාබුරජහු කෙරෙහි කෝපයක් නොකොට මෛත්‍රී කළ සේක. එරජ පොළොව ධරාගතනොහී පොළව පලා ගෙන අවීචි මහනරකයට ගියේය"යි වදාළසේකැයි "එකියන තාපසයෝ එදවස්ම කාලක්‍රියා කළහ"යි වදාරා මේ 'ක්‍ෂාන්තිවාද ජාතකය' නිමවා වදාළ සේක.

"එසමයෙහි කලාබු රජ නම් දැන් දෙවදත්තස්ථවිරයෝය, සෙනෙවිරද්දූ නම් ශාරිපුත්‍රස්ථවිරයෝය, ක්‍ෂාන්තිවාද තාපසව උපන්නෙම් දෙවාති දෙවවූ (දෙවියන්ට දෙවි) ශක්‍රාති ශක්‍ර වූ

වන්දනෙයයාභිවන්දනෙයයවූ පූජනෙයයාභිපූජනෙයයවූ තිලෝගුරු බුදුවූ මම්ම වේදැ''යි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

# 305. ලොහකුම්භි ජාතකය

තවද තිලෝගුරු සර්‍වඥරාජෝත්තමයානන් වහන්සේ එක් සමයෙක්හි සැවැත් නුවර ගොදුරු ගම්කොට දෙව්රම් වෙහෙර වැඩවසන සේක්, කෝසල රජ්ජුරුවන් අරභයා මේ ජාතකය වදාළ සේක.

එක් දවසක් කෝසල රජ්ජුරුවෝ රාත්‍රී භාගයෙහි නිරිසතුන් සතර දෙනෙකුගේ ශබ්දය ඇසූය. ඉන් එක් නිරිසතෙක් දුකාරය කීහ. එකෙක් සකාරය කීය. එකෙක් නකාරය කීය. එකෙක් සෝකාරය කීහ. ඔහු සතර දෙන පූර්‍ව ජන්මයෙහි මෙම සැවැත් නුවර රාජ කුමාරව ඉපිද ඓශ්වර්‍ය්‍යමදයෙන් (ඉසුරු මදයෙන්) බොහෝ කලක් පරදාරසේවනය පුරුදු කොට අනිකුදු බොහෝ අකුසල් රැස් කෙරෙමින් ජීවත්ව ආයු කෙළවර ඒ පරදාරකර්මය හේතු කොට ගෙන ලෝකුඹු නරකයෙහි උපන්නාහු, බඳුනෙක්හි පැසෙන සාල්මෙන් පැසී තිස් දහසක් අවුරුද්දෙන් මුවවිටට (ගැට්ට ළඟට) පැමිණ උනුන් දැක "කවර දවසෙක මේ දුකින් මිදෙමෝදැ?''යි ක්‍රමයෙන් බැගෑපත්ව ශබ්ද කළාහ.

කොසොල් රජ්ජුරුවෝ මධ්‍යම රාත්‍රියෙහි ඒ ශබ්දය අසා භයින් තැති ගෙන යහන් මත්තෙහි නොනිදා ඉඳම අරුණු නැඟී වේලෙහි පුරෝහිත බමුණන් අවුත් රාත්‍රියෙහි සැතපීමෙහි

දුක් සැප විචාළ කල්හි රජ්ජුරුවෝ "ආචාරීවරයිනි, සැතපීමෙහි සැපයෙක් කොයින්ද රාත්‍රියෙහි මෙබඳු භයානක වූ ශබ්දයක් ඇසීමි" කීය.

ඒ ඇසූ බමුණන් විසින් අතුල්සලා (සොලවා) කම්පාව සිටි කල්හි "කීමෙක් ද? ආචාරීනි" විචාරා "මහරජ්ජුරුවන් වහන්ස, උග්‍රවූ ශබ්දයෝය"යි කී කල්හි "පිළියමට සමවේදැ"යි කියා "ඒකාන්තයෙන් මේ ශබ්දයෝ ප්‍රතිකාර ක්‍ෂම (පිළියමට නොනිසි) නොවෙති. අපි වනාහි යාග විධානයෙහි මොනවට දක්‍ෂයම්හ. ඉදින් ප්‍රතිකාර නොහැර කරතොත් ශතාධික (සියයට වැඩි) පරිත්‍යාග වශයෙන් මහත්වෙයි. ඒ මහත්වූ යාගය අපගේ සාමර්ත්‍ථ්‍යයෙන් අසුරුවා සර්‍වචතුෂ්ක නම් යාගයෙන් අසුභ විපාකය වළකම්හ"යි කීකල්හි "එසේ වීනම් ප්‍රමාද නොකොට ඇතුන් සතරදෙනෙකු, අසුන් සතරදෙනෙකු, ඇලි ගොන් සතරදෙනෙකු, මිනිසුන් සතරදෙනෙකු යනාදී වශයෙන් කුරුල්ලන් දක්වා නොහැර සියළු ද්විපාද චතුෂ්පාද ප්‍රාණීන් සතරදෙනා බැගින් අල්වා ගෙන එව"යි අමාත්‍යයන්ට විධාන කළහ.

අමාත්‍යයෝ "යහපතැ"යි පිළිගෙන යථොක්ත වූ සියළු ප්‍රාණීන් හා අනිකුදු යාගයට ගතමනා සියළු උපකරණ සපයා යාගාවාට (යාග භූමියට) සමීපයෙහි සියළු ප්‍රාණීන් බැඳ සිටුවූහ. බමුණෝද "යාගය මූලිකව බොහෝ බාද්‍යාභොජ්‍ය (කෑයුතු බුදිය යුතු) හා වස්තු ලබම්හ"යි යන උත්සාහයෙන් "යාගයට මෙනම් මෙනම් දෑ උවමැනවැ"යි කියා ඔබමොබ

කුතුහලයෙන් ඇවිදිනාහුය. මල්ලිකාදේවී ඒ කෝලාහලය අසා රජ්ජුරුවන් කරා එළඹ "මහරජ්ජුරුවන් වහන්ස, බමුණෝ ඉතා මහත්ව බෙණෙමින් කුතුහලව කුමට ඇවිද්දැ"යි විචාරා එබසට රජ්ජුරුවෝ "දේවීනි, තොපට ඉන් ප්‍රයෝජන කිම්ද? තොපි තොපගේ ඓශ්වර්‍ය්‍යයෙන් මත්ව ඉඳුව දුක් ඇත්තේ අපටම වේදැ"යි කීකල්හි දෙවනුවත් "කීමෙක්ද? මහ රජ්ජුරුවන් වහන්සැ"යි විචාරා "දේවීනි, මම මෙබඳුව නෑසිය යුතු අනිෂ්ට (අශුභ) ශබ්දයන් ඇසීමි, ඒ කාරණය බමුණන් අතින් විචාළෙමි. බමුණෝ රාජ්‍යයට හෝ ඓශ්වර්‍ය්‍යයට හෝ ජීවිතයට හෝ අන්තරාය පෙණෙයි, සර්‍වචතුෂ්ක යාගයම කොට ඒ අන්තරාය වලකම්හයි කියා යාගයට සුදුසු උපකරණ සපයා මාගේ බසින් ඔබිමොබ ඇවිදිති" කීහ. "කීමෙක්ද? දේවයන් වහන්ස, මේ ශබ්දයන්ගේ නිෂ්පත්තිය දෙවියන් සහිත වූ තුන් ලොවට අග්‍ර පුරෝහිතයානන් වහන්සේගෙන් විචාළසේක්දැ?"යි කියා "දේවිනී, දෙවියන් සහිත වූ තුන්ලෝ වැසි අග්‍රපුරෝහිතයානෝ නම් කවුරුදැ?"යි විචාළෝය.

රජ්ජුරුවන්ට නැවත ඒ මල්ලිකාදේවී "දේවයන් වහන්ස, ඒ අග්‍රපුරෝහිතයෝ නම් අන් කෙනෙක් නොවෙයි, සියලු පදර්ථ (සියලු දේ) නිමවාදත් මහා ගෞතම සර්‍වඥයන් වහන්සේය. මේ මූඪ බමුණෝ කුමක් දනිද්ද? යුහුව (ඉක්මනින්) ගොස් බුදුන් විචාළ මැනවැ"යි කීකල්හි කෝසල රජ්ජුරුවෝ මල්ලිකාදේවීන්ගේ වචනය ගිවිස උදය මේ නිමවා සැපවූ රථයානාවකින් ජේතවන විහාරයට ගොස් බුදුන් වැඳ

එකත්පස්ව ආදර දක්වා සිට "මහරජ, කුමට ආයෙහිදැ"යි විචාළ කල්හි "තිලෝගුරු සර්‍වඥයන් වහන්ස, ඊයේ රාත්‍රියෙහි මම මෙබඳු ශබ්දයක් අසා උදෑසන බමුණන්ගෙන් විචාළෙමි. ඔහු රාජ්‍යයට හෝ ජීවිතයට හෝ සැපතට හෝ අන්තරාය වෙයි, සර්‍වචතුෂ්ක යාගය කොට අන්තරා වලක්කම්හයි කියා යාගස්ථානයෙහි කර්මාන්ත කෙරෙති. ඒ ශබ්දයන් සතර දෙනා ඇසීම කරණ කොටගෙන මට කවර උපද්‍රවයෙක් වේදැ?"යි විචාළහ.

එබසට ලොව එක මවෙක් වැනි මාගේ ස්වාමිදරුවූ බුදුහු අඬන පුත්‍රයක්හු ලෙහිලා සනසන්නාක් මෙන් "මහරජ, තට කිසි උපද්‍රවයෙක් නොවෙයි. නරකයෙහි උපන්නාවූ නිරිසත්හු දුක් අනුභව කෙරෙමින් ඒ ඉවසිය නොහී ශබ්ද පැවැත්වූහ. මහරජ මේ ශබ්දයෝ දැන් තා විසින්ම මතු අසන ලද්දේ නොවෙති. පුරාතනයෙහි රජදරුවන් විසිනුදු අසන ලද්දේමය. ඔහුද මෙපරිද්දෙන්ම බමුණන් විචාරා මෙසේම පශුඝාතක (සතුන් මරණ) යාග කරුණු කැමතිව යාගෝපකරණ සපයා ප්‍රාණීන් බන්ධනගත කරවූහ. එකල නුවනැත්තෝ ඒ ශබ්දයන්ගේ අභිප්‍රාය (අරමුණ) ප්‍රකාශකොට කීහ. භයට පැමිණියාවූ මහජනයා මුදා අරවා ලෝවැඩ කළෝ වේදැ"යි වදරා තුෂ්ණීම්භූතව වැඩහිඳ අතීත කථාශ්‍රවණයෙහි කෞතුහල (ඕනෑකමින්) සිත් ඇති කොසොල් රජ්ජුරුවන් විසින් ආරාධනා කළ කල්හි ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරන සමයෙහි සසර සැරිසරන්නාවූ බෝධිසත්වතෙම එසමයෙහි කසී රට එක්තරා බමුණු කුලයෙක්හි ඉපිද වැඩිවිය පැමිණ වේදත්‍රය (ඍග්, යජුර්, සාම, වේදයන්) නිමවා දැන පඤ්චකාමය හැර ගිහිගෙන් නික්ම ඍෂිප්‍රව්‍රජ්‍යාවට පැමිණ පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා ධ්‍යාන ක්‍රීඩා කෙරෙමින් හිමාලය වනයෙහි සිත්කළු වූ එක් වන ලැහැබෙක්හි වාසය කරන්නේය.

ඒ බ්‍රහ්මදත්ත රජතෙමේ එක් දවසක් රාත්‍රියෙහි නිරිසතුන් සතර දෙනෙකුගේ ශබ්දයන් අසා භයින් තැතිගෙන තා සේම රාත්‍රියෙහි නොනිදා හිඳ උදය බමුණන් විචාරා උන් විසින් මෙම රාත්‍රී විධානාත්තරයෙක් (වැඩ පිළිවෙලක්) වේවයි ඒ උපද්‍රවය මෙම යාගයෙන් සන්සිඳුවම්හයි, මෛත්‍රී ධ්‍යානයට සමවැද එයින් නැගී ලොව බලන්නේ බරණැස් රජතෙම එකල උපද්‍රවය නසම් අඥාන මූඪ වූ බමුණන්ගේ බස් ගෙන නොයෙක් ගණන් ප්‍රාණීන් නසා බොහෝ උපද්‍රව පමුණුවා ගන්ට උත්සාහ කරන්නෝය. “අද දවස මම එතනට ගොස් සත්වයන්ට පැමිණී මේ උපද්‍රවයද රජහට පැමිණී පරලොව උපද්‍රවයද වලකා ජනරඤ්චන (ජනයා සතුටු කරවන) සංග්‍රහ කරන්නට සුදුසුය”යි සිතා ඍධියෙන් අහසට පැන නැගී බරණැස් රජහුගේ උයනට බැස මගුල්සල්වට (ගල් තලාව) මත්තෙහි උන්නේය.

එසමයෙහි පුරෝහිත බ්‍රාහ්මණයාගේ ප්‍රධාන අතවැසි වූ එක් බමුණු කුමාරයෙක් ඔහු කරා එළඹ “ආචාරීන් වහන්ස, අපගේ වේදත්‍රයෙහි එකක්හු මරා අනිකක් හට සැප කිරීමෙකැයි යන දෙයක් නැත. වෙද විරෝධ වූ මෙවැන්නක් කුමට කරණ දෙයෙක්දැ”යි කියා පුරෝහිතයා විසින් “මෙයින් අපට බත් මාංස කන බොන දැ හා බොහෝ වස්තු ලැබෙයි. තෙපි ඒ නොවලකා නිකන් ඉඳුව”යි කී කල්හි “මම මේ පාපවිධානයට සහාය නොවමැ”යි සිතා විවේක කැමතිව උයනට ගොස් මඟුල්සල්වට මත්තෙහි උන් තාපසයන් දැක වැඳ කරණ ලද ප්‍රිය කථා ඇතිව එකත්පස්ව හිඳ තාපසයන් විසින් “කිමෙක්ද? සගය මෙනුවර රජ්ජුරුවෝ දැහැමෙන් රාජ්‍යය කෙරෙද්දැ”යි විචාළ කල්හි “ස්වාමීනි, රජ්ජුරුවෝ දැහැමින් රාජ්ජය කෙරෙති. එතකුදු උවත් රාත්‍රියෙහි ශබ්ද සතරක් අසා බමුණන් විචාරා උන් විසින් ඊට සර්‍වචතුෂ්ක යාගය සුදුසුයයි යනු අසා දහස් ගණන් ප්‍රාණීන් අල්වා බන්‍ධනගත කළෝය. ස්වාමීනි, නුඹවහන්සේ වැනි සිල්වත් තාපස ස්ථවිරයන් විසින් ඒ ශබ්දයන්ගේ නිෂ්පතති (හේතු) කියා ඒ සත්‍වයෝ මරණින් මුදන්ට නොවටිද්දැ”යි කීයේය.

තාපසයෝ “සගය, රජ්ජුරුවෝ අප නොහඳුනති. අපි රජ්ජුරුවන් නොහඳුනම්හ. ඉදින් රජ්ජුරුවෝ අප අතින් විචාළෝ නම් සැක නැති වනසේ ශබ්දයන්ගේ අර්ථ ප්‍රකාශ කොට කියම්හ”යි කීහ. ඉක්බිති ඒ බමුණු කුමාරතෙම “සාමීනි, එසේ වීනම් මදක් කල් ඉවත නොගොස් මෙහිම වැඩ උවමැනවයි මම රජ්ජුරුවන් වහන්සේ කැඳවා ගෙණ එමි”

කියා ගොස් "දේවයන් වහන්ස, උයනෙහි මෙවැනි තාපස කෙනෙක් ඇතැ"යි දන්වා රජ්ජුරුවන් කැඳවා ගෙන ආයේය.

රජ්ජුරුවෝත් මගුල්සල්වට මත්තෙහි ස්වර්ණප්‍රතිමාවක් (රන් පිළිමයක්) මෙන් තාපසයන් දැක එකත්පස්ව හිඳ තමා ඇසූ ශබ්දයන් පිළිවෙලින් කියා එහි අර්ථ කියන්ට යාචඤා කළහ. තාපසයෝ "මහරජ, මේ ශබ්ද පැවැත්වූ සතරදෙන පූර්වජන්මයෙහි ඔවුන් විසින් වස්ත්‍රාභරණ අන්නපාන මාලාගන්ධ විලේපනාදීන් මමත්වය කොට රක්‍ෂිත ගෝපිත වූ ස්ත්‍රීන් ඒ ඒ ස්ථානයෙන් ගෙන්ව ගෙන්වා බොහෝ කලක් මුළුල්ලෙහි පරදාර පාපය රැස් කෙරෙමින් අනිකුදු ප්‍රාණඝාතාදිවූ අනේකවිධ පාපයන් සිද්ධකොට ජීවිතාවසානයෙහි ලොහොකුඹු නරකයෙහි ඉපද කකියා (පැසී) ගිය ලෝදියෙහි පෙනනැගී පැසෙමින් තිස් දහසක් අවුරුද්දකින් මුවවිට පටන් යටතලයට පැමිණ නැවත තිස් දහසක් අවුරුද්දෙන් උඩුකුරුව පැසි අවුත් මුවවිටට පැමිණ පිටත බලා ගාථා සතරක් සම්පූර්ණ කොට කියනු කැමතිව අකුරු සතරක් කියා ඉතිරිය කියන්නට කල් මදව යට බලා කරකැවී එහිම ගිලී ගියාහ. ඔවුන් සතර දෙනා අතුරෙන් දුකාරය කියා ගැළුනු සත්වතෙම පූර්වජන්මයෙහි සියලු වස්තුවෙන් සම්පූර්ණව රාජ කුමාරව උපන්නාවූ දන වස්තු හා දන ක්‍ෂෙත්‍ර ඇති යම්කිසි වස්තුවක් පරලොව අදහා නුදුනම්හ. උපභෝග පරිභෝග වස්තු ඇතිවම පර ලොවට පිහිටක් නොකළම්හයි සියලු වස්තු පරදාරකර්මාදී අක්‍රියාවෙහි යොදා දුෂ්ට ජීවිකාවෙන් ජීවත් වුම්හයි කියනු කැමති විය. සකාරය කී සත්වතෙම "මේ

ලොහෝකුඹු නරකයෙහි පැසෙන්නාවූ අපට උඩුයටිව පැසී යාම් ඊම් දෙකින් එක්ව දැන් සැට දහසක් අවුරුදු හැමපරිද්දෙන් පිරී ගියේය. කවර කලෙක්හි කෙළවරක් වේදැ''යි කියනු කැමති විය. නකාරය කී සත්වතෙම "නිදුක්නි, මේ නරකයෙහි පැසී තව දක්වා කෙළවර නැත, කෙළවර අසවල් කලෙකැයි දක්නා කැමතිවූ අපට එවැනි කෙළවරෙක් නොපෙණෙයි. ඒ එසේමය. පූර්ව ජන්මයෙහි තොප හා අප විසින් කෙළවරක් නැතිවම පරදාරාදී වූ බොහෝ අකුසල් කරණ ලද්දේමය. එවැනි අපට කෙළවරෙක් කොයින් නම් වේද'' කියනු කැමති විය. සෝකාරය කී සත්වතෙම "ඉදින් මම මේ නරකයෙන් ගොඩ නැගී මනුෂ්‍ය ආත්මභාවයක් ලදින් නම් උදිතව (සතුටුව) සිටීම් සංඛ්‍යාත බුදු පසේබුදු සව්වන්ගේ ආශ්‍රව දැන දන්දෙන්නෙම් සරණසීලාදී සිල් රක්‍ෂා කෙරෙමින් බොහෝ කුසල් රැස් කරන්නෙම්වේදැ''යි කියා කැමති විය. යනාදීන් නිරිසතුන් සතර දෙනාගේ පූර්වකර්මය හා අක්‍ෂරයන් සතරදෙනා පටන්ගත් අභිප්‍රාය ප්‍රකාශ කොට කියා මහරජ, නරකයෙහි උපන් සත්වයෝ තමන් විඳිනා මහ දුකින් ශබ්ද පැවැත්වූහයි ඒ ශබ්දයන් කරණ කොට ගෙන තොපට කිසි අන්තරායක් නැත. තොප භය නොගනුව''යි රජ්ජුරුවන් ගිවිස්සූහ.

ඉක්බිති බරණැස් රජ්ජුරුවෝ බෝධිසත්වයන් වහන්සේගේ කථාව නැමැති අමෘතාභිෂෙකයෙන් (අමාදිය ඉසීමෙන්) මහත් අස්වස් ලැබ නුවර බෙරලවා බන්ධනගත සත්වයනට අභය දානය දී යාගශාලාදිය පිදහන කරවා ජනසංග්‍රහ කළාහ.

බෝධි සත්‍වයෝ ද ජනයාට හිතසැප එලවා කීප දවසක් උයන්හි වාසය කොට රජහට අවවාද දී පළමු විසූ හිමාලය වනයටම ගොස් වාසය කොට ආයු කෙළවර ධ්‍යානයෙන් නොපිරිහී බඹලොව උපන්නේය.

ලෝක ස්වාමී වූ බුදුරජානන්වහන්සේ මේ ධර්‍ම දේශනාව ගෙණ හැර දක්වා වදරා "එකල්හි පුරෝහිතයාගේ අතවැසි බමුණු කුමාරතෙම දැන් ශාරිපුත්‍රස්ථවිරයෝය. තාපසව උපන්නෙමි දැන් බුදුවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදරා මේ ජාතකය පූර්‍වපරසන්‍ධි ගලපා නිමවා වදාළ සේක.

## 306. මාංශ ජාතකය

තවද සර්‍වඥ (සියලු දතයුතු දේ) ගෙවා දත් අප බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සමයෙහි ඒ වෙහෙර සමහර කෙණෙකුන් වහන්සේ විරේකයට තෙල් මුසු බෙහෙදක් වැලඳූ හෙයින් මස් රස ආහාර පිණිස ගිලන් උපස්ථාන කරණ සබ්‍රම්සරුන්වහන්සේ (එකට වසන භික්‍ෂූන්) සැවැත් නුවරට වැද බත් වෙළෙඳ වීථියෙහි ගෙපිළිවලින් සිඟා ඇවිද කිසිවක් නොලදින් නැවත වෙහෙරට නික්මුනු සේක් ඉතා දහවල්ව පිඩුපිණිස සිඟාවඩනා සැරියුත් මහ තෙරුන් වහන්සේ විසින් අතුරු මග දැක "කීමෙක්ද? ඇවැත්නි, ඉතා උදසනම ආහරින් වැලක එව්දැ?"යි විචාරා එපවත් අසා "එසේ වී නම් මා හා එක්ව එව"යි එම වීථියටම කැඳවා ගෙන යන ලදුව උන්වහන්සේ දැක සතුටුව

උපාසකවරුන්ගෙන් පාත්‍රා පුරා බොහෝ මස් රස අහර ලැබ විහාරයට ගෙණ ගොස් ගිලන් භික්‍ෂූන්ට දුන් සේක.

උන් වහන්සේලා ඒ ආහාර වළඳා යපුනු කල්හි එක් දවසක් ධම්සභා මණ්ඩපයෙහි වටින් රැස්ව උන්නාවූ භික්‍ෂූන්වහන්සේ "ඇවැත්නි, ශාරිපුත්‍ර ස්ථවිරයෝ නම් දුටුවන් ප්‍රසන්න වන තරම් මහපින් ඇති සේක. විරේකයට බෙහෙත් වැලඳූ භික්‍ෂූන් උදෙසා මස්රස අහර ලබනුව බත් වෙළඳ වීථියට සිගා ගොස් කිසිවක් නොලැබ එන්නා වූ භික්‍ෂූන් කැඳවා ගෙණ ගොස් ඒ වීථියෙන් බොහෝ මස් රස භික්‍ෂාව ඇරදුන්නාහ"යි යනාදීන් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ භාග්‍යමහිමය ආදී ගුණ කථාව ඉපදදා වූ සේක.

ගඳ කිළියෙහි වැඩ උන් සර්‍වඥයන් වහන්සේ ඒ කථාව දිව්‍යකනින් අසා වදාරා ධම් සභා මණ්ඩපයට වැඩ පනවන ලද බුද්ධාසන මස්තකයෙහි වැඩ හිඳ බුද්ධ තේජසින් තැති ගෙන මුවෙන් නොබැනහුන් භික්‍ෂූන්ගේ දසාව (දෙස) බල බලා "මහණෙනි. මෙතැන්හි තෙපි කවර කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා "වෙන දෙයක් නොවෙයි සැරියුත් මහ තෙරුන් වහන්සේගේ එනම් ගුණ කථාවෙක අප කිය කියා උන්නේය"යි දැන්වූ කල්හි "මහණෙනි, දැන් මේ ශාරිපුත්‍ර ස්ථවිරයෝ දැන්මතු මාංශ භෝජයන ලද්දේ නොවෙති. පළමුත් ප්‍රිය කථාවෙහි දක්‍ෂ වූ නුවණැත්තෝ මස් අහර ලද්දේ වේදැ?"යි වදාරා තුෂ්ණීම්භූතව (නිහඬව) වැඩ ඉඳ ඒ

කථා ස්වරූප අසනු කැමති භික්ෂූන් විසින් කළාවූ යාඥාව අරභයා ඉකුත්වත් ගෙන හැර දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි අප මහබෝසතානන් වහන්සේ මෙම නුවර සිටු පුත්‍රව ඉපිද එක් වැදි පුත්‍රයෙකු මුව දඩයමට ගොස් බොහෝ මස් ලැබ ගැලක් පුරා ලැබ ගෙන වෙළඳමට නුවරට යන්ට නික්මුණු වේලෙහි ඒ නුවර අනික් සිටුපුත්‍රයන් තුන් දෙනෙකු හා එක්ව නුවරින් නික්ම මහවලට නුදුරුවූ එක් තෙනෙක්හි දුක්සැප කථා කෙරෙමින් උන්නේය.

ඉන් එක් සිටු පුත්‍රයෙක් මස් පිරුනු ගැල ගෙනෙන්නාවූ වැද්දා දැක "මේ වැද්දා ලවා මස් කඩක් ගෙන්වමිදැ"යි කියා ඉතිරි තුන් දෙන "යහපතැ"යි කී කල්හි ගැල කරා ගොස් "කොල වැද්දා, මට මස්කඩක් දෙවයි කීයේය. ඒ ඇසූ වැදි "අනුන් අතින් කිසිවත් ඉල්වන්නාවුන් විසින් ප්‍රිය කථා ඇතිවිය යුතුය. නුඹ එසේ නොව් පරුෂ වචනයෙන් ඉල්වූදැය. එවෙනි නුඹට නුඹ විසින් කීවාවූ වචනය මෙන් පරුෂරහිත වූ දළබුවම (හංකඩ) සුදුසුය. එය දෙමි" කියා පිට මාංශය හා කැපූ රොම සහිත වූ දළබුව දුන්නේය. ඒ දැක අන් සිටු පුත්‍ර තෙම "යහළු, තෝ කුමක් කියා ඉල්වා ගත්තෙහිදැ"යි විචාරා "කොල, වැද්දැයි කියා ඉල්වීමි" කී කල්හි "මමද මොහුගෙන් මස් ඉල්වීමි" කියා ගොස් "බෑනෙනි, මටද එක් මස්සක් දුන

මැනව''යි කීයේම එබසට වැදි ''මේ ලෝකයෙහි බෑනෙනි, මලනුවෙනි යනාදීන් කියන්නාවූ ප්‍රිය වචනය මනුෂ්‍යයන්ට අගවූ දෙයක, අගවු වචනය කී තොපට අගමාංසයම සුදුසුය''යි කියා මස්පිඩක් දුන්නේය.

ඒ දැක අනික් සිටු පුත්‍රතෙම ''යහළු, තෝ කුමක් කියා ඉල්වා ගනීදැ''යි විචාරා ''බෑනෙනි කියා ඉල්වමි'' කී කල්හි ''මමද වැද්ද අතින් මස් ඉල්වමි'' කියා ගොස් ''පියානෙනි, මට මස්සක් දෙව''යි කීයේය. එබසට වැදි ''ස්වාමීනි, මේ ලෝකයෙහි පියානෙනි කියන පුත්‍රතෙම පියාගේ ලය කමපා කෙරෙයි. එහෙයින් තොපගේ වචනය හෘදය මාංශයට සුදුසුය''යි කියා ඒ හා එක්ව මිහිරි මස් දුන්නේය.

ඒ දැක සතරවෙනිව බෝධිසත්වතෙම ''යහළුව, තෝ කුමක් නිසා මස් ලද්දැ''යි විචාරී ''පියානෙනි කියා ලදිමි''යි කී කල්හි ''මමත් ඉල්වමි''යි ගොස් ''මිත්‍රය, මටද මස් කඩක් දෙව''යි කියා ඉල්លූ කල්හි එබසට වැදි තෙම ''ස්වාමීනි, ලෝකයෙහි යමක්හු වසන ගම්හි මිත්‍රයෙක් නැත්නම් ඒ ගම ජනශූන්‍ය වනයක් වැන්න. නුඹ වහන්සේ කීයේ සියල්ලම ලැබ යුතු වචනයක එහි සතුටුව මම සියල්ලම දෙමි'' කියා ගැල හා සමඟ ගෙනා මස් සියල්ලම දී ගැල බෝසතානන්ගේ ගේ දෙරට ගෙන ගොස් පැමිණ වූයේය. බෝධිසත්වයෝ ද ගැලින් මස් බාවාගෙන ඉක්බිති ඕහට කළමනා සත්කාර උපකාර කොට ඔහුගේ අඹු දරුවනුත් ගෙන්වා ගෙන වැද්ද වැදි කමින් වලකා පින්කමෙහි යොද තමාගේ සම්පත් අතුරෙහි

ඔහුද ජීවත් වන ලෙසට "සමීපයෙහි වාසය කරව"යි ජීවිතාන්තය දක්වා මිත්‍රධර්‍මය රක්‍ෂා කොට වාසය කළේය.

ලෝකස්වාමී වූ සර්‍වඥයන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදරා "මහණෙනි, එකල්හි වැදි පුත්‍රව උපන්නේ දැන් මේ මාගේ ශාසනයෙහි ශාරිපුත්‍ර ස්ථවිරය, ගැල හා සමඟ සියළු මාන්සය ලද්දවූ සිටු පුත්‍රයා නම් දැන් බුදුවූ මම්මය"යි තමන් වහන්සේ ගෙනහැර දක්වා මේ ජාතකය පූර්‍වාපරසන්ධි ගලපා නිමවා වදාළ සේක.

# 307. සස ජාතකය

මෙම සැවැත් නුවර කෙළෙඹි පුත්‍රයෙක් බුදුපාමොක් මහ සංඝයා වහන්සේට සියළු පරිෂ්කාර සපයාලා තමන් දොර මාහැඟි මඩුවක් ලවා බුදු පාමොක් මහ සඞ්ඝයා වහන්සේ පවරා (ආරාධනා කොට) ගෙනවුත් මධ්‍යයේ උතුම් ආසන පනවා වඩා හිඳුවා නොයෙක් රසයෙන් යුක්ත භෝජනය වළඳවා "ස්වාමීනි, සෙටත් කරුණා කොට වදාළ මැනවැ"යි කියා මෙම ලෙසම සත් දවසක් පවරා දන් දී සත් දවසක් බුදුන් ප්‍රධාන කොට ඇති පන්සීයක් රහතුන් වහන්සේට පිරිකර දුන්නාය.

බුදුහු වළඳ අන්තයෙහි අනුමෙවෙනි බණ වදරණ සේක් "උපාසකය, තා සොම්නස් විය යුතුය. නුඹ විසින් මේ දන්දීම නම් පුරාතන පණ්ඩිතවරුන්ගේ වංසානුගත වෘත්තියක. එඹල පුරාතනයේ නුවනැති පණ්ඩිතවරු තමන් සමීපයට ආ

යාචකයන් හට ජීවිත පරිත්‍යාග කොට තමන් ඇගමස් දුන්නේය''යි වදාළ සේක.

ඒ සිටු පුත්‍රයා විසින් ''ස්වාමීනි, පෙර නුවනැත්තන් විසින් ඇගමස් දුන් නියාව අසනු කැමැත්තෙමි''යි ආරාධනා කළ කල්හි ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජක්හු රජ කරණ කල්හි බෝධිසත්ත්වයන් ද සස යෝනියෙහි ඉපිද වනයේ වසන සේක. ඔබ හිඳිනා වනයට එක් දිසාවක මහා පර්වතයෙක, එක් දිසාවෙක වනයෙක, එක් දිසාවෙක ගඟෙක සස පණ්ඩිතයන්ට සහාය තුන් දෙනෙක් ඇත්තාහ. ඔහු කවුරුයත්? වඳුරෙක, සිගාලයෙක, මස්කාවෙක, සසපණ්ඩිතයෝ යයි මොහු සතර දෙන එක්ව වසන්නාහු. තමන් ගොදුරු කන තැනින් ගොදුරු සොයාගෙන කා දස දවසින් දස දවස එක තැනකට පැමිණ මිහිරි කථා කරන්නාහු. ඔවුන්ට සස පණ්ඩිතයන් වහන්සේ අවවාද කරණ සේක. ''එම්බා සගය, දන් දෙව සිල් රකුව පෙහෙවස් වසවයි'' තුන්දෙනාට අවවාද වශයෙන් ධර්ම දේශනා කරන සේක. ඔහු තුන්දෙන ඔබගේ අවවාද පිළිගෙන තමන් හිඳිනා වනලැහැබට වැද සුවසේ හිඳිනාහ.

මෙසේ වසන කල එක් දවසක් බෝසතාණෝ ආකාශය බැළුවාහු පිරුණු සඳ දැක සෙට පොහොය දවස හෙයින් පොහාය දවසයයි නියම දැන අනිකුත් තුන් දෙනාට වදරණසේක් ''සෙට පොහොය දවසය, තෙපි තුන්දෙන සිල්

සමාදන්ව පෙහෙවස් ගනුවයි සිල්වත්ව සිට දුන් දනෙහි විපාක ඉතා මහත. එසේ හෙයින් තමා සමීපයට ආ යාචකයෙක් ඇත්නම් තෙපි අනුභව කරන දෙයින් ආහාරයක් දන් දීලව”යි වදාල සේක. ඔහු ගිවිස තමා හිඳිනා තැන ශතපී දෙවනදා උදැසනම මස්කාවානෝ ගොදුරු සොයා ගඟ ඔස්සේ ගියාහ. එවෙලේම එක් බිලී වැද්දෙක් රේමස් සත් දෙනෙකු බාගෙණ වැලක අමුනා ගෙන ගඟ වැලි පීරා යට ලාපියා වසා ගඟපාත බිලී බාන පිණිස පලා ගියේය. මස්කාවා මාංශ ගන්ධය ආඝ්‍රාණය කොට වැලි පීරා පියා මස් වැලක් ඇත, ඇරගෙන මේ මසුන් හිමි කෙනෙක් ඇරගත මැනවැයි තුන් විටක් අඬගා හිමි කෙනෙකුන් නොදැක අමුනාලූ වැල ඩැහැගෙනවුත් තමන් වසන තැන තබාලා වේලා ආකල කම් සිතා තමන්ගේ සීලය ආවර්ජ්ජනා කොට උන්නාහ.

සිවලානෝත් ගොදුරු සොයා ගියාහු. එක් ක්‍ෂෙත්‍රපාලයෙකුගේ (කුඹුරු රකින්නා) රැක වල පැල එල්වා තිබූ පලනු (පුලුස්සන ලද) කරවල ඇච්ච දෙකක්ද, ගොයකුද, එක් දීගෙඩියක් ද දැකලා මේ හැම හිමි කෙනෙක් ඇද්දැයි තුන් විටක් අඬගාලා හිමි කෙනෙකුන් නොදැක දී ගෙඩිය එල්වා තිබූ උගය කර එල්වා ගෙන කරවල හා ගොයා දතින් ඩැහැ ගෙන හිඳිනා වන ලැහැබ තබා වේලා ආකල කිම් සිතා සීලය සඳහන් කොට හුන්නේය. වඳුරානෝත් වනයේ ගොදුරු සොයා ඔහු මී අඹ කැනක් (පොකුරක්) ගෙනවිත් වේලා ආසන්න වූ කල කම් සිතා සිල් සඳහන් කොට හුන්නාහ.

බෝසතානෝ වේලා ආකල හීතණසුගක් කාපියම් සිතා තමන් වහන්සේ සීලය ආවර්ජ්ජනා කොට වැද හොත් සේක. නැවත සිතන සේක් ඉදින් අද මා සමීපයට යාචකයෙක් බඩසාගිනි කියා නම් උගට මා කන තණ කන්ට කියන්ටත් නොපිළිවන. හාල්, තෙල්, උඳු, මුන් ආදී කිසිවෙක් මාගේ නැත. ඉදින් මගේ සමීපයට යාචකයෙක් ආ නම් මාගේ ඇගමස් ඔහුට දන් දෙමි සිතූ සේක. ඔහුගේ සීල තේජසින් ශක්‍රයන්ගේ පාණ්ඩුකම්බල (පඬු ඇඹුල් අස්න) ශෛලාසනය හුනුවිය. ශක්‍රයෝ මේ කිමෙක්දෝ හෝ යි බැලුවාහු ඒ කාරණය දැක සස රජ්ජුරුවන් පරීක්‍ෂා කෙරෙමි සිතා අවුත් පළමු මස්කාවන් වසන තැනට ගොසින් සිටියාහ. මස්කාවන් විසින් "බමුණ, කුමක් නිසා ආයේදැ?"යි කීකල්හි "පණ්ඩිතයෙනි, යම්තම් ආහරයක් ලදින් නම් නුඹ වහන්සේ සේම මමත් පේවගෙණ (පෙහෙවස්) බ්‍රහ්මචාරියාව (බඹසර) රකිනෙමි වේදැ"යි කීහ.

"යහපත, මම තොපට ආහාරයක් දෙමි" කියා දන්වන්නාහු. "එම්බල බමුණ, අනුන් විසින් දියෙන් ඇරගෙණ ගොඩනගන ලද රේමසුන් සත් දෙනෙකු ලදිමි. ඒ මට ආහාරය පිණිස තුබුයේය. ඒ තොපට දෙමි. ඒ අනුභව කොට පෙහෙවස් රකිව"යි කීහ. ඒ අසා ශක්‍ර බ්‍රාහ්මණයෝ කියන්නාහු "උදෑසන වන්නාට පසුව කියා එන්නමේවේදැ"යි සිවලා සමීපයට ගියාහ. උන් විසිනුත් "බමුණු සිටියේ ඇයිදැ"යි කී කල්හි "පණ්ඩිතයෙනි, ආහාරයක් ලදින් නම් පේවගෙන මමත් බ්‍රහ්මචරියාව රකින්නෙමිවේදැ"යි කීහ. උයිත්

කියන්නුහු “එඹා මම වෙලා ආකල කම් සිතා කුඹුරක් රකිනා ගොවියෙකු පැල තුබූ පැලහු කරවල මසුන් දෙන්නෙකු හා මෙසේම පැලහු ගොයෙකු හා දිය ගෙඩියක් හා ගෙනවුත් තිබුයේය. ඒ දෙමි අනුභව කොට සිල් සමාදන්ව මේ ඉතා රම්‍ය වූ වනයෙහි සිත්වන් රුකක් මුල හිඳ බ්‍රහ්මචරියාව රකුව”යි කීහ. බමුණු කියන්නේ “තව උදසන උව, පසු එන්නෙමි වේදැ”යි වඳුරා සමීපයට ගියාහ.

උන් විසිනුත් “බමුණ, කුමක් පිණිස සිටියේදැ?”යි කී කල්හි එලෙසම “පණ්ඩිතයෙනි, ආහාරයක් ලදින් නම් මමත් පෙහෙවස් රකින්නෙමි වේදැ”යි කීහ. “එම්බල බමුණ මා ගෙනා මී අඹයෙක් ඉතා මධුර රස ඇත්තේය. තොපි රිසිසේ සමාධිව අනුභව කොට සිල් සමාදන්ව මේ රම්‍ය වූ වනයේ කැමති රුකක් මුල හිඳ මහණ දම් පුරව”යි කීහ. “තව උදසනය, පසුව එන්නෙමි වේදැ”යි කියා සස පණ්ඩිතයන් සමීපයට ගියේය.

උන් වහන්සේ විසින් “බමුණා සිටියේ නැ”යි කීකල්හි “පණ්ඩිතයෙනි, යම්තම් ආහාරයක් ලදින් නම් මමත් පෙහෙවස් වෙසෙන්නෙමි වේදැ”යි කීහ. ඒ අසා බෝධිසත්‍වයෝ මහ සොම්නසයට පැමිණ “බමුණා ආහර සොයා මා සමීපයට ආගමන ඉතා යහපත. අද මම පෙර මා විසින් නුදුන් විරූ දනක් තට දෙමි තොපි වනාහි පේවන තැනැත්තන් හෙයින් ප්‍රාණවධ (පණ නැසීම) නොකරන්නා වේද තොපි දරකඩ රැස්කොට ගිනි මොලවා අඟුරු බස්වා මට කියාලවයි, මම

මාගේ ආත්මදානය තට පමුණුවාලා අඟුරට පැන පියමි, මාගේ ශරීර මාංශය පැලහී ගිය කල මා අනුභවකොට පියා මහණදම් කරව"යි ඔහු හා කැටිව වදාරණ සේක්. "එම්බල, බමුණ තට දී ලන්ට මාගේ උඳු, මුන්, සාල්, තෙල් ආදී වූ කිසිවකුත් නැත. මා ගින්නේ පැලහී ගිය කල මාගේ මස් අනුභව කොට බ්‍රහ්මචරියාව රැක මේ වනයේ වසව"යි වදාල සේක. ශක්‍රයෝ ඔහුගේ බස් අසා තමන්ගේ ආනුභාවයෙන් අඟුරු රැසක් මවාලා බෝසතානන්ට ගිනිමොලවා "අඟුරු බස්වාලීමි"යි කීහ. උන් වහන්සේ සැතපී හිඳිනා හීතණ යහනින් නැගී සිට එතනට ගොසින් සිතන සේක්. "මාගේ ඇග කෙස් අතුරෙන් කිනිතුලන් ආදී යම් කිසි හීන් වූ සත්ව කෙනෙක් ඇත්නම් ඔහු නොමියෙත්ව"යි සිතා තුන් විටක් කිලිපොලාපියා තමන්දෑගේ සියළු ශරීරය දන මුඛයෙහි පැමිණෝවයි අධිෂ්ඨානකොටලා පියුම් ගැබකට පැන පියා සතුටුව හුන් රාජ හංසයකු මෙන් සතුටු සිත් ඇතිව අඟුරු මුදුනට පැනපුසේක. ඒ ගිනි වනාහි මහ බෝසතානන්ගේ ලෝමකූප (ලොම් පිහිටි තැන) මාත්‍රයකටවත් උණුසුම් පමණකටවත් ඌෂ්ණාකාරයක් කළ නුහුනුයේය. හිම ගර්භයකට (හිම ගුහාව) වන්නා සේ සියළු ශරීරය සිහිල් වූයේය. ඉක්බිති බමුණා කැඳවාලා "බමුණ, තාගේ ගිනි සිසිලය, මාගේ ශරීරයෙන් එකකෙසකුත් නුනුකොටපිය නුහුනුයේය, මේ කිමෙක්දැ"යි වදාළ සේක. "පණ්ඩිතයෙනි, මම බ්‍රාහ්මණයෙක් නොවෙමි, ශක්‍ර දේවේන්ද්‍රයායි දැන් නුඹ විමසන පිණිස ආමි" කීහ. මහ බෝසතානෝ වදාරණ සේක් "ශක්‍රයෙනි,

තෙපි සිටුව තොප තබා මේ සියළු ලෝකවාසීහු එක්වත් දන් දීමෙන් මා පරදවාලිය හෙන්නෝ නැත. යමක් මා නොදෙති යන්නක් කවරකෙනෙක් කියද්දැ?"යි මහ බෝසතානෝ සිහනාද කළහ.

ඉක්බිති ශක්‍රදේවේන්ද්‍රයෝ සස පණ්ඩිතයන් වහන්සේ තිරිසන්ව කළාවූ අරුමය මේ භද්‍රකල්පය මුළුල්ලෙහි සියළු සත්‍වයන්ට ප්‍රකාශව පෙනෙනු මැනවැයි අංජනකූට පර්‍වතය තමන් ආනුභාවයෙන් මිරිකාපියා රස ඇරගෙන චන්ද්‍රමණ්ඩලයෙහි සස රූපය හැඳ බෝධිසත්‍වයන් වඩා ගෙනවුත් ඒ වන ලැහැබ අළුත් හීතණ ඇතිරිපිට වඩා හිඳුවාලා තමන්ගේ දිව්‍ය ලෝකයට ගියාහ. ඒ පණ්ඩිතවරු සතරදෙන සමඟ එක්සිත්ව අටසිල් පන්සිල් නොකඩ කොට රැක කම්වූ පරිද්දෙන් ස්වර්ගස්ථ වූහ.

බුදුරජානන් වහන්සේ මේ ජාතකය ගෙන හැර දක්වා වදුරා චතුරාර්ය සත්‍යයන් ප්‍රකාශ කොට ජාතකය නිමවා වදාල සේක. ධර්‍ම දේශනාවගේ කෙළවර සියළු පිරිකර දුන් සිටු පුත්‍රයා සෝවාන් ඵලයෙහි පිහිටියේය.

" එම්බා මහණෙනි, එසමයෙහි මස් කාවා නම් දැන් ආනන්දස්ථවිරයෝය. එසමයෙහි සිඟාලයා නම් දැන් මෞද්ගල්‍යානස්ථවිරයෝය. එසමයෙහි වඳුරා නම් දැන් ශාරිපුත්‍රස්ථවිරයෝය. සස පණ්ඩිතයෝ නම් බුදුවූ මම්ම වේදැ"යි වදාළ සේක.

# 308. ඒකරාජ ජාතකය

තවද හුදුනිවන් මවාලූ රුවක් වැනිවූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කොසොල් රජ්ජුරුවන්ගේ අමාත්‍යයෙකු අරභයා මේ ජාතකය දක්වන ලදහ. මෙහි වර්තමාන කථාව සෙය්‍යංස ජාතකයෙහි විස්තර වශයෙන් කියන ලදී.

මෙහි යටගිය දවස බරණැස් නුවර එක් රජ්ජුරු කෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි එක් අමාත්‍යයකු ඒ රජ්ජුරුවන් වහන්සේගේ අන්තඃපුරයට වැදී කළ කථාව මහා සීලව ජාතකයෙහි ආයේය.

මෙහි කොසොල් රජ්ජුරුවෝද දබ්බමල්ල නම් රජ්ජුරු කෙනෙකුන්ගේ අනතඃපුරයට වැදී අමාත්‍යයාගේ කියමනින් බරණැස් නුවරට අවුත් ඒකරාජ රජ්ජුරුවන් වහන්සේ අල්වා ඉස්බිම බලා කකුල් උඩිලිය එල්වා (කකුල් උඩ අතට දමා එල්වා) දබ්බමල්ල රජ්ජුරුවෝ මතුමහල්තලයට පැන නැගී පලක් බැඳ හුන්නාහ. මතුමහල්තලයෙහි උන් දබ්බමල්ල රජ්ජුරුවන්ගේ සකල ශරීරයෙහි දහ අල්වාගෙන (මුළු ඇඟ පුරා දහඩිය දමා) ඉවසියනොහී බිම පෙරලී බොහෝ ආයාසයෙන් අමාත්‍ය ගණයා කැඳවා විචාරන්නාහු “එඹල අමාත්‍යයෙනි, මාගේ ශරීරය දහ අල්වා ගෙණ බොහෝ වේදනාවෙන් පීඩිත වීමි, කුමන කාරණයක් පිණිස දැ?”යි විචාළහ.

රජ්ජුරුවන්ට අමාත්‍යයෝ කියන්නාහු “නිරපරාධ දැහැමෙන් රාජ්ජය අනුභව කරන්නා වූ එකරාජ රජ්ජුරුවන්ට කළ ගහටයෙනැයි (කළාවූ හිරිහැර නිසා) නුඹ වහන්සේට දුහ පැමිණියෙ”යි කීකල්හි එබස් ඇසූ රජ්ජුරුවෝ “ඔහු උනව”යි කී බසින් ගිය අමාත්‍යයෝ එකරාජ රජ්ජුරුවන් ධ්‍යාන සැපයෙන් ආකාශයෙහි පලස් බැඳ උන්නා දැක ගොස් රජ්ජුරුවන් කීබස් අස්මින් වහා නැගීසිට අවුත් රජ්ජුරුවන් වහන්සේ වැඳ එකත්පස්ව සිට කියන්නාහු “එකරාජ රජ්ජුරුවන් වහන්ස, නුඹ වහන්සේ එක්ව වැස සැප අනුභව කොට සුඛුමාලව (මහත් සුවසේ) රාජ්‍යය කළ නුඹ වහන්සේ මේසා ආයාසයකට (මෙතරම් දුක් කරදරයකට) පැමිණත් නුඹ වහන්සේගේ ධෛය්‍ය්‍යීමත් පියුමක් බඳුවූ මුඛ සෝභාවත් ශරීර වර්‍ණයත් මදකුත් නොමිරිකීම සමාධි සිතකින් ඉඳිනේ කුමන කාරණයකින්දැ?”යි විචාළ සේක.

එවිට එකරාජ රජ්ජුරුවන් වහන්සේ දබ්බමල්ල රජ්ජුරුවන් වහන්සේට කියන සේක්. “මා විසින් පළමුව භාවනා නමස්කාර කිරීමෙන් ද, පඤ්චාභිඥා අෂ්ට සමාපත්ති උපදවා ධ්‍යාන සැපයෙන් පලක් බැඳ ඉඳිමනම් මාගේ මුඛ සොභාවද (මුඛයෙහි ස්වභාවය) ශරීර වර්‍ණයද කුමක් පිණිස මිරිකේද්දැ”යි කීහ.

එපවත් දබ්බමල්ල රජ්ජුරුවෝ අසා එකරාජ රජ්ජුරුවන් වැඳ ක්‍ෂමා කරවාගෙන කියන්නාහු “මහ රජ්ජුරුවන් වහන්ස, නුඹ වහන්සේගේ රාජ්‍යය පාවාගත මැනවැ”යි රාජ්‍යය පාවාදී

ද්‍රෝහිකම් කළ අමාත්‍යයාට ආඥා කරවා (දඬුවම් කිරීමට නියම කොට) "නුඹට සතුරන්ගෙන් භයක් පැමිණියේ නම් මට භාරය"යි කියා රාජ්‍යයට පලා ගියහ.

එකරාජ රජ්ජුරුවන් වහන්සේත් රාජ්‍යය අමාත්‍යගනයාට පාවාදී තපස් රක්‍ෂා කරන පිණිස වනයට ගොස් රක්‍ෂා කළ සේක් වේ දැයි මේ ජාතකය නිමවා වදාළ සේක.

"එසමයෙහි දබ්බමල්ල රජ්ජුරුවෝ නම් මෙසමයෙහි ආනන්දස්ථවිරයෝය, එකරාජ රජව උපන්නෙම් බුදුවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

## 309. දද්දර ජාතකය

තවද හුදුනිවන් මවාලූ රුවක් වැනි වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක්තරා කෝපී වූ භික්‍ෂු කෙනෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

වර්තමාන කථාව යට කියන ලද බොහෝ ජාතක වල දක්වන ලද, මෙහි වනාහි ඒ කෝපී භික්‍ෂූන් වහන්සේ කැඳවා ගෙන ධම් සභා මණ්ඩපයෙහි වැඩ උන් සර්‍වඥයන් වහන්සේට දැක්වූ කල්හි සර්‍වඥයන් වහන්සේ වදාරණසේක් "එම්බා මහණෙනි, මේ භික්‍ෂූහු නොකීකරු වූයේ දැන් මතු නොවෙයි පෙරත් දිව්‍ය නාගව ඉපිද තමා නොකීකරු හෙයින් දඬුවම් පිණිස කසල ගොඩක් මත්තෙහි තුන් අවුරුද්දක් වාසය කළාවේදැ"යි වදාරා "ඒ කෙසේදැයි" ආරාධිත වූ බුදුරජානන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි දද්දර නම් නාග භවනයෙහි සුරදද්දර නම් නාරජෙකුට පුත්‍රව මහාදද්රයෝයයි චූලදද්දරයෝයයි නාරජහු දෙදෙනෙක් උපන්නාහ.

ඉන් චූලදද්දර නම් නාරජ්ජුරුවෝ නාමෙනෙවියන් මරා තලා බොහෝ වේදනා කෙරෙති. පිය නාරජ්ජුරුවෝ ඒ අසා චූලදද්දරයන් මාගේ නාග භවනයේ වසන්ට බැරියයි වහා නික්මුනු මැනවැයි කියා එබස් අසා මහාදද්දර නාරජ්ජුරුවෝ කියන්නාහු "පියානන් වහන්ස, මාගේ මලනුවන් කළ වැරදි ඉවසා වදාල මැනවැ"යි කියා රැඳවූහ.

දෙවන වාරයෙහිත් නාග භවනයෙන් යන්ට කී කල්හි මහාදද්දරයන්ගේ යාඥවට රැඳවූහ. තුන්වන වාරයෙත් චූලදද්දර නාරජ්ජුරුවන්ට නාග භවනයෙන් යන්ට කී කල්හි මහාදද්දර නාරජ්ජුරුවෝ පියානන්ට කියන්නාහු "පියානන් වහන්ස, මාගේ මලණුවන් චූලදද්දරයන් මේ මුරයත් (වාරය) රඳවා වදාළ මැනවැ"යි කන්නලව් කී කල්හි සුරදද්දර නා රජ්ජුරුවෝ කියන්නාහු "දෙවරයෙක තොප කී කන්නලව්වට රැඳවූම්හ. තුන් වෙනි වාරයේත් රඳවන්ට බැරිය, තොප කළ වැරැද්දට පාටව පිණිස තුන් අවුරුද්දක් කසල කොඩක විසුව මැනවැ"යි කියා යවූහ.

ඔහු දෙදෙන එපරිද්දෙන්ම ගොස් මහත් වූ කසලක් මුදුනේ වසන්නාහ. ඒ නා රජ දෙන්නා ගොදුරු පිණිස නොයෙක් තැන ඇවිදිනවා කුඩා කොල්ලෝ දැක කියන්නාහු

“මහත් වූ හිසක් සිහින් වූ වාලගයක් ඇති ගැරඬියන් දියබරණුමෙන් හිස ඇත්තා වූ මේ සර්පයන් දෙන්නා මරම්හ”යි කැට මුගුරු ඇරගෙන ගසමින් ඇවිදිනාහ. මෙපවත් ඉවසා ගත නොහී චූලදද්දර නා රජ්ජුරුවෝ බෑනන්ට කියන්නාහු “බෑනන් වහන්ස, අපි දෙන්නම මහත්වූ විෂ තේජස් ඇති නාරජ්ජුරුවම්හ. අපගේ විවර නොදැන මේ කොල්ලෝ කැට මුගුරුත් ගසා අපහස නපුරුත් බැන නිස්සාරව ඇවිදිනාහු. මෝට මම මහත් වූ විෂ ධූම ඇරමෝදැ”යි බෑනන් අතින් විචාළ කල්හි මහාදද්දර නාරජ්ජුරුවෝ “එම්බා මලනුවෙනි, අපගේ පිය රජ්ජුරුවන් වහන්සේ අතින් තොප අසා ගෙන දුක විඳින පිණිස මෙතනට ආම්හ. අපගේ විවරත් කවුරුන් බවත් මේ කොල්ලෝ නොදන්නාහ. එසේ හෙයින් මොවු කෙරේ කෝපි නොව”යි අවවාද කියා ඒ කසල ගොඩ තුන් අවුරුද්දක් විසූ කල්හි පියනාරජ්ජුරුවෝ තමන් පුත්වූ දරුවන් දෙදෙනා තමන්ගේ නාගභවනයට ගෙන්වා ගෙන චූලදද්දරයන්ගේ අභිමානය බිඳ දෙබෑයෝම ස්වස්ථයෙන් (සුවසේ) වාසය කළාහයි මේ ‘දද්දර ජාතකය’ නිමවා වදාළ සේක.

“එසමයෙහි චූලදද්දරයෝ නම් ඒ කෝපී භික්ෂූහුමය, මහාදද්දරයෝ නම් බුදුවූ මම්මවේදැ”යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 310. මතරොදන ජාතකය

තවද අසරණ සරණ වූ අප බුදුහු දෙව්රම් වෙහෙර වැඩවසන සේක් එක්තරා කෙළෙඹි පුත්‍රයෙකු අරභයා මේ ජාතකය වදාළ සේක.

සැවැත් නුවර වැසි එක් කෙළෙඹි පුත්‍රයෙක් තමාගේ බෑයා මළ කල්හි ශෝකයෙන් ආහර වර්ජිත කොට ස්නාන විභූසන (සැරසීම) මාලාගන්ධ විලේපනාදිය (ගැල්වීම) නොකෙරෙයි, රූක්‍ෂවූ (කටුක) ශරීර ඇතිව සවස උදෑසන බෑයා දැවුතැන සොහොනට ගොස් අඬයි. එක් දවසක් බුදුහු අළුයම් වේලෙහි මහා කරුණා සමාප්තතියට සම වැද එයින් නැගී "මාර්ග ඵල ලැබීමට හේතු සම්පත් ඇති වෛනෙයජනයෝ (හික්මවිය හැකි) කවුරුදැ?"යි ලොව බලා වදාරණසේක්. කෙළෙඹි පුත්‍රයාගේ සෝවාන් ඵලයට සුදුසු බලවත් හේතු සම්පත ඇති බව දැක දෙවෙනි දවස් පස්වරු වේලෙහි එක් භික්‍ෂු කෙනෙකුන් වහන්සේ පසු මහණ කොට ගෙන ඔහු කෙරෙහි පැවති අනුග්‍රහයෙන් ගේ දෙරට වැඩි සේක.

ඉක්බිති ඒ කෙළෙඹි පුත්රතෙම බුදුහු වැඩිසේකැයි යනු අසා පෙරමගට අවුත් මහත් ආදරයෙන් බුදුන් තමාගේ ගෙට වඩාගෙන ගොස් මාහැඟි වූ බුද්ධාසනයක් පනවා එහි වැඩ උන් කල්හි වැඳ එකත් පස්ව උන්නේය. එවිට බුදුහු "කිමෙක්ද? කෙළෙඹිය ශෝකයක් ඇද්දැ?"යි විචාරා වදාළ සේක. එකල්හි කෙළෙඹි පුත්‍ර තෙම "එසේය ස්වාමීනි, මාගේ බෑයන් වහන්සේ මළ තැන් පටන් බොහෝ ශෝක ඇත්තෙමි"

දැන්වූයේ බුදුහු "සියලු සංස්කාරයෝම අනිත්‍ය නොවෙද්ද? ඒකාන්තයෙන් මේ ශරීරය නම් ජරාවෙන් මිරිකී ව්‍යාධියෙන් පීඩිතව මරණින් භේදයට (බිඳීම) පැමිණෙති. එබඳු ස්වභාව ඇත්තේය. මේ ලෝකයෙහි උපන්නාවූ සත්‍වයන් සංස්කාරයන් අතුරෙහි නිත්‍යව නොනැසී පවත්නා එකකුදු නැත්තේය. එහි නුවණැත්තවුන් විසින් කවර ශෝක කිරීමක්ද? පෙර නුවණැති පණ්ඩිත ජනයෝ තමන්ගේ බෑයෙක් මළ කල්හි බිඳෙන සුළු දෙය බිඳුනේය. නස්නා සුළු දෙය නැසුනේයයි සංස්කාරයන්ගේ අනිත්‍ය ස්වභාවය සලකා ශෝක නොකළෝවේදැ"යි වදාරා තුෂ්නිම්භූතව වැඩ හිඳ ඒ කථාව අසනු කැමැති කෙළෙඹි පුත්‍රයා විසින් ආරාධිත වූ සේක් අතීත කථා වස්තු ගෙණ හැර දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි අප මහා බෝධිසත්‍ව තෙම එම නුවර අසූ කෙළක් ධන ඇති සිටු කුලයක ඉපිද දෙමවුපියන්ගේ ඇවෑමෙන් සිටු තනතුරට පැමිණ බෑයන් නිසා ජීවත් වන්නේය. මෑත භාගයෙහි බෝධි සත්‍වයන්ගේ බෑවූ ඒ සිටානෝ කාල ක්‍රියා කළහ. ඤාති මිත්‍රාදීහු බොහෝ දෙන මහ හඬින් බැගෑපත්ව විලාප කියති. එතැන්හි රැස්වූ එකද සත්‍ව කෙනෙකුදු සොම්නසට නොපැමිණ ස්වභාවෙන් සිටිනට සමර්ථයෙක් නොවිය. බෝසතානෝ පමණක් නොහඬති. විලාප නොකියති. මුඛවිකාර (මුහුණෙන් දක්වන)

පනෙකුදු නොදැක්වූහ. ඒ දැක සෙසු ජනයෝ "මේ පුරුෂයාගේ කාය්‍යීදැන්මක් බලව, මේතෙම ඉතා තද රෞද්‍ර එකෙක, තමාගේ බෑයාගේ ධන කොටස් දෙකම එක් කොට අනුභව කරමියි යන සිතින් බෑයාගේ මරණ කැමති වූයේවනු"යි යනාදී බෝසතානන්ට නින්ද කරන්ට පටන් ගත්හ. අතවැස්ස බන්ධුහුද එසේම නින්ද කළහ. අවවාද කළහ.

එකල්හි බෝධිසත්ව තෙම "එඹා තෙපි හැම දෙනම තොපගේ අඥාන (මෝඩ) ස්වභාවෙන් ලාභය, අලාභය, අයසය, යසය, සැපය, දුකය යන අෂ්ටලෝකධර්‍මය සියළු සත්වයන්ට නියත බව නොදනිති. මාගේ බෑයා මළේය. ඔහු මළාය යනාදී අඬා විලාප කියව. මම ඒකාන්තයෙන් මියන්නෙම්මය. තෙපි සියල්ලෝමද එසේම මියන්නාහ. ඉඳින් අඬතොත් තමා හට පැමිණෙන්නාවූ මරණ සලකා අඬන බව මිස අනුන්ගේ මරණ උදෙසා ඇඬුමට කාරණයෙක් නැත. හේතුවෙන් උපදනා සියලු සංස්කාරයෝම නැතිවෙති. පළමු ස්වරූපයෙන් පවත්නේ නොවෙති. තෙපි හැම දෙනම මේ බව හා යථෝක්ත අෂ්ටවිධ (අටවැදෑරුම්) ලෝක ධර්‍මය ස්වාභාවය නොදැන අඬතුදු ඒ සියල්ල දත්තා වූ මම කුමට අඬම්දැ?"යි කියා නැවත ඒ ජනයන් හට "ඇවැත්නි, තෙපි සියල්ලෝ මළ එකෙක් හට හැඬීම් වැලපීම් කෙරෙති, මියන්නාක් බලා නොකෙරෙති. මේ ලෝකයෙහි සියලු සත්වයෝම ඔවුනොවුන් පසු පස්සෙහි පිළිවෙලින් මරණට පැමිණෙති. නොමියෙන එක සත්වයෙකුදු නැත. තවද මේ ලෝකයෙහි අධිකතර දිව්‍ය සම්පත්තියෙහි පිහිටි ශක්‍ර බ්‍රහ්මාදී

දෙවියෝද එසේම මනුෂ්‍ය ලෝකයෙහි අධික වූ ආධිපත්‍යයට පැමිණි චක්‍රවර්ති ප්‍රාදේශික මඬලිකා දී වූ රජ දරුවන් ආදී කොට ඇති සියලු මනුෂ්‍යයෝද බලසම්පන්න සිංහ ව්‍යාඝ්‍ර හස්ති අශ්වාදී අනේකවිධ චතුෂ්පද (සිව්පා) ජාතීහුද මහානුභාවසම්පන්න ගරුඩ (ගුරුළා) රාජයන් ආදී වූ අනේකවිධ පක්ෂීහුද උග්‍රවූ විෂ තේජස් හා මහත් දිව්‍යානුභාව ඇති වාසුකී මහාකාලාදී සර්ප රාජයෝද යනාදී වූ අපාද (පා නැති) දිපාද චතුෂ්පාදදී වූ සියලු සත්‍වයෝම තමතමන් ශරීරයෙහිම ඉසුරුනුවූවාහු දිව්‍ය මනුෂ්‍යලෝකාදී තම තමන් උපන් ස්ථානයෙහි ද ශරීර ධන ජීවිතයෙහි ද සිත් ඇලවාම පරිත්‍යාග කරණ බව මුත් එහි ආලය හැර මියන්නෝ නොවෙති. මේ යථෝක්ත ප්‍රකාරයෙන් කාම භවය රූප භවය අරූපභවය යන තුන් ලෝවැසි සත්‍වයන්ට පැමිණියාවූ සුවදුක් දෙකම නිරන්තරයෙන්ම ඒකාකාරව නොපැවත සැපයට අනතුරුව දුකය දුකට අනතුරුව සැපයයි යන මේ දෙක ක්‍රමයෙන් පෙරලී චක්‍රාකෘතිව (චකුටුව්) පවත්නා හෙයින්ම චංචල වන්නේයයි දැක අෂ්ටලෝක ධර්මය දක්නා වූ නුවනැත්තවුන්ට හැඬීම් වැලපීම් නිෂ්ප්‍රයෝජනව වැටහෙන්නේය. තෙපි මේ මහත්වූ සොක නැමති පර්වතයෙන් මිරිකී කවර කාරණයකින් දුක් අනුභව කරව්ද? තවද යම් කෙනෙක් ස්ත්‍රීධූර්ත (ගැහැණුන් කෙරෙහි ඇලුණු) සුරාධූර්ත (සුරාවෙහි ඇලුණු) වෙද්ද, දූ කෙළි ආදියෙහි ලෝල වෙද්ද, අනිත්‍යාදී වශයෙන් පැවතීමයයි කියන ලද යොනිසො මනසිකාරයෙහි යෙදීමක් නැත්තාහුද, කෙලෙස් නැමති සතුරන් ජය ගැම්මෙහි

සෞරව්‍ය්‍යී (දක්‍ෂ) නැතිවෙද්ද, ධර්මාධර්‍ම විභාග කල්පනාවකුදු නැතිව ආස්වාස මාත්‍රයෙකින් ජීවත්වෙද්ද යන මේ ධර්‍මයෙහි අදක්‍ෂ වූ ආඥාන බාල ජනයෝ තමන්ගේ අඥාන මූඪවූ (මුළාවූ) බව හේතු කොට ගෙන ඤාති ව්‍යසනාදිය (විනාශය) පැමිණි කල්හි අඬමින් අනේකප්‍රකාර විලාප කියමින් ධර්‍මය දැන ඤාති මිත්‍රාදීන්ගේ මරණයෙහි අඬිම් වැලපීම් නොකරන්නාවූ නුවනැත්තවුන්ට කිසිවක් නොදන්නා අඥානයෝයයි අපහාස කෙරෙති”යි යනාදීන් කුසල් අකුසල් හා අෂ්ටලෝක ධර්‍මය විභාග කරණයෙන් ධර්‍ම දේශනා කොට සෝක දුරු කෙළේය.

බුදුහු මේ අතීත වස්තුව ගෙණහැර දක්වා වදාරා චතුස්සත්‍යය ප්‍රකාශ කොට කෙළෙඹි පුත්‍රයා සෝවාන් ඵලයට පමුණුවා “එකල්හි අඬන්නා වූ මහජනයා ධර්‍මකථාවෙන් නිස්සෝක කළාවූ සිටු පුත්‍රයා නම් මම්ම වේදැ”යි තමන් වහන්සේ ගෙන හැර දක්වා මේ ‘මතරොදන ජාතකය’ පූර්‍වපරසන්ධි ගලපා නිමවා වදාළ සේක.

## 311. කනවෙර ජාතකය

තවද ලෝකස්වාමී වූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ සැවැත් නුවර ගම්කොට ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් පුරාණ දුතියක් (පැරණි පෙම්වතියක්) විසින් පොලඹන ලදුව සස්නෙහි උකටලී (කලකිරුණ) එක් භික්‍ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළ සේක.

මෙහි වර්තමාන කථාව අටඨක (අටවන) නිපාතයෙහි ඉන්ද්‍රිය ජාතකයෙහි කී පරිද්දෙන්ම දත යුත්තේය. බුදුහු ඒ භික්‍ෂු හට "එම්බල මහණ, තෝ පළමුත් මේ ස්ත්‍රිය නිසා කඩුවෙන් ඉස් කැපීමට පැමිණියේ වේදැ"යි වදරා එපවත් අසා නුවණැති භික්‍ෂූන්වහන්සේ විසින් යාඥාකොට (අයැද සිට) දැන්වූ කල්හි ඉකුත්වත් (අතීත) කථාව ගෙණ හැර දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි අප මහ බෝසතනානන් වහන්සේ කසී රට එක්තරා ගමෙක්හි එක් සිටාන කෙනෙකුන්ගේ ගෙයි පිළිසිඳ සොර නැකතකින් (බෙරණ නැකත) බිහිව වැඩී විය පැමිණ ශෞරවීය්‍යී (සූර වීර) හා ඇත් පොව්වකුට බඳු වූ බල ඇති ලෝක ප්‍රසිද්ධ සොරකම් කොට ජීවත් වනසේක. කිසි කෙනෙකුන් අල්වා ගත නොහෙති. එක් දවසක් සිටාන කෙනෙකුන්ගේ ගෙට උමං බිඳ වැද බොහෝ වස්තු අරගත් කල්හි දෙවෙනි දවස නුවර වැස්සෝ රජ්ජුරුවන් කරා එළඹ කියන්නා වූ "දේවයන් වහන්ස, එක් මහ සොරෙක් නුවර බොහෝ සොරකම් කොට ඇවිදිනේය. ඔහු ඇල්ලුව මැනවැ"යි කීහ.

රජ්ජුරුවෝද ඔහු අල්වන්ට නුවර රැකවලෙහි නියුක්ත පුරුෂයාට නියෝග කළහ. ඒ පුරුෂතෙම රාත්‍රියෙහි රැකවලුන් ඒ ඒ තැන්හී මුළු මුළුවකොට (කණ්ඩායම් වශයෙන්) සිටුවා

බඩු හා එක්ව සොරු අල්වා ගෙන රජ්ජුරුවන්ට දැන්වූයේය. එකල්හි රජ්ජුරුවෝ සොරුන්ගේ ඉස සිඳින්ට ඒ පුරුෂයාට නියෝග කෙළේය. ඒ පුරපාල පුරුෂ තෙම සොරු පිටිතල හයා බැඳ (අත් දෙක පිටුපසට තබා බැඳ) රත් කණේරු මල්දම් කරලා උළුසුණු (උළු කුඩු) ඉසට ගසා වීථිසන්ධියක් පාසා සැමිටියෙන් (කසයෙන්) පහර දෙමින් කර්කශවූ (රළු වූ) අඬ ඇතිව වද බෙරගස්වමින් සොරුන් මරණ තැනට ගෙනයන්ට වන්නේය. මේ නුවර වොලෝගෙන (කළඹමින්, ඝෝෂාකරමින්) ඇවිදින සොරතෙම අල්වන ලද්දේයයි මුලුනුවර එක කෝලාහල විය.

එසමයෙහි ඒ නුවර දවස දහසක් ලබන්නා වූ පන්සියයක් වෛශ්‍යා පිරිවර ඇති සාමා නම් වූ රාජ වල්ලභ වූ වෛශ්‍යාවක් (වෙසඟන) ඇත. ඕ තොමෝ එදවස්ද තමා වාසය කරණ ප්‍රාසාදයාගේ මතුමාලේ සිව්මැදුරු කවුළුව හැර වීථිය බලන්නී උතුම් වූ රූප සොභාවෙන් අග්‍රප්‍රාප්තවූ (අගතැන්පත්ව) දුටුවන් ප්‍රසාදවහවූ (පහදවන, ප්‍රියමනාපවූ) සියල්ලන්ගේ මත්තෙන් පෙනෙන්නාවූ සොරහු දැක පිළිබඳ සිත් ඇතිව මේ උතුම් වූ රූප ශ්‍රී ඇති පුරුෂයා කවර උපායකින් තමාට වල්ලභ කර ගනිම්දෝහෝයි සුදුසු උපායක් සොයන්නී තමහට වැඩ හැසිරෙන්නාවූ එක් ස්ත්‍රියක් අතට දහසක් දී මේ සොරතෙම සාමාවගේ මලනුවෝය, සාමාවන් හැර සොරුට පිටිවහලෙක් (උදව්කාරයෙක්) නැත. නුඹ වහන්සේ මේ දහස ගෙන මේ පුරුෂයා සාමාවන්ට දුන මැනවැයි කියා යන ලෙස් උගන්වා ගමන් කරවූවාය.

ඒ ස්ත්‍රී දහස ගෙන ගොස් ඒ පුරුෂයාහට දී එපරිද්දෙන් කීවාය. එකල්හි ඒ පුරපාලක පුරුෂ තෙම කියන්නේ "මේ සොරතෙම ප්‍රසිද්ධ වූ එකෙක. එසේ හළ නොහැක්ක. අන් පුරුෂයෙකු වධයට ලද හොත් පිළිසන් යානාවෙක (වැසුනු යහනක) හිඳුවා එවන්ට පිළිවන්දැ"යි කීයේය. ඒ ස්ත්‍රීද එපවත් අසාගෙන ගොස් වෛශ්‍යාවට කීවාය.

එසමයෙහි එක් සිටු පුත්‍රයෙක් සාමාව කෙරෙහි පිළිබඳ සිත් ඇතිව දවස දහසක් දෙයි. ඒ සිටුප්‍රත්‍රතෙම එදවස් සවස් වේලාවෙහි දහසක් වස්තු ගෙන ඇගේ ගෙට ගියේය. ඒ සාමාවද ඔහු දුන් දහසින් බඳපියල්ල අතට ගෙන උකුලෙහි තබා අඬන්ට පටන් ගත්තීය. "කුමට අඬද්දැයි?" විචාළ කල්හි කියන්නී "සාමිනී, වධයට ගෙනයන්නාවූ මේ සොර තෙම අනිකෙක් නොවෙයි මාගේ මලනුවෝය, තමා හීන නීචවූ සොරකම් කරන හෙයින් ලැජ්ජාවෙන් මා සමීපයට එන්ඩ අසමත්ය. පුර පාලක පුරුෂයා හට මා විසින් යාඥකොට කියාය වූ කල්හි "දහසක් දුනහොත් අරිමි" කියා එව්වේය. දැන් මේ දහස ගෙන ගොස් පුරපාලක පුරුෂයා හට දෙන්ට නිසි පුරුෂයෙකු නොබලමි" කීවාය. ඒ සිටුපුත්‍ර තෙම ඈ කෙරේ පිළිබඳ සිතින් "මම ගෙනගොස් දෙමි. තොප ශෝක නොකරව"යි අස්වැසීය. එකල්හි ඕතොමෝ කියන්නී එසේවීනම් සාමිනි තොප විසින් ගෙනා දහස තොපිම ගෙනගොස් දෙවයි කීවාය. ඒ සිටු ප්‍රත්‍ර තෙම තමා ගෙනා දහසින් බඳපියල්ල ගෙන පුර පාලකයාගේ ගෙට ගියේය.

ඒ පුර පාලක පුරුෂ තෙමේම සිටු පුත්‍රයා සඟවා තබා සොරු පිළිසන් යානාවක හිඳුවා සාමාවගේ ගෙට යවා "අප විසින් මේ වධයට ගෙනා පුරුෂතෙම රාජ්‍යයෙහි ප්‍රසිද්ධ සොරෙක, මධ්‍යම රාත්‍රියෙහි මනුෂ්‍යයන් නිදි ගෙන හැසුරුණු වේලෙහි මරම්හ"යි ඉතිරි රාජ පුරුෂයන්ට ව්‍යාජයෙන් කියා මදක් කල් යවා මනුෂ්‍යයන් නිදි ගත් කල්හි සිටු පුත්‍රයා මහත්වූ රැක වලින් සොරුන් මරණ තැනට ගෙන ගොස් කඩුවෙන් හිස කපා ශරීරය උල තබා නුවරට වන්නේය. එතැන් පටන් ඒ වෛශ්‍ය දූ තොමෝ අන් පුරුෂයන් අතින් කිසිවක් නොගෙන සොරු හා එක්වම ප්‍රියසංවාසය කෙරෙමින් වෙසෙයි.

ඉක්බිතිව ඒ සොරු සිතනුයේ මෝතොමෝ ඉතා මිත්‍ර ද්‍රෝහිය. අනිකක්හු කෙරෙහි සුපිළිබඳ සිත්වූ නමුදු ඒ සිටු ප්‍රත්‍රයා මෙන් මාත් මරවා ඔහු හා එක්වත් ප්‍රිය වාසය කරන්නීය. කවර උපායකින් මෑ කෙරෙන් මිදෙම්ද? මෙහි බොහෝ දවසක් කල් නොයවා යා යුතු යයි සිතා ඉක්බිති සිතන්නේ "යන කල සිස් අතින් ගොස් ප්‍රයෝජන කිම්ද? මැගේ ආභරණයන් ඇරගෙන යෙමි" සිතා එක් දවසක් සිතන්නේ "සොඳුර, අප මැදිරියෙහි ලූ කුකුලන් මෙන් නිරන්තරයෙන් ගෙයිම වැදලා ඉඳ දුක් විඳිමෙන් ප්‍රයෝජන කවරේද? උයන් කෙළියට යම්හ"යි කීහ. ස්ත්‍රී "යහපතැ"යි ගිවිස කන බොන දෑ ඇතුළුව උපකරණ සපයාගෙන තොමෝ ස්වර්ණාභරණයෙන් සැරහී සොරු හා එක්ව පිලිසන් යානාවෙකින් උයනට ගියාය. ඒ සොරුද ඈ හා එක්ව

උයනේ කෙළ ඇවිදිනේ දැන් මා විසින් යන කලැයි සිතා ඈ සමඟ රති ක්‍රීඩා (රාගිකව හැසිරෙන, සංවාසය) කරණු කැමැත්තෙකු මෙන් කනේරු ගස් ගොල්ලකට වැද ඈ ආලිංගනය (වැලඳ ගැනීම) කරන පසාරයෙන් (ආකාරයෙන්) දැඩි කොට මිරිකා මූර්ජාකොට සියළු ආභරණ ගලවා ඇගේ උතුරු සළුවෙහිම පොදියක් කොට බැඳ කරට දමා ගෙන උයන් වැට පැනගෙන පලා ගියේය.

සොරු ගිය නොබෝ කලකින් ඒ ස්ත්‍රිය සිහිලැබ බැණ නැගී සිට තමාගේ පිරිවර ස්ත්‍රීන් කරා ගොස් "මාගේ ස්වාමි පුත්‍රයා කොයිදැ"යි විචාරා උන් විසින් "නොදනුම්හ"යි කී කල්හි "මුර්ජා වූ මා මළැයි යන හෙයින් ගියේවනැ"යි සිතා දොම්නසට පැමිණ ගෙට ගොස් "මාගේ ප්‍රිය වල්ලභයා දුටු දවසක මුත් කවර සැප විඳිමෙක්දැ"යි යන ශෝකයෙන් සැරහූ යානෙහි නොසැතපී භූමිසෙය්‍යාව (බිම වාඩිවීම) කෙරෙමින් මනා වස්ත්‍රයෙහිද ඇළුම් නොකොට කිළුටු වස්ත්‍ර අඳිමින් එකවේල අනුභව කෙරෙමින් සුවඳ මල් ආදිය නොපැළඳ හැරම යම්කිසි උපායකින් ප්‍රිය වල්ලභයා ගෙන්වා ගණිමියි සිතා නාටකයන් ගෙන්වා දහසක් වස්තු දී "තොප විසින් නොයන තැන් නැත. ගම් නියම්ගම් රාජධානි ආදියට ගොස් ගී නැටුන් පවත්වන තැන්හි පළමු කොට මේ ගීතිකාව ගායනා කරව. මාගේ ස්වාමිපුත්‍ර තෙම එතැන්හි වී නම් මේ ගීතිකාව අසා තෝ සමග කථා කරන්නේය. ඉක්බිතිව මම සැපසේ ඉඳිනා බව කියා කැඳවා ගෙන එව. අනුන් හෝ කියා එව"යි නියෝග කොට තමාගේ ගීතිකාව උගන්වා

මාර්ගෝපකරණ (මග වියදම්) සපයා දී යැවූවාය. ඒ නාටක ජනයෝ ඒ බරණැස් නුවරින් නික්ම ගම් නියම්ගම් පිළිවෙලින් ගී නැටුන් පවත්නා ඇවිදිනාහු. ඒ සොරහු වාසය කරණ පිටිසර ගමට පැමිණ එතැන්හි රැස්වූ පිරිස් මැද නෘත්‍යමණ්ඩලය මැද ගී නැටුන් පවත්වන්නා පළමු කොට මේ ගීතිකාව කීහ.

යන්තං වසන්ත සමයෙ කණවෙරෙසු භානුසු
සාමං බාහාය පීලෙසි සාතං ආරොගයමබ්‍රවී'ති

මේ ගාථාවෙන් කීයේ නම් අනේකවිධ පුෂ්පඵල පල්ලවාදියෙන් (දලු) වනය සොභාමත් වූ වසන්ත කාලයෙහි උයන් කෙළියට ගියා වූ නුඹ වහන්සේ මොන වට පිපී මල් පැහැයෙන් රත්වූ සොභා ඇති කනේරුගස් අතුරට වැද රතික්‍රීඩා අභිප්‍රායෙන් සාමා නම් ස්ත්‍රියක් ආලිංගනය කොට මුර්ජාවූ කල්හි මළයි යන භයින් සැඟවී ගිය සේක්ද, ඕතොම නුඹ වහන්සේට තමා නිදුක්ව ජීවත්ව ඉඳිනා බව කියන්නීය යන අභිප්‍රාවය.

ඉක්බිති ඒ පිරිස් අතුරෙහි අසා සිටියා වූ සොර තෙම නාටකයා කරා එළඹ කියන්නේ "එඹල කොල නාටකය, තෝ සාමාව ජීවත්ව ඉඳිති කියන්නෙහිය. මම වනාහි වචනය අදහන්නෙම් නොවෙමි. එඹල නාටකය මෙලොවෙහි පවනෙක් තණ පරඬලා මෙන් පර්වත ගෙන යන්නේය යන මේ බසෙක් ඇද්ද? එබස ඇදහිය යුතු නොවෙයි. ඉදින් පවනෙකින් පර්වතයක් ඔබිමොබ ගෙන යන්නේ වී නම් මේ මුළු ලොව ද

එපරිද්දෙන්ම ගෙන යයි. පොළොව හා පර්වතයන් පවනින් ගෙන යෙති යනු යම්සේද, සාමාව ජීවත් වෙති යනුද එමෙන් වන්නේය. යම් හෙයකින් සාමා නම් ස්ත්‍රී මළාද ඈ ආරෝග්‍යව විචාරති යනු කුමට අදහම්ද? මළ සත්‍වයෝත් කථා කෙරෙත්දැ?"යි කීයේය. ඒ වචනය අසා නාටක තෙම කියන්නේ "සාමිනි, නුඹ වහන්සේ කුමක් කියන සේක්ද? ඒ සාමාවෝ මළෝ නොවෙති. අන් පුරුෂයකු කැමැත්තෝද නොවෙති. නුඹ වහන්සේ නික්ම ආ තැන් පටන් කිළුටු වූ වස්ත්‍ර හැඳ එක්වේලේ අනුභව කොට සුවඳ මල් විලේපනාදිය දුරු කොට යහන්වරා බිම සැතපී නුඹ වහන්සේගේ ඊම බලමින්ම ඉඳිති" කීයේය.

ඉක්බිත්තෙන් සොරතෙම කියන්නේ "ඕ තොමෝ ජීවත් වේවයි නොවේවයි ඈගෙන් ප්‍රයෝජන නැත. ඕ තොමෝ නොබෝ කලක් තමාගේ පුරුදු වූ නියමසාමි වූ සිටු පුත්‍රයා මට පැමිණි වධයට යොදා කිසි පුරුදුකමක් (හැඳිනීමක්) නැත්තා වූ අමුතුව දුටු මා වධයෙන් මුදා තමාට වල්ලභ කළාය. මතු අන් පුරුෂයකු දුටු කල ඔහු නිසා මාත් අනර්ථයට පමුණුවන්නීය. එසේ හෙයින් ඈ සමීපයට යන්නා තබා මෙයිදනුදු ඇගේ නම් පුවත් නොඅසන්නාවූ ඉතා දුරු තැනකට යෙමි" කියා ඒ නාටකයන් බල බලා සිටියදී වස්ත්‍රය තරව ඇඳ වේගයෙන් නික්ම ගියේය. නාටක ජනයෝ එපවත් දෙවනුව ගොස් සාමාවට කීහ. ඒ ඇසූ සාමාතෙම තමා කළ මිත්‍රද්‍රෝහියට කලකිරී පළමුවෙන් තමාගේ වෛශ්‍යා ස්වභාවයෙන් ජීවත් වූවාය.

තිලෝගුරු බුදුරජානන් වහන්සේ “මහණ, තෝ දැන් මතු නොවෙයි. පෙරත් මේ ස්ත්‍රී නිසා දුකට පැමිණියේ වේදැ”යි වදරා චතුස්සත්‍යය ප්‍රකාශ කිරීමෙන් මේ ජාතකය නිමවා වදාළ සේක. දේශනාවගේ කෙළවර ශාසනයෙහි උකටලීවූ භික්ෂූන්වහන්සේ සොවාන් ඵලයෙහි පිහිටි සේක.

“එකල්හි වෛශ්‍යාව නිසා ඉස් කැපුන් ලත් සිටු පුත්‍රයා නම් මේ උකටලීවූ මහණාය, එකල්හි සාමා නම් වූ වෛශ්‍යාව නම් උකටලී කරවා ශාසනයෙන් චුත කරවන්ට උත්සාහ කළ පුරාණ දූතිකාය. එසමයෙහි සොරව උපන්නේ දැන් ලොව්තුරා බුදුවූ මම්ම වේදැ”යි තමන් වහන්සේ ගෙණ හැර දක්වා වදාළ සේක.

# 312. තිත්තිර ජාතකය

තවද සමත්‍රිංශත් පාරමිතා සම්භාරයෙන් සංසිද්ධ (සම්පූර්ණ) බොධිඥානයෙන් සුපරිසුද්ධ ස්කන්ධසන්තාන (අතිශයින් පිරිසිදු) ඇති අප තිලෝගුරු සම්‍යක් සම්බුද්ධ සර්‍වඥරාජොත්තමයානන් වහන්සේ කොසඹෑ නුවර ගොචරග්‍රාම (ගොදුරු ගම) කොට බදරිකා නම් ආරාමයෙහි බ්‍රහ්මවිහාරයෙන් (උතුම් හැසිරීමෙන්) වාසය කරණ සේක් රාහුල ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළ සේක.

මෙහි වර්තමාන කථා වස්තුව යට තිපල්ලත්ථ ජාතකයෙහි විස්තර වශයෙන් කියන ලද්දේය. මේ මතු කියන තිත්තිර

ජාතකයෙහි ධර්ම දේශනාවට කාරණයෙක් යම් කලෙක උපන්ද එසමයෙහි ධම් සභා මණ්ඩපයෙහි රැස්ව උන් භික්ෂූන් වහන්සේ විසින් වදාරණසේක්, "ඇවැත්නි, රාහුල ස්ථවිර තෙම ත්‍රිවිධ ශික්ෂාවන් (සීලාදී තුන් වැදෑරුම් හික්මීමෙන්) පුරුදු කැමැත්තේ නම් ඔහු කෙරෙහි ද කුකුස් (සැකය) කරන්නේ අනුන් විසින් කරණ ලද අවවාදයෙහි පිහිටන්නේය"යි යනාදීවූ ආයුෂ්මත් (පැවිද්දන් බාල අයට කරන ඇමතීමෙක්) රාහුල ස්ථවිරයන්ගේ ගුණ කථාවත් හෙවත් ප්‍රශංසාවත් පහල වූ කල්හි ඒ භික්ෂූන්වහන්සේ විසින් කරන ලද ප්‍රශංසාව දිව කනින් අසා වදරා ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ සුගන්ධ ගන්ධකුටි (සුවඳ ගදකිළිය) විහාරයෙන් තුන්තරා ගමනින් එක්තරා ගමනකින් වැඩ වදාරණ සේක් "එම්බා මහණෙනි, දැන් වනාහි කිනම් කථාවකින් යුක්තව උනුම්හ"යි කී කල්හි බුදුහු එබසට වදාරණසේක් "එම්බා මහණෙනි, රාහුලයන් ශික්ෂා නැති වූයේත් කුකුස්කාරී (සැක සහිත) වූයේත් අවවාදක්ෂම (අවවාද ඉවසන) වූයේත් දැන් මතු නොවෙයි. පෙරත් තිත්තිර නම් ක්ෂුද්‍ර (කුඩා) පක්ෂි ජාතියක ඉපිදත් මෙබඳු ශික්ෂා ඇති ගුණ ධර්මයෙන් යුක්ත වූයේ වේදැ"යි මුඛමාත්‍රයක් (වචන මාත්‍රයක්) දක්වා වදාළ කල්හි භික්ෂූන් විසින් "ස්වාමීනි බුදුරජානන් වහන්ස, ඒ අතීත ප්‍රවෘර්තිය භවයෙන් ප්‍රතිච්ඡනන (වැසුනු) හෙයින් අපට නොදැනෙන්නේය. අපට දැනෙන පරිද්දෙන් විස්තර වශයෙන් ප්‍රකාශ කොට වදාළ මැනවැ"යි ආරාධිත වූ බුදු රජානන් වහන්සේ වදාරණ සේක්.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් සතර සංග්‍රහ වස්තුවෙන් (දානය, ප්‍රියවචනය, අර්ථචරියා, සමානාත්මතා යන සතර) ජනරඤ්ජනය (මහජනයා පාලනය කරන) කොට රාජ්‍යශ්‍රී අනුභවකරණ කල්හි පුරණ ලද බෝධිසම්භාර ඇති අප මහබෝධිසත්වතෙම බ්‍රාහ්මණ කුලයෙහි ඉපිද වැඩිවිය පැමිණියේ තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් සමීපයෙන් සියළු උගතමනා සිල්ප ඉගෙන එයින් අවුත් හිමවත් වන පෙදෙසෙහි ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් (තාපස පැවිද්දෙන්) පැවිදිව ඉර්ධිවිධාදී වූ පඤ්චාභිඥාවන්ද (ඍද්ධි විධ, දිබ්බසෝත ආදී අභිඥා පහ) රූපාරූප අෂ්ටසමාප්තිද (සමාපත්ති අට) නිපදවා ධ්‍යාන ක්‍රීඩාව කරන්නේ සිත්කළු වන ලැහැබෙක්හි වාසය කොට ලුනු ඇඹුල් සෙවිනා සඳහා එක්තරා ප්‍රත්‍යන්ත (පිටිසර ගමකට) ග්‍රාමයකට ගියේය.

ඒ ගම්හි මනුෂ්‍යයෝ ඒ තාපසයන් දැක සතුටු සිත් ඇත්තවුන් එක්තරා වනයක පන්සලක් කොට පිණ්ඩපාතාදී ප්‍රත්‍යයෙන් (ආහාරයෙන්) උපස්ථාන කරන්නාවූ ඒ පන්සල්හි වාසය කරවූවාය. එකල්හි ඒ ගම්හි පක්ෂීන් මරා දරාභරණාදිය කරණ එක්තරා වැද්දෙක් වටුවෙකු ගෙන යාපත්කොට අභ්‍යාස කරවා මැදිරියෙක ලා රක්‍ෂා කරන්නේය. එසේවූ වටුවා වලට (වනයට) ගෙන ගොස් ඔහුගේ ශබ්ද අසා ආ තිප්වටුවන් (වටු විශේෂයක්) අල්වා ගෙනෙන්නේය. ඒ මැදිරියේ උන්සේ වටුවා සිතන්නේ "මාගේ කුලෙහි බොහෝ නෑයෝ මාගේ ශබ්දය නිමිත්ත කොට ගෙන

විනාශයට පැමිනෙන්නාහ. මේ අකුශලය මට පැමිනේද්දෝහෝ"යි නිශ්ශබ්දව උන්නේය. වැදි පුත්‍රයා ඒ පක්‍ෂියා බැන නොනැග ඉන්නවා දැක ඔහු කෙරෙහි කිපුනු සිත් ඇත්තේ උන ලෑල්ලකින් (උණ පතුරකින්) ඔහුගේ ඉස් මුදුනේ පහරමින් පීඩා කරන්නේය. එසේ වටු තෙම මෙසේ සිතුයේය. "මා විසින් පවත්වන්නා වූ ශබ්දය කරණ කොට ගෙන මේ පක්ෂීහු නසිත්වයි යන මාගේ සිතක් නැත්තේය. එතකුදු උවත් මා විසින් කළ අකුසල කර්මය මාම ස්පර්ශ කරන්නේය. මා ශබ්ද නොපවත්වන කල්හිම මේ පක්ෂීහු මා සමීපයට නොඑන්නාහ. ශබ්ද පවත්වන කල්හිම එන්නාහ. ආ ආ පක්ෂීන් මේ වැදි පුත්‍රතෙම අල්වා ගෙන මරන්නේය. මේ ක්‍රියාව නිමිත්ත කොට ගෙන අකුසල් ඇද්දෝහෝයි ඒ තෙම එතැන් පටන් කවර නුවණැත්තා වූ සත්වයෙක් වනයෙහි මාගේ සිත්හි උපන්නාවූ ඔත්තප ලක්‍ෂණ වූ කාංසාව මුදන්නේදෙහෝ"යි සිතා එබඳු කාංසා විච්ඡේදනයට (සැක දුරුකිරීමට) සමර්ත්‍ථ වූ ප්‍රඥවන්තයෙකු පරීක්‍ෂා කෙරෙමින් වාසය කරන්නේ, ඉක්බිත්තෙන් එක් දවසක් ඒ වැදි බොහෝ වටුවන් අල්වා පැසක් පුරා ලා ගෙන භ්‍රමද්‍රහයන් සන්සිඳුවා ගනිමි, පැන්බොමි සිතා බෝධිසත්වයන් වාසය කරන්නා වූ ආශ්‍රමයට ගොස් ඒ පක්‍ෂියාගේ මැදිරිය බෝධිසත්වයන් වහන්සේ සමීපයෙහි තබා පැන් බී වැලිතලාවෙක්හි හොත්තේ නිද්‍රාව පැමිණියේය. එසේවූ වටු තෙම ඔහු නිද්‍රාවට පැමිණි බව දැන තමාගේ සිත උපන් කුකුස් මේ තාපසයන් අතින් විචාරමි. විචාළවූ මට තත්වූ පරිද්දෙන් දන්නා වු මේ තාපසයන්

වහන්සේ වදාරණසේකැයි මැදිරියේ සැතපී ගෙනම ඒ තාපසයන් වහන්සේගෙන් විචාරන්නාහු, එසේ වටු පක්‍ෂි තෙම පළමු කොට මෙසේ විචාළේය.

කෙසේද යත්,

"සාමිනි නුවනැත්තාවූ තාපසයන් වහන්ස, ඒකාන්තයෙන්ම සැපයෙන් ජීවත් වෙමි. මා කැමති කැමති කැවිලි පෙවිලි සුවසේ ලැබෙන්නේය. එතකුදු උවත් බොහෝ ඥාති කුලයෙහි වූ පක්ෂීන් නසා ජීවත් වෙන තරම් උපද්‍රව ස්ථානයක පිහිටියෙමි. එසේ හෙයින් තාපසයන් වහන්ස, මෙයින් මට කවර අකුශල කර්මයක් සිද්ධ වන්නේද? ඒ මාගේ සිත්හි උපන් කාංසාව පසිඳ වදාල මැනවැ"යි විචාළ වූ ඔහුගේ ප්‍රශ්නය විසඳන්නාවූ ඒ තාපසයානන් වහන්සේ මෙසේ වදාරණ සේක් "එම්බා පක්ෂිය, ඉදින් තාගේ චිත්තය පාප කර්මය පිණිස නොනැමෙන්නේය. එසේ කල්හි පාප කර්මය පිණිස සංභ්‍රමනයක් (පෙළඹවීමක්) නැත්තා වූ නිරුත්සාහවූ සත්පුරුෂ වූ තට ලාමක වූ පාප චේතනාවෙක් තා ලිම්පනය (බලපෑමක්) නොකරන්නේය. එසේ හෙයින් තට අභිවෘද්ධියම වන්නේය.  එසේ හෙයින් ශෝක නොකරව"යි වදාළසේක.

බෝධිසත්වයන් වහන්සේගේ උත්තප්‍රකාර වූ බණ ඇසූ ඒ තිත්තිර පක්ෂි තෙම මෙසේ විචාරන්නේය. "ස්වාමීනි, මම ශබ්ද නොපැවැත්තුවේ වී නම් මේ තිත්තිර පක්ෂි සමූහයෝ මා සමීපයට නොඑන්නාහ. ශබ්ද පැවැත්වූ කල්හි අපගේ ඤාති වූ පක්ෂී තෙම මෙතැන්හි ඉඳිනේයයි බොහෝ පක්ෂීහු එන්නාහ.

ඒ ආවා වූ පක්ෂීන් මේ වැදිපුත්‍රතෙම අල්වාගෙන ජීවිතක්ෂයට පමුණුවන්නේය. එසේ හෙයින් මා නිසා මේ ප්‍රාණඝාත අකුශල කර්‍මය ස්පර්‍ශ වශයෙන්ම වන්නේය. එසේ හෙයින් මාගේ චිත්තය මේ පාප කර්‍මය නිමිත්ත කොට ගෙන කාංසාවට පැමිණෙන්නේය”යි කීයේය. ඒ ඇසූ බෝධිසත්‍වයන් වහන්සේ වදාරණ සේක් “එම්බා තිත්තිර පක්ෂිය, ඉදින් පව් කරණ නිසා චිත්තයත් නිපිද වූයේය. එසේ හෙයින් තාගේ චිත්තය දූෂ්‍ය නුවූයේය. හෙවත් තන්නින්න (එයට යොමුවූ) තප්පොන (එයට නැඹුරු) භාවයෙක් නැත්තේය. එසේ කල්හි වැද්දා විසින් ආයුෂ්මත්වූ තා නිසා කරණ ලද්දාවූ පාපකර්මයක් කෙරෙමි යන සිත් නැති හෙයින් ශෝභන චිත්ත සන්තාන ඇති තට ප්‍රාණඝාත චේතනාවගේ නොවීමෙන් ඒ අකුසලය තා ලිම්පනය නොකරන්නේය” යනාදී වචනයෙන් මහ බෝසත්වූ තාපසතෙම ඒ තිත්තිර පක්ෂියාට තත්වූ පරිද්දෙන් දක්වා සංසිඳුවා වදාළසේක. ඒ තිත්තිර පක්ෂියාද මහබෝසතානන් වහන්සේ නිසා නිස්සංකා වූවේය.

ඉක්බිති ඒ වැදිපුත්‍ර නිදා පිබිද මහබෝසතානන් වහන්සේ වැඳ අවසර ගෙන ඒ පක්ෂි රාජයා ගෙන ගියා යයි ශාස්තෲවූ බුදුරජානන් වහන්සේ මේ ‘තිත්තිර ජාතක’ ධර්‍ම දේශනාව ගෙනහැර දක්වා පූර්‍වාපරසන්ධි ගලපා නිමවා වදාළසේක.

“එකල්හි තිත්තිර පක්ෂි වූයේ රාහුල ස්ථවිරය. අවවාදයෙන් ඔහු සිත උපන් සැක සිඳිනා තාපසයෝ නම්

දැන් බුදුවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ ගෙන හැර දක්වා වදාළ සේක.

## 313. සුබ්බච ජාතකය

තවද එක් සමයෙක්හි අප තිලෝගුරු සර්‍වඥරාජෝත්තමයානන් වහන්සේ ජේතවනාරාමයෙහි වාසය කරණා සේක් එක්තරා කෙළෙඹි පුත්‍රයෙකු අරභයා මේ සුබ්බච ජාතකය නිමවා වදාළසේක.

ඒ කෙළෙඹි පුත්‍රයා වනාහි ගම්හි නය එලවමින් භාර්‍ය්‍යාව හා එක්ව ගොස් නය එලවා ගෙන ගැලක් ගෙන ගොස් පසුව ගෙණඑම්යි එක්තරා ගෙයක තබා නැවත සැවැත් නුවරට යන්නාහු එක්තරා පර්‍වතයක් දුටුවාහුය. ඉක්බිත්තෙන් ඔහුගේ භාර්‍ය්‍යාතොම කියන්නී "සාමීනි, ඉදින් මේ පර්‍වතය ස්වර්‍ණමය (රනින් කළ) වීනම් මට කිසිවක් දෙන්නෙහිදැ"යි විචාළීය. එබසට ස්වාමියා කියන්නේ "මාගෙන් එලෙස ලබන්ට තෝ කවුරුද? මම නොදෙමි" කීයේය.

ඉක්බිත්තෙන් ඕතොම එපමණ කින් තදවූ සිත් ඇත්තී "ඒකාන්තයෙන්ම මේ පර්‍වතය ස්වර්‍ණමය වූ කල්හිදු මට කිසිවක් නොදන්නේය"යි කියා නොසතුටු වූවා ඉක්බිති ඒ ස්ත්‍රී පුරුෂ දෙදෙනා බුදුන් වාසය කරන්නා වූ ජේතවන විහාරය සමීපයට ගොස් මාගීශ්‍රමයන් සන්සිඳුවා පැන් බී ගෙණ යම්හයි විහාරයට වන්කල්හි බුදුරජානන් වහන්සේ ද එදා අළුයම් වේලෙහි ඔවුන් දෙදෙනාගේ ශ්‍රොතාපත්ති ඵලයට බලවත්

ප්‍රත්‍යය ඇති බව දැන වදාරා ඔවුන් දෙදෙනාගේ ඊම බලමින් ෂඩ්වර්‍ණ (පාට හය හෙවත් සවනක්) ඝන බුද්ධරස්මීන් ශ්‍රී ශරීරයෙන් නික්මවා මදක් වැඩහුන් සේක. ඒ දෙමහල්ලෝද පැන් බී අවුත් බුදුන් වැඳ එකත්පස්ව උන්නාහුය. සර්‍වඥයන් වහන්සේ ඔවුන් හා සමඟ පිළිසඳර කථා කොට හෙවත් තමන් වහන්සේ කරා පැමිණි ආගන්තුකයන්ට සන්තෝෂයට කාරණා වදාරා "තෙපි දෙදෙනා කොයි ගොසින් එව්ද?"යි විචාරා වදාළසේක. එබසට කියන්නාහු "සාමීනි, අප දෙදෙනා ලද්ද වූ ධනයන් එලවාලන්ට ගියම්හ"යි කීවාහුය. එබසට බුදුරජානන් වහන්සේ "කිමෙක්ද උපාසිකාව, තොපගේ වල්ලභවූ (ස්වාමියා) පුරුෂතෙම තොපට හිතසිත් ඇත්තෝද, උපකාරීව වාසය කරන්නේදැ?"යි විචාරා වදාළසේක. එබසට "ස්වාමීනි, භාග්‍යවත් වූ බුදුරජානන් වහන්ස, මම මොහු කෙරෙහි ස්නෙහයෙන් යුක්ත යෙමි, මේ වනාහි මා කෙරෙහි ස්නෙහයක් නැත්තේය, ඊට කාරණා කවරේද? අද දවස් මා විසින් පර්‍වතයක් දැක මේ පර්‍වතය ස්වර්‍ණමය වීනම් මට කිසිවක් දෙන්නෙහිදැ?යි විචාරණ ලද්දේ තෝ ඒ මාගෙන් ලැබීමට කවරෙක්දැයි කිසිවකුත් නොදෙමියි කීයේය. එසේ හෙයින් මෙබඳු වූ කිසි ස්නේහ ගුණයක් නැති මෙතෙම තද වූ සිත් ඇත්තේය"යි කීවාය.

එබසට බුදුරජානන් වහන්සේ "එඹල උපාසිකාව, මෙනම් දෙයක් නොවන්නේ වී නම් යම් කලෙක වනාහි තොපගේ ගුණ සිහි කෙරේද, එදවස් වනාහි සියලු ඓශ්වර්‍ය්‍යී ම (සම්පත්) දෙන්නේය"යි වදාරා බුදුන් විසින් වදාළ වචනය ඇසූ

උපාසිකා තොම "ස්වාමීනි, බුදුරජානන් වහන්ස, සියළු ඓශ්වර්‍ය්‍යයී ලැබීම නම් කවරේදැ?"යි ඔවුන් විසින් ආරාධිත වූ බුදුරජානන්වහන්සේ අතීත කථාව ගෙන හැර දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි පුරණ ලද පෙරුම් ඇති මහබෝධිසත්වතෙම ඒ රජහුගේ සියලු ක්‍රියා සිද්ධ කරන්නාවූ අමාත්‍ය විය. ඉක්බිත්තෙන් එක් දවසක් ඒ බරණැස් රජතෙම තම පුත්‍ර වූ යුව රජහු උපස්ථානයට එන්නා දැක මේ තෙමේ මාගේ අභ්‍යන්තරයෙහි වාසය නොකෙරේවයි සිතා ඒ අමාත්‍යයා සමීපයට කැඳවා "එඹා සගය, මම යම්තාක් කල් ජීවත් වන්නෙමි ඒ තාක් කල් මෙතෙම මේ නුවරෙහි වාසය කිරීම නොලබන්නේය. අන්‍යස්ථානයක (වෙනත් තැනක) වාසය කොට මාගේ ඇවෑමෙන් රාජ්‍යය කරව"යි කීයේය. එතෙම "යහපතැ"යි ගිවිස පිය රජහු වැඳ ප්‍රධාන භාර්‍ය්‍යාව හා සමග බරණැස් නුවරින් නික්ම ප්‍රත්‍යන්ත ජනපදයකට (පිටිසර ගමකට) ගොස් වනයෙහි පන්සලක් කොට වනමුල් වන ඵලාඵල අනුභව කෙරෙමින් වාසය කරන්නේය. මෑත භාගයෙහි පිය රජතෙම කළුරිය කෙළේය. යුවරජ තෙම තරු බලා ඒ තමාගේ පිත්‍රෘ වූ බරණැස් රජ කාලක්‍රියා කළ බව දැන බරණැස් නුවරට එන්නේ අතරමග එක් පර්වතයක් දුටුවේය.

ඉක්බිත්තෙන් ඔහුගේ භාර්‍ය්‍යාතොම කියන්නී "ඉදින් දේවයන් වහන්ස, මේ පර්‍වතය ස්වර්‍ණමය වී නම් මට මින් කිසිවක් දෙන්නෙහිදැ?"යි විචාළීය. එබසට යුවරජ කියන්නේ "තෝ මාගෙන් ලබන්නට කවරෙහිදැයි කිසිවක් නොදෙමි"යි කීයේය. ඉක්බිත්තෙන් ඕතොම "මම ඔහු හා සමඟ වාසය කෙරෙමියි සෙනහයෙන් වාසය කරන්ට නොහැකි වූයේය. මේ පුරුෂ ද මා කෙරෙහි කලකිරිණි. ස්නෙහව තදවූ සිත් ඇත්තේ රජ්‍යයට පැමිණද මෝතොම මට කවර යහපතක් කළාදැයි නොසතුටුවන්නේය"යි සිතා ඒ පුරුෂයා හැර වනයට නොගොස් ඔහු හා සමඟ ගියාය. එතෙම රාජ්‍යශ්‍රීයෙහි පිහිටා ඒ ස්ත්‍රිය අගමෙහෙසුනැයි යන යසස් මාත්‍රයක් (කීර්තිය) දුන්නේය. මත්තෙහි වනාහි කළ සත්කාර සම්මානයෙක් නැත්තේය. මෑත කාලයෙහි ඈ ඇති බවත් නොදන්නේය. බෝධිසත්‍වයන් වහන්සේ සිතන සේක් "මේ ස්ත්‍රී තොම රජහුට උපකාරව වල (වනයෙහි) වාසය කරණ කාලයෙහි මෙපණක් දුක් ගනිමියි සිතා නුකුසීතව (කම්මැලි නැතිව) මෙරජහට විශ්වාසව සිත පක්‍ෂපාත බැව්හි වාසය කළාය. දැන් මෙරජ වනාහි තමහට ගත දුක් පමණක් නොදැන අන්‍ය වූ ස්ත්‍රීන් හා රමණය (සිත් අලවමින්) කෙරෙමින් දවස් අරනේය. යම්සේ මෝතොම සියළු ඓශ්වර්‍ය්‍යී ලබන්නීද ඒ ලබන්නට සුදුසු උපායක් කෙරෙමි"යි සිතා එක් දවසක් බෝධිසත්‍වයන් වහන්සේ බිසෝවරුන් කරා ගොස් වැඳ "දෙවීන්වහන්ස, දැන් අපි නුඹ වහන්සේගෙන් සෙසු දේ තබා ආහරණ පමණක්

නොබලම්හ, කුමක් හෙයින් අප කෙරෙහි උදාසීන භාවයෙන් ප්‍රමාද වූ සේක්ද? ඉතා තදවූ සිත් ඇතිසේක්නු"යි කීසේක.

එබසට බිසව් කියන්නාහු "එම්බා අමාත්‍යයානෙනි, තොපට දෙන්නේ මම ලබන්නෙම් වේදැ"යි කිවුය. "නමුත් නොලබන බව කියා රජ්ජුරුවන් වහන්සේ දැන් වනාහි මට කුමක් දෙනසේක්ද? එදවස් අතර මගදී පර්වතය දැක සිත අදහනු පිණිස මේ පර්වතය ස්වර්ණමය වීනම් මට මින් කෙතෙක් දෙන සේක්දැයි විචාළ කල්හි "මාගේන් ලබන්ට තෝ කවරේදැ"යි කීයේය. දැන් වනාහි එදවස් ඒ ප්‍රවෘතතිය රජ්ජුරුවන් ඉදිරියෙහි කියන්නට හැක්කේ වීනම් කියව"යි කී කල්හි කීවේය. "රජහු සමීපයෙහි සිටියාහු මම විචාරමි, නුඹ වහන්සේ කිවමැනව"යි කී කල්හි "යහපතැ"යි කියා බෝධිසත්වයන් වහන්සේ ඒ රාජදේවිය රජ්ජුරුවන්ට උපස්ථානකොට සිටි කල්හි විචාරනසේක් "බිසවුන්වහන්ස, මම නුඹ වහන්සේගෙන් කිසිවකුත් නොලබන්නට කාරණා කවරේදැ?"යි විචාළ කල්හි බිසවු කියන්නෝ "එම්බා සගය, මම ලබන්නෙම් වේද නුඹ වහන්සේට දෙන්නේය"යි කියා. "රජ්ජුරුවන් වහන්සේ එකල්හි වනයෙහි වාසයකොට එන්නාවූ මාර්ගයේ එක් පර්වතයක් දැක ඉදින් පර්වතය ස්වර්ණමය වීනම් මට මින් කෙතෙක් දෙන සේක්දැයි විචාළමි. ඒ ලබන්ට තෝ කවරේද? ඉදින් මා දෙන දෙයක් නැතැයි කියා නිරපෙක්ෂව (බලාපොරොත්තුවක් නැතිව) හැරියාද මුන්වහන්සේ මම නොහැර එබඳුවූ තැනැත්තන් වහන්සේ දැන් මට කුමක් දෙනසේක්දැ"යි යනාදීන් මේ ප්‍රවෘත්තිය ප්‍රකාශකොට කියන්නී,

“එදවස් ස්වර්ණ පර්වතය විනම් දෙන සේක්දැයි විචාළාවූ මට ඒ පර්වතය මාගේ වචනයෙක් ස්වර්ණ පර්වතයැකැයි කී පමණක් විනා ස්වභාවයෙන් ස්වර්ණමය වූ වචන මාත්‍රයෙන් සැප දෙන්නට හැක්කාවූ පර්වතයද පවා වචනයෙන් නොදුන්නේය දැන් කුමක් දෙන්නේදැ”යි කී බිසවුන්ගේ තෙපුල් (වචන) ඇසූ රජ කියනුයේ මෙසේ කියා යමක් කරතොත් ඒම කිවයුතු වන්නේය. නොකරණ දෙය නොකියයුතු වන්නේය. නොකරණ දෙය කියන්නාවූ අඥානයාගේ ස්වභාවය තත්වූ පරිද්දෙන් පණ්ඩිතයෝ දැනහැර තුච්ඡකොට (හිස්, පහත්) සිතති. අඥානයෝ වචන මාත්‍රයටම සතුටු වන්නාහුය”යි කීවාය. රජ්ජුරුවන්ගේ බස් ඇසූ රජදේවි රජ්ජුරුවන්ට නමස්කාරකොට කියන්නී “රජ්ජුරුවන් වහන්ස, නුඹ වහන්සේ ස්වභාව ධර්මයෙහි පිහිටිසේක් වීනම් නුඹ වහන්සේට නමස්කාර වේවයි යමෙක් නුඹ වහන්සේගේ රටින් නෙරපන ලද බැවින් ව්‍යසනය (විපත්) පැමිණියේද ඔහුගේ චිත්තය සත්‍ය වචනයෙහි රමණය කරන්නේ වේදැ”යි මෙපරිද්දෙන් ඒ රජුහුගේ ගුණ කථනය කරණ කල්හි ඒ මහබෝසතාණන් වහන්සේ ඒ රාජදේවියගේ ගුණ කියනසේක් “රජ්ජුරුවන් වහන්ස, මේ ලෝකයෙහි යම් ස්ත්‍රියක් දරිද්‍රස්වභාව (දිළිඳු බව) ඇත්තීද ඕතොම දරිද්‍රයන්ට වඳින්නීය. කීර්තිමත්වූ උපභෝග පරිභෝග සම්පත්තියෙන් ආඪ්‍යවූ (පොහොසත්) යම් ස්ත්‍රියක් ඇද්ද ඕතොම එබඳුවූ ආඪ්‍යයක්හට වඳින්නීය. යම් ස්ත්‍රියක් කීර්තිසම්පන්නවූනම් එබඳු පුරුෂයන් හටම වඳින්නීය. එසේ හෙයින් කල්‍යාණවූ රජදේවියද නුඹවහන්සේට අකුශල

හෙයින් උතුම් වූ භාර්‍ය්‍යා වන්නීය"යි කියා බෝධිසත්වයන් වහන්සේ නැවත "රජ්ජුරුවන් වහන්සේ වනයෙහි දුක්ගෙන වාසය කරණ කල්හිද නුඹ වහන්සේ හා සමාන දුකට පැමිණ වාසය කළ බිසවුන්ට සත්කාර සම්මාන නොකරන්නට සුදුසු නොවන්නේය"යි කියා රාජදේවියගේ ගුණ වර්‍ණනාකොට ගියේය. රජතෙම ඒ වචනයෙන් සතුටුවූයේ ඒ බිසවුන් තමහට කළගුණය සිහිකරමින් "එඹා පණ්ඩිතයෙනි, තොපගේ වචනයෙන් මේ දේවියගේ ගුණ සිහිකරමි"යි කියා ඒ බිසවට සියලු ඓශ්වර්‍ය්‍යී දුන්නේය. දේවියගේ ගුණ ප්‍රකාශ කළ බෝධිසත්තවයන්ටද බොහෝ සතුටුවූ රජ්ජුරුවෝ මහත් සැපත් ඔහුට දුන්නේයයි ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ මේ දේශනාව ගෙණහැර දක්වා චතුස්සත්‍ය ධර්මදේශනාව ප්‍රකාශකොට පූර්‍වාපරසන්ධි ගළපා මේ ජාතකය නිමවා වදාළසේක. චතුස්සත්‍යයාගේ අවසානයෙහි ඒ දෙමහල්ලෝම ශ්‍රොතාපත්ති ඵලයෙහි පිහිටියාහුය.

"එකල්හි බරණැස් රජ්ජුරුවෝ නම් මේ කෙළඹිපුත්‍රයාය, ඒ රාජදේවිතොම මේ උපාසිකාවය, පණ්ඩිත අමාත්‍යව උපන්නෙම් බුදුවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ ගෙණහැර දක්වා වදාළසේක.

# 314. කුටි දූෂක ජාතකය

තවද කරුණාවෙන් සිහිල්වූ ළය ඇති ප්‍රඥාප්‍රද්‍යෝතයෙන් (නුවණ නැමති පහනින්) නසන ලද මොහාන්ධකාර (මෝඩකම නැමති අඳුර) ඇති ත්‍රෛලොක (තුන් ලොව) ස්වාමිවූ

ජාතිකාන්තාරාදීන් සත්ත්වයන්තරණය කොට අමෘතමහා ලක්ෂණ ක්ෂෙමභූමියට පමුණුවන හෙයින් ශාස්තෘ නම් සම්‍යක් සම්බුද්ධ රාජොත්තමයානන් වහන්සේ ප්‍රාකාර ගොපුර (දොරටු) ප්‍රාසාදදියෙන් හා මධුරි මධුග්‍රන්ධි ගන්ධිත ජායූදක (මිහිරි මල්පැණි සුවඳින් සුවඳවත්වූ සෙවනැලි සහිත ජලය ඇති) සම්පන්න රම්‍ය භූමිභාග ඇති ජේතවනාරාමයෙහි මෛත්‍රී කරුණා මුදිතා (මොළොක් බව) උපේක්ෂා (මධ්‍යස්ථ බව) ලක්ෂණ චතුර්විධ ආර්ය්‍ය ඊර්ය්‍යාපථ (ඉරියව්) විහරණයෙන් යුක්තව වාසය කරන්නාවූ එක් සමයෙක්හි මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේගේ පන්සල දැවූ එක් සාමණේරයකු අරභයා මේ ජාතකය වදාළ සේක.

ඒ කෙසේද යත්,

මේ ජාතක කථා වස්තුවට නිදානවූ විස්තර කථා වස්තුව රජගහයෙහි පහල විය. ඒ කුටිදූෂක (කුටිය විනාශ කිරීම) ක්‍රියාව යම් සමයක්හි වීද එසමයෙහි මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ රජගහනුවර ගෝචරග්‍රාම (ගොදුරු ගම) කොට වනමධ්‍යයෙහි වූ පන්සලක වාසය කරණසේක. එතැන්හි වාසය කරන්නාවූ මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේට බාල සාමණේරයන් දෙදෙනෙක් වතාවත් කරන්නාහ. ඔවුන් දෙදෙන අතුරෙන් එක් සාමණේරයන් වහන්සේ කෙනෙක් තෙරුන් වහන්සේට සුවච කීකරුව උපකාරිකව චාරිත්‍ර සීලයෙන් (කළ යුතු යුතුකම්) යුක්තව වාසය කරති. අනික් සාමණේර තෙම එබඳු ගුණ ධර්මයන් නැති හෙයින් දුශ්චාරිත්‍රව (යුතුකම් පැහැර

හරිමින්) වෙසෙයි. ඉන් වත්සම්පන්න (වත්පිළිවෙත් රකින) සාමණේරයන් විසින් කළ යම් වත්පිළිවෙත් ආදියක් අනික් සාමණේරතෙම තමා ගුණමකු හෙයින් තමා කළ දෙයක් මෙන් තෙරුන් වහන්සේට අඟවන්නේය. වත් සම්පන්න සාමණේරයන් විසින් උදෑසනක්සේ දැහැටි (දත් මැදීමට ගන්නා බෝමු වැනි කෝටු) දිය එලවා තිබූ කල්හි තෙරුන් වහන්සේගේ සමීපයට ගොස් වැඳ “ස්වාමීනි, දැහැටි දිය මා විසින් එලවා තිබෙන ලද. දැහැටිකිස සපයා වදාළ මැනව”යි යනාදීන් කියන්නේය. අනික් වත් සම්පන්න සාමණේරයන් විසින් උදෑසනක් සේ නැගී සිට පිරිවෙණ ඇමදි කල්හි තෙරුන් වහන්සේගේ පිටත නික්මෙන වේලාවෙහි එ ස්වෙච්ඡාචාරී (හිතුවක්කාර) අනාචාර (නොමනා හැසිරීම් ඇති) සාමණේරතෙම මුස්නක් ඇරගෙන ඈත මෑත පැහැර තමා විසින් ඇමදියාක් මෙන් තෙරුන් වහන්සේට අඟවන්නේය.

එපරිද්දෙන් නිරන්තරයෙන් අප වෙහෙසන ඔවුන් එක් දවසක් වෙහෙසා ඔවුන්ගේ චාටු ක්‍රියාව ප්‍රකාශ කෙරෙමි යි සිතා ඉක්බිති එක් දවසක් ඔහු ඇතුළුගමින් වළඳා අවුත් විහාරයෙහි නිද්‍රාවට පැමිණි කල්හිම වත් සම්පන්න සාමණේරයෝ නහන පැන් උනු කොට අනික් සාමණේරයන්ට නොපෙණෙනසේ පැන් නහන තැන පිට කොටුවේ (බැහැර ස්ථානයක) තබා අනික් මහා භාජනයක නැළියක් පමණ දියවත් කොට උදුනෙහි තිබුවාය. සැතපුනු සාමණේර තෙම පිබිද ගිනිහල් ගෙට ගොස් උදුනෙහි කකියා උණුසුම් නැගෙන දිය දුරදීම දැක තෙල උනුවන්නේ දිය පිරුණු භාජනයෙක්

වනැයි සිතා තෙරුන් වහන්සේ සමීපයට ගොස් “ස්වාමීනි, මා විසින් නහන පැන් සම්පාදනය කරණ ලද්දේය. පැන් සැනසුව මැනවැ”යි කීයේය. තෙරුන් වහන්සේ ඒ සැබවයි සිතා සාමණේරයා එක්ව නහන කොටුවට වැඩ “දිය කොහිදැ”යි විචාරා වදාළසේක. එවිට සාමණේර සීඝ්‍රව (වහා) ගිනිහල් ගෙට ගොස් උදුනෙහි තුබූ සිස් භාජනයෙහි කෙනෙස්ස (වතුර ගැනීමට භාවිතා කරන උපකරණයක්) එලුයේය. එසේ එලූ කෙනෙස්ස භාජනය සිස් බැවින් තට තට යන අනුකරණ පැවැත්තේය. ඒ කාරණයෙන් ඒ සාමණේරයාට එතැන් පටන් උළුකශබ්දයා (බකමූණු හඬට සමාන හඬ ඇත්තා) යයි ව්‍යවහාර විය. ඒ වේලෙහි වත් සම්පන්න සාමණේරයෝ පිට කොටුවෙහි පළමුවෙන් සපයා තිබූ උනු පැන් ගෙනවුත් තබා “ස්වාමීනි, පැන් සැනහුව මැනව”යි කියා පැන් සැනැස්වූසේක.

ඉක්බිති තෙරුන් වහන්සේ ඒ උලුඩක ශබ්දක (බකමූණු හඬ) සාමණේරයාගේ අනාචාරභාවය සිත සිතා උන්වේලෙහි සවස වතාවත් කරන්ට ආ සාමණේරයාට අවවාද කොට වදාරණසේක්. “ඇවැත්නි එම්බා සාමණේරය, මේ ශාසනයෙහි මහණදම් පුරන්නහු විසින් තමා කළ දෙයක් මෙමා විසින් කළ දෙය යි කියන්නට වටනේය. අන් පරිද්දකින් අනුන් කළ දෙය තමා විසින් කළ දෙයක් බඳු කොට කීයේවීනම් දැන දැන බොරු කීම නිමිති කොට ගෙන වාක්දුශචරිත (වචනයෙන් සිදුවන වැරදි) වෙයි. මුසාවාදයෙන් අකුසල සිද්ධවන්නේය. මෙයින් මතු මෙබඳු අභූත වචනයක් (අසත්‍ය ප්‍රකාශයක්) නොකියව”යි අවවාදකොට වදාළසේක. ඒ අවවාදක්‍ෂම

(අවවාදය නොඉවසන) නොවන සාමණේරතෙම තෙරුන් වහන්සේ කෙරෙහි කිපි සිත් ඇත්තේ දෙවන දවස් තෙරුන් වහන්සේ සිඟාවඩනා කල්හි එක්ව නොගියේය. වත්සම්පන්න සාමණේරයෝ තෙරුන් වහන්සේ කැටුවම ගියේය. සිඟන්ට වඩිනා තෙරුන් වහන්සේ කැටුව නොගිය උලුඬක ශබ්දක සාමණේර තෙරුන් වහන්සේට උපස්ථාන කරණ එක කුලගෙයකට ගොස් සිටි කල්හි ඒ කුලගෙයි ඇත්තා විචාරන්නා "සාමිනි, අපගේ භාග්‍යවත් වූ මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ කොයි දැ"යි විචාළ කල්හි ගිලන් භාවයකින් විහාරයෙහි වැඩ හිඳිනා කීකල්හි "සාමීනි, ඊට අපගෙන් කුමක් ලබන්ට සුදුසු දැ"යි විචාරණ ලද්දේ "මෙනම් මෙනම් දෙයක් දුන මැනවැ"යි තමා කැමති කැමති දෙය ඉල්වා ගෙණ කැමති තැන් වලදී ස්වෙච්ඡාවූ (තම කැමැත්තට අනුව) පරිද්දෙන් තෙමේ අනුභව කොට ගියේය. දෙවෙනි දවස් තෙරුන් වහන්සේ එම කුලගෙට සිඟන්ට වැඩිකල්හි ඒ කුලගෙයි වැස්සෝ කියන්නාහු "ස්වාමීනි, ඊයේ දවස් නුඹ වහන්සේ ගිලන් භාවයකින් විහාරයෙහි වැඩ උන්හයි යනු අසා නුඹ වහන්සේ විහාරයෙන් වැඩි සාමණේරයන් වහන්සේගෙන් අසා ගිලන් බෙහෙත් ආදිවූ දෙය එවුම්හ. ඒ නුඹ වහන්සේට ප්‍රයෝජන වීදැ"යි විචාළාහුයි.

තෙරුන් වහන්සේ එබසට මුවෙන් නොබැන ආහාර කෘත්‍යය කොට විහාරයට වැඩ සවස් වේලෙහි තමන් වහන්සේට උපස්ථාන කරන්ට ආවාවූ සාමණේරයා සමීපයට කැඳවා "ඇවැත්නි, අසවල් ගම අසවල් කුලෙහි ඇත්තන්ගෙන්

මෙනම් මෙනම් දෙයක් දුන මැනවැයි ඉල්වා ගෙන තා විසින් අනුභව කරණ ලද්දේදැ''යි විචාරා ''එපරිද්දෙන් විනවාගෙන (ඉල්වාගෙන) අනුභව කිරීම ශ්‍රමණ සාරූප්‍ය නොවන හෙයින් නුසුදුසු වන්නේය. එසේ හෙයින් මතු මෙබඳු අක්‍රියා නොකරව''යි අවවාද කොට වදාළසේක.

එවේලෙහි අවවාදක්‍ෂම නොවන්නා වූ අනාචාර වූ සාමණේරතෙම තෙරුන් වහන්සේ කළ අවවාද පමණකට ආඝාත බැඳගෙන සිතන්නේ ''මේ තෙරුන් වහන්සේ ඊයේ දවස් දිය පමණක් නිසා මා හා විවාද කළසේක. අද දවසත් තමන් වහන්සේගේ කුලුපගවූ උපාසකයන්ගේ අහර පමණක් වැලඳුවා නොඉවසනසේක්, නැවතත් කලහ කරණ සේක. ඉදින් වන්නාටය. මුන් වහන්සේට කටයුත්තක් දනිමි''යි දෙවෙනි දවස් තෙරුන් වහන්සේ පිඩුසිඟා වැඩිය කල්හි වියරුහුනු (වියරු වැටුනු) එකෙකුමෙන් මුගුරු කඩක් ඇරගෙණ වලන් බිඳ පන්සලත් ගිනිලා ගියේය. ඒ අකතීව්‍යකාරී (නොකටයුත්ත කර) පව්ටු සාමණේරතෙම ඒ ආත්ම භාවයෙහි යපී ගන්නා පමණ අහරක් නොලැබ සම් මස් නහර වියලී මනුෂ්‍ය ප්‍රේතව කාලක්‍රියා කොට අවීචි මහනරකයෙහි උපන්නේය. ඔහු විසින් කලාවූ ඒ දුෂ්ට ක්‍රියාව මහජනයා මධයෙහි ප්‍රකාශ විය. ඉක්බිත්තෙන් එපවත් ඇසූ භික්‍ෂූන් වහන්සේගෙන් සමහරක් දෙනාවහන්සේ රජගහනුවරින් සැවැත් නුවරට ගොස් සභාය භික්‍ෂූන් වැඩ හිඳිනා විහාර වල පාසිවුරු තැන්පත් කොට තබා බුදුන් සමීපයට ගොස් වැඳ එකත්පස්ව උන්නාහුය. සර්‍වඥයන් වහන්සේ ඒ භික්‍ෂූන් හා පිළිසඳර කථා කොට

"කොතැන්හි වාසය කොට අවුදැ"යි විචාරා වදාළ කල්හි "ස්වාමීනි බුදුරජානන් වහන්ස, රජගහ නුවර සිට ආම්හ"යි කීවාහුය. "එතැන්දී තොපට අවවාද කරණ ආචාරීහු කවුරුදැ"යි විචාරා වදාළසේක. "ස්වාමිනි, මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේය"යි දැන්නුවාහුයි "මහණෙනි, මහාකාශ්‍යප ස්ථවිරයන්ට සැපදැ"යි විචාරා වදාළසේක. "එසේය ස්වාමීන් වහන්ස, උන්වහන්සේ සැපසේ වාසය කරණ සේක. එතකුදු උවත් උන් වහන්සේගේ සද්ධිවිහාරික (එකට වාසය කරන) සාමණේරයෙක් අවවාදයෙහි කිපී එම කාශ්‍යප ස්ථවිරයන් වහන්සේගේ පන්සල ගිනිලා ගියාවේදැ"යි දැන්වූ සේක.

එබස් ඇසූ බුදුරජානන් වහන්සේ වදාරණසේක්. "ඒ මහාකාශ්‍යප ස්ථවිරයන්ට ඒ නුවණ නැති තුවජ (හිස්) සාමණේරයා හා එක්ව වාසය කිරීමට වඩා හුදකලාව විසීම යහපත් වන්නේදැ"යි දම්පියාවෙහි මේ ගාථාවෙන් වදාළසේක.

ඒ කෙසේද යත්,

> වරං තෙ නාධිගච්ඡෙය්‍ය සෙය්‍යා සදිසමත්තනො
> එකචරියං දළහං කයිරා නත්ථි බාලෙ සහායතා

යන මේ ගාථාව වදාරා නැවත ඒ භික්ෂූන්ට ආමන්ත්‍රණය කොට "මහණෙනි, එතෙම කුටි දූෂකයෙක් වූයේත් අවවාද දුන්නවුන් කිපුණේත් දැන් මතු නොවෙයි, පෙරත් අවවාද දුන්නවුන්ට කිපී කුටි දූෂක වූයේ වේදැ"යි වදාරා එකල්හි එයින් වර්තමාන කථාව අර්ථෝත්පත්ති (උපයොගි කරගෙන) කොට ගෙන ඒක්ෂණයෙහිම පූර්වේනිවාසානුස්මෘති ඥානයෙන්

(පෙර විසූ කඳ පිළිවෙළ දන්නා නුවණින්) අතීත කාල ප්‍රවෘත්තිය දැන වදාරණ සර්‍වඥ රාජොත්තමයාණන් වහන්සේ මේ කුටි දූෂක ජාතකයෙහි අතීත කාල ප්‍රවෘත්ති වූ කථා ප්‍රබන්ධය ගෙන හැර දක්වා වදාරණ සේක්. “එම්බා මහණෙනි, යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් චතුර්විධ සංග්‍රහ (දානය, ප්‍රිය වචනය, අර්ථ චරියා, සමානාත්මතා යන සතරින්) වස්තුවෙන් ජනරඤ්ජනය (රට පාලනය කරමින්) කෙරෙමින් රාජධර්‍මයෙන් අකොප්‍යව (නොවිරුද්ධව) රාජ්‍යය කරණ සමයෙහි පුරණ ලද බෝධිසම්භාර ඇති මහ බෝසතාණෝ සිංගිලි නම් පක්‍ෂි ජාතියෙක ඉපිද වැඩිවිය පැමිණ හිමාලය වන ප්‍රදේශයෙහි තමන් වහන්සේට සිත්කළු වූ වර්ෂා කාලයෙහි නොතෙමෙන සේ කැදැල්ලක් කොටගෙන වාසය කරන්නේය.

ඉක්බිත්තෙන් එක් වානරයෙක් වර්ෂා කාලයෙහි අච්ඡින්නධාරයෙන් (නොකඩවා වසින) නොපායා වස්නා කල්හි සීතයෙන් පෙලෙනා ලදුව වෙව්ලමින් දතින් දත්කා පහරමින් අවුත් බෝධිසත්‍වයන් සමීපයෙහි උන්නේය. බෝධිසත්‍වයන් වහන්සේ ජීවිත පීඩාවෙන් පෙළෙන්නා වූ වඳුරු දැක ඔහු හා කථා කරණ සේක් “එම්බා වානරය, තාගේ ඉස්මුදුන අතුල පතුල මනුෂ්‍යයන් බඳුවූ සටහන් ඇත්තේය. එසේ කල්හි තාගේ වාසය කිරීමට සුදුසු ගෙයක් නැත්තේය. කුමක් නිසා දැ?”යි විචාළසේක.

ඒ අසා වානරයා කියන්නේ "එඹා සිංගිලි පක්‍ෂිය, ඒ සැබෑමය මාගේ ඉසමුදුන අතුල්පතුල් මනුෂ්‍යයන්ට බඳුවූයේය. එතකුදු වුවත් මනුෂ්‍යයන් කෙරෙහි යම් ප්‍රඥාවෙක් උතුම් වන්නේද එබඳුවූ කල්පනා බුද්ධියෙක් මා කෙරෙහි නැතතේය. එසේ හෙයින් මනුෂ්‍යයන් විසින් කටයුතු වූ ක්‍රියාවක් මා විසින් කොට ගන්ට නොහැක්කෙමි. එබැවින් වාසය කරන්ට ගෙයක් කොට ගත නොහෙමි" කීයේය.

ඒ අසා බෝධිසත්‍වයන් වහන්සේ වදාරණසේක්. "එම්බා වානරය, මේ ලෝකයෙහි එකඟකොට නොපිහිටුවන ලද සිත් ඇති හෙයින් යුහුව (වහා) පෙරළෙන සුළු ස්වාභාව ඇති ලඝුවූ ප්‍රවෘත්ති (දුර දිග නොසලකන) ඇති කෙළෙහි ගුණ නොදන්නා හෙයින් මිත්‍රද්‍රෝහී වූ නිරන්තරයෙන් අඛණ්ඩ කොට රක්‍ෂා කරණ ශීලාචාරාදී ගුණ ධර්‍මයක් නැති අඥානයාට කිසිකලෙකත් කායික චෛතසික සැපයට කාරණයක් නොවන්නේය. එසේ හෙයින් යහළු වඳුරාණෙනි, ප්‍රඥාව උපදවා ගන්නා පිණිස තමාගේ දුශ්ශීල ස්වභාව පහකොට ශීලාදී ගුණ ධර්‍මයෙන් යුක්තව ඒ ශීලාදී ගුණ රක්‍ෂා කොට ගෙන ශීත සුලඟින් පීඩා නොවී වාසය කිරීමට සුදුසු උපායක් කොට ගෙනැ"යි යනාදී අවවාද කළසේක.

ඒ අවවාද අසා ස්වාභාවයෙන් ගුණමකු දුෂ්ට වානර සිතන්නේ "මූ නෙතෙමන තෙන වුන් බැවින් තමුන්ගේ අහංකාර දක්වා පරිභව බෙනෙ"යි කියා උපන් ක්‍රෝධ චේතනාවෙන් "ඉඳින් මුන් දැන් මේ කැදැල්ලෙහි සැපසේ ඉන්ට

සලස්වන්නෙමි වේදැ"යි බෝධිසත්වයන් අල්වා ගන්නා පිණිස කැදැල්ලට පීනුයේය. බෝධිසත්වයෝ කැදැල්ලෙන් ඉගිල එක්තෙනකට ගියේය. "ඒ දුෂ්ට වානරතෙම කැදැල්ල සුන්බුන් කොට ගියේ වේදැ"යි වදුරා ශාස්තෘවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ මේ කුටි දූෂක ධර්‍ම දේශනාව පූර්‍වාපරසන්ධි ගලපා නිමවා වදාළසේක.

"එකල්හි ඒ කැදැල්ල බිඳු වානරයා නම් දැන් මේ කුටිදූෂක සාමණේරය, සිංගිලි පක්‍ෂි වූයේ දැන් තිලෝගුරු බුදුවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ ගෙණහැර දක්වා වදාළසේක.

# 315. දද්දභ ජාතකය

තවද මෙසේ භාග්‍යවත් වූ බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි තීර්ත්‍ථකයන් (අන්‍ය ආගමිකයන්) අරභයා මේ ජාතකය වදාරණලදී.

ඒ කෙසේද යත්,

ජේතවනාරාමය සමීපයෙහි තීර්ත්‍ථක පරිබ්‍රාජිකාවරු වැද කණ්ටක තාපසව පඤ්චතාපන (වටේ ගිනි මැල හතරකින් හා සූර්‍ය්‍ය තාපයෙන් කෙලෙස් තවන) තාපස, කුක්කුර (බලු) ව්‍රතය යනාදීන් නොයෙක් තපස් කොට ඉඳිනාහ.

ඒ දුටු භික්‍ෂූන් වහන්සේ සර්‍වඥයන් වහන්සේ අතින් විචාරණ සේක. "ස්වාමීනි, මුන් රකිනා වූ තපස් මහා උග්‍රතපස්ව, මුන්ට මින් වන මාර්ගඵල විපාකයෙක් ඇද්දැ?"යි

විචාළසේක. සර්‍වඥයන් වහන්සේ වදාරණසේක් “මින් මුන්ට වන විපාකයෙක් නැත, මේ නිකම්ම තුච්ඡ දෙයක. පොළොව පෙරලෙයි කියා දිවූ සාවා මෙනැ”යි වදාළසේක. “ඒ කෙසේදැ”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ සිංහව ඉපිද වාසය කරණ කල්හි එක් සාවෙක් තල් ගස් හා බෙලි ගස් ඇති වනයෙක වාසය කෙරෙයි. තල්වක්කන්නක් යට වැදහොත් තැනැත්තේ සිතන්නේ “පොළොව පෙරලීගෙන ඒ නම් කුමක් කෙරෙම්දෝහෝ”යි සිතා ගෙන වැදහොත් බෙලි ගෙඩියක් තල්වක්කන්නක් පිට වැටින.

සාවා තමා සිතූ සිතිවිල්ල නියාවට පොළොව පෙරලී ගෙන එති සිතා භයින් දිවන්ට වන. ඒ දුටු සාවෝ “තා දිවන්නේ කුමක් නිසාදැ?”යි විචාළ කල්හි සාවා කියන්නේ “කිම්ද තොප විචාරන්නේ? පස්සේ පොළොව පෙරලීගෙන එයි. එසේ හෙයින් දිවමි”යි කීහ. ඒ දුටු අනික් සාවුන් විචාරා සාවෝ දහසෙක් එක්ව දිවන්ට වන්හ. එවිට සාවුන් දිවන්නාහු දැක මුවෝ සාවුන් අතින් විචාරා “සැබෑ”යි දිවන්නාහ. මුවන් අතින් විචාරා ඌරෝ දිවූහ. ඌරන් අතින් විචාරා ගෝණෝ දිවූහ. උන් අතින් විචාරා මීමු දිවූහ. උන් අතින් විචාරා ගෙරි දිවූහ. උන් අතින් විචාරා  දිවියෝ, වලස්සු, ගවරු, කඟවේනු,

ඇත්තු, අස්සු, ව්‍යාඝ්‍රයෝ, සිංහයෝ ඇතුළුවූ සියළු සිවුපාවෝ උනුන් අතින් විචාරා "ඇත්තමය"යි සිතා හතරයොත්නෙක (යොදුන් හතරක) ගැවසී සිටියාවූ සිවුපා සේනාව මූදූබත් (විනාශ) වන්ට දිවූහ.

මෙකියන සිවුපාවුන් දිවන තෙනට සමීපයෙහි වසන්නාවූ සිංහයෙක් "සිවුපාවන් දිවන කාරණා විචාරමි" සිතා තමා වැදහොත් පර්‍වතයෙන් එලියට පැන මහත් වූ සිංහනාදකොට සිටියේය. ඒ සිංහනාද අසා සිවුපාවෝ භය ගෙණ සිටියාහ. භයින් සිටියා වූ සිවුපාවුන් අතින් "දිවන කාරණා විචාරමි" සිතා විචාළ කල්හි "පොළොව පෙරලීගෙන එන හෙයින් දිවම්හ"යි සිංහයෝ කීහ. "තොපට කීවෝ කවුරුදැ"යි සිංහයන් විචාළ කල්හි "ව්‍යාඝ්‍රයන්ගෙන් ඇසුම්හ"යි කීහ. ව්‍යාඝ්‍රයෝ "ඇතුන් ගෙන් ඇසුම්හ"යි කීහ. ඇත්තු "අසුන්ගෙන් ඇසුම්හ"යි කීහ. අස්සු "කඟවෙනුන්ගෙන් ඇසුම්හ"යි කීහ. කඟවෙනු "ගවරුන්ගෙන් ඇසුම්හ"යි කීහ. ගවරු "වලසුන්ගෙන් ඇසුම්හ"යි කීහ. වලස්සු "දිවියන්ගෙන් ඇසුම්හ"යි කීහ. දිවියෝ "ගෙරින්ගෙන් ඇසුම්හ"යි කීහ. ගෙරි "මීමුන්ගෙන් ඇසුම්හ"යි කීහ. මීමු "ගොනන්ගෙන් ඇසුම්හ"යි කීහ. ගෝනෝ "ඌරන්ගෙන් ඇසුම්හ"යි කීහ. ඌරෝ "මුවන්ගෙන් ඇසුම්හ"යි කීහ. මුවෝ "සාවුන්ගෙන් ඇසුම්හ"යි කීහ. සාවුන් ලඟට ගොස් "තොපට කීවෝ කවුරුදැ?"යි විචාළ කල්හි "මේ සාවා අපට කීයේය"යි සාවෝ තොරතුරු පෑහ.

බෝධිසත්ත්වයෝ ඒ සාවා කරා ගොස් "සැබෑද? පොළොව පෙරලී එන්නේය"යි විචාළ කල්හි "මම දිටිමි. ස්වාමීනි, සැබව පොළොව පෙරලෙන්නේය"යි කීය. බෝධිසත්වයෝ "කොයි එල්ලේද පොළොව පෙරලෙන්නා දුටුදැ?"යි සාවා අතින් විචාළ කල්හි "ස්වාමීනි, මම මූදුබඩ තල්වනයක හා බෙලි වනයෙක් කෙරේ වාසය කෙළෙමි. එතැන් පටන් පොළොව පෙරලෙන්ට වන්නේය"යි කීහ. බෝධිසත්ත්වයෝ සාවා පිට හිඳුවාගෙන සාවා කී වචනයට සිංහයා නොපැන සාවා බිම සිටුවා "කොතන පටන් පොළොව පෙරලෙන්ට වනැයි කියව"යි විචාළහ.

"මම එතැනට ගොසින් පාන්ට භය ඇත්තෙමි" කියා නොගියේ බෝධිසත්ත්වයෝ "තෝ නොබා අසවල් තෙනයයි කියයි". "දැන් එතැනට ගොසින් පානට භය ඇත්තෙමි. අසවල් තල්ගසමුල තල්වක්කන්නක් යට වැදහොත්තෙමි, එතන පටනැ"යි කීහ.

බෝධිසත්ත්වයෝ එතනට ගොසින් බලා සිතන්නාහු "සාවා මේ තල්වක්කන්නට යට වැදහොත්තේ පොළොව පෙරලීගෙන ඒ නම් මම කොයියම්දේහෝ සිත සිතා වැදහොත් කල බෙලි ගෙඩියක් තල්වක්කන්නක් පිට වැටුනු අඬ අසා භයින් පොළොව පෙරලෙති සිතාගෙන දිව්නියාව"යි සිතා දෙවනුව සිවුපා සමූහයා උන් තැනට පැන සිව්පාවුන්ට කියන්නාහු "සාවා තමා කෙරෙහි භයින් කී පමණක් විනා ඇත්තෙක් නොවෙයි" කියා සිවුපාවුන් ඒ ඒ තැනට යවුහ.

ඒ අර්ත්‍ථය ප්‍රකාශ කරණ සර්‍වඥයන් වහන්සේ “මහණෙනි, සාවා කී බසින් එතක් සිවුපාවෝ පරීක්‍ෂා නොකොට මූදුබත්‍වන්ට ගිය ගමනේ සිංහයා එතන සිට පරීක්‍ෂා කොට නැවතූ හෙයින් විනා මූදුබත්‍වන්නේ නොවේද? එමෙන් මුන්ගේ ව්‍රතය කිසි විපාකයක් දීලිය (ලබා දීමට) නොහෙ”යි කියා වදරා මේ ‘දද්දභ ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි සිංහව උපන්නෙමි බුදුවූ මම්ම වේදැ”යි වදාළසේක.

# 316. බ්‍රහ්මදත්ත ජාතකය

තවද මෙසේ පූජ්‍ය වූ සර්‍වඥයන් වහන්සේ අලව්නුවර නිසා අග්ගාල නම් දේවාලයෙහි වාසය කරණසේක් කුටිකාර ශික්‍ෂාපදයක් (කුටියක් කිරීමේ ශික්ෂාපදයක්) අරභයා මේ ජාතකය දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්,

මෙහි වර්‍තමාන කථාව යටකී මණිකණ්ට ජාතකයෙහි විස්තර වශයෙන් පෙනෙන්නේය.

“මෙය වනාහි භික්‍ෂූන් වහන්සේ කුළුපග උපාසකවරුන් අතින් උන් නොකමැති කරවා ලාභය ඉල්වීම කටයුතු නොවෙයි, භික්‍ෂූන් නම් දැහැමෙන් සෙමෙන් ලත්දෙයක් විනා දසවිධ උපාසක වරුන්ගෙන් ඉල්වුකල විකේෂප (අවුල් සහගත සිතුවිලි) වෙති. පෙර උත්තමයෝ පවා එක පත්කුඩයක් හා වහන් සගලක් (සෙරෙප්පු ජෝඩුවක්) ඉල්වාගත නොහී

දෙලොස් අවුරුද්දක් ලජ්ජාවෙන් උන්නෝවේදැ''යි වදාරා ඒ ''කෙසේදැ?''යි ආරාධිත වූ සර්‍වඥයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්,

යටගිය දවස උත්තරපඤ්චාල රට කම්පිල්ලනුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ බ්‍රාහ්මණව ඉපිද පසුව කාමයෙහි ආදීනව දැක ඍෂිප්‍රව්‍රජ්ජාවෙන් පැවිදිව හිමාලය වනයට වැද වාසය කරන්නාහු ලුනු ඇඹුල් සෙවිනා පිණිස උත්තරපඤ්චාල නුවරට ආවාහු රජ්ජුරුවන්ගේ මගුල් උයනෙහි වාසය කොට උදෑසනම නුවරට සිඟා ආහ. රජ්ජුරුවෝ තාපසයන්ගේ ඊර්යාපථයෙහි (ඉරියව්වල) පැහැද වස් සාරමස උයනේ වාසය කරණ නියායෙන් ආරාධනාකොට තාපසයන් පවරා (පොරොන්දු දී) උපස්ථාන කළාහ.

තාපසයෝ වස් අන්තයෙහි හිමාලවනයට යන්ට අභිප්‍රාය (කැමැත්ත) ඇතිව රජ්ජුරුවන්ගෙන් එක්පට වහන් සඟලක් හා පත්කුඩයක් ඉල්වා ගන්නා පිණිස අභිප්‍රා ඇතිව ''රජ්ජුරුවන්ට කන්නලව් කියමි'' සිතා යම්කෙනෙකු අතින් ඉල්වීම නම් ඇඬීමය. දෙන තැනැත්තෝ දෙවෙනිව ''නැතැ''යි කිවුනම් ඒ දෙවෙනි ඇඬීමය.මේ අප දෙදෙනාගේ අඬන ඇඬීම බොහෝ දෙන මැද කීම් කටයුතු නොවෙයි කියා ''රජ්ජුරුවෙනි, රහස කටයුත්ත තනිව කියන්නා අභිප්‍රාය ඇත්නම් හ''යි කීහ.

රජ්ජුරුවෝත් ලඟසිටියවුන් පහ කරවා “වදාළ මැනවැ”යි කීහ. තාපසයෝ කියන්නාහු යම් කෙනෙකුන් අතින් යමක් ඉල්ලුකල ලැබේ හෝ නොලැබේ හෝ ඉදින් මා ඉල්ලු දෙය නැතැයි කිවුනම් රජ්ජුරුවන් සිත් කල කිරි මෛත්‍රී මදවෙයි සිතා පසුව දන්නෙම් වේදැ”යි සිතා කියා රජ්ජුරුවන් යවුහ. මෙම නියායෙන් දවසින් දවසම කියම් උත්සාහ කොට දෙළොස් අවුරුද්දක්ම ඉක්මුනේය.

රජ්ජුරුවෝ “තාපසයන් වහන්සේ මාගෙන් ඉල්වීමක් ඉල්වන්ට සිතන්නේ දෙළොස් අවුරුද්දක. අද මම උයනට ගොසින් තාපසයන් වහන්සේට බොහෝ දවසක් තපස්කොට ගිහිගෙයි ආලය ඇතිව මා අතින් රාජ්‍යය ඉල්වන අභිප්‍රාය ඇතිවිය. රජදරුවන්ගෙන් රාජ්‍යය ඉල්වීම නම් කටයුතු නොවෙයි, රජදරුවෝ නම් රාජ්‍යලෝභය ඇත්තේයයි කියා ලජ්ජාවෙන් නොයිල්වන දෙයක්වන, අද රාජ්‍යය ඉල්වුවත් දෙමි. රාජ්‍යයෙන් අර්ධයක් ඉල්ලුවත් දෙමි” සිතා තාපසයන් වහන්සේ කරා උයනට ගොස් වැඳ එකත්පස්ව හිඳ “ස්වාමිනි, මා අතින් නුඹවහන්සේ ඉල්වීමක් ඉල්වන්නේ දෙළොස් අවුරුද්දක. අද නුඹ වහන්සේ මාගේ රාජ්‍යය ඇතුළුවූ අභිප්‍රා යම් දෙයක් ඉල්ලුව මැනව දෙමි” කීහ.

එවිට තාපසයන් වහන්සේ “මහරජ, මා ඉල්වූ දෙයක් දෙව්දැ?”යි කියා විචාරා “රාජ්ජය දෙමි කියමි. සෙසු වස්තුවක් නොදෙම්දැ?”යි රජ්ජුරුවන් කී කල්හි එවිට තාපසයෝ කියන්නාහු “මහරජ, අපි හිමාලය වනයට යන්නා

අභිප්‍රාය ඇත්තෙම්හ. වහන් සගලක් හා පත්කුඩයක් ලබන්නා කැමැත්තම්හ”යි කීහ. රජ්ජුරුවෝ කියනනාහු “මෙපමණක් පසුව මට මෙතෙක් දවස් නොකියේ ඇයිදැ?”යි කීහ. “මෙපමණ සඳහා මිනිසුන් වෙහෙසෙන්නේ ඇයිදැයි සිතා නොකිමි” කියා තාපසයෝ කියන්නාහු “මහරජ, යම් කෙණෙකුන්ගෙන් නැතැයි කියා ඉල්වීම එක් ඇඬීමෙක. ඉල්ලුකල නැතැයි කිම එක් ඇඬීමකි. මේ අප දෙදෙනාගේ ඇඬීම බොහෝ දෙනා දැකීම නපුරැයි සිතා තනිව කියම්මැ”යි කියේය. “පඤ්චාලවාසී ජනයන්ට උත්තම වූ රාජෝත්තමය, යම් කෙනෙකුන් අපට යමක් ඉල්වූ කල බොහෝ නොලැබෙයි සිතා නොයිල්වූයේය. අනික් කන්නලව්වෙක් මේ මිසක් නැත, මෙපමණක්ම අපට සෑහෙයි” කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු “නුඹ වහන්සේ කී මේ ගාථාවෙහි ප්‍රසන්නවූ මම නුඹ වහන්සේට රාජ්‍යයත් දෙමි, රථ දහසකුත් දෙමි, නුඹ වහන්සේ කැමති පරිද්දෙන් මෙකී දෙය ප්‍රයෝජන උවමැනවැ”යි කීහ.

එවිට තාපසයෝ කියන්නාහු “මහරජ, පඤ්චකාමයෙහි ආදීනම දැක සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව හිමාලය වනයට ගියෙමි. එසේහෙයින් අපට වස්තුවෙන් ප්‍රයෝජන නැත. මේ පත්කුඩය හා වහන්සඟලත් පමනැ”යි කියා අරගෙන රජ්ජුරුවන්ට පන්සිල් රකුවයි අවවාද දී හිමායල වනයට ගොස් පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා නොපිරිහුනු ධ්‍යානයෙන් කම්වු පරිද්දෙන් බඹ ලොව ගියහයි වදරා මේ ‘බ්‍රහ්මදත්ත ජාතකය’ නිමවා වදාළසේක.

"එසමයෙහි බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ නම් ආනන්දස්ථවිරයෝය. තාපසව උපන්නෙම් බුදුවූ මම්ම වේදැ"යි වදාළසේක.

# 317. චම්මසාටක ජාතකය

තවද මෙසේ පූජාර්හවූ (පූජා ලැබීමට සුදුසුවූ) සර්‍වඥයන් වහනසේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි චම්මසාටක (හම් සලුවක්) නම් පරිබ්‍රාජකයෙකු (පිරිවැජියෙකු) අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

චම්මසාටක නම් පරිබ්‍රාජකයෙක් සැවැත්නුවරට යන්නාහු පොර අන්නා එළුවන් දෙන්නකු දැක නවතන්ට යයි සිටියාහ. ඉන් එළුවෙක් පරිබ්‍රාජකයන් දැක පසුබස්නේය. පරිබ්‍රාජකයෝ තමන්ට ආදර කෙරෙතියි සිතා කොයිත් නොගොසින් සිටියාහ. එළුවා දිවගෙන අවුත් පරිබ්‍රාජකයන්ගේ කලවය ඇන පලාගියේය. මේ කථාව ධම්සභාවෙහි රැස්වූ සංඝයා වහන්සේ කිය කියා වැඩ උන් තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පුර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා ආරාධිත වූ සර්‍වඥයන් වහනසේ ඉකුත් වත් දක්වා වදාළසේක.

එ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි චම්මසාටක නම්

පරිබ්‍රාජකයෙක් විටියේ යමින් සිටියේය. එළුවෝ දෙන්නෙක් පොරඅනිමින් සිටියාහ. පරිබ්‍රාජකයෝ එළුවන් දෙන්නා පොර අන්නා දැක "නවතිම්"යි සිතා සිටිකලට ඉන් එක් එළුවෙක් පරිබ්‍රාජකයන් දැක පසුබස්නේය. පරිබ්‍රාජකයෝ එළුවා තමන්ට සංග්‍රහ කරණ නිසා පසුබතියි සිතා කියන්නාහු "උතුම් ජාති ඇති එළුවානෝ මාගේ විශේෂ දත්තේය, එසේහෙයින් මම තොප වදිම් මමත් උතුම් ජාති ඇති බ්‍රාහ්මණ කුලයෙක උපනිම්"යි කිය කියා සිටිකල්හි පිළ උන් සෙට්ටියෙක් (වෙළෙන්දෙක්) පරිබ්‍රාජකයන්ට කියන්නාහු "එළුවා පසුබසිනේ ඇවිත් අන්ටය ඉවත්ව ගනුව"යි කියදිත් පරිබ්‍රාජකයෝ ඉවත් නොවි සිටියාහ. එළුවා දිවගෙණ අවුත් පරිබ්‍රාජකයන්ගේ කලවය ඇන හෙලාගත.

ඒ අර්ත්‍ථය දක්වන සර්‍වඥයන් වහන්සේ "මහණෙනි, බ්‍රාහ්මණ එළුවාට ස්තුතිකොට සිටිය ගමනේ එළුවා ඇවිත් කලවය ඇනහෙළා පියව"යි වදාළසේක.

බ්‍රාහ්මණයන් විටියේ ඇනුම් කා වැදහෙව කෙඳිරිගගා කියන්නෝ "යහපත් නියාව සත්පුරුෂකමෙක, යහපත් එකෙකැයි කියා නමස්කාර කළදීම ඇවිත් ඇවිත් එලාගෙන කලවය පලා ජිවිතක්‍ෂයට පමුණුවාපිය"යි වදරා මේ 'චම්මසාටක ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි පරිබ්‍රාජික නම් මෙසමයෙහිත් චම්මසාටක පරිබ්‍රාජිකමය, පිළඋඩ උන් සෙට්ටියා නම් බුදුවූ මම්මය"යි වදාළසේක.

# 318. ගොධ ජාතකය

තවද දශබලධාරීවූ (බල දහයක් දරන්නාවූ) සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කොහොන් තපස් කරන්නාවූ නමක් අරභයා මේ ජාතකය දක්වන ලදී.

එක් කොහොන් තපස් රක්නාවූ (කුහක තපස් රකින) නමක් සර්‍වඥයන් වහන්සේට දැන්වූ කල්හි සර්‍වඥයන් වහන්සේ "මහණෙනි, මේ දැන් මතුනොවෙයි පෙරත් කොහොන් කෙළේ වේදැ"යි වදරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙක් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ ගෝව (තලගොයෙක්ව) ඉපිද එක් තුඹසෙක වාසය කරන්නාහ. බෝධිසත්‍වයන් වාසය කරන්නාවූ ස්ථානයට නුදුරු තෙනක එක් කූට තාපසයෙක් (කපටි තවුසෙක්) වෙසෙයි. බෝධිසත්‍වයෝ "මූ ගුණ ඇති තාපස කෙනෙක් දෝ හෝ" සිතා උන් ලඟට ගොස් වැඳ පුදා එන්නාහ එක් දවසක් ගෝමස් (තලගොයි මස්) සහිතව භෝජනයක් උපාසකවරු ඒ තාපසයන්ට දුන්නාහ.

තාපසයෝ "මේ කුමන මාංසයක් දැ"යි විචාරා "ගෝමාංසය"යි යනු අසා "අප දකින්ට එන්නාවූ ගොයාන කෙණෙක් ඇත, උන් මරා මාංසය අනුභව කෙරෙමි"යි සිතා

උපසාක වරුන්ට කියා සාල් ළුනු මිරිස් පත්කඩ (සමෙන් කල හිඳගන්නා උපකරණයක්) ආදිවූ දෙය ගෙන්වා තබාගෙන පොල්ලකුත් සැස කඩ යට තබාගෙන ගොයානන් එන පෙරමග බල බලා උන්නාහ.

ඒ වෙලාවට ගොයානෝත් එතනට අවුත් තාපසයන් ඉඳිනා නියායෙන්ම "අද තාපසයන් ඉඳිනා අහංකාරයම (පෙනුම) නපුරු"යි සිතා යටි සුලගට ගොසින් තාපසයන් ඇගින් හමන ගන්‍ධය ආඝ්‍රාණය (ඉව අල්ලා) කොට ගෝමස් කෑ නියාව නියම දැන ඉවතින් (මග හැර යාමට) යන්නට වන්නාහ. තාපසයෝත් තමන් ලගට නෑවිත් ගොයාගේ වලාධිය (වලිගය) ලගින් නික්මෙන්නා කසාකඩ (කහ පාට රෙද්ද) යටතිබූ පොල්ල ඇරගෙණ දමාලා ගැසීය. දමාලු පොල්ල ගෙයාගේ වලධිය ගෑවිගෙන ඉවත පලාගියේය.

එවිට ගොයා වහා දිවගෙන ගොස් තුඹුසට වැද ගියේය. එවිට තාපසයා කියන්නේ "මා අතින් ගොයා ගැලවී ගියේ වේදැ"යි කීය. එවිට බෝධිසත්‍වයෝ කියන්නාහු "තා අතින් මා ගැලවුනු පමණක් විනා තෝ සතර අපායෙන් නො ගැලවුනේ වේදැ"යි කියා තුඹුසට වැද අනික් තුඹස් කටකින් ඉස එලියට පොවා "එම්බල තාපසය. තා කාසාය වස්ත්‍රයකුත් පොරවා අඳුන් දිවි සමින් හා ජටාවෙනුත් කම්කිම්දැ"යි කීහ.

එවිට තාපසයා කියන්නේ "එම්බල ගොයානෙනි, මාගේ ගෙයි සාල් තෙල් ළුනු මිරිස් ආදිවූ දෙය ඇත, ඇවිත් ඒ ඇම කාපියව"යි කීහ. එවිට ගොයා කියන්නේ "තාගේ සාල්

ළුනු මිරිස් තෙල් ආදිවූ දෙයින් මට ප්‍රයෝජන නැත. මා ඉදිනා තුඹස ගැඹුර සියක් රියනක් පමණ ඇතැ"යි කියා හයගන්වා "එම්බල තාපසය, තෝ මෙවක් පටන් මෙතන රැඳුනෙහි නම් තාගේ ප්‍රවෘත්තිය උපාසකරුන්ට කියමි"යි කීහ. "ඒ තාපසයාත් එතකින් පලාගියේය"යි වදරා මේ 'ගොධ ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි කූටතාපස නම් මෙසමයෙහි කූට භික්‍ෂුහුය. ගොධව උපන්නෙම් බුදුවූ මම්ම වේදැ"යි වදාළ සේක.

# 319. කක්කාර ජාතකය

තවද සියළු සත්ත්වයා ජාතිකාන්තාරයෙන් (ඉපදීම නැමති කාන්තාරයෙන්) එතර කරණ හෙයින් ශාස්තෘ (ගුරුවරයා, මග පෙන්වන්නා) නම් වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දෙවදත්ත ස්ථවිරයන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

එක් දවසක් දම්සභාවේ රැස්වූ සංඝයා වහන්සේ "දෙවදත්ත ස්ථවිරයන් සංඝභෙද කියා සංඝයා බිඳුව අකුසලයෙන් රත්පිත් (උමතු ගතිය, ලෙයට පිත මිශ්‍රවීමෙන් සෑදෙන රෝග) නගා බොහෝ දුකට පැමිණියෝ වේදැ"යි කිය කියා උන් තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදරා "මහණෙනි, මා එන්නට පූර්‍ව භාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා වදරා එපවත් අසා "දැන්මතු

නොවෙයි මහණෙනි, පෙරත් මේතෙම මුසාවාද කියා බොහෝ දුකට පැමිණියෝ වේදැ”යි වදාරා “ඒ කෙසේදැ”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි දෙලොස් යොදුන් බරණැස් නුවර දිව්‍යපුත්‍රයෝ සතරදෙනෙක් කක්කාරි නම් මල්සොළු (මල් වඩම් විශේෂයක්) සතර බැඳගෙන අවුත් ආකාශයෙහි සිටියාහ. ඒ මලෙහි සුගන්‍ධය දෙලොස් යොදුන් බරණැස් නුවර ඒකසුගන්‍ධව ගියේය.

එවිට මනුෂ්‍යයෝ “මේ කුමන සුගන්‍ධයක්දැ”යි කියන්නට වන්නාහ. එවිට දිව්‍යපුත්‍රයෝ සතරදෙන ආකාශයෙහි දිව්‍යාත්මභාවයෙන් සිට මේ කක්කාරික මලෙහි මල් ලැබ ඉන් එක් පුරුෂයෙක් කියන්නේ “තොපට දිව්‍යලෝකයෙහි මල් ලැබෙයි මට තෙල් මල් සොළුව දිපියව”යි කීහ. ඉක්බිති එක් දිව්‍යපුත්‍රයෙක් කියන්නේ “යමෙක් තෙමේ අනුන් සන්තක තෘණසලාක මාත්‍රාවකුදු ඇරගනීද, යමෙක් තෙම වචසින් (වචනයෙන්) මුසා බොරු ජීවිත පරිත්‍යාග කෙරෙත් මුත් නොකියාද හෙවත් යමෙක් තෙමේ කායද්වාර වචිද්වාරයෙන් වදනා දස අකුසල කර්‍මපථයෙන් දුරුකොට දසකුසල කර්මපථයෙහි යෙදී වාසය කෙරේද, යමෙක් තෙම ඓශ්වර්‍ය්‍යීත් (සම්පතක්) ලදින් කුශල කර්මපථයෙහි අප්‍රමාද වේද, එබඳු උත්තම පුරුෂ තෙමෙ දෙවියන් පලඳිනා

කක්කාරික දිව්‍ය පුෂ්ප සතර ප්‍රසාධනය (පැලඳ ගන්නට) කරන්නට සුදුසු යයි" කීහ.

එවිට බ්‍රාහ්මණයා "මෙකී ගුණයෙන් මට එකගුණයකුත් නැත, බොරු කියා මේ දිව්‍ය පුත්‍රයා අතින් මල්සොළුව ඇරගත මැනවැ"යි තමාගේ නැතිගුණ ඇතැයි කියා ඒ දිව්‍ය පුත්‍රයා අතින් මල්සොළුව ඉල්වාගෙණ අනික් දිව්‍ය පුත්‍රයා අතින් මල්සොළුව ඉල්වීය. ඒ දිව්‍යපුත්‍ර කියන්නේ "යමෙක් තෙමේ කෘෂි වනික් ආදිවූ ධාර්මික ජිවිකාවෙන් වේවයි රාජකාරිය කිරීමෙන් වේවයි විරති (වෙන්වීම) රජත ස්වර්ණ යනාදී වස්තු ධාර්මික වූ ජිවිකාවෙන් සොයන්නේද, යමෙක් තෙමේ වචනාදී ප්‍රයෝගයෙන් මෙරමා (අනුන්) සන්තක වස්තුව නොගනීද, යමෙක් තෙමේ වස්ත්‍රාභරණාදීවූ උපභෝග පරිභෝග (චංචල නිශ්චල) වස්තු ලදින් දස අකුශල කර්‍මපථ දුරුකොට කුසලකර්‍මපථයෙහි යෙදී අප්‍රමාදව වාසය කෙරේද එබඳු උත්තම පුරුෂ තෙමේ කක්කාර දෙවියන් ප්‍රසාධනය කරන්නාවූ කක්කාර නම් දිව්‍ය පුෂ්පය පලඳින්ට යොග්‍යයයි" කීය.

එවිට බ්‍රාහ්මණයා "මෙකී ගුණයෙන් එක් ගුණයක් මා කෙරේ නැත. බොරු කියා මූ අතින් මල්සොළුව ගනිමියි" තමාගේ නැතිගුණ ඇති නියාවට අඟවා ඒ දිව්‍ය පුත්‍රයා අතින් මල්සොළුව ඇරගෙණ අනික් දිව්‍යපුත්‍රයා අතිනුත් ඉල්වීය. ඒ දිව්‍ය පුත්‍රයාත් කියන්නේ "යමක්හුගේ සිත වහා නොබිඳේද, ක්ෂණයෙක්හි අස්වාමිව මායා වීරියෙහි වැදගත්

කසා පරිද්දෙන් ස්වභාව ඇත්තේද, යමක්හුගේ ශ්‍රද්ධා ලෞකික ලෝකෝත්තර තොමෝ කිසිවක්හු විසින් නොබිඳිවිය හැකිද, හුදකලාව මියුරු රසයක් ලබන්ට සුදුසු ශ්‍රමණ බ්‍රහ්මණයන්ට නොදී අනුභව නොකෙරේද, ඒ උත්තම පුරුෂ තෙමෙ දෙවියන් පලඳිනා කක්කාරික දිව්‍ය පුෂ්ප සතර ප්‍රසාධනය (පැලඳ ගන්නට) කරන්නට සුදුසු යයි" කීහ. ඒ බ්‍රාහ්මණයා "මෙකී ගුණයෙන් එකකුත් මට නැත, බොරු කියා මේ දිව්‍ය පුත්‍රයා අතින් මල්සොළුව ඇරගත මැනවැ"යි සිතා තමාගේ නැති ගුණ කියා ඒ දිව්‍යපුත්‍රයා අතින් මල්සොළුව ඇර ගෙණ සතරවෙනි දිව්‍යපුත්‍ර අතිනුත් මල්සොළුව ඉල්විය.

ඒ දිව්‍යපුත්‍රයා කියන්නේ "යමෙක් තෙමේ සම්මුඛයෙහි වේවයි අසම්මුඛයෙහි වේවයි ශිලශ්‍රැතාදී (සිල්වත්කම හා උගත්කම) ගුණයෙන් යුක්ත පුරුෂතෙමේ මේ කක්කාරී නම් දිව්‍ය ප්‍රසාධනය කරන්ට සුදුසුය"යි කීය. එවිට බ්‍රාහ්මණ තෙමේ "මෙකී ගුණයෙන් එකගුණයකුත් මා කෙරේ නැත, මාගේ නැති ගුණකියා මූ අතිනුත් මල්සොළුව ඇරගනිමි"යි බොරුකියා ඒ දිව්‍යපුත්‍රයා අතිනුත් මල්සොළුව ඇරගෙණ "මෙසේ දිව්‍යපුත්‍රයන් සතරදෙනෙකු අතින් මල්සොළු සතරක් ඇරගෙණ ඉස බැඳගතිමි. ඒ වෙලෙහි පටන් මට ඉස රුජාව පැහැර බොහෝ දුක්බය"යි කීය. "එසේකල තා හිසින් මල් සොළුව ඇරපියව"යි කීහ. අරින්ට වන්විටක් ඉසින් නොහැරෙයි බ්‍රාහ්මණයා බොහෝසේ පෙලෙන්නේය. රජ්ජුරුවෝ "කළමනා කින්දැ?"යි අමාත්‍යයන් විචාළාහ. අමාත්‍යයෝ කියන්නාහු "ස්වාමිනි, දෙවෙනිවත් නුවර සරහා

උත්සව කෙළිම්හ. දිව්‍යපුත්‍රයෝ සතරදෙන එවිට එන්නාහු උන් ආකල ඉස රුජාව ගුණකරම්හ''යි කිහ. රජ්ජුරුවෝත් ''යහපත ඒ ක්‍රියාවට පූජාකරව''යි කියා නුවර සරහා පූජාව පටන්ගත් කල්හි දිව්‍යපුත්‍රයෝ සතරදෙනා ආහ. එවිට බ්‍රාහ්මණ දිව්‍යපුත්‍රයන් සතරදෙනා වැඳගෙන හෙව ''ස්වාමිනි, මම මගේ නැති ගුණ කියා මල්වට ඇරගතිමි, මාගේ ප්‍රාණදනය (පණ දන් දීම) දුනමැනවැ''යි කීය. එවිට දිව්‍යපුත්‍රයෝ සතරදෙනා ''බොරු කිවායේ විපාක දුටුයේද? මෙවක්පටන් බොරු නොකියව''යි අවවාද කියා ''මල්වට සතර ඔහු හිසින් ඇරගෙණ දිව්‍යලෝකයට ගියහ''යි වදාරා මේ 'කක්කාර ජාතකය' නිමවා වදාළසේක.

''එසමයෙහි බ්‍රාහ්මණයා නම් දේවදත්ත ස්ථවිරය, දිව්‍යපුත්‍ර සතරදෙනාගෙන් එක්කෙනක් කාශ්‍යප ස්ථවිරය, එක්කෙනෙක් මුගලන් මහා ස්ථවිරය, එක්කෙනෙක් සැරියුත් මහා ස්ථවිරය. වැඩිමහළු දිව්‍යපුත්‍ර නම් බුදුවූ මම් ම වේදැ''යි වදාළසේක.

## 320. කාක ජාතකය

තවද සියලු සංස්කාර ධර්‍මයන් (කුසල් අකුසල්) ගුරුපදේශයක් නැතිව ස්වයම්භූඥනයෙන් (තමාගේම නුවණින්) දත්හෙයින් සර්‍වඥ නම් වූ බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් ස්ත්‍රියක් කෙරෙහි තෘෂ්ණාවූ භික්‍ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්?

එක් ස්ත්‍රියක් කෙරේ අභිලාෂවූ (ලොල්වූ) භික්‍ෂු කෙණෙකුන් වහන්සේ ගෙණවුත් සර්‍වඥයන් වහන්සේට දැක්වූ කල්හි "සැබෑද මහණ, තා ස්ත්‍රියක් කෙරෙහි තෘෂ්ණාව ඇතිවුයේදැ?"යි විචාළ කල්හි "සැබැව ස්වාමීනි" කී කල්හි "එඹල මහණ, ඉඹුල්වනයෙහි ලා රැකගත නුහුන ස්ත්‍රීන්ට තොප ආලය කරන්නේ කවරකටදැ?"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ ඒ රජ්ජුරුවන්ගේ බිසවුන්කුස පිළිසිඳ ඉපිද වැඩි විය පැමිණ පිය රජ්ජුරුවන්ගේ ඇවෑමෙන් රාජ්‍යයට පැමිණියාහ.

රජ්ජුරුවන්ගේ කාකදේවි නම් අග්‍රමෙහෙසිකා බිසෝකෙණෙක් ඇත්තාහ. ඉතා විශේෂී වූ රූප ඇත්තාහ. ඒ බිසවුන්ගේ රූපශ්‍රී ඉදිරියෙහි කියන්නාවූ කුනාල ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය. ඒ රජ්ජුරුවන් හා එක් ගුරුලෙක් මනුෂ්‍ය වේශයෙන් අවුත් රජ්ජුරුවන් හා කැටිව දූ කෙළි කෙළ උන්නේය. කලාතුරකින් බිසවුන් කෙරෙහි අභිලාෂ ඇතිව තමාගේ ඉඹුල් වනයේ තබාගෙණ ඉදිනේය. රජ්ජුරුවෝත් බිසවුන් නොදැක "මාගේ බිසව් කොයි පලාගියේ දෝ හෝ"යි වික්‍ෂේපයට (කළකිරීමට) පැමිණියාහ.

නට්ටකච්රූ නම් ගාන්ධර්වයෙකු (අහසෙහි සැරිසරන දේව විශේෂයක්) කැඳවා මෙපවත් කියා "තා දන්නා යම් සැටියකට බිසවුන් ගිය යම් තැනක් පරීක්‍ෂා කරව"යි විධාන කළාහ. ඒ ගන්ධර්වයාත් "මීට කාරණා කින්දැ"යි පරීක්‍ෂා කොට අනික් කාරණයක් නොදැක "රජ්ජුරුවන් වහන්සේ හා දූ කෙළිනා පුරුෂයා වින අනික් සැකයෙක් නැත. මූ පරීක්‍ෂා කරන්නට උවමැනවැ"යි රජ්ජුරුවන් හා දූ කෙළාපියා ගුරුළා නික්මෙන්නාවූ පසුපස්සේ ගොසින් තමාගේ යෙල සියයක් යොදුන් (යොදුන් එකසිය පනහක්) ගුරුළු වේසය මවා ගන්නා පියාපත් අස්සේ ගාන්ධර්වයා සැඟවී වැද උන්විට ගුරුළු රාජයාත් සමුද්‍ර මධ්‍යයෙන් ගොස් ඉඹුල් වනයට ගියේය. ඒ ගාන්ධර්වයාත් ඒ බිසවුන් හා කැටිව සංවාසයකොට කීප දවසක් ඉඹුල් වනයේ රඳා දෙවෙනිවත් ගුරුළු රාජයාගේ පියාපත් අස්සේ සැඟවී අවුත් ගුරුළුවා හා සමග රජ්ජුරුවන් දූ කෙළිනා තැනසිට "මේ වෙලාවට කාකදේවි ගුරුළු විමානයෙහි ඉඳිනා නොවේදැ?"යි කීහ.

එවිට ගුරුළා කියන්නේ "මහාසමුද්‍රය හා ගංගාවක් හා සීදන්ත සාගරය ඇතුළු වූ සත්තමහා සාගරයෙන් (සාගර හතකින්) එපිට ඉඹුල්වනයෙහි කැදැල්ලේ උන්නාවූ බිසවුන් තා දුටුවේ කෙසේදැ?"යි කීහ. එවිට ගාන්ධර්වයා කියන්නේ "තොපගේ පියාපත් අස්සේ සැඟවීගෙණ ගොසින් තොපගේ ඉඹුල්වනයේ දෙතුන් විටක් රඳා දෙවැනිවත් තොපගේම පියාපත් අස්සේම සැඟවීගෙන ආමි" කීහ. එවිට ගුරුළු රාජයා "මෙසේවූ තැන ඉඳත් රැකගත නොහැක්කාවූ ගෑනුන්

මට ප්‍රයෝජන කින්දැ?''යි බිසවුන් ගෙනවුත් රජ්ජුරුවන්ට පාවාදී එවක්පටන් රජ්ජුරුවන් හා කැටිව දූ කෙළින්ට නොආයේය''යි වදාරා මේ 'කාක ජාතකය' නිමවා වදාළසේක.

''එසමයෙහි නට්ටකචිරු නම් ගාන්ධර්‍වයා දැන් මේ උකටලී භික්ෂූහුය, බරණැස් රජව උපන්නෙම් බුදුවූ මම්ම වේදැ''යි වදාළසේක.

# 321. අනනුසොචිය ජාතකය

තවද දීපදෙත්තමවූ (ලොවට උතුම් වූ) සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි භාර්‍යාවක් මළාවූ කෙළෙඹි පුත්‍රයෙකු අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

එක් කෙළඹි පුත්‍රයෙකුගේ බිරින්දක් මළාය. ඒ කෙළෙඹි පුත්‍ර තමාගේ බිරින්ද මළාවූ ශෝකයෙන් බොහෝ විකේෂ්පව (කලකිරී) උන්නේය. සර්‍වඥයන් වහන්සේ ඒ කෙළඹි පුත්‍රයා සෝවාන්වන්ට හේතුසම්පත් ඇති නියාව දැක වදාරා කුඩා භික්ෂු කෙණෙකුන් වහන්සේ පස්සේ යවා කෙළඹි පුත්‍රයාගේ ගෙට වැඩ වදාළසේක. කෙළඹි පුත්‍රයා සර්‍වඥයන් වහන්සේට ඉඳිනා අසුන් පණවා වැඳ එකත් පස්ව උන්නේය. සර්‍වඥයන් වහන්සේ ''කිමෙක්ද උපාසකය විකෙෂප උනා?''යි වදාළසේක. කෙළඹි පුත්‍රයා කියන්නේ ''ස්වාමිනි, මාගේ බිරින්ද මළ හෙයින් විකෙෂපව උන්නෙමි'' කීහ. සර්‍වඥයන් වහන්සේ වදාරණ සේක් ''උපාසකය, නස්නා සුළුවූ යම්දෙයක් නස්සී. මළවුන්ට ශෝක

කරන්නට කාරණා කින්ද? පෙර උත්තමයෝ මළවුන්ට ශෝක නොකළෝ වේදැ''යි වදරා ''ඒ කෙසේදැ''යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ බ්‍රාහමණ කුලයෙක කුමාර බ්‍රහ්මචරියායෙන් (කුමර බඹසර) වාසය කරන්නාහ.

මෙහි වර්ථමාන කථාව දසවෙනි නිපාතයෙහි චුල්ල බෝධි ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය.

මව්පිය දෙදෙන ''අපගේ පුතනුවන්ට ඇස්සමුවේ (ඇස් ඉදිරිපිට) කුටුම්බසණ්ඨාපනය (යුග දිවියට) කරන්ට උවමැනවැ''යි කියා පුතනුවන් කැඳවා කියන්නාහු ''තොපට නිසි බ්‍රාහ්මණ කුලයකින් කුමාරිකාවක් පරීක්‍ෂා කොට කියව''යි කීහ. එවිට බෝධිසත්‍වයන් වහන්සේ කියන සේක් ''මට ගිහි ගෙයින් කම්කිම්ද? නුඹ වහන්සේලා දෙදෙන ඇතිතෙක් දවස් අත් පා මෙහෙකොට නුඹ වහන්සේගේ ඇවෑමෙන් වනයට ගොස් තපස් කෙරෙමි. මට බිරින්දගෙන් කම් කිම්දැ?''යි කීහ. එවිට බෝධිසත්‍වයන්ගේ දෙමාපියන් කීපවාරයෙකම ''කුටුම්භසණ්ඨාපනය කළ මැනව''යි කියා යවූ කල්හි බෝධිසත්‍වයන් වහන්සේ ''දෙමාපියන් කීවාට උත්තර කීම සත්පුරුෂයන්ට යුක්ති නොවෙයි. මාගේ දෙමව්පියන්ට බැරි දෙයක් කියායවමි. රන් රුවක් කරමි. මේ රූ නියාවට රූපත්

කුමාරිකාවක් ලදින් නම් ගිහිගෙයි වාසය කෙරෙමියි" රන්රුවක් කරවා දෙමාපියන් ලඟට යවිහ. මව්පියෝ දෙදෙනත් "යහපතැ"යි කියා රන්රුව රථයක තබා "මේ රන්රුව නියාවට කුමාරිකාවක් පරීක්ෂා කොට එව"යි බමුණන්ට ප්‍රසාද (තෑගි) දී යවුය. ඒ රන්රුව ඇරගෙණ නුවරක් නුවරක් පාසා ඇවිදිනා කල්හි බඹ ලොවින් චුතව බ්‍රහ්මයෙක් අවුත් එක් කසීගමෙක බමුණු කුලයක සම්මිල්ලවාහිනී නම් කුමාරිකාව උපන. එබමුණෝත් තමන් ගෙණගිය රන්රුව මග තබලා වුන්නාහ. මග යන බමුණෝ "ඇයි සම්මිල්ලවාහිනී නම් කුමාරිකාව මෙතන සිටිනැ"යි කීහ. එවිට බමුණෝ එතනට අවුත් "මේ රන්රුව හා සාදෘෂ්‍ය (සමාන) කුමාරිකාවක් ඇද්දැ"යි විචාරා "ඇත"යි යනු අසා ඒ රන්රුව ඇරගෙණ ඒ බ්‍රාහ්මණයාගේ ගෙට ගොසින් එපවත් කීහ.

ඒ කුමාරිකාවගේ දෙමව්පියෝ "යහපතැ"යි ගිවිස එපවත් කුමාරිකාවන්ට කීහ. කුමාරිකාව බ්‍රහ්මලෝකයෙන් ආ හෙයින් පඤ්චකාමයෙහි ඇල්මක් නැතිව කියන්නාහු "නුඹ වහන්සේලා දෙදෙන ජීවත්ව ඉන්නාතෙක් දවස් අත් පා මෙහෙකොට නුඹ වහන්සේලා ඇවෑමෙන් තපස් කෙරෙමි"යි කීහ. එවිට දෙමාපියයෝ "මුන් කීවාද අප කරන්නේ? මූ උරණව කුමක් කෙරෙද්දැ"යි කීයා නොකැමැති කරවාම සරණපාවා දුන්හ.

ඒ බමුණෝත් කුමාරිකාව ගෙණගොස් බෝධිසත්ත්වයන්ගේ දෙමාපියන්ට පෑහ. බෝධිසත්ත්වයන්ගේ දෙමාපියෝත් කුමාරිකාව දැක සතුටුව බෝධිසත්ත්වයන් නොකැමැති කරවාම එකගෙයිලා විවාහ මගුල් කළාහ. ඒ කුමාරිකාවත් බඹලොවින් ආ හෙයිනුත් උන්ගේ මුහුන පමණකුත් කෙලෙස් වශයෙන් නොබලා බඹුන් දෙදෙනකු මෙන් වාසය කරන්නාහ.

මෙසේ වාසය කරණ කල්හි බෝධිසත්ත්වයන්ගේ දෙමව්පියෝ කාලක්‍රියා කළාහ. ඒ බෝධිසත්ත්වයෝ දෙමව්පියන් ආදාහන කරවා තමන්ගේ සම්මිල්ලවාහිනී නම් භාර්‍ය්‍යාවන්ට කියන්නාහු "සොඳුර, මාගේ දෙමව්පියන්ගෙන් ගෙනා අසූකෙළක් වස්තු ඇත. මාගේ වස්තුවත් තොපගේ වස්තුවත් ඇරගෙණ ජීවත්වෙව. මම තපසට යෙමි" කීහ. සම්මිල්ලවාහිනී නම් කුමාරිකා කියන්නී "නුඹ වහන්සේ අළුයම දමාපු කෙළපිඬක් මාගේ ඉස්මුදුනෙන් පිළිගන්නාක් මෙන් නුඹ වහන්නේ ඇරපු සම්පත් මම පිළිගණිම්ද? නුඹ වහන්සේ තපසට යනකල මම තපසට නොයන්නෙම්දැ?යි මමත් තපසට යෙමි" කීහ.

බෝධිසත්ත්වයන් වහන්සේත් "යහපතැ"යි ගිවිස වනයට ගොස් ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පන්සල් කොට වාසය කරන්නාහු කල්යාමකින් ළුනු ඇඹුල් සෙවුනා පිණිස බරණැස් නුවරට අවුත් ගෙපිළිවෙළින් සිඟා ඇවිදිනා කල්හි සම්මිල්ලවාහිනී නම් පරිබ්‍රාජිකාව පළමු දුකක් නුදුටු හෙයිනුත් මෘදුවූ ශරීර හෙයිනුත් උනු සිහිල් බත් වැලඳීමෙන් රක්තාතීසාර (පාචන රෝගයක්) ඇතිවිය. බෝධිසත්ත්වයන්

වහන්සේත් පරිබ්‍රාජිකාවන් වඩාගෙණ ගොස් වාසය කළා. තමන්වහන්සේ සිඟාගොස් එනකල සම්මිල්ලවාහිනී නම් පරිබ්‍රාජිකාවන්ගේ ප්‍රාණය නිරුද්ධව ගියේය.

බොහෝ මනුෂ්‍යයෝ එක්ව "මෙසේවූ රූපශ්‍රීයක් ඇති පරිබ්‍රාජිකාවන් නට නියාය"යි කිය කියා අඬන්නාහ. බෝධිසත්වයයෝ එතනට ගොස් මළ පරිබ්‍රාජිකාවන් දැක "නටමනා (නැසෙන) වස්තුව නැසුනේය"යි සිත සිතා උන් මිය පියා වැදහෝනා පෝරුව මත්තේ ඉන්දදීම බත් වළඳා අත කට සෝදා බැණ නොනැගීම උන්නාහ. එවිට එතනට රැස්වූ මනුෂ්‍යයෝ "තාපසයන් වහන්ස, මේ පරිබ්‍රාජිකාවන් වහන්සේ ගිහිකල නුඹ වහන්සේ කෙසේ වාසය කළසේක් දැ?"යි විචාළාහ. "එම්බා මුනුෂ්‍යයෙනි, මේ පරිබ්‍රාජිකා මා ගිහිකල මට පාදපරිචාරිකාව (බිරිඳ) උන්හ"යි කීහ. එවිට මනුෂ්‍යයෝ කියන්නාහු "ස්වාමීනි, අපි හැම මේ පරිබ්‍රාජිකාවුන් වහන්සේගේ රූප ශ්‍රී දුටු පමණකට ලය වාවාගත නොහී බොහෝ දුකින් අඬම්හ. නුඹවහන්සේට පාදපරිචාරිකාව බොහෝ දුක්ගත් තැනැත්තන් වහන්සේ මළදී බැනනොනැගී ඉඳිනේ ඇයිදැ?"යි කිහ.

"එම්බා මනුෂ්‍යයෙනි, සම්මිල්ලවාහිනී ගිහි අවස්ථාවෙහි මට ඉතා ලෙන්ගතුව වාසය කළාහ. දැන් වනාහි මිය ගොසින් මළවුන් හා එකීභාවයට පැමිණියෝය. එසේ හෙයින් දැන් ඕ කවුරුද? ඕතොමය මම් වෙනමමය. එසේ හෙයින්ම උන්ඩ අඬා කාරිය කින්ද? මේ පැමිණෙන මුර්තුව (කනගාටුදයක

අවස්ථාව) නම් ඉන්දද්ය, සිටියද්ය, වැදහොත්ද්ය, ඇවිදිමින් සිටියද්යයි යන සතර ඉරියව්වෙන් කවර ඉරියව්වකද් මූර්තුවට ඇවිත් පැමිණෙන බවත් නොදැනෙයි. නටමනා දෙය නස්නේමය. උපන්නේ සැබැවිනම් මූර්තුවට පැමිණීම සැබෑමය. මමත් වනාහී අජරාමර එක්කෙණෙක් නොවෙමි. මමත් මූර්තුවට පැමිණෙන්නෙමි තමාට අඬන පමණක් විනා අනුන් මළාට ඇඬීමෙන් කාරිය කිම්දැ?"යි වදාරා බොහෝ දෙනාගේ ශෝක සංසිඳුවා හිමාලය වනයට වැඩ පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා නොපිරිහුනු ධ්‍යානයෙන් කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ"යි වදාරා චතුරාය්‍යී සත්‍යය ප්‍රකාශ කොට මේ 'අනනුසෝචිය ජාතකය' නිමවා වදාළසේක. චතුස්සත්‍ය දේශනාවගේ කෙළවර කෙළඹි පුත්‍රතෙම සෝවාන් පෙළෙහි පිහිටියාය.

"එසමයෙහි සම්මිල්ලවාහිනී නම් වූ බිසව් මෙසමයෙහි රාහුල මාතාවූ යසෝධරා ස්ථවිරය, තාපසව උපන්නෙමි බුදුවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේකි.

## 322. කාලබාහු ජාතකය

තවද විසුද්ධබුද්ධි සන්තාන (පිරිසිදු බුද්ධිමත් සිත් ඇති) ඇති අතුල්‍යවූ (අසමානවූ) ස්වභාවයෙන් තුන්ලොවට උතුම්වූ සම්මා සම්බුදු රජානන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වාසය කරණ සමයෙහි පිරිහුනු ලාභ සත්කාර ඇති දෙවදත්ත ස්ථවිරයන් අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ කෙසේද යත්?

දෙවදත්ත ස්ථවිරයන් විසින් බුදුන් කෙරෙහි නිස්කාරණයෙහි වයිර බැඳ දුනුවා ආදීන් යෙදූ කල්හි නාලාගිරි හස්තියා බුදුන් අභිමුඛයට මෙහෙයි. ඒ දෙවදත්ත ස්ථවිරයන්ගේ දෝෂ ගම් නියම්ගම් රාජධානියෙහි ප්‍රකාශ විය. ඉක්බිත්තෙන් ඒ දෙවදත්ත ස්ථවිරයන්ට නිරන්තරයෙන් පවත්වන ලද ආහාරාදිය මනුෂ්‍යයෝ පිරිහෙළුවාහුය (පැහැර හැරියාහුය). යහළු වූ අජාසත් රජ්ජුරුවෝද ඒ දෙවදත්ත ස්ථවිරයන් කෙරෙහි අගෞරවව ඔහුගේ මුහුණ පමණකුත් නොබලා නිස්සාර කොට ඇරපූයේය. එතෙම පිරිහුනාවූ ලාභසත්කාර ඇතිව කුලයන් විනවා (ඉල්ලාගෙන) වළඳන්නේය. මේ කාරණය ධම්සභා මණ්ඩපයෙහි වටින් රැස්වූ භික්ෂූන් වහන්සේ වදරණසේක් "ඇවැත්නි, දේවදත්ත ස්ථවිරතෙම තමාහට ලාභසත්කාර උපදවමින් උත්සාහ කොට උපන් ලාභසත්කාර ස්ථිර කොට පවත්වන්ට නොහැකි වූයේය"යි යන මෙබඳු කථාවක් පහළ කළාහුය. ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ ධම්සභා මණ්ඩපයෙහි ඉපද වූ කථාව දිව්‍යකණින් (දිවසින්) අසා වදරා එක්තරා ගමනකින් එතැන්හි වැඩ "එඹා මහණෙනි, මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා "ස්වාමීනි, නුඹ වහන්සේ විසින් නොකියන්ට වදාළ රාජකථා ආදීවූ දෙතිස් කථාවෙන් එක්තරා කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ. දේවදත්ත ස්ථවිරයෝ තමන් ලාභසත්කාර උපදවමි, උපන් ලාභසත්කාර ස්ථිරකොට ගත නුහුණුවෝදැයි යනාදීන් කිය කියා උනුම්හ"යි

බුදුන්ට දැන්වූ කල්හි “මහණෙනි, දැන්මතු නොවෙයි පෙරත් දෙවදත්ත ස්ථවිරයෝ ලාභසත්කාරයන් පිරිහුණෝ වේදැ”යි වදාරා භික්ෂූන් විසින් “ස්වාමිනි තිලෝගුරු බුදුරජානන්වහන්ස, අතීත චරියාව (හැසිරීම) භවයෙන් ප්‍රතිච්ජන්න (වැසුණු) හෙයින් භස්ම ප්‍රතිච්ජන්න(අලුයට සැඟවුනු ගිනි පුපුරක්සේ) ජාතවේදයක් සෙයින් අපට නො පෙණෙන්නේය. දැනෙන පරිද්දෙන් අපට වදාළ මැනැව”යි ආරාධිත වූ බුදුරජානන්වහන්සේ මහණෙනි,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි පුරණලද පාරමිතා ඇති අප මහබෝසතාණෝ රාධ නම් ගිරාව උපන්හ. ඒ ගිරාණෝ සෙසු ගිරවුන්ට වඩා සම්පූර්ණ වූ ශරීර අවයව ඇත්තේය. ඔහුගේ මල්වූ පොට්ඨපාද නම් ගිරවෙක් විය. එසමයෙහි එක්තරා වැද්දෙක් ඒ ගිරව් දෙන්නා බඳගෙණ ගොස් බරණැස් රජහට දුන්නේය. ඒ බරණැස් රජතෙම ගිරවුන් දෙන්නා රන් මැදිරියෙක ලා රන්තැටිල්ලෙක්හි (රන් තැටියක) මී හා විළඳ ලා කවමින් සකීරා (හකුරු) පැන් පොවමින් පෝෂ්‍ය කරන්නේය. මේ පරිද්දෙන් කරණ මහත් සත්කාරයෙන් ඒ ගිරවු ලාභයෙන් යසසින් අගපැමිනියහ. මෑතකාලයෙහි එක් වනචරයෙක් (වැද්දෙක්) කාලබාහු නම් එක් මහත් කළුවඳුරෙකු අල්ලා ගෙනගොස් ඒ බරණැස් රජහට දුන්නේය. ඒ වානරයාට පසුව ඉතා මහත් ලාභසත්කාරවිය. ගිරව් දෙන්නාට කරණ සත්කාරද ක්‍රමයෙන් අඩුවූයේය.

මහබෝධිසත්ත්වවූ රාධ නම් ගිරවාණෝ ඉතාදි ගුණයෙන් (අටලෝ දහමින් කම්පා නොවීම) යෙදුනු බැවින් හෙවත් උතුම්වූ සත්පුරුෂ ගුණයෙන් යුක්ත බැවින් කිසිවකුත් නොකියා ලත් ලත් ගොචර පමණින් යැපෙමින් උන්නේය. ඔහුගේ මල්වූ පොට්ඨපාද නම් ගිරවාණෝ වනාහි එබඳු උතුම් ගුණධර්‍මයක් තමාගේ සන්තානයෙහි නැති හෙයින් ඒ වානරයාට කරණ සත්කාර සහනය (ඉවසීම) නොකරන්නේය. “බෑනන් වහන්ස, පළමු මේ රාජභවනයහි මධුරවූ රස ඇති ඛාද්‍යාදිය (කෑ යුතුදේ) දැන් ඒ කාලබාහු වානරයාට මුත් අපට නැත්තේය. මේ ධනඤ්ජය රජුගෙන් ලාභසත්කාර නොලබන්නාවූ අපි දෙන්නා මේ ස්ථානයෙහි ඉඳ කෙසේ ජීවත්වමෝද? අවමැනව, වලට (වනයට) ගොස් වාසය කරම්හ”යි කියා රාධ නම් බෑනන්ට කීහ. ඒ අසා රාධ නම් ගිරවාණෝ කියන්නාහු “එම්බල පොට්ඨපාදය, මේ ලෝකයෙහි සියළු සතුන්ගේම යස පිරිවාර සමෘද්ධිය (වැඩිවීම) ලැබීමකදු වන්නේය. නැවත එයින් පිරීහිමද වන්නේය. යම්සේ විශේෂ ගුණයක් හේතුකොට ගෙණ කීර්තිලැබීමක්ද, නැවත ලද්දවූ කීර්තියගේ මලින භාවයට (මැලවුනු ස්වභාවය) පැමිණීමකුදු වන්නේය. එසේ හෙයින් සත්ත්වයන් කෙරෙහි මේ අෂ්ටලෝක ධර්‍මය (ලාභ, අලාභ, යස, අයස ආදිය) නිශ්‍රිතවූ (ඇසුරු කළාවූ) ආධ්‍යාත්මික බාහිර වූ සියලු සංකාර ධර්‍මයෝ නිත්‍යනොවන බැවින් ආද්‍රව (විනාශ) වන බැවින් අනිත්‍යයහ. මේ යථොක්ත අෂ්ටලෝකධර්‍මයෙන් විනිර්මුක්ත (මිදුනාවූ) එකද සත්ත්වයෙක් නැත්තේය. එසේ හෙයින් ලාභසත්කාර අඩුවූ පමණකට ශෝක

කිරීමෙන් ප්‍රයෝජන නැත්තේය. එසේ හෙයින් බැගෑපත් නොවී බැණ නොනැගී ඉඳුව''යි කීයේය. ඉක්බිති පොට්ඨපාද නම් ගිරවා ඒ වානරයා කෙරෙහි කළ ඊර්ෂ්‍යාව පහකරන්නට නොහැකිව නැවත කියනුයේ "අනාගතයෙහි වන කාරණයන් ප්‍රඥාචක්ෂුසින් (නුවණැසින්) දකින්ට සමර්ථවූ රාධ නම් බැනන් වහන්ස, මේ පාපිෂ්ටවූ (පව්ටුවූ) කාලබාහු නම් වානරයා මේ රාජභවනයෙන් පහකොට පිටි දකින්ට උපායක් සිතුවමැනව''යි කීයේය. ඒ පොට්ඨපාදයාගේ වචනය ඇසූ රාධ නම් ගිරවාණෝ කියන්නාහු "එඹා පොට්ඨපාදය, මේ කාලබාහු නම් වානරතෙම ස්වභාවයෙන්ම චඤ්චලයහ. එසේ හෙයින් චඤ්චල වන්නේය. ක්‍ෂණ ක්‍ෂණයෙහි බැම බිඳ විසුලුපෑමෙන් විරූප දක්වා රාජකුමාරවරුන් ඒකාන්තව භය ගන්වන්නේය. උෟ පරිද්දෙන් කරණ විකාර හේතුකොට ගෙන ඔහු ලබන ආහාරාදිය දුරුවනනේය. එහෙයින් තමුන් විසින් තමා ලබන සත්කාර දුරු කොට තුමූගේ වැඩ තමුන්ම නසමින් සිටියදී තොප යුහුසුළුවන්නේ (ඉක්මන්වන්නේ) ඇයිදැ?''යි කියා මලනුවන්ට සෝක නොකරන්ට කියා අවවාදකොට සන්සිඳ වුයේය. ඒ රාධ නම් ගිරවානන් කී පරිද්දෙන්ම ඒ වානරතෙම කර්ණචලන (කණ් සෙලවීම) මුඛවිකාරාදියෙන් රාජකුමාරවරුන් භය ගැන්වූයේය. භයපත්වූ රාජකුමාරවරු භයින් ත්‍රස්තව (තැතිගෙන) බැගෑපත්ව මුරගැසුවාහුය. ඒ ඇසූ රජ්ජුරුවෝ "මේ කිමෙක්දැ''යි විචාළකල්හි රාජකුමාරවරුන් වඳුරාගෙන් භයපත්ව මුරගෑනියාව අසා "ඒ දුෂ්ට වඳුරා මෙතනනින් පහකරව''යි කියා පහකරවූවායි. ඒ රාධ නම් ගිරවාණන් හා

මළනුවන් පළමු පරිද්දෙන්ම ලාභ ස්තකාර මහත්ව ප්‍රකෘතිමත් වූයේයයි ශාස්තෲවූ තිලෝගුරු බුදුරජාණන්වහන්සේ මේ ‘කාලබාහු ජාතක’ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා පූර්‍වාපරසන්‍ධි ගළපා නිමවා වදාළසේක.

“එකල්හි කාලබාහු නම් දැන් මේ දේවදත්ත ස්ථවිර වන්නේය. එකල්හි පොට්ඨපාද නම් වුයේ මේ ආනන්ද ස්ථවිරය වන්නේය. එකල්හි පොට්ඨපාදයන් අවවාදයෙන් සන්සිඳවූ රාධ ගිරවාණෝ නම් දැන් මේ රාගාදී කෙලේශයන් ප්‍රහීණ (නැතිකොට) කොට තුන්ලෝ වාසීන් විඳිනා සියළු සසර දුක් සන්සිඳුවන දැන් බුදුවූ මම්ම වේදැ”යි තමන් වහන්සේ ගෙණහැර දක්වා වදාළ සේක.

# 323. සීලවීමංශ ජාතකය

තවද භාග්‍යවත්වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සීලවිමංස බ්‍රාහ්මණයා අරභයා මේ ජාතකය දක්වන ලදහ.

මෙහි වර්තමාන කථාවත් ජාතක කථාවත් පළමු කී ජාතකවල පෙනෙන්නේය.

මෙහි වනාහි බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රාහ්මණයෙක් සොරකම් කළේය. ඒ පුරෝහිත බ්‍රාහ්මණයා රජ්ජුරුවන්ට ගෙණ ගොස් පෑවාහ. රජ්ජුරුවෝ “ඇයි පුරෝහිත බ්‍රාහ්මණය, කුමක් නිසා සොරකම් කෙළෙහිදැ?”යි විචාළ කල්හි පුරෝහිත බ්‍රාහ්මණයා

කියන්නේ "රජ්ජුරුවන් වහන්ස, මාගේ වංශය උතුම් දේ හෝ යි ශීලය උතුම් දේ හෝ යි පරීක්‍ෂා කරන නිසා සොරකම් කෙළෙමි. සජීරාජයන් පවා කඩා නොකෑ පමණකින් සිල්වත්වූ යයි ගුණ අසා ගත්තුය. මම වනාහි සොරකම් කළ පමණකින් සොරයයි නින්දාවට පැමිණියෙමි. ඉතිකින් ගිහිගෙයින් මට කම් නැත. හිමාලය වනයට වැද තපස් කෙරෙමි" රජ්ජුරුවන් අතින් අවසර ඉල්වාගෙණ වනයට යන්නාහු අතරමග වීථියෙහි එක් උකුස්සෙක් මස් කැටියක් ඩැගෙණ ආකාශයට පැන නැංගේය. අනික් උකුස්සෙක් අවුත් ඔහු ඉස ටොකු ඇන( ඔලුවට කොටා) පියාපතින් ගසා ගහට කරන්ට වන. ඒ උකුසු වේදනාව ඉවසාගත නොහී මස්කැටිය හල. අනික් උකුස්සෙක් මස් කැටිය ඩැගත. මෙම නියායෙන් මස් කැටිය හළ උකුස්සාට ගහට නැත. ඩැගන යන උකුස්සාට ගහට කෙරෙති. බොහෝ උකුස්සෝ එක්ව මේ මස් කැටිය නිසා ගහට උනාහු පුරෝහිත බ්‍රාහ්මණයාණෝ ඒ දැක පඤ්චකාම ඇල්ම ඇතිව ගිහිගෙයි වාසය කිරීම නම් මේ උකුස්සා ඩැගත් මස්කැටිය වන්නැහි පඤ්චකාමයෙහි ආලය හැරපියා යන්නෙමි නම් මස් කැටිය හැරපියා ගියාවූ උකුස්සා වන්නැයි සිත සිතා යන්නාහු එක් දාසියක් පුරුෂයකු එන්ට කියා මග බල බලා ඉඳ පෙරයම් දසපැයත් නොනිදා ඉඳ මධ්‍යම දසපැයත් නොනිදා ඉඳ නේන හෙයින් අළුයම දසපැයේ නේතියි නියමකර ආලය හැර ඇඳේ නිදාපුව. බෝධිසත්ත්වයෝ පංචකාමයෙහි ආලය හැර වාසය කරන්නාවුන්ටත් මෙම නියායෙන් සැපවිඳීම වන්නේමැයි සිතා ඔබ්බට ගියකලට තාපසකෙනෙක් ගසක්මුල ඉඳ

භාවනාකොට ධ්‍යානයෙන් උන්නාහ. එවිට පුරෝහිත බ්‍රාහ්මණයාණෝත් මේ තාපසයන්සේම සැපවිඳිමියි වනයට වැද ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් (තාපස පැවිද්දේන්) පැවිදිව පඤ්චාභිඥා (උසස් ඥාණ පහ) අෂ්ටසමාපත්ති (සමාපත්ති අට) උපදවා ධ්‍යාන සුවයෙන් වැස නොපිරිහුනු ධ්‍යානයෙන් කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ"යි වදාරා මේ 'සීලවිමංස ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි පුරෝහිත බ්‍රාහ්මණව උපන්නෙම් බුදුවූ මම්ම වේදැ"යි වදාළසේක.

# 324. රථලට්ඨි ජාතකය

තවද දිවැස පැණැස (නුවණැස) මනැස යනාදීන් පඤ්චනේත්‍රයන් (ඇස් පහක්) ඇති හෙයින් චක්‍ෂුමත්වූ (ඇස් ඇත්තාවූ) සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝසල රජ්පුරුවන්ගේ පුරෝහිත බ්‍රාහ්මණයා අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්?

පුරෝහිත බ්‍රාහ්මණයා කෙත්වත් බලන්ටයයි රථයක නැගී එන්නේය. එක් පුරුෂයෙක් ඉදිරියට රථයක් පැදගෙණ එමින් සිටියේය. ඒ බ්‍රාහ්මණයා ගොස් තමා අත තිබූ කැවිටි දණ්ඩ දමාලා ඇන්න. ඒ කැවිටි දණ්ඩ රථයේ ඇනිලා දෙවෙනිව ඇවිත් ඒ බ්‍රාහ්මණයාගේ නලල ඇනී ගැට පැන නැංගේය.

"මේ පුරුෂයා මා මැරීය"යි බ්‍රාහ්මණයා ගොස් රජ්ජුරුවන්ට පැමිණියේය.

කොසොල් රජ්ජුරුවෝ ඒ විචාරා සනිටුහන් කළහයි මේ කථාව දම්සභා මණ්ඩපයේ රැස්වූ මාළුවරුන් වහන්සේ කිය කියා උන්තෙනට සර්‍වඥයන්වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නට පූර්‍වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා වදාරා මෙපවත් අසා "මහණෙනි, දැන් මතු නොවෙයි පෙරත් මේ බ්‍රාහ්මණයා රථයෙන් එන්නාවූ බ්‍රහ්මණයාට කැවිටින් ඇන සභායෙහි පැමිණියේ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ"යි ආරාධිත වූ සර්‍වඥයන්වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රාහ්මණයා කෙත්වත් බලන්ටයයි රථයකට නැගී නික්මින. එක් පුරුෂයෙක් ඉදිරියට රථයක් පැදගෙණ එමින් සිටියේය. තමා අත තුබූ කැවිටි දණ්ඩ දමාලා ඇන්න. ඒ කැවිට දණ්ඩ රථ සකෙහි වැදගෙණ ආපස්සේ පැන බ්‍රාහ්මණයා තමාගේ නලලට ඇනි ගැට නැගීය. පුරෝහිත බ්‍රාහ්මණයා "මේ පුරුෂයා මා මැරීයයි" කියා රජ්ජුරුවන්ට ගොස් පැමිණියේය.

රජ්ජුරුවෝ "මාගේ පුරෝහිත බ්‍රාහ්මණයා මරා නලල ගැට නැගු තැනැත්තවුන්ගේ සර්‍වයසස් (සියලු යසස්) ගනුව"යි කීහ. එවිට අධිකරණ නායකයෝ කියන්නාහු "දේවයන්

වහන්ස, යම් කෙණෙක් තමන් අතින් යමක් තමන්ට පැමිණියත් අනුන් පිට වරදවා කියන්නාහු ධර්මිෂ්ටව විචාරා වැරදි පක්‍ෂයකින් දඬගත්ත යුතුයයි, යම් ග්‍රහවාසීව ජීවත්වන්නාවූ යම් පුරුෂයෙක් තමාගේ කලමනා ගොවිතැන් ආදිවූ දෙයකට කුසීතවී නම් එයින් යහපත් නොවන්නේය. නොදැමුනාවූ ඉන්ද්‍රියයන් ඇති යම් තපස්වී කෙනෙක් ඇත්නම් ඒ තාපසයත් යහපත් නොවන්නේය. අපරීක්‍ෂාකාරී (විමසීමක් නැතිව) කීවන්ගේ බස් පස්සේ යන්නාවූ යම් රජෙක් ඇත්නම් එසේවූ අපරීක්‍ෂාකාරීවූ රජත් යහපත් නොවන්නේය. යම් පණ්ඩිතයෙක් කෝප වී නම් එසේවූ පණ්ඩිතයාගේ නුවනත් යහපත් නොවන්නේය. යම් රජ්ජුරුකෙණෙක් අපරීක්‍ෂාකාරී වීනම් ඒ රජ්ජුරුවන්ගේ යසස් කීර්තියත් අඩුවන්නේය. යම් රජ්ජුරු කෙනෙක් පරීක්‍ෂාකාරීහු වීනම් ඒ රජ්ජුරුවන්ගේ යසස් කීර්තියත් වර්ධනය වන්නේයයි කීහ.

එවිට රජ්ජුරුවෝ පුරෝහිත බ්‍රාහ්මණයා ගෙන්වා දබර විචාරා පුරෝහිත බ්‍රාහ්මණයාට වරදවා සනිටුහන් කළාහයි වදරා මේ ‘රථලට්ඨි ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි පුරෝහිත බ්‍රාහ්මණයා නම් පුරෝහිත බ්‍රාහ්මණයාමය, අධිකරණ නායකව උපන්නේ නම් බුදුවූ මම්මය”යි වදාළසේක.

# 325. ජඹුක ජාතකය

තවද දසබලධාරීවූ (බල දහයක් ඇති) සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමීපයෙහි දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදහ.

දෙවදත්ත ස්ථවිරයෝ සර්‍වඥ ශාසනයෙහි පන්සියයක් භික්‍ෂූන් වහන්සේ හා සමඟ ගයා ශීර්ෂ නම් විහාරයෙහි වසන කල්හි සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ දෙවදත්ත ස්ථවිරයන් වසන්නාවූ ස්ථානයට ගිය කල්හි දෙවදත්ත ස්ථවිරයෝ කියන්නාහු "සැරියුත් මුගලන් දෙනම අප සමීපයට ආතැන් පටන් සර්‍වඥයෝ නම් මම්මය"යි සිතමින් "ශාරිපුත්‍ර ස්ථවිරයෙනි, මාගේ වසට රිදෙයි (කොන්දේ අමාරුවක්) තොපි බණ කියන්නෝ යහපතැ"යි සැරියුත් ස්වාමින්ට කී කල්හි විජිනිපත්‍රය (වටාපත) අතට දී වැද හොත්තාහ.

උන්වහන්සේ පන්සියයක් භික්‍ෂූන් වහන්සේ අර්හත් මාර්ගයෙහි පිහිටුවා එකියන භික්‍ෂූන් වහන්සේ හා සමග දෙදෙනා වහන්සේ සර්‍වඥයන් වහන්සේ සමීපයට වැඩිකල්හි අවස්ථා නොදැන නිදන්නාවූ දෙවදත්ත ස්ථවිරයන් ලඟට කොකාලික ස්ථවිරයයෝ ගොසින් විළුඹෙන් ඇන "කුමන නිදිද? නිදන්නේ පන්සියයක් භික්‍ෂූන් වහන්සේ ඇරගෙණ සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ පලාගිය සේකැ"යි යනු අසා සෝකයෙන් ලේ තුන්කටක් නගා (ලේ වමනය කර) බොහෝ ආයාසයට (වෙහෙසට, පීඩාවට) පැමිණි නියාව සර්‍වඥයන් වහන්සේ අසා වදරා "එම්බා මහණෙනි, මාගේ

විලාසය ගෙන නටුයේ දැන් මතු නොවෙයි පෙරත් මාගේ විලාසය ගෙණ නටුයේ වේදැ”යි වදරා” ඒ කෙසේදැ?”යි ආරාධිතවූ සර්‍වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි සර්‍වඥයන් වහන්සේ සිංහව ඉපිද මීමකු මරා මස් කා පැන් බී වසන්නාවූ පර්‍වත සමීපයට නික්මුණු කල්හි කැනහිලෙක් මගදී දැක සිංහයා ගැලවෙන උපායක් නොදැක බිම බැස වැදහොත්තේය. සිගාලයා දැක සිංහයා කියන්නේ “තොප කුමක් නිසා මෙතන උනිදැ”යි විචාළ කල්හි “නුඹ වහන්සේට සේවාකම් කරණ පිණිස ඔත්තේමි”යි කී කල්හි “එසේ වීනම් මා හා කැටිව එව”යි කී කල්හි කැඳවාගෙණ ගොස් සිංහයා තමා වසන්නාවූ ගල් ගුහාවේ එක්තරා තැනෙක කැනහිලා වසන නියායෙන් සලසා මාංස මරාලමින් වසන්නාහ.

ඒ මස් අනුභව කොට ස්ථුලව (මහත්ව) කැනහිලා මානයක් ඇතිව කියන්නේ “නුඹ වහන්සේ මරාලන මස් කා මෙතෙක් දවස් වාසය කෙළෙමි. ඇම දවස්ම නුඹ වහන්සේට ආයාස කරන්නේද කින්ද? මම්ම ගොසින් මහත්වූ හස්තියෙකු මස්තකයට පැන ඉස්මොල අනුභව කොට වෙසෙමි” කී කල්හි සිංහයා කියන්නේ “එඹල ජම්බුකය, ස්ථුලවූ කය ඇති දික්වූ දළ ඇති ඇතුන් ගේ මස් අනුභව කරන්නාවූ ජාතීන්ට විනා තොපට පිළිවන් නොවෙ”යි කී කල්හි එපවත් නොගිවිස

වහාගොස් පර්වතයට පැනනැගී කාලාවක (ඇත් කුලයෙහි) කුලේ හස්තියෙකු දැක "කුම්භස්තලයට පනිමි" පැන්න තැනැත්තේ ඇතාගේ පය කෙරේට පැනපියා එවෙලෙහි කැනහිලාගේ ඉස්මොල පයින් මිරිකා ඇතා පලාගිය කල්හි සිංහයා කැනහිලා පරීක්ෂා කරණ පිණිසයයි ගොසින් කැනහිලාට පැමිණි විලාසය දැක විකේෂපව (සිත් තැවුලට පත්ව) කියන්නාහු "යම් සත්වයෙක් තමාගේ බල නොදැන වාසය කරන්නේ වී නම් හස්තියාගේ මස්තකයට පනිමියි කකුල සමීපයට පැන මළාවූ කැනහිලා මෙනැ"යි කියන්නාහු "වංශවත් ශක්ති සම්පන්න ආශ්‍රද තේජස් (අන හා තෙද) ඇත්තාවූ සත්වයක්හු කරන්නාවූ කටයුත්ත හීනවූ එකෙක් කරන්නේ වී නම් හස්ති විනාශය කෙරෙමියි මළාවූ කැනහිලා මෙනැ"යි කියාද, තවද "මාගේ වංශය හා ශක්ති ආශ්‍රද තේජස් විචාර නියාවට (විමසූ අන්දමට) මෙ විචර කටයුතු කළ මැනව, නොහොත් අවිචර කටයුතු කිරීමෙන් යම් එකෙක් සිතන්නේ වී නම් ඒ සත්ව තෙමේ හස්තියා පයින් මළාවූ කැනහිලා මෙනැ"යි කියා මේ 'ජම්බුක ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි ඒ කැනහිලා නම් දේවදත්ත ස්ථවිරයහ. සිංහව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 326. බ්‍රහත්ඡත්ත ජාතකය

තවද විනායකවූ (වෙනත් නායකයකු නැති) සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි වංචා ප්‍රයෝග දන්නා භික්‍ෂුකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වනලද.

ඒ වංචා ප්‍රයෝග දන්නා භික්‍ෂූන් වහන්සේ සර්‍වඥයන් වහන්සේට දක්වන්නාවූ සර්‍වඥයන් වහන්සේ "මහණෙනි, මුන් දැන් මතුනොවෙයි පළමුත් වංචා ප්‍රයෝග දන්නේ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙක් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ ඒ රජ්ජුරුවන්ට අමාත්‍යව උපන්නාහ. කෝසල රජ්ජුරුවන් හා යුද්ධයට බරණැස් නුවර රජ්ජුරුවෝ චතුරඟිනි සේනාව (ඇත්, අස්, රිය, පාබල සේනා) ඇරගෙන යුද්ධයට ගොස් නුවර සාධා සියලු සම්පත් ඇරගෙණ තමන්ගේ නුවරට ගෙණගොස් තමන්ගේ උයනේ පන්සියයක් ලෝ සැලිවල ලවා උද්‍යානයෙහි නිදන කරවූහ.

බ්‍රහත්ඡත්ත නම් රාජකුමාරයෝ තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරීන් අතින් සූසැට කලාශිල්පය (කලා ශිල්ප හැට හතරක්) හා අෂ්ටාදස ශිල්ප (ශිල්ප දහ අටක්) ආදීවූ සිල්ප ඉගෙණ පන්සියයක් තපස්විවරයන් උන්තෙනට අවුත් ඒ

තාපසවරුන්ගෙන් බණ දහම් අසා ප්‍රවෘත්තිය දැන තපස්වීවරයන්ට නායකව වාසය කරනසේක. එක් දවසක් බ්‍රහත්ජත්ත නම් තපස්වී පන්සියයක් තපස්වීවරයන්ට කියන්නාහු'' බරණැස් නුවර සිඟා වළඳන ලෙස යමිහ''යි කීහ. පන්සියයක් තපස්වීවරයෝ කියන්නාහු “අපි ඊට ගියමෝ නම් මනුෂ්‍යයෝ අප අතින් ප්‍රශ්න විචාරති, බණ කියවති, උන් කී කල නොකී අවස්ථාවේ නොයෙක් නින්දා කියා වෙසෙති. එසේ හෙයින් අපි බරණැස් නුවරට නොයමිහ''යි කීහ. ඊට බ්‍රහත්ජත්ත නම් තපස්වී “උන් කී යම් ප්‍රශ්ණයක් විසඳහන්නට මට භාරය''යි කියා පන්සියයක් තපස්වීවරයන් ඇරගෙණ නික්ම බරණැස් නුවර රජ්ජුරුවන්ගේ මගුල් උයනේ එදා රෑ සැතපී පසුදවස් උදෑසන පන්සියයක් තපස්වීවරයෝ නුවරට සිඟා නික්මුනාහ.

රජ්ජුරුවෝ පන්සියයක් තපස්වීවරයන් තමන්ගේ රජගෙට වඩාගෙණ ගොස් ආසන වල ඉඳුවා ප්‍රශ්න හා සමග බණ විචාළාහ. එවිට බ්‍රහත්ජත්ත නම් තපස්වී පන්සියයක් තපස්වීවරයන් බැන නොනැගී ඉන්ට කියා රජ්ජුරුවන් විචාළ බණ හා ප්‍රශ්න රජ්ජුරුවන්ගේ අභිප්‍රාය නියාවටම කීහ. රජ්ජුරුවෝ සමාධිව (එකඟව) පන්සියයක් තපස්වීවරයන් වළඳවා තමාගේ මගුල් උයනේ ඉදිනා නියායෙන් සැලැස්වූහ. “යහපතැ''යි කියා බ්‍රහත්ජත්ත නම් තාපසයන් හා පන්සියයක් තපස්වීවරයෝ ඒ මගුල් උයනේ වාසය කරණ කල්හි බ්‍රහත්ජත්ත නම් තපස්වී නිධාන් දක්නාවූ ශාස්ත්‍රයක් දන්නාහ. එවිට සිතන්නාහු “මාගේ පියානන් වහන්සේ මරාපිය

බොහෝ වස්තුව බරණැස් රජ්ජුරුවෝ ගෙනාහ. ඒ සම්පත් කොයි තිබාපු දේ හෝ''යි බැලූ තැනැත්තෝ ඒ මගුල් උයනේ තිබුවා දැක පන්සියයක් තපස්විවරයන්ට බ්‍රහත්ජත්ත නම් තපස්වී කියන්නාහු ''මම පරලොවට ආධාරයෙකින් (උදව් පිණිස) තපස් වූයෙම් නොවෙමි. මම මා කෙරේ හයින් තපස්විමි. මාගේ කොසොල් නුවර රජ්ජුරුවන් වහන්සේ නම් මාගේ පියානන් වහන්සේය. එසේ හෙයින් උන්වහන්සේගේ බොහෝ සම්පත් බරණැස් රජ්ජුරුවෝ ගෙනැවිත් මගුල් උයනේ සැලවල ලැවූ පන්සියයක් නිධාන සැල ලැවූහ. ඒ සැලවල නිධාන ඇරගෙණ මම මාගේ පියානන් වහන්සේගේ කොසොල් නුවර ගණිමි. තොපි ඇම කුමක් කරව්දැ?''යි විචාළාහ. තපසවරු කියන්නාහු ''නුඹවහන්සේ ගුරුකොට ආම්හ. එසේහෙයින් නුඹ වහන්සේ හා කැටිවම කී කල දෙයක් කරමු''යි කීහ.

''යහපතැ''යි කියා කොසොල් නුවර සිට ආ මනුෂ්‍යයන්ගෙන් සමහර අයකුත් තපස්විවරයන් පන්සියයත් නිධාන සැලවල් ගොඩනගා පන්සියයක් සම්පයිද (හමින් කළ පසුබිම්) විද ඒ සම්පයිවල ලාගෙණ ඒ සැලවල තණ ආදිවූ දෙයලා තබා තිබූ වලම නිධානසැල ඔබවා කෝසල නුවරට පලාගොස් බ්‍රහත්ජත්ත නම් රාජ කුමාරයෝ රාජ්‍යයට පැමිණ ඔටුනු පැලඳ නුවර පදනම් අට්ටාල (අටලු) වෙට්ටම් (තොරණ) ආදිවූ කර්මාන්ත කරවා සතුරන්ගෙන් කිසි භයක් නොවදිනා නියාවට නුවර කරවා රාජ්‍යය කරන්නාහ.

බරණැස් නුවර රජ්ජුරුවෝ බොහෝ ශෝක පත්ව කිසිදෙයක් නොදැන මගුල් උයනේ උන් තාපසවරුන් පලාගිය නියාව අසා බොහෝ විශේෂපයට පැමිණ මගුල් උයනට අවුත් නිධාන සැලවල් තිබූ තිබූ තැනින් ගොඩනංවා බැලූ අවස්ථාවෙහි සම්පත් නැතිව තණපුරා තිබූ සැලවල් දැක රජ්ජුරුවෝ සෝපත්ව කිසිදෙයක් නොදැන උන්සිටිය එතෙනකත් තණයයි කිය කියා ඉඳිනාහ. බෝධිසත්වයෝ “රජ්ජුරුවන් කියන්නාවූ මේ ප්‍රලාප මා අරවතොත් විනා අනික් කෙනෙකුන්ට බැරිය”යි සිතා “රජ්ජුරුවන් හා කථාකරන්නට යෙමි”යි ගොස් කථාකොට උන් අවස්ථාවෙහි රජ්ජුරුවෝ “තණය තණය”යි කීහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහු “ස්වාමිනි, නුඹ වහන්සේගෙන් කෙසේවූ තණයක් අපවත්විද? කෙසේවූ තණයකට අභිප්‍රාය ඇතිසේක්ද? ඒ මට කිව මැනවැ”යි කීහ.

එවිට රජ්ජුරුවෝ කියන්නාහු “බොහෝ ඇසූපිරූ තැන් ඇති බ්‍රහත්ජත්ත නම් තාපසයෝ මාගේ මගුල් උයනේ වාසයකොට මාගේ නිධාන සැලවල් පන්සියයේ සම්පත් ඇරගෙණ සැලවල තණපරලා සම්පත් ඇරගෙණ ගිය හෙයින් කියන පමණක් විනා මා අභිප්‍රාය ඇති තණක් ඇති හෙයින් කියන දෙයක් නොවෙ”යි කීහ. එවිට බෝධිසත්වයෝ රජ්ජුරුවන්ට කියන්නාහූ “තාපසවරු නම් තමන් සන්තක වස්තුව විනා නොසන්තක දෙයින් තණකෙන්දක් විවර නොගෙණ ගියේය. ඒ රාජ කුමාරයෝ තමන්ගේ පියානන් සන්තක සම්පත් ඇරගත්තීය. නුඹ වහන්සේ සන්තක දෙයින්

තණ කෙන්දක් විවර නොගෙණ ගියේය. නුඹ වහන්සේ සන්තක සම්පත් නුඹවහන්සේගේ දරුමුනුබුරන්ට දෙන්ටත් ඇත. තමන් සන්තක වස්තුව ඇරගෙණ ගියයි කියා සෝක නොගත මැනව"යි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු "බ්‍රහත්ජත්ත නම් රාජකුමාරයන් තාපස වේසය පෑ මගේ සම්පත් අරගත්තුය. ඒ කවර වේවයි කියා බෝධිසත්‍වයන් කී අවවාදයෙන් සෝක තුනී කළහ"යි වදරා 'බ්‍රහත්ජත්ත ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි බ්‍රහත්ජත්ත තාපසයෝ නම් මේ වඤ්චා ප්‍රයෝග දන්නා භික්‍ෂුහුය. එසමයෙහි රජ්ජුරුවන්ට අවවාද කී අමාත්‍යයා නම් බුදුවූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 327. පීඨ ජාතකය

තවද සමන්ත චක්‍ෂුවූ (සියල්ල දකින) සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි උපාසක කුලයට නින්ද කළ භික්‍ෂුකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

එක් භික්‍ෂුකෙනෙකුන් වහන්සේ සැවත්නුවරට අවුත් "මේ නුවර යහපත්ව දන්දෙන්නෝ කව්ද?"යි විචාළසේක. "මේ නුවර යහපත්ව දන්දෙන්නෝ සුලු අනේපිඩු මහසිටාණෝය, විශාඛාවෝය, මල්ලිකාදේවිය"යි කීහ.

ඒ අසා පාන්වූ ගමනේ සිඟාගිය තෙන පාත්‍රය ඇරනොගත්තුය. නුවර මුළුල්ලේ ඇවිද ගණයට (පිරිස අතරට) එන කලට වහන්දෑ කැඳ වළඳපුසේක. භික්ෂූන් වහන්සේ නිදා නැගිට සිඟාගිය හෙයින් කැඳ වළඳන්ට නුවූයේය. දවාලට බත් සිඟායයි දෙවනුව ගිය ගමනෙත් නොවේලා හෙයින් පාත්‍රය ගත් කෙනෙක් නැත. ගණයේ උන් වහන්දෑ භික්ෂූන් වහන්සේ සිඟාගොස් එනකලට බත් වළඳපුසේක. නුවරින් බත් සිඟන්ටවත් නොවී ගණයෙන් වළඳන්ටවත් නොවී භික්ෂූන් වහන්සේ සුන්බත්ව (ආහාරය වැලකී) කියනසේක් "මේ නුවර උපාසකවරු යහපත්ව දන්දෙති කී පමණක් විනා දන්දෙන කෙනෙකුත් නුදුටුවාසේ" නින්දා කියමින් උන්සේක.

සර්වඥයන් වහන්සේ එතනට වැඩ වදාරා "මහණෙනි, භික්ෂූන් නම් බඹරුන් කුසුමයේ රොන් ගත්තාසේ උපාසකවරුන්ගේ සිත් නොමිරිකා දන් ගත්තොත් විනා ආක්‍රෝශ පරිභව (බැණ වැදීම) හා නින්දා කිරීම තපස්වීන්ට යොග්‍ය නොවෙයි. පෙර මහොත්තමයෝ පවා දන්දුන් උපාසකවරුන්ට නින්දා නොකොළෝ වේදැ?"යි වදාරා "හේ කෙසේදැ?"යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකනෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්ත්වයෝ බ්‍රාහ්මණකුලයක ඉපිද වැඩිවිය පැමිණ වනාන්තරයට වැඩ

ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව වාසය කරණ කල්හි බරණැස් නුවරට අවුත් "මේ නුවර යහපත්ව දන්දෙන්නෝ කව්ද?"යි විචාළ කල්හි "මේ නුවර අසවල්තෙන සිටාණෝ යහපත්ව දන්දෙති" අසා "එසේ වීනම් උන්ගේ දෙරට යම්හ"යි සිඟා වැඩිසේක. උන්වහන්සේ සිඟාවඩින්නට පළමුවෙන් සිටාණෝ රජ්ජුරුවන් වහන්සේට රාජසේවයට පළාගියහ. බෝධිසත්ත්වයෝ සිටාණන්ගේ දෙරකඩ නැතක්වේලා (බොහෝ වේලාවක්) සිඟාසිටි කල්හි සිටාණන්ගේ ගෙයින් කවුරුත් නොදුටුවාහ. බෝධිසත්ත්වයෝ සිට වෙහෙසී නික්මුනාහ.

සිටාණෝ රාජසේවය කොට ගෙට එන්නාවු තැනැත්තෝ අතරමගදී බෝධිසත්ත්වයන් දැක භික්‍ෂාපාත්‍රය දැක ගෙණ බෝධිසත්ත්වයන් වහන්සේ පවරා තමන්ගේ ගෙට ගෙනවුත් රසමසවුලෙන් යුක්තවූ භොජනය බෝධිසත්ත්වයන් වහන්සේට වළඳවා සිටාණෝ කියන්නාහු "ස්වාමීනි, මාගේ ගෙට සිඟා ආ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක්ද දුගී මගී යාචකකෙනෙක්ද දන් නොගෙන ගියවිරූ කෙනෙක් නැත. නුඹ වහන්සේ වඩනට පළමුවෙන් මම රාජසේවයට පලා ගියෙමි. යන මම එක්කෙනෙකුන්ට සම්මතකොටලා නොගියෙමි. එසේහෙයින් නුඹවහන්සේ දුටුකෙනෙක් නැත. එසේහෙයින් ඒ වැරැද්ද මා කෙරේමය සමාකළ මැනවැ"යි සිටාණෝ කීහ. එවිට බෝධිසත්ත්වයෝ කියන්නාහු "සිටාණෙනි, තොප කෙරේ අප කෝපවුයේත් නැත, ද්වෙෂවූයේත් නැත. අප ඇසු නියාවට මෙකියන සිටාණන්ගෙන් මෙවිතරදැයි සිතූ පමණක් විනා අප විකෙෂපවූයේ (සිත් තැවුලක්) නැතැ"යි කීහ.

එවිට සිටාණෝ කියන්නාහු “මාගේ දෙමාපියන් මුතුන් මිමුතුන් පරම්පරාවෙන් ශ්‍රමණ බ්‍රාහ්මණයන් දුටුකළ ආදර සම්භාවනාවෙන් (ගරු සරු ලෙස පිළිගැනීම) සතරපසයෙන් (සිව් පසයෙන්) දන්දී දෙමව්පියන් දුටුසේ ආදර භක්ති ඇත්තාහ. මේ මාගේ අඩුවෙන් වූයේය”යි කීහ.

“යහපතැ”යි බෝධිසත්වයෝ සිටාණන්ගේ ආරාධනාවෙන් උන්ගේ ගෙයි කීප දවසක් රැඳ තමුන් පළමු වාසය කළ හිමාලය වනයට ගොස් පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා බඹලොව උපන්හයි වදරා මේ ‘පීඨ ජාතකය’ නිමවා වදාළසේක.

## 328. තුෂ ජාතකය

තවද සුගත නම්වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි බිම්බිසාර රජ්ජුරුවන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්?

බිම්බිසාර රජ්ජුරුවන්ගේ බිසවුන් බඩ අජාසත් රජ්ජුරුවන් පිළිසිඳගත් පසු එකියන බිසවුන්ට රජ්ජුරුවන් දකුණු උරය පලා ලේ බොන්ට දොලොක් උපන. එපවත් බිසව් රජ්ජුරුවන්ට කියාගත නොහි වාරිති (මගහරී) රජ්ජුරුවෝ බොහෝ උත්සාහයෙන් විචාරාගත්හ. නිමිත්ත දන්නා බමුණන් රජ්ජුරුවෝ ගෙන්වා “බිසවුන්ට මෙසේ වූ දොළක් උපනැ”යි කීහ. එපවත් අසා “බිසවුන් වහන්සේගේ බඩ රාජ කුමාරයන්

වහන්සේය, උන්වහන්සේ වැඩිවිය පැමිණිකළ නුඹ වහන්සේ මරා රාජ්ජය ගන්නාසේකැ"යි කීහ. රජ්ජුරුවෝ මේ අසා "මාගේ දරුවෝ මා මරා රාජ්‍යය ගත්තු නම් ගත්තේය. අනික් කෙණෙකුන් නොවත් උන් රාජ්‍යය ගතොත් යහපතැ"යි සමාධිව (එකඟව) ශස්ත්‍රය (ආයුධය) ගෙන්වා දකුණු උරය පලා රන්තැටියේ ලේ වත්කොට බිසවුන් පොවා දෙළ සන්සිඳුවූහ.

එපවත් බිසවු අසා "මාගේ රජ්ජුරුවන් වහන්සේ මරන්නාවූ දරුකෙනෙකුන් ලබා උසුලාගෙණ ඉඳිනේය. මාගේ රජ්ජුරුවන් වහන්සේට සතුරුවූ දරුවන්ගෙන් මට ප්‍රයෝජන කින්දැ?"යි කියා බඩ මඩවා (මිරිකකා, පොඩිකර) දරුවන් එලන්ට (බැහැර ලන්නට) සැරසුණාහ. රජ්ජුරුවෝ මෙපවත් අසා බිසවුන්ට කියන්නාහු "මාගේ දරුවෝ මා මරා රාජ්ජය ගත්තු නම් ගත්තේමය. බඩ මඩවා දරුවන් නොඑලවා මා සුරතල් දැකපියන තුරාය"යි කියා බඩ මැඩවිය නොදී රැකවල් ලැවුහ. රජගෙයිදී බඩ මඩවන හෙයින් රැකවල් ලැවුහ. මගුල් උයනට ගොසින් බඩ මඩවා දරුගැබ එලන්ට උත්සහ කරණ නියාව රජ්ජුරුවෝ දැන "මගුල් උයනට යා නො දෙව"යි රැකවල් ලැවූයේය. මගුල් උයනට යා නොදී උන්කලට දස එකඩ මසකින් රාජ කුමාරයන් වැදූහ.

රාජ කුමාරයන් පියවර නගා කෙළ ඇවිදිනා ප්‍රස්ථාවෙහි සර්‍වඥයන් වහන්සේ මහා සංඝයා වහන්සේ පිරිවරා බිම්බිසාර රජ්ජුරුවන්ගේ රජගෙට සිඟා වැඩිසේක. රජ්ජුරුවෝ

සර්‍වඥයන් වහන්සේ ඇතුළුවූ භික්‍ෂු සංඝයා වහන්සේ පවරා රාජ ගෙයි වඩාහිඳුවා රසමසවුලෙන් යුක්තවූ අන්නපානාදිය (ආහාර පාන වර්‍ග) තමන්ගේ ස්වහස්තයෙන් (සියතින්ම) වළඳවා ඉක්බිත්තෙහි ධර්‍මය අසන්ටයයි උන්කල රාජ කුමාරයන් සරහා රජ්ජුරුවන්ගේ ඇකයේ හිඳුවාලූහ. රජ්ජුරුවෝ පුත්‍රප්‍රෙමයෙන් රාජකුමාරයන් සනහ සනහා සුරතල් බලා සර්‍වඥයන් වහන්සේ වදාරණ බණ සිතහෙලා නොඅසන නියාව සර්‍වඥයන් වහනසේ දැන රාජ්ජුරුවන්ට වදාරණසේක් "රජ්ජුරුවෙනි, පළමුත් රජ්ජුරුවෝ සැක ඇති රාජ කුමාරවරුන් දුරුකොට විසුවෝ වේදැ?"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්‍වයයෝ තක්සලා නුවර දිසාපාමොක් ආචාර්‍ය්‍ය උපන්නාහ. බරණැස් නුවර රාජ කුමාරයෝ දිසාපාමොක් ආචාර්‍ය්‍යන් ලගට ගොස් උගතමනා සියලු ශාස්ත්‍ර ඉගෙණ උන්කලට දිසාපාමොක් ආචාර්‍ය්‍ය රාජ කුමාරයන්ගේ අංගලක්‍ෂණ (දේහ ලකුණු) පරීක්‍ෂාකොට මතු මෙම රාජකුමාරයන් නිසා උපදිනා රාජ කුමාර කෙණෙකුන්ගෙන් රජ්ජුරුවන්ට සැලසෙන උපද්‍රව දැන රාජකුමාරයන්ට ගාථා සතරක් උගන්වා කියන්නාහු "තොපගේ රාජකුමාරයන් සොළොස් ඇවිරිදි අවස්ථාවෙහි රාජ කුමාරයනුත් තොපත් බත්කමින් ඉඳ පළමුවන ගාථාව කියව, සේනා සමුර්‍ද්ධව (සම්පූර්ණව) ආ ස්ථානයේ උන්විට දෙවන

ගාථාව කියව, උඩුමාලට නැගෙණ ඉනි ඉසට (තරප්පු පෙළ) තුන්වෙනි ගාථාව කියව, ශ්‍රී යහන් ගබඩාවට වැදහෝනාට යනකලට සතරවෙනි ගාථාව කියව”යි කියා දිසාපාමොක් ආචාරී රාජකුමාරයන්ට ඉගැන්වූහ.

රාජකුමාරයෝ නුවරට අවුත් රජ්ජුරුවන් වහන්සේට ශාස්ත්‍ර පෑ ගමනේ රජ්ජුරුවෝ සමාධිව රාජකුමාරයන්ට යුවරජ තනතුරුදී උන් අවස්ථාවෙහි රජ්ජුරුවන් අයාමෙන් රාජකුමාරයෝ රාජ්‍යයට පැමිණ රාජ්‍යය කරණ කල්හි රජ්ජුරුවන්ට රාජ කුමාරකෙණෙක් ඇතිව සොලොස් ඇවිරිදි වූහ.

එක් දවසක් රාජ කුමාරයෝ රජ්ජුරුවන් උයන් කෙළියට යන රාජ ඓශ්වර්‍ය්‍යී දැක “මම මෙසේවූ රාජ ඓශ්වර්‍ය්‍යීයක් (රජ ඉසුරු) කවරදා ලබම් දෝ හෝ”යි සිතා තමන්ගේ අතවැස්සන්ට කීසේක. අතවැස්සෝ කියන්නෝ “සිතූ නියාව ඉතා යහපත. බාල අවස්ථාවේ ලත් සම්පත විනා මාලු අවස්ථාවෙහි ලත් සම්පත්තීන් ප්‍රයෝජන කිම්ද?, රාජ්‍යයට උත්සාහ කළ මැනවැ”යි කීහ. රාජ කුමාරයෝ “ආයුධයකින් රජ්ජුරුවන් වහන්සේ මරන්ට බැරි ය”යි කියා “විෂක් ලා මරම්” සිතා රජ්ජුරුවන් වහන්සේ එක්ව බත් කමින් සිට “විෂ ලම්”යි විෂය මිටි මොලවාගෙණ “බත්කන්ටය”යි උන්නාහ. රජ්ජුරුවෝ බත් කන්ට ඉඳ සිතන්නාහු දිසාපාමොක් ආචාරී සොළොස් ඇවිරිදිවූ රාජකුමාරයා හා කැටිව බත් කන්ට ඉගැන්වූ ගාථාව රජ්ජුරුවෝ සළඳහන් කොට කීහ.

එහි අභිප්‍රාය (අදහස) නම්: “යම්සේ ඝණාන්ධකාරයෙහි (ගණාදුර) මීයෝ වී තලා දවසෙයයා (දහයියා) හැර හාලට කද්ද? එමෙන් තොප කෙසේ මට විෂලන්ට උත්සහ කළත් මා විෂ කන්නේ නැත. දවසෙයයා තෝරා සාල් කෑවාසේ විෂ තෝරා බත් කමි”යි කී ගමනේම රාජකුමාරයෝ සැකව “රජ්ජුරුවන් වහන්සේ දැන පූ නියාවේදැ”යි සිතා විෂ නුලූහ. රජ්ජුරුවන් හා කැටිව බත් කා මෙපවත් රාජකුමාරයෝ තමන්ගේ අතවැස්සන්ට කීහ. අතවැස්සෝ “එසේ වී නම් කීපදවසක් බැලුව මැනව”යි කීහ. පසු දවසෙක රජ්ජුරුවෝ ආ ස්ථානයේදී මුදලිවරුන් හා කථා කරණ පරක්කුවක් රාජ කුමාරයෝ දැක “මෙසේ වූ පරක්කුවේදී ගසමි” සිතා කඩුව ඇරගෙණ මිනිසුන්ගේ ඇස්වර බල බලා සිටියාහ. ඒ වෙලාවට රජ්ජුරුවෝ මේ ක්‍රියාව දැක දිසාපාමොක් ආචාරී මෙසේවූ ආ ස්ථානයෙක උන්වේලාවට කියවයි ඉගැන්වූ ගාථාව කීහ.

එහි අභිප්‍රාය නම්: “තොප ඇම ගෙවලදී උයනේදී කළ කථාව මා නොදනිති සිතාද? ඒ ඒ තැන සැංගී සිටිනේ ය”යි කියන්නා රාජකුමාරයෝ සිතින් සැකව පලාගොස් තමන්ගේ අතවැස්සන්ට කීහ. අතවැස්සෝ “කීප දවසක් ගිය කල යම් උපායක් කළ මැනව”යි ඉඳ කියන්නාහු “රජ්ජුරුවන් වහන්සේ නො දන්නා සේක. නුඹ වහන්සේ සිතින් සැකවෙන පමණක් විනාය”යි කීහ. “යහපතැ”යි කියා රාජ කුමාරයෝ ඉනිඉස කඩුව ඇරගෙණ සිටියාහ. රජ්ජුරුවෝ උඩුමාලට නැගෙන්ටයයි ගොස් සිතන්නාහු දිසාපාමොක් ආචාරී උඩුමාලට

නැගෙන්ටයයි යන වේලාවට කියන්ට කී ගාථාවෙක් ඇතැයි කියා සඳහන් කොට කීහ.

එහි අභිප්‍රාය නම්: "තොප මට කළ ප්‍රයෝගත් (උපක්‍රම) දනිමි. දැනුත් ඉනිඉස කඩුව ඇරගෙණ මට ගසන්ට සිටි නියාව මා නොදනිති සිතව්දැයි කීප මුරයෙක ඉවසීමි, ඉනිබ්බේ නො ඉවසමි"යි කී අභිප්‍රාය රාජකුමාරයෝ දැන භයින් ත්‍රස්තව සැඟව් පලාගොස් තමන්ගේ අතවැස්සන්ට කීහ.

අතවැස්සෝ කියන්නාහු "රජ්ජුරුවෝ තොප මෙසේ වූ දෙයක් කෙරෙතියි නොදනිති, තොපි තොප කෙරේ භයින් නොකරණ පමණක් විනා දනිතොත් තොපට කුමක් නො කෙරෙත්ද? රජ්ජුරුවෝ නොදනිතියි රාජ්‍යය ගන්ට උත්සාහ කරව"යි කීහ. "යහපතැ"යි කියා රාජකුමාරයෝ කඩුව ඇරගෙණ රජ්ජුරුවන් වැදහෝනා ශ්‍රී යහන් ගබඩාවේ යාන යට වැදඹත්තාහ.

රජ්ජුරුවෝ ශ්‍රී යහන් ගබඩාවට වැදහෝනට යන තැනැත්තෝ එලිපත පිට සිට සිතන්නෝ දිසාපාමොක් ආචාරී ශ්‍රී යහන් ගබඩාවට වැදහෝනාට යන වේලේ කියන නියායෙන් ඉගැන්වූ ගාථාවෙක් ඇතැයි සඳහන් කොට කීහ.

එහි අභිප්‍රාය නම්: "තොප කඩුව ඇරගෙණ පෙරලි පෙරලි වැදහෝනා නියාව මම නොදනිම්ද?, විෂලූ නියාවත්, ආ ස්ථානයේදී කඩුව ඇරගෙණ ගසන්ට ආ නියාවත්, ඉනි ඉස කඩුව ඇරගෙණ සිටි නියාවත්, දැන් කඩුව ඇරගෙණ යහන යට වැදහෝනා නියාවත් මම දනිමි" යන අභිප්‍රාය කී

ගමනේ රාජකුමාරයෝ භයින් ත්‍රස්තව කඩුව ඇරගෙණ යට මැස්සෙන් එලියට අවුත් කඩුව යහන පාමුල දමා වැඳහෙව "ස්වාමීනි, නිකම් මිනිසුන්ගේ බසට කෙළෙම්යි මා කෙරේ ක්‍ෂමා කළ මැනවැ"යි කීහ. රජ්ජුරුවෝ තමන් පළමු දැන උන්නාසේම මහා කෝපයෙන්ම යානින් නැගී සිට "තා මුරයෙන් මුරයේම කළදෑ මා නොදනිතියි උනිද? දරුවන් කළදෙය ඉවසන්ට උවමැනවැයි සිතා මෙතෙක් දවස් ඉවසා උනිමි. ඉනිබ්බේ නොයිවසමි" කියා රාජ කුමාරයන් දැගගෙයි ලවා රැකවල් සලස්වා ඉඳ සිතන්නාහු "මා මෙතෙක් අන්තරාවලින් ගැලවුනේ මාගේ දිසාපාමොක් ආචාරීන් නිසාය"යි ආචාරීන්ගේ ගුණ සඳහන් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ. රාජ කුමාරයන්ද දැගගෙයින් මැසුම් කප්පා රාජ්‍යයට අමාත්‍යයෝ සලස්වා ගත්තුය"යි සර්‍වඥයන් වහන්සේ වදාරන්නා "ඒ රජ්ජුරුවෝ එසේ කළේ නුමුත් මම මාගේ දරුවන් ඇර වාසයකළ නොහෙමි" කීහ. සර්‍වඥයන් වහන්සේ මේ නියාව වදාරා මේ 'තුෂ ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි දිසාපාමොක් ආචාරීව උපන්නෙමි බුදුවූ මම් ම වේදැ"යි වදාළසේක.

# 329. බාවේරු ජාතකය

තවද භූරිප්‍රාඥයන නම් වූ සර්‍වඥයන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි තීර්ත්‍ථකයන්ගේ ලාභසත්කාරයන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

සර්වඥයන්වහන්සේ ලෝකයෙහි පහළවන්නාට පළමු අබුද්ධොත්පාදයෙහි තීර්ථකයන්ට ලාභසත්කාර මහත. සර්වඥයන්වහන්සේ පහළවූ කළ ලාභ සත්කාර මදවිය. මේ කථාව සංඝයා වහන්සේ දම්සභාමණ්ඩපයෙහි රැස්ව වැඩ හිඳ කිය කියා උන්සේක. සර්වඥයන්වහන්සේ එතනට වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් සර්වඥයන්වහන්සේට දැක්වූ කල්හි මහණෙනි දැන්මතු නොවෙයි පෙරත් නීවයෝ අබුද්ධෝත්පාදකාලයෙහි ලාභසත්කාරයෙන් මහත්වූයයි වදාර ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි ව්‍යාපාරයෝ මොත්තමෙක් බාවේරු නම් ගමට කවුඩෙකු වඩාගෙණ වෙළඳාමට කියාහ. ඒ නුවර ඇත්තෝ කවුඩා කෙරේ සමාධියෙන් අපට දෙවයි කීහ. ව්‍යාපාරයෝ අප කවුඩා දෙන්නේ නැතැයි කියාදීත් උත්සාහයෙන් කියා මසුරන් දහසක් දී කවුඩා ඇරගත්තාහ. ඒ කියන කවුඩාට එම ගම ඇත්තෝ බොහෝ සත්කාර සම්මාන කළාහ. පසුව මුරයේ ඒ ගමට වෙළඳාමට යන්නා යහපත්ව නටන මොණරෙකු ගෙන්වාගෙන ආහ. ඒ මොණරා දැක ඒ ගම ඇත්තෝ මහා සමාධිව අපට

දෙවයි කීහ. ව්‍යාපාරයෝ අපගේ පළමු මුරයේ ගෙණා කවුඩාත් ඇරගත්තුය. දැන් ගෙනා මොණරාත් ඉල්ළුව අප ගෙණ ගෙණා දෙයම ඇරගන්ට උත්සාහ කරව අප දෙන්නේ නැතැයි කියාදීත් තොපට පක්‍ෂි සම්භවෙති අපට සම්භ නොවෙතියි කියා මොණරා අප දෙන්නේ නැතැයි කියාදිත් මහ උත්සාහයෙන් මසුරන් දහසක්දී මොණරා ඇරගත්තාහ. ඒ කියන මොණරාට ඒ ගම ඇත්තෝ බොහෝ සත්කාර සම්මාන කළාහ. මොණරා ඇරගත්තැන් පටන් කවුඩාට කැවිලි පෙවිලි ආදියත් අඩුව ආදරත් මදව ගිය හෙයින් තමා උන් මැදිරියෙන් පිටත්ව කසල ගොඩ ඉඳ නොයෙක් කුණු කසල ඇසිඳ කන්නේය. මොණරාට බොහෝ කැවිලි පෙවිලිත් ඇතිව රන් මැදිරියක් ඉදිකරවා ඊලා සැපසේ වාසය කරන්නේ යයි වදාරා බුදුව වැඩහිඳ වදාරණසේක් උත්තමයන් නැතිහෙයින් දශකාරණයකින් අඩුවූ කවුඩා සැප විඳින්නේය. පසුව උත්තමවූ ජාති ඇති මධුරවූ නාදඇති මනාවූ ගාත්‍රා ඇති උත්තමයා ආතැන් පටන් නිස්සෝභාගිවිය. එසේ හෙයින් සද්ධර්‍මචක්‍රවර්ති වූ සර්‍වඥයන්වහන්සේ නැති අවස්ථාවේහිදී තිර්ත්ථකයෝ ලාභසත්කාරයෙන් මහත් වුය. යම් මනාවූ ශබ්ද ඇති සර්‍වඥයන්වහන්සේ පහළවු තැන්පටන් තීර්තකයෝ ඉරුදුටු කද්‍යෝපැනියන් සෙයින් නිස්සෝභ වූහයි වදාරා මේ බාවේරු ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි කවුඩා නම් නිගන්ඨනාථ පුත්‍රය. එසමයෙහි මොණරා නම් බුදුවූ මම්ම යයි වදාළසේක.

# 330. විසයිහ ජාතකය

තවද පස්මරුන් (මාරයන් පස් දෙනා) බිඳ ජයගත් හෙයින් මාරජි නම් වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් අනේපිඬු මහ සිටානන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

මෙහි වර්‍තමාන කථාව ඛදිරඞ්ගාර ජාතකයෙහි විස්තර වශයෙන් බස්නේය (ඇතුලත්වේ). අනේපිඬු මහ සිටානන්ගේ දේවතාදුව වලක්ව වලක්වා දන් දුන්නෙමි. ඊට ආශ්චර්‍ය්‍යයී කින්ද කියන්නේ මාසේවූ ලොවුතුරා බුදු කෙණෙකුන්ගෙන් අවවාද අසා දන්දීමෙහි පෙර මහොත්තමයෝ අබුද්ධෝත්පාද කාලයෙහි ශක්‍ර දේවේන්‍ද්‍රයන් වලක්ව වලක්වා දන්දුන්නෝ වේදැ”යි වදරා “හේ කෙසේදැ?”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍ජය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ විසය්හ නම් සිටුව උපන්නාහුය. දන්හල් කරවා දවස සලක්‍ෂයක් (ලක්ෂ හයක්) ධන වියදම් කොට ජම්බුද්වීපයෙහි නගුල් උඩ බඳවා මහත් දානසම්භාරයන් කරන්නාහ.

මේ කුසල සම්භාරයෙහි ආනුභාවයෙන් ශක්‍රයන්ගේ පාණ්ඩුකම්බල ශෛලාසනය (ගල් අසුන) උනුවිය. එවිට

ශක්‍රයෝ දිව්‍යසින් බලාගෙණ ශක්‍ර සම්පත් ඇරගන්නා නිසා “මූ මේ දානාධ්‍යාසය (දන් දීමේ අදහස) කෙරෙති”යි සැකව “දානාධ්‍යාසයට මම අන්තරාය කෙරෙමි” සිතා අවුත් සිටානන්ගේ දන්දෙන්ට තිබූ එලගිතෙල් සාල් තල මුං ආදිවූ දෙයද රත්රන් මුතු මැණික් සංඛසීලා ප්‍රවාලාදිවූ (සක් ගල් පබළු) දෙයද වාල්සරක් ආදිවූ උපභොග සියලු වස්තුද අන්තර්ධාන කරවූහ. සිටානන්ගෙන් දන්දෙන්නට සැලැස්වූ පුරුෂයා සලකෂයක් වස්තුව වියදම් කොට දන්දෙන්ට තිබූ සියලු වස්තුන් අන්තර්ධාන වූවා දැක සිටානන්ට ගොසින් කියන්නේ “ස්වාමීනි, දන්දෙන්ට තිබූ සියලු වස්තු අන්තර්ධාන විය. එසේ හෙයින් සෙට දන්දෙන්ට කිසිදෙයකුත් නැතැ”යි කීහ.

එපවත් සිටානෝ අසා “ඊට කාරණා කින්දැ?”යි සිතා තමන්ගේ බිරින්ද ගෙන්වා කියන්නාහු “සෙට දවසට දන්දෙන්ට තිබූ සියලු වස්තුවක් නැතිව අන්තර්ධාන විය. මාගේ රත්රන් මුතු මැණික් ආදී සියලු වස්තුව තිබූ භාණ්ඩාගාර ගෙවල්වල දොර අරවා ඉන් වස්තු වියදම් කොට දන්දෙව”යි කියා වස්තු තිබූ ගෙවල් දොර ඇර බැලූ ගමනේ අමුනක් විවරක කිසි වස්තුවක් නැතිව අන්තර්ධාන වූ හෙයින් කිසි වස්තුවකුත් නුදුටුවාහ.

සිටානන්ගේ භාය්‍ර්‍යාවෝ සිටානන්ට කියන්නාහු “නුඹ වහන්සේගේ ඉන තුබූ සළුව හා මාගේ ඉන තිබූ කඩ විනා වී නැලියක්වත් සාල් නැලියක්වත් මස්සක් අකක් වාලක් සරකක්

නැතිව සියලුවස්තු අන්තර්ධාන වීය"යි කිවුය. සිටානෝ කියන්නාහු "මාගේ ප්‍රාණය තිබුනෙක් වේලා මාගේ දානයට අන්තරාය නොකෙරෙමි. එසේ හෙයින් උත්සාහ ඇතිව ගෙයබලා දන්දෙන්ට නිසි දෙයක් ගෙණ ව"යි කීහ. "යහපතැ"යි ගෙට ගොසින් බැලූ ගමනේ මිනිසකු දමාගිය කළකුත් දෑකැත්තකුත් දැක ගොසින් ගෙණවිත් "ස්වාමීනි මෙපමණක් විනා දුටුදෙයක් නැතැ"යි කියා සිටානන් අතට දුන්හ. සිටානෝ "හද්‍රාව, මෙතෙක්ද අපගේ සියලු වස්තු ඇති හෙයින් දනුත්දී අපිත් සැපසේ රැකුම්හ. දැන් වස්තු නැති හෙයින් රැකෙන්ටත් දන්දෙන්ටත් අනික් මානෙක් (ක්‍රමයක්) නැත. මේ කදත් දෑකැත්තත් ඇරගෙණ වලට (වනයට) ගොසින් තණදගෙණවිත් වීකොට භාගයෙක් දන්දෙම්හ. භාගයක් ගෙණ රැකෙම්හ"යි කියා කදත් දෑකැත්තත් ඇරගෙණ තණ දන ලෙස වලට නික්ම තණකළක් ගෙණවිත් වී කොට භාගයක් දන්දී භාගයක් තමන් රැකෙන්ට යයි තබාගත් ගමනේ යාචකයන් එනහෙයින් තමන්ට තිබූ භාගයත් දී නිරාහාරයෙන් ඉඳ මේ නියායෙන් සත්දවසක් දන්දී නිරාහාරයෙන් උන්නාහ.

සත්වෙනි දවසේ තණකළ කරතබාගෙණ ගෙට එන ගමනේ අව්රශ්මි ශරීරයේ වැදගත් ගමනෙනුත් සත්දවසක් නිරාහාරයෙන් උන්හෙයිනුත් සුඛුමාලවූ (සිවුමැලි) ශරීර හෙයිනුත් භ්‍රමිතව (කැරකී) තණකළ ඇරගෙණ වීථියේ වැටුනාහ. එවිට ශක්‍රයෝ ආකාශයෙහි සිට කියන්නාහු "එම්බල සිටානෙනි, තොප දුප්පත් අවස්ථාවෙහි තොපගේ ප්‍රාණයද

රැක නොගෙණ දන්නොදී සැපසේ වැදහෙව ඉඳුව''යි ශක්‍රයෝ සිටාණන්ට අවවාද කොට කීහ.

එවිට සිටාණෝ ''තෙපි කවුරුන්ද?''යි ශක්‍රයන් අතින් විචාළෝය. ශක්‍රයෝ ''මම ශක්‍රයෙක්මි''යි කිවුය. සිටානෝ කියන්නාහු ''තොප මේසා වූ ශක්‍රසම්පත් ලද්දේ විශේෂයෙන් දන්දී පඤ්චසීලය රැක පෝය අෂ්ඨාංග (අංග අටකින් යුත්) ශීලය රැක වුව මෙසේ පින්කොට මෙසේවූ ශක්‍රසම්පත් ලැබ සිටිනෝත් මේලෙස කියන්ට කාරණා කින්ද? තොප එක ශක්‍ර කෙණෙකුන් තබා දහසක් ශක්‍රයෝ අවුදින් පින් නොකරවයි කිවු නමුත් මාගේ දානයට අන්තරාය නොකරමියි, මෙසේ වූ දුක්ඛිතව සිටත් මාගේ දානාධ්‍යාශයට අඩුවක් නොකරමි'' සිටානෝ කී කල්හි ශක්‍රයෝ ''මෙසේ දුක්ඛිතව සිටත් තොප මෙසේ පින්කරමි මාගේ දානයට අඩුවක් නොකරමි කියන්නේ කවර කාරණාවක් නිසාදැ?''යි විචාළ කල්හි සිටානෝ කියන්නේ ''එම්බල ශක්‍රය, ශක්‍රසම්පත්, මාරසම්පත්, බ්‍රහ්මසම්පත්, ඇරගන්නා නිසා නොවෙයි, තා ඇතුළුවූ සූවිසි අසංඛ්‍යයක් සත්‍වයන් සංසාර සාගරයෙන් ගොඩලා සම්‍යක් සම්බෝධියට පැමිණෙන නිසාය''යි කීහ.

එපවත් අසා ශක්‍රයෝ වහා සන්තුෂ්ටව (සතුටුව) සිටාණන්ගේ ශරීරය ශක්‍රයෝ තමන්ගේ අතින් පිරිමැද ළූ ගමනේ දිව්‍ය පහස හෙයින් සිටාණන්ගේ ශරීරය පිණා නැගී සිටියාහ. එවිට ශක්‍රයෝ සිටාණන්ට කියන්නාහු ''පළමු කොට තොප දෙන්නේ සලක්‍ෂයක් වස්තුවවේද? මෙතැන්පටන් දෙළාස්

ලක්‍ෂයක් සම්පත් වියදම්කොට දන්දෙව”යි කියා සිටාණන්ගේ අනතධ්‍ධාන කළ සම්පත් සිටාණන්ට පෑ ශක්‍රයෝ තමන්ගෙනුත් සියලු සම්පතින් උන්ගේ ගෙය පුරා තමන්ගේ ශක්‍රභවනයට ගියහයි සිටාණෝ බොහෝ දනාධ්‍යාශය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදාරා මේ ‘විසය්‍ග ජාතකය’ නිමවා වදාළ සේක.

“එසමයෙහි සිටුව උපන්නෙම් බුදුවූ මම්මය”යි වදාළසේක.

# 331. තඬරී ජාතකය

තවද මේ ජාතකයෙහි වතීමාන කථාව හා අතීත කථාව මතුකියන ලද ‘කුණාල ජාතක’යෙහි ප්‍රකාශ වන්නේය.

# 332. වානර ජාතකය

තවද නරසිංහවූ (නරයන්ට සිංහ වූ හෙවත් මිනිසුන් අතර නායක වූ) සවීඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ වෛරයට (පළිගැනීමට) උත්සාය කරණ නියාව දම් සභාවේ රැස්වූ මාළුවරුන් වහන්සේ (වැඩිහිටි භික්‍ෂුන්) කිය කියා වැඩ උන් තැනට සවීඥයන් වහන්සේ වැඩ වදාරා “මහණෙනි, මා එන්නට පුවී භාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ?”යි විචාරා වදාරා

එපවත් අසා "මහණෙනි, දැන් මතු නොවෙයි පෙරත් වෛරයට උත්සහ කළෝ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් වහන්සේ රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්‍වයන් වහන්සේ එක් ගසෙක වානරව උපන් සේක. උන් වහන්සේ වාසය කරන්නාවූ වනය ලඟ ගඟාවෙක් ඇත. ඒ ගඟ වසන්නාවූ කිඹුලෙක් ඇත. ඒ කිඹුලාගේ කිඹුල්දෙනට ඒ වානරයාගේ හෘදමාංශය (හදවත) අනුභව කරන්ට දොළොක් උපන. ඒ කිඹුල්දෙන "මේ වඳුරාගේ හෘදයමාංසය ලදහොත් විනා ජීවත්වන්නේ නැතැ"යි කිඹුලාට කිව.

කිඹුලා ගොසින් බෝධි සත්‍වයන්ට කියන්නේ "එඹා සබඳ වඳුරානෙනි, මේ එක තෙනම තොප වාසය කරන්නේ ඇයිදැ?යි මේ ගඟින් එතර යහපත් අමෘත ඵලාඵල (මිහිරි පළතුරු) ඇති උයනෙක් ඇත, ඊ ගොසින් අනුභව කළ කල නපුරුදැ?"යි කීහ.

එවිට බෝධිසත්‍වයෝ කියන්නාහු "ගඟින් එතර අප යා හැකි උව කෙසේ යමෝදැ"යි කීහ. එවිට කිඹුලා කියන්නේ "මම පිට ඉඳුවාගෙණ ගොස් එතර ලමි. මා පිටට නැගෙව"යි කීහ. එවිට බෝධිසත්‍වයෝ "යහපතැ"යි කියා කිඹුලා පිටට පැනපුවාහ. කිඹුලාත් බෝධිසත්‍වයෝත් ඇරගෙණ ගඟ මධ්‍යයට ගොසින් ගඟ ගිලෙන්නට වන.

එවිට බෝධිසත්ත්වයෝ කියන්නාහු "ඇයි සබඳ, තොප මා කැඳවා ගෙණ පිට ඉඳුවා ගෙණ ආයේ ගඟින් එතරලන්ට වේද? දැන් තෝ මා බාදියයට (දිය යටට) ගිලෙන්නේ ඇයිදැ?"යි විචාළ කල්හි කිඹුලා කියන්නේ "තොපට ස්නෙහයෙන් ගඟින් එතර එලාඑල කන්ට ගෙණාමිද? මාගේ කිඹුල් දෙනට තොපගේ හෘදය මාංසයට දොළක් (ආසාවක්) හෙයින් තොප මරා උන්ට හෘදයමාංසය දෙන්ට ගෙනාමි" කී කල්හි බෝධිසත්ත්වයෝ කියන්නාහු "එසේ කළ මේ සැටියටම ගොඩදී කිව, මාගේ හෘදයමාංසය තෙල (අර පෙනෙන) දිඹුල්ගස රතුරතුව පෙනෙන්නේය. මීට ආයාසය ගන්නේ ඇයිදැ?"යි කීහ. එවිට කිඹුලාම "එසේ කළ කළමනා කින්දැ?"යි කීය.

බෝධිසත්ත්වයෝ කියන්නාහූ "මා ගෙනගොස් දිඹුල්ගසට නන්වාලන්නා හෘදය මාංසය දීලමි" කිඹුලාත් "සැබැවැ"යි සිතා බෝධිසත්ත්වයන් ගෙනගොස් දිඹුල්ගස සමීපයට ගිය. බෝධිසත්ත්වයෝත් කිඹුලා පිටින් දිඹුල් ගසට පැන "තොපි මා රැවටුව, මම තොප රවටාපීමි, වඳුරන්ගේ හෘදය මාංසයත් දිඹුල් ගස උඩ තිබේද? තා රවටාලා මාගේ ප්‍රාණය ගළවා ගතිමි. තොපගේ උයනේ ඇති අමෘත එලාඑලයෙනුත් මට කම් නැතැ"යි වදරා මේ 'වානර ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි කිඹුලා නම් දේවදත්ත ස්ථවිරය. වානරව උපන්නෙම් බුදුවූ මම්මවේදැ"යි වදාළසේක.

# 333. කුන්තානි ජාතකය

තවද නරවරවූ (මිනිසුන්ට උතුම් වූ) සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කොස්ලිහිණියක අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

කෝසල රජ්ජුරුවන් වහන්සේ වඩන (ඇතිකරන) කොස්ලිහිණියක් ඇත. ඒ කොසොල් රජ්ජුරුවන්ගේ ඒ ඒ රජ්ජුරුවන්ට රහසිගතව යවන්නාවූ යම් සන්දේශයක් (ලියමනක්, පණිවිඩයක්) ඇත් නමුත් ගෙණ ගොස් ඒ ඒ රජ්ජුරුවන්ට දී ඒ ඒ රජ්ජුරුවන්ගෙන් දී එවන සන්දේශයෙක් ඇත් නමුත් තමතන්ගේ රජ්ජුරුවන්ට ගෙණවිත් දූත මෙහෙවර සැලැස්වීමේ සිටින්නීය.

එක් දවසක් ඒ කොස්ලිහිණිය රජ්ජුරු කෙණෙකුන් ලඟට දූත මේවර යාදී රජගෙයි කෙළනා කුඩා කොල්ලෝ ඒ කොස්ලිහිණි මේවර ගොසින් ඇවිදින් "මාගේ දරුවෝ කොයිදැ?"යි විචාළීය. අසවල් කුඩා කොලු මැඩ (පාගා පොඩිකර) මරාපීය"යි කුඩා කොල්ලෝ කීහ. ඒ කොසොල් රජ්ජුරුවන්ගේ වාසල බැඳ සිටිනා ව්‍යාඝ්‍රයෙක් ඇත. එක් දවසක් කුඩා කොල්ලෝ කෙළගන යන්නාහු ඒ ව්‍යාඝ්‍රයා ලඟට ගියහ. ලිහිණීත් කුඩා කොල්ලන් හා එක්වම කෙළගණ යන්නාසේ ගොසින් කුඩා කොල්ලන් ව්‍යාඝ්‍රයාට ලන්වූ කල්හි තමාගේ දරුවන් මැරූ කුඩාකොල්ලා පියාපතින් ව්‍යාඝ්‍රයා

ළගට යතා දමාළූහ. ව්‍යාඝ්‍රයත් ඒ කුඩා කොල්ලා අල්වාගෙණ කඩා කා මැරීය. එවිට කොස්ලිහිණී “මාගේ පලිය ඇරගතිමි. මා කෙළේ රාජද්‍රොහය (රජුට හතුරුකමක් කිරීම). මා මෙතන රැඳීම කටයුතු නොවෙ”යි කියා රජ්ජුරුවන්ට කියලා ගියාහ.

මේ කථාව දම්සභාවේ රැස්වූ මාළුවරුන් වහන්සේ කිය කියා උන්තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා “මහණෙනි, මා එන්නට පුර්‍ව භාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ?”යි විචාරා වදාරා එපවත් අසා “දැන්මතු නොවෙයි, මහණෙනි, පෙරකලද මේ කොස්ලිහිණිය (හුරතලයට ඇතිකරන පක්‍ෂි විශේෂයක්) පළි ඇරගත්තෙම වේදැ”යි වදාරා “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ කොස්ලිහිණියක් ඇත. ඒ කොස්ලිහිණිය රජ්ජුරුවන්ගේ රහසිගතව ඒ ඒ රජදරුවන්ට යවන්නාවූ යම් සන්දේශයක් ඇත්නම් ගෙණගොස් දී ඒ රජදරුවන්ගේ බරණැස් රජ්ජුරුවන්ට එවන්නාවූ සන්දේශ පත්‍රයෙක් ඇත් නමුත් ගෙණවුත් දී දූත මෙහෙවර සැලැස්මෙහි සිටින්නීය.

එක් දවසක් ඒ කොස්ලිහිණිය එක් නුවරකට මෙහෙවර යාදී රජගෙයි කෙළනා කුඩා කොල්ලෝ කොස්ලිහිණියගේ

පැටවුන් මැඩ මරාපීහ. කොස්ලිහිණී ඇවිත් "මාගේ දරුවෝ කොයිදැ?"යි විචාළීය. කෙළනා කුමාරවරු කියන්නාහු "අසවල් කුමාරයා තොපගේ දරුවන් මැඩ මරාපිය"යි කීහ.

එවිට කොස්ලිහිණී රජ්පුරුවන්ගේ වාසල බැඳ සිටිනා ව්‍යාඝ්‍රයා ලඟට යන්නාවූ කුඩා කොල්ලන් හා සමඟ ගොස් තමාගේ දරුවන් මැඩ මැරූ කුමාරයා පියාපතින් ගසා ව්‍යාඝ්‍රයා ලඟට යන්න දමාලුව. ව්‍යාඝ්‍රයාත් අල්වාගෙණ කඩා කා මැරීය. එවිට කොස්ලිහිණී රජ්පුරුවන්ගේ රජගෙයි කෙළිනා කුමාර වරුන්ට රජ්පුරුවන් වහන්සේගේ හික්මවීම් (පාලනයක්) නැති හෙයින් වේද මාගේ දරුවන් මැඩ මැරූවේ. යම් මාගේ දරුවන් මැරූ සෝකයෙන් කුමාරයා ව්‍යාඝ්‍රයා ලගට යන්නා දමා පළිය ඇරගතිමි. දරු ස්නෙහයෙන් කළ පමණක් විනා මාත් කළේ රාජද්‍රොහය. ඉතිකින් හා මෙතන රැඳිම කටයුතු නොවෙ"යි කියා යන්ට වන්නීය.

එවිට රජ්පුරුවෝ එපවත් දැන කොස්ලිහිණීය ගෙන්වාගෙණ "තොපගේ දරුවන් මැරූ කුමාරයා මරා තෙපි පළි ඇරගත්තුය. පළියට පළි සරුවුව (හිලවු කිරීම, සමාන), ඒ නිසා තොප කෙරේ උදහස් නොවම්හ. තොපි මෙතනින් යන්ට කාරණා කින්ද? නොයව"යි කීහ. එවිට කොස්ලිහිණී කියන්නී "ද්වේයන් වහන්ස, දරුවන් කෙරේ සෝකයෙන් ඉවසාගත නොහී කුමාරයා මැරූ පමණක් විනා මා කෙළේ රාජද්‍රොහය. එසේ හෙයින් මම මෙතන රඳන්ට භය ඇත්තෙමි" කීව. රජ්පුරුවෝ දෙවෙනි තුන්වෙනි කීවත්

නොගිවිස කොස්ලිහිණිය පළාගියාහයි වදාරා මේ ‘කුන්තානි ජාතකය’ නිමවා වදාළ සේක.

“එසමයෙහි කොස්ලිහිණි මෙසමයෙහිත් කොස්ලිහිණිමය, බරණැස් රජව උපන්නෙම් බුදුවූ මම්මය”යි වදාළසේකි.

# 334. අම්බචොර ජාතකය

තවද කාසිය ජාතකය කුණාලයෙහි විස්තර වශයෙන් බස්නේය (ඇතුලත් වන්නේය). ධර්මරාජ ගුරුවූ (ධර්මරාජ්‍යයට ගුරුවරයෙකු වූ) සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි අඹසොර (අඹ උයන රැක බලාගන්නාවූ තෙරුන් යන අදහස දෙයි) භික්ෂූන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

එක්තරා මහළු භික්ෂුකෙණෙකුන් වහන්සේ අඹ උයනෙක වාසය කරණ සේක. එකියන අඹ උයනේ අඹ සොරු කඩා කාපුවාහ. සිටු දූ සතරදෙනෙක් අචිරවතී නම් ගඟාවෙන් ඉස්සෝධා නහා අඹ උයන බලන්ටයයි කියා උයනට ආවාහ. ඒ වෙලාවට එකියන මහළු භික්ෂූන් වහන්සේ උයනට වැඩ උයනේ අඹ නැතිනියාවත් එකියන සිටුදූන් සතරදෙනාත් සිටියා දැන එසේ වීනම් මෙකියන සිටුදූ සතරදෙනා වන අඹ කඩාගත්තේයයි සිතා “තොප ඇමය මේ අඹ කඩාගත්තේය”යි කියන්නා එකියන සිටුදූ සතරදෙනා “මේ අප නාපියා (ජලස්නානය කර) ආ පමණක් විනා අප කැඩූ අඹයක්

නැතැ”යි කීය. එසේත් “මට දිවුරන්ට උවමැනවැ”යි කියන්නා “යහපතැ”යි කියා එකියන සිටු දූ සතරදෙන දිවුලාහ. මේ නියායෙන් එකියන සිටු දූ සතරදෙනා ලජ්ජා කරවා පියා උන් ඇම තමතමන්ගේ ගෙවලට යැවූසේක.

මේ කථාව දම්සභා මණ්ඩපයට රැස්වූ මාලුවරුන් වහන්සේ (වැඩිහිටි භික්ෂූන්) කථාකොට කොට වැඩ උන් තැනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදරා “මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?”යි විචාරා වදරා එපවත් අසා, “මහණෙනි, දැන් මතු නොවෙයි පෙරත් මේ භික්ෂුහු ස්ත්‍රීන් ලජ්ජාකරවූවෝ වේ දැ”යි වදරා “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි එක්තරා තාපස කෙණෙක් අඹ උයනේ වාසය කරන්නාහු ඒ ඇත්තාවූ අඹ තමුනුත් කා අඳුනන්නන්ටත් දී වංචා ප්‍රයෝගයෙන් (බොරුවෙන් හා කපටි කමින්) දවස් යවන්නාහ.

එසමයේ බෝධිසත්‍වයන් වහන්සේ ශක්‍රදේවේන්‍ද්‍ර ව ඉපද මනුෂ්‍යලෝකය බලා වදරණසේක් “කවුරු දෙමව්පියන්ට ආදර කෙරෙත්ද? කවුරු අටසිල් රකිද්දේ? කවර තාපසකෙනෙක් තපස් රකිද්දේ? හෝ”යි බලා වදරණ සේක් මේ තාපසයන්ගේ කුහක තපස් දැක ඒ උයනට අවුත් උයනේ අඹ අන්තර්ධානකොට (අතුරුදහන් කිරීම) පැවාහ.

ඒ වෙලාවට බරණැස් නුවර සිටුදූ සතරදෙනෙක් නාපියා එතනට ආවාහ. තාපසයෝ එතනට අවුත් උයනේ අඹ නැති නියාව දැක "මේ උයනේ අඹ කඩාගත්තෝ තොපිය"යි කියන්නා උ9 සතරදෙන "අප අඹ කැඩුවේ නැතැ"යි කීහ. "එසේ කීවත් කම්නැත, දිවුරන්ට උවමැනව"යි කියන්නා "යහපතැ"යි ගිවිස පළමුවන තැනැත්තී දිවුරන්නී "ඉස්කර පුරා සුදුලොම් (ඉසෙහි පැසුණු කෙස්, සුදු කෙස්) අඬුවෙන් උදුරන්නාවූ වයස් පිරුනු මාළු පුරුෂයකු අතරේ ඉඳිම්මැයි මේ අඹ කැඩින්නමැ"යි කියා කිහ. දෙවෙනි ස්ත්‍රී කියන්නී "වයස් පසළොස් විස්ස තිස අවස්ථාවේදී සරණ නොගොස් ඔබදී (මතුවට, තවත් වයසට ගොස්) සරණයම්මැ"යි කියා දිවුලාහ.

තුන්වන ස්ත්‍රී දිවුරන්නී "අනඟයාගෙන් (කවි සමයෙහි නිතර හමුවන කාමයට අධිපති දෙවියාය, මල්සරා නමින්ද හඳුන්වයි) සැරප්‍රහාර (ඊ පහර) ලදින්ම දෙගවුවෙක ඉන්නා ප්‍රියවූ පුරුෂයෙකු ලගට ගොස් ඒ පුරුෂයා ලැබගන්නෙම්මැයි මේ අඹ කැඩින්න මැ"යි කියා කීහ.

සතරවන ස්ත්‍රී දිවුරන්නී "යහපත් කොට ඉස්සෝධා නහා සානුජබාදු (ඇඟ ගල්වන සුවඳ වර්ගයක්) ආදිවූ දෙය හා කොකුන් (එදා සබන් වෙනුවට කොකුම් භාවිතා කර ඇත) ගල්වාගෙණ යහපත් කොට අතුල යානේ තනිව වැදහෝම්මැයි මේ අඹ කැඩින්නමැ"යි කියා දිවුලාහ.

එවිට තාපසයෝ "තොපි ඇම දිවුලනියා යහපතැ"යි කියා උන් සතරදෙනා "තොපි තොපගේ ගෙවලට යව"යි කියා යවාපුවාහ.

ශක්‍රයෝත් භයංකාර (නපුරු) වෙසක් මවාගෙණ තාපසයිනුත් එතනින් පහකොටපුවයි වදාරා මේ 'අම්බචෝර ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි තාපසයෝ නම් මෙසමයෙහි මෙකියන භික්‍ෂූහුය. එසමයෙහි සිටු දූ සතරදෙනා නම් මේ සමයෙහි මේ සිටුදූ සතරදෙනාමය, එසමයෙහි ශක්‍රව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේකි.

## 335. ගජකුම්භ ජාතකය

තවද ධර්‍මරාජයන් වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කුසීත භික්‍ෂුකෙණෙකුන් වහන්සේ ඇරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

එක්තරා භික්‍ෂූකෙණෙකුන් වහන්සේ කළමනා පිළිවෙත්හිද උගතමනා ධර්‍මයන් නොයිගැන්මෙන් කුසීතභාවය (අලසකම) කරණසේක. මේ කථාව දම්සභා මණ්ඩපයට රැස්වූ මාළුවරුන් වහන්සේ (වැඩිහිටි භික්‍ෂූන්) කථාකොට කොට වැඩ උන් තැනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි

විචාරා වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ ඒ රජ්ජුරුවන්ට අමාත්‍යව උපන්සේක. රජ්ජුරුවෝ සියලු කටයුත්තෙහි කුසීතව වාසය කරන්නාහ. බෝධිසත්‍වයෝ කුසීතභාවය අරවාපියම් දෝ හෝ යි සිතා උන්කලට එක් දවසක් රජ්ජුරුවෝ මගුල් උයනට ක්‍රීඩාවටයයි ගියාහ.

ඒ උයනේ ගජකුම්භයෝයයි (කුඩා ප්‍රාණීයෙක්) යන තිරිසනෙකු යන්නාවූ රජ්ජුරුවෝ දැක බෝධිසත්‍වයන් අතින් "මේ කුමන තිරිසනෙක්දැ"යි විචාළහ.

බෝධිසත්‍වයෝ "ස්වාමීනි, මේ ගජකුම්භයෝයයි යන තිරිසනෙකැ"යි කියා බෝධිසත්‍වයෝ ගජකුම්භයා හා කැටිව කථාකරන්නේ " එම්බල ගජකුම්භය, තාගේ ගමන් දවල් තිස්සේ පලායෙහි නම් අඟලක් හෝ දෑගලක් (අඟල් දෙකක්) හෝ පලා යන්නෙහිය. ඉදින් ලැවු ගින්නෙක් වැදගත් නම් කෙසේ ගැලවීයෙයිදැ?"යි විචාළහ.

ගජකුම්භයා කියන්නේ "ගස් බිලයකට (ගසක සිදුරකට) හෝ පොළවට හෝ වැදයෙමි. ඉදින් එසේවූ දෙයක් නොලදින් නම් මාගේ ජාතිකර්‍මය (මරණය උරුමයි)"යි කීහ.

එවිට බෝධිසත්‍වයෝ රජ්ජුරුවන්ට කියන්නාහු "ස්වාමීනි, මේ ගජකුම්භයා තමාගේ කුසීතභාවයෙන් යම් දුක්ඛයකට

පැමිණේද? එමෙන් තපස්වීවරුන් වහන්සේද රජ්ජුරුවන් වහන්සේද ගිහි දනද තමතමන් කළමනා ඒ ඒ කටයුත්තේහි ප්‍රමාද වෙත්නම් පසද හායන (අවසඳ, බැස යන සඳ) පක්‍ෂයෙහි චන්‍ද්‍රයා මෙන් හායනයට (පරිහානියට) යන්නාහ.

යම් තපස්වී කෙනෙක් තමන් කළමනා වත් පිළිවෙත් ආදිවූ දෙය වේලා නොවරදවා විචාරත්නම් එසේවූ සත්තවයන්ට අවවාද කෙරේද්ද, යම් රජ්ජුරුකෙනෙක් තමාගේ රාජ්‍යයේ කළමනා කටයුතු කාය්‍ය්‍යී ඒ ඒ කාය්‍ය්‍යීවේලෙහි විචාරා කියද්ද, යම් ගිහිකෙනෙක් තමන්ගේ කලමනා ගොවිතැන් ආදිවූ සියලු කටයුතු වේලා නොවරදවා විචාරත්නම් එසේවූ සත්තවයන්ට සියලු ඓශ්වය්‍ය්‍යී (යස ඉසුරු) කලාවෙන් කලාවට (පියවරෙන් පියවරට) වඩනා පූර්‍ණ චන්‍ද්‍රයා (පුන් සඳ) මෙන් වඩනේය"යි කීහ.

"මේ කීයේ මටය"යි රජ්ජුරුවෝ දැන එතැන්පටන් කුසීතභාවය හැර රාජ්ජය කළහයි වදාරා මේ 'ගජකුම්භ ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි රජ්ජුරුවෝ නම් මේ භික්‍ෂූහුය. එසමයෙහි අමාත්‍යව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

## 336. කෙසව ජාතකය

තවද දේවාතිදේවවූ (දෙවියන්ට දෙවිවූ) සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි විශ්වාස භෝජනයක් අරභයා මේ ජාතකය දක්වන ලදී.

අනේ පිඬු මහසිටාණන්ගේ ගෙයි දවස් පතා පන්සියයක් භික්‍ෂූන් වහන්සේ වළඳන සේක. සෙසු සංඝයා වහන්සේත් අව්විජින්නව (නොකඩවා, නිරන්තරයෙන්) එළඹෙන සේක. සියලු සංඝයා වහන්සේට අනේපිඬු මහසිටාණන්ගේ ගෙය නම් සතර මං සන්ධියෙහි සාරා තිබූ පැන් පොකුණක් විය.

මේ නියාවට දවස් යවන කල්හි එක් දවසක් කොසොල් රජ්ජුරුවෝ නුවර ප්‍රදක්ෂිණාකොට (සැරිසරා) නික්මෙන කල්හි බොහෝ සංඝයා වහන්සේ අනේපිඬු මහසිටාණන්ගේ ගෙට වඩනා නියාව දැක උන් වහන්සේලා බොහෝව (වැඩිපුර) අනේපිඬු මහසිටාණන්ගේ ගෙට වඩිනේ කුමක් නිසා දැ?”යි විචාරා “නිත්‍ය සංඝයා වහන්සේ පන්සියයක්දෙනා වහන්සේ වළඳන්නට උවමැනැව”යි සිතා සර්‍වඥයන් වහන්සේ පවරා (ආරාධනා කර) පන්සියයක් සංඝයා වහන්සේට රසමසවුලෙන් යුක්තවූ භෝජනය වළඳවන්නාහ.

මේ නියාවට දන්දෙන්ට සැලසූ පමණක් විනා “අසවල් කෙණෙක් සංඝයා වහන්සේට විශ්වාසයෙන් වළඳව”යි නො සැලවූහ. ඇසූ මෙහෙවර නියාවට (චාරිත්‍රානුකූලව, පැවරුණු වගකීම) පාත්‍රා කටයුතුකොට පිළිගන්වා පියන්නාහ. සංඝයා වහන්සේ පාත්‍ර පිළිගෙණ තම තමන්වහන්සේ හිත විශ්වාස තෙනට පාත්‍රා ගෙණගොස් පාත්‍රවල බත් ඒ උපාසකවරුන්ට දී උන්ගෙන් හිත විශ්වාසයෙන් පිළිගැන්වූ යම් ආහාරයක් වළඳන සේක.

එක්දවසක් කොසොල් රජ්ජුරුවන්ට බොහෝ කොට වැල වරකා අඹ දඹ ආදිකොට ඇති මධුර ඵල (මිහිරි පළතුරු) බොහෝකොට ගෙණාහ. රජ්ජුරුවෝ "සංඝයා වහන්සේට මධුර ඵල ජාති යව"යි කියා යවූහ. සංඝයා වහන්සේ වළඳන්නට ඒ ඒ තෙනට වැඩපුසේක. එක්කෙනෙකුන් වහන්සේත් නොදැක රජ්ජුරුවන්ට ගොසින් "ස්වාමිනි, එක්වහන්දෑ නමකුත් නුදුටුයෙමි" කීහ. රජ්ජුරුවෝ "මාගෙන් දීලූ භෝජනය මගේ රජගෙයිදී නොවළඳ ඒ ඒ තැනට ගොසින් වළඳන්නට කාරණා කිමිදැ?"යි සිතා සර්‍වඥයන් වහන්සේ අතින් විචාරමි "සංඝයා වහන්සේ මාගෙන් දෙන දානය මාගේ ගෙයිදී නොවඳනම් ඒ ඒ තැන වළඳනසේක. කවර කාරණයකින් දැ"යි විචාළාහ.

සර්‍වඥයන් වහන්සේ "රජ්ජුරුවෙනි, සංඝයා වහන්සේට දන්දීම නම් ආදර විශ්වාස ඇතිව පයට දිය දී පය සෝදවා දැහැටි පැන්දී විශ්වාසව දන් දෙතොත් වළදනසේක. ඕවා දියට (ඕනෑවට එපාවට, නොසැලකිලි ලෙස) දන් දුනැයි වළඳන්ට අපහසුය. රජ්ජුරුවෙනි, පෙර උත්තමයන්ට පන්සියයක් වෙදවරුන් වෙදකම් කරණ ගමනේ ව්‍යාධියෙන් නොසිඳෙන්නා එතනින් පලාගොස් තමන්ට හිත විශ්වාස වූවන්ගෙන් ගොඩ ඇල් හුරුවි ආදියෙන් උළුකැන් (කැඳ) පිසදුන් ගමනේ ව්‍යාධි සන්සිඳුනේය. එසේහෙයින් රජ්ජුරුවෙනි, සංඝයා වහන්සේට නම් ආදර භක්තියෙන් දීලූ දානයම වටනේය"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ උතුම්වූ බ්‍රාහ්මණ කුලයක ඉපිද කප්ප නම්ව පඤ්චකාමයෙහි (රූපාදී පස්කම්හි) ආදීනව දැක හිමාලය වනයට ගොස් කේසව නම් තාපසයන් පන්සියයක් දෙනාට නායකව වාසය කරන්නවුන් දැක එකියන තාපසයන් ලඟ බෝධිසත්‍වයෝ කප්ප නම් තාපසව අතවැස්සන්ට ප්‍රධාන අතවැසිව (ශිෂ්‍යයා) හිත වාසය කරන්නාහ.

එසමයෙහි කේසව තාපසයෝ වැසි සාරමස පැමිණි හෙයින් ලුනු ඇඹුල් පිණිස තමන්ගේ පන්සියයක් තාපසවරුන් පිරිවරා බරණැස් නුවරට ගොසින් එනුවර රජ්ජුරුවන්ගේ උද්‍යානයෙහිද සැතපී නිදා නැගී පන්සියයක් තාපසවරුන්ගේ උද්‍යානයෙහි රඳවා වස් සාරමස උන්කල්හි වස් සාර මස ඉකුත් ගමනේ කේසව නම් තාපසයෝ "අපගේ හිමාලය වනයට නික්මෙම්හ"යි රජ්ජුරුවන්ට කීහ.

රජ්ජුරුවෝ "නුඹ වහන්සේ වයෝවෘද්ධ (වයස්ගත) සේක. වනාන්තරයේ ඉඳ ප්‍රයෝජන කිම්ද? නුඹ වහන්සේගේ පන්සියයක් තාපසවරුන් යවා නුඹ වහන්සේ රැඳුන මැනව"යි කීහ. කේසව නම් තාපසයෝ "යහපතැ"යි කියා තමන්ගේ පන්සියයක් තාපසවරුන් කප්ප නම් තාපසයන්ට පාවාදී ගෙණ නායක කමට සලස්වා හිමාලය වනයට යවා රජ්ජුරුවන් කී හෙයින් රැඳුනා පමණක් විනා කේසව නම් තාපසයෝ කප්ප

නම් තාපසයන්ට අධික ප්‍රේම ඇත්තාහ. ඒ ප්‍රේමයෙන් රෑ නිදිමැරීමෙන් කාපු ආහාරය නොදිරීමෙන් කේසව නම් තාපසයන්ට රක්ත අතීසාරය (ලේ සහිත මළ පහවීම) ඇතිව ව්‍යාධියෙන් පීඩිතවූ කල්හි රජ්ජුරුවෝ එපවත් දැන තමන්ගේ අංග වෛද්‍යයන් (සර්වාංග වෙදුන්) පන්සියයක් ලවා වෙදකම් කරවන්නට පටන් ගත්තාහ. දවසින් දවස කේසව තාපසයෝ රජ්ජුරුවන්ට කියන්නාහු "රජ්ජුරුවෙනි, මා ලෙඩින් ගොඩ නැගෙන්නා කැමැත්තාද? මේ ලෙඩින් නැසී යන්නා කැමැත්තා දැ?"යි විචාළ කල්හි රජ්ජුරුවෝ "ස්වාමීන් වහන්ස, සැපසේ ලෙඩින් ගොඩනැගෙන්නා කැමැත්තෙමි" කීහ. "එසේ වී නම් මාගේ හිමාලයෙහි කප්ප නම් තාපසයන් ලගට මා ඇරලවා පියව, මේ ලෙඩින් ගොඩ නැගෙමි" කීහ.

රජ්ජුරුවෝ "යහපතැ"යි කියා තමන්ලඟ සිටිනා නාරද නම් අමාත්‍යයෙකු කැඳවා "කේසව නම් තපස්වීන් කැඳවාගෙණ ගොසින් උන් වහන්සේ හිමාලය වනයෙහි ඇරලවා එව"යි කීහ. නාරද නම් අමාත්‍යයා "යහපති ස්වාමීනි" කියා කේසව නම් තාපසයන් හා බොහෝ තාපසවරුන් වාසය කරන්නාවූ උන්වහන්සේ පන්සලට ගෙණගොස් ඒහ. කේසව නම් තාපසයෝ කප්ප නම් තාපසයන් දුටු අධිකවූ ප්‍රේමයෙන් ගොඩ ඇල් හුරුවී ආදියෙන් ලුනුලා දුම් නැතිව පිස වත්කළ උළුකැන් ආදර ගෞරවයෙන් වළඳවාඒ ගමනේ රක්ත අතීසාරය ගුණව ගියේය. එවිට බරණැස් රජ්ජුරුවෝ නාරද නම් අමාත්‍යයා කැඳවා කියන්නාහු "අපගේ කේසව නම් තාපසයන්

වහන්සේගේ ව්‍යාධිය සංසිඳුනිද්දැ හෝයි නියම දැන පියා එව”යි යවූහ.

නාරද නම් අමාත්‍යයා තාපසයන් සමීපයට ගොසින් “ස්වාමීනි, වෙදවරුන් පන්සියයක් ලවා වෙදකම් කරවූ ගමනේ ගුණනුවූ රක්ත අතීසාරය දැන් කවර සැටියේ ගුණව ගියේදැ?”යි විචාළේය. කේසව නම් තාපසයෝ “නාරද නම් අමාත්‍යය මාගේ ව්‍යාධිය සන්සිඳුනු කාරණා අසව”යි කියා කියන සේක් “කප්ප නම් තාපසයන්ගේ ප්‍රිය සම්පන්නවූ පන්සලයෙහි විශේෂ ගුණ යෙන් හා කප්ප නම් තාපසයන් මා කෙරේ ඇති භක්ති ප්‍රේමයෙන් හා ගොඩ ඇල් හුරුවී ආදීයෙන් ලුනු දුන් ආදිය නැතිව පිස වත්කොට ඵැ උළුකැනින් මාගේ ව්‍යාධි සන්සිඳුනැ”යි නාරද නම් අමාත්‍යයාට කිසේක.

අමාත්‍යයා කියන්නේ “රජ්ජුරුවන් වහන්සේ දෙනලද සුභෝජන (යහපත් ආහාරය, ප්‍රණීත) වූ ආහාරයෙන් ගුණ නොදී මෙසේවූ කටුක (නීරස) ආහාරයෙන් ගුණ වූයේ කවර කාරණයකින්දැ”යි විචාළේය. කේසව තාපසයෝ “අමාත්‍යය, භෝජනය කෙසේ යහපත් වුවත් කටුක වුවත් විශ්වාස භෝජනය මාහැඟිය. නිකම් තැනින් කෑවාවූ මධුර භෝජන නියාවට හිත විශ්වාසයන් ගෙන් බීපු ඇඹුල් කැඳට අඩුය”යි කී සේක. මේ නියාවට බරණැස් රජ්ජුරුවන්ට නාරද නම් අමාත්‍යයා ඇවිත් කීහයි වදාරා මේ ‘කේසව නම් ජාතකය’ නිමවා වදාළසේක.

"එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරය, එසමයෙහි කේසව තාපසයෝ නම් ශාරිපුත්‍ර ස්ථවිරයෝය, නාරද අමාත්‍යයා නම් බක නම් බ්‍රාහ්මණයාය. එසමයෙහි කප්ප නම් තාපසව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

## 337. අයකූට ජාතකය

තවද ලෝක ගුරුවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ලෝකාර්ථචරියාව (ලොවට යහපත කිරීමෙහි) අරභයා මේ ජාතකය දක්වනලද.

මෙහි වර්තමාන කථාව මහාකණ්හ ජාතකයෙහි විස්තර වශයෙන් පෙනෙන්නේය. මෙහි වනාහී දම්සභා මණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ "සර්වඥයන් වහන්සේ ලෝකාර්ථචරියාව කළ නියාව යහපතැ"යි කියා වැඩ උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා වදාරා එපවත් අසා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්‍යය කරණ සමයෙහි බරණැස් නුවර බොහෝ මනුෂ්‍යයෝ යක්‍ෂයන්ට ප්‍රේතයන්ට එළුවන් කුකුලන් ප්‍රාණීන් (සතුන්) බොහෝ මරා බිලියම් දෙන්නාහ. රජ්ජුරුවෝ නුවර වාසීන් බොහෝව යක්‍ෂයයන්ට ප්‍රේතයන්ට ප්‍රාණීන් මරා

බිලියම් දෙන නියාව අසා "මාගේ අඥ ඇත්නම් නුවර ප්‍රාණවධ කළ නොහැක්කැ"යි බෙරලැවූහ. එතැන්පටන් ප්‍රේතයන්ට බිලියම් නැතිව ගියහෙයින් යක්‍ෂයෝ ඉඳ කථාකරන්නාහු "අපට බිලියම් නැතිකළෝ අසවල් රජ්ජුරුවෝය. උන්ගේ ඉස යකුලකින් පළා මරා පියන්ට උවමැනව"යි එක් ප්‍රේතයකු යවූහ. ඒ ප්‍රේතයා රජ්ජුරුවන් ආස්ථානයේ (තනියම) උන් ගමනේ ඉසට ගහන්ටයයි යකුලක් අතින්ගෙණ ආකාශයෙහි අමෝරාගෙණ (එල්ල කරගෙන) සිටියේය.

එපවත් ශක්‍රයෝ දැන ධර්මිෂ්ටවූ (දැහැමි වූ) රජ්ජුරුවන්ට යකුලෙන් ගසන්ට සිටි නියාව දැන තුමූද ඔහු ඉස් මුදුනේ යකුලක් ගෙණ සිටියාහ. රජ්ජුරුවන්ට ප්‍රේතයා සිටි නියාව පෙණෙයි. ශක්‍රයන් සිටි නියාව නොපෙනෙයි. එවිට රජ්ජුරුවෝ "ප්‍රේතයා තමන්ට ආරක්‍ෂාගෙණ සිටි දෙහෝ"යි සිතා "මා මේ විචාරන්ට උවමැනව"යි රජ්ජුරුවෝ ප්‍රේතයාට කියන්නාහු "තා යකුල අතින්ගෙණ ආකාශයෙහි සිටින්නේ මට ආරක්‍ෂාවටද? නැත්නම් මට සතුරුව දැ?"යි විචාළේය.

ප්‍රේතයා කියන්නේ "රජ්ජුරුවෙනි, යක්‍ෂයෝ ප්‍රේතයෝ එක්ව කථාකොට තොපගේ ඉසට මේ යකුලින් ගසන නියායෙන් එවූහ. එසේ හෙයින් තොපට මා සතුරුව ආයේය"යි කීහ. රජ්ජුරුවෝ කියන්නාහු "කාරණයක් නිසාද? මට යකුලින් ගසන්ට කියේය ය"යි විචාළාහ. ප්‍රේතයා

කියන්නේ “රජ්ජුරුවෙනි, තොප විසින් තමන් ඇමට දෙන බිලියම් (බිලි පූජා) නැවැත්තූ නිසාය”යි කීහ.

එවිට රජ්ජුරුවෝ “තා සේ ප්‍රේතයන් කෙතෙක් දෙනා යකුළුගෙණ සිටියත් මා කියපු බස දෙවෙනිව නොකියමි තාගේ ප්‍රේතයන් කී සැටියට යකුලින් (යකඩයෙන්) ගසව”යි කීහ. ප්‍රේතයා කියන්නේ “මා තොපට ගසන්නේ කෙසේද? තොප මා යකුළින් ගැසූවිටම අප ඇමට නායකවූ ශක්‍රයෝත් මා ඉසට ගසිමි යකුලක් අතින් ගෙන ආකාශයෙහි සිටිති. එසේ හෙයින් ගැසිය නොහෙමි” කීය. එවිට රජ්ජුරුවෝ “තා සේ වූ කොතොක් ප්‍රේතයන් යකුළුගෙණ අවුදින් සිටියත් මා බිය වන්නේ නැත. මා කියපු බස දෙවෙනිව නොකියමි. පළමු මම් තනිව සිටියෙමි. දැන් ශක්‍රයෝ මට ආරක්‍ෂාව සිටි පසු මම කුමට බිය වෙම්දැ?” යි කීහ.

ශක්‍රයෝ එකියන ප්‍රේතයා රජ්ජුරුවන් සමීපයෙන් පහකොට රජ්ජුරුවන් ලඟට අවුත් “රජ්ජුරුවෙනි, තොපට මෙතැන්පටන් මම ආරක්‍ෂාවට සිටිමි. කිසි භයක් නොව් පළමු මෙන් දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කරව”යි අවවාද කියා ශක්‍රයන් දෙව්ලොවට ගියහයි වදරා මේ ‘අයකූට ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි ශක්‍රයෝ නම් අනුරුද්ධ මහා ස්ථවිරය. එසමයෙහි බරණැස් රජව උපන්නෙම් බුදුවූ මම්ම ය”යි වදාළසේක.

# 338. අරඤ්ඤ ජාතකය

තවද ධර්මස්වාමි වූ (ධර්මයට අධිපතිවූ) සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි චුල්ල කුමාරිකාවන් අරභයා මේ ජාතකය දක්වන ලදී. මෙහි වර්තමාන කථාව ඉන්ද්‍රිය ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය.

මෙහි වනාහි යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙක් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ බ්‍රාහ්මණ කුලයක ඉපිද වැඩිවිය පැමිණ වාසය කරණ කල්හි බෝධිසත්ත්වයන් වහන්සේ තමන් වහන්සේගේ පුතණුවන් වහන්සේත් ඇරගෙණ වනාන්තරයට ගොසින් ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් (තාපස පැවිද්දෙන්) පැවිදිව පුතණුවන් වහන්සේ පන්සල රඳවා බෝධිසත්ත්වයන් වහන්සේ වනයට ගොසින් පලාවල ගෙණවිත් ජීවත්වන සමයෙහි සොරු මොත්තමෙක් (පිරිසක්) එක්ව ගම් පැහැරගෙණ යන්නෝ ස්ත්‍රියක් අල්වාගෙණ ගොසින් වනාන්තරයට ඇරපියා පලා ගියාහ. ඒ වනයේ ඇවිදිනා තැනැත්තී පන්සලට ඇවිදින් බැසපු වැඩි මාළු තාපසයෝ පලාවල ගෙණයන්ට ගියාහ. කුඩා තාපසයන් පන්සල උන් තැනැත්තේ ඒ ස්ත්‍රිය තමාගේ භාවභාව ලීලා කටාක්‍ෂ (ඇඟ පත ලෙලවා ඇස්කොනින් බැලීම) දක්වමින් තාපසයන් ගේ ශීල භේදකොට (සිල් බිඳීම් වශයෙන්) කියන්නී "මේ වනයේ ඉඳ කිම්ද? මනුෂ්‍යයන් ඇතිතෙනකට යම්හ"යි කීහ. තාපසයෝ "මාගේ පියානන් වහන්සේ අතින් විචාරා විනා නොයෙමි" කීහ. ඒ ස්ත්‍රී සිතන්නී

"මා මෙතන ඉන්ට කාරණා නොවෙයි. මම මඟ ඉදිමියි. වැඩිමාළු තාපසයන් වහන්සේ විචාරා එව"යි කියා පලා ගියාහ.

එතකොට වැඩිමාළු තාපසයෝ වනාන්තරයෙන් ඵලාඵල ගෙණවිත් පන්සලට ආසේක. කුඩා තාපසයෝ වැඩිමාළු තාපසයන් වහන්සේ අතින් විචාරණසේක් "ස්වාමීනි, මම මනුෂ්‍යපථයට (මිනිස් සමාජයට) ගොසින් ගිහිව රැකෙන්නෙමි. කෙසේ වාසය කෙරෙම්දැ?යි කෙසේවූ කෙණෙකුන් භජනය කෙරෙම්දැ?"යි විචාළාහ. වැඩිමාළු තාපසයෝ කියන්නාහු "පුත තපස්වී භාවය ඇර ගිහිගෙයි රැකෙන්ට සිතතොත් වෙෂ (වෙස් ගැනීම) පරදවයි. ස්ත්‍රී කී දෙයට කිපෙනසුළු කාය වාග් මනඃ යන ද්වාරත්‍රයෙන් (තුන් දෙරින්) අවැඩක්ම සිතන්නාවූ අකුසල් ආදිවූ දෙය එකඟ නොව අස්ථිරවූ (ස්ථිර නැති) චඤ්චලවූ (සෙලවෙන, චපල) සිත් ඇති එසේවූ අසත්පුරුෂයන් භජනය නොකොට වාසය කරව"යි කීහ. එබස් අසා තාපස කුමාරයෝ කියන්නාහු "මෙකී අගුණ නැති කෙණෙක් නම් නුඹ වහන්සේ විනා අනික් කෙණෙක් නැත. එසේහෙයින් නුඹ වහන්සේ ඇරපියා නොයෙමි" දැයි වදරා මේ 'අරඤ්ඤ ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි එකියන ස්ත්‍රී හා තාපසයෝ නම් මෙකියන භික්ෂූන් හා චුල්ල කුමාරිය. එසමයෙහි තාපසයෝ නම් බුදුවූ මම්මය"යි වදාළසේක.

# 339. සන්‍ධිභෙද ජාතකය

තවද තථාගතවූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සවගයේ භික්‍ෂූන් වහන්සේගේ සන්ධිභෙද ව්‍යාප්තියක් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

සවගයේ භික්‍ෂූන් වහන්සේ උනුන් ගැස්සීම් බිඳීම් ඇතිව වාසය කරණා නියාව සර්‍වඥයන් වහන්සේ දැන "එම්බා මහණෙනි, උනුන් හා විරෝධ කරන මනුෂ්‍යයෝ කඩු හා තෙප් හා සමානයෝය. පෙර සිංහයන් හා වෘෂභයන් හා හිත විශ්වාසව කරන ගමනේ උනුන් විරෝධ කරවූවා මෙන් තොප ඇමත් විරෝධව වාසය කරණාවාදැ?"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්‍වයෝ දිසාපාමොක් ආචාරීන් සමීපයෙහි සියලු ශාස්ත්‍රය ඉගෙන අවුත් පිය රජ්ජුරුවන්ට ශාස්ත්‍ර පෑ යුවරජ තනතුරෙහි සිට පියානන් අවෑමෙන් බෝධිසත්‍වයෝ රාජ්ජයට පැමිණ දැහැමෙන් රාජ්ජය කරන සමයෙහි එක්තරා පුරුෂයෙක් වනාන්තරයෙහි සරක් පට්ටි ලාගෙණ සිසානේය. මෙකියන පුරුෂයාගේ සරක්පට්ටියෙන් දැරිඇති දෙනක් තණ කාගෙණ එන තැනැත්තී හිමාලය වනයට ගියාය. ඒ වෘෂභධෙනු

තොමෝ (එළදෙන) සිංහධෙනුවක හා හිත විශ්වාසව වාසය කරන්නීය. ඒ කියන සිංහධෙනුව සිංහපැටවෙකු වැදුව. වෘෂභ ධෙනුව වෘෂභ පැටවකු වැදූව. එකියන සිංහපැටවා හා වෘෂභ පැටවා හා දෙන්නත් තමන්ගේ මවුන්දෙන්නා හිත හෙයින් තුමූ දෙන්නාත් හිතව එකතැන ගොදුරක් කා එකතැන සැතපී එකට වාසය කරන්නාහ.

එසමයෙහි ඒ දුටු වල් වැද්දෙක් මා නුදුටුවිරූ අපූර්වයයි සිතා බරණැස් රජ්ජුරුවන් දකින්ට යන්නේ තමාගේ වනයෙන් ගෙණගියමනා උපකරණයන් සපයාගෙණ රජ්ජුරුවන් දකින්ට ගොස් රජ්ජුරුවන් දිට. රජ්ජුරුවොත් "තා විසින් වසන වනාන්තරයෙහි තා දුටුවිරූ අරුමය (පුදුමය) නොඅරුම කිම්දැ?"යි විචාළාහ.

එවිට වැදි කියන්නේ "දෙවයන් වහන්ස, අනික් දුටුවිරූ ආශ්චර්‍ය්‍යයක් නැත. සිංහයකු හා වෘෂභයෙක් හිත විශ්වාසව වාසය කෙරෙති" කීය. එබස් අසා රජ්ජුරුවෝ කියන්නෝ "තුන්වන මිත්‍රයෙකු එක්වූ කල්හි විනාශයට පැමිණෙයි තුන්වන මිත්‍රයා එක්වූකල මට කියව"යි කියා වැද්දට සමුදුන් නාහ. වැදිත් "යහපතැ"යි කියා හිමාලය වනයට ගියේය.

එසමයෙහි එක්තරා කැණහිලෙක් සිංහයා හා වෘෂභයා උන්තෙනට අවුත් "මමත් තොප ඇම හා එක්ව වාසය කරන්නේය"යි එක්ව වාසය කරන්නේය. ඒ දුටු වැදි "තුන්වන මිත්‍රයෙකු ඇතිවූ කල රජ්ජුරුවන් වහන්සේ කියන්ට කීසේක. මෙපවත් රජ්ජුරුවන්ට කියන්ට යෙමි" සිතා ගියේය. ඔහු යද්දී

කැණහිලා සිතන්නේ “බොහෝ සිවුපාවුන්ගේ මස් මා විසින් කණ ලද. සිංහයන් හා වෘෂභයන්ගේ මස් මා විසින් නොකණ ලද. එසේ හෙයින් මුන්දෙන්නා උනුන් ගස්වා මරාපියා මාංශකන්ට උවමැනවැ”යි සිතා සිංහයා නොකීදෙය වෘෂභයාට කියා වෘෂභයා නොකීදෙය සිංහයාට කියා උනුන් ගස්වා දෙන්නා උනුන් හා සටන් කරවා මැරවීය.

වැදිගොසින් රජ්ජුරුවන්ට “ස්වාමීනි, තුන්වන මිත්‍රයෙක් ඇතිවිය”යි කීය. රජ්ජුරුවෝ “කෙසේ මිත්‍රයෙක්දැ?”යි විචාරා “කැණහිලාය”යි යනු අසා “එසේකල නීචයා එක්වූ පසු අනර්‍ථයට (අයහපතට) පැමිණෙන්නේ නියමය”යි කියා වහා ගමන් කරන්ට නිසි රථයකට නැගී වැද්දහු ගමන් ලන්ට සලස්වාගෙණ සිංහයා හා වෘෂභයා හුන් තෙනට ගියාහ.

ඒ වේලාවට කැණහිලා “මා සිතූ දෙය සිද්ධවිය”යි සමාධියෙන් සිංහයා පිටට පැන උගෙන් මාංශ කැටියක් කඩා වෘෂභයා පිටට පැණ ඔහුගෙන් මාංශ කැටියක් කඩා කා පැන පැන සිටියේය. රජ්ජුරුවෝ එපවත් දැන තමන්ගේ රථාචාර්‍ය්‍යාට කියන්නාහු “රථාචාර්‍ය්‍යය, සිංහයා එක්වන්නේ සිංහධේනුවක් හා කැටුවය. වෘෂභයා එක්වන්නේ වෘෂභ ධේනුවක් හා කැටුවය. සිංහයා කන්නේ මාංශය. වෘෂභයා කන්නේ තණ ජාතිය. එසේ හෙයින් ස්ත්‍රීන් නිසාවූ විපැත්තියකුත් නොවෙයි. කැවිලි නිසාවූ විපත්තියකුත් නොවෙයි. බොහෝ කාලයක් උනුන් හා හිත විශ්වාසව වාසය කළ දෙන්නා ජීවිතක්‍ෂයට පැමිණියේ නීච තැනැත්තවුන්ගේ

බසින. එසේ හෙයින් කේලාම් කියන යම් කෙනෙකුන්ගේ බස් ගිවිසීම් තියුණු මුවහත් ඇති ඛඩ්ගයක් (කඩුව) හා අඩයටියක්ද (හෙල්ල) සමානය. උනුන්ට හිත විශ්වාස කෙනෙකුගෙන් විරුද්ධ ලෙස බස් කිවු නම් උනුන් මැදයේ කියා විචාරීමෙන් ම ඇත්තෙක් වි නම් ඇත්තට පලා යෙයි. නැත්තෙක් වී නම් නැත්තට පලා යෙයි. ඒ මානයට විචාරීමෙන් ම කෙලාම් කියන තැනැත්තේ නොකියා තිබාපියයි. කේලාම් නොඇසීමෙන් දෙපක්‍ෂයේ ඇත්තන් සිතට පහසුව තිබෙයි. කේලාම් කී කෙනෙකුන්ගේ යම් තෙනක ගිවිස්සෝ නම් සිංහයාට හා වෘෂභයාට වූ දෙය මෙන්ම අනර්ත්‍ථයට පැමිණෙන්නේය”යි කියා සිංහයාගේ කෙසරු (සිංහයින්ගේ බෙල්ලේ ලෝම) සලා බහා සම් හා නිය හා තෙල් හා ඇරගෙණ තමන්ගේ බරණැස් නුවරට ම ගියාහයි වදාරා ‘සන්‍ධිභෙද ජාතකය’ නිමවා වදාළ සේක.

“එසමයෙහි රජ්ජුරුවෝ නම් බුදුවූ මම්මය”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

**චතුක්කනිපාත වර්‍ණනාව නිමි**

## 340. මණිකුණ්ඩල ජාතකය

තවද පරදුක්ඛ දුක්ඛිතවූ (අනුන්ගේ දුකේදී දුක්වන) සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝසල රජ්ජුරුවන්ගේ අන්තඃපුරයට වැරදී ගියාවූ

අමාත්‍යයෙකු අරභයා මේ ජාතකය දක්වන ලද. මෙහි වනාහි වර්තමාන කථාව මතු පහළ වන්නේය.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ බරණැස් නුවර රජ්ජුරුවන්ට පුත්‍රව ඉපිද වැඩිවිය පැමිණ තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරීන් ලඟ ශිල්ප ඉගෙණ තමන්ගේ නුවරට අවුත් පිය රජ්ජුරුවන්ගේ ඇවෑමෙන් රාජ්‍යයට පැමිණ රාජ්ජය කරණ සමයෙහි රජ්ජුරුවන්ගේ අන්තඃපුරයට  අමාත්‍යයෙක් වැරදී ගියේය. ඒ වැරදී ගිය අමාත්‍යයා රජ්ජුරුවෝ තමන්ගේ නුවරින් පිටත ලැවූහ.

ඒ අමාත්‍යයා කෝසල රජ්ජුරුවන්ගේ නුවරට පලාගොස් කෝසල රජ්ජුරුවන්ට කියා උගන්වා ගෙණ රජ්ජුරුවන් හා සේනාව ගෙණවිත් බරණැස් නුවර ඇරගෙණ රජ්ජුරුවනුත් දඟගෙයි (හිරගෙදර) ලැව්ය.

බෝධිසත්‍වයෝ දඟගෙයි ඉඳ කිසි වික්‍ෂෙපයක් (අමනාපයක්) නොව් ධ්‍යාන උපදවා ගත් ගමනේ කෝසල රජ්ජුරුවන්ගේ සකල ශරීරය සැත්කම් කරන්නාසේ (ආයුධයකින් කපන්නාක් මෙන්) මහවේදනාවට පැමිණී ගමනේ කෝසල රජ්ජුරුවන්ගේ සිතින් සැකවී "කිසි අපරාධයක් නැති බරණැස් රජ්ජුරුවන්ට කළ අපරාධයෙන් මට මේ ශරීර වේදනා වූයේය"යි සිතා බරණැස් රජ්ජුරුවන් උන් දඟගෙට අවුත් බැලූකලට ධ්‍යනයෙන් සැප සේ උන් රජ්ජුරුවන් දැක "රජ්ජුරුවෙනි, තොපගේ හස්ති සේනාව අශ්ව සේනාව

ඇතුළුවූ පාබල සේනාව ද රත්තරන් මුතු මැණික් කුණ්ඩලාභරණ (කණේ පළඳින ආභරනයක්) ආදීවූ සියළු සම්පත් ද අග්‍රමහෙසිකා බිසෝවරු නෑ දරුවන් ඇතුළුව සියළු අන්තඃපුරයද, රාජ්‍යය ද ඇරගෙණ තොප සිරගෙයි ළූ ගමනේ ඊට කිසි සෝකයක් නොවී සිත එකඟ කොට ගෙණ කෙසේ ධ්‍යාන උපදවා ගතුදැ”යි බෝධිසත්‍වයන් අතින් විචාළේය.

බෝධිසත්‍වයෝ රජ්ජුරුවන්ට කියන්නාහු, “එම්බා රජ්ජුරුවනි, සම්පත් ඇති කළ පළමුවෙන් සම්පත් හෝ නස්නේය. සම්පතට පළමු මනුෂ්‍යයෝ නසින්නාහ. චන්‍ද්‍රයා උදවූයේ නම් අස්තගත (බැස යනවා) වන්නේය. සූර්‍ය්‍යයා උදවුයේ වී නම් අස්ගත වන්නේය. එසේ හෙයින් පැමිණෙන්නාවූ අලාභය පැමිණෙන්නේමය. ඊට මා විශෙෂ කිම්දැ?යි සිතීමෙන් සිත එකඟ කොට ගෙණ ධ්‍යාන උපදවා ගතිමි”යි බෝධිසත්‍වයෝ රජ්ජුරුවන්ට කීහ.

දෙවැනිව බෝධිසත්‍වයන් වහන්සේ රජ්ජුරුවන්ට කියන්නාහු “යම් ගෘහස්ථයෙක් (ගිහියෙක්) කම්මැලිව කුසීතභාව ඇත්තේද, යම් තපස්වී කෙනෙක් ඉඳුරන්දමා (ඉන්‍ද්‍රියයන් දමනය කොට) එකඟවූ සිතින් වාසය නොකරත්නම් එසේවූ තපස්වියාද, රජ්ජුරු කෙණෙක් කී කී වන්ගේ බස්පස්සේ (වචන පසු පස) ගොසින් වෙසේනම් එසේ වූ රජත් යහපත් නොවන්නේය. යම් පණ්ඩිතයෙක් කෝපීද (කිපේද) එසේවූ පණ්ඩිතයාත් යහපත් නොවන්නේය. එසේ හෙයින් යම්

රජ්ජුරුකෙණෙක් පරීක්‍ෂාකාරීව දවසනාරිහුද, පරීක්‍ෂාකාරීව දවසරිනා රජ්ජුරුවන්ගේ යසස් හා කිර්තියත් කලාවෙන් කළාවට වඩනා චන්‍ද්‍රයාමෙන් සම්පූර්‍ණ වන්නේය”යි කීහ. එබස් අසා කෝසල රජ්ජුරුවෝ “අප නොදැන කළ දෙයට ක්‍ෂමා කළමැනැව”යි පාවාදී කෝසල රජ්ජුරුවෝ තමන්ගේ රාජ්‍යයට ගියායයි වදරා මේ ‘මණිකුණ්ඩල ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් බුදුවූ මම්ම වේදැ”යි වදාළ සේක.

# 341. සුජාත ජාතකය

තවද ස්වයම්භූඥානවූ (තමන් විසින් අවබෝධ කරගත්) සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරණ සමයෙහි පියානන් මළාවූ උපාසකයකු අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්?

එක්තරා උපාසකයෙකු තමාගේ පියාණන් මළාවූ සෝකයෙන් බොහෝ වික්‍ෂෙපයට (සිත් තැවුලට) පැමිණ ඉන්නාවූ උපාසකයා සර්‍වඥයන් වහන්සේ දැක සෝවාන් වෙන්ට හේතු සම්පත් ඇති නියාව දැක වදාළ අන්තයෙහි පසු මහණ භික්‍ෂු කෙණෙකුන් වහන්සේ ඇරගෙණ එකියන උපාසකයාගේ ගෙට වැඩි සේක. උපාසකයාත් සර්‍වඥයන් වහන්සේට අසුන් පණවා දුන්නේය. සර්‍වඥයෝත් “ඇයි උපාසකය, වික්‍ෂෙපව උන්නේ ඇයිදැ?”යි විචාළාහ. “ස්වාමීනි,

මාගේ පියාණන් නැසීගිය හෙයින් ශොකෂ ව උන්නෙමි" දැන්වූහ. "උපාසකය, මළවුන්ට ඇඬීම කාරණා නොවෙයි. පෙර උත්තමයෝ නැසීගිය උන්ට අඬන්නාවුන්ට අවවාද කීවෝ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන්වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්ත්‍වයෝ එක්තරා කෙළඹියෙක් හට පුත්‍රව උපන්නාහ. ඔහු සුජාත නම් වූහ. බෝධිසත්ත්‍වයන්ගේ මුත්තනුවෝ එක්තරා ව්‍යාධියකින් (රෝගයකින්) මළහ. බෝධිසත්ත්‍වයන්ගේ පියාණන් මළ සෝකයෙන් පියාණන්ගේ ආදාහණ භූමියෙහි තිබු ඇට ගෙණවිත් තමන්ගේ ගෙදර සමීප භූමියෙහි ලා එතනට පස් කොට දවසකට තුන්විටක් එතනට ගොස් වැඳ පුදා අඬා පෙරලී නොකා නොබී බොහෝ ශොකෂපයෙන් දුක්විඳිනාහ. බෝධිසත්ත්‍වයෝ "මපියාණන් වහන්සේ මාගේ මුත්තනුවන් වහන්සේ කෙරේ සෝකයෙන් පෙරලෙන සේක. ඒ සෝකය මා අරවන්ට උවමැනව"යි සිතා බෝධිසත්ත්‍වයෝ මළ මීමකු වැදහොත් තැනට තණත් පැනුත් ගෙණගොස් කට කෙරේ තබා "මීමා තණ කාපිය, පැන් බීවය"යි කියති.

බොහෝ මනුෂ්‍යයෝ "මේ කිම්ද සුජාත කුමාරයානෙනි මළ මීමා තණ පැන් කෙසේ කා දැ"යි කියා විචාළත් කවුරුන්ටත් කිසිබසකුත් නොකියා "මීමා තණ කාපිය, පැන් බීපිය"යි කියති. මනුෂ්‍යයෝ සුජාත කුමාරයන්ට ප්‍රලයක් (සිත්

කැළඹීමක්, උමතුවක්) ඇතිව ගොසින් මෙසේ කරන්නේයයි මනුෂ්‍යයෝ සුජාත කුමාරයන්ගේ පියානන්ට කියන්නාහු "තොපගේ පුතනුවන්ට ප්‍රලය ගුණයක් ඇතිව මළ මීමකු ලඟට ගොස් කට ලඟ තණ පැන් තිබා මීමා තණ පැන් කාපිය"යි කියති. "කවුරුන් හාත් සෙසු බසක්වත් නො කියන්නේ ය"යි ගොසින් කීහ. කෙළඹි පුත්‍රයා තමන්ගේ පියානන් මළ සෝකය හැර පුත්‍රප්‍රේමයෙන් සුජාත කුමාරයන් කරා අවුත් "කිමෙක්ද සුජාත කුමාරයෙනි? මළ මීමා කෙසේ තණපැන් කාද? තොපි මට වඩා නුවනැත්තා කවුරුදැයි උන් තැනත්තන්ගේ නුවන විශේෂ ඉතා යහපතැ"යි කීහ.

සුජාත කුමාරයෝ එවිට කියන්නාහූ "මීමාගේ දෑත දෙපය වල්ගය ඇතුළුවූ ශරීරයෙන් කිසිදෙයක් අඩු නොවී තිබුනු නිසා තණ පැන් කවයි කියා කීමියි. උඟ මළේයයි කියද්ද? උඟගේ ශරීරය තිබුනේ වේද? එසේකළ තණපත් කායි සිතා මම කීමි. මීමාගේ ඉස් කන් නාසා දෑත දෙපය වල්ගය ඇති තැනැත්තන්ට තණ පැන් කන්ට කී මම අඥාණයෙක්ද? නුඹ වහන්සේගේ පියාණන්ගේ ශරීරය දවා හස්මව කිසිදෙයකුත් නොපෙණී තිබියදී අඬා වැළප බොහෝ සෝකයට පැමිණියේ නුවණ ඇති නිසාදැ?"යි විචාළාහ. එවිට බෝධිසත්වයන්ගේ පියාණෝ "යහපත පුත, මාගේ සෝක සන්හිඳවූ නියාව දෙමාපියන්ගේ සෝක සන්හිඳුවන්ට මා භාරය. මහත් ගිනි රැසක් වැදගත් ගමනේ පැන්කල බොහෝ වත්කොට නිවුවාමෙන් මාගේ සෝක සන්හිඳුනැ"යි සුජාත කුමාරයන්ට ස්තුති කොට වදරා මේ 'සුජාත ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි සුජාත කුමාරව උපන්නෙම් බුදුවූ මම්මය"යි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

# 342. ජොත ජාතකය

තවද සියළු සත්වයන්හට නායකවූ සර්‍වඥයන් වහන්සේ භගු නම් රට සුංසුමාර නම් ගුහාව සමීපයෙහි විංසන නම් වනයෙහි වැඩ වසන සමයෙහි බොධිරාජ කුමාරයන් අරභයා මේ ජතාකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

බොධිරාජ කුමාරයෝ සෙසු රජදරුවන් ඉදිනා ගේවලට වඩා යහපත් මාලිගාවක් කරවා ඉන්ට උවමැනවැයි එක් වඩුවෙකු කැඳවා කෝකාලික නම් අනර්ඝ (විශේෂ, වටිනා) රජගෙය ඉදිකරවා "මේ වඩුතෙම මේ මාගේ මාලිගාවක්සේම රජගෙයක් අනික් රජදරු කෙණෙකුන්ට ඉදිකළේ වී නම් නපුරුය"යි වඩුවාගේ ඇස් උදුරුවාපීහ.

එපවත් දම්සභාවේ රැස්වූ භික්‍ෂූන්වහන්සේ "මෙසේ වූ රාජ ගෙයක් කළ වඩුවාට බොහෝ උපකාර කොට ප්‍රසාද දුනමනා තැන වඩුවාගේ ඇස් උදුරුවාපුවෝ වේදැ"යි කිය කියා උන්තැනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදරා "මහණෙනි, මා එන්නට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්ත ව උනුදැ?"යි විචාරා වදරා එපවත් අසා "දැන් මතු නොවෙයි, මහණෙනි, පෙරත් මේ රාජ කුමාරතෙම රජදරුවන් දහසක්

එකවිට ඇස් උදුරුවාපුවෝ වේදැ''යි වදරා ''ඒ කෙසේදැ?''යි ආරාධිතවූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ තක්සලා නුවර දිසාපාමොක් ආචාර්‍ය්‍යව බොහෝ රාජ කුමාරයන්ට ශාස්ත්‍ර උගන්වා වාසය කරන්නාහ. එසමයෙහි බරණැස් නුවර රජ්ජුරුවන්ගේ පුත්වූ බ්‍රහ්මදත්ත නම් කුමාරයෝ ශිල්ප උගන්ට යයි තක්සලා නුවරට දිසාපාමොක් ආචාර්‍ය්‍යන් සමීපයෙහි ශිල්ප උගන්නා සඳහා ගියාහ. දිසාපාමොක් ආචාර්‍ය්‍ය රාජකුමාරයන් දැක ලක්‍ෂණ (ශරීර ලක්‍ෂණ) බලා මේ රාජ කුමාරයා චණ්ඩය, මුගේ සන්තානයෙහි (සිතෙහි) ගුණයක් නැත්තේයයි රාජ කුමාරයන්ට අවවාද කරන්නාහු ''එම්බා රාජ කුමාරයෙනි, තොපි රාජ්ජයට වන්කල කිසිපිහිටක් නොලබන්නාසේ වැඩනැත්තවුව (රාජකාරියක් නැතිව), යම් අවසරයක දේවතාවෝත් අත් නොදෙන්නාහ. මනුෂ්‍යයෝ තමාම අත් නොදෙන්නාහ. සාහසික (නපුරු) කළාවූ යම් පාපයෙක් ඇත්නම් එම ජාතියෙහි විපාක දෙන්නේමය. ඒ එසේමය. යම් එලයක් රෝපණය කළේ නම් නොබෝ කලකින් එහි ලාභය (අස්වැන්න) විඳිද්ද. එසේම සාහසික කළාවූ යම් පාපයක් අත්පිට විපාකදෙයි. සහසික නොවමැ''යි රාජ කුමාරයන්ට බොහෝ අවවාද කියා උන්ගේ නුවරට යවූහ. ඒ රාජ කුමාරයෝත් බරණැස් නුවරට ගොස් රජ්ජුරුවන්ට ශිල්ප දක්වා පිය රජ්ජුරුවන් විසින් දෙන ලද්දවූ යුවරජ තනතුරු

ලැබ වාසය කරන්නාවූ පියානන්ගේ ඇවෑමෙන් රාජ්‍යයට පැමිණ රාජ්ජය කරන්නාහ.

ඒ රජ්ජුරුවන්ගේ චණ්ඩපරුෂවූ (සැඩ පරුෂවූ, නපුරු) පුරෝහිත බ්‍රාහ්මණයෙක් ඇත. ඒ බ්‍රාහ්මණයා සිතන්නේ "රජ්ජුරුවන් දස දහසක් දඹදිවට නායක කරවාපි නම් අග්‍රපුරෝහිතව බොහෝ සම්පත් ලබන්නෙම් වේදැ"යි සිතා රජ්ජුරුවන් ලඟට ගොස් මෙපවත් කියා බොහෝ කාරණා කියා රජ්ජුරුවන් පොලඹවාගෙණ යුද්ධයට යන ලෙසට චතුරංගිනි සේනාව සන්නද්ධ කරවාගෙණ පළමුකොට ගොස් කුඩා නුවරක් වටලාගන ඒ රජ්ජුරුවන් පොළඹවාගෙණ මේ නියායෙන් දස දහසක් යොදුන් දඹදිව නුවරවල් ඇරගෙණ දහසක් රජ්ජුරුවන් අල්වාගෙණ තක්සලා නුවර රජ්ජුරුවන් අල්ලා ගන්නා පිණිස ගියහ.

ඒ නුවර ලඟ ගඟෙක් ඇත. ඒ ගඟ අසල යහපත් ඡායා සම්පන්න (අතු පතර විහිදී හොඳට සෙවන ඇති) නුග ගසෙක් ඇත. ඒ නුගගස මුල රජ්ජුරුවෝ යානක් ලබාගෙණ එනත සැතපී පසු දවස තක්සලා නුවරට සටනට ගියාහ. දිසාපාමොක් ආචාරීන් ඒ රජ්ජුරුවන් යුද්ධයට එන නියාව අසා නුවර අට්ටාල (අටලු) වෙට්ටම් (වැටි, ආරක්ෂක වලලු) පවුරු වාසල් ආදිවූ තැන සේනාව සලස්වාගෙණ යුද්ධකොට නුවරට වැද්ද (ඇතුල්වීමට) නුදුන්නාහ. රජ්ජුරුවෝ නුවර සටන්කොට ඇරගත නොහී දෙවෙනිවත් නුගගස මුලට අවුත් පුරෝහිත බ්‍රාහ්මණයාට කියන්නාහු "මේසා මහත් සේනාවක්

ඇරගෙණ ගොසින් යුද්ධ කොටත් නුවර ඇරගත නුහුනුම්හ. කළමනා කිම්ද?" කැඳවා විචාළාහ.

එවිට බ්‍රාහ්මණයා කියන්නේ "මේ රජ්ජුරුවන් දහස අල්වා ඇස් උදුරා උන්ගේ පඤ්චරුධිර (මස් ලේ ආදී කොටස්. හද මස්, ළමැඩි, අක්මා, පපු, අතුණු යන පහ) මාංශයෙන් මේ නුග ගසේ වසන්නාවූ රාක්ෂයාට බිලි දී ඒ රාක්ෂසයාගේ ආනුභාවයෙන් යුද්ධකොට රාජ්‍යය ඇරගණුම්හ"යි කීහ. රජ්ජුරුවෝත් "යහපතැ"යි මල්ලවයන් (විරුද්ධ රජදරුවන්) ගෙන්වා තිරය ඇතුලේ සිටුවා රජදරුවන් එකින් එකා ගෙන්වා අල්වාගෙණ ඇස්දෙක උදුරා ළයපලා  අතුණු අක්මා පපුකැන් බඩවැල් උදුරා මිනී ගඟට දමා මේ නියායෙන් රජදරුවන් දහසම ඇස් උදුරා රුධිර මාංශ ඇරගෙණ මිනී ගඟට දමා මේ ඒ නුගගස උඩ බඩවැල් එල්වා රුධිර මාංශයත් පුද පසු දවස් සටනට ගියාහ.

ඒ වේලෙහි අට්ටාලයක සිටි එක් රාක්ෂසයෙක් දකුණු ඇස උදුරාගෙණ පළා ගියේය. රජ්ජුරුවෝ වේදනාව ඉවසාගත නොහී ඇවිත් නුගගස මුල උඩබලා වැදඹත්තාහ. මස්ලියා (මස් නැති, මස් ගැලවුනු) කාපු ඇටයක් ඩැහැගෙණ උඩින් යන පක්ෂියෙක් ඒ රජ්ජුරුවන්ගේ වම් ඇස ඇටය එලාපීය. ඒ ඇසත් උදුරාගෙණ දකුණැසින් නැංගේය. වේදනාව ඉවසාගත නොහී අඬන්නාවූ රජ්ජුරුවෝ "මාගේ ආචාරීන් වහන්සේ කීවා නොකොට යම් කෙනෙකුන්ට අනර්ථයක් නොකරව. කළාවූ අනර්ථයක් ඇත්නම් අත්පිට විපාක දෙයි

කීසේක. උන්වහන්සේ කීවා නොකොට මෙතෙක් රජදරුවන් ඇස් උදුරුවා මේ නුගගසට රුධිර මාංශයෙන් පූජා කෙළෙමි. එසේ පූජා ලත් දේවතාවත් මට අත් නුදුන්නේය. මේ පුරෝහිත බ්‍රාහ්මණයාත් මට සහයක් නුවූයේය. මම ආචාරීන් වහන්සේ කීවා නොකොට අසරණව ගියෙමි. මේ නුගයට රුධිර මාංශයෙන් පූජා කෙළෙමි.” අඬා කියන්නාහු “මාගේ රන්වන්වූ විශිෂ්ට රූ ඇති, බලා ඇස් ඇදගත නොහැක්කාවූ, මාගේ උද්ධරී නම් බිසවුන් මා විඳිනාවූ වේදනාව දකින්ටත් නුවූයේය. උන්ගේ ප්‍රිය වචනය මා කණහෙන්ටත් නුවූයේය. මාගේ ඇස්දෙක නැති වේදනාවටත් වඩා මාගේ බිසවුන් නොදක්නා වේදනාව ඉවසාගත නොහෙමි.” ඇස්දෙකේ වේදනාවෙනුත් බිසවුන් කෙරේ ශෝකයෙනුත් අඬා විටින් විට පෙරලී ප්‍රාණය නිරුද්ධව (මරණයට පත්ව) අවීචි මහනරකයට ගියාහ. දඹදිව ඒ ඒ නුවරවලින් ආ සේනාව තම තමන්ගේ නුවරටම ගියාහයි වදාරා මේ ‘ජොත ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් මෙකියන බෝධිරාජ කුමාරයෝය. පිංගල පුරෝහිත බ්‍රාහ්මණයා නම් දෙවදත්ත ස්ථවිරය. දිසාපාමොක් ආචාරීව උපන්නෙම් බුදුවූ මම්මය”යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 343. උරග ජාතකය

තවද පස්මරුන් (ක්ලේශ මාර ආදී මාරයෝ පස් දෙනා) ජයගත් හෙයින් ජින යයි නම් වූ සර්වඥයන් වහන්සේ

ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි මළාවූ පුතෙකු ඇති කෙළෙඹි පුත්‍රයෙකු අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

එක් කෙළඹි පුත්‍රයෙක් තමාගේ පුතෙකු මළ සෝකයෙන් විකෂපව (කණගාටුවෙන්) ඉඳිනේය. සර්‍වඥයන් වහන්සේ ඒ කෙළඹි පුත්‍රයා සෝවාන්වන්ට හේතු ඇති නියාව දැන අළුත මහණවූ භික්‍ෂු කෙණෙකුන් වහන්සේ කැඳවාගෙණ ඒ කෙළඹි පුත්‍රයාගේ ගෙට සිගා වැඩිසේක. කෙළඹි පුත්‍රයාත් සර්‍වඥයන් වහන්සේ දැක වැඳ පුදා එකත්පස්ව සිටියේය. සර්‍වඥයන් වහන්සේ කෙළඹි පුත්‍රයාට වදාරණ සේක් "ඇයි උපාසකය, විකෂපව උනුදැ?"යි විචාරා වදාළසේක. කෙළෙඹි පුත්‍රයා කියන්නේ "ස්වාමීනි, මාගේ පුතනු කෙණෙක් මළහෙයින් විකෂපව උනිමි" කීහ. එවිට සර්‍වඥයන් වහන්සේ වදාරණසේක් "උපාසකය, පෙර උත්තමයෝ තමන්ගේ දරුවන් මළාට සෝක නොකළෝවේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ එක්තරා බ්‍රාහ්මණ කුලයක උපන්නාහු තමනුත් තමන්ගේ භාය්‍ය්‍යාවනුත් පුතනුවෝත් දියනියෝත් පුතනුවන්ගේ භාය්‍ය්‍යාවෝත් කෙළිත් සදෙන නම් වන්නාහ.

බෝධිසත්‍වයෝ මුන් සදෙනාට මරණ සිහි භාවනා (මරණය නියතයයි සිහිකරන භාවනාව) උගන්වා නිරන්තරයෙන් භාවනා

කරන්නාහ. තුමූත් නිරන්තරයෙන් මරණ සිහි භාවනා කරන්නාහ.

එක් දවසක් බෝධිසත්ත්වයෝත් පුතනුවෝත් සිසාන්ටයයි කියා ගොසින් බෝධිසත්ත්වයෝ සීසාන්නාහ. බ්‍රාහ්මණ කුමාරයා පරඬල් එක්කොට ගිනි ලන්නාහ. ඒ ගිණිදුම් ඒ අසල තුඹසෙක වසන්නාවූ නාගරාජයකුගේ නාසයේ වන. නාගරාජයා කිපී අවුත් ඒ බ්‍රාහ්මණ කුමාරයා අත සතර දළ (තකරී, මකරී, යමී, යමදූතී යන දළ සතර) ඔබා දෂ්ට කළේය. ඒ කුමාරයාත් විෂමූර්ජාවෙන් (විෂ ශරීර ගතවීමෙන් ඇති වෙන තත්ත්වය) විසංඥව (සිහි නැතිව) වැටී හුන.

එවිට බෝධිසත්ත්වයෝ පුතනුවන් වැටීහුන්නා දැක එතනට ගොසින් පුතනුවන් වඩාගෙණ ගසක් මුල ලා කඩපටින් (රෙදි කෑල්ලකින්) මූන වසා තමුන් සීසාන්නාහ. එතනට එක්තරා පුරුෂයෙක් ආයේය. ඌ අතින් “කොයි යව්දැ?”යි විචාරා “ගමට යෙමි” කී කල්හි තමන්ගේ ගෙට කියා යවන්නාහු “මෙතෙක්දා දෙන්නෙකුට බත් ගෙණන්නාහ. ඒ අද එක්කෙනෙකුන්ට බත් ගෙනෙන්ට කියාලව. අපගේ බැමිණියත් දුවනියනුත් යෙහෙළනියනුත් කෙල්ලත් ඉස්සෝධා නා සුවඳ විලවුන් ඇරගෙණ එන්නට” කියා එවූහ. ඒ පුරුෂයාත් කියායවු සැටියේම එක්කෙනෙකුන්ට බත් ඇරගෙණ ඉස්සෝධා නා දුවනියන්ද යෙහෙළියන්ද කෙල්ලන්ද යන සතරදෙනම මල්ගඳ විලවුන් ගෙණ බෝධිසත්ත්වයන් සීසාන තෙනට ආහ.

බෝධිසත්වයෝත් පුතනුවන් මිය වැදහොත් රුප්පයේ (ගස් සෙවනේ) ඉඳම බත් කා පස්දෙනම සමාධි සමාධිව දර එක්කොට පුතනුවන් ගින්නේ ලා සතුටු සතුටුව මිණිය දවන්නාහ. උන් පස්දෙනාගේ ගුණානුභාවයෙන් ශක්‍රයෝ පාණ්ඩුකම්බල ශෛලාසනය (ගල් ආසනය) උනුව ගියේය. ශක්‍රයෝ මනුෂ්‍ය ලෝකය බලා මුන් පස්දෙනා දැක "මම එතනට ගොස් මුන්ගේ මරණ සිහි භාවනාවට මුන්ලවා සිංහනාද කරවා මුන්ගේ ගෙයත් සත්රුවනින් පුරා එමි"යි එක්තරා පුරුෂයෙකුමෙන් රූපයක් මවාගෙණ ඒ මිණිය දවන තෙනට අවුත් කියන්නාහු "මේ කුමක්ද? තොප ඇමදෙනම පුලුස්සන්නේ කින්දැ?"යි විචාළාහ. "මිණියක් දවම්හ"යි කීහ. "ඒ කිම්ද? තොපි කියන්නේ බොරුවට දඩමස් දෙම්හයි වඩාකොට කියම්ද? මුවෙකු හෝ උගරෙකු හෝ පුලුස්සති සිතමි" කීහ.

එවිට බෝධිසත්වයෝ කියන්නාහු "ඒ නැත, මිණියක් දවන්නේය"යි කීහ. "එසේවිනම් තොපගේ වෛරී එකකු දවව්දැ?"යි කීහ. "ඒ නැත, පුත්‍ර ප්‍රේමයෙන් වඩාගත් මාගේ පුතනුවෝය"යි කීහ. "එසේකල මේ පුතනුවෝ තොපට නොකීකරු වේදැ?"යි කීහ. බෝධිසත්වයෝ කියන්නාහු "මට ඉතාම ප්‍රියයෝය, කීකරුවූ හ"යි. එවිට ශක්‍රයෝ කියන්නාහු "එසේ තොපට කීකරු ප්‍රිය දරුවන් කල විසෙෂපයක්වත් නොකරන්ට කාරණා කිම්දැ?"යි කීහ.

එවිට බෝධිසත්‍වයෝ කියන්නාහු "සර්පයෙකු සැවයක් (හැවය, සිවිය) ඇරපියා ගියකල දෙවෙනිව ඊට ආලයක් නොකෙරේද්ද, මූ මෙතන කඳ තබා තමන්ගේ කර්මානුරූප (කර්මයට අනුව) පරිද්දෙන් පරලොව ගියාහ. අප ඇඬූ නියා දනිද්ද? අපගේ දරුවෝ මේ දරසෑයෙහි ගින්නේ නොදන්නාහ. ඌ ගොසින් එක්තෙනක උපදින්නාහ. අප අඬා කාරිය කිම්දැ?යි කීහ.

එවිට ශක්‍රයෝ බැමිණියන්දෑට කියන්නාහු "මැනියන් වහන්ස, මේ දවන්නාවූ පුරුෂයා කවුදැ?"යි කීහ. "පුතනුවනි, මාගේ දසමසක් උසුලා ලෙයි වැඩූ පුතනුවෝය"යි කීය. "එසේ කල පුරුෂයෝ නම් කාරණා දන්නා හෙයිනුත් ධෛර්යය උපදවා නො අඬන්නාහ. ගෑණු නම් ස්වභාවයෙන්ම අඬන සුල්ලහ, නුඹ කිසි වික්‍ෂෙපයක් නොවන්ට කාරණා කින්දැ?"යි කීහ. එවිට බැමිණියන්දෑ කියන්නේ "මුන් මාගේ බඩ පිළිසිඳ ගන්නා දවස් මට කීයේත් නැත. දැන් මිය යන ගමනේ 'මම මියෙමි'යි මට කීයේත් නැත. මාගේ දරුවෝ තෙල දරසැයේ වැද හෙව දයිද? ඌ ගොසින් කැමති එක්තෙනක පිළිසිඳ ගත්තුව, ඌ අප ඇඬූ නියාව දනිද්ද? වික්‍ෂෙප වූ නියාව දනිත්ද? එසේහෙයින් මළවුන්ට ඇඬීමෙන් කාරණා කිම්දැ?"යි කිය.

එවිට ශක්‍රයෝ බ්‍රාහ්මණ කුමාරයන්ගේ නැගනියන්ට කියන්නාහු "මේ දරසෑයේ දන්නාවූ පුරුෂයා තොපට කුමක්වේදැ"යි කීහ. "මා හා එක්කුසෙහි උපන් බෑණන්

වහන්සේ ය"යි කීහ. "එසේහෙයින් ගෑනු නෑයෝ එක්කුසේ උපන් මල්බෑයන් මළ කල මාගේ බෑනන්දෑ මළ දැයි කියා බොහෝ වික්‍ෂෙපව අඬා මුරගා ශෝක කරන්නාහ. තොප එසේවූ ඇඬීමක්වත් වික්‍ෂෙපයක්වත් නොකරන්නට කාරණා කිම්දැ?"යි විචාළාහ. එවිට නැගණියෝ කියන්නාහු "මාගේ ඇඬීමෙන් සිතට දුක්දී කයත් දුර්වලව බෑළුවන්ට අප්‍රිය කරවණ පමණක් විනා මිණිය දරසෑයේ දනසේක. උන් වහන්සේ ගොසින් එක්තැනෙක උපදිනා සේක. මා ඇඬුවයි මාගේ බෑණන් වහන්සේ ඉපිද එන්නේ නැත. මා අඬා කවර කටයුත්තෙක්දැ?"යි කීහ.

එවිට ශක්‍රයෝ මළ බ්‍රාහ්මණ කුමාරයාගේ භාර්‍ය්‍යාව කරාගොස් කියන්නාහු "මේ මළාවූ පුරුෂයා තොපට කුමක් වේදැ?"යි කියා විචාළාහ. "ස්වාමිනි, මාගේ වල්ලභයානන් වහන්සේ ය"යි කීහ. "එසේකල බන්ධූන්ටත් (නෑයන්ට) වඩා පුරුෂයා මළ කළ සෝක ඇත්තේ බිරින්දය. තමාගේ වල්ලභයා මළකල තමා කනවැන්දඹු වන හෙයිනුත් තමාගේ ස්නෙහ වඩන්නාවූ පුරුෂයා හෙයිනුත් දෙගුණයක් ශොක ඇති වන්නාහ. තොපි කණස්සල්ලකවත් ඇඬීමක්වත් නොවන්ට කාරණා කින්දැ?"යි කීහ. එවිට බැමිණී කියන්නී "මාගේ වල්ලභයානන් වහන්සේ මිය පරලොව ගොසින් යම් තැනෙක උපදිනාසේක. කින්ද තෙල දරසෑයේ දන්නේය. උන් වහන්සේ මා ඇඬු නියාව දන්නාසේක්ද? සඳ නැගෙණහිරින් නැගී බස්නාහිරින් බසීද, යම් සත්ව කෙණෙකුන් මරණින් මැකෙන්නේ නියමය. නටනා වස්තුවෙක් නස්නේමය. මළවුන්ට සෝක

කිරීමෙන් කාරිය කින්දැ?”යි කීහ. එවිට ශක්‍රයෝ කෙල්ල අතින් විචාරන්නාහු “මේ මළ පුරුෂයා තොපට කුමක් වෙද්දැ?”යි විචාළාහ. කෙළි කියන්නී “මාගේ ස්වාමි දරුවානන් වහන්සේය”යි කීහ. “එසේකල තොපට කණස්සල්ලෙක් නැත්තේ තොපට තදව මරා තලා මෙහෙවර ගත්හෙයින් ඒ කණස්සල්ලෙන් නාඩා නොදෙඩා ඉඳිනේදැ?”යි කීහ. එවිට කෙළි කියන්නී “මාගේ දරුකෙණකුන්සේ ළෙහිලා වැඩීමි. උන්වහන්සේ මට ලෙන්ගතුසේක. මමත් උන්වහන්සේට ලෙන්ගතුවෙමි. උන්වහන්සේ දරසෑයේ වැදහෙව ගින්නේ දනසේක. මා ඇඬූ නියාව දන්නාසේක්ද? සෝක නියාව දන්නාසේක්ද? යම්සේ කළයක පැන්පුරා ලාගෙන යන කල බිම වැටී බිඳී ගියේද, බිඳුනු කළය දෙවනුව සාවේද? එසේම මළ තැනැත්තන්ට අප ඇඬීමෙන් කාරිය කින්දැ?”යි කීහ.

එවිට ශක්‍රයෝ තමන්ගේ ශක්‍රාත්මභාවයෙන් සිට “තොප ඇමදෙනාගේ මරණ සිහි භාවනාව කළ නියාව යහපතැ”යි ප්‍රසංශා කොට බෝධිසත්වයන්ගේ ගෙය සත්රුවනින් පුරා “මේ සම්පත් අරගෙණ දුක්පත් නොවී සැපසේ ජීවත්වේවා”යි කියා තමන්ගේ දිව්‍යලෝකයටම ගියහයි වදාරා මේ ‘උරග ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි කෙළි නම් ත්‍රිපිටකධාරීවූ ඛුජ්ජුත්තරා නම් මෙහෙණීන්නය. එසමයෙහි බ්‍රාහ්මණයාගේ පුත්‍ර නම් රාහුල ස්ථවිරය. දූ නම් උපුල්වන් මහාස්ථවිරය. එසමයෙහි බ්‍රාහ්මණයානන්ගේ භාර්‍ය්‍යාවෝ නම් ඛේමා නම් භික්‍ෂුණීය.

බ්‍රාහ්මණව උපන්නෙමි බුදුවූ මම්මය''යි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

## 344. ඝන ජාතකය

තවද සිද්ධාර්ත්ථ නම් සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝසල රජ්ජුරුවන්ගේ අමාත්‍යයෙකු අරභයා මේ ජාතකය දක්වන ලදී.

කෝසල රජ්ජුරුවන්ගේ එක් අමාත්‍යයෙක් රජ්ජුරුවන්ට පක්‍ෂපාතව ඉඳිනේය. ඒ අමාත්‍යයා දුර්ජනයන්ගේ බසින් ඔහු කෙරේ කළකිරී සිරගෙයි ලැවූහ. ඒ අමාත්‍යයා සිරගෙයි ඉඳම සෝවාන් මාර්‍ගඵලයට පැමිණියේය. රජ්ජුරුවෝත් නොබෝ දවසකින් ඒ අමාත්‍යයාගේ ගුණ සඳහන් කොට ''දුර්ජනයන්ගේ බසින් මාගේ අමාත්‍යයා සිරගෙයි ලැවූ පමණක් විනා ඌගේ වරදක් නැතැ''යි සිරගෙයින් අරවාපීහ.

ඒ අමාත්‍යයාත් සිරගෙයින් ගැලවී ඉස්සෝධා නහා සුවඳ විලවුන් ගෙණ ජේතවනාරාමයට ගොස් සර්‍වඥයන් වහන්සේ වැඳපුදා එම්යි ගියේය. සර්‍වඥයන් වහන්සේත් අමාත්‍යයානන් දැක ''දුක්ඛයට පැමිණියාදැ''යි විචාරා වදාළසේක. ''ස්වාමීනි, එසේය දුක්ඛයට පැමිණත් සැපයක් උපදවා ගතිමි''යි ''සෝවාන් මාර්ග්ගඵලයට පැමිණියෙමි''යි කීහ. එවිට සර්‍වඥයන් වහන්සේ ''එඹල අමාත්‍යය, පෙරත් උත්තමයෝ අනර්ත්ථයට (අයහපතට) වැද අර්ත්ථය උපදවා ගත්තෝ

වේදැ''යි වදරා "ඒ කෙසේදැ?''යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්‍වයන් වහන්සේ රජ්ජුරුවන්ට පුත්ව උපන්සේක. උන් වහන්සේට නම් තබන්නාහු ඝන කුමාරයෝ යයි නම් තැබූහ.

උන් වහන්සේ වැඩිවිය පැමිණ තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් අතින් ශිල්ප නිමවා ඉගෙණ පියානන් ඇවෑමෙන් රාජ්‍යයට පැමිණ දසරාජධර්මයට අකොප්‍යව (අනුකූලව) රාජ්යය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ අමාත්‍යයෙක් අන්තඃපුරයට වැරදි ගියේය. රජ්ජුරුවෝ තමන්ගේ සිය ඇසපුරා ප්‍රත්‍යක්‍ෂයෙන් (අත්දැකීමෙන්) දැක උහට කිසි ගහටක් නොකොට "මාගේ රාජ්‍යයෙහි නොයිඳුව''යි කියා නුවරින් නෙරපූහ.

ඒ අමාත්‍යයා කොසොල්රට වංක නම් රජ්ජුරුවන් ළඟට ගොසින් පෙර ජාතිවල පරිද්දෙන් වංක රජ්ජුරුවන් හා සේනාව ඇරගෙණ බරණැස් නුවරට අවුත් බෝධිසත්‍වයන් අල්වා සිරගෙයිලා වංක නම් රජ්ජුරුවෝ රාජ්‍යය ඇරගෙණ ඉඳිනාහ. බෝධිසත්‍වයෝත් සිරගෙයි ඉඳම පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා ගත්හ. බෝධිසත්‍වයන් පඤ්චාභිඥා අෂ්ටසමාපත්තියට පැමිණිවිටම වංක රජ්ජුරුවන්ට දහ (දහඩිය) උපන්නේය.

වංක රජ්ජුරුවෝ අනික් කෙනෙකුන් නිසාවූ දෙයක් නොවෙයි සිතා සිරගෙයි උන් බෝධිසත්වයන් සමීපයට ගියාහ. බෝධිසත්වයෝත් භාවනා කොට ධ්‍යානයෙන් උන්නාහ. වංක රජ්ජුරුවෝ කියන්නාහු "එම්බා ඝන රජ්ජුරුවෙනි, නුඹ මේසා රාජ්‍යශ්‍රීයකින් පිරිහී කිසි සෝකයක් නැතිව ඉඳිනට කාරණා කිම්ද? මේසා රාජ්‍යශ්‍රීයකින් පිරිහුනු කල සෙසු කෙනෙක් විනම් අඬා දොඩා බොහෝ වික්‍ෂෙපයට පැමිණෙන්නාහ. නුඹ කිසි මුසුප්පුවක් නොකොට සමාධියෙන් ඉඳිනේ, මීට කාරණා කිම්දැ?"යි කීහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහු "එඹා වංක රජ්ජුරුවෙනි, මම කිසි පදාර්ථයකත් පළමුත් බැලීමක් නැත්තෙමි. යම් ව්‍යශනයකට පැමිණකල අඬා දොඩා යම් කෙණෙක් වික්‍ෂෙප වෙත්නම් තමන්ගේ ශරීරයටත් දුක පැමිණ සතුරන්ටත් අවසර පෙණෙන්නේය. එපමණක් විනා ඊට ලාභයක් නැත. පැමිණෙන දෙයක් පැමිණෙන්නේය. නටමනා දෙය නස්නේය. එසේහෙයින් ඓශ්වර්ය්‍යයෙන් (ඉසුරු, සැප සම්පත්) පිරිහිනිම්යි කිසි සෝකයත් නැත්තෙමි" කීහ. එවිට වංකරජ්ජුරුවෝ "දුර්ජනයන්ගේ බසට මෙලෙස කෙළෙමි" කියා බෝධිසත්වයන්ට රාජ්‍යය දී තමන්ගේ නුවරට ගියහ. බෝධිසත්වයෝත් පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා "ධ්‍යානලාභීවීම්, මට රාජ්‍යයෙන් ප්‍රයෝජන කිම්දැ?"යි රාජ්‍යය අමාත්‍යයන්ට පාවාදී හිමාලය වනයට ගොස් තපස් කොට කම්වූ පරිද්දෙන් බඹලොව ගියාහයි වදාරා මේ 'ඝන ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි වංක රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරය. ඝන රජ්ජුරුවෝ නම් බුදුවූ මම්මය"යි තමන් වහන්සේ දක්වා වදාළ සේක්.

# 345. කාරඬික ජාතකය

තවද ශෞද්ධොදනීයවූ (සුද්ධෝදන රජ පුත්) සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසනසේක් ධම්මසේනාපතිවූ සැරියුත් මහා ස්ථවිරයන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

සැරියුත් ස්වාමි වැද්දන්ට කෙවුලන්ට (මසුන් මරන්නන්ට) උන්ගේ අභිප්‍රාය නොදැනම සිල් දෙනසේක්. වැද්දේත් කෙවුලොත් සැරියුත් ස්වාමි දෙන හෙයින් සිල්ගන්නා පමණක් විනා ශීලය තාවුරුකොටගත නොහෙන්නාහ. එපවත් සැරියුත් ස්වාමීන් තමන්වහන්සේ ගේ භික්ෂූන් වහන්සේට වදාරණසේක් "මහණෙනි, වැද්දන් කෙවුලන්ට අප සිල් දෙන පමණක් විනා ශීලය උෟ  ඇම තාවුරුකොට ගත නොහෙන්නාහ"යි වදාළසේක. එවිට භික්ෂූන් වහන්සේ "ස්වාමීනි, උන්ගේ අභිප්‍රාය නොදැන සිල්දෙන හෙයින් උන් සිල් නොරක්නෝය. එසේ නොව කියා ආරාධනා කළොත් විනා සිල්දෙන්ට එපාය"යි කියා වදාළසේක.

මේ කථාව දම්සභාවට රැස්වූ මාළුවරුන් වහන්සේ (වැඩිමහල් භික්ෂූහු) කිය කියා උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්ව භාගයෙහි

කවර කථාවකින් යුක්තව උනුදැ?''යි විචාරා වදරා එපවත් අසා ''දැන්මතු නොවෙයි මහණෙනි, පෙරත් ශාරිපුත්‍ර ස්ථවිරයෝ අභිප්‍රාය නොදැනම සිල් දුන්නෝ වේදැ''යි වදරා ''ඒ කෙසේදැ?''යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ එක්තරා බ්‍රාහ්මණ කුලයක ඉපිද කාරණ්ඩික නම් කුමාරව ඉපිද වැඩිවිය පැමිණ දිසාපාමොක් ආචාරීන් ලඟ ශිල්ප ඉගෙණ උන්ගේ පන්සියයක් අතවැසින්ට නායකව වසන්නාහ.

එසමයෙහි දිසාපාමොක් ආචාරී මනුෂ්‍යයන්ගේ පමණ නොදැන අභිප්‍රායට සිල් දෙන්නාහ. ඒ මනුෂ්‍යයෝ සිල් ගන්නා පමණක් විනා සීලය ස්ථාවුරු කොට ගත නොහෙන්නාහ. උන්ගේ අභිප්‍රාය නොදැන සිල්දෙන්ට එපයි ශිෂ්‍යයන් කීවත් නොනැවතම සිල් දෙන්නාහු එක්තරා මනුෂ්‍යයෙක් දිසාපාමොක් ආචාරීන් අතවැස්සන් (තමන් යටතේ සිටින අය) පන්සියයට ''සෙට දවසට දන් මාගෙනැ''යි පැවරූහ. දිසාපාමොක් ආචාරී තුමූ නොගොස් තමන්ගේ කාරණ්ඩික නම් අතවැස්සානන් ඇතුළුවූ අතවැස්සන් පන්සියය කැඳවා ''තොපි හැම ගොස් මේ පුරුෂයාට සාන්තිකොට දනුත් කා උන්ගෙන් දුන්නාවූ ලාභසත්කාර ඇත්නුමුත් ඇරගෙණ එව''යි කියා යවූහ. එකියන අතවැස්සෝත් ඒ පුරුයාගේ ගෙට ගොස්

දනුත් කා ශාන්ති කොට ලාභත් අරගෙණ එන්නාහු අතරමග කඳු මුදුනෙක සැතපී උන්නාහ. එවිට කාරණ්ඩික නම් අතවැස්සානෝ සිතන්නාහු "අපගේ ආචාරීන් වහනසේ මනුෂ්‍යයන්ගේ අභිප්‍රාය නොදැනම සිල් දෙනසේක. මා විසින් අරවන්ට උවමැනව"යි සිතා එතනින් ගල්කැට ඇරගෙණ පාත එලන්නාහ. සෙසු අත වැස්සෝ "මේ කුමක්දැ?"යි විචාළාහ. උන් හැම කිසි බසකුත් බැන නොනැගී ගල්කැට පාත එලන්නේය. අතවැස්සෝ "මුන් ඇඟට අපාසුවක් නිසා වේදැ?"යි කියා එපවත් දිසාපාමොක් ආචාරීන්ට කීහ. දිසාපාමොක් ආචාරී ද එතනට ඇවිත් කියන්නාහු "කාරණ්ඩික නම් අතවැස්සානෙනි, තොප කරන්නේ කිම්දැ?"යි කීහ. එවිට අතවැස්සානෝ කියන්නාහු "මේ පෘථිවිමණ්ඩලය හෙරිතලයක්සේ තනාපියන නිසාය"යි කීහ.

එවිට දිසාපාමොක් ආචාරීන් "එසේ කරන්ට බොහෝ දෙනා විසිනුත් නොපිළිවනැ"යි කීකල්හි එසේකල "ආචාරීන් වහන්ස, නොයෙක් වර්ගයේ මිනිසුන්ට අභිප්‍රාය නොදැන සිල් දුනැයි කියා සිල් රක්‍ෂා කෙරෙද්දැ"යි කීහ. එවිට ආචාරී "තොප කී නියාවට තොප කීවා ගිවිස්සම්හ. මෙතැන් පටන් අභිප්‍රාය ඇති කෙණෙකුන්ට විනා සීලය නො දෙම්හ"යි කියා දෙන්නම තමන්ගේ ගෙට ගියාහයි වදාරා මේ 'කාරණ්ඩික ජාතකය' නිමවා වදාළසේක.

“එසමයෙහි දිසාපාමොක් ආචාරී නම් ශාරිපුත්‍ර ස්ථවිරය. කාරඬික බ්‍රාහමණ නම් බුදුවූ මම්මය”යි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

# 346. ලටුකික ජාතකය

තවද ගෞතම ගොත්‍රයෙහි උපන්නාවූ සර්‍වඥයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි “දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ කවුරුන් කෙරෙත් දයාවක් නොකරති” කිය කියා උන් තැනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදරා “මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?”යි විචාරා එපවත් අසා “දැන්මතු මතුනොවෙයි මහණෙනි පෙරත් දෙවදත්ත ස්ථවිරයෝ කා කෙරෙත් දයා නොකළෝ වේදැ”යි වදරා “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ අසූදහසක් ඇතුන්ට නායක වූ ඇත්රජව උපන්නාහ.

එක් කැටකිරිල්ලක් එක් මාවතෙක කැදැල්ලක් ඉදිකොට ගෙණ බිත්තරලා බිත්තර ගසා පැටවුන් පිහාඹා නොහෙන අවස්ථාවෙහි බෝධිසත්‍වයෝ අසූදහසක් ඇතුන් ඇරගෙණ ඒ ස්ථානයට පැමිණියාහ. කැටකිරිල්ල “තමාගේ දරුවන් පාගා මරති”යි බෝධිසත්‍වයන් ඉදිරියට තමාගේ පියාපත් දෙක

මුදුනේ තබාගෙණ ගොස් කියන්නී "සැට අවුරුද්දෙන් ගිලි යන මද ඇති අසූදහසක් ඇතුන්ට නායකවූ නාගරාජයානෙනි (ඇත් රජාණෙනි), තොපට නමස්කාර කෙරෙමි. මාගේ දරුවන් නොනසව"යි කිව. එවිට තමාගේ සතර පය අස්සේ කිරිල්ලගේ පැටවුන් ලාගෙණ අසූදහසක් ඇතුන් යනතුරු වැද සිට පසුව කැටකිරිල්ලට කියන්නාහු "පස්සේ එන්නාවූ ඇතෙක් චණ්ඩය, පරුෂය, තොපට පිළිවන් වී නම් ගලවා ගනුව"යි කියා ගියාහ. ඒ කියන කැටකිරිල්ලී "යහපතැ"යි ගිව්ස සිටි අවස්ථාවට එකියන ඇත් එතනට පැමිණියේය.

එවිට කැටකිරිල්ලී තමාගේ පියාපත් දෙක ඉස්මුදුනේ තබාගෙණ ඇතාට කියන්නී "පර්වතවල වනාන්තරවල වාසය කොට පියා එන්නාවූ එකචාරී (තනිව හැසිරෙන) නාගරාජය (ඇත්රාජය) තොපට මාගේ පියාපත් දෙකින් නමස්නාර වේවයි. මාගේ දුර්වලවූ දරුවන්ට හානියක් නොකරව"යි කියා නමස්කාර කළාහ. එවිට එකියන ඇත් කියන්නේ "තොපසේ දුර්වලයන්ට මා කුමක් කළත් බරයෙක්දැ?"යි කියා "මට තොප කරන්නේ කිමිද? තොපගේ පැටවුන් පීරවා අතින් හා පස්සාපයිනුත් දකුණු පයිනුත් නොමඩිමි. වම්පයින් මඩිමි" කියා වම්පයින් මැඩ මූත්‍රවතුරේ යවාපූහ.

එකියන්නාවූ කැටකිරිල්ලිත් එකගසක අත්තක් පිට ඉඳගෙණ කියන්නී "තාගේ බලයේ විචර (බලයේ තරම) හා මාගේ නුවණේ විචර හා බල. තාගේ උදක් බලයෙන් මාගේ දරුවන් නසාපුවාට මාගේ නුවණින් තාත් නසන්නෙමි වේදැ"යි

කියා තමන් ගොසින් එක් කවුඩෙකුට දෙතුන් දවසක් සේවාකම් කොට එකියන කවුඩු "තී මට සේවාකම් කරන්නේ ඇයිදැ?"යි කීහ. "ස්වාමීනි, මාගේ දරුවන් ඇතෙක් නසාපිය. එසේ හෙයින් එකියන ඇතා එකාචාරීව ඇවිදීය. ඒ ඇතාගේ අවසරයක් බලා ඇස්දෙක විදපුවොත් යහපතැ"යි කීහ. එකියන කවුඩු "යහපතැ"යි කියා ගිවිස්සේය.

එවිට එකියන කැට කිරිල්ලී නිලමැස්සෙකු සමීපයට ගොස් කීපදවසක් උන්පස්සේ සේවාකම් කරන්නීය. එවිට එකියන නිලමැසි "ඇයි තොප මා පස්සේ සේවය කරන්නේ ඇයිදැ"යි කීහ. එසඳ "එක් කවුඩෙක් එකචාරීව ඇවිදිනා ඇතකුගේ ඇස්විදිනේය. තොප ගොසින් උන්ගේ ඇසේ ඉහඬලා (පණුවන්) එව"යි කීහ. එයින් "යහපතැ"යි ගිවිස්සේය.

පසුව කැටකිරිල්ල ගොස් මැඩියෙක් ආශ්‍රය කළාය. එකියන මැඩියා "මා ආශ්‍රය කරන්නේ ඇයිදැ?"යි කීහ. එවිට කැටකිරිල්ලී කියන්නී "එක්තරා ඇස් කණාව ඇවිදිනා ඇතෙක් පැන් පිපාසයෙන් ඒ ඒ තැන ඇවිදිනේය. ඒ වෙලාවට තෝ පලා ගොස් පර්වතයක උඩඉඳ අඬාලව. එවිට ඇත් මැඩියන් ඉඳ අඬන්නේ පැන් ඇති තැනක් වේදැයි පර්වතය උඩට නැගෙන්නේය. පර්වතය උඩට නැගිකල තොප අඹරා ගොසින් පර්වතය පාත ඉඳ අඬාලව"යි කීහ. "ඒ වේලාවට ඇත් තොපකරා එන්නේය. තොප විසින් මට කරන්නේ මෙතකැ"යි කියන්නා මැඩියා "යහපතැ"යි කියා ගිවිස්සේය.

පසුව කල්යාමකින් කවුඩු ගොසින් ඇතාගේ ඇස්දෙක විදපිය. විදපු නියාව දැන නිලමැසි ගොස් ඇස් දෙක ඉහඬලාපිය. එවිට ඇතාගේ ඇස්දෙක අන්ධව ගියේය. එවිට ඇත් බොහෝ වූ වේදනාවට පැමිණියේය. පැන් පිපාස ඉවසාගත නොහී ඒ ඒ තැන විමසා ඇවිදින්නේය. ඒ වේලාවටම මඬුවා (මැඩියා, ගෙම්බා) පර්වත මුදුනේ ඉඳ ඇඬීය. ඒ වෙලාවටම එකියන ඇත් මඬුවාගේ කටහඬ අසා පැන් ඇති ස්ථානයකැයි සිතා පර්වත මුදුනට නැංගේය. ඒ වෙලාවට මඬුවා පෙරලා පර්වත පාත ඉඳ ඇඬීය. ඒ වෙලාවේ මඬුවා ඇඬු තැනට පාත බසින්ටයයි තමාගේ පය රඳවා ගත නොහි වැටුණේය. එවිටම ජීවිතක්ෂයට පැමිණියේය. එවිට කැටකිරිල්ලි ඇතා මළබව දැන උඩ "මහත් සන්තෝෂයට පැමිණියෙමි"යි ඇතාපිට සක්මන් කොට "මාගේ මනෝරථය (බලාපොරොත්තුව) මුදුන් පැමිණියේය"යි සිතා තමා වසන්නාවූ ස්ථානයට ගියාහ.

ඒ අර්ත්ථය දක්වන්නාවූ සර්වඥයන් වහන්සේ "මහණෙනි, කවුඩු හා කැටකිරිල්ලෙක නිලමැස්සෙක මඬුවකු ඇතුළුවූ ක්ෂුද්‍රප්‍රාණීන් සතරදෙනකු එක් වීමෙන් මහත්වූ හස්ති රාජයෙකු මරාගන්නාලදී. එසේහෙයින් මහතුන් කෙරෙහිත් නීචයන් කෙරෙහිත් ද්වේෂයක් (තරහක්) නම් නොකරව"යි වදාරා මේ 'ලටුකික ජාතකය' නිමවා වදාළ සේක.

"එසමයෙහි එකචාරී ඇත්රජ නම් දෙවදත්ත ස්ථවිරයෝය. අසූදහසක් ඇතුන්ට නායක ඇත්රජ නම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 347. චුල්ල ධර්‍මපාල ජාතකය

තවද ශාක්‍යසිංහ නම් වූ සර්‍වඥයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වනලද.

ඒ කෙසේද යත්?

එක් දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ (වැඩිමහල් භික්ෂූහු) "දෙවදත්ත ස්ථවිරයෝ සර්‍වඥයන් වහන්සේට වෛරීව නසන්ට නොයෙක් ප්‍රයෝග කළෝ වේදැ"යි කිය කියා වැඩඋන් තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා එපවත් දැන "මහණෙනි, දැන් මතු නොවෙයි පළමුත් දෙවදත්ත ස්ථවිරයෝ තමන්ට මා පුත්ව උපන් ගමනේ පවා අහිමාල නම් වධකරවා (ශරීරයේ අවයව කපා, එම අවයව කොටස් උඩ දමා කඩුවෙන් කැපීම) මැරෙව්වෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ"යි ආරාධිතවූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

යට ගිය දවස බරණැස්නුවර මහාප්‍රතාප නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ

රජ්ජුරුවන්ගේ අග්‍රමහෙසිකාවූ චන්‍ද්‍රාදේවී නම් බිසවුන් කුස පිළිසිඳ ගත්තාහ. බෝධිසත්ත්වයන් දසඑකඩ මසකින් (මාස නවයකින්) වදා නම් තබන්නාහු ධර්‍මපාල කුමාරයෝ යයි නම් තැබූහ. බෝධිසත්ත්වයන්ගේ මෑණියෝ චන්‍ද්‍රාදේවී බෝධිසත්ත්වයන් සත් මැසි වූ ගමනේ නාවා අඳුන් ගාවා සරහා කිරි පොවමින් සුරතල් බල බලා සමාධියෙන් (සිත සතුටින්) උන් කලට මහාප්‍රතාප රජ්ජුරුවෝ බිසවුන්ගේ ගෙට ගියාහ.

බිසව රජ්ජුරුවන් දැක නැගී නොසිටියාහ. රජ්ජුරුවෝ "තමාගේ සත්මැසි පුතෙකු ලදිමියි මා වැනි රජෙකු දැක උන්තැනින් නැගී නොසිටියාහ. මහත්ව ගියොත් තමා ව නොතකති"යි මහත් වූ කෝපයෙන් රජ්ජුරුවෝ ආපස්සේ පලාගොස් තමාගේ සිංහාසනයේ ඉඳ වධකයා ගෙණ්ව නියා යවූහ. වධක එන තැනැත්තේ එක්කණෙක රත්මල් තබා රතක් ඇඳ රතක් පෙරවා එක් අතකින් කඩුව, කෙටේරිය, දම්ගෙඩිය අරගෙණ අවුත් රජ්ජුරුවන් දැක "ස්වාමීනි, කවුරුන්ට වධ කෙරෙම්දැ?"යි කීය. රජ්ජුරුවෝ අනික් මට සතුරු කෙණෙක් නැත ධර්‍මපාල කුමාරයා අල්වාගෙණ වධකොට මරව"යි නියෝග කළාහ.

බිසව් රජ්ජුරුවන් වහන්සේ මහා කෝපයෙන් ගිය සේක. "කුමකින් කුමක් වේදෝහෝ"යි ධර්‍මපාල කුමාරයන් වඩාගෙණ අඬ අඬා වැදහොත්තාහ. වධක ගොස් වැදහොත් බිසවුන් පිටට පාරක් ගසා බිසවුන් ඉවත්කොට ධර්‍මපාල කුමාරයන් දෙකකුල අල්වාගෙණ රජ්ජුරුවන් සමීප යට ගියේය. බිසවු

අඬාගෙණ රජ්ජුරුවන් ලඟට ගියාහ. රජ්ජුරුවෝ එවිට කියන්නාහු "තෙල කුමාරයා දන්ගෙඩියේ වැද හොවා තුලු අත්දෙක කපවයි" කීහ. එවිට බිසවු කියන්නාහු "වරද කළාහු මාගේ අත්පා දෙක නොකපා බාල සත්මැසි කුමාරයන් දෑත කපන්නට කළ වරද කවරේද? වැරදි කළ මාගේ අත්දෙක කපව"යි කීහ.

එවිට රජ්ජුරුවෝ වධකයාට කියනනාහු "ප්‍රපඤ්ච (ප්‍රමාද නොවී, වහාම) නොකොට දෑත කපව"යි කීහ. "යහපතැ"යි කියා වධක කුමාරයන්ගේ දෑත කැපීය. බිසව් අත්දෙක තුරුල්ලේ ලාගෙණ අඬ අඬා සිටියාහ. වධක කියන්නේ "දේවයන්වහන්ස, කුමක් කෙරෙම්දැ?"යි විචාළේය. "තෙල කුමාරයා දෙකකුල කපව"යි කීහ. එවිට බිසව් අඬ අඬා "ස්වාමිනි, වැරදි කළාවුනුත් ස්වාමීන් දැක නැගී නොසිටියත් මාවුව, මාගේ කකුල්දෙක නොකපා බාල සත්මැයි කුමාරයන් දෙපය කපන්ට කළ වරද කවරේද? වැරදිකළ මාගේ දෙපය කපව"යි කීහ. එවිට රජ්ජුරුවෝ වධකයාට කියන්නාහු "ප්‍රපඤ්ච නොකොට තුලු දෙපය කපව"යි කීහ. "යහපතැ"යි කියා වධක කුමාරයන්ගේ දෙකකුල කැපීය. බිසව් කැපූ කකුල්දෙක තුරුල්ලේ ලාගෙණ අඬ අඬා සිටියාහ.

වධක එවිට කියන්නේ "දේවයන් වහන්ස, තව කළමනා වධ ඇද්දැ?"යි විචාළේය. රජ්ජුරුවෝ "තව කරණ වධ ඇති තුලු (ඔය, අර) ඉස කපව"යි කීහ. බිසව් "ස්වාමීනි, මාගේ දෑත දෙපය නැති පුතනුවෝ රාජ්‍යය කළ නොහෙන්නාහ.

කොට පුතනුවන් මට දීපුවොත් රැකගණිමැයි වැරදි කළ මගේ ඉසකපතොත් විනා මාගේ නිවරද පුතනුවන් ඉස නොකපවා වදාළ මැනවැ ස්වාමිනි" කීහ. වධකයාට කියන්නාහු "තුලු ඉස ප්‍රපළු නොකොට කපව"යි කීහ. "යහපතැ"යි කියා වධක කුමාරයන් ගේ ඉස කපා දැමිය. බිසව් දෑතත් දෙපයත් ඉසත් තුරුල්ලාගෙණ අඬ අඬා පෙරලෙන කලට වධකයා කියන්නේ "දේවයන් වහන්ස, මෙවර කුමක් කෙරෙම්දැ?"යි කීහ. රජ්ජුරුවෝ කියන්නාහු "තෙල සොරුන්ගේ ශරීරය ආකාශයට දමා කඩුවෙන් කප කපා අහිමාල නම් වධකරව"යි කිහ. වධකයාත් "යහපතැ"යි කුමාරයන්ගේ ශරීරය ආකාශයට දමා කඩුවෙන් කපා ශරීර මාංශ වදමල් පෙති සේ කපා දැමිය. බිසවු ඒ මාංශත් අරගෙණ දෑත දෙපය ඉසත් තුරුල්ලේ ලාගෙණ අඬ අඬා රජගෙයි වට ඇවිද කියන්නාහු "රජ්ජුරුවන්ගේ නෑකෙණෙක්වත් හිත මිත්‍ර කෙණෙක්වත් අමාත්‍ය කෙණෙක්වත් නැත්තාහ. එසේවූ කෙණෙක් ඇත්නම් මාගේ නිවරද ඖරස පුත්‍රවූ පුතනුවන්ට මෙසේවූ වධ නොපැමිණෙන්නේ වේදැ"යි කිය කියා අඬ අඬා "දරුවෙනි, මාගේ ප්‍රාණය මේ සෝකයෙන් තිබෙයි නොසිතව"යි කිය කියා ඇවිදිනා කල බිසව් ලයෙන් නැගී සෝකයෙන් හෘදයමාංශය උනකිලිල්ලක්සේ ඉඳි ලයපැලි ජීවිතක්‍ෂයට පැමිණියාහ.

නුවරවාසීහු බිසවුනුත් කුමාරයන්ගේ ශරීරමාංශ දෑත දෙපය ඉස එක්වලා ආදහන කළාහ. රජ්ජුරුවෝ සිංහාසනයේ උන්තැනැත්තෝ බිසව් කෙරේ හා පුත්‍ර ප්‍රේමයෙන් වැටුනාහු උඩුමාලේ පොරුපැලී ඉවත්ව ගියේය. එමාලෙන්

පාතමාලෙට වැටුනාහ. මේ නියායෙන් මාලෙන් මාලෙට වැටී බිම වැටුනාහ. දෙලක්‍ෂ සතලිස්දහසක් යොදුන් ඝනකඩ බොල් මහපොළොව පැලී අවීචි මහනරකයේ වැටුනාහයි වදරා මේ ‘ධම්මපාල ජාතකය’ වදාළ සේක.

“එසමයෙහි මහාප්‍රතාප රජ්ජුරුවෝ නම් දේවදත්ත ස්ථවිරය. එසමයෙහි චන්‍ද්‍රාදේවී නම් ප්‍රජාපතී ගොතමීය. එසමයෙහි ධර්‍මපාල කුමාරව උපන්නෙම් බුදුවූ මම්ම ය”යි වදාළසේක.

# 348. ස්වර්‍ණමෘග ජාතකය

තවද ශක්‍යකුලතිලකවූ (ශාක්‍ය වංශයට තිලකයක් වැනිවූ) සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දෑගසව්වන් වහන්සේට උපස්ථාන කරණ එක්තරා කුලයක් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

දෑගසව්වන් වහන්සේට උපස්ථාන කරණ එක්කුලයක දුවනිකෙනෙක් ඇත්තාහ. උග තුමූ විශිෂ්ටරූ (ලස්සන රූපයක්) ඇත්තාහ. බැලුවන්ට ප්‍රසාදනීයහ (ප්‍රියමනාපය). තුණුරුවන්ම මානය කොට වාසය කරන්නාහ. උපාසිකාව දවසරිනාහ. එකියන කුමාරිකාව තිර්ත්ථක කුලයෙක ඇත්තෝ තමන්ගේ පුතණුකෙනෙකුන්ට විවාහයට යයි කියා විවාළාහ. එකියන කුමාරිකාවගේ දෙමව්පියෝ කියන්නාහු “තොපි ඇම නම් පරම මිත්‍ථ්‍යාදෘෂ්ටිය (මිසදෙටු). එසේ වුවන්ට අපගේ දරුවන් පාවා

දුන්කල උන් සිතුසේ සංඝයා වහන්සේ වැඳ පුදගන්ට දන්දී ගන්ට නුපුළුවන. එසේ හෙයින් තොපට පාවා නොදෙම්හය"යි කීහ. එබස් අසා තිර්ථක කුලයේ ඇත්තෝ කියන්නාහු "තොපගේ දුවනියෝ අපගේ ගෙට ආ කල තමන් සිත සැටියේ දන් දෙත්වයි, සිල් රකිත්වයි, සංඝයා වහන්සේ වැඳ පුද ගණිත්වයි, ඊට අපගෙන් වාහකුලයෙක් (විරෝධයක්, බාධාවක්) නැතැ"යි කීහ. "එසේ වීනම් පාවා ගණුව"යි මහමඟුල් කොට සරණ පාවා දුන්හ.

එකියන කුමාරිකාවත් සරණ ගිය නොබෝ කලකින් තමාගේ වල්ලභයාට කියන්නී "ස්වාමිපුත්‍රයානෙනි, දෑගසව්වන් වහන්සේ දැක වැඳ පුද දන් දෙන්නා කැමැත්තෙමි" කීවාය. එකියන පුරුෂයාත් "යහපතැ"යි කීයේය. එකියන උපාසිකා සැරියුත් ස්වාමීන් මුගලන් ස්වාමීන් වැඩමවා දන් දී දෑගසව්වන් වහන්සේට කියන්නී "යම් දවසක් මේ ගෙයි ඇත්තෝ තමන්ගේ මිත්‍ථ්‍යාදෘෂ්ටිය අරිද්ද ඒ තාක්කල් මේ ගෙට සිඟන්නට වැඩිය මැනවැ"යි කිව. "යහපතැ"යි කියා ඒ ගෙට සිඟා වඩිනාසේක. එසමයෙහි තොමෝ කීප දවසක් පලා යන්නා තමාගේ ස්වාමිපුත්‍රයාට කියන්නී "ඇයි දෑගසව්වන් වහන්සේ දවස්පතා වඩිනාකල උන්වහන්සේලා වැඩිකල මට කියාලව"යි කීයේය. එකියන ස්ත්‍රීන් දෑගසව්වන් වහන්සේට අසුන් පණවා වළඳ අන්තයහි තමාගේ ස්වාමිපුරුෂයාට කීයේය. එකියන පුරුෂයාත් එතනට අවුත් දෑගසව්වන් වහන්සේ වැඳලා එකත් පස්ව උන්නේය.

ඉන් දම්සෙනෙවි සැරියුත් මහා ස්වාමි එකියන කෙළෙඹි පුත්‍රයාට දාන කථා ආදිවූ කථායෙන් ධර්‍මදේශනා කළසේක. ඒ බණ අසා එකියන පුරුෂයාත් තමාගේ මිත්‍යාදෘෂ්ටිය ඇර එවක් පටන් දන්දෙමින් සිල්රැක වාසය කරන්නාහ. මේ නියායෙන් කල්යත් එකියන පුරුෂයාගේ දෙමව්පියෝ පටන් නෑ වර්ගයාද යටත් පිරිසෙයින් කෙල්ලන් කොල්ලන් දක්වා මිත්‍යාදෘෂ්ටිය හැර සම්‍යක් දෘෂ්ටියෙහි (යහපත් දැක්මෙහි) පිහිටියෝය. එක් දවසක් සැරියුත් ස්වාමීන් වදාළ ධර්‍ම දේශනායෙන් එකියන පුරුෂයාත් ස්ත්‍රියත් දහසක් නයින් ප්‍රතිමණ්ඩිතවූ (සැරසුනාවූ) සෝවාන් ඵලයෙහි පිහිටියේය. පසුව කල්යාමකින් එකියන ස්ත්‍රී කියන්නී "ස්වාමිපුත්‍රයානෙනි, මා ගිහිගෙයි ඉන්ට අභිප්‍රාය නැත. මහණ වන්නා කැමැත්තෙමි" කීව. එකියන පුරුෂයාත් "යහපතැ"යි තොපිත් මහණවෙව, මමත් මහණවෙමියි" මහත්වූ පෙළහරින් තමන්ගේ භාර්‍ය්‍යාව මෙහෙණවරට ගෙණගොස් මහණ කරවා තුමූත් බුදුන් කරා ගොස් මහණවූහ. මහණ වූ නොබෝ කලකින් මෙහෙණිත් එකියන මහණත් සියළු කෙලෙසුන් නසා රහත්වූහ.

මේ කියන කථාව දම්සභා මණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ "අසවල් මෙහෙණීන්න නිසා තමාගේ පුරුෂයා ගලවා තමනුත් ගැලවුනේ වේදැ"යි කිය කියා වැඩ උන් තැනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා එපවත් අසා "මහණෙනි, දැන්මතු නොවෙයි එකියන ස්ත්‍රී තමනුත් ගැලවී මහත්මයනුත් ගළවා ගත්තෝ වේදැ"යි වදාරා

"ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍ජය කරණ සමයෙහි බෝධිසත්‍වයන් වහන්සේ මෘගව (මුවෙකුව) උපන්සේක. ශරීරය රන් වන් වූ පැහැයෙන් යුක්තය. සතර කකුල ලාක්‍ෂාරසයෙන් (ලාකඩ දියරයෙන්) තෙමාළූවාක් මෙන් රක්තය. මුඛය රත්පලස්වටක් (රවුම් රතු පලසක්) මෙන් රක්තය. අන්දෙක රිදීපැහැයෙන් හා සමානය. නේත්‍ර ඉන්ද්‍රනීල මාණික්‍ය (ඉදුනිල් මැණික්) දෙකක් මෙන් වුයේය. මේ නියායෙන් රුවින් අග්‍රව ඉපිද මේ නියාවට විශිෂ්ටවූ රූපයෙන් යුක්ත මෘගාංගනාවකුත් බෝධිසත්‍වයන්ට බිරින්දව ඉන්නාහ. අසූදහසක් මුවෝ සේවාකම් සිටිනාහ. එසමයෙහි එක් වැද්දෙක් වරපටින් මළ ලාළූයේය.

බෝධිසත්‍වයෝ අසූදහසක් මුවන් පිරිවරා ගොචරග්‍රහණය (ගොදුරු ගන්නා වූ, ආහාර ගන්නා) කරන්නාවූ වැද්ද ළූ මළේ පළමු යන්නාවූ බැඳූනාහ. මළ බැඳුනු ගමනේ මළ කඩාගත හැකැයි බෝධිසත්‍වයෝ පයගසලා ඇදළූ ගමනේ පය සම කැඩින. දෙවනුව ඇදළූ ගමනේ මාංශ කැඩින. තුන්වෙනිව ඇදළූ ගමනේ නහරවල් කැඩී ඇටයේ තරව ඇසිර වැදහොත් ගමනේ බෝධිසත්‍වයෝ මරණ භයින් භයපත්ව බඩරාවයෙන් (බඩ පුම්බාගෙන) මහත්කොට ඇඬූහ.

ඒ අඬ අසා අසූදහසක් මුවෝ භයින් තැතිගෙණ ඒ ඒ අත දිවපූහ. බෝධිසත්වයන්ගේ භාය්‍යීාවූ මෘගාංගනාවත් (මුව දෙන) එපරිද්දෙන්ම දිව මුවන් අතුරෙන් තමාගේ ස්වාමිපුත්‍රවූ මුවානන් නොදැක මේ භය පැමිණියේ මාගේ ස්වාමිපුත්‍රයානන් වහන්සේටයයි යන සිතින් මළ බැඳුනු බෝධිසත්වයන් ලඟට අවුත් කියන්නාහු "රන්වන් පැහැයක් ඇති මුවරජ්ජුරුවෙනි, මා හුදකළාකොට මට දුක් නොදී මහත්වූ වේගයෙන් මළකඩාපියව"යි කීහ. එවිට මුව රජ්ජුරුවෝ කියන්නාහු "භද්‍රාව, මා කරණ යම් උත්සාහයක් කෙළෙමි. පය සම් මස් නහර කැඞී ඇටයේ මන්ද ඇසිරින (හිර වුන). එසේ හෙයින් මන්ද කඩාගත නොහෙමැ"යි කීහ.

එවිට මුවදෙන් කියන්නී "ස්වාමීනි, නුඹ වහන්සේ නොබව මැනව, මාගේ ප්‍රාණය පරිත්‍යාග කොට වී නමුත් නුඹ වහන්සේ රකිමි. නොබාමැනවැ"යි කියා ඇඟ වතුරුවාගෙණ සිටි කලට වැදි කල්පාන්ත වහ්නියක්මෙන් (කල්පය කෙළවර ඇතිවන්නාවු ගින්නක් මෙන්) තෙජ ගත් (දැල් උල් ආදිය) අත් ඇතිව එන්නාවුන් දැක මුවදෙන් "ස්වාමීනි, වැදිපුත්‍ර එන්නේය. නොබව මැනව"යි බෝධිසත්වයන්ට කියා වැද්දාගේ ඉදිරියට ගොසින් නමස්කාර කොටලා සිට කියන්නී "වැදිපුත්‍රයාණන් වහන්ස. මේ මුවානෝ රන්වන්වූ ශරීර ඇත්තාහ. දස දහසක් මුවන්ට නායකයෝය. විශිෂ්ටවූ රූ ඇත්තාහ. මාගේ ස්වාමිපුත්‍රයානන් වහන්සේය. මුන්වහන්සේ නොමරා ඇරපියව. ඉදින් මරන්ට සිතවි නම් මෙසේ කොල

අතු කඩා අතුට මා මරා මාංශ ඇරගෙණ පසුව මාගේ ස්වාමිපුත්‍රයානන් වහන්සේ මරව"යි කීහ.

එවිට වැදිපුත්‍රයා මහාසමාධිව "නැතත් කාලයක් මුවන් දුටු විරීමි. මුවන් මනුෂ්‍යයන්ගේ භාෂාවෙන් කථා කරන්නවුන් නැසු විරීමි"යි කියා කියන්නේ "තොපගේ ස්වාමිපුත්‍ර වූ මුවත් තොපත් නොමරා අරිමි. තොප නොබව"යි කියා මුවාලඟට අවුත් පය බැඳුනු මන්ද ගළවා නහරින් නහර හා මසින් මස් හා සමගින් සම හා තබා පිරිමැද ලේ සෝධා ඵෑ ගමනේ වැද්දහුගේ මෛත්‍රී බලයෙන් හා බෝධිසත්ත්වයන්ගේ පාරමිතාවෙන් හා මුවදෙනගේ කරුණාවෙන්ද කිසි කැලලක් නැතිව සුවච සැපයෙහි සිටියාහ.

එවිට මුවදෙන් වැද්දවුට කියන්නී "වැදිපුත්‍රයානෙනි, අපට වූ සමාධියෙන් (සැනසීමෙන්) තොපගේ අඹුදරුවන්ටත් සතුටුවේව"යි ආවඩා (ස්තූති කොට) සිටියහ. බෝධිසත්ත්වයෝත් තමන් ගොචර භූමියෙහි දුටු මාණික්‍ය රත්නයක් වැද්දවුට දී "වැදිපුත්‍රයානෙනි, තෙල ඇරගෙණ විකොට කව. ප්‍රාණඝාත නොකරව"යි අවවාද වදරා වනාන්තරයට ගියසේක. බුදුරජානන් වහන්සේ 'ස්වර්ණමෘග ජාතකය' පූර්වාපරසන්ධි ගළපා නිමවා වදාළසේක.

"එසමයෙහි වැදිපුත්‍රයා ඡන්න නම් අමාත්‍යයාය. ඒ කියන මුවදෙන් නම් මේ භික්ෂුණීය. එසමයෙහි මුවරජ නම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 349. සුස්සොන්දිය ජාතකය

තවද සූර්‍ය්‍යවංශයට බන්‍ධුවූ (නෑ වූ) සර්‍වඥයන් වහනසේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ස්ත්‍රියක කෙරේ පිළිබඳ සිත් ඇති භික්‍ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්?

එක් භික්‍ෂු කෙණෙකුන් වහන්සේ ස්ත්‍රියක කෙරේ පිළිබඳව ශාසනයෙහි උකටලීවූසේක් (සසුන කෙරේ කළකිරී, පැවිද්ද එපා වී) සර්‍වඥයන් වහන්සේ විචාරා වදාරන්නාහු "ගුරුළුවිමන (ගුරුළු පක්‍ෂියාගේ වාසස්ථානය) ලාත් රැකගත නුහුණුවූ ස්ත්‍රියක කෙරේ පිළිබඳ සිත් ඇති වෙද්දැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර තඹතාඩ නම් රජ්ජුරුවන් කෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්‍වයන් වහන්සේ නාගද්වයින වාසය කරන්නාවූ ගුරුළු රජව බරණැස් නුවරට ගොසින් තඹතාඩ නම් රජ්ජුරුවන් හා කැටිව දූ කෙළනාහ (සූදුව හෙවත් දදු ක්‍රීඩාව). රජ්ජුරුවන්ගේ සුස්සොන්දිය නම් බිසෝ කෙණෙක් ඇත්තාහ. ඒ බිසවුන්ගේ සේවක ස්ත්‍රී ඒ මානවකයාගේ රූපය "යහපතැ"යි බිසවුන්ට විස්තරකොට කීවාහුය. බිසව් ඒ මානවකයා දක්නා අභිප්‍රාය ඇතිව මිනිසුන්

පස්සේ සිටියාහ. බෝධිසත්වයෝත් දූ කෙළිනා පරක්කුවෙන් බිසවුන් බැලූහ. බිසවුන් බෝධිසත්වයන් බලා පිළිබඳ සිත් ඇතිව එවිට බෝධිසත්වයෝ පවනක් හා අන්ධකාරයක් මවා මිනිසුන් පහකොට බිසවුන් තමන්ගේ ඇකයේ සඟවාගෙණ තමන්ගේ ගුරුළු විමානයට ඇරගෙණ ගියේය. රජ්ජුරුවෝත් තමන්ගේ බිසවුන් නො දැක "මාගේ බිසවුන් කොයිදැ?"යි කියා පරීක්ෂා කොට නො දැක තමන්ගේ සග්ගික නම් ගාන්ධර්වයෙකු (දේව විශේෂයක්) කැඳවා කියන්නාහු "මාගේ බිසවුන් ගිය තැනක් ආරංචිකොට දෙන්ටය"යි භාරකළාහ.

ඒ ගාන්ධර්වයාත් ගොසින් භාරු නම් පටුන්ගමට බැස යාත්‍රා යන්නාවූ (ඔරුවකින් ගමන් කරන) සෙට්ඨිවරුන්ට (වෙළඳුන්ට) කියන්නේ "මම විණා ගාන්ට දනිමි, තෙල නැවට නංවගණුව"යි කීහ. සෙට්ඨිවරුන් "යහපතැ"යි නැවට නන්වාගෙණ මුහුදු මධ්‍යයෙන් යන්නාහු "තොප අපට විණාගාව"යි කීහ. එවිට ගාන්ධර්වයා කියන්නේ "ගොඩබට තෙනදී විණා ගාමි මච්ඡයෝ තොපගේ නැව යා නොදෙති" කීය. එවිට උඉ ඇම කියන්නාහු "කුඩමස්සො කුමක්කෙරෙද්ද? විණාගාව"යි කීහ. එවිට ගාන්ධර්වයා විණාගාන්ට වන. දැතිමෝරෙක් පඩච්චට (රුවලට) පැන පඩච්ච බිඳපී ය. ඒ ගාන්ධර්වයා බිඳිගිය පෝරුවක් (ලෑල්ලක්) බඩ තබාගෙණ දිය පීනා බෝධිසත්වයන් ඉඳිනා නාගදිවයිනට පාවීය. එවේලාවට ගරුළුත් රජ්ජුරුවන් හා දූ කෙළින්ට පළාගියේය. බිසව් ඇත මෑත ඇවිදිනාවූ ගාන්ධර්වයා දැක "මාගේ ස්වාමීන්ගේ ගාන්ධර්වයාය"යි දැන උඉ ඉස්සෝද නාවා ඔහු හා එක්ව

ලෝකස්වාද රතියෙහි (කාම සේවනයෙහි) යෙදී බෝධිසත්වයන් එන වෙලාවට එක් තෙනක සඟවා ඉඳුවන්නාහ. මෙම නියායෙන් කීපදවසක් ගියකල්හි දඬු පත් ගන්ටයයි නැවක් ඇවිත් ඒ දිවයිනට වන. ගාන්ධර්වයාත් එනැවට නැගී බරණැස් නුවරට ගොස් තමාගේ රජ්ජුරුවන් දැක ගුරුළු හා රජ්ජුරුවන් දෙන්නා දූ කෙළිනා වේලෙහි ගීතයකින් ගුරුළු විමානයෙදී බිසවුන් දුටු නියාව කියා ගුරුළු ගාන්ධර්වයා මූන බලා "තෝ මූදුමධ්‍යයේ විමානයේ උන් බිසවුන් කෙසේ දුටුදැ?"යි විචාළාහ.

ගාන්ධර්වයා කියන්නේ "මූදු මධ්‍යයේ නැවක් නැසී පෝරුවක් බඩ තියාගෙණ පීණා ගොසින් දිවයිනට බැස බිසවුන් හා කැටිව ලෝකස්වාද රතියෙහි යෙදී රජ්ජුරුවන්ගේ මෙහෙවරින් ගොස් ආමි" කීය. එවිට බෝධිසත්වයෝ "ගුරුළු විචාළත් රැකගත නොහැක්කාවූ ගෑනුන්ගෙන් ප්‍රයෝජන කින්දැ?"යි බිසවුන් රජ්ජුරුවන්ටම පාවා දුන්හයි වදරා මේ 'සුස්සොන්දිය ජාතකය' නිමවා වදාළ සේක.

"එසමයෙහි තඹතාඬ රජ්ජුරුවෝ නම් ආනන්දස්ථවිරයෝය. ගාන්ධර්වයා නම් මේ උකටලී මහණය. සුස්සොන්දිය බිසව් නම් මේ ස්ත්‍රීය. ගුරුළුව උපන්නේ නම් බුදුවූ මම්මය"යි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

# 350. වණ්ණාරෝහ ජාතකය

තවද ආදිච්චබන්‍ධුය (සූර්‍ය්‍ය වංශයට නෑ වූ) යන නම් වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සැරියුත් මුගලන් දෑගසව්වන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්?

සැරියුත් මුගලන් දෑගසව්වන් වහන්සේ පිටිසර ගමකට ගොස් වසනසේක. එක්තරා පුරුෂයෙක් මේ දෙන්නා වහන්සේගේ මිත්‍රධර්‍මය දැක "දෙදෙනා වහන්සේ උනුඋනුන් ගස්වා (ගැටුම් ඇතිකරවා) බිඳුවාපියන්ට උවමැනව"යි සිතා සැරියුත් ස්වාමීන් කරා ගොස් කියන්නේ "ස්වාමීනි, මුගලන් ස්වාමීන් කරා එක් දවසකින් මම ගියෙමි. මා ගිය ගමනේ කියනසේක් මා හා සමාන ජාතිවංශයවත් (කුල ගෝත්‍ර වලින්) ඉර්ධි ප්‍රාතිහාර්‍ය්‍යවත් නැතිසේක. උන් වහන්සේ කිම්දැයි කියා නින්‍ද්‍ය සැටියේ බස් කීසේක. උන් වහන්සේ එසේ කීයේ නුඹ වහන්සේ කෙරේ කණ්ණස්සළුව (අමනාප ගතියකින්) වේදැ"යි කීය. උන්වහන්සේ අසා සිනාසී "එසේ කීසේක්ද? යහපත, තොපි පළායව"යි උන් එතනින් යවූසේක. එක් දවසක් මුගලන් සාමීන් කරා ගොස් එම පුරුෂයා මෙම නියාවට කියා උන්වහන්සේත් අසා සිනාසී "එසේ කීසේක්ද? යහපත තොපි යව"යි කියා යවා එක් දවසක් මුගලන් සාමීන් සැරියුත් සාමීන් කරාගොස් "අසවල් පුරුෂයා මෙතනට ආද? එකියන තැනැත්තේ කීයේ කිම්දැ?"යි විචාළ සේක. උන් කී සැටි

වදාළසේක."මටත් මෙසැටි කීය"යි උන් වහන්සේත් කියා "මෙතන උවමනා එකෙක් නොවේ"යි කියා එතනින් යවා තුන්මස එතන රඳා වස්වැස සර්‍වඥයන් වහන්සේ කරාගොස් සර්‍වඥයන් වහන්සේ දැක තමන් දෙදෙනා වහන්සේ ගස්වා බිඳින්ට පුරුෂයා කී කළදෙය වදාළසේක.

සර්‍වඥයන් වහන්සේ අසා වදාරා "දැගසව්වෙනි, දැන්මතු නොවෙයි පළමුත් එකියන පුරුෂයා තොප දෙදෙනා ගස්වා බිඳින්ට උත්සාහ කළ ගමනෙත් තොපි දෙදෙනා ඒ අසා අදහා නොගෙණ උනුන් හා කනස්සළු නුවූවෝ (විරසක නොවූ) වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්‍වයන් වහන්සේ වෘක්‍ෂදේවතාව උපන්සේක. එසමයෙහි සුදාඨ නම් සිංහ රජ්ජුරුකෙණෙකුන් හා සුබාහු නම් ව්‍යාඝ්‍රයකු හා දෙන්න උනුන් හා බලවත්වූ හිතමිත්‍රව වාසය කරන්නාහ.

එසමයෙහි එක් කැණහිලෙක් සිංහයා හා ව්‍යාඝ්‍රයා ලඟටගොස් නොයෙක් සතාසතුන් කෑතැන ඇට මාංශ කා මහත්වූ ශරීර ඇතිව ස්ථුලව සිතන්නේ "කවර සතුන්ගෙත් මාංශ කැවිමි. සිංහමස් හා ව්‍යාඝ්‍රමස් කෑවිරූ නැත. දෙන්නා උනුන් හා ගස්වා මරවමි"යි සිතා සිංහ රජ්ජුරුවන් සමීපයට කැණහිල් ගොස් කියන්නේ "ව්‍යාඝ්‍රයානන් දැකලා හිත විශ්වාසකම් කිමිදැ?"යි කීය. සිංහයා කියන්නේ "හිතකමට

අමුතු කිම්ද? බලවත් හිතයම්හ''යි කීහ. ''නුඹ වහන්සේ කියන පමණක් විනා එක් දවසක් මම ව්‍යඝ්‍රයානන් උන් තැනට ගිය ගමනේ නුඹ වහන්සේගේ නුගුණ විනා ගුනයක් නොකීවෝය. මාසේ ජාතිවන්ත (ජාතියෙන් උසස්) ගුණවත් වික්‍රමවත් රූපයක්වත් උන්ට නැත. උන් කිම්දැ?''යි කීසේක. සිංහයානෝ අසා ''එසේ කිවුදැ?''යි සිනාසී ''මෙතනින් තොපි යව''යි කියා යවූහ.

එක් දවසක් කැණහිල් ව්‍යාඝ්‍රයානන් උන්තෙනට ගොස් ව්‍යාඝ්‍රයානන් දැකලා ''නුඹ දෙදෙනාගේ හිතමිත්‍රකම් කිම්දැ?''යි විචාළේය. ''මිත්‍රකමට අමුතු කිම්දැ?''යි කියන්නා ''නුඹ වහන්සේ එසේ කියන පමණක්ව විනා එක් දවසක් මා එතනට ගිය ගමනේ නුඹ වහන්සේගේ නුගුණ විනා ගුණයක් කීයේ නැතැ''යි පළමු කීවාසේම ව්‍යාඝ්‍රයාට කීය. ව්‍යාඝ්‍රයා සිනාසී එසේ කීව්ව ''තොපි මෙතනින් පලායව''යි කියා සුදාඨ නම් සිංහ රජ්ජුරුවන් කරා ගොසින් සුබාහු නම් ව්‍යාඝ්‍රයා කියන්නේ ''සිංහ රජ්ජුරුවෙනි, සිගාලයා මා කරා අවුත් කියන්නේ නුඹ වහන්සේ මට නොයෙක්දෑ බොහෝව කීවයි කියා මට අවුත් කීය. සැබෑද නුඹ වහන්සේ මට එසේ කීයේදැ?''යි විචාළේය. සිංහ රජ්ජුරුවෝත් එවිට කියන්නේ ''තොපත් මට නොයෙක්දෑ කීවයි කියා ඇවිත් කීය. මම අදහා නොගතිමි. තොපගේ අඥාන කමෙක විවර (මෝඩ කමක තරම) මාගේ තත්‍වය දැන මෙසේවූ දෙයක් කියති කියන්නක් මෙතෙක් කාලයක් එකතැන ඉඳ නොදත් නිසාද? තොපගේ අඥාන කමෙකැ''යි කියා දෙන්නම උනුන් හා කථා

කොට "මේ නීච තැනැත්තහු ලංවීමෙන් වේද මෙසේවූ සැකයක් වුයේය"යි කියා "උඹ මෙතන ඉඳ නොහැක්කැ"යි මෙතනින් පහකොට ව්‍යඝ්‍ර රජ්ජුරුවන් ක්‍ෂමා කරවාගෙණ තමාගේ වාසස්ථානයට ගොස් සැපසේ වාසය කළහයි වදාරා මේ 'වණ්රොහ ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි සිගාලව උපන්නේ මෙකියන පුරුෂයාය. එසමයෙහි සිංහව උපන්නේ ශාරිපුත්ත ස්ථවිරය. ව්‍යාඝ්‍රව උපන්නේ මුගලන් මහා ස්ථවිරය. එසමයෙහි වෘක්‍ෂදේවතාව ඉපිද මේ කාරණය දුටුයෙමි බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 351. ශීලපරික්ඛ ජාතකය

තවද සමන්තභද්‍රවූ (හාත්පසින්ම යහපත්වූ) සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සීලය පරීක්‍ෂා කල බ්‍රාහ්මණයෙකු අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

සැවැත්නුවර එක්තරා බ්‍රාහ්මණයෙක් ශීලය යහපත්කොට රක්නේය. රජ්ජුරුවෝ මේ නියාව දැන සෙසු බ්‍රාහ්මණයන් නියාවට මෙකියන බ්‍රාහ්මණයාට ආවේනික (පක්‍ෂපාතීව, අවනතව) ඇතිව වාසය කරන්නාහ. බ්‍රාහ්මණ තමා කෙරේ රජ්ජුරුවන් ආවේනික ඇතිව් වාසය කරණ නියාව දැන "රජ්ජුරුවන් වහන්සේ මා කෙරේ ආවේනික ව. මා රක්‍ෂාකරන්නාවූ ශීලය ආනුභාවයෙන් දෝ හෝ නොහොත් මා බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තේ ඒ නිසා දෝ හෝයි මා

කෙරේ ආවේනිකය. මේ මා පරීක්ෂාකරන්නට උවමැනව”යි සිතා සෙට්ඨිවරුන්ගේ (සිටුවරුන්ගේ, වෙළෙන්දන්ගේ) පිලට ගොස් තුන් දවසෙක රන් තුන්ගාණක් උකාගෙණ පළමුදු ආචාරීන් කෙරේ ගරුත්‍වයෙන් නොකීහ. දෙවෙනිදු මේ රන් සොරකම් කරණ සොරෙකැයි අල්වාගෙණ ගොස් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝ “ආචාරීනි, මේ කුමක් නිසා කළ දෙයක්දැ?”යි විචාළාහ. “ස්වාමීනි, සීලය වැඩි ද්‍යේහෝයි පරීක්ෂාකරණ නිසා කෙළෙමි”යි කීහ. රජ්ජුරුවෝ කිසිදෙයකුත් නොකීහ.

එවිට බ්‍රාහ්මණ “ස්වාමීනි, මා රක්නාවූ ශීලයම වැඩිය. එසේහෙයින් ගිහිගෙයින් මට ප්‍රයෝජන නැත. මහණවෙමි” කියා රජ්ජුරුවන්ගෙන් අවසර ඉල්වාගෙණ සර්‍වඥයන් වහන්සේ කරා ගොස් මහණව උපසම්පදාව (උසස්ම පැවිදි ශීලය) නොබෝ කලකින් විදර්ශනා වඩා රහත්වූසේක. මේ කථාව දම්සභා මඩපයේ රැස්වූ සංඝයා වහන්සේ ශීලමයගුණ වර්‍ණනා කර කර වැඩ උන් තැනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා “මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?”යි විචාරා වදාරා එපවත් අසා “පෙර මහෝත්තමයෝ පවා ශීලයම උතුම් ද්‍යේහෝයි පරීක්ෂාකොටම හුන්නෝ වේදැ”යි වදාරා “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ බ්‍රාහ්මණ කුලයක ඉපද වැඩිවිය පැමිණ දිසාපාමොක් ආචාරීන් කරාගොස් ශිල්ප ශාස්ත්‍ර ඉගෙණ බරණැස් නුවරට අවුත් බෝධිසත්ත්වයෝ රජ්ජුරුවන් දුටහ. රජ්ජුරුන් විසින් බෝධිසත්ත්වයන් පුරෝහිත ස්ථානාන්තරයෙහි සැලැස්වූහ.

බෝධිසත්ත්වයෝ අඛණ්ඩවූ (කඩ කරන්නේ නැතිව) ශීලය රක්නාහ. රජ්ජුරුවෝ සෙසු බ්‍රාහ්මණයන් නිසා මට පුරෝහිත බ්‍රාහ්මණයන් කෙරේ මහත්වූ ආවේනික ඇත්තාහ. පුරෝහිතයෝ රජ්ජුරුවන් වහන්සේ මා කෙරේ ආවේනික ඇතිසේක. මේ මා පරීක්ෂාකරණට උවමැනවයි සිතා පළමු කථාව පරිද්දෙන් පරීක්ෂාකළාහ. රජ්ජුරුවෝ "මේ කින්ද? ආචාරීනි" විචාළාහ. පුරෝහිතයෝ "ස්වාමීනි ශීලය වැඩි දේහෝ ඇසූපිරූ ශාස්ත්‍රය වැඩි දේ හෝයි සිතා පරීක්ෂාකෙළෙමි. ඉන් වඩිනේ (වඩා වැදගත් වන්නේ) ශීලයම දනිමි ස්වාමීනි" කීහ. "උතුම්වූ ජාති හා උතුම්වූ ශාස්ත්‍රය දනිතත් වඩිනේ ශීලයම"යි කීහ.

තවද රජ්ජුරුවෝ "බ්‍රාහ්මණයෝ වෙළඳ සුද්‍ර (පහත් යයි සම්මත කුලය) ආදිවූ අය අධර්මයෙහි හැසිර සම්පත් උපදවා පොහොසත්ව රැකේනම් එසේවූ පොහොසත්වීමට වඩා දැහැමෙන් සෙමෙන් සීලය රක්‍ෂාකොට දවස් ඇරීම යහපතැයි ශීලයම වඩිනේය. තවද චතුර්වර්ණයෙහි (බ්‍රාහ්මණ, ක්‍ෂත්‍රිය,

වෛශ්‍ය, ශුද්‍ර යන කුල සතර) ඇත්තන් හා නීචකුලයෙහි උපන්නෝද සියලු සත්වයෝම ශීලයෙහි යෙදී සිල්වත්ව වාසය කෙරෙත් නම් සියල්ලවුන්ටම හොබනේය. එසේහෙයින් ශීලයම වඩිනේය"යි කියා බරණැස් රජ්ජුරුවන්ට කියා අවසර ඉල්වාගෙණ පුරෝහිතයෝ වනාන්තරයට වැද ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පංචඉර්ධි අෂ්ටසමාපත්ති උපදවා නොපිරිහිනු ධ්‍යානයෙන් බ්‍රහ්ම ලෝකයෙහි උපන්නාහයි වදාරා මේ 'ශීලපරික්ඛ ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි බ්‍රාහ්මණව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 352. හිරි ජාතකය

තවද සකල ගුණ නිධානවූ (ගුණයට නිධානයක් වූ) තිලෝගුරු (තුන්ලොවට ගුරුවරයාවූ) බුදු රජානන් වහනසේ සැවැත් නුවර නිසා ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි අණේපිඩු මහසිටාණන් විශ්වාසව ඉඳිනා පිටිසර සිටාණකෙනෙකුන් අරභයා මේ ජාතකය දක්වනලද.

ඒ කෙසේදයත්?

මෙහි වර්තමාන කථාවත් යට කියන ලද ජාතකවල පෙනෙන්නේය. මෙහි වනාහි බරණැස් නුවර සිටාණන්ගේ පිටිසර විශ්වාසවූ සිටාණකෙණෙක් ඇත්තාහ. පිටිසර සිටාණන් එවූ පඬුරු බෝධිසත්වයෝ විකොට මිළ යවන්නාහ. බෝධිසත්වයන් එවු බඩුවට නින්දකොට නොවිකුණන්නාහ.

බෝධිසත්වයන්ගේ මනුෂ්‍යයෝත් “අපගේ සිටාණන් වහන්සේගෙන් ගෙණගිය බඩු නොවිකුට නින්ද කියනකල අපිත් උන්ගේ බඩු විකුණන්නේ නැතැ”යි කියා නොවිකුට උන් යවා එපවත් බෝධිසත්වයන්ට කීහ.

බෝධිසත්වයෝ එපවත් අසා මිත්‍රධර්මය තරකොට කියන්නාහු “මෙසේ බරණැස්නුවර සිටාණෝ තමන් සමීපයට පැමිණියාවූ මනුෂ්‍යයන්ට කළමනා දෙය නොකරන්නාවූ මනුෂ්‍යයෝ ප්‍රත්‍යුපකාර (උපකාරයට දක්වන ප්‍රති උපකාරය) නොසලක්නාහුය”යි කියන්නාහු “ලජ්ජාව ඉක්ම මිත්‍රභාවයට පිළිකුල් කරන්නාවූ මම නුඹ වහන්සේගේ මිත්‍රයෙමි” හුදක් වචන මාත්‍රයකින් කියන්නාහු “දෙමි” “කෙරෙමි” යන වචනයට සුදුසුවූ උත්තම ක්‍රියා නොකරන්නාවූ මෙබඳුවූ පුද්ගලයා මේ මාගේ මිත්‍රයයි නො දතයුත්තේය. යම් සත්වයෙක් යමක් කෙරේ නම් එම කියාද, යමක් නොකරේනම් නොකියාද, නොකරන්නාවූ කාරිය කියන්නාවූ සත්වයෝ නුවණැත්තාවූ සත්වයෝ “මූ කියන්නේ නැත්තය”යි තමන්ගේ විශෙෂ වූ ප්‍රඥාවෙන් දැන ගන්නාහ. යම් සත්වයෙක් තෙමේ ඇමකල්හිම අප්‍රමාදව භේද කිරීමෙහි සිතිවිලි ඇත්තේද, රන්ධ්‍රගවෙෂිව (සිදුරු සොයමින් හෙවත් වැරදි සොයමින්) නුගුණ සොයන සුළුද එසේවූ සත්වතෙමේ මිත්‍රයෙක් නොවන්නේය. යම් සත්වයෙක් තෙමේ මෙරමා විසින් කොතෙක් නුගුණ කියාත් බිඳුවාලිය නොහැකිවේද, ළෙහිලා වැඩූ පුත්‍රයෙකුමෙන් යම් මිත්‍රයෙකු සමීපයෙහි ස්නෙහීවැ වෙසේද, එසේවූ සත්වතෙම මිත්‍ර වන්නේය. යම් සත්වයෙක් තෙමේ තමා

විසින් කෙතෙක් නුගුණ කියාත් බිඳුවාලිය නොහැකිවේද, නුවණැත්තාවූ කළ්‍යාණ මිත්‍රයා හා සමග මිත්‍රභාවය ප්‍රීති ප්‍රාමෝද්‍යයද (ප්‍රීතිය හා සතුට) උපද වන්නේය. ප්‍රශංසාද ඵලවන්නේය. මෙලෝ පරලෝ දෙකෙහි කායික චෛතසික (සිතුවිලි) සැපයද ඵල වන්නේය.

එසේහෙයින් මෙබඳුවූ විපාකානිශංසය දන්නාවූ කුල පුත්‍රතෙමේ ප්‍රඥාවන්ත උත්තමවූ පුරුෂයන් විසින් ඉසිළිය යුතුවූ දානය ශීලය භාවනාවය මිත්‍රභාවයයි කියනලද චතුර්විධවූ පුරුෂධුරය (පුරුෂ ශක්ති හතර) උසුලමින් මෙබඳුවූ මිත්‍රභාව සංඛ්‍යාතවූ බලවත් ප්‍රීතියට කාරණාද මෙලොවින් පරලොවින් ප්‍රශංසාද කයට සිතට සැපද ඵලවන්නේය. නුවණැත්තන් හා සමග මිත්‍රභාවය බිඳ නොපියන්නේය. කායවිවේක (කයේ විවේකය) චිත්තවිවේක (සිතේ විවේකය) උපධිවිවේක (කෙලෙස් නැසීමෙන් සිතෙහි ඇතිවන සන්සුන් බව) සංඛ්‍යාතවූ රසය අනුභවකොට ඒ විවේක නිසා උපන්නාවූ සොම්නස් සාරසැප ආදිය අනුභවකොට ධර්මප්‍රීති සංඛ්‍යාතවූ (දහම් ප්‍රීතිය නම්වූ) අර්හත්ඵල විමුක්තිරසයද නිර්වාණප්‍රීති සැපයද අනුභව කෙරෙමින් නුවණැත්තාවූ සත්‍වතෙමේ සියළු කෙලෙස් පරිළාහයන් (දැවීම් නැති) හුන් බැවින් කාය චිත්තයද රථ රහිත වන්නේය. රාගාදී ක්ලෙශයන් නැති බැවින් නිෂ්පාපී වන්නේයයි මෙසේ මහබෝසතාණෝ පාපමිත්‍ර සංසර්ගයෙන් කළකිරී “මට පැමිණියාවූ විවේකාවාස අමෘත මහා නිර්වාණයට පමුණුවා දේශනාවෙහි කුළු ගැන්වූව”යි වදරා මේ ‘හිරි ජාතකය’ නිමවා වදාළසේක.

"එසමයෙහි බරණැස් නුවර සිටුව උපන්නෙම් බුදුවූ මම ම ය"යි වදාළසේක.

# 353. අභිගුණ්ඨික ජාතකය

තවද අසරණ සරණවූ (අසරණයන්ට පිහිට වූ) තිලෝගුරු (තුන්ලොවට ගුරුවරයා වූ) බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි මහළු භික්‍ෂූන්වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

මහළු භික්‍ෂුකෙණෙකුන් වහන්සේ එක් සාමණෙර කෙණෙකුන් වහන්සේත් එක්ව විහාරයක වාසය කරණ සේක් සාමණේරයන් වහන්සේ මරා තලා (කරදර හිරිහැර කිරීම) නොයෙක් ගහට මහළු භික්‍ෂූන් වහන්සේ කරන්නා ඉවසාගත නොහී සිවුරුහැර සාමණෙරයන් වහන්සේ ගිහිගෙට පළාගියසේක.

මහළු භික්‍ෂූන් වහන්සේ සාමණෙරයන් වහන්සේ ඇර වාසය කළ නොහී දෙවෙනිව යාඥාව නොයෙක් දෑ කියා මහණ කරවා ගෙණ පළමුසේම නොයෙක් ගහට කරණ සෙයින් සිවුරුහැර ගිහිව වාසය කරණ කල්හි දම්සභාවේ රැස්වූ සංඝයා වහන්සේ අසවල් මහළු භික්‍ෂූන්වහන්සේ සාමණේරයන් වහන්සේට නොයෙක් ගහට කරණ හෙයින් සිවුරුහැරපුයයි සිවුරෙහි සිටිනාකල එක්ව වාසයත් කළ නොහෙති, උන්හැරත් වාසයත් කළ නොහෙති.

මේ නියාව කිය කියා උන්තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා එපවත් අසා "මහණෙනි, දැන්මතු නොවෙයි පළමුත් එකියන මහළු භික්ෂුහුත් සාමණේරයෝත් දෙන්න එක්ව වාසයකල නොහෙති, උයින් හැර වාසයත් කළ නොහෙත්ය"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒකෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ වී විකුණන වෙළඳව උපන්සේක. එසමයෙහි බරණැස් නුවර අභිගුණ්ඩික නම් බ්‍රාහ්මණයෙක් වඳුරෙකු වඩා සර්පයින් නටවා ජීවත් වන්නේය.

බරණැස් නුවර උත්සව කෙළියක් දවසෙක අභිගුණ්ඩික බ්‍රාහ්මණ වඳුරා වී වෙළඳුනන් සමීපයෙහි රඳවා තෙමේ උත්සවකෙළි කෙළිනට ගිය තැනැත්තේ සත් දවසකුත් රඳා ආය. වඳුරා තමා වැඩූ තැනැත්තා හෙයින් දැක ලගට ආය. අභිගුණ්ඩික බ්‍රාහ්මණ වඳුරා මරා බැඳලීය (පහර දී බැඳ තැබීය). වඳුරා බැම්ම කඩාගෙණ අඹ ගසට නැංගේය.

අභිගුණ්ඩික බ්‍රහ්මණ නිද පිබිද වඳුරා නොදැක ගස උඩ බලා ගස උඩ ඉඳ අඹ කන්නාවූ වඳුරා දැක "මූ සිත්ගෙණ බස්කියා පාත බාවාගෙණ (බස්සවාගෙන) අල්වා ගණිමි" සිතා ගසමුලසිට කියන්නේ "යහපත්වූ මූනක් ඇති වානරයානෙනි,

මම දූ කෙළ පැරදපියා ආමි. මට අඹකැණකුත්( අඹ පොකුරක්) අරගෙණ මා කරා එව"යි කීය.

එවිට වානරයා කියන්නේ "තෙපි කුමක් කියව්ද? වඳුරන්ගේත් යහපත් මුහුණු ඇද්ද? තොපි සිත්ගෙණ කියනබස් මම නොදනිම්ද? තෝ ව්‍යාජ කියා මා ලඟට ගෙන්නා ගෙණ අල්වාගන්ට කාරණා උපාය මම දනිමි. මාගේ ස්වාමියා කියායයි සිතා තොප කරා ගොස් උනපත්තෙන් පාර කීපයක් ගසා කළ ගහට තව දක්වා මා සිත ඇත. තොප මට රාජ්ජයක් දෙමි කීවත් තොප ලඟට මා එන්නේ නැතැ"යි කියා ගස අත්ත අගට පලාගිය යි වදාරා මේ 'අභිගුණ්ඨික ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි වානරයා නම් මේ සාමණේරය. අභිගුණ්ඨික බ්‍රාහ්මණ නම් මහළු භික්‍ෂූහුය. වී වෙළඳව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 354. ගුඹිය ජාතකය

තවද ශාස්තෲවූ තිලෝගුරු බුදුරාජණන් වහනසේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි උකටලීවූ (කළකිරුණු) භික්‍ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

භික්‍ෂුකෙණෙකුන් වහන්සේ ස්ත්‍රියක් නිසා උකටලී ව වාසය කරණ සේක. සර්‍වඥයන් වහන්සේ එපවත් දැන වදාරා "සැබෑද මහණ, තා ස්ත්‍රියක් නිසා උකටලී වූයේදැ?" යි

විචාරා වදාරන්නා "සැබෑය ස්වාමීනි, ස්ත්‍රියක් නිසා උකටලී වීමි"යි කීසේක. සර්‍වඥයන් වහන්සේ "එම්බල මහණ, ස්ත්‍රීන් කෙරේ උකටලි වීම නම් ගුම්බිය නම් රාක්‍ෂසයා මගසලා (මග දමා තිබූ) තැබූ මී මෙනැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙකෙන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්‍වයන් වහන්සේ වෙළඳ ව ඉපිද පන්සියයක් ගැල්පුරා බඩුගෙණ වෙළඳමට යන්නාහු මනුෂ්‍යයන්ට බෝධිසත්‍වයෝ කියන්නාහු "මංවල මී මුළු (මී වද) ආදීවූ දෙයක් නොකෑවිරෑ එලජාතිත් මා විචාරා විනා කවුරුත් නොකව"යි කියා වනාන්තරයට වන්නාහ. ගුම්බිය නම් රාක්‍ෂසයා මී සලා මුළු වල බැඳ මග තබා තෙමේ පොරවක් ඇරගෙණ මී කොටමින් බැද්දේ සිටියේය. මනුෂ්‍යයෝ පුරුෂයෙකුගේ සැදෑහෑ යහපතැයි කියමින් ම මුළු ඇරගෙණ කන්නට වන්හ. බොධිසත්‍වයන් "මා විචාරා විනා නොකව"යි කියද්දී මී මුළු කන්ට වන්කලට බොධිසත්‍වයෝ ඒ දැක කමින් සිටිම් උගුරු අල්වාගෙණ (වැමෑරීම) දැමුහ. අතින්ගත් මී අතින් දැමුහ. පළමු කෑ අය නැසුනාහ. යන්තමක් කෑ අය බෙහෙත් පොවා නංවාපුවාහ.

එකියන්නාවූ අර්ත්‍ථය දකවන සර්‍වඥයන් වහන්සේ වදාරණසේක් "ගුම්බිය රාක්‍ෂසයා මනුෂ්‍යයන් මරන්ට මී සලා මුළුබැඳ තිබීද, එමෙන්ම මනුෂ්‍යයෝ අනුවණීන් මී කා මළහ.

සමහර නුවණැති මනුෂ්‍යයෝ නොකා නොකෑ විසින් සුවපත්වූහ. මනුෂ්‍යයන්ට රාගචේතනාව (සරාගික සිතුවිලි) නම් මෘත්‍යුමාරයා (මාරයා) විසින් ලාළුවාවූ මලක් හාද බලියක් හාද සමාන වන්නේය. පඤ්චකාමයට (රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන පස්කම් සැපට) අසුවුනු කෙණෙක් ඇත්නම් මළවුන් හා සමානය''යි වදාරා චතුසත්‍යය (දුක්ඛාදී සත්‍ය සතර) ප්‍රකාශකොට මේ 'ගුම්බිය ජාතකය' නිමවා වදාළසේක. චතුස්සත්‍යවසානයෙහි උකටලී භික්ෂූන් වහන්සේ සෝවාන් වූසේක.

"එසමයෙහි සාන්තුනායක (වෙළඳ නායක) වෙළඳ ව උපන්නෙම් බුදුවූ මම්ම වේදැ''යි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

## 355. සාලිය ජාතකය

තවද දේවාතිදේවවූ (දෙවියන්ට දෙවිවූ) සර්වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

දම්සභාවෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ "දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ සර්වඥයන් වහන්සේ මරන්ට උත්සාහ කොට මරාගත නුහුනුවෝ වේදැ?''යි කිය කියා වැඩ උන්තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ?''යි

විචාරා එපවත් අසා "දැන්මතු නොවෙයි මහණෙනි, පෙරත් දෙවදත්ත ස්ථවිරයෝ අප මරන්ට උත්සාහකොට භය විවරකුත් කොටගත නුහුනුවෝ (නොහැකිවීම) වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ එක්තරා කෙළඹිපුත්‍ර (ප්‍රභූ පවුලක) කුලයෙක ඉපද වැඩිවිය පැමිණ කුඩා කොල්ලන් පිරිවරා නුගගසක් මුල කෙළිනාහ (ක්‍රීඩා කළහ). එක් වෙදෙක් ඒ නුවරට අවුත් වෙදකමක් නොලැබ ඒ කුඩා කොල්ලන් කෙළිනා තැනට අවුත් සිටියේය. ඒ නුගගස සිදුරෙන් සර්පයෙක් කර පොවා වැද ඕත්තේය. ඒ වෙදු සිතන්නේ "මේ සර්පයා ලවා කුඩා කොල්ලන් කඩා කවා විසබා (විෂ බස්වා) ප්‍රයෝජනයක් විඳිමි" සිතා කුඩා කොල්ලන්ට කියන්නේ "එඹල කුඩා කොල්ලෙනි, තෙල ගස්බිලියේ සැළලිහිණි පැටවෙක් ඉදිනීය. ඌ අල්වාගෙණ කෙළුවහ (සෙල්ලම් කරන්න) යි කීය. බෝධිසත්‍වයෝත් "යහපතැ"යි ගසට නැගී සර්පයා නියාව දැන ඉසටිය (හිස කොටසින්) තරයේ අල්වාගෙණ බිමට දැමුහ. සර්පයාත් වෙදු කර දරණ ලාගෙණ කා මැරීය. බොහෝ මනුෂ්‍යයෝ එතනය එක්වූහ. ඒ එක්වූ මනුෂ්‍යයන්ට බණ කියන්නාවූ බෝධිසත්‍වයෝ "මේ වෙදු මා සර්පයා ලවා කඩා කවන්ට ගසට නැංගීය.

මම සර්පයා නියාව දැන තරයේ අල්වා බිමට දමාපීමි. ඒ සර්පයා ඒ වෙද මැරීය. යම් කෙණෙක් නිරපරාධ කෙණෙකුන් නසන්ට උත්සහ කෙරෙත්නම් තමන් නසන්නා පමණමුත් අනුන් නසාගත නොහෙයි. යම් කෙණෙක් රජස් (දූවිලි) අරගෙණ උඩුසුලඟට දැමුකල ඒ රජස් දෙවැනිව අවුත් තමා ඇඟ වැදගනිද? එසේහෙයින් නිරපරාධ කෙණෙකුන් නසන්ට උත්සාහ කළත් නසාගත නොහෙන්නේම ය''යි වදාරා මේ 'සාලිය ජාතකය' නිමවා වදාළ සේක.

"එසමයෙහි වෙද නම් දේවදත්ත ස්ථවිරය. කෙළඹි පුත්‍රව උපන්නෙමි බුදුවූ මම්ම ය''යි වදාළසේක.

## 356. නවසාර ජාතකය

තවද ශක්‍රාතිශක්‍රවූ (ශක්‍රයන්ටත් ශක්‍රවූ) සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ප්‍රඥාපාරමිතාව අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

එක් දවසක් දම්සභාවේ රැස්වූ මාළුවරුන් වහන්සේ "සර්වඥයෝ ඉතා තීක්ෂණවූ නුවන ඇතිසේකැ''යි කිය කියා වැඩ උන්තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පුර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?''යි විචාරා එපවත් අසා "දැන්මතු නොවෙයි මහණෙනි, පෙරත් මූකළ නුනුවනෙහි (මෝඩකමෙහි) පටන් තීක්ෂණවූ

(සියුම්) නුවන ඇත්තෝම වේදැ''යි වදරා "ඒ කෙසේදැ?''යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේ.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍ජය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ කෙළෙඹි (ප්‍රභූ පවුලක) කුලයෙහි ඉපිද පළමු කී පරිද්දෙන්ම (සාලිය ජාතකයේ අයුරින්) බෝධිසත්‍වයෝ සර්පයෙක් අරගෙණ වෙද ඇඟට දැමූහ. සර්පයාත් වෙද කර දරණලා කා මැරීය. බොහෝ මනුෂ්‍යයෝ එක්ව "මේ කුඩා කොල්ලා මිනිසා මරාපුය''යි කුඩා කොල්ලන් බැඳගෙණ බරණැස් රජ්ජුරුවන් කරා ගෙණ ගියාහ. බෝධිසත්‍වයෝ මග යමින් සිටි කුඩා කොල්ලන්ට කියන්නාහු "තොපි ඇම රජ්ජුරුවන් දුටුකළ නාඬා නොදෙඩා සිනාසිසී සන්තෝෂයෙන් සිටුව''යි කියා ඉගැන්වූහ. ඒකියන කුඩා කොල්ලෝ ඒ නියාවටම (ඒ කියූ පරිද්දෙන්) සිටියාහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු "ඇයි කුඩා කොල්ලෙනි, තොපි ඇම වෙද මරා පියා අවුත් කිසි භයක් මුසුප්පුවක් (විපිලිසර බවක්) නොවී සිටින්නේ ඇයිදැ?''යි කීහ. එවිට බෝධිසත්‍වයෝ කියන්නාහු "දෙවයන් වහන්ස, දුර්මුඛවීමෙන් (කථා නොකර සිටීමෙන්) සතුරුව සිටන තැනැත්තේ වැරැද්දිකොට පියා මූන දුර්මුඛව සිටියේයයි සතුරාටත් අවසර පෙණෙයි. වැරදි කළ කලට දුර්මුඛ වූවයි වෙන දෙයක් වැලකුන් නැත. එසේ හෙයින් දුර්මුඛ වීමෙන් තමාගේ මූන බැළුවන්ට ප්‍රියකරු නොවන්නේය. මේ

කාරණයෙන් සන්තෝෂව කෙළ සිනාසිසී සිටියම්හ”යි කීහ. එවිට රජ්ජුරුවෝ බෝධිසත්ත්වයෙන් කී බසට සමාධිව (එකඟව) “තොපගේ වැරද්ද කියව”යි වැරදි විචාරා අද්‍යන්ත (මුල අග) අසා බෝධිසත්ත්වයන් ඇතුළුවූ කුඩා කොල්ලන් බැඳුන් මුදා බෝධිසත්ත්වයන් තමන්ට අමාත්‍ය තනතුරෙහි සලස්වා ගත්හ. සෙසු කුඩා කොල්ලන්ටත් තනතුරු දී තමන්ට සේවය කරන්ට සලස්වා ගත්හයි වදාරා ‘නවසාර ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරය. කුඩාකොල්ලෝ නම් අසූමහසව්වෝය. කෙළෙඹි පුත්‍රව උපන්නෙම් බුදුවූ මම්ම ය”යි වදාළ සේක.

# 357. මිත්තවින්දක ජාතකය

තවද බ්‍රහ්මාතිබ්‍රහ්මවූ (බ්‍රහ්මයන්ට බ්‍රහ්ම වූ) සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ලෝහිවූ භික්ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

මෙහි වර්තමාන කථාව යට කියන මිත්තවින්ද ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය.

මෙහි වනාහී බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි එක්තරා මිනිසෙක් පඩවි (ලෑල්ලකට, ලී කොටයකට) නැගී මුහුදු පීනා යන තැනැත්තේ දිව්‍ය ස්ත්‍රීන් සතරදෙනකු වාසය කරණ තෙනට ගොසින් එතන ඉන්ද නොහී දිව්‍යස්ත්‍රීන් අටදෙනෙකු වාසය කරණ තෙනට ගියේය. එතනත් ඉන්ද නොහී දිව්‍යස්ත්‍රීන්

සොළොස්දෙනෙකු වාසය කරණ තෙනට ගියේය. එතනත් ඉන්ද නොහී දිව්‍යස්ත්‍රීන් දෙතිස්දෙනෙකු වාසය කරණ තෙනට ගොස් ඉන් පැසෙන (වැඩිමහලු) තැනැත්තට කියන්නෝ "තොප කර තිබෙන පලඳනාව මා කර පලඳවා පියව"යි කීය.

එවිට පැසෙන තැනැත්තේ "මේ යාපත් පළඳනාවෙක් නොවෙයි නරකයේ උරචක්‍ර මාලාවය" (මේ අවිය ගෙල පැලඳ ගෙන සිටින විට එයට ගෙල කැපි කැපී තිබෙයි) යි කීය. "ඒ යහපත, මා කර ලාපියව"යි කියන්නා පැසෙන තැනැත්තේ උඃ කරලා ගැළවි පලා ගියේය. බෝධිසත්වයෝ දිව්‍යලෝකයෙහි ඉපිද නරකවල් බලා ගෙණ යන ගමනේ උරචක්‍ර මාලාව පැලඳගෙණ කරලා සිටි පුරුෂයා ලඟට ගියාහ. එවිට උරචක්‍ර මාලාව පැලඳගෙණ සිටි පුරුෂයා කියන්නේ "මා මෙසේවූ අකුශලයට පැමිණියේ කවර අකුශලයකින්දැ?"යි විචාළේය.

දිව්‍යපුත්‍ර කියනුයේ "තොපගේ ලෝභයෙහි වූ අකුශලය. දිව්‍යස්ත්‍රීන් සතරදෙනා අටදෙනා සොලොස්දෙනා දෙතිස්දෙනා වාසය කරණ තැන ඉඳ නොහී මේ මෙසේවූ අකුශලයකට පැමිණියේ තොපගේ ලොභ චේතනාවගේ විපාකය"යි කීහ. එවිට උරචක්‍ර මාලාවෙන් බොටුව (බෙල්ල) කැපි අනික් බසක් කිය නුහුනුවහයි වදරා මේ 'මිත්තවින්දක ජාතකය' නිමවා වදාළ සේක.

"එසමයෙහි මිත්තවින්දක නම් ලෝභි භික්‍ෂූහුය. දිව්‍යපුත්‍රව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

## 358. පලාස ජාතකය

තවද වන්දනෙයයාති වන්දනෙයයාවූ (වැඳිය යුත්තන්ගෙන් වැඳුම් ලැබීමට සුදුසුවූ) තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් ස්ත්‍රියක් නිසා උකටලිවූ භික්‍ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

එක් හි භික්‍ෂුකෙණෙකුන් වහන්සේ ස්ත්‍රියක් නිසා උකටලීව වාසය කරණ නියාව සර්‍වඥයන් වහනසේ දැන වදරා "සැබෑද මහණ, තා ස්ත්‍රියක් නිසා උකටලීව වාසය කරන්නේදැ?"යි විචාරා වදාළ කල්යි "සැබෑය ස්වාමීනි"යි කියන්නා "එම්බල මහණ, ස්ත්‍රියක් නිසා උකටලීවීම නම් කෑලගස් ඇතුලේ නුගගස් (කෑල ගසට නුග ගස එක්වූ විට මුල්ගස විනාශ වෙයි) ඇතිව කෑලගස් නැසුවා මෙනැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේ ද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ හංසව ඉපිද චිත්‍රකූට පර්‍වතයෙහි (මුදුන් තුනක් සහිත පර්‍වතය)

වාසය කොට ගෝචර භූමියට (ගොදුරු බිමට) යන එන කල කෑලගස සැතපී ඉඳිනාහ. කෑලගස සැතපී ඉඳිමෙන් ඒ ගස වාසය කරන්නාවූ දේවතාවා හංසයානන් හා බලවත් හිත මිත්‍රව වාසය කරන්නාහ.

එසමයෙහි එක් පක්ෂියෙක් නුග ඵලයක් අනුභව කොට අවුත් වර්චස් (මළපහ) කරන්නේ කෑලගසේ ඇතුලේ බිලයෙක වර්චස් කළේය. ඒ වර්චසයෙහි තිබූ නුග ඵලයෙන් සතරඟුලක් පමණක් නුග ගසක් ඇතිවිය. හංස රජ්ජුරුවෝ කෑලගස උන්නාවූ දේවතාවාට කියන්නාහු "මේ සතරඟුලක් පමණ නුග ගස නිසා මතුමේ කෑල ගස නස්නේය. දැන් මේ නුග ගස උදුරාපියව"යි හංස රජ්ජුරුවෝ කීහ. දේවතාවා කියන්නේ "මාගේ ඇකයපිට (උකුලෙහි) උන් දරු කෙණෙකුන් හා සමානය, එසේහෙයින් මම නම් පියානකෙණෙකුන් හා සමානය, මේ නුග පැලය නම් දරුකෙණෙකුන් හා සමානය, එසේ හෙයින් මේ නුග ගස නුදුරුමි"යි දේවතාවා කීය. හංස රජ්ජුරුවෝ "එසේ වීනම් තොප හා මා හා මිත්‍රකමුත් නැත. මා වෙත එන්නේත් නැතැ"යි කියා එතැන්පටන් කෑලගසට හංස රජ්ජුරුවෝ නොඑන්නාහ. ඒ සිටි කාලාන්තරයකින් නුග ගස මහත්ව කෑලගස නැසී ගියේය. දේවතාවා "මාගේ මිත්‍ර හංස රාජ්ජුරුවන් කී අවවාද නොකොට මා ඉන්නා වාසස්ථානය නුවූයේය"යි එතනින් අනතර්ධාන (අතුරුදහන්) විය. එවිට සර්‍වඥයන් වහන්සේ "එම්බා මහණෙනි, යම් සත්‍වකෙණෙක් පඤ්චකාමයෙහි ලෝභීව අනුන් කීවා නොකොළෝ නම් දේවතාවාට හංස රජ්ජුරුවන් කී අවවාද

නොගිව්ස්සෝ (නොපිළිගැනීම) මෙනැ''යි වදාරා මේ 'පලාස ජාතකය' වදාළසේක. මේ බණ අවසානයෙහි පන්සියයක් භික්ෂූන් වහන්සේ සියළු කෙලෙසුන් නසා රහත්වූසේක.

''එසමයෙහි හංසව උපන්නෙම් බුදුවූ මම්ම ය''යි වදාළ සේක.

## 359. දීඝ කොසල ජාතකය

තවද පුජනෙය්‍යාති පුජනෙය්‍යවූ (පිදිය යුත්තන් අතර පිදිය යුතුවූ) සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි වහන්දෑ දෙනමකගේ ඩබරයක් (කලහයක්) අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

මෙහි වර්‍තමාන කථාවත් ජාතක කථාවත් සංඝභෙද ජාතකයෙහි පෙණෙන්නේය. මෙහි වනාහි කොසොල්රට දීඝ රාජකුමාරයෝයයි යන රාජකුමාරකෙණෙක් ඇත්තාහ. ඒ රාජ කුමාරයන්ගේ ඇකය (උකුල) මත්තෙහි ඉස තබා දීඝ කෝසල නම් බරණැස් රජ්ජුරුවෝ වැද හොත්තාහ. එවිට දීඝ කුමාරායෝ තමන්ගේ දෙමව්පියන් මැරූ සතුරා මරාපියම් සිතා එක් අතකින් රජ්ජුරුවන්ගේ ඉසකෙස් වැටිය එක් අතකින් කඩුවත් අල්වාගෙණ සිතන්නාහු ''මාගේ පියාණන් වහන්සේ මියන ගමනේ යමක් පරීක්ෂාකාරීව කරවයි කියා මළසේක. මාගේ පියානන් වහන්සේ කීවා නොයික්මව''යි සිතා රජ්ජුරුවන් පිටට කඩුපතින් ගසා රජ්ජුරුවන් පුබුද්ද ඉසකේ

අල්වාගෙණ කියන්නාහු “එම්බා රජ්ජුරුවෙනි, තොප මරම් සිතා ඉසකේ අල්වා කඩුව ඔසවා ගතිමි. මාගේ පියාණන් වහන්සේ මියන ගමනේ පරීක්‍ෂාකාරීව යමක් කරවයි වදාළසේක. එසේහෙයින් තොප නොමරමි” කීහ. එබසට බරණැස් රජ්ජුරුවෝ කියන්නාහු “මේ වෙලාවට තොප විනා මට බන්ධු කෙණෙකුත් නැත, සහායකුත් නැත, මරතොත් මරව, තොප කැමැත්තක් කරව”යි කීහ. එවිට දීඝ කුමාරයෝ කියන්නාහු “නුඹ වහන්සේ මරණ නිසා කළ දෙයක් නොවෙයි භය නොගත මැනව”යි කියා “යම් කෙණෙකුන්ට තමාගේ ජීවිතය නසා හිංසා කිරීමද අනුන්ට පරිහානියක් කිරීමද සත්පුරුෂයෝ නොකරන්නාහ”යි කියා දෙන්නම උනුන්ට කඩුව අත්ගසා දිවුට නොවරදිනා නියායෙන් තරය කළාහ.

බරණැස් රජ්ජුරුවෝත් දීඝ කුමාරයන්ගේ බසට සමාධිව (එකඟව) රාජකුමාරයන් බරණැස් නුවරට කැන්දා ගෙණ ගොස් මෙපවත් අමාත්‍යයන්ට කියා “මේ දීඝ රාජකුමාරයෝ කෝසල රජ්ජුරුවන්ගේ පුතනුවෝය උන්ට උන්ගේ රාජ්‍යය දෙමිහ”යි තමන්ගේ දුවණියනුත් පාවාදී උන්ගේ පියාණන්ගේ රාජ්‍යයත් දී යවූහ. එවක් පටන් දෙරට රජදරුවෝ දෙදෙනම උනුන්ට නොවෙනස්ව රාජ්‍යය කොට කම් වූ පරිද්දෙන් මියපරලොව ගියාහයි වදාරා මේ ‘දීඝ කෝසල ජාතකය’ නිමවා වදාළසේක.

"එසමයෙහි දෙමවුපියෝ නම් දැන් මේ දෙමවුපියෝමය, එසමයෙහි දීඝ රාජ කුමාරයෝ නම් බුදුවූ මම ම වේදැ"යි වදාළසේක.

# 360. මුචපෝතක ජාතකය

තවද සෞද්ධොදනීය (සුද්දෝවුන් රජ පුත් වූ) වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් භික්‍ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

එක් භික්‍ෂුකෙණෙකුන් වහන්සේගේ සාමණෙර නමෙක් ඇත. ඒ සාමණෙර නම උන් වහන්සේට සුවච කීකරුව අත් පා මෙහෙවර කරණසේක. ඒ සාමණේර නම නොබෝ කලකින් ව්‍යාධියක් (අසනීපයක්) ඇතිව මළසේක. ඒ තෙරුන් වහන්සේ සාමණේර නම මළාවූ සෝකයෙන් අඬා දොඩා ඇවිදිනාසේක. මාළුවරුන් වහන්සේ අවවාද කීවත් නොගිවිස්නාසේකැයි යන මේ කථාව දම්සභාවෙහි රැස්වූ මහළුවරුන් වහන්සේ කිය කියා උන්තැනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා එපවත් අසා "මහණෙනි, මේ මහණ දැන්මතු නොවෙයි පෙරත් මේ සාමණෙරයන්ට සෝකයෙන් අඬා ඇවිද්දේවේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ ශක්‍රදේවේන්ද්‍රව උපන්සේක. එසමයෙහි එක් තාපසකෙණෙක් හිමාලය වනයෙහි වාසය කෙරෙති. උන් වසන්නාවූ පන්සලට දෙමව්පියන්ගෙන් වෙන්වූ මුව පැටියෙක් වන. ඒ තාපසයෝ මුව පැටියා තමන්ට දරුකොට වඩන්නාහ. ඒ මුවා වැඩිවිය පැමිණ විශිෂ්ටවූ රූ (ලස්සන ශරීරය) ඇතිවිය. නොබෝ කලකින් එක් දවසක් බඩ පුරා තණ කා අජීර්ණව දිරවා ගත නොහී මළේය. ඒ තාපසයෝත් මුවා කෙරෙහි සෝකයෙන් අඬා දෙඩා බොහෝ දුක් විඳිනාහ. ශක්‍රයෝ තමන්ගේ නුවණැසින් දහසක් නෙත්ලා මනුෂ්‍ය ලෝකය බලා තාපසයන් විඳිනා දුක් දැක ඒ තාපසයන් ලඟට ගොස් “උන්ගේ සෝක සන්හිඳුවා එමි” සිතා තාපසයන් සමීපයට අවුත් විචාරන්නාහු “ඇයි තාපසයන් වහන්ස, නුඹ වහන්සේ විකෂෙපව (සිත් තැවුලෙන්) ඉඳිනේ ඇයිදැ?”යි විචාළාහ. එවිට තාපසයෝ කියන්නාහු “ශක්‍රදෙවෙන්‍ද්‍රයෙනි, මා දරුකොට වැඩූ මුව පෝතකයෙක් මළේය. එසේ හෙයින් පුත්‍රසෝකයෙන් ඉවසාගත නොහී අඬා දෙඩා ඇවිදිමි” කීහ. එවිට ශක්‍රයෝත් කියන්නාහු “නටමනා (නැසෙන සුළු දෙය) යම්දෙයක් නස්නා සුළුමය, මළවුන්ට සෝක කිරීමෙන් කාරිය කින්ද, තමාගේ කයට හිතට දුක්වෙන පමණක් විනා මළවුන්ට සෝක කිරීමෙන් කාරිය කිම්දැ?”යි කීහ. එවිට තාපසයෝත් “තොප මනාකොට කියන්නාවූ වචනය ඉතා යහපත, මෙවක් පටන් ශෝක නොකරම්හ”යි කීයා එවක් පටන් සෝක නොකොට උන්නාහ.

ශක්‍රයෝත් තාපසයන්ට අවවාද කියා දිව්‍යලෝකයටම ගියාහයි වදරා 'මුවපොතක ජාතකය' නිමවා වදාළ සේක.

"එසමයෙහි මුව පැටවා නම් දැන් මේ සාමණේරය. තාපසයෝ නම් මේ භික්ෂූහුය. ශක්‍රදේවේන්ද්‍රව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

## 361. මූසික ජාතකය

තවද සර්වලෝකෛකමාන්‍යවූ (සියලු ලොවෙහි එකම පිදිය යුත්තා වූ) සර්වඥයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි අජාතශත්‍රැ (පියාට සතුරු වූ) රජ්ජුරුවන් අරභයා මේ ජාතකය දක්වන ලද.

මෙහි වර්තමාන කථාව යට කියනලද ථූප ජාතකයෙහි පෙනෙන්නේය. මෙහි වනාහි බිම්බිසාර රජ්ජුරුවෝ එක්දවසක් රාජකුමාරයන් වඩාගෙණ බණ අස අසා උන්නාහ. සර්වඥයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ ජව නම් රාජ කුමාරකෙණෙක් ඇත්තාහ. ඒ රාජ කුමාරයෝත් වැඩිවිය පැමිණ දිසාපාමොක් ආචාරීන් ලගට ශිල්ප උගන්නා සඳහා ගියාහ.

දිසාපාමොක් ආචාරී ඒ කුමාරයන්ට ඉදිරියේ වන අන්තරායක් (විපතක්) දැක ඊට කාරණා උගන්වනු

(රැකවරණයට උපදෙස්) සඳහා ගාථා කියමි, කාරණා සිතන්නා ඒ ආචාරීන්ගේ එක් අසෙක් (අශ්වයෙක්) ඇත, ඒ අසාගේ පය වණයක් (තුවාලයක්) ඇත. වණය එක් මීයෙක් දවස්පතා ඇවිත් කඩා කයි. එක් දවසක් අසා පය වණය කඩා කන්ට යයි මීයා ඇවිත් වණය කඩා කන කල්හි අසා (අශ්වයා) තමාගේ පය කුරයෙන් ඇන මීයා මරා එතන තුබූ ලිඳට දැමීය. අස්සලයෝත් එතනට අවුත් මීයා කොයිදැයි නොදැක සෙවූහ. බෝධිසත්‍වයෝත් "මීයා ගිය තැන් මම දනිමි" ගාථාවක් බැඳ රාජකුමාරයන්ට ඉගැන්වූහ. එක් කොටළුවෙක් යව වපුළාපු (වැපුරූ) සේනක ඉනි අස්සෙන් කරපොවා (බෙල්ල දික්කර බලා) යව කන්ට උත්සාහ කෙරෙයි. එයත් දැක ගාථාවක් බැඳ රාජ කුමාරයන්ට ඉගැන්වූහ. තමන්ගේ නුවනින් ගාථාවක් බැඳ ගාථා තුනම රාජ කුමාරයන් උගන්වා "ආදියෙන් උගත් ගාථාව පොකුණේ නානවිට කියව, දෙවෙනිව උගත් ගාථාව ඉණට (යමකට නැගීමට තැනූ තරප්පුව) නැගෙණවිට කියව, තුන්වෙනිව උගත් ගාථාව ඉණී ඉස සිට කියව"යි කියා රාජකුමාරයන් උගන්වා යවූය.

රාජ කුමාරයෝත් නුවරට ගොස් පියාණන්ට සිල්ප දක්වා යුවරජ තනතුරු ලැබ පියාණන් ඇවෑමෙන් රාජ්‍යට පැමිණ රාජ්ජය කරන්නාහ. රාජ කුමාරකෙණෙකුන් ලද්දූහ. ඒ රාජකුමාරයෝත් වැඩිවිය පැමිණ තමන්ගේ අමාත්‍යයන්ට කියන්නාහු "මාගේ පියානන් වහන්සේ සගබාල (අඩු වයස් කාරයෙක්) සේක. උන් වහන්සේ ඇවෑමෙන් රාජ්ජය ලබන්නේ

කවර කලද. පියානන් වහන්සේ මරා රාජ්ජය ගණිමි"යි කීහ. අමාත්‍යයෝත් "යහපතැ"යි ගිවිස්සාය. රාජ කුමාරයෝත් "පියානන් මරමි" කඩුව ගත් අත් ඇතිව මගුල් පතස පවුරකොණ (මඟුල් පොකුණේ මුල්ලක) ඇලි සිටියාහ. පතසට නාන්ට යන්නාවූ රජ්ජුරුවෝ මූසික නම් කම්මිත්ත (ආවතේව කරන දාසිය) කැඳවා "පොකුණවට රැකවල් ලා (රැකවල් යොදා) බලා එව"යි යවූහ. රාජ කුමාරයෝත් කම්මිත්ත දැක "මේ මා දුටු නියාව කිවූ නම් නපුර"යි කඩුවෙන් දෙපලුකොට ලිඳ එලාපූහ (ලිඳට දැමූහ). රජ්ජුරුවෝත් පතසට බස්නා දිසාපාමොක් ආචාරීන් පළමුකොට ඉගැන්වූ ගාථාව කිය කියා පතසට බටහ. බොහෝ මනුෂ්‍යයෝ වටකොට ගෙණ සිටියාහු මූසිකාව දකින්නේ නැතැයි කියන්නාහ. ඒ ගාථාවෙහි අභිප්‍රාය (අදහස) නම්.

"මූසිකාව ගිය තැන් තොප ඇම දන්නේ නැත. මම දනිමි. මූසිකාව මරා ලිඳට දමාපුවහ"යි කීහ. රාජ කුමාරයෝත් තමන් එතන සිටි කාරණයත් මූසිකාව මැරූ නියාවත් රජ්ජුරුවන් වහන්සේ දත්සේක්වනැයි සිතා ඔබ්බට පලා ගියාහ. ගොසින් එපවත් තමන්ගේ අමාත්‍යයන්ට කීහ. අමාත්‍යයෝත් කීප දවසක් ගිය කළ "නුඹ වහන්සේට යමක් නොකළේ රජ්ජුරුවන් වහන්සේ නොදත් හෙයිනි. තවත් උත්සාහ කළමැනවැ"යි කීහ. එවිට රාජ කුමාරයෝත් "යහපතැ"යි ගිවිස කඩුව ඇරගෙණ "පියාණන් මරමි" ඉණිපාමුල ඈත මෑත බලබලා සැඟවී සිටියාහ. රජ්ජුරුවෝත්

ඉණිපාමුලට අවුත් දිසාපාමොක් ආචාරීන් ඉගැන්වූ දෙවෙනි ගාථාව කීය. ඒ ගාථාවෙහි අභිප්‍රාය නම්.

“පළමු මූසිකාව මරා ලිඳට දමාපුසේම (දැපු විදියට) දැනුත් මරන්ට කග දික්කොට ගෙණ සිටිනා නියාදැ?”යි යන අභිප්‍රාය වන්නේය. රාජ කුමාරයෝත් එවිට “මාගේ පියාණන් වහන්සේ තමන් වහන්සේ මරණ නිසා මෙතන මා සිටිනා නියාව දත්සේවනැ”යි සැඟවී ගොසින් එපවත් තමන්ගේ අමාත්‍යයන්ට කියා දෙපෝයක් විවර (පමණ) ගියකල දව් නම් ආයුධයක් අතින් ගෙණ තුන්වෙනිවත් “පියාණන් මරමි” උත්සාහයෙන් ඉණි ඉස සැඟවී සිටියාහ. රජ්ජුරුවෝ ඉණිඉස දිසාපාමොක් ආචාරීන් ඉගැන්වූ තුන්වෙනි ගාථාව කීහ. එහි අභිප්‍රාය නම්.

“දෙවාරයක් තොපි මා මරන්ට උත්සාහ කොට සිටියාවදැ? දැනුත් මා මරන්ට ඉණිඉස සැඟවී සිටියාවදැ? ඒ මම නොදනිම්දැ? තොපි මේ වලියේ (මේ අවස්ථාවේදී) කඩ කොට කපාපුවොත් කුමක් කෙරේදැ?”යි කීහ.

එවිට රාජකුමාරයෝ තමන් අනික් යාහැකි තැනක් නැති හෙයින් දර්වනම් ආයුධය රජ්ජුරුවන් ඉදිරියට දමා “මා කළ අපරාධයට ජීවිත දානය දුනමැනව”යි වැඳගෙණ ඔත්තාහ. එවිට රජ්ජුරුවෝ “තොපට කුමට ජීවිත දානය දෙන්නෝදැ?”යි උන් අමාත්‍යයන් කැඳවා මෙපවත් කියා රාජකුමරයන් දඟගෙයි ලවා සිංහාසනාරූඪව හිඳ කියන්නාහු “එම්බා අමාත්‍යයෙනි, යම් ගෙයක ඉඳිනේ නම් ඒ ගේ තමාට

ආරක්ෂාව පිණිසය. එසේවූ ගෙයත් මට සහය නුවූයේය. තමාගේ පැමිණි යම් දුකකට සහායව සිටින්නෝ පුත්‍ර ප්‍රේමයෙන් තමා වදගත් දරුවෝය. එසේවූ දරුවෝත් මට සතුරුව සිටියෝය. මෙසේ අවධයට දිසාපාමොක් ආචාරීන් උගන්වාළු ගාථා තුනම පිහිටවූයේය. යම් කෙණෙකුන්ට පිටිවහල්ව (උපකාර වන්නේ) සිටින්නේ ශාස්ත්‍රයමය (උගත් දේමය). එසේ හෙයින් ඇමවේලෙහිම ශාස්ත්‍රයම පුරුදුකල යුතුය''යි කියා දැහැමෙන් සෙමෙන් රාජ්ජය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ. ඒ අමාත්‍යයෝත් රජපුරුවන් අවෑමෙන් රාජකුමාරයන් මැසුන් (සිරගෙයින් නිදහස් කරවා) කපා රාජ්ජයට තබාගෙණ රාජ්ජය කරවූහයි වදරා මේ 'මූසික ජාතකය' නිමවා වදාළ සේක.

''එසමයෙහි දිසාපාමොක් ආචාරීව උපන්නෙම් බුදුවූ මම්ම වේදැ''යි වදාළසේක.

## 362. චුල්ලධනුර්ධර ජාතකය

තවද සරණාගත වජ්‍රපඤ්ජරවූ (සරණ සොයා එන අයට දියමන්තියෙන් තැනූ කූඩුවක් වැනිවූ) තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් ස්ත්‍රියක් කෙරේ උකටලීවූ (මහණකම ගැන කළකිරුණාවූ) භික්ෂුකෙණෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

භික්ෂුකෙණෙකුන් වහන්සේ එක් ස්ත්‍රියක් කෙරේ ලෝභයෙන් උකටළීව වාසය කරණ සේක. සර්‍වඥයන් වහන්සේ එපවත් දැන වදරා "සැබෑද මහණ තෝ ස්ත්‍රියක් කෙරේ ලෝභයෙන් වාසය කරන්නේදැ?"යි විචාළ කල්හි "සැබෑව ස්වාමීනි" දැන්වූ කල්හි "මේ ස්ත්‍රිය කෙරේ ලොභ කළේ තොප දැන්මතු නොවෙයි, පළමුත් මූ තුමූ තොපට අනර්ත්‍ථව (විරුද්ධව) සිටියෝවේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි ගන්‍ධාර දේශයෙහි තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් සමීපයට බ්‍රාහ්මණ කුමාරයෙක් ගොස් සියලු ශිල්ප ඉගෙණ ඉනුත් ධනුශ් ශිල්පය (දුනු ශිල්පය විශේෂව) නිමවා උගත. දිසාපාමොක් ආචාරී සමාධිව (පැහැදී) බ්‍රාහ්මණ කුමාරයන්ට 'චුල්ලධනුර්‍ධර' කුමාරයෝ යයි නම් තබා තමන්ගේ වැඩිසිටි දුවනියන් පාවා දුන්හ. චුල්ලධනුර්‍ධරයෝ තමන්ගේ බිරින්ද කැඳවාගෙණ මාවතෙක යන්නාහු වනාන්තරයකට පැමිණියාහ. ඒ වනාන්තරයේ ත්‍රිමදගලිත (කම්මුල් දෙක හා නාභිය යන තුන් තැනින් මද වැහෙන) හස්තියෙක් ඇත. ඒ හස්තියා ධනුර්‍ධරයන් දැක දිවගෙණ ආය. චුල්ලධනුර්‍ධරයෝ පඤ්චායුධ සන්නද්ධව (ආයුධ පහකින් සැරසී) ඊ දඬු පන්සියයකුත් ඇරගෙණ යන්නාහු හස්තියා දිවගෙණ එන්නා ඊ දණ්ඩක් ඇදපියා

ඇරගෙණ විද්දහු වාතතුඹයෙන් (වාත වේගයෙන් අවුත්) වැද පළවා ඇතා එතනම එලා (බිම දමා හෙවත් මරා) නික්මුණු කලට, අනික් වනාන්තරයක සොරුන් පන්සියයෙක් දඩමස් මරා පුළුස්සා කනකලට චුල්ලධනුර්ධරයෝ එතනට පැමිණ තමන් බිරින්දට කියන්නාහු "දඩමස් පුළුස්සා කන මිනිසුන් උන්තැනට ගොස් දඩමස් ඉල්වාගෙණ එව"යි කියා යවූහ.

ඒ කියන සොරු පිලිස්සු දඩමස් නොදී අමු මාංශාදී යවූහ. චුල්ලධනුර්ධර කුමාරයෝ අමු මාංශ දැක කියන්නාහු "පිලිස්සු මාංශ නොදී අමු මාංශ දුන්නේ අප කෙරේ කනස්සළු වේදැ? (කළකිරීමෙකින්ද)" යි කියා දෙවෙනිව බිරින්ද අත අමු මාංශ යවන්නා සොරු පන්සියය කෝපවන. ඉන් එකෙක් "අප පන්සියය වෙහෙසයිදැ?යි කියා කෝපයෙන් දිවුවාවූ චුල්ලධනුර්ධරයෝ එකින් එකාට සොරු පන්සියය එකක් අඩු ඊ දඬු පන්සියයෙන් (ඊතල 499 කින්) විද එලූහ. සොරුන් නායක තැනැත්තේ ඉවත්ව සිට අවුත් චුල්ලධනුර්ධරයන් අල්වා ගත. සොරදෙටුවා හා චුල්ලධනුර්ධරයන් හා උනුන් කා සොරා යට කොට ඔබාගෙණ චුල්ලධනුර්ධරයෝ "සොඳුර කඩුව දීලව"යි අත්දික්කොට ලන්නා සොරාට කඩුමිටදී චුල්ලධනුර්ධරයන්ට කොපුව දීලූහ. සොරා චුල්ලධනුර්ධරයන් ඉස කපා මරා යන්ට නික්මුණු කලට ගඟක් සමීපයට පැමිණියාහ. සොරදෙටුවා සිතන්නේ "බාල කල පටන් සරණ පුරුදු පුරුෂයා (විවාහක පුරුෂයා) මරවා මා කෙරේ ලොභ කළීය. ඉදිරියේ අනික් පුරුෂයෙකු දුටත් මටත් මේ කරණ මානය (මටත් මේ ටිකම කරාවි)"යි සිතා

“මෑගෙන් මට ප්‍රයෝජන නැතැයි මා මෙතනම ඇරපියා යෙමි” සිතා “සොඳුර තොප ඉණාතුබූ ඉණාකඩින් (ඉණ බැඳි රෙද්දෙන්) තොප පලන් ආභරණ (පැළඳ සිටි ආභරණ) ගලවා බැඳ දීලන්න. එතර තිබා අවුත් තොප කැඳවාගෙණ යෙමි” කියන්නා “යහපතැ”යි ඒ නියාවට තමා ඉණ තිබූ ඉණාකඩෙහි තමා පලන් ආභරණ ගලවා බැඳ දී ලන්නා සොරදෙටු ඇරගෙණ ගඟින් එතරපීනා ගොස් යන්ට ආකාර දක්වාලීය. ස්ත්‍රිය කියන්නී “ඇයි ස්වාමිපුත්‍රයාණෙනි, මා ඇරපියා නික්මුණු නියාදැ”යි කියන්නා “තොපගේ පරණ සමනන්ට (නුඹේ පරණී සැමියාට) කළදෑ දුටුකල මට තමාම වේද? තීගෙන් මට ප්‍රයෝජන නැතැ”යි කියා නික්මුණාහ.

ස්ත්‍රී ගඟ සමීපයේ බැද්දේ උන්නීය. ශක්‍රයෝ මෙපවත් දැන පඤ්චසිඛයා (කොණ්ඩය පහතට බෙදා බැඳ ඇති නිසා පඤ්චසික නම්. සක් දෙව්ඳුගේ සංගීතය සපයන ශිල්පයා) හා මාතලී දිව්‍යපුත්‍රයා (සක් දෙව්ඳුගේ රථය පදවන රියදුරා) කැඳවා කියන්නාහු “අසවල් ගඟ සමීපයේ උන් ස්ත්‍රී වෙහෙසන්ට උවමැනවැ”යි කියා පංචසිඛයා උකුසුවෙසක් හා මාතලී දිව්‍යපුත්‍රයා මත්ස්‍ය වෙසක් හා ශක්‍රයෝ තුමූ කැණහිල් වෙසක් මවාගෙණ කටින් දඩමස් කැටියක් ඩෑගෙණ “මම ගඟ සමීපයේ වෙරළ ගාවා යෙමි”.

“පංචසිඛය, තොපි උකුසු වේසයෙන් ආකාශයෙන් ඇවිදුව, මාතලිය, තොපි මත්ස්‍ය වේසයෙන් මා යන ඉදිරියට දියෙන් ගොඩ පැනපියව, මම කට තිබූ මාංශය දමා

මත්සයයා ඩැගන්ට යෙමි, පංචසිඛය තෝ උකුසු වේසයෙන් මා දැමූ මාංශ කැටිය ඩැගනුව මාතලිය තෝ මත්සය වේසයෙන් දියට පැන පියව”යි කියා තුන්දෙන අවුත් ඒ ස්ත්‍රිය සමීපයෙහි පෙණී ගියාහ.

කැනහිල් මාංශ කැටියක් ඩැගෙණ ගඟ සමීපයේ ගොඩ අසල යන කලට මත්ස්යයෙක් දියෙන් ගොඩට පැනපීය. කට තිබූ මාංශ දමා මත්සයයා ඩැගන්ට දිවූකල මත්සයයා දියට පැනපීය. උකුසු මාංශකැටිය ඩැගත. එකියන සිඟාලයා මත්සයයාත් නොලැබ මාංශකැටියත් නොලැබ විශෂපව ගඟ සමීපයේ උන් ස්ත්‍රියගේ මුණ බල බලා සිටියේය. එවිට එකියන ස්ත්‍රී මහත් කොට සිනාසීපුවාහ. ඊට ශක්‍රයෝ කියන්නාහු “මෙතන නැටීමක් ගී කීමක් කෙළි නළුවක් (විනෝද නාටකයක්) නැතිව මහත් කොට අස්ථානයේ (තැනට නොගැළපෙන) සිනාසුනුයේ කිම්දැ?යි විචාළේය.

එවිට ස්ත්‍රිය කියන්නී “තොප කටින් ඩැගෙණ ආ මාංශ කැටිය මත්සයයා කමියි කටින් දමා මත්සයයා ඩැගන්ට ගියකලට මාංශකැටිය උකුසු ඩැගත. මත්සයයා දියට පැනපීය, මේ කාරණය දැක සිනාසීමි” කීව.

එවිට ශක්‍රයෝ කියන්නාහු “තොපි මට සිනාසෙන්ට කාරණ කිම්ද? තොපගේ පළමු පිසවා කෑ සමුනනුත් (සැමියා) නැතිව අළුත් සමුනනුත් නැතිව උභයභ්‍රෂ්ටව (දෙදෙනාම අහිමිව) ඉඳිනා තොපි මට නින්ද කියා සිනාසෙන්නේය”යි ශක්‍රයෝ නින්දකොට බිනූහ. ඊට ස්ත්‍රී කියන්නී “පළමු මෙසේවූ

කටයුත්ත කොට මෙසේ වූ දුක්කට පැමිණියෙමි. ඉනිබ්බෙ පතිව්‍රතා ධර්‍මය විනා මෙසේවූ දෙයක් නො කරමි” කීව. ශක්‍රයෝත් “පතිව්‍රතා ධර්‍මය විනා මෙසේ වූ නොකටයුත්තක් නොකරව”යි කියා අවවාදදී දෙව්ලොවට ගියාහයි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශ කොට මේ ‘චුල්ලධනුර්‍ධර ජාතකය’ නිමවා වදාළසේක. චතුස්සත්‍ය දේශනාවගේ කෙළවර උකටළී භික්‍ෂූන් වහන්සේ සෝවාන් වූසේක.

“එසමයෙහි චුල්ලධනුර්‍ධරයෝ නම් මේ භික්‍ෂූහුය. එසමයෙහි ස්ත්‍රී නම් මේ ස්ත්‍රීමය එසමයෙහි ශක්‍රව උපන්නෙමි බුදුවූ මම්ම ය”යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 363. කපොත ජාතකය

තවද කරුණාවට ආකරවූ (කරුණාව බහුලව ඇති) තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් ලෝභී භික්‍ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

ලෝභී භික්‍ෂූන් වහන්සේ සර්‍වඥයන් වහන්සේට පා (ඉදිරිපත් කොට) “සැබැද මහණ, තා ලෝභීව වාසය කරන්නේය?”යි විචාළ කල්හි “සැබෑව ස්වාමිනි මා ලෝභීව වාසය කරන්නේය”යි කීය. සර්‍වඥයන් වහන්සේ එපවත් දැන වදාරා “දැන්මතු නොවෙයි, පළමුත් ලෝභීව බොහෝ දුඃඛයට

පැමිණියෝය''යි වදරා "ඒ කෙසේදැ?''යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ පරෙව්ව ඉපද බරණැස් සිටාණන්ගේ මුළුතැන් ගෙයි අරක්කැමියා (කෝකියා) පක්‍ෂීන් පිණිස සාල්ලක් (එල්ලා තබන කූඩුවක්) ඉදිකොට බැඳ එල්වාලීය. බෝධි සත්‍වයෝත් ඒ සාල්ලෙහි වාසය කරන්නාහ.

එතනට කවුඩෙක් අවුත් බෝධි සත්‍වයන් හා එක්ව වාසය කෙරෙමි යි කියා එක්ව වාසය කරන්නේය. එක් දවසක් මුළුතැන්ගෙට බොහෝ දඩමස් ගෙනාහ. ඒ දඩමස් කවුඩු දැක ඒ මාංශ ලෝභයෙන් කොයිත් නොගොසින් (වෙන තැනකට යන්නේ නැතිව) ඉඳ බොහෝ දුක් විඳිනේය. බෝධිසත්‍වයෝ ගෝචර භූමියට (ආහාර සොයා ගන්නා ස්ථානය) යන්නාහු "තොපිත් ගොදුරු කන්ට එව, එක්වයම්හ''යි කීහ. කවුඩු කියන්නේ "'ඊයේ මා කෑ ගොචර අජීර්‍ණව තිබූ හෙයින් මම ගොදුරු කන්ට නොයමි. ස්වාමීනි, නුඹ වහන්සේ වඩිනේ යහපතැ''යි කීය. "යහපතැ''යි කියා බෝධිසත්‍වයෝ ගෝචර භූමියට ගියාහ.

කවුඩු ගාථාවකින් කියන්නේ "අසත්පුරුෂවූ පරෙව්ය මෙතනින් පලාගියේ යහපතැයි මාගේ අභිප්‍රානුකූල (හිතේ හැටියට, කැමති පරිදි) පරිද්දෙන් මාංශ අනුභව කෙරෙමි''යි සිතා උන්කලට අරක්කැමි දඩමස් විශේෂ කොට පිස නිවෙන්ට

මුඩම්වල (කෑම අරින බාජනවල) ලා තබා තමාගේ ශරීරයේ දහ නිවන නියායෙන් (ඇග සිසිල් කර ගැනීමට, ගිමන් නිවා ගැනීමට) දොර ගොසින් සිටියේය.

කවුඩු අරක්කැමියා දොරට පලාගිය නියාව දැන මුඩම මතුපිට උන්කලට මුඩම ක්‍රිං යන ශබ්ද විය. අරක්කැමි ඒ ශබ්දය අසා මුළුතැන්ගෙට වැද බැලූකලට කවුඩු මුඩුම පිට උන්නේය. අරක්කැමි කවුඩා අල්වාගෙණ ශරීරයේ ලෝම උදුරා මුදුනේ කුඩුම්බියක් (මුදුනේ පිහාටු ටිකක් ඉතිරි කර) තබා ශරීරයේ මිරිස් ළූනු දුරු සිඩිගුරු (අමු ඉඟුරු) ආදීවූ දහදෙය (දැවිල්ල ඇති කරන දේවල්) ගල්වා කීලාගෙණගලා (සම ඉරා) කැබිලිත්තක් (වලන් කෑල්ලක්) විද කරබැඳ එල්වා සාල්ලට දැමිය.

බෝධිසත්වයෝ ගොදුරු අනුභවකොට අවුත් කවුඩානන් වැදහොත් සැටිය දැක කවුඩානන් ලජ්ජාකරණ පිණිස කියන්නාහු "කොක්ඩේනුව අපගේ කවුඩානන් වාසය කරණ තැන තොප වාසයකරන්ට කාරණා නොවේ"යි කියන්නා එවිට කියන්නේ "සබඳ මට මෙසේවූ දුකක් පැමිණි තිබූ ගමනේ නුඹ වහන්සේ මට නින්දකරන්ට කාරණා නොවේ"යි කියන්නා බෝධිසත්වයෝ කියන්නා "තොප ශරීරයේ සඳුන් ගාගෙණ පලඳනාවකුත් පැලඳගෙණ අවුත් උන්හෙයින් කොයිරට ගොසින් ගෙණා පලඳනාවෙක් දෝහෝයි සිතා කී පමණක් විනා තොපට වෙහෙසන්ට (සිත් රිදවන්නට) නොවේ"යි කීහ.

එවිට කවුඩු කියන්නේ "මේ මාලාවත් පලඳනාවත් මේ ශරීරයේ ගෑ හඳුනුත් නුඹ වහන්සේගේ පසමිතුරන්ටත් නොවේවා"යි කියා කෙඳිරි ගගා වැදඹත් තැනැත්තවුගේ ප්‍රාණය නිරුද්ධව (මරණයට පත්විය) ගියේය.

බෝධිසත්වයෝ කියන්නාහු "අප මෙතන ඉඳිමෙන් සැකවෙයි, කාරණා වෙයි, කියා ඔබ්බට (වෙනත් තැනකට) ගොසින් වාසය කළාහ"යි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට මේ 'කපෝත ජාතකය' නිමවා වදාළසේක. චතුස්සත්‍ය දේශනාවගේ කෙළවර ලෝභී භික්ෂූන් වහන්සේ සෝවාන් වූසේක.

"එසමයෙහි කෘෂ්ණ කවුඩා (කලු කපුටා) නම් මේ භික්ෂූහුය. එසමයෙහි පරෙවිව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

**පඤ්චකනිපාත වර්ණනාව නිමි.**

තවද සවන නිපාතය දක්වමි. ඒ කෙසේද යත්?

# 364. ආචාරි ජාතකය

තවද දහම්ලයැති (දහමට හිත ඇති) සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් එක් නැවියෙකු අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

එක් භික්‍ෂුකෙණෙකුන් වහන්සේ “සර්‍වඥයන් වහන්සේ අද දවස් මා දුටුව මැනවැ”යි යන සිතින් අවුදින් අචිරවතී ගංතෙරට පැමිණ තොටියාට කියන සේක් “එම්බල මම සර්‍වඥයන් වහන්සේ දක්නා අභිප්‍රාය ඇතිව යෙමි. වහා එතර කරව”යි කී කල්හි ඒ තොටියා කියන්නේ “නුඹ වහන්සේ මේ වෙලේ වඩින්නේ කිම්ද? උදැසන වැඩිය මැනවැ”යි කී කල්හි “මෙතන මා සැතපෙන තැනක් නැත, වහා මා එතර කරව”යි කී කල්හි තොටියා කිපී උන් වහන්සේ නැවට නන්වා ගෙණ තොටට නොවැද උන් වහන්සේගේ සිවුරුත් තෙමා කල්යවා තොටින් එතර කළේය. උන්වහන්සේ විහාරයට ගොස් රෑ වූ හෙයින් සර්‍වඥයන් වහන්සේ නොදැක දෙවෙනි දවස් සර්‍වඥයන් වහන්සේ වැඳ එකත්පස්ව සිටිසේක. සර්‍වඥයන් වහන්සේ වදාරණසේක් “ඇයි භික්‍ෂුවෙනි, කවද අවුදැ?”යි විචාළ කල්හි “ස්වාමිනි, ඊයේ ආමි”යි කීසේක.

එබස් අසා සර්‍වඥයන් වහන්සේ වදාරණසේක් “ඊයේ අප නුදුටුයේ ඇයිදැ?”යි විචාළකල්හි භික්‍ෂුහු කියනසේක් “ගංතොට පදිනා තොටියා ගඟ පාතට ඔරුව පැද සිවුරු තෙමා මෙතර කළ හෙයින් සිවුරු වියලාගන්නා පිණිස ඊයේ දකින්ට නුවූයේය”යි සැලකළ කල්හි සර්‍වඥයන් වහන්සේ වදාරණසේක් “එම්බා මහණ, තොටියා තොපට මතු නොවෙයි ගහට කළේ. පෙර උත්තමයන්ටත් ගහට කළේ (කරදර කිරීම) වේදැ”යි වදරා “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ හිමාලය වනයෙහි තපස්ව වාසය කරන්නාහු ලුණු ඇඹුල් සපයා බරණැස් නුවරට අවුත් උයනේ වාසයකරන්නාහ.

රජ්ජුරුවෝත් තාපසයන් ලඟට උයනට අවුත් දකිනාහ. ගියවිට දවස්පතා අවවාද කියන විට “භූමිපාලොත්තමවූ (පොළව පාලනය කරන උතුමා) රජජුරුවන් වහන්ස, කාටත් නොකිපුන මැනව, කා කෙරෙත් කෝපයක් නොකළ මැනව, එසේවූ කෝප නොවන්නාවූ රජ්ජුරුවන්ගේ යසස (කීර්තිය) සදිසාන්තයේ (සය දිසා කෙළවර) පූජ්‍යවන්නේය (පිදිය යුතු වන්නේය)”යි කීහ. තවද ග්‍රාමයෙහිද නැවත වනයෙහිද ජලයෙහිද භූමියෙහිද යන සියල්ලෙහිම මෛත්‍රියක් මිසක් කෝපයක් රථොත්තම (ඒ උත්තම වූ, යුද්ධයෙහි දක්‍ෂ) වූ රජ්ජුරුවන් වහන්සේ කා කෙරෙත් නොකළ මැනවැ”යි මේ නියායෙන් දවස්පතා රජ්ජුරුවන්ට අවවාද කරන්නාහ.

රජ්ජුරුවෝත් තාපසයන් කෙරේ පැහැද ලක්‍ෂයක් නිමින ගමක් (නින්ද ගමක්) දුන්නාහ. තාපසයෝ නොයිවසූහ (පිළි නොගත්තාහ). දෙළොස් අවුරුද්දක් උපස්ථාන කළාහ. තාපසයෝත් එතන රඳන්ට කලකිරී රජ්ජුරුවන්ට කීවොත් යා නොදෙති. උයන් ගොව්වාට කියා “සැරිසරා ඇවිදිමි”යි උයනින් නික්ම පළාගියහ. යන්නෝ බරණැස් නුවර ගඟ සමීපයට ගියාහ. ඒ ගඟ මිනිසුන් ඇත් මෑත් කරන්නාවූ

අපරිමාතු නම් නැවියා අඟදන එකෙක. මිනිසුන් ගඟ එතරකළ කල "එතරදී මිලදෙම්මැ"යි කියා එතර ගොස් මිල නොදී පලායන්නාහ. මෙයින් මිල නොලදින් දුවිලව ඉන්නේය. බෝධිසත්වයෝත් ගඟ අසල සිට "මා එතර ලව"යි කීහ. "මට කුමන මිල දෙව්දැ"යි විචාළේය. "තොපට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කෙරෙමි"යි කීහ.

එවිට නැවියා ඒ වස්තුවෙක් දේ හෝ යි සිතා තාපසයන් ගඟින් එතරලා "මට වස්තු දෙව"යි කීහ. තාපසයෝ කියන්නාහු "වනයෙහිම සියල්ලෙහිම මෛත්‍රී කරව"යි අවවාද කියා "තොපි මිනිසුන් එතරලා ගන්නා හෙයින් වේද මිල නොදී යන්නේ, එතරදීම මිල ඇරගෙණ විනා මිනිසුන් එතර නොකරව"යි අවවාද කීහ. එවිට නැවියා "තොප මට දෙන වස්තු මේ දැ"යි කියා තාපසයන් අල්වාගෙණ මූනට ඇන්නේය. "රජ්ජුරුවන්ට අවවාද කියා ලක්‍ෂයක් නිමින ගමක් ලද්දුහ. අස්ථානයේ (අනිසි තැන) කටයුතු නො දක්නාවූ මුර්ඛයාට (මෝඩයාට) අවවාද කියා ඇනුන් ලද්දුහ"යි සර්වඥයන් වහන්සේ වදාළසේක.

ඒ නැවියාගේ අඹු ඇවිදින් "ඇයි තෝ කුමක් කෙරෙයිදැ? රජ්ජුරුවන් වහන්සේට කුලුපග තාපසයන් වහන්සේය, උන් වහන්සේ කුමට මරව් දැ? (කුමක් නිසා හිරිහැර කළේද)"යි කීව. එවිට තාපසයන් ඇර අඹු මැරීය. අඹුවගේ බඩ දරු ගර්භය වැටී අඹුව මළාය. එවිට එතන සිටියෝ මිනීමරු තැනැත්තේය යි නැවියා බැඳගෙන ගොස් රජ්ජුරුවන්ට

පැවාහ. රජ්ජුරුවෝත් නැවියාට ආඥා කරවූහයි (දඬුවම් නියම කළේය) සර්වඥයන් වහන්සේ වදාරා "අඥානව තාපසයන් කී අවවාද නොගිවිස තමාගේ පුතුන් නොලැබ අඹුවත් නොලැබ ආඥා වින්දේය"යි වදාරා මේ 'ආචාරි ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි නැවියා නම් මෙසමයෙහි නැවියා මය. බරණැස් රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථිවිරයෝය, තාපසව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක. මේ දේශනාවසානයේ භික්ෂුන්වහන්සේ සෝවාන් වූසේක.

## 365. ස්වෙතකෙතු ජාතකය

තවද දෙවිබඹුන් මුදුනෙහි කෙළනා පාපියුම් ඇති (දෙවි බඹුන්ගේ වැඳුම් ලබන) සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි වඤ්චා ප්‍රයෝග දන්නා (කපටි වංචා ගති ඇති) භික්ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

එක් භික්ෂු කෙනෙකුන් වහන්සේ වඤ්චා ප්‍රයෝගයෙන් දවස් අරිණාසේක. සෙසු භික්ෂුන් වහන්සේලා ඒ භික්ෂුන් වහන්සේ සර්වඥයන් වහන්සේට දැක්වූ සේක.

සර්වඥයන් වහන්සේ "සැබෑද මහණ, වඤ්චා ප්‍රයෝගයෙන් දවස් අරින්නේදැ?"යි විචාරා "සැබෑව" යනු අසා "දැන් මතු නොවෙයි මහණෙනි, පෙරත් මේ මහණ වඤ්චා ප්‍රයෝගයෙන්

දවස් හැරියේ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර මහාප්‍රතාප නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ ඒ රජ්ජුරුවන්ට පුරෝහිතව ඉපිද පන්සියයක් අතවැස්සන්ගෙන් (ශිෂ්‍යයන්ගෙන්) ශෛවතකෙතු නම් බ්‍රාහ්මණයෙක් ඇත. ඒ බ්‍රාහ්මණයා වංශවත් හෙයින් මානීව ගර්‍වයක් (කුල මානයෙන් අහංකාරව) ඇතිව වාසය කරන්නේය.

එක් දවසක් බ්‍රහ්මණයා වීථියේ යන කලට චණ්ඩාලයෙක් (සැඩොල් කුලයේ කෙනෙක්) ඉදිරියට එන්නේය. ඒ බ්‍රාහ්මණයානෝ "තෝ කවරෙක්දැ?"යි විචාරා "මම චණ්ඩාලයකැ"යි යනු අසා "තෝ චණ්ඩාල යෙක් වීනම් වහා යටිසුලඟට පලායව"යි කීය. එයින් "මේ මා නීච එකෙකැ"යි සිතා උඩුසුලඟින් ගියේය. බ්‍රහ්මණයාත් වහ වහා උඩුසුලඟින් ගොස් සිටියේය. එවිට චණ්ඩාල කියන්නේ "නුඹගේ මෙසේම මා කෙරේ ගර්‍ව කරණ පසු මා විචාළ ප්‍රශ්නය කිව මැනවැ"යි කීහ. එවිට බ්‍රාහ්මණයා කියන්නේ "ඈයි චණ්ඩාලය, තා කී ප්‍රශ්නය කිය නොහෙම්දැ"යි "කිව"යි කීහ. එවිට කියන්නේ "කියාගත නුහුනුවෝ නම් (පිළිතුරු දීමට නොහැකි නම්) මාගේ යටපස්සෙන් (දෙපා අතරින්) යන්නේදැ"යි කීය. බ්‍රාහ්මණ කියන්නේ "තාගේ ප්‍රශ්නය නොකියෙන් නම් යට පස්සෙන් යෙමි" කීය. එවිට චණ්ඩාල කියන්නේ "දිසාව

කවරේදැ?''යි විචාළේය. බ්‍රාහ්මණ කියන්නේ ''සතර දිගය සතර අනුදිගය යන මේ දිශා නමැ''යි කීය.

එවිට චණ්ඩාල කියන්නේ ''මෙච්චරත් දැනගත නොහෙන්නා තොපිද ගර්‍වකරන්නේය''යි ඉස අල්වාගෙණ ගමාගේ පය අස්සෙන් කර අල්වා දැමිය. ඒ දුටු බොහෝ මනුෂ්‍යයෝ එපවත් පුරෝහිත බ්‍රාහ්මණයාහට කීවාහුය. සේවතකෙතු බ්‍රහ්මණයා දැක ''සැබෑද බ්‍රහ්මණය, තා ඉස අල්වා චණ්ඩාලයා තමාගේ පයට පස්සෙන් යවූයේ දැ?''යි විචාරා ''සැබෑව'' යනු අසා ''එම්බල බ්‍රහ්මණය, චණ්ඩාල උවත් නුවණැත්තන් කෙරෙහි නින්ද්‍ා කිරීම කටයුතු නොවෙයි, ශාස්ත්‍රය නම් එක් කෙණෙකුන් නම් දනිති කියාත් නැත. ශාස්ත්‍රය නිමවා දැනගතහැකි දෙයක් නොවෙයි. දිශාව නම් දෙමාපියන්ම ඇතිව උත්පත්ති වන හෙයින් පුර්‍වදිග නම (දෙමව්පියන් පෙරදිග ලෙස සැලකීම), තමාගේ ආචාරී ගුරුවරයන් වසනා දිග දකුණුදිග නම් වෙයි. දන සීලාදී ගුණයෙන් යුක්තවූ සත්පුරුෂයන් වාසය කරන්නාවූ තැන් එක් දිගෙක් වෙයි, නුවණැත්තාවූ සත් පුරුෂයන් වසන්නාවූ තැන් එක් දිගෙක් වෙයි'' කියා ''මේ ඇමට වඩා නිවනට යන්නාවූ මර්ගයම ඇති දිග ප්‍රධාන වන්නේය''යි කීහ.

එවිට බ්‍රහ්මණයාත් ''මේ පුරෝහිතයාණන් මෙසේ චණ්ඩාලයකු මට නින්ද්‍ා කළ කලදී බැන නොනැගී උන්නේය. මුන් ලඟ නොරඳමි''යි තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් ලගට ගොස් ශිල්ප ඉගෙණගෙන බරණැස් නුවරට එන්නාහු

අතරමග තාපසවරු ඉන්නා පන්සලට වැද ඒ තාපසවරුන්ට නායකව ඒ තාපසවරුන් ඇරගෙන බරණැස් නුවරට ගොස් රජ්ජුරුවන්ගේ උයන සැතපී තාපසවරුන් උදැසන නුවරට සිඟා ගියාහ.

රජ්ජුරුවෝත් තාපසවරුන් දැක සමාධිව (සිත්ගෙන, පැහැදී) තමන්ගේ උයනේ වාසය කරණ නියායෙන් සැලැස්වූහ.

එක් දවසක් රජ්ජුරුවන්ගේ අභිප්‍රාය දැනගත්තොත් ඇතිතෙක් දවසට ජීවත්වන්ට පුළුවන. එසේ හෙයින් "රජ්ජුරුවන් එන වෙලාවට කණ්ඨක තපස් (කටුමැස්සේ තපස් රැකීම) වවුල් තපස් (වව්ලෙකු මෙන් එල්ලී සිටිමින් තපස් රැකීම) උක්කුටික තපස් (ඇණ තියාගෙන කරන තපස් රැකීම) පඤ්චතාප තපස් (වටේට ගිනි මැල හතරක් හා සූර්‍ය්‍ය තාපය ඇති විටෙක කරන තපස් රැකීම) ආදිවූ තපස් රකුව"යි විධාන කොට තුමූ කිකරු යාපත් තාපසවරුන් පස්දෙනෙකු තමන් සමීපයේ ඉඳුවා යාපත් දණ්ඩාසනයක් (මැස්සක් වැනි පුටුවක්) ඉදිරියේ තබා ඊ මත්තෙහි වණීයෙන් සිතියම් කරණ ලද වසා ලෑලී ඇති (පුස්කොළ පොත්වල දෙපැත්තට යොදන කැටයම් ලෑලි) පොතක් තුමු බල බලා තාපසවරුන් පස්දෙනාට ප්‍රශ්න කිය කියා උන්හ.

ඒ වේලාවට රජ්ජුරුවෝ අවුත් තාපසවරුන්ගේ වෙන වෙනම ව්‍රතත් (විවිධ තපස් ක්‍රම) දැක තාපසයන් සැලැස්මත් දැක සමාධිව "මෙසේවූ තපස් කරන්නාවූ තාපසවරුන්ට මතු යහපත් විපාක වන්නේ වේදැ"යි පුරෝහිත බ්‍රහ්මණයානන්

අතින් විචාළහ. පුරෝහිත බ්‍රාහ්මණයානෝ කියන්නාහු "මෙසේවූ තපස් කරන්නාවූ තාපසවරුන්ට මින්මතු වන්නාවූ විපාකයකුත් නැත. මින්වන ඵලයකුත් නැතැ"යි කීය. එවිට තාපසයෝ කියන්නාහු "විපාකයක් නැති කල අෂ්ටාදශ ශීලයෙන්ද (දහ අට ක්‍රමයක ශීලය) චතුර්වේදයෙන්ද (ඍග්, යජුර්, සාමන්, හා අර්ථවන් යන වේද සතර) කිසි ප්‍රයෝජනයක් නැති කල මහාබ්‍රහ්මයා විසින් මේ ශාස්ත්‍රය ඇති කරන්ට කාරණා කින්ද? පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති විනා සෙසු දෙයකින් ප්‍රයෝජන නැද්දැ?"යි කීය. එවිට පුරෝහිත බ්‍රාහ්මණයානෝ කියන්නාහු "තොප කෙතෙක් කීවත් තොපගේ ශාස්ත්‍රයෙන් මෙලොව විනා පරලොවින් කිසිම ප්‍රයෝජනයක් නැත. මුන් පන්සියයගේ අඳුන් දිවිසම් (අඳුන් දිවියන්ගේ හම්) ජටාමඩුළු (හිස වටේ බඳින ජටා) අරවා අභ්‍යන්තර සේවාකම් (ඇතුළත කළ යුතු සේවා) සලස්වා වදාළොත් යහපතැ"යි රජ්ජුරුවන්ට කීහ.

රජ්ජුරුවෝත් පුරෝහිත බ්‍රාහ්මණයා කීවාසේම තාපසවරුන් පන්සියය සේවා කමට සලසාගෙණ ආයුධ දී ගණ වැසි (තෘෂ්ණාව නැමති දිය සෙවෙල්වල ඇලී) රැකවලැයි කියා සැලසිනැයි දතයුතු. එතැන් පටන් ඒ තාපසවරු පන්සියය රජ්ජුරුවන්ට සේවාකම් කළහයි වදාරා මේ 'සේවතකෙතු ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි චණ්ඩාලයා නම් ශාරිපුත්‍රස්ථවිරය, සේවතකෙතු බ්‍රාහ්මණයා නම් වඤ්චා භික්ෂුහුය, පුරෝහිත බ්‍රාහ්මණයානන්ව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 366. දරීමුඛ ජාතකය

තවද ලොවට ස්නෙහ (ආදරය) ඇතිවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි මහබිනික්මන් (ගිහිගෙයින් නික්මීම, කාම වස්තූන්ගෙන් ඈත්වීම) අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

එක් දවසක් දම්සභා මණ්ඩපයේ රැස්වූ මාළුවරුන් වහන්සේ "මේ නියා රාජ්‍යශ්‍රීයක් (රජ සැපත) හැර මහබිනික්මන් කළ නියාව ඉතා යහපත ආශ්චර්‍ය්‍යයෙකැ (පුදුමය)"යි කිය කියා උන්තැනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදරා "මහණෙනි, මා එන්නාට පූර්‍ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා එපවත් දැන "මහණෙනි, දැන්මතු නොවෙයි පළමුත් උත්තමයෝ රාජ්‍යශ්‍රීය හැර මහණවුවෝ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්ත්වයෝ ඒ රජ්ජුරුවන්ට පුත්ව උපන්නාහ. එකියන රජ්ජුරුවන්ගේ

පුරෝහිත බ්‍රාහ්මණයානන්ගේ පුතනුකෙණෙකුන් ඇත්තාහ. එකියන බ්‍රහ්මණ කුමාර විශිෂ්ටවූ රූප (ලස්සන රූපයක්) ඇති සොභාමත්වූ මුඛශ්‍රීයක් (ප්‍රසන්න වූ මුහුණක්) ඇති හෙයින් දරීමුඛ නම් බ්‍රාහ්මණ කුමාරයත් බරණැස් රාජකුමාරයෝත් දෙන්නම එක්ව වැඩී දිසාපාමොක් ආචාරීන් සමීපයට ගොස් ශාස්ත්‍ර ඉගෙණ බරණැස් නුවරට එන අවස්ථාවට බරණැස් රජ්ජුරුවෝ මළාහ.

රාජ කුමාරයෝත් බමුණු කුමාරයත් දෙන්නා ශාස්ත්‍ර ඉගෙණ භික්ෂාටනය (ආහාර සොයාගෙන) කොට ගෙණ බරණැස්නුවරට අවුත් ගෙයකට වන්කලට ඒ ගෙයි එක් මැලි ස්ත්‍රියක් දෙන්නා දැක චතුර්වේදයෙහි (ඍග්, යජුර්, සාමන්, හා අර්ථවන් යන වේද සතර) නිපුන නියාව දැන පුටුදෙකක් තනාලා එක් පුටුවෙක සුදුකඩක් හා එක්පුටුයෙක රත්කඩක් හා අතුට ඉන්ට කිව. බ්‍රාහ්මණ කුමාර රජ්ජුරුවන්ට අද රාජ්ජය පැමිණෙයි. මට සෙනවිරත් ධුරය (ආරක්‍ෂක හමුදවෙහි ප්‍රධාන තනතුර) පැමිණෙයි නුවනින් දැන බ්‍රහ්මණ කුමාරයා රාජ කුමාරයන්ට සුදු ඉනකඩ අතුළ පුටුවදී තුමු රතු ඉනකඩ අතුළ පුටුවේ උන්නේය.

ඒ ගෙය මැලි ස්ත්‍රී බත් මාළු ඉදිකොට දෙන්නා බත් කැවූහ. දෙන්නා බත්කාලා මඟුල් උයනට ගොස් රාජ කුමාරයෝ මගුල් උයනේ සලවට පිට ඉනකඩ ඉසවසාලාගෙන (ගල් ආසනය මත රෙදි කඩකින් හිස වසාගෙන) වැදහොත්තාහ. බ්‍රහ්මණ කුමාර රාජ කුමාරයන් ගාවා

උන්නේය. බරණැස් නුවර වාසීහු පුස්රථය (රජකෙනෙකු තෝරා ගැනීම සඳහා යොදවන රථය) සරහා නුවර අළහ. පුස්රථය නුවර ප්‍රදක්ෂිණාකොට (පැදකුණු කොට) ගෙණ මගුල්උයනට ගොසින් රාජ කුමාරයන් වැදෙත් මගුල් සලවට පාමුල පුස්රථය සිටියේය.

බ්‍රාහ්මණ කුමාර රාජ කුමාරයන් පුබුද්දන්නා (නින්දෙන් නැගිටුවා) රාජ කුමාරයෝ පිබිද මගුල් සලවට පිට ඉඳ "කිමෙක්දැ?"යි විචාළාහු නුවර වාසීහු "ස්වාමිනි, අපගේ රාජ්‍යය කළ මැනවයි මේ නුවර රජ්පුරුවන් වහන්සේ මළසේකැ"යි කියන්නා බෝධිසත්‍වයන් එපවත් අසා "මේ නුවර රජ්පුරුවන්ගේ රාජකුමාර කෙණෙක් රාජකුමාරි කෙනෙක් නැද්දැ?"යි විචාරා "නැතැ"යි අසා "යහපතැ"යි ගිවිස්සාහ. බ්‍රාහ්මණකුමාර "රජ්පුරුවෝ රාජ්ජය කෙරෙති. මා සෙනවිරත් ධුරයේ සලසති. ඉන් මට ප්‍රයෝජන කින්දැ?"යි සිතා ඉවත්ව සිටි කලට රාජ කුමාරයෝ රථයට නැගී බරණැස් නුවරට ගියපසු බ්‍රාහ්මණ කුමාර මගුල් උයනේ ඉඳ විලිසවැගිරගිය (ඉදී, වැටුණු, විසිරුණු) පතක් අතට අරගෙණ ඉඳ "මේ පත්‍රය පළමු අංකුර පත්‍රයය, පසු මූකළාවූ (මෝරපු කොළය) පත්‍රයය, දැන් ජීණීවගිය (දිරාගිය) පත්‍රයය, එසේහෙයින් සියළු සංස්කාරම අනිත්‍යය (හේතු ප්‍රත්‍යයන්ගෙන් සැදුණු සියල්ල වෙනස්වන බව)"යි කිය කියා භාවනා කොට සිටිකලට පොළොව ගුගුරුවා සියළු ක්ලෙශයන් නසා පසේ බුදුබවට පැමිණියේය. ආකාශයෙන් තුන්සිවුරු පාත්‍ර අවුත් ශරීරයේ

වැලඳගත. පළමුශරීරය අන්තර්ධාන විය. පසේබුදුවූ ශරීරයෙන් ආකාශයෙන් ගන්ධමාන පර්වතයට වැඩිසේක.

රජ්ජුරුවෝ බරණැස් නුවර රාජ්ජයට පැමිණ සතළිස් අවුරුද්දක් බ්‍රාහ්මණ කුමාරයන් සඳහන් නැතිව ඉඳ (අමතකව් ඉඳ) "මාගේ දරීමුඛ නම් බ්‍රාහ්මණ කුමාරයා කොයිදැ?"යි සඳහන්කොට පරීක්‍ෂා කරන්නට උවමැනවැයි කියා දසඅවුරුද්දක් පලාගියේය. එක්ව පනස්අවුරුද්දක් ගියකලට දරීමුඛ නම් පසේබුදුන් වහන්සේ සිතනසේක් "මාගේ මිත්‍ර වූ බරණැස් රජ්ජුරුවෝ මා කොයිදැයි දක්නා අභිප්‍රාය (කැමැත්ත) ඇත්තෝය, මෙවක් පටන් රජ්ජුරුවන්ට වයසුත් මුහුකුරා දරුමල්ලනුත් ඇතිව වයස් මුහුකුරාව (වයසට පත්වීම) ගියේය. මා කී අවවාද ගිව්සති (පිළිගනීව්) මෙවිට ඔබයෙම් (එහි යම්යි සිතා)" සිතා බරණැස් නුවරට අවුත් මඟුල් උයනේ දරීමුඛ නම් පසේබුදුන් වහන්සේ වැඩඋන් කලට රජ්ජුරුවෝ උයන්ගොව්වා අතින් අසා දරීමුඛ නම් පසේ බුදුන් වහන්සේ කරා අවුත් වැඳ එකත්පස්ව උන්නාහ. පසේබුදුන් වහන්සේ "රජ්ජුරුවෙනි, දැහැමින් සෙමෙන් රාජ්ජය කරව්දැ?"යි විචාරා වදාර ඉක්බිති පසේ බුදුන් වහන්සේ පළමුවන ගාථාව වදාළසේක.

"ලෝකයෙහි යම් සත්වකෙණෙක් දියපීනන්නාවූ වැව් පොකුණු ගං හෝ ආදියෙහි හටගත්තාවූ නෙළුම් ඇඹුල උපුල සෙවෙල් ආදියෙහි ගොඩනැගී යා නොහෙද්ද, තවද යම්සේ ඝණ මඩෙහි එරුණාවූ මෘගසුනඛාදීහූ (මුව, බලු ආදී සතුන්)

නැගී යා නොහෙද්ද, එපරිද්දෙන් මේ සංසාරයෙහි ඇව්දිනාවූ වස්තුකාම කෙලේශකාම නමැති තෘෂ්ණා ශෛවලාදියෙහි ලග්නව (ආසාව නැමති දිය සෙවෙල්වල ඇලී) සංසාර සාගරයෙන් නැගී යා නොහෙන්නාහ. තවද රාග ද්වේශ මෝහ මදමාන මත්සය්ර්‍යාදිපංකයෙහි (මසුරුකම නැමති මඩයෙහි) ලග්නව සංසාර පංකයෙන් නැගී ස්වර්‍ගමොක්‍ෂාදියට පැමිණ යා නොහෙන්නාහ. තවද වස්තුකාම ක්ලේශකාමයෝ ලොභ ද්වේෂ මෝහ යන ත්‍රිකාරණා ත්‍රියුග්මුල්ලය (තුන මුල්වී) යන පවත්නා හෙයින් සසර සිටිනා සියළු සත්‍වයෝ ස්වර්ගමෝක්‍ෂාදියට පැමිණියා නොදී අපායෙහිම නැවත කරකවා එලන හෙයින් බලවත්වූ භයංකාරද වන්නේයයි බුද්ධාදී මහොත්තමයන් විසින් කියන ලදී.

තවද මහරජ, වස්තුකාම ක්ලේශකාමයෝ සුවඳසුනෙන් (සුවඳ කුඩු ගා) උලා නහා වස්ත්‍රාභරණාදීන් සැරසී සිට සත්‍වයාගේ ශරීරයෙහි ස්වභාව ඇසට අවිෂයවූ (පියවි ඇසට නොපෙනෙන) රජස්ධූලි (කෙලෙස් නමැති ධූවිලි) වැටීමෙන් යම්සේ නිස්සොභාවට (බැබලීමක් නැතිව යාමට) පැමිණේද, පිරිසිදුවූ සුනුපිරියම් කරණ ලද්දවූ සුධාධවල (සම්පූර්ණයෙන්ම සුදු) ප්‍රකාර යෙහි බිත්ති ආදිය එක්වම දුම් වැදගැන්මෙන් කිලුටු වේද, එපරිද්දෙන් මේ ලෝකයෙහි සත්‍වයන්ගේ සන්තානයෙහි හටගත්තාවූ කෙලෙස් නැමති රජස් ඒ ඒ සත්‍වයා විසින් පැමිණෙන ලද මාර්ගඵලාදියෙන් පිරිහෙලා නිස්සෝභා කරන්නේය. තවද ධ්‍යාන මෝක්‍ෂාදීන් පිරිසිදුවූ චිත්තසන්තානය ඇති සත්‍වයාගේද සන්තානයෙහි අටගත්තාවූ

සවල්පමාත්‍රවූද ක්ලේශයම ඒ සත්‍වයා කිලුටු කරන්නේය. ක්ලේශ නැමති රජස්ධූමය (දූවිලි දුම) මා විසින් තොපට විස්තර වශයෙන් කියන ලදී. ඒ කටයුත්තෙකැයි තොපට සිතේ නම් වස්තුකාම ක්ලේශකාමයෙන් හැර තපසට යව"යි යනාදීන් ධර්‍මදේශනා කළසේක.

ඉක්බිති බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ පසේබුදුන් වහන්සේට ආමන්ත්‍රණය කොට "ස්වාමීනි, මේ වස්තුකාම ක්ලේශකාමයෙහි බැඳිනිමියි අතිශයින් සක්තවිමි (ඇලී ගැලී සිටීම) පංචකාම විෂයෙහි ඇලි මූර්ඡාවට (මුසපත්වීම, සිහි නැතිවීම) ගියෙමි. ඒ කාරණයෙන් පස්කම් ගුණයෙන් වෙන්ව ජීවත්ව යා නොහෙමි" ගිහිගෙයි සිට දනාමානාදීන් බොහෝ කුසල් රැස් කෙරෙමි මහණව තපස් රක්‍ෂා කළ නොහෙමි"යි කීහ.

දීපංකර පාදමූලයෙහිදී තුන්වෙනිවූ නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව දැක කියන්නාහු "සුමේධ තාපසයෙනි, යම්සේ සිරගෙයි වසාපු කෙණෙකුන් කවරදා සිරගෙයින් ගැලවී යන්දෝ හෝ යි සිතන්නාක්හු මෙන් තොපි මේ සංසාරයෙන් කවරදා ගොඩනැගෙම් දෝහෝ සිතා ඉටාගෙණ බුදුකුරුදම් (පාරමී දම්) පුරන්නාවූ බෝධිසත්‍වයන්ට පවා මෙසේවූ සිතුවිල්ලෙක් උපන. ඒ එසේමය, මේ ලෝකයෙහි උන්මාද (සිහි මුලාව) අටකින් විසංඥ වන්නාහ.

ඒ කෙසේද යත්?

මෝහයෙන් උපදනාවූ කාම උන්මාදය, අනිෂ්ට විනාස (නපුරු ප්‍රතිඵල ගෙනදෙන) උපදනාවූ ක්‍රෝධ උන්මාදය,

විසංඥකරවන දර්‍ශන උන්මාදය, අඥාන භාවයට (මෝඩකමට) පමුණුවන මෝහ උන්මාදය, යක්‍ෂයන් වසගයට පමුණුවන යක්‍ෂ උන්මාදය, පිත අධික බවට පමුණුවන පිත්තෝන්මාදය, පාන වසග කරවන සුරා උන්මාදය, ශෝක අධික වීමෙන් වන ව්‍යසන උන්මාදයයි කියන ලද උන්මාද අටකින් දීපංකර පාද මූලයෙහි පටන් විවරණ ලත් ඒ උත්තමයානන් වහන්සේට පසේ බුදුන් වහන්සේ විසින් කියනලද්දවූ අවවාද කාමඋන්මාද හෙයින් "මට මහණ වන්නට බැරිය"යි කී සේක.

"යම් සත්‍වකෙණෙක් හිත පිණිස කීවාවූ අවවාද නො ගිවිස්සෝ වී නම් ජාති බොහෝ වෙයි. ගෙවීමක් නැත්තේය"යි කියා පසේබුදුන් වහන්සේ වදාරණසේක් "මහරජ, යම් සත්‍වයෙක් මව්කුස උපන්නේ වී නම් ඒ සත්‍වතෙම සංසාර භීරුකවූ (සසරට බියවූ) යොගාවචර පුද්ගලයා විසින් ඒ කාන්තයේ අසුභය අපවිත්‍ර යයි දක්නාලද මළමුත්‍රයෙන් පිරී සිටිනා සතර අතින් අකීලන (හැකිලෙන ස්වභාවය) සත්මසක් හෝ දසමසක් හෝ උන්තෙනින් නොසෙලවී පිනෙක් හි සිඳෙන තලපල මුවක් (තල් ඇටයක මුහුණත) මෙන් පැසී දුක් විඳිනාවූ මව්කුස් නිරයෙහි උපන්නේය. මහරජ, ඒ මවුකුස් නිරයෙන් බිහිවන්නාවූ සත්‍වයෝ සිවුදෑ ගඳ සුවඳ විලවුන් ගෙන සුගන්‍ධමාලධාරීව (සුවඳ මාලා දරාගෙන) උපන්නාහු නොවෙති. වැලි කෙසේ උපදිද්දැ යි යතහොත් පුරාණ ගූථයෙහිම (අසූචිවල) වැකී රුධිරයෙන් හැනී ඝන බොල් සෙලෙශ්මායෙන් (ඝන සෙම) තැවරී බිහිවන්නාවූ එසේ බිහිවන වේලෙහි මෙබඳු අපවිත්‍රයෙන් මිශ්‍රවූ කර්‍මජ වාතයෙන් බැහැර

හෙළන ලදුව යතෙක්හිලා මිරිකන (යන්ත්‍රයක දමා අඹරන) කලක්මෙන් මහදුක් විඳිමින් කෙසිවිදකින් අදනා නාඹු ඇතක්නු (ඇත් නාම්බෙක්) මෙන් සම්බාධයෙන් (බාධා ඇතිවීම) බිහිවීමෙන් දුක් විඳිතොත් විනා සැපයෙක් නම් නැත්තේමය. වස්තුකාම ක්ලෙශකාමයෙහි ඇලුනු සත්‍වයාට ගර්භාවක්‍රාන්ති (මව්කුසින් බිහිවීම) දුක්බය වන්නේයයි දෙයාසංඛ්‍ය කල්පලක්‍ෂයක් දන්නා නුවන ඇති ප්‍රත්‍යෙක බෝධිඥනයෙන් දැකම කීමි, අනික් කෙණෙකුන්ගෙන් ඇසීමෙන් කී දෙයක් නොවෙයි'' යනාදීන් දරීමුබ නම් පසේ බුදුහු විසිතුරු බණ කථාවෙන් විශිෂ්ටවූ නුවණ ඇති බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන්ට වස්තුකාම ක්ලෙශකාමයෙහි ආදීනව ඇති නියාව කියා ගිව්සු සේක.

ඒ නියාවට රජ්ජුරුවන්ට අවවාද කියා ''මහණ වෙතත් තොපගේ අභිප්‍රායෙක. අප විසින් සියලු ආදීනව කියා ඵම්හ''යි කියා ආකාශයට පැන නැගී පස්වනක් වලා මඬිමින් (පාට පහකින් යුත් වළාකුළු අතරින්) පසේබුදුන් වහන්සේ වඩිනට වන්සේක.

රජ්ජුරුවෝ ආකාශයෙන් වඩිනේ පසේබුදුන් වහන්සේ දෘශ්‍යනාතික්‍රාන්ත (පෙනීම අවසන් වනතුරු) වනසේක් බලාසිට බරණැස් නුවර අමාත්‍යයන් ගෙන්වා තමන්ගේ පුත්වූ බරණැස් රාජකුමාරයන් ගෙන්වා රාජ්ජයට පමුණුවා අමාත්‍යය මණ්ඩලයා ශොකයෙන් අඬ අඬා සිටිද්දී හිමාලය වනයට ගොස් මහණව පඤ්චවසෘද්ධි අෂ්ටසමාපත්ති උපදවා

නොපිරිහුනු ධ්‍යානයෙන් බ්‍රාහ්මලෝකයෙහි උපන්හයි වදරා මේ 'දරීමුඛ ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි බරණැස් රජව උපන්නෙම් තිලෝගුරු බුදුවූ මම්ම ය"යි වදාළසේක. මේ දේශනාව කෙළවර බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියාහ.

# 367. නේරු ජාතකය

තවද නිවනට දොරහළුවාවූ (දොර විවර කළාවූ) තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක්තරා භික්ෂුකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

එක්තරා භික්ෂුකෙනෙකුන් වහන්සේ පිටිසර ගමකට වැඩිසේක. පිටිසර එක්තරා පුරුෂයෙක් ඒ භික්ෂූන් වහන්සේ දැක පන්සලක් ඉදිකොට වස්වසමින් සිටිකලට ශාස්වත දෘෂ්ටි (සදාකාලික ආත්මයක් ඇතැයි පිළිගන්නා දෘෂ්ටිය) පරිබ්‍රාජකාවරු ආහ. එතැන්පටන් භික්ෂූන්වහන්සේ කෙරේ ආලිස්සන්ව (කළකිරී) පරිබ්‍රාජකාවරුන්ට සත්කාර සම්මාන කරන්නට වන. උන් සත්කාර සම්මාන කරන්ට වන්කලට උච්ඡෙදවාදී (මරණින් පසු සියල්ල අවසන් යයි පිළිගන්නා අය) ආහ. එතැන්පටන් ශාස්වතාදීන් කෙරෙහි ආලිස්සන්ව උච්ඡෙදවාදීන්ට බොහෝ සත්කාර සම්මාන කරන්නට වන. උන්ට සත්කාර සම්මාන කරන්නට වන්කලට අවෙලකාදී (වේල

යනු රෙද්දට නමකි. රෙදි අඳින්නේ නැති අය) ආහ. එතැන්පටන් උච්ඡෙදවාදීන් කෙරෙහි ආලිස්සන්ව අචෙලකාදීන් කෙරෙහි බොහෝ සත්කරා සම්මාන කරන්නට වන.

මේ නියායෙන් උත්තමය, මධ්‍යමය, අධමයයි (පහත්යයි) යන තේරීමක් නැතිව සාමාන්‍යයෙන්ම උපස්ථාන කෙළේය. ඒ භික්‍ෂූන් වහන්සේ වස් තුන්මස එතන රැඳ සර්‍වඥයන් වහන්සේ දුටුසේක. සර්‍වඥයන් වහන්සේ "ඇයි? මහණෙනි, මෙතෙක්දු කොයි ගියෙහිදැ?"යි විචාරා එපවත් අසා "මහණෙනි, ඒ පුරුෂ උත්තම, මධ්‍යම, අධම යන තුන් පක්‍ෂය නොදන්නා ගමන සවර්‍ණ පර්‍වතයෙහි උත්තම, මධ්‍යම, අධම යන පක්‍ෂීන් උන්කලට එක වර්‍ණ වන්නා මෙනැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ සවර්‍ණහංසව උපන්නාහ. බෝධිසත්‍වයන්ගේ මලනුකෙණෙකුන් ඇත්තාහ. බෝධිසත්‍වයන් මලනුවන් වහන්සේ ගොචර භූමියට (ගොදුරු බිමට) එනකල නේරු නම් ස්වර්‍ණ පර්‍වතයෙහි සැතපී එනකලට යන කලට සුදු පැහැය, කළු පැහැය, නිල් පැහැය, ආදිවූ නොයෙක් පැහැය ඇති පක්‍ෂි සිවුපාවෝ නේරු සවර්‍ණ පර්‍වතය ඡායාවෙහි (සෙවෙනෙහි) උන්කලට ඒකවර්‍ණ වන්නාහ.

මින් එක් දවසක් බෝධිසත්‍වයන් හා මලනුවෝ පර්‍වත සමීපයට පැමිණ බෝධිසත්වයන්ගේ මලනුවෝ විචාරන්නාහු

"බ්‍රූනන් වහන්ස, සිංහ ව්‍යාඝ්‍රාදී උත්තම සිව්පාවෝත් සිගාලාදිවූ සිවුපාවෝත් සවර්ණවර්ණ (රන්වන්) වන්නෝය. අපගේ උත්තම වූ පක්ෂිත් කපුටු ආදිවූ නීච පක්ෂිත් මේ පර්වත සමීපයට පැමිණිකල ඒකවර්ණ වන්නාහ. මීට කාරණා කවරේදැ?යි මේ කිනම් පර්වතයෙක්දැ?"යි විචාළාහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහු "මෙකී පර්වතය නම් නේරු පර්වතය, උත්තම මධ්‍යම අධම යනාදී සිවුපාවුනුත් පක්ෂීනුත් මෙතනට පැමිණ කල ඒකවර්ණ වෙයි. අනික් වෙසෙක් නැත්තේය"යි කීහ.

බෝධිසත්වයන්ගේ මලනුවෝ "මේ පර්වතයට නිද්‍ද වේවයි උත්තම මධ්‍යම අධම යන තුන් පක්ෂය ඒකවර්ණවෙයි. උත්තම මධ්‍යම අධමයන් තෝරාලිය නොහෙයි. එසේහෙයින් මේ පර්වතයට නින්ද වේව"යි වදරා චතුස්සත්‍ය දේශනාවසානයෙහි ඒ භික්ෂූන් වහන්සේ සෝවාන්වූ සේක.

"එසමයෙහි බෝධිසත්වයන්ගේ මළනුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. එසමයෙහි ස්වර්ණහංසව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

## 368. ආසංබවතී ජාතකය

තවද සසරට ප්‍රතිපක්ෂවූ (විරුද්ධවූ) සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් භික්ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

එක් භික්ෂු කෙණෙකුන් වහන්සේ ස්ත්‍රියක් කෙරේ උකටලීවූ (මහණකම කෙරේ කළකිරුණු) සිත් ඇතිව වාසය කරණසේක් භික්ෂූන් වහන්සේ ඒ නම සර්‍වඥයන් වහන්සේට පෑ සේක. සර්‍වඥයන් වහන්සේ "සැබෑද මහණ, තා ස්ත්‍රියක් කෙරේ පිළිබඳව උකටලීවූ සිත් ඇතිව වාසය කරන්නේය"යි විචාරා වදාළසේක. එපවත් අසා "සැබෑව ස්වාමීනි" කී කල්හි "දැන්මතු නොවෙයි මහණෙනි, පෙරත් මේ මහණ ස්ත්‍රී කෙරේ පිළිබඳ සිත් ඇතිව විසුයේ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්‍වයන් වහන්සේ හිමාලය වනයෙහි තපස් කරණසේක. එසමයෙහි දිව්‍ය ලෝකයෙන් දිව්‍යපුත්‍රයෙක් මිය අවුත් බෝධිසත්‍වයන් වහන්සේ වසන්නාවූ පන්සල සමීපයෙහි පොකුණේ පියුමක් මත්තේ සර්‍වණප්‍රතිමාවක් (රන් පිළිමයක්) මෙන් කුමාරිකාව උපන.

බෝධිසත්‍වයෝත් කීප දවසක් පියුම පරනොවී තිබෙන හෙයින් "මීට කාරණා කිම්දැ"යි කියා නානකඩ ඇඳගෙණ දියට බැස පියුම ලඟට ගොසින් පියුම මත්තේ වැදහොත්තාවූ කුමාරිකාව දැක දරුවනැයි යන සංඥාවෙන් (හඳුනා ගැනීමෙන්) වඩාගෙණ පන්සලට ගෙණවිත් වඩා වර්ධනය කොට සොළොස් ඇවිරිදි වයසට පැමිණියාහ.

ඒ කුමාරිකාව මනුෂ්‍ය ස්ත්‍රියට වඩා සිටිනීය. දිව්‍ය ස්ත්‍රීන්ටම අනුව සිටිනීය. ඒ තාපසයෝ පියුමෙහි උපන් තැනැත්තන් බලන්ට ආසාවෙන් ගිය හෙයින් ආසංඛවතී යයි නම් තුබූහ. මෙසේ මේ කුමාරිකාවන් අනර්ඝ රූපයෙන් සජ්ජිතව (සකස්වී) වසන සමයෙහි ශක්‍රයෝ බෝධිසත්ත්වයන් කරා කලින් කලට අවුත් දැක යන්නාවූ කල්යාමකින් තාපසයන් ලඟ අවුත් දැක වැඳ එකත්පස්ව ඉඳ කුමාරිකාව දැක "මේ කුමාරිකා මෙතනට කෙසේ පත්වූදැ?"යි විචාළාහ. තාපසයෝත් තමන් දුටු සැටියත් තමන් දරුකොට වැඩු නියාවත් ශක්‍රයන්ට කීවාහ. ශක්‍රයෝත් "මුන්ට කුමක් උවමනාදැ?"යි විචාළාහ. තාපසයෝ කියන්නාහු "මුන් ඉඳිනට ගෙයක්ද වස්ත්‍රාභරණ අන්නපානාදීවූ (ආහාර පාන වගී) ඛාද්‍ය භොජ්‍යාදීවූ (කැවිලි ආදිය) යන මේ සියල්ල උවමැනවැ"යි තාපසයෝ කීහ. එවිට ශක්‍රයෝත් "යහපතැ"යි දැවානමය (දැවයෙන් කල) මාලිගාවක් ද වස්ත්‍රාභරණාදී ඛාද්‍ය භොජ්‍ය අන්නපානාදීවූ දෙයද යන මේ සියල්ලම නිර්මිත (මවා) කොට කුමාරිකාවට දී දිව්‍ය ලෝකයටම ගියහ. ඒ කුමාරිකාවන් තාපසයන්ට අත්පා මෙහෙවර කොට වසන්නීය.

එක් වැද්දෙක් දඩගිය තැනැත්තේ ඒ පන්සලට වැද ඒ කුමාරිකාවන් දැක තාපසයන් සමීපයට ගොස් "තාපසයන් වහන්ස, මේ කුමාරිකාව කවුරුදැ?"යි විචාළේය. තාපසයෝ "මාගේ දුවනියෝය"යි කීහ. වැදිත් එතනින් නික්ම බරණැස් නුවරට ගොස් රජ්ජුරුවන්ට කියන්නේ "දේවයන් වහන්ස

හිමාලය වනයෙහි එක් තාපසකෙණෙකුන්ගේ දුවක් විශිෂ්ටවූ රූ ඇත්තීය. බැළු බැළුවන්ට ප්‍රසාද (පැහැදීම ඇතිකරන) වහණිය"යි රූපශ්‍රී වර්‍ණනා කෙළේය.

රජ්ජුරුවෝ උන්ගේ බස් අසා තෘෂ්ණාව උපදවා වැද්දනු මගලන (මග නතර කරන අදහසින්) නියායෙන් ඉදිරිකොට තාපසයන් කරා ගොස් වැද එකත්පස්ව ඉඳ කුමාරිකාව දැක "මේ කුමාරිකාව කවුරුදැ?"යි විචාරා "මාගේ දුවනියෝය"යි තාපසයන් කී කල්හි "තාපසයන් වහන්ස, ස්ත්‍රීහු නම් තාපසයන් වහන්සේට කිළුටක් (තපසට කිළුටක්, පලිබෝධයක්) හා සරිය. නුඹ වහන්සේගේ දුවනියන් පසු මට පාවාදුන මැනවයි මම නුවරට ගෙණගොස් ස්ථානාන්තර (තනතුරු දී රැකවරණය කිරීම) කෙරෙමි කීහ. එවිට තාපසයෝ එබසට නිහඬක් නොකියා කියන්නාහු "මාගේ දුවනියන්ගේ නම කිවොත් පාවාදෙමි" කීහ.

රජ්ජුරුවෝත් තාපසයන්ට බොහෝ නම් කියන්නාහු තාපසයෝත් "මේ මාගේ දුවනියන්ගේ නම නොවෙයි" කියති. මේ නියායෙන් රජ්ජුරුවොත් අවුරුද්දක් රඳා නම් කියාගත නුහුනුවාහ. රජ්ජුරුවන් හා කැටිව ආ ඇතුන්ට සිංහ ව්‍යාඝ්‍රයන් ගෙනුත් බොහෝ ගහට (කරදර) විඳිනේය. ඇට ලේ බොන මදුරුවන්ගෙනුත් මනුෂ්‍යයන්ට බොහෝ ගහටය. ශීත පීඩාදීයෙනුත් බොහෝ දුක්බය ගෙනා බත් සාල් නිමා ගිය හෙයිනුත් මනුෂ්‍යයන් විඳිනාවූ පීඩා දැක රජ්ජුරුවෝත් "අවුරුද්දක් රඳා මේ කුමාරිකාවන්ගේ නම කියාගත

නුහුනුම්හ''යි කියා තාපසයන් වහන්සේ වැඳ සමුගෙණ නුවරට යන්නාහු කුමාරිකාව වසන්නාවූ මාලිගාව සමීපයට ගොස් ''තොප නිසා අවුත් අවුරුද්දක් තීගේ නම පමණක් කියාගත නොහී දුක්විඳ නුවරට යම්හ''යි කීහ.

එවිට කුමාරිකා කියන්නී ''යම්දෙයක ආසාවක් කළ කල ඒ ආසාව පසිඳගෙණ විනා යාම කාරණා නොවෙයි, මා තරම් ස්ත්‍රියක් ලැබගත ඇත්ද? මා කියන කථාවක් ඇසුව මැනව, දිව්‍යලෝකයෙහි චිත්‍රාලතා වනයෙහි ආසා නම් ලියෙක් ඇත, ඒ ලිය දසක් අවුරුද්දෙන් ඵල ගන්නේය, දිව්‍ය පුත්‍රයෝ දසක් අවුරුද්දෙන් මේ ආසාලියය ඵලගත්කල ''ඵල අනුභව කරම්හ''යි දසක් අවුරුදු දුක්විඳ ඇවිද ඵල අනුභව කොට තුන් මසක් උත්සවකෙළි කෙළෙනාහ. නුඹ වහන්සේ අවුරුද්ක් දුක්විඳ මා වැනි ස්ත්‍රියක් ඇරපියා යන සේක්වේද?''යි කීහ.

එබස් ඇසූ රජ්ජුරුවෝ ආසංඛවතී කුමාරිකාවන්ගේ බසෙහි බැඳී යා නොහී එක නමකට නම් දහයක් නියායෙන් සොයා නොදැක අවුරුද්දක් සොයා නම කීවත් තාපසයෝ ඒ නොවෙයි කීමෙන් අවුරුද්දක් පලාගියේය. මනුෂ්‍යයන්ට බොහෝ දුක් නිසා තාපසයන් වැඳ සමුගෙණ රජ්ජුරුවෝ තමන්ගේ නුවරට යන්ට නික්ම ආසංඛවතී නම් කුමාරිකාව උන් ප්‍රාසාදය බලා ''අපගේ නුවරට යම්හ''යි කීහ.

අසංඛවතී කුමාරිකා කියන්නී ''රජ්ජුරුවෙනි මා කියන කථාවක් අසව, එක් කොකෙක් පර්වතයක් මුදුනේ සැතපී ඉඳ සිතන්නේ මා උන්තෙනට ගංගාවකුත් ගොදුරකුත් සැලසී ගියේ

නම් යහපත්ව පැනුත් බී ගොදුරුත් කා චිත්ත සන්තෝෂ (සිතේ සතුට) වීනම් යහපතැයි සිතාගෙණ උන්නේය. ශක්‍රයෝ අසුර භවනය ජයගෙණ තමන් ශක්‍රභවනයට ඇවිත් සිතන්නේ මාගේ මනෝරථය (අදහස, මනදෙළ) සිද්ධවිය. කවුරුන්ගේ මනෝරථය සිද්ධ නුවූයේ දැයි පරීක්‍ෂා කළාහු කොකා සිතාවුන් සිතිවිල්ල දැන කොකා උන් පර්‍වතය ගාවා ගඟා වතුරෙන් උසවා මහා ගඟාවක් මැවීය. කොකා ගඟින් පැන්බී ගොදුරුත් කා චිත්ත සනෙතාෂ කෙළේය. තිරිසන් පක්‍ෂියා පවා තමාගේ මනෝරථය සිද්ධවාගෙණ ගියෝවේද? එසේ හෙයින් නුඹ වහන්සේත් නුඹ වහන්සේගේ මනෝරථය සිද්ධකොටගෙණ ගියමැනවැ''යි කිව. ''යහපතැ''යි රජ්ජුරුවෝ ආසංඛවතී කුමාරිකාවන්ගේ බසෙහි බැඳි තමන්ගේ අමාත්‍යයන්ට කියන්නාහු ''එකී එකී නමට සියයක් නියායෙන් බඳුව''යි කියා බන්දවාගෙණ තාපසයන්ට කිවත් ''ඒ නොවෙයි'' කියා මේ නියායෙන් අවුරුද්දක් පළාගියේය.

රජ්ජුරුවෝ ''තමන්ගේ නුවරට යෙමි'' කියා තාපසයන් වැඳ සමුගෙණ නික්මුනාහු ආසංඛවතී කුමාරිකාවන් උන් ප්‍රසාදය බලා කියන්නාහු ''එම්බල කුමාරිකාව, තිගේ නම් සොයා කියමි යන උත්සාහයෙන් දැන් තුන් අවුරුද්දක් පලා ගියේය. මෙදෑතුරේ තිගේ බසෙහි බැඳි (වචනයෙහි පැහැදී) උන් පමණක් විනා පඤ්චකාමයෙකුත් රැඳුනු ගමනෙක් නොවෙයි, නිකම් බසින් ප්‍රයෝජන කිම්ද? මාගේ ආසාවෙහි පූර්‍ණත්වයක් (බලාපොරොත්තු සපුරා ගැනීමක්) නැතිවුව මාගේ නුවරට යෙමි'' කීහ.

ආසංඛවති කුමාරිකා කියන්නී “රජ්ජුරුවන් වහන්ස, නුඹ වහන්සේ දැන් කීයේ මාගේ නමය, ඒ නම තාපසයන් වහන්සේට කියා මා කැඳවාගෙණ ගිය මැනවැ”යි කියා කිව. එවිට රජ්ජුරුවෝ “එසේ වීනම් මුන්ගේ නම ආසංඛවතී නමැ”යි දැන තාපසයන් වහන්සේ සමීපයට ගොස් වැඳ “ස්වාමීනි, කුමාරිකාවන්ගේ නම ආසංඛවතී නමැ”යි කීයේය. තාපසයෝ “එසේය ආසංඛවතීයයි නමය උන් පාවාගෙණ යව”යි කීහ.

රජ්ජුරුවෝ ආසංඛවතී කුමාරිකාවගේ ප්‍රාසාදය සමීපයට අවුත් කියන්නේ “තාපසයන් වහන්සේ තොප මට පාවාගෙණ යන්නට කීසේක. ප්‍රාසාදයෙන් බැසපියව”යි කියා පාවාගත්හ. ආසංඛවතී කුමරිකා තාපසයන් සමීපයට ගොස් වැඳ සමුගෙණ රජ්ජුරුවන් හා කැටිව නුවරට ගියහයි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට මේ ‘ආසංඛවතී ජාතකය’ නිමවා වදාළසේක. චතුස්සත්‍ය දේශනාවගේ කෙළවර ඒ භික්ෂූන් වහන්සේ සෝවාන්වූ සේක.

“එසමයෙහි රජ්ජුරුවෝ නම් මේ භික්ෂුහුය. එසමයෙහි ආසංඛවතී නම් කුමාරිකා නම් පුරාණ ද්‍රිතීය. එසමයෙහි තාපසයෝ නම් බුදුවූ මම්ම ය”යි වදාළසේක.

## 369. මිගාලොප ජාතකය

තවද පඤ්චගතියෙන් (නරක, තිරිසන්, ප්‍රේත, අසුර, මනුෂ්‍ය යන ගති) විනිර්මුක්තවූ (මිදුනාවූ) තිලෝගුරු

බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි නොකීකරු භික්ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

එක්තරා භික්ෂුකෙණෙකුන් වහන්සේ නොකීකරුව වාසය කරණසේක. එකල බුදුරජාණන් වහන්සේ ඒ භික්ෂුහට "සැබෑද මහණ, තා නොකීකරුව වසන්නේය?"යි වදාරා "සැබෑව ස්වාමීනි" කී කල්හි "මහණ, තෝ නොකිකරුවුයේ දැන්මතු නොවෙයි පෙරත් නොකීකරුය. ඒ තාගේ නොකීකරුකම නිසා නුවණැත්තන් කීවා නොකිරීමෙන් නොකීකරුව නේරඹ වාතයට (ඉහළ අහසයෙහි පවතින එනම් දරුණු කුණාටුව) වැද ඛණ්ඩ ඛණ්ඩව (සුනු විසුණු වී ගිය) විසිර ගියේ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍ය කරණ සමයෙහි බෝධිසත්‍වයන් වහන්සේ ගිජුලිහිණි යෝනියෙහි අපරාෂ්ට නම් ගිජුලිහිණිව බොහෝ ගිජුලිහිණියන්ට රජව උපන්නාහ. ඒ බෝධිසත්‍වයන්ගේ මිගාලොප නම් පුත්වූ ගිජුලිහිණි පැටවෙක් ඇත. ඔහු නොකීකරු හෙයින් බෝධිසත්‍වයෝ අවවාද කියන්නාහු "මිගාලෝප නම් වූ ගිජඣ පොතකය, තෙ, තාගේ; යාදිසීගති (යම් ආකාර ගමනක්), යම්බඳුවූ ආකාශ ගමණෙක් ඇද්ද;

තං, ඒ ගතිය; මේ. මටඩ නරුව්වං, නුරුස්නේය; තාත, පුත; අතුව්වංපතසි, ඉතා උස්වූ ආකාශයට පැනයෙයි; අභූමිං, පක්ෂීන්ට විෂයයි හරින්නාවූ අභූමිය; තාත, පුත; සෙවෙස, සෙව්නේයි; තෙ, තට; පඨවි, පෘථිවිය; තාත, පුත; චතුක්කණ්ණකෙදාරං, සිවුරැස් කෙතක (හතරැස් කුඹුරක) පරිද්දෙන්; යදා, යම්කලෙක්හි; පසසසි, දක්නෙහි; තාත, පුත; (තෝ එයින්) නිවත්තසස්සු, වලකුව; ඉතො, මෙයින්; පරං, මත්තෙහි; මාගමා, නොයවා; අඥද්ඹෙදපි, අනිකුත්; පත්ත යානං, පත්‍රයාන කොට ඇති; විහංගමා, පක්ෂිහු; වාතවෙගෙන, වාත වේගයෙන්; අක්ඛිත්තා, විසුරුවා දමන ලද්දාහු; සස්සති, සමභූමිය හා සමානවූ ආත්ම තර්කනයන් ඇත්තාහු; නට්ඨා, විනාශයට පැමිණියාහ. අපපජනකවූ වැඩිමාළු පියාගේ අවවාද නොකොට කෘෂ්ණ වාතය (කළු වා තලය, වේරම්භ වාතයෙන් යට පවතින වාතය) ඉක්ම වේරඹ වාතයාගේ වසඟයට පැමිණියෝයි, මිගාලෝප නම් පක්ෂිහු අවවාද ක්‍ෂම (නොපිළිගන්නා) නොවන කල්හි ඔහුගේ පුත්‍රයෝද දූරාවෝද අනුව පවත්නාවූ යම් ගිජුඬ කෙණෙක් ඇද්ද, ඔහු සියල්ලෝම ව්‍යසනයට (විපතට) පැමිණියෝ යයි එපරිද්දෙන් යමෙක් වෘද්ධයන්ගේ (වැඩිහිටියන්ගේ) වචනය නොගිව්සිද, අතික්‍රාන්තවූ (ඉක්මවනලද) අනුශාසනා ඇති සීමාති ක්‍රමණය (සීමාව ඉක්මවා) කොට ඇසිරෙනවාද, මිගාලෝප නම්වූ ගිජුඬ පොතකයා පරිද්දෙන් වෘද්ධානුශාසනා නොකොට බ්‍යසනප්‍රාප්ත (විපතට පත්වන්නේයයි) වන්නේය යි වදාරා මේ ‘මිගාලෝප ජාතකය’ නිමවා වදාළ සේක.

"එසමයෙහි මිගාලෝප නම්වූ ගිජඬ පෝතකයා මේ අකීකරු භික්‍ෂුහුය, අපරාෂ්ට්‍ර නම් ගිජුලිහිණි රජව උපන්නෙම් බුදුවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

## 370. ශ්‍රී කාලකන්නි ජාතකය

තවද ශාන්තවූ (තැම්පත් ගුණය) ගුණ ඇති සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි අනේපිඩු මහසිටාණන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්?

අනේපිඩු මහසිටාණන් හා උන්ගේ අඹුදරුවන් හා වහල් පටන් (වහල් වැඩ කරණ අය) බැල මෙහෙකොට සිටින්නන් පටන් එක්ව නිත්‍ය ශීල වශයෙන් පන්සිල් රැක පොහොය අටසිල් රක්නාහ. මේ කථාව දම්සභා මඬපයෙහි රැස්ව වැඩ උන් මාළුවරුන් වහන්සේ "අනේපිඩු මහසිටාණන් හා උන්ගේ පරිවාරයන් (පරිවාර ජනයා) යහපත් නියාය"යි කියා කථාකොට උන්කලට සර්‍වඥයන් වහන්සේ එතනට වැඩ "මහණෙනි, අනේපිඩු මහසිටාණන් තබා පෙර උත්තමයන්ගේ යහපත්වූ පරිවාර ඇත්තෝ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වාදළ සේකි.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ ඒ නුවර සිටුව උපන්නාහ.

එසමයෙහි බෝධිසත්‍වයන් පටන් උන් අඹුදරුවන් හා වහල්පටන් බැළමෙහෙකොට සිටින්නන් පටන් එකසේම නිත්‍ය ශීල වශයෙන් පන්සිල් හා පොහොය අටසිල් රකිනා හෙයින් උන්ගේ පරිවාර සුචි විසින් සුචිපරිවාර (ගුණ ගරුක අය ඇසුරු කරන) සිටාණෝ යයි කියා මේ නමින් ප්‍රසිද්ධව ඉන්නාහ. ඒ කියන සුචිපරිවාර සිටාණෝ "මට වඩිනා කෙණෙකුන් ආ කල ඉන්ට උවමැනව"යි කියා අස්නක් පනවා තුබූහ.

එසමයෙහි ධ්‍රතරාෂ්ට (සතරවරම් දෙවියන්ගේ පළමුවැන්න) නම් දිව්‍යරජ්ජුරුවන්ගේ දූ වූ ශ්‍රීකාන්තාවද විරූළ්හක නම් දිව්‍යරජ්ජුරුවන්ගේ දූ වු කාලකන්නි නම් දිව්‍යස්ත්‍රියක්ද, දෙදෙනාම අනොතත්ත විලට නාන්ට ගියහ. අනෝතත්ත විල වනාහී සර්‍වඥයන් නානා තොටද, පසේබුදුවරයන් වහන්සේ නානා තොටද, රහතුන් වහන්සේ නානා තොටද, තාපසවරුන් නානා තොටවල්ද, සදිව්‍යලෝකේ දෙවියන්ට වෙන වෙන තොටවල්ද දිව්‍යස්ත්‍රීන්ට නානා තොටවල්ද මේ නියායෙන් වෙන වෙනම තොටවල් ඇත්තේය.

මෙකී යන්නාවූ ශ්‍රීකාන්තාව කාලකන්නි යයි යන දිව්‍යස්ත්‍රීන් දෙන්නත් දිව්‍යස්ත්‍රීන් නානා තොටට අවුත් දෙන්නම "මම පළමුකොට බසිමි" "මම පළමුකොට බසිමි"යි කියා ඩබර

කොට ගත්තාහ. ඉන් කාලකන්නි දිව්‍යස්ත්‍රී කියන්නී "යම් මනුෂ්‍ය කෙණෙකුන්ට මාගේ අශ්‍රවය, එසේහෙයින් මම පළමුකොට බසිමි" කීය. ශ්‍රීකාන්තාව යන දිව්‍යස්ත්‍රී කියන්නී "මම මනුෂ්‍යකෙණෙකුන්ට පැමිණෙන ඓශ්වර්‍ය්‍යීය මම පමුණුව වන්නෙමි, එසේ හෙයින් පළමු කොට බසින්නෙමි මම්ය"යි කිව. දෙන්නම උනුන්ට කියා ගිවිස්වාගත නොහී සතරවරන් දෙවියන් ලගටගොසින් "අපගෙන් උතුම් කවුරුදැ?"යි කියා විචාරා ගණුම්හයි කියා සතරවරන් දෙවියන් ලගට ගොස් එපවත් කීහ. ධෘතරාෂ්ට විරූළහක දෙදෙන අපගේ දරුවන් නුගුණ නොකියම්හයි කීහ. විරූපක්ඛ වෛශ්‍රවන දෙදෙන අප හා සරි දෙවියන්ගේ දරුවන්ගේ ගුණ නුගුණ නොකියම්හයි කියා "අපගේ ස්වාමීන් කරා යව"යි කීහ.

එකියන දිව්‍යස්ත්‍රීන් දෙදෙනාත් ශක්‍රයන් ලගට ගොස් එපවත් කීහ. ශක්‍රයෝ කියන්නාහු "දෙවියෝ දෙදෙන මාගේ කටයුත්තෙහි සිටිනා දෙවියෝය, උන් දෙන්නාගෙන් එක්කෙනෙක් වඩිති කීම නම් කටයුතු නොවෙ"යි කියා කියත්නාහු "සුචිපරිවාර සිටාණන්ගේ නොයිඳුල් අස්නෙක් ඇත, ඒ අස්න උන්ට කියා පළමුකොට අස්න ලත් කෙනෙක් උතුමැ"යි කීහ. "යහපතැ"යි කියා කාලකන්නි පළමුකොට නිල්පිළි ඇඳ නිල් ආභරණ ලා ගෙණ සිටාණනන්ගේ ගෙයි වැද සිටියාහ. සිටාණෝ ඈ දැක ප්‍රියව කියන්නාහු "තී වනාහී කළුපැයක් හා කළු ආභරණ හා කළු පිළි ඇඳගෙණ අප්‍රියකරුව සිඟනීය. තී වනාහී කාගේ දරුකෙණෙක්දැ?"යි විචාළාහ.

ඒවිට ඒ කාලකන්නි කියන්නී "මම විරූළ්හක නම් දිව්‍යරජ්ජුරුවන්ගේ දූ වූ කාලකන්නි නම් ඇති, කාලකන්නි යයි කියන්නේ මටය, එසේ හෙයින් නුඹ වහන්සේගේ නොයිඳුල් අස්නේ (වෙන කෙනෙක් නිදා නොගත් යහනක) රැයක් මා ලගින්ට අවකාස අලමැනවැ"යි කිව. එකියන්නා එවිට සිටාණෝ කියන්නේ "තොපගේ ගුණ කියව"යි කීහ. කාලකන්නි තමාගේ ගුණ කියන්නී "සිටාණන් වහන්ස, යම් කෙණෙක් කෙළෙහිගුණ නොදනිද්ද, පව්ටුවූ වාසය ඇද්ද, කළගුණ නොපායිද්ද, මිත්‍ර ද්‍රෝහිද, ලාමක වූ වාසය ඇද්ද, කා කෙරෙත් දයාවක් නැද්ද, කේලම් කියන්ට දනිද්ද, තද මසුරු වූ බස් කියද්ද, නුවණ නැතිව මෝහව (මෝඩකමින්) දවසරිද්ද, අනුන්ගේ සම්පතෙහි ඊර්ශ්‍යාමාත්ශය්‍යී (නුරුස්සනා ගතිය හා මසුරුකම) ලෝභී සිත් සිතද්ද, මෙසේ වුවන් කෙරේ මාගේ වාසය"යි කීහ.

එවිට සිටාණෝ කියන්නාහු "එසේ වී නම් මෙතන තිබා මේනුවරත් ඉන්ට බැරිය"යි කීහ. එවිට කාලකන්නිත් කියන්නී "මා ඇළුම්කරණ මනුෂ්‍යයන්ගේ ගුණ නුඹවහන්සේට නැත. එසේහෙයින් නුඹ වහන්සේට මාගෙන් ප්‍රයෝජනද කාරිය නැත"යි කියා කාලකන්නි අන්තර්ධාන වූවාහ.

ඒ වේලෙහි ශ්‍රීකාන්තාව රන්වන් ආභරණ පැළඳ රන්වන් වස්ත්‍රයක් ඇඳ රන්වන්වූ ශරීරශෝභාවෙන් එකාලෝක කෙරෙමින් රන්පියුමට බඳුවූ පාදයුග්මයක් (පාද දෙක) ඇතිව සිටාණන්ගේ දෙර සිටියාහ. සිටාණෝත් ශ්‍රීකාන්තාව දැක

"මෙසේවූ ශ්‍රී සමුර්ධියකින් සියළු දිග එකාලෝක කෙරෙමින් ඇවිත් සිටියාවූ තොපි කාගේ දරුකෙණෙක්දැ"යි විචාළාහ.

එවිට දිව්‍යස්ත්‍රී කියන්නී "ධ්‍රතරාෂ්ඨ නම් දිව්‍යරජ්ජුරුවන්ගේ දූ වු ශ්‍රීකාන්තාවයයි කියන්නේත් මටය, ලක්‍ෂමීයයි කියන්නේත් මටමය, පොළොව සමාන නුවණ ඇති හෙයින් භූරිපඤ්ඤ (මහත් නුවණක් ඇති නිසා) යයි කියන්නේත් මටමය, නුඹ වහන්සේගේ යාන එක දවසකට මා ලගින්ට අවසර දුනමැනව"යි කීහ. එවිට සිටාණෝ කියන්නාහු "තොපට යාන දෙන්ට තොපගේ ආචාර සීලයද තොප වසන වාසයද මට කිවමැනව. තොපගේ ශීලව්‍රත (සිල් රැකීම) සමාධිය කා කෙරහි පිහිටාද? ඒ මට නොදැනෙයි, මට කිවමැනවැ"යි කීහ.

එබස් ඇසූ ශ්‍රීකාන්තාතොම "එඹා සිටාණෙනි, යම් සත්වයෙක් තෙම ශීත පීඩාවද, උෂ්ණ පීඩාවද, අවු සුළඟින් වන ආයාසයද (හිරිහැරය), මැසි මදුරුවන් හා සර්පාදීන්ගෙන් වන උපද්‍රවයද, සාපිපාසාදීන් (බඩගින්නෙන් හා පිපාසයෙන්) වන්නාවූ උපද්‍රවයද යන සියල්ල තෘණලවයක් (තණපතක්) කොටත් නොසිතා රෑ දවල් සියලු කාරියෙහි නියුක්තව ඒ ඒ කාලයට පැමිණ කෘෂිවණික් (ගොවිතැන හා වෙළඳම) ආදී කර්මාන්ත හා දානසීලාදිවූ ඒ ඒ ක්‍රියාවන් නොනසාද, එබඳුවූ සත්වතෙම මට අතිශයින් ප්‍රිය වන්නේ ඔහු කෙරෙහිම ඇලි වාසය කෙරෙමි"යි "තවද සිටාණෙනි, යම් සත්වයෙක් ක්‍රෝධී නොවේද, බොහෝ මිත්‍රයන් ඇත්තේද,

ත්‍යාගීද, සීලාචාරයෙන් යුක්තද, ශඨ ප්‍රවෘත්තියක් (කපටි පැවැත්මක්) නැතිව සෘජුවූ කායවාක් සුචරිත සමාචාර (යහපත් හැසිරීම්) ඇත්තේද, සංග්‍රහසීලිද, ප්‍රියවූ මටසිළුටුවූ (සරල වූ ලිහිල් වූ) වචනයන් ඇත්තේද, මහන්තත්‍වයට පැමිණියෙන් සියල්ලවුන්ට යටත්‍ව පවතීද, සමුද්‍රය බලන්නාවූ සත්‍වයන්ට යම්සේ රළපතර බොහෝව පෙණේද එපරිද්දෙන් යථොක්තවූ ගුණ ඇති පුරුෂයා කෙරෙහිම වාසය කෙරෙමි”යි “තවද යම් සත්‍වයෙක් මිත්‍රයන් කෙරෙහිද ජාතිගෝත්‍රාදී ශ්‍රෙෂ්ඨයන් (කුලගොත් ආදියෙන් උසස්) කෙරෙහිද සදෘශවූවන් කෙරෙහිද වැඩෙහි හැසිරෙන්නාවුන් කෙරෙහිද අවැඩෙහි නොහැසිරෙන්නවූන් කෙරෙහිද සම්මුඛ (ළග සිටියදීත්) පරාර්මුඛ (බැහැරක සිටියදීත්) දෙක්හි සංග්‍රහ කිරීමම සොභාකොට ඇත්තේද, කිසිකලෙකත් පරුෂවචනයන් නොකියාද, එබඳු ගුණ ඇති සත්‍වතෙම මළේ නමුත් ජීවත්ව ඉඳිනා නමුත් මම ඔහු අයිතියෙමි. යම් නුවණාමද සත්‍වයෙක් මෙබඳු ගුණයන් අතුරෙන් එක්තරා ගුණයක් ලැබ ශ්‍රී මට වසඟවයි සිතා ප්‍රමාද වශයෙන් පැමිණියාවූ ගුණය නසාද, එබඳු පුද්ගලයා වැසිකිළියක් මෙන් දුරින් දුරුකෙරෙමි. සත්‍වතෙමේම තමාගේ යහපත් ගුණයෙන් ශ්‍රියා (වාසනාව) තමාට පමුණුවා ගන්නේය. තමාගේ නුගුණයෙන්ම කාලකන්නියත් පමුණුවා ගන්නේය. එසේහෙයින් ශ්‍රීකාන්තාවය කාලකන්නිය යන දෙක එක්කෙනෙක් එක්කෙනෙකුන්ට පමුණුවනකෙණෙක් නැත, තමන් තමන්ගේ ගුණ නුගුණ වශයෙන් තම තමන් කරා පමුණුවා ගන්නාහ”යි මෙසේ

ශ්‍රීකාන්තා තමාගේ ගුණකීම වශයෙන් සිටාණන්ට ධර්මදේශනා කළාය.

මෙසේ මහබෝසතානෝ ශ්‍රීකාන්තාවගේ බසට පැහැද "මේ කිසිකෙණෙකුන්ගේ ප්‍රයෝජන විඳිමෙන් ඉඳුල්නොවූ ආසනය හා යාන තොපට සුදුසු යයි අභිප්‍රාය (සිතේ හැටියට) සැටියේ සැතපෙව"යි කීය. ශ්‍රීකාන්තාවත් සිටාණන්ගෙයි එදවස් රෑ වැස අළුයම් වෙලෙහි නික්ම තව්තිසා දිව්‍යලෝකයට ගොස් අනෝතත්තවිල පළමුව ජලස්නානය කළාහ. එතැන් පටන් ලෝකයෙහි ශ්‍රියාවන් ව්‍යාවහාර පළවූයේය. බුදුරජානන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණ හැර වදරා 'ශ්‍රී කාලකන්නි' ජාතකය නිමවා වදාළ සේක.

"එසමයෙහි ශ්‍රී කාන්තාව නම් දැන් මේ උත්පලවර්ණා මහා ස්ථවිරිය. එසමයෙහි සුචිපරිවාර සිටාණෝ නම් ලොව්තුරා බුදුවූ මම්මය"යි වාදළ සේක.

# 371. බිළාල ජාතකය

තවද අනන්ත වූ කරුණා (කෙළවරක් නැති ගුණ) ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් ස්ත්‍රියක් නිසා උකටළී වූ භික්ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්?

ස්ත්‍රියක් නිසා උකටළී වූ භික්ෂු කෙණෙකුන් වහන්සේ ගෙණ ගොසින් සර්වඥයන් වහන්සේට දක්වන්නා "සැබෑද මහණ, තා

ස්ත්‍රියක් නිසා උකටලී වූයේදැ?''යි විචාළ කල්හි ''සැබෑව ස්වාමීන් වහන්ස, මා ස්ත්‍රියක් නිසා උකටලි වූයේය''යි කීහ. සර්‍වඥයන් වහන්සේ ''එඹල මහණ, ස්ත්‍රියක් නිසා උකටලීවීම ද්වේෂය (දොසක්, වරදක්) ස්ත්‍රී බොහෝ මායමින් පුරුෂයන් ලබාගෙණ දුක් පමුණුවන්නාහ. යම්සේ බැලලකු කුකුළා ලබාගන්නට කළ උත්සාහය මෙනැ''යි වදරා ''ඒ කෙසේද?''යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ වනාන්තරයෙහි බොහෝ කුකුළන් පිරිවරා වාසය කරන්නාහ. එසමයෙහි එතනට නුදුරු වූ ස්ථානයක බැලලක් වාසය කරන්නීය. ඕ තොමෝ බෝධිසත්‍වයන්ගේ බොහෝ කුකුළන් දවස්පතා කා බෝධිසත්‍වයනුත් අල්වාගන්ට බොහෝ උත්සාහ කරන්නී මෙසේ සිතුවාය. ''මේ කියන කුකුළා මා විසින් කන්ට අල්වා ගත නොහැක්ක, කුකුළාට භාර්‍ය්‍යාව ඉඳිනා නියායෙන් (බිරිඳක් වන බවට) සලස්වා ගතොත් කෑ ඇකැ''යි සිතා කුකුලන් වාසය කරන්නාවූ ගස සමීපයට ගොස් කියන්නී ''ඝණ පියාපත් ඇති, රත්වූ කරමලක් ඇති, ආකාශයෙන් ගමන් යන්නා වූ පක්ෂිරාජයානෙනි, මම තොපට බිරින්දව වාසය කෙරෙමි'' කිව. කුකුළානෝ ''මෑ කියන්නේ වචාවෙකැ (බොරුවක් බව)''යි සිතා කියන්නාහු ''තොපි සිව්පාවෝය, අපි පක්ෂිය, එසේ හෙයින් අපගේ වංශයෙන්ම අපට බිරිඳ

වෙතොත් විනා තොපගෙන් අපට බිරිඳව ඉන්ට කාරණා නොවෙ"යි බෝධිසත්වයෝ කීහ. එවිට බැලළ කියන්නී "එසේ නොකිව මැනව, මම නුඹ වහන්සේට මිදී මෙහෙවර (සියළු වැඩපල) කෙරෙමි. එසේ නොඅදහන සේක් වී නම් මේ බරණැස් නුවර වාසීන් දන්නා නියායෙන් නුඹ වහන්සේට මිදී මෙහෙවර කරණ නියාව කියා සලස්වා ගත මැනව"යි කීව. බෝධිසත්වයෝ කියන්නාහු "තී විසින් මාගේ බොහෝ කුකුළන් කා මාත් කන්ට කරණ උත්සාහ විනා මට මිදී මෙවෙහර කෙරෙමියි සිතන උත්සාහයෙක් නොවෙයි, අප පක්ෂින් හෙයින් අපගෙන් පක්ෂියකත් තොප සිව්පාවන් හෙයින් තොපගෙන් සිව්පාවකු විනා කාරණා නොවෙයි" බෝධිසත්වයෝ කීහ. සර්වඥයන් වහන්සේ "එඹල මහණ, ඒ කුකුළා ඒ බැළල කෙරෙහි ආසාවෙන් ඈ හා එක්වී නම් ජීවිතක්‍ෂය වන්නේය. එමෙන් යම් සත්ව කෙනෙක් ස්ත්‍රී වසඟවූ නම් ජීවිතක්‍ෂයට පමුනු වන්නාහ. ස්ත්‍රී වසඟ නොවු නම් බැළලගෙන් කුකුළා ගැලවුනා මෙනැ"යි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශ කොට මේ 'බිළාල ජාතකය' නිමවා වදාළසේක. චතුස්සත්‍යයාගේ කෙළවර උකටලී භික්‍ෂූන් වහන්සේ සෝවාන් වූසේක.

"එසමයෙහි කුකුළුව උපන්නෙමි බුදුවූ මම්මය"යි වදාළ සේක.

# 372. ධර්‍මධ්වජ ජාතකය

තවද සියලු සත්කාරයට භාජනවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි වඤ්චාප්‍රයෝග

(අනුන් රවටන ප්‍රයෝගකාරී) දන්නා භික්‍ෂුකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්?

එක් වඤ්චාප්‍රයෝග දන්නා භික්‍ෂුකෙනෙකුන් වහන්සේ සර්‍වඥයන් වහන්සේට දැක්වූසේක. සර්‍වඥයන් වහන්සේ "දැන්මතු නොවෙයි, පෙරත් මේ මහණ වඤ්චාප්‍රයෝගයෙන් දවස් ඇරියේ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්‍වයන් වහන්සේ මූදු මධ්‍යයේ එක් දිවයිනක (දූපතක) පක්‍ෂි කුලයක ඉපිද බොහෝ පක්‍ෂීන් පිරිවරා වාසය කරණසේක. එසමයෙහි වෙළඳු පන්සියයක් නැව් නැගී ගියාහ. එක් කපුටුවෙක් ඒ දිවයිනට ගොස් ඒ පක්‍ෂීන්ගේ බිජුවට කන්ට සිතා අවසරයක් නොලැබ "උපායෙක් කෙරෙමි" සිතා එක් පයක් උඩ ඔසවා එක් පසකින් සිට උඩ බලා කට දල්වාගෙණ සිටියේය. පක්‍ෂි එතනට අවුත් "මේ කිමෙක්ද තොපි කරන්නේ?"යයි විචාළාහ. කපුටු කියන්නේ "මාගේ ගුණානුභාවයෙන් පොළොව මා ධරාගත නොහෙයි (පොළොවට මා උසුලාගෙන සිටිය නොහැක). එසේ හෙයින් එක පයකින් සිට වායු අනුභව කෙරෙමි"යි කීය. එවිට පක්‍ෂීහු "මේ පක්‍ෂියාගේ තපසක් යහපත් නියාය"යි සමාධිව (පැහැදී) ගොදුරු කන්ට යන්නාහු ඒ කපුටුවා තමන්ගේ බිජුවට පාවාදී (පවරාදී) යන්නාහ.

කපුටුවා පක්‍ෂීන් පළායන්නා බඩ ගන්නා විවර (අවශ්‍ය ප්‍රමාණයට) බිජුවට තලා කා සිටින්නේය. මේ නියායෙන් කල්යාමෙන් බිජුවට අඩුවේගණ යන්නා මේ කපුටුවා යහපත් ගුණ ඇත්තේය, මොහු විසින් වන භයෙක් දෙ හෝ යි සැකවුවාහු බෝධිසත්‍වයන් වහන්සේ "මේ කා විසිනුත් වන භයෙක් නොවෙයි, මේ කපුටුවා විසින් මේ භය උපදනේය"යි එක් දවසක් පක්‍ෂීන් ගොදුරු කන්ට යාදී සැඟවී උන්නාහ. කපුටුවාත් පක්‍ෂි පලායන්නාම බිජුවට කන්ට වන. බෝධිසත්‍වයෝත් බලා සැඟවී ඉඳ පක්‍ෂීන් එන්නා මෙපවත් කීහ. පක්‍ෂි එක්ව කපුටුවාට ටොකු ඇන මැරූහ. එවිට බෝධිසත්‍වයෝත් "එම්බා වඤ්චාප්‍රයෝග දන්නවුන්ගේ ගුණ නුගුණ පරීක්‍ෂා කොට විනා විශ්වාස නොකට යුත්තේය. ධර්මධරයෙම්, පක්‍ෂිව ඉපිදත් මෙසේවූ දෙයක් කළෝ වේදැ?"යි ධර්මදේශනා කොට 'ධර්මධ්වජ ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි ඒ කපුටුවා නම් වඤ්චා සහගත ප්‍රයෝග දන්නා භික්‍ෂූහුය, පක්‍ෂීන්ට රජව උපන්නෙම් බුදුවූ මම්ම වේදැ"යි වදාළ සේක.

## 373. නන්දියමෘග ජාතකය

තවද පරාවාද මදීන (අනුන්ගේ වැරදි මත මැඩ පැවැත්වූ) කළාවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දෙමව්පියන්ට උපස්ථාන කරන්නාවූ භික්‍ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්?

එක් භික්‍ෂුකෙණෙකුන් වහන්සේ දෙමව්පියන්ට සිගා ලද්දවූ ආහාරයන්දී සමහර දවස් සුන්බත්ව (නිරාහාරව) ඉඳිනසේක. සැදැහැත්තන් දුන් කඩපොල්ලත් (රෙදි කැබැල්ල) දී මෙසේ නිරන්තරයෙන් දුක්ගෙණ දෙමව්පියන් රකිනාසේක. භික්‍ෂූන් වහන්සේ "මේ මහණ සැදෑ ඇත්තන්ගෙන් දුන් ආහාරයද වස්ත්‍රයද ගිහින්ට දී ගිහින් පරිහරණය කරන්නේය"යි සර්‍වඥයන් වහන්සේට පෑසේක. සර්‍වඥයන් වහන්සේ "සැබෑද මහණ, තා ගිහින් පරිහරණය (ගිහි අය පෝෂණය කරන බව) කරන්නේය?"යි විචාරා වදාළසේක. "සැබෑව ස්වාමීනි, මාගේ දෙමවුපියන් දෙදෙනා පරිහරණය කරන්නේය"යි කීසේක. සර්‍වඥයන් වහන්සේ "මේ භික්‍ෂු තබා පෙර උත්තමයෝ දෙමව්පියන් පරිහරණය කළාහුය"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස සාකේත නම් නුවර කොසොල් රජ්ජුරුවන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ මුවව ඉපිද වාසය කරන්නාහ. ඒ මුව රජ්ජුරුවන්ට නම් තබන්නාහු "නන්දිය මුව රජ්ජුරුවෝය"යි නම් තුබූහ.

එසමයෙහි කෝසල රජ්ජුරුවෝ මුව මාංශයෙහි ඉතා ගිජුව (මුව මසට කෑදරව) ඇම දවස් මුව දඩෙහි ලොල්ව (මුවන් මැරීමට ගිජුව) ඇවිදිනාහ. මනුෂ්‍යයෝ ගොව්තැන් බත්

කරන්ට අවසරයක් නොලබම්හ යි මුව රැලක් ගෙනවිත් උයනේ ළුමෝ නම් ගොවිතැන් බත් කරන්ට අවසර ලබන්නමෝ වේදැ යි කියා එක් බැද්දක් වටලා දණ්ඩ පත්තේ ගසා (දඬු කෑලි වලින් ශබ්ද නංවා මුවන් බිය වද්දා) මුවන් රැලක් එක්කොට ගෙණ ගොස් බනන්නාහු නන්දිය නම් මුව රජ්ජුරුවෝත් මුවරැල එක්ව දෙමව්පියන් දෙදෙනා මේ බැද්දේ සඟවා මුව රැල හා කැටිවම සාකේත නුවරට ගියේය. මුවරැල ගෙණ ගොස් අඤ්ජන නම් වනයෙහි ලා වට රැකවල් ලවා කෝසල රජ්ජුරුවන්ට ගොස් කියන්නාහු "දේවයන් වහන්ස, මුවරැලක් ගෙණවිත් අඤ්ජන නම් වනයෙහි ලා වට රැකවල්ලා ආම්හ. නුඹවහන්සේ ට අභිප්‍රායක් කළ මැනවැ"යි රජ්ජුරුවන්ට වැඳ සමුගෙණ තම තමන්ගේ ගම්වලට ගියාහ. රජ්ජුරුවෝත් එතැන් පටන් දවස මුවකු බැගින් මිනිසුන් යවා මරවා ගෙන්වා අනුභව කරන්නාහ. එසමයෙහි බ්‍රාහ්මණයෙක් සාකෙත නුවරට එන්නේය. බෝධිසත්ත්වයන්ගේ දෙමව්පියෝත් තමන් සැඟවී උන් වලින් එලිබැස (කැලෑවෙන් එළියට අවුත්) මග අසා සිටියාහු බමුණා දැක "කොයි යන්නේදැ?"යි විචාරා "සාකේත නුවරට යෙමි" කී කල්හි "එසේවිනම් අපගේ දරුවාන කෙණෙක් සාකේත නුවර වසන්නාහ. යම් උත්සාහයෙක සැඟවී අප ඇස පෙණෙන්ට කියව"යි කියා "ඒ නන්දිය නම් මුව රජ්ජුරුවන්ට කියව"යි කියා යැවූහ.

ඒ බ්‍රාහ්මණයාත් අඤ්ජන නම් වනයට අවුත් මුවන් දැක "දෙමව්පියන් රකින්නාවූ නන්දිය නම්වූ මුව රජ්ජුරුවෝ නම්

කවුරුදැ?"යි විචාළාහ. "මමය"යි කී කල්හි මුව රජ්ජුරුවන්ගේ දෙමව්පියන් කියා යවූ සරූප (පණිවිඩය) කීහ. මුව රජ්ජුරුවෝත් අසා රජ්ජුරුවන් වහන්සේගේ වනයේ තණ පැන් කා රජ්ජුරුවන් වහන්සේට නොකියාම යාම කටයුතු නොවෙයි. යම් දවසක රජ්ජුරුවන් වහන්සේ මුවන් මරන්ට ආ සේක් නම් උන් වහන්සේගේ ඊය්‍යීපථයට සිට (ඉදිරිපිටදී) මාගේ ජීවිත දානයක් ඉල්වා ගෙන මුවන් ජීවිත දානයත් ඉල්වා ඇරගෙණ යෙමි, බමුණා අස්වසා යවා සිටියේය.

නොබෝ දවසකින් රජ්ජුරුවෝ මුව දඩයමට අවුත් මුවන් දැක දුටුවිට හීය ලා (ඊතලය මානා සිටීම) සිටියාහ. මුවෝ මරණ භයින් තැතිගෙණ දිවගත්හ. බෝධිසත්වයෝ රජ්ජුරුවන්ගේ හී පස්සට හමුව (රජුට පිටුපසින්) ගොස් සිටියාහ. රජ්ජුරුවෝත් බෝධිසත්වයන් දැක අනඝී වූ රූපය බලා (මුවාගේ අගනා රූපය දැක) විදගතනොහී සිටියාහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහු "මහරජ, ඇයි මා නොවිද සිටිනා මා තෙල සැරයෙන් විදපියව, මම තොප කෙරේ කණස්සල්ලක් (අමනාපයක්) නැත්තෙමි. මෛත්‍රී කෙරෙමි, මා විද පියව"යි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු "මම විදින්නට සිතින් නමුත් මා අතින් සැරය නොහැරෙන්නේමය. මාගේ සැරය තොපගේ ගුණ දත, මම තොපගේ ගුණ නොදන්නෙමි" කීහ.

එවිට බෝධිසත්වයෝ "එසේවීනම් මට අභය දානය දෙව"යි කියා අභය දානය ඉල්වාගෙණ තමන් වහන්සේගේ මුවත්ටත්

ජීවිත දානය ඇරගෙණ සෙසු සිවුපාවන්ටත් අභය දානය ඉල්වාගෙණ පක්ෂින්ටත් අභය ඉල්වාගෙණ දියෙහි වසන්නාවූ සියලු මච්ඡයන්ටත් (මසුන්ට) අභය දානය ඉල්වාගෙණ රජ්ජුරුවන්ට අවවාද කොට රජ්ජුරුවන්ට බණ කියන්නාහු දන්දීමය, සිල්රක්‍ෂා කිරීමය, වස්තු පරිත්‍යාගය කිරීමය, ඍජුව අවංකවීමය, මෘදුවිමය, තප්නය (තපස), ක්‍රෝධ නොකිරීමය, හිංසා පීඩා නොකිරීමය, ක්‍ෂාන්තිය යි යන ඉවසීමය, රාජධර්ම්මයට විරුද්ධව නොකිරීමය. දසරාජ ධර්‍මයට (දානය, ශීලය, පරිත්‍යගය, ඇදනැති බව, මැදහත් බව, සිල්වත් බව, ක්‍රෝධ නොකරීම, අවිහිංසාව, ඉවසීම, අවිරුද්දභාවය යන ධර්‍ම දහය) අකෝප්‍යව (විරුද්ධ නොවී) රාජ්‍යය කරව”යි රජ්ජුරුවන්ට අවවාද කියා රජ්ජුරුවන් වනයෙහි කීප දවසක් රැඳ තමන්ගේ දෙමව්පියන් වසන්නාවූ වනයට ගියාහ”යි වදාරා “එම්බා මහණෙනි, ඒ නන්දිය මුව රජ්ජුරුවෝ නම් තමන් දෙමවුපියන් රක්නාවූ කුසලානුභාවයෙන් තුමූත් අභය දානය ලැබ මුවන් ඇතුලුවූ බොහෝ ප්‍රාණීන් මරණීන් ගළවා රජ්ජුරුවනුත් ධර්‍මයෙහි යෙදුවෝ වේදැ”යි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට ‘නන්දියමෘග ජාතකය’ නිමවා වදාළසේක. චතුස්සත්‍ය දේශනාවගේ කෙළවර මාතුපෝසක (මව පෝෂණය කළ) භික්‍ෂුන් වහන්සේ සෝවාන් වූ සේක.

“එසමයෙහි බ්‍රාහ්මණයා නම් ශාරිපුත්ත ස්ථවිරය, කෝසල රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරය, නන්දිය මුව රජ්ජුරුවන්ගේ පියාණෝ නම් සුද්ධෝදන මහරජ්ජුරුවෝ ය, මෑණියෝ නම් මහාමයා දේවිය බොහෝ ප්‍රාණීන්ට අභය ඇර

දුන්නාවූ නන්දිය මුව රජ්ජුරුවෝ නම් ලොවුතුරා බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 374. කරපත්ත ජාතකය

තවද සාගරයක්සේ ගැඹුරුවූ ගුණ ඇති ත්‍රෛලොක්‍ය තිලකවූ (තුන්ලොවට තිලකයක් බඳු) සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ස්ත්‍රියක් නිසා උකටලීවූ (නොසංසුන් වූ) භික්ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

එක් ස්ත්‍රියක් කෙරේ උකටලීවූ භික්ෂු කෙනෙකුන් වහන්සේ සර්වඥයන් වහන්සේට දැක්වූසේක. සර්වඥයන් වහන්සේ වදාරණසේක් "දැන්මතු නොවෙයි පෙරත් තෝ ස්ත්‍රියක් නිසා ජීවිත විනාශයට පැමිණ උත්තමයන් කී කාරණය ගිවිස ප්‍රාණය ලද්දේ වේදැ (උතුමන්ගේ උපදෙස් පිළිගෙන දිවි රැකගත් බව)"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ දෙදෙව්ලොව දෙවියන්ට නායකවූ ශක්‍රදේවේන්ද්‍රව උපන්සේක. එසමයෙහි දිව්‍ය නාගරාජයෙක් ගොදුරු කන්ට යයි රජ්ජුරුවන්ගේ උයනේ ඇවිදිනේය. ඒ නාගරාජයා කුඩා

කොල්ලෝ දැක වටකොට ගෙණ කැටමුගුරු ආදියෙන් තලන්ට වන්නාහ. රජ්ජුරුවෝත් ඒ වේලාවට උයනට ආවාහු "මේ කිමෙක්දැ?"යි විචාරා එපවත් අසා "නයා නොමරව"යි මැරිය නොදී ගළවාපීහ.

නාගරාජයාත් තමාගේ නාගභවනයට ගොස් "රජ්ජුරුවන් නිසා මාගේ ජීවිතය රැකුනේය"යි සතුටුව එදා රෑම බොහෝ සම්පතුත් ඇරගෙණ නාගමාණවිකාවත් කැඳවාගෙණ අවුත් රජ්ජුරුවන් දැක "රජ්ජුරුවන් වහන්ස, නුඹ වහන්සේ නිසා මාගේ ප්‍රාණය රැකුණේය. මෙවක් පටන් නුඹවහන්සේත් මාත් මිත්‍රව වාසය කරන්නට උවමැනවැ"යි මිත්‍රකමෙහි පිහිටා නුඹ වහන්සේට ආරක්ෂාවට සිටින්ටයයි නාගමාණවිකාවත් පාවාදී "මෝ ඉඳින් නුඹවහන්සේට නොපෙණී ගිය නමුත් ගිය ස්ථානය දකිනා පිණිස කියා ගත මැනව"යි දිව්‍ය මන්ත්‍රයකුත් උගන්වා නාරජ තමාගේ නාගභවනයට ගියේය.

රජ්ජුරුවෝත් එක් දවසක් නාගමාණවිකාවන් හා අන්තඃපුරයත් ඇරගෙණ මගුල් උයනට දිය කෙළින්ට ගියාහ. නාගමාණවිකාවත් දියබරණකු (දිය බරියෙකු හෙවත් දිය නයෙකු) දැක ඔහු හා කැටුව සංවාසයෙහි යෙදෙන අභිප්‍රාය (අදහස ඇතිව) ඇතිව වේශය හැර නාගවේශය මවා දියබරියා හා කැටිව ලොකාස්වාද රතියෙහි (කාම සේවනය) යෙදුනාය. රජ්ජුරුවෝත් නාගමාණවිකාව නොදැක "කොයි ගියා දෝ හෝ"යි පරීක්ෂාකොට දියබරියා හා සමග ලෝකස්වාදරතියේ යෙදෙන නියාව දැක "මෙයින් මතු

මෙසේවූ නොකටයුත්තක් නොකරව"යි උනපත්තෙන් පාර කීපයක් ගැසූහ. නාගමාණවිකාව කිපී තමාගේ නාගභවනයටම ගියාහ. නාගරජ්ජුරුවෝත් "ඇයි තී ආයේ කුමක් නිසාදැ?"යි විචාළේය. නාගමාණවිකා කියන්නී "නුඹ වහන්සේ මා රජ්ජුරුවන්ට ආරක්‍ෂාවට සිටුවාලා ආ පමණක් විනා රජ්ජුරුවෝ තමන් හා ලෝකාස්වාදරතියෙහි යෙදෙන ලෙස අත ඇල්ලූහ. මම ඊට මැලිවිමි, ඊට මා පිට පාර කීපයක් ගැසුහ. එසේ හෙයින් මම ආමි" කීව. නාගරජ්ජුරුවෝත් "මෑ කියන්නේ ඇත්තමය"යි කිපී නාගමාණවකයන් සතරදෙනෙකු කැඳවා "තොපි සතරදෙනා ගොස් තොපගේ නාසයෙහි විෂධුමයෙන් දවා භස්මකරව (අලු කිරීම)"යි කියා යැවීය.

ඒ නාගමාණවකයෝ සතරදෙනත් "යහපතැ"යි කියා ගොස් රජ්ජුරුවන්ගේ රජගෙට වන්හ. රජ්ජුරුවෝත් ඒ වේලාවට පිබිද අගමෙහෙසුන් බිසවුන් හා කථා කරන්නාහු "සොඳුර, නාගමාණවිකාව මගුල් පොකුණේදී දියබරණ හා සමග ලෝකාස්වාදරතියේ යෙදෙන්නා දැක උණපත්තෙන් පාර කීපයක් ගැසීමි. නාලොවට පලා ගියාහ. ඕ ගොස් නාගරජ්ජුරුවන්ට බොහෝ නුගුණ කියා මාගේ මිත්‍රධර්‍මය බිඳුවන්නීය. කුමක් වනු බවත් නොදනිමි. බොහෝ විකෂෙපය (ඉතා කළකිරුණු)"යි බිසවුන්ට කීහ. නාගමාණවකයෝත් බිසවුන් හා කරණ කථාව අසා "නිරපරාධවූ රජ්ජුරුවන් නසන්ට කාරණා නොවෙ"යි කියා නාගභවනයට ගොස් නාගරජ්ජුරුවන්ට එපවත් කීහ. නාරජ්ජුරුවෝත් එපවත් අසා "නිරපරාධවූ රජ්ජුරුවන් වහන්සේට මා කළේ අපරාධය"යි

රජ්ජුරුවන් වහන්සේ කරා ගොස් කළාවූ අපරාධය ක්ෂමාකරවාගන්ට උවමැනවයි රජ්ජුරුවන් කරා ගොස් “මා විසින් අපරික්ෂිතව (සොයා නොබලා) නුඹවහන්සේට අපරාධයක් කරණලද, ඒ මා කළාවූ අපරාධයට අපාද ද්විපාද චතුෂ්පාදදීන් හා කිහිඹු කුහුඹු මැසි ආදී සියල්ලන් කී යම් වචනයක් ඇත්නම් ඒ සියල්ල දැනෙයි. එසේවූ මන්ත්‍රයෙක මා තොපට උගන්වන්නේය. මේ මන්ත්‍රය කිසිකෙනෙකුන්ට නූගන්වව, යම් කෙනෙකුන් ඉගැන්වූ නම් තොපි ගිනිවැද (තමන්ම ගිනි ගනී) යව”යි රජ්ජුරුවන්ට මන්ත්‍රය උගන්වා නාරජ්ජුරුවෝ තමන්ගේ නාගභවනයට ගියාහ.

එක් දවසක් රජ්ජුරුවෝ රන්මණ්ඩපයේ මී හා කැවුම් (රණින් නිමවූ මණ්ඩපයෙහි මී පැණි හා කැවිලි) මේ නිමවන කල්හි (වළඳන කල්හි) මී බිඳුවකුත් කැවුම් පොඩියකුත් බිම වැටින, කූඹුවෙක් ඒ දැක තමාගේ සෙසු කූඹුවන්ට කියන්නේ “රජගෙයි මී කල කීපයක් හා කැවුම් සැල කීපයක් බිඳී ගියේය. තොපි වහා එකව”යි කූඹුවන් එක්කොට ඇවිදිනේය. රජ්ජුරුවෝත් කූඹුවන් කරන්නාවූ ක්‍රියාව දැක සිනා පහළ කළහ. බිසව “රජ්ජුරුවන් වහන්සේ සිනා පහළ කරන්නට කාරණ කිම්දැ?”යි කියා සැකවූහ. එක් දවසක් රජ්ජුරුවෝ ඉස් සෝධා නහා උන්නාහ. මැස්සන් තමාගේ මැස්සකුට කියන්නී “තොප හා මා ලෝකාස්වාදරතියෙහි යෙදුන මැනව”යි කීහ. මැසි කියන්නේ “රජ්ජුරුවන් වහන්සේ ඉස්සෝධා නහා සුවඳ විලවුන් ගන්නාසේක. ඉන් බිමහුනු දෙයක ඇවිත් දැවටී රජ්ජුරුවන් වහන්සේගේ පිට මධ්‍යයෙහි

ලෝකාස්වාදරතියෙහි යෙදෙම්හ"යි කීහ. රජ්ජුරුවෝත් ඒ මැසි කී කථාව අසා සිනා පහළ කළහ. බිසවු ඒ දැක සැකවූහ.

එක් දවසක් රජ්ජුරුවෝ මේ නිවමන්ට උන්නාහ. බිසවු රජ්ජුරුවන්ට බත් වැඩූහ. ඒ රන්තලියේ බතින් බත් උලක් (බත් ඇටයක්) බිම වැටින, කූඹුවෙක් ඒ බත් උල දැක "රජ්ජුරුවන්ගේ රජගෙයි බත්සැල කීපයක් බිඳී ගියේය. බත් කන්ට එව"යි කීය. රජ්ජුරුවෝ ඒකියන බසටත් සිනාසුනාහ. බිසවු එවිටත් සැකව රජ්ජුරුවන් හා එක්ව යානේ පුරුදුව සැතපුනාහ. රජ්ජුරුවන්ගේ අතින් විචාරන්නාහු "ස්වාමීනි නුඹ වහන්සේ සිනාසෙන්ට කාරණා කිම්දැ?"යි විචාළාහ. රජ්ජුරුවෝ කියන්නාහු "එඹා සොඳුර, මම දිව්‍ය මන්ත්‍රයක් දනිමි, එසේ හෙයින් කූඹුවන් මැස්සන් කී බසට සිනාසෙමි, අනිකකට සිනා සුනුයෙම් නොවෙ"යි කීහ. එවිට බිසවු "ඒ මන්ත්‍රය මා උගන්නට උවමැනවැ"යි කිහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු "තොප මන්ත්‍රය ඉගැන්වුවොත් මා ගිනි වදින්නට උවමැනවැ"යි කීහ. බිසවු කියන්නාහු "නුඹවහන්සේ ගිනිවැදහත් (ගින්නෙන් දැවී හෝ) මට මන්ත්‍රය උවමැනවැ"යි කීහ. රජ්ජුරුවෝත් "යහපතැ"යි රථයකට පැනනැගී බිසවුන් රථයකට නන්වා සේනාව පිරිවරා උයනට නික්මුණාහ.

ශක්‍රයෝ මෙපවත් දැන තමන්ගේ සුජාතා නම් අසුර කන්‍යාව ඇරගෙණ සුජාතාවන් එළු වෙසක් මවා රජ්ජුරුවන් එන ඉදිරියෙහි සිට එළුදෙන පිටට නැගෙන ආකාර දැක්විය.

රථය අදිනා අස්සු කියන්නාහු "එළුවන් ආදි මෑ ලජ්ජා නැතැයි අසා දතුම්හ. දැන් නියමයෙන් ඇසදුටුම්හ. ලෝකාස්වාදරතිය නම් රහසිගතව කළමනා දෙයය, මෙතෙක් දෙනා මැද එය ලැජ්ජා නැතිව කරන්ට කාරණා කින්දැ?"යි කීහ. එවිට එළුවා කියන්නේ "තොප අලජ්ජාව මට ලජ්ජා නැතැයි කියව්ද? රජ්ජුරුවන්ට අසුව බන්ධනාදියට පැමිණ සිටියට ලජ්ජා නැත්තාවුසේ නම් රජ්ජුරුවන් රථයේ ඉඳුවාගෙණ අඳුව, එසේවූ තොපට කවර ලජ්ජාවෙක් ඇද්දැ?"යි කීහ. එවිට අස්සු කියන්නාහු "අප වන්නා බන්ධානාදියට පැමිණ හෙයින් ලජ්ජා නැත්තම්හ. අපගේ රජ්ජුරුවන් වහන්සේට ලජ්ජා නැතැයි කියන්ට කාරණා කිම්දැ?"යි විචාළාහ. එවිට එළුවා කියන්නේ "ස්ත්‍රියක් නිසා ප්‍රාණය නසා ගිනිවදින්ට යන්නාවූ රජ්ජුරුවන්ට ලජ්ජා නැතැයි නොකියා ලජ්ජා ඇතැ"ය කීය. එවිට රජ්ජුරුවෝ එළුවාට කියන්නාහු "එසේකළ එළුවානෙනි, ඊට කළමනා කිම්දැ?"යි කීහ. එවිට එළුවා කියන්නේ "එම්බා රජ්ජුරුවෙනි, තමාගේ ප්‍රාණය ඇත්නම් සියලු වස්තුත් ඇත. බිසෝවරුන් ඇත. එක බිසෝකෙණකුන් නැතුවට සෙසු බිසෝවරුන් නැද්ද? තොපි බිසවුන්ට මන්ත්‍රය නොදෙව"යි කීහ.

එවිට රජ්ජුරුවෝ විචාරන්නාහු "එම්බා එළුවානෙනි, තොපගේ සැටිය එළුවන්ගේ සැටියක් නොවෙයි. තොපි කවුරුන්දැ?යි විචාළාහ. එවිට ශක්‍රයෝ කියන්නාහු "එම්බා රජ්ජුරුවෙනි, තොපට වන්නාවූ මරණ භයෙක් දැක භය සංසිඳුවන්ට ආවාවූ ශක්‍රදේවේන්ද්‍රයෙමි" කීහ. එවිට රජ්ජුරුවෝ

කියන්නාහු "ශක්‍රයෙනි, මම බිසවුන්ට මන්ත්‍රය දෙමි කියා කීමි, මන්ත්‍රය නුදුන් කළ බවට විරුද්ධ වෙයි" කීහ. එවිට ශක්‍රයෝ කියන්නාහු "එම්බා රජ්ජුරුවෙනි, බිසවුන්ට පාර කීපයක් ගසන්න තුමූම මට මන්ත්‍රය එපා"යි කියත්. "ඒ නියාවට කරව"යි රජ්ජුරුවන්ට උපාය කියා ශක්‍රයෝ දිව්‍යාලෝකයට ගියහ. රජ්ජුරුවෝත් රථය පදවා උයනට ගොස් රථයෙන් බැස දරසෑය ලග සිට බිසවුන්ට කියන්නාහු "තොපට මන්ත්‍රය දී මම ගිනි වදිමි, තොපට මන්ත්‍රය උවමැනව"යි කීහ. බිසවු කියන්නාහු "ගිනිවැදවත් මට මන්ත්‍රය දුන මැනවැ"යි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු "එසේවිනම් මන්ත්‍රය උගන්නා කල මන්ත්‍රයට කළමනා සත්කාර ඇත. මේ මන්ත්‍රය උගන්නා කල සැමිටියෙන් (ගැට සහිත කෝටුවක්) පාර කීපයක් ගසන්ට උවමැනවැ"යි කියා "මුරගාන්ටත් බැරිය"යි කීහ. බිසවු මන්ත්‍රාසාවෙන් "යහපතැ"යි කීහ.

රජ්ජුරුවෝත් කටු සැමිටි ගෙන්වා ලග සිටි රාජ පුරුෂයන් ලවා ගෙඩිගස්වන්ට වන්හ. බිසවු පාර කීපයක් ඉවසා "මට මන්ත්‍රය එපා"යි කීහ. එවිට රජ්ජුරුවෝ "මා ගිනිවැදත් මන්ත්‍රය උවමැනවැයි කීයේය"යි පිට තලා ගෙඩි දෙවා තමන් ගෙටම ගියහයි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට මේ 'කරපත්ත ජාතකය' නිමවා වදාළසේක.
චතුස්සත්‍යාවසානයෙහි උකටලී භික්ෂූන් වහන්සේ සෝවාන් වූසේක.

"එසමයෙහි බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවෝ නම් මේ උකටලී භික්ෂුහුය. බිසව් නම් මෙසමයෙහි පුරාණ දූතිකාවෝය. රථය පැද්දවූ අශ්වයා නම් ශාරිපුත්‍රස්ථවිරය, ශක්‍රව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

## 375. සුව් ජාතකය

තවද ආකාශයසේ අනන්තවූ ගුණ ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ප්‍රඥා පාරමිතාව අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

මෙහි වර්තමාන කථාව උම්මග්ග ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය. මෙහි වනාහී සර්වඥයන් වහන්සේ "පෙරත් තථාගතයෝ මහ නුවනැත්තෝ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ දුක්ඛිතවූ කඹුරුව (දුප්පත් කම්හල්කරුවෙකු) ඉපිද වැඩිවිය පැමිණ පිටිසර ගමෙක වාසය කරණසේක.

ඒ ගම නුදුරු තැනක ගමෙක කඹුරු දසෙක් වාසය කරන්නාහ. කඹුරු දසට නායකවූ කඹුරෙක් ඇත, ඒ කඹුරු විහයවිය (නිර්භීත), රාජවල්ලභය, උහුගේ විශිෂ්ටවූ රූ ඇති දුවක් ඇත්තීය. ඒ කඹුරුගම ඇති ස්ත්‍රියන්ගෙන් වැඩිතරන්

රුවින් යුක්තය. නොයෙක් ගම්වලින් කැති පොරෝ නොයෙක් යකඩ කරවන්ට ආ මනුෂ්‍යයෝ ඒ කුඹුරු දුවගේ රුව දැක තමතමන්ගේ ස්ථානවල ඉඳ රූප වර්ණනා කරන්නාහ. බෝධිසත්වයෝ ඇගේ රුව අසා තෘෂ්ණාවසඟව (ආසාවෙන් යුක්තව) ඈ දැක තමාගේ ගෙට ගෙණෙන්ට උවමැනවයි සිතා යහපත්ව ඉදිකටුවක් ඉදිකොට විද ඒ ඉදිකටුව ලන නියායෙන් කොපු සතක් ඉදිකොට කොපුවෙන් කොපුව ඇතුලේලා ඉදිකටුවත් කොපුවේ ලා ඇරගෙණ කඹුරන් දසක් ඉදිනා ගමට ගොස් “කඹුරන්ට නායක තැනැත්තන්ගේ දොර කොයිදැ?”යි විචාරා උන්ගේ ගේ දොර මිදුලේ සිට කියන්නාහු “සියුම් මූනක් ඇති යසුනු (යකඩ කුඩු) ලා උලා මටසිලුටුවූ ඍජුවූ යහපත්වූ ඉදිකටුවක් ඇත. ඒ ගනුව”යි කිය කියා සිටියාහ.

නායක කඹුරු බත්කාලා වැදහෝත්තේය. ඌගේ දුව තමාගේ පියාට තල්වැටක් සල සලා (තල් අත්තකින් පවන් ගසමින්) සිටියහ. බෝධිසත්වයෝ “ඉදිකටු ඇරගණුව”යි කියන බස අසමින්ම ඇගේ හිස සිය ගණන් පැන්කල වත්කරන්නාමෙන් චිත්ත සනොතාෂව (සිත පිනාගොස්) “මා උන් බලන්ට උවමැනවැ”යි සිතා තල්වැට බිමතබා බෝධිසත්වයන් කථාව කියන තැනට ගොස් දැක කියන්නේ “මෙකියන මානවකය, මේ ගම කඹුරන් දසක් වාසයකරණ ගමවුව, මේ ගමතිබා කැති පොරෝ ආදිවූ දෙය හා බිලිකටු ඉදිකටු ආදිවූ දෙය හා විශේෂවූ ආයුධ හා ඇත, එසේ වූ තැන තොප ඉදිකටු ඇරගෙණ පෙරවරුවක් ඇවිද්දත්

ඇරගන්නේ නැත, මෙතන ඇති සියලු යකඩ ඒ ඒ තෙන ගෙණගොස් විකුණන්නාහ. එසේ හෙයින් තොපගේ ඉදිකටුවත් ඇරගෙණ පිටිසරගමකදී විකුණාව''යි කිව. බෝධිසත්වයෝ එවිට කියන්නාහු ''එම්බල කුමාරිකාව, මාගේ කර්මාන්තයෙහි විශේෂයත්, මා ගත් දුකෙහි (වෙහෙස) විචරත් තොපගේ පියාණන්ට දැනෙයි, තොපගේ පියාණෝ මා කළ කර්මාන්ත දුටුවුනම් තොපත් මට පාවාදී තමන්ගේ ගෙයි සියලු සම්පතුත් මට දෙන්නේ වේදැ''යි කීහ. මේ කථාව කියන නියාව ඒ කඹුරන්ට නායක තැනැත්තේ අසා තමාගේ දුව ගෙන්නා විචාරන්නාහු ''තොප කවුරුන්ලාද කථාකරන්නේය?''යි විචාළ කල්හි ඒ කුමාරිකා කියන්නී ''එක්තරා මානවකයෙක් ඉදිකටුවක් ඇරගෙණ ඉදිකටුව ගනුවයි කිය කියා සිටින්නේ''යයි කිව. ඒ අසා කඹුරු නායක තැනැත්තේ ''උන් මෙතනට කැඳව''යි කියා කීයේය.

එවිට බෝධිසත්වයෝ එතනට අවුත් කඹුරු නායකයානන් වැඳලා සිටියාහ. කඹුරු නායක ''තොපි කවුදැ?''යි විචාළ කල්හි ''මම අසවල්ගම කඹුරානන්ගේ පුත කිමි''යි කීයේය. එවිට කඹුරු නායක ''තොපි කුමට අවුදැ?''යි විචාළාහ. බෝධිසත්වයෝ කියන්නාහු ''ඉදිකටුවක් ඉදිකොට ලීමි. ඒ ඉදිකටුව ඇරගෙණ පානනියා (පෙන්වන බව) ආමි'' කීයේය.

කඹුරු නායක ඒ අසා කියන්නේ ''තෝ ඉදිකළ ඉදිකටුව ගෙණව''යි කී කල්හි බෝධිසත්වයෝ ඉදිකටුව ඇරගෙණ මේ ගම ඇති කඹුරන් එක්වූකළ පාමි. තනිව නොපාමි'' කී කල්හි

ගම ඇති කඹුරන් එකසී එක්වූ ගමනේ කඹුරු නායකයානන් අතට දුන්හ. කඹුරු නායකයානෝ ඉදිකටුව බලා “මේද තොපි ඉදිකළ ඉදිකටුවදැ?”යි විචාළාහ. “එසේය තෙල මතුපිට කොපුවය, ඉදිකටුව ඇතුළේය”යි කීහ. කඹුරු නායකයා කොපුව අයන්ට උත්සාහකොට ඉදිකටුව අතට කොපුව අයාගත නුහුනුවාහ (කොපුව ඇරගැනීමට නොහැකි විය).

බෝධිසත්වයෝ කොපුවෙන් කොපුව අයා කොපු සත කඹුරු නායකයානන් ඉදිරියේ තබා ඉදිකටුව බෝධිසත්වයෝ කඹුරු නායකයානන් අතට දුන්හ. එතනට එක්වූ දසක් කඹුරෝ හා කඹුරුනායකයන් හා පිළි හිස සිසාරා (රෙදි කඩ හිස වටේ කරකවා) අසුරුසන්දි (සිවුරුහම් කිරීම) බොහෝ සතුටුව “මේ ඉදිකටුයේ තරය කිම්දැ?”යි විචාළාහ.

බෝධිසත්වයෝ ඉදිකටුව තරය පානා නියායෙන් (ශක්තිය පෙන්වීමට) කිණිහිරක් ගෙන්වා ඒ කිණිහිර මුදුනෙහි ඉදිකටුව කුලකින් (කුලු ගෙඩියකින්) ගැසූ ගමනේ කිණිහිර බැඳගෙණ පල්ලෙ තිබූ මඩෙහි පෙණෙයි, ඉල්පෙමින් තිබූයේය.

එවිට කඹුරන් හා කඹුරු නායකයානෝ පළමු නියාවට දියුනක්ම චිත්ත සන්තොෂව පිළි ඉස සිසාරා අසුරුසන්දි සතුටුව කඹුරු නායකයානෝ තමන් විශේෂ රූ ඇත්තාවූ දුවණියන් පාවාදී තමන්ගේ බොහෝ සම්පතුත් දී බෝධිසත්වයන්ට පාවා දුන්හ. කඹුරු නායකයානෝ නොබෝ

කලකින් මළහ. බෝධිසත්වයෝ ඒ කඹුරු දහසට නායකවූහයි වදාරා මේ ‘සුචි ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි කඹුරු දූ නම් යසෝධරා ස්ථවිරීය. එසමයෙහි කඹුරුව උපන්නෙම් බුදුවූ මම්මය”යි වදාළ සේක.

## 376. තුණ්ඩිල ජාතකය

තවද මහපොළොවසේ විපුල වූ (මහත් වූ) ගුණ ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ වේළුවනාරාමයහි වැඩ වසන සමයෙහි මරණභීරුක (මරණයට බියවන්නා වූ) භික්ෂු කෙණකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්?

එක් භික්ෂුකෙණෙකුන් වහන්සේ රාත්‍රිස්ථාන (රෑ වසන) දිවාස්ථාන (දවල් වසන) චංක්‍රමණස්ථානයට (සක්මන් මලුව) ගියතෙන පරඬලා පතක්වත් කෝටුවක්වත් පක්ෂිකෙණෙකුන් අඬාපුවක් වත් අසා මරණභයින් භීරුකව වාසය කරණ කල්හි මේ කථාව දම්සභාමණ්ඩපයේ රැස්වූ මාළුවරුන් වහන්සේ කිය කියා වැඩඋන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා “මහණෙනි, මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?”යි විචාරා වදාරා එපවත් අසා සර්වඥයන් වහන්සේ “මහණෙනි, මේ භික්ෂූහු දැන් මතු නොවෙයි, පළමුත් මරණභයින් යුක්තව විසුවෝ වේදැ”යි වදාරා “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්ත්වයෝ එක් ඊරියකගේ කුස පිළිසිඳගත් කල්හි නොබෝකලනින් වැදූහ. දෙවැනිව කුඩා ඌරුපැටියෙකුත් වැදූහ. ඌරු පැටියන් දෙන්නා තුරුල්ලේ ලාගන ඊරිය වැදෙත් තැනට මැල්ලක් තමාගේ කපුසේනට ගොසින් කපු කඩාගෙන එන තැනැත්තී ඊරිය වැදෙත්තෙනට ආව, ඊරිය තමා මරති යන භයින් පැටියන් දෙන්නා වැදෙත්තද්දි පළාගියහ. මැලි ඌරුපැටියන් දෙන්නාගෙණ මහපැටියාට මහාතුණ්ඩිලයෝය, කුඩා පැටියාට කුඩාතුණ්ඩිලයෝයයි නම් තිබා ඌරු පැටියන් දෙන්නා පුත්‍ර ප්‍රේමයෙන් වඩන්නේය.

එසමයෙහි රා සොඬුන් එක් දවසක් රා බී මාංශ නොලැබ "අසවල් මැල්ලගේ ගෙයි ඌරෝ ඇත, උන් අතින් ඇරගෙණ මරාකම්මැ"යි කියා අවුත් කියන්නාහ "මැල්ල, තොපගේ ගෙයි වඩන ඌරෝ ඇත, අපගෙන් මිල ඇරගෙණ උන්දෙව"යි කීහ. මැලි කියන්නී "මාගේ දරුවන් දීපියා දමා සම්පත් ලබන්නේය"යි කියා නොගිවිස්සා රා සොඬු මැල්ල රා පොවා මත්කොට කියන්නාහු "අපට ඌරන් දෙව්දැ"යි විචාළේය. මැලි රා බී මත්ව "යාපත දෙමි, ඉනුත් මාගේ වැඩිමහළු තුණ්ඩිලයන් නොදෙමි, කුඩා තුණ්ඩිලයන් දෙමි" කීහ. "යහපතැ"යි මැලි "පුත් චුල්ල (කුඩා) තුණ්ඩිලයෙනි, මැත එව"යි අඬගා එැහ. බෝධිසත්ත්වයෝ සිතන්නාහු "මාගේ මෑණියෝ මෙතෙක් දවසක් පළමුවෙන් මට අඬගාතොත් චිනා චුල්ල තුණ්ඩිල්ලයන් අඬනොගාතිය. අද යම්සේ මෑණියන්ට

හයෙක් ඇතමැනවැ''යි සිතා ''මල තුණ්ඩිලයෙනි, තොපගේ මෑණියෝ තොපට අඬගාතියි ඔබට යව''යි කිව. ''යහපතැ''යි වුල්ල තුණ්ඩිලයෝ මෑණියන් සිටිනා තැනට ගියකල රා සොඬුන් වටකොටගෙන සිටි නියාව දැක හයින් ත්‍රස්තව (බයෙන් තැති ගෙන) වෙවුල වෙවුලා බෑනන් කරාලා ගියහ.

මහා තුණ්ඩිලයෝ ''කිම්දැ?''යි විචාළ කල ''මෑණායන් හා රා සොඬු වටකොට ගෙණ සිටි නියාවත් බත් ඔරු තුබූ නියාවත් දැක හයින් ත්‍රස්තව දිව ආමි'' කීහ. බෝධිසත්‍වයෝ මළනුවන්ට කියන්නාහු ''මල, ඌරන් ගෝනන් මුවන් ආදිවූ සිව්පාවන් වඩන්නේ අනික් නිසා නොවෙයි. යමෙක් වේලේ මරන්ටමය. එසේ පැමිණ මරණට භීරුකවීමෙන් කම්කිම්දැ?''යි කියන්නාහු අවවාද බරණැස් නුවර මුලුල්ලටම සැලව ගිය හෙයින් රජ්ජුරුවන් හා නුවරවාසීන් එක්ව් බෝධිසත්‍වයන් උන්නාවූ බැද්ද වට කොට ගත්හ. බෝධිසත්‍වයෝ මලනුවන්ට අවවාද කියන්නාහු ''මලනුවෙනි, යහපත්ව පෑදී තිබෙන පැනෙන් ඉස්සෝද නහා ඇඟ කුණු ඇරපියව, ශරීරයේ නොයෙක් සුගන්‍ධයන් ගා ගනුව''යි අවවාද කීහ. එවිට කුඩා තුණ්ඩිලයෝ කියන්නාහු ''අපගේ ඌරන්ගෙන් කුණු අරවා වාසය කළ කෙණෙක් ඇද්ද? යහපත් පැණකින් ඉස්සෝද නෑ කෙනෙක් ඇද්ද? ශරීරයෙහි යහපත් සුගන්‍ධය ගෑ කෙණෙකුන් නැතිව ඉන්දදී බෑණන්වහන්ස, මේ කුමට කියන කාරණයෙක්දැ?''යි විචාළාහ.

බෝධිසත්වයෝ එවිට “මා කීයේ විලට බැස නාන්ට හා ශරීරයේ කුණු හැර නාන්ට හා යාපත් සුගන්ධ ගල්වන්ට නොවෙයි. අකුසල් නැමති ශරීර මලය පහකොට (අකුසල් නැමති මල පහකොට) කුසල් නැමති මනාවූ තොටට බැස නහා සියලු දවස් ශරීරය නොහැර පවත්නාවූ සිල් නැමති සුගන්ධය ශරීරයේ ගල්වන්ට මා කීයේය”යි කියා “මලනුවෙනි, යම් කෙණෙකුන් අකුසලයක් කෙරෙත් නම් ඊට සතුටුවීමෙන් දුක් බොහෝ දෙලොවටම පැමිණෙන්නේය. යම් කෙණෙකුන් කුසලයක් කෙරෙත් නම් ඊට සතුටු වීමෙන් දෙලොවම සැප එලවන්නේය. එසේ හෙයින් අකුසලය කරණ කෙණෙකුන්ටවත් සිතන කෙණෙකුන්ටවත් සතුටුවීමෙන් මරණාසන්නයෙහිත් සෙසු වේලෙහිත් මහාභය පැමිණෙන්නේය. එසේහෙයින් එසේවූ අකුසලය හැර ශීල නමැති සුගන්ධය ශරීරයේ ගල්වා ගනුව”යි කීය.

බෝධිසත්වයන් බුද්ධවිලාසයෙන් (බුදුවරයෙකුගේ ආකාරයෙන්) ඉඳ කියන්නාවූ අවවාද රජ්ජුරුවෝ අසා මහා සමාධිව බෝධිසත්වයන් යහපත් ඉණකඩකුත් (රෙද්දක්) අඳවා මාණික්‍යාභරණයකුත් පළඳවා බෝධිසත්වයන් වැඩූ මෑල්ලටත් බොහෝ සම්පත් දී බෝධිසත්වයන් හා මලණුවන් ද බරණැස් නුවරට ගෙණගොස් රජගෙයි ඉන්නට සලස්වා සියලු අධිකරණ ආදීවූ යුක්ති අයුක්ති බෝධිසත්වයන් විචාරා මැදහත්ව නිශ්චයකොට සියලු මනුෂ්‍යයන්ට පන්සිල් අටසිල් ආදීවූ දනාද්ධ්‍යාසයෙහි (දන් දීමේ අදහස) පිහිටුවා අපායට යානොදී සුගතියට පමුණවන්නාහ. බොහෝ කලකින් බරණැස්

රජ්ජුරුවෝ මළහ. බෝධිසත්වයෝ රජ්ජුරුවන්ට කළමනා ආදාහණ කෘත්‍යකොට නිමවා ඉක්බිති අධිකරණ ශාස්ත්‍රය බෝධිසත්වයෝ පොත් බලා ලියවා "මේ නියාවට අධිකරණ ඉදිරියේ විචාරව"යි කියා නුවරවාසීන් එක්කරවා බොහෝ මනුෂ්‍යයන්ට අවවාද කියා බෝධිසත්වයන් හා මලණුවෝ බොහෝ මනුෂ්‍යයන් අඬ අඬා සිටියදී තමන්ගේ පළමු විසූ වනාන්තරයට ගියහ. එද උගරුතුඩින් වදාළ බණ සැටදහසක් අවුරුදු පැවැත්තේය"යි වදාරා මේ 'තුඩිල ජාතකය' නිමවා වදාළසේක. මේ දෙශනාවසානයෙහි මරණ භීරුක භික්ෂූන් වහන්සේ සෝවාන් වූ සේක.

"එසමයෙහි  බරණැස් රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරය, චුල්ල තුණ්ඩිලයෝ නම් මරණ භීරුක භික්ෂුහුය. මහා තුණ්ඩිලව උපන්නේම් බුදුවූ මම්ම වේදැ"යි වදාළසේක.

## 377. ස්වර්ණකක්ටක ජාතකය

තවද බැලු බැලුවන් ඇස් නිමවන (ඇස් පිනවන) මනහර රූ ඇති සර්‍වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ආනන්ද ස්වාමීන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

එක් දවසක් දම්සභාවේ රැස්වූ භික්ෂූන් වහන්සේ "ආනන්ද ස්ථවිරයෝ සර්‍වඥයන් වහන්සේ මරන්ට එන්නාවූ ධනපාලයා ඉදිරියේ සිට ජීවිත පරිත්‍යාග කළෝ වේදැ?"යි කිය කියා වැඩ උන් ප්‍රස්ථාවට (අවස්ථාවට) සර්‍වඥයන් වහන්සේ වැඩ

වදාරා "මහණෙනි, මා එන්නාට පූර්‍ව භාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා ඒ පවත් අසා "දැන් මතු නොවෙයි මහණෙනි, පෙරත් ජීවිත පරිත්‍යාග කළෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්?

රජගහ නුවර සාලින්දිය නම් ගම බෝධිසත්‍වයෝ බ්‍රහ්මණ කුලයක ඉපද වාසය කරන්නාහු දසක් කිරියෙහි (කිරිය දහසක බිම් ප්‍රමාණයක ගොවි බිම) ඇවිද ගොයම් බලන්නා හා ගොයම් බලා ඒ කුඹුරු අස පොකුණෙහි ඇස මූන සෝදන්නා හා ඒ පොකුණෙහි රන්වන් කකුළුවෙක් වාසය කරන්නේය.

බොධිසත්‍වයෝ කකුළුවා ඉණලාගෙණ කුඹුර වට ඇවිද ගෙට යන කල පොකුණට ඇර යන්නාහ. ඒ කිරියෙහි එක් තල්ගසක් උඩ වාසය කරන්නාවූ එක් කැවිඩියක් තමාගේ කවුඩාට කියන්නී "මේ බ්‍රහ්මණයාගේ පස්පෑදිස්නාවූ ඇස් සගල මට උපුටා දෙව, ඒ නොලදින් නම් මාගේ ජීවිතය නොලබමි" කිව. එවිට කපුටුවා කියන්නේ "නොමළ තැනැත්තවුගේ ඇස්දෙක කෙසේ උපුටා දෙම්දැ"යි කියාත් නො වළකින හෙයින් (බේරෙන්න බැරි තැන) "ඒ තල්ගස සමීපයෙහි තුඹුසෙක වාසය කරන්නාවූ නයෙකු ඒ දෙළ පසිඳ මැනවැ"යි කිව. "යහපතැ"යි ගිවිස පසු බොධිසත්‍වයෝ කෙත්වත් බලන්ට යන්නාහු පොකුණට බැස ඇස මූණ සෝධා

රන්වන් කකුළුවානන් උත්තර සාටකයෙහි (උතුරු සළුවෙහි) ලා එන්නාවූ බෝධිසත්ත්වයන් සර්පයා තණ අස්සේ සැඟවී බලා වැදහෙව පාදපිට දෂ්ටකොට තමා වැදෙත්තාවූ තුඹසට පළා ගියේය. බෝධිසත්ත්වයෝ විෂ මෑච්ඡාවෙන් (සර්ප විෂ වැදී සිහි නැතිව) වැටී උන්හ. බොධිසත්ත්වයෝ වැටීමත් කකුළුවා බිමපිට පිනීමත් (බිමට වැටීම) කපුටුවා බෝධිසත්ත්වයන්ගේ ඇස්දෙක උපුටන්ට ඇවිත් ලයමත්තෙහි ඉඳිමත් එක්ෂණයෙහිම (එකම අවස්ථාවක සිදුවීම) විය. කකුළුවානෝ මේ කාරණය දැක "මුන් නිසා මාගේ මිත්‍රයානන්ට වූ අලාභයකැ"යි සිතා කපුටුවාගේ බොටුව නලින් අල්වා ගෙණ තරකොට මැඩළූහ. එවිට කපුටුවා සර්පයාට කියන්නේ "රන්වන්වූ ශරීරයක් ඇති, ශරීරය පිටතින් නික්ම තිබෙන්නාවූ ඇස් ඇති නල දෙකක් ඇති ඇටම සම්කොට (කටුව සම වශයෙන් ඇති) ඇත්තාවු ලොම් හට නො ගත්තාවූ කකුළුවෙක් මාගේ බොටුව කතුරකින් මඩිනාක්මෙන් මඩිනේය. මා මරහුට ඇරපියා (මාව මැරෙන්නට හැර) කොයි ගියාද? වහා අවුත් මා ගලවා ගණුව"යි සර්පයාට අඬගා කීහ.

එවිට සර්ප රාජයා තමාගේ යහළුවා කී බස් අසා පෙණය මහත්කොට සුස්මමින් තමාගේ යහළුවා ගාවට ආය. එවිට කකුළුවා සර්පයාත් අඬුවෙන් ඩැගත. එවිට සර්ප රාජයා කියන්නේ "එම්බා කකුළුවානෙනි, තොපට සර්පයන්ගේ මාංශයෙනුත් කම් නැත, කළමනා කවර කාරණයක් නිසා අප දෙන්නා අඬුවෙන් ඩැගතුදැ"යි විචාළේය. එවිට කකුළුවා කියන්නේ "එම්බල, මේ පුරුෂයා මාගේ ඉෂ්ට මිත්‍රයාය (ඉටු

මිතුරා), එසේහෙයින් උඹට පැමිණි මරණය මට පැමිණියාහාත් සමානය. ඒ කාරණය නිසා කකුළුවන්ගේ මාංශය නම් ඉතා කැලල්ව (දියාරු ගතියෙන්) මොලොක්ව තිබෙන්නේය. ඒ මාංශය මනුෂ්‍යයෝත් කැමති වන්නාහ. කපුටුවෝත් බිඳකති. මුන් නැතිවිට මටත් බොහෝ උපද්‍රා වන්නේය. එසේහෙයින් මාගේ යාළුවූ බ්‍රහ්මණයානන්ගේ විෂබාන්නා උන් නිර්ව්‍යාධිකරණ නිසා (විෂ බස්වා නිරෝගි කිරීම සඳහා) තොප දෙන්නා අඬුවෙන් ඇල්වීමි" කීහ. එවිට සර්පයා "උපායක් කියා අපි දෙන්නාම ගැලවී පළායම්හ"යි සිතා කියන්නේ "එම්බා කකුළුවානෙනි, අපි දෙන්නාම ඇර පියන්නා විෂයත් උරාගෙණ (දෙදෙනාම නිදහස් කළොත් විෂ උරා යන බව) පලා යම්ම, අපි දෙන්නාම ඇරපියව"යි කීහ.

එවිට කකුළුවා සිතන්නේ "මා වඤ්චාකොටලා දෙන්නාම ගැළවී පළායන්ට උපායක් සිතූ නියාවේද? එසේ නොහරම්"යි සිතා කියන්නේ "කපුටුවා තමාම නොහරිමි. තොපත් විෂය ඇරගන්නා විචරට (පමණට) මඳක් ලිහිල් කෙරෙමි"යි. "මාගේ යහළු බ්‍රාහ්මණයානන් නිර්ව්‍යාධි කරවා (සුවපත් කර) සිටිවිට තොප දෙන්නා අරමි" කියා කවුඩාත් තරකොට ඩෑගෙණ සර්පයා මඳක් ලිහිල්කොට විෂය උරාගෙණ බෝධිසත්වයන් නිර්ව්‍යාධිව නැගී සිටි කල්හි කකුළුවානෝ සිතන්නාහු "මේ දුර්ජනයන් දෙන්නා ඇරපීන්නම් මතු මාගේ යාළුවාට උපද්‍රව වන්නේ වේදැ"යි සිතා කතුරකින් ඇඹුල දණ්ඩ කපන්නාක්මෙන් කපුටුවාගේ ඉසටියත් නයාගේ ඉසටියත් පොළු ගසා එළුව (ගෙල සිඳීම).

බෝධිසත්ත්වයෝත් මළාවූ නාගයාගේ කඳ ලීයක අවුලා තුඹසෙහි ලා කකුළුවානන් එකතුරු පටලාගෙණ පොකුණට ඇර ඉස්සෝධා නහා ගෙට ගියහ. කකුළුවානන් හා බෝධිසත්ත්වයන් හා එවක්පටන් මිත්‍ර සන්ථවය (මිතුරුකම) තරවිය. කැව්ඩිත් එතනින් ඔබ්බට ගියහ''යි වදාරා මේ 'සවණ්කක්කටක ජාතකය' නිමවා වදාළසේක.

''එසමයෙහි කැව්ඩි නම් විසද්විමානවිකාය. කවුඩා නම් දේවදත්ත ස්ථවිරය. නයා නම් වසවර්ති මාරයයා. කකුළුවා නම් සුවාසුදහසක් (අසුහාරදහක්) ධර්මස්කන්ධයට භාණ්ඩාගාරික වූ ආනන්ද ස්ථවිරයෝය. බ්‍රාහ්මණව උපන්නෙම් බුදුවූ මම්ම ය''යි වදාල සේක.

# 378. මය්හ ජාතකය

තවද චාමිකර ස්වර්ණයට (පෙරාපු රත්තරන්) බඳුවූ ශරීර ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ආගන්තුක සිටානකෙනෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

ආගන්තුක එක් සිටානකෙණෙකුන්ට බොහෝ සම්පත් ඇත්තේය. මසුරු වූහ. අනුන්ට දහුයක් (නූල්පොටක් පමණවත්) විවර නොදෙන්නාහ. ලෝභීය. ඒ සිටානෝ කල් යාමකින් එක්තරා ව්‍යාධියක් ඇතිව නටහ. ඒ සිටානන්ට පසු උන්ගේ සම්පත් රජගෙට අදින්නවුන්ට සත්රෑ සත්දවාලක්

ගියේය. රජ්ජුරුවෝ ඒ පරක්කු වෙන් බුදුන් කරා නොගොස් සත්දවසක් ඉකුත්වූ කල්හි සර්‍වඥයන් වහන්සේ කරා ගියහ.

සර්‍වඥයන් වහන්සේ "මහරජ, මෙතෙක් දවස් පමාවුනැ?"යි විචාරා වදාළසේක. "ස්වාමීනි, අපගේ ආගන්තුක සිටානෝ නටහ. උන්ගේ සම්පත් අපගේ ගෙට අදිනවුන්ට සත්දවසක් ගියේය. එහෙයින් අවසර මඳ හෙයින් නොආමි" කීහ. රජ්ජුරුවෝ කියන්නාහු "ස්වාමීනි, මේ සිටානන් මෙතෙක් සම්පත් ඇතිව දන් නොදෙන්ට කාරණා කිම්දැ? මෙතෙක් සම්පත් ඇති වන්ට කාරණා කිම්දැ?"යි කීහ. සර්‍වඥයන් වහන්සේ වදාරණසේක් "මහරජ, මේ සිටානෝ එක් ජාතියෙක සිටුව ඉපිද තරගසිඛී නම් පසේ බුදුන් වහන්සේ වීථියෙහි සිඟා වඩිනා දැක සිටානෝ උන්වහන්සේ ගෙට කැඳවාගෙණ ගොස් ගෙය ඇත්තන්ට කියා රජගෙට ගොස් එනකලට පසේ බුදුන් වහන්සේ දන් පිළිගෙණ සිටානන් ඉදිරියට වැඩිසේක".

සිටානෝ පසේබුදුන් වහන්සේ දැක "දන් ලද්දේ ඇද්දැ?"යි විචාරා "එසේය මහසිටානෙනි, දන් ලදුම්හ"යි කීසේක. සිටානෝ පාත්‍රය බලා "මේ බත් මුන් වහන්සේට දුන්නේය, මාගෙන් එක් මනුෂ්‍යයෙක් මේ බත් කෑයේ නම් මට බොහෝ මෙහෙවර කරන්නේ වේදැ, මුන් වහන්සේට මේ දීමෙන් ප්‍රයෝජන කින්දැ?"යි සිතූහ. දන්දුන් විපාකයෙන් සම්පත් ලද්දාහ. අන්තිම අවස්ථාවෙහි සිතිවිල්ල නපුරුව ගියහෙයින් සම්පතෙහි ප්‍රයෝජන විඳින්ටත් නොලද්දේයයි වදාළසේක. එවිට රජ්ජුරුවෝ කියන්නාහු "ඒ වන්නා එසේමය.

ඒ සිටානන්ට දරුකෙණෙකුත් ඇතිනුවුයේ මක්නිසාද?" විචාළහ. "දරුකෙණෙකුන් ඇතිනුවූයේත් උන් නිසාමය"යි "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වාදළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ ගිහිගෙයහැර තාපසවූසේක. මලනුවන්දෑ බෝධිසත්‍වයන් වහන්සේගේ පුතනුවන් වඩා පෝෂ්‍ය කරන්නාහ. නොබෝ කලකින් උත්තමයන්ටත් දරුකෙණෙකුන් උපන්නාහ. උන් වැඩිවිය පැමිණී කල්හි "මාගේ බෑනන් වහන්සේගේ පුතනුවන්ට කොටසකුත් මාගේ දරුවන්ට කොටසකුත් මාගේ සම්පත් දෙන්ට උවමැනවයි එසේහෙයින් දැම්ම මරාපුවොත් යහපතැ"යි සිතා තමන්ගේ බෑනන්ගේ පුතනුවන් කැන්දාගෙණ නාන්ට යම්හයි පොකුණට ගොස් බෝධිසත්‍වයන් වහන්සේගේ පුතනුවන් දියෙහි ඔබා මරූහ. බෑදෑනියෝ (නෑනා) විචාරන්නාහු "ඇයි ස්වාමීනි, මාගේ දරුවෝ කොයිදැ?"යි විචාරන්නා "නාන්ට බට ගමනේ දිය බී මළහ"යි කියන්නා අඬා වැලප උන්නාහ.

බෝධිසත්‍වයෝ "මාගේ දානය පවතී දේ හෝ"යි දවසින් බලා දන්හළුත් විදා (දාන ශාලා ඉවත්කර) මෙසේවූ අකම්නයකුත් සැලසුනු නියාව දිවසින් දැක තාපසයන් වහන්සේ එතනට අවුත් පනවනලද ආසනයෙහි වැඩඋන්සේක. එවිට සිටානෝ තාපසයන් වැඳ එකත්පස්ව උන්නාහ. එවිට

තාපසයන් වහන්සේ "මාගේ පුතනුවෝ කොයිදැ?"යි විචාරාවදාළසේක.

සිටානෝ කියන්නාහු "දියකෙළින්ටලා පොකුණට ගිය ගමනේ දියෙහි මළහ"යි කීහ. එවිට තාපසයෝ කියන්නාහු "තොප එසේ කියන්ට කාරණා කිම්ද? තොපගේ සම්පත් දෙකොටසක්ව බෙදෙම්දැයි තොපි නොවේද? දියෙහි ඔබා මැරුවාය"යි කියා "එඹා මේ සම්පත් නම් එක්කෙණෙකුන් සන්තක දෙයක් නොවෙයි. හිමාලය වනයෙහි මහිස නම් පක්‍ෂියෙක් ගසින් ගසට පැණ මේ මාගේය, මේත් මාගේයයි කියති. උන් පසුපස්සෙහි පක්‍ෂීහු ඵල අනුභව කරන්නාහ. තොපගේ සිතිවිල්ලෙන් ඒ පක්‍ෂීන් මෙන් මෙසේ අස්ථිර සම්පතකට මෙසේ වූ ප්‍රාණ වධයක් (ප්‍රාණ ඝාතයක්) නොකළෝවේදැ"යි, මලනුවන්ට මතු මෙසේවූ වධයක් නොකරවයි අවවාද කියා හිමාලය වනයට ගියාහ.

"එසමයෙහි සිටානෝ නම් මේ සිටානෝය. සිටානන්ගේ බෑනෝ නම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

## 379. ධජවිහෙඨ ජාතකය

තවද දයාවට භාජනවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ලෝකාර්ත්‍ථචර්‍ය්‍යාව (ලොවට වැඩ සැලසීම) අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ කෙසේද යත්?

මෙහි වර්තමාන කථාව කණ්හ ජාතකයෙහි විස්තර වශයෙන් පෙනෙන්නේය. මෙහි වනාහි ජාතක කථාව,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්ත්වයෝ ශක්‍රදේවේන්ද්‍රව උපන්නාහ. එසමයෙහි විද්‍යාධරයෙක් තමාගේ මන්ත්‍රානුභාවයෙන් (මන්ත්‍ර බලයෙන්) රජගෙට වැද බිසවුන් හා ලෝකාස්වාද රතියෙහි (කාම සේවනයෙහි) යෙදී වාසය කරන්නේය. බිසව් රජ්ජුරුවන්ට කියන්නාහු "ස්වාමීනි, රාත්‍රියෙහි එක් මිනිසෙක් මා සමීපයට අවුත් ලෝකාස්වාද රතියෙන් වාසයකරන්නේය"යි කීහ.

රජ්ජුරුවෝ "ඒ පුරුෂයාට සංඥාවක් කළ ඇකිද්ද?"යි විචාළාහ. "යහපත සංඥාවක් කෙරෙමි" කියා විද්‍යාධරයා රාත්‍රියේ ආගමනේ ලෝකාස්වාද රතියෙහි යෙදී උදෑසන යන ගමනේ බිසව් ඉඟුලෝ අතගාලා (සායමක අත පොවා පිටේ ලකුණු තබා) විද්‍යාධරයා පිට අත එබූහ.

රජ්ජුරුවෝ නුවර වාසීන්ට කියන්නාහු "පිට ඉඟුල් අල්ලක් ඔබාළූ පුරුෂයෙකු දුටුවොතින් අල්වාගෙණ එව"යි කීහ. විද්‍යාධරයා උදෑසන ස්මසානයක (සොහොනක) එත පයින් සිට සූර්‍ය්‍යදිව්‍යපුත්‍රයන් වඳිමින් සිටියේය. රාජපුරුෂයෝ බලාගෙණ ගියාහු ස්මසානයෙහි සිටි පුරෂ සූර්‍ය්‍යදිව්‍යපුත්‍ර වඳිනවුන් දැක වටලා ගෙණ අල්වන්ට වන්නාහ. විද්‍යාධර තමා අල්වන නියාව දැන මන්ත්‍රය සිහිකොට ආකාශයෙන් ගියේය.

රජ්ජුරුවෝ එපවත් අසා "කෙසේ කෙණෙක්දැ?"යි විචාළාහ. "ස්වාමීනි, ඉස මුඩුවෝය, තාපසකෙනෙකුන් සැටිය"යි කීහ. රජ්ජුරුවෝ "තපස්වීකෙණෙකුන් මේ නුවර ඉන්ද නොදෙව"යි කියා රටින් තොරකළහ. එතැන් පටන් කුසල් කිරීම් නැතිව අකුසලය බොහෝ කොට මනුෂ්‍යයෝ නරකයෙහි උපන්නාහු. ශක්‍රයෝ තමන් දිව්‍යලෝකයෙහි උපදින උන් නැතිහෙයින් බරණැස් නුවරට අවුත් "මේ නුවර තපස්වීකෙණෙකුන්වත් මෙලොව පරලොව මේයයි කියා බණදහමක් කියන කෙණෙකුන්වත් දනක් පිනක් කරවන කෙණෙකුන් නැතිහෙයින් වේද මනුෂයෝ නරකයේ උපදින්නේය"යි සිතා ශක්‍රයෝ නන්දමූලක ප්‍රාබාභාරයට (ප්‍රපාතයට) ගොස් පසේබුදුන් වහන්සේගෙන් වැඩිමාළු පසේ බුදු කෙණෙකුන් වහන්සේ ඇරගෙණ බරණැස්නුවරට එම් සිතා ගොසින් වැඩිමාළු පසේබුදු කෙණෙකුන්වහන්සේ කැඳවාගෙණ ශක්‍රයෝ තුමූ තරුණ මානවක වේශයක් මවාගෙණ පාත්‍රය ඇරගෙණ පසේ බුදුන් වහන්සේ ඉදිරිකොට ලා ආකාශයෙන් අවුත් බරණැස් නුවර තුන් විටක් ප්‍රදක්ෂිණාකොට රජ්ජුරුවන්ගේ රජගෙයි සිටියාහ.

බොහෝ මනුෂ්‍යයෝ දෙදෙනාවහන්සේ දැක රජ්ජුරුවන්ට "වයොවෘද්ධ තපස්වී කෙණෙකුන්සේත් තරුණ මානවක කෙනෙකුත් වහන්සේත් නමස්කාර කොට සිටිනාසේකැ"යි කීහ. රජ්ජුරුවෝත් එපවත් අසා අවුත් ශක්‍රයන් ආකාශයෙහි සිටියන් දැක කියන්නාහු "මානවකය, තෝ වනාහී බැලුවන්ට අප්‍රියකරුවූ ජින්න භින්න පටධාරීවූ (දිරා ගිය ඉරුණු වස්ත්‍ර

ඇඳගෙන) මාළුභික්ෂුකෙනෙකුන් වහන්සේට වැඳගෙණ සිටිනේ කවර කාරණයක් නිසාද? මුන් වහන්සේගේ නම කවරේද? තොපගේ නම කවරේදැ?යි විචාළාහ. ශක්‍රයෝ "රජ්ජුරුවෙනි, මුන්වහන්සේගේ නම මුන්වහන්සේ දැක්කදීම කිය නොහෙමි. මාගේ නම කියමි. මම නම් දෙදෙව්ලොවට නායකයාවූ ශක්‍රයෝ වෙමි. මුන්වහන්සේ පසේ බුදුන් වහන්සේය"යි කීහ.

එවිට රජ්ජුරුවෝ කියන්නාහු "දිව්‍යරාජොත්තමය මුන්වහන්සේට වඳින්නේ පුදන්නේ කුමක් තකාද? නෑසියකමක් තකාද? නොහොත් කවර කාරණයක් නිසාදැ?"යි විචාළේය. ශක්‍රයෝ කියන්නාහු "මුන්වහන්සේ මා වඳින්නේ පුදන්නේ නැසීයකමක් තකා නොවෙයි වැඳීමෙන් පිදීමෙන් සවර්ගමෝක්‍ෂය සැප හා සියලු ඉෂ්ඨාර්ථසිද්ධිය (බාලාපොරොත්තු වන යහපත) වනහෙයින් හා කුසල මූලික වූ පසේබුදුන් වහන්සේ නමස්කාර කරම්හ"යි ශක්‍රයෝ කීහ.

රජ්ජුරුවෝ එපවත් අසා "ශක්‍රයෙනි, පසේබුදුන් වහන්සේ හා තපස්වීන් වහන්සේ වැඳිමි පිදීමි විපාක ඇසීමි, එසේ හෙයින් මෙතැන් පටන් තපස්වී වරයන් වහන්සේට දන් දෙමි වඳිමි පුදමි" කීහ. පසේබුදුන් වහන්සේ "රජ්ජුරුවෙනි, තපස්වීවරයන් නිසා සැලසුනු කිලුටෙක් නොවෙයි, විද්‍යාධරයකු නිසාවූ කිලුටය, තපස්වීන් කෙරේ දනාමානාදිවූ කුසල් කරව"යි අවවාද කියා පසේබුදුන්වහන්සේ නන්දමූලකර ප්‍රාබිභාරයට වැඩිසේක. ශක්‍රයෝ තමන්ගේ ශක්‍රභවනයට ගියේය. රජ්ජුරුවෝ නුවරින් පිටත පලාගිය තපස්වීවරයන් වහන්සේ

ගෙන්වා පුණ්‍ය සම්භාරයන් රැස්කොට දිව්‍යලෝකයෙහි උපන්නාහයි වදාරා මේ ‘ධජවිහෙඨ ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. එසමයෙහි ශක්‍රයෝ නම් බුදුවූ මම්මය”යි වදාළසේක.

# 380. පුෂ්පගන්ධ ජාතකය

තවද ජම්බොනද ස්වර්ණයට (දඹරන් පැහැයෙන්) බඳුවූ ශරීර ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයයෙහි වැඩ වසන සමයෙහි එක් මල් පිදීමක් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

එක් භික්ෂුකෙනෙකුන් ජේතවනාරාමයෙන් පිටිසර වස්වසන්ට ගොස් වස්වැස එනසේක් එක් විලක මල්සුගන්ධයක් අස අසා අඝ්‍රාණය (සුවඳ විදිමින්) කොට සිටිසේක් එක් දේවතාවෙක් එතනට අවුත් “ඇයි භික්ෂූන් වහන්ස, නුඹ වහන්සේට මල් සුගන්ධයෙන් ප්‍රයොජන ඇද්ද? මල් පලදිනා අභිප්‍රායක් ඇද්දැ?යි කීහ. භික්ෂූන් වහන්සේට කී බසින් එතන නොසිට ජේතවනාරාමයට ගොස් සර්වඥයන් වහන්සේට එපවත් කීසේක. සර්වඥයන් වහන්සේ “දැන්මතු නොවෙයි මහණෙනි, දෙවතාවා පෙර උත්තමයන්ටත් කුකුස් (සැක උපදවීම) ඉපදවුයේ

වේදැ''යි වදරා ''ඒ කෙසේදැ?''යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍ජය කරණ සමයෙහි බෝධිසත්‍වයන් වහන්සේ එක් බ්‍රාහ්මණ ගමෙක ඉපද සෘෂි ප්‍රව්‍රජ්‍ජාවෙන් පැවිදිව වාසය කරණසේක් එක් දවසක් එක් පොකුණක් දැක ඒ පොකුණෙහි නාන්ට බැස නානසේක් එක් පියුමක් දැක ඒ පියුම ළඟට ගොස් ඒ පියුම ඉඹ ඉඹ සිටිසේක.

එවිට දේවතා දුවක් කියනනී ''ඇයි තාපසයෙනි, තොප අදත්තාදනයෙන් (නුදුන් දෙය ගැනීමෙන්, සොරකමින්) ප්‍රයෝජන විඳින්ට කාරණා කිම්දැ?''යි කිව. එවිට තාපසයෝ කියන්නාහු ''පියුම් කඩාගත්තා නැත, කැවා නැත, ඉඹපු පමණකින් අදත්තාදනයවෙන්ට කාරණා කිම්දැ?''යි කීහ. ''අනුන් සන්තක විල මල් ඉඹී කල මේ අදත්තාදනය නොවේදැ?''යි කීහ. ඒ වේලාවට එක් පුරුෂයෙක් අවුත් විලට බැස මල් කඩා අලත් උදුරා ඇඹුල දඬුත් කඩන්නට වන. එවිට බෝධිසත්‍වයෝ ''මල ඉඹපුවාට අදත්තාදන යයි කිව. මලුත් කඩා අලත් උදුරණ තැනැත්තවුවට බැණ නොනැගෙ''යි සිතා දේවතාදුවට කියන්නාහු ''ඇයි? තෝ මට මල ආඝ්‍රාණය කළ පමණින් අදත්තාදනයයි කිව. මේ පුරුෂයාට බැණ නොනැගෙන්නේ ඇයිදැ?''යි කීහ.

එවිට දේවතා දූ කියන්නී ''එඹා තාපසයෙනි, කිරෙහි කසළක් හුනු කලක් (කිරි භාජනයට කුණක් වැටුනා වගේ)

පෙණෙයි, සුදුකඩෙහි ගැලුනු කසළක් නමුත් පෙණෙයි. කසළේ ලූ කසළක් නොපෙණෙයි, කිලුටු කඩෙහි ගැලුනු කසළක් නොපෙණෙයි. එසේ මම අසත්පුරුෂයා කුමක්කලත් වැරදි කියනොහැක්ක, තොප තාපසව යහපතක්ම කරණට නියැලී ඉඳිනා තැනැත්තන් හෙයින් තොපගේ වේසය නියාවට දවස් අරින්ට උවමැනව"යි කිව. බෝධිසත්‍වයෝ දේවතා දූ කී බසට සමාධිව "මෙයින් මතු මාගේ වැරැද්දක් දුටුකල කියව"යි කීහ. දේවතා දූ කියන්නී "මම තොපගේ වරද බලා පසුපස්සේ ඇවිදිම්ද? තොප රකිනා ඍෂිප්‍රව්‍රජ්ජාව (තාපස පැවිද්ද) නියාවට සිහි ඇතිව වාසය කරව"යි කිව.

බෝධිසත්‍වයෝත් දේවතා දූ කී අවවාදය සිතෙහි තබා පංඥභිඥ (ඍද්ධි විධ, දිබ්බ සොත ආදී ඥණ පහ) අෂ්ට සමාපත්ති (රූපාවචර හා අරූපාවචර සමාපත්ති අට) උපදවා නොපිරිහුණු ධ්‍යානයෙන් බ්‍රහ්මලෝකයට ගියහයි වදුරා චතුස්සත්‍යය ප්‍රකාශ කොට මේ 'පුෂ්පගන්ධ ජාතකය' නිමවා වදාළ සේක. චතුස්සත්‍ය දේශනාවගේ කෙළවර ඒ භික්ෂූන් වහන්සේ සෝවාන් වූ සේක.

"එසමයෙහි දෙවතා දූ නම් උපුල්වන් මහාස්ථවිරීය. තාපසව උපන්නෙම් බුදුවූ මම්මය"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 381. විඝාත ජාතකය

තවද සත්ගුණ මහාසවණීයක් (මහ මැණිකක්) බඳුවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ක්‍රිඩාශීලීවූ (කෙළිලොල්වූ) භික්ෂුකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

සර්වඥයන් වහන්සේ මතුමාලේ ප්‍රාසාදයෙහි වැඩ වසන සමයෙහි සාමණේර භික්ෂු කෙණෙකුන් වහන්සේ එක්ව යටමාලේ කෙළිනා අරගල (ක්‍රීඩා කරණ ඝෝෂාව) අසා සර්වඥයන් වහන්සේ මුගලන් සාමින් ගෙන්වා "මෞද්ගලයාණය, සාමණේරයන්ගේ ක්‍රීඩාව නවතාලව"යි වදාළසේක. "යහපතැ"යි මුගලන් සාමි යටමාලේ ඇගිලිදෙකින් සොලවා භයගැන්වූසේක.

ඒ කථාව දම්සභා මණ්ඩපයේ රැස්වූ භික්ෂූන් වහන්සේ කිය කියා වැඩ උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාර වදාරා එපවත් අසා දැන් "මතුනොවෙයි පෙරත් අශික්ෂිතව වාසය කරන්නවුන් පෙර උත්තමයෝ ඉක්මවූවෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ ශක්‍රදේවේන්ද්‍රව උපන්සේක. එසමයෙහි සත් බෑකෙනෙක් (සහොදරයෝ සත් දෙනෙක්) හිමාලය වනයෙහි මණ්ඩපයක තාපසව වාසයකරන්නාහු ක්‍රීඩාශීලීව වසන්නාහ.

ශක්‍රයෝ එපවත් දැන ගිරවකු වෙසින් තාපසවරුන් ඉඳිනා මණ්ඩපයට අවුත් ඉඳ කියන්නාහ "විඝාත නොවන (වළඳා ඉතිරි ආහාර නොගන්නා) තාපසවරුන්ට නමස්කාර කරමි"යි කීහ. ඉන් එක් තාපසයෙක් "කුමක්දැ?"යි විචාළේය. එවිට අවශේෂයෝ "අප ඇමට නමස්කාර කෙරෙමියි කියයි" කීය.

එවිට ගිරවා කියන්නේ "තොප ඇමට නොවෙයි, මා කීයේ විඝාතනොවන තාපසවරුන්ටය"යි කීහ. එවිට තාපසවරු කියන්නාහු "අපට වඩා අනික් තාපස කෙනෙක් ඇද්ද? අපි සිංහ ව්‍යාඝ්‍රයයන් කෑ ඇටකා දවස් අරිනෝය, අපගෙන් කවර අඩුවක් ඇතිව කියවුද? අපට වඩා අනික් කවර තාපසකෙනෙක් ඇද්දැ?"යි කීහ.

එවිට ගිරවා කියන්නේ "තොපි ඇම නොයෙක්දෙනා කා ඉතිරි මාංශය කන්නාම තපස්ද? තපස් නම් තමා ලත් දෙයක් දන්දී සුසීලව (සිල්වත්ව) වාසය කිරීමය. තොප ඇම ක්‍රීඩාශීලීව වාසය කිරීම දුශ්ශීලභාව යයි මෙතැන් පටන් එලෙස නොකරව"යි තාපසවරුන්ට අවවාද කියා ක්‍රීඩාශීලීකම් අරවා (නවත්වා) තමන්ගේ ශක්‍රභවනයට ගියහයි වදුරා මේ 'විඝාත ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි සත්බෑයෝ නම් මේ ක්‍රීඩාශීලී භික්ෂූහුය. ශක්‍රදේවේන්ද්‍රව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

# 382. වට්ටක ජාතකය

තවද සිතූ සිතවන් සිත් නිමවන (බුදු ගුණ සිහි කිරීමත් සිතට සැනසුමක් බව) මනහර ගුණ ඇති තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ලෝභී භික්ෂුකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්?

ලෝභී භික්ෂුකෙනෙකුන් වහන්සේ සර්වඥයන් වහන්සේට දක්වන්නා "මහණෙනි, මේ භික්ෂු දැන්මතු නොවෙයි පළමුත් ලෝභීව ඇත්කුණු මිණීකුණු ආදිවූ දෙය බොහෝව කමින් සිට තෘෂ්ණා වසඟව වනාන්තරයට ගියෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ වටුව ඉපද වනානාතරයෙහි වාසය කරණසේක.

එක් කපුටෙක් බරණැස් නුවර ඉඳ ඇත්කුණු මිණීකුණු ආදිවූ දෙය කමින් සිට තෘෂ්ණාවසඟයෙන් වනාන්තරයට වැද බෝධිසත්වයන් මහත්වූ ශරීර ඇතිව වාසය කරන්නාවූ වෘක්ෂය සමීපයට ගොස් උන්නේය. බෝධිසත්වයෝ සාමීචි නිසා (සුහදව

කථා කිරීම) කපුටුවානන් දැක "ඇයි මයිලනුවෙනි, මනුෂ්‍යභවනයේ නොයෙක් ඛාද්‍ය භෝජ්‍ය (කන බොන දෑ) ඇතිව සැපසේ වාසය කළ කල දුර්වලවූයේ කවර කාරණයකින්දැ?"යි විචාළාහ. කපුටුවා කියන්නේ "නොයෙක් ඛාද්‍ය භොජ්‍ය කැවත් මනුෂ්‍යයන් කාපු දෙයක් වහා දිරා නොයෙක් ආයාසයට (වෙහෙසට, කරදරයට) පැමිණෙන හෙයින් දුර්වලව ගියෙමි. තෙපි කවර කාරණයක් නිසා මෙසේ මහත්වූ ශරීරයක් ඇතිසේක්දැ?"යි විචාළාහ. එවිට වටුවා කියන්නේ "අපි නම් අල්ප සන්තෝෂයම්හ (ලද දෙයින් සතුටු වෙන බව). යම්තම් ආහාරයක් ලබන්නා ඉන්ම යපී යම්හ. අනිත් ආහාරයක් තව සොයන්නට උවමැනවැයි යන තෘෂ්ණාවක් නැත. එහෙයින් අපගේ චිත්ත සන්තෝෂව තිබෙන හෙයින් ශරීරයත් ස්ථූලව තිබෙයි" වදරා මේ 'වට්ටක ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි කපුටුවා නම් මේ ලෝභී භික්ෂූහුය. එසමයෙහි වටුවා නම් බුදුවූ මම්මය"යි වදාළසේක. මේ ජාතකය අවසානයෙහි ලොල් භික්ෂූන් වහන්සේ සෝවාන් වුසේක.

## 383. කාක ජාතකය

තවද අසන්නවුන් කන්හි අමා නමන (කන් පිනවන, කන්වලට අමෘතය දමන) මධුර ධර්මදේශනා ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසනා සමයෙහි ලෝභී භික්ෂුකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

මෙහි වනාහි වර්තමාන කථාව යට කියන ලද ජාතකවල පෙනෙන්නේය. මෙහි වනාහි:-

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්ත්වයෝ පරෙවිව උපන්නාහ. බෝධිසත්ත්වයන් බරණැස් නුවර අරක්කැමියෙක් ගෙණවුත් වඩනේය. කවුඩකුත් බෝධිසත්ත්වයන් උන් මැදිරියට අවුත් උන්නේය. කවුඩා අල්වාගෙණ පළමු ජාතකවල කීවාක්මෙන්ම නොයෙක් වධ පමුණුවා ශරීරයේ පියාකොල ඇම උදුරවා දම්මා (පියාපත් සියල්ල ගලවා දමා) සුදුපෑකොට ඇති බෙල්ලේ කැබිලිත්තකුත් විද අමුණුවා බැඳ එතන ලා ගියහ.

බෝධිසත්ත්වයෝ කවුඩානන් දැක කියන්නේ "නාපිතයන් ගෙන්වා (කොණ්ඩ කපන්නන් ගෙන්වා) ශරීරයේ ලොමුත් බා ඉන්ද්‍රනීල මාණික්‍යකුත් කරබැඳ කළඳෑ යහපතැ"යි කීහ. කපුටුවා කියන්නේ "නාපිතයන් ගෙන්වා ලොමුත් බාවා ඉන්ද්‍රනීල මාණික්‍යයකුත් තොපගේ කර බන්දවම්දැ?"යි විචාළේය.

බෝධිසත්ත්වයෝ කියන්නාහු "මෙසේවූ ලොම් බෑවිලිත් මෙසේවූ ඉන්ද්‍රනීල මාණික්‍යයත් තටම වේද? එතරම් මට ඉන් ප්‍රයෝජන කිම්දැ?"යි කීහ.

කපුටුවා කියන්නේ "බොහෝ දෙන ඉන්ද්‍රනීල මාණික්‍ය පළඳිති, වෙහෙසන නිසා මේ කැබිලිත්ත (බිඳුනු වලන් කෑල්ල) විද කරබැන්දේය"යි කීහ. බෝධිසත්ත්වයෝ "මෙසේවූ දුෂ්ටයන්

ඉඳිනා තැන ඉඳිම කාරණා නොවේ"යි කියා වනාන්තරයට ගියහයි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශ කොට මේ 'කාක ජාතකය' නිමවා වදාළසේක. චතුස්සත්‍ය දේශනාවගේ කෙළවර ඒ ලොල් භික්ෂූන් වහන්සේ ආනාගාමි වූසේක.

"එසමයෙහි කවුඩා නම් මේ ලෝභී වූ භික්ෂූහුය. එසමයෙහි පරෙවිව උපන්නෙම් බුදුවූ මම්ම වේදැ"යි වදාළසේක.

**සවෙනි නිපාත වර්ණනාව නිමි.**

තවද සත්වෙනි නිපාතය දක්වන්නෙමු. ඒ කෙසේද යත්?

# 384. කුක්කු ජාතකය

අසන්නවුන්ගේ කන්හි අමා නමන මධුර දේශනා ඇති (මිහිරි දේශනා විලාශයක් ඇති) සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි රාජෝවාදයක් (රජතුමාට දුන් අවවාදයක්) අරභයා මේ ජාතකය දක්වන ලදී.

මේ කථාව විස්තර වශයෙන් තෙසකුණ ජාතකයෙහි පෙණෙන්නේය. මෙහි වනාහී:-

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ රජ්ජුරුවන්ට අර්ත්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරණ අමාත්‍ය ධුරයේ උපන්සේක.

ඒ රජ වනාහි දශරාජ ධර්මයෙන් (රජෙකුට තිබිය යුතු යුතුකම් දහයක්. දාන, ශීල, පරිත්‍යාග ආදියයි) විරුද්ධව තමන් සිතූ දෙයක්ම කරන්නේය. රාජ්ජය අධර්මයෙන් පිළිපන්නේය. බෝධිසත්ත්වයන් වහන්සේ "මේ රජ්ජුරුවන්ගේ අභිප්‍රාය කාරණයකින් ගිවිස්වා (උපක්‍රමයකින්) අරවාලතොත් විනා අවවාද කියා අරවාලිය නොහැක්කැ"යි සිතා කාරණා සොයන්නාහු ඒ අවස්ථාවෙහි රජ්ජුරුවෝ එක් දවසක් උයන් බලන්ට ගියහ.

උයනේ රජ්ජුරුවන් අමුතුව කරන්නාවූ මඬපයෙක් ඇත්තේය. රජ්ජුරුවෝ මඬපකර්මාන්ත බලන්ටයයි ඇතුළට වන්නාහු ගොණැස් උරවා (පරාළ වද්දන ලද) තුඹූ කැණිමඬුල්ල (තනි කණුවේ මුදුන් වහළ) දැක "'වැටියේ දෝ හෝ"යි සිතා මෑතට අවුත් බෝධිසත්ත්වයන් කැඳවා කියන්නාහු "එඹා අමාත්‍යයානනි, මේ කැණිමඬල නොවැටෙන්ට කාරණා කිම්දැ"යි කීහ.

බෝධිසත්ත්වයෝත් රජ්ජුරුවන් වහන්සේට අවවාදය කින්නට යහපත් කාරණායයි සිතා කියන්නාහු "දේවයන්වහන්ස, මේ එලය හැර යහපත්ව සැසහැර තරව උරවන ලද්දවූ ගොණැස් බලයෙන් (පරාළ බලයෙන් මුදුන් වහළ සවිවී ඇත) මඬුල්ල රඳන්නේය. කැණිමඬල බලයෙන් ගොණැස්ස නොවැටෙන්නේය. දේවයන් වහන්ස, කැණිමඬල නම් රජ්ජුරුවන් වැන්නේය, ගොණැස්ස නම් අමාත්‍ය මණ්ඩලයා වැන්නේය. ඉන් එක් ගොණැස්සෙක් දිරාගිය නමුත් ඒ දිශාවට

කැණිමඬල නැමී යන්නේය. එමෙන් එක අමාත්‍යයෙකුට වැඩිමෙකුවී නමුත් රජදරුවන් වහන්ස්ට අලාභවන්නේ නොවෙයි. ලොකපාලවූ රජදරුවන් විසින් අමාත්‍ය මණ්ඩලයා ඇතුළුවූ සියළු ප්‍රජාව නොමිරිකා දශරාජධර්‍මයට අකොප්‍යව (විරුද්ධ නොවී) රාජ්ජය කළ යුත්තේය''යි බෝධිසත්‍වයෝ කීහ.

රජ්ජුරුවෝ බෝධිසත්‍වයන් කී බසට සතුටුව උන්අවස්ථාවට එක් පුරුෂයෙක් ලප්නාරන් ගෙඩියක් (නාරම් විශේශයක්) ගෙණවුත් රජ්ජුරුවන් අතට දින. බෝධිසත්‍වයෝත් මෙයිත් අවවාද කියන්ට නිසි කාරණයෙකැයි සිතා "දේවයන් වහන්ස, මේ ලප්නාරන් ගෙඩිය නුවණැත්තෝ තිත්තත් ඇර ඇඹුලත් ඇර අනුභව කෙරෙද්ද, නුඹ වහන්සේත් පැවැත ආ රාජධර්‍මය නොහැර රාජ්‍යවාසීන්ගෙන් කරවුවර (රජයට ලැබිය යුතු බදු) ගතමනා දෙය හැරගෙණ රාජ්‍යවාසීන්ගෙන් අන්‍යයාගේ අර්ත්‍ථය (අනුන්ගේ යහපත) නූපදවනසේක්ද, ලප්නාරන් ගෙඩිය පොත්ත තුනී විනම් තිත්ත රසවන්නේය, මස් ඝන වීනම් ඇඹුල්රස වන්නේය, තිත්තත් නොවී ඇඹුලුත් නොවී මස් අනුභව කරන්නාක් මෙන් රාජ්‍යවාසීන්ගේ කරවුවර ගෙණ රට රක්නා රජ්ජුරුවන් අමාත්‍ය මණ්ඩලයා සිත් ගන්නාහ''යි බෝධිසත්‍වයෝ කීහ.

බෝධිසත්‍වයන් කී බසට සතුටුව කථාකොට මගුල් පොකුණට ගියහ. මගුල් පොකුණෙහි යහපත් පියුමක් පිපී දියට රියනක් විතර උස්ව සිටියේය. රජ්ජුරුවෝ කියන්නාහු

"එම්බා අමාත්‍යයානනි, දිය හා මඩ ආධාරකොට ඇතිවූ මේ පියුම මඩෙහිත් දියෙහිත් දෙකින් වෙන් වෙන්ව පිපෙන්ට කාරණා කිම්දැ?"යි විචාළාහ.

බෝධිසත්වයන් වහන්සේත් එවිට කියන්නාහු "දේවයන් වහන්ස, ලොකපාලවූ රජදරුවන් වහන්සේත් ලෝභ, ද්වේෂ, මෝහ, මදමාන, මාත්සර්ය්‍යය (දීමට ඇති ලෝභකම) යන සියල්ලෝම මේ පියුම් පරිද්දන් ඇලීමක් නැතිව දශරාජධර්‍මයෙන් රාජ්‍යය කරණසේක් විනම් බ්‍රාහ්මණ වෛශ්‍ය (ගොවිතැන්, වෙළහෙළඳම් කර ජීවත්වන කුලයට අයත් පිරිස) ග්‍රහපති යන සියල්ලෝම රජදරුවන් වහන්සේට ඉතා පක්‍ෂවන්නාහ"යි කීහ.

රජ්ජුරුවෝත් බෝධිසත්වයන් කී අවවාදයෙහි පැහැද එතැන්පටන් දශරාජධර්‍මයෙන් අකොපය්‍යව දානශීලාදී පින්කම්කොට දෙව්ලොව ගියහයි වදාරා මේ 'කුක්කු ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරය, එසමයෙහි රජ්ජුරුවන්ට අමාත්‍යව උපන්නෙම් බුදුවූ මම්මය"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

## 385. මනෝජ ජාතකය

තවද සිංගිස්වර්‍ණයක් (පෙරාපු රත්තරන්) බඳුවු සර්‍වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්

විපක්‍ෂශීලී (විරුද්ධ පක්‍ෂය ඇසුරු කරණ) භික්‍ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

එක් භික්‍ෂුකෙනෙකුන් වහන්සේ දෙවදත්ත ස්ථවිරයන් වහන්සේගේ භික්‍ෂුකෙනෙකුන් වහන්සේ හා එක්ව හිතව වාසය කරණසේක. මේ කාරණය එක් භික්‍ෂුකෙනෙකුන් වහන්සේ මේ මහණ කැඳවා ගෙණගොස් සර්‍වඥයන් වහන්සේට පෑසේක. "සැබෑද මහණැ?"යි විචාරා වදාරා "සැබව ස්වාමීනි" කී කල්හි "දැන්මතු නොවෙයි මහණෙනි, පෙරත් මේ මහණ විපක්‍ෂශීලීව වාසය කළේ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍ජය කරණ සමයෙහි එක් වනයක සිංහයෙකු හා සිංහ ධේනුවක් වාසය කරන්නීය. ඒ සිංහ ධේනුව දුවකු හා පුතකු වැදූහ. සිංහපෝතකයාට මනෝජ යයි නම් තුබූහ. ඒ සිංහයා වැඩිවිය පැමිණ කල අනික් සිංහධේනුවක් බිරින්දව ගෙණවිත් තබා මව්පියන් දෙදෙනා නැගනියන්ද බිරින්ද ද තුමූද යන පස්දෙනාටද ගොදුරු සොයා ගෙණවිත් දී රකිනාහ. එසමයෙහි එක් දවසක් ඒ මනෝජ නම් සිංහයානන් ගොදුරු සොයා ගෙණෙන්නට යන කල්හි එක් ගිරි නම් කැණහිලෙක් සිංහයා ඉදිරියට පැමිණියේය. තමා එනයන තැනක් නැතිහෙයින් සිංහයා

වැඳගණ ඔත්තේය. සිංහයානෝත් හමුව “කිමෙක්දැ?”යි විචාරා “නුඹවහන්සේට සේවයට ආමි” කී කල්හි “යහපතැ”යි තමන් වාසය කරන්නාවූ ගල්ලෙණට කැන්දාගෙණ ගියහ.

සිංහයානන්ගේ පියවූ සිංහ රජ්ජුරුවෝ “මේ නීච වූ සිගාලයා කුමට ගෙණාවුදැ?”යි පුතනුවන්ට කීහ. මනෝජ නම් සිංහයානෝ පියානන් කී බස නොගිවිසම සිගාලයා පොෂ්‍ය කරන්නාහ. ඒ සිගාලයා එක් දවසක් සිංහරජ්ජුරුවන්ට කියන්නේ “සෙසු මස්කා අභ්‍යාසයෙමි (පළපුරුද්දක් ඇත්තෙමි) අස්මස් කෑවා නැත. ස්වාමීනි මට අසකු අල්වා දුනමැනව”යි කීහ. රජ්ජුරුවෝ “යහපතැ”යි කියා විචාරන්නාහු “අසුන් ඇත්තේ කොයිදැ?”යි විචාළාහ. කැණහිල් කියන්නේ “බරණැස් ගඟ නාන්ට බරණැස් රජ්ජුරුවන්ගේ අසුන් ගෙණෙන්නාහ. ඉන් එකෙකු අල්වා ගෙණ එව”යි කීහ. සිංහරජ්ජුරුවෝත් “යහපතැ”යි බරණැස් ගඟ සමීපයට ගොස් නාන්ට ගෙණා අසුන්ගෙන් එකෙකු බෙල්ල බිඳ පිටට දමාගෙණ ගල්ලෙනට ගෙණ ගොස් මෑනියන් ඇතුළු ඇමදෙනාටත් බෙදාදී තමනුත් කා කැණහිලාටත් දුන්හ. වැඩිමාළු සිංහ රජ්ජුරුවෝ පුතනුවන් අතින් “මේ අස්මස් කෑ සිංහයන්ගෙන් බොහෝ කලක් ජීවත්වූ කෙනෙක් නැත. අස්සු නම් රාජවාහනය. රජදරුවෝ තමන්ගේ රාජවාහනයට උපද්‍රාව වූ කල කිපී විද්දවායති (උවදුරු වූ විට කිපී විද මරණයට පත්කරති). යම් උපායකින් නසවති. මෙවක් පටන් අසුන්ගේ මාංශය නොකව”යි සිංහරජ්ජුරුවෝත් පියානන් කීවා නොකොට අසුන් අල්වා කන්නාහ.

රජ්ජුරුවෝත් අසුන් ගෙන්වා රාජාංගණයේ අස්සල බැඳ ඇතුලේ පොකුණක් බිඳුවා අසුන් නාවන නියායෙන් සලස්වා තමන්ගේ දුනුවායන්ට විධානය කරන්නාහු "මාගේ අසුන් කා වනසන්නාවූ සිංහයා විදුව"යි දුනුවායන්ට විධානය කළහ. දුනුවායෝත් "යහපතැ"යි සිංහයා එන වේලාව පරීක්‍ෂා කොට ඇවිදිනාහු පවුරු පැන නැග එන්නාවූ සිංහයා දැක "දැන් විද්දමෝ නම් සැහැල්ලු හෙයින් වැරදයෙයි අසු අල්වාගෙණ යනකල විදුම්හ"යි සිතා අසකු අල්වාගෙණ පැනයන්නාවූ සිංහයාට පස්සෙන් විද ඉදිරියෙන් දැඩවලා (දණ්ඩක් හරහට දමා) විද්දහ. සිංහයාත් මරණ භයින් මහත්කොට අඬගසා තමාගේ ගල්ගෙටම පිනීය. විදි තැනැත්තේ "සිංහයා විද්දෙමි" අඬගැසීය. කැණහිලා සිංහයා මරණ භයින් ගැසූ අඬත් අසා මනුෂ්‍යයා ගැසූ අඬත් අසා සිතන්නේ යාළුවූ සිංහයානෝ මළේය. මා ජීවත්වන්ට උපායකුත් නැත. මිය පරලොව ගියවුන් හා ඉතිකින් කවර විශ්වාසයක්ද? මා අනිත් තැනකයෙමි සිතා පලාගියහ.

සිංහයාත් තමාගේ ගල්ලෙණම වැටීහින. සිංහයානන්ගේ මව් පියෝ දෙන්නත් නැගණියෝත් බිරින්දත් සතරදෙන සිංහයා වටකොටගෙණ ඉඳ කියන්නාහු "පාපීවූ දුෂ්ටවූ ගිරි නම් සිගාලයා කීවාකොට මනෝජ නම් සිංහයාත් විනාසයට පැමිණියෝ වේද, යම්සේ අසත්පුරුෂයන් හා සංවාසය නොකරවයි කී අවවාද නොගිවිස මාගේ පුත්වූ මනෝජ නම් සිංහ රාජයා මරණයට පැමිණියෝය"යි සිංහරාජයානෝ කීහ. සිංහයාගේ මෑණියෝ කියන්නාහු "යම්සේ වැදූ දරුවෝ

නොකීකරුවෝ නම් මෑණියෝ උන් කෙරෙහි ඇල්මක් නැත්තාහ. මාගේ පුත් වූ මනෝජ නම් සිංහරාජයා කිවා නොකොට අසත්පුරුෂයාගේ බස් ගිවිස ලේ කටින් දමා වැදෙත්තේ වේදැ''යි කීහ. සිංහයානන්ගේ නැගණියෝ කියන්නාහු ''යම් කෙනෙක් පාපිෂ්ටයන්ගේ බස්ගෙණ කීවා කෙරෙද්ද, මෑණියන් වහන්සේ කීවාමෙන්ම මාගේ බෑණන් වහන්සේට පැමිණියා මෙන් මරණයට පැමිණෙන්නේ වේදැ''යි කීහ. සිංහයානන්ගේ බිරින්ද කියන්නාහු ''යම්සේ උත්තමයෝ උත්තමයන් හා භජනය කෙරෙද්ද, නීචයෝ නිචයන් හා වාසය කෙරෙද්ද, නිචයා හා උත්තමයා කරන්නාවූ භජනය මේ දෙකම කුමක් මෙන්දයත්, සිවුපාවන්ට උත්තමවූ සිංහරාජයා අධමයා හා එක්වීමෙන් සැරපහර ලදින් විනාසයට ගියාවන''යි කීහ. ඒ අභිප්‍රාව දක්වන්නාවූ සර්‍වඥයන් වහන්සේ ''එම්බා මහණෙනි, නීචයා නීචයාම සෙවුනා ලබන්නේය. උත්තමයා උත්තමයාම සෙවුනා ලබන්නේය. නීචයා හා උත්තමයාගේ විශ්වාසයද උත්තමයා හා නිචයාගේ විශ්වාසයද සිගාලයා හා සිංහයා මෙනැ''යි වදරා මේ 'මනෝජ ජාතකය' නිමවා වදාළසේක. ඒ විපක්‍ෂශීලී භික්‍ෂූන් වහන්සේ දහසක් නයින් ප්‍රතිමණ්ඩිතවූ (කරුණු දහසකින් බබලන්නාවූ) සෝවාන් මාර්ගයට පැමිණිසේක.

''එසමයෙහි සිංහයා නම් මේ භික්‍ෂූහුය. සිංහයාට විශ්වාසව උන්නාවූ කැණහිලා නම් දේවදත්ත ස්ථවිරය, සිංහයාගේ බිරිණඳ නම් ඛේමා නම් ස්ථවිරීය, සිංහයාගේ

නැගනියෝ නම් යසෝධරා ස්ථවිරීය. සිංහයාගේ පියාවූ සිංහයා නම් බුදුවූ මම්මය”යි වදාළසේක.

# 386. දහම්සොඬ ජාතකය

මෙම ‘දහම්සොඬ ජාතකය’ මුද්‍රිත ජාතකට්ඨ කතාවෙහි හෝ සිංහල ජාතක පොතේ නොමැත.

යටගිය දවස බරණැස රාජ්ජයකළ බ්‍රහ්මදත්ත රජුට දහම්සොඬ (ධර්‍මයට ලොල්වූ) නම් කුමාරයෙක් විය. ඒ කුමාරයා ක්‍රමයෙන් වැඩී සූසැට කලා ශිල්පද අෂ්ටාදස පුරාණද අව් ශිල්පද නිමවා සොලොස් හැවිරිදි කල්හි යුවරාජ තනතුරටද පියාගේ ඇවෑමෙන් රජකමද ලැබ චතුර්විධවූ උපායෙන්ද ත්‍රිවිධ ශක්තියෙන්ද ෂඩ් ගුණයෙන්ද සප්තාංගයෙන්ද චතුස්සංග්‍රක වස්තුවෙන්ද යුතු ව රට ආරක්‍ෂා කරමින් සිටින කල්හි දිනක් මෙබඳු සිතිවිල්ලක් ඇති විය.

සංසාරයෙහි වාසය කරන සත්වයා කෙරෙහි මෛත්‍රී කරුණාවෙන් නිවන් පුරයට පමුණුවන අපගේ සර්‍වඥයන් වහන්සේ විසින් අමෘතය මෙන් දේශනා කරනලද ශ්‍රී සද්ධර්‍මය දැන නොගෙන සැළකීමක් නොකොට කරන්නා වූ මේ රජ කම මට සුදුසු නොවෙයි. එය වෙරළ නැති රළ මෙන්ද, චන්ද්‍රයා නැති අහස මෙන්ද, ප්‍රදීපය නිවීගිය ගෙය මෙන්ද, දළසුන් මස්ත හස්තියා මෙන්ද, පියුම නැති විල මෙන්ද, නාසය බුන් චක්‍රය මෙන්ද, නොහොබින්නේයයි මෙසේ සිතා රෑ

පහන් වූ කල්හි සුවඳ පැන් සනහා සර්වාභරණින් සැරසී සුර සබයට යන ශක්‍රයා පරිද්දෙන් රාජ සභාවට පැමිණ සිංහාසනාරූඪව අමාත්‍ය මණ්ඩලයා අමතා "තිලොවට ගුරු වූ මුනීන්ද්‍රයන් වහන්සේ දෙසූ ධර්මය මට කියව්, තොප එසේ උතුම් ධර්මය ප්‍රකාශ කළ හොත් අපමණ රාජ සම්පත් සමග මුළු රාජ්ජයම පුදමි. මේ ගැන සැක නොකරව" යි කීහ.

උන් එකෙකුදු ධර්මය නොදන් බව ප්‍රකාශකල කල්හි මඟුලැතුන් සරසවා දහසින් බැඳි පියල්ලක් ඒ මත තබා "මුනිඳුන් දෙසූ ධර්මය එක් ගාථාවකින් හෝ ගාථා අඩකින්වත් මට කිසිවෙකු කිවහොත් මේ සම්පත් ඔහුහට දෙමි, තවද ඔහුගේ දාස බවට පත්වෙමි"යි ප්‍රකාශකොට යැවූහ. මෙසේ ද විමසා බණ දත් කිසිවෙකු නොලදින් මහත් සේ කළකිරී රාජ්‍යශ්‍රී අත්හැර ධර්මය සොයනු පිණිස වනයට නික්ම ගියේය.

තමාගේ පාරමිතා බලයෙන් ඒ මහා වනයේ විෂඝෝර සර්පයන් ගෙන් පීඩා නොවිඳ ගතවෙමින් යන කල්හි මේ මහතාණන්ගේ ප්‍රත්‍ය මහිමයෙන් ශක්‍රදේවේන්ද්‍රයන්ගේ ශෛලාසනය හුණු වී වහා එහි පැමිණ තවත් පරීක්ෂා කරමියි සිතා අංජන කැටයක් මෙන් භයානක උස්වූ ශරීරයකින්ද හිසෙහි යකඩ බිලී මෙන් කර්කෂවූ කෙෂයෙන්ද රෞද්‍ර රක්ත වර්ණ ඇස් දෙකකින්ද නැමීගිය දළවලින් යුතු රාක්ෂස වේසකින් දහම්සොඬ රජ්ජුරුවන් වෙතට ළන්ව එක් අතකින් යගදාව සොළව සොළවා එක් අතකින් දැලි රැවුල ඇද ඇද සිට ගත්තේය.

රජ්ජුරුවන් වහන්සේ ඒ බියකරු යක්ෂයා දැක මදකුදු තැති ගැනීමක් නැතිව වහා ඉදිරියට ගොස් "පින්වත, දෙලොව ජය ගතහැකි බණ පදයක් තා විසින් අද කිවහොත් රාජ්‍යශ්‍රී සමග මාගේ ජීවිතයද දෙමි"යි කීහ. එවිට රකුසා "බඩගින්න ඉවසිය නොහැක. තොපව අනුභව කොට බණ කියමි"යි කීය. රජ්ජුරුවන් වහන්සේ ඒ අසා "බණ ඇත්තේ පණ ඇත්නම් වෙද, මම නැත්තම් තාගේ බණ අසන මෙහි කවුරු වෙත්ද? රකුසානෙනි, තොපගේ සාගින්න සහ මගේ දහම් දෙළදුක එකවිට විසදෙන සේ මගක් විමසා කියව"යි කීය.

එබසට රකුසා "ස්වාමීනි, තොපට සදහම් ලාභයද අප හට වන මාංශ ලාභයද එකවිට පසිඳමි"යි කියා සිය ගණන් කූටයන්ගෙන් යුතු අහසෙහි ගැටි පවත්නා මහා පර්වතයක් මවා "තොප මේ ගිරට පැන මාගේ කටට පණිනු. මම ඒ අතර තොපට ධර්මය දේශනා කරමි. වහා නැගෙව"යි කීහ. රජ්ජුරුවන් වහන්සේ බුදුගුණ සිහිකර "කෙනෙක් පර්වත ගස් වැල් වලින් වැටී ද කෙනෙක් විස පානය කොටද මිය යන්නාහ, දිවි වලසුන්ට ගොදුරු වන්නාහ, ධර්මය නිසා මාගේ ජීවිතය තොරවීම නිසරු නොවේවැ"යි සිතා මහා ගිරි සිඛරයට නැග ගිනිවලක් (ගිනි ජාලාවක්) බඳු රාක්ෂයා ගේ දැල් වූ බියකරු මුඛය දැක මදකුදු කම්පා නොවී සිට රාක්ෂයා "අනිච්චාවත සංඛාරා - උප්පාදවයධම්මිනො, උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති - තෙසං වූපසමො සුඛො" (සියලු

සංස්කාර ධර්මයන්ගේ අනිත්‍ය ස්වභාවය) යන ගාථාව කියන කල්හි බුදු බව පතා එක් වරම රාක්‍ෂයාගේ මුවට පැන්නේය.

ඒ මොහොතෙහිම ශක්‍රයා බියකරු වේශය අත්හැර නියම වෙස් ගනිමින් දහම් සොඬ රජ්ජුරුවන් දෙ අතින් වඩාගෙන දෙව්ලොව ගෙනයන සිතින් අහසට නික්මී කොදිව් මහදිව් පසුකොට උතුම්වූ තව්තිසා දිව්‍ය ලෝකයට ප්‍රවිෂ්ඨව නන්දනොද්‍යානයද නන්දා පොකුණ ද තෙතිසක් කුඹින් ජ්වලිත වූ ඓරාවන හස්තිරාජයාද නගර දිව්‍යාප්සරාවන්ද දකිමින් සුධර්මා නම් ධර්ම සභාවට ප්‍රවිෂ්ඨ ව දහම්සොඬ රජ්ජුරුවන්ව පාණ්ඩුකම්බල ශෛලාසනයෙහි වඩා හිඳුවා ගඳ දුම් මල් පුදා ධර්මදේශනා කරන සේ ආරාධනා කළහ.

ආකාශ මධ්‍යයට පැමිණි චන්ද්‍රයා මෙන් දහම්සොඬ රජ්ජුරුවන් වහන්සේ දිව්‍ය සමූහයා පිරිවරාගෙන ධර්ම දේශනා කළ සේක. ශක්‍රදේවේන්ද්‍රයා ඒ මිහිරි වූ ධර්මය අසා සන්තොෂයට පැමිණ ස්තුති ඝොෂා කොට ආශිර්වාද පතා මනුලොවට ඇරලූහ. දහම්සොඬ රජතුමා නැවත තම රජ සැපතට පත්ව බුදුබව පතා පෙරසේම දැහැමින් සෙමින් රාජ්ජය කෙළේය.

එසමයෙහි දහම්සොඬ රජව උපන්නේ දැන් සම්මාසම්බුදු රජුන්ය.

# 387. සුතනු ජාතකය

තවද ධර්මමාධිපතිවූ (ධර්‍මයට අධිපතිවූ) සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි මව්පිය දෙදෙනාට උපස්ථානකරන්නාවූ භික්‍ෂුකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

මෙහි වර්‍තමාන කථාව විස්තර වශයෙන් 'සාම ජාතකයෙහි' පෙණෙන්නේය. මෙහි වනාහි:-

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්‍වයන් වහන්සේ දුක්පත් ගොවිකුලයක උපන්සේක. උන්වහන්සේට නම් තබන්නාහු සුතනුකුමාරයෝ යයි නම් තැබූහ.

එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ අමාත්‍ය මණ්ඩලය හා සමග සේනාව ඇරගෙණ දඩයමට ගොස් එක් බැද්දක් වටකොටගෙණ රැකවල් ලවා විධාන කරන්නාහු "යම් එකකු සිටිනා තැනින් මුවෙක් පළාගියේ නම් අඬදු කරවමි" (දඬුවම් කරවමි) භයගන්වා කොටුපතෙක තුමූ සිටියහ. එක් පිණිමුවෙක් රජ්ජුරුවන් සිටිකඩින් ඉදිරියට එන්නේය. රජ්ජුරුවෝත් විෂපෙවූ කණුහීය (ලීයෙන් තැනූ ඊතලය) දුනුපිට ලා ඇද මුවාට විද්දුහ. මුවා හීය වළහා හීය වැදහොත්තා මෙන් අඟවා වැටීහින.

රජ්ජුරුවෝත් "මුවා විත් කා වැටීහිනැ"යි සිතා ළගට ගියහ. රජ්ජුරුවන් ළඟ එන්නාවූ මුවා නැගී සිට දිවගත.

වටසිටියෝ "රජ්ජුරුවන් වහන්සේ සිටි තැනින් මුවා පළාගියේය"යි කියා වෙහෙසූහ. රජ්ජුරුවෝත් ලජ්ජාවී කඩුව අතට ගෙණ මුවා ලුහුබඳවාගෙණ තුන් යොදනෙක ගොස් මුවා අසුකොට කඩුවෙන් දෙපළු කොට සිතන්නාහු "මුවා මැරූ නියාව කී නමුත් නුවරවාසී අදහා නොගණිති" මුවා කඳට බැඳ කර තබාගෙණ එන්නාහු බරණැස් නුවරට නුදුරුතැන නුගගසක් මුල සැතපී ඉඳ යන්නට වන්නාහු ඒ නුග ගසෙහි වසන මඛාදේව නම් යක්ෂයෙක් රජ්ජුරුවන් කරා ගොස් දඩමස්කඳ අල්වා "රඳව"යි කීහ.

එවිට රජ්ජුරුවෝ කියන්නාහු "ඇයි කුමක් නිසා රැඳවීදැ?"යි විචාළාහ. යක්ෂයා කියන්නේ "මේ නුගසෙවන යට වන් කෙනෙකුන් කණ නියායෙන් වෙසවුණු රජ්ජුරුවන්ගෙන් වරලදිමි. මට ගොදුරුව යා නොහැක්කැ"යි කීය. එවිට රජ්ජුරුවෝ කියන්නාහු "මම එසේ කීනම් එකෙකිම් නොවෙමි. (මම සාමාන්‍ය කෙනෙක් නොවෙමි) බරණැස් රජෙමි, අද මට මේ දඩමස් කඳ ගෙණ මා නුවරට යවව, තොපට දවස බත්තලියක් හා මිනිසකු එවමි" කීහ. යක්ෂයාත් "යහපතැ"යි ගිවිස රජ්ජුරුවන් නුවරට යැවීය.

රජ්ජුරුවෝත් නුවරට ගොස් තමන් වැඩ පසස්නා අමාත්‍යයකුට කීහ. අමාත්‍යයා කියන්නේ "සාමිනි, අවධිය කීයේ ඇයිදැ?"යි (කාල සීමාවක් නොකීවේ ඇයිද?) කීහ. රජ්ජුරුවෝත් "නැතැ"යි කීය. අමාත්‍යයා කියන්නාහු "අවධියක් නොකියේ වැරැද්දැයි. එසේවුවත් භය නොකළ මැනව, නුඹ

වහන්සේගේ ජීවිතය රැකදෙමි. මට සිරගෙය දුන මැනව"යි සිරගෙය ඇරගෙණ විධානය කරන්නාහු "රැකෙන්නා කැමති කෙනෙක් මේ බත්තලිය යක්‍ෂයාට දෙමි"යි කියා යවන්නාහු මෙම නියායෙන් තිරන්තරයෙන් බත්තලියක් හා මිනිසකු බිලිදීමෙන් සිරගෙයි මනුෂ්‍යයෝත් නිමාගියහ.

අමාත්‍යයා එපවත් රජ්ජුරුවන් වහනසේට කියා රජ්ජුරුවෝත් එපවත් අසා ජීවිතයට වඩා මනුෂ්‍යයෝ අර්ත්‍ථයෙහි ලෝභ ඇත්තාහ. දහසින් බැඳි පියල්ලක් ඇතු පිට තබා "මේ මසුරන් දහස ඇරගෙණ යක්‍ෂයාට බත්තලිය දෙව"යි නුවර බෙරලවා "මසුරන් දහස ඇරගත් කෙනෙක් ඇත්නම් උඟ අත බත්තලිය යව"යි කීහ. අමාත්‍යයාත් එලෙස කළේය.

බෝධිසත්‍වයන් වහන්සේ "ඒ මසුරන් දහස ගෙණ යක්‍ෂයාට බත්තලිය දෙව"යි නුවර බෙරලැවූ මසුරන් දහස ගෙණ මෑණියන්දෑට දී සිතන්නාහු "මේ මසුරන් දහස මෑණියන්දෑට දී ගියකළ යක්‍ෂයා දමනයෙහි ලා ගතහොතින් නම් බොහෝ සම්පත් ලැබෙමි. නැත මේ යක්‍ෂයාට බිලිවෙමි. මසුරන් දහස කීප දවසක් රැකෙන්ට ඇත්තේ වේදැ"යි සිතා "මෑණියන් වහන්ස, මම යක්‍ෂයාට බත්තලියක් ඇරගෙණ යෙමි" කීහ.

එවිට මෑණියන්දෑ කියන්නාහු "පුතඬ, තොප කී මසුරන් දසෙන් මට ප්‍රයෝජන නැත, යක්‍ෂයා ලඟට තොපි නොයව"යි කීහ. බෝධිසත්‍වයෝ කියන්නාහු "මෑණියන් වහන්ස, භය නොකළ මැනව, ඒ යක්‍ෂයා දමනයේ ලා අඬන්නාවූ නුඹ

වහන්සේගේ මූණ සිනා සෙමින් එමි. මැණියන් වහන්සේ කීපචාරයෙක කීවාවූ අවවාද නොගිවිස අස්වසා රජ්ජුරුවන් හා සමඟ රජගෙට ගියහ.

රජ්ජුරුවෝත් “දරුව, තොපට උවමනා කිම්දැ?”යි කීහ. “ස්වාමීනි, නුඹවහන්සේගේ මිරිවැඩිසගල (සෙරෙප්පු කුට්ටම) උවමැන”යි කීහ. “කවර කාරණයකටදැ?”යි කීහ. “දේවයන් වහන්ස, යක්‍ෂයා සන්තක බිම නොසිටිනා නිසාය”යි කීහ. “යහපතැ”යි මිරිවැඩිසගලදී “තව කුමක් උවමනාදැ?”යි කීය. “සේසත උවමැනවැ”යි කීහ. “ඒ කවරක්දැ”යි විචාළාහ. “යක්‍ෂයාගේ ඡායාවට යට නොසිටිනා නිසාය (සේසත යට සිටිනා විට යක්ෂයාගේ සෙවණට අසු නොවන බැවිනි) යි කීහ. “යහපතැ”යි සේසතත් දී “තව කුමක් උවමනාදැ”යි කීහ. “ස්වාමීනි, නුඹවහන්සේගේ මගුල් කඩුව උවමැනව”යි කීහ. “කවරකටදැ?”යි විචාළාහ. “යක්‍ෂයා භයගන්වා ආරක්‍ෂාවටය”යි කීහ. “යහපතැ”යි කඩුවත් දී “තව කුමක් උවමැනාදැ?”යි කීහ. “නුඹවහන්සේගේ රන්තලියේ නුඹවහන්සේ මේනිමවන්ට සපයන ලද රසමසවුලෙන් යුක්තවූ භෝජනය (රජතුමාට සූදනම් කළ රසවත් ආහාර) ලා දුන මැනව”යි කීහ. “ඒ කවරටදැ?”යි රජ්ජුරුවෝ විචාළාහ. “මා තරම් නුවණැත්තාවූ පුරුෂයකු ගෙණයන්නාවූ බත් ලෝ තලියෙන් සමාන බත ගෙණයාම යුක්ත නොවන හෙයිනැ”යි කීහ. රජ්ජුරුවෝ “යහපතැ”යි රන්තලියේ බත් ලවා සරහාදී මෙකියන සියල්ලම ගෙණයන්ට මිනිසුන් සලස්වාදී යවූහ.

බෝධිසත්ත්වයෝත් මේ හැම ඇරගෙණ නික්ම ගොස් නුගගස සමීපයේදී මිනිසුන් රඳවා බත්තලිය අතට ගෙණ රන්මිරිවැඩි සඟල පයලා සේසත අතට ගෙණ කඩුව උරයේ බහාගෙණ බත්තලිය බිම තබා කඩුව අතට ගෙණ කඩුපතින් බත්තලිය නුග ඡායාව යටට කොට "මේ ගස වසන්නාවූ මඛාදේව නම් යක්‍ෂයා අපගේ රජ්ජුරුවන්ගෙන් එවන ලද රසමසවුලෙන් යුක්තවූ මේ තලිය ඇරගණුව"යි අඬගැසීය.

එවිට යක්‍ෂයා සිතන්නේ "මෙතෙක්දු එන්නාවූ පුරුෂයන්සේ නොවෙයි වඤ්චාප්‍රයෝග දන්නා එකෙක, මා වඤ්චාකොට ගැලවීයෙමි සිතාය"යි කියා කියන්නේ "තා ඉවත සිට කථාකරන්නේ ඇයිද, නුගගස යට සිට මා හා කථාකරව, බත්තලියත් මාගේය, තොපිත් මාගේ සන්තකමය, බත්තලියත් කමි, තොපිත් කමි"යි කීය.

එවිට බෝධිසත්ත්වයෝ කියන්නාහු "එඹල රාක්‍ෂසය, මා කයි නම් තටමය අඩුව. බරණැස් නුවර මට වඩා නුවණැති පුරුෂයෙක් නැත. එසේ වූ සුතනු කුමාරයන් වැනි නුවණැති ගුණ ඇති පුරුෂයකු කාපු රාක්‍ෂසයා අප තිබාදැ යි කියා සෙට පටන් තට ගෙණෙනා බත්තලියත් නැත, මිනිසාත් නැත. ඉදින් මා නොකා අලවු නම් තොපට නිරන්තරයෙන් එවන බත්තලිය එවමි. ඉදින් මා කන්ට සිතී නමුත් කෑ නැත, තාගේ බිම මා නොසිටි හෙයිනුත් තාගේ ඡායාව නොසිටි හෙයිනුත් කෑ නැත, නුගගස ඡායාවට වන් කෙනෙකුන් විනා කෑ නැති හෙයිනුත් තමාම කෑ නැත. ඉදින් නොනැවත කයි නම්

කඩුවෙන් දෙකඩ කෙරෙමි. ඉදින් අපගේ රජ්ජුරුවන්වහන්සේ ගොස් අල්වා ගනිමියි කී නමුත් තාගේ නුග ඡායාවෙන් ඉවත්ව සිටිහෙයින් කෑ නොහැක්ක''යි කීහ. එවිට යක්‍ෂයා "මුන් කීයේ සැබෑව, මුන් කෑයේ වීමිනම් සෙට පටන් මට ගෙණෙන බත්තලියත්, මිනිසාත් නැත. එයින් අලාභයයි මා ගොසින් රජ්ජුරුවන් ඇල්ලිය නොහැක්කැයි මුන් කියේ කටයුතුය''යි සිතා "යහපත තාගේ ජීවිතදානය දිනිමි, තෙල තලියත්, සේසතත්, කඩුවත්, මිරිවැඩිසගලත් රජ්ජුරුවන්ට දී අඬන්නාවූ මෑණියන් සතුටු කරව''යි කීහ. "තොපි ගොසින් සෙට පටන් මට එවන බත් තලිය හා මිනිසා එව''යි කීහ.

එවිට බෝධිසත්‍වයෝ "යක්‍ෂයා මාගේ බසට නැමින මා සිතුවා මුදුන්පත් වීය''යි සිතා එවිට කියන්නාහු "එම්බල යක්‍ෂය, ප්‍රාණඝාත කිරීම නම් මෙලෝ පරලෝ දෙකින්ම අලාභවන කටයුත්තය, ප්‍රාණඝාතාදිය නොකරව''යි යක්‍ෂයා දමනයේ ලාගෙණ "මෙතන වනයේ වාසයකොට කම්කිම්ද? බරණැස් නුවර වාසල්දෙර දේවාලයක් සරහා රජ්ජුරුවන් වහන්සේට කියා දෙවමින්'' යක්‍ෂයා ලවා සේසත්ද රන් තලියද ගෙන්වාගෙණ නුවරට නික්මුණාහ.

මග දුටු දුටුවෝ "සුතනු මානවකයෝ මඛාදේව නම් යක්‍ෂයාද දමනයේ ලාගෙණ එති''යි නුවර වාසීන්ට කීහ. නුවරවාසීහු රජ්ජුරුවන්ට දැන්වූහ.

රජ්ජුරුවෝත් සතුටුව අමාත්‍ය මණ්ඩලය හා සේනාව පිරිවරා සුතනු මානවකයන් ඉදිරියට පෙර ගමන් කොට

ගොසින් බෝධිසත්වයන් දැක සතුටුව රාක්‍ෂසයාට වාසල්දෙර දෙවොලයක් කර නුවර සියල්ලවුන්ගෙන් බත් දෙවන ලෙස සලස්වා නුවරට ගොස් සුතනු මානවකයන්ගේ ගුණ කියන්නාහු "එම්බා අමාත්‍යයෙනි, මාගේ ජීවිතය රැක දුන්නේත් නුවරවාසීන්ට සැපත දුන්නේත් සුතනු මානවකයන් නිසාය"යි ගුණ කියා බෝධිසත්වයන් වහන්සේට සෙනෙවිරත් (සේනාපති තනතුර) තනතුරු දී එතැන් පටන් බෝධිසත්වයන්ගේ අනුශාසනායෙහි දශරාජධර්මයෙන් (රජෙකුට තිබිය යුතු යුතුකම් දහයක්. දාන, ශීල, පරිත්‍යාග ආදියයි) රාජ්‍යයකොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදාරා මේ 'සුතනු ජාතකය' නිමවා වදාළ සේක.

"එසමයෙහි රාක්‍ෂසයා නම් අංගුලිමාල මහා ස්ථවිරය. බරණැස් රජ්පුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. සුතනු මානවකයෝ නම් බුදුවූ මම්ම වේදැ"යි වදාළසේක.

## 388. ගිජ්ඣ ජාතකය

තවද ධර්මරත්නාකරවූ (ධර්ම රත්නයට ආකාරයක්වූ) සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි මව්පියන්ට උපස්ථාන කරන්නාවූ භික්‍ෂුකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

එක් භික්‍ෂුකෙනෙකුන් වහන්සේ දෙමව්පියටන්ට උපස්ථාන කරණ සේක. භික්‍ෂූන් වහන්සේ සර්වඥයන් වහන්සේට එපවත්

දැන්වූ සේක. සර්‍වඥයන් වහන්සේ “දැන් මතු නොවෙයි මහණෙනි, පෙර උත්තමයෝත් දෙමව්පියන්ට උපස්ථාන කළෝ වේදැ”යි වදරා “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්ත්වයෝ ගිජුලිහිණිව ඉපිද අන්ධ වූ දෙමව්පියන් රක්නාහ. බරණැස් නුවර එක් වැද්දෙක් අමුසොහොනක් සමීපයෙහි මලක් (සතුන් අල්ලා ගැනීමට දමන මල පුඩුවක්) ලාලීය. බෝධිසත්ත්වයෝ ගොදුරු සොයා ඇවිදිනාහු ඒ මල කරලාගෙණ මලෙහි බැඳි තමන් මලබැඳි සෝකයට වඩා තමන්ගේ දුක නොසිතා දෙමව්පියන්ගේ දුක සිතා අඬන්නාවූ “අනේ මාගේ දෙමව්පියන් දෙදෙනා මා මල බැඳුනු නියාව නොදනිති, ගොදුරු සොයාලන කෙනෙකුත් නැත, දුක්ඛයෙන් ගල්ලෙන ඒ ඒ තැන වැටී අඬන්නාහ”යි කියා තමන්ගේ දුක් නොසිතා දෙමව්පියන්ගේ දුකට හැඬූහ. එවිට වැදි එතනට අවුත් බෝධිසත්ත්වයන් අඬන අඬ අසා කියන්නේ “ගිජුලිහිණියන් මනුෂ්‍ය භාෂාවෙන් කථාකරන්නාවුන් දුටුවිරූත් (දැක පරුද්දක් නැති බව) නැත, ඇසූවිරූත් (අසා පුරුද්දක් නැති බව) නැත. තොපි තොප මලබැඳුන හෙයින් භයින් අඬව්ද? නැත්නම් අනික් කවර කාරණයක් නිසා අඬ වැලපුදැ?”යි විචාළාහ. එවිට බෝධිසත්ත්වයෝ කියන්නාහු “මරණ භයින් අඬන්නේ නම් නොවෙයි, ඇස් අන්ධවූ දෙමාපියන් මා රකින්නේය. මාගේ මව්පියන් දෙදෙනා පැන් නොලැබ තළු වියලී (උගුර තොල

කට වේලී) මියන්නාහ. ඊට අඬමි'' කීහ. ඒ අසා වැදි කියන්නේ ''ඒ වන්නා එසේමය, ගිජුලිහිණියෝ නම් සියත් යොත්නෙක (යොදුන් සියයක්) ආකාශයේ යමින් සිට බිම තිබු කුණු දක්නාහ. තොපි මා ළුඈ මල නොදකින්ට කාරණා කිම්දැ?''යි කීහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහු ''යම් අකුශලයක් පැමිණෙන කල කිසිවකුත් නොපෙනෙන්නේය. වන්නාවූ විපත්තියම පැමිණෙන්නේය''යි වැද්දාට කීහ. වැදි බෝධිසත්වයන්ගේ බසට සමාධිව කියන්නාහු ''තොප කී බසට සතුටුවූ මම තොප මලින් උනාඅරිමි (බැම්මෙන් මුදවා), සැපසේ ගොසින් තොපගේ දෙමාපියන් රකුව''යි කියා බෝධිසත්වයන් මලින් උනා අළ. එවිට බෝධිසත්වයෝත් ''තොපි තොපගේ බන්ධූන් සමග ජීවත්ව''යි වැද්දාට කියා තමන්ගේ දෙමාපියන්ට ගොදුරු ගෙණ වනයටම ගියාහයි වදාරා මේ 'ගිජ්ඣ ජාතකය' නිමවා වදාළ සේක.

''එසමයෙහි වැද්දා නම් ඡන්න ස්ථවිරය. බෝධිසත්වයන්ගේ මෑණියෝ නම් මහා මයා දේවිය, පියාණෝ නම් සුද්ධෝදන රජ්ජුරුවෝය. ගිජුලිහිණිව උපන්නේ නම් බුදුවූ මම්මය''යි වදාළසේක.

## 389. දබ්බපුප්ඵ ජාතකය

තවද කරුණාවට පිහිට වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් ලෝභි භික්ෂුකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

එක් උපනන්ද සඞ්ඛ්‍යාත භික්‍ෂුකෙනෙකුන් වහන්සේ භික්ෂූන්ට කියනකල "භික්‍ෂූනි, ලාභයෙහි ගිජුනොව ලද්දෙයකින් යපෙව, අල්ප සන්‍තොෂවව"යි බණ කියන සේක. තමන්වහන්සේ ගමකට වන්කල එක් ගෙයක පාත්‍රයද, එක් ගෙයක සැරයැටියද, එක් ගෙයක පොත් මිටියද, එක් ගෙයක ඩබරාවද (පැන් කෙණ්ඩිය, පැන් පෙරන උපකරණ) යි කියා ගෙවල් සතරෙක පසෙක තමන්වහන්සේ නතුකොට ලාභ සත්කාරද ගරුභාණ්ඩ සපයාගෙණ උපාසකවරුන්ට අවවාද කියා බොහෝ වස්තු සොයා ගැලෙක පුරවාගෙණ සැවැත්නුවරට එනසේක.

සැවැත් නුවර භික්‍ෂූන් වහන්සේ වැඩහිඳිනා විහාරයට අවුත් ගෙවල් එකක් දෙකක් පන්නා යනකලට වැලක පය පැකිළින. එවිට "මේ ගෙවල්වලින් මට ලාභයක් ඇත මැනවැ"යි ඒ ගෙට වන්සේක් ඒ ගෙයි වසන මාළු භික්‍ෂු දෙදෙනකුන් වහන්සේ සංඝිකව ලත් වක්කාරි දෙකකුත් (රෙදි කඩ දෙකක්) ලක්‍ෂයක් වටනා පලසකුත් බෙදාගත නොහී තුබූයේය. ඒ දෙදෙනා වහන්සේ "ස්වාමීනි, මේ අපට බෙදාදුන මැනව"යි කීහ. උන්වහනසේ ඒ වක්කාරි දෙක දෙදෙනාවහන්සේටදී තමන් වහන්සේ "ඒ පලස විනේධර කෙනෙකුන්වහන්සේට විනා ගතයුතු නොවෙ"යි කියා තමන් වහන්සේ ඇරගත්සේක.

ඒ දෙදෙනා වහන්සේ ගිවිස්වා අරගත් දෙයක් නොවන බැවින් මුරගා භික්ෂූන්වහන්සේට කීසේක. භික්ෂූන්වහන්සේත් ධම්සභා මණ්ඩපයේ රැස්ව මෙපවත් කිය කියා වැඩඋන්තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරාවදාළ කල්හි ඒ භික්ෂූන් වහන්සේ "ස්වාමීනි, අනික් කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ, උපනන්ද සඞ්ඛ්‍යාත නම් ස්ථවිරයෝ භික්ෂු දෙදෙනකුට වක්කාරි දෙකක් දී තුමූද පලස අරගත්තුය යන මේ කථාව කියා කියා උනුම්හ"යි කීහ. සර්වඥයන් වහන්සේ "එම්බා මහණෙනි, මූ දැන්මතු නොවෙයි පෙරත් අනුන්ට ලාභය මදකොට දී තුමූ වැඩිතරමේ ලාභය අරගත්තෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්ත්වයෝ එක් ගඟක් අසල වෘක්ෂදේවතාව උපන්නාහ. ඒ ගඟ අසළ දබ්බපුෂ්ප නම් කැණහිලකු හා කැණහිල් ධේනුවක් වාසය කරන්නීය. ඒ කැණහිල්දෙන "රේමස්කන්ට දෙළම්" (ලූල් මාළු වැනි මාලු වර්ගයක් කෑමට ආසාව) යි කැණහිලාට කිව, කැණහිලාත් ගඟ අසල බලා අච්දිනකලට අනුචාරී නම් දියකාවකු හා ගම්භීරචාරී නම් දියකාවකු හා දෙදෙනක් ඇත, ඉන් ගම්භීරචාරී නම් දියකාවා මසෙකු අල්වා ගත. ඒ

කුඩමස්සා දියකාවාත් ඇරගෙණ දියයට වදින්ට වන. ඒ දියකාවා අනුවාරී නම් දියකාවාට කියන්නේ "එම්බා අනුවාරී නම් දියකාවනෙනි, මේ මත්සයයා මාත් ඇරගෙණ දියයට වදින්ට උත්සාහ කෙරෙයි වහා අවුත් මට සහායව කුඩමස්සා අල්ව"යි කීහ.

එවිට දියකාවා කියන්නේ "මේ තොපි නොබව, ඇල්ලුගැන්ම ස්ථිල නොකොට (බුරුල් කරන්නේ නැතිව) තරයේ අල්වව, මමත් එමි" කියාගොස් කුඩමස්සා ඩැගෙණ දෙන්න කැටිව ගොඩලා බෙදගත නොහී උනුත් කණකලට කැණහිලා එතනට ආය. දියකාවෝ දෙන්නා කැණහිලා දැක "එම්බා සබඳ, මේ කුඩමස්සා අපට සරියේ බෙදදීලව"යි කීහ.

එවිට කැණහිලා කියන්නේ "එම්බා මට බොහෝ අධිකරණ විචාරණ යුක්තිපසඳිනා (සාධාරණව නඩු ඇසීමට පුළුවන් බව) දනිමි, මේ කුඩමස්සා ධර්මිෂ්ටව බෙදමි" කියා අනුවාරී දියකාවට වල්පත දිසාවදී "ගම්භීරවාරී දියකාවාට ඉස දිසාව තරමැ"යි කියා දී "ධර්මිෂ්ඨව බෙදූ මට මධ්‍යයේ කැබැල්ල යහපතැ"යි ඇරගෙණ ගියාහ. දියකාවෝ දෙදෙනත් "අප සැපසේ බෙදගෙණ කන්නාවූ රේමස ඇරගෙන ගියේය"යි මුරගෑය. ඒ කැණහිල් දෙනත් කැණහිලා ගෙණෙන රේමස දැක සමෘධිව කියන්නී "මේ රේමස කොයින් සම්භවිදැ?"යි විචාරා යුක්ති කියා ගෙණා නියාව අසා "මේ රේමස සම්භවූ නියාව සක්විති රාජ්‍යයක් ලත්විවර ඇත, මාගේ මනෝරථය

(මනදෙළ, අදහස) මුදුන්පත්ව නියාය"යි කියා තමාගේ ස්වාමියාට ප්‍රසංසා කොට රේමස කෑව.

සර්‍වඥයන් වහන්සේත් "එම්බා මහණෙනි, භික්‍ෂූහු නම් අනුන්ට ලාභය නොවිඳුව"යි අවවාද කියා "තමා ලාභසත්කාර විඳිම භික්‍ෂූන් කළ මනාදෙයක් නොවේ"යි වදාරා මේ 'දබ්බපුෂ්ප ජාතකය' නිමවා වදාළ සේක.

"එසමයෙහි දියකාවෝ දෙදෙන නම් දැන් මහළු භික්‍ෂූහු දෙදෙනාය. කැණහිලා නම් උපනන්‍ද සඞ්ඛ්‍යාත ස්ථිවිරය. මේ විත්තිය ප්‍රත්‍යක්‍ෂ කොට දුටුවාවූ වෘක්‍ෂ දේවතාව උපන්නෙම් බුදුවූ මම්මය"යි වදාළසේක.

# 390. උසන්නක ජාතකය

තවද මහත්වූ ධෛර්‍ය්‍යී ඇති සර්‍වඥයන් වහන්සේත් ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් ස්ත්‍රියක් කෙරේ පිළිබඳ සිත් ඇති භික්‍ෂුකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්නව ලද.

ඒ කෙසේද යත්?

එක් භික්‍ෂුකෙනෙකුන් වහන්සේ ස්ත්‍රියක් කෙරේ පිළිබඳ සිත් ඇතිව වාසය කරණසේක. ඒ භික්‍ෂූන් වහන්සේ භික්‍ෂූහු ගෙණවිත් සර්‍වඥයන් වහන්සේට පෑ "ස්වාමීනි, මේ මහණ ස්ත්‍රියක් කෙරේ පිළිබඳව වාසය කෙරෙ"යි දැන්වූ කල්හි "සැබෑද මහණෑ?"යි වදාරා "දැන් මතු නොවෙයි, පෙරත් අනාර්ත්‍ථකාරීවූ (අයහපත කරන්නාවූ) මෑ නිසා චෛතසික

රෝගයෙන් (සිතේ ලෙඩින් පීඩාවට පත්වූයේ) මරණ ලබන්නේ නුවණැත්තවුන් නිසා ජීවිතය ලද්දහුය”යි වදාරා ඉකුත්වත් කථාව ගෙණහැර දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි පුරණ ලද බෝධිසම්භාර ඇති අප මහබෝසතානන් වහන්සේ බමුණු කුලයක උපන්සේක. උන්වහන්සේට සේනක කුමාරයෝයයි නම් තැබූහ. උන්වහන්සේ වැඩිවිය පැමිණ තක්සලා නුවරට ගොස් සියළු ශිල්ප ඉගෙණ අවුත් රජහට අර්ත්‍ථයෙන් ධර්‍මයෙන් (ආර්ථික දියුණුව හා දැහැමි ජීවිතය ගැන) අනුශාසනා කරන්නාවූ අමාත්‍ය වූසේක. සේනක පණ්ඩිතයන් වහන්සේයයි කී කල්හි චන්‍ද්‍ර සූර්‍ය්‍යයන් මෙන් ලොව ප්‍රසිද්ධ සේක.

එකල්හි රජහුගේ පුරෝහිත බමුණුගේ පුත්‍රතෙම රාජසේවයට ආයේය. සර්‍වාභරණයෙන් සැරහුනාවූ උතුම්වූ රූපශ්‍රී ධරන්නාවූ රජහුගේ අගමෙහෙසුන් බිසවුන් දැක පිළිබඳ සිත්වූයේ ගෙට ගොස් නිරාහාරයෙන් හොත්තේය, යහළුවන් විසින් විචාරණලදුව එපවත් කීය. රජතෙම පුරෝහිත පුත්‍රයානෝ දැක එපවත් අසා කැඳවා ගෙන්වා “මම තට මේ බිසව සත්දවසකට දෙමි, සත්දවසක් තොපගේ ගෙයි වස්වා අටවෙනිද කැඳවාගෙණ එව”යි කීහ. ඒ තෙමේ “යහපතැ”යි පිළිගෙණ බිසව ගෙට කැඳවාගෙණ ගොස් එක තැන විසීමෙන් ඔවුනොවුන් කෙරේ පිළිබඳ සිත් අතිව කිසිවක්හට නොදන්වාම

උදය හළ දෙරින් ඇමට පළමු නික්මගොස් අන් රජක්හුගේ ආඥා පවත්නා (අණසක පවතින) රටකට වන්නාහුය. නැවත ගිය මගක් මෙන් ඔවුන් ගිය මග කවුරුත් නොදක්නාහු වෙති. රජ නුවර බෙරලවා නොයෙක් පරිද්දෙන් නුවර පරීක්ෂා කරන්නේත් ගිය තැනක් දැනගතනොහී ඈ නිසා ඒ රජහට බලවත් සෝක උපන, හෘදය උනුවිය, බඩින් ලේ යන්නට පටන්ගත. බලවත් වෙදවරු ඇවිත් පිළියම්කොට ගුණකරන්නට නොහැකිවූවාහුය.

බෝසතනන් වහන්සේ ඒ දැක “මෝ හට වාතපිත්තාදියෙන් (වා පිත් කිපීමෙන්) උපන් ව්‍යාධියෙක් නොවෙයි, භාය්‍යාව නුදුටු බැවින් මනෝදුක්ඛයෙන් ආ ව්‍යාධියෙක, (මානසිකව හටගත් රෝගයක්) උපායකින් ඕ හට පිළියම් කෙරෙමි”යි ආයුර නම්වූද පුක්කුස නම්වූද පණ්ඩිත අමාත්‍යයන් දෙන්නා කැඳවා “රජහට මේ බිසව නොදැක්මෙන් උපන් ලෙඩ විනා වෙන ලෙඩක් නැත, මේ රජ අපට උපකාරී එකෙක, උපායෙන් පිළියම් කරම්හ. රජගෙයි මළුවේ නැටුම් යොදා කඩුවක් ගිලින්නට දන්නා එකෙකු ලවා කඩුව ගිලින්ට සලස්වා රජ සිව්මැදුරු කවුළුව සමීපයෙහි ඉන්ට සලස්වා ඒ දක්වම්හ, ඒ දැක මීට වඩා දුෂ්කරයෙක් ඇද්දැ?”යි විචාරන්නේය, යහළු ආයුර පණ්ඩිතයෙනි, තෙපි එබසට “අසවල් දෙය දෙමි කියා ප්‍රතිඥා කොට කීම ඊටත් වඩා දුෂ්කරය” යි කියාලව. එම්බා පුක්කුස පණ්ඩිතයෙනි, තොපි “යමක් දෙමි කියා ප්‍රතිඥා කොට ඔහුගේ ආසාව වඩා නැවත නොදෙම්යි කියා අසා විච්ඡේදය කිරීම (ආසාවන්

බලාපොරොත්තු බිඳ දැමීම) ඊටත් වඩා දුෂ්කරය'' යි කියාලව, ඉන් ඇත කියයුත්ත මම දනිමි'' කියා වදාළසේක.

එසේ කියා නැටුම් යොදා රජහුගේ සමීපයට ගොස් ''මහරජ්ජුරුවන් වහන්ස, නැටුම් බලා වදාල මැනව, ශරීර දුක්ඛයත් මඳක් ශාන්ත වෙයි'' කියා රජහු කැඳවාගෙණ සිව්මැදුරු කවුළුව සමීපයේ නැටුම් බලා ඉන්ට සැලැස්වූවාහුය, බොහෝ දෙන නැටුම් පෑවාහුය.

එක් පුරුෂයෙක් තෙතිස් අඟුල් දිග (අඟල් තිස්තුනක් දිග) ඇති තියුණු මුවහත් ඇති කඩුවක් ගිළීය. රජ ඒ දැක ''මේ පුරුෂතෙමේ තියුණු ධාරා (සියුම් මුවාත) ඇති සතුරන් ඇග රුධිරපානය කරණ දසන්නක දෙශයෙහි උපන්නාවූ මේ කඩුව ගිළීය, මේ ඉතා දුෂ්කරයෙක් ලොව ඇද්දැ?''යි ආයුර පණ්ඩිතයන් අතින් විචාළේය. එබසට ආයුර පණ්ඩිතතෙම ''දේවයන් වහන්ස, මේ පුරුෂයා තමන් අභ්‍යාසකළ (පුහුණු) හෙයින් කඩුව ගිළින්නේය. ඒ ඉතා දුෂ්කරයෙක් නොවයි. යමෙක් තමාට ආවේනික වූ ධනයක් අනිකක්හට දෙමි කියාද ඒ කීමම දුෂ්කර වන්නේය, ඉන් පිටත් දුෂ්කරයෙක් නැතැ''යි කියේය.

ඒ අසා රජ ''කඩුව ගිළීමට වඩා දෙමි කියන බස දුෂ්කරවේල, මමද පුරෝහිත පුත්‍රයාට බිසව දෙමි කීමි, මා විසින් දුෂ්කරයෙක් කරණලද'' සලකන්නහට මඳක් සෝක නැතිවිය, නැවත ''මේ දෙමි කීමට වඩා අනික් දුෂ්කරයෙක් ඇද්දැ?''යි පුක්කුස පණ්ඩිතයන් විචාරණුයේ ''මේ ආයුර

පණ්ඩිතතෙම කඩුව ගිලීමට වඩා තමා සන්තක දෙයක් දෙමි කීම දුෂ්කරය''යි කීය. එකල්හි පුක්කුසය පණ්ඩිත තෙම "දේවයන් වහන්ස, යමෙක් කාරිය සිද්ධියට නොපමුණුවන්නාවූ (ක්‍රියාවට නැන්විය නොහැකි) වූ නිෂ්ඵලවූ තෙපුල් කියන්නේ විනම් ජනයෝ ඔහු ඇසිරුව ජීවත් වම්හයි නොසිතති. එබැවින් යමෙක් දෙමි කියා ලබන අයගේ ආසාව වඩා නැවත නොදෙමි කීමට වඩා දුෂ්කරයෙක් ලොව නැතැ''යි කිය.

රජ ඒ බව අසා "මම පුරෝහිත පුත්‍රයාට බිසව දෙමි පළමුකොට කියා දිනිමි. නැවත අර ගන්නා සිතින් පරීක්‍ෂා කරවීමි, මා කළේ ඉතා දුෂ්කරයෙකැ''යි සිතන්නාහු රජහුගේ සිතෙහි සෝක මඳක් තුනීවිය. ඉක්බිත්තෙන් රජතෙම මේ සේනක පණ්ඩිතයන්ට වැඩි පණ්ඩිතකෙනෙක් ලොව නැත. එබැවින් මේ ප්‍රශ්ණය ඔවුන් අතින් විචාරමි සිතා "එම්බා සේනක පණ්ඩිතයෙනි, මේ පුක්කුස පණ්ඩිතතෙමෙ යමක් දෙමිකියා නොදෙමි කීම දුෂ්කරයෙකැයි කීය. දුෂ්කරයට වැඩි අනික් දුෂ්කරයෙක් ඇත්නම් ඒ තොපි කියව''යි කීයේය. එකල්හි මහබෝසතාණන් වහන්සේ මෙසේ වදාළසේක.

"මහරජ, යම් කිසිවෙක් මඳවූද බොහෝවූද දනයක් දුන්නේද, යමෙක් දන්දී පසුතැවිලි නොවේද, එතෙම ඊටත් වැඩියෙන් දුෂ්කර වන්නේ''යි මෙසේ අප මහබෝසතානෝ රජහට දන්වනසේක් දනයදී අපර චේතනාව (තුන්වැනි සිත, යමක්දී අවසානයේ ඇතිවන සිත) පිරිසිදුකොට ගන්නට දුෂ්කර බව වෙස්සන්තර ජාතකයෙන් දන්නේය. ජූජක නම්

බ්‍රාහ්මණයාට පුත්‍රයන් දී ඔහු විසින් හිංසාව දැක මාගේ පුත්‍රයන් ගෙන එම්දේදැයි බෝධිසත්වාදී මහොත්තමයෝ "දන්දී කවරෙක් පසුතැවිලි වන්නේහිදැ?"යි සිතූසේක.

රජ්ජුරුවෝ බෝධිසත්වයන්ගේ වචනය අසා සලකාගත් සේක. "මම මාගේ සිතින්ම පුරෝහිත බ්‍රාහ්මණ පුත්‍රයාහට මහේසිකාවදී සිත් දරාගන්නට නොහැකිවූයෙමි, සෝකකෙරෙමි, මිරිකුණෙමි, මට මේ සුදුසු නොවෙයි. ඉදින් මා කෙරෙහි ස්නේහ ඇත්නම් මේ ඓශ්වර්‍ය්‍ය (රාජ සම්පත්) හැර නොයන්නීය. මට ස්නේහ නොකොට ගියාහ. ඇගෙන් මට කවර ප්‍රයොජනදැ"යි සිතන්නාහුගේ පියුම් පත්හි දියබිඳු සෙයින් සියලු සෝකය පහව ගියේය. එකෙණෙහි කුක්ෂි රෝගය සන්හිඳී සුවපත්ව සිට බෝසතාණන්ට ස්තුතිකරණසේක්, "ආයුර පණ්ඩිතයෝද ප්‍රශ්නය ප්‍රකාශ කළෝය. පුක්කුස පණ්ඩිතයෝද එසේම ප්‍රශ්නය ප්‍රකාශ කළෝය. ඔවුන්ට වැඩියෙන් නුඹ වහන්සේගේ ප්‍රශ්න විසඳීම යහපතැ"යි ස්තුතිකොට බෝසතානන් වහන්සේට සතුටුව බෝහෝ වස්තු දුන්සේක.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ජාතක ධර්‍ම දේශනාව ගෙණ හැර දක්වා වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට මේ ජාතකය නිමවා වදාළසේක. චතුස්සත්‍යාවසානයෙහි උකටලී භික්ෂූහු සෝවාන් ඵලයෙහි පිහිටිසේක.

"එකල්හි රජහුගේ අගමෙහෙසුන් බිසව් නම් දැන් මේ පුරාණ දුතිකාවන්නීය. එකල්හි රජ නම් උකටලී භික්ෂූහුය.

ආයුර පණ්ඩිතයෝ නම් මෞද්ගල්‍යායන ස්ථවිරයෝය. පුක්කුස පණ්ඩිත නම් ශාරිපුත්ත ස්ථවිරයෝය. එකල්හි රජහට අර්ත්‍ථයෙන් ධර්‍මයෙන් අනුශාසනා කළාවූ සේනක පණ්ඩිතයෝ නම් දැන් බුදුවූ මම්මය''යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 391. සත්තුභස්ත ජාතකය

තවද සර්‍වධර්‍මයන් ස්වයම්භූඥානයෙන් (සියලු දතයුතු ධර්‍මයන් තම නුවණින්ම දත්) දත්තාවූ අප තිලෝගුරු සම්‍යක් සම්බුදු රජොත්තමයානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ප්‍රඥාපාරමිතාව අරභයා මේ ජාතකය දක්වන ලද, මෙය වනාහී විස්තර වශයෙන් උම්මග්ග ජාතකයෙන් පෙණෙන්නේය.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර ජනක නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ බ්‍රාහ්මණ කුළයක ඉපිද වැඩිවිය පැමිණ සේනක නම්ව දිසාපාමොක් ආචාරීන් අතින් ශිල්පය නිමවා ඉගෙණ රජ්ජුරුවන් කරා අවුත් රාජ්ජය දසරාජ ධර්‍මයෙන් (දාන, ශීල, පරිත්‍යාග, ඇදනැතිබව, මැදහත්බව, සිල්වත්බව, ක්‍රෝධ නොකරීම, අවිහිංසාව, ඉවසීම, අවිරුද්ධභාවය) අනුශාසනා කොට වස්සාරපෝයේ (වස් කාලයේ ප්‍රධාන පෝය හතර) නුවර වාසීන්ට ධර්‍මාසනාරූඪව බණ කියා බුද්ධලීලාවක්

(බුදුවරයෙකුගේ විලාසයෙන්) මෙන් සියළු ලොකවාසීන් සතුටුකරමින් වාසය කරණසේක.

එසමයෙහි එක්තරා මාළු බ්‍රාහ්මණයෙක් මසුරන් දසක් සිඟාගෙණ එක් බ්‍රාහ්මණයෙකුගේ ගෙයක තබා ගොසින් කල්යාමකින් "මාගේ මසුරන් දෙව"යි කියා ඉල්වීය. ඒ බ්‍රාහ්මණයාත් "තමාට දෙන්ට රන් නැති හෙයින් තමා දුක්පත් හෙයිනුත් තමාගේ දුව තෙලේ රණට සිලව්කොට (ඒ ණය වෙනුවට) ගෙණයව"යි බ්‍රාහ්මණයාට පාවාදින. ඒ බමුණාත් ඈ ගෙණගොස් තමාගේ ගෙයි රඳවා උන්නේය. බැමිණී තමන් තරුණ ස්ත්‍රී හෙයිනුත් කාමයෙහි අර්තථිව (ගිජුව) පරපුරුෂයන් සේවනය බොහෝ කොට කරන්නීය. පරදර පරපුරුෂ (පර අඹුවන් හා පර පුරුෂයන්) සේවනයෙහි තෘප්තියක් (ඇතිවීමක්, සෑහීමක්) නැත්තේය.

මේ ලෝකයෙහි නොපිරෙන්නාවූ වස්තු සොළසෙක් ඇත්තේය. ඒ කවරේද යත්? සාගරය තෙමේ සියලු ජලප්‍රවාහයෙන් තෘප්ති නිවාරණයකට නොපැමිණෙන්නේය, වහ්නි (ගින්න) තෙමේ ඉන්ධනයෙන් (දැවීමෙන්) තෘප්ති නිවාරණයකට නොපැමිණෙන්නේය, රජ්පුරුවෝ රජ්‍යයෙන් තෘප්තියකට නොපැමිණෙන්නාහ, අඥනයා පව් කිරීමෙන් තෘප්ති නිවාරණයකට නොපැමිණෙන්නේය, ස්ත්‍රී මෛථුන ධර්‍මයෙන්ද (කාම සේවනයෙන්) සැරහීමෙන්ද දරුවන් වැදීමෙන්ද තෘප්ති නිවරණයකට නොපැමිණෙන්නීය, බ්‍රාහ්මණයා මන්ත්‍ර ඉගැන්වීමෙන්ද තෘප්ති නිවාරණයකට

නොපැමිණෙන්නේය, ධ්‍යානයට සමවදින්නාවූ භික්ෂූන් වහන්සේ ධ්‍යාන සමාපත්තියෙන් තෘප්ති නිවාරණයකට නොපැමිණෙන්නේය, ශෛක්ෂ පෘථග්ජනයන් වහන්සේ (කෙලෙස් සහිත පුහුදුන් පුද්ගලයා) කෙලෙසුන් තවන්නාවූ වීර්යයෙන් තෘප්තියකට නොපැමිණෙන්නේය, අල්පෙච්ඡ (ලද දෙයින් සතුටුවන) භික්ෂූන් වහන්සේ ධුතාඞ්ග (භාවනා කරන අය අනුගමනය කරන ධූතාංග 13) සමාදන්වීමෙන් තෘප්තියකට නොපැමිණෙන්නේය, පටන්ගත්තා වූ වීය්‍ර්‍ය ඇත්තේ වීය්‍ර්‍යාරම්භයෙන් (වෙර දැරීමෙන්) තෘප්තියකට නොපැමිණෙන්නේය, ධර්මකථිකයන් වහන්සේ ධර්මසාකච්ඡාවෙන් තෘප්තියකට නොපැමිණෙනසේක, බුහුටි ධර්මධරයෝ (දක්ෂ ධර්මදේශකයෝ) පර්ෂත් බොහෝයයි තෘප්තියකට නොපැමිණෙනාහ, සැදැහැ ඇත්තෝ සංඝයාවහන්සේට උපස්ථාන කිරීමෙන් තෘප්තියකට නොපැමිණෙන්නාහ, ත්‍යාගී පුරුෂයා වස්තු පරිත්‍යාග කිරීමෙන් තෘප්තියකට නොපැමිණෙන්නාහ, නුවණැත්තා බණ ඇසීමෙහි තෘප්තියකට නොපැමිණෙන්නාහ, සිව්වනක් පර්ෂත් (භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව් පිරිස) බුදුන් දැකීමෙන් තෘප්තියකට නොපැමිණෙන්නාහ.

බැමිණිත් පුරුෂයන් කෙරෙහි තෘප්තියකට නොපැමිණෙන්නීය. ඇගේ සොරසැමියෙක් ඇත්තේය, ඌ හා තමා හා සැපසේ දවස් අරිණ නිසා තමාගේ සැමියාට කියන්නී, "එම්බල බමුණු, තට නිරන්තරයෙන් දර ගෙණෙන්නට, පිසන්නට, පරිත්තට (දාසියක් වෙන්නට) මට බැරිය, මෙරට

සිගා රන් එක්කොටගෙණ වහා මට කෙල්ලක ගෙණව"යි කීව. බමුණුත් අඹුවට උත්තර කියාගත නොහී අඹුවට කියන්නේ "එසේ වීනම් සොඳුර මට මාගෝපකරණ (මග වියදම්) සපයා දෙව"යි කියා විළඳ අත්සුනු (පොරි හා අග්ගලා) ආදීවූ දෙය සපයා පසුම්බියේ ලාගෙණ ගම් නියම්ගම් රාජධානිවල ඇවිද මසුරන් සත්සියය සිගාගෙණ කෙල්ලකු හා කොල්ලකු අරගණ්නට බරණැස් නුවරට එන්නේ අතරමග ගසක්මුල අත්සුනු පයිය තබා පයිය උනා අත්සුනු කා පැන් බොන්ට ගොස් පැන් බී එනකලට ඒ ගස වසන්නාවූ නාගයෙක් අවුත් අත්සුනු ගන්‍ධයෙන් පයියට වන. බමුණා පැන් බී ආ තැනැත්තේ පයිය බැඳ කරතබාගෙණ යන්ට වන. ඒ වෘක්‍ෂයෙහි වාසය කරන්නාවූ දේවතාවෙක් බෝධිසත්‍වයන් වහන්සේගේ නුවණ දඹදිව ප්‍රකාශ කරණු සඳහා අර්ධ ශරීරයක් දක්වා කියන්නේ "එඹල බ්‍රාහ්මණය, ගෙට ගියෙයිනම් තාගේ අඹුව මියෙයි, අතර මග ලැග්ගේ නම් තෝ මියෙයි"යන බස්දෙක කියා අන්තර්ධාන විය. බ්‍රාහ්මණයන් වට පිට බලා කාත් නොදැක භයින් ත්‍රස්තව අඬ අඬා යන්නේය.

එදවස් පසළොස්වක් ලත් දිනය පැමිණ බෝධිසත්‍වයෝ බණ කියන්නට වන්සේක. බොහෝ මනුෂ්‍යයෝද ගඳ දුම්මල් පහන් ගෙණ බණ අසන්නට යන්නාහු බමුණු අන් ඇම දැක "කොයියවුදැ?"යි විචාරා "බණ අසන්නට යම්හ"යි යනු අසා පණ්ඩිතයෝ නම් නුවණැත්තාහුය. උන් ලඟට ගොස් මාගේ සෝක සන්සිඳුවාගණිමි යි පණ්ඩිතයන් බණ කියන්නාවූ ස්ථානයට ගොස් බණ පිරිස් කෙළවර අඬ අඬා බණ අසා

සිටියේය. බෝධිසත්වයන් වහන්සේ විස්තර කොට බණ වදාරා වට බලන්නාහු බණ පිරිස් කෙළවර අඬ අඬා සිටිනා දැක "ඇයි තා අඬන්ට කාරණා කිම්දැ?"යි "තට කුමණ අලාභයෙක් කවර අර්ථහානියෙක් ප්‍රාණහානියෙක් (ධන හානියක් හෝ ජීවිත හානියක්) සැලසිනිද? මට කිය, තාගේ සෝක සන්සිඳුවාලමි. ඇයි තෝ සේනක පණ්ඩිත නියාව නොදනිදැ?"යි කීහ. එවිට බ්‍රාහ්මණයා කියන්නේ "පණ්ඩිතයෙනි, එක් දේවතාවෙක් මට කියන්නේ අතරමග ලැග්ගොත් තෝ මියෙයි, ගෙට ගියොත් අඹු මියෙයි. එසේ හෙයින් ගෙටත් යානොහී අතර මගත් ලැග්ගනොහී මරණභයින් අඬමි"යි කීහ.

බෝධිසත්වයෝ මිනිසුන්ට වන්නාවූ අන්තරාය පරීක්‍ෂා කරන්නාහු සමුද්‍රයෙහි ගැළුනාහුද බැල මච්ඡයන් (බලගතු මසුන්) විසින් ගන්නා ලද්දාහුද ගග වැටී හුන්නාහුද කිඹුලන් විසින් ගන්නා ලද්දාහුද රුකකින් හුනවාහුද කටුවෙන් විදිනා ලද්දාහුද විෂකෑවාහුද කරවැල්ළෑවාහුද ප්‍රපාතයෙහි වැටීද අතිශීත අතිඋෂ්ණ ආදීරෝගයෙන් මඩනා ලද්දාහුයයි යන මෙතෙක් අන්තරාය ඇත. කවරදේ හෝ යි පරීක්‍ෂා කොට අන්තරායක් නොදැක පරීක්‍ෂා කරණසේක් මූ කර තිබෙන පසුම්බි පයියේ අත්සුනුවන්ට කාරණා මූ අතරමග ගසක් මුලදී අත්සුනු පයිය බිම තබා පයිය උනා අත්සුනු කා පැන් බොන්නට යාදී මේ පයිය ඇතුලට අත්සුනු ගඳයට සර්පයකු වන් නියාය. අතරමග ලැග්ගහොත් මෙතෙම අත්සුනු කන්ට පයියේ අත එලීනම් (අත දැම්මොත්) සර්පයා කඩා කා

තෙමේ මියෙයි. ගෙට ගියොත් "මෙතෙක් දවස් ගොසින් කුමක් ගෙණාදැ?"යි පසුම්බිය උනා අතලයි. එවිට ඇගේ අත කඩා කා අඹු මියන්නීය යි කී නියායයි සිතින්ම පරීක්‍ෂා කොට සර්පයා දැනගතනොහී කෘෂ්ණ සර්පයකුවන්ට (කළු නාගයකු) උමමැනව, නොසැලී නිශ්ශබ්ද දී දරණලා වැදහොනේය. ඒකාන්තයෙන් නයාමයයි පරීක්‍ෂාකොට දිවසින් දුටු කෙනෙකුන්මෙන් සියල්ලම නුවණැසින් දැක බොහෝ දෙනාට කියවන පිණිස බමුණා අතින් විචාරා "බමුණ තාගේ පසුම්බියේ කුමක් ඇද්දැ?"යි විචාළසේක.

"ස්වාමිනී, අත්සුනුය"යි කීය. "ඒ අතරමගදී කෑදැ?"යි විචාළසේක. "මග එක් ගසක්මුල පසුම්බිය තබා අත්සුනු කෑමි" කිව. "තෝ පැන් බොන්නට ගියෙහිද? නොගියෙහිදැ?"යි විචාළසේක. "ගියෙමි ස්වාමිනී" කීය. "එම්බල බමුණ, තෝ පැන් බී අවුත් අත්සුනු පයිය පරීක්‍ෂාකොට බැන්දෙහිදැ?"යි විචාළසේක. බමුණා කියන්නේ "ස්වාමිනී, පැන් බොන්නට යන ගමනේත් සළහන් මදව (කල්පනාව අඩුකමින්) නොබැන්දෙමි. ආ ගමනේත් පරීක්‍ෂා නොකොට බැඳගෙණ කර තබාගෙණ ආමි" කීය. එවිට බෝධිසත්‍වයන් වහන්සේ "එම්බල බමුණ තා කර තිබෙන්නාවූ පසුම්බිය ඇතුළේ සර්පයෙක් වැද හොන්නේය. එයිත් නයෙක. දේවතාවා කීයේ නම් එයින් තට සැකවිනම් පසුම් පයිය බිම තබා උනා දික් දණ්ඩකින් ගසා ලන්නා සූ සූ යන අනුකරණයෙන් මහත් පෙණයක් කොටගෙණ මේ බණ පිරිස් මධ්‍යයේ පිටවන්නේය"යි කී සේක.

බමුණා පසුඹියේ නාගයායයි කියන්නා මහ හයින් පසුඹිය බිමට දමා පසුඹිය උනා දණ්ඩකින් පසුඹියට ගසාලීය. නයා බෝධිසත්වයන් කී පරිද්දෙන් පෙණය කොටගෙණ පිටත්විය. නයින් කෙළවනසේ (නයි නටවන) දන්නා අහිකුණ්ඩිකයෙක් නයා අරගෙණ වලට (වනයට) අළුයේය. එතන සිටියාවූ බොහෝ බණපිරිස් මධ්‍යයේ සේනක පණ්ඩිතයන් වහන්සේ බමුණා අතතුබූ පසුඹියේ ඔත්තාවූ සර්පයා යම් කෙනෙකුන් අතින් නොඅසා දිවසින් දුටු කෙනෙකු මෙන් දැන සර්පයා විභාගකොට නයාමය යි වදාළසේක. යහපත නුවණ විශේෂයකැයි බොහෝ දෙනා සමාධිව පිළිඉස නටවා (රෙදි කඩ හිසේ කරකවමින්) අත්පොලසන් දීම් අසුරුසන් (ඇගිලි දෙකින් නගන හඬ) දිම් ආදීවූ බොහෝ සන්තෝෂයට පැමිණියාහ.

බමුණාත් සමාධිව "සේනක පණ්ඩිතයෙනි, මා අත කෙතෙක් සම්පත් තිබුයේ වී නමුත් එතකුන් දීපියන්ට සමාධි ඇත, මා සිඟා ලද්දේ මේ මසුරන් සත්සියය පමණයයි, මින් තොපට පුජා කෙරෙමි"යි කීහ. බෝධිසත්වයෝත් "එම්බල බමුණ ප්‍රශ්ණ කියා වස්තු උපයන්නේ නොවෙමි. මේ තාගේ රනින් මට ප්‍රයෝජන කිම්දැ?"යි කියා තමන් වහන්සේගෙන් මසුරන් තුන්සියයක් දී දස පුරා මින් කොල්ලකු ඇරගෙණැයි දී "තා සිඟා ඇවිදින්ට කාරණා කිම්දැ?"යි විචාළසේක.

බමුණු කියන්නේ "පණ්ඩිතයත් වහන්ස, මාගේ බිරින්ද "රට සිඟා කෙල්ලෙකු කොල්ලෙකු ගෙණව මැනව"යි කී හෙයින්

සිගා ඇවිදිමි" කීය. එවිට පණ්ඩිතයෝ විචාරන්නාහු "තාගේ අඹු තරුණ ස්ත්‍රියක්ද? මැහැළිදැ?"යි විචාළසේක. බමුණු කියන්නේ "ස්වාමිනි, ළදරු ස්ත්‍රිය"යි කීය. බෝධිසත්ත්වයෝ කියන්නාහු "එම්බල බමුණ, තාගේ අඹුවට සොරසැමියෙකු ඇති හෙයින් ඔහු තමා හා ස්වේච්ඡා පරසේවනය (සිය කැමැත්තෙන් පරපුරුෂ සේවනය කිරීමට) කරන්නට උවමනා හෙයින් එතනින් තා නෙරණ නියායි" (ගෙදරින් පිටමන් කරවන්නට ඇත) කියා "එම්බල බමුණ, මේ මසුරන් දස ගෙට ගෙණා ගියෙයි නම් තාගේ අඹු තමා සොරසැමියාට දීපියන්නීය, තෝ ගෙට ගෙණ නොගොස් මසුරන් දස ඉවතෙක සඟවාලා ගොට ගොස් බැණනොනැගී ඉඳ තාගේ අඹුවට රන් ගෙණාමි නොකිය"යි උගන්වාලා යවූසේක.

බමුණත් "යහපතැ"යි ගිවිස අතරමග ගසක්මුල මසුරන් දස සඟවා ගෙට ගොසින් "පින්වත දොර ඇරව"යි කීය. එවේලාවට බැමිණියත් සොරසැමියාත් වැදඹත්තාහ. බැමිණී නැගීසිට පාණ නිවා දොරහැර සොරසැමියා දොරබා බොක්කේ (දොර මුල්ලේ) සිටුවා බමුණා ගෙට කැඳවා සොරසැමි පිටතට යවා සමනන් ළඟ ඉඳ පසුම්බි පයිය බලා "මෙතෙක් දවස් ගොසින් ගෙණා වස්තුයෙක් නැද්දැ?"යි විචාළීය. එවිට බමුණා අඹුව කෙරේ හයින් "සොඳුර රැහැණී නොව (අමනාප නොවන්න) මම රන් මසුදහසක් ගෙනාමි. අසවල් තැන ගසක්මුල සඟවා තබාලීමි, උදෑසන ගෙනෙමි" කීය. බැමිණී ඒ අසා දොරට ගොස් සොරසැමියාට සළකුණු කියා "රන් තුබූ තැනින් ඇරගෙණ එව"යි කීය. සොරසැමියාත් ඈ කී

සලකුණෙන් ගොස් රන් ඇරගෙණ ඔබ්බේ තිබ්බය. බමුණාත් උදෑසනක්සේ රන්තුබූ තෙනට ගොස් රන් නොදැක බෝධිසත්වයන් කරා අඬාගෙන ගිය.

එවිට පණ්ඩිතයෝ "ඇයි බමුණ රන් තුබූ තැන් බැමිණියට කියාපිදැ? රන් ගෙනා නියාව නොකියන්ට උගන්වා යවි ගමනේ කියාපිදැ? වන්නාට තොපගේ රන් ඇරදුනමනා වේදැ"යි කියා "තොපගෙන් බමුණන් සත්දෙනෙකුත් තාගේ බිරින්දගෙන් බමුණන් සත්දෙනෙකුත් ඇතුළුවූ දසසතරදෙනෙකුට සත් දවසක් දන්දී දවස දෙන්නකු නියායෙන් ඇර සත්වෙනි දවස් බමුණා තෝරාගෙණ කියව"යි සත්දවසකට වියදමත් දී යවූහ. බමුණාත් "යහපතැ"යි ගිවිසගෙණ ගොස් බෝධිසත්වයන් කී සැටියට සත්වෙනි දවසක් දන්දී සත්වෙනි දවස් බමුණා තෝරාගෙණ බෝධිසත්වයන්ට කීය.

බෝධිසත්වයන් වහන්සේ තමන් වහන්සේගෙන් පුරුෂයන් යවා බමුණා ගෙන්වාගෙන "ඇයි බමුණ, මේ බමුණාගේ මසුරන් දස සැඟවූයේදැ?"යි විචාළසේක. "ස්වාමීනි, මම නොදනිමි" කිය. පණ්ඩිතයෝ කියන්නාහු "එම්බල බමුණ, මා සේනක පණ්ඩිත නියාව නොදනීදැ?"යි කීසේක. එවිට බමුණු සිතන්නේ පසුම්බි පයියේ උන් නයා කියාපු තැනැත්තා මේ තමායයි කියන්නාහයි භයගෙණ "සැබැව ස්වාමීනි, මම මසුරන් දස ඇරගතිමි" කියා "දැන් කොයිදැ?"යි විචාරා ගෙන්වාගෙණ බමුණාට දෙවා සොරකම් කළවුනුත් පරදාර

කළවුනුත් විඳගතමනා ආඥා (විඳින්නට සිදුවන දඬුවම්) කරවා බමුණාට කියා බැමිණීත් ගෙන්වා "මේ බැමිණිය තට උවමනාවේදැ?"යි විචාරා "උවමැනව"යි කී කල්හි ඈටත් "මතු මෙසේ දෙයක් නොකරව"යි ශික්‍ෂා කරවා බමුණාට පාවාදී බොහෝ වස්තු දී තමන් වහන්සේගේ ගෙය ගාවා ගෙයක්දී දැසිදස් දී රැක්කාහයි වදාරා මේ 'සත්තුභස්ත ජාතකය' නිමවා වදාළසේක.

එසමයෙහි බ්‍රාහ්මණයා නම් ආනන්ද ස්ථවිරය. එසමයෙහි දේවතාවා නම් ශාරිපුත්‍රස්ථවිරයෝය. එසමයෙහි පෂීත් (පිරිස) නම් බුදු පිරිසය. සේනක පණ්ඩිතයෝ නම් බුදුවූ මම්මය"යි වදාළසේක.

# 392. අට්ඨිසේන ජාතකය

තවද ප්‍රඥා නැමති ප්‍රදීපයෙන් (නුවණ නැමති පහනින්) නසන ලද මොහ නැමති අන්ධකාර (මෝඩකම නැමති අඳුර) ඇති තිලෝගුරු බුදුරජාණන් වහන්සේ අලවිනුවර අග්ගලා නම් චෛත්‍යයෙහි වැඩ වසන සමයෙහි කුටිකාර ශික්‍ෂාපදය (සෙනසුන් කුටියක් තැනීමට පැනවූ විනය නීතිය) අරභයා මේ ජාතකය දක්වන ලදැ.

හේ කෙසේද යත්?

මෙහි වර්තමාන කථාව මණිකණ්ඨ ජාතකයෙහි විස්තර වශයෙන් එන්නේය. මෙහි වනාහි,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ බ්‍රාහ්මණ කුලයෙක ඉපිද අට්ඨිසේන නම් නමක්ව දිසාපාමොක් ආචාරීන් වසන්නාවූ තක්සලා නුවරට ගොස් සියලු ශාස්ත්‍ර ඉගෙණ අවුත් ගිහිගෙයි කළකිරී හිමාලය වනයට ගොස් ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් (තවුස් පැවිද්දෙන්) පැවිදිව වසන සමයෙහි ලුණුඇඹුල් පිණිස අවුත් බරණැස් නුවර රජ්ජුරුවන්ගේ රජගෙයි වාසල සමීපයට පැමිණියාහ.

රජ්ජුරුවෝ මතුමහල්තලයෙහි සිටියාහු තපස්වීන් වහන්සේගේ දැමුනාවූ ඉන්ද්‍රියයන් (සන්සුන් වූ ඉඳුරන්) දැක සමාධිව (පැහැදී) රජගෙට ගෙන්වා වැළඳවූහ. තාපසයන් වහන්සේ අනුමෙවෙනි බණ වදාළසේක. රජ්ජුරුවෝ සමාධිව තමාගේ මගුල් උයනේ ඉඳිනා නියායෙන් සලස්වා තාපසයන්ට කියන්නාහු "ස්වාමීනි, මාගේ රාජ්‍යය උවමනා චීනමුත් ඉල්වා ඇරගත මැනව"යි ආරාධනා කළත් තාපසයන් වහන්සේ කිසි දෙයකුත් නොඉල්වන සේක.

රජ්ජුරුවෝ තාපසයන්ට කියන්නාහු "ස්වාමීනි, මා නොඅඳුනන බොහෝ මනුෂ්‍යයෝ පවා මා සමීපයට අවුත් නොයෙක් සම්පත් ඉල්වා ගන්නාහ, නුඹ වහන්සේත් උවමනා යම් දෙයක් අරගත මැනැව"යි කීහ. එවිට තාපසයන් වහන්සේ කියන සේක් "රජ්ජුරුවෙනි, කටින් කියා බත් පිළි ආදිවූ දෙය ඇරගැන්මද එලෙස නොව හස්තවිකාරයෙන් (අතින් ඇඟවීම) බත් දුන මැනවයි බඩ අතගෑමද පිළි

දුනමැනවැයි ඉණ අත ගෑමද බුලත් දුනමැනවයි කට අතගෑමද යන මෙකී දෙයින් පෑමත් කටින් කියා ඉල්වීමත් තාපස්වරුන්ට අගනේ නොවෙයි. යම් අභිප්‍රායකින් සිගා සිටිකල සිටියාවූ ක්‍රියා දැන පිළිගැන්වූ දෙයක් ඇත්නම් පිළිගෙණ අභිප්‍රාය සිද්ධවීනම් (අදහස ඉටුවීනම්) වූ පමණක් විනා නුවූයේ නම් නුවූයේ යයි ඉඳිනා විනා හස්තවිකාරයෙන් වුවත් මුවෙන් කියා වුවත් ඇරගැන්ම කාරණා නොවෙයි. රජ්ජුරුවෙනි, දෙමව්පියන් ගෙන් වුවත් යම් කෙනෙක් ඉල්වත් නම් ඉල්වන තැනැත්තන් කෙරෙහි සියල්ලෝම අප්‍රිය වන්නාහ. නෑසියකෙනෙක් වී නමුත් දසවිට යමක් ඉල්වත් (නිතර ඉල්ලීම) නම් මූට ඇත්තේ ඇමවේලෙහිම ඉල්වා කෑමයයි ඔහු මෛත්‍රීයවත් නොකරන්නාහ".

එවිට රජ්ජුරුවෝ කියන්නාහු "යාචකයන් නම් ඉල්ලූකල විනා දෙන කෙනෙක් නම් නැත්තාහ. ඉල්වීමෙන් දෙන තැනැත්තෝ මා අතින් මෙසේවූ දෙයක් ඉල්වන්නේ යාචකයින් කෙරේ සමාධියෙන් දෙන්නෝය, එසේ හෙයින් ඉල්වීම යහපතැ"යි කීහ. "තාපසයන් වහන්සේ, ඉල්වීමෙන් යාචකයන්ටත් දෙන්නන්ටත් ලාභය. නොඉල්වීමෙන් යාචකයන්ටත් අලාභය. දෙන්නන්ටත් අලාභය. නුඹ වහන්සේ බැණ නොනැගී වැඩ සිටිසේක. එසේ හෙයින් නුඹවහන්සේගේ අභිප්‍රායානුකූල වාසයටත් නුඹ වහන්සේගේ ධර්මමයටත් සතුටුවූ මම රතු වෘෂභයෙකු ප්‍රධාන කොට ඇති ගෙරින් දහසක් (රතු ගොණෙකු ප්‍රධාන කොට ඇති හරක් දසක්) දෙමි"කීහ. තාපසයන් වහන්සේ "මහරජ, අපි සරක්

අසුන්කොට පට්ටිලා (අසුන් පට්ටි ගස්සනවා වාගේ) ඇවිදිමෝද්‍රැ"යි නොයිවසා වදාළසේක. රජ්ජුරුවෝත් තාපසයන්ගේ අනුශාසනාවෙහි පිහිටා කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදරා මේ 'අට්ඨිසේන ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. තාපසයෝ නම් බුදුවූ මම්මය"යි වදාළසේක.

# 393. කපි ජාතකය

තවද සූර්‍ය්‍යමණ්ඩලය නැති ආකාශයට පූර්ණචන්ද්‍රමණ්ඩලයක් (පුන්සඳමඬලක් වැනිවූ) බඳුවූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ පොළව ගිළුෑ (පොළව පලාගිය) කථාවක් අරභයා මේ ජාතකය දක්වන ලද.

එක් දවසක් දම්සභාමණ්ඩපයෙහි රැස්වූ භික්ෂූන් වහන්සේ "දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ සර්‍වඥයන් වහන්සේට විපරීතව පක්ෂ හා සමග (විරුද්ධ පිරිස සමග) පොළොව ගිලුනේ වේද්‍රැ"යි කිය කියා වැඩ උන්තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩවදරා "මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනූද්‍රැ?"යි විචාරා වදරා එපවත් අසා "දැන්මතු නොවෙයි මහණෙනි, පෙරත් අප කීවා නොකොට පක්ෂ හා සමග මරණයට පැමිණියෝ වේද්‍රැ"යි

වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදතත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්‍වයන් වහන්සේ වානරව ඉපිද රජ්ජුරුවන්ගේ උයනේ වඳුරන් පන්සියයක් ඇරගෙණ වාසය කරන්නාහ. අනිකුත් වඳුරෙක්ද පන්සියයක් වඳුරන් ඇරගෙණ වාසය කරන්නාහ.

එක් දවසක් රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රාහ්මණයා උයනට අවුත් ඉස්සෝද නහා ගඳවිලවුන් ගෙන තමාගේ ගෙට යන්ටයයි නික්මින. එක් දුෂ්ට වඳුරෙක් බ්‍රාහ්මණයා යන්නාවූ මග තොරණ මත්තේ හිඳ බමුණා ඉස වර්චස් පිඩක් එළාලීය (අසූචි පිඩක් දැමීය). "මේ කිමෙක්දැ?"යි උඩ බැලූකල කටේ වර්චස් පිඩක් එලිය. එවිට බ්‍රහ්මණයා වඳුරාට කිපී "තොප ඇමට නිහඬ දන්නෙමි (තොපට නිහඬව කළ යුතු දෙය) වේදැ"යි කිපී තමාගේ ගෙට ගියේය. බෝධිසත්‍වයන් වහන්සේ මෙපවත් අසා "දුර්ජනයන් ඉඳිනා සමීපයෙහි ඉඳිම කටයුතු නොවෙ"යි කියා වඳුරන් දහස එක්කරවා අවවාද කියා හිමාලය වනයට යම්හයි තමන්ගේ වඳුරන් පන්සියය ඇරගෙණ එතනින් හිමාලය වනයට ගියේය. අනික් වඳුරාත් පන්සියයක් වඳුරෝත් "මේ බ්‍රහ්මණයා වෛරීව (වෛර බැඳ) අපට කුමක් කොටපියදැ"යි කියා බෝධිසත්‍වයන් කැටුව නොගොස් එම උයනේ රැඳුනාහුය.

එසමයෙහි එක් මැල්ලක් වී ටිකක් අව්වේ වනාළුව, එක් සැඩ ඇති එළුවෙක් වී කන්ට වන, මැලි ගිණිපෙණෙල්ලක් බලා ගැසූය. ඒ ගිනි එළුවා ඇදගත, එළුවාත් දිවගෙන ගොස් ඇත්හලට වැද තණෙහි (තණකොල වලට) ගිණි ඇවිලින, ඒ ගිණි තණෙහි වැදගෙන ඇත්හල තණකොල සීන් දඩුපතුත් ගින්නෙන් ද ඇතුපිට වැටී පිටද වණව ගියේය. වෙදවරු පිළියම් කොටත් වණ බොහෝව තිබූ හෙයින් රජ්ජුරුවෝ පුරෝහිත බ්‍රාහ්මණයා කැඳවා කියන්නාහු "බමුණානනි ඇතුන්පිට වණබොහෝය. වහා ගුණකරව"යි කීහ.

එවිට බමුණු මෙවිට මනොරථය සිද්ධකෙරෙමි (අදහස සිදු කරමි) . "දෙවයන් වහන්ස, මේ වණ පිළියමට වඳුරන් මරා උන්ගේ මාංශ ගෙණ තෙල් සිඳ ඖවොත් වණ ගුණවෙයි" කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු "වඳුරෝ කොයි ඇද්දැ?යි කීහ. "ස්වාමීනි, උයනේ වඳුරෝ ඇතැ"යි කීහ. රජ්ජුරුවෝත් දුනුවායන් ගෙන්වා වඳුරන් විද මැරූහ. ඉන් නායක වඳුරා විත් කා දිවගොස් බෝධිසත්‍වයන් වසන්නාවූ වනයෙහි වැටී මළහ.

බෝධිසත්‍වයන් වහන්සේ වඳුරා දැක තමන් වහන්සේ හා කැටිව ආවාවූ වඳූරන් පන්සියයට බණ වදාරණ සේක් "ගම් නියම් ගම් රාජධානියෙක්හි සතුරෝ ඇත්නම් නුවණැත්තෝ එතැන්හි නොවසන්නෝය. ඉදින් කිසියම් කාරියක් නිසා සතුරන් ලඟ දවසක් දෙදවසක් ඉඳිනේ වී නමුත් දුකසේ වසන්නේය. ලඝුවූ අව්‍යවස්ථි (අල්ප වූ නියම විදියට නැති)

සිත් ඇති නෑ කෙනෙකුන් හෝ මිත්‍රකෙනෙකුන්ගේ බස් ගිවිස යමෙක් සිතුවක් කරන්නේ වීනම් එතෙම බෝහෝ දෙනාට සතුරු වන්නේය. කුමක් මෙන්දැයි යතහොත් නොකීකරු මේ වඳුරා වානර සමූහයාට පීඩා කෙළේය. සමූහය රකින නුවණැත්තෙම් යන සිත් ඇති අඥනතෙම යහපත් නොවන්නේය. එසේවූ සත්‍වයා තමාගේ සිත්වූ පරිද්දෙන් ගොස් නොකටයුතු කොටපියා මිය වැදහොත් වඳුරා පරිද්දෙන් ව්‍යසනයට (විපතට) පැමිණෙන්නේය. නුවණැති තැනැත්තෝ තමාගේ බන්‍ධූන්ට වැඩ කරන්නේය. නුවණැති ප්‍රජාව කරන්නාවූ උත්තමතෙම තව්තිසා වැසි දෙවියන්ට උත්මවූ සක්දෙව් රජහුමෙන් නුවණැත්තේත් නෑයන්ට මෙලෝ පරලෝ දෙකින් ඉෂ්ට වන්නේය. යම් සත්‍වයෙක් පිරිසිදු ශීලයද විශිෂ්ටවූ ප්‍රඥවද බොහෝ ඇසූවිරූ තැන් (බහුශ්‍රැත භාවය) ඇතියෙම්යි තමා දකීද? එසේවූ සත්‍වතෙම තමාටද අනුන්ටද යන දෙපක්‍ෂයේ ඇත්තන්ටම වැඩක්ම කරන්නේය. ඒ කාරණය හේතුකොට ගෙණ ශීලප්‍රඥදී උතුම් ගුණයෙහි තමා පිහිටා ගෙණ බොහෝ දෙනාට අවවාද අනුශාසනාකොට රක්නේ හෝය ගණසංගනිකාවයෙන් දුරුව (සමූහයාගෙන් ඈත්ව) ඉඳ කුසල් හෝ පුරන්නේ යනාදීන් බෝධිසත්‍වයෝ ධර්‍මදේශනා කළෝවේද මහණෙනි" වදුරා මේ 'කපි ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි නොකීකරුව මරණයට පැමිණියාවූ වඳුරා නම් දෙවදත්ත ස්ථවිරයෝය. වනාර රජව උපන්නෙම් බුදුවූ මම්මය"යි වදාළසේක.

# 394. බකබ්‍රහ්ම ජාතකය

තවද මරසෙනගට භයඩිකරවූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි බක බ්‍රහ්මයා අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

බකබ්‍රහ්මයෙක් වේහප්ඵල නම් බඹලොව පන්සියයක් කප් (කල්ප පන්සියයක්) ආයුෂ විඳ එයින් චුතව සුභකිණ්හ නම් බඹලොව සූසැටක් කප් (කල්ප හැටහතරක්) ආයුෂ විඳ එයින් චුතව ආභස්සර නම් බඹලොව අටකපක් අයුසංස්කාර (ආයුෂ) විඳිමින් සිටිකල්හි මෙකියන බ්‍රහ්මයා මාතෘ ගර්භයකින් ප්‍රසූත විමක් නැති හෙයින් නිදා පුබුදිනා එකෙක් මෙන් බ්‍රහ්මලෝක තුනක ආයුසංස්කාර විඳිහෙයින් මෙතෙම සිතන්නේ බ්‍රහ්මලෝකයෙහි උපදිනාහට ජරාවිළිපිළියවත් (මහලුවියට පත්වීමක්, ඇඟ රැලිවැටීම, කෙස්පැහීම) ගර්භෝත්පත්තියක්වත් (මව්කුස පිළිසිඳ ගැනීම) මරණයක්වත් නැති හෙයින් මේ බ්‍රහ්මලෝකයේ ආයුසංස්කාරය, නිත්‍යප්‍රසවය (ස්ථිරව බිහිවීම), මෙම ශාන්ති පුරයයි යනාදීන් පරමවූ මිථ්‍යාදෘෂ්ටියෙක් (දැඩි මිසදිටු බවක්) උපන. එපවත් සර්‍වඥයන් වහන්සේ දැන වදරා කූටාගාරයක් (මුදුන් වහලක්) බිමවැටෙන්නේ සාරමසක් ගියකල එසේවූ බ්‍රහ්මලෝකයට ශක්ති සම්පන්න පුරුෂයෙක් දික්කල අතක් වක් නොකරණා කලින් වැඩ වදරා බක නම් බ්‍රහ්මයාට පෙනී වදාළසේක.

උන්වහන්සේ දැක බක නම් මහාබ්‍රහ්මයා කියන්නේ "ගෞතම ගෝත්‍රයෙහි උපන්නාවූ නිදුකාණන් වහන්ස, වැඩියේ ඉතා යහපත, මේ බ්‍රහ්මලෝකය සේ නිත්‍යවූ අචලවූ ස්ථානයෙන් අනිත් තැනක නැති හෙයින් නුඹ වහන්සේ වැඩි නියාව ඉතා යහපත් වන්නේය"යි කියා එපවත් සර්වඥයන් වහනසේ අසා වදාරණසේක් "එම්බල මහාබ්‍රහ්මය, තා වාසය කරන්නාවූ බ්‍රහ්මලෝකය නිත්‍යදැවද (ස්ථිර බව) අපරාධිත ස්ථානද (පරාජය නොවන තැන) මෙසේවූ මිත්ථ්‍යාදෘෂ්ටියක් ගන්ට තට විනා අනික් කෙනෙකුන්ට බැරිය"යි වදාළකල්හි බකබ්‍රහ්ම සිතන්නේ "මා විසින් තනිව කියා මුන්වහන්සේ සිතට නැන්විය නොහැක්කැ (අවබෝධ කරවීම දුෂ්කරය)"යි සිතා කියන්නෙ "මා හා මිත්‍රව වසන්නාවූ බ්‍රහ්මයන් සත්‍යතාවයක් ඇති හෙයින් ඔවුන් ඇමදෙනාගේ අභිප්‍රාය මා කීයේය"යි කිය. "එසේ හෙයින් මා කීයේ ඇත්තමය"යි මේ බ්‍රහ්මලෝකය නිත්‍යදැවය කිය.

නැවත සර්වඥයන් වහන්සේ වදාරණසේක් "එම්බල බ්‍රහ්මය, තාගේ මේ ලෝකය ඉදින් තා විඳින්නාවූ ආයුෂය එක් ලක්‍ෂ දසදහසක් අවුරුදුය, එසේහෙයින් තාගේ ආයුසංස්කාරයද තා කළ කුසල් අකුසල් දෙකද මා විසින් දක්නාලදද. එසේ හෙයින් තා මේ මිත්ථ්‍යාදෘෂ්ටි ගැන්ම යුක්ති නොහෙ"යි වදාළකල්හි බ්‍රහ්මයා සිතන්නේ "මේ සර්වඥයන් වහන්සේ සියල්ලම දනිම් වදාරණ සේක. මුන් වහන්සේ අතින් මා කළාවූ කුසල් විචාරම්" සිතා කියන්නේ "සර්වඥයන් වහන්සේ මා කළාවූ කුසල් දනිම් වදාළේ ඇත්තේවේද? ඒ මට වදාළමැනවැ"යි කීහ.

ඒ අසා සර්‍වඥයන් වහන්සේ වදාරණසේක් "එම්බල බ්‍රාහ්මණය, ගිය දවස එක් කල්පයෙක්හි තෝ එක්තරා වනයක් මධ්‍යයෙහි වාළුකා කාන්තාරයෙක (වැලි කතරක) තපස්විභාවයෙන් පන්සලක් කොට ඒ තපස් රක්‍ෂා කරන්නේ එසමයෙහි එක්තරා වෙළෙන්දන් සමූහයෙක් ගැල් දහසක් බඩු පටවා ගමන්කරණ වෙළෙන්‍දු එකියන වාළුකා කාන්තාරයට පැමිණ මං වැරදින, ගැල්වල පැටවූ දර පැන් නිමවා බොහෝ දුක්බයට පැමිණ ගැල් අදිනා ගවයන් උනා ගැල් එක්තැන්කොට ඒ ඒ ස්ථානයෙහි වැටී වැදහොත්තාහ. එපවත් ඒ පන්සල වසන්නාව තපස්වී දැක මොහු මියයාදී බලායාම සත්පුරුෂ ධර්‍මයට පිටතැයි මහත්වූ ඍද්ධියෙන් ගංගාවක් මවා බොහෝ ජනයාට අන්නපානාදිය දරපැන් ආදිය දී රැක්කේ වේදැයි ඒ ජාතියෙහි තොප කළ දෙය අළුයම දුටු සිනයක් මෙන් දිටිමි" වදාරා දෙවනු වදාරණසේක් "තොප එක් ජාතියක තපස්ව එක් වනයක වාසය කරන සමයෙහි සොරු පන්සියයක් එක්ගමක් පැහැර කොල්ලකා ඒ ගම ඉඳිනවුන් ලවාම උසුලාගෙණ යන්නාහ. තොපි මේ සොරුන් ගම් පැහැරපියා යන නියාව දැන මා වැනි එකෙකු මෙතන ඉන්දදී මෙතෙක් දෙනාට ගහට විඳින්ට කාරණා නොවෙයි කියා තොපගේ ආනුභාවයෙන් ගැයීම, පිඹීම් හා මහා සේනාව එන්නාක් මෙන් මවා සොරු ඉදිරියට ආකල්හි සොරු අප ආ නියාව රජ්ජුරුවන් වහන්සේ දැන අප ඉදිරියට එනසේක් වනැයි භයින් ඇරගත් කොල්ලත් ඇර (අල්ලාගත් වස්තුව අතහැර) මිනිසුනුත් ඇරගියහ"යි වදාරා "තොපකළ දෙය

අළුයම දුටු සීනයක් මෙන් දිටිමි" වදුරා "තවද එක්තරා ගඟක් අසල වාසය කරන්නාවූ මනුෂ්‍යයෝ ඒ ගඟ කසල කරන්නාහ, දියකෙළිනාහ, එක් දවසක් මිනිස්සු බොහොදෙනා එක්ව ගඟට බැස ඔරු පාරු ආදීවූ දෙය ඇරගෙණ ඔබිනොබ කෙළිනට වන්නාහ. ඒ ගඟ වාසය කරන්නාවූ නාගරාජයෙක් කිපී මහා නාගවෙශයක් මවා ගෙණ දියකෙළි මිනිසුන් ඔබිනොබ ලුහුබඳවා භයගන්වා කඩා කන්ට වන. ඒ මනුෂ්‍යයෝ ඒ ඒ තැන සැඟවී අඬා මුරගාන්ට වන්නාහ. තෝ එසමයෙහි සෘද්ධිවන්ත තපස්වීව ඉපිද මනුෂ්‍යයන්ට වූ භය දැක ගුරුළු වේශයක් මවාගෙන ඒ නයා ලුහුබඳවා මිනිසුන්ගේ භය දුරු කෙළේය. ඒ තා කළාවූ කටයුත්ත අළුයම දුටු සීනයක්මෙන් දනිමි" වදුරා "තවද තෝ එක් ජාතියෙක් කේසව නම් තාපසව උයනේ වාසය කරණ කල්හි මම තොපට එසමයෙහි කප්පින නම් ශිෂ්‍යව උපනිමි. එතැන්පටන් තොපගේ උත්පත්තිය දනිමි" වදාළ සේක.

බ්‍රහ්මයාත් තමාගේ උත්පත්තිය වදාළ බව තමාටම දැනුනු හෙයින් සමාධිව වැඳවැතිර ගිය, සර්‍වඥයන් වහන්සේත් උන්ගේ මිත්‍ථ්‍යා දෘෂ්ටිය බිඳ සම්‍යක් දෘෂ්ටියෙහි (හරි දැක්ම) පිහිටවූසේක. එවිට බ්‍රහ්මයාත් "බුදුන් බුදුවූ බව නියමය"යි ප්‍රත්‍යක්ෂ කොට බුදුන් කෙරේ පැහැද ගියවුන් ඇතුළුවූ දසකෙළදහසක් බ්‍රහ්මයෝ අමාමහා නිර්‍වාණයෙහි පිහිටුවා බ්‍රහ්මයන්ට දෙසූ ධර්‍මය ජේතවනාරාමයෙහි වැඩහිඳ අනඳ සාමීන් ඇතුළුවූ බොහෝ භික්ෂූන් වහන්සේලාට වදාළසේක. බොහෝ භික්ෂූන් වහන්සේද අධිගම ආදීවූ දෙයට පැමිණිසේක.

මේ ධර්මදේශනාව බොහෝ දෙනාට අභිවෘද්ධිය වීයයි වදාරා ‘බකබ්‍රහ්ම ජාතකය’ නිමවා වදාළසේක.

# 395. ගන්ධාර ජාතකය

තවද පඤ්චවිධඥෙයමණ්ඩලය (සංස්කාර, විකාර, ලක්ෂණ, නිර්වාණ, ප්‍රඥප්ති යන පහ) විශේෂයෙන් දත්තාවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි භෙසජ්ජ සන්නිධිකාර ශික්ෂාපදයක් (බෙහෙත් වගී තබා ගැනීමේදී අනුගමනය කළයුතු ශික්ෂාපදය, පිලිගෙන සතියක් යන තුරු පාවිච්චි කළ හැකිය) අරභයා මේ ජාතකය දක්වන ලද.

හේ කෙසේද යත්?

සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි පිලින්දිවච්ඡ නම් මහාතෙරුන් වහන්සේ රජගහ නුවර වසනසේක් රෝගී තැනට ගිලන් පසක් නිසා රජගෙට ගොස් රජගෙයි දොර සිඟා සිට තමන්වහන්සේගේ ශරීරාලෝකයෙන් රජගෙය රන්වන් කරවූසේක.

එවිට රජ්ජුරුවෝ බිසෝවරු රජ යුවරජ මහාමාත්‍යයෝත් සමාධිව උන්වහන්සේට චතුමධුරයෙන් (ගිතෙල්, මීපැණී, උක්සකුරු, සූකිරි යන සතර මිශ්‍රකර සාදන මිහිරි ආහාරයකි) කිරිපිඬු දුන්නාහ. උන් වහන්සේගේ විහාරයේ වැඩ හිඳිනා භික්ෂූන් වහන්සේ ඇමදෙනාවහන්සේට බෙදාදුන්සේක.

භික්ෂූන් වහන්සේත් එදවස් වළඳනා දෙයත් වළඳ ඉතිරි දෙය පාත්‍රවල ලා පසුදවස් වළඳන්ටයයි තුබූසේක. උපාසකවරුද මේ දැක "භික්ෂූන් වහන්සේලාට අප දුන් චතුමධුර තබන්ට කාරණා කිම්දැ?"යි උද්ඝෝෂණය කළාහ.

සර්‍වඥයන් වහන්සේ එපවත් අසා වදරා "මහණෙනි, ආහාරය තබා එලගිතෙල් සකීරා මී (හකුරු මී ආදිය) ආදිවූ ගිලාන ප්‍රත්‍යය (ගිලන්පස) ගිලනුන්ටයයි සිඟා වැළඳීම කටයුතු නොවෙයි, සත්දවසකින් ඔබ්බෙහි තිබූදෙය වැළඳීමෙන් අකැපය"යි වදරා මේ භෙසජ්ජ සන්ධිකාර ශික්ෂා පදය පණවා "එම්බා මහණෙනි, පෙර උත්තමයෝ ළුනුසුනු විවරකුත් කැපකළෝ (ලුනු කුඩු ස්වල්පයක් වුවද කැපකර පිළිගත්තා බව) වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

හේ කෙසේද යත්?

යටගිය දවස ගන්ධාර රට ගන්ධාර නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරන සමයෙහි බෝධිසත්‍වයෝ රජ්ජුරුවන්ට පුත්ව උපන්නාහ. ඒ රාජ කුමාරයන්ටත් ගන්ධාර කුමාරයෝයයි නම් තුබූහ. එසමයෙහි මියලුනුවර වේදේහ නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරන්නාහ. ඒ ගන්ධාර රජ්ජුරුවෝත් වේදේහ රජ්ජුරුවෝත් දෙන්නම උනුන් නොදැකම මිත්‍රව ඉඳිනාහ.

එසමයෙහි එක් දවසක් ගන්ධාර රජ්ජුරුවෝත් අමාත්‍ය මණ්ඩලයාත් පිරිවරා සඳල්ලේ (සඳලු තලයෙහි) උන්නාහ. එදවස් පූර්‍ණචන්‍ද්‍රයා පහළවිය. එවේලෙහි රාහු ඇවිත් සඳමඩල

අල්වාගත. එවිට රජ්ජුරුවෝ "සඳමඬල මහත් හෙයින්වේද මීට අනර්ත්‍ථ (විපත්) පැමිණීයේ කුඩා තරුවට හානියෙක් නැත්තේවේද, අපටත් මේ අන්තරාය පැමිණෙන්නේය"යි එම අරමුණක් කොටගෙන ගන්‍ධාර නුවරත් කාශ්මීර රටත් හැර හිමාලය වනයට වැද සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවූහ.

වේදේහ රජ්ජුරුවෝත් ගන්‍ධාර රජ්ජුරුවෝ මහණවූ නියාව අසා "මාගේ යාහළුවානන් මහණවූකල මමත් මහණවෙමි"යි ගමන්ගේ එක්සියවිසි ගව්වක් (සැ.4 ක් ගව් එකයි) දිග පලළ ඇති වේදේහ රාජ්ජයත් කොටුළු පිරී සිටිනා (ගබඩා පිරී ඇති) සොළොස් දහසක් බත්ගම්ද අන්තඃපුර පිටිපුර යන සියල්ලම හැර හිමාලය වනයට වැද මහණවූහ.

කල්යාමකින් ගන්‍ධාර තාපසයෝත් වේදේහ තාපසයෝත් දෙන්නම උනුන් දැක වේදේහ තාපසයෝත් නොඅඳුනන හෙයින් ගන්‍ධාර තාපසයන්ට අත්පා මෙහෙවර කරන්නාහ. එක් දවසක් තාපසයන් දෙන්න කථාකොට කොට උන්කලට සඳමඬල නැංගේය. රාහු ඇවිත් සඳමඬල ගත. ගන්‍ධාර තාපසොයෝ කියන්නාහු "සඳපාන මදවන්ට කාරණා කිම්දැ?"යි විචාළාහ. වේදේහ තාපසයෝ කියන්නාහු "රාහු ඇවිත් සඳමඬලය ඇල්ලු හෙයිනැ"යි කීහ. එවිට ගන්‍ධාර තාපසයෝ කියන්නාහු "එම්බා වේදේහ තාපසයෙනි, මහත් කෙනෙකුන්ටමය යම් හානියක් පැමිණෙන්නේය, මමත් මාගේ රාජ්‍යය හැර මේ වනයට එන්නෙම් මේ අරමුණක් කොටගෙන

මාගේ ගන්ධාර රාජ්‍යය කාශ්මීර රට හැර ඇවිත් මහණවීමි"යි කීහ එවිට වේදේහ තාපසයෝත් "එසේද? නුඹ වහන්සේ ගන්ධාර තාපසයන් වහන්සේ නමැ"යි කීහ. "එසේ වීනම් මමත් මියුලු නුවර රජකම් කළාවූ වේදේහ රජ්ජුරුවෝ නම් මමය"යි කීහ.

එවිට ගන්ධාර තාපසයෝ කියන්නාහු "තොප මහණවුයේ ඇයිදැ?"යි විචාළාහ. "මාගේ යාළු ගන්ධාර රජ්ජුරුවන් මහණ වු කළ මට රාජ්‍යයෙන් ප්‍රයෝජන කිම්දැ? යි සිතා මහණවීමි" කියා දෙන්නම උනුනුන් ඇඳිනගෙන සමාධිව එකතැන වාසය කරන්නාහු ලුනු ඇඹුල් සෙවුනා සඳහා නොබෝ කලකින් පසල්ගමකට ගොසින් දෙදෙනාම විටීයේ සිඟා යන්නාහ. ඒ ගම මනුෂ්‍යයෝ දවසක් ළුනුමුසුව ආහාරය පිළිගන්නාහ. දවසක් නිකම් ආහාරය දෙන්නාහ.

එක් දවසක් සිඟා ගියකළ ලුනු බොහෝකොට දුන්හ. ඒ ලුනු වේදේහ තාපසයෝ ගන්ධාර තාපසයන්ට දිලා තමනුත් අනුභවකොට ඉතිරි ලුනු කෙහෙල් පතෙක ලා පලයේ (වහලේ) සඟවා තැබූහ. පසුදවස් සිඟා ගිය ගමනේ ලුනු නොලද්දහ. එ දවස් වේදේහ තාපසයෝ තමන් තැබූ ලුනු ඇරගෙන ගන්ධාර තාපසයන්ට පිළිගැන්වූහ. ගන්ධාර තාපසයෝ "අප විටීයෙහි සිඟා ගිය ගමනේ ලත් ළුනක් නැත. මේ ළුනු කොයින්දැ?"යි විචාරා "ඊයේ ගෙණා ළුනු තිබීම්"යි කී කල්හි එවිට ගන්ධාර තාපසයෝ කිපී "තොප සොළොස් දහසක් බත්ගම් ඇරපියා මහණවූයේ කිසිදෙයකත්

ආලය නැතිව වේද? එසේවූ තොපි ලුනු සිගිත්තක් නිසා ලෝභකරන්ට කාරණා කිම්දැ?"යි හාසකොට (සිනාවට ලක්කර) කීහ.

එවිට වේදේහ තාපසයෝ කිපී "නුඹ වහන්සේ ලොකවාසීන්ට අවවාද අනුශාසනා කොටගත නොහෙම් කියා තපසට ආයේය. මම කෝප කරන්ට කාරණා කිම්දැ?"යි කීහ. එවිට ගන්ධාර තාපසයෝ කියන්නාහු "තොපි උරණ වූ නමුත් කුමක් කරවු නමුත් මා අවවාද කියන්නේය. තොප කළේ ඉතා නපුරු කාරණයෙක් නොවෙයි. තාපසවරු නම් ලත්දෙයකින් යපෙන පමණක් විනා මෙලෙස කිරීම කළයුතු නොවෙයි" කීහ. එවිට වේදේහ තාපසයෝ කියන්නාහු "නුඹවහන්සේ මාගේ සිත කණස්සලු කරවා (සිත් තැවුල්කොට) අවවාද කිරීම නම් නොකැපෙන කරයකින් (දැලි පිහිය) හිස කපන්නාක් මෙනැ"යි කීහ. "තෙපි කෙසේ කණස්සලු වී නමුත් මා කීයේ කාරණාය"යි වේදේහ තාපසයන්ට අවවාද කීහ.

වේදේහ තාපසයෝත් කාරණා කියා ගිවිස බෝධිසත්වයන්ගෙන් කර්මස්ථාන (භාවනාවට අවශ්‍ය කමටහන්) ඉගෙන දෙන්නම හිමාලය වනයට ගොස් පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා කම්වූ පරිද්දෙන් මිය බඹලොව ගියහයි වදරා මේ 'ගන්ධාර ජාතකය' නිමවා වදාළ සේක.

"එසමයෙහි වේදේහ තාපසයෝ නම් ආනන්ද ස්ථවිරයෝය. ගන්ධාර තාපසයෝ නම් බුදුවූ මම්මය"යි වදාළ සේක.

# 396. මහා කපි ජාතකය

තවද අකුතොභයවූ (කිසි බියක් නැති) තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි බන්ධුසමාගමයක් (ඥතීන්ගේ එකතුවක්) අරභයා මේ ජාතකය දක්වන ලද.

මෙහි වර්තමාන කථාව භද්‍රසාල ජාතකයෙහි පෙනෙන්නේය. මෙහි වනාහී මහළුවරුන් වහන්සේ දම්සභාවේ රැස්ව "සර්වඥයන් වහන්සේ බන්ධූන් කෙරෙහි අනුග්‍රහ කරන සේකැ"යි කිය කියා වැඩ උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදරා එපවත් අසා "මහණෙනි, දැන්මතු නොවෙයි පළමුත් මහෝත්තමයෝ බන්ධූන්ට අනුග්‍රහ කළෝ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි අරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

හේ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ වානරව උපන්නාහ. මහත්වූ ශරීරයක් ඇත්තාහ. අසූදහසක් වඳුරන්ට නායකව වසන්නාහ. හිමාලය වනයෙහි ගංගාවක් සමීපයෙහි මහත්වූ අඹගසක් ඡායාසම්පන්නව (සෙවනින් යුක්තව) මහත්වූ අතුපතර ඇතිව ඉන්ද්‍රනීල පර්වතයක් මෙන් ශෝභමත්ව සිටිනේය. මෙහි පල්ලවයෙන් සශ්‍රීකය (කොළවලින්

සරුසාරවූ) මෙහි අඹ කල පමණ මහත ඇත්තේය. රස දිව්‍යරසය, සුවඳ දිව්‍ය සුවඳය.

බෝධිසත්ත්වයන් හා අසූදහසක් වඳුරෝ ඵලජාති කාගෙන ගියාහු අඹ ගස දැක දිව්‍ය රසවූ අඹ අනුභවකොට එහි වසන්නාහ. ඒ අඹගස එක් අත්තෙක අඹ ගොඩ වැගිරෙන්නේය (ගොඩබිමට වැටෙන්නේය). එක් අත්තෙක අඹ දියෙහි වැගිරෙන්නේය. බෝධිසත්ත්වයෝ ඒ අඹ දියෙහි වැම්මීමෙන් මතු උපද්‍රවයෙක් සැලසුනි නම් නපුරැයි සිතා "දියෙහි වැම්මෙන අඹ අත්තේ අඹ මැලසි අවස්ථාවේ නසව"යි (ලා අවස්ථාවේ, වැඩී ඉදෙන්නට පෙර) කියා වඳුරන්ට සම්මත කළාහ (නියෝග කළේය).

අසූදහසක් වඳුරෝ ඒ නියාවටම අඹ කන අවස්ථාවෙහි එක් අඹයෙක් දිමි කදළු අස්සේ තිබී මුකරා අසූදහසක් වඳුරන් ඇසට නොපෙණී විලිස්සව (ඉදිලා) ගඟ දියෙහි වැටුනේය. ඒ අඹ ගෙඩිය බරණැස් නුවර රජ්ජුරුවන් නාන්ට එන තොට සමීපයෙහි දෙපිල දැල එල්වා තුබූයේය. ඒ අඹ ගෙඩිය ලෝදැල බැඳින. ලෝදැල් අකුලන්නට ගිය කෙවුලෝ (මසුන් මරණ අය) එකියන අඹය දැක කවර ඵලාජාතියක් බවත් නොදැන රජ්ජුරුවන්ට ගෙන ගොසින් දුන්නාහ.

රජ්ජුරුවෝ "මේ කවර ඵල ජාතියෙක්දැ?"යි විචාරා "නොදනුම්හ"යි කීමෙයින් වැද්දන් ගෙන්වාගෙන "මේ කවර ඵල ජාතියෙක්දැ?"යි විචාළාහ. "ස්වාමීනි, හිමාලයේ ගඟක් සමීපයේ අඹයෙකැ"යි කීහ. රජ්ජුරුවෝ ඒ වැද්දන් අත තුබූ

සෙල්ලයෙන් (ආයුධයකින්) අඹය සස්වා (කපවා) පළමුයෙන් වැද්දන්ට කවා පසුව නුවරුන් පටන් රජ්ජුරුවන් වහන්සේ මේ නිමවා (අනුභවකර) "ඒ වැද්දන් ඇරගෙන ඒ ගස සමීපයට මග පාව"යි කියා චතුරංගණී සේනාව ඇරගෙන ඔරු පාරු පඩව් (ලෑලි වලට) ආදියට නැගී ගඟ ඔස්සේ ගොසින් අඹ ගස මුලට බැස රජ්ජුරුවෝ අඹරස අනුභව කොට ලැගුම්ගෙන වට චතුරංගනි සේනාව සලස්වා එතන බොහෝ ගිනිමැල බඳවා බොහෝ අරගල පැවැත්වූහ.

මධ්‍යම රාත්‍රියේ අරගල සන්සිඳී ගිනිත් නිවී නිශ්ශබ්දව මනුෂ්‍යයෝ නිදන්ට වන්නාහ. බෝධිසත්වයන් ඇතුළුවූ අසූ දහසක් වඳුරෝ අඹ ගසට නැගී අඹ කන්ට වන්නාහ. බොහෝ වඳුරන් හෙයින් බොහෝ අරගලවූ ගමනේ රජ්ජුරුවෝ පිබිද මනුෂ්‍යයන් පුබුද්දවා "අඹ ගස බොහෝ වඳුරෝය. කොයිත් යානොදී නිද නැගිකල්හි අඹ රසත් වඳුරු මසුත් කම්මැ"යි කියා වට රැකවල්ලවා දුනුවායනුත් ලැවූහ. වඳුරෝ ඒකසී භයපත්ව (එක වගේ බියපත්ව) බෝධිසත්වයන් සමීපයට ගොස් මෙපවත් කීහ. බෝධිසත්වයෝ මෙපවත් අසා "තොපි හැම භය නොගනුව"යි කියා සන්තර්පණය (සනසා) කොට අඹගස අග අත්තට නැගී මහත්වූ වේග දක්වා එගොඩ කැලයකට පැනපූවාහ. බෝධිසත්වයෝ ගඟ එගොඩට පිනූ ගමනේම දුනු දිය නුළුඇ දුන්නේ සියක් දුන්නයයි නියම දැන එච්චරටත් ගස බඳිනා විචරටත් වේවැලක් කඩාගෙන වේවැල ගසබැඳ බෝධිසත්වයෝ තමන්ගේ ඉග බඳිනා පමණ පරීක්ෂා නොකොට ඉගබැඳ දෙවනුව පිනුවාහු අඹ අත්ත

අල්ලා ගත්තාහ. ඉඟ බදිනා ප්‍රමාණය ලුහුඬුව ගිය හෙයින් බඳදීලා (වැල මදි ප්‍රමාණයට අත්ත අල්ලාගෙන) අත්ත අල්වාගෙන වැදඹත්තාහ. බෝධිසත්‍වයෝ වඳුරන්ට කියන්නාහු "ඉඟ බඳිනා ප්‍රමාණය පරීක්‍ෂා නොකළ හෙයින් අත්තපිට සැපසේ වැදහෝනට නොසේරුය. තොප හැම කිසි සැකයක් නොසිතා මාගේ ඉඟ මැඩගෙන සැපසේ ගඟින් එතර පලායව"යි කීහ.

වඳුරෝ කියන්නාහු "ස්වාමීනි, අපගේ ප්‍රාණ ආසාවෙන් නුඹ වහන්සේගේ පිට මැඩගෙන යනවිනා නුඹ වහන්සේට ලන්වන්නටත් බම්හ"යි කියා බෝධිසත්‍වයන් වැඳ වඳුරෝ එකින් එකා නියායෙන් අසූදහසම ගඟින් එගොඩ ගියාහ. දේවදත්තයා ඒ ජාතියේ එකියන වඳුරන් හා එක්ව ඉපද අග අත්තට නැගී උන් තැනැත්තේ ආරලා බෝධිසත්‍වයන් පිටට පිනුගමනේ හෘදයමාංසයත් (හදවත) කඩාගෙන තෙමේ පලා ගියේය.

රජ්ජුරුවෝ නොනිඳ උන් තැනැත්තෝ බෝධිසත්‍වයන්ගේ ක්‍රියාවත් වඳුරන්ගේ ක්‍රියාවත් දේවදත්තයන්ගේ ක්‍රියාවත් දැක පාන්වූ ගමනේ අටල්ලක් බාවා (අට්ටාලයක් තනා) ඊපිට මැස්සක් ලවා මැස්ස උඩට මිනිසුන් නංවා බෝධිසත්‍වයන් ඉඟබැඳි වැල් උනවා බිමට බාවාගෙන වසටකඩක් (රෙදි කඩකින් වෙලා) වෙලා උලා නාවා මධුර ආහාර කවා සතපාක (සියක් වර සිඳින ලද) සහස්‍රපාක (දහස් වර සිඳින ලද) තෙල් ශරීරයෙහි ගල්වා රජ්ජුරුවන් තමන් වැදහෝනා

යානේ තෙලිසමක් ලා බෝධිසත්වයන් එහි වැදහොවා රජ්ජුරුවන් කථා කරන්නාහු "වීරපුරුෂ වූ වඳුරාණන් වහන්ස, නුඹ වඳුරන්ට කුමක් වන්නේද? වඳුරෝ නුඹට කුමක් වෙත්දැ?"යි විචාළහ.

බෝධිසත්වයෝ කියන්නාහු "මේ අසූදහසක් වඳුරෝ මා නායක කොට තමන් ඇමට භයක් පැමිණියොත් අප ගලවාගත මැනවැයි මා රජ කොට තැබූහ. එසේ හෙයින් උන්ට පැමිණි භයින් සන්හිඳවීමි, මාගේ වසට බැඳිවැල ළුහුඬුව ගියහෙයින් වසට ඇද තිබෙන හෙයිනුත් වඳුරන් අසූදහස මාගේ පිට මැඩගෙණ ගිය ආයාසයෙකැ (පිට පාගාගෙන ගියාට මහන්සියක්) යි නොදනිමියි, මාගේ වඳුරන් සැපසේ පලාගිය ගමන්ම මට මහ සන්තෝෂය, සතුරන් මඩිනා හෙයින් අරින්දමය (සතුරන් දමනය කළ නිසා) යි රජ්ජුරුවන් විසිනුත් තමන්ගේ රාජ්‍යවාසීන්ට භයක් පැමිණියේ නම් එයින් ගලවා දසරාජ ධර්මයට කොපය නොව රාජ්‍යය කිරීම විනා පැමිණි භයකට රාජ්‍යවාසීන් හැම මැරීම රාජ ධර්මයට ඇතුළත් නොවෙයි" අවවාද කිය කියා වැදෙත් ගමනේ ප්‍රාණය නිරුද්ධ විය.

රජ්ජුරුවෝ බෝහෝ විකෂේපයට (කණගාටුවට) පැමිණ නුවරවාසීන් එක්කරවා "රජදරු කෙනෙකුන්ට කළමනා ආදහණයක් මෙන් කරව"යි කියා ගැල් දහසකින් දර අද්දවා සොළොස් දහසක් බිසෝවරුන් පිළි අඳවා ඉසකේ පිටි මුදා හෙලවා රන්මල් රිදීමල් විලඳ ආදිවූ දෙය ඉසිනා නියායෙන්

සලස්වා නුවරවාසීනුත් සොළොස්දහසක් බිසෝවරුනුත් සුසාන භූමියට යවා බෝධිසත්ත්වයන් ආදාහන කරවූහ.

බෝධිසත්ත්වයන්ගේ කපාලය නොදා (ඔලු කට්ට නොදැවී) තිබුවා රජ්ජුරුවෝ ගෙන්වා රන්පටක් ඉදිකරවා ජයකොන්තය (ජය සංකේත කරන ආයුධයක්) හා එක්ව මස්වා බරණැස් නුවරට ගෙනගොස් ගඳදුම්මල් ආදීවූ දෙයින් විශේෂයෙන් නුවර සරහා රන් දාගැබක් බඳවා ශීර්ෂ කපාලය (හිස් කබල) රන් දාගැබෙහි පිහිටුවා පූජා සත්කාරය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදාරා මේ ‘මහාකපි ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයයෝය. එසමයෙහි වඳුරුව උපන්නෙම් බුදුවූ මම්මය”යි වදාළසේක.

# 397. කුම්භකාර ජාතකය

තවද අද්භූත පුද්ගලවූ (සමාන්‍ය අයට නැති පුදුම ගුණ ඇති පුද්ගලයා) සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ක්ලෙශ විෂ්කම්භයක් (කෙලෙස් නිග්‍රහයක්) අරභයා මේ ජාතකය දක්වන ලද.

මෙහි වනාහි විස්තර වශයෙන් ප්‍රව්ජන්ද ජාතකයෙහි පෙණෙන්නේය. මෙහි කෙළෙඹි පුත්‍රයෝ පන්සියයක් මහණව ජේතවනාරාමයෙහි වාසය කරන්නාහු එක් දවසක් රෑ ඒ පන්සියයක් දෙනා වහන්සේම රාගචිත්තය (රාග සිතුවිලි) උපදවා කෙළෙස් වසඟවූ කල්හි සර්වඥයන් වහන්සේ අළුයම්

වෙලෙහි බිජුරකිනා කිරලක මෙන්ද, වාලධිය රක්නා සෙමෙරක (වලිගය රකිනා සෙමෙර මුවා, දිවි පරදුවට තබා වලිගය රකිනා සතෙකි), මෙන්ද එක පුතෙකු රකිනා මවක් මෙන්ද, එක ඇසක් රකිනා එකකු මෙන්ද මාගේ භික්‍ෂූහු කවර ලෙස වාසය කෙරෙද්දෝ හෝ යි කරුණා සමාපත්තියෙන් නැගී ලොව බලා වදාරණසේක් මේ පන්සියයක් භික්‍ෂූන් වහන්සේ රාගචිත්තය උපදවා ක්ලෙශ වසඟවූ නියාව දැක භික්‍ෂූන් පන්සියයම තනිව කැඳවීන්නම් මුන් ඇම "අප සිතූ සිතුවිල්ල සර්වඥයන් වහන්සේ දැනගත්වනැ"යි භය ඇතිව මා කියන්නාවූ ධර්මය නොඅසන්නාහයි සිතා වදාරා අනඳ සාමීන් කැඳවා "ආනන්දයෙනි, භික්‍ෂූන් එක්කරව"යි වදාළසේක.

අනඳ සාමීන් ජේතවනාරාමයෙහි වාසය කරන්නාවූ භික්‍ෂූන් වහන්සේ ධර්මසභා මණ්ඩපයට රැස් කරවූසේක. සර්වඥයන් වහන්සේත් "එම්බා මහණෙනි, යම්සේ ක්ලෙශ වසගයෙන් රාගචිත්තයෙක් උපන්නේ වීනම් ඒ දළු නොලවා (වැඩෙන්නට ඉඩ නොදී) වහාම නසාපිය යුත්තේය. පෙර උත්තමයෝ යම්තම් අරමුණක් දැක උපන්නාවූ ක්ලෙශයන් නසාපුවෝ වේදැ"යි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

තේ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ පසල් ගමක දුක්පත් කුඹල් කුලයෙක ඉපද වැඩිවිය පැමිණ

බිරින්ද හා සමග තමන් හා දෙදෙන බැලමෙහෙකොට වාසය කරන්නාහ.

එසමයෙහි කලිඟුරට දන්තපුර නුවර කරණ්ඩක නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි ඒ රජ්ජුරුවෝ එක් දවසක් මගුළුයන් යන්නාහු උයන් දොරකඩ පලගෙණ සිටියාවූ අඹගසෙක විලිකුන් අඹ (ඉදුණු අඹ) දැක ඉන් අඹ ගෙඩියක් කා ගියාහ, පස්සේ එන්නාවූ අමාත්‍යයන් හා සේනාව එකහිම අඹ කඩා කැට මුගුරු ආදිය ගසා අතුපත් කඩා අඹ ගසට බොහෝ විනාශ කළාහ.

රජ්ජුරුවෝත් රජගෙට යන්නාවූ අඹ ගස දැක මෙපවත් අසා සම්පත් ඇත්තවුන්ටත් වන්නාවූ අනර්ථය (අවැඩ, විපත) මේ අඹ ගස මෙනි, කුමකුත් නිරපේක්‍ෂව (බලාපොරොත්තුවක් නැතිව) වාසය කරන්නාවූ තාපසවරුන්ට කිසි භයෙක්වත් සිතට දුකෙක්වත් නැත, සියල්ලම අනිත්‍යය, දුක්කඛ, අනාත්මය (සාර වශයෙන් ගත යුක්තක් නැති බව) යි තිලකුණු භාවනාකොට එම අඹගස මුල සිට සියළු කෙලෙසුන් නසා පසේබුදුවූ සේක. පසේබුදුව "ඉතිකින් මේ ශරීරය දෙවනුව උත්පත්තියක් වන්නෙත් නැත, මේ ඇට සැකිල්ල මේ ජාතියෙහිම නිරපෙක්‍ෂව ඇරපීමි. ඒ ඒ ජාතිවල ඇඬු කඳුළු කියතොත් සමුද්‍ර ජලයටත් බොහෝව දුක්ඛයෙනුත් මිදුනෙමි"යි තිලකුණු භාවනාකොට වැතිරගෙණ වැඩ සිටිසේක.

එවිට අමාත්‍යයෝත් "ඇයි ස්වාමීනි, රජගෙට වැඩිය මැනව, මෙතන වැඩ සිටිනේදැ?"යි කීහ. රජ්ජුරුවෝත්

"එම්බල මම පසේබුදුව ගියෙමි, මට රජ්ජුරුවන් වහන්සේයයි නොකියව" වදාළසේක. අමාත්‍යයෝ කියන්නාහු "පසේබුදුවරුන් වහන්සේ නම් තුන් සිවුරු (දෙපට සිවුර, තනිපට සිවුර, අඳන සිවුර යන තුන) පාත්‍රධරව ඉසමුඩුව මනාවේදැ?"යි කීහ. එවිට ඉස පිරිමැදළූ සේක. ඉස කෙස් සතරඟුල් දික්ව තුන් සිවුරු පාත්‍රධරව ආකාශයට නැගී නන්දමූල පබ්භාරයට වැඩිසේක.

තවද එසමයෙහි ගන්ධාර රට තක්සලා නුවර තග්ගා නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ඒ රජ්ජුරුවෝ එක් දවසක් සඳැල්ලේ (සදළු තලයෙහි) අමාත්‍යයන් පිරිවරා උන්නාහ. වීථියේ කුඩාකෙල්ලෙක් වැලි පූ කරන්නී තමා අත තුබූ රුවන් වලලු දෙක එක් අත ළූ හෙයින් ශබ්ද පවත්වන්නට වන. රජ්ජුරුවෝත් නිවීම යහපත සම්පත් නම් මිනිසුන්ට විනා සසරට සහයව සිටිනේ නොවෙයි, එසේ හෙයින් තනිව වාසය කරන්නාවූ තපස්විවරයන් වහන්සේට කිසි භයෙක් නැත්තේය. එම අරමුණු කොට තිලකුණු භාවනා මෙනෙහිකොට සියළු කෙලෙසුන් නසා පසේබුදුවූසේක.

අමාත්‍යයෝත් "ඇයි දේවයන් වහන්ස, බැන නොනැගී ඉඳිනේ ඇයිදැ?"යි කීහ. එවිට "එම්බල මට දේවයනි නොකියව, මම පසෙන්බුදුව ගියෙමි" කීහ. එවිට අමාත්‍යයෝ කියන්නාහු "පසේබුදුන් කල අට පිරිකර ධරා සිටියමනා වේදැ"යි කීහ. "එසේදැ"යි තමන්වහන්සේගේ ඍද්ධ්‍යානුභාවයෙන් (එර්දි බලයෙන්) අටපිරිකර ධරා ආකාශයට නැගී ගන්ධමාදන පර්‍වතයට වැඩිසේක.

තවද මියළු නුවර වේදේහ රට නිමි නම් රජ්ජුරුකෙනෙකුන් රාජයය කරන්නාහු එක් දවසක් මතුමාල් තෙලහි උන්නාහු අඟානියේ (මිදුලෙහි) කෙල්ලක් දඩ මස් විකුණන්නීය, ඉන් එක දඩමස් කැටියක් උකුස්සෙක් ගසාගත, ඒ උකුස්සාගේ ඔළුවේ ඇන අනික් උකුස්සෙක් ගසාගත, ඌ අතින් අනිකෙක් ගසාගත මස් කැටිය ඇරපූ උකුස්සාට ගහටයෙක් නැතැයි මේ පඤ්චකාම ඇල්මත් මේ උකුස්සා මෙන, ඇල්ම නැති තැනැත්තේ නම් මස්කැටිය ඇරපු උකුස්සා මෙනැයි මෙම අරමුණු කොටගෙණ තිලකුණු සඳහන් කොට විදර්ශනා භාවනා (තිලකුණු භාවනාව) කොට පසේබුදුවූ සේක.

අමාත්‍යයෝ "ඇයි ස්වාමීනි, බැන නොනැගී ඉඳිනේ ඇයිදැ?"යි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු "එම්බා මම පසේබුදුවිමි" කී කල්හි "පසේබුදුවූ කළ මෙසේ ඉඳිනේ ඇයිදැ?"යි විචාල කල්හි "අටපිරිකර ධරව සිටින්ට උවමැනැවැ"යි කී කල්හි එවිට ඉස පිරිමැදළුෑ සේක. අටපිරිකර ධරව අමාත්‍ය මණ්ඩලයා හා රාජ්‍යවාසීන්ට අවවාද කියා නන්දමූල පබ්භාරයට වැඩිසේක.

තවද පඤ්චාල රට උත්තරපඤ්චාල නුවර දුර්මුඛ නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරන්නාහ. මතුමාල්තල උන්නාහු වීථියේ එක් වෘෂභයෙක් (ගොණෙක්) දෙනකට නැගෙන්ටයයි වන, අනික් මොල්ලිය මහත් වෂභයෙකු දිවගෙණ අවුත් ඒ ගොනා ඇන බඩපලා පියා ඒ දෙනට නැංගේය,

රජ්ජුරුවෝත් පඤ්චකාමයෙහි ලෝභකිරීමෙන් තෙල ගොණා මරණට පැමිණියා මෙන් මරණට පැමිණෙන්නේයයි අනිත්‍යය, දුක්ඛය, අනාත්මයයි තිලකුණු භාවනා කොට විදර්ශනා වඩා පසේබුදුවූ සේක.

එවිට අමාත්‍යයෝ "ඇයි ස්වාමීනි, බැනානොනැගී ඉඳිනේය?"යි කීහ. රජ්ජුරුවෝ කියන්නාහු "මම පසේබුදුවීමි"යි කීසේක. "පසේබුදුවූ කල මෙලෙස ඉඳිනේදැ?"යි "අටපිරිකර ධරා උනමැනවැ"යි කීහ. එවිට ඉසපිරිමැදළු ගමනේ අටපිරිකරධරව පාත්‍රයක් අතින්ගෙණ රාජ්‍යවාසින්ට අවවාද කියා නන්දමූල පබ්භාරයට වැඩිසේක.

පසේ බුදුන් සතරදෙනා වහන්සේම නන්දමූල පබ්භාරයෙන් නික්ම පසල්ගමකට බැස ගැටවටුගන්වා (සිවුරු පොරවන විලාශයක්, දෙවුර වසා සිවුර පෙරවීම) බෝධිසත්ත්වයන් ඉඳිනාවූ ගෙට සිගා වැඩිසේක. බෝධිසත්ත්වයන් වහන්සේ උන්වහන්සේලා සතරදෙනා වහන්සේ වඩා ඉඳුවා දන්වළඳවා "ස්වාමීනි, නුඹ වහන්සේලා සතරදෙනාගේ ඉරියාපථයේ දැක සමාධිවීමි (ඉරියව්වලට පැහැදී), නුඹ වහන්සේලා සතරදෙනා වහන්සේ කවර අරමුණක් දැක පසේබුදු වුයේදැ?"යි විචාළසේක.

එවිට වැඩිමාළු බුදුන් වහන්සේ "මම පල ගෙණ සිටි අඹ ගසකටවූ හානිත්, පලදු නොවු ගසකට නුවූ හානිත් දැක අර්ත්ථය ඇති නැතැන්තවුට (ධනයඇති අයට) වන්නාවූ

අනර්ථයන් මේ අඹ ගසටවූ හානිය මෙනැයි අරමුණු කොට පසේබුදුවීමි”යි වදාළසේක.

දෙවෙනි බුදුන් වහන්සේ “කුඩා කෙල්ලක අත තනිව තුබූ වලල්ල නොඅඬන නියාවත් වලලුදෙක එක්ව තුබූ ගමනේ අඬන නියාවත් දැන බොහෝ දෙනා හා වාසය කිරීමෙන් ඉන් ඊට ගැටීමෙන් සිතට වන්නාවූ ගහට මේ වලලු දෙකමෙනැයි මෙම අරමුණක් කොට පසේ බුදුවීමි”යි වදාළසේක.

තුන්වෙනි පසේබුදුන් වහන්සේ වදාරණසේක් “එක් උකුස්සෙක් මස්කැටියක් ඩැගෙන ආකාශයට නැංගේය, අනික් උකුස්සෙක් උඟ ඔළුවේ ඇන ඒ මස්කැටිය ඇරගෙණ ගියේය. පඤ්චකාමයෙහි ආලය අළුවාවූ සත්‍වයා නම් මස් කැටියේ ආලය ඇරපු උකුස්සා මෙන් පඤචකාමයෙහි ඇල්ම කළාවූ සත්‍වයා නම් මස් කැටිය ඩැගෙණ යන උකුස්සාමෙනැයි මෙම අරමුණක් කොට පසේබුදුවීමි”යි වදාළසේක.

සතරවෙනි පසේබුදුන් වහන්සේ වදාරණ සේක් “එක් ගොණෙක් දෙනකට නැගෙන්ට උත්සාහ කෙරෙයි, ඉවත සිට අනික් ගොණෙක් දිවගෙණ අවුත් ඒ ගොණා අඟින් ඇණ බඩ පලා මරා තෙමේ ඒ දෙනට නැංගේය. පඤ්චකාමයෙහි ඇළුම් කළාවූ යම් සත්‍වයෙක් ඇත්නම් මේ ගොණා මෙන් විනාශයට පැමිණෙන්නේයයි මේ අරමුණක් කොට පසේබුදුවීමි”යි වදාළසේක.

බෝධිසත්‍වයෝත් මේ නියාව අසා උන්වහන්සේ සතරදෙනා වහන්සේ කෙරේ සමාධිව උපස්ථාන කළසේක. පසේබුදුන්

වහන්සේත් බෝධිසත්‍වන් වහන්සේට අනුමෙවෙනි බණ වදරා නන්‍දමූල පබ්භාරයට වැඩිසේක. බෝධිසත්‍වයන් වහන්සේත් බොහෝ කලකින් "මෙසේවූ රජදරුවෝ මහත්වූ සම්පත් හැර පසේබුදුවිය. මම වනයට ගොස් මහණ වෙමි"යි තමන් වහන්සේගේ බිරින්‍දට කියනසේක් "එම්බා භද්‍රාව, කලිඟුරට දන්තපුර නුවර කරණ්ඩක රජ්ජුරුවෝද, ගන්‍ධාර රට හා කාශ්මීර රට නායක තක්සලා නුවර නග්ගාරි රජ්ජුරුවෝද, වෛදේහ රට මියුළු නුවර නිමි රජ්ජුරුවෝද, පඤ්චාල රට උත්තරපඤ්චාල නුවර දුර්මුඛ නම් රජ්ජුරුවෝද යන මේ සතරදෙනාම තමතමන්ගේ මහත් රාජ ඓශ්වර්‍ය්‍යී හැර පසේබුදු වූහ. ඒතරම් මහාසම්පත් ඇති රජ දරුවන් පවා පසේබුදුවූ කල අපට කන්ට බත් නැතිව අඳින්ට පිළි නැතිව දුක්ඛ ජීවිකාවෙන් දවස් අරුම්හ. අපට තමා මේ ගිහිගෙන් ප්‍රයෝජන කිම්දැ?"යි "එම්බා භද්‍රාව, මම් වනයට වැද ඍෂිප්‍රව්‍ර්‍ජ්‍යාවෙන් පැවිදිවන්නා කැමැත්තෙමි" කීහ.

එවිට කියන්නාහු "භග්ගව ගෝත්‍රයෙහි උපන්නාවූ කුම්භකාරයන් වහන්ස, සිතූදේම යහපත ඊට බාධා නැතැ"යි කියා සිතන්නාහු "මුන් වහන්සේ දරුවන් මා ඇඟට දමා තමන්වහන්සේ මහණව ගියසේක් වීනම් දරුවන් පෝෂ්‍යකරන්ට බැරිය. මහණවීම නම් සිතූ සිත හා සමග වූවොත් විනා පසුව බොහෝ සිතිවිලි සිතීගියේ නම් කාරණා නොවෙයි. මුන්වහන්සේ අතින් අවසර ඉල්වාගෙණ යෙත්නම් යානොදෙන සේකැයි කලය ගෙණ පැනට යන්නාක්මෙන් ගොස් තාපසවරුන් වසන්නාවූ පන්සලට වැද පරිව්‍රාජිකාවූදැය,

(පිරිවැජි මෙහෙණක්) බෝධිසත්වයන් වහන්සේත් දරුවන් හැරපියා යානොහී මුන් වඩීන වූකල යෙම් සිතා මදක් වැඩිගන්නා මාගේ දරුවෝ කටයුතු කාරිය දනිද්දෝ හෝ යි පරීක්ෂා කරණ නිසා දවසක් සාල්කරණසේක. එක් දවසක් යහපත්ව පිසනසේක. දවසක් මාළුයේ ළුනු මද කරණසේක, දවසෙක ඇඹුල් මද කරණසේක. ඒ දරුවෝ දෙදෙනෙක් “ඇයි පියාණන් වහන්ස, අද බත් සාල්කළ සේක, අද කඩුකොට පිසූසේක, අද යහපත්ව පිසුසේක, අද මාළුයේ ළුනු මදකල සේක, අද ඇඹුල් මද කළසේකැ”යි කියන්නාහ.

බෝධිසත්වයෝත් “මාගේ දරුවෝ කටයුතු දැනගත්තුය”යි කියා නෑයන් අතට දරුවන් පාවාදී තමන් වහන්සේ තාපස්වරුන් වසන්නාවූ පන්සලට වැද මහණවූසේක.

එක් දවසක් තාපසයන් වහන්සේත් පරිබ්‍රාජිකා වහන්සේත් සිඟා වැඩි ගමනේ වීථියේදී උනුනුන් දැක “මාගේ දරුවන් මරාපියා මහණවූ සේක්ද? නොහොත් දමාපියා මහණවූ සේක්දැ?”යි විචාළසේක. “මැරුයේත් නැත, දැමුයේත් නැත, උන්ගේ නෑයන් අතට පාවාදී මහණවීමි” වදාළ තැන්පටන් මියනතුරා දෙදෙන උනුන් නොදැක කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදාරා මේ ‘කුම්භකාර ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි බෝධිසත්වයන්ගේ කුඩා දියණියෝ නම් උපුල්වන් මහා ස්ථවිරිය, පුතණුවෝ නම් රාහුල මහා

ස්ථවිරය, පරිබ්‍රාජිකාවෝ නම් යසෝධරා ස්ථවිරීය, කුම්භකාරව උපන්නෙම් බුදුවූ මම්මය”යි වදාළසේක.

## 398. දල්හධම්ම ජාතකය

තවද අප්‍රතිපුද්ගලවූ (සමාන පුද්ගලයෙකු නැති) තිලෝගුරු බුදුරජානන් වහන්සේ කොසඹෑනුවර ඝෝසිකාරාමයෙහි වැඩ වසන සමයෙහි උදේනි රජ්ජුරුවන්ගේ භද්‍රාවතී නම් ඇතින්නක් අරභයා මේ ජාතකය දක්වන ලද.

මෙහි වනාහි විස්තර වශයෙන් මාතඞ්ග ජාතකයෙහි පෙණෙන්නේය. මෙහි වනාහි උදේනි රජ්ජුරුවන්ගේ භද්‍රාවතී නම් ඇතින්නක් ඇත්තීය. ඒ ඇතින්නී රජ්ජුරුවන්ට නොයෙක් කාරිය කොට දවස සියක් යොත්නක් ගොසින් එන්නීය. ඒ චණ්ඩප්‍රද්‍යෝත රජ්ජුරුවන්ගේ දුවනියනුත් ඒ ඇතින්නිය නිසා ලද්දාහ. රජ්ජුරුවෝත් ඒ ඇතින්න තමන්ට කටයුතු කරන්නට ශක්ති ඇතිව කරණතෙක් දවස් සියලු හස්ත්‍යාලංකාරත්දී (ඇතාට සුදුසු ඇඳුම් ආදිය) තමන් මෙහෙ නිමවන්නා සේ (තමන්ට ආහාර පිළියෙල කරන්නාසේ) ඇතින්නටත් කැවිලි සලස්වා ඇතින්න දුර්වලව ගිය අවස්ථාවෙහි ඇතින්නට තිබූ රාජවෘත්තියත් ඇරගෙණ ඇතින්න උනා අලහ (ලිහා හැරියා, සේවයෙන් නිදහස් කළා). ඇතින්න එක් දවසක් සර්වඥයන් වහන්සේ කරා ගොස් “ස්වාමීනි, මාගේ රජ්ජුරුවන් වහන්සේ මා නිසා බිසවුන් වහන්සේත් ලත්සේක. ජීවිතයත් ලත්සේක. මා තරුණ දවස් සියලු රාජකාරියම කරවා මට සියලු හස්ත්‍යාලංකාරයෙනුත් සරහා මා සිටිනා ඇත්හල පෝරුවපිට

(ලෑලි මත) සිටින්නට පයට ආයාසයයි (අපහසු නිසා) මොලකට තිල්ලත්(මොලොක් පලසක් වැනි දෙයක්) තනවා තමන් වහන්සේ මේ නිමවන සැටියේ රසමසවුලෙන් යුක්තවූ ආහාරයත් මට නිරන්තරයෙන්ම දෙවා මලමුත්‍ර බිම වගුරුවන්ට නපුරැයි මිදිවලන් තබා මෙසේ නොයෙක් ඉසුරුදී මා රැකිසේක. දැන් මා දුර්‍වල අවස්ථාවෙහි තණසුගක් (තණකොල ටිකක් වත්) පමණකුත් නොලා උනා ඇරපුසේක. මම වනයෙහි වැටකේ අත්තක් යම්කිසි කොලබොල කඩා කා ජීවත්වෙමි. මාගේ පිරිහී ගියාවූ ඓශ්වර්‍ය්‍යයෙහි පිහිටුවාලන්ට ස්වාමීනි නුඹ වහන්සේට විනා අනික් කෙනෙකුන්ට බැරිය"යි සර්‍වඥයන් වහන්සේට කිව.

සර්‍වඥයන් වහන්සේත් "යහපතැ"යි පසුව දවස් රජගෙට සිඟා වැඩිසේක. රජ්ජුරුවෝත් සර්‍වඥයන් වහන්සේ ඇතුළුවූ මහා සංඝයා වහන්සේට දන්දී බණ අසා එකත්පස්ව උන්නාහ. සර්‍වඥයන් වහන්සේ රජ්ජුරුවන් අතින් විචාරණසේක් "මහරජ, තොපගේ භද්‍රාවතී නම් ඇතින්න දැන් නොදකුම්හයි ඕ දැන් කොයිදැ?"යි විචාරා වදාළසේක. "ස්වාමීනි, දුර්‍වලව ගිය හෙයින් පිටත උනාහළීමි" කීහ. එවිට සර්‍වඥයන් වහන්සේ "මහරජ, තොපගේ බිසවුනුත් ඇ නිසා ලදුව, තොපගේ ජීවිතයත් ඇ නිසා ලදුව, එසේ වූ උපකාරී ඇතින්නට තිබූ තරන් අරගන්නට කාරණා කිම්ද? කටයුතු කරන්නාවූ යම් කෙනෙකුන් තරුණ අවස්ථාවෙහි කටයුතු ගෙණ දුර්‍වල අවස්ථාවෙහි උන් ස්ථානාන්තරය පිරිහෙළීම(තනතුරින් පහළ දැමීම) රජ්ජුරුවන්ට කටයුතු නොවේ"යි කියා ඇතින්න

ගෙන්වා පළමු තිබූ ස්ථානාන්තරයෙක් ඇත්නම් ඒ සියල්ලම ඇතින්නට සලස්වා වදාළසේක. රජ්ජුරුවෝත් ඒ නියාවට ඇතින්නට පළමු තිබූ තරන් නියාවට අඩු නැතුව පසිඳුවයි නුවර බෙරලැවූහ.

එක් දවසක් දම්සභාවේ රැස්වූ භික්ෂූන් වහන්සේ "සම්පත්තියෙන් පිරිහුනාවූ භද්‍රාවතී නම් ඇතින්න රජ්ජුරුවන්ට කියා සර්‍වඥයන් වහන්සේ පළමු සිටි ස්ථානාන්තරයෙහිම පිහිටීම පිහිටුවූසේක් වේදැ"යි කියා කියා වැඩ උන් තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්‍ව භාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා එපවත් අසා "දැන් මතු නොවෙයි පෙරත් භද්‍රාවතී නම් ඇතින්නිය ස්ථානාන්තරයෙන් පිරිහුනු තෙනැත්තිය සම්පත්තියෙහි පිහිටු වූයෙම් වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර දල්හධම්ම නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරන්නාහ. බෝධිසත්‍වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ට අමාත්‍යධුරයෙහි උපන්සේක. ඒ රජ්ජුරුවන්ගේ ආචාර මෙවරෙහි දක්‍ෂ වූ යුද්ධයට කඩුසොටි (කඩු හා තෝමර වැනි ආයුධ) බැඳ සතුරන් මධ්‍යයට වැද යුද්ධ කරන්නට සමර්‍ථ වූ ඔටුදෙනක් ඇත්තීය. රජ්ජුරුවෝත් උදේනි රජ්ජුරුවන් භද්‍රාවතී නම් ඇතින්නට තිබූ යම් ස්ථානාන්තරයෙක් ඇත්නම් තමා රැක දුර්‍වලව ගිය

අවස්ථාවෙහි තුබූ රාජවෘත්තිය (රාජ්‍ය සේවය) ඇරගෙණ පිටතට අලහ.

එක් දවසක් රජ්ජුරුවන්ගේ මුලුතැන්ගෙට වලන් ලන්නාවූ කුඹලා වලන් පමාකෙළේය. රජ්ජුරුවෝත් කුඹලා ගෙන්වාගෙණ "වලන් නොපසිඳින්නට (වලන් පිළිස්සීම නොකරන්නට) කාරණා කිම්දැ?"යි කීහ. "ස්වාමීනි, ගොමවැරටි අදිනා ගොන් නැතිහෙයින් වලන් නොපිළිස්සූ නියාය, වලන් නොපසු නොවෙයි"' කීහ. රජ්ජුරුවෝත් එවිට කියන්නාහු "අපගේ පරණ ඔටුදෙනෙක් ඇත්තීය. ඒ කොයිදැ?"යි විචාළාය. කුඹලා කියන්නේ "ස්වාමීනි, ඕ ඉච්ඡාපරයේ (නිදහසේ) ඈ සිටිනීය"යි කීහ. "එසේ නම් ඈ බැඳගෙණ ගොමරිති අද්දව"යි කුඹලාට පාවාදුන්හ. කුඹලාත් එතැන් පටන් ඈ බැඳගෙණ ගොමරිති අද්දවන්නේය.

එක් දවසක් බෝධිසත්වයන් දැක ඔටුදෙන කියන්නී "මම පළමු රජ්ජුරුවන් වහන්සේට පක්ෂපාතිව සිට ලෙයි කඩුසොටි බැඳගෙණ සිට ඒ ඒ තැන යුද්ධත් කෙළෙමි, සියක් යොත්නේ සන්තානයකටත් පත්ලියා කර බැඳලුකල ඒ රජ්ජුරුවන් ලඟට ගෙණගොස් සන්තාන පිරිමසාගෙණ උන්ගෙන් ලියා දුන් බස පතා අපගේ රජ්ජුරුවන් වහන්සේට ගෙණවිත් දී නොයෙක් රාජකාරිය පරිමසා දිනිමි. දැන් දුර්වලව ගිය අවස්ථාවෙහි මාගේ තරම් පදමුත් ඇරගෙණ මා පිටත තණකොලකා ජීවත්වන තෙනැත්තිය පිටතත් සිටියනොදී කුඹලාට වලන් පුළුස්සන ගොමවැරටි අදිනා නියායෙන් සලස්වා වදාළසේක.

මේ විඳිනා දුක්ඛයෙන් මුදන්ටත් පළමු සිටි ස්ථානාන්තරයෙහි පිහිටුවන්ටත් නුඹ වහන්සේට භාරය"යි වැඳහෙව කීය.

බෝධිසත්ත්වයන් වහන්සේ ඈ කී කටයුතු අසා "යහපතැ"යි "රජ්ජුරුවන්ට කියා තොප පළමු සිටි ස්ථානාන්තරයෙහි පිහිටුවා ලමි"යි නුවරට වැද රජ්ජුරුවන් වහන්සේ වැඳ එකත්පස්ව සිට අනික් කථාවක් උපදවා "ස්වාමීනි, මේ රජගෙයි පළමු සිටි ඕටුදෙන් කොයිදැ?"යි විචාළසේක. රජ්ජුරුවෝ කියන්නාහු "දුබ්ලව පිටත සිටි තැනැත්තිය කුඹලා වලන් පුළුස්සන්ට ගොමවැරටි අදින්ට පාවාදුනුමි" කීහ.

බෝධිසත්ත්වයන් වහන්සේ "දේවයන් වහන්ස, යම් අසත්පුරුෂ කෙනෙකුන්ට යම් කෙනෙක් අර්ත්‍ථලාභව නම් උන්ට අනර්ත්‍ථකිරීම අසත්පුරුෂයන්ට සුදුසු පමණක් විනා නුඹවහන්සේ වැනි රජදරුවන් වහන්සේට තරම් නොවෙයි, එසේ හෙයින් ඕටුදෙන නුඹ වහන්සේ ඒ ඒ තැන රජ දරුවන් ලඟට මෙවර ගොසින් කළ සන්තානත් (කළ වැඩ සිහිකර, සිත තුළ ධරා) ලෙයි ආයුධ බැඳගෙණ සතුරන් මධ්‍යයට වැද නොයෙක් වාරයේ කළාවූ යුද්ධත් නුඹ වහන්සේටම දැනෙන්නේ වේද? තමාට තරුණ අවස්ථාවෙහි රාජකටයුත්තක් කළාවූ යම් කෙණෙක් දුබ්ලව යන්නාවූ උන්ගේ ස්ථානාන්තරයෙනුත් පිරිහෙලා උනුත් ඇරපුකල නුඹ වහන්සේට දුක්ගන්නා සියල්ලෝය මුන් වහන්ස්ට දුක්ගැනීමෙන් කවර ප්‍රයෝජනයෙක්ද? තමන් වහන්සේට බොහෝ දුක්ගත් ඕටුදෙන පවා සිටි ස්ථානාන්තරයත් සියල්ලම පිරිහෙලා කුඹලාට

ගොමවැරටි අදින්නට පාවාදීපුසේකැ යි කියා නුඹවහන්සේට යම් අවසරයකට නොලැබෙන්නාහ. නුඹවහන්සේට දුක්ගත් යම් කෙනෙකුන් තරුණ අවස්ථාවෙහිත් දුර්වල අවස්ථාවෙහිත් නොහැර උන්ගේ තරම් පදමුත් ස්ථානාන්තරත් නොපිරිහෙලා රැක්ක මැනව. එවිට සියල්ලෝම නුඹ වහන්සේ කෙරෙහි තව අපගේ ස්වාමි අප කටයුත්තකට භව්‍යවුවත් අභව්‍යවුවත් රැකවදුරණසේකැයි රාජඅමාත්‍යාදීවූ සියල්ලෝම යම් අවසරයෙක නොහරණාහ''යි රජ්ජුරුවන් වහන්සේට නොයෙක් කාරණා කියා අවවාදයෙහි පිහිටුවා ඔටුදෙනත් පළමු නියායෙන් ස්ථානාන්තරයෙහි පිහිටුවෝ වේදැයි වදුරා මේ 'දල්හධම්ම ජාතකය' නිමවා වදාළ සේක.

"එසමයෙහි ඔටුදෙන නම් මේ භද්‍රාවතී නම් ඇතින්නය, අමාත්‍යව උපන්නෙම් බුදුවූ මම්මය''යි වදාළ සේක.

## 399. සොමදත්ත ජාතකය

තවද මෛත්‍රී නැමති ජලයෙන් නිවන ලද කෝපාග්නි (කෝපය නැමති ගින්න) ඇති ලොකොත්තමවූ (ලොවට උතුම් වූ) සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් මහළු භික්‍ෂූන් වහන්සේ නමක් අරභයා මේ ජාතකය දක්වල ලද.

ඒ කෙසේද යත්?

එක් මහළු භික්‍ෂුකෙනෙකුන් වහන්සේගේ අත්පා මෙහෙවර කරන්නාවූ එක් සාමණේර නමක් එක් ව්‍යාධියකින් (රෝගයකින්)

කළුරිය කළසේක. ඒ මාළු භික්ෂූන්වහන්සේ උන් වහන්සේ මළාවූ ශෝකයෙන් අඬා වැලපෙ ශාසනයෙහි සිතිවිල්ලක් නැතිව (සසුනට ඇල්මක් නැතිව) මහත් ශෝකයෙන් ඉඳිනාසේක. භික්ෂූන් වහන්සේ දම්සභාවේ රැස්ව ඉඳ "අසවල් මාළු භික්ෂූහු තමන්ගේ සාමණේර නමක් මළාවූ ශොකයෙන් අඬාවැලපෙ ඉඳිනාහ"යි කිය කියා වැඩ උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදරා "මහණෙනි, මා එන්නට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා මෙපවත් අසා "දැන් මතු නොවෙයි මහණෙනි, මේ භික්ෂූහු පෙරත් මේ සාමණේරයන් නිසා අඬාවැලපෙ දුක්විඳිනවුන්ම මම සන්හිඳුවූයෙමි වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්ත්වයෝ ශක්‍රදේවේන්ද්‍රව උපන්නාහුය. එසමයෙහි එක් බ්‍රාහ්මණයෙක් පඤ්චකාමයෙහි ආදීනව දැක වනයට වැද තාපසව වාසය කරන්නාහ. එක් දවසක් ඵලාඵල කඩා ගියාහු එක් ඇත්පැටියෙකු දැක පන්සලට ගෙණවුත් සොමදත්තයයි නම් තබා දරුකොට වඩන්නාහු ඇත් පැටියා පන්සල රඳවා ගියහ. තාපසයන් වනයට යාදී තණකා අජීර්ණව දිරවාගත නොහී තාපසයන් එන වේලාවට වැටිහිනි. තාපසයෝත් ඵලාඵල ඇරගෙණ එන්නාහු "ඇයි? මෙතෙක් දවස් සෝමදත්තයෝ මා ඉදිරියට එන්නාහ. අද නාවෝය. මේ වැදෙත්තෝ වනැ"යි ඇතා ළඟට ගොස් "මාගේ පුතනුවෝ

වැදහෝනේය, නිදා වැදහෝත්තා මෙන් මා හා බැනනොනැගී වැදහෝනාහ''යි බැගෑපත්ව අඬා අතකර වැළඳගෙණ මහත්වූ ශෝකයෙන් නොකා නොබී අඬා වැලපුනාහ. ශක්‍රයෝත් තාපසයන් විඳිනාවූ ශෝකය දිවසින් දැක බමුණු වෙසක් මවාගෙණ තාපසයන් කරා අවුත් විචාරන්නාහු "ඇයි තාපසයෙනි, තොප අඹු දරුවන් ආලය හැර කිසිදෙයකත් නිරපේක්‍ෂව නොවේද තොප තපසට ආයේ, එසේ වූ තොප මේ ඇතකු නිසා අඬන්නට දෙඩන්ට කාරණා කිම්දැ?''යි කීහ. එවිට තාපසයෝ කියන්නාහු "එම්බල ශක්‍රදේවේන්‍ද්‍රය, යම් කෙනෙක් බොහෝ දවසක් එකතැන වැස ඇරගියෝ නම් උන්ගෙන් වියෝවූකල ඇත්තාවූ ශෝක ස්වභාව ලෝකධර්‍මයෙක. සියල්ලෝම අඬා වැලපෙන්නාහ. එසේ හෙයින් මාගේ පුතනුවන් කෙරේ ශෝක ඉවසාගතනොහී අඬමි'' කීහ.

එවිට ශක්‍රයෝ කියන්නාහු "මේ මළාවූ ඇතාට ශෝකයෙන් තොප ඇඬූ නියාව දනිද්ද? මළවුන්ට ඇඬීමෙන් තමාගේ ශරීරයට දුක්වන පමණක් විනා ඉන් ප්‍රයෝජන කිම්දැ? ඉදින් මළ කෙනෙක් උපදිත් නම් නුඹ වහන්සේගේ බොහෝ නෑයෝ මළෝවේද? ඌ උපදිත්නම් නුඹ වහන්සේත් මමත් දෙන්නම අඬමිහ''යි කීහ. එවිට තාපසයෝ කියන්නාහු "දේවේන්‍ද්‍රයෙනි, තොප මාගේ පුත්‍ර ශෝකාග්නි (පුතා නැතිවූ ශෝක ගින්න) නිවූ නියා ඉතා යහපතැ''යි වදරාලා "තෙල් වත්කොට දල්වන්නාවූ ගින්නක් නිවූකලක් පරිද්දෙන් ශෝකය තුනීකරණලද. යම්සේ පයක ඇනුනාවූ හුලක් ඇර දුනමනා කලක් මෙන් මාගේ ළෙයි (සිතෙහි ඇතිවූ) තුබූ ශෝක නමැති

උල උදුරාපුද, අද පටන් ශෝකත් නොකරමි නාඬමි නොදෙඩමි''යි සන්හිඳුනු සේක. ශක්‍රයෝත් තාපසයන් වහන්සේ ශෝක සන්සිඳුවා තමන්ගේ දිව්‍ය ලෝකයටම ගියාහ.

''එසමයෙහි තාපසයෝ නම් මේ මාළුවූ භික්‍ෂූහුය. ඇත්පැටියා නම් සාමරණේරය. ශක්‍රව උපන්නෙමි ලොව්තුරා බුදුවූ මම්මය''යි වදරා 'සොමදත්ත ජාතකය' නිමවා වදාළ සේක.

# 400. සුසීම ජාතකය

තවද සංසාර චක්‍රය මථනය (සසර ගමන නැවැත්වූ) කළාවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි මහබිනික්මන් අරභයා මේ ජාතකය දක්වන ලද.

එක් දවසක් දම්සභාවේ රැස්වූ භික්‍ෂූන් වහන්සේ සර්වඥයන් වහන්සේ, ''මේසා මහත් රාජෛශ්වර්ය්‍යයක් (රජ ඉසුරු) තිබාපියා මහාබිනික්මන් කළේ වේදැ''යි කිය කියා වැඩඋන් ප්‍රස්ථාවට සර්වඥයන් වහන්සේ වැඩ වදරා ''මහණෙනි, මා එන්නාට පූර්ව භාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ?''යි විචාරා වදරා එපවත් අසා ''දැන් මතු නොවෙයි මහණෙනි, පෙරත් මහබිනික්මන් කළෝ වේදැ''යි වදරා ''ඒ කෙසේදැ?''යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි උන්ට පුත් රජ කුමාරකෙනෙක් උපන්නාහ. උන්ට බ්‍රහ්මදත්ත කුමාරයෝ යයි නම් තුබූහ.

ඒ රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රහ්මණයාගේ ගෙයි බෝධිසත්වයෝ උපන්නාහ. උන්ට සුසීම කුමාරයෝ යයි නම් තුබූහ. ඒ කුමාරවරහු දෙදෙනාම වැඩිවිය පැමිණ තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් කරා ගොස් සියලු ශාස්ත්‍ර නිමවා ඉගෙණ නුවරට අවුත් යුවරජ තනතුරෙහි සිට පියාණන් ඇවෑමෙන් රාජ්‍යයට පැමිණ මාගේ යහළුවූ සුසීම කුමාරයනුත් පුරෝහිත තනතුරෙහි පිහිටුවා දෙන්නම දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කරන්නාහු. එක් දවසක් රජ්ජුරුවෝ නුවර ප්‍රදක්ෂිණා කරන්නාහු තුමූ ඇත්කඳකට පැන්නැගී (ඇතුපිට නැගී) පුරෝහිත බ්‍රාහ්මණයා තමන් පිටිපසේ ඉඳුවා නුවර ප්‍රදක්ෂිණා කරන්නාහ. රජ්ජුරුවන්ගේ මැණියෝ සැදැල්ලහි සිටියාහු රජ්ජුරුවන් පිටිපස්සේ ඇතුපිට උන්නාවූ සුසීම කුමාරයන් දැක උන්කෙරේ අභිලාෂා (පිළිබඳව සිත් ඇතිව) ඇතිව "මුන් නොලදින් නම් ප්‍රාණයෙන් කම් කිම්දැ?"යි ගෙට වැද යහන් මතුයෙහි මුනින් වැදඹත්තාහ. රජ්ජුරුවෝ නුවර පැදකුණු කොට රජගෙට අවුත් මැණියන් ඉඳිනාවූ රජගෙට ගොස් "මැණියන් වහන්සේ කොයිදැ?"යි විචාරා "ලෙඩට වැදහෝනාසේකැ"යි අසා "මැණියන් වහන්ස, අපාසු කිම්දැ?"යි විචාළාහ.

බිසවුන් පුතනුවන්ට කියයතු දෙයක් නොවන හෙයින් ලජ්ජා ඇතිව බැණනොනැගී උන්හ. රජ්ජුරුවෝත් මාලිගාවට අවුත් අගමෙහෙසුන් බිසවුන්ට කියන්නාහු “මැණියන් වහන්සේට ඇති අපාසු විචාරා එව”යි කියා බිසවුන් යවූහ. රජ්ජුරුවන්ගේ මැණියෝත් ස්ත්‍රී නම් උන්සිත ඇත්ත (සිතෙහි ඇති දෙය) නොසඟවන හෙයින් යේලනියන්ට මෙපවත්කීහ. බිසවුන් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝත් එපවත් අසා සුසීම නම් පුරෝහිත බ්‍රාහ්මණයානන් කැඳවා කියන්නාහු “එම්බා සුසීම නම් පුරෝහිත බ්‍රාහ්මණයානෙනි, මාගේ මැණියන් වහන්සේට මෙසේවූ අභිප්‍රායක් ඇතිව ලෙඩසේක. උන් වහන්සේගේ මනෝරථය සිද්ධනුවූයේ නම් උන්ගේ ප්‍රාණය රැක්ක නොහැක්ක, තොප විසින් උන්වහන්සේ රැකදෙව, මම තොපට පුත්‍ව යුවරජ තනතුරෙහි සිටිමි” කීහ.

පුරෝහිත බ්‍රහ්මණයානෝ කියන්නාහු “ස්වාමීනි, මෙලෙස කීම ආචාරයෙක් (සුදුසු නොවේ, සිරිතක් නොවේ) නොවෙයි” කියා නොගිවිස්සාහ. රජ්ජුරුවෝත් නොයෙක් කාරණා කියා සුසීම නම් පුරෝහිත බ්‍රාහ්මණයානන්ට මැණියන් පාවාදී උන් රාජ්‍යයෙහි පිහිටුවා තුමූ යුවරජ තනතුරෙහි පිහිටියාහ. රජ්ජුරුවෝ එතැන් පටන් රාජ්‍යය කරන්නාහු ගිහිගෙය කලකිරී “කවර විටෙක මේ ගිහි බන්‍ධනයෙන් (ගිහි ගෙයි විසීමෙන්) ගැලවීයෙම්දෝ හෝ”යි සිත සිතා තනිව සිටිනාහ, ඉඳිනාහ, ඇවිදිනාහ. බිසව් සිතන්නාහු මා මැහැලිසෙයින් මා කෙරේ ආලය මදව ඉඳිනාසේක්වනැයි සිතා එක් දවසක් රජ්ජුරුවන් ඉස බලන්නාක් මෙන් බල බලා ඉඳ තමුන් ඉසින්

නරකෙන්දක් ආරගෙණ රජ්ජුරුවන්ට පෑ "දේවයන් වහන්ස, මම මතු නොවෙයි මැහැල්ලෙමි, නුඹ වහන්සේත් මහළුව ගියසේකැ"යි රජ්ජුරුවන්ට කීහ.

එවිට රජ්ජුරුවෝ මෘත්‍යුමාරයා (මරණයට ලංවී) අවුත් ඉසකේ අල්වා ගත්තාක් මෙන් කොට සිතා භයින් ත්‍රස්තව තුමූ තමන්ට අවවාද කියන්නාහු "එම්බා සුසීම කුමාරයෙනි, තොපගේ කළුවූ කෙස් විලිස්සෙන්ට (පැසෙන්න, සුදු වන්නට) වන, ඉතිකින් තොප මහණවන්ට යන්ට කලැ"යි කීහ.

එවිට බිසව් කියන්නාහු "දේවයන් වහන්ස, මම නුඹ වහන්සේ වංචා කරණ නිසා මාගේ ඉසින් නරපතක් ඇරගෙන පෑමි, නුඹ වහන්සේ ඉස නරයෙක් නොවෙයි, මා නිශරණකොට (අනාථ කර) නුඹ වහන්සේ මහණවන්නට යනසේද්‍ැ?"යි කියා "නුඹ වහන්සේ ඉතා විශිෂ්ට රූ ඇති සේක. බැළුවන්ට ප්‍රියකරු සේක. මේ අවස්ථාවෙහි මහණවීමට කාරණා නොවෙයි. මහණවන්නට නොගිය මැනව"යි කීහ.

එවිට බෝධිසත්ත්‍වයෝ කියන්නාහු "එම්බා මම මාළුවයසට පැමිණ සිටිනවුන් බොහෝ කොට දිටිමි. තරුණ අවස්ථාවෙහි අනුන් පොළඹන්නාවූ ස්ත්‍රීහු මැහැලි අවස්ථාවෙහි සැරයටි දඬුගත් අත් ඇතිව තුමූ තමන් පෙළඹා ගත නොහෙන්නාහ. මම ළදරුවනුත් මහල්ලනුත් දුටුවිරීමි, තොප කෙසේ කීවත් මහණවන්නට යෙමි" කියා රාජකුමාරයන්ට රාජ්‍යය පාවාදී වනයට ගොස් ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් (තාපස පැවිද්දෙන්) පැවිදිව පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා කම්වූ පරිද්දෙන් මිය

පරලොව ගියහයි වදාරා මේ 'සුසීම ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි රජ්පුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. බිසව් නම් යසෝධරා ස්ථවිරීය. පුරෝහිත බ්‍රාහ්මණවූයෙම් බුදුවූ මම්මය"යි වදාළ සේක.

# 401. කොටිසිඹලි ජාතකය

තවද සංසාර සාගරයෙන් පරතෙරට පැමිණියාවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ක්ලේශ නිග්‍රහයක් (කෙලෙස් ගැරහීමක්) අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

එක් දවසක් පන්සියයක් භික්ෂූන් වහන්සේට කාමවිතර්කයෙක් (කම් සැප පිළිබඳව තර්ක කිරීම) උපන. ඒ උපන් කාමවිතර්කය සර්වඥයන් වහන්සේ දැන වදාරා "මහණෙනි, කාමවිතර්ක, ව්‍යාපාදවිතර්ක (ව්‍යාපාදය නම් අනුන් නැසේවායි සිතන සිතුවිල්ල. ඒ ගැන තර්ක කිරීම), විහිංසාවිතර්ක (හිංසා කල යුතුයැයි තර්ක කිරීම) සිතීමෙන් මාර්ග්ග නැමති (සෝවාන් ආදී මාර්ග ඵලවලට) ඵලවිපාකයට බාධකය, යම් ගස්බිලයෙක (ගස් බෙනයක) පක්ෂියෙක් වර්චස් කළේ (මල පහකිරීම) නම් ඒ වර්චසින් නුගපැලය ඇතිව ඒ ගස විනාශයට පැමිණෙන්නා මෙන් රහත් ඵල නැමති විපාක නසාපියන්නේය. එමෙන් කාමවිතර්ක නොසිතව"යි වදාරා

“දේවතාවා තමාගේ ගස උන් පක්ෂියා දැක බාගියේද, (බිය වීම) එමෙන් මහණෙනි, කාමවිතර්කයන් උපන්කල ඊට භීරුකව (බිය ඇතිව) වාසය කරවයි වදාරා “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් වහන්සේ රාජ්‍යය කරණ සමයෙහි එක්තරා ඉඹුල්වනයක ගුරුළු රජ්ජුරුකෙනෙක් වාසය කරන්නාහ. ඒ ගුරුලා මහත්වූ ශරීරයක් ඇතිව සමුද්‍රජලය (මුහුදු ජලය) දෙබෑ කොට නාගභවනයට වැද මහත්වූ නාගරාජයකු ඩැගෙණ (අල්වා ගෙන) පිටත්ව ආකාශයෙන් යන කලට නාගයා මහත් වෘක්ෂයෙක් වෙලාගත. ගසත් උදුරා ඇරගෙණ ගුරුළු රජ්ජුරුවෝ තමන්ගේ වෘක්ෂයේ ඉඳ නාගයා ඉස මොල ආදිවූ දෙය අනුභව කොට නාගයාත් වෘක්ෂයත් එලීය (අත හැරියා, බිමට දැමීය).

වැටෙන වෘක්ෂය සමුද්‍රයෙහි වැටෙන්නට වන වෘක්ෂයේ උන් පක්ෂියෙක් ඒ ගසින් පිටත්ව ගුරුළු රජ්ජුරුවන් උන් වෘක්ෂයේ ගොසින් උන්නේය. ඒ වෘක්ෂයේ උන් දේවතාවා භයින් ත්‍රස්තව වෙවුලන්නට වන.

එවිට ගුරුළු රජ්ජුරුවෝ දේවතාවා දැක “ඇයි, තොප මා වැනි කෙනෙකුත් මහත්වූ ශරීරයක් ඇති නාගරාජයෙකුත් ඇවිත් උන් ගමනේ නොවෙවුලා දැන් වෙවුලන්නට කාරණා කිම්දැ?”යි විචාළේය.

දේවතාවා කියන්නේ "මේ පක්ෂියා අනුභව කරන්නේ නුග දිඹුල් ආදි වූ ඵලජාතිය, මාගේ ගස ඉඳ ගස් බිලයෙක වර්චස් කෙළේ නම් නුග ගසෙක් හෝ යම් ගසෙක් ඇතිවීනම් මාගේ විමානය නසින්නේය. එසේ හෙයින් ඉදිරියේ වන උපද්‍රව (විපත) දැක භයින් වෙවුලා ගියෙමි" කීයේයයි වදාරා මේ "කොටිසිඹලි (ලොකු ඉඹුල් ගස, මල් නැතිව ගෙඩි හටගන්නා අට්ටික්කා ගසටද සිම්බලි යයි කියයි) ජාතකය' නිමවා වදාළ සේක.

"එසමයෙහි ගුරුලා නම් ශාරිපුත්ත ස්ථවිරය. එසමයෙහි දේවතාවා නම් බුදුවූ මම්මය"යි වදාළ සේක.

# 402. ධූමකාරි ජාතකය

තවද නිර්මිමලවූ (පිරිසිදු වූ) පස්පැදිස්නා (පාට පහකින් බබළන්නාවූ) ඇස් ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝසල රජ්ජුරුවන්ගේ ආගන්තුක සංග්‍රහයක් අරභයා මේ ජාතකය දක්වන ලද.

කෝසල රජ්ජුරුවෝ පරණ මහා අමාත්‍යයන් හා යෝධයන් හැර අමුතුව ඇතිකළ (අළුතෙන් පත්කළ, අමතර) අමාත්‍යයන් හා යෝධයන් ඇරගෙණ පරණ ජනයන් කෙරෙහි නිස්සාරව (නොසලකා හැරීම) පවත්නාහ.

එසමයෙහි රජ්ජුරුවන්ට සොරුන් කැටි (සමග) යුද්ධයෙක් පැමිණියේය. රජ්ජුරුවෝ පරණ අමාත්‍යයන් හා යෝදයනුත්

අළුත් මුදලිවරුන් හා ඇම සේනාවත් ඇරගෙණ සටනට ගියාහ. පරණ අය කෙරේ රජ්ජුරුවන් වහන්සේ සරුකාරියක් (ගණන් නොගෙන) නැතිව අලසේක. තමන් වහන්සේගේ අළුත් මුදලිවරුන් හා සේනාව ඇරගෙණ සටන් කරවා ගන්නාසේක්වා යි මැලිවූහ. අළුත් මුදලිවරුන් හා ඇමති සේනාවත් අපට වලගොඩ නොදැනෙයි (පරිසරය ගැන දැනීමක් නැති බව, මඟතොට ගැන දැනීමක් නැති බව) කියා තමන් නොදන්නා හෙයින් තොරතුරු නොදැන පසුබටහ. සොරුන් සටන් කොට සේනාව බින්දවූහ (පැරුද්දුවා). රජ්ජුරුවෝ සටනේ පැරද බිඳී නුවරට අවුත් පරණ මහ අමාත්‍යයන් හා යෝධයන් ඇරගෙණ උන්ගෙනුත් කටයුතු කරවා ගතත් නුහුණුයෙමි. අළුතුන් ගෙනුත් නුහුණුයෙමි. “මට වූයේ අලාභයෙකැ”යි කියා “මේ මට මතුවූ දෙයෙක් දෙ හෝ පෙරත් රජදරුවන්ට මෙසේවී දේ හෝ යි සර්වඥයන් වහන්සේ ලඟට ගොස් විචාරමි”යි ජේතවනාරාමයට ගොස් සර්වඥයන් වහන්සේ වැඳ එකත්පස්ව ඉඳ මෙපවත් කීහ. සර්වඥයන් වහන්සේත් “මහරජ, දැන්මතු නොවෙයි පෙරත් එසේම වීය”යි වදරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස කුරුරට ඉඳිපත් නුවර ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරන්නාහ. ඒ රජ්ජුරුවන්ට අර්ත්‍ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නාවූ විධුර නම් පණ්ඩිතකෙනෙක් ඇත්තාහ. ඒ රජ්ජුරුවෝත් පරණ අමාත්‍යයන් හා යෝධයන් හැර අළුත් අමාත්‍යයන් හා

සේනාව ඇති කරන්නාහ. පළමු මුදලිවරුන් කෙරේ සාරයක්වත් (ගරු සරුවක්) විචාරයක්වත් (විමසීමක්) නැත්තාහ. එසමයෙහි රජ්ජුරුවන්ගේ පසල්ගම (පිටිසර ගමක) කුපිත (කැරැල්ලක්) විය. රජ්ජුරුවෝ උන් හා කැටිව යුද්ධයට ගියහ. පරණ අමාත්‍යයෝ "රජ්ජුරුවන් වහන්සේ අප කෙරේ විචාරයක් සමැන්මක්* (සැලකිල්ලක්. ගණන් ගැනීමක්) (*සමනීමක්, යනු ඇතැම් පොතක එයි) නැතිසේක. තමන් වහන්සේගේ අළුත් මුදලිවරුන් හා සේනාව ලවා යුද්ධ කරවා ගන්නා සේක්ව"යි කියා යුද්ධයට නොවැද සිටියාහ. අමුතුව ඇතිකළ අමාත්‍යයන් හා සේනාවද තමන්ට යුද්ධයෙහි තොරතුරු නොදැනෙන හෙයින් සටන් කරණසේ නොදැන පසුබටහ. සතුරු සෙනගත් රාජ සේනාව සටනට නොවදනා හෙයින් තරයේ යුද්ධයට වන්හ. ඒ සේනාව පසුබස්නා සතුරු සේනාව බල වැඩී එන හෙයින් රජ්ජුරුවෝ සිටිය නොහී පසුබැස නුවරට ගොසින් තමන්ගේ විධුර පණ්ඩිතයන් අතින් විචාරන්නාහු "පණ්ඩිතයෙනි, මම පරණ මහා අමාත්‍යයන් හා සේනාව හැර අමුතු මුදලිවරුන් හා සේනාව ඇතිකොට පරණුන් ගෙනුත් නුහුණුයෙමි. අලුතුන් ගෙනුත් නුහුණුයෙමි. මාසේම පෙරත් අතින් කෙනෙකුන්ටත් මෙලෙස විදෑ?"යි විචාළාහ.

එවිට පණ්ඩිතයෝ කියන්නාහු "යුධිෂ්ඨිර ගොත්‍රයෙහි උපන්නාවූ ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවන් වහන්ස, මේ කුමක්ද? මෙවිතරටත් වඩා විශිෂ්ඨ ගොත්‍ර ඇති ධූමකාරි නම් බ්‍රාහ්මණයාණන් කෙනෙක් ඇත්තාහ. උන්ගේ එළුපට්ටියෙක්

ඇත. ඒ එළුවන්ට සීත අවදියෙහි (සීත කාලයෙහි) වට ගිණිදුම් (වටේට ගිනි රස්නය ලබාදීම) කරන්නාහ. සවස ගාලේ ලන්නාහ. කිරි තෙල් කන්නාහ, තනකොල ගෙනවිත් ලන්නාහ, එසමයෙහි වෂා කාලය පැමිණියේය. වනයෙහි සිට මුවෝ පන්සියයෙක් බ්‍රාහ්මණයානන් වසන්නාවූ පන්සල ලඟට ආවාහ. බ්‍රාහ්මණයාත් යහපත්වූ මුවරැල දැක එළුවන් කෙරේ ආලය හැර මුවන් එක්කොට ගෙණ තණකොළ කවා උන් පෝෂ්‍ය කර එළුවන් කෙරේ ආලය අලහ. එළුවෝත් එතැන්පටන් ගාලේ ලන්නන් නැතිහෙයින් ඒ ඒ තැන ඉසිරගොස් (සී සී කඩ ගොස්) සිංහ ව්‍යාඝ්‍රයන් හා වගුන් (වලසුන්) දිවියන් අතින් විනාශයට පැමිණියාහ. මුවෝත් වෂා කාලය නිමායන්නා තමන් වසන්නාවූ වනයට පලාගියාහ. බ්‍රාහ්මණයාත් අළුත් මුවන් දැක එළුවන් කෙරේ ආලය හැර ලබන කිරි දී කිරියෙනුත් (මුදවපු කිරි) නොවී එළුවන්ගෙනුත් නුවූයේයයි මුවන් ගෙනුත් නුවූයේය"යි කියා "රජ්ජුරුවන් වහන්ස, අළුතුන් දුටුවයි පරණ අමාත්‍යයන් හා සේනාව දුරුකිරීමත් කටයුතු නොවෙයි. අමුතුව ඇතිකර ගන්නාවූ ප්‍රධානයන් හා සේනාවත් ඇතිකළ මනාමය. පරණ අමාත්‍යයන් හා සේනාවත් උන් උන්ගේ ස්ථානාන්තරයෙන් නොපිරිහෙලා (තනතුරෙන් පහත නොදමා) තරම් පදවි (සුදුසු තනතුරු) දී රැක්ක මැනව. එසේ කල්හි පරණනුත් අළුතුනුත් සියල්ලෝම එක්සිත්ව නුඹවහන්සේගේ පැමිණි යම්ම කාරියක් පිරිමසන්නාහ"යි කීහ.

රජ්ජුරුවෝත් විධුර පණ්ඩිතයන් කීවාවූ අවවාදයෙහි පිහිටා පරණ මහ අමාත්‍යයන් හා යෝධයනුත් නොහැර අමුතුව ඇතිකළ මුදලිවරුන් හා සේනාවත් වෙනසක් නොකොට රැක පණ්ඩිතයන් කෙරේ සමාධිව (පැහැදී) බොහෝ දැසිදස් ආදීවූ වස්තු දී තමන් කළාවූ කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදාරා මේ ‘ධූමකාරි ජාතකය’ නිමවා වදාළ සේක.

“එසමයෙහි බ්‍රාහ්මණයා නම් කෝසල රජ්ජුරුවෝය, ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය, විධුර පණ්ඩිතව උපන්නෙම් බුදුවූ මම්මය”යි වදාළ සේක.

# 403. ජාගර ජාතකය

තවද ප්‍රඥාවිෂයාතික්‍රාන්තවූ (නුවණ විෂය ඉක්මවූ) ධර්ම්මකාය ඇති සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි නොනිදා සක්මන් කරන්නාවූ උපාසකයෙකු අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

එක් සෝවාන් (සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස යන සංයෝජන නැසීමෙන් ලබන තත්වය) උපාසකයෙකුත් වෙළඳහු පන්සියයක් බඩු ගැල්පුරා වෙළඳාමට යන්නාහු අතරමග පඩංගු බැඳ (නවාතැන් ගෙන) උන්නාහ. රෑව යන්නා සොරු පන්සියයක් වෙලඳුන් මරා බඩු හැරගනුම්හයි කැටමුගුරු දඬුපත් (පහරදීමට යොදාගන්නා

ගල් පොලු වැනි ආදිය) ආයුධගත් අත් ඇතිව ආවාහ. සෝවාන් වූ වෙළෙඳුනෝ සක්මන් කොට සිටියාහු මංපහරින්ට ආ සොරු "මේ මිනිසා නිදුපු කළ සොරකම් කරම්හ"යි සිතා සිටිනාහ. ඒ වෙළෙඳ තුන්යම් රාත්‍රියෙහිම නොනිඳ සක්මන් කොට පාන් කොටපුවාහ. සොරුන් සිටියාසේම සිට පාන්කොට පාන්වන්නා තමන්ගෙණා කැටමුගුරු දඬුපත් දමා වෙළෙඳුන්ට "තොප ඇමම රැකුනේත් තොප වස්තු රැකුනේත් මුන් නිසාය, බොහෝ උපකාරව"යි කියා පළාගියාහ.

වෙළඳුන් ගැල්ගෙණා වෙළඳමට ගොස් වෙළෙඳම් කොට ගෙණා නුවරට අවුත් සර්‍වඥයන් වහන්සේ කරා ජේතවනාරාමයට ගියහ. සර්‍වඥයන් වහන්සේත් "ඇයි උපාසකය, මෙතෙක් දවස් කොයි ගියාදැ?"යි විචාරා වෙළඳුන් වෙළෙඳමට ගිය නියාවත් අතරමග ලැගි නියාවත්, නොනිදම සක්මන් කළ නියාවත්, සොරුන් ආ නියාවත්, තමන් කළ නියාව දැක සොරු පාන්වන තුරු සිට පාන්වන්නා අත තුබූ කැටමුගුරු දමාගිය නියාවත් සර්‍වඥයන් වහන්සේට කීහ.

සර්‍වඥයන් වහන්සේත් "එම්බල උපාසකය, පෙර උත්තමයෝත් නොනිඳ සක්මන් කොට දේවතාවන් අතින් සාධුකාර ලද්දෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ

බ්‍රාහ්මණ කුලයක ඉපිද පඤ්චකාමයෙහි (රූප, ශබ්ද, ගන්ධ ආදී පස්කම්හි) ආදීනව (දෙස්) දැක සෘෂිප්‍රව්‍රජාවෙන් (තවුස් පැවිද්දෙන්) පැවිදිව වනයෙහි වාසය කරන්නාහු රෑ නොනිදා රාත්‍රිය තිස්පැයෙහි සක්මන් කරන්නාහ.

එක් දේවතා දුවක් කියන්නී "නිදන්නාවුන් අතුරෙන් නොනිදන තැනැත්තෝ කවුරුද? නොනිදන්නවුන් අතුරෙන් නිදන්නෝ කවුරුදැ?"යි දේවතාදුව විසින් විචාල කල්හි ඒ ප්‍රශ්නය විසඳන්නාවූ මහාබෝධිසත්ත්වයෝ දේවතාදුවට "මේ ලෝකයෙහි යම් සත්ත්වකෙනෙක් ශීලසඞ්ඛ්‍යාදමයද (ශීලයෙන් තැන්පත්ව) ඉන්ද්‍රිය දමනයයි (ඇස්, කණ්, නාසාදී පසිඳුරන් පාලනය කිරීම) කියනලද භාවනා මනස්කාරයෙන්ද සතරමග සතරඵලය නිර්වාණ ධර්මයෙහි කියන ලද නවලෝකෝත්තර (සතර මග ඵල නිවන්) සද්ධර්මය නොදන්නාහු විනම් සම්මොහ නිද්‍රායෙන් නිදන්නාවූ සත්ත්වයන් අතුරෙන් මම ඒ ධර්මතාවය දැන වාසය කරණ හෙයින් මම නොනිදන්නා නම් වෙමි. යම් ක්ෂීණාශ්‍රාවක (රහතන් වහන්සේ) කෙනෙකුන් වහන්සේ රාග ද්වෙෂ මොහයයි (ඇල්ම, තරහ, මුලාව යන කෙලෙස්) කියන ලද යම් සකල ක්ලේශයන් දුරුකොට සම්මෝහ නිද්‍රායෙන් පිබිද වසනසේක්ද, එසේවූ රහතුන් වහන්සේ අතුරෙන් ක්ලේශ විධ්වංශනය (කෙලෙස් පලවා හැරීම) කොට සම්මෝහ නිද්‍රායෙන් දවස් යවන හෙයින් මම නොනිදන්නා නම් වෙමි"යි මේ ප්‍රශ්ණදෙක විසඳීමෙන් මහාබෝධිසත්ත්වයන් බණ කී කල්හිද සතුටුවූ දේවතා දූ මාත් දන්නාසේමය. මහපුරුෂයාණෝ කීයේයයි සියළු වන දෙවියන් සන්තුෂ්ටි කෙරෙමින් ස්තුතිකොට

සාධුකාර දුන්නීය. බෝධිසත්වයෝත් එතැන වැස කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදාරා මේ ‘ජාගර ජාතකය’ නිමවා වදාළ සේක.

“එසමයෙහි දේවතා දී නම් උපුල්වන් මහා ස්ථවිරීය. තාපසව උපන්නෙම් බුදුවූ මම්මය”යි වදාළ සේක.

# 404. කුම්මාසපිණ්ඩි ජාතකය

තවද චක්‍රලක්‍ෂණයෙන් (රෝද ලකුණු) චිහ්නිතවූ (කවන ලද්දවූ) ශ්‍රීපාද ලක්‍ෂණ ඇති තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි මල්ලිකා දේවින් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

මල්ලිකා දේවින්ගේ උත්පත්තිය මෙසේ දතයුතු:- එක් මාලාකාරයෙකුගේ (මල් මාලා තනන්නෙකුගේ) විශිෂ්ටවූ රූ ඇති දුවක් ඇත. ඇට නම් තබන්නාවූ මල්ලිකා දේවියයි නම් තැබූහ. ඕ තොමෝ තමා හා සමවයස් ඇති කුමාරිකාවරුන් ඇරගෙණ මල් වත්තට යන්නී කොමුපිඩු (යව සහලෙන් තැනූ පිට්ටු) සතරක් ගෙණ ගියාය. සර්‍වඥයන් වහන්සේ සිඟා වඩිනා දැක තමා අත තිබූ කොමුපිඩු සතර සර්‍වඥයන් වහන්සේගේ පාත්‍රාධාතූන් වහන්සේට පිළිගැන්නුවාය. සර්‍වඥවන් වහන්සේ කොමුපිඩු පිළිගෙණ සිනා පහල කොට වැඩිසේක. අනඳ සාමි සිනා පහළ කළ නියාව දැක “ඇයි ස්වාමීනි, සිනා පහළ කළේය”යි විචාරා සර්‍වඥයන් වහන්සේ වදාරණ

සේක් "මේ කුමාරිකාවට අග මෙහෙසුන් තනතුරු අද දවස් පැමිණෙයි" වදාරා ජේතවනාරාමයට වැඩිසේක.

කෝසල රජ්ජුරුවෝ යුද්ධයට ගියාහු යුද්ධයෙහි පරාජයව අසකුපිට නැගී ඇවිත් මල්වත්ත සමීපයට පැමිණියාහ. මාලාකාර කුමාරිකාවෝ රජ්ජුරුවන් දැක ඒ ඒ අත පලාගියාහ. මල්ලිකාදේවි මහත්වූ ධෛර්‍ය්‍ය (එඩිතරකම) ඇති හෙයින් කිසි කාංසාවක් (සැකයක්) නැතිව සිට රජ්ජුරුවන් ලගට අවුත් අසුගේ රැන අල්වාගෙණ සිටියාහ. රජ්ජුරුවෝ කුමාරිකාවන් දැක "තොපි සස්වාමිකදැ?"යි (ස්වාමියෙක් සිටිනවාද) විචාරා "අස්වාමිකයෙමි"යි කී කල්හි මල් වත්තට අවුත් අසු පිටින් බැස සැකයක් නැතිව ඇකය පිට ඉසතබා ගිමන් නිවාගෙණ රජ්ජුරුවෝ රජගෙට ගොස් මහත්වූ පෙරහරින් එවා මල්ලිකා කුමාරින් ගෙන්වා රුවන්රැසක්පිට සිටුවා අභිෂේක ජලය වත්කොට සොළොස් දහසක් (දසය දසක්) බිසෝවරුන්ට අගමෙහෙසිකා නියාවට සලස්වා මහත්වූ ස්නේහයෙන් (ආදරයෙන්) වාසය කරන්නාහ. මල්ලිකා දේවීත් රජ්ජුරුවන් කෙරේ අධික ස්නෙහය ඇත්තාහ. සර්‍වඥයන් වහන්සේට උපාසිකා තනතුරෙහි සිටිනීය. මල්ලිකාදේවින් අග්‍රමෙහෙසිකා වූයේ සර්‍වඥයන් වහන්සේට පිළිගැන්වූ කොමුපිඩුයෙහි අනුසසෙනැයි නොයෙක් තෙන ප්‍රකාශ විය.

මේ කතාව දම් සභාවේ රැස්වූ මහළුවරුන් (වයසක පැවිදි අය) වහන්සේ කිය කියා වැඩ උන් තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නට පූර්‍ව භාගයෙහි

කිනම් කතාවකින් යුක්තව උනුදැ?''යි විචාරා වදරා එපවත් අසා "මහණෙනි, මා වැනි ලොවිතුරා සර්‍වඥයන්ට දන්දී එමවිට මහත් ඓශ්වර්‍ය්‍යී ලබන්නට අමුතු කිම්ද? පළමු පසේබුදුන් වහන්සේට දන්දී එවිට ඓශ්වර්‍ය්‍යී (සම්පත්) ලද්දේ වේදැ''යි වාදරා "ඒ කෙසේදැ?''යි ආරාධිතවූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ දුප්පත් කුලයෙක ඉපද අනුන්ට බැළමෙහෙකොට ජිවත් වන්නාවූ ඒණු නැති, තෙල් නැති කොමුපිඬු සතරක් ඇරගෙණ අනුන්ට බැළමෙහෙයට (කුලියට) හී සාන්ට යන්නාහු පසේබුදුන් සතරදෙනකුන් වහන්සේ වාසල සිගා වඩින්ටය යි සිටි නියාව දැක සිතන්නාහු "මා අත තුබූ කොමුපිඬු සතර පිළිගන්වම්'' සිතා ආරාධනා කොට පසේබුදුන් සතරදෙනා වහන්සේ කැඳවාගෙණ ඡායාසම්පන්න (අතුපතර විහිදී ඇති) වෘක්‍ෂයක් සමීපයට ගොස් රුප්පය පිස (අතුගා) වැලිපායා (වැලි එකතු කොට) වැලිගොඩ සතරක් තනා වැලිගොඩ සතරපිට වඩා හිඳුවා ගොටුවෙන් (කොළ ගොට්ට) පැන් ගෙණවිත් පිළිගන්වා ඉන තුබූ කොමුපිඬු සතර මෑත්කොට "ස්වාමීනි ගැත්තවුට (යටහත් තැනැත්තාට, අසරණයාට) අනුකම්පා කොට වළඳා පින්පුරවා වදාළ මැනවැ''යි මහත්වූ ආදරයෙන් පාත්‍ර සතරට කොමුපිඬු සතර පිළිගන්වා

වැළඳවූහ. පසේබුදුන් වහන්සේ කරුණාවෙන් වළඳා අනුමෙවෙනි බණ (වළඳා අවසානයේදී කියන බණ, පුණ්‍යානුමෝදනාව) වදාළසේක. බෝධිසත්ත්වයෝත් මහත් සන්තෝෂයෙන් බණ අසා "මතු මෙසේ වූ දුක්ඛිත කුලයෙක නොඉපද ධනේෂ්වරවූ (ධනවත්) කුලයක උපදිම්ව"යි ප්‍රාර්ථනා කළාහ. පසේබුදුන් වහන්සේත් "තොප කළ ප්‍රාර්ථනාව සිද්ධ වේවා"යි කියා තමන් වහන්සේලා වසන ස්ථානයට වැඩ වදාළ සේක.

එවිට ඒ සිට නොබෝ කලකින් බෝධිසත්ත්වයෝ නැසී උපදිනාහු එම බරණැස් නුවර බිසවුන් කුස පිළිබඳගත් ගමනේ දසඑකඩමසකින් (එකක් අඩු දස මසකින්) වැදූහ. රාජකුමාරයෝ රාජ්‍යයට පැමිණ නුවර සරහා ඔටුනු පැළඳ ඒ ඒ තැන සිටිනා අමාත්‍ය මණ්ඩලයා හා බ්‍රාහ්මණ සමූහයා පඬුරු පාක්කුඩම් (තෑගි බෝග) ගෙණ ඒ ඒ තැන සිටිනවුන් හා සොළොස් දහසක් බිසෝවරුත් සොළොස් දහසක් නාටක ස්ත්‍රීන් පඤ්චාඞ්ගික තූර්‍ය්‍යී (ආතත, විතත, විතතාතත, ඝණ, සුසිර යන පහ) නාදයෙන් පිරිවරණ ලද ශක්‍රදෙවෙන්ද්‍ර විලාසයෙන් (සක්දෙවිඳු මෙන්) ඉඳ සිතන්නාහු ජාතිස්මරණඥාණ නුවණ (පෙර ජාති සිහි කරණ නුවණ) පහළවූ හෙයින් "මේ සියළු ඓශ්වර්‍ය්‍යී මා ලද්දේ පසේබුදුන් වහන්සේට පිළිගැන්වූ කොමුපිඩු සතරෙහි විපාකයෙනැ"යි සිතා සිංහාසනයේ ඉඳ ප්‍රීතිවේගයෙන් උදන් අනන්නාහු ගාථා දෙකක් කීහ.

එහි අභිප්‍රාව නම්:- "මම පසේ බුදුන් වහන්සේට ගිය ජාතියෙහි දුන්නේ ළුනු නැති තෙල් නැත්තාවූ පින්නෙහි තබා ඉදිකළ කොමුපිඩු සතරක් දන්දී බ්‍රාහ්මණ ගෘහපති අමාත්‍ය මණ්ඩලයන් හා සොළොස් දහසක් බිසෝවරුන් සොළොස් දහසක් නාටක ස්ත්‍රීන් හා ඇත්, අස්, රථ, පාබල චතුරඞ්ගිනි සේනාව හා පඞ්චාඞ්ගික තූර්ය්‍යනාද හා තුන් සියයක් යොදුන් මේසා බරණැස් නුවරක් හා සියළු සම්පත්තීන් අඩුවක් නැතිව මා ලද්දේ පසේ බුදුන්වහන්සේට මා දුන් කොමපිඩු සතරිනැ"යි ගාථා දෙකින් රාජ්‍යයට පැමිණ ඔටුණු පලඳිනා ගමනේ කීහ.

තුන්සියයක් යොදුන් නුවර බොහෝ මනුෂ්‍යයන් හා බ්‍රාහ්මණ ගෘහපති අමාත්‍යය මණ්ඩලය හා රජ්ජුරුවන් වහන්සේ ඔටුනු පැළඳ වැඩඉඳ වදාළ ගාථා දෙකයයි කියා බොහෝ මනුෂ්‍යයෝ ඉගෙණ කියන්නාහු මෙහි අර්ත්‍ථය නොදන්නාහ. කෝසල රජ්ජුරුවන්ගේ දුවණියන් රජ්ජුරුවන්ට අගමෙහෙසිකා කළහ. ඒ බිසව ගාථා දෙක ඉගෙණ එක්වන් කියන්නාහ. මෙහි අර්ත්‍ථ කවර විටක විචාරම් දෝ හෝ යි සිතා උන්කලට එක් දවසක් බිසවුන් රජ්ජුරුවන්ට කළ සංග්‍රහයක් නිසා සමාධියෙන් (පැහැදීමෙන්) බිසවුන්ට රජ්ජුරුවෝ කියන්නාහු "තොප කැමති වරයක් ඇරගණුව"යි කීහ. බිසව "සෙසු මට අඩු කිම්ද? මට නුඹ වහන්සේ ඔටුනු පැලඳ ඉඳ වදාළ ගාථා දෙකෙහි අර්ත්‍ථ අසන්නා කැමැත්තෙමි, ඒ මට වදාළ මැනවැ"යි කීහ.

රජ්ජුරුවෝ "තොපට තනිව නොකියමි. දෙලොස් යොදුනක් පමණ බරණැස් නුවර බෙරපියවි කරවා (අඬ බෙරගසා) රාජද්වාරයෙහි රත්නයෙන් විසිතුරු වූ මණ්ඩපයක් කරවා රත්නපර්‍ය්‍යඞ්ක පණවා (රත්‍රන් ආසනයක් පනවා) අමාත්‍යයන් හා බමුණු වෙළඳ ආදීන් විසින්ද, නුවර වැස්සන් විසින්ද, සොළොස් දහසක් පමණ පුරගනාවන් විසින්ද පිරිවරණ ලදුව මේ කීවවුන් මැදයේ රත්නපර්‍ය්‍යඞ්කයෙහි හිඳ කියමි" කිවුය. "යහපත රජ්ජුරුවන් වහන්සැ"යි බිසවුන් පිළිගත්හ. රජ්ජුරුවෝද මෙපරිද්දෙන් සියල්ල සමුර්ද්ධකරවා (සම්පූර්ණ කරවා) දිව්‍ය සමූහයා විසින් පිරිවරණ ලදුව ශක්‍රදෙවේන්‍ද්‍රයා පරිද්දෙන් මහත්වූ ජනසමූහයා පිරිවරණ ලදුව රත්නපර්‍ය්‍යඞ්කයෙහි උන්හ. මල්ලිකාදේවීද සර්‍වාභරණයෙන් සැරසී ස්වර්‍ණයෙන් විසිතුරු කරණ ලද භද්‍රපීඨයක් (යහපත් පුටුවක්) අතුට එකත් පසෙක ඇස් කෙළවරින් රජ්ජුරුවන් බල බලා කථා කරන්නට සුදුසු වූ ස්ථානයෙ හිඳ "රජ්ජුරුවන් වහන්ස, නුඹ වහන්සේ සතුටු සතුටුව කියන්නාවූ මංගල ගීතිකාවගේ අර්‍ථ මට ආකාශ තලයෙහි සම්පූර්‍ණ චන්‍ද්‍රයාසේ ගෙණහැර පාණ කලක් පරිද්දෙන් ප්‍රකාශකොට වදාළ මැනවැ"යි කියා කියන්නී මෙසේ කිවුය. "කුසල ධර්‍මයෙහි අධ්‍යාස ඇත්තාවූ රාජෝත්තමයාණන් වහන්ස, එක්වක් නුඹ වහන්සේ තර කොට සතුටු සිත් ඇතිව ගාථා දෙකක් වදාළ සේක්ද, රාජ්‍යය වර්ද්ධනය කරන්නාවූ රජ්ජුරුවන් වහන්ස, ඒ ගාථාවෙහි අර්ත්‍ථ නුඹ වහන්සේ අතින් විචාරමි, ඒ මට ප්‍රකාශ කොට වදාළ මැනවැ"යි කිවුය.

ඉක්බිත්තෙන් බිසවුන්ට ගාථාවන්ගේ අර්ථ ප්‍රකාශ කොට කියන්නාහු මහබෝසතාණෝ මෙපරිද්දෙන් කියාත් "එම්බා භද්‍රාව, මම මේ බරණැස් නුවර නාමගොත්‍රයෙන් අප්‍රසිද්ධ වූ එක්තරා දිළිඳු කුලයෙක්හි උපනිමි, ඒ කුලයෙහි උපන්නාවූ මම ද දිලිඳු බැවින් අනුන්ට මෙහෙවර කොට ජීවත්වන්නෙමි අනුන්ට මෙහෙකරුව උපන්නෙමි අනුන්ගේ දුක්පත් වියදමෙන් රැකෙන්නාවූ මමද දුශ්ශීලභාවය හැර (වැරදි වලින් වැළකී) පඤ්චශීලසංවරයෙහි පිහිටියෙමි (පන්සිල් රැක්කෙමි). සිල්වත් මා විසින් එදවස් කළමනා කර්ම්මාන්ත කරන පිණිස නික්මුණාවූ මම මහමාවතකට නැග කර්මාන්ත භූමියට යන්නෙමි භික්ෂාව පිණිස බරණැස් නුවරට වදනා සමෘද්ධවූ ආචාරයන් (තැන්පත්වූ පැවැත්ම) හා ශීලයන් ඇති රාගාදි පරිලාහයන් (කෙලෙස් දැවිල්ල) සන්හිඳවීමෙන් සිහිල්වූ කාමාදී ආශ්‍රවයන්(කාමාදී කෙලෙස්) රහිත වූ බුදුන් වහන්සේ සතරනමක් දිටිමි. උන් වහන්සේලා කෙරෙහි සිත පහදවාගෙණ වැලිගොඩ සතරක්කොට ඊමත්තේ කොල අතුට වැඩහිඳුවා දක්ෂිණෝදකය දී කර්ම්මාන්ත භූමියෙහිදී මා කන්ටයයි ගෙණයමින් සිටි තෙල් මී සකුරු ආදී කිසිවකුත් රසයක් නැත්තාවූ කොමුපිඩු සතර සතරදෙනා වහන්සේගේ පාත්‍රවලට ස්වහස්තයෙන් (සියතින්ම) සිත පහදවාගෙණ පිළිගැන්වීමි, ඒ කුශල කර්මයාගේ විපාක මෙබඳු වන්නේයයි මෙබඳු කුසලවිපාක හේතුකොටගෙණ ධන ධාන්‍යාදීන් හා වස්ත්‍රාභරණ ආදීවූ සියළු සම්පත්තීන් පිරුණා වූ උතුම්වූ මේ පෘථිවි මණ්ඩලය අනුභවකෙරෙමි (පොළොව පාලනය කරමි),

භද්‍රාව තොප ප්‍රධාන කොට ඇති සොළොස් දහසක් පුරඟනන් හා මාගේ මේ සියළු සමෘද්ධ මුළුල්ලම ඒ පසේබුදුන් සතරදෙනා වහන්සේට චෙතනාත්‍රය ශුද්ධකොටගෙණ (මුල, මැද, අග යන තුන් සිතුවිලි පිරිසිදු කොටගෙන) මා පිළිගන්වා ළු කොමුපිඩු සතර නිසා”යි යනාදීන් තමන් පූර්‍වජාතියෙහි කළ කුශලය ප්‍රකාශකොට කිවාහුයි.

මෙපරිද්දෙන් මහබෝසතාණන් තමන්ගේ පූර්‍වජාතියෙහි කළ කුශලයාගේ විපාක විස්තරකොට කී කල්හි ඒ අසා පහන්වූ සිත් ඇති මල්ලිකා දේවි කියන්නාහු “මහරජ්ජුරුවන් වහන්ස මෙලෙසින් ප්‍රත්‍යක්‍ෂකොට (ඇස් පනාපිටදී) දානයෙහි විපාක දන්නාවූ නුඹ වහන්සේ මෙතැන් පටන් කොට එක බත්පිඩක් පමණකුත් ලැබ ධාර්මික ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්ට දන්දීම අනුභව කළ මැනැව”යි බෝධිසත්‍වයන් වහන්සේට ස්තුති කොට කියන්නී “කුශලයෙහි අධිපති වූ රජ්ජුරුවන් වහන්ස නුඹ වහන්සේ ශ්‍රමණ බ්‍රාහ්මණ දුගී මගී යාචකයන්ට ලත් දෙයක් ශක්ති විචරකින් දානපරිත්‍යාග කොට අනුභව කළ මැනව දානාදීකුශලයෙහි ප්‍රමාදයක් නුවුව මැනව පතිරූපදෙවාසාදී (සුදුසු ප්‍රදේශයක වාසය) චතුර්විධවූ ධර්‍මචක්‍රය පැවැත්වුව මැනව, යම්සේ අන්‍යවූ අඥානගතියට (වෙනත් අනුවණ ගතියකට) යන්නාවූ සත්‍වයෝ ලෝකවාසීන් උක්යතෙක ලා පෙලන්නාක් මෙන් (උක් යන්ත්‍රයක දමා පොඩි කරන්නාක් මෙන්) පීඩාකොට වස්තු රැස්කරන්නාහු අධර්මිෂට වෙත්ද, නුඹවහන්සේද එපරිද්දෙන්ම අධර්මිෂ්ට නුවුව මැනව.

දානං සීලං පරිච්චාගං - අජ්ජවං මද්දවං තපං,
අක්කොධො අවිහිංසාච - ඛන්තීඤ්ච අවිරොධතා.

කියනලද්දා වූ මේ දසවිධවූ රාජධර්‍ම රැක්ක මැනව, නොහළ මැනවැ"යි අවවාද කළාහ. ඒ මල්ලිකා දේවීන් කී බස් පිළිගත්තාවූ මහබෝසතාණෝ මෙලෙස කියත් "සොඳුර" කෝසල රජ්ජුරුවන්ගේ දුවනියනි, එම මා විසින් දන්දෙන ලද්දේයයි තෘප්තියක් නොකොට නැවත නැවත බුද්ධාදීවූ මහාත්මයන් හැසුරුණාවූ දාන මාර්‍ගයෙහි හැසිරෙමි. අග්‍රදක්ෂිණෙය්‍ය (පූජා ලැබීමට උතුම්ම සුදුස්සා) බැවින් අභීත්වූ ඒ උත්තමයෝ මම දක්නට මනාමය. යහපත, එසේ හෙයින් ඔවුන්ම දක්නා කැමැත්තෙමි". ඒ මල්ලිකා දේවින්ගේ සියළු සමෘර්ද්ධිය (සියලු දියුණුව) දැක "සොඳුර, දැන් මා විසින් පූර්‍ව ජාතියෙහි කළාවූ මාගේ කුශලකර්‍මය* (*'මාගේ කුශලානුභාවයෙන්' සමහර) තොපට ප්‍රකාශ කොට කියන ලද, තෙපි වනාහී මේ සොළොස් දහසක් පමණ පුරඟනාවන් හා නාටක ස්ත්‍රී සමූහයා මධ්‍යයෙහි රූපයෙන්ද, ලීලායෙන්ද, ස්ත්‍රී විලාසයෙන්ද තොප හා සදෘශ්‍යවූ (සමාන වූ) එකද ස්ත්‍රියක් නැත. තෙපි කවර කුශලයක් කොට මේ සම්පත්තිය ලද්දාහුදැ?යි විචාරන්නාහු බෝධිසත්ත්වයෝ මෙසේ කියත් "සොඳුර, කොසොල් රජ්ජුරුවන්ගේ දියණියෙනි තොපි රූපසමෘද්ධියෙන් (රූප ශෝභාවෙන්) ත්‍රයත්‍රිංසත් (තිස් තුනක්) දිව්‍යලෝකයෙහි ශක්‍රදේවේන්ද්‍රයන්ගේ එක්තරා දිව්‍යස්ත්‍රියක් මෙන් මේ ස්ත්‍රී සමූහයා මධ්‍යයෙහි සොභාමත්වූ පූර්‍වජාතියෙහි කවර නම් උත්තම කුශල කර්‍මයක් කළාද, කවර

කාරණයෙකින් මෙ ලෙස රූපශ්‍රීයෙන් යුක්ත වූවාහුදැ?යි විචාළාහුයි.

ඉක්බිත්තෙන් බෝධිසත්ත්වයන්ට ඒ මල්ලිකාදේවී පූර්ව ජාතියෙහි තමා කළාවූ කුශලකර්මය ජාතිස්මරණ ඥාණයෙන් දැක කියන්නී මෙසේ කියා, "මහරජ්ජුරුවන් වහන්ස, මම පූර්ව ජාතියෙහි එක් කෙළෙඹි කුලයක්හට දාසව උපනිමි, අනුන් විසින් ඒ ඒ කටයුතු කරණ පිණිස නියෝග කරණලද එකකිමි, සෙසු කෙල්ලෝ නම් දුශ්ශීලහ, මම වනාහී කායවාක්මනඃ (කය, වචන, සිත යන තුන) යන ද්වාරත්‍රයෙන් කිසිත් අකුශලයක් නොකොට නිරන්තරයෙන් පන්සිල් රක්‍ෂා කිරීමෙන් ශීලසම්පන්නයෙමි, පරවඤ්චාදියක් (අනුන් රැවටීමක්) නොකොට දැහැමින් සෙමෙන් පවත්වන ලද ජීවිකා ඇත්තෙමි, ආචාර සම්පන්නයෙමි, ගුණ ඇත්තෙමි, යහපත්වූ දර්ශනයන් ඇත්තෙමි, ප්‍රියවූ ස්වභාගයක් ඇත්තෙමි, ඉක්බිත්තෙන් මම එකල්හි ස්වාමි දරුවන් විසින් මට කොටස් කොට තබනලද්දවූ මට පැමිණි බත් කොටස සිඳුනාලද ක්ලේශයන් ඇති පසේබුදු කෙනෙකුන් වහන්සේට හටගත්තාවූ සොම්නස් ඇතිව ආහාරයෙහි ලෝභ තෘෂ්ණා රහිතව ආදි මධ්‍යාවසාන (මුල, මැද, අවසාන) කොට ඇති චේතනාත්‍රය සුද්ධකොට ගෙණ පිළිගැන්වීමි, හේ මම ආයුපමණින් එහි සිට කාලක්‍රියා කොට සැවැත්නුවර කොසොල් රජ්ජුරුවන් වහන්සේගේ අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳගෙණ එයින් බිහිව දැන් නුඹ වහන්සේට පාදපරිචාරිකාව වෙසෙමින් මෙබඳු සම්පත්තියක් අනුභව කෙරෙමින් මෙසේවූ රූපසමූර්ද්ධියකින්

(දියුණු රූ සපුව) යුක්තයෙමි, රජ්ජුරුවන් වහන්ස ඒ පසේබුදුන් වහන්සේට අනුන්ට දසිව සිට සිත පහදවා ගෙණ මා දන් දුන්නාවූ බත් කොටසෙහි විපාක මෙබඳු වන්නේය”යි කියා තමාගේ පූර්‍ව චරිතය ප්‍රකාශ කළාහ.

මෙසේ රජ්ජුරුවන් හා මල්ලිකා බිසව් හා සමග දෙදෙනා තමන් ගේ පූර්‍ව ජාතියෙහි කළාවූ කුශලකර්‍මය විස්තර කොට නුවර සතරවාසල් දෙර හිඳ නුවර මධ්‍යයෙහි ද මාලිගා දෙරකඩද යන මේ ස්ථානවල්හි දන්හල් සයක් කරවා සියළු දසදහසක් යොදුන් ජම්බුද්වීපයෙහි නගුල් උඩ බඳවා (ගොවි තැන් වැඩ නවතා) මහදන් පවත්වා පඤ්චශීල සංරක්‍ෂණයෙන් පේවස් රක්‍ෂාකොට (සිල් රැක) ජීවිතයාගේ ආයුෂ කෙළවර ස්වර්‍ගයම පරම ප්‍රතිෂ්ඨාකොට (උතුම්ව පිහිටා) ඇත්තාවූ හෙවත් දිව්‍යලෝකයෙහි උපන්නාහයි තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා වදරා ‘කුම්මාසපිණ්ඩි ජාතකය’ නිමවා වදාළ සේක.

එකල්හි මල්ලිකාදේවිය නම් රාහුල මාතාවෝය. රජ්ජුරුවෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැ”යි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

# 405. පරන්තප ජාතකය

තවද ලොවුතුරා සර්‍වඥයන් වහන්සේ රජගහ නුවර නිසා වේළුවනාරාමයෙහි වාසය කරණසේක් දෙව්දත් ස්ථවිර

වහන්සේගේ වධයට උත්සාහ (මරන්න කළ උත්සාහයක්) කිරීමක් අරභයා මේ ජාතකය වදාළසේක.

එකල්හි දම්සභාමණ්ඩපයෙහි මේ කථාව ඉපදවූහ. “ඇවැත්නි, දෙවදත්ත ස්ථවිරයෝ සර්‍වඥයන් වහන්සේ මැරීම පිණිස උත්සහ කෙරෙති, දුනුවායනුත් මෙහෙයූහ, මුදුනට ගල් පෙරළූහ, නාලාගිරි නම් හස්තියාද සිගායන ඉදිරියෙහි මෙහෙයූහ, සර්‍වඥයන් වහන්සේට විනාශය පිණිසම උපාය උත්සාහ කෙරෙති”යි කථා කොට භික්ෂූන් වහන්සේ වැඩ උන්සේක. සර්‍වඥයන් වහන්සේ ධම්සභාමණ්ඩපයට වැඩ “මහණෙනි, මා එන්නට පූර්‍ව භාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ?”යි විචාරා වදාළ කල්හි “මහණෙනි, මේ දෙවදත්ත ස්ථවිරයෝ දැන් මතු නොවෙයි, පූර්‍වයෙහිත් උත්සාය කළේය. ඒ උත්සාහයෙන් මාගේ චිත්තොත්‍රාස (සිතේ තැති ගැන්මක්) පමණකුත් නසන්ට නොහැකි විය, තෙමේම දුක් අනුභව කෙළේ වේදැ”යි වදාරා ඉකුත්වත් ගෙණහැර දැක්වූසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි මහා බෝධිසත්‍වයෝ ඒ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ මව් කුසින් බිහිව වැඩිවිය පැමිණියාහු තක්සලා නුවරට ගොසින් උගතමනා සියලු ශිල්පයන් උගත්තාහ. සියලු සතුන්ගේ ශබ්දය තෝරාගන්ට නිසි මන්ත්‍රයකුත් (සතුන් හඬ තේරුම් ගන්න මන්ත්‍රයක්) උගත්හ. ඒ බෝධිසත්‍වයෝ

ආචාරීන්ට තමන් නික්ම යන නියාව කියා නැවත බරණැස් නුවරට ගියාහ. පියරජ්ජුරුවෝ ඒ බෝධිසත්‍වයන් යුවරජ තනතුරෙහි තිබූහ. ඔවුන් එලෙස තිබුවත් මරවනු කැමැත්තේ, ඇස දකින්ට නොකැමැත්තාහ. (ඇසට දකින්නටවත් කැමති නැත)

ඉක්බිත්තෙන් එක් කැණහිල් බැල්ලක් (නරි දෙනක්) තමාගේ පැටියන් දෙන්නෙක් ඇරගෙණ රාත්‍රියෙහි මනුෂ්‍යයන් නිදුපු කල්හි දිය යන හොරොව්වෙන් (කානුවක් අස්සෙන්) ඇතුළු නුවරට වන. බෝධිසත්‍වයන් වැදහෝනා ගබඩාවට නුදුරු ස්ථානයෙක්හි එක් ශාලාවෙක් ඇත. ඒ ශාලාවෙහි එක් මගී මිනිසෙක් තමා පයළූ වහන්සගල (සෙරෙප්පු කුට්ටම) ගලවා පාමුල තබාගෙණ එක් පෝරුවක් (ලෑල්ලක්) මත්තෙහි වැදහොත්තේය. ඒතාක් කල් නොනිදුයේය. කැණහිල් පැටියෝ දෙන්න කියන්නාහු "අම්ම බඩසාය (කුසගිනියි), අප කනදෙයක් දෙව"යි කියන්නා කැණහිල්දෙන් කියන්නී "තෙලේ ගෙයි වැදහෝනා පුරුෂයා ලඟ වහන්දෙකක් තිබෙයි උන් නිදුපියන්නා (නින්දට ගියාම) වහන් දෙක දීලමි" කීව. එකියන කථාව බෝධිසත්‍වයෝ අසා "තෙල ගෙය කවුරුදැ?"යි විචාරා "ස්වාමීනි, මම"යි කියන්නා "බිමතිබු වහන්දෙකක් ඇත්නම් උඩ තබාලව"යි කියන්නා වහන්දෙක උඩ තිබූහ. කැණහිල් "මුන්ට මා කෙළේ කවර සතුරුකමක්දැ?"යි කියා එතනින් පලාගියාහ. එතන සමීපයෙහි පොකුණක් ලඟට කැණහිල්දෙන හා දරුවෝ දෙන්න පැමිණ කැණහිල් පැටියෝ කියන්නාහු "අම්ම අප බඩසාය"යි කිවුය. කැණහිල්දෙන් කියන්නී "තෙල පොකුණෙහි

මිනිසෙක් මියගියේය, දැන් මදකින් ඉලිප්ප (මතුවූවාම) ගියකල මිනිය කම්හ, අත මුන්දක් හා කනලන මෙවර දෙකක් (අරුන්ගල් දෙකක්) හා කඩපොල්ල (රෙදි කැබැල්ල) ඇරගනිති මිනිය අපටය"යි කීහ.

බෝධිසත්‍වයෝ ඒ අසා මිනිසුන් ගෙන්වා "තෙල පොකුණේ මිනිසෙක් මියගිය අතලන මුන්දක් හා කණ ලන මෙවරදෙක හා කඩපොල්ල ඇරගෙණ මිනිය නොයිල්පෙන නියායෙන් පොකුණේ දියයට තබව"යි කීවාහ. ඒ කැණහිල්දෙන් බෝධිසත්‍වයන් කෙරේ වෛර බැඳ "පළමුත් මාගේ දරුවන් කන්නට තිබූ වහනුත් උඩ බැඳ එල්වා අලාභ කළව, දැනුත් කන්ට උන් මිනියෙනුත් නොකාලව, අදට සත්වෙනි දවස් තොපගේ රජ්ජුරුවන්ට සටනට පසල් රටින් (ඈත පිටිසර ගමකින්) රජ්ජුරුකෙනෙක් එන්නාහ, සටනට තොප යවන්නාහ, තෙපි ඒ සටනේ වැටෙන්නාහ, එවිට තොපගේ ඇඟමස් කම්" කියා කැණහිල්දෙන් පළා ගියාය.

බෝධිසත්වයෝත් මේ සිත තබාගෙණ උන්නාහ. එද සත්වෙනි දවසට පසමිතුරු රජ්ජුරුවන් හා සේනාව සටනට අවුත් වාසල්දොරකඩ කඳවුරු බැඳගත්හ. රජ්ජුරුවෝත් බෝධිසත්‍වයන්ට "සේනාව ඇරගෙණ සටනට යව"යි කීහ. බෝධිසත්‍වයෝ කියන්නාහ "පියාණන් වහන්ස, අද මට නොසිහෙයි (අද මම සටනට සෑහෙන්නේ නැත), මම සටනට නොයෙමි" කීහ. "සටනෙහි මියතත් රැකෙතත් (මළත් නොමළත්) තොපිම යන්නාහ"යි කීහ. "යහපත පියාණන්

වහන්ස, යෙමි” කියා සේනාව ඇරගෙණ අනික් වාසලකින් පිටත්ව කඳවුරු බැඳගෙණ වැද උන්සේක. රජ්ජුරුවෝ “මාගේ පුතණුවෝත් නුවරින් පිටත්ව මට විපක්ෂව උන්නාහ, සතුරෝත් ඇවිදින් ඉඳිති, ඉතිකින් මාත් මාගේ ජීවිතය රැක ගණුත් යහපතැ”යි අග්‍රමෙහෙසිකා බිසවනුත් පුරෝහිත බමුණන් පරන්තප නම් කොල්ලකුත් ඇරගෙණ නුවරින් පිටත්ව වනාන්තරයට වැද පන්සලෙක වාසය කළාහ. බෝධිසත්වයන් වහන්සේත් පිය රජ්ජුරුවන් නුවරින් පලාගිය නියාව අසා නුවරට අවුත් සතුරන් සාදා (පරදවා) නුවරට වැද රාජ්‍යය කරමින් උපන්නාහ.

එසමයෙහි බරණැස් නුවර රජ්ජුරුවෝත් පුරෝහිත බ්‍රාහ්මණයාත් දෙන්න පරන්තප නම් කොල්ලාත් බිසවුනුත් පන්සල රඳවා එලාඑල කඩාගියාහ. මෙසේ නිරන්තරව උන් දැකීමෙන් බිසව් පරන්තප නම් කොල්ලා කෙරේ අභිලාෂා උපදවා (ආසාව ඇතිකර ගෙන) ඔහු සමග ලෝකාස්වාදරතියෙහි (කාමසේවනයෙහි) යෙදුනාහ. මෙසේ නිරන්තරයෙන් වාසය කරන්නාහු එක් දවසක් පරන්තප නම් කොල්ලාට බිසව් කියන්නාහු “තොප හා අප හා කරණ කටයුත්ත රජ්ජුරුවන් වහන්සේ දන්නාසේක් නම් කටයුතු නොවෙයි (අනතුරුදායකයි), රජ්ජුරුවෝ තොප අතට කඩුවත් අඳනාකඩත් දී නාන්ට යන්නාහ. එවිට රජ්ජුරුවෝ දියට බටවිට ඉස අල්වා කඩුවෙන් දෙකඩ කොට කපාපියව”යි කීහ. ඒ පරන්තප නම් කොලුත් “යහපතැ”යි කියා උන්නේය. ඒ බිසවුන් බරණැස් රජ්ජුරුවන් අයිතිවූ දරුගර්භයක් ඇත්තේය.

එක් දවසක් රජ්ජුරුවෝ පන්සල රඳා පුරෝහිත බමුණා ඵලාඵල කඩා යවා තුමූ නාන්ටයයි පරන්තප නම් කොල්ලා අතට අඳනාවත් කඩුවත් දී ගඟට ගොස් අඳනාකඩ ඇඳගෙණ ස්නානයට ගඟට බැස නාන කල්හි පරන්තපයාත් කඩුව අතින් ගෙණ දිවගොස් රජ්ජුරුවන්ගේ ඉසකේ අල්වාගත. මරණභයින් තැතිගෙණ මහත් කොට අඬ ගැසූහ. පුරෝහිත බ්‍රාහ්මණයාත් ඵලාඵල කඩාගියේ එතනට නුදුරුවූ තැන උස් ගසක් උඩ ඵලාඵල කඩා උන්නේ රජ්ජුරුවන් ගැසූ අඬ අසා භයින් බිම වැටී කැලැයෙක ඉවත සැඟවී උන්නේය.

පරන්තපයාත් රජ්ජුරුවන් ඉස කපා පොළොකොට ගසා වලෙකලා වසා ගස අත්ත සැලීගියා දැක "මේ ගස අත්ත සැලෙන්ට කාරණා කිම්දැ?"යි ගසමුලට ගොස් ගසවටා බලා කාත් නොදැක බිසවුන් ඉඳිනා පන්සලට ගොස් රජ්ජුරුවන් මැරූ නියාව බිසවුන්ට දන්වා දෙන්නම සැකයක් නැතිව එකතැන්හිම වාසය කරන්නාහ. ඒ බ්‍රාහ්මණයාත් ඇස්දෙක නැසීගියාක්මෙන් (අන්ධ වූ ආකාරයෙන්) ඇසපියාගෙණ ඒ ඒ තැන වැටි වැටී සැරයටියක් අතට ගෙණ බිසවුන් ඉන්නාවූ පන්සලට ගියේය. පරන්තප නම් දාසයාත් "ඇයි බ්‍රාහ්මණය, මේ තට කුමක් වුයේදැ?"යි විචාළාහ.

බ්‍රාහ්මණයා කියන්නේ රජ්ජුරුවන් නොඅඳුනන කෙනෙකුන් මෙන් "දේවයන් වහන්ස, ඵලාඵල කඩා ගිය ගමනේ ඇස්දෙක අන්ධවීය"යි කීහ. එසේ වීනම් නයෙකු අල විෂධූමයකින් (නයෙකු පිට කළ විෂ දුමකින්) ඇස්දෙක අන්ධවූ නියාය"යි

කියා "භය නොගනුවයි මම තොපි රකිමි". බිසවුනුත් පුරෝහිත බ්‍රාහ්මණයාත් දෙන්නා පන්සල ඉඳවා පරන්තපයා වනයට ගොස් ඵලාඵල කඩා ගෙණෙන්නේය. මේ නියායෙන් දවස් අරිනා කල්හි එක් දවසක් "එම්බා දෙවිනි, රජ්ජුරුවන් මරන්ටයයි ඉසකේ අල්වා කඩුව කොපුවෙන් අයන විට එක් ගසෙක ඉඳ මිනිසෙකු හෝ ශාඛාමෘගයෙකු (වඳුරෙකු) හෝ නොදැනෙහි බිම වැටිහින. මේ අත්ත සැලීමෙන් යම් දවසෙක මට අනර්ත්‍ථ වන්නේය"යි බිසවුන්ට ගාථාවකින් කියා බ්‍රහ්මණයා නිදන එකකු මෙන් වැදහෙව. එක් දවසක් පරන්තපයා ඵලාඵලයට යාදී තමාගේ බිරිඳ කෙරේ ශෝකයෙන් අඬන එකකු මෙන් කියන්නේ "මාගේ විශිෂ්ටවූ රූ ඇති ප්‍රියවූ දර්ශනයක් (දැකුම්කලු වූ) ඇති මාගේ හෘදයක් වැනි මාගේ භාර්ය්‍යාවන් නොදැක තැවෙන්නාවූ මාගේ හෘදය අත්ත සැලීගිය සංකාවෙන් තැවෙන්නාවූ පරන්තපයාගේ හෘදය මෙනැ"යි අඟවා කීහ. බිසව් ඒ අසා "කුමක්ද තොපි කියන්නේය"යි විචාළාහ. පුරෝහිත බ්‍රාහ්මණයාත් "තමාගේ බිරින්ද කෙරේ අඬමි" කියා පිරිමසා තිබීය, බිසව් බඩ දරුගර්භයක් මුකුරා දසඑකඩ මසකින් කුමාරයකු වැදූහ. ඒ කුමාරයාත් වැඩිවිය පැමිණ සොලොස් ඇවිරිදි වූ කල්හි එක් දවසක් කුමාරයන්ට කියන්නේ "කුමාරයෙනි ඔයට නාන්ට යම්හ. මාගේ සැරයටිය කොණ අල්වාගණුව"යි කුමාරයන් අතට සැරයටිය අගදී ඔයට ගොස් දැස්හයා කුමාරයන් බැළුයේය. එවිට රාජකුමාරතෙම "බමුණා අන්ධ නොවන්නේහිදැ?"යි විචාළේය. "රාජකුමාරයාන් වහන්ස, දැස්

අන්‍ධයයි මේ උපායෙන් රැකුනෙමි”(ඇස් අන්ධ වේසය නිසා දිවි රැකුණු බව) කියා “නුඹ වහන්සේගේ පියාණන් වහන්සේ දන්නා සේක්දැ?”යි විචාළ කල්හි “එසේය දනිමි” කියා කීයේය.

එවිට බමුණු කියනුයේ “මේ පුරුෂතෙම තොපගේ පියා නොවන්නේය. තොපගේ පියාණෝ බරණැස් රජ්ජුරුවෝය. දාසවූ මේ පුරුෂයා තොපගේ මෑණියන් කෙරෙහි වරදවා පැවත මේ ස්ථානයෙහි තොපගේ පිය රජ්ජුරුවන් මරා වැලලූයේය”යි ඇරගෙණවුත් පෑයේය. එවිට කුමාරයාට බලවත්වූ ක්‍රෝධ ඉපිද “දැන් කුමක් කෙරෙම්දැ?”යි බ්‍රාහ්මණයා අතින් විචාළේය. එවිට බ්‍රාහ්මණයා කියනුයේ “ඒ දාසයා විසින් තොපගේ පිය රජ්ජුරුවන්ට මේ තොටේදී යමක් කරන ලදද එපරිද්දෙන් කරව”යි කියා රජ්ජුරුවන් මැරූ සියලු ප්‍රවෘත්තිය රාජ කුමාරයන්ට කියා එදවස් පටන් ඛඩ්ගශිල්පයෙහි ශික්‍ෂා (කඩු ශිල්පය පුහුණු කරවා) කරවූයේය.

ඉක්බිත්තෙන් නොබෝ දවසකින් රාජකුමාරතෙමේ කඩුවත් අඳනා කඩත් ගෙණ “පියාණන් වහන්ස, නහන පිණිස ගඟට යම්හ”යි කීයේය. එවිට පරන්තපයා “යහපතැ”යි කියා රාජකුමාරයා එක්ව නහන තොටට ගොස් ඔහු ස්නානය පිණිස ගඟට බට කල්හි රාජකුමාරතෙම දකුණතින් කඩුව හයා වමතින් ඔහුගේ කෙස්වැටිය ගෙණ “මාගේ පියාණන් වහන්සේ මේ ස්ථානයෙහිදී හඬව හඬවා මැරූයෙහිය. මමද

තා එපරිද්දෙන්ම මරමි" කීයේය. එවිට මරණ භයින් භයපත් විලාපයකුත් කියා අඬන්නාවූ පරන්තපයාද "මා රජ්ජුරුවන් මරන්නාවූ කාලයෙහිම මනුෂයෙකු විසින් හෝ මෘගයෙකු විසින් හෝ ගසෙක ශාඛාවෙක් සොලවන ලද ඔහු විසින් ඉදිරි භයෙක් උපදින්නේ යයි කල්පනා කරන ලද, ඒ භය දැන් මා කරා පැමිණියේය"යි "ආගමානූන සෝ භව්වො"යි ගාථා දෙක කියා හැඬුයේය.

ඉක්බිති කුමාරතෙම කියනුයේ "කොල දුෂ්ට වූ (ද්‍රෝහී වූ) දසය, ස්නානය පිණිස ගඟට යම්හයි විශ්වාසයෙන් මාගේ පියාණන් වහන්සේ කැඳවාගෙණ ගොස් ස්නානය කරන්නාවූ උන් වහන්සේ මරා කඩ කඩ කොට කපා වළලන්නාවූ තෝ මේ ක්‍රියාව කවරෙක් දන්නේද? ඉදිරි මට මෙබඳු භයෙක් වන්නේයයි මා වඤ්චා කෙළෙහිය. ඒ උන් වහන්සේට පැමිණියා වූ මරණ දැන් තා කරා පැමිණියේය"යි කියා ඔහු එතැනිම ජීවිතක්‍ෂයට (මරණයට පත්කර) පමුණුවා වළලා කොල අතු කඩා වසා කඩුව සෝධා ස්නානය කොට පන්සලට ගොස් ඔහු මැරූ බව පුරෝහිත බමුණාට කියා මෑනියන්ට පරිභවබැණ (නින්දා අපහාස කොට) "වෙනෙහි වාසය කිරීමෙන් කවර ප්‍රයෝජනයෙක්දැ?"යි ඔවුන් තුන්දෙනාම බරණැස් නුවරට ගියාහුය.

බෝධිසත්වයෝ තුමූ රාජ්‍යයට පැමිණ මළනුවන්ට යුවරජ තනතුරු දී දනාදි කුසල් කොට දිව්‍යලෝකයෙහි උපන්නේයයි

තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මේ පරන්තප ධර්‍මදේශනාව ගෙණහැර දක්වා වදාළසේක.

එකල්හි පියරජ නම් දේවදත්ත ස්ථවිරය. ඕහට පුත්‍රව උපන්නාවූ රාජ කුමාරයෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්මය”යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

**සත්වෙනි නිපාත වර්‍ණනාව නිමි.**

තවද අටවැනි නිපාතය (පරිච්ඡේදය) දක්වමි. ඒ කෙසේද යත්?

# 406. කච්චානි ජාතකය

අෂ්ටෝත්තර ගත මංගල ලක්‍ෂණයෙන් විරාජමාන වූ ශ්‍රීපාදපද්ම (එකසිය අටක් මගුල් ලකුණෙන් බබළන සිරිපා දෙක) ඇති සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි මව්පියන්ට උපස්ථාන කරන්නාවූ උපාසකයකු අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

එක් උපාසකයෙක් දෙමව්පියන්ට සකසාම (තමා අතින්ම සකස් කොට) උපස්ථාන කරන්නෙහිය. උන්ගේ දෙමව්පියෝ පුතුනුවන්ට කියන්නාහු “පුතණ්ඩ, උපස්ථාන කිරීමකුත් ගොවිතැන් බත් කිරීමකුත් තොපට මහා ආයාසය (වෙහෙසක්), තොපි තොපට සුදුසු තෙනකින් බිරිඳක් ගෙණ එව. උන් ගෙනාකල උන් අපට උපස්ථාන කරන්නාහ. තොපි ගොවිතැන් බත් කරන්නාවේදැ”යි කීහ.

ඒ උපාසකයා කියන්නේ "මා උපස්ථාන කරණසේ උපස්ථාන කළ එද්ද? මා විනා අනිත් කෙනෙක් මාගේ සිතසැටියට (හිතේ හැටියට) උපස්ථාන කෙරෙත්දැ?"යි නොගිවිස්සාහ (පිළිගත්තේ නැත). උන් නොගිවිස්සත් දෙමව්පියෝ සුදුසු කුලයකින් බිරින්දක් ගෙණවිත් ලූවාහ. ඒ ස්ත්‍රීන් ආදවස් පටන් සමනන්ටත් ඉතා ලෙන්ගතුව (හිතවත්ව) වාසයකොට නැදිමයිලන්ටත් (නැන්ද මාමාට) සැපසේම උපස්ථාන කරන්නී කල්යාමකින් නැන්දනියන් කෙරේ කලකිරී උණුපැන් ඉල්ලුවොත් ඉතාම ඇඟ සමියන ලෙසට උණුපැන් දෙන්නීය. ඇල්පැන් ඉල්ලුවොත් ඉතා සීතයෙන් වෙව්ලන ලෙසට ඇල්පැන් දෙන්නීය. මාළුයේ ළුනු මදයයි කීවොත් ඉතා ළුනු බෝ කරන්නීය. ළුනු බෝයි කිවොත් ඉතාම මද කරන්නීය. ඇඳ මකුණෝයයි කීවොත් අසල ගෙවල ඇත්තන්ට නුඹ ඇමට ඇසෙන නියායෙන් නොවේද? මා ඇඳ මකුණන් ගැසූයේයයි කියන්නීය. තොමෝම ඒ ඒ තැන සෙම් සොටු කාරා දමා "කවුරුදැ?"යි විචාළ කල "නුඹගේ මැණියන්දෑය"යි කියන්නීය.

එක් දවසක් සමණයන්ට (සැමියාට) කියන්නී "නුඹගේ මැණියන්දෑට පිස පෑර තිබන්ට (කෑම පිළියල කිරීම) හා සොප්පනි තිබන්නට (ආවතේවාකම් කරන්න) අපට බැරිය, නුඹගේ මැණියන්දෑ මෙතන ඉඳිතොත් මම නොඉඳිමි. උන් මේ ගෙන් යව්ව මැනවැ"යි කීහ. එවිට උපාසකයා කියන්නේ "තොපි නම් සග බාලහෙයින් (වයස්ගත නොවූ නිසා) තොපට කොයිත් ගොසින් ඉන්දහැක. මාගේ මැණියන් වහන්සේ

මැහැලිව දුවීල සේක. උන්දෑ කොයි යන්දැද? තෝ යෙයි නම් පළායව"යි කියා තමාගේ බිරින්දට කෝප කළහ. එතැන් පටන් පළමු නියාවට දියුණුවක්ව නැන්දනියන්ට උපස්ථාන කරන්නාහ.

උපාසකයා එක් දවසක් ජේතවනාරාමයට ගොස් සර්‍වඥයන් වහන්සේට වැඳ එකත්පස්ව ඉඳ බණ අසා සර්‍වඥයන් වහන්සේට එපවත් කීයේය. සර්‍වඥයන් වහන්සේ වදාරණ සේක් "තොප අඹුවන් කීවා නොගිවිසි පමණක්විනා පෙර තාගේ බිරින්දගේ බස් ගෙණ මෑණියන් පහකොටපුයේ (ගෙදරින් පලවා හැරීම) වේදැ"යි වදාරා "ඒ කෙසේද?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාලසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්ත්වයෝ ශක්‍රදේවේන්ද්‍රව උපන්නාහ. යටකී ප්‍රවෘත්තිය (පුවත) මෙන් වන්නාහ. මෙහි වනාහි උපාසකයා තමාගේ බිරින්දගේ බසට මෑණියන් ගෙයින් පහකොටපුවාහ. උයිත් එතැන්පටන් ඈතමෑත ඇවිද බැලමෙහෙකොට ජීවත්වන්නාහ. එසමයෙහි උන්ගේ යෙහෙළනියන්ට දරු ගර්‍භයෙක් ඇතිවිය. දස එකඩ මසකින් (එකක් අඩු දස මසකින්) දරුවන් ලැබ දවසින් දවසට සියලු සම්පත්තියෙන් අඩුවක් නැතිව දවස් අරනාහ "මේ මැහැලි මාගේ ගෙයි ඉන්නා තෙක් අපට කිසිවැඩෙක්

නොසැලසින, උන්දෑ ගියදවස් පටන් දරුවනුත් ලැබී සැපසේ අභිවෘද්ධියම සැලසුනැ"යි කීවාහ.

එවිට උපාසකයාගේ මව් තමා ගෙයින් පිටත් කළ පසු දරුවන් ලද්දැයි අසා මෙසේ සිතුවාය. "ඉදින් මේ ලෝකයෙහි ධර්‍මය නොනැසී පවතී නම් බිරින්දගේ බසට මවුන් තලා හෙයින් පිටත් කළ දරුවෝ මෙලෙස දරුවන් ලැබ සුවපත් වෙත්ද? එසේ හෙයින් ධර්‍මය නැසුනේවන. ඒ නැසුනාවූ ධර්‍මයට "පිතෘපිණ්ඩ දානය කෙරෙමි" (නැසුණු ධර්‍මය වෙනුවෙන් මතක දානය දීම) සිතා ඒ මැහැලි එක් දවසක් තල මුං සාල් වලන් සැඳි සාළු (උපකරණ) අරගෙණ අමුසොහොනකට ගොස් ලිප් කැටට මිණීඉස්කබල් තිබා ගිනිමොලොවා ගඟට ගොස් ඉස් සෝදා නහා හන්පෙරවී පිළී (ඇඳිවත්) සෝදා බැඳි ලිප ගාවට ඇවිත් ඉසකේ මුදාහෙලා සාල් දෙවුන් අරින්ට (සහල් සේදීමට) පටන්ගත්තීය.

එකල්හි පුරණ ලද බෝධිසම්භාර ඇති බෝධිසත්‍වයෝ ශක්‍රදේවේන්ද්‍රව ඉපිද එදවස් දිවසින්ම මනුෂ්‍යලෝකය බලන්නාහු ඒ මැහැල්ල කරන්නාවූ ක්‍රියාව දැක බමුණුවෙසක් මවාගෙණ මගයන එකෙකු මෙන් ඒ ඈ සිටිනා තැනට ගොස් "සොහොනේදී බස් පිසන කෙනෙක් නම් නැත. එම්බා කච්චානි නම් තැනැත්තෙනි, ඉස සෝදා නහා සුදුපිළි හැඳ මිනී ඉස්කබලින් ලිප් බැඳ තලකිරිබත් පිසන්නේ කාටදැ?"යි විචාළේය.

එවිට මැහැලි කියන්නී "බමුණානෙනි, මේ ලෝකයෙහි වැඩිමහළු නෑයන්ට ආදර සත්කාර කිරීම ආදිවූ සුචරිත ධර්‍මය නැසුනේය. එසේ හෙයින් මම ඒ නැසුනාවූ ධර්‍මයට පිතෘපිණ්ඩ දානය කෙරෙමි" කී කල්හි ශක්‍රබ්‍රාහ්මණතෙම කියනුයේ "එම්බා කච්චානීය, අසදෘශවූ ආනුභාව (අසමාන වූ ආනුභාව) හා දහසක් නුවණැස් ඇති සද්ධර්‍ම ස්වරූපවූ සක්දෙව් රජතෙම ධර්‍මය පවත්වමින් ජීවත්වන්නේය. එසේ හෙයින් ධර්‍මය නොනැසුනේය"යි කීයේය.

එබස් අසා මැහැලි කියන්නී "බමුණානෙනි, කුමක් කියව්ද? මේ ලෝකයෙහි යම් සත්‍වකෙනෙක් කුශලධර්‍මයෙහි නොයෙදී පාපයෙහි යෙදී වාසය කෙරෙත්ද? එබඳුවූ සත්‍වයෝම පුත්‍රදාරා, දැසි, දස්, ගව මහිසාදී (මීහරකුන්) ධනධාන්‍ය සම්පත්තියෙන් සමෘද්ධවෙති (දියුණු වෙති). පළමු වඳවූ මාගේ යෙහෙලනියන් (ලේලිය) අද්‍රෝහී වූ කුල ජ්‍යෙෂ්ටවූ (පවුලේ වැඩිමහලු වූ) මා තලා ගෙයින් පිටත්කොට දරු වදා සියලු අපගේ කුලයට ප්‍රධානවූවාය. තොප කුමක් කීවත් ධර්‍මය නැසුනැයි යනු ඒකාන්තයෙන් මට සැකයක් නැතැ"යි කීවාය.

ඉක්බිති සක්දෙව්රජ කියනුයේ "කාත්‍යායනිය, තෝ යම් ධර්‍මයක් මළායයි කිවු නම් ඒ ධර්‍මය නම් අනිකෙක් නොවෙයි, ජීවමාන වූ මම්මය, අන් කාරියක් නැතිව තොප නිසාම මෙතැන්හි පැමිණියෙමි. යම් ස්ත්‍රියක් තොප තලා ගෙයින් නෙරා දරුවන් ලැබ ප්‍රබලවූද ඈ දරුවන් හා එක්ව මාගේ ධර්‍ම තේජසින් දවා අළුකෙරෙමි" කිවුය.

එවිට මැහැලි "අනේ මේ කුමක් කියන නියාද? මාගේ මුනුබුරා හා යෙහෙලිය සැපසේ ඉදීම යහපතැ"යි සිතා කියන්නී "ස්වාමීනි, සක්දෙව් රජ්ජුරුවන් වහන්ස, මා පිණිස මෙතැන්හි වැඩිසේක් වීනම් මාගේ පුතාද යේලිද මුනුබුරාද අපි හැමදෙන ඔවුනොවුන් හා සමග සතුටුව යම්සේ වාසය කරමෝද, එම නුඹ වහන්සේටත් කැමතිවේව"යි කී කල්හි "උන් විසින් දුකට පමුණුවනු ලැබූ තෝ සත්පුරුෂධර්‍මය (සත්පුරුෂයා සතුරාගේ දියුණුව වුවත් අගය කරයි) නොහැර ඔවුනොවුන්ට යහපතක් කැමති වූයේය"යි සන්තෝෂව "තොපි හැමදෙනාම ඔවුනොනුන් හා සමග සතුටුව එක්තැන්හි වාසය කරව"යි කියා සක්දෙව්රජ ශක්‍රාත්මභාවයෙන් සැදී පැහැදී අහස්හි සිට කියනුයේ "නොබව කාත්‍යායනිය, තොපගේ පුතනුවන් හා යෙහෙලනියෝ මාගේ ආනුභාවයෙන් පෙරමඟට අවුත් ක්‍ෂමා කරවා තොප කැඳවාගෙණ යෙති. කුශලධර්‍මයෙහි අප්‍රමාදව වසව"යි අවවාදකොට තමා වාසය කරන්නාවූ දිව්‍ය ලෝකයටම ගියේය.

ඔවුන් දෙදෙන ශක්‍රානුභාවයෙන් මෑණියන්ගේ ගුණ සිහිකොට "අපගේ මෑණියන් වහන්සේ කොයිදැ?"යි ගම මනුෂ්‍යයන් අතින් විචාරා "අමුසොහොන දිසාවට ගිය"යි යනු අසා අඬාගෙණ ගොස් දැක පසෙක අඬා වැටී "මෑණියන් වහන්ස, අපගේ දෝෂ ක්‍ෂමා කළ මැනව"යි කීවාහුය.

ඒ මැහැලි ප්‍රෙමයෙන් මුනුබුරා වඩාගත්තීය. මෙසේ සමගිව ඔහු හැමදෙන ගෙට අවුත් ශක්‍රයන්ගේ ආනුභාවයෙන් ඒ

කාත්‍යායනි තොම යෙහෙලියන්දෑ පුතනුවන් මුනුබුරානන් විසින් ඒ ශක්‍රානුභාවයෙන් කරණලද උපස්ථාන විඳ සැපසේ වාසය කළෝ වේදැයි චතුස්සත්‍යය ප්‍රකාශ කොට මේ ජාතකය පූර්‍වාපරසන්ධි ගළපා (අතීත වර්තමාන චරිත ගළපා) නිමවා වදාළ සේක. චතුස්සත්‍ය ධර්‍මදේශනාවගේ අවසානයෙහි උපාසකතෙම සෝවාන් ඵලයෙහි පිහිටියේය.

"එකල්හි මෑණියන්ට උපස්ථාන කළ පුරුෂයා නම් දැන් වර්‍තමාන කාලයෙහි මාතෘපස්ථායක වන්නේය. එකල්හි භාර්‍ය්‍යාවූ ස්ත්‍රීතොම දැන් මේ ස්ත්‍රිය. ශක්‍රදේවේන්ද්‍ර නම් සමය්‍යක් සම්බුදුවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ ගෙණහැර දක්වා වදාළ සේක.

# 407. අෂ්ටශබ්ද ජාතකය

තවද කරුණා නිධානවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වාසය කරණසේක් මධ්‍යම රාත්‍රියෙහි කොසොල් රජ්ජුරුවන් විසින් අසනලද විභාග නැති (තේරුම් කළ නොහැකි) භයානක ශබ්ද අටක් අරභයා මේ ජාතකය දක්වා වදාළ සේක.

මෙහි වර්‍තමාන කථාව යට 'ලෝබකුම්භි ජාතකයෙහි' පෙණෙන්නේය මේ ජාතකයෙහි කොසොල් රජ්ජුරුවන් විසින් "ස්වාමීනි, තිලෝගුරු බුදුරජාණන් වහන්ස, මේ ශබ්දයන් ඇසුවායින් කුමක් වන්නේදැ"යි විචාළ කල්හි "නොබව මහරජ, මෙයින් කිසි අන්තරායෙක් නොවන්නේය. මෙබඳුවූ භයානක

ශබ්ද තොපිම නොඇසුවච, පෙරත් රජදරුවෝ මෙබඳු ශබ්ද අසා බමුණන්ගේ බස් ගෙණ සර්වචතුෂ්ක (සියල්ල හතර බැගින් ගන්නා) නම් යාගයක් කරණු කැමැත්තාහු නුවණැත්තවුන්ගේ බස් අසා යාගයට මරණු පිණිස ගෙණාවූ සත්‍වයන් නොමරණ පිණිස නුවර බෙරලවා අභයදානය දුන්නාහු වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ බ්‍රාහ්මණ කුලයෙහි ඉපිද වැඩිවිය පැමිණ ගිහිගෙයි කලකිරී හිමාලය වනයට වැද ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් (තවුස් පැවිද්දෙන්) පැවිදිව වාසය කොට ලුණු ඇඹුල් පිණිස බෝධිසත්‍වයෝ බරණැස් නුවර ආ ගමනේ රජ්ජුරුවන්ගේ මගුල් උයනේ වාසය කරන්නාහ.

එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ මධ්‍යම රාත්‍රි වේලෙහි ශබ්ද අටක් ඇසූහ. ඒ ශබ්ද අට කවරේද යතහොත් පළමු කොට රජ්ජුරුවන්ගේ උයන සමීපයෙහිදී දියසුන් (දිය හිඳුනු) පොකුණක් සමීපයෙහි හිඳ කොකෙක් අඬාලීය. දෙවෙනිව ඒ අඬට අනතුරුව රජ්ජුරුවන්ගේ ඇත්හල තොරණ සමීපයේ ඉඳ කැවිඩි ධේනුවක් අඬළුව. තුන්වෙනිව ඒ අඬට අනතුරුවම රජ්ජුරුවන්ගේ රජගෙයි කැණිමඩලේ (වහලේ මුදුන් කොත) කළදපණුවෙක් අඬාලීය. සතරවැනිව ඒ අඬට අනතුරුව

රජ්ජුරුවන්ගේ රජගෙයි මැදිරියේ ඉඳිනා කොවුල්ලෙක් අඬාලීය. පස්වෙනිව ඊට අනතුරුව රජජුරුවන් වඩනා (ඇති කරණා) මුවෙක් අඬාලීය. සවෙනිව ඊට අනතුරුව මැදිරියේ හිඳිනා වඳුරෙක් අඬාලීය. සත්වැනිව ඊට අනතුරුව මැදිරියේ හිඳිනා කින්නරාවක් (කිඳුරු දෙනක්) අඬලුව. අටවැනිව ඊට අනතුරුව රජ්ජුරුවන්ගේ මගුල් උයනට ආකාශයෙන් වඩනාවූ පසේබුදු කෙනෙකුන් වහන්සේ උදන් ගාථා (ප්‍රීතිය ප්‍රකාශ කරණා වාක්‍ය) වදාළ සේක.

මේ ශබ්ද අටම ඒ රජ්ජුරුවන් ඇසූහ. ඒ අසා රජ්ජුරුවෝ තුන්යම් රාත්‍රියෙහි භයින් නොනිදාම පාන්කළහ. පුරෝහිත බ්‍රාහ්මණයාත් පාන්වූ පසු රජගෙට අවුත් රෑ නිදිලත් සැටිය විචාළේය. රජ්ජුරුවෝ කියන්නාහු "මට සැපයෙක් නම් කොයින්ද? රෑ මෙසේවූ ශබ්ද අටක් අසා භයපත්ව නිදි නොලද්දෙමි" කීහ. එවිට පුරෝහිත බ්‍රාහ්මණයා සිතන්නේ "අප කන්ට කැවිල්ලක් ලා ගියේය"යි බමුණානන් සත්කාර එක්කොට කියන්නේ "මේ මහා භයංකරවූ ශබ්දයෙක, මීට සව්වතුෂ්ක නම් යාගයක් කළොත් විනා නපුරැ"යි රජ්ජුරුවන්ට කියා "බොහෝ ප්‍රාණීන් එක්කරවාගෙණ යාගයක් කරවන්ට උවමැනවැ"යි නොයෙක් සතා සතුන් පක්ෂීන් මිනිසුන් ඇතුළුවූ අය යාගයට එක්කරවූහ. එවිට ඒ පුරෝහිත බ්‍රාහ්මණයාගේ අතවැසිවූ බමුණෙක් කියන්නේ "ආචාරීන් වහන්ස, අප උගත් වේදශාස්ත්‍රයෙහි ප්‍රාණයක් නසා කරන්ට කී යාගයක් දුටුයේ නැත, මෙතෙක් ප්‍රාණ නසා පව්කරන්නාවූ කාරණා කිමිදැ?"යි කීහ.

එවිට පුරෝහිත බ්‍රාහ්මණයා කියන්නේ “තොපිම රජ්ජුරුවන්ට පක්‍ෂපාතව ගියාද? මෙතෙක් දෙනාට වන්නාවූ ලාභ අලාභ කරවුදැ?”යි කෝප කළාහ. ඒ අතවැසිත් ආචාරීන් අතින් කෝප අසා “කෙතෙක් කෝප කළත් මා මේ ප්‍රාණවධයට එක් වන්නේ නැතැ”යි පලාගොස් මේ පුරෝහිත බ්‍රාහ්මණයාටත් රජ්ජුරුවන්ටත් පිරෙන්නාවූ පාප සංසිඳුවාපියන්ට නිස්සෝ (සුදුසු කෙනෙක්) කවිරුදැයි පරීක්‍ෂාකොට රජ්ජුරුවන්ගේ උයනට යන්නාවූ තාපසයන් කරා ගොස් කියන්නාහු “තාපසයන් වහන්ස, අපගේ රජ්ජුරුවන් වහන්සේ ඊයේ රෑ ශබ්ද අටක් අසා වද්‍රා ඒ ශබ්ද අට ඇසූ නියාව පුරෝහිත බ්‍රාහ්මණයාට කීසේක. පුරෝහිත බ්‍රාහ්මණයාත් තමා රැකෙන උපායට සර්‍වචතුෂ්ක නම් යාගයක් කළ මැනවැයි ප්‍රාණීන් රැස්කරවාගෙණ මරන්ට උවමැනවැයි යාග ශාලාවක් ඉදි කරවා ඒ ශාලාවෙහි මෙකී අය බැඳගෙණ ප්‍රාණවධයට එක්කරන්නාහ. ඔබ වහන්සේ වැනි ඍද්ධි ඇති තාපසයන් වහන්සේ මෙතන වැඩ ඉන්දදී රජ්ජුරුවන් වහන්සේට පිරෙණ පාපය නැතිකොට හික්මවා වදාළ මැනවැ”යි කීහ.

එවිට තාපසයෝ කියන්නාහු “රජ්ජුරුවෝ අප ලඟට අවු නම් මේ ශබ්ද අටෙහි විපාකත් කියා රජ්ජුරුවන් හික්මවන පමණක් විනා අප ඉස අකුස්සක් (හෙන්ඩුවක්) බැඳගෙණ රජ්ජුරුවන් ලඟට ගොස් හික්මවන්නේදැ”යි කීහ.

එවිට බ්‍රාහ්මණයා "මම ගොසින් රජ්ජුරුවන් වහන්සේ කැඳවාගෙණ එමි" කියා රජ්ජුරුවන් ලඟට ගොස් කියන්නේ "ස්වාමීනි, නුඹ වහන්සේ ඇසූ ශබ්ද අටේ අර්‍ථ විභාගකොට කියන්නට දන්නාවූ තාපස කෙනෙකුන් වහන්සේ මගුල් උයනේ වැඩ ඉඳිනාසේක. නුඹ වහන්සේ එතනට ගොස් අර්‍ථ විචාළ මැනවැ"යි කීහ. රජ්ජුරුවෝත් "යහපතැ"යි උයනට ගොස් තාපසයන් වැඳ ඇසූ ශබ්ද අට තාපසයන්ට කීහ.

තාපසයෝ ඒ ශබ්ද අටෙහි අර්‍ථ විසඳන්නාහු "පළමුවන ශබ්දයෙහි කොකෙකු ඇඬූ කාරණය නම් පළමු මේ පොකුණේ මත්ස්‍යයන් කා පැන් බී වාසය කෙළෙමි. දැන් මැඩියන් කා ජීවත්වෙමි, තමාගේ වික්ෂේපයෙන් (කණගාටුවෙන්) අඬාලිය. මින් රජ්ජුරුවෙනි තොපට වන්නාවූ අනර්‍ථයෙක් නැත. පොකුණ බිඳුවා පැන් පුරවා පියන්නා දැනුත් කොකා විසින් කිසි වික්ෂේපයක් නැතිව සැපසේ ඉඳිනේය"යි කී කල්හි රජ්ජුරුවෝ පොකුණේ කසල හරවන්ට අමාත්‍යයන්ට කීහ. "මින් තොපට වන්නාවූ භයෙක් නැතෙ"යි කියා බෝධිසත්වයෝ දෙවෙනි ශබ්දයේ අර්ත්‍ථ විසඳන්නාහු "රජ්ජුරුවෙනි, ඇත්හල තොරණ වසන්නාවූ කැවිඩි තමාගේ දරුවන් ඇතුන් මරාපු හෙයින් පුත්‍රස්නේහයෙන් (දරු සෙනෙහසින්) ඇඬූහ. තොපට මින් අනර්ත්‍ථයෙක් නැතැ"යි කියා තුන්වැනි ශබ්දයෙහි අර්‍ථ විසඳන්නාහු "රජ්ජුරුවෙනි, තොපගේ රජගෙයි කැණීමඩුල්ලේ කඳපණුවෙක් වාසය කරන්නේය. ඒ තමා යන එන තැනක් නැතිහෙයින් මම මින් කවර දවසෙක ගැලවී පලායෙම්ද? ගොදුරක් කවර කලක බඩපුරා ලබම්දැ?යි කියා ඇඬිය.

මිනිසෙකු ගෙන්වා කැණිමඩුල්ල බිඳවා කඳපණුවා ඇරගෙණ ඔබ්බේ ලවාපියවයි සැපසේ තමා කැමති තැනක ඇවිදිනේය. මින් තොපට වන අන්තරාය නැතැ"යි කීහ.

සතරවන ශබ්දයේ අර්ථ කියන්නාවූ බෝධිසත්වයෝ "මහරජ්ජුරුවෙනි, තොපගේ මැදිරියේ ඉඳිනා කොවුලු මම මේ මැදිරියෙන් ගැලවී ගියේ නම් සැපසේ ඒ ඒ ගස් උඩවල හිඳ එලාඑල අනුභවකොට සැපසේ ඇවිදිම් කියා ඇඬුව. මින් තොපට වන්නාවූ අනර්ථයෙක් නැතැ"යි කියා පස්වැනි ශබ්දයෙහි අර්ථ කියන්නාහු "මුවා මුවරැලට නායකව වනයේ වාසය කරන්නේ වැද්දෙකුට අසුව මේ සා බන්ධනයකට පැමිණියෙමි, ඉදින් මිදීගියෙම් නම් සැපසේ වනයෙහි වාසය කරන්නෙම් වේදැයි කියා ඇඬීය. මින් තොපට වන්නාවූ අන්තරා නැතැ"යි කියා සවෙනි ශබ්දයේ අර්ත්ථ කියන්නාවූ තාපසයෝ "රජ්ජුරුවෙනි, මේ වඳුරු වැදිරියෙක නිසා කාමයෙහි ගිජුව අවුත් බන්ධනයකට පැමිණියෙමි, ඉදින් මේ දුකින් මිදී ගියෙම් නම් සැපසේ වනයේ ඇවිදිනෙම් වේදැයි කියා ඇඬීය. මින් තොපට වන්නාවූ භයෙක් නැතැ"යි කියා සත්වන ශබ්දයේ අර්ත්ථ කියන්නාහු "මේ කින්නරයා එක් දවසක් පර්වතයකින් ඇඳිරියෙහි බස්නේ තමාගේ කින්නරාඞ්ගනාවට අතදී බැස තමාගේ ස්ථානයෙහි සැපසේ වැදහෙව ලෝකස්වාදරතියෙහි (කම් සුව විඳීම) යෙදී වාසයකොට දැන් එසේ වූ කින්නරාවක් හැර බන්ධනයට පැමිණියෙමි, මින් මිදී ගියෙන් නම් සැපසේ වනයට වැද වාසය කරන්නෙම් වේදැයි ඇඬීය. මින් තොපට වන්නාවූ

භයෙක් නැතැ''යි අටවැනි ශබ්දයෙහි අර්ත්‍ථ කියන්නාහු ''එක් පසේබුදු කෙනෙකුන් වහන්සේ හිමාලය වනයේ සිට කාල ක්‍රියාවට ආසන්න හෙයින් මනුෂ්‍යාපතයෙහි (මිනිස් වාසයෙහි) බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන්ගේ උයනේ කාලක්‍රියා කෙරෙමි උයනට යනසේක් මේ ජාතියෙන් දෙවැනි ජාතියෙක උත්පත්තියෙක් නොවන්නේය. මින් චුතව නිර්‍වාණ පුරයට පැමිණ නිවන් සැප අනුභව කෙරෙමියි ප්‍රීති වාක්‍ය කිය කියා උදන් අන අනා වැඩිසේක. මින් තොපට වන්නාවූ අන්තරායෙක් නැතැ''යි කියා මේ ශබ්ද අටෙහි අර්ත්‍ථ විසඳ වදාළ සේක.

රජ්ජුරුවෝ තාපසයන් වහන්සේ කෙරේ සමාධිව (පැහැදී) පසේ බුදුන් වහන්සේගේ කඳ (දේහය) ආදාහන කරවා බන්‍ධනාගාරයෙහි සිටියාවූ සතුන් බන්‍ධනයෙන් උනා හැරවුවයි වදරා මේ 'අෂ්ටශබ්ද ජාතකය' නිමවා වදාළ සේක.

''එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. බ්‍රාහ්මණ මානවකයා නම් ශාරිපුත්ත ස්ථවිරයෝය. එසමයෙහි තාපසව උපන්නෙමි බුදුවූ මම්ම වේදැ''යි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

## 408. සුලසා ජාතකය

තවද දිගුපුළුල්වූ නුවන් (දිග පළල ඇස්) ඇති සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි අනේපිඩු මහසිටාණන් ගේ දාසියක අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

අනේපිඬු මහාසිටාණන්ගේ පුණ්‍යලක්ෂණයෙන් දියනිකෙනෙක් ඇත. උන්ගේ දසියක් "උයන් කෙළියට යෙමි" තමාගේ ස්වාමි දුව අතින් ලක්ෂයක් වටිනා පළඳනාව ඉල්වා අතකර ලාගෙණ උයන් කෙළියට යන්නිය දැක එක් සොරෙක් ඈ අතකර තිබූ ආභරණ දැක ඒ ආභරණයෙහි ලෝභකොට "මෑ මරා පියා ආභරණ අරගණිමි" ඈ හා කැටිව ක්ලේශවසඟයෙන් (ආලවන්ත ලෙස) කථාකොට ඈට රා මස් ආදිවූ දෙය දෙන්නේය. ඔයිත් ක්ලේශ වසඟයෙන් දෙතියි ඇරගන්නීය.

ඒ සොරාත් ඈ උයන්කෙළි කෙළ ඉක්බිතිව ඈ හා ලොකස්වාදරතියෙහි (කම්සුව විඳිම) යෙදෙනා ලෙස එක් තෙනකට ගොස් කියන්නේ "මෙතන නපුර ඔබ්බට යම්හ"යි (ඈතට) කීය. එවිටත් සිතන්නී රහසිගතව කරණ දෙයකට මෙතනට වඩා නිසි තැනක් නැත, මෙතනින් මා ඔබ්බට ගෙණ යන්නේ මරන්ට වනැයි සිතා තීක්ෂණ උපායක් (සියුම් උපායක්) සිතා කියන්නී "රා මස් කා මාගේ සර්වාංගය වියලි (මළු සිරුරම මැලවී) ගියේය. මට පැන් උකාදීලා (වතුර සපයාදී) මට පැන් පොවා ලව"යි ලිඳක් කරා ගෙණ ගොස් කලය හා ලනුව සොරා අතට දින. සොරාත් සැබැවින්ම කියන දෙයක්වනැයි සිතා ලනුවෙන් කලය කට බැඳ කලය ලිඳට ලාලීය. එවිට පිටිපස්සේ සිටි ස්ත්‍රිය දෑතින් තරයේ ඇන ලිඳට එලා ඉසට උළුකැටකින් ගසා මරා ගෙට ගොස් තමාගේ ස්වාමිදුවට මෙපවත් කියා ආභරණ පාවා දුන්නාය.

ඒ ඇසූ සැටිය පුණ්‍යලක්‍ෂණා දේවී පියාණන්ට කීය. අනේපිඬු මහාසිටාණෝ ජේතවනාරාමයට ගොස් සර්‍වඥයන් වහන්සේට එපවත් කීහ. සර්‍වඥයන් වහන්සේ "දැන්මතු නොවෙයි සිටාණෙනි, පෙරත් ඒ ස්ත්‍රිය පුරුෂයා මැරුවිරුයේ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ඒ නුවර සුලසා නම් වෛශ්‍යා ස්ත්‍රියක් (ගණිකාවක්) ඇත. ඒ නුවර සඬුකා නම් සොරෙක් නිරන්තරයෙන් ගෙවල් සොරකම් කොට ඇවිදිනේය. රජ්ජුරුවෝ එපවත් අසා ගම් රැකවලුන් විධානකරවා ඒ සොරා අල්වාගෙණ උල අන්ට (උල තබන්නට) විධාන කළහ.

ගම් රැකවලුන් (ගම් රකින්නන්) විසින් උග ඇරගෙණ උල අන්ට ගෙණයන කල්හි සුලසා නම් වෛශ්‍යාව තමාගේ ගෙයි උඩුමාලේ සිටින තැනැත්තිය ඒ සොරු දැක කණේරු ජාතකයෙහි කී පරිද්දෙන් ඔහු කෙරෙහි අභිලාෂා (ආසාව උපදවා) ඇතිව සිතන්නී "මෙසේවූ වීරපුරුෂයෙකු ගලවා ගතිම් නම් සැපසේ ඇතිතෙක් දවසට ඉච්ඡාපරයෙන් (හිතේ හැටියට) වාසය කරන්නෙම් වේදැ"යි සිතා තමාගේ ගෙයි පළමු සිටි සිටුපුත්‍රයෙකුත් මසුරන් දසකුත් ගම්රැකවලුන්ට දී ඒ සොරු ගලවාගෙණ තමාට ස්වාමිකොට ගෙයි රඳවාගෙණ උන්නීය.

සොරුත් කීපදවසක් ඇගේ ගෙයි වැස සිතන්නේ "මෙතන මා ඉඳ ප්‍රයෝජන කිම්ද? මෑ මරාපියා මෑ අතකර ලන ආභරණ ඇරගෙණ යෙමි" සිතා වෛශ්‍යාවට කියන්නේ "එම්බා හද්‍රාව, මා ඒ දවස් පිටතලහයා බැඳලා (දෑත් පිටිපසට තබා බැඳ) උල අනින්ට ගෙණයන දවස් පර්‍වතයක වසන දේවතාවෙකුට ආරාධනාවක් කෙළෙමි. ඒ ආරාධනාවට බලි දුනමැනවැයි (බිළි පූජාවක් දීම) බොහෝ මිනිසුන් හා බත්තලියක් ඇරගෙණ තොප හා මා හා දෙන්නාම සර්‍වාභරණයෙන් සැරසී රුක්දෙවියාට බලි දෙන්ට උවමැනව"යි කීහ.

වෛශ්‍යා ස්ත්‍රී කියන්නී "යහපත නුඹ වහන්සේගේ අභිප්‍රාය නියාවට (කැමති පරිද්දි) බලි දුනමැනවැ"යි කියා බොහෝ පූජා භාණ්ඩ ඇරගෙණ සොරතෙමේ පඤ්චායුධ (ආයුධ පහක්) සන්නද්ධව පර්‍වතය ළඟට ගොසින් කැටිව ගියවුන් පර්‍වතය පාත රඳවා සාඩුක නම් සොරා සුලසා නම් වෛශ්‍යාව ඇරගෙණ පර්‍වතය උඩට නැඟීගණ ගොස් ගල මත්තේ තබා කියන්නේ "තොප ශතප්‍රමාණ (අඩි සියයක් පමණ) උස ඇති පර්‍වතය උඩට බලිදෙන්ට ගෙණායෙමි නොවෙයි, තොප මරා අතකර තිබූ ආභරණ අරගන්ට අයේය"යි කීය.

එවිට සුලසා කියන්නී "තොප කෙරේ ස්නෙහයෙන් මාරු දී ගලවාගතිමි, තොප ඒ මරණීන් ගැලවූ මා මරා ප්‍රයෝජන කිම්ද? මාගේ ආභරණත් ඇරගෙණ මා තොපට වහල්

නියාවට (යටහත් දසියක් ලෙස) බොහෝදෙනා මැදයේ කියා වහල්කොට ගණුව"යි කිව

එවිට සාධුකයා කියන්නේ "මම මේසා වනතුරු මිනියක් නොමරා වස්තුවක් ඇරගත්විරූ නැත, සොරු මිනී නොමරා වස්තු ඇරගැණීම ආචාර නොවෙයි (සුදුසු නැත. සිරිත නොවේ), තොපගේ තෙල උතුරු සළුව බිම තබා තොප ආභරණ ගලවා කඩෙයි ලා පොදිය (රෙදි කඩට දමා ගැට ගසා) බැඳ ලව"යි කිය.

එවිට සුලසා කියන්නී "මා මැරුණ පසු මා කටයුතු දැන පුරුෂයන් හා කැටිව වාසයෙන් යෙදෙන අවස්ථාවෙහි පටන් තොප කෙරෙන් ඇති ස්නෙහයට වඩා ස්නේහයක් ඇත්තේ නැත. ඉතිකින් මේ දැක්මෙන් අනික් දැක්මක් නොවත්වූව (අවසාන දැක්ම වන නිසා), තොප සතර තැනක සිට වැඳ පැදකුණුකොට (වටේ යමින් කරන වැඳිම) සිපගෙණ සනාපියන්ට උවමැනව"යි කිව. සොරුත් "යහපතැ"යි ගිවිස්සේය.

ඒ වෛශ්‍යාවත් කී පරිද්දෙන්ම වැඳ පැදකුණුකොට ඉදිරියෙන් සනහපියා පිටිපස්සට ගොසින් වඳින්ට නැඹුරු වන්නාක් මෙන් නැඹුරුව පටිපස්ස අල්වාගෙණ ශතප්‍රමාණ පර්වතයෙන් හෙලාපුව එවිට ඇට බැට (ඇට කටු) සුනුවිසුනුව කැඩී ප්‍රාණය විනාශ විය.

ඒ බලාසිටියාවූ වෘක්ෂදේවතාවා "හැමතැන්හිම පුරුෂයන්ම නුවණැතැයි කියාම නැත. ස්ත්‍රීන් නුවණැත්තෝමය. සාඩුක නම්

සොරා සුලසාවන් මරන්ට උත්සාහකොට තෙමේ නුනුවනින් මෙළේය. සූක්‍ෂමවූ නුවණ ඇතිව දුටු ප්‍රස්ථාවකට (තැනට සුදුසු නුවණ) කාරිය සිතාගෙණ නොහෙන්නාවූ යම්කෙනෙක් ඇත්නම් සාඩුකයා මෙන් නස්නාහුය”යි දේවතාවා කීයේය.

ඒ සුලසා නම් වෛශ්‍යාත් පර්‍වතයෙන් බැස තමාගේ පෂීත්(පිරිස) සිටිතැනට ගියාය. ඒ පරිවාරස්ත්‍රී කියන්නාහු “නුඹ වහන්සේගේ ස්වාමීන් වහන්සේ කොයිදැ?”යි විචාළාහ. “උන්ගේ දෙයක් මට නොකියව”යි කියා රථයකට පැන නැගී තමාගේ ගෙට ගියායයි මේ ජාතකය ගෙණහැර දක්වා වදාරා මේ ‘සුලසා ජාතකය’ නිමවා වදාළ සේක.

“ඒ සමයෙහි සොරා නම් මේ සොරාමය, එසමයෙහි සුලසා නම් මේ දාසිමය, එසමයෙහි වෘක්‍ෂ දේවතාව උපන්නෙම් බුදුවූ මම්මය”යි වදාළ සේක.

## 409. සුමංගල ජාතකය

තවද අසමසමවූ (සම කළ හැකි කෙනෙක් නැති) සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි රාජෝවාදයක් (රජුට කළ අවවාදයක්) අරභයා මේ ජාතකය දක්වන ලද

ඒ කෙසේද යත්?

සර්‍වඥයන් වහන්සේ කෝසල රජ්ජුරුවන්ට වදාරණසේක් “මහරජ, රජදරුවන් නම් සන්හිඳි (සැනසීමෙන්) වාසය කටයුතුය, පෙරත් රජදරුවෝ සන්හිඳි වාසය කළෝවේදැ”යි

වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රජ්ජය කරණ සමයෙහි ඒ නුවරට පසේබුදුකෙනෙකුන් වහන්සේ වැඩිසේක. රජ්ජුරුවෝ පසේබුදුන් වහන්සේ දැක තමන්ගේ උයනට වඩා ගෙණගොස් උයනේ වැඩහිඳිනා නියායෙන් සලස්වා තමන්ගේ සුමංගල නම් උයන්ගොව්වා පසේබුදුන් වහන්සේට අත්පා මෙහෙවර (ඇප උපස්ථාන) කරණ නියායෙන් සැලැස්වූහ.

ඒ උයන්ගොව්වාත් ආදරසම්භාවනා (ගරු සරු ඇතිව) ඇතිවම රජ්ජුරුවන් කී සැටියේම පසේබුදුන් වහන්සේට අත්පා මෙහෙවර කරන්නේය. පසේබුදුන් වහන්සේත් රජගෙන් වළඳ උයනේ වාසය කරණ සේක. කීප මසක් වැස උයන්ගොව්වාට වදරණසේක්"සුමංගලය, පිටිසර ගමකට ගොසින් එන්නට යෙමි"යි උයන්ගොව්වාට කියා පිටිසර ගමකට වැඩිසේක. උයන්ගොව්වාත් උන්වහන්සේ පිටිසර ගමකට ගිය නියාව කියා උයනට නොගියේය. පසේබුදුන් වහන්සේත් පිටිසර ගිය කීප දවසකින් උයනට වැඩිසේක. උයන්ගොව්වා උන් වහන්සේ වැඩි නියාව නොදන්නේය. උදෑසන තමා දෙන අමුතු බතකට (විශේෂ ආහාර වේලකට) මුවන් විදින්ටයයි ගියේය. පසේබුදුන් වහන්සේ උයනේ සලවට (ගල් ආසනයේ) සිව් රෙන් මොට්ටක්කිලිය (සිවුරෙන් හිස වැසෙනසේ තබා) ගසා

වැඩඋන්සේක. උයන්ගොව්වාත් මේ වැදහෝනේ මහා මුවෙකැයි සිතා ඇරගෙණ විද්දේය. ඒ හීය ලෙන් ඇනී පිටින් (පපුව පසාකර ගෙන ගියේය) නැංගේය. එවිට පසේබුදුන් වහන්සේ "ඇයි සුමංගලය මමය"යි වදාළ සේක. එවිට උයන්ගොව්වා අත දුන්න දමාපියා "ස්වාමීනි, මහා මුවෙකැයි සිතා විද්දෙමි" කියා "ක්‍ෂමා කළ මැනවැ"යි කියා වැඳ වැතිර ගියේය.

පසේබුදුන් වහන්සේ "ඉතිකින් කළමනා කිම්දැ? (දැන් කළ යුත්තක් නැත) යි කියා "මා ඇඟ ඇනී ගිය මේ හීය ඇද දමාපියව"යි කී සේක. එවිට හීය ඇදපු කීප පැයකින් ප්‍රාණය නිරුද්ධ විය (පිරිනිවන් පෑහ). උයන්ගොව්වාත් පසේබුදුන් වහන්සේට විදි නියාව රජ්ජුරුවන් වහන්සේ ඇසූ සේක් වීනම් මට ආඥාකරණ සේකැයි (මරණ දඬුවම නියම කරාවි) භයින් අඹු දරුවන් ඇරගෙණ වලට (කැලෑවට) වැද ගියේය. ඒ උයනේ වසන්නාවූ අනික් කෙනෙක් නැත්තාහ. දේවතාවෝ පසේබුදුන් වහන්සේ විත් කා මළසේකැයි බරණැස් නුවර මුළුල්ලේ සැලකළාහ.

රජ්ජුරුවෝත් එපවත් අසා අමාත්‍යමණ්ඩලයා හා සමග උයනට ගොස් පසේබුදුන් වහන්සේ ආදාහන කරවා නුවරට ගියාහ. උයන්ගොව්වා අවුරුද්දක් සැඟවී ඉඳ තමා සිත (තමාට හිතවත්) එක් අමාත්‍යයෙකුට පෙණී "රජ්ජුරුවන් වහන්සේ මා කෙරේ කෝප ඇතිසේක් දෝ හෝ යි නියමකළ මැනැව"යි කීය. ඒ අමාත්‍යයාත් රජ්ජුරුවන් කරා ගොස් "ස්වාමීනි, සුමංගල නම් උයන් ගොව්වා උයනට එලාඑල

ඇතිකරන්නට ඉතා සමර්ථය, උඹ ගිය තැන් පටන් උයන ඉතාම නපුරුව ගියේය"යි කීය. රජ්ජුරුවෝ උඹ දිසාවට මුනත්නොලා (පැත්ත නොබලාම) උන් කියන බසුත් නොඇසුවාහ. ඒ අමාත්‍යයාත් ගෙට අවුත් "'තව කෝප සන්නොසිඳුණේය, නැවත අවුරුද්දක් සැඟවී ඉඳුව"යි කියා යැවීය.

එයිත් අවුරුද්දක් සැඟවී ඉඳ පළමු පරිද්දෙන්ම ඇවිත් ඒ අමාත්‍යයා දිට. ඒ අමාත්‍යයාත් පළමු පරිද්දෙන්ම රජ්ජුරුවන්ට කීයේය. රජ්ජුරුවෝ දෙවෙනි වාරයේත් නොඇසුවාහ. ඒ වාරයේත් "තව අවුරුද්දක් සැඟවී ඉඳුව"යි කියා යැවීය. එවකත් ගොසින් අවුරුද්දක් සැඟවී ඉඳ තුන්වෙනි වාරයේත් ඇවිත් දිට. ඒ අමාත්‍යයාත් තුන්වෙනි වාරයේත් රජ්ජුරුවන්ට කීය. රජ්ජුරුවෝ තුන්වෙනි වාරයේ උගේ පවත් අසා ගෙන්වා ගෙණ පාවයි අමාත්‍යයාට කීහ. ඒ අමාත්‍යයාත් තමාගේ ගෙයි උන් උයන්ගොව්වා රජ්ජුරුවන්ට ගෙණවිත් පෑහ. රජ්ජුරුවෝත් උයන්ගොව්වා දැක "ඇයි තා පසේබුදුන් වහන්සේ කුමට විද්දේදැ?"යි විචාළාහ. "ස්වාමිනි, පසේබුදුන් වහන්සේ උයනට ආ නියාව නොදත්තෙමි. මම මුවන් විදින්ටයයි ගියෙමි. ඉස වසා සිවුර ලාගෙණ වැඩ උන් තැනැත්තන් වහන්සේ මහමුවෙකැ යි සිතා නොදැන විද්දෙමි"යි කීහ. රජ්ජුරුවන් වහන්සේ "නොදැන කළ වරදට කරන්නේ කිම්දැ?"යි කියා උඹට බොහෝ වස්තු දී පළමුසේම උයන රැකවලට සැලැස්වූහ.

ඒ අමාත්‍යයාත් "ඇයි ස්වාමීනි, දෙමුරෙක මා දන්වන ගමනේ බැණ නොනැගී වැඩඉන්ටත් දැන් වූකලී මූට ප්‍රාසාද දෙන්ටත් කාරණා කිම්දැ?"යි විචාළාහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු "එම්බා ඉසුරුමතුන් වීනම් යම් කෙනෙකුන්ගේ වැරැද්දක් ඇසූ කල තමාගේ කෝප නිවීගිය අවස්ථාවේ ගෙන්වාගෙණ උගේ වැරදි විචාරා නිවැරදි හෙයින් මූට ප්‍රසාදත් දී ඌට උයනත් සැලැස්වීම්"යි රජ්ජුරුවෝ කීහ. එතන උන්නාවූ අමාත්‍ය මණ්ඩලයා සාධුකාර දී බොහෝ කෝලාහල කළාහ. අරගල සන්හිඳියන්නා උයන්ගොව්වා නැගීසිට රජ්ජුරුවන් වහන්සේ වැඳ "ස්වාමීනි, නුඹ වහන්සේ ශ්‍රී කාන්තාවත් ලක්‍ෂමීත් නොහැර පවතිත්වයි නිරන්තරයෙන් සියල්ලවුන් කෙරේ කෝපයෙන් නොවී දැහැමින් සෙමෙන් රාජ්‍යය කරණසේක්වයි, සියක් අවුරුද්දක් සැපසේ බොහෝ දෙනා කෙරේ මෛත්‍රී කොට මින් චුතව (මරණයට පත්ව) දිව්‍යලෝකයට ගොස් දිව්‍යසම්පත් අනුභව කරණසේක්ව"යි ආවඩා ස්තුති ඝෝෂා කෙළේයයි වදරා මේ 'සුමංගල ජාතකය' නිමවා වදාළ සේක.

"එසමයෙහි පසේබුදුන් වහන්සේ ආදාහන කරවා පූජා කළාවූ රජ්ජුරුවෝ නම් බුදුවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 410. ගඩිගාමාල ජාතකය

තවද අප්‍රතිවාදීවූ (වෙනත් වාද කළ හැකි කෙනෙක් නැති) සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන

සමයෙහි පෙහෙවස් (සිල් රකින) රැකs උපාසකයෙකු අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්?

එක් උපාසකයෙක් පෙහෙවස් රැක සර්වඥයන් වහන්සේ ලඟ බණ අස අසා උන්නාහ, සර්වඥයන් වහන්සේ "පෙර උත්තමයෝ යන්තම් වේලෙකත් (ටික කාලයක් හෝ) පෙහෙවස් රැක්කෝ වේදැ"යි වදරා ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි ඒ නුවර සුචිපරිවාර නම් සිටාන කෙනෙක් ඇත්තාහ. උන්ගේ පරිවාරත් (පිරිවර ජනයා) තමනුත් නිරන්තරයෙන් පන්සිල් රකිණාහ. පෝය අටසිල් රැක යටත් පිරිසෙයින් බැලමෙහෙකරන්නන් දක්වාත් "පන්සිල් රකුව"යි පන්සිල් රක්වන්නාහ.

එසමයේදී බෝධිසත්වයෝ එක්තරා දුප්පත් කුලයක ඉපද ඉණ බඩ පැදගන්නා විචරකුත් නැතිව (භරියාකාර වස්ත්‍රයක්වත් නැතුව) දවසරින්නාහු සුචිපරිවාර සිටානන්ගේ ගෙයි බැල මෙහෙකරන්ටයයි කියා ආවාහ. සිටානෝත් බෝධිසත්වයන් දැක "කුමට අවුදැ?"යි විචාරා "බැලමෙහෙ කරන්ට ආමි" කී කල්හි සිටානෝ බෝධිසත්වයන් දැක උවමනා කෙනෙකැ යි පන්සිල් රකුවයි නොකියාම මේ බැලමෙහෙ දෙවයි විධාන කළාහ. බෝධිසත්වයෝ එතැන් පටන් බැලත් ඇරගෙන මේවර කරන්නාහ.

එක් දවසක් සිටානෝ තමන්ගේ ගෙට විධාන කරන්නාහු "එම්බා හෙට අටවක පෝයය වේලාපසම බත් පිස කා අවසර ඇමදෙනම පෙහෙවස් රකුව"යි කියා විධාන කළාහ. බෝධිසත්‍වයෝ එබස් නොඇසූහ. උදෑසනක්සේම තමන් කර්‍මාන්ත කරන මේ බිමට ගොස් කර්‍මාන්ත කරන්නාහ. සිටානෝත් බෝධිසත්‍වයන් නොදැක "එම්බල බැල මෙහෙකරන තැනැත්තන් දුටුයේ නැතැ"යි කියා "උන්ට බත් තබව"යි කියා බත් තුබූහ. බොධිසත්වයෝ කර්‍මාන්ත කොට ගෙට ආකල්හි "බත්කව"යි බත් කන්ටලූහ. බෝධිසත්‍වයෝ "මෙතෙක් දවස් මේ වෙලාවට මේ ගෙයි කන බොන අරගල බොහෝව තිබෙයි. අද අරගලයකුත් නැතිව කන බොන කෙනෙකුන් නැතිව ඉන්ට කාරණා කිම්දැ?"යි විචාළාහ. බත්ලන කෙලී (බත් පිළියෙල කරන කාන්තාව) කියන්නී "අද අටවක පෝය හෙයින් ඇමදෙනාම පේවුය (සිල් ගත්හ). එසේහෙයින් වේලපසම කා බී පෙහෙවස් රකිනාහ"යි කිව.

බෝධිසත්‍වයෝ එපවත් අසා "මේ වේලාවට පෝය ඇද්දැ?"යි විචාරා "රෑ තිස්පැය පෝය ඇතැ"යි යනු අසා සුවිමහපරිවාර සිටානන් කරා ගොසින් "මම පෙහෙවස් රකිමි"යි "මා පෙහෙකරවාළුව (සිල් සමාදන් කරවීම) මැනව"යි සිටානන් අතින් අටසිල් ඇරගෙණ පේවස් ඉටාගෙන වැදඹත්තාහ. දවළුත් බත් නොකන හෙයිනුත් රෑ මධ්‍යම රාත්‍රි වෙලාවට හසිලාක (ආහාර නොගැනීම නිසා ඇතිවන ආමාශගත රෝගයක්) නම් රුජාවෙක් පහරින්ට වන. සිටානෝ එපවත් අසා "මී හා විලඳ හා සකිරා එලගිතෙල්

(මීපැණි හා පොරි, හකුරු හා ගිතෙල්) අනුභව කරව”යි ගෙණගියාහ.

බෝධිසත්ත්වයෝ “මා දුකසේ රකිනා ශීලය අර්ධ දවසක මා සමාදන් වූයේය. මම මේ ඇම අනුභව නොකරමි”යි නොකළාහ. රුජාවත් තරකොට ගන්ටවන (ආමාරුව වැඩි වන්නට විය), සිටානෝත් චුතවන (මරණාසන්න බැවින්) අවස්ථා හෙයින් වීථියෙහි පිල ලවාපුහාව (වීථියෙහි අයිනක තැබුව). බරණැස් රජ්ජුරුවෝ පසුව දවස් මහත්වූ සේනාවාහනයෙන් හා මහත්වූ ඓශ්වර්ය්‍යයෙන් නුවරට පිටත්වූවාහ. බෝධිසත්ත්වයෝ රජ්ජුරුවන්ගේ ඓශ්වර්ය්‍යය දැක එහි ලොභ ඉපදවූහ. එක්ෂණයෙහි (ඒඅවස්ථාවේදීම) ප්‍රාණය නිරුද්ධ විය. චුතිසුඛව (චුතිය පිරිසිදුව මළ නිසා) ප්‍රාණය නිරුද්ධවූවා සමග අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ ගත්තාහු දස එකඩමසකින් වැදුවාහ. ඒ කුමාරයන්ට නම් තබන්නාහු උදය කුමාරයෝයයි නම් තුබූහ. ඒ රාජකුමාරයෙත් වැඩිවිය පැමිණ පියාණන්ගේ ඇවෑමෙන් රාජ්‍යයට පැමිණියාහ.

එක් දවසක් මතුමාල්තෙලෙහි හිඳ තමන්වහන්සේ කළාවූ පින් දැක “මෙසේවූ කුශලයක් කොට මෙසේවූ ඓශ්වර්ය්‍යයක් ලදිමි”යි උදන් අනා ඉන්නාසේක. ඒ නුවර උතුරුදිග දෙරටුපාලයා රත්‍රන් සතරවියටක් (වී ඇට සතරක් බර රන්) උපායගත. දකුණුදිග දෙරටුපාලයාගේ අඹුත් එසේම රත්‍රන් සතරවියටක් සොයාගෙණ උතුරු දිග වාසල පව් රේ වලක් කැණ නිධාන කළාහ.

එක් දවසක් නුවර උත්සව කෙළියෙක් ඇතිවිය. එවිට අඹු කියන්නී "නුඹ වහන්සේ අත යම් වස්තුයෙක් ඇත්නම් ඇරගෙණ විකොට උත්සවකෙළි කෙළුම්හ"යි කීහ. එවිට දෙරටුපාලයා "උතුරුදිග දෙරටුවේ රත්‍රන් සතර වියටෙක් නිධාන කෙළම්. ඒ ගෙණෙන්ට යෙමි"යි කණ මල්ගන්වාගෙණ (කණේහි මල් රඳවාගෙන) දෙළොස් ගව්වක් දිග පළල ඇති නුවර හෙයින් වහ වහා යන්නේය.

රජ්ජුරුවෝ මතු මාල්තෙලෙහි උන්නාහුය. දෙරටුපාලයා කණ මල්ගන්වාගෙණ යන්නාහු දැක රජ්ජුරුවෝ සිතන්නාහු "මෙසේවූ තද අව්වේ කකියාගිය වැල්ලේ (රත්වූ වැලි මත) දෙළොස් ගව්වක් සමාධිව කිසි ආයාසයක් නැති කෙනෙකුන් මෙන් යන්නේය. මා මූ අතින් විචාරන්ට උවමැනවැ"යි ළඟ සිටි පුරුෂයෙකු කැඳවා "කණ මල්ගන්වාගෙණ සමාධි සමාධිව යන්නේය. ඒ පුරුෂයා කැඳවාගෙණ එව"යි කියා යැවූහ. ඒ පුරුෂයාත් ගොසින් දෙරටුපාලයාට කියන්නේ "ස්වාමි තොප කැන්දුසේකැ (කැඳෙව්ව) යි කිය. එවිට දෙරටුපාලයා කියන්නේ "ස්වාමි කුමට කැන්දූසේක්දැ?"යි කීය. එසේදවුවත් ඒ ගිය පුරුෂයා කැඳවාගෙණ අවුත් රජ්ජුරුවන්ට පෑය. රජ්ජුරුවෝත් දෙරටුපාලයා දැක "එම්බල දෙරටුපාලය, තෝ ඉතා රත්වගියාවූ භූමියෙහි කකියන වැල්ලේ පය බිම ඔබාගත නොහැකි මගයන්නාවූ තෝ ගී කිය කියා සමාධි සමාධිව කණ මල් එල්වාගෙණ යන්නේය. තට කවර සමාධියකින් පිණ පිණා යන්නෙහිදැ?"යි විචාළාහ.

එවිට දෙරටුපාලයා කියන්නේ "ස්වාමීනි, මාගේ භාර්‍ය්‍යාව උත්සව කෙළියක් කෙළුම්හයි කීව. එසේ හෙයින් මාගේ නිධානයෙක් දකුණු දිග දෙරටුව කෙරේය. ඒ ඇරගෙණ එන නිසා යෙමි" කීහ. "කිමෙක්ද නිධානය රත්රන් ලක්‍ෂයකට ඇද්දැ?යි විචාළාහ. "එසේ නැතැ"යි කීහ. "පණස් දහසකට ඇද්දැ"යි විචාළාහ. "එහෙත් නැතැ"යි කීහ. "එසේකල සතළිස් දහසකට ඇද්දැ"යි කීහ. "එසේත් නැතැ"යි කීය. "තිස් දහසකට, විසිදහසකට, දසදහසකට, පන්දහසකට ඇද්දැ"යි විචාළාහ. "එසේත් නැතැ"යි කීය. ක්‍රමයෙන් විචාරා "දහසකට ඇද්දැ?"යි විචාළාහ. "එසේත් නැතැ"යි කීය. "එසේ කල නවසියයෙක්ද? අටසියයෙක්ද? සසියයෙක්ද? පන්සියයෙක්ද? සාරසියයෙක්ද? තුන්සියයෙක්ද? දෙසියයෙක්දැ?"යි විචාළාහ. "එසේත් නැතැ"යි කීහ. "එසේ කල සියයෙක්ද? අනුයෙක්ද? අසූයෙක්ද? සැත්තෑවෙක්ද? සැටෙක්ද? පණසෙක්දැ?යි විචාරා "දසකලඳෙක්දැ?"යි කීහ. "එසේත් නැත ස්වාමීනි" කීය. "එසේ කල පස්කලඳෙක්ද? සතරකලඳෙක්ද? තුන්කලඳෙක්ද? දෙකලඳෙක්ද? කලඳෙක්ද? දසකෙක්ද? පසකෙක්ද? තුනකෙක්ද? අකෙක්දැ?"යි විචාළාහ. "එසේත් නැත ස්වාමීනි" කීය. "එසේ කල විසිවියටෙක්දැ?"යි කීය. "එසේත් නැත ස්වාමීනි" කීය. "දසවියටෙක්දැ?"යි කීහ. "එසේත් නැත ස්වාමීනි" කීහ. "එසේ කල මදටෙක්දැ?"යි කීහ. "එසේත් නැත ස්වාමීනි" කීය. "එසේ කල සතරවියටෙක්දැ?"යි කීහ. "එසේය ස්වාමීනි" කීය. එවිට රජ්ජුරුවෝ කියන්නාහු "රත්‍රන් සතරවියටක් නිසා දැන්

සගව්වක් ආයේවේද? ඉදිරියෙත් සගව්වක් ගියමනාවේද? මම තට රත්‍රන් සතරවියටක් දෙමි"යි. "ඇරගෙණ පළායව"යි කීය. "ඒ රත්‍රන් සතරවියටත් ගනිමි, මාගේ රත්‍රන් සතරවියටත් ගනිමි" කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු "මම රත්‍රන් අටවියටත් දෙමි, ඇරගෙණ පළායව"යි කීහ. එවිට කියන්නේ "මේ රත්‍රන් අටවියටත් ගනිමි, මාගේ රත්‍රන් සතරවියටත් ගනිමි" කීය. එවිට රජ්ජුරුවෝ කියන්නාහු "මම රත්‍රන් සොළොස්වියටත් දෙමි" කීහ. "මම සොළොස්වියටත් ගනිමි, මාගේ රත්‍රන් සතරවියටත් ගනිමි" කීහ. "එසේකල රත්‍රන් අකක්දෙමි" කීහ. "මේ රත්‍රන් අකත් ගනිමි, මාගේ රත්‍රන් සතරවියටත් ගනිමි" කීය. "එසේ වීනම් රත්‍රන් කලඳක් දෙමි" කීහ. "මේ කලඳත් ගනිමි, මාගේ රත්‍රන් සතරවියටත් ගනිමි" කීය. "එසේකල දෙකලඳක් දෙමි" කීය. "මේ දෙකලඳත් ගනිමි, මාගේ රත්‍රන් සතර වියටත් ගනිමි" කීහ. "එසේකල අටකලඳක් දෙමි" කීහ. "මේ අටකලඳක් ගනිමි, මාගේ රත්‍රන් සතර වියටත් ගණිමි" කීය.

"එසේ වීනම් සොළොස් කලඳක් දෙමි" කීහ. මේ සොළොස් කලඳක් ගනිමි, මාගේ රත්‍රන් සතර වියටත් ගනිමි" කීය. "එසේ කල දෙතිස් කලඳක් දෙමි" කීහ. "මේ දෙතිස් කලඳත් ගනිමි, මාගේ රත්‍රන් සතර වියටත් ගනිමි" කීය. "එසේ වීනම් සැටසතර කලඳක් දෙමි" කීහ. "ඒ සැටසතර කලඳක් ගනිමි, මාගේ රත්‍රන් සතරවියටත් ගනිමි" කීය. "එසේ කල රත්‍රන් සියයක් දෙමි" කීහ. "ඒ රත්‍රන් සියයත් ගනිමි, මාගේ රත්‍රන් සතරවියටත් ගනිමි" කීය. "එසේකල රත්‍රන්

දෙසියයක් දෙමි” කීහ. “මේ රත්‍රන් දෙසියයත් ගනිමි, මාගේ රත්‍රන් සතරවියටත් ගනිමි” කීය. “එසේකල රත්‍රන් සාරසියයක් දෙමි” කීහ. “මේ සාරසියයක් ගනිමි, මාගේ රත්‍රන් සතරවියටත් ගනිමි” කීය. “එසේ කළ රත්‍රන් අටසියයක් දෙමි” කීහ. “මේ රත්‍රන් අටසියයක් ගනිමි, මාගේ රත්‍රන් සතර වියටත් ගනිමි” කීහ. “එසේ කල රත්‍රන් දසක් දෙමි” කීහ. “මේ රත්‍රන් දසත් ගනිමි, මාගේ රත්‍රන් සතරවියටත් ගනිමි” කීය.

“එසේ කල රත්‍රන් දෙදසක් දෙමි” කීහ. “මේ රත්‍රන් දෙදසත් ගනිමි, මාගේ රත්‍රන් සතරවියටත් ගනිමි” කීය. “එසේ කල රත්‍රන් සාරදහසක් දෙමි” කීය. “මේ රත්‍රන් සාරදහසක් ගනිමි, මාගේ රත්‍රන් සතරවියටත් ගනිමි” කීය. “එසේ කල රත්‍රන් අටදසක් දෙමි” කීහ. “මේ රත්‍රන් අටදහසක් ගනිමි, මාගේ රත්‍රන් සතරවියටත් ගනිමි” කීය. “එසේ කල රත්‍රන් සොළොස් දහසක් දෙමි” කීහ. “මේ රත්‍රන් සොළොස්දහත් ගනිමි, මාගේ රත්‍රන් සතරවියටත් ගනිමි” කීය. “එසේ කල රත්‍රන් දෙතිස්දසක් දෙමි” කීහ. “රත්‍රන් දෙතිස්දහත් ගනිමි, මාගේ රත්‍රන් සතරවියටත් ගනිමි” කීය.

“එසේකල රත්‍රන් සූසැටදහසක් දෙමි” කීහ. “මේ රත්‍රන් සූසැටදහසක් ගනිමි, මාගේ රත්‍රන් සතරවියටත් ගනිමි” කීය. “එසේකල රත්‍රන් එකසිය විසිඅටදසක් දෙමි” කීහ. “මේ රත්‍රන් එකසිය විසිඅටදසත් ගනිමි, මාගේ රත්‍රන් සතරවියටත් ගනිමි” කීහ. “එසේ කල රත්‍රන් දෙලක්‍ෂ සතළිස් දසක් දෙමි” කීහ.

“ඒ රත්‍රන් දෙලක්‍ෂ සතළිස්දහස ගනිමි, මාගේ රත්‍රන් සතරවියටත් ගනිමි” කීය. “එසේ කල රත්‍රන් පන්ලක්‍ෂයක් දෙමි” කීහ. “මේ රත්‍රන් පන්ලක්‍ෂයත් ගනිමි, මාගේ රත්‍රන් සතරවියටත් ගනිමි” කීය. “එසේ කල රත්‍රන් දසලක්‍ෂයක් දෙමි” කීහ. “ඒ රත්‍රන් දසලක්‍ෂයත් ගනිමි, මාගේ රත්‍රන් සතර වියටත් ගනිමි” කීය. “එසේ කල රත්‍රන් විසිලක්‍ෂයක් දෙමි” කීහ. “ඒ රත්‍රන් විසිලකෂයත් ගනිමි, මාගේ රත්‍රන් සතර වියටත් ගනිමි” කීය. “එසේ වීනම් රත්‍රන් සතලිස් ලක්‍ෂයක් දෙමි” කීහ. “මේ රත්‍රන් සතළිස් ලක්‍ෂයත් ගනිමි, මාගේ රත්‍රන් සතර වියටත් ගනිමි” කීය. “එසේ වීනම් රත්‍රන් අසූලක්‍ෂයක් දෙමි” කීහ. “මේ රත්‍රන් අසූලක්‍ෂයත් ගනිමි, මාගේ රත්‍රන් සතර වියටත් ගනිමි” කීය. “එසේ වී නම් රත්‍රන් අනූලක්‍ෂයක් දෙමි” කීහ. “මේ රත්‍රන් අනුලක්‍ෂයක් ගනිමි, මාගේ රත්‍රන් සතරවියටත් ගනිමි” කීය. “එසේ වීනම් රත්‍රන් කෙළක් දෙමි” කීහ. “මේ රත්‍රන් කෙළ ගනිමි, මාගේ රත්‍රන් සතර වියටත් ගනිමි” කීය. “එසේ වීනම් රාජ්‍යයෙන් කැබැල්ලක් දෙමි” කීය. එවිට දෙරටුපාලයාත් “යහපතැ”යි ගිවිස්සේය. රජ්ජුරුවෝ ඔහු දැලිඅන්දම් තබ්බවා ඔහු ඉස්සෝද නහවා සළු අඳවා රාජ්‍යය කණුගස්වා (රාජ කුමාරයෙකුට ඔබින පරිදි සරසා) දුන්හ. ඒ රාජ්‍යයත් තමාගේ රත්‍රන් සතරවියටත් තුබූ භාගය නොහැර ගත. එසේ හෙයින් අර්ධමාස රජ්ජුරුවෝ යයි නම් තුබූහ. ඒතැන් පටන් උදය රජ්ජුරුවෝත් අර්ධමාස රජ්ජුරුවෝත් නොවෙනස්ව රාජ්‍යය කරන්නාහ.

එක් දවසක් උයනට ගියාහ. උදය රජ්ජුරුවෝ අර්ධමාස රජ්ජුරුවන්ගේ කලවයෙහි ඉස තබා වැදහෙව නිදාපුවාහ. අර්ධමාස රජතෙම "මොහු මරාපියා රාජ්‍යය මම ඇරගතිමි, රජ්ජුරුවන්ගේ ඉස කපාපියමි" කඩුව අතටගෙණ සිතන්නාහු "මා රත්‍රන් සතරවියටක් පමණ වස්තු ඇති තැනැත්තහු මේසා මහත් රාජ්‍යශ්‍රීයක පිහිටවූ තැනැත්තෝයයි කඩුව බිම තබා දෙවැනිවත් තුන්වෙනිවත් ක්‍ෂමාකළ මැනව"යි කීහ. එවිට උදය රජ්ජුරුවෝ කියන්නාහු "යාළු මට කළ වැරැද්දක් නැත. ක්‍ෂමා කරන්නේ කිම්දැ?"යි කීහ. එවිට අර්ධමාස රජ්ජුරුවෝ තමන් කළ සැටිය කියා උදය රජ්ජුරුවන් ක්‍ෂමා කරවූහ. උදය රජ්ජුරුවෝත් "එසේ කළ රාජ්‍යය තොපිම හැරගනුව"යි කීය. අර්ධමාස රජ්ජුරුවෝත් "තොපගේ රාජ්‍යයෙන් මට ප්‍රයෝජන නැතැ"යි රජ්ජුරුවන්ට රාජ්‍යය පාවාදී වනයට ගොස් ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවූහ.

උදය රජ්ජුරුවෝත් "අර්ධ රාත්‍රියෙහි (රෑ අඩක්) පේවස් රැකි පමණකින් මේසා මහත් රාජ්‍යශ්‍රීයක් ලදිමි"යි මාගේ යාළුවූ අර්ධමාස රජ්ජුරුවෝත් තපසට පළාගියාහ. මම ගිහිගෙයි සිටියෙමි ඇමවේලේම ගාථාවක් කිය කියා ඉදිනාහ. බිසව් ගාථාවෙහි අභිප්‍රාය (අදහස් කරන දෙය) අහන්නා කැමැත්තාහ. ඒ රජ්ජුරුවන්ගේ ගංගමාල නම් නාවිසයෙක් (රජුගේ නාසයේ දිග ලොම් කපන තැනැත්තා) ඇත්තේය. රජ්ජුරුවෝ එක් දවසක් බිසවුන්ට කියන්නාහු "ගංගාමාලයා මාගේ ඇඟලොම්ලා (ඇඟ පිරිමැද) දැළිකපන වේලෙහි

(රැවුල කපන අවස්ථාවේ) උඟ ඉල්වූ යම් වරයක් දෙන්ට අභිප්‍රාය"යි කීහ.

බිසව් නාවිසයා කැඳවා කියන්නාහු "ගංගාමාලය අද පටන් රජ්ජුරුවන් වහන්සේගේ දැළි කපන කල පළමු කොට නාසයේ ලොම් උදුරා පසුව දැළි කපා ඇඟලොස් බාවාළූ විට රජ්ජුරුවෝ තොපට කොල තා කැමති වරයක් ගනැ"යි කියති. එවෙලෙහි "ස්වාමීනි, මට අනික් වරයකින් ප්‍රයෝජන නැත. නුඹ වහන්සේ කියන්නාවූ ගාථාවේ අර්ත්‍ථ කිවමැනවැයි කියා කියව"යි බිසව් උගන්වා ඇරිකල්හි නාවිසයාත් එක් දවසක් රජ්ජුරුවන්ගේ දැළි බාන්ට ගොසින් ආදි කොට නාසයේ ලොම් උදුරන්ට වන. එවිට රජ්ජුරුවෝ කියන්නාහු "මේ කිමෙක්දැ"යි "ආදිකොට නාසයේ ලොම් උදුරන්නේය"යි කීහ. නාවිසයාත් කියන්නේ "නාසා කර්මාන්ත නම් අපූර්ව දත් දෙයක් කරන්නාහ"යි කියා ආදිකොට නාසයේ ලොම් හා පසුව දැළිය කපා ඇඟ ලොම්බෑය. රජ්ජුරුවෝ සමාධිව "තා කැමති වරයක් ගණැ"යි කීහ.

ගංගාමාලයා "ස්වාමීනි, මට සෙසු වරයකින් කම්නැත. නුඹ වහන්සේ ඇමවිට කිය කියා ඉඳිනාවූ ගාථාවෙහි අර්ත්‍ථ කිවමැනවැ"යි කීය. රජ්ජුරුවෝත් 'කුම්මාසපිණ්ඩ ජාතකයෙහි' අර්ත්‍ථ කීවාක් මෙන් ගාථා වෙහි අර්ත්‍ථ කියන්නාහු "අර්ධ රාත්‍රියෙහි රැකි පෙහෙවස් ආනුභාවයෙන් මේසා මහත් සම්පතක් ලදිමි. මාගේ යාළුවූ අර්ධමාස රජ්ජුරුවෝත් තපසට ගියාහුය. මම ගිහිගෙයි සිටියෙමි"යි මේ ගාථාවෙහි

අථියයි කීහ. ඒ ගංගාමාල නාවිසයා එපවත් අසා හිමාල වනයට ගොස් සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව විදර්ශනා වඩා සකල ක්ලේශයන් නසා පසේබුදුවූ සේක.

පසේබුදුව බරණැස්නුවර උයනට ආවාහ. රජ්ජුරුවෝත් ගංගාමාල නම් පසේබුදුන් වහන්සේ උයනට වැඩිසේකැයි අසා මහා සේනාව හා සමග උයනට ගියාහ. රජ්ජුරුවන්ගේ මෑණියෝත් උයනට ගියාහ. ගංගාමාල නම් පසේබුදුන් වහන්සේ “බ්‍රහ්මදත්තයෙනි සැපසේ උනුදැ”යි විචාරා වදාළ සේක. රජ්ජුරුවන්ගේ මෑණියෝ “ඇයි ගංගාමාලය, තොපි පසේ බුදුව ගියයි ජාතිය පලාගියේද? මාගේ දරුවන්ට බ්‍රහ්මදත්තයයි කියන්නේ, තෝ තාගේ විවර නොදනිදැ?”යි බිසව් කියා කීහ. රජ්ජුරුවෝ “එලෙස නොකිව මැනව මෑණියන් වහන්ස, උන් වහන්සේ සියලු කෙලෙසුන් නසා පසේබුදුව ගියසේක. උන්වහන්සේට ජාතියෙන් කම් කිම්දැ?යි මෑණියන් අස්වැසූහ. සේනාවත් එලෙස දෙඩන්ට වන්හ. රජ්ජුරුවෝ සේනාවත් අස්වසා තුමූ පසේබුදුන් වහන්සේට වැඳ වැතිර ගියාහ. රජ්ජුරුවන් ඇතුළුවූ සියල්ලවුන්ම පසේබුදුන් වැඳ එකත්පස්ව සිටියාහ.

එවිට රජ්ජුරුවෝත් “ස්වාමීනි, මාගේ මෑණියන් වහන්සේත් නුවර වාසීනුත් නොදැන කී දේෂයට ක්‍ෂමා කළ මැනවැ”යි ක්‍ෂමා කරවාගත්හ. රජ්ජුරුවෝත් පසේබුදුන් වහන්සේත් රජ්ජුරුවන්ට අවවාද කියා නන්දමූලක පබ්භාරයට

වැඩිසේකැයි වදාරා මේ ‘ගඟාමාල ජාතකය’ නිමවා වදාළ සේක.

“එසමයෙහි උදය රජ්ජුරුවෝ නම් ලොව්තුරා බුදුවූ මම්මය”යි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

# 411. චෙතිය ජාතකය

තවද වීතරාගීවූ (පහවූ රාගය ඇති) සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ පොළොව ගිලූ කථාව අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

ධම්සභාවේ රැස්වූ මාළුවරුන් වහන්සේ “දෙවදත්ත ස්ථවිරයන් පොලොව පලාගෙණ නරකයට ගියේය”යි කිය කියා වැඩ උන් තැනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා “මහණෙනි, මා එන්නාට පූර්‍ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?”යි විචාරා වදාරා එපවත් අසා “දැන්මතු නොවෙයි මහණෙනි, පෙරත් දෙවදත්ත ස්ථවිරයන් පොලව පලාගෙණ නරකයට ගියේය”යි වදාරා “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

යට ප්‍රථම කල්පයෙහි මහාසම්මතය, රොජය, වරරෝජය, කල්‍යාණය, වරකල්‍යාණය, උපොසථය, මන්ධාතුය, වරමන්ධාතුය, වරය, උපවරය යි යන රජ දරුවෝ දස දෙනෙක් වූහ.

ඉන් උපචර නම් රජ්ජුරුවන්ගේ පුත් චෙතිය නම් රජෙක් චෙතිය රට සොත්ථිය නම් නුවර රාජ්‍යය කරන්නේය. ඒ රජහුගේ කපිල නම් පුරෝහිත බ්‍රාහ්මණයක් ඇත. ඒ පුරෝහිත බ්‍රහ්මණ "මම වෘද්ධයෙමි (වැඩිමහලු වෙමි), රජ්ජුරුවෙනි, දිවපැන යා නොහෙමි. මට මින් කම් නැතැ"යි තුමූ පැවිදිව පඤ්චාභිඥා අෂ්ට සමාපත්ති උපදවා උයනෙහි තාපසව වාසය කරන්නාහ. තමන්ගේ පුරෝහිත ධුරය අනික් කෙනෙකුන්ට නොසලස්වා තමන්ගේ පුතනුවන්ටම භාරකොට තපසට ගියාහ. කපිල තාපසයන්ගේ කොරකළම්බ නම් මළනුකෙනෙක් ඇත. රජ්ජුරුවන් හා කොරකලම්බයන් හා බාලද පටන් පුරුද්දහ. රජ්ජුරුවෝත් කොරකලම්බයාට කියන්නේ "ඇයි තොපගේ බෑනන් වහන්සේ සිටි පුරෝහිත ධුරයට තොපි සිටුව"යි කීහ.

එවිට කොරකලම්බයෝ "අපගේ බෑනන් වහන්සේ තාපසවූ පමණක් විනා තමන් වහන්සේ ධුරයට නොසැලැස්වූ සේක. ඉන් උන් වහන්සේ සැලසුවොත් විනා ධුරයට සිටින්නේ කෙසේදැ?"යි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු "තොපි මම් වැඩිමාළු කෙරෙමි. තොපගේ බෑනන් තොපට බාල කෙරෙමි" කීහ. එවිට කොරකලම්බයෝ කියන්නාහු "ස්වාමීනි, උන් වහන්සේ ප්‍රයෝග දන්නා සේක. නුඹ වහන්සේට ආකාශයෙන් වැටෙන්නාසේ දක්වන සේක. පොළොව ගලන්නාසේ (පොළොවෙහි ගිලෙන) දක්වන සේක. ඊට භය නොගෙණ තරයේ සිටිනාසේක් (කම්පා නොවී, නොසැලී) වීනම් යහපතැ"යි කීහ. එවිට රජ්ජුරුවෝ "කවර විෂ්මයෙක්

(පුදුමයක්) පැවෝතිනුත් තරයේ සිටිමි. සැකයක් නොසිතව"යි කීහ. "ඒ කවර දවස්ද? කියන්නේය"යි විචාළේය. "අදට සත්වෙනි දවස්ය"යි කීහ.

මේ කථාව නුවර මුළුල්ලේ සැලව "අපගේ රජ්ජුරුවන් වහන්සේ අදට සත්වෙනි දවස් බොරුවක් කියන සේකල. බොරු නම් උල්ද? වටද? සතරුස්ද? නිල්ද? සුදුදැ?"යි කියා නුවරවාසී මැසිපිට මැසි ලමින් ඒ ඒ තැන රැස්වූහ. තාපසයන්ගේ පුතනුවෝත් තාපසයන් ලඟට ගොස් "සෙට රජ්ජුරුවන් වහන්සේ බොරු කියනසේකැ"යි පියාණන් වහන්සේට කීහ. උන් වහන්සේත් උයනින් අවුත් ආකාශයේ වැඩ සිටිසේක. රජ්ජුරුවෝත් සර්වාභරණයෙන් සැරසී ආකාශයෙහි සිටියාහ. තාපසයෝ කියන්නාහු "මහරජ, බොරු කීකල සතරදිග රැකගෙණ සිටිනා දෙවියෝ පලා යන්නාහ. මෙලෝ පරලෝ දෙකින්ම අවැඩ පැමිණෙන්නේය. එසේ හෙයින් බොරු නොකියව මැනැව"යි කීහ. තාපසයන් එසේ කීවත් රජ්ජුරුවෝ "නුඹ වහන්සේ බාලසේක. කොරකලඹයෝ වැඩි මහළුය"යි කීහ.

එවිට සතර දිග රැකවල්ගෙණ සිටි දෙවියෝ සතරදෙන තමන් අත තුබූ කඩුසතර රජ්ජුරුවන් පාපිට දමා පළාගියාහ. රජ්ජුරුවෝ ඒ දැක භයපත්ව කොරකලඹයන් මූන බැළූහ. එවිට කොරකලඹයා කියන්නේ "ආදිම කියෙම් වේද? නුඹ වහන්සේ භය ගන්නා නියායෙනැ"යි කීහ. එවිට රජ්ජුරුවෝ තාපසයන්ට කියන්නාහු "තාපසයන් වහන්ස, නුඹ වහන්සේ

බාල සේක. කොරකලඹයා වැඩිමාළුය"යි කීහ. එවිට තාපසයෝ කියන්නාහු "මහරජ, එකවිට කී බොරුවෙන් රුකවල සිටි දෙවියන් පලා ගිය නියාව දුටුවාවේද? දෙවැනි බොරුවෙන් බිම වැටී හුනුව මුඛයෙන් හමන මහනෙල්මල් සුවඳ නැතිව දුර්ගන්ධ (දුගඳ) හමන්ට වන. සඳුන් සුවඳ හමන්නාවූ ශරීරයෙන් අසුචි ගන්ධ හමන්නට වන. මේ දැකත් තොපට ප්‍රත්‍යක්ෂ නොවේද? පළමුසේම සැබෑවයෙහි සිටුව. බොරු කියා අවීචියට නොයව"යි කීහ.

ඒ අසා රජ්ජුරුවෝ කොරකලඹයන් මූණ බැලූහ. කොරකලඹයා කියන්නේ "නොබව මැනව රජ්ජුරුවන් වහන්ස මේ මායමැ"යි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු "තාපසයන් වහන්ස නුඹ වහන්සේ බාලයා සේක. කෝරකලඹයා වැඩිමාළු ය"යි කීහ. එවිට රජ්ජුරුවන්ගේ දන දක්වා පොලොව ගැලපිය (ගිලුනා). එවිට තාපසයෝ කියන්නාහු "මහරජ, පළමුසේ සැබෑවයෙහි පිහිටා තොපගේ අභිවෘද්ධිය පළමුසේම වන්නේය"යි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු "මහ තාපසයන් වහන්සේ බාලසේක. කොරකලඹයා වැඩිමාළුය"යි කීහ. එවිට උකුල දක්වා පොලොව ගැලපීය. එවිට තාපසයෝ කියන්නාහු "මහරජ, බොරුකීම නම් මෙලෝ පරලෝ දෙකින්ම අවැඩ සැලසෙන්නේය. බොරු කියන තැනැත්තවුට දරුවෝ ඇති නොවන්නාහ. ඉදින් ඇතිවෙත්නම් ගැණු දරුවෝ ඇතිවන්නාහ. ඉදින් පිරිමි පුතෙක් ඇතිවී නමුත් නොකීකරු වන්නාහ. බොරු කියන තැනැත්තවුගේ මුඛයෙන් උපනුපන් ජාතියෙහි දුර්ගන්ධ වෑහෙන්නේය. බැලුවන්ට අනිභිප්‍රාය (අප්‍රිය

වීම) වන්නේය. මහරජ සැබැවයෙහි පිහිටා පෙරසේම රාජ්‍යශ්‍රීයෙහි පිහිටිය මැනවැ''යි කීහ.

එවිට රජ්ජුරුවෝ මේ තාපසයන්ගේ සෘර්ධියෙන්ම වන දෙයකැයි සිතා කියන්නාහු ''තාපසයන් වහන්ස, කොරකලඹයා වැඩි මාළුය. නුඹ වහන්සේ බාලය''යි කීහ. එවිට තනමත්ත (පපුව තෙක්) දක්වා ගැලපීය. එවිට තාපසයෝ කියන්නාහු ''මහරජ, බොරු කියා අවීචිනරකයට නොගොස් සැබෑවයෙහි පිහිටා නුඹ වහන්සේ ඓශ්වර්‍ය්‍යයෙන් නොපිරිහී පළමු රජ්‍යශ්‍රීය විඳ මැනවැ''යි කීහ. එපවත් රජ්ජුරුවෝ කියන්නාහු ''නුඹ වහන්සේ බාලය''යි යන බසම කීහ. එවිට සෙනෙහැති (ආදරය ඇති) මවක පුතකු රත්පලසකින් (රතු පොරෝණයකින්) වසාගෙණ යන කලක් පරිද්දෙන් අවීචිමහනරකයෙන් ගිනිකඳෙක් අවුත් රජ්ජුරුවන් වටකොටගෙණ අවීචිනරකයට ඇරගෙණ ගියේය.

ඒ රජ්ජුරුවන්ගේ රාජකුමාරවරු පස්දෙනෙක් ඇත්තාහුය. ඒ පස්දෙනම එතනට ආවාහුය. ඒ තාපසයෝ රාජකුමාරයන්ට කියන්නාහු ''තොපි ඇම මේ නුවර නොයිඳුව''යි කියා වැඩිමාළු රාජ කුමාරයන්ට කියන්නාහු ''මේ දිසාවට ගිය කල්හි අසවල් තැන ඇත්රුවෙක් ඇත. එතන නුවරක්කොටගෙණ ඉඳුව''යි කීහ. එහි වනාහී හස්තිපුර නම් වෙයි දෙවැනි රාජකුමාරයන්ට කියන්නාහු ''මේ දිසාවෙහි ගියකල අස්රුවෙක් ඇත. එතන නුවරක් කොටගෙණ ඉඳුව''යි කීහ. ඒ වනාහී අශ්වපුරය නම් වෙයි. තුන්වෙනි කුමාරයන්ට

කියන්නාහු "මේ දිසාවේ අසවල් තැන සිංහ රුවෙක් ඇත. තොපි එතන නුවරක් කරගෙණ ඉඳුව"යි කීහ. ඒ වනාහී සිංහපුර නම් වෙයි. සතරවෙනි කුමාරයන්ට කියන්නාහු "අසවල් තැන පර්‍වත දෙකක් ඇත. ඒ පර්‍වතයෙන් වැටෙන්නාවූ ජලධාරා දධ දධයයි වැගිරෙන්නේය. තොපි ඒ ස්ථානයෙහි නුවරක් කොටගෙණ ඉඳුව"යි කීහ. ඒ නුවර දද්ධර නම් නුවර වෙයි. පස්වෙනි කුමාරයන්ට කියන්නාහු "තොපි මේ නුවර පස්කොටා කන්දක් කොට පවුරු ලවා (ප්‍රාකාරයක් බැඳ) මාලිගා ඉදිකොට වසව"යි කියා යවූහ. කුමාරයෝ පස්දෙනත් තාපසයන් කී සැටියෙන් ඒ ඒ තැන නුවර කොටගෙණ දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදාරා මේ 'චෙතිය ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි චෙතිය රජ්ජුරුවෝ නම් දෙවදත්ත ස්ථවිරයෝය. කපිල තාපසයෝ නම් බුදුවූ මම්මය"යි වදාළසේක.

# 412. ඉන්ද්‍රිය ජාතකය

තවද විතද්දේෂවූ (පහවූ ද්වේශය ඇති) සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් ස්ත්‍රියක් කෙරේ පිළිබඳ සිත් ඇති භික්‍ෂුකෙනෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

එක් කෙළෙඹි පුත්‍රයෙක් ඉතා වෘද්ධ අවස්ථාවෙහි "මහණවෙමි"යි සර්‍වඥයන් වහන්සේ කරා ගොස් "මහණවන අභිප්‍රාය ඇත්තෙමි"යි කීය.

සර්‍වඥයන් වහන්සේත් "තුලූ (මොහු, මේ තැනැත්තා) මහණකරව"යි එක්කෙනෙකුන් වහන්සේට භාරකළසේක. උන් වහන්සේත් ඒ කෙළඹි පුත්‍රයා මහණ කළසේක.

ඒ මහණ, භික්ෂූන් වහන්සේ හා සමග දන් වලඳන්ට ගිය කල සෙසු භික්ෂූන් වහන්සේට යහපත් අසුන් පණවන්නාහ, මේ භික්ෂූන් වහන්සේට එක් විවර කොළොඹුවක් (ඉඳ ගැනීමට ප්‍රයෝජන වන ලී කොට කැබැල්ලක්) හා පුටුවක් ලන්නාහ. කැඳ පිළිගන්වන කල සැන්දෙන් උළුගැටීගිය (හට්ටි පතුලට ඇලුණ) සැලිපත්ලේ තිබූ කැඳ වත් කරන්නාහ. අවුළුපත් (කැවිලි වර්ග) පිළිගන්වන කලත් කැඩිකැඩීගිය පොඩි පිළිගන්වන්නාහ. බත් පිළිගන්වන කළ දැඹකඩ දැඹුබත් (දන් කොඩය) දෙන්නාහ. එයිත් යපෙන විවරට නොලබන්නාහ. මෙසේ විඳ තමන්ගේ පුරාණ දූතිකාව (කලින් සිටි භාර්‍ය්‍යාව) වසන්නාවූ ගෙට යන්නාහ. ඒ දූතිකාවන් පාත්‍රය බලා යහපත් බත් මාළු පිස වලඳවන්නීය. ඒ මහණත් දවස් පතා ආසාව පිස වලඳවන බතෙහි ආසා තෘෂ්ණාවෙන් නිරන්තරම ඒ ගෙට සිගා එනසේක.

ඒ ස්ත්‍රී මුන්වහන්සේ මා කෙරේ ඉතකම් ඇතිසේක් (නැවතත් හිතවත් බව) දේ හෝ යි පරීක්ෂා කරන්නට උවමැනව යි පුරුෂයන් සතරදෙනෙකුට අමුතු බතක් දෙමි යි

උන් ඇමත් ගෙයි රඳවා තොමෝ පිසන ගෙයි වට තිරයක් බඳවා කැවුම් පිසින්නීය. ඒ වේලාවට ඒ භික්‍ෂූන් වහන්සේ සිඟා වැඩිසේක. උන් වහන්සේට ආයුණු (දීමට කසිවක් සූදනම් නැති බව අඟවන කීමක්) කීහ. උන් අයුණු කීවත් නොයනසේකැ යි කීහ. දෙවෙනිවත් තුන්වෙනිවත් අයුණු කීවත් නොයනහෙයින් නොදන්නා කෙනෙක් මෙන් තිරය ඉවත් කොට එලියට අවුත් “අපගේ දරුවන්ගේ පියානන් වහන්සේය”යි කියා ගෙට වඩාගෙණ අවුත් උන් වහන්සේ වඩා ඉඳුවා දන්වළදවා කියන්නාහු “නුඹ වහන්සේ මහණව ගිය සේක. ස්ත්‍රී නම් කණවැන්දඹුව ඉඳිනා කල ඉතා ආඑාසුව, මා කැඳවා පිටිසරින් ආවාවූ පුරුෂයෝ මූ ඇම සිටිනෝය. නුඹ වහන්සේ දහවිටක් මාගේ ගෙට වඩිනාසේක. ඒසේ හෙයින් අන් පුරුෂයෙක් මෙතනට එන්ට නොසිතන්නාහ. මේ පුරුෂයන් හා සමගවම පිටිසර යෙමි. නුඹ වහන්සේ ගිහිකල මා කීකළ දෙයක් ඇත්නම් ක්‍ෂමාකළ මැනැවැ”යි “නුඹ වහන්සේ රකිණා ශීලය යහපත් කොට රැක්ක මැනව, මම පිටිසර යෙමි. එවිට භික්‍ෂූන් වහන්සේ එබස් අසා ලෙන් ඇනීගිය හීයක් මෙන් (පපුවේ ඇනීගිය ඊතලයක් මෙන්) මහත්වූ ශෝකයට පැමිණ “මම තොප ඇර වාසය කළ නොහෙමි. මේ මාගේ තුන්සිවුරු පාත්‍රා ගුරුන් වහන්සේට දෙන්ට යෙමි, මම අසවල් තෙනදී සිවුරු අරිමි, එතනට පිළිසඟලක් (ඇඳුම් දෙකක්) එව”යි කියා ගුරුන් වහන්සේට පාත්‍රා සිවුරු දෙන්ටයයි විහාරයට ගොසින් ගුරුන් වහන්සේට තමන්වහනසේගේ පාසිවුරු ඇරගන්නට කීසේක.

ගුරුන්වහන්සේ "ඇයි කුමක් නිසාදැ?"යි විචාළසේක. ඒ භික්ෂූන් වහන්සේ කියනසේක් "මම මාගේ පුරාණ දූතිකාව ඇර වාසය කළ නොහෙමි. මට ශාසනයෙන් ප්‍රයෝජන නැත, සිවුරු අරිමි" කීහ. එවිට ගුරුන් වහන්සේ උන් වහන්සේ නොකැමැති කරවාම සර්වඥයන් වහන්සේට දැක්වූසේක. සර්වඥයන් වහන්සේ "ඇයි මේ මහණහු නොකැමැති කරවා අපට පෑයේ ඇයිදැ?"යි විචාළ කල්හි "ස්වාමීනි, මේ මහණ තමාගේ පුරාණ දූතිකා කෙරේ අභිලාෂයෙන් සිවුරු අරිමි යි කීහ"යි වදාළසේක.

සර්වඥයන් වහන්සේ "දැන්මතු නොවෙයි පෙරත් මේ මහණ මේ ස්ත්‍රිය නිසා ධ්‍යානයෙන් (දැහැණෙන්) පිරිහී ප්‍රාණ විනාශයට (පණ නසා ගැනීමට) පැමිණ තෙනැත්තවුට ප්‍රාණ රැක දුනුමෝ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන් වහන්සේගේ පුරෝහිත බ්‍රාහ්මණයාට පුත්ව උපන්නාහ. උන් උපන් දවස් රාත්‍රියෙහි නුවර මුළුල්ලෙහි ආයුධ දිලිහී ගියේය. එසේ හෙයින් උන්ට නම් තබන්නාහු ජෝතිපාල කුමාරයෝයයි නම් තුබූහ.

ඒ කුමාරයන් වැඩිවිය පැමිණ තක්සලා නුවරට ගොස් ශිල්ප ඉගෙණ රජ්ජුරුවන්ට ශිල්ප දක්වා පුරෝහිත ධුරයට

පැමිණ "මට ගිහිගෙයින් කාරිය නැත, තපසට යෙමි" උතුරුවාසල් දෙරකඩට නික්ම ගිවුළුවනයට ගොස් ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ජෝතිපාල තාපසෝය යි මේ නමින් ප්‍රසිද්ධ පංචාභිඥා අෂ්ටසමාපත්ති උපදවා වාසය කරන්නාහු බොහෝ දහස්ගණන් තාපසවරුන්ට ගණශාස්තෘව (නායක ගුරුවරයා) පිරිවරා ඉන්නාහ.

උන්ගේ අතවැසි (ගෝලයන්) ශ්‍රේෂ්ඨවූ තාපසවරුන් සත්දෙනෙක් ඇත්තාහ. ඉන් සාලිස්සර නම් තාපසයෝ තමන් වසන්නාවූ ගිවුළුවනයෙන් නික්ම සුරඨත නම් ජනපදයෙහි සාදේද්කා නම් ගඞ්ගාව සමීපයෙහි සියදහස්ගණන් තාපසයන් පිරිවරා වාසය කරන්නාහ. දෙවැනි මෙණ්ඩිස්සර නම් තාපසොය් පජරක්ඛද රජ්ජුරුවන්ගේ විජිතයෙහි ලම්බචූලක නම් නියම්ගම් නිසා සියදහස්ගණන් තාපසවරුන් පිරිවරා වාසය කරන්නාහ. ඉන් පර්‍වත නම් තාපසයෝ වනාන්තරයක ජනපදයත් නිසා සියදහස්ගණන් තාපසවරුන් පිරිවරා වසය කරන්නාහ.

කාලදේවල තපස්වීන් වහන්සේ අවන්ති නම් රට දක්ෂිණාපථයෙහි (දකුණු මාර්ගයෙහි) සියදහස්ගණන් තාපසවරුන් පිරිවරා වාසය කරන්නාහ. කිසවච්ඡ නම් තාපසොය් දණ්ඩකී නම් රජ්ජුරුවන්ගේ කුම්භවතී නම් නුවර නිසා උයනෙහි එකාලව (තනියම) වාසය කරන්නාහ.

අනුශිෂ්‍ය නම් තාසයෝ බෝධිසත්‍වයන්ට උපස්ථායකව සමීපයෙහි වාසය කරන්නාහ. කාලදේවල තාපසයන්ගේ මල්වූ

නාරද නම් තපස්වී මධ්‍යදේශයෙහි ආරඤ්ජරගිරි නම් පර්වතජ්වාලාන්තරයේ (පර්වත වලල්ල අතරෙහි) එක් ගල්ගුහාවෙක උදකළාව වාසය කරන්නාහ.

ආරජගිරි නම් පර්වතය සමීපයෙහි බොහෝ මනුෂ්‍යයන් ගැවසී ගත්තාවූ එක් නියම්ගමෙක් ඇත. ඒ පර්වතයටත් ගමටත් අතුරෙහි එක් ගඟාවෙක් ඇත.ඒ ගඟාවට ජලස්නානය පිණිස බොහෝ මනුෂ්‍යයෝ බස්නාහ. උතුම් රූ ඇති ඝටචෙටිකාවොත් (කළ ගෙඩි ගත් තරුණියන්) පුරුෂයන් පොළඹවමින් ඒ ගංතෙර ඉඳිනාහ. එකල නාරද නම් තාපසයෝ ඉන් එක් කුම්භදාසියක් (කළ ඇතැති දස්සක්) දැක ඈ කෙරේ පිළිබඳ වූ සිත් ඇතිව ධ්‍යානයෙන් පිරිහී නිරාහාරව වීරිය කෙරෙමින් ක්ලේශවසඟයට (කෙලෙස් හරිතව) පැමිණ සතියක් වැදහොත්තාහ. එකල ඒ තාපසයන්ගේ කාලදේවල නම් තාපසයෝ දිවසින් පරීක්‍ෂාකොට ඒ කාරණය දැන ආකාශයෙන් අවුත් නාරද නම් තාපසයන් උන් ගල්ලෙනට වන්නාහ. නාරද නම් තාපසොය් බෑනන් දැක "පින්වතානන් වහන්ස, කුමක් පිණිස ආසේක්ද?"යි කීහ. එබසට කාලදේවල තාපසයෝ කියන්නාහු "පින්වත්වූ තොප අනාථ නියාව දැක තොප රක්නා පිණිස ආමි" කීහ. එබසට නාරද තාපස තෙම "පින්වත්තෙම සිස්වූ අවස්තුකවූ බොරුව (හේතුවක් නැති බොරුවක් කීම) කියන්නේය"යි තුමූ බොරුවෙන් තාපසයන් තැතිගැන්හූහ. එසේද වුවත් කාලදේවල තාපසයෝ "මොහු ඇරපීම නොවටනේය"යි සාලිස්සර නම් තාපසයන්ද මෙණ්ඩිස්සර නම්

තාපසයන්ද පර්වතතිස්ස නම් තාපසයන්ද යන තාපසවරුන් තුන්දෙනා ගෙන්වූහ. නාරද තාපස තෙම ඔවුන් තුන්දෙනා දැකත් මුසාවාදයෙන් තැතිගැන්වූයේය.

තවද කාලදේවල තාපසයෝ ආකාශයෙන් ගොස් සරභංග ශාස්තෘන් වහන්සේ කැඳවාගෙණ ආහ. උන් වහන්සේ නාරද නම් තාපසයන් දැක උන් ඉන්ද්‍රිය වසගයට (ඉඳුරන් පිනවීමට) පැමිණියා දැන "ඉන්ද්‍රිය වසඟයට පැමිණියෙහිදැ?"යි විචාරා ඔහු විසින් එබස් අසමින් හුනස්නෙන් නැගී වැඳ "ස්වාමීනි" දැන්වූ කල්හි "එම්බල නාරදය, ඉන්ද්‍රිය වසඟයට ගියාවූ සත්වයෝ ඒ ආත්ම භාවයෙහිම වියලෙමින් මතුමත්තෙහි මහත්වූ දුක් අනුභව කොට දෙවැනි ආත්මභාවයෙහි නරකයෙහි උපදනේ වේදැ"යි වදරා ධර්මදේශනා කරන්නාහු "එම්බල නාරදය, මේ ලෝකයෙහි යම් පුරුෂයෙක් තෙම රූපාදියෙහි සුහවූ සෝකයෙන් දුකට පැමිණෙන්නාහ"යි ධර්මදේශනා කළසේක. එබස් අසා නාරද තාපසයෝ "ආචාරීන් වහන්ස, කාමයෙහි යෙදීම නම් සැපවන්නේය, එබඳුවූ සැපයක් කුමක් පිණිස දුකැ යි කියනසේක්දැ?"යි විචාළාහ.

සරභඟ ශාස්තෘන් වහන්සේ "එසේවීනම් නාරදයෙනි අසව"යි කියන්නාහු "එම්බා නාරදයෙනි, මේ ලෝකයෙහි සැපයට අනතුරුවූ දුකකුත් ඇත. දුකට අනතුරු වූ සැපයකුත් ඇත. ඒ කවරේදැ?යි යතහොත් යම් සත්වයයෙක් ස්වල්පවූ කාමසැපය පිණිස නරකයෙහි උපදනේය. සමහර සත්වයෙක් ශිල්රක්‍ෂා කරණ අවස්ථාවෙහි විදර්ශනා කර්මස්ථාන (විදසුන්

කමටහන්) වැඩීමෙන් මිරිකී දුක්විඳ සිල් රක්‍ෂාකොට ඒ ශීල බලයෙන් යට කියන ලද බොහෝ දිව්‍ය මනුෂ්‍ය සම්පත් හා නිර්‍වාන සැපයට පැමිණෙන්නාහ. එසේ හෙයින් තොපි දුක්ඛමූලිකවූ (දුකට මුල් වූ) කාමසැපය හැර දිව්‍යලෝක සම්පත් හා නිර්‍වාණ සැපයට පැමිණෙන්නට නිසිවූ සිල් රක්‍ෂාකොට ධ්‍යාන සැප ප්‍රාර්ථනා කරව"යි කීහ.

එවිට නාරද තාපසෝ කියන්නාහු "ආචාරීන් වහන්ස, මේ දුක්ඛය ඉතා සහනයකොටගත (විඳ දරා ගැනීමට) නොහැක්කේය. එසේ හෙයින් මම සහනය කළ නොහෙමි" කීහ. ඉක්බිති බෝධිසත්‍වයෝ කියන්නාහු "නාරදෙයෙනි, දුකක් නම් උපන් කල ඉවසිය යුතුය"යි ධර්‍මදේශනා කරන්නාහු මෙසේ කියත්, "එම්බා නාරදයෙනි, යම් සත්‍වයෙක් තෙම කායිකවූද චෛතසිකවූද (සිතුවිලි පිළිබඳ) දුකැයි කියන ලද කටයුත්තක් උපන් කල්හි අප්‍රමාදවම ඒ කටයුත්ත හරණාවූ උපාය කරන්නේය. සහනසීලිවූ ඒ කටයුත්තට අනුව නොපැවත ඒ ඒ උපායෙන් ඒ කටයුත්ත මැඩ විනාශයට පමුණුවා නුවණැත්තාවූ පුරුෂයා ආකෘත්‍යයාගේ (නොකළ යුත්තෙන් ඈත්වීම) අන්තිමයයි කියන ලද ධ්‍යාන සැපයට පැමිණෙන්නේය. එසේ පැමිණෙතත් නොමිරිකී පැමිණෙන්නේය"යි කීහ. නැවත නාරද තාපසයෝ "ආචාරීන් වහන්ස, කාමසැපය නම් උතුම් වූ සැපයෙක එසේ වූ සැපය මම අල නොහෙමි" කීහ.

නැවත බෝධිසත්වයෝ කියන්නාහු "එම්බා නාරද තාපසයෙනි, වස්තුකාමයෙහි ප්‍රාර්ථනා පිණිස ධර්මය හැරපීම සුදුසු නොවන්නේය. යම් අනර්ථයක් උපන් කල්හි ඒ අනර්ථය වලකනු කැමැත්තේ අවැඩට සිටියාවූ ධර්මය ඇරපීම සුදුසු වන්නේය. තවද අසවල් අනර්ථයෙක් මට උපනේය යි මෙසේ අනර්ථය පිණිසත් සුදුසු නොවන්නේය යි ව්‍යායාම් කිරීමෙන් මුදුන් පැමිණෙන ලද ධ්‍යාන සැපය ඇරපීම නසාපීම සුදුසු නොවන්නේය" යනාදීන් මෙසේ සරභඟ ශාස්තෲන් විසින් ගාථා සතරකින් ධර්මදේශනා කළ කල්හි කාලදේවල තාපසයෝත් තමන්ගේ මලණුවන්ට අවවාද කරන්නාහු "එම්බා නාරදයෙනි, යම් ගෘහපතියෙක් කෘෂිවනික් (ගොවිතැන් හා වෙළදාම) ආදීවූ වස්තු උපදවන පිණිස යම් දුකක් ගන්නේ වීනම් ඔහු විසින් ගන්නාවූ දුක දුකෙක් නොවන්නේය. යහපත්ම වන්නේය. එසේම උපයාගත්තාවූ වස්තුව ශ්‍රමණ බ්‍රාහ්මණ පුත්‍රකලත්‍ර මිත්‍රාදීන්ට සංවිභාගකොට පරිත්‍යාග කිරීම දුක් නොවන්නේය. යහපත්ම වන්නේය. එසේවූ වස්තු ලැබීමෙහි උඩඟු නොවීමත් යහපත් වන්නේය. එසේවූ අර්ථයාගේ විපත්තියෙහි (ධන හානියේදී) සෝක නොකිරීමත් යහපත් වන්නේය. එසේ හෙයින් නාරද තාපසයෙනි, තොපි මාගේ ධ්‍යාන පිරිහුණේය යි සෝක නොකරව. ඉදින් තොප ඉන්ද්‍රිය වසඟයට නොගියා නම් නටුවාවූ තොපගේ ධ්‍යානය නැවතත් ප්‍රකෘතිවන්නේය"යි කීහ.

මෙසේ කාලදේවල තාපසයෝ නාරද තාපසයන්ට අවවාද කී නියාව තථාගතවූ සර්වඥයන් වහන්සේ බුදුව වැඩ ඉඳ

වදාරණසේක් “එම්බා මහණෙනි, ඒ කාලදේවල තාපසතෙම මෙසේ මේ මහණ අවවාදයක් කීද, යම් සත්‍වයෙක් තෙම ඒ අවවාදය පිළිනොගෙණ ඉන්ද්‍රියයන්ගේ වසඟයට පැමිණියේ වීනම් ඒ සත්‍වයාට වඩනාවූ ලාමක සත්‍වයෙක් නැත්තේ වේදැ”යි වදාළසේක.

ඉක්බිති සාරභඟ ශාස්තෲන් වහන්සේ වදාරණ සේක් “මෙසේ එව නාරද තාපසයෙනි, මා කියන්නක් අසව, යම් සත්‍වයෙක් තෙම පළමුව කළමනා කටයුත්තක් නොකෙරේද? එසේවූ සත්‍වතෙම වල්වන්නාවූ මානවකයක්හු (කැලේ අතරමන්වූ මිනිසෙකු) මෙන් ශෝක ගන්නේය, අඬන්නේය, විලපින්නේය”යි කියා, මින් තවද පෙරවූවක් කියන්නාහු “එම්බා, යටගිය දවස කසී නම් නියම් ගමෙක තරුණ වූ එක් බ්‍රාහ්මණ කුමාරයෙක් විශිෂ්ටවූ රූ ඇත්තේය. ඇත්බල ඇත්තේය. එක් දවසක් ඒ පුරුෂතෙම සිතන්නේ “කිමෙක්ද? මා විසින් සී සෑම් ආදියකොට දෙමව්පියන් විසින් පෙළෙන ලද්දෙමි, එසේ හෙයින් මට දෙමව්පියන්ගෙනුත් ප්‍රයෝජන කිම්ද? පුත්‍රදාරාවන්ගෙනුත් (අඹුදරුවන්ගෙන්) මට ප්‍රයෝජන කිම්ද? දන් පින් කිරීමෙනුත් මට ප්‍රයෝජන කිම්ද? එසේ හෙයින් කිසිකෙනෙකුන් පොෂ්‍යයක් නොකොට පිනකුත් නොකොට වලට (වනයට) වැද මුවන් මරා කාගෙණ තමා විවරක්ම පෝෂ්‍ය කෙරෙමි”යි සිතා පඤ්චායුධයෙන් සන්නද්ධව ගෙණ හිමාලය වනයට වැද නොයෙක් මෘගජාතීන් (ගොණ, මුව ආදී සතුන්) මරා කාගෙණ හිමාලය මධ්‍යයෙහි වැනදඹු නම් ගංතෙර ගලින් වටකරන ලද පර්‍වත ජාලාවකට පැමිණ

මුවන් මරා අගුරෙහි පැළවූ (අගුරු මත පිළිස්සූ) මස් කමින් වාසය කරමින් එක් දවසක් සිතන්නේ ඇමද ශක්ති සම්පන්නයෙම් නොවෙමි. දුර්වල කාලයෙහි ඇවිදගත නොහෙමි. එසේ හෙයින් දැන්ම නොයෙක් මෘගජාතීන් මරා ඇරගෙණ පර්වත ජාලයෙහි ඇතුළෙහිලා දොරක් ඉදිකොට අගුළු ලා මුවන් මරවාගෙණ වනයෙහි නොඇවිදීම අභිප්‍රාය වූ පරිද්දෙන් මෘගජාතීන් මරාකම් සිතා එපරිද්දෙන්ම වාසය කරමින් කල්යාමකින් ඔහු විසින් කරන ලද අකුශල කර්ම්මය මුදුන් පැමිණෙන්නේය. ඉහජාතියෙහිම දෘෂ්ටධර්ම්මවේද්‍යයෙහි (මෙලොව වශයෙන් ලැබෙන විපාක) පැමිණියේය.

තමාගේ අතපයත් නොලද්දේය, ඇතින් මෑත පෙරළීගතත් නොහෙන්නේය, කිසි කෑමක් පීමක් වේවායි නොදන්නේය, ශරීරය ඉතා මළානික වූ දුර්වල වූයේය. නොමියම මනුෂ්‍ය ප්‍රේත වූයේය. නියගෙහි පොළොව පැළෙන්නාක් මෙන් ඔහුගේ ශරීරය ඒ ඒ තැනින් පැලී ඉරා වැටුනේය. මෙසේ කල්යාමකින් සිවි නම් රට සිවි නම් රජ්ජුරු කෙනෙකුන් "වලට (වනයට) වැද අඟුරු පැලහූ මස් කම්" කියා අමාත්‍යයන්ට රාජ්‍යය පාවාදී පඤ්චායුධ සන්නද්ධව වලට වැද මුවන් මරා මස් පලහා කමින් පර්වත ජාලාන්තරයට පැමිණ ඒ පුරුෂයා දැක භයින් ත්‍රස්තව ධෛර්ය්‍ය උපදවාගෙන "එම්බල පුරුෂය, තෝ කවරෙක්දැ?"යි විචාළාහ. ඒ කියන්නේ "ස්වාමීනි, මම මනුෂ්‍යප්‍රෙතයෙකිමි (මිනිස් ප්‍රේතයෙකි), මා විසින් කරණ ලද අකුශල කර්ම්මයාගේ විපාකය ඉහාත්ම භාවයෙහිම (මේ ආත්මයේදීම) අනුභව කෙරෙමි. තොපි වනාහි

කවුරුදැ?"යි විචාළේය. රජ්ජුරුවෝ "මම සිවි නම් රජ්ජුරුවෝය"යි කීහ. නැවත ඒ පුරුෂයා "එසේකල කුමක් පිණිස මේ ස්ථානයට අවිදැ"යි විචාළෝය. "මුවන් මස් කණ පිණිස ආමි"යි කීහ. නැවත ඒ පුරුෂ තෙම කියන්නේ "රජ්ජුරුවෙනි, මමත් ඒ කරණ කොටගෙණ මේ ස්ථානයට අවුත් මනුෂ්‍ය ප්‍රේත වීමි" යනාදීන් තමාගේ ආද්‍යන්ත රජ්ජුරුවන්ට විස්තර වශයෙන් කියන්නේ "රජ්ජුරුවන් වහන්ස, මම මේ ලොකයෙහි ඓශ්වර්‍ය්‍යී දෙන්නාවූ කටයුතු කොට, ශිල්පශාස්ත්‍ර නොයිගෙණ, උපායෙන් වස්තු නූපදවා, ආවාහ විවාහ නොකොට, ශිල්රක්‍ෂා නොකොට, මාගේ ක්‍රියා වලක්වන්ට සුදුසු වූ කල්‍යාණ මිත්‍රයන් භජනය නොකොට, මෙසේ යස දායකවූ (කීර්තිය දෙන්නාවූ) ලෝකධර්‍මයට නින්‍දාකොට හැර මේ වනයට වැද මට සැප කැමතිව අනුන්ට දුක්දීමෙන් ඉහාත්ම භාවයෙහිම මනුෂ්‍ය ප්‍රේත වීමි, තොපි වනාහි අකුසල්නොකොට තොපගේ සියනුවරට ගොස් දානාදී කුසල් කරව"යි කීයේය.

රජ්ජුරුවෝ ඔහු කී බස් "යහපතැ"යි ගිවිස සිය නුවරට ගොස් දානාදිවූ කුසල් කොට ස්වර්ගොත්පත්තියට (දෙව්ලෝ උපදීමට) ගියහ"යි යනාදීන් මේ කාරණය ගෙණහැර දක්වා තාපසයන් සන්හිඳුවූහ. තාපසයෝ සාරභඞ්ග ශාස්තෘන් වහන්සේගේ කථාවෙන් සංවේගයට පැමිණ වැද ක්‍ෂමා කරවාගෙණ කිසිණුපිරියම් (කසින භාවනා වඩා) කොට නටුවාවූ ධ්‍යානය උපදවාගත්හ.

සරභඞ්ග ශාස්තෘෘන් වහන්සේ ඒ තාපයන් එතන රැඳිය නොදී කැඳවාගෙණ තමන් වහන්සේගේ ආශ්‍රමයට වැඩිසේක.

මෙසේ බුදු රජානන් වහන්සේ මේ ධර්‍මි දේශනාව ගෙණහැර දක්වා වදරා මේ 'ඉන්ද්‍රිය ජාතකය' පූර්‍වාපර සන්ධි ගලපා නිමවා වදාළසේක. චතුස්සත්‍යයාගේ කෙළවර ශාසනයෙහි උකටලී (කළකිරුණු) වූ භික්‍ෂූන් වහන්සේ සෝවාන් ඵලයෙහි පිහිටිසේක.

"එසමයෙහි නාරද තාපසයෝ නම් දැන් මේ ශාසනයෙහි උකටලී මහණය. එසමයෙහි කාලිස්සර තාපසයෝ නම් දැන් මේ ශාරීපුත්ත ස්ථවිරයෝය. එසමයෙහි මෙඬිස්සර තාපසයෝ නම් දැන් මේ කාශ්‍යප ස්ථවිරයෝය. එසමයෙහි පර්‍වත තාපසයෝ නම් දැන් මේ අනුරුද්ධ ස්ථවිරයෝය. එසමයෙහි කාලදේවල තාපසයෝ නම් දැන් මේ කාත්‍යායන ස්ථවිරයෝය. එසමයෙහි අනුශිෂ්‍ය තාපසෝ නම් දැන් මේ ආනන්ද ස්ථවිරයෝය. එසමයෙහි කිසවච්ඡ තාපසයෝ නම් දැන් මේ මෞද්ගල්‍යයාන ස්ථවිරයෝය. එසමයෙහි සරභඞ්ග තාපසයෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැ"යි වදාළසේකි.

## 413. ආදිත්ත ජාතකය

තවද ලෝකත්‍රයට ප්‍රදීපයක් බඳුවූ (තුන්ලොවටම පහනක් වැනි) සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝසල රජ්ජුරුවන්ගේ අසදෘස දනයක් (සාමාන්‍ය අයට දිය නොහැකි) අරභයා මේ ජාතකය දක්වන ලද.

මෙහි විස්තර වශයෙන් මහාගෝවින්‍ද ජාතකයෙහි පෙණෙන්නේය. මෙහි වනාහී "කෝසල රජ්ජුරුවෝ ක්‍ෂත්‍රිය දැනම (දිය යුතු අය දැනගෙන දන්දීම) දානය දුන්නේය. දන් දුන් නියාව ඉතා යහපතැ"යි දම්සභාවේ රැස්වූ භික්‍ෂූන් වහන්සේ කිය කියා වැඩ උන් තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදරා "මහණෙනි, මා එන්නාට පූර්‍ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදරා එපවත් අසා "දැන් මතු නොවෙයි මහණෙනි, පෙර උත්තමයෝත් ක්‍ෂත්‍රිය දැනම දන්දුන්නෝ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ ස්ක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර සිවිරට විරන්‍ද නම් නුවර භරත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි රජ්ජුරුවන්ගේ සමුද්‍රවිජයා නම් අග්‍රමෙහෙසිකා කෙනෙක් ඇත්තාහ. ඒ රජ්ජුරුවෝත් ඒ බිසවුත් බොහෝ දුගී මගී යාචකයින්ට දන් දෙන්නාහ. දන්දී එක් දවසක් බිසවුත් රජ්ජුරුවෝත් එකතැන ඉඳ කියන්නාහු "මෙතෙක් දෙන්නාවූ දානය නිසිතෙනකට දෙන්ට නොලබම්හ. අප සිතට සමාධියක් (සිතේ එකග්‍රත්වයක්) නොවන්නේය"යි කීහ.

බිසව් කියන්නාහු "මම දන් ඉදිකරවමි. නුඹ වහන්සේ පසේබුදුන් වහන්සේ වඩනා නියායෙන් ආරාධනා කළ මැනැවැ"යි කීහ. රජ්ජුරුවෝ "කෙසේ ආරාධනා කෙරෙම්දැ?"යි කීහ. "මල් සතරමිටක් ඇරගෙණ නැගෙණහිරට

දමා ආරාධනා කළ මැනැව”යි කීහ. ඒ දිග පසේබුදුන් වහන්සේ නැතිහෙයින් නොවැඩි සේක. පසුව දවස් දකුණු දිගට මල්දමා ආරාධනා කළහ. ඒ මල් නන්‍දමූල දිගත් (නන්දමූල පර්වතය ඇති පැත්තට) පසේබුදුන් වහන්සේ නැති හෙයින් නොවැඩිසේක. තුන් වෙනි දවසුත් බස්නාහිට මල් දමා ආරාධනා කළහ. ඒ දිග පසේබුදුන් වහන්ස් නැති හෙයින් නොවැඩිසේක. සතරවෙනි දවස උතුරු දිගට මල් සතරමිටක් දමා ආරාධනා කළාහ. ඒ මල් නන්‍දමූලක පබ්භාරයට ගොස් පන්සියයක් පසේ බුදුන් වහන්සේ වඩනා තැනට ගොස් වැගිරින. පසේ බුදුන් වහන්සේ මේ කාරණය දැක දිවසින් බලා “භරත රජ්ජුරුවෝ අපට ආරාධනා කරන්නාහ”යි කියා පසේ බුදුන් සත්දෙනෙකුන් වහන්සේ තොරා භරත රජ්ජුරුවන්ගේ ආරාධනාවට ගොස් සිගව (පිඩු සිගා වඩින්න) යි යවුසේක.

උන් වහන්සේලා සත්දෙනා වහන්සේත් ගැටවටුගන්වා (සිවුරු පොරවන ක්‍රමයක්. දෙවුර වසන) ආකාශයෙන් අවුත් රජ්ජුරුවන්ගේ රජගෙයි සමීපයෙහි සිඟා වැඩ සිටි සේක. රජ්ජුරුවෝත් පසේ බුදුන් වහන්සේලා දැක ප්‍රීතියෙන් පිනා දන්දී පසුව දවසටත් ආරාධනා කොට ශ්‍රමණ පරිෂ්කාර (පැවිදි පිරිකර) ඉදිරියෙහි තුබූහ.

උන් වහන්සේලාත් ශ්‍රමණ පරිෂ්කාර පිළිගෙන වඩනා පසේබුදුවරයන් වහන්සේලාගෙන් පළමු වඩනා පසේබුදුන් වහන්සේ රජ්ජුරුවන් වහන්සේට අනුමෙවෙනි බණ වදාරණසේක්

ගාථා දෙකක් කීසේක. “මහරජ, යම් ගෙයක් ගිනි වැදගත්කල ගෙයි තුබූ වස්තු ගින්නේ දන හෙයින් වහ වහා ගෙන් පිටත ලද්ද? එමෙන් ජරාමරණ තමාට පැමිණෙන්නාට පළමුව තමා සෙව් වස්තුව (සපයා ගත් වස්තුව) දනවිෂයෙහි පරිත්‍යාගකොට (දන්දී) මහරජ දිව්‍යලෝක සම්පත්තිය විඳුව”යි රජ්ජුරුවන්ට අවවාද කොට තමන්වහන්සේට දුන් පිරිකරත් ඇරගෙණ කැණීමඩල පලාගෙණ ආකාශයට පැණනැගී නන්දමූලක පබ්බාරයට වැඩිසේක.

දෙවැනිව වඩනා පසේ බුදුන් වහනසේ රජ්ජුරුවන්ට අනුමෙවැනි බණ වදරණසේක්.”මහරජ, දන්දෙන්ට ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඇතිව වස්තුව දන්නොදී වේතරණී ආදීවූ මහනරකවල වැටී පැසෙන්නාහ. මහරජ වස්තුව ඇතිව දන්දී මතු ස්වර්ගමොක්ෂ සම්පත් විඳුව”යි රජ්ජුරුවන්ට අවවාද කියා ආකාශයට පැණනැගී පස්වනක් වලා (පාට පහකින් යුත් වලාකුළු) මඩිමින් තමන් වහන්ස්ට දුන් පිරිකර ගෙණ නන්දමූලක පබ්භාරයට වැඩිසේක.

තුන්වැනිව වඩනා පසේබුදුන් වහන්සේ රජ්ජුරුවන්ට අනුමෙවෙණී බණ වදරණ සේක් “මහරජ, දන්දීමද යුද්ධකිරීමද සමාන වන්නේය. ඒ කවර හෙයින්ද යත්? සෞරවිය්‍යී (සූරකම) ඇති පුරුෂයෝ බොහෝ සතුරන් ජයගන්නේය. ස්වල්ප වූ පුරුෂයෝ බොහෝ මසුරු සිත් ජයගන්නේය. මහරජ එසේ හෙයින්ම දනමානාදී බොහෝ පින්කම්කොට ස්වර්ගමොක්ෂ සැප විඳුව”යි රජ්ජුරුවන්ට අවවාද

කොට තමන්වහන්සේට පිළිගැන්වූ පිරිකරත් ඇරගෙණ ආකාශයට පැණනැගී නන්‍දමූල පබ්භාරයට වැඩිසේක.

සතරවෙනිව වඩනා පසේබුදුන් වහන්සේ රජ්ජුරුවන්ට අනුමෙවෙනි බණ වදාරණ සේක් “මහරජ, යහපත් ගුණ ඇති ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට දුන්නාවූ දානය පරලොවෙහි යහපත් විපාක දෙන්නේය. ඒ එසේමය. යහපත්වූ භූමියෙහි වපුලාවූ බිජුවට යහපත් සස්‍යඵලය (බිත්තර වී හොඳ නම් අස්වැන්න හොඳබව) දෙන්නේද? එමෙන් යහපත් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට දුන්නාවූ දානයත් මහවිපාක දෙන්නේය”යි රජ්ජුරුවන්ට අවවාද කියා තමන් වහන්සේට දුන් පිරිකරගෙණ ආකාශයට පැණනැගී නන්දමූලක පබ්භාරයට වැඩිසේක.

පස් වැනිව වඩනා පසේබුදුන් වහන්සේ රජ්ජුරුවන්ට අනුමෙවෙනි බණ වදාරණ සේක් “මහරජ, උත්තමයන් සිටිනා තරම් පදමටත් තමන්ගේ ජාති ගොත්‍රයටත් නපුරැ යි කියාත් පරලොව භයත් මෙලොව අපකීර්තිය නිසා පවු නොකරන්නාහ. සමහර කෙනෙක් එකෙකු මරාපුව යි එකෙක් අප නසාපියාද? පව් නම් කුමක්ද? පින් නම් කුමක්ද? උදාර සිතින් පවුකරන්නාහ. මහරජ එලෙස පවුනොකොට පින්කම්කොට සැප විඳුව”යි රජ්ජුරුවන්ට අවවාද කොට තමන් වහන්සේ අටපිරිකරගෙණ නන්‍දමූලක පබ්භාරයට වැඩිසේක.

සවෙනිව වඩනා පසේබුදුන් වහන්සේ රජ්ජුරුවන්ට අනුමෙවෙනි බණ වදාරණ සේක් “මහරජ, දන්දීමට වඩා

සිල්රැකීම උත්තමය, සිල්රැකීමට වඩා සමථ විදර්ශනා (කෙලෙස් යටපත් කිරීම) වඩා කෙලෙසුන් නසා පසේබුදුවීම උත්තමය"යි අවවාද කියා අටපිරිකරගෙණ ආකාශයට නැගී නන්දමූලක පබ්භාරයට වැඩිසේක.

සත්වැනිව වැඩිපසේ බුදුන් වහන්සේ රජ්ජුරුවන්ට අනුමෙවෙනි බණ වදාරණ සේක් "මහරජ, යම් දෙයක් ලබමි යි කරන්නාවූ හීනවූ බ්‍රහ්මචය්‍ය්‍යායෙන් රජව උපදනාහ. මධ්‍යමව කරන්නාවූ බ්‍රහ්මචය්‍ය්‍යාවෙන් දිව්‍යලෝක සැපත් ලබන්නාහ. උත්තම වූ බ්‍රහ්මචය්‍ය්‍යායෙන් නිර්වාණ සම්පත්තිය ලබන්නාහ. මහරජ ඒ උත්තම බ්‍රහ්මචය්‍ය්‍යාව රැක අමෘතමහා නිර්වාණ සම්පතියට උත්සාය කරව"යි අවවාද කියා ටපිරිකර ගෙණ ආකාශයට නැගී නන්‍දමූලක පබ්භාරයට වැඩිසේක.

රජ්ජුරුවෝත් ආකාශයෙන් යන්නාවූ පසේබුදුන් වහන්සේ බලාසිට මහත්වූ ප්‍රීතින් පිණා පසේබුදුන් වහන්සේ වදාළ අවවාද සිත තබා දසරාජ ධර්මයෙන් රාජ්‍යය කොට පරලොව ගියාහයි වදාරා මේ 'ආදිත්ත ජාතකය' නිමවා වදාළ සේක.

"එසමයෙහි ඒ සමුද්‍රවිජයා බිසව් නම් රාහුලමාතාවූ යසෝධරා ස්ථවිරාවෝය. භරත රජ්ජුරුවෝ නම් බුදුවූ මම්මය"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 414. දිවි ජාතකය

තවද පරහිත නිරතවූ (අනුන්ගේ යහපතෙහි ඇලුනු) සර්‍වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එළුදෙනක අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

වටකොට ගල්වැටක්සේ තිබෙන්නාවූ එක දෙරකඩක් ඇති ගිරිගර්භ (පර්‍වත ගුහාව) නම් විහාරයෙහි මුගලන් සාමි වාසය කරණසේක. එළු ගොපොල්ලොත් (එළුවන් බලාගන්නා අය) "මෙතන එළුවන්ට උපද්‍රව නැතැ"යි ඒ ගල් අස්සේ එළුවන් ලාලා පලායන්නාහ. උදැසනක් පාසා එළුවන් තණට අරණාහ. මෙසේ එක් දවසක් එළුවන් ගාලෙන් ඇරපුකල්හි එළුවන් පලායන්නාහ. එක් එළුදෙනක් පසුවෙලා යන තැනැත්තිය දිවියෙක් දැක "අල්වාගෙණ කමි" සිතා ගල්පසුර (ගල්තලාව) දෙරකඩ රැක ගෙණ එලිගෙණ (බැහැර නොවී බලාගෙන) උන්නේය.

එළුදෙනත් දුරදී දිවියා දැක "මේ දිවියා රැක ඉඳිනේ මා අල්වාගෙණ කන්ටය"යි සිතා "ආපස්සේ යන්නාමුත් මා ලුහුබන්ද අල්වාගෙණ යන්නේය. මූ උන් දෙරකඩින්ම යෙමි" කිළිපොලා අන්දෙක කෙළින් ඉඳුවා දිවියාගේ ඇස්වර බලා මහත්වූ වේගයෙන් පැනගෙණ දිවගොස් තමාගේ බල එළුවන් හා සමග එක්ව ගියාය. මේ දුටු මුගලන් සාමින් සර්‍වඥයන් වහන්සේට මෙපවත් දැන්වූ සේක. සර්‍වඥයන් වහන්සේ "එම්බා

මුගලන, දැන් ගැලවී පළාගියා පමණක් විනා පෙර මේ දිවියා එළුදෙන අඬව අඬවා බෙල්ල කඩාකා මැරූයේ වේදැ''යි වදරා "ඒ කෙසේදැ?''යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස මගධ රට බොධිසත්‍වයෝ එක්තරා දුප්පත් කුලයෙක ඉපද තාපසව මුගලන් සාමින් වාසය කරන්නාවූ ගිරිගර්භ නම් පර්‍වතවලල්ලසේම ගල්වැටක් ඇතුලේ වාසය කරන්නාහ. එසමයෙහි එළුගොපොල්ලෝ ඒ ගල්වලල්ල ඇතුලෙන් තණට පිටත් කරන්නාහ. එක් දවසක් එළුවන් ගාලෙන් පලාගියහ. එළුදෙනක පසුව පියා යන්නිය දැක එක් දිවියෙක් අල්වාගෙණ කමි සිතා ඇවිත් දෙරකඩ රැකගත එළුදෙන් "මුන්ට උපායක් කියා ගැලවෙමි'' සිතා කියන්නී "කිමෙක්ද? මයිලනුවන් වහන්ස, නුඹ වහන්සේට පාසු අපාසු නැද්ද? නුඹ වහන්සේගේ සුවදුක් විචාරාගන්නා ලෙස මාගේ මෑණියන් වහන්සේ මා එවුසේකැ''යි කීහ. එවිට දිවි කියන්ගේ "වල්පතද මිරිකාගෙණ (වලිගය හකුලාගෙන) ඇවිත් මා ඉදිරියේ සිට නෑකම් බණවූදැ?''යි කීය. එවිට එළුදෙන් කියන්නී "නුඹ වහන්සේ නැගෙණහිරට මූනලා උන් හෙයින් නුඹ වහන්සේ ඉදිරියට ආමි මා වල්පත මිරිකුයේ කෙසේ දැ?''යි කිව සප්තමහා සාගරයද, සප්තකුල පර්‍වතයෝද (සත් කුල පව්), සක්වළ ගලද යන මේ සියල්ල වටකොට මාගේ වල්පතමය. තොප මා වල්පත නොමිරිකා ආයේ කෙසේදැ?''යි

කීය. එවිට එළුදෙන් "මම භයගතින් නම් ආකාශයෙන් ඇවිත් බැසපියම්, නුඹ වහන්සේගේ වල්පත මා මිරිකූයේ කෙසේදැ?"යි කිව. එවිට දිවියා කියන්නේ "තොප මෙතනට එන වෙලාවට මුවන් හා ඌරෝ, ගොණෝ මෙතන සිටියෝ ඉවත පලාගියෝය. උන්මට ගොදුරුව සිටියවුන් ඉවත පළාගිය හෙයින් ඉන් තොප උන් මාරුවට කම්" කීහ. එවිට එළුදෙන් අඬ අඬා කියන්නී "මා මෙසේ වූ කන්නලව් කිය කියා යාච්ඤා කළදී (බැගෑපත්ව ඉල්ලද්දී) කුමට මා කන්නේදැ"යි කිව. එවිට දිවියා කියන්නේ "අප දරුණුවූ කෲරවූ සත්වයන්ට තොපගේ කන්නලව්වෙන් කම් කිම්දැ?"යි කියා එළුදෙනගේ බොටුවට පැණ බෙල්ල කඩාගෙණ මස් කෑය.

සර්වඥයන් වහන්සේත් ඒ අසත්පුරුෂවූ දිවි ඒ එළුදෙන කී කන්නලව්ව නොඅසා ඇගේ ජීවිතක්‍ෂය කෙළේවේද මුගලනැ"යි වදරා මේ 'දිවි ජාතකය' නිමවා වදාළ සේක.

**අටවෙනි නිපාත වර්ණනාව නිමි.**

තවද නවවැනි නිපාතය (පරිච්ඡේදය) දක්වමි. ඒ කෙසේද යත්?

# 415. ගිජ්ඣ ජාතකය

තවද එක් කලක සකලගුණනිධානවූ (සියලු ගුණ තැන්පත්වූ) විශුද්ධ (පිරිසිදු වූ) චිත්තසන්තාන (සිත් සතන්) ඇති අප තිලෝගුරු බුදු රජානන් වහන්සේ දෙව්රම්

වෙහෙරේ සිව්බඹ විහරණයෙන් (මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා) යුක්තව වාසය කරණ සේක් නොකීකරුවූ භික්ෂුවක් අරභයා මේ ජාතකය දක්වා වදාළ සේක.

එක් කුළ පුත්‍රයෙක් නෛර්‍ය්‍යානික (නිවණට පමුණුවන) බුදුසස්නෙහි මහණව ආචාය්‍ර්‍ය උපාධ්‍යායන් විසින් හා සබ්‍රම්සරුන් (තමන් සමග එකට ගුණදම් පුරණ අය) විසින් "මෙපරිද්දෙන් හිඳුව, මෙපරිද්දෙන් හැසිරෙව්, මෙසේ පාසිවුරු ධරව, මෙසේ පිඬුසිඟව, මෙසේ පස්විකා වලඳව (දන් වලඳන විට, මද වැඩීම පිණිස නොව හුදෙක් ජීවත්වීම පිණිසම යයි සිතීම), පසිඳුරන් වසඟ නොකරව, රෑ දෙවේලෙහි නිදිවර්ජිතකොට (වැඩිපුර නොනිඳා) ග්‍රන්ථධුර (පොත පත ඉගෙනීම හෙවත් අධ්‍යාපනය ලැබීම) විදර්‍ශනාධුර (අනිත්‍ය, දුක්ඛ, ආනාත්ම යන තුන වැඩීම) පුරව, මේ ආගන්තුකවත (තමන් වෙත එන ආගන්තුක භික්ෂූන් වෙනුවෙන් කළ යුතු යුතුකම්), මේ ගමිකවත (භික්ෂූන් ගමෙහි හැසිරෙන විට අනුගමනය කළයුතු ප්‍රතිපත්ති), මේ තුදුස්කඳුවත (චුල්ල වග්ග, මහා වග්ග දෙකේ සඳහන් ආගන්තුකත වත් ආදී වත් දහතර), මේ අසූවක් මහවත (මහවත් අසූව), එහි තොප විසින් මනාව පැවත යුත්තේය, තෙලස් ධූතාංග (යෝගාවචරයෙකු විසින්අනුගමන කළ යුතු පිළිවෙත් දහතුන) ගුණයෝද රක්‍ෂා කටයුත්තාහ යි අවවාද කරණු ලබන්නේ කීකරු නුවූයේය. ඔවුන් කී අවවාද ආදරයෙන් නොපිළිගන්නේය. "තොපි මට අවවාද කරණුවාද? මම මට වැඩ අවැඩම මම දනිමි" කීයේය. භික්ෂූන් වහන්සේ ඔහු

නොකීකරු බව දම්සභා මණ්ඩපයෙහි කිය කියා වැඩ උන්සේක.

එබස් සර්‍වඥයන් වහන්සේ දිව්‍යකනින් අසා දම්සභා මණ්ඩපයට වැඩ "මහණෙනි, මා එන්නාට පූර්‍ව භාගයෙහි කවර කථාවකින් යුක්තවුදැ?"යි විචාරා "මෙනම් කථාවකින් යුක්තව උනුම්හ"යි යනු අසා ඔහු කැඳවා "සැබෑද මහණ, තෝ නොකීකරුයෙහිදැ?"යි විචාරා "එසේය ස්වාමීනි" දැන්වූ කල්හි "කවර හෙයකින් මහණ, තෝ මේ බුදුසස්නෙහි මහණව තමාට වැඩ කැමැත්තවුන්ගේ බස් නොකරන්නෙහිද? පෙරත් තෝ නුවණැත්තවුන්ට නොකීකරුව වේරම්භ වාතයට (ඉහළ අහසෙහි ඇති තද සුළගක්) පැමිණ සුනුවිසුනුවූයෙහිදැ"යි වදරා ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්?

පෙර ගිජ්ඣකූට නම් පර්‍වතයෙක මහබෝසතාණන් වහන්සේ ගිජුලිහිණිව උපන්සේක. උන් වහන්සේගේ පුත්‍රවූ සුපත්‍ර නම් ගිජු රජෙක් නොයෙක් දහස් ගණන් ගිජුලිහිණියන් පිරිවැරූයේ ශක්ති සම්පන්න වූයේ වයෝවෘද්ධවූ මව්පියන් පිඹුරුමස් ආදී ගොදුරු ගෙණවුත් දී රක්‍ෂා කරන්නේය.

එසේ රක්‍ෂාකරන්නාවූ අහස ඉතා දුරතැන් නැගී යාමට සමර්ත්‍ථවූ තමන් වහන්සේගේ පුත්‍රවූ සුපත්‍ර නම් පක්‍ෂිරාජයාට අවවාද කරණ මහබෝසතාණන් වහන්සේ "එම්බා පක්‍ෂිරාජය, තොප අහස්කුසට නැගි කල්හි මේ දඹදිව මුළු පොළොව දියපිට ඉලුපුලක් මෙන් පෙණේද? නැවත යම් තැනකට

පැමිණියාවූ තොපට සාගර ජලයෙන් පරිවර්‍ජිත්නවූ (වට කරන ලද) මෙම ජම්බුද්වීපය රථසකක් (කරත්ත රොදයක්) මෙන් වටව පෙණෙන්නේය. එතැනින් නැවත ඈත නොයව"යි වදළසේක. ඒ පක්‍ෂිතෙම ඒ අවවාදය "යහපතැ"යි පිළිගත්තේය.

එක් දවසක් අළුත වට වැස්සෙහි ගිජුලිහිණියන් හා සමග අහසට පැන නැගී ඔවුන් පසුකොට අහසට ඉතා දුර තැනට ගියේය. ඕහට බෝසතාණන් වදළ පරිද්දෙන් දඹදිව රථසකක් මෙන් වටව පෙණුනේය. එසේත් නොනැවත නොකීකරුව පක්‍ෂිරාජ තෙමේ ගොස් වේරම්භ වාතයට පැමිණ සුනුවිසිනු වූයේය. ඒ නොකීකරුවූ පක්‍ෂිරාජයා නිසා ජීවත් වන්නාවූ පක්‍ෂීහුද ඔහුගේ මව්පියෝද අඹුදරුවෝද යන සියල්ලම විනාශයට පැමිණියෝය. "එමෙන් මේ ශාසනයෙහි යමෙක් වැඩිමහල්ලන්ගේ අවවාද වචනය පිළිගෙණ එපරිද්දෙන් නොපවත්නේ වීනම් ඒ ගිජුලිහිණියාගේ අවවාදගෙණ එසේ නොපැවත විනාශයට පැමිණියාවූ ලිහිණිරජු මෙන් මහත්වූ ව්‍යසනයට පැමිණෙන්නේය. එසේ හෙයින් මහණ තෝ ද ඒ නොකීකරු ගිජුලිහිණියාමෙන් නොවී වැඩකැමැත්තාවූ මහතුන්ගේ (ගුණ නුවණින් වැඩි උත්තමයා) අවවාද වචනය කරව"යි වදළ සේක.

මෙසේ බුදුන් විසින් අවවාද කරණ ලද ඒ මහණ තෙම එතැන් පටන් කීකරු වූයේය.

සර්‍වඥයන් වහන්සේ “මහණෙනි, එකල්හි නොකීකරු ගිජුලිහිණියා නම් දැන් මේ නොකීකරු මහණ වන්නේය. එකල්හි අවවාද දුන් ගිජුලිහිණියා නම් දැන් ලොව්තුරා බුදුවූ මම්ම වේදැ”යි මේ ජාතකය පූර්‍වාපර සන්ධි ගළපා නිමවා වදාළ සේක.

## 416. කොසම්බ ජාතකය

තවද චන්‍ද්‍රමණ්ඩලය (සඳ මඬල) මත්තෙන් යන්නාවූ සූර්‍ය්‍යරශ්මි පරිද්දෙන් සියළු ලොව මැඩගෙණ පවත්නා ගුණ ප්‍රබන්ධයෙක් ඇති විශුද්ධවූ (අතිශයින් පිරිසිදුවූ) සම්‍යයක් සම්බුදුරාජෝත්තමයන් වහන්සේ එකසමයෙක්හි කොසඹෑනුවර සමීපයෙහි ඝෝෂිත නම් සිටානන් විසින් කරවා පිළිගන්වනලද ආරාමයෙහි වාසය කරණසේක් කොසඹෑ නුවරවැසි කලහාකාරී භික්ෂුවක් අරභයා මේ ජාතකය දක්වා වදාළසේක.

බුදුන් එහි වැඩ වසන සමයෙහි විනයපිටකය (භික්ෂූන් සඳහ පනවන ලද විනය කරුණු ඇතුළත් කොටස) නොපිරිහෙලා ධරන්නාවූ එක් තෙරකෙනෙකුන් වහන්සේද, එසේම සූත්‍රපිටකය (සූත්‍ර කොටස් ඇතුළත් ග්‍රන්ථ පහ) ධරන්නාවූ එක් තෙරකෙනෙකුන් වහන්සේද, යන මේ දෙදෙනෙකුන් වහන්සේ එක් සෙනස්නේ වාසය කරණසේක. එකල ඒ දෙදෙනා වහන්සේගෙන් සූත්‍රපිටකය ධරන්නාවූ තෙරුන් වහන්සේ එක් දවසක් නහනගෙට ගොස් උදක කෘත්‍යයකොට (ස්නානය කොට) ඉතිරි දිය භාජනයෙහි තබා නික්ම ගියසේක.

ඉක්බිති විනයධර තෙරුන් වහන්සේද නහනගෙට වැද ඒ බඳුනෙහි තුබූ දිය දැක “ඇවැත්නි, නහන කොටුවේ බඳුන්හි ඉතිරි දිය තබා ආවෝ තොපිදැ?”යි වදාළසේක. “එසේය ඇවැත්නි, අපි ය”යි කී කල්හි එබසට විනයධර තෙරුන් වහන්සේ “මෙහි ඇවැත් (සුළු වරදක්) ඇතිබව තොපි නොදනුදැ”යි කී සේක. “එසේය ඇවැත්නි, අපි නොදනුම්හ”යි කීසේක. විනයධර තෙරුන් වහන්සේ එහි ඇවැත්වන බව කීසේක.

එබස් අසා සූත්‍රධර තෙරුන් වහන්සේ “එසේවීනම් ඇවැත්නි, ආපත්තියට පිළියම් කෙරෙමි”යි කීසේක. එබසට විනයධර තෙරුන් වහන්සේ “ඇවැත්නි, තොපි නොදැන සිහි නැතිව (අමතක වීමකින්) අව නම් ආපත්ති නැතැ”යි වදාළසේක. එබස් ඇසූ සූත්‍රාන්තික තෙරුන් වහ්සේ අනාපත්ති යන සංඥා ඇතිවූසේක.

ඉක්බිති විනයධර ස්ථවිරතෙම තමන්ගේ අතවැසි භික්ෂූන්ට “මේ සුත්‍රාන්තික ස්ථවිරතෙම ආපත්තියට ඇවදත් ඇවැත් ඇති බව නොදත්නේය”යි කීසේක. එබස් ඇසු භික්ෂූහු සුත්‍රාන්තික තෙරුන් වහන්සේගේ අතවැස්සන් දැක “තොපගේ උපාධ්‍ය ස්ථවිරයෝ ආපත්තියට වැදවත් එහි ඇවැත් ඇතිබව නොදනිති”’යි කීවාහුය. එබස් ඇසූ අතවැසි භික්ෂූහු එපවත් තමන්ගේ උපාධ්‍යයන් වහන්සේට කීවාහුය. එබසට තෙරුන් වහන්සේ වදාරණසේක් “මේ විනයධර තෙරුන් වහන්සේ

පළමුවෙන් ආපත්ති නැතැයි කියා දැන් ආපත්ති ඇතැයි කියනසේකැ යි බොරු කියන කෙනෙකැ''යි කීසේක.

එසඳ ඔහුගේ අතවැසි භික්ෂූහු ගොස් විනයධර තෙරුන්වහන්සේගේ අතවැස්සන් දැක "තොපගේ උපාධ්‍යා ස්ථවිරයෝ බොරු කියන කෙනෙකැ''යි කියා මෙසේ ඔවුනොවුන් හා විවාදකොට ඒ සුත්‍රාන්තික තෙරුන් වහස්සේට අවසරයක් බලා ලැබගෙණ ඇවැත් ආපත්ති නොදැක්මෙහි "උක්‍ෂෙපනිය කර්‍මය (උක්ඛෙපනීය කර්‍මය, සිදුවූ ඇවත නොදන්නවුන්ට කරන විනය කර්‍මය)'' කළාහුය. එතැන් පටන් ඒ දෙදෙනා වහන්සේට උපස්ථාන කරන්නාවූ උපාසකවරුද, උන් වහන්සේගේ අවවාද පිළිගන්නා භික්ෂුභික්ෂුණීහුද, අරක්ගත් දෙවියෝද, ඔවුන්ට දෘෂ්ටමිත්‍ර (දුටු මිතුරුවූ) දෘඪමිත්‍රවූ (දැඩි මිතුරුවූ) දෙවියෝද, අකාසස්ථ දෙවියෝද, අකනිටා බඹලොව වැසි බ්‍රහ්මයෝදැයි යන සියළු පෘථග්ජනයෝද දෙපක්‍ෂයකට බෙදී මහත් කෝලාහල පැවැත්වූවාහුය.

එකල එක් භික්‍ෂුකෙනෙකුන් වහන්සේ බුදුන් කරා එළඹ "ස්වාමීනි, මේ සූත්‍රධර තෙරුන්වහන්සේට උක්‍ෂෙපනීය කර්‍මය කළේ ධර්‍මයෙන, අධර්‍මයෙන් නොවෙයි. එතකුදු වුවත් මේ සූත්‍රධර තෙරුන් වහන්සේගේ පක්‍ෂයෙහි භික්‍ෂූහු අධර්‍මයෙන් කළ උක්‍ෂෙපනීය කර්‍මයෙකැයි සිතා ඒ තෙරුන් වහන්සේ උසස්කොට පිරිවරාගෙණ ඇවිදිනාහුය''යි දැන්වූසේක.

එකල භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ "භින්නො භික්ඛුසංඝො''යි වදාරා ඒ භික්‍ෂූන් සමීපයට වැඩ ඒ විනයධර

තෙරුන් වහන්සේ විසින් කළාවූ උක්‍ෂෙපනීය කර්‍මයෙහිද සූත්‍රධර තෙරුන් වහන්සේගේද අවන් ඇවැත් නොදැන්මෙහිද දේෂවදරා වැඩිසේක.

ඉක්බිති භික්‍ෂූන් එතන එකසීමාවෙහිදී පෝය පවුරුණු ආදිය කොට හෝජනශාලාවෙහි හිඳිනා අසුන් පිණිස විවාධ කළකල්හි දෙවෙනිවත් එතැන්හි වැඩ දබරකරන්නාවූ දෙන්නෙකු එකතැන නොහිඳිනා පරිද්දෙන් අතුරෙහි එකි එකී ආසනයකට බිම තබා ඉඳිනා ලෙසට හොජනශාලාවෙහි වත් පණවා "මහණෙනි, විවාද කිරීමෙන් ප්‍රයෝජන නැතැ"යි එහි දේෂ වදරා වැඩිසේක.

එකල්හි සර්‍වඥයන් වහන්සේට වන වෙහෙස නොදකැමැත්තාවූ එක්තරා ධර්‍මවාදී වූ භික්‍ෂු කෙනෙකුන් වහන්සේ "ස්වාමීනි, තිලෝගුරු බුදුරජාණන් වහන්ස, මදක් කල් ඉවසා වදාළ මැනව, නිරුත්සාහව ඵලසමාපත්ති (උත්සාහයෙන් තොරව විඳින ඵල සම්පත්) සැප අනුභව කළ මැනව, අපි මේ විවාදයෙන් වන යහපතක්වත් නපුරක්වත් දක්නමෝ වේදැ"යි කීසේක. එබස් අසා ඒ භික්‍ෂුහට ධර්‍මදේශනා කරන්නාවූ සර්‍වඥරාජෝත්තමයානන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්?

මහණෙනි. පෙර බරණැස් නුවර උපභෝග පරිභෝග වස්තුයෙන් හා සියළු සේනාවාහන ධනසමෘද්ධියෙන් (ධන සම්පත් ඇති) සමන්විත වූ බ්‍රහ්මදත්ත නම් රජකු රාජ්‍යය

කරණ කල්හි කොසොල් රට සේනාවාහන ආදිය නැත්තාවූ දීඝතිස්ස නම් රජෙක් රාජ්‍යය කරන්නේය.

එකල ඒ බ්‍රහ්මදත්ත නම් කසී රජ තමාගේ හස්ත්‍යාශ්වාදී චතුරංගිණී සේනාවාහනයන් සන්නද්ධකොට සරහා දීඝතිස්ස නම් කොසොල් රජු කරා සටනට නික්මින. එකල්හි කොසොල් රජතෙම බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ සෙනග ගෙණ තමා කරා සටනට එති යනු අසා සිතනුයේ “මේ රජ උපභෝග පරිභෝග වස්තුවෙන් හා නිධාන කොට තිබූ කෙළකෝටිගනන් ධනයෙන් ආඪ්‍යයහ (ධනයෙන් දියුණුය). මහත් සේනාවාහන ඇත්තේය. මම වනාහී එබඳු සේනාවාහන ධනසමෘද්ධියක් නැතිහෙයින් ඒ රජු හා යුද්ධකරන්ට නොහැක්කෙමි. එසේ හෙයින් බැහැරගොස් ජීවත්වීම උතුම් වන්නේය”යි සිතා තමාගේ අගමෙහෙසුන් බිසවුන් කැඳවාගෙණ ඔහු එන්නට පළමුකොට තෙමේ නුවරින් නික්ම ගියේය.

ඔහු ගිය ඉක්බිති ඒ බ්‍රහ්මදත්ත රජ තමාගේ සේනාවාහන සමඟ ඒ කොසොල් රජහුගේ නුවර ගෙණ වාසය කළේය. ඉක්බිති කොසොල් රජ්ජුරුවෝ තමන්ගේ බිසවුන් හා සමග අනුක්‍රමයෙන් බරණැස් නුවරට ගොස් එහි එක්තරා කුඹලුන්ගේ ගෙයක වාසය කරන්නාහු එකල රජහුගේ බිසවුන්ට දරුගැබක් පිහිටා ඉරුඋදවන වේලෙහි සන්නාහසන්නද්ධවූ (යුද ඇඳුමෙන් සැරසී) සිව්රඟසෙනග යහපත් තෙනක සිටියා දක්නට ද ඔවුන් ආයුධ සේදූ දිය බොන්නටද දෙළොක් උපන. එකල බිසව්තොම “දේවයන් වහන්ස, මම ගර්භිණී

වූයෙහි, මට මෙවැනි දෙළකුත් උපන්නේය''යි තමන්ගේ කොසොල් රජහට කිවාහුය. රජු එබස් අසා ''සොඳුර, දිලිඳුවූ අපට සන්නාහයෙන් සන්නද්ධවූ සිව්රඟසේනඟ යහපත් තෙනක සිටියා දැකීම් හා ඔවුන් ආයුධ සේදූ දිය බොන්නට කොයින් ලැබෙන්නේදැ''යි කීහ. බිසව් ''එසේවීනම් දේවයන් වහන්ස, මාගේ ජීවිතය නොතිබෙන්නේය''යි කීවාහ.

එසමයෙහි බ්‍රහ්මදත්ත රජ්පුරුවන්ගේ පුරෝහිත බමුණෙක් ඒ දීඝතිස්ස නම් කොසොල් රජහට මිත්‍රව වාසය කරන්නේය. එකල ඒ කොසොල් රජ තමාගේ මිත්‍රවූ පුරෝහිත බ්‍රාහ්මණයා ලඟට ගොස් ''එම්බා යහළුව, තොපගේ යෙහෙලනීවූ අපගේ බිසවුන්ට ගැබෙක් පිහිටා මෙසේ දෙළෙක් උපන්නේය''යි කීහ. ''එසේවීනම් දේවයන් වහන්ස, මම ඒ බිසවුන් දක්නා කැමැත්තෙමි''යි බමුණා කීහෙයින් කොසොල් රජ තමාගේ බිසව් කැඳවාගෙණ ඒ බමුණුන් කරා ගියේය. පුරෝහිත බ්‍රාහ්මණයාද එන්නාවූ බිසවුන් දුරදීම දැක උනස්නෙන් නැගීසිට උතුරුසළුව ඒකාංශ (උඩු කයේ එක පැත්තක් වැසෙන පරිදි සළුව දමා ගැනීම) කරගෙන බිසවුන්ට නමස්කාර කොට සිට ''තොපගේ කුස පිළිසිඳගත්තේ කොසොල් රටට අධිපතිවන්නාවූ මහා පිනැති රජෙකැ''යි තුන්යලක් (තුන් වාරයක්) උදන් අනා ''දේවයන් වහන්ස සතුටුවුව මැනව, සූර්‍ය යෝද්ගමන (ඉර උදාවෙන වේලයෙහි) සන්නාහයෙන් සන්නද්ධව සිටියාවූ චතුරංගී සේනාව දක්නටද, ඔවුගේ ආයුධ සේදූ දිය බොන්නටද ලැබෙන්නේය''යි කොසොල් රජහට කියා ගිව්ස්සා තෙමේ බ්‍රහ්මදත්ත

රජ්ජුරුවන් කරා ගොස් "දේවයන් වහන්ස, සෙට උදෑසන චතුරංගිණී සේනාව සන්ධව සිටීමද, ඔහුන් තමන්ගේ ආයුධ සේදීමටද කාරණයක් දිටිමි. ඊට විධාන කළ මැනැව"යි කීයේය.

"එසේවීනම් සගයෙනි, තොප පුරෝහිත බමුණන් කියාලු පරිද්දෙන් සැරහීගණුව"යි රජ සේනාවට නියෝග කළේය. ඔවුහුද රජහුගේ නියෝග වූ පරිද්දෙන් සැරහී තමන් වහන්සේගේ ආයුධ සේදුවාහුය.

එකල දීඝතිස්ස නම් කොසොල් රජහුගේ අගමෙහෙසුන් බිසවුන්ට ඉරුඋදයෙහි සන්නාහයෙන් සන්නද්ධ සිව්රඟසෙනඟ දැකීමද, ඔවුන් ආයුධ සේදූ දිය බීමටද සිද්ධවිය. ඉක්බිති බිසව් මුහුකළ ගැබ් ඇතිව (මෝරා ගිය ගැබ් ඇති) දස එකඩ මසකින් පුත්කුමරුවකු වැදුවාහුය. ඕහට දීඝායු කුමාරයෝ යයි නම් තබා වැඩිවිය පැමිණ නුවනැති වූ කල්හි පියරජතෙම සිතනුයේ "බ්‍රහ්මදත්ත රජ අපට බොහෝ අනර්ථ කළේය. මොහු විසින් අපගේ බලවාහන, ජනපද, රන්රුවන් ගබඩා, කොටුගෙවල් ආදිය පැහැරගන්නා ලදී. ඉදින් අප අඳුනන්නේ වීනම් අප තුන්දෙනා මරන්නේය. එසේහෙයින් දීඝායු කුමාරයන් නුවරින් පිට වාසයකරවුව මැනවැ"යි සිතා ඔහු පිටිනුවරට වැස්සුයේය.

ඒ දීඝායු කුමාරයාද අප්‍රසිද්ධ වේශයකින් වසන්නේය. කොසොල් රජු හා බිසවුන් එහි වසන්නා දැක බ්‍රහ්මදත්ත රජ හට දැක්වූවාහුය. "එසේවීනම් කොල, තෙපි ඒ රජ හා

බිසව හා සමග අල්වාගෙණ එව"යි නියෝග කොට මිනිසුන් ගමන් කරවා ගෙන්වාගෙණ වධයට විධාන කරණුයේ "සගයෙනි, මේ රජු බිසව් හා සමග දැඩි ලනුවකින් පිටිතොල හයා (දෑත් පිටුපසට කර බැඳ) බැඳ කරයෙන් ඉසකේ මුඩුකොට වධ බෙර ගස්වමින් වීථියෙන් වීථියෙහි ගෙන ගොස් දකුණු වාසල් දොරින් නික්මයා එතනදී දෙදෙනා සතරකඩක් කොට පොළු ගසා වලසතරක ලා එව"යි කීයේය.

එබස් ඇසූ ජනයා "යහපති දේවයන් වහන්සැ"යි රජුහුගේ නියෝගවූ පරිද්දෙන් බිසව හා එක්කොට රජුපිටිතොල හයා බැඳ ඉසමුඩුකොට වීථියෙන් වීථියට ගෙනයන්ට පටන් ගත්හ.

ඒ වේලෙහි දීඝායු කුමාරතෙම "තමාගේ මව්පිය දෙදෙනා බොහෝ දවසක් නොදක්නාලදහ. ඔවුන් දක්නෙමි"යි බරණැස් නුවරට ගොස් පිටිතොල හයා බැඳ වීථියෙහි යන්නාවූ මව්පියන් දැක ලඟට යනුව අභිමුඛවිය. එකල කොසොල් රජ එන්නාවූ ඔහු දුරදී දැක "පුත දීඝායු කුමාරය, දුර බලව, ලඟ නොබලව වෛරයෙන් වෛරය නොසන්හිඳෙයි වෛර නොකිරීමෙන්ම වෛර සන්හිඳේ"යි කීයේය.

ඔහු එසේ කී කල්හි "මනුෂ්‍යයෝ මේ කොසොල් රජු උන්මත්ත නන් දොඩන්නේය(පිස්සුවෙන් කතා කරන බව), මෝහට දීඝායුවක් නම් කොයින්ද? කවුරුන් දැක මේ මෙසේ කියන්නෙහිදැ"යි කීවාහුය. ඔහු එසේ කී කල්හි මනුෂ්‍යයෝ මේ කොසොල් රජු උන්මත්ත නම් දොඩන්නේය, මෝහට දීඝායුවක්

නම් කොයින්ද කවුරුන් දැක මේ මෙසේ කියන්නෙහිදැයි කීවාහුය.

එකල ඒ රජතෙම "සගයෙනි, මම උමතුව නන් දෙඩන්නෙම් නොවේමි යි යමෙක් නුවණැත්තේ වීනම් ඒ දන්නේය"යි නැවත නැවතත් කීයේය. ඉක්බිති මනුෂ්‍යයෝ ඒ රජහුගේ බිසව හා සමග රජුහුගේ නියෝගවූ පරිද්දෙන් නුවර ඇවිදුවා දකුණු වාසලන් පිටතට ගෙණගොස් සතරකඩක් කොට කපා වලසතරක ලා රැකවල් ලවා ගියාහුය.

එකල දීඝායු කුමාරතෙම බරණැස් නුවරට වැද රා ඇරගෙණ රැකවලුන් පොවා (ආරක්‍ෂකයන්ට රා පොවා) ඔවුන් රා මදින් මත්ව ඒ ඒ තැන හුනුකල්හි තෙමේ දරසෑයක් බැඳ මව්පියන්ගේ මෘතදේහ දරසෑයට නැග ගිණිදල්වා දෙහොත් මුදුනෙහි බැඳ තුන් යලක් වටකොට ඇවිද්දේය (තුන් වරක් සොහොන වටේ යාම).

එසඳ බ්‍රහ්මදත්ත රජ ප්‍රසාදයෙහි මතුමහල්තලයෙහි සිට එසේ දරසෑය වට ඇවදිනා කුමාරයා දැක "සැක නැතිවම කොසොල් රජුගේ නෑකෙනෙක, මොහු කෙරෙන් මට අනර්ත්ථයක් වන්නේය. කවුරුත් මොහු ඇති බව මට නොකීවාහුය"යි සිතුවාහුය.

ඉක්බිති ඒ කුමාරතෙම වලට (වනයට) ගොස් කැමති පමණක් අඬා වැලප බරණැස් නුවරට වැද එහි වාසය කෙරෙමින් එක් දවසක් ඇත්හලට ගොස් ඇත්ගොව්වා දැක "ආචාරීනි, මම හස්ති ශිල්පය උගන්නා කැමැත්තෙමි" කියා

“යහපති උගණුව”යි කී කල්හි එද්‍ රැ ඒ ඇතහල ලැග “අළුයම නැගීසිට මියුරු කට හඬින් ගී කිය කියා විනා ගෑවෝ කවුරුන්දැ”යි විචාරා “දේවයන් වහන්ස, හස්තයාචාරීහුගේ අතවැස්සෝය”යි අසා “ඔහු කැඳවාගෙණ එව”යි කියා ගෙන්වාගෙණ “ඇත්හල ගී කිය කියා විනා ගෑවෝ තොපිදැ?”යි විචාරා “එසේය දේවයන් වහන්ස, අපිය”යි කී කල්හි “එසේ වීනම් දැනුත් ගී කිය වීනා ගායනා කරව”යි නියෝග කළේය.

එකල දීඝායු කුමරතෙම බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ සිත් ගන්නා කැමතිව මධුරස්වරයෙන් ගී කිය කියා වීනා ගායනා කෙරෙමින් රජහුගේ සිත් ගෙන උපස්ථාන කරන්නේ රජහට පළමු නැගීසිට ගායනා කෙරෙයි, රජහට ඉක්බිතිව තෙමේ සැතපෙයි, කටයුතු කවර්දැ?යි රජහු විචාරයි. රජහට සිත්වූ පරිද්දෙන් ප්‍රිය තෙපුල් කියයි, මෙසේ දීඝායු කුමාරතෙම නොබෝ කලකින් බ්‍රහ්මදත්ත රජහට අභ්‍යන්තරව (ළග ඇසුරට පත්ව) විස්වාස වූයේය.

ඉක්බිති එක් දවසක් බ්‍රහ්මදත්ත රජහු විසින් “දිඝායු කුමාරය, මම මුව දඩයමට යනු කැමැත්තෙමි, රථය යොදව”යි කී කල්හි “යහපත දේවයන් වහන්සැ”යි රථය යොද්‍ රජහු රථයට නංවා තෙමේ රථය පදිනේ සේනාව හෝ රථයක් හෝ ආසන්න නොවන පරිද්දෙන් වහා රථය පැදගෙන ගියේය. එසඳ රාජකුමාරයාට කියනුයේ “කොල, මම මිරිකුණු ශරීර ඇත්තෙමි, මදක් සැතපෙණු කැමැත්තෙමි,

රථය රඳවාපියව"යි කීයේය. එකල ඒ කුමාරතෙම "යහපත දේවයන් වහන්ස"යි රථය අතහැර තෙමේ රුක් සෙවනක අරම්ණිය බැඳගෙණ උන්නේය. එකල රජ දීඝායු කුමාරයා උකුලේ හිස තබා සැතපී විඩාවගිය ශරීර ඇති හෙයින් වහා නිද්‍රාවට පැමිණියේය.

එකල දීඝායු කුමාරතෙම සිතනුයේ "බ්‍රහ්මදත්ත රජ අපට බොහෝ අවැඩ කෙළේය. මොහු විසින් අපගේ යාන වාහන ජනපද කොෂ්ටාගරාදිය (ගබඩාවල්) පැහැර ගන්නා ලද. අපගේ මව්පිය දෙදෙන මොහු විසින් මරණ ලද්දහුය. දැන් මට ඒ වෛරය සිද්ධ කරන්ට කල්වන්නේය"යි කොපුවෙන් කඩුව හමාගෙණ සිතනුයේ "මාගේ පියරජ්ජුරුවන් වහන්සේ මරණ කාලයේහිදී දීඝායු කුමාරය, තෝ දුරබල, ලග නොබලව, වෛරයෙන් වෛරය සන්නොසිඳෙනේය වෛර නොකිරීමෙන්ම වෛර සන්හිඳෙන්නේය යි කී සේක. ඒ මාගේ පියානන් වහන්සේගේ බස් ඉක්මවන්ට නුසුදුසුය"යි කඩුව කොපුවෙහි බහාගෙණ මෙසේ දෙවැනි තුන්වැනිව කඩුව කොපුවෙන් හයාගෙණ පිය රජහු කී තෙපුල් සිහිකොට නැවතත් කොපුවේ බහා ගත්තේය.

එකල බ්‍රහ්මදත්ත රජ භයින් තැතිගෙණ වහා නැගී සිටි කල්හි දීඝායු කුමාරතෙම "දේවයන් වහන්ස, භයින් තැතිගෙණ නැගී සිටියේ කුමක් නිසාදැ?"යි කීයේය. ඒ පුරුෂයාට කියනුයේ "මා සැතපුන කල්හි දීඝතිස්ස නම් කොසොල් රජහුගේ පුත් වූ දීඝායු නම් කුමාරයෙක් කඩුවක් ගෙණ මා

දෙපළු කොට එළුයේයයි ස්වප්නයෙන් (සිහිනෙන්) දිටිමි, එයින් මම භයගෙණ නැගී සිටියෙමි" කීයේ. එසඳ දීඝායු කුමාරතෙම වමතින් බ්‍රහ්මදත්ත රජුගේ ඉසකෙස්කැටිය ගෙණ දකුණතින් කඩුව තියාගෙණ "දීඝතිස්ස කොසොල් රජහුගේ පුත්වූ දීඝායු කුමාරයා නම් මමය, තොපි අපගේ පියරජ්ජුරුවන් හා මෑනියණුත් මරා සේනාවාහන ජනපද ආදියත් පැහැරගෙණ බොහෝ අවැඩ කළෝ වේද? මම යම් පුරාණ වෛරයක් සිත තබා ඒ සිද්ධ කරණු කැමැති වන්නේ නම් දැන් ඊට කල් වන්නේය"යි කීයේය.

එකල බ්‍රහ්මදත්ත රජ භයගෙණ දීඝායු කුමාරයෝ පය වැඳගෙණ හෙව "එම්බා දීඝායු කුමාරයෙනි, මාගේ ජීවිතය දෙව"යි කීසේක. එබසට දීඝායු කුමාරයා විසින් "නුඹ වහනසේගේ ජීවිතය දෙන්ට මම කවරෙක්ද? මාගේ ජීවිතය නුඹ වහන්සේ දුන මැනවැ"යි කී කල්හි "එසේ වීනම් තෙපිත් මාගේ ජීවිතය දෙව, මම තොපගේ ජීවිතය දෙමි" කියා රජ්ජුරුවන් හා කුමාරයන් දෙදෙන ඔවුනොවුන් ජීවිතදනයදී මතු විරුද්ධ නොවන ලෙස සත්තය (පොරොන්දු) කළාහුය.

ඉක්බිති බ්‍රහ්මදත්ත රජතෙම "දීඝායු කුමාරය, නුවරට යම්හ, රථය පදවාගෙණ සේනාවාහන ළඟට අවුත් ඔවුනොවුන් හා සමග බරණැස් නුවරට වැද ඇමති මණ්ඩලය පරිවරා හිඳ "සගයෙනි, තොපි කොසොල් රජහුගේ පුත්වූ දීඝායු කුමාරයා දුටුවාහු නම් ඕහට කුමක් කරව්දැ?"යි විචාළේය. එබසට සමහර කෙනෙක් "දේවයන් වහන්ස, අපි

ඔහුගේ අත් කපම්හ”යි කීවාහුය. සමහර කෙනෙක් “කන් සිඳුම්හ”යි කීවාහුය. සමහර කෙනෙක් “නාසා සිඳුම්හ”යි කීවාහුය. සමහර කෙනෙක් “කන්නාසා සිඳුම්හ”යි කීවාහුය. සමහර කෙනෙක් “ඉස සිඳුම්හ”යි කීවාහුය. එසඳ බ්‍රහ්මදත්ත රජතෙම කියනුයේ “සගයෙනි, දීඝතිස්ස කොසොල් රජහුගේ පුත්වූ දීඝායු කුමාරයා නම් මේය, මෝහට කිසිවකුත් නොකොට යුත්තේය. මොහු විසින් මාගේ ජීවිතය දෙනලදැ”යි කියා ඉක්බිත් බ්‍රහ්මදත්ත රජතෙම දීඝායු කුමාරය “තොපගේ පිය රජ්ජුරුවන් විසින් දුර බල, ලඟ නොබල, වෛරයෙන් වෛරය සන්නොසිඳෙයි, වෛර නොකිරීමෙන් වෛර සන්හිඳෙයි කීවේ කුමක් නිසාදැ?”යි විචාළේය.

එබසට දීඝායු කුමාරතෙම කියනුයේ “දේවයන් වහන්ස, අපගේ පිය රජ්ජුරුවන් වහන්සේ විසින් දුර බලව යි කීයේ නම් බොහෝකල් වෛර නොකරවයි කී නියාය. ලඟ නොබලව යි කීයේ නම් මිත්‍රයන් භේද නොකොරව යි කියාය. වෛරයෙන් වෛර නොසන්හිඳෙයි, වෛර නොකිරීමෙන්ම වෛර සන්හිඳෙයි කීයේ නම් නුඹ වහන්සේ විසින් මාගේ මව්පියන් මරණ ලද්දහුය යි ඉඳින් නුඹ වහන්සේ මැරූයේ විනම් නුඹ වහන්සේට වැඩකැමැත්තාහු කෙනෙක් මා මරන්නාහුය. එසඳ මට වැඩකැමැත්තාවූ කෙනෙකුන් ඔහුන් මරති. මෙසේ වෛරයෙන් වෛර නොසන්හිඳෙන්නේය. දැන් නුඹ වහන්සේ විසින් මාගේ ජීවිතය දෙනලද, මා විසිනුත් නුඹ වහන්සේගේ ජීවිතය දෙන ලද, එසේ වෛරයෙන් වෛර

නොසන්සිඳුන්නේය, වෛර නොකිරීමෙන්ම සන්හිඳෙන්නේය''යි කියා ''දේවයන් වහන්සැ''යි කීයේය.

එකළ බ්‍රහ්මතත්ත රජතෙම ''මේ කුමාරයා පියානන් සංක්ෂේපයෙන් (කෙටියෙන්) කී දෙයෙහි අර්ත්‍ථ විස්තරයෙන් දන්නේය, ඉතා නුවණැත්තාවූ පුරුෂයෙකැ''යි විස්මයපත්ව පිය රජ්ජුරුවන් සන්තකවූ සේනාවාහන, ජනපද, කොෂ්ටාගාරාදිය තැන්පත්කොටදී තමාගේ දියනිකෙනෙකුන් පාවාදී මිත්‍රව විසුයේයයි අප තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ඒ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ හා දීඝායු කුමාරයන්ගේ මේ කථාව ගෙණහැර දක්වා වදාරා ''මහණෙනි, සත්‍වයන්ට වධබන්‍ධනාදී දණ්ඩනිග්‍රහකොට ආයුධ බලයෙන් ආඥාචක්‍රය (අණසක) පවත්වා රජකරණ රජ දරුවෝ පවා මෙබඳුවූ ඉවසීමට හා කීකරු බවට පැමිණෙන්නාහුය. තොපි අවිපරීතවූ (වෙනස් නොවන) ධර්‍මවිනය ඇති ශාසනයෙහි මහණව කවර කාරණයකින් ඉවසාගත නොහෙව්ද? කීකරු නොහෙව්දැ?''යි දෙතුන් වෙනිවත් විවාද නොකරණසේ අවවාද වදාරා එසේත් නොසන්හිඳෙන හෙයින් ''මේ භික්ෂූහු ද්වේෂයෙන් මඩනාලද (වෛරයෙන් කළඹන ලද) සිත් ඇත්තාහ. මොහු සන්හිඳුවන්ට නොහැක්කේය''යි එතැනින් වැඩ දෙවෙනි දවස් වළඳා ඉක්බිති ගඳකිළියෙහි මදක් සැතපී සෙනසුන් පිරිකර තැන්පත් කොට තබා තමන් වහන්සේ පාසිවුරු ගෙණ ඒ අසමගි භික්ෂු සංඝා මධ්‍යයේ ආකාශයෙහි වැඩ සිට වදාරණ සේක් ''මේ කලහකාරී භික්ෂු සංඝයාතෙම වටින් එකවිටමත් ශබ්ද පැවැත්වීමෙන් මහ හඬ ඇත්තාහුද වෙති, ගුණයෙන් සමානත් වෙති, මොවුන්

අතුරෙන් කිසිවකුත් මම නුවණැත්තෙමි නොසිතා පණ්ඩිතමාණීව (උගතුන් යයි සිතාගෙන) භික්‍ෂු සංඝයා බෙදන කල්හි මා නිසා මේ භික්‍ෂුසංඝයා වහන්සේ බිඳෙන සේකැ යි කිසි කාරණාදෙයකුත් නොසිතුයේය. තවද මෙහි භික්‍ෂුසංඝයාතෙම ද්වේෂයෙන් සිහිමුළාව අපි නුවැණැත්තම්හ, සතරසතිපට්ඨානාදිවූ ආර්‍ය්‍යධර්ම්මයන් අරමුණු නොකොට කටහයා යමක් කියනු කැමැත්තේ වීනම් එපමණක් බස් සබමැද ගෞරවයක් නැතුව කියමින් අලජ්ජි බවට පැමිණෙත්. ඒ විවාදය මෙබඳු මහත් ආදීනව ඇත්තේ යයි සලකාගත නොහෙන්නේද? තවද මට අක්‍රොෂ (බැණ වැදුණු) කළේය, හස්තපාදාදියෙන් තැළුයේය, කුළුදෙයි (සිත් රිදවන දේ) ආදිය කියවා මා පැරදවුයේය, මාගේ පරිභෝග වස්තු පැහැරගත්තේයයි යමෙක් තණ පිදුරු ආදියෙන් කුණුමස් වසා වෙලන්නෙකු මෙන් නැවත නැවත වෛර බඳීද? ඔහුගේ වෛරය නොසන්හිඳී ඔහු දුකට පමුණුවන්නේය. යම් කෙනෙක් එබඳු වෛරය තමන් සිත්හි නූපදවා පවතිත්ද ඔහුගේ වෛරය වහා සන්හිඳීමට පැමිණෙන්නේය. තවද මේ සත්ව ලෝකයෙහි ‘අනත්ථම්මෙ අකරි’ යනාදිවූ නව අඝාත (වෛරය ඇතිවීමට හේතුවන කරුණු නවයක්) වස්තූන් කරණ කොටගෙණ උපදනා වෛරයෝ කෙළ කුණු මලමුත්‍රාදී අසූචි වැකිතැන් එම අසුචියෙන් සොධා පිරිසිදුකොට ගත නොහැක්කාමෙන් වෛරයෙන් වෛර සන්හිඳිය නොහැක්කාහ. එබඳු අසුචි වැකිතැන් පිරිසිදු දියෙන් සෝද පිරිසිදු කරන්නාසේ ක්‍ෂාන්ති මෛත්‍රී ආදිවූ ගුණයෙන්ම සන්හිඳවිය

හැක්කාහ. අවෛරයෙන් වෛර සන්හිඳවීම පෙර බුදුවරයන් ගියාවූ මාර්ගයෙක්මය. තවද සගමැද කෝලාහල කරණකල්හි අපරීක්ෂාකාරීව නුවණැති භික්ෂූහු අපි හැමවෙලේම මරු මුඛයට යම්හ යි නොසලකන්නාහ. මෙයින් යම් නුවණැති භික්ෂුකෙනෙක් අපි සතතයෙන් මරුමුඛයට යම්හයි (නිරන්තරයෙන් මරණයට ලඟාවන බව) නොසලකා ඒ විවාද සන්හිඳීමට උත්සාහ නොකරෙත් නම් ඔවුන් නිසා ඒ විවාදය සන්හිඳෙන්නේය. තවද සත්වයන්ගේ ඇට බිඳ තලා පණ ගන්නා රජදරුවෝ පවාත් අවාහ විවාහ සම්බන්ධයෙන් මිත්‍රභාවයට පැමිණ සමගිව වාසය කෙරෙතියි, මහණෙනි, ක්ෂාන්තිය (ඉවසීම) ගුරුකොට පැවිදිවූ තෙපි කවර හෙයකින් එසේ නොවව්ද? ඉදින් යමෙක් නුවණැතිව තුනුරුවන්හි හටගත් සැදැහැති තමා හා එක්ව වසන්ට නිසිවූ ධෛර්‍ය්‍ය සම්පන්න කල්‍යාණ මිත්‍රයෙකු ලද්දේ වීනම් ඒ තෙම තමාට වන්නාවූ සියළු උපද්‍රව දුරුකොට සතුටු සිත් ඇතිව සිහි නුවණින් යෙදී වාසය කරන්නේය. තවද මෙලෝ පරලෝ වැඩ නොදන්නා අඥානයන් හා එක්ව විසීමට වඩා ඇත් රලින් වෙන්ව වල්හි (වනයේ) උදකළාව වසන්නාවූ මේ පාරිලෙය්‍ය නම් හස්තිරාජයාගේ ගණය හැර (පිරිසෙන් ඈත්ව) තනිව විසීම උතුම් වන්නේය”යි තිලෝගුරු බුදුරජාණන් වහන්සේ නොයෙක් කාරණා කියාත් ඒ කලහාකාරී භික්ෂූන් සමගි කොටගත නොහී බාලකලෝනකාර නම් ගමට වැඩ එහි භගු නම් තෙරුන් වහන්සේට සමගිව විසීමෙහි අනුසස් වදාරා එයින් තුන් කුලපුතුන් වසන තැනට වැඩ සමගි වාසයෙහි අනුසස්

වදරා එයින් පාරිලෙය්‍ය නම් වනයට වැඩ එහි තුන්මසක් වාසයකොට නැවත කොසඹෑ නුවරට අවුත් සැවැත්නුවරට වැඩිසේක.

එකල කොසඹෑ නුවර උපාසකවරු "මේ භික්ෂූහු අපට අනර්ත්‍ථකාරීහ (අවැඩ කරන පිරිසක්). මුන් කරණ පීඩා ඉවසාගත නොහී අප බුදුරජාණන් වහන්සේ වැඩිසේක. අපි මුන් වහන්සේලාට නමස්කාර නොකරම්හ යි සිඟා ආකල ආහාර නොදෙම්හ. එකල මොහු දුරයාමක් හෝ සිවුරු ඇරීමක් බුදුන් පැහැදවීමක් හෝ කරති"යි සනිටුහන්කොට එසේම කළාහුය.

භික්ෂූහුද ඔවුන් පැවැත්වූ දඬුවමින් පීඩාවට පැමිණ සැවැත්නුවරට ගොස් බුදුන් ක්‍ෂමා කරවූවාහුය.

මෙසේ භාග්‍යවත් වූ සර්‍වඥයන් වහන්සේ මේ ජාතකය ගෙනහැර දක්වා පූර්‍වාපරසන්‍ධි ගළපා වදාළසේක.

"එකල්හි දීඝායු කුමාරයාගේ පිය රජ්ජුරුවෝ නම් දැන් සුද්ධෝදන මහරජ්ජුරුවෝය. එකල්හි ඔහුගේ මෑණියෝ නම් දැන් මහාමායා දේවිය. එකල්හි දීඝායු කුමාරයෝ නම් සියළුසත්‍වයන් කෙරෙහි පතළකරුණායෙන් සමතිස් පෙරුම්පුරා සවාසනා සර්‍වක්ලෙශයන් (වාසනා සහිත සියලු කෙලෙස්) ප්‍රහීණකොට බුදුවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ වදාළසේකි.

# 417. මහ ගිරා ජාතකය

තවද ආත්මාර්ත්‍ථ පරාර්ත්‍ථ (තමාගේ යහපතත්, අනුන්ගේ යහපතත්) සාධනයෙන් ලොකොත්තමවූ (ලොවට උතුම් වූ) ගෞතම නම් අප බුදුරජාණන් වහන්සේ එක්සමයක දෙව්රම් වෙහෙර වැඩවසන සමයෙහි එක් මහණකු අරභයා මේ ජාතක ධර්‍මදේශනාව ගෙණහැර දක්වා වදාළසේක.

ඒ මහණතෙම බුදුන් කෙරෙන් කමටහන් ගෙන කොසොල්දනව්වට ගොස් එක් පසල්ගමක් (පිටිසර ගමක්) නිසා විසීය.

ඒ ගම්වැසි මිනිසුන් ඒ භික්ෂුහට යාම ඊමට සැප තැනහි හෝනා ඉඳිනා සෙනසුන් කරවාදී උපස්ථාන කළාහුය. ඔහු වස් විසූ පළමුවැනි මස ඒ ගම ගින්නෙන් ද ගියේය. වපුල බිජු පමණකුදු (ගොවිතැක් පවා විනාශ වූ බව) නොවීය. එයින් ඒ ගම්වැස්සෝ ඒ මහණට පිණිබොජුන් (ප්‍රණීත ආහාර) දෙන්නට නොහැකිවූහ.

ඒ මහණද සැපසේ සෙනස්නෙහි වසන්නේ සැප අහර නොලැබීමෙන් සතරමග සතරඵලයට පැමිනෙන්ට නොහැකිවිය. වස් තුන්මස ඉක්බිති බුදුන් වඳිනට ගියාහ. ඕහට සර්‍වඥයන් වහන්සේ පිළිසඳර කතාකොට “කිමෙක්ද? මහණ, අහරින් දුකෙක් නැද්ද? සෙනසුන් සැපදැ?”යි විචාරා වදාළසේක. ඒ මහණද එපවත් බුදුන්ට දැන්විය.

එකල්හි බුදුරජානන් වහන්සේ "මහණ, මහණුන් විසින් නම් සැප සෙනස්නක් ඇත. ප්‍රත්‍යයෙහි ලොල්ව (සිව්පසයට ගිජුව) හැසිරීම් හැර ලද මේ කිසිවක් අනුභව කොට මහණදම් පිරියයුත්තේය. පෙර නුවණැත්තෝ තිරිසන් යෝනියෙහි ඉපද තමා වසන රුක මළ කල්හි එහි සුනු (දිරා හැලෙන කුඩු) අනුභව කරන්නාහුම ලෝභසඞ්චාරය (ලෝභීව හැසිරීම) හැර මිත්‍රධර්මය නොබිඳ අන්තැන්හි නොගොස් විසුවාහුය. තෝ කවර හෙයකින් ආහාර ස්වල්පය රූක්‍ෂය සැප (තරමක් අපහසුකම් ඇති) සෙනස්න හැර ආයෙහිදැ?" යි වදරා ඔවුන් විසින් ආරාධිතවූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

පෙර එක් කලෙක හිමවත දිඹුල්වනයෙක (විශාල දිවුල් වනයක) නොයෙක් දහස් ගණන් සුවගණයා (ගිරව් සමූහයක්) විසූහ. ඔවුන් අතුරෙහි එක් ගිරවෙක් තමා ලත් නාරුක ඵල කල ඵල අනුභවකොට සෙසු කල කොල, දළු, සුබුළු කා ගඟ දිය බී යැපී උන් රුකින් අන් රුකකට නොගොස් අපිස් සතොස් (ලද දෙයින් සතුටුව) ගුණයෙන් වෙසෙයි.

ඔහුගේ මෙම ගුණමහිමයෙන් ශක්‍රභවනය කම්පාවිය. එවිට දහස් නැණසකින් සක්වළ බලන සක්දෙව්රජානෝ එබඳු ගුණවතුන් ඒ බෝසතුන් දැක ඔහු ගුණ විමසනු සඳහා තමා මහිමයෙන් හිමවත සුහුඹුල් දිඹුල්රුක (සරුවට තිබුනු දිවුල් ගස) නොවෙලා වියලා වෙලෙප් දලු කොළ සුඹුළු නැති

උඩින් යටින් ඇඳුරු සිදුරු නැති සිදුරුව සුනු වෑහෙන දිරුණු කණු පමණක් කෙළේය.

ගිරාරජද එසේ වුවද එහි සුනු අනුභවකොට ගගින් පැන් බී ලොබින් අන් රුකත් කරා නොගොස් අවු සුලඟින් දිඹුල් සිදුරු ඇතිව එම දිඹුල් කණුව මත්තෙහි උන්නේය.

එසඳ සක්දෙව් රජද පෙරසේ "ඔහුගේ මිත්‍රගුණය ලොවට දන්වා ඒ රුක අමාඵල ගන්වා එමි"යි හංසරාද වෙසින් එම වෙස්ගත් සුජාතාවන් හා සමග අවුත් ඒ දිරුනුතුරට නුදුරු තුරු අතුරෙක හිඳ මහ බෝසතාණන් වහන්සේ සමඟ කථාකරණුයේ "එම්බා ගිරා රජ්ජුරුවෙනි, තොපගේ පියාපතර මෙන් නිල්වූ අතුපතුරෙන් නිලඹරසේ හොබනාවූ (නිල් අහස මෙන් බබළන) තොපගේ තුඩ වැනි රන්විලිකුන් ඵලයෙන් පියුම්රාමිණිරුවන් (පද්මරාග මාණික්‍යයෙන්) ගහණ නිල් ජලතලාවක් මෙන් බබලන බොහෝ දිඹුල් රුක් මෙහි හාත්සප රුඳි සිටියේය. එතකුදු වුවත් තෝ මළ කණුවෙහි බැඳි (දිරච්ච කණුවක රුඳි) ඉන්නාක් මෙන් මේ මළ කණුවෙහි උන්නේය. කවර හෙයකින් මේ කණුමරවැල්ලෙහි ආලය කෙළෙහිදැ?"යි විචාළේය. එබසට ගිරා රජ්ජුරුවෝ "එම්බල හංසය, බොහෝ දවස් මේ ගස වැස රසඵල විලිකුන් (ඉදුණු ගෙඩි) අනුභව කළම්හ. එයින් රුක ඵල නැතත් පළමුවෙන් සිත්ම (මුලින් පවති හිතවත් බව දැනුත් ඇකි බව) දැනුත් තරකරම්හ. හංසරාද මේද එක් සත්පුරුෂ ධර්මයෙකැ"යි කීයේය.

එබසට හංසරාජතෙම "එම්බා ගිරා රජ්ජුරුවෙනි, වගුල කොල ඇති වියළි මළගස පක්ෂීහු විපක්ෂී මෙන් (පක්ෂීන් නොවන්නාක් මෙන්) නිරපේක්ෂව (බලාපොරොත්තුවක් නැතිව) හැරයෙති. ඒ පක්ෂීන් එසේ යාමෙහි තොපි කවර දෝෂයක් දැක නොයව්දැ"යි විචාළේය. එසේ විචාළාවූ හංසයාට කාරණා දක්වන්නාහු මහබෝසතාණන් වහන්සේ "එම්බල හංසය, යම් පක්ෂිකෙනෙක් ඵල කැමැත්තාවූ රුක් සේවනය කෙරෙද්ද? ඵල නැති කල නිෂ්ඵලය යි හරිද්ද? අත්වැඩ මිස පරවැඩ නොතකන ඒ පක්ෂීහු මිත්‍ර පක්ෂය නසන හෙයින් පක්ෂපාත නම් වෙති"යි වදාළසේක.

එබසට ඒ හංසතෙම "එම්බා ගිරා රජ්ජුරුවෙනි, යහළු බවද මෛත්‍රියද කාමරාග විස්වාසයෙන් අන්‍යවූ ප්‍රකාශ විශ්වාසයද යන මේ උතුන් ගුණායන් යමෙක් කැමැත්තේ වීනම් ඒ නුවණැත්තවුන් විසින් ප්‍රසංසා කටයුතු වන්නේය. ඒ ගුණයෝ තොප කෙරෙහි ඇත්තාහ. එයින් මරාමිණින් නිපන්නාක් වැනි (මරකත මැණිකකින් කළාක් වැනි, කොළපාට මැණික් විශේෂයක්) පියාපතරින් හා රන් මැණිකෙන් කළාක් වැනි මුව තුඩින් රුවන් රුවක් මෙන් බබලන අනගි ගුණමිණිගණගිහිණි (ගුණ නැමති මැණික් සමූහයෙන් යුක්තවූ) ගිරා රජ්ජුරුවෙනි, තොපට සතුටුවූ වරයක් දෙන්නෙමි, තොප කැමැත්තක් ඉල්වා ගණුව"යි කීයේය.

එබසට බෝසතානන් වහන්සේ වදාරණසේක් "එම්බල හංසරදළ, අද යම් වරයක් දෙනු කැමැත්තෙහි නම් හුනු දිරුණු

මේ රුක්කණුව පිරුණු රුකක් මෙන් ඵල පත්‍ර ශාඛාවෙන් සැරහුනා දක්නා කැමැත්තෙමි. ඒ එසේමය. මා හැඟි නිධානයක් (වටිනා නිධානයක්) ලද දිලින්දක්හු මෙන් මෙවන් රුක දැක නිරන්තරයෙන් සතුටු වෙම්ද? එබඳු වරයක් දෙව"යි වදාළසේක.

එසඳ සක්දෙව්රද හංස වේසය හැර දිව්‍යවේසය ගෙණ සුජාතාව හා සමග නොපමාව දිය ගෙණවුත් අමාවක් මෙන් ඒ රුක්හි නමාලීය. එකෙණෙහි ඒ රුක්කණුව බෝසතානන්ගේ සිහිල් කුලුණු ගුණවත් (කරුණා ගුණයට) සෙවන කෙරෙමින් පිරුණු බුදුකුරුදම් (පාරමී ධර්‍ම) ලොවට පහලවන්නාක් මෙන් තුරුණු අකුරු (තරුණ අංකුර) දළුපතර මියුරු රසඵල විහිදී අතුපතර ඇතිව පෙණුනේය.

එසේ පහළවූ රුක දැක සක්දෙව් රජහට සතුටුව ස්තුති කරණ මහබෝසතානන් වහන්සේ "එම්බා සක්දෙව් රජානෙනි, අද මේ නොමද පෙලෙන් මනනද (ගෙඩි වලින් අඩු නැති) මේ රුකලක් මම පැහැද යම් සැපයකට පැමිණියෙම්ද? එසේම තොපිද සුරරද ඉසුරෙන් ඇමසඳ සුවපත් වේවා"යි වදාළසේක. එසඳ සක්දෙව් රජාණෝ මෙසේ බෝසතානන්ගේ සිත සතුටුකොට අහසට පැණනැගී අවට පිහිටි රුවන් දෙරටු දහසකින් සැදුම්ලත් තමන්ගේ පුරයටම ගියේය.

අප තිලෝගුරු සම්‍යක් සම්බුද්ධ රාජෝත්තමයන් වහන්සේ මේ ධර්‍මදේශනාව ගෙණහැර දක්වා වදරා "මහණෙනි, මෙසේ පුරාතනයෙහි නුවණැත්තාවූ තිරිසන් ජාතියෙහි ඉපිදත්

ප්‍රත්‍යලෝභය (සිවුපසයට ගිජු නොවීම) හැර වාසය කළාහුය. තෝ මේ නෛර්‍යාණික (නිවණට පමුණුවන) ශාසනයෙහි මහණව කවර හෙයකින් ප්‍රත්‍යලෝභයෙන් යුක්තව හැසිරේදැ?”යි අවවාදකොට කමටහන් දී ඕහු පළමු විසූ තෙනටම ගමන් කරවූ සේක. ඒ මහණද එතැන්හි ගොස් පඤ්චස්කන්ධය ඛයවයහෙයින් (ඇතිවන නැතිවන ස්වභාවය) දක්නේ රහත් ඵලයට පැමිණියේය.

පෙර ඒ අප ලත් රුක සඵල කළ සක්දෙව් රජාණෝ නම් දැන් මේ ශාසනයෙහි කිසිකෙනෙකුන් විසින් විරුද්ධ නොකොටහැකි ගුණමහිම ඇති අනුරුද්ධ ස්ථවිරයෝය. දිරා වගුළතුර (දිරාපත් කඩා හැලෙන ගස) නොහැර මිතුරු ගුණ පුරා ඒ ගිරා රජ්ජුරුවෝ නම් දැන් සව්නේ දැන විනේදන නිවන්පුර ලන මම්ම වේදැ”යි තමන් වහන්සේ ගෙණහැර දක්වා වදාළසේක.

(තවත් පොතෙක මෙසේ එයි)

තවද ආත්මාර්ථ පරාර්ථ සාධනයෙන් ලොකොත්තමවූ ගෞතම නම් අප බුදුරජාණන් වහන්සේ එක්සමයක දෙව්රම් වෙහෙර වැඩවසන සමයෙහි එක් මහණකු අරභයා මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාළසේක.

ඒ මහණතෙම බුදුන් කෙරෙන් කමටහන් ගෙන කොසොල්දනව්වට ගොස් එක් පසල්ගමක් නිසා විසීය.

ඒ ගම්වැසි මිනිසුන් ඒ භික්‍ෂුහට යාම ඊමට සැප තැනහි හෝනා ඉඳිනා සෙනසුන් කරවාදී උපස්ථාන කළාහුය. ඔහු වස් විසූ පළමුවෙනි මස ඒ ගම ගින්නෙන් දා ගියේය. වපුල බිජු පමණකුදු නොවීය. එයින් ඒ ගම්වැස්සෝ ඒ මහණාට පිණ්ඩ බොජුන් දෙන්නට නොහැකිවූහ.

ඒ මහණද සැපසේ සෙනස්නෙහි වසන්නේ සැප අහර නොලැබීමෙන් සතරමග සතරඵලයට පැමිනෙන්ට නොහැකිවිය. වස් තුන්මස ඉක්බිති බුදුන් වඳිනට ගියාහ. ඕහට සර්‍වඥයන් වහන්සේ පිළිසඳර කතාකොට "කිමෙක්ද මහණ, අහරින් දුකෙක් නැද්ද? සෙනසුන් සැපදැ?"යි විචාරා වදාළසේක. ඒ මහණද එපවත් බුදුන්ට දැන්විය.

එකල්හි බුදුරජානන් වහන්සේ "මහණ, මහණුන් විසින් නම් සැප සෙනස්නක් ඇත, ප්‍රත්‍යයෙහි ලොල්ව හැසිරීම් හැර ලද මේ කිසිවක් අනුභව කොට මහණදම් පිරියයුත්තේය. පෙර නුවණැත්තෝ තිරිසන් යෝනියෙහි ඉපද තමා වසන රුක මළ කල්හි එහි සුනු අනුභව කරන්නාහුම ලෝභසඞ්චාරය හැර මිත්‍රධර්‍මය නොබිඳ අන්තැන්හි නොගොස් විසුවාහුය. තෝ කවර හෙයකින් ආහාර ස්වල්පය රූක්‍ෂය සැප සෙනස්න හැර ආයෙහිදැ?" යි වදරා ඔවුන් විසින් ආරාධිතවූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

එක් සමයෙක්හි හිමවත දිඹුල්වනයෙක නොයෙක් ලක්‍ෂ ගණන් ගිරව් විසූහ. එයින් එක් ගිරා රජෙක් තමා වසන රුක

ගෙඩි ඇති කල්හි ගෙඩි අනුභවකොට ඒ නැති කල්හි දළු, කොල, සුඹුළු අනුභවකොට ගගින් පැන් බී අනික් රුකකට නොගොස් අපිස් සතොස් ව වසන්නේය.

ඔහුගේ අපිස්සතොස් ගුණයෙන් ශක්‍රභවනය කම්පාවිය. සක්දෙව්රජ විමසනුයේ ගිරා රජහු දිවසින් දැක ඔහුගේ ගුණ විමසනු සඳහා තමාගේ ආනුභාවයෙන් දිඹුල්රුක දිරවා අතු වෙලෙප් නැති, කණු පමණක් කෙළේය. ඒ තෙම උඩින් යටින් කළ සිදුරෙන් වැහෙන සුනු පමණක් ඇතිව සිටියේ ඒ ගිරා රජද ඒ සුනු අනුභවකොට ගගින් පැන් බී අවු සුළගින්වන් දුක් නොතකා දිඹුල් කණුව මත්තෙහි උන්නේය.

ඒ දුටු සක්දෙව් රජ එහුගේ උතුම් ගුණය දැක ඔහු ලවා මිත්‍රගුණය කියවා වරයක් දී දිඹුල් රුක අමාඵල කොට එමියි සිතා එක් හංසරාජ වේසයක් මවාගෙන එම හංසධෙනුව සුජාතා නම් අසුරකන්‍යාවත් ඉදිරිකොට දිඹුල් වනයට ගොස් ඒ මළ රුකට නුදුරු තෙනක හිඳ ඒ ගිරාරජහු හා සමග කථාකරණුයේ “එම්බා ගිරා රජ්ජුරුවෙනි, මිත්‍රභාවය නැසුනු රුක යම්කලෙක මධුරඵල ඇත්තේද එකල පක්ෂීහු අත්තෙන් අත්තට පැන ඇවිද ඵල අනුභව කෙරෙති, යම් කලෙක ඵල නැත්තේ ද එකල ඵල නැතැයි දැන ඒ ඒ දිග යන්නාහු වෙති. පබළු කලඹක්* (*කඩක්) මෙන් රත්වූ මුඛතුඩයක් ඇතිව වසනකල වෙනෙහි පලාවන් පැයමෙන් නිල්වූ පියාපත් ඇති එම්බා ගිරාරජ්ජුරුවෙනි කුමක්නිසා තෙපි වනාහි මේ දිරැණු කණුව මත්තෙහි සෝකව සිතා හිඳිනාහු ද, ඵලාඵල

නිසා වෙනෙහි හැසිරීම යහපත, කුමට මෙහි නිරාහාරව ඉඳ මියව්ද? තොප මෙම කණුවේ නොහැර ඉඳිනා කාරණය මට කියවයි කීයේය. ඒ ගිරාරජ හංසයාට තමා කෙළෙහි ගුණ දන්නා බව හා එයින් ඒ රුක නොහරනා පරිදි කියන්නේ "එම්බල හංසය, යම් කෙනෙක් යම් කෙණෙකුන්ට යහළුවූනම් නුවනැත් මහතුන් ගුන සිහිකරන්නා වූ ඔහු තමන්ගේ යහළුවන් භෝග සම්පත්තියෙන් පිරිහුනත් ජීවිතාන්තය දක්වා සුවදුක්හි ඔහුන් නොහරණාහුමය. මමත් ඒ සත්පුරුෂයන් අතුරින් එක්තරා එකකිමි. එයින් මේ රුක මට ප්‍රිය වඩන හෙයින් ඤාතීද වන්නේය. එක්ව බොහෝ කලක් පුරුදු බැවින් මිත්‍රද වන්නේය. එබැවින් මගේ දිවි රැකීම නිසා පිරිහුනාවූ මේ රුක් කනුව හැර අන්තැනකට නොයෙමි. එසේ යාම ගුණධර්මීයෙක් නොවෙයි" කීයේය.

එකල සක්දෙව්රජ වරයක් දෙනු කැමැත්තේ පක්‍ෂපත්‍රයම යානාවක් කොට අහස ධාරණය කරන්නාවූ එම්බා ගිරා රජ්ජුරුවෙනි, මිත්‍රභාවය ස්නෙහය ප්‍රකාශ වූ විස්වාසය යන මේ ගුණ තුන යමෙක් කැමැත්තේ වීනම් ඒ නුවනැත්තාවුන් විසින් ප්‍රශංසා කරනු ලබන්නේය. ඒ සියළු ගුනයෝ තොප කෙරහි ඇත්තාහුය. එසේ හෙයින් තොපට වරයක් දෙනු කැමැත්තෙමි. තොප කැමති දෙයක් ගනුවයි කීයේය.

ඒ අසා ගිරා රජ්ජුරුවෝ වර ඉල්වන්නාහු එම්බල හංසය මේ රුක නැවත ඕජා සහිත වේද, විහිදුනු අතුපතරින් හා හටගත් මධුර ඵලයෙන් යුක්ත වේද ඒ වරය කැමැත්තෙමි

කීහ. එසේ කී ගාරා රජහට වරදෙන්නාවූ සක්දෙවුරජතෙම එම්බා ගිරා රජ්ජුරුවෙනි එසේ උවහොත් මහත් අතුපතරෙන් හා ඵල පත්‍රයෙන් යුක්තවූ මේ රුක නොදක්නෙහිය. මේ රුක හා තාගේ සහවාසයද වන්නේය. ඇසිල්ලකින් මේ රුක නොදක්නෙහිය, මේ රුක මධුර ඵලගෙණ සිටින්නේ යයි කියා ඒ ශක්‍රදෙවෙන්‍ද්‍රතෙම තමාගේ හංසවේසය හැර සුජාතාවන් සමග දිව්‍යරූපයෙන් සිට ගඟින් දියගෙන දිඹුල් කණුවෙහි වත්කලේය. එකෙණෙහි ඒ කණුව අතුවෙලෙප් දළු කොල මිහිරි ඵල ගෙණ මුඩු (*මිඩි) නිල්මිණි පවුරක් මෙන් බබලමින් සිටියේය.

ඒ දැක සක්දෙව් රජහට ස්තුතිකරණ ගිරාරජ්ජුරුවෝ "එම්බා ශක්‍රදෙවෙන්‍ද්‍රයෙනි අද මේ ඵල පත්‍රශාඛාවෙන් විචිත්‍ර වූ මේ රුක දැක යම්බඳු සතුටකට පැමිණීයෙම්ද තොපිද එසේ තොපගේ නෑයන් හා සතුටුව"යි කීයේය. ඉක්බිති මෙසේ ඒ වෘක්‍ෂය පත්‍රශාඛාවෙන් සරහා තමාගේ දිව්‍යපුරයටම ඒ ශක්‍රදෙවෙන්‍ද්‍රතෙම ගියේය.

අප තිලෝගුරු සම්‍යක් සම්බුද්ධ රාජෝත්තමයන් වහන්සේ මේ ධර්‍මදේශනාව ගෙණහැර දක්වා වදාරා "මහණෙනි, මෙසේ පුරාතනයෙහි නුවණැත්තාහු තිරිසන් ජාතියෙහි ඉපදත් ප්‍රත්‍යලෝභය (සිවුපසයට ගිජු නොවීම) හැර වාසය කළාහුය. තෝ මේ නෛර්‍ය්‍යාණික (නිවණට පමුණුවන) ශාසනයෙහි මහණව කවර හෙයකින් ප්‍රත්‍යලෝභයෙන් යුක්තව හැසිරේදැ?"යි අවවාදකොට කමටහන් දී ඔහු පළමු විසු

තෙනටම ගමන් කැරවූ සේක. ඒ මහණද එතැන්හි ගොස් පඤ්චස්කන්ධය ඛයවයහෙයින් (ඇතිවන නැතිවන ස්වභාවය) දක්නේ රහත් ඵලයට පැමිණියේය.

එකල දක්දෙව්රජානෝ නම් දැන් මේ ශාසනයෙහි අනුරුද්ධ ස්ථවිරයෝය. ගිරාරජනම් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

## 418. සුළුසුව ජාතකය

තවද එක් සමයෙක්හි බිය සසර සරණ (බියකරු සංසාරයේ හැසිරෙණ) අසරණ සරණ (අසරණයින්ට පිහිට වන) කරුණානිධානවූ අප බුදුරජාණන් වහන්සේ විපත්තියට සැවැත්නුවර නොහැර දෙව්රම් වෙහෙර විහරණය (වැඩ වාසය කරණ) කරණසේක් තමන් වේරංජානුවර විසූ කරුණු අරභයා මේ ජාතක ධර්මදේශනාව දක්වා වදාළසේක.

බුදුන් වේරංජානුවර වස්වැස වස් පවරා ඒ පුරහැර දෙව්රම් වෙහෙරට පැමිණි කල්හි දම්සභා මණ්ඩපයෙහි රැස්ව උන් භික්ෂූහු "ඇවැත්නි අප තථාගතයන් වහන්සේ විපත්තියට නොපත් සම්පත්තියෙන් මහත් කැත්කුලෙහි (ක්ෂත්‍රිය කුලය, රජ කුලය) උපන් ලත් බැවින් හා සදෙස් කෙලෙස් සතුරන් (දෙස් සහිත කෙලෙස් සතුරන්) නසා නිදෙස් පිරිසිදු බුදුබැව් ලත්බැවින් ඉතා සිව්මැලිසේක. මහත් සෘද්ධිමහිම ඇතිසේක. එතකුදුවුවත් වේරංජා නුවර වැසි වේරංජා නම් බමුණාගේ පැවරීමෙන් (ආරාධනාවෙන්) වස් ලැබ වසවත්මරු කළ

සිත්පෙරළියෙන් (සිත් වෙනස් කරවීමෙන්) සිහිනොලත් ඒ බමුණාගේ එකදවසකුත් මඳකුත් ආහාරයක් නොලැබද ලොභසංචාරය (ආහාරයට ගිජුව සොයා යාම) හැර දවස් පතා නැලියක් යවසාලින් කලපිටි දියත්තකින් (යවසාල් පිටියෙන් කල තලපයක් හෝ කැඳකින්) එපමණකින් වස් තුන්මසක් අන් තැනකට නොගොස් විසූසේක. බුදුන්ගේ අපිස් සතොස් ගුණය (ලද දෙයින් සතුටුවීමේ ගුණය) ඉතා ආශ්චර්‍ය්‍යී (මහත් පුදුමයකි) ය”යි කීවාහුය.

සර්‍වඥයන් වහන්සේ එබස් දිවකණින් අසා දම්සභා මණ්ඩපයට වැඩ බුද්ධාසනයෙහි වැඩහිඳ “එම්බා මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි මෙතැන්හි කවර කථාවක් පහළකොට උනුදැ?”යි විචාරා “මෙනම් කථාවකින් යෙදී උනුම්හ”යි දැන්වූ කල්හි “මහණෙනි, දැන් සව්නේ දැන බුදුවූ බුදුවරයන්ගේ ලොල් සසරින් දුරුවීම ආශ්චර්‍ය්‍යී නොවෙයි, පෙරතිරිසන් යෝනියෙහි උපන්නාහුද ඔහු ලෝභසංචාරය හැර විසුවාහුවේදැ”යි වදරා ඒ අසනු කැමති මහණුත් විසින් ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

පෙර එක් කලෙක හිමවත තුමුල් දිඹුල්වනයෙක (විශාල දිවුල් වනයක) නොයෙක් දහස් ගණන් සුවගණයා (ගිරව් සමූහයක්) විසූහ. ඔවුන් අතුරෙහි එක් ගිරවෙක් තමා ලත් නාරුක එල කල එල අනුභවකොට සෙසු කල කොල, දළු,

සුබුළු කා ගඟ දිය බී යැපී උන් රුකින් අන් රුකකට නොගොස් අපිස් සතොස් ගුණයෙන් වෙසෙයි.

ඔහුගේ මෙම ගුණමහිමයෙන් මහමෙර ගිරිමුදුනෙහි පිහිටි පුරඳුරුපුර (සක්‍ර පුරය) කම්පාවිය. එවිට දහස් නැණසකින් සක්වළ බලන සක්දෙව්රජානෝ එබඳු ගුණවතුන් ඒ බෝසතුන් දැක ඔහු ගුණ විමසනු නිසා තමා මහිමයෙන් හිමවත සුහුඹුල් දිඹුල්රුක (සරුවට තිබුනු දිවුල් ගස) නොවෙලා වියලා වෙලෙප් දලු කොළ සුඹුළු නැති උඩින් යටින් ඇඳුරු සිදුරු නැති සිදුරුව සුනු වැහෙන දිරුණු කණු පමණක් කෙළේය.

ගිරාරජද එසේ වුවද එහි සුනු අනුභවකොට ගඟින් පැන් බී ලොබින් අන් රුකත් කරා නොගොස් අවු සුළඟින් දිඹුල් සිදුරු ඇතිව එම දිඹුල් කණුව මත්තෙහි උන්නේය.

එසඳ සක්දෙව් රජද පෙරසේ "ඔහුගේ මිත්‍රගුණය ලොවට දන්වා ඒ රුක අමාඵල ගන්වා එමි"යි හංසරද වෙසින් එම වෙස්ගත් සුජාතාවන් හා සමග අවුත් ඒ දිරුනු තුරට නුදුරු තුරු අතුරෙක හිඳ මහ බෝසතාණන් වහන්සේ සමඟ කථාකරණුයේ "එම්බා ගිරා රජ්ජුරුවෙනි, තොපගේ පියාපතර මෙන් නිල්වූ අතුපතුරෙන් නිලඹරසේ හොබනාවූ (නිල් අහස මෙන් බබළන) තොපගේ තුඩ වැනි රන්විලිකුන් ඵලයෙන් පියුම්රාමිණිරුවන් (පද්මරාග මාණික්‍යයෙන්) ගහණ නිල් ජලතලාවක් මෙන් බබලන බොහෝ දිඹුල් රුක් මෙහි හාත්සප රැඳී සිටියේය. එතකුදු වුවත් තෝ මළ කණුවෙහි බැඳී (දිරච්ච කණුවක රැඳී) ඉන්නාක් මෙන් මේ මළ කණුවෙහි

උන්නේය. කවර හෙයකින් මේ කණුමරවැල්ලෙහි ආලය කෙළෙහිදැ?"යි විචාලේය. එබසට ගිරා රජ්ජුරුවෝ "එම්බල හංසය, බොහෝ දවස් මේ ගස වැස රසඵල විලිකුන් (ඉදුණු ගෙඩි) අනුභව කළම්හ. එයින් රුක ඵල නැතත් පළමුවෙන් සිත්ම (මුලින් පැවති හිතවත් බව දැනුත් ඇති බව) දැනුත් තරකරම්හ. හංසරද මෙද එක් සත්පුරුෂ ධර්‍මයෙකැ"යි කීයේය.

එබසට හංසරාජතෙම "එම්බා ගිරා රජ්ජුරුවෙනි, වගුල කොල ඇති වියළි මළගස පක්ෂීහු විපක්ෂි මෙන් (පක්ෂීන් නොවන්නාක් මෙන්) නිරපේක්ෂය (බලාපොරොත්තුවක් නැතිව) හැරයෙති. ඒ පක්ෂීන් එසේ යාමෙහි තොපි කවර දෝෂයක් දැක නොයව්දැ"යි විචාළේය. එසේ විචාළාවූ සංඝයාට කාරණා දක්වන්නාහු මහබෝසතාණන් වහන්සේ "එම්බල හංසය, යම් පක්ෂිකෙනෙක් ඵල කැමැත්තාවූ රුක සේවනය කෙරෙද්ද, ඵල නැති කල නිෂ්පලය යි හරිද්ද අත්වැඩ මිස පරවැඩ නොතකන ඒ පක්ෂීහු මිත්‍ර පක්ෂය නසන හෙයින් පක්ෂපාත නම් වෙති"යි වදාළසේක.

එබසට ඒ හංසතෙම "එම්බා ගිරා රජ්ජුරුවෙනි, යහළු බවද මෛත්‍රීයද කාමරාග විස්වාසයෙන් අන්‍යවූ ප්‍රකාශ විශ්වාසයද යන මේ උතුන් ගුණයන් යමෙක් කැමැත්තේ වීනම් ඒ නුවණැත්තවුන් විසින් ප්‍රසංසා කටයුතු වන්නේය. ඒ ගුණයෝ තොප කෙරෙහි ඇත්තාහ. එයින් මරාමිණින් නිපන්නාක් වැනි (මරකත මැණිකකින් කලාක් වැනි, කොළපාට මැණික්

විශේෂයක්) පියාපතරින් හා රන් මැණිකෙන් කලාක් වැනි මුව තුඩින් රුවන් රුවක් මෙන් බබලන අනගි ගුණමිණිගණගිහිණි (ගුණ නැමති මැණික් සමූහයෙන් යුක්තවූ) ගිරා රජ්ජුරුවෙනි, තොපට සතුටුවූ වරයක් දෙන්නෙමි, තොප කැමැත්තක් ඉල්වා ගණුව"යි කීයේය.

එබසට බෝසතානන් වහන්සේ වදාරණසේක් "එම්බල හංසරද, අද යම් වරයක් දෙනු කැමැත්තෙහි නම් හුනු දිරුණු මේ රුක්කණුව පිරුණු රුකක් මෙන් ඵල පත්‍ර ශාඛාවෙන් සැරහුනා දක්නා කැමැත්තෙමි. ඒ එසේමය. මා හැගි නිධානයක් (වටිනා නිධානයක්) ලද දිලින්දක්හු මෙන් මෙවන් රුක දැක නිරන්තරයෙන් සතුටු වෙම්ද, එබඳු වරයක් දෙව"යි වදාළසේක.

එසඳ සක්දෙව්රද හංස වේසය හැර දිව්‍යවේසය ගෙණ සුජාතාව හා සමග නොපමාව දිය ගෙණවුත් අමාවක් මෙන් ඒ රුක්හි නමාලිය. එකෙණෙහි ඒ රුක්කණුව බෝසතානන්ගේ සිහිල් කුලුණු ගුණවත් (කරුණා ගුණයට) සෙවන කෙරෙමින් පිරුණු බුදුකුරුදම් (පාරමී ධර්‍ම) ලොවට පහලවන්නාක් මෙන් තුරුණු අකුරු (තරුණ අංකුර) දළුපතර මියුරු රසඵල විහිදී අතුපතර ඇතිව පෙණුනේය.

එසේ පහළවූ රුක දැක සක්දෙව් රජහට සතුටුව ස්තුති කරණ මහබෝසතානන් වහන්සේ "එම්බා සක්දෙව් රජානෙනි, අද මේ නොමද පෙලෙන් මනනද (ගෙඩි වලින් අඩු නැති) මේ රුක ලත් මම පැහැද යම් සැපයකට පැමිණියෙම්ද,

එසේම තොපිද සුරරද ඉසුරෙන් ඇමසඳ සුවපත් වේවා''යි වදාළසේක.

එසඳ සක්දෙව් රජාණෝ මෙසේ බෝසතානන්ගේ සිත සතුටුකොට අහසට පැණනැගී අවට පිහිටි රුවන් දෙරටු දහසකින් සැදුම්ලත් තමන්ගේ පුරයටම ගියේය. මෙසේ සියලු ලොව පතළ මහාකරුණා ඇති බුදුරජාණන් වහන්සේ මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර නිමවා වදාළ සේක.

පෙර ඒ අප ලත් රුක සඵල කළ සක්දෙව් රජාණෝ නම් දැන් මේ ශාසනයෙහි කිසිකෙනෙකුන් විසින් විරුද්ධ නොකොටහැකි ගුණමහිම ඇති අනුරුද්ධ ස්ථවිරයෝය. දිරා වගුලතුර (දිරාපත් කඩා හැලෙන ගස) නොහැර මිතුරු ගුණ පුරා ඒ ගිරා රජ්ජුරුවෝ නම් දැන් සව්නේ දැන විනේදන නිවන්පුර ලන මම්ම වේදැ''යි තමන් වහන්සේ ගෙණහැර දක්වා වදාළසේක.

# 419. හාරිත ජාතකය

තවද එක් සමයෙක්හි තුන්ලොවට පතළවන නව අරහාදි බුදුගුණයෙන් අප්‍රතිසමවූ (සම කෙනෙකු නැති) සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි චතුර්විද ආර්ය්‍ය විහරණයෙන් (සිව් වැදෑරුම් ඵලසමාපත්ති සැපයෙන්) යුක්තව වාසය කරණසේක් වස්ත්‍රාභරණයෙන් සැරහී සිටි මාගමක (කාන්තාවක්) දැක සිත උපන් බලවත් රාගයෙන් සස්නෙහි

දුකින් දිවි පවත්වන මහණෙකු අරභයා මේ ජාතකය දක්වා වදාළසේක.

දික් නිය, ලොම්, කෙස් ඇති සිවුරු හරණා කැමතිව (ගිහිවීමට) සිටියාහු දැක ඇදුරු තෙරුන් විසින් නොකමැති පරිද්දෙන් තමා කරා කැඳවාගෙණ ආ ඒ මහණහට "සැබෑද මහණ, තෝ සස්නෙහි උකටලීවූයෙහිදැ? (කළකිරුණු)"යි විචාරා "ස්වාමීනි, සැබැව"යි දැන්වූ කල්හි "ඊට කාරණා කවරේදැ?"යි වදරා "සැරහුනු ස්ත්‍රියක දැක සිත උපන් කෙලෙසුන් නිසාය"යි දැන්වූ සඳ "මහණ, කෙළෙස් නම් සියළු ගුණ නහණ කෙනෙක. මඅ ආස්වාදයක් නැත්තේය. සතර අපායෙහි උපදනේය. කේල්ශයෝ කවර හෙයකින් තා මැඩ නොපවත්නේද? ඒ එසේමය, මහමෙර පැහැර උපුටාගෙණ යන තරම් මහපවණ (මහමෙර ගසා ගෙන යාමට තරම් බලගතු සුළඟට) පරණලාපතෙක පැකිළ (පරඬලයක පැකිලී නවතින්නේ නැතුව වගේ) සිටින්නේ නොවෙයි. මේ ක්ලෙශයා නිසා බෝධිසම්භාරයන් පුරණ ලද පසේදවාහිසෙද අෂ්ටසමාපත්තියෙන් පිරිසිදු මහපුරුෂයෝ පවා ස්ත්‍රීරූපය දැක සිහිඑලවාගත නොහී ධ්‍යානයෙන් පිරිහුනාම වේදැ"යි වදරා ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්?

පෙර බරණැස් නුවර බඹදත්ත නම් රජක්හු රජ කරණ සමයෙහි අප මහා බෝසතානන් වහන්සේ අසූකෙළක් (කෝටි අසූවක්) ධන ඇති බමුණුකුලයක උපන් සේක. රන්වන්වූ ශරීර

ඡවි (ශරීරයේ හම රන්වන් පාට) ඇති බැවින් ඕහට හාරිත කුමාරයෝය යි නම් තුබුවාහුය. ඒ තෙම වැඩිවිය පැමිණ තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරීන්ගෙන් උගත් ශිල්ප ඇත්තේ දාරපරිග්‍රහකොට (අඹුදරුවන් පෝෂණය කොට) මව්පියන්ගේ ඇවෑමෙන් රැස්කොට තිබූ අසූකෙළක් වස්තු දැක මේ වස්තුව පෙණෙන්නේය. මේ වස්තුව ඉපදවූ පුරුෂයෝ දක්නා නොලැබෙති. මා විසිනුත් මරහු මුඛයට පැමිණ සුනුවිසුනු විය යුතුය (මමත් මරණයට පත්වන බව) යි මරණ භයින් භයපත්ව මහදන්දී හිමවතට වැද තවුස් පැවිදිවූ සත්වෙනිදා පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා වනමුල් වනඵල අහරින් එහි කලක් වැස ළුනු ඇඹුල් සෙවුනා පිණිස හිමවතින් බැස ගම් නියම්ගම් පිළිවෙළින බරණැස් නුවරට පැමිණ රජ උයන්ලැග දෙවෙනි දවස් බරණැස් සිඟා ඇවිදිනාසේක් රජගෙයි දොරට පැමිණිසේක.

බඹදත් රජ උන් වහන්සේ දැක පහන්සිත් ඇත්තේ කැඳවා නගන ලද සේසත් (සුදුකුඩ) ඇති සිංහාසනයෙහි වඩාහිඳුවා නොයෙක් රසබොජුන් වලඳවා අනුමෙවෙනි බණ අසා ඉතා පැහැද "වහන්ස, කොයි වඩිනාසේක්දැ?"යි විචාරා "මහරජ, වස්වසන තැනක් බලා යම්හ"යි වදාළ කල්හි "වහන්ස, එසේදැ"යි විචාරා "එසේය"යි වදාළ ඉක්බිති උන් වහන්සේ කැඳවා ගෙණ උයනට ගොස් උන් වහන්සේට හෝනා හිඳිනා සෙනසුන් කරවාදී උයන් ගොව්වා අත්පා මෙහෙවර කරණුකොට සලස්වා වැඳ අවසරගෙණ ගියේය. මහබෝසතානන් වහන්සේ එතැන් පටන් දොලොස් අවුරුද්දක්

නිබඳ රජගෙයි වළඳ උයන්හි වාසය කළසේක. එක් දවසක් බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ සතුරන් ගෙන් කිපුනු පසල් දනව්ව (පිටිසර ගමක අරගලයක්) සන්හිඳුවා ලනු පිණිස යනුවෝ "අපගේ පින්කෙත නොනසා රක්‍ෂාකරව"යි කියා මහබෝසතානන් වහන්සේ අගමෙහෙසුන් බිසවුන්ට භාරකොට ගියෝය. එතැන් පටන් දේවීතොම මහබෝසතානන් සිය අතින් වළඳවන්නීය.

ඉක්බිති එක් දවසක් මධුරාහාරය සපයා තිබා බෝසතානන් කල්යවනු යෙන් තොමෝ සුවඳපැන් නහා සීන් සිළුටු සළුවක් හැඳ සිව්මැදුරු කව්ළු දෙර හැර ඇඟ පවන් ගසමින් මිටි ඇඳෙක හොත්තීය. බෝසතානන් වහන්සේද ඉතා දහවල් කොට හැඳ පෙරව භික්‍ෂාභාජනය (පාත්‍රය) ගෙණ අහසින් ඇවිත් කවුළුදෙර සමීපයට පැමිණි සේක. වඩනා ඒ බෝසතානන් වහන්සේගේ වාක් චීවරයෙහි ශබ්දය අසා (වැහැරි සිවුරෙහි හඬ ඇසී) වෙලෙව්ව (කලබලවී) ඇඳින් නැගීසිටිනා බිසවුන්ගේ සිළුටුසළුව මදක් ලිහිල්ව ඉනින් ඉනීහිණ (දුහුල් සළුව ඉණෙන් හැලුනි). ඒ විෂභාගාරම්මණය (හේතු කාරණය, නිරුවත් කය දැකීම) මහබෝසතානන් වහන්සේගේ ඇසට අරමුණ විය. නොයෙක් කෙළ ලක්‍ෂගණන් අවුරුදු මුළුල්ලෙහි සිත් සනහා විසූ රාගය (සිත තුල යටපත් වී තිබුණු රාගික හැඟීම) පෙට්ටියක හොත් සර්පයෙකු මෙන් උත්ගතව ධ්‍යානය නැසීය. ඒ තෙම සිහි එළවාගත නුහුනුයේ ගොස් බිසව අතගෙණ ලෝකාස්වාදරතියෙන් (අඹුසැමින් ලෙස

එක්වීම) යෙදී ආහාර වළඳා නැවත උයනටම ගියේය. එතැන් පටන් දවස්පතා එසේම පැවැත්තේය.

එසේ පවත්නා තාපසයන් වහන්සේගේ ඒ රහස මුළුනුවර ප්‍රකාශ වුයේය. නුවර රැකවල සිටි අමාත්‍යයෝ ඒ බව පත්‍රලියා (පත්තිරුවක ලියා) රජ්ජුරුවන්ට ගමන් කරවූවාහුය (යොමු කරවූහ). රජ්ජුරුවෝ ඒ අසා "අමාත්‍යයෝ තාපසයන් කෙරේ මා බිඳුවනු කැමැත්තාහුවනැ"යි අදහා නොගෙණ පසල්දනව්ව සෙමෙහි තබා බරණැස් නුවරට නැවත අවුත් නුවර පැදකුණුකොට රජගෙට වැද බිසවුන් වසන ගෙට ගොස් "සැබෑද සොඳුර, අපගේ ආර්‍ය්‍ය වූ තාපසයන් වහන්සේ තොප කෙරෙහි වරදවා පැවතිසේක්දැ?"යි විචාළේය. එසඳ බිසව් "සැබැව, දේවයන් වහන්ස"යි කීවාය. එත් රජ්ජුරුවෝ අදහා නොගෙණ "තාපසයන් වහන්සේම විචාරමි"යි උයනට ගොස් බෝසතානන් වැඳ එකත්පසව හිඳ කාරණාය විචාරන්නාහු "එම්බා තාපසයන් වහන්ස, නුඹ වහන්සේ අසධර්‍ම සේවනය (කාමයේ වරදවා හැසිරීම) කෙරෙති යි අප විසින් අසනලද, කිමෙක්ද? එය සැබෑබසෙක්ද? නොහොත් බොරු බසෙක්දැ?"යි විචාළේය.

එකල්හි බෝසතානන් වහන්සේ "ඉදින් මේ රජ මා බොරුයයි කීවත් අදහාගන්නේය. එසේද වුවත් සත්‍ය වචනය වැනි මෙලොවට පිහිටෙක් නම් නැත්තේය. සත්‍ය වචනයෙන් දුරුවූ කෙණෙක් බෝමැඩ ඉඳ බුදුවන්නට නොහැකිවෙති, එයින් මා විසින් සැබෑවක්ම කිය යුතුය"යි සිතූසේක. ඒ

එසේමය, බෝධිසත්ත්වයන්ට කිසිකලෙකත් ප්‍රාණඝාතයද, අදත්තාදානයද, කාමමිත්‍ථ්‍යාචාරයද, සුරාපානයද සිද්ධවන්නේය. කවර කලෙකත් තුන් අගින්යුක්ත (කරුණු තුනකින් යුතු) බොරුව සිද්ධනොවන්නේය. එබැවින් සැබෑවක්ම කියන්නාවූ ඒ මහබෝසතානෝ "එම්බා මහරජ්ජුරුවෙනි" තොප විසින් යමක් ඇසිමි යි කියන ලදද ඒ සැබෑ දෙයක්මය. එය සියළු සත්ත්වයන් මෝහකරවන්නාවූ කාය ගුණයෙහි මමත් මුළාව අසත්පථයට (මුළාවෙහි අන්තයට ගොස්) පැමිණීයෙමි"යි වදාළසේක.

එබසට රජ්ජුරුවෝ "එම්බා තාපසයන් වහන්ස, මෙලොව ගිලන් මිනිස්සු තමන්ට උපන් ව්‍යාධිය (රෝගය) ඖෂධයෙන් සන්සිඳුවා ගනිති. උපන් පිපාසය දියෙන් සන්සිඳුවා ගනිති. නුඹ වහන්සේ වූකලී සිත උපන්නාවූ රාගය කිසිසේත් දුරු කොටගත නුහුනුසේක. එසේකල මේ සූක්‍ෂම අර්ත්‍ථ සිතීමට සමර්ත්‍ථ වූ නුවණින් (සියුම්ව සිතන්නට හැකි නුවණ) ප්‍රයෝජන කවරේදැ?"යි කීයේය. එසේ කී රජහට ඒ කෙලෙසුන්ගේ දැඩි බව හා එහි නුවණ නොපවත්නා බව දක්වන්නාවූ මහබෝසතානන් වහන්සේ,

"චත්තාරො මෙ මහාරාජ - ලොකෙ අතිබලා භුසා
රාගො දොසො මදො මොහො - යත්ථ පඤ්ඤා නසාධති"

යන මේ ගාථාවෙන් "එම්බා මහරජ්ජුරුවෙනි, මේ ලොව්හි සියළු සත්‍වයන්ට අනර්ත්‍ථ කිරීමට අසමර්ත්‍ථ වූ අධික බල ඇති වස්තූහූ සතරදෙනෙක් වෙති .ඔහු කවරේද? ශීලසමාධ්‍යාදි බොහෝ ගුණ එකවිට නසන හෙයින් රාගයද (ඇල්ම බලවත් බව) එක් බලවත් එකෙකි, ක්‍ෂාන්ති (ඉවසීම), මෛත්‍රී ආදීවූ විශිෂ්ට ගුණයන් නසන හෙයින් ද්වේෂයද (තරහ ගතිය) එක් බලවත් එකෙකි, බොහෝ කලක් පුරුදු ශීලසංවරාදීවූ සතිවිප්‍රවාසයට (සිහි මුළාව) පමුණුවා අනර්ත්‍ථකාරී හෙයින් බලමද පුරුෂමදාදීවූ (කාමුක අහංකාර ගති) මදයද ඉතා දැඩි බලවත් එකෙකි, අමෘත මහා නිර්‍වාණ ප්‍රතිලාභයට කාරණා වූ අනිත්‍ය දුක්ඛ අනාත්ම ස්වභාව පරිඥානය (තිළකුණු පිරිසිද නොදැක) මැඩ පවත්නා හෙයින් මෝහයද (මුළාව) දැඩි බලවත් එකෙකි, යම්සේ ගැඹුරු මහවතුරෙහි වැටුන එකෙක් එහි පිහිනා සිටිය නොහේද, එසේම මේ කෙලෙසුන් උපන් සිත නසන පැවති ප්‍රඥාවෙන් පිහිට නොලබන්නේය"යි වදාළසේක.

ඒ මහබෝසතානන් වහන්සේගේ තෙපුල් අසා බඹදත් රජ්ජුරුවෝ "ස්වාමීනි, තාපසයන් වහන්ස, නුඹ වහන්සේ පිරිසිදුයයි කියාද සිල්වතැයි කියාද නික්ලේශීයයි (කෙලෙස් නැතැයි) කියාද ස්වාභාවික ප්‍රඥා ඇතිසේකැයි කියාද අප විසින් සලකණ ලද්දේ වේදැ?"යි කීයේය. එබසට හාරිත තාපසයන් වහන්සේ "එම්බා මහරජ්ජුරුවෙනි, ශුභාකාරයෙන් (යහපත් අයුරින්) රාගය හා පැවැත්තාවූ ලාමකවූ අකුශල විතර්කයෝ (අකුසල සිතුවිලි) ධ්‍යානසමාපත්ති ආදී විශේෂ

ගුණයෙන් යුක්ත බලවත් නුවණැති ඍෂිවරයනුත් නස්නාහුමය''යි වදාළසේක. ඉක්බිති ඒ මහබෝසතානන්ගේ සිත උපන් කෙලෙසුන් දුරුකිරීමෙහි උත්සාහ වඩන්නාවූ බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවෝ ''එම්බා තාපසයන් වහන්ස, නුඹ වහන්සේගේ සිත උපන් මේ රාගය නම් ශරීරවර්‍ණය හා ගුණවර්‍ණය නසන්නේය. ඒ දුෂ්ටවූ රාගචේතනාව දුරුකළ මැනව. ඒ එසේමය, නුඹ වහන්සේ ලොව බොහෝ දෙනාට නුවණැති කෙනෙකැ යි අභිමතසේක්මය''යි කීයේය.

ඉක්බිති පුරණ ලද බෝධිසම්භාර ඇති ඒ මහබෝසතානන් වහන්සේ සිහි එලවා වස්තුකාම ක්ලේශකාමයෙහි ආදීනව සලකා වදාරණ සේක් ''එම්බා බ්‍රහ්මදත්ත රජ්ජුරුවෙනි, නුවණැති ඇස අන්‍ධකරණ හෙයින් මේ රාගාදී ක්ලේෂයෝ අන්‍ධකාරයක් වැන්නේය. තමන් උපන් චිත්තසන්තානයෙහි කුසල් නසන හෙයින් හා කෲරවූ විපාක (දරුණු ප්‍රතිඵල) දෙන හෙයින් විෂයක් වැන්නේය. දෙලොව නසන හෙයින් දුක්ඛදායක වෙති, එසේ හෙයින් ඔවුන් නසනු කැමැත්තාවූ මම නුවණින් මෙනෙහි කිරීමය යි කියනලද ඔවුන්ගේ උත්පත්ති කාරණා සොයන්නෙමි. මෙසේ රාගෝත්පත්ති (රාගය ඉපදවීමට) කාරණය දුටුවාවූ මම සුභනිමිත්තාදී බන්‍ධනයෙන් යුක්ත රාගය ප්‍රඥා නමැති ඛඩ්ගයෙන් (කඩුවෙන්) කපා හරිමි. මහරජ, මට මදක් අවසර දෙව''යි අවසර ගෙණ පන්සලට වැද කිසුනු මඩුල්ල බලා නැවතත් රූපාරූප ධ්‍යානයන් උපදවා අහස බද්ධපර්‍ය්‍යංකයෙන් (අරම්ණිය ගොතාගෙන) වැඩහිඳ රජ්ජුරුවන්ට ධර්‍මදේශනා කොට ''මහරජ, මම

අස්ථානයෙහි විසූනිසා (අනවශ්‍ය තැනක සිටි නිසා) මහජනයා මැද මෙබඳුවූ නින්දාවට පැමිණියෙමි. එසේ හෙයින් සත්ව සංචාර විරහිතවූ (මිනිස් ඇසුර නැති) හිමාලවනයටම යන්නෙමි. තෙපිද කුසල් කිරීමෙහි පමානොව"යි කියා රජහු අඬ අඬා සිටියදීම සත්පරාක්‍රම ඇති ඒ තාපසයන් වහන්සේ නැවත හිමාලවනයටම ගොස් නොපිරිහුනු ධ්‍යානයෙන් බ්‍රහ්මලෝකයෙහි උපන්සේකැ යි චතුස්සත්‍යය ප්‍රකාශ කොට මේ ජාතක ධර්මදේශනාව නිමවා වදාළ සේක. මේ චතුස්සත්‍ය ධර්මදේශනාවගේ අවසානයෙහි උකටලී ඒ මහණ රහත් බැව්හි පිහිටියේය.

නැවත සර්වඥයන් වහන්සේ "එම්බා මහණෙනි, එකල ඒ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ නම් දැන් මේ ශාසනයෙහි ධර්මභාණ්ඩාගාරික වූ ආනන්ද ස්ථවිරයයෝ. හාරිත තාපසයෝ නම් දැන් මේ ලොව්තුරා බුදුවූ මිමම වේදැ"යි තමන් වහන්සේ ගෙණහැර දක්වා වදාළ සේක.

# 420. රාජෝවාද ජාතකය

තවද මහර්ෂිවූ (ඉසිවරුන්ටත් ඉසිවරයෙකු වූ) සර්වඥරාජෝත්තමයානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසනසේක් රාජෝවාදයක් (රජකෙනෙකුට කළ අවවාදයක්) අරභයා මේ ජාතකය දක්වන ලදී.

මෙහි වනාහී රාජෝවාදය විස්තර වශයෙන් 'තේසකුණ ජාතකයෙ'හි පෙණන්නේය.

මෙහි සර්‍වඥයන් වහන්සේ කෝසල රජ්ජුරුවන්ට වදරණසේක් "මහරජ, පෙර රජදරුවෝ දසරාජධර්‍මයෙන් (දාන, සීල, පරිත්‍යාගාදි රාජ ධර්‍ම දහයට) අකොප්‍යව (විරුද්ධ නොවී) රාජ්‍යය කළෝ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරන්නාවූ දසරාජධර්‍මයෙන් යෙදී රාජ්ජය කෙරෙමින් තමන්ගේ නුගුණයක් කියන කෙනෙක් ඇද්දෝ හෝ යි අන්තඃපුර පිටිපුර විථිපුර නුවර මුලුල්ලෙහි පරීක්‍ෂාකොට තමන්ගේ නුගුණයක් කියන කෙනෙක් නැති හෙයින් පිටිනුවර ගොස් පිටිනුවරත් තමාන්ගේ නුගුණයක් කියන කෙනෙකුන් නොදැක "වනාන්තරයට යෙමි"යි හිමාලයට ගොස් බෝධිසත්ත්වයන් වහන්සේ තපස් කරණ පන්සලට පැමිණියහ.

බෝධිසත්ත්වයානන් වහන්සේත් රජ්ජුරුවන් දැක "ගමන් ශ්‍රමදහ (ගමන් මහන්සිය) නිවා මේ නුගපත් ශර්කරා රස (හකුරු රස නුග කොල) වැන්න මේ අනුභවකොට පැන් බී සැතපී ගණුව"යි කියා දුන්සේක.

රජ්ජුරුවෝත් නුගපත් අනුභවකොට "තාපසයන් වහන්ස, නුගපත් නම් තිත්ත රසය. මේ පැනි රසවන්ට කාරණා කිම්දැ?"යි විචාලාහ.

එවිට බෝසතානන් වහන්සේ වදාරණසේක් “පින්වත් පුරුෂය, රජදරුවන් ධර්මිෂ්ඨව රාජ්ජය කරණ හෙයින් මේ නුගපත් තිත්තරසය නැතිව පැණිරස වන්නේය”යි කීහ.

එවිට රජ්පුරුවෝ කියන්නාහු “රජ්පුරුවන් ධර්මිෂ්ඨ කල නුගපත් පැණිරස වන්නේත් අධර්මිෂ්ඨ කල තිත්තරස වන්නේත් ඊට කාරණා කිම්දැ?”යි විචාළාහ.

එවිට බෝධිසත්වයෝ කියන්නාහු “පින්වත් පුරුෂය, රජදරුවන් අධර්මිෂ්ඨවූ කල පොළොව රසයද සරියනක් පාත බැස (පොළෝ රසය රියන් හයක් යටට අඩුවන බව) පොළොව ඕජාව නැතිවෙයි. එහෙයින් නුගපත් තිත්තරස වන්නේය”යි කීහ.

එවිට රජ්පුරුවෝ “රජදරුවන් අධර්මිෂ්ඨවූ කල නුගපත් තිත්තරසය වේදැ?”යි කීය. රජ්පුරුවෝ තමන් රජබව නොහඟවා තමන් බරණැස් නුවරට ගොස් “තාපසයන් කී බස පරීක්ෂා කෙරෙමි” සිතා නොබෝ දවසක් අධර්මිෂඨව රාජ්‍යය කොට තාපසයන් කී බස සැබෑව, බොරුව පරීක්ෂාකෙරෙමි”යි “ඉදින් නුගපත් කව යි දුන්කල රජ්පුරුවන්ට තිත්තට ගියේ නම් තපසයන් කී බස සැබැව, පැණිරස වීනම් තාපසයන් කී බස බොරුය”යි සිතා මේ නියායෙන් නොබෝ දවසක් අධර්මිෂ්ඨව රාජ්‍යකොට දෙවැනිවත් හිමාලවනයට බෝධිසත්වයන් ලඟට ගියාහ. බෝධිසත්වයෝ පළමු පරිද්දෙන් “නුගපත් කව”යි දුන්හ.

රජ්ජුරුවෝ නුගපත් සපා තිත්තරස හෙයින් කෙල සමග නුගපත් ඉවත ලා "තාපසයන් වහන්ස, නුගපත් තිත්ත රසය"යි කීහ.

එවිට බෝධිසත්ත්වයන් වහන්සේ වදාරණ සේක් "පින්වත් පුරුෂය, රජ්ජුරුවන් අධර්මිෂ්ඨවූ සැටිය, එසේ හෙයින් නුගපත් තිත්ත රසය"යි කීහ. දියෙහි පීනන ලෙස තොටකින් ගොන් එළැකල පළමු පිනන්නාවූ ගොණා එල්ල තොටටම නොපීනා පාත්ව ඉවත පීනාද, සෙසු ගෙරිත් ඔහු පස්සේ පීනත්ද එසේහෙයින්ම රජ්ජුරුකෙනෙක් අධර්මිෂ්ඨව රාජ්‍යය කෙරෙත් නම් ඒ රාජ්‍ය වාසීන් අධර්මිෂ්ඨ වන්නාහ. එසේ කල්හි රාජ්‍යවාසීන්ටත් රාජ්‍යයටත් සැපයක්වත් වැඩක්වත් නොසැලසෙන්නේය. යම් තොටකින් ගොනෙකු දිය පීනන ලෙස දියෙහි එළැද, පළමු පීනන්නාවූ ගොණා වංකයක් නැතිව දිය පීනා ගොඩ නැගේද, පසුපස්සෙහි පීනන ගෙරින් ඉඳුරාම පීනායෙත්ද, එමෙන්ම රජ්ජුරුකෙනෙක් ධර්මිෂ්ඨව රාජ්‍යය කෙතේද, රාජ්‍යවාසී එපරිද්දෙන්ම වාසය කරන්නාහ. එසේහෙයින් රාජ්‍යයටත් මනුෂ්‍යයන්ටත් සියලු අභිවෘද්ධියත් (දියුණුව) සැපත් එලවන්නෙය"යි කීහ.

එවිට රජ්ජුරුවෝද "ස්වාමීනි, ආදී මේ නුගපත් පැණිරස කෙළෙමුත් මමය. දෙවැනිව තිත්තරස කෙළෙමුත් මම්මය"යි තමන් රජ නියාව අඟවා නුවරට ගොස් දසරාජධර්මයෙන් රාජ්‍යය කළාහ යි වදරා මේ 'රාජොවාද ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයන්ය. තාපසව උපන්නේ නම් බුදුවූ මම්ම වේදැ"යි වදාළ සේක.

# 421. පදමානවක ජාතකය

තවද කරුණානිධානවූ (කරුණාව තැන්පත්ව ඇති) තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි 'පියවර අසවළුන්ගෙය (අහවල් අයගේ)'යි දැන්වීම අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

සැවැත්නුවර සිටානකෙනෙකුන්ගේ පුතෙක් ඇත. ඒ පුත් වනාහි සත් අවුරුද්දක් ගිය යම්ම කෙනෙකුන්ගේ පියවර අවසළුන්ගේය යි පියවර සලකුණෝන් ගොස් උන්සිටි යම්ම තෙනකට ගොසින් සිටිනා නුවණ පහළවිය. එසේ හෙයින් ඕහට පදමානවක කුමාරයෝයයි නම් තුබූහ.

පියාණෝ පුතනුවන් පරීක්ෂාකරණ පිණිස අනික් ගෙයක සැඟවී උන්නාහ. පුතනුවෝ අවුත් පියාණන් විචාරා "ගෙය නැතැ"යි කී හෙයින් පියාණන් උන් තෙනට පියවර සලකුණෝන් ගොසින් සිටියාහ. දෙවැනි මුරයකුත් පුතනුවන් පරීක්ෂාකරනු පිණිස සිටානන්ගේ ගෙට වැද පැලදෙරින් අනික් ගෙයකට වැද ඒ ගෙයි පැලදෙරින් ගොසින් තමන්ගේ ගෙට වැද වීථියට බැස වීථියෙන් පිටත මගබලා ගොස් ජේතවනාරාමයට ගොස් බුදුන් වැඳ සිටියාහුය. පුතනුවෝ ගෙට අවුත් පියානන් විචාරා "නුදුටුම්හ"යි කී හෙයින් සිටානන් ගිය පියවර

සලකුණෝන් ගොස් අනික් ගෙයකට වැද ඒ ගෙයි පැලදොරින් තමන්ගේ ගෙට අවුත් වීථියට බැස පිටමග ඔස්සේ ගොසින් ජේතවනාරාමයට ගොසින් පියානන් ලඟ සිටියාහ. සිටානෝ සර්‍වඥයන් වහන්සේට දන්වන්නේ "ස්වාමීනි, මාගේ පුත්‍රයාට සැඟවී මෙතනට ආමි. මාගේ පියවර සලකුණෝන් සොයාගෙණ අවුය. මුන්ගේ නුවණ යහපත් නියාය"යි දැන්වූහ. සර්‍වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

හේ කෙසේද යත්?

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනකුන් රාජ්‍යය කරණ කල්හි රජ්ජුරුවන්ගේ අග්‍රමෙහෙසිකා බිසව් අනාචාරයෙහි (කාමයෙ වරදවා) යෙදී වාසය කරන්නාහුය. රජ්ජුරුවන් විසින් එපවත් අසා කෝපවූ කල කියන්නාහු අනාචාරයේ සිට "රජ්ජුරුවන් වහන්ස, මම එසේ නොකෙලෙමි. එසේවූ අනාචාරයක් කෙළෙම් නම් අස්මුහුණක් ඇතිව යක්‍ෂණීව උපදිනෙව"යි කියා බොරු දිව්ලිය (බොරුවට දිවුරීම). දිවුල නොබෝ කලකින් මිය ඒ දිව්ල පරිද්දෙන් අස්මුහුණක් ඇතිව යක්‍ෂණීව ඉපිද වෙසමුණි රජ්ජුරුවන්ට දොළොස් අවුරුද්දක් පැන් ඇද දිගින් තිස්ගව්වක් හා පලලින් පස්ගව්වක් ඇති වනාන්තරයක් මිනීකන නියායෙන් වරලැබ ගල්ගුහාවක වාසය කරන්නීය.

එසමයෙහි එක්දවසක් බ්‍රාහ්මණයෙක් තමාගේ පිරිවර හා සමගින් ගමනක් යන්නේ ඒ වනාන්තරයට පැමිණිසේක. ඒ යකින්නී දුර එන්නාවූ බ්‍රාහ්මණයා දැක එතනට පැමිණ කර

ඉඳුවාගෙන තමාගේ ගුහාවට ගෙණ ගියාය. බ්‍රාහ්මණයාගේ ශරීර පහස (සිරුර ස්පර්ෂය) තමා ශරීරයේ වැදගත් ගමනේ සමාධියෙන් (පැහැදීමෙන්) බ්‍රාහ්මණයා තමාට ස්වාමිපුත්‍රකොට තබාගෙණ ඔහුට බත්බුලත් ආදීවූ දෙය බැගින් ගෙණගොස් බ්‍රාහ්මණයාට දෙන්නීය. තොමෝ මිනීමස් කන්නීය. එ කියන බ්‍රාහ්මණයා හා යක්‍ෂණී මහත් සන්තෝෂයෙන් වාසය කරන්නාහ.

එසමයෙහි ශ්‍රීමත්වූ බෝධිසත්ත්වයෝ බ්‍රාහ්මණයානන් නිසා යකින්න බඩ පිළිසිඳ දසඑකඩමසකින් (මාස නවයයි දින 15 යි) වදාපුව. බෝධිසත්ත්වයෝ වැඩිවිය පැමිණියාහ. යකින්නී මස්කන්ට යනකල පුතනුවන් හා ස්වාමිපුත්‍රයානන් ගල්ගුහාවේ ලා "සැගවී පලායති"යි සිතා මහත් ගල්ලෑල්ලකින් දොරකඩ වසා යන්නීය. එක්දවසක් බෝධිසත්ත්වයෝ ගල්ලෑල්ල ඉවත් කොට දොරමිදුලේ සිටියාහ. යකින්නී අවුත් වැදගියාය. බෝධිසත්ත්වයෝ ගල්ගුහාවට වන්නාහ. යකින්නී "කවුරුද මේ ගල්ලෑල්ල ඉවත්කළෝය?"යි කිව. බ්‍රාහ්මණයා කියන්නේ "තොපගේ පුතනුවෝ තුළු (මෙම) ගල්ලෑල්ල ඉවත්කළෝය"යි කීහ. යකින්නී පුත්‍රසෙනෙහයෙන් කුමක් (කිසිවක්) නොකිව.

එක් දවසක් බෝධිසත්ත්වයෝ පියානන්ට කියන්නාහු "මපියානන් වහන්ස, නුඹ වහන්සේගේ මුහුණාත් මාගේ මුහුණාත් එකපෑ මුහුනුවරය (මුහුණුවර සමාන බව), මෑණියන් වහන්සේගේ මුහුණුවරය වෙනය, මීට කාරණා කිම්දැ?"යි කීහ. එවිට බ්‍රාහ්මණයා කියන්නේ "තොප හා අප හා මිනිස්සුව,

මෝ යකින්නීය"යි කියන්නා, බෝධිසත්වයෝ "මුන් යකින්නී කල අප එකතෙන වාසය කරන්නේ කෙසේදැ?"යි කියා බෝධිසත්වයන් වහන්සේ පියානන් ඇරගෙණ නික්මුණකලට යකින්නී වහා අවුත් ගල්ලෙන බලා නොදැක මගට ගොසින් දෙන්නා එක්ව අල්වාගෙණ "ඇයි බමුණ කුමක් කෙළේදැ?"යි විචාරන්නා "මම නොවෙයි දරුවෝය"යි බ්‍රාහ්මණයා කීයේය. යකින්නී පුත්‍රසෙනහයෙන් කුමකුත් නොකළීය (කිසිවක් නොකළාය).

මේ නියායෙන් තුන්වාරයක් මගට ගිය ගමනේ යකින්නී ගෙණාව. පසුව දවසෙක බෝධිසත්වයෝ සිතන්නාහු මේ නියාවට ගොසින් ගැලවිය නොහැක්ක. මාගේ මෑණියන් අතින් "ඉම විචාරාගෙණ (සීමාව අසාගෙණ) යෙමි" සිතා බෝධිසත්වයෝ මෑණියන්ට සුරතල් කොට "විචාරාගනිමි" සිතා "මෑණියන් වහන්ස, දෙමාපියන් සන්තක වස්තුනම් දරුවන් සන්තකය, එසේහෙයින් නුඹ වහන්සේ මිනීකන ඇතුලත ඉම ගම (සීමාව) මට කියන්ට උවමැනව"යි කියන්නා යකින්නී බෝධිසත්වයන්ට "අසවල් පර්වතය අසවල් ගස ඇතුළුතැන මාගේ ඉමය"යි දිගින් තිස්එක්ගව්වක් හා පළලින් පස්ගව්වක් හා ඇතුළතැන ඉම කිව.

බෝධිසත්වයෝ එක් දවසක් යකින්නී ගොදුරු කන්ට යාදී (ගොදුරු සොයා ගිය අතර) පියානන් කර ඉඳුවාගෙණ පවනට බඳු වේගයෙන් දිවගෙණ ගොස් යකින්නියගේ ඉම මධ්‍යයට පැමිණ සිටි කලට යකින්නී ගල්ලෙනට අවුත් බලා

නොදැක මහත් වේගයෙන් ඉම ඉවරට අවුත් කියන්නී "පුත තොප හා තොපගේ පියානන්ට කවර අපාසුවක් දැක මා ඇර යවුද? තොපගේ පියානන් නොදැකීමෙන් මාගේ ජීවිතය තිබෙයි යන්නක් නොසිතව"යි කියද්දීම ගඟින් එගොඩ බැස බෝධිසත්වයෝ කියන්නාහු "මෑණියන් වහන්ස නුඹ වහන්සේ යකිනියක, අපි මිනිස්සුය එක තැන වාසය කිරීම අපාසුය"යි කීහ. එවිට යකිනි කියන්නී "පුත තොප හා වියෝවීමෙන් මාගේ ජීවිතය නොතිබේ"යි (මම ජීවත් නොවන බව) කියද්දීත් බෝධිසත්වයෝ "මෑණියන් වහන්ස, නුඹ වහන්සේ කෙසේ කීවත් නුඹ යකකුව අපි මිනිස්සුව එක තැන වාසය බැරිය"යි කියා "නික්මෙමි"යි කීහ. යකින්නි "පුත තොපි ගිහිගෙයි වාසය කිරීම නොයෙක් දේ ඉගෙණ ගෙණ වාසය කරන්ට උවමැනව, දොළොස් අවුරුද්දක් කල් සොරකමෙන් වී නමුත් පදලාංඡනයකින් (පා සටහනකින්) අල්වා ගන්නා නිමිත්ත කියන්නාහු චින්තාමාණික්‍යයක් (සිතූ පැතූ සම්පත් දෙන මැණිකක්) මෙන් පෙනෙන්නාවූ යහපත් දිව්‍ය මන්ත්‍රයක් ඇත, ඉගෙණගෙණ යව"යි කීහ. ඒ "යහපතැ"යි කියා වැදඹත්තේය. මන්ත්‍රය ඉගෙණගෙණ වැඳලා "මෑණියන් වහන්ස, වැඩිය මැනව"යි කියා බෝධිසත්වයන් නික්මෙන අකාර දැක්වූ ගමනේ "පුත මා ඇරපියා යව්දැ?"යි කියා ළෙයි අතගැසූ ගමනේම (පපුවට අතින් ගැසූ මොහොතේ) ළය දෙකක්ව පැලී මළාය. බෝධිසත්වයන් හා පියානෝ දෙවෙනිව ගඟින් මෙගොඩට ඇවිත් ආදහණකොට අඬා වැලප නික්මුනාහුය.

යක් දරුවෝ වෑවෙති (සමාන වෙයි) යක් දෙමව්පියෝ නොවෑවෙති කියත. එසේහෙයින් පියානන් හා සමගව බෝධිසත්‍වයන් හා දෙදෙනා බරණැස්නුවරට ගොසින් රජ්ජුරුවන් ගේ වාසල සිට කියා යවූහ. රජ්ජුරුවෝ කියන්නාහු "සොරාගේ පියවර සලකුණෙන් ගොස් සොරකම් අසුකරන්නට වූ පදමානවකයෝ නම් තොපිදැ"යි විචාළාහ. "සබඳ දරුව, තොපි සොරකම් අසු කරන්නේය"යි විචාරන්නාවූ එවේලෙහි බෝධිසත්‍වයෝ "සැබැව ස්වාමීනි, දෙළොස් අවුරුද්දක් කළ සොරකමුත් පාදලාඤ්ඡනයකින් අල්වා පාවාදෙමි" කීහ.

රජ්ජුරුවෝ "යහපති, මා හා කැටිව සේවය කරව"යි කී ගමනේ "ස්වාමීනි, සේවාකමට සිටීමට මස්සෙන් දසක් නියාවට පඩි (මසුරන් දසක් පමණ වැටුප්) දුනමැනවැ"යි කියා සලස්වාගෙණ රජ්ජුරුවන්ගෙන් පඩිකා සේවය කරන්නාහ.

එසමයෙහි එක් දවසක් රජ්ජුරුවන්ගේ පුරෝහිත බමුණා රජ්ජුරුවන්ට කියන්නේ "ස්වාමීනි, මූ සොරකම් අසු කරම් කියති. ඒ සැබෑ බවත් බොරු බවත් නොදෙනෙයි. ඒ පරීක්‍ෂා කරන්ඩ උවමැනවැ"යි කියන්නා රජ්ජුරුවෝ "යහපතැ"යි කියා පුරෝහිතයානෝත් රජ්ජුරුවෝත් මතුමහලට නැගී භාණ්ඩ තුබු ගබඩාවේ දොර හැර ඉන් සම්පත් ඇරගෙණ ඉණිමගින් පාත බැස රජගේ වට තුන්විටක් ඇවිද පහුරේ ඉණිමග වතුරුවා (පෙරලා) ඊපිටින් බැස අධිකරණ ශාලාවේ නැතක් වේලා සිට දෙවැනිව ඉණිමගින් ඇතුළට අවුත් මගුල් උයනේ පතස

වටකොට (වලක් වටේ) තුන් විටක් ඇවිද පතස ඇතුලේ ගෙණගිය සම්පත් සඟවා තබා රජගෙට ගියාහ.

පසුව දවසක "භාණ්ඩාගාරේ සොරකම් කළෝය"යි නුවර මුලුල්ල (නගරය පුරා) ප්‍රකාශ විය. රජ්ජුරුවෝ බෝධිසත්‍වයන් කැඳවා කියන්නාහු "ඊයේ රෑ උඩුමාලේ ගබඩාවේ සොරකම් කොට ගත්තාහ, අපට අල්වාදෙව"යි කීහ.

බෝධිසත්‍වයෝ උඩුමාලට නැගී මන්ත්‍රය දුන් මෑණියන් වහන්සේට නමස්කාර කොට කියන්නාහු "දේවයන් වහන්ස, මෙතැන සොරුබෑය, (සොරුන් දෙදෙනා) අධිකරණ ශාලාවේ මදක් වෙලා සිට දෙවැනිව එම ඉණිමගින් පතසට ගොසින් පතස වට තුන්විටක් ඇවිද පතසට බැස දියෙහි තුබූ සම්පත් ඇරගෙණ රජ්ජුරුවන්ට දුන්හ. එවිට සියදහස් ගණන් මනුෂ්‍යයෝ දස සියගණන් පිළි ඉස සිසාරා (වස්ත්‍ර ඉස වටා කරකවා) නැටුම් ඔල්වරසන් දී මහත්වූ සන්තෝෂවූහ.

රජ්ජුරුවෝත් එවිට "සොරකම් කල සොරුන් නම අපට කිව මැනව"යි කී කල්හි "ස්වාමීනි, සම්පත් තිබූ පසු සොරුන්ගෙන් ප්‍රයෝජන කිම්ද? සොරකම් කල සොරුන් නම මම දනිමි. මම නොකියමි. මෙතනමය"යි කීහ. රජ්ජුරුවෝ "සොරුන්ගේ නම අසන්ට උවමැනව"යි තත්පරව (දැඩිව) කියන්නාහු බෝධිසත්‍වයෝ "ස්වාමීනි, සොරුන් නම කිය නොහැක්කේය. බොහෝ සම්පත් ඇති මනුෂ්‍යයෙක සොරකම් කළේය. නම් කී කල බොහෝ දෙනා විපක්ෂ වන බැවින් අසවල්හු යයි නම කිය නොහැක්ක, කාරණයෙක් දක්වමි"

කියා කියන්නාහු "රජ්ජුරුවන් වහන්ස, යටගිය දවස බරණැස්නුවර පාඨළි නම් විද්දතෙක් (වීණා ශිල්පයෙක්) ඇත. ඒ විද්දතා ගඟින් එතර ගමනක් යන්ට යයි කියා යන තැනැත්තේ ගඟට බසිනා ගමනේ ගඟවතුර හෙයින් වීණාව තමාගේ බොටුවේ බැඳගෙණ අඹුව උරෙහි එල්වාගෙණ ගඟින් එගොඩ පිනන කලට ගඟ මධ්‍යයෙහි වීණාවට දිය ඉකී මියන්ට වන්කලට අඹුව අතහැර ගොඩපිනා සිට කියන්නේ "දැන් මදකින් තොප පැන් බී මියෙහි, තොප බොහෝ ගී දන්නෙහි වේද? ඉන් ගීයක් මා රැකෙණ නියායෙන් (මාගේ ජීවිකාව පිණිස) උගන්වා ලව"යි කිව.

එවිට විද්දතා කියන්නේ "මියෙන කල තොපට කුමන ගීද උගන්වන්නේය"යි කියා කියන්නනේ "පැන් මුල්ව පිපාසා පටන් ආදිවූ දෙයද අනිකුත් බොහෝ වැඩියේ යෙදෙන්නාවූ පැනින් මා මරණකල මා කළමනා කිම්දැ?"යි කීයේය. "එමෙන් සියළු මනුෂ්‍යයන්ට අභිවෘද්ධිදයකවූ (දියුණුව සලසන) කෙනෙකුන් විසින් වූ දෙයක, එසේ හෙයින් සොරකම් කළවුන් කියනොහැක්ක. ස්වාමීන්ඩම දැනෙයි"යි කියද්දීත් තත්පරවම රජ්ජුරුවෝ "සොරුන්ගේ නම කියන්ට උවමැනවැ"යි කියන්නාහ. එවිට බෝධිසත්වයෝ "රජ්ජුරුවන් වහන්ස, අසවළුනැයි කීමෙන් බොහෝ උපද්‍රව සැලසෙ"යි කියන්නාහු "රජ්ජුරුවන් වහන්ස, මෙම නුවර එක් කුඹලෙක් වලකින් පස් කපා මැටිගෙණ පිටතව යන්නේ එම මැටි ගත් වල දවසක් වැසීමෙන් දියපුරා වැසින. කුඹලා මැටි කපමින් සිට කියන්නේ

"මට ප්‍රතිෂ්ඨාවූ (පිහිට වූ) හැමිය නිසා මට භය පැමිණෝන්නේය"යි කීය.

එමෙන් "රජ්පුරුවන් වහන්ස, මේ සොරකම කළවුන්ගේ නම කිය නොහැක්ක, නම් කීමෙන් බොහෝ අලාභයට මූලික වෙයි. නුඹ වහන්සේටත් සොරුන්ගේ නම් දැනෙයි" කියාදීත් "මට මේ ව්‍යාඛ්‍යාන (අර්ථ නිරූපනයන්) කීමෙන් ප්‍රයෝජන නැත. සොරුන්ගේ නම මට කියන්ට උවමැනැව"යි කීහ.

නැවත බෝධිසත්ත්වයෝ කියන්ට භයකෙරෙයි කියා අනික් කාරණාවක් දක්වමින් කියන්නාහු "රජ්පුරුවන් වහන්ස, මෙම නුවර පුරුෂයෙකුගේ ගෙයක් ගින්නෙන් වැදගෙණ ඒ ගෙයි ගිනි වැදගත් පුරුෂයා තමාගේ ගෙයි සම්පත් දොරට දෙමින් සිට අනික් පුරුෂයෙකු කැඳවා තමාගේ සම්පත් ඇද පිටතට ලාපියව"යි කියන්නා "යහපතැ"යි සහායව ගෙන් පිටතට සම්පත් අදිනා කලට දොර වැසීගිය හෙයින් දුම් සිසැරී දොරකඩ සොයාගත නොහන තැනැත්තේ සියළු ආහාරයන්ද පිසින්නාවූ සීත කාලයෙහි සීත නිවාරණය වන්නාවූ සියළු කුණප දවා අන්තර්ධාන කරන්නාවූ ගින්නෙන් මෙසේවු භය කරන්නේ කිම්දැ?"යි කීවාසේම "රජ්පුරුවන් වහන්ස, සොරකම් සැලසුනේ සියලු සතුන්ට ප්‍රතිෂ්ඨාවූ තැනකින. මා අමුතුව අසවළුනැ යි කීවමනා දැ?"යි කීහ. එසේ කියෙද්දීත් රජ්පුරුවෝ "මට වඤ්චාකොට කීමෙන් ඒ නොදැනෙයි, සොරු අසවළුය යි කිය මැනවැ"යි කීහ.

බෝධිසත්ත්වයෝ නැවත කාරණක් දක්වා කියන්නාහු "රජ්ජුරුවන් වහන්ස, මේ නුවර පුරුෂයෙකු වාතව්‍යාධි රුජාවෙන් (වාත අමාරුවකින්) පීඩිතව පෙළෙමින් සිට කියන්නේ "සියළු සත්ත්වයන්ටද දුහකරණ අවස්ථාවෙහි දුහ සන්හිඳුවන්නාවු පවනින් මට ආයාස (වෙහෙස) පමුණුවන්නාහුය". "එමෙන් සියළු මනුෂ්‍යයන්ට වැඩදායක කෙනෙකුන් කළ සොරකමය. එසේහෙයින් කියනොහැක්කැ"යි කීහ. "මේ ව්‍යාඛ්‍යාන කීමෙන් මට ප්‍රයොජ්න නැතැ, සොරුන් අසවළුයයි කියව"යි කීහ.

බෝධිසත්ත්වයෝ නැවත කාරණ දක්වන්නාහු "රජ්ජුරුවන් වහන්ස, මෙම නුවර එක් පුරුෂයෙක් බත් අජීර්ණකොට කා දිරවා ගත නොහැකි තැනැත්තේ කියන්නේ සියළු මනුෂ්‍යයන් ජීවිතාරක්‍ෂා වන්නේය. එසේවූ බත්කා දිරවාගත නොහී ප්‍රාණය යන්නේයයි ඇඩීය. එමෙන් සියළු මනුෂ්‍යයන්ට ප්‍රතිෂ්ඨාව යසදායක (කීර්තිය දෙන) තැනකින්ම කළ සොරකමය. එසේහෙයින් කිය නොහැක්කේය"යි කියදීත් තත්පරවම "සොරුන්ගේ නම කියමැනවැ"යි කීහ.

නැවතත් බෝධිසත්ත්වයෝ අනිත් කාරණක් කියන්නාහු "රජ්ජුරුවන් වහන්ස, හිමාලය වනයෙහි එක් මහ වෘක්‍ෂයෙක බොහෝ පක්‍ෂි වාසය කරන්නාහ. ඒ වෘක්‍ෂයේ අතු දෙකක් ඊ ඊ ගැටී ගිනිවැදගත. ඊ පක්‍ෂීන්ට නායක වූ පක්‍ෂියා කියන්නේ "තොපට පළමු ප්‍රතිෂ්ඨාවූ වෘක්‍ෂයෙන්ම ගිනි ගැටී වෘක්‍ෂය දවන්නේය. තොප දන්නා යම් අතකට ගොස් ජීවත්ව"යි කී

කල්හි ඒ ඒ අත ගියහ. එමෙන් රජ්ජුරුවන් වහන්ස, සියලු මනුෂ්‍යයන්ට ප්‍රතිෂ්ඨා කෙනෙකුන් වහන්සේ කීකල සොරකම හෙයින් කිය නොහැක්කෙමි" කීහ. රජ්ජුරුවෝ "වංචාවෙන් මෙසේ කීවයි අදහා නොගනිමියි සොරකම් කළෝ අසවල්ලුයයි කියව"යි කීහ.

බෝධිසත්වයෝ නැවතත් කියන්නාහු "රජ්ජුරුවන් වහන්ස, කාරණාවක් දක්වමි. ඒ කෙසේද යත්, මේ නුවර බොහෝ කිඹුලුන් ගහණවූ ගඟක් සමීපයෙහි ගමෙක එක්තරා පුරුෂයෙක් තමාගේ කණවැන්දඹු මවක් රකිනේය. එකියන පුරුෂයාගේ මවු "දරුවෝ මට බොහෝ දුක්ගෙණ පෝෂ්‍ය කරන්නාහ. එසේහෙයින් මුණ්ට බිරින්දක් ගෙණෙමි සිතා එක්තරා ස්ත්‍රියක් ගෙණවිත් සරණපාවා දුන. ඒ ස්ත්‍රිය පුරුෂයාට දරුවන් වදා ඒ ගෙට වල්ලභ ස්ත්‍රී වූහ. ඒ ස්ත්‍රී තමා නැන්දාට කනස්සළුව බොහෝ නුගුණ කියන්නී "නුඹදෑගේ මෑණියන්දෑ මේ ගෙයි ඉන්දෑ නම් මා මේ ගෙයි ඉන්නේ නැත" ඒ කාන්තව කියන්නීය. ඒ පුරුෂයා කියන්නේ "එසේ කල කුමක් කරමෝදැ"යි කීහ. "කිඹුල්ලු බොහෝ ඇති ගඟ දමාපුවොත් යහපතැ"යි කියා "තොපගේ මෑණියෝත් අපගේ මෑණියෝත් එකතැන සැතපෙති. එසේහෙයින් ඇඳ සලකුණට වැලක් බඳව"යි කීහ. "යහපතැ"යි කියා ගොසින් නැන්දා වැදෙත් (වැතිරී සිටින) ඇඳ වැලක් බැඳ අවුත් සැමියාට කිව. ඒ පුරුෂයා කියන්නේ "මිනිසුන් වැදේනා තුරු නිදාපියව"යි කියා බිරින්ද අස්වසාලා නිදිගන්වා මධ්‍යම රාත්‍රී වෙලෙහි තමාගේ මෑණියන් ඇඳ බැඳලු ලණුව තමාගේ

බිරින්දගේ මැණියන් වැදේනා ඇඳ බැඳලා අඹුව පුබුදුවාගෙණ ගොසින් දමමි කියා ලණුව අල්වාගෙණ ගොස් ඇඳ ඔසවාගෙණ ගඟට ගෙණගොස් මැල්ල ගඟ මධ්‍යයට දැමූහ. මැල්ල දැමු ගමන් කිඹුල්ලු ගසා කාපූහ.

පසුවදා පාන්වූ පසු ස්ත්‍රිගේ මැණියන් නැතිව පුරුෂයාගේ මැණියන් උන්නා දැක "මාගේ මැණියන් දමාපුවේය. තොපගේ මැණියෝ උන්නේය. උනුත් මරන්ට උවමැනව"යි කීහ. එසේකල "කෙසේ මරමෝදැ" විචාළෝය. "ගඟට දමන්ට බැරිය අමුසොහොනක දමාපියව"යි කිවුය. "යහපතැ"යි කියා මැල්ල වැද නිදන කලට මධ්‍යම රාත්‍රියෙහි දෙන්න කැටිව ඇඳ ඔසවාගෙන අමුසොහොනට ගෙණ ගොස් ඇඳ තබලා පුරුෂයා කියන්නේ "ගිනි ගෙනාවේ නැත. තොපි ගොසින් ගිනි ඇරගෙණ එව"යි අඹුවට කිව. අඹුව "තනිව ගිනි ගෙණ නොහෙමි" කිව. "එසේ වීනම් දෙන්නම ගොසින් ගෙණෙමිහ"යි කියා දෙන්නම ගියාහුය. ඒ පවනන් ඇතිතෙන පවන් ඇවිත් ඇඟ වැදගත්තේය. මැහැලි වහන්සේ පිබිද නැගීසිට වටපිට බලා අමුසොහොනන නියාව දැන "මා මරන්ට කළ උපායක් වේදැ"යි සිතා එතන තිබූ මිනියක් ඔසවා ඇඳ තබාලා ඉනකඩකින් වසාගිය තැනැත්තී සොරුන් සොරකම්කොට අවුත් වස්තු තුබු ගල්ලෙනට වැදගියාය.

දෙමල්ලෝ ගිනිගෙණවිත් මැල්ලයයි සිතා දවාපියා ගෙට ගියාහ. සොරුන් තමන් වස්තු තිබූ ගල්ලෙනට අවුත් එහි උන් මැල්ල දැක "යකින්නියකැ"යි යන භයින් යකදුරකු ලඟට

ගොසින් "මේ සැටි යකින්න පහකරන්නට මට භාරය"යි කියා ගල්ලෙන සමීපයට ආකල්හි මැලි කියන්නී "මම යකකු නෙවෙමි, තොපසේම මිනිස්සුය"යි කිව. "එසේ වීනම් තොප අඳහාගන්නේ නැතැ"යි කීය. මැලි කියන්නී "එසේ වීනම් තොප හා මා හා දිවෙන් දිව ගෑවොත් විනා නැත්නම් සැක ඇත්තෙමි"යි කී හෙයින් යකදුරාත් එම නියාවට සිටිසඳ දිව දික්කොටලී. මැහැලි දිව ඩැහැගත්තීය. තමන් කටට දිවින් කැබැල්ලක් කඩාගත්තාහු.

එවිට යකදුරා හයින් දිව අවුත් කියන්නේ "යකින්න නියාව සැබෑමය"යි කියන්නා සොරු දිවපුවාහුය. මැහැලි ගල්ලෙන තුබූ රත්‍රන් අත කර ලාගෙණ යාපත් පිළි හැඳ යහපත් පිළි පෙරවා ගෙණවුත් තමාගේ පුත්‍රයාගේ ගෙට වන්හ. එවිට යෙහෙළනියෝ දිවගෙණවුත් වැඳ "ඇයි නැන්දනියෙනි, නුඹ දවාපුවෝවේද කෙසේ ආද?"යි විචාළීය. මැලි කියන්නී "අමුසොහොනේ දැවූවන් මේ ගෙට එනමනාය"යි කීව.

එබසට යෙහෙළනියෝ තමන්ගේ සමනන්ට (සැමියාට) කියන්නාහු "මාත් එසේම සැරහීගෙණ එන නියායෙන් එම අමු සොහොන දවාපුව මැනවැ"යි කිව. "යහපතැ"යි කියා තමාගේ අඹුව ගෙණගොස් අමුසොහොනේ දවාපුව. පසුව දවස් තමාගේ මෑණියන් ආ වේලාවට නොඑන හෙයින් කියන්නේ "මෑණියෙනි, මාගේ බිරින්ද නේනට කාරනා කිම්ද? ඊයේ නුඹ මේ වේලෙහි ආයේවේද? අද මුන් නේනට කුමන කාරණායෙක්දැ?"යි විචාළේය. මැලි කියන්නී "දවාපු මිනිස්සු

ගෙට එද්දැ?යි පුතනුවෙනි, තොප වඩා වර්ධනය කොට තොපගේ ඓශ්වර්ය්‍යී බලමි සිතා තොපට බිරින්ද ගෙණවිත්ලා රැකෙන්ට උන්නෙමි. තොපගේ බිරින්දගේ බස් ගෙණ මා මරන්ට උත්සාහ කළා වේදැ?"යි කියා "එමෙන් ප්‍රතිෂ්ඨාවූ ස්ථානයෙකින්ම මේ සොරකම් පැමිණෙන්ට උවමැනවැ"යි කීය.

එවිට රජ්ජුරුවෝ "මෙසේ සඟවා කීමෙන් අපට නොදැනෙයි, සොරා අසවලායයි අපට කිවමැනව"යි කියන්නාහු "සොරකම් කළෝ අසවල්ලුය යි කියව, නොකීවොත් තෙපිය සොරකම් කෙළේය"යි කීහ. එවිට බෝධිසත්‍වයෝ "ඒසේ වීනම් මාගේ වරද නැතැයි නුවරවාසීන්ට දෙස්ගන්වා කියන්වාහු අසව මේ නුවර සොරකම්කළෝ රජ්ජුරුවන් හා පුරෝහිතයාය. තමා සොරකම්කොට අනුන් සොරකම් කරති" කීහ. එවිට අසා සිටි සේනාව ඉසකට කැටක් කැබලිත්තක් බැගින් ගසා (හිසට ගල් ගසා) රජ්ජුරුවනුත් පුරෝහිතයාත් ජීවිතක්‍ෂයට පමුණුවාපුවහ"යි වදාරා මේ 'පදමානවක ජාතකය' නිමවා වදාළ සේක.

"එසමයෙහි බෝධිසත්‍වයන්ගේ පියානෝ නම් සුද්දෝධන රජ්ජුරුවෝය. මෑණියෝ නම් මහාමායා දේවිය. එසමයෙහි සොරකම ඇල්ලු බෝධිසත්‍වයෝ නම් බුදුවූ මම්මය"යි වදාළ සේක.

# 422. ලොමසකාශ්‍යප ජාතකය

තවද එක් සමයෙක්හි විශුද්ධ ගුණමහිමයෙන් (පිරිසිදු ගුණ බලයෙන්) ලෝක ප්‍රසිද්ධවූ සම්‍යක් සම්බුදුරාජෝත්තමයානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසනසේක් උකටලී (කළකිරුණු) මහණකෙනෙකුන් අරභයා මේ ජාතකය දක්වා වදාළසේක. ඒ මහණහට "සැබෑද මහණ, තෝ උකටලීයෙහිදැ?"යි වදරා "සැබෑව ස්වාමීනි" දැන්වූ කල්හි "මහණ, ක්ලේශයෝ තමා මහත් යසවතුන්ද (පැසසුම් ලබන්නන්) අයසට (අපකීර්තිය) පමුණුවති. පිරිසිදු සතුන්ද සකිලිටු කෙරෙති. තොප වැන්නවුන් කුමකැ යි උකටලි නොකරැද්ද"යි වදරා ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

පෙර බරණැස බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන්ගේ පුත්වූ බ්‍රහ්මදත්ත කුමාරද පුරෝහිත බමුණාගේ පුත්වූ කාශ්‍යප නම් කුමාරද යන මොහු දෙදෙන යාළුව එක ගුරුන්ගේ සමීපයෙහි ශිල්ප උගන්නාහුය. ඔවුන් දෙදෙනා අතුරෙන් බ්‍රහ්මදත්ත කුමාරතෙම පිය රජ්ජුරුවන් ඇවෑමෙන් රාජ්‍යශ්‍රීයට පැමිණියේය. "බ්‍රහ්මදත්ත කුමාර වනාහී මාගේ යහලු රාජකුමාරතෙම රාජ්‍ය සම්පත්තියට පැමිණියේය. එතෙම මට බොහෝ ඓශ්වර්‍ය්‍යී (සම්පත්) දෙන්නේය. අකුශල වර්‍ධනයට කාරණාවූ ඒ සම්පත්තියෙන් මට කවර ප්‍රයොජනද? මම මව්පියන්ද රජදරුවන්ද විචාරා පැවිදිවෙමි" සිතා ඒ තමා සිතූ ලෙසම මව්පිය දෙදෙනා හා රජ්ජුරුවන් විචාරා හිමාලය

වනයට ගොස් තවුස් පැවිදිව සත්වෙනිදා පඤ්චාභිඥා අෂ්ට සමාපත්ති උපදවා නමින් ලෝමසකාශ්‍යපය යි ප්‍රසිද්ධව ඇවිදිලි අහරින් (පිඬු සිඟමින්) යැපී දවස් හරන්ණේය. එතෙම වසඟවූ (හික්මවන ලද) පසිඳුරන් ඇත්තේය. ඝෝරවූ (උග්‍ර දැඩි) තපස් ඇත්තේය. ඔහුගේ තපෝ තේජසින් ශක්‍රභවනය කම්පා වූයේය.

ඒ විමසා බලන්නාවූ සක්දෙව් රජතෙම ඒ ලෝමසකාශ්‍යපයන්ගේ තපෝ තේජසිනැයි දැන "මේ තාපසයෝ ඉතා උග්‍රවූ තපෝ තේජස් ඇත්තේය. ඉදින් සිතුවානු නම් ශක්‍ර සම්පත්තිය පැහැරගන්ට සමර්ත්‍ථයෝය. එබැවින් බරණැස් රජ්ජුරුවන් හා සහායකොට ගෙණ ඔවුන්ගේ තපෝ තේජස් බිඳපුව මැනවැ"යි මධ්‍යම රාත්‍රියෙහි බරණැස් රජ්ජුරුවන්ගේ ශ්‍රීයහන් ගබඩාව තමාගේ ශරීරසෝභාවෙන් බබුලුවා අහස සිට "මහරජ නැගිටුව"යි කීයේය. "තෝ කවරෙක්දැ?"යි කී කල්හි "ශක්‍රදේවේන්ද්‍රයෝ නම් මමය"යි කීය. "කුමට ආයෙහිදැ?"යි විචාළ කල්හි "මහරජ, තොපි සියළු දඹදිව එක්සත්කොට රජකරණු කැමැත්තෙහිදැ?"යි විචාරා "ඒ කුමක් නියා නොකැමැතිවෙද්දැ?"යි කී කල්හි එසේ වී නම් "මහරජ, තෝ ලෝමසකාශ්‍යපයන්ගෙන්වාගෙණ පසුඝාතයාගය (සිව්පාවුන් නසා කරණ යාගය) කරව, එයින් තෝ මා මෙන් අජරාමර වෙයි. සියලු දඹදිව එක්සත් කරන්නේය"යි කීයේය. ඔහුගේ බස් බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ "යහපතැ"යි පිළිගත්තාහුය.

ශක්‍රදේවේන්ද්‍රයාද "එසේ වීනම් මහරජ පමා නොව"යි කියා දිව්‍ය පුරයටම ගියේය.

දෙවැනි දවස් බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ සය්හ නම් අමාත්‍යයා කැඳවා "යහළු, තෙපි මාගේ ප්‍රියයහළු වූ ලෝමසකාශ්‍යප තාපසයන්ගේ සමීපයට ගොස් අපගේ රජ්ජුරුවන් වහන්සේ තාපසයන් ලවා පසුඝාත යාගය කරවා සියලු දඹදිව එකරජකරණු කැමතිසේක. නුඹවහන්සේ යම් පමණක් ඊට කැමැතිසේක් වීනම් සියල්ල දෙනසේක. මා හා සමග වැඩිය මැනව යි කියා කැඳවාගෙණ එව"යි කීයේය. ඒ අමාත්‍යයාද "යහපතැ"යි පිළිගෙණ තාපසයන් වසන තැන නොදැන නුවර බෙර හසුරුවා පිරිවරින් ඒ බෝසාතානන් වසන තැනට ගොස් තාපසයන් වහන්සේ වැඳ එකත්පස්ව හිඳ රජ්ජුරුවන් කී අසුන් (පණිවිඩය) දැන්වූයේය.

එකල්හි ඒ ලෝමසකාශ්‍යපයන් වහන්සේ "එම්බා සය්හ අමාත්‍යයෙනි, තොපි කුමක් කියව්ද? සක්වලගළ අවසන් කොට ඇති මහාසමුද්‍රයෙක්හි පලනාලද රත්නකුණ්ඩයක් (රන් කරාබුවක්) මෙන් බලා සියළු ජම්බුද්වීපය මට දෙතත් පසුඝාත යාගයෙන් ප්‍රාණඝාත කොට නින්දිතව ලබන්නාවූ ඓශ්වර්‍ය්‍යී මමත් නොකැමැත්තෙමි. යම් ජීවිකාවක් තොප අපායට පමුණුවන්නාවූ අධර්‍මය මුල්කොට පවතීද, එබඳු සැපත් ලැබීමට මම්ම නින්ද කරන්නෙමි. ඒ එසේමය, මෙලොව යමෙක් ලග්නා පැල් පමණක් (නතරව සිටින්නට පැලැක්වත්) නැතිව භික්ෂා පාත්‍රය අතින්ගෙණ සිගා ජීවිකාව කෙරෙද්ද,

යමෙක් අධර්‍මයෙන් මුළු ලොව වසඟකොට රාජ්‍යශ්‍රී විඳිනේද, ඔහුගේ ඒ රජසුව වැලඳිමට වඩා භික්‍ෂාචාරයෙන් ජීවත්වන්නාවූ ඒ දුක්ඛිතයාගේම ජීවිකාවම සියදහස්ගුණයෙන් උතුම් වන්නේයයි වදාළසේක.

උන් වහන්සේ බස් ඇසූ සය්හ අමාත්‍යතෙම නැවත බරණැස් නුවරට ගොස් රජ්ජුරුවන්ට එපවත් දැන්වීය. "එසේ නොවඩිනා කල කුමක් කරමෝදැ"යි රජ නිරුත්සාහ විය. නැවත ශක්‍රදේවේන්‍ද්‍රතෙම මධ්‍යම රාත්‍රියෙහි අවුදින් අහස සිට "කිමෙක්ද මහරජ, ලෝමසකාශ්‍යප තාපසයන් කැඳවා යාග නොකරන්නේහිදැ?"යි විචාළේය. "ශක්‍රදේවේන්‍ද්‍රයෙනි, කැඳවා ගමන් කරවුම්හ. නොවඩනා සේකැ"යි කීයේය.

ඒ බසට ශක්‍රදේවේන්‍ද්‍රයෝ "එසේ වීනම් මහරජ, තොපගේ චන්‍ද්‍රාවතී කුමාරිකාවන් සර්‍වාභරණයෙන් සරහා සය්හ අමාත්‍යයා හා සමඟ ගමන් කරවා ඉදින් යාග කළහොත් තොපට රජ්ජුරුවෝ මේ කුමාරිකාවන් දෙන්නාහුය යි කියවා ලව. ඒකාන්තයෙන් මේ කුමාරිකාවන් කෙරහි පිළිබඳ සිත් ඇති තාපසයෝ එන්නාහුය"යි කීයේය.

එබසට බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝද එබස් අසා "යහපතැ"යි පිළිගෙණ දෙවැනි දවස් චන්‍ද්‍රාවතී කුමාරිකාව සරහා සය්හ අමාත්‍යා හා සමඟ ගමන් කරවූහ. එසඳ ගොස් මහබෝසතානන් වැඳ පිළිසඳර කථාකොට දිව්‍ය කණ්‍යාවක් වැනිවූ රාජ කුමාරිකාවන් තාපසයන් දක්වා තෙමේ එකත් පසෙක සිටියේය. ඒ ලෝමසකාශ්‍යපයෝද ඉන්‍ද්‍රිය සංවරය බිඳ

ඒ කුමාරිකාවන් දෙස බැළුවාහුය. ඈ කෙරෙහි පිළිබඳ සිත් උපන් හෙයින් ධ්‍යානයෙන් පිරිහුණාහුය.

සය්හ අමාත්‍යයා තාපසයන් කුමාරිකාව කෙරෙහි පිලිබඳ සිත් ඇති බව දැන "තාපසයන් වහන්ස, නුඹ වහන්සේ ඉඳින් යාග කරනසේක් විනම් අපගේ රජ්ජුරුවෝ තොපට මේ කුමාරිකාවන් අත්පා මෙහෙකරණ පිණිස දෙනනාහුය"යි කීයේය. එබසට තාපසයෝ රාග චේතනාවෙන් කම්පාවූවාහු "කිමෙක්ද, මේ කුමාරිකාවන් මට දෙද්දැ?යි විචාරා "එසේය යාගකරන්නාවූ තොපට දෙන්නාහුය"යි කීකල "යහපත එසේ විනම් යාගය කරමි"යි කියා කුමාරිකාවන් හා සමග රථයානාවකට නැගී ජටාමඩුලු නොහැර තවුස්වෙසින්ම බරණැස්නුවරට ආයේය.

එසඳ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝද තාපසයන් එති යනු අසා යාගාවාටයෙහි (යාග භූමියෙහි) කර්‍මාන්ත පටන්ගැන්වූවාහු ආවාවූ ඒ තාපසයන් දැක "එම්බා තාපසයෙනි, සෙට යාගය කරම්හ, ශක්‍රයාසේ අජරාමරව යාගය කළ අවසන තොපට දියණියන් පාවාදෙමි" කීයේය. ලෝමසකාශ්‍යපයෝද "යහපතැ"යි පිළිගත්තාහු බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝද දෙවැනි දවස් තාපසයන් කැඳවාගෙණ චන්ද්‍රාවතී කුමාරිකාවන් හා සමග යාගකරණ තැනට ගියේය. එතැන්හි හසත්‍යස්ව ගවමහිසාදිවූ (ඇත්, අස්, ගව, මීගව) සියළු සිවුපාවෝ බැඳ සිටුවන ලද්දාහුය.

ඒ ලෝමසකාශ්‍යප තාපසයෝද ඔවුන් මරා යාග කරන්නට පටන්ගත්තාහු ඉක්බිති එතැන්හි රැස්වූ මහජනයෝ “එම්බා තාපසයෙනි, මේ තොපට සුදුසු නොවෙයි, තපස්වීව සිට ප්‍රාණඝාතකර්‍මී නොකරව”යි කියා නැවතත් කියන්නාහු “මෙලොව ඝණාන්ධකාර (ගණඳුර) නැසීමට ඉර සඳ දෙදෙනාහැර වෙන බලවත් දෙයක් නැත්තේය. චන්ද්‍ර සූර්‍ය්‍යයෝ එම්බා තාපසයෙනි, බලවත්වෙති. ඉෂ්ටා නිෂ්ටවූ (සුභ අසුභ) අරමුනු වේග ඉවසීමෙහි හෙවත් සිත උපන්නාවූ රාගද්වේෂයන් සන්හිඳීමෙහි සිල්වත් මහණ බමුණෝම ලොව බලවත් වෙති. මහමුහුද දියකඳ නවතාලීමට වෙරළ බලවත් වන්නේය. මේ සියලු බලවත් සතුන්ට වඩා සියල්ලවුන් තමා වසඟ කරණ හෙයින් ස්ත්‍රීහුම ඉතා බලවත් වෙති. දැන් මෙලොවට ප්‍රත්‍යක්‍ෂවන නියාය. ඒ එසේමැයි, සියල්ල නිරාලයව හැර (ආසාවක් නැතිව) උදකලාව මහවලට (මහා වනාන්තරයට) වැද පැවිදිව උග්‍රවූ තපෝ තේජස් ඇතිව අහසින් යන තරම් ඍද්ධිමහිම ඇතිව වසන මේ ලෝමසකාශ්‍යප නම් තාපසයානන් චන්ද්‍රවතී නම් රාජකුමාරිකාතොමෝ තමා වසඟකොට පියානන් උදෙසා වාචාපෙය්‍යය යාග (වචනයට පමණක් සීමාවූ යාගය) කරණසේ යොදා සතර අපායෙහි උපදවා දුක් දෙන්නාවූ ප්‍රාණඝාත කර්‍මය කරන්නී වේදැ”යි කීවාහුය.

එසමයෙහි ඒ ලෝමසකාශ්‍යප තාපසයෝ යාග කරණු පිණිස මඞ්ගල හස්තියාගේ ග්‍රීවය ගෙණ දකුණතින් කඩුව ගෙණ ඔසවාගත්හ. එකෙණෙහි හස්තිරාජතෙම මරණභයින්

තැතිගෙණ මහත්කොට නාද කෙළේය. ඔහුගේ බැගෑ අඬ අස අසා සෙසු චතුෂ්පාද ජාතිහුද එසේම නාදකළාහු. ඒ දුටුවාවූ මහජනයෝ මහත් අඬින් (මහ හඬින්) ඇඬුවාහුය. තාපසතෙම ඔවුන්ගේ අඬ අසා මහත් කොට කළකිරීමට පැමිණියේය. තමාගේ තවුස්වෙස් බැලීය. එකෙණහි පළමුවෙන් සිත උපන් රාගය මුළාව සලකාගත නුහුනු ජටාමඬුල්ලද දික්ව තිබෙන දැලිරැවුළුද ළෙහි රෝමයන්ද දැක තවුස්වෙස්නියාව දැන "ඉතා නුසුදුසු පාපකර්‍මයෙක් මා විසින් කරණ ලදැ"යි සිත උපන් උද්වේගය එතැන්හි ප්‍රකාශකොට කියනුයේ "චන්‍ද්‍රවතී කුමාරිකාව කෙරෙහි ලෝභය උපදවා ඒ නිසා මා විසින් යම් මේ අකුශල කර්‍මයක් කරණලදද, ඒ දැඩිවූ දුක්ඛවිපාක දෙන්නේය. මෙසේ අකුශල කිරීමට කාරණා කවරේදැයි බලන්නාහු මම නුනුවණින් සලකාගැන්ම යයි කියන ලද අයෝනිසෝ මනස්කාරයම (සිහි නුවණ නොමැති බව) දිටිමි. එසේහෙයින් මේ කඩුවෙන් මට කම් නැත. ප්‍රඥා නැමති කඩුව ගෙණහැර සුභනිමිත්තය හා බැඳී පවත්නාවූ මේ රාගය කපා හරින්නෙමි" කීයේය.

එබස් ඇසූ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ "එම්බා තාපසයන් වහන්ස, දැන්ද මේ චන්‍ද්‍රවතී කුමාරිකාවන්ද මේ රාජ්‍යයද සත්රුවන් රැසක්ද දෙමි. තොපි භය නොගෙණ යාගය කරව"යි කීයේය. එබසට තාපසයන් වහන්සේ "එඹා රජ්ජුරුවෙනි, ඉතා බොහෝ ඓශ්වර්‍ය්‍යයි දෙමි කීවත් කාමසම්පත්තියට මම නොකැමැත්තෙමි. තොප දෙමි කී චන්‍ද්‍රවතී කුමාරිකාවන්ද රාජ්‍යයද තොපටම වේව යි මම

වනාහි අපේක්‍ෂාවක් නැත්තෙමි" කියා ඒ ජනමාධ්‍යයෙහිම සිට කිසුනු භාවනාකොට (කසින භාවනාව) ධ්‍යාන උපදවා අහස ඌරුබඩාසනයෙන් (අරමිණිය ගොතාගෙන) ඉඳ රජහට ධර්මදේශනා කොට පින් කිරීමෙහි පමා නොවන ලෙස අවවාදකොට යාග ශාලාව බිඳුවා සියලු මහජනයාට අභය ඉල්වා දී රජහු යාඥ කළද අහසින්ම තමා වසන තැනටම ගොසින් ජීවිතාන්තය දක්වා බ්‍රහ්මවිහාර භාවනා කොට බඹලොව උපන්සේකැ යි මෙසේ මේ ජාතක ධර්මදේශනාව දක්වා චතුස්සත්‍යය ප්‍රකාශකොට පූර්වාපර සන්ධිගලපා නිමවා වදාළසේක. චතුස්සත්‍ය ධර්මදේශනාවගේ අවසානයේ උකටලී මහණ රහත් ඵලයට පැමිණිසේක.

"එකල්හි සය්හ අමාත්‍යයෝ නම් දැන් මේ ශාසනයෙහි ශාරිපුත්ත ස්ථවිරයයෝය. ලොමස කාශ්‍යප තාපසයෝ නම් දැන් ලොව්තුරා බුදුවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ ගෙණහැර දක්වා වදාළ සේක.

# 423. සක්වාද ජාතකය

තවද එක් සමයෙක්හි දෙව් බඹ නා සුර ගරුඬ ගුරුළු මිණිරැස් දියෙන් දෙව් සිරිපා පියුම් ඇති ගොයුම්ගොත්හි උපන් අප බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර සිව්බඹ විහරණයෙන් (මෙත්තා, කරුණා, මුදිතා, උපේක්‍ෂා) විහරණය කරණසේක් ප්‍රත්‍යයෙහි (සිව්පසට) ලෝභී සිත් ඇති එක්තරා මහණකු අරභයා මේ ජාතක කථාව ගෙණහැර දක්වා වදාළසේක.

ඒ මහණ ඉතා තමා ප්‍රත්‍යයෙහි ලෝභී හෙයින් ඇදුරුවත් (ආචාර්ය්‍ය වත්) තෙරවත් (තෙරුන් වහන්සේලාට කළ යුතු වත්) ආදිය උදාසීනව නොකර හැර උදෑසනම සැවැත්නුවර විශාඛා මහා උපාසිකාවන්ගේ නිවෙසනට ගොස් වැඩහිඳ නොයෙක් අවුළු හා සමග එලවූ කැඳ වළඳ දනවල් රසමසවුලෙන් යුත් පිණිබොජුන් (ප්‍රණීත ආහාර) අනුභව කොට එයින් තෘප්තියට නොගොස් සුළුඅනේපිඬු මහසිටානන් කොසොල් රජුන් ආදීන්ගේ ගෙවල පස (ප්‍රත්‍ය) ලොල්ව ඇවිදිනේය.

එකල්හි එක් දවසක් දම්සභා මණ්ඩපයට වටින් ඇවිත් රැස්ව උන් භික්‍ෂූන් ඔහුගේ ලොල් අසර (හැසිරීම) අරභයා කථාවක් කිය කියා උන්නාහුය.

එකල බුදුරජානන් වහන්සේ දම්සභාවට වැඩ “මහණෙනි, මා එන්නාට පූර්‍ව භාගයෙහි තෙපි කිනම් කථාවක් කිය කියා උනුදැ?”යි විචාරා වදාරා “ස්වාමීනි, අපි අසවල් භික්‍ෂුන්ගේ ප්‍රත්‍යයෙහි ලොල් බහුලබව කිය කියා උනුම්හ”යි දැන්වූ කල්හි ඔහු කැඳවා “සැබෑද මහණ, තෝ ලෝභසචාර (ලොල්ව ඇවිදීම) ඇත්තෙහිදැ?යි විචාරා “සැබෑව ස්වාමීනි” දැන්වූ කල්හි මහණ කවර හෙයකින් ප්‍රත්‍යයෙහි ලොභ කෙරෙහිදැ යි පලමුත් තෝ ආමිසයෙහි ලොල්ව බරණැස්නුවර මහත් ඇත්කුණු ආදිය සිත්සේ අනුභවකොටත් නොපිරුණු සිත් ඇතිව එයින් ගොස් ගංගා තීරයෙහි සඤ්චාරණය කෙරෙමින් අසවල් පසල්දනව් නැති හිමව් පියසට (හිමවතට) පිවිසියෙහි

වේදැ"යි වදරා එපවත් අසනු කැමැති මහණුන් විසින් ආරාධිත වූ බුදුරජානන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බඹදත් නම් රජකු රජකරණ සමයෙහි එපුර මළ ඇත්, අස් ආදීන්ගේ කුණපයෙන් දිව්වටා (දිවි පැවැත්ම) නොපසුබට ඇවිටියෙන් (ආසාවෙන්) ඇවිදිනා කපුටුවෙක් එයින් නොසතුටුව ගොස් මස් අනුභව කෙරෙමින් ගංතෙරට පැමිණ මළ මසුන් කා කීපදවසක් එහි වැස නැවතත් එහි කළ ආලයෙන් හිමාලයට වැද නොයෙක් වනමුල් වනඵල අනුභව කෙරෙමින් ගොස් මස් කැස්බන්ගෙන් ගැවසී නිලුපුල් ඈ පස්පියුමෙන් සැදුම්ලත් පියුම් විලකට පැමිණ එහි සෙවෙල් කමින් පෙමින් උනුන් නොහැර එක්ව වසන සක්වාවන් දෙදෙනකු දැක "මොහු මනා වර්‍ණසම්පත්තිතෙයන් (ශරීර පැහැයෙන්) සමන්විතය. මොවුන්ගේ භොජනය ඉතා සිත පිනවන්නේ යයි එයින් මොවුන් කන ගොදුරු විචාරා මමත් එම අනුභව කරන්නට වීම්නම් මැනවැ"යි සිතා ඔවුන් සමීපයට ගොස් අදරින් පිළිසඳර කථාකොට විසිතුරු අතුපතරක හිඳ ඔවුන්ට ප්‍රසංශායුත් තෙපුල් (වර්ණනාත්මක වචන) බණනේ, "එම්බා පක්‍ෂිනි, රන්වන් පිළිපෙරෙවියවුන් බඳුව යුක්මව එක්ව සතුටු සිතින් මේ තැන්හි ඇවිදිනා තොපට මනුෂ්‍යයෝ කවර පක්‍ෂිකෙනෙකුනැයි කියද්ද? ඒ අපට වහා කියව"යි කියේය.

ඔහුහට තමා වංශය දක්වා කියන්නාහු සක්වා ලිහිණිතෙම, “ආමිස ලෝභයෙන් මිනිසුන්ට මෙහෙකොට හැසිරෙන්නාවූ එම්බල කපුටුව, ප්‍රිය සංවාසයෙන් එක්ව කිසි භයක් නැතිව පියුම් විල්හි වාසය කරන්නාවූ අපට සක්වා ලිහිණි නම් පක්ෂිජාතියකැයි කියාද සියළු පක්ෂීන් කෙරෙන් මොහු කල්‍යාණගුණ ඇත්තාහුය යි කියාද මනුෂ්‍යයෝ කියන්නාහුය”යි කීයේය.

එබසට කපුටුතෙම “අනින්දිතවූ (නින්ද නැති) එම්බා චක්‍රවාකයෙනි (සක්වා ලිහිණිය), තාගේ මේ ශරීර වර්‍ණය හා කායබල ඉතා අනල්පය, කිමෙක්ද? තොපි මේ සුපිපි තඹරකරෙහි (නෙළුම්) කවර ඵලයක් අනුභව කරවුද? නොහොත් ස්වර්‍ණවර්‍ණ වීමට නිසි කවර ප්‍රාණීන්ගේ ශරීරමාංශයක් අනුභව කරව්දැ?යි විචාළේය. එසඳ චක්‍රවාකතෙම කියනුයේ “එම්බල කපුටුව, මේ තටාකයෙහි අනුභව කිරීමට නිසි පලාඵලයෙක්ද නැත. මේ චක්‍රවාක ජාතියෙහි උපන් අපට මාංසයක් නම් කැලම නැත. එයින් අපි මේ පියුම්විලෙහි සෙවෙල් පමණක් අනුභවකොට වසම්හ. තොපි කපුටුවන් මෙන් දිවිවැඩුම පිණිස පරපණ නොනසම්හ”යි කියේය. එබසට කපුටුතෙම කියනුයේ “එම්බා චක්‍රවාකයෙනි, තොපගේ මේ ආහාර අපට අරුචිකරන්නේය, රන්වන් සිරුරු ඇතිව මේ චක්‍රවාක ජාතියෙහි උපන්නාවූ තෙපි නින්දිතවූ ආහාර අනුභව කිරීමට සුදුසු නොවව, ඒ කාරණයෙන් තොපගේ මේ ශරීර වර්‍ණයට අපට විමැතිවුයේය (සැක ඇති විය). අපි වනාහි රණමුඛයෙහි නිර්භීතවූ (යුධ

පිටියෙහි බිය නොවූ) සූර පුරුෂයන් මෙන් මිනිසුන් කෙරෙන්ම සවුල රස හා ළුනු තෙල් මුසු මියුරු රස ආහාර රැගෙණ කැමතිලෙස අනුභව කරම්හ. එතකුදු වුවත් තෙල තොපගේ ශරීරය පැහැ වැනි පැහැයෙක් අපට නැත්තේය. එසේහෙයින් සෙවෙල් පමණක් අනුභවකොට වසම්හයි කීවාවූ තොපගේ බස් අදහා නොගනිමි”යි කීවාහුය.

එකල්හි කපුටුවාගේ වර්‍ණසම්පත්තිය නොවීමට හා තමාගේ ශරීරවර්‍ණ සෞන්දර්‍ය්‍යයට කාරණා කියන්නාවූ ඒ සක්වා ලිහිණිතෙම “එම්බල කපුටුව, තොපි අනුන් අයිති දෙය පැහැරගෙණ කන හෙයින් නොපිරිසිදු ආහාර ඇතිව ඒ මතුද නොවෙයි, ජනයාගේ කිසි ප්‍රමාදයක් දුටුකෙණෙහි ඔවුන් සතුවූ ආමිෂයෙහි හෙන්නේහිය, එකල්හි ඔහු කැටකැබලිති ආදියෙන් පැහැර ලුහුබඳවති, එයින් තොපට කන බොන දෑ දුකසේ ලැබෙන්නේය, ඒ තමා අමුසොහොන්හි දැමූ මිනීමස් ආදියෙනුත් සතුටු නොවව, තවද එම්බල කපුටුව, යමෙක් අනුන් වෙහෙසද්දී ලත් දෙයින් දිවිපවත්වාද? ඒ තෙමේ එයින් නින්දිතව පසුතැවිලියට පැමිණ ශරීරවර්‍ණයෙන් හා කාය බලයෙන් පිරිහෙන්නේය. ඉදින් එම්බල කපුටුව, යමෙක් අනුන්ට පීඩා නොකොට දැහැමෙන් සෙමෙන් ලද දෙය අනුභව කරන්නේ වීනම් ඒ නුවණැති උත්තමයාගේ කායබල හා වර්‍ණසම්පත්තිය වැඩෙන්නේය. එසේහෙයින් මේ ශරීරවර්‍ණය නම් අනේකප්‍රකාර ආහාරයෙන්ම වන්නේය නොවෙයි, කර්ම්ම චිත්ත ඍතුවෙනුත් වැඩෙන්නේය”යි කීයේය. මෙසේ ඒ සක්වා

ලිහිණිතෙම නොයෙක් කාරණයෙන් ඒ කපුටුවාට අපහාස කළේය.

එකල ඒ කපුටුතෙම "අපගේ අවර්ණ කී තොපගේ වර්ණයෙන් අපට ප්‍රයෝජන කවරේදැ?"යි ඕහට දොඩාගෙණ ගියේය යි කියා මෙසේ සියළු ලොක අනුශාසක ශාක්‍යකුලතිලකවූ අප තථාගතයන් වහන්සේ චතුස්සත්‍යය ප්‍රකාශකොට මේ ජාතක ධර්මදේශනාව දක්වා වදාළසේක. එසිව්සස් වණී දෙසුන් අවසන්හි පසලොල් ඒ මහණ අනාගාමී ඵලයෙහි පිහිටියේය.

"එකල කපුටුවා නම් ප්‍රත්‍යාලෝභිවූ මෙ කල මේ මහණ වන්නේය. සක්වා ලිහිණි නම් දැන් මේ සව්නෙන් ගිහිනි මේ රාහුලමාතා වන්නීය. ඒ සක්වා ලිහිණියා නම් සව්සත වෙත පතල කරුණා ඇති මෙත් සමතිස් පෙරුම් (පාරමී, උපපාරමී, පරමත්ථ පාරමී වශයෙන් තිහකි) පුරා විදුරසුන් අරා පස්මරුන් මරා ලොව්තුරා බුදුවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ ගෙණහැර දක්වා වදාළ සේක.

# 424. භලින්ද්‍රිය ජාතකය

සමස්ත ලොකෛකනායකවූ (ලොවට එකම නායක වූ) විශුද්ධගුණගණාධාර (පිරිසිදු ගුණ සමූහයට ආධාර වූ) සද්ධර්මරාජන් වු සර්ව්ඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරණ කල්හි පතිකුලයට නොගොස් දෙමාපියන්ගේ

ගෙයි වැඩුනු වයසින් මහත් එක කුමාරිකාවක් විසින් එක්තරා මහණක්හුගේ චිත්ත ලෝභයක් අරභයා වදාළසේක.

මෙහි වර්තමාන කථාව මතුකියන 'චුල්ලනාරද ජාතකයෙ'හි වර්තමාන කථාව හා සමාන වන්නේය, අතීත කථාව වනාහී මේ මතු කියන ආකාරයෙන් දතයුතු.

ඒ කෙසේද යත්?

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජක්හු රාජ්‍යශ්‍රී අනුභව කරණ කල්හි පුරණලද බෝධිසම්භාර ඇති අප මහබෝසතානන් වහන්සේ කසී රට එක් බමුණු මහසල් කුලයෙක (බ්‍රාහ්මණ මහාසාර කුලයක) ඉපිද උගත් ශිල්ප ශාස්ත්‍ර ඇතිසේක් දූරපරිග්‍රහ (අඹුදරුවන් පෝෂණය කොට) කොට විසූසේක.

උන්වහන්සේගේ භාර්‍ය්‍යාවූ බ්‍රාහ්මණ කුමාරිකාතොමෝ පුතකු වදා නැසුනාය. එකල බ්‍රාහ්මණ කුමාරතෙම සිතනුයේ "මාගේ ප්‍රිය භාර්‍ය්‍යාවූ මේ කුමාරිකාවන් කරා පැමිණියාවූ මරණය කුමකැ යි මා කෙරේ ලජ්ජාවේද? එබැවින් මට මේ ගිහිගෙයි විසීමෙන් කම් නැත. කාමසම්පත්තිය හැර පැවිදිවෙමි" සිතා සිතූ ලෙසම සියල්ල හැර ඒ බ්‍රාහමණ කුමාරයා පමණක් කැඳවාගෙණ හිමාලය වනයට ගොස් ඔහු හා සමඟ තවුස් පැවිද්දෙන් පැවිදිව ධ්‍යානාභිඥා උපදවා වනමුල් ඵල ආහාරකොට එහි වාසය කෙළේය.

එකල්හි පසල් දනව්වෙහි (පිටිසර ජනපදයක) වසන්නාවූ බොහෝ සොරහු ගම්පැහැර එහි මනුෂ්‍යයන් අල්වාගෙණ උන් ලවා බඩු පොදි ගෙන්වාගෙණ තමන් වසනතැනට එන්නාහු වෙති. ඔවුන් අතුරෙන් රූපශ්‍රීසාරවූ ශඨප්‍රයෝග (රුවින් යුත් කපටිකම් දන්නා) දන්නාවූ එක් ස්ත්‍රියක් මොහු අල්වාගෙණ දසිකොට මෙහෙගන්නාහු වෙති. එබැවින් "එක් උපායකින් මොවුන්ගෙන් මිදී යායුතුය"යි සිතා "ස්වාමීනි, සිරුරු කිස කරුණු කැමැත්තෙමි. මදක් දුරුව සිටිය මැනවැ"යි කියා සොරුන් වලහා සැගවී ගොස් වල්හි ඇවිදිනී, මහබෝසතානන් වහන්සේ තාපසකුමාරයා පන්සල සිටුවා ඵලාඵල පිණිස වැඩිකල්හි පෙරවරු පන්සලට අවුත් තමාගේ රූපශ්‍රීයෙන් තාපසකුමාරයා පොළඹවා ඔහුගේ ශීල භේදකොට ඔහු තමා වසඟවූ බැව් දැන "මොහු රවටා මිනිස් පියසට කැඳවාගෙණ යෙමි"යි සිතා කථාකරන්නාවූ ඒ කුමාරිකාතොමෝ "එම්බා තාපස කුමාරයෙනි, ජනසඤ්චාර (මහජනයා ගැවසෙන්නේ නැති) රහිතවූ මේ මහා වල්හි රූපාදිවූ පඤ්චවිධ කාමකොට්ඨාසයෝ බොහෝසේ නොලබන හෙයින් නැවත නැවත විසිය නොහැක්කේය, යමෙක් ගම්හි වාසයකොට ඒ රූපාදිවූ පඤ්ච කාමකොට්ඨාසය ඉවසන්නේ වීනම් ඒ මහත්වන්නේය. හෙවත් ඔහුගේ ශීලයම මහත්ඵල වන්නේය"යි කීවාහුය.

එබසට ඒ ඇසූ තාපස කුමාරතෙම "මාගේ පියානන් වහන්සේ ඵලාඵල පිණිස වලට වැඩිසේක. ආකල්හි උන්වහන්සේ විචාරමි" කීයේය. එකල්හි ඒ ස්ත්‍රීතොම මේ

කුමාරයාට පියානකෙනෙකුන් ඇත්ල, ඉදින් ඒ තාපසතෙම මා දුටුයේ වීනම් ඵලාඵල ගෙණෙන කලත් දඬු කෙළවරින්ම තළා විනාශයට පමුණුවන්නේය, එබැවින් මා පළමුකොට යායුතු යයි සිතා "එම්බා කුමාරයෙනි, මම් මග අතුසන් කඩා (අතු කඩා සළකනු තබා) පළමු යන්නෙමි, තෙපි පසුව එවයි කියා ගියාය.

ඒ ස්ත්‍රිය ගිය කල්හි එපන්සල සැපවියයුතු දරදිය නොසපයා උදක් සෝක කරමින් උන්නේය. ඵලාඵල ගෙණ එන තාපසයන්ට පෙර ගමන් පමණකුත් නොකෙළේය. එයින්ම තාපසයන් වහන්සේ මේ ස්ත්‍රී වසගයට වීයයි දැන "කුමක් නිසා තෝ දරදිය නොසපයා සෝකකොට උන්නෙහිදැ?"යි විචාළසේක. එබසට කුමාරතෙම "ස්වාමීනි, බැද්දෙහි ඉඳ රක්‍ෂා කළාවූ සිල් මහත්ඵල නොවෙයි කියාද, ගම ඉඳ රක්‍ෂා කළාවූ සිල් මහත්ඵල වෙයි කියාද ඇසීමි. එබැවින් මම ගමට ගොස් සිල් රක්‍ෂා කරණු කැමැත්තෙමි. මාගේ යාළුවානෝද මා එන්ඩ කියා තුමු පළමුවෙන් ගියෝය. ඔවුන් හා සමග මමද යනු කැමැත්තෙමි. එම්බා තාපසයන් වහන්ස, මේ මහවලින් ගමට ගියාවූ මම කෙබඳු සීලයක් කෙබඳු ව්‍රතයක් ඇති පුරුෂයෙකු සේවනය කෙරෙම්ද? කෙබන්දක්හු සේවනය කිරීමට මට යහපත්ද? වදාළ මැනැව"යි කීයේය.

එබසට තාපසයන් වහන්සේ "එම්බල කුමාරය, මෙලොව යමෙක්හට කයින් සිද්ධවන්නාවූ ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිතථ්‍යාචාරය යි කියනලද අකුශලයෝද, වචනයෙන්

සිද්ධවන චතුර්විධ අකුශලයෝද, (බොරුව, කේලම, රළු වචන, හිස් වචන) මනසින් සිද්ධවන්නාවූ අභිද්‍යාය (මෝඩකම), ව්‍යාපාදදිවූ (කෝපය) ත්‍රිවිධ අකුශලයෝද සිද්ධ නොවේද්ද හෙවත් නැත්තාහුද එබඳු සත්‍වයා මවගේ ළෙහි වැතිර මව භජනය කරන්නාවූ ප්‍රිය පුත්‍රයෙකු මෙන් මෙයින් ගම ගියාවූ තෝ භජනයකර. නැවත යමෙක් දැහැමෙන් හැසිරේද එසේ දැහැමෙන් හැසිරෙන්නෙත් අනුන්ට නින්ද නොකෙරේද පිරිසිදුවූ චාරිත්‍ර ඇති තෙනත්තහු ඒ පුරුෂයා භජනය කර. එම්බා තාපසකුමාරය, සියලු දසදහසක් යොදුන් දඹදිව සියළු මනුෂ්‍යයෝම නැසී එක පුරුෂයෙක් පමණ සිටියේ වී නමුත් ඒ පුරුෂ කසායෙන්වූ (කහ) පෑහය අවු ආදියෙන් නැසී බොහෝ කලක් නොපවත්නේද එමෙන්ම වහා නැසෙන්නාවූ සෙනහස ඇත්තේද වඳුරන්සේ චඤ්චලවූ (සෙලවෙන චපල ගති) ප්‍රවෘත්ති ඇත්තේද එක අරමුණක පවත්නා සිත් නැත්තේද ඒ පඤ්චවාකාම ගුණකොට්ඨාශයෙහි ඇවිල එකෙණෙහි විරත්තවීම (නොඇලීම) ස්වභාවකොට ඇත්තේද එබඳුවූ පුරුෂයා භජනය නොකර, යම්සේ ගැල් ආදීවූ යානාවෙන් යන්නාවූ සත්‍වයෝ වලගොඩ කණුපහණ (උල් ගල්) ආදියෙන් සම නොවන්නාවූ මාර්ගයද අපවිත්‍රයෙන් ගැවසීගත්තාවූ මාර්ගයද හැර තමන්ට සැපවූ මාර්ගයෙහි යෙද්ද එපරිද්දෙන් දඬෙන් ගැසූකල කිපෙන්නාවූ සර්පයකු මෙන් කාරණා කාරණා නොදැන මදකින් කිපෙන අසත්පුරුෂයා භජනය නොකර හෙවත් දුරු කරව. තවද එම්බල තාපසකුමාරය, නුවණැත්තාවුන් විසින් භජනය නොකොට

යුතුවූ අමිත්‍ර වූ අඥනයා අතීතානාගත වර්‍තමාන කාලත්‍රය සංඛ්‍යාත හැම කල්හි නිරන්තරයෙන් ඔහු හා සමග භජනය සමාගමය යි කියනලද විශ්වාසය නොකර, ඒ එසේමය, එබඳු අඥනයා භජනය කරන්නාහට බොහෝ අවැඩ වන්නේය. එසේහෙයින් තොපට වැඩවනු පිණිස මේ යථොක්ත ගුණයෙන් යුත් අඥනයා භාජනය නොකර, ඔහු භජනය කරන්නාහට බොහෝ දුක් වන්නේය" යනාදීන් මෙසේ අවවාද කොට "මේ මාගේ අවවාදවූ පරිද්දෙන් පිළිපදුව, මාගේ වචනයෙහි පිහිටුව"යි කීයේය.

මෙසේ පියානන් විසින් අවවාද කරණ ලද්දවූ ඒ කුමාරතෙම කියනුයේ "මම මනුෂ්‍යපථයට ගියෙම් වීන්නම් නුඹ වහන්සේ වැනි පණ්ඩිත කෙනෙකුන් වහන්සේ ලැබගත නොහැක්කෙමි. එතැන්හි යාමට භය ඇත්තෙමි. එසේහෙයින් නුඹ වහන්සේ සමීපයෙහි වාසය කෙරෙමි" කීයේය. ඔහු එසේ කී කල්හි නැවතත් අවවාද දෙන්නාවූ තාපසතෙම කිසුණුපිරියම් (කසින පරිකර්‍ම භාවනා) ඉගැන්වූයේය. ඒ කුමාරතෙම නොබෝ කලකින් පඤ්චාභිඥ අෂ්ට සමාපත්තීන් උපදවා තමන්ගේ පිය තාපසයන් හා සමග බ්‍රහ්ම ලෝකයට ගියේය යි මෙසේ දේවාතිදේව වූ අප තිලෝගුරු සම්‍යක් සම්බුදුරජානන් වහන්සේ මේ ධර්‍මදේශනාව ගෙණහැර දක්වා චතුස්සත්‍යය ප්‍රකාශකොට ජාතකය නිමවා වදාළසේක. චතුස්සත්‍යාවසානයෙහි උකටලී වූ මහණතෙම සෝවාන් ඵලයෙහි පිහිටියේය.

"එකල්හි මනුෂ්‍යපථයට යෙමි යි කැමතිවූ තාපසකුමාරයෝ නම් මේ උකටලී මහණය. එකල්හි මනුෂ්‍යපථයට කැඳවූ කුමාරිකාව නම් මෙකල්හි මොහු උකටලී කරවූ මේ කුමාරිකා වන්නීය. එකල්හි ඒ බ්‍රාහ්මණ කුමාරයන්ට අවවාදදුන් පිය තාපස නම් දැන් ලොව්තුරා බුදුවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාල සේක.

# 425. සමුග්ග ජාතකය

තවද මහිනීයය (පිදිය යුතු) මහානුභාව ගුණොපෙත (ගුණයෙන් යුක්තවූ) නවාද්ධ්‍ය විද්‍යාවරණ (අෂ්ට විද්‍යා හා පසළොස් චරණ ධර්‍ම) ධර්ම්මයෙන් නිමිලවූ අප තථාගතයන් වහන්සේ එක් සමයෙක්හි ක්ලෙශ ඝර්ම්මාහිතප්ත (කෙලෙස් ග්‍රීස්මයෙන් තැවුණු) සත්‍වයන් ධර්‍මාමෘත පානය කරවමින් ජේතවන විහාරයෙහි චතුර්විධ බ්‍රහ්ම විහරණයෙන් වාසය කරණසේක් දුදසුන් (දුකසේ දැකිය යුතු) නිවන් දක්වන බුදු සසුන් වැද පැවිදි වද කෙළෙසුන් වසඟවෙමින් සස්නෙහි කලකිරී වසන එක් මහණකු අරහයා මේ ජාතකය දක්වා වදාළසේක.

එක් දවසක් සර්‍වඥයන් වහන්සේ ශාසනයෙහි ලාෂය හා සමග කෘශවූ දේහ (කෙට්ටු වූ සිරුරු) ඇති සිතෙහි උපන් රාගය හා සමග ගතෙහි ඉපිලි නහර ඇති ක්ලෙශයන් හා සමග වැටුනාවූ ක්ලෙශයන් ඇති ශාසනයට මුඛවූ සිත් (සසුනට යොමුවූ) හා සමග දික්වූ නඛ (නියපොතු) ඇති සිල් හා සමග කිලුටුවූ සිවුරු ඇති ඒ භික්‍ෂූහු ශික්‍ෂාවෙහි අපේක්‍ෂා

නැතිව වසන බව දැක "කිමෙක්ද මහණ, තෝ ශාසනයෙහි උකටලී වුයෙහි වේදැ?"යි විචාරා වදාරා "එසේය ස්වාමීනි" දැන්වූ කල්හි "මහණ, ස්ත්‍රීහු නම් මායා සාඨෙයයාදී (මායම් කපටිකම් ආදී) නොයෙක් වඤ්චාප්‍රයෝග දන්නා කෙළෙහිගුණ නොදන්නා අයහ. එසේහෙයින් තෝ කුමට ප්‍රාර්ථනා කෙරෙයිද? පෙර දරුණුවූ දානවරාක්‍ෂයෝ (එනම් රකුස් විශේෂයක්) පවා ඔවුන් කුක්‍ෂියෙහි (උදරයෙහි) තබා රක්‍ෂා කරන්නාහු තමන් අයිති කොට ගත නුහුනුවාහුය. තෝ කෙසේ අයිතිකොටගත හැකිවන්නේහිදැ?"යි විචාරා මේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

සියල් සිරින් තිදස්පුර පසස්කළ (තව්තිසාව ප්‍රදර්ශන කළ) දෙළොස් යොදුන් බරණැස් නුවර පෙර බ්‍රහ්මදත්ත නම් රජකු රාජ්‍යශ්‍රී අනුභව කරණ සමයෙහි පුරණලද බෝධිසම්භාරයන් ඇති අප මහබෝධිසත්වයන් වහන්සේ වස්තුකාම ක්ලේශකාම හැර නිල්මහමේකුළු (කලු වැහිවලා) මෙන් බබලන ගණසා මඬලෙන් (ගණයට වැඩුණු අතු පතරින්) හොබනා විදුලිය මෙන් සුපිපි ලිය වැලැඳි විසිතුරු පතරින් හා ලපළුපත් කමින් තමන් සුතන් (තම දරුවන්ට) කවමින් පෙමින් ඔවුනොවුන් ඇඟ තොළු තබා කෙළනා මුවකැලන්ගෙන් හා සුනිල් මිණිගල් මුදුනෙහි රඟනා ලිය කිඳුරන්ගේ මියුරු ගියෙහි ලොබින් ගොදුරෙහි ලොභ නොකොට සිටිනා සිරලන්ගෙන් හා විමල් වැලිතලාවල මොණර කිකිළින් මැදෙහි පිලඹරා නටනා (පිල්

විදහා නටන) බලවත් මොණරුන්ගෙන් හා පිළිමල් ගජන් ඇන උරිරුවැකි (රුධිරය තැවරුණු) දළින් මදමත් ඇත්මුලින් හා සුපුල් පලොල් මිදෙලි සල් විසල් වනපෙතින් වගුළ නොයෙක් සුවඳ මුවරද ගෙණ වැහෙන සිහින් ගගුලැල්ලෙන් සැදුන්ලත් විවිධ ජනාලයවූ (නොයෙක් ජනයාට ආසා ඇතිකරණ) හිමාලයට වැද ක්ලෙශ තාපයට හේතුවූ තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පංචාභිඥ අෂ්ටසමාපත්ති උපදවා වනමුල් ඵලාහාරම ආහාරකොට වාසය කරණසේක.

එකල උන් වහන්සේ වසන පන්සල අසල තුමුල් (විශාල) ගල්ගුහාවෙක වසන මනුෂ්‍ය මාංශ භක්‍ෂණය (අනුභව) කරණාපේක්‍ෂ එක් රාක්‍ෂයෙක් අතුරතුරෙහි මහබෝසතානන් වහන්සේ කරා එළඹ බණ අසන්නේය. ඒ බණ අස අසාත් තමා පරහිංසාවෙහි සතුටුවන පව්ටුජන්මයෙහි උපන් හෙයින් මහවනමැද මහජනයා එන යන මග රැක සිට දනන් ලුහුබඳවා අල්වාගෙණ සල්ව සල්වා දෙකපොළින් ලේ වගුරුව වගුරුවා කන්නේ. එකල කසීරට වාසීවූ දුටු දුටුවන් විසින් කරණ රුසිරින් මනාවු එක්තරා කුමාරිකාවක ප්‍රත්‍යන්ත ජනපදයෙක සරණ ගොස් වාසය කරන්නී, එක් දවසක් තමාගේ දෙමාපියන් දකිනු පිණිස පිරිවර ජනයා හා සමග අවුත් නැවත තමා වසන පසල් දනව්වට යෙමින් ඒ වන මැදට පැමිණියාය.

එකල්හි ලෙලෙන දිව් නැමති සලවිදුලිය ඇති වක්ව තිබෙන බැම නැමති දිලියෙන්නාවූ ඉඳුසැව් ඇති උදුල

දළයුවල (බබළන දළ දෙක) නැමැති හජන බලපෙළ ඇති උරිරු (ලේ) පානය කිරීමෙන් කෙසරු සලාවෙහි රැඳි මදින් වෑහෙන ලේබිඳු නමැති පොද පතර ඇති පතල සැඩහඬ නමැති මිහිගුම් ඇති කුරිරු දරුණු වෙස් ඇති ඒ දනව රකුස්තෙම අහස්කුස පහළ නිල්මහමේකුළක් මෙන් අවුත් ඒ වනමැද මගට බටුයේය.

එවෙලෙහි ඒ පරිවාර ජනයෝ තම තමා අත තුබූ අවි දමා ඒ ඒ අත දිව්වාහුය. එසඳ ඒ දනවතෙම යානාවේ යා නොහී උන් උතුම්වූ රූපශ්‍රීයෙන් කාන්තවූ ඒ කාන්තාව ඒකාන්ත කොට තමා වසන තැනට ගොස් ප්‍රිය භාර්‍ය්‍යාකොට තබා තෙල් මී සකුරු සාල් ආදිවූ නොයෙක් තොස කරණ උපකරණ ගෙණවිත් පෝෂ්‍ය කෙරෙමින් විචිත්‍ර වස්ත්‍රාභරණයෙන් සරහා අනිකකු නොදන්නා ලෙස රක්නා කැමතිව නොඅඩුවූ සෙනහසින් කරඬුවෙක ලා ගැල කුක්ෂියෙහි (ගිල උදරයෙහි තබා) තබා රක්‍ෂා කරන්නේය.

මෙලෙස රක්නාවූ එතෙම එක් දවසක් ජලස්නානය කරණු කැමතිව සිහිල් සිලිල් පිරි (සීතල ජලයෙන් පිරුණාවූ) නිමල් කමල් විලකට ගොස් බඩ තුබූ කරඬුව වමාරා එයින් ඈ පිටතට ගෙණ පළමු කොට නහවා නොමඳ සුවඳ විලවුන් ගල්වා නන් විසිතුරු රුවන් ආභරණ පලඳවා “මදක් තොප ශරීරයෙහි තෙත් සිඳුවාගණැ”යි තෙමේ එතැන්හි සැක කටයුතු කිසිකෙනෙකුන් නැති හෙයින් නහන තොටට බැස දුරුව සිට දිය නාන්නේය.

එසඳ ඒ කුමාරිකාවෝ වයස්සුපුත්‍ර නම්වූ උතුම් රූපශ්‍රීධර විද්‍යාධරයෙකු (අහසින් යන දේව විශේෂයක්) ඛඩ්ගායුධ සන්නද්ධව (කඩු හා ආයුධ වලින් සැරසී) අහසින් එනවා දැක ඔහු කෙරෙහි පිළිබඳ සිත් ඇතිව "මෙසේ එව"යි අත්සන් කොට කැඳවූවාය.

එසඳ විද්‍යාධරතෙම සුරපුරෙන් බස්නා සුරකුමරෙකු මෙන්ද ගුවන් කුසින් එන රුවන් රුවක් මෙන්ද ඈ කෙරෙන් ඒ රකුසාගේ මතු වෙන්වීමට පෙර නිමිතිව පතිතවන උල්කාපාතයක් මෙන්ද වහා අහසින් බටුයේය.

එකල ඒ කුමාරිකාවෝ ඔහු කරඬුවේ හිඳුවා දානවයාගේ ආගමනය බලමින් කරඬුව මත්තේ හිඳ දියනා ගොඩනැගී එන්නාවූ ඒ දානවයාට තමා දක්වා ඔහු ලගට එන්නට පළමුකොට ගතගබගිලි විදුලියක් මෙන් ඒ කරඬුව ඇතුළට වැද තමා සළුවෙන් ඉසවසා පෙරව නොවලසා ඔහු වසාගෙන ඔත්තාය. ඒක්ෂණයෙහි ඒ රාක්ෂසතෙම අවුත් පරීක්ෂා නොකොට පළමු පරිද්දෙන්ම කරඬුව ගැල තමා වසන ගුහාවට යෙමින් අතරමගදී සිතනුයේ "ඒ අපගේ තාපසයන් වහන්සේ බොහෝ කලක් නොදක්නා ලද. ඉන් උන්වහන්සේ කරා ගොසින් දැක පැහැද වැඳපුදා බණ අසා යෙමි"යි පන්සලට ගියේය.

තාපසයන් වහන්සේද එන්නාවු ඔහු දුරදීම දැක දෙදෙනකු කුස තුල වසන බව දිව්‍යචක්ෂුරභිඥානයෙන් (දිවසින්) දැක අඥානවූ ඕහට විඥාපන කරණු (අවබෝධ කරවීමට) කැමැතිව

වදාරණසේක් "එම්බා පින්වත්නි, තොපි තුන්දෙනා කොතැන්හි අවුද? බොහෝ කලකින් අද මෙතැන්හි තොපගේ පැමිණීම වුයේය. කිමෙක්ද තොපි නිදුක් නිරෝගීවව්ද? යහපත මෙසේ අවුත් තෙල අස්නෙහි හිඳුව"යි වදාළසේක. එබස් අසා ඒ දානව රාක්ෂසතෙම "මේ තාපසයන් වහනසේ එකලාව මෙතැන්හි ආ මට තුන්දෙනෙකැයි වදාරණසේක. කිමෙක්ද? තත්වය දැන කියනසේක්ද? නොහොත් උන්මත්ත (පිස්සුවෙන්) නන්දෙඩනසේක්දැ?"යි සිතා තාපසයන් කරා එළඹ වැද එකත්පස්ව හිඳ එපවත් පුළුස්නා අදහසින් කතාකරණුයේ "කිමෙක්ද? තාපසයන් වහන්ස, නුඹ වහන්සේ කිසි සහයක් නැතිව මෙතැන්හි ආ මට තෙපි තුන්දෙනා කොයිසිට අවුදැ?"යි වදාළේය.

එබසට තාපසයන් වහන්සේ "එම්බා රක්ෂසය, තෝ මේ කාරණය ඉඳුරා අසනු කැමැත්තෙහිදැ?"යි වදාරා ආදරයෙන් "එසේය ස්වාමීනි" දැන්වූ කල්හි "පළමු තෝද තාගේ කුක්ෂිගත (කුස තුල) කරඬුකයෙහි තබා ප්‍රෙමභාරයෙන් රක්ෂාකරණ ලද භාය්‍යීාවද යන දෙදෙනා තනිවම විසූහ. දැන් වනාහී ඕ තොමෝ වයස්සුපුත්‍ර නම්වූ විද්‍යාධරයකු හා සමග පාපයෙහි ලැජ්ජා නොකොට තමා අධ්‍යාසයවූ (අදහස් කළ) පරිද්දෙන් ලොකස්වාදරතියෙහි (කාම සේවනය) යෙදී ඉන්නීය. එසේ හෙයින් තොප තුන් දෙනෙකුයයි කීමි"යි වදාළසේක.

එබස් අසා දනව රක්‍ෂතෙම සිතනුයේ "විද්‍යාධරයෝ නම් අනල්පවූ මන්ත්‍ර ජපනය කොට මායාකාරයෙන් සඤ්චාරණය කරණා අයෙක ඉදින් මාගේ කුක්‍ෂිගතවූ ඔහුගේ කඩ්ගය ස්වහස්තගත (තම අතට පත්) වීනම් බඩපලාගෙණ පලායන්ටත් සමර්ත්‍ථවන්නේය"යි භයින් තැතිගෙණ සිත් ඇතිව වහා කරඬුව වමාරා තාපසයන් වහන්සේගේ ඉදිරියෙහි තබා නිදනයක් මෙන් රක්‍ෂා කළ ඒ කරඬුයෙහි පිධානය හළුයේය. ඒක්‍ෂණයෙහි ඒ විධ්‍යාධරතෙම කූටයන්ත්‍රයකින් නික්මුනු ශරීරයක් මෙන් මන්ත්‍ර ජල්පනය (මන්ත්‍ර ජපකර) කොට අහසට පැනනැංගේය.

එසඳ ඔහු දැක මහබෝසතානන්ට බොහෝසේ සතුටුව ස්තූතිකරණ ඒ දනව රාක්‍ෂසතෙම "උග්‍රවූ තපෝ තේජසින් අග්‍රවූ තාපසයන් වහන්ස, නුඹවහන්සේ මේ කාරණය දත් පරිදි ඉතා යහපත. නිරන්තරයෙන් මාගේ ප්‍රාණය මෙන් කුක්‍ෂියෙහි තබා රක්‍ෂාකරණ ලද්දවූ මේ ස්ත්‍රී පවා මිත්‍රද්‍රෝහී කර්‍මකොට අන්පුරුෂයෙකු කරා සරාගව (ආලය) එළිය. එසේහෙයින් මේ ලෝකයෙහි අන් සත්‍ව කෙනෙකුන් විසින් කෙළෙස් ප්‍රවේශනයෙන් (කෙළෙස් ඇතුළුවීමෙන්) අවසඟව (වසඟ නොවී) ස්ත්‍රීවසඟයට පැමිණියාහුද ඔහු ඉතා නින්දවට පැමිණෙන්නාහුය. ඒ එසේමය. සවස උදෑසන ගිනිදෙවියාට යාගකොට වෙනෙහි වාසයකරණ තාපසයන් විසින් රක්‍ෂාකරණ ලද වහ්නියක් (ගින්නක්) පරිද්දෙන් තොමෝ මා විසින් නිරන්තරයෙන් ආදරයෙන් රක්‍ෂා කරණ ලදුව මෙබන්දේ පවා ඔවුන් කුසතුළ තබා රැකගත නුහුනුවාහුය, එසේවූ ස්ත්‍රීද

පතිව්‍රතා ධර්මමය කවරෙක් අප විසින් රක්‍ෂාකරණ ලද්දේය යි සිතා විශ්වාස කරන්නේද? ඒ එසේමය. ස්ත්‍රීහු නම් ලෝකස්වාදය රතියෙන් සම්පූර්‍ණ නොවන්නාවූ සිත් ඇති බැවින් අගාධවූ මහා සමුද්‍රයාගේ පත්ලය වැන්නේමය. එසේවූ ඔවුන් කෙරෙහි රාග වශයෙන් බැඳුනාවූ නුවණැක්තාවූ සත්‍වතෙම මෙලෝ පරලෝ දෙක්හි මහත් දුක්ඛයට පැමිණෙන්නේය. එසේහෙයින් විසුද්ධවූ (පිරිසිදුවූ) ධ්‍යන ප්‍රතිලාභය (ධ්‍යාන උපදවා ගැනීමට) ප්‍රාර්ත්‍ථනා කරන්නාවූ ප්‍රඥාවන්ත උත්තම සත්‍වයෝ සියලු ද්වේෂයට වාසස්ථානවූ පඤ්චඉන්ද්‍රියයන්ට උත්සව ක්‍රීඩාවූ භවසාගරයට දියසලාවූ (දිය සුළිය) ලෝභ ලතාවට තුමුල් මුල්වූ (විශාල මුල්) අපායට වාසල් දොරවූ සසර මහවෙනෙහි සරණ සත්‍ව වර්‍ග නමැති මෘගයන්ට පාසවූ අපාය නමැති සමුද්‍රයට ගෙන යන ජලප්‍රවාහ (ජල පාරක්) බඳුවූ අවිශ්වාස වූ ස්ත්‍රීන් විශ්වාස නොකරන්නාහුය”යි කියා ඒ දනව රාක්‍ෂසතෙම මතු ආලවක සුචිරෝම ඛරරෝමාදිවූ චණ්ඩ සත්‍වයන්ගේ අභිමාන (අහංකාරය) හැර නමස්කාර බහුමාන කිරීමට පූර්වනිමිත්ත දක්වා යුගාන්ත වාතවේගයෙන් (යුග කෙළවර සුළඟ) පතිතවූ පර්‍වතකූටයක් මෙන් ලෝසත්හට බෝසත්කරණ බෝසත්වූ ඒ තාපසයන් වහන්සේගේ ශ්‍රීපාදය වැඳහෙව “මෝහ නැමැති ගණඳුරට දිවයුරුහු බඳුවූ ක්ලේශ නමැති දවානලයට (ලැව් ගින්නට) මහා මේඝයක් බඳුවූ මෛත්‍රී නමැති ලතාවට තෝතැන්නක් බඳුවූ කරුණා නැමති ගංගාවට හිමාලය බඳුවූ ශීලාදී ගුණරත්නයට රත්නාකරයක් බඳුවූ දහම් නමැති අමාවට මහමුහුද බඳුවූ නුවණ නමැති

පහණාට රන්පහයක් බඳුවූ නිවන්මඟට රුවන්හිණක් (රන් ඉණිමඟක්) බඳුවූ තුන්ලොවට තිලකවූ ස්වාමීනි, තාපසයන් වහන්ස, නුඹවහන්සේ නිසා අද මාගේ දිවි ලබනලද නැතහොත් මේ විද්‍යාධරයා ලවා මදකලකින් මේ මා මරාපුවා වේදැ?"යි මහබෝසතානන් වහන්සේට ප්‍රසංශා කෙළේය.

ඉක්බිති මහබෝසතානන් වහන්සේද ඒ දානව රක්‍ෂසයාට ධර්‍මදේශනා කොට "මෑ කෙරෙහි තෝ රෝෂණයෙන් (තරහෙන්) කිසි රෝෂයක් (පළිගැනීමක්) නොකරව"යි අවවාද කොට ඔහු පඤ්චශීලයෙහි පිහිටවූසේක.

එකල ඒ දානව රක්‍ෂසතෙම "මම තී කුසතුල තබා රක්‍ෂාකරන්නෙම්ද අධර්‍මසේවනයෙන් වලකාගත නුහුනුයෙමි, අන්කවරෙක් තොප ඔයින් වලකා රක්‍ෂාකොටගත හැකිවන්නේදැ?"යි කියා ඈ ගමන්කරවා තෙමේ තමා වසන තැනටම ගියේය යි මෙසේ අතීතානාගත වර්‍තමාන යන කාලත්‍රයවර්තිවූ (තුන්කලට අයත්) සර්‍වධර්‍මයන් ස්ර්වාකාරයෙන් අවබෝධ කළාවූ අප බුදුරජානන් වහන්සේ මේ ධර්‍මදේශනාව ගෙණහැර දක්වා වදරා චතුස්සත්‍යය ප්‍රකාශකොට පූර්‍වාපර සන්ධි ගළපා මේ ජාතකය නිමවා වදාළසේක.

මේ ධර්‍මදේශනාවසානයෙහි උකටලී වූ ඒ මහණතෙම දහසක්නයින් ප්‍රතිමණ්ඩිතවූ (අලංකාරවූ) සෝවාන් ඵලයෙහි පිහිටියේය.

"එකල්හි රාක්‍ෂයාගේ කුක්‍ෂියෙහි දෙදෙනෙකු වසන බව දිව්‍යඥානයෙන් දැක ඕහට වන අවැඩ වලකා ප්‍රාණඝාතාදී

පාපකර්‍මයන් නොකරණ ලෙස අවවාදකොට පඤ්චශීලයෙහි පිහිටුවූයෙමි දැන් අසාරවූ සංසාර සාගරයෙහි නිමග්නව සඤ්චාරණය (ඇවිදින්නාවූ) කරන්නාවූ සත්ත්ව වර්ගයා එයින් ගොඩලා අමාමහ නිවන්පුරයට පමුණුවන්නාවූ මම්ම වේදැ''යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 426. පූතිමාංශ ජාතකය

තවද එක් සමයෙක්හි සකල සත්ත්වයන් කෙරෙහි අකාරණ පරමවත්සලවූ (හේතුවක් නැතිව ඇතිවන මහත් ආදරය) අප තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම්වෙහෙර වැඩ වසන සේක්, ඉන්‍ද්‍රිය සංවරය අරභයා මේ ජාතකය වදාළසේක.

එක් සමයෙක්හි බොහෝ භික්ෂූහු චක්ෂුරාදී ඉන්‍ද්‍රියයෙහි සිහි නමැති දොර නොවසා වාසය කරන්නාහ. එකල සකල ගුණ නිධාන වූ සර්‍වඥරාජෝත්තමයානන් වහන්සේ මේ භික්ෂූන්ට අවවාද කරන්නට වටනේය යි ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙහෙවර වදරා (සංවිධානය පවරා) ඒ වෙහෙරෙහි සියළු භික්ෂූන් රැස්කරවා සරභන ලද උතුම්වූ බුද්ධාසනයේ හිඳ වදාරණසේක් "මහණෙනි, මහණුන් විසින් රූපාදිවූ අරමුණු සුභනිමිත්තාකාරයෙන් (සුභ නිමිති වශයෙන්) නොගතයුත්තේය, ඉදින් ඒ අරමුණු සුභාකාරයෙන් ගෙණ කාලක්‍රියා කෙළේ විනම් අපායෙහි ඉපද බොහෝ දුක් විඳින්නේය. එසේහෙයින් මහණෙනි, තෙපි අසුභවූ රූපාදී ආරම්මණයන් සුභාකාරයෙන් ගෙණ වාසය කරව, තවද මහණෙනි, රූපාදී අරමුණු ගොදුරුකොට වාසය කරන්නාවූ

පුද්ගලතෙම ඉහාත්ම භාවයෙහිම මහත් විනාසයට පැමිණෙන්නේය. එසේහෙයින් රූපාදීන් සුභාකාරයෙන් බැලීමට වඩා ගිනිගෙණ දිලියෙන අය සලාකායෙන් (යකඩ හැන්දෙන්) චක්‍ෂු ප්‍රාසාදය පිරිමැදීම (ඇස පිරිමැදීම) උතුම් වන්නේය"යි කියා වදරා "මහණෙනි, තොප විසින් රූපය බැලියයුතු කලත් ඇත, ඒ නොබැලියයුතු කලත් ඇත. එයින් බැලියයුතු කල්හි සුභාකාරයෙන් නොබලා අසුභාකාරයෙන් බලව, එසේකල්හි තොපි සතර සතිපට්ඨානය (කායානුපස්සනා දී සතිපට්ඨාන සතර) ආර්‍ය්‍යවූ අෂ්ටාංගික මාර්ග්‍ගය නවවිධවූ ලෝකෝත්තර ධර්‍මය යන ගොචරයෙන් නොපිරිහෙව (ගුණ ධර්‍ම වලින් ඈත් නොවීම). එසේ නොපිරිහී ඒ ගොචරයෙහි හැසිරෙන්නාවූ තොප කරා ක්ලේශමාරතෙම පැමිණෙන්ට අවසරයක් නොලබන්නේය. ඉදින් තෙපි කෙලෙසුන් වසඟ බවට පැමිණ සුභ නිමිත්තාකාර වශයෙන් ඒ රූපය බැලුවාහු වීනම් පූතිමාංශ (කුණු මස්) නම්වූ සිගාලයා මෙන් තොපගේ ගොචරයෙන් පිරිහෙන්නාහු ය"යි වදරා එපවත් අසනු කැමති මහණගණයා විසින් ආරාධිත වූ බුදුරජානන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්?

පෙර බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජකු රාජ්‍යය කරණ සමයෙහි හිමාලය වනප්‍රාන්තයෙහි එක් අරණ්‍ය ප්‍රදේශයෙක ගල්ගුහාවෙක්හි නොයෙක් සියගණන් එළුවෝ වාසය කරති.

ඔවුන් වසනාතෙනට නුදුරු තැන්හි එක් ගල්ලෙනක පූතිමාංශ නම්වූ කැණහිලෙක් තමාගේ වේනි නම්වූ භාය්‍යීාව හා සමග වාසය කෙරෙමින් එක් දවසක් ඈ හා සමග ඒ වනාන්තරයෙහි ගොදුරු සොයා ඇවිදිනේ ඒ ගුහාවෙහි වසන එළුවන් දැක එක් උපායකින් මොවුන් මරා මස් කෑ යුත්තේය යි සිතා ගොස් දවස දවස එකී එකී එළුවකු බැගින් මරා කන්නේය. මෙසේ ඔවුන් දෙදෙන එළුවන් කමින් ස්ථූලවූ ශරීර ඇතිව මහත් ශක්තිසම්පන්න වූවාහුය.

මෙසේ කල්යාමකින් ඒ සියලු එළුවෝ විනාශයට පැමිණියාහුය. ඔවුන් අතුරෙන් මෙලමාන නම්වූ එක් එළුදෙනෙක් නුවණැත්තීය. උපායෙහි දක්‍ෂ වන්නීය. එම කැණහිල්තෙම ඈ මරා කන්ට නොහැකිව ඒ තමාගේ භාය්‍යීාවූ වේනි නම් සිවල් ධෙනුව හා සමග මන්ත්‍රණය කරණුයේ "සොඳුර, සියළු එළුවෝම අප විසින් මරා කනලදින් නිමාවට ගියාහුය. මේ එළුදෙන එක් උපායකින් මරන්ට වටනේය, එසේහෙයින් තෝ තනියම ගොස් ඒ එළුදෙන හා සමඟ මිත්‍රව තොප ඈ හා සමඟ විස්වාසවූ කල්හි මම මළ ආකාර දක්වා හෙව නිදිමි, එකල තෝ ඈ ලඟට ගොස් "යෙහෙලිය, මාගේ ස්වාමිපුත්‍රයා මළේය, මමද කිසි පිළිසරණයක් නැත්තෙමි, දැන් තොප ඇර අනික් කෙනෙක් මට නැත, එසේහෙයින් අපි දෙදෙන ගොස් අඬා වැලපා ඔහුගේ ආදාහනකෘත්‍ය කරම්හ"යි කියා ඈ කැඳවාගෙණ මෙතැන්හි එව, එසේ කල්හි මම හොත්පලින් පැනනැගී ඇගේ බොටුව ඩැහැ මරමි" කීයේය.

එසඳ ඒ වේනී නම් සිවල්දෙන්තොම "යහපතැ"යි ඔහුගේ බස් පිළිගෙණ ඒ එළුදෙන හා සමඟ මිත්‍ර විස්වාසය උපන් කල්හි පළමු ඒ සිඟාලයා කී සියල්ලම එළුදෙනට කීවාය. එසඳ ඒ එළුදෙන්තොම කියන්නී "යෙහෙළි, තීගේ ස්වාමිපුත්‍රයා විසින් මාගේ සියළු නෑයෝ මරා කන ලද්දහුය. එසේහෙයින් ඔහු කරායන්නට මම භය ඇත්තෙමි" කීවාය. "යෙහෙළි, තෝ භය නොව මළාවූ ඒ තෙම තොපට කුමක් කරන්නේදැ?"යි කීවාය. එබසට නැවතත් ඒ එළුදෙන කීයන්නී "තොපගේ ස්වාමිපුත්‍රතෙම ඉතා දැඩිවූ මන්ත්‍රණ ඇත්තේය, එසේහෙයින් මම ඔහු සමීපයට නොයමි" කියාද නැවතත් ඒ සිවල්දෙන විසින් යාච්ඤාකරණ ලදුව මෙසේ කියන්නේ "ඒකාන්තයෙන් මළනියාව වේදැ"යි සිතා ඇගේ බස් ගිවිස ඈ එක්ව නික්ම ගියාය.

එසේ යන්නීත් "කුමකින් කුමක් වේද්ද හෝ"යි ඒ කැණහිලා කෙරෙහි සැකයෙන් සිවල්දෙන ඉදිරිකොට විමසමින් යන්නීය.

එකල ඒ සිඟාලතෙම එන්නාවූ ඔහුන්ගේ ශබ්දය අසා "එළුදෙන් ආවා හෝ"යි ඉස ඔසවා ඇස දල්වා බැලුයේය. එකල ඒ එළුදෙන්තොම එසේ බලන්නාවූ ඔහු දැක "මේ පාපිෂ්ඨ ගුණ ඇති දුෂ්ට තෙනැත්තේ මා රවටා මරා කනු කැමතිව මළවෙස්ගෙණ හොත්තේය"යි නැවත යන්ට නික්මුනාය.

එකල සිවල්දෙන විසින් "යෙහෙලි, තෝ කවර හෙයකින් නැවත යන්නෙහිදැ?"යි විචාරණලදුව තමා යන කාරණා සිවල්දෙනට කියන්නාවූ ඒ එළුදෙන "එම්බල යෙහෙලි, තීගේ ස්වාමිපුත්‍රවූ පූතිමාංශ නම්වූ සිගාලයාගේ බැලීම මට යහපත් නොවන්නේය. එසේහෙයින් මෙබඳුවූ වංචා ප්‍රයෝග දන්නා අසත්පුරුෂයා කෙරෙන් දුරුවීම යහපතැ"යි කියා තමා වසන තැනට ගියාය.

ඒ සිගාල ධෙනුව ඒ එළුදෙනගේ ගමන් වලකාගත නොහී කිසිත් නැතිව තමාගේ ස්වාමිපුත්‍රයා ලඟට ගොස් සෝක කෙරෙමින් නොයෙක් සිතිවිලි සිතා කලකිරී උන්නාය. එකල එසේ උන්නාවූ ඒ සිවල්දෙනට විධාන කරන්නාවූ ඒ සිගාලතෙම "එම්බල වේනීය, තෝ පළමු මාගේ යෙහෙලියවූ එළුදෙන් මට බොහෝ ස්නෙහ ඇත්තීය, මා කීවා කරන්නීයයි ගුණ වර්ණනා කොට අප ලඟට කැඳවාගෙණ එම් කියා ගොස් දැන් වනාහී අප සමීපයට නොඇවිත් දුරසිටම නැවත යන්නාවූ ඈ වලකාගත නොහී තෝ මෙතැන්හි අවුත් උමතුවාක් (සිහි මුලාවෙන්) මෙන් ඉඳ කුමට සෝක කරන්නේහිදැ?"යි කීයේය.

එබසට සිවල්දෙන්තොම කියන්නී "එම්බල ස්වාමිපුත්‍රය, තෝ පළමුවෙන් මළවුන්ගේ ආකාර දක්වා හෙව ඈ ලඟට ආ කල්හිම නැගීසිට බොටුව ඩැහැ මරම් මන්ත්‍රණය කොට දැන් ඈ සමීපයට එන්ට පළමුවෙන් ඉස ඔසවා බැළුයෙහිය. එසේ හෙයින් පරීක්ෂා නුවණැත්තෙහිත් තෝමය"යි කීවාය.

මෙසේ ඒ වේනී නම් සිවල්දෙන් තොම තමාගේ ස්වාමිපුත්‍රයානන් හිඳුවා ඉක්බිති “ස්වාමිපුත්‍රයානන් වහන්ස, නුඹවහන්සේ සෝක නොකළ මැනව, නැවතත් මම ඈ උපායකින් මෙතනට කැඳවාගෙණ එමි, එකල නුඹවහන්සේ ඈ පමානොවී අල්වාගත මැනවැ”යි කියා ඈ සමීපයට ගොස් කියන්නී “එම්බල යෙහෙලිය, පළමු ආ තොප ගියගමනින් බොහෝ වැඩවිය, තොප එතැන්හි ගොස් ආ තැන්හි මාගේ ස්වාමිපුත්‍රයා දැන් සිහි ලැබ ජීවත්වන්නේය, එසේහෙයින් ප්‍රිය පඬුරක් ලදින් සතුටු කරන්නාක් මෙන් ඒ අපගේ ස්වාමිපුත්‍රයා කරාගොස් පිළිසඳර කථාකොට එව”යි කීවාය.

එසඳ ඒ එළුදෙන්තොම “මේ පව්ටු තෙනැත්තී මා රවටා කනු කැමැත්තීය, මොවුන් වෛර කරවා ගැන්ම සුදුසු නොවන්නේය, එසේහෙයින් උපායෙන්ම මෑ රවටා දුරුකෙරෙමි” සිතා කියන්නී “යහපත යෙහෙලිය, තොප සතුටුකොට එමි, එසේ එන නමුදු බොහෝ පිරිවර ගෙණ එමි. ඒ එන්නාවූ අපට කෑ යුතුවූ භෝජනයන් සපයා තබව”යි කීවාය.

ඉක්බිති ඒ සිවල්දෙන්තොම විචාරන්නී “මම තොප කීවාවූ පර්ෂදට (පිරිසට) යම් භෝජනයක් පිසමි, ඒ තීගේ පරිවාර ජනයෝ කෙබඳු වන්නාහුද? කිනම් ඇත්තාහුද? ඔවුන් අපට නොවලහා කියව”යි කියා කීවාය.

එබසට එළුදෙන්තොම තමාගේ පිරිවර කියන්නී “එම්බල වේනීය, සුනඛයන් පන්සියයක් පිරිවරකොට ඇත්තාවූ මාලිය

නම්වූද චතුරක්ඛ නම්වූද පිගිය නම්වූද ජම්බුක නම්වූද යන මොහු සතරදෙන මාගේ පිරිවර වන්නාහ. මේ සියල්ලවුන් පිරිවරාගෙණ එන්නාවූ මට තෝ ගොස් අහර සපයා තබව. ඉදින් තෝ ආහාර සපයා නොතිබුවා නම් මාගේ පිරිවරවූ දෙදසක් බල්ලෝ තොප දෙදෙනා මරා මස්කන්නාහුය''යි කීවාය. එබස් අසා ඒ සිගාල ධෙනුතොම "යහපත ඉදින් තොමෝ එතැන්හි ගියා නම් අපට මහත් අනර්ථ වන්නේය. එසේහෙයින් නොයන පරිද්දෙන් කෙරෙමි'' සිතා කියන්නී "එම්බල යෙහෙලිය, තොප මේ වසන තැනින් නික්ම ගියකල්හි තොපගේ උපකරණ විනාශ වන්නේය. එසේහෙයින් තොපගේ යහළුවූ ඒ සිගාලයාට තොප නිදුක් නිරෝගි බව මම කියාලමි. තෝ අනික් තැන්හි නොගොස් මෙතැන්හිම සැපසේ වාසය කරව''යි ඒ එළුදෙනට කියා තොමෝ මරණ භයින් තැතිගෙණ වේගයෙන් ස්වාමිපුත්‍රයා ළඟට ගොස් ඔහු කැඳවාගෙණ අන්තැනක විසීමට ගොස් නැවත ඒ ගුහාවට නොආවාහුය යි සර්‍වඥයන් වහන්සේ මේ ධර්‍මදේශනාව ගෙණහැර දක්වා වදරා පූර්‍වාපර සන්‍ධි ගළපා මේ ජාතකය නිමවා වදාළසේක.

"ඒ අරණ්‍ය ප්‍රදේශයෙහි වනස්පති වෘක්ෂයෙහි (විශාල ගසක) අධිගෘහිතව (අරක්ගෙන සිටි) ඒ සිගාලයාගේ හා සිවල්දෙනගේ භාෂණය (කථාව) ඇසූවාවූ දේවතාවා නම් ලොව්තුරා බුදුවූ මම්මය''යි තමන් වහන්සේ දක්වා වාදාළසේක.

# 427. තිත්වටු ජාතකය

තවද එක් සමයෙක්හි මහනීය ගුණ (පිදිය යුතු ගුණ ඇති) මහිම සම්‍යක් සම්බුද්ධ රජොත්තමයානන් වහන්සේ ධර්‍මාමෘත වර්‍ෂාවෙන් (දහම් අමා වැස්සෙන්) ක්ලේශ දහන නිර්‍වාපණය (කෙලෙස් දැවීම නිවා) කොට වෛනෙය (හික්මවිය හැකි) ජනයන් මනදෙළ පුරමින් ලකුළු ගිජුකුළු පව්වෙහි ආර්‍ය්‍ය ඊර්‍ය්‍යාපථ (උතුම් ඉරියව් පැවැත්මෙන්) විහරණයෙන් වාසය කරණසේක්, මේ ජාතක ධර්‍මදේශනාව ගෙණහැර දක්වා වදාළසේක.

එසමයෙහි ප්‍රසිද්ධ දම්සභා මණ්ඩපයෙහි විශුද්ධ බුද්ධාශන පිරිවරා උන් ශික්‍ෂාකාමී භික්ෂූහු බලා "ඇවැත්නි, මේ දෙවදත්ත ස්ථවිරයෝ නම් ලජ්ජා නැති එකෙක, ඔහු සිත සංජාත උතුම් ගුණ ලවයකුත් (ගුණ බිඳක්වත්) නැත්නේය. එසේ සිටන් බුදුවනු කැමැත්තේය. මුළුලොවට පතල අපමණ ගුණ ඇති බුදුරජානන් වහන්සේගේ සසුන් වැද කෙළෙසුන්ම දැරීය, අජාසත් රජු හා සමග නිවන් මග වලකන්නාක් මෙන් බුදුන් විදීමට දුනුවායන් යෙදීය. අපායමග එළිකරන්නාක් මෙන් ගල් පෙරළීය, අධර්‍ම නමැති රජ ප්‍රදක්‍ෂිණා (අදහම පැදකුණු කරන්නාක් මෙන්) කරන්නාක් මෙන් මදැතු බුදුන් සිඟා වඩනා පුරවීථියෙහි හැරවූයේය. තමාගේ සිල්සෙනඟ භග්න කරන්නාක් මෙන් සංඝභේද කළේය." යනාදීන් සත්ගුණයෙන් අස්ථිර වූ දේවදතත ස්ථවිරයාගේ නුගුණ පහළ කළාහුය.

එබස් දිව්‍යකණින් අසා ලොවට මතුවන වැඩ නිසා අසාධාරණ වූ බුද්ධමහිමයෙන් ධර්මරාජන්වූ (දහමට අධිපතිවූ) සර්‍වඥයන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩ ප්‍රඥප්තවූ බුද්ධාසන මස්තකයෙහි වැඩහිඳ රත්න ප්‍රතිමාවන් මෙන් නිශ්චලව උන් භික්‍ෂු ගණයා බලා "එම්බා භික්‍ෂූනි, මා එන්නාට පළමුවෙන් මෙහි කවර කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා "මෙනම් කථාවකින් යුක්තව උනුම්හ"යි අසා "මහණෙනි, මා නිසා අසාරවූ දේවදත්ත ස්ථවිරතෙම දැන් මතු වද යෙදුයේ නොවෙයි, බෝසත් කලත් මහත් වද යෙදුයේ වේදැ"යි වදාරා සංක්‍ෂේපව පැවති එපවත් විස්තරයෙන් අසනු කැමති ගණයා විසින් ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්?

පෙර දෙලොස් යොදුන් බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජක්හු රාජ්‍යශ්‍රී අනුභව කරණ කල්හි වෙද වෙදංග සමය සමයාංග (ආගම දහම) ශිල්ප ශාස්ත්‍රයෙහි නිෂ්පත්තියට (පරතෙරට) පැමිණි දිසාපාමොක් ආචාරියෙක් ඒ බරණැස වසන පන්සියයක් පමණ මානවකයන්ට ශිල්ප උගන්වනුයේ, එක් දිනයෙක "සම්බාධවූ (බාධ ඇතිකරණ) මේ ගෘහ වාසය මටත් පළිබෝධය (උවදුරු සහිතය). ශිෂ්‍යයන්ගේ ශිල්ප ඉගැන්මටත් බාධාය, එබැවින් හිමවත් වනයට යෙමි" සිතා එපවත් අතවැස්සන්ට කියා වල්හි (වනයේ) කල්යවා විසීමට නිසි තල සහල් තෙල් මී සකුරු වස්ත්‍රාභරණ නොහැර ගෙණ

පිරිවර අතවැස්සන් හා සමඟ මහමගගෙවා විවේක ජනාලයවූ (විවේකය කැමති ජනයාට හිතකර) හිමාලයෙහි ජනමන නන්‍දනවනයක් මෙන් හොබනා එක් අරණ්‍ය ප්‍රදේශයකට පැමිණ මග අසල් තැනෙක (මාර්‍ගයට ආසන්න) පන්සල කරවා විසීය.

ඒ පන්සියයක් අතවැස්සෝද පන්සල්කොට එතැන විසුවාහුය. ඔවුන්ගේ නෑයෝද තමන්ගේ උපකරණ ඔවුන්ට එවන්නාහු වෙති. එපන්සලට අසල්වූ පසල් දනව්වෙහි වසන ජනයෝද ශිල්ප උගන්වා වසන්නාවූ ඒ ආචාරීන්ගේ ගුණ කථා අසා ප්‍රසන්නවූ සිතින් අන්නපානාදීවූ උපකරණ එවන්නාහුය. තවද එයින් එක් මිනිසෙක් “මෙයින් ආචාරීහට නිදුක් වේවා”යි කියා කිරි දෙනෙකු හා වස්සෙකු එවීය. ඒ ඇදුරා වසන මැදුරට නුදුරු තැන්හි එක් තුරු සිදුරෙක දරුදෙදෙනකු ගොරුකවා ගෝ දෙනෙක් (ගව දෙනෙක්) වාසය කරන්නීය. ඒ වනයෙහි වසන උග්‍රවූ සිංහ ව්‍යාඝ්‍රයෝද විග්‍රහනොවී (වෙනසක් නැතිව) ඕහට උපස්ථානයට එති. නොමදහත්වද ලොවට මහත් මහිම දක්නට මෙත් බෝසත්වූ අප මහබෝසතානෝ තිත්වටු (වටු විශේෂයක්) ජන්මයෙහි ඉපද ඒ මානවකයන් හා කැටුව විශ්වාසීන්ව වසන්නාවූ ඒ ඇදුරුහු හදාරවන වෙදත්‍රය විස්තරයෙන් දැන චිත්‍ර කථිකව (දක්ෂ කථිකයෙකුව) තිත්තිර පණ්ඩිත වූසේක.

ඉක්බිති අතවැසි මානවකයන් වෙද ප්‍රමාණය නිමවා නිපුණ කරන්නාට පළමුකොට (වේදය ඉගනීමට පෙර) දිසාපාමොක්

ආචාරීතෙම මරහු විසින් වසඟ කරණ ලද්දේවිය. අතවැස්සෝ ඔහුගේ ආදාහන කෘත්‍ය නිමවා වැල්ලෙන් චෛත්‍යයක් කොට නිත්‍යයෙන් පූජාකොට විලාප කියා හඬති.

බෝසතානන් වහන්සේ අඬන කාරණ විචාරා "මිත්‍රයෙනි, වේදත්‍රය තව විස්තර කොට වදරා නොනිමියේය. එසේහෙයින් හඬම්හ"යි මානවකයන් කී කල්හි "එසේවුවහොත් තොප උගත් ඒ වේදත්‍රය දැන් කියව"යි කී කල්හි ලෝකෙක නෙත්‍රවූ (ලොවට එකම ඇසක් වැනිවූ) ඒ තිත්තිර පණ්ඩිතයන් වහන්සේ විශේෂවත්වූ මනුෂ්‍ය භාෂාවෙන් ග්‍රන්ථිස්ථාන නිශ්ශෙෂ (ගැටලු තැන් අත් නොහරිමින්) කොට පර්වත මස්තකයකින් ගඟා ප්‍රාවාහයක් බානා පරිද්දෙන් වෙද මන්ත්‍රොද්ධාරණය කළසේක. එසඳ මානවකයෝ තුටුපහටු සිත් ඇතිව තිත්තිර පණ්ඩිතයන්ගේ සමීපයෙහි වෙදමන්ත්‍ර ඉගැන්මට පටන්ගත්තාහුය.

ඒ බෝසතානෝ දිසාපාමොක් තනතුරෙහි සිට ශිල්ප උගන්වනසේක. ඔහුද උන්වහන්සේට ඇදුරු නොවන තරම් සොඳුරු පැහැසර රන්මැදිරියක් කරවා එහි වැඩහිඳුවා රන්තැටියෙන් මී විළඳ දී ඇමසඳ නොමඳ සුවඳ කුසුම් පුද හැමද මනනඳ මහත් සත්කාර කෙරෙති. "තිත්තිර පණ්ඩිතයෙකු පන්සියයක් මානවකයන්ට ග්‍රන්ථ හදරති"යි උදාරවූ කීර්ති ඝෝෂාව බුද්ධොත්පාද කාලයක් මෙන් ලොව පතළේය.

ප්‍රසිද්ධ සම්පත්ති භාරයෙන් හා සුරනරවර සුරපුරයක් සේ බබලන රජගහනුවර ගිරිසිඛර සුරන්ට (පර්‍වත මුදුන්හි දෙවියන්ට) බිලිදෙන පිණිස අවුරුදු පතා කරණ මහපුද මෙන් එකල සකල ජම්බුද්වීපයෙහි වසන මිනිසුන් විසින් සන්තෝෂව මහත් උත්සවයට උද්ඝෝෂණය කරණ ලද ඒ උත්සව ක්‍රීඩාව නිසා තමන්ගේ මව්පියන් විසින් කියා එවූ කල්හි ඒ බ්‍රාහ්මණ මානවකයෝ පන්සියයද පන්සලත් බෝසතානනුත් ගෝදෙනට රක්‍ෂාකරණ පිණිස නියෝග කොට පණ්ඩිතයන් වැඳ අවසර ගෙණ ගියෝය.

එකල කලිගුරටින් සටකපට (අනුන් රවටන) දුෂ්ට පාපිෂ්ට (පව්කාර) මනුෂ්‍යයෙක් උපචිත (රැස් කරණ ලද) වඤ්චා සඬයක් (බොරු ගොඩක්) සේ උස්වූ ජටාවක් බැඳ, තමා මුවාකොට මුවන් මැරීමට ඇග වැසූ වල් කැලෑවක් ඇඳිසේ වල්කැලෑපෙරව (පතුරු ඇඳුම් හෙවත් වැහැරි සිවුරු පොරවා), චිත්ත විවෙක විභාග (සිත්වල ස්වභාවය) නොදැක්මෙන් කරුණාවෙන් තොරව මස් පලහා (පුළුස්සා) කණ අග්නිකපාලයක් (ගිනි කබලක් වැනි) මෙන් භික්‍ෂා පාත්‍රයක්ද, ශුෂ්ක මාංශ ගුප්තකොට (වියලි මස් සඟවා) තබන ගබඩාවක් බඳු ඩබරාවක්ද, තුන්කල් සිත වංකබව දක්වන්නාක් මෙන් වංකත්‍රයක් ඇති පිරිකරක්ද, අපායට මානයට යෂ්ටියක් බඳුවූ චාරයෂ්ටියක්ද (සැරයටියක්) ගෙණ, තමා මැරූ ගණනට එබූ බින්දු වැනි තිත්පෙලින් නුදුන් අඳුන් දිව්සමක් ඒකාංශයෙහි කොට රුධිර පානයෙහි ලේ රැඳි රත්ව ගියාක් වැනි මහත් තඹ රැවුලකින් හා වෑහෙන ලේ

බිඳුවට තිබූ පිහිල්ලක්සේ දික්වූ දැලිවලල්ලකින් (තාපස උපකරණයක්) යුක්ත සත්‍ව සන්තාප වඤ්චා තාපස වෙසකින් උපායෙන් සතුන්ට දුක්දෙන අපායෙහි යමපල්ලකු මෙන් ඒ පන්සලට පැමිණියේය.

ඔහු දැක ගොදෙන්ද සොයා යන ගොදුරු තබා දයාබර සබා තාපසයෙකැ යි නොබා ගොස් ඔහු කෙරෙහි භක්තියෙන් බත්පිස කවයි සහල් ආදිය දක්වා දී ගොදුරු පිණිස ගියාය. ඒ තාපසයාද එදා උදෑසන බත්පිස හැමකලම සංග්‍රහ කළාවූ ජනයන්ට නිග්‍රහකරණ දුර්ජනගුණය අවබෝධ කරන්නාක් මෙන් ඒ ගෝධෙනුවගේ දරු දෙදෙනා මරා මස්රසයෙන් බත් අනුභවකොට දහවල් මැදිරියෙහි උන් ලොවට කල්‍යාණ මිත්‍රවූ කුශලයට ජන්මක්ෂෙත්‍රවූ (උපන් බිමක් වැනි) සද්ධර්මයට ඒකච්ඡත්‍ර (එක කුඩයක්) මෛත්‍රියට පාත්‍රවූ චාරිත්‍රයෙන් පවිත්‍රවූ පක්ෂපත්‍රයෙන් විචිත්‍රවූ තිත්තිර පණ්ඩිතයන් වහන්සේ ඒ තාපසතෙම තමාගේ පූර්ව වෛරය හා සමග එළියට ගෙණ වනදේවතාවන් හා සමග හඬව හඬවා ඒ වෙනෙහි සිංහ ව්‍යාඝ්‍රයන් හා සමඟ විකේෂ්පකොට අතවැස්සන් හා සමග දුකට පමුණුවා තමාගේ අකුශල් හා සමග ගිණිදල්වා කුශල්මුල් හා සමග එළහාවීර රිච්බව් (වීරත්වය) හා සමඟ අනුභවකොට එසේද වස්සාද මරා කා නැවත දරුවන් මැරූ බැව් නොදැන කිරිදෙන පිණිස පැමිණි දෙනද මරා හවස මස් අනුභවකොට පරලොව යාත්‍රාවට ගමන් ගතවන්නාසේ පන්සලින් නික්ම ගස්මුලෙක හෙව වස්සාගේ හා දෙන්නාගේ බැගෑපත් හඬසේ ප්‍රධ්වනි නාද සේ ගොරව ගොරවා

නිදන්නට පටන්ගත. ගෝදෙන් ගොදුරු බිමින් අවුත් දරුවන් දෙදෙනා නොදැක බලා ඇවිදිනීය.

එසේ තමා ලග්නා බිලෙන් පාව ඇවිදිනා ඒ ගෝදෙන දැක වනදේවතාවෙක් විසිතුරු අතුරෙකින් (ආකාරයකින්) පෙනී මනහර සොඳුරුවර දිව්‍යරූපයෙන් සිට මියුරු තෙපුලින් කථාකරනුයේ "එම්බල, තොප විසින් යමෙක්හට අදරින් ආහාර සපයාදී මහත් සත්කාර කරණ ලදද, ක්‍රෑරවූ ඒ චෝර පුරුෂතෙම තොපගේ දරුදෙදෙනා මරා කා තෙල තුරුමුල හෙව නිදන්නේය. දැන් තොප ගොසින් දලින් ඩැහැ එයින් ජීවිතක්‍ෂයට පමුණුවව, ප්‍රාණවධ කැමති ඔහු ජීවත්වීම තොපට නොකැමැතිවෙයි" කීවේය.

එබසට ගෝදෙන දේවතාවට කියන්නී "එම්බල දිව්‍යපුත්‍රය, මේ කුල පුත්‍රතෙම බාලපුත්‍රයන් වඩනා දෑසී ස්ත්‍රියකගේ මලමුත්‍රයෙන් රැදුනු වස්ත්‍රයක් මෙන් අපවිත්‍රවූ චාරිත්‍ර ඇති රෞද්‍රවූ එක් වැදිපුත්‍රයෙක, දුෂ්ටකර්මයෙන් කඨිනවූ (තදවූ) මොහුගේ ගාත්‍රයෙහිද මොළොක් තැනක් නොදන්නෙමි. එයින් ඩැහැ මරන්ට නොකැමැත්තෙමි" කියා නැවතත් ඔහු කෙළෙහිගුණ නොදන්නා බව පෙන්වා කියන්නී "එම්බල දේවතාව, තවද මෙලොව යමෙක් උපකාරී ජනයන්ට ප්‍රත්‍යුපකාර හෙයින් අකෘතඥවේද, නිරන්තරයෙන් ගොදුරු සොයා යන පක්‍ෂියෙකු මෙන් විපක්‍ෂව සියල්ලවුන්ගේ සිරුරම දක්නා සුළුවේද, එබඳු දුර්ජ්ජනයාට චතුස්සාගර පරියන්ත නගර නිගම ග්‍රාම රමණීය සමස්ත සම්පත්ති සම්භාර

සමලංකෘත (සම්පත් සමූහයෙන් අලංකාරවූ) සකල පෘථිවි මණ්ඩලය සත්කාර පූර්වාධිගමකොට දුන්නේවී නමුත් එසේත් ඔහුගේ සිත්ගත නොහැක්කේය”යි මෙසේ රුක්දෙවියාට කියා ගෝදෙන ඒ තවුසා නිසා භයින් අන්තැන්හි ගිය කල්හි බෝසතානන්ගේ මෛත්‍රී මහිමයෙන් මිත්‍රව වෙනෙහි වසන සිංහ ව්‍යාඝ්‍රයන් දෙදෙනා අතුරෙන් සිංහරාජතෙම කියනුයේ “එම්බා ව්‍යාඝ්‍රරාජය, ධර්මාධර්ම විභාගය දේශනාඥනයෙන් ප්‍රතිමණ්ඩිතවූ අපගේ තිත්තිර පණ්ඩිතයන් වහන්සේ දැන් සත් අට දවසක් නුදුටුම්හ. තෙපි ගොස් ඒ ගුණවත්හුගේ පවත් දැන එව”යි ව්‍යාඝ්‍රරාජයා ගමන් කරවිය.

එසේද ගෝදෙන ගිය වේලෙහිම ගොස් මිනිස් බඳින් රඳන පවුකඳක් මෙන් නිදන ජඩවූ ඒ තාපසයාගේ විපත්තිලතාවෙහි (විපත් වැලෙහි) හටගත් විචිත්‍රාංකුර පත්‍රයක් (විසිතුරු අංකුර කොළයක්) මෙන් ජටාතුරෙහි පෙණෙන තිත්තිර පණ්ඩිතයන්ගේ පක්ෂපත්‍රයන්ද පැතිරගිය ඔහුගේ කර්මරාශිය සේ විසිර ගිය දෙනගේ හා වස්සාගේ ඇට රාශියද ගුණෙන් සිස්වූ මහතාපසයාගේ සිතුසේ බෝසතුන්ගෙන් සිස්වූ මැදිරිය දැක මේ පාපිෂ්ටයාගේ දුෂ්ටකර්මයෙනැයි රුෂ්ටව (කිපී) පයින් ඇන පිබිදවිය. ඒ තාපස නැගීසිට තමාගේ බෝසතුන් මරා රැස්කළ අකුශල කර්මය දෘෂ්ට ධර්මවේද්‍ය (මෙළොව වශයෙන් විපාක දෙන කර්ම) මූර්තිමත්ව පෙණුනාක් මෙන් භයංකාරව සිටි ව්‍යාඝ්‍රයා දැක භයින් තැතිගත්තේය.

එසඳ ව්‍යාඝ්‍රතෙම "මේ සත්‍වයින් මරා කෑවේ තෝ වේදැ"යි විචාරා ඔහු "නොමැරීමි" කී කල්හි "මේ සතුන් තා නොමැරුව මේ වෙනෙහි වෙන මරන්නෝ නැත. එයින් බොරු නොකියව"යි කියා භය ගැන්විය. හෙද භය පත්ව "සෙස්සවුන් මැරීමි. තිත්තිර පණ්ඩිතයන් නොමැරීමි" කියා නැවතත් එය ගිවිස්වනු පිණිස කලිඟුරට තමා උපන්තැන් පටන් වට නොයෙක් රට ඇවිද තමා කළ පව්වුකම් ආදිය කී කල්හි එසේත් නොගිවිස අනිස "තෝ මෙසේ කියයිදැ?"යි ඇවිස සිංහ රජ්ජුරුවන් සමීපයට එව යි කියා පව්වු තවුසා තමන් හට පෙරටු කොටගෙණ ගියේය. ඔහු ඉදිරිකොට එන ව්‍යාඝ්‍රරාජයාට කථාකරන්නාවූ සිංහරාජතෙම රාහුමුඛයට නොපැමිණි පූර්ණ චන්‍ද්‍රයා මෙන් සම්පූර්ණ වූ පූර්වගාත්‍රයන් ඇති හෙයින් සුබාහු නම්වූ "එම්බා ව්‍යාඝ්‍ර රජ්ජුරුවෙනි, ඉතා සීඝ්‍රවූ මනුෂ්‍යයෙකු කැඳවා ගෙණ මෙතැන්හි ආයෙහිය. ක්‍රියවික්‍රිය (ගණු දෙණු ආදියක් නැති) කිසාකර්ම්මාන්ත රහිත මේ වනාන්තරයෙහි වසන තොපට මනුෂ්‍යයන්ගෙන් කවර ප්‍රයොජනයෙක්ද? එබැවින් සැබැවින් මොහුගෙන් සිද්ධවන යම් ප්‍රයෝජනයෙක් ඇද්ද? ඔහුට නොවලහා කියව"යි කීයේය.

එබසට ව්‍යාඝ්‍ර රජතෙම "එම්බා සිංහරාජ, සත්ගුණ රන්නයට නිධාන වෙදත්‍රයට උපදෙශවූ සද්ධර්මයට අසාධාරණවූ තොපට කල්‍යාණමිත්‍රවූ යම් තිත්තිර පණ්ඩිත කෙණෙක් ඇද්ද, ඕහට පැමිණියාවූ වධය අධමවූ මේ අසත්පුරුෂයා විසින් කළ පාපකර්මයෙන් ඇසූවාවූ මම මොහුගෙන් පැමිණියායයි සිතමි. ඒ එසේම සකල ජනානන්දකර (සියලු ජනයාට සතුට ගෙන

දෙන) මධුර ලාබයෙන් මනෝහරවූ ඒ තිත්තිර පණ්ඩිතයන් මේ වනාන්තරයෙහි දැන් ජීවත්ව ඉන්නාහු නොවෙති" කීයේය.

එබසට සිංහ රාජතෙම විචාරණුයේ "එම්බා ව්‍යාඝ්‍රය, තා විසින් අසන ලද මේ පුරුෂයාගේ ජීවිකාවෘත්තිය නිසා ප්‍රවෘත්ති වූ කර්මයෝ නම් කවරහුද? පාපනිවරණ කාරනාවූ ශ්‍රමණ වේසයෙන් සිටිනා මේ මානවකයා කවර ප්‍රතිඥාවක් ගෙණ තිත්තිර පණ්ඩිතයන්ගේ විනාශයට මොහු සැක කරන්නෙහිදැ?"යි විචාළේය.

එකල සියල්ල ප්‍රකාශ කොට කියන්නාහු ව්‍යාඝ්‍රතෙම කියන්නේ "මනෝහර රූපහාරවිහාර බලපරාක්‍රමයෙන් (රූපයෙන් හා බලයෙන් නොඅඩු) මෘගරාජන්වූ එම්බා සිංහරජ්ජුරු වහන්ස, මේ පුරුෂ තෙම කලක කලිගුරට වසනකල කපට වෙළඳුන්ගේ බඩුපොදි ඉසින් උසුලා බඩ වැඩීම පිණිස ගමින් ගම ඇවිද දාසයකුමෙන් වාසය කළේය. කලෙක තුලාකූට මානකූට (කිරුම් මැනුම්) කර්ෂපනාදී (කහවණු) චාටුක්‍රියාවෙන් වෙළඳාම් කළේය. කලෙක කණු ගසා වේවැල් බැඳ එල්ලී යායුතුවූ දුර්ග්ගමාර්ගයෙහි සාඛා මෘගයෙකු (වඳුරෙකු මෙන්) මෙන් සංචාරයද කෙළේය. කලෙක මුළු මුළුව නටා ඇවිදිනා නළු නාටකයන් හා කැටුව වැටුප් නිසා යටත්ව ඇවිද්දේය. කලෙක නිරය ගිනිදැල් ඉසලීමට පෙරනිමිත්ත පානාක් මෙන් වරදැල් වැද්දන් හා වල්වැද දැල් ඉසලීය. කලෙක සිරුරෙහි අඟුරුගුරු තවරකර (අඟුරු දැලි ගාගෙන) දෙරින් දෙර මුගුරු සරඹපෑ අඟුරු තරවෙසින්

ඇවිද්දේය. කලෙක විකිණි මස් පිණිස ගිහිණි වල්වැද නොමද මලිති ලිහිණියන් බද දිළිඳු වැදිවෙසින් ඇවිද්දේය.

කලෙක වී මැනදීමෙන් ගෙණ දිවිපවත්වා කොටගුළු රක්‍ෂා කළේය. කලෙක අනර්ඝයට හැරී දෙර සේ බෙදූ දූකෙල ඇවිදිනා ධූතීයන්ට පැහැද පසඇට ගෙණදී ඇවිද්දේය. කලෙක දිවසැපතට පැමිණ මැඩියන් අණුහව කරණ සපීයෙකු මෙන් උතුම් තවුස් වෙස් දරා දහනවූ අකුශල් කෙළේය. කලෙක රජුන්ට අපරාධ කෙළෙන් අත්පා කපාහල නරන් කරා සොර මැදුම් රැ (මධ්‍යම රාත්‍රී) ගොස් කුඩා දුම්පැලේ නවතා එයින් දිවිරැක ඇවිද්දේය. කලෙක ජීවිකාව නිසා ආජීවකයන් කෙරෙහි පැවිදිව උනු බත් වළද දැත් දවා ඇවිද්දේය.

මොහු විසින් ජීවිකාවෘත්තිය නිසා කරණලද මේ යථොක්ත අනාචාර ප්‍රවෘත්තිය ඇසූහෙයින්ද චිත්තයෙහි ක්ලේශ ජටාවෙන් අවුල්වූ මොහුගේ ජටා අතුරෙහි තිත්තිර පණ්ඩිතයන්ගේ පක්‍ෂ පත්‍රයන් (පිහාටු) දුටු හෙයින්ද, ලොවට වධහිංසා නොවන බැවින්ද මරන්ට නුසුදුසු දෙන හා දරුවන් මරා කෑ හෙයින්ද, තිත්තිර පණ්ඩිතයන්ගේ වධයට දැන් මොහුම සැක කෙළෙහි''යි කීයේය.

එකල්හි සිංහරාජතෙම කොපුයේ හයාලන කඩුපත් සේ භයානක සේ තියුණු නබ පන්තීන් නික්මවා (නිය පෙළ විහිදුවා) "සබඳ කොල, තෝ අපගේ තිත්තිර පණ්ඩිතයන් මැරූයෙහිදැ?''යි විචාළේය.

එකල්හි ජරාමරණ හැර යා නොහැකි ක්‍රෑරවූ සිංහ ව්‍යාඝ්‍ර දෙදෙනාගේ අතුරෙහි සිට භයින් අනිකක් කිය නොහී බිලියක් වමාරණ මත්ස්‍යයෙකු මෙන් මහත් උත්සහයෙන් "ස්වාමීනි සැබව"යි කීයේය. එබස් අසා සාධාරණ සිංහරාජතෙම නොමරා හරණ අභිප්‍රාය වීය. ව්‍යාඝ්‍රතෙම නොමරා හරණ අතිදුෂ්ටයාගේ ජීවත්වීම ලොවට ඉෂ්ට නොවන්නේය"යි කියා ධර්‍මී නමැති ශරීරයෙහි හටගත්තාවූ පුණ්ඩරීකයක් (නෙළුම් මලක්) සේ කෘෘරවූ ඒ පුරුෂයා වෛද්‍යාචාර්‍ය්‍යයකු සැත්කම් කරන්නාක් මෙන් දලගින් පැහැර පලා ඒ වෙනෙහි සත්‍වයන්ට සාන්ති කොට අපායට යන්නාවූ ප්‍රාණයට පසු ගමන් කරන්නාකේ මෙන් පතිතවූ ඔහුගේ මෘතදේහය දැක "මේ පරිභව කටයුතු ද්‍රෝහී පුරුෂතෙම අනුභව නොකටයුතු එකෙකැ"යි ඔහුගේ මෘතදේහයත් අපායේ හෙලන්නාක් මෙන් භූමිවිද්‍රරණය කොට එහි බහා පස්වසාලමින් වනදේවතාවන් අස්වසාලීය.

ඉක්බිති උත්සව ක්‍රීඩාවට ගිය පන්සියයක් මානවකයෝ පන්සලට පැමිණ බෝසතානන් නොදැක "අනේ අපගේ පණ්ඩිතයානන් වහන්සේ කොයි වැඩිසේක්දැ?"යි තැනින් තැන වැටී පෙරලී ගතින් ගත් වැල්ලෙන්, අතින් ගත් කුසින්, ඉසින් ගත් පරණලින්, නෙතින් ගත් කඳුලෙන්, සිතින් ගත් සෝකින් ඒ පන්සල හාත්පසින් බලා නැවත පන්සලට වැද ගාන්ධර්‍වයන්ගේ ගීතිකා මෙන් මනොහර ශක්‍රයන්ගේ සභාමණ්ඩපය මෙන් පළමු පණ්ඩිතයන්ගේ මධුරාලාපයෙන් ප්‍රතිමණ්ඩිතවූ (මිහිරි කතාවෙන් ලක්‍ෂණවූ) මෙපන්සල දැන්

නිරිඳුන් හැරගිය කඳවුර මෙන් නිශ්‍රීක වූයේය. පෙර මාණික්‍යරත්නයෙන් ඒකාලෝකවූ වෛපුල්ල පර්‍වත ගුහාව සේ බබලන මේ රන්මැදිරිය දැන් ඇඳිරියක් සේ තිබුයේය. පෙර වේද සැදෑරීමෙන් එකකෝලාහලවූ මේ ආශ්‍රමය දැන් රැල සුං මුහුදක් සේ නිශ්ශබ්ද විය. සද්ධර්‍ම ප්‍රදීපය නිවුනු නියාය, වෙදත්‍රය මුළුපුට නියාව (මුලින්ම උපුටා දැමුවක් වැනිය), සුගති මාර්‍ගය වැසූ නියාය, අපායට දොර හළ නියාය, ගුරුප්‍රදේශ විනාසවූ නියාය, මෙබඳු පණ්ඩිත කෙනෙකුන් කවර කලෙක දකිමෝද? මෙවැනි වචනාමෘතයක් කවර කලෙක ලබමෝද? මෙබඳු ශාස්ත්‍රාර්ථයක් (උතුම් දැනුම් සම්භාරයක්) කවර කලෙක අසමෝද? මේ මහතානන්ගේ මධුර ශබ්දයෙහි බැඳී උන් මේ වෙනෙහි පක්‍ෂීහූ දැන් කවරක්හුගේ ශබ්ද අසා සතුටුවෙද්ද? මුන්වහන්සේගේ මෛත්‍රී මහිමයෙන් මිත්‍රවවිසූ නිත්‍යවිරෝධි සත්‍වයෝ මතු කෙසේ විස්වාසව වෙසෙද්ද? මුන්වහන්සේගේ සද්ධර්‍ම ගඟාවෙහි ගිලී සැනසුනු වනදේවතාවෝ මතු කෙසේ සැනසෙද්ද? යනාදීන් මෙසේ වෙනවෙනම විලාප කියා ඇඬීමෙන් යුගාන්ත වාත ප්‍රහාත සමුද්‍රයාගේ තරඟ ඝෝෂාව සේ ඒ සියලු මහවනය එකකෝලාහල කොට ඒ පන්සියයක් බ්‍රාහ්මණ මානවකයෝ තමන්ගේ වාසස්ථානවලට ගියාහුය.

මෙසේ ක්‍රෝධයෙන් ප්‍රමත්තවූ (ප්‍රමාද වූ) දහම්හි අව්‍යක්තවූ දේවදත්ත ස්ථවිරතෙම පෙරත් වධ යෙදුයේම වේදැ යි මේ ජාතක ධර්‍මදේශනාව පූර්‍වාපරසන්ධි ගළපා නැවතත් විශුද්ධ (පිරිසිදු) විද්‍යාවරණ ගුණයෙන් ප්‍රශස්ත

(උතුම්වූ) ලොකෙක නායක සාන්තිප්‍රදයක (සැනසුම දුන්නාවූ) ශාක්‍යකුලතිලක ශාස්තෘ වූ තිලෝගුරු සම්‍යක් සම්බුද්ධ රාජොත්තමයානන් වහන්සේ “එම්බා මහණෙනි, එකල තාපස වේසයට පැමිණ ප්‍රාණවධ කළාවූ අධම පුරුෂ නම් මෙකළ මේ ශාසනයට පැමිණ මහණදම් තබා අකුසල් කරන්නාවූ දෙවදත්තස්ථවිරයන් වන්නේය. එකල තාපසයා කෙරෙහි භයින් පලාහැර අන්තැන්හි ගිය ගෝධෙනුව නම් මෙකල මේ ගෞතම ගොත්‍රයෙහි ඉපද සසර භයින් ගිහිගෙය හැර ශාසනයෙහි මහණවූ කිසාගෝතමී ස්ථවිරී වන්නීය. එකල ඒ තවුසා නසා මිතුරුගුණ මහිම දැක්වූ ව්‍යාඝ්‍රරාජයා නම් මෙකල මේ කෙලෙසුන් නසා ඍද්ධිමහිම දැක්වූ මෞද්ගල්‍යාන ස්ථවිර වනනේය. එකල ඒ වෙනෙහි සියළු මෘගයන්ට උතුම්වූ සිංහරජ්ජරුවෝ නම් මෙකල මේ ශාසනයෙහි සියලු නුවණැත්තන්ට උතුම්වූ ශාරිපුත්‍ර ස්ථවිර වන්නේය. එකල ශිල්පයෙන් අගතැන්පත් දිසාපාමොක් ආචාර්ය්‍ය නම් මෙකල සියළු ධූතාඞ්ගයෙන් අගතැන්පත් මහාකාශ්‍යප ස්ථවිර වන්නේය. එකල පන්සියයක් කුලපුත්‍රයන්ට වෙදත්‍රයෙන් අනුශාසනා කළාවූ තිත්තිර පණ්ඩිතයෝ නම් මෙකල භුවන්ත්‍රය (තුන් ලෝ වැසි සත්වයන්ට) වාසීවූ ජනයන්ට පිටකත්‍රයෙන් (සූත්‍ර, විනය, අභිධර්‍මය යන තුන් පිටකයෙන්) අනුශාසනා කොට අජරාමර වූ අමෘත මහා නිර්‍වාණයට පමුණුවන්නාවූ බුදුවූ මම්මවේදැ”යි තමන් වහන්සේ දක්වා වදාළසෙක.

**නවවෙනි නිපාත වර්‍ණනාව නිමි.**

තවද දසවැනි නිපාතය දක්වමි. ඒ කෙසේද යත්?

# 428. චතුද්වාර ජාතකය

තවද සුරාසුරවර (උතුම් දෙවියන් හා අසුරයන්) චක්‍රවාටචූඩාමණිමරීචිසඞ්ඝයපරිචුම්භිත (සක්වල මුදුන්හි සිළුමිණෝ කාන්ති සමූහය ස්පර්ශවූ) චරණ නඛමයූඛ (පා නිය රැස්) ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි නොකීකරු භික්ෂුකෙනෙකුන් අරභයා මේ ජාතකය දක්වනලද්දී. මෙහි විස්තර වශයෙන් නවවැනි නිපාතයෙහි 'ගිජ්ඣ ජාතකයෙහි' විස්තර වශයෙන් පෙණෙන්නේය.

මෙහි වනාහි "සැබෑද මහණ? තා නොකීකරුව වාසයකරන්නේය"යි විචාරා "සැබව ස්වාමීනි" කී කල්හි "දැන් මතු නොවෙයි මහණ, තෝ පෙරත් නොකීකරුව වාසය කළේ වේද්‍ද?"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස කාශ්‍යප සර්වඥයන් වහන්සේගේ කාලයෙහි එක් ගමෙක දුක්පත් උපාසකයකු හා උපාසිකාවක් ඇත්තීය. උන්ගේ මිත්තවින්දක නම් පුතෙක් ඇත්තේය. ඔහුගේ දෙමව්පියෝ තුමු ශ්‍රද්ධා සම්පන්නයහ. ශීලාචාරයෙන් යුක්තයහ. ඒ මිත්තවින්දක නම් කුමාර ඉතා අනාචාරශීලීව (නරක ගති ඇතිව) දවස් අරනේය. එසමයෙහි ඒ උපාසකයා මළේය. උපාසිකාව සැමියා මළත් කළමනා දම්පින් අඩුවෙක්

නැතුව කරන්නාහුය. පුතනුවන්ට "එම්බා පුත, මෙලොව ඇත, පරලොව ඇත, දන්පින් කරව"'යි අවවාද කීහ.

ඒ මිත්තවින්දකතෙම "පින්කම් කොට කුමන කාරියෙක්ද? පින්කම් කොට ලබන්නේ කිම්දැ?"යි මෑණියන් කීවා නොකොට දසවිධ පින්කම් (දාන, සීල, භාවනා, පිං ගැනීම, පිං දීම, බණ කීම, බණ ඇසීම, පිදිය යුත්තන් පිදීම, වතාවත් කිරීම, සිත පිරිසිදු කිරීම) කළවුන්ට නම් තබා මාසේ වූවාය. පව්කලවුන්ට "මෙසේවූ නපුරුකැ"යි කීහ. "ඒ යාපත නපුර මම්ම දනිමි. නුඹට ඇයිදැ?"යි කියා අනාචාරශීලීව වසන්නේය.

එක් දවසක් පිරුණු පසළොස්වක් ලත් පෝය පැමිණියේය. මිත්තවින්දකයාගේ මෑණියෝ කියන්නාහු "එම්බා අද පෝහෝදවසය, තොපට මසුරන් දහසක් දෙමි, විහාරයට ගොස් බණ අසා එව"යි පුතනුවන්ට කීහ. පුතාත් "යහපතැ"යි සම්පතෙහි කළ ලෝභයෙන් දවල් මුළුල්ලේ ඇත මෑත ඇවිද දුෂ්ටකම් කොට සවස් වේලෙහි ගණයට (පිරිසට) ගොස් තමාට බණ නොඇසෙන තෙන දුර වැදහෙව නිද්‍ර නැගී උදෑසනක් සේ ඇසමුව සෝද්‍ර ගෙට ආයේය. උන්ගේ මෑණියෝත් "අද මාගේ පුතනුවෝ බණ අසා තෙරුන් වහන්සේ කැඳවාගෙණ එන්නාහුය"යි කැඳ අවුළුපත් ඉදිකොට උන්නාහුය. ඒ මිත්තවින්දකයාත් තනිවම ගෙට ගියේය. මෑණියෝ කියන්නාහු "ඇයි පුත තෙරුන්නාන්සේ කැඳවාගෙණ නොආයේදැ?"යි කීහ.

එවිට කියන්නේ “මම මසුරන් දහස නිසා බණ අසන්ට ගිය පමණක් විනා තෙරුන් වහන්සේ කැඳවාගෙණ එන්ට ගියෙන්දැ?”යි කීහ. “එසේ වීනම් තොප බණ ඇසුයේම මට ලාභය, තොප මේ කැඳබත් බී අවුළුපතුත් (කැවිලි වගී) අනුභව කරව”යි කීහ. “මට මසුරන් දස දුනහොත් විනා කැඳ අවුලුපත් අනුභව නොකෙරෙමි”යි කියා මසුරන් දස ඇරගෙණ අවුළුපත් අනුභවකොට වෙළඳමට ගොස් වෙළඳම්කොට මසුරන් එක්ලක්‍ෂ විසිදසක් සොයාගෙණ මෑණියන්ට ගොස් කියන්නේ “මෑනියන් වහන්ස, මම වෙළඳමට යෙමි” කීහ. “පුත, සමුද්‍රයෙහි නැව් නැගී කරණ වෙළඳම් නම් විස්වාස කළ නොහැක්ක. මාගේ ගෙයි අසූදහසක් සම්පත් ඇත. වෙළඳමට යන්නේ මේ සම්පත් මදිවැදැ?”යි පුතනුවන් එකරුත්ත (එක්වරම) අල්වා ගත්තාහ.

ඒ මිත්තවින්දකයා මෑණියන් අතගලවා කන්සට පාරක් ගැසීය. ඒ පාර කා මෑණියන් මුර්ඡාවට පැමිණ වැටී යන්නා තෙමේ පඩව් නැගී (නැවකට නැගී) සදවසක් මුද යාත්‍රා කළ කල්හි ඒ නැව සමුද්‍ර මධ්‍යයේ ඇනක් ගසාපුවාක් මෙන් නොසැලවී සිටියේය. ඒ නැවට නැංගාවූ බොහෝදෙනා “මේ නැවට නැංගාවූන්ගෙන් අකුශල් කළ කෙනෙකුන් ඇති නියාය” කියා කුශපත් ලා බැලූහ.

ඒ මිත්තවින්දකයා නම ලිව් කුශපත ගිලී ගියේය. ඔහු ලෑල්ලෙක ඉඳුවා සමුද්‍රයට අලහ. ඒ ලෑල්ල බඩතබා පීනන්නේ දැවාණමය ප්‍රාසාදයක (දැවයෙන් කළ මැදුරක) විමානප්‍රේත

නම් ස්ත්‍රීන් සතරදෙනෙකු ඉන්නා ස්ථානයකට පැමිණියේය. ඔහු සතරදෙනම ඒ මිත්තවින්දකයා දැක තමන්ගේ ප්‍රාසාදයට ඇරගෙණ කවා විමාන ප්‍රේතයන් විසින් සත්දවසක් සැපවිඳ සත්දවසක් දුක් විඳිනාහ, එසේහෙයින් "දුක්විඳිනට යන්නාවූ අපි ඇම අපගේ කටයුත්තට යම්හ, අප එනතුරු උකටලී නොවව"යි ඔහු ඒ ප්‍රාසාදයේ රඳවා ගියාහ. ඒ දිව්‍යස්ත්‍රීන්ගේ ප්‍රාසාදයෙහි සම්පත් වින්ද නොහී ඒ ලැල්ල බඩතබා පීනාගෙණ යන්නේ දිව්‍යස්ත්‍රීන් අටදෙනෙකු ඉඳුනාවූ රිදීමය විමානයකට ගියේය.

එතනිනුත් උන්හැම දුක්විඳිනට යාදී එතනත් නොරඳ අනික් සොළොස් දෙනෙකු හිඳිනා මැණික්මය ප්‍රාසාදයකට ගියේය. එතනිනුත් නොරඳ උන් හැම දුක්විඳිනට යාදී දිව්‍යස්ත්‍රීන් දෙතිස් දෙනෙකු ඉඳිනා රත්‍රන්මය විමානයකට ගියේය. එතනිනුත් උන්සැම දුක්විඳිනට යාදී ලැල්ල බඩ තබාගෙණ පීණායන්නේ වට පවුරක් ඇති වාසල් සතරකින් යුක්තවූ නුවරක් සේ බොහෝ නරකයෙහි පෙණෙන්නාවූ මනුෂ්‍යයන් දැක එතනට පැමිණියේය. එතන එක්පවුලක පුරුෂයෙක් උරචක්‍රමාලාවක් (ඉසට දමන කැපෙන ආයුධයක්) ඉස තබාගෙණ පැසෙන්නේය (දුක් විඳින්නේය).

ඒ මිත්තවින්දකයා නෙළුම් මලක් ඉස තබාගෙණ සිටින්නාසේ පෙනී ඔහු ලය පස්තැනකින් යදමකින් මසා තිබෙන්නේය. ඒ මූට අවුල්හරක් සේ පෙණෙන්නේ. ඌගේ ඇග මුළුල්ල උරචක්‍රමාලාවෙන් කැපී ලෙයින් තැවරී පිරී

තිබෙන්නේය. ඒ මූට රත්සඳුන් ඇඟ ගැල්වූවාක් මෙන් පෙණෙන්නේය. ඒ තමාගේ වේදනාවෙන් මුරගානේ ගී කියන හඬක්සේ ඇසින. ඒ මිත්තවින්දක පුරුෂයා ඔහු කරා ගොස් කියන්නේ "එම්බල පුරුෂය, මේ නෙළුම්මල මට දීපියව නැතක් දවස තා අත තිබෙන්නේය"යි කීය. ඒ පුරුෂයා කියන්නේ "එම්බල නෙළුම්මලෙක් නොවෙයි, තට ඒ කුමටදැ?"යි කියා සිතන්නේ "මුන් මාසේ මැණියන් මරා ආ කෙනෙකැ"යි සිතා "මාගේ අකුශල ගෙවුමට පැමිණෙන නියාවවේදැ"යි සිතා "එසේ වීනම් අරගනැ"යි උඹ ඉසට දැමීය. උඹ ඉස තබාගෙණ තැවෙන්ට වන "මේක නෙළුම්මල නොව හැර ගණැ"යි වේදනාව ඉවසාගත නොහී වටපිට දිවයන්ට වන, ඒ පුරුෂයා අන්තර්ධාන විය. බෝධිසත්‍වයෝ දිව්‍යපුත්‍රව ඉපිද සමුද්‍රයෙහි ඇවිදිනාහු එතනට පැමිණියාහ. ඒ පුරුෂයා දිව්‍යපුත්‍රයා අතින් විචාරන්නේ "එම්බල දිව්‍යාරාජය, මම කුමන අකුශලයක් කොට මෙතනට පැමිණියෙම් මේ දුක්ඛය විඳිම්දැ"යි "ඒ මට නොදැනෙයි මට කියව"යි බෝධිසත්‍වයන් අතින් විචාළේය.

එවිට බෝධිසත්‍වයෝ කියන්නාහු "එම්බල තෝ මසුරන් එක්ලක්‍ෂ විසිදහසක් සොයාගෙණ දෙමව්පියන් කීවා නොකොට මැණියන් කන්සට (කණට) ගසා මූර්ජාකරවා පඩවු නැගී සමුද්‍රයෙහිදී පඩව්ව නොයන හෙයින් තොප මූදට දමාපුහ. තෝ ලෑල්ල බඩතබාගෙණ දියපීනා දිව්‍ය ස්ත්‍රීන් සතරදෙනෙකු ඉඳිනා විමානයට ගියේය. එතනිනුත් තෘෂ්ණාබලයෙන් රඳගත නොහී අට දෙනෙකු ඉඳිනා විමානයට ගියේය. එතනිනුත්

තෘෂ්ණාබලයෙන් රඳාගත නොහී දෙළොස් දෙනෙකු ඉඳිනා විමානයට ගියේය. එතනිනුත් තෘෂ්ණාබලයෙන් මෑණියන් කනස්ට ගැසු අකුශලින් එතනින් රඳාගත නොහී දෙතිස් දෙනෙකු ඉඳිනා විමානයට ගියේය. එතනිනුත් තෘෂ්ණාබලයෙන් රඳාගත නොහී මෙතනට පැමිණ මෙසේවූ දුක්ඛයකට පැමිණියේය. තෘෂ්ණා නමැති වල කෙතෙක් උත්සාහකර පිරුවෝතිනුත් පල්ලපුරා ගත (අඩියවත් පුරවන්නට බැරිය) නොහැක්කේය. ඒ තාගේ තෘෂ්ණා බලයෙනුත් මෑණියන්ගේ කන්සට ගැසූ අකුශල් බලයෙනුත් මේ උරචක්‍රමාලාව ඉස තබාගන දුක්විඳින්ට පැමිණියේය"යි කීහ.

එවිට මිත්තවින්දක තෙමෙ "මේ දිව්‍යපුත්‍රයා මාගේ උත්පත්ති සියල්ලම දන්නේය. මා මේ දුකින් මිදෙනකලුත් දන්නේය. මුන් විචාරමි" සිතා කියන්නේ "එම්බල දිව්‍යරාජය, මම මේ අකුශලයෙන් කෙතෙක් දවසින් ගැලවෙම්දැ?"යි විචාළේය.

එවිට බෝධිසත්වයෝ කියන්නාහු "එම්බල මිත්තවින්දකය, තා මේ දුනික් මිදෙන කල් මෙතෙකැ යි කියන්ට නොදනුම්හ. අනන්තාපරිමාන කලක් (අප්‍රමාණ කාලයක්) මෙහි පැසෙන්නේ වේදැ"යි දිව්‍යරාජයා අන්තර්ධානවීයයි වදාරා මේ 'චතුද්වාර ජාතකය' නිමවා වදාළසේක.

"එකල ඒ මිත්තවින්දක නම් දැන් මේ නොකීකරු භික්ෂුහුය. එසමයෙහි දිව්‍යරාජන්ව උපන්නෙම් බුදුවූ මම්මය"යි තමන්වහනසේ දක්වා වදාළසේක.

# 429. කෘෂ්ණ ජාතකය

තවද ශාක්‍යකුල නායකවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ කිඹුල්වත්පුර නිග්‍රෝධාරාමයෙහි වැඩවසන සමයෙහි සිනාවක් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

සර්වඥයන් වහන්සේ භික්ෂුසංඝයා පිරිවරා කිඹුල්වත්පුර ඒ ඒ ස්ථානවල් බලා ඇවිදිනා ගමනේ එක්තරා භූමියක් දැක එතන මදවේලා වැඩහිඳ සිනහ පහළ කළසේක.

අනඳසාමින් සර්වඥයන් වහන්සේ සිනා පහළ කළ නියාව දැන "සර්වඥයන් වහන්සේ නොකාරණයෙක (හේතුවක් නැතිව) සිනා පහළ කළසේක. ඒ කාරණය විචාරමි"යි සිතා සර්වඥයන් වහන්සේ සමීපයට අවුත් "ස්වාමීනි, මෙතන වැඩ සිට සිනා පහළ කලේ කවර කාරණයකින්දැ?යි විචාළසේක. "එම්බා ආනන්දයෙනි, පළමු මෙතන උග්‍රවූ තේජස් හා පඤ්චර්ධි (ඍද්ධි පහ) අෂ්ට සමාපත්ති (සමාපත්ති අට) ඇති ක්‍රිෂ්ණ (කලු පාට) තාපස කෙනෙක් උන්නාහ. උන් සිතා සිනා පහළ කෙළෙමි" වදාළසේක. "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ උතුම්වූ බ්‍රාහ්මණකුලයෙක උපන්සේක. ශරීරය ඉන්ද්‍රනීල මාණික්‍යයකට බඳුවූ පැහැ ඇති හෙයින් ක්‍රිෂ්ණ කුමාරයෝ

යයි නම් තිබූහ. බෝධිසත්ත්වයෝ වැඩිවිය පැමිණ දිසාපාමොක් ආචාරීන් සමීපයට ගොස් උගතමනා ශිල්පශාස්ත්‍ර ඉගෙනගෙණ අවුත් තමන් පියානන්ට ශිල්පශාස්ත්‍ර පෑකල්හි පියානන්ගේ අයාමෙන් (පියාගේ මරණයෙන් පසු) පුරෝහිත ස්ථානාන්තරයට පැමිණ තමන්ගේ දෙමව්පියන් මුතුන් මීමුතුන් ඇතුළුවූවන්ගේ නොයෙක් වස්තු ලියා තුබූ ස්වර්ණපත්‍රය (රන්පත) ගෙන්වා බලා "මේ වස්තු නම් රජදරුවන්ගෙන්, සොරුන්ගෙන්, සතුරන්ගෙන් දියෙන් ගින්නෙන් ඇතුළුවූ පඤ්චප්‍රකාරයට පැමිණ නස්නේය. මෙසේවූ සම්පත් දනමුඛයට පමුණුවා පඤ්චවර්ධි අෂ්ටසමාපත්ති උපදවා සැපසේ වාසය කරමි. මාගේ මෙතෙක් වස්තු රජ්ජුරුවන් වහන්සේට කියා දන් දෙමි"යි රජ්ජුරුවන් සමීපයට ගොස් "ස්වාමීනි, මාගේ දෙමාපියන් මුතුන් මීමුතුන් ඇතුළුවූවන්ගේ බොහෝ සම්පත් ඇත. ඒ සම්පත් ඔබවහන්සේ ගෙන්වාගත මැනව"යි කීහ. රජ්ජුරුවෝ "බමුණ, මාගෙන් තා කැමති සම්පත් හැර ගණුව. තාගේ සම්පත් මට හැයිදැ?"යි රජ්ජුරුවෝ කීහ. බමුණානෝ කියන්නේ "ස්වාමීනි, මාගේ බොහෝ සම්පත් දනමුඛයට පමුණුවා තපස් කරන්නෙමි"යි කීහ. රජ්ජුරුවෝ "තොපගේ සම්පත් කැමති සැටියේ දනමුඛයට පමුණුව"යි කී ගමනේ "යහපතැ"යි බෝධිසත්ත්වයෝ ගෙට අවුත් සම්පත් තිබූ ගබඩාවල යතුරු අරවා සියළු යාචකයෝ ඇවිත් කැමති සැටියට සම්පත් ගෙණ යෙත්ව"යි විධාන කළාහ.

යාචකයෝ අවුත් සත් රෑ සත් දවාලක් සම්පත් ඇද නිමාවෙක් නුදුටු හෙයින් බෝධිසත්ත්වයෝ "සම්පත් බලා සම්පත්

දන්දී යෙත් නම් ජරාව හෝ පැමිණෙයි, ව්‍යාධිය හෝ පැමිණෙ”යි සිතා “කැමති සත්‍වකෙනෙකුන් ගෙණ යෙත්‍ව“යි කියා ගබඩාවල යතුරු හරවා තපසට නික්ම එක් වානාන්තරයෙක මුඬ නම් ගසක් මුල වාසය කරන්නාහ. බෝධිසත්වයෝ ඒ ගසමුල විනා අනික් ගසක් මුලකට පලාඵල කඩා නොයන හෙයින් රුකඛමූලිකාඞ්ගයත් (ගස මුල විසීමේ ධුතාංගය) පුරන්නාහ. වනාන්තරයෙහි වාසයකරණ සෙයින් අරණ්‍යකාඞ්ගයත් පුරන්නාහ. එක් ගමෙක නොවසන හෙයින් අබ්භොකාසිකාඞ්ගයත් (එළිමහනේ වාසය) පුරන්නාහ. පලාඵලයක් එකතැනක ඉඳ විනා සිතූ සිතූ තැනක ඉඳ නොකණ හෙයින් ඒකාසනිකාඞ්ගයත් (එක අසුනක හිඳ වැලඳීම) පුරන්නාහ. නොනිද ඉන්නා හෙයිනුත් ඉදින් නිදන නමුත් භූමියෙහි විනා මැස්සෙක ඇඳෙක නොසැතපෙන හෙයින් නෙසජ්ජිකාඞ්ගයත් (ඇඳක නොනිදන ප්‍රතිපත්තිය) පුරන්නාහ. මෙසේවූ ධුතාඞ්ගයෙන් හා ප්‍රථම ධ්‍යාන ද්විතීය ධ්‍යානාදී පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා වාසයකරන්නාහ.

තවද බෝධිසත්‍වයෝ තමන් ගස ඵලජාති අමුවුවත් විලිකුන්වුවත් (ඉදුනත්) එම අනුභව කරන්නාහ. මල් ඇතිද මල් අනුභව කෙරෙති. මල් නැතිද සාඛාජාති අනුභව කරන්නාහ. තමා ඉදිරියේ තිබු දෙයෙක් විනා ඉවත තිබු දෙයකට අත නොපොවන්නාහ. ඇල්ළු අත්තේම තිබු ඵල ජාතිවුවත් මල් ජාතිවුවත් අනුභව කොට මේ නියායෙන්

ඝෝරවූ (දුෂ්කරවූ) තපස් කොට පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා වාසය කරන්නාහ.

එසමයෙහි මෙකියන කෘෂ්ණ තාපසයන්ගේ ආනුභාවයෙන් ශක්‍රයාගේ පණ්ඩුකම්බල ශෛලාසනය හුණුවිය. ඒ කියන ආසනය හුණුවන්නේ සතර කාරණයකින්ය. හේ කෙසේද යත්? ශක්‍රයාගේ ආයුෂ මද අවස්ථාවේ හුණුවන්නේය, යම් කෙණෙක් ශක්‍රසම්පත්ති ප්‍රාර්ථනා කෙරෙත් නමුත් හුණාවන්නේය, යම් තපස්වී කෙනෙකුන්ගේ ශීල තේජසින් හුණුවන්නේය, මහාගුණවතුන් කුකුස් ඉපදවීමෙන් උණුවන්නේය, මේ සතර කාරණයෙන් ශක්‍රයන් නොකමැති කරවා පාණ්ඩුකම්බල ශෛලාසනය හුණු වන්නේය.

එවිට ශක්‍රයෝ තමන්ගේ ආසනය නොකැමැති කරවා හුණුවූ හෙයින් පරීක්‍ෂාකළ ගමනේ මෙකියන කෘෂ්ණ තාපසයන්ගේ ආනුභවයෙන් උණුවූ නියාව දැන එතනට අවුත් බෝධිසත්‍වයන්ගේ පිටිපස්සේ සිට කියන්නාහු "ඒකාන්තයෙන් මේ පුරුෂතෙම කෘෂ්ණවූ ශරීර ඇත්තේය. කෘෂ්ණවූ එල අනුභව කරන්නේය. කෘෂ්ණ භූමියෙහි සෙයྱාව (බිම නිදීම) කරන්නේය. එසේහෙයින් මේ පුරුෂයාගේ ක්‍රියාව මාගේ සිතට ප්‍රිය නොවන්නේය"යි කියා බෝධිසත්‍වයන් පිටිපස සිට කියන්නාහු "ඒකාන්තයෙන් මේ පුරුෂයා තමන්ගේ නුගුණ කී කල්හි කිපෙත්දෝ හෝ යි නොකිපෙත්දෝ හෝ යි පරීක්‍ෂා කරණු සඳහා ශක්‍රදේවේන්ද්‍රයෝ බෝධිසත්වයන්ට කිපෙන්ට නිසි බස් කීහ.

කෘෂ්ණ තාපසයෝ ශක්‍රදේවේන්ද්‍රයන් කී බස් අසා “ඒ මා හා සමග කථා කරන්නේ කවරෙක්දෝ හෝ යි” දිවසින් පරීක්‍ෂා කරණ තැනැත්තේ ශක්‍රදේවේන්ද්‍රයන් නියාව දැන කරකැවී ශක්‍රදේවේන්ද්‍රයන්ගේ මූණ නොබලාම කථාකරන්නාහු “ශක්‍රදේවේන්ද්‍රයෙනි, ඇඟ සම කළුවූවයි සත්‍වතෙමේ කෘෂ්ණ නම් නොවන්නේය. යමෙක් අභ්‍යන්තරයෙහි ශීල සමාධි ප්‍රඥා විමුක්ති විමුක්තිඥාන (කෙලෙස් වලින් මිදීමේ නුවණ) දර්ශනයෙන් සමන්විතවුයේ නම් එබඳු සත්‍වතෙම සන්තානයෙන් පිටත්කරණ ලද රාග ද්වේෂාදී අකුශල ධර්‍මයන් ඇතිබව හේතුකොටගෙණ බ්‍රාහ්මණ නමුදු වන්නේය, තපස්වී නමුදු වන්නේය. යම් සත්‍වයෙක්හු සන්තානයෙහි රාග ද්වේෂාදී වූ අකුශල ධර්‍මයන් බහුලව පවතී නම් ඒ සත්‍වතෙමේ ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණනාදීවූ යම් කිසි උත්තම කුලයක උපන්නේ වීනමුත් සවර්‍ණරූපයක් හා සමානවු රන්වන්වූ ශරීර සෝභාවෙන් යුක්තවූයේ වීනමුත් කෘෂ්ණවූ අකුශල ධර්‍මයෙන් සමන්විත බැවින් කෘෂ්ණ නම් වන්නේය”යි කීහ. මෙසේ කියා මේ ලෝකයෙහි සත්‍වයන් කෘෂ්ණභාව කරන්නාවූ අකුශල ධර්‍ම අනේක ප්‍රකාරයෙන් විස්තරකොට කියා ඒ අකුශල ධර්‍මයන්ට නින්දාකොට ශීලාදී ගුණධර්‍මයන්ට ප්‍රශංසාකොට ආකාශයේ සඳමඬල ගෙණහැර පානාසේ ශක්‍රදේවේන්ද්‍රයන්ට ධර්‍මදේශනා කළහ.

ශක්‍රදේවේන්ද්‍රයෝ බෝධිසත්‍වයන්ගේ ධර්‍මකථා අසා සතුටුවූ සිත් ඇතිව වරයෙන් ආරාධනා කරන්නාහු “තපස්වීන් වහන්ස, ලොව්තුරා බුදුකෙනෙකුන් වහන්සේ මෙන් නුඹවහන්සේ විසින්

මනාකොට කියන ලද්දවූ මේ සුභාෂිත (යහපත් වචන) වචනය නිසා නුඹවහන්සේට වරදෙනු කැමැත්තෙමි. නුඹවහන්සේ සිතූ යම් වරයෙක් ඇත්නම් මාගෙන් ගත මැනව යි සියළු වරම් දෙමි'' කීහ. එබස් අසා මහාබෝසතාණෝ කියන්නාහු ''සියළු දෙවියන්ට අධිපතිවූ ශක්‍රදේවේන්‍ද්‍රයෙනි, ඉඳින් තෙපි මට වරදෙනු කැමැත්තා නම් නොකිපීම් වශයෙන් කිසිසේත් කෝප කටයුතු වස්තුයෙහි කෝප නොකිරීම් ගැටෙන්නට නිසි වස්තුයෙහි නොමගැටීමය, ද්වෙෂයෙන් ද්වෙෂය නොකිරීමය, අනුන් සන්තක වස්තුයෙහි කිසිදෙයකත් ලොභ නොකිරීමය, දූ දරුවන් ආදිවූ විඤ්ඤාණක වස්තු හා ධනධාන්‍යාදිවූ අවිඤ්ඤාණක වස්තුයෙහි ලොභ නොකිරීම, ඉඳින් ඒ සියල්ලම මා සන්තක වී නමුත් ඒකාන්තයෙන් එහි ලෝභ නූපදවා මෙබඳුවූ චතුරාඞ්ගයෙන් සමන්විතවූ මාගේ ප්‍රවෘත්තිය කැමැත්තමි. එසේ හෙයින් ශක්‍රදේවේන්‍ද්‍රයෙනි, ක්‍රොධ නොකිරීමය, ද්වෙෂය නොකිරීමය, පරසම්පත්තියෙහි ලොභ නොකිරීමය, මා සන්තකවූ සවිඤ්ඤනක අවිඤ්ඤනක වස්තුවෙහි ස්නෙහ නොකිරීමයයි යන මේ වරසතර මට දෙව''යි ඉල්වූහ. එබස් අසා ශක්‍රදේවේන්‍ද්‍රයෝ කියන්නාහු ''තපස්වීන්වහන්ස, නුඹවහන්සේ ක්‍රොධය, ද්වෙෂය, ලොභය, ස්නෙහය යන මේ සතරෙහි ආදීනවයන් දුටුසේක්ද, අපි එහි ආදීනවයන් නොදනුම්හ මා විසින් විචාරණ ලද්දවූ නුඹවහන්සේ ඊට කාරණා කිවමැනවැ''යි කීහ.

ඉක්බිති මහබෝසතාණෝ ''එසේ වීනම් ශක්‍රදේවේන්‍ද්‍රයෙනි අසව'' කියා කාරණා කියන්නාහු ''නොයිවසන්නාවූ ස්වභාව

ඇති සත්වයාගේ අක්ෂාන්තියෙන් (නොඉවසීමෙන්) උපන්නාවූ ක්‍රොධය තෙමේ පළමුකොට ස්වල්පව ඉපද පසුව ඊමත්තේ බොහෝව උපදනේය. යමක්හට උපන්නේ වීනම් ඒ සත්වයා එහිම අලවන්නේය. ඒ කෝප කටයුතුවූ වස්තුව ඇර යා නොදෙන්නේය. පෙරල පෙරලා අක්‍රොෂ (බැණ වැදීම) පරිභවාදිය කරවන්නේය. නැවත කායික චෛතසික දුක්ඛසංඛ්‍යාතවූ පීඩාවෙන් සමන්විත වූ ක්‍රෝධය නිසා ප්‍රාණඝාතාදී අකුශල කර්ම්මයන් කොට දනශීලාදී වූ සුචරිත ධර්ම්මයෙන් දුරුව මෙලෝ පරලෝ දෙකින් වධ බන්ධන චිත්ත පීඩාදියට පැමිණ දුක්කම්කටුල් ආදී බොහෝ දුක් අනුභව කරන්නේය. එසේහෙයින් ක්‍රෝධ නම් මෙසේ අනෙකප්‍රකාර ආදීනව ඇත්තේය යි දැන කෝපයත් නොකැමැත්තෙමි".

"තවද ශක්‍රදේවේන්ද්‍රයෙනි, කිපීම ස්වභාව කොට ඇති ක්‍රෝධයෙන් කිපී පසුව අප්‍රතිකාර ස්වභාවවූ ද්වෙෂයෙන් නොසතුටුවූ සිත් ඇති සත්වන්ට පළමුකොට එම්බල කොල තෝ දසයා නොවේදැයි පරුෂ වචනයන් පිටත් වන්නේය. ඒ පරුෂ වචනයට අනතුරුවම ඈත මෑත ඇවිදීම් වශයෙන් අතින් අත ගැන්ම වන්නේය. ඊට අනතුරුව උපක්‍රම වශයෙන් පාණිප්‍රහාරය (අතින් ගැසීම) වන්නේය. ඊට අනතුරුව ඔවුනොවුන්ට දණ්ඩෙන් පැහැරීම වන්නේය. දණ්ඩප්‍රහාරය ඉක්ම ඒකතෝධාර (එක පැත්ත කැපෙන) උභතෝධාර (දෙපැත්ත කැපෙන) ඇති ඛණ්ඩිතල (කඩු තලය) කණ්ඩු ආදිවූ ආයුධයෙන් ඔවුනොවුන්ට පැහැරීම් වන්නේය. යම් කලෙක ශස්ත්‍රයෙන් ඔවුනොවුන්ගේ ජීවිත විනාශ කෙරේද,

එසඳ ද්වෙෂ මස්තක ප්‍රාප්තවුයේ වෙයි. යම්සේ ඇඹුල් නොවන්නාවූ මොරුවත් කාඩිවත් කල්යාමෙන් පාකයට ගොස් (පැසීමට පත්ව) නැවත ඇඹුල්වේද, එක ජාති ඇත්තාවුම මෝරු හා කාඩි ඇඹුල ඇඹුල් නැත්තේය යි කියනු ලැබේද, එපරිද්දෙන්ම පළමුකොට උපන්නේ ක්‍රොධ නම් වෙයි. මුකුරා ගොස් මතු මත්තෙහි උපදනේ ද්වෙෂ නම් වෙයි. ඒ තෙමේ අකුශල මුක්ත වශයෙන් සමාන ජාති ඇත්තේ වීනමුත් ක්‍රොධය ද්වෙෂ යයි වෙන් වෙන් කොට කියනු ලැබෙයි. ඇඹුල් නැති වස්තුවෙන් යම්සේ ඇඹුල උපන්නේද, එපරිද්දෙන් ද්වෙෂයත් කෝපයත් උපන්නේ, යම්හෙයකින් ඒ ද්වෙෂය අනේක ප්‍රකාරවූ ආදීනව ඇත්තේද, එසේහෙයින් ද්වේෂයත් නොකමැත්තෙමි.

"තවද ශක්‍රදේවේන්ද්‍රයෙනි, දෙවෙනි දවල් ගම් පැහැර කොල්ලකා මනාද ආයුධ ශරීරයෙහි තබා මෙනම් දෙයක් සාහසික ක්‍රියාවෙන් වස්තු ගැම්මද, රත්රන් නොවන දෙය රත්තරනැයි ඒ හා සමාන වූ වස්තුවක් පෑ අනුන් සන්තක වස්තු ගැම්මද, නැවත අනෙකප්‍රකාර වඤ්චා ප්‍රයෝගයෙන් මෙරමා මෝහ පමුණාවා වස්තු ගැම්මද යන මේ පාපධර්මයෝ ලෝභයෙන් මඩනා ලද්දවූ සත්‍වයන් කෙරෙහි පෙනෙන්නාහ. ලොභ රහිතවූ සත්‍වයෝ මෙබඳුවූ අකුශල කර්ම්මය නොකෙරෙති. මෙසේ ලොභ නම් අනේකප්‍රකාර ආදීනව ඇත්තේය. එසේ හෙයින් ලෝභයත් නොකැමැත්තෙමි".

"තවද ශක්‍රදේවේන්ද්‍රය, අරමුණෙහි ඇලෙන්නාවූ ස්වාභාව ඇති සෙනෙහයෙන් ග්‍රන්ථිතවූ (ආදරයෙන් බැඳුනු) නැවත උත්පත්ති වශයෙන් ගැලවුනාවූ හුයින් මල් ගෙතුවාක් මෙන් අනේකප්‍රකාර ආලම්බනයෙහි (අරමුණෙහි) පවත්නාවූ අභිද්‍යා කායහස්කයෙන් (දැඩි ලෝභකම නැමති අතින් ගෙතුනාවූ) ගෙතුනාවූ ස්වර්ණාදියෙන් උපන්නාවූ ස්වර්ණාභරනාදීන් මෙන් මනසින් උපන් බැවින් මනෝමයට අභිජ්ඣාකාය ග්‍රන්ථාදීහු (අභිද්‍යා නැමති ක්ලේශය) ඒ ඒ අරමුණෙහි පවත්නාහ. ඒ ලෝභාදී ධර්මයෝ සන්තානයෙහි ඉඳ බලවත්වූ සන්තාපය උපදවමින් අත්‍යර්ත්ථයෙන් සත්වයන් මිරිකා පීඩාකරන්නාහ. මඞ්ගල බෝධිසත්වයන්ට දරුවන් දන්දී බලවත් ශෝකයෙක් උපන, වෙස්සන්තර බෝධිසත්වයන්ටද දරුවන් දන්දී මහත්වූ දෙම්නස් උපන, මෙසේ පිරූ පාරමිතා ධර්මයන් ඇති මහබෝධිසත්වයන්ට පවා මෙසේ සංඛ්‍යාත අකුශල ධර්මමයෝ තැවිලි කරන්නාහ. මේ ස්නෙහයෙහි ආදිනව වන්නේය. එසේහෙයින් ස්නෙහයත් නොකැමැත්තෙමි" කීහ.

එබස් අසා ශක්‍රදේවේන්ද්‍රයෝ "කෘෂ්ණ පණ්ඩිතයෙනි, තොප විසින් මේ ප්‍රශ්ණය සර්වඥ විලාසයෙන් මනාකොට කියනලද තොප කෙරෙහි ඉතා සතුටු වීමි. එසේහෙයින් නැවතත් තොපට වරයක් දෙමි"යි කීහ. එබස් අසා මහබෝසතාණෝ කියන්නාහු "දෙදෙව්ලොව දෙවියන්ට අධිපතිවූ ශක්‍රදේවේන්ද්‍රයෙනි, ඉදින් තොපි මට වරයක් දෙනු කැමැත්තා නම් නිරන්තරයෙන් උදකලාව මේ වල්හි (වනයෙ) වසන්නාව මාගේ තපසට අන්තරාය කරන්නාවූ ව්‍යාධියෙක් නූපදවයි

එසේවූ වරයක් දෙව"යි කීහ. ශක්‍රදේවේන්‍ද්‍රයන්ගෙන් කෘෂ්ණ පණ්ඩිතයෝ වරගන්නා තැනැත්තෝ ආමිස නිශ්‍රිතවූ වරයක් නොගනිම්, තපෝකර්‍ම නිශ්‍රිතවූ වර ගණිති කියා වඩවඩාලා ප්‍රසන්නව "නැවතත් වරයෙක් දෙමි" කීහ. බෝධිසත්‍වයෝ වර ගන්නාහු "ව්‍යාජයෙන් ධර්‍මදේශනා කෙරෙමි" සිතා ධර්ම්මදේශනා කරන්නාහු "ශක්‍රදේවේන්‍ද්‍රයනි, මා නිසා මට වැඩ කැමති බැවින් කිසි සත්‍වයක් හට කිසිකලෙක කායද්වාර, වචීද්වාරය මනෝද්වාරය යි යන ත්‍රිවිධවූ කර්ම්මද්වාරයෙන් උපන්නාවූ ප්‍රාණඝාතාදිවූ දශ අකුසල කර්ම්මපථයෙහි (තිදෙරින් සිදුවන අකුසල් දහය) මිදී පිරිසිදු චිත්ත සන්තාන ඇතිවෙම්ව"යි කියා මෙසේ මහබෝසතානෝ යථොක්තවූ කාරණයන් කියා වර ගන්නා තැනැත්තෝ ප්‍රව්‍රජ්‍යාවට සුදුසුව වර ගත්තාහ.

ශක්‍රයෝ කෘෂ්ණ තාපසයන්ට වරදී "නිදුක් නිරෝගීව මේ වෘක්ෂමූලයෙහි ඉඳ සැපසේ වාසය කරව"යි කියා වෘක්ෂයෙන් එල එල්ලවයෙන් නිර්මිතකොට (මවා) ශක්‍රයෝ තමන්ගේ ශක්‍රභවනයට ගියාහ. කෘෂ්ණ තාපසයෝත් එම වෘක්ෂමුලයෙහිම ඉඳ නොපිරිහුනු ධ්‍යානයෙන් බඹලොව ගියහයි වදරා මේ 'කෘෂ්ණ ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි ශක්‍රයෝ නම් දැන් අනුරුද්ධ මහා ස්ථවිරයෝය. එසමයෙහි කෘෂ්ණ තාපසයෝ නම් බුදුවූ මම්ම වේදැ"යි වදාළසේක.

# 430. චතුපොසථ ජාතකය

චතුපෝසථ ජාතකය පූර්ණජාතකය හා සදෘශය. තවද චතුපෝසථ ජාතකය විධුර ජාතකයෙහි විස්තර වශයෙන් පෙනෙන්නේය.

# 431. සංඛ ජාතකය

තවද ශාක්‍යකුලකේතුවූ (ශාක්‍ය කුලයට කොඩියක් බඳුවූ) තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සර්වපරිෂ්කාර (සියලු පිරිකර සහිත) දානයක් අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්?

සැවැත්නුවර එක්තරා උපාසකයෙක් සර්වඥයන් වහන්සේ ඇතුළුවූ සියළු භික්ෂූන් වහන්සේ පවරා සත් දවසක් දන්දී ඉක්බිති ස්වර්පරිෂ්කාර දානයක් දින. ඉන් වහන්දානය (සෙරෙප්පු දානය) විශේෂයෙන් දුන්නේය. ඉන් සර්වඥයන් වහන්සේට දුන්නාවූ වහන්සඟලෙහි අගය දහසක් වටනේය. දැගසව්වන් දෙදෙනා වහන්සේට දුන්නාවූ වහන්සඟල පන්සියයක් වටනේය. භික්ෂූන්වහන්සේට දුන් වහන්සඟල සියය සියය වටනේය. මේ නියායෙන් උපාහණ (පා වහන්) දානය මහත්කොට දින.

සර්වඥයන් වහන්සේ "උපාසකය, තොප දුන්නාවූ වහන්දානය තොපි කැමති යම් ප්‍රතිෂ්ඨාවකට (පිහිට පිණිස) පැමිණෙයි. එසේහෙයින් තොපට මහත්වූ විපාක දෙන්නේය.

පළමු උත්තමයෝ පසේබුදුන් වහන්සේ සගලක් හා පත්කුඩයක් (තල කොළයෙන් තැනූවක්, ගොටු අත්ත) දන්දී සමුද්‍ර මධ්‍යයෙහි ප්‍රතිෂ්ඨාව ලද්දේ වේදැ"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස්නුවර මෝලී නම් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්‍වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ට සංඛ නම් පුරෝහිතව මහත්වූ සම්පත්තින් වාසය කරන්නාහ. සතර දන්හල් කරවා දවස් පතා මහත්වූ දානය දුගී මගී යාචකයන්ට දුන්නාහුය. එසේ දන් දෙමින් සිතන්නාහු "මාගේ සම්පත් යම් නියායෙක අඩුව ගියේ නම් ඒ දවස් මාගේ දානය පිරිහෙයි. ඊට පළමු වෙළඳාම් ආදියෙන් සම්පත් උපදවා එමි"යි සිතා "අරිට්ඨපුරයට ගොස් වෙළඳාම් කොට සම්පත් ගෙණෙන්ට උවමැනවැ"යි පඩව් තොටට (නැව් තොටට) යන සංඛ නම් බ්‍රාහ්මණතෙම පය වහන්සගලක් ලා පත්කුඩයක් ගෙණ පසුඹිය කරලාගෙණ මධ්‍යාහ්න වේලේ පඩව් තොටට යන්නාහ.

එදවස නන්දමූලක පබ්භාරයෙහි වාසය කරන්නාවූ පසේබුදුන් වහන්සේ ලොවට කාරුණාවෙන් බලා වදරණසේක් සංඛ නම් බ්‍රාහ්මණයානන් පඩව් නැගී යාත්‍රාවට යන නියාව දැන වදරා යාත්‍රා ගියකල මුන්ට වන උපද්‍රව ඇද්දේ හෝ යි නැද්දේ හෝ යි පරීක්‍ෂාකොට සමුද්‍ර මධ්‍යයෙහිදී මුන්ට වන

උපද්‍රව දැක ඒ උපද්‍රව මා එතනට ගියකල වහන්සගලක් හා පත්කුඩය දන්දීමෙන් වැලකී ප්‍රතිෂ්ඨාව (පිහිට) ලැබේති යි දැන වදරා එතනට එන්නාවූ පසේබුදුන් වහන්සේ ගිනි අඟුරු මෙන් කකියන්නාවූ (පිච්චෙන්නාවූ) වැලි මැඩගෙණ මධ්‍යහ්න වේලේ අවුත් සංඛ නම් බ්‍රාහ්මණයානන් දුටුසේක. බෝධිසත්‍වයෝ පසේබුදුන් වහන්සේ දැක ඡායා සම්පන්න (සෙවෙන ඇති) වෘක්ෂයක් සමීපයට ගොස් පසුම්බියෙහි තිබූ තෙලින් පසේබුදුන් වහන්සේගේ ශ්‍රීපාදය මැඩ වහන්සගල පසේබුදුන් වහන්සේගේ ශ්‍රීපාදයේ ලා පත්කුඩයත් අතටදී "ස්වාමීනි, පත්කුඩය ඉසට ගෙණ වහන්සගල පයලා නොමිරිකී (පීඩාවක් නැතිව) කරුණාවෙන් වඩනේ යහපතැ"යි කීහ.

පසේබුදුන් වහන්සේ බෝධිසත්‍වයන්ට අනුමෙවෙනි බණ වදරා තමන් වහන්සේ පළමු විසූ නන්දමූල පබ්භාරයට පස්වණක් වලාමඩිමින් ආකාශයෙන් වැඩිසේක. බෝධිසත්‍වයෝ බොහෝ මනුෂ්‍යයන් හා සමගින් යාත්‍රාකරන්නාහු සමුද්‍ර මධ්‍යයට පඩව්ව ගියකලට එක් ඇලියකින් පඩව්ව බිඳී පැන් ඉකෙන්ට වන, මනුෂ්‍යයෝ පැන් ඉසින්ට වන්නාහ. පැන් ඉසගත නොහැකිව පඩව්ව නැසෙන්ට වන්කලට මනුෂ්‍යයෝ අඬන්ට වන්නාහ. බෝධිසත්‍වයෝ කිසි සැකයක් නැතිව එලගිතෙලින් සකීරා අනා බඩපුරා කා තලතෙල් ශරීරයේ ගල්වා පිලි තරකොට ඇඳ අතවැස්සාත් මේ නියායෙන් සලස්වාගෙණ කුඹ උඩට දෙන්නම පැණනැගී තමන්ගේ නුවර අසවල් දිසාය යි නියම දැන මනුෂ්‍යයන් කන්ට එක්වූ මස්කැස්බන් වලහා (මඟහැර) ඉස්බක් තැන් බෝධිසත්‍වයන් හා

අතවැස්සා හා පැණපුව, සත්රෑ සත්දවාලක් සමුද්‍රයෙහි පීණන කලට සතරවරම් දෙවියන් විසින් දෙමවුපියන්, පඤ්චශීල, අෂ්ඨාංගශීලය රක්‍ෂා කරන්නාවූ දානාධ්‍යාස කරන්නාවූ යම්ම සත්‍වයෙක් සමුද්‍රයෙහි වැටුනේ වීනම් උන්ට ප්‍රතිෂ්ඨාය යි සැලැස්වූ මණිමේඛලාදෑ (එනම් දෙව් දුව) අපරීක්‍ෂිතව (පරීක්ෂාවක් නැතිව) උන්නී සත්වෙනි දවස සමුද්‍රය බලා සත්රෑ සත්දවාලක් පීණන්නාවූ බෝධිසත්‍වයන් දැක තුමූදෑ දිව්‍යභාරණයෙන් සැරහී රන්තලියකින් බත් ඇරගෙණ බෝධිසත්‍වයන් සමීපයට අවුත් ආකාශයේ සිට "එඹල පුරුෂය, තෝ නිරාහාරයෙන් මූදෑ පිණන්නේ සත්රෑ සත්දවාලෙක මා ගෙණා මේ රන්තලියේ බත් අනුභව කරව"යි කීහ.

බෝධිසත්‍වයෝ "එඹල ස්ත්‍රිය, මම පේවීම්, වේලා නොවරද්දෑ විනා වේලා වරද්දෑ බත් නොකම්, තෝ පලාය"යි කීහ. එවිට පස්සේ පීනුයේ අතවැසි මණිමේඛලා දුව අවුත් සිටිනා නියාව නොපෙණෙන්නේය. බත්කන්ට කීවාදෑ නොඇසෙන්නේය. බෝධිසත්‍වයෝ වේලා වරද්දෑ බත් නොකම්, රන්තලියේ බත් තෝ ඇරගෙණ පළාය යි කී බස් අසා අතවැසි සිතන්නේ "සංඛ නම් බ්‍රහ්මණයානන් වහන්සේ සුකුමාල හෙයින් හා සත්රෑ සත්දවාලක් නිරාහාර හෙයින් නිකම් ප්‍රලාප කියනසේකැ"යි සිතා කියන්නේ "සංඛ නම් බ්‍රාහ්මණයානන් වහන්සේ බොහෝ ඇසූපිරූ තැන් ඇතිසේක. බොහෝ ශ්‍රමණ බ්‍රාහ්මණයන් මා කථා ආදියත් ඇතිව දානධ්‍යාශය කළසේක. සත්රෑ සත්දවාලක් බත් නොකෑවයි මරණාසන්නයෙහි නිකම් ප්‍රලාප කුමට දෙඩනසේක්දෑ? වේලා

වරද්ද බත් නොකමි, තොප ඇරගෙණය යි මෙසේවූ ප්‍රලාප කියන්ට නුඹවහන්සේට මා විනා අනික් කෙනෙකුන් නැතිව ඉඳ මේ කියන්නේ කාටදැ?''යි විචාළේය.

එවිට බෝධිසත්ත්වයෝ "මේ දිව්‍යස්ත්‍රී මුන්ට නොපෙණෙන නිසා වේදැ''යි සිතා "එඹල සබඳ, මා ඉදිරියෙහි දිව්‍යස්ත්‍රියක් බවත් නොදැනෙයි, සෘද්ධි ඇති මනුෂ්‍යස්ත්‍රියක් බවත් නොදැනෙයි, රන්තලියකින් බත් ඇරගෙණ කන්ට කියයි ඈ හා කැටිව කථාකෙළෙමි, නිකම් ප්‍රලාපයක් නොකියමි'' කීහ. එවිට අතවැසි කියන්නේ "දිව්‍යස්ත්‍රියෙක බව මනුෂ්‍යස්ත්‍රියෙක බව විචාරන්ට උවමැනවැ''යි දෙපයින් පීන පීනා දැතින් නමස්කාරකොට "අපට ගැලවීමක් ඇද්දැ?යි විචාළ මැනවැ''යි කීයේය. සංඛ නම් බ්‍රාහ්මණයාත් මුන් කීයේ කටයුතුය යි "විචාරමි''යි සිතා "විශාල වෘක්‍ෂස්ථල (පළල් පපුව) ඇති සිහින් වූ සිගුවලඟයක් (සිහින් ඉඟ) ඇති දෙව්දූනු හා සමානවූ භ්‍රෑයුග්මයක් (ඇහි බැම දෙකක්) ඇති සූර්‍ය්‍යමණ්ඩලයක් මෙන් ශරීරශෝභා ඇති සර්‍වාලංකාරයෙන් සැරහෙන ලදුව මා ඉදිරියේ සිටිනා තෙපි දිව්‍යස්ත්‍රියෙක්ද? සෘද්ධි ඇති මුනුෂ්‍යස්ත්‍රියක්දැ?''යි විචාළේය. එවිට දිව්‍යස්ත්‍රී කියන්නී "සතරවරම් දෙවියන් විසින් සමුද්‍රහුණු (මුහුදුබත්) මේ සත්ත්වකෙනෙක් ඇත්නම් උන්ට ප්‍රතිෂ්ඨාවට සිටුවනලද මණිමේඛලා දූ නම් මමය, තෙපි කිසි භයක් නොවී තොපට උවමනා වස්ත්‍රාභරණ අන්නපානද ඇත්වාහන අස්වාහන ඈතුළුවූ වාහනයක්ද ඇරගණුව, කිසි භයක් නොගණුව''යි කීව.

බෝධිසත්ත්වයෝ “එඹල දිව්‍යස්ත්‍රිය, මට උවමනා දෙයක් දෙම් කියන්නේ මාගේ ජාතිගොත්‍ර බලාද? නොහොත් මා කළ කුශලයක් බලාදැ?”යි විචාළේය. දිව්‍යස්ත්‍රී කියන්නී “තොප පඬව් නැගෙන්ට එන ගමනේ තොප පසේබුදුන් වහන්සේට දුන් පත්කුඩය හා වහන්සඟලේ ආනුභාවයෙන් මා තොපට කැමති දෙයක් දෙමි. කීයේත් තොපට මෙතන පෙණී ප්‍රතිෂ්ඨාවූයේත් (පිහිට වූයේ) ඒ කුශල බලයෙනැ”යි කීව.

එවිට බෝධිසත්ත්වයෝ කියන්නාහු “අපට අනික් දෙයකින් ප්‍රයෝජන කිම්ද? අපගේ මෝලිනී නම් නුවරට පළායන නියායෙන් යහපත් වරය ඇති රිටි පළුපත් ඇති පඬව්වෙක (රිටවල් හා හබල් ඇති නැවක) අප ලා අපගේ නුවරෙහි ලා පියව”යි කීහ.

එවිට දිව්‍යස්ත්‍රී “යහපතැ”යි කියා අටඉස්බක් දිගඳ සතරඉස්බක් පළලද ඉස්බක් ගැඹුරුද ඇති සත්රුවන් නැවක් මවා මැණික්මය කුඹයකින්ද රත්රන්මය රැනද රිදීමය රුවලද මවිතකොට සත්රුවන්ද ඒ නැවපුරා බෝධිසත්ත්වයන්ට නැව පා එහි වඩාහිඳුවූහ.බෝධිසත්ත්වයෝ අතවැස්සා නැවලන්ට කී ගමනේ මණීමේඛලා දූ කියන්නි “උන් කළ කුශලයක් නැතිව ඉන්දදී නැව ලන්නේ කෙසේදැ?”යි කීව. බෝධිසත්ත්වයෝ තමන් කළ කුශලයන් පින් දුන්හ. පින් අනුමෝදන්වූ ගමනේ දෙව්දූ අතවැස්සාත් උස්වා නැව ලාගෙණ බෝධිසත්ත්වයන් මෝලිනී නම් නුවරට ගෙණ ගොස් උන්ගේ ගෙය සත්රුවනින් පුරාලා මනිමේඛලා දූ ගියාය.

බෝධිසත්‍වයෝ සම්පත් ගෙන නොයෙක් කුශල් කොට කම්වූ පරිද්දෙන් මියපරලොව ගියහ යි වදාරා මේ ‘සංඛ ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි මණිමේඛලා දු නම් දැන් උපුල්වන් මහාස්තවිරිය. එසමයෙහි අතවැස්සා නම් දැන් මේ ආනන්ද ස්ථවිරය, එසමයෙහි සංඛ බ්‍රාහ්මණව උපන්නෙම් බුදුවූ මම්ම වේදැ”යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 432. චුල්ලබෝධි ජාතකය

තවද ශීල සමාධි ප්‍රඥායෙන් යුක්තවූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝපී භික්ෂුකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

එක් භික්ෂුකෙනෙකුන් වහන්සේ තද රළු පරුෂව කීවන්ගේ බසට කෝපීව වාසය කරණසේක. සර්‍වඥයන් වහන්සේ එපවත් දැන වදාරා “සැබෑද මහණ, තෝ කෝපීව වාසය කරන්නේය?”යි විචරා වදාරා “සැබැව ස්වාමිනි” කී කල්හි “මහණ, තා කෝපයෙක් නැත්තාවූ බුද්ධශාසනයෙහි මහණව කෝපවන්ට කාරණා කිම්ද? පෙර උත්තමයෝ බුද්ධශාසනයෙන් පිටත් තාපසභාවයෙහි සිටත් කෝපකළමනා ස්ථානයෙහි කෝපනුවූවෝ වේදැ”යි වදාරා “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් වහන්සේ රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ එක් බ්‍රහ්මණ කුලයෙක උපන්හ. උන්ට නම් තබන්නාහු බෝධිසත්ව කුමාරයෝයි නම් තුබූහ. ඒ කුමාරයෝත් වැඩිවිය පැමිණ තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් කරා ගොස් උගතමනා ශිල්ප නිමවා ඉගෙණ දෙමව්පියන්ට ශිල්ප පෑවාහ.

දෙමව්පියෝත් පුතනුවන් කෙරෙහි සතුටුව සුදුසු කුලයකින් බිරින්දක් ගෙණවිත් පාවාදෙන්ට උත්සාහ කළාහ. ඒ කුමාරයෝ "මට බිරින්දගෙන් කාරිය නැත. මම තපසට යෙමි"යි නොගිවිස්සාහ. දෙමව්පියෝත් උන් නොගිවිස්සත් සමාන කුලයකින් කුමාරිකාවක් ගෙණවිත් විවාමඟුල් කරවා පාවා දුන්හ. බිරින්ද පාවාදුන් පමණක් විනා කෙළෙස් වසඟයෙන් (රාගී හැඟීමෙන්) මූණ පමණකුත් නොබලා එකගෙයි වාසය කරන්නාහ.

එසමයෙහි දෙමව්පියෝ දෙදෙනාම කාලක්‍රියා කළාහ. බෝධිසත්වයෝ බොහෝ සම්පත් බලා කියන්නාහු "මේ සම්පත් තෙපි ඇරගණුව"යි බිරින්දට කීහ. කුමාරිකාව කියන්නී "ඇයි ස්වාමිනි නුඹ වහන්සේ කොයි වඩනා සේක්ද, මට සම්පත් පාවාගන්ට කියන්නේ ය?"යි කීහ. බෝධිසත්වයෝ කියන්නාහු "මම හිමාලය වනයට තපසට යෙමි"යි කීහ. "ඇයි ස්වාමිනි

ස්ත්‍රීන්ට තපස් කරන්ට නපුරුදැ?''යි විචාළාහ. ''නපුරු නොවෙයි තොපට පුළුවන් වීනම් තපස් කරව''යි කීහ.

එවිට දෙන්නම ඒ දෙමව්පියන්ගේ සම්පත් හැර හිමාලය වනයට ගොස් ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව දස අවුරුද්දක් අඛණ්ඩ (කඩ නොකර) ශීලය යහපත්ව රක්‍ෂා කළ පමණක් විනා පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවාගත නුහුනුවාහ. ඇඹුල් ලුණු සෙවුනා පිණිස මනුෂ්‍යපථයට (මිනිස් වාසයට) ගොස් බරණැස් රජ්ජුරුවන්ගේ උයනෙහි වාසය කරන්නාහ.

ඒ උයන රක්නා උයන්ගොව්වා උයනේ යහපත්වූ පලාඵල ඇරගෙණ රජ්ජුරුවන් කරා ගොස් රජ්ජුරුවන්ට පලාඵල දින. රජ්ජුරුවෝ කියන්නාහු ''එඹල උයන්ගොව්ව, අප කීප දවසකින් උයන්කෙලියට එම්හ. උයන යහපත්කොට සරසව''යි කීහ.

උයන්ගොව්වාත් ''යහපතැ''යි උයනට ගොස් උයන කසළ හැර සරහාලීය. රජ්ජුරුවෝත් උයනට ගොස් උයන්කෙලි කෙළ ඒ ඒ තැන ඇවිදිනාහු තාපසයන් හා පරිව්‍රජිකාවන් දැක වැඳ එකත්පස්ව සිටියාහු පරිබ්‍රාජිකාවන් දැක උන් කෙරෙහි පිළිබඳ සිත් ඇතිව පරිව්‍රජිකාවන් පුවත් තාපසයන් අතින් විචාරන්නාහු ''ස්වාමීනි, මේ පරිබ්‍රාජිකාවන් වහන්සේ නුඹවහන්සේට කුමක්වන සේක්දැ?''යි විචාළාහ. ''මහරජ, කුමක්වෙද්ද? එක්ව තපස් කරණ තැනැත්තෝය. එසේද වුවත් මා ගිහිකල පාදපරිචාරිකාවෝය (බිරිඳ)''යි කීහ.

එවිට රජ්ජුරුවෝ "මේ තාපසයන් වහන්සේ කෝප ඇතිසේක්දෝ නැතිසේක්දෝ හෝයි පරීක්ෂාකරන්ට උවමැනවැ"යි සිතා කියන්නාහු "තාපසයන් වහන්ස, ඉදින් යමෙක් පරිව්‍රජිකාවන් වහන්සේ බලයෙන් උදුරාගෙන යන කෙනෙක් වීනම්ද ඇත්නම්ද කෝප ඇද්ද නැද්දැ?"යි විචාළාහ.

තාපසයෝ කියන්නාහු "මහරජ රහත් නූනහෙයින් කෝප නැත කියද්ද ඉදින් කෝපයක් ඇතිවුවත් මම වනාහි ඇවිලෙන ගින්නෙක පැන්කල සලා ගිනි නිවන්නාසේම සන්තානයෙහි කෝපය අඩුකරණ පමණක් විනා අනුන්ට දැනෙන නියායෙන් කෝප නොකෙරෙමි. මාගේ ජීවිතය දක්වාත් කෝප නොකෙරෙමි"යි කීය.

රජ්ජුරුවෝත් තමන්ගේ එක්තරා අමාත්‍යයෙකු කැඳවාගෙණ "තෙල පරිව්‍රජිකාවන් ඇරගෙණ රජගෙට ගෙණයව"යි කීහ. ඒ අමාත්‍යයාත් පරිව්‍රජිකාවන් අත අල්වාගෙණ මුරගාවා "මෙසේවූ අධර්මියෙක් ඇද්ද? මෙසේවූ අධර්මියෙක් මේ ලෝකයෙහි පවත්නා නියාය"යි කියා මුරගාව මුරගාවා රජගෙට ගෙණ ගොස්ලීය. තාපසයෝත් කරඹස බලා බැණනොනැගී උන්නාහ.

රජ්ජුරුවෝත් කල්යවා එතන නොසිට රජගෙට ගොස් පරිව්‍රජිකාවන්ට කියන්නාහු "මාගේ සොළොස් දහසක් පුරඟනාවන්ට නායක කොට අගමෙහෙසුන් තනතුරෙහි පිහිටුවාලමි. මේ තපස් කිරීමෙන් කුමණ කාරියෙක්දැ?යි කීහ. පරිබ්‍රාජිකාවෝ කියන්නාහු "මහරජ, තොපගේ සම්පත්තීන් මට

කුමණ ප්‍රයෝජනද? තපස් කිරීම උත්තමය''යි කියා නොගිවිස්සාහ.

රජ්ජුරුවෝත් ඒ පරිබ්‍රාජිකාව නොගිවිස්නා හෙයින් එක් ගෙයක ලවා තාපසයෝ උරණ (තරහ වී) ඇද්දේ හෝ යි නැද්දේ හෝ යි පරීක්‍ෂාකරන්ට උවමැනවැ යි තනිව උයනට ගොස් පදසන් (පා හඬ) නො ඇසෙන නියායෙන් තාපසයන් වසන ස්ථානයට ගියාහ. තාපසයෝ පරණ වල්කලාවක් (පට්ටාවලින් සාදන ලද) ඇරගෙණ ගෙත්තම් (මැහීම) කරන්නාහු, රජ්ජුරුවන් එන නියාව නොදත් හෙයින් බැණනොනැගී උන්නාහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු "ඇයි තාපසයන් වහන්ස, මාගේ ජීවිතාන්තය දක්වාත් කෝප නොකෙරෙම් යි කියාවේද නුඹවහන්සේ කියේය. මා ඇවිත් සිටිනා මෙතෙක් වේලා බෑණනොනැගේ, කෝප නැත්තෙන්දැ?''යි කීහ.

එවිට තාපසයෝ කියන්නාහු "මහරජ, එවිට උපන්නාවූ කෝපය එවිටම නැගාවූ ධූලි රැසක් වැසිවැස නිවාපුවාසේම සන්හිඳුවාපීමි'' කීහ. එවිට රජජුරුවෝ කියන්නාහු "තාපසයන් වහන්ස, මෙසේවූ කෝපයට අඬගුවන්නට කාරණා කිම්දැ?''යි කීහ. තාපසයෝ කියන්නාහු "මහරජ, දඬුදෙකක් එක්ව ගෑකල ගිනි වැටෙන්නේය. නැවත ඒ ගිනි දඬුදෙකම දවන්නේය. මහරජ එමෙන් මේ කෝපය ඇතිවූ කල එවිටම නිවාපියතොත් විනා කෝපය දිවුණු කල තමාටම ආයාස (විපත්) වන්නේය. එසේවූ කෝපය වහා නසාපිය යුත්තේය''යි

බොහෝ නය (කරුණු කියා) දක්වා කෝපයෙහි ආදීනව කීයේය. රජ්ජුරුවෝත් තාපසයන් වහන්සේ විශිෂ්ඨකොට (විශේෂ කොට) කියන ලද්දවූ ධර්‍මයෙහි සතුටුව තමන්වහන්සේ පරිව්‍රජිකාවන් උදුරාගෙණ ගියාවූ මා කෙරෙහි කෝපයක් නොකොට බණ වදාළසේකැයි සතුටුව අමාත්‍යයකු කැඳවා පරිව්‍රජිකාවන් ගෙන්වා තාපසයන්ට පාවාදී උයනේ වාසය කරණ නියායෙන් ආරාධනා කොට වස්වා උපස්ථාන කළාහ.

නොබෝ කලකින් පරිව්‍රජිකාවෝ මළහ. තාපසයෝත් හිමාලය වනයට ගොස් පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා නොපිරිහුනු ධ්‍යානයෙන් බ්‍රහ්මලොව ගියහයි වදාරා මේ 'චුල්ලබෝධි ජාතකය' නිමවා වදාළසේක.

එසමයෙහි පරිව්‍රජිකාවෝ නම් යසෝධරා ස්ථවිරීය. රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. චුල්ලබෝධි තාපසයෝ නම් බුදුවූ මම්මය"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

## 433. කණ්හදීප ජාතකය

තවද ශාක්‍යකුල චූඩාමාණික්‍යවූ (ශාක්‍යකුලයට මුදුන් මිණක් වැනිවූ) තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ශාසනයෙහි උකටලීවූ (කළකිරුණු) භික්‍ෂුකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වනලදී.

මෙහි වනාහි ජාතක කථාව 'කුස ජාතකයෙහි' විස්තර වශයෙන් පෙණෙන්නේය. මෙහි වනාහි සර්‍වඥයන් වහන්සේ

භික්ෂූන් වහන්සේ ගෙන්වා "තෝ වනාහි ශාසනයෙහි උකටලී වූයේ සැබැදැ?"යි වදාළ ගමනේ "සැබෑව ස්වාමීනි, ශාසනයෙහි සිටින්ට අභිප්‍රාය (කැමැත්ත) නැත්තෙමි"යි සිව්වනක් පෂීත් (පිරිස) මද්ධ්‍යයෙහි කීසේක.

සර්වඥයන් වහන්සේ එවිට වදාරණසේක් "පෙර උත්තමයෝ පණස් අවුරුද්දක් ශාසනයෙහි අභිප්‍රාය සිටිනා ගමනේ මෙහි වාසය කරන්ට අනභිප්‍රායෙමි (අකැමැත්ත) යන බස කියාගත නොහී සිටියේ වේද තොපි භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකාය යන සිව්වනක් පෂීත් මද්ධ්‍යයෙහි ශාසනයෙහි උකටලී වීමියි නිර්ලජ්ජාවම කියෙහි වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස වත්සර නම් රට කොසඹෑ නුවර රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ එක්තරා බ්‍රාහ්මණ කුලයක ඉපිද වැඩිවිය පැමිණ අනික් බ්‍රහ්මණ කුමාරයෙකු හා දෙන්න පඤ්චකාමයෙහි (පස්කම් සැපයෙහි) ආදීනව දැක හිමාලය වනයට ගොස් ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව දීප තාපසයෝ ය මඬප තාපසයෝය යි මේ නමින් දෙන්නාම වාසය කරන්නාහ.

ඔණු ඇඹුල් පිණිස බරණැස්නුවර පසල්ගමෙක (පිටිසර ගමෙක) අවුත් මඬප්ප උපාසකයාගේ ගෙට අවුත් වන්හ. ඒ දෙදෙනා වහන්සේ පළමුත් ඒ උපාසකයා අඳුනන හෙයින් දෙදෙනාවහන්සේට සිව්පසයෙන් (සිවුරු, පිණ්ඩපාත, සෙනසුන්,

බෙහෙත්) දන් දෙන්නේය. මඬප තාපසයෝ ඒ ගම සිට බරණැස් නුවරට අවුත් ඒ නුවර අවිමුක්ත නම් සුසාන භූමියෙහි වාසය කරන්නාහ. ඒ නුවර සොරු සොරකම්කොටගෙණ යන කලට මනුෂ්‍යයෝ දැක සොරුන් ලුහුබඳවා ගත්කලට සොරු පවුරයට සොරුව්වෙන් (තාප්පය යට දිය බසින කාණුවෙන්) දිවගෙණ ගොස් මඬප තාපසයන් වසන සුසාන භූමියට තමන් ගෙන යන සම්පත් දමා දිවූහ.

මනුෂ්‍යයෝ සොරුන් නොදැක තාපසයන් දැක "එසේද දවල් සිඟාකා රෑ සොරකම් කරන්නේදැ?"යි කියා අල්වාගෙණ ගොස් රජ්ජුරුවන්ට පෑහ. රජ්ජුරුවෝ කියන්නාහු "ගෙණ ගොස් උල ඇනපියව"යි කීහ. "යහපතැ"යි එම සුසාන භූමියට ගෙණ ගොස් කිහිරි උලක් ඉදිකොට අන්නට (අනින්නට) වන්නාහ. ඒකියන උල නො ඇනෙන්නේය. කොසඹ උලක් ඉදිකොට උල අන්ට වන් ගමනේ එකියන කොසඹ උලත් නොහැනෙන්නේ යහුලක් ඉදිකොට අන්ට වන් ගමනේ යහුලත් නොඇනෙන්ය.

තාපසයෝ එවිට "මා නොකළ කර්ම්මය මං විඳිනේය යි මම කුමන අකුශලයක් කෙළෙම්දැ?"යි පරීක්‍ෂා කළ කල්හි දිවැස් පහළවිය. එවිට පරීක්‍ෂා කළාහු යටගිය ජාතියෙහි වඩුවකුට පුත්‍ව උපන් ගමනේ කොබෝලීල දඬු සසින තැනැත්තේ කොබෝලීල කූරක් ඇරගෙණ මැස්සකු අල්වා උල ඇනි අකුශලය දැක කළ කර්‍මය විපාක දෙන්නේය යි "දැන් කවර උලක් ඉදිකොටගෙණ උල අනිතත් නොහැනෙයි,

කොබෝලීල උලක් ඉදිකොටගෙණ අනුව"යි කීහ. "යහපතැ"යි එකියන පුරුෂයෝ කොබෝලීල උලක් ඉදිකොටගෙණ තාපසයන් උල ඇන එතනට එන්නෝ ඇද්දේ හෝයි පරීක්ෂාකරන්නට උන්නාහ. දීප තාපසයෝ "මාගේ මඬප තාපසයන් නැතක්ද (කීප දවසකින්) මා නොදකින්නේව"යි සිතා දක්නට එන්නාහු අතර මගදී මඬප තාපසයන් උල ඇනි නියාව අසා වහා අවුත් මණ්ඩප තාපසයන් දැක කියන්නාහු "තාපසයෙනි තොපකළ කර්‍මයෙක්ද තොපට විපාක දෙන්නේය"යි විචාළ ගමනේ එවිට තාපසයෝ "මා කළ අකුශලයේ විපාක දිනැයි නොකළ දෙයෙක් විපාක දේදැ"යි කීහ.

එවිට දීප තාපසයෝ කියන්නාහු "තොප කළ අකුශල විපාක දුන්නේය. රජ්ජුරුවන් කෙරේ අමෛත්‍රියක් (වෛරයක්) සිතුදැ?"යි විචාළ කල්හි "මා කළ අකුශලය විපාක දුන්නේය. රජ්ජුරුවන් කෙරේවත් වද කළවුන් කෙරේවත් අමෛත්‍රියක් නොසිතමි"යි කීහ. දීප තාපසයෝ "මෙසේ වූ මෛත්‍රියක් ඇත්තවුන්ගේ සෙවණේ ඉඳිම යහපත් වන්නේය"යි සැතපි උන්නාහ. මඬප තාපසයන්ගේ ලේ බිඳු දීප තාපසයන් ඇග වැම්මී කළු පැයට ගැලසුනේය (ගලාගියේය). මේ නියාව රජ්ජුරුවන්ට ඉවත බලා උන් මනුෂ්‍යයෝ කී කල්හි රජ්ජුරුවෝ "අපරීක්ෂිතව (සොයා නොබලා) මඬප තාපසයන් උල අන්ට කීයෙමි, බලන්ට යෙමි" කියා අවුත් දීප තාපසයන්ට රජජුරුවෝ කියන්නාහු "තාපසයන් වහන්ස මේ ලේ වැම්මෙන මෙතන නුඹවහන්සේ උන්නේ කුමක් නිසාදැ?"යි

විචාළ ගමනේ දීප තාපසයෝ කියන්නාහු "මේ නිරපරාධ මඬප තාපසයන්ට මේ අකුශලය සැලසුනු හෙයින් උන්ට ආරක්ෂා පිණිස මෙතන උනිමි"යි කීහ.

රජ්ජුරුවෝ එවිට "මා පරීක්ෂා නොකොට තාපසයන්ට උල අන්ට කියේය"යි සිතා මඬප තාපසයන් උලින් ගලවන්ට උත්සාහ කළ ගමනේ උලින් නොහැරෙණ (නොගැලවෙන නිසා) හෙයින් එවිට මඬප තාපසයෝ තමන් මැස්සා උල ඇනි ගමනේ නොමළ උල කඩාගෙණ පලාගොස් ජීවත්වූ නියාව දිවසින් දැක "රජ්ජුරුවෙනි, මේ උල මා බඩින් නොහැරෙන්නේය. මා රකිණා කැමැත්තා නම් සම හරියේදී කියතතින් මේ උල කප්පව"යි කීහ. එවිට රජ්ජුරුවෝ "කියතක් ගෙණව"යි කියත ගෙන්වා කැප්පු උල් කැබැල්ල බඩම තිබුයේය. එසේහෙයින් එතැන් පටන් ආනි මඬප්ප තාපසයෝය යි කියත්. දීප තාපසයන් ශරීරයේ ලේ වැම්මී කළුවූ හෙයින් කණ්හදීප තාපසයෝය යි මේ නමින් ප්‍රසිද්ධ වූහ. රජ්ජුරුවෝත් තාපසවරුන් වැඳ ක්ෂමා කරවාගෙණ රජගෙට ගියහ. තාපසවරුත් මඟුල් උයනේ ඉඳ වනමුනතට (තුවාලයේ මුදුනට) බෙහෙත් කොට සුවකොටගෙණ මඬප තාපසයන් උන් ගමට ගියාහ. මඬප්ප උපාසක තාපසවරුන් දෙදෙනා එන නියාව අසා පෙරගමන් කොට වඩාගෙණ ගොස් වලඳවා වැඩහිඳිනා අසුන් පණවා උල ඇනි කථාව කිය කියා උන්නාහ. මඬප්ප උපාසකයාගේ යඤ්ඤදත්ත නම් පුතෙක් ඇත. ඒ පුත් බඹරක් ඇරගෙණ කෙළිමින් සිටිකලට ඒ ගැසූ බඹරා ගොස් එතන සමීපයෙහි තුඹසෙක නයෙකුගේ ඉස

වැදගත. ඒ කුමරා බඹරා ගෙණෙන්ට ගිය තැනැත්තේ තුඹස ඇතුලේ වැටීගිය බඹරය දැක අරගන්ටය යි අතපොවා ඵැකලට කෝපවීපියා වැදහොත් නයා කුමාරයාගේ පොවාඵැ අත ඇඟිල්ල දෂ්ට කෙළේය. කුමාර විෂමූර්ඡාව (විෂ වැදී සිහි නැතිව) වැටීගිය තැනැත්තහු දීප තාපසයන්ගේ පාමුල ලා කියන්නාහු "තාපසවරු නම් බොහෝ මන්ත්‍ර හා ඖෂධ දනිති, එසේහෙයින් තෙල කුමාරයාගේ විෂ බෑව මැනවැ"යි කීහ.

එවිට තාපසයෝ සත්‍යක්‍රියා කරන්නාහු "මා මහණවූ සත් දවසක් මාගේ අභිප්‍රායෙන් වාසය කෙළෙමි. මේ පණස් අවුරුද්දක් මුළුල්ලෙහි අනභිප්‍රායෙන් (අකැමැත්තෙන්) තපස් කෙළෙමි, අසවල් තාපසයෝ අනභිප්‍රායෙන් තපස් රක්‍ෂාකෙරෙති කිසිකෙනෙකුන්ටත් නොහඟවා වාසය කෙළෙමි, මේ සැබෑ වීනම් මේ සත්‍යක්‍රියායෙන් මේ යඤ්ඤදත්ත නම් කුමාරයාගේ විෂ බසීව"යි සත්‍යක්‍රියා කළ ගමනේ කුමාරයාගේ තනමත්ත (තන තිබෙන ප්‍රදේශයට) පමණට විෂ බැස ගියේය.

බෝධිසත්‍වයෝ "මම මට පිළිවන් විවර සත්‍යක්‍රියා කෙළෙමි, මණ්ඩප්ප උපාසකයෙනි, තොපිත් තොපගේ සත්‍යක්‍රියාවෙන් විෂබාව"යි කීකල්හි මණ්ඩප්ප උපාසකයෝ කියන්නාහු "මම දුටු යම් ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙකුන්ට දන්දෙමි. එදවසුත් මාගේ අභිප්‍රායෙන් දන්පින් කෙළෙමි. අසවල් උපාසක අනභිප්‍රායෙන් දන්පින් කරන්නේය යි කිසිකෙනෙකුන්ටත් නොහැඟුණේය. ඒ සැබෑ වීනම් යඤ්ඤදත්ත

කුමාරයාගේ විෂ බසීව"යි කියා සත්‍යක්‍රියා කළ ගමනේ ඒ කුමාරයාගේ විෂ උකුළසරියට බැස ගියේය.

මණ්ඩප්ප උපාසක තමන්ගේ භාර්‍ය්‍යාවට කියන්නේ "තෙපි තොපගේ සත්‍යක්‍රියාව කොට විෂ බාව"යි කී කල්හි එකියන භාර්‍ය්‍යාව කියන්නී "තොප දැක්කදී මා සත්‍ය ක්‍රියා කරන්නේ කෙසේදැ?"යි කිව. එවිට මණ්ඩප්ප උපාසක කියන්නේ "තොපි කිසි සැකයක් නැතිව සිත ඇත්ත කියව"යි කී කල්හි ඒ ස්ත්‍රී කියන්නී "එඹල පුත, තොප සකසා කෑ නයා කෙරේ මම අසමාධියෙන් (එකඟතාවයකින් තොරව) නම් තොපගේ පියානන් කෙරෙත් මම අසමාධියෙමි, උන්කෙරේ මම අසමාධි නියාව තොපගේ පියානෝ නොදන්නාහ. පිටතකින් කෙනෙකුන්ටත් නොහඟවා වාසයකෙළෙමි. මේ සැබෑ වීනම් යඤ්ඤදත්ත කුමාරයන්ගේ විෂ බසීව"යි සත්‍යක්‍රියා කළ ගමනේ විෂ බැස සැපසේ ඇවිද්දහ.

එවිට මණ්ඩප්ප උපාසක බෝධිසත්වයන්ට කියන්නේ "ස්වාමීනි, මේ පණස් අවුරුද්දේ ආලය නැතිව තපස් රක්‍ෂාකළේ කෙසේදැ?යි විචාළකල්හි තාපසයෝ කියන්නාහු "මෙලෝ පරලෝ ඇතැයි මම මහණවීමි, මහණවූ ගමනේ සිවුරු ඇරපියත් නම් කෙලෙතොල්ලා (මෝඩයා) සිවුරු පොරව සිටිය නුහුනුයේය යි නින්දා පරිහාර (පරිභව) අසාගත නොහී අනභිප්‍රායෙන් වුවත් වාසය කෙළෙමි" කීහ.

ඊට බෝධිසත්වයෝ "මණ්ඩප්ප උපාසකයෙනි, තොප අප ඇම ඇතුළුවූ ශ්‍රමණ බ්‍රහ්මණයන්ට මෙතෙක් දවස දන්

දෙන්නාහු අනභිප්‍රායෙන් දන් දුන්නේ කුමක් නිසාදැ?''යි විචාළාහ. මණ්ඩප්ප උපාසක කියන්නේ ''මාගේ සත්මුතු පරම්පරාවේ පැමිණ ආ කුශලය හෙයින් කෙළෙමි. නොකොළොත් මට නින්ද කෙරෙති සිතා කෙළෙමි'' කීහ.

එවිට මණ්ඩප්ප උපාසක තමන්ගේ භාර්‍ය්‍යාව අතින් විචාරන්නේ ''භාර්‍ය්‍යාවෙනි, තොපි කුමාරි අවස්ථාවේ අවුත් මෙතෙක් දවස් මා කෙරෙහි නිරාලයෙන් (ආලයක් නැතිව) වාසය කොට එක් දවසකුත් ආලය නැති නියාව නොහඟවා වයෝවෘද්ධ වයසට පැමිණෙන කල් කෙසේ වාසය කළාදැ?''යි විචාළ කල්හි එවිට ස්ත්‍රී කියන්නී ''මාගේ සත්මුත්තන් පරම්පරාවේ එකසරණක (එක විවාහයක් පමණයි) විනා දෙසරණක උන් කෙනෙක් නැත්තාහ. එසේහෙයින් තොප කෙරේ ආලය නැත්ත නොහඟවා උනිමි'' කීහ. එවිට බෝධිසත්වයන්ට ''ස්වාමීනි, මා කීයේ පුරුෂයන් දැක්කදී කිවමනා දෙයක්ද, මාගේ දරුවන් නිසා මා කියේය, ඊට ක්ෂමා කළ මැනවැ''යි කීව.

එවිට බෝධිසත්වයෝ ''තොප එසේ සිතිය යුතු නොවෙයි. මෙතැන් පටන් උන් කෙරේ ආලය ඇතිව වාසය කරව''යි කියා එබැවින් ඒ පුරුෂයා කියන්නේ ''ඉනිබ්බේ මට අවිස්වාස නොවව''යි කියා ක්ෂමා කෙළේය. එවිට ස්ත්‍රී ''යහපතැ''යි කියා ක්ෂමා කරවා ගත්තාහ. එවිට මණ්ඩප්ප උපාසක බෝධිසත්වයන්ට කියන්නේ ''ස්වාමීනි, නුඹ වහන්සේත් අපි හැම දුන්නාවූ දනය අනුභව කොට සැපසේ විකේෂ්ප නොවී (සිත්

අමනාප නොකර) ශීලය රැක්ක මැනැවැ"යි අවවාද කීය. තාපසයන් වහන්සේත් "යහපතැ"යි එතැන් පටන් ශීලය රක්‍ෂාකරණ සේකැ යි එවිට තාපසයන් වහන්සේ මඬප්ප උපාසයක්නට කියනසේක් "තමා අභිප්‍රායෙන්ම කුසල් කරන්නේය. උපාසකයෙනි, තොප දෙන දානය යහපත්ව සිත පහදවාගෙණ දෙව"යි කියා අවවාද කීසේක.

එතැන්පටන් සිත පහදවා දන් දෙන්නේය. ස්ත්‍රීන් එතැන්පටන් තමාගේ පුරුෂයා කෙරෙහි ස්නෙහයෙන් වාසය කරන්නීය. මඬප්ප උපාසකයාත් තමා අභිප්‍රායෙන් කුශල් කරන්නේය. බෝධිසත්‍වයෝත් නොපිරිහුණු ධ්‍යානයෙන් පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා බඹලොව ගියහයි මේ 'කණ්හදීප ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි ස්ත්‍රී දැන් විශාඛාවෝය. එසමයෙහි මඬප්ප උපාසක නම් ආනන්ද ස්ථවිරය. යඤ්ඤදත්ත කුමාරයෝ නම් දැන් මේ රාහුල ස්ථවිරය. එසමයෙහි මඬප තාපසයෝ නම් ශාරිපුත්ත ස්ථවිරය. එසමයෙහි කණ්හදීපායන තාපසයෝ නම් බුදුවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

***

# 439. නිග්‍රෝධ ජාතකය

තවද සියලු සත්ත්‍වයන්ට අභිවෘද්ධිදායක වූ සර්‍වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි දේවදත්ත

ස්ථවිරයන් වහන්සේගේ කථාවක් අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ කෙසේද? යත්,

එක් දවසක් භික්ෂූන් වහන්සේ දේවදත්ත ස්ථවිරයන් වහන්සේට කියනසේක් "දේවදත්ත ස්ථවිරය, සර්‍වඥයන් වහන්සේ තොපට බොහෝ උපකාරව උපසම්පදාවත් උන්වහන්සේගෙන් ලැබ් ප්‍රථම ධ්‍යානයත් ලදුව, එසේ බොහෝ උපකාර කළා වූ සර්‍වඥයන් වහන්සේට තොප අනුපකාරී වන්ට කාරණා කිම්දැ?"යි වදාළසේක. එවිට දේවදත්ත ස්ථවිරයෝ වදාරනසේක් "සර්‍වඥයන් වහන්සේ තණ පතක් අග වැද ගත් තෙල් බින්දුවක් විචරත් උපකාර මට කෙළේ නැතැ"යි කීසේක. එවිට භික්‍ෂූන් වහන්සේ "මේ දේවදත්ත ස්ථවිරයන් නපුර කියා 'බුදුන් තමන්ට තෙල් බින්දුවක් විචරත් උපකාරයක් නොකළැ'යි කියති" නුගුණ කියා වැඩඋන් තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා එපවත් අසා "දැන්මතු නොවෙයි, පෙරත් දේවදත්ත ස්ථවිරයන් කළ උපකාර මකා කළ ගුණ නොදත්තෝ වේදැ"යි වදාරා "හේ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස රජගහ නුවර මගධ නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි ඒ නුවර එක් සිටාණ

කෙනෙක් ඇත්තාහ. ඒ සිටාණන්ගේ පුත් වූ සිටු කුමාරයෙක් ඇත්තේය. ඒ සිටු කුමාරයාට එක් සමාන කුලයකින් සිටු දුවක ගෙනවුත් සරණ පාවා දුන්හ. ඒ සිටු කුමාරයාගේ ගෙයි වසන්නා වූ ඒ සිටු දුවට දරු කෙනෙක් නැත්තාහ. ඒ සිටු පුත්‍රයාගේ දෙමව්පියෝ කියන්නාහු "මේ වඳ තැනැත්තිය අපගේ ගෙයි ඉඳ කාරිය කිම්දැ"යි කියා ඉඳිනාහ. ඒ සිටු කුමාරිකා තමාගේ කිරි මැණියන් කැඳවා විචාරන්නී "අම්ම, දරුවන් ඇති වූ ගැණුන්ට කවර ක්‍රියාවක්දැ?"යි විචාරා "ඒ ක්‍රියාව උන් අතින් අසා දැරි ඇත්තෙමි" අඟවා ඔසප් සඟවා බඩපිළි තබා බැඳ තලා අතපය උදුම්මා "දෙළදුකැ"යි ඇඹුල් කා ප්‍රයෝගයකින් තනපුඩු කළුකොට ගෙන ඉඳ නවමස් පිරී දසමසට පැමිණ කල්හි වදන කල් විය. "ප්‍රසවන්ට කවර ක්‍රියාවක්දැ?"යි විචාරා "දෙමව්පියන්ගේ ගමට යෙමි" කීහ.

එවිට සිටුපුත්‍රයාත් රථයක් සරහා ඒ රථයට සිටු කුමාරිකාව නන්වා බොහෝ දැසිදස් පරිවාර පිරිවරා යන්නාහ. උන්ට ඉදිරියේ වෙළඳහු කෙනෙක් වෙළඳම්කොට ගෙන යන්නාහු දෙගව්වෙන් දෙගව්වට ඉදිරියේ ලැග ලැග යන්නාහ. උන් දෙගව්වෙන් දෙගව්වට අල අල තැන සිටු කුමාරිකා ලගිනීය. වෙළෙඳුන් හා කැටුව යන්නා වූ දුක්පත් දැරි ඇති ස්ත්‍රියක් ඇත්තීය. දසමස් පිරී විලි පහරින්ට වන. ඒ ස්ත්‍රී වෙළෙඳුන් යා දී නුග ගසක් මුල ඉඳ දරුවන් වදා "තමා හා කැටුව ආ වෙළෙඳුන් පලාගිය හෙයින් දරුවන් නිසා රැඳිනී නම් මාගේ බොහෝ කටයුතු කාරිය නස්නේය"යි වැදූ මසින්ම දරුවන් නුග ගස මුල තබා ගියාහ.

ඔහු දුක්පත් ස්ත්‍රිය බඩ පිළිසිඳන පමණක් විනා කෘතාධිකාර බුඩාංකුරයාණන් වහන්සේය. එසේ හෙයින් කවුඩෙක්, බල්ලෙක් ඒ ලේ ගඬුව අන්තරාය කළ නුහුනුයේය. ඒ සිටු කුමාරිකාවත් වෙළෙඳුන් හල ලැග්මේ ඇර නුග ගස මුලට ගිය තැනැත්තී පොළොවේ වසා ඔත් කුමාරයන් දැක කාත් නොහඟවා ඒ දරුවන් වඩා "බඩ බිලි පහරින්ට වනැ"යි අඟවා වට තිර බඳවා විලි ලා ඇඟ ලේත් ගාගෙන දරුවන් වඩා මෑත ඇරගෙන නාවා කිරි පොවා එතනම රඳා තමන්ගේ සමනන්ට පත් ලියා යවූය.

ඒ සිටු කුමාරයාගේ දෙමව්පියෝත් එතනට අවුත් "දරුවන් වදන නියාවේද ගමට යන්ට ආයේය. දරුවන් වදාපු පසු ගමට යන්නේ ඇයිදැ?"යි තමන්ගේ සමනන්ගේ ගමට ගියාය. ඒ කුමාරයා නුග ගස මුල උපන් හෙයින් 'නිග්‍රෝධ කුමාරය'යි නම් තුබූහ. එමදාම ඒ නුවර අනික් සිටාණ කෙනෙකුන්ගේ බිරින්දක් අත්තක් අල්වාගෙන පුතණු කෙනෙකුන් වැදූහ. අත්ත අල්වාගෙන සිට උපන් හෙයින් 'සාඛා කුමාරයෝය'යි නම් තුබූහ. එමදාම සිටාණන්ට මේවර කරන්නා වූ සන්නාලියාගේ බිරින්දක් කැපූ කෙළවර රෙදි ගොඩක් පිට පුතණු කෙනෙකුන් වැදූහ. ඌට නම් තබන්නාහු 'මුත්තිය කුමාරයෝය'යි නම් තුබූහ.

එවිට සිටාණෝත් ඒ එක ද උපන් කුමාරයන් තුන්දෙනාට කිරිමවුන් සලස්වා සියලු වැටුප් උත්තාංති සලස්වා වැඩිවිය

පැමිණි කල දිසාපාමොක් ආචාරීන් ලඟට ශිල්ප උගන්වා නිසා යවූහ.

සිටු කුමාරයෝ දෙන්න තමන් අත සම්පත් ඇති සෙයින් දීලා ශිල්ප උගන්නාහ. මුත්තිය කුමාරයා තම අත සම්පත් නැති හෙයින් නිග්‍රෝධ කුමාරයෝම ශිල්ප උගන්වන්නාහ. මෙසේ තුන්දෙනා ශිල්ප නිමවා ඉගෙන නුවරට යන්නාහු "රටවල් බලාගෙන නුවරට යම්හ"යි ඒ ඒ තැන ඇවිදිනාහු, බරණැස් නුවරට යන්නාහු එක්තරා දේවාලයක රෑ වැද ඔත්තාහ. ඒ කුමාරවරුන් ඒ නුවරට එන්නාට පළමු සත් දවසෙක බරණැස් නුවර රජ්ජුරුවෝ මළාහ. ඒ නුවර රජකමට නිසි කෙනෙකුන් නැති හෙයින් අමාත්‍යවරු "පුස්සරථය නුවර අරුම්හ"යි කථා කළාහ. ඒ කුමාරවරුන් දේවාලයේ වැදෙත් කලට එතන ගසක් උඩ කුකුළෝ දෙන්නෙක් වැද හොත්තාහ. උඩ අත්තේ වැදෙත් කුකුළා වර්චස් පාරක් ලාහ. පාත අත්තේ වැදෙත් කුකුළාගේ ඉස වැගුරුණේය. එවිට කුකුළු කියන්නේ "තෝ මාගේ විචර නොදනිද? මාගේ ඉස නාන ගෙයක් කොට සිතා ගෙණිදැ?"යි කෝප විය. එවිට අග අත්තේ වැදෙත් කුකුළු කියන්නේ "මම නොදත්තෙමි, තොපි පාත අත්තේ වැදෙත් නියාය. ඊට ක්‍ෂමා කරව" නොදැන කෙළෙම් කියාදීත් කෝප විය. එවිට "මාගේ තත්ව තමා නොදනිද? තමා මට කෝප කරන්නේය"යි කියා "තා මෙසේම මානී පසු තාගේ තත්ව කියා බලව"යි අග අත්තේ වැදෙත් කුකුළු කීය. පාත වැදෙත් කුකුළු එවිට

කියන්නේ "මාගේ තජව අසව, යම් කෙනෙක් මා මරා මාගේ මස් කැවූ නම් එදවසම සේසත් දසෙන් ලැබෙන්නේය"යි කීහ.

එවිට උඩ අත්තේ වැදෙත් කුකුළු කියන්නේ "තාගේ මස් කෑ කෙනෙකුන් ලබන්නේම සේසත් දසෙක් වේද? මෙපමණක් ගෙන තා පෑය, මාගේ පඤ්චමධුර මාංශය යම් කෙනෙක් කෑවෝ නම් රාජ්‍යය ලබති. ඍණ මාංශය කෑ කෙනෙක් සෙනෙවිරත් ධුරය ලබති. ඇට නහර මුසු මස් කැවූ නම් භාණ්ඩාගාරයේ නායක කම් කරන්නේ වේදැ"යි කීයේය. එවිට කුකුළන් දෙන්න කථා කරන කලට නිග්‍රෝධ කුමාරයොත්, ශාඛා කුමාරයෝත් දෙන්න වැදහෙව නිදන්නාහ. මුත්තිය කුමාරයෝ නිග්‍රෝධ කුමාරයන්ගේ පය උකුලේ තබාගෙන මැඩ මැඩ උන්නාහු මේ කුකුළන් දෙන්නාගේ කථාව අසා "දවස දස ලැබෙන කුකුළන් කිම්ද? රාජ්‍යය හා සෙනෙවිරත් ධූරය හා භාණ්ඩාගාර නායක කම් ලබන්නා මෙසේ වූ කුකුළා වේද? යහපතැ"යි සිතා නිග්‍රෝධ කුමාරයන්ගේ පය උකුලෙන් බා සෙමින් ගසට නැගී අත්තේ වැදෙත් කුකුළා අල්වාගෙන මරා පඤ්චමධුර මාංශය වෙනම පිස තබා ඍණ මාංශය වෙනම පිස තබා ඇට නහර මාංශය වෙනම පිස තබා වැදහෙව නිදන කුමාරවරුන් දෙන්නා පුබුදුවා නිග්‍රෝධ කුමාරයන්ට රාජ්‍යය ලැබෙන මාංශ ලා සාඛා කුමාරයින්ට සෙනෙවිරත් ධූරය ලැබෙන මාංශය ලා තුමූ භාණ්ඩාගාරයේ නායක කම් ලැබෙන මාංශ ලාගෙන කා මුත්තිය කුමාරයෝ කියන්නාහු "නිග්‍රෝධ කුමාරයන්ට රජ්‍යය ලැබෙයි. සාඛා

කුමාරයන්ට සෙනෙවිරත් ධුරය ලැබෙයි. මට භාණ්ඩාගාර නායක කම් ලැබෙන්නේය''යි කීහ.

එවිට නිග්‍රෝධ කුමාරයන් හා සාඛා කුමාරයෝ කියන්නාහු ''තොපට දැනෙන්නේ කෙසේදැ?''යි විචාළාහ. එවිට මුත්තිය කුමාරයෝ කුකුළා කී ප්‍රවෘත්තිය කීයේය. නිග්‍රෝධ කුමාරයෝ ''යහපතැ''යි කියා පාන් වන්නාට පළමු මූන සෝදා තුන් දෙනම මඟුල් උයනට ගොසින් නිග්‍රෝධ කුමාරයෝ මඟුල් ශාලාවට නැගී ඉස වසා කඩ ලාගෙන වැදහොත්තාහ. සාඛා කුමාරයන් හා මුත්තිය කුමාරයා හා දෙන්නම බිම වැදෙත්තාහ.

ඒ වේලාවට පුස්ස රථය පිට පඤ්ච රාජ කකුධ භාණ්ඩ තබා පුස්ස රථය අලහ. රථය මඟුල් උයනට ගොසින් මඟුල් සල වට වැදෙත් නිග්‍රෝධ කුමාරයන් පාමුලට ගොසින් රථය පස්සැ පෑ නුවරට මූණ ලා සිටියේය. එවිට පුරෝහිත බ්‍රාහ්මණ වැදෙත් නිග්‍රෝධ කුමාරයන් පාමුලට ගොස් පය වසා තුබූ ඉන කඩ ඉවත්කොට පය ලක්ෂණ බලා බරණැස් නුවර තබා ජම්බුද්වීපය ඒකච්ඡත්‍රකොට රාජ්‍ය කරන්ට ලක්ෂණ දැක ''ධෛර්ය පරීක්ෂා කරන්නට උවමැනවැ''යි සිතා පඤ්චාංගික තූර්ය නාදය එකවිට පැවැත් වූහ. එවිට නිග්‍රෝධ කුමාරයෝ කිසි චකිතයක් නොවී ඉවසා, තිබූ ඉන කඩ ඉවත්කොට බලා ඇලට නැමී මදක් වැදහෙව නැගී සිට ආසන පිට උන්නාහ. එවිට පුරෝහිත බ්‍රාහ්මණයා කියන්නේ ''ස්වාමීනි, නුඹවහන්සේට රාජ්‍යය පැමිණියේය. රාජ්‍යය කළ

මැනවැ''යි කීහ. නිග්‍රෝධ කුමාරයෝ ''මෙනුවර රජ්ජුරුවන් වහන්සේ කොයිදැ?''යි විචාළාහ. එපවත් අසා ''මළහ''යි කීහ. ''රාජ කුමාරවරු නැද්දැ?''යි කීහ. ''රාජ කුමාරවරු නැත. නුඹවහන්සේ රාජ්‍යය කළ මැනවැ''යි කීහ. එවිට ''යහපතැ''යි ගිවිස වටතිර බඳවා දැලි රැවුළු අන්දම් තබා රුවන් රැසක් පිට සිටුවා අභිෂේකකොට රාජ්‍යයට පැමිණි වුහ.

එවිට නිග්‍රෝධ රජ්ජුරුවෝ සාඛා කුමාරයන්ට සෙනෙවිරත් ධූරය දුන්නාහ. මුත්තිය කුමාරයෝ රජ්ජුරුවන් හා කැටිව රජගෙට ගියහ. රජ්ජුරුවෝ සාඛා සෙනෙවිරදුන්ට කියන්නාහු ''අපගේ දෙමව්පියනුත් කැඳවාගෙන එව''යි කීහ. සාඛා සෙනවිරද්දු ''මට බැරිය, නොයමි'' කීහ. රජ්ජුරුවෝත් මුත්තිය කුමාරයන් කැඳවා ''රජගහ නුවරට ගොසින් අපගේ දෙමව්පියනුත් තොපගේ දෙමව්පියනුත් කැඳවාගෙන එව''යි කීහ. මුත්තිය කුමාරයෝ ''යහපතැ''යි ගිවිස රජගහ නුවරට ගොස් රජ්ජුරුවන්ගේ දෙමව්පියන් කැන්දූහ. ''අපගේ සම්පත් ඇත. අප එන්නේ නැතැ''යි කීය. සාඛා කුමාරයන්ගේ දෙමව්පියනුත් කැන්දූහ. ඔයිත් කියන්නාහු ''අපට පොහොසත්කම එපයි, අප එන්නෙ නැතැ''යි කීහ. මුත්තිය කුමාර තමාගේ දෙමව්පියන් කැන්දූ ගමනේ ''සන්නාලි මේවර පමණ ඇත, අප එන්නේ නැතැ''යි කීහ. මුත්තිය කුමාරයෝ දෙවෙනිව බරණැස් නුවරට අවුත් ''සාඛා සෙනෙවිරදුන්ගේ ගෙට අවුත් බත් කා ගමන් විඩා නිවා ගනිමි'' සිතා සෙනෙවිරදුන්ගේ ගෙට ගොස් දොරකඩ සිට කියන්නේ ''සාඛා

සෙනෙවිරදුන්ගේ යහළු වූ මුත්තිය කුමාරයෝ ආවෝ යයි කියාලව''යි මිනිසුන් අත කියා යවූහ.

එවිට සෙනෙවිරදු බත් කමින් ඉඳ සිතන්නේ "රාජ්‍යයට පැමිණෙන මාංශය නුදුන්නේය. සෙනෙවිරත් ධූරයට පැමිණෙන මාංශය දුන්නේය''යි කෝපයෙන් බස් කා ඉක්බිති දොර අවුත් කියන්නේ "මුත්තිය කුමාරයෝ නම් කවුරුද? මුන් අඳුනන්නේ කවුරුදැ?''යි කියමින් "මුන් සෙව්වෝද අපට මිත්‍රයෝය. තුළු අනුව''යි කියා අන්නවා බන්දවා පිටකර ගෙන නෙරපූහ. එවිට මුත්තිය කුමාරයෝ "සෙනවිරදුන්ගෙන් සංග්‍රහ ලදිමි. රජ්ජුරුවෝ කුමක් කෙරෙද්දෝ හෝයි, එයිත් පරීක්‍ෂා කරමි'' සිතා රජගෙට ගොස් රජ්ජුරුවන්ට කියා යවිය. එවිට රජ්ජුරුවෝ සිංහාසනයෙන් උන්නාහු මුත්තිය කුමාරයන් ආ නියාව අසා ගොස් මුත්තිය කුමාරයන් සිපගෙන "යහළු කිමෙක්ද? මාගේ දෙමව්පියෝ නොයෙද්ද?'' විචාළාහ. "තමා කී පවතුත් නොයෙම්මැ''යි කී පවතුත් රජ්ජුරුවන්ට කීයේය. සාබා සෙනෙවිරද්දු "මුත්තිය කුමාර තමාට කළ දෙය රජ්ජුරුවන්ට කියා බිඳවාපු නම් නපුරැ''යි සිතා "තමා කළ දෙය මා කෙරේ භයින් දැක්ක දී කිය නොහෙන්නේ වේදැ''යි සිතා මුත්තිය කුමාරයන්ට පස්සේ ආයේය. මුත්තිය කුමාර රජ්ජුරුවන් දුටු ගමනේ "රජ්ජුරුවන් වහන්ස, නුඹවහන්සේත් රාජ්‍යය ලද්දේ මා නිසාය. සාබා සෙනෙවිරදුන් සෙනෙවිරත් ධූරය ලද්දේත් මා නිසාය. එසේ හෙයින් සාබා සෙනෙවිරදුන්ගේ ගෙට ගොස් ගමන් විඩාව සන්හිඳුවා ගණිමි

සිතා ගියෙමි. මට නොකී නොකළ ගහටයෙක් නැත, නුඹවහන්සේට කියා කළෝද නොකියා කළෝදැ"යි කියේය.

රජ්ජුරුවෝ කියන්නාහු "උන් මට කීයේ නැත. මා ලත් රාජ්‍යය තොප සන්තකය. තොප නිසාය මා රාජ්‍යය ලද්දේය"යි කියා "මම මෙසේ වූ අමැදහත්කම් කරම්දැ"යි කියා රජ්ජුරුවෝ කියන්නාහු "එම්බල මුත්තිය කුමාරයෙනි, අසත්පුරුෂයාගේ ගුණ නම් බැදපු බිත්තරයක් සේය. බැදපු බිත්තර වපුට සස්‍ය ඵල දෙයක් දැක්ක නොහැකිද? එමෙන් දුර්ජනයාට කෙතෙක් සත්පුරුෂකම් කලත් ඒ අසත්පුරුෂම වන්නේය. සත්පුරුෂයෝ නම් යහපත් බිජුවක් සාර භූමියක වපුළ කල යහපත් සස්‍ය ඵල ලබන්නා සේ සත්පුරුෂයාට කළ උපකාර මහත් ඉෂ්ට විපාක දෙන්නේය"යි කියා රජ්ජුරුවෝ වට සිටි අමාත්‍යයන්ට කියන්නාහු "අමාත්‍යයෙනි, මා රාජ්‍යය ලද්දේත් උන් නිසාය, සාබා සෙනෙවිරදුන් සෙනවිරත් ධූරය ලද්දේත් උන් නිසාය, එසේ වූ තැනැත්තන් මුන් ගෙට ගිය ගමනේ බොහෝ සංග්‍රහකොට උපස්ථාන කළමනා තැන මුන්ට නොකී නොකළ ගහටයක් නැත්ල, මෙසේ වූ අමැදහත් කෙළෙහි උපකාර නොදන්නා තෙනැත්තහු මෙතන සිටින මා අභිප්‍රාය නැත. තුළුැ ගෙනගොස් අඩයටි තෝමරාදීයෙන් ඇන මරා පියව"යි කියා "මුත්තිය කුමාරයෙනි, තොපි සෙනවිරත් ධූරය කරව"යි කීහ.

එවිට මුත්තිය කුමාර "රජ්ජුරුවන් වහන්සේ, මා නිසා සෙනෙවිරදුන් ජීවිතක්ෂයට පමුණා සෙනවිරත් ධූරයෙනුත්

පිරිහෙන්නේය"යි සිතා "මා නිසා මුන්ගේ ජීවිතයටත් අර්ථයටත් විනාශයක් නොපැමිණේවයි, රජ්ජුරුවන් වහන්සේ ඒ කවරේද, වරදක් කළා යයි මුන් ජීවිතක්‍ෂයටම පැමිණි වූ කල ඉදිරියේ මුන් ලවා කරවා ගතමනා කටයුත්තක් පෙණුනු විට මුන් උපදවාගත හැකිද? මූ බිනුයේ මට වේද, නුඹවහන්සේ ක්‍ෂමා කළ මැනවැ"යි කී හෙයින් "එසේ වීනම් ජීවිතදානය දුනුම්හ. උන්ගේ සෙනෙවිරත් ධූරය තෙපි කරව"යි කීහ. එවිට මුත්තිය කුමාරයෝ "ස්වාමීනි, මූ කටයුතු කිරීමෙහි දක්‍ෂයෝය. සෙනවිරත් ධූරයෙහිම සිටිත්ව"යි කියා ස්ථානාන්තරයෙන් නොපිරිහෙණ ලෙසට සැලැස් වූහ. එවිට රජ්ජුරුවෝ "මුත්තිය කුමාරයෙනි, තොපි එසේ වීනම් සේනාවට පඩිප්‍රසාද දීමෙන් නායකත්වය ඇති භාණ්ඩගාර නායක කම් කරව"යි කියා භාණ්ඩාගාරික නායක කමට මුත්තිය කුමාරයන් සැලැස්වූහ. එතැන් පටන් භාණ්ඩාගාර නායක කම් ඇති විය.

මුත්තිය කුමාරයන්ට ගෙවල් දෙරවල් හා අඹුදරුවන් ඇතිවී මහත් විභවයකට පැමිණ තමන් දරුවන් ට අවවාද කියන්නාහු "දරුවෙනි, යහපත උවත් නපුර උවත් නිග්‍රෝධ රජ්ජුරුවන්ට සේවයකොට ඉඳිතොත් විනා සාඛා සෙනෙවිරදුන් හා භජනය නොකරව, සාඛා සෙනෙවිරදුන් ගෙන් කෙතරම් යසස් ලබන්නා බලාත් නිග්‍රෝධ රජ්ජුරුවන්ගෙන් ආඥා විඳ මියයාම උත්තමය, සාඛා සෙනෙවිරදු අසත්පුරුෂයෝය, උන් හා භජනය නොකර නිග්‍රෝධ රජ්ජුරුවන්ටම සේවය කරව"යි තමන්ගේ දරුවන්ට අවවාද කියා තුන්දෙන කම් වූ පරිද්දෙන්

මිය පරලොව ගියහයි වදාරා මේ 'නිග්‍රෝධ ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි සාඛා සෙනෙවිරදු නම් දේවදත්ත ස්ථවිරය. මුත්තිය කුමාරයෝ නම් ආනන්ද ස්ථවිරයෝය. නිග්‍රෝධ රජ්ජුරුවෝ නම් බුදුවූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 440. තක්කාරි(තක්කළ) ජාතකය

තවද ශාක්‍යකුල ප්‍රසාදනීය වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පිතෘ උපස්ථාන කරන්නා වූ කෙළෙඹි පුත්‍රයෙකු අරභයා මේ ජාතකය දක්වන ලදි.

එක්තරා පුරුෂයෙකුගේ දරුවෝ ඇත්තාහ. ඇමට ම බාල පිරිමි පුතෙක් ඇත්තේය. ඔහුගේ මෑණියනුත් සහෝදර නෑයනුත් මළ ගමනේ පියාට උපස්ථාන කරන්නේය. එකියන පුරුෂයා තමාගේ පුතාට කියන්නේ "එම්බල පුත, තොප ඇමදම දුක් විඳිනට මහා ආයාසය, එසේ හෙයින් තොපට බිරින්දක් ගෙනව"යි කීයේය. පුත්‍රයා කියන්නේ "බිරින්දක් එපාය"යි කීහ. එසේ කීවත් පියා සුදුසු කුලයකින් බිරින්දක් ගෙනවුත් පාවා දුන්නේය. එකියන ස්ත්‍රීත් තමාගේ මයිලාට කැවිලි, පෙවිලි සැප සේ සලස්වා වාසය කෙරෙයි.

පුරුෂයාත් තමාගේ බිරින්ද තමාගේ පියාට කැවිලි ආදී වූ දෙයින් අඩුවෙක් නොකරන හෙයින් මධුර රසයක්

ගෙනාවත් තමාගේ බිරින්ද අතට දෙන්නේය. ස්ත්‍රීත් තමාගේ මයිලාට උණුපැන්, සිහිල්පැන්, කැවිලි, පෙවිලි ආදී වූ දෙය අඩුවක් නොව පිරිමසන්නීය.

කල් යාමකින් මයිලා කෙරේ කලකිරී කැවිලි ආදී වූ දෙයිනුත් අපාසුව කෙළේය. සෙම්, සොටු ආදී වූ දෙයත් ගේ මුළුල්ලේ ලා තමෝ තමාගේ සැමියාට කියන කල "නුඹගේ පියාණන්දෑ ගෙයි මුළුල්ලේ සෙම්, සොටු ලා නරක් කරනදැයි, උන් රඳවාගෙන මා ඇරපියන්න" තමාගේ සැමියාට කියන්නීය. පුරුෂ කියන්නේ "තෝ පලා ගිය නම් අනික් බිරින්දක් ගෙනෙමි. මාගේ පියාණන්දෑ කුමට යවත්දැ?"යි කෝපකොට කීයේය. එසේ කීවත් "මා රඳවාගෙන උන්දෑ ඇරපියන්න, නොහොත් උන්දෑ රඳවාගෙන මා ඇරපියන්නැ"යි තමාගේ සැමියාට කියන්නී, නැවතත් කෝප කළ කල්හි ස්ත්‍රී භයපත් ව පළමු සේ තමාගේ මයිලාට කැවිලි, පෙවිලි ආදියෙන් සැප සේ උපස්ථාන කරන්නීය. පුරුෂතෙම බිරින්දගේ අඬදබරයෙන් සර්වඥයන් වහන්සේ දකින්ට කීප දවසකින් ගොස් දිට.

සර්වඥයන් වහන්සේ එකියන පුරුෂයා දැක "ඇයි පුරුෂය, තා කීප දවසක් නොආයේය?"යි වදාරා වදාළ කල්හි තමාගේ බිරින්ද තමාගේ ගෙන් නාරින්ට කී කථා ප්‍රෘත්තිය කීයේය. සර්වඥයන් වහන්සේ එපවත් අසා වදාරා "එම්බල පුරුෂය, තෝ පළමු ජාතියෙහි තාගේ පියා මරා වල ලා පස් ගසන්ට වන් ගමනේ හත් ඇවිරිද්දෙන් මා කී අවවාද තොප සිත් තිබූ හෙයින් තෝ ගිවිසි පමණක් විනා පළමු ජාතියෙහි මේ

නියාවට වන්නේ වේදැ''යි වදරා "ඒ කෙසේදැ?''යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි එක්තරා ගමෙක පුරුෂයෙක් තමාගේ පියාට වර්ථමාන කථාව මෙන් අත් පා මෙහෙවර කරන්නේයයි දතයුතු. මෙහි වනාහි පිටිසර ගමෙක පියා හා පුතා හා පුතාගේ බිරින්ද හා තුන්දෙන වාසය කරන්නාහු. යෙළි මයිලාට නුරුස්සා තමාගේ ස්වාමියාට කියන්නී "නුඹගේ පියාණන්දෑ මැරුවොත් විනා මා ඉන්නේ නැතැ''යි කීවාය. පුරුෂ කියන්නේ "මිනියක් නිකම් අනාථයේ ගසා මරන්නේ කෙසේදැ?''යි කීයේය. එවිට ස්ත්‍රී කියන්නී "නුඹගේ පියාණන්දෑට නුඹ කියන කල 'පියාණන් වහන්ස, නුඹවහන්සේ පළමු පිටිසර ගමෙක අසවළුන්ට දීපු ණය ඉල්වා ගියෙමි, අපට දෙන්නේ නැතැ'යි කියා නුදුන්නෝය. නුඹවහන්සේ ඇතිව ඉන්දදී දීපු ණය නොලැබෙන කල නුඹවහන්සේ මළ කල තමාම නොලබන්නේ වේදැයි රථයක ලාගෙන 'ඒ ණය ඉල්වාගෙන එන්ට යම්මැ'යි කියා ගොසින් අමුසොහොනක වල සාරා වළ ලා පස්වසා ඔළුව තලා මරාපියා එව''යි කිව.

එකියන කෙළෙඹි පුත්‍රයාගේ සත් ඇවිරිදි පුතෙක් ඇත. ඒ පුත් තමාගේ මව තමාගේ පියාට කියන කථාව අසා "මාගේ පියාණන් වහන්සේ මාගේ මුත්තණුවන් මරන්ට උත්සහ

කරනසේක. උන්වහන්සේ මැරීමෙන් බොහෝ අකුසල් පිරෙයි, ඒ අකුසලය මා වලකන්ට උවමැනවැ''යි සිතා තමාගේ මුත්තණුවන් මරන්ට උත්සහ කරන්නවුන් දැක මුත්තණුවන් වහන්සේ හා එක්ව එදා රෑ වැද හොත්තේය. පසුව ද එකියන පුරුෂ තමාගේ බිරින්ද කී සැටියේ තමා පියා රථයක ලාගෙන යන්ට වන එවිට එකියන පුතා රඳන්ට කීවත් නොරඳා රථයට නැගී තුන්දෙන නික්මුනාහ. අමුසොහොන සමීපයට ගොස් පුතණුවන් හා පියාණන් රථයේ ඉන්ද දී රථයෙන් බැස අමුසොහොනේ සතරැස් වලක් සාරන්ට වන්හ.

එවේලෙහි උන්ගේ පුතණුවෝ රථයෙන් බැස පියාණන් සමීපයට ගොස් "පියාණන් වහන්ස, මෙතන වල සාරන්නේ කවරේටද? මෙතන පෙනෙන්නා වූ කටුඅල වැල්අල ආදී වූ දෙයින් පෙනෙන දෙයක් නැත වල සාරන්නේ කවරේටදැ?''යි විචාළේය. එවිට පුරුෂ කියන්නේ "එම්බල පුත, මපියාණන් වහන්සේ ලෙඩ දුක් අතිවැ ඉතා දුර්වලව ගියසේක. වයෝවෘද්ධ ව ගිය හෙයින් මා පියාණන් වහන්සේට දුක් දෙන්නේ ඇයිදැ?යි සිතා මරා වළලන්ටය''යි කීයේය.

එවිට කුමාර "පියාණන් වහන්ස, නුඹවහන්සේ සිතූ සිතිවිල්ල යාපත් නොවෙ''යි කියා පියාණන් අත තුබූ උදැල්ල ඇරගෙන තුමූත් වලක් සාරන්ට වන්හ. එවිට පියා කුමාරයාගේ විශිෂ්ට වූ කාරණා බල කියන්නේ "ඇයි පුත, තෙපි මේ වල සාරන්නේ කවරකටදැ?''යි විචාසේක. එවිට කුමාරයා කියන්නේ "ඇයි පියාණන් වහන්ස, දරුවෝ

දෙමව්පියන් කොට එන චාරිත්‍ර කරන්ට උවමනා වේද? නුඹවහන්සේගේ පියාණන් මරා වළලන්ට වල සාරණ කල නුඹවහන්සේත් ඔබලත් වූ කල වළලන්දැයි මම වළ සාරා තිබීමි'' කීහ.

එවිට පුරුෂ කුමාරයාට කියන්නේ "ඇයි පුත, මට සුත ප්‍රේමයෙන් වදගත් දරුවෝ වේද, නොකම්කළු වූ බස් කියන්නේ කවරේදැ?''යි විචාළේය. කුමාර කියන්නේ "නුඹවහන්සේ අවලක්‍ෂණයක් නිසා මා කීයේ නොවෙයි, නුඹවහන්සේ මෙලෙස කරන්නා මමත් ඒ ලක්‍ෂණයෙකැයි සිතා කෙළෙමි, නුඹවහන්සේ ඊට ක්‍ෂමා කළ මැනවැයි, පියාණන් වහන්ස, යම් කෙනෙක් දෙමව්පියන්ට නොකළමනා දෙය කෙරෙත් නම් ඉන් වැඩෙක් නැත, අවැඩමය''යි කීයේය. ඒ වේළෙහි කෙළෙඹිපුත්‍ර කියන්නේ "පුත, මා සිතාගෙන කළ දෙයෙක් නොවෙයි, තොපගේ මැණියන් වහන්සේ මට එක්වන් කන්සන් කරන හෙයින් කෙළෙමි, තොප කීයේ ඉතා ඇත්තමය, මෙවක් පටන් මෙසේ වූ දෙයක් නොකෙරෙමි'' කෙළෙඹිපුත්‍ර කියේය.

කුමාර ඒ වේලෙහි තමන්ගේ පියාණන්ට කියන්නේ "පියාණන් වහන්ස, ස්ත්‍රීන් කීවා කිරීමෙන් කටයුතු නොවෙයි, මතු මෙසේ වූ දෙයක් නොකියන්නේ යයි කියා අපගේ මැණියන් වහන්සේ භය ගන්වා කෝපකොට ගෙන් යවාපුව මැනව, මෙසේ වූ නොකටයුත්තක් නොකියනසේකැ''යි කුමාර කීයේය. "යහපතැ''යි කියා තුන් පිතුපියෝ රථයට නැඟී ගෙට

එන්ට වන්නාහ. කෙළෙඹිපුත්‍රයාගේ අඹු "මාගේ ගෙන් අද කාලකණ්නියා පහව ගියේය"යි මහා සමාධියෙන් ගෙයි ගොම පැන් සඳුන් ඉස තුමුත් පිරිසිදු ව කිරිබත් ආදි වූ දෙය පිසමින් සිටි කලට තුන් පිතුපියන් දුර එන්නාවුන් දැක මහා කණස්සළුව "මාගෙන් පහව ගිය කාලකණ්නියා දෙවෙනිව එන නියාවේදැ"යි සෝකයෙන් සිටියාහ. තුන් පිතුපියෝ රථයෙන් බැස පියාණන් හා පුතණුවන් ගෙට යවා රථයේ බැඳි ගොන් ගෙන උනා රථය එතන තිබා පුරුෂයා ගෙට ආයේය. ස්ත්‍රී පුරුෂයා දැක "මාගෙන් පහව ගිය කාලකණ්නියා ගෙනායේ ඇයිදැ?"යි කියා "මම ගෙන් යමි" කියා ස්ත්‍රී කලහ කළාහ. පුරුෂ කියන්නේ "දුෂ්ට කාලකණ්නිය, තී කීවද මා පියාණන් කෙසේ මරාපියමිදැ?"යි කියා ස්ත්‍රීගේ ඉසකේ පත අල්වාගෙන බිම හෙලා අතින් පයින් තළා, මාගෙන් පළා යව"යි කියා ගෙන් යවා තුන් පිතුපියෝ ගෙයි පිස තුබූ කිරිබත්, සුදුබත් ආදි වූ දෙය ලාගෙන කාලා උන්නාහ. ස්ත්‍රී ඉවත ගෙයක උන්නීය. කුමාර තමා පියාට කියන්නේ "පියාණන් වහන්ස, මාගේ මෑණියෝ මුත්මුනේ නැත, උන්වහන්සේ ඉක්මෙන්නේ නුඹවහන්සේ කියන කල 'තී මට ඇයිද, මාගේ මයිලණු කෙනෙකුන්ගේ දියණී කෙනෙක් ඇත. උන් ගෙනෙන්ට එමිය' කියා පිරිවර ගොස් ඉඳපියා අවමැනව, එවිට මාගේ මෑණියන් වහන්සේ ඉක්මෙනසේකැ"යි කීහ.

පුරුෂයාත් "යහපතැ"යි කියා ඒ කී නියාවට "තී මට එපයි, මාගේ මයිලණුවන්ගේ දියණියන් ගෙනෙමි" කියා නික්මුණේය. අසල ගෙවල ඇත්තෝ ඒ ස්ත්‍රීට කියන්නේ

"එම්බල ස්ත්‍රිය, තීගේ සැමි තී ඇර අනික් බිරින්දක් ගෙනෙන්ට ගමට ගියේය. තී පිසවාගෙන නොකන්නේය"යි කී ගමනේ ස්ත්‍රී මහත් වූ සෝකයට පැමිණ "අනික් මට පිහිටක් නැත. කුමක් කෙරෙම් දෝ හෝ"යි සිතා ගෙට අවුත් පුතණුවන් පයවැටී අඬා "පුතණුවෙනි, තොපගේ පියාණෝ මා ඇර අනික් 'බිරින්දක් ගෙනෙමි' කියා ගියේය. මා කළ වැරුද්දෙක්දැ?"යි කිව කුමාර කියන්නේ "මෑණියන් වහන්ස, මෙවක් පටන් නුඹවහන්සේගේ මයිලණුවන් වහන්සේට අමෛත්‍රී නොසිතා උන්ගේ සුවදුක් විචාරව, මපියාණන් වහන්සේට කියා ගෙන්වා ගනිමි" කියා යවා ගෙට පියාණන් එන්නා දැක කුමාර කියන්නේ "පියාණන් වහන්ස, මෑණියන් වහන්සේ ඉක්ම ගියසේක. උන්වහන්සේ ගෙට ගෙන්වාගත මැනව"යි කීයේය. කෙළෙඹිපුත්‍ර "යහපතැ"යි තමාගේ බිරින්ද ගෙට ගෙනායේය. එකියන ස්ත්‍රී තමාගේ මයිලණුවන් හා ස්වාමිපුත්‍රයා වැඳ "මම ගිය දවස නොදැන අපරාදයක් කෙළෙමි. ඊට ක්‍ෂමා කළ මැනවැ"යි කියා වැඳ ක්‍ෂමා කරවාගෙන එතැන් පටන් ස්වාමිපුත්‍රයාටත් මයිලණුවන්ටත් දෟගැබට පූජා සත්කාර කරන්නාක් මෙන් අඩුවක් නොකොට පෝෂ්‍යය කෙළේයයි වදුරා මේ 'තක්කාරි ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි පුරුෂයා නම් දැන් මේ පුරුෂයාය. එසමයෙහි ස්ත්‍රී නම් දැන් මේ ස්ත්‍රිය. එසමයෙහි අවවාද කී කුමාර නම් බුදුවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ වදාළසේක.

# 441. මහා ධර්මපාල ජාතකය

තවද ශාක්‍යකුලාලෝක වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ කිඹුල්වත්පුර නුවර නිග්‍රොධාරාමයෙහි වැඩවසන සමයෙහි සුද්ධෝදන රජ්ජුරුවෝ අදහා නොගත් දෙයක් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

සර්වඥයන් වහන්සේ විසි දහසක් රහතන් වහන්සේ පිරිවරා වීථියෙහි සිඟා වඩනා ගමනේ සුද්ධෝදන රජ්ජුරුවෝ අසා සර්වඥයන් වහන්සේත් විසි දහසක් රහතන් වහන්සේත් පවරා රජගෙට ගෙන ගොසින් කැඳ වළඳවා ඉක්බිති වූ ගමනේ බත් වළඳන තුරු සර්වඥයන් වහන්සේ හා සුද්ධෝදන රජ්ජුරුවෝ කථා කරමින් උන්නාහු "ස්වාමීනි, නුඹවහන්සේ දුෂ්කරක්‍රියා පුරණ අවස්ථාවෙහි එක් දවසක් දවල් මා වැදහෙව නිදන ලද දේවතා දුවක් ඇවිත් මට කියන්නී 'සිද්ධාර්ථ කුමාරයෝ දුෂ්කරක්‍රියා භූමියෙහි මළෝය'යි අවුත් මට කිව, එවිට මම 'සිද්ධාර්ථ කුමාරයෝ බුදු ව කාලක්‍රියා කළෝද? නුබුදු ව කාලක්‍රියා කළෝදැ?'යි විචාළෙමි. 'නුබුදු ව කාලක්‍රියා කළෝය'යි දේවතා දුව කී නියාව අසා එසේ වීනම් බුදුව විනා කාලක්‍රියා නොකෙරති අදහා නොගත්තෙමි"යි රජ්ජුරුවෝ කීහ. සර්වඥයන් වහන්සේ වදාරණසේක් "රජ්ජුරුවෙනි, මේ ජාතියේ තබා පළමු ධර්මපාල ජාතකයෙහි දිසාපාමොක් ආචාරීන් සමීපයට ශාස්ත්‍ර උගන්ට ගිය ගමනේ 'මා මළැ'යි කියා එළු ඇටයක් ගෙනැවිත් දිසාපාමොක්

ආචාරීන් තොපට පෘ ගමනේ දක්වා අදහා නොගත්තෝ වේදැ''යි වදරා ''ඒ කෙසේදැ?''යි සුද්ධෝදන මහරජ්ජුරුවන් විසින් ආරාධිත සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි ධර්‍මපාල නම් ගමෙක ධර්‍මපාල නම් බ්‍රාහ්මණයෙක් ඇත. ඒ ගමට ධර්‍මපාල නාමය කෙසේවීද? යත්, ඒ ගම ඉඳිනා ධර්‍මපාල නම් බ්‍රාහ්මණයා පටන් උන්ගේ නෑදැයන්ද ගෙයි වහල් ඇතුළු වූ අය පටන්වම පොහොයෙන් පොහොයට අටසිල්ද දවස්පතා පඤ්චශීලයද රකිමින් දස පින් කිරියවත්ද කරන්නාහ. එසේ හෙයින් ඒ කියන ගමටත් බ්‍රාහ්මණ කුලයටත් නම ධර්‍මපාල යයි සැලසින.

එසමයෙහි බෝධිසත්ත්වයෝ එකියන ධර්‍මපාලයාණන් බිරින්දගේ කුස පිළිසිඳ ඉපද වැඩිවිය පැමිණියාහ. වැඩිමාළු ධර්‍මපාල බ්‍රාහ්මණයෝ තමන්ගේ පුතණුවන් ධර්මපාල කුමාරයන්ට ශාස්ත්‍ර උගන්වන්ට දිසාපාමොක් ආචාරීන් සමීපයට යවන්නාහු මසුරන් දහසක් දී යවූහ. එකියන ධර්‍මපාල කුමාර තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරීන් සමීපයට ගොස් මසුරන් දහස දීලා ශිල්ප උගන්නා කැමැත්තෝ පන්සියයක් අතවැස්සෝ තුමූට ආචාරීවන නියාවට ශාස්ත්‍ර උගන්නාහ. එසමයෙහි දිසාපාමොක් ආචාරීන්ගේ පුතණු කෙනෙකුන් මළහ. උන් මළ සෝකයෙන් දිසාපාමොක්

ආචාරීන් හා පන්සියයක් අතවැස්සන් ආදී වූ අය අඬා ආදාහනකොට අතවැස්සෝ කථාකොට උන්නාහු "ආචාරීන් වහන්සේගේ බාලතරුණ වූ පුත්‍රයා මළේය"යි කියා උන් තෙනට ධර්මපාල කුමාරයෝ අවුත් කියන්නාහු "බාල මනුෂ්‍යයෝත් මියෙත්ද? ඒ කෙසේ වූ දෙයෙක්දැ?"යි කීයේය. එවිට සෙසු කුමාරයෝ කියන්නාහු "ඇයි ධර්මපාල කුමාරයෙනි, මරණයට බාල යයි වැඩිමාළු යයි නොපැමිණේද? මරණ තමා කරා එන නියාව නොදනීදැ?"යි කියා ධර්මපාල කුමාරයෝ කියන්නාහු "මරණ පැමිණෙන නියාව දනිමි, මේ බාල අවස්ථාවෙහි අපගෙන් මියන්නෝ නැතැ"යි කීහ. මේ නියාව අතවැසි පන්සියය දිසාපාමොක් ආචාරීන්ට කීහ.

දිසාපාමොක් ආචාරීන් එපවත් අසා ධර්මපාල කුමාරයන් ගෙන්වා "සැබෑද? තොපගේ වර්ගයේ මාළු ව විනා බාල අවස්ථාවෙහි මියෙන්නෝ නැත්තේදැ?"යි විචාළේය. එවිට ධර්මපාල කුමාර කියන්නාහු "එසේය, ආචාරීන් වහන්ස, අපගේ වර්ගයේ මාළු ව විනා බාල අවස්ථාවෙහි නොමියති" කී කල්හි "ඒසේ වීනම් ඒ පරීක්ෂා කරන්ට උවමැනවැ"යි සිතා දිසාපාමොක් ආචාරී මළා වූ එළුවකුගේ ඇටයක් සෝධා අතවැස්ස අත පසුම්බිව ලා ධර්මපාල බ්‍රාහ්මණයාණන්ගේ ගමට ගොස් "වැඩිමාළු බ්‍රාහ්මණයාණන්ගේ ගෙය කොයිදැ?"යි විචාරා ගෙට අවුත් ආචාරීන්ට ඉඳින්ට අසුන් පණවා හිඳ කථා කොට කොට උන්නාහ. ඒ වේලෙහි දිසාපාමොක් ආචාරී ධර්මපාල බ්‍රහ්මණයන්ට කියන්නාහු "තොපගේ පුතණුවෝ යහපත්ව ශාස්ත්‍රය හා ත්‍රිවේදයත් ඉගෙන උන් අවස්ථාවට

එක්තරා ව්‍යාධියකින් මළාහ"යි කීහ. එවිට වැඩිමාළු ධර්මපාල බ්‍රාහ්මණයාණෝ අතින් අත පැහැර සිනා සී කියන්නාහු "අපගේ දරුවෝත් බාල අවස්ථාවේ මියෙද්ද? ඒ කෙසේ වූ දෙයක්දැ?"යි කීහ.

දිසාපාමොක් ආචාරී දෙවෙනිව "ධර්මපාලයෙනි, තොපි මා කීවා අදහා නොගනුද? මේ තොපගේ පුතණුවන්ගේ ඇට නොවේද? මේ දැකත් අදහා නොගනුදැ?"යි කීහ. එවිට ධර්මපාල බ්‍රාහ්මණයෝ කියන්නාහු "මේ එළුවකුගේ ඇට හෝ බල්ලෙකුගේ ඇට හෝ වේද, අපගේ දරුවෝත් මියෙත්දැ?"යි ධර්මපාලයන් හා උන්ගේ නෑයන් හා ගෙයි වාල් ආදී හැම සිනාසුනාහ.

එවිට දිසාපාමොක් ආචාරීන් "තොපගේ දරුවන්, නෑයන් බාල අවස්ථාවෙහි නොමියන්ට කාරණා කවරේදැ?"යි විචාරන්නාහු "කුමන උපායෙක්ද? කුමන බ්‍රහ්මචර්යාවෙක්ද? කුමන කාරණයක් නිසාද? බ්‍රහ්මණය, තොපගේ දරුවන් නොමියෙන්නේය"යි විචාළේය. ඊට කාරණා කියන ධර්මපාල බ්‍රහ්මණයෝ කියන්නාහු "දස කුශලධර්ම කරම්හ. කෙළි පිණිසත් බොරු නොකියම්හ. දස අකුශල පථයන් නොකරම්හ. එක් කෙනෙකුන් නපුරැයි කියන දෙයකුත් නොකරම්හ. එසේ හෙයින් අපගේ වංශයෙහි බාල අවස්ථාවෙහි නොමියන්නාහ. තවද අපි දන් දෙන අවස්ථාවෙහිත් සන්තෝෂ වම්හ. දන් දෙමින් සිටත් සන්තෝෂ වම්හ. දන් දී ඉක්බිති සන්තෝෂ වම්හ. දන් දී පශ්චාත්තාපයට නොපැමිණෙන හෙයින් අපගේ වංශයෙහි

නොමියන්නාහ. තවද ශ්‍රමණ බ්‍රාහ්මණයන් කෙරෙහිද, වන්දිභට්ටයන් කෙරෙහිද, දුගී මගී යාචකයන් කෙරෙහිද, සමසිතින් දන් දෙම්හ. එසේ හෙයින් අපගේ වංශයෙහි බාල අවස්ථාවෙහි නොමියන්නාහ. තවද අපගේ බිරින්ද හැර ඔබ්බේ ස්ත්‍රියකට ආලය නොකරම්හ. අපගේ බිරින්දත් ඔබ්බේ පුරුෂ කෙනෙකුන් කෙරෙහි ආලය නොකරන්නාහ. අපි වනාහි ඔබ්බේ ස්ත්‍රීන්ට බඹවස් රකිනා සරියම්හ. ඔබ්බේ ස්ත්‍රී අපට මවුන් හා සරියෝය. එසේ හෙයින් අපගේ වංශයෙහි බාල අවස්ථාවෙහි නොමියන්නාහ. තවද එසේ වූ ස්ත්‍රීන්ගේ බසින් වැදූ දරුවෝත් නුවණින් ප්‍රාප්තව ත්‍රිවේදයෙහි නිපුණ වන්නාහ. එසේ හෙයින් අපගේ වංශය බාල අවස්ථාවෙහි නොමියෙන්නාහ. තවද අපගේ මව්පිය, නෑදි මයිලන්, බෑ, බුන්, දූ දරු යනාදී සියල්ලෝම ධර්‍මයෙහිම පරලොවට බා හැසිරී වාසය කරම්හ. එසේ හෙයින් අපගේ වංශයෙහි බාල අවස්ථාවෙහි නොමියන්නාහ. තවද අපගේ සේවකයෝද, බැලමෙහෙ කරන්නෝද, කුලියට මෙහෙ කරන්නෝද යනාදී සියල්ලෝම පරලොව අදහා ධර්‍මයෙහි හැසිර වාසය කරන්නාහ. එසේ හෙයින් අපගේ වංශයෙහි බාල අවස්ථාවෙහි නොමියන්නාහ". තවද බ්‍රාහ්මණයා කියන්නේ ධර්‍මය රකිනා තැනැත්තවුන් ධර්‍මය පෙරලා රකිනේමය. ඊට කාරණා කෙසේද? යත්, මහත් වරුෂාවට ඡත්‍රයක් සේය. ඔහුට ප්‍රතිෂ්ඨා වේද එමෙන් ප්‍රතිෂ්ඨා වෙයි. එසේ හෙයින් මාගේ පුත් වූ ධර්‍මපාල කුමාරයෝත් ධර්‍මයෙහි පිහිටියාව. එසේ හෙයින් මේ ඇටය අනික් කෙනෙකුන්ගේ ඇටයක, මාගේ

දරුවෝ සැපසේ උන්නාහ. මේ අපගේ චාරිත්‍රය සම්බුද්ධ පරමාර්ථයෙන් ආයේය"යි කීයේය.

එවිට දිසාපාමොක් ආචාරීන් "ආ ගමනේ ලාභ ලදිමි" සිතා "තොපගේ පුත්හු සැප සේ උන්නාහ. මම තොප විමසන පිණිස එළු ඇටය ගෙනායේය. ඊට ක්ෂමා කරව"යි කියා ක්ෂමා කරවාගෙන "මේ තොප දවස් අරණා සැලැස්ම" පත ලියවාගෙන එතන කීප දවසක් රඳා දිසාපාමොක් ආචාරී තමන් වසන තක්සලා නුවරට ගොස් ධර්මපාල කුමාරයන් නොනිමි අකුරු කරවා මහත් වූ පෙරහරින් උන්ගේ නුවරට එව්වාහයි වදාරා මේ 'මහා ධර්මපාල ජාතකය' දක්වා චතුස්සත්‍ය ප්‍රකාශකොට වදාළසේක.

තවද අර්ථය දක්වන සර්වඥයන් වහන්සේ වදාරණසේක් "මහරජ, යම් කෙනෙක් ධර්මය රකිත්ද? ඒ ධර්මය පෙරලා උන් දෙලොවම රකිනේම ය. මේ ධර්මය අනිසංසයම මළ කලත් දුගතියට නොගොසින් සුගතියට යන්නාහ". මේ ධර්මය අවසානයෙහි සුද්ධෝදන රජ්ජුරුවෝ අනාගාමී ඵලයෙහි පිහිටිසේක.

"එසමයෙහි ධර්මපාල කුමාරයන්ගේ දෙමව්පියෝ දෙන්නා නම් මේ සමයෙහි සුද්ධෝදන රජ්ජුරුවන් හා මහාමායා දේවිය. එසමයෙහි දිසාපාමොක් ආචාරී නම් දැන් ශාරිපුත්‍ර ස්ථවිරය. පන්සියයක් අතවැස්සෝ නම් දැන් මේ බුදුපිරිසය. එසමයෙහි ධර්මපාල කුමාරයෝ නම් බුදුවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 442. කුක්කුහ(කුක්කුට) ජාතකය

තවද විරාජමාන වූ සර්‍වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි වධයට උත්සාහයක් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

එක් දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස් වූ මාළුවරුන් වහන්සේ "දේවදත්ත ස්ථවිරයන් වහන්සේ තමන්ට බැරි වුවත් සර්‍වඥයන් වහන්සේ නසන්ට ම උත්සහ කෙරෙති" කිය කියා වැඩඋන් තෙනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා එපවත් අසා "මහණෙනි, දැන්මතු නොවෙයි, පෙරත් මා දේවදත්ත ස්ථවිරයෝ නසන්නට උත්සහකොට නසාගත නුහුනුවෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස කොසඹෑ රට කොසම්බිය නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්‍වයෝ ඇටිකුකුල් ව ඉපද බොහෝ ඇටිකුකුළන් පිරිවරා හුන වනයක වාසය කරන්නාහ.

ඒ වනාන්තරයට නුදුරු ස්ථානයක උකුස්සෙක් වාසය කරන්නේය. ඒ උකුසු බෝධිසත්ත්‍වයන් ලඟ උන් ඇටිකුකුළන් දවස එකෙකු බැගින් නිමවා බෝධිසත්ත්‍වයන් පමණක් තනි

වූහ. බෝධිසත්ත්වයන් නසාගත නොහී “මිත්‍ර ව නසා ගනිමි” සිතා උකුසු එක් දවසක් බෝධිසත්ත්වයන් සමීපයට ගොස් කථා කරන්නාහු “සබඳ, තොප හා මිත්‍රව ඉන්ට උවමැනව, එසේ හෙයින් අසවල් වනාන්තරයේ නොයෙක් මධුර වූ පලාඵල ඇත්තේය. එතනට ගොසින් තොපි පලාඵල අනුභව කරව”යි කියේය. ඇටිකුකුල් කියන්නේ “සබඳ, තොප හා මා හා කෙසේද විස්වාසය කරන්නේ? තොප විසින් මාගේ බොහෝ ඇටිකුකුළන් කා මා තනිකොට හිඳ දැන්ද? තොප මිත්‍ර වන්නේය”යි ඇටිකුකුල් කියේය. එවිට උකුසු කියන්නේ “සැබැව, තොපගේ ඇටිකුකුළන් නසන ලදැයි තොප මා කෙරේ සාංකා විය යුතුය. එසේ වුවත් මෙතැන් පටන් සංකා නොකරවයි මිත්‍ර වන්නේය”යි ඇවිත් කීහ.

බෝධිසත්ත්වයෝ “මා තොප කෙරෙහි වාසය කරන්නාට සැක ඇත්තෙමි” කියා වනාන්තරයෙහි සියළු දේවතාවන් සන්තෝෂ කරවා බෝධිසත්ත්වයෝ බුද්ධලීලායෙන් කියන්නාහු “පළමුකොට කරනලද බොහෝ අකුශල් ඇති පුද්ගලයා කෙරෙහි සත්පුරුෂයන් විසින් විස්වාස නොකොට තමා පිණිස ප්‍රඥා සෙනෙහයෙන් මිස භජනය නොකරේද, යමක් කැමතිව භජනය කෙරේද, එසේ වූ ධානර්ථ සත්ත්වයන් කෙරෙහිත් විශ්වාස නොකොට යුත්තේය. යම් සත්ත්වයෙක් ඇතුලෙන් සාන්ත දන්ත ගුණයෙක් නැතිව තිබැද්දී පිටතින් සන්සුන් ගුණය දැක් වීමෙන් සාන්ත ස්වරූපයට ඇත්තේද එබඳු සැග උනා වූ ක්‍රියා ඇති තුඹසින් වැසි නොපෙන්නා වූ සර්පයින් හා සමාන කුහක වූ පාප පුද්ගලයා තමා කෙරෙහිත් විශ්වාස

නොකට යුත්තේය. යම් සේ පාපවාසීන් වූ ගෙරි තොටට බැස මුබය පුරා පැන් බී ස්නානයකොට සන්තර්පප වෙද්ද, ස්නාන පානයට සුදුසු වූ ජලය පිහිටුවා වැව් පොකුණු ආදිය බැඳිම් වශයෙන් ඊට කලමනා කිසි කර්මාන්තයක් නොකෙරේද, එපරිද්දෙන්ම මේ ලෝකයෙහි සමහර කෙනෙක් 'තොපට මෙසේ වූ යහපතක් කරම්හ'යි මධුර වූ වචනයෙන් මුත්‍රයන් අනුභව කරන්නාහු මෙන් හඳුරන්නාහ. ප්‍රිය වචනයට සුදුසු කාරිය නොකරන්නාහ. එබඳු වූ කටින් එකක් කියා, සිතින් එකක් සිතන්නා වූ අවස්ථාවාදිත්‍වාකාරී නොවන්නා වූ පුද්ගලයා කෙරෙහිත් විශ්වාස නොකොට යුත්තේය. ඉදින් විශ්වාස කළොත් මහත් වූ අවැඩට පැමිණෙන්නේය".

"යම් සත්ත්‍ව කෙනෙක් බද්ධාංජලීව දෙහොත් මුදුනෙහි තබාගෙන 'ස්වාමීනි, නුඹවහන්සේට මෙනම් මෙනම් දෙයක් දෙම්හ. කරම්හ'යි කියා ළසින්ම වෙලාගෙන සිස් වූ දෙහොත් මුදුනේ තිබීම පමණකින්ම සිත් ගනිද්ද, එබඳු නිස්සාර වූ පිරඹක් හා සමාන වූ පුද්ගලයන් කරා පැමිණ විශ්වාස නොකොට යුත්තේය. යම් පුද්ගලයෙක් කෙළෙහිගුණ දැන්මෙක් නැත්නම් එබඳු වූ අකෘතඥ වූ පුරුෂයන් කෙරෙහිත් භජනය පර්යුපාසනය නොකොට යුත්තේය. යම් සත්ත්‍ව කෙනෙක් අනේකප්‍රකාර වූ ලඝු චිත්ත ඇති කාර්යමාර්ගයෙක නොපවතිත් ද එබඳු වූ පුරුෂයන් කෙරෙහි විශ්වාස නොකොට යුත්තේය. යම් සත්ත්‍ව කෙනෙක් 'මොහු හා එක් නොවී විනාශයක් යොදන්ට නොපිළිවනැ'යි සිතා අන්තරාය කරන පිණිස නොයෙක් කාරණයෙන් සංසගී නොවී විශ්වාස

තරව ගිය ගිය කල්හි, ඉතිකින් මේ මාර්ගය අත් නොහරනේ යයි සිතට දැනී ගිය කල්හි පසුව ඔහු නසන්ට උත්සහකොට ජීවිතාන්තරය කෙරේද, එබඳු පුද්ගලයා කෙරෙහිත් විශ්වාසය නොකොට යුත්තේය. තවද යම් සත්ත්ව කෙනෙක් අනාචාර වූ පාප පුද්ගලයන්ගේ ක්‍රියාව කෙරෙමින් ප්‍රාණඝාතාදී වූ අකුශල ධර්මයන් කෙරේද, අස්ථිර වූ බස් ඇත්තේද, අවසරයක් ලදින් සියල්ලවුන් විසින්ම නසන්ට සිතාද, කොපුවෙන් හෝ රෙද්දකින් හෝ වසා තබන ලද තියුණු වූ මුවහත් ඇති කඩුවක් මෙන් තමාගේ ඇති පුරුදු ගුණය සඟවාද, එබඳු අමිත්‍ර ප්‍රතිරූපක වූ පුද්ගලයා කෙරෙහිත් විශ්වාසය නොකට යුත්යේ. තවද යම් සත්ත්ව කෙනෙක් මටසිළුටු වූ ප්‍රිය වචනයෙන් යුක්ත වේද, තවද පරුෂද, අනේකප්‍රකාර වූ උපායෙන් තමාට යහළු වූ පුද්ගලයාට අන්ර්ථය කරන්ට අවසරයක් බලා ඇවිද්ද, එබඳු වූ අමිත්‍රයක්හු හා සමාන පුද්ගලයා කෙරෙහි විශ්වාස නොකොට හැක්කේය".

"තවද යම් සත්ත්ව කෙනෙක් අනුභව කරන්ට නිසි වූ ආහාරපාණ වර්ගයක් හෝ අවශේෂ වූ ඇඳ, පුටු, කොට්ට, මවුලා ආදී වූ වස්තුවක් හෝ තමාගේ යහළුවා ගෙයි යම් තැනක තිබුයේ වීනම් එහි ලෝභයකොට ඒ වස්තුව සොරා ඇරගනීද, අවසරයක් පෙණී ගියේ වීනම් තමාට යහළු ව සිටි පුද්ගලයාත් නසාපියා යේද, එබඳු වූ සත්ත්වයා කෙරෙහිත් විශ්වාසය නොකොට යුත්තේය".

තවද ඒ අර්ථය දක්වන්නා වූ සර්‍වඥයන් වහන්සේ වදාරණසේක් “එම්බා මහණෙනි, යම් සත්ත්‍ව කෙනෙක් තමන්ගේ සිත නුගුණ හඟවා ගුණ ප්‍රකාශකොට සත්ත්‍වයන් භජනය පර්යුපාසනය කෙරෙති, එබඳු අසත්පුරුෂයන් ඇටිකුකුළා උකුස්සා දුරුකළාක් මෙන් නුවණැත්තා වූ සත්ත්‍ව තෙමේද දුරින් දුරුකරන්නේය. යම් සත්ත්‍වයෙක් තමාට උපන්නා වූ අනර්ථය අවැඩක් වහා දැනගත නොහෙන්නේ වීනම් ඒ සත්ත්‍වතෙමේ සතුරන්ගේ වසඟයට පැමිණෙන්නේය, නැවත පශ්චාත්තාපයටත් පැමිණෙන්නේය. යම් සත්ත්‍වයෙක් තමාට උපන්නා වූ වැඩට නිසි අභිවෘද්ධි කාරණයක් වහා දැන ගණීද, ඒ සත්ත්‍වතෙමේ උකුස්සාගෙන් ගැළවුනා වූ ඇටිකුකුළා මෙන් සතුරන්ගෙන් වන පීඩාවෙන් ගැලවෙන්නේය. තවද වනයෙහි මුවන් බඳන පිණිස අටවන ලද මලක් වැනි වූ අනවරතයෙන් අනුන්ට අවැඩක්ම කියන කරන සුළු වූ අනර්ථකාරී වූ යම් පුද්ගලයෙක් ඇත්නම් එබඳු සත්ත්‍වයා නුවණ නැත්තේය. යම් සේ උන වනයේ වසන්නා වූ ඇටිකුකුළා තමාට ප්‍රතිකෙෂ්ප වූ උකුස්සා දුරින්ම දුරු කෙළේද, එපරිද්දෙන් තමාට සතුරු ව සිටි පුද්ගලයාද දුරින් දුරු කරන්නේය”යි මෙසේ ඒ ඇටිකුකුළා උකුස්සාට ආමන්ත්‍රණයකොට කියන්නේ “යහළු, තෝ ඉදින් මෙතන විසුයෙහි වීනම් තට කළමනා කාරිය දනිමි”යි භයගැන් වූයේය. එබස් අසා උකුස්සාද එතනින් පළා ගොස් අනික් තෙනක වාසය කෙළේයයි ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්‍ම දේශනාව ගෙනහැර දක්වා වදාරා “මහණෙනි,

දේවදත්ත ස්ථවිරයෝ පෙරත් මට වධයට උත්සහ කළෝ වේදැ''යි වදරා මේ 'කුක්කුහ ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි උකුස්සා නම් දැන් මේ දේවදත්ත ස්ථවිරයෝය. එසමයෙහි ඇටිකුකුළු ව උපන්නෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ''යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 443. මට්ටකුණ්ඩලී ජාතකය

තවද සංසාර ප්‍රතිෂ්ඨා වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් පුත්‍රයෙකු මළ සෝකයෙන් ඉන්නා උපාසකයෙකු අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

එක්තරා උපාසකයෙක් තමාගේ පුතෙකු මළ සෝකයෙන් නොකා නොබී විකෂෙප ව "ඇයි පුත, මට නොකියා පලා ගියාදැ?''යි කිය කියා බොහෝ විකෂේපයට පැමිණ ඇදින් නැගී සිටිය නොහී වැදහොත්තාහ. එක් දවසක් අළුයම් වේලෙහි මහාකරුණා සමාපත්තීන් සමවැද ලොව බලා වදරනසේක්, එකියන උපාසකයා සෝවාන් වන්ට නිසි හේතු ඇති නියාව දැක වදරා සැවැත් නුවර සිගා වළඳා පස්වරු භාගයෙහි අනඳ සාමීන් පසු මහණකොට එකියන උසාකයාගේ ගෙට වැඩිසේක. එකියන පුරුෂයාගේ ගෙයි මනුෂ්‍යයෝ සර්‍වඥයන් වහන්සේ වැඩ හිඳිනා ලෙස බුද්ධාසනයක් පණවා

එකියන පුරුෂයා අතපය ඔලොම්බා ගෙනවුත් සර්වඥයන් වහන්සේ ලඟ හෑහ.

සර්වඥයන් වහන්සේ “ඇයි පුරුෂය, තා එක පුතෙකුට ඇඬුයේදැ?”යි වදාළ කල්හි “එසේය ස්වාමීනි, මාගේ ඇත්තේ එක පුත්‍රයාය. එසේ හෙයින් මට කීකරුය. එසේ හෙයින් සෝකයෙන් ඇඬිමි” කියේය. එවිට සර්වඥයන් වහන්සේ “පළමුත් බ්‍රාහ්මණයෙක් තොප සේම පුත්‍ර ප්‍රේමයෙන් අඬා සෝකාතුර ව උන් අවස්ථාවේත් උත්තමයන්ගේ බස් ගිවිස සෝක තුනීකළෝ වේදැ”යි වදරා “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි ඒ නුවර එක්තරා බ්‍රාහ්මණයෙකුගේ පසළොස් අවස්ථාවේහි පුතෙක් මළ තැනැත්තේ දිව්‍ය ලෝකයෙහි උපන එකියන බ්‍රාහ්මණ තමාගේ පුත්‍රයාට සෝකයෙන් අඬ අඬා නොකා නොබී දුක් විඳම දවස්පතා සුසුන භූමියට ගොස් වට තුන් විටක් ඇවිද මහත් වූ දුකින් සොකාතුරව වාසය කරන්නේය. දිව්‍ය ලෝකයෙහි උපන් දිව්‍යපුත්‍ර “මම මාගේ කුශලයෙන් දිව්‍ය ලෝකයෙහි උපනිමි. මාගේ පියාණෝ කෙසේ ඉඳින් දේ හෝ”යි සිතා දිවැසින් බැළයේය. තමාගේ පියාණන් තමන්ට සෝකයෙන් වලපිණා නියාව දැක “තමාගේ පියාණන් සුසාන භූමියට යන්නාට පළමුවෙන් යෙමි” සිතා මට්ටකුණ්ඩලියා මෙන් සැරහී

බ්‍රාහ්මණයන් සුසාන භූමියට එන්නාට පළමුකොට දිව්‍යපුත්‍රයා සැරහී සුසාන භූමියෙහි සිටියේය.

ඒ වේලෙහි එකියන බ්‍රාහ්මණ තමාගේ පුත්‍රයා ගැන අඬ අඬා සුසාන භූමියෙහි ආ තැනැත්තේ තමාගේ පුතා මෙන් සැරහී සිටි මට්ටකුණ්ඩලියා දැක බ්‍රාහ්මණ කියන්නේ "මම වනාහි මාගේ පුත්‍රයාට සෝකයෙන් අඬමි. තොපි වනාහි කවරේද?"යි විචාළේය. එවිට මට්ටකුණ්ඩලී කියන්නේ "මම දේවතාවෙක්මි, සත්රුවන් රථ මැදිරියක් ලදිමි, ඊ ලන්ට රථ සක් දෙකෙක් නැත්තෙන් සිටියෙමි"යි කීයේය. බ්‍රාහ්මණ "තොපට රථ සක් දෙක රත්රනින්, රිදියෙන්, යකඩින්, මුතුයෙන්, ලෝකඩින්, මැණිකකින් කවරකින් ඉදිකරවා දෙම්දැ?"යි කීයේය.

එවිට මට්ටකුණ්ඩලී දිව්‍යපුත්‍රයාද කියන්නේ "මාගේ රථ මැදිරිය ඉතා සෝභමානය, එසේ හෙයින් අනික් රථ සක් දෙකකින් මට ප්‍රයෝජන නැත, හිරුමඬල, සඳමඬල දෙක මට දෙව"යි කීයේය. බ්‍රාහ්මණ කියන්නේ "ඇයි මට්ටකුණ්ඩලිය, තෝ උමතුව පියා දෙඩවයිද? හිරුමඬල, සඳමඬල ඇරගෙන තොපගේ රථ සකට දෙන්නේ කෙසේදැ?"යි කීයේය. මට්ටකුණ්ඩලියා කියන්නේ "හිරුමඬල, සඳමඬල නැගෙන දිසාවටද, බස්නා දිසාවටද යන අවදි පෙනෙන්නේය. එසේ වූ හිරුමඬල, සඳමඬල මට දුන මැනවැයි කීමද උමතුව? තොපගේ මළා වූ, කොතනක උපන් බවත් නොදන්නා වූ

පුතණුවන්ට අඬන තොපිද උමතුව? කියන්නේය. මම උමතුව කියන්නේ නොවෙමි'' කියේය.

බ්‍රාහ්මණ කියන්නේ "සැබැව, මට්ටකුණ්ඩලියෙනි කියන්නේ ඇත්තමය. උමතුව දෙඩුයේ මම්ම ය. තෙල් කළ සිය ගණන් වත්කොට දල්වන්නා වූ මහා ගින්නක් පැන් කළ සිය ගණන් වත්කොට ගිනි නිවුවා සේ මාගේ සෝකග්නි නිවූ නියා යහපත, තොප මට කළ උපකාරය යහපතැයි, ඉනිබ්බෙ මාගේ පුත්‍රයාව සෝක නොකරෙමි''යි බ්‍රාහ්මණයා කියේය. එවිට මට්ටකුණ්ඩලිය දිව්‍යපුත්‍රයා කියන්නේ "බ්‍රාහ්මණයාණෙනි, මළවුන්ට සෝක කිරීමෙන් ප්‍රයෝජන නැත. තොපගේ මළා වූ පුතා නම් මම්ම ය''යි තමන්වහන්සේ දක්වා "සෝක නොකරව''යි බ්‍රාහ්මණයාණන්ට අවවාද කියා දිව්‍ය ලෝකයට ගියේය. එකියන බ්‍රාහ්මණයාත් තමාගේ මළා වූ පුත්‍රයාට සෝක හැර දානාදී කුශලයන් රැස්කොට පරලොව ගියහ. මේ 'මට්ටකුණ්ඩලී ජාතකය' පූර්‍වාපර සන්ධි ගළපා නිමවා වදාළසේක.

"එසමයෙහි මට්ටකුණ්ඩලී නම් දිව්‍යපුත්‍ර ව උපන්නෙමි බුදුවූ මම්ම ය''යි වදාළසේක.

# 444. බිළාර(රි) කෝසිය ජාතකය

තවද කාලත්‍රයවර්ති වූ සර්‍වධර්‍මයෙන් සර්‍වාකාරයෙන් දත්තා වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි

දන් දී අනුභව කරන්නා වූ භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

එක්තරා භික්ෂු කෙනෙකුන් වහන්සේ බත් ආලෝපයක් වත් උප්පතක් වත් යම් දෙයක් දන් දී වළඳනසේක. උන්වහන්සේ දන් දී වළඳන නියාව එක් දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස් ව උන්නා වූ භික්‍ෂූන් වහන්සේ "ඇවැත්නි, අසවල් භික්ෂූහු දන් දී මිසක් අනුභව නොකරෙති" කියාම කථාවකොට උන්සේක. එතනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා එපවත් අසා "මහණෙනි, මේ කියන්නා වූ භික්ෂූහු මහා ලෝභිය. මාගේ අවවාදය අසා ඒ ජාතියෙහි ලෝභි කම් අලහ. එසේ හෙයින් මේ ජාතියේත් ලෝභි කම් නැත්තේ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි ඒ නුවර එක්තරා සිටාණ කෙනෙක් සදම්හල් කරවා දන් දී තමාගේ පුතාට කියන්නේ "මා සේම දන් දී සිල් රකුව"යි පුතාට භාරකොට තෙමේ මිය ගොස් ශක්‍රභවනයෙහි ශක්‍ර දේවේන්ද්‍ර ව ඉපද දිව්ඉසුරු විඳිනා කල්හි ඔහුගේ පුත් කුමාරයත් සිටු සේසත් ලදින් පියාණන් සේම දන් පින්කොට මිය ගොස් චන්ද්‍රපුත්‍ර ව උපන්නේය. ඔහුගේ පුතාත් එසේම දන් පින්කොට මියගොස් සූර්‍ය දිව්‍යපුත්‍ර ව උපන්නේය. ඔහුගේ පුතාත් එසේම දන්

පින්කොට මියගොස් මාතලී දිව්‍යපුත්‍ර ව උපන්නේය. ඔහුගේ පුතාත් එසේම දන් පින්කොට මියගොස් පඤ්චශිඛ දිව්‍යපුත්‍ර ව උපන්නේය. ඔහුගේ පුතා වනාහි තමාගේ පරම්පරාවෙන් ආවා වූ දන වාහනය නසා දන්හල් ගිණි ලා සිඟා ආ ජනයන් බොටුව අල්වා දමා මේ නියායෙන් තදපරුෂ ව කිසි දයාවක් නැතිව යටත් පිරිසෙයින් තණ අගක් තෙලෙහි ගලාවත් එක් කෙනෙකුන්ටත් නොදී මසුරු ව වාසය කරන්නාහ. එසේ හෙයින් උන්ට "බිළාර කොසිය සිටාණෝය"යි කියා මෙනමින් ප්‍රසිද්ධ ව දවස් අරිනාහ.

එක් දවසක් ශක්‍ර දේවේන්ද්‍රතෙම "මම කුමක් පිණිස මේ සා සම්පත් ලද්දේදැ"යි දිවැසින් ලොව බලන්නාහු බරණැස් නුවර සිටුකුලයෙහි ඉපිද දන් දී උපන් නියාව දැක "මාගේ පුතණුවෝ කොයිදැ?"යි කොතැන්හි උපන් දේ හෝයි බලා චන්ද්‍ර දිව්‍යපුත්‍ර ව උපන් නියාව දැක, උන්ගේ පුතණුවෝ කොයි උපන් දේ හෝයි බලා සූර්ය දිව්‍යපුත්‍ර ව උපන් නියාව දැක, උන්ගේ පුතණුවෝ කොයි උපන් දේ හෝයි බලා පඤ්චශිඛ දිව්‍යපුත්‍ර ව උපන් නියාව දැක, ඔහුගේ පුත් කොයි උපන් දේ හෝයි බැලුවාහු පරම්පරාවෙන් ආවා වූ දන්හල් දවා සිඟන්නන් මරා එහුබඳවා ලෝභි ව වසතියි දැක "මා දක්වා මේ දිව්‍යපුත්‍රයන් සතර දෙනත් මමත් ගොසින් ලෝභි කම් අරවාපියා එමි" සිතා චන්ද්‍ර, සූර්ය, මාතලී, පඤ්චශිඛ දිව්‍යපුත්‍රයන් සතර දෙනා තමන් කරා කැඳවා කියන්නාහු "බිළාර කෝසිය සිටුවරයා අපගේ දනවංශය නසා ලෝභි ව වාසය කෙරෙති. එසේ හෙයින් අපි පස්දෙනා උන් කරා

ගොසින් උන්ගේ ලෝභය අරවා, දන් පින් කරන නියායෙන් සලස්වා එම්මැ"යි කියා "අපි පස්දෙනා එකවිට ගිය කල හයින් මුර්ජා වෙයි. එකවිට නොගොසින් එක් කෙනෙකුන් නියායෙන් බ්‍රාහ්මණ වේශයෙන් යම්හ"යි කියා "සිටාණන් රජගෙට අවුත් තමන්ගේ ගෙට ගිය කල යම්හ"යි කථාකොට සිටාණන් තමන් ගෙට අවුත් සත්වෙනි දොරටුවේ විථිය බල බලා සිටි කලට ශක්‍රයෝ බ්‍රාහ්මණ වේශයෙන් අවුත් සිටාණන්ගේ සමීපයට පැමිණ "සිටාණෙනි, සා දුකෙන් ඉතාම පීඩිත ව ගියෙමි. මාගේ දුක්ඛය නිවා දෙව"යි කී කල්හි සිටාණෝ ශක්‍ර බ්‍රාහ්මණයා කී බස හා සමඟ "මාගේ ගෙයි පිසූ බතුත් නිමා ගියේය. පිසන්ට සාළුත් නැතැ"යි කීහ. ශක්‍ර බ්‍රාහ්මණයා කියන්නේ "සිටාණෙනි, මා කියන්නා වූ සොලෝවෙක් ඇත. අසව"යි බ්‍රාහ්මණයා කීය. සිටාණෝ "මට සොලෝවෙන් ප්‍රයෝජන කිම්ද? මම නොඅසමි" කීවත් බ්‍රාහ්මණයන් වලක්ව වලක්වා කියන්නාහු "පින්වත් මහසිටාණෙනි, පිස අනුභව නොකරන්නා වූ සත්පුරුෂයෝ සිගාල භෝජනය දෙනු කැමැති වෙති. උදුකළාව නොකෙරෙති. පිස අනුභව කරන්නා වූ තොපි තොපගේ වස්තුව ඇතිව තිබැද්දී තමා සමීපයට පැමිණියා වූ යාචකයන්ට දන් නොදෙව් නම් එසේ නොදීම තොප වැන්නවුන්ට සුදුසු නොවන්නේය. දනමානයෙහි මසුරු බැවින් ප්‍රමාද බැවින් යන මේ දෝෂ දෙකෙන්ම නොමිදෙන්නාහ. කුසල් කැමැත්තා වූ නුවණැත්තා වූ සත්ත්වයන් විසින් ස්වල්ප වූ

දෙය ධර්‍මයෙක් ඇති නම් එයින් භාගයක් වත් දිය යුත්තේය"යි කීහ.

එබස් අසා සිටාණෝ "ගෙටවැද ඉඳුවයි, යන්තමක් ලබන්නේ වේදැ"යි කීය. ශක්‍ර බ්‍රාහ්මණයෝ ගෙට වැද සිටාණන්ට තමන් කී කාරණය මෙනෙහි කරමින් සොලෝව කිය කියා උන්නාහුය. ඉක්බිති චන්ද්‍ර දිව්‍යපුත්‍රයෝ අවුත් බත් ඉල්වා "තොපට බත් නැතැයි, යව"යි කී කල්හි "මහසිටාණෙනි, ඇතුළු ගෙයි එක් බමුණෙක් සිටිති. බමුණන් පවරා දන් දෙන තෙනකැයි සිතිමි. එසේ හෙයින් මමත් ගෙට වදිමි" කීහ. "බමුණන්ට දෙන දනෙක් නැත. මෙතන නොසිට පළා යව"යි සිටාණන් කියමින් සිටියදී එසේ වීනම් සොලෝවක් කියන්නා වූ චන්ද්‍ර දිව්‍යපුත්‍රයෝ "මසුරු සිත් ඇත්තා වූ සත්ත්වතෙම යම් ක්‍ෂුධා පිපාස දෙකට භයින් භයපත් ව දන් නොදෙන්නා වූ සත්ත්වයාට ඒ තෙම භය නොවන්නේය. කුමක් නිසාද? යත්, 'මම මා සන්තක වස්තුව අනුන්ට දන් දී පියා ක්‍ෂුධා පිපාස දෙකින් පීඩිත වම්දැ'යි සිතා භයපත් වේද, ඒ ක්‍ෂුධා පිපාස සංඛ්‍යාත වූ භය අඥාන වූ සත්ත්වයා උපන් තැන්හි මෙලොව පරලොව දෙකෙහිම පීඩාවට පමුණු වන්නේය. ඉතා දිළිඳු බවටත් පමුණු වන්නේය. එසේ හෙයින් තමාගේ සන්තානයෙහි උපන් මාත්සර්‍ය්‍ය මලය මැඩගෙන නුවණැත්තා වූ සත්ත්වයින් විසින් දන් දිය යුත්තේය. සියළු සත්ත්වයන්ට කුශල නම් බලවත් පිහිටෙක් වන්නේය"යි කීහ. එබස් අසා සිටාණන් විසින් "එව ගෙට වැද ඉඳුව, මදක්

ලබන්නේ වේදැ"යි කී කල්හි චන්ද්‍ර දිව්‍යපුත්‍රයෝ ගෙට වැද ශක්‍රයන් සමීපයෙහි උන්නාහ.

ඉක්බිත්තෙන් මඳක් කල් යවා සූර්ය දිව්‍යපුත්‍රයෝ බත් ඉල්වා සිට කියන්නාහු "දානය නම් මාත්සර්‍ය්‍ය මලය මැඩගෙන දිය යුතු හෙයින් නොදිය හැකි දෙයක් වන්නේය. නැවතද දානය නම් යුද්ධයක් හා සමාන වන බැවින් නොකොට හැකි කාරියෙක් වන්නේය. එසේ හෙයින් නොදිය හැක්කක් කරන්නා වූ සත්පුරුෂයෝ දන් දීගත නොහෙන්නාහ. එසේ හෙයින් සත්පුරුෂ බෝධිසත්ත්වවරයන්ගේ ස්වභාව අන්‍ය සත්ත්වයන් විසින් ගත නොහැක්කේය. මේ කාරණයෙන් සත්පුරුෂයන්ගේ ගතිය මෙයින් පරලොව ගිය කල්හි වෙන වෙනම වන්නේය. අසත්පුරුෂයෝ තමා මාත්සර්‍ය්‍ය වශයෙන් දන් නොදී නරකයට යන්නාහ. සත්පුරුෂයෝ දාන ඵලය තමන්ට ප්‍රත්‍යක්ෂව දැනෙන හෙයින් මාත්සර්‍ය්‍ය නොව දන් දී ස්වර්ග ලෝකයෙහි උපදනාහ"යි ධර්‍මදේශනා කළාහ. එබස් අසා සිටාණෝ අනිකක් කියා කොටගත හැකි කාරණයක් නොදැක "එසේ වීනම් ගෙට වැද සමීපව ඉඳුව, මඳක් ලබන්නා වේදැ"යි කීය.

ඉක්බිත්තෙන් මඳක් කල් යවා මාතලී දිව්‍යපුත්‍රයා අවුත් බත් ඉල්වා "නැත පලා යව"යි කී කල්හි එබස් හා සමඟ අවවාද වශයෙන් කාරණා කියන්නේ "මහසිටාණෙනි, මේ ලෝකයෙහි සමහර නුවණැත්තා වූ සත්ත්ව කෙනෙක් තමන්ගේ ගෙවල ස්වල්ප ව තිබෙද්දී දන් දෙනු කැමැත්තාහු වෙති. සමහර සත්ත්ව කෙනෙක් තමන්ගේ වස්තුව බොහෝ වී නමුත්

දන් දෙනු නොකැමැත්තාහ. එසේ හෙයින් මේ ලෝකයෙහි කම්පල අදහා දෙන ලද්දා වූ සැන්දක් පමණවත් මහත්ඵල මහානිසංස වන බැවින් සහසින්ගේ දානය හා සමාන වන්නේය”යි කීහ. එබස් අසා සිටාණෝ “එසේ වීනම් ගෙට වැද ඉඳුව”යි කීය.

ඉක්බිත්තෙන් මඳක් කල් යවා පඤ්චශිඛ දිව්‍යපුත්‍රයා අවුත් බත් ඉල්වූහ. “නැත පලා යව”යි කී කල්හි “මම තාගේ ගෙට ගොසින් දුන් දෙය ගෙනාවිරූ එකෙකි. කිම්ද? මේ ගෙයි බමුණන්ට ආරාධනාකොට දන් දෙන තෙනැකැ”යි කියා සිටාණන්ට ධර්‍ම දේශනා කරන්ට පටන් ගත්තාහු මෙසේ කීහ “සිටාණෙනි, මේ ලෝකයෙහි යම් සත්ත්වයෝ ත්‍රිවිධ සුචරිත ධර්‍මයෙහි හැසිරේද, ගම සිඟා ඇවිද වී සාල් ආදී වූ දෙයෙන් හා බත් ආදියෙන් ජීවත් වේද, වනයේ ඇවිද පලාඵල ආදී වූ දෙය ගෙනවුත් ජීවත් වේද, එසේ ඇවිද ආහාරයෙන් ජීවත් වන්නා වූ සත්ත්වයාත් ධර්‍මයෙහි හැසිරෙන්නේම වෙයි. යම් සත්ත්ව කෙනෙක් තමාගේ වස්තුව ස්වල්ප ව තිබැද්දී ධාර්මික වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් හා දුගී, මගී, යාචකයන්ට දන් දේද, එම ස්වල්ප වස්තුවෙන් පුත්‍රදාරාවන් පෝෂ්‍යය කෙරේද, ඒ සත්ත්වයාත් ධර්‍මයෙහි හැසිරෙන්නේ නම් වෙයි. මෙර මා හට භය හා පීඩාකොට නොබඳ කරවූ වරද ආදියෙන් වස්තු රැස්කොට දවස දහසක් වස්තු වියදම්කොට දන් දෙන හෙයින් සහශ්‍රයාගී නම් වූ ඉසුරුමතුන් ලක්‍ෂයක් දෙනාගේ දානය දැහැමෙන් වස්තු උපදවාගෙන ඒ මනා වස්තුවෙන් දන්

දෙන්නා වූ දුක්ඛිත මනුෂ්‍යයාගේ දානයෙන් සොළොස්වන කොට්ඨාසයෙන් කොට්ඨාසයකුත් නොඅගනේය”යි කීහ.

පඤ්චශිඛයන්ගේ බස් අසා බිළාර කෝසිය සිටාණෝ කාරණා සලසා දුගී පුරුෂයාගේ ස්වල්ප දානයට සහශ්‍රාදීන් ලක්‍ෂයක් දෙනාගේ දානට නොඅගනා කාරණය විචාරන්නාහු “බමුණානෙනි, සහශ්‍ර වශයෙන් ඉතා මහත් බැවින් දැහැමින් සෙමින් වස්තුව උපදවා දන් දෙන්නා වූ පුරුෂයාගේ ස්වල්ප වූ දෙය ධර්‍මයෙහි සොළොස්වන කොට්ඨාසයෙන් කොට්ඨාසයකුත් නොඅගන්ට කාරණා කවරේදැ?”යි විචාළාහ. ඉක්බිති ඊට කාරණා කියන්නාහු පඤ්චශිඛ දිව්‍යපුත්‍රයෝ “සිටාණෙනි, මේ ලෝකයෙහි සමහර සත්ත්ව කෙනෙක් ප්‍රාණඝාතාදී දශ අකුශල කර්මයෙහි පිහිටියා වූ අනුන් තලා මරා දඬුමුගුරුගෙන නොබද අය පඬුරුගෙන සත්ත්වයන් සන්තානයෙහි සෝක ඉපද වීමෙන් සම්පත් රැස්කොටගෙන ඒ බලාත්කාරයෙන් උපයනා ලද වස්තුවෙන් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට දන් දෙන්නාහ. සත්ත්වයන්ට ද දණ්ඩණයකොට උපදවාගත් වස්තුවෙන් දෙන ලද්දා වූ දානය දැහැමෙන් දෙන වස්තුවට සරි නොවන්නේය. මෙසේ යථොක්ත ක්‍රමයෙන් පරහට පීඩාකොට වස්තුව උපදවාගෙන දන් දෙන්නාහු ලක්‍ෂයක් දෙනාගේ දානය දැහැමෙන් වස්තුව උපදවා දන් දෙන දුගී පුරුෂයාගේ දානය දුන්නාවු කාරණා වශයෙන් සොළොස්වන කොට්ඨාසයෙන් කොට්ඨාසයකුත් නොඅගනේය”යි සිටාණන්ට ධර්‍ම දේශනා කළාහ. පඤ්චශිඛයන්ගේ ධර්‍ම කථාව අසා සිටාණෝ “එසේ වීනම් යව, ගෙට වැද ඉඳුවයි, මදක්

ලබන්නේ වේදැ"යි කීහ. එබස් අසා පඤ්චශිඛ දිව්‍යපුත්‍රයෝ ගොස් ශක්‍ර බ්‍රාහ්මණාදී සතර දෙනාගේ සමීපයෙහි උන්නාහ.

ඒ වේලෙහි බිළාර කෝසිය සිටාණෝ තමන්ගේ ගෙයි කෙල්ල කැඳවා කියන්නාහු "තෙල, හිඳිනා බමුණන් පස් දෙනාට බොල්මුසු වී පස් නැළියක් දිපියව"යි කීහ. "යහපතැ"යි කියා කෙලී වී පස් නැළියක් ගෙන ගියාය. බමුණෝ පස්දෙන පස් නැළිය දැක "අපට වී එපාය"යි ලවා නොගත්තාහ. ලවා නොගත් නියාව කෙලී සිටාණන්ට කීවාය. සිටාණෝ "නිවුඩු සාල් පස් නැළියක් ලවා පියව"යි කීහ. එවිට කෙලී සාල් පස් නැළියක් ගෙන ගියාහ. බ්‍රාහ්මණයෝ "සාලුත් අප ලවා ගන්නේ නැතැ"යි කියා නොගත්තාහ. සාල් ලවා නොගත් නියාවත් සිටාණන්ට කෙලී කිව. "බත කත් නම් අසුන්ට උයාපු නිවුඩු සාලේ බත් ලා පියව"යි කීහ. "යහපතැ"යි කියා බමුණන් පස්දෙනා ඉඳුවා අසුන්ට ඉවූ නිවුඩු සාලේ බත් ලූ ගමනේ බත් පිඩි කට තබා ගෙල ගත්තාක් මෙන් ඇස් උඩ ඉලුවා වැටී වැදඹත්තාහ. කෙලී එමවිට බ්‍රාහ්මණයන් ඇස් උඩ ඉලුවා වැටී වැදහොත් නියාව දැක "මළහ"යි සිතා සිටාණන්ට "බමුණෝ බත් ගිලේ ගැණී මළෝය"යි කෙලී කිව. සිටාණෝ "මට අපකීර්තියෙක, අසුකෙළක් සම්පත් ඇති සිටාණෝ සුඛුමාලය වූ බමුණන් පස්දෙනාට ඉඳුරා බත් සුඟක් ලවාලිය නොහී අසුන්ට ගෙරි මීවුන්ට පිසූ බත් ලා බ්‍රාහ්මණයන් මරා පුහයි ප්‍රසිද්ධව බොහෝ මට අපකීර්තිය"යි කියා කෙල්ලට කියන්නාහු "උන්ගේ තැටිවල නිවුඩු බත් හැර මට පිසූ සුවඳ ඇල් සාලේ

බත් තැටි පසේ ලව''යි කීයේය. කෙලි ඒ නියාවට නිවුඩු සාලේ බත් හැර සිටාණන්ට පිසූ බත් බමුණන් පස් දෙනාගේ තැටිවල ලුව. සිටාණෝ දෙරකඩ වැද සිට යන එන බොහෝ මනුෂ්‍යයන් කැඳවා කියන්නේ ''මේ බමුණන් පස් දෙනාට මට පිසූ සුවඳ ඇල් සාලේ බත් ලැවීමි, බමුණෝ නම් ලෝභී ජාතියෙක නිසා මහත්කොට බත් පිඩ කා ගිලේගෙන මළහ. අපගේ වරදකින් මළ ගමනෙක් නොවෙයි, තොපි හැම දනුව''යි සිටාණෝ කීහ.

එවිට බ්‍රාහ්මණයෝ පස් දෙන බොහෝ මනුෂ්‍යන් එක් වූ නියාව දැන නැගී සිට ''එසේද? සිටාණෙනි, තොපගේ මීවුන් ගෙරින් ආදීන්ට ඉවූ බත් අපිට ලා දැන් තැටිවල කැකුළු සාලේ බත් ලා තොප කළදෑ නොදැනුදැ?''යි කට තුබූ නිවුඩු සාලේ බත් පිඩු පස බිමට එලූහ. එවිට බොහෝ මනුෂ්‍යයෝ ''යහපත, තොපගේ දනාධ්‍යාසය එකවිවරය, තොපගේ සත්මුතු පරම්පරාවේ පැවත ආ කුශලයක් නැත්ල, බොහෝ උත්සහයෙන් දෙවනවන් දනෙක මෙසේ වූ බ්‍රාහ්මණයන්ට තොපට පිසූ බතින් බත් ලා යවාපුවොත් කවර වැරද්ද? තොප සේ අශ්‍රද්ධනයෙකුත් නැතැ''යි කියා බොහෝ නින්දා කීහ.

එවිට ශක්‍රයෝ කියන්නාහු ''මේ සිටාණෝ මෙතෙක් සම්පත් ඇතිව තිබැද්දී අපට ලැබුණු බතේ සැටිය, මේ සම්පත කාගේ සම්පත්දැයි දැනුදැ?''යි විචාළේය. එවිට මනුෂ්‍යයෝ ''නොදනුම්හ''යි කීහ. බ්‍රාහ්මණයෝ කියන්නෝ ''පළමු මේ නුවර සතරදිග සතර දන්හල් කරවා දන් දුන් අසවල්

සිටාණන් තම ඇසූවිරුද්දැ?”යි විචාළාහ. ඇසූවිරූ මනුෂ්‍යයෝ “ඇසුම්හ”යි කීහ. බ්‍රාහ්මණ කියන්නේ “එසේ වීනම් ඒ කුශලය කළා වූ සිටාණෝ නම් ඒ කුසල මූලයෙන් ශක්‍රභවනයෙහි උපන් ශක්‍රයෝ නම් මම්ම ය”යි කියමින් සිටියදීම බ්‍රාහ්මණ වේශය හැර පස් දෙනාම දිව්‍ය ආත්මභාවයෙන් සිට කියන්නාහු “ඒ සිටාණෝ නම් ශක්‍ර වූ මම්මය. මාගේ පුත්‍රයා නම් මා කළ කුශල්කොට චන්ද්‍ර දිව්‍යපුත්‍ර ව උපන්නේ තූළුය, තූළුන්ගේ පුත්‍රයාණෝ එම කුශල්කොට සූර්ය දිව්‍යපුත්‍ර ව උපන්නේ තූළුය, තූළුන්ගේ පුත්‍රයාණෝ එම කුශලයකොට මාතලී දිව්‍යපුත්‍ර ව උපන්නේ තූළුය,  තූළුන් පුත්‍රයාණෝ එම කුශලයකොට පංචශිඛ දිව්‍යපුත්‍රය උපන්නේ තූළුය. මේ සිටාණන්ගේ පියාණෝය. එසේ හෙයින් මේ සම්පත් මාගේ සම්පත, මෙතෙක් සම්පත් තිබැද්දීත් නිවුඩු බතෙහි විවර දුටුවාදැ?”යි කියා “මට බත් නැති හෙයින් මුගේ බත් කන්ට ආයේ නොවෙමි. බොහෝ කාලයක් පැවත ආ දානය නුදුන් හෙයින් ඉදිරි ඇතිවුනු කෙනෙකුන් නොදෙති. එසේ හෙයින් මුන් හික්මවන්ට ආමි” කියා ශක්‍රයන් ඇතුළු වූ දිව්‍ය පුත්‍රයෝ මහත් වූ සෝභායෙන් ආකාශයෙහි සිටයාහ.

සිටාණෝ “එසේ වීද මා ඉක්මවන නිසා ආසේක්ද? සැබැව, මෙතෙක් දවස් දන් කඩකොට නුදුන්නෙමි, මෙතැන් පටන් මා පැවත ආ දානය කෙරෙමි” කියා ගිවිස්සේය. ශක්‍රයෝ “බොහෝ මනුෂ්‍යයන්ට දන් පින්කොට අප සේම දිව්‍ය ලෝකයෙහි උපදව”යි කියා අවවාදකොට ශක්‍රයන් ඇතුළු වූ දිව්‍යපුත්‍රයෝ තමන්ගේ දිව්‍ය ලෝකයටම ගියාහ.

එතැන් පටන් කෝසිය සිටාණෝ පළමු නියාවට දන්හල් කරවා දනාධ්‍යාශයකොට දිව්‍ය ලෝකයට ගියහයි වදාරා මේ ‘බිළාර කෝසිය ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි බිළාර කෝසිය සිටාණෝ නම් දැන් පින් කරන්නා වූ මේ භික්ෂූහුය. පඤ්චශිඛ දිව්‍යපුත්‍රයෝ නම් ආනන්ද ස්ථවිරය, මාතලී දිව්‍යපුත්‍රයෝ නම් අනුරුද්ධ මහස්ථවිරය, සූර්ය දිව්‍යපුත්‍රයෝ නම් මුගලන් මහස්ථවිරය, එසමයෙහි චන්ද්‍ර දිව්‍යපුත්‍ර නම් සැරියුත් මහස්ථවිරය, එසමයෙහි ශක්‍රයෝ නම් බුදුවූ මම්ම වේදැ”යි වදාළසේක.

# 445. කාක (චක්කවාක) ජාතකය

තවද ශාක්‍යකුල චිත්තමාණික්‍ය වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ලෝභී භික්ෂූ කෙනෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

ලෝභී වූ භික්ෂු කෙනෙකුන් වහන්සේ සර්වඥයන් වහන්සේට පෑ ගමනේ “සැබව ස්වාමීනි, තෘෂ්ණා වසඟයෙමි” කී කල්හි සර්වඥයන් වහන්සේ “එම්බා මහණෙනි, මූ දැන්මතු නොවෙයි, පළමුත් තෘෂ්ණා වසඟයෙන් ඇත් කුණු අදී වූ නොයෙක් කුණු ඇතිව තිබැද්දී හිමාලය වනයට ගොදුරු සොයා ගියේ වේදැ”යි “ඒ කෙසේදැ?”යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි මෙම නුවර කපුටුවෙක් ඇත් කුණු, මිනී කුණු ආදී වූ දෙය කා ඉන් තෘප්තියකට නොපැමිණ ගොදුරු සොයා වනාන්තරයට ගිය තැනැත්තේ එක්තරා විලෙක වාසය කරන්නා වූ සක්වාලිහිණි යුගලයක් දැක කියන්නා "සක්වා යුගල, තොපගේ ශරීර වර්ණය හා පැහැපත යහපත් වුයේය. පෙටියන්, පලයින්, කණයින්, මුදුමස් ආදී වු මාංශ කන්නේ වේද? තොපගේ වර්ණය යහපත් වුයේය"යි කීහ. සක්වා ලිහිණියෝ එවිට කියන්නාහු "තොප කියන්නාවු ගොදුරු අප කන්නේ නැත. සෙවෙල් ආදී වූ දෙය"යි කී කල්හි කවුඩු කියන්නේ "තොප කී බස් අදහා ගන්නේ නැත. සෙවෙල් කා මෙසේ සෝභාවර්ණ ඇති වූ කල, මා කන්නේ මනුෂ්‍යයන් කැවමනා ලුණු, ඇඹුල් ලා පිසූ මාළු ආදී වූ කැවුම් ආදී වූ රස භෝජනය, මෙසේ අවර්ණ වූයේ කවර නිසාදැ?"යි කීහ.

එවිට සක්වාලිහිණි කියන්නේ "තොප කවර කැවිලි කතක් භයින් කන හෙයින් හා කැවිලි තොපගේ හෘදය මාංශය උණුව තිබෙන හෙයින් වහාම දිරා යෙයි. නොයෙක් දෙනාගෙන් තොපට භය ඇති හෙයින් කෑ කැවිලි ශරීරයෙහි ප්‍රත්‍යයට යන්ට නැතිව ද භස්ම වන්නේය. අපට එසේ වූ භයකුත් නැත. ඇම වේලේ චිත්ත සන්තෝෂව තිබෙන හෙයින් ශරීරයේ ඡවි වර්ණයත් යහපත්ව කෑ දෙයත් ප්‍රත්‍යය වන්නේය. අපට භයකුත් නැත. අපට විපාක කුමක් සිතූ කෙනෙක් ඇත්නම් උන් තමන්ට විනා අපට වෙන ආයාසයක් නැති

හෙයින් මෙසේ යහපත්ව වාසය කරම්හ''යි වදාරා මේ 'කාක ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි කවුඩා නම් මේ භික්ෂූහුය. එසමයෙහි සක්වාලිහිණි නම් යසෝධරා ස්ථවිරය. එසමයෙහි සක්වාලිහිණියා නම් බුදුවූ මම්ම ය''යි වදාළසේක.

# 446. මහා මංගල ජාතකය

තවද ශාක්‍යකුලතිලක වූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි මහා මංගල සූත්‍රය අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද? යත්,

එක් දවසක් ශාලාවෙක බොහෝ මනුෂ්‍යයෝ එක්ව උන්නාහ. ඉක් එක් මිනිසෙක් තමන්ගේ ගෙයි මඟුල් ඇතැයි නැඟී සිට පළා ගියේය. එතන උන් මනුෂ්‍යයෝ කියන්නාහු "මඟුල් තමා කවරේදැ?''යි කීහ. ඉන් එකෙක් නැඟී කියන්නේ "කිරි දෙන බැමිණි, දෙනක හා එළගිතෙල් හෝ වෘෂභයෙකු හෝ සුදු කඩක් හෝ සර්‍වාභරණයෙන් සැරසුනාහු ස්ත්‍රියක යනාදීන් මෙකී දෙයින් යමක් දුටුහොත් මේ මඟුලැ''යි කීය. එකෙක් "එසේ නොව, ඇසින් දුටු දෙය මඟුල් නොවෙයි, නිදා නැඟී පුණ්‍යයයි කියාවත්, වඩ්ඪයයි කියාවත් යන මේ ශබ්දයෙන් එකක් කන වැටිනි නම් මඟුලැ''යි කීය. එකෙක් කියන්නේ "කනට ඇසුනු දෙයක් මඟුල් ද? ඒ මඟුල් නොවෙයි. යමෙක් නිදා නැඟී සිටගෙන පොළව අල්වා රතුන් අල්වා ද,

සුවඳ විලවුන් අල්වා ද, රේමස් අල්වාද, මෙකී දෙයින් එකෙක් කෙළේ වීනම් ඒ මඟුලැ''යි කීය.

මේ නියායෙන් මේ මනුෂ්‍යයෝ තුන් කොට්ඨාසයක් ව දිට්ඨ මංගල්‍යය, සුත මංගල්‍යය, මුත මංගල්‍යයි මේ මඟුල් තුනින් මේ මඟුල් යයි, විභාගයක්කොට දැනගත නොහී උනුන් විචාරා මනුෂ්‍යයෝ ද, සදිව්‍ය ලෝකයෙහි දෙවියෝද, සොළොස් බඹ තලෙහි බ්‍රහ්මයෝද යන සියල්ලෝම තුන් කොටසක්ව බෙදී ගියාහ. එවිට ශක්‍රයෝ ''මේ මඟුලයි දෙව් මිනිසුන් සිතට නංවා කියා ලන්ට අනික් කෙනෙක් නැත'' සර්‍වඥයන් වහන්සේ කරාගොස් වැඳ ''**බහූදෙවා මනුස්සාච**'' යනාදින් ගාථායෙන් මංගල ප්‍රශ්නය විචාළ දෙවියන්ට සර්‍වඥයන් වහන්සේ ''**අසෙවනාච බාලානං**'' යනාදි ගාථා එකොළසකින් එකී මංගල ප්‍රශ්නය විචාළ දෙවියන්ට ගාථා එකොළසකින් අටතිස් මඟුල් වදාරා දෙව්බඹුන් ඇතුළු වූ සියල්ලවුන්ගේ සැක දුරුකොට මහමංගල ප්‍රශ්නය විසඳා වදාරා මංගල ප්‍රශ්නය අවසානයෙහි කෙළ දහසක් සත්ත්වයෝ රහත්ව අමා මහනිවන් දුටුහ. සෙසු සෙදගැමි, අනාගැමි සතරමග සතරඵලයට පැමිණ සත්ත්වයන්ගේ මෙතැකැයි පමණ නැත්තේය.

එතැන්හි රැස් වූ භික්ෂූන් වහන්සේ ''දෙව්බඹුන් ආදී වූ බොහෝ සත්ත්වයන්ට සැක උපන්නා වූ මංගල සූත්‍ර ප්‍රශ්නය සර්‍වඥයන් වහන්සේ විසඳා වදාළ නියාව ඉතා යහපතැ''යි කිය කියා උන් තැනට සර්‍වඥයන් වහන්සේ වැඩ වදාරා ''මහණෙනි,

මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා එපවත් අසා "දැන්මතු නොවෙයි, මහණෙනි, පෙරත් දෙව් මිනිසුන් සිත සැක මුදා මේ මංගල ප්‍රශ්නය විසඳුයේ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රාහ්මණ කුලයෙක බෝධිසත්ත්වයන් වහන්සේ උපන්සේක. උන්වහන්සේට නම් තබන්නාහු 'රක්ඛිත කුමාරයෝ' යයි නම් තැබූහ.

ඒ බ්‍රාහ්මණ කුමාර වැඩිවිය පැමිණ පඤ්චකාමයෙහි ආදීනව දැක හිමාලය වනයට ගොස් ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා තාපසවරුන් පන්සියයක් පිරිවරා වාසය කරනසේක. ඒ තාපසවරු ඒ රක්ඛිත තාපසයන්ට කියන්නාහු "ස්වාමීනි, තපස් කාලය ආසන්න හෙයිනුත් ලුණු ඇඹුල් සෙවුනා පිණිසත් දිනචර්‍ය්‍යාව පිණිසත් මනුෂ්‍යපථයට යම්හ"යි කීහ. රක්ඛිත තාපසයෝත් "යහපතැ"යි අවසර දුන්හ. ඒ තාපසවරුත් අවසරගෙන නියම්ගම් රාජධානිවල ඇවිද බරණැස් නුවරට ගොස් රජ්ජුරුවන්ගේ උයනේ වාසය කරන්නාහ.

එසමයෙහි පළමු මංගල සූත්‍රයෙහි ක්‍රමයෙන් බරණැස් නුවර දිට්ඨිමංගලය, සුතමංගලය, මුතමංගලය යන තුන් දෙනෙක් මගුල් කාරණා කියා ඇවිදිනා මේ කථාව නුවර ප්‍රකාශකොට රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝ මගුල්

විභාගකොට ගත නොහී ඉඳිනාහු තමන්ගේ උයනට තාපසවරු ආ නියාව අසා "තාපසවරු නම් මහානුවණ ඇත්තාහ. මේ මංගල ප්‍රශ්නය විචාරමි" උයනට ගොස් තාපසවරුන් වැඳ එකත්පස්ව සිට මේ කාරණය විචාළාහ. තාපසවරු කියන්නාහු "මේ මංගල ප්‍රශ්නය අපට නොදැනෙයි. අපගේ ආචාරී වූ රක්ඛිත තාපසයන් වහන්සේ හිමාලය වනයෙහි වාසය කරන්නාහ. උන්වහන්සේ ප්‍රශ්න විසඳා වදාරනසේක. ඔබ යව"යි කීහ. රජ්ජුරුවෝ කියන්නාහු "හිමාල වනය නම් ඉතා දුරය. අපි යා නොහෙම්හ. නුඹවහන්සේලා ගොසින් විචාරා එන්නේ යහපතැ"යි කීහ.

තාපසවරුත් හිමාල වනයට ගොසින් තාපසයන් වැඳ එකත්පසක සිටියාහ. රක්ඛිත තාපසයෝත් තාපසවරුන්ගේ දුක් සැප විචාරා ඉක්බිති තාපසවරුන් පන්සියයකට ජ්‍යෙෂ්ඨ තාපසයෝ තාපසයන් වැඳ නමිනව සිට තමන්ගේ ආචාරී වූ රක්ඛිත තාපසයන් අතින් විචාරන්නාහු "දිට්ඨමංගලය, සුතමංගලය, මුතමංගල යයි මඟුල් තුනක් කියති. මේ මඟුල් තුනින් කවර මංගල්‍යයක් කළ කල ඉහලෝක පරලෝක දෙකින් වැඩ සැප දෙන්නේය. මේ මඟුල් තුනින්වත් මේ හැර අනික් මංගල්‍යයකින් වත් වැඩ එලවන්නේත්, සුවදායක වන්නේත් මෙසේවූ මංගල්‍යකිනැයි වදාළ මැනවැ"යි රජ්ජුරුවන් කළ ආරාධනා තාපසයන්ට කීහ.

එවිට රක්ඛිත නම් තාපසයෝ කියන්නාහු "එම්බල, දිව්‍ය බ්‍රහ්මයන්ටද, තමන්ගේ දෙමව්පියන්ටද, තමා කෙරෙහි වෛරව

ඉඳිනා සත්ත්වයන්ටද මෛත්‍රී කරන්නා වූ සත්ත්වයෙක් ඇත්නම් එසේ වූ තැනැත්තවුන්ට මෙලොවින් වැඩ සෑදෙන්නේය. මේ උතුම් මඟුලැ”යි කියා තවද කියන්නාහු “එම්බල, යම් කෙනෙක් නිබඳ තමාට වැඩි තරම්ව සිට ආක්‍රෝශ පරිභව බෙණේද? එසේ වූ තැනැත්තවු කෙරේ ක්‍රෝධ නොව ඉවසාද, එසේ වූ පුරුෂයාට මෙලොව පරලොව දෙකින් වැඩ සෑදෙන්නේය. මෙයින් එක් උතුම් මංගල්‍යයෙක”යි නැවත කියන්නාහු “එම්බල, යම් කෙනෙක් ‘මේ නීචයා මූට යටතැ’යි නොසිතා ඌ දන්නා වූ යම් ශාස්ත්‍රයක් ඉගෙන ගනීද, ඌ කෙරේ අහංකාර නොවේද, හෙලා නොකෙරේද එසේ වූ පුරුෂයාට මෙලෝ පරලෝ දෙකින් වැඩ සෑදෙන්නේය. මෙයිත් එක් උතුම් මංගල්‍යයෙක”යි කියා නැවත කියන්නාහු “යම් මිත්‍රයෝ නම් මෙලොව පරලොව දෙකින්ම සුව නොඑලවන්නා වූ අසත්පුරුෂ මිත්‍රයන් හැර සජ්ජන වූ මිත්‍රයන් හා භජනය කිරීම් නම් මෙලෝ පරලෝ දෙකින් වැඩ සෑදෙන්නේය. එසේ වූ මිත්‍රයන් ඇති වීමක් උතුම් මංගල්‍යයෙක”යි කියා නැවත කියන්නාහු “එම්බල, යම් ස්ත්‍රියක් තමා හා සම වූ වයස් ඇත්තීය, යහපත් වූ රූපශ්‍රී ඇත්තීය, වංක නැත්තීය, ආචාරශීලයෙන් යුක්තද, පතිව්‍රතා ධර්මය රකීද එබඳු වූ ස්ත්‍රිය පාදපරිචාරිකාව ලබන්නා වූ පුරුෂයාට මෙලෝ පරලෝ දෙකින් වැඩ සෑදෙන්නේය. මෙයිත් උතුම් මඟුලැ”යි කියා නැවත කියන්නාහු “එම්බල, යම් භූමිපාල වූ රජදරුවන්ට යම් අමාත්‍යයෙක් රජ්පුරුවන්ට අභිප්‍රාය ක්‍රියාව, ඉහලොවින් පරලොවින් වැඩ පසස්නා කටයුතු කියාද, වැඩෙහි

හැසිරේද එසේ වූ තෙනැත්තවුට මෙලෝ පරලෝ දෙකින් වැඩ සෑදෙන්නේය. මෙයිත් එක මංගල්‍යයෙක”යි කියා නැවත කියන්නාහු “යම් තපස්වී කෙනෙක් ආචාරශීලයෙන්ද, පඤ්චශීල, අෂ්ඨාංගශීලය, කෝටියක් සංවරශීලය යනාදී වූ අර්හත් මාර්ගයෙන් රහත්වන්ට නිසි වූ ක්‍රම දනින්ද, මෙයිත් උතුම් මංගල්‍යයෙකැ”යි කියා මේ මංගල ප්‍රශ්නය අරහන්ත දේශනාවන් කුළුගෙන “එම්බා තාපසවරුනි, මේ අට කාරණයෙන් දවස් අරන යම් කෙනෙක් ඇත්නම් ඉහලෝක පරලෝක දෙකින්ම වැඩ සෑදෙන්නේය”යි ඒ තාපසවරුන්ට බණ වදාරා “දිට්ඨමංගල්‍යය, සුතමංගල්‍යය, මුතමංගල්‍යයි කියන ලද මඟුල් බ්‍යර්ථය, ඉන් වන ප්‍රයෝජනයෙක් නැත, මඟුල් නම් මේය”යි කීසේක.

තාපසවරු කීප දවසක් රඳා බරණැස් නුවරට ගොස් උයනේ සැතපුනාහ. රජ්ජුරුවෝ තාපසවරුන් ආ නියාව අසා සමාධි ව උයනට ගියාහ. තාපසවරු බෝධිසත්ත්වයන් කී ලෙසම මංගල්‍ය කාරණායන් විස්තර වශයෙන් කියා බොහෝ මනුෂ්‍යයන් සිතට නංවා හිමාල වනයට ගියාහ. බරණැස් නුවරවාසීන් හා රජ්ජුරුවෝ තාපසවරුන් කී සැටියේම දවස් යවා මිය දිව්‍ය ලෝකයට ගියහයි වදාරා මේ ‘මංගල ජාතකය’ නිමවා වදාළසේක.

“එසමයෙහි තාපසවරුන් නම් දැන් මේ බුදුපිරිසය. ජ්‍යෙෂ්ඨ අතවැස්සාණෝ නම් ශාරීපුත්‍ර ස්ථවිරයෝය. රක්ඛිත තාපසයෝ නම් බුදුවූ මම්ම වේදැ”යි වදාළසේක.

# 447. ඝතපණ්ඩිත ජාතකය

තවද ශාක්‍යකුලකල්පද්‍රැම වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පුත්‍රයෙකු මළ පියෙකු අරභයා මේ ජාතකය වදාරන ලදි.

ඒ කෙසේද? යත්,

මෙහි වර්තමාන කථාව මට්ටකුණ්ඩලී ජාතකයෙහි විස්තර වශයෙන් පෙනෙන්නේය. මෙහි වනාහී පෙර උත්තමයෝත් කී අවවාදයෙහි "පුත්‍ර ස්නේහය ඇත්තෝ පවා සෝක සන්හිඳුවා උන්නෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස උත්තරාපථයෙහි කංසභෝග නම් රට අසිතජ නම් නුවර මහකංස නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි රජ්ජුරුවන්ගේ කංසය, උපකංසය යි පුත්තු දෙන්නෙක් ඇත්තාහ. දේවගර්භා නම් දියණී කෙනෙක් ඇත්තාහ. ඒ දියණීයන් උපන් ගමනෙම නැකැත් කියන්නා වූ බමුණෝක් ලක්‍ෂණ දැක කියන්නාහු "මේ කුමාරි නිසා මේ රාජවංශය නස්නේය. දැන්ම නසාපුවොත් යහපතැ"යි කීහ. එවිට රජ්ජුරුවෝ "මේ මාගේ දුවණියන් රාජ්‍යයට පැමිණි කල නසතත්, වචනත් උභම දනිති, මම නොදනිමි" ස්නේහයෙන් ඒකස්ථම්භ මාලිගාවක් කරවා අන්ධක වේනහු නම් කොල්ලා, නන්ද ගෝපාල නම් කෙල්ල හා දෙන්නා අත්පා

මෙහෙ කරන්නට සැලැස් වූහ. එවිට කල්යාමකින් මහකංස රජ්ජුරුවෝ මළහ. උන්ගේ වැඩිමහළු පුත්‍ර වූ කංස නම් කුමාරයෝ රාජ්‍යයට පැමිණ තමන්ගේ මලණුවන් යුවරජ තනතුරෙහි තබා පළමු බ්‍රාහ්මණයන් “නැගණියන් නිසා රාජවංශය නසති” කීවා දැන දැනත් නැගණියන්කෙරෙහි ස්නේහයෙන් නොනැසුනාහ.

ඉක්බිති උත්තරා මධුරා නම් නුවර මහසාගර නම් රජ්ජුරුවෝ රාජ්‍යය කරන සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ සාගරය, උපසාගරය යි දරුවෝ දෙදෙනක් ඇත්තාහ. මහසාගර නම් රජ්ජුරුවන් මළ පසු සාගර නම් කුමාරයෝ රාජ්‍යයට පැමිණ තමන් මළණුවන් උපසාගර නම් රාජකුමාරයන්ට යුවරජ තනතුරු පැමිණ වූහ. උපසාගර නම් කුමාරයෝ තමන්ගේ බෑණන් වහන්සේගේ අන්තඃපුරයට වැරදි ගියහ. සාගර නම් රජ්ජුරුවෝ තමන්ගේ අන්තඃපුරයට මළණුවන් වැරදි ගිය ගමනේ එහුබඳවා ගත්හ. උපසාගර කුමාරයෝ අසිතජ නම් නුවරට ගොසින් ඒකස්ථමහ මාලිගාව දැක “මේ කාගේ මාලිගාවෙක්දැ?”යි විචාළ ගමනේ “දේවගර්භ නම් බිසවුන් විසින් ඉඳිනා ඒක මාලිගාවය”යි අසා නම ඇසූ පමණේම්ම ප්‍රතිබද්ධ වූ සිත් ඇතිව නන්ද ගෝපාල නම් කෙල්ල සමීපයට ගොස් කථාකොට බිසවුන් පොලඹවා ගත්තාහ. රාජකුමාරයෝ දේවගර්භා නම් බිසවුන් හා ප්‍රතිබද්ධව එක් උනායෙන් දරු ගර්භයෙක් ඇති විය. එපවත් රජ්ජුරුවන් හා යුව රජ්ජුරුවෝ අසා නැගණියන් කෙරේ ස්නේහයෙන් උන්ට උත්තර නොකියා “පිරිමි පුතෙක් උපනිම්

නම් මරම්හ, ගෑනු දුවක් වීනම් නොනසන්ටය”යි කියා උපසාගර කුමාරයන්ට සෙනෙවිරත් ධූරය දී තමන්ට සේවාකම් කරන්ට සලස්වා නැගණියන් උන්ට පාවා දුන්නාහ.

දේවගර්භා නම් බිසව් නොබෝ කලකින් දුවණි කෙනෙකුන් වැදුහ. රජ්ජුරුවෝ දෙන්න අසා සමාධිව “අංජන දේවිය”යි නමකුත් තබා ගෝවර්ධන නම් නමකුත් දුන්නාහ. ඉක්බිති බිසවුන්ගේ ගර්භයෙක් ඇති විය. නන්ද ගෝපාල නම් කෙල්ලගේ බඩත් දරු ගර්භයක් ඇති විය. දස එකඩ මසකින් රාජකුමාර කෙනෙකුන් වැදූහ. නන්ද ගෝපාල නම් කෙලීත් දියණි කෙනෙකුන් වැදූහ. ඒ බිසව් එවිට තමන් වැදූ පුතණුවන් රජදරුවෝ දෙදෙන ගෙන නසාපියති සිතා නන්ද ගෝපාල නම් කෙල්ල වැදූ දුවණියන් තමන් ලග ලාගෙන තමා වැදූ රාජකුමාරයන් කෙල්ල ලග ලා ගත්හ. මේ නියායෙන් බිසව් රාජකුමාරයන් දස දෙදෙනකු වදෘ කෙල්ල ලග ලා වැඩූහ. කෙල්ල වැදූ දූන් දස දෙනා තමන් ලග ලා වැඩූහ.

ඒ කියන රාජකුමාරයන් දස දෙනාගෙන් පළමුවන කුමාරයෝ වාසුදේවය, බලදේවය, චන්ද්‍රදේවය, සූර්යදේවය, යඟදදේවය, වරුණදේවය, අර්ජුනදේවය, පර්ජුනය, ඝතපණ්ඩිතය, අංකුරය යි යන රාජකුමාරවරු දස දෙනා වැඩිවිය පැමිණ නුවර කොල්ලකා ගෙන ඇවිදිනාහ. රජ්ජුරුවෝ එපවත් අසා කෙල්ල ගෙන්වා “තොපගේ දරුවන් දස දෙනා නුවර කොල්ලකා ගෙන ඇවිදිති. තොපගේ

දරුවන් ඉක්මවා ගනුව''යි කීහ. කෙලි කීප මුරයක් අවවාද කීවත් නොහික්ම, නොයෙක් අලාභ කරන්නාහ. රජ්ජුරුවෝ නන්ද ගෝපාල නම් කෙල්ල දෙවැනිවර ගෙන්වා ''තොපගේ දරුවන් ඉක්මවා ගනුව''යි කී කල්හි එවිට කෙලි ජීවිත දානය ඉල්වාගෙන කියන්නී ''මා වැදූ දස දෙන බිසවුන් වහන්සේ ලගය. උන්වහන්සේ දස බෑ රාජකුමාරයන් වහන්සේ මේ මොලකම් කොටගෙන ඇවිදිනාසේකැ''යි කෙලි කීව. රජදරුවෝ දෙදෙන භයින් ත්‍රස්තව අමාත්‍යවරුන් ගෙන්වා ''එම්බල, දස බෑ රාජකුමාරවරු එක්ව අලෝභල කෙරෙති. කවර උපායකින්වත් උන් හැම මරන්ට උවමැනව''යි රජ්ජුරුවෝ කීය. එවිට අමාත්‍යවරු කියන්නා ''රජ්ජුරුවන් වහන්ස, අන් මානෙක ඇල්ලිය නොහැක්ක. දස බෑ රාජකුමාරවරුන් වහන්සේ මල්ලවයෙහි දක්‍ෂයෝය. ඒසේ හෙයින් 'මල්ලව බලම්හ'යි කියා ඇතුලට ගෙන්වාගෙන අල්වා මරතොත් විනා බැරිය''යි කීහ.

රජ්ජුරුවෝ අකණ්ඩයේ කණය අද්දවා ධජපතාකත් බඳවා අකණ්ඩය සරසා දස බෑ රාජකුමාරවරුන්ට ''මල්ලව අල්වන්ට එව''යි කියා යැවූහ. රාජකුමාරවරුන් ''යහපතැ''යි වීථියට ගොසින් ඒ ඒ වණී පිළි ඇඳගෙන වෑපාර වීථියෙන් සිලිඳු සුවඳ ආදී වූ දෙය ලවාගෙන මාලාකාරයන් සමීපයට ගොසින් මල්වට ආදී වූ දෙය උදුරා පැලඳගෙන අත්පොලසන් දෙමින් ඔල්වර අඬ ගසමින් අවුත් අකණ්ඩයට වැද බලදේවයෝ අත්පොලසන් දී මල්ලනවා නුවර මල්ලන්වා සිටියාය. ''මූට මාගේ අතින් අල්වා එලම්දැ''යි සිතා ඇත්හලට

ගොසින් ඇතුන් බඳිනා කඹයක් ගෙනවුත් කඹය අල්වා දමා ඉග බැඳ මධ්‍යයෙන් බැඳ ලනුව දෙපිල අල්වා ගල්වීතක් කරකවන්නා සේ ඉස වට සිසාරා පොළොව අපුලා කණයමින් එපිට දැමූ ගමනේ වානර මල්ලව ජීවිතක්‍ෂයට පැමිණියේය. දෙවනි ව මුෂ්ටි මල්ලව අවුත් අත්පොලසන් දෙමින් බලදේවයන් හා කැටිව ගාඪට සිට ගමනේ, එවිට බලදේවයෝ මුෂ්ටි අල්වාගෙන ඒ ඒ තැන ඇට සුනුවිසුනු කෙරෙමින් අල්වන ගමනේ "මම මල්ලවයෙක් නොවෙමි" කියද්දී "තා මල්ලව වේවායි, නොවේවා"යි කියමින් සුනුවිසුනු කරන ගමනේ ප්‍රාණය යන අවස්ථාවේ මුෂ්ටි මල්ලවයා ප්‍රාර්ථනා කරන්නේ "මූ උපන් යම්ම ජාතියක නසම්මැ"යි වෛර බැඳ ජීවිතක්‍ෂයට පැමිණී කාලමත්ති නම් වනයෙහි යක්‍ෂව ඉපද ගියේය. එවිට කංස නම් රජ්ජුරුවෝ "මුන් දස බෑයන්, මල්ලවයන් ලවා මරාගත නුහුනුම්හයි, යම් උපායකින් මරවමි"යි අමාත්‍යයන්ට විධාන කළහ. වාසුදේව නම් රාජකුමාරයෝ තමන් අත පාරාවලල්ලෙන් ගැසූ ගමනේ කංස නම් රජ්ජුරුවන් හා උපකංස නම් යුවරජ්ජුරුවන් හා දෙදෙනාගේ ඉස් දෙක පාරාවලල්ලෙන්ම කැපී ජීවිතක්‍ෂයට පැමිණියේය. නුවරවාසී භයින් ත්‍රස්ත වූහ. "භය නොගනුව"යි කියා අස්වසා රාජ්‍යයට හිමිව එයින් නික්ම අයෝධ්‍යපුරයට වැද කාලසේන නම් රජ්ජුරුවන් ජීවිතක්‍ෂයට පමුණුවා ඒ නුවරත් ඇරගෙන එයින් නික්ම සේනාවත් ඇරගෙන වාරවති නුවරට ගියාහ.

ඒ නුවර එක් දිසාවෙක ගංගාවය, එක් දිසාවෙක පර්වතය, එක් දිසාවෙක සමුද්‍රය, ඒ නුවර ගන්ට යම් සතුරු කෙනෙක්

අවුත් නම් ඒ නුවර පවුරු පිට යක්‍ෂණියෙක් සිට කොටළු වේශයෙන් අඬළූ ගමනේම නුවරත් පැතිර ආකාශයට හෝ පැණ නැගී සමුද්‍ර මධ්‍යයෙහි හෝ ගොසින් සිටින්නේය.

එසේ හෙයින් සතුරු කෙනෙකුන් විසින් ඒ නුවර ගත නොහැක්කැයි කීප මුරයෙක උත්සාහකොටත් වාරවති නුවරට අරගත නොහී පලාගොස් එපවත් කණ්හදීපායන තපසයන්ට කීහ. එවිට තාපසයෝ ඒ නුවර ඇරගන්ට උපාය පරීක්‍ෂාකොට කී ගමනේ "යහපතැ"යි කියා දස බෑයෝ ගොසින් කොටළුවාට කියන්නාහු "තොපි නොහඬව, මේ නුවර ඇරගන්ටය"යි කීහ. කොටළු කියන්නේ "මා නොහඬන්ට බැරිය, මම උපායක් කියාලමි. මිනිස් පමණක් උස යානාරාසන සතරයක් ඉදි කරවා වාසල් සතරේ පිටත බිම ඉඳුවා එලිපතුවල කඹ ලාලා බඳන්නා වූ නුවර නොයෙ"යි.

මේ නියාවට නුවර ඇරගෙන ඒ නුවර ඉඳ තෙසැට දසක් රාජධානි සාදා දස බෑයෝ දස කොටසක් බෙදා රාජ්‍යය කරන්නාහු ඒ අවධියෙහි මනුෂ්‍යයන්ට විසිදහසක් අවුරුද්දට ආයුෂ ඇති විය. දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කරන සමයෙහි අපගේ බුහුණිනියන් වහන්සේට කොටසක් දුන්නේ නැත. "උන්ටත් කොටසක් දෙන්ට උවමැනවැ"යි කියා "එකොළොස් කොටසක් කොට බෙදා දෙමිහ"යි කීහ. එවිට බාල අංකුර රජ්ජුරුවෝ කියන්නාහු "මාගේ කොටස දෙමි. නුඹවහන්සේලාගේ රාජ්‍යයේ වෙළඳාම් ආදී වූ දෙයක් කොට රැකෙමි. සුංගම් විවරක් ඇරෙන්නා පමණකැ"යි කියා

අරවාගෙන ඒ නියාවට සලස්වා තමන්ගේ බෙත්ම රට අංජන දේවීන්ට සලස්වා අංකුර රජ වෙළඳාමෙන් වැඩෙයි.

වැඩිමහළු වාසුදේව රජහුගේ කුමාර කෙනෙක් මළහ. උන් මළ සෝකයෙන් නොකා නොබී මහත් වූ සෝකයෙන් ඉඳිනාහ. සන්හිඳුවාලන කෙනෙක් නැති හෙයින් ඝත නම් පණ්ඩිතයෝ "ඒ සෝක සන්හිඳුවමි" සිතා තුමූ අපස්මාර උනු කෙනෙකුන් මෙන් වියරු වෙස්ගෙන ආකාශය බලා "මට සාවෙකු දෙන්ට" කිය කියා මුරගානේය. එවිට රෝහිනී නම් අමාත්‍යයා වාසුදේව නම් රජ්ජුරුවන් සමීපයට ගොස් කියන්නේ "රජ්ජුරුවන් වහන්ස, නුඹවහන්සේගේ මළණුවෝ වියරු වැටී ඒ ඒ තැන වීථියේ ඇවිදිති" කීයේය.

එපවත් රජ්ජුරුවෝ අසා එවිට ප්‍රත්‍ර සෝකය හැරී "මාගේ මළණුවෝ කොයිදැ?"යි කියා වීථියෙහි ඒ ඒ තැන ඇවිදිති දැක සිපගෙන කියන්නාහු "මළණුවෙනි, තොපි කෙසේ වූ සාවකුදැ? තොපි වියරු වැටී සාවෙකු දෙවයි කියන්නේ, රත්රනින්, රිදියෙන්, මුත්තෙන්, මැණිකෙන්, යකඩින්, තඹ කඩින්, පබුළුවෙන් සාවෙකුදැ? නොහොත් බැද්දේ ඉඳිනා සාවෙකු දෙන්ටය"යි කියා වාසුදේව රජ්ජුරුවෝ විචාළාහ. එවිට බෝධිසත්ත්වයෝ කියන්නාහු "මම එසේ වූ සාවෙකුට බැද්දේ ඉඳිනා සාවෙකුට වියරු හුනුයෙම් නොවෙමියි, චන්ද්‍රයා මධ්‍යයෙහි තිබෙන සාවාටය උත්සාහ කරන්නේය"යි කීහ. එපවත් රජ්ජුරුවෝ අසා "මුන් වියරු වැටුනේ සැබැව, ජීවිතය නුමුත් අරගත නොහැකි සාවාට මුන් උත්සාහකොට

වියරු වැටුනේ සැබෑව”යි සිතා කියන්නාහු “මළණුවෙනි, තොපි නුවණැති තැනැත්තන් මෙසේ කියන්නේ කවර නිසාද? කෙසේ තෙපි කීවත් චන්ද්‍රයා මධ්‍යයේ තුබූ සාවා ඇරගත නොහැක්කැ”යි කීහ.

ඝත පණ්ඩිතයෝ කියන්නාහු “රජ්ජුරුවන් වහන්ස, පෙනෙන්නා වූ චන්ද්‍රයා මධ්‍යයේ තිබූ සාවා ඇරගත නියාවට දෙස් නුඹවහන්සේට කීසේක් වෙද, එසේ කල පෙනෙන සාවා ඇරගත නොහැකි කල නුඹවහන්සේගේ මළා වූ පුතණුවෝ කෙසේ එද්දැ?යි උන් නිසා නොකා නොබී සෝකයෙන් ඉන්ට කාරණා කවරේදැ?”යි කීහ. එබස් අසා වාසුදේව රජ්ජුරුවෝ “එසේද කීසේක් වෙද මළණුවෙනි, මාගේ පුත්‍ර ශෝකය අරවන නිසා මේ වියරු වෙස්ගෙන කළ උපායද? මාගේ පුත්‍ර ශෝකය නැමති වන්නිය බොහෝ තෙල් කළ වත්කොට ඇවිලෙන ගින්නට පැන් කළ දහස් ගණන් වත්කොට නිවුවා සේ නිවී ගියේය. මාගේ හෘදයේ වැදගත් මාගේ පුත්‍ර ශෝකය නැමති සල්ලය හල නියාව ඉතා යහපතැයි, මෙතැන් පටන් මාගේ පුත්‍ර ශෝකය අරිමි” කියා එතැන් පටන් සෝක නොකොට ඝත පණ්ඩිතයන් කී අවවාද සිත තබාගෙන රාජ්‍යය කරන්නාහ.

එසමයෙහි දස බෑ රජ්ජුරුවන්ගේ රාජකුමාරවරු එක්ව කෙළිනාහු උනුන් හා කථාකොට “කණ්හදීපායන තාපසයන් වහන්සේ දිවැස් ඇතිසේකැයි කියා අසන්නේය. ඒ අපට පරීක්ෂා කරන්ට උවමැනවැ”යි ඉන්ම රූ ඇති රාජකුමාරය

කෙනෙකුන් ස්ත්‍රී පළඳනා සරහා බඩ පිළී බැඳ දැරි ඇති නියාවට සලස්වාගෙන ගොසින් කියන්නාහු "තාපසයන් වහන්ස, නුඹවහන්සේ දිවැස් ඇතැ"යි කියා අසන්නේය. මේ කුමාරිකාව දැරි ඇතිය, මුන්ගේ බඩ දරුවෝ පිරිමිද? ගෑනුදැ?"යි විචාළේය. එවිට තාපසයෝද "මුන්ගේ බඩ කිහිරි ගැටයක් ඇතිව ඒ උන්ගේ බඩින් වැටෙ"යි දැන රාජකුමාරවරුන්ට කියන්නාහු "මුන්ගේ බඩ ගෑනු දරුවන් කිම්, පිරිමි දරුවන් කිම් තොපට ඇයිදැ?යි තාපසයෝ කීහ. එවිට රාජකුමාරවරු "අපට තත් වූ පරිද්දෙන් කියන්ට උවමැනවැ"යි කියන්නාහු "තමන්ට මරණ කවරද පැමිණේදැයි පරීක්‍ෂා කළාහු එමද පැමිණෙන නියාව දැක එසේ වීනම් තත් වූ පරිද්දෙන් කියමි" සිතා "මුන්ගේ බඩ කිහිරි ගැටයක් ඇත. ඒ කිහිරි ගැටය සත් දවසකින් වදති. ඒ වැදූ කල මුන්ගේ රාජවංශයට විනාශ පැමිණේයි. ඒ කිහිරි ගැටය වන ලා කොටා ධූලි කොට දවා අළුකොට දියෙහි ලා පියව"යි තාපසයෝ කීහ.

එවිට කුමාරවරු "මේ තාපසයෝ මහකූට තාපසයෝය, පිරිමිත් දරුවන් වදද්"යි කියා අතින් පයින් තළා මැරූහ. එවිට දස බෑ රජ්ජුරුවෝ තාපසයන් මැරූ නියාව අසා භයින් ත්‍රස්ත ව රාජකුමාරවරුන් ගෙන්වා විචාළ ගමනේ තාපසයන් කී නියාව තත් වූ පරිද්දෙන් කීහ. රජ්ජුරුවෝ එපවත් අසා රාජකුමාරවරුන්ට රැකවල් ලවා උන් කලට සත්වෙනි දවසින් ඒ රාජකුමාර කිහිරි ගැටය වන ලා කොටා දවා අළුකොට ගඟට දැමූහ. ඒ දැමූ අළු ගඟහලින් ගොස් එක් ගල්හස්සෙක සුඟක් වැලි මුසුව රැඳී ගියේය. එතන

බේරු පඳුරෙක් ඇති වූහ. රාජකුමාරවරු නොබෝ දවසකින් ගඟට දිය කෙළියට ගියාහු දියකෙළිමින් සිට උනුන් හා ඩබරක් වී ඒ ඩබර මහත් විය. ඒ ඩබර රජදරුවෝ එක්ව ගිහාය. ඒ රාජකුමාරවරුන්ගෙන් එක් කෙනෙක් ගඟ අස තිබූ බේරු පඳුර දැක බේරු පඳුරෙන් දණ්ඩක් කඩා ගත්හ. ඒ කැඩූ බේරු පඳුර කිහිරි දණ්ඩ විය. ඒ ඇරගෙන ගැසූහ. සෙසු රජදරුවෝත් ඒ බේරු පඳුරෙන් අතු කඩා ගෙනත් කිහිරි දණ් විය, පත්‍ර කඩා ගත්තන් කිහිරි පත්‍ර විය. මේ නියායෙන් කිහිරි දඬු ගෙන උනුන් මරා ජීවිතක්‍ෂයට පැමිණා වුහ.

ඉන් ගැලවුනා වූ වාසුදේව රජ්ජුරුවෝය, බලදේවය, අඤ්ජන දේවිය, පුරෝහිත බ්‍රාහ්මණයාය යන මේ සතර දෙන රථයකට නැගී නුවර අනික් තැනකට යන්නාහු කාලමත්ති නම් වනයට පැමිණියාහ. බලදේවයන් හා මල්ලව අල්වා මළා වූ මුෂ්ටි නම් මල්ලවයා ඒ වනයෙහි රාක්‍ෂස ව උපන්නේය. “මාගේ සතුරා කවර දවසෙක මරම් දෝ හෝ”යි සිත සිතා උන් තෙනට වාසුදේව රජ්ජුරුවන් නැගී රථය පැමිණියේය. මුෂ්ටි මල්ලව බලදේවයන් දැක මල්ලව වේශයෙන් අවුත් අත්පොලසන් දී මල්ලවයාට සිටියේය. බලදේවයෝ ඔහු දැක “මල්ලව අල්වමි” රථයෙන් බස්නට වන්කල වාසුදේව රජ්ජුරුවෝ “මල්ලව නොඅල්ව”යි වලක්ව වලක්වා කියදීත් නොවැලක මල්ලව අල්ලන්ට බැසපු කලට රාක්‍ෂසයා බලදේවයන් අල්වාගෙන උණ කිලිල්ලක් සේ සපා කාපීය. වාසුදේව රජ්ජුරුවන් හා අඤ්ජන දේවින් හා බ්‍රාහ්මණයා හා

තුන්දෙන රථයට නැගී අනික් ගමකට ගොස් රජ්ජුරුවෝ තුබූ බැද්දට වැද තුමූ ඉනකඩින් ඉස වසාගෙන තනට වසාගෙන අඤ්ජන දේවීන් හා බමුණාත් බත් පිසගෙණ එන නියායෙන් යවූහ.

ඒ ගම ජරා වැද්දෙක් දඩයමට ගිය ගමනේ "ඌරෙකැ"යි සිතා තෙබින් ඇනි කලට මිනිසෙකු නියාව දැන භයින් ත්‍රස්තව දිවන්ට වන් කලට "නොයව, නොබව"යි තමන් ලගට ගෙන්වාගෙන "තාගේ නම කිම්දැ?"යි විචාළ ගමනේ "ජරා නමැ"යි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු "එම්බල, මාගේ ජාතකයෙහිති ජරා නම් එකෙකු අතින් ඇන්මක් කා මියති" කීහ. "එසේ හෙයින් නොබව"යි කියා රඳවාගෙන ඌ ලවාම තෙබ අද්දවා බේත් බඳවාගෙන උන් කලට අඤ්ජන දේවින් හා බ්‍රාහ්මණ ආයේය. එවිට රජ්ජුරුවෝ කියන්නාහු "මට මරණ මෙතන දී නියමය"යි එපවත් කියා "තෙපි දෙන්න යම් තැනක ඉඳ රැකෙව"යි කියා උන් හැම රක්නා විචරට ශාස්ත්‍රයක් උගන්වා යවා තුමූ එතනම මළහ. "එම්බා මහණෙනි, මෙතෙක් රජදරුවන්ගෙන් ගැලවුනේ අඤ්ජන දේවීමය වදරා මේ 'ඝත ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි රෝහිනී නම් අමාත්‍ය ආනන්ද ස්ථවිරය. එසමයෙහි වාසුදේව නම් රජ ශාරිපුත්‍ර ස්ථවිරයෝය. එසමයෙහි ඝත පණ්ඩිතයෝ ව උපන්නෙම් බුදුවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 448. මාතුපෝසක ජාතකය

තවද මේ ජාතකය ජේතවනාරාමයෙහි වැඩවසන්නා වූ සර්‍ව ක්ලේශයන් සර්‍වාකාරයෙන් නැසුවා වූ සියළු පදර්ථතයන් ස්වයම්භූ ඥානයෙන් දත්තා වූ සර්‍වඥයන් වහන්සේ විසින් දෙමව්පියන්ට උපස්ථාන කරන්නා වූ එක් භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

මෙහි වර්ථමාන කථාව සාම ජාතකයෙහි විස්තර වශයෙන් කියන ලදි. එපරිද්දෙන්ම සර්‍වඥයන් වහන්සේ තමන් සමීපයට ඒ මාතුපෝසක භික්‍ෂූන් වහන්සේ කැඳවාගෙන ආවා වූ භික්‍ෂූන් වහන්සේට ආමන්ත්‍රණයකොට වදරණසේක් “එම්බා මහණෙනි, ඒ භික්‍ෂු හට නින්ද නොකරව, පුරාතනයෙහි තිරිසන් ව උපන්නාහු පවා මෑණියන්ගෙන් වෙන් වූවාහු සතියක් මුළුල්ලෙහි නිරාහාරව වියලෙන්නා වූ රජදරුවන්ට සුදුසුකොට එලවන ලද ආහාරය ලැබත් ‘මෑණියන් ඇරපියා අනුභව නොකෙරෙමි’ කියා මෑණියන් දැක ගොදුරු කෑවෝ වේදැ”යි වදරා එක්තරා භික්‍ෂු කෙනෙකුන් වහන්සේ විසින් ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි අප මහබෝසතාණෝ හිමාලය වනයෙහි ඇත් කුලයක ඉපද සර්වාංගය ධවල ව

විශිෂ්ට රූපයක් ධරන්නා වූ අසූ දහසක් පමණ ඇත්තු නිරන්තරයෙන් පිරිවරන්නාහ.

මහබෝසතාණන්ගේ මෑණියෝ ඇස් අන්ධ වූයේය. එකල බෝධිසත්ත්වයෝ මිහිරි වූ පලාඵල ඇතුන් අතට කඩා දී මෑණියන් සමීපයට යවන්නාහු ගෙනියන්නාවූ ඇත්තු තුමූ තුමූම අනුභවකොට පියා ගෙනගොස් නොදන්නාහ. ඒ මහබෝසතාණෝ පරීක්ෂාකොට ඒ බව දැන ඇත් සමූහයා ඇර "මාගේ මෑණියන් මම්ම පෝෂ්‍යය කෙරමි" කියා රාත්‍රියෙහි සෙසු ඇතුන්ට නොහඟවා මෑණියන් කැඳවාගෙන 'චන්ඩෝර' නම් පර්වත පාදයට ගොස් එතන හුණ පඳුරක් සමීපයෙහි පිහිටියා වූ ගල් ගුහාවෙක මෑණියන් රඳවා නිරන්තරයෙන් පලාඵල ගෙනවුත් පෝෂ්‍යය කරන්නාහ.

එකල බරණැස් නුවර වසන්නා වූ වැදිපුත්‍රයෙක් වලට වැද මන්මුළා වූයේය. දිග් නියමයක් කොට නොහෙන්නේ මහහඬින් ඇඬුයේය. මහබෝසතාණෝ ඔහු ඇඬූ අඬ අසා "මේ පුරුෂතෙම අනාථයකින් මා වැනි එකෙකු විද්‍යමානව සිටියදී මිය ගියේ වීනම් සුදුසු නොවන්නේය"යි ඔහු කරාගොස් තමන් දැක භයගෙන යන්නාවූට "එම්බල පුරුෂය, මා නිසා තට භයක් නැත්තේය"යි ඔහු රඳවා "තෝ මේ වනයෙහි කුමක් පිණිස අඬා ඇවිදීදැ?"යි විචාරා ඔහු විසින් "ස්වාමීනි, මන්මුළා වුයේ අදට සතියෙකැ"යි කී කල්හි මහබෝසතාණෝ "එම්බල පුරුෂය, තොපට භයෙක් නොකොට ගෙනගොස් මනුෂ්‍යපථයෙහි පිහිටුවා ලමි" කියා ඒ මිනිසා

පිටට නන්වාගෙන වලින් මඟට බාවා මහබෝසතාණෝ නැවත වල් වන්නාහ. පාපී වූ ඒ පුරුෂයාද "මම නුවරට ගිය කල්හි රජ්ජුරුවන්ට කියමි" සිතා තමා යන්නා වූ මහවෘක්‍ෂයෙන් හා පර්‍වත සලකුණු පරීක්‍ෂාකොට ගෙන ගියේය. එකල බරණැස් රජ්ජුරුවන්ගේ මඟුලැතා වැටුණේය. රජ්ජුරුවෝද ඒ දවස් නුවර බෙර ලවන්නාහු "ඉදින් යම් කෙනෙක් කොතනක මඟුලැත් කමට සුදුසු ඇතකු දුටුවා වීනම් කියව"යි නුවර බෙර ලැවූහ.

එසඳ ඒ පුරුෂතෙම රජ්ජුරුවන් කරා ගොස් "දේවයන් වහන්ස, නුඹවහන්සේට ආරෝහනයට නිසි සර්‍වාඩග ධවල වූ ඇත් රජෙක් මා විසින් දක්නා ලදී. ඔහු ලඟට මම මඟ කියමි. මා හා කැටිව ඇත්රුවන් එවා ගෙන්වාගත මැනවැ"යි කීහ. රජ්ජුරුවෝ "යහපතැ"යි ඔහු හා කැටිව ඇතරුවන් යැවූහ. ගියා වූ ඇතරුවෝ ඔහු සමඟ ගොස් බෝධිසත්ත්වයන් විසින් පියුම් විලට ගොස් ගොදුරු අනුභව කරන්නවුන් විසින් දුටහ. බෝධිසත්ත්වයෝද ඇතරුවන් දැක "මට මේ උපන්නා වූ භය අනෙක් කෙනෙකුන් නිසා උපන්නෝ නොවෙයි, මා විසින් මනුෂ්‍යපථයට පමුණුවා සංග්‍රහ කරන ලද පුරුෂයා සමීපයෙන් උපන්නේය. මම වනාහි හස්තීන් දහසක් දෙනා බිඳුවාපියන තරම් මහබල ඇත්තෙමි. ඉදින් මම කිපියෙම් වීම් නම් බලවාහන සහිත වූ සියළු රාජ්‍යය නසාපියන්ට සමර්ථයෙමි. එසේම කිපීයෙන් වීම් නම් මා විසින් රක්‍ෂා කරන ලද ශීලය බිඳෙන්නේය. එසේ හෙයින් මේ සත්ත්වයෝ අද මට

ශස්ත්‍ර අඩයටි වලින් කොටත් නමුත් නොකිපෙමි" සිතා අධිෂ්ඨානකොට ගෙන කරබා නිශ්චලව සිටියාහ.

එකල ඇතරුවෝද පියුම් විලට බැස මහබෝසතාණන් ලක්‍ෂණ සමුර්ධිය දැක "මෙසේ එව දරුව"යි කියා රිදි දමකට බඳු වූ සොඬ අතින් අල්වාගෙන නික්ම සත්වෙනි දවස් බරණැස් නුවරට පැමිණියෝය. බෝධිසත්ත්වයන්ගේ මෑණියෝ පුතණුවන් නොයන හෙයින් "මාගේ දරුවන් රාජ රාජාදී මහඅමාත්‍යයන් විසින් ගෙනයන ලද්දේ වන, දැන් මාගේ දරුවන්ගේ වියෝගය මේ වන ලැහැබ වැඩෙන්නේය"යි කියමින් අඬන්නාහු මෙසේ කියත් "මේ දෙමව්පියන්ට උපස්ථාන කරන්නා වූ ඇත් රජ්ජුරුවන්ගේ බැහැර යාමෙන් මේ වනයෙහි හිසළු කිළිඳු, කණේර ආදී වූ අනේකප්‍රකාර පුෂ්ප ජාතීහූ අතු පතු නොකැඩීමෙන් සලෝලව වැඩී සිටිනාහ. වන නෙළුම්, අලගොඬ, මහමූ, කිනිහිරි ආදී වූ වෘක්‍ෂ ජාතීහුද, අතමුල අතුපතරක් නොකැඩීමෙන් මනාව හටගෙණ මලින් සැදී සිටිනාහුය. යම් බඳු වූ මා පුතණුවන් පිට උන්නාහු රජ, යුවරජ, ඇමති ආදී වූ අය නිර්භීතව පස මිතුරන් බිඳ මරා රාජ්‍යය ගන්නාහ. සවර්ණාලඞකාරයෙන් සැරහුනා වූ එබඳු රාජ රාජ මහකුමාරාදීහු තමන්ගේ පරසතුරන් සාධා දුන් හෙයින් සතුටුව රජ්ජුරුවන්ගේ මෙහෙ නිමවන ලද රසමසවුලෙන් යුක්තකොට සමුර්ධි කරන ලද උතුම් භෝජනයෙන් පෝෂ්‍යය කරන්නේ වේදැ"යි යනාදීන් කියමින් අඬන්න වූහ.

බෝධිසත්ත්වයන් ගෙන යන්නා වූ ඇතරුවෝද ඇත් රජ්ජුරුවන් ගෙනෙන නියාව රජ්ජුරුවන්ට කියා යවූහ. රජ්ජුරුවෝද නුවර අලඞකෘතකොට සැරසවූහ. එකල හස්ත්‍යාචාරීහුද මහබෝසතාණන් ගෙන නුවරට වැද පිරිබඩගෙන සරහා පිළියෙල කරන ලද ඇත්හලට ගෙනගොස් සිටුවා විසිතුරු තිරබඳවා රජ්ජුරුවන්ට දන්වා යවූහ. රජ්ජුරුවෝද සතුටුව නොයෙක් රසයෙන් අග්‍ර වූ භෝජනය ගෙන්වා ගෙනගොස් මහබෝසතාණන්ට දෙවූහ. බෝධිසත්ත්වයෝද "මෑණියන් නැතිව ගොදුරු අනුභව නොකරමැ"යි ආලෝපයකුත් නොගත්තාහ. මෙසේ ගොදුරු අනුභව නොකරන්නා වූ ඇතාණන්ට යාඥා කරන්නා වූ රජ්ජුරුවෝ මෙසේ කියත් "එම්බා ඇත් රජ්ජුරුවෙනි, යම් රාජ්‍ය කටයුත්තක් නිසා ගෙන්නුවෝ වීනම් එසේ වූ තොප විසින් සිද්ධ කරවන රාජකාරිය බොහෝය. එසේ හෙයින් තොපගේ ශරීරය දුර්වල නොකොට ගොදුරු අනුභව කරව"යි කීය.

එබසට බෝධිසත්ත්වයෝ කියන්නාහු "රජ්ජුරුවන් වහන්ස, මාගේ වියෝගයෙන් බැගෑපත් කිසි පෝෂ්‍යයක් කරන කෙනෙකුන් නැතිව අන්ධ හෙයින් චන්ඩෝර නම් පර්වත ප්‍රාන්තයට පැමිණ එතැන්හි උල් පහන් මඩිමින් ඇවිදින්නාහු කනේරු ධෙනුවක මෙන් ඒකාන්තයෙන් අඬා ඇවිදිනීය. එසේ හෙයින් මා ගොදුරු අනුභව කරන්නේ නැතැ"යි කීහ. නැවත රජ්ජුරුවෝ කියන්නාහු "එම්බා ඇත් රජ්ජුරුවෙනි, එසේ ඇස් අන්ධව පෝෂ්‍යය කරන්නා වූ, කිසි කෙනෙකුන් නැතිව

චන්ඩෝර නම් පර්වත සමීපයෙහි උල් පහන් මඩමින් ඇවිදිනා වූ ඇතින්නී තොප කවරෙක්දැ?"යි විචාළාහ. එවිට බෝධිසත්ත්වයන් වහන්සේ කියන්නාහු "රජ්ජුරුවන් වහන්ස, ඇස් අන්ධව එලෙස ඇවිදිනා වූ ඇතින්නී නම් මා විසින් ගොදුරු ගෙනවිත් ලා පෝෂ්‍ය කරන ලද මාගේ මෑණියෝය"යි කියා "ඇස් අන්ධ වූ මෑණියන් පෝෂ්‍ය කරමියි, මා විසින් පෝෂ්‍ය කරන ලද ඒ මාගේ මෑණියන් ගොදුරු නොලත්තේ ආදීන් සත් දවසය. එසේ වූ ගොදුරු නොලබන්නා වූ මාගේ මෑණියන් වියළී මියන්නාහුය. උන් මළ දී ගොදුරු අනුභව කරන්නේ නැතැ"යි කීය. එබස් ඇසූ රජ්ජුරුවෝ අමාත්‍යයන්ට කියන්නාහු "එම්බා ඇස් අන්ධ වූ මෑණියන් පෝෂ්‍ය කරමි. උන් මළ දී ගොදුරු අනුභව කරන්නේ නැතැයි කියන ලද මෙම ඇතාණ කෙනෙක් ඇද්ද? උන් වහා මුදා ඇරපියාව. ඒ ඇත් රජතෙමේත් තමාගේ මෑණියන් හා අවශේෂ බන්ධුන් හා ද එක්ව සතුටු ව සැපසේ යෙමි"යි කියා බන්ධනයෙන් මුදාපුව.

ඒ බන්ධනයෙන් මිදුනා වූ ඇත් රජ්ජුරුවෝද මදක් සැතපීගෙන රජ්ජුරුවන්ට දසරාජ ධර්මයෙන් බණ කියා අවවාදකොට මහජනයා විසින් ගඳමල් ආදියෙන් පූජා කරමින් සිටියදී නුවරින් පිටත්ව එදවස්ම පියුම් විලට ගොස් "මාගේ මෑණියන් ගොදුරු අනුභව කරවා විනා මම ගොදුරු නොගනිමි" බොහෝ නෙළුම් මල් ඇරගෙන ගොස් ගල්ලෙනින් පිටත්ව දොරකඩ සමීපයෙන් උන් මෑණියන් සමීපයට ගොස් නිරාහාරයෙන් වියළී ගිය ශරීරයට ස්නේහ පිණිස ඉස් මුදුනේ

පැන් සැළූහ. එකල මහබෝසතාණන්ගේ මෑණියෝ “වැසි වසති” යන සිතින් කියන්නාහු “යම් බඳු වූ මට පෝෂ්‍යය කරන්නා වූ මා වදාගත් මාගේ පුතණුවෝ අනියන්ව ගියහ. එසේ හෙයින් සෝක කරව, මා සමීපයෙහි දුෂ්ට වූ අනාචාර්ය ස්වරූප ඇති කෙසේ වූ නොකල් වැස්සෙක්ද වසිනේය”යි යනාදීන් අක්‍රෝස කළාහ. එකළ මහබෝසතාණෝ අස්වසන්නා වූ “මෑණියෙනි, වැදෑ රටවාසී වූ යසපිරිවර ඇති ඒ කසි රජ්ජුරුවන්ගෙන් මිදිනිමි. මම නුඹවහන්සේගේ පුතණු වෙමි, ආයෙමි. එසේ හෙයින් නැගී සිටිමින් කිමෙක්ද? ගොදුරු අනුභව කරන්නැ”යි කීය. එකල බෝධිසත්ත්වයන්ගේ මෑණියෝ රජ්ජුරුවන්ට අනුමෙවැනි කරන්නාහු “යම් සේ මට නිරන්තරයෙන් වැඩ පසස්නා වූ මාගේ පුතණුවන් කසීරට වැඩ පසන්නා වූ යම් රජ්ජුරු කෙනෙක් මුදවා අරවාපූද? ඒ රජ්ජුරුවෝ බොහෝ කලක් ජිවත් වෙත්ව”යි කියමින් ස්තුති කළාහ.

රජ්ජුරුවෝද බෝධිසත්ත්වයන්ගේ ගුණයෙහි පැහැද පියුම් විල සමීපයෙහි ගමක් කරවා මහබෝසතාණන් හා මෑණියන්ට නිරන්තරයෙන් වෘර්ති තිබූහ. ඉන් මෑත භාගයෙහි බෝධිසත්ත්වයන්ගේ මෑණියන් කළුරිය කළ කල්හි මහබෝසතාණෝ ශරීරය අදාහණ කෘත්‍යයකොට ක්‍රන්ත නම් ආශ්‍රම පදයට ගියාහ. ඒ ස්ථානයෙහි පන්සියයක් පමණ තපස්විවරහු හිමාලයෙන් අවුත් වන්නාහු බෝධිසත්ත්වයන්ට ලැවූ වෘර්තිය ඒ තාපසවරුන්ට සැලැස් වූහ. රජ්ජුරුවෝ මහබෝසතාණන්ගේ රූපය හා සමාන රුවක් ගලින් කරවා

නිරන්තරයෙන් මහත් වූ සත්කාර පවත් වන්නාහ. ජම්බුද්වීපවාසී වූ අවුරුද්දක් පාසා හස්තිපුර නම් පූජාවක් කරන්නාහ. ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදරා චතුස්සත්‍යය ප්‍රකාශකොට මේ ‘මාතිපෝසක ජාතකය’ නිමවා වදාළ සේක. චතුස්සත්‍යයාගේ කෙළවර මාතිපෝසක භික්‍ෂූන් වහන්සේ සෝවාන් ඵලයෙහි පිහිටිසේක.

“එකල රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. එදවස් ඇතිනී නම් දැන් මේ මහමායා දේවිය. එදවස් මෑණියන්ට උපස්ථාන කළ ඇතාණෝ නම් බුදුවූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 449. ජුණ්හ ජාතකය

තවද මේ ජාතකය ජේතවනාරාමයෙහි වසන්නා වූ බුදුරජාණන් වහන්සේ විසින් ආනන්ද සාමීන් විසින් ලබන ලද වර අටක් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්,

සර්වඥයන් වහන්සේට බුදුවූ විසි අවුරුදු වනතුරු නිරන්තරයෙන් නියම උපස්ථාන කරන්නා වූ එකද භික්ෂු කෙනෙකුන් වහන්සේ නැත. සමහර දවසක් නාගමාල නම් තෙරුන් වහන්සේ නියමයක් නැතිව උපස්ථාන කරනසේක. එක් දවසක් සර්වඥයන් වහන්සේ භික්‍ෂූන් වහන්සේ සමීපයට කැඳවා වදරනසේක් “එම්බා මහණෙනි, මම දැන් වයෝවෘද්ධ යෙමි.

සමහර භික්ෂු කෙනෙකුන් මා හා සමග යමින් සිට 'මේ මගින් යම්හ'යි කීවොත් ඔහු අන් මගකින් යන්නාහ. සමහර කෙනෙක් මාගේ පා සිවුරු බිමට දමාපියා යන්නාහ. එසේ හෙයින් මට නිරන්තරයෙන් උපස්ථාන කරන්නා වූ එක් භික්ෂු කෙනෙකුන් නියම දනුව"යි වදාළසේක. එසේ කල "මම උපස්ථාන කෙරෙමි" දෙහොත් මුදුනේ බැඳ සිටියා වූ සැරියුත් සාමි ආදිකොට ඇති භික්‍ෂූන් වහන්සේලාට වදාරනසේක් "එම්බා, තොප තොපගේ ප්‍රාර්ථනා මුදුන් පැමිණියේය"යි වළකා වදාළසේක. නැවත භික්‍ෂූන් වහන්සේ එක්ව අනඳ සාමීන්ට "ඇවැත්නි, තොපි උපස්ථාන කරන්නා වූ ස්ථානාන්තරයට යාඥා කරව"යි කීසේක. එකල අනඳ සාමි වදාරනසේක් "ස්වාමීනි, බුදුහු ඉදින් තමන් ලත් සිවුරු මට නොදෙනසේක් වීනම්, තමන් ලත් ආහාරයක් මට නොදෙනසේක් වීනම්, එක ගඳකිළියේ වාසය කළ නොදෙනසේක් වීනම්, මා කැඳවාගෙන තමන්වහන්සේට ආරාධනාවට වඩනාසේක් වීනම්, ඉදින් දුරුරට වලින් බුදුන් දකින්ට අවුත් පැමිණි සත්ත්වයන් ඒ වේලෙහි කැඳවා ගෙනගොස් දකින්ට ලැබේ නම්, යම් කලෙක්හි මට සැකයෙක් උපනී නම් ඒ වේලෙහි මම බුදුන් කරා යන්ට අවසර ලැබේ නම්, බුදුහු ඉදින් මා නෝමැදයේ බණ වදාළසේක් වීනම් ඒ බණ අවුදින් මට වදාරනසේක් වීනම් එවිට මම ද බුදුන්ට උපස්ථාන කෙරෙමි.

මේ ප්‍රතික්‍ෂෙප වර සතරක්ද, යාඥා වර සතරක්දැයි වර අටක් ඉල්වූසේක. බුදුහු වර අට දෙවා වදාළසේක. ඒ දවස්

පටන් අනඳ සාමි පස්විසි අවුරුද්දක් බුදුන්ට නිරන්තරයෙන් උපස්ථාන කළසේක. මේ ආනඳ සාමි පඤ්චස්ථානයකින් ඒතදග්‍රපාලියෙහි තිබිය යුතු ධානාන්තරයට පැමිණිසේක. අඩගසම්පදය, අධිගමසම්පදය, අර්ථපරිපුච්ඡාසම්පදය, යොනිසොමනස්ස සම්පදය, බුඞිපණිශ්‍රය සම්පදයයි මේ සප්තවිධ සම්පදවෙනුත් යුක්තසේක. සර්‍වඥයන් වහන්සේගෙන් වර අටක් ලැබ ශාසන නැමති ආකාශයෙහි පැන නැංගා වූ පුන්සඳ මඬලක් මෙන් ප්‍රසිද්ධ ව වසනසේක.

එකල්හි එක් දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස්ව වැඩ හුන් භික්ෂූන් වහන්සේ ඔවුන් වහන්සේට ආමන්ත්‍රණයකොට වදරනසේක් "එම්බා ඇවැත්නි, බුදුහු ආනන්ද ස්ථවිරයන්ට වර දීමෙන් සන්තර්පණය කළසේකැ"යි කියමින් උන්සේක. එකල සර්‍වඥයන් වහන්සේ ගඳකිළියෙහි වැඩහිඳ ඒ බව දිව්‍යකණින් අසා තුන්තරා ගමණින් එක්තරා ගමනකින් දම්සබා මණ්ඩපයට වැඩ බුද්ධාසන මස්තකයෙහි වැඩහිඳ වදරනසේක් "එම්බා මහණෙනි, මා එන්නාට පූර්‍ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?යි කිනම් කථාවෙක් තොපට අඩාල විදැ?"යි විචාරා වදරා ඒ භික්‍ෂූන් වහන්සේ විසින් "ස්වාමීනි, නුඹවහන්සේ විසින් නොකියන්නට වදාළ දෙතිස් කථාවෙන් එක්තරා කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ. දැන් මේ ආනන්ද ස්ථවිරයන් වරලත් නියාව කිය කියා උනුම්හ"යි කී කල්හි "එම්බා මහණෙනි, ආනන්ද ස්ථවිරයන් වර ලද්දේ දැන්මතු නොවෙයි, පෙරත් වර ලද්දේ වේදැ"යි වදරා භික්‍ෂූන් වහන්සේ අතුරෙන් එක්තරා භික්ෂූ කෙනෙකුන්

වහන්සේ විසින් ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ විසින් ඉකුත්වත් දක්වා වදාළසේක.

එම්බා මහණෙනි,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි පුරණලද බෝධිසම්භාර ඇති අප මහබෝසතාණෝ බරණැස් රජ්ජුරුවන්ට පුත් ව ඉපිද "ජුන්හ කුමාරය"යි මේ නමින් ප්‍රසිද්ධ ව තක්සලා නුවරට ගොස් ශිල්ප උගන්නාහු එක් දවසක් රාත්‍රී භාගයෙහි ආචාර්‍යයාට වනපොත් දී තමන් වසන්නා වූ ගෙට වහ වහා යන්නාහු එක්තරා බමුණකු බත් සිඟාගෙන තමා වසන තෙනට යන්නාහු අන්‍ධකාරයේ උරයෙන් පැහැර බමුණා හා සමග බත් ලබ්බත් බිඳපූහ. බමුණුද වැටී හුණුයේය, බැගෑපත් හැඬින් ඇඬුයේය, ජුන්හ කුමාරයෝත් ඔහු දැක උග කෙරේ කරුණාවෙන් ආ පස්සේ අවුදින් බමුණා අත අල්වා නගා සිටුවා, බමුණුද කුමාරයන් එකරුත්ත අල්වාගෙන "එම්බා දරුව, තොප විසින් මාගේ භික්‍ෂා භාජනය බිඳ පියනලද, එසේ හෙයින් මාගේ බත් මිළ දෙව"යි කීහ. එබසට ජුන්හ කුමාරායෝ කියන්නාහු "එම්බා බමුණානෙනි, දැන් තොපගේ බත් දිය නොහෙමි. මම වනාහී කසී රජ්ජුරුවන්ගේ පුත් වූ ජුන්හ කුමාරයෝය. රාජ්‍යයෙහි පිහිටි කල මා සමීපයට අවුදින් වස්තු ඉල්වා ගණුව"යි කීහ. එතනින් පහව ශිල්ප ඉගෙන නිමවා ආචාර්‍යයන් වැඳ සමුගෙන බරණැස් නුවරට ගොස් පියරජ්ජුරුවන්ට ශිල්ප දැක්වූහ. රජ්ජුරුවෝද "ජීවත්ව

උන්නා වූ මා විසින් මාගේ දරුවෝ දක්නාලදද. රාජ්‍යශ්‍රීයට පැමිණියාහුන් දැකිමි" සිතා කුමාරයන් රාජාභිෂේක කළාහ.

එකල "ජුන්හ රජ්ජුරුවෝය"යි මේ නමින් ප්‍රසිද්ධව දසරාජ ධර්‍මයෙන් රාජ්‍යය කරන්නාහ. බමුණු එපවත් අසා "දැන් වනාහී මාගේ බත් මිළ ගෙනෙමි" කියා බරණැස් නුවරට ගොස් රජ්ජුරුවන් සර්‍වාභරණයෙන් සැරහී නුවර පැදකුණුකොට යන කල්හි දැක එක් උසකට පැන නැගී අත්නගා "ජයතු භවං මහා රාජ" යනාදීන් ආශිර්‍වචනයකොට සිටියේයි. රජ්ජුරුවෝ ඔහු නොදැකම නික්මුණාහ. රජ්ජුරුවන් නොබලා නික්මුණු නියාව දුටු බමුණු රජ්ජුරුවන් හා සමග කථා කරන්නට පටන් ගත්තේය. මෙසේ කියා "ජනප්‍රධාන වූ රාජෝත්තමයාණනි, මා කියන්නා වු බස් ඇසුව මැනව. එක් කටයුත්තක් පිණිස මම මෙතනට පැමිණියෙමි. එසේ හෙයින් කතර ගෙවා ආවා වූ අප වැනි බමුණන් සිටිය දී පිටිපාලා යාම සුදුසු නොවේ"යි කීව. රජ්ජුරුවෝ ඔහු කී බස් අසා විදුර අකුස්ස ගෙන ඇතු කොටා රඳවා බමුණා හා සමග කථා කරන්නාහු මෙසේ කියත් "එම්බල බමුණ, සම කටයුත්තක් පිණිස තෝ මා සමීපයට පැමිණියේ වීනම් ඒ මට කියවයි මම සිට අසමි. තෝ මා කවර ප්‍රයෝජනයක් පිණිස ප්‍රාර්ථනාකොට සමීපයට ඇයිද? ඒ බැවින් විචාළ මට නොවලහා කියව"යි කීහ.

එබසට බමුණු කියන්නේ "රජ්ජුරුවන් වහන්ස, මට ගංවර පසක් දුන මැනව, කෙල්ලන් සියයක් දුන මැනව, කිරිදෙනුන්

පන්සියයක් දුන මැනව, ගොන් සත්සියයක් දුන මැනව, රත්‍රන් සත්විසි දසක්ද, තවද කුලයෙන් මා හා සාදෘශ්‍ය වූ බිරින්ද කෙනෙකුන් දුන මැනව"යි කීහ. එබසට රජ්ජුරුවෝ කියන්නාහු "බමුණ, තාගේ භයානක වූ ස්වරූප ඇති තපසෙක් ඇද්ද? නොහොත් විසිතුරු ස්වභාව ඇති සිතූ දෙය සිද්ධකොට දෙන්නා වූ මන්ත්‍රයෙක් ඇද්ද, නොහොත් තෝ කීවා සිද්ධකොට දෙන යක්‍ෂයෙක් ඇද්ද, නොහොත් තොප විසින් මට කරනලද උපකාරයක් සිහි කරවුදැ?"යි විචාළාහ.

එකල බමුණු කියන්නේ "භයානක ස්වරූප ඇති තපසකුත් මා කෙරෙහි නැත, සිතූ සිතුවා සිද්ධ කර දෙන මන්ත්‍රයකුත් නැත, මා කිවා සිද්ධකොට දෙන කෙනෙක් නැත, නුඹවහන්සේට මා විසින් පෙර කරනලද උපකාරයකුත් නොදනිමි. බල එකෙක් ඇත්නම් නුඹවහන්සේ හා මා හා පෙර ඔවුනොවුන් හා කරනලද කථා ස්වරූප මාත්‍රයෙක් ඇතැ"යි කීහ. නැවත රජ්ජුරුවෝ කියන්නාහු "එම්බල බමුණ, තාගේ හා මාගේ පළමුවන දැකුම වන්නේය, මට පළමු තා දන්නේ නැත. එසේ හෙයින් කවර කලෙක තා හා මා හා සංගමයෙක් ඇද්දැ?යි, ඒ කාරණා විචාළවූ මට කියව"යි කීහ. නැවත බමුණු කියන්නේ "ගන්ධාර රාජ්‍යයෙහි සිත්කළු වූ තක්සලා නුවරදී රාත්‍රියෙහි ඝණ වූ අන්ධකාරයෙහි අපි දෙන්න උරය ගැටී ගියම්හ. එකල අපි දෙන්නාම එතන සිට මතු කල්පනා කටයුත්තක් සිහි කළම්හ. අප දෙන්නාගේ මිත්‍ර සථවයෙක් නම් එපමණෙක්මය, ඊට පසුව පළමු මා දන්නා සත්ත්වයෙක් නැතැ"යි කීය. එකල ඒ රජ්ජුරුවෝ කියන්නාහු

“එම්බල බමුණ, යම් කලෙක්හි සත්පුරුෂ සත්ත්වයන් හා සමග සංග්‍රහයෙක් වීනම් නුවණැත්තෝ ඒ නොනසන්නාහුය, අඥානයන් හා සමග මිත්‍ර සන්‍ථවයෙක් ඇත්නම් වේවයි පළමු කරනලද කෘතෝපකාරයෙක් වේවයි අඥානයන් විෂයෙහි බොහෝකොට කරන ලද්දා වූ උපකාරයෙක් ඇත් නමුත් නස්නේය, ඒ එසේමය. අඥානයෝ කෙලෙහි ගුණ නොදන්නා වූ ස්වභාව ඇත්තාහුය. නුවණැත්තාවුන්ගේ වනාහි මිත්‍ර සන්‍ථවයෙක් ඇත්නම් වේවයි පළමු කරනලද උපකාරයෙන් ඇත්තේ වීනම් නොනස්නේය. එසේ හෙයින් නුවණැත්තෝ ස්වල්ප මාත්‍ර වූ කෘතෝපකාරය නොනස්නායුය ස්වභාව ඇත්තාහ”යි කියා ඔවුන් විසින් ඉල්වනලද වර දුන දෙන්නාහු මෙසේ කියත් “එම්බල බමුණ, තට ලක්‍ෂයක් නිමන්නා වූ ගම්වර පසක්ද, කෙල්ලන් සියයක් දෙමි. දෙනුන් පන්සීයක් දෙමි. ගොන් සත්සීයක් දෙමි. මැණික් දහසක් දෙමි. කුලයෙන් තොප හා සදෘශ්‍ය වූ භාර්යාවෝ දෙන්නෙකු දෙමි” කියා ඒ සියල්ලම අනූනව දුන්හ.

එසේ සම්පත් ලද්දා වූ බමුණු රජ්ජුරුවන්ට ස්තුති කරන්නේ “කසීරට අධිපති වූ රජ්ජුරුවන් වහන්ස, පෑලවිය පටන් පසළොස්වක දකිනා තෙක් තාරකාවන් මධ්‍යයෙහි පිහිටියා වූ පුන්සඳ මණ්ඩල යම් සේ සම්පූර්ණ වේද? එසේම නුඹවහන්සේ විසින් දෙනලද ගම් වර ලත් මමද එපරිද්දෙන් මාගේ මනෝරථය අද මුදුන් පැමිණියෙමි. එහෙයින් තොප හා මා හා අද වූ සංග්‍රහයක් මෙන් මහත් වූ සන්තෝෂයට පැමිණියෙමි” කියා රජ්ජුරුවන්ට ස්තුති කළේය.

මහබෝසතාණෝද බමුණාට මහත් වූ යසශ්‍රී දී කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදුරා පූර්‍වාපර සන්‍ධි ගලපා මේ ‘ජුන්හ ජාතකය’ නිමවා වදාළසේක.

එකල්හි ගම් වර ලද්ද වූ බමුණානෝ නම් දැන් ආනන්ද ස්ථවිරයෝය. එකල්හි ඒවා දුන් රජ්ජුරුවෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 450. ධර්‍ම ජාතකය

තවද මේ ජාතකය ජේතවනාරාමයෙහි වසන්නා වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්දත් තෙරුන් වහන්සේ පොළොව පළායාම අරභයා වදාරන ලදි.

ඒ කෙසේද? යත්,

එක් දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස්ව වැඩ උන්නා වූ භික්‍ෂූන් වහන්සේ කථාවක් පහළ කරනසේක් “එම්බා ඇවැත්තනි, දේවදත්ත ස්ථවිරයෝ බුදුන් හා සමග විරුද්ධ ව පොළොව පළා වන්නෝ වේදැ”යි කියමින් උන්සේක. එකල සර්‍වඥයන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩ “මහණෙනි, මා එන්නාට පූර්‍ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?”යි විචාරා “මේ නම් කථාවක් කොට උනුම්හ”යි කී කල්හි “එම්බා මහණෙනි, දැන් මාගේ සර්‍වඥ චක්‍රයෙහි පැහැර පොළොවට වන්නේය. පළමුත් මාගේ ධර්‍ම චක්‍රයෙහි පැහැර පොළොවට වැද අවීචි නරකයෙහි උපන්නෙහි වේදැ”යි වදාරා

එක්තරා භික්ෂු කෙනෙකුන් වහන්සේ විසින් ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝධිසත්ත්වයෝ කාමාවචර දිව්‍ය ලෝකයෙහි ධර්‍ම නම් දිව්‍යපුත්‍ර ව උපන්නාහුය.

එකල දේවදත්තයෝ එම දිව්‍ය ලෝකයෙහි අධර්‍ම නම් දිව්‍යපුත්‍ර ව උපන්නාහුය. ඔවුන් දෙදෙනා අතුරෙන් ධර්‍ම නම් දිව්‍යපුත්‍ර තෙම මිනිසුන් සවස් වේලෙහි බත් අනුභවකොට තමන් ගෙදරවල සැප වූ කථාකොට උන් කල්හි තුමූ සර්‍වාභරණයෙන් සැරහී දිව්‍ය රථයකට පැන නැගී දිව්‍යාඞ්ගනාවන් විසින් පිරිවරණ ලදුව මැදිපොහො දවස ගම් නියම්ගම් රාජධානිවල ආකාශයෙන් ඇවිද "ප්‍රාණඝාතාදී දස අකුශලින් දුරුව මව්පියන්ට උපස්ථාන කිරීමෙන් දිව්‍ය ලෝකවල ඉපිද මහත් වූ සම්පත් අනුභව කරව"යි කියා මනුෂ්‍යයන් දශ කුශල පථයෙහි සමාදන් කරවමින් ජම්බුද්වීපය පැදකුණු කෙරෙමින් ඇවිදිනාහ.

එකල අධර්‍ම නම් දිව්‍යපුත්‍රයා ජම්බුද්වීපය වාමාවෘතකොට ඇවිදිමින් "ප්‍රාණඝාත කරව" යනාදින් දශ අකුශල කර්මයෙහි යොදවමින් ඇවිදිති. එසේ ඇවිදින කල්හි ධර්‍ම නම් දිව්‍යපුත්‍රයාගේ රථයට අභිමුඛව පැමිණියේය. එකල ඔවුන් දෙදෙනාගේ පිරිවර ඔවුනොවුන් අතින් "තොපි කාගේදැ?"යි

විචාරා "අපි ධර්‍ම නම් දිව්‍යපුත්‍රයන්ගේය. අපි අධර්‍ම නම් දිව්‍යපුත්‍රයන්ගේය"යි කියමින් දෙභාගව සිටියහ. එකල ධර්‍ම නම් දිව්‍යපුත්‍රයාණෝ කියන්නාහු "එම්බල යහළු අධර්‍ම නම් දිව්‍යපුත්‍රය, මම ධර්‍මයෙහි හසුරුවමින් ශ්‍රමණ, බ්‍රාහ්මණා දී වූ සත්ත්වයන්ට සිය අතින්ම යසස් දනය කෙරෙමි. එසේ හෙයින් මම ධර්‍ම නම් වීමි. දෙව්මිනිසුන් කෙරේ ප්‍රසිද්ධ හෙයින් අසත්පුරුෂයන්ට වඩා බල ඇත්තෙමි. එසේ වූ මට පළමුකොට මඟ අරණට සුදුසුය. එසේ හෙයින් තෝ මේ මඟින් පහව මඟ ඇරපියව"යි කීහ.

එකල අධර්‍ම නම් දිව්‍යපුත්‍ර තෙම කියන්නේ "එම්බල ධර්‍ම නම් දිව්‍යපුත්‍රය, මම දෘඪ වූ අධර්‍ම යානාවකට නැගී ආයෙමි. සත්පුරුෂ ධර්‍මයෙක් මාගේ නැත. එසේ හෙයින් සත්පුරුෂයාට වඩා බල ඇත්තෙමි. එසේ වූ මම කවර කාරණයකින් තොපට අද මඟ අරිව්ද? මට පළමු කිසි කෙනෙකුන්ටත් අලව්රූ නැත, මඟ නොහරිමි"යි කීයේය.

එකල ධර්‍ම නම් දිව්‍යපුත්‍ර තෙම කියන්නේ "එම්බල සබඳ, මේ ලෝකයෙහි ප්‍රථම කල්පයෙහිම දශකුශල කර්මපථ සංඛ්‍යාත ධර්‍මය ම පළමු පැනවිය. අධර්‍මය පසුව උපන. එසේ හෙයින් ධර්‍ම ජ්‍යෙෂ්ඨය නමුත් මමය, එසේ වූ මට මඟ හැර කණිෂ්ඨ වූ තෝ මඟින් පහව"යි කීය. එකල අධර්‍ම නම් දිව්‍යපුත්‍ර තෙම කියන්නේ "එම්බල සබඳ, අප දෙන්නා යාඥකොට ඉල්වීමත් තරම් නොවෙයි, ඉල්වීමට තොපට මඟ දීමත් තරම් නොවෙයි, බල එකෙක් කියමි. අපි දෙන්නාම අද

යුද්ධ කරම්හ. ඒ යුද්ධයෙන් අප දෙන්නා අතුරෙන් යමෙක් ජය ගත්තේ වීනම් මේ මාර්ගය ඕ හට වන්නේය''යි කීහ.

එබසට ධර්‍ම දිව්‍යපුත්‍ර තෙම කියනුයේ "එම්බල අධර්‍මියකොට වනාහී මේ සසර දුක් බබුළුවන්නා වූ ගුණයෙන් ප්‍රසිද්ධ වෙමි. මහත් වූ කායබල, සේනාබල ඇත්තෙමි. ප්‍රමාණාතික්‍රාන්ත වූ යසපිරිවර ඇත්තෙමි. කිසි කෙනෙකුන් හා අසද්‍රිස වෙමි. සියළු ගුණයෙන් සමෘද්ධි යෙමි. එසේ වූ අධර්‍මිය කොට තෝ කෙසේ ජය ගණිදැ?''යි කීහ. එකල අධර්‍ම තෙම කියන්නේ "එම්බල යහළු, ඒකාන්තයෙන් ලෝහයෙන් රන්රුවන් නසීද? රන්රුවණින් ලෝහය නසීද? එපරිද්දෙන්ම සත්ත්වයන්ට දර්ශනීය වූ රත්‍රන් යම් සේ යකඩින් නසීද? එපරිද්දෙන්ම මාගේ නම පුරුදු කරන අධර්‍ම ගුණයෙන් තොපගේ යහපත් ධර්‍ම ගුණය නසා රඳව''යි කීහ.

එබසට ධර්‍ම නම් දිව්‍යපුත්‍ර තෙම කියනුයේ "එම්බල සබඳ, තෝ ඉදින් යුද්ධයට සමර්ථයේ වීනම් තට වැඩි කෙනෙක් වේවයි, ගරු කටයුතු කෙනෙක් වේවයි, නුවණැති කෙනෙක් වේවයි නැද්ද? එසේ තට මම මඟ අරිමි. තාගේ රළු රූක්‍ෂ වූ බවටත් ක්‍ෂමා කෙරෙමි'' කීහ. මෙසේ ඒ බෝධිත්සත්‍වයන් කී බස් අසා අධර්‍ම තෙම රථයෙහි සිටිය නොහී බිම හිම හිස බිම් ලා පය උඩුකොට වැටී පොළොව විවර වූ කල්හි පොළොවට වැද අවීචි මහනරකයෙහි උපන්නේය.

ඒ බව වදරන්නා වූ බුදුරජාණන් වහන්සේ "එම්බා මහණෙනි, ඒ අධර්‍ම නම් දිව්‍යපුත්‍ර තෙම ධර්‍ම දිව්‍යපුත්‍රයා කී

බස් අසමින් රථයෙහි සිටිය නොහී හිස බිම් බලවා පය උඩුකොට වැටී පොළොව පළාගෙන ගොස් නරකයෙහි උපන්නේ වේදැ''යි වදරා මතුමත්තෙහි ධර්‍ම දේශනා කරනසේක් ''ක්‍ෂාන්ති බලයෙන් යුද්ධබල ජයගෙන ඒ අධර්‍මියා නසා ඒ වූ පරාජයට පමුණුවා සැබෑ බසම පෙරදැරිකොට ඇති මහත් වූ බල ඇති ඒ බෝධිත්සත්වයෝ සෘජු වූ මාර්ගයෙහි ගියේ වේදැ''යි වදරා තවද ''යම් සත්ත්ව කෙනෙක් ක්‍ෂාන්ති නොකිරීමෙන් තෙමේ දෙමව්පියන්ටද, ශ්‍රමණ බ්‍රාහ්මණයන්ටද ස්වකීය වූ තමාගේ ගෙයි දී කිසි සත්කාර සම්මානයක් නොකොට කා බුන් මරණින් මත්තෙහි කලේබරය මෙලොව්හි ම දමා යම් සේ අධර්‍මියෙන් අධෝශිර්‍ෂව නරකයෙහි ඉපද වැටෙන්නාහ''යි වදරා ''එම්බා මහණෙනි, මේ දේවදත්ත ස්ථවිරයෝ ප්‍රතිවිරුද්ධ ව පොළොව පළා නරකයෙහි උපන්නේ වේදැයි, පෙරත් නරකයට ගියෝ වේදැ''යි වදරා මේ 'ධර්‍ම ජාතකය' නිමවා වදළසේක.

''එකල්හි ඒ අධර්‍ම දිව්‍යපුත්‍රයා නම් දැන් මේ දේවදත්ත ස්ථවිරයෝය. ඔහුගේ පර්ෂිත් නම් දැනුදු දේවදත්ත ස්ථවිරයන්ගේ පර්ෂිදය, ධර්‍ම නම් දිව්‍යපුත්‍රයාණෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැ''යි තමන්වහන්සේ දක්වා වදළසේක.

# 451. උදයභද්ද (උදය) ජාතකය

තවද මේ ජාතකය ජේතවනාරාමයෙහි වැඩ වසන්නා වූ බුදුරජාණන් වහන්සේ විසින් ශාසනයෙහි උකටලී වූ එක් භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා වදාරන ලදි.

එහි වර්තමාන කථාව කුස ජාතකයෙහි විස්තර වශයෙන් කියනලදි. මේ ජාතකයෙහි භික්ෂූන් වහන්සේ විසින් ශාසනයෙහි උකටලී වූ භික්ෂූන් වහන්සේ දම්සභා මණ්ඩපයට ගෙනහැර දැක් වූ කල්හි "සැබෑද? මහණ, තා ශාසනයෙහි උකටලී වූයේය"යි විචාරා වදාරා "සැබැව ස්වාමිනි" දැන් වූ කල්හි "එම්බල මහණ, කුමක් නිසා ක්ලේශ වසඟයෙන් මෙබඳු වූ නෛර්යානික ශාසනයෙහි මහණව උකටලීද? පුරාතයෙහි නුවණැත්තෝ දෙළොස් යොදුනක් පමණ ඇති සියල්ලෙන්ම සමුද්ධ වූ සුරන්ධ නම් නුවර රාජ්‍යය කරන්නා වූ සුරාංගනාවක හා සමාන ස්ත්‍රියක සමග සත්සියයක් අවුරුදු එක ගබඩාවෙහි වසන්නා වූ ඉඳුරන් බිඳ ලෝභ වශයෙන් නොබැළුවෝ වේදැ"යි වදාරා එක්තරා භික්ෂු කෙනෙකුන් වහන්සේ විසින් ආරාධිත වූ බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස සුරන්ධ නම් නුවර කසී නම් රජ කෙනෙකුන් රාජ්‍යය කරන්නාහ. ඒ රජ්ජුරුවන්ගේ එකද දූ පුත් කෙනෙක් නැත්තාහ. එකල රජ්ජුරුවෝ "දරුවන් ප්‍රාර්ථනා කරව"යි

නියෝග කළාහ. එකල බෝධිසත්ත්වයෝ බ්‍රහ්ම ලෝකයෙන් චුතව අවුත් රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ උපන්නාහ. ඒ කුමාරයන්ට නම් තබන්නාහු බොහෝ දෙනාගේ සිත් සතුටු කරවමින් උපන් හෙයින් 'උදයභද්‍ර කුමාරයෝය'යි නම් තැබූහ.

කුමාරයන් පියවර නගා කෙළ ඇවිදින අවස්ථාවෙහි අනික් බ්‍රහ්මයෙක් බ්‍රහ්ම ලෝකයෙන් චුතව එම රජ්ජුරුවන්ගේ එක්තරා බිසෝ කෙනෙකුන් බඩ කුමාරිකාවක් ව උපන්නාහ. ඒ කුමාරිකාවන්ට 'උදයභද්‍ර දේවිය'යි නම් තැබූහ. උදයභද්‍ර කුමාරයෝ වැඩිවිය පැමිණි කල්හි ශිල්ප ශාස්ත්‍රයෙහි නිපුණ වූහ. ජාතියෙන්  ජාතියෙන් බ්‍රහ්මචාරීහ. ස්වප්නයෙනුත් මෛථුනයන් නොම දන්නාහ. ක්ලේශ වසඟ චිත්තයෙන් නුපදනේය. එකල රජ්ජරුවෝ "පුතණුවන් රාජ්‍යයෙහි අභිෂේකකොට නාටක ස්ත්‍රීන් පිරිවරමි" සිතා පුතණුවන් සමීපයට අස්නක් යවූහ. මහබෝසතාණෝ කියන්නාහු "මට රාජ්‍යයෙන් ප්‍රයෝජන නැත. ක්ලේශයෙහි මාගේ සිත ඇත්තේ නැත" කියා ප්‍රතික්ෂේප කළාහ. දෙමව්පියෝ නැවත නැවත කියා යවූහ. එකල මහබෝසතාණෝ ජාම්බොනද ස්වර්ණමය ස්ත්‍රී රුවක් කරවා "මෙබඳු ස්ත්‍රී රුවක් ළදහොත් රාජ්‍යය පිළිගණිමි" දෙමව්පියන් සමීපයට යැවූහ. ඔහු ඒ රන්රුවත් මුළු දඹදිව ඇවිදුවා පරීක්ෂා කරවා එබඳු ස්ත්‍රියක නොලැබ උදයභද්‍රාවන් සරහා ඒ රන්රුව සමීපයෙහි සිටුවූහ. ඕ තොමෝ ඒ රන්රුව ඉක්ම සිටිනීය. එකල ඔවුන් දෙදෙනාම නොකැමැති පරිද්දෙන් කුඩා මෑණියන්ගේ දුව කුමාරිකාවන්

නැගණියන් උදයභද්‍රා නම් කුමාරිකාවන් අග්‍රමහේසිකා කොට බෝධිසත්ත්වයන් රාජාභිෂේක කළාහ.

ඒ දෙදෙන බ්‍රහ්මචර්‍ය්‍යාව වාසය කරන්නාහ. කල්යාමකින් දෙමව්පියන් ඇවෑමෙන් බෝධිසත්ත්වයෝ රාජ්‍යය කරන්නාහු දෙදෙනාම එක ගබඩාවෙහි වසන්නා වූ ලෝභ සිතින් ඔවුනොවුන් මූණ පමණකුත් ඉඳුරන් බිඳ නොබැලූහ. එතකුදු වුවත් "අප දෙදෙනා අතුරෙන් යම් කෙනෙක් පළමුකොට මළෝ වීනම් ඔහු තමන් උපන් තෙනින් අවුත් 'මම අසවල් තෙන උපනිමි' කියත්ව"යි කතිකාවක් කළාහ.

ඉකිබිත්තෙන් බෝධිසත්ත්වයෝ රාජ්‍යයට පැමිණී සත්සියයක් අවුරුදු ඇවෑමෙන් කාලක්‍රියා කළාහ. අනික් රජ්ජුරු කෙනෙක් නැත්තාහ. උදයභද්‍රාවන්ගේ ආඥාව ම පවත්නේය. අමාත්‍යයෝ රාජ්‍යය අනුශාසනා කරන්නාහ. බෝධිසත්ත්වයෝද තව්තිසා භවනයෙහි ශක්‍ර ව ඉපද ඓශ්චර්‍ය්‍ය මදයෙන් සතියක් උදයභද්‍රාවන් සිහි නොකළාහ. මෙසේ මනුෂ්‍ය ගණනාවෙන් සත්සියයක් අවුරුදු ගිය කල්හි සිහිකොට උදයභද්‍රා නම් රාජ කුමාරිකාවන් වස්තුවෙන් විමසා සිංහනාද කරවා "ධර්‍මදේශනා කරමින් කතිකාවෙන් මිදී එමි" සිතූහ. එකල්හි වනාහි මනුෂ්‍යයන්ට දස දහසක් අවුරුද්දට ආයුෂය ඇතිකල් වන්නේය. කුමාරිකාද එදවස් රාත්‍රියෙහි මනාකොට වසනලද දොරකවුළු ඇති වටලනලද රැකවල් ඇති සත්මාල් ප්‍රාසාදයෙහි උතුම් වූ මතුමාලේ ශ්‍රී යහන් ගබඩාවෙහි

උදකළාව නිශ්චලව තමන්ගේ ශීලය අවර්ජනා කෙරෙමින් උන්නාහ.

එකල ශක්‍රයෝත් රන්මසු පුරවනලද එක් රන් තලියක් ඇරගෙන අවුත් ශ්‍රී යහන් ගබඩාවට පහළව එකත්පස්ව බිසවුන් හා කථා කරන්නාහු මේ ජාතකයෙහි පළමුවන ගාථාවෙන් මෙසේ කියත්, මනා වූ වස්ත්‍රයක් ඇඳි ඇත් සොඬකට බඳු වූ ආකාර ඇති මටසිළුටු වූ ඌරු යුගලයක් ඇති පඤ්ච ප්‍රාසාදයකින්ද මණ්ඩලත්‍රයකින්ද හෙබියා වූ කින්නරාඞගනාවන් ඇසි හා සමාන ඇස් ඇති පාදාන්තයෙහි පටන් කේසාන්තය දක්වා සියළු අඞග ප්‍රත්‍යඞගයෙන් කිසි ඌනතාවක් නැතිව හෙබියා වූ උතුම් ප්‍රාසාද තලයෙහි උදකලාව උන්නා වූ උත්තමාවියන්ට යාඥා කෙරෙමි, අද එක රාත්‍රිය අලංකෘත වූ මේ යහන් ගබඩාවෙහි තී හා මා එක යහන වැස සෙයයා කරම්හ”යි කීහ.

ඉක්බිති රාජකුමාරිකා තොමෝ කියන්නී “මේ දොළොස් යොදුන් පමණ සුරන්ධ නම් නුවර අතුරෙහි දිය අගල ආදි අගලින්ද මහත් වූ දෙරටු අටල්ලෙන්ද ගැවසී ගත්තේය. ආයුධ ගන්නාලද අත් ඇති දස දහසක් යොධයන් විසින් රැකවල් ගන්නාලද, එසේ හෙයින් මේ සියළුම නුවරට ඇතුළෙහි කරනලද මාගේ නිවාස පුරයටද යන මේ දෙකටම කිසි කෙනෙකුන් වැද්ද නොහැක්කේය. තවද ළදරු වේවයි, වෘඬ වේවයි, ශක්ති සම්පන්න යෝධයෙකු වේවයි අනිකුත් කිසි මහත් වූ පඬුරක් අරගෙන එන්නෙකුගේ ඊමෙක් නම් නැත.

එසේ වූ යම් ස්ථානයට අවුදින් මා හා සමග කැමති වන්නා වූ තෙපි කවරෙක්හිදැ?යි කෙසේ නම් ආයිදැ?යි විචාළාහ.

එවිට ශක්‍රයෝ කියන්නාහු "එම්ල සොදුර, මම එක් දේවතාවෙක්මි. දිව්‍යානුභාවයෙන් මේ ස්ථානයට ආමි. තොප වනාහි අද කාමාස්වාදයෙන් සතුටු කරව, තොපට මම රන්මසු පුරනලද මේ රන් තලිය පඬුරුකොට දෙමි" කීහ. එබස් අසා කුමාරිකාවෝ කියන්නාහු "එම්බා දිව්‍ය රජ්ජුරුවනි, මම මාගේ උදය රජ්ජුරුවන් හැර අනික් දෙවියෙකු වේවයි, යක්‍ෂයෙකු වේවයි ප්‍රාර්ථනා නොකරමි. එසේ හෙයින් මෙතන නොසිට පලා යව. තොපගේ පඬුරෙන් මට ප්‍රයෝජන නැත. මතු මෙතනට නොයෙව"යි කීහ. ශක්‍රයෝද බිසවුන්ගේ සිංහ නාදයක් වැනි වූ බස් අසා නොසිට පළා ගියාක් මෙන් එතනම අන්ථධානව සිට දෙවනි දවස් එම වේලාවට රන්මසු පුරනලද රිදී තලියක් අරගෙන දෘශ්‍යමානව සිට බිසවුන් හා කථා කරන්නාහු "එම්බල භද්‍රාව, කාමභෝගී නම් වූ සත්ත්ව කෙනෙක් යමක් කරණකොට ගෙන කාය දුශ්චරිතාදියෙන් හැසිරෙද්ද? එසේ වූ සත්ත්වයාගේ යම් ඇලීමකින් මේ කාමරතියෙහි කරනලද ඇල්ම වන්නේද, එසේ වූ කාමරති දෙන්නවුන්ගෙන් තෙපි මනාකොට දෙනලද දෑ මම ඒ ලබනු කැමැත්තෙමි. ඒ නිසා තොප සමීපයට එන මම සිස් අතින් නොයායෙමි. ඊයේ දවස රන්මසු පුරනලද රන්තලියක් ගෙනාමි, අද රන්මසු පුරනලද රිදීතලියක් ගෙනාමි, ඒ දැනි තොපට දෙමි, එක රාත්‍රිය මා හා සමග සෙයයාව කරව"යි කීහ.

එබස් අසා බිසව සිතන්නනාහු "මේ තෙම කථා කරන්නට ලැබෙන්නේ වීනම් නැවත නැවතත් එන්නේය. එසේ හෙයින් මම දැන් මොහු හා සමග බැණ නොනැගෙමි" සිතා මුවෙන් නොබැණ ම උන්නාහ. ශක්‍රයෝ උන් බැණ නොනැගෙන නියාව දැන ඒ දවසුත් එතනම අන්තර්ධානව සිට දෙවන දවසුත් එම වේලාවට ලොහෝ තලියක කහවණු පුරා ඇරගෙන සිට "සොඳුර, අද මා හා කාමරතියෙන් සතප්පව, තොපට මේ කහවනු පිරූ ලෝහතලිය දෙමි" කීහ. එබස් අසා බිසව කියන්නාහු "එම්බල පින්වත් වූ පුරුෂය, තෝ අඥානයෙහිය. සත්ත්වයෝ නම් ස්ත්‍රියක ක්ලේශ වශයෙන් වස්තුවෙන් ගිවිස්වන්නාහු යම් වස්තුවෙක් ගෙනායේ වීනම් එසේ වූ වස්තු දවස දවස වඩ වඩා ගෙනවුත් වර්ණා කෙරෙමින් ගිවිස්වා පොළඹන්නේය. තෝ වනාහි දවසින් දවස අඩු අඩු කෙරෙමින් තාගේ ස්වභාවටත් විරුද්ධ කරන්නෙහිය. පළමු දවස් රන්මසු පිරූ රන්තලියක් ගෙනායෙහිය. දෙවනි දවස් රිදීතලියක් ගෙනායෙහිය. තුන්වන දවස් කහවණු පිරූ ලොහතලියක් ගෙනායෙහිය. ඊට කාරණා කිම්දැ?"යි විචාළාහ.

එකල බෝධිසත්ත්වයෝ කියන්නාහු "එම්බල සොඳුරු රාජකුමාරිකාව, මම වනාහි වෙළඳාමෙහි ඉතා දක්‍ෂ වෙමි. අර්ත්‍ථය නොනසමි. ඉදින් තොපි ආයුෂයෙන්ද, ශරීර වර්‍ණයෙන්ද දවසින් දවස වැඩූ නම් මමත් තොපට පඬුරු වඩ වඩා ගෙනෙන්නෙමි. තොපි වනාහි දවසින් දවස හානියට පැමිණියව. එසේ හෙයින් මම තොපට පඬුරුත් අඩුකොට ගෙනාමි කියන්නාහු "එම්බල සොඳුර, මනුෂ්‍ය ලෝකයෙහි

සත්ත්වයන්ගේ ආයුෂද, ශරීර වර්ණයද පෙරහණෙක්හි වත්කළ ජලයක් මෙන් චක්ෂුප්‍රාසාදියෙහි දවසින් දවස අඩුවන්නේය. තොපගේ වනාහි පළමු දවස් ආ වේලේ පැවැත්තා වූ ආයුෂද, ඊයේ දවසට නොපැමිණ කෙටේරියක් ගෙන සුන්කළාක් මෙන් එදවස් අතුරුදහන් විය. ඊයේ දවස් පැවති ආයුෂද අද දවස් නොපැමිණ ඊයේම නිරුද්ධ විය. එසේ හෙයින් තොප පෙරවි දවස් ඇර අද දැන් මා බල බලා සිටියදීම තොපගේ ශරීර වර්ණය නපුරු වන්නේය. එසේ හෙයින් මෙතැන් පටන් රාත්‍රි දින යම් ඉකුත් වීමෙන් නොබෝ දවසකින් තොපි ජරාවට පැමිණෙව, සොඳුර, තොපි ඊට පළමුව තොපගේ රන්වන් ශරීරය ජරාවෙන් නොකෙළසන තෙක් ශ්‍රේෂ්ඨ වූ ශ්‍රම ධර්මයන් පුරා වඩ වඩා මතුමත්තෙහි වර්ණවත් වන පරිදි කරව"යි කීහ.

ඉක්බිති බිසවුන් කියන්නනු "එම්බල දේවතාව, යම් සේ මනුෂ්‍යයෝ ජරාවට පැමිණෙත් නම් දෙවියෝ එසේ ජරාවට නොමැමිණෙත්හ, ඔවුන්ගේ ශරීරයෙහි විලිපිළි නැත. එසේ හෙයින් මහත් වූ ආනුභාව ඇති දේවතාවෝ අතින් විචාරමි, ඒ දෙවියන්ගේ ශරීරය කවර ප්‍රකාරයක් ඇත්තේදැ?"යි විචාළහ.

ඒ බව ප්‍රකාශකොට කියන්නා වූ ශක්‍රයෝ "එම්බල සොඳුර, මනුෂ්‍යයෝ රූපයෙන්ද, ඡවි වර්ණයෙන්ද, චක්ෂු ප්‍රසාදයෙන් ද යන මේ සියල්ලෙන් යම් සේ පිරිහී ජරාවට පැමිනෙත්ද, දෙවියෝ එසේ නොවෙති. ඔවුන්ගේ ගාත්‍රායෙහි

විළිපිළි නැත. සිළුටු වූ ගණරන් පටක් හා සමාන ශරීර වර්‍ණ වන්නේය. දවසක් පාසා දිවුන දිවුනා ඓශ්වර්‍ය්‍යීද වැඩෙන්නේය. යම් සේ නොපිරිහෙන්නා වූ ස්වභාව ඇත්තේය. එසේ හෙයින් තොපි ජරාවට නොපැමිණ ගිහිගෙන් නික්ම මහණවව, එසේ කල්හි තොපි මේ ක්‍ෂය ස්වභාව ඇති මනුෂ්‍ය ලෝකයෙන් චුතව වර්ධන ස්වභාව ඇති දිව්‍ය ලෝකයෙහි උපදවාදැ”යි කීහ.

බිසව් දිව්‍ය ලෝකයෙහි යම් වර්‍ණනා අසා ඊම යන්ට මන් විචාරන්නාහු “දිව්‍ය රජ්ජුරුවෙනි, ක්‍ෂත්‍රියාදී නොයෙක් කුලජාති භේද ඇති මනුෂ්‍ය ජනසමූහ කුමට හයින් හා කා කෙරේ හයින් හා යන ස්වභාව ඇති මනුෂ්‍ය ලෝකයෙන් දිව්‍ය ලෝකයට යෙත්ද? ඒ තමා දිව්‍ය ලෝකයට යන්ට මන් නුවණැත්තා කියන ලදහ. ඒ මාර්ගයන් අතුරෙන් කවර මාර්ගයෙක්හි සිටි සත්ත්ව තෙම නොබා පරලොවට යන්නෙහිදැ?”යි විචාළාහ.

දිව්‍ය ලෝකයට යන්නා වූ මර්‍ගය ශක්‍රයෝ මෙසේ කියත් “එම්බල සොඳුර, උදයභද්‍රාව, යම් සත්ත්ව කෙනෙක් කාය, වක්, මනඃ යන ද්වාරත්‍රය සකස්කොට පිහිටුවා අකුසල් නොකොට කුශල ධර්‍මයන් සමාදන්ව පවත් වන්නේද, බොහෝ ආහාරපාන වර්ගයන් දන විභාග සැදැහැයෙන් යුක්තව ශ්‍රමණ බ්‍රහ්මණාදීන්ට දන්දේද, සතර සංග්‍රහවතින් ජනරංජනය කෙරේද යන මෙතෙක් ගුණයෙහි පිහිටියේ පරලොවට නොබා යන්නේය”යි කීහ.

බිසව් එබස් අසා උන්ට සතුටුව ස්තුති කරන්නාහු "යම් සේ මැණි කෙනෙක් පියාණ කෙනෙක් තමාගේ වැදූ දරු කෙනෙකුටත් වැඩ කැමති ව අවවාද කෙරෙත්ද? ඒ පරිද්දෙන්ම තොපිත් මටත් වැඩ කැමති ව අනුශාසනා කළාහ. මට එසේ අවවාද කරන්නා වූ විපුල වූ ශරීර සෝභා ඇති මනා වූ ව්‍රත සමාදානය ඇති තෙපි තමා කවුරුදැ?යි විචාරමි, මට කියව"යි කීහ.

ඉක්බිති බෝධිසත්ත්වයෝ කියන්නාහු "එම්බල සොදුරු දැකුම් ඇති භද්‍රාව, මම වනාහි මේ මා උපන් ජාතියට පළමු ජාතියෙහි තොපට වල්ලභ වූ උදය රජ්ජුරුවෝ නම් මමය. ඒ මම තී සමීපයෙන් මියගොස් තව්තිසා භවනයෙහි ශක්‍රදේවේන්‍ද්‍ර ව උපනිමි. එතනින් තොප සමීපයට එන්නා වූ මම ක්ලේශ වසග චිත්තයෙන් ආයෙන් නොවෙමි. තොප විමසාපියා පළමු කතිකාවක් කළමෝ වේද, ඒ කතිකාවෙන් මිදී තොපට මම අසවල් තෙන උපනිමි කියාපියා යන පිණිස ආමි. දැන් ඉන් මිදිනිමි. එසේ හෙයින් මම දෙව්ලොවට යෙමි" කීහ.

එසඳ බිසව් කඳුළුඑධරා වගුරුවමින් "ස්වාමීනි, නුඹවහන්සේ උදය රජ්ජුරුවෝද? නුඹවහන්සේගෙන් වෙන්ව මා විසියහෙන්නේ නැත. යම් සේ පෙර නුඹවහන්සේ මා හා එක්ව වාසය වීනම් දැනුම් එපරිද්දෙන්ම එක්වන නියායෙන් මට උගන්වා කතිකාවෙන් මිදි වැඩිය මැනවැ"යි කීහ.

නැවත බිසවුන්ට අනුශාසනා කරන්නා වූ ශක්‍රයෝ මෙසේ කියත් "එම්බල සොඳුරු උදයභද්‍රාව, මේ ලෝකයෙහි සත්ත්වයන් ආදි, මධ්‍යම, අන්තිමය යන මෙතුන් වයසය සිඳුව වහනය කරන්නා වූ ගංගාවක් මෙන් නොනැවත වහාම ඉක්ම ගෙවෙන්නේය. උපන්නා වූ සත්ත්වයන්ට නොනැසී සිටිමෙක් නැත. බුදුන් ආදිකොට ඇති සියළු සත්ත්වයන්ගේ ජීවිතය අස්ථිර වන්නේය. සියල්ලවුන්ම රන්වන් වූ මටසිළුටු වූ ශරීරයක් ඇත්නම් එයින් නිරන්තරයෙන් ම ජරාවට පැමිණ නස්නේය. ඒ කාරණාවෙන් උදයභද්‍රාවෙනි, තොපිත් මේ සියල්ලම පැමිණෙයි සිතා වහා නොපමාව දසකුශල කර්මපථයෙහි යෙදෙව. තවද සොඳුර, යම් එකම සත්ත්වයක් හට මේ පෘථිවි මණ්ඩලය හා සියළු යසසෙක් පැමිණියේ වීනම් එහි තෘප්තියක් සෑහෙයි යන්නක් නොසිතා පහ නොවූ ක්ලේශ චිත්තයෙන් කළුරිය කරන්නේය. එසේ හෙයින් තෘෂ්ණාවෙහි තෘප්තියක් නැති නියාව දනුව. තවද මෑණියන් පුතණුවන්ටද, පුතණුවන් මෑණියන්ටද, පියාණෝ පුතණුවන්ටද, පුතණුවෝ පියාණන්ටද, බෑනෝ නැගණියන්ටද, නැගණියෝ බෑනන්ටද, වල්ලභයා ස්ත්‍රීන්ටද, ස්ත්‍රී වල්ලභයාටද, ස්වාමියා වස්තුවටද, වස්තුව සත්ත්වයාටදැයි මේ සියල්ලම මරණ කාලයෙහි පළමු වශයෙන් ඔවුනොවුන් නොබලා යාමෙන් ස්ථිරයක් වීමක් නැතිබව දනුව. තවද මේ සංසාරයෙහි කපුටු ආදි තිරිසනුන්ගේද, මනුෂ්‍යයන්ගේද ආදී වූ සියළු සත්ත්වයන්ගේද යන මේ දුගති, සුගති දෙක්හිම සත්ත්වයන්ගේ භෝජනද, යසසද එක්ව කරන්නා වූ වාසයද, ජීවිතයද යන

මේ සියල්ලම අස්ථිර යයි දැන අප්‍රමාද ව දසකුශල කර්මපථයෙහි යෙදෙව”යි කියා මෙසේ මහබෝසතාණෝ අවවාද කළාහ.

බිසව්ද බෝධිසතත්ත්වයන්ට අවවාද කියන්නාහු “දේවතාවෙනි, තොප කියේ ඉතා යහපත. මේ සත්ත්වයාගේ ජීවිකාව නම් ස්ථිර නොවෙයි, ස්වල්ප දුකින් මිශ්‍රය. එසේ හෙයින් මම කසීරට හා සුරන්ධපුරය ඇර උදකළාව තපසට යෙමි” කීහ. බෝධිසත්ත්වයෝ බිසවුන්ට අවවාද දී දිව්‍ය ලෝකයටම ගියාහ. බිසව්ද දෙවන දවස් උදෑසන අමාත්‍යයන්ට රාජ්‍යය පාවා දී තමන්ගේ එම නුවර සිත්කළු වූ උයනෙහි ඍෂි ප්‍රව්‍රජ්‍යවෙන් පැවිදිව ධර්‍මයෙහි හැසිර අයුසංස්කාරයාගේ කෙළවර තව්තිසා භවනයෙහි බෝධිසත්ත්වයන්ට ම පාදපරිචාරිකා ව උපන්නාහ. සර්‍වඥයන් වහන්සේ ද මේ ‘උදයභද්ද ජාතක’ ධර්‍ම දේශනාව ගෙනහැර දක්වා වදාරා චතුස්සත්‍ය ප්‍රකාශකොට පූර්‍වාපරසන්ධි ගළපා මේ ජාතකය නිමවා වදාළසේක. චතුස්සත්‍යයාගේ කෙළවර ශාසනයේ උකටලී වූ භික්ෂූන් වහන්සේ සෝවාන් ඵලයෙහි පිහිටිසේක.

“එසමයෙහි උදයභද්‍රා දේවී නම් දැන් මේ රාහුල මාතාවෝය. එසමයෙහි ශක්‍රදේවේන්ද්‍රයෝ නම් ලොවුතුරා බුදුවූ මම්ම වේදැ”යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 452. පාණීය ජාතකය

තවද මේ ජාතකය ශාන්ත වූ දාන්ත වූ ගුණ ඇති බුදුරජාණන් වහන්සේ ක්ලේශ නිග්‍රහයක් අරභයා වදාළසේක.

එක් සමයෙක්හි සැවැත් නුවර වැසි පන්සියයක් පමණ පුරුෂයෝ සර්‍වඥයන් වහන්සේගෙන් බණ අසා මහණ උපසම්පදා ලැබ විහාර සීමා ඇතුළේම වාසය කරන්නාහු මධ්‍යම රාත්‍රී වේලේහි කාම විතර්කයක් උපදවාහු, මෙහි වර්ථමාන කථා යටකියන ලද්ද හා සදෘශ වන්නේය. මෙහි බුදුන් නියෝගයෙන් ආනන්ද සාමීන් විසින් සංඝයා වහන්සේ රැස්කළ කල්හි බුදුහු පණවනලද ධර්මාසනයෙහි වැඩහිඳ භික්‍ෂු කෙනෙකුන් වහන්සේ උදෙසා සාමාන්‍යයෙන් වදාරනසේක් "එම්බා මහණෙනි, ක්ලේශයෝ නම් ක්‍ෂුද්‍ර යයි යන්නෙක් නැත. භික්‍ෂූන් විසින් නම් උපන්නා වූ ක්ලේශයන් එම විටම නිග්‍රහ කටයුතුය. පුරාතණයෙහි නුවණැත්තෝ අබුද්ධෝපාද කාලයෙහි පවා ක්ලේශ නිග්‍රහකොට පසේබුදු වුවෝ වේදැ"යි වදාරා එක්තරා භික්‍ෂු කෙනෙකුන් වහන්සේ විසින් ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි කසීරට එක් ගමෙක්හි යාළුවෝ දෙදෙනෙක් පැන්ලබු දෙකක් ඇරගෙන කුඹුරට ගොස් එක් තැනෙක තබා නියර ආදී වූ දෙය කොටා පැන්

පිපාස වූ කල්හි පැන් තිබූ තෙනට ඇවිත් පැන් බී යන්නේය. එකල උන් දෙදෙනා අතුරෙන් එකෙක් පැන් බොන පිණිස අවුත් තමාගේ පැන් නොනසන පිණිස අනිකාගේ පැන් ලබ්බෙන් පැන් බී මෙහෙකොට සවස ගෙට යන පිණිස ගොස් එක් තෙනකින් නහා ගොඩ නැගී සිට “අද මාගේ කායවාරයෙන් කිසි පාපයක් පිරුණේ දෝ හෝ”යි සිතා පරීක්ෂාකොට සොරා පැන් බූ නියාව දැන කලකිරීමට පැමිණ “මේ මාගේ තෘෂ්ණා වඩනේ, මා අපායට දමා පියන්නක් මෙන්ය. එසේ හෙයින් ලෝභ නිග්‍රහ කෙරෙමි” සිතා “සොරා පැන් බීම අරමුණුකොට විදර්ශනා වඩා පසේබුදු බවට පැමිණ තමන් විසින් ලබනලද ප්‍රත්‍යෙකබෝධි ඥණය ආවර්ජනාකොට සිටියාහ.

එකල බඳ වූ අනික් පුරුෂයා නහා ගොඩ නැගී සිට “ඇයි? යහළු, ගෙට යම්හ”යි කීය. එබසට පසේබුදුහු වදරනසේක් “තොපි ගෙට යව, මට ගෙන් ප්‍රයෝජන නැත. අපි පසේබුදු වුනමෑ”යි වදළසේක. එබසට ඒ පුරුෂයා කියන්නේ “පසේබුදුහු නම් තොප සේ නොවෙති”යි කීය. පසේබුදුහු වදරනසේක් “එසේ කල පසේබුදුහු කෙබඳුදෑ?”යි වදළසේක. ඒ පුරුෂයා කියන්නේ “පසේබුදුන්ගේ දෑගුල් මනා ඉසකෙස් වන්නේය. කාසය වස්ත්‍රය අඳිනේය. උතුරු හිමාලයෙහි නන්දමුලක නම් පබ්භාරයෙහි වසන්නාහ”යි කීහ. එකල පසේබුදුන් අතින් ඉසපිරිමැද ඵෑසේක. ඒ ක්ෂණයෙහි ගිහි වෙස අන්තර්ධානව මනා වූ රන් වූ සිවුර දෙපට අඳනා ලද්දේම විය. විදුලියවන් පටිය බඳනා ලද්දේම විය. බඳු වද

පෙත්තක් සමාන පැහැ ඇති පොරෝනා සිවුරද ඒකාංශයෙන්හි උරයෙහිම විය. මේඝ වර්‍ණ වූ පාංශුකූල සිවුර කර ලන ලද්දේම විය. මුන් වන් වූ මැටි පාත්‍රය වං උරයෙහිම එල්වන ලද්දේම විය. මෙසේ ඒ පසේබුදුහු ආකාශයෙහි සිට ධර්‍මදේශනාකොට නන්දමූල පබ්භාරයට වැඩිසේක.

එසේම අනිකුත් කසී ගම්වැසි එක් කෙළෙඹි පුත්‍රයෙක් සල්පිල උන්නේ එක් පුරුෂයෙකු තමාගේ භාර්‍ය්‍යාව ඇරගෙන යන්නාහු දැක උතුම් වූ රූ ඇති ස්ත්‍රියක ඉඳුරන් බිඳ ලෝභයෙන් බලා නැවත සිතන්නේ “මේ ලෝභය සේ මෙසේ වඩනේ වීනම් මා නරකයෙහි එලන්නේය”යි කලකිරී විදර්ශනා වඩා පසේබුදුව ආකාශයෙහි සිට ධර්‍ම දේශනාකොට නන්දමූලක නම් ගල් ලේනට ම වැඩිසේක.

තවද කසී ගම්වැසි දෙපුතුපියන් එක්ව ගමනක් නික්මුණාහ. එක් මහවනයෙහි සොරු සිට දෙපුතුපියන් කෙනෙක් ලදු නම් පියා රඳවාගෙන “තාගේ පියා වස්තු ගෙන විත් දී ගලවාගත මැනවැ”යි පුතු යවන්නාහ. පුතු රඳවාගෙන පියා යවන්නාහ. දෙබෑ කෙනෙක් ලදු නම් මලු රඳවාගෙන බෑයා යවන්නාහ. ගුරුශිෂ්‍ය දෙදෙනකු ලදු නම් ගුරුන් රඳවාගෙන ශිෂ්‍යයා අරින්නාහ. ශිෂ්‍යය තෙම ශිල්ප ලෝභයෙන් වස්තු ගෙනවිත් දී ගුරුන් ගලවාගෙන යන්නේය. එකල ඔහු දෙපුතුපියන් ඒ සොරු වන්මුඛයෙහි සිටියා දැක ඔවුනොවුන්ට “පියාණෝය පුතණුවෝ යයි නොකියම්හ”යි

කථිකාකොට සොරුන්ට අසුව "තොපි ඔවුනොවුන්ට කුමක් කියව්දැ?"යි විචාළ කල්හි "අපි කිසි නෑකමක් නැත්තම්හයි දැන බොරු කියා සොරුන්ගෙන් ගැලවී සවස නාහා ගොඩ නැගී සිට පුතණුවෝ තමන්ගේ ශීලය පරීක්‍ෂා කරන්නාහු තමන් කී බොරුව දැන "මේ අකුශලය වඩනේ මා නරකයෙහි එලන්නේ යයි, මේ ක්ලේශයට නිග්‍රහ කෙරෙමි" විදර්ශනා වඩා පසේබුදු ව ආකාශයෙහි සිට පියාණන්ට ධර්‍ම දේශනාකොට නන්දමූලක පබ්භාරයට වැඩිසේක.

තවද කසී ගම්වැසි එක් ගම්දෙටුවෙක් ප්‍රාණඝාත නොකරන්නේය. එකල බිලියම් කරන පිණිස මහජනයා රැස්ව ගම්දෙටුවාට කියන්නාහු "ස්වාමීනි, අද බිලියම් කරන දවසය. එසේ හෙයින් අප ඇම උගරන් මුවන් මරා බිලියම් කරම්හ"යි කීහ. එබසට ගම්දෙටුවාණෝ කියන්නාහු "පෙර තොප කරන සැටියේ කරව"යි කීහ. මනුෂ්‍යයෝද බොහෝ දෙන රැස්ව බොහෝ ප්‍රාණවධ කළාහ. ගම්දෙටුවාණෝ බොහෝ මච්ඡමාංශ දැක "මේ සත්ත්වයෝ මෙතෙක් ප්‍රාණවධ කරන්නාහු මාගේ එක වචනය නිසාම කළහ"යි කුකුස් ව කවුළුදොර සිට විදර්ශනා වඩා පසේබුදු ව ආකාශයට නැගී ධර්‍ම දේශනාකොට නන්දමූලක නම් පබ්භාරයට වැඩිසේක.

තවද කසී ගම්වාසී ගම්දෙටුවෙක් සැනකෙළි පිණිස එක් වූ දනව්වාසීන්ට සුරාපානාදිය දී "කෙළෑහ"යි අවසර දී ඔහු රා බී මත්ව ඔවුනොවුන් මරා දණ්ඩනයට පැමිණියාහ. එකල ගම්දෙටුවාණෝ ඒ බව දැක සිතන්නාහු "මා නොකීවොත්

මොහු මෙතෙක් දුක් නොවින් දේ වේදැ''යි මෙපමණකින් කුකුස්කොට විදර්ශනා වඩා ප්‍රත්‍යෙකබෝධි ඥානය උපදවා මහජනයාට ධර්‍ම දේශනාකොට ආකාශයට පැන නැගී නන්දමූලක පබ්භාරයට වැඩිසේක.

මෙසේ කල්‍යාමකින් පසේබුදුහු පස්දෙනා වහන්සේ එක්ව පිඩුසිගාන පිණිස බරණැස් නුවර දෙරට බැස මනාකොට හැඳ පෙරව ප්‍රසාදවහ වූ යාම ඊමෙන් පිඬුසිඟා ඇවිදිනාසේක් රජගෙයි දොරකඩට පැමිණිසේක. රජ්ජුරුවෝ උන්වහන්සේලා දැක මහසතුටු ව රජගෙට වඩාගෙන ගොස් පය සෝධා සුවඳ තෙල් ගල්වා මධුර වූ ආහාරපාන වර්ගයෙන් සතප්පා එකත්පස්ව ඉඳ ''ස්වාමීනි, නුඹවහන්සේලා අභිනවයෙම පැවිදි හොබනේය. මේ වයසේම මහණවනසේක් කාමයෙහි කෙසේ ආදිනවයක් දැක කුමක් අරමුණුකොට වුසේක්දැ?''යි විචාළසේක.

එකල ඔබ හැමත් වෙන් වෙන්කොට වදාරනසේක් ''එම්බා රජ්ජුරුවෙනි, අපි දෙයාළු කෙනෙකුන් මෝ පැන් ලබු දෙකක් ඇරගෙන ගොවි මේවරට ගියමෝ පිපාස කල එකෙක් ගොඩ නැගී පැන් බෝම්හ, එකල මම මාගේ පැන් රක්නා පිණිස මිත්‍රයාගේ ලබ්බේ පැන් නොකියා බී පීමි. ඒ අකුශලයෙහි කලකිරීය මා පැවිදි වූයේය''යි වදාළසේක. අනික් පසේබුදුහු වදාරනසේක් ''රජ්ජුරුවෙනි, මම පෙර ස්ත්‍රියක දැක ලෝභය උපදවා ඒ අකුශලයෙහි කලකිරී 'මෙබන්දක් නැවත මා කරා නොඑව'යි කියා මා පැවිදි වූයේය''යි. වදාළසේක.

තවද එක් කෙනෙකුන් වහන්සේ වදාරනසේක් "පෙර අපි දෙපුතුපිය කෙනෙකකුන් මෝ වනයෙහි සොරුන්ට අසුව විචාළ කල්හි 'අපි නොනෑයම්හ'යි බොරු කීහ. ඒ අකුශලයෙහි කලකිරී 'මෙබන්දක් මා කරා නොව'යි කියා මා පැවිදි වූයෙය"යි වදාළසේක. තවද එක් කෙනෙකුන් වහන්සේ වදාරනසේක් "මහරජ, පෙර මම ගම්දෙටුවක් ව දේවතාවන්ට බිලි දෙන පිණිස සත්ත්වයන්ට ප්‍රාණඝාත කරන්ට අනුදැක්කෙමි, ඔහු හැමදෙනාම බොහෝ ප්‍රාණඝාත කළාහ. ඒ දැක 'මා නිසා වේද මෙතෙක් තිරිසනුන් නටුයේය'යි ප්‍රාණඝාතයෙහි කලකිරී 'මතු මා කරා මෙසේ වූ අකුශලයක් නොවව'යි කියා මා මහණ වුයේය"යි වදාළසේක. තවද එක් කෙනෙකුන් වහන්සේ වදාරනසේක් "මහරජ, පෙර මම ගම්දෙටුවෙක් ව සැනකෙළි දවසෙක බොහෝ දෙනාට අනර්ථයට කාරණා වූ සුරාපානය බොන්නට අවසර දිනිමි. ඔහු ඇම රා බී මත්ව ඔවුනොවුන්ට හිංසා පීඩාකොට බොහෝ දෙන දණ්ඩනයට පැමිණියාහ. ඒ අකුශලය දැක 'නැවත මෙබන්දක් මා කරා නොඑව'යි කියා මහණ වුයේය"යි වදාළසේක.

රජ්ජුරුවෝ පස්දෙනා වහන්සේගේම ධර්මය අසා සතුටු ව සිවුරු පිළිඳ, බෙහෙත් පසඳ පිළිගැන් වූහ. උන්වහන්සේලාත් රජ්ජුරුවන්ට අනුමෙවෙනි බණ ධර්ම දේශනාකොට නැවත වාසස්ථානයට වැඩිසේක.

එදවස් පටන් රජ්ජුරුවෝ වස්තු කාමයෙහි කලකිරී ඇල්මක් නැතිව නොයෙක් රසයෙන් උතුම් වූ ආහාරය අනුභව

නොකට ස්ත්‍රීන් හා බැණ නොනැසීම, නොකැඳවා ශ්‍රීයහන් ගබඩාවට වැඳ සුදු වූ භික්තිය බලා කිසුනු පිරියම්කොට ධ්‍යාන උපදවා "පඤ්චකාමයෙහි නින්ද කරන්නා වූ බොහෝ පසමිතුරන් ඇති පිළිකුල් දුර්ගන්‍ධ වූ මේ කයට නින්ද වේවයි, මෙබඳු වූ මම කාමයෙහි සෙව්නෙමි, මෙබඳු ධ්‍යාන සැපයක් නොලබම්ද? එසේ වූ කාමයට නින්ද වේව"යි කියමින් උන්හ.

ඉක්බිත්තෙන් බිසව් රජ්ජුරුවෝ පසේබුදුන්ගෙන් බණ කථා අසා කලකිරුණා වූ ස්වරූපයෙන්ද, අප හා සමඟ කථා නොකොට යහන් ගබඩාවට වන්හ. ඒ මා පරීක්‍ෂා කරන්ට උවමැනවැ"යි සිතා ශ්‍රී යහන් ගබඩාව දොරකඩට ගොස් කාමයට නින්දකොට උදන් අනන්නා වූ රජ්ජුරුවන්ගේ බස් අසා "රජ්ජුරුවෙනි, කාමයට නින්ද නොකරව, කාම සැප සේ වූ සැපයෙක් ඇද්දැ?"යි වර්ණනා කරන්නාහු "රජ්ජුරුවෙනි, මේ කාමය නම් මහත් ආස්වාද ඇත්තේය. කාමයට වඩනා වූ එකද සැපයෙක් නැත. එසේ වූ කාම සැපයට යමෙක් සිටියේ වීනම් සත්ත්වතෙම අපායට නොගොස් සවීගයෙහිම උපන්නේය"යි කීහ.

එබස් අසා රජ්ජුරුවෝ බිසවුන්ට "රැහැනිව නැඟී සිටියා වූ චණ්ඩාලිය, කුමක් කියවුද? කාමයෙහි සැපයෙක් නම් කොයින්ද පෙරලෙන්නා වූ ස්වභාව ඇත්තේය"යි නින්ද කරන්නාහු "මේ කාමය ස්වල්ප සැප ඇත්තේය. කාමයට වැඩි දුකකුත් නැත. එසේ වූවේ වී නමුත් ඒ සත්ත්ව තෙම නරකයෙහි උපදනේය. තවද නොකොට මුවහත් ගන්නාලද

විෂ පෙවූ කඩුවක් යම් සේද, ශස්ත්‍රයක් යම් සේද, ළය එල්ලට බැඳ එල්ලන ලද්දේ යම් සේද කාමයත් එපරිද්දෙන්ම මහත් වූ භය හා දුක් ඇත්තේය. තවද පුරුෂ ප්‍රමාණයටත් වැඩි ගැඹුරු වූ සාලගුරු වලෙක්හි හුනුවා වූ සත්ත්වයෙකුට දවසක් මුලුල්ලෙහි රත් කරනලද යකබලෙක්හි හුනු සත්ත්වයෙකුට යම් සේ දුක්ද කාමය නම් ඊටත් වඩා දුක් ඇත්තේය. හලාහල විෂයෙන් යම් සේ කකියන තෙලක් යම් සේද, පිරී ගිය තඹ ලෝහාදිය යම් සේ සත්ත්වයන් හුනු කල දුක්දේද, මේ කාමය ඊටත් වඩා දුක් ඇත්තේය"යි යනාදින් බිසවුන්ට ධර්ම දේශනාකොට අමාත්‍යයන් රැස් කරවා "එම්බා පින්වත් අමාත්‍යයෙනි, තොපි ඇම රාජ්‍යය පිළිපදුව. මම මහණ වෙමි" කියා අමාත්‍යයන්ට රාජ්‍යය පාවා දී මහජනයා හඬමින් වැළපමින් සිටිය දී නැගී සිට අවවාදකොට ආකාශයෙන් උතුරු හිමාලයට ගොස් සිත්කළු තෙනක පන්සල් මවා සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි ව ආයුෂයාගේ කෙළවර ධ්‍යානයෙන් බ්‍රහ්ම ලෝකයෙහි උපන්නාහුය. සර්වඥයන් වහන්සේ මේ 'පාණීය ජාතකය' ගෙනහැර දක්වා වදාරා "එම්බා මහණෙනි, ක්ලේශ නම් කුඩා යයි නැත. ස්වල්ප මාත්‍රයකුදුව නුවණැත්තන් විසින් නිග්‍රහ කටයුතුය"යි වදාරා චතුස්සත්‍ය ප්‍රකාශකොට වදාළසේක. ඒ ධර්මයන්ගේ කෙළවර පන්සියයක් භික්ෂූන් වහන්සේ රහත් වූසේක.

"එකල පසේබුදුන් වහන්සේ පිරිනිවිසේක. එකල බිසව් නම් දැන් මේ රාහුල මාතාවෝය. එකල රජ්ජුරුවෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 453. යුද්ධජ්ජය (යුධඤ්ජය) ජාතකය

තවද මේ ජාතකය සත්ත්‍වයන් ජාති කාන්තරාදීන් තරණයකොට සාත්තුවක් වැනි වූ හෙයින් ශාස්තෘ නම් බුදුරජාණන් වයන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි මහබිනික්මන් අරභයා වදාළසේක.

ඒ කෙසේද? යත්,

එක් දවසක් දම්සබා මණ්ඩපයෙහි රැස්ව උන් භික්ෂූන් වහන්සේ “එම්බා ඇවැත්තනි, ඉදින් සර්වඥයන් ගිහි ගෙහි වසනසේක් වීනම් සියළු චක්‍රාවාට ගර්භයට නායක වූ සප්ත රත්නයෙන් සමන්විත ව සෘර්ධියෙන් සමන්විත වූ පුත්‍රයන් දහසක් පරිවාරකොට ඇති සක්විති රජ වනසේක. එසේ වූ ශ්‍රී විභූතියක් හැර කාමයෙහි ආදීනව දැක මධ්‍යම රාත්‍රි වේලෙහි ඡන්න නම් අමාත්‍යයාගේ සහායෙන් කන්ථක නම් අශ්ව රාජයාට නැගී මහබිනික්මන් කොට ගංතෙර දී මහණ ව සාවුරුද්දක් දුෂ්කර ක්‍රියාකොට සර්වඥතා ඥානයට පැමිණීසේකැ”යි බුදුන්ගේ ගුණ කථාව කියමින් උන්සේක. එකල බුදුනු දිව්‍යකනින් අසා වදරා තුන්තරා ගමනකින් එක්තරා ගමනකින් දම්සභා මණ්ඩපයට වැඩ ධර්මාසන මස්තකයෙහි වැඩහිඳ “මා එන්නාට පුර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?”යි විචාරා “මෙනම් කථාවකින් යුක්තව උනුම්හ”යි කී කල්හි “එම්බා මහණෙනි, බුදුනු දැන්මතු නොවයි, පෙරත් මහබිනික්මන් නික්මුණෝ වේදැ”යි වදරා

එක්තරා භික්ෂු කෙනෙකුන් වහන්සේ විසින් ආරාධිත වූ බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර තෙම උදය ජාතකයෙහි සුරුන්ධන නම, චුල්ල සුතසොම ජාතකයෙහි සුදස්සන නම, සොනන්නද ජාතකයෙහි බ්‍රහ්මවර්ධන නම, ඛණ්ඩහාල ජාතකයෙහි පුෂ්පතීම නම, මේ යුද්ධජ්ජය ජාතකයෙහි රම්ම නම් නුවරක් විය. එහි සබ්බදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි උන්ගේ දහසක් පමණ පුත්‍රයෝ වන්නාහ. ඔවුන් හැමදෙනාට වැඩිමාළු පුතණුවෝ යුද්ධජ්ජය කුමාරයන්ට යුවරජ පදවි දුන්නාහ. ඒ යුද්ධජ්ජය කුමාරයෝ එක් දවසක් උදෑසනක් සේ උතුම් වූ රථයකට පැන නැගී මහත් වූ ශ්‍රී සමෘද්ධියෙන් උයන් කෙළියට යන්නාහු ඒ මග තණ අග මකුළුදැල් ආදියෙහි මුතුදැල් ආකාරයෙන් එල්ලෙන්නා වූ පිණිබිංදු දැක "යහළු රථාචාර්‍ය්‍යී, මේ කිමෙක්දැ?"යි විචාරා "දේවයන් වහන්ස, මේ හිම කාලයෙහි වැටෙන්නා වූ තුසාර බිඳුය"යි යනු අසා දිවා මාන උයන් කෙළි කෙළ සවස් වේලෙහි නැවත නුවරට එන්නාහු පිණිබිඳු නොදැක රථාචාර්‍ය්‍යීයා අතින් "ඒ නොපෙණෙන්ට කාරණා කිම්දැ?"යි විචාරා "දේවයන් වහන්ස, ඒ පිණිබිඳු ඉර නැගී කල්හි සිඳී බිඳී යන්නේය"යි කී කල්හි "මේ සත්ත්වයන්ගේ ජීවිත සංස්කාරයත් තණ අග රැඳි පිනිබිඳු පරිද්දෙන් අස්ථිර වන්නේය"යි කලකිරීමට පැමිණ "මා විසිනුත් ජාති, ජරා,

මරණය යන මේ සියල්ලත් නොපෙණෙන තෙක් දෙමව්පියන් අනුදන්වා මහණ වන්නට වටනේය”යි තුසාර බින්දු අරමුණුකොට “මේ භවත්‍රය ගිණිගෙන දිලියෙන්නා වූ ගෙයක්” මෙන් සිතා තමන්ගේ ගෙට ගොස් මනාකොට සරහන ලද ශාලාවෙහි උන්නා වූ තමන්ගේ පියාණන් සමීපයට ගොස් වැඳ එකත්පස ව සිට මහණ වන්නට යාඥා කරන්නාහු මෙසේ කියත් “මිත්‍රයන් හා අමාත්‍යයන් විසින් පිරිවරන ලද රථොත්තම වූ දේවයන් වහන්ස, නුඹවහන්සේ වැඳ දන්වමි, මම මහණවනු කැමැත්තෙමි. නුඹවහන්සේ අනුදැන වදාළ මැනවැ”යි කීහ.

ඉක්බිති රජ්පුරුවෝ ප්‍රතිෂේපකොට වලකා කියන්නාහු “එම්බා පුත, තොපට ඉදින් පඤ්ච කාමයෙන් යමෙක් අඩු වීනම් මම ඒ සම්පුර්ණකොට ලමි. යමෙක් තොපට හිංසාවක් පිඩාවක් කරන්නේ වීනම් එයිත් මම වලකමි. එසේ හෙයින් තොප මහණ නොවව”යි කීය.

එබස් අසා කුමාරයෝ කියන්නාහු “දේවයන් වහන්ස, මට පඤ්ච කාමයෙන් අඩුවෙකුත් නැත. හිංසාවෙක් කරන කෙනෙකුත් නැත. බල, එකෙක් නම් ජරා, මරණ මා කරා නොඑන්ගෙන් පළවුම මම මට ප්‍රතිෂ්ඨාවක් කරණා කැමැත්තෙමි. කෙසේ වූ පිහිටෙක් ඇද්දැ යි යතහොත් යම් ද්වීපයෙක් ජරා, මරණ නැවති සොරහු නොපරි නම් එසේ වූ නිර්වාන නැමති ද්වීපයට යනු කැමැත්තෙමි. මා නොවැලකුව මැනව”යි කීහ.

මෙසේ පියාණෝ පුතණුවන් වලක්නාහ. පුතණුවෝ පියාණන්ට යාඥා කරන්නාහ යි යනාදීන් බොහෝ ප්‍රත්‍යුත්තරකොට නැවත කුමාරයෝ කියන්නාහු "රාජොත්තම වූ දේවයන් වහන්ස, කාමයෙන් මත් වූ කාම වසඟයට පැමිණියා වූ ජරා වසඟයට පමුණුවා ද යම් සේ මම සර්‍වඥතා ඥානය සමධිගමය කළහොත් නම් එපරිද්දෙන් මා නොවලකා මහණ වන්ට අවසර දුන මැනවැ"යි කීය. මෙසේ කී කල්හි රජ්ජුරුවෝ කිසිවක් මුවෙන් නොබැන උන්හ.

එකල කුමාරයන්ගේ මව් බිසව් "පුතණුවන් පියාණන් අතින් මහණ වන්නට අවසර ඉල්වන නියාව අසා කුමක් කිව්ද? දරුවෙනි" කියමින් වියළුනා වූ හෘදය වස්තුව හා මුඛ ඇතිව රන්සිවි ගෙයකට නැගී වහ වහා අධිකරණ ශාලාවට අවුත් පුතණුවන්ට යාඥා කරන්නාහු "එම්බා පුත, තොපට යාඥාකොට වලකා කියමි, මම තොප බොහෝ කාලයක් දැක දැක ඉන්නා කැමැත්තෙමි. එසේ හෙයින් පුත යුද්ධජ්ජය කුමාරයානි, තොප මහණ නොවව"යි කීහ.

ඒ අසා කුමාරයෝ කියන්නාහු "එම්බා මෑණියෙනි, තණ අග පිනි බිඳු යම් සේ ඉරු නැගි කල්හි සිඳී බිඳී විනාශයට පැමිනේද, එපරිද්දෙන් ම සත්ත්‍වයන්ගේ ආයුෂයත් විනාශයට පැමිණෙන්නේය. එසේ හෙයින් මා නොවැලකුව මැනවැ"යි කීහ. බිසව් මෙසේ කී කල්හි නැවතත් යාඥා කර පියාණනන්ට කියන්නාහු "රථොත්තම වූ රජ්ජුරුවන් වහන්ස, සංසාර කාන්තාරයෙන් එතර වන්නා වූ මා වලකන මේ මාගේ

මෑණියන් වහා යානාවකට නැගී රජගෙට යන පරිද්දෙන් සම්මත කළ මැනවැ"යි කීහ. රජ්ජුරුවෝ පුතණුවන්ගේ බස් අසා බිසවුන්ට කියන්නාහු "සොඳුර, තොප වහා රන්සිවිගේකට පැන නැගී රතිවර්ධන ප්‍රාසාදයට නැගෙව"යි කීහ. බිසව රජ්ජුරුවන්ගේ බසට සිටිය නොහී සිවිගේකට පැන නැගී ස්ත්‍රී සමුහයා පිරිවරා ගොස් ප්‍රාසාදයට නැගී "කුමකින් කුමක් වේදෝ හෝ"යි විනිශ්චය ශාලාවේ දෙර බල බලා සිටියාහ.

බෝධිසත්ත්වයෝ මෑණියන් ගිය කල්හි නැවත පියාණන්ට යාඥකොට පියාණන් වහන්සේ විසින් වැලකිය නොහී "එසේ වීනම් තොපගේ මනෝරථය මුදුන් පමුණුවා ගණුව"යි අනුදත් කල්හි බෝධිසත්ත්වයන්ගේ මල් වූ යුදිට්ඨිල කුමාරයෝ ද පියාණන් වැඳ "පියාණන් වහන්ස, මට පැවිද්ද අනුදත මැනවැ"යි අනුදත්වාගෙන දෙබෑයෝම පියාණන් වැඳ සමුගෙන පඤ්චකාමය හැර මහජනයා පිරිවරා විනිශ්චය ශාලාවෙන් නික්මුණාහ. බිසව් යන්නා වූ බෝධිසත්ත්වයන් දැක "මාගේ පුතණුවන් මහණ වූ කල්හි මේ රම්‍ය නුවර සිස් වන්නේය"යි අඬන්නාහ. තමන් වටකොට සිටිනා ස්ත්‍රීන් අමතා බිසව් කියන්නී "සබ්බදත්ත පියරජ්ජුරුවන් විසින් අනුදන්නාලද මාගේ පුතණුවෝ තපසට යන්නාහ. උන් තපසට ගිය කල මේ රම්‍ය නුවර සිස් වන්නේය. තොපි හැම වහා ගොස් වලකව"යි කීහ. බෝධිසත්ත්වයෝ තවම මහණ ව නොවුනාව දෙමව්පියන් වැඳ මලණුවන් යුධිට්ඨිල කුමාරයන් කැඳවාගෙන නුවරින් පිටත්ව මහජනයා වලකා හිමාලය වනයට වැද

සිත්කළු වූ තැනක පන්සල් මවා ඍෂි ප්‍රව්‍රජ්‍යයෙන් පැවිදි ව ධ්‍යානභිඥාවන් උපදවාගෙන වනමුල් පලාඵලයෙන් ජිවත් වන්නාහු ආයුෂයාගේ කෙළවර බ්‍රහ්ම ලෝකයෙහි උපන්නාහුය.

ඒ අර්ථය ප්‍රකාශ කරන්නා වූ බුදුරජාණන් වහන්සේ "යුද්ධඤ්ජය, යුධිට්ඨිලය යන කුමාරවරුන් දෙදෙන දෙමව්පියන් හැර මරහුගේ සංගමය සිඳ මහණ වුවෝ වේදැ"යි වදරා "එම්බා මහණෙනි, බුදුහු මහබිනික්මන් කළේ දැන්මතු නොවෙයි, පෙරත් මහබිනික්මන් කළෝ වේදැ"යි වදරා මේ 'යුද්ධඤ්ජය ජාතකය' නිමවා වදාළසේක.

"එසමයෙහි දෙමව්පිය දෙදෙන නම් දැන් මේ සුද්ධෝදන රජ්ජුරුවන් හා මහමායා දේවි ය. එසමයෙහි යුධිට්ඨිල කුමාරයෝ නම් දැන් මේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයෝ ය. එසමයෙහි යුද්ධඤ්ජය කුමාරයෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 454. දසරථ ජාතකය

තවද මේ ජාතකය ජේතවනාරාමයෙහි වසන්නා වූ සුන්දර ගතියක් ඇති හෙයින් සුගත නම් වූ සර්වඥයන් වහන්සේ පියා මළ සෝකයෙන් අඬන්නා වූ එක් කෙළෙඹි පුත්‍රයෙකු අරභයා වදාළසේක.

ඒ කෙසේද? යත්,

ඒ කෙළෙඹි පුත්‍රයා පියා මළ කල්හි සෝකයෙන් මඬනා ලද්දේ කළමනා සියළු කර්මාන්ත හැර සොකය ම අනුව

පවත්නේය. සර්‍වඥයන් වහන්සේ අළුයම් වේලෙහි මහා කරුණා සම්පත්තියෙන් නැගී ලොව බලා වදාරනසේක් ඒ පුරුෂයාගේ ශ්‍රොතාපත්ති ඵලයට උපනිශ්‍රය ඇති නියාව දැන දෙවන දවස් උදෑසනම සැවැත් නුවර පිඩුසිගා වළඳා කරනලද ආහාර කෘත්‍යය ඇතිසේක් භික්‍ෂූන් වහන්සේ යවා එකම භික්ෂූ කෙනෙකුන් කැඳවා කෙළෙඹි පුත්‍රයාගේ ගෙට ගොස් ඔහු විසින් වැඳ එකත්පස්ව උන් කල්හි මිහිරි වූ කට හඬින් කථා කරනසේක් “සෝකය කිම්ද? උපාසකය”යි වදාරා ඔහු විසින් “එසේය ස්වාමීනි, පියා කෙරෙහි කරනලද සෝකයෙන් මා පෙළෙන්නේය”යි කී කල්හි “එම්බා උපාසකය, පුරාතනයෙහි නුවණැත්තෝ අෂ්ටලෝක ධර්‍මය තත්ත්‍ව හෙයින් දන්නාහු පියාණන් කළුරිය කළ කල්හි ස්වල්ප මාත්‍රයකුත් සෝක නොකළෝ වේදැ”යි වදාරා ඒ උපාසකයා විසින් ආරාධිත වූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද, යත්,

යටගිය දවස බරණැස් නුවර දසරථ නම් මහරජ්ජුරු කෙනෙකු අගති ගමනින් දුරුව දසරාජ ධර්‍මයෙන් රාජ්‍යය කරන්නාහුය. ඒ රජ්ජුරුවන්ගේ සොළොස් දහසක් පුරාංගනාවන්ට නායක අග්‍රමහේසිකා බිසව් පුතුන් දෙදෙනෙකු හා එකම දියණි කෙනෙකුන් වැදූහ. ඔවුන් අතුරෙන් වැඩිමාළු පුතණුවෝ රාමපණ්ඩිත නම් වෙති. මලණුවෝ ලක්‍ෂමණ කුමාර නම් වෙති. දියණියෝ සීතා දේවීන් වන්නාහ. මෙසේ වයස ගිය බිසව් කළුරිය කළාහ. එකල රජ්ජුරුවෝ බොහෝ

සෝකයට පැමිණ අමාත්‍යයන් විසින් සන්හිඳුවන ලද්දා වූ බිසවුන්ගේ ආදහන කෘත්‍ය කරවා අනික් බිසෝ කෙනෙකුන් අගමෙහෙසුන් තනතුරෙහි තිබූහ. එකල ඒ බිසවිද රජ්ජුරුවන්ට ප්‍රිය වන්නාහුය, මන වඩන්නාහු කල් යාමකින් දරු ගැබක් ඇතිව පුතණු කෙනෙකුන් වැදූහ. ඒ කුමාරයන්ට “භරත කුමාරයෝය”යි නම් තැබූහ. එකල රජ්ජුරුවෝ පුත්‍ර ස්නේහයෙන් බිසවුන්ට කියන්නාහු “සොඳුර, තොපට වරයක් දෙමි, ගණුව”යි කීහ. බිසව් වර ගන්නෝ කුමාරයන් සත්අට ඇවිරිදි අවස්ථාවෙහි රජ්ජුරුවන් සමීපයට ගොස් “දේවයන් වහන්ස, නුඹවහන්සේ විසින් මට වරයක් දෙන ලද්දේ වේද, දැන් මට ඒ දුන මැනවැ”යි කීහ. රජ්ජුරුවෝත් “යහපත, දේවිනි ගණුව”යි කීහ. එකල බිසව් කියන්නාහු “දේවයන් වහන්ස, නුඹවහන්සේ විසින් මාගේ පුතණුවන්ට රාජ්‍යය දුන මැනවැ”යි කීහ. එබසට රජ්ජුරුවෝ “රැහැනි ව අසුර ගසා නැසී ගියා වූ චණ්ඩාලිය, මාගේ පුත්‍රයෝ දෙදෙනෙක් ගිණි කඳන් සේ දිලියෙන්නා වූ ඔවුන් මරවා තිගේ පුතාට රාජ්‍යය ඇරදෙනු කැමැත්තෙහිදැ?”යි භය ගැන්වූහ.

බිසව් භයපත් ව ශ්‍රී යහන් ගබඩාවට වැද දෙවැනි දවසෙක නැවත රාජ්‍යය ඉල්වන්නාහුය. රජ්ජුරුවෝද බිසවුන්ට ඒ වරය නොදී සිතන්නාහු “ගෑණු නම් කෙළෙහි ගුණ නොදන්නාහ. මිත්‍රද්‍රෝහීය. ‘තෝ මාගේ නෑයෝය’යි කියා සොරපතක් ගෙන අත්ලස් හෝ දී මාගේ දරුවන් මරාපු නම් නපුරු”යි සිතා කුමාරවරුන් දෙන්නා සමීපයට ගෙන්වා ඒ බව කුමාරවරුන්ට කියා “දරුවනි, තොපි මෙහි වසන කල

අන්තරායෙක් වීනම් නපුරුයි, තෙපි දුරු රටකට හෝ වලකට හෝ ගොස් මාගේ ඇවෑමෙන් අවුදින් තොපගේ කුලසන්තක රාජ්‍යය ගණුව”යි කියා ලක්‍ෂණ පාඨකයන් ගෙන්වා තමන්ගේ ආයු සංස්කාරය විචාරා “ඉදිරියෙන් දොළොස් අවුරුද්දක් පවතින්නේය”යි අසා “එම්බා දරුවෙනි, මට දොළොස් අවුරුද්දක් ගිය කල අවුදින් සේසත් නන්වා රාජ්‍යය කරව”යි කීහ. කුමාරවරුන් “යහපතැ”යි පිය රජ්ජුරුවන් වැඳ සමුගෙන අඬමින් වලපමින් ප්‍රාසාදයෙන් බටහ.

එකල සීතාදේවී “මමත් බෑනන් වහන්සේලා කැටුව යෙමි” කියා පියාණන් වැඳ සමුගෙන අඬමින් වලපමින් නික්මුණාහ. මෙසේ තුන් බිත්තෝම මහජනයා පිරිවරා නික්ම මහජනයා රඳවා අනුක්‍රමයෙන් හිමාලයට ගොස් සමුර්ධි වූ ජලාශ්‍රයන් ඇති සුලභ වූ පලාඵලයන් ඇති ස්ථානයෙක්හි පන්සල් මවා පලාඵලයෙන් යැපෙමින් වාසය කරන්නාහුය. එකල ලක්‍ෂණ පණ්ඩිතයෝද සීතාදේවීද රාම පණ්ඩිතයන්ට යාඥා කරන්නාහු “නුඹවහන්සේ අපට පීතෘපස්ථානයෙහි සිටිසේක. එසේ හෙයින් ආශ්‍රමයෙහි නුඹ වහන්සේ රැඳුන මැනව, පලාඵල ගෙනහැර නුඹවහන්සේ පෝෂ්‍ය කරම්හ”යි ප්‍රතිඥා ගෙන එදවස් පටන් ආශ්‍රමයෙහි රාම පණ්ඩිතයන් රඳවා තුමූ දේවීත් පලාඵල ගෙනහැර පෝෂ්‍ය කරන්නාහ.

මෙසේ තුන් බිත්තෝම පලාඵලයෙන් ජීවත් ව වසන කල දසරථ රජ්ජුරුවෝ පුත්‍ර ස්නේහයෙන් පෙළෙමින්ම නවවෙනි අවුරුද්දෙහි කාලක්‍රියා කළාහ. එකල බිසව් රජ්ජුරුවන්

ආදාහන කරවා ඉක්බිති තමාගේ පුතණුවන් භරත කුමාරයන් රාජ්‍යාභිෂේක කරන්නට වන්හ. එකල අමාත්‍යයෝ "රාජ්‍ය ස්වාමීහු වල්හි වසන්නාහ. එසේ හෙයින් භරත කුමාරයන්ට රාජ්‍යය නොලැබෙ"යි වැලක්කාහ. එකල භරත කුමාරයෝ "මාගේ බෑනන් වලින් ගෙනවුත් අභිෂේක කරවමි" පඤ්චකකුධ භාණ්ඩයනුත් ගෙන්වාගෙන සිවුරඟ සෙනග ගෙන රාම පණ්ඩිතයන් වසන තැන්ට ගොස් නුදුරු තෙනක කඳවුරු බැඳ අමාත්‍යයන් කීප දෙනෙකු හා සමග ලක්‍ෂණ කුමාරයන්ද සීතාදේවීන්ද වල් ගිය වේලාවට ආශ්‍රමයට වැද පන්සල් දෙරකඩ තබනලද රන්රුවක් වැනිව උන්නා වූ රාම පණ්ඩිතයන් සමීපයට ගොස් වැඳ එකත්පස්ව සිටියාහුය.

දසරථ රජ්ජුරුවන් මළ නියාව කියා අමාත්‍යයන් සමග රාම පණ්ඩිතයන් පාමුල්හි වැටී ඇඬූහ. රාම පණ්ඩිතයෝ නොහැඬූහ. සෝක මාත්‍රයකුත් නොකළාහ. භරත කුමාරයන් අඬා වලපමින් උන් කලට සවස් වේලේ වල් ගිය ලක්‍ෂණ කුමරු හා සීතාදේවී දෙදෙන පලාඵල ඇරගෙන ආහ. එකල රාම පණ්ඩිතයෝ කියන්නාහු "මේ කුමාරවරු දෙදෙනම බාලයෝය. සෝක සහනය කළ නොහෙන්නේය"යි සිතා "සනිකෙම තොපගේ පියාණෝ මළෝ යයි කී කල්හි සෝක ඉවසිය නොහී ළය පැලී මියන්නාහ. එසේ හෙයින් උපායෙන් මුන් දියට බාවා මේ ප්‍රවෘත්තිය කියමි" සිතා කුමාරවරුන් දෙදෙනා ඉදිරියේ එක්වන් පොකුණක් දක්වා "තොපි ඇම ඉතා කල් යවා ආ හෙයින් තොපට දඬුවමැ"යි කියන්නාහු "ලක්‍ෂණ කුමාරයන් හා සීතා දේවීන් හා දෙන්නම මෙසේ එව,

තොප පමා වූවාට දඬුවන් පිණිස කරවටක් දියට බැස දිටුව''යි කීහ. එක බස හා සම ඔහු දෙදෙනම දියට බැස සිටියාහ. කුමාර එකල පියාණන් මළ නියාව කියන්නා වූ රාම පණ්ඩිතයෝ "එම්බා ලක්‍ෂණ කුමාරයන් හා සීතාදේවීනි, මේ භරත කුමාරයෝ දසරථ රජ්ජුරුවන් මළහ යි කියති'' කීහ. ඔහු දෙදෙනා "පියාණන් මළහ''යි කියන බස අසමින් විසඥ ව දිය පිට හුනහ. දෙවෙනිවත් තුන්වෙනිවත් නගා සිටුවා එපවත් කියා දියෙන් ගොඩනගා මදක් අස්වැසිලිලත් කල්හි ඇම එක්ව අඬා වැලප උන්කල භරත කුමාරයෝ සිතන්නාහු "මාගේ බෑණන් වහන්සේ, ලක්‍ෂණ කුමාරයෝද මාගේ නැගණියෝ සීතාදේවීද පියාණන් මළ නියාව අසා සෝක සහනය කළ නොහී විසඥ ව ගියහ. රාම පණ්ඩිතයෝ වනාහි නොහඬන්නාහුය. සෝක නොකරන්නාහු'' උන් සෝක නොකරන කාරණා විචාරන්නාහු "රාම පණ්ඩිතයන් වහන්ස, සෝක කටයුත්තෙහිද නුඹවහන්සේ සෝක නොකරන්නේ කවර ආනුභාවයකින්ද? නුඹවහන්සේ පියාණන් මළ නියාව අසාත් සෝකයෙන් නොපෙලෙන්නට කාරණා කිම්දැ?''යි විචාළාහ.

ඉක්බිත්තෙන් රාම පණ්ඩිතයෝ තමන් සෝක නොකරන කාරණා කියන්නාහු "එම්බල භරත කුමාරයෙනි, ජීවත් වන්නා වූ සත්ත්වයෙකුගේ මරණ කාලයෙහි සෝකයෙන් අඬන්නා වූ කිසි සත්ත්වයෙක් රැකගත නොහේද? සෝක සන්හිඳුවාගත නොහේද? එසේ හෙයින් දැන් අෂ්ටලෝක ධර්මය සත්‍ය හෙයින් කියන්නාහු මෙබඳු වූ නුවණැති ප්‍රාඥයක්හු මරණාන්තරයාගේ කෙළවර මළා වූ සත්ත්වයක්හු මළැයි තමා තැවීමෙන් කිම්ද?

කිසිම උපකාර නැති සෝක කිරීමෙන් කවර ප්‍රයෝජනද? මලණ්ඩ භරත කුමාරයෙනි, මේ මරණ නම් රන්රුවන්ට බඳු වූ රූ ඇති ළඳරුයයිද, කුමාරාදී කුල ඇත්තන්ද, වැඩිහිටි ශක්ති සම්පන්න යෝධයන්ද, නුවණැත්තා වූ පෘථජ්ජනයන්ද, බුද්ධාදී වූ ප්‍රාඥයන්ද, චක්‍රවර්ති ආදී වූ ඉසුරුමතුන්ද, වස්ත්‍ර අන්නපාන නොලබන්නා වූ දිළිඳු යයි යන මේ සියල්ලවුන් කෙරෙහි වෙනසක් නැත්තෝය. ඒ සියල්ලෝම මරු හා කිසි ලැජ්ජාවක් නැතිව එහිම භජ්ම වන්නාහ. තවද මලණ්ඩ භරතයෙනි, යම් සේ විලික්ෂව ගියා වූ ඵලයෙන් විලික්ෂුණු තැන් පටන් තුවටුවෙන් දැන් ගිලිහෙයි කියා භයවේද? එහි වැටීම ඒකාන්තයෙන් නියමද, ජීවත් වන්නා වූ සත්ත්වයාගේ ජීවිතයත් ඒකාන්තයෙන්ම අසවල් වේලෙහි අසවල් ඇසිල්ලෙක මියෙති නියමයක් කළ නොහැක්කේය. තවද උදෑසන දුටුවා වූ බොහෝ සත්ත්වයෝ සවසට නොපෙණෙන්නාහ, සවස දුටු බොහෝ සත්ත්වයෝ උදෑසන නොපෙණෙන්නාහ, මරු මුඛයට පෙණෙන්නාහ. තවද මාගේ පියාණෝය පුතණු යයි අඬන්නා වූ යම් සත්ත්ව කෙනෙක් තෙම ගති මුඩව තෙමේ තමා ම පෙලෙන්නේය, ස්වල්ප මාත්‍රයකුත් වැඩක් ඵලවාගත නොහෙන්නේය. ඕ හට අනික් වැඩකුත් කළ නොහෙන්නේය. මළා වූ සත්ත්වයා ගෙන්වා ගතත් නොහෙන්නේය. තවද යම් සත්ත්වයෙක් අඬන්නේ වීනම් එසේ වූ සත්ත්වතෙම කෘශ වන්නේය, නපුරු ශරීර වර්ණ ඇති වන්නේය. එසේ හෙයින් තමාගේ කායචිත්ත දෙකටම තාපනය කරණ විවරක්ම වන්නේය. ඒ ඇඬීමෙන් මළා වූ සත්ත්වයා ජීවත් වන්නේත්

නැත, ඕ හට ඇඬීමම වන්නේය. තවද යම් නුවණැති සත්ත්වයෙක් තෙම තමා වසන්නා වූ ගෙයි ගිණිගත් කල්හි මදකුත් මලිත කමක් නොවී සියදස් ගණන් පැන්සල සලා ගිණි නිවාද? එපරිද්දෙන්ම නුවණැති සත්ත්ව තෙම නැංගා වූ සෝකාග්නිය නිවන්නේය. වාත මුඛයෙහි අරණලද පුළුම් රැලෙක් යම් සේ ද නුවණැත්තෝ එපරිද්දෙන්ම සෝකය නසා දුරු කරන්නේය. තවද යම් සත්ත්වයෙක් තෙම පරලොව යන්නේ උදකලාව ම යන්නේය. ක්‍ෂත්‍රියාදී යම් කුශලයෙක් උපන්හොත් උදකලාව ම උපදනේය. එතන මාගේ මිත්‍රයෝය, නෑයෝය, මෑණියෝය, පියාණෝ යයි එක්ව සන්වාසය කරන පමණක් විනා සියළුම සත්ත්ව තෙම කළා වූ කුසල් අකුසල් දෙකම ප්‍රාණ ප්‍රතිෂ්ඨාකොට ඇත්තේය. ඒ කාරණය හේතු කොටගෙන බොහෝ ඇසූපිරූ තැන් ඇති නුවණැති සත්ත්ව තෙම අෂ්ටවිධ වූ ලෝක ධර්‍මද මෙලොව පරලාව දෙක්හි බලන්නේ වීනම් ඕ හට මහත් වූ සෝකයකුත් ශරීර තාපනය නොකරන්නේය”

“තවද සත්ත්වයා හට ලාභද, අලාභයද, අයස්ද, යසස්ද, නින්දාවද, ප්‍රශංසාවද, සැපයද, අසැපයද යන මේ සියල්ලම නිත්‍ය බව සත්ත්වයන්ගේ ස්වභාව ධර්‍මයෙක් වන්නේය. එසේ හෙයින් සෝක නම් නොකටයුතු වන්නේය. තවද මලණ්ඩ භරත කුමාරයෙනි, නුවණැත්තා අන්ධ වූ අඥාන සත්ත්වයන් මෙන් ඇඬීම, වැලපීම් සුදුසු නොවන්නේය. මම වනාහි මාගේ පියාණන්ගේ ඇවෑමෙන් උන්ගේ තනතුරෙහි සිට දුගීමගී යාචකයින්ට දන්දීම්ද, යසපිරිවර දෙන්ට නිස්සන්ට යසස්ද,

මාගේ පියාණන් අනුභව කළා සේම යසස් අනුභව කෙරෙමින් නෑයන් පෝෂ්‍යය කෙරෙමි. අවශේෂ වූ මාගේ පරිවාර ජනයන් රකිමි. ධාර්මික වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට රක්‍ෂාවරණයෙන් රකිමි. මෙතන කර්තව්‍ය දන්නා වූ ප්‍රාඥයන්ට සුදුසු වන්නේය. එසේ හෙයින් මා සෝක කරන්නේ නැතැ''යි කීහ.

එකල සිටියා වූ පර්ෂිත් රාම පණ්ඩිතයන්ගේ අනිච්චතාව ප්‍රකාශ කරන්නා වූ ධර්‍ම දේශනාව අසා නිස්සෝකී වූහ. ඉක්බිති භරත කුමාරයෝ රාම පණ්ඩිතයන් වැඳ ''බරණැස් රාජ්‍යය පිළිපැදද මැනවැ''යි කීහ. රාම පණ්ඩිතයෝ කියන්නාහු ''එම්බල, ලක්‍ෂණ කුමාරයන් හා සීතා දේවීන් කැඳවාගෙන ගොස් රාජ්‍යනුශාසනා කරව''යි කීහ. එබසට භරත කුමාරයෝ කියන්නාහු ''දේවයන් වහන්ස, නුඹවහන්සේ යනු''යි කීහ. රාම පණ්ඩිතයෝ කියන්නාහු ''මාගේ පියාණන් වහන්සේ මට දොළොස් අවුරුද්දක් ගියකල අවුත් රාජ්‍යයට කරව''යි කීසේක. මම දැන්ම ගියේ වීනම් උන්වහන්සේට නොකීකරුවා නම් වෙයි. එසේ හෙයින් අනික් තුන් අවුරුද්දක් ගියකල එමි'' කීහ. නැවත භරත කුමාරයෝ කියන්නාහු ''එසේකල මෙදෑතුරු රාජ්‍යය කරන්නෝ කවුරුදැ?''යි කීහ. රාම පණ්ඩිතයෝ ''තෙපි රාජ්‍යය කරව''යි කීහ. භරත කුමාරයෝ ''අපි රාජ්‍යය නොකරම්හ''යි කීහ. නැවත රාම පණ්ඩිතයෝ කියන්නාහු ''එසේ වීනම් යම්තාක් මාගේ ඊම වේද ඒතාක් මේ මිරිවැඩිසඟල රාජ්‍යය කරවන්නේය''යි තමන්ගේ මිරිවැඩිසඟල පාවා දුන්හ.

එකල ඔහු දෙන්නා හා භරත කුමාරයන් හා මිරිවැඩිසඟල ඇරගෙන රාම පණ්ඩිතයන් වැඳ සමුගෙන මහජනයා පිරිවරා බරණැස් නුවරට ගොස් තුන් අවුරුද්දටම මිරිවැඩිසඟල තබා රාජ්‍යය කළාහුය. ඒ අමාත්‍යයෝ මිරිවැඩිසඟල පර්‍ය්‍යඞ්කයෙහි තබා යුක්ති විචාරන්නාහ, ඉදින් ඒ විනිශ්චය නපුරු වීනම් මිරිවැඩිසඟල ඇරගෙන ඉන් වෙන්වී වැදගන්නේය. ඒ සලකුණෙන් අමාත්‍යයෝ නැවත විනිශ්චය කරන්නා මනාකොට විනිශ්චය කරන ලද්දේ වීනම් නිශ්චලව තිබෙන්නේය. රාම පණ්ඩිතයෝද තුන් අවුරුද්දක් ඉකුත් වූකල වලින් නික්ම බරණැස් නුවරට ගොස් උයනට වැද උන්හ. ඒ බව දත් කුමාරවරහු අමාත්‍යයන් පිරිවරා උයනට ගොස් සීතා දේවීන් අග්‍රමහේසිකා කොට දෙදෙනාම අභිෂේක කළාහ.

මෙසේ අභිෂේකයට පැමිණියා වූ මහබෝසතාණෝ සරහා පිළියෙළ කරන ලද්දා වූ උතුම් වූ රථයට පැන නැගී සිටියාහු මහත් වූ පෙරහරින් නුවරට වැද පැදකුණුකොට සුචන්ද්‍රා නම් ප්‍රාසාදයෙහි මතුමාලට නැගී එතැන් පටන් සොළොස් අවුරුද්දක් දැහැමෙන් රාජ්‍යයකොට ස්වර්‍ගග ලෝකය පිරුවාහුය. ඒ අර්ථය ප්‍රකාශ කරන්නාහු බුදුරජාණන් වහන්සේ "එම්බා මහණෙනි, රන් මිහිගු බෙරක් හා සමාන වූ ග්‍රීවයක් ඇති මහත් වූ බාහු යුග්මයක් ඇති ඒ රාම රජ්ජුරුවෝ දස දහසක් හා නැවතී සසියයක් සම්බන්ධ වූ සදසක් ඇතුළු වූ සොළොස් දහසක් අවුරුදු ධර්‍මයෙන් රාජ්‍යය කළෝ වේදැ"යි වදරා මේ 'දසරථ ජාතකය' නිමවා වදළසේක.

චතුස්සත්‍යයාගේ කෙළවර සෝකාතුර වූ කෙළෙඹිපුත්‍ර තෙම සෝවාන් ඵලයෙහි පිහිටියාහ.

"එසමයෙහි දසරථ රජ්ජුරුවෝ නම් දැන් මේ සුද්ධෝදන රජ්ජුරුවෝය. එසමයෙහි මව් බිසව නම් දැන් මේ මහමායා දේවිය. එසමයෙහි සීතාදේවී නම් දැන් මේ රාහුල මාතාවෝය. එසමයෙහි භරත කුමාරයෝ නම් ආනන්ද ස්ථවිරයෝය. එසමයෙහි ලක්‍ෂණ කුමාරයෝ නම් දැන් මේ ශාරිපුත්‍ර ස්ථවිරයයෝය. එසමයෙහි පර්ෂිත් නම් දැන් මේ බුදුපිරිසය. එසමයෙහි රාම පණ්ඩිතයෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 455. සංවර ජාතකය

තවද පිරිසිදු ගුණ ඇති බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි පසුබට වීර්‍ය්‍ය ඇති භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ කෙසේද? යත්,

සැවැත් නුවර වැසි කුලපුත්‍රයෙක් බුදුන්ගේ බණ අසා මහණ ව ආචාරී වත්, උපාධ්‍යාය වත් පුරන්නේ උභය මාතෘකා වනපොත්කොට පිරුණා වූ පස් වස් ඇතිව කර්මස්ථාන ඉගෙන වල්හි වාසය කෙරෙමින් ආචාර්‍ය්‍ය උපාධ්‍යයන් ගෙන් අවසරගෙන කොසොල්රට එක් පසල් ගමකට ගොස් තමන්ගේ සාන්ත දාන්ත ගුණයෙහි පැහැද ඒ ගම උපාසකවරුන් විසින් කොටා දෙනලද පන්සලෙහි වාසය

කෙරෙමින් උපස්ථාන කෙරෙමින් උපස්ථාන විඳ වස්වැස විදර්ශනා වඩා ඉතා ආයාසකොට වඩනා ලද වීර්‍ය්‍යයෙන් තුන් කර්මස්ථාන භාවනාකොට අපහාස මාත්‍රයකුත් උපදවාගත නොහී සිතන්නාහු “ඒකාන්තයෙන් සර්‍වඥයන් වහන්සේ දෙසු පුද්ගලයන් සතරදෙනා අතුරෙන් මම පාළි ඉගැන්වීමෙන් මෙහි දක්‍ෂ වෙමි. එසේ හෙයින් මම වල්හි වාසය කිරීමෙන් කම් කිම්ද? බුදුන්ගේ රූප ශ්‍රී බල බලා මිහිරි වූ බණ අස අසා දවස් යවමි” සිතා වීර්‍ය්‍ය හැර එතනින් නික්ම අනුක්‍රමයෙන් ජේතවනාරාමයට ගොස් අචාර්‍ය්‍ය උපාධ්‍යයන් සන්දිෂ්ට සම්භක්තයන් විසින්ද ආ කාරණය විචාරණ ලදුව “තමන් කර්මස්ථාන ඇර ආ නියාව” කියා ඔවුන් ඇම විසින් “මහණ, තෝ කුමක් පිණිස කර්මස්ථාන යෙදීමෙන් පසුබටදැ?”යි නින්දාකොට බුදුන් සමීපයට ගෙනගොස් බුදුන් විසින් “මහණෙනි, මේ භික්ෂූහු කුමක් පිණිස නොකමැති කරවා ගෙණාහුදැ?”යි කී කල්හි එපවත් අසා “මහණ, තෝ කුමක් පිණිස පසුබටවුවා වූ වීර්‍ය්‍ය ඇත්තෙහි විද? මේ ශාසනයෙහි වීර්‍ය්‍ය නැත්තා වූ කුසීත පුද්ගලයන්ට අග්‍රඵල අරහත්වයෙක් නම් නැත. පටන් ගන්නාලද වීර්‍ය්‍ය ඇති මහණ තෙම ධර්‍ම ක්‍ෂාත්ක්‍ෂාත් කරන්නේය. තෝ වනාහි පෙර වීර්‍ය්‍ය ඇත්තෙහිය. අවවාද ක්‍ෂමායෙහි එම කාරණයෙන් බරණැස් රජ්ජුරුවන්ගේ පුතුන් සියයකට බාල මල් වත් නුවණැත්තන්ගේ අවවාදයෙහි සිට රාජ්‍යයට පැමිණියෝ වේදැ?”යි වදරා ඒ භික්‍ෂූන් විසින් ආරාධිත වූ බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් වහන්සේ රාජ්‍යය කරන සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ පුතුන් සියයකට බාල "සංවර කුමාරයෝය"යි යන පුතණු කෙනෙකුන් වන්නාහුය. එකල රජ්ජුරුවෝ එකී එකී අමාත්‍යයෙකුට පාවාදී "ශිල්ප උගන්ව"යි සම්මත කළහ. එසේ පාවාදෙන සංවර කුමාරයන්ට ආචාරීකමට බෝධිසත්ත්වයෝ සැලැස්වාහුය. ප්‍රාඥ වූ ව්‍යක්ත වූ ඒ බෝධිසත්ත්වයෝ ඒ රාජකුමාරයන්ට පීතෘ ස්ථානයෙහි සිට හික්මවන්නා වූ අවශේෂ අමාත්‍යයෝ රාජකුමාරවරුන් උගන්වා රජ්ජුරුවන් දක්නාහුය. රජ්ජුරුවන් කුමාරවරුන්ට දනව් දී යවන්නාහුය.

එකල සංවර කුමාරයෝත් ශිල්ප ශාස්ත්‍ර ඉගෙන නිමවා බෝධිසත්ත්වයන් අතින් විචාරන්නාහු "ආචාරීන් වහන්ස, ඉදින් මාගේ පියාණන් වහන්සේ මට ජනපදයක් දී යවනසේක් වීනම් කළමනා කිම්දැ?"යි කීහ. මහබෝසතාණෝ කියන්නාහු "දරුව, තොපි දනව් ගම් දෙන්ට වන් කල ඒ නොගෙන 'දේවයන් වහන්ස, මම ඇමටම බාලයෙමි. මාත් ගිය කල නුඹවහන්සේගේ ශ්‍රීපාද සෙවන සිස් වන්නේය. එසේ හෙයින් මම සමීපයෙහි වෙසෙමි' කියව"යි කීහ. ඉක්බිති එක් දවසක් සංවර කුමාරයන් වැඳ එකත්පස්ව සිටි කල්හි රජ්ජුරුවෝ කියන්නාහු "පුත, තොප ශිල්ප ඉගෙන නිමියේදැ?"යි කීහ. කුමාරයෝත් "එසේය, දේවයන් වහන්සැ"යි කීහ. "එසේ වීනම් පුත, තොපට ජනපදයක් ඇරගණුව"යි කීහ. කුමාරයෝ කියන්නාහු "දේවයන් වහන්ස, ඒසේ කල්හි නුඹවහන්සේගේ

සමීපය සිස් වන්නේය. මම සමීපයෙහි වෙසෙමි” කීහ. එබසට රජ්ජුරුවෝ සතුටුව “යහපතැ”යි පිළිගත්හ.

එදවස් පටන් රජ්ජුරුවන් සමීපයෙහි වාසය කෙරෙමින් බෝධිසත්ත්වයන් වහන්සේ අතින් “ආචාරීන් වහන්ස, තවත් මා කළමනා කිම්දැ?”යි විචාළාහ. බෝධිසත්ත්වයෝ කියන්නාහු “රජ්ජුරුවන් අතින් පරණ උයනක් ඉල්වාගෙන එහි අටගත් මල් හා පලාඵලයෙන් නුවරවැස්සන් ඉසුරුමතුන් සිත් ගැනීමට කටයුතු කරව”යි කීහ. නැවත “කළමනා කිම්දැ?”යි ගුරුන් අතින් විචාළාහ. “දරුව රජ්ජුරුවන්ගේ අන්තඃපුරයටත් වැටුප් පසිඳුව”යි කීහ. කුමාරයෝත් එපරිද්දෙන්ම කළාහ. නැවතත් බෝධිසත්ත්වයන් විචාරා රජ්ජුරුවන්ගෙන් අවසරගෙන අන්තඃපුරයෙහි ඇතුන්ටද, දැසි දසුන්ටද, සියළු පාබල සෙනඟටද නිරන්තරයෙන් වු‍ර්ති නොවරදවා නොපිරිහෙලා පසිඳිනාහ. නොයෙක් රටවලින් ආවා වූ දූතයන් ආදීන්ට නවාතැන් ආදියද, වෙළඳුන් ආදීන්ගෙන් ගතමනා සුන්වත් ආදිය යන මේ සියල්ලම තමන්ගේ විධානයෙහිම තිබූහ. මෙසේ සංවර කුමාරයෝ බෝධිසත්ත්වයන්ගේ අවවාදයෙහි පිහිටා සියළු අන්තඃපුර ජනයාද, පිටිසර වැස්සන්ද, ගන්වර වැස්සන්ද, ජනපද වාසීන්ද, නොයෙක් තැනින් ආ ආගන්තුක ජනයාද උපස්ථාන කිරීමෙන්ද, සංග්‍රහ වස්තුයෙන්ද සිත්ගෙන සියල්ලවුන්ට මනාව වැඩ ව හැසිරෙන්නාහ.

මෙසේ කල්යාමකින් මරණ මඤ්චකයෙහි සිටි කල අමාත්‍යයෝ “දේවයන් වහන්ස, නුඹවහන්සේගේ ඇවෑමෙන්

රාජ්‍යය කාට පමුණුවමෝදැ?”යි විචාරා රජ්ජුරුවෝ කියන්නාහු “එම්බා දරුවෙනි, මාගේ දරුවෝ ඇමෝම අභිෂේකයට නිස්සෝහ. එසේ හෙයින් යම් කෙනෙක් තොපගේ සිතට ප්‍රියයෝ වීනම් තොප ඇම සිත්ගෙන වෙසෙත් නම් උන්ට රාජ්‍යය පමුණුව”යි කියා කාලක්‍රියා කළාහ. උන් කළුරිය කල කල්හි ආදාහන කෘත්‍යයකොට සත්වෙනි දවස් අමාත්‍යයෝ ඇම එක්ම “යම් කෙනෙක් තොපගේ සිතට ප්‍රියයෝ වීනම්, තොප ඇම සිත්ගෙන වෙසෙත් නම් රාජ්‍යය උන්ට දෙවයි රජතුමා මිය යද්දී කීහ. එසේ හෙයින් දැන් සංවර කුමාරයන් ඇම සිත්ගෙන වසන්නාහ”. බන්ධු පිරිවර කොට ඇති සංවර කුමාරයන් කචන මාලාවෙන් හෙබියා වූ සේසත් නන්වා අභිෂේක කළාහ. සංවර රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන්ගේ අවවාදයෙහි සිට දැහැමෙන් රාජ්‍යය කළාහ. අවශේෂ කුමාරවරු තමන්ගේ පියාණන් මළ බවත්, සංවර කුමාරයන් අභිෂේක කළ බවත් අසා “උං ඇමට බාලයෝය. එසේ හෙයින් උන්ට රාජ්‍යය නොපැමිණෙයි, ඇමට වැඩිමාළු තැනැත්තන්ට රාජ්‍යය පමුණුවම්හ”හි ඇවිත් පිටිනුවර සිට “රාජ්‍යය හෝ දෙව, යුද්ධ හෝ කරව”යි කියා සංවර රජ්ජුරුවන්ට අසුන් යවා නුවර වටළුහ.

එකල සංවර රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන්ට එපවත් කියා “කළමනා කිම්දැ?”යි කීහ. බෝධිසත්ත්වයෝ කියන්නාහු “මහරජ, තොපට බෑයන් හා යුද්ධයෙන් කම් නැත. පියාණන් සන්තක වස්තුව සියක් කොටස බෙදා එකුන් සියයක් පමණ මේ කුමාරවරුන්ට තොපගේ පියාණන් සන්තක වස්තු

කොට්ඨාස ගණුව. මම තොප හා කරන යුද්ධයක් නැතැ''යි සම්මත කළාහ. සංවර රජ්ජුරුවෝ එපරිද්දෙන්ම කළහ.

එකල ඇමට වැඩිමාළු බෑණෝ උපෝසථ නම් කුමාරයෝ අවශේෂ කුමාරවරුන් තමන් සමීපයට කැඳවා "එම්බා මල්නි, රජදරුවන් ඉක්ම පවතින්ට සමර්ථ කෙනෙක් නම් නැත, මුයිත් අපට බාල සිට මලණුවෝය. අපට සතුරුත් නොවී පියාණන් සන්තක වස්තුවත් එවා සටන් නොකෙරෙති කියා එවන්නාහ. අපි ඇමත් එකවිටම අභිෂේක කරන්නමෝ නොවම්හ. එකක් හට ඒ අභිෂේක කරම්හ. එසේ හෙයින් මුන්ටම රාජ්‍යය වන්නේය. යම්හ උන් සමීපයට ගොස් දැක රජ්ජුරුවන්ගේ අන්තඃපුරය උන්ට පාවාදී අපි අපගේ ජනපදවලට යම්හ''යි කීහ. එකල ඒ කුමාරවරු ඇමදෙනම "යහපතැ''යි නුවරදොර අරවා සතුරු නොව නුවරට වන්හ. සංවර රජ්ජුරුවෝද උන් ඇමට සත්කාර සම්මාන අමාත්‍යයන් ලවාගෙන පෙරමගට යවූහ. කුමාරවරුද මහපෙරහරින් පයින් ම රජගෙට ගොස් වැඳ සංවර රජ්ජුරුවන්ට ආදර දක්වා මිටි වූ අසුන්වල උන්හු, සංවර රජ්ජුරුවෝ නගනලද දලපුඩු සේසත් ඇති සිංහාසනමස්තකයෙහි උන්හ. උන්නා වූ ඒ රජ්ජුරුවන්ගේ මහත් වූ යසස්ද ශ්‍රී සොභාද විය. බැළූ බැළූ දිසාව කම්පා වනනේය. එකල උපෝසථ කුමාරයෝ සංවර රජජුරුවන්ගේ ශ්‍රී සමුර්ධිය දැක "අපගේ පියාණන් වහන්සේ තමන් වහන්සේගේ ඇවෑමෙන් සංවර කුමාරයන්ට රාජ්‍යය සිතා වන, අප ඇමට ජනපද දී යවා මුන්ට නුදුන්නාහු නුවණැ''යි සිතා සංවර රජ්ජුරුවන් හා සමඟ කථා කරන්නාහු

“මහරජ්ජුරුවෙනි, අපගේ පියරජ්ජුරුවෝ එකුන් සියයක් පමණ කුමාරවරුන්ට ජනපදවලින් පුජාකොට යවන්නාහු ‘තමන්ගේ ඇවෑමෙන් තෙමේ රාජ්‍යයට පැමිණෙන්නේය’යි දැනම තොපට කුඩා වු ජනපදයක් නුදුන්නේ වන. තවද මහරජ්ජුරුවෙනි, තොපි රාජ්‍යය පතන්නාහු අපගේ පියරජ්ජුරුවෝ තමන් ජීවමානව ඉන්නා කලම තැකූහ. නොහොත් උන් ඇවෑමෙන් අමාත්‍යයන් හා ජනපදවාසීන් හා තොපගේ නෑයෝ තමන්ට වැඩ සඳහා රාජ්‍යයට පැමිණි වූහ. තවද සංවර රජ්ජුරුවෙනි, තොපගේ කවර ශීලව්‍රත සමාදානයකින් තොප කෙරෙහි හටගත් කවර ගුණයකින් මෙතනට රැස් වූ එකුන් සියයක් කුමාරවරුන් ආදි කොට ඇති සියළු නෑයෝ තොප හික්මයෙද්ද? තොප උන්ට පැවැත්තෝද? ඒ මට කියව”යි කීහ.

එබස් අසා සංවර රජ්ජුරුවෝ තමන් ගුණ ඇති කියන්නාහු “එම්බා රාජකුමාරයෙනි, මම කිසි සත්ත්වයක්හට ඔහුගේ යසස් දැක ‘මේ සම්පත් මෝ හට නොවෙව’යි මා සොම්නස් උනේ නැත, තවද සමිත පාපී හෙයින් ශ්‍රමණ නම් වූද මහත් වූ ශීලස්කන්ධයන් එෂණ ගවේෂණ කරන හෙයින් මහණ නම් වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් දුටුකල පසඟ පිහිටුවා උන්ගේ පාදයන් වැඳ දන්න මුත් උන් ඇමට ධාර්මික වූ රක්‍ෂාවරණගුප්තිය එලවමින් පුජා කරන්නා වූ මම්ම ඇමට සකස්කොට පුජා කෙරෙමි. තවද ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මෙබඳු ගුණ ඇති මා මෙසේ වු ගුණයක් ඇතැයි දැන ‘මෙබන්දක් කරව’යි ‘මෙබන්දක් නොකරව’යි අනුශාසනා

කරන්නාහ. මමද මහසෘෂි වූ ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ බස් අසා කිසිවක් ම නොකරමි. මාගේ චිත්තය කුසලයෙහිම නිරත කෙරෙමි. තවද ඇත්රුවන් අසරුවන් වැනි නාහකවරුන්, රථාචාරීවරුන්, පාබල සෙනඟද යන මේ සියල්ලවුන්ට නිරන්තරයෙන් දිය යුතු යම් වස්තුවෙක් ඇත්නම් නොපිරිහෙලා දෙමි. තවද බෑයන් වහන්ස, මාගේ නුවණැති මන්ත්‍රණයෙහි දක්‍ෂ අමාත්‍යයෝද, අවශේෂ පිරිවර ජනයෝද ඇත. නුඹවහන්සේලා ඇම ප්‍රඥා සම්පන්න පණ්ඩිතවරුන් නොලත් හෙයින් සේක. අපගේ ආචාරී නුවණැත්තෝය. උපායෙහි දක්‍ෂයෝය. උං රාජ්‍යයෙහි පිහිටු වූහ. තවද බෑයන් වහන්ස, මා අභිෂේක කළ තැන් පටන් අපගේ රජ්ජුරුවෝ ධාර්මිකයෝය, උන්ගේ රට සාරපෝයෙහි වැසි වස්නේය, උන් රට සමුර්ධිබල ඇත්තේය, බරණැස් නුවර ආදී වූ බොහෝ රටවලින් ආඩ්‍ය වූ වෙළෙඳවරුන් ඇවිත් මෙහි වසන්නාහ, එසේ හෙයින් උන්ගෙන් මට ආරක්‍ෂා ඇත. තවද හස්ති රත්නය, අශ්ව රත්නය, මුතු, මැණික් ආදිය හැරගෙන ඇවිත් නිරුපද්‍රිත ව වෙළඳමුත් කරන්නා වූ වෙළඳනුන් බොහෝව. බෑයන් වහන්ස, මම මෙතෙක් කාරණයෙන් ඇමට බාලවත් මාගේ බෑයන් හැමට මැඩගෙන රාජ්‍යයට පැමිණියෙමි. ඒ බව දැනුව”යි කීහ.

ඉක්බිති සංවර රජ්ජුරුවන්ගේ ගුණ අසා උපෝසථ කුමාරයෝ කියන්නාහු “මල සංවර රජ්ජුරුවෙනි, තොපි වනාහි එකුන්සියයක් පමණ වැඩිමාළු බෑයන් ආනුභාව මැඩ ධර්ම බලයෙන් ම පවතුව, මෙතැන් පටන් තොපිම රාජ්‍යය

කරව. නුවණින් යෙදී වසව. බන්ධුන්ටත් හිතව වසව. තවද ඒ ගුණයෙන් සමුර්ධව තෙපි අප එකුන්සියයක් ඇති ඤාති සමුහයා පිරිවරා සප්තවිධ රත්නයෙන් සමන්විත වූ තව්තිසාවැසි දෙවියන් පිරිවරකොට ඇති ශක්‍රදේවේන්ද්‍රයන් අසුරයෝ ජයගත නොහෙන්නා සේ තොපත් එපරිද්දෙන්ම පරසතුරෝ ජයගත නොහෙන්නාහ. එසේ හෙයින් තුන්සියයක් පමණ යොදුන් කසීරට දෙළොස් යොදුන් බරණැස් නුවර සැප සේ රාජ්‍යය කරව”යි කීහ.

ඉක්බිති සංවර රජ්ජුරුවෝ එකුන්සියයක් පමණ තමන්ට වැඩිමාළු රජකුමරුන්ට මහත් සම්පත් දුන්හ. ඔහු ඇමදෙනත් මසක්, පෝයක් රජ්ජුරුවන් කෙරේ වාසයකොට “මහරජ, ජනපදවලින් සතුරෝ ඇත්නම් ඊට නිහඬ අපි දනුම්හ. නුඹවහන්සේ රාජ්‍යය කළ මැනවැ”යි කියා තමන්ගේ ජනපදවලටම ගියාහ. සංවර රජ්ජුරුවෝද බෝධිසත්ත්වයන්ගේ අවවාදයෙහි සිට රාජ්‍යය පරිපාලනයකොට ආයුෂයාගේ කෙළවර දෙව්ලොව පුරමින් ගියාහ. සර්‍වඥයන් වහන්සේ මේ ධර්‍ම දේශනාව ගෙනහැර දක්වා “මහණ, තෝ මෙසේ අවවාදක්‍ෂමායෙහි දැන් කුමක් පිණිස වීර්‍ය්‍ය නොකරන්නෙහිදැ?”යි වදරා චතුස්සත්‍ය ප්‍රකාශකොට මේ ‘සංවර ජාතකය’ නිමවා වදාළසේක. චතුස්සත්‍යයාගේ කෙළවර ඒ භික්ෂුතෙම සෝවාන් ඵලයෙහි පිහිටියේ.

“එදවස් සංවර රජ්ජුරුවෝ නම් දැන් මේ මහණ වන්නේ. එසමයෙහි උපෝසථ කුමාරයෝ නම් ශාරිපුත්ත ස්ථවිරයෝය.

අවශේෂ අටානුවක් කුමාරවරු නම් අසූ මහසව්වන් හා අනුරුද්ධ ස්ථවිරයෝය. එසමයෙහි රජ පිරිස නම් දැන් මේ බුදු පිරිස් වන්නාහ. එසමයෙහි සංවර කුමාරයන්ට අවවාද දුන් අමාත්‍යයෝ නම් ලොවුතුරා බුදුවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# 456. සුප්පාරක ජාතකය

තවද මේ ජාතකය සර්වධර්මයන් සර්වකාරයෙන් පරෝපදේශ රහිතව ස්වයම්භූ ඥානයෙන් දත්තා වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසනසේක් ප්‍රඥා පාරමිතාව අරභයා වදාළසේක.

ඒ කෙසේද? යත්,

එක් දවසක් සවස් වේලෙහි සර්වඥයන් වහන්සේ ධර්මශාලාවට වැඩනා පෙරමඟ බල බලා උන් භික්ෂූන් වහන්සේ "ඇවැත්නි, අනේ බුදුන්ගේ ඥාණයෙක් යහපත් නියාව, මහත් වූ ප්‍රඥා ඇතිසේක. තීක්ෂණ ප්‍රඥා ඇතිසේක. නිර්ව්‍යාජ වූ ප්‍රඥා ඇතිසේක. ඒ ඒ උපායෙහි යෙදෙන්ට නිසි ස්ථානොචිත ප්‍රඥා ඇතිසේක. පොළොව සේ පතල වූ ප්‍රඥා ඇතිසේක. සමුද්‍රය සේ ගැඹුරු වූ ප්‍රඥා ඇතිසේක. ආකාශය සේ පතල වූ ප්‍රඥා ඇතිසේක. සියළු දඹදිව උපන්නා වූ ප්‍රශ්නයන් බුදුන් ඉක්මයන්ට සමර්ථයෙක් නැත. යම් සේ සමුද්‍රයෙහි නැංගා වූ තරඟ ඉක්ම නොගොස් වෙරළාන්තයෙහිම භග්න වේද? එපරිද්දෙන්ම කිසිවෙක් බුදුන් ඉක්ම යන්නෙක් නම් නැත. පාද

මූලයට පැමිණම භග්න වන්නේය"යි බුදුන්ගේ මහත් වූ ප්‍රඥා පාරමිතාවන් වර්ණනා කොට කොට උන්සේක. බුදුහු එකල තුන්තරා ගමනින් එක්තරා ගමනකින් දම්සභා මණ්ඩපයට වැඩ "මහණෙනි, මා එන්නට පූර්ව භාගයෙහි කිනම් කථාවක් කොට උනුදැ?"යි විචාරා වදරා "මෙනම් කථාවකින් යුක්තව උනුම්හ"යි කී කල්හි "එම්බා මහණෙනි, බුදුහු දැන්මතු නුවණැත්තෝ නොවෙයි, පෙරත් නුමුහුකුරුනා වූ නුවණැති කලක් අන්ධ ව මහසමුද්‍රයෙහි ජන සහිඥාවෙන් 'මෙනම් සමුද්‍රයෙහි මෙනම් රුවක් ඇත්තේය'යි දත්තෝ වේදැ"යි වදරා එක්තරා භික්ෂු කෙනෙකුන් වහන්සේ විසින් ආරාධිත වූ බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන්නාහුය. එනුවර භරුකච්ඡ නම් පටුනු ගමකුත් ඇත්තේය. එකල අප මහබෝසතාණෝ භරුකච්ඡ නම් පටුන්ගම නියමුන්ට නායක වූ නියමුවාට පුත්‍ර ව උපන්නාහු දුටුවන්ට ප්‍රසාද එලවන්නා වූ රන්වන් ශරීර ඇත්තා වූ කුමාරයන්ට නම් තබන්නාහු "සුප්පාර කුමාරයෝය"යි නම් තැබූහ.

මෙසේ ඒ සුප්පාර කුමාරයෝ මහපෙරහරින් වැඩෙන්නාහු සොළොස් ඇවිරිදි වයසම ශිල්පයෙහි පරතෙරට පැමිණ කල්යාමකින් පියාණන්ගේ ඇවෑමෙන් නියමුවන්ට නායකකම පැමිණ නියමු නායකකම් කරන්නාහු ප්‍රාඥයෝය. නුවණැත්තාහුය. උන් විසින් නැගී නැවක් නොනස්නේය. මෙසේ

කල්යාමකින් එනු දිය ගැසීමෙන් මහබෝසතාණන්ගේ ඇස් දෙකම නටුයේය. එතැන් පටන් නියමු දෙටුවෝ නියමුකම් නොකොට "රජ්ජුරුවන් නිසා ජීවත් වෙමි" සිතා රජ්ජුරුවන් සමීපයට ගොස් වන්නාහ. රජ්ජුරුවෝත් බෝධිසත්ත්වයන් වස්තු අගය කරන්නා වූ තනතුරෙහි පිහිටු වූහ. එතනැ පටන් බෝධිසත්ත්වයෝත් රජ්ජුරුවන්ගේ හස්ති රත්නය, අශ්ව රත්නය, මුක්තා මාණික්‍ය රත්නය ලක්‍ෂණ බලා අගය කරන්නාහු එකල එක් දවසක් රජ්ජුරුවන්ට මඟුලැත් තනතුරෙහි අඤ්ජන කූටය සේ කළු වූ ඇතකු ගෙනාහ. රජ්ජුරුවෝද ඒ ඇතු දැක "සුප්පාර පණ්ඩිතයන්ට පාව"යි කීහ. "යහපතැ"යි ගෙනගොස් බෝධිසත්ත්වයන්ට පෑහ. බෝධිසත්ත්වයෝ ඇතුගේ ශරීරය අතින් පිරිමැද බලා කියන්නාහු "මේ තෙම මඟුලැත් කමට නොනිසිය. පසකුඹින් සිටිනේය. මේ ඇතුගේ මව වදන ගමනේ ඇකයෙන් රඳවාගත නුහුනු වන. එසේ හෙයින් මෙතෙම බිම වැටි පස්කඩින් මිටි ව ගියේය"යි කීහ. ඒ බව ඇතු ගෙනා පුරුෂයන් අතින් විචාළාහු ඔහු ඇමත් "පණ්ඩිතයන් කියේ සැබැව"යි කීහ. රජ්ජුරුවෝ එපවත් අසා සතුටු ව පණ්ඩිතයන්ට කහවණු අටක් දුන්හ. තවද එක් දවසක් රජ්ජුරුවන්ට "මඟුල් අස් තනතුරටය"යි අසකු ගෙනාහ. ඔහුත් රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන්ට යවූහ. බෝධිසත්ත්වයෝ අශ්වයාත් අතින් පිරිමැද "මඟුලස් වන්ට සුදුසු නොවෙයි. මොහු උපන් දවස් මව් මැලි වන. එසේ හෙයින් මවගේ කිරි නොලදින් ඉඳුරා වැඩුනේ නොවෙ"යි කීහ.

ඒ බව ගෙනා පුරුෂයන් අතින් විචාරා "සැබැව"යි කීහ. ඒ බව අසාත් රජ්ජුරුවෝ කවහණු අටක් දුන්හ.

තවද එක් දවසක් රජ්ජුරුවන්ට "මඟුල් රථය"යි රථයක් ගෙනාහ. රජ්ජුරුවෝ දැක පණ්ඩිතයන් සමීපයට යවූහ. පණ්ඩිතයෝ රථයද අතින් පිරිමැද කියන්නාහු "මේ රථය සිදුරු ඇති ගසකින් කරන ලද්දේය. එසේ හෙයින් මේ රථය මඟුල් රථයට සුදුසු නොවේ"යි කීහ. ඒ බව විචාරා සැබෑම වුයේය. රජ්ජුරුවෝ ඒ අසාත් කහවණු අටක් දුන්හ.

තවද එක් දවසක් මාහැගි පලසක් ගෙනාහ. ඒ ද පණ්ඩිතයන්ට පෑහ. අතින් පිරිමැද බලා "මේ පලස මියන්ගෙන් දෂ්ටයෙනක් ඇතැ"යි කීහ. ඒ පරීක්‍ෂාකොට බලා දැක රජ්ජුරුවන්ට දැක් වූහ. රජ්ජුරුවෝ සතුටුව කහවණු අටක් දුන්හ. එකල පණ්ඩිතයෝ "මොහුගේ තෑගි කරණැවැමියෙකුගේ දීමක් මෙන. එසේ හෙයින් මේ කරණැවැමියෙකුට ද එකකු වනැ"යි සිතා "මෝහට උපස්ථානකොට ප්‍රයෝජන කිම්දැ?යි මා වසන්නාවූ ගමට යෙමි"යි භරුකච්ඡ නම් පටුනු ගමට ගියාහ.

මෙසේ ඒ බෝධිසත්ත්වයන් වාසය කරන කල වෙළෙන්දු නැවක් සරහා "කවරක්හු නියමු කරමෝදැ?"යි කථා කරන්නාහු "සුප්පාර පණ්ඩිතයන් නැගී නැවක් නොනස්නේය. උඹ තුමූත් නුවණැත්තෝය. උපායෙහි දක්‍ෂයෝය. ඇස් අන්ධ වී නමුත් සුප්පාර පණ්ඩිතයෝ අපට උත්තමයෝය"යි බෝධිසත්ත්වයන් සමීපයට ගොස් "අපට නියමුකම් කළ

මැනවැ''යි කියා බෝධිසත්ත්වයන් විසින් "මම අන්ධයෙමි. කෙසේ නියමුකම් කෙරේමිදැ?''යි කී කල්හි "ස්වාමීනි, අන්ධ වුවත් නුඹවහන්සේම අපට උත්තමසේකැ''යි නැවත නැවත යච්ඤා කළ කල්හි "යහපත දරුවෙනි, තොප ඇම කී සලකුණෙන් නියමුකම් කෙරෙමි''යි ගිවිස නැවට නැගී නික්මුනු කල්හි නැව් මහසමුද්‍රයෙහි සත් දවසක් උපද්‍රව නැතිව ගොස් සත්වෙනි දවස් ආ කල වාතයක් නගා නැව සාරමසක් මුළුල්ලෙහි පියවි සමුද්‍රයෙහිම ඇවිදුවා ඛුරමාලි නම් සමුද්‍රයට පැමිණ වුයේය. ඒ සමුද්‍රයෙහි මත්ස්‍යයෝ මනුෂ්‍ය ශරීර ඇත්තාහුය. දියෙහි ගැලෙමින්, ඉලිප්පෙමින් ඇවිදිනාහ. එකල වෙළඳුන් එම සත්ත්වයන් දැක බෝධිසත්ත්වයන් අතින් සමුද්‍රයෙහි නම් විචාරන්නාහු මෙසේ කියත් "කරමුවාතට බඳු වූ නාසා ඇති මනුෂ්‍යයෝ යටත් කුමුදුනාහ, උඩත් කුමුදුනාහ සුප්පාර පණ්ඩිතයන් වහන්ස, නුඹවහන්සේ අතින් විචාරම්හ. මේ සමුද්‍රය කවර සමුද්‍රයක්දැ?''යි කීහ. මේ එසේ ඒ වෙළඳුන් විචාළ කල්හි බෝධිසත්ත්වයෝ තමන්ගේ නියමු ශාස්ත්‍රයෙන් බලා දැක කියන්නාහු "වස්තු වෙළඳම් පිණිස හරුකච්ඡ නම් පටුන් ගමින් ආවා වූ තොපි ඇම නැව් නැගී පැමිණ මේ සමුද්‍රය 'ඛුරාමාලි' යයි කියති'' කීහ. ඒ සමුද්‍රයෙහි විදුරු උත්සන්න වන්නේය. බෝධිසත්ත්වයෝ සිතන්නාහු "ඉදින් මම මුන්ට 'විදුරු සමුද්‍රය'යි කීම් නම් මූ හැම වස්තු ලෝභයෙන් බොහෝ විදුරු උකා නැව නසා ගන්නාහ''යි. උන් හැමට නොකියාම නැව රඳවා උපායෙන් එක් යොතක් එලා මසුන් අල්ලන්නා සේ දැල් දම්මා විදුරු ගොඩනාංවා නැවෙයි බහා

නැව තුබුවායෙන් ස්වල්ප වූ බඩුවක් දම්මවා නික්මුනු කල්හි ඒ සමුද්‍රය ඉක්මගොස් මත්තෙහි ‘අග්නිමාලි’ නම් සමුද්‍රයට ගියාහ. ඒ සමුද්‍රය තෙම දිලියෙන්නා වූ ගිණිකඳු මෙන්ද, මුදුන් පැමිණි ඉරුමඬලක් මෙන්ද රැස්මි පවතිමින් සිටියේය. ඒ සමුද්‍රය දැක වෙළඳහු “යම් සේ ගිණිදැල් පෙණේද? යම් සේ සුර්යමණ්ඩලය පෙණේද? එපරිද්දෙන් මේ සමුද්‍රය පෙණෙන්නේය. සුප්පාර පණ්ඩිතයන් වහන්ස, නුඹවහන්සේ අතින් විචාරම්හ. මේ සමුද්‍රය කවර සමුද්‍රයෙක්ද? අපට කිව මැනවැ”යි කීහ.

එවිට බෝධිසත්ත්වයෝ කියන්නාහු “විදේශීව ආවා වූ තොප ඇම පැමිණි මේ සමුද්‍රය ‘අග්නිමාල’ යයි කියති” කීහ. ඒ සමුද්‍රයෙහි රත්රන් බොහෝකොට ඇත්තේ යයි බෝධිසත්ත්වයෝ එතනින් රත්‍රනුත් පෙර පරිද්දෙන් උපායෙන් නැවට නංවා ගත්හ. නැවත ඒ සමුද්‍රයත් ඉක්ම ‘දධිමාලි’ නම් සමුද්‍රයට පැමිණියේය. ඒ සමුද්‍රය දුටු වෙළඳහු විචාරන්නාහු “කිරෙහි පැහැයක් යම් සේ ද? දියෙහි පැහැය ද එපරිද්දෙන්ම වන්නේය. සුප්පාර පණ්ඩිතයන් වහන්ස, නුඹවහන්සේ අතින් විචාරම්හ, මේ සමුද්‍රය කිනම්දැ?”යි විචාළාහ.

බෝධිසත්ත්වයෝ කියන්නාහු “හරුකච්ඡ නම් පටුන් ගමින් නික්ම ධන සොයා ඇවිදිනා වූ තොප ඇම වෙළඳුන් විදේශීව ආවා වූ මේ නැව පැමිණි සමුද්‍රය ‘දධිමාලි’ යයි කියති” කීහ. ඒ සමුද්‍රයෙහි රිදී බොහෝ වන්නේය, එයින් බබලන්නේය.

එයින් උපායෙන්ම ගොඩනංවා නැවට නංවා ගත්හ. නැව සමුද්‍රය ඉක්ම 'කුසමාලි' නම් සමුද්‍රයට පැමිණියේය. වෙළඳහු ඒ සමුද්‍රය දැක විචාරන්නාහු "හී තණ වනයක් සේ ද? නිල්ගත් හොමයක් සේ ද? මේ සමුද්‍රයත් ඉන්ද්‍රනීල මැණික් පරිද්දෙන්ම බබලන්නේය. සුප්පාර පණ්ඩිතයන් වහන්ස, නුඹවහන්සේ අතින් විචාරම්හ, මේ සමුද්‍රය කිනම්දැ?"යි විචාළාහ.

බෝධිසත්වයෝ කියන්නාහු "හරුකච්ඡ නම් පටුන් ගමින් නික්ම වස්තු සොයා යන්නා වූ තොප ඇම වෙළඳුන් විදේශීව ආවා වූ අය මෙතනට පැමිණි මේ සමුද්‍රය 'කුසමාලි' නමැ"යි කීහ. ඒ සමුද්‍රයෙහි ඉන්ද්‍රනීල මාණික්‍ය බොහෝ වන්නේය. ඒද උපායෙන් නැවට නංවා ගත්හ. නැවත ඒ සමුද්‍රයෙන් ඉක්මගෙන 'නලමාලි' නම් සමුද්‍රයට පැමිණියේය. ඒ සමුද්‍රය වෙළඳහු දැක විචාරන්නාහු "යම් සේ උණ වනයෙක් බට වනයෙක් පෙනේද? එපරිද්දෙන්ම ඒ සමුද්‍රයත් පෙණෙන්නේය. සුප්පාර පණ්ඩිතයන් වහන්ස, නුඹවහන්සේ අතින් විචාරම්හ, මේ සමුද්‍රය කිනම්දැ?"යි විචාළාහ.

බෝධිසත්ත්වයෝ කියන්නාහු "හරුකච්ඡ නම් පටුන් ගමින් නික්ම වස්තු සොයා විදේශීව නැව් නැගී තොප ඇම පැමිණි මේ සමුද්‍රය 'නලමාලි' නමැ"යි කීහ. ඒ සමුද්‍රයෙහි වෛඩූර්‍ය්‍ය මාණික්‍ය බොහෝ වන්නේය. බෝධිසත්ත්වයෝ ඒද උපායෙන් නැවට නංවා ගත්හ. වෙළඳහු නලමාලි සමුද්‍රය ඉක්ම ඔබ්බට ගියකල 'වළබාමුඛ' නම් සමුද්‍රය දුටහ. ඒ සමුද්‍රයෙහි ජලය ඒ

ඒ ස්ථානයෙහි හාත්පසින් කඩාගෙන යන කලක් පරිද්දෙන් යන්නේය. විලී ගිය හෙබ සේ පෙණෙන්නේය. රැල නැගූ කල්හි එක් පාර්ශවයකින් ප්‍රපාත වන්නේය. භය ජනක ශබ්ද උපදනේය. කන් සීලිවන කලක් මෙන් ලය පැලී යන කලක් මෙන් සමුද්‍රය දැක වෙළඳහු භයින් ත්‍රස්තව බෝධිසත්ත්වයන් විචාරන්නාහු "මහත් වූ භය උපදවන්නා වූ අමානුසික වූ ඝෝර වූ මහත් ශබ්ද ඇසෙන්නේය. යම් සේ ගැඹුරු වූ හෙප් පෙනේද? එපරිද්දෙන් භය ජනක ප්‍රපාත ඇති සමුද්‍රයෙක් පෙණෙන්නේය. සුප්පාර පණ්ඩිතයන් වහන්ස, නුඹවහන්සේගෙන් විචාරම්හ, මේ සමුද්‍රය කිනම් සමුද්‍රයෙක්දැ?"යි විචාළාහ.

බෝධිසත්ත්වයෝ කියන්නාහු "එම්බා දරුවෙනි, තොප මේ පැමිණි සමුද්‍රය 'වළබාමුඛ' නම්, මේ සමුද්‍රයට පැමිණ කෙනෙකුන්ගේ ආපසු යාමෙක් නම් නැත. මේ සම්පත හා නැව ගලා විනාශයට පමුණු වන්නේය"යි කීහ. ඒ නැවෙහි සත් සියයක් පමණ නැංගා වූ මනුෂ්‍යයෝ ඇම දෙනම මරණ භයින් තැතිගෙන අවීචි මහනරකයෙහි සත්ත්වයන් මෙන් එපරිද්දෙන් ඉතා බැගෑපත්ව එකපැහැර භයින්ම හඬන්ට පටන් ගත්හ.

එකල මහබෝසතාණෝ "මා ඇර අනික් මුන් ඇමටම සැපතක් කරන්නට සමර්ථ කෙනෙක් නැත. සත්‍ය ක්‍රියායෙන් මුන් ඇමට සැපයක් කරන්ට" සිතා වෙළඳුන් තමන් සමීපයට කැඳවා "එම්බා දරුවෙනි, මා වහා සුවඳ පැනින් නාවා, අළුත් වස්ත්‍රයක් හඳවා, තලියක් පැනින් සම්පුණීකොට සරහා

නැව් හිස තබව"යි කීහ. වෙළඳහුත් වහ වහා එපරිද්දෙන්ම කළහ. බෝධිසත්ත්වයෝත් දෙඅතින් පිරුණු තලිය ගෙන නැව් හිස සිට සත්‍යක්‍රියා කරන්නාහු "යම් තෙනෙක්හි පටන් මම නවමනාව දනිම්ද? එතැන් පටන් මම මාහි කෙරෙම්ද? දැන දැන එකම ප්‍රාණියකු නැසූ නියාවත් නොදනිමි. පස් පවින් එකක් කළ නියාවත් නොදනිමි. ඒ සත්‍යක්‍රියාව හේතු කොටගෙන මේ නැව සැප සේම සිය නුවරට යෙව"යි කියා තලියෙහි පැන් නැව් හිස වත් කළාහ. එක්ෂණයෙහි සාරමසක් මුළුල්ලෙහි සමුද්‍රයෙහි ඇවිදි නැව ආපස්සේ නික්ම ඍද්ධිමත් කෙනෙකුන්ගේ ඍද්ධියානුභාවයක් සේ එක දවසකින්ම භරුකච්ඡ නම් පටුනු ගමට ගියේය. ගොසිනුත් අට ඉස්බක් පමණ තැන්ගොස් නැව ඇති තැනැත්තවුගේ ගේදොර සිටියේය.

එකල බෝධිසත්ත්වයෝ වෙළඳුන්ට ඒ සම්පත් බෙදා දී "තොප හැමට මෙතෙක් සම්පත් සෑහෙයි, මින්මතු යාත්‍රාවක් නොකරව"යි අවවාදකොට දිවි පමණින් කුසල්කොට කා බුන් මරණින් මත්තෙහි දෙව්ලොව උපන්හ. සර්වඥයන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා වදාරා "මහණෙනි, බුදුනු පෙරත් නුවණැත්තෝම වේදැ"යි වදාරා මේ 'සුප්පාර ජාතකය' නිමවා වදාළසේක.

"එකල නැව් නැගී පිරිස් නම් දැන් බුදුපිරිස් වන්නාහ. එසමයෙහි සුප්පාර පණ්ඩිතයෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.